සද්ධම්මසාගර

නම් වූ

ධම්මපදවණ්ණනාව

සද්ධම්මසාගර

නම් වූ

ධම්මපදවණ්ණනාව

ප්‍රතිපාදක.

රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ

ධම්මකුසලනායකස්ථවිරපාදයන් වහන්සේ

ප්‍රකාශනය

සෝමාවතී භේවාවිතාරණ භාරය



THE LATE

MR. SIMON ALEXANDER HEWAVITARNE.

BORN 20TH MARCH, 1875. DIED 17TH JANUARY, 1913.



සෝමාවතී හේවාවිතාරණ මැතිනිය



THE LATE

VEN'BLE ANAGARIKA DHARMAPALA.

(SIRI DEVAMITTA DHAMMAPALA)

Director of Tripitaka Muddrana Sabha

BORN 17TH SEPTEMBER, 1864. DIED 29TH APRIL, 1933

ප්‍රස්තාවනා

මහාසත්වයෝ පරදුක් නො ඉවසන්නෝ ය. පරදුකෙහි තැවෙන්නෝ ය. පරදුක් තම කරපිටට ගන්නෝ ය. මුළුලොව යියත් සේ ගන්නෝ ය. අන්හු නිසා ඇස්. ඉස්, මස්, ලේ, දෙන්නෝ ය. අන්හු නිසා සියදිවි හරින්නෝ ය. අන්හු නිසා ගිනිඅහුරෙන් පිරුණු සක්වළගැබ දෙපයින් මැඩ යැමෙහි සමර්ථයෝ ය. අන්හු නිසා අතර නො තබා උඩුකුරු කොට භිඳ වූ අඩයටිතුඹින් පිරී ගත් සක්වළගැබ මැඩ යැමෙහි සමර්ථයෝ ය.

මේ ඒ මහසතුන්ගේ අදහස:—

"මා වැන්නකු බලැති – එකලා ව තරු මේ සසර,
කිමරුත? බුදු ව ලෝසත – එතෙර කරණෙම් සසරින්"

ඇතැම් විට බුඩානන්තර කිහිපයක් ගෙවා ද නො ලැබිය හැක්කෝ ය, මෙබඳු මහාසත්වයෝ. එහෙයින් මොවුහු ලොව නැතැ යි කිය යුතු සේ ය ගත්යුතු.

ලොව නො ලැබිය හැකි මෙබඳු මහාසත්වයෙක් සර්වඥත්වොත්-තම වූ දීපඞ්කර සම්මා සම්බුදුරජානන් වහන්සේට මූණ ගැසුනේ ය, දිනෙක අතරමග දී. ඔහු නම්, සුමෙධ තවුස් තෙමේ ය.

මේ මහාභද්‍රකල්පයට සරුසැකි කප් සුවහසකින් ඔබ දඹදිවැ අමරවතී නම් නුවරෙක් විය. එ දවසැ එ නුවරැ හැම නුවරක් යට කොට නැඟී සිටියේ, දෙවිනුවරක් සේ ය. පින් දම් කරණවුනට තැන් වූ එ නුවර විරප්‍රසිඞ්ධ්‍රාහමණමහාසාරකුලයෙක් වූයේ ය. ඒ කුලය වනාහි කවදුත් ජාතිවාදයෙන් නින්දා නො කරණ ලද්දේ, සත්වන කුලපරම්පරාව තෙක්, අතර නො සිඳ දුක්විය හැකි පියමුතු පරපුරෙන් මොනවට පිරිසිදු වූයේ ය. නිදන් කොට ගුබු අසූ කෙළක් ධනය ඇති මේ බමුණුගෙදරැ දවස වියදම් දස අමුණෙක් විය කහවණු ම.

සුමෙධ තවුස් තෙමේ එ දවසැ මෙම බමුණුගෙදරැ උපන්නේ ය. නම් කළෝ ය, මවුපියෝ සුමෙධ යි. නිසි වයසේ දී උගත යුතු හැම ඛ්‍රාහමණධර්මයක් ඉතිරි නො කොට මැනැවින් මොහු උගත්තේ ය. මවුපියන්ගේ ඇවෑමෙන් මොහුට අයත් වූ මුතු මැණික් මිල මුදල් ආදි ධනරාශිය ද අතිවිශාල ය. එහෙත් මොහු ඉන් එකකුත් නො ගෙණ සියල්ල "ගන්නා එකෙක් ගණිවා"යි හැර දමා ඇඳි වතින් ම බමුණුමහාවාසලින් නික්ම හිමාලය කඳුවැටියට ගොස්,

බුදුතණකෙඳිවලින් කළ වැහැරියක් හැඳ පොරොවා, තපස් කරන්නට පටන් ගත්තේ, සත් දිනක් නො යවා ම එහි දී ලබන්නට හැකි පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගත්තේ ය.

මෙ දවසැ රම්මකනුවරැ වැස්සන් විසින් රම්මකනුවරට වඩින්නට ආරාධනා කරණ ලද්දේ වූහ දීපඞ්කර සම්බුදුරජානන් වහන්සේ. එහෙයින් ඔවුහු උන්වහන්සේ වඩිනා මගැ වළ ගොඩැලි සම කොට පිළියෙල කරන්නට පටන් ගත්හ. මේ වේලෙහි අහයින් යන සුමෙධ තවුස් තෙමේ මග පිළියෙල කරණ මේ මිනිසුන් දැක වහා බිමට බැස කරුණු අසා ඉන් මගකොටසක් ඉල්ලා ගෙණ සරසන්නට පටන් ගත්තේ ය. සුමෙධ තවුසන් ගත් මේ මගකොටස පිළියෙල කොට අවසන් කරන්නට කලින් බුදුරජානන් වහන්සේ සාරලක්ෂයක් රහතුන් ද ගෙණ රම්මක නුවරට වඩින්නට එ මගැ වැඩි සේක. තවුස් තෙමේ ඉදිරියට ම ආ උන්වහන්සේ දැක දොහොත් මුදුන් දී වැඳ "භාග්‍යවතුන් වහන්සේ මේ මඩ නො පාගා මාගේ පිට උඩින් වඩිනා සේක්වා" යි කොණ්ඩය ලිහා අඳුන්දිවිසම් දළවැහැරි ද මඩමතුයෙහි අතුරා ඒදණ්ඩක් සේ මඩ උඩ දිගා විය. එසේ මඩ උඩ දිගා වී සිතී ය. මෙසේ. "මේ දිවකුරු බුදුරදුන් සේ මම ත් අභිසම්බොධියට පැමිණ අසරණමහාජනයා බිහිසුණු මේ සසරදුකෙන් එ තෙර කොට පසුව පිරිනිවී යමි, ඒ ය මට සුදුසු" යි.

ඉක්බිති තීලෝගුරු වූ දීපඞ්කර සම්බුදුරජානන් වහන්සේ මඩ උඩ දිගා වී හුන් තවුස්, මතු බුදුවනබව දැන "බලවු මේ තවුස්, මොහු උග්‍රතපස් ඇත්තෙක්' ලෙහෙසියෙන් මිනිය හැකි මිනි හෙක් නො වේ මොහු, මේ මහාමඩ ගොහුරු උඩ දිගා වී සිටින්නේ නිකමට නො වේ, මා සේ බුදුවන්නට සිතා, ඒ පැතීම ඉටු වේ, මෙයින් සාරාසැකි කප් සුවහසක් ගිය තැනැ, ඒ වරදින්නේ නො වේ ය" යි වදාරා තවුසාට පසසා මල් අට මිටකිනුත් පුදා පැදකුණු කොට නුවර බලා වැඩි සේක. සාරලක්ෂයක් පමණ මහරහතුන් වහන්සේ ද තවුසා ගඳින් මලින් පුදා පැදකුණු කොට ගියහ.

එ තැන් සිට මේ මහාසත්ව තෙමේ වෙසතුරු අත්බව දක්වා ඒ ඒ අත්බව්හි ඉපිද ත්‍රිවිධචර්‍යා, චතුස්සඞ්ග්‍රහවස්තු, පංචමහා පරිත්‍යාග, සමත්‍රිංශත්පාරමීධර්ම ආදී බුඩකාරකධර්ම සම්පූර්ණ කොට තුසිතදෙව්ලොව උපන්නේ දස දහස් ලෝදාහි දෙව්බඹුන් විසින් කළ ආරාධනා ඇත්තේ ඉන් චුත ව සුද්ධොදනමහරජුන් නිසා මහාමායාදේවීන් කුසැ පිළිසිඳ ගත්තේ දසමස් ගෙවා මවුකුසින් බිහි විය.

ඒ අවදියෙහි නමින් සිඩාර්ථ නම් වූ මේ මහාසත්ව තෙමේ නිසි වයස්හි හැම ක්ෂත්‍රියධර්මයක පරතෙර දැක දෙව් සිරි පරයා රජසිරි විඳිනුයේ ද එහි කලකිරී ඒ හැර දමා එකුන් තිස්වියේ දී ගෙයින් නික්ම පැවිදි වූයේ ය. එ තැන් සිට පැවිද්දෙහි පල ලබන්නට සිතූ මහාසත්ව තෙමේ කෂ්ටව්‍රතසමාදානයෙන් සාවුරුද්දක් කල් ගෙවූයේ ය. නැවැත සිය අත්බව මෙසේ තැවීමෙන් පෙළීමෙන් වෙහෙසට පැමිණ වීමෙන් දුක් දීමෙන් සිය අදහස මුදුන් පමුණු වන්නට නො හැකිබව දැන මැදුම්පිළිවෙතට පිළිපන්නේ අජපල්නුගරුක්මුල දී සුජාතාවන් දුන් දිය නො මුසු කිරිපිඩු වලදා ආනාපාණසති වඩා රූපාරූපසමාපත්තීන් උපදවා දෙවියන් මැවූ මගින් මහබෝමැඩ කරා යනුයේ අතරමග දී සොත්ථිය නම් බමුණු දුන් කුසතණ ද පිළිගත්තේ ය. මෙසේ බෝමැඩ කරා ගිය මහාසත්ව තෙමේ ඒ කුසතණ එහි අතුරා වැඩ හිඳ ඉර බසින්නට පෙරාතු ව ම හැම මරුරුපුන් මැඩ ප්‍රථම යාමයෙහි පුබ්බෙනිවාසානුස්සතිඤ්ඤාණය, මධ්‍යමයාමයෙහි දිබ්බ චක්ඛුඤ්ඤාණය, පශ්චිමයාමාවසානයෙහි ආසවක්ඛයඤ්ඤාණය ලබා දශබලචතුවෛශාරද්‍යදී වූ හැම ගුණයකින් පිරී ගත් ඥානසාගර ය යි කියූ සර්ව්ඥතාඥානයට පැමිණ තත්ත්වපුණිඅසහායමහාපුරුෂ වූයේ ය. ඒ මහාපුරුෂ නම්, ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණ යෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයන්ගෙන් හෙබි ලොකාලොක කර වූ ගෞතම සම්මා සම්බුදු රජානන් වහන්සේ ය.

බුඩවචනය

අසහායමහාපුරුෂත්වයට පැමිණි මාගේ පිය වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙහි ගම් නිසම් ගම් රජදනවුහි හැසිර සත්වහිත පිණිස දෙශනා කරණ ලද ධර්ම යෙහි මහත්ත්වය තෙමේ ලොකයෙහි පුහුදුන් කිසිවකු විසිනුත් නො කියහැකි ය. ඒ කිය යුත්තේ එබඳු බුදුකෙනෙකුත් විසින් ම ය. බවදුක් නැසීමෙහි එකායනමාර්ගය වූ ඒ නෛර්යාණිකධර්මයාගේ මහත්ත්වය හා චිරස්ථිතිය පැතූ මහාකාශ්‍යපමහාස්ථවිරප්‍රමුඛවසීගණයා විසින් උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ඒ මේ ධර්ම සමූහය තෙමේ මේ ධර්ම ය, මේ විනය ය, මේ ප්‍රථම බුඩවචන ය, මේ මධ්‍යමබුඩවචන ය, මේ පශ්චිමබුඩවචන ය, මේ විනයපිටක ය, මේ සූත්‍රපිටක ය, මේ අභිධර්මපිටක ය යන ඈ ලෙසින් මුළුමනින් සඞ්ගායනා කරණ ලද්දේ ය. ව්‍යවස්ථා කරණ ලද්දේ ය.

ප්‍රථමසඞ්ගීතියෙහි ලා රස-ධර්මවිනය-බුඩවචන-පිටක-නිකාය-අඞ්ග-සකන්ධ-උද්දාන-වර්ග-පෙය්‍යාල - නිපාත-සංයුත්ත - පණ්ණාස

විසින් සඞ්ගීත වූ ඒ මේ ධර්මසමූහයෙහි ධම්මපදය තෙමේ ඛුද්දකනිකායයට පිවිස ගත්තේ, අඞ්ග විසින් බෙදුනු තැන ගාථාඞ්ගයට ඇතුල් ව ගත්තේ ය.

ධර්මපදය

ධර්ම නම්, ශ්‍රොතාපත්තිආදිචතුර්විධමාර්ගය ය. කෙලෙසුන් නිසා සිවු අපායයෙහි හෙන, පුන පුනා සසරු ඉපැදෙන සත්වයන් අපායයෙහි හීමෙන්, පුන පුනා සසරු ඉපැදීමෙන් මුදා ලන්නේ ඒ ය. එහෙයින් ප්‍රධාන විසින් ධාරණාර්ථයෙන් ධර්ම නම් වූයේ ය මෙ ය. කෙලෙස් නැසූ පසු ද කෙලෙස් පුරුද්ද කෙලෙස් නැසූ සිතෙහි ඉතිරි වන්නේ ය. ඒ සංසිඳෙනු මාර්ගයනට අනතුරු ව උපදනා චතුර්විධඵලධර්මවිසිනි. කෙලෙස් නසා කෙලෙස් පුරුද්ද සංසිඳ වූ මාර්ග-ඵලයනට අරමුණු වන්නේ නිවන ය. මෙකී ශ්‍රොතාපත්තිආදිචතුර්විධමාර්ගය හා චතුර්විධඵලය නිර්වාණය යන නවලොකොත්තරධර්මය ප්‍රතිපත්තිය උඩ රඳා සිටියේ ය. ප්‍රතිපත්ති-යය මෙයට පදනම. අඞ්තාලම. එ හෙයින් ප්‍රතිපත්තියෙන් ගිලිහුන වුනට නවලොකොත්තරධර්මලාභයෙක් නො වන්නේ ය. ඒ මේ නව ලොකොත්තරධර්මලාභයට කරුණු වූ ප්‍රතිපත්තිය පහදා ලන්නේ මතු කොට දෙන්නේ දක්වන්නේ පර්‍යාප්ති යි අන් නමකිනිදු ප්‍රසිඞ්ඛුඞ්වචනය ය. මෙසේ පර්‍යාප්තිසඞ්ඛ්‍යාතබුඞ්වචනය නව ලොකොත්තරධර්මලාභයට උපාය වූ ප්‍රතිපත්තිය දරණ බැවින් හා පවසන බැවින් කියාලන බැවින් අප්‍රධාන විසින් ධර්ම නම් වූයේ ය. පර්‍යාප්තිය, ප්‍රතිපත්තියට ත් ප්‍රතිපත්තිය, ප්‍රතිවෙධසඞ්ඛ්‍යාත නවලොකොත්තර ධර්මයට ත් කරුණු වන බව මින් හොඳට ම පැහැදිලි ය.

පද නම්, නුවණැත්තන් විසින් යායුතු මග ය. ඒ නම් නවලොවුතුරුදහම ම ය. ඒ එක් ලෙසක් ය. යමක් කරණ කොට යමක් නිසා ඵලයට නිෂ්පත්තියට පැමිණේ නම්, ඵල ලාභයට නිෂ්පත්තියට උපාය වූ එය ද පද නම් වේ. ඒ නම් පිළිවෙත ය. **ධම්ම** යනු හා **පද** යනු හා එකට සටිත වූයේ ඒ නිසා ය. මේ දෙයරුත ම ගෙණ ය **ධම්මපද** වූයේ. සත්තිස් බෝ පැකිදම් දැනුමට උපාය වූ ඒ දම්අරුත් දත් වන්නා වූ ධර්මපද ගාථාවන්ගේ සමූහය, ඒ ගාථාවන්ගේ නිවාසය **ධර්මපද** නම්. මේ පොත ය ඒ.

සූත්‍රනික්ෂේපය

අත්තජ්ඣාසය - පරජ්ඣාසය - පුච්ඡාවසිකය - අටඨුප්පත්තිකය යි සූත්‍රනික්ෂේපය සිවු වැදැරුම් ය. එහි යම් සූත්‍ර කෙනෙකුන්

අනුන්ගෙන් ආරාධනා නො ලැබ තමන් වහන්සේගේ අදහසින් ම වදාළ සේක් ද ඒ ය අත්තජ්ඣාසය. ආකඞ්ඛෙය්‍ය-වත්ථ-සතිපඨාන සූත්‍රාදීහු, අත්තජ්ඣාය විසින් වදාළ සූත්‍රයෝ ය.

යම් සූත්‍රකෙනෙකුන් අන්‍යයාගේ අදහස කැමැත්ත සිත ප්‍රාර්ථනාව අවබොධය දැන වදාළ සේක් ද, ඒ ය පරජ්ඣාසය. චූලරාහුලොවාද – මහාරාහුලොවාද–ධම්මචක්කසූත්‍රාදීහු, පරජ්ඣාසය විසින් වදාළ සූත්‍රයෝ ය.

දෙව්බඹුන් ඈ විසින් අසන ලද ප්‍රශනයනට පිළිතුරු විසින් වදාළ ධර්මයය පුච්ඡාවසික. බොජ්ඣඞ්ගසංයුත්ත – දෙවතා සංයුත්ත – කොසලසංයුත්තාදීහු ය, ඔවුහු.

යම් යම් සූත්‍රකෙනෙක් උපන් කරුණෙහි ලා වදාරණ ලද්දේ ද ඔවුහු අට්ඨුප්පත්තික. ධම්මදායාද – චූලසීහනාද – අග්ගික්ඛන්ධුපම සූත්‍රාදීහු එහි ලා ගැණෙත්. ධර්මපදය ද අර්ථොත්පත්තික නික්ෂෙප යෙහි ය. පුද්ගලාධිෂ්ඨාන වශයෙන් දෙසූ ගාථා විසින් මෙහි ගාථා සාරසියතෙවිස්සෙක් ඇත්තේ ය. ඒ ගාථා දෙශනා කිරීමට ලක් වූ කථාවස්තු එකක් අඩු තෙ සියයෙක් අර්ථකථාවෙහි එන්නේ ය. වර්ග විසින් සවිසිවගෙක් ඇත්තේ ය. වර්ගසඞ්ගීත වූයේ ධර්මාර්ථස්වභාවය සලකා ගෙණ ය.

අර්ථකථාව

ධර්මපදයෙහි එන ගථාවන්ගේ අර්ථවිවරණය ධර්මපදාර්ථ කථා යි ගණිති. එය කළෝ ප්‍රථමසඞ්ගීතිකාරකමහාක්ෂීණාශ්‍රව යන් වහන්සේ ය. උන්වහන්සේ කළ එම අර්ථකථාව ලඞ්කා ශාසනප්‍රතිෂ්ඨාපකමහාමහීන්ද්‍රමහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් මෙහි වඩිනා ගමනේ දී මෙහි ගෙණවුත් සිහලබසට නගා තබන ලද්දී ය, විශෙෂ විසින් සිංහලයන්ට ම හිතපිණිස. ධර්මපදාර්ථ කථාව ත් මේ පෙරළියට අසු වූ ය. මුළුමනින් සිංහල වූ ය. එදා සිට බුදුගොස් මහාතෙරුන්ගේ අටුවා පෙරළිය දක්වා මේ මෙසේ සිටියා ය. මිහිඳු මහරහතුන් වහන්සේ විසින් හෙළ බසින් තැබූ මේ අටුවා ගැණ තොරතුරු මෙරට පමණක් නොව මින් පිට රට ද පැතිර සිටියේ ය. එයින් මේ තොරතුරු දඹදිවැ සිටි බ්‍රාහ්මණජාතිකබුද්ධඝොෂ මහාචාර්‍ය පාදයන්ගේ ද කණ වැටුනේ ය. උන්වහන්සේ එයින් තෙද ගැණුනෝ මෙහි ආහ. අවුත් මහ වෙහෙරැ වැස්සන්ගේ වහළ ලැබ හෙළබසින් තුබූ ඒ අටුවා සියල්ල වැඩිවැඩ සලකා පෙළබසට නැගූහ. එහි දී උන්වහන්සේ අතින් හෙළ දම්පියාටුවාව ද පෙළබසට නැගුනා ය. ඕය ධම්ම පදඨකථා යි දැන් අප අත ඇත්තී. මෙය හෙළබසින් පෙළබසට

නගද්දී බුඩඝොෂපාදයෝ හෙළටුවාවෙහි ආ ඇතැම් ධම්පද පිළිබඳ අධිකවිස්තාරය හැර දමා කෙටි මගක් ගෙණ එහෙත් අරුත් පිරිහීමකට ඉඩ නො තබා ම මහාවිහාරවාසීන්ගේ අදහස් ලෙසින් පෙළබසට නැගූහ. එයින් මෙතෙක් ධම්හානියක් නො වූ ය. මතු ත් නො වන්නී ය. වූවා හානියක්. එ නම්, හෙළබසින් තුබූ අටුවාව හෙළයට නැතුව යෑම ය. දෙසැත්තෑවක් පමණබණවරින් යුක්ත වූවා ය, මෝ. මෙහි ධම්පදගාථාදෙශනාවට වස්තු වූ එකක් අඩු තෙසියයක් කථාවස්තු වූයේ තැනැ තැනැ උනුත් පිළිබඳ අතීතකථාවස්තූන්ගෙන් හා අන්තරකථාවස්තූන් ගෙන් ද සැදී සිටියා ය.

පරිවාරග්‍රන්ථ

ධම්පියාගැටපදය – සඩම්රත්නාවලිය – ධම්පදපුරාණ සන්නය–සඩම්කෞමුදිය යි ප්‍රශස්තග්‍රන්ථ සතරෙක් මෙයට පිරිවර ව සිටියේ ය. මේ පොත පරිශීලනය කරන්නන්ට මෙකී පරිවාරග්‍රන්ථයන්ගෙන් ලැබෙන වහළ දැනුම ඉමහත් ය. හැමෙකක් ධම්පදයට ලන ආලොකය එකසේ මහත් ය. එමතු ද, මෙකී ග්‍රන්ථ අපේ සාහිත්‍යයට දෙන ආලොකය ද නො කිය හැකිය පමණ කොට. එහි ධම්පියාගැටපදය **අබාසලමෙවන් කසුප්** මහරජ තුමන්ගේ ය. සඩම්රත්නාවලිය **ධම්සෙන** මහාස්ථවිර පාදයන් වහන්සේගේ ය. ධම්පදපුරාණසන්නය කැරුණේ කවුදැ යි මම නො දනිමි. වාගීශ්වරාචාර්‍ය මොරොන්තුඩුවේ ශ්‍රී ඥානෙශ්වර **ධම්මානන්දනායක** ස්වාමීන්ද්‍රයන් වහන්සේ අතින් ලියැවුනී ය. සඩම්කෞමුදි ය. මේ හැම එකෙකින් ධම්පදයෙහි අනුත්තානපද උත්තාන වන්නේ ය. ගැඹුරු අරුත් මතු වන්නේ ය.

පෙර පටන් ගිහිපැවිදි හැම කෙනෙකුන් විසින් හැම තැනක දී හැම කරුණක දී ගරු කොට ගන්නා ලද්දේ ධම්පදය ය. පැවිද්දෝ එහි ද මතු වී පෙණෙති. ලෞකිකජීවිතය හැම අතකින් යහපතෙහි දියුණුවෙහි මුදුනට නංවා එයට ලොකොත්තරතත්ත්වය දී තදබද කොට සසරදුක මුළුමනින් නසාලීමෙහි හැබෑ බලවෙගයෙක් ධම්පදයෙහි හැම පදයෙක කැවී ඇත්තේ ය. ඒ ය එයට හෙතු. ධම්පදගාථාවන්හි ඇතුළත් උපදෙස් යම් ජීවිතයක් පදනම් කොට ක්‍රියාත්මක වේ නම්, ඒ ජීවිතයෙහි ඇති මහත්ත්වය මොන රුසියකුට ත් නො කියැකි ය. නො මිනියහැකි ය. එ හෙයින් ධම්පදයට ඇත්තේ නො පිදිය යුත්තහු පිදිය යුතු කරන්නට, නො වැඳිය යුත්තහු වැඳිය යුතු කරන්නට, නො එළැඹිය යුත්තහු එළැඹිය යුතු කරන්නට හැකි ධාර්මිකාකර්ෂකබලවෙගයෙකි.

ධම්පදය තෙමේ දුෂ්ටයා අදුෂ්ට කරන්නේ ය. සැහැසියා නොසැහැසි කරන්නේ ය. නොදුහැමියා දුහැමි කරන්නේ ය. අසත්පුරුෂයා සත්පුරුෂ කරන්නේ ය. අයොග්‍යයා යොග්‍ය කරන්නේ ය. අශාන්තයා ශාන්ත කරන්නේ ය. චණ්ඩයා අචණ්ඩ කරන්නේ ය. අශික්ෂිතයා ශික්ෂිත කරන්නේ ය.

ධම්පදය තෙමේ සතුන් මරන්නා එයින්, හොරකම් කරන්නා එයින්, පරඹුවන් කරා යන්නා එයින්, බොරු කියන්නා එයින්, කේලාම් කියන්නා එයින්, රළුබස් කියන්නා එයින්, නිසරු බස් කියන්නා එයින්, කෑදරකම් කරන්නා එයින්, ක්‍රෝධ කරන්නා එයින්, මිසදිටුගත්තහු එයින් මුදා ලන්නේ ය.

ධම්පදය තෙමේ නිරය දුක් දක්වා, ප්‍රෙත දුක් දක්වා, අසුර දුක් දක්වා, තිරිසන් දුක් දක්වා සතුන් පවින් ගලවා ලන්නේ ය.

ධම්පදය තෙමේ පින්කම්හි ඉටුපල කියා පවිකම්හි අනිටුපල කියා මිනිස් ගුණ වගා කරණ මිනිසා උසස් තැනක තබන ඉතා හොඳ උපදෙස්වලින් පිරී ගත් දෙව් මිනිස් සැප ලබා දෙන මග-පල -නිවන් සුව සඳලන එක් ම බණපොත ය.

මෙහි මුල් ගය අසා, තිස් දහසක් දෙනා, දෙවන ගය අසා අසූසාර දහසක් දෙනා, තෙවන ගය අසා, දහසක් දෙනා ,ඈ ලෙසින් බර ගණනක් නිවන් දුටහ. ඉන් මෙ පිට ගුණයන්ගෙන් වගාවුනු තෙද ගැණුනු දෙව් නර යක් රකුස් ආදීන්ගේ ගණන මොනලෙසකිනුත් කියන්නට නොපිළිවන. මේ ඇ සලකන විට ධම්පදයෙන් සිදු වූ ලොකාභිවෘඩිය කෙබඳු දැයි සිතා ගැණීම අපහසු නොවේ.

ධම්පදය ජනප්‍රිය ය, අන් හැම පොතකට ම වඩා. එය විය යුතු ය. එහි පුදුමයෙක් නැත. ධම්පදය ඉදිරියෙහි හගවද්ගීතාවට කුරුන්පොතට, බයිබලයට තැන් නැත. එහෙයිනි ඒවා එක් එක් රටට එක් එක් මිනිස් ගණයට වෙන් වූයේ. ධම්පදය එසේ එක් රටකට එක් මිනිස් ගණයකට වෙන් නොවන්නේ ය. කාලය බලා රට බලා මිනිසුන් බලා වෙනස් නොවේ. එහෙයින් එය සාර්වකාලික ය. සාර්වජනීන ය. හැම කලට හැම රටට හැම දැයට හැම බසට සුදුසු එක් ම පොත මේ ය. නුවණ පමණින් වැර පමණින් හැම එකක්හට වැඩ සාදා දීමෙහි සමත් එක් ම පොත මේ ය. මේ නිසා ධම්පදය **සංස්කෘතයට, ප්‍රාකෘත්‍යට, හින්දියට, චංගයට, තිබ්බතියට, බුරුමයට** යනාදී වූ පෙර දිග බසට හා **ඉංග්‍රීසියට, ජර්මනියට** යනාදී වූ අපර දිග බසට නැගුනේ ය. අන්‍ය ලබ්ධික යෝ ද සවලබ්ධිය පසෙක තබා මෙහි අර්ථ රසය උරා බීහ. දැනුත් උරා බොති. එයින් උන් මින් ලැබූ දැන් ලබන මහදර්ශිය කාට කිය හැකි ද.

සඩම්සාගර නම් වූ ධම්පදවණ්ණනාව

ධම්පියාගැටපදය ධම්පදයට ආලොකය දෙන්නේ පාලි ධම්පදාර්ත්ථකථාවෙහි එන ගැටලු තැන් බර තැන් එදා බසට නගා අරුත් පළකිරීමෙනි. **සඩම්රත්නාවලිය** ධම්පදගාථාදෙශනා කිරීමට කරුණු වූ කථාවස්තු එදා බසට පෙරළා ධම්පදගාථාවන්ගේ අරුත් රසය මධුර රසය ඉතා කොටින් එහි ම ගන්වා ලීමෙන් එලිය දෙන්නේ ය. **ධම්පදපුරාණසන්නය** අර්ත්ථකථාව අනුව යමින් ගාථාවන්ගේ අර්ත්ථය, පදාර්ත්ථකථනමුඛයෙන් විස්තර විසින් ඉස්මතු කරන්නේ ය. එහෙයින් මේ පොත් තුනෙන් ධම්පදයට වැටෙන ආලොකයෙන් අද බෙහෙවින් ප්‍රයොජන ගන්නේ එදා බස හා බණ දහම් දත් හුදීජන තෙමේ ය. එදා කෙසේ වුව ද අද නම් ඒ තරමට නො වියත් දෙනාගේ සිත් නො ගන්නේ ය, මේ පොත් තුන. එදා බසෙහි හා මෙදා බසෙහි වෙනස් බවය නො වියත් දෙනාගේ සිත් නො ගැන්මේ හෙතුව. එහෙත් කාලය විසින් වැකුණු මල පහව ගිය දවස මේ පොත් තුන අපේ සාහිත්‍ය මණිකොෂ්ඨාගාරයෙහි අන් හැමෙකක් ඔබා බබලන ශ්‍රෙෂ්ඨ මිණි රුවන් තුනැ යි කීම අතිශයොක්තියක් නො වේ.

සඩම්කෞමුදිය ය ධම්පදගාථාවන්ගේ ධම්සාරය අර්ත්ථසාරය වියත් නො වියත් හැම දෙනාට එකසේ මතු කොට දෙන, ධම්පද ගාථා සාරය එලියට ඇද දෙන එක් ම පොත. ඒ ලියැවී ඇත්තී මුළුමනින් ගාථාවන්ගේ ම පදාර්ත්ථ – භාවාර්ත්ථ – විස්තරාර්ත්ථ දක්වා විස්තර කටයුතු ධම්පදයනට පරිකථා ද දැක්වීමෙනි. මෙසේ මෙය ගාථාර්ත්ථය ම මතු කොට ධම්මාර්ත්ථය ම මතු කොට දක්වන්නේ ගාථා දෙශනායෙහි එළැඹ සිටි, ගාථා දෙශනාවට නිමිත්ත වූ කථාවස්තූන් පිළිබඳ ස්ථාන – පුද්ගලාදීන්ගේ නම් පමණක් දක්වනු මුත්, උන් පිළිබඳ විස්තරකථාවට නො බැස්සේ ය. ඒ බලා අප හිතවතුන් කිහිප දෙනකුන් "ධම්පදාර්ත්ථකථාගතකථාවස්තූන් අද වහරෙහි වැටෙන සිංහලට නගා එහි ගාථාවනට විවරණයක් ලියන්නැ"යි කළ භක්තිපූර්වකආරාධනය මෙහි මා පෙළඹ වී ය. මා කළ මේ පරිවර්තනය එම කථාවස්තූන්හි එල්බ කරණ ලද්දේ ද, එහි පරිවර්තනයෙකැ යි කියැකිතරමේ පරිවර්තන විලාසයෙක් මෙහි නැත්තේ ය. පාළිපොතෙහි ඇති විභක්ත්‍යන්ත පදය ඒ විභක්තියට සරිලන සේ සිංහලට නැගීමෙන් සිංහලභාෂාවේ ව්‍යවහාරවිධිය, මිහිරිකම පැන යන තැන් ඇත්තේ එකෙක් දෙකෙක් නො වේ. එබඳු තැන් බොහෝ ය. එ හෙයින් එහි අද වහර රකින්නට අද වහරට අනුව ම මේ පරිවර්තනය කෙළෙමි. මෙහි දී එක් ම පාළිපදය සිංහලට නගන්නට සිංහල වචන, පද දෙක තුන ද, පාළිපද

කිහිපයක් සිංහලට නගන්නට එක් ම සිංහලපදයද යොදන ලද්දේ ය. සමහර තැනෙක එක් එක් පාළිපදය, එක් එක් සිංහල වාක්‍ය කොට ද යොදා ඇත්තේය. පූර්‍වාපරසම්බන්ධය ඇති ව සිංහලට කතාව නගා ගැණීමේ දී පාළිපොතෙහි ආ අනවශ්‍යය යි මට පෙණුනු දීඝීවාක්‍ය ද මෙයින් බැහැර කෙරුණේ ය. එ ද එකෙක් දෙකෙක් නො වේ. එහෙත් එයින් කථාවස්තුනට හානියක් නැත. කථාවස්තුන්ගේ අඩුබවෙක් කථාවස්තුන් දිරාගිය බවෙක් නො පෙණේ.

ධම්මපදගාථාවනට කරුණ වූ කථාවස්තු සඩම්රත්නාවලිය යියබසින් කියද්දී ඔවුන්ගේ තවත් යියබස් පෙරළියක් අනවශ්‍ය ය යි කියන්නෝ ද වෙති. ඒ ඔවුන්ගේ පිළිගැණීම ය. මෙයට අවුරුදු හත් අට යියයකට උඩ යිටි සිංහල භාෂාවෙන් එදා යිටි සිංහලයන්ගේ සිරිත් විරිත් බස්වහර ගෙයි කටයුතු ගණු දෙනු ආ බලා ලියැවුනු සඩම්රත්නාවලිය, මෙකල ඒ හැමෙකෙකින් ගිලි හී ගිය නො වියත් සිංහලයන්ගේ සිත් නො ගන්නාබව කිහිප තැනක දී මට පෙණී ගියේ ය. එහෙයිනි මෙය මෙකල බසට නගාලිය යුතුය යි මා ගත්තේ. එදා භාෂාව මෙදා භාෂාවෙන්, මෙදා භාෂාව එදා භාෂාවෙන්, ප්‍රකෘති වියින්, නාමපද වියින්, ක්‍රියාපද වියින්, වාග්රීති වියින්, රචනාශෛලිය වියින් ඇත් ව ගොස් යිටින්නී ය. එදා භාෂාව හා මෙදා භාෂාව එක් ම භාෂාවක් වුව ද මෙහි කාලය වියින් නොයෙක් හැපීම් ගැටීම් වියින් ඇති කරණලද වෙනස්කම් සුලු කොට නො තැකියැකි ය. එක් ම භාෂාව භාෂා දෙකක් සේ පෙන්නීමෙහි අපොහොසත් ද නො වේ මේ වෙනස. මේ නිසා එදා බසින්, එදා රීතියෙන්, එදා ශෛලියෙන් ලියැවුනු මේ කථාවස්තු මෙදා බසින්, මෙදා රීතියෙන්, මෙදා ශෛලියෙන් ලියා තැබීම වරදක් සේ, නො කළ යුත්තක් සේ අපරාධයක් සේ මට නො පෙණිණ. තව ද එන දවසෙහි භාෂෙහි හාසගවෙෂකයනට වහලක් වනු ද මට පෙණුනේ ය එය. එදා සිංහලයන්ගේ සිතුම් පැතුම් සිරිත් විරිත් කියුම් කෙරුම් යෑම් ඒම් කෑම් බීම් ආදිය ත් ඔවුන් දිවි පැවැත්වීමෙහි ලා යෙදුනු ගේ දොර යාන වාහන ඇඳුම් පැලඳුම් මිල මුදල් බඩුමුට්ටු ආදිය ද අද සිංහලයන්ගේ සිතුම් පැතුම් ආදී වූ හැමෙකෙකට වෙනස් ව ගියේ ය. කාලයෙන් ඈත් කළ සිංහලයන් අතර ඇති වූ මේ වෙනස්කම් භාෂාව කෙරෙහි ද බල පවත්වා ඇත්තේ ය. එ හෙයින් එදාට වඩා අද, අදට වඩා එදා සිංහලභාෂායෙහි පහත බැස්මක් හෝ ඉහල නැගුමක් විය යුතු ම ය. සිංහලයන් අතර වූ මේ වෙනස්කමට බොහෝ සෙයින් රුකුල් දුන්නේ අන්‍යජාතීන් හා සිංහලයන් ලැබූ සම්බන්ධය ය. එක්වීම ය.

ධම්පදගාථාවන් සිංහලට නගා එයට විවරණ ලිවීමේදී මට වැඩියක් පෙණී ගියේ, අපගේ ධර්මදේශකයන් වහන්සේ ය. ධම්පදයෙහි විස්තර කළ යුතු විස්තර කළහැකි හැම බණ පදයක් ම වඩා පළල් කොට, පෙළ අටුවා ටීකා ප්‍රකරණාදියෙන් කරුණු ගෙණ විස්තර කළේ එහෙයිනි. එයට මට වහල් වූ ග්‍රන්ථයන්ගේ නාම ලෙඛනය මෙහි අන් තැනෙක යොදා ඇත. එහි ලා සමහර තැනෙක ව්‍යාකරණ හා නිරුක්ති ද දැක්වීමි. එ හෙයින් ධම්පද ගාථාවන්ගේ අරුත් දැනුමට ධම්පදගාථාවන් ගෙන් බණ කියුමට අන් කිසිත් පොත පතක වහලෙක් මෙය පරිශීලනය කරන්නවුනට වුවමනා නො කෙරේ. ධම්පදගාථා, පදත්‍ථි–භාවාත්‍ථි – විසතාරත්‍ථි – පරිකත්‍ථා – ව්‍යාකරණ – නිරුක්ති යන හැමෙකෙකින් මෙහි විවෘත ව ඇත. ඇතැම් විට එක් ම බණ පදය එසේ විස්තර කරන්නට යිය තැනේ දී මේ පොතෙන් පිටු 7–8 සමහර විට එයට වැඩිතරම් පිටු ගණනක් ඒ සඳහා යොදා ඇතිබව දැක්ක හැකි ය.

මම, මෙසේ මේ පොත ලියා මාගේ ධර්මශාස්ත්‍ර දෙක්හි පදනැදුරු වූ **කොළඹ විද්‍යෝදයමහාවිද්‍යාලයාධිශ්වර ව වැඩ විසූ සර්වඥකල්පවෘක්ෂ අනිගරු සඝරත්න ශ්‍රී සුමඞ්ගල ශ්‍රී රත්නසාර නිධානප්‍රධානසඞ්ඝනායකඝණ්ඨාමීන්ද්‍රයන් වහන්සේ** වෙත අදුරු බැති පෙරටු කොට පිළිගැන්වීමි. මාගේ ජීවිතයට ආශීර්වාද කළ ඒ මහොත්තමයෝ මෙය සතුටින් පිළිගත්හ. **"තමුසේ ලියූ මේ පොත බණදහම් නො දන් මිනිසුන්ට හුගක් ප්‍රයොජනෑ"** සි ද වදාළහ. ප්‍රථමතරඞ්ගයෙහි අවසානය තෙක් ශුද්ධිපත්‍ර ද බැලුහ. මේ පිළිගැණීම හා ශුද්ධිපත්‍ර බැලීම හා වේ මෙහි ගෞරවයට කරුණු.

එදා මෙය මුද්‍රණය කරවීමේ දී පිටපත් කරදීමෙන් හා ශුද්ධි පත්‍ර කියැවීමෙන් අපගේ ධර්මානෙතෘවාසිකයකු වූ **අම්බලම්ගොඩ ධම්මදිංඝ** සථවිර තැන බෙහෙවින් මට උපකාර වූ බව සතුටින් කියමි.

මෙහි මා ලියූ යමකාවගීයෙහි මුල්පිටපත දෙවනවරැ පිටපත් කර දීමෙන් අප පිරිවේණෙහි ආචාර්‍යවරයකු වූ **අම්බලම්ගොඩ සුමඞ්ගල** සථවිර තැන මෙහිලා බෙහෙවින් උපකාර වූ බව සතුටින් කියමි. එහෙයින් මේ සථවිර දෙපල කෙරෙහි මා සිත්තුළ නහිනා ශුභප්‍රාර්ථනාව ඉමහත් ය.

මේ ප්‍රථමතරඞ්ගය මුල්වර මුද්‍රණය කරවීමේ දී ඒ සඳහා මුදල් වියදම් කිරීමෙන් මට මෙහිලා ද අනුබල දුන්නේ, මාගේ දියුණුවට (මා මැනියන් දූ හැර) අන් හැම කෙනෙකුට ම වඩා,

නැම අතකින් උපකාර කළ **අම්බලම්ගොඩ චන්‍රලතා** නිවසෙහි අධිපති ව දිවි යැවූ මාගේ දෙවන සහෝදර **ඒ මැන්දිස් සිල්වා මහතා ය.** මොහු අද ජීවතුන් අතර නැත. මට මොහු කළ උපකාරය ම මාගේ ජීවිතය මේ ලෙයින් මෙතැනට එන්නට හෙතු වූයේ, එකාන්තය.

මෙහි දෙවන – තෘතීය තරඹ දෙක (අප්‍රමාද – චිත්තවග්ග) 1936 වන වර්ෂයේ දී මුද්‍රණය කරවා මහාජනයා අතට පත් කෙළෙමි. එය ද, සියඛනය යොදා මුද්‍රණය කර වූයේ මාගේ ඒ සහෝදරයා ය. එය මුද්‍රණයෙන් නිකුත් ව ගියේය.

තුරීයතරඹය වූ පුෂ්පවග්ගය ද මුද්‍රණය වීණිස දෙවන වරද සකසා පිළියෙල කොට ඇත. එහෙත් එය මෙතෙක් මුද්‍රණයට නො ගියේය. එය මුලසිට අවසානය තෙක් කියවා බලා ගෞරවයට පත් කලෝ **විද්‍යෝදයමහාවිද්‍යාලයාධිපති වූ මහොපාධ්‍යාය අතිගරු බද්දේගම ශ්‍රී ප්‍රියරත්නාභිධානප්‍රධානසංඝනායකමහා ස්ථවිරයන් වහන්සේය.** උන්වහන්සේ කෙරෙහි මාතුළ පවත්නා භක්තිය අසීමිත ය.

මෙහි පුෂ්පවග්ග – බාලපණ්ඩිතවග්ගයන්හි මුද්‍රණ වියදම් දුරුයේ මා කුඩා කල සිට මාගේ දියුණුව පතා ක්‍රියා කළ පොල්වත්තේ ඉන්‍රාගාරයෙහි සභාපතිවර වූ **ඩී. ඩී. ඇස්. වීරසූරිය මහතා ය.** මේ වීරසූරිය ජීවිතය පවිත්‍ර ය. කීර්තිමත් ය. ගුණවත් ය. ලෝ සසුන් දෙකට හිතකර ය. හිතකර වචනයෙන් නො වේ. ක්‍රියාවෙන් ය. මේ ජීවිත ඇද වැටුනු දවස මෙබඳු හොඳ ආදර්ශවත් ජීවිත, වර්තමානසමාජයෙන් ලැබිය හැකිය යි කාට කියැකි ද, මම ඒ මහතාගේ චිරජීවනය පතන්නෙම් කෘතඥතායෙන් හා ආගමාලයෙනි.

විතීයසංස්කරණය

මෙම ප්‍රථමතරඹය මුල්වර මුද්‍රණය කරවීමේ දී මෙහි විතීය සංස්කරණයක් ගැන ප්‍රතිඥ කළ ද එයට පසු යෙදුනු කරුණු නිසා මම එහි ලා බලාපොරොත්තු නො වීමි. එහෙත් දුන් සඛමීසාගරයෙහි විතීයසංස්කරණයෙක් ද මහාජනයා ඉදිරියට ආයේ ය. ආයේ ද නැවැත එය මහාජනයා සතුටින් පිළිගත් බැවිනි. මේ වර සඛමීසාගරය, ඒ වර සඛමීසාගරයට වඩා හැම එකෙකින් සුපුල ය. ව්‍යාපන ය. ඔජෝවත් ය. මාගේ අනවධාන තායෙන් හා නුගත්කමින් හා වණීයොජකයන්ගේ අපරිඤ්ඤා යෙන් හා වැද්ද දුන් දෙෂස්ථාන කිහිපයෙක් ඒ වර සඛමී සාගරයෙහි ගැලී නො පෙණී සිටියේ මේ වර එතැන් මතුවී සංස්කෘත විය. එහෙත් මේ වරද සඛමීසාගරය එබඳු

දෙශසථානයන්ගෙන් මූළමනින් විනිර්මුකතය යි මම නො කියමි. ධර්මය ඉතා ගැඹුරු ය. එහි ලා මාගේ නුවණ කිම? එ හෙයින් මේ වරද මෙහි දෙශසථාන ඇතුළත් විය හැකි ය. එය පුදුමයෙක් නො වේ. එබඳු කැන්හි හැම කෙනකුන් ම අප අතින් වූ වරද වරද සේ දැන ධර්මාර්ථය ම සොයා දැන සතුටු වනු ය යෙදෙන්නේ.

ඉපැරණි යෙදුම් බලා එදුට වඩා ශබ්දකොෂය අතින් පොහොනි වූ වර්තමානසිංහලභාෂායෙහි යෙදුම් ද ඒ ඉපැරණි යෙදුම් අනු ව විය යුතු ය යි කෙනෙක් කියති. ඒ නො මැනැවි. වර්තමන් බස නොයෙක් ගැටීම් නිසා එදුට වඩා අද නොයෙක් අතින් වෙනස් ව ගොස් ඇතිබව කාවුරුත් පිළිගණිත් නම්, එදු සේ අද ත් බස් වහර විය යුතුය යි කීමෙහි තේරුමෙක් නැත්තේ ය. කියන කරුණ නො වරදවා ඒ හැටියට පහසුවෙන් වැටහෙන ලෙසට ක්‍රියාකාරකයන්ගේ සම්බන්ධය නිර්‍ව්‍යාකූල ව තැබීමය ව්‍යාකරණයෙන් කෙරෙණ ප්‍රධානඅනුශාසනය. සඩ්ඉසාගරය පිළිගැණුනේ ඒ ලෙස ය. එහෙයින් එදු බහු වචනය කොට අනුශිෂ්ට 'ඔහු' යන්න සඩ්ඉසාගරය එක වචනය කොට ගෙණ මෙහි යෙදී ය. බහුවචනය කොට ගත්තේ 'ඔවුහු' යන්න ය. එසේ ගත්තේ නො වියත් දෙනාගේ බස්වහර බලා ය. මෙබඳු යෙදුම් මෙහි තව ඇත. එ තැන් කිසිවකුගේ අසහනයට කරුණු නො විය යුතු ය.

සිහි කඩයුත්තෝ

උග්‍ර වූ සංයමයෙන් සංයත ව සදුකලපසමපත්තීන් ප්‍රභාවිත ව **අම්බලම්ගොඩ සුනන්දාරාමමහාවිහාරාධිපති ඩ වැඩ විසූ අතිගරු ගණාචාර්‍ය ශ්‍රී ඉන්දජෝත්‍යභිධානමහාසථාමීන්ද්‍රයන් වහන්සේ** ය මා සසුන් ගත කොට වැඩුවෝ. උන්වහන්සේය මාගේ පැවිද්දෙහි ආචාර්‍යදේවයෝ. උන්වහන්සේය, විනයප්‍රදීපිකා නම් සිංහලසමන්නපාසාදිකාව, විනයප්‍රභාෂිණී නම් සිංහලකඩ්ඛාවිතරණිය, සඩ්ඉසාගර නම් ධර්මපදවණ්ණනාව, ධාතුරූපරතනාවලී නම් සාරසවතධාතුකොෂය, සිංහල අකුරු, චතුර්භේදය යන මෙගත් ලියන්නට මා අත පළමු ව හුරුපුරුදු කළෝ. මාගේ ජීවිතයට, එහි විනයට පළමු ව වැටුනු ආලොකධාරාව නම්, මුන්වහන්සේගේ සදාශාරාවය. මම උන්වහන්සේට ගැත්තෙමි.

කොළඹ විද්‍යෝදයමහාවිද්‍යාලයාධිපති ව වැඩ විසූ අතිගරු **කහවේ ශ්‍රී සුමඟල ශ්‍රී රත්නසාරාභිධානප්‍රධානසඩ්ඝනායක මහාසථාමීන්ද්‍රයන්වහන්සේ** හා පානදුරේ සෞගතවිද්‍යාලයාධිපති ව වැඩ විසූ අතිගරු **පානදුරේ ශ්‍රී ඤානවිමලතිෂ්‍යාභිධාන**

නායක සාමීන්ද්‍රයන්වහන්සේ ත් ධර්මානුවර්තියයෙනි මාගේ ප්‍රධාන ගුරුදෙවතාවෝ. උන්වහන්සේගේ පවිත්‍රදයාවට මා පාත්‍ර වූ බැවින් ම මේ විෂමලෝකයෙහි මෙතරම්දුර ත් ජීවත්වීමේ වාසනාව මට ලැබිණ. නැත, නො ලැබෙනු ඇත.

අම්බලම්ගොඩ මහාවිහාරාධිපති ව වැඩ විසූ ගෞරවාර්හ අම්බලම්ගොඩ **ශ්‍රී සුමනසාර** මහාසථවිරපාදයන් වහන්සේ. ගෞරවාර්හ අම්බලම්ගොඩ **ශ්‍රී ඉන්ද්‍රසාර** මහාසථවිරපාදයන් වහන්සේ ගොඩහේනේ පුෂපාරාමාධිවාසී වූ ගෞරවාර්හ මාතලේ **ශ්‍රී විමලසිරි** මහාසථවිරපාදයන් වහන්සේ හා, පැරැළියේ පදුම ගබහාරාමාධිපති ව වැඩ විසූ ගෞරවාර්හ පැරැළියේ **ශ්‍රී ධම්මවිසුද්ධි** මහාසථවිරපාදයන් වහන්සේ මාගේ වැඩිම, මාගේ දියුණුව අකුටිල ව පැතූහ. බලාපොරොත්තු වූහ. අවවාදඋනයෙන් මා රැක්කාහ.

කලුතර පුලිඤතලාරාම විහාරාධිපති වූ අතිගරු **බේරුවල ශ්‍රී සුමඞ්ගල ශ්‍රී නිධානාභිධානමහානායකසාමීන්ද්‍රයන් වහන්සේ** ය, පාන්දුරේ රත්කොත් විහාරාධිපති වූ අතිගරු **කරගම්පිටියේ ශ්‍රී ඤානිරතනාභිධානඅධිකරණනායකසාමීන්ද්‍රයන් වහන්සේ** ය යන මුන්වහන්සේලා මා සියතන්හි නවතා ගෙණ සිය සිසුදරුවකු සේ ගෙණ මාගේ දියුණුවෙහි අනුබල දුන්හ. විශෙෂ වියින් අධිකරණ නායක සාමීන්ද්‍රයන් වහන්සේ ධර්මානුකම්පයෙන් මා වැඩුහ.

ඒ. මැන්දිස් ද සිල්වා, පී. වයි. එන්ඇරිස් ද සිල්වා, බී. එච්. එලේනිස් ද සිල්වා, ඩෙවිට් ද මාස් ගුණවර්ධන යන මේ මහත්මෝ සිහිකටයුතු ය නිතර කළගුණ සලකා මා විසින්. මාගේ දියුණුවෙහි නො සැලී පෙණී සිටියෝ ය මේ මහත්මෝ තම දිවිහරිණ තුරු ම.

සතුතිය

මෙහිලා මට උපකාර කළ හැම හිතවතකුට ම මා කරණු ලබන්නී ඉතා හිතවත් සතුතියක. එහිදු මේ ප්‍රථමතරඛණ්ඩය දෙවනවර මුද්‍රණය සඳහා ගිය මුළුවියදම දැරීමෙන් ලෝ සසුන් හිතවැඩකා යෙදුනු පින්වතුනටත් මෙහි මුද්‍රණය ඉතා හොඳට ඉතා ඉක්මනට කර දුන් කොළඹ අනුලමුද්‍රණාලයේ **ඩබ්ලිව්. ඩී. ජේ. රත්නායක** මහතාට ත් මාගේ විශෙෂ ස්තුතිය හිමි ය. තවද අනුලමුද්‍රණාලයේ සෙසු සේවක පිරිස ද මෙහි ලා ස්තුති කටයුතු ය.

පැතීම

ත්‍රිපිටකධර්මාගතධර්මපදසමූහයක්, පදාර්ත්ථ – භාවාර්ත්ථාදීන්ගේ වශයෙන් විකාශයට පත් කළ සඩර්මකොෂාකෘතික වූ මෙම මහා ධර්මග්‍රන්ථය නිපදවාලීමෙන් හා, තවත් නොයෙක් ලෙසින් මා අත්පත් කොට ඇති අපරිමිතපුණ්‍යරාශිය, මාගේ මවුපිය ගුරුවර නෑදෑ හිතමිතුරු දායකකාරකශිෂ්‍යාදී වූ හැම කෙනෙක් හට අනුමොදන් කරවමින් මේ හැම කෙනෙක්හට එය සංසාර විමුක්තිය පිණිස වේවා යි පතමි.

මිට-හිතාර්ථ

අම්බලම්ගොඩ ධම්මකුශල ස්ථවිර

2497
1954 මැයි 1 වන දින
අම්බලම්ගොඩ ශාස්ත්‍රාදය පිරිවෙණේදීය.

ප්‍රස්තාවනා

රාජකීය පණ්ඩිත, මහෝපාධ්‍යය අතිපූජ්‍ය අම්බලංගොඩ ධම්මකුසලාභිධාන මහානායක මාහිම්පාණන් වහන්සේ විසින් විරචිත අති ශ්‍රේෂ්ඨතම ධර්ම විවරණය වූ "සද්ධර්මසාගර" නම් වූ ධර්මපද වර්ණනාව නැවත මුද්‍රණය කොට බෙදා හැරීම සඳහා සම්පූර්ණ අයිතිය සෝමාවතී හේවාවිතාරණ භාරයට පවරා ඇත. අමරපුර නිකායේ මහා නායක පූජ්‍ය අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සතුව පැවති එම අයිතිය මුළුමනින්ම එකී භාරයට පවරා තිබේ. 20 වන ශතවර්ෂයේ මෙරට ලියවුණු ධර්ම විවරණ ග්‍රන්ථ අතර මෙකී ග්‍රන්ථයට වඩා මහඟු වෙනත් ග්‍රන්ථයක් නොමැති බව නිසැකවම පැවසිය හැකිය. අතීත ඉතිහාසයේ රාජ්‍ය යුගයක මෙම ග්‍රන්ථය ලියවුණි නම් නිසැකවම රාජ්‍ය ගෞරවයට මෙන්ම විවිධ සම්මානයට භාජන වනු නිසැකය.

කොළඹ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේ ආදි ශිෂ්‍යවරයෙක් වූ ධම්මකුසල මහා නාහිම්පාණෝ ඉතා දක්ෂ ශිෂ්‍යවරයකු ලෙස අධ්‍යයනය ලබා විද්‍යෝදය පිරිවෙන් අවසාන පරීක්ෂණයෙන් ගෞරව පන්තියෙන් සමාර්ථය ලැබූ ශිෂ්‍යාට පිරිනැමෙන ස්‍යාමරාජ ත්‍යාගයට ද හිමිකම් කියූවෙකි. විද්‍යෝදය පිරිවෙණේ පැරණි වාර්තා වලින් ඒ බව මැනවින් ප්‍රකට වේ. උන්වහන්සේ ග්‍රන්ථ රාශියක් රචනා කොට ඇති නමුත් ඒ සියල්ලටම වඩා ධර්මපද වර්ණනාව ප්‍රධානය.

සෝමාවතී හේවාවිතාරණ භාරයේ ප්‍රධානත්වය උසුලන විශ්‍රාමික ඇල්ලස් කොමසාරිස් නොයෙල් විජේනායක මැතිතුමා ප්‍රධාන භාරකාර මණ්ඩලය ත්‍රිපිටක ග්‍රන්ථ හා අටුවා ග්‍රන්ථ මුද්‍රණය කරමින් කරන්නාවූ ශාසනික සේවාව තවත් පුළුල් කරමින් මෙවැනි සම්භාවනීය ධර්ම විවරණ ග්‍රන්ථ පළ කිරීමට උනන්දු වීම අතිශයින් අගය කළ යුතුය. එපමණක් නොව මුද්‍රණ වියදම පමණක් අයකර ගනිමින් ලාභයකින් තොරව මෙවැනි ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදාහැරීමට කටයුතු කිරීම කාගේත් ප්‍රශංසාවට ලක්විය යුත්තකි.

ධම්මපදයේ එන ගාථා විස්තර කිරීමට ලියා ඇති මෙම ග්‍රන්ථය කාණ්ඩ කිහිපයකින් යුක්ත අතර මුද්‍රිත පිටු 3500 ද ඉක්මවා ඇත. ධම්මපදය පිළිබඳ මෙතෙක් ලියවී ඇති පරිවාර ග්‍රන්ථ සංඛ්‍යාව විශාලය. එහෙත් සද්ධම් සාගරය තරම් ප්‍රමාණයෙන් මෙන්ම පරිපූර්ණත්වයෙන් උසස් කෘතියක් මෙතෙක් ලියවී නැත. මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීමේදී ධම්මකුසල මහා නාහිමියන්ගේ ත්‍රිපිටක ධර්මය පිළිබඳ ගැඹුරු දැනීම, සමයාන්තර පිළිබඳ තුලනාත්මක ඥානය, දර්ශන පිළිබඳ පටුත්වය මෙන්ම තර්ක න්‍යාය ආදිය පිළිබඳ ලබා ඇති දැනුම ද ප්‍රකට වේ. එමෙන්ම ඒ සියල්ල අළලා ව්‍යක්ත ලෙස සිය මතය ඉදිරිපත් කිරීම ද දක්නට ලැබේ. එත්මන් භාෂා උපයෝගි කර ගනිමින් සරල භාෂා රීතියකින් රචිත සද්ධම්සාගර නම් වූ ධර්මපද වර්ණනාව කියවීමේ රුචිය වඩවන අතර ගැඹුරු දහම් දැනුම ද ලැබේ. එවැනි කෘතියක් මෑත අතීතයේ පහළ වී නොමැත.

මෙම ග්‍රන්ථය සෑම පන්සලකම සෑම ගෙදරකම තිබිය යුතු ධර්ම පුස්තකයෙකි. හින්දූන්ට භගවත් ගීතාව, ක්‍රිස්තියානීන්ට බයිබලය, මුස්ලිමුන්ට අල් කුරාණය යම් සේ අගතේද බෞද්ධයන්ට ධම්මපදය ද එසේම ය. මුළු මහත් ත්‍රිපිටකය හකුලුවා සාරය ගෙන හැර දක්වන පාලි සාහිත්‍යයේ ඇති එකම ග්‍රන්ථය ධම්මපදය වේ. එය අත් පොතක් ලෙස පුරාණයේ සිට භාවිතයට ගෙනම ඇත. එවැනි ග්‍රන්ථයක ඇති ධර්මපදයන්ට අඩුවක් නැතිව තොරතුරු එකතු වී ඇති ග්‍රන්ථය මෙම ධම්මපද වර්ණනාවයි. විශේෂයෙන් ධර්ම කථික භික්ෂූන වහන්සේලාට ධම්මපද ධර්ම දේශනා සඳහා අවශ්‍යය සියලු කරුණු එක තැනකින් ලබාගත හැකි වීම මහත් පහසුවකි. ත්‍රිපිටක ග්‍රන්ථ රාශියක් පරිශීලනයෙන් එකතු කර ගත යුතු වූ ධර්ම පද විවරණ බොහෝ ප්‍රමාණයක් මෙහි එක්තැන් කොට ඇත. එමෙන්ම ධර්මඥානය දියුණු කර ගැනීමට අපේක්ෂා කරණ ආධුනිකයන්ට මෙන්ම ධර්මඥානය ප්‍රගුණ කරගත් ප්‍රවීනයන්ට ද මෙයින් ලැබිය හැකි ප්‍රයෝජනය අතිමහත්ය

කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණාධිපති,
රාජකීය පණ්ඩිත දර්ශනපති
පූජ්‍ය බලන්ගොඩ සෝභිත නාහිමි.

සද්ධර්මසාගරය
(තෙවනවර)

සද්ධර්මසාගරයෙහි ප්‍රථමතරඞ්ගය වූ යමකවර්ගය මේ තෙවනවර ද මුද්‍රණයෙන් පළට කරවන්නට සිදුවූයේ මෙහිලා පාඨකයන්ගේ පිළිගැණීම අතිමාත්‍ර විසින් නැගී ගොස් ඇති බැවිනි. "අපගේ සිංහල මිනිසුන් අතර සිංහල බණපොතපත කියවා ප්‍රයොජන ගන්නෝ මෙකල ඉතා ටික දෙනෙක් ම වෙති"යි නොයෙක්විට නොයෙක්තැන නොයෙක් දෙනා විසින් කියූ, කියන කතා ඇසූ මම ද ඒ කතා සත්‍යය යි මෙතෙක් පිළිගෙණ සිටියෙමි. එහෙත් එදා කියූ දැනුත් කියන ඒ කතා කරුණු නො දැන කියනලද්දක් කියන්නක් බැවින් නො ද පිළිගත යුතුය යි සද්ධර්මසාගරය කියාලන්නේ ය. සද්ධර්මසාගරය සිංහල බණපොතෙකි.

මහනුවර, කුරුණෑගල, කොළඹ, ගාල්ල, මාතර ආදී වූ ප්‍රසිද්ධනගරයන්හි ඇති පොත්පත් විකුණන පොත්හල්වලින් කෙරෙණ දැන්වීම්වලින් පෙණී යනුයේ සද්ධර්මසාගරය සොයන බලන ධර්මකාමීන්ගේ සඞ්ඛ්‍යාව දිනපතා නැගී යන බව ය.

මේ තෙවනවර මුද්‍රණයෙහි දී දෙවනවර මුද්‍රණයෙහි දී කරණ ලද සකස් කිරීම්වලට වඩා ධර්මපද පිළිබඳ වැඩි සකස් කිරීමෙක් නැත්තේ ය. දෙවනවර මුද්‍රණයෙහිදී ඉතා සැකෙවින් දක් වූ දෙතුන් ධර්මපද කෙනෙක් ම මදක් විස්තර විසින් මෙහි දක්වන ලදහ. විශෙෂ විසින් එයට වඩා මේ තෙවනවර මුද්‍රණයෙහි ලා කියයුත්තේ මෙහි ලා යෙදූ කරදාසියෙහි මිල ගණන අධිකවීම හා මුද්‍රණාලයවියදම් ඉහල නැග යෑම ය. එහෙයින් විකිණිය යුතු මිලද මදක් නැගී ගියේ ය. එය ග්‍රාහක භවතුන්ගේ අසහනයට කරුණු නො වියයුතු ය.

පොතපතමුද්‍රණය කරවීමෙහි අද ඇති තතු නො ඉවසිය හැකි බැවින් මෙය තෙවනවරකුත් මුද්‍රණය කරවීමෙහි අදහසෙක් මා තුළ නො වී ය. එහෙත් ධර්මකාමීහු මා මෙහිලා ධෛර්‍යවත් කළහ. එයින් මෙය තෙවනවර මුද්‍රණයෙනුදු මෙසේ ධර්මකාමීන් අතට පැමිණියේ ය. එය මට මහත් සතුටෙකි. එසේ ම මෙහි දී මට මේ පිණිස අනුබලදුන් හැම කෙනෙක් ම මාගේ සිහියෙහි තරව සිටිති.

මෙයට,

2511 ප්‍රතිපාදකා.

1967 – 8 – 30

අම්බලම්ගොඩ ශාස්ත්‍රාදය පිරිවෙණේදීය

ප්‍රථමතරඩගීයකථාසූචි

පිට	වයතුව	
1	1	ශුෂ්කවිදර්ශීකක්ෂීණශ්‍රව චක්‍රඛුපාල ස්ථවිරයන් වහන්සේ
28	2	මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා
39	3	ථුල්ලතිස්ස ස්ථවිරයන් වහන්සේ
49	4	කාලීයකින්න
58	5	ඝොෂිතාරාමයෙහි කොලාහලය
70	6	චූලකාල-මහාකාල ස්ථවිරයන් වහන්සේලා
95	7	දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ
129	8	අග්‍රශ්‍රාවක මහාක්ෂීණශ්‍රව ශාරිපුත්‍ර - මෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේලා
153	9	නන්ද මහාස්ථවිරයන් වහන්සේ
164	10	චුන්ද නම් ඌරුවැද්දාගේ මරහඬ
183	11	ධම්මික උපාසක මහතා
190	12	දෙවදත්තස්ථවිරයන් අවීචියෙහි උපන් සැටි
210	13	සුමනා දෙවිය
218	14	බුදුරජානන් වහන්සේගේ ස්තුතිය.

ආශ්‍රිත ග්‍රන්ථ

පාරාජිකාපාළි
පාචිත්තියපාළි
මහාවග්ගපාළි
චුල්ලවග්ගපාළි
පරිවාරපාළි
දීඝනිකාය
මජ්ඣිමනිකාය
සංයුත්තනිකාය
අඞ්ගුත්තරනිකාය
ඛුද්දකපාඨය
ධම්මපදය
උදානය
ඉතිවුත්තකය
සුත්තනිපාතය
විමානවත්ථු
පෙතවත්ථු
ථෙරගාථා
ථෙරීගාථා
ජාතක
චූලනිද්දෙස
මහානිද්දෙස
පටිසම්භිදා
අපදාන
චරියාපිටක
ධම්මසඞ්ගණී
විභඞ්ග
පුග්ගලපඤ්ඤත්ති
පට්ඨාන
සමන්තපාසාදිකාවිනයට්ඨකථා
දීඝනිකායට්ඨකථා
මජ්ඣිමනිකායට්ඨකථා
සංයුත්තනිකායට්ඨකථා
අඞ්ගුත්තරනිකායට්ඨකථා
ධම්මපදට්ඨකථා
උදානට්ඨකථා
ඉතිවුත්තකට්ඨකථා

සුත්තනිපාතට්ඨකථා
විමානවත්ථුඅට්ඨකථා
පෙතවත්ථුඅට්ඨකථා
ථෙරගාථාට්ඨකථා
ථෙරීගාථාට්ඨකථා
ජාතකට්ඨකථා
චූලනිද්දෙසට්ඨකථා
මහානිද්දෙසට්ඨකථා
පටිසම්භිදාට්ඨකථා
අපදානට්ඨකථා
චරියාපිටකට්ඨකථා
බුද්ධවංසට්ඨකථා
ධම්මසඞ්ගණිඅට්ඨකථා
විභඞ්ගට්ඨකථා
පඤ්චපකරණට්ඨකථා
විනයත්ථමඤ්ජුසා
විමතිවිනෝදනී
සාරත්ථදීපනී
අභිධම්මත්ථසඞ්ගහවිභාවිනී
විසුද්ධිමග්ග හා, එම ටීකා
බුද්ධකයිකඛා
නෙත්තිඅට්ඨකථා
විනයවිනිච්ඡයටීකා
නාමරූපපරිච්ඡේදය
පරමත්ථවිනිච්ඡය
අභිධම්මත්ථසංගහ
පාතිමොක්ඛ
මිලින්දපඤ්හ
සාරසංගහ
සද්ධම්මෝපායනය
මඞ්ගලත්ථදීපනී
උපාසකජනාලඞ්කාරය
සුශ්‍රැතය
වාගභටය
චරකය
තර්කසංග්‍රහ

යමකවග්ගය

සද්ධම්මසාගර

නම් වූ

ධම්මපදවණ්ණනාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මාසම්බුද්ධස්ස.

ගුඡකවිදර්ශනක්ෂීණාශ්‍රව චක්ඛුපාල
සථවිරයන් වහන්සේ

1 – 1

දඹදිව බුදු පසේබුදු මහරහතුන්ට, සක්විත්තන්ට, මහදනු මැතියන්ට, මහදනැතියන්ට වාසස්ථාන බැහැත්, අත් දිවයිනට වඩා ඉතා උතුම් ය. මහාමේරුපර්වතයට උතුරු දිග ද, චක්‍රවාටපර්වතයට දකුණු දිග ද පිහිටියේ ය. ගැලක සටහන් ඇත්තේ, තුණැස් වූයේ, දිගින් හා පළලින් දස දහසක් දස දහසක් යොදුන් පමණින් ගණින ලද්දේ ය. කොදෙව් පන්සිය-යකින් විසිතුරු වූයේ ය. දඹදිවැ ඒ මේ යොදුන් දස දහසින් සාර දහසක් පමණ තැන, මුහුදට යට ව ගියේ ය. තුන්දහසක් පමණ තැන, හිමාලය පර්වතය පැතිර ගත්තේ ය. තුන් දහසක් පමණ තැන ය, මිනිසුන්ට වාසස්ථාන වූයේ.

නො කියැකි නො දතැකි දිගුකාලක සිට, කපක් සිටුනා මහදඹ ගසක් නිසා, ප්‍රසිද්ධියට ගිය මෙම දිවයිනෙහි **අංග, මගධ, කාසි, කොසල, වජ්ජී, චෙති, වංස, කුරු, පංචාල, මච්ඡ, සූරසෙන, අස්සක, අවන්තී, ගන්ධාර, කාම්බෝජ** යන මොවුහු අපගේ බුදුරජුන් දවස දිවුරුම් ව අතින් ඉතා උසස් තැන්හි තුබූ සොළොස් මහාජනපදයෝ ය.

පිරූ පැරැම්බලයෙන් මරුරුපුන් බිඳා ජය ගෙණ බුදුබව ලත් අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ, ලොවට වැඩ වඩමින් රජදනවුහි සැරි සරනුවෝ, ඒ ඒ ජනපදයනට අයත් **චම්පා, කජංගලා, උක්කට්ඨ, අස්සපුර, අංගුත්තරාපය, ආපණ, සාවත්ථි, රාජගහ, නාලන්ද, අම්බලට්ඨිකා, කලන්දගාම, අන්ධකවින්ද, මහාතිත්ථ, හාලිද්ද, පාටලී, එකනාලා, බ්‍රාහ්මණගාම, බ්‍රාහ්මණී, සාවත්ථී, සාකේත, ආලවි, වෙසාලී, බෙලුව, කොසම්,**

කපිලවාඝතු, කුසිනාරා, පාවා, අනුපිය, භොගනගර, සංකස්ස, වෙරඤ්ජා යනාදී වූ ගම්, නියම්ගම්, මහ නගරයන්හි රාජරාජමහාමාත්‍යාදීන් විසින් සැදැයෙන් කරවන ලද මහාවිහාර යන්හි චතුර්විධබ්‍රහ්මවිහරණයෙන් යෙදී වැඩ වාසය කළ සේක.

දෙවිබඹුන් සහිත ලෝකයාට හිත වැඩ පිණිස බුදුරජුන් වැඩ වාසය කළ මහවෙහෙර අතුරෙහි, සැවැත්නුවර අනාථපිණ්ඩික මහසිටාණන් විසින් සිවුපණස් කෙළක් ධන වියදම් කොට, ජෙතවනඋයන්හි කරවා පිළිගැන්නූ දෙවරම් මහවෙහර දසනව වසක් ද, විසාඛාවන් විසින් සත්විසි කෙළක් ධන වියදම් කොට, කරවා පිළිගැන්නූ පූර්වාරාමයෙහි සවසක් දැ සි සැවැත්නුවර පස් විසි වසක් වැඩ වාසය කළහ. අනාථපිණ්ඩික, විසාඛා දෙදෙනාගේ ගුණමහත්බය මෙයට කරුණු විය. ඒ දෙදෙනා දවසට දෙවරක් විහාරයට යති. යන්නෝ ද, "ලදරු හෙරණේ! අප අත ගෙණ බලන්නෝ ය"යි සිස් අතින් නො යති. පෙරවරුයෙහි නම් කැයුතු දෙයක් ගෙන්වා ගෙණ යති. පස්වරුයෙහි යන්නෝ සකුරු සූකිරි යිතෙල් පැන් ආදිය ගෙන්වා ගෙණ යති. ඔවුන්ගේ ගෙවල් ද දිනපතා දෙදහස දෙදහස භික්ෂූන් වහන්සේ දන් වළඳති. යමෙක් යමක් කැමති වේ නම්, එය ඔහු කැමැති සේ එහි සැපයෙන්නේ ය.

මේ කාලයෙහි සැවැත්නුවර සත්කෙළක් පමණ මනුෂ්‍යයෝ වාසය කළෝ ය. එයින් පස් කෙළක් පමණ මනුෂ්‍යයෝ ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ ය. දෙ කෙළක් පමණ මනුෂ්‍යයෝ පෘථග්ජනයෝ ය. ආර්‍ය්‍යශ්‍රාවකයෝ උදැසන කාලයෙහි දන් දී සවස් කාලයෙහි බණ අසනු පිණිස සුවඳ මල් ගත් අත් ඇති ව ආහාර පාන වස්ත්‍රාභරණාදිය ද ගෙන්වා ගෙණ ජෙතවනමහාවිහාරයට යන්නාහ.

ධනවතුන්ට හා කුලවතුන්ට වාසස්ථාන වූ එසේ ම හැම එකෙකුන් පිරිගත් මේ මහානගරයෙහි වත් පොහොසත් කම්වලින් කිසිත් අඩුවක් පාඩුවක් නැති **මහාසුදත්ත** නම් ධනපතියෙක් වාසය කෙළේ ය. ඔහු විසින් ධාර්මික ව උපයනලද ධනය ද පරිභොගයට සුදුසු වූ වස්තුව ද ටික නො වී ය. තමන් දැහැමින් සපයන ලද වස්තුව තමන්ගේ ඇවැමෙන් පරිපාලනය කිරීමට පුතකු වත් දුවක වත් නො ලැබීම මොහුගේ කැවිල්ලට එක් මහෙතු ව විය.

දිනක්, මේ මහාසවණී තෙමේ දිය නෑමට ගංතොටුපලට ගොස් නාලා ගෙදර එන්නේ, අතරමග දී ලොකු කුඩා අතුවලින් වැඳගිය වන දෙටු රුකක් දුටුයේ, "මේ ශොභාවත් වූ මහාගස මහෙශාක්‍ය වූ දෙවතාවක විසින් අයත් කොට ගන්නා ලද්දේ

වනැ"යි සිතා, ඒ ගස හාත්පස භූමිය ශුඛ කරවා, පවුරකින් වට කරවා සුදුවැලි අතුරවා ධජපතාකා නංවා මොනවට අලඬකාර කොට "මට පුතකු හෝ දුවක ලබා දුන්නොත්, මේ ගස අරක් ගත් දෙවියන් වහන්සේ මෙයට අධික වූ මහාසත්කාරයෙන් පුදන්නෙමි" යි කියා ප්‍රාර්ථනා කොට් ගියේ ය.

ඒ මේ දෙවතාරාධනාවෙන් පික දවසකට පසු, ඔහුගේ භාර්‍යා තොමෝ හටගත් ගැබ් ඇත්තී ඒ බව සිය සැමියාට දන්වා සිටියා ය. එයින් අධිකසනෙතාෂයට පත් මහාසවණී කෙළෙඹි තෙමේ ගැබිනියනට කළයුතු වූ ගැබ්රකුම් එකකු ත් නො හැර සිදු කෙළේ ය. ඕ තොමෝ ද ලැබූ උපසථාන ඇත්තී නිදුක් වූවා, දස මසක් ගිය තැන මහපිණැති එක් පුතකු ප්‍රසූත කළා ය. මහාසවණියෝ අතිශයින් ඔද වැඩුනෝ "තමන් විසින් පාලනය කළ වන දෙවු රුකෙහි අරක් ගත් දෙවියන්ගේ අනුහසින් ලදැ"යි සිතා ලැබූ පුතුට "පාල"යි නම් කළෝ ය. ඉන් පික කලකට පසුත් කෙළෙඹි භාර්‍යා තොමෝ තවත් පුතකු වැදූ ය. ඔහුට "චුල්ලපාල" යි නම් තබා වැඩිමහල්ලාට "මහාපාල" යි නම් කෙළේ ය.

ධනයෙන් කිසිත් අඩුවක් නැත්තා සේ, දැන් දරුවන්ගෙන් ද අඩුවක් නැති ව ජීවත් වන මේ අඹු සැමි දෙ දෙනා තම දරු දෙදෙන නිසා, මහත් සතුටක් ලැබූහ. දරු දෙ දෙනා ද, මවු–පියන්ගේ අවවාද අනුශාසනා නොයික්මවා, කීකරු ව එක එකා කෙරෙහි බලවත් සහෝදර ප්‍රේමයෙන් යුක්ත ව වැඩෙමින්, කරකාරඛණ්ඩනයට සුදුසු අවසථාවට පත් වූවෝ, මවුපියන් විසින් තම කුලයට සුදුසු කුලයන්ගෙන් අඹුවන් ගෙණවුත් පාවා දී ගෘහජීවිතයට ද ඇතුළත් කරණ ලදහ.

මෙසේ ගිහිජීවිතයට පත් වූ ඔවුහු, මවුපියන්ගෙන් තමන්ට අයත් වූ වතු පිටි ගේදෙර මිලමුදල් ගව මීගොන් ආදී සියලු වස්තූන් මැනවින් රකිමින්, නිරවද්‍ය වූ ධාර්මිකගෘහසථජීවිතයක් ගත කළෝ ය. මේ කාලයෙහි දිනෙක සුවඳ මල් ආදිය ගත් අත් ඇති ව ආහාරපානවසත්‍රාභරණාදිය ගෙන්වා ගෙණ, බණ අසනු පිණිස විහාරයට යන ආර්‍යශ්‍රාවකසමූහයක් දුටු මහාපාල තෙමේ "මේ මහාජනයා සුවඳ මල් ආදිය රැගෙණ කොා තැනක යෙද්දැ"යි විමැරූ දුන, "මම ත් බණ අසනු පිණිස විහාරයට යමි"යි ඔවුන් හා එකතු ව ගොස් බුදුන් වැඳ ධම්ශාලායෙහි එක් කෙළවරක වාඩි ගත්තේ ය. අපගේ සවාමිදරු වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ධම්දෙශනා කරණ සේක්, ධම්ශ්‍රවණය පිණිස එහි පැමිණ සිටින මහාජනයාගේ අදහස් බලා වදාරා, බණ අසන්නන්ගේ අදහසට

ගැළපෙන ලෙසින් ධර්මදෙශනා කරණ සේක. මහාපාලයා බණ අසනු පිණිස පැමිණ සිටි දිනයෙහි ද, උන්වහන්සේ මහාපාලයාගේ හෙතු සම්පත් බලා වදාරා, ධර්මදෙශනා කරණ සේක්, **දානකථා, ශීලකථා, ස්වර්ගකථා, කාමයන්ගේ දොෂ, කාමයන්ගේ ඇති ලාමකකම, කෙලසීම, පැවිද්දෙහි අනුසස්,** ගැබ් කොට ගත් ආනුපුබ්බීකථාව දෙශනා කළ සේක.

බුදුරජුන් දෙසූ මේ ධර්මකථාව ඇසූ මහාපාල තෙමේ **"පරලොව යන්නහු කැටුව තමන් විසින් උපයා තැන්පත් කළ වස්තුවෙන් කිසිවක් නො යන්නේ ය, ආදරයෙන් හා ප්‍රෙමයෙන් වැඩූ අඹු දරුවෝ ද, පරලොව යන්නහු සමග නො යන්නෝ ය, වැඩියක් කුමට යැ, යටත් පිරිසයින් කවා පොවා නාවා තැනූ තමන්ගේ ශරීරය වත් තමන් කැටුව නො යන්නේ ය, අනේ සසරහැටි! කරුණු මෙසේ බැවින් ගිහිගෙයි විසීමෙන් මට ඇති ප්‍රයෝජනය කිම? අද ම මහණ වෙමි"**යි සිතා ධර්මදෙශනාව අවසන් වූ විට, වහා බුදුරජුන් කරා ගොස්, වැඳ, මහණකම ඉල්ලා සිටියේ ය. එවිට බුදුරජානන් වහන්සේ "පැවිද්ද පිළිබඳ ව තා විසින් විචාළ යුතු වූ කිසි නෑයෙක් තට නැත්තේ දූ"යි විචාළ සේක. "ස්වාමීන් වහන්ස! බාලසහෝදරයෙක් මට ඇත්තේ ය" යි මහාපාල තෙමේ ඉතා යටහත් ව දන්වා සිටියේ ය. "එසේ නම් ඔහුගෙන් අසා දැන එව"යි වදාළහ. මහාපාල තෙමේ, "මැනැවැ"යි ඒ පිළිගෙණ බුදුරජුන් වැඳ, ගෙදර ගොස්, මලනුවන් කැඳවා, "මලනුවෙනි! අපේ මේ කුලයෙහි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වූ යම්කිසි ධනයෙක් ඇත්තේ නම්, ඒ සියල්ල නුඹට භාර ය, ඒ සියලු ධනය පිළිගෙණ, මැනැවින් දිවි පවත්වා ගණුව"යි කී ය. එවිට මලනු තෙමේ "සහෝදරය! නුඹවහන්සේ කුමක් බලාපොරොත්තු වන්නහු දූ"යි ඇසී ය. "මම බුදුරජුන් ලඟ පැවිදි වන්නෙමි"යි හේ කී ය. "කුමක් කියන්නහු සහෝදරය! නුඹවහන්සේ ම පමණක් මාගේ මවු මළකල්හි මව මෙන් ද, පියා මළ කල්හි පියා මෙන් ද ලබන ලද්දහු ය, නුඹවහන්සේට අයත් වූ මේ ගෙයි මහත් සම්පත්තියක් ඇත්තී ය, පැවිදි නො වූවාට පින් කරණු හැකි ය, එබැවින් මෙසේ නො කළ මැනැවැ"යි මලනු තෙමේ බැගෑපත් ව ඉල්ලා සිටියේ ය. "මලනුවෙනි! මා විසින් අසන ලද්දේ යහපත් ධර්මයෙකි, ඒ ඉතා සියුම් ය, ගිහි ගෙයි වසන්නවුන්ට ඒ ධර්මය පිරිය නො හැකි ය, මලනුවෙනි! එ බැවින් පැවිදි වන්නෙමි"යි කීයේ ය. එවිට ඔහු "සහෝදරය! නුඹවහන්සේ තවම තරුණ ය, මහලු වූ කළ පැවිදි විය හැක්කේ ය, එ හෙයින් පැවිදි නො වෙනු මැනැවැ"යි නැවැත ත් කියා සිටියේ ය. ඒ කතාවට මහාපාල තෙමේ "මලනුවෙනි! මහලු වූ

කල තමන්ගේ අත් පා තම කැමැත්තට අනු ව හැසිර විය නො හැකි ය, තමන්ගේ වශයෙහි නො පවත්නේ ය, මහල්ලාගේ වචන අත්හු නො පිළිගණිත් ය'යි කිය යුතු කරුණක් වේ ද? කරුණු මෙසේ බැවින් මම තාගේ වචනය නො පිළිගණිමි, ශ්‍රමණ ප්‍රතිපත්තිය පුරන්නෙමි, මම පැවිදි වන්නෙමි"යි කියා මලනුවන් හඬද්දී ම බුදුරජුන් වෙත ගොස් පැවිදි ව උපසපන් බව ලැබී ය. මෙසේ පැවිදි උපසපන් බවට පැමිණ සිය ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් ගේ සමීපයෙහි පස් අවුරුද්දක් වාසය කොට පස්වන වස පවරා, බුදුරජුන් කරා එළැඹ "සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! මේ ශාසනයෙහි පැවිද්දකු විසින් වැඩිය යුතු ශාසනික ධුරයෝ කෙතෙක් වෙත් ද"යි බුදුරජුන් අතින් විවාළේ ය. "මහණෙනි! මාගේ ශාසනයෙහි පැවිද්දන් විසින් වැඩිය යුතු වූ ගන්‍ථධුරය, විදර්‍ශනා ධුරය කියා ධුර දෙකක් තිබේ ය"යි උන්වහන්සේ ඔහට වදාළ සේක. ඉක්බිති මහාපාල ස්‍ථවිර තෙමේ "සවාමීනි! එසේ වේවා, එහි ගන්‍ථධුරය කුමක් ද? විදර්‍ශනා ධුරය කුමක් ද? ඒ කෙසේ ද"යි විවාළේ ය. **"තමන්ගේ නුවණට සුදුසු පරිද්දෙන් එක නිකායක් හෝ නිකාය දෙකක් හෝ සියලු තෙවලා බුදුවදන් හෝ මොනවට ඉගෙණ ඒ දැරීම, කීම, කියවීම, යන යමෙක් වේ ද මේ ය ගන්‍ථධුර ය, සැහැල්ලු පැවතුම් ඇති ප්‍රාණන සෙනසුන්හි ඇළුනහුගේ ආතමභාවයෙහි ඛයවය ඵලවා සතතක්‍රියාවශයෙන් විදර්‍ශනා වඩා අර්‍හත්වය ගැණීම්ය විදර්‍ශනාධුර නම්"යි** වදාළ සේක.

ඉන් පසු මහාපාල ස්‍ථවිර තෙමේ "සවාමීනි! මහලු කල්හි පැවිදි උපසපන් වූ මට ගන්‍ථධුරය පුරන්නට නො හැකි ය, විදර්‍ශනාධුරය පුරන්නෙමි, එ හෙයින් ඒ පිළිබඳ කර්‍මස්‍ථාන මට වදාළ මැනැවැ"යි කී ය. බුදුරජානන් වහන්සේ ඔහට අර්‍හත්වය දක්වා කර්‍මස්‍ථාන වදාළ සේක ස්‍ථවිර තෙමේ බුදුරජුන් වැඳ ගොස්, තමන් හා එකතු ව භාවනාවට යෑමට භික්‍ෂූන් සැට නමක් කැමැති කරවා ගෙණ, ඒ සැට දෙනා සමග වෙහෙරින් නික්ම එක්සිය විසි යොදුන් පමණ වූ දිග් මහාමගට බැස ප්‍රාගමනින් ගොස්, එක් පිටිසර ගමකට පැමිණ, එහි තම පිරිවර සහිත ව පිඬු පිණිස සිඟා යියේ ය එහි වැසි මිනිස්සු සත්හුන් වූ වත් පිළිවෙතින් සරු මේ භික්‍ෂූන් දුන, අති ශයින් පැහැදුනෝ, අසුන් පණවා වඩා හිඳුවා, ප්‍රණීත ව පිළියෙල කළ ආහාරයෙන් වළඳවා "සවාමීනි! ආයර්‍යයන් වහන්සේලා කොහි වසිද්දැ"යි ඇසූහ. "උපාසකවරුනි! මහණ පිළිවෙත් පිරීමට පහසු ඇති තැනක් සොයා යමු"යි කී කල්හි, දුන උගත් ඒ මනුෂ්‍යයෝ "මුන් වහන්සේලා වස් විසීමට සෙනසුනක් සොයති"යි දුන, "සවාමීනි! පින්වතුන් වහන්සේලා මේ තෙමස අප ගමැ වසන්නාහු

නම්. අපි සරණසීලයෙහි පිහිටා සිල් සමාදන්වුවමු”යි කීහ. එකල උන් වහන්සේලා ද “අපි මේ සැදැහැවත් කුලයන් නිසා සසරින් මිදෙන්නෙමු”යි සිතා, ඒ නුවණැති මිනිසුන්ගේ ආරාධනාව සතුරින් පිළිගත්හ. ඔවුහු උන්වහන්සේලා ආරාධනාව පිළිගත් බව දැන විහාරයක් පිළියෙල කොට, එහි රාත්‍රිස්ථාන දිවාස්ථාන ද ගොඩනගා ඔවුන්ට භාර කළහ. උන්වහන්සේලා මෙසේ පිළියෙල කොට දුන් විහාරයෙහි වැඩ වසමින් එ ගමට ම පිඬු පිණිස වඩින්නාහ. මේ අතර එගම් වැසි වෙද මහතෙක්, උන්වහන්සේලා කරා පැමිණ “ස්වාමීනි! බොහෝ දෙනා වාසය කරණ ස්ථානයන්හි නොයෙක් ලෙඩ රෝගාදිය ඇතිවීම ස්වාභාවික ය, එ හෙයින් ඔබ වහන්සේලා අතර එබදු ලෙඩරෝ අයුරක් ඇති වූ විට, මට දන්වනු මැනැව, මම ඊට පිළියම් කිරීමට කැපකරුවකු වශයෙන් බැඳෙමි”යි පවරා සිටියේ ය.

මේ භික්ෂූන් වහන්සේලා අතර ප්‍රධාන තැන්පත් මහාපාල ස්ථවිර තෙමේ වස්වසන දිනයෙහි, ඒ භික්ෂූන් කැඳවා “ඇවැත්නි! තමුන්නාන්සේලා මේ තෙමස මෙහි කෙතෙක් ඉරියව්වලින් කල් යවන්නහු දැ”යි ඇසී ය. ඔවුහු “ස්වාමීනි! අපි ඉරියවු සතරින් ම කල් යවමු”යි කීහ. “ඇවැත්නි! ඒ කිම සුදුසු ද? අප්‍රමත්ත විය යුතු නොවේ ද, අපි වනාහි ජීවමාන බුදුරජුන්ගේ සමීපයෙහි කමට හන් ගෙණ ආවෝ නොවෙමු ද, **බුදුවරයෝ වනාහි කෙරෙවිකකමින් සතුටුකරන්නට නොහැක්කෝ ය, උන්වහන්සේලා හොඳ අදහසින් ම සතුටුකළ යුත්තෝ ය,** ඇවැත්නි! ප්‍රමත්ත වූ තැනැත්තාහට බිහිසුණු සතර අපායයෝ සියගෙය වැනි ය, එ හෙයින් අප්‍රමත්ත වුව”යි ස්ථවිර තෙමේ කියේ ය. එවිට ඒ ස්ථවිරයන් වහන්සේලා “ස්වාමීනි! නුඹ වහන්සේ මේ තෙමස කෙතෙක් ඉරියව්වලින් ගත කරන්නට සිතහු දැ”යි ඇසූහ. “මම වනාහි ඉරියවු තුණකින් කල් යවන්නෙමි, පිට නමා දිග නොහරින්නෙමි, නොනිදන්නෙමි”යි හේ කියේ ය.

මෙසේ කියා නොනිදන්නට තරයේ ඉටා, නොනිදා ම භාවනානුයොගී ව එකලා ව කල් යවන මහාපාල ස්ථවිරයන් වහන්සේට, වස් තෙමසින් පළමු මස ඉක්ම ගිය තැන, බලවත් ඇස් ලෙඩක් හට ගත්තේ ය. ඒ කරණ කොට, සිදුරු කළයෙන් දියදහරා වැගිරෙන්නා සේ, ඇස්වලින් කඳුළුදහරා වැගිරෙන්නට වූ ය. එහෙත් උන්වහන්සේ මුළු රැය භාවනා කොට, අරුණ නගින විට තමන් වසන කාමරයට ඇතුල් ව උන්හ. සෙසු භික්ෂූන් වහන්සේලා පිඬු පිණිස හැසිරෙන වේලෙහි තෙරුන් ලඟට ගොස් “ස්වාමීනි! දැන් පිඬු පිණිස හැසිරෙන වේලාවැ”යි කීවාහු ය. “ඇවැත්නි! එසේ නම් පාසිවුරු ගණිවු” කියා තමන් වහන්සේගේ පාසිවුරු ගෙන්වා

ගෙණ, පිඬු පිණිස ගමට වැඩියහ. ගමෙහි පිඬු සිඟද්දී සමග වැඩිය භික්ෂූන් වහන්සේලා කටුළු වැගිරෙන සක්පල් තෙරුන්ගේ ඇස් දුක "සවාමීනි! මේ කිමැ"යි ඇසූහ. එවිට "ඇවැත්නි! මාගේ ඇස්වල බලගතු ලෙඩක් හට ගෙණ තිබේ, එහෙයින් නිතර කටුළු වැගිරේ"යි කීයේ ය. "ඇයි සවාමීනි! අපි වෙදකු විසින් පවරණ ලද්දමෝ නොවෙමු ද, එ බැවින් ඒ වෙදමහතාහට මේ බව කියමු"යි භික්ෂූහු කීහ. උන්වහන්සේ ද "ඒ මැනැවැ"යි පිළිගත් පිට ඔවුහු වෙදමහතාට මේ බව දැන් වූහ. වෙද තෙමේ ද, වහා තෙලක් සිඳ නස්‍යය කරණු පිණිස තෙල් පන්සලට යැවූයේ ය. සථවිර තෙමේ ඒ පිළිගෙණ නොනිදා ඉඳ නස්‍යය කොට අනික් තෙරුන් සමග ගමට පිඬු පිණිස වැඩියේ ය. වෙද තෙමේ පිඬු පිණිස හැසිරෙන උන්වහන්සේ දුක "ලෙඩේ කෙසේ යැ, තවමත් ඇස් රිදේ ද?"යි ඇසී ය. එවිට උන්වහන්සේ "එසේ යැ, රිදේ ය"යි කීහ. ඉක්බිති වෙදමහතා "සවාමීනි! මා විසින් එවූ තෙල නස්‍යය කෙළේ ද"යි ඇසුයේ ය. ඊට ද "එසේ යැ"යි පිළිතුරු දුන්හ. "දැන් කෙසේ ද"යි ඇසූවිට "උපාසකය! තව ම රිදේ ය"යි කීහ. "ඇයි, එසේ වනු, මාගේ මේ නස්‍යතෙල නස්‍යය කළ එකවරින් ම ලෙඩ සංසිඳවීමෙහි පොහොසත් වූ මහානුභාවසම්පන්න වූ තෙලෙකි, කුමක් හෙයින් මුන්වහන්සේගේ මේ ඇස්ලෙඩේ මෙතෙක් නොසංසිඳුනේ ද" යි සිතා "සවාමීනි! ඔබවහන්සේ විසින් තෙල, නස්‍යය කරණ ලද්දේ ඉඳ ගෙණ ද? නැතහොත් වැද හොවී ද?"යි විචාළේ ය. එයට සථවිර තෙමේ නිහඬ වූයේ ය. නැවැත දෙතුන් විටක් අසන ලද්දේ ද කිසිවක් නොකීයේ ය. එවිට වෙදමහතා විහාරයට ගොස් "තෙරුන් වසන තැන බලන්නෙමි"යි සිතා තෙරුන් විහාරයට පිටත් කොට, තෙමේ පසු ව ගොස් තෙරුන් වසන තැන බලන්නේ, සක්මන් කරණ තැන ත්, ඉඳින තැන ත් දුක නිදන්නට පිළියෙල කරගත් තැනක් නොදුක "ඔබවහන්සේ විසින් තෙල නස්‍යය කරණ ලද්දේ ඉඳ ගෙණ ද? නැතහොත් වැද හොවී ද?" යි එහි දී ත් තෙරුන් විචාළේය. සථවිර තෙමේ එහිදී ත් කිසිවක් නොකී ය. "සවාමීනි! මෙසේ නොකළ මැනැව, තෙමේ නීරෝගී වේ නම්, මීහණකම කරණු හැකි ය, එහෙයින් කරුණා කොට වැද හොවී තෙල නස්‍යය කරණු මැනැවැ"යි නැවැත නැවැත ත් යාච්ඤා කෙළේ ය. "හොඳයි උපාසකය! තමුසේ යන්න! මම කතා කොට බලා ඒ කරන්නෙමි"යි සථවිර තෙමේ වෙදුට කියා සිටියේ ය. වෙදු ගෙදර ගියේ ය.

ඉක්බිති උන්වහන්සේ ගෙට වැද තමන් හා ම කතා කරන්නෝ, **"පාලිතය! කොහොම ද? නුඹ ඇස් ගැණ බලාපොරොත්තු වෙහි ද? නැතහොත් බුඩසාසනය ගැණ බලාපොරොත්තු වෙහි ද? කියන්න, පාලිතය! එතෙර මෙතෙර නැති සසර**

සැරි සරන නුඹ ඇස් නැති ව උපන් ආතමභාවයන්හි ගණන් නැත, පාලිතය! නුඹ සසර ඇවිදිද්දී සියගණන් දහස් ගණන් බුදුවරයෝ ඉපිද ලෝවැඩ කොට පිරිනිවී ගියහ, නුමුත් නුඹට ඒ එක් නමක් වත් නිසි සේ ආශ්‍රය කරණු බැරි විය, එ හෙයින් මේ තුන් මස නො නිදා භාවනායෙහි ම යෙදී විසිය යුතු ය, එහෙයින් පාලිතය! තාගේ ඇස් නැසී වැනසී ගිය ත් බුඩසාසනය ම දරව" යි මේ ආදී වශයෙන් තමන් හා කතා කොට, නස්‍යය ත් කර ගෙණ, පිඬු පිණිස ගමට ගියහ. එහි දී වෙදමහතා තෙරුන් දැක "ස්වාමීනි! නස්‍යය කරණ ලද්දේ දැ"යි විචාළේ ය. "උපාසකය! එසේ ය"යි උන්වහන්සේ පිළිතුරු දුන්හ. "එසේ නම් ස්වාමීනි! ලෙඩේ තතු දැන් කෙසේ දැ"යි වෙදා ඇසී ය. "උපාසකය! එහි වෙනසෙක් නැත, දැනු ත් එසේ ම රිදේ ය" යි කීහ. "මොක ද මේ? ස්වාමීනි! ඔබවහන්සේ විසින් ඉඳ ගෙණ නස්‍යය කරණ ලද්දේ ද? නැත, වැද හොවි කරණ ලද්දේ දැ?"යි එවරත් ඇසී ය. ස්ථවිර තෙමේ කිසිවක් නො කී ය. වෙදා විසින් නැවැත නැවැත විචාරණු ලබන්නේ ද නිශ්ශබ්ද ම වී ය. එකල්හි වෙදා "ස්වාමීනි! කොතෙක් කීව ත්, ඔබවහන්සේ පිළියමට සුදුසු සේ ක්‍රියා නො කරන්න හු ය, ඒ නිසා අද පටන් අසුවල් වෙදා විසින් මට තෙලක් සිඳ දෙන ලද්දේ ය යි කිසිවක්හට ත් නො කියනු මැනැව, මමත් මා විසින් ඔබ වහන්සේට තෙලක් සිඳ දෙන ලද්දේ ය යි කිසිවක්හට ත් නො කියන්නෙමි"යි කීයේ ය.

මෙසේ පිළියමෙන් බැහැර කළ ඒ මහාපාල ස්ථවිර තෙමේ විහාරයට ගොස් **"පාලිතය! දැන් තෝ වෙදහු විසින් දුරු කරණ ලද්දේ වෙහි, මරුවාට නියම වූ යෙහි, පාලිතය! දැන් කරුණු මෙසේ බැවින් තව තවත් කුමට ප්‍රමත්ත වෙහි දැ"** යි මෙසේ තමාට අවවාද කොට, වැඩියක් මහණදම් කරන්නට පටන් ගත්තේ ය. මෙසේ සිත්හි බලවත් අධිෂ්ඨානයෙන් යුක්ත ව භාවනා කරද්දී, එදා රාත්‍රියෙහි මධ්‍යමයාමය ඉකුත් වත් ම එකවිට ම ඇස් හා කෙලෙස් බිඳී ගියේ ය. කෙලෙස් බිඳී ගිය පසු ඒ ස්ථවිර තෙමේ ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ නමක් ව කාමරයට වැද හුන්නේ ය. භික්ෂූන් පිඬු පිණිස හැසිරෙන වේලෙහි උන්වහන්සේ ලඟට පැමිණ "ස්වාමීනි! පිඬු පිණිස හැසිරෙන වේලාව පැමිණියා"යි දන්වා සිටිවිට "ඇවැත්නි! එසේ දැ"යි ඇසී ය. භික්ෂූහු "එසේ ය"යි පිළිතුරු දුන්හ. "එසේ නම් තෙපි යවු" යි කී ය. භික්ෂූහු "කිමෙක් ද? ඔබ වහන්සේ පිඬු පිණිස නො වඩින්නහු දැ" යි! ඇසූහ. "ඇවැත්නි! කො තැන යන්නට? මාගේ ඇස් පිරිහී නොපෙණී ගියේ"යි කී ය. එහි පැමිණි භික්ෂූන් වහන්සේලා උන්වහන්සේගේ පිරිහී ගිය ඇස් බලා,

කඳුළු පිරුණු ඇස් ඇත්තෝ ව, හඬා වැලප "සඞ්ඝත්ථේර! අමූත්තක් නො සිතනු මැනැව, අපි ඔබ වහන්සේට උපස්ථාන කරන්නෙමු"යි තෙරුන් සනසා, කළයුතු කුදු මහත් වත් ද කොට, පිඬු පිණිස ගමට වැඩියහ. එහි ගම්වැස්සෝ තෙරුන් නො දැක "සඞ්ඝත්ථේර! අපගේ පින්වතුන් වහන්සේ කොහි දැ"යි ඔවුන් විචාරා, සියලු සුවත් දැන පළමු කොට කැඳ අවුළු පත් පන්සලට යවා, තුමූ පිණ්ඩපාතය ගෙණ, විහාරයට ගොස්, තෙරුන් වැඳ පාමුල පෙරළෙමින් අඬා "සඞ්ඝත්ථේර! අපි ඔබ වහන්සේට උපස්ථාන කරන්නෙමු, ඔබ වහන්සේ අමූත්තක් නො සිතනු මැනැවැ"යි අස්වසා සියහ. එතැන් පටන්, ඔවුහු උන්වහන්සේට කැඳ බත් නිතර විහාරයට යවත්. එහි වැසි අනික් භික්ෂූන් වහන්සේලා ද උන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා කළ භාවනා බලයෙන් පවාරණ දිනය ලංවත් ම පිළිසිඹියාවත් සමග රහත්බවට පැමිණියෝ ය.

ඉන් පසු උන්වහන්සේලා වස් පවාරණය කොට, බුදුරජුන් දකිනු කැමැත්තෝ ව, "සඞ්ඝත්ථේර! අපි බුදුරජුන් දකිනු කැමැත්තම් හ"යි තෙරුන්ට දැන් වූහ. සඞ්ඝත්ථේර තෙමේ ඒ අසා "මම දුර්ලභ වෙමි, අතරමග අමනුෂ්‍යයන් විසින් අරක් ගත් මහාවනයෙක් ඇත්තේ ය, මා මොවුන් සමග යන කල්හි සියල්ලෝ, කලාහන වන්නාහු ය, කෑම් පිම් ලැබීමෙහි ද, අපොහොසත් වන්නාහු ය, ඒ නිසා මොවුන් පළමු කොට බුදුරජුන් වෙත යවමි"යි සිතා "ඇවැත්නි! නෙඳ යවු"යි කී ය. "සඞ්ඝත්ථේර! නුඹ වහන්සේ නො වඩින්නහු දැ"යි විවාළවිට "ඇවැත්නි! මම දුර්ලභ වෙමි, අතර මග ත් අමනුෂ්‍යයන් විසින් අරක් ගත් මහාවනයෙක් ඇත්තේ ය, මා සමග යන කල්හි සියල්ලෝ ම කලාහන වන්නාහු ය, ඒ නිසා තමුන්නාන්සේලා පළමු යනු මැනැවැ"යි කී ය. එවිට උන්වහන්සේලා "සඞ්ඝත්ථේර! එසේ නො කළ මැනැව, අපි ඔබ වහන්සේ සමග ම යන්නෙමු"යි කියා සිටියහ. "ඇවැත්නි! තමුන්නාන්සේලාට එය රුචි නො වේවා, එසේ වී නම්, මට අපහසු වන්නේ ය, මාගේ මලනු තෙමේ නුඹ වහන්සේලා දැක මාගේ සහෝදරයා මම කොහි වෙමි දැ?යි විචාරන්නේ ය, එවිට ඔහට මාගේ ඇස් අඬා වූ බව දන්වා ලවු; එකල මාගේ මලනු තෙමේ මා සමීපයට කිසිවකු එවනවා ඇත, ඔහු සමග මම එන්නෙමි, අමූත්තක් නො සිතනු මැනැව, තමුන්නාන්සේලා මාගේ වචනයෙන් ද බුදුන් ද, අසූ මහතෙරුන් ද වඳිනු මැනැවැ"යි සඞ්ඝත්ථේර තෙමේ භික්ෂූන් වහන්සේලා පිටත් කර යැවූයේ ය. ඔවුහු තෙරුන් කමා කරවා ගෙණ, ඇතුල් ගමට වැඩිහ. මිනිස්සු උන්වහන්සේලා වඩා හිඳුවා දන් දී "සඞ්ඝත්ථේර! කිමෙක් ද, නුඹ වහන්සේලා මේ කොයි වඩින්නහු දැ?"යි ඇසූහ. "උපාසකවරුනි! අපි බුදුරජුන් දකිනු කැමැත්තම්හ,

ඒ පිණිස සැවැත්නුවරට යමු”යි දැන්වූහ. “ස්වාමීනි! තව ටික කලක් අපට අනුග්‍රහ පිණිස අප විහාරයෙහි වැඩ හිඳිනු මැනැවැ”යි ආරාධනා කළ විට ද, උන්වහන්සේලා ඒ ආරාධනාව නො පිළි ගත්හ. ගම්වැස්සෝ උන්වහන්සේලා සමග ටික දුරක් ගොස්, මහත් සේ හඬා නැවතුනාහු ය.

සැවැත්නුවර ජෙතවනමහාවිහාරයට පාගමනින් ගිය ඒ භික්ෂූන් වහන්සේලා බුදුරජුන් ද, අසූ මහතෙරුන් ද සක්පල් තෙරුන්ගේ වචනයෙන් වැඳ, පසුදා තෙරුන්ගේ මලනුවන් වසන කඩපලට පිඬු සිහා ගියහ. කෙලෙඹි තෙමේ උන්වහන්සේලා දැන, ඇඳින, වඩා හිඳුවා, කළ පිළිසඳර කතාවෙන් පසු, “මාගේ සහෝදර තෙමේ කොහි දැ”යි විචාළේ ය. එවිට භික්ෂූන් වහන්සේලා තෙරුන් පිළිබඳ සියලු තොරතුරු ඔහුට දැන් වූහ. හෙතෙමේ උන්වහන්සේලාගේ පාමුල පෙරළෙමින් හඬා “ස්වාමීනි! දැන් ඉතින් කුමක් කටයුතු ද”යි ඇසී ය. සථවිර තෙමේ මෙහෙත් කිසිවකුගේ පැමිණීම බලාපොරොත්තු වෙයි, කිසිවකු එහි ගිය කල්හි ඔහු සමග මෙහි වඩින්නේ ය”යි කීවාහු ය. “ස්වාමීනි! එසේ නම් මේ පාලිත තෙමේ මාගේ බෑනා ය, මොහු එහි යවනු මැනැවැ”යි කෙලෙඹි තෙමේ කීයේ ය. එවිට ඔවුහු මොහු මෙසේ යවන්නට නො හැකි ය, මගැ උවදුරු බොහෝ ය, එබැවින් පැවිදි කොට යැවිය යුතු ය”යි ඔහු පැවිදි කොට පසළොස් දවසක් පමණ සිවුරු පෙරවීම් ආදිය උගන්වා, පාරද කියා දී තෙරුන් සමීපයට යැවිවාහු ය. සාමණේර තෙමේ පිළි වෙළින් ගොස්, ඒ ගමට පැමිණ, ගම් දෙරකඩ සිටි එක් මහලු මිනිසකු දැක “මේ ගම නිසා කිසි ආරණ්‍ය විහාරයෙක් ඇත්තේ දැ”යි විචාරා දැන ඒ මහලු මිනිසා සමග ම තෙරුන් වහන්සේ වසන විහාරයට ගියේ ය. සාමණේර තෙමේ තෙරුන් වැඳ, පසළොස් දවසක් වත් පිළිවෙත් කිරීමෙන්, තෙරුන්ට උපස්ථාන කොට “ස්වාමීනි! මාගේ මාමා නුඹ වහන්සේගේ එහි පැමිණීම බලාපොරොත්තු වේ, එබැවින් එහි වඩිමු”යි කීයේ ය.

“හා! හොඳයි, එසේ නම් මාගේ මේ සැරයටි කොණ ගණුව”යි කීහ. සාමණේර තෙමේ සැරයටි කොණ ගෙණ තෙරුන් සමග ඇතුල් ගමට ගියේ ය. මිනිස්සු උන්වහන්සේ වඩා හිඳුවා “මොක ද, ස්වාමීනි! මේ කොයි වඩින්නහු?”යි ඇසූහ. “උපාසකවරුනි! “අපි බුදුරජුන් දැක, වදිනු පිණිස සැවැත්නුවරට යමු”යි කීහ. “ස්වාමීනි! නො වැඩිය මැනැව, මෙහි වැඩ වාසය කරණු මැනැවැ”යි නොයෙක් ලෙසින් ගමත් වැළැක්වීමට උත්සාහ කළ ඔවුහු, ඒ නො හැකි ව උන්වහන්සේලා සමග අඩ මගක් ගොස් හඬා වැලප නැවතුනාහු ය. සාමණේර තෙමේ තෙරුන්ගේ සැරයටි කොණ

ගෙණ යන්නේ, අතර මග වනයෙහි තෙරුන් කලින් වාසය කොට පළපුරුදු කම් ඇති කාඤ්චනගරයට පැමිණියේ ය. එහි දී සාමණේර තෙමේ වනයෙහි ගී සින්දු කියමින් දර කඩන ස්ත්‍රියක ගේ ගී හඬෙහි නිමිති ගෙණ "මේ ශබ්දය තෙමේ ස්ත්‍රියකගේ ය" යි නිශ්චයට බැස, කාමදාහයෙන් දැවෙන්නට පටන් ගත්තේ ය. සත්‍යයෙකි. **"ස්ත්‍රියකගේ ශබ්දය වැනි පුරුෂයන්ගේ සිරුර පැහිර සිත බැහැ ගැණීමෙහි සමර්ථ වූ අන් ශබ්දයෙක් මුළු ලොව නැත්තේ ම ය"** මේ බව බුදු රජානන් වහන්සේ මෙසේ වදාළ සේක.

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි. යො එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති. යථයිදං භික්ඛවෙ! ඉත්ථිසද්දො, නි"

ඒ ස්ත්‍රීශබ්දමාත්‍රයෙහි බැඳී කාමදාහයෙන් දැවී ගිය සාමණේර තෙමේ මුඹ වූයේ යුක්තායුක්තවිවාරණයෙහි අපොහොසත් වූයේ, තෙරුන් අත තුබූ සැරයටියෙහි තමන් ගත් කොණ බිමැ දමා "ස්වාමීනි! පොඩ්ඩක් සිටිනු මැනැව, මට වැඩෙක් තිබේ"යි ස්ත්‍රියගේ ගී හඬ ඔස්සේ වනයෙහි ගමන් කොට, ඇ වෙතැ ගියේ ය. ඕ තොමෝ හතිලමින් සිහිවිකල වූවකු සේ එහි පැමිණි මේ පුදුම මිනිහා දැක නිහඬ වූවා ය. සාමණේරයා ඇය සමඟ තමන් කැමති සේ කාම සෙවනය කොට සීලවිපත්තියට පැමිණියේ ය. මේ අතර ස්ථවිරයන් වහන්සේ "දැන් වනයෙහි එක් ගී හඬෙක් ඇසුනේ ය, ඒ හඬ ස්ත්‍රියකගේ හඬෙකි, සාමණේරයා ත් තව ම නො පැමිණියේ ය, ඒකාන්තයෙන් මේ තෙමේ සීලවිපත්තියට පැමිණියේ වනැ"යි සිතූහ. සාමණේරයා ද තමන්ගේ කටයුතු අවසන් කොට පැමිණ, "ස්වාමීනි! දැන් ඉතින් යමු"යි කියේ ය. එවිට ස්ථවිර තෙමේ "සාමණේරය! තෝ පව්ටෙක් වූ යෙහි දැ"යි විචාළේ ය. ගෙ තෙමේ නිශ්ශබ්ද විය. දෙතුන් විටක් අසන ලද්දේ ද කිසිවක් නො කියේ ය. එයින් ස්ථවිර තෙමේ කාරණය මැනැවින් දන්නේ "බොල! පව්ට! තා වැනි කමකට නැති පව්ටකු ලවා මම මාගේ සැරයටි කොණ ගත්වම් ද, බොල! හෙරණ! තා වැනි නීඳිතයකු ලවා මාගේ සැරයටි කොණ ගැන්වීමෙක් නැත්තේ ය" කියා සාමණේරයා පන්නා හැරියේ ය. සාමණේර බලවත් දුකට පැමිණ, පොරවා තිබුණු සිවුරු අස් කොට, ගිහියකු සේ හැඳ "ස්වාමීනි! මම මීට කලින් සාමණේරයෙක් ව සිටියෙමි, දැන් වනාහි ගිහියෙක්මි, මහණවූයේ ත් ශ්‍රද්ධායෙන් නො වෙමි, මග උවදුරු නිසා ය පැවිදි වූයේ, එබැවින් වහා වඳිනු මැනැවැ"යි නැවැත ත් කියා සිටියේ ය. **"බොල! පව්ට! ගිහියා වුවත් පව්කම් කෙරේ නම් ඔහු පාපයෙකි, මහණ වුවත් පව්කම්**

කෙහේ නම් ඔහු පාපයෙකි, ගිහි පාපයා ත් පාපයා ම ය, මහණ පාපයා ත් පාපයා ම ය' ශ්‍රමණභාවයෙහි සිටත් තට ශීලමාත්‍රයක් පුරණු නො හැකි විය, ගිහි ව සිට කරණ යහපත කුමක් ද, තා වැනි පාපයකුට මාගේ සැරයටි කොණ ගැණීමට ඉඩ නො දෙමි"යි තෙරුන් කිවිට "සවාමීනි! මේ මග අමනුෂ්‍යඋපද්‍රව බොහෝ ය, නුඹ වහන්සේගේ ත් ඇස් අඬ ය, ඉතින් මෙහි කොහොම වසන්නට-දූ" යි ඔහු කීයේ ය. සථවිර තෙමේ "නුඹ එහෙ ම සිතන්නට එපා, මා මේ වනයෙහි මැරුණ ද තා වැනි පවිටකු සමග නම් නො යමි" යි කියා,

"එකැතින් නැසුනු ඇස් - ඇත්තෙම් කතර ආයෙම්,
හෝනේ නො යමි යහළු - බැව් නැත අදබලුත් හා

එකැතින් නැසුනු ඇස් - ඇත්තෙම් කතර ආයෙම්,
මැරෙන්නෙම් නො ද යන්නෙම් - යහළු නැත අදබලු හා"

යි මෙසේ ත් කීයේ ය. තෙරුන්ගේ මේ කතාව අසා හෙරණ තෙමේ මහත් සංවෙගයට පැමිණ "අහෝ! මා විසින් ඉතා බැරුරුම් ක්‍රියාවක් කරණ ලද්දේ ය, මා විසින් කරණ ලද ඒ කමීය ඉතා සැහැසි ය, දරුණු ය, නො සුදුසු ය" යි හිසැ දෙඅත් බැඳ අඩමින් වනයට ම රිංගා ගත්තේ ය. එයින් තෙරුන් වහන්සේ වනයෙහි තනි වූහ. ඇසු ත් අඬ ය. මෙසේ විපතට වැටුන තෙරුන්ගේ ඒ මහත් වූ ගුණශීලතෙජයින් ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පඬු ඇඹුල් ගල් අසුන උණු වී ගියේ ය. එවිට ශක්‍ර තෙමේ කවරෙක් මා මෙ තැනින් පහකරණු කැමැත්තේ දූ" යි දිවැස් යොමා බලන්නේ, ඇස් අඬ ව වනයෙහි තනි වී ගිය චකඛුපාල මහ තෙරුන් දුටුයේ ය. දැන, "ඉදින් මම මෙබඳු පවට බිය වූ දහම් ගරු කොට ගත් පින්වතුන් වහන්සේගේ සමීපයට නො යන්නෙම් නම්, මාගේ හිස සත් කඩකට පැළී යන්නේ ය" යි සිතා වහා තෙරුන් ලඟට ගොස්, තමන් පැමිණි බව දැන්වීමට පයින් ශබ්ද කෙළේ ය. ඉක්බිති සථවිර තෙමේ 'මෙ තෙමේ කවරෙක් දූ" යි විවාළේ ය. "සවාමීනි! මම මගැ යන්නෙක්මි" යි හේ පිළිතුරු දිනැ. "උපාසකය! කොතැන යෙහි දූ"යි තෙරුන් විවාළ විට, "සවාමීනි! මම සැවැත්නුවරට යමි" යි කීයේ ය. "උපාසකය! එසේ නම් යව" යි කී විට, "සවාමීනි! පින්වතුන් වහන්සේ කොතැන වඩින්නාහු දූ"යි ඇසුයේ ය. "මම ත් එහි යමි"යි සථවිර තෙමේ කීයේ ය. "එසේ නම් සවාමීනි! අපි දෙදෙනා එකතු ව යමු" යි මගියා කී විට, "මම දුර්ශීල වෙමි, මා සමග යන්නා වූ තමුසේට ප්‍රමාද වන්නේ ය" යි කී ය. "සවාමීනි! මට හදිසි කටයුත්තෙක් නැත, පින්වතුන් වහන්සේ සමග යෑමෙන් මට දශ

විධපුණ්‍යක්‍රියාවස්තූන් අතුරෙහි එකක් ලැබිය හැකි ය"යි කීයේ ය. සථවිර තෙමේ "මේ තෙමේ සත්පුරුෂයෙක් වන්නේ ය" යි සිතා "උපාසකය! එසේ නම්, මාගේ මේ සැරයටියෙහි කොණ අල්ලා ගණුව" යි කීයේ ය. ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ ද සැරයටි කොණ ගෙණ, තමන්ගේ දෙවතානුභාවයෙන් පොළොව හකුළුවමින් ගොස් සවස් කාලයෙහි තෙරුන් ජේතවනාරාමයට පමුණුවාලූයේ ය. සථවිර තෙමේ සැවැත්නුවර ඒ ඒ තැන ගයනු ලබන මිහිරි වූ භාත්කලූ වූ තූර්‍යනාදයන් අසා "මේ මිහිරි ශබ්දය කොතැන පවතින්නෙක් දෑ" යි ඇසුයේ ය. "ස්වාමීනි! සැවැත්නුවරය" යි ඔහු කීයේ ය. "උපාසකය! පෙර දවසැ මේ ගමනට අපට බොහෝ කාලයක් ගත විය, අද නම් ඉතා ඉක්මනින් ගමන කරණු හැකි වී ය" යි තෙරුන් කී කල්හි "ස්වාමීනි! මම සැවැත්නුවරට යෑමට කොට මගක් දනිමි, අද ඒ මගින් ආමි"යි කී කල්හි සථවිර තෙමේ "මෙ තෙමේ මිනිසෙක් නොවේ, දෙවියකු විය යුතු ය"යි සැල කුයේ ය. සක්දෙව් තෙමේ තෙරුන් සඳහා උත්වහන්සේගේ මලනු කෙළඹියා විසින් කරවන ලද පන්සලට තෙරුන් පමුණුවා, එහි අසුන්ක වඩා හිඳුවා, නැවැත පිය යහළුවකුගේ වෙසින් තෙරුන්ගේ මලනුවන් ලඟට ගොස් "යහළු පාල! යි කැඳවා "කිම, තෙරුන් ආබව නොදන්නෙහි ද? තෙරුන් වහන්සේ පැමිණියහ, මම දැන් පන්සලට ගියෙමි, නුඹ විසින් කරවන ලද පන්සලෙහි උන් තෙරුන් දැක ආයෙමි"යි කියා ගියේ ය. කෙළෙඹි තෙමේ විහාරයට ගොස් තෙරුන් දැක, පා මූල පෙරළෙමින් අඬා "ස්වාමීනි! ඔබ වහන්සේට සිදුවන මේ විපත දැක, මම මුල දී ඔබ වහන්සේගේ පැවිදි වීමට විරුඬ වීමි"යි කියා දැස දරුවන් දෙදෙනකුත් දැසකමින් මුදු තෙරුන් ලඟ පැවිදි කරවා ඇතුල් ගමින් කැඳබත් ආදිය ගෙණවුත් තෙරුන්ට උපස්ථාන කරවූ"යි නියම කළේ ය. සාමණේරයෝ ද තෙරුන්ට උපස්ථාන කලෝ ය.

මේ කාලයෙහි දවසක් දිසා වැසි බොහෝ භික්ෂූහු "බුදුරජුන් දකිමු"යි ජේතවනයට අවුත් බුදුරජුන් දැක වැඳ, අසූ මහතෙරුන් හමු ව වෙහෙරතුළ හැසිරෙන්නාහු "චක්ඛුපාල තෙරුන් වසන තැන ත් බලමු"යි සවසූ එහි යන්නට පිටත් වූහ. එ කෙණෙහි සතර දිගින් මහවලාකුළෙක් නැංගේ ය. භික්ෂූන් වහන්සේලා "දැන් සවස් විය, වලාකුළෙක් ද පෙණේ, දැන් ගමනට සුදුසු නැත, එ බැවින් හෙට උදැසන ම ගොස් බලන්නෙමු"යි නැවතුනාහ. වලාකුළ ද පෙරයම වැස, මැදියම පහ ව ගියේ ය. පටන් ගත් විගස් ඇති පුරුදු කළ සක්මන් ඇති සැදැලෙන් බැඳි චක්ඛුපාල සථවිර තෙමේ වැස්සෙන් ඳසු සක්මන් කිරීමට සක්මන්මලුවට ගියේ ය. එ වේලෙහි වැසිදියෙන් තෙමී ගියා වූ පොළොවෙන් බොහෝ ඉදුගොව්වෝ

උඩට මතු වූහ. තෙරුන් සක්මන් කරද්දි පයට පැයි බොහෝ ඉදිලාගොවිවෝ මිරිඟණහ. අනුවැයියනට ද එදා සක්මන් මලුව හැමදිම අමතක විය. මේ අතර දිසාවැසි තිස්සූහු "තෙරුන් වහන්ස, තැන බිලිදීම උදුරාගෙන තෙරුන් එපන තැනට ගොස් ඔබ්බෙන්ම සැතිසෙන්නාහු, සක්මන් මලුවේ මල සඳුන් දුක "කවරෙක් මේ තැන සක්මන් තෙළෙ දැ"යි විචාළෝ ය. තෙරුන් ගේ අනුවැස්සෝ "ස්වාමීනි! අපගේ උපාධ්‍යායයන් වහන්සේ"යි කීවාහු ය. එවිට එහි ගිය ඒ භික්ෂූහු "බලවු, ශ්‍රමණයාගේ වැඩක හැටි, ඇස් පෙණීම් ඇති කල සිසිවක් නො සෙංට නිදා හිඳ, දැන් ඇස් නවසල සක්මන් කරමි"ය මෙතෙක් සතුන් පාගා මැරුයේ ය, යහපතක් කරමි යි අයහපතක් ම නොලේ ය"යි ගරහා, බුදුරජුන් ළඟට ගොස් "ස්වාමීනි! චකවුපාල ස්ථවිර තෙමේ සක්මණට බිසු බොහෝ සතුන් මැරුයේ ය"යි දන්වා සිටියාහ. "කිම? චකවුපාල තෙමේ සතුන් මැරුවේ ය, තමුසේලා විසින් දක්නා ලද්දේ දැ"යි උත්විහත්සේ අසා වදාළ සේක. "ස්වාමීනි! නො දක්නා ලද්දේ ය"යි ඔවුහු කීහ. "සම් ලෙසකින් ඔහු සතුන් මරණු කෙසේ නො දනිතු ද, එසේ වකවුපාල තෙමේ ත් ඒ සතුන් නො දකියි, මහණෙනි! රහතුන්ට මරණවෙතනා නැතැ"යි බුදු රජාණන් වහන්සේ වදාළ සේක. "ස්වාමීනි! මෙසේ රහත්වීමට මාසනාව ඇති කල කවර හෙයකින් හෙ තෙමේ අඹ වූයේ දැ"යි විචාළාහු ය. "මහණෙනි! තමන් විසින් කළ කර්මයාගේ විපාක වසයෙනැ"යි වදාළ කල්හි "ස්වාමීනි! ඔහු කළ කර්මය කිමැ"යි විචාළාහු ය. "මහණෙනි! එසේ නම් ඔහු කළ කර්මය දැන ගණුව"යි චකවුපාල තෙරුන් කළ ඒ කර්මය මෙසේ වදාළ සේක.

"යටගිය දවස බරණැස්නුවර බරණැස් රජු රාජ්‍යය කරවන කල්හි එක් වෙදෙක් ගම් නියම්ගමේහි හැසිර වෙදකම් කරයි, [illegible] ඇස් එළවල වූ ගැබිණියක දැක 'නිට ඇති අදහසක් තියෙයි ඇති ය, ඒ හොයා ඇස් පෙණීම් අඩු ය'යි කීවා ය, 'මේ දැ, මහ හොඳ ය, මට ඊට තිබි බෙහෙත් දෙමි, ඊට මට කුමක් දෙන්නෙහි දැ" යි විචාළ විට 'මහත්මයානෙනි! යම් කිසි ලෙසකින් මාගේ ඇස් මුළුමනින් බුලින් පැවැති තැනට පත් කෙළෙහි නම්, මම දූ පුතුන් සමග හිඳුමුමන්නේ යුසියක් වන්නෙමි' යි සටහන් ව කියා සිටියා ය, වෙදා එයට සතුටු වූ, ඇස්වල ගෑමට බෙහෙතක් හිසට කෙළේ ය, ඒ බෙහෙතින් ම ඇසේ ඇස් බුලින් පැවැති තැනට පත් විය. එකල්හි ඒ ගැබිණියේ 'මම දූ පුතුන් සමග හිඳුමේ යුසියක් වන්නෙමි' යි පොරොන්දු වීමි. එසේ වූ වුව ත් ඇය තමා කැමැත්තක් පෙන්වනු ඇත, මොලොක් බසින් කතා නො කරන්නේ ය, ඒ හෙයින් මොහු රවටන්නෙමි'යි සිතා

උඩට මතු වූහ. තෙරුන් සක්මන් කරද්දී පයට පැගී බොහෝ ඉදුගොච්චෝ මැරුණාහ. අතැවැස්සනට ද එදා සක්මන් මලුව හැමදීම අමතක විය. මේ අතර දිසාවැසි භික්ෂූහු "තෙරුන් වහන තැන බලමු"යි උදැසනම තෙරුන් වහන තැනට ගොස් ඔබිනොබ හැසිරෙන්නාහු, සක්මන් මලුවෙහි මළ සතුන් දැක "කවරෙක් මෙ තැන සක්මන් කෙළේ ද"යි විචාළෝ ය. තෙරුන් ගේ අතැවැස්සෝ "ස්වාමීනි! අපගේ උපාධ්‍යායයන් වහන්සේ"යි කීවාහු ය. එවිට එහි සිය ඒ භික්ෂූහු "බලවු, ශ්‍රමණයාගේ වැඩක හැටි, ඇස් පෙණීම ඇති කල කිසිවක් නො කොට නිදා හිඳ, දැන් ඇස් නටකල සක්මන් කරමි"යි මෙතෙක් සතුන් පාගා මැරුවේ ය, යහපතක් කරනී යි අයහපතක් ම කෙළේ ය"යි ගරහා, බුදුරජුන් ලඟට ගොස් "ස්වාමීනි! චක්ඛුපාල ස්ථවිර තෙමේ සක්මණට බැස බොහෝ සතුන් මැරුයේ ය"යි දන්වා සිටියාහ. "කිම? චක්ඛුපාල තෙමේ සතුන් මරන්නේ, තමුසේලා විසින් දක්නා ලද්දේ දැ"යි උන්වහන්සේ ඇසූ සේක. "ස්වාමීනි! නො දක්නා ලද්දේ ය"යි ඔවුහු කීහ. "යම් ලෙසකින් ඔහු සතුන් මරණු තෙපි නො දනිහු ද, එසේ චක්ඛුපාල තෙමේ ත් ඒ සතුන් නො දකියි, මහණෙනි! රහතුන්ට මරණවෙතනා නැතැ"යි බුදු රජානන් වහන්සේ වදාළ සේක. "ස්වාමීනි! මෙසේ රහත්භාවට වාසනාව ඇති කල කවර හෙයකින් හෙ තෙමේ අඬ වූයේ ද"යි විචාළාහු ය. "මහණෙනි! කවුන් විසින් කළ කර්මයාගේ විපාක වසයෙනැ"යි වදාළ සැටියි "ස්වාමීනි! ඔහු කළ කර්මය කිම"යි විචාළාහු ය. "මහණෙනි! එසේ නම් ඔහු කළ කර්මය දැන ගණුව"යි චක්ඛුපාල තෙරුන් කළ ඒ කර්මය මෙසේ වදාළ සේක.

"යටගිය දවස බරණැස්නුවර බරණැස් රජු රාජ්‍යය කරවන කල්හි එක් වෙදෙක් ගම් නියම්ගම්හි හැසිර වෙදකම් කරයි, වෙදු ළ ඤුවරු එක් ඇස් දුර්වල වූ සත්‍රියක දැක 'නිට ඇති අපහසුව කිමැ'යි ඇසී ය, ඕ තොමෝ ඇස් පෙණීම අඩු ය'යි කීවා ය, වෙද, 'හා! හොඳ යි, මම ඊට නිට බෙහෙත් දෙමි, ඊට මට කුමක් දෙන්නෙහි ද" යි විචාළ විට 'මහත්මයානෙනි! යම් කිසි ලෙසකින් මාගේ ඇස් මුළුමනින් මුලින් පැවති තැනට පත් කෙළෙහි නම්, මම දූ පුතුන් සමග ඔබතුමන්ගේ දාසියක් වන්නෙමි' යි යටහත් ව කීයා සිටියා ය, වෙද එයටූ සතුටුව, ඇස්වල ගැමට බෙහෙතක් නියම කෙළේ ය, ඒ බෙහෙතින් ම ඇගේ ඇස් මුලින් පැවති තැනට පත් විය, එකල ඕ තොමෝ 'මම දූ පුතුන් සමග වෙදගේ දාසියක් වන්නෙමි' යි පොරොන්දු විමි. එසේ වූ විට මෙයා මට හැණිදුඩිකම් පෙන්වනු ඇත, මොළොක් බසින් කතා නො කරන්නේ ය, එ හෙයින් මොහු රවටන්නෙමි'යි සිතා

වෙදා, එහි අදියේ අහනිවැඩ [illegible] වෙයේදැයි විවාලවිට 'මහත් වියැහෙනි! මිටි සුදුවා මුලේ [illegible] දිවුවෙනි, දුන් [illegible] බලාපොරොත්තු කිබුණ, [illegible] ඉඩකඩ ඉතා අඩු සංඛ්‍යාවී වෙයේ නියා සි, මෑ දෙන කුලියෙන් එව විදියේ [illegible] දුවේ වේදනා [illegible] සරණාගති සිතා ගනිහනිතව [illegible] සාරණය කිරීම සිටියේ ය. අවුව දැනිස්සන්දු වුණා, [illegible] හත් වෙනකුන් පිදියෙල කොට, [illegible] ඒ [illegible] හොස් [illegible] [illegible] [illegible]

වෙදූ එහි අවුත් අසනීපය දැන් කෙසේ දැ යි විමාළවිට 'මහත් මයානෙනි! මීට කලින් මගේ ඇස්වල තිබුනේ විකා රිදුමෙකි, දැන් එය ඉතා බලවත් ය' යි කිවූ ය, වෙදූ 'මෑ මා රවටා කිසිවක් නොදෙනු කැමැත්තී මෙසේ කිය යි, මෑ දෙන කුලියෙන් මට වැඩෙක් නැත, දැන් මම මෑ අඛිතැනැත්තියක කරමි'යි සිතා හකිහනිකට වහා ගෙදරට ගොස්, අඹුවටත් මේ කාරණය කියා සිටියේ ය, අඹුව ද නිශ්ශබ්ද වූවා ය, එවිට වෙදූ එක් බෙහෙතක් පිළියෙල කොට, තමුන් රැවටූ ඒ ගැමි ගැහැණිය ලඟට ගොස් 'මෙන්න ඉතා වටිනා හොඳ බෙහෙතක්, මේ බෙහෙත ඇස ගෑවිට ඔය හැම රිදුමෙක් ම මෙයින් ම නැති ව යන්නේ ය'යි කියා බෙහෙත දී ඇ ලවා ම එය ඇස ගැවී ය, එ කෙණෙහි ඇගේ දෙඇස් පහන්සිළු දෙකක් නිවී යියා සේ නැසි ගියේ ය, වකුගඩාල වූයේ ඒ මේ වෙද තෙමේ ය,

'මහණෙනි! එදූ මේ මාගේ පුත්‍රයා විසින් කළ ඒ කම්ය ඔහු පසු පස්සේ ලුහුබැඳ ආයේ ය, කළ පාපකම්ය වනාහි ගැල උසුලන ගොනුන්ගේ පිය අනු ව යන රියසහ මෙන් පාපකාරී පුද්ගලයා අනුව යේ ය''යි වදාළ සේක. ඒ වදාළෝ මෙසේ ය.

මනෝ පුබ්බඞ්ගමා ධම්මා මනෝසෙට්ඨා මනෝමයා,
මනසා චේ පදුට්ඨෙන භාසති වා කරොති වා,
තතෝ නං දුක්ඛමන්වෙති චක්කං ව වහතෝ පදන්ති

අරූපිධම්මයෝ සිත පෙරටු කොට ඇත්තාහ. සිත අධිපති කොට ඇත්තාහ. සිතින් කරණ ලද්දාහ. ඉදින් කිලිටි වූ සිතින් යමක් කියා ද, යමක් කෙරේද, ඒ හෙතුවෙන් විපාකදුක, ඒ පව්කම් කළ කැතැත්තා අනු ව යයි. (කුමක් මෙන්දයත්,) ගැල උසුලන ගොනුගේ පිය අනු ව යන හැල්සක සේ ය.

මනෝ පුබ්බඞ්ගමා ධම්මා = අරූපිධම්මයෝ සිත පෙරටු කොට ඇත්තාහ.

මෙහි මූල සිටි **මනෝ**, යන්න අවිශෙෂයෙන් කාම – රූප – අරූප – ලොකොත්තරභූමි සතරට අයත් කුශලාකුශලාදී වූ සියලු සිත් කියූ ද, මෙහිලා කියේ, මෙය දෙසීමට කරුණු වූ කථා වස්තුව අනු ව **'දෙමනස්සසහගතපටිඝසම්පයුත්තචිත්තය'** යි.

''මනොති කාමාවචරකුසලාදිභෙදං සබ්බම්පි චතුභූමිකචිත්තං, ඉමස්මිං පන පදෙ තදූභයස්ස දෙසනාය නිමිත්තභාවූපගං වචනාපිසමානං පරිවජ්ජජිසමානං දෙමනස්සසහගතං පටිඝසම්පයුත්තචිත්තමෙව ලබ්භති'' යනු අටුවා ය. යම් නාමධම්යෙක් අරමුණු දනී ද, අරමුණු දැන ගැණීමට

උපකාර වේ ද ඒ නාමධර්මය මනසැ, යි කියනු ලැබේ. **"යො නාමධම්මො ආරම්මණං මනති, සො නාමධම්මො මනොනාම"** යන්නෙන් ඒ පැහැදිලි ය. නැළියකින්, තරාදියකින් මනින්නා සේ අරමුණ මැන, කිරා, පිරිසිඳ බලා ද, ඒ මනසැ, යි එය තවත් ලෙසකින් තේරුම් කළහ. **"එකාය නාළියා එකාය ච තුලාය මිනමානො විය ආරම්මණං මිනාති පරිච්ඡින්දතීති=මනො"** යනු පාළි යි. අරමුණු දැන ගන්නේ විඤ්ඤාණය යි. මනසැ යි කියනු ලබන්නේ ද ඒ ය.

ධම්මා යනු, ගුණ-දෙසනා-පරියත්ති-නිස්සත්තනිජ්ජීව යන සතර තැනෙක හෙන බව අටුවාව කියයි. එහි **"න හි ධම්මෙහි අධම්මෙහි ච උභො සමවිපාකිනො"** යනාදි තන්හි ආයේ ගුණ යෙහි ය. **"ධම්මං වො භික්ඛවෙ! දෙසිස්සාමි ආදිකල්‍යාණං"** යනාදි තන්හි දෙසනායෙහි වැටුනේ ය. **"ඉධ පන භික්ඛවෙ! එකච්චෙව කුලපුත්තා ධම්මං පරියාපුණන්ති සුත්තං ගෙය්‍යං"** යනාදියෙහි වූයේ පරියත්තියෙහි ය. **"තස්මිං ඛො පන සමයෙ ධම්මා හොන්ති ධම්මා හොන්ති"** යනාදි තන්හි නිස්සත්ත නිජ්ජීවධර්මයෙහි වැටේ. මෙහි ද ආයේ, නිස්සත්තනිජ්ජීවධර්මයන් කෙරෙහි ය.

අටුවාව මෙසේ කියත ත්, කොෂග්‍රන්ථයෝ මෙයින් අන් තන්හි ද මේ හෙනබව කියත්.

"ධම්මා සභාවෙ පරියත්තිපකාසු
කුසලෙසු සච්චපකතීසු පුඤ්ඤ,
ඤෙය්‍යෙ ගුණචාරසමාධිසූපි
නිස්සත්තතාපත්තිසු කාරණදෙ"

යනු කොෂවචන යි. **"කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා"** යනාදී තන්හි සභාවයෙහි, **"යස්සෙතෙ චතුරො ධම්මා සඩ්ඪස්ස සරමෙඝිනො"** යනාදි තන්හි ප්‍රඥාවෙහි, **"නෙ ස ධම්මෙ මහාරාජ! යං ඛං ගවෙජය්‍ය එකඤ්ඤො අහම්පි තෙන ගච්ඡාමි යෙන ගච්ඡසි ඛත්තිය"** යනාදි තන්හි න්‍යායයෙහි, **"දිට්ඨධම්මා පත්තධම්මා"** යනාදි තන්හි ප්‍රකෘතියෙහි, **"ධම්මෙ හවෙ රක්ඛති ධම්මචාරිං"** යනාදි තන්හි පුණ්‍යයෙහි, **"කුසලා ධම්මා"** යනාදි තන්හි ඥෙයමණ්ඩලයෙහි, **"එවං ධම්මා නෙ භගවතෙනා අභෙසුං"** යනාදි තන්හි සමාධියෙහි, **"පාරාජිකා ධම්මා සඩ්ඝාදි සෙසා ධම්මා"** යනාදි තන්හි ආපත්තියෙහි, **"හෙතුම්හි කුසලං ධම්මපටිසම්භිදා"** යනාදි තන්හි හෙතුයෙහි ආයේ ය. ආදි ශබ්දයෙන් මින් පිටත් තන්හි ද මේ වැටෙන බව කියත්. කෙනෙක් ධර්මශබ්දයාගේ ප්‍රවෘත්තිවිෂය නිශ්චිත වීසින් දස වැදෑරුම් කොට කියත්.

"ඤෙය්‍යෙ මග්ගෙ ච නිබ්බාණෙ සභාවෙ අථ ජාතියං,
මනෙ විසයපුඤ්ඤෙසු භාවෙ පාවවනෙ පි ච,
ඉමෙසු දසස්වත්ථෙසු ධම්මසඳ්දෙ පවත්තති"යි.

මෙහිලා සාධකපාඨ පොතපතෙහි සුලභ ය.

ඒ ඒ ආචාර්‍යවරයෝ, ධම්මශබ්දය **"අත්තානං ධාරෙන්තො අපායෙ වට්ටදුක්ඛෙ ච අපතමානෙ කත්වා ධාරෙතීති=, අපායෙ ස්වපතමානෙ අධිගතමග්ගාදිකෙ සත්තෙ ධාරෙති ධරති තෙනෙති වා=, සලක්ඛණං ධාරෙති පච්චයෙහි ධරියතීති වා,= ධම්මොති, අනෙකවිධෙසු ධම්මෙසු ලොකුත්තරො උප්පාදිතො සච්ඡිකතො ච චතුසු අපායෙසු සංසාරෙ වා සත්තෙ අපතමානෙ ධාරෙතීති=, සොතාපත්තාදීහි අරියෙහි ධරියති න පුථුජ්ජනෙහීති=, සලක්ඛණං ධාරෙතීති කක්ඛලත්තාදිනා ඵුසනාදිනා සන්තිආදිනා සකසකභාවෙන පණ්ඩිතෙහි ධරියති සල්ලක්ඛියතීති=, සකත්ථාදිභෙදෙ අත්ථෙ ධාරෙතීති=, පාපකෙ අකුසලෙ ධම්මෙ ධුනාති කම්පෙති විධංසෙතීති = ධම්මො"**යි තදර්ත්‍ථානුකූල ව ප්‍රකෘතිප්‍රත්‍යයාදීන්ගේ විභාගයෙන් විග්‍රහ කළහ.

එහි අරූපීධර්මැ යි ගැණෙන චෛතසිකයන් කෙරෙහි කෙළින් ම නැගී සිටියේ **"සලක්ඛණං ධාරෙතීති = ධම්මො"** යන මේ ය. තම තමන් පිළිබඳ ලක්ෂණ දරණුයේ, ධර්ම නමැ'යි යනු එහි තේරුම ය. වෙදනාව වෙදයිතලක්ෂණය, සංඥාව විජානනලක්ෂණය, ස්පර්ශය ඵුසනලක්ෂණය, චෙතනාව චෙතනා භාවලක්ෂණය දරයි යන ඈ ලෙසින් වෙදනා – සංඥා – සංස්කාර යන සකන්ධත්‍රයයෙහි ගැණෙන දෙපණස් චෛතසිකය තම තමන් පිළිබඳ ලක්ෂණ දරණ බැවින්, ධර්මව්‍යවහාරය ඔවුන් කෙරෙහි නැගී සිටියේ ය. ස්වලක්ෂණධාරණයෙන් ධර්ම නම් වෙති යනු අර්ත්‍ථවත් ය. වෙදනා – සංඥා – සංස්කාර යන සකන්ධත්‍රය ම මින් කිය වේ. සත්වපුද්ගල රහිත බැවින් මේ සකන්ධ තුණ නිඃසත්ව නිජ්ජීව ධර්මැ යි කියත්. එහෙත් මෙහි ප්‍රධාන විසින් ගැණෙන්නෝ අකුශලචෛතසිකයෝ ය. චෛතසිකයෝ නම්, සිතෙහි ඇතිවන ගතිවිශෙෂයෝ ය.

එහි වෙදනාසකන්ධයෙහි **සුඛ – දුක්ඛ – අදුක්ඛමසුඛ** යි වෙදනා තුනෙකි. ඒ ම නැවැත **සුඛ – දුක්ඛ – සොමනස්ස – දොමනස්ස උපෙක්ඛා** යි පසක් කොට බෙදූහ. ආහාරරස අනුභව කරන්නකු සේ සියලු අරමුණුවල රස උරා බොන්නී **වෙදනා** ය. මෝ සිත හා අනික් චෛතසිකයන් ලවා අරමුණුවල රසය විඳවයි. එහෙත් ප්‍රධාන විසින් අරමුණු රස උරා බොන්නී වෙදනාව ම ය. එහි අරමුණු

පිළිබඳ මිහිරිබව, ඉටු අරමුණුරසය විඳින්නා වූ සභාවය සුඛ – සෞමනස්‍ය වෙදනා යි ද, අරමුණු පිළිබඳ අමිහිරිබව අනිටු අරමුණු රසය විඳ ගන්නා වූ සභාවය දුක්ඛදෞර්මනස්‍යවෙදනා යි ද, අරමුණු පිළිබඳ මිහිරි ත් නොවූ අමිහිරි ත් නොවූ මැදහත්බව විඳ ගන්නාවූ සභාවය, උපෙක්ඛාවෙදනා යි ද ගණු ලැබේ. වේදනා යන්න ඵ එක් ව හිටි සහජාතධර්මයෙන් රැකිය යුතු අවශ්‍ය දෙයි. සෙසු තන්හි ද එසේ ය.

සංඥා නම්, පිතට පැනවූ නිමිත්තෙහෙදයෙන් වෙන් ව නිය අරමුණු සලකුණු කොට දැනගන්නා ලෞකික ධර්මය යි. මෙහිත් යියලු අරමුණු හඳුනාගැනීම් දෙවැනි ලැබේ. ඒ මින්නේ දැවදඹු ලකුණු කිරිවිත් සේ රූපාදී වූ අරමුණු ලබා දෙන ආකාරයෙන් පවත්නේ මේ ප්‍රභේදය යි. [illegible] පරිච්ඡේදයෙන් කළු වැනි පඤ්ඤත්තිරූපයන්ගේ යි [illegible] ගණිති [illegible]

මෙහි ඵ ශබ්දාදීන් [illegible] පකටි පිටුකුරුම් ලකුණු කොට දැනී යම් ඒ ධර්මසමූහයෙහි [illegible] ද, ඒ සියල්ල එක් රැස් කොට සංඛෝපෙත්වා යි කියනු ලැබේ. ප්‍රධාන වියින් මෙයි වෙතනාව කෘතකාරී යි ගණිත්. අනික් සහජාදිධර්ම වෙතනාව ප්‍රධාන කොට පවත්නා බැවින්, ප්‍රධානයාගේ වශයෙන් නො වෙනස් ව ගෙණ සංස්කාරී යි කියනු ලැබේ. එහි සම්පණසක් ධර්ම ඇතුලත් ය. **වෙතනා, ඵස්ස, මනසිකාර, ජීවිතින්ද්‍රිය, එකග්ගතා, චිත්තක්ක, විචාර, අධිමොක්ඛ, සඩා, සති, හිරි, ඔත්තප්ප, අලෝභ, අදෝස, අමෝහ, තත්‍රමජ්ඣත්තතා, කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, කායලඝුතා, චිත්තලඝුතා, කාය මුදුතා, චිත්තමුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා, කායපාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා, කායුජුඤ්ඤතා, චිත්තුජුඤ්ඤතා, කරුණා, මුදිතා, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව, ලෝභ, දෝස, මෝහ, දිට්ඨි, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප, විචිකිච්ඡා, මාන, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, ථින, මිද්ධ, යන මේ ය එ සම් පණස.**

එහි **වෙතනා** නම්, නමා ත් ඩිළියෙලවීම් වශයෙන් අරමුණෙහි යෙදෙමින්, තමන් හා එක් ව සිටි අනෙක් සහජාදිවෙතසිකයන් උනුන් පිළිබඳ කෘත්‍යයන්හි යොදා ලන්නා ය.

ඵස්ස නම්, ඇස් කන් නාස් ආදිවූ සදෙරින් වැද ගන්නා වූ රූපාදි වූ අරමුණුවල යහ ත් ඒ හා යෙදුනු අනෙක් වෙතසික යනු ත් එපුත්නා සේ ගටන්නා සේ පවත්නේ ය.

පිළිබඳ මිහිරිබව, ඉටු අරමුණුරසය විඳින්නා වූ ස්වභාවය සුඛ-සොමනස්ස වෙදනා යි ද, අරමුණු පිළිබඳ අමිහිරිබව අනිටු අරමුණු රසය විඳ ගන්නා වූ ස්වභාවය දුක්ඛදොමනස්සවෙදනා යි ද, අරමුණු පිළිබඳ මිහිරි ත් නො වූ අමිහිරි ත් නො වූ මැදහත්බව විඳ ගන්නාවූ ස්වභාවය, උපෙක්ඛාවෙදනා යි ද ගණු ලැබේ. වෙදනා යන්න හා එක් ව සිටි සක්ඛිශබ්දයෙන් රාශිය යන අර්ථය දෙයි. සෙසු තන්හි ද එසේ ය.

සංඥා නම්, සිතට නැගුනු නිලාදිභෙදයෙන් වෙන් ව තිය අරමුණු සලකුණු කොට දැන ගන්නා චෛතසිකධර්මය යි. මෙයින් සියලු අරමුණු හඳුන්වා දෙනු ලැබේ. වඩුවන්ගේ දැවදඬු ලකුණු කිරීමක් සේ රූපාදී වූ අරමුණු ලකුණු කිරීම් ආකාරයෙන් පවත්නේ මේ චෛතසිකය යි. සමහරවිට මෙය පඹ හා පරඩලායෙන් කළ රූපය පණැතිරූපයකැ යි වරදවා ගන්නා සේ අරමුණු වරදවා ත් ගණියි. සමහර විට ඇතිසැටියෙනු ත් ගණියි.

මොනවට රැස්කිරීම හෝ එකට පිඩුකිරීම ලකුණු කොට ඇති යම් ඒ ධර්මසමූහයෙක් වේ ද, ඒ සියල්ල එක් රැස් කොට සංස්කාරස්කන්ධ යි කියනු ලැබේ. ප්‍රධාන විසින් මෙහි චේතනාව සංස්කාරැ යි ගණිත්. අනික් ස්පර්ශාදිධර්ම චේතනාව ප්‍රධාන කොට පවත්නා බැවින්, ප්‍රධානයාගේ වශයෙන් නො වෙනස් ව ගෙණ සංස්කාරැ යි කියනු ලැබේ. එහි සම්පණසක් ධර්ම ඇතුළත් ය. චේතනා, ඵස්ස, මනසිකාර, ජීවිතින්ද්‍රිය, එකග්ගතා, විතක්ක, විචාර, විරිය, පීති, ඡන්ද, අධිමොක්ඛ, සඩා, සති, හිරි, ඔත්තප්ප, අලොභ, අදොස, අමොහ, තත්‍රමජ්ඣත්තතා, කායපස්සඩ්ධි, චිත්තපස්සඩ්ධි, කායලහුතා, චිත්තලහුතා, කාය මුදුතා, චිත්තමුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා, කායපාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා, කරුණා, මුදිතා, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව, ලොභ, දොස, මොහ, දිට්ඨි, උඩච්ච, අහිරික, අනොත්තප්ප, විචිකිච්ඡා, මාන, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, ථින, මිඩ, යන මේ ය ඒ සම පණස.

එහි චේතනා නම්, තමා ත් පිළියෙලවීම් වශයෙන් අරමුණෙහි යෙදෙමින්, තමන් හා එක් ව සිටි අනෙක් ස්පර්ශාදිචෛතසිකයන් උනුන් පිළිබඳ කෘත්‍යයන්හි යොදා ලන්නා ය.

ඵස්ස නම්, ඇස් කන් නාස් ආදීවූ සදොරින් වැද ගන්නා වූ රූපාදී වූ අරමුණුවල සිත ත් ඒ හා යෙදුනු අනෙක් චෛතසිකයනු ත් හපන්නා සේ ගටන්නා සේ පවත්නේ ය.

මනසිකාර නම්, ඉදිරියට පැමිණ රූපාදී වූ අරමුණුවල චිත්තාවෙතසිකයන් මෙහෙයන ශක්තිමාත්‍රය යි. එය ආරම්මණ සමපාදකමනසිකාරනාමයෙන් ආගමෙහි ආයේ ය.

ජීවිතින්ද්‍රිය නම්, දියෙහි ගට ගන්නා පියුම් උපුල් ආදීන්ගේ කලක් නො හැසී පැවැත්මට දිය මී ප්‍රධාන වන්නා සේ, තමන් හා එකට උපන් අනෙක් අරූපධර්මයන් නොබිඳී පැවැත්මට ප්‍රධාන වසින් උපකාර වූ ධර්මය යි. ජීවිතෙන්ද්‍රිය වූ කලී චිත්ත වෛතසිකයන් රකිමින් සන්තතිපරිනිම්මාණය දක්වා යවතී.

එකාගතා නම්, චිත්ත-වෛතසිකයන්ට නන් අරමුණෙහි විසිර යා නොදී, ගත් අරමුණෙහි ම ඛහා එකඟ කොට තබන්නේ ය.

චිත්තක්ක නම්, යහ ත් සිත සමග යෙදී සිටි වෛතසික ත් යම් බලයකින් අරමුණට නැඟේ ද ඒ ය.

විචාර නම්, චිතඛිය වසින් අරමුණට නැඟ සිත හා සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි හසුරු වන්නා ය

පීති නම්, තමන් හා එකට උපදනා චිත්ත – වෛතසිකධර්මයන් පිණ වන්නේ ය.

අධිමොක්ඛ නම්, සිතෙහි පවත්නා අරමුණු කෙරෙහි නිශ්චය යි. අධිමොක්ෂවෛතසිකය පවත්නා කාලයෙහි සිතෙහි උපදනා චේතසික, නිශ්චල ව සිටියි.

සද්ධා නම්, තමන් සමග උපදනා චිත්ත - වෛතසිකධර්මයන් පහද වන්නී ය. එය උදකප්පසාදකමණිඛ්‍යය සේ ය.

සති නම්, චිත්ත – වෛතසිකධර්මයන්ට ඇතිහාක් අරමුණු සිහිකර දෙන්නී ය.

හිරි නම්, කායදුච්චරිතාදී වූ පාපධර්මයන් කරණ කොට සිතෙහි උපදින පිළිකුල ය.

ඔත්තප්ප නම්, සතුන් මැරීම හොරකම් කිරීම් ආ පව්කම් කිරීමේදී ඒ හෙතුවෙන් සිතෙහි ඇතිවන බිය ය.

අලෝභ නම්, සිතෙහි ගැටෙන රූපාදී වූ අරමුණුවල නො ලැගීම ය. අලෝභය කෙමේ නෙලුම්කොළයෙහි වැටුනු දිය නො ඇලී පවත්නා සේ, එසා ද අරමුණෙක වත් නො ඇලී සිටියේ ය.

අදෝස නම්, සිතෙහි නැගෙන අරමුණුවල අදුෂ්කබව ය. අනුකූල මිත්‍රයකු සේ සිටියේ ය.

අමෝහ නම්, අරමුණුවල ඇති තතු දැන ගන්නා වූ ඒ ඒ අර මුණුවල යථාසභාවය දැනගැණීමට උපකාර වන්නා ය.

මනසිකාර නම්, ඉදිරියට පැමිණ රූපාදී වූ අරමුණුවල චිත්තාවෙතසිකයන් මෙහෙයන ශක්තිමාත්‍රය යි. එය ආරම්මණ සම්පාදකමනසිකාරනාමයෙන් ආගමෙහි ආයේ ය.

ජීවිතින්ද්‍රිය නම්, දියෙහි හට ගන්නා පියුම් උපුල් ආදීන්ගේ කලක් නො නැසී පැවැත්මට දිය මී ප්‍රධාන වන්නා සේ, තමන් හා එකට උපන් අනෙක් අරූපධර්මයන්ගේ නො නැසී පැවැත්මට ප්‍රධාන වියින් උපකාර වූ ධර්මය යි. ජීවිතෙන්ද්‍රිය වූ කලී චිත්ත චෛතසිකයන් රකිමින් සන්තතිපරිනිම්මාණය දක්වා පවතී.

එකග්ගතා නම්, චිත්ත-චෛතසිකයන්ට නන් අරමුණෙහි විසිර යා නො දී, ගත් අරමුණෙහි ම ඛහා එකඟ කොට තබන්නේ ය.

චිත්තක්ක නම්, සිහ ත් සිත සමග යෙදී සිටි චෛතසික ත් යම් බලයකින් අරමුණට නැඟේ ද ඒ ය.

විචාර නම්, චිතයිය වියින් අරමුණට නැඟ සිත හා සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි හසුරු වන්නා ය.

පීති නම්, තමන් හා එකට උපදනා චිත්ත – චෛතසිකධර්මයන් පිණ වන්නේ ය.

අධිමොක්ඛ නම්, සිතෙහි පවත්නා අරමුණු කෙරෙහි නිශ්චය යි. අධිමොක්ෂචෛතසිකය පවත්නා කාලයෙහි සිතෙහි උපදනා චේතසික, නිශ්චල ව සිටියි.

සද්ධා නම්, තමන් සමග උපදනා චිත්ත – චෛතසිකධර්මයන් පහද වන්නී ය. එය උදකප්පසාදකමණික්‍යය සේ ය.

සති නම්, චිත්ත – චෛතසිකධර්මයන්ට ඇතිතාක් අරමුණු සිහිකර දෙන්නී ය.

හිරි නම්, කායදුච්චරිතාදී වූ පාපධර්මයන් කරණ කොට සිතෙහි උපදින පිළිකුල ය.

ඔත්තප්ප නම්, සතුන් මැරීම හොරකම් කිරීම ආ පව්කම් කිරීමේදී ඒ හෙතුවෙන් සිතෙහි ඇතිවන බිය ය.

අලෝභ නම්, සිතෙහි ගැටෙන රූපාදී වූ අරමුණුවල නො ලැගීම ය. අලෝභය කෙමේ නෙලුම්කොළයෙහි වැටුනු දිය නො ඇලී පවත්නා සේ, එක ද අරමුණෙක වත් නො ඇලී සිටියේ ය.

අදෝස නම්, සිතෙහි නැගෙන අරමුණුවල අදුෂ්ටභාව ය. අනුකූල මිත්‍රයකු සේ සිටියේ ය.

අමෝහ නම්, අරමුණුවල ඇති තතු දැන ගන්නා වූ ඒ ඒ අර මුණුවල යථාසභාවය දැනගැණීමට උපකාර වන්නා ය.

තත්‍රමජ්ඣත්තතා නම්, චිත්ත - චෛතසිකයන් සමබවට පමුණු වන්නේ ය. චිත්තචෛසිකයන් සමබවෙහි තබන්නේ ය.

කායපස්සඩි නම්, වෙදනා-සංඥා-සංස්කාර යන සකන්ධයන්ගේ සංසිඳුම ය

චිත්තපස්සඩි නම්, සිතෙහි සංසිඳීම ය.

කායලහුතා නම්, වෙදනා-සංඥා-සංස්කාර යන සකන්ධයන්ගේ බරබව සංසිඳුම ය.

චිත්තලහුතා නම්, සිතෙහි බරබව සංසිඳුවන්නී ය.

කායමුදුතා නම්, වෙදනාදී වූ චිත්තසම්ප්‍රයුක්තධර්මයන්ගේ මොළොක්බව ය.

චිත්තමුදුතා නම්, සිතෙහි මොළොක්බව ය.

කායකම්මඤ්ඤතා නම්, ඒ ඒ කටයුතුවලට කයෙහි ඇති සුදුසුකම ය.

චිත්තකම්මඤ්ඤතා නම්, ඒ ඒ කටයුතු කෙරෙහි සිතෙහි ඇති සුදුසුකම ය.

කායපාගුඤ්ඤතා නම්, චිත්තසම්ප්‍රයුක්තධර්මයන්ගේ නො ගිලන් බව ය.

චිත්තපාගුඤ්ඤතා නම්, සිතෙහි නො ගිලන්බව ය.

කායුජ්ජුකතා නම්, චිත්තසම්ප්‍රයුක්තධර්මයන්ගේ නො ඇදබව ය.

චිත්තුජ්ජුකතා නම්, සිතෙහි නො ඇදබව ය.

කරුණා නම්, අනුන්ගේ දුකෙහි දී සිතෙහි උපදනා අනුකම්පා ය පරදුක් නො ඉවසන කම්පිතගති ය.

මුදිතා නම්, පරසම්පත්තිය දක්නහුගේ සිතෙහි උපදනා ඒ පිළිබඳ අනුකූලභාවය ය.

සම්මාවාචා නම්, චතුර්විධවාක්දුශ්චරිතයෙන් වළකින්නහුගේ සිතෙහි උපදින විරතිය ය.

සම්මාකම්මන්තන ම්, ත්‍රිවිධකායදුශ්චරිතයෙන් වළකින්නහුගේ සිතෙහි. උපදින විරතිය ය.

සම්මාආජීව නම්, දිවි පැවැත්වීම උදෙසා කරණ ප්‍රාණඝාතාදි යෙන් වැළකීම ය.

ලොභ නම්, ඇස් කන් නාස් ආදියෙන් වැද ගන්නා රූපාදී වූ අරමුණුවල ඇලීම ය.

දෝස නම්, තමාගේ සිත් නොගත් තමා නොකැමැති අරමුණු නිසා සිතෙහි උපදනා සැඩබව ය.

මෝහ නම්, සිතෙහි වැටුනු අරමුණු තතු වසාලීම ය. අරමුණු මුවහකිරීම ය. අරමුණු තතු නොදැනීම ය.

දිට්ඨි නම්, අරමුණු වරදවා දැකීම ය.

උඛච්ච නම්, සිතෙහි නොසංසුන්බව ය.

අහිරික නම්, පවිකිරීමෙහි ලජ්ජා නැතිකම ය. පවිකිරීමෙහි නොපිළිකුල ය.

අනොත්තප්ප නම්, පවිකිරීමෙහි බිය නොවීම ය.

විචිකිච්ඡා නම්, අරමුණු පිළිබඳ සැක ය. අරමුණු කෙරෙහි නොවිස්වස ය.

මාන නම්, තමා උසස් කොට ගැණීම ය. උඩහුකම ය.

ඉස්සා නම්, පරසම්පත් නොඉවසීම ය.

මච්ඡරිය නම්, තමා අයත් සැපත සැඟවීම ය.

කුක්කුච්ච නම්, කළ දුසිරිත් හා නොකළ සුසිරිත් ගැණ පසු තැවිල්ල ය.

ථින නම්, සිතෙහි පසු බැස්ම ය. ක්‍රියා සිදු කිරීමෙහි අසමත් බව ය.

මිද්ධ නම්, චිත්තසම්ප්‍රයුක්තධර්මයන්ගේ පසුබැස්ම ය. ක්‍රියා සිදු කිරීමෙහි නොසමත්බව ය.

මූලමනින් චෛතසික දෙපණසෙකි. එයින් සංඝකාරසාධාරණ යෙහි ලා දැක්වුනේ සම පණසෙකි. වේදනා - සඤ්ඤා දෙක චෛතසික වුව ද එ දෙක සකල දෙකක් කොට වෙනම ගත් බැවිනි එසේ දැක්වුනේ.

ඒ දෙපණස් චෛතසිකයන් අතුරෙහි **ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර,** යන මොවුහු සියලු සිත්වල උපදනා බැවින් **'සබ්බචිත්තසාධාරණ'** නම් වෙති.

විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද, යන මොවුහු ශෝභනචිත්තයන්හි මෙන් ම අශෝභනචිත්තයන්හි ද යෙදෙන බැවින්, **'ප්‍රකීර්ණක'**යි, කියනු ලැබෙත්.

මෝහ, අහිරික, අනොත්තප්ප, උඛච්ච, ලෝභ, දිට්ඨි, මාන, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, ථින, මිද්ධ, විචිකිච්ඡා, යන මොවුහු අකුසල් සිත්හි ම උපදනා බැවින් අකුසල් නම් වෙත්.

සඩා, සති, හිරි, ඔත්තප්ප, අලොභ, අදොස, තත්‍රමජ්ඣත්තතා, කායපස්සඩි, චිත්තපස්සඩි, කායලහුතා, චිත්තලහුතා, කායමුදුතා, චිත්තමුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා, කායපාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා යන මොවුහු කුසල් සිත්හි ම යෙදෙන බැවින් **'ශොභනචිත්තසාධාරණ'** නම් වෙති.

සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව යන මොවුහු චතුර්විධවාක්දුශ්චරිතයෙන්, ත්‍රිවිධකායදුශ්චරිතයෙන්, මිත්‍ථ්‍යාආජීවයෙන් වැළැක්ම නු යි **'විරති'** නම් වෙති.

කරුණා, මුදිතාවෝ අප්‍රමාණසත්වයන් අරමුණු කොට පවත්නා බැවින් **'අප්පමඤ්ඤ'** යි කියනු ලැබෙත්. සංස්කාරයන් පිළිබඳ අනිත්‍යාදිලක්ෂණප්‍රකාරයෙන් දන්නී **'පඤ්ඤා'** ය.

සර්වචිත්තසාධාරණචෛතසික		7
ප්‍රකීර්ණක	,,	6
අකුශල	,,	14
ශොභනසාධාරණ	,,	19
විරති	,,	3
අප්පමඤ්ඤා	,,	2
පඤ්ඤා	,,	1
		52

මේ කියන ලද්දේ චෛතසිකයන් පිළිබඳ නම් අරුත් පමණෙකි[1].

මෙහි මෙසේ කොටින් කියූ චෛතසිකයෝ ය සිත පෙරටු කොට ඇත්තෝ. **"මනො පුබ්බඞ්ගමො එතෙසන්ති= මනො පුබ්බඞ්ගමා"**යි අටුවාව **"මනො පුබ්බඞ්ගමා ධම්මා"** යන්න විදහා දැක් වූ සැටි යි. සිත සමග එකට ඉපදීම, සිත සමග එකට නිරුඩවීම, සිත ගන්නා අරමුණ ගැණීම, සිත හා එක් වස්තුවෙහි ම පැවැත්ම යන මේ සතර, චෛතසිකයන් පිළිබඳ ලක්ෂණ සතරෙකි. එහෙයින් චෛතසික, සිත ඇතිවිට ම උපදනා බව ප්‍රකට ව පෙණේ. **"මනො පුබ්බං පඨමතරං ගච්ඡති එතෙසන්ති= මනො පුබ්බඞ්ගමා"**යි එය වඩාත් පැහැදිලි කළ සැටි ය. චෛතසිකයන්ගේ ඉදිරියෙහි යන්නේ, චෛතසිකයන්ගේ පෙරටු වෙහි යන්නේ සිතැ යි මින් කියනලදී.

"යෙ කෙචි ගික්ඛවෙ! ධම්මා අකුසලා-සබ්බෙ තෙ මනො පුබ්බඞ්ගමා මනො තෙසං පඨමං උප්පජ්ජති අත්වදෙව අකුසලා ධම්මාති, යෙ කෙචි ගික්ඛවෙ! ධම්මා කුසලා-සබ්බෙ තෙ මනො

පුෂ්පවනියෙහි 'කො ඉමං පඨවිං විජෙස්සති' යන්නට කළ පරිකථාව බලනු.

පුබ්බඞ්ගමා මනො තෙසං ධම්මානං පඨමං උප්පජ්ජති අන්වදෙව කුසලා ධම්මාති'' යනු එහි සාධකසූත්‍රයෝ ය.

'රජු නික්මිනැ' යි කී කල්හි රජු සමග රාජසෙනාව නික්මුනා ද? නො නික්මුනා ද? යි අමුතුවෙන් ඇසිය යුතු නො වේ. සියලු සෙනාව නික්මුනා මැ යි පිළිගණු ලැබේ. එ මෙන් සිත උපනැ යි කී තැන් පටන්, සිත හා හැනී සිටි සහජාතධර්ම ත් උපන්නේ ද නො උපන්නේ ද'යි ඇසිය යුතු කරුණෙක් නො වේ. ඔවුහු සියල්ලෝ ද උපන්නා හ යි පිළිගැණෙන බැවිනි. මේ නිසා සිත ඒ සම්ප්‍රයුක්තධර්මයන් හා එක් ව ඉපදීම් ඇත්තේ ද, එක් ව නිරුධවීම් ඇත්තේ ද, එ හෙයින් ඔවුනට පළමු උපදී ය යි වදාළ සේක. පූර්වෝක්තසාධකසූත්‍ර දෙකෙහි වූ **'අන්වදෙව'** යන මෙයින් වදාළෝ ද, ඒ මේ චිත්ත-චෛතසිකධර්ම එක් ව ම උපදනා බව ය. එහි වූ ව්‍යඤ්ජනයන්හි එල්ලා ගෙණ "පළමු ව සිත උපදී ය, පසු ව චෛතසික උපදී ය" යි නො ගත යුතු ය.

''චෙතසි හවං තදායත්තවුත්තිතායාති = චෙතසිකං'' යන ටීකාපාඨය කියනුයේ ද, ස්පර්ශාදිනාමධර්මසමූහය, සිතට අයත් සිතට අනුකූල වූ පැවැතුම් ඇතිබව හා සිත නිසා පවත්නාබව ය. එයිනුදු පැහැදිලි වනුයේ චෛතසිකයන්ට සිත පෙරටුවන බව ය. **''න හි තං චිත්තෙන විනා ආරම්මණගහණසමත්ථං, අයති චිත්තෙ සබ්බෙන සබ්බං අනුප්පජ්ජනතො, චිත්තං පන කෙන ච චෙතසිකෙන විනාපි ආරම්මණෙ පවත්තතීති තං චෙතසිකමෙව චිත්තායත්තවුත්තිකං නාම''** සිත නැති විට, සිත නො උපදනා විට කොයි අතකිනිදු සම්භර චෛතසික නො උපදනා බැවින්, ඒ චෛතසික සිතින් වෙන් ව අරමුණු ගැණීමෙහි පොහොසත් නො වේ. සිත වනාහි, සම්භර චෛතසිකයන්ගෙන් වෙන් ව අරමුණෙහි පවතී. එ හෙයින් චෛතසිකයෝ සිතට අයත් පැවැතුම් ඇත්තෝ ය. සිතට අනුකූල වූ පැවැතුම් ඇතියෝ ය. සිත පෙරටු කොට සිටියෝ ය. සිත හා ම උපදින්නෝ ය. සිත ගන්නා අරමුණ ම ගන්නෝ ය. සිත හා එක් වස්තුවෙක සිටින්නෝ ය.

සිත, චෛතසිකයන් හා එක් වස්තුවක් ඇති ව, පෙර පසු නො ව, එක කෙණෙහි උපදී නම්, සිත චෛතසිකයන්ට කෙසේ පෙරටු වේ ද? යන ප්‍රශ්නයට චෛතසිකයන්ගේ ඉපැත්මට හෙතු වන අර්ථයෙන් ය, යනු දිය යුතු පිළිතුර ය. පෙර පසු නො ව චෛතසික හා එක් ව උපදින්නා, චෛතසික උපදවන්නා සිත ය. **''යස්මා පන තෙසං මනො උප්පාදකො කාරකො ජනකො සමුට්ඨාපකො නිබ්බත්තකො, තස්මා මනො පුබ්බඞ්ගමා නාම හොතති''** යනු අටුවා ය.

මනොසෙට්ඨා = (අරූපිධර්මයෝ) සිත අධිපති කොට ඇත්තාහ.

"යථා හි චොරාදීනං චොරජෙට්ඨකාදයො අධිපතිනො සෙට්ඨා, තථා තෙසම්පි මනොති මනොසෙට්ඨා", සොරුන්ට සොරදෙටුවන් අධිපති වන්නා සේ, චෛතසිකයන්ට සිත අධිපති වේ, යනු ඒ පාළියෙන් කියන ලද්දේ ය.

මනොමයා = (අරූපිධර්මයෝ) සිතින් කරණ ලද්දාහ.

"යථා පන දූරූ ආදීහි නිප්ඵන්නානි තානි තානි භණ්ඩානි දූරූමයාදීනි හොන්ති; තථා එතෙපි මනතො නිප්ඵන්නත්තා මනොමයා නාම" දූවදඬු ආදියෙන් කළ ඒ ඒ භාණ්ඩ එ නමින් හඳුන් වන්නා සේ, චෛතසිකයෝ සිත්න් නිපත් බැවින් මනොමය නමැ යි හඳුන්වන ලදහ. රනින් කළේ රන්මුවා යි ද, රිදියෙන් කළේ රිදිමුවා යි ද, දඬුයෙන් කළේ දඬුමුවා යි ද කියන්නා සේ චෛතසික සිතින් නිපන් බැවින් මනොමය යි කීම යුකතියුකත ය.

මනසා වෙ පදුට්ඨෙන = ඉදින් කිලිටි වූ සිතින්.

භවාඞ්ගචිත්ත යි නම් කරණ භවයාගේ නො යිඳ පැවැත්මට හෙතු වන පියවි සිත පිරිසිදු ය. මඩ බොරනැති පහන් දියක් සේ නිමිල ය. ඒ මේ පිරිසිදු සිත ඇස් - කන් - නාස් ආදී වූ දොරටු මඟින් ඇද වැද ගන්නා අරමුණු නිසා උපදනා ලොභ - වෙෂාදී වූ කෙලෙසුන්ගෙන් අපිරිසිදු වේ. කෙලෙස් මල සහිත වේ. පහන් දිය පිටතින් එන නීලාදිය කරණ කොට අපිරිසිදු වන්නා සේ ය ඒ වනුයේ. **"පභස්සරමිදං භික්ඛවෙ! චිත්තං, තං ච ඛො ආගන්තු-කෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං"** යනු එහිලා දෙශනා ය. එ හෙයින් "ආගනතුක වූ අභිඩ්‍යාදෞර්මනස්‍යාදිදෞෂයකින් කැළඹුනා වූ මලසහිත වූ කිලිටි වූ සිතින්" යන අරුත 'මනසා වෙ පදුට්ඨෙන' යන්නෙන් ගතයුතු ය.

මනසා යනු, තෘතියාවිභක්ත්‍යන්තපදයෙකි. මනොගණයෙහි බැවින් **'මනසා'** යි සිටියේ ය. සංස්කෘතභාෂායෙහි අස්භාගාන්ත ශබ්ද මනොගණයෙහි ඇතුළත් ය. නා - ස - සමා - සම්මං යන් විභක්තිවිෂයෙහි සකාරාගම ව 'මනසා' යනාදී වූ විශෙෂරූප ලැබෙනුයේ එහෙයිනි. මනොගණශබ්ද පුල්ලිඞ්ගික ය, යනු බුඩ ප්‍රියාචාර්‍යයන්ගේ පිළිගැණීම ය. එහෙත් මනශබ්දය පුංනපුංසක දෙක්හි ම වන බව **"චිත්තං චෙතො මනො නිප්පි"** යන අභිධානප්පදීපිකා පාඨයෙන් පෙණේ. පුල්ලිඞ්ගික අකාරන්තයන්ගේ මෙන් නපුංසකලිඞ්ගයෙහි ද 'මනො' යි ඔකාරන්තවිකල්පරූපයෙක් දක්නට ඇත. **"ඝනනං තස්ස මනං හොති, පතිතං අසුභෙසු මුනිස්ස මනො පලිතං සිරො"** යනාදී යෙදුම් 'මනො' යන්න නපුංසක බැව් ද සඳුට කෙරේ.

චෙ යනු, නිපාත යි. එය **"මං චෙ ත්වං නික්ඛණං වනෙ"** යනාදි තන්හි අනියමාර්ථයෙහි ආයේ ය. **"නිට්ඨිතවිවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ විප්පවසෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං"** යනාදියෙහි ආයේ සංශයාර්ථයෙහි ය. මෙහි අනියමාර්ථ යි. **'පදුට්ඨෙන'** යනු 'මනසා' යන්නට විශෙෂණ ව සිටියේ ය.

භාසති වා කරොති වා = බෙණේ නම් හෝ කෙරේ නම් හෝ.

බොරුබස් – කේලාම්බස් – කැකුළුබස් – අරුත්නැතිබස් කියා නම් හෝ, සතුන්මැරීම – හොරකම්කිරීම – කාමයෙහි වරදවා හැසිරීම කෙරේ නම් හෝ යි මෙහි අරුත් ගතයුතු ය. මෙහි කියන්නකු, කරන්නකු දැක්වෙන කර්තෘපදයෙක් විශෙෂයෙන් නො යෙදුනේ ක්‍රියා පදයන්ගේ ශක්තියෙන් ඒ ඇදී එන බැවිනි. ගාථායෙහි පස්වන පාදයෙහි සිටි **'ත'** ශබ්දරූපය සිටියේ, **'ය'** ශබ්දරූපයක් ගැණ බලාපොරොත්තුවෙනි. එහෙයින් යශබ්දය පිළිබඳ එකවචනප්‍රථමාවිභක්ත්‍යන්තපදයෙක් 'භාසති' 'කරොති' යන ක්‍රියාපද දෙක හා සමානාධිකරණත්වයෙන් බැඳේ. බැඳෙන්නේ ද අනියමිතව ය. අසුවලා ය යි එහි නියමයෙක් නැත. පැවිද්දෙක් හෝ වේවා, ගිහියෙක් හෝ වේවා, පුරුෂයෙක් හෝ වේවා, සත්‍රියක් හෝ වේවා දශඅකුශලකර්මපථය පුරා නම්, පව්කම් කෙරේ නම්, ඔහු ය මෙහි කර්තෘවශයෙන් බැඳෙන්නේ.

කායදුශ්චරිතයක් හෝ වාක්දුශ්චරිතයක් කරන්නේ, කියන්නේ අභිඩ්‍යාදික්ලෙශධර්මයන්ගෙන් සිත දූෂිත බැවිනි. මෙසේ ඇති කල්හි, මොහුට දශඅකුශලකර්මපථය ම පිරී සිටියි.

වා යනු, නිපාත යි. එය සමුච්චය–උපමා-සන්දෙහ–පදපූරණ –ව්‍යවස්ථිතවිභාෂා–නිශ්චය–විකල්ප යන අරුත්හි වැටේ. **"පාටලි පුත්තස්ස ඛො ආනන්ද! තයො අන්තරායා භවිස්සන්ති අග්ගි තො වා උදකතො වා මිථුභෙදතො වා"** යනාදි තන්හි ආයේ සමුච්චයෙහි ය. උපමායෙහි ආයේ **"මධුවා මඤ්ඤති බාලො"** යනාදියෙහි ය. **"කො වා ත්වං කස්ස වා පුත්තො"** යනාදි යෙහි සන්දෙහයෙහි ය. **"ඉමස්ස වචනං සච්චං වා යදි වා මුසා"** යනාදියෙහි වූයේ පදපූරණයෙහි ය. **"අමාපතො ස්මිං ස්මානං වා"** යන මෙහි ව්‍යවස්ථිතවිභාෂා ය. **"වා වස්සගෙග නිපාතො"** යනාදි යෙහි දක්නේ නිශ්චයෙහි ය. **"වග්ගන්තං වා වග්ගෙ"** යනාදි යෙහි විකල්ප යි. මෙහි වූයේ සමුච්චයෙහි ය.

තතො නං දුක්ඛංඅන්වෙති = ඒ හෙතුවෙන් දුක ඔහු අනුව යයි.

ලී හොතුමෙනෑ සි වදුලෝ, කළාදු ත්‍රිවිධදුශ්චරිතයන්ගේ බලය ඇත්තෙකි හා නිරයලොව ඇතුන් පැන ඉපදෙන්නට කරුණු වන බැවින් අපායයෙන හා මිනිසුන් අතර ඉහා පහත් තැන ප්‍රතිසන්ධිය දෙන හා දශදුශ්ශීලකර්මයෙහි පිහිටා ඒකා, කල් අකුසල් ඇති ලී පුරුෂයා දඹුවි [illegible]

[illegible] නාස් ආදිය ලී ලී දෙරටුයෙහි උපදනා බවත් [illegible] හැසිරෙන තැන් බැමිනි බවුනට වදාළ සේක. **"චිඤ්ඤාණඤ්ච ඛ්වස්ස චිත්තසෙවනඤ්ඤා තං නිස්සායඤ්ඤා වත්තතී"** යනු විචාරණයයි.

කයට අදුරුවූ තැනුම පහසක් ලැබීවිට ලී අරමණු කොට උපදනා කායවිඤ්ඤාණාදීන්හි යෙකි හා, ලී විඤ්ඤාණයින විඳිනුදු ජවත් වීත්හි ද පහළ වන දුක්ඛවේදනාව **'කායසම්ඵස්සජදුක්ඛා'** නම් වේ. චක්ඛු-සොත-ඝාණ-ජිව්හා හදඅ යන මෙවුනු ඉතාරවත්‍රූපයන ඇස්-කන්-නාස් ආදිය නොඇද ගන්නා, නොපිළිවිය [illegible] වල දී පහළ වන චක්ඛුවිඤ්ඤාණාදීන් [illegible] චිත්තවිපිවල උපදනා ජවනයන [illegible] දුක්ඛවේදනාව **'දුතරසම්ඵස්සජදුක්ඛා'** නම් වේ. **"තතෝ තිඛ්ඛ දුබ්බවතිතතා නං පුගෙල දුක්ඛායතීති දුබ්බිඤ්ඤානුභාවෙන චතුත්‍ථ අපායෙසු මහාඝාසෙ වා තතෝපරං සම්පත්තානං සාසං විඤ්ඤාණඤ්ච දුතරසෙති දුබ්බා සම්පත්තියා සෙව ඝාසියා චෙතසිකා විඤ්ඤාණඤ්ච දුතරසෙති වුච්චති"** යනු අට්ඨවා ය.

අඤ්ඤිති යන මෙහි, පද වෙන්කිරීම **'අනුඤ්ඤි'** කියා වේ. එහි **අනු'** යන්න ඵල්ය-අනිසස-ආදිය-අනුවත්තන-අනුවත්තති කින-තතියා-අනුගත-දෙස-ලක්ඛණ-විච්ඡා-ඉත්ථම්භූත-භාග ය තාදි අර්ථයන්හි එන උපසගයෙකි. **"අනුරථා - අනුරමනතා - අනුරූපං අනුසයෝ - අනුඝාතිපුත්තතං පඤ්ඤා නදීමඤ්ඤිතා ඝසතා අඤ්ඤි - ඵලඤ්ඤානුවිඤ්ඤාතතා එවමාදි - ඵලඤ්ඤාදීසු අනුඤ්ඤා විඤ්ඤාණඤ්ච විඤ්ඤාණඤ්ච සාධිඤ්ඤාදයෙතා සාතරමතු යදෙසෙ ච අනුඤ්ඤා තං දියතු"** යනු විඤ්ඤාදීන්හි නදසන්ට මෙහි ගතාපිසෙ ය

ඵලකං [illegible]
යන ගැදීසයි.

[illegible] ලොමේ අවසන් [illegible] නැත, ඇඹමසයා. මසයි ගැල [illegible] නැවත්, නැල නළනා ලන්නට වත් හැර දමන්නාට වත් පොහොසත් නොවේ ඉඤ්ඤරහ යි කියවිරි, විඤ්ඤාදු වි සෙල්ලේ හැපීමෙන් ද

ඒ හෙතුවෙනැ යි වදාළෝ, කළා වූ ත්‍රිවිධදුශ්චරිතයන්ගේ බලය අපායයෙහි හා මිනිස්ලොව පහත් තැන ඉපැත්මට කරුණු වන බැවිනි අපායයෙහි හා මිනිසුන් අතර ඉතා පහත් තැන ප්‍රතිසන්ධිය දෙන්නා වූ දශඅකුශලකර්මහෙතුයෙන් විපාකදුක, කළ අකුසල් ඇති ඒ පුද්ගලයා අනු ව යයි. පසු පස්සේ ලුහු බැඳ යයි.

කායවක්ඛුක - ඉතරවක්ඛුක යි දුක දෙ පරිදි ය. ඇස්-කන් නාස් ආදිය ඒ ඒ දොරටුයෙහි උපදනා චිත්ත - චෙතසිකයන් හැසිරෙන තැන් බැවින් ඔවුනට වස්තු නම් වේ. "වසන්ති ඒතෙසු චිත්තචෙතසිකා තං නිස්සයත්තා වක්ඛූනි" යනු විවරණය යි.

කයට අප්‍රිය වූ කැකුළු පහසක් ලත්විට ඒ අරමුණු කොට උපදනා කායවිඤ්ඤාණචිත්තයෙහි හා, ඒ චිත්තවීථිය පිළිබඳ ජවන් සිත්හි ද පහළ වන දුක්ඛවෙදනාව 'කායවක්ඛුකදුක්ඛ' නම් වේ. චක්ඛු-සොත-ඝාණ-ජිහ්වා හදය යන මොවුහු ඉතරවක්ඛුකයහ. ඇස්-කන්-නාස් ආදිය නො ඇද ගන්නා, නො පිණවන අරමුණු වල දී පහළ වන චක්ඛුවිඤ්ඤාණාදිය මැදහත් ව සිටිය ද, ඒ ඒ චිත්තවීථිවල උපදනා ජවනයන් දුක් හා හැනි සිටි බැවින් ඒ දුක්ඛවෙදනාව 'ඉතරවක්ඛුකදුක්ඛ' නම් වේ. "තතො කිවිධ දුච්චරිතතො තං පුග්ගලං දුක්ඛමන්වෙති දුච්චරිතානුභාවෙන වතුසු අපායෙසු මනුස්සෙසු වා තමභාවං ගච්ඡන්තං කාය වක්ඛුකම්පි ඉතරම්පීති ඉමිනා පරියායෙන කායිකං චෙතසිකං විපාකදුක්ඛං අනු ගච්ඡති" යනු අටුවා ය.

අන්වෙති යන මෙහි, පද වෙන්කිරීම 'අනුඑති' කියා වේ. එහි අනු' යන්න පච්ඡා-අතිසය-සාදිස්ස-අනුපච්ඡින්න-අනුවත්ති ඝීන-තතියා-අනුගත-දෙස-ලක්ඛණ-වීප්ජා-ඉත්ථම්භූත-භාග යනාදී අර්ථයන්හි එන උපසර්ගයෙකි. "අනුරථං - අනුරත්තො - අනු රූපං-අනුසයො-අනුසාරිපුත්තං පඤ්ඤවා නදිමන්වසිතා සෙනා අන්වෙති - රුක්ඛමනුවිජ්ජොතතෙ වන්දෙ - රුක්ඛංරුක්ඛමනු විජ්ජොතතෙ විජ්ජු-සාධුදෙවදත්තො මාතරමනු - යදෙත්ථ මං අනුසියා තං දියතු" යනු පිළිවෙළින් නිදසුන් ය. මෙහි අනු ගතාර්ථයෙහි ය.

චක්කං ඉව වහතො පදං = ගැල උසුලන ගොනුගේ පිය අනු ව යන ගැල්සක සේ ය.

ගැලෙහි යෙදූ, ගැල ඇද ගෙණ යන ගැල් බර උසුලන ගොන් තෙමේ දවසක් දෙකක් නැත, අඩමසක්, මසක් ගැල ඇද්දේ නමුත්, ගැල නවතා ලන්නට වත් හැර දමන්නට වත් පොහොසත් නො වේ. ඉස්සරහට ගියවිට, වියදඹු ව බෙල්ලේ හැපීමෙන් ද

පස්සට යියහිට, ගැල්සහ බලවා මස්වල හැපීමෙන්ද පිඹිරුවා පන් වේ. මේ‍ස මේ ගැල්සහ, දෙපයින් පෙළපියන් උණ ලුහුබැඳ සසු පස්සේ යයි ය මෙහෝ හිලිටි කිනිසා හුන් ලැයරින් පුරා ඔවි පුලුලා නිද්දාලී වූ බවය පාහන්ත දුස්සාරා, ඒ දුස්සාරාගේ ගෑ බැහැ දී ම දසියාගේ මුල් සොරා ඇති දුයරින් මුල් කොට ඔවි සාසික චේතස්කදුඛස්ස ඵුහුබැඳ යේ ය යි වදාළ ය.

එකක ශබ්දය, නොයෙක් අරුත්හි එන්නෙහි. ඊර්ෂ්‍ය-ලක්ඛණ ධම්මචක්ක-උරුවක්ක-ඉරියාපථ - සම්පත්ති - එකකාරහන - මිණ්ඩල බල-කුලාලහත්ථ - ආණා - ආයුධ - ඛුන - සඞ්ඛය යන අරුත්හි එන්නේ ය. මේහි රථාවයවයෙහි ආයේ ය. **"නාභෙරාති ගමනං අරනෙනාති = භඤ්ඤං, එකෙකාති ඒකථේරා ගීතයි කුමිනාති = චක්කං"** යනු තදාකාරාර්ථ ය යි.

ඵුට යනු, නිපාත යි. එය සම්භනගාව-උත්තදුක්ඛා-අලපාඨ වාක්‍යාලඞ්කාර යන්හි වූ අවියන්හි එන්නේ ය. මෙහි සම්භන භාවයෙහි ආයේ ය. ඉවසබ්දය ඊවසඤ්ඤී ආන්නේ ය යි මහා හාස්‍යයෙහි කියා ලදී.

චේතසිකයන්ට සිත පෙරටු වේ. අධිපති වේ. චේතසික ඉපැදෙන්නේ සිතින් ය. සිතින් වෙන් ව චේතසිකයන්ගේ ඉපැත් මෙක් හටගැන්මෙක් නො වන්නේ ය. දුනිඛ්‍යාදිසොළසයන්ගෙන් කිලිටි වූ කැළඹුනා වූ සිතින් යමක් කියා ද, සමක් නෙරේ ද, සමක් යිනා ද, ඒ හැම එකෙක් ම අකුසල් ය. ඒ අකුසල් හෙතු යෙන් දුඛ ඔහු පසුපස ඵුහු බැඳ යන්නේ ය. ගැල් දිවා හොපුන් ගේ විය පසුපස නො නැවතී යන ගැල් සහ සේ ය, යනු ගාථාවේ ඉතා කෙටි අදහස ය.

ඒ නිර්දෙහනාව අසා සිටි නිස් දහසක් භික්ෂූන් වහන්සෙලා ඒ [illegible] අසී-ඛ්‍රී-නිරුඤ්ඤි-ප්‍රතිභාහ යන [illegible]

[illegible]

සඞ්ඛයාඤ්ඤාඨවිරවිරචිතයේ නිමිතයේය.

පස්සට ගියවිට, ගැල්සක කලවා මස්වල හැපීමෙන් ද පීඩාවට පත් වේ. මෙසේ මේ ගැල්සක, දෙපයින් පෙළමින් ඌ ලුහුබැඳ පසු පස්සේ යයි. එ මෙන් කිලිටි සිතින් තුන් දුසිරිත් පුරා සිටි පුගුලා නිරයාදී වූ කො තැනක උපනත්, ඒ උපනුපන් හැම තැන දී ම දුසිරිත් මුල් කොට ඇති දුසිරිත් මුල් කොට සිටි කායික - චෛතසිකදුඃඛය ලුහුබැඳ යේ ය යි වදාළ සෙක.

චක්ක ශබ්දය, නොයෙක් අරුත්හි එන්නෙකි. රථඞ්ග-ලක්ඛණ ධම්මචක්ක-උරචක්ක-ඉරියාපථ - සම්පත්ති - චක්කරතන - මණ්ඩල බල-කුලාලභණ්ඩ - ආණා - ආයුධ - දාන - සමූහය යන අරුත්හි එන්නේ ය. මෙහි රථාවයවයෙහි ආයේ ය. **"කරොති ගමනං අනෙනාති = චක්කං, චක්කෙති බ්‍යථති හිංසති භූමිත්ති = චක්කං"** යනු තදර්ථකථන ය යි.

ඉව යනු, නිපාත යි. එය සමානභාව-උත්ප්‍රේක්ෂා-අල්පාර්ථ වාක්‍යාලඞ්කාර යනාදි වූ අර්ථයන්හි එන්නේ ය. මෙහි සමාන භාවයෙහි ආයේ ය. ඉවශබ්දය එවශබ්දාර්ථ ඇත්තේ ය යි මහා භාස්‍යයෙහි කියන ලදී.

චෛතසිකයන්ට සිත පෙරටු වේ. අධිපති වේ. චෛතසික ඉපැදෙන්නේ සිතින් ය. සිතින් වෙන් ව චෛතසිකයන්ගේ ඉපැත් මෙක් හටගැන්මෙක් නො වන්නේ ය. අභිඛ්‍යාදිකෙලශයන්ගෙන් කිලිටි වූ කැලඹුනා වූ සිතින් යමක් කියා ද, යමක් කෙරේ ද, යමක් සිතා ද, ඒ හැම එකෙක් ම අකුසල් ය. ඒ අකුසල් හෙතු යෙන් දුක ඔහු පසුපස ලුහු බැඳ යන්නේ ය. ගැල අදින ගොනුන් ගේ පිය පසුපස නො නැවති යන ගැල් සක යේ ය, යනු ගාථාවේ ඉතා කෙටි අදහස ය.

මේ ධර්මදෙශනාව අසා සිටි තිස් දහසක් භික්ෂූන් වහන්සේලා ඒ අවසන්හි අර්ථ-ධර්ම-නිරුක්ති-ප්‍රතිභාන යන සිටු පිළිසිඹියා වන්ගෙන් යුත් රහත්බවට පැමිණියෝ ය. අසා සිටි සෙස්ස නට ද දෙශනා තොමෝ ඵලසහිතවූ ය

චක්ඛුපාලස්ථවිරවයතුව නිමියේය.

මට්ටකුණ්ඩලීදිව්‍යපුත්‍රයා

1 - 2

සැවැත්නුවර අදින්නාපුබ්බක නමින් ප්‍රසිද්ධ වූ බමුණෙක් විසී ය. ඔහු කිසි දිනෙක, කිසිවක් පිණිස, කිසිවක්හට, කිසිවක් දුන්නෙක් නොවේ. එහෙයින් නුවරවැස්සෝ ඔහුට "අදින්නාපුබ්බක" යි නම් තැබූහ. ඔහුට පියකරු මනවඩන පුත්‍රයෙක් වූයේ ය. ඒ පුතුට පැලඳීමට කඩුක්කමක් කර දෙනු කැමැති බ්‍රාහ්මණ තෙමේ ඒ පිණිස රත්කරුවක්හට කීයෙම් නම්, වැටුප් දියයුතු වන්නේ ය යි සිතා, තමා ම ගෙයි තුබූ රත් කැබැල්ලක් ගෙණ තලා මට්ටම් කොට, කඩුක්කමක් සාදා දුන්නේ ය. ඒ පැලඳ ගත් බ්‍රාහ්මණපුත්‍ර තෙමේ ඉන් පසු 'මට්ටකුණ්ඩලී' යි ප්‍රසිද්ධ විය. සොළොස් වියේ දී ඔහුට පාණ්ඩුරෝගයෙක් හට ගැණිණ. එකල මවු තොමෝ පුතු පාණ්ඩුරෝගයෙන් පෙළෙන බව දැන, සිය භිමියා වෙත ගොස්, "භිමියෙනි! ඔබ පුත් මට්ටකුණ්ඩලී තෙමේ පාණ්ඩුරෝගයෙන් රොගී ව වසයි, එ බැවින් වහා ඔහුට යම් කිසි පිළියමක් කරවනු මැනැවැ" යි කිවූ ය. "සොඳුරිය! බෙහෙත් කරන්නට වෙදකු ගෙණාවොත්, ඔහුට වැටුප් දිය යුතු ය, කුමක් කියහි? එසින් වන මූදල් වියදම නො බලහි දැ' යි බමුණා කීවිට, "හොඳයි, ඔහාට කැමැත්තක් කරන්නැ" යි ඇ නිහඬ වූවා ය. ඉක්බිති ඔහු අඩු වියදමකින් බෙහෙත් කරන්නට සිතා, වෙදුන් කිහිපදෙනකුන් කරා ගොස්, "අසුවල් අසුවල් ලෙඩට වෙද මහත්මයාලා කරණ බෙහෙත් මොනවා දැ"යි ඇසී ය. වෙදවරු බමුණාගේ තරුනිරම ගැණ දැන සිටි බැවින් පොතපතෙහි නම් නැති ගස් පැලැටි කිහිපයක නම් කියා "අපි ඔබදු ලෙඩවලට මේ මේ ගස්පැලැටිවල කොළ පොතු මූල් මල් ගෙණ කොටා ඉස්ම ගෙණ බෙහෙත් කරන්නෙමු"යි කීහ. බමුණා ඒ අදහා ගෙණ ගෙදර අවුත් වෙදුන් කියූ කොළ පොතු මූල් මල් ගෙන්වා කොටා ඉස්ම ගෙණ පුතුට පෙවී ය. එසින් රොගය තිබුනාට ද වඩා බලගතු ව ගියේ ය. සුවපත් කරන්නට බැරි තැනට වැටුනේ ය. එවිට බමුණු තෙමේ වෙදකු ගෙන් වී ය. වෙදු ලෙඩා බලා පරීක්ෂා කොට "මේ වේලෙහි මා විසින් කළයුතු දෙයක් නැතැ"යි සිතා "ලෙඩාට බෙහෙත් කරන්නට මට නොහැකි ය, අන් වෙදකු ගෙන්වා ගන්නැ"යි කියා ආපසු ගියේ ය. එවිට ඔහු, පුතු මැරෙණ බව දැනා "මොහු මළපසු මළගමට එන්නෝ ගෙයි ඇති දේපල බලා මට ගරහන්නෝ ය, එයට කලින් මූ ගෙයින් බැහැර කළ යුතු ය" යි සිතා බැහැර කොට පිල්කඩෙහි නිදි ගැන්වී ය.

එ දවස මාගේ සවාමිදරුවූ සම්මා සම්බුදුරජානන් වහන්සේ, අලුයම් වේලෙහි මහකුළුණු සමවතින් නැගිට පෙර බුදුවරුන් විෂයයෙහි කළ පැතුම් ඇති මහත් කුසල් මූල් ඇති විනෙයජන නැමැති බඳුන් දකිනු පිණිස බුදු ඇසින් ලොව බලා වදරණ සේක්, දස දහසක් සක්වළ නුවණදැල පතුරා හැරි සේක. වාසනාවකට මෙන් පාණ්ඩුරොගයෙන් ඔත්පල ව සියගෙයි පිල්කඩෙහි ඇඳ කබලකැ වැතිර හුන් මටටකුණ්ඩලියා හුන් ලෙසින් ම ඒ නුවණ දැලට අසු විය. මොන ලෙසකිනුත් පිළියම් නො කොට හැකිබවට ගොස් සිටි මටටකුණ්ඩලියා ගෙයින් බැහැර කොට පිල්කඩෙහි හෙවූ බව දුටු බුදුරජානන් වහන්සේ, මහකුළුණෙන් ලතෙත් වූ සේක්, "මා මෙහි යෑමෙන් වැඩෙක් වේ දෝ"යි බලා වදාළ සේක. එකෙණෙහි "මේ තෙමේ මා කෙරෙහි සිත පහදා කලුරිය කොට තව්තිසා දෙව්ලොව තිස් යොදුන් රත්වම්මතෙක උපදින්නේ ය, දෙවඟනන් දහසෙක් ඔහුට පිරිවර වන්නේ ය, අදින්නපුබ්බකයා මළසිරුර ආදහණ කොට හඬමින් සොහොනැ හැසිරෙන්නේ ය, දිව්‍යපුත්‍ර තෙමේ තුන් ගව්වක් පමණ තරම් වූ වටිනා මහත් දිව්‍යාභරණයෙන් සරසනලද දෙවඟනන් දස දහසක් විසින් පිරිවරණලද සියඅත්බව බලා 'කිනම් පිණකින් මා විසින් මේ මහත් සම්පත් ලද දැ'යි බලන්නේ මා කෙරෙහි කළ සිත් පැහැදුම් පමණින් ලත් බව දැන, 'මුදල් වියදමට බියෙන් මාගේ පියා එදා බෙහෙත් නො කොට හැර, අද සොහොනට ගොස් හඬා වැලපෙයි, එ හෙයින් ඔහු වියරු වැටුනකු කරන්නෙමි'යි පියා කෙරෙහි නො ඉවසීමෙන්, මටට කුණ්ඩලිවෙසයෙන් අවුත් සොහොනට නො දුරෙහි වැද හෙව් හඬන්නේ ය, එවිට අදින්නපුබ්බක තෙමේ 'තෝ කවරෙක් වෙහි දැ?'යි විචාරන්නේ ය, 'මම තාගේ පුත්‍ර වූ මටටකුණ්ඩලි වෙමි'යි ඔහු කියන්නේ ය, තෝ කොතැනැ උපනැ'යි එවිට අසන්නේ ය, 'තව්තිසාදෙව්ලොවැ'යි දෙව්පුත් කියන්නේ ය, 'කි නම් කුශලකර්‍මයකින් එහි උපන්හි දැ'යි ඇසූ විට 'මා කෙරෙහි කළ යම්තාක් සිත් පැහැදුමෙනැ'යි කියන්නේ ය, එවිට බමුණා 'ඔබවහන්සේ කෙරෙහි සිත් පැහැදුමෙන් දෙව්ලොව උපන්නෝ තවත් වෙද් දැ"යි මා අතින් විචාරන්නේ ය, එවිට මම 'මා කෙරෙහි සිත් පහදවා ගෙණ දෙව්ලොව උපන් අයගේ ගණන, ගණන් වශයෙන් නො දැක්විය හැකි ය'යි කියා ධම්මපදයෙහි ගාථාවක් කියන්නෙමි, ඒ දෙසුම් අවසන්හි අසූකාර දහසක් ප්‍රාණීන්ට ධර්‍මාවබෝධය වන්නේ ය, මටටකුණ්ඩලියා ත් අදින්නපුබ්බකයා ත් සෝවන් මගට පැමිණෙනු ඇත, මෙසේ මේ කුලපුතුන් නිසා මහත් ධර්‍මයාගයෙක් වන්නේ ය"යි උන්වහන්සේට පෙණී ගියේ ය. එකල්හි උන්වහන්සේ මහාභික්ෂුසඞ්ඝයා පිරිවරා සැවැත් නුවරැ කෙමෙන්

පිඬු සිහා ගොස්, බමුණුගෙදරට ද වැඩි සේක. එ මෙලෙයි, බිත්තියට මුණ ලා නිදු හුන් මටටකුණ්ඩලියා බුදුරජුන් එනි වැඩි බව නො දන්නේ ය එ හෙයින් උන්වහන්සේ තමන් වහන්සේ එහි වැඩිබව දක්වන්නට රන්වන් සිරුරෙන් රැස්කලඹක් විහිදුවා හැරියහ. එ කෙණෙහි මාණවකයා 'ඒ කිමැ'යි හැරී බලන්නේ, බුදුරජුන් දැක, "මාගේ මේ මෝඩ පියා නිසා මෙබඳු බුදුරජුන් කරා එළැඹි වතාවතක් කරන්නට දැනයක් දෙන්නට බණ පදයක් අසන්නට නො හැකි වීමි, දැන් නම් අනේ! මාගේ අත් පාද මට කීකරු නැත, ඉත පහදු ගැණීම මිසක් දැන් කළයුතු අනෙකෙක් නැහැ" යි බුදු රජුන් කෙරෙහි ඉත පහදු ගන්නේය. උන්වන්සේ, මටටකුණ්ඩලියා තමන් වහන්සේ කෙරෙයි ඉත පහදු ගන්බව දැන, "මොහුට දෙව්ලොව ඉපදීමට මේ පමණැ"යි සිතා, ආපසු විහාරයට වැඩි සේක. මටටකුණ්ඩලී තෙමේ බුදුරජුන් නො පෙණියත් ම මියගොස් තව්තිසාදෙව්ලොව උපන.

ඉක්බිති බ්‍රාහමණ තෙමේ මළසිරුර දවා සොහොනට ගොස් "අනේ! එක් ම පුත! නුඹ කොතැන ගියහි? අනේ! එක් ම පුත! කොතැන ගියහි"යි නන් දෙඩමින්, අඩමින්, වැලපෙමින් දිනපතා සොහොනෙහි හැසිරෙන්නට වන. දෙව්ලොව දිවඅත්බව ලබා උපන් මටටකුණ්ඩලී තෙමේ හදිසියෙන් තමන් ලත් සම්පත්තිය බලා, "කුමන පිණකින් මේ ලද දැ"යි විමසන විට, බුදුරජුන් කෙරෙහි කළ ඉත් පැහැදුමෙන් බව දැන "මාගේ පියා මා ලෙඹින් සිටිය දී බෙහෙත් නො කරවා, දැන් සොහොනට ගොස් අඩයි, මොහු පිස්සකු උමතුවුවකු කරන්නට වටී ය"යි සිතා, මටටකුණ්ඩලී වෙසයෙන් එහි අවුත් සොහොනට නො දුරෙහි සිට හිසැ දෙඅත් බැඳ අඩන්නට වන. පුත්සොවින් සොහොනෙහි අඩන අදිත්‍ය පුබ්බක තෙමේ ඔහු දැක "හා! මොක ද අඩනෙහි? මම පුත්සොවින් අඩමි, උඹ?"යි දිව්‍යපුත්‍රයාගෙන්

ඕස්!

"නානබරණ ඇඟ ලූ – කඩුක්කම් කන් රැඳ වූ,
මල්බරිනි බෝ බර වූ – රන්වන් සඳුන්ලෙව් දුන්.

ඔබ මේ මහාවන – මැද එකලා ව දෙයත ද,
බැඳ හිසැ හඬා වැලපෙහි – කිම දුකට පත්වූයෙහි?"

යි ඇසී ය. එවිට දිව්‍යපුත්‍ර තෙමේ මෙසේ කී ය.

"රනින් කළ පහසර - ලැබුනේ ය රියපදුරෙක්,
සක් සහලෙක් එයට නැත - දිව් හරිමි මම එදුකින්" යි.

බ්‍රාහ්මණ තෙමේ

"සොඳුර! කිය මට දැන් - සක් සහලක් කර දෙමි,
මිණියෙන් හෝ රනින් හෝ - රිදියෙන් හෝ ලෝහයෙන්" යි

කී ය. දිව්‍යපුත්‍ර තෙමේ ඒ අසා, එදු පුතුට බෙහෙත් නො කොට සිට අද පුතු වැනි මා දුක අඬමින් වැලපෙමින් රත් රිදියෙන් රිය සකක් කර දෙමි, යි කිය සි "හොඳ' එසේ වේවා" යි සිතා "තමුසේ කොතරම් මහත් සක් සහලක් කර දෙන්නහු ද" යි ඇසී ය. බමුණා "නුඹ බලා පොරොත්තු වන්නෙහි යම්පමණ එකොක් නම්, එ තරම් එකෙකැ" යි කී විට දිව්‍යපුත්‍ර තෙමේ "මට වුවමනා සඳ හිරු දෙදෙනා ය" යි කියා ඒ ඉල්ලමින්,

"මා රන්මුවා රිය - බබලනුයෙ සඳහිරුගෙනි,
දෙනු මට රැගෙණ එ දෙ දෙන - කී ය ඔහු ඒ බමුණුට"

එවිට බමුණා,

"නෝ පැතිය යුත්ත ඔබ - පතනා නුවණ නැත්තෙහි,
නො ලැබේ ඇ තට සඳහිරු - ඉන් ඔබ මැරී යනු ඇත" යි

කී ය. දිව්‍යපුත්‍ර තෙමේ "මොකා ද ඔහොම කියන්නෙහි, පෙණෙන දෙයක් ගැණ හඬන්නේ මේඩයා ද? නැත, නො පෙණෙන දෙයක් ගැණ හඬන්නා මේඩයා දු" යි අසා මෙ ද කී ය.

"පෙණේ උන් යනෙහු - පැහ සටහන් ද පැහදිලි,
පෙණේ ගමන් වේ මග - ඔවුන් යනෙනා අහසේ.
එ නමුත් බමුණ! ඒ - පරලොව ගියේ නො පෙණේ,
වැලපෙන අප දෙදෙනතර - කවරෙක් නුවණ නැත්තේ" යි

බමුණා මෙය අසා, "මේ තෙමේ කියන්නේ ඇත්තෙක්මය"යි සලකා

"සැබවකි, ඔබ කියුම් - මම වෙමි නුවණ නැත්තේ,
සඳට වැලපෙන දරු සේ - මළහු පතමින් හඬනා" යි

මෙසේ කියා ඔහුගේ කතාවෙන් ගොනා නැත්තෙක් ව ඔහුට,

"ගිතෙල් ඉසි ගිනි සේ - සෝගිනි ඇවිළ ගත් මා,
දිය ඉස නිවන්නකු සේ - සියලු සතැවිලි නිවිහී,
යමෙක් දැඩි සොඹිනී - පෙළුනු මාගේ පුත්සෝ,
දුරු කෙළෙ ද, හේ මාගේ - හදු සෝ හුල් උදුරා ලී,
ඒ මම ඔබ වදන් - අසා හළහුල් අත්තෙම්,
ඔහිල් වූයේ නිවුනේ - නො හඬමි සෝක නො කරමි" යි

ඔහුට සතුති කොට නැවැත,

"දෙවියෙක් ද? ඔබ කිම – ගඳබෙක් ද? නැත, දෙවිඳු ද?
කවරෙක් ද? කාගේ පුත් – වෙහි දූ යි කෙසේ දනිමු ද?" යි

ඔහු පිළිබඳ තොරතුරු ඇසී ය. එවිට දිව්‍යපුත්‍රයා,

"දවා පුතු සොහොනෙහි – දූන් යම් පුතකු උදෙසා,
මෙහි හඬා වැලපෙහි නම් – ඒ පුත් මම ය ඔබගේ,
කුසල් කම් කොට මම් – සහබවට දෙවියන්ගේ,
ගියෙ මිනිසත් බව හැර – දූන් විදිමි දෙව්සැපතුම්"

යි කී විට,

"මඳ හෝ නො මඳ හෝ – දනක් දෙනු සිය මැදුරේ,
පෙහෙවස් රැකුම් හෝ කිසි – එබඳු පින්කම් කරණු,
කිසිදිනෙක නො දිටිමි – කිය! කිනම් කමකින් ඔබ;
දෙව්ලොව ගියේ වෙහි දූ යි – සතුටට කරුණු වේ එය"

යි බමුණ ඇසී ය. එවිට,

"සිය නිවසැ සිටියෙම් – හටගත් රෝග ඇත්තෙම්,
දුකට පත්වූයේ මම් – පෙළුනෙම් ගිලන් වූයෙම්,
සිවු සස් දහම් දත් – පහකළ කෙලෙස් මුල් ඇති,
සැක හැර සිටි සුගත් සඳ – දිටිමි පිරිපුන් නුවණැති,
තුටු සිත් ඇති එ මම – බුදුනට ඇඳිලි කෙළෙමි,
එ කුසල් බෙලෙන් මම් එහි – ගියෙම් දෙවියන් සහබව"

යි දෙවපුත්‍ර තෙමේ මහත් සතුටින් කියා සිටියේ ය. දෙව් පුත් මෙසේ කියත් කියත් ම බමුණගේ මුළු සිරුර සතුටින් පිරී ගියේ ය. ඔහු ඒ සතුට පවසන්නට,

"මෙබඳු ඇඳිලිකම් – විපා පුදුමෙක! අරුමෙක!,
පෙර නො වූවෙක! මම අද – බුදුන් සරණැයි ගණිමි"

යි මෙසේ කී ය. නැවැත ඔහුට දෙවපුත්‍ර තෙමේ,

"පහන් සිතැති ව ඔබ – බුදුන් හා දම් සහ තුම්"
සරණ ගොස් පන්සිල් රකු – නො කඩ කොට දැඩිසේ ගෙණ,
පණිවාය සොරකම – මත්පැන් බීම බොරුබස,
යන මේ පවින් දුරු වෙව – සියඹුව හා ම තුටු වෙව"

යි අවවාද දුන්නේ ය. බමුණ, ඒ පිළිගණිමින්,

"යක් ඔබ මෙ මට අත් – කැමැත්තෙහි, හිතවත් වෙහි,
ඇදුරෙහි වැඩ කැමැත්තෙහි – ඔබ වදන් මම කරමි,
පිහිටැ යි දරම් මම් – බුදුරජු ද තුම් දහම ද,
නරදෙව්දුපුත් සහන ද – සරණ කොට යම් දිවිහිම්,
පරපණ නැසීමෙනි – වහා වැළකෙම් සොරකම,
හැර යම් නො බොම් මත් පැන් - බොරු ද නො කියා සිටිමි,
තුටුවෙමි සියඹු හා – පරඹුවන් ඇස හැර වත්,
නො බලම් මෙසේ පන්සිල් – රකිම් දෙව්යෙනි! සත්න යි"

කියා පොරොන්දු වූ කල්හි "බ්‍රාහමණය! ඔබගේ ගෙයි බොහෝ වසතුව තිබේ, එ හෙයින් නිතර දන් දෙව! පන්සල් යව! බණ අසව! බණේ නො නේරෙන තැන් අසා දැන ගණුව, දුප්පතුනට හා අසල්වැසියනට හොදට සලකව! සසුන්දියුණුවෙහි තරව යෙදෙව!" යනාදීන් අවවාද දී වැඩ දක්වා අතුරුදහන් විය. ඉක්බිති බමුණු තෙමේ ගෙට ගොස් බැමිණිය අමතා "සොදුරිය! මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙහි වැඩමවා ගෙණ ධර්මාසනයක් කිරීමට අදහස් කර ගෙණ සිටිමි, උඹ එයට උදවු දිය යුතු ය, උන්වහන්සේට සියලු සැලකිලි ඔයා අතින් කෙරෙන්නට ඕනෑ ය" යි කියා පන්සලට ගොස් වැදුම් පිදුම් සැලකිලි කිසිවක් නො කොට පැත්තක සිට ගෙණ "ගෞතමයන් වහන්ස! භික්ෂූ සඞ්ඝයාන් සමග හෙට දවසැ දුනය පිණිස අප ගෙට වැඩම කරන්නැ" යි ආරාධනා කෙළේ ය. බුදුරජාණන් වහන්සේ එය පිළිගත්හ. බමුණා පෙරළා ගෙට ගොස් කැමි බීම් හැම දෙයක් ම වහා පිළියෙල කරවී ය. පසු දා බුදුරජාණන් වහන්සේ භික්ෂූ සඞ්ඝයා ත් කැටුව එහි වැඩම කොට පිළියෙල කොට තුබූ අසුනෙහි වැඩහුන් සේක. බමුණා උන්වහන්සේලා මැනැවින් වැළඳ වී ය. මහාජන තෙමේ ද එහි රැස් විය. ඔවුන් අතුරෙහි මිසදිටු ගත්තෝ "ප්‍රශන ඇසීමෙන් වෙහෙස කරණ ශ්‍රමණ ගෞතමයා බලන්නෙමු" යි ආහ. බෞද්ධ මහාජන තෙමේ ආයේ බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්‍යවත් මහත් වූ බුද්ධවිලාසය බලන්නට ය. දන් වලදා අවසන් කළ බුදුරජුන් වෙත හිය බමුණු තෙමේ මිටි බන්කුවක් ගෙණ එහි වාඩිවී, "ගෞතමයන් වහන්ස! නුඹවහන්සේට කිසිදෑහ දන් නො දී අන් එබඳු පූජාවකු ත් නො කොට හැර බණදහමකු ත් නො අසා පෙහෙවස් නො රැක තනිකර හිතේ පැහැදුමෙන් දෙව්ලොව උපත් අය ඇද්දැ" යි ඇසී ය. "බමුණ! මා විචාරන්නහු කිම? තාගේ පුත් මට්ට කුණ්ඩලී තෙමේ මා කෙරෙහි සිත පහදා ගත් පමණින් දෙව්ලොව උපන් බව කට කීයේ නො වේ දැ" සි වදාළ විට "කවදා දැ" යි හේ

ඇසී ය. බුදුරජානන් වහන්සේ "ඇයි! නුඹ සොහොනට ගොස් එහි අඩ අඩා සිටිය දී, නුඹ සේ ම එහි හඬ හඬා හුන් මිනිසකු හා ඒ ගැණ කතා කළහු නො වහු ද? ඔහු ඒ ගැණ කීයේ නො වේ ද? බමුණ! මා කෙරෙහි පැහැදීමෙන් දෙව්ලොව උපන්නවුන්ගේ ගණන ඉතා මහත් ය" යි වදාරා එහි රැස් ව සිටි මිනිසුන්ගේ විමති දුරු කරණු පිණිස මට්ටකුණ්ඩලී දෙවපුත්‍රයා එහි ගෙන්වූ සේක. ඔහු ද තුන් ගවු පමණැති දිවබරණින් සැරසූ අත් බැවින් යුක්ත ව විමානය ද ගෙණ එහි පැමිණ විමානයෙන් බැස බුදුරජුන් වැඳ පසෙක සිටියේ ය. "තා මේ සම්පත් කි නම් පින් කමකින් ලද දූ"යි බුදුරජුන් ඔහු අතින් විචාළ කල්හි ඔබවහන්සේ කෙරෙහි සිත පැහැදීමෙනැ" යි හේ කී ය. මහාජන තෙමේ විමානය සමග පැමිණි මට්ටකුණ්ඩලියා දැක "අය්යෝ! බුදුගුණ මහාපුදුමෙක! එය කෙසේ වැණිය හැකි ද"? මට්ටකුණ්ඩලියා අන් කිසිත් පින්කමක් නො කොට බුදුරජුන් කෙරෙහි පැහැදීමෙන් පමණක් මෙබඳු මහත් සැපතක් ලද නම්, එය කො තරම් ආශ්චර්‍යවත් දූ"යි කියන්නට වන. ඔවුන්ගේ සතුට සීමා රහිත විය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ ඔවුන් මැද කුසල් අකුසල් කිරීමේ දී සිත පෙරටු වන බව ද, සිත එහිලා ප්‍රධාන වන බව ද, පහන් සිතින් කළ කුශලකර්මය, කළ පුගුලහු තමන් අත් නො හැර යන සෙවනැල්ල මෙන් ඔහු පසු පස ගොස් දෙව්ලොවට හා මිනිස්ලොව උසස් තැනට පමුණුවන බව ද වදාළ සේක. වදාළෝ මෙසේ ය:–

මනො පුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා,
තතො නං සුඛමන්වෙති ඡායා ව අනපායිනී, නි.

අරූපීධර්මයෝ සිත පෙරටු කොට ඇත්තාහ. සිත අධිපති කොට ඇත්තාහ. සිතින් කරණ ලදහ. ඉදින් පහන් සිතින් යමක් කියා ද, යමක් කෙරේ ද ඒ හෙතුවෙන් විපාකසුඛය ඒ සුචරිත සමඞ්ගී පුද්ගලයා අනු ව යයි. (කුමක් මෙන් ද යත්,) සිරුරෙන් පහව නො යන සෙවනැල්ල සේ ය.

මනො-පුබ්බඞ්ගමා ධම්මා = අරූපීධර්මයෝ සිත පෙරටු කොට ඇත්තාහ.

සාමාන්‍යයෙන් **ධම්මා** යන්නෙන්, අරූපස්කන්ධ තුණ කියැවුන ද, මෙහිලා ගැණෙනුවෝ ඒ ස්කන්ධ තුණට අයත් කුශල චෛතසිකයෝ ය. ඔවුහු ද යට කියූ සේ සත්ව පුද්ගල රහිත බැවින් ස්වලක්ෂණධාරණමාත්‍රයෙන් ධර්ම නම් වෙත්. කුශලචෛතසිකයන්ගේ උත්පත්තියට සොමනස්සසහගතඤාණසම්පයුත්තචිත්තය

ප්‍රත්‍යය වන බැවින් ඒ කුශලවෙතසිකයෝ සිත පෙරටු කොට ඇත්තාහ, යනු වදාළ සේක. වෙතසිකයෝ උපදින්නෝ ත් නිරුඬ වන්නෝ ත් සිත හා එක් ව ම ය. අරමුණු ගන්නෝ ත් එක් වසතුවෙක රැඳෙන්නෝ ත් සිත හා එක් ව ම ය.

මනෝ යන්න, කාමාවචරාදි භෙද ඇති හැම සිතක් උදෙසා ම නො වෙනස් ව යෙදිය හැකි ය. එහෙත් ඒ මෙහි යෙදුනේ කාමාවචර කුසල් සිත් අට අතුරෙහි වූ සොමනස්සසහගතඤාණ-සම්පයුත්තචිත්තය උදෙසා ය. මේ වසතුව දෙසීමට නිමිති වූයේ ඒ සිත ය. (එහි විස්තර පිණිස චිත්තවගියෙහි **"එජනා චපලං චිත්තං"** යන්නට කළ පරිකථාව බලනු.)

"මනෝති අවිසෙසෙන සබ්බම්පි චතුභූමිකචිත්තං වුච්චති, ඉමස්මිං පන පදෙ නියමියමානං වවත්ථාපියමානං පරිච්ඡිජ්ජියමානං අට්ඨවිධං කාමාවචරචිත්තං ලබ්භති, වත්ථුවසෙන පනාහරියමානං තතොපි සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං චිත්තමෙවලබ්භති" යනු අටුවා ය.

බොහෝ දෙනකු එකතු ව දන් පින්කම් ඇ කරණ කල්හි යමෙක් එහි පෙරටු වේ ද, යමකු නිසා අන්‍යයෝ එය කෙරෙත් ද, ඔහු ම එහි ප්‍රධානයා ලෙස ගණිනු ලැබේ. එ මෙන් මේ සොමනස්ස සහගත ඤාණසම්පයුත්තාචිත්තය හැම කුශලවෙතසිකයකගේ ම උත්පත්තියට හෙතු වන බැවින්, උපකාර වන බැවින් ප්‍රධාන වේ වෙතසිකයන්ගේ පෙරටුවෙහි යන්නේ වේ.

මනොසෙට්ඨා = (අරූපීඛම්යෝ) සිත අධිපති කොට ඇත්තාහ.

සිත නො උපන්නොත් වෙතසිකයන්ගේ ඉපදීමෙක් නැත. ඇතැම් වෙතසික නො උපන්න ද, සිත නම් උපදී. එ හෙයින් වෙතසික, සිත අධිපති කොට සිටියේ ය. ගණයට අධිපතියා 'ගණසෙට්ඨ' යි ද, සෙනාවට අධිපතියා 'සෙනිසෙට්ඨ'යි ද කියන්නා සේ වෙතසිකයන්ට අධිපති වූයේ සිත ය. එ හෙයින් වෙත-සිකයෝ සිත ශ්‍රෙෂ්ඨ කොට සිටියහ යි කියත්.

මනොමයා = සිතින් කරණ ලද්දාහ.

රතින් රිදියෙන් කළ ඒ ඒ බඳු රන්බඳු-රිදීබඳු යි ගන්නා සේ වෙතසික, සිතින් ම නිපත් බැවින් 'මනොමය'යි කියනු ලැබේ.

මනසා වෙ පසන්නෙන = ඉදින් පහන් සිතින්.

සිත පහන් වන්නට නම්, එහි අලොභ – අදෙසාදී වූ කුශල වෙතසිකා යෙදිය යුතු ය. නැත, සිත පහන් නො වේ. උන් යෙදුනු විට සිත පහන් වේ. එබඳු ගුණයන්ගේ යෙදීමෙන් පහන් වූ සිතින් ය යන අර්ථ යි.

භාසති වා කරොති වා = කියා නම් හෝ කෙරේ නම් හෝ.

මෙබඳු පිරිසිදු සිතින් යමෙක් යමක් කියා ද, ඒ කියන හැම, වාක්සුචරිත ය. ඒ වාක්සුචරිතය සිවු වැදැරුම් ය. පිරිසිදු සිතින් යමෙක් යමක් කෙරේ ද, ඒ කරණ හැම, කායසුචරිත ය. ඒ තෙ වැදැරුම් ය. අලොභ-අදොසාදී වූ ගුණ යෙදුනු සිතැත්තහුට බොරු කියනු, කේලාම් කියනු, රළුබස් කියනු, නන්දොඩනු, සතුන් මරණු, සොරකම්කරණු, පරපුරුෂපරස්ත්‍රීසෙවනය කරණු බැරි ය. එහිලා සිත නතු නො වේ. ඔහු මේ හැම එකකින් ම මොනවට රැකේ. කායවාක්සුචරිතය නො කළ ද, නො කියුව ද, අලොභාදී වූ ගුණ යොගයෙන් සිත පහන් බැවින් මනස්සුචරිතය පිරේ. මනස්සුචරිතය ද තෙ වැදැරුම් ය. මෙසේ මොහුට දශකුශලකර්මපථය ම සම්පූර්ණ වන්නේ ය. මෙයින් අදහස් කරණ ලද්දේ කාමාවචර – රූපාවචර – අරූපාවචරකුසල් ය.

තතො නං සුඛං අන්වෙති = ඒ හෙතුවෙන් සැපය ඔහු අනු ව යයි.

කාමරූපාරූප යන භූමිත්‍රයට අයත් සුචරිතයන්ගේ බලයෙන් මනුෂ්‍ය-දිව්‍ය-බ්‍රහ්මලොක යන සුගතියක හෝ දුගතියෙහි සුව විඳින තැනෙක හෝ ඉපිද සිටියහු අනු ව, කායික – චෛතසික විපාක සුඛයගමන් කරන්නේ ය. කළහු පසුපස්සේ ලුහු බැඳ යන්නේ ය.

මේ කායික-චෛතසිකවිපාකසුඛය **කායවත්ථුක-ඉතරවත්ථුක-අවත්ථුක** යි තෙ පරිදි ය. 'එහි කයට සුව දෙන මොළොක් පහසක් ලැබුනු විට එහි එල්බ උපදනා කායවිඤ්ඤාණචිත්තයෙහි හා ඒ චිත්තවීථිය පිළිබඳ ජවනයන්හි ද යෙදෙන සුඛවෙදනාව කායවත්ථුක සුඛ නම්. චක්ඛු-සොත-ඝාණ-ජිහ්වා-හදය යන මොවුනට ප්‍රිය වූ රූපශබ්දාදී වූ අරමුණක් හමු වූ විට එහි එල්බ උපදනා චක්ෂුර්-ද්වාරිකචිත්තවීථීන් පිළිබඳ ජවනයන්හි යෙදෙන සුඛවෙදනාව ඉතර වත්ථුකසුඛ නම්.

චක්ඛුවත්ථු ආදී වූ සය මුළුමනින් ලැබෙනුයේ කාමභූමියෙහි ය. නරක – තිරච්ඡාන – පෙත – අසුර යන අපායභූමි සතර හා මනුස්ස – චාතුම්මහාරාජික – තාවතිංස – යාම – තුසිත – නිම්මානරති – පරනිම්මිතවසවත්ති යන සුගතිභූමීහු සත්ත් කාමභූමීහු ය. මුළුල්ල එකොළොසෙකි. කායවත්ථුක – ඉතරවත්ථුකසුඛය ලැබෙනුයේ මේ කාමභූමියෙහි ම පමණෙකි. රූපධර්ම නො අඩු ව ලැබෙන්නේ මෙහි ය. එ හෙයින් අවත්ථුකසුඛයෙක් නම් නො ලැබේ.

බ්‍රහ්මපාරිසජ්ජ – බ්‍රහ්මපුරෝහිත – මහාබ්‍රහ්ම යි ප්‍රථමධ්‍යානභූමි තුණෙක. පරිත්තාභ – අප්පමාණාභ – ආභස්සර යි දුතියධ්‍යානභූමි තුණෙක. පරිත්තසුභ – අප්පමාණසුභ – සුභකිණ්ණ යි තතියධ්‍යානභූමි තුණෙක. වෙහප්ඵල – අසඤ්ඤසත්ත – අවිහ – අතප්ප – සුදස්ස – සුදස්සී - අකනිට්ඨ යි චතුත්ථධ්‍යානභූමි සතෙකැ යි රූපාවචරභූමි සොළොසෙකි. රූපීබ්‍රහ්මයන්ට චක්ඛු – සොත – හදය යන වස්තු තුණ ලැබේ. ඝාණ – ජිව්හා – කාය යන වස්තුහු එහි නො ලැබෙති. එබැවින් රූපීබ්‍රහ්මයන්ට ලැබෙනුයේ පූර්වොක්ත වස්තුත්‍රය ඇසුරු කළ සුවය යි. ඒ සුවය භවඞ්ගික ය. හෘදයවස්තුව ඇති බැවිනි. මේ වස්තු ඔවුනට ලැබෙනුයේ ද, බුදුන් දැකුම් බණ ඇසුම් ආදිය සඳහා ය.

ආකාසානඤ්චායතන – විඤ්ඤාණඤ්චායතන – ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන සතර, අරූපභූමීහු ය.

මෙකී අරූපබ්‍රහ්මලොකවල එක ද වස්තුවෙක් නො ලැබේ. රූපවිරාගභාවනාබලයෙන් ඒ නසා හැරිය බැවිනි. හෘදයවස්තුවෙන් තොර ව ම එහි සිතේ පැවැත්ම ද වේ. මෙසේ බැවින් මොවුනට ලැබෙන ධ්‍යානසුඛය ය අවත්ථුක නම්.

ඡායා ඉව අනපායිනී = සිරුරෙන් පහ නො වන සෙවනැල්ල සේ ය.

ත්‍රිවිධ සුචරිතයෙහි නිතර යෙදී බැඳී සිටි පුද්ගලයා සුගතියෙහි හෝ දුගතියෙහි සුව විඳින්නට සුදුසු තැනෙක හෝ උපන්නේ ද, කායික-චෛතසිකවිපාකසුඛය, ඔහු පස්සේ, ඔහු අත් නො හැර යන්නේ ය. සෙවනැල්ල සේ ය යන්නේ

"නත්ථි අපායො අස්සානි අනපායිනී" යනු අනපායිනී යන්නෙහි විවෘති යි. සෙවනැල්ලට නිමිත්ත වූ වස්තු ව නිබෙනතුරු නො නැසී පවත්නීය යනු අරුත් ය. නිඛෙලය. අපායශූන්‍යය අනඤ්ඣරය.

සිරුර පිළිබඳ සෙවනැල්ල සිරුර පිළිබඳ බැවින්, යන විට යයි. සිටින විට සිටියි. හිඳින විට හිඳියි. නිදන විට නිදයි. මොළොක් බසින් කියා හෝ, රළු බසින් කියා හෝ කොයිලෙසකිනු ත් නවතාලන්නට බැරි ය. තළා පෙළා ත් නවතනු බැරි ය. එසේ බැරි, සෙවනැල්ල සිරුර පිළිබඳ බැවිනි. එ මෙන් පහන් සිතින් කළ දශකුශලකර්මයන්ගේ විපාකබලවෙගය, ඒ පින්කළහු පසුපස ඔහු අත් නො හැර යයි. එයින් ඔහු ගිය ගිය තැන උපනුපත් තැන දිගා ඇත්තේ වෙයි. පැහැපත් වෙයි. සුවපත් වෙයි. උදුරවත් වෙයි. බ්‍රහ්මත් වෙයි. විශාරද වෙයි.

"යථා හි ඡායා නාම සරීරපටිබද්ධා සරීරෙ ගච්ඡන්තෙ ගච්ඡති, තිට්ඨන්තෙ තිට්ඨති, නිසීදන්තෙ නිසීදති, න සක්කා සණ්හෙන වා ඵරුසෙන වා නිවත්තාතීති වත්වා වා පොඨෙත්වා වා නිවත්තාපෙතුං, කස්මා? සරීරපටිබද්ධත්තා. එවමෙව ඉමෙසං දසන්නං කුසලකම්මපථානං ආචිණ්ණසමාචිණ්ණමූලකං කාමාවචරාදිභෙදං කායිකචෙතසිකසුඛං ගතගතට්ඨානෙ අන පායිනී ඡායා විය හුත්වා න විජහති" යනු අටුවා.

මෙසේ වදාළ මේ ධර්මදෙශනාවගේ අවසන්හි අසූ සාර දහසක් දෙනාට ධර්මාවබොධය විය. මට්ටකුණ්ඩලී-අදින්නපුබ්බක දෙදෙනා සෝවන්පලයෙහි පිහිටියෝ ය. අදින්නපුබ්බක තෙමේ උපයා තුබූ සියලු වස්තුව බුදුසසුන් දියුණුවට යෙදී ය.

මට්ටකුණ්ඩලීවස්තුව නිමියේය.

ථුල්ලතිස්සස්ථවිරයන් වහන්සේ

1 - 3

ථුල්ලතිස්ස ස්ථවිර තෙමේ තිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේගේ නැන්දතියගේ පුත්‍රයා ය. ඔහු පැවිදි වූයේ මහලු කලැ ය. මහලු කලැ පැවිදි වී බුදුන්ට ලැබෙන සියලු ලාභසත්කාර ගෙණ ගොස් වළඳන්නේ ටික දිනකින් ම තරබාරු සිරුරු ඇත්තේ විය. හොඳට පෙණුමට පඬු පෙවූ සිවුරු පොරවා ගෙණ නිතර පන්සල මැද පිහිටි උපස්ථානශාලායෙහි හිඳි යි. බුදුන් දකිනු පිණිස පැමිණි ආගන්තුකභික්ෂූන් වහන්සේලා හොඳට පඬු පෙවූ සිවුරු පොරොවා ගෙණ තරබාරු සිරුරු ඇති ව උපස්ථානශාලා යෙහි හුන් ථුල්ලතිස්ස තෙරුන් දැක "මේ එක් මහාස්ථවිර නමක් වනැ" යි සිතා ලඟට ගොස් වත් විචාරති. අත්පා මිරිකන්නට අසති. මේ සියල්ලෙහිදී ම ඔහු නිහඬ වෙයි. කිසිත් නො බෙණෙයි. දිනක් එක් තරුණ භික්ෂු නමක් ඔහු ලඟට ගොස් "ඔබ වහන්සේ කෙතෙක් වස් ඇත්තහු දැ?"යි ඇසී ය. "මට ඇති වසෙක් නැත, මම මහණ වූයේ නාකිවෙලා ය" යි කී විට, ඒ ගැටවර භික්ෂු නම "ඕයි! හැඩි දැඩි මහල්ල! ඔබ ඔබගේ තරම නො දන්නෙහි, මෙතෙක් මහතෙරුන් දැක ත් කිසි ත් සැලකිල්ලක් නො දක්වහි, වත් අසන විට නිහඬ වෙහි, තට කිසි ත් ගැණ කුකුස් පමණකු ත් නැත, මයින් ලෙයින් වැඩුනු ගොනෙකු සේ ය ඔබැ"යි අසුරක් ගැසී ය. එවිට ස්ථවිර තෙමේ රාජාභිමානය උපදවා "තෙපි කා බලා ආවහු දැ"යි විචාරා "බුදුරජුන් බලා ය"යි කී කල්හි "මේ කවරෙක් දැ යි මා ගැණ සිතුවහු ද? තොපගේ මුල ම කපා හරිමි" යි නො සතුටු සිතින් බුදුරජුන් වෙත ගියේ ය.

බුදුරජානන් වහන්සේ "මොක ද තිස්ස! නුඹ නො සතුටු සිතින් මෙහි ආයෙහි?"යි විචාළ සේක. භික්ෂූන් වහන්සේලා ද "මෙ තෙමේ බුදුරජුන් වෙත ගොස් යම්කිසි කලබලයක් කරන්නේ ය"යි සිතා ඔහු හා කැටි ව ම ගොස් බුදුරජුන් වැඳ පැත්තකට වී හුන්හ. බුදුරජුන් විසින් "මෙහි පැමිණියෙහි කුමක් නිසා දැ?"යි ඇසූ ස්ථවිර තෙමේ "ස්වාමීනි! මේ උන්නාන්සේලා මට ආක්‍රොශ කළහ"යි කීයේ ය. එවිට බුදුරජානන් වහන්සේ "තිස්ස! කො තැනෙක හුන්නෙහි දැ?"යි විචාළ සේක. "ස්වාමීනි! මම පන්සල මැද උවටැන් හලෙහි හුන්නෙමි"යි කී ය. "තා මේ නමලාගේ පැමිණීම දක්නා ලද දැ?"යි ඇසූ විට "එසේය, දක්නාලදැ"යි කීයේ ය. "එසේ නම් කෙළෙහි කුමක් ද? උන් තැනින් නැගිට ඉදිරියට ගොස් පා සිවුරු ගත්තෙහි ද? වත් විචාළෙහි ද? පා ඥෙනා පැන් ඈ තැබූයෙහි ද,

අසුන් පැණවූයෙහි ද? වඩා හිඳුවා පා මැඩීම් කෙළෙහි ද? පවන් සැලූයෙහි දැ?" යි ඇසූ විට හේ "කිසිවක් නො කෙළෙමි"යි කී ය. "නිසස! වැඩි මහල් භික්ෂූන් පිළිබඳ මේ සියල්ල කියින් නො අඩු කොට තා විසින් කළයුතු ව තුබුනේ ය, එහෙත් මේ කිසිවක් තා විසින් නො කරණ ලද ය, තා වැන්නකු පන්සල මැද නො හිඳිය යුතු ය, වරද තා අතේ ම ය, මේ උන්නාන්සේලා කමා කර ගණුව"යි වදාළ විට, "සවාමීනි! ඒ මට නො කළ හැකි ය, මේ උන්නාන්සේලා මට බැන්නෝ ය, මම ඔවුනට ඔත් රිදෙන කිසිවක් නො කෙළෙමි, නො කීමි, වරදකාරයෝ මොවුහු ම ය, එ හෙයින් මොවුන් කමා කර ගත්නැ යි කීමෙහි තේරුමක් නැත, ඒ මට නො කළ හැකි ය"යි කී ය. "නිසස! එසේ කරන්නට එපා, වරද තා අතේ ම ය, කමා කරන්නැ"යි වදාළ විට ද "කොතෙක් වදාළේ ද, මට නම් ඒ කරණු නො හැකි ය"යි නිසස තෙමේ කියා සිටියේ ය. එහි සිටි භික්ෂූන් වහන්සේලා "සවාමීනි! මොහු නො භික්මුනු එකෙක, බුදුරජුන්ගේ ඉදිරියෙහි මෙ තරම් ගැඹිදැඩි කම් දක්වන මොහු කෙබන්දෙක් දැ"යි කී කල්හි සම්මා සම්බුදුරජාණන් වහන්සේ "මහණෙනි! මොහු දැන් පමණක් ම නො භික්මුනෙක් නො වේ, පෙර ත් නො භික්මුනෙකැ"යි වදාරා භික්ෂූන්ගේ ඉල්ලීම පරිදි චුල්ලනිසසයන්ගේ යටගියාව මෙසේ වදාළ සේක.

"යට ගිය දවස බරණැස්නුවර බරණැස් රජුන් රජය කරණ කල්හි දෙවල් නම් තවුසෙක් එහි විසී ය, හෙ තෙමේ තපස් කරමින් අට මසක් හිමාලයවනයෙහි වාසය කොට ලුනු ඇඹුල් මුසු අහර ගන්නට සාර මසක් නුවර වසමි'යි හිමාලයයෙන් නික්ම ආයේ; නුවරදොර සිටි ලමයින් කිපදෙනකු දැක 'මේ නුවරට එන තවුසෝ කොතැනෙක වසත් දැ'යි ඇසී ය, 'සවාමීනි! වලන් කළගෙඩි තනන්නන්ගේ කුඹල්හලෙක් මෙහි තිබේ, නුවර බලා එන බොහෝ තවුස් කෙනෙක් වසන්නෝ එහි ය'යි ලමයින් කී විට තවුස් තෙමේ කුඹල්හල්ට ගොස් දොර කඩ සිට 'පින්වත! මම ආගනතුක යෙක්මි, ආයේ හිමාලයවනයේ සිට ය, තට කරදරයෙක් නො වේ නම්, මට එක් රැයක් මෙහි නවාතැන් දෙන්නැ'යි කුඹල්කරු ගෙන් ඉල්ලී ය, 'සවාමීනි! කුඹල්හලෙහි මට රැ වැඩෙක් නැත, කුඹල්හල ත් ලොකු ය, ඉඩකඩ තිබේ, කැමැති ලෙසට සුවසේ වසනු මැනැවැ'යි ඔහු වලත්හල තවුසාට හාර කෙළේ ය, ඔහු එහි සුවසේ වෙසෙයි, මේ අතර නාරද නම් අන් තවුසෙක් ද හිමාලයයෙන් අවුත් කුඹල්හලෙහි වසන්නට කුඹල්කරුගෙන් අවසර ඉල්ලී ය,

'සවාමිනි! දැන් එහි තවුසෙක් වෙසේ, මම ඔහුට කුඹල්හල භාර දුනිමි, ඔහු ඔබවහන්සේ හා එකට වසන්නට කැමැති නම්, මගෙන් වරදෙක් නැතැ'යි කීයේ ය, එවිට නාරද තවුසා කුඹල් හලට ගොස් දෙවල තවුසා හමු ව 'ඇදුර! ඔබට කරදරයෙක් නො වේ නම්, මටත් එක් රැයක් මෙහි වසන්නට ඉඩ දෙනු මැනැවැ'යි ඉල්ලී ය, 'හොඳයි, වරදෙක් නැත, ගේ ඉඩ කඩ තිබේ, කැමැති හැටියකට පසෙක ඉන්නැ' යි දෙවලයා කී ය, අනතුරු ව ඔහු එක්පසෙක නවාතැන් ගත්තේ ය, රෑ බෝ වූ කල්හි දෙ දෙනා ම නිත්දට ගියහ, නාරදයා නිත්දට යද්දී දෙවලයා නිදන තැනත් දෙරකඩත් සලකා බලා සිත තබා ගෙණ නිදි ගත්තේ ය, දෙවලයා, නාරදයා නිත්දට ගිය කල්හි වෙනදා නිදන තැන නො නිදා දෙරමැද හරහට නිදා ගත්තේ ය, නාරද මහරු හදිසියෙන් නිත්දෙන් නැගිට පිටතට යන විට දෙරමැද නිදා හුන් දෙවලයාගේ ජටාව ඔහුට පැහුනේ ය, එවිට දෙවලයා 'මාගේ ජටාව පැහුයේ කවරෙක් දැ" යි මහහඬින් කෑගැසී ය, 'ගුරුදෙවය! මමැ' යි නාරද බැගැහඬින් කී ය, 'හොර තවුස! තෝ වනයෙහි සිට මෙහි ආයෙහි, මාගේ ජටාව පා ගන්නට දැ' යි දෙවලයා කොපයෙන් ඇසූ විට 'ආචාර්‍යය! ඔබතුමන් මෙහි නිදනු මම නො දනිමි, එහෙත් මා අතින් සිදු වූ මේ වරදට මට කමා වන්නැ' යි කියා, දෙවලයා කෑ ගසද්දීම නාරද තෙමේ පිටතට බැස්සේ ය, ඒ අතර දෙවල තෙමේ 'මේ මිනිහා පිටතට යද්දී මා ගැණ නො සලකා මා පාගා ගෙණ ගියේ ය, දැන් පෙරළා එන විට ත් මා පා ගත්තේ ය' යි සිතා කලින් පා තුබූ තැන හිස ත්, හිස තුබූ තැන පා ත් තබා නිදි ගත්තේ ය, නාරදයා ද 'මා එලියට එද්දී නො දැනීමෙන් ගුරුන්ගේ ජටාව මට පැහුනේ ය, ඒ නිසා දැන් මෙ වර පා තිබෙන පැත්තෙන් යමි' යි සිතා ගෙට ඇතුල් වන නාරදයාට එ වර දෙවලයාගේ බෙල්ල පැහුනේ ය, එයින් පළමුවරට ද වඩා හැඬි දැඩි වූ දෙවල තෙමේ 'මාගේ බෙල්ල පැහුයේ කවරෙක් දැ' යි අසා 'මමැ' යි නාරදයා කී කල්හි 'තෝ මහයකෙක්, මුල්වර මාගේ ජටාව පාගා දැන් නැවැත බෙල්ල පැහුවෙහි ය! තට ශාප කරමි' යි ගුගුලේ ය, නාරද තෙමේ 'වහන්ස! මා අත වරදෙක් නැත, ඔබ වහන්සේ මෙසේ නිදන බව මම නො දනිමි, මේ ඇත්ත ය, පළමු නිදා ගත් ලෙසට නිදා ගණු ඇතැ යි මම සිතීමි, එ හෙයින් ය මම මේ පැත්තෙන් ගෙට ඇතුල් වූයේ, කෙසේ වුවත් මෙයට මට කමන්නැ' යි කී ය. 'හොර තවුස! තට මගෙන් කමාවක් නැත, දෙ වරක් ම තෝ මා පැහුවෙහි ය, තට ශාප කරමි" යි කියා,

"සහස්රැස් සියතෙද – හැම ඇඳුරු දුරු කරණා,
හිරුදෙවි උදාවත් තා – පැළේ හිස සත් කඩකට'

යි මෙසේ ශාප කෙළේ ය, එවිට නාරද තෙමේ 'ඇඳුර! ඔබ මා අත වරදෙක් නැතැ යි කියද්දී ත් මා හිස සත් කඩකට පැළේවා යි ශාප කරන්නෙහි ය, දැන් මම, වරද යමකු අතැ වේ නම්, ඔහුගේ හිස පැළේවා යි ශාප කරමි" යි.

"සහස්රැස් සියතෙද – අඳුරු දුරු කරණා හිරු,
උදාවත් වරදැතියකු – පැළේ හිස සත් කඩකට"

යි ශාප කෙළේ ය,

නාරද තවුස් මහත් අනුභාව ඇත්තෙක, ඉකුත් කාලයෙන් සතළිස් කපෙක, ඉදිරියෙන් සතළිස් කපකැ යි අසූ කපක් සිහි කිරීමෙහි පොහොසත් ය, එ හෙයින් දැන් 'කවරකු හිසට ශාපය හෙන්නේ දැ' යි බලන්නේ, ගුරුන්ගේ හිස උඩ ශාපය වැටෙන බව දැක ඔහු කෙරෙහි හට ගත් අනුකම්පායෙන් තම සෘඩිබලයෙන් අරුණ නැගීම වළකාලී ය, නුවරවැස්සෝ එක් ව රජගෙට ගොස් 'දෙවයන් වහන්ස! අරුණ නො නගින බව පෙණේ, එය ඔබ වහන්සේගේ රජයෙහි වරදෙක් ද? කියනු මැනැව, අපට කිසි වැඩක් කර කියා ගන්නට නො හැකි ය, නො පමාව අරුණ නා වන්නැ' යි අරගල කළහ, එවිට රජ තෙමේ තමන් අතින් දැන හෝ නො දැන යම් වරදෙක් සිදු වී තිබේ දැ යි සලකන්නේ, කිසිදු වරදක් තමන් අතින් නො සිදු වූ බව දැන, මෙබඳු දේ පැවිද්දන්ගේ අරගලවලිනු ත් වන්නට හැකි ය, යි සිතා 'මෙ දවසැ මෙ නුවරැ පැවිද්දෝ ත් ඇද්දැ' යි සොයා බැලී ය, නුවරවැස්සෝ 'පින්වත් දෙවයෙනි! ඊයේ සවස් වේලෙහි ආ පැවිද්දෝ දෙදෙනෙක් කුඹල් හලෙහි වෙසෙති' යි කීහ, රජ තෙමේ ඒ වේලෙහි ම හුලුඅතු පන්දම් විලක්කු දල්වා ගෙණ එහි ගොස් නාරද තවුසා වැඳ එකත් පසෙක හිඳ,

"නාරදතුමනි! මේ – දඹදිවැ කිසිත් කමතක්,
නො පවති කවර කරුණෙන්–ලොව අඳුරුදැ යි කිය! මට"

යි ඉල්ලා සිටියේ ය, නාරද තවුස් එහි වූ අරගලයේ සියලු විස්තරය රජුට කියා 'දෙවල මේ කාරණයෙන් මට ශාප කෙළේ ය, එවිට මම, මා අත වරදෙක් නැත, වරද ඇත්තහු හිස පිට ශාපය වැටේවා' යි ශාප කෙළෙමි, එසේ ශාප කොට පසුව ශාපය කා ඔලුවට එන්නේ දැ යි බැලීමි, අපැදුරු දෙවලයා හිස පිට, ඒ කඩා වැටෙන බව දැක, ඔහු කෙරෙහි කරුණායෙන්, අරුණ නගින්නට නො දෙමි" යි කී ය, 'ස්වාමීනි! ශාපයෙන් මොහුට අන්තරායයෙක් නො වන්නේ කෙසේ දැ" යි රජු ඇසී ය, 'දෙවලයා මා කමා කරව තොත්, අන්තරායයෙක් නො වේ' යි ඔහු කී ය, රජ තෙමේ

දෙවලයා වෙතට ගොස් 'සවාමීන් වහන්ස! ඔබ වහන්සේලාගේ අරගලයෙන් අපගේ රට වැසියා පෙළෙයි, රජේ කිසිත් වැඩෙක් නැත, රෑ දුවල් නො දුන මිනිසුනට කෙසේ වැඩ කළ හැකි ද' එම නිසා අපගේ රටවැස්සා කෙරෙහි කරුණායෙන් යෙදී නාරද සවාමීන් කමා කර ගන්නැ' යි කියේ ය, එවිට දෙවල තවුස් තෙමේ 'මහරජතුමනි! නාරදයා මාගේ ජටාවත් බෙල්ල ත් පාගා මේ අරගලය ඇති කෙළේ ය, මා අතින් සිදු වූ කිසිත් වරදෙක් නැත, එසේ තිබියදී ත් මම මොහු කෙසේ කමා කරවා ගණිම් ද, ඒ මට නො කළැකි' යි කී ය, රජ තෙමේ 'සවාමීනි! කරුණා කරන්න. තරහ අවසර ලැබීම නො සුදුසු ය, රටවැසියා ගැණ කරුණායෙන් සිතා, නාරද සවාමීන් කමා කරවා ගන්නැ' යි නැවැත ත් ඉල්ලී ය, දෙවල තෙමේ නො කැමැති විය, 'නාරද සවාමීන් කමා කරවා නො ගන්නහු නම්; ඔබ වහන්සේගේ හිස සත්කඩට පැළී යන්නේ ය' යි කියද්දී ද, දෙවල තෙමේ නාරදයන් කමා නො කරවී ය, එවිට රජ තෙමේ වහා සිය පිරිස ලවා දෙවල තවුසා අතින් පයින් බෙල්ලෙන් අල්ලවා නාරද තාපසයාගේ පාමුල නතු කරවී ය, එවිට නාරද තෙමේ 'ඇදුරු! නැගී සිටිනු මැනැව, මම ඔබ වහන්සේට කමා කරමි' යි කී ය, නැවැත නාරද තෙමේ 'මහරජ! මේ තෙමේ සිතේ කැමැත්තෙන් මා කමා නො කරවයි, මෙය මොහුගේ ගැලවීමට කරුණු නො වන්නේ ය, මේ නුවර අසල පිහිටා ඇති විලට මොහු ගෙණ ගොස් හිසේ මැටි පිඬක් තබා බෙල්ල තෙක් දියට බස්වා සිටවනු මැනැවැ' යි කියේ ය, රජ තෙමේ දෙවලයා අල්ලා ගෙණ ගොස් එසේ කෙළේ ය, නාරද තෙමේ දෙවලයාට 'ඇදුරුතුමනි! මා සෘඩිය හළ කල්හි හිරුරැස් නැගී එයි, එවිට ඔබවහන්සේ දියෙහි ගිලී පීනා ගොස් අන් තැනෙකින් මතු වන්නැ' යි දන්වී ය, නාරද සෘඩිය හළේ ය, ඒ හාම හිරු රැස් නැංගේ ය, මැටි පිඬ සත්කඩට පැළී ගියේ ය, දෙවලයා දියෙහි ගිලී පිනා ගොස් අන් තැනකින් මතු වී ය" යි මේ පුවත මෙසේ ගෙණ හැර දැක් වූ බුදුරජානන් වහන්සේ "මහණෙනි! මේ ආනන්ද ඒ කාලයෙහි රජ ව සිටි ය, දෙවලයා මේ ථුල්ලතිස්ස තෙමේ ය, නාරද වූයේ මමැ යි, මොහු එදු ත් හැඬිදුඬි ය, නො කීකරු ය, කියන දේ ඒ හැටියට කරන්නෙක් නො වී ය" යි වදාරා ථුල්ලතිස්ස තෙරුන් අමතා "අසුවලා මට බැන්නේ ය, අසුවලා මට ගැසුවේ ය, අසුවලා මා පැරද වී ය. අසුවලා බඩු පැහැර ගත්තේ ය, යි සිතන්-නහුගේ වෛරය නො සංසිඳෙ යි, මෙසේ සිතා වෛර නො බඳින්නහුගේ ම වෛරය සංසිඳේ ය" යි වදළ සේක. වදලෝ මෙසේ ය:-

අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං උපනයහන්ති වෙරං තෙසං න සම්මති.
අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං න උපනයහන්ති වෙරං තෙසූපසම්මති'ති.

මට බැන්නේ ය, මට ගැසුයේ ය, මා දිනා ගත්තේ ය, මාගේ වසතුව පැහැර ගත්තේ ය' යි යම් ගිහි-පැවිදි කොනෙක් (බැණුම්, ගැසුම්, දිනුම්, පැහැර ගැණුම් ආදිය නිසා උපත්) ඒ වෛරය නැවැත නැවැත සිතෙහි බඳින් ද, ඔවුන්ගේ වෛරය නො සංසිඳේ.

මට බැන්නේ ය, මට ගැසුයේ ය, මා දිනා ගත්තේ ය, මාගේ වසතුව පැහැර ගත්තේ ය, යි යම් ගිහි-පැවිදි කොනෙක් (බැණුම්, ගැසුම්, දිනුම්, පැහැර ගැණුම් ආදිය නිසා උපත්) ඒ වෛරය නැවැත නැවැත සිතෙහි නො බඳින් ද, ඔවුන්ගේ වෛරය සංසිඳේ.

අක්කොච්ඡි මං – (අසුවලා) මට බැන්නේ ය.

"තෝ සොරෙක් වෙහි, බාලයෙක් වෙහි, මූඪයෙක් වෙහි, ඔටුවෙක් වෙහි, ගොණෙක් වෙහි, කොටළුවෙක් වෙහි, නිරිසතෙක් වෙහි, නිරිසනෙක් වෙහි, තට සුගතියක් නැත, දුගතිය ම කැමැති විය යුතු ය" යන මෙබඳු වූ ආක්‍රොශවසතුවකින් හෝ එහි ම ගැනෙණ "හීනයෙක් වෙහි, පහත් කුලයෙක ඉපදුනෙහි, තාගේ කුලය ලොකසම්මත නො වේ, තාගේ පියා සතුන්මැරීම් ආදි පවිකම් කරන්නෙක, මවත් එබඳු ම ය" යනාදි ලෙසකින් හෝ, අසුවලා මට බැන්නේ ය, යි බණ දහම් නො දත්තේ සිතයි. ඒ සිතීමය මෙයින් වදුලේ.

අවධි මං = (අසුවලා) මට ගැසුයේ ය.

යමෙක් යමක්හට අතින් පයින් දඬුයෙන් මුගුරෙන් පහර දේ ද, ඒ පහර කෑ නැනැත්තේ නුගත් වූයේ, අසුවලා මට පහර දුනා, යි සිතයි.

අජිනි මං = (අසුවලා) මා දිනා ගත්තේ ය.

බොරු සාක්ෂ්‍යකිම්, කියවිම්, වාදකිරීම් ඇ යමකින් (අසුවලා) මා පැරද වී ය යි සිතයි.

අහාසි මෙ = (අසුවලා) මාගේ වසතුව පැහැර ගත්තේ ය.

යමෙක් යමක්හට අයත් මුතු – මැණික් – රෙදිපිළි – අබරණ – ඉඩකඩම – ගේ දොර – හරකබාන ඇ යමක් පැහැර ගත්තේ නම් ඒ ගිමියා, අසුවලා මා සතු මුතු – මැණික් – මිල – මුදල් ඇ වසතුව පැහැර ගත්තේ ය, යි සිතයි.

යෙ තං උපනයහන්ති = යම් කෙනෙක් ඒ ක්‍රොධය නැවැත නැවැත සිතෙහි බඳිත් ද.

යමකු යමක්හට මේ කියූ ලෙසකින් නපුරක් අවැඩක් කළ විට, ඒ ගැණ ම සිතමින් කියමින් කල් යැවීම, එයට යටත් වූ බණ දහම් නො දත් බොහෝ දෙනකුන්ගේ සිරිත ය. එයට හෙතුව වතුයේ බණ දහමින් පැසුනු නුවණ නැතිබව ය. එසේ සිතීමෙන් කිමෙන් වන්නේ, මූලින් උපන් වෛරය, තව තව ත් යිය සිතෙහි තද බදවීම ය. නැගී යෑම ය. විකකින් සංසිඳ වන්නට නො හැකි කැනට වෛරය තදබදවීම ය. අනුන් කළ නපුර නිසා, සිතෙහි උපන් වෛරය ගැණ පුන පුනා සිතීමෙන් සිතෙහි බැඳීම, කුණු මස් ආදී වූ යමක් තණපත් ආදී වූ යමකින් වෙළා බැද තැබීමක් වැනි ය. කුණුමස් එසේ බැඳ තැබීමෙන් එහි දුගඳ තව තවත් දියුණු වනු මිස, වැඩිවනු මිස දුරුවීමෙක් නො වේ. එ මෙන් යන්තමකින් උපන් වෛරය, 'අසුවලා මට බැන්නේ ය' යනාදි ලෙසින් නිතර සිහි කිරීමෙන් තදබද ව යන්නේ ය. බුරුල් වීමෙක්, දුරුවීමෙක් නො වේ.

මෙහි වූ **යෙ'** යන්න දෙව්-මිනිස්-ගිහි-පැවිදි කෘ උදෙසා ත් ය යෙදුනේ. **තෙසං'** යන්න බලමින් සිටිදි මෙහි.

උපනයහන්ති' යනු ක්‍රියාපදයි. එහි මූල සිටි **උප'** යන්න **"උපාදානං, උපායාසො"** යනාදී තන්හි මෙන් තදබද යන අරුත්හි ආයේ ය. මේහිලා වැඩිකතාවක් ඉදිරියෙහි එන්නී ය.

වෙරං තෙසං න සම්මති = ඔවුන්ගේ වෛරය නො සංසිඳේ.

සිත විරූපබවට පත් කරණුයේ වෛරය යි. **"විරූපෙන අරති ගච්ඡතීති = වෙරං"** යන අර්ථසමර්ථනයෙන් ඒ පැහැදිලි ය. ඇස් කන් නාස් ආදී වූ සවැදෑරුම් දෙරටු අතුරෙහි යම් කියි දෙරටුව කට සිත් නො ගන්නා යම්කියි රූප ශබ්දාදි වූ අරමුණක් හමු වූ විට සිතෙහි හටගන්නා වෙනස් බව, රළුබව, අරමුණ හා සිතෙහි ගැටීම වෛරය යි. මෙය ඉපැදෙනුයේ අරමුණ, සිත හා එකට ගැටීමෙනි. වෛරය මුල් කොට සිත් දෙකක් උපදී. එ දෙක දෙලොස් වැදෑරුම් අකුසල්සිත්වලට ඇතුළත් ය.

මෙහි ඉපැත්මට, කරුණු දසයෙක් හෙතු වේ. මේය ඒ. "අසුවලා මට පෙර නපුරක් කෙළේ ය, දැනු ත් එසේ ම කරයි. මතු ත් එසේ ම කරන්නේ ය, මාගේ ඥාතිවතාට පෙර නපුරක් කෙළේ ය, දැනු ත් එසේ ම කරයි, මතු වත් එසේ ම කරන්නේ ය, මාගේ සතුරාට පෙර වැඩ සිදු කෙළේ ය, දැනු ත් එසේ ම කරයි, මතු ත් කරන්නේ ය, යන මේ නව ආකාරය හා අත් පා ආදිය

ගසක මූලක හැපීම-හිරුරස් ඇති නැතිවීම-වැසි ඇති නැතිවීම යනාදී වූ කරුණු ය. මෙහි මුලින් කියූ නවවිධ ආඝාතවස්තුවට මේ අස්ථානක්‍රොධහෙතුව එක් කොට ගතයුතු යි. එවිට ය දසවැදැරුම් වනුයේ. පාළිය මෙසේ ය:- **"අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතො ජායති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරීති ආඝාතො ජායති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං චරීති ආඝාතො ජායති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං චරිස්සතීති ආඝාතො ජායති, අට්ඨානෙ වා පන ආඝාතො ජායතීති"**

"අනත්ථං මෙ අචරීති" යනාදී විසින් වදාළ ක්‍රොධවස්තුහු අනිෂ්ටස්තු විසින් දක්වන ලදහ එසේ ම ඉෂ්ටවස්තුන් නිසාත් ක්‍රොධය උපදනේ ය. බණපොතෙහි ඒ ආයේ මෙසේ යැ:- **"ඉට්ඨං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි කොධො ජායති, අච්ඡින්දනෙතපි කොධො ජායති, අච්ඡිනෙතපි කොධො ජායති, ඉට්ඨං වත්ථුං විපරිණාමසඞ්කිනොපි කොධො ජායති' විපරිණමනෙතපි කොධො ජායති, විපරිණතෙපි කොධො ජායති"** යි.

තමා කැමැති වස්තුව පැහැර ගණිති යි සැක ඇත්තහුට ක්‍රොධය උපදී. තමා කැමැති වස්තුව පැහැර ගත්නා කල්හි ක්‍රොධය උපදී. තමා කැමැති වස්තුව පැහැර ගත් කල්හි ක්‍රොධය උපදී. තමා කැමැති වස්තුව වෙනස් වෙති යි සැක ඇත්තහුට ක්‍රොධය උපදී. තමා කැමැති වස්තුව වෙනස් වන කල්හි ක්‍රොධය උපදී. තමා කැමැති වස්තුව වෙනස් වූ කල්හි ක්‍රොධය උපදී, යනු එහි අරුත් ය.

විරොධ, විදෙදස, දොස, පටිඝ කොධ, ආඝාත, කොප, රොස, ව්‍යාපාද, අනභිරධි, යන නම් ද මෙයට පර්‍යාය වේ. මේ සියල්ලෙන් කිය වෙනුයේ සිතෙහි ඇතිවන රළුගති ය යි. එය සමහර විටෙක අනිටු අරමුණු ලැබීමෙන් සිත හැඩ ගැසෙන සැටි මේ නම්වලින් දක්වන ලද්දේ ය.

වෛරය, සත්වසන්තානය කෙලෙසන බැවින් කෙලශ යි ද, අර්ථනමාර්ගඥානාදිය අවුරණ බැවින් නීවරණ යි ද, වර්තමාන ආත්ම භාවය, අනාගත ආත්ම භාවය හා ද, නාමධර්ම, රූපධර්ම හා ද එකට ගැටගසන බැවින් ග්‍රන්ථ යි ද, අරමුණක් ලැබුනු විට ඉපැදෙන බැවින් අනුශය යි ද, සසර දුකින් නිදහස්ව යා නො දී සත්වයා සසර බැඳ තබන බැවින් සංයොජන යි ද, සත්වශරීරය දවන බැවින් වහනි යි ද වදාරණ ලද්දේ ය. මෙහි සමූලඝාතනය අනාගාමී මාර්ගයෙන් සිදු වන්නේ ය.

මෙහි වූ **තෙසං'** යන්නෙන් කියැවෙන්නෝ නම්, "අසුවලා මට බැන්නේ ය, ගැසූයේ ය" යනාදීන් අනුන් කළ නපුර නිතර සිහි කරමින් සිතෙහි උපන් ක්‍රොධය තදබද කරන්නෝ ය. වඩ වඩා ත් දියුණු කරන්නෝ ය.

න' යනු ප්‍රතිෂෙධයෙහි ය. **සම්මති'** යනු ක්‍රියාපද යි. එය න' යන නිපාතය හා එක් වූයේ 'නො සංසිඳේ' යන සිංහල අරුත දෙයි.

අනෙකකු තමහට කළ නපුර නිතර නිතර සිහිකිරීම, එයින් උපන් වෛරය, බඩවෛරයක් වන්නට කරුණු ය යි මෙයින් වදාළ සේක.

අක්කොච්ඡි මං = අසුවලා මට බැන්නේ ය.

අවධි මං = අසුවලා මට ගැසූයේ ය.

අජිනි මං = අසුවලා මා දිනා ගත්තේ ය.

අහාසි මෙ = අසුවලා මාගේ වස්තුව පැහැර ගත්තේ ය

යෙ තං න උපනයහන්ති = යම් කෙනෙක් ඒ උපන් වෛරය (සිතෙහි) නො බඳිත් ද.

වෙරං තෙසං උපසම්මති = ඔවුන්ගේ වෛරය සංසිඳේ.

අනුන් කළ අපරාධයන්, අනර්ථයන් සිහි නො කරණ සිත්හි නගා නො ගන්නා වූ ගිහි-පැවිද්දන්ගේ ඒ අපරාධයන් අනර්ථ යන් නිසා සිය සිත්හි උපන් වෛරය සංසිඳී යයි. "පෙර ඒ ඒ ජාතිවලදී තා විසිනු දු නිදොස් වූ වරදක් අපරාධයක් නො කළ කිසිවක්හට ඇණුම් බැණුම් කරණලද්දේ ය, පහර දෙන්නට ද ඇත. බොරු සාක්ෂ්‍ය කීමෙන් කිසිවකු පරදවන්නට ද ඇත, අනුන් අයත් යම් යම් දේ පැහැර ගන්නට ද ඇත, ඒ නිසාය නිදොස් ව හිඳත් උනුන්ගේ ඇණුම්, බැණුම්, ගැසුම්වලට තැන් වූ යෙහි" යි මෙසේ පූර්වකර්මය සැලකීමෙන් ද, උපන් ඒ වෛරය දර නැති ගින්න නිවී යන්නා සේ සංසිඳී යයි. **"අසති අමනසි කාරෙන වා කම්මපච්චවෙක්ඛණවසෙන වා යෙ තං අක්කොසාදිවත්ථුකං කොධං තයා පි කොචි නිද්දොසො පුරිමභවෙ අකකුට්ඨො භවිස්සති, පහටො භවිස්සති, කුටසක්ඛිං ඔතාරෙත්වා ජිතො භවිස්සති, කස්ස වි පසයහ කිඤ්චි අවජිනනං භවිස්සති, තස්මා නිද්දොසො හුත්වාපි අක්කොසාදීනි පාපුණාසීති එවං න උපනයහන්ති, තෙසු පමාදෙන උපනනම්පි වෙරං ඉමිනා අනුපනයහනෙන නිරින්ධනො විය ජාතවෙදො උපසම්මති"** යනු අටුවා ය.

අනෙකකු කළ අපරාධ, අනර්ථ ගැණ නැවැත නැවැත ත් නො සිතා හැරීම හා පෙර තමන් කළ කර්ම ගැණ සිහි කිරීම උපන් වෛරය සංසිඳීමට කරුණු වන බව මෙයින් වදාළ සේක.

මේ ධර්මදෙශනාව කෙළවර ලක්ෂයක් භික්ෂූහු සෝවන් පලාදි යට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය. හැඩිදැඩි ව සිටි ථුල්ලතිස්සස්ථවිර තෙමේ ද මේ බණකතාව අසා කීකරු වූයේ ය.

ථුල්ලතිස්සස්ථවිරවස්තුව නිමියේ ය.

කාලියකින්න

1 – 4

යටගිය දවස දැහැමින් සෙමින් වැඩුනු ඉතා හොඳ කෙළෙඹි පුත්‍රයෙක් වූයේ ය. ඔහු පියා මළ පසු, ගෙදරදොරේ කටයුතු ත්. වතු පිටි කුඹුරුවල කටයුතු ත් නො පිරිහෙළා කරමින්, මෑනියන්දැ ද මැනැවින් රැක බලා ගත්තේ ය. මවු තොමෝ තම පුතු විඳින්නා වූ දැඩි වෙහෙස දැක ඉවසා ගත නො හී දිනෙක පුතුට අඬගා "පුතා! උඹට සැහෙන තැනකින් අඹුවක ගෙණෙන්ට ඕනෑ ය"යි කිවු ය. එවිට ඔහු "අම්මා! මට ඔය කසාදබැඳුම් කියන්නට එපා, මා ඕවාට කැමැති නෑ, මට වුවමනා මා මැරෙණතුරු අම්මාට දුක් නො දී හොඳින් සැලකීම පමණැ"යි කීවිට, මෑනියෝ "පුතේ! එහෙ ම කියා බැරි ය, ගේ දොර වතුපිටි කුඹුරුවල වැඩ ගැණ උඹ විඳින්නා වූ වෙහෙස පෙණෙන විට මා සිත වෑවෙන්නේ නෑ, මා හිතට සැප යෙක් නෑ, සැනසීමෙක් නෑ, කො තරම් හොඳට කෑව ද, හිතට සැනසීමෙක් නැති නම්, ඒ කෑම්බීම්වලින් ඇති වැඩේ මොක ද; එයින් වැඩෙක් නැත, උඹ කොහො ම කීවත් එය කෙරෙන්නට ම ඕනෑ ය'යි කීපවරක් ම ලඟට ගෙන්වා කිහ. ඒ හැම වර ම ඔහු එයට කැමැති නො වී ය. එහෙත් ඔහු අන්තිමේ දී "මෙය මා මග හැරියොත් නාවා කවා පොවා කිරි දී වැඩූ මෑනියන්ගේ සිත රිදේ ය" යන බියෙන් "මෑනියන් කැමැත්තක් කරන්නැ"යි නිහඬ විය. පුතුට සැහෙන අඹුවක සොයන්නට සිතා, ගෙන් නික්මුනු මෑනියන් දුටු ඔහු "අම්මේ! මේ කොතැන යෙහි දැ?"යි ඇසී ය. "පුතා! මම අර පෙණෙන ගෙදරට යමි"යි මෑනියන් කීවිට ඒ ගෙට යෑම වළකා තමන් සිත් ගත් තරුණියක වසනා ගෙයක් පෙන්වා, එහි ගොස් කතා කර බලන්නැ' යි කී ය. මවු තොමෝ ද පුතා කී ගෙට ගොස් සැප දුක් විචාරා සතුටු ව තමන් පැමිණි කාරණය ඔවුනට දැන් වූ ය. ඔවුහු එයට සතුටු වූහ. අනතුරු ව එහිදී ම ඔවුන් හා කතා කොට මගුල සිදු කරණ දිනය ත් නැකතත් නියම කොට ගෙදර පැමිණි ඕ තොමෝ මගුලට වුවමනා හැම දෙයක් ම වහ වහා කඩී මුඩියේ පිළියෙල කළා ය. නැවැත නියම දිනයෙහි මනාලියගේ ගෙට ගොස් මනාලිය කැඳවා ගෙණ අවුත් සිරිත් සේ ඇය පුතුට පාවා දුන්නා ය.

එ තැන් සිට ඔවුහු දෙ දෙනා නියම අඹු සැමියන් සේ උනුන් කෙරෙහි මහත් ප්‍රේමයෙන් කල් යවති. මෙසේ කල් යවත්, කෙළෙඹි මවු තොමෝ ලේලිය වඳබව තේරුම් ගෙණ පුතුට කතා කොට

"පුතේ! උඹේ ඕනෑකමට ගෙණ ආ ගෑණිය වඳියකැ යි මට පෙණේ, දූ පුතුන් නැති ගෙය නැසී යයි, පරම්පරාවක් නො පවතී, මෙයින් වත්තේ අපේ කුලය ත් නැසී පරම්පරාව ත් නැසී යෑම යි, ඒ නිසා අන් තැනකින් අන් තරුණියක උඹට ආවාහ කර දෙන්නට මම අදහස් කර ගෙණ සිටිමි, ඊට උඹ ත් සතුටු විය යුතු ය"යි කිවු ය. "අනේ! අම්මේ! මේ මොන වදයෙක් ද, මට තවත් ගෑණු වුවමනා නැත, එක් ගෑණියකගේ වැඩ කර ගන්නට බැරි ව ඉන්නා මට තවත් ගෑණියක් කුමට ද, ඔය හිරිහැර වදබෑලුම් මට වුවමනා නැතැ"යි ඔහු කියේ ය. මේ කතාව අසා හුන් වදඹු තොමෝ "දරුවෝ කොතෙක් බැරිය යි කියුව ද අන්තිම මොහොතේ කෙසේ හෝ මවුපියන්ගේ කීමට නැමෙන්නෝ ය, ඒ නිසා මොහු ද එසේ වන්නට බැරිකමෙක් නැත, යම් ලෙසකින් මොහු මවුගේ බසට කන් දී, අන් ගෑණියක ගෙණාවොත් මා දැසියක් කොට සලකන්නට පිළිවන, දැසියකගෙන් ගන්නා වැඩ මාගෙන් බලාපොරොත්තු වනු ඇත, එවිට වරදින්නේ මට ය, මට ගෙයින් දෙරට බසින්නට සිදු වේ, ඒ නිසා මම ම මෙයාට සැහෙන තැනකින් කුලකතක මෙහි කැඳවා ගෙණ අවුන් පාවා දුන්නෙම් නම් එය මට පස්සට ප්‍රයොජනවත් විය හැකි ය"යි සිතා තමන් දන්නා ඇඳුනුම් කම් ඇති ගෙදරකට ගොස් තම භිමියාට පාවා දීමට ඒ ගෙදරින් තරුණියක නියම කර ගන්නට කතා බස් කළා ය. එහි අය මෑගේ මේ කතාව කවට කමට කරණ එකකැ'යි සිතා "අනේ! ඔය මගුල්වලට නම් අපට එකඟ වන්නට නො හැකි ය"යි ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. "හා! ඇයි, ඔහොම කියන්නේ? දුර දිග බලන්න, මම වඳියක්මි, දූ පුතුන් නැති කුලය නැසී යයි, පරම්පරාව ද දිගට නො යයි, ඒ නිසාය අපි මෙසේ කල්පනා කළමෝ, මාගේ ඉල්ලීමට මේ අය කැමති වෙත් නම්, එය ඔය උදවියට මහත් වාසියක් වනු එකාන්ත ය, මේ කුලකතට මහත් වස්තුවක් අයිති වේ ය"යි ඇය කී කල්හි ඔවුහු එයට කැමති වූහ.

පෙරළා සියගෙට ගොස් ඒ බව නැන්දනියට හා තම භිමියාට ද කියා ඔවුන් ද සතුටු කරවා ගත් ඕ තොමෝ කතා කර ගත් ලෙසට තරුණිය කැඳවා ගෙණ ගොස් සවාමියාට පාවා දුන්නා ය. එසේ කොට "යම් විදියකින් මැයට පුතෙක් හෝ දුවක් ලැබුනේ නම්, මේ ගෙයි ඇති සියලු දේපල මෑට ම අයිති වේ, මට සිදු වන්නේ දෙරට යන්නට ය, ඒ නිසා මෑට දූ පුතුන් නො ලැබෙන හැටියක් කරන්නට ඕනෑ ය" යි කල්පනා කොට "නැගනිය! දරුගැබක් තා කුසැ හටගත්තොත් එය හොඳට රැක ගන්නට ඕනෑ ය, ඒ පිණිස කළ යුතු වැඩ රාශියකි, ඒ නිසා දරුගැබක් පිහිටියොත් මට කියන්නැ" යි අලුත් අඹුවට

කියා සිටියා ය. ඕ තොමෝ මේ වදගැහැණියගේ කපටි අදහස් රැවටිලිබස් නො දැන, මේ කියනු ඇත්ත ය" යි සිතා දරුවෙක් පිළිසිඳ ගත්තේ ය යි දැන එ බව එක්තරා දිනෙක ඇයට දැන් වූ ය. එදා සිට ඕ තොමෝ ගැබිණියට උවැටන් කළා ය. කුදු මහත් කටයුතු කරන්නී ත් කෑද බත් දෙන්නී ත් ඕ ය. දවසක් කෑද බත් දෙන්නී, ඒ හා මුසු කොට දරුගැබ වැටෙන්නට බෙහෙතක් දුන්නු ය. ගැබ වැටුනේ ය. දෙවන වර ත් ඕ තොමෝ මෙසේ කළා ය. එ වර ද ගැබ වැටුනේ ය. පිට පිට දෙවරක් ම දරුගැබ වැටීමෙන් සැකයට පත් අසල ගෙවල වැසි ගැණු "මොක ද, උඹට සැතිරිය සතුරුකම් කරන්නී දැ?" යි ඇසුහ. ඈ ඔවුනට සියලු තොරතුරු කීවා ය. "මෝඩ ගැණිය! ඔහොම කරන්නට එපා, දරුගැබක් පිහිටියා ම ඇට කියන්නී ඇයි?, ඈ නුඹට ලැබෙන යස ඉසුරු වත් පොහොසත් කම් ගරු බුහුමන් නො ඉවසන්නී එයට බිය වී ගැබ වැටෙන්නට බෙහෙත් දෙනවා, ඒ නිසා ය මේ දරුගැබ් වැටෙන්නේ, මින් පසු නම්, මේ මෝඩකම කරන්නට එපා ය" යි ඇලා ඇට කීහ.

ගැබිණිය ද එය පිළිගෙණ තෙවන වර ගැබ පිහිටිබව ඇයට නො කිවු ය. දවසක් වද ගැහැණි තොමෝ වැඩී මෝරා ගිය දරු ගැබ දැක "දරුගැබ පිහිටි බව මට නො කීවා ඇයි දැ?" යි ඇසූ ය. "ඔව්! බොහෝ ම හොඳයි නුඹ කළා, නුඹ මා මෙහි ගෙණ අවුත් දෙ වරක් ම මා මරන්නට තැත් කෙළෙහි ය, මම මෙහි ආවා නුඹේ බස් අදහා ගෙණ වෙමි, ඒ මා මරන්නට කටයුතු කිරීම කොතරම් වරද ද; මේ වර ත් දැන් වූ නම්, මේ ගැබ ත් නුඹ බෙහෙත් දී හෙලනු ඒකාන්ත ය" යි ඇය කී කල්හි බිය පත් වූ වදගැණි "අයියෝ! මම නැසුනෙමි, වැඩ වැරදුනේ ය" යි සිත සිතා උමතුවූවන සේ කලබැගැනී ව සිටියා, ගැබිණියගේ ප්‍රමාදයක් දැක එවර ත් ගැබ වැටෙන්නට බෙහෙතක් කැවූ ය. ගැබ මෝරා තුබූ බැවින්, ගැබ එක පිට නො වැටී එය කුසෙහි සරස් විය. එයින් ඇයට ඉවසිය නො හෙන දරුණු වෙදනාවක් උපන. ජීවිතය ද සැකතැනට වැටුනේ ය. "බොල! වඳිය! තී මා නැසූයෙහි, මා මෙහි ගෙණවුත් මට කළ ටික ඇත, මාගේ දරුවන් තිදෙනකු කා දැමූයෙහි, මා පණ කඳ කොයි වේලක නැසී යේ දැ' යි කියන්නට බැරි ය, මා මැරුණොත් මම යකින්නක් ව තීගේ දරුවන් ද කමි, මෙයට පළිගණිමි" යි ඈ වෙවුලමින් ගොත ගස ගසා කියමින් සිටියදී ම මැරී ගොස් ඒ ගෙයි බැලලියක් ව උපන්නී ය. ඒ අතර මේ දෙ දෙනාගේ ම ස්වාමිපුරුෂ වූ කෙළෙඹි තෙමේ මේ සියල්ල දන්නේ, වඳිය කෙස් වැටියෙන් අල්ලා ඇද බිම හෙලා, "තී මා ද නැසූයෙහි, මාගේ ගෙදර කා දැමූයෙහි" යි කියමින් අල්ලා

ගෙණ කටින් නැහැයෙන් ලේ උතුරා යන තුරු අතින් පයින් දඬු මුගුරුවලින් තරයේ තළා ලී ය. ඕ තොමෝ එයින් රොගාතුර වුවා වැඩි දවස් නො යාදී ම කලුරිය කොට එහි ම කිකිළියක් ව උපන. මේ කිකිළිය හෙලන හැම බිත්තර බැලලිය කයි. මෙසේ ටික දිනක් ගත වන විට දෙතුන් වරක් ම බැලලිය, තම බිත්තර කෑබව හා තමනු ත් මරා කන්නට කෙළ වගුරමින් මාන බලන බව ද වැටහී ගිය කිකිළියට "මැරී ගොස් දූ පුතුන් සහිත වූ මෑ කන්නට ලැබේවා" යි සිතෙක් උපන. ඒ සිතින් ඒ අදහසින් ඒ වෛරයෙන් මැරී ගොස් කිකිළිය දිවිදෙනක් ව උපන. බැලලිය කලුරිය කොට මුවදෙනක් ව උපන. මුවදෙන වැදූ විට දිවිදෙන ඇවිත් මුව පැටවුන් අල්ලා කයි. මෙහි මෙය මෙසේ තෙ වරක් ම සිදු විය. මුවදෙන, මැරෙන්නට පණ අදින වේලෙහි දිවිදෙන කළ විපත සිහිවීමෙන් "මෑ කන්නට ලැබේවා" යි සිතැතිව මැරී යකින්නක් ව උපන. දිවිදෙන කලුරිය කොට ඒ තිරිසන් බැවින් මිදී සැවැත් නුවර එක්තරා කුලගෙයක උපන්නී ය.

මේ කුලදූ තොමෝ වැඩි විය පැමිණියා, නුවරින් පිටත ගමෙක එක්තරා පුරුෂයකු හා දීග ගියා ය. ඉන් මාස කීපයකින් පසු ඕ තොමෝ ගැබ් ගත්තා පුතකු වැදූ ය. එකල යකින්න යෙහෙලියකගේ වෙසයෙන් එහි පැමිණ "මා යෙහෙලිය කොයි දැ?"යි ඇසූ ය. මේ කිසිවක් නො දත් එහි ගෙහි සිටියවුන් "ඇතුල් ගෙයි පුතකු වදා හිදී ය" යි කී විට "බලමි" යි ගෙට ඇතුල් වී බලන්නියක මෙන් දරුවා ගෙණ ලේ පෙරමින් කාලා පැන ගියා ය. දෙවන වර ද මේ යකින්න ගෙට වැද දෙවන වර වැදූ දරුවා ද කෑවා ය. තෙවන වර ද දරුගැබ පිහිටි පසු වදන්නට ලංවත්ම ඕ තොමෝ සිය හිමියාට කතා කොට "හිමිය! වදන්නට කාලය ඉතා ලහ යි, එය මෙහි දී සිදු වී නම්, මුල්වාරවල දී මෙන් ලැබෙන දරුවා යකින්නට බිලි විය හැකි ය, එහෙයින් අපි එයට පෙර කුලගෙදරට යමු" යි කියා හිමියා සමග එහි ගියා ය. එහි දී ඕ තොමෝ පුතකු වැදූ ය. මෙ දවස යකින්න තමන්ට නියම දියමුරයට ගොස් සිටියා ය.

යකින්නෝ වෙසවුණු යක්රජුට මුරවශයෙන් අනවතප්තවිල සිට හිසින් දිය අදිති. සමහරෙක් සිවු මසක් ගිය තැන දිය මුරෙන් නිදහස ලබති. සමහරු පස් මසක් ගිය තැන නිදහස ලබති. එහෙත් සමහරු මේ කාලය ගෙවී යන්නට පෙරාතු ව මැරී යත්. මේ යකින්න දියමුරෙන් මිදුනු මොහොතෙහි ම මහත් වේගයෙන් වහා ඒ ගෙදරට ගොස් "මාගේ යෙහෙලිය කොයි දැ?" යි ඇසූ ය. "නො දනිහි ද?, මෙහි දී ඇගේ දරුවන් දෙවරක් ම යකින්නක් පැමිණ කා පැන ගියා, එ බැවින් මේ වර

දරුවැදීම පිණිස තම මවුපියන්ගේ ගෙට ගියා ය" යි එහි සිටියවුන් කී විට, යකින්න "ඕනෑ තැනෙක යේවා, උන්දැ නම් මාගෙන් නො මිදෙනි" යි වෛරවෙගයෙන් තදින් තෙද ගැණුනී, ඈ ගිය අත බලා වහා දුවන්නට වන. වැදීම සඳහා තම මවුපියන්ගේ ගෙට ගිය සත්‍රිය එහි දී ලත් පුතුට නම් තබන මගුල්දා ලදරුවා කාවා, නම ද තබා අවසන් කොට "හිමිය! දැන් ඉතින් අපට ගෙදර යනු හැකි ය, එ හෙයින් අපි ගෙදර යමු" යි කියා හිමියා ත් සමග පුතු ද වඩා ගෙණ දෙවිරම්මහවෙහෙරමැද මාවතින් යන්නී, පුතු, හිමියා අතට දී දෙවිරම්පොකුණෙහි නාලා ගොඩ වී, පුතු තම අතට ගෙණ හිමියා නාලා අවසන් කරණ තුරු පුතුට කිරි පොවමින් සිටියා ය. ඒ වේලෙහි ඉදිරියෙහි වෙගයෙන් දුව එන යකින්න හැඳින, "හිමිය! හිමිය! ගොඩ එන්න, ගොඩ එන්න, ගොඩ එන්න, අර එන්නී දරුවන් කෑ යකින්න ය, ඉක්මනට ටෝ" යි කෑ ගැසූ ය. එහෙත් ඕ හිමියා එනතුරු නො බලා ම දරු ද ගෙණ දුව දෙවිරම්වෙහෙර තුළට වැදුනා ය.

මේ වේලෙහි සම්මාදරු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ධම්මසාලායෙහි ධම්දෙසනා කරමින් වැඩ හුන්හ. පුතු ද රැගෙණ එහි ගිය ඒ සත්‍රිය තම පුතු බුදුරජාණන් වහන්සේගේ සිරිපා මූල දමා "නිලෝගුරු හිමියෙනි! මම ඔබවහන්සේට මේ මා පුතු දෙමි, මේ ගැන්නාට දිවි දුන මැනැවැ" යි හඬමින් කිවු ය. විහාර දෙරවුයෙහි රැකවල් ගෙණ සිටිනා සමන්දෙව් තෙමේ එහි දුව ආ යකින්නට එහි ඇතුල් වන්නට ඉඩ නො දුන්නේ ය.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ "ආනන්දය! තමුසේ දෙර කොටුව ලඟට ගොස් යකින්න කැඳවා ගෙණ එවු"යි අනද තෙරුන්ට නියම කළහ. එය අසා සිටි සත්‍රිය "අනේ! නිලෝගුරු හිමියෙනි! එපා! ගෙන්වන්නට, ඒ වැඩේ හොඳ නෑ, යකින්න මෙහි ගෙන්වන්නට එපා, ඈ ආවොත් මේ බිලිඳු කා දමනු ඇත, නො ගෙන්වනු මැනැවි, නිලෝගුරු හිමියෙනි! අනේ! අන්න එනවා, නවතාලනු මැනැවි, එන්නට දෙන්නට එපා ය"යි බියෙන් ගැසි ගැසි කීවා ය. බුදුරජාණන් වහන්සේ "ඈ ආවා වේ, කෑ ගසන්නට එපා ය"යි වදාළ සේක. ආනන්ද සථවිරයන් වහන්සේ යකින්න එහි කැඳවා ගෙණවුත් බුදුරජුන් ඉදිරි පිටට පැමුණුවා ලුහ. එවිට උන්වහන්සේ "මොක ද තී මෙසේ කරන්නෙහි?, යම් ලෙසකින් තෙපි මට නො හමු වූහු නම්, වලසුන්ගේ හා කොලොම්රුක්වැසි දෙවියන්ගේ වෛරය මෙන්, කවුඩන්ගේ හා මහමුණන්ගේ වෛරය මෙන් කපක් පවත්නා වෛර ඇත්තෝ වන්නහු ය, කුමක් නිසා වෛරයට වෛර කරවු ද? වෛරය වෛරයෙන් සංසිඳවන්නට බැරි ය, වෛරය සංයිඳෙන්නේ වෛර නො කිරීමෙනැ"යි වදාළ සේක. වදාළෝ මෙසේ ය:-

නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති එසධම්මො සනන්තනොති.

මේ සත්ව ලොකයෙහි වෛරයෝ වෛරයෙන් කිසි කලෙක ත් නො සංසිඳෙත්. වෛරයෝ අවෛරයෙන් ම සංසිඳෙත්. අවෛර යෙන් වෛරසංසිඳවීම පෞරාණිකධර්මයෙකි.

න හි වෙරෙන වෙරානි සම්මන්ති ඉධ කුදාචනං - මේ සත්ව ලොකයෙහි වෛරයෝ වෛරයෙන් කිසිකලෙක ත් නො සංසිඳෙත්.

නව ආඝාතවස්තූන් නිසා සත්වයාගේ සිත තුළ උපදින වෛරය, වෛරයකින් සංසිඳවිය නො හැකි ය. නින්දා පරිභව කළහුට, ඒ නින්දා පරිභවය නිසා තම සිතෙහි උපන් වෛරය නිවා ගැන්මට, තමනු ත් නින්දා පරිභව කිරීම, පහර දුන්නහුට, එයින් උපන් වෛරය නිවා ගැන්මට පහරදීම, තමන් බැන්දහු ඒ බැඳීමෙන් උපන් වෛරය නිවා ගැන්මට බැඳීම, කෙල-සොටු-මල-මූත්‍රාදියෙන් අපිරිසිදු වූ තැනක්, ඒ කෙල සොටු-මල-මූත්‍රා දියෙන් ම පිරිසිදු කරන්නට ගන්නා උත්සාහය වැනි මෝඩ වැඩෙකි. කෙල-සොටු-මල-මූත්‍රාදියෙන් අපිරිසිදු තැන, පිරිසිදු කරන්නට සිතා, එහි කෙල-සොටු-මල-මූත්‍රාදිය බැහීම, හෙලීම එතැන, වඩාලා ත් අපිරිසිදු වීමට කරුණු වේ. මෙය නො දන්නා අඥයෙක්, මිනිසුන් අතර වේ ද, අපිරිසිදු තැන, අපිරිසිදු දෙයින් පිරිසිදු කරන්නට බැරිවා සේ ම, නින්දාවට නින්දාව- පරිභවයට පරිභවය ගැසීමට ගැසීම- බැඳීමට බැඳීම වෛර සංසිඳුවීමට කරුණු නො වේ. නින්දා පරිභවයෙන් උපන් වෛරය, මේ නිසා තව තවත් දැඩි වේ. නින්දා පරිභවාදිය නිසා උපන් වෛරය, නින්දා පරිභවාදිය කිරීමෙන් කිසිකලෙක ත් නො සංසිඳවිය හැකි ය.

මේ මෙහි මදක් විස්තර විසින් කියූ කතාව අටුවායෙහි කියූයේ මෙසේ ය:- **යථා හි බෙලසිඞ්ඝාණිකාදිඅසුචිමක්ඛිතට්ඨානං තෙහෙව අසුචීහි ධොවන්තො සුද්ධං නිග්ගන්ධං කාතුං න සක්කොති, අථ බො තං ඨානං භියොසොමත්තාය අසුද්ධතරං චෙව දුග්ගන්ධතරං චෙව හොති, එවමෙවං අක්කොසන්තං පච්චක්කොසන්තො පහරන්තං පටිපහරන්තො වෙරෙන වෙරං වූපසමෙතුං න සක්කොති, අථ බො භියොවෙරමෙව කරොති, ඉති වෙරානි නාම වෙරෙන කිස්මිච්චි කාලෙ න සම්මන්ති. අථ බො වඩ්ඪන්තියෙව"** යි.

අවෙරෙන ච සම්මන්ති = අවෛරයෙන් ම සංසිඳෙත්.

කෙල-සොටු-මල-මුත්‍රාදිය තැවරුණු තැන, පිරිසිදු ජලයෙන් සෝදා හැරියේ, යම්සේ පිරිසිදු වේ ද, එමෙන් විරුඬයක්, නපුරක් අවැඩක් කළ තැනැත්තාට, ඔහු කළ සේ නො කොට හැරීම, ඔහු කෙරෙහි ක්ෂාන්ති-මෛත්‍රී ආදි ගුණ ඉපදවීම. ඒ විරුඬයෙන් සිත් තුළ උපන් වෛරය සංසිඳීයෑමට හෙතු වේ. අනුත් කළ අහිතය නො සිතා හැරීමෙන් ම ඒ අහිතයෙන් උපන් වෛරය සංසිඳිය යුතු ය.

මේ අටුවා:- **"යථා පන නානි බෙලාදීනි අසුචීනි විප්ප සන්නෙන උදකෙන ධොවියමානානි නස්සන්ති, තං ඨානං සුද්ධං හොති නිග්ගන්ධං, එවමෙව අවෙරෙන ඛන්තිමෙත්තො දකෙන යොනිසොමනසිකාරෙන පච්චවෙක්ඛණෙන වෙරානි වූපසම්මන්ති පටිප්පස්සම්භන්ති, අභාවං ගච්ඡන්ති"** යනු.

එසො ධම්මො සනන්තනො = මේ වෛරය සංසිඳවීම පෞරාණික ගුණධර්මයෙකි.

එසධම්මො, යන මෙහි **'එසො + ධම්මො'** යි පදච්ඡේද යි. **එසො'** යනු **ධම්මො'** යන්න වෙසෙසා සිටියේ ය. මෙහි 'ධම්ම' නම් වෛරසංසිඳවීම ය. මෙත්සිත් ඉපැදවීම ය. ඒ ඉතා උතුම් ගුණයෙකි. එහෙයින් 'ධම්ම'ශබ්දය ගුණය කියයි.

සනන්තනො, යන මෙ පදයෙන් වදාළෝ ඒ වෛරසංසිඳවීම මෙත්සිත් ඉපැදවීම පොරාණික වූ ගුණයක් බව ත්, සියලු බුදු, පසේබුදු, මහරහතුන් ගිය මගබවත් ය. අටුවාව කියේ මෙසේය ඒ:- **"එස අවෙරෙන වෙරූපසමනසඞ්ඛාතො පොරාණකො ධම්මො සබ්බෙසං බුද්ධපච්චෙකබුද්ධඛීණාසවානං ගතමග්ගොති"** යි. ඒ එසේ ම ය. ඉතා බොහෝ කලක් ඉතා දිගු කලක් ලොවට හිත පතා බුදුබව පිණිස වැර වැඩූ බුදුරජානන් වහන්සේට ඒ ඒ අත් බැව්හි දී තමන් වහන්සේගේ දිවි නසා විපත් පැමිණ වූ කිසිවකු කෙරෙහි කිසිලෙසකින් විපතක් නපුරක් කරන්නට නො ම සිතූහ. **ජදදන්තජාතක-සංඛපාලජාතක-මහාකපිජාතක-සරභමිගජාතක-මහාධම්මපාලජාතක**වලින් එය පැහැදිලි වේ. බුදු වූ පසු ද තමත් නසන්නට ආ දෙවදත්තාදීන් කෙරෙහි තමන්ට ඇණුම් බැණුම් කළ චිඤ්චිමාණවිකාදීන් කෙරෙහි, නොයෙක් ලෙසින් දොෂාරොපණය කළ මිත්‍ථ්‍යාවාදී බ්‍රාහ්මණාදීන් කෙරෙහි, විපතක් නපුරක් කරන්නට නො සිතූහ. සිතුවෝ ඒ හැමදෙනා කෙරෙහි සැපතක් ම ය. මෙ බැවින් වෛරයට වෛර නො කිරීම සනන්තන ධර්මයෙක් ම ය. පෞරාණිකධර්මයෙක් ම ය. බුදු පසේබුදු මහරහතුන් ගිය උතුම් වූ මගෙක් ම ය. උන්වහන්සේලා ඇසුරු කළ ගුණයෙක් ම ය.

සනානනනා, යන මෙහි **සනං'** යනු සත්වන විබත් අරුත් ඇති පදයෙකි. නැත, පුරාණාඛ්‍යනිපාතයෙකි. ඒ හා යෙදුනු **තන'** යනු ප්‍රත්‍යයයෙකි. එය ඒම් අරුත් ඇත්තේ ය. එහෙයින් "පුරාණයෙහි වූයේ" යන අරුත්හි 'යනනනනා' ශබ්දය ආයේය.

මේ දෙශනාවගේ අවසානයෙහි යකින්න සෝවත් පලයෙහි පිහිටියා. දෙශනාව පැමිණ සිටි පිරිසට වැඩ සහිත වූ ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ "නීගේ පුතා මේ යකින්න අතට දෙන්නැ" යි සත්‍රියට වදාළ කල්හි "තිලෝගුරු හිමියෙනි! මම එයට බිය වෙමි"යි ඕ තොමෝ කිවූ ය. "බිය නොවව! මැනිසා හිට කිසි විපතක් නොවේ"යි වදාළ විට ඕ තොමෝ සිය පුතු යකින්න අතට දුන්නා ය. යකින්න ලමයා වඩා සිඹ පික වේලාවක් නලවා ආදරය කොට මවට දී හඬන්නට වන. ඒ දුටු බුදුරජානන් වහන්සේ "අඬන්නී කුමක් නිසා ද?"යි අසා වදාළ කල්හි "කුළුණුබර හිමියෙනි! අනේ! මම මෙතෙක් දවස් දිවි ගෙණ ආවා යම්තම් ටිකක් ලබා ගෙණ ය, කිසි දිනෙක බඩ පුරා කෑමක් නම් නොලැබින, දැන් මේ තැන් සිට ඒ ටික ත් නැති විනැ යි සිතා හැඬුනේ ය"යි ඇය කී ය. එවිට උන් වහන්සේ "නොහඬව! මම එයට පිළිවෙළක් යොදමි"යි යකින්න සනසා සත්‍රියට කතා කොට "මේ යකින්න එහි කැඳවා ගෙණ ගොස් කැඳ බත් දී හොඳින් රැක බලා ගන්නැ"යි නියම කළහ. ඕ තොමෝ යකින්න කැඳවා ගෙණ ගොස් ගේ පිළිකන්නෙහි රඳවා බුදුරජුන් වදාළ ලෙසට කැඳ බත් දීලා වැඩුවා ය. එහි නාවුරුන් හෝ වී කොටන විට එ හඬ යකින්නට මෝල්ගසින් ඔලුවට ගසන්නා සේ වැටහෙයි. එහෙයින් ඕ තොමෝ ගෙයි සවාමිදුවට කතා කොට, "අනේ! මට මෙ තැන වසන්නට නොහැකි ය, මා අන් තැනෙක නවතා ලන්නැ"යි කිවූ ය. එවිට ඇය යකින්න කැඳවා ගෙණ ගොස් මෝල් තබන සාලාවෙහි පදිංචි කර වූ ය. එ කල්හි එහි නිබෙන මෝල් ගස් සියල්ල යකින්නගේ හිසට වදින්නා සේ වැටහෙන්නට වන. එවර ද එ තැනින් ගෙණ ගොස් දියහැළිය ලඟ පදිංචි කර වූ ය. "මෙ තැන කොල්ලෝ ඉදුල් දිය වත් කරති, එ බැවින් මෙ තැනත් ඉන්නට නොහැකි ය"යි කිවිට ලිබ්බොක්කෙහි වාසය කරවූ ය. "මෙ තැන බල්ලෝ නිදත්, බැ මෙ තැනැ"යි කී කල්හි අගුවට ගෙණ ගියා ය. "කොල්ලන් මල මූ කරණ මෙ තැන වසන්නට නොහැකි ය සි කී විට කුණුගොඩක නැවැත්තූ ය. එහි වසන්නට නොහැකි ය"යි කිවිට ගම්දෙරකඩට ගෙණ ගියා ය. "ගම්වැසි කොල්ලෝ මා ඉලක්කයක් කරත්, මෙ තැනත් වසන්නට නොපිළිවනැ"යි කිවිට එ තැනින් ගෙණ ගොස් ගමෙන් පිටත එක්තරා

ඉඩපහසුකම් ඇති තැනක නවත්වා කැඳ බත් එහි ගෙණ ගොස් දී වැඩුවා ය. කැඳ බතින් පිණා ගිය යකින්න, "මේ අවුරුද්දෙහි හොඳට වැසි වස්නේ ය, ඒ නිසා ගොඩබිම ගොයම් කරව, මේ අවුරුද්දෙහි වැසි අඩු ය, එ බැවින් පහත් බිමැ ගොයම් කරව"යි ඒ සත්‍රියට කියයි. ඕ තොමෝ එසේ ගොයම් කොට බොහෝ අස්වැන්න ලබා ගණියි. එගමැ වැසි සෙස්සන් කරණ ගොයම් සමහර විට වතුරෙන් විනාශ වී යයි. සමහරවිට ගොයමට සෑහෙන පමණින් වතුර නො ලැබීමෙන් විනාශ වී යයි.

මේ දුටු ගම්වැස්සෝ ඒ ගැහැණිය කරා ගොස් "උඹ කරණ ගොයම් කලක සිට වතුර වැඩිවීමෙන් නැසී යන්නේ ත් නැත, වතුර නො ලැබීමෙන් විනාශ වන්නේ ත් නැත, මෙ දවස වැසි වසී, මෙ දවස වැසි නො වසී, යි හොඳට තොරතුරු දැන ගොයම් කරණ බව පෙණේ, මේ වග විභාග කෙසේ දැන ගණිහි දැ?"යි ඇසූහ. මගෙන් උවටැන් ලබන යකින්න "මෙ දවස ගොඩැ ගොයම් කරව, මෙ දවස මඩැ ගොයම් කරව"යි මට කියයි, මම ඇ කියන ලෙසට ඒ ඒ, කලට සුදුසු සේ ගොයම් කරමි, මට එයින් හොඳ අස්වැන්නෙක් ලැබේ, අටු කොටු පුරවා ගත හැක්කේ ඒ නිසා ය, දවස ගානේ මා ගෙණ යන කැඳ බත් තමුසේලාට නො පෙණේ ද, දිනපතා ඇයට කැඳ බත් මෙහෙන් ගෙණ යනු ලැබේ, තමුසේලා ත් මා වාගේ යකින්නට කැඳ බත් යවතොත්, ඔය ඇත්තන්ගේ ත් කර්මාන්ත සොයා බලා ඒවායින් පල ලබන හැටි කියා දෙනවා ඇතැ"යි ඕ තොමෝ කීවා ය. එදා සිට ගම්වැස්සෝ ද යකින්නට කැඳ බත් ආදිය යවන්නට පටන් ගත්හ. යකින්න ද එ තැන් සිට කාගේ ත් කර්මාන්ත සොයා බලා පල ලබන හැටි කියා දෙමින් ලාභයෙන් පිරී ගියා ය. මහත් පිරිවර ඇත්තී ද වූ ය. ඕ තොමෝ පසු කල ලහබත් අටක් තැබූ ය.

කාලියක්ෂණ්වසතුව නිමියේ ය.

සොෂිතාරාමයෙහි කොලාහලය

1 - 5

සොසඞ්ඝානුග්‍රහ සොෂිත සිටානන් කර වූ විහාරය සොෂිතා රාම නමින් ප්‍රසිද්ධ වූයේ ය. එහි බුදුරජුන් දවස මහාසථවිරයන් වහන්සේලා දෙ නමක් වාසය කළහ. එක් නමක් විනයධර ය. එක් නමක් ධර්මකථික ය. ඒ දෙ දෙනා වහන්සේට ම පන් සියයක් පන් සියයක් ශිෂ්‍යයෝ වූහ. එක් දිනක් ධර්මකථික සථවිරයන් වහන්සේ, සිරුරුනිස සඳහා වැසිකිළියට වැඩියෝ, එහි සිරුරුනිස කොට අත පය සෝදා ඉනිරි වූ දියත්ත බඳුනෙහි ම තබා වැසිකිළියෙන් නික්ම ආහ. ඉන් ටිකකට පසු විනයධර සථවිරයන් වහන්සේ, එහි වැඩියෝ, බඳුනෙහි තුබූ ඒ දියත්ත දැක, "ඇවැත්නි! ඔබ වහන්සේ ප්‍රයෝජනයට ගෙණ ඉනිරි වූ දියත්ත බඳුනෙහි තබා ආවහු දැ?"යි ධර්මකථික සථවිරයන්ගෙන් ඇසූහ. "ඔව්! ඇවැත්නි!"යි ඒ සථවිර තෙමේ පිළිතුර දුන. එවිට විනයධර තෙමේ "කිම ඇවැත්නි, මේ නිසා ඇවැත් සිදුවන් බව නො දනිහු දැ?"යි ඇසී ය. "නො දනිමි"යි ඔහු කී ය. "ඇවැත්නි! මෙහි ඇවැත් මේ, මේ නිසා ඔබ වහන්සේට ඇවැත් යදු වී ඇතැ"යි විනයධර සථවිරයන් කී විට, මේවා, එසේ නම් එයට මම පිළියම් කරමි"යි ධර්මකථික සථවිර තෙමේ කී ය. "ඔබවහන්සේ එය නො දුන සිහි මදකමින් මේ කළහු නම්, ඇවැත් නැතැ"යි කී කල්හි, ධර්මකථික සථවිර තෙමේ "ඒ ඇවැතෙහි ඇවැත් නැතැ"යි සිතා ගත්තේ ය. විනයධර තෙමේ ධර්මකථිකයාට එසේ කියා, පසු ව සිය අතැවැස්සන්ට "අර අපගේ ධර්මකථිකයා ඇවැතට පැමිණ ද, ඒ ඇවැත නො දනී"යි කී ය. එවිට ඔහුගේ අතැවැස්සෝ ධර්මකථික තෙරුන්ගේ අකැවැස්සන්ට "ඔබ වහන්සේලාගේ ගුරුවරයා ඇවැතට පැමිණ ද ඇවැත නො දනී"යි නිගා කළහ. ඔවුහු සිය ගුරුන් වෙත ගොස් එය දැන්වූහ. එවිට ධර්මකථික තෙමේ "මේ විනයධරයා මූල දී ඇවැත් නැතැ යි කියා දැන් ඇවැත් ය'යි කියයි, මොහු බොරු කියන්නෙකැ"යි සිය අතැවැස්සන් ඉදිරියෙහි කීයේ ය. එවිට ඔහුගේ අතැවැස්සෝ "ඔබ වහන්සේ ලාගේ ගුරුවරයා බොරු කියන්නෙකැ"යි විනයධර සථවිරයන්ගේ අතැවැස්සන්ට නිගා කළහ. මෙයින් දෙ පස අතර මහත් අරගල යෙක් හටගත්තේ ය.

එකල්හි විනයධර සථවිර තෙමේ ඉඩ ලබා ධර්මකථික සථවිර යන්ට උත්ක්ෂෙපණීය කර්ම කෙළේ ය. ඒ තැන් සිට ඔවුන්ගේ ප්‍රත්‍යය දායකයෝ ද, උපස්ථායකයෝ ද දෙ පසට බෙදී ගියහ. ඔවුන්ගේ අවවාද පිළිගන්නා භික්ෂූකීහු ද දෙ කොටසක් වූහ. අරක් ගත් දෙවියෝ, සාදිඨ-සමඝත්ත දෙවියෝ, අහසැ වැසි දෙවියෝ, බඹ

ලොව දක්වා වාසය කළ සියලු පෘථග්ජනයෝ දෙ පසට බිදුනාහ. චාතුම්මහාරාජික දිව්‍යලොකය පටන් අකනිට්ඨ බ්‍රහ්මලොව දක්වා මේ අරගලය නැඟ ගියේ ය. මෙසේ හටගත් මේ අරගලය දිසුණු ව ගිය කල්හි එක් භික්ෂූන් වහන්සේ නමක් බුදුරජුන් වෙතට ගොස් "ස්වාමිනි! භාග්‍යවතුන් වහන්ස! මේ උත්ක්ෂෙපණීයකම්ය කළෝ, තමන් විසින් ධාර්මිකකම්යෙන් ම ධම්කථික තෙමේ උත්ක්ෂෙප කරණ ලදැ'යි අදහති, උත්ක්ෂෙප කරණ ලද්දහුට අනුව යන්නෝ, අධාර්මිකකම්යකින් උත්ක්ෂෙප කරණ ලදැ'යි අදහති, අධාර්මික කම්යකින් උත්ක්ෂෙප කරණ ලදැ'යි සිතිගන්නෝ, උත්ක්ෂෙපක යන් විසින් වළකනු ලබන්නෝ ද, උත්ක්ෂෙප කරණ ලද්දහුගේ ලබ්ධිය ගෙණ ඔහු අනු ව හැසිරෙත් ය"යි දන්වා සිටියාහ.

ඒ ඇසූ සවාමිදරු වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ "සමගි වවු"යි දෙවරක් ම ඔවුනට දන්වා වදාළ සේක. එහෙත් ඔවුහු සමගි නො වූහ. ඒ බව දත් උන්වහන්සේ තෙවන වර "භික්ෂූසඞ්ඝ තෙමේ බිඳුනේ ය, භික්ෂූසඞ්ඝ තෙමේ බිඳුනේ ය"යි ඔවුන් වෙත වැඩම කොට, උත්ක්ෂෙපණීයකම්ය කළවුන්ගේ ඒ කම්ය කිරීමෙහි වරද ද උත්ක්ෂෙපණීයකම්ය කරණ ලද්දහු, අනු ව යන්නන්ගේ ඇවැත් නො දෙසීමෙහි වරද ද වදාරා, නැවැත දෙ පස ගත් ලබ්ධින්ගේ වෙනස් බව දැන ඔවුනට එක් සීමායෙහි වෙන වෙන ම පොහොය කිරීම් ආදී වූ විනයකම් අනුදැන වදාරා, කොලාහල කරුවන්ට දැනශාලාදියෙහි හිඳිනා විට, අසුනක් හැර අසුනක හිඳීම ද නියම කොට වැඩි සේක. එහෙත් ඔවුන් කොලාහල කරමින් ඩබර ඇත්තන් ව වාසය කරනී'යි අසා, නැවැත ත් එහි වැඩම කොට "මහණෙනි! කොලාහලය දරුණු ය, ඉතා නරක ය, නපුරු ය, කොලාහල කිරීමෙන් වැඩෙක් නැත, කොලාහල නො කරවු"යි අවවාද කොට, නැවැත ද, "මේ කලහවිවාදයෝ මේ ලොව පරලොව දෙකේ දිසුණුව නසන්නෝ ය, බලවු **කලහය** නිසා කැටකිරිල්ලියක මහඇතකු මැරූහැටි"යි ලටුකික ජාතකය දෙසා, **"සමගි වවු; විවාද නො කරවු; කොලාහල නො කරවු; බලවු! විවාදය නිසා දහස් ගණන් වටුවෝ මළහ"**යි වට්ටකජාතකය වදාළ සේක. එහෙත් ඔවුහු එය නො ද පිළිගත්හ. එවිට උන්වහන්සේට වන වෙහෙස දුටු එක් අඛම්වාදීභික්ෂු නමක් ධම්ස්වාමි වූ භාග්‍යවතුන් වහන්සේ මනුත්සාඟි ව දිට්ඨධම්මසුඛවිහරණයෙහි යෙදී වාසය කරණ සේක්වා, අපි මේ කොලාහලයෙන් ප්‍රසිඩ වන්නෙමු"යි කියේ ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ "මහණෙනි! මම තමුසේලාට පෙරැ වූ සිඳියක් කියමි, එය මනා කොට අසවු! පෙර බරණැස් නුවර

ප්‍රහමදත්ත නම් කසී රජෙක් වූයේ ය, එ දවස ම කොසොල් රට දීඝිති නම් කොසොල් රජෙක් විය. එක් අවදියක කසීරජු සිවුරඟසෙනග ගෙණ ගොස් කොසොල්රජු වට කෙළේ ය, එවිට කොසොල්රජ තමන්ගේ බැරිකම් සලකා දිවි රැක ගැණුමේ අදහසින් බිසොව ද ගෙණ නුවරින් පිටත පැන ගොස් බරණැසට පැමිණ පිටිසරගමක කුඹල්කරුවකුගේ ගෙදර අප්‍රසිඩ ව වාසය කරයි, එ දවස ඔහුගේ මෙහෙසී තොමෝ දරුගැබ් ඇත්තී වූවා, පුතකු වැදූ ය, දීඝාවු, යනු ඔහුගේ නම යි, ඔහු වැඩි දවසක් නො යවා ම නුවණැති බවට පත් විය, පිය රජ තෙමේ පුතුට ආරක්ෂාව සලසන්නට සිතා ඔහු නුවරින් පිටත වාසය කර වී ය, එහි දී මේ කුමාර තෙමේ ඉගෙණ ගත යුතු හැම ශිල්පයක් ම උගත්තේ ය,

ටික දිනක් ගතවත් කසීරජ තෙමේ, කොසොල්රජු පිටිසර ගමක මෙහෙසිය ත් සමග වාසය කරණ බව අසා, ඔහු අල්වා ගෙණ එන්නට රාජපුරුෂයන් යෙදී ය, රාජපුරුෂයෝ මෙහෙසිය හා කොසොල්රජු අල්වා ගෙණ අවුත් රජු ඉදිරියට පැමිණ වූහ, එවිට කසීරජ 'කොසොල්රජු ත් ඔහු මෙහෙසිය ත් සතරට පලු කොට සිවුදිග වල් සතරක් කපා එහි දමවු'යි අණ කෙළේ ය,

මේ දවස වනවිට දීඝාවු කුමාර තෙමේ වැඩිවිය පැමිණ සිටියේ මවුපියන් දකිනු කැමැත්තෙන් බරණැසට ගියේ ය, එහි දී හිස් බූ ගා දෙයත් පිටිපස කොට බැඳ මරන්නට ගෙණ යන මවුපියන් දැක ඔවුන්හට ලංවී ය, කොසොල්රජ තෙමේ පුතු දැක, පුත! දීඝාවු කුමාරය! ඇත ත් නො බලව! ලහ ත් නො බලව! වෛර යෙන් වෛරයෝ නො සංසිඳෙති'යි කී ය. එවිට වධකයෝ කොසොල්රජු පිස්සෙකැයි සිතා නුවරින් බැහරට ගෙණ ගොස් පලු කොට සතර පැත්තේ සාරා තුබූ වල්වල දමා ගියහ.

වීණාගැයීමෙහි දක්ෂ වූ දීඝාවු කුමාර තෙමේ එක් දිනෙක වීණා ගායනා කෙළේ ය, එ නද කණ වැටුනු කසීරජ තෙමේ දීඝාවු කුමරුන් ගෙන්වා තමන්ට උවටැන් කරන්නටැ යි රජමහලෙහි ම නවතා ගත්තේ ය, ටික දිනක් යත් රජ තෙමේ දීඝාවු කුමරුන් කෙරෙහි දැඩි ඇල්මක් දැක්වී ය, මේ අතර දවසෙක රජ තෙමේ කුමරුන් හා රථයට නැගී මුව දඩයමට ගියේ, මාගීවිඩාවෙන් කලාන්ත ව කුමරුගේ ඔඩොක්කුවෙහි හිස තබා නිදන්නට වන, එවිට කුමාර තෙමේ 'අප විනාශ කළේ මොහු ය, මාගේ මවුපියන් පලු ගසා දැම්මේ මූ ය, රට පැහැර ගත්තේ මූ ය'යි තමන්ට කළ විපත සිහි වී එයට දැන් පළිගණිමි'යි සිතා කොපුවෙන් කඩුව එලියට ඇද්දේ ය, එ කෙණෙහි ම ඔහුට එදා වධකස්ථානයට ගෙණ යනු ලැබූ මවුපියන් විසින් 'පුත! දීඝාවුකුමර! ඇත බලන්නට එපා,

ලඟ ත් බලන්නට එපා, වෛරයෙන් වෛරයෝ කවදාවත් නො සංසිඳෙන්, පුත! දීඝාවූ! අවෛරයෙන් ම වෛරයෝ සංසිඳෙත්'යි කළ අවවාදය සිහියට නැගුනෙන් කඩුව කොපුව තුළට බැහීය, දෙවන තෙවන වරද කොපුවෙන් ඇද ගත් කඩුව, ඒ සිහිවීමෙන් කොපුව තුළ ම බැහීය, ඒ අතර කසිරජ බිය වී නින්දෙන් නැගී සිටියේය. කුමාර තෙමේ 'කිම? දෙවයන් වහන්ස! බිය වූවහු දැ'යි ඇසී ය. 'ඔව්, බිය වීමි, කොසොල් රජුගේ පුත්‍ර තෙමේ මා නසනු, මා මරණු සිහිනෙන් දිටිමි, එයට මම බිය වීමි' යි කී ය, කුමාර තෙමේ වම් අතින් රජුගේ හිස පිරිමදිමින් දකුණු අතින් කඩුව ගෙණ 'දෙවයන් වහන්ස! කොසොල් රජුගේ පුත් තෙමේ මම වෙමි, ඔබ වහන්සේ අපට බොහෝ විපත් කළහුය, රට පැහැර ගතහුය, මාගේ මවුපියන් නැසූවහුය, මේ එයට පළි ගැණීමට කාලය' යි කීය, එවිට රජ තෙමේ 'පුත! දීඝාවූ! කුමර! මා රැක ගන්න, මට දිවි දෙන්නැ' යි නැවැත නැවැත කියන්නට වන, 'මම ඔබට කෙසේ නම් දිවි දෙමි ද, මම ඔබ කෙසේ නම් රකිමි ද, ඔබ වහන්සේ මට දිවි දෙන්නහු දැ'යි කුමරුන් ඇසූවිට, රජ තෙමේ, 'මා රකින්න' ඔබ කියන්නක් කරමි' යි කුමරුන්ගේ අත අල්වා ගත්තේ ය, කුමාර තෙමේ ද රජු අත ගත්තේ ය, දෙ දෙනා ම එනුන් රකින්නට පොරොන්දු වී එහි දී දිවුරුම් දුන්හ, මෙසේ එනුන් රකින්නට දිවුරුම් දී දෙ දෙනා ම බරණැසට ගියහ,

ඉක්බිති රජ තෙමේ 'දෙමවුපියන් එදා මගදී ඔබ දුක කළ අවවාදවල තේරුම කිමැ' යි ඇසී ය, දෙවයන් වහන්ස! මාගේ පියා මට ඇත නො බලන්නැ' යි කීමෙහි අදහස, දිගින් දිගට වෛරය නො පැවැත්විය යුතු ය යනු යි, ලඟ නො බලන්නැ' යි කීමෙහි අදහස, මිතුරන් හිතවතුන් හා වහා නො බිඳෙව, යනු යි, එ හෙයින් වෛරයෙන් වෛරයෝ නො සංසිඳෙත්, අවෛරයෙන් වෛරයෝ සංසිඳෙත්, යන මේ කීමෙහි තේරුම ඔබ විසින් මාගේ මවුපියෝ නසන ලදහ, ඒ නිසා මම ඔබ මැරුයෙම් නම්, ඔබට වැඩ කැමැත්තෝ මා නසති, එසේ කල්හි ඒ වෛරය වෛරයෙන් නො සංසිඳෙන්නේ ය, දැන් ඔබ විසින් මට ජීවිතය දෙන ලද්දේ ය, එ හෙයින් දැන් අවෛරයෙන් වෛරය සංසිඳුනේ ය, යනුයි, කුමාර තෙමේ කී ය, එවිට රජ තෙමේ මහත් සතුටට පැමිණ 'දීඝාවු කුමරු පණ්ඩිතයෙකැ' යි සතුති කොට යිත සනසා සිය දුව පාවාදී සියලු රාජෛශ්වර්‍යය ද දුන්නේ ය" යි වදාරා "මහණෙනි! දඬු ගත්, අවි ගත්, රජුන්ගේ පවා ඉවසීමත්, කිකරුකමත්, දුරදිග බැලීමත් මෙසේ නම්, මාගේ සසුන්පිළිවෙතෙහි හැසිරෙන තමුසේලා ඉවසන්නෝ ත්, උනුන් කෙරෙහි ඇලුනෝ ත් වන්නහු නම්

කො තරම් හොබනහු දැ'' යි අවවාද කොට ත් ඔවුන් සමගි කරන්නට නො හැකි වූ සේක් ''දැන් මම මොවුන් හා එක් ව වසමි, එහෙත් මොවුහු මා කියන්න නො පිළිගණිත්, මොවුන් හා විසීම කරදර ය, මම මොවුන්ගෙන් වෙන් ව තනි ව වෙසෙමි''යි සිතා කොසඹෑනුවරෙහි පිඬු සිහා ගොස් භික්ෂූන් ගැණ නො බලා පා සිවුරු ගෙණ **බාලකලොණක** නම්, විහාරයට වැඩ එහි විසූ **භගුස්ථවිරයන් වහන්සේට** එකචාරික වත ත් **පාවීනවංස** මුවවෙනෙහි හුන් **අනුරුඩාදි** කුලපුත්‍රයන් ති දෙනාට සමගියෙහි අනුසසු ත් වදාරා පාරිලෙය්‍යකවනයට වැඩි සේක. එහි ඇතුන් රැකි බැවින් **රක්ඛිත** නම් වනලැහැබෙහි මහාසල්රුකක් මූල පාරිලෙය්‍යකවනය ඇසුරු කොට එහි වැඩ විසූ සේක. පාරි ලෙය්‍යක ඇත් තෙමේ එහි උපස්ථායක විය.

කොසඹෑනුවරු වැසි උපාසකවරු විහාරයට ගියෝ බුදු රජුන් නො දැක ''බුදුරජානන් වහන්සේ කොයි දැ'' යි භික්ෂූන්ගෙන් ඇසූහ. ඔවුන් ''උන්වහන්සේ පාරිලෙය්‍යකවනයට වැඩි සේකැ'' යි කී කල්හි ''උන්වහන්සේ කුමකට එහි වැඩි සේක් දැ'' යි නැවැත ඇසූහ. ''බුදුරජානන් වහන්සේ අප සමගියෙහි පිහිටුවන්නට නොයෙක් ලෙසින් උත්සාහ කළහ, එහෙත් අපට සමගියෙහි පිහිටන්නට බැරි විය, වනයට වැඩියෝ එහෙයිනැ''යි භික්ෂූහු කීහ. එවිට උපාසකවරු ''ඇයි, මොක ද, තමුන්නාන්සේලා බුදුරජුන් ලඟ මහණ ව උන්වහන්සේ සමගි වන්නට කියද්දී ත් සමගි නො වූ වහු'' යි ඇසූහ. භික්ෂූහු එයට ත් ''එසේ ය'' යි කීහ. එවිට ''මොවුහු බුදුරජුන් ලඟ මහණ ව, උන්වහන්සේ සමගි වන්නට කියද්දිත් සමගි නො වූහ, මොවුන් නිසා අපට බුදු රජුන් දැකීම නැති විය, මොවුන්ට අසුන් දෙන්නට, දැක නැඟී සිටින්නට, වැඳුම් පිදුම් කරන්නට, බත් මාළු සපයන්නට වුවමනා නැත, අපි ඒ කිසිවක් මොවුන් උදෙසා නො කරමු'' යි නියම කර ගත් ඒ උපාසකවරු ඔවුන් උදෙසා කළ ආදර සංග්‍රහ සැලකිලි නො කොට අත්හැර දැමූහ. එයින් ඔවුහු ආහාර පානාදිය නො ලැබීමෙන් කලාන්ත ව ගියහ. ටික දිනක් යත් ම කලහකාරක භික්ෂූහු එක්සිත් ව උනුන් ම වරද පිළිගෙණ සමගි වූවෝ; ඒ බව ප්‍රත්‍යයදායකාදීන්ට කියා සිටියහ. එවිට ඔවුහු ''ඔබ වහන්සේලා බුදුරජානන් වහන්සේ කමා කරවන ලද්දාහු දැ'' යි අසා යැවූහ. ''නැත'' යි කී විට ''බුදුරජුන් කමා කරවා ගණිවු, එවිට අපි ඔබ වහන්සේලාට දානමානාදියෙන් පෙර සේ සංග්‍රහ කරන්නෙමු'' යි කීහ. වස්කාලය වූ බැවින් බුදුරජුන් වෙතට යා නො හැකි ව ඒ කාලය ඒ භික්ෂූහු ඉතා දුක සේ ඉක්ම වූහ.

පාරිලෙය්‍යකවනයට වැඩිය දෑ සිට පාරිලෙය්‍යක ඇත් රජ තෙමේ බුදුරජුන්ට උවැටන් කරන්නේ ය. ඒ ඇත් තෙමේ ද සිය ඇත්සමූහය අත් හැර දමා නිදහස් ව තනි ව වසන්නට ඒ වනයට පැමිණ සිටියේ ය. එහි පැමිණියේ ද දින පතා ඇතුන්-ඇතින්නන්-ඇන්නාම්බන්-ඇන්පැටවුන් නිසා සිදු වන වෙහෙස පිඩාව කරදර විද දරා ගත නොහැකි වූ බැවිනි. ඔහු ඒ වනයෙහි ඔබ නොබ හැසිරෙණුයේ සල්රුකක්මූලැ එකලා ව වැඩ හුන් බුදුරජුන් දැක වැඳ, වට පිට බලනුයේ කිසිවකු නොදැක එ තැන පසින් ගසා සමතලා කොට අත්තක් කඩා ගෙණ අතුගා දමා, කළයක් සොඬින් ගෙණ පිරිසිදු පැන් ඇති තැනකට ගොස් පැන් ගෙණ වුත් තබන්නේ ය. උණු දිය ප්‍රයොජනයට ගන්නා දිනයෙක් වී නම්, එ දින මියුලිදරකඩ දෙකක් එකට ගටා, ගිනි දල්වා එහි හව තවත් දර දමා ගින්න මහත් කොට, දල්වා එහි ගල් කැට කිහිපයක් බහා ගිනියම් කොට දරකඩකින් පෙරළා ගෙණ ගොස් වතුර ටිකක් ඇති කුඩාගල්පොකුණක දමා එහි දිය රත් වූ පසු, බුදුරජුන් වෙත ගොස් වැඳ එ බව දන්වා ලන්නේ ය. එවිට බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට උණුදිය නාන්නාහ. ඇතා ඒ අතර කැලයට වැද, පලවැල කඩා රැස් කොට තබා, දිය නාලා වැඩම කළ බුදුරජුන්ට ඒ පිළිගන්වාලයි. ගමට පිඬු පිණිස වඩිනා දිනයෙහි, බුදුරජුන්ගේ පා සිවුරු කුඹෙහි තබා ගෙණ උන්වහන්සේ හා නික්ම යයි. ගමට ලං වූ විට, "පාරිලෙය්‍යකය! මේ තැනින් එහාට යෑම තට නොසුදුසු ය, පා සිවුරු මට දෙව" යි ඇතා එහි නවතා බුදුරජාණන් වහන්සේ පා සිවුරු ගෙණ ගමට පිඬු සිහා වඩිනා සේක. පිඬු සිහා පෙරළා වඩිනා විට, ඇතා ඉදිරියට ගොස්, පළමු කී සේ පා සිවුරු ගෙණ අවුත් බුදුරජුන් වසන තැන තබා බුදුරජුන් වැඩ හුන් පසු කොළඅත්තක් ගෙණ පවන් සලයි. රෑ කාලයෙහි වනයෙහි සිවුපාවුන්ගෙන් වන උවදුරු වළක්වනු පිණිස, ලොකු දඬුකඩක් ගෙණ එලිවන තුරු වනයතුළ හැසිරෙයි. එලි වූ වාට පසු මුවඳෙනා පැන් ආදිය තබා වත් කරයි.

මේ කාලයෙහි එම වනයෙහි ගසක වසන වඳුරෙක් බුදුරජුන් පිණිස කුදු මහත් වත් කරණ මේ ඇතා දැක, "මම ත් කිසියම් වතාවතක් කරමි" යි සිතා මැස්සන් නැති දඬුවෙල්බැමියක්, දණ්ඩත් සමග කඩා ගෙණ අවුත්, බුදුරජුන් ඉදිරියෙහි තබා, කඩා ගත් කෙහෙල් කොළයක ලා බුදුරජුන්ට පිළිගැන් වී ය. උන්වහන්සේ එය පිළිගත්හ. "මේ වඳුරා වලඳන්නෝ ද, නොවලඳන්නෝ දැ" යි බලා හුන් වඳුරා බුදුරජුන් එය අතට ගෙණ හිඳිනු දැක, "නොවලඳන්නෝ කුමක් නිසා දැ" යි සිතා, ලංවී

දඬුකෙළවර ගෙණ පෙරළා බලනුයේ, පිළවුන් දැක ඒවා අස් කොට නැවැත පිළිගැන්වී ය. බුදුරජානන් වහන්සේ එය වැළඳු සේක. ඒ දැක මහත් සතුට ට පැමිණ ගසඋඩ අත්තෙන් අත්තට පැන පැන නටන්නට වන් වඳුරා ඇල්ලූ අත්ත ත් පා තැබූ අත්ත ත් දෙක ම බිඳී ගොස්, බිම තුබූ කණුවක් උඩ වැටී සිරුර පසා වී ගියෙන් එ තැන ම මළේ ය. මළේ ද බුදුරජුන් කෙරෙහි පහන් සිතිනි. ඒ හෙතුයෙන් ඌ තව්තිසාදෙව්ලොව රන් විමනක උපන්නේ ය. දහසක් දෙවඟනෝ පිරිවර වූහ.

මෙසේ බුදුරජුන් පාරිලෙය්‍යකඇතුගෙන් උවැටන් ලබමින් එ වනැ වැඩ වසන බව; දඹදිව පුරා පතළ වී ගියේ ය. එකල අනේපිඩුමහසිටු, විසාමහඋවැසි යන මොවුන් මුල් කොට ඇති, සැවැත්නුවරැ වැසි ජනප්‍රධානයෝ එකතු ව "අපට බුදුරජුන් දක්වනු මැනැවැ" යි ආනන්ද ස්ථවිරයන් වහන්සේට දන්වා යැවූහ. පිටිසර පළාත්වැසි පන් සියයක් පමණ භික්ෂූන් වහන්සේලා ත්, ආනන්ද ස්ථවිරයන් වහන්සේ කරා ගොස්, "බුදුරජානන් වහන්සේ වෙතින් අපට කලකින් බණක් දහමක් අසන්නට නො ලැබුනේ ය, එ හෙයින් උන්වහන්සේ වෙතින් බණක් අසන්නට ඉඩ සලසා දෙනු මැනැවැ" යි දන්වා සිටියහ. එවිට ආනන්ද ස්ථවිරයන් වහන්සේ "තෙමසක සිට තනි ව වසන බුදුරජුන් වෙතට මෙතෙක් දෙනා සමග යෑම නො සුදුසු ය" යි සිතා ඒ භික්ෂූන් වනයෙන් පිටත නවතා තමන් තනි ව බුදුරජුන් වෙතට ගියහ. තනි ව බුදුරජුන් වෙතට එන තෙරුන් දුටු ඇතා, පොල්ලක් ගෙණ උන්වහන්සේගේ ඉදිරියට දිව්වේ ය. බුදුරජානන් වහන්සේ එසේ දුවන්නා වූ ඒ ඇතා දැක "පාරිලෙය්‍යකය! නවතින්න! පැත්තකට වන්න! ඔය එන්නේ මාගේ උපස්ථායකයා ය"යි වදාළ විට, ඇතා සොඬින් ගත් පොල්ල පැත්තක දමා, උන්වහන්සේගෙන් පා සිවුරු ඉල්ලී ය. උන්වහන්සේ ඒ නො දුන්හ. ඇතා "මේ ස්ථවිරයන් වහන්සේ හොඳින් හැදුනු වැඩුනු උගත් කෙනෙක් නම් බුදුරජුන් වැඩ හිඳිනා ගල්ලෑල්ලඋඩ තමන්ගේ පා සිවුරු නො තබති" යි සිතී ය. උන්වහන්සේ ද තම පා සිවුරු බිම තැබූහ. **"හොඳින් හැදුනු වත්තසම්පන්න සුවිනීත ශිෂ්‍යයෝ ගුරුන්ගේ අසුනක යහනක තමන් අයත් පිරිකර නො තබති"**

මෙසේ උන්වහන්සේ තම පා සිවුරු බිම තබා බුදුරජුන් වැඳ පසෙක හුන්නෝ ය. එවිට බුදුරජානන් වහන්සේ "ආනන්දය! තමුසේ හා එක් ව ආ අනික් භික්ෂූහු දැන් කොහි දැ" යි අසා වදාළ කල්හි, "බුදුරජුන්ගේ අදහස නො දන්නා බැවින්, ඔවුන් වනයෙන් පිටත නවතා තනි ව ආයෙමි" යි උන්වහන්සේ කීහ. ඒ භික්ෂූන්

මෙහි කැඳවා ගෙණ එන්නැ" යි වදාළ විට, තෙරුන් වහන්සේ එසේ කළහ. ඉක්බිති බුදුරජානන් වහන්සේ ඔවුන් හා පිළිසඳර කතාවෙහි යෙදී සුවදුක් විචාළහ. ඒ අතර ඔවුහු "භාග්‍යවතුන් වහන්ස! බුදුරජානන් වහන්සේ බුදුබැවින් සියුමැලි වන සේක, රජකුලයෙහි බැවිනුත් සියුමැලි සේක, මේ නිසා තෙමසක් තනි ව මේ කරණ ලද්දේ අනුන්ට කරණු බැරි වැඩක් ය. වත් පිළිවෙත් කරන්නෙක් ද මෙහි නැත, මුව දෝනා පැන් ටිකක් දෙන්නට වත් එකෙක් නැත, මෙය අතිශය දුෂ්කරයෙකැ" යි කීහ. එවිට බුදුරජානන් වහන්සේ "මහණෙනි! මේ ඇත්රජ තෙමේ මාගේ සියලු කටයුතු නො පිරිහෙළා කලට වේලාවට මැනැවින් කෙළේ ය, මෙවැනි හොඳ ගුණවත් සහායයෙක් යමකුට සිටී නම්, ඔහු හා එක් ව විසිය යුතු ය, යමකුට එවැන්නෙක් නො වේ නම්, ඔහුට තනි ව වාසය සුදුසු ය" යි වදාරා "සියලු අවස්ථාවන්හි එක් ව හැසිරෙන යහපත් පැවැතුම් ඇති නුවණැති යහළුවකු ඉදින් ලබන්නේ නම්, ඔහු සිහි ඇති ව සියලු උවදුරු නසා ඔහු සමග සතුටු සිතින් වසන්නේ ය, යම් ලෙසකින් එබඳු යහළුවකු නො ලබන්නේ නම්, දිනූ රට හැර දමා ගිය මහාජනකරජු සේ ද, වන වැසි මාතඞ්ග ඇතු සේ ද එකලා ව හැසිරෙන්නේ ය, ඒ එකලා ව විසීම උතුම් ය, හිතකර ය, බාලයා කෙරෙහි යහළුබවෙක් නැත, වන වැසි මාතඞ්ග ඇතු සේ උත්සාහවත් ව තනි ව හැසිරෙන්නේ ය, පව්කම්, නො කරන්නේ ය"යි කියා ත් වදාළ සේක.

මේ දෙශනාවගේ අවසානයෙහි ඒ පන්සියයක් දෙනා වහන්සේ එ කෙණෙහි ම රහත් වූහ. ඉක්බිති ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනේපිඩුසිටු ආදීන්ගේ ඉල්ලීම දන්වා "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! අනේපිඩුසිටුතුමා ප්‍රධාන කොට ඇති පස්කෙළක් ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ බුදුරජානන් වහන්සේ සැවැත්නුවරට වැඩමවාගන්නට බලාපොරොත්තු වෙති" යි කීහ. "එසේ නම් පා සිවුරු ගන්නැ"යි පා සිවුරු ගන්වා ගෙණ සැවැත්නුවරට වඩින්නට එ තැනනින් නික්මුනු සේක. එ කෙණෙහි ඇත්රජ තෙමේ මග හරහට සිටියේ ය. "ස්වාමිනි! ඇතා කුමක් නිසා මෙසේ කෙරේ දැ?"යි ඇසූ කල්හි මූ තමුසේලාට දනක් දෙන්නට බලා පොරොත්තු වේ, මෙ තෙමේ මට බොහෝ කලක් උපකාර කෙළේ ය, කොහොමත් මේ සතාගේ සිත රිදවන්නට සිත නරක් කරන්නට නො වටී, ඒ නිසා තමුසේලා කවුරුත් අද නැවතී යවු"යි වදාරා බුදුරජානන් වහන්සේ ද පන්සියයක් භික්ෂූන් සමග නැවතුනු සේක. ඇතා කැලයට ගොස්, කොස් කෙසෙල් අඹ දඹ දෙඩම් ආදී වූ පළතුරු

රාශියක් එකතු කොට පසු දා භික්ෂූන්ට පිළිගැන්වී ය. එහෙත් එකතු කොට තුබූ පළතුරු එයින් නිමාවට නො ගියේ ය.

වළඳා අවසානයෙහි බුදුරජාණන් වහන්සේ පා සිවුරු ගෙණ සැවැත්නුවරට වඩින්නට මගට පිළිපන් සේක. එදා ඇතා භික්ෂූන් වහන්සේලා පසු කොට ගොස් බුදුන් ඉදිරියෙහි හරහට සිටියේ ය. භික්ෂූන් ඒ ගැණ ඇසූ කල්හි "මහණෙනි! මේ තෙමේ තමුසේලා පිටත් කොට යවා මට මෙහි නවතින්නැ' යි කියා" යි වදාළාහු ය. අනතුරු ව උන්වහන්සේ ඇතුට කතා කොට "ඇත්රජ! මේ ගමන මට කොයි ලෙසකින් වත් නවතාලන්නට බැරි ය, තට මේ ආත්මභාවයෙන් ඥානවිදර්ශනාමාර්ගඵලයක් නො ලබනු හැකි ය, එ හෙයින් සිත සතුටු කොට ගෙණ මෙහි ම නවතුව, මට යන්නට ඉඩ දෙව" යි වදාළ කල්හි ඇතා සොඬ කටෙහි ලා ගෙණ හඬ හඬා බුදුරජුන් පසුපස ගියේ ය. ගමට ළංවන තුරු ම පසුපස හඬමින් ආ ඇත්රජුට "පාරිලෙය්‍යකය! මෙ තැන් සිට තා යායුතු නැත, එ හෙයින් මෙහි නවතුව, තට මෙ තැන් පටන් ඉදිරිය යොග්‍ය භූමිය නො වේ, ඒ මනුෂ්‍යභූමිය යි, මිනිසුන් හැසිරෙන බිම යි, ඒ බිම තට උවදුරු සහිත ය, එහෙයින් ඉදිරියට නො යා යුතු ය"යි නැවැත ද වදාළ සේක. එවිට ඌ හඬ හඬා මොර දෙමින් එහි නැවතී සිට ඉදිරියෙහි වඩිනා බුදුරජුන් තමන්ගේ ඇසට නො පෙණියත් ම සෝකයෙන් ලය පැළීයියෙන් කලූරිය කොට බුදුරජුන් කෙරෙහි කළ පහන් සිතින් තව්තිසා දෙව්ලොව උපන.

බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් සමග දෙව්රමට වැඩි සේක. කොසඹෑනුවර වැසි භික්ෂූහු බුදුරජුන් දෙව්රමට වැඩිය බව අසා බුදුරජුන් කමා කරගන්නට එහි ගියහ. කොසොල්රජු "කලහකාරකභික්ෂූන් බුදුරජුන් වෙතට එත් ය"යි අසා එයට කලින් බුදුරජුන් වෙතට ගොස් "ස්වාමීනි! මේ කලහකාරක වූ උන්නාන්සේලාට මාගේ රටට ඇතුල් වන්නට ඉඩ නො දෙමි"යි කී කල්හි "මහරජ! ඒ උන්නාන්සේලා සිල් ඇත්තෝ ය, හුදෙක් එකිනෙකා විනයයෙහි එන කරුණු ගැණ වාද කිරීමෙන් හටගත් අමනාපය උඩ මා දුන් අවවාදය නො පිළිගත්හ, දැන් එන්නෝ මා කමා කරවාගන්නට ය, ඒ නිසා ඔවුන්ට එන්නට ඉඩ හැරිය යුතු ය"යි වදාළ සේක. අනේපිඬුසිටු තෙමේ "ඔය සැඩ පරුෂ නො භික්මුණු උන්නාන්සේලාට මාගේ විහාරයට ඇතුල් වන්නට ඉඩ නො දෙමි" යි කී ය. "මහසිටු! එසේ නො කළයුතු, මේ කොලාහලය නිසා ඒ උන්නාන්සේලා දුශ්ශීලයෝ නො වූහ, ඒ නමලා සිල්වත් ය" යි වදාළ කල්හි සිටු තෙමේ නිහඬ විය. ඒ අතර ඒ භික්ෂූහු දෙව්රමට පැමිණියහ. බුදුරජාණන් වහන්සේ

ඔවුන්ට ඉඩ පහසු ඇති පැත්තක සෙනසුන් පිළියෙළ කරවා දුන්හ. එහි වැසි අතික් භික්ෂූන් වහන්සේලා ඔවුන් හා එකට නොහිඳිත්. නොසිටිත්. ඔවුන් හා කිසිවක් කතා නොකෙරෙත්. එහි පැමිණියෝ "කලහකාරක වූ උන්නාන්සේලා කවුරු දැ" යි බුදුරජුන් අතින් විචාරත්. උන්වහන්සේ "ඒ මොවුනැ" යි දක්වත්. "මේ ඒ කොලාහලකාරයෝ දැ?" යි එහි රැස්වූවන් විසින් ඇඟිලි දික් කොට කියනු ලබන්නෝ ලජ්ජාවෙන් හිස ඔසවන්නට නොහැකි ව බුදුරජුන්ගේ යිරිපාමුල වැටී බුදුරජුන් වැඳ කමාකර වූහ. එකල්හි උන් වහන්සේ "මහණෙනි! තමුසේලා විසින් කරණ ලද්දේ ඉතාබැරැරුම් නොකියැකි තරමේ සැහැසි කමෙක් ය, මා වැනි බුදුවරයකු වෙත පැවිදි ව කොලාහල නොකරවු, එක් වවු, සමඟි වවු' යි කී කල්හි ද, සමඟි නොවූ වහු ය, පැරණි පඬිවරු මවු පියන්ගේ අවවාදය නිසා, ඒ මවු පියන් ජීවිතයෙන් තොර කරණ කල්හි ද, ඒ ඉවසා සිටියහ, එසේ ඉවසා සිටි එක් නුවණැති පුරුෂයෙක්, කාසි - කොසල දෙරටෙහි රජකම හා හැම යසිසුරු ලැබී ය" යි වදුරා නැවැත කොසම්බිකජාතකයන් වදාළ සේක. "කරුණු මෙසේ බැවින් මාගේ වචනය නොපිළිගැණීමෙන්, නොසලකා හැරීමෙන් තොප කලේ මහසැහැසිකමෙකැ" යි වදුරා මේ ගාථාව දෙසූ සේක.

පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා'ති.

මෙහි සහමැද (කොලාහල කරණ අන්‍යයෝ "අපි නැසෙමු" යි නොදනිත්. එහි යම් කෙනෙක් වනාහි ("අපි නැසෙමු" යි) දනිත් ද, ඒ හෙතුයෙන් කලහයෝ සංසිඳෙත්.

නොහොත් මාගේ නොවන්නෝ "අපි මේ සහමැද (කලහ වැඩීමට) උත්සාහ කරම්හ" යි නොදනිත්. එහි (යම් කෙනෙක් "අපි කලහ වැඩීමට උත්සාහ කරම්හ" යි) දනිත් ද, ඒ හෙතු කොට කලහයෝ සංසිඳෙත්.

පරෙ ච න විජානන්ති මයං එත්ථ යමාමසෙ = මෙහි සහමැද (කොලාහල කරණ) අන්‍යයෝ "අපි නැසෙමු" යි නොදනිත්.

මෙහි කලහකරුවෝ ය, අන්‍යයෝ. ඔවුහු නුවණැත්තෝ නොවෙති. නුවණැත්තන්ගෙන් බැහැර වූවෝ ය ඔවුහු. මේ අටුවා ය:- **"පණ්ඩිතෙ ඨපෙත්වා තතො අඤ්ඤෙ භණ්ඩනකාරකා පරෙ නාම"** යනු. ඔවුහු සහමැද කොලාහල කරන්නෝ "අපි නැසියන්නෙමු, එ තැනින් මරහු සමීපයට යමු" යි නොදනිත්. මෙන්න ඒ අටුවා:- **"තෙ තත්ථ සඞ්ඝමජ්ඣෙ කොලාහලං කරොනතා**

මයං යමාමසෙ උපරමාම නස්සාම සතතං සමිතං මච්චු සන්ති කං ගච්ඡාමාති න ජානන්ති'' යනු.

යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා = එහි යම් කෙනෙක් දනිත් ද, ඒ හෙතුයෙන් කලහයෝ සංසිඳෙත්.

සඟමැද ඔවුන් අතුරෙහි යම් නුවණැති කෙනෙක් වෙත් නම්, ඔවුහු "අපි මරහු සමීපයට යමු"යි දනිත්. මෙසේ දත් ඒ නුවණැත්තෝ වනාහි නිතර යොනිසොමනසිකාරය උපදවා ලීමෙන් කලහයන්ගේ සංසිඳීම පිණිස පිළිපදිත්. එකල ඔවුන්ගේ ඒ ප්‍රතිපත්තියෙන් කලහයෝ සංසිඳෙත්. මෙන්න අටුවා:- **"යෙ තත්ථ පණ්ඩිතා මයං මච්චුසමීපං ගච්ඡාමාති විජානන්ති, එවං හි තෙ ජානන්තා යොනිසොමනසිකාරං උප්පාදෙත්වා මෙධගානං කලහානං වූපසමාය පටිපජ්ජන්ති, අථ නෙසං තාය පටිපත්තියා තෙ මෙධගා සම්මන්ති''** යනු.

මෙහි **පරෙ,** යන්නෙහි අර්ථය තවත් ලෙසකින් පැහැදිලි කෙරෙත්. ඒ නම් "කොලාහල නො කරවු, විවාද නො කරවු, එකතු වවු, සමගි වවු" යනාදි ලෙසින් කලහයෙහි විපත හා සමගියෙහි සැපත දක්වා, මා විසින් අවවාද කරණ ලද්දෝ ද, මාගේ ඒ අවවාද නො පිළිගත් බැවින් අවවාද කළ ඒ මා කෙරෙහි මමත්වය නැත්තෝ ය, මාගේ අවවාද නො පිළිගත් බැවින් මාගේ නො වන කලහකාරයෝ ය" යනුයි. **"පරෙ චාති පුබ්බෙ මයා මා භික්ඛවෙ භණ්ඩනංති ආදිනි වත්වා ඔවදියමානාසි මම ඔවාදස්ස අපටිගගහණෙන අමාමකා පරෙ නාම''**යි ඒ විස්තර කළ සැටි යි.

සඟමැද කොලාහල කරණ ආපත්ති – අනාපත්ති – යුක්ති – අයුක්ති ඇත්ත නැත්ත තෝරා බේරා ගැණීමෙහි අපොහොසත් නුවණ නැති කොලාහලකරුවෝ "අපි මේ නිසා මේ හෙතුකොට එ ලොව මෙ ලොව දෙකින් ම පිරිහෙමු"යි නො දනිත්. ඒ තොප අතුරෙහි නුවණැති යම් කෙනෙක් එසේ දැන සලකා සිතා බලා කලහ සංසිඳවීමට උත්සාහ කෙරෙත් ද, ඒ හේතුයෙන් කලහයෝ සංසිඳෙත්.

මාගේ නො වන කලහකාරකභික්ෂූහු "අපි ඡන්දාදීවශයෙන් ලාමක පව්ටු අදහස් ඉදිරිපත් කොට මේ සඟමැද කලහ වැඩීමට ව්‍යායාම කරම්හ"යි නො දනිත්. ඒ තොප අතුරෙන් යම් කෙනෙක් ඒ දනිත් ද, ඒ නිසා මෝඩකමින් උපන් කලහයෝ සංසිඳෙත්. කරුණු දත් නුවණැත්තන් නිසා කලහයෝ සංසිඳෙත්.

පරෙ යනු, ප්‍රථමා බහුවචන යි. ප්‍රකෘතිය **"පර"** යනු යි. එය පසම්තුරු – උත්තම – අන්‍ය – පශ්චාද්භාව යන අරුත්හි එයි. මෙහි ආයේ අන්‍යාර්ථයෙහි ය. එ හෙයින් මෙහි සර්වනාමැ යි ගැණේ. ප්‍රථමාබහුවචනයෙහි "පරෙ"යි ආයේ එබැවිනි.

ච යනු, නිපාත යි. සම්පිණ්ඩන – සමාහාර – අන්වාචය – ඉතරි තරයොග – පදපූරණ – අවධාරණ – විකල්ප – ව්‍යතිරෙක යන අරුත්හි එන්නෙකි ඒ. මෙහි පදපූරණයෙහි ආයේ ය.

මෙධගා යනු, කලහයෝ ය. **"අත්තනො නිස්සයං ච පරං ච මෙධමානො ගච්ඡතීති = මෙධගො"** යනු නිරුක්ති යි. තමන් පිළිබඳ වූවත් හා තමන් පිළිබඳ නොවූ අන්‍යයන් හිංසා කරණුයේ නසනුයේ මෙධග යි. මෙධග නම් කලහය.

කොසම්බකවසතුව නිමියේ ය.

චූලකාල මහාකාලස්ථවිරයන් වහන්සේලා

1 – 6

සෙතව්‍යනුවරු, චූලකාල – මජ්ඣිමකාල – මහාකාල යි සහෝදරයෝ තිදෙනක් වූහ. තිදෙනා ම ධනපතියෝ ය. උන් අතුරෙන් චූලකාල – මහාකාල දෙදෙනා නොයෙක් ඇත පළාත්හි ගොස් ඇවිද, බරකරත්තවලින් බඩු ගෙණැවිත් විකිණීමට මජ්ඣිම කාලයාහට භාර දෙන්නෝ ය. ඔහු ඒ සියලු බඩු නියමිත ගණනට විකුණා, මුදල් රැස් කරයි. එක් කලෙක මහාකාල-චූලකාලයෝ, බර කරත්ත පත් සියයකට බොහෝ බඩු පටවා ගෙණ සැවැත්නුවරට පැමිණ, නුවරටත් දෙව්රම් මහවෙහෙරටත් අතර තැනක කරත්ත ලිහා විඩා සංසිඳුවමින් උන්හ. එදා සවස මහාකාල තෙමේ සුවඳමල් සුවඳකුරු සුවඳසුණු සුවඳතෙල් පහන් අත් පුරා රැගෙණ බණ අසන්නට විහාරයට යන ආර්‍යශ්‍රාවකයන් දැක ඔවුන් විචාරා "මම ත් බණ අසන්නට යමි"යි ඔවුන් හා එක් ව විහාරයට ගොස් බුදුරජුන් වැඳ ධර්මශාලාවේ කෙළවරක වාඩි ගෙණ බණ අසමින් හුන්නේ ය.

බුදුරජානන් වහන්සේ එහි ධර්මශාලායෙහි කොණකට වී හුන් මහාකාලයා දැක ඔහුගේ අදහස් බලා ඒ අදහසට අනු ව දුක්ඛඛන්ධ සූත්‍රාදීන්ගේ වශයෙන් කාමයෙහි දොස් කාමයෙහි ලාමකකම් කාමයෙහි කිලිටි බැව් හා පැවිද්දෙහි අනුසස් දැක්වෙන පිළිවෙළ කතාව වදාළ සේක. මහාකාල තෙමේ මිහිරිහඬින් දෙසූ ඒ බණ කතාව අසා "අය්යෝ! අප කරණු කුමක් ද, පරලොව යන්නහු තමන් වෙහෙස විඳ දුකින් පෙළෙමින් මිරිකෙමින් සැපයූ සියලු දේපල හැර යා යුතු නො වේ ද, මේ මොක ද, භොගයෝ නෑදැයෝ කිසිකෙනෙක් පරලොව යන්නහු පසු පස්සේ නො යති, ඉතින් ගිහිකම් කිරීමෙන් ඇති ඵලය කුමක් ද, මම පැවිදි වෙමි, මට මේ කිසිවක් වුවමනා නැතැ"යි සිතට ගෙණ බණ අවසන්හි රැස් ව හුන් මිනිසුන් විහාරයෙන් පිට වී ගියකල්හි බුදුරජුන් වෙතට ගොස් "ස්වාමීනි! මා පැවිදි කරන්නැ"යි කියා සිටියේ ය. බුදුරජුන් "මහාකාලය! පැවිදි වන්නට නම් මවු පියන්ගෙන් අවසර වුවමනා ය, මවු පියෝ ජීවතුන් අතර නැද්ද? එසේ නම් එයට සුදුසු නෑයකුගෙන් අවසර ලබාගත යුතු ය"යි වදාළ විට "ස්වාමිනි! මට බාලසහෝදර යෙක් සිටි"යි කී ය. "ඒ ඇති, එසේ නම් පැවිදිවන බව ඔහුට දන්වා අවසර ගෙණ මෙහි එන්නැ"යි කී විට ඔහු ඉතා යුහු ව මලනුවන් කරා ගොස්, "මල්ලී! අපට අයත් මේ සියලු මිල මුදල් බඩු මුට්ටු උඹට භාර යි, නුඹ මේ සියල්ල හොඳින් බලා සොයා ගෙණ කටයුතු කරන්නැ"යි මලයාට පැවැරී ය. එකල චූලකාල තෙමේ "අය්ය!

ඇයි! එහෙම කියහි?" යි ඇසී ය. "මම බුදුහාමුදුරුවන් ලඟ පැවිදි වෙමි, මට මේ කිසිවකින් වැඩෙක් නැත, මෙයින් ප්‍රයෝජන නුඹටැ"යි කී ය. චූලකාල තෙමේ මෙය වෙනස් කරන්නට නොයෙක් ලෙසින් මහන්සි දැරී ය. කරුණු කී ය. එහෙත් නො හැකි විය. අන්තිමේදී "අය්යා! මා කියන්න නො පිළිගණිහු නම් කැමැත්තක් කරන්නැ" යි කියේ ය. එවිට මහාකාලයා බුදුරජුන් වෙත ගොස් පැවිදි ව මහණපිළිවෙතෙහි යෙදී වසන්නේ යහතින් කල් දවස ගත කෙළේ ය. මේ අතර කාලයෙහි චූලකාල තෙමේ සහෝදරයාගේ වෙන්වීමෙන් හටගත් සිත් තැවුල් ඇත්තේ සහෝදරයා න් සිවුරු හරවා ගෙණ එමි"යි සිතා තෙමේ ත් ගොස් පැවිදි වී ය.

පැවිද්දෙන් ටික දිනකට පසු මහාකාල තෙමේ උපසම්පදාව ලබා බුදුරජුන් වෙතට ගොස් වැඳ "සසුනෙහි පැවිදිවූවන් විසින් පිළිපැදිය යුතු වූ ධුරයෝ කොතෙක් දැ?යි ඇසී ය. උන්වහන්සේ ඒ පිළිබඳ තොරතුරු වදාළවිට, "ස්වාමීනි! මාගේ වයස දැන් ගෙවී ගොස් ය, එහෙයින් මට ග්‍රන්ථධුරය පුරණු නො හැකි ය, විදර්ශනා ධුරය පිරිස හැකි ය, මට එයට කමටහන් වදාරණු මැනැවැ"යි උන්වහන්සේ වෙතින් රහත්බව දක්වා කමටහන් කියවා උගෙණ, සොසානිකධුතඔඝය සමාදන් ව ගෙණ, මහරු ගෙවල සියලු දෙනා නින්දට ගිය පසු, සොහොනට ගොස්, භාවනායෙහි යෙදී හිඳ, එළිවැටෙන්නට කලින් මිනිසුන් නින්දෙන් නැඟිටින්නට පෙර විහාරයට එයි.

එදා, කාලී නම් සොහොන් ගොවු දුවක් එම සොහොන භාර ව සිටියා ය. ඕ තොමෝ තමන් නො දන් කිසිවකු එහි උන් සිටි තැන් දැක, "කවරෙක් මෙහි ඒ දැ"යි විපරම් කරමින් හුන්නි ද ඒ දැනගන්නට නො හැකි වූ ය. දිනක් ඕ තොමෝ සොහොන් පැලෙහි පහන් දල්වා, දූ පුතුනු ත් සමග ගොස්, එහි පසෙකට වී නො නිදා බලා සිටියා ය. එදා මහරු මහාකාල සථවිරයන් වහන්සේ පෙරසේ භාවනා කරන්නට සොහොනට පැමිණියහ. කාලිය තෙරුන් දැක "ස්වාමීනි! මේ තැනැ වසන්නහු ඔබ වහන්සේ දැ?"යි ඇසූ ය. සථවිර තෙමේ "එසේ ය, උපාසිකාවෙනි"යි පිළිතුරු දින. ඕ තොමෝ "ස්වාමීනි! සොහොනැ වසන්නන් විසින් පිළිපැදිය යුතු ක්‍රම කිහිපයෙක් තිබේ, ඔවුන් ඒ සියල්ල මැනැවින් දැන ගෙණ ඒ හැටියට සොහොනෙහි විසිය යුතු ය"යි කිවූ ය. "කිම, අපි ඔය සොහොන්ගොවුදුව කියන හැටියට වසන්නමෝ දැ?"යි නො කියා, උන්වහන්සේ "අප විසින් පිළිපැදිය යුතු සැටි කියන්නැ"යි කීහ. "ස්වාමීනි! සොහොනැ වසන්නන් තමන් සොහොනෙහි වසන බව, සොහොන් පල්ලන්ට, විහාරයෙහි මහතෙරුන්ට,

ගම්මුලාදැනියාට දැන්විය යුතු ය, හොරු මිනිසුන් ලුහු බඳනාවිට හොරකම් කළ බඩු ත් රැගෙණ සොහොනට දුවැවිත් තමන්ගේ නිදහස පිණිස ඒ සොර බඩු සොහොනෙහි දමා පලා යන්නෝ ය, සොරුන්ගේ පස්සේ දුව එන මිනිස්සු සොහොනෑ වසන්නන් අල්ලා, සොරු මොවුහු, යි බැඳගෙණ තැළීම් පෙළීම් කරන්නෝ ය, තමන් සොහොනෙහි වසනබව, සුසානපාලකාදීන්ට කලින් කියා සිටි කල එබඳු අකෝරයන්ට අසු නො වෙති, ඔවුහු ඒ හැම උවදුරක් ම වළකාලති, තව ද සොහොනෑ වසන්නන් විසින් මත්ස්‍යමාංස හා පිටියෙන් කළ තෙලින් බැඳි කැවිලි නො කෑ යුතු ය, දෑවල නො නිදිය යුතු ය, අලසයකු නො විය යුතු ය, ඊර්ෂ්‍යය ඇත්තකු විය යුතු ය, කපටිකම් රැවටිලිවලින් හා කුහක අදහස්වලින් වෙන් විය යුතු ය, ඉතාහොඳ පිවිතුරු අදහස් ඇත්තන් විය යුතු ය, සියල්ලන් නිදි ගත් පසු විහාරයෙන් ආ යුතු ය, උදැසන කිසිවකු නින්දෙන් නැගී සිටින්නට පෙරුතු ව වෙහෙරට යා යුතු ය, මේ කී ලෙසට ඔබ එහන්සේ මෙහි වසන්නහු නම්, ඔබ වහන්සේගේ අදහස් පරිදි පැවිදිබව මුදුන් පමුණුවා ගත හැකි ය, මිනිසුන් මළසිරුරු මෙහි ගෙණා කල්හි, මම ඒ මළ සිරුරු කම්බිලිවලින් කුඑගෙවල් සාදා, එහි නංවා සුවඳ මල් ආදියෙනුත් සත්කාර කොට දවන්නෙමි, එසේ කරන්නට නො හැකි වූ විට, කුඩාදරසැයක් සාදා එය දල්වා, උලෙන් එලියට ඇද පොර වෙන් කොටා, කුඩා කුඩා කැලි කොට ගින්නෙහි ලා දවන්නෙමි"යි කිවු ය. එවිට මහාකාල සථවිර තෙමේ "හොඳ යි, උපාසිකාවෙනි! මම ඒ සියල්ල, උපාසිකාව කී ලෙසට කරමි, යම් දිනෙක මළසිරුරක් මෙහි ගෙණාවොත්, එය මට දන්වන්නැ"යි කියා විහාරයට ගියේ ය. ඕ තොමෝ එය "එසේ ය"යි පිළිගත්තා ය මහාකාල සථවිර තෙමේ ඉතා සතුටින් දැන් මහණදම් කරයි. ඔවුන් සහෝදර වූ චූලකාල තෙමේ මහණකම් පසෙක තබා, භාවනාවක නො යෙදී නිතර ගේ දොර ගැණ සිතමින් දවස් යවයි අඹුදරුවන් ගැණ සිහි කරයි. "මාගේ අය්යා කරන්නේ ඉතා බැරෑරුම් වැඩෙකැ"යි ද සිතයි.

මේ අතර, හදිසි ලෙඩකින් කලුරිය කළ සත්‍රියකගේ නොමැලවුනු මළසිරුරක් නාදුනිතමිතුරෝ දර පොල්කටු තෙල් රෙදි ආදිය ත් රැගෙණ, සවස සොහොනට ගෙණවුත් සොහොන් ගොවු දුවට "මේ මළසිරුරු දවන්නැ"යි කියා භාර කොට ඒ පිණිස කුලිය ද දීලා ගියහ. කාලිය ඒ මළසිරුර ඔතා තුබූ රෙද්ද ඉවත් කොට, එ වේලෙහි මළ බැව්ත් වෙනස් ව නො ගිය සිරුරු බලා, "මෙය හාමුදුරුවන්ට දුක්විමට සුදුසු අරමුණෙකැ"යි තෙරුන් වෙත ගොස් වැඳ, "හොඳ අරමුණෙක් ලැබී තිබේ, බලන්නට වහින්නැ"යි

කිවු ය. උන් වහන්සේ වහා ගොස් ඕතා තුබූ රෙද්ද ඉවත් කරවා, පතුල පටන් කෙස් අග දක්වා මළසිරුර ගැණ සලකා "මේ රූපය තදින් පිණාගිය එකෙක, එසේ ම රත්වන් ය" යි සිතට ගෙණ "ගින්නෙහි බහා ගිනිදැලින් ඇවිළ ගත් විට කියන්නැ"යි කියා තමන් වසන ආවාසයට ගියහ. කාලිය එසේ මළසිරුර ගින්නෙහි බහා තෙරුන්ට දැන් වූ ය. උන්වහන්සේ එහි ගොස් එය බැලූහ. මළසිරුරෙහි ගිනිදැල් වැදුනු කැන් කබර දෙනකගේ සිරුරු පැහැය ගෙණ තුබුනේ ය. පා තුන හතරට නැවී ගියේ ය. අත් වකුටු විය. නළලෙහි හම ගැලවී ඵුබුනේ ය. මේ මළසිරුර බලා තමන් වසන තැනට ගිය සථවිර තෙමේ "දැන් මේ සිරුර කිසිවකුගේ ද සිත් ගත්නේ නො වේ, ඒ තබා බලන්නට ද සිත් නො දේ" යි සිතමින් **"එකාන්තයෙන් සංඛාරධම්මෝ සඳකල්හි නොද පවතින් නෝය, ඉපිද නැසෙන සභාවය ඇත්තෝ ය, සංඛාරයෝ ඉපිද නැසෙති, මෙසේ ඉපිද නැසෙන සංඛාරධම්මයන්ගේ සංසිඳීම සැප වේ"** යන දෙශනාවට අනු ව විදසුන් වඩා භාවනා කොට සිවුපිළිසිඹියාවන් ද ලබමින් රහත් වූයේ ය.

මේ දවස, සම්මා සම්බුදුරජානන් වහන්සේ භික්ෂුසඞ්ඝයා ත් සමග දනවු සැරි සරන සේක්, සෙතව්‍යනුවර ඇවිළේරිය වනයට වැඩම කළ සේක. බුදුරජුන් සෙතව්‍යනුවරට වැඩම කළ බව දත් චූලකාල තෙරුන්ගේ භාය්‍යාවෝ "අපගේ සවාමියා සිවුරු හරවා ගණිමු" යි කතා බස් කොට, පසු දා දානයට භික්ෂුසඞ්ඝයා ත් සමග ගෙදරට වඩින්නට බුදුරජුන්ට ආරාධනා කර වූහ. දත් පිණිස ආරාධනා කළ ගෙදර නුපුරුදු ගෙදරක් නම්, එහි බුදුරජුන්ට අසුන් පැණවීමට භික්ෂු නමක් කලින් එ තැනට යා යුතු මේ. එය සිරිති. අසුන් පණවන තැන බුදුරජානන් වහන්සේට මැද අසුන් පණවා, එහි දකුණුපස ත් වම්පස ත් සැරියුත්-මුගලන් දෙනමට අසුන් පැණවිය යුතු ය. එතැන් පටන් දෙපසෙහි අනික් දෙනාවහන් සේට අසුන් පැණවෙන්නේ ය. එ හෙයින් එදා මහාකාල සථවිරයන් වහන්සේ අසුන් පණවන්නට චූලකාල සථවිරයන් කලින් එහි යැවූහ. ගෙදර අය උන්වහන්සේ එහි ගිය වේලේ පටන් කෙළි කවටකම් කරන්නට පටන් ගත්හ. ඔවුන්, කුඩා මිටි අසුන් සඞ්ඝ සථවිරයන් වැඩ හිඳිනා කෙළවර ත් උස් අසුන් සඞ්ඝනවකයා හිඳිනා කෙළවර ත් තබා පිළියෙල කරණ විට "මේ අසවු, කුඩා මිටි අසුන් සඞ්ඝසථවිරයන් වහන්සේ වැඩ හිඳිනා කෙළවර නො තබවු, උස් අසුන් සඞ්ඝනවකයා හිඳිනා කෙළවර නො තබවු, උස් අසුන් සඞ්ඝසථවිරයන් වහන්සේට ත් කුඩා මිටි අසුන් සඞ්ඝ නවකයන් පිණිස ත් පණවන්නැ" යි චූලකාල තෙරණුවෝ කීහ. ගෙයි හුන් ගැණු තෙරුන්ගේ මේ නියමය නො ඇසෙනවුන් සේ

"හා! ඔයා මොක ද දැන් කරන්නේ?, ඔයාට නරක ද අසුන් පණවන්නට?, ඔයා කාගෙන් අසා බලා ද මහණ වූයේ?, ඔයා මහණ කළේ කවු ද?, කොයි ද යසට තුබුනු කොණ්ඩය?, කෝ රුවුල?, අපට කන්නට අඳින්නට දෙන්නේ කවු ද? අපි කවුරුන් ගැණ බලාපොරොත්තු වෙමු ද?, මේ දරුවෝ?, මොක ද මෙහි ආයේ"යි බැණ වදිමින් හැඳ පොරොවා තුබූ සිවුරු ගලවා, පැත්තක දමා, මල්වඩමක් හිසෙහි තබා, "යන්න බුදුන් වැඩමවා ගෙණ එන්න, අපි අසුන් පණවන්නෙමු" යි කියා පිටත් කොට යැවූහ. **"පැවිදි වූ අලුත ම සිවුරු හැර යන්නන්ට එසින් ලජ්ජාවක් නුපදී"** යි. එහෙයින් චූලකාලයා ද තම අඹුවන් විසින් ගැන් වූ වෙසයෙන් ම අමුත්තක් නො මැති ව විහාරයට ගොස්, බුදුරජුන් ප්‍රධාන මහා සඞ්ඝයා වහන්සේ වැඩමවා ගෙණ, ගෙට පැමිණියේ ය. හැම දෙනා එකතු ව උන්වහන්සේලා අසුන්වල වඩා හිඳුවා, මැනැවින් පිළියෙල කොට තුබූ දානය වැලඳෙව්වාහු ය. උන්වහන්සේලා වලඳ අවසන් කොට දහම් දෙසා විහාරයට වැඩියහ. එ වේලෙහි මහාකාල තෙරුන්ගේ අඹුවෝ "චූලකාලයන්ගේ අඹුවන් කළ වැඩේ ඉතා කදිම යි, තැනැ තැනැ හුන් ගැණුන් මෙහි ගෙණැවිත් උන් අතරමං කොට අතහැර යෑම මොන මිනිස් කමෙක් ද, ඇලා කළ වැඩේ කිසි වරදෙක් නැත, අපිත් අපේ එක්කෙනා ගලවා ගණිමු" යි කතා කොට, කවුරුත් එකමනින ව පසු දා දානයට ත් එහිදී ම ආරාධනා කළහ.

එදා අසුන් පැණවීමට මහාකාල තෙරණුවෝ එහි නො ගියහ. අන් භික්ෂූ නමක් ඒ පිණිස එහි ගියේ ය. මහාකාල තෙරුන්ගේ අඹුවන්ගේ අදහස ඒ නිසා ඉටු නො වී ය. ඇලා එයින් කණස්සල්ලට පත් වූහ. ඇලා ම අසුන් පැණවූහ. පසු දා බුඩප්‍රමුඛමහා සඞ්ඝයා වහන්සේ එහි වැඩ, පණවා තුබූ අසුන්හි වැඩ හුන්හ. ඔවුහු දන් පිළිගැන් වූහ. සමහර දෙනා වහන්සේ එහි පණවා තුබූ අසුන්වල ම වැඩ හිඳ දන් වැලඳූ අතර, සමහර දෙනා වහන්සේ පිටතට වැඩියහ. බුදුරජානන් වහන්සේ එහි ම වැඩ හිඳ දන් වලඳ, අවසන් කළ ඉක්බිති මහාකාල තෙරුන්ගේ අඹුවෝ "සවාමිනි! දානානුශංසඪර්මදේශනාවට මහාකාල තෙරුන් මෙහි නවතා වඩිනු මැනැවි, අපි උන්වහන්සේගෙන් බණ අසනු කැමැත්තමිහ" යි කීහ. බුදුරජානන් වහන්සේ ද "යහපතැ" යි මහාකාල තෙරුන් එහි නවතා, අනික් හැම දෙනා වහන්සේ ත් ගෙණ, විහාරයට වැඩිය සේක. එවිට භික්ෂූන් වහන්සේලා ගම්දෙර සිට, "බුදුහාමුදුරුවන් මේ කළේ කුමක් ද, දාන කරණ ලද්දේ ද, නො දාන කරණ ලද්දේ ද, ඒයේ චූලකාලයා අසුන් පණවන්නට ගිය විට අල්වා සිවුරු ගලවා දැමූහ, එයින් ඔහුට මහණකම නැති විය, අද ඒ

පිණිස වෙනෙකකු ගිය බැවින්, එබදු විපතෙක් එබදු නපුරෙක් අද නො වී ය, බුදු හාමුදුරුවෝ මහාකාල තෙරුන් එනි නවතා ආහ, මහාකාල තෙරුන්නාන්සේ නම් සිල්වත්හ, ආචාර සම්පන්නයහ, ඒ නිසා මහණකම රැකේ ද, චූලකාලයාහට අඹුවෝ දෙ දෙනෙකි, මහාකාල තෙරුන්ට අඹුවෝ අටදෙනෙකි, චූල කාලයාගේ මහණකම මෙසේ නැති ව ගියේ නම්, මේ මහාකාල තෙරුන්ගේ මහණකම කෙසේ නම් රැකේ දැ සි අපි නො දනුම්හ" යි විරුඬව කතා කළහ.

බුදුරජානන් වහන්සේ මේ කතාව අසා, "මහණෙනි! නුඹුසේලා මහාකාලයා චූලකාලයා වැනි කොට ගත්තහු ද, එසේ නො ගණිවු, චූලකාලයා වාසය කළේ නිතර නිතර සුඛඅරමුණු අනුව සිත යොදවමින් ය. ඔහු අනිටු අරමුණු නිතර සිතමින් විසී ය, මහණ කම ගැණ සිතක් ඔහුට නො තුබුනේ ය, මාගේ පුතා මහාකාල තෙමේ එසේ නො වේ, ඔහු වාසය කළේ අසුඛඅරමුණුවල සිත යෙදීමෙන් ය, ඒ තැන මහාගල්කන්දක් සේ නිසල ය, එහෙයින් චූලකාලයාට සේ මහාකාලයාට කිසිත් විපතෙක් නපුරෙක් අතෝරයෙක් නො වේ ය" යි වදාරා ඒ කරණු කොට මේ ධම් දෙශනාව ද කළ සේක:-

සුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු අසංවුතං,
භොජනම්හි අමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං,
තං වෙ පසහති මාරෝ වාතෝ රුක්ඛංව දුබ්බලං.

අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං,
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං,
තං වෙ නප්පසහති මාරෝ වාතෝ සෙලංව පබ්බතං,නි.

(රූපාදි අරමුණු) ශුභය යි එක්වන් දක්නා සුලු ව වාසය කරණ ඇස් කන් නාස් ආදී වූ ඉඳුරන්හි සංවර නැති අහරෙහි ද පමණ නො දන් අලස වූ වීර්‍යරහිත ඒ පුද්ගලයා මාර තෙමේ ඒකාන්ත යෙන් මැඩ ගණියි. (කුමක් මෙන්ද යත්?) දුර්ලවෘක්ෂයක් (මුලින් උපුටාලන) වාතයක් මෙනි.

(එක්තරා අශුභයක් හෝ කෙශාදිය) අශුභය යි එක්වන් දක්නා සුලු ව වාසය කරණ ඇස් කන් නාස් ආදී වූ ඉඳුරන්හි මනා භික්මීමක් ඇති අහරෙහි පමණ දන්නා වූ සැදැහැති වැඩි වීර්‍ය ඇති ඒ පුද්ගලයා මාර තෙමේ ඒකාන්තයෙන් නො මැඩ ලයි. (කුමක් මෙන්ද යත්?) ගල්පර්වතක් (සලන්නට අපොහොසත්) වාතයක් මෙනි.

සුභානුපස්සිං විහරන්තං = (රූපාදි අරමුණු) ශුභය යි, එක්වන් දක්නා සුලු ව වසන.

නූගත් මිනිසුන් විසින් දිවා රෑ දෙක්හි ශුභවශයෙන් සිතන කියන අරමුණු සයෙක් ආගමෙහි දක්වන ලද්දේ ය. රූප සද්ද-ගන්ධ-රස-ඵොඨබ්බ-ධම්ම යන මේ ය ඒ. මේ රූපාදිය ය අරමුණු. චිත්ත-චෛතසිකධර්මයන් එල්බගන්නා තැන් ය. දුර්ලපුරුෂයකු විසින් සැරයටි ආදිය එල්බ ගණු ලබන්නා සේ චිත්ත-චෛසික ධර්මයන් එල්බ ගන්නේ මේ රූපාදිය ය. එහෙයිනි ඒවාට අරමුණුය කියන්නේ. **"දුබ්බලපුරිසෙන දණ්ඩාදි විය චිත්තචෙතසිකෙහි ආලම්බියතීති = ආලම්බනං"** යනු ඒ කී පරිදි යි. චිත්ත-චෛත සිකධර්ම යම් තැනෙක ඇලේ නම් ඒ ඇලෙන්නේ රූප - සද්දාදීන් කෙරෙහි ය. එහෙයින් ඒ රූපශබ්දාදිය අරමුණු ය යි කියත්. **"චිත්තචෙතසිකා ධම්මා ආගන්ත්වා එත්ථ රමන්තීති=ආරම්මණං"** යනු ඒ අරුත දැක් වූ සැටි යි. එහෙයින් රූපය, ආලම්බනය යි දෙකක් නැත. රූපය ම ය රූපාරම්මණ නම් වනුයේ. ශබ්දය ම ය සද්දාරම්මණ වනුයේ. සෙස්සද මේ ලෙසින් ගන්න.

එහි **රූප** නම්, ඇසින් දැක්ක යුතු ඇසින් දකින පැහැය යි. **"වණ්ණවිකාරං ආපජ්ජමානං රූපයති හදයඞ්ගතභාවං පකාසෙතීති = රූපං"** වණ්විකාරයට පැමිණීමෙන් හෘද්ගතභාවය පවසනුයේ රූපැ යි එයින් කියන ලද ය. (විස්තරය පිණිස මෙහි පුෂ්පවර්ගයෙහි **"කො ඉමං පඨවිං විජෙස්සති"** යන්නට කළ පරිකථාව බලන්න.) මේ සැකෙවිනි.

ශබ්ද නම්, කණින් ඇසිය යුතු වූ හඬ ය. එය මහාභූත රූපයන් නිසා නැගෙන්නෙකි. ඔවුන්ගේ ගැටීමෙන් හා බිඳීමෙන් ඒ නගින්නේ ය. **"සප්පති සොතවිඤ්ඤෙය්‍යභාවං ගච්ඡතීති = සද්දො"** කණින් දැනගත යුතුබවට පැමිණෙන්නේ ශබ්ද යනු එහි තේරුම යි.

ගන්ධ නම්, නැහැයට ගොදුරු වන දුගඳ සුවඳ ය. නැහැයේ උපකාරයෙන් වහළින් එහි උපදනා විඥානයට දැනෙන්නේ ය. ඝ්‍රාණ විඥානයට දැනෙන්නා වූ රූපධර්මය යි. **"ගන්ධයති අත්තනො වත්ථුං සුචයතීති=ගන්ධො"** තමා පිළිබඳ නිඃශ්‍රයවස්තුව ප්‍රකාශ කරන්නේ ගන්ධ නම් යනු එහි තේරුම යි.

රස නම්, දිවෙන් විඳ ගත යුතු වූ මධුරාදිය යි. දිව නිසා උපදනා විඥානයට දැනෙන්නේ ය. **"රසීයති අස්සාදීයතීති= රසො"** විඳ ගණු ලබන්නේ රසය යනු එහි තේරුම යි. **"රසන්තීතං සත්තා අස්සාදෙන්තීති=රසො"** සත්වයෝ යමක් විඳ ගණිත් ද, ඒ රසය යනු එහි තේරුම යි.

ඵොට්ඨබ්බ නම්, කයින් දතයුතු රූපය යි. කායවිඤ්ඤාණයට දැනෙන්නේ ය. **"ඵුසියතීති = ඵස්සෝ"** සත්වයන් විසින් කාය ප්‍රසාදයේ උපකාරයෙන් වහලින් ස්පර්ශ කරණු ලබන්නේ ය, යනු එහි තේරුම යි.

ධම්ම නම්, ප්‍රසාදරූප – සූක්ෂ්මරූප – චිත්ත – චෛතසික – නිර්වාණ – ප්‍රඥප්ති යන මේ ය.

එහෙයින් ඇසින් දැක්ක යුතු නීල-පීතාදී වූ පැහැය හා දිග්-නො දිග් – සිවුරුස් – අටැස් ආදීවූ සටහන් රූපාරම්මණ යි ද, සත්වයන් පිළිබඳ දෙඩුම් – බැණුම් – කියුම් – සිනාසීම් ආදිය හා මිහිඟුබෙර – ගැටබෙර – පණාපෙර ආදී වූ ශබ්ද සද්දාරම්මණ යි ද, කපුරු – කස්තුරි – තුරුවලා ආදිවූ සියලු දුගඳ සුවද, ගන්ධාරම්මණ යි ද, මිහිරි – කටුක – නිකතාදී වූ සියලු රස වෙසෙස්, රසාරම්මණ යි ද, උපාදින්නඅනුපාදින්නසඞ්ගහිත, ඵොට්ඨබ්බාරම්මණ යි ද, ප්‍රසාද රූප – සූක්ෂ්මරූප – චිත්ත – චෛතසික – නිර්වාණ – ප්‍රඥප්ති යන සය, ධම්මාරම්මණ යි ද දතයුතු ය.

මේ සියලු අරමුණු **දිට්ඨ-සුත-මුත** යි නො පරිදි වන්නේ ය. එහි දිට්ඨ නම්, ඇසින් දක්නා ලද රූපය යි. සුත නම්, කණින් අසන ලද ශබ්දය යි. මුත නම්, නැහයෙන්, දිවෙන්, කයින් ගන්නා ලද ගන්ධ – රස – පහස යි.

ඔහුගේ – මොහුගේ – ඇගේ – මැගේ රූපය කදිම ය, ශබ්දය කදිම ය, ගන්ධය කදිම ය, පරිභෝගරසය කදිම ය, පහස කදිම ය යි ඒ රූපාදිය පිළිබඳ සත්ත්ව-පුරුෂ නිමිති ගෙණ, අත්ල, පත්ල, ඉහවිය, බඩ, කන්, මූහුණ, දත්, ඇස්, කන්, පැහැය, නහය, කෙස්, පිහිටීම් යහපත් ය, සිරුරු ගෑ කොකුම්, කස්තුරි, සඳුන් සුවද යහපත් ය, කීකරුකම, දෙතොල වැකුණු කෙළවල රසය, දෙනලද කැඳබත්වල රසය යහපත් ය, ඇඳි රෙදිපිළිවල පහස පැලඳි මල්දම් පහස, අතේ, කවේ, මූහුණේ පහස යහපත් ය, යෑම ඒම, වටපිට බැලීම, ගනිගුණ යහපත් ය, සිත් ගන්නේ ය, යනාදි ලෙසින් අනුව්‍යඤ්ජන ත් ගෙණ ප්‍රිය වූ අරමුණට සිත මෙහෙයා ප්‍රියරූපාදිවූ අරමුණු කැත හිතින් වල්ගිතින් ගුහ වශයෙන් නිතර බලන්නේ, සිතන්නේ, සිහි කරන්නේ කෙලස ධර්මයන්ට යටත් වූයේ **'සුභානුපස්සී'** නම්.

මෙන්න එය අටුවාව කී සැටි:- **"යො හි පුග්ගලෝ නිමිත්ත-ග්ගාහං අනුබ්‍යඤ්ජනග්ගාහං ගණ්හන්තො නඛා සොභනාති, ගණ්හාති, අඞ්ගුලියෝ සොභනාති ගණ්හාති හත්ථපාදා ජඞ්ඝා ඌරූ කටි උදරං ථනා ගීවා ඔට්ඨා දන්තා මුඛං නාසා අක්ඛීනි භමුකන්තරමුඛා නලාටං කෙසා සොභනාති ගණ්හාති, කෙසං**

ලොමා නඛා දන්තා තචෝ සොභනානි ගණ්හාති, වණ්ණෝ සුභෝ, සණ්ඨානං සුභන්ති ගණ්හාති, අයං සුභානුබ්‍යඤ්ජන නාම" යනු.

ඉන්ද්‍රියෙසු අසංවුතං = ඉඳුරන්හි හික්මීම් නැති.

ඉන්ද්‍රියසංවරසීලයෙන් තොරවූයේ ය මේ තෙමේ. ඇස්-කන්-නාස් ආදිය නොරක්නා තැනැත්තේ ය. ඇස් කන් නාස් ආදිය නිසා, සිතතුළට වැද ගන්නා ප්‍රියරූපාදී වූ සියලු අරමුණෙහි රාගාදි වූ කෙලෙසුන් උපදවන්නා ය. ඉඳුරන් නිසා උපදනා කෙලෙසුන්ට යටත් වූයේ ය.

චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-මන යි, ඉන්ද්‍රිය සයෙකි. විඤ්ඤාර විසින් දෙවිස්සෙකි. මෙහි කියන්නේ මේ දැක් වූ සය ය.

මෙහි **චක්ඛු** නම්, රූප දකින තැන යි. නැත, රූප දැකීමේ ශක්තිය යි. එය සසම්භාර - පසාද යි දෙ වැදෑරුම් ය. ලොකයා විසින් (අප විසින්) ඇසැ යි හඳුන් වන ඇස් (මස්) ගඩුව උපකරණ සහිත බැවින් සසම්භාර චක්ඛු යි කියනු ලැබේ. හිස්මොළයෙන් පැමිණී නහරවැලින් එල්බ පවතී මෙය. මෙහි සෙම් වැනි තැන් සුදු ය. පිත වැනි තැන් නිල ය. ලේ වැනි තැන් රතු ය. පඨවීධාතු වැනි තැන් තද ය. ආපොධාතු වැනි තැන් තෙත් ය. තෙජොධාතුව නිසා උණුසුම් ය. වායොධාතුව නිසා සැලෙ යි. මේ මෙසේ පිළියෙල වුව ද, රූපදැකීමේ ශක්තියක්, පුළුවන් කමෙක් මෙයට නැත. රූප දකින්නේ පසාදචක්ඛුව යි. එය පිනිවිලේ මේ ඇස්ගඩුවෙහි කළුඉංගිරියාව මැද ය. එයට, ඉදිරියෙහි සිටියවුන්ගේ රූප ඇඳ ගැණීමේනි ශක්තියක් තිබේ. මේ ඇස්ගඩු ව පටලසතකින් යුක්ත ය. හොඳට පොළාලූ කපුපුලුන් තව්වූ සතක් එක පිට එක පිහිටියා සේ, මේ පටල සත එක පිට එක පිහිටා සිටියේ ය. මතුපිට සිටි කපු පුලුන් තව්වුවෙහි, පහන් තලතෙල්බින්දුවක් වන්කල විට, ඒ තෙල් බින්දුව යටට ගලා ගොස්, තව්වූ සතෙහි ම පැහිරී සිටින්නා සේ, පෙර අත් බැවිහි රූපදැකීමේ ආසාව මුල් කොට ඇති කම්යෙන් හටගත් ප්‍රසන්නතාව (රූපදැකීමේ ශක්තිය) ඇස් පටල සතෙහි ම පැහිර පවතී. මේ ය පසාද චක්ඛු. සම්භර ආචාර්‍ය්‍ය කෙනෙක් පමණින් මෙය මහමුංපියල්ලක් පමණය යි ද, සම්භර කෙනෙක් උකුණු හිසක් පමණය යි ද කියත්. මේ කීම් දෙක ම වරද නැත.

ප්‍රසාදරූපය ඉතා සියුම් ය. ඇස් පියාපත් දෙකක් ඇත්තේ එය රකින්නට ය. එ දෙක, ඇසට යමක් ලංවූ විට ඇස වසයි. මෙයට, තනි ව රූප දකින්නට නොහැකි ය. අවිත්තක බැවිනි.

එසේ ම, සිතට ද, තනි ව රූප දකිනු බැරි ය. තමා ඇස නො වන බැවිනි. රූප දකින්නේ, ප්‍රසාදචක්ෂුස වස්තු කොට ඇති සිත ය. එය මෙන්න කී සැටි:- **"චක්ඛු රූපං න පස්සති අචිත්තකත්තා, චිත්තං න පස්සති අචක්ඛුකත්තා, චාරාම්මණ සඞ්ඝටෙට පන පසාදචක්ඛුකෙන චිත්තෙන පස්සති"** යි. ප්‍රසාද චක්ෂුස වස්තු කොට ඇති සිත, රූප දකින්නේ ද, එය නො බිඳී සිටීම, එහි ඉදිරියට රූපයක් ලැබීම, ආලොකයක් ලැබීම, සිහි කිරීම යන මේවා ත් ඇති විට ය. **"තත්ථ අසම්භිත්තත්තා චක්ඛුස්ස ආපථගතත්තා රූපානං ආලොකසන්නිස්සිතං මනසිකාර හෙතුකං චතුහි පච්චයෙහි උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං සඩිං සම්පයුත්තධම්මෙහි"** යි ඒ කීහ.

සොත නම්, කන් සිදුරෙහි, රොමකූපයක් නිසා පවත්නා ශබද ඇසීමෙහි ශක්තිය යි. සසම්භාර – පසාද යි ඒ දෙපරිදි ය. අප විසින් කණැ යි හඳුන්වනු ලබන්නේ ඇසට පෙණෙන කන් පෙත්ත සහිත වූ කන්බිලය යි. එය උපකරණ සහිත බැවින් සසම්භාරසොත යි කියනු ලැබේ. ඒ මේ සසම්භාරසොතබිලය තුළ සිහින් තඹවන් ලොමින් ගැවසී ගත් ඇඟිලිමුදුවක සටහන් ඇති ස්ථානයෙක් ඇත්තේ ය. ඒ ය සොතප්පසාදය. ඒ ය නියම කණ. ඒ ය ශබද අසන්නේ. පෙර අත්බැව්හි ශබද ඇසීමේ ආසාව මුල් කොට ඇති කර්මබලයෙන් හට ගත්තේ ය. සසම්භාර–සොතයට ශබද අසන්නට නො හැකි ය. ඒ පිණිස එයට ශක්තියක් නැත. සොතප්පසාදය ද සොතවිඤ්ඤාණය වස්තු කොට ඇත්තේ ම ශබදශ්‍රවණය කරයි. තව ද නො බිහිරිබව, ශබද ඉදිරියට ඊම, අවකාශය ඇසුරු කිරීම, සිහිකිරීම යන මේ ද ලැබිය යුතු ය. එවිට ය ශබද ඇසිය හැක්කේ.

ඝාණ නම්, ගඳ සුවඳ ඇද ගැණීමට සුදුසු වූ නාසය තුළ පිහිටි ප්‍රසන්නභාවය යි. ගඳ සුවඳ ගැණීමේ ශක්තිය යි. සසම්භාර – පසාද යි මෙහි ද භෙද දෙකෙකි. අප විසින් නැහැය යි හඳුන් වනු ලබන්නේ ඇසට පෙණෙන සිදුරු දෙකකින් යුක්ත වූ නාසිකා දණ්ඩය යි. එය ය සසම්භාරඝාණ. එසේ කියන්නේ උපකරණ සහිත බැවිනි. එයට ගඳ සුවඳ දැන ගන්නට බැරි ය. එහි තුළ, එළුකුරයක සටහන් ඇති තැන, ඝ්‍රාණවිඥානාදියට වස්තුචාරභාවය සිඩ කරමින් පිහිටි යේ ඝාණප්පසාදය යි ඒ ය නැහැ ය. මෙය පෙර අත්බැව්හි ගන්ධතෘෂ්ණාව මුල් කොට ඇති කර්මබලයෙන් හට ගත්තේ ය. යම් කිසි ගඳ සුවඳක් ගැටුනු විට ඒ ඝ්‍රාණප්‍රසාදය නිඃශ්‍රය කොට උපදනා ඝ්‍රාණවිඥාන චිත්තයෙන් ගඳ සුවඳ විඳ ගණී යි. විකල නො වූ ප්‍රසාදය,

ගන්ධාලම්බනය, වාතය, මෙනෙහි කිරීම යන මේ ද ගන්ධඝ්‍රාණය පිණිස ලැබිය යුතු ය. එවිට ය ගඳ සුවඳ ඇඳ ගත හැක්කේ.

ජිහ්වා නම්, රස විඳින තැන ය. දිව ඇසුරු කොට පවත්නා රස විඳ ගැණීමේ ශක්තිය ය. එ ද සසම්භාර - පසාද යි, දෙ පරිදි ය. අප විසින් දිවැ යි හඳුන්වනු ලබන්නී මුව තුළ පිහිටි කෑමට බීමට කතා කිරීමට රුකුල් දෙන දිව ය. ඒ ය, සසම්භාරජිහ්වා. උපකරණ සහිත බැවින් එසේ කියත්. එයට රස විඳින්නට බැරි ය. දිවමුල මැද, මැදින් සිද ගත් උපුල්පෙති අගක සටහන් ඇති තැනැ පැතිර ගත්තා වූ ප්‍රසන්නභාවය ජිහ්වාපසාද ය යි කියනු ලැබේ. යටගිය ජාතියේ රසතෘෂ්ණාව මුල් නොට කරණ ලද කර්මයන්ගේ බලයෙන් හට ගත්තේ ය. ජිහ්වාවිඤ්ඤානාදියට සුදුසු පරිදි වඤ්චුද්වාරනාවය සිදු කරමින් පවතී. යම් කිසි මධුරාදී වූ රසයක් එහි වැදුනු විට, ඒ නිශ්‍රය කොට උපදනා ජිහ්වාවිඤ්ඤනයෙන් රස විඳ ගැණීම කෙරේ. විකල නොවූ ජිහ්වා ප්‍රසාදය, රසාලම්බනය, කෙළය, මනසිකාරය යන මොවුන් එක් වූ විට ය රස විඳ ගැණීම වන්නේ.

කාය නම්, පහස විඳින්නේ ය. සසම්භාර - පසාද විසින් දෙ වැදෑරුම් ය. බඹයක් පමණ වූ මේ ශරීරය සසම්භාරකාය නම් ඇට, සම්, මස්, නහර ආදියෙන් කැටි ව සිටියේ ය. මෙහි කෙස් ලොම් නිය අග, වියලිසම්, ජඨරාග්නි යන මේ හැර, අන් සියලු ශරීරයෙහි කප්පුලුන් පටලයක් මතුපිට වත්කළ තල තෙලක් සේ පැතිර ගත්තේ කායපසාදය වේ. යට කිය ජාතියේ ඵොට්ඨබ්බ තණ්හාව මුල් කොට කරණලද කර්මයන්ගේ බලයෙන් හට ගත්තේ ය. කායවිඤ්ඤාදියට සුදුසු පරිදි වඤ්චුද්වාරනාවය සිදු කරමින් පවතී. යම් පහසක් එහි ගැටුනු විට, ඒ ඇසුරු කොට උපදනා කායවිඤ්ඤනයෙන් පහස විඳ ගණී යි. නොනට නොවියලි කායපසාදය, ඵොට්ඨබ්බාරම්මණය, කායප්‍රසාදයට නිශ්‍රය වූ පඨවීධාතු ය, මනසිකාරය යන මොවුන් එක් වූ තැන පහස විඳ ගැණීම කෙරේ.

චක්ඛු - සොත - ඝාණ - ජිහ්වා - කාය යන මේ පස වෙන වෙන ම පඨවී - ආපෝ - තෙජෝ - වායෝ, වණ්ණ - ගන්ධ - රස - ඔජා ජීවිතින්ද්‍රිය යන මොවුන් හා එක් ව ම සිටියි. නොහැර සිටියි.

මන නම්, මෙහි භවාඞ්ගචිත්තය යි. මන යන්නෙන් භවාඞ්ග චිත්තය ගණු ලැබේ. **"ආවජ්ජනං භවඞ්ගනන්තු මනොචාරකන්ති වුච්චති"** යි කී බැවින් එහි ආවජ්ජනයට නැමී සිටි භවාඞ්ගය ම ගණු ලැබේ. ආවජ්ජනයට නැමී සිටියේ ම ගත යුතු ය.

මෙසේ සැකෙවින් කියූ මේ ස දෙන, ඇස දැකීමෙහි, කණ ඇසීමෙහි, නැහැය ගඳ සුවඳ ගැණීමෙහි, දිව රසවිඳුමෙහි, කය පහස ගැන්මෙහි, මන අරමුණු මැන බැලීමෙහි අධිපතිභාවය කරණ හෙයින් **චක්ඛුන්ද්‍රිය-සොතින්ද්‍රිය-ඝාණින්ද්‍රිය-ජිහවින්ද්‍රිය-කායින්ද්‍රිය-මනින්ද්‍රිය** යි කියනු ලැබේ. **"ඉන්දට්ඨං කරොති චක්ඛුදවාරභාවෙන ත දවාරකෙහි අත්තනො ඉන්දභාවං පරමිස්සරියභාවං කරොතීති=චක්ඛුන්ද්‍රියං"** යන මෙයින් එබව දත හැකි ය. ඒ ඒ ද්වාරයෝ හැම දෙනෙක්, ඒ ඒ ද්වාරයන්හි හටගන්නා වූ චිත්ත-චෛතසික යන් තමාට අනුකූල කර ගණිත්. ඒ ඒ ද්වාරයෙහි හටගන්නා චිත්ත-චෛතසිකයෝ ඒ ඒ ඉන්ද්‍රියයන්ට අනු ව පවතිත්. **"චක්ඛු එව ඉන්ද්‍රියං=චක්ඛුන්ද්‍රියං"** යි කී බැවින් චක්ෂුස ම ය චක්ඛුන්ද්‍රිය වනුයේ. දර්ශනකෘත්‍යයෙහි අධිපති වූයේ චක්ෂුස ම ය. සෙස් ද මෙසේ ය.

ඇස්-කන්-නාස් ආදී වූ සදොරින් සිතට වැද ගන්නා ප්‍රියරූපා දී වූ ස වැදෑරුම් අරමුණෙහි රාග-ද්වෙෂ-මොහාදිකෙලශධර්මයන්ට ඉපදීමට හැම අතින් ඉඩ කඩ පහසුකම් ඇති වන පරිදි සිහි නුවණින් තොර ව වසන්නේ **'ඉන්ද්‍රියෙසු අසංවුත'** නම්. ඉන්ද්‍රිය යන් කෙරෙහි සංවරයක්, හික්මීමක් නැති ව වසන්නහු රාගද්වෙෂ මොහාදිකෙලශධර්මයෝ නිතර ලුහු බඳිත්. තමන් යටතට ගණිත්.

භොජනම්හි ච අමත්තඤ්ඤුං = ආහාරයෙහි ද පමණ නො දත්.

මෙහි ආහාරය යි කීයේ, ප්‍රධාන විසින් කබලීකාරාහාරය යි පිඩු පිඩු කොට ගණු ලබන, කඩ කඩ කොට කනු ලබනදේ ය. ඒ මේ අහරසෙවීමෙහි, පිළිගැන්මෙහි, වැලඳීමෙහි, අනුනට දීමෙහි තරම පමණ නො දැන්මෙන්, සිවුපසය ප්‍රත්‍යවෙක්ෂා නො කොට වැලඳීමෙන්, කුලසංග්‍රහපිණ්ස දීම නිසා කුලදූෂණයට පැමිණී මෙන්, සිල්වතුන් සඳහා දෙන ලද දෙය නො එසේ වූවනට දීමෙන්, "මේ භොජනය එක්විසි අන්වෙෂණයෙන් ඉපිද වූ හෙයින් ධාර්මික නො වේ, පිණ්ඩපාතචර්‍යාදියෙන් ලැබූ මේ භොජනය ධාර්මික ය" යි භොජනයෙහි කැප- නො කැපබව නො දැනීමෙන් බොජුනෙහි පමණ නො දන්නේ වේ. මෙතෙමේ එලොව මෙලොව දෙකින් පිරිහේ. භොජනයෙහි පමණ නො දැන්ම කාමච්ඡන්දා දී පාපධර්මයන්ගේ ඉපදීමට හෙතු ය.

මේ විස්තර විසින් වදාරණ බුදු රජානන් වහන්සේ **"තත්ථ කතමා භොජනෙ අමත්තඤ්ඤුතා? ඉධෙ'කච්චො අප්පටිසඞ්ඛා අයොනිසො ආහාරං ආහාරෙති, දවාය මදාය මණ්ඩනාය විභූසනාය, යා තත්ථ අසන්තුට්ඨිතා අමත්තඤ්ඤුතා අප්පටිසඞ්ඛා භොජනෙ"** යනු වදාළ සේක.

යමෙක් බොජුන්හි, සිවුපසයෙහි මහත් ආශාවෙන් මැඩුනේ, එහි ගැටුනේ, එහි ගැලුනේ, මුසපත් වූයේ පිළිගැණීම් ආදියෙහි පමණ නොදනී ද, ඔහු, දෙනු ලබන හැම දෙයක් ම පිළිගණියි. පමණ ඉක්මවා පිළිගණී යි. "සිල්වතෙක, ධූතාඞ්ගධාරියෙක, වන වැසියෙකැ" යි මහාජනයාගෙ හඟව හඟවා ද සිවුපසය ම සොය යි, "මට මේ පමණැ"යි කිසිවිටෙකත් නොකිය යි. දරින් ගින්න, දියෙන් මුහුද, පුරවාලන්නට සතුටු කරන්නට බැරිවා සේ, මහත් ආශා ඇත්තහු සිවු පසය කොතරම් දුන්නේ ද සතුටු කරන්නට නොහැකි ය. තව තවත් පතන්නේය. සොයන්නේය.

කුසීතං = අලස වූ.

ගාථාවෙහි එන **තං'** යන්නට වෙසෙසුන් ව සිටියේ ය. කාම-ව්‍යාපාද-විහිංසා යන පාපවිතර්කයන්ට යටත් ව එ ලොව මෙ ලොව වැඩ සඳලන ක්‍රියාවන්ගෙන් කොර වූයේ එයින් ඇත්හි වූයේ **'කුසීත'** නම. වසතුකාම-කෙලෙහකාම වසින් කාමය දෙ පරිදි වේ. ඒ දෙ වැදෑරුම් වූ කාමයන් පිළිබඳ තැකීම, සිහිකිරීම, එහි සිත යෙදීම කාමවිතර්කී යි. මෙත්සිතට පටහැනි ව සිටි ඕරුද්ධ ව සිටි වනාස්සිනිවිල්ල ව්‍යාපාදය යි. එය "අන්‍යයෝ නැසෙත්වා, වැනසෙත්වා" යනාදී ලෙසින් සිතේ පවත්නේ ය. මේ සිනිවිල්ල නිසා, සිතෙහි ප්‍රකෘතිගහිය නැසී යෑමෙන්, සිත පිණුල් බතක් මෙන් කුණුවීමට දූෂිතභාවයට පැමිණේ. මනා හැසිරීම, හිත සුව, මේ සිනිවිල්ලේ හෙතුවෙන් නැසී යයි. සිත, ඒ සිනිවිල්ලෙන් යුක්ත ව සිතන සිතුම් පැතුම් ව්‍යාපාදවිතර්කී යි. අනින්-පයින්- දණෙඩන්- මුගුරෙන්- සැකින්- කැට කැබලිත්තෙන්- අවියෙන්- රැහනින් යන යම් කිසිවකින් අනුන් තැළීම, පෙළීම විහිංසා නම. ඒ හිංසාසිතින් කරණ තැකුම්, බැලුම්, සිහිකිරීම් විහිංසාවිතර්කී යි.

කාමවිතර්කය ප්‍රිය වූ මන වඩන්නා වූ සත්වයන් හා සංස්කාරයන් ගැණ සිතන බලන තැනැත්තාහට උපදී. ව්‍යාපාදවිතර්කය අප්‍රිය වූ මන නොවඩන්නා වූ සත්වයන් හා සංස්කාරයන් ගැණ කිපී බලන්නහුට උපදී. විහිංසාවිතර්කය උපදනේ සත්වයන් ගැණ බලන්නහුට ය. සංස්කාරයන් කෙරෙහි එය නූපදී.

මේ විතර්කයනට වශී වූයේ යටත් වූයේ විතර්කයන් නිසා මැඩුනේ ග්‍රන්ථධුරයෙහි, විදර්ශනාධුරයෙහි, වත්පිළිවෙත් පිරීමෙහි මැලි වේ. එයින් ඔහු එ ලොව මෙ ලොව දෙකින් පිරිහේ කුසීතවසතු අටෙකි. පහත දුක්වෙන්නේ ඒ ය.

සසුන් වන් පැවිද්දන් විසින්, තමන් සමාදන් ව ගත් සිල් පිරිසිදු කරන්නට, තහවුරු කරන්නට බුදුරජුන් විසින් දක්වා වදාළ වත්පිළිවෙන් නො පිරිහෙලා කළයුතු ය. දැගැබ්-මහබෝ ආදියෙහි වත්, ආචාර්ය-උපාධ්‍යායයන් පිළිබඳ වත්, ගිලන් මහලු ආදීන් පිළිබඳ වත්, ගම්බා ආගන්තුකාදීන් පිළිබඳ වත් යන මේ ආදී වූ කුදු මහත් සියලු වත්පිළිවෙත්, පැවිද්දන් විසින් සිල් පිරෙන්නට සිල් පිරිසිදු වන්නට කළයුතු වත් ය. වත්පිළිවෙත් නො කළ-නො කරණ පැවිද්දාගේ සිල් පිරිසිදු නො වේ. නිවන් පිණිස ඒ පවත්නේ නො වේ. මෙන්න ආගම:-

"වත්තං න පරිපූරෙනෙතා න සීලා පරිපූරති,
අසුඛසීලෝ දුපපඤ්ඤෝ දුක්ඛා න පරිමුච්චති."

එහෙත් වත්පිළිවෙත් කළ යුතු තැනැ ඇතැම් මහණෙනි, "මා විසින් දැන් වත්පිළිවෙත් කමීනත කළ යුතු වුව ද, ඒ කලොත් මාගේ සිරුර වෙහෙසට පත් වන්නේ ය, එහෙයින් දැන් නිදමි"යි අදහස් කොට නිදත්. නො පැමිණි ගුණයට පැමිණීමට, නො දත් දෙය දැන ගැණීමට, ප්‍රත්‍යක්ෂ නො කළ ධර්ම ප්‍රත්‍යක්ෂ කිරීමට වීර්‍ය නො කරති. මේ මුල් කුසීතවසතුව යි.

"අධාවුසෝ භික්ඛුනා කම්මං කාතබ්බං හොති, තස්ස එවං හොති, කම්මං බෝ මේ කාතබ්බං භවිස්සති, කම්මං බෝ පන මේ කරොනතස්ස කායෝ කිලමිස්සති, හන්දාහං නිපජ්ජාමීති, සෝ නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං පඨමං කුසීතවත්ථු" යනු එහි පාළිය යි.

යම් කිසි පැවිද්දකු විසින් යම් කිසි වතක් පිළිවෙතක් කමීනතයක් කරණ ලද්දේ වේ ද, එකල ඔහුට, "මම වත් පිළිවෙත් කමීනත කෙළෙමි, එයින් මාගේ සිරුර වෙහෙසට වැටින, බුදියෙමි" යි ඔහු නිද යි. තමන් කෙරෙහි නැති ගුණදහම් ඇති කර ගැණීමට වීර්‍ය නො කරයි. මේ දෙවන කුසීතවසතුව යි. මෙන්න ඒ පාළි ය:-

"පුනවපරං. ආවුසෝ භික්ඛුනා කම්මං කතං හොති, තස්ස එවං හොති, අහං බෝ කම්මං අකාසිං, කම්මං බෝ පන මේ කරොනතස්ස කායෝ කිලන්තෝ, හන්දාහං නිපජ්ජාමීති සෝ නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං දුතියං කුසීතවත්ථු" යනු.

යම් කිසි පැවිද්දකුට යා යුතු ගමනක් එළඹ සිටි කල්හි "මට දැන් යා යුතු ගමනක් තිබේ, මග යන විට මාගේ සිරුර විඩාවට

පත් වේ, එ හෙයින් ගමන නවතා බුදියමි" යි ඔහු බුදිය යි. නො පැමිණි, නො ලත්, නො දත් ගුණදහම් ලං කර ගැණීමට දියුණු කර ගැණීමට වීර්‍ය්‍ය නො කරයි. මේ තෙවන කුසීත වස්තුව යි. එහි පාළිය මේ:-

"පුනචපරං ආවුසො භික්ඛුනා මගෙගා ගන්තබ්බො හොති, තස්ස එවං හොති, මගෙගා බො මෙ ගන්තබ්බො භවිස්සති, මගගං බො පන මෙ ගච්ඡන්තස්ස කායො කිල මිස්සති, හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං තතියං කුසීතවත්ථු" යනු.

යම් කිසි පැවිද්දෙක් ගමනක් ගොස් අවුත්, වෙහෙසට පත් ව, "මම මේ ගමනින් තදින් වෙහෙසට පත් වීමි" යි නිදා ද, ඔහු නො පැමිණි, නො ලැබූ නො දත් ගුණදහම් වඩන්නට වීර්‍ය්‍ය නො කර යි. මේ සිවුවන කුසීතවස්තුව යි. මේ ඒ පාළිය:-

"පුනචපරං ආවුසො භික්ඛුනා මගෙගා ගතො හොති, තස්ස එවං හොති, අහං බො මගගං අගමාසිං, මගගං බො මෙ ගච්ඡන්තස්ස කායො කිලන්තො, හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං චතුත්ථං කුසීතවත්ථු" යනු.

ගමක හෝ නියම්ගමක, ගෙ පිළිවලින් පිඬු සිඟා යන පැවිද්දකුට, කටුක වූ හෝ ප්‍රණීත වූ හෝ ආහාරයක් සෑහෙන පමණින් නො ලැබුනු විට "පිඬු සිඟා ගිය මට කටුක වූ හෝ ප්‍රණීත වූ ආහාරයක් මට සෑහෙන තරමට නො ලැබුනේ ය, එ හෙයින් සිරුර විඩාවට පත් විය, කිසිවක් කරන්නට දැන් නො හැකි ය, නිදමි" යි ඔහු නිද යි. ගුණධර්ම වැඩීමට වීර්‍ය්‍ය නො කර යි. මේ පස්වන කුසීතවස්තුව යි. මෙන්න පාළිය:-

"පුනචපරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො න ලභති ලූඛස්ස වා පණ්තස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස එවං හොති, අහං බො ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො නාලත්ථං ලූඛස්ස වා පණ්තස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස මෙ කායො කිලන්තො අකම්මඤ්ඤො, හන්දාහං නිපජ්ජාමීති සො නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං පඤ්චමං කුසීතවත්ථු" යනු.

ගම් නියම්ගම්හි ගෙ පිළිවෙලින් පිඬු සිඟා ගිය භික්ෂු නම කටුක වූ හෝ ප්‍රණීත වූ ආහාරයක් සෑහෙන පමණ ලැබුනු

විට "මම පිඬු සිඟා ලත් ආහාරය සෑහෙන පමණ අනුභව කෙළෙමි, එයින් සිරුර බර විය, කටයුතු කරණු බැරිය, නිදමි"යි ඔහු නිද යි. ගුණදහම් පිණිස වීර්‍ය්‍ය නො කරයි. මේ සවන කුසීතවස්තුව යි. එහි පාළිය මේ:-

පුනච්පරං ආවුසො භික්ඛු ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තො ලභති ලූඛස්ස වා පණ්තස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස එවං හොති, අහං ඛො ගාමං වා පිණ්ඩාය චරන්තො අලත්ථං ලූඛස්ස වා පණ්තස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං, තස්ස මෙ කායො ගරුකො අකම්මඤ්ඤො මාසාචිතං මඤ්ඤෙ, හන්දාහං නිපජ්ජාමිති සො නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං ඡට්ඨං කුසීතවත්ථු" යනු.

යම් කිසි පැවිද්දෙක් යම්තම් ආබාධයක් ඇති විට, "මම ලෙඩෙක්මි, මට වැඩ කරණු බැරි ය, වහ බැඳ ගෙණ හිඳිමි"යි නිදා ද, ඔහු ගුණදහම් වඩන්නෙක් නො වේ. ඒ පිණිස වීර්‍ය්‍ය කරන්නෙක් නො වේ. මේ සත්වන කුසීතවස්තුව යි. පාළිය මේ:-

"පුනච්පරං ආවුසො භික්ඛුනො උප්පන්නො හොති අප්පමත්තකො ආබාධො, තස්ස එවං හොති, උප්පන්නො ඛො මෙ අප්පමත්තකො ආබාධො, අත්ථි කප්පො නිපජ්ජිතුං හන්දාහං නිපජ්ජාමිති සො නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං සත්තමං කුසීතවත්ථු" යනු.

භික්ෂු තෙමේ ලෙඩින් නැගී සිටියේ, "මම ලෙඩින් නැගිට වැඩි දවසෙක් ගත නො වී ය, මාගේ ශරීරය දුර්වල ය, කටයුතුවලට නුසු දුසු ය, එ හෙයින් නිදමි"යි නිද යි. ඔහු නො පැමිණි ගුණයන්ට පැමිණෙන්නට වීර්‍ය්‍ය නො කරයි. මේ අටවන කුසීත වස්තුව යි.

"පුනච්පරං ආවුසො භික්ඛු ගිලානා වුට්ඨිතො හොති, අචිරවුට්ඨිතො ගෙලඤ්ඤෙ, තස්ස එවං හොති, අහං ඛො ගිලානා වුට්ඨිතො, අචිරවුඨිතො ගෙලඤ්ඤෙ, තස්ස මෙ කායො දුබ්බලො අකම්මඤ්ඤෙ, අත්ථි කප්පො නිපජ්ජිතුං, හන්දාහං නිපජ්ජාමිති සො නිපජ්ජති, න විරියං ආරභති, අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය, ඉදං අට්ඨමං කුසීතවත්ථු" යනු එහි පාළිය.

කුඩා පසුරකට නැග මුහුද එතෙර යනු කැමැත්තේ, ඉවුරට නො පැමිණ මුහුද මැදදී ම දියෙහි කිදා බස්නේ, මස් කැසුබ් ආදීන්ට යම් සේ ආහාර වේ ද, එ මෙන් වීර්‍ය්‍යාරම්භරහිත වූ අකර්මණ්‍ය වූ කෙලශධර්මයන්ට යටත් වූ පුද්ගලයාගේ ආශ්‍රය

හෙතුයෙන්, යහපත් සිල් ඇත්තේ නමුත්, හටගත් කාමවිතර්කාදීන් විසින් මැඩ ගණු ලබන්නේ සසර පරතෙරැ යි කියූ නිවණට යා නො හැකි ව සසරසයුරෙහි ගැලී නැසී යන්නේ ය. මෙන්න එබව වදාළ හැටි:– **"එවං කුසීතං ආගම්ම සාධු ජීවීපි සීදති"** යි

හිනවීරියං = වීර්‍යරහිත වූ වීර්‍යයෙන් තොර වූ.

තං' යන්නට විශෙෂණ යි හිදීම – සිටීම – නිදීම – සක්මන් කිරීම යන ඉරියවු සතරෙහි ද, කුදු මහත් වත්පිළිවෙතෙහි ද, සිය දිවිපෙවෙත පිරිසිදු කිරීමෙහි ද පැවැත්විය යුතු කායිකවීර්‍යයෙන් හා රාගද්වෙෂමොහාදික්ලෙශධර්මයන් තැවීමට වැඩිය යුතු වූ චෛතසිකවීර්‍යයෙන් පිරිහුනු තැනැත්තේ ය **'හිනවීරිය'** නම්.

තං වෙ පසහති මාරො = ඒ (මෙබඳු) පුද්ගලයා මාර තෙමේ ඒකාන්තයෙන් මැඩලයි.

රූපාදිඅරමුණු ශුභවශයෙන් බලමින් වසන, ඇස්–කන්–නාස් ආදී වූ ඉඳුරන් කෙරෙහි හික්මීමක් නැති, (ඉඳුරන් නො හික්ම වූ) කෑම්, පීම්, ඇඳුම්, පැලඳුම් ආදියෙහි පමණ නො දත් (පමණ ඉක්මවා කෑම් පීම් ඇඳුම් පැලඳුම් කරණ) කාම විතර්කාදීන්ට යටත් වීමෙන් දියුණුවට හිත වූ කටයුතුවල මැලි වූ කායික–චෛතසික වීර්‍යයෙන් තොර වූ පුද්ගලයා, සිය සිත්හි උපන් බලගතු කෙලෙස් මරු තෙමේ ඒකාන්තයෙන් යටපත් කොට ඔබා ගණී යි.

තං, යනු සර්වනාම යි. **වෙ,** යනු නිපාත යි. **"න වෙ අනත්ථ කුසලෙන අත්ථවරියා සුඛාවහා"** යනාදි තන්හි සේ එකාන්තාර්ත්ථයෙහි ය ඒ. **'පසහති'** යනු ක්‍රියාපද යි. **'මාරො'** යනු එහි කර්තෘපද යි. එයට කර්මය වූයේ තං, යන්න ය.

මාර නම්, මෙහි ක්ලෙශමාර තෙමේ ය. සත්ත්වසන්තානයෙහි උපදනා රාගද්වෙෂමොහාදී වූ ක්ලෙශසමූහය තෙමේ, සත්ත්ව සන්තානයෙහි ම උපදනා ගුණධර්මයන් මරණ බැවින්, විනාශ කරණ බැවින්, සත්ත්වයන් අවැඩෙහි යොදන බැවින් මාර නම් වේ. ඛන්ධ–කිලෙස–අභිසඞ්ඛාර–මච්චු–දෙවපුත්ත යි මරහු පස් දෙනෙක් ආගමෙහි දක්වන ලදහ. (චිත්තවර්ගයෙහි **"යොධෙථ මාරං පඤ්ඤායුධෙන"** යන්නට කළ පරිකථාව බලනු.)

"කුසලධම්මෙ මාරෙතීති - මාරො" යනු නිරුක්ති යි. අර්ත්ථ කථාවන්හි මාර – නමුවි – තණ්හා – පමත්තබන්ධු, යි මාරයාට නම් සතරෙක් ආයේ ය. කොෂග්‍රන්ථයන්හි තවත් නම් දැක්ක හැකි ය.

වාතො රුක්ඛං ඉව දුබ්බලං = වාතය දුර්වල වෘක්ෂයක් (මුලින් උදුරා දමන්නාක්) මෙනි.

මහත් වෙගයෙන් හමා යන වාතය තෙමේ කැඩී බිඳී ගිය ඉවුරක හටගත් මුල් ශක්තිමත් නො වූ ගසක, මල් කොළ ගෙඩි ආදිය කඩා විසුරුවා හැර, ලොකු කුඩා අතු යිද බිඳ දමා, ගස උදුරා උඩුකුරු කොට හෙලා ලන්නේ යම්සේ ද, එසේ කෙලෙශධර්මයන්ට යටත් වූ කෙලෙශධර්මයන් දියුණු නියුණු කරණ පුඟල තෙමේ, ඔහු යිතට නැගී සිටි කෙලෙස් මරු විසින් යටපත් කරණු ලබන්නේ ය. මැඩලනු ලබන්නේ ය. බලන්න මේ කී සැටි:-

"යථා හි සො වාතො තස්ස රුක්ඛස්ස පුප්ඵපලාසාදිමපි භාදෙති විනාසෙති බුද්දඛාසාඛාපි භඤ්ජති මහාසාඛාපි භඤ්ජති සමූලඛමපි තං රුක්ඛං උබ්බත්තෙත්වා පාතෙත්වා උධමූලං අධොසාඛං කත්වා ගච්ඡති, එවමෙවං එවරූපං පුගඟලං අනෙනා උප්පත්තෙනා කිලෙසමාරො පසහති" යි.

තව ද, බලගතු වාතයෙන් දුබල ගසෙහි මල් කොළ ගෙඩි ආදිය කැඩී විසිරී යන්නා සේ, කෙලෙසයන්ට යටත් වූ කෙලෙස යන් විසින් ඔබා ගත් පුඟල තෙමේ (ශ්‍රමණ තෙමේ) අපායට නො බිය ව ක්ෂුද්‍රානුක්ෂුද්‍රකාපත්තීන්ට පැමිණේ. ලොකු කුඩා අතු කැඩී බිම හෙන්නා සේ, නිසඝිපවිති ආපත්ති ආදියට හා සඞ්ඝාදිසෙසාපත්තීන්ට පැමිණේ. මුළුමනින් ගස ඉදිරී බිම් ඇද වැටෙන්නා සේ, පාරාජිකාපත්තීන්ට පැමිණේ. මෙසේ ඔහු ස්වාඛ්‍යාතශාසනයෙන් බැහැර ගොස් ගිහිබවට පැමිණේ ය, යි වදාළ සේක බුදුරජාණන් වහන්සේ.

මේ වදාළ සැටි:-

"බලවවාතො දුබ්බලරුක්ඛස්ස පුප්ඵපලාසාදිසාදනං විය එවරූපො පුගඟලො බුඤ්ඤුබුද්දඛාපත්තිආපජ්ජනමපි කරොති. බුද්දඛාසාඛාභඤ්ජනං විය නිසඝිකියාදිආපත්ති ආපජ්ජනමපි කරොති. මහාසාඛා භඤ්ජනං විය තෙරස සඞ්ඝාදිසෙසාපත්තිආපජ්ජනමපි කරොති. උබ්බත්තෙත්වා උධමූලඛං හෙට්ඨාසාඛං කත්වා පාතනං විය පාරාජිකා පජ්ජනමපි කරොති" යි.

අසුභානුපස්සිං විහරන්තං = අශුභය යි නැවැත නැවැත දක්නා සුලු ව වසන.

උත්තිමාතකාදී වූ යම්කිසි අශුභයක්, කෙශාදී වූ යම්කියි කුණපයක් අශුභ ය, යි ඇති සැටියෙන් ගෙණ රෑ දෙවේලේ බලනුයේ සිතනුයේ මෙනෙහි කරනුයේ 'අසුභානුපස්සී' නම්.

උඬුමාතක – විනිලක–විපුබ්බක–විච්ඡිද්දක–වික්ඛායිතක – වික්ඛිත්තක–හතවික්ඛිත්තක–ලොහිතක – පුළවක – අට්ඨික යි අසුභ දසයෙකි.

එහි සුලඟින් පිම්බුනු සම්පසුම්බියක් සේ ඉදිමී ගිය මළ සිරුර 'උද්ධුමාත' නම්. එය ම පිළිකුල් බැවින් නින්දිත වූයේ, කයන්නකින් වැඩී කොට, **'උඬුමාතක'** යි කියනු ලැබේ. සුදු රතු ඈ විසින් මුසු පැහැ ඇති, පෙර පැවැති පැහැයෙන් අන් පැහැයකට පෙරළුනු මළසිරුර පිළිකුල් බැවින් නින්දිත වූයේ **'විනිලක'** නම්. ඇඟමස් උස් ව සිටි තැන රත් පැහැය ද, සැරව රැස් ව සිටි තැන සුදු පැහැය ද, තැන තැන නිල්පිළියක් පෙරවියා සේ නිල් පැහැය ද ඇති මළසිරුරට ත් මේ නම යෙදේ. කැඩී බිඳී ගිය තැනින් වැගිරෙන සැරව ඇති සිරුර නින්දිත වූයේ **'විපුබ්බක'** නම්. දෙ කඩට කැපුනු මැදින් දෙකට සිඳුනු සිරුර නින්දිත වූයේ **'විච්ඡිද්දක'** නම්. බලු සිවල් ගිජුලිහිණි කවුඩු උකුසු ආදීන් විසින් නොයෙක් ලෙසින් ඇඟ මස් ඇද කඩා කෑයේ, එහෙයින් නින්දිත වූයේ **'වික්ඛායිතක'** නම්. බලු සිවල් ආදීන් විසින් මස් කඩා කෑමෙන් වෙන් වෙන් ව ගොස් තැන තැන විසුරුණු අවයව ඇත්තේ, එ හෙයින් නින්දිත වූයේ **'වික්ඛිත්තක'** නම්. තැනක අත්, තැනක පා ඈලෙසින් විසුරුණු අත් පා ඇති මළසිරුරය මේ. සතුරන් විසින් කඩු තෝමර ආදියෙන් ඇණ කඩා හෙළීමෙන් විසුරුණු අවයව ඇත්තේ, එහෙයින් නින්දිත වූයේ **'හතවික්ඛිත්තක'** නම්. කවුඩු අඬිලෙසින් ආයුදවලින් අඟ පසඟ, ඇණ කොටා තැනැ තැනැ විසුරුණු අවයව ඇති මළසිරුරට ය මේ නම්. තැනින් තැනින් ලේ ගලන, වැගිරෙන ලෙසින් වැකුණු සිරුර ය නින්දිත බැවින් **'ලොහිතක'** නම්. පණුවන් වගුරු වන්නේ, පණුවන්ගෙන් අතුරු සිදුරු නැති ව සිටියේ, එහෙයින් නින්දිත වූයේ **'පුළවක'** නම්. ලේ මස් නහර දිය වී ගොස් ඉතිරි වූ ඇටසැකිල්ල නින්දිත බැවින් **'අට්ඨික'** නම්. මෙහි එක එක ඇටය ද ඇට සැකිල්ලය, යි කිය හැකි ය.

මේ දසඅසුභයන් නිසා උපන් නිමිති ද, ඒ නිමිතිවල ලැබූ ධ්‍යානය ද මේ නම්වලින් ම හඳුන් වත්. මින් එක්තරා අසුභයක් ඉදිරියට ගෙණ, සිතා මතා බලන්නහුගේ සිත, කිසිලෙසකින් "රූපය සුභය, කදිමය, හඬ කදිමය" යනාදී ලෙසින් පහත් අරමුණුවල නො ඇලෙයි. විස්තරය මතු එන්නේ ය.

කෙස් – ලොම් – නිය – දත් – සම් – මස්පිඬු – නහර – ඇට – ඇටමිදුලු – වකුගඩු – හදමස් – අක්මා – දලබූ – බඩදිව – පපුමස් –

අතුනු – අතුනුබහන් – නොදිරූ අහර-මල – හිස්මොළ-පිත – සෙම – සැරව – ලේ – දහ – මේද – කඳුලු – වුරුණු – කෙල – සොටු – සඳමිදුලු – මූත්‍ර යන මොටුහු මේ දෙතිස් කුණපයෝ ය.

'කෙස් පැහැයෙන් අමු පෙණල ඇට සේ කලු ය, සටහන් විසින් දික් වූ වට වූ කරාදිදණ්ඩක් වැනි ය, දිසා විසින් උඩ දිසායෙහි හට ගත්තේ ය, දෙපස කන් සිළුවෙන්, ඉදිරියෙහි නළල් කෙළවරින්, පිටිපසින් ගලවලුයෙන් සීමා කරණ ලද්දේ ය, හිස්කබල වෙළා සිටි අලුත්හම, අවකාශය කොට සිටියේ ය, හිස වෙළා සිටි සමෙහි වී අගක් පමණ ඇතුළට වැද ගත්තේ ය, යටින් තම මුලින්, උඩින් අහසින්, සරස උනුන්ගෙන් වෙන් කරණ ලද ය' යන වණ්ණ-සණ්ඨාන-දිසා-ඔකාස-පරිච්ඡේද වශයෙන් මේ දෙ තිස් කුණපයන් සිතා මතා බලන්නහුගේ සිත කිසි ලෙසකින් රූපාදි අරමුණුවල නො ඇලෙයි. (විස්තර විශුද්ධි මාර්ගයෙන් දතයුතුය.)

ඉන්ද්‍රියෙසු සුසංවුතං = ඉඳුරන්හි මොනවට හික්මුනු. ඉඳුරන් මැනැවින් හික්ම වූ.

ඇස්-කන්-නාස් ආදී වූ ඉඳුරන්ගේ ඉදිරියට එන ගැණු පිරිමි ඇ නිමිති හා අත් පා මදසිනා ආදී වූ කුඩා නිමිති, **"එසා සුභා, සුසණ්ඨානා, එතිස්සා හත්ථා සොභනා, පාදා සොභනා, මුඛං සොභනං"** යි නො ගෙණ නො සලකා නො සිතා දුටු පමණෙහි ම පිහිටා සිහියෙන් රැකගත් ඉඳුරන් ඇත්තේ **'ඉන්ද්‍රියෙසු සුසංවුත'** නම. ඉන්ද්‍රියසංවරසීලයෙන් සිල්වත් වූයේ ය මේ. මේ වදාළ සැටි බලන්න:-

"සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහි හොති නානුබ්‍යඤ්ජනග්ගාහි, යත්වාධිකරණ මෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා —පෙ— ඝානෙන ගන්ධං ඝායිත්වා —පෙ— ජිහවාය රසං සායිත්වා —පෙ— කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා —පෙ— මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහි හොති නානුබ්‍යඤ්ජනග්ගාහි, යත්වාධිකරණමෙතං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති" යි.

පාතිමොක්ඛසංවරසීලයෙහි පිහිටි මහණ තෙමේ ඇසින් රූපයක් දැක්කේ එහි නිමිති නො ගණී යි. අනුව්‍යඤ්ජන නො

ගණී සි. යමක් හෙතු කොට සංවර නො කළ නො හික්ම වූ චක්ෂුරින්ද්‍රිය (ඇස) ඇත්තහු, අභිඛ්‍යාදෞර්මනස්‍ය යන ලාමකඅකුශල ධර්මයෝ ලුහු බඳින් ද, (වසා ගන්නෝ ද.) (එහෙයින්) චක්ෂුරින්ද්‍රිය යෙහි සංවරය පිණිස පිළිපදී. චක්ෂුරින්ද්‍රිය රැකා ගණී යි කණින් ශබ්දය අසා, නැහයෙන් ගඳ සුවඳ ඇදගෙණ, දිවින් රස බලා, කයින් පහැසිය යුත්තා පහසා, සිතින් ධර්මය දැන නිමිති නො ගණී සි. අනුව්‍යඤ්ජන නො ගණී සි. මෙකී ඇස් කන් නාස් ඈ ඉඳුරන් නො හික්ම වූ කල්හි ලාමකඅකුශල ධර්මයෝ ඒ ඉඳුරන් නො රැකී මහණහු ලුහු බැඳ එන්නාහ. ඔහු පසු පස්සේ ඵලවා එන්නෝ ය. එහෙයින් මෙකී ඉඳුරන්හි සංවරය පිණිස පිළිපැදිය යුතු ය. මෙකී ඉඳුරන් රකියි. එහි සංවරයට පැමිණේ යනු, එහි කෙටි තේරුම සි.

මෙසේ ස්ත්‍රී-පුරුෂයන්ගේ කුදු - මහත් නිමිති, හැඩහුරුකම්, අඩයාලම් ආදිය කදිම ය, සිත්කලු ය, මනරම් ය, සිත් ගන්නේ ය, ඇසට රසදුනෙක, කණට මිහිරෙක, නැහැයට සුවඳෙක, දිවට රසයෙක, ඇහට සැනසුමෙක යනාදි ලෙසින් නො පිළිගෙණ ඇති තතුයෙහි පිහිටා සිටි පුදහල තෙමේ ය චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නේ. චක්ෂුරින්ද්‍රිය රකින්නේ.

චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයෙක් හෝ අසංවරයෙක් නැත. ප්‍රසාද චක්ෂුස නිසා සිහිය හෝ සිහිමුළාව නූපදී. යම් කලෙක්හි රූපා ලම්බනයෙක් ඇසට හමු වේ ද, එකල භවාඞ්ගචිත්තය දෙවරක් ඉපිද නිරුඬ වේ. ඉන් පසු ක්‍රියාමනොධාතුචිත්තය ආවජ්ජන කෘත්‍යය සිඬ කරමින් එක් වරක් ඉපිද නිරුඬියට යයි. අනන්තරු ව පිළිවෙළින් චක්ෂුර්විඥානචිත්තය දර්‍ශනකෘත්‍යය සිඬ කරමින් එක් වරක් ද, විපාකමනොධාතුචිත්තය අරමුණු පිළිගැණීම කරමින් එක් වරක් ද, විපාකඅහෙතුකමනොවිඥානධාතුචිත්තය අරමුණු තීරණය කරමින් එක් වරක් ද, ක්‍රියාහෙතුකමනොවිඥානධාතු චිත්තය අරමුණු නියම කරමින් එක් වරක් ද ඉපිද නිරුද්ධ වෙති. අනන්තරු ව ඝික ජවන් වසයෙන් සත් වරක් ඉපිද නිරුඬ වේ. මෙතෙක් සිත් අතුරෙහි භවාඞ්ග සිත් උපදනා කාලයෙහි ද, ආවජ්ජනාදී වූ එක්තරා සිතක් උපදනා කාලයෙහි ද සංවරයෙක් හෝ අසංවරයෙක් නො වේ. ඉදින් ජවන් සිත් උපදනා කාලයෙහි අමනසිකාර හෙතුවෙත් ලොභ දෙස-මොහ-අහිරික-අනොත්තප්පාදී වූ පාපවෙතසිකධර්මයෝ ඒ ජවන් සිත් හා එක් ව යෙදෙත් ද ඒ හෙතු කොට ය දුසිල් බවෙක් හෝ සිහිමුළා බවෙක් හෝ නො දැනීමෙක් හෝ උපදනේ. ඒ ය අසංවර නම්. මෙසේ ජවන් කාලයෙහි වන්නා වූ අසංවරය ම චක්ෂුරින්ද්‍රියයෙහි

අසංවර ය යි කියනු ලැබේ. ජවන් කාලයෙහි යොනිසොමනසිකාරයෙන් යෙදී සංවරය නො කෙළේ නම්, චක්ඛුර්ද්වාරය ත් භවාඬගචිත්තය ත් ආවජ්ජනාදිවීථිචිත්තයනු ත් නො රැකියවුන් ම වන බැවිනි එ.

නුවර සතර වාසල් දොර නො වසා, නුවර ඇතුළෙහි වූ ගේ දොර කොටු ගැබ් ආදිය වැසූයේ නමුත්, එයින් නුවර තුළ වූ සියලු බඩු නො රැකුනේ වේ. නුවරදොරින් නුවරට වැද සොරහු යමක් කරණු කැමැති නම්, ඒ හැම එකක් ම කෙරෙති. එපරිද්දෙන් ජවන් කාලයෙහි දුසිල් බැවි ආදිය උපන් කල්හි ජවන් සිත්වල සංවරයෙක් නො ලැබේ. එයින් ම චක්ඛුරාදිද්වාරයෝ ද ආවජ්ජනාදිවීථිචිත්තයෝ ද නො රැකෙති. මේ ජවන් සිත්හු යොනිසොමනසිකාරහෙතුයෙන් කුශලපක්ෂයෙහි වූ කුශලපක්ෂයට අයත් සමෘති-ප්‍රඥා-ඤාණනම්-වීර්‍යසඞ්ඛ්‍යාතවෛතසිකධර්මයන් හා යෙදී උපන්නාහු ද, එකල්හි චක්ඛුර්ද්වාරාදිය ත් භවාඬගයෝ ත් ආවජ්ජනාදිවීථිචිත්තයෝ ත් රැකුනෝ ම වෙති. නුවරදොර වැසූ විට ඇතුල් නුවර ගේ දොර නො වැසුව ද, එහි වූ සියලු බඩු රැකේ ද, සොරුන්ගේ ඇතුල් වීමෙක් නො වේ ද, එසේ ජවන් කාලයෙහි සීලසංවරය-සතිසංවරය ඤාණසංවරය-ඛන්තිසංවරය-වීරියසංවරය යන මොවුන් උපන් විට චක්ඛුර්ද්වාරාදිය ත් භවාඬගචිත්ත ත් චිත්තවීථි ත් රැකෙති. එබැවින් ජවන් කෙණෙහි උපදනා සීලසංවරාදිය ම චක්ඛුරින්ද්‍රියයාගේ සංවරය යි කියනු ලැබේ.

මෙහි චක්ඛුද්වාරයට. රූපාලම්බනයක් හමු වූ විට, සිත භවාඬග වශයෙන් දෙවරක් ඉපිද ඊට අනතුරු ව පංචද්වාරාවජ්ජන-චක්ඛුවිඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොට්ඨපන යන මොවුන්ගේ වශයෙන් එක් එක් වර බැගින් ඉපිද, ඊට පසු ජවන් වශයෙන් නැගී නැවැත භවාඬගයට වැටෙන්නේය. මේ ජවන් කාලයෙහි, සිත යොනිසොමනසිකාරයෙන් යුක්ත වී නම්, කුසල් වේ. අයොනිසොමනසිකාරයෙන් යුක්ත වී නම්, අකුසල් වේ. මෙහි භවාඬගපාතය වේ ය යි කියේ ඇසට රූපාලම්බනය හමුවන්නට කලින් සිත එල්බ සිටි කර්මාදී වූ අරමුණක් ම ගන්නේ ය යනුයි. මෙසේ සිත කිහිපවරක් භවාඬගවශයෙන් ඉපිද අවුත් නැවැත එම අරමුණ එල්බ, භවාඬගවශයෙන් දෙ වරෙක, මනොද්වාරාවජ්ජනවශයෙන් එක් වරෙක, ජවන් වශයෙන් සත්වරෙකැ, යි මනොද්වාරයෙහි චිත්තවීථිය උපදී. නැවැත ත් සිත කිහිපවරක් භවාඬගයට වැටී, එම අරමුණ ම ගෙණ, එම මනොද්වාරයෙහි ම දෙවනවර භවාඬගවශයෙන් දෙ වරක්, මනොද්වාරාවජ්ජනවශයෙන් එක් වරක්, ජවන්

වශයෙන් සත් වරක් උපදනේ ය. මෙසේ මේ තුන්වන මනෝ ද්වාරිකචිත්තවීථියෙහි උපදනා ජවනයෝ ම "මෝ තොමෝ සත්‍රී ය, මේ තෙමේ පුරුෂ ය" යි ඇති සැටියෙන් හැඳිනීම හෝ, ඒ සත්‍රී පුරුෂ අරමුණු ශුභවශයෙන් ගෙණ ඇලීම හෝ අශුභවශයෙන් ගෙණ නො ඇලීම හෝ කෙරෙත්. ජවන් කෙණෙහි දුසිල් බව හෝ සිහිමුළාව හෝ වූ කල්හි අසංවරය වේ ය යි තුන් වන චිත්තවීථියෙහි ජවන් සඳහා කීහ. සොත-ඝාණ-ජිහ්වා-කාය යන දෙරටුවල සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ යන අරමුණු ගැටීමෙන් ඒ ඒ අරමුණු නිසා උපදනා චිත්තවීථිහු ද, සංවර-අසංවරයෝ ද මෙසේ දත යුතු ය.

'පාතිමොක්ඛ – සති – ඤාණ – ඛන්ති – විරිය' යි සංවරයෝ පස් දෙනෙකි. එහි **"ඉමිනා පාතිමොක්ඛසංවරේන උපෙතෝ හොති සමුපෙතෝ"**යි ආයේ පාතිමොක්ඛසංවරය යි. **"රක්ඛති චක්ඛුන්ද්‍රියං-චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති"**යි ආයේ සතිසංවර යයි. **"යානි සොතානි ලොකස්මිං (අජීතාති භගවා) සති තෙසං නිවාරණං සොතානං සංවරං බ්‍රූමි සඤ්ඤමෙථෙ පිහියරෙ"** යි ආයේ ඤාණසංවරය යි. චීවරාදිප්‍රත්‍යයප්‍රතිසෙවනය ද මෙහි ම ඇතුළත් ය. **"ඛමෝ හොති සීතස්ස උණ්හස්ස"** යි මේ ආදි ක්‍රමයෙන් ආයේ ඛන්තිසංවරය යි. **"උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති"** යි මේ ආදි ලෙසින් ආයේ විරිය සංවර ය යි. ආජීවපාරිශුද්ධිය ද මෙනි ම ඇතුළත් ය. මෙහි 'ඉන්ද්‍රියෙසු සුසංවුතං' යි වදුළ වචනයෙන් දැක්වුනේ, ඉන්ද්‍රිය සංවරය යි කියූ සතිසංවරය'යි. ඉන්ද්‍රියයන් පිළිබඳ සංවරය සිහියෙන් සිඳ කටයුතු බැවිනි.

හොජනමහි ච මත්තඤ්ඤුං = සිවුපසයෙහි ද පමණ දත්.

තං, යන්නට විශෙෂණ යි. බොජුන්හි පමණ නො දන්මට පටහැනි ව සිටි, බොජුන් පැන් සෙවීම, පිළිගැන්ම, වැලඳීම, පස්වකීම, හැරීම යන මේ මාත්‍රාවන් ගැණ දත්තේ **'හොජනමත්තඤ්ඤුං'** නම්. "මේ හොජනය එක්වසි අනෙස්නෙන් ඉපැයූ බැවින් දැහැමි නො වේ, මේ හොජනය ගෙපිළිවළින් සිඟා යැමෙන් ඉපැයූ බැවින් දැහැමි ය"යි බොජුනෙහි කැප නො කැපබව දුන අකැප බොජුන් බැහැර කොට දුරු කොට කැපබොජුන් වැලඳීමෙන් බොජුන්හි පමණ දත්නේ වේ. බඩගිනි පමණ නො බලා ආහාර අනුභව කොට හුන් තැනින් නැගී ගත නො හැකි **'ආහාරමත්තඤ්ඤු'** බමුණා මෙන්, බොහෝ කොට කෑමෙන් පිරී ඉතිරී ගිය බඩ ඇති, නැගී සිටියේ නමුත් රෙද්ද හැඳගත නො හැකි **'අලංසාටකා'** බමුණා මෙන්, බඩ පුරා කා හුන් තැනින් නැගී සිටින්නට බැරි ව

එහි ම පෙරළෙන ගැලෙන **'තත්‍රවටටඤ'** බවුණා මෙන්, කවුඩන් විසින් හොවින් එලියට ඇද කැහැකි තරමට උගුර තෙක් ආහාර අනුභව කළ **'ඤාඤමාඤඤ'** බවුණා මෙන්, බොහෝ කොට කා දිරවා ගත නො හැකි ව එහි ම වමනය කළ, **'භුත්තාවමිතඤ'** බවුණා මෙන්, ආහාර අනුභව නො කොට,

"වත්තාරෝ පංච ආලෝපෙ අභුත්වා උදකං පිවෙ,
අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනෝ"

යි කී ලෙසට භාවනායෙහි යෙදුනහුගේ සැපවිහරණයට පහසුවන පරිදි සතර පස් බත් පිඬකට ඉඩ තබා පැන් බීමෙන් පමණ දැන වලඳන්නේ මෙ තෙමේ ය. මැනැවින් දෙසූ සසුන්හි පිළිගන්නා විසින් ම පමණ දතයුතු ය. නපුරු කොට දෙසූ සසුන්හි පමණ දතයුත්තේ දෙන්නන් විසිනැ"යි වදාළ වචනය සිහිකළ යුතුය.

මේ ඒ වදාළ සැටි:-

"දුරක්ඛාතෙ භික්ඛවෙ! ධම්මවිනයෙ දායකෙන මත්තා ජානිතබ්බා, නො පටිග්ගහකෙන තං කිස්සහෙතු? දුරක්ඛාතත්තා භික්ඛවෙ! ධම්මස්ස, සඞ්ඛාතෙ භික්ඛවෙ! ධම්මවිනයෙ පටිග්ගාහකෙන මත්තා ජානිතබ්බා, නො දායකෙන තං කිස්ස හෙතු? සඞ්ඛාතත්තා භික්ඛවෙ! ධම්මස්ස" යි.

සඛං = සැදුහැති ඇදහීම ඇති.

තං, යන්න වෙසෙස යි. කමී, කර්මඵල, එ ලොව, මෙ ලොව ඇතැ යි යන ඇදහීම ලකුණු කොට ඇති ලෞකිකශ්‍රද්ධායෙන් ද, තුණුරුවන්හි නො සැලෙන පරිදි පිහිටි පැහැදීම ය යි කියූ ලොකොත්තරශ්‍රද්ධායෙන් ද යුක්තවූයේ මෙයින් කියැ වේ.

ආරඛවිරියං = සම්පූර්ණවීර්‍යය ඇති. වැඩූ වීර්‍යය ඇති.

තං, යන්න වෙසෙස යි. සතර ඉරියව්වෙහි වැඩූ වීර්‍යය ඇති වත් පිළිවෙත් පුරණ ආජීවය පිරිසිදු කරණ කායිකවීර්‍යයෙන් හා කෙලෙසුන් තවන කුසල් දහම් වඩන චෛතසිකවීර්‍යයෙන් ද යුක්තවූයේ, මේ තෙමේ ය. සමූහයෙහි ඇලී ගැලී සිටීම අතහැර සිවු ඉරියව්වෙහි අට වැදෑරුම් ආරම්භවස්තූන්ගේ වශයෙන් එකලාව වසන්නේ වත් පිළිවෙත් පිරීම් ආදියෙහි අනලස් ව යෙදුනේ **'ඤාඝින ආරඛවිරිය'** නම් වේ. තවද ගමන් බිමන් කරණ කල්හි උපන් කෙලෙසුන්ට සිටින අවස්ථාවේ දී ඉපැදෙන්නට නො දී, සිටිනා කල්හි උපන් කෙලෙසුන්ට හිඳිනා අවස්ථාවේ දී ඉපැදෙන්නට නො දී, හිඳිනා වේලේ උපන් කෙලෙසුන්ට හිඳිනා අවස්ථාවේ ඉපැදෙන්නට නො දී මනස්‍යෙන් නයකු පෙළන්නකු සේ සිවු ඉරියව්වෙහි ම කෙලෙස් මැඩ සිටියේ ද **'ආරඛවිරිය'** නම්.

කෙලෙස් වශයෙන් ඒ ඒ තැන ඇලීම් අත හැර අෂ්ටසමාපත් තීන්ගේ වශයෙන් එකලා ව වසනුයේ කෙලෙස් තැවීම් ආදියෙහි යෙදුනේ, **'චෙතසිඝාරඩ්ඩියා'** නම් වේ. තව ද යම්ලෙසකින් කෙලෙසුන්ගේ ඉපදීම වළක්නා හැක්කේ ද එලෙසින් විසීම් ඇත්තේ ද **'ආරඩ්ඩියා'** නම.

තං වෙ නාපසහති මාරෝ = ඒ පුද්ගලයා මාර තෙමේ එකාන්ත යෙන් නො මැඩලයි.

දශ අශුභ අතුරෙන් එක්තරා අශුභයක් එක්වන් බලමින් වසන කෙස් ලොම් නිය දත් ආදිය අශුභ ය යි සිතන සිහි කරණ ඇස්, කන්, නාස් ආදී වූ ඉඳුරන් කෙරෙහි මොනවට නික්මුනු බොජ්ඣන්හි පමණ දන්නා වූ සැදුහැති වැඩූ වියත්ය ඇති පුද්ගලයා මරුට කිසිලෙසකින් මැඩ ලන්නට යටපත් කරන්නට නො හැකි ය යි වදුල සැටිය මේ.

වාතෝ සෙලං ඉව පබ්බතං = (දුශ්ශීල) වාතය ගල් කන්දක් කම්පිත නො කරන්නා සේ ය.

වේගයෙන් තදින් නො හමන යන්තමකින් හමන වාතය අතිශය ඝන වූ ඉතා තද වූ ගල් කන්දක් සොලවා ලන්නට යම්සේ අපොහොසත් වේ ද, එසේ මේ පුද්ගලයාගේ සිතෙහි උපදනා දුශ්ශීල වූ කෙලෙශමාරයාට යට කියූ මහත් ගුණ ඇති මිනිස් සිත මැඩලන්නට නො හැකි ය. කෙලෙශමාර තෙමේ එහිලා අසමර්ථ වේ.

බුදුරජානන් වහන්සේ එහි දන් වළඳ අවසන් කොට අනු මෙවෙනි බණ වදාරන්නට මහාකාල තෙරුන් නවතා අනික් භික්ෂූන් වහන්සේ සමග විහාරයට වැඩි සේක. එ වේලෙහි මහාකාල තෙරුන්ගේ පැවිද්දට කලින් සිටි අඹුවෝ අටදෙනා තෙරුන් වට කොට ගෙණ, "හා! තමුසේ පැවිදි වූවහු කාගෙන් අසා ද?, පැවිදි වන්නට කීවෝ කවුරු ද?, අපි නො කීවෙමු පැවිදි වන්නට, දැන් දැන් වහා සිවුරු හැර දමන්න! එන්න ගෙදරැ"යි කියා සිවුරු ගලවන්නට සූදානම් වත් ම තෙරුන් වහන්සේ හුනස්නෙන් නැඟී සෘඩ්බලයෙන් උඩට නැග වහළ බිඳ ගෙණ අහසට පැන නැග අවුත් බුදුරජුන් යට කියූ ගාථාව දෙශනා කොට අවසන් කරන්නට කලින් බුදුරජුන්ගේ රන්වන් සිරුරට සතුති කරමින් අහසින් බැස සිරිපා වැන්දේ ය.

මේ ධර්මදෙශනාව අවසන්හි පැමිණ සිටි භික්ෂූන් වහන්සේලා සෝවන් පලාදියට පැමිණියාහු ය.

චූලකාල මහාකාල සථවිරවත්ථුව නිමියේ ය.

දෙවදහන සථවිරයන් වහන්සේ

1 — 7

එක් කලෙක අග්‍රශ්‍රාවකයන් වහන්සේලා දෙනම තමන් වහන්සේලාගේ පන්සියය පන්සියය තරම් වූ ශිෂ්‍යසමූහයා ත් කැටුව බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලබා දෙව්රම් මහ වෙහරින් නික්ම රජගහනුවරට වැඩියෝ ය. රජගහනුවර වැස්සෝ උන්වහන්සේලාට දෙතුන් දෙනා ත් හතර පස් දෙනා ත් බොහෝ දෙනා ත් එකතු ව ආගනතුක දන් පිළිගැන් වූහ. මහ රහත් සැරියුත් මහතෙරුන් වහන්සේ දිනෙක දන් වලඳ අනු මෙවෙනි බණ වදාරණ සේක්, "උපාසකයෙනි! යමෙක් අනුන් සමාදන් නො කරවා තෙමේ ම තනි ව දන් දේ ද, හෙ තෙමේ උපනුපත් අත්බැව්වල දී භොගසම්පත්තිය ලබයි, පරිවාරසම්පත්තිය නො ලබයි, යමෙක් අනුන් සමාදන් කරවා අනුන් ලවා දන් දෙවා තෙමේ දන් නො දේ ද, ඔහු උපනුපත් අත්බැව්වල දී පරිවාරසම්පත්තිය ලබයි, භොගසම්පත්තිය නො ලබයි, යමෙක් තෙමේ ත් දන් නො දේ ද, අන්‍යයා ත් සමාදන් නො කරවා ද ඔහු උපනුපත් අත්බැව්වල දී බඩ පුරා කැඳින්තකු ත් නො ලබයි, උපනුපත් හැම තන්හි ම අසරණයෙක්, අනාථයෙක් වෙයි, යමෙක් තෙමේ ත් දන් දේ ද, අනුන් ලවා ත් දන් දෙවා ද, ඔහු උපනුපත් අත්බැව්වල දී සිය ගණන් දහස් ගණන් ලක්ෂ ගණන් අත්බැව්වල දී භොගසම්පත්තිය හා පරිවාර සම්පත්තිය ලබා" යි වදාළ සේක.

එ බණ ඇසූ එක් නුවණැති මිනිසෙක් "මහතුනි! හාමුදුරුවන් වහන්සේ වදාළ බණ නම් ඉතා යහපත් ය, එහෙයින් මම මේ දෙ වැදෑරුම් සම්පත් ලබා දෙන පින් කමක් කරන්නට අදහස් කෙළෙමි" යි එහි සිටියවුන්ට දන්වා, "සවාමීනි! හෙටට මාගේ දානය පිළිගණු මැනැවැ" යි මහතෙරුන්ට ආරාධනා කෙළේ ය. උන්වහන්සේලා "උපාසකය! ඒ පිණිස තමුසේට උන්නාන්සේලා කෙතෙක් වුවමනා දැ"යි ඇසූ විට, "ඔබවහන්සේලා දෙනමගේ භික්ෂූපිරිස කොපමණ දැ?" යි ඇසී ය. "අප දෙනමගේ පිරිස දහසක් පමණ ය"යි දැන් වූ විට "මට ඒ හැම දෙනා වහන්සේ ම වුවමනා ය, හැම දෙනා වහන්සේ සමග වඩින්නැ"යි උපාසක තෙමේ කී ය. උන්වහන්සේලා එය ඉවසූහ. ඉන්පසු උපාසක තෙමේ ගෙයක් ගානේ කඩපිළක් ගානේ යමින්, 'අම්මේ! තාත්තේ! අය්යේ! මල්ලී! අක්කේ! නංගී! යන ඇලෙයින් ඒ ඒ අයගේ තරුණිරමින් කතා කොට, තමන්, හෙට දනට දහසක් දෙනා

වහන්සේ ට ආරාධනා කළ බව කියා, "මේ හැම දෙනා මාගේ දානයට තම තමන්ට හැකි පමණින් උපකාර කරන්ට ඕනෑ ය මේ උදව්ය කොතෙක් දෙනා වහන්සේට දන් පිළියෙල කරන් නෝ ද? කියන්න, තමුසේලා කොතෙක් දෙනා වහන්සේ ට දන් පිළියෙල කරන්නහු දැ?" යි හැම දෙනාගෙන් ඇසී ය. පළාත් වැසි හැම ගෑණු පිරිමි කෙනෙක් ම "අපි දස නමකට, අපි විසි නමකට, අපි සියයක් නමකට දන් පිළියෙල කරන්නෙමු" යි තම තමන්ගේ ඇති වත් පොහොසත්කම් අනු ව කියා යිටියහ. "එසේ නම් දානට වුවමනා උපකරණ එක් තැනක රැස් කොට තබා, කවුරු ත් එකතු ව දන් උයමු" යි කියා "තමුසේ තල, තමුසේ සහල්, අස්සා ගිතෙල්, අක්කා මී පැණි, නංගී කිරි, මල්ලි උක්හකුරු ගෙණ එන්නැ" යි මේ ලෙසින් ඒ ඒ අයට නියම කොට, උපාසක තෙමේ දානය පිණිස සූදානම් විය. උපාසකයා නියම කළ ලෙසට හැම කෙනෙක් ම තල- සහල් ගිතෙල්- මීපැණි- කිරි- උක්හකුරු- එලවුළු- කැවිලි- පෙවිලි පලතුරු ආදිය ගෙණ ආහ. උපාසක තෙමේ ඒ සියල්ල එක් තැනක තැබ්බ වී ය.

එක් පවුල්කාරයෙක් තමන් ලඟ තුබූ ලක්ෂයක් තරම් වටිනා සුවඳ කැවූ සියුම් කසටවතක් ගෙණැවිත් දී "මේ වස්ත්‍රය විකොට ඉන් ලැබෙන මුදලින් මහත්මයාගේ දානට යමක් අඩු නම්, ඒවා ගෙන්වා ගන්න, දානොපකරණ සම්පූර්ණ නම් මහත්මයා කැමැති හාමුදුරුනමකට පූජාකරන්නැ යි කීයේ ය. දානයට වුවමනා සියලු බඩුමුට්ටු සම්පූර්ණ වතුබූ බැවින්, උපාසක තෙමේ දානයට සමබඬ ව සිටි හැම කෙනකුත් රැස් කරවා, "පින්වත්නි! එක් දානවත් මහත්මයෙක් මේ වටිනා රෙද්ද ගෙණැවිත් දී දානයට යමක් අඩු නම්, මෙය විකුණා ලැබෙන මුදලින් ඒ අඩු පාඩු පිරිමසා ගන්නැ යි මට කියා යියේ ය, එහෙත් දානට වුවමනා හැම දෙයක් තිබේ, එයට කිසිවක් අඩු නැ නෝ වේ ද, ඒ නිසා මෙය අපි හාමුදුරු නමකට දෙමු, දෙන්නමෝ කවරකුට දැ?" යි රැස් ව සිටි මිනිසුන් ගෙන් ඇසී ය. ඒ පිරිසෙහි සමහර කෙනෙක් "එය සැරියුත් හාමුදුරුවන්ට දෙමු" යි කීහ. සමහර කෙනෙක් නැගිට "එහෙ ම දෙන්නට බැහැ, සැරියුත් හාමුදුරුවන්ට අප මතක් වන්නේ ගොයම් පැසෙන අවදියට ය, ගොයම් පැසෙනු බලා හිඳ ඒ කාලයට මෙහි ඇවිත් යති, අපට ඒ හාමුදුරුවන්ගෙන් වැඩ වැඩක් නැත, දෙවදහක හාමුදුරුවෝ එසේ නො වෙති, ඒ සවාමීන් වහන්සේ අපගේ මගුල් අවමගුල් තොවිල් පවිල් ආදී වූ හැම එකේදී ම අපට උපකාර වෙති, එසේ ම ලෙඩට දුකට පිහිට වන්නෝ ත් ඒ සවාමීන් වහන්සේ ය, ඒ සවාමීන් වහන්සේ

අපට බොහෝ උපකාර ය, දියපිරූ මහහැළියක් සේ නිතර පිහිට ය, ඒ නිසා මේ රෙද්ද ඒ හාමුදුරුවන්ට දෙමු' යි කිහ.

මෙසේ පිරිස දෙ පසට බෙදුනු විට උපාසකා තෙමේ වැඩි දෙනාගේ කැමැත්ත පිමසී ය. එහි දී 'දෙවදත්ත හාමුදුරුවන්ට දිය යුතු ය' යි කියන්නෝ ම බොහෝ වූහ. එ හෙයින් වැඩි දෙනාගේ කැමැත්ත ලෙසින් ඒ රෙද්ද දෙවදත්ත ස්ථවිරයන් වහන්සේට දුන්නේ ය. දෙවදත්ත ස්ථවිර තෙමේ එය ගෙණ ගොස් සිවුරක් කොට හොඳට මසා හැඳ පොරවා ගෙණ රෑ දුවල් දෙක්හි මිනිසුන්ට පෙණෙන සේ ඒ ඒ තැනැ ඇවිදින්නට පටන් ගත්තේ ය. ඒ දුටු ගෑණු පිරිමි 'මොක ද මේ සෙල්ලම, මෙහෙ ම වැඩෙක් තිබේ ද, මහණ උන්නාන්සේලා රෑ දුවල නො කෑ නො සිතා නිතුමනාපයට කඩපිළක් ගානේ හන්දියක් ගානේ මිනිසුන් හැසිරෙන තැන්වල ගමන් කෙරෙත් ද, අශ්යෝ! මේ සිවුර මේ තැනට නුසුදුසු ය, මෙය මොහුට දුන්නේ උමතුවෙන් ද, මෙය සුදුසු මහාගුණවත් අගසවු සැරියුත් හාමුදුරුවන්ට ය, මෙ තරම් ඔවිනා සිවුරක් පෙරවිය යුත්තෝ සැරියුත් හාමුදුරුවන් වහන්සේ වැනි මහාගුණවත්හු ය, දෙව්දත් හාමුදුරුවෝ පස්සට කොහොම ම වූවත්, දැන් නම් එතරම් උසස් ගුණවතෙක් නො වෙති, මෙය දෙව්දත් හාමුදුරුවන්ට ගැළපෙන්නේ නැත, ඒ හාමුදුරුවන්ට නො තේරුනාට නුවණැතියන්ට නම්, දෙව්දත් තෙරුන්ගේ මේ සිවුර පෙරවීම මහාවිහිලුවක් ය, හොඳ එකක් හොඳ තැනක තැබිය යුතු නො වේ ද, හොඳ එකක් නරක තැනක තැබූ විට එහි ඇති අගය කුමක් ද, ආනිසංසය කුමක් දැ' යි තැනෑ තැනෑ රැස් ව කතා කරන්නට වූහ. මේ නිසා මිනිසුන් අතර මහත් නො සංසුන්කමෙක් හටගැණුනේ ය.

මෙ දවස දිසාවැසි එක් භික්ෂු නමක් රජගහනුවරින් සැවැත් නුවරට ගොස් බුදුරජුන් දැක වඳින්නට දෙවරම් මහවෙහෙරට ගියේ ය. එහි ගොස් වැද සිටි කල බුදුරජානන් වහන්සේ ඔහුගෙන් පළමු කොට සුව දුක් විචාරා නැවැත අග්‍රශ්‍රාවකයන් වහන්සේලාගේ සැප දුක් කෙසේ දැ? යි ඇසූහ. එවිට මේ භික්ෂු තෙමේ දෙව්දත් තෙරුන් තමන්ට නුසුදුසු සිවුරක් හැඳ පොරවා ගෙණ තැනෑ තැනෑ ගමන් බිමන් කරණ බව ත්, මහජනයාට එය අප්‍රියබව ත්, එහෙයින් මිනිසුන් අතර නො සංසුන් බවක් හටගෙණ ඇති බව ත් දන්වා සිටියේ ය එ කල්හි බුදුරජානන් වහන්සේ 'මහණෙනි! දෙවදත්ත තෙමේ තමහට නුසුදුසු සිවුරු දරණුයේ අද විතරක් නො වේ, පෙර ත්

තමාට නුසුදුසු වස්ත්‍ර හැඳ පොරවා සිටියෙකැ' යි වදාරා භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීම පරිදි ඒ පුවත, මෙසේ හෙලි කළ සේක:-

'පෙර බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රජය කරණ කල්හි එ නුවර ඇතුන් මරන්නෙක් වාසය කළේ ය, ඔහු ඇතුන් මරමින් උන්ගේ දත් නියපොතු කටු අතුනු මස් සම් ගෙණවුත් විකුණා ජීවිකාව කරයි, එදා එහි එක් වනයෙක් දහස් ගණන් ඇතුන්ගෙන් පිරී පැවැත්තේ ය, එහි ගොදුරු සොයා ඔබමොබ හැසිරෙන ඇත්තු එහි ම විවෙකයෙන් වැඩ හිඳිනා පසේ බුදු කෙනකු දැක එතැනින් යනෙනාකල දනින් වැටී වැඳ යති, දිනක් මේ ඇතුන් මරන්නා ඇතුන්ගේ දනින් වැටී කරණ ඒ ක්‍රියාව දැක 'මම මෙතෙක් දවස් ඇතුන් මරන්නේ ඉතාඅමාරුවෙන් අපහසු යෙන් මරා ගතිමි, එහාමෙහා යන එන මොවුහු පසේබුදු කෙනෙ කුන් දැක වඳිති, එසේ කරන්නෝ කුමක් නිසා දැ'යි සිතන්නේ 'පසේබුදුන් පෙරවූ සිවුර දැක වඳිත් ය'යි සලකා 'මම ද සිවුරක් සොයා ගෙණ පොරවා ගණිමි'යි සිතා විලක් ලඟට ගියේ ය, ඒ විලෙහි පසේබුදු කෙනකුන් වහන්සේ සිවුරු ගලවා ඉවුරෙහි තබා දියනානු දැක විල්ඉවුරෙහි තිබුනු උන්වහන්සේගේ ඒ සිවුරු දැක ඉන් එකක් සොරා ඇරගෙණ ගොස් ඇතුන් යන එන මග සැතක් ගෙණ හිසෙහි පටන් සිවුර ලාගෙණ හිඳින්නට වන, ඇත්තු වෙන දා මෙන් එ තැනින් යන්නෝ ඔලුවේ සිට සිවුර ලාගෙණ හුන් හස්තිඝාතකයා දැක 'පසේබුදු කෙනකැ'යි යන අදහසින් දනින් බිම වැටී වැඳ යත්, හස්තිඝාතකයා ද ඇත් රැළෙහි පසුව යන ඇතු සැතින් ඇණ මරා දත් නියපොතු ආදිය ගෙණ ඉතුරු හරිය වළැ දමා යයි.

මතු එන දවස බුදුවන්නට පෙරුම් පුරණ අප මහාබොධිසත්ව යන් වහන්සේ ඇතුන් කෙරෙහි ඉපිද වැඩිවිය පැමිණ මේ ඇත් රැළට එකතු ව එහි නායක ඇතා විය, ඇතුන් මරන්නා ද මෙසේ සිවුරක් කරා ලාගෙණ ඇතුන් මරන්නට වූයේ ද මේ කාලයෙහි ය, කල් යත් යත් සිය පිරිසෙහි පිරිහීම දුටු ඇත්රජ තෙමේ 'මේ පිරිහීමට යම් කිසි හෙතුවක් තිබිය යුතු ය'යි සිතන්නට වන, එසේ සිතත්, සිවුරු කරා ලා හුන් ඒ හස්තිඝාතකයා වහා සිහියට නැංගේ ය, ඉක්බිති ඇත්රජ තෙමේ ඔහු ගැණ සිතා සැක කොට සියලු ඇතුන් ඉදිරියෙහි යවා, තෙමේ උන් පසු පස ගියේ ය, එදින ද ඔහු වෙන දා මෙන් ඇතුන් තමන්ට වැඳ ඉදිරියට ගිය කල්හි සිවුර හකුළා පැත්තක තබා එක් රියන් හමාරක් තරම් දිග ඇති සැතින් පසුව ගිය ඇත්රජුට දමා ගැසී ය, ඇත් තෙමේ පස්සට

පැන සැත් පහර වළකා මෙතෙක් ඇතුන් මැරුයේ මූ ය' යි දුන අල්වා ගන්නට නැවැත ඉදිරියට පැන්නේ ය, ඇතුන් මරන්නා ගසකට මූවා වීය, එවිට මූ ගස ත් සමග අල්ලා ගෙණ බිම ගසන් නෙම්'යි සිතූ ඇත් තෙමේ එ වෙලෙනි උඟ දික් කළ සිවුර දුක සැලුනේ 'මුට මම කිපුනෙම් නම්, දහස් ගණන් බුදු පසේබුදු මහරහතුන් ගැණ නොසලකා හැරියෙක් වෙමි'යි උපන් ක්‍රොධ වෙගය ඉවසා 'තට නොසුදුසු, පහව හිය කෙලෙස් ඇත්තවුනට සුදුසු සිවුරක් හැඳ පොරොවා තා විසින් මෙ කරණ ලද්දේ බලගතු පාපයෙකැ'යි කියා **"අනික්කසාවෝ කාසාවං —පෙ— ස වෙ කාසාවමරහති"** යනු ද දක්වා නැවැත ත් නිග්‍රහ කොට අත්හැර හියේ ය' යි.

ඉක්බිති බුදුරජානන් වහන්සේ මේ නිසා මෙ දවස ද මේ දෙශනාව ගෙණ හැර දක්වා, 'එ දවස හස්තිසාතකයා වූයේ මේ දෙවදත්ත තෙමේ ය, ඇත්රජ වූයේ මම මැ' යි ජාතකය ගළපා 'මහණෙනි! මේ දෙවදත්ත තෙමේ තමහට නොසුදුසු වස්තු දරණුයේ මෙ දවස පමණක් නොවේ, පෙර ත් මෙසේ ඔහු තමන්ට නොසුදුසු වස්තු දැරුයේ ය' යි මේ ගාථාවන් දෙශනා කළ සේක:-

අනික්කසාවෝ කාසාවං යෝ වත්ථං පරිදහිස්සති,
අපෙතෝ දමසච්චෙන න සෝ කාසාවමරහති.
යෝ ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතෝ,
උපෙතෝ දමසච්චෙන ස වෙ කාසාවමරහතීති.

කෙලෙස් කසට සහිත වූ ඉන්ද්‍රියදමනයෙන් හා වාක්සත්‍යයෙන් පහ වූ යමෙක් තෙමේ කසාවතක් දරන්නේ වේ ද, ඔහු කසාවත් දැරීමට සුදුසු නොවේ.

යමෙක් වනාහි වැමෑරූ කෙලෙස් කසට ඇත්තේ වේ ද, සීලයන්හි මොනවට පිහිටියේ වේ ද, ඉන්ද්‍රියදමනයෙන් හා වාක් සත්‍යයෙන් යුකතවූ යේ වේ ද, ඔහු එකාන්තයෙන් කසාවත් දැරීමට සුදුසු වේ.

අනික්කසාවෝ = කෙලෙස් කසට සහිත වූ. පහ නොකළ කෙලෙස් කසට ඇති.

යෝ, යන්න වෙසෙසා සිටියේ ය. **සත්‍යසන්නානය** යම්කිසි ධර්මයකින් කිලිටි වේ ද, ඒ කෙලඟ නම්. **"චිත්තං කිලිස්සති උපතප්පති බාධියති වා එතෙහීති = කිලෙසා"** යි කියේ එහෙයිනි. සූත්‍රාභිධර්මපිටක වශයෙන් කෙලඟයෝ දස දෙනෙකි. ඒ ප්‍රධාන විසිනි. සිත කෙලසන හැම ධර්මයක් ම, හැම ගතියක් ම කෙලඟ නමැ යි ගත යුතු ය. එහෙයින් සිත කෙලසන ධර්මයන්ගෙන් නොතොර වූයේ, කෙලෙස් පහ නොකළේ **'අනික්කසාව'** නම.

ලොභ - දෙස - මොහ - මාන - දිට්ඨි - විචිකිච්ඡා - ථින - මිඩ අහිරික - අනොත්තප්ප යන මොවුහු ය දස කිලෙස්.

එහි **ලොභ** නම්, රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය යන අරමුණුවල ඇලීමට කරුණු වන ධර්මය යි. සිතෙහි ලොභය නො යෙදුනේ නම්, සිත අරමුණුවල නො ඇලෙන්නේ ය. සිත අරමුණු වල ඇලෙනුයේ ලොභය ඇතිවිට ම ය. එය අරමුණෙහි සිත ඇලවීම ලකුණු කොට සිටියේ ය. **"සො ආරම්මණෙ අභිස්සඩ්ග ලක්ඛණො"** යි කීයේ එබැවිනි.

වඳුරන් මරන්නකු වඳුරන් මරන්නට ලෑල්ලක ලාටු ගා, වඳුරන් යන එන තැනක තැබූ විට, එහි පැමිණියාවූ වඳුරෙක් 'ඒ කිමැ' යි පිරික්සන්නට එහි අත තබන්නේ ය. එවිට ඌගේ ඒ අත එහි ඇලෙන්නේ ය. එය බේරා ගන්නට සිතා අනික් අත තබන් නේ ය. එ ද ඇලුනු විට, ඌ දැත බේරා ගන්නට එක් පයක් එහි තබන්නේ ය. එ ද ඇලී ගිය විට, දැත හා පය හා ගලවා ගන්නට සිතා, දෙවන පාදය ද තබන්නේ ය. එ ද එහි ඇලී ගියේ ය. මෙසේ දැත ත් දෙපය ත් ඇලී ගිය පසු වඳුරා, අත් පා සතර ගලවා ගන්නට එහි මුහුණ ද තබා උත්සාහ කරන්නේ ය. දැන් වඳුරා පස් තැනකින්එහි ඇලී සිටියේ ය. එවිට වඳුරුවැද්දා පැමිණ එහි ලෑලිකඩෙහි ලූ ලාටුවෙහි ඇලී හුන් වඳුරා මරා ගෙණ යන්නේ ය. එ පරිද්දෙන් සත්වයා ලොභය කරණ කොට රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන කාමවස්තුන්හි ඇස-කණ-නාසය-දිව-ශරීරය යන පස් තැනින් ඇලී බැඳී තද බද ව ගොස් මාරයාගේ අතට හසු ව සිටු අපායයෙහි වැටී නැසී යන්නේ ය. මෙසේ හෙයින් ලොභය වඳුරු ලාටුවක් බඳු ය. ප්‍රාණඝාතාදී වූ හැම පාපකර්මයක් කිරීමට සත්වයනට ලොභය අනුබල දෙන්නේ ය. මෙය කාමා වචරාදිධර්මයන් කරුණු කොට නැගී සිටි කල්හි **'කාමරාග'** යි ද, රූපාවචරධර්මයන් කරුණු කොට පවත්නා විට **'රූපරාග'** යි ද, අරූපාවචරධර්මයන් කරුණු කොට පවත්නා විට **'අරූපරාග'** යි ද, යි කියනු ලැබේ. තෘෂ්ණා-ආශ්‍රව-ඔඝ-යොග-ග්‍රන්ථ-උපාදාන-නීවරණ-අනුසය-සංයොජන යන නම්වලින් ද ඒ ඒ අවස්ථානු රූප ව මේ හඳුන් වනු ලැබේ.

දෙස නම්, රූපාදී වූ අරමුණු නිසා සිතෙහි පහළ වන චණ්ඩ ස්වභාවය යි. අරමුණු නිසා සිතෙහි ඇති වන දූෂිතභාවය යි. එය අරමුණෙහි සැඩබව ලකුණු කොට සිටියේ ය. **"සො ආරම්මණෙ චණ්ඩික්කලක්ඛණො"** යි කීයේ එබැවිනි. ගස් සිදුරක වසන නයකු වැනි ය මේ සැඩබව. ගස් සිදුරක් තුළට වැද වසන නයකුට දඬු මුගුරු කැට කැබලිති ආදී වූ යමකින්

පහර දුන් විට, එයින් බැහැරට ආ සර්ප තෙමේ ක්‍රොධයෙන් තදව ගියේ එහි සිටියවුන්ට පහර දෙන්නේ ය. එයින් ඔවුහු ජීවිත විනාශයට පවා පැමිණෙති. එ මෙන් මේ සැඩගතිය, දෙවෂය යමකු තුළ පිහිටියේ නම්, ඔහුගේ ජීවිතය පවා වයින් විනාශ වී යන්නේ ය. එසේ ම යකඩයෙහි උපන් යකඩයෙහි නැගි මලය, එම යකඩය විනාශ කරන්නා සේ, දූෂිත සිත් ඇති තැනැත්තේ, සිතේ ඒ දූෂිතභාවය නිසා විනාශයට පැමිණෙන්නේ ය. ප්‍රාණ ඝාතාදිඅකුශලකර්මයනට මුල් වේ මේ දෙවෂ ය. මේ නිසා සත්ව තෙමේ සිවුඅපායයෙහි හෙන්නේ ය.

මොහ නම්, සත්වයන් ඒ ඒ අරමුණුවල මුළාබවට පත් කරන්නේ ය. අරමුණුතතු වසා ලන්නා ය මොහය. එය අරමුණුවල ඇති නියම තත්වය ඇති සැටිය වසාලීම ලකුණු කොට සිටියේ ය. **"සො ආරම්මණසභාවච්ඡාදනලක්ඛණො"** යන මෙයින් එහි ලක්ෂණ කියා පෑයේ ය. සිවුරහින් යුත් මහඅඳුරෙක සිටින්නකුට කිසි දෙයක් ඇසට නො පෙණෙන්නේ යම්සේ ද, එ මෙන් 'මේ යුතු ය, මේ අයුතු ය, මේ වරද ය, මේ නිවරද ය, මේ කුසල ය, මේ අකුසල ය' යි මොහයෙන් මුළාවූවහුට නො පෙණෙන්නේ ය. යුක්තායුක්ති විචාරණයෙහි මොහය නිසා සත්ව තෙමේ අසමර්ථ වේ. මෙය චතුරඞ්ගයෙන් යුත් අන්ධකාරයක් වැනි ය. එය සම්බුදු රජානන් වහන්සේ ඉතා කොටින් වදාළ සැටි මෙන්න:-

"දුක්ඛෙ අඤ්ඤාණං" දුකෙහි තතු නො දැනීම, **"දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං"** දුක් හටගැන්මේ හෙතු ව නො දැනීම, **"දුක්ඛනිරොධෙ අඤ්ඤාණං"** දුක් නිරුද්ධ කිරීමය යි කියන නිවන නො දැනීම, **"දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං"** දුක් නිරුද්ධ කිරීම පිණිස පිළිපැදිය යුතු වත පිළිවෙත නො දැනීම, **"පුබ්බන්තෙ අඤ්ඤාණං"** පෙර විසූ කඳපිළිවෙළ නො දැනීම, **"අපරන්තෙ අඤ්ඤාණං"** අනාගතයෙහි වැළඳිය යුතු කඳ පිළිවෙළ ගැණ නො දැනීම, **"පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං"** පෙර-මතු වැළඳිය යුතු කඳපිළිවෙළ නො දැනීම, **"ඉද්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං"** පටිච්චසමුප්පාදය නො දැනීම. මෙය ඉදිරියෙහි විස්තර විසින් එන්නේ ය.

මොහය තෙමේ අකුශලපක්ෂයට පැමිණ ප්‍රඥාව මෙන් ක්‍රියා කරයි. මොහය මිත්‍යාඥානය යි කියනු ලබන්නේ එහෙයිනි. මේ හෙතු කොට සත්ව තෙමේ මරණින් මතු සිවු අපායයෙහි වැටී පමණ නො කොට හැකි කලක් බලගතු දුක් විඳින්නේ ය.

මාන නම්, 'මම ම මෙ ලොව ශ්‍රේෂ්ඨ වෙමි, මට වඩා ශ්‍රේෂ්ඨයෙක් ලොව නැත' යනාදී වූ ලෙසින් තමා උසස් කොට

සැලකීම ය. එය උඩඟුබව ලකුණු කොට සිටියේ ය. **"සෝ උන්නතිලක්ඛණෝ"** යි කීයේ එහෙයිනි. එය විස්තර විසින් ආයේ මෙසේ ය:-

තමන් පිළිබඳ යිතෙහි උපදනා සිතෙහි නගිනා යම් උඩඟු බවෙක් වේ නම්, ඒ වශයෙන් මානය එක් වැදෑරුම් වේ. **"එක විධෙන මානෝ යා චිත්තස්ස උන්නති"** යි.

අනුනට වඩා මෙහි තමන් හැම අතකින් උසස් ය යි උපදනා හැඟීම, අන්‍යයා තමනට වඩා හැම අතකින් පහත් ය යි උපදනා හැඟීම, යන අත්තුක්කංසන-පරවම්භන විසින් මානය දෙ වැදෑරුම් වේ. **"දුවිධෙන මානෝ, අත්තුක්කංසනමානෝ, පරවම්භන-මානෝ"** යි.

'මම ශ්‍රේෂ්ඨ වෙමි' යි ශ්‍රේෂ්ඨයාගේ සැලකීම, 'මම සමාන යෙක්මි' යි අන්‍යයා හා සමානයාගේ සැලකීම, 'මම හීනයෙක්මි' යි හීනයාගේ සැලකීම යන සෙය්‍යමාන-සදිසමාන-හීනමාන විසින් තෙ වැදෑරුම් වේ. **"තිවිධෙන මානෝ, සෙය්‍යෝ හමස්මීති මානෝ, සදිසෝ හමස්මීති මානෝ, හීනෝ හමස්මීති මානෝ"** යි. මේ ම යථාවමාන-අයථාවමාන විසින් ද දෙ පරිදි වේ.

ලාභය නිසා, යසස නිසා, ප්‍රශංසාව නිසා, සැපය නිසා යිත්හි උපදනා මාන විසින් සිවු වැදෑරුම් වේ. **"චතුබ්බිධෙන මානෝ, ලාභෙන මානං ජනෙති, යසෙන මානං ජනෙති, පසංසාය මානං ජනෙති, සුඛෙන මානං ජනෙති"** යි.

'මම මන වඩන රූප, මන වඩන ශබ්ද, මන වඩන ගඳ, මන වඩන රස, මන වඩන ස්ප්‍රෂ්ටව්‍යයන් ලබන සුලු වෙමි' යි යන මේ විසින් පස් වැදෑරුම් වේ. **"පඤ්චවිධෙන මානෝ ලාභීමහි මනාපිකානං රූපානන්ති මානං ජනෙති, ලාභීමහි මනාපිකානං සද්දානන්ති මානං ජනෙති, ලාභීමහි මනාපි කානං ගන්ධානන්ති මානං ජනෙති, ලාභීමහි මනාපිකානං රසානන්ති මානං ජනෙති, ලාභීමහි මනාපිකානං ඵොට්ඨ-බ්බානන්ති මානං ජනෙති"** යි.

චක්ඛුසම්පත්තිය නිසා, සොතසම්පත්තිය නිසා, ඝාණ සම්පත්තිය නිසා, ජිව්හාසම්පත්තිය නිසා, කායසම්පත්තිය නිසා, මනොසම්පත්තිය නිසා උපදනා මාන විසින් ස වැදෑරුම් ය. **"ඡබ්බිධෙන මානෝ, චක්ඛුසම්පදය, සොතසම්පදය, ඝාණ සම්පදය, ජිව්හාසම්පදය, කායසම්පදය, මනොසම්පදය, මානං ජනෙති"** යි.

යිතෙහි උපදනා යිතෙහි නගිනා උඩඟු හැඟීම, 'ජාති කුල ගොත්‍ර වශයෙන් මා තරම් උසස් කෙනෙක් නැතැ' යි අන්‍යයා පහත් කොට අභිභවනය කොට සැලකීම, 'මෙ තෙමේ පෙර මා වැනි ය, මම දැන් ශ්‍රෙෂ්ඨ වෙමි, මොහු වනාහි ඉතා පහත් ය'යි සැලකීම, 'නෝ වනාහි ජාති ඇත්තෙහි ය, ඒ ජාතියෙ සාත්‍ත ජාතිය වැනි ය, නෝ වනාහි ගොත්‍ර ඇත්තෙහි ය, ඒ ගොත්‍රය චණ්ඩාලගොත්‍රය වැනි ය, තව කටහඬෙක් ඇත්තේ ය, එය කවුඩු හඬක් වැනි ය' යි මෙසේ තමන්ට කියා ගන්නා, තමන් කෙරෙ කොට පවත්නා සැලකීම, සිවුසස්දහම් නො දැන 'දැන ගතිමි' යි අදහස් ඇත්තන්ගේ, සිවුසස්දහම් අවබෝධ නො කොට අවබෝධ කළ අදහස් ඇත්තන්ගේ, සිවුමගින් කළයුතු කටයුතු නො කොට සිවුමගින් කළයුතු කටයුතු කළ අදහස් ඇත්තන්ගේ, රහත්බව ප්‍රත්‍යක්ෂ නො කොට ප්‍රත්‍යක්ෂ කළ අදහස් ඇත්තන්ගේ, සිත්හි උපදනා සැලකීම, 'රූපය මම වෙමි' යි මේ ආ ලෙසින් පංචස්කන්ධය නිසා උපදනා හැඟීම, ලාමක වූ ඇසිඇතුළත-ශ්‍රොත්‍රඇතුළත-ඝ්‍රාණඇතුළත-ජිව්හාඇතුළත-කයඇතුළත-ශ්‍රුත-ප්‍රතිභා-ශීලව්‍රත යන මොවුන් නිසා ලාමක දෘෂ්ටිය නිසා උපදනා හැඟීම, යන මොවුන්ගේ වශයෙන් සත්වැදෑරුම් වේ. **"සත්තවිධෙන මානො, මානො-අතිමානො-මානාතිමානො-ඔමානො-අධිමානො-අසම්මානො-මිච්ඡාමානො"** යි, මාන, අතිමාන, මානාතිමාන, ඔමාන, අධිමාන, අසම්මාන, මිච්ඡාමාන යනු ය ඒ සත් වැදෑරුම් මාන.

එහි කෙවුල් වැදි ආදීන් විසින් සත්ඝාතනය පිණිස, සතුන් නැසීම පිණිස කරණ කම්, ලාමකකාම්‍යතන නම්. දුල් දැමීම්, කුමිණ බැඳීම්, මළපුඩු ඇටවීම්, උල් සිටුවීම් ආදියෙහි දක්ෂභාවය, ලාමකශිල්පායතන නම්. අනුන් නැසීම පිණිස කරණ විද්‍යාය, ලාමකවිද්‍යායතන නම්. භාරතයුඛ, සීතාහරණාදිය ගැබ් කොට ගත් කතාඇසීම ය, ලාමකශ්‍රුත නම්. දුර්භාෂිත ප්‍රයෝගකාව්‍ය නාටකාදිය පිළිබඳ වැටහීම ය, ලාමකප්‍රතිභා නම්. ගොසිල, අජසිල, ගොව්‍රත, අජව්‍රත ආදි ය, ලාමකශීලව්‍රත නම්. දෙ සැටක් මිසදිටු අතුරෙහි යම් කිසි මිස දිටුවක් ය, ලාමක දෘෂ්ටි නම්.

ලාභය නිසා උපදනා මානය, අලාභය නිසා උපදනා ඔමානය, යසස නිසා උපදනා මානය, අයස නිසා උපදනා ඔමානය, ප්‍රශංසාව නිසා උපදනා මානය, නින්දාව නිසා උපදනා ඔමානය, සැපය නිසා උපදනා මානය, දුක නිසා උපදනා ඔමාන ය යි මේ විසින් අට වැදෑරුම් වේ. **"අට්ඨවිධෙන**

මානෝ, ලාභෙන මානං, අලාභෙන ඔමානං, යසෙන මානං, අයසෙන ඔමානං, පසංසාය මානං, නින්දාය ඔමානං, සුඛෙන මානං, දුක්ඛෙන ඔමානං ජනෙති''යි.

'ශ්‍රේෂ්ඨයාහට ශ්‍රේෂ්ඨ වෙමි, ශ්‍රේෂ්ඨයාහට සමාන වෙමි, ශ්‍රේෂ්ඨයාහට හීන වෙමි' යි උපදනා තෙ වැදෑරුම් මානය, 'සමානයාහට ශ්‍රේෂ්ඨ වෙමි, සමානයාහට සමාන වෙමි, සමානයාහට හීන වෙමි' යි උපදනා තෙ වැදෑරුම් මානය, හීනයාහට ශ්‍රේෂ්ඨ වෙමි, හීනයාහට සමාන වෙමි, හීනයාහට හීන වෙමි' යි උපදනා තෙ වැදෑරුම් මානය, යි මේ විසින් නව වැදෑරුම් වේ. **''නවවිධෙන මානෝ, සෙය්‍යස්ස සෙය්‍යො හමස්මීති, සෙය්‍යස්ස සදිසෝ හමස්මීති, සෙය්‍යස්ස හීනෝ හමස්මීති, සදිසස්ස සෙය්‍යො හමස්මීති, සදිසස්ස සදිසෝ හමස්මීති, සදිසස්ස හීනෝ හමස්මීති, හීනස්ස සෙය්‍යො හමස්මීති, හීනස්ස සදිසෝ හමස්මීති, හීනස්ස හීනෝ හමස්මීති මානෝ** යි.

එහි 'ශ්‍රේෂ්ඨයාහට ශ්‍රේෂ්ඨ වෙමි' යි මානය උපදනේ රජුන්ට හා පැවිද්දන්ට ය. රජු, රාෂ්ට්‍රයෙන් ධනයෙන් වාහනයෙන් 'මට වඩා ශ්‍රේෂ්ඨයෙක් කොතැන වේ ද' යි මානය උපදවන අතර, පැවිද්ද සීලධුතඞ්ගාදිගුණයෙන් 'මට වඩා ශ්‍රේෂ්ඨයෙක් කොතැන වේ ද' යි මානය උපදවයි. 'ශ්‍රේෂ්ඨයාහට සමාන වෙමි' යි උපදනා මානය ද උපදිනුයේ මේ දෙ දෙනාහට ම ය. රජු, රටින් ධනයෙන් වාහනයෙන් අන් රජුන් හා මාගේ වෙනස් කම කුමක් ද' යි මානය කරණ අතර, පැවිද්ද 'සීලධුතඞ්ගාදියෙන් අන්‍ය භික්ෂූන් හා මාගේ වෙනස් කම කුමක් ද' යි මානය කරයි. 'ශ්‍රේෂ්ඨයාහට හීන වෙමි' යි උපදනා මානය ත් මේ දෙදෙනා හට ම උපදී. යම්කිසි රජකුගේ රට හෝ ධනවාහනාදිය වැඩියක් සම්‍යක්ඛීමත් නො වූව ද 'මම රජ වෙමි' යි මානය උපදවයි. පැවිද්ද සුවලප වූ ලාභ සත්කාර ඇත්තේ නමුත්, 'මම ධම්කථිකයෙක්මි, මම බහුශ්‍රැතයෙක්මි, මම මහාස්ථවිර වෙමි' යි මානය කරයි.

'සමානයාහට ශ්‍රේෂ්ඨ වෙමි, සමානයාහට සමාන වෙමි, සමානයාහට හීන වෙමි' යි උපදනා මානය උපදනේ ඇමැති ආදීන්ට ය. 'රටවැස්සන්ගෙන් හෝ හොඟ යාන වාහන ආදියෙන් හෝ මා සමාන අන් රජ ඇමැතියෙක් නැත්තේය'යි සිතීමෙන්, 'අන් ඇමැතියන් හා මාගේ වෙනස කිමැ' යි සිතීමෙන්, මට ඉදුල් පමණ කුත් නැත්තේ ය, එහෙත් මම රජඇමැති වෙමි' යි සිතීමෙන් මේ උපදනේ ය.

'හීනයාහට ශ්‍රේෂ්ඨ වෙමි, හීනයාහට සමාන වෙමි, හීනයාහට හීන වෙමි' යි උපදනා මාන තුණ දුසාදීන්ට උපදී. 'මවු පසින් හෝ පියපසින් මා හා සම අන් දුසයෙක් කොතැන වේ ද?, අන්හු ජීවත්වන්නට මගක් නොමැති ව උදරහෙතුවෙන් දුසවූවෝ ය, මම ප්‍රවේණියෙන් ආ බැවින් ශ්‍රේෂ්ඨ වෙමි' යි සිතීමෙන්, ප්‍රවේණියෙන් ආ මවු පිය දෙපසින් පිරිසිදු වූ අසුවල් දුසයා හා මාගේ වෙනස කිමැ' යි සිතීමෙන්, 'උදරහෙතුයෙන් මම දුසයෙක් වීමි, මාගේ මවු පියන් විලිබඳ දුසභාවයෙක් නැත, කිම, මම දුසයෙක් වෙමි ද' යි සිතීමෙන් මේ උපදනේ ය.

මෙහි 'ශ්‍රේෂ්ඨයාහට, ශ්‍රේෂ්ඨ වෙමි' යි උපදනා මානය යථාව මාන නම්. ශ්‍රේෂ්ඨයාහට උපදනා සදිසමානය හා හීනමානය අයථාවිමාන නම්. සමානයාහට උපදනා සදිසමානය හා හීනයාහට උපදනා හීනමානය ද යථාවමාන නම්. අන් මානයෝ අයථාවිමාන නම් වෙත්. එහි යථාවමානයෝ අහීනමාගීඤ්ඤනයෙන් නැසිය යුතු ය. අයථාවමානයෝ සෝතාපත්තිමාගීඤ්ඤනයෙන් නැසිය යුතු ය.

ජාති ගොත්‍ර කුලපුත්‍රභාවය නිසා, වණ්ණසොඳුරුකම නිසා, ධනය නිසා, ඉගෙණීම නිසා, කම්මායතන නිසා, ශිල්පායතන නිසා, විද්‍යාවන් නිසා, බහුශ්‍රැතභාවය නිසා, ප්‍රතිභානය නිසා අන්‍යතර අන්‍යතරවස්තූන් නිසා උපදනේ මානය දස වැදෑරුම් වේ. **"දස විධේන මානෝ, ඉධෙකච්චෙ මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣායනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා"** යි.

දිට්ඨි නම්, ඒ ඒ දෙරටුමගින් සිතට වදනා අරමුණු වරදවා දක්වන ශක්තිමාත්‍රය යි. ඕ වැරදිදැකීම ලකුණු කොට සිටියා ය. **"සා මිච්ඡාපි ලක්ඛණා"** යි කීයේ එබැවිනි. යම් ධම්ශකතිය තින් සත්ව තෙමේ ලොකයෙහි නියම තත්ත්‍වය පසෙක දමා විරුද්ධාකාර යක් ගණී ද, 'ලොකය දෙවියකු විසින් මවන ලද ය' යන ආදී විසින් හෙතු රහිත අදහස් ප්‍රකාශ කෙරේ ද, එයට අනුබල දුන් ඒ සඩ්ඛාරය ය දිට්ඨි. කැටකැබලිති රන් රුවන් කොට දක්වන්නා සේ මේ දෘෂ්ටිය ඒ ඒ අරමුණුවල නියම තතු වසා දක්වයි. මෝ විනාහි සත්ත්‍වයන්ට බලගතු වූ තද දුක් දෙන්නී ය. සසර දුකට මූල් වූ ය. මෝ ප්‍රධාන විසින් **නත්ථික-අහෙතුක-අකිරිය දිට්ඨි** යි තුන් වැදෑරුම් වේ.

එහි **නත්ථිකදිට්ඨි** නම්, දුන් දනෙහි විපාක නැත. යාග වශයෙන් සතකාරවශයෙන් කරණ ලද්දෙහි විපාක නැත, කුසල් අකුසල්හි විපාක නැත, මෙලොවෙක් නැත, පරලොවෙක් නැත, මවක් නැත, පියෙක් නැත, ඔපපාතිකසත්වයෝ නැත. මේ ලොව පරලොව දැන මොනවට පිළිපන් මහණ බමුණෝ නැතැ'යි ගන්නා දිට්ඨිය ය. මෙන්න ඒ දිට්ඨිය පෙන් දැ සැටි:- **"නත්ථි දින්නං, නත්ථි සිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකෝ, නත්ථි අයං ලෝකෝ, නත්ථි පරෝ ලෝකෝ, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහමණා සම්මග්ගතා සම්මා පටිපන්නා, යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති"**යි. මෝ තොමෝ මෙසේ දශවස්තුවෙන් පවත්නා බැවින් 'දශවත්ථුකාමිච්ඡාදිට්ඨි' යි කියනු ලැබේ.

අහෙතුකදිට්ඨි නම්, කාම-රූප-අරූප යන තුන් භවයන්හි වසන සත්වයන්ගේ සිත කොලෙසීමට හෙතුයෙක් නැත, හෙතු ප්‍රත්‍යය රහිත ව සත්වයෝ කෙලෙසෙත්. සත්වයන්ගේ විරිසිදු වීමට හෙතුයෙක් නැත, හෙතුප්‍රත්‍යය රහිත ව සත්වයෝ විරිසිදු වෙත්. තමන් කළ කර්මයෙහි විපාක නැත, අනුන්ගේ අවවාද යෙහි පිහිටා කළ කර්මයෙහි විපාක නැත, තමන්ගේ පුරුෂවීර්‍ය යෙහි ඵලයෙක් නැත, බලයෙක් නැත, වීර්‍යයෙක් නැත, පුරුෂ පරාක්‍රමයෙක් නැත, සියලු සත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ සියලු ජීවයෝ අවසභයෝ ය, බල නැත්තෝ ය, වීර්‍ය්‍ය නැත්තෝ ය, නියම පැවැතුම් ඇති බැවින් ස වැදෑරුම් අනිජාතීන් අතුරෙහි ඒ ඒ ගතිවලට පැමිණ සුව දුක් විඳිති'යි ගන්නා දිට්ඨිය ය. මෙන්න එය දක්වූ සැටි:- **"නත්ථි හෙතු නත්ථි පච්චයෝ සත්තානං සඞ්කිලෙසාය, අහෙතු අප්පච්චයා සත්තා සඞ්කිලිස්සන්ති, නත්ථි හෙතු, නත්ථි පච්චයෝ සත්තානං විසුද්ධියා, අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති, නත්ථි අත්තකාරෙ නත්ථි පරකාරෙ නත්ථි පුරිසකාරෙ නත්ථි බලං නත්ථි විරියං නත්ථි පුරිසථාමෝ නත්ථි පුරිසපරක්කමෝ, සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා අවසා අබලා අවිරියා නියතිසඞ්ගතිභාවපරිණතා, ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති"**යි.

අකිරියදිට්ඨි නම්, 'කරන්නාහට, කරවන්නාහට, කප්පන්නාහට, කප්පවන්නාහට, පෙළන්නාහට, පීඩා කරවන්නාහට, ශොක කරන්නාහට, ශොක කරවන්නාහට, වෙහෙසෙන්නාහට, වෙහෙස වන්නාහට, කම්පිත වන්නාහට, කම්පිත කරවන්නාහට,

ප්‍රාණඝාත කරන්නාහට, කරවන්නාහට. සොරකම් කරන්නාහට, කරවන්නාහට, ගෘහසන්ධි සිදින්නාහට, කිසිවක් ඉතිරි නො කොට ගන්නාහට, එක් ගෙයක් වට කොට උවදුරු කරන්නාහට, උනුන් මරා බඩු පැහැර ගැණීමට මගැ සැඟවී සිටින්නාහට, පරඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, පව් කරන්නාහට පව් නැත්තේ ය, තවද යමෙක් ඛුර නම් ආයුධයෙන් සියලු සතුන් මරා එක් ම මස්ගොඩක් එක් ම මස්පිඩක් කරන්නේ ද, ඒ හෙතුවෙන් පවෙක් නැත්තේ ය, පාපයාගේ පැමිණීමෙක් නැත්තේ ය, සත්‍යයන් හිංසා කරමින් කරවමින්, සිදිමින් සින්දවමින්, පීඩා කරමින් කරවමින් ගඞ්ගානදියෙහි දකුණු තෙරට යන්නේ ද, ඒ හෙතු කොට ද පාපයෙක් නැත්තේ ය, පාපයාගේ පැමිණීමෙක් නැත්තේ ය, දෙමින් දෙවමින්, යාග කරමින් කරවමින්, ගඞ්ගානදියෙහි උතුරු තෙරට යන්නේ ද නමුත්, ඒ හෙතුයෙන් ද පිණෙක් නැත්තේ ය, පිණේ වැඩීමෙක් නැත්තේ ය, දීමෙන්, ඉඳුරන් දැමීමෙන්, උපොසථයෙන්, සීලයෙන්, සත්‍යවචනයෙන් පිණෙක් නැත්තේ ය, පිණේ වැඩීමෙක් නැත්තේ ය' යි ගන්නා දීඝිය ය. මෙන්න එය පොතෙහි ආ හැටි:- **"කරොතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචාපයතො සොචයතො සොචාපයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදිත්තං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරොතො න කරීයති පාපං-පෙ-උත්තරං වෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යජාපෙන්තො නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො"** යි.

මෝ මිත්‍ථ්‍යාදෘෂ්ටිය, සිවු වැදැරුම් කෙවලශාස්වතදෘෂ්ටිය, සිවු වැදැරුම් එකත්‍යශාස්වතදෘෂ්ටිය, සිවු වැදැරුම් අන්තානන්තිකදෘෂ්ටිය, සිවු වැදැරුම් අමරාවික්ෂෙපිකදෘෂ්ටිය, දෙ වැදැරුම් අධිත්‍යසමුත්පන්නිකදෘෂ්ටිය, සෙළොස් වැදැරුම් සංඥීදෘෂ්ටිය, අට වැදැරුම් නෛවසංඥීනාසඥීදෘෂ්ටිය, සත් වැදැරුම් උච්ඡේදදෘෂ්ටිය, පස් වැදැරුම් දෘෂ්ටධර්මනිර්වාණවාදදෘෂ්ටිය යි දෙ සැටකට භෙද වූ ය.

එහි ධ්‍යානසමාපත්තිබලයෙන් ලත් පෙර විසූ කඳපිළිවෙළ දක්නා නුවණින්, කපකින් මෙපිට, තමහට පෙණෙන පමණින් ජාතීන් සිහි කිරීමෙහි පොහොසත්වූවහුගේ, චිත්තචෛතසිකයන්ගේ ක්ෂණභඞ්ගය නො දැක්මෙන් යම්කිසි සකන්ධයක් ආත්මය යි සලකා ඒ ආත්මය හා ලොකය, නිත්‍යය, සදාකාලික ය'යි ගැණීම.

මේ ප්‍රථමාවස්ථාවට වඩා මෝරා ගිය පෙර විසූ කඳපිළිවෙළ දක්නා නුවණින් දස කපකින් මෙ පිට මුත්, එ පිට සිහි කිරීමෙහි අපොහොසත්වූවහුගේ දස කපකින් මෙ පිට විසූ කඳපිළිවෙළ දැක, ආත්මය හා ලොකය, නිත්‍ය ය, සනාතන ය යි ගැණීම.

මේ චිතීයාවස්ථාවට වඩා තදබද වූ පෙර විසූ කඳපිළිවෙළ දක්නා නුවණින්, ධ්‍යානසමාපත්තියෙහි වැඩියක් ලත් වශීභාවය නිසා, සතළිස් කපකින් මෙ පිට විසූ ආත්මභාවයන් සිහි කොට, ආත්මය හා ලොකය නො නැසී පවතී ය, යි ගැණීම.

සිටුවන කෙවලශාස්වතදෘෂ්ටිය, දෘෂ්ටිගතිකයන්ගේ වශයෙන් සිටු වැදැරුම් ය. අනුශ්‍රැතික-ජාතිස්මරණික-ලාභී-තාර්කික, යි.

එහි 'එ දවස වෙසතුරු රජ වූයේ දැන් බුදුරජ තෙමේ නම්, ආත්මය සදාකාලික ය' යි ගන්නේ අනුශ්‍රැතික ය. ජාතීන් සිහි කිරීමෙහි නුවණින්, අත්බැව් එකක් දෙකක් සිහි කොට 'මම පෙර මෙ නම් වීමි, එහෙයින් ආත්මය සදාකාලික ය'යි ගන්නේ ජාතිස්ම-රණික ය. තමන් වෙත ගලා එන අධිකලාභ දැක, 'මම පෙර ත් මෙසේ වීමි, මතු ත් මෙසේ වන්නෙමි' යි ආත්මය සදාකාලික කොට ගන්නේ ලාභී ය. 'මෙසේ ඇතිවිට මෙසේ වේ, මෙසේ නැතිවිට මෙසේ නො වේ'යි සිතන්නේ තාර්කික ය.

මේ කීයේ කෙවලශාස්වතදෘෂ්ටි සතර ය. **සියල්ල ම සදාකාලිකය යි ගන්නී මේ දෘෂ්ටිය** යි.

කප නැසී හට ගන්නා කල්හි, පහළ වන ශූන්‍ය වූ බ්‍රහ්ම විමානයෙහි, උඩ බඹතලයකින් ගිලි හී උපදනා සත්වයාහට, පසු කාලයෙහි තම පැතීම නිසා, එහි උපන් අනික් සත්වයන් ගැණ, 'මම මහාබ්‍රහ්ම වෙමි, මාගේ ප්‍රෘත්ථනාව නිසා මොවුහු මෙහි උපන්නෝ ය, මම සියල්ලන්ට වඩා වෘඩ වෙමි, ලොකය හා පෘථිවී-පර්වත-චන්ද්‍රසූර්‍යාදීන් මම මැවීමි, මොවුහු මවන ලද්දෝ මා විසිනැ' යි සිතිවිල්ලෙක් උපදනේ ය. එහි පසු ව උපන් අනික් සත්වයෝ ද 'අප මැවූයේ මේ මහාබ්‍රහ්ම තෙමේ ය' යි අදහා ගණිත්. මොවුන් අතුරෙහි යම් සත්වයෙක් ආයු ගෙවී යෑම් ආදී යම් කිසි හෙතුවකින්, එයින් ගිලි හී මිනිස්ලොව ඉපිද, පැවිදි ව, චිත්තසමාධියට පැමිණ, පෙර විසීම පමණක් සිහි කොට 'ඒ මහාබ්‍රහ්ම තෙමේ නිත්‍ය ය, සනාතන ය, ඔහු විසින් මැවූ අපි අනිත්‍යයම්හ, මහාබ්‍රහ්ම තෙමේ ය සදාකාලික ත්, නො පෙරළෙන්නේ ත්, අපි සදාකාලික ත්, නො පෙරළෙන්නෝ ත් නො වෙමු' යි දෘෂ්ටිග්‍රහණය කරන්නේ ය. ඒ ගැණීමය ඒකත්‍යශාස්වතදෘෂ්ටියෙහි පළමු වැන්න.

ඛිඩ්ඩාපදූසිකා නම්, දෙවිලොව උපන් කිසියම් දෙවියෙක් ක්‍රීඩා පසුත ව ආහාර නො ගැණීමෙන්, එයින් ගිලි හී, මිනිස් ලොවට ආයේ, පැවිදි ව ධ්‍යාන ලබා, ඒ පළමු යිපි අත්බව යිහි කොට 'මම ආහාරය අමතක කිරීම නිසා එයින් ගිලි හී ගියෙමි, ඒ මම අනිත්‍ය වෙමි, සනාතන නො වෙමි, එබඳු අමතකවීම් නැත්තෝ ම නිත්‍යයෝ ය, සනාතනයෝ ය' යි ගණියි. ඒ ය එකත්‍යශාස්වතයෙහි දෙ වැන්න.

මනොපදූසිකා නම්, දෙවිලොව උපන් දිව්‍යපුත්‍රයෝ දෙදෙනෙක්, උනුන් කෙරෙහි කිපි දෙවඟනන් හඬමින් සිටියදී ම, ඒ කොපහෙතුයෙන් එයින් චුත ව යන්නාහ. උන් අතුරෙහි යම් එකෙක් මිනිස්ලොව උපන්නේ නම්, ඔහු පැවිදි ව ධ්‍යාන ලබා පෙර විසූ ආත්මභාවය යිහි කොට 'උනුන් කෙරෙහි නො කිපුනු දෙවියෝ ම නිත්‍යයහ, අපි අනිත්‍යයමිහ' යි මේ ආදී ලෙසින් දෘෂ්ටි ගණියි. ඒ ය මෙහි තෙවැන්න.

'ඇස – කණ – නාසය – දිව – කය – සිත යන ඉඳුරන් ආත්ම ය' යි වරදවා ගෙණ, පසු ව 'චක්ෂුරාදී වූ පඤ්චේන්ද්‍රිය අනිත්‍ය ය, සිත නිත්‍ය ය, සදාකාලික ය, පක්ෂීහු ගසක් හැර ගසෙක ලගිත් ද, එ පරිද්දෙන් ආත්මභාවය නැසී ගිය කල්හි, සිත අන් බවයකට යන්නේ ය' යි වරදවා ගැණීම ය මෙහි සිවුවැන්න.

කොටසෙක් සදාකාලික ය, කොටසෙක් සදාකාලික නො වේ ය, යි කියන්නී මේ දෘෂ්ටිය ය.

යමෙක් ප්‍රතිභාගනිමිත්ත සක්වළ කෙළවර කොට නො වඩා, කසිණසමාපත්තියෙහි ලත් චිත්තසමාධි ඇති බැවින් එහි වූ රූපා රූපධර්ම ලොක ය, යි සලකා ලොකය කෙළවර ඇත්තෙකැ, යි ගණී ද, ඒ ගැණීම ය අන්තානන්තිකදෘෂ්ටියෙහි පළමු වැන්න. මෙය ශාස්වතත් වේ. උච්ඡේදත් වේ. 'ලොකය කෙළවර ඇත් තෙක් ය, හාත්පස ම පෙණෙයි, සිත එකඟ කිරීමෙන් මම දුන වෙසෙමි' යි මේ දෘෂ්ටියෙහි බැස සිටියේ කියා පා යි.

සක්වළ කෙළවර කොට වැඩූ කසිණ ඇත්තේ, සමාපත්තිය තුළ පැවැති රූපාරූපධර්ම ලොක ය යි ද, කසිණපරිච්ඡේදයාගේ අන්තිමය කෙළවර නැත්තෙකැ යි ද ගෙණ 'මේ ලොකය කෙළවර නැති එකෙකැ' යි කියන්නේ ය. ඒ කීමට හුඹු දුන් දෘෂ්ටිය මෙහි දෙ වැන්න ය. මෝ ද ශාස්වත-උච්ඡේදදෘෂ්ටි දෙකට ම බැස ගණියි.

උඩ යට දෙ දිශාවෙහි නො වඩා, සරසට වැඩූ කසිණ සමාපත්තියෙහි, සිත එකඟ කිරීමෙන් 'උඩ යට දෙ දිශාව

කෙළවර ඇත්තේ ය, සරස කෙළවර නැත්තේ ය' යි අන්තානන්තය ගැණීම, මෙහි තෙ වැන්න ය.

මේ වාදයට ප්‍රතිපක්ෂ ව ආනන්තදෘෂ්ටිය පෙරටු කොට නම්හට වැටහෙන පමණක් ගෙණ 'ලොකය කෙළවර ඇත්තෙක් විය, ලොකය කෙළවර නැත්තෙක් නො වූයේ ය' යි ගැණීම, මෙහි හිවූ වැන්න ය.

ලොකය කෙළවර ඇත්තේ ය, ලොකය කෙළවර නැත්තේ ය, ලොකය කෙළවර ඇත්තේ ය, නැත්තේ ය, ලොකය කෙළවර ඇත්තෙක් නො වූයේ, කෙළවර නැත්තෙක් නො වූයේ යි යන නිරුක්ති සතර උඩ පැවැති දෘෂ්ටිය ය අන්තානන්තිකදෘෂ්ටි නම්.

යමෙක් කුසල් අකුසල් ගැණ විචාළවිට කිසිවක් නො කියා 'මේ කුසල් ද' යි අසන ලද්දේ 'එසේ ත් නො මේ ය' යි ද, 'මේ අකුසල් ද' යි අසන ලද්දේ 'එසේ ත් නො වේ ය' යි ද, 'ආත්මය හා ලොකය සදුකාලික ද' යි අසන ලද්දේ 'එසේ ත් නො වේ ය' යි ද, 'ශාස්වතයෙන් අන්‍ය වූ එකාන්තශාස්වත ද' යි අසන ලද්දේ 'එපරිද්දෙනු ත් නො වේ ය' යි ද යි මෙසේ කුසල් අකුසල් ආදිය පිළිබඳ ප්‍රශ්නයනට පිළිතුරු දී ගත නො හැකි ව, ඤාණදර්ශන කරණ කොට නො මග හියේ ද, වචන ගත්තා දම්මා ද ඔහුගේ මේ නො මග යෑමට, වචන ගත්තා දුම්මට තුඩු දුන් දෘෂ්ටිය අමරාවික්ෂේපිකදෘෂ්ටියෙහි පළමු වැන්න ය.

'මම කුසල් අකුසල් කත් වූ පරිදි නො දනිමි, ඒ බැවින් මම මේ කුසලය කියා හෝ, මේ අකුසලය කියා හෝ කියම් ද, එහි දී මට රාගයෙක් හෝ ක්‍රෝධයෙක් හෝ වන්නේ ය, යම් ප්‍රකාශයක් නිසා මට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ දොෂයෙක් හෝ ප්‍රතිඝයෙක් හෝ වන්නේ ද, එය මට දුඩි ගැණීමෙක් වන්නේ ය, යමෙක් මට දුඩි ගැණීමෙක් වේ ද, එය මට දුක් ප්‍රාප්ති වන්නේ ය, යමෙක් මට දුක් ප්‍රාප්ති වේ නම්, එය මට සවඥි-මොක්ෂ දෙක වළකන්නේ ය' යි මෙසේ යමෙක් දුඩි ගැණීමට බියෙන් පිළිකුල් කිරීමෙන් කුසල් අකුසල් ගැණ ඇසුවිට මොකුත් නො කියා, එසේ ද, ඒ පරිද්දෙක් ද, අන් පරිද්දෙන් ද' යි ඇසූ කල්හි එසේ නො වේ, නැත් ද' යි ඇසූ විට, නැත කියා ත් නො වේ, නැත්තේ ත් නො වේ ද' යි ඇසූ කල්හි, නැත්තේ නො වත්තේත් නො වේ' යි මේ පිළිවෙළින් කොළවරක් නැති පරිදි වචනවික්ෂේපයට පැමිණේ ද, එයට තුඩු දුන් දෘෂ්ටිය එහි දෙ වැන්න ය.

'අස්ලොම් ආදිය බලා විදින දුනුවායන් සමාන වූ සියුම් නුවණින් මැසිදිටු බිඳින්නන් සේ හැසිරෙන මහණ බමුණෝ මා අතින් ලබිය විමාලෝ නම්, ඔවුන්ට එය සපුරා කියන්නට මම අපොහොසත් වෙමි, එය මට පීඩාවකි, යමෙක් මට පීඩා නම්, එය සඟ මෙහි දෙකට අනන්තරායකි' යි ඔවුන් හා එක් ව යෙදීමේ බියෙන් කුසල් අකුසල් ගැණ ඇසූ ප්‍රශ්නයන් ගැණ මොකුත් නො කියා 'මෙසේ ත් මට නැත්තේ ය, එසේ ත් මට නැත්තේ ය, අන් පරිද්දෙකිනු ත් නැත්තේ ය, නැත්තේ ත් නො වේ ය, නැත්තේ නො වන්නේ ත් නො වේ' යි මෙසේ ගන්නාහුගේ ඒ ගැණීමට, වචන ගසා දැමීමට තුඩු දුන්නී එහි තෙවන දෘෂ්ටිය යි.

'යම්කිසි මහණබමුණෙක් මදනුවණ හා බලවත් ව නැඟුනු මුළාව ඇති බැවින් ඒ ඒ තන්හි ප්‍රශ්න විමාලේ නම්, කිමෙක් ද, පරලොවක් ඇත් දැ' යි විමාලේ නම්, 'පරලොව ඇතැ' යි මට වැටහිනි නම්, එය තට කියන්නෙමි, මට, එසේ ත් නො වේ, එ පරිද්දෙනු ත් අන් පරිද්දෙකිනු ත් නො වේ, නැත්තේ ත් නො වේ, නැත්තේ නො වන්නේ ත් නො වේ' යි යනාදි ලෙසින් යමෙක් පවසා නම්, එයට තුඩු දුන්නී එහි සිවු වැන්න ය.

මැදිමක් නැති බැවින් 'අමරා' නම් වූ දෘෂ්ටිවචන යන්ගේ ඉවත දැමීම ඇති බැවින් අමරාවික්ඛෙපිකා නම් වූ නොහොත් දියෙහි ගැලීම් මතුවීම් ආදි වශයෙන් හැසිරෙන අල්වා ගත නො හැකි (ආදුන් වැනි) අමරා නම් මත්ස්‍ය ජාතිය සේ ඛබිනොබ දුව යන මේ වාදය අමරාවික්ඛෙප නම් වේ.

නිජ්ඣායතනයක පැවිදි වූ එකෙක් වායොකසිණභාවනාව බඩා සිවුවන ධ්‍යානය උපදවා ඉන් නැගී සිතෙහි දෙස් දකියි. 'සිත ඇති විට අන් පා සිදීම් බිඳීම් ආදිවූ දුක් හා බිය ද ඇති වේ, එ හෙයින් සිතින් කම් නැත, වැඩෙක් නැත, සිත නැතිබව ම යහපතැ' යි සිතා නො පිරිහුනු ධ්‍යානයෙන් ම කලුරිය කිරීමෙන් අසංඥාලයෙහි උපදී. සිත මෙහි ම නිරුඬ වේ. රූපසඤ්ඤා-මාත්‍රයෙක් ම එහි පහළ වෙයි. යම් සේ දුනුදියෙන් විදිනා ලද ඊය දුනුදියෙහි වෙගය පමණින් අහසැ යේ ද, එසේ ධ්‍යානවෙගය නිබෙනාතුරු ම එහි සිටියි. ධ්‍යානවෙගය නැති වූ විට ම පිරිහී යිය විට ම රූපසඤ්ඤය අතුරුදහන් වේ. ප්‍රතිසන්ධිසංඥාව මෙහි උපදී. මෙහි උපන් ඒ ප්‍රතිසන්ධිසංඥාවෙන් අසංඥසත්වයන්ගේ චුතිය පෙණෙන්නී ය. එහෙයින් සංඥාමාත්‍රය ම උත්පත්ති කොට

ඇති අසංඥසත්වයෝ අසංඥතලයෙන් චුත වෙත්. "**සඤ්ඤුප්පාදා ච පන තෙ දෙවා තම්හා කායා චවන්ති**" යි කියන ලද්දේ එහෙයිනි. ඒ බ්‍රහ්මකායයෙන් චුත ව මිනිස්ලොව ඉපිද පැවිදි ව චිත්තසමාධිය ලැබූ හෙතෙමේ අසංඥතලයෙහි උත්පත්තිය පමණක් සිහි කරයි. ඉන් මතු එයින් ඔබ සිහි නො කොට 'ආත්මය ත් ලොකය ත් කරුණු නැති ව හෙතු රහිත ව උපන්නේ ය, එබැවින් පෙර නො වූ මම සත්වභාවයට පැමිණියෙමි' යි ගැණීමට අනුබල දෙන දෘෂ්ටිය දෙ වැදැරුම් අධිත්‍යසමුත්පන්නිකදෘෂ්ටියෙහි පළමු වැන්න ය.

යමෙක් තර්කානුකූල ව තීරණය කොට තමන්ගේ නුවණට වැටහෙන පමණක් ම ගෙණ 'ලොකය හා ආත්මය හෙතු රහිත ව උපන්නේ ය' යි ගණී ද, ඔහුගේ ඒ ගැණීම ය එහි දෙවන දෘෂ්ටිය.

ආත්මය හා ලොකය අහෙතුක ව උපන්නේ ය යි ගන්නා දෘෂ්ටිය අධිත්‍යසමුත්පන්නික නම්.

රූපද්‍යානය ලබා 'කසිණරූපය ආත්මය වේ, එහි පැවැති සංඥා ව සංඥී ය, ආත්මය රූපවත් ය, මරණින් මතු නිත්‍ය වූයේ සංඥී ය යි ගන්නා ගැණුම, සොළොස් වැදැරුම් සංඥීදෘෂ්ටියෙහි පළමු වැන්න ය.

අරූපද්‍යාන ලබා අරූපසමාපත්තිනිමිත්ත ආත්මවශයෙන් ගෙණ සලකා 'ආත්මය අරූපී ය, නිත්‍ය ය, මරණින් මතු සමාපත්තිසංඥාව ඇත්තේ ය' යි ගැණීම, එහි දෙ වැන්න ය.

රූප-අරූපසමාපත්ති දෙක මුසු කොට ගැණීමෙන් 'ආත්මය රූපවත් ද අරූපවත් ද වේ, මරණින් මතු නිත්‍ය ය' යි ගැණීම, තෙ වැන්න ය.

'ආත්මය රූපයෙන් තොර ය, ආත්මය අරූපයෙනු ත් තොර ය, එහෙත් ඒකාන්තයෙන් සංඥා ඇත්තේ මරණින් මතු නිත්‍යසංඥා ඇත්තේ ය' යි ගැණීම, සිවු වැන්න ය.

'ආත්මය කෙළවර ඇත්තේ ය, මරණින් මතු එය නිත්‍ය වූයේ සංඥා ඇත්තේ ය' යි ගැණීම, පස් වැන්න ය.

'ආත්මය කෙළවරක් නැත්තේ ත්, මරණින් මතු එය නිත්‍ය වූයේ ත් සංඥා ඇත්තේ ය' යි ගැණීම, ස වැන්න ය.

'ආත්මය කෙළවර ඇත්තේ ත්, කෙළවර නැත්තේ ත් මරණින් මතු එය නිත්‍ය වූයේ ත් සංඥා ඇත්තේ ය' යි ගැණීම, සත් වැන්න ය.

'කෙළවර ඇත්තෙක් වූයේ ත්, කෙළවර නැත්තෙක් නො වූයේ ත් ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම, අටවැන්න ය.

'ධ්‍යානයට් සමවැදුනහුගේ වශයෙන් එකත්වසංඥ ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම, නවවැන්න ය.

'ධ්‍යානසමාපත්තියට් නො සමවැදුනහුගේ සමවැදීමක් නැත්තහුගේ වශයෙන් හා නානාත්වසංඥ ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම, දසවැන්න ය.

'හීනකසිණයාගේ වශයෙන් පරිත්තසංඥ ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම එකොළොස්වැන්න ය.

'විපුලකසිණයාගේ වශයෙන් අප්‍රමාණසංඥ ඇත්තේ ආත්මය වේ, ඒ මේ ආත්මය මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම, දොළොස්වැන්න ය.

'සිවුවන ධ්‍යානභූමියෙහි ඉපදීම් වශයෙන් එකාන්තක සැප ඇත්තේ ආත්මය වේ, ඒ මේ ආත්මය මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම, තෙළෙස්වැන්න ය.

'නරකයෙහි ඉපදීම් වශයෙන් එකාන්තයෙන් දුක් ඇත්තේ ආත්මය වේ, ඒ මේ ආත්මය මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම, සුදුස්වැන්න ය.

'මිනිස්ලොව ඉපදීම් වශයෙන් සැප දුක් දෙක ඇති ආත්මය තෙමේ මරණින් මතු නිත්‍ය වූයේ සංඥ ඇත්තේ ය' යි ගැණීම, පසළොස්වැන්න ය.

'වෙහපඵල බඹලොව උපත්තබුන් දැහ එහි ඉපදීම් වශයෙන් සැප දුක් දෙක නැති ආත්මය තෙමේ නිත්‍යසංඥ ඇත්තේ ය' යි ගැණීම, සොළොස්වැන්න ය.

සිත ඇත්තේ ය යි ගත්තා නැණුම ය, සංඥීදණ්ඩි ය යි කියනු ලබන්නී.

'රූප ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සිත නැත්තේ ය' යි ගත් දෘෂ්ටිය අටවැදෑරුම් වූ අසඤ්ඤිදණ්ඩියෙහි ප්‍රථමය වේ.

'රූප නැත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ නැත්තේ ය' යි ගත්තී දෙවැන්න ය.

'රූප ඇත්තේ ද නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ නැත්තේ ය' යි ගත්තී තෙවැන්න ය.

'රූප නැත්තේ ද, අරූප නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ නැත්තේ ය' යි ගත්තී සිවුවැන්න ය.

'කෙළවර ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ නැත්තේ ය' යි ගත්තී පස්වැන්න ය.

'කෙළවර නැත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ නැත්තේ ය' යි ගත්තී සවැන්න ය.

'කෙළවර ඇත්තේ ද, කෙළවර නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ නැත්තේ ය' යි ගත්තී සත් වැන්න ය.

'කෙළවර නැත්තේ ද, කෙළවර නැත්තේ නො වූයේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ නැත්තේ ය' යි ගත්තී අටවැන්න ය.

මරණින් මතු සිත නැකැසි ගන්නා දෘෂ්ටිය අසංඥී නම්.

'රූප ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, නෛවසංඥීනාසංඥී ය' යි ගත් දෘෂ්ටිය අටවැදෑරුම් වූ නෛවසංඥී නාසංඥීදෘෂ්ටියෙහි ප්‍රථමය වේ.

'රූප නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය ය, නෛවසඥීනාසංඥී ය' යි ගත්තී දෙවැන්න ය.

'රූප ඇත්තේ ද, නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ නෛවසංඥීනාසංඥී ය' යි ගත්තී තෙවැන්න ය.

'රූප නැත්තේ ද, අරූප නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ නෛවසංඥීනාසංඥී ය' යි ගත්තී සිවුවැන්න ය.

'කෙළවර ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ නෛවසංඥීනාසංඥී ය' යි ගත්තී පස්වැන්න ය.

'කෙළවර නැත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ නෛවසංඥීනාසංඥී ය' යි ගත්තී සවැන්න ය.

'කෙළවර ඇත්තෙක් වූයේ ද, නැත්තෙක් වූයේ ද, ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ නෛවසංඥීනාසංඥී ය' යි ගත්තී සත්වැන්න ය.

'කෙළවර ඇත්තේ නො වූයේ ද, කෙළවර නැත්තේ නො වූයේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූයේ නෙව සංඥිනාසංඥී ය' යි ගත්තී අටවැන්න ය.

සංඥා ඇත්තේ නො වන්නේ ය, සංඥා නැත්තේ නොවන්නේ ය'යි ගත් දෘෂ්ටිය නෙවසංඥිනාසංඥී නම්.

'සතර මහාභූතයන්ගෙන් හටගත් මවුපියන්ගේ ශුක්‍ර ශ්‍රොණිත දෙකින් උපන් රූපයක් ඇති මේ ආත්මය ශරීර භෙදයෙන් සිඳෙන්නේ ය, විනාශ වන්නේ ය, මරණින් මතු නො පවතින්නේ ය, මෙ පමණකින් මේ ආත්මය හොඳින් සිඳී ගියේ වේ ය' යි මෙසේ විද්‍යමාන වූ සත්‍වයාගේ උච්ඡේදය, විනාශය, විභවය, ප්‍රකාශකිරීම සත්වැදැරුම් වූ උච්ඡේද දෘෂ්ටියෙහි ප්‍රථමය වේ.

'රූපයන් ඇති ස දෙව්ලොවැ හැසිරෙන කැබලි කොට කන ආහාර අනුභව කරණ අන්‍ය වූ දිව්‍යමයආත්මයෙක් ඇත්තේ ය, ඒ ආත්මය ශරීරභෙදයන් මත්තෙහි සිඳෙන්නේ ය, විනාශ වන්නේ ය, මරණින් මතු නො වන්නේ ය, එ පමණකින් මේ ආත්මය මනාකොට සිඳුනේ ය' යි සත්‍වයාගේ විනාශය ප්‍රකාශකිරීම එහි දෙවැන්න ය.

'ඒ ආත්මය ඇත්තේ ය, නැත්තේ නො වේ, ඒ ආත්මය මෙ පමණකින් සිඳුනේ නො වේ, රූපයක් ඇති සිතින් උපදනා ලද සියලු අහපසඟ අවයව ඇති පරිපූර්ණ ඉන්ද්‍රියයන් ඇති අන්‍ය වූ දිව්‍යාත්මයෙක් ඇත්තේ ය, යම්හෙයකින් ඒ ආත්මය ශරීර භෙදයෙන් සිඳෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මතු නො වන්නේ ද එ පමණකින් මේ ආත්මය මනාකොට සිඳුනේ ය' යි සත්‍වයාගේ විනාශය පැවසීම එහි තෙවැන්න ය.

'මේ ආත්මය ආකාසානඤ්චායතනයට පැමිණ අන්‍ය වූ ආත්මයක් ව ඇත්තේ ය, යම් කිසි කලෙක ඒ ආත්මය ශරීරභෙද යෙන් සිඳෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මතු නො වන්නේ ද, මෙ පමණකින් ඒ ආත්මය මනාකොට සිඳුනේ ය' යි සත්‍වයාගේ විනාශය පැවසීම එහි සිවුවැන්න ය.

'ඒ ආත්මය ඇත්තේ ය, මෙ පමණකින් ඒ ආත්මය මොන වට සිඳුනේ නො වේ, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනයට පැමිණි ආත්මයෙක් ඇත, යම් කිසි කලෙක ඒ ආත්මය, ශරීර භෙදයෙන් සිඳෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මතු නො වන්නේ ද, මෙ පමණකින් ඒ ආත්මය මනාකොට සිඳුනේ ය' යි සත්‍වයාගේ විනාශය පැවසීම එහි පස්වැන්න ය.

'ඒ ආත්මය නැත්තේ නො වේ, ඒ ආත්මය මෙ පමණකින් මොනවට සිදුනේ නො වේ, සර්ප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියා වූ අන්‍ය ආත්මයෙක් ඇත්තේ ය, ඒ ආත්මය ශරීරභෙදයෙන් සිදෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මත්තෙහි නො වන්නේ ද මෙ පමණකින් ඒ ආත්මය මනාකොට සිදුනේ ය' යි සත්වයාගේ විනාශය කියා පෑම එහි සවැන්න ය.

'ඒ ආත්මය ඇත්තේ ය, ඒ ආත්මය මෙ පමණකින් මොනවට සිදුනේ නො වේ, සර්ප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි අන්‍ය ආත්මයෙක් ඇත්තේ ය, යම් කිසි කලෙක ඒ ආත්මය ශරීරභෙදයෙන් සිදෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මත්තෙහි නො වන්නේ ද මෙ පමණකින් ඒ ආත්මය මොනවට සිදුනේ ය' යි විද්‍යමාන සත්වයාගේ විනාශය කියා පෑම එහි සත්වැන්න ය.

සත්ව තෙමේ මරණින් මතු නූපදනේ ය යි ගත් දෘෂ්ටිය උච්ඡේද නම්.

'මේ ආත්මය මන්ඩාතුරජු සේ මානුසිකකාමයෙන් ද, පරනිර්මිතවශවර්තිදිව්‍යරාජයා සේ දිව්‍යකාමයෙන් ද, සමන්විත වූයේ ඉඳුරන් පිණවා ද, ඉඳුරන් හසුරුවා ද, මෙ පමණකින් මේ ආත්මය උත්තම වූ දෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ වේ ය' යි විද්‍යමානසත්වයාගේ උත්තමදෘෂ්ටධර්මනිර්වාණය පැවසීම, පස්වැදැරුම් වූ දෘෂ්ටධර්මනිර්වාණවාදයෙහි ප්‍රථමය වේ.

'ඒ ආත්මය ඇත්තේ ය, නැත්තේ නො වේ, මේ ආත්මය මෙ පමණකින් උත්තම වූ දෘෂ්ටධර්මනිර්වාණයට නො පැමිණියේ වේ, හෙතු කිම? පංචකාමයෝ වනාහි අනිත්‍යයහ, දුඃඛයහ, පෙරළෙන සුලු ය, ඔවුන්ගේ පෙරළීම් වෙනස්වීම් නිසා, සොක, වැලපීම්, කායික වූ දුක් දොම්නස් හා උපායාසය ද යන මොවුහු උපදිත්, යම් හෙයකින් මේ ආත්මය කාමයන්ගෙන් වෙන් ව අකුශලධර්මයන්ගෙන් වෙන් ව විතර්කවිචාරසහිත වූ විවෙකයෙන් හටගත් ප්‍රීතියෙන් යුත් සැප ඇති ප්‍රථමඛ්‍යානයට එළැඹැ වාසය කෙරේ ද, එ පමණකින් මේ ආත්මය උත්තම වූ දෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ වේ ය' යි පැවසීම එහි දෙවැන්න ය.

'ඒ ආත්මය ඇත්තේ ය, ඒ නැත්තේ නො වේ, මෙ පමණකින් එය උත්තම වූ දෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ නො වේ, එහි වූ විතර්ක-විචාරයන් කරණ කොට, ඒ ධ්‍යානය ලාමක සේ පෙණෙයි. එ හෙයින් මේ ආත්මය විතර්ක-විචාරයන්ගේ සංසිඳී

මෙන් සිතෙහි ප්‍රසන්නතාකායෙන් හා එකඟ බැවින් යුත් විතර්ක-විචාර රහිතසමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති විතීයධ්‍යානයට එළැඹ වාසය කෙරේ ද, මෙ පමණකින් මේ ආතමය උත්තම වූ දෘෂ්ට ධම්මනිබ්බාණයට පැමිණියේ ය' යි කියා පැම තෙවැන්න ය.

'මෙ පමණකින් ඒ ආතමය උත්තම වූ දෘෂ්ටධම්මනිබ්බාණයට පැමිණියේ නො වේ, එහි ප්‍රීතිය ද, සිතෙහි ඉවිල පවත්නා බව ද හෙතු කොට ඒ ධ්‍යානය ලාමක ය යි පෙණේ, මේ ආතමය ප්‍රීතියෙහි නො ඇලීමෙන් සිතිය හා ප්‍රඥව ඇත්තේ උපෙක්ෂක ව වාසය කෙරේ ද, කයින් සැප විඳී ද, ආර්‍යයෝ යමකට පැමිණ උපෙක්ෂාව ඇත්තෝ ය, සිහි ඇත්තෝ ය, සැප විහරණ ඇත්තෝ ය යි කියද්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කෙරේ ද, මෙ පමණකින් මේ ආතමය උත්තම වූ දෘෂ්ටධම්මනිබ්බාණයට පැමිණියේ ය' යි කියාපා ද ඒ ය සිවුවැන්න.

'මෙ පමණකින් ඒ ආතමය දෘෂ්ටධම්මනිබ්බාණයට පැමිණියේ නො වේ, එහි සැපය යි නැවැත නැවැත මෙනෙහිකිරීමෙක් වේ ද, එයින් එය ලාමක ය යි පෙණේ, මේ ආතමය සැප-දුක පහ කිරීමෙන් සොමනස්-දෙමනස් නැති ව යැමෙන් දුක්-සැප නැති උපෙක්ෂා-සමාති දෙ දෙනාගේ පිරිසිදුබව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරේ ද, මෙ පමණකින් මේ ආතමය පරමදෘෂ්ට ධම්මනිබ්බාණයට පැමිණියේ ය' යි පැවසීම ය පස් වැන්න.

මේ අත්ථවෙදි ම බුද්ධංසංඝිම වේ ශ යි ගාත් දෘෂ්ටිශ දෘෂ්ටධම්මනිබ්බාණවාද නම්.

මෙහි ශාශ්වත, එකත්‍යශාශ්වත, අනන්තානන්තික, අමරාවික්ෂේපික අධිත්‍යසමුත්පන්නිකදෘෂ්ටිහු පූර්වභවය ඇසුරු කොට සිටිය බැවින් පූර්වාන්තකල්පික නම් වෙත්. සංඥී, නෛවසංඥී නාසංඥී, උච්ඡේද, දෘෂ්ටධම්මනිබ්බාණවාදදෘෂ්ටිහු අනාගතභවය ඇසුරු කොට සිටිය බැවින් අපරාන්තකල්පික නම් වෙත්. මෙවුනාතුරෙන් පස් පණසෙක් ශාශ්වතදෘෂ්ටියෙහි ද සතෙක් උච්ඡේදදෘෂ්ටියෙහිද හැසී සිටියහ.

මේ දෘෂ්ටිජාලය ඉපැදෙන්නේ දශ වස්තුවෙහිමි ය. ඒ දශ වස්තුව යට කියූ නාස්තිකදෘෂ්ටියෙහි ලා දැක්වූ සේ දකයුතු ය.

පුබ්බන්තහෙතුවාදය - අපරන්තහෙතුවාදය - අමරාවික්ඛේපවාදය, යි මෙහි තවත් භෙද තුනෙක් වේ.

එහි සත්‍යයන් විසින් විඳිනු ලබන සියලු සැප දුක් පෙර කරණ ලද කුශලාකුශලකර්මයන්ගේ විපාකබලයෙන් ම විඳිනු ලබන්-

නේ ය, වා පිත් සෙම් ආදී වූ එකෙකින් හටගත් රෝගව්‍යසනයෝ නැත්තාහු ය, සියලු සැප දුක් කර්මානුකූල ව සිද්ධ වේ ය' යි ගත් දෘෂ්ටිය 'පුබ්බෙකතහෙතුවාද' නම්.

'ලොකය ත් සත්‍වයා ත් යම්කිසි දෙවියකු විසින් මවන ලද ය, සත්‍වයන් විසින් විඳිනු ලබන සැප දුක් ඒ මැවුම්කාර දෙවියන්ගේ කැමැත්ත ලෙස ම විඳිනු ලබා ය' යි ගත් දෘෂ්ටිය 'ඉස්සරනිම්මාණහෙතුවාද' නම්.

'සත්‍වයන් විසින් විඳිනු ලබන සැප දුක් කිසි යම් හෙතුවකින් හෙතුවක් නිසා විඳිනු ලබන්නේ නො වේ, හෙතුවක් නො මැති ව ම විඳිනු ලබා ය' යි ගත් දෘෂ්ටිය 'අහෙතුකඅප්පච්චයවාද' නම්.

මෝ මිත්‍ථ්‍යාදෘෂ්ටිය සියකය පිළිබඳ කොට පවත්නා කල්හි 'සත්කායදෘෂ්ටිය' යි කියනු ලැබේ. එය විසි අයුරකින් උපදී. එ හෙයින් ඒ විසතිවත්ථුකය මෙසේය, වදාළ සැටි:-

"රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං, සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං, සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං, විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං" යි.

රූපය ආත්මය' යි ආත්මය රූපවත් ය' යි රූපය ආත්මය කෙරෙහි පිහිටියේ ය' යි ආත්මය රූපය කෙරෙහි පිහිටියේ ය'යි රූපස්කන්ධය ගැණ මෙසේ සතර අයුරකින් බලයි. එසේ ම වෙදනාව ආත්මය' යි ආත්මය වෙදනා ඇත්තකැ' යි වෙදනාව ආත්මය කෙරෙහි පිහිටියේ ය' යි ආත්මය වෙදනාව කෙරෙහි පිහිටියේ ය' යි වෙදනාස්කන්ධය ගැණ සිටු අයුරකින් බලයි. එසේ ම සංඥාව ආත්මය' යි ආත්මය සංඥා ඇත්තකැ' යි සංඥාව ආත්මය කෙරෙහි පිහිටියේ ය' යි, ආත්මය සංඥාව කෙරෙහි පිහිටියේ ය' යි සංඥාස්කන්ධය ගැණ සිටු අයුරකින් බලයි. එසේ ම සංස්කාර ආත්ම ය' යි ආත්මය සංස්කාර ඇත්තකැ' යි සංස්කාර ආත්මය කෙරෙහි පිහිටියේ ය' යි ආත්මය සංස්කාරයන් කෙරෙහි පිහිටියේ ය' යි සංස්කාරස්කන්ධය ගැණ සිටු අයුරකින් බලයි. එසේ ම විඥානය ආත්මය' යි ආත්මය විඥානය ඇත්තකැ' යි විඥානය ආත්මය

කෙරෙහි පිහිටියේ ය' යි ආත්මය විඥානය කෙරෙහි පිහිටියේ ය' යි විඥානසකන්ධය ගැණ සිටු අසුරකින් බලයි. යනු, එහි කෙටි තේරුම ය.

'යමෙක් ගිනිසිළුව වේ නම්, එය ම වර්ණය වේ, යමෙක් වර්ණය වේ නම්, එය ම ගිනිසිළුව වේ' යි ගිනිසිළුත් වර්ණයත් එකක් කොට ගන්නා සේ, යමෙක් රූපය වේ නම්, එය ම ආත්මය වේ, යමෙක් ආත්මය වේ නම්, එය ම රූපය වේ ය' යි රූපයත් ආත්මයත්, වෙදනාවත් ආත්මයත්, සංඥාවත් ආත්මයත්, සංස්කාරත් ආත්මයත්, විඥානයත් ආත්මයත් එකක් කොට බලන්නේ ය මේ දෘෂ්ටියෙහි පිහිටියේ. ඒ බලන සැටිය මේ කීයේ.

අහෙතුක-අකිරිය-නත්ථිකදිට්ඨිහු ස්වර්ගය හා මාර්ගය වළකා ලන්නෝ ය. දසවත්ථුකඅත්තඤ්ඤාභිකදිට්ඨිය මාර්ගය වළකා. ස්වර්ගය නො ම වළකා. විසතිවත්ථුකසක්කායදිට්ඨිය ස්වර්ග-මාර්ග දෙක ම නො වළකා.

එහෙත් මුං ඇට මැ ඇට තරම් වූ ද ගල් කැට කැබලිති දියෙහි බහාලන ලද්දේ උඩ මතු නො වේ ද, යටට ම බැස යිටී ද, එ මෙන් සක්කායදිට්ඨි තොමෝ ද, ස්වර්ගයට පැමිණවීමෙහි ලා සමර්ථ නො වේ. අපායයෙහි ම බහාලන්නිය. මේ කීයේ අටුවාව ය. මෝ උපමා වශයෙන් ඉන්ද්‍රජාලයකට බඳු උපමා ඇත්තී ය. ඉන්ද්‍රජාලික තෙමේ කැට කැබලිති ආදිය රන් රුවන් කොට දක්වන්නේ යම්සේ ද, එ පරිද්දෙන් මේ දෘෂ්ටිය අනාත්මය ආත්මය කොට, කුසලය අකුසලය කොට, අකුසලය කුසලය කොට දක්වන්නී ය. එහෙයිනි වදාළෝ "මිච්ඡාදිට්ඨි භික්ඛවෙ! පරමානි වජ්ජානි" යි. මිත්‍යාදෘෂ්ටිය අතිශය මහාසාවද්‍ය වේ. ආනන්තරිය කර්මයන්ගේ වනාහි කෙළවර පෙණුන ද, නියතමිත්‍යාදෘෂ්ටියගේ නම් කෙළවරෙක් නො පෙණේ. සසරට මුල් වූවා ඕ තොමෝ ය. නියතමිත්‍යාදෘෂ්ටිකයාහට භවයෙන් නැගී සිටීමෙක් නො ලැබේ. ඔහුට ස්වර්ගය ත් නැත. මාර්ගය ත් නැත. කප් නැසී යන විට සෙසු මිනිස්සු බඹලොව උපදින්නෝය. එහෙත් නියත මිසදිටු ඇත්තහුට එහි ද ඉපැත්මෙක් නැත. ඔහු උපදනේ සක්වළින් පිටත ය. ඒ පිටසක්වළ දැවෙන විට ඔහු ආකාසයෙහි අවකාශ ඇති තැනෙක ඉපිද පැසෙන්නේ ය.

විවිකිච්ඡා නම්, සිතෙහි නගින සිතෙහි පහළවන බුඩාදීන් කෙරෙහි සැකය යි. අරමුණු නිශ්චය කොට ගත නො හැකිබව යම් ධර්ම ශක්තියක් නිසා වන්නේ ද ඒ ය විවිකිච්ඡා. ඒ ඒ ධර්මයන් පිළිබඳ ඇති තතු සොයන්නා එහි විඩාවට පැමිණෙන්නේ ද මේ

නිසා ය. "විකිච්ඡිතුං දුක්කරතාය විගතා විකිච්ඡා ඤාණප්පතිකාරො ඉමිස්සාති = විචිකිච්ඡා" පිළියම්කිරීමට නො හැකි බැවින් ඥාන ප්‍රතිකාරයෙක් යමකට නැත්තේ ද ඒ විචිකිච්ඡා' නැමැ යි එයින් කීහ. ඕ සැකය ලකුණු කොට සිටියා ය. "සා සංසයලක්ඛණා" යි කීයේ එබැවිනි. සැකයෙන් පෙළුනු සැකය ලකුණු කොට සිටි සිතට නුවණ නැමැති බෙහෙතින් ප්‍රයොජනයෙක් නො වේ.

"සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති, ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති, සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති, සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති, ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති විචිකිච්ඡති" යි එය අට වැදැරුම් බව මෙයින් වදාළ සේක.

බුදුරජුන් කෙරෙහි, ධර්මය කෙරෙහි, සඞ්ඝයා කෙරෙහි, ශික්ෂාව කෙරෙහි, පෙර අත්බැව් කෙරෙහි, අනාගත අත්බැව් කෙරෙහි, පෙර-මතු අත්බැව් කෙරෙහි, ප්‍රතීත්‍යසමුත්පන්නධර්ම කෙරෙහි සැකය විචිකිච්ඡාය යනු, එහි කෙටි තේරුම ය.

'සුප්පතිට්ඨිතපාදතා'දි මහාපුරුෂලක්ෂණ හා අනුව්‍යඤ්ජන, අනන්‍යසාධාරණසර්වඥතාඥානය හා අර්හත්ත්වාදිගුණ, බුදුරජුන් කෙරෙහි වූයේ ද, නො වූයේ ද, යි බුදුරජුන් කෙරෙහි උපදනා සැකය, සූත්‍ර, අභිධර්ම, විනය යන පිටකත්‍රයධර්මය සත්‍ය ද, අසත්‍ය ද සොත්‍රාපත්ති මාර්ගය-ඵලය, සකෘදාගාමිමාර්ගය-ඵලය, අනාගාමිමාර්ගය-ඵලය, අර්හත්මාර්ගය-ඵලය, නිර්වාණය යන නවලොකොත්තර ශ්‍රීසඩර්මය සත්‍යයන්ගේ කෙලෙස් නැසීමෙන් යහපත සලසා ද, නො සලසා ද' යි ධර්මය කෙරෙහි උපදනා සැකය, අට වැදැරුම් වූ ආර්‍යපුද්ගලසමූහය කෙරෙහි සුප්‍රතිපන්නතාදිගුණ ඇත්තේ ද, නැත්තේ ද, ඔවුන් කෙරෙහි කරණලද පරිත්‍යාගයෙන් ඵල ලැබේ ද, නො ලැබේ ද' යි සඞ්ඝයා කෙරෙහි උපදනා සැකය, අධිශීල-අධිචිත්ත-අධිප්‍රඥාශික්ෂා යි ශික්ෂා තුනෙක් තිබේ ද, එසේ නම් එහි හික්මීමෙන් ඵල ලැබේ ද, නො ලැබේ ද, යි ශික්ෂාව කෙරෙහි උපදනා සැකය, පෙර මම ඉපිද සිටියෙම් ද, ඉපිද නො සිටියෙම් ද, යි ඉකුත් ව ගියා වූ සකන්ධ-ධාතු-ආයතනයන් කෙරෙහි උපදනා සැකය, මම මතු උපදින්නෙම් ද, නො උපදින් නෙම් ද, යි අනාගතයෙහි පහළවන සකන්ධ-ධාතු-ආයතනයන් කෙරෙහි උපදනා සැකය, ඉකුත් භවයන්හි සකන්ධ-ධාතු-ආයතනයෝ වූවෝ ද, නො වූවෝ ද, අනාගතයෙහි වන්නෝ ද, නො වන්නෝ ද, යි මෙසේ අතීත-අනාගත-සකන්ධ-ධාතු-ආයතනයන් ගැණ උපදනා සැකය, කාලතුනකින්, අඞ්ගදොළොසකින්, ආකාර

විස්සකින්, සඤ්ඤුනකින්, සංඛෙපසතරකින්, වෘත්තතුනකින්, මූලදෙකකින් යුත් අවිජ්ජා-සංඛාරාදිහෙතු-ඵලධර්මයන් ගැණ උපදනා සැකය, සි ඒ කොටින් මෙසේ දතයුතු ය.

මගැ ගොස් පළපුරුදුකම් නැති මිනිසෙක් දෙ මංහන්දියට පැමිණියේ, මේ මග යා යුතු ද, අනික් මග යා යුතු දැ, සි යා යුතු නොයා යුතු මග තීරණය කොට ගත නොහැක්කා සේ, විචිකිච්ඡාවට ද, අරමුණු තීරණය කර ගන්නට නොපිළිවන. එ හෙයින් දෙ මංහන්දියකට බඳු උපමා ඇත්තේ ය. සොහොනෙක දෙ දණ ඔසවා උඩ බලා නිදන්නා වූ මිනිසා රෑ නින්දෙන් නැගිට බැලූ විට, ඔසවා තුබූ තම දෙ දණ යකුත් දෙ දෙනෙකැ'සි සිතා බිය වන්නා සේ, විචිකිච්ඡාවෙන් යුත් සිතැත්තේ කුසල ය, අකුසල ය' සි ගෙණ බියට පත් වේ. එ හෙයින් මෝ සොහොනෙක උඩ බලා නිදන මිනිසකු බඳු ය. විචිකිච්ඡාව එකානතඅකුසලයෙකි. විසතර මතු එන්නේ ය.

ථීනා නම්, සිතේ ඇතිවන පසු බැස්ම ය. මේ නීසා ය සබ්බෙමේ අරමුණු ගැන්මෙහි පසුබැස්ම කරන්නේ. එය උත්සාහ රහිතබව ලකුණු කොට සිටියේ ය. **"තං අනුස්සාහලක්ඛණං"** යනු කියේ එහෙයිනි. මෙහි උත්සාහරහිතබව මැලිකම් නීසා ම සිත කුශලධර්මයන් කෙරෙහි ලා හැකිලෙන්නේය. සිතෙහි කම්මැලිකම ය මේ. **"තඤ්ච ඛෝ කබමං ථීනං, සා චිත්තස්ස අකල්ලතා, අකම්මඤ්ඤතා, ඔලීයනා, සල්ලීයනා, ලීනං, ථීයං, ථීයනා, ථිඝිතත්තං"** යන මේ දෙසනායෙන් එය වඩාත් පැහැදිලි වේ. අකල්ලතා, අකම්මඤ්ඤතා' ආදී වූ මේ හැම පදයෙක් ම එහි හැටි පැහැදිලි කරන්නෝය. සිතෙහි ගිලන්බව, වැඩට නොසුදුසු බව, පසු බැසීම, හැකිළීම, ගණ බැවිත් සිටීම, නොපැතුරුම යන මේ කොයි ලෙසකින් කියුව ද, ඒ හැම තැන ථීනය ම ගැණේ. මෙයට සහජාත-උපනිශ්ශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වන්නෝ වනසෙනසුන්හි හා ශමථ-විදර්ශනා භාවනාවන්හි නොඇලීම, (අරති) කුසල් දහම් වැඩුමෙහි කම්මැලිකම, (තන්දි) කටයුතු ඵලැඹැ සිටි කල්හි ඇඟ මැලි කැඩීම, (විජම්භිකා) බනින් ඇතිවන බත්මත (භත්ත සම්මද) යන මොවුහු ය. ගින්නට ලං කළ කුකුළු පියාපිට හැකිළෙන්නා සේ, චිත්ත-චෛතසිකධර්ම මේ නීසා හැකිළෙන්නේ ය. එහෙයින් මෙය ගින්න බඳු ය.

උඛච්ච නම්, සිතෙහි නොසන්සුන් බව ය. සිත සැලෙන්නේ මේ නීසා ය. මෙය නොසන්සුන්බව ලකුණු කොට සිටියේ ය. **"තං චෙතසෝ අවූපසමලක්ඛණං"** යනු කියේ එහෙයිනි. සිතෙහි උඛතුබවය මේ. අවුගොඩට ගලක් ගැසුවිට අවු විසිරී

යන්නා සේ, ගල්ලෑල්ලක් මතුපිට කරකැවෙන බඹරය සේ චිත්ත-චෛතයිකධර්ම නො සන්සුන් වතුයේ මේ නිසා ය.

අහිරික නම්, පව්කිරීමෙහි ලජ්ජා නැති කම ය. පව්කිරීමට ලජ්ජිත නො වන්නේ මේ නිසා ය. පවට පිළිකුල් නො කිරීම ලකුණු කොට සිටියේ ය. **"තං කායදුච්චරිතාදීහි අජිගුච්ඡන ලක්ඛණං"** යි කියේ එහෙයිනි. මල මූ කරණ තැනට යන මිනිස්සු නැත. ඔවුහු මුළුමනින් ඒ තැන පිළිකුල් කෙරෙති. නො දකිනු කැමැති වෙති. එහෙත් ගම්ඌරා මල මූ හැමෙකක් මිහිරක් සේ ගෙණ අනුභව කරයි. ඒ මෙන් ලජ්ජාව නැත්තේ සතුන්මැරීම් ආදී වූ පව්කම් කරයි. පව්කම්කිරීම උසස් මිනිසුන්ගේ වැඩකැ'යි සිතයි. අද රාඅරක්කුබීම උසස් සමාජසිරිතැ' යි සිතන්නේ ලජ්ජා නැතිකම නිසා ය. යමකුගේ සිත්හි යන්තමකිනු ත් ලජ්ජාව තිබේ නම්, ඔහු කිසිවිටක රාඅරක්කුබීම් ආදී වූ පව්කම් වලට නතු නො වේ. ලජ්ජා නැති මිනිසා එයට නතු වේ. ගම්ඌරා මල මූ මිහිරක් කොට ගන්නා සේ, ඔහු ද රාඅරක්කු බීම මිහිරක් සේ සලකන්නේ ය. ගම්ඌරාගේ ත් ලජ්ජා නැති මිනිසාගේ ත් මෙහිලා වෙනසෙක් නැත.

අනොත්තප්ප නම්, පව්කම්කිරීමෙහි බියරහිතබව ය. පව්කම් කිරීමට බිය නො වන්නේ මේ අනොත්තප්පය නිසා ය. මෙය පව්කම් කිරීමෙහි තැති නො ගැණීම ලකුණු කොට සිටියේ ය. **"තං අනුත්තාස ලක්ඛණං"** යනු කියේ එහෙයිනි. දැල් වූ තෙල් පහනෙහි පහන්සිළ දුටු පළඟැටියා එහි එලියෙන් මුළා වී පහන්වැටියෙහි වැටී විනාශයට යන්නා සේ, නැසී යන්නා සේ පව්කම් කිරීමෙහි නො බිය වූ මිනිසා සතුන්මැරීම් ආදී වූ පව්කම් සැපයට, හිතයට හෙතු ය'යි සලකා පව්කම් කිරීමෙහි බියට නො පැමිණ පව්කම් කරයි. එහෙයින් මෙය පලඟැටියකු බදු ය.

මෙහි මෙසේ ඉතා කොටින් කියූ යේ ප්‍රධාන වශයෙන් ආගමධර්මයෙහි කෙලෙස් නමින් දැක්වෙන ධර්මසමූහය යි. කසට තැවරුණු රෙද්දක් යම් සේ අපිරිසිදු වේ ද, කිලිටි වේ ද ඒ මෙන් සිත ද කෙලෙස්වලින් යුක්ත වූවිට අපිරිසිදු වේ. මොවුනට කෙලෙස් කසට ය යි කියේ එහෙයිනි.

කාසාවං = කසටින් රැඳූ. පඬු පෙවූ.

වත්ථං' යන්නට විශෙෂණ යි. 'කාසාවං වත්ථං'යි ඒ දෙක එක් කොට කසටවතැ'යි අරුත් ගණිත්. කෂාය-තික්තාදි ෂඩ්රසයෙන් එක්තරා රසයෙක් කසාව යන්නෙන් ගැණේ.

"කං පානීයං සෙවතෙති = කසාවං" යනු නිරුක්ති යි. කසාව ශබ්දය ප්‍රා නප්‍රුංසක දෙක්හි ආයේ ය. මෙහි වත්ථ ශබ්දය බලා සිටි කසාව ශබ්දය නප්‍රුංසක ය.

මෙහි මෙසින් ගත යුත්තේ පැවිද්දන් ප්‍රයොජනයට ගන්නා චීවරනාමයෙන් ආගමෙහි එන වස්තුවිශෙෂය යි. අරහඬජ යනු ද මෙයට නමෙකි. පැවිද්දන්ගේ සිවුරු පෙවීමට බුදුරජුන් විසින් කසට සයෙක් නියම කරණ ලද්දේ ය. ඒ නියමය මෙසේ ය:- **"අනුජානාමි භික්ඛවෙ! ඡ රජනානි, මූල රජනං ඛන්ධරජනං තචරජනං පත්තරජනං පුප්ඵරජනං ඵල රජනන්ති"** යි. විනයෙහි නියම කළ ගස් මූල් තම්බා ගත් දිය, දඬු තම්බා ගත් දිය, පොතු තම්බා ගත් දිය, කොළ තම්බා ගත් දිය, මල් තම්බා ගත් දිය, ගෙඩි තම්බා ගත් දිය යන මේ ස වැදෑරුම් කසට (පඬු) අතුරෙහි එක්තරා එකක් පෙවූ චීවරය කාසාව' නම්. **"කසාවෙන රත්තං කාසාවං"** යනු අර්ථසමර්ථන ය යි. මෙය ඝ පැවිද්දන්ට සුදුසු සිවුර.

යො වත්ථං පරිදහෙය්‍යාති = යමෙක් (කෂාය) වස්ත්‍රයක් පරිභොග කරන්නේ ද.

මෙහි යො' යන්නෙන් ඇද ගන්නේ පහ නොකළ කෙලෙස් කසට ඇති ඉන්ද්‍රියදමනයෙන් හා වාක්සත්‍යයෙන් තොර වූයේ ය, ඔහු. එබන්දෙක් හැදීම්-පෙරවීම් ආදිවශයෙන් නිකෙලෙසින්ට සුදුසු වස්ත්‍රයක් (සිවුරක්) දරා නම්.

මෙහි වත්ථ' නම්, පැවිද්දන් අඳනා පොරෝණා සිවුර යි. **"වෙය්‍යතෙ අවජ්ජාදියතෙති=වත්ථං"** යනු නිරුක්ති යි. පැවිද්දන් අඳනා පොරෝණා වස්ත්‍රය බොහෝ සෙයින් ආයේ චීවර නාමයෙනි.

දිනක් බුදුරජාණන් වහන්සේ රාජගහා – වෙසාලී දෙ නුවර අතර මගට බැස වඩිනා සේක්, සිවුරු පොදි බැඳ හිස තබා කර තබා ඉණ තබා එන භික්ෂූන් දැක 'මේ උත්නාන්සේලා ඉතා ඉක්මනට ම බහුලවශයෙන් චීවරපරිභොගයට වැටී සිටින්නෝ ය, ඒ නිසා මොවුනට සිවුරු පිළිබඳ සඞ්ඛ්‍යානියමක් කළයුතු ය' යි සිතා භික්ෂූන් කැඳවා **"අනුජානාමි භික්ඛවෙ! තිචීවරං දිගුණං සඞ්ඝාටිං එකචච්චියං උත්තරාසඞ්ඝං එකචච්චියං අන්තරවාසකන්ති"** යි චීවරපරිභොගයෙහි සඞ්ඛ්‍යානියමය කළහ. මෙයින් සිවුරු තුනක් අනු දැන වදාළ සේක. සඞ්ඝාටි-උත්තරාසඞ්ඝ-අන්තරවාසක යනු ඒ සිවුරු තුනේ නම් ය. සාමාන්‍යලොකයා සඞ්ඝාටිය දෙපට සිවුර නමින් ද, උත්තරා

සඞ්ඝය තනිපට සිවුර නමින් ද, අන්තරවාසකය අඳනය නමින් ද හඳුන්වයි. එහි යමකු උදෙසා නම් සිවුර, ඔහුගේ රියනෙන් උසින් සිවුරියන් හමාරක් හා පළලින් පස් රියන් හමාරක් ද ඇති පස් කඩ පටන් වැඩිකඩ ගණනක් කොට දෙ පටක් තබා මැසූ සිවුර සඞ්ඝාටි නම්. සඞ්ඝාටියෙහි කී පරිදි දිග පළල තබා තනි පටින් මැසූ සිවුර උත්තරාසඞ්ඝ නම්. දිගින් සිවුරියනක් හා මිටිරියනක් ද පළලින් දෙ රියනක් ද තබා තනි පටින් මැසූ සිවුර අන්තරවාසක නම්. වස්ත්‍රය කඩ කඩ කොට කපා මහ මැඩිලි ආදි ඒ ඒ කොටස් එක් කොට මසා ගත් වස්ත්‍රය චීවරය යි. **"වත්ථඛණ්ඩෙහි වීයතීති = චීවරං"** යනු නිරුක්ති යි. ඒ ඒ අවස්ථාවන්හි ප්‍රයොජනය ගන්නා පිණිස මෙයින් අන්‍ය වූ ද සිවුරු කිහිපයක් අනුදැන වදාළ සේක. ඒවා මහවගචීවරක්ඛන්ධකය බලා දත යුතු ය.

පරිදහෙස්සති' යන්න පරිදහිස්සති' යි ද එන්නේ ය. **"පරිද-හෙස්සතීති නිවාසන පාරුපන අත්ථරණවසෙන පරිභුඤ්ජිස්සති"** යනු අටුවා ය.

අපෙතො දමසච්චෙන = ඉන්ද්‍රියදමනයෙන් හා වාක්සත්‍යයෙන් පහ වූ.

අපෙතො, යන්න **යො'** යන්න බලා සිටියේ ය. යමෙක් ඇස්-කන්-නාස් ආදී වූ ඉඳුරන්දැමීමෙන් හා වාක්සත්‍යයෙන් තොර ව වෙසේ නම්, නො හික්මුනේ නම්, ඔහු ය මෙයින් කීයේ. ඉන්ද්‍රියදමනය නම් ඉන්ද්‍රියසංවරසීලය යි. ඒ යට කියූ සේ දත යුතු ය. මුසවා බිණීමෙන් වළකින අයුරින් සිතෙහි උපදනා සම්මාවාචා චෛතසිකය වාක්සත්‍යය යි ගැණේ. එය පරමාර්ථසත්‍යපාක්ෂික ය. කාමාවචරාදී වූ කුසල්සිත්වල සම්පත්ත-සමාදාන-සමුච්ඡේද යන තෙ වැදැරුම් වූ විරතීන්ගේ වශයෙන් උපදනා සම්මාවාචා නම් වාක්කර්මය, සත්‍ය නම් වේ. **"යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, සොමනස්සසහගතං ඤාණසම්ප-යුත්තං, මුසාවාදා විරමන්තස්ස යා තස්මිං සමයෙ ආරති"** යනාදී දෙශනාවන්ගෙන් ඒ පැහැදිලි ය.

සත්‍යශබ්දය **"සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය"** යනාදි තන්හි වාක්සත්‍යයෙහි ආයේ ය. **"කස්මානු සච්චානි වදන්ති නානා"** යනාදී තන්හි ආයේ දෘෂ්ටිසත්‍යයෙහි ය. **"එකං හි සච්චං න දුතියං"** යනාදි තන්හි යෙදී සිටියේ පරමාර්ථ-නිර්වාණ-මාර්ග සත්‍යයන් සඳහා ය. **"චත්තාරි අරියසච්චානි"** යනාදි තන්හි යෙදුනේ චතුරාර්‍ය්‍යසත්‍යය කියයි. මෙහි හුනුයේ වාක්සත්‍යයෙහි ය.

බුඩාදිමහොත්තමයන් කෙරෙහි වූයේ සත්‍යය යි. **"සච්චෙනසූ භවං සච්චං"** යනු එයට සාධක ය. සත්‍යවචනය එකාන්තකුසල චෛතසිකයෙකි. සිහියෙන් හට ගැණේ. **"සතිතෝ සමුට්ඨාසච්චං"** යනු සාධක යි. මෙසේ බුඩාදිමහොත්තමයන් කෙරෙහි සමෘතිබලයෙන් හටගැණෙන සත්‍යවචනය සසර දුක් නසා ලන්නේ ය. **"දුක්ඛං හිංසතීති=සච්චං"** යන්න එය කියයි. සත්‍ය වචනය **ලක්ෂණ** විසින් චතුර්විධවාග්දුශ්චරිතයෙන් වැළකීම ලක්ෂණ කොට සිටියේ ය. උපමා විසින් මිනීමැරුම් ආදී වූ දරුණු අපරාධයන්ගෙන් වළක්නා සොරකුට බඳු උපමා ඇත්තේ ය. රජ දඬුවමින් බිය පත් ව මා පැහැරීම් ගෙවල් බිඳීම් ආදියෙන් වළකින්නා වූ සොර තෙමේ අඹු දරුවන් රැකුමට මෙර මා අයත් රන් රිදී මුතු මැණික් ආදී වූ වසතුව සොරා ගැණුමෙහි දක්ෂ වූයේ ද, 'මෙකල පලාකොළ මිටක් සොරකම් කළ එකකු පවා දිවස්හුල ඉදුවයි, මම සොරකමෙහි දක්ෂ වූයෙමි ද, සොරකම් කෙළෙමි නම් මාගේ දිවි නැසෙන්නේ ය' යි සලකා රජදඬුවමට බියෙන් සොර කමින් වළකින්නේ ය. එමෙන් සම්මාවාචාචෛතසිකය, අපායභය සැලකීමෙන් මුසාවාදදිවතුර්විධ වාග්දුශ්චරිතයෙන් වළකියි.

න සෝ කාසාවං අරහති = ඔහු කසාවත (දුරීමට) සුදුසු නො වේ.

න' යනු නිපාතයි. යට කියූ යෝ' යන්න සම්බන්ධ ව සිටියේ මෙහි පෙණෙන සෝ' යන්න සමග ය. යමෙක් රාගාදී වූ කෙලෙස් කසටින් තොර නො වූයේ නම්, ඉන්ද්‍රියදමනයෙන් හා වාක්සත්‍යයෙන් පහවූයේ නම්, ඔහුය ඒ.

යෝ ච වනතකාසාවස්ස– යමෙක් වනාහි වැමැරූ (කෙලෙස්) කසට ඇත්තේ වේ ද.

යෝ' යනු සර්‍වනාම යි. 'ස වෙ කාසාවමරහති' යන තන්හි සිටි සෝ' යන්න බලා සිටියේ ය. **ච'** යනු පදපූරණයෙහි නිපාත යි. **වනතකසාවෝ** × **අස්ස** යනු පදවෙජ්ද යි. **"වනතානි කසාවානි යෙන"** යනු **"වනතකසාවෝ"** යන්නෙහි ව්‍යස්ත වාක්‍යය යි. (සෝ) **"වනතකසාවෝ"** යනු සමස්තවාක්‍යය යි. වන්ත ශබ්දය 'වමූ × උගිරණෙ' යන ධාතුයෙන් කර්‍මාර්‍ථයෙහි ත' ප්‍රත්‍යය වී, එයට නත' ආදෙශය හා ධාත්වන්තලෝපය වීමෙන් සිද්ධ ය. **අස්ස'** යනු ක්‍රියාපද යි. වන්තකසාව වනුයේ කෙලෙස් කසට වමාරා දැමූ විට ය. ඒ කල හැක්කේ ආර්‍යමාර්‍ගයෙනි. ආර්‍යමාර්‍ගී නම්, නිවන් අරමුණු කොට උපදනා සෝතාපත්ති ආදී වූ කුසල්සිත් සතර හා ඵලසිත් සතර ය. **සෝතාපත්ති**

මගඤ්ච්ඡත්තා සකදාගාමිමගඤ්ච්ඡත්තා- අනාගාමිමගඤ්ච්ඡත්තා- අරහත්තමගඤ්ච්ඡත්තා - සෝතාපත්තිඵලච්ඡත්තා – සකදාගාමිඵලච්ඡත්තා – අනාගාමිඵලච්ඡත්තා- අරහත්තඵලච්ඡත්තා, යන මේ ය ඒ මගඵල සිත්. මේ සිත් නිවන් අරමුණු නොට හිටියේ ය.

සොත' යනු බැස යන දිය පහරට නමෙකි. නම්මාදිට්ඨිඤ්ච මූල් නොට සිටි අට වැදෑරුම් ආර්‍යමාර්ගය, බැස යන දිය පහරක් වැනි බැවින්, ආගමඛ්මියෙහි සොත' යි හඳුන් වනු ලැබේ. ඒ මේ සොතය නිවන් නැමැති මහමුහුදට ය බැස යන්නේ. ආර්‍යමාර්ග ස්‍රොතයට හසු වූ යේ ඒ ආර්‍යමාර්ගස්‍රොතය විසින් නිවන් නැමැති මහමුහුදට පමුණු වනු ලබන්නේ ය. ස්‍රොතයට හෙවත් ආර්‍ය මාර්ගයට පළමු කොට පැමිණීම සොතාපත්ති' නම්. එසේ පැමිණීමෙන් ලැබූ සිත සොතාපත්තිමගඤ්චිත්තය යි. තවද ආර්‍යමාර්ගයට මුලින් පැමිණී තැනැත්තේ ද සොතාපත්ති නම් වේ. ඔහු විසින් බද්ධ මාර්ගචිත්තය සොතාපත්තිමග්ගචිත්තය යි කියනු ලැබේ. "නිබ්බානං පති සවනතෝ උපගමනතෝ නිබ්බානමහාසමුද්දනිනතාය කාය සොතසදිසතතා වා සොතෝ ති වුච්චති අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, සෝතෙයය ආපන්නති ආදිතතා සඤ්ඤානං පාපුණනං සඛ්ඛාතෙන තෙනාඞ්ගෙන සොතාපත්ති" යන මේ පාලිප්‍රදේශයෙන් එය පැහැදිලි කරණ ලද්දේ ය.

නිවන් සොයන්නේ නිවන් කැමැත්තන් විසින් සොයනු ලබන්නේ, කෙලෙස් නසා නිවන් යන්නේ මග්ග' යි කියන ලදී. මේ ඒ කියූ සැටි:- "නිබ්බානං මග්ගති නිබ්බානමේසතීති වා මග්ගියති කිලෙසෙ මාරෙතෙතා ගච්ඡතීති වා=මග්ගෝ" යි. සොතාපත්තිය හා එක් ව යෙදුනු සිත ය, නැත, සොතාපත්තියට පැමිණියහුගේ සිතය නිවන් සොයන්නේ. නිවන් කැමැත්තන් විසින් සොයනු ලබන්නේ. කෙලෙස් නසා නිවන් යන්නේ.

මේ මිනිස්ලොවට උපපත්තිවශයෙන් එක් වරක් එන්නේ සකදාගාමි නම් වේ. ඔහුගේ සිත නිවන් සොයන්නේ ය. නිවන් කැමැත්තන් විසින් සොයනු ලබන්නේ ය. කෙලෙස් නසා නිවන් යන්නේ ය. එහෙයින් ඒ සිත සකදාගාමිමග්ගචිත්ත නම් වේ. "සකිං එකවාරං සඤ්ඤාවසෙන ඉමං මනුස්සලොකං ආගච්ඡතීති=සකදාගාමී, තස්ස මග්ගො සකදාගාමිමග්ගො, සකදාගාමිමග්ගෙන සම්පයුත්තං චිත්තං සකදාගාමිමග්ගචිත්තං" යනු එයට සාධක ය.

කාමලොකයෙහි උපපත්තියට නො එන්නේ අනාගාමි නම්. ඔහුගේ සිත නිවන් සොයන්නේ ය. නිවන් කැමැත්තන් විසින්

සොයනු ලබන්නේ ය. කෙලෙස් නසා වනසා නිවන් යන්නේ ය. එ හෙයින් ඒ සිත අනාගාම්මග්ගචිත්ත නම් වේ. **"පජහති වසෙනා ඉමං කාමබන්ධනං න ආගච්ඡතීති=අනාගාමී, තස්ස මග්ගො අනාගාම්මග්ගො, තෙන සම්පයුත්තානං චිත්තං අනාගාම්මග්ගචිත්තං"** යනු පාළියි.

සිවු පසය ලැබීමට සුදුසු වූයේ, කෙලෙස් නැමැති සතුරන් හෝ සංසාර චක්‍රයෙහි වූ (කෙලෙස්) අර නැසූයේ රහසන් පව් නො කරණුයේ රහත් නම්. නිවන් සොයන්නේ, නිවන් කැමැත්තන් විසින් සොයනු ලබන්නේ, කෙලෙස් නසා නිවන් යන්නේ ඔහුගේ සිත ය. ඒ සිත අරහත්තමග්ගචිත්ත නම් වේ. **"සූහි විසෙසං අරහතීති=අරහා, කිලෙසසඞ්ඛාතා අරයො, සංසාරචක්කස්ස වා අරා කිලෙසා හතා අනෙනාති=අරහා, පාපකරණෙ රහාභාවතො වා අරහා, තස්ස මග්ගො අරහත්තමග්ගො, තෙන සම්පයුත්තා චිත්තා අරහත්තමග්ගචිත්තං"** යනු පාළියි.

ඵල නම්, විපාක යි. සොතාපත්තිමග්ගචිත්තය ලැබූ පුඟලයාහට එයට අනතුරු ව උපදනේ සොතාපත්තිඵලචිත්තය යි. මග්ගචිත්තය කුසල් ය. ඵලචිත්තය එහි විපාකය යි. කුසල් හෙතුයෙන් ලත් විපාකය ඵලය යි. මෙ තියූ ලොකොත්තරකුසලයන්ගේ විපාකය එ කෙණෙහි ම ලැබෙන්නේ ය. අනික් මග්ගසිත්වලට අනතුරු ව, ඒ ඒ මග්ගසිත් පිළිබඳ ඵලසිත් උපදනේ ද මෙසේ ය යි දකයුතුය.

ඒ ඒ මග්ගසිත් පිළිබඳ කෙලෙසවාසනා නැසී යන්නේ, ඒ ඒ ඵල සිත්වලිනි. කෙලෙසවාසනා නැති කොට සිත මුළුමනින් පිරිසිදු කරන්නේ ඵලසිත් ය. කෙලෙසදුහය සංසිදු වන්නේ ඵලසිත් ය.

මෙහි යට කියූ කෙලෙස් අතුරෙහි, ලොභයෙහි තද බද ගතිය අනාගාම්මාගීයෙන් නැසී යයි. මුළුමනින් ඒ නැසෙන්නේ අර්හත්මාගීයෙනි. වෙෂය අනාගාම්මාගීයෙන් නැසෙයි. මොහය සොතාපත්ති ආදී වූ එකෙකි සිතින් නැසෙයි. මානය කිසිත් ඉතිරි නො කොට නසන්නේ අර්හත්මාගීය යි. සොතාපත්තිමග්ගචිත්තය තෙමේ දිට්ඨිය හා විචිකිච්ඡාව නසා ලන්නේය. ඵිනය හා උඛවය නැසෙන්නේ අරහත්තමග්ගචිත්තයෙනි. අහිරිකය හා අනොත්තප්පය සොතාපත්ති ආදී වූ මග්ගසිත්වලින් වැනසේ. විස්තර මතුයෙහි එන්නේ ය.

මෙසේ ඒ ඒ මග්ගසිත්වලින් නැසියයුතු හැම කෙලෙස් එසේ නසා, ඒ ඒ ඵලසිත්වලින් සංසිඳවිය යුතු කෙලෙසවාසනා ද සංසිඳුවා, සිය සිත කෙලෙසයන්ගෙන් මුළුමනින් අස් කොට ගෙණ සිටියේ 'වනතකඝාවා' නම් වේ.

සීලෙසු සුසමාහිතො = සීලයන්හි මොනවට පිහිටියේ.

ප්‍රාතිමොක්ෂ – ඉන්ද්‍රිය – ආජීව – ප්‍රත්‍යයසන්නිශ්ශ්‍රිත යන සිවු වැදැරුම් සීලයෙහි මනාසේ පිහිටියේය මේ කියූයේ.

උපෙතො දමසච්චෙන = ඉඳුරන් දැමීමෙන් හා ඇත්ත දැකීමෙන් යුක්ත වූයේ.

ස වෙ කාසාවං අරහති = ඔහු එකාන්තයෙන් කසාවතට සුදුසු ය.

'**සො × වෙ**' යනු පදච්ඡේද යි. මේ ගාථායෙහි මූල සිටි යො' යන්න සිටියේ මේ සො' යන්න බලා ය. මෙ දෙකෙහි මූල ප්‍රකෘතිය ය, ත' යනු නිත්‍යසම්බන්ධය ඇත්තේ ය. "**යත්තදෙර් නිත්‍යසම්බන්ධඃ**" යනු කීයේ එහෙයිනි.

යමෙක් කෙලෙස් වමාරා, සීලයන්හි මොනවට පිහිටා, ඉඳුරන් දමා, සබවස පිහිටා සිටියේ ද, ඔහු ය බුදු පසේබුදු මහරහතුනට හිමි, සිවුර හැඳීමට, පෙරවීමට සුදුසු. කෙලෙස් වැමැරීමට පිළිවෙත් පුරන්නා ද සුදුසුය සිවුරට.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ පිටිසර භික්ෂු නම සෝවන්පලයට පැමිණියේ ය. එහි හුන් අන්‍යයෝ ද මේ අසා සොතාපත්තිඵලාදියට පැමිණියෝ ය. ධර්මදෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

දෙවදත්තවසතුව නිමියේ ය.

අග්‍රශ්‍රාවක මහාකෝණාශ්‍රව ශාරීපුත්‍ර මෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේලා.

1 – 8

මේ මහානද්‍රකල්පයට සාරාසඛ්‍යකාල්පලක්ෂයකින් මත්තෙහි දඹදිව අමරවති නම් නුවරෙක් විය. එහි සුමේධ නම් බමුණු කුමරෙක්; උගත යුතු සියලු ශිල්ප උගෙණ කෙළ පැමිණියේ, මවුපියන් ඇවැමෙන් කෙළගණන් ධනය දැනවිසයෙහි පරිත්‍යාග කොට සියල්ල හැර ඉසිපැවිද්දෙන් පැවිදි ව හිමවතට ගොස් භාවනා කරන්නේ ධ්‍යානාභිඥාවන් ලබා අහසින් යන්නේ ය. දිනක් ඔහු අහසැ යන අතර, දීපඞ්කර බුදුරජානන් වහන්සේට සුදර්‍ශන මහාවිහාරයෙහි සිට රඹගම්නුවරට වැඩම වනු පිණිස මහමග සරසන මිනිසුන් දැක, උන්ගෙන් තමනුත් එහි එක් මගැ කොට සක් ඉල්ලා ගෙණ, සරසන්නට පටන් ගත්තේ ය. මෙසේ මේ තවුසානන් ඉල්ලා ගත් ඒ බිම් කොටස සරසා පිළියෙල කිරීමට පළමුව ම බුදුරජානන් වහන්සේ ශ්‍රාවක සඞ්ඝයා ත් සමග එ මගැ වැඩි සේක. එවිට තවුස් තෙමේ 'ශ්‍රාවක සඞ්ඝයා සහිත වූ බුදුරජානන් වහන්සේ මඩ නොපාගා මා පිටින් වඩින සේක්වා'යි එහි මඩ උඩ හෙයක් මෙන් දිග ඇදී වැතිර ගත්තේ ය. බුදුරජානන් වහන්සේ මෙසේ වැතිර ගත් තවුසා දැන 'මහණෙනි! මේ තෙමේ සාමාන්‍ය මනුෂ්‍යයෙක් නොවේ, මහාඍඪියෙකි, නිතර හමුවන ජාතියේ මිනිසෙක් නොවේ, මොහු, බුදුවන්නට පෙරුම් පුරන්නෙකි, අනාගතයෙහි මෙයින් සාරාසංඛ්‍යකල්ප ලක්ෂයක් ගිය කැත්තේදී ගොතම නමින් බුදුවන්නේ මොහු ය'යි වදාළ සේක.

මේ තවුස් තෙමේ දීපඞ්කර බුදුරජානන් වහන්සේට පසු ව **කොණ්ඩඤ්ඤ, මඞ්ගල, සුමන, රේවත, සොභිත, අනෝමදස්සි පදුම, නාරද, පදුමුත්තර, සුමේධ, සුජාත, පියදස්සි, අත්‍ථදස්සි, ධම්මදස්සි, සිද්ධත්ථ, තිස්ස, පුස්ස, විපස්සි, සිඛී, වෙස්සභූ, කකුසන්ධ, කොණාගමන,** කස්සප යන බුදුරජුන් දවස පිළිවෙළින් විජිතාවී සක්විති ව, සුරුචි බමුණු ව, අතුල නම් රජ ව, අතිදෙව බමුණු ව, සුජාත බමුණු ව, යක් සෙනෙවි ව, සිංහරාජ ව, එක්තරා තවුසෙක් ව, ජටිලමහරෂි ව, උත්තර මාණවක ව, සක්විතිරජ ව, කසුප් බමුණු ව, සුජාත නරදෙවි ව, පඤ්චානන විජිතාවීරජ ව, අතුල නාරජ ව, අරින්දම රජ ව, සුදස්සන රජ ව, ඛෙම රජ ව, පබ්බත රජ ව, ජෝතිපාල මාණවක ව

ලැබූ විවරණ ඇත්තේ දස පෙරුම්-දස උපපෙරුම්-දස පරමත් පෙරුම් පුරා වෙසතුරු අත්බවෙහි සිට පොළොව වෙවුල්වා මහදන් දී අඹුදරුවන්ත් දන් කොට ආයු කෙළවර කලුරිය කොට තුසිත දෙවිලොව උපත්තේ ය. එකල දස දහසක් සක්වළ වැසි දෙවියෝ එක් රැස් ව බෝසතුන් කරා ගොස්,

"මහබලැනි හිමියෙනි! – කලැයි ඔබහට මේ දැන්,
පිළිසඳ ගන්න මවු කුසැ – ලෝ සත සසර සයුරෙන්,
එතෙර කරවා ලනු – හිමියෙනි! මහාකුළුණැති,
අවබුදු කරණු මැනැවි – ලොවුතුරු අමාපද තුම්"

යි මෙසේ අයැද සිටියහ. එකල බොධිසත්ව තෙමේ පස් මහබැලුම් බලා තුසිතදෙවිලොවින් චුත ව දඹදිව කිඹුල්වත් පුරයෙහි සුදොවුන් මහරජු නිසා මහාමායා දේවීන් කුසැ පිළිසිඳ ගෙණ දස මස් ඇවැමෙන් වෙසක් මස පුරපසලොස්වක් පොහොය දා ලුම්බිනී සල්වන උයන්හි මවුකුසින් බිහි විය.

මෙසේ බිහිවී වදාළ මහාසත්ව තෙමේ, කෙමෙන් වැඩි විය පැමිණ, හෙමන්ත-ගිම්හ-වස්සාන යන ඒ ඒ ඍතුවලට සුදුසු මාලිගා තුණෙක දෙමිසිරි වැනි රජසිරි විඳිමින් දෙව් කුමරකු සේ වැඩෙන්නට වන. මේ අතර එක් දිනෙක උයන් කෙළියට ගිය මහසත් තෙමේ, ජීණ්-රෝගි-මෘත යන තුන් දෙවදූතයන් දැක හටගත් සසර කලකිරීම් ඇත්තේ, සිවුවනවර දුටු පැවිදි රැවෙහි ආශා උපදවා 'පැවිද්ද ඉතා යහපතැ'යි සලකා ගෙණම උයන් ගියේ එහි දුවල් දවස ගෙවාලන්නට සිතා මනුල්පොකුණුඉවුරෙහි හුන්නේ ය. එහි දී රාහුල කුමරුන් උපන් බව අසා පුත්‍රස්නෙහය බලවත් බව දැන 'යම්තාක් මේ බන්ධනය නො වැඩේ ද, එතාක් එය සිඳ හරින්නෙම්"යි සවස තුවරට පිවිසෙන්තේ,

"මෙබඳු හිමියෙක් යම් – බිරියකට වේ නම් ඇය,
නිවියාය යනු එනතින් – හඟිම් සැකයෙක් නැත කිහි,
මෙබඳු පුත් රුවනෙක් – මවකට ඇත ද යම්කිසි,
නිවියාය ඒ අම්මා – හඟිම් සැකයෙක් නැත එහි,
මෙබඳු පුත් රුවනෙක් – පියකුට ඇත ද යම්කිසි,
නිවියේය ඒ අප්පා – හඟිම් සැකයෙක් නැත එහි"

යන නැන්දනියන්ගේ දූ වූ කිසාගොතමිය කියූ නිබ්බුතපදය අසා 'මෑ විසින් නිබ්බුත පදය අස්වන ලද්දේ වෙමි'යි කර තුබූ මුතුපට ගලවා ඇට යවා මාලිගාවට පිවිස සිරියහන්හි වැතිර ගත්තේය. එහි නිදි ගත් නළඟනන්ගේ වියරු වෙස් දැක කල කිරුණු සිතැත්තේ ඡන්න අමාත්‍යයා නින්දෙන් නැගිට්ටවා

කන්ඨක අසු සරසවා ගෙන්වා ගෙණ උඟ පිටට නැග ඡන්නයා ත් සමග දස දහසක් සක්වළැ වැසි දෙවියන් විසින් පිරිවරණ ලදු ව මහබිනික්මන් කොට අනොමා ගංතෙරදී පැවිදි වූයේ ය. මෙසේ පැවිදි වූ මහසත් තෙමේ රජගහ නුවරට ගොස්, එහි විඳු සිහා පාණ්ඩව' නම් කදුපාමුලැ හුන්නේ, මගධ රජු කළ ආරාධනාව නො පිළිගෙණ, බුදුබව ලබා ඔහුගේ නුවරට එන්නට පොරොන්දු දී, ආලාරයා හා උදකයා වෙතට ගොස් ටික දිනක් ඔවුන් ඇසුරු කෙළේය. එහිදී උන් ලැබූ විශෙෂගුණයක් නො දැක, එතැනින් නික්ම එකලා ව උරුවේලාවට ගොස් එහි ද සාවුරුද්දක් මුළුල්ලෙහි අන්කෙනෙක්හට නො කළ හැකි වූ දුෂ්කර ක්‍රියා කොට වෙසක් පුණුපොහෝ දා උදැසන සුජාතාවත් පිළිගැන් වූ කිරිබත් වලඳා, රන්තලිය නෙරඤ්ජරා' නම් ගඟෙහි පා කොට හැර, ගං ඉවුරෙහි වූ මහාවනලැහැබෙහි නානාවිධ සමාපත්තීන්ගෙන් දවල දවස ගෙවා, සවස සොත්තිය' නම් බමුණා දුන් තණ ගෙණ, කාල' නම් මහා නාරජු විසින් කළ ගුණසතුති ඇති ව, බෝමැඩ කරා හිඳෙය. ගොස්, එහි තණ අතුරා 'යම්තාක් මාගේ සිත උපාදාන රහිත ව ආශ්‍රවයන්ගෙන් මිදේ ද, ඒ තාක් මේ පළඟ නො හරමි" සි ඉටා පෙරදිගට මුණ ලා වැඩ හිඳ, ඉර බැසීමට කලින් මර සෙනඟ නසා, පළමු යම පෙර විසූ ඤදපිළිවෙළ දන්නා නුවණ ද, මැදුම්යම චුතිඋපපත්ති දන්නා නුවණ ද ලබා, පැසුළුයම පටිච්ච සමුප්පාදයෙහි නුවණ මෙහෙයා, දශබල චතුවෛශාරද්‍යාදිසකලගුණ යන්ගෙන් පිරිපුන් සර්ව්ඥතාඥානය ලැබී ය.

මෙසේ සර්ව්ඥතාඥානය ලබා තුන් ලොවට ගුරු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ, බෝමැඩ ම සත් සතියක් ගෙවා, අටවනසතියෙහි අජපාලනිග්‍රොධමූලයෙහි වැඩ හිඳ තමන් අව බොධ කළ ධර්මයෙහි ගාම්භීර්‍යබව සලකා, අනුනට දහම් දෙසීමෙහි මනුෂ්‍යාභි වූ සේක. ඉක්බිති සහම්පති මහාබ්‍රහ්ම තෙමේ ඒ දැන, බමුන් පිරිවරා බුදුරජුන් කරා පැමිණ, 'ස්වාමීනි! ධර්මාවබොධයෙහි සමර්ථවූවෝ ඇත්තාහ, එහෙයින් දහම් දෙසනු මැනැවැ'යි දන්වා සිටියේ ය. ඉක්බිති උන්වහන්සේ 'මම පළමු කොට කවරක්හට දහම් දෙසන්නෙම් දැ'සි සිතූහ. එවිට උන්වහන්සේට ආලාර-උදඤ දෙදෙනාට පළමු කොට දහම් දෙසිය යුතු ය යි සිත් උපන. 'ඔවුහු දැන් කොතැනක දැ' සි බලත් කලුරිය කොට සිටිබව දැක, නැවැත පස්වග මහණුන් තමන්ට ඉතා උපකාර ව සිටිබව සලකා, ඝුනස්නෙන් නැගිට, කාශි නගරයට වැඩම වන්නට මගට පිළිපන් සේක. අතර මග දී උපක ආජීවකයා හමු විය. ඔහු හා මද වේලාවක් සාකච්ඡා කොට ඔහු හැර ගිය බුදුරජාණන් වහන්සේ ඇසළ

මස පුණුපොහෝදා බරණැස ඉසිපතනාරාමයෙහි පස්වග මහණුන්ගේ වාසස්ථානයට වැඩි සේක. ඔවුන් තමන් වහන්සේ හා නුසුදුසු පරිදි කතා කරණ විට 'තථාගතයන් හා මෙසේ කතා නොකළ යුතු ය' යි දන්වා අඤ්ඤාකොණ්ඩඤ්ඤ'තෙරුන් මුල් කොට සිටි අටලොස් කෙළක් මහබඹුන්ට අමාපැන් පොවමින් දම්සක් පැවැත් වූ සේක.

මෙසේ උන්වහන්සේ දම්සක් පවත්වා ඒ පඤ්චයෙහි පස් වන දා ඒ භික්ෂූන් රහත්බවට පමුණුවා, එදින ම ගිහිගෙයි කලකිරී ගෙය හැර නික්මුණු යසකුලපුත්‍රයාගේ වාසනාව දැක, ඔහු ගෙන්වා, එදින රෑ ම සෝවන් කොට පසුව දා රහත්බවට පමුණුවා ලූහ. යසකුලපුත්‍රයාගේ යහළුවන් සිවුපණස් දෙනකු ද එහිභික්ෂුභාවයෙන් රහත් බවට පමුණුවා ලූ සේක.

මෙසේ ලෝකයෙහි එක් සැටක් රහතුන් ඇති වූ කල්හි, වස් පවරා, රහතුන් අමතා 'මහණෙනි! දෙවියන් සහිත ලොකයාට සෙත් සලසනු පිණිස දනවු සැරිසරවු. දහම් දෙසුවැ'යි වදාරා, ඒ භික්ෂූන් සැට නම දිසාවන්හි යවා, තමන් වහන්සේ උරුවෙල් දනවිවට යන්නට මගට පිළිපන් සේක. අතර මගදී කපපාසික වනලැහබෙහි හුන් භද්දවග්ගිය කුමරුන් තිස් දෙනකු භික්ම වූ සේක. ඔවුනතුරෙහි ඉතා බාලතැනැත්තේ සෝවන් විය. වැඩි මහල්ලා අනාගාමී විය. එතැන්දී ම ඒ තිස් දෙනා ද එහිභික්ෂූ භාවයෙන් පැවිදි කොට, ලෝවැඩ පිණිස ගම් දනවුවලට පිටත් කොට තමන් වහන්සේ උරුවේලාවට වැඩියහ. එහි දී තුන් දහස් පන්සියයක් පෙළහර දක්වා, දහසක් ජටිලයින් පිරිවර කොට සිටි, උරුවෙලකස්සප-නදීකස්සප-ගයාකස්සප යන තුන් බෑ ජටිලයන් භික්මවා එහිභික්ෂුභාවයෙන් පැවිදි කොට ඔවුන් ගයාශීර්ෂයෙහි දී **'ආදිත්තපරියාය'** සූත්‍රය දෙසා රහත් බවෙහි පිහිටුවා ලූ සේක. මේ දහසක් දෙනා විසින් පිරිවැරුණු බුදුරජාණන් වහන්සේ බිම්සර රජුට දුන් පොරොන්දුව මුදන්නට රජගහනුවර සමීපයෙහි වූ වැල්මී වනයට වැඩියාහ. එබව දත් බිම්සර රජ තෙමේ දෙලොස් නහුතයක් බමුණු-ගැහැවියන් හා බුදුරජුන් වෙත ගියේ, එහි දී බණ අසා එකොළොස් නහුතයක් දෙනා සමග සෝවන් පලයට පැමිණියේ ය. එක් නහුතයක් සරණ සීලයෙහි පිහිටියේ ය. පසුදා මාණවකයකු සේ පෙණී සිටි සක් දෙව්රජු විසින් කළ සතුති ඇති බුදුරජාණන් වහන්සේ රජගහ නුවරට වැඩ එහි විසූහ. ශාරිපුත්‍ර-මොග්ගල්ලායන දෙදෙනා වහන්සේ බුදුරජුන්ට හමුවූවෝ එහිදී ය. මේ එහි පිළිවෙළ කතාව:-

බුදුරජානන් වහන්සේ ලෝ පහළ වීමට පෙර **උපතිස්ස-කොලිත** සි ගම් එහි දෙකක් විය. එදෙනා ම බමුණුගම් ය. ඒ දවස උපතිස්සගමෙහි රූපසාරී' නම් බැමිණියක් වූ ය. මොග්ගලී' නම් බැමිණියක් කොලිතගමෙහි විසූ ය. මැලා දෙ දෙනා ම, එක් දවස හටගත් දරුගැබ් ඇත්තෝ වූහ. දෙ කුලයෝ ද පිළිවෙළින් පරම්පරා සතක් ම දැඩි ව බැලුනු යහළුකම් ඇත්තෝ ය. මේ දෙ දෙනාට දරුගැබ් රැකුම් කටයුතු කළෝ ද එකා දවසේ ම ය. ඔවුහු දසමසක් ගිය තැනේ දී මහත් පිණැති පුතුන් දෙ දෙනකු වැදූහ. නම් තබන දිනයෙහි සාරිපුත්‍රගේ පුතුට උපතිස්ස ගමෙහි ප්‍රධාන කුලයෙහි පුතු බැවින් උපතිස්ස' සි ද, මොග්ගලියගේ පුතුට කොලිතගමෙහි ප්‍රධාන කුලයෙහි පුතු බැවින් කොලිත' සි ද නම් තැබූහ. කෙමෙන් වැඩෙන මේ බ්‍රාහ්මණ කුමාරයෝ දෙ දෙනා කල් නො හැර ම සකලශිල්පයන්හි කෙළවරට ගියහ. උපතිස්සකුමරු සෙල්ලම් කරන්නට ගඟට, උයනට යන විට රන්සිවිගෙවල් පන්සියයක් පිරිවර ව යයි. කොලිතකුමාර තෙමේ අසුන් යෙදූ රිය සත් සියයක් පිරිවර පිණිස ගෙණ යයි. දෙ දෙනා ට ම පන්සියයක් පන්සියයක් මාණවකයෝ ද පිරිවර වූහ.

එ දවස රජගහා නුවර අවුරුද්දක් පාසා පවත්වන ගිරග්ග' නම් නාට්‍යයෙක් විය. මේ දෙ දෙනා ද නැටුම් බැලීමට එහි යති. එහි ගිය ඔවුහු ගැලරියෙහි එකා තැනකා ම හිඳ නැටුම් බලති. නැටුම් බලනාතර සිනාසීමට තැනක් ආ විට සිනාසෙති. කණගාටු වන්නට තැනක් ආ විට කණගාටු වෙති. මිලමුදල් දෙන්නට ආ තැන මිලමුදල් දෙති. මෙසේ කල් යත් නුවණ මෝරා ගිය බැවින් පසු කාලයෙහි ඔවුහු නැටුම් බැලීමෙහි ආශා නැත්තෝ වූහ. නැටුම්ගැයුම්හි ආශා රහිත වූ මේ දෙ දෙනා සසර දුකින් මිදීමේ උපායයක් ගැණ සිතන්නට වූහ. දිනක් කොලිත තෙමේ උපතිස්සට අඬගා 'උපතිස්ස! තමුසේ වෙන දෙ ඉතා සතුටින් කල් දවස යැවූ වහු, දැන් එසේ නො වන්නහු කුමක් නිසා දැ?' සි ඇසී ය. 'මිත්‍රය! නැටුම්ගැයුම්හි කිසිත් වැඩෙක් නැතැ සි මට වැටහී තිබේ, එය දෙලොවින් පිරිහීමට කරුණු වනබව ද පෙණේ, දැන් මා සිත යන්නේ සසරින් මිදීමට උපායමාර්ගයක් සෙවීමට ය' සි එයට පිළිතුරු වශයෙන් උපතිස්සයන් කීවිට කොලිත තෙමේ ද 'ඇත්ත සි, මට ත් ඔය ලෙසට ම වැටහී තිබේ ය' සි කී ය. ඉක්බිති උපතිස්ස තෙමේ කොලිතයා ද තමන් හා සමාන අදහස් ඇත්තකුබව දැන, 'හරි! අප දෙ දෙනාගේ ම අදහස එක හැටි ය, මොක්ෂය සොයන්නට නම් පැවිදි විය යුතු ය, පැවිද්දෙන් තොර ව ඒ නො සෙවිය හැකි ය, ඒ නිසා පැවිදි විය යුතු ය, එහෙයින් කා වෙත අපි පැවිදි වන්නෙමු ද' සි කීයේ ය.

මේ කාලයෙහි රජගහානුවර සඤ්ජය නම් පරිව්‍රාජකයෙක් වාසය කෙළේ ය. ඔහුගේ පිරිස ඉමහත් ය. මේ බව දත් බ්‍රාහ්මණ තරුණයෝ දෙදෙන සඤ්ජය වෙත පැවිදි වන්නට සිතා, තමන් අනුව ආ දහසක් තරුණයන්ගෙන් පන් සියයක් හා සිවිකාරථ සියල්ල ද ගම්බලට යවා ඉතිරි පන්සියය ත් ගෙණ සඤ්ජය වෙත ගොස් පැවිදි වූහ. මොවුන්ගේ පැවිද්දෙන් සඤ්ජය තෙමේ පෙරට වඩා මහත් ලාභසත්කාර ඇත්තේ විය.

මේ අලුත් පැවිද්දෝ සඤ්ජය කෙරෙහි වූ සියලු ඛමීය නාල් නොයවා ම උගෙණ ඔහු කරා ගොස් 'ඔබවහන්සේ දන්නා ඛමීය මෙ පමණ දැ?'යි ඇසූහ. ඔහු 'මාගේ ඛමීය ඔපමණ ය, ඒ සියල්ල නොප විසින් උගන්නා ලදැ'යි කී ය. එවිට ඔවුහු 'මොහු වෙත කරණ බ්‍රහ්මචර්‍යාවාසයෙන් අපට වැඩෙක් නො වේ, අපි ගෙවල් හැර දමා මොක්ෂයක් සොයනු පිණිස පැවිදි වූවෝ වෙමු ද, එය මොහු වෙත නැත, මොහු වෙතින් ඒ ලබන්නට නො හැකි ය, ප්‍රමත්තු විය යුතු නො වේ, දැන් දැන් ම මෙ තැනින් නික්ම යා යුතු ය, දඹදිව ඉතා මහත් ය, ගම් නියම්ගම් රජදනවුති සොයා බැලීමු නම්, මොක්ෂඛමීදෙශකආචාර්‍යවරයකු සොයා ගත හැකි ය'යි සිතා එ තැනින් නික්ම ගියෝ, යම් යම් තැනෙහි උගත් මහණ බමුණෝ ඇතැ'යි කියත් ද, ඒ හැම තැන් ගොස් ඔවුන් හා සාකච්ඡා කරති. මෙසේ මුළු දඹදිව ඇවිද සොයා බලා ද මොක්ෂදෙශකයකු නො ලැබ, පෙරලා තමන් වසනා තැනට පැමිණියාහ. දිනක් උපතිස්ස තෙමේ කොලිතට කතා කොට 'කොලිතය! අපි දෙ දෙනාගෙන් යමෙක් පළමු කොට නිවන් සොයා ගණී ද ඔහු එය අනිකාට කිය යුතු ය'යි කීයේ ය. කොලිත ද එය පිළිගත්තේ ය.

මෙ දවස අපගේ සවාමි දරු වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ රජගහානුවර වෙළුවනාරාමයෙහි වැඩ වාසය කරණ සේක. තැනැ තැනැ දහම් දෙසන්නට පිටත් කොට යැවූ සැට දෙනා වහන්සේ අතුරෙහි පස්වග භික්ෂූන් වහන්සේලාට ඇතුළත් අස්සජි' මහාස්ථවිරයන් වහන්සේ එහි රජගහා නුවරට වැඩියෝ, පසු දා උදැසන පා සිවුරු ගෙණ පිඬු සිඟා ගියහ.

එදා උදැසන ම උපතිස්ස පිරිවැජි තෙමේ ආහාර අනුභව කොට පිරිවැජියන්ගේ අරමට යනුයේ, පිඬු පිණිස යන අස්සජි තෙරුන් දුටුයේ ය. 'මා විසින් මෙබඳු පැවිද්දෙක් මාගේ මේ ජීවිතයේ දී නම්, තව ම නො දක්නා ලද ය, ලොකයෙහි රහත් වූ හෝ රහත් මගට පිළිපන්නා වූ හෝ පැවිද්දෝ වෙත් නම්, ඔවුන අතර මොහු එක්තරා එකකු විය යුතු ය, මම මොවුන් කරා ගොස්

ලං ව, ඔබ කවරකු උදෙසා පැවිදි වූයෙහි ද? ඔබගේ ශාස්තෘ වරයා කවරෙක් ද? ඔබ කවරක්හුගේ දහමක් පිළිගත්තෙහි දැ?යි ඇසූයෙම් නම්, එය මට හිත පිණිස වන්නේ ය'යි සිතා 'එයට දැන් කල් නො වේ, පිඩු සිහන්නහුගෙන් මග දී ප්‍රශ්න ඇසීම සුදුසු නැතැ'යි උන්වහන්සේ ලුහුබැඳ ගියේ ය. අස්සජි තෙරුන් යැපෙන පමණට පිඩු සිහා ගෙණ එක්තරා විවෙකස්ථානයකට ගොස් වැඩ හිඳින්නට කැමැති බවක් දැක් වූ කල්හි පිරිවැජි තෙමේ පිරිවැජිපුටුව පිළියෙල කොට දුන්නේ ය. එහි වැඩ හිඳ උන්වහන්සේ සිහා ගත් ආහාර වැළඳූහ. පිරිවැජිජා තම කොණ්ඩියෙන් පැන් පිළිගැන් වී ය. වතාවත ද කෙළේ ය. වලදා අවසන්හි තෙරුන් හා පිළිසඳර කතාවට වැටුනු, පිරිවැජි තෙමේ 'තමුන්නාන්සේගේ චක්ෂුරාදිඉන්ද්‍රියයෝ අතිප්‍රසන්නයහ, සිරුරු පැහැය ඉතාපිරිසිදු ය, කදිම ය, කාන්තිමත් ය, තමුන්නාන්සේ පැවිදි වූවහු කවුරුන් වෙත ද? ශාස්තෘවරයා කවු ද? පිළිපදනා ධර්මය කුමක් ද?' යි ඇසී ය. එවිට ස්ථවිරයන් වහන්සේ 'මූලා සසුනට විරුඩයෝ ය, එබැවින් මූට අපගේ සසුනෙහි ගැඹුරුබව දක්වමි'යි සිතා 'මම සසුනට බැස ගත්තේ අලුත යි, මහණ වෙලා කල් නො ගියේ ය, ඒ නිසා විස්තර බණක් කියන්නට මම අපොහොසත් වෙමි' යි කීහ. 'හා, හොඳයි! මාගේ නම නො දන් නහු ද?, උපතිස්ස කියන්නේ මට යි, මම පිරිවැජියෙක් මි, ඔබ දන්නා පමණින් බණ කියන්න, මම, ඔබ කියන ඒ බණ ක්‍රම සියයකින් දහසකින් දැන ගැණීමෙහි පොහොසත් වෙමි, බණ කියන්නැ' යි කියා නැවත,

"මඳ හෝ නො මඳ හෝ – බණක් හිමියෙනි! දෙසනු,
මට 'රුත හිතය කිය' රුත – බොහෝ කුරු කුම් කරති"

යි මෙසේ ද කී ය. එකල ස්ථවිරයන් වහන්සේ **"යෙ ධම්මා හෙතුප්පභවා"** යනාදී වූ ගාථාව දෙසූහ. පිරිවැජි තෙමේ ගාථා යෙහි පළමු පද දෙක තම කණ වැටෙත් ම දහසක් නයින් යුත් සෝවන් පලයෙහි පිහිටියේ ය. අතික් දෙපදය ඇසූයේ සෝවන් පලයෙහි පිහිටා සිට ය. ඉක්බිති පිරිවැජි තෙමේ 'මට මෙයට වඩා උසස් ගුණයක් නො ලැබුනේ, යම් කිසිවක් නිසා ය' යි සලකා, 'ස්වාමීනි! බණ මට සෑහුනේ ය, දැන් කියූ බණ ඇත, බණ නවතා ලන්න, මේ බණ සොයා ගත් ශාස්තෘවරයා දැන් කොහි ද?, කියන්නැ' යි කී ය. උන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන බව තෙරුන් කීවිට, 'ස්වාමීනි! ඔබවහන්සේ වඩින්න! මට හිත වතෙක් සිටී, 'යමෙක් පළමු ව නිවන ලබා ද, ඔහු අනිකාට එය දැන් විය යුතු ය' යි මා හා උන් හා නියම කර ගෙණ තිබේ, ඒ

නිසා මම මේ කාරණය උඹට දන්වා, උඹ ත් කැටුව ඔබ වඩිනා මඟින් ම ශාස්තෘන් වහන්සේ වෙත එන්නෙමි' යි පසඟ පිහිටුවා, තෙරුන් පාමුල වැටී නැඟිට නැවැත තෙවරක් පැදකුණු කොට වැඳ, පිරිවැජියන්ගේ අරමට මුණ ලා එන උපතිස්ස පරිව්‍රාජකයා දුරදී ම දුටු කොලිත පරිව්‍රාජක තෙමේ 'හා! වැඩේ හරි ගියා සේ ය, උපතිස්සගේ මුණ වෙන දෙයාගේ නොවේ, අද බොහොම ඵලිය යි, මුණ බබලයි, නොවරදින්නට මුට නිවන ලැබී ඇතැ'යි සිතා වෙත පැමිණියා වූ මිතුරාගෙන් 'කොහොම ද; නිවන ලබා ගත්තෙහි දැ?' යි ඇසී ය. 'ඔව්, ඒ හරි; නිවන ලැබුනේ ය' යි කියා අස්සජී තෙරුන් අතින් ඇසූ 'යෙ ධම්මා හෙතුප්පභවා' යනාදි වූ ගාථාව ඔහු කියා පෑය. ගාථාව කියා අවසන්වත් ම කොලිත තෙමේ ද සෝවන් ඵලයෙහි පිහිටා, 'මිත්‍රය! අපගේ මේ ශාස්තෘන් වහන්සේ දැන් කොහි වෙසෙත් දැ?' යි ඇසී ය. 'උන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසනබව අපගේ ගුරු වූ අස්සජී ස්ථවිරයන් වහන්සේ වදාළාහ' යි උපතිස්ස කී විට, එසේ නම් අපි එහි යමු' යි කොලිත කී ය.

ශාරීපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ වනාහි හැම දෙනා ගුරුන් පුදන්නෝ ය. ගුරුන් ඉදිරියෙහි කිසිදෙනා ත් උස්හඬින් මහහඬින් කතා නොකරන්නෝ ය. හිස වසා ගෙණ නොහිඳින්නෝ ය. පය වහන් නොලන්නෝ ය. ඉදිරියෙහි නොසිටින්නෝ ය. ඉදිරියෙහි සෑජුව ගමන් නොකරන්නෝ ය. ඉදිරියෙහි සිටිනා විට, දෙර උළුවහු ආදි වූ කිසිවකට හේත්තු වී නොසිටින්නෝ ය. ඉදිරියෙහි නොසිනාසෙන්නෝ ය. ගුරුන්ට ඇසෙන පරිදි අන්‍යයන් හා කතා නොකරන්නෝ ය. කැරීම් කැගැසීම් නොකරන්නෝ ය. ඉදිරියෙහි කෙල නොහෙලන්නෝ ය. දුක දුක අසුන්හි නොහිඳින්නෝ ය. ගුරුන් වසන දිසාවට පය ලා නොනිදන්නෝ ය. ගුරුන් කෙරෙහි අහිතයක් නොකරන්නෝ ය. ගුරුන් කෙරෙහි හිතයක් ම හිතන්නෝ ය. ගුරු හිත නොරිදවන්නෝ ය. ගුරුන්ගේ සිත්හසර දැන එයට අනුව දවසරින්නෝ ය. ගුරුන් පිළිබඳ කළයුතු වතාවත, උපස්ථානය කොයි වේලකා පැමිණේ දැ'යි ඉතා කැමැත්තෙන් බලාපොරොත්තු වන්නෝ ය. ගුරුන් පිළිබඳ කළයුතු වතාවත නොපිරිහෙලා කරන්නෝ ය. ගුරු දූජාව කොයි මොහොතකා කරම් දැයි රෑ දෙවේලේ බලාපොරොත්තු වන්නෝ ය. මෙසේ ශාරීපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ මහත් ගුණයෙන් පිරී ගත් බැවින් 'අප විසින් නිවන් අයත් කරණ ලද්දේ ය, එය අපගේ ගුරු වූ සඤ්ඤයතුමාට ත් කිය යුතු ය, ඔහු ද එය අපෙන් අසා අවබෝධ කෙරේ නම්, අවබෝධ කෙරේවා, එසේ අවබෝධ නොකෙරේ නම්, ශාස්තෘන් වෙත ගොස් බණ

අසා මග පල අවබොධ කරණු ඇතැ'යි කීහ. මෙසේ කියා දෙ දෙන ම සඤ්ජය වෙත ගියහ. 'කිම දරුවෙනි! අමාමග දෙසන උතුමෙක් සොයා ගන්නා ලද දැ' යි සඤ්ජය ඔවුන් විචාළ විට 'එසේ ය, සොයා ගතිමු, ඒ දෙසන්නෝ ගෞතම බුදුරජානන් වහන්සේ ය, උන් වහන්සේ ලොව පහළ ව සිටිති, අමාදහම ද ලොව පහළ ව තිබේ, සඞ්ඝ තෙමේ ද උපන, දැන් රතනත්‍රය ම ඇත්තේ ය, එහෙයින් දැන් නො මග නො යා යුතු ය, නිවරද මග යෑමට ඉඩ කඩ තිබේ, තමුන්නාන්සේ යන මග, නිවන් ලැබීමට කරුණු නො වේ, අප සමග එනු මැනැවැ' යි ඔවුහු දන්වා සිටියහ. 'තෙපි යවු; මට යනු නො හැකි ය, මා ගෞතමයන් කරා යෑම නො සුදුසු ය' යි කීවිට 'ඇයි; තමුන්නාන්සේ එසේ කියහු?' යි උපතිස්ස-කොලිතයෝ ඇසූහ. 'මම මහාචාර්‍යවර යෙක්මි, ඒ මම අනෙකක්හුගේ අතවැස්සකු වීම ලොකයාගේ සිනහවට කරුණු ය, තෙපි ඒ නො දනිහු ද? මට අනෙකක්හුගේ අතැවැස්සකු වන්නට නො හැකි ය' යි ඔහු කීවිට 'එසේ නො සිතන්න, අප හා යන්නට එනු මැනැව, එයින් ඔබ වහන්සේට මහත් වැඩෙකැ'යි ඔවුහු කීහ. 'දරුවෙනි! නුඹලාගේ කතාව ඇත්ත යි, එහෙත් මට නම් එහි යන්නට නො හැකි ය, තෙපි යවු'යි කී විට ද පරිව්‍රාජකයෝ දෙ දෙනා 'ගුරුතුමනි! බුදුරජුන් ලොව උපන් ද, සිට මහාජන තෙමේ සුවඳ මල් ඈ ගෙණ උන් වහන්සේ කරා ගොස් උන්වහන්සේ ම පුදයි, හැම පිදිවිල්ලක් ම පුද දෙන්නේ උන්වහන්සේට ය, මේ අපි ත් එහි යන්නෙමු, අප ගිය විට ඔබවහන්සේ කරන්නහු කුමක් දැ?' යි ඇසූහ. 'හා මොක ද, එසේ කියහු, ලොකයෙහි වැඩී මෝඩයෝ ය, පණ්ඩිතයෝ ටික දෙනෙක් ම වෙති, එහෙයින් පණ්ඩිතයෝ, පණ්ඩිත වූ ශ්‍රමණ භවත් ගෞතමයන් කරා යති, මෝඩයන් මෝඩ වූ මා කරා එනු ඇත, කැමති සේ කරවු; මට නම් යා නො හැකි ය' යි සඤ්ජය තෙමේ කීයේ ය.

ඉක්බිති පරිව්‍රාජකයෝ දෙ දෙන 'තමුන්නාන්සේ ප්‍රකට වහු' යි කියා ඔහු හැර ගියහ. එහි සඤ්ජයගේ පිරිස කැඩී බිඳී ගියේ ය. ආරාමය හිස් විය. සඤ්ජය තැනි ගත්තේ ය. ඇඟපත දෙදරා ගියේ ය. අතපය සැලෙන්නට වන. කටින් ලේ ගලන්-නට වන. ඒ අතර උපතිස්ස පරිව්‍රාජකයාගේ පන්සියයක් පමණ වූ පිරිවැජි පිරිසෙන් සඤ්ජයට හිතවත් වූ දෙසිය පණසක් පරිව්‍රාජකයෝ එහි නතර වූහ. උපතිස්ස-කොලිත දෙ දෙන තම අතැවැසි අනික් දෙසිය පණසක් පිරිවැජ්ජනුත් ගෙණ, වෙළුවනාරාමයට ගියහ. ඒ වේලෙහි ස්වාමිදරු වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ සිටු පිරිස මැද දහම් දෙසමින් වැඩහුන්

සේක්, දුර මගැ එන ඔවුන් දැක, 'මහණෙනි! අර ලහ එන්නෝ උපතිස්ස -- කොලිත පරිව්‍රාජකයෝ දෙ දෙනා ය, ඔවුහු දැන් මා සමීපයට එති, මාගේ අග්‍රශ්‍රාවක වන්නෝ ද මේ දෙ දෙනා ය, මේ වනාහි හද්‍රයුග්මයෙක් වන්නේ ය' යි වදාළ සේක. බුදුරජුන් වෙත පැමිණි ඔවුහු බුදුරජුන් වැඳ පැත්තක හිඳ 'ස්වාමීනි! අප පැවිදි කරන්න! අපි බුදුරජුන් වෙත පැවිදිවන්නට කැමැත්තෙමු, උපසම්පදාවත් අපට දෙනු මැනැවැ' යි ඇයද සිටියහ. 'මහණෙනි! මෙහි මා වෙතට එවූ; මා සොයා ගත් ධර්මය සසර දුක් නැති කිරීමේ එක් ම මාගිය යි, දුක් නැසීමට මේ හැර අන් මගෙක් නැත, එහෙයින් ඒ පිණිස බඹසර රකිවූ' යි වදාරණු හා ම ඒ පිරිසෙහි වූ සියලු දෙනා සෘඩියෙන් ලත් පා සිවුරු දරා සියක් අවුරුදු වයස් ඇති මහතෙරුන් සේ බුදුරජුන් ඉදිරියෙහි පෙණී සිටියෝ ය.

අනතුරු ව බුදුරජානන් වහන්සේ එ පිරිසෙහි චරිත බලා දහම් දෙසූහ. උපතිස්ස - කොලිත දෙ දෙනා හැර, සෙස්සෝ එහි දී රහත් වූහ. ශ්‍රාවකපාරමීඥානයාගේ මහත්බව නිසා, මේ දෙ දෙනාහට මත්තෙහි ලැබිය යුතු තුන් මග පිළිබඳ කටයුතු නො නිමියේ ය. මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ පැවිද්දෙන් සත්වන දිනයෙහි, මගධරටට අයත් කල්ලවාල' නම් ගමැ විසීමට ගියහ. එහි දී උන්වහන්සේගේ සිතෙහි ජිනමිඩය බලවත් වන්නට විය. ඒ දැක වදාළ බුදුරජානන් වහන්සේ මුගලන් තෙරුන් සංවෙගයට පමුණුවා ජිනමිඩය දුරු කොට, ධාතුකර්ම ස්ථානය දී ඒ දියුණු කිරීමෙහි උත්සාහවත් කළහ. මුගලන් තෙරණුවෝ ඒ වඩා මත්තෙහි වූ තුන් මග පිළිබඳ කටයුතු අවසන් කොට ශ්‍රාවකපාරමීඥානයෙහි මුදුනට පැමිණියහ.

ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පැවිද්දෙන් අට මසක් ගෙවා, බුදුරජුන් සමග සූකරඛත, නම් ලෙනෙහි වසන්නෝ, බැනනු වූ දීඝනඛ' පරිව්‍රාජකයාහට දෙසූ **'වෙදනාපරිග්‍රහ'** සූත්‍ර දෙශනායෙහි නුවණ යොදා අනෙකක්හට එළ වූ බතක් අනුභව කරන්නකු සේ එකෙණෙහි ශ්‍රාවකපාරමීඥානයෙහි මුදුනට ගියහ. පරිකර්ම මහත් බව නිසා මුන්වහන්සේ මුගලන් තෙරුන්ට පසු ව ශ්‍රාවකපාරමීඥානය ලැබූහ. යමක් කමක් නැති දුප්පත් මිනිස්සු ගමන් බිමන් කිරීමේ දී ඒ පිණිස අමුතුවෙන් පිළියෙල නො වෙති. එහෙයින් සිතූ සැටියේ ම ගමන් බිමන් කෙරෙති. එබඳු ගමන් බිමන්හිදී රජවරුන්ට හා රජදරුවන්ට යාන වාහන පිළියෙල කිරීම් ආදී වූ පරිකර්ම ඉතාබොහෝ ය. ඒ නිසා සිතූ සැටියේ ම ගමන්බිමන් කිරීමෙහි අපොහොසත් හ, රජවරු හා රජදරු

සෙනෙවි ආදිහු. එ පරිද්දෙන් සැරියුත් තෙරුන්ට ශ්‍රාවකපාරමී ඥානය පිණිස පරිකර්ම බොහෝ විය.

එ දින ම සවස බුදුරජානන් වහන්සේ ශ්‍රාවකයන් වෙළුවනාරාමයට රැස් කොට, සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට අගසවු තනතුරු දී පාමොක් උදෙසූහ. එවිට එහි රැස් වූ භික්ෂූන් වහන්සේලා 'බුදුරජානන් වහන්සේ මූණ බලා තනතුරු දෙති, පළමු පැවිදි වූ පස්වග භික්ෂූන් වහන්සේලාට දියයුතු, අගසවු තනතුරු, ඊට පසු පැවිදි වූ සැරියුත් - මුගලන් දෙ දෙනා වහන්සේට දුන්හ, මෙය කො තරම් අයුත්තෙක් ද, පස්වග භික්ෂූන් වහන්සේට මේ නො දෙන සේක් නම්, යස ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන පිරිසට මේ දියයුතු ව තුබුනේ ය, ඔවුනට ත් නො දෙන සේක් නම් භද්‍රවග්ගිය භික්ෂූන් වහන්සේට දියයුතු ය, එහෙත් මේ හැම යුතුකමක් ම නො බලා, මේ කිසිවකු ත් ගැණ නො සලකා හැමට පසු පැවිදි වූ සැරියුත් තෙරුන් වහන්සේලාට දුන්හ, මේ මූණ බලා ම දෙන ලද්දෙකැ' යි අවමන් කළහ. 'තමුසේලා කුමක් කියහු දැ' යි විචාරා, දැන බුදුරජානන් වහන්සේ 'මහණෙනි! ඔහො ම නො කියවු, තමුසේලා ඔය ගැණ කිසිවක් නො දනිහු මම මූණ බලා තනතුරු දෙන්නෙක් නො වෙමි, ඇයි ඔහො ම කියහු, මේ නමලා දෙ නම මේ තනතුරු ලබා ගන්නට බොහෝ කලක සිට බලාපොරොත්තු වූවෝ ය, ඒ පිණිස නොයෙක් තැන නොයෙක් පින්කම් කළහ, මහන්සි ගත්හ, අඤ්ඤාකොණ්ඩඤ්ඤ තැන හැමට පළමු නිවන් අවබොධ කර ගන්නට සිතමින් පතමින් එක් ගොයම් මුරයක දී නව වරක් අගසස් දන් දුන්හ, ඒ තැන මේ අගසවු තනතුරු බලාපොරොත්තු නො වූ හ, ඒ නො පැතූහ, ඒ තැන හැම පින්කමක් ම කළෝ, හැමට පළමු රහත් වන්නට ය ඒ තැනගේ අදහස ලෙසින් පැතීම ලෙසින් ඒ ඉටු විය, සැරියුත් මුගලන් දෙ දෙන පින්කම් කළෝ, අගසවු තනතුරු ලබන්නට ය, එ හෙයින් ඒ තැනලාට ඒ තනතුරු ලැබුනේ ය' යි වදාළවිට භික්ෂූන් වහන්සේලා 'ස්වාමීනි! ඔය තොරතුරු අපි නො දනුම්හ අපි ඒ දැන ගණු කැමැත්තම්හ, අපට එය වදාරන්නැ' යි ඉල්ලා සිටියහ.

ඉක්බිති බුදුරජානන් වහන්සේ 'මහණෙනි! මෙයින් පෙර අනුඑක්වන කපෙහි විපස්සී බුදුරජානන් වහන්සේ ලොව පහළ වූහ, එකල මහාකාල-චුලකාල නම් වූ ධනවත් සහෝදරයෝ දෙ දෙනෙක් වූහ, ඒ දෙ දෙන හවුලට හැල් කෙතක් වැපුරූහ, දිනක් චුලකාල තෙමේ වෙලට ගියේ, වැඩි තිබූ හැල් කරලක් කඩා ගෙණ එය පළා කෑයේ ය, එහිදී එය ඉතාරසවත්බව ඔහුට

වැටහින, එ හෙයින් ඔහු බුදුපාමොක් මහසඟනට හැල්ගැබ් දනක් දෙන්නට සිතා, අය්යා ලඟට ගොස්, 'අය්යේ! අද මම වෙලට ගියා, ඒ ගිය මට බුදුපාමොක් මහසඟනට හැල්ගැබ් පළා උයවා දනක් දෙන්නට සිත් වී ය, යි කී ය, ඇයි, මල්ලී! කුමක් කියහි, හැල්ගැබ් පළා දන් දීමක් කොහි තිබේ ද?, ගොයම නො නසව, යි මහාකාලයා කියූව ද, චූලකාල තෙමේ ඒ කළයුතු ම බව තරයේ කියා සිටියේ ය, එහි දී මහාකාල තෙමේ 'එසේ නම් කුඹුර දෙකට බෙදා, නුඹගේ කොටසෙහි ගොයමට නුඹට කැමැත්තක් කරන්න, මාගේ කොටසෙහි ගොයමට කිසිවක් කරන්නට එපා ය' යි කී ය, 'හා හොඳයි, එසේ කරමු' යි කුඹුර බෙදා ගෙණ මිනිසුන් හා කුඹුරට ගොස් හැල්ගැබ් පළා ගෙට ගෙණ අවුත් දිය නොමුසු කිරෙන් පිසවා, ගිතෙල්, මී, හකුරු, හා එක් කොට බුදුපාමොක් මහසඟනට පුදා, අවසන්හි 'මාගේ මේ අග්‍රදානය හැමට පළමු නිවන් අවබොධ කිරීමට හෙතු වේවා' යි පැති ය, බුදුරජානන් වහන්සේ 'ඒ එසේ වේවා' යි අනුමෙවෙනි බණ දෙසූහ, ඉන් පසු චූලකාලයා එදාම කුඹුරට ගොස් බැලූ විට, මුළු කුඹුර එකට මිටි බැන්දා සේ හැල්ගස්වලින් තදින් ගැවසී ගෙණ තිබෙනු දැක, ප්‍රීතියෙන් ඔදවැඩි ව 'මට වූයේ මහත් ලාභයෙකැ' යි සිතා ගොයම පැසී ගිය තැනේ දී පුඨුකග්ග' නම් දනක් ද, කැපීමේදී දායග්ග' නම් දනක් ද, එකතු කිරීමේදී වෙණග්ග' නම් දනක් ද, මිටි කොට බැඳීමේදී කලාපග්ග' නම් දනක් ද, කලවිටෙහි කොළ නැගීමේ දී ඛලග්ග' නම් දනක් ද ගොයම් පාගා වී එකතු කිරීමේ දී ඛල-භණ්ඩග්ග' නම් දනක් ද, කොටුවෙහි වී පිරවීමේ දී කොට්ඨග්ග' නම් දනක් දැ, යි නව වරක් අගසස් දන් දුන්නේ ය, ඒ දන් දුන් හැම වර ම, දන් දීමට ඒ ඒ දේ ගත් තැන් මුළුමනින් පිරී ගියේ ය, ගොයම වැඩියෙන් දියුණු වී ය, (ධර්මය තෙමේ තමන් රකින්නහු රකියි, මොනවට පුරුදු පුහුණු කළ ධර්මය තෙමේ සැප එළවයි. මොනවට පුරුදු පුහුණු කළ ධර්මයෙහි මේ ආනිසංසය' යි ධර්මයෙහි හැසිරෙන සුලු පුද්ගල තෙමේ දුගතියට නොය') යි බුදුරජානන් වහන්සේ වදාළ සේක.

මෙ තෙමේ මෙසේ විපස්සී බුදුරජුන් දවස හැමට පළමු නිවන් ලබන්නට සිතා නව වරක් අග දන් දුන්නේ ය, මෙයින් කප් සිය දහසකින් මත්තෙහි හංසවතී නගරයෙහි දී පියුමුතුරා බුදුරජුන් දවස ද, සත් දිනක් බුදුපාමොක් මහසඟනට මහදන් දී ඒ බුදුරජුන් පාමුල වැටී 'මම හැමට පළමු නිවන් අවබොධ කරන්නෙමි'යි පැතී ය, මෙසේ මුන් විසින් පතන ලද්ද ම ය, මා විසින් දෙන ලද්දේ, මම මූණ බලා තනතුරු නො දෙමි''යි වදාළ සේක.

නැවැත භික්ෂූහු 'ස්වාමිනි! අපට යසකුලපුත්‍රයා ප්‍රධාන පිරිසෙහි තොරතුරු ත්, ඔවුන් කළ දේ ත් කියා දෙනු මැනැවැ' යි ඉල්ලා සිටියාහ.

'මහණෙනි! මේ අයද එක් බුදු කෙනකු වෙත රහත්බව පතා බොහෝ පින්කම් කළහ, පසු කාලයෙහි බුදුරජුන් ලොව පහළ වීමට පෙර, හැමදෙනා එකමුතුව යහළු ව පින් කරන්නෝ, මළ සිරුරු දැවීම් ආදිය කරමින්, ඒ ඒ තැන හැසුරුනාහ, දිනක් ඔවුහු කලුරිය කළ දරුගැබ් සහිත ස්ත්‍රියක දැක දවමු, යි සොහොනට ගෙණ ගියහ, ඔවුනතුරෙන් පස් දෙනකු මළ සිරුර දවන්නට සොහොනෙහි නවතා සෙස්සෝ ගමට ගියහ, යසදරක තෙමේ මළ සිරුර යහුලින් විද විද පෙරළ පෙරළා දවන්නේ, අශුභ සංඥාව ලැබී ය, අනික් සිවුදෙනාට ද, කබරදෙනක සේ තැන තැන නැසුනු ගැලවී ගිය හම ඇති දුගඳ හමන පිළිකුල් වූ ඒ සිරුර දැක්වී ය, ඔවුහු ද ඒ බලා අශුභ සංඥාව ලැබූහ, අනතුරුව පස් දෙනා ම ගමට ගොස් තම පිරිසෙහි වූ අනික් යහළුවන්ට ඒ කීහ, යස තෙමේ ගෙදර ගොස් මවුපියන්ට හා භාර්‍යාවට ද දැන් වී ය, ඒ සියල්ලෝ ද එහි අශුභසංඥාව වැඩූහ, මේ ඔවුන්ගේ පූර්වකර්මය යි, ඒ නිසාම ය යසට අන්තඃපුරය සොහොනක් සේ වැටහුනේ, සියල්ලන්ට විශෙෂාවබොධය වූයේ ද ඒ නිසා ය, මෙසේ මොවුන් විසින් ලද්දේ ද, මොවුන් පතන ලද්ද ම ය, ඒ මිසක් මම මූණ බලා තනතුරු නො දෙමි'යි වදාළ සේක.

අනතුරු ව භද්‍රවග්ගීය භික්ෂූන්ගේ තොරතුරු ඇසූ භික්ෂූන්ට බුදුරජානන් වහන්සේ 'මහණෙනි! භද්‍රවග්ගීයයෝ ද පෙර බුදු රජුන් දවස උන්වහන්සේලා වෙත රහත්බව පතා පින් කළහ, පසු දවස, බුදුරජුන් ලෝ පහළ වන්නට පෙර, ධූර්තයෝ ව තුණ්ඩිලොවාදය අසා සැට දහසක් අවුරුදු පන්සිල් රැක්කාහ, මෙසේ මොවුහු ද ලැබුවෝ, මොවුන් පතන ලද්ද ම ය, මම මූණ බලා තනතුරු නො දෙමි'යි වදාළ සේක.

'උරුවෙල් කසුප් ආදිහූ කුමක් කළෝ දැ' යි නැවැත භික්ෂූහු ඇසූහ. 'මහණෙනි! ඔවුහු ද රහත්බව ම පතා පින් කළෝ ය, මෙයට අනුදෙවන කපෙහි තිස්ස-ඵුස්ස නමින් බුදුවරු දෙනමක් ලොව පහළ වූහ, ඵුස්ස බුදුරජුන්ගේ පියා මහින්ද නම් වී ය, ඔහු එ දවස එහි රජකම් කෙළේ ය, මේ රජුගේ බාලපුත්‍රයා බුදුරජුන්ගේ අගසවු විය, පෙරෙවිබමුණාගේ පුත්‍රයා ය දෙවන අගසවු වූයේ, මහින්ද රජ තෙමේ 'මාගේ වැඩිමහල් පුතා බුදු වෙයි, බාල පුතා අගසවු වෙයි, පෙරෙවි බමුණු පුතා දෙවන අගසවු වෙයි, ඔවුන් ගැණ සිතා 'බුදුරජානන් වහන්සේ

මාගේ ම ය, ධර්මය ත් මාගේ ම ය, සඞ්ඝයා ත් මාගේ ම ය, ඒ මාගේ තෙරුවනට නමස්කාර වේවා' යි තෙවරක් උදන් අතා, බුදුරජුන්පාමුල වැටී වැඳ 'ස්වාමීනි! මාගේ අනුදහසක් පමණ වූ ආයුසයෙහි මේ සොළවර ය, එහෙයින් අනුන් වෙත නො ගොස් යම්තාක් මම ජීවත් වෙම් ද, ඒ තාක් මා දෙන ඕවුප්පසය ඉවසනු මැනැවැ' යි ආරාධනා කොට, නිතර දෙ වේලේ බුදුපාමොක් මහසඟනට උපස්ථාන කරයි, රජහට තවත් පුත්‍රයෝ තිදෙනෙක් වූහ, ඒ තිදෙනාගෙන් වැඩි මහල්ලාට පන්සියයක් යුබනටයෝ වූහ, දෙවැන්නාට යුබනටයෝ තුන් සියයෙනි, බාලයාට දෙසිය පණසෙකි, ඔවුහු ද 'අප ත් අපේ සොහොයුරාට ඔවු පසයෙන් උපස්ථාන කළයුතු ය' යි නියම කොට ගෙණ, පියා කරා ගොස් ඒ පිණිස පියාගෙන් අවසර ඉල්ලූහ, එහෙත් රජ තෙමේ එයට, ඔවුනට අවසර නො දුන්නේ ය, ඔවුහු නැවැත නැවැ ත් අවසර ඉල්ලූහ, ඒ කිසිවරක රජ තෙමේ අවසර නො දුන්නේ ය, එ දවස ම රජුට අයත් රටෙහි ප්‍රත්‍යන්ත දෙශවාසීහු රජුට විරුද්ධව නැගී සිටියහ, රජ තෙමේ එය සංසිඳ වන්නට පුතුන් තිදෙනා හා ඔවුන්ගේ හටසේනා එහි යැවී ය, ඔවුහු එහි ගොස් රට සංසිඳුවා පෙරලා පියා වෙත ආහ, එවිට රජ තෙමේ පුතුන් වැළඳ ගෙණ, හිස සිඹ 'පුතුනි! මෙ තැන් සිට මම නොප කියන්නක් කරමි' යි කියා පුතුන් සැනසී ය, ඔවුහු ද 'යහපතැ' යි එය පිළිගත්හ, කිහිප දිනක් ගිය තැන, රජ පුතුන් අමතා වුවමනා යමක් කියවූ යි කී ය, 'ප්‍රියතුමනි! අපට අන් කිසිවකින් වැඩෙක් නැත, අපට අපේ සහොදරයාට සිවු පසයෙන් සංග්‍රහ කරන්නට අවසර දුන මැනැවැ' යි ඔවුහු අවසර ඉල්ලූහ, රජ තෙමේ එයට එකඟ නො වී ය, එවිට ඔවුහු අවුරුදු සතකට අවසර ඉල්ලූහ, රජ එය ද ප්‍රතික්ෂේප කෙළේ ය, නැවැත අවුරුදු සයකට, පසකට, සතරකට, තුනකට, දෙකකට, එක් අවුරුද්දකට, සත් මසකට, ස මසකට, සාර මසකටැ යි පිළිවෙළින් අවුරුදු – මාස අඩු කොට තෙ මසකටව ත් අවසර දෙනු මැනවැ' යි ඉල්ලා සිටියහ, රජ 'එවිට ද ඉඩ දිය නො හැකි ය' යි කී විට ඔවුහු 'දෙවයන් වහන්ස! හොඳයි, එසේ වේවා, අප එකෙකුට එකෙක මස බැගින්, මේ තෙ මස වත් ඉඩ දෙනු මැනවැ' යි නැවැත ත් ඇයැද සිටියහ, රජ තෙමේ 'හොඳයි, එසේ නම්, තුන් මසක් වලඳවවු' යි තෙමසකට අවසර දුන්නේ ය,

ඉක්බිති ඔවුහු තිදෙන, තම භාණ්ඩාගාරිකයා හා අයනැමියා ගෙන්වා 'අපි මේ තෙ මස දසසිල් සමාදන් ව, කාහවත් හැඳ බුදුන් වෙත වසන්නෙමු, නුඹලා සැහෙන පමණ දුනොපකරණ ඇපයා දින පතා අනුදහසක් භික්ෂූන් වහන්සේට හා දහසක්

යුද්ධභටයන්ට කෑම් බීම් පිළියෙල කොට දෙවු, අවි මෙතැන් සිට කිසිවක් නො කියමු' යි කියා පිරිවර පුරුෂයන් දහසක් ද සමග ගොස්, දසසිල් සමාදන් ව කහවත් හැඳ විහාරයෙහි ම විසූහ, භාණ්ඩාගාරිකයා හා අයකැමියා ඒ නියම පරිදි, ඔවුන්ගේ කොටුගෙවලින් වරින් වර දුනොපකරණ ගෙණ, දන් පිළියෙල කොට් දෙසි, ඒ අතර දන් පිළියෙල කරන්නන්ගේ දරුවෝ කෑදබත් ඉල්ලා නිතර හඬා වැලපෙත්, එවිට ඔවුහු භික්ෂූන් වහන්සේ වලඳවන්නට පළමු ව හඬා වැලපෙන ඒ දරුවනට කෑදබත් ආදියෙන් සංගඟ කොරෙති, භික්ෂූන් වලඳ අවසානයෙහි කිසිවක් එහි ඉතිරි නො වේ, පසු, කල් යත් යත් දරුවන්ට දෙමු' යි දන්බත් ගෙණ, දන් පිළියෙල කරන්නෝ ද කති, රෑනැති අහරක් වුවිට ඔවුන්ගේ කටට තදින් කොල උනා එන්නේ ය, එහිලා ඔවුන්ගේ කෑදර සිත එතරම් මහත් ය, ඔවුහු සුවාසූදහස් දෙනෙකි, මේ සියල්ලෝ සතුන් පිණිස පිළියෙල කළ දන්බත් හා මැරී ගොස් ප්‍රෙතලොකයෙහි උපත්හ,

පන්සලට වැද දසසිල් රැකි සොහොයුරෝ තිදෙන, ඒ දහසක් දෙනා සමග මියෙ ගොස් දෙව්ලොව ඉපිද, දෙව්ලොවින් දෙව්ලොව සැරි සරන්නෝ, දෙයාතුනාපක් ගෙවුහ, මෙසේ මොවුහු සසර එන්නෝ රහත්බව පතා පින් කළෝ ය, ඔවුන් පැතූ සේ ඔවුනට එය ලැබිනැ, ඒ මුත් මම මුණ බලා තනාතුරු නො දෙමි, එ දවස ඔවුන්ගේ අයකැමියා මේ බිම්සර රජ තෙමේ ය, විසාඛඋපාසක තෙමේ ය භාණ්ඩාගාරිකයා, මේ ජටිලයෝ තිදෙන ඒ රජදරුවෝ ය, ඔවුන්ගේ කම්කරුවෝ සුගති දුගති වශයෙන් සසර එන්නෝ, මේ කල්පයෙහි බුඬානන්තර සතරක් දෙව්ලොව ම උපන්හ, ඔවුහු එහි හැමට ම පළමු උපන් සතළිස් දහසක් අවුරුදු ආයු ඇති කකුසඳ බුදුරජුන් කරා පැමිණ, 'අපට අහර ලැබෙන දවසක් කියනු මැනැවැ' යි ඉල්ලා සිටියෝ ය, උන්වහන්සේ ද 'මා ජීවත් ව ඉන්ද දී නොපට කෑම් බීම් කිසිවක් නො ලැබේ, මගෙන් පසු මේ මහපොළොව යොදුනක් පමණ උසට නැගී සිටි නල්හි කොණාගමන' නමින් බුදුවරයෙක් ලොව පහළ වන්නේ ය, එකල උන්වහන්සේ හමු ව මේ විචාරවු' යි වදාළ සේක, ඔවුහු එතෙක් කල් ගෙවා කොණාගමන බුදුරජුන් උපන් කල්හි උන්වහන්සේ කරා පැමිණ, 'සවාමීනි! අපට කන්නට දෙයක් ලැබෙන දවස වදාරණු මැනැවැ' යි ඉල්ලා සිටියහ, උන්වහන්සේ ද 'මා දවස නොපට කිසිවක් නො ලැබේ, මගෙන් පසු මේ පොළොව යොදුනක් පමණ උස් ව යන්නේ ය, පොළොව එ පමණ උස් ව සිටි කැනේ දී කාශ්‍යප' නමින් බුදුවරයෙක්, අද මෙන් ලොව පහළ වන්නේ ය,

උන්වහන්සේ වෙතින් එය දැන ගණිවු' යි වදාළ සේක, එතෙක් ගෙවා කාශ්‍යප බුදුරජානන් වහන්සේ ලොව පහළ වූහ, එ කල්හි මොවුහු උන්වහන්සේ වෙත පැමිණ පෙර සේ කන්නට දෙයක් ලැබෙන දවස ඇසූහ, එවිට උන්වහන්සේ ද මගෙන් පසු පොළොව යොදුනක් උස් ව සිටි තැනේ දී ගෞතම නමින් බුදුවරයකු ලොව පහළ වනු ඇත, එ දවස තොපගේ නෑ රජෙක් වන්නේ ය, නම බිම්සර ය, ඔහු ඒ බුදුරජුන්ට දන් දී තොපට පින් පමුණු වන්නේ ය, ඒ පින් තොපට ලැබෙනු ඇතැ' යි වදාළ සේක.

මොවුනට වනාහි එක් බුද්ධාන්තරයෙක් සෙට දවස වැනි විය. ඔවුහු අප බුදුරජුන් දවස බිම්සර රජු විසින් දන් දී පින් පැමුණුවාලූ, මුල් දවසේ පින් නො ලැබීමෙන්, රෑ බිහිසුණු හඬ කොට තමන් දුක්වූහ. රජ තෙමේ පසු දා වෙළුවනයට ගොස් බුදුරජානන් වහන්සේට එ පුවත දන්වී ය. 'මහරජ! මෙයට දෙයාතු කපකින් පෙර, ඵුස්ස බුදුරජුන් දවස මේ ප්‍රෙතයෝ ඔබට නෑයෝ ව සිටියෝ ය, ඵුස්ස බුදුරජුන්ට පිළියෙල කළ දන් බත් කා ප්‍රෙතලොකයෙහි ඉපිද එන්නා වූ මොවුහු ඉන් මිදෙන්නට මේ දවස ඔබ දෙනු ලබන පින් බලාපොරොත්තුවෙන් ආහ, එහෙත් ඔබ ඊයේ දුන් පින් නො ලබා මේ ගැහැට කලෝ ය' යි වදාළවිට 'ස්වාමිනි! දැන් පින් දුන්නොත් ඒ නො ලබත් දැ?'යි රජ තෙමේ බුදුරජුන් විචාළේ ය. 'මහරජ! පින් දුන්නොත් පින් ලබන්නාහ' යි උන්වහන්සේ වදාළ සේක. එවිට රජ තෙමේ පසු දා බුදුපාමොක් මහසඟනට මහදන් පවත්වා, 'මේ පිණෙන් මාගේ ඥතිප්‍රෙතයෝ ආහාරපාන ලබා සුඛිත වෙත්වා' යි පින් දුන්නේ ය. එවිට ඔවුහු දිව්‍යාහාරපාන ලැබූහ. පසු දා ප්‍රෙතයෝ නිර්‍වස්ත්‍ර ව තමන් දුක්වූහ. එවිට රජ තෙමේ පෙර සේ බුදුරජුන් කරා ගොස් කරුණු විචාරා, බුදුපාමොක් මහසඟනට සිවුරු මසා පූජා කොට 'මේ පිණෙන් මොවුහු වස්ත්‍රාභරණ ලබත්වා' යි පින් දුන්නේ ය. එ කෙණෙහි ඔවුනට වස්ත්‍රාභරණ ලැබිණ. ප්‍රෙතාත්මභාවය හැර දමා ඔවුහු දිව්‍යාත්මභාවය ලැබූහ. එහි අනුමෙවෙනි බණ වදාරණ බුදුරජානන් වහන්සේ **"තිරෝකුඩ්ඩෙසු තිට්ඨන්ති"** යනාදීන් තිරොකුඩ්ඩානුමෝදනාව කළ සේක. ඒ අවසන්හි අසූසාර දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය විය. මෙසේ බුදුරජානන් වහන්සේ තුන්බෑ ජටිලයන්ගේ තොරතුරු වදාරා, පූර්ණෝක්ත ධර්මදේශනාව ද ගෙණහැර දැක්වූහ.

අනතුරු ව භික්ෂූන් වහන්සේලා අගසවු දෙනමගේ තොරතුරු විචාළාහු ය. එවිට බුදුරජානන් වහන්සේ 'මහණෙනි!

ඒ නමලා අග්‍රශ්‍රාවකභාවය පිණිස පැතුම් තබා වින් හළෝ ය, මෙයින් කප් සිය දහසක් අධික කොට ඇති කල්පඅසංඛ්‍යයකින් පෙර ශාරීපුත්‍ර තෙමේ බමුණුමහසල්කුලයෙහ ඉපිද සරද' යන්න් ප්‍රසිද්ධ විය, මුගලන් තැන ගැහැවිමහසල්කුලයෙහ උපන්නෝ ය, නම සිරිවඩ්ඪ' ය, මේ දෙදෙනා ම වැලිකෙළියේ සිට යහළුවෝ ය, සරද තෙමේ තම පියා මළ පසු කුලසතු දී මහත් ධනය රක්නේ, දවසක විවෙකී ව 'මම දන්නේ මෙලොව ගැණ ය, පරලොව ගැණ දනුමෙක් මට නැත, උපන්නහුට මරණය නම් නියත ය, ජීවිතයෙහි සාරයෙක් නැත, නිවන් ලබන්නට මහණ වියයුතු ය' යි සිතා සිරිවඩ්ඪයා කරා ගොස්, 'මිත්‍රය! දවසෙක, විවෙකී වූහුන් මට නිවන් ලබන්නට මහණ වියයුතු ය යි සිතේක් උපන, ඒ සිත එසේ ම දැනුත් බල පවත්ව යි, උඹත් මා හා මහණ වන්නට කැමැත්තෙහි නම් එන්නැ' යි කියේ ය, සිරිවඩ්ඪයා 'මහණ වන්නට නො හැක්කෙමි' යි කී විට සරද තෙමේ 'පරලොව යන්නෝ, යහළුවන් හෝ නෑ මිදුරන් හෝ ගෙණ නො යති, එසේ ගියෝ නොතැනක ත් නැත, තමන් කළ හොඳ නො හොඳ දෙක, තමන් කැටුව යයි, මේ නිසරු ජීවිතයෙන් වැඩෙක් නැතැ' යි රැවන්කොටුගෙවල දොරවල් හරවා දුගී මගී යාචකාදීන්ට මහ දන් දී කඳුපාමුලකට ගොස් ඉසි පැව්ද්දෙන් පැව්දි විය, ඔහු හා හැත්තෑ හතරදහක් දෙනා පැව්දි වූහ, සරද තෙමේ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා සිය අතැවැසි පැව්ද්දන්ට ද කිසිණුපිරියම් ඉගැන් වී ය, ඔවුහු ද කල් නො යවා පඤ්චාභිඥඅෂ්ටසමාපත්ති ඉපද වූහ, අනොමදස්සී බුදු රජානත් වහන්සේ ලොව පහළ වූවෝ මෙ දවස ය, උන්වහන්සේ උපන් නගරය චන්ද්‍රවතී ය, පියා යසවන්තරජ තෙමේ ය, මවු යශොධරා දේවී ය, බොධිය වූයේ කුඹුක්ගසෙක් ය, අග්‍රශ්‍රාවකයෝ නිසභ-අනොම දෙනම ය, උපසථායක වරුණ තෙමේ ය, සුන්දරා-සුමනාවෝ අග්‍රශ්‍රාවිකාවෝ ය, උන්වහන්සේගේ ආයුෂය අවුරුදු ලක්ෂයෙකි, උස පමණ, පණස් අට රියනෙකි, ශරීරාලොකය දෙළොස් යොදුන් තැන පැතිර ගත්තේ ය, දහසක් දෙනා, පිරිවරවූහ,

දිනෙක උන්වහන්සේ ඉතාඅලුයම, මහකුළුණසමවතින් නැගිට ලොව බැලූහ, එහි දී සරද තාපසයා දුටහ, 'අද මම සරද තාපසයා වෙත ගියෙමි නම්, මාගේ බණදෙසුම මහත් ඵල සහිත වන්නේ ය, ඔහු ද බුදුකෙනකුන් වෙත අගසවු තනතුර පතන්නේ ය, සිරිවඩ්ඪයා ත් එහි දී මුණ ගැසෙන්නේ ය, ඔහු ඒ

බුදුරජුන් වෙත ම දෙවන අගසවු තනතුර පතනු ඇත, බණදෙසුම් අවසන්හි සරදයාගේ පිරිවර වූ හැත්තෑහතරදහක් ජටිලයෝ රහත් වන්නෝ ය' යි දුන වදුළ බුදුරජාණන් වහන්සේ පා සිවුරු ගෙණ එකලා ව හැසිරෙන සිංහරාජයකු සේ එකලා ව ම සරද තවුසාගේ අතැවැස්සන් ගඩාගෙඩි කඩාගෙණ එන්නට වනයට ගිය වේලේ 'මාගේ බුද්ධභාවය දනීවා' යි ඉටා අහසින් ගොස් සරද තවුසා බලා සිටිද්දී ම අහසින් බැස පොළොව සිට ගත්හ.

සරද තවුස් තෙමේ බුද්ධානුභාවය හා සිරුරුලකුණු බලා, 'මේ නුමේ එකාත්තයෙන් බුදුවරයෙකැ' යි දුන, පෙර ගමන් කොට, පසඟ පිහිටුවා වැඳ අසුනක් පණවා බුදුරජුන් එහි වඩා හිඳුවා, තෙමේ තමන්ට සුදුසු අසුනක් ගෙණ පසෙකට වී හුන්නේ ය, ඒ අතර ගඩාගෙඩි පිණිස වනයට ගිය අතැවැස්සෝ ඉතා රසැනි ඔජොගුණ යුත් ගඩාගෙඩි කඩා ගෙණවුත් ගුරුන් ඉදිරියට පැමිණියෝ, බුදුරජුන් වැඩ හුන් අසුන හා ගුරුන් හුන් අසුන ත් බලා 'ඇදුරුතුමනි! අපි ඔබවහන්සේ අනුව ආවමෝ, මේ ලොක යෙහි ඔබවහන්සේට වඩා ඉමහත් කෙනෙක් තවත් නැත, යන අදහසින් ය, එහෙත් මේ ඉන්නා පුරුෂ තෙමේ ඔබට වඩා ඉමහත් එකකු සේ පෙණේ ය' යි කීහ, එවිට සරද තෙමේ 'දරුවෙනි! තෙපි කුමක් කියහු, හැට දහසක් යොදුන් උස් වූ මහමෙර, අබැටක් හා සම කරන්නට කැමැත්තහු ද, මේ සියල්ල දන් බුදු කෙනෙකි, උන්වහන්සේ හා මා සම නො කරවු' යි කියේ ය, එකල්හි ඔවුහු 'මොහු ලාමකාසත්‍වයකු නො වීය යුතු ය, ඒ නිසාම ය අපගේ ආචාර්‍යිවරයා මෙබඳු උපමාවක් ඇර දුක්වූයේ, මොහු ඒකාන්තයෙන් මහාසත්‍වයකු වීය යුතු ම ය' යි බුදුරජුන් පා මුල්හි ඇද වැටී නමස්කාර කළහ, සරද තවුස් තෙමේ 'දරුවෙනි! බුදුරජුන්ට පිදිය යුතු දෙයක් දැන් අප ළඟ නැත, උන්වහන්සේ මෙහි වැඩියෝ, පිඬු සිඟා යන වේලේ ය, එ හෙයින් දැන් අප තරමට් මොකවත් උන්වහන්සේට පිළිගැන් විය යුතු ය, තොප ගෙණ ආ ගඩාගෙඩි අතර ඇති හොඳ රසැති ගඩාගෙඩි මෙහි ගෙණ එවු' යි ගෙන්වා දුන සෝදා ඒ ගඩාගෙඩි බුදුරජුන්ගේ පාත්‍රයෙහි බැහි ය, බුදුරජුන් පිළිගත් ඒ ගඩාගෙඩිවල දෙව්යෝ එකොණෙහි ම දිව්‍යඔජස් කැවූහ, තාපස තෙමේ පැන් පෙරා පිළිගැන් වී ය, බුදුරජාණන් වහන්සේ ඒ වැලඳූහ, වලඳා අවසන් කළ ඉක්බිති, තාපසයා බුදුරජුන් සමීපයෙහි අතැවැස්සනු ත් කැඳවා ඔබ කතාවට පටන් ගත් විට උන්වහන්සේ 'මාගේ අගසවිවෝ අනෙක් භික්ෂූන් ද ගෙණ මෙහි එත්වා' යි සිතූහ, එකෙණෙහි ම ඔවුහු, බුදුරජුන් සිතූ ලෙස්ට ලක්ෂයක් රහතුන් ද ගෙණ එහි පැමිණ වැඳ එකත්පස් ව සිටියාහ, තාපස තෙමේ

අතැවැස්සන් අමතා 'බුදුරජුන් වැඩ ඉන්නා අසුනා ඉතා කුඩා ය, ලක්ෂයක් තරම් වූ මේ භික්ෂූන් වහන්සේලාට දීමට වෙන අසුනෙක් ද නැත, එහෙත් අද තව තවත් මෙයට වැඩිතරම් සත්කාර කළයුතු ය, එ හෙයින් වනයට ගොස් කඳුපාමුලින් පැහැයෙන් හා සුවඳින් යුත් මල් කඩා ගෙණ එවු' යි කී ය, ඒ කී වහාම තවුසෝ මොහොතකින් ම මල්ගෙණවුත් බුදුරජුන්ට සතරගවු පමණ වූ බින්ගත් මල්අසුනක් පැණවූ හ, සාඛ්‍යානුභාවය නොසිතිය හැකි ය, නොකිය හැකි ය, එ හෙයින් 'මල් ගෙණෙවු' කියත් ම මල් ගෙණ ආහ, තවුසෝ, දැගසව්වන්ට තුන්ගවු පමණ වූ ද සෙස්සන්ට දෙගවු පමණ වූ දැ යි මෙසේ උනුන්ගේ තරාතිරම් තරමට මල් අසුන් පැණ වූ හ, එහි හැමට කුඩානමට පැණ වූ අසුන සතළිස්රියන් උස ය, එවිටි සරද තෙමේ බුදුරජුන් ඉදිරි යෙහි දෙනොත් මුදුන් දි සිට. 'ස්වාමීනි! මට බොහෝ කාලක් හිත සැපවිණිස මේ මල්අසුනෙහි වැඩ හිඳුනු මැනැවැ' යි ආරාධනා කෙළේ ය.

මේ ඒ කියූ සැටි පොතේ:-

"වෙරුනි ලෝ හිමියෙනි! – ඔබට නිසිලෙස පැණ වූ,
මලසුන මත හිඳිනු මැන – මෑසිත පහන් කරමින්.
රැ දුවල සතක් – බුදුරද මල්අසුන් මත,
වැඩහුනි මසිත පාදු – තොස්වා සදෙවි ලෝසත".

බුදුරජානන් වහන්සේ රැදුවල් සතක් ඒ මල්අසුනෙහි වැඩ හුන්හ, දැගසව්වෝ ද සෙසු භික්ෂූන් වහන්සේ ද තම තමන්ට පත් අසුන්හි හුන්හ, ඉක්බිති තවුස් තෙමේ රැදුවල් සතෙහි මල් කුඩයක් ගෙණ බුදුරජුන් මත්තෙහි දරමින් සිටියේ ය, බුදුරජානන් වහන්සේ ජටිලයන්ගේ මේ මහත් සත්කාරය මහත්ඵල ඇත්තක් කරන්නට එහි ම නිරෝධසමාපත්තියට සමවැදුනු සේක, දැගසව්වෝ ත් අනික් භික්ෂූහු ත් සමාපත්තියට සමවැදුනාහ, එවිට තවුස්අතැවැස්සෝ අහර ගන්නා වේලෙහි වනමුල් ගඩා ගෙඩි අනුභව කොට දවස දෙවේලේ බුදුරජුන්ට දෙහොත් මුදුන් දී වැඳ සිටිත්, සරද තෙමේ ඒ රැ දුවල් සතෙහි අහර නො ගෙණ ම මල්කුඩය උසුලා ප්‍රීතිසැපයෙන් ගත කෙළේ ය, එකල ඒ රැදුවල ගෙවා නිරෝධසමාපත්තියෙන් නැගුනු බුදුරජානන් වහන්සේ දකුණුපස හුන් නිසභ තෙරුන් අමතා 'නිසභය! සත්කාර කරණ උසස් අදහස් ඇති මේ තවුසන්ට මල්අසුන් දීමේ අනුසස් කියා දෙන්නැ' යි වදාළාහු ය, එවිට සථවිරයන් වහන්සේ ශ්‍රාවකපාරමීඥානයෙහි සිටියෝ, මල්අසුන් පිදීමේ අනුසස් වදාළ සේක, ඒ දෙසුම්අවසන්හි දෙවන අගසවු වූ

අනෝම තෙරුන් අමතා 'තමුසේ ත් මේ තවුස් පිරිසට මොඝවත් බණක් කියන්නැ' යි බුදුරජුන් වදාළ විට උන්වහන්සේ ද එසේ කළහ, එහෙත් උන්වහන්සේලා දෙනමගේ ඒ දෙශනාවන්ගෙන් එහි එකකුට වත් මාගිඵලාවබෝධයෙක් නො වී ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ පමණ නො කොට හැකි බුබ්ඛිෂයයෙහි සිට දහම් දෙසූහ, එහි දී සරද තවුසා හැර සෙසු සියල්ලෝ රහත් වූහ, රහත් වූවන්ට උන්වහන්සේ 'මහණෙනි! මෙහි එවු' යි ශ්‍රීසසනය දිගු කොට ඇමතූ ඇසිල්ලෙහි ඔවුන්ගේ කෙස්රැවුල් අතුරුදහන් වී ගියේ ය, සියල්ලෝ ම තුන්සිවුරු පාත්‍ර ලදින් මහණ මහලු පැවිද්දෝ වූහ, සරද තෙමේ එහිදී විසිරී ගිය සිතැත්තේ රහත් නො වී ය, ශ්‍රාවකපාරමී ඥාන යෙහි සිට නිසහ තෙරුන් දෙසූ ධර්මදෙශනාව ඔහුගේ කණ වැටෙන්නට වූ තැන් පටන් 'මට ද අනාගතයෙහි ලොව පහළ වන බුදුකෙනකුන්ගේ ශාසනයෙහි, මේ ශ්‍රාවකයන් ලැබූ තනතුර ලැබේ නම් කොතරම් කදිම දැ' යි සිත් උපන, එහෙයින් මොහුට මාගීඵලාවබෝධය නො වී ය, ඉක්බිති තවුස් තෙමේ බුදුරජුන් වැඳ 'සවාමීනි! මේ අසුන්නි වැඩහුන් හාමුදුරුවෝ ඔබවහන්සේගේ ශාසනයෙහි කිනම් තනතුරක් දරන්නෝ දැ?' යි ඇසී ය, 'ඒ තැන මාගේ ශාසනයෙහි, ශ්‍රාවකපාරමීඥානයෙහි කෙළවරට පැමිණි, සොළොස් වැදෑරුම් වූ ප්‍රඥාවන්ගෙන් ප්‍රඥාවත් වූ මා පැවැත් වූ දම්සභා එ ලෙස පවත්වා අග්‍රශ්‍රාවකභාවයට පැමිණියෝ ය' යි වදාළවිට 'සවාමීනි! රැදුවල් සතක් මේ මල්කුඩිය දැරීමෙන් මා විසින් යම් සත්කාරයෙක් කරණ ලද ද ඒ සත්කාරයාගේ විපාකවශයෙන් මම ශක්‍රභාවාදී වූ කිසිවක් නො පතමි, මම පතන්නෙමි, මේ නිසහ හාමුදුරුවන් මෙන් අනාගතයෙහි බුදුවරයකුගේ අග්‍රශ්‍රාවකයකු වීම ය' යි කියා 'මම අනාගතයෙහි බුදුවරයකුගේ අග්‍රශ්‍රාවක වෙම් වා' යි පැතී ය, එවිට බුදුරජානන් වහන්සේ 'මොහුගේ පැතීම ඉටු වේ දැ' යි බලා වදාරණුවෝ කප් සියදහසක් අධික කොට ඇති එක් අසඞ්ඛ්‍යකල්පයක් ඉක්මගිය තැනේ දී, ඉටුවනබව දැක, 'තවුස! තාගේ පැතීම හිස් නො වන්නේ ය, අනාගතයෙහි කප් සියදහසක් අධික කොට ඇති එක් අසඞ්ඛ්‍යයක් ඉක්මගිය තැනේ දී ගෞතම නමින් බුදුකෙනකු මෙලොව ඉපදෙනු ඇත, උන්වහන්සේගේ මවු මහාමායා නම් වන්නී ය, පියා සුද්ධොදන නම් රජු ය, පුතා රාහුල නම් ය, උවැටන් කරන්නේ ආනන්ද නැමැත්තේ ය, දෙවන අගසව්වා මුගලන් නම් ය, ඔබ ප්‍රථම අග්‍රශ්‍රාවක වන්නෙහි ය, නාම ය ශාරීපුත්‍ර ය, මහාජනයා ඔබ අදුන්වනු ලබන්නෙහි 'ධර්මසෙනාපති ශාරීපුත්‍ර' යන නාමයෙනැ' යි වදාරා

භික්ෂුසඞ්ඝයා ත් කැටුව අහසට නැගී ගත් සේක, සරද තවුස් තෙමේ අතැවැසි තෙරුන් වෙතට ගොස් 'ස්වාමීනි! ඔබවහන්සේලා වැඩිය විට මාගේ යහළු වූ සිරිවඩුට, 'තමුසේගේ යහළු වූ සරදයා අනොමදස්සී බුදුරජුන් පාමුල දී අනාගතයෙහි බුදුවන ගෞතම බුදුරජුන්ගේ දකුණත් සවුබව පතන ලද්දේ ය, එහෙයින් ඔබ වමත් සවුබව පතා ගන්නැ' යි කියනු මැනැවැ' යි ඒ තෙරුන් අත කියා යැවී ය, මෙසේ පණිවුඩ යවා ත්, තෙමේ අන් මගකින් ගොස්, තෙරුන්ට පළමු ව ම සිරිවඩු කොළෙඹියාගේ ගෙදරට පැමිණියේ ය, සිරිවඩු තෙමේ ගෙට පැමිණි තවුසා දැක සතුටු ව, 'මාගේ යහළුවා බොහෝ කලකින් ආයේ ය' යි අසුනක හිඳුවා, තමන් එයට මිටි අසුනක් ගෙණ හිඳ 'ස්වාමීනි! ඔබවහන්සේගේ ශිෂ්‍ය පිරිස කොහි දැ' යි ඇසී ය, 'මිත්‍රය! පසු ගිය දිනෙක මා වසන පන්සලට අනොමදස්සී බුදුරජානන් වහන්සේ වැඩි සේක, අපි උන්වහන්සේට අපට පිළිවන් හැටියට බතින් බුලතින් සතකාර කෙළෙමු, එහි දී උන්වහන්සේ බණ වදාළෝ ය, ඒ බණ අසමින් හුන් සියල්ලෝ බණඅවසන්හි රහත් ව පැවිදි වූහ, මම, බුදුරජානන් වහන්සේගේ අගසවු වූ නිසභ තෙරුන් දැක, තොරතුරු අසා, ඒ තෙරුන් මෙන්, මතු බුදු වන ගෞතම බුදුරජුන්ගේ අගසවු වන්නට පැතීමි, එහෙයින් ඔබ ත් ඒ බුදු රජුන්ගේ ම දෙවන අගසවු වන්නට පතව' යි කියේ ය, එවිට සිරිවඩු තෙමේ 'තාපසයන් වන්ස! මට බුදුවරුන් සමග හැසිර කතාබස් කොට කියා ත් පළපුරුද්දෙක් නැතැ' යි කි ය, බුදු රජුන් හා කතාබස්කිරීම මට කළ හැකි ය, ඔබට එහි අපහසු වෙක් නො වේ, නුඹ විසින් කළයුත්තේ උන්වහන්සේට පිදීමට යමක් පිළියෙලකිරීමැ' යි සරද තවුසා කී විට, සිරිවඩු තෙමේ 'හා! හොඳයි, පිදීමට වුවමනා හැම දෙයක් මම පිළියෙල කරමි' යි කියා තමාගේ ගෙදර බිම රාජමානයෙන් අට කිරියක් පමණ තැන් සමතලා කරවා, වැලි අතුරවා විලඳ මල් ඉස, නිලුපුලින් සෙවෙනි කළ මණ්ඩපයක් කරවා, එහි බුදුරජුන්ට සුදුසු අසුනක් පිළියෙල කොට තබා, සෙසු භික්ෂූන් උදෙසා ත් අසුන් පණවා, කෑම්බීම් හැම දෙයක් සකස් කොට, බුදුරජුන් වැඩමවා ගෙණෙන් නැ' යි සරදයාහට දැන් වී ය, ඔහු සඞ්ඝයාසහිත වූ බුදුරජානන් වහන්සේ එහි වැඩමවා ගෙණ ආයේ ය, මගැ දුර වඩින බුදුරජුන් දුටු සිරිවඩු තෙමේ ඉදිරියට ගොස් බුදුරජුන් අතින් පාත්‍රය ගෙණ අවුත්, මණ්ඩපයට ඇතුල් ව බුදුරජුන් උදෙසා පිළියෙල කොට තුබූ අසුනෙහි උන්වහන්සේ වඩා හිඳුවා නැවැත සෙසු භික්ෂූන් වහන්සේ ඒ ඒ අසුන්හි වඩා හිඳ වී ය, අනතුරු ව උන්වහන් සේලාට පැන් පිළිගන්වා, දන් පිළිගැන්වී ය, දන් වලඳවා අවසන්හි

හැම දෙනා වහන්සේට සිවුරු පිණිස වටිනා වස්ත්‍ර ද පුදා 'ස්වාමීනි! මාගේ මේ පින්කම, සුලු දෙයක් නිසා, සුලු හැඟීමක් නිසා කරණ පින්කමෙක් නො වේ, මේ පින්කම මෙසේ සත් දවසක් ම නො නවත්වා කිරීමට ය, මාගේ අදහස, එහෙයින් පිළිවෙළින් සත් දවසක් ම මට අනුකම්පා කරණු මැනැවැ' යි ඉල්ලා සිටියේ ය, බුදුරජානන් වහන්සේ එය ඉවසා වදාළ සේක.

කෙළෙඹි තෙමේ මුල් දවසෙහි කළ පරිද්දෙන් ම ඒ සත් දවස මහදන් පවත්වා, අවසානදිනයෙහි බුදුරජුන් වැද දොහොත් මුදුන් දී සිට 'ස්වාමීනි! මා මිත්‍ර සරද තෙමේ යම් බුදුවරයකුගේ අගසවුබව පැතී ද, මම ත් උන්වහන්සේගේ ම දෙවන අගසවුබව පතමි' යි කී ය, එවිට බුදුරජානන් වහන්සේ අනාගතය බලා එය සඵලවනබව දැක, 'ඔබ මෙයින් කප් සියදහසක් හා, කල්ප අසඞ්ඛ්‍යයක් ඉක්ම ගිය තැන ලොව පහළ වන ගෞතම බුදුරජුන්ගේ දෙවන අගසවු වන්නෙහි ය' යි වදාළ සේක, ඒ වදාළ වචනයෙන් සිරිවඩු තෙමේ ඔදවැඩි විය, බුදුරජානන් වහන්සේ භික්ෂුසඞ්ඝයා ත් සමග විහාරයට වැඩියහ' යි වදාරා 'මහණෙනි! මා මේ කීයේ, එදවස, මා පුතුන් පැතූ පැතුම් ය, ඔවුහු තම තමන් පැතූ තනතුරු එලෙස ම ලැබූහ, මම මේ තනතුරු එකඟුදු මුණ බලා නො දීමි, දැනුත් නො දෙමි, ඉදිරියට ත් නො දෙන්නෙමි' යි ද වදාළ සේක.

මෙසේ වදාළ කල්හි අග්‍රශ්‍රාවකයෝ බුදුරජුන් වැද 'ස්වාමීනි! අපි ගිහි දවස ගිරග්ග නම් නැටුමක් බලන්නට ගියෙමු, ඒ බලා එහි හරයක් නො දැක කලකිරී සිටින අතර, දිනෙක මග දී අස්සජි ස්ථවිරයන් වහන්සේ හමු වූහ, එහි දී උන්වහන්සේ වෙතින් සෝවන්පලය ලැබීමු' යි තොරතුරු කියා සඤ්ජයපරිබ්‍රාජකයා පිළිබඳ තොරතුරු ද කියා සිටියහ.

ඉක්බිත්තෙන් බුදුරජානන් වහන්සේ 'මහණෙනි! සඤ්ජය තෙමේ තමන්ගේ දැනීමේ වරද නිසා, සාරය අසාරය දැන ගත නො හී අසාරය, සාරය යි ද, සාරය, අසාරය යි ද, ගෙණ සිටියි, තමුසේලා තමන්ගේ දැනුමේ නිවරදබව නිසා සාරය, සාරය යි ද, අසාරය අසාරය යි ද දැන අසාරය හැර, සාරය ගෙණ ක්‍රියා කළහු ය' යි වදාළ සේක. වදාළෝ මෙසේ ය:-

අසාරෙ සාරමතිනො සාරෙ චාසාරදස්සිනො,
තෙ සාරං නාධිගච්ඡන්ති මිච්ඡාසඞ්කප්පගොචරා.

සාරං ච සාරතො ඤත්වා අසාරඤ්ච අසාරතො,
තෙ සාරං අධිගච්ඡන්ති සම්මාසඞ්කප්පගොචරා'ති.

අසාරයෙහි සාරය යන දැකුම් ඇත්තා වූ ද, සාරයෙහි අසාරය යන දැකුම් ඇත්තා වූ ද, මිත්‍ථ්‍යාසඞ්කල්පය ම ගොදුරු කොට ඇත්තා වූ ද ඒ අඥානපුද්ගලයෝ සාරධර්මය නො ලබත්.

සාරය සාර හෙයින් දැන, අසාරය අසාර හෙයින් දැන (වසන්නා වූ) සම්‍යක්සඞ්කල්පය ම ගොදුරු කොට ඇත්තා වූ ඒ ප්‍රාඥ පුද්ගලයෝ සාරධර්මය ලබත්.

අසාරෙ සාරමතිනො = අසාරයෙහි සාරය යන දැකුම් ඇත්තා වූ.

චීවර-පිණ්ඩපාත-සෙනාසන-ගලානප්‍රත්‍යය යන සිව් පසය ද, මිච්ඡාදිට්ඨි-මිච්ඡාසඞ්කප්ප-මිච්ඡාවාචා-මිච්ඡාකම්මන්ත-මිච්ඡා ආජීව-මිච්ඡාවායාම-මිච්ඡාසති-මිච්ඡාසමාධි යන අට හා මිච්ඡාඤ්ඤාණ-මිච්ඡාවිමුත්ති යි කියූ දසවස්තුකමිත්‍ථ්‍යාදෘෂ්ටිය ද* ඒ මිත්‍ථ්‍යාදෘෂ්ටියගේ උත්පත්තියට කරුණු වූ ධර්මදෙශනා ද යන මොවුහු අසාරයෝ ය. **"චත්තාරො පච්චයා දසවත්ථුකා මිච්ඡාදිට්ඨි තස්සා උපනිස්සයභූතා ධම්මදෙසනා'ති අයං අසාරො නාම"** යනු අටුවා ය. මේ අසාරය සාරය යි ගන්නෝ මෙහි **සාරමති'** නම්. යහපත, අයහපත හිත, අහිත තෝරා බේරා ගැණීමෙහි නුවණ නැත්තෝ ය මොවුහු.

සාරෙ ච = සාරයෙහි ද.

සම්මාදිට්ඨි-සම්මාසඞ්කප්පාදී වූ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය, දස වස්තුක සම්‍යග්දෘෂ්ටියගේ ඉපැත්මට කරුණු වූ ධර්මදෙශනාය, ශීල-සමාධි ප්‍රඥා-විමුක්තිඥානදර්ශන-නිර්වාණය යන මේය සාර ය. **"දස වත්ථුකා සම්මාදිට්ඨි තස්සා උපනිස්සයභූතා ධම්මදෙසනාති අයං සාරො නාම"** යනු අටුවා ය. ඒ මේ සාරය සාරය නො මේ ය යි ගන්නෝ **අසාරදස්සි'** නම්.

තෙ සාරං න අධිගච්ඡන්ති = ඒ අඥාන පුද්ගලයෝ සාරය නො ලබති.

මේ **තෙ'** යන්න වෙසෙසන පද තුනක් මේ ගාථායෙහි එයි. **'සාරමතිනො, අසාරදස්සිනො, මිච්ඡාසඞ්කප්පගොචරා'** යනු ඒ පද තුන ය. අසාරය සාරය කොට, සාරය අසාරය කොට ගත්, වැරදි අදහස් ගොදුරු කොට සිටියෝ ය 'තෙ' යන්නෙන් ගැණෙන්නෝ. ඔවුහු අඥයෝ ය. මෙ ලොව පරලොව නො දන්නෝ ය. හිතාහිතය නො දන්නෝ ය. එහෙයින් ඔවුහු ශීල-සමාධි-ප්‍රඥා-විමුක්ති-විමුක්තිඥානදර්ශන-නිර්වාණ යන ලෞකික-ලොකොත්තරධර්මසාරය නො ලබත්. මේ ධර්මසාරයෙන් ඔවුහු ගිලි ගි සිටියෝ ය. මෙයින් ඔවුනට පිහිටෙක් නැත. මේය එහි අටුවා:- **"තෙ පන තං මිච්ඡාදිට්ඨිගහණං ගහෙත්වා ඨිතා කාමවිතක්කාදිනං**

* 'අනිකකසාවො' යන්නට කළ පරිකථාව බලන්න.

වසෙන මිච්ඡාසඞ්කප්පගොචරා ඛුද්ධා සීලසාරං සමාධිසාරං පඤ්ඤාසාරං විමුත්තිසාරං විමුත්තිඤාණදස්සනසාරං පරමත්ථසාරං නිබ්බානඤ්ච නාධිගච්ඡන්ති" යි[1].

මිච්ඡාසඞ්කප්පගොචරා = වැරදි අදහස් ගොදුරු කොට ඇත්තා වූ.

කාම-ව්‍යාපාද-විහිංසාවිතර්කයෝ මිච්ඡාසඞ්කප්ප නම් වෙති. එහි වස්තුකාම-ක්ලේශකාමයන් හා හැනී යිටි කල්පනාව **කාම සඞ්කප්ප**' නම. අන්‍යුන නැසෙත්වා යි පැවති කල්පනාව **ව්‍යාපාද සඞ්කප්ප**' නම. අන්‍යුනට වෙහෙස කිරීමේ කල්පනාව **විහිංසා සඞ්කප්ප**' නම. මෙකී මිථ්‍යාසඞ්කල්පයනට යටත්වූවෝ ය, මොවුන් ගොදුරු කොට ගත්තෝ ය, මෙහි සිත හසුරුවන්නෝ ය, මෙයින් කියන ලද්දාහු.

සාරං ච සාරතො ඤත්වා = සාරය, සාරහෙයින් දැන.

අසාරං ච අසාරතො (**ඤත්වා**) = අසාරය අසාරහෙයින් දැන.

තෙ සාරං අධිගච්ඡන්ති = ඒ ප්‍රාඥයෝ සාරය ලබත්.

සම්මාසඞ්කප්පගොචරා=නිවැරදි අදහස් ගොදුරු කොට ඇත්තා වූ.

දසවස්තුකසම්මාදිට්ඨිය, එහි ඉපැත්මට කරුණු වූ ඛම්දෙශනා ය, ශීලසාරාදිඛම්සාරය, නිර්‍වාණය යන මේ සාරයන් සාර හෙයින් ද, සිවුපස ය, දසවස්තුකමිච්ඡාදිට්ඨිය, එහි ඉපැත්මට කරුණු වූ ඛම් දෙශනා ය, යන මේ අසාරයන් අසාර හෙයින් දැන වසන, නිවැරදි සඤ්ඤාලපයන් ගොදුරු කොට ඇත්තා වූ ඒ ප්‍රාඥයෝ, නුවණැත්තෝ ශීල-සාමාධිආදිසාරධම්ය ලබති. සාරධම්යට පැමිණෙති යනු මේ ගාථායෙහි කෙටි අදහස ය.

නෙක්ඛම්ම-අව්‍යාපාද-අවිහිංසාවිතර්කයෝ සම්මාසඞ්කප්ප නම් වෙති. එහි වස්තුකාම-ක්ලේශකාමයෙන් වෙන්වීමේ කල්පනාව **නෙක්ඛම්මසඞ්කප්ප**' නම. හැමදෙනා සුවපත් වෙත්වා යි පැවැති කල්පනාව **අව්‍යාපාදසඞ්කප්ප**' නම. අන්‍යුනට වෙහෙස නොකිරීමේ කල්පනාව **අවිහිංසා සඞ්කප්ප**' නම. මේ කල්පනා තුන ම නිවරද ය. නිදොස් ය. එහෙයින් සම්මාසඞ්කප්ප යි කියත්. මෙකී සම්‍යක්සඞ්කල්පයන්ට යටත් වූවෝ, මොවුන් ගොදුරු කොට ගත්තෝ **සම්මාසඞ්කප්පගොචර**' නම් වෙති. මෙය මේ ගාථා යෙහි එන **තෙ**' යන්න වෙසෙසා සිටියේ ය.

මේ ඛම්දෙශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. ඛම්දෙශනාව පැමිණසිටියවුන්ට වැඩ සහිත වූ ය.

අග්‍රශ්‍රාවකාවසානව නිමියේ ය.

---

1 පුෂ්ප වග්ගයෙහි සීලවතං ගන්ධෝ' යන්නට කළ පරිකථාව බලන්න.

නන්දමහාසථවිරයන් වහන්සේ

1 – 9

මාගේ සවාමි දරුවූ සම්මා සම්බුදුරජානන් වහන්සේ, පවත් වන ලද උතුම් **දම්සක්**ඇති සේක්, රජගහානුවරට වැඩම කොට, වේළුවනමහාවෙහෙර වැඩ වසන සේක. එ කල්හි සුඛොදන මහ රජුන් විසින් **'මාගේ පුත්‍රයා කැඳවා ගෙණ අවුත් මට දක් වවු'** සි ඇමැතියන් දස දෙනකු වරින් වර, බුදුරජුන් වෙත යැවී ය. ඔවුනතුරෙක් හැමට පසු බුදුරජුන් වෙත ගිය කාලුදායි තෙමේ එහි දී රහත්බවට පැමිණියේ කල් දුන, මගවැණුම් වණ්ණ, විසි දහසක් රහත් නිකුණුන් සමග, සම්බුදුරජානන් වහන්සේ කිඹුල්වතට පැමිණ වී ය. එහි දී උන්වහන්සේ නැයන් ඉදිරියෙහි පොකුරුවැස්සක් කරුණු කොට **වෙස්සන්තරජාතකය** වදාළ සේක. **'උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය'** යනාදි ගාථාව දෙසා, පියානන් සෝවන් පල යෙහි පිහිටුවාලූ සේක. අනතුරු ව **'ඛණ්ණං චරේ'** යනාදිගාථාව දෙශනාකිරීමෙන් මහාපජාපතිගොතමිය සොතාපත්තිඵලයට ද, සුඛොදනමහරජු සකදාගාමිඵලයට ද පමුණුවා, නැවැත දන් වලදා අවසන් කොට, එහි දී රාහුලමාතාවන්ගේ ගුණ කථාව ඇසීමෙන් **චන්දකින්නරජාතකය** දෙසූහ. එයින් පසු ද නන්ද කුමරුන්ගේ අභිෂෙකය – ගෘහප්‍රවෙශය – විවාහය යන මඟුලඋත්සවයන් පවත්නා අතර, බිඹු සිහා එහි වැඩි සේක. එහි දී නන්ද කුමරුන්ගේ අතට තමන් වහන්සේගේ පාත්‍රය දී **මඟුල සූත්‍රය** දෙශනා කොට, හුනස්නෙන් නැගිට, පාත්‍රය නො ගෙණ වැඩි සේක. නන්ද කුමරු, බුදුරජුන් කෙරෙහි වූ බලවත් ගෞරවය නිසා, 'සවාමිනි! පාත්‍රය ගෙණ වඩින්නැ' සි කියන්නට අපොහොසත් ව, 'පඩිපෙල අග දී පාත්‍රය ගණු ඇතැ' සි සිතා බුදුරජුන් පසු පස ගියේ ය. උන්වහන්සේ එහි දී පාත්‍රය නො ගත්හ. එවිට නන්දකුමරු 'පඩිපෙල මූල දී පාත්‍රය ගණු ඇතැ' සි සිතා ගියේ ද, එහිදී ත් නො ගත්හ. නැවැත 'ගෙමිදුලෙහි දී ගණු ඇතැ' සි සිතා ගියේ ද, එහි දී ත් නො ගත්හ. මෙසේ 'අතැන දී ගණු ඇත, මෙතැන දී ගණු ඇතැ' සි සිත සිතා, බුදුරජුන් පසුපස ගිය කුමරුන්ගේ සිත්හි, ගමන් නවතාලීමෙහි අදහස උපන්නේ ද, බුදුරජුන් කෙරෙහි වූ ගෞරවය නිසා 'පාත්‍රය ගන්නැ' සි කියන්නට, ඔහු අපොහොසත් වී ය. බුදුරජුන් පසු පස්සෙ ම ගියේ ය. බුදුරජුන් පසු පස්සේ යන නන්ද කුමරු, දුටු ගැණු විරිමි, ජනපදකල්‍යාණිය වෙත ගොස්'දනිවූ ද, ආයුෂ්මතෙනි! නන්ද කුමරුන් ඔබගෙන් වෙන් කරන්නට සිතා, බුදුරජානන්

වහන්සේ ඔහු විහාරයට කැඳවා ගෙණ ගියහ' යි දැන්වූහ. එය අසා කලබලයට පත් ජනපදකල්‍යාණී තෙමෝ, කඳුලු තෙලමින් හිස පිරිමදිමින් වහා ගොස් 'ආර්‍යපුත්‍රය! මේ කොතැන යහු ද? පාත්‍රය බුදුරජුන්ට දී වහා එන්නැ' යි කීවා ය. ඒ වචනය කුමරුගේ ලෙහි තදින් ඇණී සිටියේ ය. බුදුරජානන් වහන්සේ පාත්‍රය නො ගෙණ කුමරුන් විහාරයට ගෙණ ගොස් 'නන්දය! පැවිදි වන්නැ' යි කී ය. ඔහු ද බුදුරජුන් කෙරෙහි ඇති ගෞරවය නිසා බුදුරජුන්ගේ කීම බැහැර නො කොට, 'හොඳ ය, පැවිදි වෙමි' යි කී ය. එවිට බුදුරජානන් වහන්සේ 'එසේ නම් නන්දයා පැවිදි කරවූ' යි භික්ෂූන්ට නියම කළහ. බුදුරජුන් කිඹුල්වතට වැඩම කොට තුන්වන දිනයෙහි නන්දකුමරු පැවිදි කළ සේක.

සත්වන දිනයෙහි යශොධරා තොමෝ, තම සුරතල පුත් කුමරුන් නන්වැදෑරුම් විසිතුරු වූ වස්ත්‍රාභරණයන්ගෙන් හොඳට සරසා, 'මා පියපුත! විසි දහසක් මහණුන්ගෙන් පිරිවැරුණු බඹකයට බඳු රන්වන් සිරුරක් ඇතිව අර මගැ යන මහණහු දෙස බලන්න, ඒ නුඹගේ පියා, ඔහුට අයත් ඉතාලොකු නිදන් කිපයක් ඇත, ඔහු ගෙයින් නික්ම ගිය දා සිට, ඒ නිදන් අපට දකින්නට නො ලැබින, යන්න! පුතේ! ගොස් කියන්න! පියේ! මම අභිෂෙක ලැබ සක්විතිරජ වන්නෙමි, මිලමුදිලින්, ඇතු මැණිකෙන් කළයුතු වැඩ බොහෝ රාශියක් මා ඉදිරියෙහි තිබේ, එය පියාට ද පෙණෙන්නේ ය, පියා සතු නිදන් ගතවූ ඒ වස්තු මට දෙන්න! ඔබ සතු සියල්ලට ම හිමියා ඔබ පුත් වූ මම ය' යි කියා දායාද ඉල්ලන්නැ' යි කියා, බුදුරජුන් ඉදිරියට යැවූ ය. රාහුල කුමාර තෙමේ, බුදුරජුන් වෙතට ගොස්, පියපෙම් උපදවා ගෙණ තුටුසිත් ඇතියේ, 'පියේ! ඔබගේ සෙවන මට මහත් සැපයෙකි, මට එතරම් සැපයෙක් මුළු ලොව ම නැත, ඔබ මා හැර ගියහු කුමක් නිසා ද, අම්මාගේ ගැහැටෙක් ඔබට වී ද, නැත, සීයාගේ තජ්ජනයෙක් වී ද, ගෙදර දොරේ වැඩ කටයුතු සිත් නො ගත්තේ ද, කියන්න! පියේ! මා හැර ඔබට ජීවත් විය හැකි ද, මට ඔබ හැර අන් පිහිටෙක් නැත, එන්න, පියේ ගෙදර යන්නට, මට ඔබසතු සියලු නිදන් දෙන්නැ' යි කියමින්, බුදුරජුන් වෙත සිටියේ ය. බුදුරජානන් වහන්සේ දන් වලදා අනුමෙවෙනි කොට, කිසිත් නො බැණ හුනස්නෙන් නැගී වැඩි සේක. එවිට කුමාර තෙමේ 'දායාද දෙන්නැ' යි කියමින් බුදුරජුන් ලුහුබැඳ ගියේ ය. උන්වහන්සේ ද ඔහු නො නැවත්තු සේක. පිරිවරජනයා ද කුමරු නවතාලන්ට අපොහොත් විය. කුමරු දායාද ඉල්ලමින් විහාරයට ම ගියේ ය. එවිට බුදුරජානන්

වහන්සේ 'මේ දරුවා ඉල්ලන ධනය මොහුට හිත පිණිස නො වේ, එය නිතර දුක් දෙන්නෙකි, දුක් දෙන ඒ ධනය මොහුට දිය යුතු නො වේ, දෙතොත් දියයුත්තේ මා බෝමැඩ දී ලැබූ උත්තම වූ ආර්‍යධනය යි, ලොකොත්තරධනයට හිමියෙක් කළ යුතු ය මොහු' යි සිතා, ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ එහි කැඳවා, 'ශාරීපුත්‍රය! මෙය බලන්න, රාහුල මාගෙන් දායාද ඉල්ලන සැටි, ඒ නිසා මොහුට දියයුත්තේ බෝමැඩ දී මා ලැබූ ඒ ආර්‍යධනය යි, එය ය මොහුට හිත පිණිස වන්නේ, සසරදුක දිගහැසෙන ධනයෙක් මොහුට දියයුතු නො වේ, එ හෙයින් රාහුල පැවිදි කරන්නැ' යි වදාළ සේක. බුදුරජුන්ගේ නියමය පරිදි ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ කුමරු පැවිදි කළහ. ඒ බව දැන් සුඩොදන මහරජුගේ සිත තදින් දැවෙන්නට විය. බලවත් දුකෙක් හට ගැණින. රජ තෙමේ 'මවුපියන් විසින් නො අණුදන්නා ලද පුත්‍රයෙක් පැවිදි නො කළයුතු කොට ව්‍යවස්ථා පණවන්නටැ' යි, බුදුරජුන්ට දන්වා සිටියේ ය. උන්වහන්සේ පියරජුගේ ඒ ඉල්ලීම පරිදි, එසේ ව්‍යවස්ථා පැණවූ සේක. නැවැත දවසෙක රජගෙදර උදැසනැ දන් වලදා අවසන් කොට එහි වැඩ හුන් බුදුරජුන්ට රජ තෙමේ 'ස්වාමීනි! ඔබවහන්සේ දුෂ්කර ක්‍රියා කරණ දවසෙහි එක් දෙවියෙක් මෙහි මා ඉදිරියට අවුත්, 'ඔබගේ පුතු කලුරිය කෙළේ ය' යි මට කී ය, එහෙත් මම එය නො පිළිගතිමි, මාගේ පුතා බුදුබවට නො පැමිණ කලුරිය නො කරණ බව මම ඔහුට කිමි, එයට පෙර ද මිනී ඇට කිහිපයක් ගෙණවුත් පෙන්වා ඔබ පුතු මළේ ය' යි කීවිට ද, මම එය නො ඇදහීමි' යි කීයේ ය. බුදුරජානන් වහන්සේ එහි දී මේ කාරණයෙහිලා **මහාධම්මපාල ජාතකය** වදාළ සේක. එය අසා සිටි රජ තෙමේ අනාගාමීඵලයට පැමිණියේ ය.

මෙසේ බුදුරජානන් වහන්සේ පියරජු ඵල තුනෙක පිහිටුවා භික්ෂුසඞ්ඝයාත් කැඳවා ගෙණ, පෙරළා රජගහානුවරට වැඩි සේක. උන්වහන්සේ එහි වැඩ වසන කල්හි අනේපිඩුමහාසිටුහු විසින් සැවැත්නුවරට වැඩමවීමට ආරාධනා කරණ ලද්දෝ. දෙව්රම් මහවෙහෙරැ කළයුතු කටයුතු නිමි කල්හි එහි වැඩමවා එහි වැඩ වාසය කළහ. ඒ අතර නන්දු ස්ථවිරයන් වහන්සේ ශාසනයෙහි නො ඇලුනෝ, භික්ෂූන් ඉදිරියෙහි 'ඇවැත්නි! ශාසනයෙහි ඇලීමෙක් මට නැත, මාගේ සිත ශාසනයෙහි නො ඇලේ, ගිහි වන්නට ම ය සිත, මේ දැන් ශාසනබ්‍රහ්මචර්‍යයෙහි හැසිරෙන් නෙම් ද, එහි ඇලුමක් බැඳුමක් ඇතුව නො වෙමි, මහණකම කරන්නට නො හැක්කෙමි, ශික්ෂාවප්‍රතික්ෂේපකොට ගිහි වන්නෙ-මි' යි කීහ. බුදුරජානන් වහන්සේ මේ බව දැන, නන්දතෙරුන්

තමන් වහන්සේගේ ඉදිරියට කැඳවා, 'ඒ සත්‍ය දැ?' යි ඇසූහ. නන්ද ස්ථවිරයන් වහන්සේ 'එසේ ය' යි කී කල්හි 'තමුසේ කුමක් නිසා ශාසනයෙහි නො ඇලුනහු ද, බඹසර රකින්නට ඇති අමාරුව අපහසුව කුමක් ද, කුමක් නිසා ගිහි වන්නට සිතුවහු ද, කියවු' යි වදාළ සේක. 'සවාමීනි! ශාක්‍ය දුහිතා වූ ජනපදකල්‍යාණී නොමෝ එදා අප ගෙදරින් එද්දී. මා දැක අඩ අඩා දුව ඇවිත් 'ආර්‍යපුත්‍රය! වහා එන්නැ' යි කී වචනය, මට නිතර සිහි වේ, ඒ සිහි වන විට මාගේ ගත සිත පැරී යයි, සසුනෙහි ඇලුම් නැති වේ, නිතර සිහියට නගින්නී ජනපදකල්‍යාණිය යි, එහෙයින් මහණකමට සිත නො හඟියි, සිවුරු හැර යෑමට අදහසැ' යි නන්ද තෙරුන් කී විට, බුදුරජානන් වහන්සේ තෙරුන් අත ගෙණ, සෘඞ්ඛලයෙන් තව්ත්සාදෙව්ලොවට ගෙණ යන්නෝ, අතර මගැ මිනිසුන් දුවූ හේනක දැවී ගිය කණුවක් මත හුන් කපා හළ කන් නාසා වලිගා ඇති එක් පුලුටු වැඳිරියක පෙන්වා, දෙව්ලොවට නැඟ, එහි සක්දෙවිරජුට උපස්ථානයට ආ පරවියන්ගේ පා වැනි පා ඇති දැකුම්කලු දෙවඟනන් පත් සියයක් දැක් වූහ. අනතුරු ව තෙරුන් අමතා, 'නන්දය! තමුසේගේ අදහස කෙසේ ද, ජනපදකල්‍යාණිය තමුසේ නේ සිත් ගන්නී ද, මේ දෙවඟනෝ සිත් ගන්නෝ ද, වඩා හැඩ වඩා දැකුම්කලු කවුරු ද, ජනපදකල්‍යාණිය ද හැඩ, මේ දෙවඟනෝ ද, කියන්න, නන්ද! තමුසේගේ සිත ඇලුනේ, කවුරුන් කෙරෙහි ද, යි කියවු' යි වදාළ සේක. එවිට නන්ද ස්ථවිරයන් වහන්සේ 'සවාමීනි! ජනපදකල්‍යාණිය අප එද්දී අතර මග දී දුටු කපා හළ කන් නාස් වලිගා ඇති පුලුටු වැඳිරිය වැනි ය, ඈ මේ දෙවඟනන්ට මොනලෙසකින් වත් සම නො වේ, මේ දෙවඟනෝ ම හැඩ ය, දැකුම්කලු ය, මා සිත් ගණිති' යි කීහ. බුදුරජානන් වහන්සේ 'එසේ නම් තමුසේ සසුන්හි සිත් අලවා බඹසර රකින්න, මම තමුසේට මේ දෙවඟනන්ගෙන් පත් සියයක් ලබාදීමට ඇප වෙමි' යි වදාළ විට 'සවාමීනි! බුදුරජානන් වහන්සේ මට දෙවඟනන් පත් සියයක් ලබා දෙන්නට ඇපවන සේක් නම්, මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර හැසිරෙමි' යි තෙරුන් වහන්සේ කීහ. නැවැත බුදුරජානන් වහන්සේ, නන්ද තෙරුන් දෙවිරම් වෙහෙරට ගෙණ ආහ. ඒ වේලෙහි එහි විසූ භික්ෂූන් වහන්සේලා 'භග්‍යවතුන් වහන්සේගේ කුඩා මැනියන්ගේ පුත් නන්ද තෙරණුවෝ දෙවඟනන් ලබාගැණීමට බ්‍රහ්මචර්‍යා රකිති' යි ද, උන් ලබා දෙන්නට බුදුරජානන් වහන්සේ ඇප වූහ' යි ද, දුන 'ඒක ද, නන්ද ස්ථවිරයෝ කුලියට වැඩ කරන්නෙකැ, වික්‍රණා ගන්නා ලද්දෙකැ, දෙවඟනන් ලබාගැණීමට බඹසර

හැසිරෙන්නෙක, බුදුරජානන් වහන්සේ ඔහුට දෙවඟනන් පත් සියයක් ලබා දෙන්නට පොරොන්දු වූහ' යි නන්ද තෙරුන්ට අපහාස ලෙයින් කතා කරන්නට වූහ. එවිට සථවිර තෙමේ යහළුවන්ගේ ඒ කතායෙන් හටගත් ලජ්ජායෙන් මිරිකුනේ, පෙළුනේ, එයින් ම හිඤ්ඡූපිරිසෙන් වෙන් ව ගියේ, තනි වූයේ, අප්‍රමත්ත වූයේ, කෙලෙස් නවන වැර ඇත්තේ, හළ ආතමාලය ඇත්තේ වැනි දවස් නො යවා ම රහත් පලයට පැමිණියේ ය.

ඉක්බිති එක් දෙවියෙක් රාත්‍රියෙහි මුළු දෙවිරම්මහවෙහෙර බබුලුවා, බුදුරජුන් වෙත පැමිණ, වැඳ 'සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! නන්ද සථවිරයෝ ආශ්‍රවයන් නැති කොට ලැබිය යුතු ඵලසමාධිය හා ඵලප්‍රඥව ලබා වෙසෙත්' යි දැන්වී ය. බුදුරජානන් වහන්සේ ද නන්ද තෙරුන් රහත් වූ බව හුවණින් දැන සිටියහ. එදා රෑ ඉක්මගිය පසු සථවිර තෙමේ බුදුරජුන් වෙත ගොස් 'එදා භාග්‍යවතුන් වහන්සේ මට දෙවඟනන් ලබාදීමට ඇපවූහ, එහෙත් මම අද භාග්‍යවතුන් වහන්සේ ඒ මට වූ ඇපයෙන් මුදා හරිමි' යි කියා සිටියේ ය. එවිට බුදුරජානන් වහන්සේ, 'නන්ද! තමුසේ රහත්බවට පැමිණ වසනබව, මම දැන සිටියෙමි, මට දෙවියෙක් ද, ඒ බව දැන්වී ය, නන්ද! තමුසේගේ සිහ යම් දිනෙක ආශ්‍රවයන් ගෙන් මිදුනේ ද, එදා ම මම තමුසේට වූ ඒ ඇපයෙන් මිදුනෙමි' යි වදළහ. බුදුරජානන් වහන්සේ,

"කෙලෙස්මඬ තරුයේ – යමෙක් කම්කටු මැඩුයේ,
නිවනට පැමිණියේ ඔහු – සුවදුක් දෙක්හි නො සැලේ"

යන ප්‍රතිවාක්‍යය පහළ කළ සේක.

මේ අතර එක් දිනෙක භික්ෂූන් වහන්සේලා නන්ද තෙරුන් කරා ගොස් 'සථවිරතුමනි! දැන් කෙසේ ද පසු ගිය දා සසුන කෙරෙහි කලකිරී සිටියෝ නො වූහු ද, අද නම් එසේ දැ' යි ඇසූහ. 'සථවිරවරුනි! එදා ගිහිගෙය ගැන මාසිතැ පැවැති කැමැත්ත දැන් නැත, එය මුළුමනින් නැති ව ගොස් තිබේ, දැන් පොඩ්ඩක් වත් ගිහිකමෙහි ආලයෙක් නැතැ' යි තෙරුන් කීවිට ඒ භික්ෂූහු 'නන්දයා බොරු කියයි, රහත්බවට පැමිණියෙමි යි කියයි, පසු ගිය දා කියේ සසුනෙහි කලකිරී සිටුනා බව ය, අද රහත්බවට පැමිණි බවක් හඟවා, නන්දයා බොරු කියයි, මෙය බුදුරජුන්ට දැන්විය යුත්තකැ' යි බුදුරජුන් වෙත ගොස් එය දන්වා සිටියහ. බුදුරජානන් වහන්සේ 'මහණෙනි! නන්දගේ ඒ කිම ඇත්ත යි, නන්ද කියේ බොරු නො වේ, පසුගිය දවසෙහි නන්දගේ අත් බව සකස් කොට මැනැවින් නො සෙවිලි කළ ගෙයක් වැනි ව

තුබුනේ ය, දැන් එසේ නො වේ, ඒ එදා ය, දැන් සකස් කොට මැනැවින් සෙවිලි කළ ගෙයක් වැනි ය, නන්දු, දෙවගනන් දුටුදා සිට මහණදම් පලසහිත කරන්නට මහන්සි ගත්තා, වැර දැරුවා ඒ මහන්සිය ඒ වැරදැරීම දැන් මුදුන් පැමිණ තිබේ, නන්දුගේ මහන්සිය වැරදැරීම පලසහිත වී ය' යි මේ ධර්මදෙශනාව කළ සේක:-

යථාගාරං දුච්ඡන්නං වුඨි සමතිවිජ්ඣති,
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති.

යථාගාරං සුච්ඡන්නං වුට්ඨි න සමතිවිජ්ඣති,
එවං සුභාවිතං චිත්තං රාගො න සමති විජ්ඣතීති.

නො සකස් කොට සෙවිලි කළ ගෙය වැස්සෙන් තදින් තෙමී යන්නේ යම්සේ ද, එසේ නො වැඩූ සිත, රාගය තෙමේ තදින් විනිවිද යයි.

සකස් කොට සෙවිලි කළ ගෙය, වැස්සෙන් තදින් නො තෙමෙන්නා සේ, මනා කොට වැඩූ සිත රාගය තෙමේ තදින් විනිවිද නො යයි.

යථා අගාරං දුච්ඡන්නං = නො සකස් කොට සෙවිලිකළ ගෙය.

යථා, යනු; නිපාත යි. එය යෙදුනේ, නො සකස් කොට සෙවිලි කළ ගෙය ත්, ශමථ – විදර්ශනා භාවනාවශයෙන් නො වැඩූ සිත ත් එක් ලෙසකින් සමානබව දක්වනු සඳහා ය.

අගාර, නම්, ගෙය යි. **දුච්ඡන්න**' යන්න, කුදු මහත් සිදුරු ඇති කොට සෙවිලිකරණ ලද, යන අරුත් ඇත්තේ ය. ගෙවල් සෙවිලි කිරීම නො දත් ඒ ගැණ පළපුරුදුකම් නැතියවුන් විසින් තණ, පිදුරු, රුක්පොතු, උළු ආදී වූ ඒ ඒ උපකරණයන්ගෙන්, සිදුරු තබා, නො සකස් කොට සෙවිලි කරණලද ගෙය **'දුච්ඡන්නං, අගාරං'** යන මෙයින් කිය වේ. මිනිසුන් තම තමන්ගේ විසීමට ගොඩ නගන තණගෙවල්, කොළගෙවල්, පිදුරුගෙවල්, උළු ගෙවල් ආදී වූ හැම ගෙයක් අගාර' යන්නෙන් ගැණේ.

වුට්ඨි සමතිවිජ්ඣති – වැසිදහර (යම්සේ) තදින් විනිවිදිනී වේ ද.

"වස්සනං = වුට්ඨි" 'වස්ස–සෙචනෙ' යන ධාතුවෙන් ති ප්‍රත්‍යය ව සිඩ ය.

එවං අභාවිතං චිත්තං = එසේ නො වැඩූ සිත.

නො සකස් කොට සෙවිලි කළ ගෙය යම්බඳු ද, නො වැඩූ සිත ත් එබඳුය යනු, මෙයින් පැහැදිලි කරති. සිතේ වැඩීම

ක්‍රමදෙකකින් සිදු කළ හැකි ය. ඒ ක්‍රමදෙක, ශමථ-විදර්ශනා නාම යෙන් ආගමෙහි එයි. **කාමච්ඡන්ද - ව්‍යාපාද - ථිනමිද්ධ - උද්ධච්ච කුක්කුච්ච - විචිකිච්ඡා** යනාදී වූ කෙලෙසුන් සංසිඳ වන්නට ශමථ යානිකයාගේ වශයෙන් නියමිත වූ අටතිස් අරමුණු අතුරෙන්, **එක්තරා අරමුණක** සිත එල්වා තබා, එහි ම සිත දියුණු කිරීම **ශමථ** නම. කෙලෙස් සංසිඳුවන අරුතින් ශමථ නම් වේ. ශුද්ධ වූ ශමථභාවනා තොමෝ තදඞ්ග-විෂ්කම්භණවිමුක්තිත්ගේ වශයෙන් කෙලෙස් සංසිඳුවා ලයි. **පඨවි-ආපෝ=තේජෝ-වායෝ-නීල-පීත-ලෝහිත-ඔදාත-ආකාස-ආලෝකාකසිණ,** යන දස කසිණය ද, **උද්ධුමාතක-විනීලක-විපුබ්බක-විච්ඡිද්දක-වික්ඛායිතක-වික්ඛිත්තක-හතවික්ඛිත්තක-ලෝහිතක-පුළවක-අට්ඨික** යන දස අසුභය ද, **බුද්ධ-ධම්ම-සඞ්ඝ-සීල-චාග-දෙවතා-උපසම-මරණ-කායගතා-ආනාපානසති,** යන දස අනුස්සතිය ද, **මෙත්තා-කරුණා-මුදිතා-උපෙක්ඛා,** යන සතර බ්‍රහ්මවිහාරය ද, **ආකාසානඤ්චායතන - විඤ්ඤාණඤ්චායතන - ආකිඤ්චඤ්ඤායතන - නෙවසඤ්ඤානාසඤ්ඤායතන,** යන සතර අරූපඛ්‍යානය ද, යන මේ අටතිසෙන් එකෙකි, ශමථභාවනා වඩන්නට අරමුණු වන්නේ. එ ද චරිතානුකූල ව ම වේ. ඒ ඒ චරිත ඇත්තන් දෙස බලා ය, ආගමෙහි මේ අරමුණු අටතිසක් කොට බෙදුවෝ. **ආහාරෙ පටිකූලසඤ්ඤා-චතුධාතුවවත්ථාන** දෙක, කායගතාසතියෙහි ඇතුළත් වන බැවින් මේ අරමුණු, අටතිසෙක් වේ.

සංඝාරධර්මයන් කෙරෙහි නිසඟසිද්ධ වූ ප්‍රකෘතියෙන් කැළි ඇති **අනිත්‍ය-දුඃඛ-අනාත්ම** යන ලකුණු තුන, ගනිතුන සිතට් ගෙණ, නොයෙක් වර සිත එහි වැඩීම, **විදර්ශනා** නම. සංඝාර යන්ගේ ඇති තතු ඒ හැටියෙන් නො වෙනස් ව හොඳින් දැන ගන්නෑ අරුතෙන් විදර්ශනා නම් වේ. සංඝාරයන් කෙරෙහි වූ අනිත්‍යාදි ලක්ෂණ සිතට නගා සිත එහි පුරුදු කිරීමෙන් භවත්‍රය යෙහි වූ කිසිවක සිත නො ඇලෙ යි. කිසිවිටෙක ත් සංඝාර ධර්ම නිත්‍ය-ශුභ-සුඛාදිවශයෙන් නො ද පිළිගණී යි. සංඝාරයන් පිළිබඳ අනිත්‍යාදී වූ ලකුණුවල පුන පුනා වැඩීමෙන් බලවත් ව ගිය විදර්ශනාව **'උදයානගාමිනී විදර්ශනා'** යි කියනු ලැබේ. මේ ය එඤ්ඤායෙන් නිවන ලබා දෙන්නී.

ශමථ-විදර්ශනාවශයෙන් නො වැඩූ සිත, සත්වයනට අහිතකර බව **"චිත්තං භික්ඛවෙ! අභාවිතං මහතෝ අනත්ථාය සංවත්තති"** යනාදී වූ දෙශනාවන්ගෙන් ද පැහැදිලි වේ.[1]

---

[1] "ඵන්දනං චපලං චිත්තං" ඉත්‍යාදිය සඳහා කළ පරිකථාව බලනු.

එවං' යනු, නිපාත යි. ඒ වනාහි පටිභාග - සම්පටිච්ඡන - නිදස්සන-ආකාර-උපමා-සංපහංසන-උපදෙස-වචනපටිග්ගහන - අවධාරණ-ගරහ යනාදී වූ නොයෙක් අරුත්හි ආයේ ය. **"එවං විජිතසඞ්ගාමං සත්ථවාහං අනුත්තරං"** යන තන්හි පටිභාගයෙහි, **"එවං භන්තෙති ඛො තෙ භික්ඛු භගවතො පටිස්සුත්වා"** යන මෙහි සම්පටිච්ඡනයෙහි, **"එවම්පි තෙ මනො"** යන මෙහි නිදස්සනයෙහි, **"එවං බ්‍යා ඛො අහං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාමි"** යන මෙහි ආකාරයෙහි **"එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං"** යන මෙහි උපමායෙහි, **"එවං තෙ අභික්කමිතබ්බං එවං තෙ පටික්කමිතබ්බං"** යන මෙහි උපදෙසයෙහි **"එවං භන්තෙති ඛො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං"** යන මෙහි වචනපටිග්ගහනයෙහි, **"තං කිං මඤ්ඤථ කාලාමා -පෙ- එවං නො එත්ථ හොති"** යන මෙහි අවධාරණයෙහි, **"එවමෙවං පනායං වසලි යස්මිං වා තස්මිං වා තස්ස මුණ්ඩකස්ස සමණස්ස වණ්ණං භාසති"** යන මෙහි ගරහායෙහි ආයේ ය. මෙහි පෙණී සිටියේ ප්‍රතිභාගාර්ථයෙහි ය.

රාගො සමිතිවිජ්ඣති = රාගය තෙමේ තදින් විනිවිදියි.

නො සකස් කොට සෙවිලි කළ ගෙය, වැසිදියෙන් නිතර තෙමී යන්නා සේ, භාවනා වශයෙන් දියුණු නො කළ සිත, රාගය තෙමේ විනිවිද, පසා කොට යයි. **"තං අගාරං වුඩ්ඩි විය භාවනාරහිතත්තා අභාවිතං චිත්තම්පි රාගො සමිතිවිජ්ඣති"** යනු අටුවා ය. රාගය පමණක් ම නො වැඩූ සිත විනිවිද යන්නේ නො වේ. අනෙක් දොස - මොහ - මානාදිසකලක්ලෙශයෝ ම, එබඳු සිත නො වැඩූ සිත තදින් විනිවිද යති. **"න කෙවලා රාගො ව, දොසමොහ මානාදයො සබ්බකිලෙසා තථාරූපං චිත්තං අතිවියවිජ්ඣන්ති යෙව"** මේ ඒ අටුවා ය.

රාග නම්, රූපාදී වූ අරමුණුවල ඇලීම ය. සත්ව තෙමේ යම් ශක්තියකින් රූපාදී වූ අරමුණුවල ඇලේ නම්, ඒ ඇලීමට උපකාර වූයේ ද රාග ය යි. **"රඤ්ජනං, රඤ්ජන්ති වා ඉයන සො රාගො"** යනු අරුත්කීම ය.

යථා අගාරං සුච්ඡන්නං = සකස් කොට සෙවිලි කළ ගෙය.

යථාගාරං' යනු කී සේ ය. සුච්ඡන්න, යන්න 'නො තෙමෙන සේ මැනැවින් සෙවිලි කරණ ලද' යන අරුත් ඇත්තේ ය.

වුට්ඨි න සමිතිවිජ්ඣති = වැසිදහර (යම්සේ) තදින් විනිවිදිනි නො වේ ද.

එවං සුභාවිතං චිත්තං = එසේ මැනැවින් වැඩූ සිත.

රාගෝ න සමතිවිජ්ඣති = රාගය තෙමේ තදින් විනිවිදින්නේ නො වේ.

ශමථ-විදර්ශනා භාවනාවශයෙන් මැනැවින් දියුණුවට පත් කළ සිත, මැනැවින් සෙවිලි කළ ගෙය වැනි ය. ඒ ගෙය මහත් වූ වැසිදියකිනුදු විනිවිද නො නෙමෙන්නා සේ, භාවනාබලයෙන් ඔද වැඩුනු නෙදගැණුනු සිත රාගයට විනිවිද, පසා කොට නො යා හැකි ය. භාවනායෙන් වැඩුනු දැමුනු රැකුනු සිත, රූපාදී වූ අරමුණු, නිත්‍ය - ශුභ - සුඛාදිවශයෙන් නො පිළිගණී යි. සත්ත්වයාහට අහිත වූ රූපරාගාදිහු ඒ සිතෙහි නූපදනා හ. ඒ බවය මෙසින් වදාළෝ.

දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙනා සෝවන් ඵලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

ඉන් පසු භික්ෂූන් වහන්සේලා 'බුදුවරයෝ ආශ්චර්‍යවත්හ, නො සිතිය හැකි වූ මහාතෙදගුණ ඇත්තෝ ය, ජනාපදකල්‍යාණීය නිසා කලකිරී සිටි නන්ද ස්ථවිර තෙමේ බුදුරජුන් විසින් දෙවඟනන් ලබා දෙන්නට ඇප වී මුළුමනින් භික්ෂුභාවය ලද'සි ධර්මශාලාවට රැස් ව බුදුගුණ කිය කියා උන්හ. ඒ අතරතුර බුදුරජානන් වහන්සේ එහි වැඩි සේක. 'මොක ද, මහණෙනි! තමුසේලා කියන්නහු' යි අසා වදාළ කල්හි 'භාග්‍යවත් බුදුරජාණන් වහන්ස! බුදුරජාණන් වහන්සේ නන්ද තෙරුන් දමනය කළ සැටි කතා කරමින් හුන්නමෝ ය' යි භික්ෂූහු දන්වා සිටියහ. 'එහෙම ද; තමුසේලා දන්නහු, අද ඊයේ නන්ද දැමූ සැටි යි, පෙර ත් මම නන්දයා දැමීමි, ඒ දැමුයේ ද මාගමක් පෙන්වා ය' යි බුදුරජුන් වදාළ විට 'ස්වාමිනි! අපට ත් දැන ගන්නට ඒ වදාරණ මැනැවැ' යි ද ඔවුහු ඇයද සිටියාහ.

'මහණෙනි! අසවු! පෙර දවස බරණැස්නුවර බ්‍රහ්මදත් නම් රජෙක් රජය කෙළේ ය, ඒ දවස ම එහි කපපට' නම් වෙළෙඳෙක් විසී ය, දස අමුණක් බර ගෙණ යා හැකි කොටලුවෙක් ඔහුට සිටියේ ය, ඌ එක දවසට සත් යොත්නක් පමණ දුර ගමන් කර යි, වෙළෙන්දා දිනෙක කොටලුවාගේ පිට බඩු පටවා ගෙණ තක්සලාවට ගොස්, ගෙණ ගිය බඩු වෙළඳපල තබා බඩු විකිණෙන තුරු ඌ බැම්මෙන් මූදා හැරියේ ය, කොටලුවා ද කැමැති සේ වැව් බැම්මක් මතු පිට හැසිරෙන්නේ, එහි සිටි කොටලු දෙනෙක දැක, ඇට ලං විය, එවිට

කොටලු දෙන – හා! කොතැනෙක සිට ආයෙහි ද?

කොටලුවා – බරණැස් සිට,

කොටලු දෙන – මොක ද ආයෙහි?

කොටලුවා - වෙළඳුමට,

කොටලු දෙන – කෙතෙක් බර ඉසිලිය හැකි ද?

කොටලුවා – දස අමුණක්,

කොටලු දෙන – මෙතෙක් බර උසුලා කෙතෙක් දුර යා හැකි ද?

කොටලුවා – සත් යොත්තක්,

කොටලු දෙන – අත් පා මඬින්නියක්,

කොටලුවා – නෑ,

කොටලු දෙන – එසේ නම් මහ දුකක්, යි උන් දෙන්නා අතර කථා ප්‍රතිකථාවක් උපන.

තිරිසනුන් අතර පා මිරිකීම් ආදියක් නැත ත්, තිරිසන් සත්‍රිය කෙරෙහි ද, සත්‍රීමායමෙහි අඩුවක් පාඩුවක් නැති බැවින්, තමන් කෙරෙහි ඇලුම් කරවන්නට සිතා මෙසේ කිවු ය, ඇගේ මේ කතාවෙන් කොටලුවා උකටලී විය, කපපටයා ද' වෙළඳුමට ගෙණා බඩු විකොට, කොටලුවා ලඟට ගොස්, 'ඉනින් යමු'යි කී විට කොටලුවා 'ඔබ යන්න! මට නොයා හැකි'යි කී ය. වෙළඳ තෙමේ ඌ ගෙණ යෑ ට උත්සාහ කෙළේ ද, නොහැකි ව බිය ගත්වා ගෙණ යමි යි සිතා,

'කොටලුව! තට මෙ මම – සොළොසතුල් දික් කටු ඇති,
කෙවිටක් කොටින් පහරා – තගෙ සිරුර සිද බිඳ ලමි'

යි කී ය, එවිට කොටලුවා,

'මට ඔබ කප්පටය! – සොළොසතුල් දික් කටු ඇති,
කෙවිටක් කරන්නෙහි නම් – පහර දෙනුවස් එදවස;
පිහිටා පෙර පයින් – පසු පස පා නගා මම,
තගෙ කටට ඇණ දත්වික – බිඳලමි දනුව තෝ එය'

යි කීයේ ය, වෙළෙන්ද, කොටලුවාගේ මේ වේගවත් කියමන අසා 'කුමක් නිසා මෙසේ කියා දැ'යි සිතමින් ඔබිනොබ හැසිරෙන්–නට විය, එවිට එහි සිටි කොටලුදෙනක දැක 'මූ මෑ කෙරෙහි ඇලුනේ වන, මූ මැය විසින් මෙසේ කියන්නැ යි උගන්වන ලද්දේ වන, ඒ නිසා අන් මායමක් පෙන්වා, පොළොඹවා ගෙණ යමි, යි සිතා,

'සිවුපයැනි සක්වත් – මුණැනි හැමඟ හොබනා,
කොටලූ දෙනක මම තට – අඹු කොට ගෙණෙම් කොටලු!'

යි මෙසේ කී ය, එයසා සතුටට පැමිණී කොටලුවා,

'කප්පට වෙණද! ඔබ – කී ලෙස නො හැර ඒ හැටි,
සිවුපයැනි සකයුරවත් – අඟපසඟ හැම හොබනා,
කොටලූ දෙනක මට – අඹු කොට ගෙණෙන්නෙහි නම්,
තුදුස් යොත්නක් දුර බර – උසුලා රැගෙණ යම් මම'

යි කී ය, ඉක්බිති කපපට තෙමේ 'හා! හොඳයි යන්නට එව'යි කොටලුවා ගෙණ, පිය ගෙට ගියේ ය, ඌ කිහිප දිනකට පසු, 'ඔබ මට අඹුවක ගෙණැවිත් දෙන බව කියූයේ නො වෙහි ද? එහි පමාවන්නෙහි කුමක් නිසා දූ'යි ඇසී ය, 'ඔව්! මම එසේ කීයෙමි, මම එය කරන්නෙමි, තට අඹුවක ගෙණැවිත් දෙන්නෙමි, එහෙත් මා දෙන කුලිය නම් තට පමණක් ම දෙමි, දැන් දෙන කුලිය ම ය එදට දෙන්නේ ත්, දැන් නම් තට එයින් ජීවත් විය හැකි ය, අඹුවක ගෙණැවිට, මා දෙන ඒ වැටුප, දෙදෙනාට ජීවත්වීමට සැහේ දූ'යි මට නො කියැකි ය, එය සැහේවා හෝ, නො සැහේවා මට එයින් වැඩක් නැත, තෝ ම එය දැන ගණුව, තොප දෙදෙනාට දූ පුතුත් ලැබුනොත්, පවුල තවත් බරපතල වන්නේ ය, ඒ හැම කෙනකුම තාගේ වැටුපෙන් දිවි පැවැත් විය යුතු ය, මා මේ ටික කී යේ, තට සිතන්නට යැ'යි වෙළෙන්දා කී කල්හි අඹුව ගැණ කොටලුවාගේ තුබූ බලා පොරොන්තුව මුළුමනින් නැතිව ගියේ ය'යි බුදුරජානන් වහන්සේ නන්දු තෙරුන් පිළිබඳ ඉකුත් පුවත මෙසේ දක්වා, 'මහණෙනි! එදා ඒ කොටලු දෙන, මෙදා මේ ජනපද කල්‍යාණිය ය, එදා ඒ කොටලු තෙමේ, මෙදා මේ නන්දු තෙමේ ය, කපපට වෙළඳ තෙමේ මම මැ' යි වදාරා 'මම පෙරත් මොහු මාගමක් පෙන්වා, ඒ මගින් පොළොඹවා නික්ම වූ යෙමි' යි වදාළ සේක. එහි සිටි නිස්සුන් වහන්සේලා, ඒ අසා බුද්ධගුණයෙහි අතිශයින් ප්‍රමුදිත වූහ.

නන්දසථවිරවත්‍ථු නිමි යේ ය.

චුන්දනම් උඟුරුවැද්දගේ මරහඬ

1–10

පණස් පස් වසක් උඟුරන් මරා කමින්, කෑ ඉතිරි කොටස විකුණමින්, ජීවිතය ගෙණ ගිය චුන්දසූකරික තෙමේ දුර්භික්ෂකාලයෙහි වී සහල් ගැලෙක පටවා ගෙණ, ජනපදයට ගොස්, නැළිය දෙ නැළිය පමණ දීලා ගම් උඟුරුපැටවුන් ගෙණ, වී සහල් ගෙණ ගිය ගැලෙහිම ලා ගෙණැවිත්, ගේ පිටිපස ගාලක් පිළියෙල කොට එහි රඳවා, කෑම් බීම් දී පොෂණය කරයි. උන් කෑවී වැඩුනු පසු, උඟුරකු මරණ දිනයෙහි උඟුරා අල්ලා, ඔබනොබ පැන යන්නට නොහැකි පරිදි කණුවක තද කොට බැඳ, මස් තර කරන්නට සිවු රැස් මුගුරකින් තළයි. උඟුරා මරහඬ දෙයි. පැය කිහිපයක් තළා සිරුරු මස් ඝන වූ පසු කට හරවා දඬුකඩක් දමා කකියන්න උණුදිය, හැන්දකින් ගෙණ, උඟුරාගේ කටෙහි වත් කරයි. ඒ උණුදිය බඬ තුළට ගොස්, සියලු මල මූ කසළ ගෙණ මලමගින් නික්මෙයි. කිසිත් කසළෙක් බඬතුළ ඉතිරි නොවේ. අනතුරුව උණුදිය ඇඟපත වත් කොට, ලොම් හා කලු හම ගලවා දමයි. ගිනිහුලකින් ද ලොම් දවා හරියි. නැවැත බෙල්ල කපා හිස සිරුරෙන් වෙන් කොට ඉන් වැහිරෙන ලේ වළඳකට ගෙණ, සිරුරු මස් කුඩා කැබලිවලට කපා, වළදෙහි වූ ලේ සමග අනා, උයා අඹුදරුවන් පිරිවරා හිඳ කයි. කෑ ඉතිරි කොටස විකුණයි. මොහු මෙලෙසින් පණස්පස් වසක් කුල් ගෙවී ය. මොහු විසූ ගෙය පිහිටියේ වෙළුවනාරාමය අසල ය. මේ දවස බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වාසය කෙරෙති. එහෙත් එක දවසකුදු චුන්දසූකරිකයා බුදුරජුන් වෙත නොගියේ ය. බුදුරජුන් උදෙසා මල් මිටක් පූජා නොකෙළේ ය. බත්කටක් නොදුන්නේ ය. ඔහු කළ අන් පින්කමෙක් ද නැත්තේ ය.

මද කලක් ගිය පසු චුන්දසූකරිකයාගේ සිරුරෙහි ඉවසිය නොහැකි වූ බලගතු රෝගයෙක් හට ගැණිණ. මැරෙන්නට කල් තිබියදී ම, ඔහුට තෙමේ අවීචිමහානරකයෙහි වැටී එහි මහගිනි කඳින් දැවී ගියකු සේ වැටහිණ. අවීචිමහානිරයගින්න යොදුන් සියයකින් ඇත සිට බලන්නහුගේ ඇස් පුපුරුවා හරියි. **"සමන්තා යොජන සතං ඵරිත්වා තිඨති සබ්බදා"** යන මෙයින් ඒ බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක. අවීචිමහානිරයගින්නෙහි බහාලූ මහාකුළුගෙයක් පමණැති මහගලක් බහාලූ ඇසිල්ලකින්

පැසී යයි. ඒ නිරයගින්න එ තරම් බලගතු ය. දළ ය. එහෙත් එහි උපන් සත්ත්වයෝ මවුකුසැ උපන්නවුන් සේ කම්බලයෙන් නොනැසී සිටිති. තමන් නිරා ගින්නෙන් දැවුනෙකැයි වැටහුනු පසු වැදි තෙමේ තමන් කළ කර්මයට අනුරූප ව, වරක් දෙදණින් පෙර දෙරට ත්, වරක් පැසුළු දෙරට ත්, උණුරු හඬ තල තලා ගෙයතුළ ඔබිනොබ හැසිරෙන්නට වන. එවිට ගෙයි වැස්සෝ ඔහු තද කොට අල්වා කට වසති. කර්මවිපාකය වනාහි කිසිවකුට ත් වළකාලන්නට නොහැකි ය. එහෙයින් උණුරු වැද්දාගේ උණුරු හඬ නැඟීම වළකාලන්නට ඔවුහු අසමර්ථ වූහ. ඔහු රෑ දවල එකසේ උණුරු හඬ තල තලා ගෙය තුළ දෙදණින් හැසිරෙයි. අවට ගෙවල වැස්සෝ ද, එ හෙයින් නිදි නොලැබ පෙළෙනෝ ය. ඔවුහු චුන්දසූකරිකයාගේ නෑදෑයන්ට ද ඇණුම් බැණුම් කළහ. එවිට නෑයෝ උණ අල්ලා ගෙය තුළ ම ලා හිර කොට, ඒ මරහඬ ගෙයින් පිටතට නොඇසෙන සේ දෙර ජනෙල් වසා, රෑ දවල දෙක්හි ගෙයින් බැහැර ව සිටිති. උණුරු වැදි තෙමේ සත් දිනක් ගෙය තුළ ම නිරාගින්නෙන් දැවී දැවී මොර දෙමින් සිට, සත්වන දා මැරී ගොස්, අවීචිමහානරකයෙහි උපන. එහි තොර උණුරු මදක් **දෙවදූතසූත්‍රයෙන්** දත හැකි ය.

දිනක් චුන්දසූකරිකයාගේ ගේඅසලින් යන භික්ෂූන් වහන්සේලා ඒ මරහඬ අසා, උණුරකුගේ මොර ගැමකැ' යි යිතා වෙහෙරට ගොස් බුදුරජුන් කරා එළැඹ වැඳ 'ස්වාමීනි! අර ගෙදර වසන චුන්දසූකරිකයා දැන් දින ගණනක සිට ඒ ගේ දෙර වසා උණුරන් මරණබව පෙණේ, එකත් එකට ම ඔහුගේ ගෙදරැ මහුලක් විය යුතු ය, එසේ වුව ද, මෙතෙක් උණුරන් මරන්නා වූ උණට කරුණාවක්, මෛත්‍රියක් නූපන්බවය මහාපුදුමය, මෙබඳු දරුණු නපුරු මිනිහෙක් මෙයට කලින් අප දුක නැතැ' යි කීහ. බුදුරජානන් වහන්සේ 'මේ දවස්වල එහි උණුරන් මැරීමෙක් නැත, චුන්දසූකරිකයා මැරෙන්නට ලඟ ය, මැරෙන්නට කලදී ම තමන් කළ කර්මයට, පාපයට අනුරූප වූ විපාක ඔහු විඳියි, පණ තිබියදී ම, ඔහු අවීචිමහානරක දුක විඳියි, මේ ඒ ය, අවීචිමහානරකයෙහි උපදී' යි වදාළවිට 'ස්වාමීනි! මේ උණුරුවැද්ද මෙලොවදී ත් ශොකයෙන් පෙළී සිට මරණින් පසු ත් ශොක කරණ නැනෙක ම උපදින්නේ නොවේ දැ' යි ඒ භික්ෂූන් වහන්සේලා නැවැත ත් කීහ. 'ඔව්! යහියෙක් හෝ වේවා, පැවිද්දෙක් හෝ වේවා, යමෙක් පව්කම් කෙළේ නම්, ඔහු දෙලොව ම ශොක කෙරේ ය' යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක:-

ඉධ සොචති පෙච්ච සොචති
පාපකාරී උභයත්ථ සොචති,
සෝ සොචති සෝ විහඤ්ඤති
දිස්වා කම්මකිලිට්ඨමත්තනෝ,ති.

පව් කරණ සුලු පුදගල තෙමේ මෙලොවැ ශොක කරයි. පරලොවැ ශොක කරයි. එලොවැ මෙලොවැ යන දෙලොවැ ම ශොක කරයි. ඔහු තමන්ගේ කිලිටි කම්ය දැක ශොක කරයි හෙතෙමේ විශෙෂයෙන් නැසෙයි.

ඉධ සොචති = මෙලොවැ ශොක කරයි.

ශොක කරණ්‍යයේ පච්චම් කරණ තැනැත්තේ ය. ඔහු ජීවත් වන්නේ ම තමන් කළ අකුශලකම්යන්ගේ වශයෙන් 'මා විසින් මෙතෙක් කුසල් නො කොට අකුසල් ම කරණ ලදැ' යි ශොක කරයි. මෙ ලෙසින් හෙතෙමේ සෙසු දවසැ ශොක නො කෙළේ ද, මරණය ලං වූ විට නම්, මොන ලෙසකින් හෝ ශොක කරන්නේ ම ය. ඒ එකාන්ත ම ය. කම්ම-කම්ම නිමිත්ත-ගතිනිමිත්ත වශයෙනි ඒ ශොක කිරීම. මේ තුනෙන් එකක් සවස් වේලෙහි කඳුසෙවනැල්ල පෙර දිගට නතු ව වැටෙන්නා සේ, මරඇදෙහි හෝනා සත්වයා කරා පැමිණ සිටියි. මේ වනාහි මවු පියාදී වූ කිසිවකු විසින් කරණු ලබන්නේ නො වේ. කම්දිහු කම්ානුභාවයෙන් ම එළැඹ සිටිති. සත්වයකු අතැ ඇති කම්යන්ගේ ගණන කියන්නට කිසිවක්හටත් නො පිළිවන. එය ගණන් මග ඉක්ම සිටියේ ය. අනතුරු භවයෙහි පිළිසඳ දීමට නියත වූ ප්‍රතිසන්ධිජනක කම්ය, කම්නිමිත්තාදිය සත්වයා කරා එළවයි. සත්ව තෙමේ උපදවනු ලබන්නේ කම්ය විසිනැ යි දතයුතු ය. සත්වයකු මැරෙණවිට ඔහු ඉදිරියට බොහෝ සෙයින් එන්නේ ඔහු වැඩිවශයෙන් පුරුදු කළ කම්ය යි. යමෙක් ප්‍රාණ වධය ම වැඩිවශයෙන් පුරුදු කෙළේ නම්, ඒ ප්‍රාණවධඅකුශල කම්ය ඔහු මැරෙණවිට ඔහුට පෙණී යයි. ඒ අකුශලකම්ය කිරීමට ඔහුට යමක් උපකරණ වී නම්, දඬු මුගුරු කඩු තෝමර ආදී වූ ඒ ය කම්නිමිත්ත. යමකු විසින් මෙයින් යමක් උපකරණ කොට ගත්නා ලද ද, ඔහු මැරෙණවිට උපකරණ කොට ගත් එය ඔහුට පෙණී යයි. සත්වයකු විසින් කළ අකුශලකම්යන්ගේ වශයෙන්, කම්ය විසින් ම ගතිය ද නියම කොට, මරණාසන්නකාලයෙහි ඔහුට ගතිය ද දක්වනු ලබන්නී ය. නිරාගිනි-නිරයපාල-කාලසුනඛ-වන-ගඩ්ගාදිය ගතිය නියම කිරීම් වශයෙන්, මැරෙණ සත්වයාට පෙණී යන නිමිති ය. මේ නිමිති අකුශලකම් කළ සත්වයාගේ ඉදිරියට එන්නේ ය.

මෙසේ සබ්බ තෙමේ මරණාසන්නකාලයෙහි ලාංවූ මරණය ඇති කල්හි කම්මය ත්, කම්මනිමිත්ත ත්, ගතිනිමිත්ත ත් දැක, මෙලොවැදී ම ශොක කරයි.

පෙච්ච සොචති = පරලොවැ ශොක කරයි.

පෙච්ච' යනු, භවාන්තරවාචකනිපාතයෙකි. එය සප්තමී විභක්ත්‍යන්ත යි. **'පෙච්චාමුත්‍ර භවනන්තරේ'** යනු කොශ යි. ප්‍රාණවධාදී වූ අකුශලකම් කළ සබ්බ තෙමේ දිවි හැර මැරී ගොස්, දුගතියක ඉපිද, එහි විඳින කායික දුඃඛවිපාකයන්ගේ වශයෙන් ශොක කරයි.

පාපකාරී = පවිකරණ සුලු පුදාල තෙමේ.

යමකුගේ සභාවය පවිකම් කිරීම නම්, ඒ **පාපකාරී'** ය. යමක් නො කොට හැරීමෙන් සත්පුරුෂයෝ තමන් රැක ගණිත් නම්, තමන් රැකුමට සත්පුරුෂයන් අත්හළ ඒ ක්‍රියා **පාප'** නම් වේ. අපායයට පමුණුවන ක්‍රියා සියල්ල පාප නමින් ගණිත්.

"පාතෙති රක්ඛතීති සුජනා අත්තානං අසමාති = පාපං, අපායා පාති රක්ඛතීති වා, දුග්ගතිං පාපෙතීති වා = පාපං, පං අපායං පෙති ගච්ඡති එතෙනාති = පාපං' යනු නිරුක්ති කළ සැටියි.

කායකම්-වාක්කම්-මනසකම් යි පාපකම්ය තෙ වැදැරුම් ය. එහි ද කායකම්-මනසකම් තුන් තුන් වැදැරුම් වූයේ, වාක්කම්ය සිවුවැදැරුම් වේ. මූළුල්ල දසයෙකි. මෙ කම්මාරවශයෙනි. ප්‍රාණඝාත-අදින්නාදාන-කාමමිත්‍යාචාර යන මෙ තුන කායවාරයෙන් සිදුවන කායකම් යි.

එහි ජීවිතෙන්ද්‍රියප්‍රතිබද්ධ වූ සඤ්ඤා-ධාතු-ආයතනයන්ගේ එක්වීම ගැලපීම කැවිවීම, සත්ත්ව යි කියනු ලැබේ. ඒ සත්වයාගේ පරමාර්ථ විසින් ජීවිතෙන්ද්‍රියයාගේ විනාශය **කම්මාත්‍රූප** ව හිමින් සිදු වන්නට ඉඩ නො දී යම්කිසි උපක්‍රමයකින් වහා විනාශ කිරීම ය **ප්‍රාණඝාත'** නම්. මෙන්න එය අටුවාව කී සැටි:- **"පාණාතිපාතොති ඝනිච්චං පතිතුං අදත්වා පාණස්ස අතීව-පාතනාති'** යි.

කායද්වාර-වාග්ද්වාර යන ද්වාර දෙකින් ප්‍රධාන වශයෙන් කායද්වාරයෙහි පැවැති වධකචෙතනාව ප්‍රාණඝාත නම් වේ. කයින් අදහස් හැඟවීම වචනයෙන් අදහස් හැඟවීම සිතින් අදහස් හැඟවීම යන මෙතුන කායකම්දින්ගේ නිකුත් වීමට දොරටු වන බැවින් ද්වාර නම් වේ.

ප්‍රාණඝාතඅකුශලයට අඞ්ග පසක් ලැබිය යුතු ය. ප්‍රාණියකු බව-ප්‍රාණියකුබවදැනීම-පණනැසීමෙහි සිත-එහිලා යොදන උපක්‍රම-ඉන් මැරීම යන මේ ය ඒ පස. මොවුන් අතරෙහි යම්කිසි අඞ්ගයෙක් නො ලැබ ගියේ නම්, ප්‍රාණඝාතය, අකුශලකර්මභාවයට නො පැමිණේ.

ප්‍රාණියකුබව නම්, ජීවිතෙන්ද්‍රියප්‍රතිබද්ධ වූ දිවි ඇති යම්කිසි සතකු වීම ය. සතකු මැරීමට ඉදිරිපත් වූවහු විසින් මොහු දිවි ඇති එකෙකැ යි හොඳින් දැනීම ප්‍රාණියකුබව දැනීම නම්. උඳ මොනලෙසකින් හෝ මැරීමට සිතීමය පණනැසීමෙහි සිත නම්. උපක්‍රම නම්, මැරීම පිණිස කරණු ලබන ප්‍රයොගය යි. ප්‍රයොගය සවැදැරුම් ය. **සාහත්‍ථික-ආණත්තික-නිස්සග්ගික-ථාවර-විජ්ජාමය-ඉද්ධිමය** යි. අත් පා ආදී වූ සිරුර පිළිබඳ අවයවයකින් නැත, දඬුමුගුරු ආ යමකින් පහරදීම සාහත්‍ථික' නම්. මෙසේ ඇණ කොටා මරන්නැ යි අනුනට කරණ නියොගය ආණත්තික' නම්. ඈත්හි සිටියකු මරන්නට දඬුමුගුරු ආ යමකින් කරණ ප්‍රයොගය නිස්සග්ගික' නම්. මරන්නට උගුල්ඇටවීම්, බොරු වළ කැණීම්, උල් සිටුවීම්, වැවිපොකුණුවල විස යෙදීම්, ආ විසින් කරණ ප්‍රයොගය ථාවර' නම්. මන්ත්‍ර ජප කිරීම් ආ විසින් කරණ ප්‍රයොගය විජ්ජාමය' නම්. සෘඞ්බලයෙන් කරණ ප්‍රයොගය ඉඞ්ධිමය' නම්.

මෙහි, සාහත්‍ථිකය, **උද්දිස්ස - අනොද්දිස්ස** විසින් දෙවැදැරුම් ය. 'අසුවලා මරව' යි කරණ ලද නියමයෙහි සිට අත් පා දඬු මුගුරු ආ යමකින්, ඒ නියම කරණ ලද සත්වයා නැසීමට මැරීමට කරණ ලද ප්‍රයොගය උද්දිස්සසාහත්‍ථික' නම්. අත්පා දඬුමුගුරු ආදී වූ යමකින්, නියම කරණලද සත්වයා ගැණ නො සලකා නියම නො කරණලද අන් සතකු දිවි ගලවන්නට කරණ ප්‍රයොගය අනොද්දිස්සසාහත්‍ථික' නම්. මරන්නට කරණලද ප්‍රයොගයකින්, එකෙණෙහි මළ ද, කලක් ගොස් මළ ද ප්‍රයොග කලාවූ ඇයිල්ලෙහි ම ප්‍රාණඝාතඅකුශලය සිදු වේ.

ආණත්තිකය, **වත්‍ථු - කාල - දෙශ - ශස්ත්‍ර - ඊර්යාපථ - ක්‍රියා - විශෙෂ** විසින් ස වැදැරුම් ය. අණකිරීමෙන් මරන්නට ලක් කරණ සත්වයා වත්‍ථු. 'අසුවල් වේලෙහි මරව' යි නියමිත පෙරවරු-පස්වරු කාලාදියය කාල. අසුවල් නුවර දී, ගම දී තැනේ දී මරව යි නියම් කරණ ලද නුවර ගම් පෙදෙස් ආ ය දෙශ. අසුවල් ආයුධයෙන් ගසා ඇණ මරව යි දැක් වූ ආයුධාදිය ය ශස්ත්‍ර. ඒ ප්‍රාණීස ම දැක් වූ ඉදුම් හිටුම් ආදී වූ ඉරියවු ය ඊර්යාපථ. මේ එකකු ත් වරදවා කළ ප්‍රාණඝාතයට, අණකළ තැනැත්තේ නො බැඳෙන්නේ ය.

මද වූ වෑයමකින්, සිරුර පමණින් කුඩා වූ සත්වයකු නැසීමෙන් වන අකුශලය අල්පසාවද්‍ය ය. මහත් වූ වෑයමකින්, යිරුර පමණින් මහත් වූ සත්වයකු නැසීම මහාසාවද්‍ය ය. සත්වයාගේ ප්‍රමාණය අනුව මැරීමට කරණ උපක්‍රමය උස් පහත් වේ. මහත් වූ උපක්‍රමයකින්, මහත් වූ තිරිසන් සතකු මැරීමෙන් වන අකුශලයට වඩා, පව්කම් කරණ සුලු පව්කම්හි යෙදුනු මිනිසකු මැරීම මහාසාවද්‍ය ය. ගුණහීන මිනිසකු මැරීමෙන් වන අකුශලයට වඩා ගුණවත් වූ මිනිසකු මැරීම මහාසාවද්‍ය ය. මැනැවින් පන්සිල් රකින්නකු මැරීමට වඩා, අටසිල් රකින්නකු මැරීම මහාසාවද්‍ය ය. අටසිල් රකින්නකු මැරීමට වඩා දසසිල් රකින්නකු මැරීම මහාසාවද්‍ය ය. මෙසේ මිනිසුන් අතර ගුණයන්ගේ උස්මිටිකම් අනුව, මේ අකුශලකර්මයාගේ අල්පසාවද්‍ය-මහාසාවද්‍යභාවය දතයුතු ය.

ප්‍රාණඝාතඅකුශලය සතර අපායයෙහි දුක්විඳීමට හේතු වේ ප්‍රාණඝාතඅකුශලය ප්‍රාණඝාතය කළහු අපායයෙහි උපදවා දුක් දෙයි. සතර අපායයෙහි වැටුනු ඔහු, පෙර දවසැ කොට තුබූ යම්කිසි පිණකින්, ඉන් ගැලවී ගොස් මිනිස්බවට ආයේ, මද වූ ආයු ඇත්තෙක්, විරූපයෙක්, වැරුණු සිරුරු ඇත්තෙක්, බෙල්හිනයෙක්, සිත් නොගත් දුකුම් ඇත්තෙක්, බිම් නොවදනා වක් වූ පාතල ඇත්තෙක් වන්නේ ය. මේ හැමට වඩා ප්‍රාණඝාතී පුද්ගලයා සතර අපායයෙහි ඉපිද විඳුනා දුක ම ඉතාබහිසුණු ය. ඉතාදුඩි ය. ඉතාමහත් ය. මෙන්න බුදුරජානන් වහන්සේ වදාළ සැටි ඒ ගියල්ල පිඩු කොට:—

"පාණාතිපාතො භික්ඛවෙ! ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති, තිරච්ඡානයොනිසංවත්තනිකො හොති, පෙතනිච්සයසංවත්තනිකො හොති, යො සබ්බලහු, සො පාණාතිපාතස්ස විපාකො, මනුස්සභූතස්ස අප්පායුකසංවත්තනිකො හොතීති' යි.

ලොභ-දෙස-මොහ යන මොවුන් මුල්වීමෙන් මේ අකුශල කර්මය සිදු වේ. මස් කන්නට, මස් විකොට ජීවිකා කරන්නට සිටු මුදල් උපයන්නටැ යි සතුන් මරන්නාහට ලොභය මුල් කොට ද, මූ මට විපතක් කළැ යි සතුන් මරන්නාහට දෙසය මුල් කොට ද, 'සතුන් මරා දන් දීමෙනි, යාග කිරීමෙහි වරද නැතැ' යි සතුන් මරන්නාහට මොහය මුල් කොට ද මෙය සිදුවන්නේ ය. **"තෙසු පාණාතිපාතො දෙසමූලෙන ජායති'** යන ආචාර්‍යවචනයෙන් පෙණෙනුයේ මේ අකුශලකර්මය දොසය මුල් කොට සිදුවන බවය. ප්‍රධාන ඒ ය. එහෙයිනි එසේ කීයේ. ලොභය හා මොහය ද මෙයට මුල් ය. **මතඤහතත-ධොනසාඛඤ්ඤ** බැලිය යුතුය.

'දිවි ඇත්තෙක් නො වේ' යි සිතැත්තාහට, දිවි ඇත්තකුබව නො දන්නාහට, 'මරම්' යි සිත් නැත්තාහට, උම්මත්තකාදීන්ට මේ සිදු නො වේ.

වස්තුහිමියා විසින් කයින් හෝ වචනයෙන් නො දුන්, වස්තු හිමියා විසින් රක්නාලද දෙය අදින්න නම්. **"අදින්නං නාම යං අනිස්සඨං අපරිච්චත්තං රක්ඛිතං ගොපිතං මමායිතං පර-පරිග්ගහිතං එතං අදින්නං නාම"** යන ආප්ත වචනයෙන් එය පැහැදිලි වේ. ඒ අනුන් සතුදෙයගැණීම. **අදින්නාදාන'** නැමැයි කොටින් දැන ගතයුතු ය. යම් වස්තුවක් අනුන් අයත් ය යි දැන දැන ඒ ගන්නා පිණිස යෙදූ උපක්‍රමයන්ගෙන් හටගැණුනු කාය-වාග්ද්වාර දෙකින් එක්තරා ද්වාරයක පැවැති සොරසිත අදින්නාදානැ' යි කියනලද ය.

අදින්නාදානඅකුශලකර්මය වනාහි අඞ්ග පසක් එකතු වූ තැනය සිදු වන්නේ. මෙන්න ඒ පස. අනුන් අයත්බව-එබවදැනීම-නො කියා, නො විචාරා ගණිමි යන සිත-ගන්නට කරණ උපක්‍රම එයින් ගැණීම මෙයින් එකක් වත් නො ලැබ ගියේ නම්, අදින්නා දානඅකුශලකර්මයෙක් එහි නැත. අදින්නාදානඅකුශලකර්මයට මේ පසඟ ම ලැබිය යුතු ය. අදින්නාදානය වන්නේ, **ථෙය්‍යාවහාර-පසය්‍හාවහාර-පටිච්ඡන්නාවහාර-පරිකප්පාවහාර-කුසාවහාර** යන මේ පස් ලෙසින් එක් ලෙසකින් ගැණීමෙනි. එහි ථෙය්‍යාවහාර නම්, නුදුන් දෙය වංචාවෙන් ගැණීම ය. පසය්‍හාවහාර නම්, බලාත්කාරයෙන් ගැණීම ය. පටිච්ඡන්නාවහාර නම්, සඟවා ගැණීම ය. පරිකප්පාවහාර නම්, කල්පනාවශයෙන් නියම කොට ගැණීම ය. කුසාවහාර නම්, කුසපත් සලකුණු පමුණුවා ගැණීම ය.

පවිටු මිනිසකු අයත් වූ වස්තුවක් සොරකම්කිරීමෙන් වන අකුශලය අල්පසාවද්‍ය වේ. ගුණවත් මිනිසකුට අයත් වූ වස්තුවක් සොරකම්කිරීමේ දී මහාසාවද්‍ය වේ. ගුණයන්ගේ උස්මිටිකම් අනු ව අල්පසාවද්‍ය-මහාසාවද්‍යභාවය වන්නේ ය.

අදින්නාදානඅකුශලය, සතර අපායයෙහි දුක් විඳීමට හෙතු වේ අදින්නාදානඅකුශලය අදින්නාදානය කළහු, (සොරකම් කළහු) සතර අපායයෙහි උපදවා දුක් දෙයි. සතර අපායයෙහි වැටුනු ඔහු, යම්කිසි පිණකින්, ඉන් ගැල වී ගොස් මිනිස්බවට ආයේ දීනයෙක්, දිළින්දෙක්, නො මනා දැකුම් ඇත්තෙක් වන්නේ ය. මේ හැමට වඩා අදින්නාදායීපුද්ගලයා සතර අපායයෙහි විඳුනා දුක ම ඉතාබිහිසුණු ය. ඉතාදැඩි ය. ඉතාමහත් ය. මේ එය බුදුරජානන් වහන්සේ සියල්ල පිඩු කොට වදාළ සැටි:—

"අදිත්තාදානං භික්ඛවෙ! ආසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං හොති, තිරච්ඡානයොනිසංවත්තනිකං හොති, පෙතතිවිසයසංවත්තනිකං හොති, යො සබ්බ ලහු, සො අදිත්තාදානස්ස විපාකො, මනුස්සභූතස්ස මනුස්සදෙ, භග්ගියසංවත්තනිකං හොතීති" යි.

ලොභ-දෙස-මොහ යන මෙ තුන, මෙයට මුල් වේ. 'තමන් හා අඹුදරුවන් රකිමි' යි සිතා, අනුන් අයත් නො දුන් දෙය, සොරසිතින් පැහැර ගන්නහුට, ලොභය මුල් කොට ද, නවාඝාත වස්තූන්ගේ වශයෙන් ක්‍රොධය උපදවා, අන්සතුදෙය පැහැර ගන්නහුට, දෙසය මුල් කොට ද, 'දුෂ්ට නිග්‍රහ කරමි' යි ගෙණ, අන්සතුදෙය පැහැර ගන්නහුට, මොහය මුල් කොට ද සිදුවන් නේ ය. තුන්වන, පස්වන **සීලවිම සනත්තක** බැලිය යුතුය.

කෙලෙශකාම විසින් කායද්වාරයාගේ ලාමක වූ නින්දිත වූ හැසිරීමෙන් සිදුවන අකුශලකර්මය **කාමමිත්‍යාචාර'** නම්. මෙවුන් දම් සෙවුමේ අදහසින්, කායද්වාරයෙහි හට ගැණුනු නො යා යුතු වූ ස්ථාන ව්‍යතික්‍රමණවෙතනාව කාමමිත්‍යාචාරා' යි කියන ලදි.

"කාමෙසු මිච්ඡාචාරොති එත්ථ පන කාමෙසුති මෙථුන-සමාචාරෙසු මිච්ඡාචාරොති එකන්තනින්දිතො ලාමකාචාරො, ලක්ඛණතො පන අසද්ධම්මාධිප්පායෙන කායචාරප්පවත්තා අගමනීයට්ඨානවීතික්කමවෙතනා කාමෙසු මිච්ඡාචාරො" යන මෙයින් කීයේ ඒ ය. ලොකසම්මතනීතියෙන් අඹුසැමිබවට නො ගිය සත්‍රී-පුරුෂයන්ගේ මගින් මග සෙවුමෙන් කරණ කාමසෙව-නය මේ. එය තිරිසනුන්ගේ කාමසෙවනයට ද වඩා නින්දිත ය. ලාමක ය. වැරදිසහිත ය. සතරඅපායදුකට හිත ය. කාලකණ්ණි කමට හෙතු ය. දරුපවුල්දිවිය බිඳවැටීමට හෙතු ය.

කාමමිත්‍යාචාරඅකුශලකර්මය, සිවු අඟක් එකතු වූ තැනය සිදු වන්නේ. නො සෙවියයුතු සත්‍රී - පුරුෂයන් අතුරෙන් එකකු වීම-මෙවුන්දම්සෙවුමෙහි පැවැති සිත-ඒ පිණිස කරණ උපක්‍රම-මගින් මගසෙවුම ඉවසීම යන මේ ය ඒ සිව් අඟ. මින් එකකු ත් නො ලැබුනුකල්හි අකුශලකර්මයෙක් සිදු නො වේ.

මොවුහු ය නො පැමිණිය යුතු ගැණු. අන් සතු ගැණු. ඇලා විසිදෙනෙකි. **මාතුරක්ඛිතා - පිතුරක්ඛිතා - මාතුපිතුරක්ඛිතා-භාතුරක්ඛිතා-භගිනිරක්ඛිතා-ඤාතිරක්ඛිතා-ගොත්තරක්ඛිතා - ධම්මරක්ඛිතා-සාරක්ඛා-සපරිදණ්ඩා-ධනක්කීතා - ඡන්දවාසිනී-භොගවාසිනී - පටවාසිනී - ඔදපත්තිනී - ඔහතවුම්බවා - දාසිච භරියා-කම්මකරිච භරියා-ධජාහටා- මුහුත්තිකා.**

මෑලා අතර, මුල සිට පිළිවෙළින් මාතුරක්ඛිතාදී වූ අට දෙනා සමග, ආරක්ෂකයන්ගේ නියමයෙන්, කැමැත්තෙන් වූ කම්සෙවුමෙහි යෙදුනහුට කාමමිත්‍යාචාරඅකුශලය සිදු නො වේ. නියමයක්, ඉල්ලීමක් කැමැත්තක් නො ලබා කම්සෙවුම් කළෝ වරදෙහි බැඳෙති. අන් දෙළොස් ගෑණුන් හා මෙවුන්දම්සෙවුමෙහි යෙදුන වුන්ට යටැ කියූ අඞ්ගයන්ගේ ලැබීමක් ඇතිකල්හි අකුශලකර්මය සිදු වේ.

ගුණහීනයන් හා මෙවුන්දම්සෙවුමෙහි ලා නැගෙන පාපය අල්පසාවද්‍ය ය. ගුණසම්පන්නයන් හා මෙවුන්දම්සෙවුමෙහි නැගෙන පාපය මහාසාවද්‍ය ය. ඒ ඒ ගෑණු පිරිමින්ගේ ගුණ පිළිබඳ උස් මිටිකම් අනු ව අල්පසාවද්‍ය-මහාසාවද්‍යභාවය වන්නේ ය.

කාමමිත්‍යාචාරඅකුශලය, සතර අපායයෙහි දුකට හෙතු ය. කාමමිත්‍යාචාරඅකුශලය, ඒ කළ තැනැත්තහු, සතර අපායයෙහි ගල්වා, දුක් දෙයි. සතර අපායයෙහි ගැලුනු ඔහු, යම්කිසි පිණකින් මිනිස්බවට ආයේ නම්, සතුරන් ඇත්තෙක්, නො මනා අප්‍රිය වූ දැකුම් ඇත්තෙක්, නපුංසකයෙක්, පණ්ඩකයෙක් වන්නේ ය. මේ හැමට වඩා, ඔහු විඳුනා අපාය දුක ම ඉතාබිහිසුණු ය. ඉතා දැඩි ය. ඉතාමහත් ය. ඉතානපුරු ය. වදාළෝ ය, බුදුරජනන් වහන්සේ එය කොටින් මෙසේ:-

"කාමෙසු මිච්ඡාචාරො භික්ඛවෙ! ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති, තිරච්ඡානයොනිසංවත්තනිකො හොති, පෙත්තිවිසයසංවත්තනිකො හොති, යො සබ්බ ලහු, සො කාමෙසු මිච්ඡාචාරස්ස විපාකො, මනුස්ස භූතස්ස සපත්තවෙරසංවත්තනිකො හොතීති" යි.

මේ අකුසලයට මුල් වන්නේ ලොභ-දෙස-මොහ යන මෙ තුන ය. සිරුරුපැහැයෙහි ආලය බැඳීම උපදවා, රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ඨ්‍ය යන පස්කම්හි ආශාව උපදවා, 'මොවුන් හා මෙවුන්දම් සෙවුමෙන් ලාභ-කීර්ති-ප්‍රශංසා ලැබේ ය' යි සිතා මෙවුන්දම් සෙවුම්හි යෙදෙන්නහුට, ලොභය මුල් කොට ද, යටැ කියූ මාතුරක්ඛිතාදී වූ ගෑණුන් කෙරෙහි, ඔවුන් රක්නා මවුපිය ස්වාමිපුරුෂයන් කෙරෙහි වෛර උපදවා, 'උන්ගේ මානය නසමි' යි ගෙණ යෙදෙන්නහුට, දෙසය මුල් කොට ද, 'මේ ගෑණුන් අතර, මේ ගෑණිය හා මෙවුන්දම්සෙවුමෙන් වරදෙක් නො වේ ය' යි ගෙණ එහි යෙදෙන්නහුට මොහය මුල් කොට ද සිදු වන්නේ ය. **ලොහකුම්භි-මහානාරදජාතක** බැලිය යුතු ය.

සුරාපානඅකුශලය, දශ අකුශලකර්මපථයට අතිශය උපකාර නු යි සහාග වියින් කාමමිථ්‍යාචාරයෙහිලා ගැණේ. **පිඤ-පුව-ඔදනිය - කිණ්ණපක්කිත්ත - සමභාරසංයුත්තසුරා'** යි සුරාවගී පසෙකි. **පුප්ඵ-ඵල-ගුළ-මධු-සමභාරසංයුත්තාසව,** යි මෙරයවගී පසෙකි. මේ හැම එකක් ම සත්වයාගේ මත්වීමට හා ප්‍රමාදයට කරුණු බැවින් **මජ්ජපමාදට්ඨානා'** යි කියනු ලැබේ. මිනිසුන්ගේ මත්වීමට හා ප්‍රමාදයට කරුණු වූ ඒ මේ සුරාවක් හෝ මෙරයක් බොනු කැමැති සිතින් ගෙණ බීම **සුරාමෙරයපානා'** නම් වේ.

සුරාපානඅකුශලය සිදු වන්නේ, සිවු අහක් එකතු වූ තැන ය. මේ ය ඒ සිවු අඟ. රහමෙරක්ඛව-බොනුකැමැති සිත-බීමෙහි උත්සාහය-උගුරෙන් යටැ හුනුබව. මොවුනතුරෙන් එකෙකුදු නො ලැබුනේ ද, එකල මේ අකුශලකර්මය සම්පූර්ණබවට නො යයි.

කායවිකාරයකට නො පැමිණෙන පරිදි රහමෙරපානය කිරීම අල්පසාවද්‍ය ය. කායවිකාරයකට පැමිණෙන්නට තරම් වන සේ බීම මහාසාවද්‍ය ය.

සුරාපානඅකුශලය සතර අපායයෙහි දුකට හෙතු ය. සුරා පානඅකුශල ය, සුරාපානය කළහු, සතර අපායයෙහි ගල්වා දුක් දෙයි. එහි ගැලී දුක් විඳින ඔහු, යම් පිණකින් මිනිස්බවට ආයේ නම්, ඉතිරි ව තුබූ සුවල්ප වූ ද සුරාපානඅකුශලයෙන් සිහි විකලවූවෙක්, නුවණ නැත්තෙක් තැනි ගත්තෙක්, ගොළුවෙක්, බිහිරෙක්, කිපෙන්නෙක්, ලජ්ජාභය නැත්තෙක්, කටයුතු නො කටයුතු නො දන්නෙක්, දීනයෙක්, දිළින්දෙක්, නිතර දෙඩවන් නෙක්, නො මනා දැකුම් ඇත්තෙක් යිත් නො ගත්තෙක් වන් නේ ය. මේ හැමට වඩා ඔහු අපායයෙහි විඳුනා දුක ම ඉතා බිහිසුණු ය. ඉතාදුඃඛී ය. ඉතාමහත් ය. මෙය වදාලෝ බුදුරජාණන් වහන්සේ ඵදුක් කොටි කොට මෙසේ:-

"සුරාමෙරයපානං භික්ඛවෙ! ආසෙවිතං භාවිතං බහුලී කතං නිරයසංවත්තනිකං හොති, පෙතවිසයසංවත්තනිකං හොති, යො සබ්බලහු, සො සුරාමෙරයපානස්ස විපාකො, මනුස්සභූතස්ස උම්මාදසංවත්තනිකො හොති නි" යි.

ලොභ-දෙස-මොහ යන මේ තුන, මෙයට මුල් වේ. රසයෙහි බැඳී බොන්නහුට, ලොභය මුල් කොට ද, අනුනට පහර දෙන්නට සිතා බොන්නහුට, දෙසය මුල් කොට ද, 'රුඹේමෙහි වරද නැතැ' යි සිතා බොන්නහුට මොහය මුල් කොට ද, මේ අකුශල කර්මය සිදු වේ. **කුම්භ-භද්‍රඝට ජාතක** බැලිය යුතුය.

මුසාවාදය - පිසුණවචනය-ඵරුසවචනය-සම්ඵප්පලාපය යන සතර, වාග්වාරයෙන් සිදුවන වාක්කර්ම යි. එහි අසත්‍ය ය, සත්‍ය ය ලෙයින් අනුනට කියා පෑම **මුසාවාද'** නම්. අසත්‍ය ය, සත්‍ය ලෙයින් කියනු කැමැත්තහුගේ කාය වාග්වාර දෙක්හි විඳුප්ති පහළ කරන්නා වූ චෙතනාව ය, මුසාවාද. **"මුසාවාදෙති විසංවාදනපුරෙක්ඛාරස්ස අත්ථභඤ්ජනස්ස වචීපයොගෝ කායප්පයොගෝ වා විසංවාදනාධිප්පායෙන පන පරවිසංවාදක කාය වචීපයොගසමුට්ඨාපිකා චෙතනා මුසාවාදෙ"** යන මෙය එය පැහැදිලි කරයි. කළ දෙය නො කෙළෙමි, නො කළ දෙය කෙළෙමි, දුටු දෙය නො දුටිමි, නො දුටු දෙය දුටිමි, යන ආදී ලෙයින් ඇත්ත නැත්ත දැන දැන කීමෙහි, අඞ්ගයන්ගේ ද ලැබීමෙන්, මුසාවාදඅකුසලය සිදු වේ.

බොරුබව-දැනිතැතැ වසා සඟවා කියමි යන සිත- ඒ පිණිස වූ උපක්‍රම-එයින් දැනීම යන මේ ය එහි අඞ්ග. මොවුනැතුරෙන් එකකුත් පිරිහුනු කල්හි මෙය අකුශලකර්මභාවයට නො යන්නේ ය.

බොරුවෙන් වන අවැඩ, නපුර, ලොකය හා විපාකය අනින් සැලප වූ කල්හි මුසාවාදඅකුසලය අල්පසාවද්‍ය ය. මහත් වූ කල්හි මහාසාවද්‍ය ය.

මුසාවාදඅකුසලය සතර අපායයෙහි දුකට හෙතු ය. මුසාවාද අකුසලය, එයින් බැඳුනහු, සතර් අපායයෙහි ගල්වා දුක් දෙයි. ඔහු යම්කිසි පිණකින් මිනිස්බවට ආයේ නම්, ඉතිරි ව තුබූ කුඩා අකුශලයෙන් නොයෙක් ඇණුම් බැණුම්වලට ලක් වන්නෙක්, නුවණ නැත්තෙක්, නො මනා දැකුම් ඇත්තෙක්, දිව නැත්තෙක්, කට දුගඳ හමන්නෙක් වන්නේ ය. මේ හැමට ම වඩා අපායදුක ම ඉතාබිහිසුණු ය. ඉතාදුඃඛ ය. ඉතා මහත් ය. මෙය වදලෝ බුදුරජානන් වහන්සේ මෙසේ කොවුන්:

"මුසාවාදෙ භික්ඛවෙ! ආසෙවිතෝ භාවිතෝ බහුලීකතෝ නිරයසංවත්තනිකෝ හොති, තිරච්ඡානයොනිසංවත්තනිකෝ හොති, පෙත්තිවිසයසංවත්තනිකෝ හොති, යෝ සබ්බලහු, සෝ මුසාවාදස්ස විපාකෝ' මනුස්සභූතස්ස අභූතබ්භක්ඛානසංවත්තනිකෝ හොතීති" යි.

ලොභ දෙස-මොහ යන මේ තුන මෙයට මුල් වේ. ජීවත් වීමට, අල්ලස්ගැණීම් ආදිය සඳහා බොරු කියන්නහුට ලොභය මුල් කොට ද, 'අනුන් නසමි' යි සිතා බොරු කියන්නහුට දෙසය මුල් කොට ද, දහමට එක් කොට, මෙවුන්දම් සෙවුමට බොරුකීම වරද නැකැයි සිතා බොරු කියන්නහුට මොහය මුල් කොට ද මෙය සිදු වේ. **චෙතිය-තක්කාරජාතක** බලනු.

යමක්හුගේ යම් කිසි බසක් ඇසීමෙන්, ඇසුවහුගේ සිත්හි, අන්හු කෙරෙහි පැවැති ප්‍රියමනාපභාවය පිස දැමීයේ ද, නැසීයේ ද, ඒ ප්‍රියමනාපභාවය නැසී යෑමට හෙතු වූ වචනය **පිසුණවාචා'** නම්. තතු ඉසින් උනුන් අතර වූ සමගිය බිඳ හරින්නට කැමැත්තෙන් හෝ, තමන්ට ප්‍රියයකු කරවා ගණු කැමැත්තෙන් හෝ, උනුන් බිඳුවන වාග්විඥප්තිය උපදවන චෙතනාව ය, පිසුණවචන' නම්. **"යාය වාචාය යස්ස තං වාචං භාසති තස්ස හදයෙ අත්තනෝ පියභාවං පරස්ස ච සුඤ්ඤභාවං කරොති සා පිසුණවාචා"** යන මෙය එය පැහැදිලි කරයි.

පිසුණබස් කියා පෑමෙන් බිදියයුතු යම්කිසි කෙනකු ලැබීම – 'මා කියන වචනය අසා, බිඳෙත්වා' යි සිතීම–එයට සුදුසු වෑයම–එයරුත් දැනීම යන මේ ය එහි අඞ්ග. මේ සිවු අඟින් එකෙකු ත් නො ලැබ ගියේ නම්, අකුශලකර්මය සම්පූර්ණ නො වේ. විනය පාළියෙහි මේ පිණිස අඞ්ග තුනක් ලැබිය යුතු ය යි කීහ. භික්ෂු නමක්හුගේ පිසුණබසක් අන්‍ය භික්ෂුනමක් වෙත ගෙණ යෑම–ප්‍රියකම්‍යතාදීන් අතුරෙන්, එක්තරා අද්හසක් ඉදිරිපත්වීම – කියන වචනය ඒ සැටියෙන් පිළිගැණුම යන මේ ය ඒ.

කේලාම්බස් අසා, හෙද වන්නෝ ගුණහීනයෝ නම්, මොවුන්ගේ හෙදයෙන් වන කර්මය අල්පසාවද්‍ය ය. ගුණසම්පන්නයෝ නම් මහාසාවද්‍ය ය. හෙද වන්නන්ගේ උස්කම් මිටිකම් අනු ව ද එහිලා යොදන උපක්‍රමයන්ගේ උස්කම් මිටිකම් අනු ව ද මේ වන්නේ ය.

පිසුණවාචා නම්, අකුශලකර්මය සතර අපායයෙහි දුකට හෙතු ය. පිසුණවචනයෙන් බැඳුනේ අපායයෙහ් උපදී. කල් ගෙවා නමුත් යම් කිසි පිණකින් ඉන් ගැල වී ගොස් මිනිස් බවට ආයේ, ගෙවා ඉනිරි ව තුබූ ඒ මද වූ අකුශලයෙන්, එක්ලැ මිත්‍රද්‍රොහියෙක්, නො මනා දුකුම් ඇත්තෙක්, සමාජයට අප්‍රිය යෙක් වන්නේ ය. බුදුරජානන් වහන්සේ ඒ සියල්ල කෙටි කොට, මෙසේ වදාළ සේක:–

"පිසුණවාචා භික්ඛවෙ! ආසෙවිතා භාවිතා බහුලීකතා නිරයසංවත්තනිකා හොති, තිරච්ඡානයොනිසංවත්තනිකා හොති, පෙතත්විසයසංවත්තනිකා හොති, යො සබ්බලහු, සො පිසුණාය වාචාය විපාකො, මනුස්සභූතස්ස මිත්තෙහි භෙදන සංවත්තනිකො හොතීති" යි.

ලොභ–දෙස–මොහ යන මේ තුන, මෙයට මූල් වේ. ලාභ උපදවන්නට සිතා, උනුන් භෙද කරන්නට පිසුණවචන කියන්න

හුට, ලොභය මුල් කොට ද, උනුන් කෙරෙහි කිපී උනුන් හෙද කරන්නට කියන කලැ දෙසය මුල් කොට ද, කේලාම් කීමෙන් වරදෙක් නො වේ ය යි සිතා කියන කලැ මොහය මුල් කොට ද සිදු වේ. **වණ්ණාරොහ-සඤ්ඤාභෙද ජාතක** බලනු.

යම්කිසි ඛසෙක් තමන්ගේ හා අනුන්ගේ සිත රළු කරන්නට සමත් වේ ද, තමන්ට හා අනුන්ට සැප පිණිස නො වේ ද, එබස් **පරුෂවචන'** නම්. නියම අරුත් විසින් අනුන්ගේ මම් සිදින්-නා වූ රළුබස් කීමෙහි උත්සාහයෙන් උපන් චෙතනාව, පරුෂ වචන' නම් වේ. **"යාය පන අත්තානම්පි පරම්පි එරුසං කරොති, යා වාචා සයම්පි එරුසා හොව කණ්ණසුඛා න හදයසුඛා වා, පරස්ස මම්මච්ඡෙදකකායවචීපයොගසමුට්ඨාපිකා එකන්ත එරුසචෙතනා එරුසවාචා"** යන මෙය එය පැහැදිලි කරයි.

ආක්‍රොශ කටයුතු එකකු ලැබීම – ආක්‍රොශකිරීමෙහි යිත – ආක්‍රොශ කිරීම යන මෙ තුන ය එහි අඞ්ග. මින් එකෙකුත් අඩුව ගියේ නම්, එ කල්හි අකුශලකම්ය සම්පූර්ණ නො වේ. මෙයට විනයෙහි **ඔමසවාද'** යි ද, අඞ්ග සතරෙක් ලැබිය යුතුය යි ද කීහ. ආක්‍රොශ කරන්නා උපසපන් එකකුවීම–අනෙකකු නො දක්වා, ඔහුට ම ආක්‍රොශකිරීම – ආක්‍රොශය මා පිළිබඳ යි දැනීම – අරුත් පෙරටු කොට, අනුශාසනා කිරීම යන මේ එහි කියූ අඞ්ග යි.

පරුෂවචනය මදගුණැත්තකු කෙරෙහි වේ නම්, එකලැ එම අකුශලය අල්පසාවද්‍ය ය. මහාගුණැත්තකු කෙරෙහි වේ නම්, එකලැ මහාසාවද්‍ය ය.

පරුෂවචනඅකුශලය සතර අපායයෙහි දුකට හෙතු ය. පරුෂ වචනඅකුශලය, පරුෂවචන කීවහු සතර අපායයෙහි උපදවයි. ඉන් මිදී මිනිස් බවට ආකල්හි මිහිරි තෙපුල් නො අසන්නෙක් ගිය ගිය තැනැ රළුබස් අසන්නෙක්, නො මිහිරි කටහඬ ඇත්-තෙක් වන්නේ ය. මේ හැමට වඩා සතර අපායයෙහි දුක ම ඉතාබිහිසුණු ය. ඉතාදුඃඛී ය. ඉතාමහත් ය. ඉතානපුරු ය.

ජාත්‍යාදියෙන් ගටා බිණු කල්හි යම් කිසිවක් ලැබිය හැකි ය යි සිතා ලාභාශාවෙන් පරුෂවචන කියන්නාහට, ලොභය මුල් කොට ද, උපන්නා වූ වෛරයක් ඇසුරු කොට හෝ අන්‍යයා පිළිබඳ ලාභසත්කාර නො ඉවසීමෙන් හෝ, කියන්නාහට, දෙසය මුල් කොට ද, තමනට වඩා පහතින් සිටි දැසි-දැසාදීන්ට, තෝ-තා-අරු-මු යන ආදී ලෙසින් රළුබස් කීමෙන් අවැඩෙක් නැතැයි සිතා කියන්නහුට, මොහය මුල් කොට ද මේ අකුශලකම්ය සිදු වේ. **නන්දිවිසාල-සුජාතජාතක**. බලනු.

තමන්ගේ හා මෙරමාගේ දෙලොවැ දියුණුව නසන වචන කීම, **සම්ඵප්පලාප**' නම්. නියම අරුත් ලෙසින්, සීතාහරණ-භාරතයුබාදිඅශ්ලීශුන්‍යකථාකිරීමෙහි කාය-වාග්විඥප්ති උපදවන සකිලිට්ඨ චෙතනාව ය සම්ඵප්පලාප. **"අනත්ථසංහිතා කායවචීපයොගසමුට්ඨාපිකා අකුසලචෙතනා සම්ඵප්පලාපො"** යනා මෙය එය පැහැදිලි කරයි.

සීතාහරණ-භාරතයුබාදිඅශ්ලීශුන්‍යකථා පෙරටු කොට් ඇති බව-එබඳු කතාකීම යන මේ ය එහි අඞ්ග. මේ දෙයගින් එකෙකුත් නො ලැබ ගියේ නම්, අකුශලකර්මය සම්පූර්ණ නො වේ.

සීතාහරණ-භාරතයුබාදි කථාවන්හි මද වශයෙන් යෙදෙන්න හුගේ ඒ මේ සම්ඵප්පලාපය අල්පසාවද්‍ය ය. එම කථාවන්හි බොහෝ සෙයින් යෙදෙන්නහුගේ කර්මය මහාසාවද්‍ය ය.

සම්ඵප්පලාපඅකුසලය, සතර අපායයෙහි දුකට හෙතු ය සම්ඵප්පලාපඅකුසලය, සම්ඵප්පලාප කීවහු, සතර අපායයෙහි උපද වයි. ඉන් මිදී ගොස් මිනිස්බවට ආකල්හි නො ඇදහියහැකි වචන ඇත්තෙක්, ජනසමාජයට අප්‍රියවූවෙක්, සිත් නො ගත් අහපහ ඇත්තෙක් වන්නේ ය. මේ හැමට වඩා, සතර අපායයෙහි දුක ම ඉතාබිහිසුණු ය. ඉතාදුනි ය ඉතාමහත් ය. ඉතානපුරු ය.

'දිවි පැවැත්වීමට යමක් උපදවම්' යි සිතා, අනුන් සිත් ගෙණ, යමක් උපදවන්නට සිතා, අශ්ලීශුන්‍යකථා කරන්නහුට ලොභය මුල් කොට ද, අනුන් පිරිහෙලන්නට සිතා කියන්නහුට, දෙසය මුල් කොට ද, අශ්ලීශුන්‍යකථාකීම හා ඇසීම කුසලැ යි සිතා කියන් නහුට, මොහය මුල් කොට ද මේ අකුශලකර්මය සිදු වේ. **නිහතිර -අහාලරාවිඡනඤ්ච** බලනු.

අභිජ්ඣා-ව්‍යාපාද-මිච්ඡාදිට්ඨි යන තුන මනොද්වාරයෙන් සිදු වන මනසකර්ම යි. අභිමුඛ කොට සිතීම **අභිජ්ඣා**' නම්. අභිමුඛ කොට සිතීම නම්, අනුන් අයත් දුයි දස්-ඇත්-අස්-ගොන්-මීගොන් ආදි වූ දිවි ඇති වස්තූන් හා, රන් රිදී-මුත්-මැණික්-ගේදෙර-ඉඩකඩම් ආදි වූ දිවි නැති වස්තූන් ද, දැක එහි ලොභ උපදවා, මේ හැම එකෙක් මට ලැබේ නම්, යහපතැ යි ගෙණ, එය තමන් වෙත නතු කරගන්නට සිතීම ය. **"පරභණ්ඩාභිමුඛී භූත්වා තණ්හානතතාය පවත්තතීති අභිජ්ඣා"** යනු එය පැහැදිලි කරයි.

පරායත්තාවසතුවක්බව-එය තමහට පිරිනැමීම යන මේ ය එහි අඞ්ග. මේ දෙයගින් එකෙකුත් නො ලැබුනේ නම්, අකුශල කර්මය සම්පූර්ණ නො වේ.

අනිජ්ඣාව, ගුණහීනයන් පිළිබඳ වස්තූන්හි උපදනා කල්හි අල්පසාවද්‍ය ය. ගුණසම්පන්නයන් පිළිබඳ වස්තූන්හි උපදනා කල්හි, මහාසාවද්‍ය ය. වස්තූන්හි හා වසතුස්වාමීන්ගේ උස්කම් මිටිකම් අනු ව මේ වන්නේ ය.

අනිජ්ඣාඅකුසලය, සතර අපායයෙහි දුකට හෙතු ය. අභිධ්‍යා වෙන් බැඳුනහු, සතර අපායයෙහි උපදවයි. ඉන් මිදී ගොස් මිනිස් බවට ආකල්හි, කටයුතු සිදුකර ගැණීමෙහි අපොහොසතෙක්, නො මනා දුකුම් ඇත්තෙක්, දිළින්දෙක් වන්නේ ය. මේ හැමට වඩා, සතර අපායයෙහි දුක ම ඉතා බිහිසුණු ය. ඉතාදැඩි ය. ඉතා මහත් ය. ඉතානපුරු ය.

'මෙරමා අයත් වූ සැපත මට ලැබේ නම්, යහපතැ'යි එහි ලොභ උපදවන්නහුට, ලොභය මූල් කොට ද, 'මෙය මොහුට තරම් නො වේ, තරම් වන්නේ මටැ'යි අනුන් අයත් වූ සැපතෙහි නො සතුටු ව, එහි ලොභය උපදවන්නහුට, දෙසය මූල් කොට ද, 'අනුන් අයත් වූ සැපත තමහට පිරිනමා ගැණුම පාපයෙක් නො වේ ය'යි සිතා අන් සතු වූ සැපතෙහි ලොභ උපදවන්නහුට මොහය මූල් කොට ද මේ අකුශලකර්මය සිදු වේ. **සුවණ්ණහංස - මහා වාණිජජාතකය** බලනු.

ඝන සුවය නසන්නේ **ව්‍යාපාද'** නම්. අනුන් නැසීම පිණිස සිත කිලිටි කර ගැණීම ලකුණු කොට සිටියේ ය.

අන් සතකුබව - ඔහු නසන්නට සිතීම, යන මේ ය එහි දෙයහය. මින් එකෙකුත් නො හමු ව ගියේ නම්, අකුශලකර්මය සම්පූර්ණ නො වේ.

ගුණ නැති සතකු කෙරෙහි 'මූ නැසේවා' යි සිතීම අල්ප සාවද්‍ය ය. ගුණැති සතකු කෙරෙහි 'මූ නැසේවා'යි සිතීම මහා සාවද්‍ය ය.

ව්‍යාපාදඅකුශලය, සතර අපායයෙහි දුකට හෙතු ය. ඉන් බැඳුනහු, සතර අපායයෙහි උපදවයි. ඉන් මිදී මිනිස්බවට ආයේ නම් රූ නැත්තේ, රොගපීඩා ඇත්තේ, නො මනා දුකුම් ඇත්තේ වන්නේ ය. මේ හැමට වඩා, සතර අපායයෙහි දුක ම ඉතා බිහිසුණු ය. ඉතාදැඩි ය. ඉතාමහත් ය. ඉතානපුරු ය.

අනුන් සතු වූ වසතුවෙහි ලොභය නිසා වසතුස්වාමියාගේ විනාශය පතන්නහුට ලොභය මූල් කොට ද, අනුන් පිළිබඳ ලාභ සතකාරාදිය ඉවසනු බැරි ව, වෙෂී ව 'මෝවුහු මැරෙත්වා'යි පතන්නහුට දෙසය මූල් කොට ද, වරද කළහුට වරද කිරීම වරදෙක්

නො වේ ය' යි අන්‍යයාගේ විනාශය පතන්නහුට, මොහය මූල් කොට ද මේ අකුශලකර්මය සිදු වේ. **එකපණ්ණ-තිලමුට්ඨිජාතකය** බලනු.

'දන් සිල් ආ පින්කමින් වැඩෙක් නො වේ, සතුන් මැරීම් ආ අකුසලින් අපායගත නො වේ, සත්ව තෙමේ මෙයට කලින් නො උපන්නේ ය, මතු උපදින්නේ නො වේ, සියල්ල ම නිත්‍ය ය' යනාදි ලෙසින් තතු ඉක්මවා ගිය තතු වසා ගත් ලබ්ධිය **මිච්ඡා දිට්ඨි'** නම්.1

ඒ ඒ වස්තූන් පිළිබඳ ගත් අයුරෙහි වෙනස්බව—යම් පරිද්දෙකින් ගණී නම්, එ පරිද්දෙන් ඒ වස්තූන්ගේ වැටහීම යන මේය එහි අර්ථය. මේ දෙයහ ලැබීමෙන් ය එය අකුශල වනුයේ. එකකු ත් නො ලැබුනු කල්හි අකුශලකර්මය සම්පූර්ණ නො වේ.

අනියතමිච්ඡාදිට්ඨිය, අල්පසාවද්‍ය ය. නියතමිච්ඡාදිට්ඨි ය, මහා සාවද්‍ය ය. ආනන්තරියකර්මය කළහුට, සසරින් මිදුමෙක් ඇත්තේ ය. නියත මිසදිටු ගත්තහුට, සසරින් මිදුමෙක් නැත්තේ ය. සඟගියෙහි ඉපදීම් පමණෙකු ත් නැත්තේ ය.

මිථ්‍යාදෘෂ්ටිඅකුශලය, සතර අපායයෙහි දුකට හෙතු ය. මිසදිටු ගත්තහු, සතර අපායයෙහි උපදවයි. යම් පිණකින් ඉත් ගැල වී මිනිස්බවට ආයේ නම්, මිසදිටු අදහස් ඇත්තේ, නො ඇද පිළිවෙත් නැත්තේ, මැරී ගොස් නැවැතත් අපායයෙහි ම හෙත්තේ ය. මොහු විඳුනා අපායයෙහි දුක ම ඉතාබිහිසුණු ය. ඉතාදුකි ය. ඉතා-මහත් ය. ඉතානපුරු ය. සසරදුකින් මිදුමෙක් මිසදිටු ගත්තහුට නැත්තේ ය.

යම් යම් අමිහිරි දේ මිහිරි යි ගෙණ එහි ලොභයෙන් තදබද වන්නහුට ලොභය මූල් කොට ද 'මිසදිටු ගත්තේ අපායයෙහි උප-දනේ ය, එහෙයින් මිසදිටු හැරිය යුතු ය' යි කියන බණ අසා, ඒ කියන්නවුන් කෙරෙහි කොපයෙන්, 'නිවත් සඳුලන්නේ මේ ය' යි විපරීත අදහස් ගත්තහුට, දෙසය මූල් කොට ද, ධර්මය අධර්මය යි ද, අධර්මය ධර්මය යි ද, සුභාෂිතය, දුර්භාෂිත ය යි ද, දුර්භාෂිතය සුභා-ෂිතය යි ද ගත්තහුට මොහය මූල් කොට ද මේ අකුශලකර්මය සිදු වේ. **මාතඞ්ග-මහාබ්‍රහ්මජාතකය** බලනු.

කය-වචන-සිත යන දෙරටු තුනින් සිදුවන සියලු අකුසලයෝ මේ දශවිධ අකුශලකර්මපථයෙහි ඇතුළත් වෙති. එහෙයින් කයින්-වචනයෙන්-සිතින් යමෙක් කුඩා වූ හෝ මහත් වූ යම් පව්කමක් කෙරේ නම්, ඔහු **පාපකාරී'** ය.

---

1. 1, 7, 'අනික්කසාවෝ' යන්නට කළ පරිකථාව බලනු.

මෙහිලා ප්‍රකීර්ණකථා විසින් මෙය ද මෙසේ දතයුතු ය:-

මිනිසුන් විසින් ලොභ-දෙවෂ-මොහ යන මොවුන්ගේ හෙතු-වෙන් මේ දසවැදෑරුම් වූ අකුශල කර්ම කරණු ලැබේ. එ හෙයින් ප්‍රාණඝාතඅකුශලකර්මයක් කරන්නට සිත් උපන් කල්හි 'මෙය මෙලොවැ පරලොවැ දෙක්හි ම දුකට හෙතු ය, මේ නිසා පරලොවැ අපායයෙහි ඉපද කටුක දුක් විඳිඇ යුතු ය, මෙලොවැ දී හොයෙක් වධබන්ධනයන්ට මූණ දියැයුතු ය, යනාදී වූ දුර්විපාක සලකා පරපණනැසීමෙන්-

අන්හු විසින් නො දුන් දෙයක් සොරසිනින් ගැණීමට සිත් උපන් කල්හි, මේ හෙතුවෙන් මරණින් මතු සතර අපායයෙහි ඉපද අවුරුදු කෙළගණන් මහත් කටුක දුක් විඳ මිනිස්බවක් ලත් කල්හි එහි විපාකවශයෙන් එදුමේල සපයාගැණීමෙහි අපොහොසත් වන්නේ ය, ගෙයක්. කඩපිළක් ගානේ හිහමනෙහි යැයුතු වන්නේ ය, යනාදීවූ දුර්විපාක සලකා අන්සතු නූල්පටක් පමණ කුත් හොරකම් කිරීමෙන්-

'පරදාරසෙවනය-පරපුරුෂසෙවනය යන කාමමිථ්‍යාචාරයෙහි මෙවුම්දම්සෙවුම්නිලා සිත් උපන් කල්හි අන් අඹුවන් ගැණීම අන් පිරිමින් ගැණීම සතර අපායයෙහි ඉපද අවුරුදු කෙළගණන් දුක් විඳීමට කරුණු වන්නේ ය, ඉන් මිදී මිනිස්ලොවැ උපන් කල්හි උපනුපන් හැමජාතිවලැ සතුරන්ඇතියෙක්, අප්‍රිය වූ දැකුම්ඇතියෙක්, ආහාරපාන වස්ත්‍රාභරණ නො ලබන්නෙක්, රටට ණයගැතියෙක්, නපුංසකයෙක්, කුදුවූවෙක්, කොරවූවෙක්, ඉදුරන් විකලවූවෙක්, හිතමිතුරන්ගෙන් ඇත්වූවෙක් වන්නේ ය, යනාදී වූ දුර්විපාක සලකා පරඹුවන් ගැණීමෙන් හා පරපුරුෂයන් ගැණීමෙන්-

'රහමේරපානය කෙලශකාමයාගේ ඉපැත්මට කරුණු ය, යමක්හුගේ සිත් තුළ කෙලශකාමයෝ උපදින් නම්, ඒ කෙලශ කාමයන් විසින් ඔහු මරණින් මතු සතර අපායයෙහි උපදවනු ලබන්නේ ය, එහිදී යමපලුන් විසින් කරණුලබන නො ඉවසිය හැකි වධබන්ධනයන්ට යටත් වියැ යුතු ය, දුක් විඳියැ යුතු ය, මේ අපාදුක අවුරුදු කල්පගණනක්ම විඳියැ යුතු ය, එසේ අපායයෙහි දුක් විඳ ඉන් ගැලවී මිනිස්දිවියක් ලත් කල්හි පිස්සෙක් වන්නේ ය, විළිබිය නැත්තෙක් වන්නේ ය, රෙදිපිළී නැති ව නිරුවතින් මහ මහැ යන්නේ ය, යනාදී වූ දුර්විපාක සලකා රහමේරපානයෙන්-

'බොරුකීම යම් කෙනකු විසින් පුරුදු කරණුලද්දේ නම්, ඔහු ඒ බොරුකීමේ හෙතුවෙන් මරණින් මතු සතර අපායයෙහි ඉපද කෙළගණන් කල්පයන්හි මහත්දුක් විඳැ කවද, හෝ කරණුලද

පින්කම් හෙතුවෙන් ඉක් ගැලවී අවුත් මිනිස්බවක් ලද්දේ නම්, එහිදී ශෙෂව තුබූ මුසාවාද අකුසලයෙන් ඔහු නැනිදෙස් ලබන්නේ ය, නො කළ වරදට හසුවන්නේ ය, දුක් ඇත්තේ අඳ වූයේ වන්නේ ය, කාපිලමතස්සයා මෙන් දුඟද හමන මුවඇත්තෙක් වන්නේ ය, යනාදි වූ දුර්විපාක සලකා බොරුකීමෙන් –

'පිසුණුබස් කීමේ හෙතුවෙන් පිසුණුබස් කීයේ මිය ගොස් ඒ පවින් සතරඅපායයෙහි ඉපද එහි නොයෙක් කල්ප දහස් ගණන් දුක් විඳ, එයින් මිදී කිසිකලෙක මිනිස්බවක් ලැබුයේ නම්, ඔහු උපනුපන් හැම කල්හි කෙළතොල්ලෙක් වැරුනු සිරුරුඇත්තෙක් වන්නේ ය, යනාදී වූ දුර්විපාක සලකා පිසුණුබස්කීමෙන් –

'පරුසබස් කීමේ හෙතුවෙන් හා නිසරුබස් කීමේ හෙතුවෙන් ඒ පරොස්බස් නිසරුබස් කීයේ මරණින් මතු සතර අපායයෙහි උපදින්නේ ය, එහි මහත් දුක් විඳ මිනිස්දිවි ලදුයේ නම්, එතැනදී විරූප වන්නේ ය, විකල වූ ඉඳුරන් ඇතියේ වන්නේ ය, කැකුළු දුක් විඳියැ යුතු වන්නේය, යි යනාදිය සලකා පරොස්බස් හා නිසරුබස්කීමෙන් –

'අභිධ්‍යා නම් වූ විෂමලොභයෙහි අනිෂ්ටවිපාක විසින් මරණින් මතු සතරඅපායයෙහි ඉපද දුක් විඳින්නේ ය, එයින් මිදී ගොස් මිනිස්බවක් ලැබුයේ නම්, ඔහු සිතන බලන නිසිවක් සිදු නො වන්නේ ය, මුව දෙ කොණින් කෙළ ගලන්නේ ය, කැම්බිම් ලැබීමෙහි අපොහොසත් වන්නේ ය, යනාදී වූ දුර්විපාක සලකා විෂමලොභයෙන් –

'ව්‍යාපාදඅකුශලකර්මයෙහි බලයෙන් මරණින් මතු සතර අපාය යෙහි ඉපද දුක් විඳ, ඉන් මිදී මිනිස්බවක් ලැබුයේ විරූප වූ දුකුම් ඇත්තේ වන්නේ ය, මවුපියන්හට අප්‍රියයෙක් වන්නේ ය, ඉතා සුලුකරුණෙහි පවා හැපෙන්නේ ය, ගැටෙන්නේ ය, යනාදී වූ දුර්විපාක සලකා ව්‍යාපාදයෙන් –

'දෙසැටකට බෙදීගිය මිත්‍යාදෘෂ්ටිය තරම් බිහිසුණු පාපයෙක් නැත්තේ ය, එය මහාසාවද්‍යය, මිසදිටු ගත්තේ මරණින් මතු සතර අපායයෙහි ඉපද කල්ප කෙළගණන් එහි දුක් විඳ ඉන් ගැලවී අවුත් මිනිස්බවක් ලද්දේ නම්, එහිදී ප්‍රතිපත්තියෙන් තොර වූ මිත්‍යාකල්පනා ඇතියෙක් වන්නේ ය, මෙලොවැදීත් තව තවත් පව්කම්හි යෙදෙන්නේ ය, ඒ පව්කම් ද ඔහුට මෙලොවැ දුක් විඳීමට කාරණ වන්නේ ය. මෙසේ මිනිස්දිවිය ගෙවා මැරී ගොස් නැවතත් සතර අපායයෙහි උපදින්නේ ය, යනාදී වූ දුර්විපාක සලකා මිත්‍යාදෘෂ්ටියෙන්ද යි මේ දසඅකුසලින් වැළකී සිටිය යුතු ය.

උභයත්ථ සොචති = එලොවැ මෙලොවැ දෙක්හි ශොක කරයි.

මෙලොවැ දී කර්මශොචනයෙන් පරලොවැ දී විපාකශොචනයෙන් ශොක කරණ බව ය, මෙයින් වදාළෝ. තමන් කරණලද අකුශලකර්මයන් ගැණ සිතමින් කියමින්, එහිලා තැවීම ය, කර්ම ශොචන. මරණින් මතු දුගතියකැ ඉපද, තමන් කරණලද කර්ම ලෙසින් ලත් බිහිසුණු දුක් ඉවසනු බැරි ව එහිලා ලතැවීම ය, විපාක ශොචන **"අකතං මෙ කල්‍යාණං කතං පාපන්ති එකං සෙනෙව මරණ සමයෙ ඉධ සොචති, ඉදමස්ස කම්මසොචනං, විපාකං අනුභොන්තො පන පෙච්ච සොචති, ඉදමස්ස පරලොකෙ විපාකසොචනං, එවං සො උභයත්ථ සොචතියෙව"** යනු අටුවා ය.

සො සොචති සො විහඤ්ඤති දිස්වා කම්මකිලට්ඨං අත්තනො = ඔහු තමාගේ කිලිටි කර්මය දැක ශොක කරයි. ඔහු නැසෙයි.

තමන්ගේ කිලිටි වූ කර්මය නම්, තමන් විසින් ප්‍රාණඝාතාදීන්ගේ වශයෙන් චාරත්‍රය වෙහෙසා, කරණලද අකුශල කර්ම යි. ඒ අකුශලකර්ම දක්නේ, මෙලොවැදී ම ශොක කරයි. ඔහු පරලොවැ ගියේ, ඒ තමන් කළ අකුශලකර්මයන්ගේ වශයෙන් බිහිසුණු දුක් විඳින්නේ, නොයෙක් ලෙසින් වැලපෙන්නේ, විශෙෂයෙන් නැසෙන්නේ ය. පෙළෙන්නේ ය.

පාපකාරී පුද්ගලයා තමන්ගේ කිලිටි වූ කර්මය දැක මෙලොවැ දී ශොකවන සැටි ත්, පරලොවැ දී ඒ පාපකර්මයන්ගේ විපාක විඳිමින් ශොකවන සැටි ත් මෙයින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

චුන්දසූකරිකවස්තුව නිමියේ ය.

ධම්මිකඋපාසක මහතා.

1-11

අප බුදුරජුන් දවසෑ සැවැත්නුවර ධම්මික නමින් හැඳින්නූ පන්සියයක් උපාසකයෝ වාසය කළහ. උන් එකිනෙකාට පන් සියය පන්සියය උපාසකයෝ පිරිවර වූහ. මෙහි හිසන ධම්මිකා උපාසක තෙමේ, ඒ හැම දෙනා අතර වැඩිමහල්ලා විය. ඔහුට පුත්තු සත් දෙනෙක, දූලා සත් දෙනෙකැයි දූ පුත්තු දස සතර දෙනෙක් වූහ. උන් හැම කෙනෙක් එක් එක් ලහ කැදක්, ලහ බතක්, අඩමස් බතක්, අලුත් සඳ දුටු දා දෙන නවසඳ බතක්, වස් විසූ භික්ෂූන්ට දෙන වස්වැයි බතක් දැ යි බත් කිපයක් දුන්හ. ඒ හැම දෙන ධම්මිකයාගේ අනුජාත දූ පුත්තු වූහ. ධම්මිකයා ත් ලහ කැද, ලහ බත් ආදිය දුන්නේ ය. ඔහු අඹුව ද ලහ කැද, ලහ බත් ආදිය දුන්නා ය. අඹුදරුවන් සහිත වූ ධම්මිකා තෙමේ සිල් ඇත්තේ, යහපත් ගති පැවතුම් ඇත්තේ, දීමෙහි ඇලුනේ විය.

මෙසේ දූහැමින් කල් යවන ධම්මිකා උපාසකා තෙමේ, කල් යත් රෝගාතුර විය. ඔහුගේ ආයුසංඛ්කාරය පිරිහී ගියේ ය. රොගී ව ඇඳ වැතිරී ගත් උපාසක තෙමේ, බණ අසනු කැමැති ව 'භික්ෂූන් අට නමක් හෝ සොළොස් නමක් එවන්නැ' යි බුදුරජානන් වහන්සේට ආරාධනාවක් යැවී ය. උන්වහන්සේ ඔහුගේ ආරාධ නාව පරිදි භික්ෂූන් එහි යැවූහ. උන්වහන්සේලා උපාසකයාගේ ගෙට ගොස් ඔහු වැනිරී හුන් ඇඳ වටා පණවා තුබූ අසුන්හි වැඩහුන්හ. එවිට උපාසක තෙමේ භික්ෂූන් දෙස බලා, 'ස්වාමීනි! දැන් මට ඇත්තේ ඔබවහන්සේලාගේ පිහිට ය, ඔබවහන්සේලා දැකීම මට මහත් පිහිටෙක, එදා මාගේ ශරීරෙහි තුබූ ශක්තිය දැන් නැත, ඇස් දෙක ත් මදක් අඳුරු ය, කන්ඇසීම ත් ටිකක් අඩු ය, මට බණ ටිකක් වදාරන්නැ' යි කී ය. 'උපාසකාතුමනි! අසන්නට වඩා කැමැති සූත්‍රය කුමක් ද' කියන්න, මහන්මයාගේ කැමැත්තේ හැටියට අපට ඕනෑ ම සූත්‍රයක් කිය හැකි ය' යි භික්ෂූන් කී විට 'සියලු බුදුරජුන් විසින් අත් නොහැර ගෙණ ආ **'මහාසතිපට්ඨාන සූත්‍රය'** වදාරන්නැ' යි දන්වා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා ඒ දෙශනා කරන්නට පටන් ගත්හ.

එ වේලෙහි උපාසකයාගේ පින් තෙදින් මෙහෙයුනු සදෙවිලෝ වැස්සෝ, එක් එක් දෙව්ලොවින් දහස දහස අසුන් යෙදූ එක් සිය පණස් යොදුන් පමණ වූ මොනවට සැරසූ දෙව්රිය සයක් ගෙණවුත්, උපාසකයාහට පෙණෙන සේ අහස තබා 'අපි ගෙණ

යන්නෙමු, අපි ගෙණ යන්නෙමු' යි වහසි බෙණෙමින් 'උපාසකය! මැටි බදුනක් බිඳ රන් බඳුනක් ගන්නකු සේ අපගේ දෙව්ලොවට යන්නට මේ රියට නගින්න, මේ රියට නගින්නැ' යි වෙන වෙන ම කියා සිටියහ. එවිට උපාසක තෙමේ 'බණට අනතුරු නොකොට, ඒ අවසන් වනතුරු පොඩ්ඩක් ඉවසන්නැ' යි අත් සනින් දන්වා සිටියේ ය. ඒ දුටු භික්ෂූන් වහන්සේලා බණ නවතා ලන්නට කියනි යි සිතා, බණ නවතාලූහ. ඉක්බිති ගෙයි වැස්සෝ මොක ද මේ; අපේ පියා මෙයට කලින් කියි දිනෙකැ මෙසේ කළේ නොවේ, යිහි මදකමෙක් ද මේ, එදා කොතරම් බණ ඇසුවත් උන්දැට මදි ය, බණඇසීමෙහි සෑහීමෙක් මෙයට පෙර කවදත් උන්දැට තුබුනේ නැත, අග්යෝ! ඕනෑකමින් ම හාමුදුරුවරු ගෙන්වා, ගත්තේ ත් තාත්තා ය, දැන් තාත්තා ම බණ නවතා ලන්නට කියයි, මරණයට බිය නොවත්තේ කවරෙක් ද' යි කියමින් හඬන්නට පටන් ගත්හ. භික්ෂූන් වහන්සේලා ද දැන් බණට ඉඩ නැතැ යි විහාරයට වැඩියාහ.

මිදකට පසු, උපාසක තෙමේ 'නුඹලා කුමක් නිසා හඬහු දැ?' යි ඔවුන්ගෙන් ඇසි ය. 'තාත්තා හාමුදුවරු වැඩමවා, බණ අසන්නට පටන් ගෙණ, නැවැත තාත්තා ම ඒ වළකාලූබව අපට පෙණුනේ ය, තාත්තා මරණයට බියෙන් මෙසේ කරන්නේ ය යි සිතා අපි හැඬුවෙමු' යි කීහ. 'නෑ මම මරණයට බය නොවෙමි, කොහි ද හාමුදුරුවරු?' යි උපාසක තෙමේ ඇසී ය. 'උන්වහන්සේලා බණ කියන්නට ඉඩ නැතැ' යි කියා විහාරයට වැඩියබව කීවිට, 'මම උන්වහන්සේලාට බණ නවතාලන්නට නොකීමි, උන්වහන්සේලා හා කතා නොකෙළෙමි'යි කී ය. ඉක්බිති පුත්තු 'තාත්තා කතා කළේ කා සමග දැ?' යි ඇසූහ. 'සදෙවිලෝ වැස්සෝ එක් එක් දෙව්ලොවෙන් එක් එක් රිය බැගින් රියසයක් සරසා ගෙණවුත් අහස තබා, 'අපේ දෙව්ලොව, සැපතින් මහත් ය, අපේ දෙව්ලොව සැපතින් මහත් ය, අපේ දෙව්ලොවට එන්න! මේ රියට නගින්න! මේ රියට නගින්නැ' යි මට කියති. ඒ නිසා මම ඔවුන්ට බණ අසන බව කියා, පොඩ්ඩක් ඉවසන්නට අත නගා කීමි, ඒ හැර හාමුදුරුවරුන්ට බණ නවතන්නට නොකීම'යි කී විට, ඔවුහු 'කොහේ ද තාත්තේ ඒ දෙව්රිය, අපට එකෙක් වත් නොපෙණේ, කොහේ ද, අපට පෙන්වන්නැ'යි කීහ. එවිට උපාසකයා, ගෙතු මල්දමක් ගෙන්වා, 'කිනම් දෙව්ලොව වඩා සිත්කලු දැ'යි අසා, 'තුසිතදෙව්ලොව හැමට සිත්කලු ය'යි කී විට, 'එසේ නම් මේ මල්දම තුසිතදෙව්ලොවින් ආ දෙව්රියෙහි එල්ලේවා'යි සිතා අහසට දමවූ'යි කියේ ය. ඔවුහු එසේ සිතා මල්වඩම අහසට වීසි කළහ එය සිතූ පරිදි තුසිතදෙව්ලොවින්

ආ දියෙහි ලැගුනී ය. එහි රැස් ව සිටියවුනට මල්වඩම පෙණිනා. රිය නොා පෙණිනා. උපාසක තෙමේ 'මල්වඩම පෙණේ දැ'යි දූ පුතුන් විචාළේ ය. ඔවුන් 'එසේ ය'යි කී විට, 'ඒ මල්වඩම් ලැගී තිබෙන්නේ තුසිතදෙවිලොවින් ආ රථයෙහි ය, මම දැන් තුසිත දෙවිලොවට යමි, ඒ ගැණ නුඹලා දුක් නොා වියැ යුතු ය, නුඹලා ත් මා සමීපයට එන්නට සිතා තව තව පින් කරන්න! දන් දෙන්න! සිල් රකින්න! භාවනා කරන්න! සතුන් මැරීමෙන්, සොරකම් කිරීමෙන්, පරසත්‍රී—පරපුරුෂසෙවනයෙන්, රා අරක්කු බීමෙන්, බොරු කීමෙන්, කේලාම් කීමෙන්, රළුබස් බිණීමෙන්, ඕපාදූපා කතා කිරීමෙන්, මූළුමනින් වෙන්වන්න! පවිකමක්, වැරදි වැඩක් කිසි දවසක නොා කරන්න! කරුණා මෛත්‍රී ආදී වූ ගුණ දියුණු කරන්නැ'යි මේ ආ ලෙසින් අවවාද දී කලුරිය කොට, තුසිතදෙවිලොවින් ආ රථයෙහි නැගී සිටියේ ය. එ කෙණෙහි ම උපාසකයාගේ ආත්මභාවය තුන්ගවු පමණ වූයේ, ගැල් සැටක පුරාලන්නා වූ අබරණවලින් සැරසුනේ විය. දෙවහනන් දහසක විසින් පිරිවැරුණේ ය. පන්සිය යොදුන් පමණැති රත්විමනෙක් ද පහළ විය.

සතිපට්ඨානසූත්‍රදෙශනාවට උපාසකයා වෙත වැඩිය භික්ෂූන් වහන්සේලා, පෙරලා විහාරයට වැඩිය කල්හි බුදුරජානන් වහන්සේ, ඔවුන්ගෙන් අතින් 'උපාසකයා හොඳට බණ ඇසී දැ' යි ඇසූහ. ඔවුහු 'එසේ ය, උපාසකයා හොඳට බණ අසා හිඳ අතරමගැ දී බණ නවතාලන්නට කී ය, එ කෙණෙහි ඔහුගේ දූ පුත්තු හඬන්නට පටන් ගත්හ, අපි දෙරට බැස ආවෙමු' සි කීහ. 'උපාසකයා කතා කළේ තමුසේලා සමඟ නොා වේ, ඔහු තමුසේලාට කිසිවක් කීයේ නැත, ඒ වේලෙහි සදෙවිලෝවැස්සෝ රිය සයක් සරසා ගෙණවුත් දෙවිලොවට එන්නැ යි අඬ ගැහ, උපාසකයා, බණට අනතුරු නොා කොට, පොඩ්ඩක් ඉවසන්නැ යි අත් නගා දෙවියන්ට දැන්වී ය, ඒ මුත් තමුසේලාගේ බණ නවතාලන්නට ඔහු නොා කීයේ ය' යි බුදුරජුන් වදාළ කල්හි, භික්ෂූන් වහන්සේලා 'උපාසක තෙමේ නොා තැනක උපන්නේ දැ?' යි ඇසූහ. 'තුසිත දෙවිලොව'යි උත්තර දුන්සේ කීහ. නැවැත භික්ෂූන් වහන්සේලා 'ධම්මික උපාසක තෙමේ ජීවත් වන්නේ, නැයන් මැද ඉතා සතුටින් ජීවත් වූයේ ය, දැන් මැරී ගොස් ද, සතුටු විය හැකි තැනක ම උපන්නේ ය' යි කීවිට, 'ඔව්! මහණෙනි! නොා පමා වූ ගිහියෙක් හෝ වේවා, පැවිද්දෙක් හෝ වේවා, සියලු දෙන සියලු තැන ම සතුටු වෙති' සි වදාරා මේ ධම්මදෙශනාව ද කළ සේක:—

ඉධ මොදති පෙච්ච මොදති
කතපුඤ්ඤෝ උභයත්ථ මොදති,
සො මොදති සො පමොදති
දිස්වා කම්මවිසුඩිමත්තනො ති.

කළ පින් ඇත්තේ මෙලොවැ සතුටු වෙයි. පරලොවැ සතුටු වෙයි. (මෙසේ) දෙලොවැ සතුටු වෙයි. හෙතෙමේ තමන්ගේ, නොහොත් තමන් කළ පින්කම දැක, සතුටු වෙයි. පරලොවැ දී තදින් සතුටු වෙයි.

ඉධ මොදති = මෙලොවැ සතුටු වෙයි.

මෙලොවැ උපන්නේ, ජීවත් වන්නේ ම තමන් විසින් කළ කුශල කර්මයන්ගේ වශයෙන් 'මා විසින් ඒකාන්තයෙන් පාපකර්මයෙක් නම් නො කරණ ලද ය, කරණ ලද්දේ කුශලකර්ම මැ' යි කළ කුසල් සිහි කිරීමෙන් සතුටු වෙයි. කළ පිණැත්තහු හැම ඉරියව්කැ දී ම තමන් කළ කුශලකර්ම සිහි කිරීමෙන් සතුටුවීම ස්වභාවධර්මයෙකි. එසේ කළ කුසල් ගැණ සිතා, එහි අනුසස් සැලකීම, කුශල ඵලයාගේ මහත්ත්වයට කරුණු වේ. පින් නො කළ තැනැත්තාට මරණාසන්නකාලයෙහි ශොක වීමට කරුණු ඉදිරි පත් වෙතත්, කළ පින් ඇත්තහුට එම අවස්ථායෙහි ඉදිරිපත් වන්නේ සන්තොෂ වීමට කරුණු ය. ඔහුට, තමන් වැඩිවශයෙන් පුරුදු පුහුණු කළ කුශල කර්මයක් ම මැරෙන්නට ලං වූ විට ඉදිරි පත් වේ. ඔහු, ජීවත් වන්නේ, දන්දීම වැඩි වශයෙන් පුරුදු කෙළේ නම්, ඒ සිදුකිරීමට උපකාර කොට ගත් භොජන, චීවර, ධජ, පතාකා, සුවඳ මල් ඈ කිසිවෙක් වේ නම්, එයින් කිසිවෙක් ඔහුට මැරෙණ විට කර්මනිමිත්ත වශයෙන් පෙණී යයි. එසේ ම ඒ කුශලකර්මවිපාකයට අනුරූප ව ගතිය නියමකිරීම්වශයෙන් දෙවඟනන්, දෙව්විමන්, කප්රුක්, මස් වැදලි ඈ අතුරින් කිසිවෙක් පෙණී යයි. පෙණී යනු සදෙරින් එක් දෙරකට ය. මරණාසන්නකාලයෙහි කළ පිණැත්තහුට, මෙසේ පිරිසිදු කර්මය, කර්මනිමිත්ත, ගතිනිමිත්ත යන මොවුන් පෙණී යෑමෙන් උපදින සතුට ටික නො වේ. ඒ ඉමහත් ය. එහෙයිනි වදාළෝ 'ඉධ මොදති' යි.

පෙච්ච මොදති = පරලොවැ සතුටු වෙයි.

ජීවත් ව සිටැ, පින්කම් කළේ, මරණින් මතු මිනිසෙක් ව උපන්නේ, මිනිසුන් පිළිබඳ හැම යස ඉසුරු උසස් ලෙසින් ලැබීමෙන් සතුටු වන්නේ ය. දෙවියෙක් ව උපන්නේ, දෙවියන් පිළිබඳ හැම යස ඉසුරු උසස් ලෙසින් ලබා සතුටු වන්නේ ය. පින්කම්

කළහුට, එහි විපාක විසින් ලැබෙන්නේ දෙවි-මිනිසුන් අතර උසස් උත්පත්තිය හා උන් පිළිබඳ මහත් යස ඉසුරු ය. එයින් ඔහු පිණා යයි. සතුටු වෙයි.

කතපුඤ්ඤා = කළ පිණැත්තේ.

දන් – සිල් – බැවුම් ඇ විසින් කළ පිණැත්තේ **කතපුඤ්ඤ'** නම්. කළ තැනැත්තහු හෝ, ඔහු සිත පිරිසිදු කරන්නේ **පුඤ්ඤ'** නම්. යම්කිසි ක්‍රියාවකින් රාගාදී වූ දොෂයකින් අපිරිසිදු වූ සත්ව යන්ගේ සිත, පිරිසිදුබවට යේ නම්, ඒ හැම ක්‍රියා පින් ය. මේය නිරුක්ති එහිලා **"පුනාතීති පුඤ්ඤං, අත්තනො කාරකං ජනං අත්තසන්තානං වා යත්ථ සයං උප්පත්තං තං සන්තානං පුනාති සොධෙතීති = පුඤ්ඤං, පුජ්ජභාවං, ජනෙතීති වා = පුඤ්ඤං, පූජිතං වා නෙතීති = පුඤ්ඤං"** යි.

පුඤ්ඤ ශබ්දය, කුශල-සුන්දර-පවිත්‍ර යන අරුත්හි ආයේ ය. (**පණ්ඩකෙ සුඛතෙ**) **පුඤ්ඤං** (**මනුඤ්ඤෙ පාවනෙ තිසු**) යනු කොෂ යි. මෙහි ආයේ කුසල්හි ය.

මිනිසත්බව ලද්දහු විසින් කළ යුත්තේ පින්කම් ම ය. **"එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං"** යනු වදාළෝ එහෙයිනි.[1] ආගමයෙහි දාන-සීල-භාවනා යි පුණ්‍යක්‍රියා තුනෙක් දැක් වේ. මේ තුන ද ගෙණ නැවැත අපචායන-වෙය්‍යා වච්ච-පත්ති දාන-පත්තානුමොදනා-ධම්මසවණ-ධම්මදෙසනා-දිට්ඨුජ්ජුකම්ම යන පින්කම්, දසවැදැරුම් කොට කීහ. මෙ දසයතුළ හැම පින් කමෙක් ම දැක්ක හැකි ය.

දියයුතු වස්තු, දීමෙහි සිතිවිල්ල, දීම යන මේ **දාන'** නම්. **"දීයතීති = දානං, දෙය්‍යධම්මස්සෙතං නාමං, සවත්ථුකා වා චෙතනා දානං, සම්පත්තිපරිච්චාගස්සෙතං නාමං"** යනු, දානං' යනු විස්තර කළ සැටියි.[2]

සම්පත්ත-සමාදානවිරතීන්ගේ වශයෙන් ප්‍රාණවධාදියෙන් වළ කින්නහුගේ, උපාඞ්‍යාය-ආචාර්‍ය්‍යවත්ත යනාදී වූ වත් පිළිවෙත් පුරන්නහුගේ චෙතනාදීධම් **සීල'** නම්. **"පාණතිපාතාදිහි වා විරමන්තස්ස වත්තපටිවත්තං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා සීලං නාම"** යි සීලං' යනු විස්තර කළ සැටියි.[3]

---

1 4, 8, 'කත්තබ්බං කුසලං බහුං' යන්නට කළ පරිකථාව බලනු.

2. 13, 10, 'බාලා හවෙ නප්පසංසන්ති දානං' ,, ,, බලනු.

3. 4, 10, 'සීලවතං ගණ්ඩො' ,, ,, බලනු.

සත්‍වයාගේ සිත කිලිටි කරණ ලොභ-දෙස-මොහාදී වූ සියලු කෙලෙසුන්ට පටහැනි ව නැගුනු කුශලපක්ෂයෙහි වූ සිතිවිල්ල **භාවනා'** නම්. **"චිත්තස්සුපක්කිලෙසානං යා චිත්තා පටිපක්ඛිකා, තස්සා යා භාවනා සා හි භාවනාති පකිත්තිතා"** යනු ඒ කියූ සැටියි.

මානය දුරු කොට විද්‍යමානශීලාදී වූ ගුණයක් හෝ, තමාට කළ උපකාරයක් හෝ, සිහි කිරීමෙන් බුද්ධාදි උතුමන් කෙරෙහි, මවුපියා දීන් කෙරෙහි ආචාර්‍ය්‍යඋපාධ්‍යායයන් කෙරෙහි කරණ පූජාවය **අපචායන'** නම්. **"ගුණයුත්තෙසු සක්කාරකිරියා වන්දනාදිකා, පූජාරහෙන මුනිනා පූජාති පරිකිත්තිතා"** යි ඒ කියූ සැටියි.

ගිලනුන්ට ගුණවතුන්ට උවැටන් කිරීම, **වෙය්‍යාවච්ච'** නම්. **"ගිලානගුණවන්තානං දානාදිකිරියාසු වා ආසනොදකදානාදි වෙය්‍යාවච්චන්ති සඤ්ඤිතං"** යන මෙයින් කීයේ ඒ ය.

අන්‍යයා කෙරෙහි කරුණාවෙන්, තමහට කළ උපකාර සැල කීමෙන් තමන්ට වන වැඩ නො බලා තමන් කළ කුශලය අන්‍යයා කෙරෙහි පැමිණවීම, **පත්තිදාන'** නම්. **"අත්තත්ථමන පෙක්ඛිත්වා පරත්ථං දියතෙ යතො කරුණාකතං ඤාණයොගං පත්ති දානන්ති කිත්තිතං"** යන මෙයින් ඒ කී ය.

යමකු විසින් කරණලද කුශලකර්මයෙහි කුශලමහිමය ඊර්ෂ්‍යා වෙෂ මාත්සර්‍ය්‍යාදිය දුරු කොටැ, ශ්‍රද්ධාප්‍රඥාදී වූ ගුණයන්ගෙන් යෙදුනු සිතැති ව අනුමෝදන්වීම, **පත්තානුමොදනා'** නම්.

දහම් අසා එයට අනු ව කල් යවා, ලෞකික-ලොකොත්තර ගුණයන්ට පැමිණෙමි යි හෝ, දැනැ ඉගෙණැ ජනසංග්‍රහ පිණිස අනුන්ට බණ කියමි යි හෝ මෙසේ අන්‍යයා නිසා හෝ තමන් නිසා පැන නැගුණු ධර්මශ්‍රවණචෙතනාව, **ධම්මසවණ'** නම්. **"විහාය වික්ඛෙපමලං අට්ඨි කත්වාන සාධුකං සඛම්මසවණං එත්ථ සවණන්ති පකාසිතං"** යනු ඒ කී සැටියි.

ලාභාපෙක්ෂාවෙන් තොර ව, විමුක්තායතනශීර්ෂයෙහි සිට දහම් දෙසන්නහුගේ, නිරවද්‍යවිද්‍යායතනාදිය උගන්වන්නහුගේ හෘදගත චෙතනා මාත්‍රය, **ධම්මදෙසනා'** නම්. **"හිතජ්ඣාසයතො යා හි පරස්ස හිතදෙසනා, දෙසනාමයපුඤ්ඤන්ති දෙසයී තං සුදෙසකො"** යනු ඒ කී සැටියි.

දීමෙහි ඵල ඇතැ, යනාදී ලෙසින් ඒ ඒ ක්‍රියාවන්හි ඒ ඒ ධර්මයන්හි නියම තතු දැනැ තම දැක්ම පිරිසිදු කිරීම, **දිට්ඨුජ්ජු කම්ම'** නම්.

දසවැදෑරුම් වූ පින්කිරියවත්හි චෙතනාව ම ප්‍රධාන වේ. එහෙයින් දශවිධපුණ්‍යක්‍රියා නම් දශවිධපුණ්‍යක්‍රියාවන්හි පැවැති චෙතනා ය.

උභයත්ථ මොදති = දෙලොවැ සතුටු වෙයි.

පින් කළ මිනිසා තමන් කළ පින්කම්, රැ දෙවේලේ සිතමින් සිහි කරමින් මැරෙණතුරු කමීමොදනයෙන් සතුටු වෙයි. මරණින් මතු, කළ පින්කමින් සුගතියෙහි ඉපද, යස ඉසුරු ලබා විපාක මොදනයෙන් සතුටු වෙයි.

සො මොදති සො පමොදති දිස්වා විසුද්ධකම්මං අත්තනො = හෙතෙමේ තමන්ගේ නොහොත් තමන් කළ පිරිසිදු කමීය (පින්කම) දැක සතුටු වෙයි. පරලොවැ දී තදින් සතුටු වේ.

පින් කළ මිනිසා තමන් කළ පින්කම් ගැණ සිතා, මෙලොවැ දීත්, පින්කම්වල විපාක විඳිනවිට පරලොව දී ත්, තදින් සතුටු වන බව මෙයින් වදුලෝ ය. පින්කම්, කරන්නහුගේ සිත පිරිසිදු කරණ බැවින් 'කම්විශුද්ධි' යි කීහ. 'මොදති' යන්න 'පමොදති' යි වඩාලා වදුළෝ, පින් කළහු පරලොව දී යසඉසුරු ලබා තදින් සතුටු වන බැවිනි.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

ධම්මිකඋපාසක වස්තුව නිමියේ ය.

දෙවදත්තස්ථවිරයන් අවීචියෙහි උපන් සැටි

1—12

බුදු රජානන් වහන්සේගේ අසූ දහසක් තරම් නෑ කුලයෝ, උන්වහන්සේගේ ලකුණු පිළිගන්නා දවසෙහි 'අපගේ ඥාති ශ්‍රෙෂ්ඨ තෙමේ රජ හෝ වේවා, බුදු හෝ වේවා, කොයි කෙනකු වුවත්, රජදරුවන් ම පිරිවර කොට වෙසේවා' යි රජදරුවන් අසූ දහසක් පැවිදි කරවන්නට ප්‍රතිඥා දුන්හ. කල් නො යාදී ම ඒ ප්‍රතිඥාව ලෙසින් බොහෝ දෙනෙක් පැවිදි වූහ. එහෙත්, එතෙක් පැවිදි නො වූ – **භද්දිය – අනුරුඬ – ආනන්ද – භගු – කිම්බිල – දෙවදත්ත** යන ක්ෂත්‍රිය කුමරුන් දුටු නෑ කුලයෝ 'අපි අපගේ පුතුන් පැවිදි කරවීමු, මේ සදෙන නො නෑයන් වියැ යුතු ය, පැවිදි නො වන්නෝ එහෙයිනැ' යි කතාවක් ඇති කළහ. ඒ කතාව කණැ වැටුනු කෙණෙහි මහානාමශාක්‍ය තෙමේ, අනුරුද්ධ කුමරුන්ට ලඟට අඬගා, 'මල්ලි! අපගේ කුලයෙන් පැවිදි වූවෙක් තව ම නැත, ඒ නිසා මල්ලී! පැවිදි වන්න, නුඹට නො හැකි නම්, මම පැවිදි වෙමි' යි කී ය.

අනුරුද්ධ තෙමේ ඉතා සියුමැලි ය. වතුපිටි ගේදොරින් පොහොසත් කමින් කිසිත් අඩුවක් ඇත්තේ නො වේ. ඔහු නැත' යන වචනය පවා කිසි දවසෙකැ අසා නැත. දවසෙකැ මේ සදෙන කැවුම් ඔට්ටුවට තබා සෙල්ලම් කළහ. එදා අනුරුද්ධ තෙමේ පැරදුනේ ය. එ හෙයින් කැවුම් ගෙනෙන්නට කොළුවකු ගෙට යැවී ය. මවු තොමෝ කැවුම් තම්බා පිළියෙල කොට, ඒ ආ කොළු අතැ ම යැවූ ය. හැම දෙන ඒ කැවුම් කා, නැවැත ත් සෙල්ලම් කළෝ ය. එවර ද අනුරුද්ධ තෙමේ පැරදුනේ ය.එවර ත් කැවුම් ගෙන්වා කාලා සෙල්ලම් කළහ. මෙ ලෙසින් සෙල්ලම් කළ හැම වර ම අනුරුද්ධ තෙමේ පැරදී ගියේ ය. ඒ හැම වර ම ගෙදරින් කැවුම් ද ගෙන්වා ගත්තේ ය. මවු තොමෝ තෙ වරක් ම කැවුම් යවා, සතර වන වර 'කැවුම් නැතැ' යි කියා යැවූ ය. අනුරුද්ධ තෙමේ මෙයට කලින් කිසි දවසෙකැ නැත' යන වචනය නො අසා සිටි බැවින්, මේ ත් එක්තරා කැවුම් වගයෙකැ' යි සිතා 'නැති කැවුම් එවන්නැ' යි මෑනියන්ට කියා යැවී ය. එවර පණිවිඩකරු එහි ගොස් නැති කැවුම් ඉල්ලී ය. එවිට මවු තොමෝ 'මපුත් මෙයට කලින් කිසි දවසෙකැ නැත' යනු අසා නැත, එ හෙයින් ඔහුට නැත, යන්නෙහි තේරුම දැන්වීමට මේ වේලාවැ' යි සිතා හිස් රන්තැටියක්, එබඳු අන් රන්තැටියකින් වසා, 'මපුත්හට මේ දෙව' යි පණිවිඩකරු අත ඒ යැවූ ය.

එ නුවරැ අරක් ගත් දෙවියෝ, 'මේ කුමරු පෙර අත්තභාර ව උපන් කාලයෙහි තමන්ගේ බත්කොටස උපරිඳ පසේබුදුරජුන්ට පුදා මට කවදත් නැත' යන්න අසන්නට නො ලැබේවා' යි ද බත් උපදනා තැන් දැන ගැන්මෙක් නො වේවා' යි ද ප්‍රාර්ථනා කොට සිටියේ ය, එ හෙයින් මොහුට මේ හිස් වූ තැටි දැකීමට ඉඩ තැබීම අපේ හිස් හත්කඩට පැළෙන්නට තරම් වන්නේ ය, මේ නිසා දෙවියන් අතරට ගොස් පෙණී සිටීමට ද අපට ඉඩ නො-ලැබෙන්නේ ය' යි සිතා දෙවියන් කන කැවුමෙන් ඒ රන්තැටි පුරවා ලූහ. පණිවිඩකරු ගෙණ ගිය ඒ රන්තැටිය සෙල්ලම්පිටි යෙහි තබා, පසු ව වසා තුබූ රන්තැටිය ඉවත් කළ ඇසිල්ලෙහි ම කැවුම්සුවඳ මුළු නුවර තුළ පැතිර සිටියේ ය. කුමාර තෙමේ කැවුම්කැබැල්ලක් අතට ගෙණ කට ගැයේ ය. එ කෙණෙහි එහි රසය, සිරුරෙහි පැතිර සත් දහසක් රසනහර මතු කොට ගෙණ සිටියේ ය. අනුරුඬ තෙමේ මාගේ මවුට මම ප්‍රිය නො වෙමි, මට මෙතෙක් කල්, මේ කැවුම් තම්බා නො දුන්නී එහෙයින, වේවා, මම අද සිට අන් කැවුමක් නම් නො කමි' යි සිතා ගෙදර ගොස්, 'අම්මේ! අම්මාට මම ප්‍රිය ද? අප්‍රිය ද? මට එය නො සඟවා කියන්නැ' යි කීයේ ය. 'පුතා! කුමක් කියහි; එක් ඇසක් ඇත්තහුට, ඒ එක් ඇස යම්සේ ද, පුතා ත් මට එසේ ය, රන් කඳ! හදවත! මාගේ, මේ කුමක් නිසා අසහි; පුතා මාගේ පණ සේ ය' යි ඕ තොමෝ කිවූ ය. 'අම්මේ! ඇයි; එසේ නම් මෙතෙක් දවස්, මේ කැවුම් තම්බා නො දුන්නී, කියන්නැ' යි කුමරුන් කී කල්හි, රන් තැටිය ගෙණ ගිය කොළු, ලහට ගෙන්වා, 'ලමයා! උඹ ගෙණ ගිය රන්තැටියෙහි මොකවත් කැවුමෙක් තුබුනේ ද' යි ඇසූ ය. කොළු ද 'ආයුෂ්මතුනි! රන්තැටිය මුළුමනින් කැවුම්වලින් පිරී තුබුනා ය, එහෙ ම කැවුම් මෙයට කලින් මා ත් දැක නැත, ඒ කැවුම් එ තරම් සුවඳ ය, එ තරම් රස ය' යි කීයේ ය. 'මපුත් මහ පිණැත්තේ ය, කළ පැතුම් ඇත්තේ ය, නුවරැ අරක් ගත් දෙවියන් විසින් මේ කරණලද්දේ වනැ' යි ඕ තොමෝ සිතූ ය. නැවැත අනුරුඬ තෙමේ 'අම්මේ! මින් පසු මම අන් කැවුමක් නො කමි, මට වුවමනා මේ කැවුම් ය' යි කීයේ ය. ඕ තොමෝ එතැන් සිට කුමරුන් 'කැවුම් තම්බන්නැ' යි කීවිට, රන්තැටියක් තවත් රන් තැටියකින් වසා, මෙසේ හිස් තැටි දෙකක් කුමරුන් වෙත යවයි. දෙවියෝ ඒ හිස් රන්තැටි කැවුමෙන් පුරවති. කුමාර තෙමේ ඒ කැවුම් කා සතුටු වෙයි. ඔහු යම්තාක් කල් ගිහිගෙයි සිටියේ ද, ඒ තාක් කෑයේ දෙවියන් දුන් කැවුම් ම ය.

මෙ ද පමණකුත් නො දත්, අනුරුඬ තෙමේ පැවිද්ද නම් කිමැ යි දනී ද; එහෙයින් ඔහු, පැවිදි වන්නැ යි කී විට 'පැවිද්ද

නම් කුමක් දැ?' යි සොහොයුරු අතින් විමසූයේ ය. එවිට මහානාම තෙමේ 'මල්ලි! පැවිදි වන්නහු සිද හළ නිස රැවුල් ඇත්තකු, කහ වත් හැඳ පෙරවූ දඬුඇදකැ හෝ, වේපත්ඇදකැ හෝ නිදන්නකු, පයක් ගෙණ පිඬු සිහා ගොස් එසින් ලැබෙන්නකින් සැපෙන්නකු වියැ යුතු ය, මේ පැවිදි වන්නාගේ පැවතුම්' යි කීයේ ය. 'අය්යේ! එසේ නම් පැවිදිකම් කරන්නට මට නො හැකි ය, මම සිවුමැලි වෙමි' යි අනුරුඬයන් කියා සිටි විට, 'හොඳයි! මල්ලි! මම පැවිදි වන්නෙමි, උඹ කම්මැන්න ඉගෙණ, ගේ දොර ඉඩකඩම් වාසිවි බලා ගෙණ, ගිහිගෙයි වසන්න, අප දෙදෙනාගෙන් කෙනකු පැවිදිවියැ යුතුම ය' යි මහානාම තෙමේ කියා සිටියේ ය. එවිට අනුරුඬ තෙමේ 'කම්මැන්න නම් කිමැ' යි ඇසී ය. මෙය පුදුමයෙක් නො වේ. බත් උපදින තැන් නො දන්නේ කිම කම්මැන්න දනී ද;

දිනෙක, භද්දිය—කිඹිල—අනුරුඬ යන මේ තිදෙනා අතර, බත් උපදින තැන ගැණ කතාවක් උපන. කිඹිලයන් 'බත් උපදින්නේ කොටුවෙහි ය' යි කී කල්හි, භද්දිය තෙමේ 'බත් උපදින තැන නුඹ නො දන්නෙහි, බත් උපදින්නේ සැලියෙහි ය' යි කීයේ ය. අනුරුඬ තෙමේ 'තෙපි ඒ නො දනිහු, බත් උපදින්නේ රන්තැටියෙහි ය' යි කී ය. කොටුවෙහි බත් උපදී' යි කිඹිලයන් කීයේ, දවසෙකැ කොටුවෙන් වී බිමට බාන්නවුන් දැක, වී කොටුවෙහි හටගතැ යි සලකා ය. භද්දිය සැලියෙහි බත් උපදී'යි කීයේ, සැලියෙන් බත් නගා ගණු දැක ය. අනුරුඬ තෙමේ කොටුවෙන් වී බානු කිසි දිනෙකැ නො දුක්කේ ය. සැලියෙන් බත් නගා ගණු නො දුක්කේ ය උන් දක්නා ලද්දී, බත් බෙදූ ඉදිරි පිට තැබූ රන්තැටිය ය. එහෙයින් ඔහු රන් තැටියෙහි බත් උපදී' යි කීයේ ය. මෙසේ ඒ තිදෙන ම බත් උපදින තැන පවා නො දනිති. ඒ හෙයින් සහෝදරයා අතින් අනුරුඬයන් කම්මැන්න නම් කිමැ යි ඇසීම පුදුමයෙක් නො වේ.

ඉක්බිති මහානාමශාක්‍ය තෙමේ 'පළමු ව කුඹුර සෑ යුතු ය' යනාදීන් අවුරුද්දක් පාසා කුඹුරෙහි කළයුතු කටයුතු කියේ ය. අනුරුඬ තෙමේ 'එසේ නම් කම්මැන්නවල කෙළවරෙක් කවදා පෙණේ ද, නිදුක් ව සම්පත් අනුභව කරන්නමෝ කවදා දැ' යි සිතනුයේ, මහානාමයන්, මෙසේ කම්මැන්නයන්ගේ කෙළවරක් නො ලැබිය හැකි බව කී කල්හි, 'අය්යා! නුඹ ම ඒ වැඩ කර ගෙණ ගෙදර ඉන්න! කම්මැන්න කරන්නට මට නො හැකි ය' යි මැනියන් වෙත ගොස්, 'අම්මේ! මට පැවිදි වන්නට අවසර දෙන්නැ' යි පැවිදි වන්නට අවසර ඉල්ලා සිටියේ ය. ඕ තොමෝ ඒ ඉල්ලීම තෙ වරක් ම පිළිකෙව් කළා, වළකාලන්නට නො හැකි තැනැ, 'පුතේ! නුඹේ යහළුවා, භද්දිය ත් පැවිදි වන්නේ නම්, පැවිදි

වන්නැ' යි කිවූ ය. එවිට අනුරුඬ තෙමේ භද්දිය කරා ගොස්, 'සුහෘදය! ඉතින් ඔන්න; මාගේ පැවිද්ද නුඹ අතේ, නුඹ ත් පැවිදි වෙතොත් මට ත් පැවිදි වන්නැ' යි අම්මා අවසර දුන්නා, යමු පැවිදි වන්නට, කල් යවන්නට නො හැකි ය' යි භද්දියට නොයෙක් ලෙසින් කරුණු කියා, සත්වන දිනයෙහි තමන් සමග පැවිදි වන්නට, භද්දියත් සතුටු කරවා ගත්තේ ය.

අනතුරු ව භද්දිය-අනුරුඬ-ආනන්ද-භගු-කිම්බිල-දෙවදත්ත යන ශාක්‍යයෝ සදෙන උපාලි කපුවා ත් සමග සත් දිනක් මුළුල්ලෙහි මහත් රජසිරි විඳැ සිවුරඟ සෙනග ගෙණ, උයන් කෙළියට යන්නවුන් සේ රජගෙවලින් නික්ම දිග්මග ගෙවා ගොස් තමන් හා එක්ව ගිය මුළු සෙනග පෙරළා සියරට යවා, තුමූ පර රජුන් අයත් වූ රටකට ගියහ. එහි දී ඔවුහු තම තමන් ඇඳ පැලඳ තුබූ සියලු වටිනා මාහැඟි ඇඳුම් ආයිත්තම් ගලවා පොදි කොට බැඳ උපාලි කපුවාට දී 'තම ජීවිකාවට මේ ඇත, එ හෙයින් මේ ගෙණ සිය රට ගොස්, තමන්ට කැමැති සේ ජීවිකාව කරව' යි කීහ. එකල උපාලි තෙමේ ඔවුන්ගේ පාමුල වැටී හඬා රජ අණ ඉක්මවා ලන්නට නො හැක්කේ නැවතුනේ ය. මද වේලාවක් එහි නැවතී සිට වට පිට බැලූ උපාලි තෙමේ 'ශාක්‍යයෝ නම් චණ්ඩයහ, මූ අපගේ කුමරුන් මරා දමා රෙදි පිළි අබරණ පැහැර ගන්නා ලදැ යි මා මරන්නෝ ය, මොවුහු මෙබඳු මහත් රජසිරි හැර මේ වටිනා රෙදිපිළි අබරණත් කෙලපිඩක් සේ අත්හැර පැවිදි වන්නෝ නම්, මට මෙයින් ඇති ඵලය කිමැ'යි රෙදි පොදි ලිහා රෙදි හා අබරණ ගසෙක එල්ලා තබා 'වැඩ ඇත්තෝ ගණිත්වා' යි සිතා එතැනින් නික්ම ගොස් ශාක්‍ය කුමරුන් වෙත ගියේ ය. ඔහු දුටු කුමරුන් 'තෝ නැවැත ආයෙහි කිමැ' යි විචාළ විට, උපාලි තෙමේ තම අදහස ඔවුනට දැන් වී ය. ඔවුහු කපුවාත් ගෙණ බුදුරජානන් වහන්සේ වෙත ගොස්, 'ස්වාමීනි! අපි මානයෙන් තදබද ව ගිය ශාක්‍යයෝ වම්හ, මේ අප හා සිටින උපාලි කපුවා, කලක සිට අපගේ කුදු මහත් හැම මෙහෙවර ම නොපිරිහෙළා කරන්නෙකි, එහෙයින් මූ පළමු කොට පැවිදි කරණු මැනැවි, පැවිද්දෙන් පසු, අපි මොහුට වැඳුම් පිදුම් කරන්නෙමු, එවිට, අපගේ තදබද ව ගොස් ඇති මානය ද, පහ ව යනු ඇතැ' යි දන්වා, කපුවා පැවිදි කරවා, හැම දෙන ඔහුට වැඳුම් පිදුම් කොට පසු ව පැවිදි වූහ. මෙසේ පැවිදි වූ ඔවුනතුරෙන් භද්දිය ස්ථවිරයන් වහන්සේ ත්‍රිවිද්‍ය ලැබූහ. අනුරුඬ ස්ථවිරයන් වහන්සේ දිවැස් ලැබූහ. එයින් පසු, **'මහාපුරිසවිතක්ක සූත්‍රය'** අසා රහත් වූහ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ සෝවන් වූහ. භගු-කිම්බිල දෙදෙනා වහන්සේ විදර්ශනා වඩා, මදක් කල් ගෙවා රහත් වූහ. දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ ලෞකිකසෘඬිමාත්‍රයක් ලැබූහ.

මොවුන්ගේ පැවිද්දෙන් පසු, බුදුරජානන් වහන්සේ ශ්‍රාවක සඞ්ඝයා ත් ගෙණ, කොසඹෑනුවරට වැඩම කළහ. එහිදී උන්වහන්සේට බොහෝ ලාභසත්කාර උපන. රෑ දෙවේලේ සැදැහැති මිනිස්සු, රෙදි පිළි ගිතෙල් මී උක්සකුරු සුවඳ මල් ආදී වූ නොයෙක් පූජාද්‍රව්‍ය යත් ගෙණ, විහාරයට ගොස් 'බුදුරජානන් වහන්සේ කොකැනැ? සැරියුත් හාමුදුරුවෝ? මුගලන් හාමුදුරුවෝ? මහසුප් හාමුදුරුවෝ? භද්දිය-අනඳ හාමුදුරුවරු? භගු-කිම්බිල හාමුදුරුවරු දෙනම කොහි ද' යි අසූ මහාශ්‍රාවකයන් වහන්සේලාගේ නම් ගම් කිය කියා සොයමින් බලමින් අසමින් ආවාසගෙයක් ගානේ ඇවිදිනි එහෙත් 'දෙවදත්ත හාමුදුරුවෝ කොහි ද?' යි සොයන බලන අසන එකෙකුත් නැත්තේ ය. එ කල්හි දෙවදත්ත සථවිරයන් වහන්සේ 'මොක ද මේ; මම ත් පැවිදි වූයෙම්, මොවුන් සමග ය, මූලා ත් ක්ෂත්‍රියයෝ, මම ත් ක්ෂත්‍රිය ය, එහෙත් සිවුරු පිරිකර තෙල් බෙහෙත් ගෙණෙන්නෝ මූලා ම සොයති, මූලාට ම දෙති, මා සොයන, මාගේ නම කියන එකෙකුත් මෙහි නැත, මට ත් සිවුරු පිරිකර තෙල් බෙහෙත් දෙන්නෙක් සොයා ගත යුතු ය, එ හෙයින් ඒ පිණිස කවරකු පහදවා ගණිම් ද' යි සිතූහ. 'බිම්සර රජු බුදුරජුන් දුටුදා ම, එකොළොස් නහුතයක් දෙනා සමග සෝවන් විය, එ හෙයින් මට ඔහු නම් පහදවනු නො හැකි ය, කොසොල්රජුත් නතු කරණු බැරි ය, අජාසත් කුමරු මෙතෙක් කිසිවකුගේ හොඳ නො හොඳ කිසිවකුත් නො දනී, බලන්නට, උඟ සමග වත් එකතු විය හැකි දැ' යි සිතා, දෙවදත්ත සථවිරයන් වහන්සේ කොසඹෑනුවරින් රජගහනුවරට ගොස්, කුමරවෙසක් මවා ගෙණ, නයින් සතරදෙනකු අත් පා සතරෙහි ද, එකකු බෙල්ල වටා ද ඔතා ගෙණ එකකු දරත්නක් කොට හිස තබා, එකකු එකස් කොට උරැ දවටා, මෙසේ සැරසී අහසින් ගොස් බැස, අජාසත්කුමරුගේ ඔඩොක්කු වෙහි හිඳ ගත්හ. බියට පැමිණි අජාසත් තෙමේ 'ඔබ කවරහි' යි ඇසී ය. 'මම දෙවදත්ත වෙමි' යි කියා ඔහුගේ බිය දුරු කරන්නට ඒ වෙශය හැර, මහණවෙස් ගෙණ කුමරුන්ගේ ඉදිරියෙහි පෙණී සිට උන් පහදවා ගෙණ, ලාභසත්කාර ලැබෙන්නට කටයුතු සලසා ගත්හ. එ කල්හි දෙවදත්ත සථවිරයන්ට භික්ෂුසඞ්ඝයා පරිහරණය කරන්නට සිතෙක් උපන. ඒ ඇසිල්ලෙහි ම දෙවදත්ත තෙමේ ඍද්ධියෙන් පිරිහී ගියේ ය. ඒ වේලෙහි වෙළුවනාරාමයෙහි රජුන් පිරිවරා හිඳ දහම් දෙසන බුදුරජුන් ඉදිරියට ගොස් වැඳ ඇඳිලි බැඳ ගෙණ 'සවාමීනි! භාග්‍යවත් තෙමේ දැන් මහලු ය, අන්තිම වයසෙහි සිටියේ ය, කටයුතු කිරීමෙහි උත්සාහයෙක් ද දැන් නැත, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දිඨධම්මසුඛවිහරණයෙහි යෙදී වාසය කරණ සේක්වා, මම මේ භික්ෂුසඞ්ඝයා පරිහරණය කරමි, මට ඒ කරණු

හැකි ය, මට භික්ෂුසඞ්ඝයා පාවා දුන මැනැවැ' යි ඉල්ලී ය. එවිට බුදුරජානන් වහන්සේ කෙලතොලුවාදයෙන් ගරහා එය පිළිකෙව් කළ සේක. එයින් නො සතුටු වූ දෙවදත්ත තෙමේ බුදු රජුන් කෙරෙහි වෙර බැඳැ නික්ම ගියේ ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ රජගහානුවර දී ඔහුට **පකාසනීයකර්මය** කර වූහ. දෙව්දත් තෙමේ 'මහණ ගොයුම් තෙමේ මා දුරු කෙළේ ය, එ හෙයින් ඔහු විපතක හෙලියැ යුතු ය' යි සිතා, අජාසත් කුමරුන් වෙත ගොස්, 'කුමාරය! පෙර දවසැ විසූ මිනිස්සු බොහෝ කල් ජීවත් වූහ, දැන් එසේ වූ එකෙක් පෙණෙන්නට නැත, එ හෙයින් බලා සිටියොත් ඔබවහන්සේට මෙහි රජකම් කරන්නට නම් නො ලැබෙනු ඇත, ඔය ලෙසින් ම මැරෙන්නට සිදු වේ, මේ කීයේ ඇත්ත ය, එ හෙයින් අද හෙට ම වැඩිකල් නො යවා රජකම ගන්න! මම බුදුන් මරා බුදු වෙමි' යි කීයේ ය. ඔහුගේ වචනයෙන් නැගී සිටි තෙද ගැණුනු අජාසත් තෙමේ ඒ ලෙසට කල් නො යවා ම පියා මරා රජ වූයේ ය. දෙවදත්ත තෙමේ බුදුරජුන් මරන්නට මිනිසුන් යෙදුයේ ය. බුදු රජුන් මරන්නට බුදුරජුන් වෙත පැමිණි ඒ මිනිස්සු හැමදෙන සෝවන් වූහ. ඉක්බිති ඔහු, 'හොඳ, එසේ වේවා, මම ම ශ්‍රමණ ගෞතමයා මරමි' යි ගිජුකුළුපව්වට නැග කඳුපාමුලැ වැඩහුන් බුදු රජානන්ගේ හිසට මහගලක් පෙරළා හැරියේ ය. එයින් ඔහුට **ලොහිතුප්පාදකකර්මය** සිදු විය. මෙලෙසිනුත් මරන්නට නො හැකි ව, නැවැත ඒ පිණිස බුදුරජුන් ඉදිරියට නාලාගිරි මහඇතා යැවී ය. ඌ බුදුරජුන්ගේ ඉදිරියට එනු දුටු ආනන්ද ස්ථවිරයන් වහන්සේ තම දිවි පුදා, බුදුරජුන් ඉදිරියෙහි සිට ගත්හ. ස්වාමි දරු වූ බුදුරජානන් වහන්සේ ඇතු හික්මවා නුවරින් විහාරයට වැඩම කොට, නොයෙක් දහස් ගණන් උපාසකයන් විසින් පිළි ගැන්නූ දන් වලඳා, එහි රැස් වූ අටළොස් කෙළක් තරම් රජගහා නුවරැ වැස්සන්ට දානකථාදී වූ පිළිවෙළ කතාව වදාළ සේක ඉන් අසූසාර දහසක් දෙනාට ධර්මාවබෝධය විය.

'ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වනාහි මහාගුණ ඇත්තාහ, අරතරම් බිහිසුණු ඇතු, ඉදිරියට දුව එන කල්හි තම දිවි නො බලා, බුදුරජුන්ගේ ඉදිරියේ සිට ගත්හ' යි රැස් ව හුන් භික්ෂූන් වහන්සේලා කියන්නට වූහ. මේ දත් බුදුරජානන් වහන්සේ 'මහණෙනි! ආනන්ද තැන, මා පිණිස දිවි පුද කළෝ, දැන් පමණක් නො වෙති, පෙරත් දිවි පිදූහ' යි වදාළ කල්හි, භික්ෂූන් වහන්සේලා 'ඒ වදාරණු මැනැවැ' යි ඇයද සිටියාහ. එකල්හි බුදුරජානන් වහන්සේ ඒ එලි කරන්නට **චූලහංස-මහාහංස-කක්කට ජාතක** වදාළ සේක.

රටවැසි මිනිස්සු 'බිම්සර රජු මරා දමන ලද්දේ දෙවදත්තයා විසිනි, උඹ විසින්ම ය වධකයෝ ත් යොදන ලද්දේ, ගල පෙරළන ලද්දේ ත් උඹය, එසේ කොට දැන් ඔහු නාලාගිරි ඇතා ත් එවී ය, එහෙත් අජාසත් රජු, මෙබඳු පව්ටකු ගෙණ හැසිරේ ය' යි අරගල කරන්නට පටන් ගත්හ. රජ තෙමේ මිනිසුන් අතර හටගෙණ ඇති අරගලය දැන, දැස්සන් මෙහෙකරුවන් අතැ දෙවදත්තයාහට බන් සැලී යවා, තෙමේ රජගෙයි ම සිටියේ ය. රටවැස්සෝ එ තැන් සිට තමතමන්ගේ ගෙට පැමිණි දෙවිදත්හට, බත්සැන්දක් පමණකු ත් නොදුන්හ එ තැන් සිට දෙවිදත් තෙමේ ලාභසත්කාර ලැබීමෙන් හොඳට ම පිරිහී ගියේ ය. එවිට කුහකකම් ගෙණ හැර දක්වා බඹ රකින්නට සිතූ ඔහු දවසෙක බුදුරජුන් වෙත ගොස්, **'ස්වාමිනි! මහණහු දිවි තිබෙන තාක් වනයෙහි වසන්නකු විය යුතු ය, පිඬු සිඟා යෑමෙන් ජීවත් වන්නකු විය යුතු ය, පවුල් සිවුරු දරන්නකු විය යුතු ය, රුක්මුලැ වසන්නකු විය යුතු ය, මත්‍සය මාංස කිසිවක් නොබුදින්නකු විය යුතු ය,** යන මා විසින් කියනු ලබන මේ කරුණු පස භික්ෂූන්ට කළයුතු හැටියට නියම කරණු මැනැවැ' යි කියා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ 'දෙවදත්ත! එයින් කමෙක් නැත, යමෙක් කැමැති නම්, ඔහු එසේ කරණු ඇත දෙවදත්ත වත් මා වත් එයට බවුනට බල කරණු යුතු නැතැ' යි දෙවදත්තයාගේ ඉල්ලීමට ඉඩ නොදුන්හ. එ කල්හි දෙවදත්ත තෙමේ මහණ ගණයා මැදට ගොස් 'හොඳ ද බුදුන්ගේ හැටි; මාගේ ඉල්ලීම ඔහු ප්‍රතික්ෂෙප කෙළේ ය, මාගේ ඉල්ලීම මහණුනට කොතරම් හිත ද; බලන්න, මම බුදුන් ලඟට ගොස් 'ස්වාමිනි! භික්ෂූහු දිවි තිබෙනතුරු වනයෙහි වසන්නෝ වෙත්වා, පිඬු සිඟී මෙත් යැපෙන්නෝ වෙත්වා, පවුල්සිවුරු දරන්නෝ වෙත්වා, රුක්මූලැ වසන්නෝ වෙත්වා, මත්‍සය්‍යමාංස නොකන්නෝ වෙත්වා' යි නීති පණවන්නට ඉල්ලා සිටියෙමි, ඒ ඉල්ලීම දුර දිග නොබලා ම ඔහු ප්‍රතික්ෂෙප කෙළේ ය, අප දෙදෙනාගෙන් භික්ෂූගණයාට හිත කවරෙක් ද; එ හෙයින් ඔබ වහන්සේලාගෙන් යමෙක් දුකින් මිදෙනු කැමැති නම්, ඔහු මා සමග ඒවා, එසේ නොකැමැත්තෙක් වේ නම් ඔහු මෙහි නතර වේවා' යි කියා සිටියේ ය. මේ ඇසූ නුවණ නැති ඇතැම් අලුත් පැවිද්දෝ 'දෙවදත්ත කියන්නේ යහපතකැ' යි අදහා, ඔහුට එකතු වූහ. මෙසේ දෙවිදත්, භික්ෂූන් පන්සියයක් තමතට ගෙණ, රළු පිළිවෙතට පහත් වූ මිනිසුන්, කරුණු කියා පහදවා ගෙණ, ගෙයක් ගානේ ගොස් අහර ගණිමින් සඞ්ඝභෙදයට උත්සාහය කෙළේ ය. ඒ දත් බුදුරජාණන් වහන්සේ 'දෙවදත්ත! සඞ්ඝභෙදයට උත්සාහ කරන්නෙහි සැබෑ දැ?' යි අසා වදාළහු ය. 'සැබෑවැ' යි කියූ කල්හි 'සඞ්ඝභෙදය වනාහි ඇනන්තරම් මහත් පාප

යෙකැ' යි ද දැන් වූහ. අවවාද කළහ. එහෙත් ඒ බුදුවදන් නො ද පිළිගත් දෙවදත්ත තෙමේ රජගහනුවර පිවූ සිහා හැසිරෙන ආනන්ද ස්ථවිරයන් වහන්සේ දැක. 'ආනන්ද! දැන ගත්නා! මා අද සිට බුදුන්ගෙන් වෙන් ව සඞ්ඝයාගෙන් වෙන් ව පොහොය කරණ බවත්, සඞ්ඝකර්ම කරණ බවත්' යි දැන්වී ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ දෙවිදතුන් කියූ මේ කතාව බුදුරජාණන් වහන්සේට දැන් වූහ. ඒ කතාව ඇසීමෙන් හටගත් මහත් ධර්මසංවේග ඇති බුදුරජාණන් වහන්සේ 'දෙවදත්ත මොක ද මේ කරන්නේ; මෙය අවීචිමහානිරයෙහි උපදවන බරපතල අකුසලයක් බව දෙවදත්ත නො දනී ද; දෙවියන් සහිත ලොකයට ම මෙය අනර්ථකර ය, ඇයි ද, මේ නම මෙසේ කරන්නේ' යි සලකා වදාරා,

"සුකරානි අසාධූනි අත්තනෝ අහිතානි ච,
යං වෙ හිතං ච සාධුං ච තං වෙ පරමදුක්කරං"[1].

යනුත් වදාළ සේක. අනතුරු ව උන්වහන්සේ,

"සුකරං සාධුනා සාධු සාධු පාපෙන දුක්කරං,
පාපං පාපෙන සුකරං පාපමරියෙහි දුක්කරං"[2]

යන මේ ප්‍රීතිවාක්‍යය ද ප්‍රකාශ කළ සේක.

දෙවිදත් තෙරුන් පොහොය දවසෙහි සිය පිරිස සමග පසෙකැ හිඳ, 'ඇවැත්නි! යමක්හට මේ පංචවස්තු රිසි වී නම්, ඔහු මෙයින් කුසපතක් ගත යුතු ය' යි කිවිට, කිසි හසරක් නො දන් පන්සියයක් වජ්ජීපුත්‍රකභික්ෂූහු ඒ ගත්හ. එයින් සඞ්ඝ තෙමේ හෙද වී ගියේ ය. දෙවිදත් තෙමේ ඒ පන්සියදෙනා ත් ගෙණ ගයාශීර්ෂයට ගියේ ය. බුදු රජාණන් වහන්සේ ඒ භික්ෂූන් ගෙණ එන්නට දූතයන්වත් එහි යැවූහ. උන්වහන්සේලා එහි ගොස් **'එවං තෙ මනෝ'** යන ඇලෙයින් ආදෙසනාපාටිහාරියානුසාසනාවෙන් හා ඉද්ධිපාටිහාරියානුසාසනාවෙන් ද අනුසාසනා කොට, නිවන් අවබෝධ කරවා, ඔවුනු ත් රැගෙණ අහසින් ආහ.

---

1 යම් කර්මයක් අයහපත් ද, තමාට අහිත ද, එබඳු කර්ම පහසුවෙන් කළ හැකි ය ඉදින් යම් කර්මයක් තමාට හිත ද, යහපත් ද එබඳු කර්ම කරණු ඉතා ම අපහසු ය

2. සත්පුරුෂ මිනිසුන්ට නිවැරදි කර්මය සුවසේ කට හැකි ය පාපයාට එබඳු නිවැරදි කර්මය සුවසේ නො කොට හැකිය පාප කර්මය පාපයාට සුවසේ කළ හැකි ය. හෙයින් හැදුනු වැඩුනු යහපත් මිනිසුන්ට පාපකර්ම නො කළ හැකි ය.

දෙව්දත් තෙරුන්ගේ අතවැසි කොකාලික තෙමේ, නිදු හුත් දෙව්දතුන් වෙත ගොස්, 'වහා නැගිටින්න, ශාරිපුත්‍ර - මෞද්ගල්‍යායනයෝ මෙහි අවුත් ඔබ වහන්සේගේ ශිෂ්‍යභික්ෂූන් ගෙණ ගියහ, ඔවුන් කෙරෙහි විශ්වාසයෙක් නො තැබියැ යුතු ය යි මා මුලින් කියා ඇත, ඔවුහු පහත් අදහස් ඇති ලාමක්යෝ ය, ලාමකයන්ගේ වශයට ගියෝ ය' යි කිය කියා දෙව්දතුන්ගේ පපුවට තට්ටු කෙළේ ය. මෙයැසූ දෙව්දත් තෙරුන්ගේ කටින් ලේ ගලන්නට වන. භික්ෂූන් වහන්සේලා ත් ගෙණ අහසින් එන සැරියුත් මහ තෙරුන් දුටු එහි සිටියා වූ භික්ෂූන් වහන්සේලා, බුදුරජුන් වෙත ගොස්, 'ස්වාමීනි! ශාරිපුත්‍ර මහාසථවිරයන් වහන්සේ ගයාශීර්ෂයට යද්දී ගියෝ තනියම ය, දුන්, අර, අහස, එන්නෝ මහත් පිරිසක් ගෙණ එති, එය ඉතා හොඳනේ ය' යි කිහ. 'මහණෙනි! ශාරිපුත්‍ර මෙසේ එන්නේ දැන් පමණක් ම නො වේ, පෙර දවසැ එක්තරා තිරිසන්යෝනියක ඉපද සිටි අවදියේ දී ද, මෙසේ මා ඉදිරියට එන්නේ, සොහමානව ම ආයේ ය' යි වදරා ඒ දවදිය දක්වන්නට **ලක්ඛණමිගජාතකය** වදළ සේක. අනතුරු ව භික්ෂූන් වහන්සේලා 'ස්වාමීනි! දෙවදත්ත තෙමේ දැගසව්වන් තමන් දෙපසැ හිඳුවා, බුදුරජුන්ගේ ලීලාවෙන් බණ කියමි'යි බුදුරජුන්ට සමාන ව ක්‍රියා කෙළේ ය' යි දන්වා සිටිවිටි, 'දෙවදත්ත එබඳු වැඩ කරන්නේ දැන් පමණක් ම නො වේ, පෙරුත් මා සමාන ව ක්‍රියා කරන්නට තැත් කෙළේ නො හැකි වී ය' යි දක්වන්නට **විරඟ ජාතකය** වදළ බුදුරජානන් වහන්සේ එය ම පැහැදිලි කරන්නට අන් දවස්හි එබඳු කතා නිසා ම **කණ්ඩගලඟ - විරොචනජාතකාදී** ජාතක කිපයක් ගෙණ හැර පෑහ. නැවැත, 'දෙවදත්ත කළගුණ නො දන්නෙක් ය' යන කතාවක් නිසා **ජවනාසකුණජාතකය** ද මරන්නට කළ උත්සාහය නිසා, **කුරුඩමිගජාතකාදී** වූ ජාතක ද 'දෙවදත්ත ලාභසත්කාරයෙන් හා ශ්‍රමණගුණයෙන් පිරිහුනේ ය' යන කතාවක් අසා **උභතොභට්ඨජාතකා** දී වූ ජාතක ද වදළ සේක. මෙසේ බුදුරජානන් වහන්සේ රජගහනුවර වැඩ වාසය කරණ සේක්, දෙව්දත් තෙරුන් නිසා, ජාතක බොහෝ ගණනක් වදරා, රජගහනුවරින් සැවැත්නුවරට වැඩම කොට දෙව්රම්මහ වෙහෙරෙහි වැඩ හිඳුහ.

කටින් උණු ලේ නික්මුණු දා සිට නව මසක් ගිලන් ව සිටි දෙවදත්ත තෙමේ පසු දවසෙකැ බුදුරජුන් දකිනු කැමති ව සිය සව්වන්ට, 'මා බුදුරජුන්ගේ ඉදිරියට ගෙණ යවු' යි කී ය. එවිට අතැවැස්සෝ 'ඔබ වහන්සේ බලගතු ව සිටි කාලයෙහි බුදුරජුන් හා විරුඬව ක්‍රියා කළහු ය, උන්වහන්සේ හා සටනෙහි යෙදී සිටියහු ය, මරන්නට තැත් කළහු ය, එබඳු වූ විරුඬකාරයකු ඔවුන් ගේ

ඉදිරියට අපි කෙසේ ගෙණ යමු ද, එය අපට කරන්නට නො හැකි ය' යි කීහ. ඉක්බිති දෙවදත්ත 'අනේ! තෙපි මා නො නසවු, මා බුදුරජුන්ට අපරාධ කළ බව සැබෑ ය, එහෙත් උන්වහන්සේ මට කෙසගක් පමණ වූ ද කිසිත් වරදක් නො කළහ, උන්වහන්සේ නසන්නට ගිය මට, අංගුලිමාලයාහට, ධනපාල ඇතාට, සිය පුත් රාහුලයාහට යන සියල්ලන්ට වෙනස් බවක් නො දක්වති, ඒ හැම දෙනා කෙරෙහි සමසිත් ඇත්තාහ, ඒ නිසා අමුත්තක් නො සිතා මා බුදුරජුන් ඉදිරියට ගෙණ යවු' යි කිහිපවිටක් ම කීයේ ය. එවිට ඔවුහු දෙව්දත් තෙරුන් ඇදෙක තබා කරට ගෙණ දෙව්රම්මහවෙහෙරට යන්නට පිටත් වූහ. භික්ෂූන් වහන්සේලා ඒ දැන, බුදුරජුන් වෙතට ගොස්, 'ස්වාමීනි! දෙවදත්ත තෙමේ බුදුරජුන් දකින්නට ඒ ය' යි දැන් වූ කල්හි 'මහණෙනි! ඒ වන්නෙක් නො වේ, මේ ආත්මයේදී නම්, ඔහුට මා දකින්නට නො ලැබේ ය' යි දැන්වූහ. **"යම් මහණෙක් යට කියූ පඤ්ච-වසතුන් ඉල්ලා සිටියේ නම් ඔහුට එ තැන් සිට බුදුරජුන් දකින්නට නො ලැබේ"** මේ ධර්මනියමය යි.

දෙවදත්තයන් දෙව්රමට ලා ලා වත් ම භික්ෂූන් වහන්සේලා 'දෙවදත්ත අසුවල් තැනට ආයේ ය, මෙයින් යොදුනක් පමණ තැනට ආයේ ය, අඩයොදුනක් පමණ තැනට ආයේ ය, ගව්වක් පමණ තැනට ආයේ ය, දෙව්රම්පොකුණලඟට ආයේ ය' යි කිහිප විටක් ගොස් දැන් වූ විට, 'දෙව්දත් විහාරය තුළට, මේ මා ලඟට ආයේ ද, මා දකින්නට නො ලබා' යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. දෙව්දත් කර තබා ගෙණ ආවෝ, දෙව්රම්පොකුණ ඉවුරෙහි ඇඳ බහා තබා නාන්නට පොකුණට බැස්සාහ. දෙව්දත් ද ඒ අතර ඇදෙන් නැගිට, දෙපා බිමැ තැබී ය. එ කෙණෙහි ම පොළොව පැළී ගියා ය. දෙව්දතුන්ගේ දෙ පය ඒ විවරයෙහි ගැලින. නැවැත දෙව්දත් තෙමේ පිළිවෙළින් ගොප් ඇටය, දන මඩල, උකුලුඇටය, බෙල්ල දක්වා පොළොව ගැලී හනුඇටින් බිමැ පිහිටා ගත්තේ ය. දෙව්දත් තෙමේ,

"පිහිටා හනුඇටින්, - නැත, කරුණු අටකින් දැන්,
දෙවියනට අදිදෙවි වූ - නරදම්සැරී සමතැසී,
සියපින් ලකුණු ඇති - ඒ අගපුගුල් බුදුරජ,
දිවිහිම් කොටින් ගියෙමි - සරණ කොට බෝ බැතිලෙන්"

යි බුදුරජුන් සරණ ගියේ ය.

බුදුරජානන් වහන්සේ මෙසේ දෙව්දතුන් මෙ තැනැදී සමාදන් වන මේ සරණාගමනය දැක, ඔහු පැවිදි කළ සේක. දෙව්දතුන් නො පැවිදි ව සිට ලොහිතුප්පාදදිකම් කරණ ලද නම්, ඒ කම්

මෙයට වඩා ඉතාබලගතු වන්නේ ය. අනාගතයෙහි ද ලැබෙන පසේබුදුබව ද නො ලැබෙන්නේ ය. පැවිදිවූවාහට ද ආනන්තරිය කර්මය, සඞ්ඝභේද විසින් බැහැරුම් වන්නේ ය. එහෙත් අනාගත භවයට උපනිඃශ්‍රයසම්පත්තීන් සිදු කිරීමෙහි ලා ඔහු නො පොහොසත් නො වේ. බුදුරජානන් වහන්සේ දෙව්දතුන් පැවිදි කළෝ එහෙයිනි. මොහු මෙයින් සිය දහස් කපකින් මතුයෙහි අවීසිසහස්‍ර නම් පසේ බුදු වන්නේ ය.

දෙවදත්ත තෙමේ මෙසේ පොළොව ගිලුනේ අවීචිමහානිරයෙහි උපන. හැමතින් නිසල වූ බුදුරජුන් කෙරෙහි කරණ ලද අපරාධ හෙතුවෙන් නිසල ව ම පැසිඇ යුතුය යි සියක් යොදුන් ඇති අවීචි මහානිරයතුළ සියක් යොදුන් උස් වූ සිරුරු ඇති ව උපන්නේ ය. හිස, කන්පෙති දක්වා, නිරය වසා මත්තෙහි සිටියා වූ පියන්පත තුළට කා වැදී ගියේ ය. දෙපය ගොප් ඇටය දක්වා, යපොළොවට ඇතුල් විය. මහතල්කදක් පමණැති යකඩහුලක්, පැසුලු බිත්තියෙන් නික්ම අවුත්, පිට මැද පසා කොට නික්මී පෙරදිග බිත්තියට ඇතුල් ව සිටියේ ය. අන් යහුලක් දකුණුදිග බිත්තියෙන් නික්ම, උතුරු දිග බිත්තියට ඇතුල් විය. තවත් යහුලක් හිස්කබල බිඳ ඇතුල් ව මලමඟින් නික්ම යපොළොව ඇණී සිටියේ ය. මෙසේ දෙව්දත්, හැමතින් යහුලින් සිර කරණ ලදු ව තදබද වී නිශ්චල ව එහි පැසෙයි.

භික්ෂූන් වහන්සේලා 'අයියෝ! දෙව්දතුන්ට වූවා මහාවිපතක, මෙ පමණ කැන් ආයේ ද බුදුරජුන් නො දැක්කේ ය, පොළොව ගැලී ගියේ ය' යි කතාබස් කරණු අසා, බුදුරජානන් වහන්සේ 'මහණෙනි! දෙවදත්ත මට විරුඬ ව හැසිරී පෙරත් පොළොව ගැලී ගියේ ය' යි වදාරා ඒ පිණිස **සීලවනාගරාජජාතකය** වදාළ සේක. නැවැතත් එගැණ කතාබස් උපන් කල්හි කලාබුරාජකාලයෙහි පොළොව ගිලුනු සැටි දක්වන්නට, **ඛන්තිවාදී ජාතකය** ද, ප්‍රතාපරාජකාලයෙහි පොළොව ගිලිනු සැටි දක්වන්නට, **චුල්ලධම්මපාල ජාතකය** ද වදාළ සේක.

රටවැසි ගැණු පිරිමි හැම දෙන, තුටුපහටු ව මංමාවත් හා ගේදොර සරසා, 'දෙව්බඹුන් සහිත අපට වූයේ මහත් ලාභයෙක, අපගේ හතුරා නිරයට ගියේ ය' යි කියමින් සැණකෙළි කෙළින්නට වූහ. ඒ දුටු භික්ෂූන් වහන්සේලා, ඒ බව බුදුරජුන්ට දැන් වූ කල්හි, උන්වහන්සේ 'පෙරත් දෙවිදතුන් මළකල්හි රටවැසි මිනිසුන් තුටුපහටු වූහ' යි දක්වන්නට,

"පිහුවන් ඇස් ඇති - බැවිනෙනම් ලත් රජහු,
පෙළු හැමදෙන නෙකතින් - ඌ මළකල්හි එ දෙනා,
සිතැ සතුට විඳිනී - දෙරටුපලු! කිම තෝ මෙහි?,
හඬනෙහි ද? ඒ පිහුවන් - ඇසැති රජ තට පිය වෙ ද?,
නො කලු ඇස් ඇති ඔහු - මට පිය නො වූයේ වේ,
පෙරළා ඌ ඒ ද යන - සිතින් බමි මම දැන් මෙහි,
මියගිය ඔහු මරු - පෙළු නම් මෙහි නැවැත ත්,
පෙරළා ඌ එවන්තේ - යන සිත් දුකිනි හඬමි"

යි පිඹුලපාතකය වදුළ සේක

අනතුරු ව භික්ෂූන් වහන්සේලා 'දෙවිදත් කොහි උපන්නේ-දැ' යි ඇසූහ. 'මහණෙනි! ඔහු අවීචිමහානිරයෙහි උපනැ' යි වදුළු විට, 'සවාමීනි! බලා වදුරන සේක්වා, මෙලොවැ නොයෙක් කම්-කටොලු විඳ තැවෙමින් සිට, පරලොවැ ගියේ ක්, තැවෙන්නේ නො වේ දැ' යි කිහ. 'ඔව්, පැවිද්දෙක් හෝ වේවා, ගිහියෙක් හෝ වේවා, පව්කම් කෙළේ නම්, ඔහු දෙලොවැ ම තැවෙන්නේ ය, එය කාට ත් වළකනු නො හැකි ය' යි වදුරා බුදුරජානන් වහන්සේ මේ ධම්දෙශනාව කළ සේක.:-

ඉධ තප්පති පෙච්ච තප්පති
පාපකාරී උභයත්ථ තප්පති,
පාපං මේ කතන්ති තප්පති
භියෝ තප්පති දුග්ගතිං ගතොති.

පව්කරණ සුලු තැනැත්තේ මෙලොවැ තැවෙයි. පරලොවැ තැවෙයි. (එලොවැ මෙලොවැ) දෙලොවැ තැවෙයි. මා විසින් පව්කම් කරණ ලදු යි මෙලොවැ තැවෙයි. පරලොවැ දුගතියට ගියේ, තදින් තැවෙයි.

ඉධ තප්පති = මෙ ලොවැ තැවෙයි.

සතුන්මැරීම්, හොරකම්කිරීම්, පරඹුවන් පරපුරුෂයන් සෙවුම් ආදි වූ පව්කම් කරණ තැනැත්තේ, ඒ තමන් කළ පව්කම් සිහි කොට, මේ ජීවිතයේදී ම තැවෙයි. වැලපෙයි.

පෙච්ච තප්පති = පරලොවැ තැවෙයි.

මෙ ලොවැ ජීවත් ව සිටියදී කරණ ලද පාපකර්මයන්ගේ බලවෙගය නිසා, මරණින් පසු පරලොවැ දුගතියකැ ඉපද ගන්නා සත්ව තෙමේ, ඒ දුගතියෙහි ඇති තැළුම් පෙළුම් වදබැඳුම් ආදී බිහිසුණු දුක් විඳින්නේ තැවෙයි.

පාපකාරී = පව් කරණසුලු තැනැත්තේ. පව්කරණ මිනිසා.

උභයත්ථ තප්පති = දෙලොවැ තැවෙයි.

දෙලොව නම්, වර්තමානභවය හා අනාගතභවය යි. මේ ජීවිතය හා මරණින් මතු ලබන ජීවිතයත් ය, දෙලොව නම්. මේ ජීවිතයේ දී කරණ ලද පව්කම් දක්නේ, 'අහෝ! මා දරුණු වැඩ කරණ ලද්දේ නො වේ දැ' යි තැවෙයි. මරණින් මතු ලබන ජීවිතයේ දී, මේ ජීවිතයේ දී කළ පව්කම්වල විපාක විඳින්නේ තැවෙයි.

පාපං මෙ කතං ඉති තප්පති = මාවිසින් පව්කම් කරණලදැ යි තැවෙයි.

පාපකාරී පුද්ගල තෙමේ රැදෙවේලේ 'මා විසින් අකුශලකර්ම කරණ ලද්දේ ය, එයට ලැබෙන විපාක බිහිසුණු ය, දරුණු ය, මට එය මෙලොවැ තැවීමට ත් පරලොවැ තැවීමට ත් හෙතු ය' යි යනාදි ලෙසින් කර්මදාහයෙන් තැවෙයි.

භියෝ තප්පති දුගගතිං ගතො = දුගතියට ගියේ වැඩියක් තැවේ.

මෙ ලොවැදී කළ පව්කම් සිහි කිරීමෙන් තැවී සිටි පාපකාරී පුද්ගල තෙමේ, මරණින් මතු එයට වඩා සිය දහස් ගුණයකින් වැඩි වූ බලවත් දුක් විඳිමින් තැවෙන්නේ ය. පව්කම් කළ තැනැත්තේ, බොහෝසෙයින් ඉපැදෙනුයේ, සිවු අපායයෙන් එකෙකැ ය.

නරක - තිරච්ඡාන - පෙත - අසුර යන මේ ය ඒ සිවු අපාය. පිණැයි පිළිගත් සම්පත්තීන්ගෙන් පහ වූ තැන් ය ඒ. **"පුඤ්ඤ සම්මතා අයා යෙභුය්‍යෙන අපගතාති = අපායා"** යනු අර්ථ සමර්ථනය යි. මේ තැන් **දුගති'** යි හඳුන්වන ලද්දේ නින්දිතගති ඇති බැවිනි. **"දුට්ඨු කුච්ඡිතා ගති = දුගගති"** යි එය කීහ.

එහි, නරකය, මහානරක විසින්, **සඤ්ජීව-කාලසූත්‍ර-සඞ්ඝාත-රොරුව-මහාරොරුව තාප-පතාප-අවීචි** යි අටෙකි. මේ එක් මහානරකයකට දොරටු සතරෙක් ඇත්තේ ය. ඒ එක් දොරටුවකැ උස්සදනරක සතර සතර බැගින්, එක් මහානරකයකට උස්සද

නරක සොළොසෙක් වේ. අට මහානරක හා ගත් කල, මුළුල්ල එක්සිය සතිසෙකි. මෙයින් අන්‍ය වූ ද, උස්සදනරක ඒ ඒ තැනැ ගම් කෙත් මෙන් ඇතැ යි කිහ.

යමපලුන් විසින් කඩකඩ කොට ගිදින ලද්දේත් යම් තැනෙක, නැවැත නැවැත උපදී ද, එ තැනය **සඤ්ජීව'** නම්. කලු ගූ ගසා, සතරැස් අටැස් ඇ ලෙසින්, නිරිසතුන් මහත්කුළු පමණ කොට, ගිනි ගත් වැසෙන් සිදින සසින තැන **කාලසුත්‍ර'** නම්. ගිනි ගත් අයොමයපඨිතයෙන් නිරිසතුන් සුන්බුන් කොට මිරිකන තැන **සඞ්ඝාත'** නම්. නව දෙරින් සිරුරතුළට වදනා ගිනිදැලින් හටගත් දුකින් නිරිසතුන් හඬ දෙන තැන **රොරුව'** නම්. රතුලේ වත් ගිනිදැලින් පිරුණු ඉතාබලගතු දුකින් ගුගුරා පැසෙන නිරිසතුන් ඇති තැන **මහාරොරුව'** නම්. ගිනි ගත් යපොළොවෙහි සිටැ, ගිනි ගත් යහුල්හි ඇවිණැ, නිරිසතුන් නිසල ව පැසෙන ගින්නෙන් අතරක් නැති තැන **තාප'** නම්. නිරිසතුන්, ගිනිදැලින් නද දුනින් අතරක් නැති ව පැසෙන තැන **අච්චි'** නම්.

මේ අට මහානරකයෝ, පිනිවීම් විසින් සතරැස් වෙති. දිගින්, පළලින්, උසින් සියක් සියක් යොදුන් පමණ වෙති. එහි එක් බින්තියක් නව යොදුන් පමණ ඝන ය. යපොළොව හා යපියන් පත ද එ පමණ ඝන ය. කල්පය පටන් ගත් තැන සිටැ මේ නරකයෝ ගිනිදැලින් අතරක් නැති ව පිරී පවතිත්. නිරිසත්තු ම දර කිස කරති. සඤ්ජීවනරකයෙහි ආයුකාලය, පන්සිය අවුරුද්දෙකි. සිවුමහරජයෙහි දෙවියන්ගේ මුළු ආයුකාලය අවුරුදු අනූලක්ෂ යෙකි. මේ අවුරුදුඅනූලක්ෂය, සඤ්ජීවයට එක් ම රෑදාවලෙකි. ඒ රෑදාවල් තිසෙක්, මාසයෙකි. ඒ මාසයෙන් මාස දෙළොසෙක්, අවුරුද්දෙකි. ඒ අවුරුද්දෙන්, අවුරුදු පන්සියයෙකි සඤ්ජීවයෙහි ආයුකාල ය.

සිවුමහරජයෙහි වැසි දෙවියන්ගේ පන්සිය අවුරුද්දක් තරම්වූ ආයුකාලය, සතරින් ගුණ කරණ ලද්දේ, තව්තිසාවැසි දෙවියන්ගේ ආයුකාලය වේ. මේ කාලය, කාලසූත්‍රනරකයට එක් රෑදාවලෙකි. ඒ දවස් තිසෙක්, මාසයෙකි. මාසදෙළසෙක්, අවුරුද්දෙකි. ඒ අවුරුදු දහසෙක්, කාලසූත්‍රනරකයෙහි ආයුකාලය යි.

තව්තිසාවැසි දෙවියන්ගේ ආයුකාලය, සතරින් ගුණ කරණ ලද්දේ යාමදෙවියන්ගේ, ආයුකාලය වේ. මේ කාලය, සඞ්ඝාත යට එක් දවසෙකි. ඒ දවස් තිසෙක් මාසයෙකි. මාසදෙළොසෙක් අවුරුද්දෙකි. මේ අවුරුදු දෙදහසෙක්, සඞ්ඝාතයෙහි ආයුකාලය යි.

යාමයන්ගේ ආයුකාලය, සතරින් ගුණ කරණ ලද්දේ, තුසිත දෙවියන්ගේ ආයුකාලය වේ. මේ කාලය, රොරුවයට එක් දවසෙකි. ඒ දවස් තිසෙක් මාසයෙකි. මාසදෙලොසෙක් අවුරුද්දෙකි. මේ අවුරුදු සාරදහසෙක් රොරුවයෙහි ආයුකාලය යි.

තුසිතයන්ගේ ආයුකාලය, සතරින් ගුණ කරණ ලද්දේ, නිම්මාණරතිදෙවියන්ගේ ආයුකාලය වේ. ඒ මේ ආයු කාලය, මහා රොරුවයට එක් දවසෙකි. ඒ දවස් තිසෙක් මාසයෙකි. මාස දෙලොසෙක් අවුරුද්දෙකි. මේ ලෙසින් අවුරුදු අටදහසෙක් මහා රොරුවයෙහි ආයුකාලය යි.

නිම්මාණරතිකයන්ගේ ආයුකාලය සතරින් ගුණ කරණ ලද්දේ, පරිනිම්මිත වසවත්‍ති දෙවියන්ගේ ආයුකාලය වේ. මේ ආයු කාලය, තාපයට එක් දවසෙකි. ඒ දවස් තිසෙක් මාසයෙකි. මාස දෙලොසෙක් අවුරුද්දෙකි. මේ ලෙසින් අවුරුදු සොළොස් දහසෙක් තාපයෙහි ආයුකාලය යි.

අනන්තකල්පයෙකින් අඩෙක්, ප්‍රතාපනරකයෙහි ආයුකාලය යි. අනන්තකල්පයෙක් අවීචිමහානරකයෙහි ආයුකාලය යි. මිනිසුන්ගේ ආයුකාලය, දසවසින් පටන් ගෙණ පිළිවෙළින් නැගී ගොස්, අසඞ්ඛ්‍යයට පැමිණ, නැවැත, අසඞ්ඛ්‍යයෙහි සිට, පිළිවෙළින් පිරිහී ගොස් පහත බැස, දසවසට වැටේ මෙදැතුර කාලය අනන්තකල්ප නම්. රෝගානන්තකල්ප-ශස්ත්‍රානන්තකල්ප-දුර්භික්ෂානන්තකල්ප යි අනන්තකල්පය තෙ වැදෑරුම් ය.

ලොභ-දෙස-මොහයෙන් මැඩී, සතුන්මැරීම් හොරකම්කිරීම් ආදී වූ පවකම් කරන්නෝ, නො දහමින් වැරදි ලෙසින් ලෝ වැස්සනට දුක් දෙන්නෝ, අනුන් කෙරෙහි ක්‍රොධයෙන් සැඩ බැවින් යුද-කොලාහල කරන්නෝ, යන මේ ඈ ලොවැ අපරාධ කරන්නෝ සඤ්ජීවයෙහි ද,

මවුපියන්ට, ගුරුවරුන්ට, කුලදෙටුවන්ට, දුහී-මහී-යාචකයනට අපරාධ කරන්නෝ, බොරු කියන්නෝ කාලසූත්‍රයෙහි ද,

අත්පාදඞ්මුගුරින් අනුනට පහර දෙන්නෝ ඇත්-අශ්-ගොන්-මීගොන් ඈ සතුනට දුක් දෙන්නෝ සඞ්ඝාතයෙහි ද,

බොරුසාක්ෂ්‍ය කියන්නෝ, හොර වෙළඳම් කරන්නෝ, ඉන්ද්‍රජාලමායාකාරයෝ රොරුවයෙහි ද,

බුදුන්-දහම්-සඟුන්සතු ඉඩකඩම්, වතුපිටි, ඇද, පුටු, කොට්ට, මෙට්ට ඇඳඇතිරිලි, පාන්, පඞ්ක්තිකම් ඈ සොරකම් කරන්නෝ,

කොස්, දෙල්, පොල්, පුවක්, කෙසෙල් ඈ කා දමන්නෝ, තෙරුවන් උදෙසා එක් රැස් කළ මිල මුදල් ගසා කන්නෝ, දුප්පතුන් අයත් ඉඩකඩම් ගේදොර මිලමුදල් පැහැර ගන්නෝ මහාරොරුවයෙහි ද,

පරුෂවචන කියා, අනුන් වෙහෙසන්නෝ සතර අගතියෙන් බැඳී සිටින්නෝ 'පින් පව් නැතැ' යි මිසදිටු ගත්තෝ තාපයෙහි ද,

බුඬ-ධම්ම-සඞ්ඝ යි තෙරුවනෙක් නැතැ යි ආදි ලෙසින් මිසදිටු ගත්තෝ පතාපයෙහි ද,

මවු-පියන්-රහතුන් මරන්නෝ, ලොහිතුප්පාදය කරන්නෝ, සඞ්ඝභෙද කරන්නෝ, තෙරුවන් සතු අරම්, දාගැබ්, මහබෝ, පෙතිපිළිම ඈ නසන්නෝ අවීචියෙහි ද උපදිති.

මෙසේ මේ මහානරකයකැ වැටී දරුණු දුක් විඳින සත්වයකු, 'නරකයෙන් නික්මෙමි' යි සිතා, පැසුළු දිග සිට, පෙර දිග බැලූ කල්හි පෙර දිග දොර, ඇරී සිටියා සේ ඔහුට පෙණේ. එකල ඔහු, ගිනිගත් යපොළොවෙහි පා තබ තබා, නැසි නැසී, පෙර දිග දොරට පැමිණේ. එහෙත් දොර ඇරුණේ නො වේ. මෙසේ, ඔහු පාප-කර්මය විසින් ගින්නෙහි ලා දව දවා, හැම දොරකට පමුණුවනු ලබන්නේ ය. එහි වසන යමපල්ලෝ ද, ගිනිගත් යහුලින් ඇණ කොටමින් ඔහු තව තවත් දුකට පත් කරත්. පව්කම් කළ සත්ව තෙමේ, ඒ ඒ නරකයන්හි ආයු පමණින් පැසුනේ ද, තමන් කළ අකුශලකර්මය, අවසන් ව නො ගියේ නම්, පුන පුනා නරකයෙහි ම හෙන්නේ ය.

මහානරකයෙහි අවුරුදු ගණනින් දුක් වින්දවන, සඞ්ඛ්‍යා නාමයන් විසින්, හඳුන්වන ස්ථාන දශයෙක් ඇත්තේ ය. **අබ්බුද - නිරබ්බුද - අහහ - අබබ - අටට - සොගන්ධික - උප්පල - කුමුද - පුණ්ඩරීක - පදුම** යන මේය ඒ.

තලඇට, අට ලක්ෂයෙක්, එක් නැළියෙකි. ඒ නැළියෙන් නැළි සතරෙක් එක් ලාස්සෙකි. සතර ලාස්සෙක් එක් ද්‍රොණයෙකි. ද්‍රොණ සතරෙක් එක් මාණිකාවකි. මාණිකා සතරෙක් එක් ඛාරි-යෙකි. ඛාරීවිස්සෙක් තලින්පිරූ බරකරත්තයෙකි. මිනිසුන්ගේ ආයුකාලයෙන්, සියක් අවුරුද්දක් ගිය තැන, මේ තලකරත්තයෙන් එක් තලඇටය බැගින් බැහැර ලෑමෙන්, ඒ තලකරත්තයෙහි තල ඇට සියල්ල අවසන් ව ගියේ ද, අබ්බුදයෙහි අවුරුදු ගණන තව ම නො පිරුණේ ය. ඒ මේ අබ්බුදයෙහි අවුරුදු ගණනින්, මහානිර-යෙහි පැසියයුතු තැන, අබ්බුදනරකය යි හඳුන්වනු ලැබේ.

අබ්බුද විස්සෙක් එක් නිරබ්බුදයෙකි. නිරබ්බුද විස්සෙක් එක් අහහයෙකි. අහහ විස්සෙක් එක් අබබයෙකි. අබබවිස්සෙක් එක් අටටයෙකි. අටටවිස්සෙක් එක් සොගන්ධිකයෙකි. සොගන්ධික විස්සෙක් එක් උප්පලයෙකි. උප්පල විස්සෙක් එක් කුමුදයෙකි. කුමුද විස්සෙක් එක් පුණ්ඩරීකයෙකි. පුණ්ඩරීක විස්සෙක් එක් පදුමයෙකි. (මේ සඞ්ඛ්‍යා නියමය සමහර අටුවාවන්හි මෙයට වෙනස් ව දක්නා ලැබේ.)

ඒ ඒ අපායයන්හි උපන් නිරිසතුන් විසින් විඳිනු ලබන, ප්‍රමාණ නොකොටහැකි දුකෙහි තතු කියා පෑමෙහි බුදුරජානන් වහන්සේ හැර කවරෙක් සමර්ථ වේ ද, මේ දුක්වූනේ, අඩුවක් ප්‍රමාණකු ත් නොවේ.

කිසිලෙසකින් මගඵල ලබන්නට නොහැකි වූ එහෙයින් ම පහතට හෙන, කාමයෙන් හා බියෙන් නිතර තැවෙන සත්ත්වයෝය තිරච්ඡාන. **"තිරෝ අඤ්ඤිතාති = තිරච්ඡානා"** යනු අරුත් පැවසීම ය. යම් සත්ව කෙනෙක් මොහයෙන් මුසා ව, අකුසලකර්ම කළෝ ද, ඔවුහු බොහෝසෙයින් තිරිසන්යොනියෙහි උපදිති.

තිරිසනුන්ගේ හෙද වෙනස්කම් බොහෝ ය සමහරු ඇසට පෙණෙති. සමහරු ඇසට නොපෙණෙති. ඇතැම් තිරිසන්හු දිග ය. ඇතැම්හු කොට ය. ඇතැම්හු මැදියම් ය. ඇතැම්හු මහත් ය. ඇතැම්හු සියුම්හ. අණ්ඩජ-ජලාබුජ-සංසෙදජ-ඔපපාතික-අපාද-ද්විපාද-චතුෂ්පාද බහුපාද යන මේ හෙද ද, තිරිසන් ගණයෙහි දක්නා ලැබේ. තිරිසන්අපායයෙහි ඉපදීම් හා එහි දුක්විඳුම, පෙර කරණලද අකුශලකර්මයන්ගේ වශයෙන් සිදු වේ. තිරිසනුන් විඳින දුක ත් ඔවුන් ඉපිළිබඳ ජාති ත්, උපදින ස්ථාන ත් මෙතෙකැ යි නොකියැකි ය. එක් මිනිසකුගේ ශිරෝරුහ කොට උපදින තිරිසනුන්, කුල විසින් අසූ දහසකැ යි කියති. ඇසට නොපෙණෙන තිරිසනා පටන්, පත්තියයක් ගොදුන් දිගැති තිමිරපිඹලමත්ස්‍යයා දක්වා, නොයෙක් ලෙසින් බෙදී යිය තිරිසන්හු, උනුන්ට ගොදුරු ව වැනසෙති. කාම-ගොචර-මරණ යන සංඥා හුන, තිරිසනුන් කෙරෙහි නොතොර ව දක්නා ලැබේ. ධර්මසංඥාවක් ඔවුනට නැත. කාමසෙවනය නිතර බලා පොරොත්තු වෙති තිරිසන්හු. කී නම් වේලක ගොදුරෙක් ලැබේ දැ යි සොය සොයා ඇවිදිති. මරණබියෙන් නොතොර ව ම, කාම සෙවනය කරන්නෝ ත්, ගොදුරු සොයන්නෝ ත් වෙති. තිරිසනුන් විඳින දුක, ප්‍රමාණ කොට නොදැක්වියැ හැකි ය. ඒ දැක්වීමෙහි බුදුරජානන් වහන්සේ ය සමර්ථ වන්නෝ. අන් කවරෙකු ත් එහි සමර්ථ නොවේ.

මුළුමනින් සැපයෙන් පහව ගියෝය ප්‍රෙතයෝ. **"පඤ්ඤෙන සුඛතෝ ඉතා ගතානි=පෙතා"** යන්නය ඒ කියේ. ඔවුන් අතර **නිජ්ඣාමතණ්හික-ඛුප්පිපාසික-පංසුපිසාචක-පරදත්තූපජීවික-කාලකඤ්ඤ-අට්ඨිසංඛලික-මංසපිණ්ඩික** යනාදී වූ නම්වලින් හඳුන්වන ප්‍රෙතයෝ ඇත්තාහ.

සිරුරතුළ දැල්වුනු ගිනිදැලින් දැවෙන සිරුර ඇති ප්‍රෙතයෝ ය **නිජ්ඣාමතණ්හික'**. ගස්සිදුරෙහි හටගත් ගින්නෙන් ගස දැවෙන්නා සේ ය ඔවුහු දැවෙන්නෝ. මල-මූ-සෙම්සොටු පමණකුත් නොලබා, බුඬාන්තර දහස් ගණන් සා පිපාසා දෙකින් පෙළෙන්නෝ ය **ඛුප්පිපාසික'**. පස්ගොඩ-කුණුගොඩ-අසුවිවළ-කඳු බැවුම ඇ අපිරිසිදු තන්හි උපන්නෝ ය **පංසුපිසාචක'**. අන්හු දෙන දෙයින් ජීවත් වන්නෝ ය **පරදත්තූපජීවික'**. සඳළුලියක්, හිරු එලියක් යන්තමකිනු ත් නොලබා, තදගනදුරෙන් වැසුනු, තද සීතලෙන් අතර නැති, උපන්නහුගේ සිරුර සිඳා බිඳා දමන, ක්ෂාරෝදකයෙන් පිරුණු චක්‍රවාට තුනක් මැද උපන්නෝ ය **කාලකඤ්ඤ'**. තුන් ගවු පමණ උස් වූ සිව්යෙන් සමින් නහරින් පමණක් වැසුනු ලේ මස් නැති ඇටසැකිලි දරන්නෝ ය **අට්ඨිසංඛලික'**. ඇට නහර වැසූ සම පමණකුත් නැති ව, කුණු වූ මස් ගොඩක් වැනි සිරුරු ඇත්තෝ ය **මංසපිණ්ඩික'**.

දන් නොදෙන්නෝ, උනුනට ඊර්ෂ්‍යා කරන්නෝ, ලොභයෙන් තද බද වන්නෝ, සම්පත් සඟවන්නෝ, දස අකුසල් කරන්නෝ, අනුන්ට ලැබෙන ලාභ වළකන්නෝ, මවු පියන් කෙරෙහි ඵලි බිය නොදක්වන්නෝ අනුන්ගේ පින්කම්වලට අනතුරු කරන්නෝ 'මල මූ කව' කියා අනුනට පරිභව කරන්නෝ, නොදහමින් ගම්වැස්සත් පෙළන්නෝ අගතියෙන් නොමග යන්නෝ අල්ලස් ගන්නෝ යන ඇ පව් කම් කරන්නෝ ප්‍රෙතභූමියෙහි, උපදිත්.

හැම ප්‍රෙතයෝ ම, සා පිපාසා දෙකින් මැඩුනෝ, වැහැරී ගිය සිරුරු ඇත්තෝ ය. මහත් ඔලු ඇත්තෝ ය. ඇටසැකිලි දරන්නෝ ය. කෙල, සොටු, කැහි, මල, මූ, වැදුමස්, මළකුණු කන්නෝය. රළුහිසකෙස්, ලොම්, නිය, දත් ඇත්තෝ ය. නගනාව වසන්නෝ ය. බිහිසුණු දැකුම් ඇත්තෝ ය. ඉදිකටුමල සේ, ඉතාකුඩා මුව ඇත්තෝ ය. කකුළුඇස් සේ, පිටතට නෙරුණු දැස් ඇත්තෝ ය. නාස්පුට දෙකින් නික්මුණු, පා පිටු දක්වා දික්ව එල්ලෙන මස් වැදිලි දරන්නෝ ය. යමක් කන බොන විට හිසැ තබා කති. බොහී. ගිනිගත් යකඩමුගුරෙන්, උනුන් ඇණ කොටා ලේ සැරව උරා බොති. මෙසේ ප්‍රෙතයන් විඳින දුක පමණ කොට දැක්වියැ නොහැකි ය. එහි සමඟී වන්නෝ බුදුරජානන් වහන්සේ ම ය. අන් කවරෙකු ත් එහි සමඟී නොවේ.

මෙසේ පමණ කොට නො දැක්වියැ හැකි ඉතා සැහැසි වූ ඇසූ පමණින් සිතූ පමණින් ලය කකියවන බිහිසුණු දුක් විඳීමට තැන් වූ පව්කම්හි අනිටුපල විඳීමට තැන් වූ ප්‍රෙත ලොකයෙහි දුක් ගැණ සිතා බලා දැන ප්‍රෙතලොකයෙන් මිදී ගණු පිණිස දාන-ශීල-භාවනාදී වූ දශ පුණ්‍යක්‍රියා වස්තූන්හි යෙදී රැ දාවල දෙක්හි අප්‍රමත්ත වියැ යුතුය. සග සැප හා නිවන් සැප ලැබීමට උත්සාහවත් වියැ යුතුය. කීහ එය මෙසේ:-

"ඉති ච සකලපෙතෙ තිබ්බදුක්ඛානුභොන්තෙ
අකුසලඵලභූතෙ භූතතො සංවිදිත්වා,
තිවිධකුසලකම්මං සඤ්චයන්තා අනන්තං
තිවිධසුඛමනන්තං වායමෙ සෙට්ඨමග්ගං" යි."

අසිලොම - සූචිරොම ප්‍රෙතයෝ ද මොවුන් කෙරෙහි ම වැටෙති. කඩු වැනි ලොම්, උඩ බලා නැගී, මුළුසිරුර දැල්කවුළුවක් සේ සිදුරු කරණ ලොමින් ගැවසී ගත් සිරුරු ඇත්තෝ ය අසිලොමයෝ. ඉදිවැනි ලොමින්, මුළු සිරුර විදින ලද්දෝ ය සූචිරොමයෝ. ලොව පුරා වසන ප්‍රෙතයන්ගේ ආයුකාලය, කියන්නට නො හැකි ය. කළ පව්කම් නො ගෙවී පවත්නාතුරු ම, ඔවුහු නොයෙක් දුක් විඳිති.

ඉසුරු මදයෙන් මත් ව, ක්‍රීඩා නො කරන්නෝය අසුර. මෙයින් ප්‍රෙතාසුරයෝ ම ගැණෙති. වෙපචිත්තිඅසුරයෝ නො ගැණෙති. ඔවුහු, දුහෙතුකකාමාවචරවිපාකසිතින් පිළිසිඳ ගෙණ, විපාක කාලයෙහි ත්‍රිහෙතුකමහාවිපාකයන්ගේ වශයෙන්, දෙවියන්ට බඳු පස්කම්සැප අනුභව කෙරෙති. එහෙයින් තව්තිසාවැසි දෙවියන් ගේ ගණයට වැටෙති. එහෙත් මොවුනට ත්‍රිහෙතුක දෙවියන්ට මෙන් ධ්‍යාන-මාර්ග-ඵල නො ලැබේ. අපායගණයෙහි ලා ගිණු අසුර භූමිය ප්‍රෙතදුඃඛවිභාගයෙහි දැක් වූ කාලකඤ්ජ ය යි දතයුතු ය.

කාලකඤ්ජ අසුරභූමිය තුන් තුන් සක්වළ එක් වූ තැනැ පිහිටි යාය. අසූසාරදහසක් අසූසාරදහසක් යොදුන් පමණ දිග පළල ඇත්තී ය. සක්වළ ගල් තුනට මැදිව සිටියා ය. මහාමේරු පර්වතය වුව ද එහි බලාලන ලද්දේ නම් එහි වූ අධික සීතය නිසා ලුනු පිඩක් සේ විරී වැගිරී යන්නේය. මේ කාලකඤ්ජ අසුර යොනි යෙහි උපන්නවුන්ගේ සිරුරු තුන් ගවු පමණ වෙත්. කට ඉදි කටු මල සිදුර සේ ය. ඇස් කකුළු ඇස් වැනි ය. පිටතට නෙරා ගියහ. මොවුහු යමක් කන බොන කල්හි හිස නවාගෙණ කන්-නෝ ය. බොන්නෝ ය. මේ ප්‍රෙතලෝකයක් සේ ද දැක් වේ.

"තිරච්ඡානපෙතතිවිසයඅසුරකායානං පන විසුං භූමි නත්ථි, තෙසං ඛන්ධප්පවත්තිවිසයොයෙව භූමි නාම" තිරච්ඡාන ප්‍රෙත-අසුරභූමිගතසත්වයනට අයත්, ඔවුනට ම වෙන් කළ හැකි වෙන ම භූමියක් නැත. ඔවුන්ගේ සකන්ධයෝ ම ඔවුනට භූමි වෙති.

සිවු අපායැ වැස්සන්ගේ ප්‍රතිසන්ධිය, උඩච්චසහගතඅකුසලය හැර, අනික් සෙසු එකොළොස් අකුශලකර්මයන්ගේ ශක්තියෙන් අකුසලවිපාකඋපෙක්ඛාසන්තීරණවිත්තයෙන් වන්නේ ය. එහෙ යිනි සිවු අපායවැස්සෝ, එකත්තසඤ්ඤී-නානත්තකායී' කියනු ලබන්නෝ. එහි එකත්තසඤ්ඤී' යනු එක් ම උපෙක්ඛාසහගත සන්තීරණය ඇත්තෝ ය යන අර්ථ යි. නන් වැදැරුම් වූ සිරුරු සටහන් ඇත්තෝ ය නානත්තකායී.

මෙසේ ඉතා සැකෙවින් කියූ අපාය අතුරෙහි එක්තරා අපායකැ වැටුනු සත්ව තෙමේ එහි තදින් තැවේ ය යි වදාළ සේක.

දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩසහිත වූ ය.

දෙවදත්තස්ථවිරවසතුව නිමියේ ය.

සුමනා දෙවිය

1 — 13

අනාථපිණ්ඩික තෙමේ, සැවැත්නුවර විසූ මහාධන්පතියා ය. ඔහුගේ ගෙදරැ දිනපතා දෙ දහසක් භික්ෂූන් වහන්සේලා දන් වලඳති. විශාඛාමහාඋපාසිකාවගේ ගෙදරැ ද, එසේ ම දෙ දහසක් භික්ෂූන් වහන්සේලා දන් වලඳන්නෝ ය. සැවැත්නුවර වැස්සෝ සිය ගෙවල දන් දෙනවිට, මොවුන් දෙදෙනා, එහි පමුණුවා ගණිති. දන් දෙන තැනකැ මේ දෙදෙන පෙණී සිටියෝ නම්, ඒ දුනය ඉතා උසස් දනකැයි නුවරවැස්සෝ සැලකූහ. දන් දෙන තැනකට මොවුන් නො පැමිණිවිට දුනය සිය දහසක් වියදම් කොට පිළියෙල කළ ද එය උසස් දනක් සේ ඔවුහු නො පිළිගණිති. භික්ෂූන් වහන්සේලාගේ කැමැත්ත ත්, ඒ ඒ භික්ෂූන් වහන්සේට වුවමනා දේ ගැණ ත්, භික්ෂූන් පිළිබඳ වතාවත ත් මේ දෙ දෙන හොඳින් දන්නෝ ය. දුනශාලාවේ කටයුතු, මොවුන් සොයා බලන කල්හි, භික්ෂූන් වහන්සේලා ද, කැමැති සේ වලඳති. මේ නිසා දන්ගෙවලැ කළයුතු කටයුතු පිණිස නිතර නිතර තැනැ තැනැ යන මොවුන්ට, සියගෙවල වලඳන භික්ෂූන් වහන්සේලාගේ වතාවත කරන්නට ඉඩ පහසු නො ලැබෙන්නේ ය. එක් දිනක්, විශාඛාමහාඋපාසිකාව 'මා කරණ මේ කටයුතු කරන්නට කවරෙක් සමර්ථ වේ දැ' යි සිතන්නී, මිණිබිරිය දැක, ඇට ඒ කටයුතු භාර කළා ය. ඕ තොමෝ එතැන් සිට ඒ කටයුතු නො පිරිහෙලා මැනැවින් ඉටුකළා ය. අනාථපිණ්ඩික තෙමේ ත්, තමන් විසින් කළ ඒ කටයුතු, සිය වැඩි මහල් දියනිය වූ මහාසුභද්‍රාවට පැවරී ය. ඕ තොමෝ ද, එ තැන් සිට සඞ්ඝයා වහන්සේ පිළිබඳ ඒ කටයුතු හොඳින් සිදු කළා ය. සඞ්ඝයා වහන්සේගේ ආශ්‍රයෙන් බණදහම් උගත් මහාසුභද්‍රා තොමෝ කල් නො යවා ම සෝවන් වූවා, විවාහ ජීවිතයට ද පත් වූ ය. ඉන් පසු අනාථපිණ්ඩික තෙමේ සඞ්ඝයා වහන්සේ පිළිබඳ කටයුතු, බාලදියනිය වූ සුමනාවට භාර කෙළේය. ඕ ද, කල් නො යවා, සකදාගාමිඵලයට පැමිණියා ය. දිග නො ගොස්, ගෙයි වැඩුනු ඕ තොමෝ, බලගතු ලෙඩකින් ඔත්පල වූවා, කෑම් බීම් ද බැහැර කළා ය.

මේ අතර දිනකැ, පියා දකිනු කැමැති සුමනා තොමෝ, පියා ලඟට කැදෙව්වා ය. අනාථපිණ්ඩික තෙමේ ද වහා එහි ගොස්, 'දුව! සුමනා! ඇයි මා කැදෙව්වෙහි?' යි ඇසුයේ ය. 'බාල සහෝදරය! කුමක් කියන්නෙහි දැ' යි ඈ ඇසූ ය. 'දුව! සුමනා! මොක ද මේ?, නත් දෙඩ වන්නෙහි' යි කීවිට, 'බාල සහෝදරය! නෑ මම නත්

දෙඬවන්නී' යි ඕ තොමෝ කිවු ය. 'එහෙ නම්, දුව! සුමනා බිය පත් වූවා දැ' යි ඇසූ විට, 'බාල සහෝදරය! බියපත් වන්නෙම් කුමකට ද යි අසා, එ කෙණෙහි ම කලුරිය කළා ය.

අනාථපිණ්ඩික සිටු තෙමේ සෝවත් ව සිටියේ ද දුවගේ මරණ යෙන් හටගත් ශොකය දරා ගත නො හැක්කේ, ආදහනය කොට නිමවා අඬ අඬා බුදුරජුන් වෙත ගොස් පසෙකට වී හුන්නේ ය. එවිට බුදුරජාණන් වහන්සේ, 'ගැහැවිය! මොක ද, දුකින් අඬා අඬා කඳුලු වගුරු වන්නෙහි? කියව' යි කිහ. 'සවාමීනි! මාගේ දුව සුමනා, මාගේ දුව, කලුරිය කළා, දරන්නට බෑ සවාමීනි! දුක කොයිලෙස කිතුත්' යි කිවිට බුදුරජාණන් වහන්සේ 'තමුසේ ඇයි, ඔයට ශොක කරන්නහු?, මරණය කාට ත් නියම යි, මරණයෙන් මිදුනෙක් තුන් ලොවැ කොහැනකැ වත් සිටී ද?, නිසරු ඇඬුමෙක්, උපන්නාහට මරණය නියම වූයේ, උපන්දම ය, ඇයි තමුසේ, මේවා නො දන්නහු දැ' යි ඇසූවිට 'සවාමීනි! මම ඒවා දනිමි, හඬන්නේ මරණය ගැණ ශොකයෙන් නො වෙමි, ලජ්ජා භය ඇති ව දවස් යැවූ මාගේ දුව, මැරෙද්දි සිහි එළවා ගත නො හැකි ව, නත් දෙඬව දෙඬවා මළ බැවිනැ' යි කීයේ ය. එවිට බුදුරජාණන් වහන්සේ 'ඇ මැරෙද්දී කුමක් කීවා දැ' යි ඇසූහ. සිටු තෙමේ 'සවාමීනි! ඇට මම දුව! සුමනා! යි කතා කළා, එවිට ඇ මට 'බාල සහෝදරය!' යි කීවා, නැවැත මම 'දුව! නත් දෙඬ වන්නෙහි දැ' යි ඇසුවා, ඒවර මට 'බාල සහෝදරය! මම නත් නො දෙඬවමි' යි කීවා, ආයින් මම 'දුව බියපත් වූවා දැ' යි ඇසුවා. එයට ඇය 'බිය පත් නො වෙමි' යි කියා ඒ ඇසිල්ලෙහි ම කලුරිය කළා ය' යි කියේ ය. එවිට බුදුරජාණන් වහන්සේ, 'මහසිට! ඔබගේ දුව නත් නො දෙඩුවා ය, ඇය කීවා ඇත්ත යි, සිටුතුමන් බාල බැවින් ම ය ඇය එසේ කීවා, ඔබගේ දුව මගපල ලැබීමෙන් ඔබට වඩා මහලු ය, ඔබ සෝවන්, ඔබගේ දුව සෙදගැමි, ඒ නිසා ය ඇය මෙසේ කීවා' යි වදාළ විට ඔහු 'එසේ දැ' යි අසා නැවැත 'සවාමීනි! මා දුව කොහි උපන්නී ද, යි ඇසී ය. 'තුසිත භවනයෙහි' යි උන්වහන්සේ කිහ.

ඉක්බිති සිටු තෙමේ, සවාමීනි! මාගේ දුව ජීවත් වන්නී, නැයන් මැද, ඉතාසතුටින් ජීවත් වූවා ය, එය මට ද මහත් සතුටෙක් විය, මැරී ගොස් උපන්නී ද, සතුටු වන්නට හැකි තැනක ය, එ ද මට සතුටෙකැ' යි කියේ ය. බුදුරජාණන් වහන්සේ 'ගැහැවිය! ඔව්! ගිහියෙක් හෝ, පැවිද්දෙක් හෝ වේවා, යම් කෙනෙක් අප්‍රමත්ත නම්, ඔවුහු එලොවැ මෙලොවැ දෙක්හි ම සතුටු වෙති' යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක:-

ඉධ නන්දති පෙච්ච නන්දති
කතපුඤ්ඤෝ උභයත්ථ නන්දති,
පුඤ්ඤං මෙ කතන්ති නන්දති
භියෝ නන්දති සුගතිං ගතෝ හි.

කළ පිණැත්තේ මෙලොවැ සතුටු වේ. පරලොවැ සතුටු වේ. (මෙසේ) දෙලොවැ (ම) සතුටු වේ. මා විසින් පින්කම් කරණලදු යි (මෙලොවැ) සතුටු වේ. සුගතියට ගියේ, වැඩියක් සතුටු වේ.

ඉධ නන්දති = මෙලොවැ සතුටු වේ.

දානශීලාදීන්ගේ වශයෙන් කරණ ලද පිණැත්තේ, තමන් කළ කුශලකම් සිහි කිරීමෙන් මේ අත්බවේදී ම සතුටු වේ.

පෙච්ච නන්දති = පරලොවැ සතුටු වේ.

ජීවත් ව ඉන්ද දී, කරණ ලද කුශලකම්යන්ගේ විපාක වශයෙන්, මැරී ගොස් සුගතියකැ ඉපද, එහි විඳිනු ලබන ඉසුරු බලා සතුටු වේ.

කතපුඤ්ඤෝ = කළපින්කම් ඇත්තේ. පින්කම් කෙළේ.

ශ්‍රද්ධාදිගුණසම්පත්තියෙහි පිහිටා, කළ දන් සිල් ඇ පින්කම් ඇත්තේ, පින්කම් කිරීමේ දී ඇතිවිය යුතු චේතනාවිසුද්ධියෙහි පිහිටා පින්කළේ, **කතපුඤ්ඤෝ'** නම්.

උභයත්ථ නන්දති = එලොවැ මෙලොවැ යන දෙලොවැ සතුටු වේ.

පින්කම් කිරීමේ දී සම්පූර්ණ විය යුතු කරණු සම්පූර්ණ කොට, පින්කම් කරන්නේ 'මෙලොවැ දී මා විසින් කරණ ලද්දේ පින්කම් ය, පවකම් නොකරණ ලද්දේ ය' යි සතුටු වේ. පරලොවැ ගියේ, එහි විපාක විඳිමින් සතුටු වේ.

පුඤ්ඤං මෙ කතං ඉති නන්දති = මා විසින් පින්කම් කරණලදු යි සතුටු වේ.

පින්කෙළේ රැ දවල් දෙක්හි 'මා විසින් පින්කම් කරණ ලද්දේ ය, ඒ පින්කම් මට දැනු ත් හිත පිණිස වේ, පරලොවැත් හිත පිණිස වන්නේ ය' යනාදීන් තමන් කරණලද කුශලකම් සිහි කොට, කම්නඳනයෙන් සතුටු වේ.

භියෝ නන්දති සුගතිං ගතෝ = සුගතියට ගියේ වැඩියක් සතුටු වේ.

පින් කෙළේ, මරණින් පසු සුගතියෙහි ඉපද පින්කම් පල විසින් ලැබූ යස ඉසුරු සින් සේ විදිමින් විපාකනුභවනයෙන් වැඩියක් සතුටු වේ.

කලපිණැත්තහුගේ උපපත්තිසථානය සුගති' කම්. එසේ කියනු, නන්වැදෑරුම් වූ සම්පත්තීන්ට ආධාරසථාන බැවින් හා ශොභන වූ කාමාවචරකුශලකර්මශක්තියෙන් පිළිසිඳ ගත යුතු තැන් බැවිනුත් ය. **"අනෙකවිධසම්පත්තිඅධිඨානතාය, සොභනා ගන්තබ්බතො උපගන්තබ්බතො ගතීති = සුගති"** යි ඒ කීහ.

කාමාවචර-රූපාවචර-අරූපාවචර යි ඒ තෙ වැදෑරුම් ය. එහි කාමාවචරසුගති ය, **මනුස්ස-චාතුම්මහාරාජික-තාවතිංස-යාම-තුසිත-නිම්මානරති-පරනිම්මිතවසවත්ති** යි සත් වැදෑරුම් ය.

සමාධි-ශූරභාව - බ්‍රහ්මවය්‍ය යනාදි වූ ගුණයන් විසින් වැඩූ එයින් තෙද ගැණුනු සිතැත්තෝ, උසස් ගුණයන්ගෙන් විසිතුරු වූවෝ මනුෂ්‍යයෝ ය. දඹදිව්වැස්සන් ම මෙයින් ගණිති. මෙ කියූ ගුණයන්ගෙන් මොවුහු උතුරුකුරුදිවයින් වැස්සන්, තවිනිසා වැනි දෙවියන් සටපත් කෙරෙති. බුදුරජානන් වහන්සේ, **"භික්ඛවෙ! කතමෙහි ජම්බුදීපිකා මනුස්සා උත්තරකුරුකෙ මනුස්සෙ අභිභවන්ති දෙවෙ ච තාවතිංසෙ"** යනු වදාළෝ එහෙයිනි.

මිනිසුන් අතැ ඇති පස්කම් සැපයට වඩා, විසිතුරු වූ පස්කම් සැපයක් දෙවියන් අතැ ඇත්තේ ය. එහෙත් භික්ෂුශ්‍රාමණෙරශීලාදි උසස් ගුණ ඔවුනට නැත. ඒ සැපත් ඇත්තේ දඹදිව්වැස්සනට ය. එයින් හා ඉතා උතුම් බුදු-පසේබුදු-අගසවු-මහසවු-සක්විත්තන් හා ඉන් අන් මහානුභාවසම්පන්නපුරුෂයන් මොවුන් අතර ම පහළ වන බැවින් දඹදිව් වැස්සෝ ම ප්‍රධාන විසින් මනුෂ්‍යයෝ ය. කුඩාදිවයින් සහිත අන් මහදිවයින්වැස්සෝ දඹදිව්වැස්සන් හා සමාන වණ් සංසථානාදිය ඇති බැවින් මනුෂ්‍ය' යි කියනු ලැබෙත්. සියල්ල පිඬු කොට පොතපතෙහි මේ කී සැටි:- **"සත්තිසුරභාව බ්‍රහ්මචරියයොගතාදිගුණවසෙන උපචිතමානසා උක්කට්ඨ ගුණචිත්තා, කෙ පන තෙ? ජම්බුදීපවාසිනො සත්තවිසෙසා' තථාහි බුඩා භගවන්තො පච්චෙකබුඩා අග්ගසාවකා මහා සාවකා චක්කවත්තිනො අඤ්ඤ ව මහානුභාවා සත්තා තත්ථෙව උප්පජ්ජන්ති, සමානරූපාදිතාය පන සඩ්ඪි පරිත්ත දීපවාසීහි ඉතරමහාදීපවාසිනොපි මනුස්සාත්ථෙව පඤ්ඤායිංසු"** යි.

ලොවැ පළමු උපන් මනුරජුගේ දරුමුණුබුරුපරපුර මනුෂ්‍ය' යි ද කියත්. **'මනුනො ආදිඛත්තියස්ස අපච්චං පුත්තාති'** යනු කීයේ, ඒ ව්‍යක්ත කරණු සඳහා ය.

කුඩාදිවයින් පන්සිය ය පන්සිය ය පිරිවර කොට ඇති **ජම්බුදීප-අපරගොයාන-උත්තරකුරු-පුබ්බවිදෙහ** යන මේ මහා දවීප සතර මනුෂ්‍යභූමීහු ය. දඹදිව, ගැලක සටහන් ඇති ව, තුනැස් ව පිහිටියේ ය. දිග පළලින් දස දහස් දස දසස් යොදුන් පමණ ය. අපරගොයානය කැටපතක සටහන් ඇති ව, වට ව පිහිටියේ ය. දිග පළලින් සත්දහස් සත්දහස් යොදුන් පමණ ය. පුටුවක සටහන් ඇති ව, සතරැස් ව පිහිටියේ ය. උත්තර-කුරු, දිග පළලින් අට දහස් අට දහස් යොදුන් පමණ ය. පූර්වවිදෙහය පිහිටියේ, අඩ සඳක සටහන් හා දෙකොන් ඇතුව ය. දිග පළලින් සත් දහස් සත් දහස් යොදුන් පමණ ය. මේ දිවයින් වැසි මිනිසුන්ගේ මුහුණු ද, බොහෝසෙයින් ඒ ඒ සටහන් ඇතැ යි කියත්.

මේ මිනිස්බිමැ **ගෘහපතිමහාසාරසම්පත්තිය, බ්‍රාහ්මණ මහාසාරසම්පත්තිය, ක්ෂත්‍රියමහාසාරසම්පත්තිය, ප්‍රදෙශ රාජ්‍ය සම්පත්තිය, චක්‍රවර්තිරාජ්‍යසම්පත්තිය** යනාදී වූ නන් වැදැරුම් මහත් සම්පත්තීහු දක්නා ලැබෙත්.

එහි, සතළිස් කෝටියක් ධනය නිදන් කොට තබා, දවසක වියදම පිණිස කහවණු දස අමුණක් යොදන, එසේ ම දවසක් ගානේ කහවණු දස අමුණක් අය විසින් ලබන සිටුකුලසැපත **'ගෘහපතිමහාසාරසම්පත්තිය'** යි දතයුතු ය.

අසූ කෝටියක් ධනය නිදන් කොට තබා, දවසක වියදම පිණිස කහවණු දස අමුණක් වැය කරණ, දවසක් ගානේ කහවණු විසි අමුණක් ගෙට ගන්නා බමුණුකුලසැපත **'බ්‍රාහ්මණමහාසාර සම්පත්තිය'** යි කියනු ලැබේ.

සියක් කෝටියක් ධනය නිදන් කොට තබා, දවසක වියදම පිණිස විසි අමුණක් කහවණු වැය කරණ, දවස ගානේ සතළිස් අමුණක් ගෙට ඇද ගන්නා වූ රජකුලසැපත **'ක්ෂත්‍රියමහාසාර සම්පත්තිය'** නම්.

විසි යොදුන්, තිස් යොදුන්, සතළිස් යොදුන්, පණස් යොදුන්, එක්සිය විසි යොදුන් පමණ වූ ඒ ඒ රටැ, ඒ ඒ රජුන් විසින් විඳින සැපත **'ප්‍රදෙශරාජ්‍යසම්පත්තිය'** නම් වේ.

පෙර කියූ සිවු මහාදිවයිනෙන් හා, දෙ දහසක් කොදෙවු වලින් යුත් මුළු සක්වළ තුළැ රජකම් කරන්නන් විසින් විඳියැ යුතු සැපත **'චක්‍රවර්තිරාජ්‍යසම්පත්තිය'** යි.

මිනිස්ලොවැ උපන් කුළපින් ඇත්තහුට තමන් කළ කුශල කර්මයන්ගේ විපාක විසින් මේ ඈ නොයෙක් සම්පත් විඳියැ හැක්කේ ය. විස්තර පොතපතින් දතයුතු ය.

සිවු මහවරම් රජුන් කෙරෙහි හකති ඇත්තෝ, ඔවුන් වසන තැනැ වූවෝ, එ නම් දෙව්ලොවැ උපන්නෝ **'චාතුම්මහාරාජිකා'** නම්. මෙන්න එය කියූ සැටි:- **"චතුමහාරාජෙසු හතති යෙසං, චතුන්නං මහාරාජූනං නිවාසඨානභූතෙ චතුමහාරාජෙ භවාති = චාතුම්මහාරාජිකා"** යි. ඒ මේ චාතුම්මහාරාජිකය පිහිටියේ, මහාමෙරුපර්වතයෙහි පස්වන ආලින්දයේ ය. එ තැනට මිනිස් බිම සිට, යොදුන් දස දහසෙක් ඇත්තේ ය. පර්වත – ගඞ්ගා – සමුද්‍ර – වෘක්ෂාදිය ඇසුරු කොට වසන දෙව්යෝ, ද්විහෙතුක ලාමක කාමාවචර කුශලකර්ම බලයෙන්, අහෙතුක කුසලවිපාකඋපෙක්ඛා සන්තීරණචිත්තයෙන් පිළිසිඳ ගත්තා භූමි ගතවිනිපාතිකාසුරයෝ, පොළෝතල පටන්, යුගන්ධරපර්වතය දක්වා සිටි භූමිනිශ්ශ්‍රිත දෙවියෝ, ආකාශගතදෙවියෝ චාතුම්මහාරාජිකා යෙහි ම ඇතුළත් වෙති. මෙහි අභ්‍යන්තරමාගීය හැර, සෙසු සියලු තැන් රනින් ආලෙප කරණ ලද්දේ ය. මැණික්වලින් කළ විමානයන්ගෙන් අතරෙක් නැත්තේ ය. සප්තවිධරතනයෙන් නිමැවුනු සිවුමහරජුන්ගේ නගරය, යුගන්ධරපර්වතමස්තකයෙහි පිහිටියේ ය. මිනිසුන්ගේ වයසින් අවුරුදු පණසෙක් චාතුම්මහාරාජිකයට එක් දවසෙකි. ඒ දවස් තිසෙක් මාසයෙකි. ඒ මාස දෙළොසෙක් අවුරුද්දෙකි. ඒ අවුරුද්දෙන් පන්සිය අවුරුද්දෙක් ඒ දෙවියන්ගේ ආයු කාලය වේ.

මඝමාණවකයා හා එක් ව, පින් කළ තෙ තිස් දෙන, යම් තැනෙකැ උපන්නෝ ද, ඒ තෙ තිස් දෙනා උපන් තැන තෙත්තිංස' නම්. එ තැන ම **තාවතිංස'** නම් ද වේ. ඔවුනට වාසස්ථාන වූ බැවිනු ත්, **තාවතිංස'** යි කියනු ලැබේ. මෙන්න පාළිපොතෙහි කියූ සැටි:- **"මඝමාණවෙන සද්ධිං තෙත්තිංස සහපුඤ්ඤකාරිනො එත්ථ නිබ්බත්තානි = තං ඨානං තෙත්තිංසං, තෙත්තිංසං එව තාවතිංසං, තං නිවාසො එතෙසන්ති = තාවතිංසා"** යි.

චාතුම්මහාරාජිකයෙහි සිට, යොදුන් දෙසාළිස් දහසක් ගිය තැනැ, මහාමෙරුපර්වතමස්තකයට සම ව සිටි අහස් පෙදෙසැ ය මේ දෙව්ලොව පිහිටියේ. ශක්‍රපුරය පිහිටියේ එහි මැද ය. එහි පෙරදෙර සිට, පැසුළුදෙරට යොදුන් දස දහසෙක් වේ. දහසක් රුවන් දෙරටුවෙන් හා සත් රුවන් පවුරුවලල්ලෙන් ඒ වට කරණ ලද්දේ ය. රන්, රිදී, මිණි, මුතුයෙන් කළ නන්වැදෑරුම් විමානවලින් හොබනේ ය. පුෂ්පාරාම, ඵලාරාම, පුෂ්කරණී

ශතයෙන් දූකුම්කලු ය. චාතුම්මහාරාජිකයන්ගේ ආයුකාලය, සතරින් ගුණ කරණ ලද්දේ, තව්තිසා වැසි දෙවියන්ගේ ආයු කාලය වේ.

එක්තරා කලක්, යම් දෙවිකෙනෙක් දුකින් පහව සිටින් ද, ඔවුහු යාමයෝ ය. ඔවුන් වසන තැන ත් **යාම**' නම්. **"දුක්ඛතෝ යාතා අයයාතා නි = යාමා"** යනු, යාම, යන්න තේරූ සැටි ය. තව්තිසාදෙව්ලොව සිට, යොදුන් දෙසාළිස් දහසක් ගිය තැනැ, මෙය පිහිටියේ ය. නානාවිධවණ්ණවත් විචිත්‍රකම්මානතයන්ගෙන් ශොභමාන වූ පුෂ්පාරාම, ඵලාරාම, පුෂ්කරණීගතයෙන් ප්‍රතිමණ්ඩිත වූ මහානගරයන්ගෙන් පිරී ගත්තේ ය. සත්රුවන්මය පවුරු වලල්ලෙන් හා, නන්වැදෑරුම් දෙව්විමනින් සැදුම් ලද්දේ ය. තව් තිසාවැසි දෙවියන්ගේ ආයුකාලය, සතරින් ගුණ කරණ ලද්දේ යාමදෙවියන්ගේ ආයු කාලය වේ.

යම් දෙවිකෙනෙක්, තම ඓශ්වර්‍යයෙන් ඔද වැඩුනෝ, ප්‍රීති යට පැමිණියෝ ද, ඔවුහු ය තුෂිත. ඔවුන් වසන තැන ත් **තුෂිත**' නම්. මෙන්න ඒ කියූ සැටි:- **"අත්තනෝ සිරිසම්පත්තියා තුසං පීතිං ඉතා ගතානි = තුසිතා"** යි. තුසිතදෙව්ලොව, යාමදෙව් ලොවින්, යොදුන් සතලොස්ලක්ෂ, අසූ අට දහස්, අට සියයක් ගිය තැනැ පිහිටියේ ය. මේ දෙව්ලොව වනාහි බෝසතුන්ගේ වාසස්ථානය වේ. පස්කම්සැපතින් පිරී ඉතිරී ගිය මහත් ආනුභාව ඇති දිව්‍යගණයාගෙන් පිරී සිටියේ ය. චක්‍රවර්තිරාජ්‍යසම්පත්තිය තුසිතදෙවියන්ගේ සම්පත්තිය හා, සම කරණ ලද්දී, මිනිස් ලොව දුගියකු ලත් සැපතකට සරි ය. යාමදෙවියන්ගේ ආයු කාලය සතරින් ගුණ කරණ ලද්දේ, තුසිතදෙවියන්ගේ ආයු කාලය වේ.

තමන් උදෙසා පහළ වූ ශ්‍රී සම්පත්තියෙහි ඇලුම් ඇත්තෝ ය. නිම්මාණරතිහු. ඔවුන් වසන තැන ත්, **නිම්මාණරති**' නම්. **"නිම්මාණෙ රති එතෙසන්ති=නිම්මාණරතිනො"** යනු එහි අරුත් පැවසීම ය. තුසිතදෙවිලොවින්, යොදුන් එකොළොස් ලක්ෂ, තිස් පන් දහස් දෙසියයක් ගිය තැනැ, මේ පිහිටියේ ය. රෑ දවල පස්කම්සැපතින් මත් ව, ඒ ඒ තැනැ ඇලී වසන දිව්‍ය ගණයාගෙන් අතුරු සිදුරු නැත්තේ ය. තුසිතදෙවියන්ගේ ආයු කාලය සතරින් ගුණ කරණ ලද්දේ, නිම්මාණරතීදෙවියන්ගේ ආයුකාලය වේ.

යම් දෙවිකෙනෙක් අනුන් ලත් සැපත, තම අතැ යටට ගණිත් ද, ඔවුහු ය **පරනිම්මිතවසවත්තිහු**. ඔවුන් වස තැන ත් එ නම් ය. නිම්මාණරතීදෙවිලොවින්, යොදුන් දස සතරලක්ෂ,

අසූපන්දහස් හ සියයක් ගිය තැනැ මේ විහිරියේ ය. කරුණු දසයකින් අගතැක් ගත් වශවත්තිමරුන්ගෙන් හා, නානාවිධ දිව්‍යගණයාගෙන් ආකීර්ණ වූයේ ය. ඉමහත් පස්කම්සැපයින් පිරී සිටියේ ය. සතරින් ගුණ කළ නිම්මාණරතිදෙවියන්ගේ ආයු කාලය පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ ආයුකාලය වේ.

මේ සත්වැදෑරුම් වූ කාමසුගතිභූමීන් අතරෙහි වූ මනුෂ්‍යසුගති භූමියෙහි සත්වයන්ගේ ආයුකාලය පිළිබඳ පරිවේජදයක් නො දුක්විය හැක්කේ ය.

වසතුකාම-කෙලෙසකාම විසින් දෙවැදෑරුම් කාමයක් හැසිරෙන පවතින තැන, **කාමාවචර**' කම්. මිනිස්ලොව පටන්, පරනිම්මිත වසවත්තීදෙව්ලොව අවසන් කොට සිටි, එ දෙක ත් ඇතුළුව සත් වැදෑරුම් වූ සවගීය කාමාවචරයි කියනු ලැබේ.

ඉතා සැකෙවින් මෙහි, දෙව්ලොවැ තොරතුරු කියේ. එහෙයින් මෙය, දෙව්ලොවැ තොරතුරු කීමෙකැ යි කියිලෙසකින් නො ගත යුතු ය. ඒ පිණිස අන් පොතපත බැලිය යුතු ය. එහෙත් පුහුදුනට, මොනලෙසකිනුත් එහි තොරතුරු නො දත හැකි ය. දත හැක්කේ ඒ පිළිබඳ පොතපතෙහි ආ තොරතුරු පමණෙක් ය.

පොතේ වහළින්, එහෙත් ඉතා ම කොටින් මෙහි කියූ කාම සවගීයෙහි උපන්නේ, එහි වූ යස ඉසුරු විදිමින් බොහෝ සේ සතුටු වේ.

මෙහි යෙදුනු '**සුගහනිං**' යන්නෙන්, ප්‍රධාන වසින් අදහස් කරණ ලද්දේ කාමසවගීයෝ ය. රූපාවචර-අරූපාවචර භූමීන් 'සුගහනිං' යන්නෙහි වැදී සිටිය ද, එහි තොරතුරු නො කියැවුනේ එහෙයිනි. එහි තොරතුරු මතුයෙහි එන්නේ ය.

මේ ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදිගට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

සුමනාදෙවීවත්ථුව නිමියේ ය.

බුදුරජානන් වහන්සේගේ සතුතිය

1-14

සැවැත්නුවර වැසි කුලපුත්‍රයෝ දෙදෙනෙක් බොහෝ කලක සිට ඉහා යහළුව සිසුහ. දිනක් ඔවුහු විහාරයට ගොස් බුදුරජානන්ගෙන් බණ අසා, කාමයෙහි කලකිරී ගේ දොර සියල්ල හැර දමා, ගොස් පැවිදි වූහ. පැවිදි වූ තැන් සිට, අවුරුදු පසක් ගුරුන් වෙත ගෙවා, දිනෙකැ පැවිදිවූවහු විසින් පිරියැ යුතු බුර කෙතෙක් දැ' යි ගුරුන්ගෙන් ඇසූහ. ඔවුහු, බුර දෙකකැ යි කියා, එහි තොරතුරු ද කීහ. ඉක්බිති විස්තර විසින් විදර්‍ශනාබුරයෙහි හා එසේම ග්‍රන්ථබුරයෙහි තොරතුරු දත් ඒ භික්‍ෂූ දෙන ම අතුරෙහි එක් නමක් 'මට නම්, මේ කියන ග්‍රන්ථබුරය පුරන්නට නො හැකි ය, මම මහල්ලෙක්මි, ග්‍රන්ථබුරය පිරියැ යුතු තරුණයන් විසිනි, මට විදර්‍ශනාබුරය නම් පිරිය හැකි ය, මම එය පුරා බලමි' යි රහත්බව දක්වා එහි සියලු විස්තර අසා ගෙණ, විදර්‍ශනා වඩන්නට පටන් ගත්තේ ය. රැදුවල් දෙක්හි ම එහි යෙදුනේ, කල් නො යවා ම සිවුපිළිසිඹියාවන් සමග ම රහත්බව ලැබී ය. අනික් භික්‍ෂූන් වහන්සේ 'මම ග්‍රන්ථබුරය පුරමි' යි පටන් ගෙණ, පිළිවෙළින් ත්‍රිපිටකබුද්ධවචනය මැනැවින් උගෙණ, තැනැ තැනැ ධර්‍මදෙශනා කරති. උදාත්තස්වරයෙන් දහම් දෙසන උන්වහන්සේ පන්සියයක් භික්‍ෂූන් වහන්සේට බණ ද උගන්වති. එහෙයින් සුත්තනන්තිකගණ-වෙනයිකගණ-ආභිධම්මිකගණ ආදී වූ අටලොස් මහාගණයට මහඇදුරුද වූහ උන්වහන්සේ.

මෙ දවසැ බුදුරජානන් වහන්සේ වෙතින් කමටහන් ගත් බොහෝ ගණනක් භික්‍ෂූන් වහන්සේලා, මහලුවියෙහි සිටි ඒ විදර්‍ශක ස්ථවිරයන් වහන්සේ වසන තැනට ගොස්, උන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා, රහත් වී තෙරුන් වැඳ 'ස්වාමීනි! බුදුරජුන් දකින්නට කැමැත්තමිහ, එයට අපට අවසර දුන මැනැවැ' යි ඉල්ලා සිටියාහ. එවිට උන්වහන්සේ 'හොඳයි! යන්න, ගොස්, බුදුරජුන් වැඳ, අසූ මහාසව්වන් වඳින්න, ඉන් පසු, මාගේ යහළු තෙරුන් වසන තැනට ගොස්, මා වඳිනබව කියා, ඒ තෙරුන්ට ත් වඳින්නැ, යි අවසර දුන්හ. ඔවුහු විහාරයට ගොස්, බුදුරජුන් හා අසූ මහාසව්වන් වැඳ, අනතුරු ව ගුරුවරයාගේ යහළු තෙරුන් වෙත ගොස්, 'ස්වාමීනි! අපගේ ගුරුවරයා ඔබවහන්සේ වඳී ය'යි කියා වැන්දහ. ධර්‍මකථික ස්ථවිරයන් වහන්සේ 'තමුන්නාන්සේලාගේ ගුරුවරයා කවු දැ' යි ඇසූහ. 'ඇයි, නො දන්නහු ද?, ඔබවහන්සේගේ යහළුවා, ඒ අපගේ ගුරුවරයා'යි ඔවුහු කිහිප විටක් ම කීහ.

පසු දවසෙකැ ද. මේ භික්ෂූන් වහන්සේලා ධම්කථික සථවිරයන් වහන්සේ කරා ගොස් 'අපගේ ගුරුදෙවයෝ, ඔබවහන්සේ වඳින් ය'යි වැඳැ, නැගී සිටි විට, පළමු සේ 'ඔබවහන්සේලාගේ ගුරුවර යා කවු දැ'යි ධම්කථික සථවිරයන් වහන්සේ ඇසූහ. එවර ද 'ඔබ වහන්සේගේ යහළුවා අපගේ ගුරුදෙව යා'යි කීවිට, 'තමුන්නාන්සේලා ඒ මාගේ යහළුවාගෙන් කුමක් ඉගෙණ ගන්නා ලද ද?, තුන් පිටකය?, එක් පිටකයක්?, නැත, එක් සතියක්?, එක් වගක් වත්' යි අසා, 'මොහු එක් ගාථාවක් පමණකුත් නො දනී, පාංශුකූලය ගෙණ, පැවිදි වූ දා සිට කැලයට වැදී සිටියේ ය, අතැවැස්සත් බොහෝ ගණනකුත් ලැබූයේ ය, මෙහි ආවා වේ, ආ විට ප්‍රශ්නයක් දෙකක් අසා බලන්නෙමි'යි ධම්කථික සථවිරයන් වහන්සේ සිතා ගත්හ.

විදර්ශීක සථවිරයන් වහන්සේ, විහා දවසකට පසු, බුදුරජුන් දකින්නට දෙවරම් මහවෙහෙරට ගියහ. එහි දී සිය සිවුරු පිරිකර තම යහළු තෙරුන් වසන කාමරයෙහි තබා, බුදුරජුන් වෙත ගොස්, උන්වහන්සේ වැඳැ, අසූ මහසඹුවන් වෙත ගොස්, උන් වහන්සේලා ත් වැඳැ, පෙරළා යහළු තෙරුන් වසන තැනට ආහ. එවිට ධම්කථික සථවිරයන් වහන්සේ උන් පිළිගෙණ වත් පිළිවෙත් කරවා, අසුනක් පණවා දී සම අසුනක් ගෙණ එහි හිඳැ, ප්‍රශ්න විචාරන්නෙමි'යි සිතූහ. ඒ අතර බුදුරජාණන් වහන්සේ ධම්කථික තෙරුන්ගේ මේ සිතුවිල්ල දැන, 'මේ ධම්කථිකයා මාගේ පුතු වෙහෙසට පමුණුවා, අපායයෙහි උපදින්නේ ය'යි ඔහු කෙරෙහි අනුකම්පායෙන් ගදකිළියෙන් නික්ම විහාරවාරිකාවෙහි හැසිරෙන්නා සේ, ඔවුන් හුන් තැනට ගොස්, පැණ වූ අසුනෙහි වැඩ හුන්හ. **භික්ෂූන් වහන්සේ නමක් කොතැනැ හුන්නා ද, එහි බුදුරජුන් උදෙසා අසුනක් පණවා තැබීම එදා සිරිත වූයේ ය.** පණවා තුබූ අසුනෙහි වැඩහුන් බුදුරජාණන් වහන්සේ, ධම්කථික භික්ෂූනම ගෙන් ප්‍රථමධ්‍යානය පිළිබඳ ප්‍රශ්නයක් අසා වදාළ සේක. ඔහු එයට පිළිතුරු දින. නැවැත, විතීයධ්‍යානය මූල් කොට අෂ්ටසමාපත්තීන් රූපාරූපසමාපත්තීන් පිළිබඳ ප්‍රශ්න විවාළ සේක. ඔහු ඒ හැමට පිළිතුරු දුන්නේ ය. නැවැත උන්වහන්සේ, ඔහුගෙන්, සෝවන් මග පිළිබඳ කරුණු ඇසූහ. එහි දී ඔහු නිරුත්තර විය. එයට පිළිතුරු දී ගත නො හැකි විය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ විදර්ශීකභික්ෂූන් අතින් ඒ ඇසූහ. ඔහු එයට නො පැකිළ පිළිතුරු දින. එවිට උන්වහන්සේ 'මා පුත් මහානුභාවයෙක, දුත් පිළිතුරු ඉතා කදිම ය'යි සතුති කොට, සෙසු මග පිළිබඳව ද, ප්‍රශ්න ඇසූහ. ඉන්ද්‍රියභාවනාභික්ෂූන් වහන්සේ ඒ එකකට වත් පිළිතුරු නො දුන්හ.

විදර්ශීකභික්ෂූන් වහන්සේ ඒ හැම එකක් ම විසඳූහ. එ හෙයින් බුදු රජානන් වහන්සේ ඔහුට සතර තැනකැ දී සාධුකාර දුන්හ. භූමි ගත වූ දෙවියන් පටන් කොට, ලොවැ පුරා සිටි හැම දිව්‍යබ්‍රහ්මාදි සත්වයෝ මහත් සේ සාධුනාද කළහ. එවිට ත්‍රිපිටකධාරී භික්ෂූන් වහන්සේගේ අතැවැස්සෝ, 'බුදුරජානන් වහන්සේ, කිසි හසරක් නො දත් ජරමහල්ලකුට සතර වරක් සාධුකාර දුන්හ, සතුති කළහ, පිස්සු වැඩෙක්, බුදුරජුන් විසින් මේ කරණලද්දේ කුමක් ද, සකලපඨවීප්තිධර වූ, පන්සියයක් භික්ෂූන්ට ප්‍රධාන වූ අපගේ ආචාර්යදේවයන්ට පැසසුම් පමණකුත් නො කළහ'යි බුදුරජුන්ට දෙස් නගන්නට වූහ. එ බව දත් උන්වහන්සේ 'ඕය්! තමුසේලාගේ ගුරුවරයා, මාගේ මේ සාසනයෙහිලා සැලකිය යුත්තේ, කුලියට ගවයන් රකින්නකු සේ ය, මේ, මා පුත් එසේ නො වේ, තමුන්නාන්සේලාගේ ගුරුවරයා වැන්නෙක් නො වේ, ඔහු තමන් රිසි සේ, කිරි ගිතෙල් ආ පස්ගෝරසය, කන බොන ගව හිමියකු වැනි ය, තමුසේලාගේ ගුරුවරයා කුලිකාරයෙක්, මා පුත් ගොසවාමියෙක් ය'යි වදාරා එම තහවුරු කරන්නට මේ ධම්දේශනාව කළ සේක:-

බහුම්පි චෙ සහිතං භාසමානෝ,
න තක්කරෝ හොති නරෝ පමත්තෝ,
ගොපෝ ව ගාවෝ ගණයං පරෙසං,
න භාගවා සාමඤ්ඤස්ස හොති,
අප්පම්පි චෙ සහිතං භාසමානෝ,
ධම්මස්ස හොති අනුධම්මචාරී,
රාගඤ්ච දෝසඤ්ච පහාය මෝහං,
සම්මප්පජානෝ සුවිමුත්තචිත්තෝ,
අනුපාදියානෝ ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හොති නි.

පමා වූ මිනිස් තෙමේ ත්‍රිපිටකබුඩවචනය බොහෝ කොට කියන්නේ නමුත්, නොහොත්, බොහොමයක් වූවත් ත්‍රිපිටකබුඩවචනය කියන්නේ නමුත්, ඒ ධම්ය අනුව කරන්නෙක් නො වේ නම්, අනුන් අයත් ගෙරින් රක්නා වූ ගොපල්ලකු මෙන් ශ්‍රමණගුණයට හිමි නො වේ.

සවලපයක් නමුත් ත්‍රිපිටකබුඩවචනය කියන්නා වූ මිනිස් තෙමේ ධම්යට අනුරූප වූ ධම්යෙහි හැසිරෙන සුලු වේ නම්, රාගයද ද්වේෂය ද මෝහය ද පහකොට සිටියා වූ මනා කොට දන්නා වූ මනාව මිදුනු සිත් ඇත්තා වූ මෙලොවැ හෝ පරලොවැ හෝ කිසිවක් නො ගත්නා වූ ඔහු ශ්‍රමණගුණයට හිමි වේ.

බහුං අපි වෙ සහිතං භාසමානො = ත්‍රිපිටකබුඬවචනය බොහෝ සේ කියන්නේ ද, (නොහොත්) බොහෝ වූ ද ත්‍රිපිටකබුඬවචනය කියන්නේ ද නමුත්.

සහිත නම්, බුඬවචනය යි. යම් වචනයෙක් ලෞකික ලොකොත්තරාර්‍ථයෙන් ප්‍රඥප්තිත් ව, දෙවියන් සහිත ලොකයෙහි එක කුත් නො හැර හැම කෙනෙක්හට දෙලොවැ ම එක සේ හැම කල්හි ම හිත පිණිස වේ නම්, ඒය සහිත. බුඬවචනය ය එසේ වන්නේ. ලොවැ විසූ නොයෙක් ශාස්තෘවරයන් විසින් තම තමන්ගේ නුවණ පමණින්, නොයෙක් බණදහම් දෙසන ලද ය. අප බුදුරජුන් හැර, අන් සියලු ශාස්තෘවරයෝ ම, රාග-දෙස-මොහාදි වූ කෙලෙසුන් ගෙන් ඇවුරුණු වැසුනු නුවණැස් ඇත්තෝ ය. එසේ කෙලෙසුන් ගෙන් වැසී ගිය නුවණැස් ඇත්තා වූ ශාස්තෘන් විසින් දෙසූ ධර්‍මය, කිසිකලෙක කිසිලෙසකින් සාර්‍ථක නො වේ. එහෙයින් බුදුදහම හැර, අන් දහමෙක් 'සහිත' යන්නෙන් නො ගැණේ.

සියලු බුද්ධවචනය රසවශයෙන් එක් වැදෑරුම් ය. ධර්‍ම විනය වශයෙන් දෙ වැදෑරුම් ය ප්‍රථම-මධ්‍යම-පශ්චිමවශයෙන් හා පිටක වශයෙන් තෙ වැදෑරුම් ය. නිකායවශයෙන් පස් වැදෑරුම් ය. ධර්‍මස්කන්ධවශයෙන් සුවැසූ දහසෙක් ය. මේ මෙසේ බෙදූවෝ ප්‍රථම සඞ්ගීතිකාරකමහාකාශ්‍යපස්ථවිරාදීන් වහන්සේලා ය.

එහි, මාගේ ස්වාමිදරු වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ සම්‍යක් සම්බෝධියට පැමිණි තැන් පටන් අනුපාදිශෙෂනිර්‍වාණ ධාතුයෙන් පිරිනිවන් පානාතුරු මෙදුතුර පන්සාලිස් අවුරුද්දක් මුළුල්ලෙහි දෙව් බඹ මිනිස් ආ හැම සත්‍වයනට හිත සැප සාදු දෙනු පිණිස දෙසූ ඒ මේ ධර්‍මය තෙමේ රසවශයෙන් විමුක්තිරසය ම ගැබ් කොට සිටියේ ය.

වෙනසක් නො තබා සියලු ම බුඬවචනය, කෙලෙස් හික්ම වන බැවින් විනය නම් වූයේ, අවවාදය, අනුශාසනය පරිදි පිළිපදින්නවුන් අපායයෙන් ගලවා ලන බැවින්, අපායයෙන් වළක්වා දරණ බැවින් ධර්‍ම නම් වූයේ ය. **"යනහුන මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාම, අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං"** යි ප්‍රථමසඞ්ගීතිකාරක මහාකාශ්‍යපමහාස්ථවිරයන් වහන්සේ වදලෝ එහෙයිනි. මේ, ධර්‍ම විනය වශයෙන් දෙ පරිදි වූ සැටියි.

"අනෙකජාතිසංසාරං සඤ්ඡවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තෝ දුක්ඛාජාති පුනප්පුනං.
ගහකාරක! දිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා"

යන මෙය ධම්මපදඅට්ඨකථෝ ප්‍රථමබුද්ධවචනය යි කියත්. එහෙත් ඛුද්දකනිකායට්ඨකථෝ කියන්නෝ, බුද්ධකයෙහි ආ-

"යදා හවෙ පාතුභවන්ති ධම්මා ආතාපිනෝ ඣායතෝ බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා යතෝ පජානාති සහෙතු ධම්මං.

යදා හවෙ පාතුභවන්ති ධම්මා ආතාපිනෝ ඣායතෝ බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා යතෝ ඛයං පච්චයානං අවෙදී.

යදා හවෙ පාතුභවන්ති ධම්මා ආතාපිනෝ ඣායතෝ බ්‍රාහ්මණස්ස,
විධූපයං තිට්ඨති මාරසෙනං සූරියෝ ව ඔභාසයමන්තලික්ඛා".

යන මේ උදානගාථාවත් ප්‍රථමබුද්ධවචනය බවය.

පිරිනිවන්පානකාලයෙහි පරිනිබ්බාණමඤ්චකයෙහි වැඩ හිඳ **"හන්දදානි භික්ඛවෙ! ආමන්තයාමි වෝ වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ"** යි වදාළ මේ වචනය පශ්චිමබුද්ධ වචනය ය. මේ පූර්ව-පශ්චිමබුද්ධවචනයන්ගේ අතර පන් සාළිස් වසක් මුළුල්ලෙහි වදාළ ධර්ම මධ්‍යමබුද්ධවචන නම් මේ. මේ ප්‍රථම, මධ්‍යම, පශ්චිමබුද්ධවචනවශයෙන් තෙ පරිදි වූ සැටි යි.

මෙසේ පූර්ව, මධ්‍යම, පශ්චිමවශයෙන් බෙදුනු මේ සියලු ධර්ම විනයපිටක-සුත්තන්තපිටක-අභිධම්මපිටක යි තෙ වැදෑරුම් වේ. එහි ප්‍රථමසඞ්ගායනාකාලයෙහි සඞ්ගායනා කරණ ලද්දා වූ ද සඞ්ගායනා නො කරණ ලද්දා වූ ද සියල්ල ම එක් කොට ගත් උභය ප්‍රාතිමොක්ෂය, උභයවිභඞ්ගය, හා දෙ විසි ඛන්ධකය, පොළොස් පරිවාරය යන මේ ය **විනයපිටක.**

පස්වැදෑරුම් වූ පාතිමොක්ඛුද්දෙස, සත් වැදෑරුම් වූ පාරාජිකාදි ආපත්තික්ඛන්ධ, මාතිකාවිභඞ්ගාදිපභෙදනය යන මෙයින් ද, දුර්කිරීම හා ලිහිල්කිරීම ප්‍රයොජන කොට ඇති අනුප්‍රඥප්තිනය ඇති බැවින් ද, කායික, වාචසික අධ්‍යාචාර වළකාලීමෙන් කාය වාක් ද්වාරයන් භික්මවන හෙයින් ද යි මෙසේ නොයෙක් නය ඇති බැවින් **මේ විනය** නම් වී ය. මේ ඒ කී සැටි.-

"විවිධවිසෙසනයත්තා – විනයනතොා වෙව කායවාචානං,
විනයත්ථවිදූහි අයං – විනයෝ විනයෝ ති අක්ඛාතෝ" යි.

විනයපිටකය-ආණාදෙසනා, යථාපරාධසාසන, සංවරාසංවරකථා යන නම්වලිනුදු හඳුන්වනු ලැබේ. එහි 'මේ මෙසේ නොකට යුතු ය' යන ආඥාබාහුල්‍යයෙන් දෙසූ බැවින් **ආණා දෙසනා**' යි ද, අපරාධකාරීසත්ත්වයන් අපරාධ පරිදි භික්ම වූ බැවින් **යථාපරාධසාසනා**' යි ද, අඩ්‍යාවාරයනට පටහැනි ව සිටි කුඩා මහත් සංවරය මෙහි ඇතුළත් බැවින් **සංවරාසංවරකථා**' යි දැ යි කියත්.

විනයපිටකය ග්‍රන්ථවශයෙන් **පාරාජිකපාළි-පාචිත්තියපාළි -මහාවගගපාළි-චුල්ලවගගපාළි-පරිවාරපාළි** යි පසකට බෙදන ලද්දේ ය.

එහි පාරාජික, සඞ්ඝාදිසෙස, අනියත, නිස්සග්ගියපාචිත්තිය යන කාණ්ඩත්‍රයෙහි එන එකුන්පණස් ශික්ෂාපදයන්ගේ සංග්‍රහය **පාරාජිකපාළි**' නම්. ඉතිරි මහාවිභඞ්ගයෙහි හෙන සුද්ධපාචිත්තිය, පාටිදෙසනීය, සෙඛිය, අධිකරණසමථ යන එක් සිය අට සැත්කෑවක් ශික්ෂාපදයන්ගේ සංග්‍රහය **පාචිත්තියපාළි**' නම්. භික්ඛුනීවිභඞ්ගය ද මෙහි ම හෙන්නේ ය. මහාඛන්ධක, උපොසථඛන්ධක, වස්සූපනායිකඛන්ධක, පවාරණඛන්ධක, චම්මඛන්ධක, හෙසජ්ජඛන්ධක, කඨිනඛන්ධක, චීවරඛන්ධක, චම්පෙය්‍යඛන්ධක, කොසම්බකඛන්ධක යන දස වැදෑරුම් වූ මහා ඛන්ධකයන්ගේ සංග්‍රහය **මහාවගගපාළි**' නම්. කම්ම, පාරිවාසික, සමූච්චය, සමථ, බුද්ධ, සෙනාසන, සඞ්ඝභෙද, වත්ත, පාති මොක්ඛඨපන, භික්ඛුනී, පංචසතික, සත්තසතික යන ඛන්ධක යන්ගේ සමූහය **චුල්ලවගගපාළි**' නම්. පඤ්ඤත්ති, ආපත්ති, විපත්ති, සඞ්ගහ, සමුට්ඨාන, අධිකරණ, සමථ, සමුච්චය යන අට වැදෑරුම් වූ වාරයන්ගේ හා ප්‍රත්‍යයවිශෙෂයෙන් නැවැත කියූ අට වාරයන්ගේ දැ යි යන සොළොස් පරිවාරයන්ගේ ද භික්ෂු විභඞ්ගයෙහි ආ සොළොස් පරිවාරයන්ගේ ද සමූහය **පරිවාර පාළි**' නම්.

මෙයින් පාරාජිකපාළි-පාචිත්තියපාළිසඞ්ග්‍රහ, උභයවිභඞ්ග යෙන් සංග්‍රහ කරණලද ය. එහි උභයවිභඞ්ග නම්, මහාවිභඞ්ග-භික්ඛුනීවිභඞ්ග දෙක ය. ඒ දෙක අතුරෙහි මහාවිභඞ්ගයෙහි දෙසිය විස්සක් ශික්ෂාපදයෝ වෙති. භික්ඛුනීවිභඞ්ගයෙහි තුන්සිය සතරක් ශික්ෂාපදයෝ ය. මේ උභයවිභඞ්ගය සූ සැටක් බණවරින් යුක්ත ය. මහාවගගපාළි-චුල්ලවගගපාළි, ඛන්ධකයන්ගෙන් සංග්‍රහ කරණ ලද ය. ඒ ඛන්ධකයන්ගේ නම් යට කියන ලදී. එය අසූ බණවරක් පමණ වූයේ ය. පස්විසි බණවරක් පමණ වූයේ ය පරිවාරය.

විනයපිටකයෙහි ලා අධිශීලශික්ෂාය, කෙලශව්‍යතික්‍රමප්‍රහාණය, දුශ්චරිතසංකෙලශප්‍රහාණය යන මෙ තුනෙහි ගැබ් වූ කරුණු වදාළෝය බුදුරජානන් වහන්සේ.

දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ඛුද්දකනිකාය යි කොටස් පසකට බෙදුනේ ය සුත්ත පිටකය. මෙසේ කොටස් පසකට බෙදුනු මේ සූත්‍රසමූහය තෙමේ, ආත්මාර්ථ පරාර්ථ ලෞකික ලොකොත්තරාදිභෙදගත වූ හැම අර්ථයක් පවසන බැවින්, භික්මවියැ හැකි භික්මවියැ යුතු හැම දෙනකුන්ගේ අදහසට අනු ව මොනවට වදාළ බැවින්, පලදෙන ගොයම් ඇ සස්‍යයක් සේ අර්ථ ප්‍රසවය කරණ බැවින්, කිරි වගුරණ දෙනක සේ අරුත් වගුරණ බැවින්, එසේ පිළිපන්න වුන් මොනවට රකින බැවින්, වඩුවන්ගේ නූල්ගැසීම (හැරිය යුත්ත හැර, ගතයුත්ත ගෙණ ලීය සැසීමට) පමණ වන සේ නුවණැතියන්ට පමණ වන බැවින්, හූයෙහි ඇවැණු මල් නො විසිරෙන්නා සේ අරුත් නො විසිරෙන බැවින් **සූත්‍ර** නම් වූයේ ය. මේ ඒ කි සැටි:-

"අත්ථානං සූචනතො-සුවුත්තතො සවනතොථ සුදනතො,
සුත්තාණාසුත්තසභාගතො ච-සුත්තං සුත්තන්ති අක්ඛාතං"යි.

සූත්‍රයපිටකය, **වොහාරදෙසනා-යථානුලොමසාසන-දිට්ඨිවිනිවෙඨනකථා** යන මෙ නම්වලිනුදු හඳුන් වනු ලැබේ. එහි ව්‍යවහාරබාහුල්‍යයෙන් වොහාරදෙසනා යි ද, මෙහි ලා නොයෙක් ආශය, අනුශය, චරිත, අධිමුක්ති ඇති සත්වයෝ අනුශාසනා කරණ ලදහ යි යථානුලොමසාසන යි ද, දෙසැට මිසදිටුවට පට හැනිව ඒ මිසදිටුවෙන් මිදීම මෙහි පවසන ලදනු යි දිඝිවිනිවෙඨන කථා යි දැ යි කියත්. සූත්‍රපිටකය ග්‍රන්ථවශයෙන් යට කියූ සේ පස කට බෙදුනේ ය. එහි ප්‍රථමය **දීඝනිකාය** ය. දීර්ඝප්‍රමාණසූත්‍රයන් ගේ සමූහය හෝ නිවාසය දීඝනිකාය' නම් වේ. සූත්‍රසූතිසකින් ඝටිත වූයේ වර්ගත්‍රයයකින් සැදුනේ ය.

"චතුත්තිංසෙව සුත්තන්තා තිවග්ගො යස්ස සඞ්ගහො,
එස දීඝනිකායොති පඨමො අනුලොමිකො"

යන මෙයින් ඒ කිහ. සූ සැටක් පමණ බණවරින් පමණ කරණ ලද්දේය, මෙ ය.

පසළොස් වගකින් සංග්‍රහ කරණ ලද එක් සිය දෙ පණස් සූත්‍රයන්ගේ සමූහය **මජ්ඣිමනිකාය'** නම් වේ.

"දියඩ්ඪසතසුත්තන්තා වෙ ච සුත්තානි යත්ථ සො,
නිකායො මජ්ඣිමො පඤ්චදසවග්ගපරිග්ගහො"

යි ඒ කීහ. මෙය අසූවක් පමණ බණවරින් පමණ කරණ ලද ය.

දෙවතාසංයුත්තාදිවශයෙන් පැවැති සූත්‍රයන්ගේ සමූහය, **සංයුත්තනිකාය'** නම් වේ. එහි සූත්‍ර සත් දහස් පන්සිය දෙ සැටෙක් ඇත්තේ ය. සියයක් පමණ බණවරින් පමණ කරණ ලද ය.

"සත්තසුත්තසහස්සානි සත්තසුත්තසතානි ච,
චාසඞ්ඛ වෙ ච සුත්තන්තා, එසො සංයුත්තසඞ්ගහො"

යි ඒ කීහ.

එක්සිය විසි බණවරින් පමණ ඇති නව දහස් පන්සිය සත් පණසක් සූත්‍රයන්ගේ සමූහය, **අඞ්ගුත්තරනිකාය'** නම් වේ.

"නවසුත්තසහස්සානි පංචසුත්තසතානි ච,
සත්තපඤ්ඤාසසුත්තන්තා සඞ්ඛ්‍යා අඞ්ගුත්තරෙ අයං"

යි ඒ කීහ.

මේ කියූ නිකාය සතර හැර, අනික් සියලු බුඩවචන, **ඛුද්දක නිකාය'**යි ගණිත්. විනයපිටකය හා අභිධර්මපිටකය ත් ඛුද්දකපාඨ ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදා, අපදාන, බුඩ වංස, චරියාපිටක, යන ග්‍රන්ථ පසළොස ත් ඛුද්දකනිකායයෙහිලා ගණිත්. ඒ කීහ මෙසේ:-

"ඨපෙත්වා චතුරොපෙතෙ නිකායෙ දීඝ ආදිකෙ,
තදඤ්ඤං බුඩවචනං නිකායො ඛුද්දකො මතො"

යි සූත්‍රපිටකයෙහිලා අධිචිත්තශික්ෂාය, ක්ලෙශයන්ගේ පයර්‍ය්‍යුත්ථාන ප්‍රහාණය, ක්ලෙශයන්ගේ විෂකම්භණප්‍රහාණය යන මේ ධර්ම වදාළෝය බුදුරජානන් වහන්සේ.

ධම්මසඞ්ගණිප්පකරණය, විභඞ්ගප්පකරණය, ධාතුකථාප්ප කරණය, පුග්ගලපඤ්ඤත්තිප්පකරණය, කථාවත්ථුප්පකරණය යමකප්පකරණය, පඨානප්පකරණය යි කොටස් සතකට බෙදුනේ ය අභිධම්මපිටක ය. මෙසේ ප්‍රකරණ විසින් කොටස් සතකට බෙදුනු මේ ධර්මසමූහය තෙමේ වැඩීමට ගිය ධර්ම, **ලක්ෂණසහිත** වූ ධර්ම, පුදනලද ධර්ම, පිරිසිදිනලද ධර්ම, අධිකධර්ම පවසන බැවින් **අභිධර්ම,** නම් වූයේ ය. මේ ඒ කී සැටි:-

"යං එත්ථවුඩිමන්තො - ස ලක්ඛණා පූජිතා පරිච්ඡින්නා,
වුත්තාධිකා ච ධම්මා - අභිධම්මො තෙන අක්ඛාතො"

අභිධර්මපිටකය, පරමත්ථදෙසනා, යථාධම්මසාසන, නාමරූප පරිච්ඡේදකථා යන නම්වලිනුදු හඳුන්වනු ලැබේ. එහි පරමාත්ථධර්ම බාහුල්‍යයෙන් දෙසූ බැවින් **පරමත්ථදෙසනා'** යි ද, ශුඩසංස්කාර යන් කෙරෙහි අහඩකාර මමඩකාර ඇති සත්වයන්, ඇති තතු කියා පැමෙන් හික්ම වූ බැවින් **යථාධම්මසාසන'** යි ද, රාගාදි සංක්ලෙශ ධර්මයන්ට පටහැනි වූ නාමරූපපරිච්ඡේදය දෙසූ බැවින් **නාමරූප පරිච්ඡේදකථා'** යි දැ යි කියත්.

අභිධර්මපිටකයෙහි ප්‍රථම ප්‍රකරණය වූ ධම්මසඞ්ගණිප්පකරණය තෙමේ චිත්ත-රූප-නික්ඛෙප-අත්ථුඩාරවිභත්ති යි විභක්ති සතර කින් බෙදන ලද ය.

අනතුරු ව වදාළ විභඞ්ගප්පකරණය, ඛන්ධ-ආයතන-ධාතු-සච්ච-ඉන්ද්‍රිය-පටිච්චසමුප්පාද-සතිපඨාන-සම්මප්පධාන-ඉඩිපාද-බොජ්ඣඞ්ග-ඣාන-මග්ග-අප්පමඤ්ඤා-සික්ඛාපද-පටිසම්භිදා-ඤාණ-ඛුද්දකවත්ථු-ධම්මහදයවිභඞ්ග යි විභඞ්ග අටළොසකින් ප්‍රමාණ කරණ ලද ය.

ධාතුකථාප්පකරණය, සඞ්ගහො - අසඞ්ගහො - සඞ්ගහිතෙන අසඞ්ගහිතං - අසඞ්ගහිතෙන සඞ්ගහිතං - සඞ්ගහිතෙන සඞ්ගහිතං - අසඞ්ගහිතෙන අසඞ්ගහිතං - සම්පයොගො - විප්පයොගො - සම්ප යුත්තෙන විප්පයුත්තං - විප්පයුත්තෙන සම්පයුත්තං - සම්පයුත්තෙන සම්පයුත්තං - විප්පයුත්තෙන විප්පයුත්තං - සඞ්ගහිතෙන සම්පයුත්තං විප්පයුත්තං - විප්පයුත්තෙන සඞ්ගහිතං අසඞ්ගහිතං යන තුදුස්නය ලෙසින් බෙදන ලද්දේ ය.

පුග්ගලපඤ්ඤත්තිප්පකරණය, ඛන්ධ - ආයතන - ධාතු - සච්ච - ඉන්ද්‍රිය - පුග්ගලපඤ්ඤත්ති යි ෂඩ්විධ ප්‍රඥප්තීන් විසින් බෙදන ලද්දේ ය.

කථාවත්ථුප්පකරණය, සකවාදයෙහි ලා සූත්‍ර පන් සියයෙක, පරවාදයෙහි ලා සූත්‍ර පන්සියයෙකැ යි සූත්‍ර දහසක් එක් තැන් කොට ගෙණ බෙදන ලද්දේ ය.

යමකප්පකරණය, මූල-ඛන්ධ-ආයතන-ධාතු - සච්ච - සඞ්ඛාර - අනුසය-චිත්ත-ධම්ම-ඉන්ද්‍රියයමක යි දසකොටසකින් බෙදුනේ ය.

පට්ඨානප්පකරණය, හෙතු - ආලම්බන - අධිපති - අනන්තර - සමනන්තර-සහජාත-අඤ්ඤමඤ්ඤ-නිස්සය-උපනිස්සය-පුරෙජාත-

ාච්ඡාජාත-ආසෙවන-කම්ම-විපාක-ආහාර-ඉන්ද්‍රිය-ඣාන-මග්ග-සමපයුත්ත-විප්පයුත්ත-අත්ථි-නත්ථි-විගත-අවිගතප්පච්චය යි සූවිසි ප්‍රත්‍යයයකින් බෙදුනේ ය.

අභිධර්මපිටකයෙහිලා බුදුරජානන් වහන්සේ අධිප්‍රඥාශික්ෂාය, කෙලශයන්ගේ අනුශයප්‍රහාණය, සමුච්ඡේදප්‍රහාණය, දෘෂ්ටිසංකෙලශප්‍රහාණය යන මේ වදාළ සේක.

විනයාදිශබ්දත්‍රය හා එක් වූ පිටකශබ්දය පර්‍යාපති-භාජන යන දෙයරුත කියන්නේ ය. එහිලා ඒ අරුත් කියන්නේ ම විනය-සුත්ත-අභිධම්මශබ්දයන් හා වෙන් වෙන් ව යෙදී සිටියේ ය. "විනයො ච සො පිටකං ච=විනයපිටකං, සුත්තං ච තං පිටකං ච=සුත්තපිටකං, අභිධම්මො ච සො පිටකං ච=අභිධම්මපිටකං" යනු ඒ එක්වන සැටි ය. පහත දැක්වෙන ගයින් කීවෝ පිටක ශබ්දය, විනයාදිශබ්ද තුන හා එක්කරන්නට ය.

"පිටකං පිටකත්ථවිදූ – පරියත්තිභාජනත්ථතො ආහු,
තෙන සමොධානෙත්වා – තයො'පි විනයාදයො ඤෙය්‍යා"

ත්‍රිපිටකයෙහි ලා දතයුතු පර්‍යාපති තුනෙක් අලගද්දපරියත්ති-නිස්සරණපරියත්ති-භණ්ඩාගාරිකපරියත්ති යන නමින් ආයේය.

"සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො අලගද්දත්ථිකො අලගද්ද ගවෙසී අලගද්දපරියෙසනං චරමානො, සො පස්සෙය්‍ය මහන්තං අලගද්දං, තමෙනං හොගෙ වා නඞ්ගුඪෙ වා ගණ්ඩෙය්‍ය, තස්ස සො අලගද්දො පරිවත්තිත්වා හත්ථෙ වා බාහාය වා අඤ්ඤ-තරස්මිං වා අඞ්ගපච්චඞ්ගෙ ඩසෙය්‍ය, සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං, තං කිස්ස හෙතු?, දුග්ගහිතත්තා භික්ඛවෙ! අලගද්දස්ස, එවමෙව ඛො භික්ඛවෙ! ඉධෙකච්චෙ මොසපුරිසා ධම්මං පරියාපුණන්ති සුත්තං-පෙ-වෙදල්ලං, තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං න උපපරික්ඛන්ති, තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං අනුප-පරික්ඛතං න නිජ්ඣානං ඛමන්ති, තෙ උපාරම්භානිසංසා චෙ ව ධම්මං පරියාපුණන්ති ඉතිවාදප්පමොක්ඛානිසංසා ච, යස්ස ච ත්ථාය ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං නානුභොන්ති, තෙසං තෙ ධම්මා දුග්ගහිතා දීඝරත්තං අහිතාය දුක්ඛාය සං-වත්තන්ති, තං කිස්ස හෙතු? දුග්ගහිතත්තා භික්ඛවෙ! ධම්මානං" යි වදාළ බැවින් අත්ථි වරදවා ගන්නාලද අනුනට ගැරහීමේ අනුන් ඔබා ගැණීමේ හෙතුවෙන් පුරුදු පුහුණු කළ පර්‍යාපතිය, තමහට එලොවැ මෙලොවැ දෙකෙහි අහිතපිණිස අවැඩපිණිස දුක්පිණිස පවත්නා බැවින් අලගද්දපරියත්ති යි ගත යුතු ය.

සජීයකු අල්ලා ගන්නේ, සජියාගේ සිරුරෙන් හෝ නගුටෙන් අල්ලා ගත්තේ නම්, සජි තෙමේ ආපසු හැරී ඔහුගේ අත් පා ආදි යම්කිසි අවයවයක් දෂට කරන්නේ ය. එයින් ඔහු මරණයට හෝ මරණය තරම් දුකට පැමිණෙන්නේ ය. එසේ වන්නේ සජියා අල්ලා ගතයුතු ලෙසට නොං අල්ලා ගෙණ වැරදි ලෙසට අල්ලාගත් බැවිනි. එ මෙන් මේ සස්නෙහි යම්කිසි පැවිද්දෙක් බුදු දහම් පුහුණු කරන්නේ උගන්නේ ලාභසත්කාරාදිය උපදවා ගෙණ ප්‍රසිඩජීවිත-යක් ගත කරන්නෙමි යි සිතා හෝ අනුන් මැඩ ඔබා ගෙණ යිවින් නෙමි යි සිතා හෝ අනුන් හා වාද කොට ජය ගෙණ වසන්නෙ මි යි සිතා හෝ පුහුණු කෙරේ ද, උගන්නේ ද, ඔහු එසේ සිතා පුහුණු කළ උගත් ඒ ධර්මය ඔහුට අහිතපිණිස අවැඩපිණිස දුක් පිණිස වන්නේ ය. ශීලපූරණාදි වශයෙන් ධර්මයෙන් ලැබිය යුතු නියම ප්‍රයොජනය ඔහුට නොං ලැබේ. මෙසේ වන්නේ වැරදි අදහස් ඉදිරිපත් කොට බුදුදහම් පුහුණු කළ බැවිනි. වැරදි අදහස් ලාමක අදහස් ඉදිරිපත් කොට උගත් ධර්මය උගත්ත හුට කිසිසේත් හිතපිණිස නොං පවත්නේ ය. මේ ය, අලගද්දූපරියත්ති.

යමෙක් සිවුපසය ලබන්නෙමි යි හෝ සිවු පිරිස්මැද උසස් තැනක් ගන්නෙමි යි හෝ, ලාභසත්කාර උපදවන්නෙමි යි හෝ, බුදුදහම් පුහුණු කෙරේ ද, මේ අදහස් ඇති ව බුදුදහම් ඉගෙණීම, පුහුණු කිරීම සජියකු වරදවා අල්ලා ගැණීම සේ, අහිතකර බැවින්, ඔහිසුණු බැවින් අලගද්දූපරියත්ති යි මැදුම්සහි අටුවාවේ කියනලද්දේ ය.

යම් පර්‍යාපත්තියක් තොමෝ ශීලාදිගුණධර්මයන්ගේ වැඩීම පිරි ම ම කැමැති වන්නහු විසින් අරුත් නොං වරදවා මොනවට උගන්නා ලද ද, අනුනට ගැරහීම් ආදිය පෙරටු කොට නොං උගන්නා ලද ද සසරින් මිදීම ම ප්‍රයොජන කොට ඇති මේ පර්‍යාපත්තිය නිස්සරණපරියත්ති' නම්.

දන්නා ලද සකල ඇති ප්‍රහීණ කළ කෙලෙස් ඇති වැඩූ මාගී ඇති ප්‍රතිවෙධ කළ අර්‍ථඵල ඇති ප්‍රත්‍යක්ෂ කළ නිරෝධය ඇති ක්ෂීණාශ්‍රවයන් වහන්සේ හුදෙක් ප්‍රවේණිපාලනය පිණිස වංශරක්ෂණය පිණිස යම් ධර්මයක් පුහුණු කෙරේ ද, ඒය භණ්ඩාගාරිකපරියත්ති.

විනයෙහි සුපිළිපන් මහණ තෙමේ ශීලසම්පත්තිය නිසා පුබ්බනිවාසානුස්සති-දිබ්බචක්ඛු- ආසවක්ඛයකරඤාණ යන ත්‍රිවිද්‍ය වන්ට පැමිණේ. සූත්‍රයෙහි සුපිළිපන් මහණ තෙමේ සමාධි

සම්පත්තිය නිසා ඉඩිවිධ – දිබ්බසොත – පරවිත්තවිජානන-පුබ්බෙ නිවාස – දිබ්බචක්ඛු – ආසවක්ඛයකරඤ්ඤාණ යන ෂට් අභිඥාවන්ට පැමිණේ. අභිධර්මයෙහි සුපිළිපන් මහණ තෙමේ ප්‍රඥාසම්පත්තිය නිසා අර්ථ-ධර්ම-නිරුක්ති-ප්‍රතිභාණ යන සිවු පිළිසිඹියාවන්ට පැමිණේ:

විනයයෙහි දුපිළිපන් මහණ තෙමේ බුදුරජුන් විසින් අනු දන්නා ලද සැප එළවන පහසින් යුත් ආස්තරණපාපුරණාදීන්ගේ සැප පහසුකම සාධාරණත්වයෙන් ගෙණ උන්වහන්සේ විසින් වළකන ලද, මගින් මගසෙවීම් ආදියෙන් හට ගන්නා (උපාදින්න වස්තූන්ගෙන් හට ගන්නා) පහසවිසයයෙහි ද නිවරද ඇදහීම් ඇත්තේ ශීලවිපත්තියට ද පැමිණේ.

අරිට්ඨභික්ෂු තෙමේ 'ගිහියෝ වනාහි පස්කම්සැප හිත කට පුරා විඳින්නෝ ම සෝවත් සෙදගැමි අනගැමි වෙති, මහණෝ ද මනවඩන රූප, සිත් ගත් ශබ්ද, සිරුර පොපියන සුවඳ, නහර පිණවන රස, මොළොක් පහස විඳින්නෝ ය, ඒ එසේ නම්, මහණනුට ඒ සුදුසු නම්, ස්ත්‍රීන්ගේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නො වටනේ කුමක් නිසා ද, එ ද මහණහුට වටනේ ය යි නිරවද්‍ය ප්‍රත්‍යයපරිභොගය හා සාවද්‍ය කාමගුණපරිභොගරසය සංසන්දනය කොට සමාන කොට සලකා සච්ඡන්දරාගපරිභොගය හා නිච්ඡන්ද පරිභොගය හා එකක් කොට ගෙණ දළවැහැරි හා ඉතා සියුම් හුයක් ගටන්නා සේ, ගළපන්නා සේ අබැටක් හා මහමෙර සම කරන්නා සේ, ලාමකදෘෂ්ටියක් ගෙණ බුදුරජුන් විසින් මහමුහුද බඳින්නා සේ මහත් වෑයමකින්, ප්‍රථමපාරාජිකාව පණවන ලද්දී ය, එහෙත් එහි දොසෙක් නැතැ යි සර්ම්ඥතාඥානයට පටහැනි ව ආර්‍ය්‍යමාර්ගයෙහි කණුකටු හෙලමින් මෙවුන්දම් සෙවුමෙහි වරද නැතැ'යි ජිනචක්‍රයට පහර දුන්නේ ය. **"තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නාලං අන්තරායාය"** යනු පොතෙහි ආ සැටියි.

මේ අරිට්ඨභික්ෂු තෙමේ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ ය. ධර්මකථික ය. එහෙත් විනයයෙහි අදක්ෂය. එහෙයින් කර්ම-ක්ලෙශ විපාක-උපවාද-ආඥාව්‍යතික්‍රම යන පස් වැදැරුම් අන්තරායිකයන් අතුරෙන් ඔහු දන්නේ කර්ම-ක්ලෙශ-විපාක-උපවාද යන සතර පමණ ය. විනයයෙහි අදක්ෂ බැවින් ව්‍යතික්‍රමාන්තරාය ඔහු නො දනියි. එහෙයින් ම ය ඔහු මෙසේ සිතුයේ.

සූත්‍රයෙහි දුපිළිපත් මහණ තෙමේ "**වත්තාරෝ මෙ භික්ඛවෙ! පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ වත්තාරෝ? අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය, පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය**" යනාදි තැන්හි බුදු රජානත් වහන්සේගේ අදහස් නො දන්නේ, මිථ්‍යාදෘෂ්ටියට බැස ගත්තේ ය.

බුදුරජුන්ගේ දෙශනාව සම්මුති-පරමත්ථ විසින් දෙපරිදි ය. **පුග්ගලො, සත්තො, ඉත්ථී, පුරිසො,** යනාදිය සම්මුතිදෙසනා ය. **ඛන්ධා, ධාතුයො, ආයතනා, සතිපඨානා,** යනාදිය පරමත්ථ දෙසනා ය. සම්මුතිවසයෙන් කළ දෙසනාව අසා නිර්වාණාධි ගමය කරණුවන් සඳහා ය සම්මුතිදෙසනාව. පරමත්ථවසයෙන් කළ දෙසනාව අසා නිර්වාණාධිගමය කරණුවන් සඳහා ය, පරමත්ථදෙසනාව.

මෙසේ උන්වහන්සේගේ අදහස් නො දන්නේ තමන් ගත් මිත්‍යාදෘෂ්ටිය නිසා උන්වහන්සේට ගර්හා කරන්නේ ය. තමාගේ කුසලමූලය ද සාරා දමයි. බොහෝ අකුසල් රැස් කරයි. එයින් ඔහු අපායයෙහි හෙන්නේ ය.

අභිධර්මයෙහි දුපිළිපත් මහණ තෙමේ දහම් තතු සිතීමෙහි පමණ ඉක්මවා යෑමෙන් නො සිතිය යුතුදේ සිතයි. එයින් හෙ තෙමේ චිත්තවික්ෂෙපයට පැමිණෙයි. "**වත්තාරි'මානි භික්ඛවෙ! අචින්තෙය්‍යානි න චින්තෙතබ්බානි, යානි චින්තන්තො උම්මා දස්ස විඝාතස්ස භාගී අස්ස**" යනු එහි සාධක වචන යි.

මෙසේ මේ පිටකයන්හි දුපිළිපත් මහණ තෙමේ පිළිවෙළින් දුසිල් බව, මිසදිටුව, සිත්විකෙව්බව යන විපතට පැමිණෙන්නේ ය. මේ පිටකවශයෙන් ද තෙපදිරි වූ සැටියි. නිකායවශයෙන් බෙදුනු සැටි යටැ කියූ සේ දන්න.

මේ කියනු ලබනුයේ අඞ්ගවශයෙන් බෙදුනු සැටි යි. එහි සකල බුද්ධවචනය තෙමේ **සුත්ත-ගෙය්‍ය-වෙය්‍යාකරණ-ගාථා-උදාන ඉතිවුත්තක-ජාතක-අබ්භුතධම්ම-වෙදල්ල** යි නවයකට බෙදුනේ ය.

සුත්ත නම්, උභතොවිභඞ්ග, චුලනිද්දෙස, මහානිද්දෙස, ඛන්ධක, පරිවාර, මඞ්ගල, රතන, නාලක, තුවටකසූත්‍ර හා මින් අන්‍ය වූ සූත්‍රනාමයෙන් ආ බුද්ධවචන යි.

ගෙය්‍ය නම්, සියලු ගාථාසහිතසූත්‍රසමූහය ය. විශෙෂ විසින් සංයුත්ත නිකායයෙහි එන සගාථකවර්ගය ගෙය්‍ය නම්.

වෙය්‍යාකරණ නම්, අභිධම්මපිටකය හා නිග්ගාථකසුත්‍රසමූහය යි. මේ කියූ නවඟින් සංග්‍රහ නොකළ අන්‍ය වූ සම්ම බුද්ධවචනයෙක් වේ නම්, ඒ ද වෙය්‍යාකරණ යි.

ගාථා නම්, ධම්මපද, ථෙරගාථා, ථෙරීගාථා, හා සූත්‍රනිපාතයෙහි සුත්‍ර නාම විරහිත වූ සුද්ධිකගාථා ය.

උදාන නම්, සොම්නස් හා පැවැති ඤාණයෙන් උපන් ගාථාවක් ගෙන් යුත් දෙයසූවක් සූත්‍රධම් යි.

ඉතිවුත්තක නම්, 'වුත්තං හෙතං භගවතා' යන ආ නයින් පැවැති එක්යිය දෙළොසකින් ප්‍රමාණ කරණලද සූත්‍රධම් යි.

ජාතක නම්, අපණ්ණකජාතකය මුල් කොට ඇති පන්යිය පණස් ජාතකකථා ය.

අබ්භුතධම්ම නම්, 'චත්තාරෝ'මේ භික්ඛවෙ! අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ' යන ආ නයින් පැවැති සියලු ම ආශ්චර්‍යාද්භුතධම්ප්‍රති සංයුක්තසූත්‍රධම් යි.

වෙදල්ල නම්, චූළවෙදල්ල, මහාවෙදල්ල, සම්මාදිට්ඨි, සක්කපඤ්හ, සඞ්ඛාරභාජනීය, පුණ්ණමසූත්‍රාදි වූ නුවණ ත් සතුට ත් ලබා ලබා විචාරණ ලදුව වදුල යියලු ම සූත්‍රධම් යි. මේ අඞ්ගවශයෙන් බෙදූ සැටි යි.

ධම්මසඞ්ගවශයෙන් සකලබුද්ධවචනය සුවාසූ දහසකට බෙදූ සේ ය. ගොපකමොග්ගල්ලායනයන් විසින් 'ආනන්ද! තමුන්නාන් සේගේ බහුශ්‍රැතභාවය බුදුසසුනෙහි ඉතා ප්‍රකට ය, බුදුරජුන් විසින් දෙසනාකරණ ලද කෙතෙක් ධම්යෝ නුඹ වහන්සේ විසින් දරණ ලද්දේ දැ?' යි ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙන ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් වදුල,

"චාසීතිං බුද්ධතෝ ගණ්හිං චෙ සහස්සානි භික්ඛුතෝ,
චතුරාසීතිසහස්සානි යෙ මෙ ධම්මා පවත්තිනෝ"

යන මෙහි දැක්වෙන ලෙසින් ධම්මඛන්ධයන්ගේ වශයෙන් සුවාසූ දහසෙක් වේ. එහි එක් අනුසන්ධියක් ඇති සතිපට්ඨාන සූත්‍රාදිය එක් ධම්මඛන්ධයෙක් වේ. සතිපට්ඨානසූත්‍රය "ඒකායනෝ අයං භික්ඛවෙ! මග්ගෝ සත්තානං විසුද්ධියා" යනාදින් මුල සිට අවසානය තෙක් සතර සතිපට්ඨානයන්ගේ විභාගය දැක්වීම් වශයෙන් පැවැති බැවින් එකානුසන්ධික යි කියනු ලැබේ. නොයෙක් අනුසන්ධි ඇති මහාපරිනිබ්බාණසූත්‍රාදී වූ සම්ම සූත්‍රධම්යෙක් වේ නම්, එහි අනුසන්ධිවශයෙන් ධම්මඛන්ධයන්ගේ ගිණුම වේ. පරිනිබ්බාණ

සූත්‍රය නොයෙක් ධර්මදේශනාවන්ගේ වශයෙන් අනෙකානුසන්ධික වේ. ගාථාබන්ධයන්හි එන **"කති ජිණ්ණෙ"** යනාදී වූ ලෙසින් ආ එක් ප්‍රශ්න විචාරීමෙක් එක් ධර්මස්කන්ධයෙක් වේ. එසේ ම එක් ප්‍රශ්න විසඳුමෙක් එක් ධර්මස්කන්ධයෙක් වේ.

අභිධර්මයෙහි එක් එක් තික දුක භාජනයෙක් ද, එක් එක් චිත්තවාරභාජනයෙක් ද එක් එක් ධර්මස්කන්ධයෙක් වේ.

විනයයෙහි සුදින්නාකාණ්ඩාදිවස්තු ඇත. **"යො පන භික්ඛු භික්ඛූනං සික්ඛා සාජීවසමාපන්නො"** යනාදීන් ඒ ඒ අධ්‍යාචාර නිමිති කොට පැණ වූ ශික්ෂාපදමාතෘකා ඇත. **"යො පනාති යො යාදිසො"** යනාදි ලෙසින් ආ ශික්ෂාපද බෙදුම් ඇත. **"පවිලාතං උක්කිපති ආපත්තිං දුක්කටස්ස"** යනාදීන් පැණ වූ අනන්තරාපත්ති ඇත. **"අනාපත්ති අජානන්තස්ස"** යනාදී ලෙසින් ආ අනාපත්ති වාර ඇත. **"දසාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී නිස්සග්ගියං පාචිත්තියං වෙමතිකස්ස නිස්සග්ගියං පාචිත්තියං, අනතික්කන්ත සඤ්ඤී නිස්සග්ගියං පාචිත්තියං"** යනාදී ලෙසින් ආ තිකපරිච්ඡේද ඇතැ' යි වදාළ එක් එක් කොටස එක් එක් ධර්මස්කන්ධයෙක් වේ. ධර්මස්කන්ධයන්ගේ වශයෙන් මේ කියූ සැටියි.

'දෙයාසූ දහසක් ධර්මස්කන්ධ බුදුරජුන් වෙතින් ගතිමි, දෙදහසක් ධර්මස්කන්ධ ශාරිපුත්‍රාදිනිඝ්‍රන්ථයන් වෙතින් ගතිමි, යම් ධර්මකෙනෙක් මා ලෙහි පවත්නෝ ද, ඒ ධර්මයෝ අසූසාර දහසෙකැ' යි යනු **"මාසිතිං බුද්ධතො ගණ්හිං"** යනාදි ගාථාවේ කෙටි තේරුම ය.

බුදුරජුනත් වහන්සේ ධර්මාණකාලයෙහි උගත් ධර්මස්කන්ධයන්ගේ වශයෙනි මේ කියනලද්දේ. උන්වහන්සේගේ පිරිනිවීමෙන් පසු, ආනන්දස්ථවිරයන් වහන්සේ විසින් දෙසූ සුභසූත්‍රය, ගොපක මොග්ගල්ලායනසූත්‍රය, මොග්ගලිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ දෙසූ කථාවත්‍රප්‍රකරණය යන මොවුන්ගේ වශයෙන් ගිණූ කල්හි ධර්මස්කන්ධසඛ්‍යාව සුවාසූදහසට වැඩී වේ.

සඟිත නම් වූ බුද්ධවචනය, දක්ෂ වූ ගුරුන් ඇසුරු කොට, ක්‍රම නොවරදවා මැනැවින් උගෙණ උද්දෙස-පරිපුච්ඡාදීන්ගේ වශයෙන්, උපනිසින්නකකථා වශයෙන්, භුක්තානුමෝදනා වශයෙන්, ධර්මදේශනාවශයෙන් යන ආ ලෙසින් කියන කියවන තැනැත්තේ **භාණකමානක**, නම්.

අපි, වෙ' යනු, නිපාත යි. එහි අපි' යන්න සම්භාවනා-ගරහා-අපෙක්ඛා-සමුච්චය-පඤ්හා-සංවරණ යනාදී වූ අර්ථයන්හි හෙන්නේ ය. **"අපි සබ්බෙසු කාමෙසු රතිං සෙ නාධිගච්ඡති"**

යනාදි තැන්හි සම්භාවනායෙහි ද, **"අමහාකම්පි පණ්ඩිතකා"** යනාදි තැන්හි ගර්හායෙහි ද, **"අයම්පි ඛෙමෝ අනියතෝ"** යනාදි තැන්හි අපෙක්ෂායෙහි ද, **"ඉති පි අරහං"** යනාදි තැන්හි සමුච්චයෙහි ද, **"අපි භණෙන සික්ඛං අලභිත්ථ"** යනාදි තැන්හි ප්‍රශ්නයෙහි ද, **"අප්පිඛානං"** යනාදි තැන්හි සංවරණයෙහි ද වැටේ. මෙහි ආයේ අපෙක්ෂායෙහි ය. සමුච්චයෙහිලා ගත ද වරද නැත. **වෝ'** යනු කියන ලදී.

න තක්කකරෝ හොති නරෝ පමත්තෝ = පමා වූ මිනිස් තෙමේ ඒ දහම් අනු ව නො තරන්නේ වේ. (නම්.)

පමත්තෝ නරෝ තක්කකරෝ න හොති, යන පද පිළිවෙළින් අරුත් ගන්නේ ය. යමෙක් සිල්වත් ව සිට, බණදහම් මොනවට ඉගෙණ, අනුනට කියත ත්, කියවත ත්, තෙමේ ඒ වූ ලෙස පිළිවෙත් නො පුරන්නේ, කුකුළකු පියා පහරණ පමණ කලකුත්, සංඝකාරධම්යත් පිළිබඳ අනිත්‍ය – දුඃඛ – අනාත්ම යන ඇති තතු නුවණින් මෙනෙහි නො කරන්නේ **පමත්ත,** නම්.[1] ඔහු, ත්‍රිපිටක බුද්ධවචනය බොහෝ කොට ඉගෙණ අනුනට කියමින්, උගන්වමින් සිටියේ ද, බණදහම් දැන උගත්තහු විසින් කළයුතු භාවනානුයොගාදී වූ කිසිවකුත් නො කරන්නේ නම්, බණදහම් අනු ව නො පිළිපදනේ නම්, අනිත්‍යාදිවශයෙන් යොනිසොමනසිකාරය නො පවත් වන්නේ නම්, යන අරුත් **'න තක්කකරෝ හොති'** යන පදත්‍රයයෙන් කිය වෙන්නේ ය.

ගොපෝ ඉව භාවෝ ගණිඝං පරෙඝං = අනුන්ගේ ගෙරින් රක්නා ගොපල්ලකු මෙන්.

"පරෙඝං භාවෝ ගණිඝං ගොපෝ ඉව, යනු පද පිළිවෙළය. පමා වූ මිනිසා, අනුන්ගේ ගෙරි රක්නා ගොපල්ලකු වැනි බව ය, මෙයින් වදාළේ. කුලියට අනුන්ගේ ගෙරින් රක්නා ගොපලු තෙමේ, උදය සිට කවමින්, පොවමින්, නාවමින් ගෙරින් **රැක,** සවසැ ගෙණවුත් ගෙරින් අසිනිකරුට උන් පාවා දී දවස් කුලිය ඉඟණ යන්නේ නමුදු ගෙරින් පිළිබඳ පස්ගොරසයට හිමි නො වේ. දවස්කුලිය පමණක් ම ය ලබන්නේ. එ මෙන් මේ පමා වූ මිනිසා, ඉගැණුම් පමණට අතැවැස්සන්ගෙන් වත් පිළිවෙත් පමණක් ම ලබන්නේ ය. යන්තම් සැලකුමක් ලබන්නේ ය. ගොපොල්ලා ලබන කුලිය වැනිය මේ උගතා ලබන සැලකුම්.

---

1. 2. 1 'පමාදෙ මඳිවුත්තා පදං' යන්නට කළ පරිකථාව බලනු.

න භාගවා සාමඤ්ඤස්ස හොති = ශ්‍රමණගුණයට හිමි නො වේ

යමෙක්, කො තරම් සිල්වත් වුව ද, කො තරම් උගතකු වුව ද, කො තරම් බණ කියුව ද, කො තරම් බණ ඉගැන්නුව ද, බණ ලෙසින් නො ද පිළිපදනේ නම්, භාවනායෙහි නො ද යෙදුනේ නම්, අනිත්‍යාදිවශයෙන් යොනිසොමනසිකාරය නො ද පවත්වා නම්, කුකුළකු පියා පහරණ පමණ කලකුත්, සංඝකාරධර්මයන් පිළිබඳ අනිත්‍යාදී වූ ලකුණු නො බලා නම් ඔහු ශ්‍රමණගුණයට, මොන ලෙසකිනුත් හිමි නො වේ ය යනු වදාළෝ ය මෙයින්. එහෙත්, ගොහිමියන් පස්ගොරස වලදා සුඛිත මුදිත වන්නා සේ, මොහු කියූ බණ අසා, ඒ අනු ව පිළිවෙත් පුරන්නෝ, ධ්‍යානාභිඥ මාර්ගඵල ලබා සුඛිත මුදිත වෙති.

සාමඤ්ඤස්ස, යන්නෙන් කියූයේ සෝවන් ආදී වූ මගපල අට ය. [1]අවිශෙෂයෙන් එසේ කියූව ද, එහි පරමාර්ථ විසින් ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය **සාමඤ්ඤ,** නම් වේ. සොතාපත්තිඵල-සකදාගාමීඵල-අනාගාමීඵල-අරහත්තඵල යන ආර්‍යඵල **සාමඤ්ඤ ඵල'** නම් වේ. මේ ය සූත්‍ර ය:- **"කතමං ච භික්ඛවෙ! සාමඤ්ඤං?, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථිද?, සම්මා දිට්ඨි -පෙ- සම්මාසමාධි, ඉදං වුච්චති භික්ඛවෙ! සාමඤ්ඤං, කතමං ච භික්ඛවෙ! සාමඤ්ඤ ඵලං?, සොතාපත්තිඵලං -පෙ- අරහත්තඵලන්ති."**

මෙහි මේ ප්‍රථමගාථාව දෙසන ලද්දී, අනිත්‍යාදි වශයෙන් යොනිසොමනසිකාරයෙහි ප්‍රමත්ත වූ බොහෝ බණ දහම් දැනුම් ඇති සිල්වත් භික්ෂුනම ඉදිරිපත් කොට ය.

අප්පං අපි වෙ සහිතං භාසමානො=බුඩවචනය ස්වල්පයක් නමුත් (උගෙණ) කියන මිනිස් තෙමේ.

ධම්මස්ස = ධර්මයට

මාර්ග-ඵල සතර හා නිවණ යන නවලොවුතුරු දහම හා, ඒ ලැබුමට මග පෙන්වන ත්‍රිපිටකබුඩවචනයත් ය **ධර්ම.** එහෙත් මෙහිලා ගැණෙන්නේ, නවලොවුතුරු දහම ය.

කෙලෙස් මුළුමනින් ඉතිරි නො කොට සිඳ දැමීමට මග-පල සිත්වලට අරමුණු වන ශාන්තධර්මය **නිර්වාණ'** නම්. තෘෂ්ණාව **වාන,** යි කියනු ලැබේ. එසේ කියනු, ත්‍රෛභූමිකධර්ම, උඩු-යටි කොට, යටි-උඩු කොට වෙළන, අවුණන බැවිනි. සක්ඛායතනාදි ත්‍රෛභූමිකධර්ම, එසේ අවුල් කොට වෙළන, අවුණන තෘෂ්ණාවෙන්

1. 1-7. 'යොච චත්තකසාවස්ස' යන්නට කළ පරිකථාව බලනු

නික්මුණු බැවින්, ඒ මේ ශාන්තධර්මය නිර්වාණ යි හඳුන් වනු ලැබේ. මේ මෙය කියූ සැටි:- **"ඛන්ධායතනාදිහෙදෙ තෙභුමක ධම්මෙ හෙටඨුපරියවසෙන විනනතො සංසිබ්බනතො වානං වුච්චති තණ්හා, තාය නික්ඛනතත්තා විසයාතික්කමනවසෙන අතීතත්තා නිබ්බානං"** යි.

නිවන නම් කිමැ, යි වඩාලා ත් පැහැදිලි කරන්නට **"යො සො සබ්බසඞ්ඛාරසමථො, සබ්බුපධිපටිනිස්සගෙගා, තණ්හක්ඛයො විරාගො නිරොධො, නිබ්බානං"** යනු වදාළ සේක. මෙහි ආ මේ හැම පදයකින් පැහැදිලි කරණුවෝ නිවන්තතු ය. යම් ශාන්තසුඛයක් නිසා, සියලු සංස්කාරයෝ සංසිඳෙත් ද, කාමූපධි ආදී වූ සියලු උපධීහු මුළුමනින් බැහැර කරණ ලද්දෝ වෙද් ද, සියලු තෘෂ්ණාවෝ වැනසෙත් ද, කිලෙසරාගයෝ නො ඇලෙත් ද, සියලු දුක් නිරුඬ වේ ද, සංස්කාරයන්ගේ, උපධීන්ගේ, තෘෂ්ණාවන්ගේ, කිලෙසරාගයන්ගේ, දුඃඛයන්ගේ සංසිඳීමට, දුරුවීමට, වැනසීමට, නො ඇලීමට, නිරුඬවීමට කරුණු වූ ඒ ශාන්තසුඛය ය නිවන. එය සංසිඳීම ලකුණු කොට සිටියේ ය. ඒ සංසිඳීම කිසි විටෙක ත් අත් නො හැර පැවැත්ම එහි කෘත්‍යය වේ. හිත සැප කෘත්‍යය කොට සිටියේ ය යි ද කියැ යුතු ය. සියලු සංස්කාරයන් ගෙන් නික්මීම එයට ආසන්න කාරණය වේ. චතුර්විධමාර්ගඥාන යෙන් ඒ දතයුතු ය. එ හෙයින් සතරමාර්ගඥානය ලැබූ ආර්‍යපුද්ගල යන්ට, මෙය ප්‍රත්‍යක්ෂසිද්ධ ය. කල්‍යාණපෘථග්ජනයනට අනුමාන සිද්ධ ය. ඒ අනුමානසිඬිය වනාහි දෙසුම්මග නිසා ම වන්නේ ය. අන්ධබාල පෘථග්ජනයනට කොයිලෙසිනුත් අසිද්ධ ය. ඔවුනට කොයිලෙසකිනුත් නො දත හැකි ය. මාර්ග-ඵලයන්ට ම අරමුණු වේ. මේ **"නිබ්බානං පන ලොකුත්තරසංඛාත චතුමග්ගඤ්ඤාණෙන සච්ඡිකාතබ්බං මග්ගඵලානමාලම්බනභූතං"** යනු කීයේ එහෙයිනි.

විඳියැ යුතු සැපයෙක් නො වේ මෙ ය. විඳියැයුතු සැපය මුළු මනින් දුකෙකි. එ හෙයින් එය දුඃඛසත්‍යයෙහි ඇතුළත් වේ. **වෙදයිත-සාන්ති** යි සුවය දෙපරිදි ය. එහි රූපශබ්දාදීන්ගේ රස විඳුම වෙදයිතසුඛය යි. විඳියැ යුතු සැපය යි කියූයේ මේ ය. රූපාදීන්ගේ රසවිඳුම්සැපය, අරූප වූ නිවනෙහි නො ලැබෙන්නේ ය. හැම දුකක් ම ඉතිරි නො කොට සංසිඳවීම සාන්තිසුඛය යි. ඒ ය නිවණෙහි ඇත්තේ.

ඒ මේ නිවන, සංසිඳීම්සැප විසින් එකෙක් වූයේ ද, **සොපාදිසෙස, අනුපාදිසෙසනිබ්බානෑ,** යි කාරණව්‍යවහාරයෙන් දෙ පරිදි ය. පංචස්කන්ධය උපාදි නම් වේ. එසේ කියනු ලබන්නේ,

එය උපාදානයන් විසින් දැඩි ව තරයේ ගණු ලබන බැවිනි. **කාම-දිට්ඨි-සීලබ්බත-අත්තවාද** යි උපාදාන සතරෙකි. නාගයා, මැඩියා දැඩි ව අල්ලා ගන්නා සේ අරමුණ තදින් දැඩි ව **අල්ලා** ගත්තෝ ය මොවුහු. එහෙයින් මොවුහු උපාදානයෝ ය. මොවුන් විසින් පංචසකන්ධය දැඩි ව අල්ලා ගණු ලැබේ. **"චතූහි උපාදානේහි උපාදියතීති = උපාදි, පඤ්චක්ඛන්ධෝ"** යනු කියේ එහෙයිනි. කොටසක් හෝ මූළුමනින් හෝ කම්කෙලෙස් ගෙවා දැමූ කල්හි කෙලෙස් නැසී ගිය කල්හි, ඉතිරි වන්නේ කෙලෙස් රහිත වූ, උපාදානස්කන්ධයන්ගෙන් වෙන් වූ උන් හා නො හැකුනු සස්කඛ පමණෙකි. එවිට මෙහි කියා ත් කිලිටෙක් නැත්තේ ය. ඇත්තේ ද කෙලෙස් සහිත අවස්ථායෙහි තුබූ උපාදි යන නම පමණෙකි. ඒ මූල් නම ත්, කෙලෙස් රහිත සස්කඛ ත් ඉතිරිවූවහු පිළිබඳ සංසිඳීම **සොපාදිසෙසනිබ්බානං'** යි කියනු ලැබේ. මග-පල ලබා ජීවත් වන්නහු පිළිබඳ නිවන ය සොපාදිසෙස. ඉතිරි වූ ඒ කෙලෙස් රහිත සස්කඛ ත් බහා තබා ලබන සංසිඳීම **අනුපාදිසෙසනිබ්බානං'** යි කියනු ලැබේ. රහත්පල ලබා පිරිනිවන් පැවහු පිළිබඳ නිවනය අනුපාදිසෙස. මේ මෙය කියූ සැටි:- **"උපාදි එව සෙසෝ කිලෙසෙහි උපාදිසෙසෝ, සහ උපාදිසෙසෙන වත්තතීති=සොපාදිසෙසෝ, නත්ථි උපාදිසෙසෝ එතස්සාති = අනුපාදිසෙසෝ"** යි. කිලෙසපරිනිබ්බාන - ඛන්ධපරිනිබ්බාන - දිට්ඨධම්මනිබ්බාන - සමපරායිකනිබ්බාන යන නම්වලිනුදු මේ දෙක හඳුන්වනු ලැබේ.

මෙය ආකාරභෙදයෙන් **සුඤ්ඤත-අනිමිත්තත-අප්පණිහිත** යි තෙ පරිදි ය. අරමුණු විසින්, සම්ප්‍රයොග විසින් රාග-දෙස-මෝහ යන්ගෙන් ශූන්‍යබැවින් සුඤ්ඤත, නම් වේ නිවන. **"ආරම්මණතො සම්පයොගතො ච රාගදෙසමොහෙහි සුඤ්ඤත්තත්තා = සුඤ්ඤං සුඤ්ඤමෙව සුඤ්ඤතං"** යනු එහි අරුත් කී සැටි යි. අරමුණු විසින්, සම්ප්‍රයොග විසින් රාගාදි වූ සසරදුක්ගෙතුන්ගෙන් වෙන් වූ බැවින් අනිමිත්ත, නම් වේ, නිවන. **"රාගාදිනිමිත්තත්තා රහිතත්තා = අනිමිත්තං"** යනු එසරුත් කිම ය. අරමුණු විසින්, සම්ප්‍රයොග විසින් රාගාදිප්‍රණිධි රහිත බැවින් අපණිහිත, නම් වේ නිවන. මේ කියූ සැටි:- **"රාගාදිපණිධිරහිතත්තා = අප්පණිහිතං"** යි. මැරී ඉපැදීමක් නැති, කෙළවර රහිත, ප්‍රත්‍යයයන් විසින් නො සකස් කළ නිරුත්තරපදය නිවනැ යි තෘෂ්ණාවෙන් මිදී සිටි මහර්ෂිහු කියති. **"පදමච්චුතමච්චන්තමසඞ්ඛතමනුත්තරං, නිබ්බානමිති භාසන්ති වානමුත්තා මහෙසයෝ"** යනු එහි පාළිය යි. විස්තර ඉදිරියෙහි එන්නේ ය.

අනුබ්‍යඤ්ජනසෝ හොති = අනුගතඛණ්ඩයෙහි හැසිරෙණ සුලු වේ(ද)

නවලොවුතුරා දහමට, චතුස්පාරිශුද්ධිශීලය – ත්‍රයොදශ ධුතාඞ්ගය–දශඅශුභකර්මස්ථානය යනාදීහු අනුගතධර්මයෝ වෙති. ප්‍රධාන විසින් එහි චතුස්පාරිශුද්ධිශීලය නම්, පාතිමොක්ඛසංවරසීලය–ඉන්ද්‍රියසංවරසීලය – ආජීවපාරිසුද්ධිසීලය – පච්චයසන්නිස්සිතසීලය යන මේ ය.

"ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාර ගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු" යි වදාළෝ **පාතිමොක්ඛසංවරසීලය'** යි.

'මේ සසුන්හි යම් මහණෙක් තෙමේ පාතිමොක්ඛසංවර සීලයෙන් සංවෘත ව ප්‍රාතිමොක්ෂසංවරශීලය සමාදන් ව ගෙණ එහි පිහිටා ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත ව සවලපවූ ද වරදෙහි බිය දක්නා සුලු ව ජීවිතාශා හැර දමා ශික්ෂාපදයන්හි හික්මේ' ය යනු එහි සිංහල ය.

පාතිමොක්ඛ නම්, ශික්ෂාපදශීලය යි. **"පාතිමොක්ඛන්ති සික්ඛාපද සීලං"** යි ඒ ආයේ ය. යමෙක් ඒ ශික්ෂාපදශීලය රකී ද ඒ ශීලය, ඒ රකින්නහු අපායාදී වූ හැම අතකින් හැම නපුරකින් මුදාලන්නේ ය. ගොඩ ලන්නේ ය. එහෙයිනි පාතිමොක්ඛ' යි කීයේ. මේ විතර වැකිය බලන්න:– **"තං හි යො නං පාති රක්ඛති තං මොක්ඛෙති මොචෙති ආපායිකාදීහි දුක්ඛෙහි තස්මා පාතිමොක්ඛන්ති වුච්චති"** යනු. ඉදිරියෙහි මෙහි විස්තර කථා ඇත.

මේ ශීලය රකින්නා ආචාරයෙන් හා ගොචරයෙන් හා යුක්ත වියැ යුතු ය. ආචාර-ගොචර දෙකින් වියුක්තවූවහුට මේ සීලය නියම ලෙසින් රකිනු නො හැකි ය. ආචාර නම්, කායසුචරිතය, වාක් සුචරිතය, කායවාක් සුචරිතය යන මේ ය. මේ ඒ කී සැටි:– **"කායිකො අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායික වාචසිකො අවීතික්කමො, අයං වුච්චති. ආචාරො"** යි. මේ ඉතාම කෙටියෙනි.

හුණදඬු දීම් ආදී වූ ලාමකක්‍රියාවන්ගෙන් හා බුදුරජුන් විසින් ගරහන ලද තවත් නොයෙක් වැරදි සහිත වූ පහත් ලාමක ක්‍රියාවන්ගෙන් දිවි නො පැවැත්වීම එක් ආචාරයෙකි.

සඞ්ඝයා ඉදිරියට, වැඩිමහල්ලන් ඉදිරියට, ගුරුන් ඉදිරියට පැමිණ සිවුරෙන් සිරුරෙන් අතින් පයින් උන් ගටමින් නො සිටීම නො ඉදීම, උසසුන්හි නො ඉදීම, දැක නැගීසිටීම, ලහසිට නො බෙණීම, වහන් නො දැරීම, හිස වසා නො පෙරවීම, කුඩ හිසැ නො දැරීම එක් ආචාරයෙකි.

ශ්‍රඩාදිගුණ නිසා ගෞරවයෙන් යුක්තවීම යහපත් පැවතුම් ඇදීම් පෙරවීම් යෑම් ඊම් බැලීම් අත්පාහැකිළීම් අත්පාදිගුකිරීම් සිවුපසය සෙවීම් පිළිගැණීම් වැළඳීම් ආදියෙහි පමණ දැනීම, භාවනායෙහි යෙදීම, යථාලාභසන්තොෂාදියෙන් තුටුවීම, ආශාවෙන් නො මැඩීම, කෙලෙස්තැවුමෙහි වැරදැරීම එක් ආචාරයෙකි.

වැඩීමහලු භික්ෂූන් විචාරා දහම්දෙසීම, පාමොක්උදෙසීම, ගෞරව පෙරදැරි ව කතාකිරීම, ගෑණුන් ඉදිරියෙහි 'කන්නට මොනවා තිබේ ද, බොන්නට මොනවා තිබේ ද, කෑද තිබේ ද, බත් තිබේ ද,' යන ඈ ලෙසින් නො දෙඩීම එක් ආචාරයෙකි.

මහණකමට අන්තරායකර බැවින්, මහණකම නැසීයෑමට හෙතුවන බැවින්, ගර්භාවට හෙතු වන බැවින් නො යා යුතු නො එළැඹිය යුතු තැන්වලට නො යෑම, තෙරුවන් කෙරෙහි ඇදහිලි නැති කම්පලඇදහීමෙන් තොර, භික්ෂූන්ට බණින දෙඩන බිය ගන්වන අවැඩ කැමැති මිනිසුන්ගේ ආශ්‍රයෙන් වෙන්වීම එක් ගොචරයෙකි.

බණදහම් දැන උගෙණ කර්ම-කර්මඵලයන්හි හා තුනුරුවන්හි තමාගේ නො ඇද ඇදහීම වඩ වඩාත් ශක්තිමත් කොට රූපාරූප ධර්ම තතු සේ දැන, සත්ව – ජීවසංඥාවන් උගුළා දමා එහි සැක දුරු කොට, උදය-ව්‍යයඥානාදීන්ගේ වශයෙන් විදසුන් වඩා, ආර්‍ය්‍ය භූමිය ලබා ගෙණ මොන ලෙසකිනුත් නො සෙවියැ හැකි නො සැලෙන සැදැයෙන් තුනුරුවන් කෙරෙහි සිත පිහිටුවා ගත් කළණ මිතුරන් සෙවුම එක් ගොචරයෙකි.

පිඬුසිහීමට ගමට වැද, යට හෙලූ ඇස් ඇති ව, වියදඬු පමණින් දුර බලා හැසිරීම, ඇස්-කන්-නාස් ආදී වූ ඉඳුරන් රැක ගෙණ ඇත්-අස්-රිය-පාබල-ගෑණු-පිරිමි යන මොවුන් දෙස නො බලා සංචරවීම එක් ගොචරයෙකි.

භාවනා සිත, වැඩූ සිත, අතැනැ මෙතැනැ නොයාදී සතර සති පඨානයෙන් බැඳ තැබීම එක් ගොචරයෙකි. මේ කියූ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවීම **ආචාරගොචරසම්පන්න'** නම්.

නො දැන සෙඛියශික්ෂාපදයන් ඉක්මවීම, අකුශලචිත්තයන්ගේ ඉපදීම යනාදී වූ ඉතා සුලු වරද ය අණුමාත්‍ර වරද. එබඳු සුලු වරද පවා මහමෙර මෙන් ලොකු කොට සිතා බිය පත්වීම **අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවි'** නම්.

මේ පාතිමොක්ඛසංවරසීලයෙන් මුළුමනින් සංවෘත වූ භික්ෂු තෙමේ චක්ෂුර්ද්වාරාදියෙන් රූපාදී වූ අරමුණු ගෙණ ඒ රූපාදී වූ

අරමුණු ශුභවශයෙන් ගැණීම, අවයව සටහන් ශුභවශයෙන් ගැණීම නො කරන්නේ චක්ඛුර්ද්වාරාදියෙහි සංවරයට පැමිණෙන්නේ ය යි වදළ ශීලය ඉන්ද්‍රියසංවරසීල' නම්. මෙහි විස්තාර යටැ කියන ලද්දේ ය.

"යා පන ආජීවහෙතු පඤ්ඤත්තානං ජනනං සික්ඛාපදානං වීතික්කමස්ස කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පේසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතාති එවමාදිනං වසෙන පවත්තා මිච්ඡා ජීවා විරති, ඉදං ආජීවපාරිසුද්ධිසීලං" යනු වදුලෝ **ආජීවපාරිසුද්ධිසීලය,** යි.

'ආජීවහෙතුයෙන් පැණවූ ශික්ෂාපදයන් සදෙනාගේ ඉක්මවීම් වශයෙන් පැවැත්තා වූ ද, විසමයකරවීම ප්‍රත්‍යය දැයකයා උසස් තැනැ තබා කතා කිරීම, ප්‍රත්‍යය ඉපදවීමට නිමිති දැක්වීම, ලාභ උපදවන්නට අනුන් පෙළීම, ලාභයෙන් ලාභසෙවීම යන මේ ආදී වූ පාපධර්මයන්ගේ වශයෙන් පැවැත්තා වූ ද යම් වැරදි සහිත ලාමක ජීවිකාවෙන් වෙන්වීමෙක් වේ ද, ඒ ය **ආජීවපාරිසුද්ධිසීලය,** යනු එහි සිංහල ය.

"ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡා ඉච්ඡාපකතෝ අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ආපත්ති පාරාජිකස්ස,

ආජීවහෙතු ආජීවකාරණා සංචරිත්තං සමාපජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස,

ආජීවහෙතු ආජීවකාරණා යෝ තෙ විහාරෙ වසති, සෝ භික්ඛු අරහාති භණති පවිච්ජානනස්ස ආපත්ති ථුල්ලච්චයස්ස,

ආජීවහෙතු ආජීවකාරණා භික්ඛු පණීතභොජනානි අගිලානෝ අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස,

ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුනි පණීතභොජනානි අගිලානා අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස,

ආජීවහෙතු ආජීවකාරණා සූපං වා ඔදනං වා අගිලානා අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්ස' යන මේ ඔකපද සය ය ආජීව හෙතුයෙන් පැණවුනේ.

"පවිසඞ්ඛා යොනිසෝ චීවරං පටිසෙවති යාවදෙව සීතස්ස පටිඝාතායාති ආදිනා නයෙන **බුද්ධෙන පවිසඞ්ඛානපරිභුඤ්ජා චතුපච්චයපරිභොගෝ පච්චයසන්නිස්සිතසීලං නාම'** යි කී

බැවින් ප්‍රත්‍යවෙක්ෂායෙන් නුවණින් සලකා බැලීමෙන් පිරිසිදු වූ සිවුපසය වැළඳීම **පච්චයසන්නිස්සිතසීල,** නම්. සිවුපසය ප්‍රයෝජන ගැණීමේ නිරවද්‍යවෙතනාය ඒ.

තවු අරුත් විසින් උපසම්පන්න භික්ෂුව ඇවැතට නොපැමිණීම නිසා ඔහුගේ සිතෙහි ඒ පිළිබඳව පහළ වන කාමාවචරකුසලචිත්ත චීථියෙහි වූ චේතනාවෙතසිකය පාතිමොක්ඛසංවරසීලය යි. ඇස් කන් නාස් ආදියෙන් අරමුණු නොගෙණ ඇස් කන් නාස් ආදී වූ ඉඳුරන් රකින්නාහට ඒ අරමුණු අනිත්‍ය-දුඃඛ-අනාත්ම වශයෙන් පහළ වන කුසලචිත්තචීථි හා යෙදුනු චෙතනාවෙතසික, ඉන්ද්‍රිය සංවර සීලය යි. වැරදි දිවි පැවැත්මෙන් වළකින්නහුට ඒ ඒ වැළැක්මෙහි දී පහළ වන කුසලචිත්තචීථි හා යෙදුනු විරතිය, ආජීව පාරිසුද්ධිසීලය යි. ප්‍රත්‍යවෙක්ෂා කොට නුවණින් සලකා බලා සිවුපසය ප්‍රයෝජනය ගන්නහුට ඒ ඒ ප්‍රත්‍යය පිළිබඳව උපදින කුසලචිත්තචීථි හා යෙදුනු චෙතනාවෙතසික, පච්චයසන්නිස්සිත සීලය යි. මෙහි විස්තාරකථා ඉදිරියෙහි එනු ඇත.

මෙහි මෙසේ ඉතා ම සැකෙවින් කියූ සිවුපිරිසිදු සිල් පිළිබඳ වඩාත් පිරිසිදුබව සපයනුවෝ ආලෝකය දෙනුවෝ ඵලදායක කරණුවෝ ධුතඞ්ගයෝ ය. මේ ධුතඞ්ග සපයන්නහු පළමු කොට සිල්වත් විය යුතු ය. එහි වැර ඇත්තකු විය යුතු ය. සැදැහැතියකු විය යුතු ය. නුවණැතියකු විය යුතු ය. ලද දෙයින් සතුටු වන්නකු විය යුතු ය. මෙසේ ඇති කල්හි ම ය, ධුතඞ්ග පුරන්නහුගේ සිත එහිලා එඹිතර වන්නේ. පසු නොබසින්නේ.

දුරුකරණලද ලාභසත්කාර ඇති කාය-ජීවිත දෙක්හි අපෙක්ෂා රහිත වූ බලාපොරොත්තු නැති නිවන් ලැබීමට අනුලෝම් ව සිටි පිළිවෙත සිදුකරණු කැමැති කුලපුත්‍රයන් නිසා ය බුදුරජනන් වහන්සේ ධුතඞ්ග තෙළෙසක් අනුදැන වදළෝ.

පංසුකූලිකඞ්ග - තේචීවරිකඞ්ග - පිණ්ඩපාතිකඞ්ග - සපදාන චාරිකඞ්ග - ඒකාසනිකඞ්ග - පත්තපිණ්ඩිකඞ්ග - ඛලුපච්ඡාභත්තිකඞ්ග - ආරඤ්ඤිකඞ්ග - රුක්ඛමූලිකඞ්ග - අබ්භොකාසිකඞ්ග - සොසානිකඞ්ග - යථාසන්තතිකඞ්ග - නෙසජ්ජිකඞ්ග යන මේ ය ධුතඞ්ග.

අරුත් විසින් මේ සියලු ධුතඞ්ග, ඒ ඒ පංසුකූලිකඞ්ගාදීන්ගේ සමාදානයෙන් තද්ඞ්ගවශයෙන් නැසූ කෙලෙස් ඇති බැවින් නැසූ කෙලෙස් ඇති මහණහුගේ අඞ්ගනු යි ධුතඞ්ග නම්. යමක් කරමි යි හෝ නොකරමි යි ඉටා ඒ ඒ අඞ්ග සමාදන් වන මහණහට උපදින චිත්තචීථිය හා යෙදුනු චෙතනාවෙතසික ම, කෙලෙස් නැසීමට කරුණු වන බැවින් ධුතඞ්ග නම් වේ.

ඒ ඒ අඞ්ග සමාදන් ව ගන්නා මහණහුගේ ඒ ඒ අඞ්ග පිළිබඳ ව පහළ වන චිත්තවීථිය හා යෙදුනු ප්‍රඥාචෛතසිකය, ධුතඞ්ග නම්. කෙලෙස් නැසීමට කරුණු වනුයේ ඒ ය. රාගාදිප්‍රතිපක්ෂධර්ම කපන නහන බැවින් ශීලාදිප්‍රතිපත්තියට කරුණු වන බැවින් ඒ පංසුකූලචීවරධාරණාදිය ධුතඞ්ග නමැ යි කීයේ එහෙයිනි

ලකුණු විසින් මේ හැම ධුතඞ්ග කෙනෙක් ම සමාදන් ව ගන්නා චෙතනාව හෝ ධුතඞ්ග රක්නාතුරු ඒ අරමුණෙහි උපදින චිත්තවීථින් පිළිබඳ චෙතනාවන් ලකුණු කොට ගෙණ සිටියෝ ය. ධුතඞ්ග රක්නේ පුද්ගල නම. ධුතඞ්ග සමාදන් වන කාලයෙහි සමාදන් වන ඔහුගේ සිත්හි උපදින චිත්තවීථිය පිළිබඳ චෙතනාව හැර අනික් චිත්තචෛතසිකධර්ම ධුතඞ්ගයට හෙතු ය. ඒ චිත්ත වීථිය හා යෙදුනු චෙතනාචෛතසිකය ධුතඞ්ග. ධුතඞ්ගධරයා විසින් පිළිකෙව් කළ දුරු කළ ගෘහපතිදානාදිය ය වත්ථු.

කෘත්‍යය විසින් සියලු ධුතඞ්ගයෝ තෘෂ්ණා නැමැති සොරු නැසීම කෘත්‍යය කොට සිටියෝ ය. ධුතඞ්ගයෝ ඒ ඒ වස්තූන් හි පවත්නා ලොල්බව නසන්නෝ ය. වැටහීම් විසින් හෙවත් පල විසින් තෘෂ්ණා නැමැති සොරු නසනබව වැටහීම් කොට සිටියෝ ය. ආසන්න කරුණු විසින් මදදෙයකින් සතුටුවීම් ආදී වූ ආර්‍යගුණධර්ම ආසන්නකාරණ කොට සිටියෝ ය.

සමාදානවිධාන විසින් හැම ධුතඞ්ගයෝ ම බුදුරජුන් ධරමාණ කල්හි උන්වහන්සේ වෙත ම සමාදන් වියැ යුතු ය. උන්වහන්සේ පරිනිවි කල්හි, මහාශ්‍රාවකයකු ඉදිරියෙහි, මහාශ්‍රාවකයකු නැති කල්හි ක්ෂීණාශ්‍රවයකු ඉදිරියෙහි, ක්ෂීණාශ්‍රවයකු නැති කල්හි අනාගාමීශ්‍රාවකයකු ඉදිරියෙහි, අනාගාමීශ්‍රාවකයකු නැති කල්හි සකෘදාගාමීශ්‍රාවකයකු ඉදිරියෙහි, සකෘදාගාමීශ්‍රාවකයකු නැති කල්හි සොතාපන්නයකු ඉදිරියෙහි, සොතාපන්නයකු නැතිකල්හි ත්‍රිපිටක ධරයකු ඉදිරියෙහි, ත්‍රිපිටකධරයකු නැති කල්හි විපිටක ධරයකු ඉදිරියෙහි, විපිටකධරයකු නැති කල්හි එකපිටකධරයකු ඉදිරියෙහි, එකපිටකධරයකු නැති කල්හි එක්සඟියක් දරන්නකු ඉදිරියෙහි, එක් සඟියක් දරන්නකු නැති කල්හි අටුවා ඇදුරකු ඉදිරියෙහි, අටුවා ඇදුරකු නැති කල්හි ධුතඞ්ගධරයකු ඉදිරියෙහි, ධුතඞ්ගධරයකු නැති කල්හි දාගැබ්මලු හැමදු උක්කුටිකයෙන් හිඳැ බුදුරජුන් ඉදිරියෙහි සමාදන්වන්නකු මෙන් සමාදන් වියැ යුතු ය. ඇදුරකු නැති කල්හි තෙමේ සමාදන් වූයේ ද වරද නැත.

සියලු ම ධුතඞ්ග, ශෛක්ෂ්‍ය – පෘථග්ජන – ක්ෂීණාශ්‍රව යන මොවුන්ගේ වශයෙන් කුසල් ද අව්‍යාකත ද වේ. ස්‍රොතාපත්ති මාර්ගස්ථයා පටන් අර්හන්මාර්ගස්ථයා තෙක් සිටි ආර්‍යයෝ ත්, පෘථග් ජනයෝ ත්, ඉදිරියෙහි ලබන මග පල බලා ධුතඞ්ග රක්ති. මෙසේ මොවුන් ධුතඞ්ග රක්නා කල්හි ඒ ධුතඞ්ග කුසල් ය. සැප විහරණ පිණිස රහතුන් රක්නා කල්හි අව්‍යාකත ය. අකුසලධුතඞ්ගයෙක් කැල ම නැත්තේ ය.

ධුතඞ්ගසෙවනය රාගචරිතයාහට හා මොහචරිතයාහට සත් ප්‍රාය වේ. එහෙත් ආරඤ්ඤිකඞ්ග–රුක්ඛමූලිකඞ්ග සෙවනය, දෙස චරිතයාහට ද සත්ප්‍රාය වේ. එසේ කියනු අරණ්‍ය–වෘක්ෂමූලයන්හි නො ගැටී වසන්නහුට දෙවෂය සංසිඳෙන බැවිනි (මත්තෙහි මෙය වඩාත් විස්තර වන්නේ ය.)

අසුභය, භාවනාකර්මයට ස්ථාන බැවින් අශුභකර්මස්ථානැ යි කියනු ලැබේ. අසුභ දසයෙකි. ඒ යටැ කියන ලද්දේ ය.

උද්ධුමාතකසරීරයෙහි උද්ධුමාතකනිමිත්ත උපදවා උද්ධුමාත කඞ්ගය වඩනු කැමැත්තහු විසින් පළමු කොට පොතෙහි දැක් වූ ගුණ නුවණැති ගුරුවරයකු වෙත ගොස් කමටහන් උගත යුතු ය. මේ හැම තැනක සීලය මුල් වියැ යුතු ය. කය-වචන දෙකේ මනා පැවැත්ම සීලයෙන් වන්නේ ය. කය වචන දෙක නො හික්මුනක් හට සිතෙහි හික්මීමෙක් නො ලැබෙන්නේ ය. එහෙයිනි හැම තැනැ සීලය මුල් වියැ යුතු ය යි කීයේ. අශුභකර්මස්ථානයෙන් වන්නේ සිතේ හික්මීමෙකි.

අශුභකර්මස්ථානය වඩන්නහු ගුරුවරයාගෙන් අශුභයෙහි උග්ගහනිමිත්ත ගන්නා සැටි, සොහොනට යන සැටි, මළසිරුර අවට සිටි නිමිති ගන්නා සැටි, යනෙන මගසැලකීම යනාදී වූ අප්පණාවිධිය අවසන් කොට ඇති එහි පිළිපදින හැම විධියක් උගත යුතු ය. ඉන් පසු සොහොනෙහි ඉදිමී ගිය මළසිරුරක් බහන ලදැ යි දැන පොතෙහි කී විධි නො වරදවා එහි ගොස් නියමිත ලෙසින් ඇස් දල්වා බලා නිමිති ගතයුතු ය. **"උඬුමාතකපටිකකූලං, උඬුමාතකපටිකකූලං, විනීලකපටිකකූලං විනීලකපටිකකූලං"** යනාදි ලෙසින් උඬුමාතකාදි පද සමග පටිකකූලශබ්දය ද යොදා භාවනා වැඩියැ යුතු ය.

එහි උඬුමාතකයෙහි ලැබෙන උද්ග්‍රහනිමිත්ත විරූප ය. පිළි කුල් ය. බිහිසුණු ය. විනීලකයෙහි උපදනා උද්ග්‍රහනිමිත්ත රතු සුදු නිල් පැහැ මුසු බැවින් බොහෝ සෙයින් කබරවණ් ඇත් තේ ය. විපුබ්බකයෙහි සැරව වැහෙන්නා සේ චඤ්චල වූ උද්ග්‍රහ

නිමිත්තෙක් උපදනේ ය. විචිඡුඳුකඅසුභයෙහි ලැබෙනුයේ මැදින් කැපුවා සේ වැටහෙන උද්ග්‍රහනිමිත්තෙකි. ඒ ඒ තැනැ බලු කවුඩු ආදීන් විසින් කන ලද්දක් සේ වැටහෙන උද්ග්‍රහනිමිත්තෙක් විකඛායිතකයෙහි ලැබෙන්නේ ය. විකඛිත්තකයෙහි උපදින නිමිත්ත, ප්‍රකට ව පෙණෙන අතරතුර ඇති ව වැටහෙන්නේ ය. හතවික්ඛිත්තයෙහි උද්ග්‍රහනිමිත්ත, ප්‍රකට ව පෙණෙන කඩු සැත් පහර මුවවලින් යුක්තාවූවක් සේ සිතට නැගේ. ලොහිතකයෙහි පෙණෙනුයේ සුලඟින් පහර ලත් රකතවණ්ණධ්වජයක් සේ වඤ්චල වූ නිමිත්තෙකි. පුළුවකයෙහි නිමිත්ත, සැලෙන්නා වූ පණුකැලක් සේ ය සිතට නැගෙනුයේ. එක් ඇටයක් භාවනාවට අරමුණු වූයේ නම් එහි පෙණෙන උද්ග්‍රහ-ප්‍රතිභාග නිමිති දෙක ම එක සේ ය. ඇටසැකිල්ලක ලැබෙන උද්ග්‍රහ නිමිත්ත, වැටහෙනුයේ විවර ඇත්තක් සේ ය. එක් ඇටයක ද උපදින නිමිත්තා වුව ද මිනිස්ඇට බැවින් විරූප බිහිසුණු බිය එළවන එකක් විය යුතු ය යි කියන ලද්දේ ය. උද්ග්‍රහනිමිති වැටහීම මෙසේ වුව ද මෙහි ලැබෙන ප්‍රතිභාගනිමිති මෙයට වඩා හැම අතකින් ශාන්ත ව නිසල ව පරිපූණ්ණ ව වැටහෙන්නේ ය.

උඹුමාතකය සිරුරු සටහන්හි ඇලුම් ඇත්තහුට, විනීලකය සිරුරු පැහැයෙහි ඇලුම් ඇත්තහුට, විපුබ්බකය පිටතින් දුන් සිරුරුසුවදෙහි ඇලුම් ඇත්තහුට, විචිඡුඳුකය සිරුරෙහි අඟපසඟ වල හා ශකනියෙහි ඇලුම් කරන්නහුට, විකඛායිතකය පියවුරු කලවා ආදියෙහි ඇලුම් කරන්නහුට, විකඛිත්තකය අත් පා සැලීම් ආදියෙහි ඇලෙන්නහුට, හතවික්ඛිත්තකය අඟපසඟ ගැළපීම්හි ඇලුම් කරන්නහුට, ලොහිතකය වස්ත්‍රාභරණයෙන් ඉපද වූ ශොභායෙහි ඇලුම් කරන්නහුට, පුළුවකය මම ය, මාගේ ය යි ඇලුම් කරන්නහුට, අට්ඨිකය දත්සැපතෙහි ඇලුම් කරන්නහුට සත්ප්‍රාය වේ. මෙසේ සටහන්වශයෙන්, වණ්ණවශයෙන් සුගන්ධවශයෙන්, ස්පිරතාවශයෙන්, මස්වැඩීම්වශයෙන්, ලීලා වශයෙන්, මනාගැළපීම්වශයෙන්, ශොභාවශයෙන් මම ය, මාගේ ය යන හැඟීම් වශයෙන් දනනසම්පත්තීන්ගේ වශයෙන් ඇලීම දස වැදෑරුම් වේ. අසුභය, රාගචරිතයාගේ වශයෙන් මෙසේ දස වැදෑරුම් වූයේ ද, ලක්ඛණ විසින් එකෙක් ම ය. ලක්ඛණ නම් අපිරිසිදු දුගඳ වහන නිත්ය, කරණලද පිළිකුල්බව ම ය. හුදෙක් මළ සිරුර ම අසුභ නොවේ. ජීවමානකශරීරය ද අසුභ වේ. එහි ද මූහුකළු නුවණැත්තන්හට අසුභනිමිත්තා වැටහෙන්නේ ය. මෙහි අඟුහලක්ඛණ ආගනතුකඅලඞ්කාරයෙන් වැසී සිටියේ ය.

ගසා යන දියපහර ඇති ගඞ්ගායෙහි නැව නවතනුයේ රිවේ බලයෙනි. රිට නැති ව නැව නවතනු බැරි ය. එ පරිද්දෙන් අසුභය පිළිකුල් බැවින් විතර්කරහිත වූ සිත අසුභාරම්මණයෙහි පිහිටුවන්නට නො හැකි ය. මෙසේ අරමුණු දුර්ල බැවින් සිත අරමුණට නගාලන විතර්කබලයෙන් ම සිත එහි පිහිටන්නේ ය. දස අසුභයෙහි විතර්කයෙන් තොර ව සිත එකඟ ව තබන්නට නො පිළිවන. එහෙයින් ප්‍රථමධ්‍යානය පමණක් ම එහි උපදනේ ය. දවිතීය-තෘතීය-චතුර්ථධ්‍යානයන්ගේ ලැබීමෙක් මෙහි නැත්තේ ය. මේ කීයේ ඉතා ම කෙටියෙනි. මොවුහු ම නවලොවුතුරා දහම් ලැබුමට මූලින්, පිළිවෙළින් පිරිය යුතු බැවින් **සුඛඛාගපටිපදා**' යි ද කියනු ලැබෙත්.[1] මේ ධර්මයන්හි හැසිරෙන්නේ නව ලොවුතුරා දහමට අනු ව හැසිරෙන්නේ වේ. ඔහු අද අද ම ප්‍රතිවෙධය ලැබේ ය යි බලාපොරොත්තු වන්නේ ය. (විසතර ඉදිරියෙහි ඇත.)

රාගඤ්ච දෝසඤ්ච පහාය මෝහං = රාගය ද දෙසය ද මොහයද පහ කොට.

කාම-රූප-අරූප වශයෙන් පැවැති රාගය, සත්කයන් හෝ, වෙන යම්කිසි අරමුණක් හෝ විෂය කොට 'නැසේවා' යනාදින් උපදින දෙසය, චතුරාර්‍යසත්‍යයෙහි විපරීතවිත්තයාගේ වශයෙන් පැවැති මොහය යන මොවුන් මග ඤණින් පහ කොට, නසා, යන තේරුම මින් දෙන්නේ ය.[2]

සම්මප්පජානෝ = මනාකොට දන්නා වූ.

පිරිසිඳා දතයුතු ධර්මයන් මොනවට පිරිසිඳා දන්නේ ය, **සම්මප්පජානා**. පිරිසිඳා දතයුතු ධර්ම නම් පඤ්චුපාදානක්ඛන්ධ-චතුරාර්‍යසත්‍ය යන මේ ය.[3] පඤ්චුපාදානක්ඛය නාම-රූපාදි හෙදයෙන් හා අනිත්‍ය-දුඃඛ-අනාත්මලක්ඛණ විසින් දැනීම ත්, දුඃඛසත්‍යය දතයුතු ය, සමුදය සත්‍යය දුරු කටයුතු ය, නිරෝධසත්‍යය ප්‍රත්‍යක්ෂ කළ යුතු ය, මාර්ග සත්‍යය වැඩිය යුතු ය යි දැනීම ත් පිරිසිඳා දැනීම නම් වේ.

රූප-වේදනාදිඋපාදානස්කන්ධයන්ගේ උපාදානක්ඛන්ධය, චක්ඛු-සෝතායතනාදින්ගේ ආයතනක්ඛන්ධය, චක්ඛු - සෝතාදිධාතූන්ගේ ධාතුක්ඛන්ධය, දුක්ඛයාගේ පීළනාර්‍ථය, සමුදයාගේ ප්‍රභවාර්‍ථය, නිරෝධයාගේ ශාන්තාර්‍ථය, මාර්ගයාගේ දර්‍ශනාර්‍ථය යනාදී වූ හෙද තීරණය කොට කිරා බලා ප්‍රකට විසින් මනාකොට දක්නේ ම 'සම්මප්පජානා' යන මෙයින් ගන්නේ ය.

සුවිමුත්තචිත්තෝ = මනාකොට මිදුනු සිත් ඇත්තා වූ.

---

1 4. 10, 'සීලවතං ඉත්ථිං' යන්නට කළ පරිකථාව බලනු.
2 15, 4, 'තත්‍රීරාගසමෝ අග්ගි' ,, ,, ,, ,,
3. 4, 1, 'කෝ ඉමං පඨවිං විජෙස්සති ,, ,, ,,

සුවිමුක්තයකු වන්නට නම්, පස් ලෙසකින් විමුක්ත විය යුතුය **තදඞ්ග-විකඛම්භණ - සමුච්ඡේද - පටිප්පස්සද්ධි - නිස්සරණ** යනු ඒ පස් ලෙස ය. මේ පස්ලෙසින් ම ක්‍රමයෙන් හැම කෙලෙසුන් කෙරෙන් ම මොනවට මිදුනු සිතැත්තේ ය **සුවිමුත්තචිත්ත**.

එහි විදර්ශනාඥානයෙහි අවයව වූ ඒ ඒ ඥානයන් කරණ කොට එයට පටහැනි වූ ධර්මයන් කෙරෙන් සිත් මිදීම, අලොභාදි කුසලාඞ්ගයන්ගෙන් ලොභාදි අකුසලාඞ්ගයන් මැඩ, යටපත් කොට ඒ යටපත් වූ කෙලෙසුන්ගෙන් වන සිත් මිදීම **තදඞ්ගවිමුත්ති'** නම්. මේ අටුවා:- **"දෙය්‍යධම්මපරිවාරාදිකේ තෙකේ තෙකේ ඤාණඞ්ගකේ නාමරූපපරිච්ඡේදාදිවිපස්සනාඞ්ගකේ ච යං චිත්තස්ස අපරිහානිවසෙන ච පවත්තනිතං විකිතං පටිපක්ඛභාවතෝ තදඤ්ඤේකේ විමුච්චනං පහාණං තදඞ්ගවිමුත්ති නාම"** යනු. ප්‍රහාන් එලියෙන් අදුරු දුරු කරන්නා සේ ය මෙය.

තව ද දැනයෙන් මච්ඡරියලොභාදියෙන්, ශීලයෙන් ප්‍රාණඝාතාදියෙන්, නාමරූප පිරිසිඳ බැලීමෙන් සක්කාය දෘෂ්ටියෙන්, නාම රූපයන්ගේ ඇතිවීමෙහි හෙතු සොයා බැලීමෙන් අහෙතු විසමහෙතු දෘෂ්ටින්ගෙන්, නයවිදර්ශනායෙන් මම ය, මාගේ යයි ගැණීමෙන්, මහ නොමහ දැනීමෙන් නොමගෙහි මහය යන වැරදි හැඟීමෙන්, නාම රූපයන්ගේ හටගැන්ම දැකීමෙන් උච්ඡේදදෘෂ්ටියෙන්, නාමරූප යන්ගේ නැසීයෑම දැකීමෙන් ශාස්වත දෘෂ්ටියෙන්, සංස්කාරයන් භය වශයෙන් දැකීමෙන් අභය දර්ශනයෙන්, සංස්කාරයන්ගේ ඇති ජාති ජරාමරණාදි දෙස් දැකීමෙන් සංස්කාර රසවත් යි ගැණීමෙන්, සංස්කාරයන් කෙරෙහි කලකිරීමෙන් සංස්කාරයන්හි නොඇලීමෙන්, සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැත්ත නිසා නොමිදෙනු කැමැත්තෙන්, සංස්කාරයන් මැදහත් ව බැලීමෙන් සංස්කාරයන් මැදහත් ව නොබැලීමෙන්, අනුලෝමඥානයෙන් සංස්කාරයන් නිත්‍යාදිවශයෙන් ගැණීමෙන්, ගොත්‍රභූඥානයෙන් සංස්කාරාලම්බන යෙන් යන නාමරූප පරිච්ඡේදඥානය පටන් ගොත්‍රභූඥානය කෙළවර කොට විදර්ශනාඥානාඞ්ග හෙතුයෙන් ප්‍රතිපක්ෂධර්මකෙරෙන් සිත් මිදීම තදඞ්ගවිමුක්ති නම්.

ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ පහළවීම යටපත් කිරීමෙන් ද, ද්විතීයධ්‍යානාදියෙන් විතර්කාදීන් දුරු කිරීමෙන් ද ලබන සිත් මිදීම **විකඛම්භණවිමුත්ති'** නම්. මේ අටුවා:- **"යං පන උපචාරප්පණාභෙදෙන සමාධිනා යා චිත්තස්ස අපරිහානි වසෙන පවත්තති, කාය ච ඛාණවජ්ජාදිනං නීවරණානං චෙව චිත්තකාදීනඤ්ච පච්චනීකධම්මානං අනුප්පත්තියඤ්ඤාතං විමුච්චනං, අයං විකඛම්භණවිමුත්ති නාම"** යනු. මෝ වනාහි

දිය මතුයෙහි බැඳුනු දියසෙවෙල්, දිය ගන්නා තුරු කළයෙන් පහරා ඉවත් කිරීම වැනි ය. ලෞකිකසමාධීන්ගේ බලයෙන්, නීවරණාදී විරුද්ධධර්මයන් ඔබාතැබීමෙන් ලබන සිතේ මිදීම ය මේ.

සොතාපත්තිමග්ගඤ්ඤාණාදියෙන් නැවැත කවදාවත් නො උප දින සේ කෙලෙසුන් නැසීමෙන් ලැබෙන සිතේ මිදීම **සමුච්ඡේද විමුත්ති'** නම්. මේ අටුවා:- **"යං චතුත්තං අරියමග්ගානං භාවිතත්තා තත්තම්මග්ගවතො අරියස්ස සත්තානෙ යථාරහං දිට්ඨිගතානං පහාණායාති ආදිනා නයෙන වුත්තස්ස සමුදයපක්ඛියස්ස කිලෙසගණස්ස පන අච්චන්තං අප්පවත්තිභාවෙන සමුච්ඡේදප්පහාණවසෙන විමුච්චනං, අයං සමුච්ඡේදවිමුත්ති නාම"** යනු. හෙණ පහරින් ගසක ඇදවැටීම සේ ය මෙය.

මාර්ගඥානයෙන් සිඳැ දැමූ කෙලෙස් ඇති සිතෙහි තවත් ඉතිරි වන කෙලෙස් පුරුද්දත් නසාලීමෙන් ලැබෙන සිතේ මිදීම **පටිප්පස්සඬ්ඩිවිමුත්ති'** නම්. මේ අටුවා:- **"යං පන ඵලක්ඛණෙ පටිප්පස්සද්ධත්තං කිලෙසානං, අයං පටිප්පස්සද්ධිවිමුත්ති නාම"** යනු. මෙය වන්නේ පලසිත් පහළවීමෙනි මෙය ගිනි තුබූ තැනැ පැවැති උණුසුමට දිය ගැසීමක් සේ ය.

නිවන්ලැබීම **නිස්සරණවිමුත්ති'** නම්. මේ අටුවා:- **"සබ්බ සඞ්ඛතනිස්සටත්තා පන සබ්බසඞ්ඛරා විමුත්තං නිබ්බානං, අයං නිස්සරණවිමුත්ති නාම"** යනු. නිස්සරණ නම් නිවන ය. කාම භවාදීභවයන්ගෙන් නික්මුනු බැවින් එසේ කියැ වේ. මෙකී භව යන්ගෙන් නික්ම යෑමට කරුණු වන්නේ නිවන ය. ඵලඥානයනට ගොදුරුවන සන්සිඳීම ය.

මෙහි කාමාවචරකුසලචිත්තය, තදඞ්ගවිමුත්ති යි ද, රූපාවචර අරූපාවචරචිත්තය, වික්ඛම්භණවිමුත්ති යි ද, මාර්ගචිත්තය, සමුච්ඡේද විමුත්ති යි ද, ඵලචිත්තය පටිප්පස්සඬ්ඩිවිමුත්ති යි ද, නිර්මාණය නිස්සරණ විමුත්ති යි ද කියනු ලැබේ.

තදඞ්ගවිමුත්ති, වික්ඛම්භණවිමුත්ති, සමුච්ඡේදවිමුත්ති පටිප්පස්සද්ධිවිමුත්ති යි ගැණෙන කාමාවචර, රූපාවචර, අරූපාවචර, මාර්ග, ඵලචිත්තයෝ චිත්තවිමුත්තියෙහිලා ද, නිර්මාණය නිස්සරණවිමුත්තියෙහි ලා ද ගැණෙති. එහෙයින් පස්වැදැරුම් වූ විමුත්තිය, චිත්තවිමුත්තිනිබ්බාන යි දෙපරිදි විසින් ද කියනු ලැබේ. (පොත දිග් ගැසෙන බැවින් විස්තර නො ආයේ ය.)

අනුපාදියානො ඉධ වා හුරං වා = මෙලොවැ හෝ පරලොවැ හෝ කිසිවක් නො ගන්නා වූ.

'ඉධ වා හුරං වා අනුපාදියානෝ' යනු අරුත් ගන්නා පද පිළිවෙළ ය. මෙලොව පරලොව දෙකට අයත් වූ හෝ ආධ්‍යාත්මික බාහිර වූ හෝ සඞ්ඛ්‍යාතධාතුආයතනයන් සිවු වැදෑරුම් උපාදානයන් කරණ කොට, නිත්‍ය-ශුභ-සුඛ-ආත්ම වශයෙන් නො ගන්නේ ය, **අනුපාදියානෝ.**

උපාදාන යටැ කියනලදී. එහි **කාම** නම්, රූපශබ්දාදිය අරමුණු කොට සිතෙහි හට ගන්නා කෙලශකාමය ය. **දිට්ඨි** නම්, ලොකය හා ආත්මය සදාකාලික ය යි ගන්නා මිථ්‍යාදෘෂ්ටිය ය. **සීලබ්බත** නම්, ආත්මශුද්ධිය සඳහා අජශීල-ගොශීල-අජ්වත-වඟ්ගුලිව්‍රතාදිය සමාදන් ව ගැන්ම ය. **අත්තවාද** නම්, භවයක් පාසා නො නැසී යන නිත්‍ය වූ ආත්මයෙක් සත්වයන් පිළිබඳව ඇතැ යි ගැන්ම ය. මේ කීයේ යම්තමකිනි.

පරමාර්ථ වශයින් සත්වයකු පිළිබඳ ව ඇත්තෝ, සඞ්ඛ්‍යාත ආයතනයෝ ය. ඔවුහු භවයෙහි උපන් සත්වයාගේ අවසානය දක්වා නො සිඳැ පවතිත්. එහෙයින් සත්වයන් පිළිබඳ ව මොවුහු භවයක් පාසා පහළ වෙති. මෙසේ අවශ්‍ය ව, හෙතු-ඵලවශයෙන් දිග් ගැසී යන සඞ්ඛ්‍ය ධාතු-ආයතනසමූහය, මම ය, මාගේ ය යනාදීන් දැඩි ව ගන්නේ, මේ උපාදානයන් නිසා ය. එසේ නො ගන්නේ, උපාදානයන් සිවු මඟින් නැසී ගිය පසු ය.

චක්ඛුධාතු – රූපධාතු – චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු - සද්ද ධාතු – සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු - ගන්ධධාතු - ඝානවිඤ්ඤාණ ධාතු, ජිව්හාධාතු – රසධාතු – ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු – ඵොට්ඨබ්බධාතු-කායවිඤ්ඤාණධාතු, මනොධාතු-ධම්මධාතු-මනොවිඤ්ඤාණධාතු යි ධාතු අටලොසෙකි. එයින් සයෙක් ද්වාරධාතු ය. සයෙක් ආලම්බනධාතු ය. සයෙක් ද්වාරාලම්බන ගැටීමෙන් හට ගන්නා විඤ්ඤාණධාතු ය.

චක්ඛායතන – රූපායතන, සොතායතන – සද්දායතන, ඝානා යතන-ගන්ධායතන, ජිව්හායතන-රසායතන, කායායතන-ඵොට්ඨ බ්බායතන, මනායතන – ධම්මායතන යි ආයතන දෙලොසෙකි. එයින් සයෙක් ද්වාරායතන ය. සයෙක් ආලම්බනායතන ය. මේ දෙලොස් ආයතනයන්හි චිත්ත - චෛතසික – රූප - නිර්‍වාණ යන සකල පරමාර්ථධර්මයෝ ඇතුළත් වෙති.

යටැ කියූ **සම්මප්පජානෝ – සුවිමුත්තචිත්තා – අනුපාදියා නෝ** යනු මේ පද තුන ඉදිරියෙහි සිටි **යෝ'** යන්න බලා එයට විශෙෂණ ව සිටියේ ය.

ස භාගවා සාමඤ්ඤස්ස හොති = ඔහු ශ්‍රමණගුණයට හිමි වේ.

'සෝ භාගවා' යනු පද සිද්ධිය. මහාක්ෂීණශ්‍රව වූ චතුර්විධ පුද්ගල තෙමේ සෝ, යන්නෙන් ගණු ලැබේ. අසඟයපුණ්‍යක්ෂේත්‍රය වන්නෝ ද උන්වහන්සේ ය. උන්වහන්සේ රාග-දෝස-මෝහයන් දුරු කොට, දහයුතු සියලු ධර්ම මොනවට දැන, මොනවට මිදුනු සිත් ඇත්තෝ සඤ්ඤා-ධාතු-ආයතන කියිවක් මම ය, මාගේ ය, නිත්‍ය ය, ශුභ ය, සුඛ ය, ආත්ම යි නොගත්තෝ ය. එ හෙයින් ම ය උන්වහන්සේ ශ්‍රමණගුණයට හිමිවූවෝ.

මේ ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහාජනයාට වැඩසහිත වූ ය.

දේවසභායක්ෂවස්තුව නිමියේ ය.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී රාජකීය පණ්ඩිත අම්බලම් ශෝඩ ධම්මකුසල නායක සථවිරයන් කළ සද්ධර්මසාගර නම් වූ ධර්මපදවර්ණනායෙහි යමකවග්ගාත්‍මකප්‍රථමතරඞ්ගය මෙතෙකින් නිමියේ ය.

අප්‍රමාදවග්ගය

විනයනරඬගීයකථාසූචි

පිට	වස්තුව
249	1. සාමාවතී මාගන්දියාදීන්ට සිදු වූ විපත
343	2. කුම්භඝොෂක සිටුතුමා.
356	3. ශ්‍රීලපණ්ඩක මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ
370	4. සැවැත්නුවර නැකත් කෙළියක්
378	5. මහාකාශ්‍යපසථවිරයන් වහන්සේ සත්වයන්ගේ ච්‍යුතිය හා උත්පත්තිය බැලීම
388	6. යහළු භික්ෂූ දෙනමක්
392	7. සක්දෙව්රජතුමා
405	8. කන්දක් උඩදී රහත් වූ උතුමෙක්
409	9. නිගමනිස්ස සථවිරයන් වහන්සේ

සාමාවති මාගන්දියාදීන්ට සිදු වූ විපත

2 — 1

යමගියෙ දවස මේ මහත් දඹදිව 'අල්ලකප්ප' නම් රටෙක් වූයේ ය. එහි රජය කළ රජතෙමේ ද 'අල්ලකප්ප' නමින් ප්‍රසිද්ධ විය. ඒ දවස ම දඹදිව 'වෙඨකදීපක' යි රටෙක් ද විය. එහි රජතෙමේ ද 'වෙඨකදීපක' නම් වූයේ ය. ඒ දෙදෙන කුඩා කාලයෙහි එක් ම ගුරුකුලයෙක ශිල්ප උගත්හ. එහෙයින් ඔවුහු දෙදෙන එකෙකා කෙරෙහි මහත් සෙනහ ඇත්තෝ වූහ. කල් ගියනැන සිය පියන්ගේ ඇවැමෙන් දිගින් දස යොදුන් පමණැති ඒ ඒ රටෙහි රජකම් ලැබූහ. එතැන් සිට යහළුකම් වඩාලා ත් දියුණු කරන්නට කලින්කල එක් තැන් ව ප්‍රියභාෂණයෙහි යෙදුනු මේ දෙදෙන, උපදින මහලු වන මැරෙණ මිනිසුන් ගැණ සිත සසර කලකිරී පැවිදි වන්නට තීරණය කොට ගෙණ රජකම් අඹුදරුවන්ට භාර දී ඉසි පැවිද්දෙන් පැවිදි ව තපස් කරන්නට හිමාලය වනයට **ගියහ**.

එහි දී දිනෙක 'අපි රජකම් ඇ සියල්ල හැර දමා ආවමෝ, මෙසේ දිවි ගෙවන්නට නොවෙමු, පැවිදි වීමෙහි අපගේ අදහස් මුදුන් පමුණුවා ගන්නට නම් මෙසේ එක් තැන් ව කල්ගෙවීම සුදුසු නොවේ, ඒ පිණිස කළ යුත්තේ, එකලා ව හිඳ, බවුන් වැඩීම ය, එවිට ය අපි පැවිද්දෝ වන්නමෝ, දැන් නොපැවිද්දෝ වන්නමෝ ය අපි, අද සිට අපි වෙන් ව එකෙකාගෙන් ඇත් ව වසමු, තමුසේ අර පෙණෙන කන්දෙහි නවාතැන් ගන්න, මම මේ කන්දෙහි වසම්, පසළොස් දවසකට වරක් පෝයදිනයෙහි එක් වෙමු' යි නියම කර ගත් ඔවුහු නැවැත 'මේ එකතුවීම ද හොඳ නැත, එද ගණසඬගණිකාවක් ය, ගණසඬගණිකාව තපස් කරන්නන්ට හිත නොවේ, ඔබ, ඔබ වසන කන්දෙහි පහනක් දල්වන්න, මම මෙහි පහනක් දල්වම්, ඒ ලකුණෙන් අප දෙන්නා ඇති නැති බව අපට දත හැකි ය' යි කතා කොට එසේ කළහ.

ඉන් ටික දවසකට පසු, වෙඨදීපක තවුස් තෙමේ කලුරිය කොට, මහානුභාවසම්පන්නාදිව්‍යරාජයෙක් වූ උපන්නේ ය. එතැන් සිට ඔහු විසූ කන්දෙහි පහන් දැල්වීමෙක් නොවූයේ ය. අල්ලකප්ප තෙමේ ඒ සලකුණෙන් වෙඨදීපකයන් කලුරිය කළබව දන්නේ ය. දෙව් ව උපන් වෙඨදීපක තෙමේ තමන් ලත් දිව්‍ය-ඉසුරු බලා, 'මේ කිනම් කමකින් ලදැ' යි බලනුයේ ගෙය අත් හැර ගොස් කළ තපශ්චරණය එයට හේතු වූ බව දුටුයේ ය.

නැවැත ඔහු 'තමන් හා එක්ව තපස් කළහු බලමි' යි සිතා දිව අත් බව හැර මග යන්නකුගේ වේසයෙන් අල්ලකප්පයා ලඟට ගොස් වැඳ පැත්තකට වී සිටියේ ය. අල්ලකප්ප තෙමේ 'නුඹ කොහි සිට එහි දැ?' යි ඔහුගෙන් ඇසී ය. 'ස්වාමීනි! මම මගියෙක්, එන්නේ බොහෝ ඈත සිට, මෙතැන වසන්නහු ඔබ වහන්සේ?, වසන්නහු එකලා ව? අන් කවුරුත් මෙහි නැත් දැ?' යි දෙව් රජුන් ඇසූ කල්හි, තවුස් තෙමේ 'අර පේණ කන්දෙහි මාගේ යහළුවෙක් තපස් කළා, පසුගිය පෝය දා සිට ඒ කන්දෙහි පහන් දැල්වුණේ නැත, එහෙයින් ඔහුට කුමක් වී දැ යි කියන්නට මම නො දනිමි, නො මළේ නම් ගම්රට බලා යන්නට ඇතැ' යි කී ය. එවිට දෙව්රජ තෙමේ 'ඔව්, ස්වාමීනි! ඒ මම, ඔබ වහන්සේගේ යාළුවා, කලුරිය කොට දෙව්ලොව උපන්මි, ඔබ තුමන් දැක යන්නට මෙහි ආමි, ඉතින් මට කියන්නහු කුමක් ද?, මෙ තැන විසීම කරදර ද?, කියන්නැ' යි කීයේ ය. තවුස් තෙමේ 'කරදර බොහෝ ය, අලිඇතුන් නිසා මම වෙහෙසට පත් වෙමි, මා හැම ද අවසන් කළ විට, අලිඇත්තු පැමිණ පයින් පහර දී පස් නගා ලන්නෝ ය, මල මූ දමන්නෝ ය, කොළ අතු කැබලි කඩා ලන්නෝ ය, වැට කටු බිඳින්නෝ ය, මොර දෙන්නෝ ය, මෙසේ කොට උන් ගිය පසු නැවැත මම බිමැ පස් සම කොට කුණු කසළ ඇද දමා හැමද වැට කටු බඳින්නෙමි, මේ නිසා මට ඇති කරදර ඉතා මහත් ය' යි කී ය. දෙව්රජ 'හොඳයි! ස්වාමීනි! මම ඒ සියලු කරදර වළකාලමි, ඔබ වහන්සේ යහතින් තපස් රකින්නැ' යි කියා තවුසාට හත්ථිකන්තවීණාවක් හා හත්ථිකන්ත මන්ත්‍රයක් ද දී, වීණායෙහි තැත් තුනක් දක්වා, මන්ත්‍රය තෙ පරිදි කොට උගන්වා, 'මේ තැත ගසා, මේ මන්ත්‍රය කියූ විට, ඇත්තු ආපසු නො බලා ම හැරී යන්නෝ ය. මේ තැත ගසා, මේ මන්ත්‍රය කියූ විට, නායක ඇතා පිට එළවන්නේ ය, එහෙයින් ඔබ වහන්සේට කැමැත්තක් කරන්නැ' යි කියා වැඳ ගියේ ය. එතැන් සිට තවුස් තෙමේ අලිඇතුන් ආ විට තැත ගසා මන්ත්‍රය කියා උන් පන්නා හැර සුවසේ වාසය කරයි.

එ දවස කොසඹෑනුවර 'පරන්තප, නම් රජෙක් රජය කෙළේ ය. දිනෙක ඔහු ගැබ්බරැති සිය මෙහෙසිය හා උදෑසන්හි හිරු රැස් විඳිමින් ඉඩ පහසු තුබූ තැනෙක හුන්නේ ය. එ වේලෙහි මෙහෙසිය, රජුගේ ලක්ෂයක් වටිනා රතු කම්බිලිය පොරොවා, එසේ ම ලක්ෂයක් වටිනා රජුගේ මුද්ද ගලවා තම ඇඟිල්ලක බහා රජු ලඟ ම හුන්නී ය, අහස පියාඹා යන ඇත්කඳලිහිණියෙක් කම්බිලිය පොරොවා හුන් මෙහෙසිය දැක,

මස්වදුල්ල කෑ සි සිතා, බිමට බැස්සේ ය. රජ තෙමේ පියා පහරණ ගඩ අසා බිය පත් ව එ තැනින් වහා නැඟිට දුව ගොස් මාලිඟාව තුළට වැද ගත්තේ ය. ගැබ්බරෙත් හා බියසුලු බැවින් යා ගත නො හැකි වූ මෙහෙසිය, ඇත්කඳලිහිණී තෙමේ තමන්ගේ නිය පඳුරෙහි රඳවා ගෙණ අහසට නැංගේ ය. ඇත්කඳලිණියකුට ඇතුන් පස් දෙනකුන්ගේ බලය ඇත්තේ ය. එහෙයින් කැමැති බරක් ඌට ගෙණ යා හැකි ය. මේ මහාබලැති පක්ෂියා විසින් ඩැහ ගෙණ යන ඒ රජමෙහෙසිය මරණ බියෙන් බිය වූවා, 'මම කෑ මොර ගැසිම් නම්, එ ගඩ මූට බිය උපද වන්නේ ය, එවිට මූ මා බිම හෙලන්නේ ය එයින් මා මැරෙණු ඒ කාන්තය, කෝ තැනක හෝ හිඳ මූ මා කන්නට සැරසෙනු ඇත, එතැන දී මොර දී මූ පලවා හරිම්' යි සිතා ඒ දුක ඉවසා සිටියා ය.

හිමාලයවනයෙහි මණ්ඩපයක් සේ මදක් උසට වැඩී ශිය නුගගසෙක් විය. මේ ඇත්කඳලිහිණියා නොයෙක් අන්දමේ සතුන් ඩැහ ගෙණ ගොස් අනුභව කරන්නේ, මේ ගසෙහි හිඳ ය. ඌ, රජ මෙහෙසිය ද, එහි ගෙණ ගොස් ගසවෙළෙප් අතර තබා ආ මග බැලී ය. ඒ ඔවුන්ගේ සිරිති. එ කෙණෙහි මෙහෙසිය 'දැන් මූ පලවා හැරිය යුතු වේලාවැ' යි සිතා දෙ අත් ඔසොවා, අත්ල ගසා, මොර ගැසූ ය. ලිහිණියා ද බියෙන් වහා පැන ගියේ ය. ඉරු බැස්සේ ය. මෙහෙසියට විලිරැඳු ද හට ගැණිණ. සිවු දිගින් වැසි වසින්නට වන. කුඩාකල සිට කිසිදු දුකක් නො ලැබ සුවසේ වැඩුනු හැදුනු මෑයට 'බිය නොවව' යන වචන පමණකුත් නො ලැබුනේ ය. එදු මුලුරැයෙහි ම නින්දෙක් නො වී ය. පාන් විය. වැස්ස නැවතින. අරුණ නැගුනේ ය. මෙහෙසිය ද ගැබ්බරින් සැහැල්ලු වූ ය. වැසි නැවතීම, අරුණ නැගීම, ගැබ්බරින් සැහැල්ලුවීම යන මෙතුන එක විට ම සිදු විය. එහෙයින් ඒ උපන් පුතුට ඔහොමෝ 'උදෙන' යි නම් තැබූ ය.

අලඟකපප තවුසාගේ තවුස්කිළිය පිහිටියේ ද මේ නුග ගස අසල ය. තවුස් තෙමේ වැසි දවස්හි පලවැල ගෙණෙන්නට වනයට නො ගොස් අසල වූ ඒ නුගගසමූලට ගොස් පක්ෂීන් කා දැමූ සතුන්ගේ ඇට කැබලි ගෙණවුත් කොටා හොද්දක් සාදා බොන්නේය. එදු ද, වැසි දවසක් වූ බැවින් ඇටකැබලි ගෙණෙන්නට නුගගස යටට ශියා වූ තවුසාට, ඇටකැබලි එකතු කරණ විට, ගසඋඩ දරු හඬෙක් ඇසින. තවුසා උඩ බැලී ය. එවිට ගස වෙළෙප් අතර ඉතා අපහසුවෙන් හුන් මෙහෙසිය දැක 'නී කවරියක් දැ?' යි ඇසී ය. ඕ 'මම මිනිස්

ගෑණියක්මි' යි කිවු ය. 'මෙහි ආවා කෙසේ දූ?' යි ඇසූ විට, ඇත්කඳලිහිණියකු ගෙණා බව කිවු ය. 'ගසින් බසින්නැ' යි තාපස තෙමේ කීයේ ය. 'ජාතිභෙදයට බිය ඇත්තී වෙමි' යි ඇ කී කල්හි 'තීගේ ජාතිය කිමැ' යි ඔහු ඇසී ය. 'මම ක්ෂත්‍රිය ජාති ඇත්තියකැ'යි කී විට 'මමත් එසේ වෙමි' යි කීයේ ය. 'එසේ නම්, ක්ෂත්‍රියමායම් කියන්නැ' යි ඕ තොමෝ කිවු ය. තවුස් තෙමේ ඒ කීයේ ය. එයට පසු 'දරුවා ගසින් බස්සා ගන්නැ' යි මෙහෙසී තෙමෝ කිවු ය. ඔහු එක් පසකින් ගසට නැග, ඇගේ අත නො අල්වා ම, දරුවා ගසින් බස්වා ගත්තේ ය. ඕ ද ගසින් බැස්සා ය. තවුස් තෙමේ මෙහෙසියත් ඇයගේ සිහිති දරුවාත් පන්සලට ගෙණ ගොස් ශීලභෙදයකට නො පැමිණ ම උන් කෙරෙහි අනුකම්පාවෙන් උන් රැක බලා ගත්තේ ය. කැලේ හැවිද මැස්සන් නැති මීවද සොයා ගෙණවුත් ඇල් හාලින් කැඳ උයා, ඒ මී සමග ඔවුනට දෙයි. මෙහෙසිය මෙසේ ටික දිනක් ගෙවා, 'මම නම් ආ මගත් නො දනිමි, යන මගත් නො දනිමි, මොහු හා මාගේ ඒ තරම් තද බැඳුමෙකුත් තව ම නැත, මොහු අප හැර යම් තැනක ගියේ නම්, අපට වන්නේ මහත් විනාශයෙක, එහෙයින් මොහුගේ සිල් බිඳ දමා, මා හා දරු හැර නො යන ලෙසක් කළයුතු ය' යි සිතා සිය සිරුරෙහි වැසිය යුතු, සැඟ විය යුතු තැන් පෙන්ව පෙන්වා හැඳ පොරොවමින් අත් පා මඩිමින්, කෙළි කවටකම් කරමින් තවුසා පොළොඹවා, එක් පැදුරෙහි වැතිර නිදා ඔහුගේ සිල් බිඳ දැම්මා ය. එ තැන් සිට ඔවුහු අඹු සැමියන් සේ කල් ගෙවූහ.

දවසෙක තාපස තෙමේ නැකත්තරු බලන්නේ, කොසඹෑ නුවර පරන්තප රජුගේ ජන්මනක්ෂත්‍රයට වූ දරුණු පීඩාවක් දැක, 'සොඳුර! කොසඹෑ නුවර පරන්තප රජු මළේ ය' යි කී ය. ඕ තොමෝ ඇඬූ ය. 'ඇයි ඔබ වහන්සේ පරන්තප රජු ගැණ එසේ කියහු? උන් හා අමනාපයෙක් දූ?' යි ඇසූ ය. 'සොඳුර! මම එසේ කියන්නෙම්, නැකත්තරු ගැණ බලා ය, රජුගේ ජන්මනක්ෂත්‍රයට ලොකු පීඩාවක් ඇතිබව මට පෙණේ, එහෙයින් රජු කලුරිය කළ යුතු ම ය, යි තවුසා කී විට ඇ වඩාලාත් හඬන්නට වූ ය. 'ඇයි සොඳුර! හඬහි? තිට උන්ගෙන් ඇති කාරිය කිමැ?' යි ඇසූ විට, පරන්තප රජු තමන්ගේ ස්වාමියා බව කීවා ය. 'සොඳුර! උපන් සත්වයාට මරණය නියත ය, එය වළකාලනු බැරි ය, මරණය එන්නේ ඉපදීමත් සමගය, නො හඬව' යි කී විට, 'හිමිය! මම ඒ දනිමි, මා හඬනු ඒ පිණිස නො වේ, මේ මාගේ පුතා කුලසතු වූ රාජ්‍යයට එක ම හිමියා ය, එක ම සුදුස්සා ය, මා පුත් එහි වූයේ නම්, අද සේසත් නංවා

රජය කරන්නේය, එය කාට ත් වලකනු බැරිය; වූයේ ලොකු සැපතකින් පිරිහීම ය, හැඬෙන්නේ ඒ නිසා ය' යි මෙහෙසි තොමෝ කීවා ය. තාපස තෙමේ 'වේවා එසේ, සොඳුර කනස්සලු නො වන්න, නො අඬන්න, මම ඔබගේ පුතුට ඒ රජය ලබා දෙමි' යි කියා ඒ කුඩාදරුට තමන්ට දෙවියන් දුන් හස්තිකන්ත විණාව හා හස්තිකන්තමන්ත්‍රයත් දී, 'ඇතුන් එන්නට කලින් ගසට නැග, උන් ආකල මේ තැත ගසන්න, එවිට උඉලා පැන යති' යි කීයේ ය. ඒ ලමයා තාපසයා කියූ ලෙසින් කොට අවුත් ඒ බව තාපසයාට දැන්වී ය. පසුදා තාපස තෙමේ 'අද මේ මන්ත්‍රය කියා, මේ තැත ගසන්න, එවිට සියලු ඇත්තු පසු පස බල බලා දුව යති' යි කී ය. ඔහු එසේ කොට අවුත් තාපසයාට දැන් වීය. තෙවනදා තාපස තෙමේ 'මේ මන්ත්‍රය කියා මේ තැත ගසන්න, එවිට නායක ඇතාම පිට ඵලවමින් ඉදිරියට ඒ ය' යි කීයේ ය. එදා ත් ඔහු එසේ කොට අවුත්, දන්වා සිටියේ ය. ඉක්බිති තාපස තෙමේ මෙහෙසියට කතා කොට, 'නුඹගේ පුතුට ලියුමක් දෙන්න, ඔහු එය ගෙණ එහි ගොස් කොසඹෑනුවර රජ වන්නේ ය' යි කියේ ය. ඕ පුතුට අඬගා ලහට ගෙණ 'පුත! නුඹ කොසඹෑනුවර පරන්තප රජුගේ එක ම පුතා ය, පසු ගිය දා ඔබ පියරජු මළේ ය, ඒ රජයේ හිමියා ඔබ ය, එහෙයින් දැන් එහි ගොස් ඒ රජය ගන්නැ' යි කියා එහි මැනි ඇමැති සෙනෙවි ආදීන්ගේ නම් ගමුත් කියා දී 'යමකු එය නො පිළිගත හොත්, මේ කම්බිලිය හා මුද්දද දක්වන්නැ' යි කම්බිලිය හා මුද්දද දී පිටත් කර යැවූ ය. තාපසයා ද 'ගඟක පාත අන්තේ හිද මන්ත්‍රය කියා තැත ගැසුවිට නාසකාඇතා නුඹට පිට දී එන්නේ ය, ඔහු පිටට නැග ගොස් රාජ්‍යය ගන්නැ' යි කීයේ ය. කුමාර තෙමේ මවු පියන් වැඳ මන්ත්‍රය කියා තැත ගසා ඇතු ගෙන්වා ඌ පිට නැග, 'මම කොසඹෑනුවර පරන්තප රජුගේ පුතා ය, මා පියා මැරී වික දවසෙක් ගත විය, ඒ රජය අයිති මට ය, ඒ රජය, මට ගෙණ දෙන්නැ' යි කණට කොදුරා ඇතුට කීයේ ය. ඇත් තෙමේ ඇත් හඬ නඟා දහස්ගණන් ඇතුන් රැස් කොට, නැවැත ඇත්හඬ නඟා ම මහලු ඇතුන් පිටත් කර යවා, ඉතා තරුණ ඇතුන් නවතා ගත්තේ ය. කුමාර තෙමේ දහස්ගණනක් තරුණ ඇතුන් පිරිවරා ගෙණ, පසල් ගමකට ගොස් 'මම පරන්තප රජුගේ පුත්‍රයා ය, සමපත් කැමැත්තෝ මා හා එක්වෙත්වා' යි මිනිසුන් රැස් කරගෙණ, ඔවුනට සංග්‍රහ කරමින් ගොස් නුවර වට කොට, රජය හෝ දෙවු, නැත, යුඬ කරමු' යි ලියුම් යැවී ය. රටවැස්සෝ 'රජයත් නො දෙමු, යුඬත් නො කරමු, රජු ඉන්ද දීම මෙහෙසිය

ඇත්කඳලිහිණියකු විසින් ඩැහැගෙණ යන ලද්දී ය, අෑ ඇති නැති බව අපි නොදනිමු, ඒ දන්නාතුරු රජය දෙනු නොහැකි ය, යුද්ධ කරණුත් නොහැකි ය' යි පිළිතුරු යැවූහ. එවිට කුමාර තෙමේ 'මම ඇයගේ පුතා, මැති ඇමැති සෙනෙවියන්ගේ නම් මේ ය, මේ පියා පෙරැවූ කම්බිලි ය, මේ ඇඟිල්ලෙහි දැමූ මුද්දෙ' යි රට වැස්සන්ට දක්වා සිටියේ ය. එසින් නිසැක වූ රටවැස්සෝ ඔහු පරනතපරාජ්‍යයෙහි අභිෂික්ත කළහ.

මේ උදෙනරජුගේ උත්පතනිකථාව ය.

දැඩිදිව 'අජිත, නම් රටෙක් විය. එහි එක් අවදියක, දුර්භික්ෂ-යෙක් හට ගත්තේ ය. එහෙයින් එහි ජීවත් වන්නට නොහැකි වූ 'කොතූහලික' නම් ඇති මිනිසෙක් 'කාපි' නම් වූ සිය පුතුත් 'කාළී' නම් වූ සිය බිරියත් ගෙණ කොසඹෑනුවරට යන්නට සිතා, අතැ තුබූ මිල මුදල් ආදිය මගවියදම් පිණිස ගෙණ මගට බැස ගියේ ය. මොහු මෙසේ මග බැස ගියේ අභිවාතක රොගයට බියෙනැ සි ද සමහරු කියත්. මෙසේ මගැ යන මොවුන්ගේ අත තුබූ මගවියදම් අතරමග දී අවසන් වී ගියේ ය. එහෙයින් ඔවුහු බඩගින්නෙන් දිගට ම පෙළෙන්නට වූහ. පුතු වඩන්නට ද මවුපියෝ අපොහොසත් වූහ. එවිට කොතූහලික තෙමේ 'සොඳුර! බඩගින්නෙන් තදින් පෙළෙන මේ වේලේ අපි පුතු කෙසේ උසුලා ගෙණ යමු ද, අප නොමැරී ජීවත් වුවොත් පුතකු ලැබීම අසීරු නොවේ, ඒ නිසා මූ මෙහි දමා යමු' සි කී ය. පියාගේ හදවතට වඩා, මවුගේ හදවත සැබෑවින් ම මොළොක් ය. එබැවින් කාළී තොමෝ 'මා පණ තිබෙන තුරු ඒ වැඩේ නම් කරණු නොහැකි ය' සි ඒ වැළකූ ය. 'එසේ නම් කුමක් කරමු දැ?' සි ඔහු ඇසී ය. 'වරින් වර අපි දෙදෙන පුතු වඩා ගෙණ යමු' සි කාළිය කිවා ය. ඔහු එය පිළිගත්තේ ය, කාළිය පුතු උසුලන්නී මල්දමක් සේ ඔසොවා උරහිස තබා උසුලන්නී ය. තම වාරයෙහි වුව ද, පුතු ඉසිලීම කොතූහලිකයාට මහත් වධයෙක් විය. බඩගින්නට ත් වඩා ඔහු එසින් පෙළුනේ ය. එවිට ඔහු නැවැතත් 'සොඳුර! මේ මොන ගැහැටෙක් ද, අත පය පණ නැති කල දරුවන් වඩන්නමෝ කෙසේ ද, නොමැරී ඉතිරි වුවොත් අපට දරුවකු ලැබීම අපහසු නොවේ, ලොකු වැඩෙක් නොවේ, ඒ නිසා මූ මෙහි බහා යමු' සි කී ය. එවරද කාළිය එය වැළකූ ය. කොතූහලික තෙමේ නැවැත නැවැත ත් එය ම කියා සිටියේ ය. කාළිය නිහඬ වූවා ය. වරින් වර උනුන් අතට යැමෙන් විඩාවට පැමිණි දරු ද පියා අත ඉන්ද දී නින්දට

වැටුනේ ය. කොතුහලිකා තෙමේ පුතු නිදන බව දැන, මවු ඉදිරියෙහි යවා, ටික දුරක් ගොස් ගසක් යට කොළ ගොඩක් මත්තෙහි පුතු නිදි කරවා, ගියේය. මවු තොමෝ හැරී බැලුවා පුතු නො දැක 'මාගේ පුත් කොහි දැ' යි ඇසූ ය. 'ගසක් යට නිදි ගැන්වීමි' යි කී විට මා නො නසව, පුතු නැති ව මම ජීවත් නො වෙමි, පුතු ගෙණෙන්නැ' යි කියමින් පපුවට ගස ගසා හඬන්නට වූ ය. කොතුහලිකයා දුව ගොස් පුතු ගෙණ ආයේ ද අතර මගදී පුතු මළේ ය. මේ පුතු හැර දැමීමේ පවින් මොහු භවයෙහි සත්වරක් ම හැර දැමුනේ ය. එහෙයින් පාප කර්මය සුලු ය යි කිසිවිටෙකත් නො සැල කිය යුතුය.

මෙසේ මග බැස යන මේ දෙදෙන එක් ගොපලු ගෙදරකට පැමිණියෝ ය. එදවස එහි දෙනුන් පිළිබඳ මගුලෙක් විය. ගොපලු ගෙදර එක් පසේබුදු කෙනෙක් නිතර වළඳති. එදා ද උන්වහන්සේ වැඩමවා දන් වළඳවා මගුල් කෙළේ ය. ඒ පිණිස එහි කිරිබත් පිළියෙල කොට තුබුනේ ය. ගොපලු තෙමේ මුත් දෙන්නා දුක, 'කොහි සිට ආවහු දැ' යි විචාරා, තොරතුරු දැන, උන් කෙරෙහි මහත් කුළුණෙන් උන්ට ගිතෙල් ටිකකුත් සමග කිරිබත් දෙවී ය. එවිට කාළිය 'හිමිය! කිරිබත් කන්න, ඔබ ජීවත් වූ කලය, මම ජීවත් වන්නෙම්, ඔබගේ ජීවිතයට අනතුරෙක් වී නම්, එයින් ම මාගේ ජීවිතය ද නැසෙන්නේ ය, දින ගණනක් ම ඔබ වහන්සේ බඩ ගින්නෙන් පෙළෙන්නහු ය, එහෙයින් සැහෙන පමණින් ගිතෙලුත් සමග කිරිබත් කන්නැ' යි කිරිබත් හා ගිතෙල් ඔහු ඉදිරියෙහි තබා තොමෝ ටිකක් ගෙණ කෑවා ය. කොතුහලිනියා ඒ සියල්ල ඉතිරි නො කොට කෑයේය. සත් අට දවසක් ම බඩගින්නෙන් පෙළුනු ඔහුගේ ආහාරාභාව එයින් නො සන්සිඳින. ගොපලු තෙමේ උන්ට කිරිබත් ගිතෙල් දෙවා තෙමේත් කන්නට පටන් ගත්තේ ය. කොතුහලික තෙමේ කිරිබත් කන ගොපොල්ලා දෙස බලමින් හුන්නේ, ගොපොල්ලා විසින් පුවුව යට නිදා හුන් බැල්ලියට දුන් කිරිබත් පිඩ දැකා, 'අස්යෝ! මේ බැල්ල කොතරම් පින් ඇත්තියක් ද, මෑ නිතර මෙබඳු රසවත් ආහාර ලබන්නී, නො වේ දැ' යි සිතුයේ ය. එදා රෑ ම, කෑ ඒ කිරිබත දිරවා ගත නො හී කොතුහලිකයා කලුරිය කොට ඒ බැල්ලගේ කුස උපන්නේ ය. ඔහු බිරිය, සැමියාගේ සිරුර පුළුස්සා දමා, එහි ම කුලිවැඩ කොට සහල් නැළියක් සපයා ගෙණ ඒ උයා පසේබුදුරජුන්ට පිළිගන්වා, 'මේ පිණ ඔබ වහන්සේගේ මෙහෙකරුට, මාගේ හිමියාට ලැබේවා' යි පින් දුන්නී ය. එසේ කොට නැවැත ඈ 'මා මෙහි ම විසිය යුතු ය, නිතර බුදුරජුනත් වහන්සේ මෙහි වැඩමවන සේක,

දෙන්නට දෙයක් නැත ද, දවස ගානේ උන්වහන්සේට වඳිමින් වතාවත් කරමින් පින් දහම් රැස් කර ගත හැකි ය' යි සිතා එහි ම කුලීවැඩ කරමින් කල් ගෙව්වා ය. බැල්ල ද සමසක් සත් මසක් තරම් කල් ඉක්මවා බලු පැටවකු වැදූ ය. ගොපොල්ලා ඌට දෙන-කගේ කිරි දුන්නේ ය. එහෙයින් ඌ නොබෝ දිනකින් ම වැඩී ගියේ ය. පසේ බුදුරජානන් වහන්සේ ගොපලු ගෙදර වළඳන්නාවූ සෑම දවසක ම ඌට බත් පිඩක් දෙන සේක. එහෙයින් ඌ බුදුරජුන් කෙරෙහි ස්නෙහ කෙළේ ය. ගොපොල්ලා දවසට දෙවරක් බුදුරජුන්ට උවැටන් කරන්නට යයි. යන්නේ අතර මග නපුරු වන සතුන් ඇතැ යි සිතෙන තැන්හි දඬු කඩකින් ගස් කොළන්වලට හා පොළොවට ගසා මහත් සේ හඬ නගා වන සතුන් පලවා හරි යි. බලු පැටවා ද ඔහු සමග යයි.

දවසක් ගොපොල්ලා පසේ බුදුරජුන් වසන පන්සලට ගොස් 'ස්වාමිනි! මට එන්නට ඉඩ නැති දැට මේ බල්ලා මෙහි එවන්-නෙමි, ඒ සලකුණෙන් අප ගෙට වඩිනු මැනැවැ' යි ආරාධනා කෙළේ ය. උන් වහන්සේ එය ඉවසූහ. එබඳු දිනෙක ගොපොල්ලා 'යන්න, පුත! පසේබුදුරජුන් මෙහි වැඩමවා ගෙණ එන්නැ' යි බල්ලා යැවී ය. ඌ ඒ කී සැටියේ ගෙයින් දෙරට පැන යන්නේ ගොපොල්ලා අතරමගදී ගස් කොළන්වලට හා පොළොවට ගසන තැන්වල නැවතී සිට තුන් තුන්වර බුරා වන සතුන් පලා ගියහ යි සිතා පන්සලට යයි. ගොස් පසේබුදුන් වසන පන්සල දෙරකඩ සිට, තෙවරක් බුරා, තමන් ආ බව දන්වා, පසෙකට වී හිඳියි. පසේබුදුරජුන් වේලාව සලකා පන්සලෙන් නික්ම වඩිනා කල්හි, බල්ලා බුරමින් උන්වහන්සේගේ ඉදිරියෙහි යයි. බුදුරජානන් වහන්සේ, ඌ විමසනු පිණිස අතරතුරේ දී අන් මගට ද බස්නා සේක. බල්ලා උන්වහන්සේගේ ඉදිරියෙහි හරහට සිට වළක්වනු ලබන්නෝ ද, නො නැවතී බල්ලා පයින් ඈත් කොට වඩිනා සේක. එවිට ඌ සිවුරෙහි කොණ කටින් අල්ලා ඇද බුදුරජුන් නියම මගට පමුණුවා ගණියි. මෙසේ ඒ බලු තෙමේ බුදුරජුන් කෙරෙහි මහත් ස්නෙහයක් උපදවා වෙසෙ යි.

කලක් ගිය තැන, බුදුරජුන් පෙරවූ සිවුර දිරුම් කඩට ගියේ ය. ඒ දුටු ගොපලු තෙමේ උන්වහන්සේට සිවුරු පිණිස වස්ත්‍රයක් පිදී ය. 'උපාසකය! සිවුරක් එකකුට කරණු බැරි ය ඒ පිණිස පහසු ඇති තැනකට යා යුතු ය, එහෙයින් සිවුර කරන්නට පහසු ඇති තැනකට ගොස් සිවුර කර ගෙණ එමි' යි බුදුරජුන් වදාළ විට, 'ස්වාමිනි! මෙතැනින් කොතැනක ත් නො වඩිනු මැනැවි. මෙහි ම හිඳ සිවුර කර ගණු මැනැවැ' යි ගොපොලු

තෙමේ කියේ ය. 'උපාසකය! තනි මට සිවුරක් මසනු බැරි ය, එයට වැඩි දවසෙක් ගත වන්නේ ය' යි කීවිට ගොපලු තෙමේ 'සාමීනි! එසේ නම්, පහසු ඇති තැනකට ගොස්, සිවුර කර ගෙණ, වහා මෙහි වඩිනු මැනැව, වැඩි දවසක් පිටත නො වසනු මැනවැ' සි කී ය. බල්ලා ද මේ කතාව අසා හුන්නේ ය. පසේ බුදුරජාණන් වහන්සේ ගොපොල්ලා නවතා අහසට නැඟ ගඹ මාදන පර්වතය බලා වැඩි සේක. අහසැ වඩනා බුදුරජුන් දෙස බලමින් බුර බුරා හුන් බල්ලාගේ හදවත, උන්වහන්සේ නො පෙණී ගිය තැනේ දී දෙකට පැළී ගියේ ය.

"තිරිසන්නු නො ඇද ගති ඇත්තෝ ය. අවඩක අදහස් ඇත්තෝ ය. මිනිස්සු සිතෙහි අනෙකක් තබා, කවින් අනෙකක් කියති. එහෙයින් මිනිස්සු ඇද ගති ඇත්තෝ ය. ඇද අදහස් ඇත්තෝ ය"

මෙසේ ඒ බලු කලුරිය කොට තව්තිසාදෙව්ලොව උපන. දුන් දෙවහනත් දහසක් විසින් පිරිවැරුණේ දෙව්සැප විඳියි. කණට කොදුරා කතා කරන විට එහඬ, දෙලොස් යොදුන් තැන පැතිර සිටි ඔ. පියවි හඬ, දස දහස් යොදුන් පමණැති මුළු දෙව්නුවර වසා පැතිර ගණියි. එහෙයින් මොහු ඝොෂක දෙවපුත්‍ර යි පළ විය. මේ වනාහි පසේබුදුන් කෙරෙහි ස්නෙහයෙන් බැඳි කරණ ලද බිරිමෙහි ඵලය වේ. මද වූ ද පින්කමෙහි විපාක මහිමය බලනු මැනැවි.

ඝොෂකදෙවපුත්‍ර තෙමේ, ඒ දෙව්ලොව වැඩි කල් නො යවා එයින් චුත වී ගියේ ය. **ආයුපිරිහිම- පින්පිරිහිම- ආහාර පිරිහිම- කිපීම** යන මේ කරුණු සතර, දෙව්ලොවින් දෙවියන්ගේ ගිලිනීමට කරුණු වේ. යමෙක් මහත් පිණක් කළේ ද, ඔහු දෙව්ලොව ඉපිද ආයු නිබෙන තුරු එහි සිට ඔතු මතු උත්පත්තියට යයි. මෙසේ වනුයේ ආයුපිරිහීමෙනි. මද පිණක් කළේ, ඒ පිණ, රජකොටු ගෙයක ලූ තුන් නැළි සතර නැළි තරම් ධාන්‍ය සේ, අතරදී ම ගෙවී යයි. එහෙයින් මද පිණක් කොට දෙව්ලොව උපන්නේ අතරදී ම කලුරිය කරයි. පින් පිරිහීමෙන් චුතවීම මේ ය. කම් සැප වළඳන්නේ සිහි මුළා ව ගොස් අහර නො ගැණීමෙන් විඩාපත් සිරුර ඇත්තේ, කලුරිය කරයි. මේ ය ආහාරපිරිහීමෙන් චුතවීම. අනෙකෙක් අනෙකකුගේ සැපත නො ඉවසන්නේ, කිපී කලුරිය කරයි. මේ ය කිපීමෙන් චුතවීම.

මේ ඝොෂකදෙවි තෙමේ කම්සැප වළඳන්නේ, සිහි මුළා ව ගොස් ආහාර නො ගැණීමෙන්, දෙව්ලොවින් ගිලිනී ගියේ ය.

ඉන් ගිලිහී පිළිසිඳ ගත්තේ, කොසඹෑනුවර වෙසඟනක කුසේ ය. ඕ වැදූ දිනම 'මෙ කිමැ' යි දැසිය විචාරා, පුතෙකැ යි කී විට, 'මූ කුල්ලක බහා ගෙණ ගොස් කුණු ගොඩක ලව' යි කිවූ ය. දැසිය එසේ කළා. වෙසඟනෝ දූලා ම රකිති. වඩති. පුතුන් නො රකිත්. නො වඩත්. දූලා ම ඇලාගේ ගණිකාවෘත්තිය රකින බැවිනි එසේ දූලා ම රකින්නෝ. වඩන්නෝ.

කුණුගොඩැ ලූ ලදරු, බලු කපුටෝ වටකර ගත්හ. එහෙත් බලු කල, පසේබුදුන් කෙරෙහි ස්නෙහයෙන් කළ බිරිමෙහි අනුසසින් මුන් අතර එකෙකුත් ඒ ලදරුට ලංවීමෙහි අපොහොසත් විය. ඒ අතර මිනිසෙක් මේ බලුකපුටුරැස්වීම දැක, මේ කිමැ යි එහි ගොස් කුණුගොඩැ හුන් ලදරු දැක, උන් කෙරෙහි ස්නෙහ උපදවා 'මට පුතෙක් ලැබිනැ' යි මහත් සතුටින් ඒ ලදරු ගෙණ ගියේ ය. ඒ අතර දවසෙක කොසඹෑනුවර සිටානෝ රජමැදුරට යන්නෝ, අතරමගදී පෙරෙවිබමුණා දැක, 'ගුරුතුමනි! ඔබ වහන්සේ අද නැකත් තරු හේ ම බැලුවහු දැ?' යි ඇසූහ. 'ඔව්! බැලුවා, එයින් අපට වැඩෙක් නැතැ' යි පෙරෙවි තෙමේ කී ය. නැවැත, සිටානන් 'අපේ ජනපදයට වන වැඩ අවැඩ කෙසේ දැ?' යි ඇසූ විට 'සිටු තුමනි! අද මෙනුවර උපන් දරු නම් කවදා නමුත් මෙහි ප්‍රධාන සිටු වනු ඇතැ' යි ඔහු කී ය. මෙ දවස සිටුගේ භාර්‍යා තොමෝ දරගැබ් ඇත්තී වූ ය. සිටානෝ පුරුෂයකුට අඩගා 'තෝ ගොස් මා බිරිය වැදූ දැ යි දැන එව' යි කීහ. ඔහු ගොස් සොයා බලා නො වැදූ බව දැන අවුත් ඒ බව සිටානන්ට දැන්වී ය. රජු බැහැ දැක වහා පෙරළා ගෙට ආ සිටානෝ, දැසිය කැඳවා, දහසක් දී, 'පල, මෙනුවර අද උපන් දරු සොයා බලා මෙහි ගෙණෙව' යි කීහ. ඕ ඒ සොයා යන්නී එහි එක් ගෙයකට ගොඩ වැදී 'මේ දරු කවදා උපන්නේ දැ?' යි එහි සිටි ගැහණිය අතින් විචාළා ය. ඕ තොමෝ 'මේ දරු අද උපනැ' යි කිවූ ය. එවිට දැසී තොමෝ 'මේ දරු මට දෙන්න' මෙන්න මුදල්' යි කහවණු එකේ පටන් දහස දක්වා වැඩි කොට, අන්තිමේ දී දහසක් දී දරු ගෙණ අවුත් සිටානන්ට දැක්වූ ය. ඔහු 'යම් ලෙසකින් මට දුවක් ලැබුනි නම්, මේ කොලුට ඈ පාවා දී මෙහි ම රඳවා, සිටුතනතුරට හිමියකු කරන්නෙමි, පුතෙක් ලැබුනේ නම්, මූ මරා ලන්නෙමි' යි මිලට ගෙණා ඒ දරු භාර ගෙණ ටික දිනක් පොෂණය කෙළේ ය. ඒ අතර සිටු බිරිය පුතකු වැදූ ය. 'මූ නැති කල මා පුතුට සිටු තනතුර ලැබෙන්නේ ය, එහෙයින් මූ මරා දැමිය යුතු ය' යි සිතා සිටානෝ දැසියට 'කෙල්ල! මේ දරු ගෙණ ගොස්, ගාලෙන් ගොනුන් පිටත එන වේලෙහි ගාල් දොර මැද හරහට නිදි කරව,

එවිට ගොන් දෙනුන් මූ පාගා මරා ලනු ඇත, ඒ දැන එව' සි කීහ. ඕ තොමෝ දරු ඔසොවා ගෙණ ගොස්, සිටු කී ලෙසට ගාල් දෙර අරින්නට කලින්, ඌ ගාල් දෙර හරි මැද හරහට කැබූ ය. අන් දවස සියලු ගොනුන්ට පසුව ගාලෙන් පිටතට එන ප්‍රධාන ගොනා, එදා හැමට පළමු නික්ම අවුත් ඒ කුඩා දරු පා සතර අතර කොට සිටියේය. සෙසු ගොන්නු පිටත එන්නෝ, මේ මහගොනුගේ ඇඟ දෙපස හැපිහැපී එලියට බැස්සෝ ය. ගොපොල්ලා 'මේ ගොනා වෙන දා නික්මෙන්නේ හැම ගොනුන්ට පසු ය, අද හැමට පළමු නික්ම ගාල් දෙර අවුරා සිටියේ ය. 'මේ කිමැ' සි ගොස් බලනුයේ, ගොනුගේ පා අතර නිදා හුන් ලදරුවා දැක 'මට පුතෙක් ලැබිනැ' සි සතුටු ව ගෙට ගෙණ ගියේ ය. දුසිය එ ප්‍රවත සිටුට දැන්වූ ය. 'කෙල්ල! වහා එහි ගොස්, මේ දහස ඔහුට දී ඒ කොලු මෙහි ගෙණෙව' සි සිටානෝ දුසියට කීහ. දුසි දහස ගෙණ එහි ගොස්, එය ගොපොල්ලාට දී, කොලු ගෙණ, සිටුට දුක්වූ ය. එවිට සිටානෝ 'බොල! මූ ගේණ ගොස් කරත්ත පාර මැද නිදි කරව, එවිට අලුයම මෙනුවරින් වෙළඳුමට පිටත්ව යන කරත්තවල බැඳි ගොනුන්ට පෑගී මූ මැරෙණු ඇත, නැත, කරත්ත රෝදවලට හසු වන්නේ ය, ඒ තොරතුරු දැන අවුත් මට කියව' සි දුසියට කීහ. ඕ එසේ කළා. එදා ගැල් දෙටුවා ඉදිරියෙහි ගියේ ය. ඔහුගේ කරත්තයෙහි බැඳි ගොන්නු, දරු හුන් තැනට පැමිණ, වියකර බිම හෙලූහ. නැවැත නැවැත විය බැඳ දක්කන ලද්දෝ ද එක අඬියකුත් ඉදිරියට නො ගියහ. මෙසේ කරත්, පාන් විය. ඉක්බිති ගැල්දෙටු තෙමේ 'ගොනුන්ගේ මේ නො ගික්මුම කිමැ' සි බලනුයේ, මග හරහට නිදා හුන් දරු දැක සැලී ගියේ, 'මට පුතෙක් ලැබිනැ' සි සතුටු ව ඔහු ගෙණ ගෙට ගියේ ය. දුසිය ඒ වග තුග සිටුට දැන්වූ ය. නැවැතත් සිටු තෙමේ දහසක් දී දුසිය යවා දරු ගෙන්වා, 'මූ අම්බ සොහොනෙහි දමව, එහි දී මූ බලු සිවලුන්ට බත් වන්නේ ය, නැත, අමනුෂ්‍යයන්ට බිලි වනු ඇතැ' සි කියා දරු දුසිය ලවා අම්බ සොහොනෙහි දැම්මවී ය. ඕ තොමෝ එසේ කොට පසෙක ඉඳ බලා සිටියා ය. බල්ලෙක්, කවුඩෙක්, අමනුෂ්‍යයෙක් දරුට ලං නො විය. පුදුම යෙකි, මේ දරු මෙසේ මරණින් ගලවන්නට මවු පිය ඇ කිසි කොනෙක් එහි නො වූහ. එහෙත් රැකුනේ ය. රැකුනේ බලු ව උපන් කාලයෙහි පසේබුදු රජුන් කෙරෙහි ස්නෙහයෙන් කළ බිරිමේ අනුසසින් ය.

ඒ අතර එළු එඬෙරෙක් දහස් ගණනක් එළුවන් ගෙණ තණ බිමට යන්නේ, ඒ සොහොනට ආයේ ය. එළුදෙනක්

කොළපත් කමින් හැසිරෙන්නී ගසක් යට හොත් ඒ දරු දූක, දෙ දණ බිම ඇණ කිරි පොවන්නට පටන් ගත්තා ය. එඬේරු මේ කිසිත් නොදූන එළුවන් ගෙණ යන්නට හඬ නගා උත්සාහ කළ ද, මේ එළුදෙන් තොමෝ එ තැනින් නොනික්මුනී ය. එවිට එඬේරු තම අත තුබූ කෙව්ටෙන් ගසා ඇද ගණිමි යි සිතා එතැනට ගියේ, දරු දූක, මහත් වූ ස්නෙහයෙන් 'පුතකු ලදිමි' යි උඟ වඩා ගෙණ ගෙට ගියේ ය. ඉක්බිති දුසිය සිටුගෙට ගොස් මේ තොරතුරු සිටානන්ට කිවූ ය. සිටු තෙමේ තවත් දහසක් දී දුසිය යවා දරු ගෙන්වා, 'මූ ගෙණ ගොස් හොරුන් හෙලන කඳු මුදුනට නැගී බිම හෙලව, එවිට මූ කන්දෙහි වැදී කඩ කඩ ව යන්නේ ය, එබව දූණ එව' යි දුසියට කීවේ ය. ඇ එසේ කළා. ඒ කන්දඅසල කන්ද ඇසුරු කොට ගෙණ වැඩුණු උණ පදුරෙක් විය. එහි මුදුන සන වූ ඔළිදවැලෙන් වැසී සිටියේ ය. කඳුමුදුනෙන් හෙන ඒ කුඩා දරු එහි රැඳුනේ ය. එ දවස එක් නලාකාරයෙක් උණදඬු කපන්නට සිය පුතු සමග ඒ කඳුපාමුලට ගියේ, උණදඬු කපන්නට පටන් ගත්තේ ය. ඔවුන් හුණදඬු කපා අදින විට, එහි මුදුන රැඳී හුන් දරු හඬන්නට වන. නලකරු එහි මුදුනට නැංගේ, දරු දූක වඩා ගෙණ බිමට බැස 'පුතෙක් ලැබිනැ' යි සතුටු ව ගෙට ඇරගෙණ ගියේ ය. දුසිය ගොස් මේ සියලු තොරතුරු සිටානන්ට කිවූ ය. එවර ද සිටු තෙමේ දහසක් යවා ඒ කුඩා දරු ගෙන්වා ගත්තේ ය. සිටානන් මෙසේ දහස් ගණන් දී මරන්නට තැත් කරද්දී දරු තෙමේ වයසින් වැඩුනේ ය. සොෂක නමින් ද හැදුනුනේ ය. ඔහු සිටානන්ට ඇස ඇණුනු කටුවක් සේ විය. ඇස හැර බලන්නට ද සිටු තෙමේ අපොහොසත් විය. දරු මරන්නට නැවැතත් උපාය සොයන්නට පටන් ගත්තේ ය.

දවසක් සිටු තෙමේ, සිටුගෙට වලත් සපයාගෙණ එන්නාවූ කුඹල්කරු වෙත ගොස් කතාවට බැස 'තෝ මෙහි වලත් පලහන පෝරණයෙහි ගිනි දල් වන්නෙහි කවදා දැ?' යි ඇසී ය. 'සෙටැ' යි කුඹල්කරු කී ය. 'මට නා ලවා කරවා ගතයුතු වැඩෙක් තිබේ, එය රහසක්, මෙන්න දහසක්, මෙය ගණින්, වැඩේ අවසන් වූවාසින් පසු' යි සිටානන් කී පසු, කුඹල්කරු තෙමේ 'මොකක් ද සවාමීනි! රහස?, කියන්න ඔබ වහන්සේ වෙනුවෙන් ඕනෑ ම දෙයක් මම කරමි, කියන්න, බියවන්න එපා, තමුන්නාන්සේ වෙනුවෙන් මාගේ දිවි ගියා වේ, උපකාරය වුවමනා තැනට උපකාර කරන්නට මම දනිමි, නොසහවා කියන්නැ' යි කීයේ ය. 'ඔව්, මම දන්නවා, උඹ එහෙම මිනිහා බව, මේක ලොකු ම රහසෙක්, ඒ නිසා ය උඹ ලඟට ආවේ, කාටත් නොදූනෙන

ලෙසට කරගත්නට, මට අවජාතපුත්‍රයෙක් සිටියි, ඌ කෙසේ නමුත් මරා දැම්මට ය මාගේ අදහස, එහෙයින් ඌ තා සමීපයට එවන්නෙමි, ආ විට අල්ලා කැලිවලට කපා, වලන් පලහන පෝරණයෙහි දමා පුළුස්සන්න, මේ දහස අත්තිකාරම්, අත් සැලකිලි සියල්ලක් වැඩේ අවසන් වූවාට පසු' යි සිටානත් කී විට, 'හා! ඕක මොනාක් ද, මම ඔබ වහන්සේගේ වැඩේ ඉතා රහසි ව කාටත් නොදැනෙන ලෙසට කරමි, ඒ ගැන සැක නූපදවනු මැනැවි, ළමයා එවන්නැ' යි කුඹලා කීයේ ය. සිටානෝ පසු දා, සොෂකයා ගෙන්වා, 'පුත! ඊයේ මා අපට වලන් සපයා ගෙණ එන කුඹලාට වැඩක් කියා ඇත, නුඹ දැන් එහි ගොස් ඌට කියා ඒ වැඩේ කරවා ගෙණ එන්න, මෙහෙන් කාවත් දැන් එහි නොගිය හොත් ඒ වැඩේ කරවා ගැණීම අත පසු වේ, ඒ නිසා දැන් එහි ගොස් එන්නැ' යි සොෂකයා පිටත් කළහ. සොෂක ද 'යහපතැ' යි කියා ගෙයින් නික්ම යන්නේ, යිටුගේ අනික් පුතු සෙල්ලම් කරණ තැනට ගියේ ය. ඔහු, සොෂක දැක, 'අය්යා මේ කොයි යන්නේ දැ?' යි ඇසී ය. 'මම තාත්තාගේ පණිවුඩයක් ගෙණ අපට වලන් සපයන කුඹල් ගෙදර යමි' යි ඔහු කී ය. 'අය්යේ! මම එහි යන්නම්, මේ ළමයා දැනට මගෙන් මසු ලක්ෂයක් දිනා ගෙණ තිබේ, ඒ නිසා අය්යා මුන් සමග සෙල්ලම් කරන්න! මම කුඹල්ගෙදර යන්නම්, මට ඒ ලක්ෂය දිනා දෙන්නැ!' යි එහි සෙල්ලම් කරමින් සිටි ඒ සිටුපුත් තෙමේ කියා සිටියේ ය. සොෂක 'මල්ලි මට බැහැ, මා එහි නොගිය හොත් පියා මව තළනු නොඅනුමාන ය, මම එයට බිය වෙමි' යි කී විට; සිටුපුත් තෙමේ 'අය්යා බිය නොවන්න! මම එය බලා ගන්නම්, පණිවුඩය ගෙණ ගොස් දීලා පියා කියූ ඒ වැඩේ කුඹලා ලවා හොඳට කරවා ගෙණ එන්නම්, අය්යා මුන් සමග සෙල්ලම් කරන්න! මගෙන් මුන් දිනාගත් ඒ ලක්ෂය මට දිනා දෙන්නැ!' යි ඇවිටිලි කෙළේ ය.

සොෂක, ගුළකෙළියෙහි දක්ෂයෙකි. ඇවිටිල්ල එහෙයිනි. අන්තිමේ දී සොෂක තෙමේ 'එහෙ නම මල්ලි! කුඹල්ගෙදර ගොස්, කුඹලා හමු ව, ඊයේ කියූ ඒ වැඩේ පමා නොකොට අද හෙට ම කර ගෙණ එන්නැයි පියා කියූ බව, කුඹලාට කියන්නැ!' යි කියා සිටුපුත්, කුඹල්ගෙදරට පිටත් කොට යවා තෙමේ සෙල්ලම් කෙළේ ය. සිටුපුත් තෙමේ කුඹල්ගෙදරට ගොස් සොෂකයා කියූ ලෙසට පියාගේ පණිවුඩය කුඹලාට කීයේ ය. එවිට කුඹලා මොහොතකුත් පමාව නොසිට, ඒ කුඹලමයා ගෙට ඇදගෙණ ගොස් මරා වැයකින් කැලි කොට, වලන් පලහන පෝරණයෙහි දමා පිළිස්සී ය. සොෂක, දවස මුළුල්ලේ එහි සෙල්ලම් කොට

සවස ගෙදර ගියේ ය. සිටු තෙමේ සොෂක දුක, 'මොක ද, පුතේ! නුඹ කුඹල්ගෙදර නො ගියෙහි දැ?' යි ඇසී ය. 'මල්ලි ගියා, මා එහි යන විට සෙල්ලම් පිටියේ දී මල්ලි හමු වුනා, පණිවුඩය ඔහු ගෙණ යන බව කියා මට සෙල්ලම් කරන්නට කිව්වා, ඒ වේලාවෙහි දී මල්ලි ලක්ෂයකින් පැරදී සිටියා, ඒ ලක්ෂය නැවැත දිනා දෙන්නැ යි මට ඇවිටිලි කළා, සෙල්ලම් කරන්නට බෑ කියද්දී ත් ඔහු මට සෙල්ලම් කරන්නැ යි කරදර කළා, ඒ නිසා මම සෙල්ලම් කළා, මල්ලි කුඹල්ගෙදර ගියා' යි සොෂක කිව්ට සිටු තෙමේ ගැසෙන්නට විය. හැඬුනේ ය. වෙව්ලන්නට වන. සිරුරෙහි ලේ උණු විය. සිහි මුළා ව ගියේ ය. 'කුඹළ! කුඹළ! හා, මා නො නසව! හා! මා නො නසව!' යි කියමින් හඬ හඬා කුඹල්ගෙය බලා දුව ගියේ ය. කුඹළා දුව එන සිටු, දුරදීම දුක, 'මොක ද සවාමිනි! හඬ හඬා?, නො හඬන්න! නො හඬන්න, මම ඒ වැඩේ හරියට ම කළා, බිය නො වන්නැ!' යි කියේ ය. සිටානන් මේ නිසා විඳිනලද සෝකය ඉ මහත් ය. මැරෙණ තුරු ම ඔහු එය වින්දේ ය. **"අපරාධ නො කළ අයට, අපරාධ කරන්නේ, මෙලොව ම මහත් දුකට පැමිණේය"** යි බුදුරජානන් වහන්සේ,

"දඹුවමට නුසුදුසු — නො දැහැවියවුන් කෙරෙහී,
දේ ද දඹුවම් යමෙකෙක් — කා ඇ දඹුවමින් හේ;

දසවැදෑරුම් දුක් — කරුණෙන් එක්තරා එක්,
කරුණකට (මෙලොවම) වහා — පැමිණේ (නියමයයි ඒ)

කැකුළු විදුමට හෝ — නැසුමකට හෝ පින්ගුණ,
සිරුරු බිඳුමට හෝ බර — ලෙඩකට සිත්විකෙව් හෝ,

රජඋවදුරට හෝ — රුදුරු ගැරහුම් ලැබුමට,
නෑ දන නැසුමකට හෝ — සැපත් නැසුමට (පැමිණේ),

ඔහු අයත් ගේ දෙර — හිනි ගෙණ හෝ දැවේ යලි,
මරණින් මතුයෙ නිරයේ — උපදී නුවණ නැත්තේ"

යි වදාළ සේක.

මෙ තැන් සිට සිටු තෙමේ ඇස හැරපියා සොෂකයාගේ මුණ නො බැලී ය. ඔහු එහි අපොහොසත් විය. ටික දවසෙක් ගත විය. සොෂකයා මරවන්නට ම ය සිටානන්ගේ සිත. එහෙයින් ඔහු 'මූ කෙසේ මරවම් දැ' යි සිතන්නේ, 'ගම්රකින මුදලිතැන ලවා මරවමි' යි සිතා ඔහුට, ලියුමක් ලිවිය.

කොසඹෑනුවර සිටුමැදුරේ දී ය.

ප්‍රණයපූජිකනිවෙදන ය යි.

මා පියමාමණ්ඩි!

මට අවජාත පුත්‍රයෙක් ලැබී සිටියි; මේ ලියුම රැගෙණ එන්නේ උඟය. මූ ජීවත්වනු දැක්මට මම නොකැමැත්තෙමි. එහෙයින් මූ මෙසේ එවිමි. මාමණ්ඩි ඉතා රහසේ මූ මරා වළලා ඒ බව මට දන්වා එවූ පසු කළයුතු සැලකුම් එකකුත් නොහැර මම කරන්නෙමි. මෙය ඉටුවිය යුතුම ය. මෙය මට කරණ ලොකු වැඩෙකි.

ඒ වගත් මෙසේ දන්වන්නේ,

කොසඹෑනුවර සිටුතෙමේ ය.

මේ ලියුම, ඝොෂකයාට අඩගා ඔහු ඇදි රෙද්දේ දුවලු කෙළවර බැඳ, 'පුතා! මේ ලියුම රැගෙණ ගොස් අපේ ගම්රකින මුදලිතැනට දෙන්නැ' යි කියා ඔහු එහි පිටත් කෙළේ ය. ඝොෂකයා අකුරු නොදනී යි. ලදරු කල පටන් මරවන්නට තැත් කළ සිටුතෙමේ ඔහුට අකුරු උගන්වා ද. ඝොෂක තෙමේ තම මරණ ලියුම දුවලුකෙළවර බැඳ ගෙණ ගෙයින් නික්මෙන්නේ 'පියානෙනි! මට මගවියදම් පිණිස මිලමුදල් නැතැ' යි කී ය. 'පුතා! මගවියදම් වුවමනා නොකර යි, — ගම ඉන්නෝ මා යහළු සිටාන කෙනෙකි, ඒ සිටුමැදුරට යන්න! එහි දී පුතාට උදැසනට මොකවත් කාලා බීලා යා හැකි ය, මගවියදම් වුවමනා නැතැ' යි සිටානන් කී කල්හි ඔහු පියා වැඳ අවසර ගෙණ ගියේ ය. ටික දුරක් මග ගෙවා ගොස්, සිටානන් කියූ ඒ ගමට පැමිණ, සිටුගෙය සොයා දැනගෙණ එහි ගොඩ වැදුනේ ය. ඒ වේලෙහි සිටු භාර්‍යා තොමෝ පිටත පිලෙහි සිටියා, 'කොහි සිට ආවා දැ?' යි ඝොෂකයාගෙන් ඇසූ ය. 'ඇතුල් නුවර සිට ආවෙමි' යි ඔහු කී ය. 'තාත්තා කවු දැ?' යි ඇසූ විට 'ඔබ තුමන්ලාගේ යහළු වූ කොසඹෑනුවර සිටු' යි කී විට 'ඝොෂක උඹ දැ?' යි ඇසූ ය. 'ඔව්, ඝොෂක නම් මමැ' යි ඔහු පිළිතුරු දින. සිටුබිරියට ඝොෂකයන් දුටු ඇසිල්ලෙහි මහත් වූ පුත්‍රස්නෙහයෙක් උපන. මේ සිටුහට සිටින්නී එක ම දුවක. ඕ වයසින් සොළොස් හැවිරිදි ය. දුටුවන් පහදවා සිත් ගන්නා රූ ඇත. ඇ රක්නට පණිවුඩ ගෙණ යන දැසියක් නිල කොට සිටියා. ඇගේ රැක්මෙහි මෝ සිටියා සත්මහල්පාසෙහි උඩමාලෙහි සිරි යහන්ගබඩාවෙහි ය. ඝොෂක, සිටුමැදුරට පැමිණ සිටි වේලෙහි මේ සිටුකුමරිය, සිය දුස්ස කිසියම් කාරියක් සඳහා කඩපිලට යැවූ ය. කඩපිලට යන ඇය දුටු සිටුභාර්‍යා තොමෝ ඇයට අඩ ගා 'කොහි යා දැ?' යි ඇසූ ය. 'ආර්‍යාවෙනි! පුංචිනෝනාගේ වුවමනාවක් සඳහා කඩපිලට යමි' යි කී කල්හි 'පොඩ්ඩක් වරෙන්!

තව ටිකකින් එහි යා හැකි සි, මේ මාපුතුට ඉන්නට පුටුවක් සූදානම් කරපන්! පා සෝදූ තෙල් ගාපන්! ඇඳක ඇතිරිලි එලා පිළියෙල කරපන්' සි කිවූ ය. ඕ එසේ කොට, කඩපිළට ගොස්, කුමරියගේ වුවමනා වත් සිදු කර ගෙණ, මදක් කල් ගෙවා, උඩමහලෙහි කුමරිය වෙත ගියා ය. එවිට සිටුකුමරිය ඇයට තදින් තරවටු කළා. 'මම කුමක් කරම් ද, ලොකුනෝනා මට අඩ ගා කතාකොට ඝොෂක සිටු කුමරුට ඉන්නට පුටුවක් සූදානම් කොට, කුමරුගේ පා සෝදූ තෙල් ගා ඇඳක් ඇතිරිලි එලා පිළියෙල කර යන්නැ සි මට කිව්වා, මම ඒ සියල්ල කොට කඩපිළට ත් ගොස් නෝනා මහත්මයාගේ වුවමනාව ත් සිදු කර ගෙණ ආමි, පමා වූවා ඒ නිසා ය, මා කෙරෙහි අමනාප නො වනු මැනැවැ' සි දැසිය කිවූ ය. ඝොෂක යන නම ඇසූ සැටියේ සිටු කුමරිය ගැස්සී සිටියා ය. උඩ බිම බැලූ ය. කිසිවක් කියා ගත නුහුනා ය. ඝොෂක යන්න කණ වැටුනු ඇසිල්ලෙහි, ඈ සිත හටගත් ආලය, ඇගේ සිව්මස් නහර බිඳ ගොස්, ඇටමිදුලුවල වැදී සිටියේ ය. ඝොෂකයා කොතුහලිකා ව උපන් ජාතියේ උඟට අඹු වූවා මේ සිටුකුමරී තොමෝ ය. එදා මේ තොමෝ සිටුගෙයක බැලමෙහෙ කොට, බැල පිණිස සහල් නැළියක් ලබාගෙණ එය පිසැ පසේ බුදුරජානන් වහන්සේ නමකට පූජා කළා ය. මේ ඒ දැනයාගේ අනුභාවය ය. මෙයිනි ඕ සිටු කුලයෙහි උපන්නී. එදා මුන් දෙන්නා, අතර තුබූ ඒ ස්නෙහය, මෙදා ත් මෙසේ ඉස්මතු වූයේ, උන් දෙන්නා යට කොට සිටියේ ය.

"පෙර සමග විසුමෙන් – වත්මන්හි හිතයෙන් හෝ,
මෙසේ ඒ පෙම් උපදී – දියැ උපුල් හට ගණු මෙනි."

යි බුදුරජානන් වහන්සේ වදාළ සේක.

මදක් නිසල ව කල්පනායෙන් සිටි සිටුකුමරිය 'කෝ දැන් ඔහු?' යි දැසිය අතින් විවාළා ය. 'ඇදෙහි නිදි' යි යනු දැස්සගේ පිළිතුර විය. 'අත මොකවත් තිබේ දැ?' යි නැවැත ඇසූ. 'ඔව්! ඇඳ තිබෙන රෙද්දේ දැවලූ කෙළවර එල්ලූ ලියුමක් තිබේ, වෙන මොකවත් නැතැ' යි ඕ තොමෝ කිව්වා ය. ඉක්බිති සිටුකුමරිය 'ලියුම ගෙණ බලමි' යි උඩුමහලින් බැස, ඝොෂකාගේ නිදි බලා හිමින් සිරුවේ නිදුහුන් ඇඳ ලඟට ගොස්, ලියුම දැවල්ලෙන් ලිහා ගෙණ, තම කාමරයට වැදී දෙර වසා ජනේලය හැර ලියුම කියවා බලා, 'අනේ! මෝඩයෙක්, මා අතට මේ ලියුම නො ලැබිනි නම්, මොහු ඉවරැ' යි යනු තමන්ට ම කියා ගෙණ ලියුම ඉරා දමා අන් ලියුමක් ලියූ ය.

කොසඹැනුවර සිටුමැදුරේදී ය.

ප්‍රණයපූර්ණකනිවේදනය යි.

මා ප්‍රිය මාමණ්ඩි!

මේ ලියුම ගෙණෙන්නේ මාගේ පුතා ය. නම සොෂක ය. මා අයත් ගම් කොන්වලින් බඩුමූට්ටු ගෙන්වා මාමා වසන ගමේ ම දෙමහල් ගෙයක් කරවා, එය වට කොට තාප්පයක් බැඳ මුරකරුවන් ද සිටුවා රැකවල් ඇති කොට මොහුට භාර දෙන්න. ඉන් පසු ගම් සියයෙන් පඬුරු පාක්කුඩම් ගෙන්වා, ජනපද සිටානන්ගේ දූ භාය්‍යාව කොට දී මගුල් කොට මට දන්වා එවන්න. මට දැන්වූ පසු ඔබට කළ යුතු හරිය මම කරමි.

ඒ වගත් මෙසේ දන්වන්නේ,

කොසඹැනුවර සිටුතෙමේ ය.

ලියුම අකුළා කවරයක බහා දුවලූ කෙළවර බැන්දා ය. සොෂක නිත්දෙන් නැගිට, මුණකට සෝදා බත් කා එතැනින් පිටත්ව ගියේ, පසුදා උදය එගමට පැමිණියේ ය. එහිදී මුදලි තැන ඔහුට හමු විය. ඔහු, සොෂක, ගෙට කැඳවා ගෙණ ගොස්, කත්නට බොන්නට දී සංග්‍රහ කොට, පැමිණීමේ තොරතුරු ඇසී ය. 'මාගේ පියා ඔබට දෙන්නැ යි ලියුමක් දුන්නා, මෙන්න ඒ ලියුම,' යි ලියුම ඔහුට දුන්නේ ය. මුදලි ලියුම කියවා බලා 'මාගේ සැමියා මා කෙරෙහි කොතරම් ස්නෙහ ඇත්තේ ද, තමන්ගේ වැඩිමහල්පුතුට මගුලක් කර දෙන්නැ යි මට දන්වා එවා තිබේ, මෙහිලා දැන් පමාවිය යුතු නොවේය' යි සිතා ඒ ඒ ගම්වල විසූ ගැහැවියන්ට 'වහා දුව දඬු එවන්නැ' යි දන්වා යැවී ය. ඔවුහු දුව දඬු එවූහ. මුදලි තෙමේ සිටානන් දන්වා එවා තුබූ ලෙසට ගෙය ගොඩ නංවා, තාප්ප බන්දවා මුර කරුවන් සිටුවා, පඬුරු පාක්කුඩම් ගෙන්වා ගබඩා පුරවා. ජනපදසිටුකුමරිය ගෙණවුත් භාය්‍යා කොට දී කළයුතු සියල්ල අවසන් කොට මේ සියලු තොරතුරු සිටානන්ට දන්වා යැවී ය. සිටු තෙමේ ගැසෙන්නට වන. ඇඟ රත් වී ගියේ ය. සිහි නැති විය. නාන් දෙඩවී ය. 'අය්යෝ! මොක ද මේ මා සිතන කරණ කියන එකෙකුත් සිදු නොවේ, සිදු වන්නේ නොසිතන නොකියන නොකරණ දේය' යි සිතූ සිටුහුගේ සිතෙහි හටගත් ශොකය, පුතු මළ ශොකයත් සමග දැඩි ව ගොස් ඇඟ ලේ උණු වී අතීසාරයෙන් පෙළෙන්නට වූයේ ය. සොෂක භාය්‍යා තොමෝ මේ දැන, මුරකරු ගෙන්වා, 'කොසඹැනුවර සිටුමැදුරෙන් යමකු, පණිවුඩ ගෙණ ආවොත්, ඔහු පළමු කොට මා වෙත කැඳවා ගෙණ එන්නැ' යි නියම කළා ය. කොසඹැනුවර සිටු තෙමේ ලෙඩ ඇඳ

වැතිර හිඳ 'දැන් මේ කොල්ලා මාගේ දේපලවල හිමියා වන්නේ ය, මේ දේපල මාගේ පරපුරෙන් ගිලිහී යන්නේ ය, මූට මේවා අත් නො වන ලෙසක් කළ යුතු ය' යි සිතා, ලඟ සිටි මූලාදැනියකුට කතා කොට 'කාවත් යවා මාපුත් ඝොෂක මෙහි ගෙන් වන්න! ඌ දකිනු කැමැත්තෙමි' යි කීයේ ය. මූලාදැනියා සිටානන්ගේ සියලු තොරතුරු කියා, පණිවුඩ කරුවකු ඝොෂක වෙත යැවී ය. ඔහු එහි ගියේ ය. දෙරකඩ සිටි මුරකරු, පණිවුඩකරු දෙරකඩ නවතා, ගොස් ඝොෂක භාර්‍යාවට, කොසඹෑනුවරින් පණිවුඩයක් ගෙණ මිනිසකු අවුත් සිටිනා බව දැන්වී ය. ඕ තොමෝ ඔහු ගෙන්වා 'ආයෙහි කුමක් නිසා දැ?' යි ඇසූහ. 'ආර්‍යාවෙනි! සිටුතුමා ගිලන් වූයේ ය, ඝොෂක කුමරු දකිනු රිසියෙන් ඔහු කැඳවා ගෙණ එන්නැ යි කිය යි, එහෙයින් මම මෙහි ආමි' යි පණිවුඩ කරු කීවිට 'ඕයි! සිටුතුමා හුඟ ක්ම ගිලන් වූයේ දැ' යි ඇසූ ය. එවිට ඔහු 'එතරම් ම ගිලන් වූයේ නො වේ, කායශක්තියේ අඩු කමකුත් එතරම් ම නැත, තව ම ආහාර ගණී ය' යි කී ය. සිටුභාර්‍යා තොමෝ මේ කිසිවක් ඝොෂකට නො දන්වා පණිවුඩය ගෙණ ආවහුට, වියහියදම් දෙවා, 'මා දැන් වූ විට යා හැකිය, එතෙක් මෙහි හිඳුව' යි කීවා ය. ඔහු එහි නතර විය.

සිටු තෙමේ නැවැත මූලාදැනියාට අඩගා 'ඝොෂක වෙත කාවත් යැවී දැ?' යි ඇසී ය. 'ස්වාමීනි! ඔබ වහන්සේ කියූ සැටියේ ම මිනිසකු එහි යැවීමි, එහෙත් තව ම ඔහු නො ආයේය' යි කී විට, එහෙ නම් ඉක්මනට තව එකකු යවන්නැ' යි කී ය. වෙන එකකු යැවී ය. සිටු භාර්‍යා තොමෝ ඔහු ද එහි නවතා ගත්තී ය. මේ අතර සිටුගේ රොගය බලවත් විය. එක් මලබඳුනක් මලමගට ලං කොට තබා, එහි කලින් තුබූ බඳුන අස් කරයි. ඒතරමට රෝගය නැගී සිටියේ ය. සිටු තෙමේ නැවැතත් මූලාදැනියාට අඩගා කතා කොට 'පුතු වෙතට කෙනකු යැවී දැ' යි ඇසී ය. 'යැව්වා! තවම ඔහුත් ආවේ නැතැ'' යි කී විට, 'තව එකකු යව' යි කී ය. මූලාදැනියා තව එකකු යැවී ය තෙවනවර ඝොෂකයා වෙත පණිවුඩ ගෙණ ආවහු අතින් සිටු භාර්‍යා තොමෝ සිටානන්ගේ තොරතුරු ඇසූ ය. 'ආර්‍යාවෙනි! දැන් නම් සිටුතුමා බලවත් සේ ගිලන්ව වෙසෙ යි, කෑම් බීම් කිසිවක් නො ගණී යි, ඇඳෙන් නො නැගිටි යි, මල යෑම අතර නො තබා ම සිදු වේ, කොයි වේලේ කරදරයෙක් වේ දැ යි නො කියැකි ය, රොගය ඒ තරමට බල ගතු ය' යි ඔහු කී විට, ඕ තොමෝ 'දැන් තම යි යා යුතු කාල ය' යි සිතා ඝොෂකට කතා කොට 'ස්වාමිය! පියා රොගාතුරව සිටී ය යි දන්වා එවා තිබේ, අප දැන් එහි යා යුතු ය, හිස් අතින් යෑම නුසුදුසු ය, එහෙයින් ගම්වලින් ලැබෙන යමකුත් ගෙණ යමු' යි කිවු ය. ඔවුහු දෙදෙන සහල්-තිරිගු-කුරක්කන්-මෙනේරි-දුරු-

මිරිස්-අඹ-කොසෙල්කැන්-ගිතෙල්-මී ආදී නොයෙක් දේ ගෙන්වා ගැලක පුරවා ගෙණ පිටත් ව ගියහ. මදක් දුර ගොස්, සිටු භාර්‍යා තොමෝ 'ස්වාමියි! පියා ඉන්නේ මරණයට ලංව ය, දැඩිසේ හිලන් ව ඉන්නා බව දන්වා එවා තිබේ, අප වහා එහි යා යුතු ය, මේ පඬුරු පාක්කුඩම් ගෙණ යෑම ඒ ගමනට බාධාකර ය, එහෙයින් මේවා තබා යමු' යි ගෙණ ආ ඒ සියල්ල ආ පසු තම කුලගෙට යවා, 'ස්වාමියි! ඔබ එහි ගිය විට, පියා නිදන ඇදේ පා කොණ සිටින්න! මම හිස ලන සිටින්නෙමි, එසේ සිට පියාගේ වගතුග සොයා බලමු' යි කිවු ය. සොෂක ද 'යහපතැ' යි පිළිගත්තේ ය. තමන් හා ගිය සෙස්සන්ට ගෙය වට කොට ගෙය ඉදිරිපස හා පසු පස රැකවල් ගෙණ සිටින්නට ඕ තොමෝ නියම කළා ය. සොෂක ගෙට ඇතුල් ව පියාගේ ඇඳ පා මුල සිටියේ ය. සිටුභාර්‍යාව හිස අද්දර සිටියා ය. සිටු තෙමේ ඒ වේලෙහි උඩුකුරු ව සයනය කෙළේ ය. මූලාදුනියා පා මිරිකමින් සිටියේ, සොෂක කුමරු ඇවිත් සිටී ය' යි කීය. 'කෝ, කවුදැ?' යි සිටානන් ඇසූ විට 'මේ පා මූල ඉන්නේ ය' යි පෙන්වී ය. සිටු තෙමේ ඇස් ඇර බලා, අයකැමියා ශෝවා මගේ ධනය කෙතෙක් දැ' යි ඇසි ය. 'ස්වාමීනි! මුදල් පමණක් සතළිස් කෝටියකි, උපභොග පරිභොග බඩු, ගම්, කෙත්, දෙපා, යාන, වාහන මේ මේ පමණ ය' යි අය කැමියා දැන්වී ය. ඒ අසා සිටු තෙමේ 'මාගේ මෙතෙක් ධනය මම සොෂකයාට නො දෙමි' යි කියන්නට ගියේ ද, 'සොෂකයාට දෙමි' යි කියවුනේ ය. ඒ අසා සිටි සිටුභාර්‍යාව 'මොහු මෙය නැවැතත් කියේ නම්, අනිකක් කියන්නේ ය' යි සිතා නොකයෙන් මැඩුනියක සේ හිස කෙස් විහිදුවා හඬමින් 'පියේ! මේ කියනු කිම; ඔය වචනය අසන අපි කාලකණ්ණි වම්හ, අනේ! පියේ! අපි ආවමෝ මිල මුදල් වතුපිටි ගේ දොර හරකබාන ගන්නට නො වෙමු, අපට වුවමනා පියාගේ ජීවිතය ය, අනේ! පියේ! ඇයි; ඔහොම කියනු, තව කල් ජීවත් වන්න පියේ! අනේ! පියේ! යි කියමින් ඇඳ උඩ වැටී, නැවැත එබන්දක් කියන්නට බැරිවන සේ සිටානන්ගේ පපුව මැද ඔලුව හපමින් හඬන්නට වූවා ය. සිටු තෙමේ කලුරිය කෙළේ ය.

ඉක්බිති සොෂක තෙමේ තමන්ගේ පියා මළ බව උදෙන රජුට දන්වා යැවී ය. රජ තෙමේ සිරුරු කිස කරවා, 'සිටානන්ට දූ පුත්හු වෙත් දැ?' යි ඇසී ය. 'දෙවයන් වහන්ස! ඔහුට පුතෙක් සිටි යි, ඔහුය සොෂක, සිටු තෙමේ ඔහු අයත් සියලු දේ ම පුතුට පවරා දී මළේ' යි නිලධරයෝ කීහ. රජ තෙමේ සොෂක ගෙන් වී ය. එ දවස මහාවැසි දවසෙකි. රජමිදුලෙහි තැන තැන දිය රැඳී තුබුනේ ය. සොෂක රජමැදුරට ගියේ ය. ගියේ ඒ ඒ

තැන තුබූ දිය කඩිනිවලින් පැන පැනය. රජ තෙමේ සොෂක දිය කඩිනිවලින් පැන පැන එනු දුටුයේ ය. සොෂක රජුගේ ඉදිරියට ගොස්, වැඳ සිටි කල්හි 'සොෂක නුඹ දැ?' යි ඇසී ය. 'දෙවයන් වහන්ස! 'එසේ ය' යි ඔහු කී ය. 'සොෂක! පියා මළැයි ශොක නො කරව! තාගේ පියා සතුවූ සිවුතනතුර තට දෙමි' යි රජ තෙමේ ඔහු සනසා යන්නැ' යි කියා පිටත් කෙළේ ය. රජ ගෙයින් නික්ම යන සොෂක තෙමේ දිය කඩිනිවල බැස ගියේ ය. ඒ දුටු රජ තෙමේ එ වේලෙහි ම ඔහු ආපසු ගෙන් වී ය. ගෙන්වා 'දරුව! නුඹ රජගෙට එන්නෙහි දිය කඩිනිවලින් පැන පැන ආයෙහි ය, පෙරළා යන්නෙහි එහි බැස හිමින් සිරුවේ යන්නෙහි ය, එසේ ආයෙහි, යන්නෙහි කිමැ' යි ඇසී ය. 'දෙවයන් වහන්ස! ඔබ වහන්සේ වෙත ආ මම ඒ වේලෙහි කොල්ලෙක්මි, කොල්ලෝ බොහෝ සෙයින් සෙල්ලමට කැමැත්තෝ ය, එහෙයින් මෙහි එද්දී මම සෙල්ලම් කරමින් ආමි, දැන් එසේ නො වෙමි, ඔබ වහන්සේ විසින් මම සිවු තනතුරට නියම කරණ ලද්දේ වෙමි, දැන් කොල් ලෙක් නො වෙමි මම, එහෙයින් අන් දවස්හි මෙන් දැන් හැසිරීම ගමන බිමන මට තරම් නො වේ ය' යි සිතා පෙරළා යන ගමනේ දිය කඩිනිවල බැස බැස හිමින් සිරුවේ ගියෙමි' යි සොෂකයන් කී කල්හි, රජ තෙමේ 'මෙතෙමේ ඛෙත්තීසමපන්න පුරුෂයෙක, සිවු තනතුරට හොබනේ ය, එහෙයින් මොහුට සිවු තනතුර දුන් දියයුතු ය' යි සිතා සොෂකගේ පියා අයත්වූ ගම්බිම් ආදී වූ හැම දෙයක් දී තවත් තමන් ගෙන් ද නොයෙක් මාදිලියේ පඬුරු පාක්කුඩම් දෙමින් සිවු තනතුර ද දුන්නේ ය. නළලැ සිවුපට බැන්දේ ය. එකල සොෂක තෙමේ රියකට නැගී නුවර පැදකුණු කෙළේය. රියට නැගී යන සොෂක සිවු බැලු බැලූ දිග සැලෙන්නට වන. එය මගුල් ලකුණක් බව දත් සිවුභාර්‍යා තොමෝ කාලිය හා කතා කරමින් හුන්නී, 'නීගේ පුතුට මෙතෙක් මහත් සමපත් අත් වූවා මා නිසා ය' යි කිවු ය. 'ඇයි, එසේ කියන්නී?' යි කාලිය ඇසූ ය. 'මෙයා, තමන්ගේ මරණලියුම, තමන් ඇඳි රෙද්දේ කොණක බැඳ ගෙණ අපගේ ගෙට ගොඩ වැදුනා, මම රෙදි කොණ බැඳ තුබූ ඒ ලියුම මොහුට නො දැනෙන සේ නිත්දෙහි දී ලිහා බලා ඉරා දමා, 'දෙමහල් ගෙයක් ගොඩ නගා, එහි පදිංචි කරවා ගම් බිම් දී රැක වල් තබා මා භාර්‍යා කොට දෙන්නැ" යි අන් ලියුමක් ලියා එය මොහුට නො දැනෙන සේ රෙදි කොණ බැඳ තබා, මේ යස ඉසුරු ලබන්නට මග සැලැස්සුවා' යි සිවු භාර්‍යා තොමෝ කිවු ය. 'ඔබ ගේ දැහැම ඔපමණෙක්ම නේ ද? සිවු තුමා මොහු මරවන්නට නො කල දෙයක් නැත, සිවුතුමන්ගේ මියගිය පුතු උපන් දා සිට ඔහු ගැණ සිතා මොහු මරවන්නට සිවු තුමා නොයෙක් උපක්‍රම

යෙදුවා, ඒ පිණිස වියදම් කරණ ලද මුදල ද ඉතා විශාල ය' යි කාලිය කී විට, සිටුභාර්‍යාව 'සිටු විසින් කරණ ලද්දේ ඉතා සැහැසි වැඩෙකැ' යි කියමින් හුන්නී නුවර පැදකුණු කොට එන සොෂකයා දැක 'මොහු විසින් මේ සම්පත් ලද්දේ මා නිසා ය' යි සිතා සිනාසුනා ය. සොෂක තෙමේ ඒ දැක 'කුමක් නිසා සිනාසුනා දැ' යි ඇසි ය 'එක් කරුණක් ගැණ සිහිවීමෙනැ' යි ඕ තොමෝ කිවූ ය. 'ඒ කියව' යි සොෂක කී ය. එහෙත් ඕ තොමෝ එය නො ද කිවූ ය. සොෂක තෙමේ ගුගුලේ ය. 'නො කියහි නම්, තී දෙපලු කරමි' යි කඩුව එලියට ඇද්දේ ය. සිටුභාර්‍යාව බියවූවා 'ඔබ තුමන් මේ සම්පත් ලද්දේ මා නිසා ය යි සිතා සිනාසුනෙමි' යි කීවා ය. 'මොනවා කියහි, මාගේ පියා ඔහු සතු දෙපල මට පවරා දුන්නේ ය, තී මෙහි ලා කුමක් කෙළෙහි?' යි සොෂකයා ඇසූ විට, 'ඔබ වහන්සේගේ පියා ඔබ මරවන්නට නො කළ උපක්‍රමයක් නැත, අන්තිමේ දී ඔබ, මරා සඟවන්නට කියා, ලියුමක් ලියා, ඔබ ඇඳි රෙද්දේ කොණක බැඳ, හොඟ ගම් රැක බලන මුදලි තැනට දෙන්නැ යි කියා ඔබ එහි පිටත් කර හැරියේ ය, එහි යද්දී ඔබ නවාතැනට අප ගෙට පැමිණියෙහි ය, රෙදි කොණේ බැඳ තුබූ ඒ ලියුම, මම නිදාගත් ඔබට නො දැනෙන්ට ලිහා ගෙණ කියවා බලා ඉරා දමා, ඔබට මා භාර්‍යා කොට දී හැම දෙයක් ම සලසා දෙන ලෙස අන් ලියුමක් ලියා, රෙදි කොණ බැඳ තැබීමි, ඔබ ඒ ලියුම මුදලිතැනට ගෙණ ගොස් දී මේ හැම සැපතක් ලැබුයෙහි ය' යි සිටුභාර්‍යාව කිවූ ය. සොෂක ඒ නො පිළිගෙණ, කාලිය අතින් 'මැ කියන්න ඇත්ත දැ?' යි ඇසී ය. 'සිටුතුමනි! ඔබ ආර්‍යාව කීවා ඇත්ත ය, එහි එකෙකුත් බොරු නො වේ, සිටුතුමන්ගේ, මිය ගිය පුතු, උපන්දා සිට ඔබ මරන්නට ම ඔහු උත්සාහ කෙළේ ය, එහෙත් ඒ සියල්ල වැරදී ගියේ ය, ඒ පිණිස වියදම් කළ මුදල ද ටික නො වේ, දහස් ගණනෙකි ඒ, මම ම, පියාගේ අණින්, ඔබ ගෙණ ගොස් මැරෙන්නට අමු සොහොන් ඇති කිහිප තැනෙක අන් හැර දමා ආමි, එහෙත් ඒ හැම තැනේදී ම, ඔබ රැකුනෙහි ය, මේ ලෙසින් සත් තැනෙකදී ම මරණින් ගැලවුනෙහි ය, අන්තිමේදී ඔබට පිහිට වූවා ඔබ ආර්‍යා ව ය, ආර්‍යාව කීවා ඇත්ත ය' යි කාලිය සියලු තොරතුරු කිවූ ය. සොෂක ඒ අසා 'මා කළ වැඩේ ඉතා බැරෑරුම් ය, මෙසේ මරණයෙන් මිදුනු මට ප්‍රමත්තජීවිතය නො සුදුසු ය, අප්‍රමත්ත වෙමි' යි සිතා දවස් පතා දහස බැගින් වියදම් කොට අඳ ගොළු බිහිරි දුගී මගී යදියනට දන්වැට තැබී ය. මිත්‍රකෙළෙඹි තෙමේ ඒ කටයුතු යොදා දුන්නේ ය.

සොෂකඋපාසකස්ස කථාව ය.

මෙ දවස දඹදිව **භද්‍රවතී** නම් නුවරෙක් වූයේය. එහි සිටු තෙමේ **භද්‍දවතිය** නම් ය. භද්‍රවතීනුවරු වැසි වෙළෙන්දෝ වෙළඳාම් පිණිස කොසඹෑනුවරට යති. කොසඹෑ නුවරු වැසි වෙළෙන්දෝ වෙළඳාම් පිණිස භද්‍රවතී නුවරට යති. කොසඹෑනුවරු වැසි සොසිත සිටු තෙමේ භද්‍රවති නුවර සිට ආ වෙළඳුන්ගෙන් භද්‍දවතිය සිටුගේ සම්පත් වයස් ඈ තොරතුරු අසා ඔහු හා යහළුබව කැමැති ව ඒ වෙළඳුන් අතම භද්‍දවතිය සිටුහට තෑගි බෝග යැවූයේ ය. භද්‍දවතිය සිටු තෙමේ කොසඹෑනුවරින් ආ වෙළඳුන්ගෙන් කොසඹෑනුවර සිටුගේ සම්පත් වයස් ඈ තොරතුරු අසා ඔහු හා යහළු වන්නට සිතා, ඒ වෙළඳුන්අතැ ම තෑගි බෝග යැවූයේ ය. මෙසේ ඔවුහු, උනුත් නො දැක ම, ඇති කර ගත් යහළුකම් ඇත්තෝ වූහ.

පසු දවසක, භද්‍දවතීයසිටුගෙදරු අභිවාතක නම් රොගයෙක් හට ගැණුනේ ය. එය ඉතා බිහිසුණු ය. ඒ රොගයෙන් මුලින් ම මැරෙන්නෝ ගෙයි ඉන්නා මැස්සෝ ය. අනතුරු ව පිළිවෙළින් මී, කුකුළු, ඌරු, ගෙරිසරක්, දැසි දස් ආදීහු මැරෙති. එහි ඉන්නා සියලු කුඩා සතුන් මැරී ගිය පසු ය ගෙයි වැසි මිනිස්සු මැරෙන්නෝ මේ රොගය හටගත් විට, යම් කෙනෙක් ගෙයි මැද බිත්තිය බිඳ ගෙයින් පිට වී යත් ද, නො මැරී ඉතිරි වන්නෝ ඔවුහු පමණක් ම වෙති. භද්‍දවතිය සිටු තෙමේ මෙ ය දන්නේ ය. එහෙයින් ඔහු, රොගය හට ගෙණ ගෙයි හුන් කුඩා සතුන් මැරී යනු දැක, අඹුව හා දුවත් ගෙණ, ගෙයි බිත්තිය බිඳ මග වියදම් ටිකක් ද ඇති ව ගෙයින් පිට වී, සොසිතසිටු ගැණ සිහි කොට කොසඹෑ නුවරට යන්නට මගට බැස්සේ ය. මගට බැස යත්, අතැ තුබූ ඒ මගවියදම් සියල්ල අවසන් විය. ඔවුහු අවුසුළන්සාපිපාසායෙන් තදින් පෙළෙන්නට වූහ. ඉතා දුකින් කොසඹෑනුවරට පැමිණ, අසල තුබූ පොකුණක දිය නාලා නුවරදෙරකඩැ තුබූ අම්බලමකට ඇතුල් ව හුන්හ.

ඉක්බිති සිටු තෙමේ අඹු ව අමතා, 'සොඳුර! සිටු හමුවන්නට මේ ලෙසට නො යා හැකි ය, දැන් අපගේ තතු, වැදූ මවගේ ද සිත් නො ගණී යි, අර දෙරකඩැ දන්හල් පවත්වන්නේ මා යහළු සිටු තුමා ය, ඔහු එහි දවසකට දහස බැගින් වියදම් කොට, එන හැම යදියනට ම කෑම් බීම් දෙන්නේ ය, ඒ නිසා අප දුව එහි යවා, කෑම් බීම් මොකුත් ගෙන්වා ගෙණ කා බී, මෙහි දවස් කිහිපයක් හිඳ, සිරුරුවෙහෙස සන්සිඳවා ගෙණ සිටු හමු වන්නට යමු' යි කීයේ ය. ඈ 'ඒ යහපතැ'යි කිවු ය. එදා ඔවුහු අම්බලමෙහි ම විසූහ. පසුදා ගෙඩිය ගසා කල් දැන් වූ විට, නන් දෙසින් අවුත් සිටි යාචකයෝ එහි ඇදී ගියහ. ඒ දුටු මහදෙන්නා දුවට කතා කොට, 'දූ! උඹත් අර පෙණෙන දෙරදන්පලට ගොස්, කෑම් බීම් මොකුත් ගෙණ වරෙන්' යි කියා තැටියකුත් දී දුව පිටත් කොට යැවූහ.

උපභොගපරිභොගසම්පත්තියෙන් කියන් අඩුවක් නැති මහා කුලයක උපන් මේ දරිය, විපතට වැටීමෙන් යටව ගිය විළිබිය ඇත්තී, තැවියත් ගෙණ, හිඟන්නන් අතරට වැටී, දෙරදන්පලට ගියා ය. කැම් බීම් බෙදූ කොටස් කොට දෙන්නෝ 'දරිය! උඹට කොටස් කීයක් වුවමනාද?'යි ඇසූහ. ඕ තොමෝ විළිබිය හැර කොටස් තුනක් වුවමනාය,යි කිවු ය. ඔවුහු කොටස් තුනක් දුන්හ. ඈ එය ගෙණ ගොස් මවුපියන් ගේ ඉදිරියෙහි තැබූ ය. තිදෙන ම ඒ කන්නට වාඩි වූහ. ඒ අතර මවු තොමෝ 'ඉඹිය! වැරදීම, විපත, කාටත් සිදු වේ, එය වන්නේ අපට පමණක් නොවේ, ඒ නිසා ඒ ගැණ නොසිතා මේ බත් ටික ඔබ ම කන්න! ඔබ ජීවත් වූ කලය අපට ජීවත් විය හැකි, ඔබ නැසුනොත් අපේ නැසීම ත් ඒ ය, ඒ නිසා මේ බත් ටික කන්නැ'යි අවිවිලි කළා ය. දුවත් අම්මා කී සේ කියා කන්නට ම බල කළා ය. අන්තිමේ දී සිටු තෙමේ ඒ බත් සියල්ල කෑයේ දිරවා ගත නොහී පාන් වත් ම කලුරිය කෙළේ ය. ඔවුහු දෙ දෙන හඬා වැලප සිරුර දැවූහ. පසුදා සිටුදුව අහර ගෙණෙන්නට දන්පලට ගියා, කොටස් දෙකක් ඉල්ලා ගෙණ අවුත් ඒ කොටස් දෙක ම මවට අනුභව කරවූ ය. මවු ද එය කා දිරවා ගත නොහැකි වූවා, එදා ම මිය ගියා ය. සිටුදුව එකලා වූවා, මවුපියන්ගේ මරණයෙන් හා ඔඩ ගින්නෙත් තදින් පෙළුනා හිඟන්නන් හා එක් ව දන් පලට ගොස් එදා එක් කොටසක් ඉල්ලා සිටියා ය. මිත්‍ර කෙළෙඹි තෙමේ ඇය හැඳින 'වසලිය! පිට වෙව! මේ තැනින්, අද ද තී තීගේ බඩෙහි පමණ දන්නෙහි, මෙතෙක් දවස් බත්කොටස් දෙක තුන බැගින් ගත්තා, පල! මෙ තැනින්'යි තරවටු කෙළේ ය. විළිබියැති ඇයට කෙළෙඹියාගේ මේ වචන, ලයෑ ඇණුනු සැත් පහරක් සේ ද, වණයෙහි ඉසින ලද කාරම් දියක් සේ ද විය. එහෙයින් ඕ තොමෝ 'මහතානෙනි! එසේ කියනු කිමැ'යි ඇසූ ය. 'තී පෙරේදා බත් කොටස් තුනක් ගත්තෙහි, ඊයේ කොටස් දෙකක් ගත්තෙහි ය, අද ගත්තෙහි එක් කොටසෙක, එයින් පෙණෙන්නේ බඩෙහි පමණ දන්නා ලද්දේ අද බව,'යි කෙළෙඹියා කී විට 'මහත්මයානෙනි! එසේ නොසිතනු මැනැවි, බත්කොටස් තුනක් ගන්නා ලද්දේ තනි මාගේ ප්‍රයෝජනයට නොවේ, මුල් දවසේ බත් කෑමට අපි තිදෙනෙක් සිටියෙමු, ඊයේ අපි දෙදෙනෙකි, අද මම පමණමි' යි ඕ තොමෝ කිවු ය. එවිට 'ඇයි එසේ වූයේ' යි ඔහු ඇසී ය. ඕ තොමෝ සිදු වූ සියලු තොරතුරු කෙළෙඹියාට නොසඟවා කීවා ය. ඔහු ඒ අසා දුකට පැමිණියේ 'දුව! දුක් නොගන්න, එදුස හදුවනිය සිටුගේ දූ වූවා, අද සිට 'මාගේ දූ ය' සි කියා ලඟට ඇද ගෙණ හිස සිඹ ගෙට කැඳවා ගෙණ ගොස් තම වැඩි මහල් දූ කොට ගත්තේ ය. ඉන් පසු

දිනෙක ඕතොමෝ දන්සැලෙහි කෑ කෝ ගැසීම් අසා, 'පියානෙනි! මෙහි දන් ගන්නට එන්නවුන් නිහඬ වූවන් කොට, දන් දෙනු නො හැකි දැ' යි ඇසූ ය. 'නො හැකි ය' යි කෙළෙඹියා කී විට 'ඇයි, පියානෙනි! කරණු හැකි ය, දන්හල වට කොට වැටක් තරව සිටින සේ බැඳ, එකෙකාට ඇතුල් වීමට හැකි ලෙසට දෙරටු දෙකක් සාදා, එක් දෙරටුවකින් ඇතුළට ගෙණ කෑම් බීම් දී අනික් දෙරටුවෙන් බැහැර කරණු මැනැව, එවිට හැමදෙනා නිහඬ ව කෑ කෝ නොගසා අහර ගෙණ නික්ම යනු ඇතැ' යි කිවු ය. ඔහු 'ඒ යහපතැ' යි ගෙණ එසේ කර වී ය. සාමා නම් වූ ඒ සිටුදුව, එහි වැට කර වූ තැන් සිට සාමාවතී නම් වූ ය. දන්හලෙහි ද කෑ කෝ ගැසීම් මුළු මනින් සිදී ගියේ ය. සොසිතසිටු, තම දන්හලෙහි දන් ගන්නන් ගේ කෑ කෝ ගැසීම් අසා 'මාගේ දන්හලෙහි කෑ කෝ ගැසීම් ය' යි සිතා සතුටු වේ. දෙතුන් දිනක් එ හඬ නො ඇසුනු බැවින් ඔහු එහි ආ කෙළෙඹියාගෙන් 'දැන් දන් නො දේදැ' යි ඇසීය. 'ඇයි, සවාමිනි! එසේ අසනු? දැනුත් දිනපතා ම පෙර සේ දන් දෙනු ලැබේ ය' යි කී විට 'දෙතුන් දිනක් ම දන්හලෙහි කිසිත් හඬෙක් කෑ කෝ ගැසුමෙක් නො ඇසුනේ ය, වෙන ද, දන් දෙන විට ඉව සන්නට නො හැකි තරමට එහි කෑ කෝ ගැසීම් බොහෝ ය, ඇයි, දැන් එසේ නැත්තේ' යි සිටු තෙමේ ඇසී ය. 'මම ඔවුනට නිශ්ශබ්ද ව දන් ගැණුමට පිළිවෙළක් යෙදීමි' යි කෙළඹියා කීයේ ය. 'ඇයි, මුලදී ම ඒ නො කෙළෙහි' යි ඇසූ විට 'එදා ඒ ගැණ දැනුමක් මට නො තිබිනැ' යි කී ය. 'එදා නො වූ දැනුමෙක් අද කොයින් වී දැ?' යි සිටු තෙමේ ඇසී ය 'මාගේ දුවනිය එය මට කියා දෙන ලදැ' යි කී විට 'මා නො දන්නා දුවක් තට කොයින් දැ' යි ඇසී ය. ඉක්බිති කෙළෙඹි තෙමේ භද්දවතියසිටු අභිවාතකරොගය නිසා ගෙය අත්හැර ආ තැන් පටන් ඔවුන් පිළිබඳ සියලු තොරතුරු කියා ඔහුගේ දුව තමන් දූ කොට ගත් බව කියා සිටියේ ය. 'ඇයි, මෙතෙක් දවස් එය මට නො කීයෙහි ද, භද්දවතියසිටු, මාගේ ගොදම යාළුවා, ඇය අයිති මට, ඈ මාගේ දූ, මෙහි කැඳවා ගෙණ එන්නැ' යි සිටු තෙමේ කීයේ ය. කෙළෙඹියා ගෙට ගොස් සාමාවතිය කැඳවා ගෙණ දී යේ ය. එවිට සිටු තෙමේ 'දුව! නුඹ කාගේ දූ දැ' යි ඇසුයේ ය. 'මම භද්දවතියසිටුගේ දූය' යි ඇය කී කල්හි සිටු තෙමේ 'දුව! නුඹ මෙ තැන් සිට මාගේ දූ, අමුත්තක් නො සිතා සිතට නො ගෙණ මෙහි ඉන්න! උඹගේ සියලු සැපදුක් සොයන්නේ මම, වුවමනා හැම දෙයක් මට කියන්න, හැම දෙයක් මම කරමි' යි ඇය ලඟට ගෙණ හිස සිඹ සනසා ඇයට මෙහෙවර කරණු පිණිස ගැණුන් පත් සියයක් පාවා දී තම වැඩි මහල් දූ කොට ගත්තේ ය.

දිනෙක එ නුවර නැකත්කෙළියක් විය. අන් දවස්හි ගේ දෙරින් කො තැනත් නොා යන කුලකාන්තාවෝ ඒ නැකත්දින යෙහි සියපිරිවරත් කැටුව පාඟමනින් ම ගංතොටුපොලවලට ගොස් සනානය කරති. එදු සාමාවතී තොමෝ ද සිය මෙහෙවර කරණ ගැණුන් හා එක් ව නාන්නට ගංතොටට ගියා ය. ගියා ද රජගේ අසල මගිනි. උදෙන රජ තෙමේ උඩුමහලැ සී මැදුරු කවුළුව ලඟ සිට නුවර දෙස බලා සිටියේ, ඇලා දුක 'මේ නිළියෝ කවුරුන් වෙත ඉන්නෝ දැ' සි ඇමතියන්ගෙන් ඇසී ය. 'දෙව යන් වහන්ස! මැලා නිළියෝ නොා වෙති, කොසිත සිටානන්ගේ දූ වූ සාමාවතිය හා ඇයගේ මෙහෙවර කරණ පන්සියයක් ගැණුය' සි උන් කී විට, සාමාවතිය දැකීමෙන් හටගත් සෙනහය ඇති රජ තෙමේ,

කොසඹැනුවර
උදෙනරජමැදුරේ දී ය.

සිටාන!

ඔබගේ දූ මාගේ අගබිසෝ තනතුරෙහි තැබීමට මම අදහස් කර ගත්තා. එ බැවින් අද හෙට ම ඇය මෙහි එවිය යුතු බව මෙයින් නිවෙදනය කරණු ලැබේ.

ඒ වගත් මෙසේ දන්වන්නේ,
උදෙනරජතුමා ය.

සි මෙසේ ලියා කොසිත සිටානන් වෙත යැවී ය. ලියුම කඩා බලූ කොසිත සිටු තෙමේ,

කොසඹැනුවර
කොසිතසිටුගෙදර දී ය.

ඉතා යටත් ව ලියමි,
දෙවයන් වහන්ස!

දෙවයන් වහන්සේගේ ඉල්ලීම ඉටු කරන්නට නොා හැකි බව මා දන්වනු ලබන්නේ ඉතා යටත්ව ය.

මෙයට, ඔබගේ කිකරු, මෙහෙකරු,
කොසිත'

සි ලියා එයට පිළිතුරු යැවී ය. රජ තෙමේ ලියුම බලා

කොසඹැනුවර
උදෙනරජමැදුරේ දී ය.

සිටාන!

මාගේ ඉල්ලීම ඉටු නොකිරීම තට හිත පිණිස නොවේ. එහෙයින් එය ඉටු කළ යුතුම ය. සාමාවතිය කල් නොයවාම මෙහි එවිය යුතු බව මෙයින් ද දන්වනු ලැබේ.

ඒ වගත් මෙසේ දන්වන්නේ,
උදෙන රජතුමා ය.

යි මේ ලියුම සොසිත සිටානන් වෙත යැවී ය. සොසිත සිටු තෙමේ මෙය බලා එයට පිළිතුරු විසින් මෙසේ ලියා යැවී ය.

කොසඹැනුවර
සොසිතසිටුගෙදර දී ය

ඉතා යටත්ව ලියමි.
දෙවයන් වහන්ස!

දෙවයන් වහන්සේ දෙවන වර එවා වදාළ ලියුමට ද පිළිතුරු වශයෙන් දැන්විය යුත්තේ මා දූ නොවිය හැකි බවම ය. තවද අපි ගැහැවියෝ වම්හ. රජ දරුවෝ අපගේ දූරියන්ට වෙසෙ දී කතා කරති. එයට අපි බිය ඇත්තෝ වෙමු. මෙයට කමා කරණ සේක්වා යි.

මෙයට,
ඔබගේ කීකරු, මෙහෙකරු,
සොසිත.

මෙයින් කොපයට පත් රජ තෙමේ සිටු ගෙට ගොස් සිටානන් හා සිටු භාර්‍යාව අතින් ඇද ගෙණ ගෙයින් පන්නා හැර ගෙයි දොර ජනෙල් වසා සිල් තබා ආයේ ය. දිය නාලා පෙරළා පැමිණි සාමාවති තොමෝ ගෙයින් පිටත සිටි පියා දැක 'පියානෙනි! මේ කිමැ' යි ඇසූ ය. 'දුව! නුඹ රජ මැදුරට එවන්නැ' යි කියා රජ තෙමේ මට ලියුම් දෙකක් එවී ය, ඒ දෙකට ම ඒ නොකළැකි යි මම ලියා යැවීමි, එයින් ඇවිසුනු රජ තෙමේ මෙහි අවුත් අප ගෙයින් එලියට ඇද දමා ගේ සිල් තබා හිඳේ ය' යි සිටානන් කී විට 'ඔබ තුමන් දන්වා යැවූ සැටි හොඳ මදි ය, තරමක් එය බැරැරුම් ය, දන්වා යැවිය යුතුව තුබුනේ, පිරිවර ගැණුත් සමග ගන්නහු නම් එවිය හැකි බව ය' යි ඕතොමෝ කිවු ය. 'දුව! නුඹ

කැමැති නම් මම එසේ කරමි' යි කියා සිටු තෙමේ සාමාවතී කි
ලෙසින් රජුට දන්වා යැවී ය. රජ තෙමේ සාමාවතිය පිරිවර
ගැණුන් හා ගෙන්වා අභිෂේකත කොට සිය අග මෙහෙසිය කෙළේය.
සෙසු ගැණු සාමාවතියට ම පිරිවර කොට දුන්නේ ය.

මේ සාමාවතියගේ උත්පත්තිකථාව යි.

උදෙන රජුට 'වාසුලදත්තා' යි තවත් අන් බිසවක් වූ ය. ඕ
තොමෝ චණ්ඩපජ්ජොත රජුගේ දූ ය. චණ්ඩපජ්ජොත තෙමේ
රජය කළේ ද, උදෙන තුවරෙහි ම ය. ඔහු දිනක් උයන් ගොස්
එන්නේ, තමන්ගේ සමපත් සිහි කොට, 'මෙබඳු මහත් සැපතක්
අන් කවරකුට වේ දැ'යි කියේ ය. එහි සිටි මිනිසුන් 'ඔබ වහන්-
සේගේ මේ සැපත, උදෙන රජුගේ සැපතට මෙන ලෙසකිනුත්
ලා විය නොහැකි ය, උදෙන රජුගේ සැපත ම ඉතා මහත් ය'යි
කී විට 'එසේ නම් ඔහු අල්ලා ගණිමු' යි කී ය. 'දෙවයන්
වහන්ස! ඔහු අල්ලා ගණු නො කළැකි ය, ඔහු හස්තික්‍රාන්ත නම්
පුදුම ශිල්පයක් දනී, හස්තික්‍රාන්ත මන්ත්‍රය කියා, හස්තික්‍රාන්ත
විණාව වයා ඔහු සමහර විටෙක ඇතුන් පන්නා හරි යි, සමහර
විටෙක ඇතුන් ගෙන්වා ගණී යි, ඔහු තරම් ඇත් වාහන ඇත්-
තෙක් ඒ අතින් බලවතෙක් මේ රටේ කොතැන ත් නැත,
එහෙයින් ඔහු අල්ලා ගණු පහසු නැතැ'යි රාජ පුරුෂයෝ කීහ
'ඒ කෙසේ වුවත් ඔහු අල්ලා ගත යුතු ම ය'යි රජු කී කල්හි
ඔවුහු 'දෙවයන් වහන්ස! ඔබ වහන්සේගේ අදහස ඕනෑකම ඔහු
අල්ලා ගන්නට නම්, ලී දඬුවලින් ඇතකු සාදවා යන්ත්‍ර ද යොදා
උදෙන රජු ඉදිරියට ඒ දඬුමුවා ඇතු යවනු මැනැවි, ඇත් වාහන
යක් හෝ අස් වාහනයක් නොතරම් ඇත සිටිය ද, ඔහු ගොස්
අල්ලා ගණු සිරිත ය, අප යවන මේ දඬුමුවා ඇතු, නියම ඇතෙකැ
යි සිතා ඔහු මේ දඬුමුවා ඇතු අල්ලන්නට එන්නේ ය, ඒ ආවිට
අපට උදෙන රජු පණ පිටින් අල්ලා ගත හැකි ය'යි කීහ.
රජ තෙමේ 'ඒ යහපතැ'යි ඔවුන් කී ලෙසට දඬුමුවා ඇතකු
සාදවා යන්ත්‍ර යොදා පිටත රෙදි ඔතා සිතුවම් කොට උදෙනරජු
ගේ තුවර අසල එක්තරා විල්ඉවුරෙක තැබ්බ විය. දඬුඇතුගේ
බඩැතුල සැටක් පුරුෂයෝ උදෙනරජුගේ ඊම බලා හුන්හ. තැනෑ
තැනෑ ඇන්ලඹ ද බැහුහ.

වනයේ හැසිරෙන මිනිහෙක් ඒ ඇතු දැක කරුණු නො විමසා
'අපගේ රජුට සුදුසු ඇතෙකැ'යි සිතට ගෙන වහා ගොස් 'දෙව-
යන් වහන්ස! සියලු සිරුර සුදු පැහැති කොලෙස්කුල වැනි මහ

ඇත්රජෙක් මට මුණ ගැසුනේ ය, මෙයට කලින් මා එබඳු ඇතකු කවදාවත් දැක නැත, ඌ සුදුසු ඔබ වහන්සේට ම ය' යි දන්වා සිටියේ ය. උදෙනරජ ඌ අල්ලන්නට ඒ මිනිහා හා පිරිසත් ගෙණ ඇතකුට ම නැඟී නික්ම ගියේ ය. උදෙන රජුගේ පැමිණීම දත් චරපුරුෂයෝ වහා දුවගොස් එබව චණ්ඩපජ්ජොත රජුට දැන් වූහ. චණ්ඩපජ්ජොත රජ වහා එහි ගොස් සිය පිරිස මග දෙපස රඳවා බලා සිටියේ ය. උදෙනරජ මේ කිසිත් නො දැන ඇතු ලුහු බැන්දේ ය. මන්ත්‍ර කියා වීණාවාදනය කරණ විටත් ඇත් තෙමේ ඒ හඬට නතු නො වී දුවන්නට වන. උදෙන අසකු පිට නැඟී ඇතු ලුහුබැන්දේ ය. ඇතු ලුහුබැඳ යන්නා වූ රජ දුටු බලසෙනඟ පසු බැස්සේ ය. රජ තෙමේ තනි විය. මගදෙපස රැක සිටියා වූ චණ්ඩපජ්ජොතයන්ගේ පුරුෂයෝ උදෙන රජු අල්ලා චණ්ඩ පජ්ජොතරජුට පාවා දුන්හ. ඉක්බිති උදෙන රජුගේ පුරුෂයෝ තමන්ගේ රජු සතුරුරජුගේ යටතට පත් වූ බව දැන පිටත කඳවුරු බැඳ බලා හුන්හ. චණ්ඩපජ්ජොත තෙමේ උදෙන රජු පණ පිටින් අල්ලා ගෙණ ගොස් සොරුන් ලන ගුහාවක බහා රැකවල් තබා තෙදිනක් ජයපානය කෙළේ ය. මේ අතර දිනෙක උදෙන තෙමේ 'තොපගේ රජු කොහි දැ'යි මුරකරුවන් අතින් විචාළේ ය. ඔවුහු 'සතුරු රජෙක් අල්ලා ගන්නා ලදැ' යි කියා අප රජ තෙමේ ජයපානය කෙරේය'යි කීහ. උදෙන ඒ අසා 'මේ මොන වැඩෙක් ද, මෙය ගැණියකගේ වැඩක් වැනි වැඩක්, සතුරු රජකු අල්ලා ගත් විට ඔහු හැරිය හෝ නැසිය යුතු නො වේ ද, අල්ලා යටතට ගත්තහු දුකෙහි ලා කරණ ජයපානය කුමක් ද, එය නින්දිත'යි කී ය. ඔවුන් ගොස් මේ උදෙනයන් කියූ කතාව චණ්ඩපජ්ජොත රජුට දැන් වූ කල්හි ඔහු උදෙන කරා ගොස් උන් හා මෙසේ කතාවට බැස්සේ ය.

චණ්ඩපජ්ජොත:- තමුසේ මෙබඳු කතාවක් කළහු සැබෑ ද?

උදෙන :- ඔව්, මම එසේ කීමි.

චණ්ඩපජ්ජොත:- ඔබ ලඟ මන්ත්‍රයක් තිබේය යි මා අසා තිබේ. එය ඇත්ත ද? එසේ නම්, එය මට දෙන්න, දෙන්නහු නම්, ඔබ නිදහස් කොට හරිමි.

උදෙන :- දිය හැකි යි. ගන්නා විට ගත යුතු ලෙසට ගත යුතු ය. ඒ ගන්නා වේලේ ඔබ මට වඳින්නහු ද? වඳින්නහු නම් දිය හැකි යි.

චණ්ඩපජ්ජොත:- මම ඔබට නොවදිමි. මට ඒ කරුණු නොහැකි ය.

උදෙන .- මම ඔබට මන්ත්‍රය නොදෙමි.

චණ්ඩපජ්ජොත:- මම තට රජ අණ කරමි.

උදෙන :- කරන්න, ඔබ මාගේ මේ සිරුරට අධිපති වහු, සිතට අධිපති නොවහු.

චණ්ඩපජ්ජොත රජ තෙමේ උදෙන රජුගේ මේ ශූරගජීනාව නිහීය කථාව අසා 'මෙය කෙසේ ගණිම් ද' යි සිතන්නේ 'අතිකකු ලවා මෙය ගැන්වීම නොසුදුසු ය, මා දුව ලවා, ගන්වා ඇගෙන් මම උගණිමි'යි සිනී ය. එසේ සිතා 'ඔබට වඳින කාහට වුවත් මෙය උගත් වන්නහු දැ'යි ඇසුයේ ය. 'ඔව්, කාටවුව ත් මට කම් නැත, මට වඳින එකකුට උගන්වමි'යි උදෙන කීයේ ය. 'අප රජ මැදුරෙහි එක් කුදියක් ඇත, මෙහි තිරයක් ඇද ඇය තිරය ඇතුළෙහි හිදුවම්, ඔබ තිරයෙන් පිටතැ හිද ඇයට ඇසෙන්නට මන්ත්‍රය කියවු, එවිට ඇය මන්ත්‍රය ඉගෙණ ගණු ඇතැ' යි කීවිට 'කුදියක් හෝ වේවා, පිළියක් හෝ වේවා, මට ඉන් කම් නැත, මා වඳින්නියකට මන්ත්‍රය උගන්වමි' යි උදෙන කී ය. ඉක්බිති රජ තෙමේ රජ මැදුරට වහා ගොස්, වාසුලදත්තාව ලඟට ගෙන්වා 'දුව! ශ්වේතකුෂ්ඨය ඇගේ පැතිර ගත් එක් මිනිහෙක් වවිනා මන්ත්‍රයක් දනී යි, එය අනෙකකුට ඉගෙන ගත නොහැකි ය, නුඹ අර තිරයතුළ හිද ගණින්, ඌ තිරයෙන් පිටතැ සිට නුඹට ඇසෙන්නට මන්ත්‍රය කියනු ඇත, එවිට නුඹ එය ඉගෙණ ගණින්, ඉන් පසු නුඹගෙන් මම ඉගෙණ ගන්නෙමි' යි කීයේ ය. රජ තෙමේ උනුන් අනුරාගයෙන් බැඳි සත්‍යය කරණු ඇත යන බියෙන් දුව කුදියක කොට ත්, උදෙන රජු කුෂ්ඨ ඇත්තකු කොට ත් මෙසේ උන්ට කීයේ ය.

උදෙන රජ තෙමේ තිරයෙන් පිටතැ සිට තිරය තුළ හුන් වාසුලදත්තාවට ඇසෙන්නට මන්ත්‍රය කිහිප වරක් කීයේ ය. එහෙත් වාසුලදත්තාවට එය හරිහැටි නොකියැ වේන්නේ ය. එවිට 'බොල! කුදිය! තිගේ තොල් ඉතා ඝන ය, කොපුල් ද එසේ ය, මේ මෙසේ කියාවා' යි උදෙන තෙමේ කී ය. ඉන් කිපුනු වාසුලදත්තාව 'බොල! කුෂ්ඨී පුරුෂය! තෝ කුමක් කියහි, මා වැන්නෝ කුදියෝ, තෝ?' යි ඇසූ ය. එවිට උදෙන, කඩතුරු කොණ ඔසොවා බලා, 'නී කවර තැනැත්තියක් ද' යි ඇසී ය. 'මම චණ්ඩපජ්ජොත රජුගේ දූ වාසුලදත්තාවය' යි කී විට 'නිගේ පියා නී කුදියකා කොට කීම්' යි කීයේ ය. වාසුලදත්තාව ඒ අස

මාගේ පියා මට කියූ යේ තා කුඹ ඇත්තකු කොට ය' යි 'කිවු ය. ඉන් පසු ඒ දෙදෙන උනුන් කෙරෙහි බැඳුනු ආලය ඇත්තෝ එ තැනදී ම අඹු සැමියන් සේ කාම සඤ්චය කළෝ ය. එ තැන් සිට මන්ත්‍ර උගැන්මෙක් නො විය. 'මන්ත්‍ර උගණිවු දැ'යි ඇසූ හැම වරක ම වාසුලදත්තාව 'මන්ත්‍ර උගණිමි' යි කියයි.

මේ අතර දිනෙක උදෙන රජ තෙමේ ඇයට 'සොඳුර! සවාමි පුත්‍රයකු ඔයින් කළ හැකි වැඩ, කළ යුතු වැඩ මවුපියනට, සහෝදරයනට, සහෝදරියනට කරන්නට පිළිවන් කමෙක් නැත, මා කියනු අසන්න! මා මෙයින් නිදහස් කරන්නෙහි නම්, තී මාගේ අගබිසොව කරන්නෙමි, සත්‍රින් පන්සියයක් පිරිවර කොට දෙන් නෙමි' යි කීයේ ය. 'හොඳයි, තමුන්නාන්සේ එසේ කරන්නහු නම් මම නුඹ වහන්සේ මෙයින් මුදා හරිමි' යි ඇ කී කල්හි 'සොඳුර! කුමක් කියහි, මාගේ කතාවෙහි කියින් වෙනසෙක් නො වේ, තී ය මාගේ පණ, ඔබ අග බිසොව කරන්නෙමි, හැම සැපත් දෙන්නෙමි' යි උදෙන කී ය. වාසුලදත්තාව පිය රජු වෙත ගොස් වැඳ සිටියා ය. එහිදී 'දුව! සිප් උගෙණ නිමවන ලද දැ' යි ඇසූ විට, 'පියාන! මන්ත්‍රයට උපචාර පිණිස, මහ රෑ තරුඵලි යෙන් බෙහෙතක් සොයා ගත යුතුව තිබේ, එය වේලාව බලා හිඳ සොයා ගත නො හැකි ය, වේලාවෙහි වේවා, අවේලාවෙහි වේවා, වේලාව නො බලා ඒ පිණිස කෙතැනක මුත් යා යුතු ය, එයට ඉඩ පහසු ඇති විය යුතු ය, එහෙයින් දෙරගුලු නො දැමූ දෙර කඩක් හා වේගයෙන් යා හැකි වාහනයකුත් අපට වුවමනා ය' යි ඕ තොමෝ කිවූ ය. රජ තෙමේ ද එය සැබෑවෙකැ යි පිළි ගෙණ, එක් දෙරක දෙරගුලු නො දමන ලෙස නියම කෙළේ ය. එක් දවසට පණස් යොදුන් දුර යන හඳවතී නම් ඇතින්න ය, සැට යොදුන් දුර යන කාක නම් අසය, සියක් යොදුන් දුර යන වෙලකණ්ඨි-මුඛඡාකෙසී නම් දෙ අසුන්ය, එක් සිය විසි යොදුන් දුර යන නාලාගිරි ඇත් ය යන මේ වාහන පස ඒ රජුට අයත් වාහන විය. දුවට හඳවතී නම් වාහනය දුන්නේ ය.

මේ රජ තෙමේ, අබුඩොන්පාදකාලයෙක එක් බලවතකුට උවැටැන් කරන්නෙක් වූයේ ය. දවසෙක, මේ බලවත් තෙමේ, නුවරින් පිටතට ගොස්, දිය නා එන්නේ ය. එ දවස එක්පසේ බුදුවරයෙක් නුවර පිඬු සිඟා හියේ ද, නුවර වැස්සන් මරු වැහී සිටී බැවින් උන්ගෙන් එක් බත් උළකුදු නො ලැබ, සිස් පාත්‍රය ගෙණ, නුවර දෙරට වැඩියේ ය. එවිට, මාර තෙමේ අන් වෙසක් ගෙණ, උන් වහන්සේට ලං ව 'සවාමීනි! මොකුත් ලද දැ' යි ඇසී ය. 'කිමෙක් ද නෝ ලබන ලෙසක් කෙළෙහි දැ' යි උන්වහන්සේ

ඇසූහ. 'සවාමීනි! එසේ නම්, ආපසු එහි වඩිනු මැනැවි, ලබන ලෙසක් කරමි' යි මාරයා කී විට, 'මම නැවැත එහි නොයමි' යි කීහ. මරුගේ මේ බස් ගෙණ, උත්වහත්සේ පෙරළා එහි වැඩි සේක් නම්, මාර තෙමේ, නුවර වැස්සන්ගේ සිරුරෙහි වැහි, අත්ලෙහි අත්ල ගසා සිනා සෙන්නේ ය. නුවරින් පිටතැ ගොස්, දිය නාලා එන අධිපති තෙමේ, බත් උළකුත් නොලැබ, සිස් පය ගෙණ මගැ සිටි පසේ බුදුන් දැක වැඳ 'සවාමීනි! මොනවා හෝ ටික දෙයක්වත් නොලද්දේ දූ' යි ඇසූයේ ය. 'නුවරැ හැසිර නික් මුණෙමි'' යි උත්වහන්සේ ඔහුට කීහ. 'මා විසින් ඇසූ කරුණට කිසි ත් නොවදුරා අනෙකක් ම වදුරන්නාහ, මොකා ද මේ, කිසි වක් නොලද්දේ දූ' යි සිතා, පාත්‍රයට එබී බලා කිසිත් නැහි බව දැක, ගෙයි ද බත් ඇති නැති බව නොදැන පාත්‍රය ගන්නට අපොහොසත් වූ ඔහු 'සවාමීනි! මදක් වැඩ සිටිනු මැනැවැ' යි වේගයෙන් ගෙට ගියේ, 'බත් පිස නිමියේ ද' යි අසා 'නිමියේ ය' යි කී කල්හි, තම උපස්ථායකයාට අඬගා, තා තරම් වේග යෙන් යා හැක්කෙක් නැත, එහෙයින් වහා ගොස්, පසේ බුදු රජුන්ගේ පාත්‍රය ගෙණ එව' යි කියේ ය. ඔහු ද වහා ගොස්, පාත්‍රය ගෙණ ආයේ ය. අධිපති තෙමේ, තමන්ට පිළියෙළ කොට තුබූ භොජනයෙන් පාත්‍රය පුරවා, 'වහා ගොස්, මෙය, බුදුරජුන්ට පිළිගන්වා ලව, මම තට මෙයින් පින් දෙමි' යි භොජන පාත්‍රය උපස්ථායකයා අතට දුන්නේ ය. ඔහු වහා ගොස්, උත්වහන්සේට එය පිළිගන්වා, පසඟ පිහිටුවා වැඳ, 'සවාමීනි! වළඳන වේලාව ඉතා ලංවූවා ය, එ හෙයින් මම ඉතාවේගයෙන් ගොස්, ඉතාවේග යෙන් ආයෙමි, ඉර අවරට යන්නට පෙර දත් වළඳනු මැනැවි, සවාමීනි! මේ පිණෙන් යොදුන් පණසක්, සැටක්, සියයක්, එක් සිය විස්සක් යන ඇලෙයින්, වේගයෙන් යන්නට හැකි වාහන, සසර දී මට ලැබේවා, එහා මෙහා ආ ගිය මාගේ සිරුර අව්වෙන් දැවී නියේ ය, එහෙයින් උපනුපන් හැම තැන දී මාගේ අණ, හිරු ගේ තෙද වැනි වේවා, මේ පිණ්ඩපාත දානයේ පින් මාගේ සවාමියා විසින් මට ත් පමුණුවන ලද්දේ ය, එ හෙයින් නුඹවහන්සේ දත් ධර්මයට, මම ත් කොටස් කරුවෙක් වෙම්වා' යි කියා සිටියේ ය. එවිට බුදුරජානන් වහන්සේ-

"ඉස්නා ලද පැනු - හැම දේ සමිජී වේවා,
පණුරැසි සදෙවි සියලූ - සකප්හු සපුරෙත්වා,
ඉස්නා ලද පැනු - හැම වහා ඉජී වේවා,
මිණිඳෝරසෙවි සියලූ - සකප්හු සඳිරෙත්වා"

යි අනුමෙවෙනි බණ වදාළ සේක. මේ වනාහි පසේබුදු රජුන්ගේ

අනුමොදනාගාථා ය. මේ චණ්ඩපජ්ජොත රජුගේ පෙර සිරිත ය. පෙර කියූ කම්බෙලෙන් ඔහුට මේ වාහන පස ලැබුනේ ය. මේ අතර දවසෙක චණ්ඩපජ්ජොත තෙමේ, උයන් කෙළියට ගියේ ය. මෙ දින උදෙන තෙමේ, 'අද පලා යා යුතු ය' යි එහි තුබූ ඉතා මහත් වූ ලොකු සම්පසුම්බි, හැමෙකක් කහ වණුයෙන් හා රන් රුවනින් පුරවා ඒ හැම හඳුවතී නම් ඇතිනිය පිට නංවා, වාසුලදත්තාව ත් ගෙණ එ තැනින් පැන ගියේ ය. ඇතුල් පුර රක්නෝ, එසේ යන්නවුන් දැක, වහා ගොස් රජුට දැන් වූහ. රජ තෙමේ, 'වහා යවු, අල්ලා ගෙණ එවු' යි මහත් සේනාවක් යැවී ය. උදෙන තෙමේ, සෙනාව තමන් පසු පස ලුහු බැඳ එන බව දැක, කඩිමුඩියේ කහවණු මල්ලක් ලිහා බිම හෙලූයේ ය. ලුහුබැඳ ආ මිනිස්සු, කහවණු කෙරෙහි වූ ලොභයෙන් එ තැන නතර ව කහවණු ඇහිඳ, නැවැත දුවන්නට වූහ. එවිට, උදෙන, රන්මිල පුරවා තුබූ මල්ලක් ලිහා බිම හෙලී ය. මිනිස්සු, එ තැන නතර ව, රන්මිල එකතු කරන්නට වූහ. ඒ අතර උදෙන තෙමේ, දුව ගොස්, නුවරින් පිටතැ පිහිටුවා තුබූ තම කඳවුරට වැදුනේ ය. කඳවුරට වැදුනු උදෙනරජු දුටු ඔහුගේ හට සේනාවෝ ඔහු වහා නුවරට ඇතුල් කළහ. එහි දී උදෙන රජ තෙමේ, වාසුලදත්තාව අගබිසෝ තනතුරෙහි තැබී ය.

මේ වාසුලදත්තාවගේ උත්පත්තිය යි.

උදෙනරජුට 'මාගන්දියා' නම් වූ තවත් අග බිසොවක් වූ ය. ඕ කුරුරට මාගන්දිය බ්‍රාහ්මණයාගේ දූ ය. මවු තොමෝ ත්, මාගන්දියා නම් ය. මෑගේ සුලු පියා ත්, මාගන්දිය නම් වූයේ ය. දැකුම්කලු රූ ඇති මාගන්දියා තොමෝ දෙවඟනක සේ වූ ය. මාගන්දියා, දීග දිය යුතු වයසට පැමිණි කල්හි පියබමුණු තෙමේ දුවට කැපෙන තරුණයකු සෙවීමෙහි යෙදුනේ ය. එහෙත්, ඔහු, දුවගේ වයසට, රුවට මහතට උසට කැපෙන තරුණයකු සොයා ගැණීමෙහි අපොහොසත් විය. නොයෙක් ගම් රටවල පිරිවර ඇති ඉසුරුමත් වූ මහත් කුලවලින් පැමිණ, ඉල්ලන ලද්දී ද, 'තෙපි මාගේ දුවට, නො ද කැපෙන්නහු' යි කියමින් ආ ආවුන් පිටත් කර හරියි. මෙ දවස බුදුරජානන් වහන්සේ මහකුළුණු සමවතින් නැගී ලොව බලා වදාළ සේක. එවිට, අනාගාමීඵලය ලැබීමෙහි තෙද ගැණී සිටි මාගන්දිය දෙමාල්ලෝ, උන්වහන්සේට පෙණී ගියහ. ඉක්බිති උන්වහන්සේ පා සිවුරු ගෙණ, කාහටත් නො දන්වා ගමෙන් පිටතැ ඔවුන් ගිනි පුදන තැනට වැඩි සේක. බ්‍රාහ්මණ තෙමේ උන්වහන්සේගේ රූප ශ්‍රීයෙන් අගතැන්

පත් වූ ශ්‍රී දෙහය බලා විසමයට පැමිණ 'මේ වැනී පුරුෂයෝ ත් මෙලොව සිටිත් ද, අය්යෝ! මොහු වැන්නෙක් කොං තැනිත් ලැබිය හැකි ද, දුවගේ පිණ, මූ මාගේ දුවට කැපෙන පිරිමියා, මාගේ දුව මූට දිය යුතු ය' යි සිතට ගෙණ, බුදු රජුන්ගේ ඉදිරියට ගොස්, 'ශ්‍රමණය! අසන්න! ඔය ගිහමන අත් හරින්න! මට යස දුවක් සිටියි, ඈ රූපයෙන් හා හැඩහුරුකම්න් දෙව ඉසක සේ ය, ඈ සුදුසු තමුන්නාන්සේට ම ය, තමුන්නාන්සේගේ ඔය රූසටහන් ඇගේ රූසටහන් සේ ය, තමුන්නාන්සේ ඇට ත් ඈ තමුන්නාන්සේට ත් හරියට ම හරිය, නොං දුකිය හැකි අඹු සැමි යුවලෙක් ඇත් තමුන්නාන්සේ ත්, එ හෙයින් මම ඈ තමුන්නාන්සේට දෙන්නම්, දෙන්නාට දිවි තිබෙනතුරු දිවි ගෙණ යෑමට සැහෙන පමණට ත් වඩා, දයාද ත් දෙන්නම්, පොඩ්ඩක් මෙහි නවතින්න! මා ගෙට ගොස් එනතුරු, කොං තැනක ත් නොං ගොස් මෙහි ම සිටින්නැ' යි කියා වහා ගෙට ගියේ ය. බුදුරජානන් වහන්සේ කිසිත් නොං බැණ නිහඬව ම වැඩ සිටි සේක. බ්‍රාහමණ තෙමේ, ගෙට දුව ගොස්, 'හා! හරි! මාගේ දුවට කැපෙන තරුණයකු සොයා ගතිමි, අඹු සැමි යුවල හරියට ම හරි, දුවට කැපෙන හොඳ පිරිමියා, ඌට මෑ ත්, මෑට ඌ ත් හොඳට ම හරි, සොඳුර! කෙල්ල සරසන්නැ' යි දූ සරසවා ගෙණ අඹුව ත් සමග බුදු රජුන් හමුවන්නට ගියේ ය. මුළු රට ම දෙදරා ගියේ ය. රට වැස්සෝ 'මේ කිමැ' යි ගල් ගැසී ගියහ. ඔවුහු 'බමුණා මෙතෙක්, තම දුවට කැපෙන තරුණයෙක් නැතැ' යි දුව කිසිවකුට ත් පාවා නොං දී සිට, අද දුවට කැපෙන පිරිමියෙක් ලද්ද' යි දූව සරසා ගෙණ දූ පාවා දෙන්නට යයි, දූ දෙන මේ තරුණයා අප විසින් ද බැලිය යුත්තෙකැ' යි බමුණා සමග ම ගෙවලින් පිටත් ව ගියහ. බුදුරජානන් වහන්සේ බමුණා කී තැන නොං සිට එහි සිරිපාලකුණ තබා, බමුණා එන්නට පෙරුතු ව, එ තැනින් බැහැරට ගොස් අන් තැනෙක වැඩ සිටි සේක

බුදුවරුන්ගේ සිරිපාලකුණ වනාහි, තමන් වහන්සේ ඉටා තැබූ තැනැ ම පෙණෙන්නේ ය. නැත, නොං පෙණෙන්නේ ය. යමකු සඳහා එය තබන ලද්දේ නම්, ඒ ඔවුනට පෙණෙන්නේ ය. එය, නොං පෙණෙනු පිණිස කිසිත් කරණු නොං හැකි ය. සදෙවි ලොවැ කිසි කෙනෙක් එය මඬින්නට, පෙරළන්නට ගලවන්නට, යටපත් කරන්නට, වසන්නට පොහොසත් නොං වෙති.

බැමිණි තොමෝ 'කෝ ඔය කියන හැඩ ඇති තරුණයා?' යි ඇසූ ය. 'මා ගෙට යද්දී, ඔහු මෙ තැනැ සිටියා, පොඩ්ඩක් මා

දූ ගෙණ එන තුරු කොතැනකත් නො ගොස් මේ තැනැ සිටින්නැ යි මම ඔහුට කීමි, ටිකක් සොයා බලමු' යි කියා බ්‍රාහ්මණ තෙමේ, බුදුරජුන් වැඩි තැන් බලනුයේ, පා සටහන් දැක, 'මේ ඒ තරුණයාගේ පා සටහනැ' යි බැමිණියට අඬගා පෙන් වී ය. ඕ, ත්‍රිවේදයෙහි දක්ෂ තැනැත්තියක බැවින්, දෙහ ලක්ෂණ විද්‍යුව අනු ව, ඒ පාසටහන විමසා, 'මේ පාසටහන පස්කම් සැප විඳින තරුණයකුගේ නම් නො වේ ය' යි

"අසිරා රා ඇතී—මිනිස්පා මැද උස් වේ,
අසිරාදෙසින් මැඩුනහු—පියග එබුනේ නො ද සැක,
අසිරා මොහැනි දන—පා මුලට ඇදුනේ වේ,
මේ පා කෙලෙස් සෙවණැලි—පා කළ එකකුගේ වේ"

යි එහිලා ශාස්ත්‍රයුක්තිය කිවු ය. එවිට බමුණු තෙමේ, 'හා! හරි! ඔයාගේ කතාව, ඔයා, දියබදුනෙහි කිඹුලන්, ගෙමැද සොරුන් දකින්නියක සේ ය, කට මැත නො දෙඩා නිහඬ වන්නැ' යි කී ය. එහෙත්, බැමිණිය නැවැතත් 'ඔයා කෙසේ කියූ ද, මේ පා සටහන පස්කම් සෙවනය කරන්නකුගේ නම් නො වේ ය' යි කිවු ය. බමුණා වට පිටාව බලනුයේ, බුදුරජුන් දැක, 'මේ ඉන්නේ මා කියූ තුරුණයා' යි බුදුරජුන් වෙතට ගොස්, 'ඕ! කොහොම ද, මහණ! මෙන්න මා කී මාගේ ඒ දූ, තමුන්නාන්සේට අඹුව කොට දෙන්නට ගෙණ ආමි, පිළිගන්නැ' යි කීයේ ය. 'තාගේ දුවගෙන් මට වැඩෙක් ඇත නැතැ' යි නො කියා 'මා ගිහි ගෙයින් නික්මුනු තැන් පටන්, අජපල්ලුගරුක්මුලට එනු දක්වා, මාරයා මා පසු පස එළවා ආයේ ය, එහෙත්, ඔහු, මා බැඳ ගන්නට කළ හැම උත්සාහයක් ම, සිඳ බිඳ හැර, මම ඔහුගේ විෂයය ඉක්මවා ගියෙමි, එසින් සිත් තැවිල්ලට පැමිණි මාරයා, අස්වසනු පිණිස, ඔහුගේ දූවරු මා වෙතට පැමිණ, නොයෙක් අන්දමේ නැටුම් නැටූහ, නොයෙක් වෙස්, මා ඉදිරියෙහි දැක්වූහ, නොයෙක් දේ කීහ, ඉගිබිගි කළහ, තොල් මැරුහ, එහෙත් ඒ එකකින්වත් මා පෙළන්නට, මා ඇදගන්නට ඇලා පොහොසත් නො වූහ' යි වදාළ බුදුරජානන් වහන්සේ,

"තණහා රති රගා—දූක මෙවුන්දම්සෙවුමෙහි,
නො ද විය සඳෙක් මා සිතැ—එ මට තා දුව කුමටයැ
මලමූදෙකෙන් පිරි—නිතර ම දුගඳ වහනා,
තා දූ පයින් පමණ ත්—පහසනු නො ඉස්නේ වෙමි"

යි මෙසේ ත් වදාළ සේක. අවසානයෙහි ඒ බමුණු දෙමාල්ලෝ, අනාගාමිඵලයෙහි පිහිටියෝ ය. එහෙත් මාගන්දියා තොමෝ 'මූට මාගෙන් වැඩෙක් නැත්තේ නම්, ඒ බව නො කියා, මූ දැන්

මා මලමූත්‍රයෙන් පිරුණියක කරයි, වේවා, මට තැනෙක් ලැබුනා වේ, එදාට මම මුට තරණ එක දනිමි' යි බුදුරජුන් කෙරෙහි තදින් වෛර බැන්දා ය.

බුදුරජාණන් වහන්සේ, මාගන්දියා තමන් වහන්සේ කෙරෙහි වෛර බඳනා බව දැන දැන, මෙසේ වදාලෝ, අනික් දෙ දෙනාට වන වැඩ සලකා ය. බුදුවරයෝ වනාහි, තමන් කෙරෙහි උනුන් උපදවන ක්‍රෝධය නො සලකති. මාගඵලාවබොධයට සුදුසු වූවන් දැක ධර්මදේශනා කෙරෙති.

ඉක්බිති මාගන්දියදෙමාල්ලෝ, තම දූ කැදවා ගෙණ ගොස්, චූල මාගන්දියට හාර කොට, පැවිදි ව කෙලෙස් හැම බිඳ හැර රහත්බවට පැමිණියෝ ය. චූල මාගන්දිය ද, 'මාගේ දූ එසේ මෙසේ යම්තම් පිරිමියකුට දිය යුතු නො වන්නී ය, රජකුට ම සුදුසු ය ඇ' යි කොසඹැනුවරට ගොස්, වටිනා ඇඳුම් කැඩුම් ආසිත්තමින් මැනැවින් සරසා, උදෙනරජු වෙතට ගොස්, ඔහුට පාවා දුන්නේ ය. උදෙනරජ තෙමේ ඈ දැක, උපන් බලවත් ඇලුම් ඇත්තේ, පන්සියයක් ගැණුන් පිරිවර කොට තබා අග බිසෝ තනතුරෙහි තැබුයේ ය.

මේ මාගන්දියාගේ උත්පත්තිය යි.

මෙසේ උදෙනරජහට සාමාවතී-වාසුලදත්තා-මාගන්දියා යි අග බිසෝවරු තිදෙනෙක් වූහ. එක් එක් බිසොවට, පන් සියයක් පන්සියයක් නළඟනෝ පිරිවර වූහ. එ දවස, කොසඹැනුවර ඝොෂිත - කුක්කුට-පාවාරිය යි සිටුහු තිදෙනෙක් ද වාසය කළහ. ඔවුහු හිමාලය වනයෙන් අවුත්, නුවර සිසාරා පිඬු සිහා යන තාපසයන් පන් සියයක් දැක, ඔවුන් ගෙන්වා වඩා හිඳුවා, දන් පිළියෙල කොට වැළඳවූහ. දන් වළඳවා අවසන්හි, තවත් සාර මසක් එහි නවතින ලෙසට උන්ට ආරාධනා ද කළහ. තාපසයෝ ද ඒ පිළිගෙණ එහි නතර වූහ. එසේ සාරමස ගෙවා හිමාලය වනයට යන්නට සැරසුනු තවුසන්ට සිටුවරු නැවැත වස්කාලයෙහි එන ලෙසට ද ආරාධනා කළෝ ය. තාපසයෝ හිමාලය වනය බලා ගියහ. ගොස් එහි අට මසක් ගෙවා, නැවැත, වැසිකාලය ළං වත් ම, පෙරළා, සිටුවරුන්ගේ ආරාධනාව සිහි කොට නුවරට ආහ. මෙසේ ඒ තවුසෝ, අට මසක් හිමාලයයෙහි ද, සාර මසක් සිටුවරුන් වෙත ද වාසය කෙරෙති.

එක් අවදියක මොවුහු, හිමාලයයෙන් එන්නෝ, කාලෑවෙහි හොඳට වැඩුනු ලොකු නුගගසක් දැක, එහි මුල වාඩිලා ගත්හ.

දෙටු තවුස් තෙමේ, 'මේ ගස අරක් ගත් දෙවි තෙමේ සුලුපටු එකෙක් නො වන්නේ ය, ලොකු එකකු ම විය යුතු ය මොහු, එ හෙයින්, මේ නුගයට අරක් ගෙණ සිටින දෙවි රජානන් වහන්සේ, අපට බොන්නට පැන් ටිකක් දෙන සේක්වා' යි සිතී ය. සිතූ කෙණෙහි ම, දෙවි තෙමේ පැන් දුන්නේ ය. නැවැත ඒ තවුසා, 'නාන්නට වතුර, කන්නට කෑමක් දෙන සේක්වා' යි ඉල්ලී ය. දෙවි තෙමේ ඒ හැම දුන්නේ ය. එ හෙයින් තවුසාට දෙවියන් දැකීමෙහි ආශාවක් උපන. ඒ ඇසිල්ලෙහි දෙවි තෙමේ ගස පළා ගෙණ, ඔවුන්ට තමන් දැක්වී ය. ඉක්බිති තවුසෝ, 'දෙවරාජය! ඔබගේ සම්පත් මහත් ය, පුදුම ය, මේ ලබන්නට කළ පින්කම කිමැ' යි ඇසූහ. 'ඒ නො අසනු මැනැවැ' යි දෙවි තෙමේ කී ය. 'කියන්නැ' යි තවුසෝ නැවැත නැවැත ත් කියා සිටියහ. තමන් කළ ඒ පින්කම, ඉතා කුඩා එකක් බැවින් දෙවි තෙමේ ඒ කීමෙහි ලජ්ජා ඇත්තේ විය. එහෙත් තවුසන්ගේ ඇවිටිල්ල මහත්වූ බැවින්, 'පින්වත! මම එදා අනාථපිණ්ඩික සිටානන්ගේ ගෙදර, කුලීවැඩ කළ කුලීකරුවෙක් වීමි, එහි දී මට ලැබුනු කුලියෙන්, මම යන්තමින් දිවි පැවැත් වීමි, පෝය දිනෙක, සිටු තෙමේ විහාරයේ සිට අවුත්, ගෙට වැද ගෙයි සිටි අයගෙන්, 'අද පෝයබව මෙහි කුලීකරුට කියන ලද දැ' යි ඇසී ය, 'නො කීවෙමු' යි ඔවුහු කීහ, 'එසේ නම්, ඔහුට සෑහෙන පමණ සවසට බත් ටිකක් උයා දෙවු' යි කී ය, එවිට, බත් පිසන්නෝ, හාල්නැළියක බත් පිසූහ, මම මුළු දවස වනයෙහි වැඩ කොට, සවස ගෙට ආමි, බත් බෙදා දෙන්නෝ, එවිට මට බත් බෙදා දුන්හ, එහෙත් වෙනදා මෙන් එදා එහි බත් ගෙණෙවු, මස් ගෙණෙවු, මාලු ගෙණෙවු, එලවලු ගෙණෙවු, පලතුරු ගෙණෙවු, පැන් ගෙණෙවු, ඉඳුල් ලන බඳුන ගෙණෙවු, යි යන කිසිත් කෑ කෝ ගැසීමක් ඉල්ලීමක් නො වූ බැවින්, එහි සිටියවුන් වැතිර නිදිගත් බැවින්, බඩගිනි තදින් තුබුන ද, මම බත් නොකා මට ම පමණක් බත් දුන්නෝ කුමක් නිසා දැ යි කල්පනා කොට, මෙහි ඉන්නා අන් අය, රැට බත් කෑවෝ දැ යි ඇසීමි, නැතැ යි කී කල්හි, කුමක් නිසා, නො කෑවෝ දැ යි මම ඇසීමි, ඇයි නො දන්නෙහි ද, පෝයදාට මේ ගෙයි අය පෙහෙවස් සමාදන් වෙති, එ හෙයින් රැට අහර නො ගණිත්, සිටුතුමා, කිරිදරුවන්ගේ පවා කට සෝදවා, චතුමධුර කටගා, පෙහෙවස් සමාදන් කර වයි, සුවඳතෙල්පහන් දල්වා, තැබූ කල්හි ලොකු කුඩා හැම දෙනා, නිදන අසුන්වලට නැගී චත්තිංසාකාරය සජ්ඣායනා කරති, නුඹට අද පොහොයදවසබව කියන්නට අපට අමතක විය, නුඹට පමණක් බත් පිසුවමෝ එහෙයිනි, බත් කව' යි ඔවුහු

කිහ. එවිට, 'මම, දැන් පෙහෙවස් සමාදන් වෙමි' යි සිතා සිටුහුගෙන් අසන්නට කිමි, ඔහු ගොස්, සිටුහුගෙන් ඇසූහ. සිටු තුමා, එසේ නම්, දැන් අහර නො ගෙණ, කට සෝදා, උපොසථඟ ඉටා, උපඩ්ඪුපොසථය ලබව' යි කී ය, මම එසේ කෙළෙමි, මුළුදවස ම වනයේ බර වැඩ කොට, වෙහෙසට පත් ව, තද බඩ හිත්නෙන් පෙළී සිටියා වූ මාගේ සිරුරෙහි, ඇට නහර බිඳ ගෙණ වාතයෝ කිපී නැගී සිටියෝ ය, මම රුහැණක් බැඳ, රුහැන් කොණ අල්ලා ගෙණ, ඔබිනොබ පෙරළෙමි, එවිට සිටු තෙමේ, පහන් දල්වා, වතුමධුර ගෙණ, මා වෙත පැමිණ, අසනීපය කිමැ යි අසා, එසේ නම් මේ බේත ගණුව' යි කී ය, 'ඔබ වහන්සේ අනුභව කරණු මැනැවැ' යි මා කී විට, 'අපට අපහසුවෙක් නැත, ඔබ අනුභව කරවු' යි කී ය, පෙහෙවස් සමාදන් වන්නේ, සියල්ල සමාදන් වන්නට නො කැමැති වීමි. සමාදන් වූයේ අඩෙකි, මා ඒ සමාදන් වූ පෙහෙවස් අඩ බිඳී ශේෂ ඇත බියෙන්, ඒ අනුභව කරන්නට නො කැමති වීමි, එකල, සිටු තුමා 'පුතා! එසේ නො කරව, මෙයින් ටිකක් කට ගා ගන්නැ' යි කී ය, එහෙත් මම එසේ නො කෙළෙමි, ඒ රෝගයෙන් පෙළුනේ, පාන් වත් ම කලුරිය කොට, මේ නුග ගස උපන්මි, සිටු තෙමේ බුඩ්මාමක ය, ධම්මාමක ය, සඞ්ඝ මාමක ය, එතුමන් ඇසුරු කොට, කළ උපඩ්ඪුපොසථයාගේ විපාකය වශයෙන් මම මේ සමපත් ලැබීමි' යි දෙවි තෙමේ කීයේ ය, බුඩ යන වචනය ඇසූ තවුසෝ, හුන් තැනින් නැගිට, දෙහොත් මුදුන් දී බුඩ යනු තෙවරක් කියවා ගෙණ, 'මේ වචනය ලොකයෙහි නො ලැබිය හැකි එකෙකැ' යි තෙවරක් උදන් අනා, 'කප් සිය දහස් ගණනින් ද, නො ඇසිය හැකි මේ උතුම් වචනය කාගෙන් ඇසුවෙමු' යි දෙවියාට සතුති කළහ. ඉක්බිති අතැවැස්සෝ, 'ආචාය්‍යතුමනි! බුදුරජුන් වෙත යමු' යි කීහ. 'කොසඔෑනුචර සිටුවරු නිදෙන අපට බොහෝ උපකාර කරති, හෙට ඔවුන්ගේ ගෙයි දැනය ගෙණ, මේ බව ඔවුන්ටත් දන්වා යමු, හෙට වනතුරු ඉවසවු' යි ඇදුරු තවුස් කී ය. ඔවුහු එය පිළිගත්හ.

පසුදා සිටුවරු, කැම්බීම් පිළියෙළ කොට, අසුන් පණවා, 'අද අපගේ තවුස් හිමිවරුන් මෙහි වඩින දිනැ' යි බලා හිඳ එන්නවුන් දැක ඉදිරියට ගොස්, ගෙට කැඳවා ගෙණ අවුත්, වඩා හිඳුවා දන් පිළිගැන්වූහ. වළඳා අවසන්හි තවුසෝ, 'අපි යමු' යි සිටු වරුන්ට දැන්වූහ. එවිට සිටුහු 'ඇයි! ස්වාමීනි! ඔබ වහන්සේලා වැනි සාරමස මෙහි අප වෙත නවතින බවට පොරොන්දුවක් දුන්නෝ නො වහු ද, ඇයි! මෙහෙ ම කියනු, කොහි වඩින්නහු ද,

මෙහි නවතිනු මැනැවැ' යි කීහ. 'සිටු තුමනි! බුදු රජතෙමේ ලොව පහළ වූයේ ය, දහම් ලොව පහළ වූයේ ය, සඞ්ඝ තෙමේ ලොව පහළ වූයේ ය, එ හෙයින් මෙහි රැඳෙනු තරම් නො වේ, පමාවනු නො සුදුසුය' යි කී විට 'පොඩ්ඩක් නවතිනු මැනැවි, අප ත් ගමනට සූදානම් වනතුරු' යි සිටුවරු කීහ. 'තමුසේලා ගමනට සූදානම් වනතුරු, අප මෙහි රැඳීම වැඩකට ඇත්තෙක් නො වේ, එය අපට ලොකුපමාවකි, තමුසේලා පසු වී එන්න, අපි යන්නෙමු' යි ඔවුහු පිටත්ව ගියහ. ගොස්, බුදුරජුන් හමුවට පැමිණ, ස්තුති කොට වැඳ පුදා පසෙකට වී හුන්නෝ ය. බුදු රජානන් වහන්සේ, ඔවුන්ගේ අදහස් බලා ඔවුනට ආනුපුබ්බී කථාව වදාරා, දහම් දෙසූහ. ඒ අවසන්හි සියල්ලෝ, පිළිසිඹි යාවන් ලබා රහත් වූහ. 'මහණෙනි, මෙහි එවු' යි වදාළ වචනය හා, සෘඩියෙන් ලත් පා සිවුරු දරන්නෝ, එහි භික්ෂු භාවයෙන් පැවිද්ද ලැබූහ.

සිටුවරු ද, පන්සියය පන්සියය ගැල් පිළියෙල කොට ඒ හැමෙකක, සහල්-උඳු-මුං-පොල්-පුවක්-දුරු මිරිස්-දෙහි-දෙඩම්-ගිතෙල්-මී-උක්හකුරු ආදිය හා රෙදි පිළි ආදී වූ දානොපකරණ පටවා ගෙණ, සැවැත්නුවරට පැමිණ, ගෙණ ආ හැම එකක් පසෙක තබා, බුදුරජුන් වෙත ගොස්, වැඳ, බණ අවසන්හි සෝවන්පලයට පැමිණියහ. ඔවුහු, එහි රැඳී පසළොස් දවසක් දන් දුන්හ. මෙසේ පසළොස් දවසක් බුදුරජුන් වෙත රැඳී දන් දී අවසන් කොට, කොසඹෑ නුවරට වඩින ලෙසට ආරාධනා කොට යන්නට අවසර ඉල්ලූහ. එවිට බුදුරජානන් වහන්සේ, ඔවුනට, ගමනට අවසර දී 'තථාගතයෝ වනාහි, ශූන්‍යාගාර යෙහි ඇලෙත්' යි ද, වදාළ සේක. 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! අපි ඒ දනිමු, අප දන්වා එවූ විට, කොසඹෑනුවරට වඩිනු යහ පතැ' යි කියා, කොසඹෑනුවර බලා, සැවැත්නුවරින් පිටත්ව ගියහ. ටික දිනකට පසු, එහි කොසඹෑනුවරැ ඝොසිත සිටු ඝොසිතාරාමය ද, කුක්කුටසිටු කුක්කුටාරාමය ද, පාවාරියසිටු පාවාරිකාරාමය ද යන මහාවිහාර කරවා, අවසන් කොට, එහි වැඩමවන්නට ආරාධනා කොට බුදුරජානන් වහන්සේට ලියුම් යැවූහ. බුදුරජානන් වහන්සේ එහි වැඩි සේක. සිටුවරු, ඉදිරියට ගොස්, උන්වහන්සේ විහාරයට වැඩමවා ගෙණ අවුත්, එකෙකා වරින් වර උවටැන් කරති. බුදුරජානන් වහන්සේ, දවස දවස එක එක විහාරයෙහි වැඩ වසති.

එ දවස ඒ සිටුවරුන්ට මල්වඩම් ගොතන සුමන නම් මල් කරුවෙක් සිටියේ ය. ඔහු දිනෙක සිටුවරුන් කරා ගොස්, 'මම

ඔබ වහන්සේලාට කලක සිට, උපකාර කරන්නෙක්මි, මම ත් බුදුරජුන් වළඳවනු කැමැත්තෙමි, එහෙයින් මට ත් බුදුරජුන් වළඳවන්නට දිනක් නියම කොට දුන මැනැවැ' සි ඉල්ලී ය. එවිට සිටුවරු, 'හා! හොඳ සි, හෙට බුදුරජුන් වළඳ වන්නැ' සි කීහ. සුමන තෙමේ, 'යහපතැ' සි කියා ගොස් බුදුරජුන්ට දුනය පිණිස ආරාධනා කොට, දුනොපකරණ පිළියෙල කෙළේ ය.

උදෙනරජුගේ අගබිසොවක වූ සාමාවතියට මල්වඩම් ගොනා දෙන්නේ ද, මේ සුමන මාලාකාර තෙමේ ය. උදෙන රජ, මල් වඩම් ගන්නට සාමාවතියට දිනපතා කහවණු අටක් දෙන්නේ ය. බුජ්ජුත්තරා නම් සාමාවතියගේ දාසිය, මල්වඩම් ගෙණෙන්නට සුමන මාලාකාරයා වෙත යන්නී. මල්කරු බුදුරජුන් වළඳ වන්නට දත් පිළියෙල කරණ දවසෙහි ද, ඕ තොමෝ මල්දම් ගෙණෙන්නට එහි ගියා ය. සුමන තෙමේ, 'අද බොහෝ ම වැඩ, මම අද දුනය පිණිස බුදුරජුන්ට ආරාධනා කෙළෙමි, උන්වහන්සේ දුන් මෙහි වඩින සේක, මල් දෙන්නට නොහැකි ය, මල් උන්වහන්සේට පිදිය යුතු ය, ටිකක් මෙහි නව තින්න, මේ කටයුතුවලට මට උදවු දෙන්න, බණත් අසා, ඉතිරි වන මලුත් ගෙණ ආපසු යා හැකි ය' සි බුජ්ජුත්තරාවට කී ය. ඕ තොමෝ එහි නැවතුනා ය. බුදුරජානන් වහන්සේ භික්ෂූන් වහන්සේ සමග එහි වැඩම කොට දත් වළඳ අවසන් කළහ. ඉක්බිති මල්කරු බුදුරජුන්ගේ පාත්‍රය ගත්තේ ය. උන්වහන්සේ එහි අනුමෙවෙනි බණ දෙසූහ. බුජ්ජුත්තරා තොමෝ බණ අවසන්හි සෝවන් පලයට පැමිණියා ය.

ඕ තොමෝ මෙයට පෙර දවස, කහවණු අටෙන් සතරක් දීලා මල් ගෙණ, සතරක් ඉතිරිකර ගෙණ ගියා ය. එදා කහවණු අට ම දී මල් ගෙන ගියා ය. සාමාවතී තොමෝ, මල් රැස බලා, 'දුව! මොක ද අද මල් හුඟක්, රජතුමන් අද මල් මිල, වෙනදාට වඩා වැඩියෙන් දෙකක් කොට දෙන ලදදූ' සි ඇසූය. 'අයාර්‍යවෙනි රජතුමන් වෙනදාට වැඩියෙන් මල් මිල දෙන ලද්දේ නො වේ, දුන්නේ වෙනදා දෙන මල් මිල ම ය, මම මෙයට පෙර හැමදා එයින් කහවණු සතරක් ඉතිරි කොට ගෙණ සතරක් දී මල් ගෙණ ආමි''සි ඕ තොමෝ කිවූ ය. 'මොක ද අද එසේ කළා' සි ඇසූවිට, 'අද බුදුරජානන් වහන්සේ, දුනය පිණිස මල්කරුගේ ගෙදරට වැඩ, දත් වළඳ බණ දෙසූහ, මම එහි දී උන්වහන්සේ වදාළ බණ අවබෝධ කර ගතිමි, එහෙයින් වෙනදා මෙන් නො කොට, අද මෙසේ කෙළෙමි' සි බුජ්ජුත්තරා තොමෝ කීවා ය. 'බොල කෙල්ල! දුෂ්ට දාසිය! තී මෙතෙක් ගත් කහවණු ගෙණ දෙන්නැ' සි සැරවැර

නො කොට, 'දුව! එහිදී තී දත් දහම්, තී බී අමාපැන්, මට ත් පොවාලව' යි සාමාවතී තොමෝ කිවු ය. 'එසේ නම් මා නාවන්-නැ' යි බුජ්ජුත්තරාව කී විට, සාමාවතී තොමෝ, ඇය සුවඳදියෙන් නාවා; මොළොක් සළු දෙකක් දෙවූ ය. ඕ තොමෝ, එකක් ඇද, එකක් පොරවා හිඳින්නට අසුනක් ගෙණ එහි හිඳ විජිනිපතක් අතෙහි දරා පන්සියයක් ගැණුන් ඉදිරියෙහි උන් අමතා බුදුරජුන් වදාළ සැටියෙන් ම බණ කීවා ය. එහි බණට කන් දි සිටි සියල්ලෝම එහිදී ම සෝවන් පලයට පැමිණියෝ ය. ඇලා සියල්ලෝ බුජ්ජුත්තරාවට වැඳ 'මැනියෙනි! අද පටන් ඔබතුමී අප කාගේ ත් මැනියෝ ය, ආචාර්‍යාවෝ ය, මින් මතු දාසකම් කරණු බැරි ය, එහෙයින්, මෙ තැන් සිට අප හැම දෙනාගේ මවු තනතුරෙහි ගුරු තනතුරෙහි සිට, බුදුරජුන් වෙත ගොස්, බණ අසා අවුත් අපට බණ කියන්නැ' යි ඉල්ලා සිටියහ. ඕ එසේ කරන්නී, දවස් නො යවා ම තෙවළාදර වූ ය. එවිට බුදුරජානන් වහන්සේ ඇය තමන් වහන්සේගේ බහුශ්‍රැත වූ ධර්මකථිකශ්‍රාවිකාවන් අතුරෙහි ශ්‍රේෂ්ඨ ස්ථානයෙහි තැබූහ.

අනතුරු ව ඒ පන් සියයක් සත්‍රීහු 'මැනියෙනි! අපි බුදුන් දකිනු කැමැත්තම්හ, උන්වහන්සේ අපට දක්වන්න, ගඳින් මලින් සුවඳින් උන්වහන්සේ පිදිය යුතු ය' යි කීහ. 'රජගෙය සැහැසි ය, බිය එළවන්නේ ය, නුඹලා'ගෙන් පිටත ගෙණ යන්නට නො හැකි ය' යි බුජ්ජුත්තරාවන් කී විට 'අප නො නසන්න, අපට බුදුරජුන් දක්වන්නැ' යි ඇලා තරයේ කියා සිටියහ. 'බුදුරජුන් දැක්මේ කැමැත්ත බලගතු නම්, බැලිය යුතු ම නම්, නුඹලා වසන කාමරවල බිත්ති පිටත බැලීමට හැකි තරම් පමණට සිදුරු කොට සුවඳමලුත් ගෙන්වා ගෙණ ඒ සිදුරු ලඟ සිට සිටුගෙවලට බුදුරජුන් වඩින වේලේ උන්වහන්සේ බලා සැනසී අත් දිගු කොට වැඳ පුදා ගණිවු, දැන් එයට වඩා දෙයක් කරන්නට ඉඩ නැතැ' යි බුජ්ජුත්තරා තොමෝ කීවා ය. ඇලා එ තැන් පටන් සිදුරු ලඟ සිට යනෙන බුදුරජුන් බලා වඳිති. පුදති.

මේ අතර දවසෙක මාගන්දියා තොමෝ, තමන් වසන පහයෙන් පිටතට අවුත් සක්මන් කරන්නී, ඇලා වසන තැනට ගියා, කාමර බිත්තිවල සිදුරු දැක, 'මේ කිමැ' යි ඇසූ ය. මාගන්දියා බුදුරජුන් කෙරෙහි වෙර බැඳ සිටින්නියක බව නොදත් ඒ සත්‍රීහු බුදුරජානන් වහන්සේ දකිනු රිසියෙන් මෙසේ කෙළෙමු' යි කීහ. ඕ තොමෝ 'ශ්‍රමණ ගෞතමයා මෙහි අයේ ද, අයේ නම් කළ යුත්ත දනිමි, නුඹලාටත් කළ යුත්ත දනිමි' යි සිත සිතා රජු වෙත ගොස්, 'මහරජ! සාමාවතිය හා ඇගේ පරිවාර සත්‍රීහු පර පුරුෂයන්

පතති, එය ඔබ වහන්සේට ලොකු මදිකමෙකි, මැලා නැසිය යුතු ය' යි දන්වා සිටියා ය. එහෙත් රජ තෙමේ 'ඇලා එසේ කරතී'යි නො ද පිළිගත්තේ ය. මාගන්දියා තොමෝ නැවැත නැවැතත් එසේ කියා සිටියා ය. රජ තෙමේ නො පිළිගත්තේ ය. දෙතුන් වරකුත් කියා රජු නො ඇදහූ කල්හි 'මාගේ වචනය නො අද හන්නහු නම්, ඇලා වසන තැනට ගොස් විමසා බලනු මැනැවැ'යි ඕ කිවු ය. එවර රජ තෙමේ එහි ගියේ කාමරවල බිත්ති සිදුරු කොට නිබෙන බව දැන 'මේ කිමැ' යි අසා, තොරතුරු දැන ඇලා කෙරෙහි නො කිපි කිසිත් නො බැණ සිදුරු වස්වා සියලු කාමරවල උසින් දැල් කවුළු කරවී ය. දැල් කවුළු ලැම මිනිසුන් අතර පළමු වෙන් ඇතිවූයේ මේ කාලයෙහිය යි පිළිගණිති.

සාමාවතියට හා සාමාවතියගේ පරිවාර සත්‍රීන්ට, ගැහැට කිරීමෙහි අපොහොසත් වූ මාගන්දියා තොමෝ 'ශ්‍රමණගෞතමයාට කලයුත්ත කරමි' යි සිතා එ නුවරැ වැසි ගුණ නොදත් සැහැසි මිනිසුන්ට මිලමුදල් හා කැම්බිම් දීලා 'තෙපි, ශ්‍රමණගෞතමයා මෙ නුවරැ ඔබ නොබ හැසිරෙන විට, දැසිකම්කරුවනුත් සමග ඔහු ඉදිරියට ගොස්, ඇණුම් බැණුම් කොට මෙ නුවරින් පන්නා හරිවු' යි නියම කළා ය. මිසදිටු ගත්තෝ, කවදුවත් තෙරුවන් කෙරෙහි පැහදුම් නැත්තෝ ය. එ හෙයින්, ඔවුහු නුවරතුළට වත් බුදුරජනත් වහන්සේට, පසුපස යමින් නිතු පරිභව කෙරෙති. එකල, ආනන්ද ස්ථවිරයන් වහන්සේ, බුදුරජුන් වෙත ගොස් වැඳ, 'ස්වාමිනි! මෙ නුවරවැස්සෝ, අපට තදින් තලා පෙලා කතා කරති, කරණ නිතු පරිභව ඉතා සැහැසි ය, එ හෙයින් මෙ නුවර හැර යමු' යි කිහ. 'ආනන්දය! මේ හැර කොතැන යමු ද' යි බුදුරජුනත් වහන්සේ වදාළ සේක. 'ස්වාමීනි! වෙන අත් නුවරකටැ' යි ආනන්ද ස්ථවිරයන් වහන්සේ කී කල්හි, 'ආනන්දය! එහි මිනිසුන් තලන පෙලන කල්හි කොහි යමු ද' යි ඇසූහ. 'වෙන අන් නුවරකට යමු' යි කී කල්හි, 'ආනන්දය! තමුසේ කියන ලෙසට, බණින දෙඩන නිතු පරිභව කරණ මිනිසුන් වසන ගම් රට හැර ගියොත් අවසානයේ දී අපට යන්නට ගමෙක් රටෙක් ඉතිරි නො වන්නේ ය, එ හෙයින් තමුසේ කියන ලෙසට අත් තැනක යෑම නො සුදුසු ය, යම් තැනක දී යම් අධිකරණයෙක් උපන්නේ නම්, එය එහිදී ම සන්සිඳවා යා යුතු ය, උනුන් නිතු පරිභව කළ තරමකින්, ඒ ඒ තැන්, හැරදමා යෑම, යුතු නො වේ, එහි ලා කළකිරීම ද යුතු නො වේ, ආනන්දය! බණින්නේ දෙඩන්නේ කවු ද' යි බුදුරජුනත් වහන්සේ අසා වදාළ සේක. 'ස්වාමීනි! දැසි දස් කම්කරු කෙලි කොලු පටන් හැම දෙනෙකු බණිති, දෙඩති' යි අනඳ තෙරුන් කී කල්හි, 'ආනන්දය! දැන

ගන්න, මම යුද බිම වන් ඇතකු වැනි ය, යුදට වන් ඇතා; හැම දිගින් එන සියලු කඩු තෝමර ඊතල ආදිය ඉවසන්නේ ය, එය එසේ එන ඒ හැම එකෙක් ඉවසිය යුතු ය, එහිලා පසු නො බැසිය යුතු ය, ඒ හැටියට ඔය දුශ්ශීලයන් විසින් පහත් මිනිසුන් විසින්, නුගතුන් විසින්, මිසදිටුවන් විසින් කරණ කියන ඇණුම් බැණුම් මම ඉවසම්, එම මට භාරු' යි වදාළ බුදුරජානන් වහන්සේ,

"යුදබිමෙහි දුන්නෙන් - ගිලිහී සිරුර හුනු ඒ,
ඉවසන ඇතකු සේ මම - සැහැසි රළුබස් ඉවසම්,
මහ දන යම් ලෙසකිනි - දුසිල් වේ නම් එහෙයිනි.
දුම්නු ඇත් හෝ අස් - තැනට මහදන රැස් වූ,
ගෙණ යති රජු ද දුම්නහු - පිට ම නගිනේ නො බියව,
බිණු රොස්බස් යමෙකෙක් - ඉවසාද අරිමගිනී,
දුම්නු ඔහු දුම්නූ - මිනිසුන් අතර තුම් වේ,
වෙළඹ කුස උපනස් - දමන්නහුගේ අදහස්
දත් එ අස් සිදු අස් හා - මහැන් දුම්නෝ තුම් වෙති,
දුම්නු ඒ ඇත් ඇස් - හැමට වැඩියෙන් අරිමග,
මැනැවින් තෙමේ දුම්නේ - ඒ මය උතුම් වනුයේ" යි

දහම් දෙසූහ. ධර්මදේශනාව මහාජනයාට වැඩ සහිත වූවා ය.

බුදුරජානන් වහන්සේ මෙසේ ධර්මදේශනා කොට, 'ආනන්දය! මේ බැණුම් දෙඩුම් ගණන් ගත යුතු නො වේ, ඔවාට කන්දීම හිත වැඩ පිණිස නො වන්නේ ය, ඔය බැණුම් දෙඩුම් පවත්නේ සත් දිනක් තුළ ය, අටවන දින දැන් ඔය බණින දෙඩන හැම දෙනා, නිහඬ වන්නෝ ය' යි වදාළ සේක. බුදුරජුන් පිළිබඳ අධිකරණයෝ, සත් දිනකට වැඩියෙන් නො පවත්නෝ ය.

මෙසේ ඇණුම් බැණුම් කොට, බුදුරජුන් පලවා හරින්නට අපොහොසත් වූ මාගන්දියා, 'සාමාවතිය හා ඇයගේ පරිවාර සත්හු මේ ශ්‍රමණයාට උපසථාන කරති, එහෙයින් ඇලා නැසිය යුතු ය' යි සිතා, දිනක් රජුගට සුරාපානශාලාවේ දී උපසථාන කොට, තමන් වසනා තැනට අවුත් එහි මෙහෙ කරණ මෙහෙ කරුහට අල්ලස් වශයෙන් මිල මුදල් දී ඔහු තමන්ට නතු කොට තබා, නැවත' සුලු පියාට, පහත පෙණෙන ලියුම ලියා යැවූ ය.

කොසඹැනුවර
උදෙනරජමැදුරේදී ය,

යටත්ව ලියමි.
පියතුමනි!

මෙහි අපගේ ප්‍රයොජනය සඳහා, මළ කුකුළන් අට දෙනකු හා පණැති කුකුළන් අට දෙනකුත් ගෙණ, ඉතා කඩිනමින් මෙහි එනු මැනැවි. මෙහි ආවිට එකාවර ම රජතුමන්ගේ සුරාපාන ශාලාවට නො වැද, පිටත පඬිපෙළමත සිට, ආබව එහි සිටින මෙහෙකරු අත දන්වා යවා, මෙහි එන්නැ යි රජතුමන් දුන් වූ විට ද, රජතුමන් හමුවට නො ගොස් පළමු කොට තමන් ගෙණ ආ නො මළ කුකුළන් අට දෙන පමණක් රජුට දෙන්නැ යි මෙහෙකරු අත යවනු මැනැවි. පසුව මෙහෙකරු පැමිණ මළ කුකුළන් ඉල්ලූ විට, නො මළ කුකුළන් ගෙණ මළ කුකුළන් ඔහුට දෙන්න මෙය මෙසේ ඉටුවිය යුතු බව දන්වමි.

මෙයට,
සෙනෙහැති,

දූ මාඝඤ්ඤියා
උදේනරජබිසොව.

මාගන්දියාගේ සුලු පිය වූ මාගන්දිය බ්‍රාහ්මණ තෙමේ, ලියුම බලා එහි ලියා ඇති පරිදි මළ කුකුළන් අට දෙනකු කුඩයක ලා බැඳ ගෙණ රජ මැදුරට ගොස්, කියා තුබූ ලෙසට පිටත පඬිපෙළ මත සිට, තමන් ආ බව මෙහෙකරු අත දන්වා යැවී ය. රජ තෙමේ 'ඔහු මෙහි ඇතුළට කැඳවා ගෙණ එන්නැ' යි මෙහෙකරුට කී ය. මෙහෙකරු ගොස් ඒ දැන්වීය. 'මම රජතුමන්ගේ සුරාසැල් තුළට නො එමි' යි ඔහු කියා යැවූයේ ය. එවිට මාගන්දියා තොමෝ නැවැත ත් මෙහෙකරු තම සුලු පියා වෙත යැවූ ය. එවර මාගන්දිය බ්‍රාහ්මණ තෙමේ, 'මේ කුකුළන් රජුට දෙන්නැ' යි නො මළ කුකුළන් අට දෙන රජුවෙත යැවූයේ ය. රජ තෙමේ ඒ දැක, 'රසැති කැමෙකැ' යි සතුටු ව 'මෙය පිසන්නේ කවරෙක් දැ' යි ඇසූයේ ය. 'මහරජ! සාමාවතියත්, ඇගේ මෙහෙවර කරණ ගැණුත්, කිසිත් වැඩක් නො කොට, නිකරුණේ ඔබ නොබ ඇවිදිති, මේ කුකුළන් උයා එවන්නැ යි ඇලා වෙත යවනු මැනැවි, ඇලා උයා එවනු ඇතැ' යි මාගන්දියා තොමෝ කිවූය. රජතෙමේ ද, 'මේ කුකුළන් ඇලාට දී, දුරුම්රිස් ලා ලුනු ඇඹුල් ඇති ව හොඳට උයා එවන්නට කියව' යි කුකුළන් අටදෙනා සාමාවතිය වෙත යැවූයේ ය. මෙහෙකරු, කුකුළන්

ගෙණ, සාමාවතිය වෙත ගොස්, කුකුළන් පෙන්වා, 'මුන් මරා දුරුමිරිස් ලා, ලුනු ඇඹුල් ඇති ව හොඳට උයා රජු වෙත එවන්නැ' යි කීයේ ය. කුකුළන් දුටු සාමාවතිය හා පරිවාර සත්‍රීහු, හිසැ දෙයත් බැඳ ගෙණ 'අනේ! මේ මොන පවෙක් ද; අපට සතුන් මරණු බැරි ය, ගෙණ යන්න, ගෙණ යන්න, අපි ප්‍රාණඝාත නො කරන්න මෝ ය' යි මහහඬින් කියා සිටියාහ. මෙහෙකරු, පෙරළා කුකුළන් රැගෙණ, රජු කරා ගොස්, සාමාවතිය කියූ කතාව රජුට කීයේ ය. මාගන්දියා තොමෝ රජු වෙත සිටියා මේ කතාව අසා, 'මහරජ! ඔබතුමන්ගේ බිසොවගේ සැටි, ඔබතුමන්ට ඇති සැලකිල්ල බලා වදාරන්න, ඔය කුකුළන් මරා අර ශ්‍රමණ ගෞතමයාට උයා යවන්නැ යි කියා යවන්න, සතුන් මරණ නො මරණ බව, එවිට ඔබ වහන්සේට ම දත හැකිය. එසේ කරණු මැනැවැ' යි කීවා ය. රජ තෙමේ ද එසේ කියා යැවූයේ ය. මෙහෙකරු, ඒ නො මළකුකුළන් ගෙණ යන්නකුසේ හඟවා ගොස්, නො මළ කුකුළන් මාගන්දිය බමුණුට දී, ඔහු අතැ තුබූ මළකුකුළන් ගෙණ, සාමාවතිය කරා ගොස්, 'මෙන්න! මේ කුකුළන් කුඩා කැබලිවලට කපා, කොටා, සෝදා දුරු මිරිස් ලා ලුනු ඇඹුල් ඇති ව හොඳට උයා ශ්‍රමණ ගෞතමයාට යවන්නට රජතුමා කීයේ ය' යි සාමාවතියට හා මෙහෙකරු ගෑණුන්ට කියා සිටියේ ය. ඈලා ඒ බලා, මළකුකුළන් බව දැන, 'දෙන්න, අපට ඒ කළ හැකි ය' යි කියා, ඉදිරියට ගොස්, ගත්හ. මෙහෙකරු රජු කරා ගොස්, 'දේවයන් වහන්ස! ශ්‍රමණ ගෞතමයාට, උයා යවන්නැ යි කී සැටියේ ම, ඉතා සතුටින් ඉදිරියට අවුත්, ඈලා කුකුළන් ඉල්ලා ගත්හ' යි කී ය. එවිට, මාගන්දියා තොමෝ, 'මහ රජ! ඔන්න! බලන්න! උන්ගේ හැටි, රජුට ඇති ආදරය, ඔබ වහන්සේ පිණිස උයන්නැ යි කී විට ප්‍රාණඝාත නො කරමු යි කීහ, ශ්‍රමණ ගෞතමයා පිණිස උයන විට ඈලාට ප්‍රාණඝාත කළ හැකි ය, එය පවෙක් ද නො වන්නේ ය, මැලා පරපුරුෂයන් පතනබව, මම කල් තබා ම, ඔබ වහන්සේට කීමි, එය ඔබ වහන්සේ නො පිළිගත්තහු ය, දැන් අදහස කෙසේ දැ' යි ඇසූ ය. රජ තෙමේ ඒ අසා කීසිත් නො බැණ නිහඬ විය. නැවැතත් මාගන්දියා තොමෝ 'කුමක් කරම් දැ' යි සිතන්නී වූ ය.

මේ කාලයෙහි රජ තෙමේ, සාමාවතී-වාසුලදත්තා-මාගන්දියා යන බිසොවුන්ගේ ප්‍රාසාදයන්හි වරින්වර එක පහයෙහි සත් දවස බැගින් කල් යවන්නේ ය. 'අද හෝ හෙට, රජ තෙමේ කල් ගෙවන්නට සාමාවතියගේ ගෙට යන්නේ ය' යි දැන සිටි මාගන්දියා තොමෝ 'බෙහෙත් ගටා දළ සෝදා, විස බස්වා සජියකු ගෙණෙව' යි සුලු පියාට කියා යැවූ ය. ඒ කී ලෙස කොට ඔහු

සඡියකු ගෙණ ආයේ ය. රජ තෙමේ යන යන තැන හසති ක්‍රාන්තවීණාව ද ගෙණ යන්නේ ය. ඒ වීණාපොකුරෙහි සිදුරෙක් ඇත්තේ ය. මාගන්දියා, ඒ සිදුරෙන්, සඡියා වීණාව තුළට රිංගවා සිදුර මල්ගුටිකාවකින් වසා තැබූ ය. සඡි තෙමේ, කිසින් අහරක් නො ලැබ, දෙතුන් දිනක් වීණාව තුළ ම හුන්නේ ය. මාගන්දියා රජුගේ ඉදිරියට ගොස් වැඳ, 'දේවයන් වහන්ස! දේවයන් වහන්සේ අද කාගේ පහයෙහි ලඟින්නට යන සේක් දැ' යි ඇසූ ය. 'සාමාවතියගේ පහයට' යි කී ය. 'එහි අද නො යනු මැනැවි, මම නපුරු සිහිනයක් දුටිමි, එහි එලය යහපත් බිය නො හැකි ය, අද එහි නො යා යුතු ය' යි මාගන්දියා කියූ විට රජතෙමේ, 'අද එහි යා යුතු ම ය' යි කියේ ය. 'එසේ නම් දෙවයන් වහන්ස! මම ත් එමි' යි කී කල්හි, 'තිගේ එහි යෑමෙන් වැඩෙක් නැත, මෙහි නවතුව' යි රජු විසින් වලක්වනු ලබන්නී ද, 'අද කුමකින් කුමක් වන්නේ දැ යි නො දනිමි' යි කියමින් රජු හා එක් ව ගියා ය. රජ තෙමේ එහි ගොස්, මූණ කට සෝදා, සාමාවතිය දුන් විසන්‍නාහරණ පැලඳ, මල් සුවඳ ගෙණ, සුවඳ ඇඟ ගල්වා ආහාර අනුභව කොට, වීණාව ඉහ ඉද්දර තබා සිරියන්හි නිදි ගත්තේ ය. මාගන්දියා තොමෝ, රුකවල් පිණිස ඔබිනොබ හැසිරෙන්නියක සේ, මායම් කොට, එහි කිසිවකු නැති වේලේ වීණාසිදුරෙහි ඔබා තුබූ මල් ගුලාව එයින් ඉවත් කළා ය. සඡි තෙමේ, දෙතුන් දිනක් ම වීණාව තුළ නිරාහාර ව සිටියේ, සිදුරෙන් නික්ම හුස්ම හෙල හෙලා පෙණගොබය විදහා ගෙණ, එහි සිරියන්හි මතුයෙහි හොත්තේ ය. එ කෙණෙහි මාගන්දියා තොමෝ, 'දේවයන් වහන්ස! සඡියෙක්, සඡියෙක්, වහා නැගිටින්න! යහනින් බසින්න! අය්යෝ! මේ මෝඩ රජු මා මෙහි නො ආ යුතුය යි කියද්දීත් මාගේ ඒ වචනය නො පිළිගෙණ මෙහි ආයේ ය, කාලකණ්ණිකමෙක හැටි, මැලාත් කාලකණ්ණි ය, මැලා රජුට හිතවත් නො වෙති, කිමැ, රජු තොපට නො සලකන්නේ ද, කෑම් බීම් ඇදුම් පැළඳුම් යාන වාහන මිල මුදල් ආදිය නො දෙන්නේ ද, රජු මලොත් තොපට යහතින් ජීවත් විය හැකි ද, රජුගෙන් තොපට ඇති ගැහැට කරදරය කුමක්ද මා අද නපුරු සිහිනයෙක් දක්නා ලදැ යි කියද්දීත් රජු මෙහි ආයේ, තොපට ඇති හිතවත්කම් නිසා නො වේ දැ' යි රජුටත් සාමාවතියටත් ඇණුම් බැණුම් කළා ය. රජු ද සඡියා දැක, මරණ භයින් තැති ගත්තේ වෙවුලා ගියේ "මැලා මෙබඳු වැඩ කරත් ද, අය්යෝ! මැලා පව් අදහස් ඇත්තෝ ය, මම, මැලා පව් අදහස් දරණ බව, මාගන්දියා කියද්දීත් ඒ නො පිළිගනිමි, පළමු ව තමන් ලඟින කාමරවල බිත්ති සිදුරු කර ගෙණ

හුන්නෝ ය, නැවැත මා පිසන්නට එවූ කුකුළන් තමන්ට පිසනු නො හැකි ය යි හරවා එවූහ, දැන් ඇදෙහි නයකු බැහැර යි බලවත් ක්‍රොධයෙන් ඇවිල ගත්තේ ය.

ඒ දත් සාමාවතිය 'සහෝදරියෙනි! මෙත් වඩවු, අපට දැන් අන් පිහිටෙක් නැත; මෙත් වඩනු හැර, එහෙයින් රජු කෙරෙහි, රජබිසොව කෙරෙහි, තමන් කෙරෙහි යන මේ හැම තැනැ සම සමවූ ම මෙත් වඩවු, කිසි තැනක ක්‍රොධ නො කරවු' යි සිය පරිවාරසත්‍රීන්ට අවවාද කළා ය. රජ තෙමේ, එ වේලේ ම දහස් දෙනකු විසින් නගාලිය යුතු දරදඬු මහාමැඩහතු දුන්නක් ගෙන්වා දුනුදිය අතැ පොළා පියා විස පෙවූ ඊයක්, සරසා ඒ මතැ නගා සාමාවතිය මුලට තබා, සියලු සත්‍රීන් පිළිවෙළින් සිටුවා සාමාවතියගේ උරහිසට එය විද්දේ ය. එ වේලෙහි උන් කළ මෙත්වැඩුමේ අනුභසින්, ඊය ආපසු හැරී ආ දිගට ම මූණ ලා රජුගේ පපුවට ඇතුල්වන්නා සේ සිට ගත්තේ ය. එවිට, රජ තෙමේ, 'මා යැවූ ඊය ගලක් නමුත් පසා කොට බිඳගෙණ යන්නේ ය, අහසැ වැදෙන තැනෙක් ද නැත, එහෙත් මේ ඊය ආපසු හැරී මා දිහාවට මූණ ලා සිටියේ ය, මෙසේ සිටියේ, සාමාවතියගේ ගුණය නිසා විය යුතු ය, සිත් පිත් නැති මේ ඊය ඇයගේ ගුණය දැන සිටියි; මිනිසෙක් වූ මම, ඒ නො දත්තේ වෙමි' යි සැලී ගියේ දුන්න පසෙක දමා, දෙහොත් මුදුන් දී සාමාවතියගේ පාමුල උකකුටිකයෙන් හිඳ,

"මුළාසිකැත්තෙමි – කැමත හා පමුවෙහි මම,
සාමා! මෙ මා රැකගත් – නී ම වනු පිහිටත් මට"

යි කියා සිටියේ ය. එවිට සම්‍යක්සම්බුද්ධශ්‍රාවිකා වූ ගුණවත් සාමාවත්තොමෝ,

"මහරජුනි! මම යම් – කෙනකු පිහිටැ යි ගත්තෙමි,
එ තුමත් පිහිට කොට ගණු – මෙ මා පිහිටැ යි නො ගණු,
මහරජුනි! එ තෙමේ – සියලු දත යුතු දෙය දැන,
බුදු ය හැම දෙන යට කොට – සිටියේ නිරුත්තර වේ,
ඒ බුදුන් ඔබ දැන් – පිහිට කොට ගෙණ බැතියෙන්,
මෙ මට පිහිට ද වනු මැන – බවදුක් ගෙවේ ඉතිකින්"

යි කීවා ය. ඉක්බිති රජ තෙමේ, දැන් මම වැඩියක්ම බිය වෙමි' යි

'මේ මම් බෝ ලෙසින් – මුළා සිත් ඇත්තෙමි වෙමි,
හැම දිගනුදිග්, මාහට – වෙත්මය මුළා වූවෝ,
සාමාවතිය! ඔබ – මෙ මා රැකගත් හැමතින්,
සාමා! නී ම මාහට – පිහිට ද වනු යහතී"

යි මෙසේ ද කියේ ය. මේ ඉල්ලීම ද සාමාවතී තොමෝ වැළකුවා ය. රජ තෙමේ 'එසේ නම්, ඔබත්, බුදු රජුනුත් සරණ කොට ගණිම්, නිට වරයක් ද දෙමි' යි කියේ ය. 'වරය ගන්නා ලද්දේ වේවා, වරයෙන් මට වැඩෙක් නො වේ, බුදුරජුන් වෙත යමු' යි සාමාවතී තොමෝ, රජු බුදුරජුන් වෙත පමුණුවා ලූ ය. රජ තෙමේ බුදුරජුන් වෙත පැමිණ, සරණ ගොස්, පවරා බුදුරජුන් ප්‍රධාන මහාසඞ්ඝයා වහන්සේට, සත් දිනක් මහ දන් පිළිගන්වා, සාමාවතියට අඬගා, 'නී කැමැති වරයක් ගන්නැ' යි කී ය. 'මහරජ! මට රනින්, රිදියෙන්, මුත්තෙන්, මැණිකෙන් මුදලෙන් වතුයෙන් පිටියෙන් ඇ කිසිවකින් වැඩෙක් නැත, මට වරයක් පඬුරක් දෙන සේක් නම්, දෙනු මැනැවි, නිතර බුදුරජානන් වහන්සේ හා පන්සියයක් භික්ෂූන් වහන්සේලා මේ මාලිගාවට වැඩමවා ගන්නට වරයක්, නිතර බණ අසන්නට විහාරයට යන්නට වරයක්, මට අන් මොකුත් වුවමනා නැතැ' යි සාමාවතිය කිවු ය. රජ තෙමේ බුදුරජුන් සකසා වැද, 'සවාමිනි! භාග්‍යවතුන් වහන්ස! සාමාවතිය, ඔබ වහන්සේ නිතර මේ මාලිගාවට, පන්සියයක් භික්ෂූන් වහන්සේ ත් සමග වැඩමවා ගන්නට ඕනෑය යි ද, බණ ඉගෙණ ගන්නට ඕනෑය යි ද කියයි, එහෙයින් ඔබ වහන්සේ භික්ෂූන් වහන්සේලා ත් සමග නිතර මෙහි වැඩම කොට, ඇලාට බණ උගන්වනු මැනවැ' යි ආරාධනා කෙළේ ය. 'මහරජ! මට නිතර මෙහි එන්නට නො හැකි ය, බුදුවරුන් නිතර එක් තැනක ම යන සිරිතෙක් නැත්තේය, ඒ කරණු නො හැකි ය, මහාජන තෙමේ බුදුවරුන් ගැණ නිතර බලා-පොරොත්තු වේ ය' යි බුදුරජුන් වදාළ විට, 'එසේ නම්, සවාමිනි! එක් භික්ෂු නමකට, නිතර මෙහි වඩින්නට නියම කරණු මැනැවැ' යි රජ තෙමේ ඉල්ලී ය. එවිට, උන්වහන්සේ, ආනන්ද සථවිරයන් වහන්සේට එය භාර කළහ. එ තැන් සිට, ආනන්ද තෙරණුවෝ නිතර එහි වැඩ, ධම් දෙශනා කෙරෙති. දිනෙක බණ අසා, පැහැදී සිටි බිසෝවරු, උන්වහන්සේට තමන් පොරෝණා උතුරුසළු, පන් සියයක් එක් කොට පූජා කළහ. ඒ එක් උතුරු සළුවක් කහවණු පන් සියයක් අගනේ විය. දවසක්, එක් වතක් පමණක් ඇඳ සිටි බිසෝවරු දුටු රජ තෙමේ, 'තොප පෙර වූ උතුරුසළු කොහි දැ' යි ඇසී ය. 'අපි ඒවා අනඳ තෙරුන්ට පූජා කෙළෙමු' යි ඔවුහු කීහ. 'ඒ සියල්ල උන්වහන්සේ පිළි-ගත්තු දැ' යි ඇසූ විට, 'එසේය' යි කීහ. රජ තෙමේ තෙරුන් කරා ගියේ ය. ගොස්, පිළිසඳර කතාවෙහි යෙදුනේ ය.

රජ :- ස්වාමිනි! ඔබ වහන්සේට මාගේ බිසෝවරු ඊයේ සළු පන් සියයක් පූජා කළෝ ද?

තෙරණුවෝ :- ඔව්,

රජ :- සළු බොහෝ ගණනෙක් නො වේ ද?

තෙරණුවෝ :- ඔව්,

රජ :- මෙතෙක් සළුවලට ඔබ වහන්සේ කුමක් කරන්නහු ද?

තෙරණුවෝ :- මට සෑහෙන පමණ ගෙණ, සෙසු සළු දිරාගිය සිවුරු ඇත්තන්ට සිවුරු කර ගන්නට දෙන්නමි,

රජ :- දිරා ගිය සිවුරුවලට උත්වහන්සේලා කුමක් කරත් ද?

තෙරණුවෝ :- ඔවුහු, ඒ සිවුරු, වැඩියක් දිරා ගිය සිවුරු ඇත්තන්ට දෙන්නෝ ය,

රජ :- ඒ වැඩියක් දිරා ගිය සිවුරුවලට?

තෙරණුවෝ :- ඔවුහු ඒවා පසතුරුණුවලට යොදා ගන්නෝ ය,

රජ :- පරණ පසතුරුණු?

තෙරණුවෝ :- බුමුතුරුණුවලට යොදන්නෝ ය,

රජ :- පරණ බුමුතුරුණු?

තෙරණුවෝ :- පා පිසුම් කරන්නෝ ය,

රජ :- පරණ පා පිසුම්?

තෙරණුවෝ :- කෑලි කෑලි කොට මැටි හා කවලම් කොට බිත්ති පිරියම් කරන්නෝ ය,

රජ .- කොතරම් හොඳ ද, ස්වාමිනි! මෙතෙක් තැන් ගොසිනුත් ඒවා නො නැසුනේ නො වේ ද?

තෙරණුවෝ :- ඔව්! මහරජ! අපට දෙන ලද්ද කොතරම් කබල් මුවත් නො නැසෙන්නේ ය, දුන් අයට පින් පිණිස අපි ඒවා ප්‍රයෝජන ගන්නමෝ ය,

රජ තෙමේ සතුටින් ඉල්පගියේ, තවත් සළු පන් සියයක් ගෙන්වා, තෙරුන් පා මූල තැබ්බවී ය.

අහෝ! පිණ පුදුම ය! පුණ්‍යවිපාකය කෙසේ පිරිසිඳිය හැකි ද, ආනන්ද ස්ථවිරයන් වහන්සේ, තමන්ගේ පාමුල තබාලා දුන්නා වූ කහවණු පන්සියය පන්සියය අගනා පිළි, දහස දහස බැගින්,

ලක්ෂ වාරයක් ද, කහවණු දහස දහස අගනා පිළි, දහස දහස බැගින් දහස් වරක් ද, කහවණු ලක්ෂය ලක්ෂය අගනා පිළි, දහස දහස බැගින් සියවරක් ද ලැබූහ. මහාපිණ්ඩිත්තෝ ය, ආනන්ද ස්ථවිරයන් වහන්සේ. එක, දෙක, තුණ, හතර, පහ, දහය යන ඇලෙසින් ලැබූ පිළිවල ගණනෙක් නැත්තේ ය. බුදුරජුන් පිරිණිවුනු කල්හි, ආනන්ද ස්ථවිරයන් වහන්සේ, මුළු දඹදිව අනු මුළු නොහැර, හැම වෙහෙරැ වැසි භික්ෂූන් වහන්සේලාට, තමන් අයත් සිවුරු පිරිකර බෙදූ දුන්හ.

මෙතෙක් මාගන්දියා, සාමාවතිය නසන්නට හා, බුදුරජුන් පිරිහෙලන්නට කළ හැම උපායයෙක් ම මෙසේ නිෂ්ඵලව ගියේ ය. එහෙයින් ඕ තොමෝ 'මම යමක් කරම් ද, ඒ හැමෙකෙක් ඒ මා සිතූ ලෙසින් නොවන්නේ ය, දැන් කුමක් කරම් ද' යි සිතුවිලි දූලෙහි වැටී සිටියා ය. දිනෙක, උදෙනරජු උයන් ගිය කල්හි මාගන්දියා තොමෝ ගෙට වැද සුලුපියාට ලියුමක් ලියූ ය. ඒ ලියුමය මේ.

කොසඹැනුවරැ
උදෙන රජමැදුරේදී ය.

යටත්ව ලියමි.
පියතුමනි!

මම දැන් ලොකු අමාරුවක වැටී ඉඳිමි. කිසි අතෙකින් මට සැනසිල්ලෙක් නැත. කරණ වැඩවලින් මෙතෙක් කිසිත් පලෙක් නොලැබුනේ ය. රෑට නිදි නැත. සිතුවිලිවලින් ඔළුව අවුල් වී ගොස් ය. දැන් මට එක ම පිහිට පියතුමා ය. එහෙයින් පියතුමන් අද හෙට ම කල් නොහැර සාමාවතිය-ගේ පහයට ගොස් එහි තිබෙන රෙදි ගබඩාවලින් රෙදි ගෙණ තෙල් පොවා ඒ තෙල් රෙදිවලින් පහයෙහි හැම කණුවක් ම ඔතා කොයි ලෙසකින් නමුත් සාමාවතියත් ඇගේ පිරිවර ගැණුත් ඇලාට නොදැනෙන ලෙසට පහයට ඇතුල් කොට දෙරගුලු ලා පහයට ගිනි දල්වා ලනු මැනැවි. එසේ කොට පහයෙන් වහා බැස ආ යුතු ය.

මෙයට, කීකරු දූ,
මාගන්දියා
උදෙන රජබිසොව.

මේ ලියමන ලත් මාගන්දියාගේ සුලුපිය වූ මාගන්දිය බ්‍රාහ්මණ තෙමේ, සාමාවතියගේ මාලිගාවට ගොස්, පහයට නැගූ ගබඩා

හැර රෙදි ගෙණ ඒ රෙදි තෙල් හැළිවල බහාලා තෙමා කණු ඔතන්ට පටන් ගත්තේ ය. සාමාවතිය හා ඇයගේ පිරිවර ගැණු 'මේ කිමැ' යි කියමින් ඔහු වෙතට ගියහ. 'පහයෙහි කණු ශක්තිමත් කරණු පිණිස මෙහි හැම කණුවක් ම තෙල්රෙදිවලින් ඔතාලන්නැ යි රජතුමන් විසින් දන්වා එවා තිබේ, රජගෙයි යහපත අයහපත කිමැ යි දත නො හැක්කේ ය, ඒ නිසා නුඹලා මෙ තැනින් ගොස් තමන්ගේ කාමරවලට වැද වෙනදා මෙන් තම තමන්ගේ කටයුතු කළ යුතු ය' යි ඇලා කාමරතුළට කොට දොරගුලු ලා සැණෙකින් ගිනි තබා පහයෙන් බැස ගියේ ය. ගිනි දැල් දුටු සාමාවතී තොමෝ, පරිවාර සත්‍රීන් අමතා, 'නො බියවවු මුලක් නැති මේ සසරට බැස එන අප මේ ලෙසින් ගින්නෙන් දැවුනු අත්බව්වල සීමාවක් ගණනක් මොන ලෙසකින් වත් පිරිසිඳ නො දත හැකි ය, එහෙයින් අප්‍රමත්ත වවු' යි අවවාද කළා ය. ඇලා සීයල්ලෝ ම ගේ ගින්නෙන් ඇවිළ දන කල්හි **වෙදනා පරිග්‍රහකමීස්ථානය** සිතට නැගූහ. ඒ වේලෙහි උන් අතුරෙහි කෙනෙක් සෙද ගැමි වූහ. කෙනෙක් අනගැමි වූහ.

එදා සවස බොහෝ ගණනක් භික්ෂූන් වහන්සේලා බුදුරජුන් කරා ගොස් වැඳ, පසෙක හිඳ, 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! උදෙනරජු උයන් කෙළියට ගිය වේලේ, සාමාවතිය හුන් ඇයගේ පහය ගින්නෙන් දැවී ගියේ ය, සාමාවතී හා ඇගේ පරිවාරසත්‍රීහුද එහි තුළ හුන්හ, ඇලා ද, ගින්නට අසු වී දැවී ගියහ' යි දැන ගන්නට ලැබී තිබේ, එසේ නම්, ස්වාමීනි! ඇලාගේ උපත කොතැනැ වී ද, කෙසේ වී දැ' යි ඇසූ හ. 'මහණෙනි! මේ උපාසිකා සමූහයෙහි, කෙනෙක් සොතාපන්න ය, කෙනෙක් සකෘදාගාමී ය, කෙනෙක් අනාගාමී ය, ඒ සියලු උපාසිකාවෝ, ලැබූ ඵල ඇත්තෝ ව කලුරිය කළහ' යි වදාළ බුදුරජානන් වහන්සේ,

"මොහසබඳලොවැසී – පෙණේ නිස්සකු ලෙසිනී,
කෙලෙසුපදිබඳඅඳබල් – මොහඳුරෙන් පිරිවැරුණේ,
රූ ඇ සස්වතෙව් – වැටහේ මෙලොව හැමදේ,
බලන්නහුහට විදසුන් – නැණ යොදා නැත කිසිවක්"

යි උදන් ඇනූහ. 'මහණෙනි! සසර සැරිසරණ සත්වයෝ හැම කල්හි ම අප්‍රමත්ත ව පින්දම් නො කරති, ප්‍රමත්ත ව පව්කම් ද කරති, සසර ඇවිදින සත්වයෝ, සැප දුක් දෙකට ම යටත් වන්නෝ එහෙයිනැ' යි උන්වහන්සේ එ වේලෙහි දහම් දෙසූහ.

උයන් ගිය උදෙන රජ තෙමේ 'සාමාවතියගේ පහය ගින්නෙන් දැවේ ය' යි අසා වේගයෙන් එහි ආයේ ය. ඔහු එ තැනට ලඟා වන්නට පෙරාතුව ම පහය දැවී තුබුනේ ය. එ දත් ඔහුගේ

ගත සිත දෙදරා ගියේය. බලවත් සින් තැවිල්ලට පත් වූ රජ තෙමේ, අමාත්‍යමණ්ඩලය රැස් කරවා සාකච්ඡා කෙළේ ය. එහි දී 'මේ සාහසික ක්‍රියාව මාගන්දියා විසින් කරවන ලදු' යි හැම දෙනකුන් විසින් එකමනික ව තීරණය කරණ ලද්දේ ය. ඔවුහු, රජුගේ නියමයෙන් මාගන්දියා එතැනට පමුණුවා 'මේ මිනී මැරුම තී විසින් කරණ ලද දු' යි ඇසූ හ. 'අනේ! පින්වන්නි! මම ඔබඳු සැහැසි කම් කරම් ද, සාමාවතිය හා මා හා අතර කවදත් කිසි වෙනසෙක් නො වී ය, මාගේ සහෝදරිය සාමාවතී, මම ඇයගෙන් මොනවා ගන්නට ඇයට මෙබඳු සැහැසි කම් කරම් ද, මෙය මාගෙන් ඇසීම මට පුදුමයෙකි, රජතුමන් වැඩිපුර ආදරය දක්වන්නේ මට ය, වැඩිපුර සලකන්නේ ත් මට ය; සොයා බලන්නේ ත් මා ගැණ ය, එසේ රජතුමන්ගේ සැලකුම් බැලුම් ලබන මම රජතුමන්ට විපත් කරම් ද, මෙහි ලා මට මෙසට කියන්ට යමක් නැතැ' යි මාගන්දියා නිහඬ වූවා ය. එවිට, රජ තෙමේ, මාගන්දියා පිටත් කොට යවා, ඇමැතියන් හා සාකච්ඡාවට බැස, 'මම එකලා ව ඔබගෙන් අසා බලන්නෙමි' යි ඇමැතියන් පිටත් කොට හැරියේ ය. ඇමැතිවරුන් එතැනින් ගිය නොබෝ වේලාව කින්, රජ තෙමේ මාගන්දියා කැඳවා, 'පිය සොඳුර! මම මෙතෙක් ජීවත් වූයෙම්, හැම තැනෙක ම සැක ඇති ව ය, මේ නිසා බොහෝ සේ රජයේ කටයුතු ද අතපසු විය, සාමාවතිය මෙහි ආදු පටන් ම මට අස්වැසිල්ලෙක් නො වී ය, තරමක අස්වැසිල්ලක් ලැබුනේ ඔයා ආදු සිට ය, නයකු ලා මා මරන්නට තැත් කළ අවස්ථාවේ, එයින් බේරුණේ ඔයා නිසා ය, ඔයා යම් යම් අවස්ථාවන්හි කී දේ මා නො පිළිගත්තේ, අනික් බිසෝවරුන් අමුත්තක් සිතා ය යන අදහසිනි, සාමාවති වාසය කළා, හැම මොහොතක ම මාගේ සිදුරු සොයමින් ය, මා නසන්නට උපාය යොදමින් ය, මෙතෙක් මට නිදි නො ලැබුනේ ය, දැන් ඒ කරදර අවසාන ය, ඔයා මට ලබා දුන් මේ සැනසිල්ල සුලු එකෙක් නො වේ, මෙහි තුබූ හැම කරදරයක් ම මෙයින් අවසානයට ගියේ ය, දැන් බිය රහිත ව නිදිය හැකි ය, කෑ හැකි ය, උයන් කෙළියට යා හැකි ය, මේ කලේ ද ඔයා විසින්ය යනු මාගේ පිළිගැණීම ය, එ හෙයින් ඔයාට වරයක් දීම සුදුසු ය යි මට දැන් වැටහින, කියන්න, වුවමනා වරය' යි කීයේ ය. එවිට මාගන්දියා තොමෝ 'දෙවයන් වහන්ස! කාරණය, තේරුම් ගත් සැටි හරි ය, දෙවයන් වහන්සේ නසන්නට සාමාවතිය කළ දේ දන්නේ මම ය, මම සිටියා ඉවසිල්ලෙන් නො වෙමි, මැය නසා රජතුමන්ගේ ජීවිතය, කෙසේ රැක ගණිම් දැ යි රැ දෙවේලේ සිතමින් සිටියෙමි, මෙය කලේ මාගේ බාප්පා ය, මාගේ නියමය පිට ය, සංවිධානය පරිදිය, ඔබතුමන්ගෙන් වර

ගන්නට මේ නො කෙළෙමි, මට වුවමනා කළේ ඔබතුමන් රැක ගැන්ම ය' යි මහත් සතුටින් කියා සිටියා ය. 'පියසොඳුර! මේ වැඩේ, ලොකු වැඩෙක්, එක් වරයක් දිය යුතු තරම් කුඩා වැඩෙක් නො වේ මෙ ය, මෙසේ නො වූයේ නම්, මට වන්නේ ලොකු විනාසයෙකි, එහෙයින් ඔයාගේ සුලුපියා ඇතුළු සියලු නෑයන් අද හෙට ම ගෙන්වා ගන්න, ඔවුන්ට හොඳට කෑම බීම පිළියෙල කරන්නැ' යි රජ තෙමේ කීයේ ය. මාගන්දියා තොමෝ 'රජ මැදුරට එන්නැ' යි නෑයන්ට දන්වා යැවූ ය. නෑයෝ එකකුත් නො තබා එහි ආහ. ඒ ආ හැම කෙනෙකුට ම, රජ තෙමේ සත්කාර කරවී ය. මේ සත්කාරය අසා නො නෑයෝ ත් ආහ. රජ තෙමේ කෑම් බීම් දී සියල්ලන් රජමැදුර මිදුලෙහි රැස් කර වී ය. කම්කරුවන් ලවා එහි නැබ පමණට ගැඹුරු වූ ලොකු වළක් සාරවා උන් හැට දෙනා ඒ වළැ දමා උන්ගේ හිස පිට පිදුරු බහා ගිනි තැබ්බවී ය. මාගන්දියාගේ සිරුරෙහි තද තද තැනින් ආයුධයකින් මස් කඩා ගලවා තෙල්ඇතිලියක් ලිප තබ්බවා ගැල වූ මස්කැබලි එහි ලා කැවුම් මෙන් බද්දවා ඇයටම කැවූයේ ය.

මේ අතර දවසෙක ධර්මශාලාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා 'සාමාවතියට සිදු වූ මේ විපත ඇයට නො සුදුසු එකකැ' යි කීහ. ඒ වේලෙහි බුදුරජානන් වහන්සේ එහි වැඩම කොට 'මහණෙනි! සාමාවතියට සිදුවූ මේ මහාවිපත ඇයගේ මේ ජීවිතයේ හැටියට නම් නො සුදුසු ය යි මම ද කියමි, එහෙත් ඇය පෙර කළ අකුශලකර්මයක් අනු ව නම් නො සුදුසුය යි නො කියහැකි ය, සාමාවතිය හා ඇයගේ පරිවාරස්ත්‍රීන් පෙර කරණලද කර්මයකට අනු ව මේ මරණය ලදැ' යි වදාළ විට 'ස්වාමිනි, ඇලා ඒ පෙර කරණ ලද කර්මය අපට පහදා දෙන සේක්වා' යි ආරාධනා කළහ.

'මහණෙනි! පෙර, බඹදත්කාලයෙහි බරණැස් නුවර බඹදත් රජගෙදරු පසේ බුදුවරු අට නමක් නිතර දන් වළඳති, පන් සීයයක් ස්ත්‍රීහු, උන්වහන්සේලාට උපස්ථාන කරති, ඒ බුදුවරුන් අතුරෙන්, සත් නමක් හිමාලයට ත්, එක් නමක් ගං ඉවුරකට ත් වැඩම කරති, ගංඉවුරට වඩින පසේ බුදු රජ තෙමේ, එහි තණ ලැහැබෙක ධ්‍යාන කරමින් සිටියි, එක් දවසෙක, රජ තෙමේ, පසේ බුදුවරුන් වැඩිය කල්හි, ඒ ස්ත්‍රීන් හා දිය කෙළියට ගියේ ය, ගඟෙහි බැස රැ වනතුරු දියකෙළියෙක යෙදුනු ඒ ස්ත්‍රීහු, සීත ඉවසනු නො හැකි ව, ගොඩ නැගී, ගිනි තපින්නට තැනක් පිළියෙල කර ගන්නට සිතා, ඈත මෑත හැසිරෙන්නෝ, පසේ බුදුරජුන් ධ්‍යානයට සම වැද හුන් තණලැහැබ දැක, වැඩිදුර නො විමසා තණගොඩෙක යන කල්පනාවෙන් එහි ගිනි දල්වා

ගිනි තැප්පාහ, තණලැහබ මුළුමනින් ද, ගිය පසු, එහි හුන් පසේබුදුරජුන් දැක, 'අය්යෝ! අපි නටුම්හ, අපි නටුම්හ, අපගේ බුදුරජාණන් වහන්සේ කිත්නෙන් දැවෙති, අය්යෝ! සිදුවූයේ ලොකු වරදෙකි, මෙය රජු දැන ගත්තොත් අප නසන්නේ ය, රජුට දැනගත නොහැකි ලෙසින් හොඳට ම පුළුස්සන්නෙමි' යි සියලු දෙන එක් ව දර ගෙණවුත් පසේ බුදුරජුන් මත්තෙහි ගොඩ ගසා ගිනි තබා සියල්ලෝ ම නික්ම ගියහ, ඇලා එය පළමු කොට කලෝ නොදැන ය, එහෙයින් මුල්වර කමීයෙන් නොබැදුනෝ ය, පසුව දැන සිතා කළ බැවින්, වධකචෙතනා ඇති ව කළ බැවින් කමී යෙන් බැඳුනෝ ය, සමාපත්තිය තුළ සිටින කෙනෙකුහට ගැල් දහසක දර මතුපිට ගසා ගිනි දැල්වී ද, එයින් ඔහුට උණුසුමක් පමණකුත් දන්වන්නට නොහැක්කේ ය, එහෙයින් පසේ බුදුරජ තෙමේ සමාපත්තියෙන් නැගිට සිටියේ ය, ඒ කමීය කළ මේ සත්ත්වයා, අවුරුදු ලක්ෂගණනක් නරකයෙහි ඉපිද පැසී ඒ කමීයාගේ විපාකාව ශෙෂ වියෙන් අත්බව් සියයෙක ම මේ ලෙයින් ගෙය තුළ ගිත්නෙන් දැවුනෝ ය, මහණෙනි! මේ මැලා පෙර කරණ ලද කමීය' යි වදාළ බුදුරජුන් අතින් නැවැත ත් ඒ භික්ෂූහු 'ස්වාමීනි! බුදුරජාණන්වහන්සේ කුදු වූවා කුමන කමීයකින් ද? නුවණැත්ති වූවා කුමන කමීයකින් ද? සෝවන්පලයට පැමිණියා කුමන කමීයකින් ද? අනුන්ගේ පණිවිඩ ගෙණයන්නී වූවා කුමන කමීයකින් ද?' යි ඇසූහ.

'මහණෙනි! ඒ පසේ බුදුරජ තෙමේ මදක් කුදු වූ සවාභාව ඇත්තේ ය, උන්වහන්සේට උවැටැන් කරණ එක් සත්තියක් කවට කමට කම්බිලියක් පොරවා ගෙණ රත්තැටියකු ත් අතින් ගෙණ අපගේ බුදුරජාණන් වහන්සේ මෙසේ වඩිනි සි වක ගසා කුදු ගැසී උන්වහන්සේ යනෙන ලෙසින් ගමන් කළා ය, කුදු වූවා කවට කමට කළ මේ කමීයෙන් ය, දිනෙක උණු කිරිබත් පිළිගත් පසේ බුදුවරුන්ගේ අත් දුවෙන්නට වීස, එවිට උන්වහන්සේලා කිරි බත් පිරූ පාත්‍ර අතින් අතට මාරු කෙරෙත්, ඒ දුටු මේ සත්තිය තමන් ලඟ තුබූ දළකඩින් කළ වළලු අටක් ඒ අට නමට දී මෙහි පාත්‍ර තබනු මැනැවැ' යි කීවා ය, උන්වහන්සේලා ඇයදෙස බැලූහ, ස්වාමීනි! මෙයින් මට වැඩෙක් නැත, මේවා නුඹ වහන්සේලාට පිදිමි, ගෙණ වඩිනු මැනැවැ යි කිවූ ය, උන්වහන්සේලා නන්දමූලකා නම් ගල්තල්ල බලා වැඩි සේක, අදත් ඒ වළලු එහි නොනැසී තිබේ, ඕ තොමෝ වළලු පිදූ ඒ කමීඅකනියෙන් දැන් තෙවලාදර වූ මහා නුවණැත්ති වූ ය, බුදුවරුන්ට කළ උවැටැනෙන් සෝවන් පලයට පැමිණියා, මේ මැය පෙර කළ කමීය, තව ද මැ කසුප් බුදු රජුනන් වහන්සේ දවස බරණැස් සිටුගේ දුවක් වූ ය, දවසෙක ඕ තොමෝ පස්වරු වේලෙහි කැඩපතක් ගෙණ සිය සිරුර

සරසන්නට වූ ය, ඒ අතර එක් මෙහෙණක් ඇය දකිනු රිසියෙන් එහි පැමිණියා ය, මෙහෙණෝ රහත් වූවෝ ද, සවස්වේලෙහි උපස්ථායකකුලයන් දකිනු රිසියෙන් උපස්ථායකකුල කරා යති, මෙහෙණ එහි පැමිණිවේලේ සිටුදුවවෙත පණිවිඩ ගෙණයන දූස්සක් නො සිටියා ය, සිටුදුව මම ආයස්මාව වදිමි, ස්වාමිනි! කරුණා කොට මාගේ අර පෙණෙන අබරණ පැස මෙහි ගෙණ දෙනු මැනැවැ' යි කිවු ය, මෙහෙණ තොමෝ මා මෙය මැයට ගෙණ නො දුන්නී නම් මෝ මා කෙරෙහි අමනාපයෙන් මැරී ගොස් අපායයෙහි උපදින්නී ය, මා මෙය ගෙණවුත් දුන්විට ඒ පවින් අනුන්ගේ පණිවිඩ ගෙණ යන දූස්සක් ව උපදින්නී ය, නිරයගින්නට දරවනුවට වඩා දූස්සක් ව ඉපැත් ම යහපතැ' යි ඇය කෙරෙහි කරුණා උපදවා අබරණපැස ගෙණවුත් ඇයට දුන්නු ය, ඒ පවින් ය මෝ අනුන්ගේ පණිවිඩ ගෙණ යන දූස්සක් වූවා' යි වදාළ සේක.

පසු දවසෙක ධර්මශාලාවෙහි හුන් භික්ෂූන් වහන්සේලා අතර 'සාමාවතී ප්‍රමුඛ සත්‍රීහු ගෙයි දූවුනෝ ය, මාගන්දියාගේ නෑයෝ පිදුරු ගින්නෙන් දූවුනෝ යකඩනගුලින් බිඳුනෝ ය, මාගන්දියා තොමෝ කකියන තෙලෙහි පැසුනු, මොවුනතුරෙහි ජීවත් වන්නෝ කවුරු ද? මළෝ කවුරු දූ' යි කතාවක් උපන. ඒ අතර බුදුරජානන් වහන්සේ එහි වැඩි සේක. එහි හුන් සියලු දෙනා වහන්සේ නිහඬ වූහ. 'තමුසේලා ඇයි නිහඬවුනෝ? කතා කළෝ කුමක් ගැණ දූ' යි අසා භික්ෂූන් කතා කරමින් හුන් කාරණය දැන්වූ විට 'මහණෙනි! යම් කෙනෙක් ප්‍රමත්ත වූවෝ ද, ඔවුහු අවුරුදු සියයක් ජීවත් වන්නෝ නමුත් මළෝ ය, මළවුන් වැන්නෝ ය, යම් කෙනෙක් අප්‍රමත්ත වූවෝ ද ඔවුහු මළාහු නමුත් නො මළෝ වෙති, ජීවත් වන්නෝ ය, ඔවුහු, මාගන්දියා ජීවත් වන්නී ද, මළ එකියක, සාමාවතීලා මළාහු නමුත් ජීවත් වෙති' යි වදාරා නැවැත 'අප්‍රමත්තයෝ නො මැරෙති' යි දක්වන්නට මේ ධර්මදෙශනාව කළ සේක.

අප්පමාදෙ අමතපදං පමාදෙ මච්චුනො පදං,
අප්පමත්තා න මියන්ති යෙ පමත්තා යථා මතා,
එතං විසෙසතො ඤත්වා අප්පමාදම්හි පණ්ඩිතා,
අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා,
තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා,
ඵුසන්ති ධීරා නිබ්බාණං යොගක්ඛෙමං අනුත්තරන්ති.

අප්‍රමාදය තෙමේ නිවනට කරුණු වේ. ප්‍රමාදය තෙමේ මරණ යට කරුණු වේ. නො පමාවූවෝ නො මියෙති. යම් කෙනෙක් පමාවූවෝ නම්, ඔවුහු මළවුන් වැනි වෙති.

'නො පමාවූවෝ නො මියෙති, යම් කෙනෙක් පමාවූවෝ නම්, ඔවුහු මළවුන් වැනි වෙති' යන මෙය වෙසෙසින් දැන නො පමාබවෙහි ඇලුනු බැඳුනු නුවණැත්තෝ ආර්‍යගොචරයෙහි ඇලුනෝ නො පමාබවෙහි අතිශයින් සතුටු වෙති.

ධ්‍යාන කරණසුලු වූ නිතිපැවැති කායික චෛතසික වීර්‍යය ඇති නිතිපැවැති දුඝපරාක්‍රමයෙන් යුත් ඒ නුවණැත්තෝ චතුර්විධයොගයන්ගෙන් නිර්භය වූ නිර්වාණය ස්පර්ශ කරති.

අප්පමාදෙ = අප්‍රමාදය තෙමේ. නො පමාබව. සිහි ඇතිබව

අප්‍රමාදය කිමැ යි මෙහිලා දත යුතු ය. **'අප්පමාදෙ නාම පමාදස්ස පටිපක්ඛභූතො එකො ධම්මො'** යන මෙයින් අප්‍රමාදය නම්, ප්‍රමාදයට පටහැනි ව සිටි විරුඬ ව සිටි එක් ධර්ම යෙකැ යි දක්වන ලද්දේ ය. යම් ධර්මයෙක් ප්‍රමාදයට පටහැනි ව නැගී සිටියේ ද ඒ ධර්මය අප්‍රමාදය යි මෙයින් අනුශාසිත ය.

ප්‍රමාදයට විරුඬධර්මය අප්‍රමාදය යි කියන ලද්දේ ද ඉතා ම කෙටියෙනි. අප්‍රමාදය නම් අරුත් විසින් සිහියෙන් නො තොර වීම ය. නිතර එළඹ සිටි සිහියට අප්‍රමාද යනු නමෙකි. මෙයින් පෙණෙනුයේ සිහියෙන් වෙන් නොවී සිහි ඇති ව කෙරෙණ කායි කාදීආචාරයන්ගේ මනා පැවැත් ම, සුචරිතධර්මවිෂයයෙහි නිතොර මැනැවින් එළඹ සිටි සුචරිතධර්ම හා එක් ව යෙදුනු සිහිය, අප්‍රමාදය බව ය. **'සො පන අත්ථතො සතියා අවිප්පවාසො නාම නිච්චං උපඞ්ඨිතාය සතියා චෙතං නාමං'** යි ඒ කීහ.

අන් ඇදුරු කෙනෙක් සතිසම්පජඤ්ඤය හා එක් ව යෙදුනු චතුර්විධ අරූපසකන්ධය අප්‍රමාදැ යි කියත්, **'අපරෙ පන සතිසම්පජඤ්ඤයොගෙන පවත්තා චත්තාරො අරූපිනො ඛන්ධා අප්පමාදෙති වදන්ති'** යනු එහි පාලි ය.

'එකො ධම්මො බහුපකාරො, කතමො එකො ධම්මො අප්පමාදෙ කුසලෙසු ධම්මෙසු' යන මේ පාලියෙන් අප්‍රමාදය, සිල්පිරීම, ඇස්-කන්-නාස් ආදි ඉඳුරන්හි හික්මීම, බොජුන්හි පමණ දැනීම, නිදි දුරු කිරීම යනාදී නිවරද වූ සියලු කුශලධර්ම යන්හි බොහෝ උපකාරව සිටුනා බව පෙණෙන්නේ ය. ඒ නිසා ම බුදුරජානන් වහන්සේ **'යාවතා භික්ඛවෙ! සත්තා අපදා වා ඒපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤී වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ අප්පමාද මූලකා අප්පමාදසමොසරණා අප්පමාදෙ තෙසං ධම්මානං අග්ගමක්ඛායති'** යනු වදාළ සේක.

'මහණෙනි! පා නැත්තා වූ දෙ පා ඇත්තා වූ සිවු පා ඇත්තා වූ බොහෝ පා ඇත්තා වූ රූ ඇත්තා වූ රූ නැත්තා වූ සංඥී වූ අසංඥී වූ නෛවසංඥීනාසංඥී වූ යම් පමණ සත්වයෝ වෙත් නම් ඒ සියල්ලන් අතර තථාගත තෙමේ අග්‍රය යි කියනු ලැබේ ද, එ පරිද්දෙන් යම්කිසි කුශලධර්මයෝ වෙත් නම්, ඒ සියලු කුශල ධර්මයෝ අප්‍රමාදය මුල්කොට ඇත්තාහු ය. අප්‍රමාදය පිහිට කොට ඇත්තාහ. (එහෙයින්) අප්‍රමාදය ඔවුනට අග්‍රය යි කියනු ලැබේ' යනු එහි කෙටි තේරුම ය. මෙයින් පෙණෙනුයේ සියලු සත්වයන් අතුරෙහි බුදුරජානන් වහන්සේ ම ශ්‍රෙෂ්ඨබව ත් එ මෙන් සියලු කුශලධර්ම අතුරෙහි අප්‍රමාදය ම ශ්‍රෙෂ්ඨබවත් ය.

අප්‍රමාදය මුල් කොට ඇති අප්‍රමාදයෙන් මතු වී එන කුශල ධර්මයෝ කාමාවචර-රූපාවචර-අරූපාවචර-ලොකොත්තර යි භූමි-භෙදයෙන් සිවුවැදැරුම් ය. එහෙත් අප්‍රමාදය කාමාවචර යි. 'කාමාවචර වූ අප්‍රමාදය කාමාවචරකුශලධර්මයන්ට කෙසේ මුල් වන්නේ දැ?' යි මෙහි ප්‍රශ්නයෙක් නැගේ. මෙලොව පරලොව වශයෙන් ලැබිය යුතු වූ ස්වර්ගමනුෂ්‍යසම්පත්තිප්‍රතිලාභය වනුයේ අප්‍රමාදයෙන් ම බැවින් අප්‍රමාදය කාමාවචරකුශලයනට මුල් වන්නේ ය, යනු එහිලා පිළිතුරු ය. උසස් වූ ලොකොත්තරකුශල ධර්මයෝ ද අප්‍රමාදයෙන් ම ලැබිය යුත්තෝ ය. අප්‍රමාදයෙන් තොර ව නො ලැබිය හැක්කෝ ය, ලොකොත්තරකුශලයෝ ත්. සියලු බුදු පසේ බුදු මහරහත්හු අප්‍රමාදයෙහි පිහිටා සදෙවක-ලොකයා විසින් පිදිය යුතු බවට පත් වූවාහු ය.

දුරු කටයුතු අකුශලධර්ම දුරුකිරීමත් සම්පාදනය කටයුතු කුශලධර්ම සම්පාදනයකිරීම ත් දෙක ම වන්නේ ස්මෘතිඅවිප්‍රවාසය යි කියූ අප්‍රමාදයේ බලයෙනි. **'ඉමෙ අකුසලා ධම්මා පහාතබ්බා ඉමෙ කුසලා ධම්මා සම්පාදෙතබ්බා'** යනාදීන් වදාළ සූත්‍රධර්ම-යෙන් එය පැහැදිලි වන්නේ ය. ස්මෘතිඅවිප්‍රවාසය අප්‍රමාදය යි පිළිගන්නවුන් විසින් මෙය ද පිළිගත යුතු ය.

සියලු කුශලධර්ම, අප්‍රමාදය මුල් කොට ඇති බැවින් තෙවළා-දහම් අප්‍රමාදයෙහි ගැලී සිටි බැවින් අප්‍රමාදය යන මේ පදය මහත් අරුත්රැසක් ගැබ් කොට ගත්තේ ය.

'සෙය්‍යථාපි භික්ඛවෙ! යානි කානි චි ජඞ්ගමානානං පාණානං පදජාතානි, සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති යදිදං මහන්තත්තෙන, හත්ථිපදං තෙසං අග්ගමක්ඛා-යති යදිදං මහන්තත්තෙන, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදො තෙසං අග්ගමක්ඛායති' යන මේ දෙශනාව ද

කියන්නී ඒ වග ය, 'මහණෙනි! ඇවිදින සත්වයන්ගේ පාදයෝ ඇත් පියවරෙහි යම් සේ ඇතුළත් වෙත් ද, ඇත් පියවර ම මහත් බව කරණකොට ඒ අන් හැම පියවරකට ම වඩා ශ්‍රේෂ්ඨ වේ ද, එමෙන් යම්කිසි කුශලධර්මයෝ වෙත් නම් ඒ සියලු කුශලධර්මයෝ අප්‍රමාදය මූල් කොට ඇත්තෝ ය, අප්‍රමාදය පිහිට කොට ඇත්තෝ ය, අප්‍රමාදය ඒ සියලු කුශලධර්මයන්ට අග්‍රය යි කියනු ලැබේ ය' යනු උඩ කියූ පාලියේ කෙටිසිංහල තේරුම ය.

සියලු කුශලධර්මයන්ට මූල් වූ ඒ මේ අප්‍රමාදයෙහි මහත්බව දක්වන්නට බුදුරජාණන් වහන්සේ තව තවත් කරුණු ලොකයා අතර ප්‍රකට කරුණු ගෙණ හැර පෑහ. මෙහි පහත දැක්වෙන්නේ එයින් සුවලපයෙකි.

'සෙය්‍යථාපි භික්ඛවෙ! කූටාගාරස්ස යා කාචි ගොපානසියො, සබ්බා තා කූටඞ්ගමා කූටනින්නා කූටසමොසරණා, කූටං තාසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා සඞ්ඛතෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා, අප්පමාදෙ තෙසං ධම්මානං අග්ගමක්ඛායති.

සෙය්‍යථාපි භික්ඛවෙ! යෙ කෙචි මූලගන්ධා, කාලානුසාරියං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා, -පෙ- අප්පමාදෙ තෙසං ධම්මානං අග්ගමක්ඛායති.

සෙය්‍යථාපි භික්ඛවෙ! යෙ කෙචි සාරගන්ධා, ලොහිතචන්දනං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා -පෙ- අප්පමාදෙ තෙසං ධම්මානං අග්ගමක්ඛායති, සෙය්‍යථාපි භික්ඛවෙ! යෙ කෙචි පුප්ඵගන්ධා, වස්සිකං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා -පෙ- අප්පමාදෙ තෙසං ධම්මානං අග්ගමක්ඛායති.

සෙය්‍යථාපි භික්ඛවෙ! යෙ කෙචි ඛුද්දරාජානො, සබ්බෙ තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයන්තා භවන්ති, රාජා තෙසං චක්කවත්ති අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා -පෙ- අප්පමාදෙ තෙසං ධම්මානං අග්ගමක්ඛායති.

සෙය්‍යථාපි භික්ඛවෙ! යා කාචි තාරකරූපානං පභා, සබ්බා තා චන්දප්පභාය කලං නාගඝනන්ති සොළසිං, චන්දප්පභා තාසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා, -පෙ- අග්ගමක්ඛායති.

සෙය්‍යථාපි භික්ඛවෙ! සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සුක්කමානො සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා -පෙ- අගගමක්ඛායති.

සෙය්‍යථාපි භික්ඛවෙ! යා කාචි මහානදියො, සෙය්‍යථිදං? ගඞ්ගා යමුනා අචිරවතී සරභු මහි, සබ්බා තා සමුද්දඞ්ගමා සමුද්දනිනනා සමුද්දපොනා සමුද්දපබ්භාරා, මහා සමුද්දො තාසං අගගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ! යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා, අප්පමාදො තෙසං ධම්මානං අගගමක්ඛායති'

කූටාගාරයක වූ සියලුපරාල, එහි කැණිමඩලට නැමී පවත්නේ යම් සේ ප්‍රධාන වේ ද, මූලගන්ධයන් අතුරෙහි කලුවැල් සුවඳ යම් සේ ප්‍රධාන වේ ද, සාරගන්ධයන් අතුරෙහි රත් සඳුන් සුවඳ යම් සේ ප්‍රධාන වේ ද, පුෂ්පගන්ධයන් අතුරෙහි දැසමන්මල් සුවඳ යම් සේ ප්‍රධාන වේ ද, ලොකයෙහි රජුන් අතුරෙහි සක්විති රජතෙමේ යම් සේ ප්‍රධාන වේ ද, සරත්කල්හි පහ වූ වලාපටල ඇති අහසෙහි සූර්‍ය තෙමේ සියලු අඳුරු දුරු කොට බබලන්නේ යම් සේ ප්‍රධාන වේ ද, සප්තමහාගඞ්ගාවෝ මුහුදට ගලා බස්නෝ ඔවුනට මුද යම් සේ ප්‍රධාන වේ ද, එ මෙන් සියලු කුශලධර්මයෝ අප්‍රමාදය පිහිට කොට ඇත්තෝ, ඔවුන් හැමට අප්‍රමාදය ප්‍රධාන වේ, යනු මේ දෙශනා පාලියෙහි ඉතා කෙටි තේරුම ය.

කුසිනාරානුවර මල්ලරජදරුවන්ගේ සල්වනඋයන්හි පිරිනිවන් ඇඳෙහි වැදහොත් බුදුරජානන් වහන්සේ බුදුබවට පැමිණි තැන් පටන් සතළිස් පස් වසක් මුළුල්ලෙහි සදෙවක ලොකයාගේ හිත සැප පිණිස දෙශනා කොට වදාළ සියලු ධර්මය එක් තැන් කොට එක් පදයක සංග්‍රහ කොට **'හන්දදානි භික්ඛවෙ! ආමන්තයාමි, වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ'** යනු වදාළ සේක. අප්‍රමාදයෙහි මහත්බවම ය, මෙයිනුත් වදාළෝ.

දිනෙක සැවැත්නුවර දෙව්රම් මහවෙහෙර වැඩ විසූ බුදු රජානන් වහන්සේ වෙත ගිය පසේනදීකොසොල් මහරජ තෙමේ වැඳ, එකත්පසෙක හිඳ, 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මෙලොව පරලොව දෙක්හි මිනිසුනට එක සේ වැඩ සිදු කර දෙන ධර්මයෙක් තිබේ දැ' යි ඇසී ය. 'ඔව්! මහරජ! තිබේ ය' යි වදාළ විට 'ඒ කිමැ' යි නැවැත ඔහු ඇසී ය. 'මහරජ! ඒ නම් අප්‍රමාදය' යි වදාළ බුදුරජානන් වහන්සේ එහිලා ඔහුගේ වැඩියක් දැනීම සඳහා,

"ආයුං ආරොගියං වණ්ණං සඝගං උච්චාකුලීනතං,
රතියො පත්ථයනෙතන උළාරෙ අපරාපරෙ,

අපපමාදං පසංසන්ති පුඤ්ඤකිරියාසු පණ්ඩිතා,
අපපමත්තො උභො අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතො,

දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යො චත්ථො සම්පරායිකො,
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චති"

යනු වදාළෝ ය.

ආයුෂය, නීරොගබව, සිරුරුපැහැඟ, සුගීය, උසස් කුල ඇතිබව, තවත් නොයෙක් මහත් පස්කම් ඇලුම් හා ධ්‍යාන විදර්‍ශනාමාගී ඵල ඇලුම් පතන්නහු විසින් අප්‍රමාදය ම කටයුතු ය. බුද්ධාදිපණ්ඩිතයෝ දන් දීම් ආ පුණ්‍යක්‍රියාවන්හි අප්‍රමාදය ම පසසත්. අප්‍රමත්ත වූ පණ්ඩිත තෙමේ මෙලොව පරලොව දෙක්හි ම ගිහි පැවිද්දන් පිළිබඳ හැම අර්‍ථයක් ම අප්‍රමාදහෙතුවෙන් සිදුකර ගණී යි. අර්‍ථප්‍රතිලාභය හෙතු කොට, ඛෘතිසම්පන්න පුදගල තෙමේ පණ්ඩිත යි කියනු ලැබේ.

කායදුච්චරිතය පහා, කායසුචරිතය වඩා, එහි නො පමාව වචීදුච්චරිතය පහා, වචීසුචරිතය වඩා, එහි නො පමාව මනොදුච්චරිතය පහා, මනොසුචරිතය වඩා, එහි නො පමාව මිච්ඡාදිට්ඨිය පහා, සම්මාදිට්ඨිය වඩා, එහි නො පමාව මුළු බුදුදහම ගැබ් කොට ගත් සියලු කුශලධර්‍මයන්ට පිහිට වූ අප්‍රමාදය කටයුතු ය. යම් දවසෙක යමකු පිළිබඳ කායදුච්චරිතය පැහුනේ, කායසුචරිතය වැඩුනේ ද, වචීදුච්චරිතය පැහුනේ, වචීසුචරිතය වැඩුනේ ද, මනොදුච්චරිතය පැහුනේ, මනොසුචරිතය වැඩුනේ ද, මිච්ඡාදිට්ඨිය පැහුනි, සම්මාදිට්ඨිය වැඩුනි ද, ඔහු පරලොව වන මරණයට බිය වන්නේ නොවේ. මේ මෙහි දෙශනාව.

'චතූහි භික්ඛවෙ! ඨානෙහි අප්පමාදෙ කරණීයෙ, කතමෙහි චතූහි? කායදුච්චරිතං භික්ඛවෙ! පජහථ, කායසුචරිතං භාවෙථ, තත්‍ථ ච මා පමාදත්‍ථ, වචීදුච්චරිතං භික්ඛවෙ! පජහථ, වචීසුචරිතං භාවෙථ, තත්‍ථ ච මා පමාදත්‍ථ, මනොදුච්චරිතං භික්ඛවෙ, පජහථ, මනොසුචරිතං භාවෙථ, තත්‍ථ ච මා පමාදත්‍ථ, මිච්ඡාදිට්ඨිං භික්ඛවෙ! පජහථ, සම්මාදිට්ඨිං භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ, යතො ඛො භික්ඛවෙ! භික්ඛුනො කායදුච්චරිතං පහීනං හොති කායසුචරිතං භාවිතං, වචීදුච්චරිතං පහීනං හොති වචීසුචරිතං භාවිතං, මනොදුච්චරිතං පහීනං හොති මනොසුචරිතං භාවිතං, මිච්ඡාදිට්ඨි පහීනා හොති සම්මාදිට්ඨි භාවිතා, සො න භායති සම්පරායිකස්‍ස මරණස්‍සාති'

රහතුන් වහන්සේ මෙලොව පරලොව දෙක්හිම මරණයට බිය වූවෝ නො වෙති. මේ වනාහි දෙශනාමාත්‍රයෙකි. රහතුන් වහන්සේ ම මෙහිලා ගැණෙත්.

තමහට හිත කැමැත්තහු විසින්, අප්‍රමාදය රකින්නහු විසින් 'මාගේ සිත රාගයට කරුණු වූ ඉටු අරමුණුවල නො ඇලේවා, වෙෂයට කරුණු වූ අරමුණුවල දූෂිත නො වේවා, මොහයට කරුණු වූ අරමුණුවල මොහිත නො වේවා, මදයට කරුණු වූ අරමුණුවල මත් නො වේවා' යි මේ කරුණු සතරෙහි සිහියෙන් යුත් සිතැති ව අප්‍රමාදය රැකිය යුතු ය. යම් දවසෙක සිත පහ වූ රාගය ඇති බැවින්, සිත ඇලීමට කරුණු අරමුණුවල නො ඇලේද, පහ වූ වෙෂය ඇති බැවින් වෙෂයට කරුණු වූ අරමුණුවල සිත දූෂිත නො වේද, පහ වූ මොහය ඇති බැවින් මුළාවට කරුණු වූ අරමුණුවල සිත මොහිත නො වේ ද, පහ වූ මදය ඇති බැවින් මදයට කරුණු වූ අරමුණුවල සිත මත් නො වේ ද, ඔහු කිසි විටෙක ත් දෘෂ්ටිවශයෙන් තැති නො ගන්නේ ය. පරවාදී ශ්‍රමණ බ්‍රාහමණයන්ගේ වචන නො ද පිළිගන්නේ ය. මෙන්න මෙහි දෙශනාව.

'චතුසු භික්ඛවෙ! ඨානෙසු අත්තරූපෙන අප්පමාදෙ සති චෙතසො ආරක්ඛො කරණීයො, කතමෙසු චතුසු?, මා මෙ රජනීයෙසු ධම්මෙසු චිත්තං රජ්ජී, ති -පෙ- දුස්සී, ති -පෙ- මුයහී, ති -පෙ- මජ්ජී, ති අත්තරූපෙන අප්පමාදෙ සති චෙතසො ආරක්ඛො කරණීයො, යතො ඛො භික්ඛවෙ! භික්ඛුනො රජනීයෙසු ධම්මෙසු චිත්තං න රජ්ජති වීතරාගත්තා, දොසනීයෙසු ධම්මෙසු චිත්තං න දුස්සති වීතදොසත්තා, මොහනීයෙසු ධම්මෙසු චිත්තං න මුයහති වීතමොහත්තා, මදනීයෙසු ධම්මෙසු චිත්තං න මජ්ජති වීතමදත්තා, සො න ච්ඡම්භති, න කම්පති, න වෙධති, න සන්තාසං ආපජ්ජති, න ච පන සමණ වචන හෙතු'පි ගච්ඡති'පි' නො පමාබැවින් යුතු ව, කෙලෙස් තවන වැර ඇතු ව, හළ ආත්මාලය ඇතු ව වසන්නහුගේ සිත සියලු කෙලෙසුන්ගෙන් මිදී යන්නේ ය. **'අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා ආසවා පරික්ඛයං ගච්ඡන්ති''** යනු එහි පාලි ය.

එහෙයින් මෙලොව පරලොව දෙක්හි ම දියුණු වන්නට නැගී සිටින්නට අප්‍රමාදය වැඩිය යුතු ය. දියුණු කළ යුතු ය. වැඩූ අප්‍රමාදයේ හැටි දියුණු කළ අප්‍රමාදයේ හැටි **'එකධම්මො භික්ඛවෙ! භාවිතො බහුලීකතො උභො අත්ථෙ සමධිගයහ තිට්ඨති දිට්ඨධම්මිකඤ්ච අත්ථං සම්පරායිකඤ්චාති, කතමො එක-**

ධම්මෙසු? අප්පමාදෙ කුසලෙසු ධම්මෙසු, අයං වො භික්ඛවෙ! එතධම්මෙසු භාවිතො බහුලීකතො උභො අත්තෙ සම්ධිනයහ තිට්ඨති දිට්ඨධම්මිකඤ්ච අත්තං සම්පරායිකඤ්චාති' යන මේ සූත්‍රයෙන් ද පැහැදිලි කළහ බුදුරජාණන් වහන්සේ.

වැඩූ හොඳට ම වැඩූ පුන පුනා වැඩූ අප්‍රමාදය තෙමේ මෙලොව එලොව දෙක්හි ලැබිය යුතු වූ සියලු සම්පත් දුන් ව අල්ලා ගෙණ සිටී ය, යනු එහි සිංහල ය.

'අප්‍රමාදය වැනිය යුතු ය' යි කියූ බැවින් කෙනකුට එය 'අපපමාදභාවනා' යි වෙන් කොට ගන්නා එක් භාවනාවකැ යි සිතිය හැකි ය. එසේ නො ගත්ත. මේ ශාසනයෙහි එබදු නමකින් හඳුන්වන විශෙෂ භාවනාවක් නැත. මෙන්න මේ කතාව කියූ හැටි:- **'න අප්පමාදභාවනා නාම විසුං එකා භාවනා අත්ථි, යා කාචි පුඤ්ඤකිරියා කුසලකිරියා සබ්බා සා අප්පමාදභාවනා-මෙව වෙදිතබ්බා'** යනු. මේ දෙශනාවට යටත් ව කිය යුත්තේ තුන් දෙර මෙහෙයවා කරණ කියන හිතන හැම පිණක් ම හැම පින් සිතිවිල්ලක් ම අපපමාදභාවනාව බව ය. නිවන් ඇසුරු කොට සිටී සරණාගමනය- කය සිත දෙක්හි මනා හික්මීම යන මේ පටන් සියලු සීලභාවනාවෝ, සියලු සමාධිභාවනාවෝ, සියලු ප්‍රඥාභාවනාවෝ අපපමාදභාවනාවෝම ය. සියලු සීල-සමාධි-ප්‍රඥා භාවනාවෝ අපපමාදභාවනාවෝ ම වෙති. **'විසෙසතො පන චිවටවූපනිස්සයං සරණාගමනං කායික-චෙතසිකසංවරඤ්ච උපාදාය සබ්බා සීලභාවනා සබ්බා සමාධිභාවනා සබ්බා පඤ්ඤා භාවනාති සබ්බා කුසලභාවනා අනවජ්ජභාවනා අප්පමාද භාවනාති වෙදිතබ්බා'** යනු එහි සාධක සූත්‍රය වේ.

අමතපදං - නිවනට කරුණු වේ. නිවන් ලැබීමේ මාර්ගය වේ.

මෙහි **අමත'** නම් නිවන යි. ඉපැත්මෙක්, විනාශයෙක් අන් අතකට පෙරළීමෙක් එහිලා දැක්විය නො හැකි ය. එහෙයින් එය හට ගත්නෙක්, දිරන්නෙක්, මැරෙන්නෙක් නො වේ. මේ බලන්න බණ පොත එය කියූ සැටි;- **'යඤ්හි පනස්ස න උප්පාදෙ පඤ්ඤා-යති න වයො පඤ්ඤායති න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති, තස්මා තං න ජායති න ජීයති න මීයති, ති කත්වා අමතන්ති වුච්චති'** යි. සසර ඇවිදින සත්වයාගේ ඒ සසර ඇවිදීම, මැරි මැරී ඉපැත්ම යම් සභාවධර්මයකට පැමිණ නැවත්තුයේ නම්, ඒ නැවැත්ම, ඒ නැවැත්ම සිදුකළ ධර්මශක්තිය නිවනැ යි කියති. නෙරුක්තිකයෝ, එය නිරුක්ති කළ සැටි මෙසේ ය:- **'නත්ථි එතස්ස මරණසඞ්ඛාතං මච්චුති-අමතං'** යි. නිවනෙහි තතු දක්වන්නට, පෙර ඇදුරන් විසින් නිවන සඳහා යෙදූ නම් රාශියක්

පොතපතෙහි දැක්ක හැකි ය. **අච්චන්ත- අකත- අනන්ත- අපලොකිත- පණ්ණිත- සරණ- ඛෙම- තාණ- ලෙන- පරායණ- සිව- නිපුණ- සච්ච- දුක්ඛක්ඛය- අනාසව- සුදුද්දස- අසඞ්ඛත- පර- පාරමොක්ඛ- නිරොධ- නිබ්බාණ- ධුව- දීප- අව්‍යාපජ්ඣ- පවට්ට- කෙවල- අනීතික- අනාලය- පද- අච්චුත- අක්ඛර- විමුත්ති- අපවග්ග- විරාග- යොගක්ඛෙම- සන්ති- විසුඩි- අසඞ්ඛතධාතු- නිබ්බුති- සුඩි- අරූප-** යන නම් එයින් කිහිපයෙකි. (නිවනෙහි විස්තර ඉදිරියෙහි එන්නේ ය.

මේ හැම නාමපදයකින් ම, නිවනෙහි තතු, නිවන නම්, මේ ය. යනු ඒ ඒ ලෙසින්, නිවනින් සිදුවන හිතරුත් අනු ව, පහදා ලිය හැකි ය. පහදාදිය හැකි ය.

නිවන සඳහා යෙදුනු **මේ අමත'** යන්න මෙහි ආයේ නිවන සඳහා ම ය. **'අමතවස්සං'** යනාදි තන්හි ආයේ ජලයෙහි ය. **'ධම්මාමතරසෙන'** යනාදි තන්හි හුනුයේ, සුධාභොජනයෙහි ය.

පද' නම්, හෙතු ය. කාරණය-මාර්ගය යි කියන ලදද වරද නැත්තේ ය. මෙහි යම් ධර්මයෙක්, නිවන් ලැබීම සඳහා පිළිපැදිය යුතු නම්, රැකිය යුතු නම්, වැඩිය යුතු නම් ඒය පද. අප්‍රමාදය යි. අප්‍රමාදය නො වඩා නිවන් නො ලැබිය හැකි ය. ඒ තබා, අන් සැපයකුත් අප්‍රමාදය හැර දමා නො ලැබිය හැක්කේ ය. මේ මෙහි, නිරුක්ති:- **'අරියෙහි පටිපජ්ජිතබ්බත්තා ගන්තබ්බත්තා = පදං, පජ්ජති ඵලමෙතෙනාති = පදං, පජ්ජතෙ ගච්ඡතෙ එතෙනාති = පදං'** යනු.

'අමතස්ස = පදං, අමතපදං' නිවනට කරුණු වූයේ, අමතපද නම්. නිවන් ලැබීමේ හෙතුව වනුයේ, අප්‍රමාදය, යි මෙයින් වදාළෝය.

පමාදො – ප්‍රමාදය. ප්‍රමත්තභාවය. පමාබව. සිහියෙන් තොර බව. සිහි නැති කම.

'තත්ථ කතමො පමාදො? කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනඞ්ඝිතකිරියතා ඔලින-වුත්තිතා නික්ඛිත්තජ්ඣතා නික්ඛිත්තධුරතා අනදිට්ඨානං අනනුයොගො අනාසෙවනා අභාවනා අබහුලීකම්මං පමාදො, යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං අයං වුච්චති පමාදොති' යනු බුදුරජුන් ප්‍රමාදය වදාළ සැටියි. එලි කළ සැටියි.

කායදුශ්චරිතාදියෙහි හා පංචකාමයෙහි සිත හැර, සිතින් වෙන් ව, ක්‍රියාකිරීම මෙහි කි කරුණුවලදී සිහියෙන් වෙන්වීම, සිහියෙන් වෙන් වූ හැඟීම, කුසල්දහම් වැඩීමෙහි නොසකස් බව, කුසල්දහම් නිතර නොකිරීම, එහි සිහිය නොපිහිටුවීම, එහි ඇකිලී සිටීම, එහි අත්හළ කැමැත්ත, පසුබස්නා පැවැත් ම යනාදි ලෙසින් ධර්මයට පටහැනි වූ සිහියෙන් වෙන්වීම, ප්‍රමාදය යි එයින් කිය වෙන්නේ ය.

කොටින් කිය යුත්තේ, දන්-සිල්-බැවුම් යන තෙවැදෑරුම් කුසල්කම් කිරීමෙහි සිහිය නොඑළවා සිටීම ප්‍රමාදය යි. **'පමාදෙ, චිත්තස්ස උපක්කිලෙසො'** යන දෙශනාව කියන්නී ප්‍රමාදය සිත පිළිබඳ කෙලෙශයක් බව ය. එහෙයින්, ප්‍රමාදයෙන් කෙලෙසුනු නොසන්සුන් වූ සිතට, ඒ ඒ ධර්මයන්ගේ ඇති තතු දත නොහැක්කේ ය. අශුභය ශුභ, යි දුඃඛය සුඛ, යි අනිත්‍යය නිත්‍ය යි අනාත්මය ආත්ම යි, ගන්නේ, ප්‍රමාදයෙන් මැඩුනු කිලිටි වූ සිතය.

රූප-වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන සතර පස, අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ගති තුනට යටත් ව සිටියේ ද, එහි නිත්‍ය-ශුභ-සුඛ යි ගත යුත්තෙක් නොවූයේ ද පමාවෙන් යුත් සිතට, සිහියෙන් තොර සිතට ඒ පෙණෙනුයේ, නිත්‍යයක් සේ ය. සුඛයක් සේ ය. ආත්මයක් සේ ය.

නොඋපන් අකුසල් ඉපැත්මට, උපන් කුසල් පිරිහෙන්නට නිතර අනුබල දෙන්නේ, ප්‍රමාදය යි. මේ ඉපැදුම්-පිරිහුම් දෙකට, ප්‍රමාදය තරම් අනුබල දෙන, අන් ධර්මශක්තියක් බුදුනුවණට ද අසු නොවූ ය. ප්‍රමත්තයාහටම ය නොඋපන් අකුසල් උපදින්නේ. උපන් කුසල් පිරිහෙන්නේ. මෙන්න ඒ වදාළ සැටි.-

'නාහං භික්ඛවෙ! අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ! පමාදෙ, පමත්තස්ස භික්ඛවෙ! අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්ති, නී' යි.

ප්‍රමාදය තෙමේ, ඒ ලොව මෙ ලොව දෙක්හි, සියලු යහපත නසාලයි. සියලු අවැඩට හෙතු වෙයි. සගදෙර වසාලයි. අවාදෙර ඇරලයි. සසර ඉපැත් ම ගෙණ දෙයි. එහෙයින් ප්‍රමත්තයාහට විදසුන් වඩා නොපිළිසිඳෙන බවට, නොඉපැදෙන බවට පැමිණෙන්නට නොහැකි ය. ඔහු දිගින් දිගට සසර ඉපිද ඉපිද මැරී යයි. **'පමත්තෙනා හි විපස්සනං වඩ්ඪෙන්තා අප්පතිසන්ධිකභාවං පතුං අසක්කොනෙනා පුනප්පුනං සංසාරෙ ජායති චෙව මීයති ච'** යනු එහි පාලිය යි.

මච්චුනො පදං]- මරණයට කරුණු වේ. උපාය වේ. මග වේ.

ප්‍රමත්ත පුද්ගල තෙමේ ඉපැත්ම නො ඉක්මව යි. එහෙයින් උපන්නේ, දිරයි. මැරෙයි. ප්‍රමාදය, මරණයට මගය, උපාය යි වදාළෝ එහෙයිනි. දිගින් දිගට සසරු ඉපිද ඉපිද මැරි මැරී යන්නෝ, ප්‍රමත්තපුද්ගලයෝ ය. ප්‍රමාදය නිසා ම සසරු ඉපිද ඉපිද මැරි මැරී යති. ඉපැත්ම, දිරීම, මැරීම ප්‍රමත්තයනට වළකා ලන්නට බැරි ය.

අප්පමත්තා න මීයන්ති = අප්‍රමත්තයෝ නො මැරෙති. නො පමා වූවෝ නො මැරෙති.

නො පමා වූවෝ කවුරු? **'අප්පමත්තොති සක්කච්චකාරි සාතච්චකාරී අඩිතකාරී අනොලිනවුත්තිකො අනික්ඛිත්ත-ඡන්දො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, කථාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං පරිපූරං වා සීලක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුගගණ්හෙය්‍යන්ති, යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානි ච සති ච සම්පජඤ්ඤං ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසු -පෙ- කථාහං අපරිඤ්ඤාතං වා දුක්ඛක්ඛන්ධං පරිජානෙය්‍යං අප්පහීනෙ ච කිලෙසෙ පජහෙය්‍යං අභාවිතං වා මග්ගං භාවෙය්‍යං අසච්ඡිකතං වා නිරොධං සච්ඡිකරෙය්‍යන්ති, යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානි ච සති ච සම්පජඤ්ඤං ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙ-සුති අබ්බුළ්හසල්ලො චරමප්පත්තො'** යනු නො පමා වූවෝ කවුරු? යන ප්‍රශ්නයට ආගම දුන් පිළිතුර ය. කුසල්දහම් සකස්ව කරන්නේ, නිරතුරු ව කරන්නේ, නො හැර කරන්නේ, එහි නො පසුබස්නා පැවතුම් ඇත්තේ, නො හළ ආසා ඇත්තේ, නො හළ වීර්‍යය ඇත්තේ, අසම්පූර්ණ වූ ශීලස්කන්ධය, අසම්පූර්ණ වූ සමාධිස්කන්ධය, අසම්පූර්ණ වූ ප්‍රඥාස්කන්ධය කෙසේ සම්පූර්ණ කරන්නෙම්, සම්පූර්ණ වූ ශීලස්කන්ධය, සම්පූර්ණ වූ සමාධිස්කන්ධය, සම්පූර්ණ වූ ප්‍රඥාස්කන්ධය, විමුක්තිස්කන්ධය, විමුක්තිඥානදර්ශනස්කන්ධය නුවණින් කෙසේ ලංකර ගන්නෙම්, නො දත් දුක කෙසේ දන්-නෙම්, නො පහළ කෙලෙස් කෙසේ පහන්නෙම්, නො වැඩූ මග කෙසේ වඩන්නෙම්, අවබොධ නො කළ නිවන කෙසේ අවබොධ කරන්නෙම්' යි මේ ඈ ලෙසින් කුසල්දහම්විෂයයෙහි කරුණු කැමැත්තෙක්, ව්‍යායාමයෙක්, උත්සාහයෙක්, අධිකොත්සාහයෙක්, නො පසුබස්නා බවෙක්, සිහිකිරීමෙක්, මනා දැන්මෙක්, වීර්‍යයෙක්,

දැඩිවීර්‍යයෙක්, තදින් පිහිටීමෙක්, නිතර යෙදීමෙක්, නොපමා බවෙක් යමකු පිළිබඳ වේ ද, මෙ ගුණ යුත් ඔහු අප්‍රමත්ත නම් වේ ය යනු, ඒ පාලියෙහි කෙටි සිංහල ය.

'අප්‍රමත්තයෝ නො දිරති. නො මැරෙති' යි නො ගත යුතුය. නො දිරණ නො මැරෙණ එකෙකුත් ලොව නැත්තේ ය. අප්‍රමත්තයෝ, සිහිනුවණින් යෙදුනෝ සිහිනුවණින් කුසල්දහම් කොට, හළ යුත්ත හැර, වැඩිය යුත්ත වඩා, නො කුසීත ව දිරි ගැන්වී තෙද ගැන්වී මගපල පසක් කොට, සසර බැඳුම් බිඳලති. සසර දුකින් මිදෙති. ජීවත් වන්නෝ ත්, මිය ගියෝ ත් ඔවුහු මගපල පසක් කොට, නිවන් දුටු බැවින් නො මළවුන් වැනි වෙති. නො පමාවූවහුට සසර ඉමෙක් ඇත්තේ ය. අප්‍රමාදී ව ගුණදහම් වඩා, මාර්ගඵලාවබොධයෙන් නො මැරෙණ, නිවන් සැප ලබන්නෙක් වන්නේ ය. ඔහු සසර භවයක් හැර භවයක් ගෙණ දිගට නො යන්නේ ය.

යෙ පමත්තා යථා මතා = යම් කෙනෙක් පමා වූවෝ ද, ඔවුහු මළවුන් වැනි වෙති.

මළා වූ සත්වයෝ, ජීවිතෙන්ද්‍රියයෙන් තොර බැවින්, දඬු කඩක් සේ, පහව ගිය විඥානය ඇත්තෝ වෙති. එමෙන් 'දන් දෙමු, සිල් රකිමු, භාවනා කරමු, පෙහෙවස් වසමු, මවුපියන් රකිමු, මහණ බමුණන් පුදමු, බණ අසමු' යි ඈ ලෙසින් කිසිවිටෙක ත් එක ද සිතකු ත් නො උපදවන ගිහියෝ ත්, 'ආචාර්‍ය උපාඛ්‍යාය වත් පුරමු, ධුතගුණ රකිමු, කමටහන් වඩමු' යි ඈ ලෙසින් එක ද සිතකු ත් නො උපදවන පැවිද්දෝ ත් නො මළෝ ද මළවුන් වැනි ය. මොවුහු අචෙතනත්වයෙන්, මළවුන් හා වෙනසක් නැත්තෝ ය. මළවුන් වැන්නෝ ය. මෙහි කොටින් කියූ ගුණදහම් නො පුරණ ගුණදහම් නො වඩන ගිහි පැවිද්දෝ, බොහෝ කල් ජීවත් වන්නෝ ද, ප්‍රධානමරණයෙන් මළ බැවින්, ගුණදහමින් මළ බැවින් මළගණයට වැටෙති. මළවුන් සේ සැලකෙති. මෙහිලා ඔවුන්ගේත් මළවුන්ගේ ත් කිසි වෙනසෙක් නැත්තේ ය.

එතං විසෙසතො ඤත්වා = මෙය වෙසෙසින් දැන ඉතා හොඳට දැන.

'පමාවූවහුට සසරින් මිදීම නැත, නො පමාවූවහුට සසරින් මිදීම ඇත, අප්‍රමාදය නිවණට මග ය, ප්‍රමාදය සසරට මග ය, යන මෙය වෙසෙසින් දැන' යනු යි. වෙසෙසින් දැනීම නම්, යම්තමකින් දැනීම නො ව, ඇති තතු ඒ හැටියට ඉතා හොඳින් දැනීම ය.

'විසෙසතො සුතවාති පමත්තසස වටටතො නිසසරණං නත්ථි අපපමත්තසස අත්ථි එතං විසෙසං විසෙසතො ව ජානිතවා' යනු අටුවා ය.

අපපමාදමහි පණ්ඩිතා = නො පමාබවිහි පිහිටි නුවණැත්තෝ.

සතුන් මැරීම් ආදිවූ අකුසල් කිරීමෙන් තොර ව, කුසල්දහම්හි පිහිටා ගත්තෝ ය පණ්ඩිතයෝ. මේ බලන්න මෙය කියූ සැටි පාළියෙන්:- **'පණ්ඩිතා නාම පාණාතිපාතා වෙරමණි ආදි දසකුසලකම්මපථසමන්නාගතා සත්තා'** යි.

බුදු පසේබුදු අසුමහාසව්වන් හා අනික් බුදුසව්වෝ ය නියම පණ්ඩිතයෝ. හොඳ ම හොඳ පණ්ඩිතයෝ. මොවුහු කිසි විටෙකත් දසඅකුසල් ඇ කිසිත් අකුසලයෙක නො යෙදෙන්නෝ ය. දිවි තකා ව ත් පණ රැක ගැණීමට කියාව ත් අකුසල් නම් නො කරන් නෝ ය මොවුහු. මේ සියල්ලෝ දිටඨධම්මික සමපරායික අර්‍ථයන්හි ප්‍රඥාගතියෙන් ම යෙදෙන්නෝ ය. **'පණ්ඩන්ති ති = පණ්ඩිතා, දිඨධම්මිකසම්පරායිකෙසු අත්ථෙසු පඤ්ඤාගතියා ගච්ඡන්ති ති පණ්ඩිතා,** යනු 'පණ්ඩිතා' යන්න විදහා දක්වූ සැටි යි.

'පණ්ඩා' යනු නුවණට නමෙකි. **'පණ්ඩානි පඤ්ඤා'** යනු එහි ටීකා ය. ඉතා සියුම් අර්‍ථයන්හි පවා ගමන් කරණ බැවින්, දුඃඛ සත්‍යාදීන් පිළිබඳ පිළිනාදී වූ ඒ ඒ අර්‍ථයන් දන්නා බැවින් ප්‍රඥ නොමෝ පණ්ඩා යි කියනු ලැබේ. මේ මෙහි පාළිය. **'සා පි සුඛුමෙසු හි අත්ථෙසු පණ්ඩති, ගච්ඡති, දුකඛාදීනං පිළනාදි භෙදම්පි ආකාරං ජානාති ති = පණ්ඩා, තානි වුච්චති'** යනු.

තවත් එය පැහැදිලි කළ සැටි මෙසේ දන්න:- **'පණ්ඩාය ඉනෝ ගතෝ පවත්තෝ ති = පණ්ඩිතෝ, අථ වා සඤ්ඡාතා පණ්ඩා එතසසාති-පණ්ඩිතෝ, පණ්ඩති ඤාණගතියා ගච්ඡතීති-පණ්ඩිතෝ, පණ්ඩිච්චෙන සමන්නාගතෝති = පණ්ඩිතෝ'** යි. මෙහි **පණ්ඩිච්ච'** යි කියේ නුවණ ය. ඒ මේ නුවණ **ජවනපඤ්ඤා-නිබ්බේධිකපඤ්ඤා - මහාපඤ්ඤා - තික්ඛපඤ්ඤා- විපුලපඤ්ඤා-ගම්භීරපඤ්ඤා-අසාමන්තපඤ්ඤා** යි සත් වැදෑරුම් කොට බෙදූහ. මේ සත් වැදෑරුම් බෙදුම එක් කොට දක්වන්නට **'පටිවෙධබහුඤ්ඤා-සච්චෙන පණ්ඩිතෝ'** යි කීහ. ප්‍රතිවෙධබහුශ්‍රැතභාවයෙන් පණ්ඩිත වේ යනු එහි කෙටි තේරුම ය.

පණ්ඩිතලක්‍ෂණ, පණ්ඩිතයාගේ හැඩහුරුකම්, නො දුන, සාමාන්‍යලොකයාට පණ්ඩිතයා හඳුනා ගත නො හැක්කේ ය. එ හෙයින් මාගේ සවාමිදරු වූ තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ, **'නිනි'මානි භික්ඛවෙ! පණ්ඩිතසස පණ්ඩිතලක්ඛණානි**

පණ්ඩිතනිමිත්තානි, පණ්ඩිතාපදානානි, කතමානි තීනි? ඉධ භික්ඛවෙ! පණ්ඩිතො සුචිනතිතචිනතී ච හොති සුභාසිත භාසී සුකතකම්මකාරී, නො චෙදං භික්ඛවෙ! පණ්ඩිතො සුචිනතිත-චිනතී ච අභවිස්ස සුභාසිතභාසී සුකතකම්මකාරී, කෙන නං පණ්ඩිතා ජානෙය්‍යුං, පණ්ඩිතො අයං භවං සපපුරිසොති, යස්මිං බො භික්ඛවෙ! පණ්ඩිතො සුචිනතිතචිනතී ච හොති සුභාසිතභාසී සුකතකම්මකාරී, තස්මා නං පණ්ඩිතා ජානනති පණ්ඩිතො අයං භවං සපපුරිසො ති, ඉමානි බො භික්ඛවෙ! තීනි පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානානි ති' යනු වදාළ සේක.

පණ්ඩිතයාගේ පණ්ඩිත ලකුණු තුනෙක් වේ. යහපත් සිතිවිලි සිතීම, යහපත් බස් බිණීම, යහපත් කම් කිරීමය ඒ තුන. ඉදින් පණ්ඩිතයා, යහපත් සිතිවිලි සිතන්නෙක්, යහපත් බස් කියන්-නෙක්, යහපත් කම් කරන්නෙක්, නො වූයේ නම්, ඔහු පණ්ඩිතැයි කෙසේ දැන ගත හැක්කේ ද, යම් හෙයකින් පණ්ඩිත තෙමේ, යහපත් සිතිවිලි සිතන්නේ, යහපත් බස් කියන්නේ, යහපත්කම් කරන්නේ වේ ද, එහෙයින් ඔහු, පණ්ඩිතැයි දත හැක්කේ ය, යනු මෙහි කෙටි අදහස ය.

මෙහි ඉතා සැකෙවින් කියූ ගුණ නුවණින් යුත් පණ්ඩිතයෝය නො පමාබවෙහි පිහිටා දෙලෝ වැඩ සාදාලන කුසල්දහම් තව තවත් කරන්නෝ.

අප්පමාදෙ පමොදනති = නො පමාබවෙහි තදින් සතුටු වෙති.

නො පමාබවෙහි පිහිටි පණ්ඩිතයෝ, 'තමන් පිහිටි නො පමා බව, කුදු මහත් සියලු සැප සිදු කර දෙන මහත් ගුණයෙක අපි පිහිටා ගතුම්හ, දැන් මේ ලබා ඇති සැපත ද, අපි ලැබුවමෝ නො පමාබව නිසාමැ'යි හැම කල්හි ඉතා තදින් සතුටු වෙති.

අරියානං ගොචරෙ රතා = ආර්‍යයන්ගේ ගොචරයෙහි ඇලුනෝ.

ආර්‍යයෝ නම්, බුදු පසේබුදු මහරහතුන්වහන්සේ ය. ඒ තතු අරුත් විසිනි. දුක්ඛ-සමුදය-නිරොධ-මාගී යන සිවු සස් දහම් අවබොධ කළෝ උන්වහන්සේ ය. මෙහිලා ගැණෙන්නෝත් උන් වහන්සේ ය. උන්වහන්සේලාගේ ආර්‍යභාවයෙහි යුතුකම් මෙසේ දන්න:- **'කිලෙසාරයො හනතීති = අරහො, සො එව අරියො, අරති අධිගච්ඡති මගගඵලධම්මෙති = අරියො, කිලෙසෙහි ආරකාති = අරියො, ලොකෙහි අරණීයො අපගනතබ්බො ති වා = අරියො'** කෙතෙක් අරුත් විසින් මුන්වහන්සේලා ආර්‍ය වෙත් ද යනු, මෙයින් එලි වන්නේ ය. කෙලෙස් සතුරන් නැසූ

බැවින්, මාර්ගඵලධර්මයන් අවබොධ කළ බැවින්, කෙලෙසුන් කෙරෙන් ඈත් වූ බැවින්, ලෝ වැස්සන් විසින් ලංව ඇසුරු කළ යුතු බැවින් මුන්වහන්සේලා ආර්‍ය්‍ය වෙති. මොවුනතුර ද, ප්‍රධානාර්‍ය්‍ය වනුවෝ බුදුරජානන් වහන්සේ ය. මුන්වහන්සේලා ප්‍රතිවෙධාර්‍ය්‍ය නාමයෙන් ද හැඳින් වෙති.

ආර්‍ය්‍යනාමයෙන් ගැණෙන තව තිදෙනෙක් පොතපතෙහි දැක්වෙති. ආචාර අරිය – දස්සන අරිය – ලිඞ්ග අරිය යි. සදාචාර ගුණයෙහි පිහිටියේ ආචාරඅරිය නම්. රූසටහනින් හා සිවු ඉරියව් වෙන් අන් සිත තුටු කරණුයේ දස්සනඅරිය නම්. පා සිවුරු දැරීම් හිස මුඩු කිරීම් ඈ පැවිදිලකුණු ගෙණ නියම පැවිද්දකු සේ කල් ගෙවන දුසිල් තෙමේ ලිඞ්ගඅරිය නම්. මේ තිදෙන ම මෙහි නො ගැණෙති.

ඒ ඒ මාර්ගඵල ධර්මයන් අවබොධ කළා වූ ආර්‍ය්‍යයෝ එක්සිය අට දෙනෙකි.

එහි සොතාපන්නයෝ =

1. දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤඑකබීජී,
2. දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤඑකබීජී,
3. සුඛාපටිපදාදන්ධාභිඤ්ඤඑකබීජී,
4. සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤඑකබීජී,
5. දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤකොලංකොල,
6. දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤකොලංකොල,
7. සුඛාපටිපදාදන්ධාභිඤ්ඤකොලංකොල,
8. සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤකොලංකොල,
9. දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤසත්තක්ඛත්තුපරම,
10. දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤසත්තක්ඛත්තුපරම,
11. සුඛාපටිපදාදන්ධාභිඤ්ඤසත්තක්ඛක්ඛත්තුපරම,
12. සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤසත්තක්ඛත්තුපරම'යි

දොළොස් දෙනෙකි.

යම් කිසිවකුගේ ආත්මභාවග්‍රහණය, හෙවත් භවයෙහි ඉපැත්ම එක් වරක් වේ නම්, හෙ තෙමේ එකබීජී නම් වේ. **'යස්ස හි සොතාපන්නස්ස එකං යෙව ඛන්ධබීජං අත්ථි, එකං අත්තභාවග්ගහණං සො එකබීජී නාම'** තියුණු නුවණ ඇත්තේ ම ය එසේ වන්නේ. **'තික්ඛපඤ්ඤො එකං භවං නිබ්බත්තෙන්තො එකබීජී නාම'** යනු එහිලා දතයුතුය.

සසුන්පිළිවෙතෙහි පෙර නොලද පුරුද්ද ඇති, නො කළ අභිනිවෙශය ඇති යමෙක්, පූජාවස්ථායෙහි, රූප පිරිසිඳ දැනීමෙහි, අරූප පිරිසිඳ දැනීමෙහි, නාමරූපධර්ම පහළවීමට හා පැවැත්මට හෙතු වූ කරුණු පිරිසිඳ දැනීමෙහි, අතීත අනාගත කාල පිරිසිඳ දැනීමෙහි, මග නොමග දැනීමෙහි කුලාන්ත වනුයේ, වෙහෙසට පත් වනුයේ, විදර්ශනාවට ද පැමිණ උදයානුපස්සනා, භඞ්ගානුපස්සනා, භයතුපට්ඨාන, ආදීනවානුපස්සනා, නිබ්බිදානුපස්සනා, මුඤ්චිතුකම්‍යතා, සඞ්ඛාරුපෙක්ඛා, අනුලෝම, ගොත්‍රභූ යන නවවිදර්ශනාඥානයන්හි කුලාන්තව ම වෙහෙසට පත්ව ම එකබීජී වේ ද, ඔහු ඒ එකබීජීභාවය, ලොකොත්තරමාර්ගය, මෙසේ දුකින්, ගරු භාවයෙන් සාක්ෂාත් කළ බැවින් **'දුක්ඛාපට්පදදන්ධාභිඤ්ඤඒකබීජී,** නම් වේ.

යමෙක්, පූජාවස්ථායෙහි, ඔට කියන ලද පස් වැදෑරුම් දැනුම්හි, කුලාන්ත වූයේ, වෙහෙසට පත් වූයේ, අපරභාගයෙහි විදර්ශනාවනට පැමිණ අකුලාන්ත ව වෙහෙසට නො පත් ව එකබීජී වේ ද, ඔහු, එය දුකින්, අගරු භාවයෙන්, සාක්ෂාත් කළ බැවින්, **'දුක්ඛාපට්පදක්ඛිප්පාභිඤ්ඤඒකබීජී,** නම් වේ.

යමෙක්, මේ කියූ ලෙසින්, එකබීජීභාවය සැපයෙන් ගරුභාවයෙන් අවබෝධ කෙළේ නම්, ඔහු, **සුඛාපට්පදදන්ධාභිඤ්ඤඒකබීජී,** නම් වේ.

යමෙක්, මේ කියූ ලෙසින්, ලොකොත්තරමාර්ගය සැපයෙන්, අගරුභාවයෙන් අවබෝධ කෙළේ නම්, ඔහු **'සුඛාපට්පදක්ඛිප්පාභිඤ්ඤඒකබීජී,** නම් වේ.

එකබීජීආර්‍යයෝ මෙසේ ප්‍රතිපදාභෙදයෙන් සිවු දෙනෙක් වෙති.

යම් කිසිවක්හුගේ භවයෙහි ඉපැත්ම, සය වරක් හෝ එයට අඩු ව හෝ වේ නම්, හෙ තෙමේ **'කොලංකොල,** නම් වේ. **'කුලතෝ කුලං ගච්ඡතී ති = කොලංකොලෝ.'** මැදියම් නුවණ ඇත්තෝ ය එසේ වන්නෝ ය. **'මජ්ඣිමපඤ්ඤා පරං ඡඤ්ඤං භවං නිබ්බත්තෙන්තෙනා කොලංකොලෝ නාම'** යනු එහිලා දතයුතුය එකබීජී සොතාපන්න තෙමේ, යම්සේ ප්‍රතිපදාභෙදයෙන් සිවුදෙනක් වූයේ ද, මොහු ද ඒ ප්‍රතිපදාභෙදයෙන් සිවු වැදෑරුම් වේ.

යම් කිසිවක්හුගේ භවයෙහි ඉපැත්ම, සත් වරක් හෝ, එයට අඩු ව හෝ වේ ද, උත්පත්තිවශයෙන් අටවන භවයෙක් නො වේ ද, එසේ සත් වරක් හෝ එයට අඩු වරක් හෝ භවයෙහි උපදනේ **'සත්තක්ඛත්තුපරම,** නම් වේ. **'සත්තක්ඛත්තුං පරමා සත්තභවාපරමා භවූපපත්තී අත්තභාවගහණං අස්ස, තතොපරං අභවං**

භවං නාදියතීති = **සත්තක්ඛත්තුපරමො'** මෘදු නුවණැත්තේය එසේ වන්නේ. **'මුදුපඤ්ඤො හි සොතාපන්නො සත්තභවෙ නිබ්බත්තෙන්නො සත්තක්ඛත්තුපරමො නාම'** යනු එහිලා කීහ. මොහු ද යට කියූ සේ ප්‍රතිපදාභෙයෙන් සිවු වැදෑරුම් වේ.

සකෘදාගාමීහු—

1 දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤකාමභවපරියාපන්න,
2 දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤකාමභවපරියාපන්න,
3 සුඛාපටිපදාදන්ධාභිඤ්ඤකාමභවපරියාපන්න,
4 සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤකාමභවපරියාපන්න,
5 දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤරූපභවපරියාපන්න,
6 දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤරූපභවපරියාපන්න,
7 සුඛාපටිපදාදන්ධාභිඤ්ඤරූපභවපරියාපන්න,
8 සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤරූපභවපරියාපන්න,
9 දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤඅරූපභවපරියාපන්න,
10 දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤඅරූපභවපරියාපන්න,
11 සුඛාපටිපදාදන්ධාභිඤ්ඤඅරූපභවපරියාපන්න,
12 සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤඅරූපභවපරියාපන්න,
යි දොළොස් දෙනෙකි.

මේ ආර්‍යයන් පිළිබඳව ද කිය යුත්තේ, සොතාපන්නයන් ගැණ කියූ සේ ම ය. වෙනස, කාම - රූප - අරූපභවයන්හි ඇතුළත් බවය.

අනාගාමීහු =

අවිහ = 1. අන්තරාපරිනිබ්බායී, 2. උපහච්චපරිනිබ්බායී,
3. සසඞ්ඛාරපරිනිබ්බායී, 4. අසඞ්ඛාරපරිනිබ්බායී,
5. උඩංසොතො අකනිඨගාමී.

අතප්ප = 1. අන්තරාපරිනිබ්බායී, 2. උපහච්චපරිනිබ්බායී,
3. සසඞ්ඛාරපරිනිබ්බායී, 4. අසඞ්ඛාර පරිනිබ්බායී,
5 උඩංසොතො අකනිඨගාමී.

සුදස්ස = 1. අන්තරාපරිනිබ්බායී, 2. උපහච්චපරිනිබ්බායී,
3. සසඞ්ඛාරපරිනිබ්බායී 4. අසඞ්ඛාරපරිනිබ්බායී,
5. උඩංසොතො අකනිඨගාමී

සුදස්සි = 1. අන්තරාපරිනිබ්බායී, 2. උපහච්ච පරිනිබ්බායී,
3. සසඞ්ඛාරපරිනිබ්බායී, 4. අසඞ්ඛාරපරිනිබ්බායී,
5. උඩංසොතො අකනිඨගාමී.

අකනිඨ = 1. අනන්තරාපරිනිබ්බායී, 2. උපහච්ච පරිනිබ්බායී 3. සසඞ්ඛාරපරිනිබ්බායී, 4. අසඞ්ඛාරපරිනිබ්බායී' යි සූචිසි දෙනෙකි.

අවිහ - අතප්ප - සුදස්ස - සුදස්සී - අකනිඨ යන මේ නම්වලින් කියවෙනුයේ, සුඛාවාසබඹලොව පස ය. ලොභ - චෙෂයන්ගෙන් නො කිලිටි වූ, ලොභ - දොෂයන්ගෙන් නො කැලඹුනු පිරිසිදු බ්‍රහ්මයන්ට ම වාසස්ථාන බැවින්, මේ බඹලොව පස, සුඛාවාස යි හඳුන්වනු ලැබේ.

එහි, අවිහයෙහි පස් දෙනෙක, අතප්පයෙහි පස්දෙනෙක, සුදස්ස යෙහි පස් දෙනෙක, සුදස්සියෙහි පස් දෙනෙක, අකනිඨයෙහි සිවු දෙනෙකැ' යි අනාගාමීහු සූචිසි දෙන, මෙසේ දතයුතුය.

මේ එහි පාළිය:- **'අනන්තරාපරිනිබ්බායී උපහච්චපරිනිබ්බායී සසඞ්ඛාරපරිනිබ්බායී අසඞ්ඛාරපරිනිබ්බායී උද්ධංසොතා අකනිට්ඨගාමී ති අවිහෙ පංච, තථා අතප්ප සුදස්ස සුදස්සිසු, අකනිට්ඨෙසු පන උද්ධංසොතවජ්ජා චත්තාරොති චතුවීසති අනාගාමිනෝ'** යි.

අනන්තරාපරිනිබ්බායී =

සුඛාවාසයෙක උපන් යමෙක්, එම සුඛාවාසයට නියමිත අයුෂ යාගේ හරි මැදට නො පැමිණ එයට පෙරාතු ව, අයුෂයෙහි පෙර අඩ නොයික්මවා කෙලෙස් නසා පිරිනිවී යේ නම් ඔහු ය. **'ආයු වෙමජ්ඣස්ස අනන්තරායෙව කිලෙසපරිනිබ්බානේන පරිනිබ්බා නතෝ අනන්තරාපරිනිබ්බායී'** යනු එහි ලා කීහ. මොහු **උපපන්න සමනන්තරපරිනිබ්බායී, ආයුවෙමජ්ඣං අප්පත්වා පරිනිබ්බායී, ආයුවෙමජ්ඣං පත්වා පරිනිබ්බායී,** යි තෙ වැදෑරුම් වේ. එහි සුඛා වාසයෙහි උපන් සැටියේ, ඉපැත්මට අනතුරුව, කෙලෙස් නසා පිරි නිවියේ, **'උපපන්නසමනන්තරපරිනිබ්බායී'** නම්. ආයුෂයාගේ මැදට නො පැමිණ පිරිනිවියේ **'ආයුවෙමජ්ඣං අප්පත්වා පරිනිබ්බායී'** නම්. අයුෂයා ගේ මැදට පැමිණ පිරිනිවියේ **'ආයු වෙමජ්ඣං පත්වා පරිනිබ්බායී'** නම්. මේ මෙසේ වූයේ ද, මේ තිදෙන ම, අනන්තරාපරිනිබ්බායී' යි ගණිත්.

උපහච්චපරිනිබ්බායී =

සුඛාවාසයක උපන් යමෙක්, එහි නියමිත වූ ආයුකාලයෙන් අඩක් ඉක්මවා හෝ, කලුරිය කිරීමට පැමිණ හෝ, කෙලෙස් පිරිනිවී මෙන්, පිරිනිවියේ නම් ඔහු ය. **'ආයුවෙමජ්ඣං අනික්කමිත්වා වා කාලකිරියං උපගන්ත්වා වා කිලෙසපරිනිබ්බානේන පරිනිබ්බායී උපහච්චපරිනිබ්බායී නාම'** යනු පාළියි.

සසඞ්ඛාරපරිනිබ්බායී =

සුඛාවාසයෙක උපන්නේ, තදදුකින් ඉතාඅමාරුවෙන් කෙලෙස් නිවන්නට, තදින් ව්‍යායාම කොට, කෙලෙස් පිරිනිවූයේ ය මෙතෙමේ. එහි පාළිය:- **'සසඞ්ඛාරෙන දුක්ඛෙන කසිරෙන අධිමත්තප්පයොගං කත්වා'ව කිලෙසපරිනිබ්බාණෙන පරිනිබ්බායී සසඞ්ඛාරපරිනිබ්බායී නාම'** යනු.

අසඞ්ඛාරපරිනිබ්බායී =

මෙ තෙමේ සුඛාවාසයෙහි ඉපිද, උත්සාහරහිත ව, ප්‍රයොගරහිත ව විඩාවට නො පත් ව, අධිමාත්‍රප්‍රයොගයක් ද නො කොට, කෙලෙස් පිරිනිවූයේ ය. මේ එහි පාළිය:- **'අසඞ්ඛාරෙන අප්පයොගෙන අධිමත්තප්පයොගං අකත්වා' ව කිලෙස පරිනිබ්බාණෙන පරිනිබ්බායී අසඞ්ඛාරපරිනිබ්බායී නාම'** යනු

උඩංසොතො අකනිඨගාමී.

උඩංසොතො අකනිඨගාමී, උඩංසොතො න අකනිඨගාමී' න උඩංසොතො අකනිඨගාමී' න උඩංසොතො න අකනිඨගාමී' යි ඔවුහු සිවුදෙනෙක් වෙති.

අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, යන සිවු බඹලොව ශොධනය කොට, අකනිටා බඹලොව ඉපිද, පිරිනිවන් පාන්නේ, **'උඩංසොතො අකනිට්ඨගාමී'** නම්. මේ පාළිය:- **'යො අවිහතො පට්ඨාය චත්තාරො බ්‍රහ්මලොකෙ සොධෙත්වා අකනිට්ඨං ගන්ත්වා පරිනිබ්බායති, අයං උද්ධංසොතො අකනිට්ඨගාමී නාම'** යනු. අවිහ, අතප්ප, සුදස්ස යන බඹලොව තුන ශොධනය කොට, සුදස්සී බඹලොව සිට පිරිනිවන් පාන්නේ, **'උද්ධංසොතො න අකනිට්ඨ ගාමී,** නම්. **'යො හෙට්ඨා තයො බ්‍රහ්මලොකෙ සොධෙත්වා සුදස්සී බ්‍රහ්මලොකෙ ඨත්වා පරිනිබ්බායති, අයං උද්ධංසොතො න අකනිට්ඨගාමී නාම'** යනු එහි පාළියයි. මෙයින් කො තැනකත් නො ගොස් අකනිටා බඹලොවට ම ගොස් පිරිනිවන් පාන්නේ **'න උඩංසොතො අකනිට්ඨගාමී'** නම්. **'යො ඉතො අකනිට්ඨමෙව ගන්ත්වා පරිනිබ්බායති, අයං න උද්ධංසොතො අකනිට්ඨගාමී නාම'** යනු පාළිය යි. යට බඹලොව සතර අතුරෙහි, ඒ ඒ බඹලොවකදී ම පිරිනිවන් පාන්නේ **'න උද්ධංසොතො න අකනිට්ඨගාමී'** නම්. එහි පාළිය:- **'යො හෙට්ඨා චතුසු බ්‍රහ්මලොකෙසු තත්ථ තත්ථෙ'ව පරිනිබ්බායති, අයං න උද්ධංසොතො න අකනිට්ඨගාමී නාම'** යි.

මෙහි දැක්වූ මේ අනාගාමීආර්‍යයෝ සුඛාවාස බඹලොව ගෙණ කියන ලදහ. අනාගාමීහු, රූප-අරූප රාගයන් ප්‍රහීණ නො කළ

බැවින්, බලාපොරොත්තු සහිත වූවෝ, සෙසු රූපාරූප භවයන්හිද උපදිති. සුද්ධාවාසයෙහි උපන්නෝ නම්, අන් තැනෙක නො උපදිති. මේ එය කියූ සැටි:- **'අනාගාමිනො පන රූපරාගාරූප රාගානං අප්පහීණත්තා ආකඞ්ඛමානා සෙසරූපාරූපභවෙසු නිබ්බත්තන්ති, සුද්ධාවාසෙ නිබ්බත්තා පන අඤ්ඤත්ථ න උප්පජ්ජන්ති'** යි.

දැන් 'උඩංසොතො' යන්නෙහි හා 'අකනිට්ඨගාමී, යන්නෙහි තේරුම් මෙසේ දත යුතුය. උඩට පමුණුවනසුලු බැවින්, උඩ බලා ගිය තෘෂ්ණාස්‍රොතයෙක් හෝ ව්‍රතස්‍රොතයෙක් හෝ මොහුට ඇත්තේ ය. උඩ ලොවට හෝ ගොස් පිළිලැබිය යුතු බැවින් උඩ බලා ගිය මාර්ගස්‍රොතයෙක් මොහුට ඇත්තේ ය' යි 'උද්ධං-සොත' නම්. **'උඩංවාහිභාවෙන උඩමස්ස තණ්හාසොතං වට්ටසොතං වා තී = උඩංසොතො, උඩං වා ගන්ත්වා පටිලභි-තබ්බතො උඩමස්ස මග්ගසොතන්ති = උද්ධංසොතො'** යනු එය කියූ සැටි යි. අකනිටාවට යන සුලු වූයේ, 'අකනිට්ඨගාමී' නම්. **'අකනිට්ඨං ග්ච්ඡතීති - අකනිට්ඨගාමී'** යනු එහි විවෘති යි. මේ සියල්ලෝ, උත්පත්තිවශයෙන් කාමාවචර ලොකයට නො එන්-නෝ යි. කාමාවචරලොකයෙක නො ද උපදින්නෝ ය යි අනාගාමී නම්.

සුද්ධාවාසයන්හි උපදින මොවුහු, තම තමන් විසින් වැඩූ ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-ස්මෘති-සමාධි-ප්‍රඥා යන පංචෙන්ද්‍රියයන්ගේ එකක් අනෙකට වඩා අධික ව සිටියා වූ ගුණබලයෙන්, ඒ ඒ බඹතල-යන්හි උත්පත්තිය ලබන්නෝ ය. ශ්‍රඛෙන්ද්‍රිය අධික ව වැඩීමෙන් කප් දහසක් ආයු ඇති අවිහබඹතලයෙහි, වීර්‍ය්‍යෙන්ද්‍රිය අධික ව වැඩීමෙන්, කප් දෙදහසක් ආයු ඇති අතප්පබඹතලයෙහි, ස්මෘතීන්ද්‍රිය අධික ව වැඩීමෙන් කප් සාර දහසක් ආයු ඇති සුදස්සබඹතලයෙහි, සමාධීන්ද්‍රිය අධික ව වැඩීමෙන්, කප් අට දහසක් ආයු ඇති සුදස්සීබඹතලයෙහි, ප්‍රඥෙන්ද්‍රිය අධික ව වැඩී-මෙන්, කප් සොළොස් දහසක් ආයු ඇති අකනිටා බඹතලයෙහි උපදනේ ය.

අවිහයෝ—ටික කලකින් තම තැන නො හරින්නෝ ය. **'අප්ප-කෙන කාලෙන අත්තනො ඨානං න විජහන්තීති-අවිහා'**

අතප්පයෝ—කිසිවකින්, කිසි තැනෙක නො ද තැවෙන්නෝය. **'න කෙනපි තප්පන්තී ති = අතප්පා'**

සුදස්සයෝ—ඉතා යහපත් රූසිරි - කැලුම් ඇති බැවින් නිදුකින් සැපසේ දකින්නෝ ය. **'පරම සුන්දරරූපත්තා සුඛෙන දිස්සන්තීති = සුදස්සා'**

සුදස්සිහු—ඉතා පිරිසිදු සිත් ගන්නා දැකුම් ඇත්තෝ ය. **'සුපරිසුඛ දස්සනත්තා සුඛෙන පස්සනත්ති = සුදස්සිනො'**

අකනිට්ඨයෝ — නො කියැකි තරම් උසස් සම්පත් ඇත්තෝ. කනිටු බවක් නැත්තෝ ය. **'උක්කට්ඨසම්පත්තිකත්තා නත්ථි එතෙසං කනිට්ඨභාවොති = අකනිට්ඨො'**

රහත්හු =

සුක්ඛවිපස්සක-සමථයානික යි දෙදෙනෙකි.

එහි, ධ්‍යාන කිසිත් නො උපදවා, විදසුන් පමණක් වඩා රහත්වූවෝ රහත් වන්නෝ සමථයෙන් නො තෙමුනු බැවින්, වියලුනු විදසුන් ඇත්තෝ ය සුක්ඛවිපස්සකයෝ. සමථභාවනා-වෙන් ඉපද වූ ධ්‍යාන හා පඤ්චාභිඥ ඇති ව රහත්පලය පසක් කළෝ ය සමථයානිකයෝ. මොවුහු අර්ථ-ධර්ම-නිරුක්ති-ප්‍රතිභාණ යන පටිසම්භිදාඤ්ඤාණයන්ගෙන් ද යුක්ත වන්නෝ ය.

සොතාපන්නයෝ, ප්‍රතිපදාභෙදයෙන්	12
සකෘදාගාමීහු, ,,	12
අනාගාමීහු, ස්ථානභෙදයෙන්	24
රහත්හු, යානභෙදයෙන් හා මාර්ගභෙදයෙන්	6
	54

මේ සූපණස් දෙන ශ්‍රඩාධුර-ප්‍රඥාධුර විසින් දෙකට බෙදී එක් සිය අටදෙනෙක් වෙත්. **'තෙහි එකබීජි කොලඞ්කොලො සත්තක්ඛත්තුපරමොති තයො සොතාපන්නා, කාමරූපාරූප-භවෙසු අධිගතඵලා තයො සකදාගාමිනො, තෙ සබ්බෙපි චතුන්නං පටිපදානං වසෙන චතුවීසති, අන්තරාපරිනිබ්බායී, උපහච්චපරිනිබ්බායී, සසඞ්ඛාරපරිනිබ්බායී, අසඞ්ඛාරපරි-නිබ්බායී, උඩංසොතො අකනිඨගාමි'ති අවිහෙසු පඤ්ච, තථා අතප්ප සුදස්ස සුදස්සීසු, අකනිඨෙසු පන උඩංසොතවජ්ජා චත්තාරො'ති චතුවීසති අනාගාමිනො, සුක්ඛවිපස්සකො, සමථයානිකො'ති ලෙ අරහන්තො, චත්තාරො මග්ගඨා'ති චතුපණ්ණාස, තෙ සබ්බෙ'පි සඩාධුරපඤ්ඤාධුරානං වසෙන දිගුණා හුත්වා අඨ සතා හොන්ති'** යනු සුත්‍රනිපාතාර්ථකථාව ආර්‍යපුද්ගල භෙදය කියූ සේ ය.

අඞ්ගුත්තරනිකායාර්ථ කථාව, මෙය කීයේ, මෙයට වඩා වෙනස් ලෙසක් ගෙණ ය. මේ එහි කියූ සැටි:- **'චතුවීසති සොතාපන්නා, චාදස සකදාගාමිනො, අඨචත්තාලීස අනාගාමිනො, චාදස ච අරහන්තො කථෙතබ්බා, ඉමස්මිං හි සාසනෙ සඩාධුරං පඤ්ඤා-ධුරන්ති ලෙධුරානි, දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤායො චතස්සො**

පටිපදා තත්ථෙකො සඩාධුරෙන අභිනිවිසිත්වා සොතාපත්තිඵලං පත්වා එකමෙව භවං නිබ්බත්තිත්වා දුක්ඛස්සන්තං කරොති, අයමෙකො එකබීජී, සො පටිපදානං වසෙන චතුබ්බිධො හොති. යථාවෙස එවං පඤ්ඤාධුරෙන අභිනිවිඝො' පී ති අඝ එකබීජිනො. තථා කොලඞ්කොලා සත්තක්ඛත්තුපරමා චා' ති ඉමෙ චතුවීසති සොතාපත්තා නාම,

තීසු පන විමොක්ඛෙසු සුඤ්ඤතාවිමොක්ඛෙන සකදාගාමී භූමිං පත්තා චතුන්නං පටිපදානං වසෙන චත්තාරො සකදාගාමිනො, අනිමිත්තවිමොක්ඛෙන පත්තාචත්තාරො, අප්පණිහිතවිමොක්ඛෙන පත්තා චත්තාරො'ති ඉමෙ වාදස සකදාගාමිනො. අවිහෙසු පන තයො අන්තරාපරිනිබ්බායී, එකො උපහච්ච පරිනිබ්බායී, එකො උඩංසොතො අකනිඝගාමී'ති පංච අනාගාමිනො. තෙ අසඞ්ඛාරපරිනිබ්බායිනො පංච'සසඞ්ඛාර පරිනිබ්බායිනො පඤ්චා'ති දස හොන්ති. තථා අතප්පාදිසු. අකනිඝෙසු පන උඩංසොතො නත්ථි. තස්මා තත්ථ චත්තාරො සසඞ්ඛාරපරිනිබ්බායී, චත්තාරො අසඞ්ඛාරපරිනිබ්බායී'ති අඝ. ඉමෙ අඝචත්තාළීස අනාගාමිනො. යථා පන සකදාගාමිනො තථෙව අරහන්තො වාදස වෙදිතබ්බා' යි.

සත්තිස් බෝපැකිදම් හා, නවලොවුතුරා දහම් මෙහි ආයතිගොචරා' යි කීහ. ගොචර නම්, සිත හැසිරෙන තැන් ය. සතිපඨාන සතර, සම්මප්පධාන සතර, ඉඩිපාද සතර, ඉන්ද්‍රිය පස, බලපස, බොජ්ඣඞ්ග සත, මග්ගඞ්ග අට යන මේ සත්සතිය බෝ පැකිදම්.

එහි, කායානුපස්සනා – වෙදනානුපස්සනා – චිත්තානුපස්සනා – ධම්මානුපස්සනා යන සතර සතිපඨානය, එක් ම ස්මෘතියක් කොට, නො උපන් අකුසල් නො ඉපදවීමෙහි උත්සාහය – උපන් අකුසල් පහ කිරීමෙහි උත්සාහය-නො උපන් කුසල් ඉපදවීමෙහි උත්සාහය-උපන් කුසල් දියුණු කිරීමෙහි උත්සාහය යන සතර සම්මප්පධානය, එක් ම සම්‍යක්ව්‍යායාමය කොට ගණිති. **'එත්ථ පන චත්තාරො සතිපඨානා'ති සම්මාසති එකා' ව පවුච්චති, තථා චත්තාරො සම්මප්පධානා' ති ච සම්මාවායාමො'** යන පාළියෙන් එය කී සැටී යි.

මේ සත්තිස් බෝපැකිදම්, එක එකින් සංග්‍රහ කොට ගත් කල්හි, ඡන්ද-චිත්ත-උපෙක්ඛා-සඩා-පස්සඩි-පීති-සම්මාදිඝි සම්මා සඞ්කප්ප- සම්මාවායාම-සම්මාවාචා- සම්මාකම්මන්ත- සම්මාආජීව-සම්මාසති - සම්මාසමාධි යි තුදුසෙක් ද, සතිපඨාන-සම්මප්පධාන-ඉඩිපාද-ඉන්ද්‍රිය-බල – බොජ්ඣඞ්ග – මග්ගඞ්ග යි ජාති විසින් සත් වැදැරුම් වෙති. කීහ මෙය මෙසේ:-

"ඡන්දෙ චිත්තමුපෙක්ඛා ච – සඩා පස්සඩි පීතියො
සම්මාදිට්ඨි ච සඞ්කප්පො – වායාමො විරතිත්තයං,
සම්මාසති සමාධී'ති – චුද්දසෙතෙ සභාවතො,
සත්තතිංසප්පභෙදෙන – සත්තධා තත්ථ සඞ්ගහො" යි

සම්මාසඞ්කප්ප- පස්සඩිසම්බොජ්ඣඞ්ග- පීතිසම්බොජ්ඣඞ්ග- ඡන්දිඩි-පාද- චිත්තිඩිපාද- සම්මාවාචා- සම්මාකම්මන්ත- සම්මාආජීවවිරති යන මේ නවය, එක් එක් කෘත්‍යයෙක් ඇත්තේ, එක් එක් ස්ථාන-යෙක් ඇත්තේ ය. වීර්‍යය තෙමේ, සම්මප්පධාන සතර, විරියිඩිපාද විරියින්ද්‍රිය, විරිය බල, විරියසම්බොජ්ඣඞ්ග, සම්මාවායාම විසින්, කෘත්‍ය නවයක් හා, ස්ථාන නවයෙක් ඇත්තේ ය. සමෘතිතොමෝ, සතිපඨාන, සතින්ද්‍රිය, සතිබල, සතිසම්බොජ්ඣඞ්ග, සම්මාසති විසින්, කෘත්‍යය අටක් හා ස්ථාන අටෙක් ඇත්තී ය. සමාධි තෙමේ, සමාධින්ද්‍රිය, සමාධිබල, සමාධිසම්බොජ්ඣඞ්ග, සම්මාසමාධි විසින් කෘත්‍ය සතරක් හා, ස්ථාන සතරෙක් ඇත්තේ ය. ප්‍රඥතොමෝ, වීමංසිඩිපාද, පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤබල, ධම්මවිචයසම්බොජ්ඣඞ්ග, සම්මාදිට්ඨි විසින්, කෘත්‍ය පසක් හා ස්ථාන පසෙක් ඇත්තී ය. ශ්‍රඩා තොමෝ, සඩින්ද්‍රිය, සඩාබල විසින්, කෘත්‍ය දෙකක් හා ස්ථාන දෙකක් ඇත්තී ය. කීහ මෙය මෙසේ ගාථා බන්ධනයට නගා:-

"සඞ්කප්ප පස්සඩි ච පීතුපෙක්ඛා,
ඡන්දෙ ථ චිත්තං විරතිත්තයං ච,
නවෙකඨානා විරියං නවඪ,
සතී සමාධි චතු පඤ්ච පඤ්ඤ,
සඩාදුඨානුත්තම සත්තතිංස,
ධම්මානමෙසො පවරො විභාගො" යි.

මෙහි මුලින් කියූ කෘත්‍ය නවය හා දෙවනු ව කියූ කෘත්‍ය නවය ද, තෙවනුව කියූ කෘත්‍ය අට හා සිවුවනු ව කියූ කෘත්‍ය පස ද, පස්වනු ව කියූ කෘත්‍ය සතර හා සවනුව කියූ කෘත්‍ය දෙක ද යන කෘත්‍ය සත්තිස, සත්තිස් බෝපැකිදහම් යි ගණිති.

මේ සියලු බෝපැකිදම්, අටවැදැරුම් ලොකොත්තර සිත්හි යෙදෙයි. ශුෂ්කවිදර්ශකක්ෂීණාශ්‍රවයාහට හා, ප්‍රථමඩ්‍යානය පාදක කොට, විදර්ශනා වඩා මගපල පසක් කරණ සමථයානිකයා හට නො අඩුව ලැබෙති මොවුහු. විතීය-තෘතීය-චතුර්ථඩ්‍යාන යන විතර්ක රහිත ධ්‍යානයන්, පාදකාදිවශයෙන් ගෙණ භාවනා කොට, මාර්ගඵලාවබොධය කරන්නා වූ ක්ෂීණාශ්‍රවයාහට, ලැබෙන්නේ, සම්‍යක්සඞ්කල්පනාමාර්ගාඞ්ගයෙන් තොර වූ බෝපැකිදම් සතිසෙකි. ප්‍රීතිරහිත වූ රූපාවචරපංචමඩ්‍යානය හෝ, ආදිම වූ අරූපාවචර-

ඩ්‍යාන තුන හෝ වඩා, මාර්ගඵලාවබොධය කරන්නා වූ ආර්‍යයනට, ලැබෙන්නේ සම්මාසඞ්කප්පයෙන් හා පීතිසම්බොජ්ඣඞ්ගයෙන් තොර වූ බෝපැකිදම් පන්තිසෙකි.

සතිපඨානාදී වූ යම්කිසි ධර්මයක් සීල – චිත්ත – දිඨි – කඞ්ඛා විතරණ – මග්ගාමග්ගඤ්ඤාණදස්සන – පටිපදාඤ්ඤාණදස්සන යන ලෞකික ෂට් විශුඬින් දියුණු කරන්නාහට ඔවුන්ගේ වශයෙන් උපදින කාමාවචරකුසලචිත්තයෙහි' යථායොගයෙන් යෙදෙන යෙදෙන සැටියෙන් ලැබෙන්නෝය මොවුහු. එය කීහ. මෙසේ:–

"සබ්බෙ ලොකුත්තරෙ හොන්ති – නවාසඞ්කප්පපීතියො,
ලොකියෙපි යථායොගං – ඡබ්බිසුඩ්ප්පවත්තියං" යි.

විස්තර මත්තෙහි එන්නේ ය.

නව ලොවුතුරුදහම් ද, ආර්‍යයන්ගේ ගොචරු යි මෙහි මුලින් කීයේ ඇත. එහිලා කෙටි කතාවක් ද යට කියන ලදී.[1]

ඣායිනො = ධ්‍යානකරණ සුලු. ධ්‍යාන වඩන්නා වූ.

ධ්‍යාන නම්, විතක්ක – විචාර – පීති – සුඛ – එකග්ගතා යන මොවුන් පස්දෙන, එක් කොට ගැණීම ය. මොවුන්ගේ එක්වීම ය. අරමුණු ලං කොට ගත්තේ කාමච්ඡන්දාදී වූ ප්‍රතිවිරුඬධර්මයන් දවා ලන්නේ යන අරුත් විසින්, මොවුන්ගේ එක්වීම, සංහතිය ධ්‍යාන නම් වේ. **'ආරම්මණං උපනිජ්ඣායතී'ති = ඣානං, පච්චනීක ධම්මෙ ඣාපෙතී'ති = ඣානං'** යනු බලාය අප කියූ සිංහලය සිටියේ.

විතක්කාදී වූ පස් දෙන, සමබරට, එකකට එකක් අඩු වැඩි නො ව, එකවිට ම නැඟී සිටීම ම ය ධ්‍යාන. රථ යි කියන්නේ, නිම්වළලු, රෝද, බොස්ගෙඩි, දැති ඈ එක් ව යෙදූ තැන ය. නිම්වළලු රථය නො වේ. රෝදය රථය නො වේ. බොස්ගෙඩිය රථය නො වේ. දැති රථය නො වේ. රථ නම් මුන් එකට යෙදූ තැන ය. නිම්වළල්ල එකලා ව සිටියේ, නිම්වළල්ල ම වේ. රෝදය එකලා ව සිටියේ, රෝදය ම වේ. බොස්ගෙඩිය එකලා ව සිටියේ, බොස්ගෙඩිය ම වේ. දැති එකලා ව සිටියේ, දැති ම වේ. එමෙන් විතක්කාදී වූ පස, එක් ව සිටීම ම ය ධ්‍යාන. විතක්කය එකලා ව සිටියේ, විතක්කය ම වේ. ධ්‍යාන නො වේ. සෙස්ස ද මෙසේ ය:

ධ්‍යානචිත්තයෙහි යෙදුනු විතක්කය තෙමේ තමන් හා හැනීසිටි චිත්ත – චෛතසිකධර්මයන් අරමුණට නන්ව යි. විචාරය, ඔවුන් අරමුණෙහි හසුරුවයි. ප්‍රීතිය, ඔවුන් අරමුණෙහිලා පිණවයි. සුඛය,

1. 'යො ච වත්ත කසාවස්ස' යන්නෙහි පරිකථාව බලනු.

ඔවුන් ඔදවඩයි. එකග්ගතාව, අතැනැ මෙතැනැ යා නොදී ඔවුන් නවතාල යි. රැක ගණියි. මෙසේ මොවුහු, පස් අයුරකින් අර මුණෙහි ක්‍රියා කරන්නෝ ය. ආරම්මණූපනිජ්ඣානය කරවන්නෝ ය. එහෙයිනි ධ්‍යාන.

තවද, විතර්කය තෙමේ, ඊනම්ඩය, චිත්ත - චෛතසිකයන් පිළිබඳ අලසකම් දවා. විචාරය තෙමේ විචිකිච්ඡාව, බුදුන් දහම් ඇ අට තන්හි සැකය දවා. ප්‍රීතිය තොමෝ, ව්‍යාපාදය, සිතේ සැඩ බව දවා. සුඛය තෙමේ, උඩච්ච කුක්කුච්චය, සිතේ නොසන් සුන් බව හා කුකුස, දවා. එකාග්‍රතා තොමෝ, කාමච්ඡන්දය, කාම යන්හි කැමැත්ත ආසාව දවා. මෙසේ මොවුහු, එකතු ව, එකට සිට කාමච්ඡන්දදීප්‍රත්‍යනීකධර්ම දවා හලු කරත්. එහෙයිනි මොවුහු ධ්‍යාන නම්.

ධ්‍යානයෝ, **ආලම්බනොපනිඩ්‍යාන-ලක්ෂණොපනිඩ්‍යාන** යි දෙ පරිදි වෙති. පඨවිකසිණාදී වූ යම් අරමුණක්, සිතට ගෙණ සිතෙහි නගා, එහි සිත පුරුදු කොට, ලැබිය යුතු වූ අෂ්ට සමාපත්තීහු 'ආලම්බනොපනිඩ්‍යාන' නම්. තිලකුණු මෙනෙහි කොට, ඉපදවිය යුතු විදර්ශනාමාර්ගඵල යන මොවුහු, 'ලක්ෂණොපනි ඩ්‍යාන' නම්.

අෂ්ට සමාපත්තීහු, රූපාවචර - අරූපාවචර විසින් දෙ පරිදි යි. ප්‍රථම - චිතීය - තෘතීය - චතුර්ථ - පංචමඩ්‍යානසමාපත්තීහු, රූපා වචරයෝ ය. ආකාසානඤ්චායතන - විඤ්ඤාණඤ්චායතන - ආකි ඤ්චඤ්ඤායතන - නෙවසඤ්ඤානාසඤ්ඤායතනඩ්‍යානසමාපත්තීහු, සිවුදෙන අරූපාවචරයෝ ය. මෙහි රූපාවචරඩ්‍යානසමාපත්ති පංචකය, චතුෂ්ක නයින්, පස, සතරක් කොට බෙදා, අරූපාවචර ඩ්‍යාන සමාපත්ති සතර හා ගිණු කල්හි, අටෙක් වේ. මේ අටය මෙහි සමාපත්ති යි කීයේ. ආලම්බනොපනිද්ධ්‍යානැ යි කීවෝ ත් මොවුහු ම ය. තවද රූපාවචරද්ධ්‍යානපංචකය හා අරූපාවචර ඩ්‍යානචතුෂ්කය එක් කොට, ගිණු කල්හි ලැබෙන නවය, 'නවානු පුබ්බවිහාරසමාපත්ති, යි ආගමයෙහි ප්‍රසිද්ධ ය. රූපාවචරයන්, චතුෂ්ක නයින් ගෙණ, අරූපාවචරචතුෂ්කයත් සඤ්ඤාවෙදයිත නිරොධයත් උන් හා ගිණු කල්හි ලැබෙන, මේ නවය, සමහර තැනෙක, 'නවානුපුබ්බවිහාරසමාපත්ති' යි ගණිත්. අනුපිළිවෙළින් පැමිණිය යුතු බැවින්, මොවුනට මේ නම කියනු, සුදුසුය. අර්ථ වත්ය. රූපාවචරද්ධ්‍යානයන්ගේ මේ චතුෂ්ක පංචකනය වදාළෝ බුදුරජානන් වහන්සේම ය. තියුණු නුවණ ඇත්තනට වැඩ පිණිස ය චතුෂ්කය. මද නුවණ ඇත්තනට වැඩ පිණිස ය පංචකය. මේ බුදුරජානන් වහන්සේගේ අදහස ය. බුදුරජානන්

වහන්සේ, සුඛ – එකග්ගතා යන දෙ අඟින් යුත් රූපාවචරපංචම ද්‍යානය හා, එම දෙ අඟින් ම යුත් අරූපාවචරද්‍යාන සතර අඞ්ගසමත්වයෙන් ගෙණ, ඒ අතින් ධ්‍යාන සතරක් කොට දැක්වූහ චතුත්ථ – පංචමධ්‍යාන හා, අරූපාවචරධ්‍යාන යන මොවුන් ස දෙන, අවයවගණනින් සම වුව ද, සුඛ – එකග්ගතා යන දෙ අඟින් යුත් ධ්‍යාන ය, චතුත්ථධ්‍යානය කොට ද, රූපාවචර පංචමඞ්‍යානය හා අරූපාවචරද්‍යාන සතර, උපෙක්ඛා එකග්ගතා යන අඞ්ගයන්ගේ සමානත්වයෙන් හා ගණනින් සම බැවින්, පංචමද්‍යානය කොට ද දැක් වූහ. මේ ක්‍රම දෙක එක් කොට, එයට 'සුද්ධිකනවක' යි කියත්. ධ්‍යානවිභඞ්ගයෙහි ලා ඒ සුද්ධික නවකය, පරිත්තාලම්බනාදි ආලම්බන සතරින් හා දුක්ඛා පටිපදාදි ප්‍රතිපදා සතරින් ද, නැවැත, එ දෙක මිශ්‍ර කිරීමෙන් ද, නවක පස් විස්සක් වදාළෝ ය, බුදුරජානන් වහන්සේ.

ධ්‍යාන උපදවන්නේ, පළමු කොට සතර සංවරසීලයෙහි පිහිටන්නේ ය. දස පළිබොධයන් සිඳ හරින්නේ ය. කමටහන් දෙන කළණමිතුරකු කරා යන්නේ ය. එහි දී, තමාගේ සිරිතට කැපෙන කමටහනක් ගන්නේ ය. ගෙණ, එය වැඩීමට, නො සුදුසු තැන් හැරලා සුදුසු තැනකට යන්නේ ය. ගොස්, කුඩා පළිබොධ සිඳ හරින්නේ ය. කමටහන වඩන්නේ ය.

සතරසංවරසීල නම්, පාතිමොක්ඛ- ඉන්ද්‍රිය- ආජීව- පච්චයසන්නි- ස්සිත සීල යි.

දසපළිබොධ නම්, ආවාස- කුල- ලාභ- ගණ- කම්ම- අද්ධාන- ඤාති- ආබාධ- ගන්ථ- ඉද්ධි යන මේ ය.

කළණමිතුරු නම්, සිය සිල් සැපතින් ප්‍රිය වූයේ ය. ගරුතර ගුණයෙන් බුහුමන් කටයුත්තේ ය. අවවාද අනුසාසනා විසින් කරුණු කියන සුල්ලේ ය. චොදනා විසින් කළ කියූ දේ ඉවසන සුල්ලේ ය. පටිච්ච සමුප්පාදාදී වූ ගැඹුරුදහම් කියන සුල්ලේ ය. නො සුදුසු තැන නො ම යොදන්නේ ය. ශ්‍රද්ධා- ශීලාදි ගුණ- යෙන් හෙබියේ ය. අතැවැස්සන්ට හිත කැමැත්තේ ය.

කමටහන්, පඨවි – ආපො – තෙජො – වායො – නීල – පීත – ලොහිත – ඔදාත – ආලොක – පරිච්ඡින්නාකාසකසිණ – උඬුමාතක විනීලක – විපුබ්බක – විච්ඡිද්දක-වික්ඛායිතක – වික්ඛිත්තක – හත- වික්ඛිත්තක – ලොහිතක – පුලවක – අට්ඨිකඅසුභ, බුද්ධ – ධම්ම – සඞ්ඝ – සීල – චාග – දෙවතා – මරණ – කායගතා – ආනාපාන – උපසමානුස්සති, මෙත්තා-කරුණා-මුදිතා-උපෙක්ඛා-බ්‍රහ්මවිහාර-

ආකාසානඤ්චායතන- විඤ්ඤාණඤ්චායතන- ආකිඤ්චඤ්ඤායතන- නෙවසඤ්ඤානාසඤ්ඤායතනාරූප්ප, ආහාරපටිකකූලසඤ්ඤා, චතුධාතුවවත්ථාන, යි සතළිසෙකි.

චරිත, රාග- දෙස- මොහ-සද්ධා- බුද්ධි- විතක්ක- රාගදෙස- රාගමොහ- දෙසමොහ- රාග දෙස මොහ- සද්ධාබුද්ධි- සද්ධා විතක්ක- බුද්ධිවිතක්ක- සද්ධාබුද්ධිවිතක්කචරිත යි චරිත තුදුසෙකි. මේ තුදුස මිශ්‍රවීමෙන් චරිත තෙ සැටෙක් ලැබේ. කොටින් සයෙකි.

රාගචරිතයට සුදුසු ය, දස අසුභය හා කායගතාසතිය.

දෙසචරිතයට සුදුසු ය, බ්‍රහ්මවිහාර සතර හා, නීල - පීත - ලොහිත - ඔදාත යන වණ්ණකසිණ සතර.

මොහචරිතයට සුදුසු ය, ආනාපානසතී ය.

විතක්කචරිතයට සුදුසු ය, ආනාපානසතිය.

සද්ධාචරිතයට සුදුසු ය, බුද්ධ - ධම්ම - සඞ්ඝ - සිල - චාග -දෙව තානුස්සති.

බුද්ධිචරිතයට සුදුසු ය, මරණ - උපසමානුස්සති, චතුධාතුවවත්ථාන ආහාරපටිකකූලසඤ්ඤා.

සියලු චරිතයනට, පොදුවේ සුදුසු ය, පඨවි-අපො-තෙජෝ-වායො-ආලොක-පරිච්ඡින්නාකාසකසිණ හා ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන-ආකිඤ්චඤ්ඤායතන-නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන යන මොවුහු.

භාවනාවට නො සුදුසු තැන්, මහවෙහෙර- අලුත් වෙහෙර- දිරූ වෙහෙර - මග අසලවෙහෙර - පැන් පොකුණු ඇති වෙහෙර - පලාකොළ ඇති වෙහෙර - පුෂ්පාරාමය - ඵලාරාමය - පැතිය යුතු වෙහෙර - නුවර ඇසුරු කළ වෙහෙර - දූවදඬු බහුල වෙහෙර - කුඹුරු ඇසුරු කළ වෙහෙර - නො සම මහණුන් ඇති වෙහෙර පටුනුගම් ඇසුරු කළ වෙහෙර - පිටිසරගම් ඇසුරු කළ වෙහෙර- රාජ්‍යසීමා ඇසුරු කළ වෙහෙර - අසප්පාය වෙහෙර - කළණ මිතුරන් නො ලැබිය හැකි වෙහෙර.

භාවනාවට සුදුසු ය, නො දුරු නො ලං ගමනාගමනින් යුත්, රැදාවාල මහා ජනයාගෙන් හා මහා ජනයාගේ කෑ මොර ගැසුම් වලින් තොර, මැසිමදුරු නයි පොළොං ඈ උවදුරු නැති, පහසුවෙන් ලැබිය හැකි සිවුපසය ඇති උගත් ගුණවත් මහණ කුගේ විසීම ඇති සෙනසුන.

කුඩාපළිබොධ, දික් කෙස් ලොම් නිය සිඳීම් – දිරූ සිවුරු මසා පිළියෙල කර ගැණීම් – කිලිටි සිවුරු සෝදා පඬු ගැන්වීම් පාත්‍රය පුළුස්සා පිරිසිදු කර ගැණීම් – ඇඳ පුටු කොට්ට මෙට්ට ඇතිරිලි බිසි පාබිසි පිරිසුදු කර ගැණීම් ආ ය.

මෙහි මෙසේ ඉතාසැකෙවින් කියූ මේ සියල්ල, ධ්‍යාන වඩන්නට කැමැත්තහු විසින්, ධ්‍යාන වඩන්නට පෙරාතු ව, සම්පූණී කළ යුතු ය. හැරිය යුත්ත හැරිය යුතු ය. ගතයුත්ත ගතයුතු ය. වඩන්නේ පඨවිකසිණය නම්, පළමු කොට කසිණමණ්ඩලයක් සාදා ගත යුතු ය. එය සාදිය යුත්තේ, කාවේරීගංඉවුරෙහි ඇති අරුණුවන් මැටියෙනි. අරුණුවන් මැටි අන් තැනින් ගෙණ ඒ සඳහා යෙදුව ද වරද නැත. පළල, එක් වියත් සතරඟුලක් තබා වට කොට ඒ කළ යුතු ය. ධ්‍යාන කරන්නහු, හිඳින අසුන ද, එක් වියත් සතරඟුලක් උස ඇත්තක් විය යුතු ය. ඒ අසුනෙහි, හිඳ අරුණුවන් මැටියෙන් තනා ගත් කසිණමණ්ඩලය ඉදිරිපිටට ගෙණ කාමසෙවනයෙහි වරද, දෙස් තදින් සිතට නගාගෙණ සියජීවිතය බුදුරජුන්ට පුදා 'මේ පිළිවෙත සියලු බුදු පසේ බුදු මහරහතුන් පිළිපන් උතුම් පිළිවෙතැ' යි පිළිවෙතෙහි මහත් ගෞරවයක් ඉපිදවිය යුතු ය.

මෙසේ, ධ්‍යානභාවනාවෙහි, පෙරාතු ව කළ යුතු සියල්ල කොට, පිළිවෙතෙහි උපදවා ගත් ගෞරව ඇති උත්සාහවත් යොගි තෙමේ ඉතාවැඩියෙනුත් ඉතාඅඩුවෙනුත් ඇස නොදල්වා සම පමණට ඇස හැර, කසිණමණ්ඩලයෙහි පැහැය හා ලකුණු නොසලකා, එහෙත් පැහැය නොහැර, පඨවීධාතුව පිළිබඳ ප්‍රඥප්ති ධර්මයෙහි සිත තැන්පත් කොට, එකඟ වූ සිතින් **'පඨවි පඨවි'** යි නිමිති ගන්නේ ය. නිමිති ගැණෙන තුරුම, සිත එහි පතුලට කැවෙනතුරු ම එසේ කරන්නේ ය. එය 'පරිකම්මනිමිත්ත' යි කියත් ඒ භාවනාව 'පරිකම්මභාවනා' යි හඳුන්වති. යොගියා, මෙසින් කලේ, නත් අරමුණුවල විසිර යන සිත, ඒ හැම අරමුණකින් වළක්වා වෙන් කොට, පඨවිකසිණපරිකම්මනිමිත්තෙහි, නවතා-ලී ම ය. තැන්පත් කිරීම ය. කසිණ යනු, සියල්ල යන අරුත් ඇත්තේ ය. එ හෙයින්, මේ කියූ පරිකම්මනිමිත්තෙහි සිත වැඩී-මෙන්, පොළොව කිමිද ගත්තහුට, සියලු දිසාවන් පෘථිවියැ යි වැට හෙන්නා සේ, මේ යොගියාහට, 'මගේ සියලු දිසාවෙහි ඇත්තී පෘථිවිය' යි වැට හෙන්නේ ය. එසේ, වැටහුනු කල, ඔහුට උග්ගහ-නිමිත්ත උපන්නේ නම්. පරිකම්මනිමිත්ත, සිතින් දැඩි ව ගත් කල්හි ඇස වසා බලන කල්හි, ඇස හැර බලන කල්හි සේ ත්, අන්

තැනකට ගොස්, සිහිකරණ කල්හි, එතැනැ සිට එය බලන කල්හි සේ ත්, ඒ හැටියට ම මනොචාරාවර්ජනවිත්තයන්ගේ හමුවට ඉදිරියට කසිණමණ්ඩලයාගේ පැමිණීම, වැටහීම 'උග්ගහනිමිත්ත' නම.

මෙසේ උග්ගහනිමිත්ත උපන් පසු යොගී තෙමේ, එ තැනින් නැගිට තමන් වසන තැනට හෝ වෙන අන් විවෙක ඇති ගල්ගුහා ඈ සෙනසුනකට හෝ ඇතුල් ව, මනොචාරයට වැටහුනු පරිකර්ම-නිමිත්තඡායාසඞ්ඛ්‍යාතඋග්ගහනිමිත්ත අරමුණු කොට, 'පඨවි පඨවි' යි පෙර සේ නැවැත සිත එහි වඩන්නේ ය. සිත එහි හසුරුවන්නේ ය. සියදහස් වරකුත් වඩන්නේ ය. මෙසේ වඩන කල්හි මෙසේ හසුරුවන කල්හි යම් ලෙසකින්, අසප්පාය කරුණක් නිසා ඒ ගෙණ තුබූ උග්ගහනිමිත්ත නැසී ගියේ නම්, නො පෙණී ගියේ නම්, නැවැතත් පරිකර්මනිමිත්ත තුබූ තැනට ගොස් ඒ යොගියා විසින් සිත එහි වැඩිය යුතුය. වඩා උග්ගහ නිමිත්ත නැවැතත් උපදවා ගත යුතු ය. මෙසේ ගන්නා නිමිත්ත, නැසෙන හැමවර ම පරිකර්මනිමිත්ත තිබෙන තැනට ගොස්, භාවනා කොට නැසීගිය උග්ගහනිමිත්ත උපදවා ගත යුතු ය. උග්ගහනිමිත්ත නැසුනැ යි භාවනාව අතහැර දැමීම යොගීධර්මය නො වේ. එය නැසෙත් නැසෙත් ම යොගියා, එහි වඩ වඩා ත් උත්සාහවත් විය යුතු ය. එය ය යොගීධර්ම ය. උග්ගහමිත්ත උපදවා ගැණීමෙන් ලැබුනු ඒ සමාධිය තරුණ ය. මෝරා ගියා වූ සමාධියෙක් නො වේ එ ය. එහෙයින් මෙසේ නැසී යනු හැකි ය. උග්ගහනිමිත්ත සිතට ගෙණ අරමුණු කොට, සිත වඩන කල්හි, යොගියා පිළිබඳ පංච නීවරණධර්මයෝ යටපත් වෙති. ශ්‍රඩාදිඉන්ද්‍රියයෝ තියුණු වෙති. අශ්‍රඩාදීහු දුරු වෙති. වලා ගැබක් පලා ගෙණ, සඳමඩල නික්මෙන්නා සේ පසුම්බියකින් කැඩපතක් එලියට ඇද ගන්නා සේ මනා කොට සේදූ සක්තලියක් සේ වැසිවලාවක ඉදිරියෙහි පියාඹන කොකෙකු සේ උග්ගහනිමිත්ත විවෘත කොට පළමුවර මුල් තැන ම කණමැදිරි එලියක් තරම් ආලොකයෙක් යොගියා පිළිබඳ ව පහළ වන්නේ ය. එය දෙ සැත්තෑවක් වස්තුධර්මයන් ගෙන් මිදුනේ ය. මේ ආලොකය ඒ යොගියාහට ලොකයෙහි ඇති සියලු ආලොකයන්ට වඩා ඉතා පහන් සේ වැට හෙන්නේ ය. මේ ආලොකය, කසිණාලොකය යි කියනු ලැබේ. කසිණපටිභාග නිමිත්තත් මේ ය. ධ්‍යානය තව ම නො උපන්නේ ය. එහෙයින් යොගියා විසින් උපන් ඒ ආලොකය මහත් වේවා යි ආශාව උපදවා නැවැතත් එම අලොකය අරමුණු කොට 'පඨවි පඨවි' යි භාවනා කළ යුතු ය. එකල ආලොකය අඟලක් හෝ දැඟලක් පමණ මහත් වන්නේ ය. එපමණ මහත් වූ එම ආලොකය 'පරිත්තා-

ලම්බන' යි කියනු ලැබේ. දැන් ධ්‍යානය ඉපිද විය හැක්කේ ය. එහෙත් එ පමණින් සෑහීමට නො ගොස් තව තවත් කසිණා ලොකය මහත් කරන්නට පෙරකී සේ සිත වැඩිය යුතු ය. එවිට සරාවක් හෝ වට්ටියක් පමණට එය මහත් ව පිහිටින්නේය. එ තරමට වැඩුනු විට එම ආලොකය 'මඛ්‍යාලම්බන' යි කියනු ලැබේ. මෙ තැනදී ත් ධ්‍යනය ඉපදවිය හැක්කේ ය. එහෙත් මෙතැනදීත් සෑහීමට පත් විය යුතු නො වේ. තෙමේ කැමැත්තේ නම් තම සෙනසුන පමණට ආරාමය පමණට ගම පමණට නුවර පමණට දිවයින පමණට සක්වළ පමණට එම කසිණාලොකය වැඩිය හැකි ය. ආලොකය මෙ තරම් මහත් වූ කල 'අප්‍රමාණාලම්බන'යි හඳුන්වනු ලැබේ. මේ අප්‍රමාණාලම්බනය සක්විති කුමරකු පිළිසිඳ ගත් මවු කුසක් සේ මහත් ගෞරවයෙන් මහත් ආදරයෙන් මහත් ඕනෑ කමින් නො පමාවූවහු විසින් රැකිය යුතු ය. ඒ රැක්මට නො සැප වූ සෙනසුන, ගොදුරුගම, කතා, පුද්ගල, බොජුන, උතු, ඉරියවු යන සත දුරු කට යුතු ය. සැප වූ සෙනසුන් ඇ සෙවිය යුතු ය. මෙසේ දුරු කටයුතු සෙනසුන් ඇ, දුරු කොට සෙවිය යුතු සෙනසුන් ඇ, සෙවනය කරමින් අප්‍රමාණාලම්බනයෙහි සිත වඩන්නා වූ යොගියාහට කල් නො යා දී ම, අජිණාසමාධිය උපදනේ ය. යම් ලෙසකින් එය නො උපන්නේ නම්, සිරුරු, සිවුරු යනාදී වස්තූන් පිරිසිදු කිරීම, ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන් සමබවට පත් කිරීම, පඨවිකසිණාදීනිමිත්තෙහි දක්ෂභාවය, සිත වැඩියයුතු කල්හි වැඩීම, සිතට නිග්‍රහ කටයුතු කල්හි නිග්‍රහ කිරීම, සිත සතුටු කළයුතු කල්හි සතුටු කිරීම, සිත මැදහත් බවට පැමිණ විය යුතු කල්හි මැදහත් බවට පැමිණවීම නොභික්මුනු පුද්ගලයන් දුරු කිරීම, සත්හුන් පුද්ගලයන් සෙවන කිරීම, සමාධිය ඉපදවීමෙහි කැමැත්ත, යන මේ කරුණු අනුව ක්‍රියා කළ යුතු ය. මේවා එකකු ත් නො හැර පැවැත්වීම 'අජිණාකෞශල්‍ය' යි කියත්. මේ කටයුතු සපයන යොගියාහට ලැබුනු පටිභාග නිමිත්ත විෂය කොට ය අජිණාව පවත්නී.

මෙසේ ත් අජිණාසමාධිය නො උපන්නේ නම්, යොගී තෙමේ තම සිතේ පැවැත්ම සලකා, නැවැත වියයුතු, සමබවෙහි යොදන්නේ ය. එහිලා පමණ ඉක්මවා වියයුතු නො කට යුතුය අත්‍යාරබ්ධවියයුතු හැරදමා හැකුළුනු බවෙන් හා උඩඟු බවෙන් සිත මුදා සම කොට තබා පටිභාගනිමිත්තට අභිමුඛ කොට, 'ප්‍රථමධ්‍යානය ලැබේවා'යි ප්‍රාර්ථනා කොට ආශා උපදවා 'පඨවි පඨවි' යි සිත වඩන්නේ ය. එසේ සිත වඩත්, මෙහෙයත් භවාඞ්ග චිත්තය සිඳ පඨවිකසිණය අරමුණු කොට මනොචාරවජ්ජන චිත්තය උපදනේ ය. අනතුරු ව එහි ම ඒ අරමුණු කොට ම

ජවනයෝ සිවු දෙනෙක් හෝ පස් දෙනෙක් උපදිති. ජවන් සතරක් උපන් කල්හි එහි ප්‍රථමජවනය, පරිකම්ම, උපචාර කියා ද, දෙවනජවනය, අනුලොම කියා ද, තෙවන ජවනය ගොත්‍රභූ කියා ද, සිවුවැන්න අජීණා කියා ද නම් ලබන්නෝ ය. ජවන් පස් දෙනකු උපදනා කල්හි ප්‍රථම ජවනය පරිකම්ම යි ද, දෙවනජවනය උපචාර යි ද, තෙවන ජවනය අනුලොම යි ද, සිවු වන ජවනය ගොත්‍රභූ යි ද, පස්වැන්න අජීණා යි ද කියනු ලැබේ. මේ අජීණාචිත්තය, රූපාවචරප්‍රථමධ්‍යානචිත්ත ය යි කියනු ලබන්නේ මෙහි විතක්ක- විචාර- පීති- සුඛ- එකග්ගතා යන අඞ්ග පස යෙදී සිටි බැවිනි. මේ අජීණා ව එකචිත්තක්ෂණික වේ. නැවැත භවාඞ්ගයට වැටේ.

අස්ලොම් විදින්නට පුරුදු කරණ ධනුර්ධර තෙමේ, අස්ලොමක් විද, 'මම දුන්න මෙසේ අතට ගතිමි, දුනුදිය මෙසේ නැගීමි, ඊය මෙසේ හිඳුවීමි, මේ ඉරියව්වෙන් සිටියෙමි, මෙසේ විද්දෙමි'යි විදීමට පා එස වූ හැටි දුන්න අතට ගත් හැටි දුනුදිය නැඟූ හැටි ඊතලය යෙදූ හැටි සිටි ඉරියව්වෙ හැටි නැවැත නැවැත සලකා ඒ හැම හැටිය සිතට ගන්නේ ය. පසු දවසෙක අස්ලොම් විදිනු කැමැති කල මුලින් කළ හැටියට අස්ලොම් විදින්නේ, නො වරදවා අස්ලොම් විද දෙපලු කරන්නේ ය. එ මෙන්, මේ යොගියා ද 'මම මෙබඳු භොජනයක් වැළඳීමි, මෙබන්දකු ඇසුරු කෙළෙමි, මෙබඳු සෙනසුනක හුන්නෙමි, මෙබඳු ඉරියව්වකින් සිටියෙමි, මෙබඳු කලෙක ධ්‍යානයට පැමිණියෙමි' යි සලකා සැප වූ බොජුන් ඇ සැපයිය යුතු ය. එසේ සපයා ගත් කල යොගී තෙමේ තමන් උපදවා ගත් ඒ තරුණ සමාධිය පිරිහී ගියේ නම්, නැවැත එය උපදවා ගැණුමට, නො පුහුණු ධ්‍යාන පුහුණු කොට අජීණාවට පැමිණෙන්නට පොහොසත් වන්නේ ය.

තවද, හොඳට කටයුතු දත් අරක්කැමි තෙමේ තම ස්වාමියා වළඳනු ලබන කල්හි යම් මාලු පිණියක් ඔහු සතුටින් වළඳනු දැක, එතැන් සිට, ස්වාමියාට රුචි වූ මාලු පිණි ම කෑමට එළවා තබන්නේ ය. එයින් අරක්කැමි තෙමේ ස්වාමියාගේ සිත් ගන්නේ, මහත් ලාභ ද ලබන්නේ ය. එ මෙන්, මේ යොගියා ද ධ්‍යානයට පැමිණි කල්හි, එයට හිත වූ සැප වූ බොජුන් ආදියෙහි ආකාර සලකා, ඒම සපයන්නේ, නැවැත නැවැත අජීණා සමාධිය ලබන්නේ ය.

අජීණාසමාධිය, මෙ තරමකින් කල් පවත්නේ නො වේ. අජීණා ව කල් පවත් වන්නට, සමාධියට සතුරු වූ නීවරණ ධර්මයන්ගෙන් සිත නිදහස් කර ගත යුතු ය. ධ්‍යානය බොහෝ

කල් පවත්වා ගැණීමට කැමැති යොගියා විසින්, නීවරණධර්ම යටපත් කොට, ධ්‍යානයට සමවැදිය යුතු ය. සමාධිභාවනාවෙන් අභිඥ උපද වන්නට උපචාර - අර්පණා වශයෙන් ලැබූ ප්‍රතිභාග නිමිත්ත වැඩිය යුතු ය. ඒ වඩන භූමිය ද උපචාර - අර්පණා විසින් දෙවැදෑරුම් ය. උපචාරයට පැමිණ හෝ ප්‍රතිභාගනිමිත්ත වැඩිය යුතු ය. අර්පණාවට පැමිණ හෝ වැඩිය යුතු ය. එහෙත්, තමන්ගේ සිතට අනුකූල සේ, උපචාරයෙහි හෝ, අර්පණාවෙහි හෝ එක් තැනෙක නිරතුරු වැඩිය යුතු ය.

මැටිබඳුන් තනන කුඹල්කරු තෙමේ, පළමු කොට බදුනේ යට කොටස, කුඹිල්සකෙන් වෙන් නොකොට මතු වත්නට බඳුන වඩන්නේ ය. සීමා බඳින භික්ෂූහු, පළමු කොට, අට දිසා වෙහි නිමිති සලකුණු කොට ඒ නිමිති අතර ම සීමා බඳිත්. එ මෙන් යොගියා විසින් තමන් ලැබූ ඒ නිමිත්ත එක් අඟල, දෙයඟල, තෙයඟල, සතරඟල පමණට හෝ ඉනුත් වැඩි ව හෝ 'මෙතෙක් තැන වඩමි' යි වඩන ප්‍රදේශය පළමු කොට සිතින් සීමා කොට, වෙත් කොට ඒ වෙත් කළ පමණට වැඩිය යුතු ය. වඩන පෙදෙස වෙන් නොකොට නොවැඩිය යුතු ය. වෙන් නොකොට වඩන්නහුට නිමිත්ත නොවැඩෙන්නේ ය. වියත, රියන, ගේමිදුල, පිරිවෙණ, වෙහෙරඉම්, ගම්, නියම්ගම්, දනවු, රාජ්‍ය සීමා, සමුද්‍රසීමා යන මොවුන් ද, සිනින් සීමා කොට වෙන් කොට වඩන්නහු විසින් මුළුසක්වළ හෝ එයින් මත්තෙහි හෝ පිරිසිඳ වැඩිය යුතු ය. මේ කී ලෙසට නිමිත්ත වඩන යොගියාහට නිමිත්ත වැඩූ තැන්හි පොළොවෙහි ගොඩ තැන්, වලතැන්; ගඩොා, කඳු යන සියලු සම නොසම තැන්, එකසේ සමව වැට හෙන්නේ ය. නිමිත්ත වඩා ප්‍රථමධ්‍යානයට පැමිණි ආදි කර්මිකයා විසින් ධ්‍යානාඞ්ග බහුල වශයෙන් ප්‍රත්‍යවේක්ෂා නොකොට ධ්‍යානයට සම වැදීම ම බහුල කොට විසිය යුතු ය. ධ්‍යානාඞ්ග බහුල ව ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ඒ ධ්‍යානයේ යෙදී සිටි චිතක්ක - විචාරාදී ධ්‍යානාඞ්ගයෝ මලානික ව දුර්බල ව වැටහෙන්නෝ ය. එසේ එහි ධ්‍යානාඞ්ග ඔලාරික වත් දුර්බල වත් වැටහීම ත්, මත්තෙහි ද්විතීය ධ්‍යානය ඉපදවීමට කරුණු වන්නේ ය. ලැබූ ධ්‍යානයෙහි පුහුණුව නොලැබ මතු ධ්‍යානයෙහි උත්සාහ කරන්නේ ලැබූ ප්‍රථමධ්‍යානයෙන් ද පිරිහෙන්නේ ය. මත්තෙහි ද්විතීයධ්‍යානය ලැබීමට හැමතකින් ඔහු අසමර්ථ වේ.

ඉක්බිති ප්‍රථමධ්‍යානය, ආවජ්ජන - සමාපජ්ජන - අධිට්ඨාන - වුට්ඨාන - පච්චවෙක්ඛණවසිතාවන්ගෙන් වසී කළයුතු ය. තම යටතට ගත යුතු ය. ප්‍රථමධ්‍යානය, නීවරණධර්මයන්ට ආසන්න ය,

නීවරණ ධම් ප්‍රථමධ්‍යානය ලභ හැසිරෙයි, විතකී නැමැති බලගතු අවයවයකින් යුක්ත වූයේ ය, යනාදි ලෙසින් එහි වරද දෙස් දැක්ක යුතු ය. සත්‍රියක සරණ කරගත් පුරුෂයෙක් අන් සත්‍රියක කෙරෙහි ඇලී පළමු සරණ කොට ගත් සත්‍රියගෙන් වෙන්වනු කැමැත්තේ දෙස් දැක ඇ කෙරෙහි තුබූ පිළිබඳ ආලය හැර දමන්නේ යම්සේ ද, එසේ, මේ ප්‍රථමධ්‍යානික තෙමේ, ප්‍රථමධ්‍යාන යෙහි දෙස් බලා එහි ආලය දුරු කොට, විතීයධ්‍යානයෙහි ආලය කරන්නේ ය. ඒ ආලයෙහි සිට ම සිවුරහින් යුත් විතීයධ්‍යානය ලබන්නට නැවැත **'පඨවි පඨවි'** යි යොග කරන්නේ ය. එසේ යොග කරණ කල්හි ඔහුට විතක්කයෙන් තොර වූ විචාර-පීති-සුඛ-එකග්ගතා යන සිවුරහින් යුත් විතීයධ්‍යානය එක් වරක් උපදනේ ය. අනතුරු ව සුදුසු පමණින් භවාඞ්ගයසින් පහළ වේ. සෙස්ස ප්‍රථමධ්‍යානයෙහි කී සේ ය.

ඉක්බිති මේ විතීයධ්‍යානය මුලින් කී පංචවසිතාවන්ගෙන් වසී කළ යුතු ය. වසී කොට, 'මා ලත් මේ ධ්‍යානයට ලං ව හැසිරෙනා විතකී නම් සතුරෙක් ඇත්තේ ය, විචාර නමැති බලගතු අවයව යෙක් ද මෙහි ඇත්තේ ය, යන ඇ ලෙසින් විතීයධ්‍යානයෙහි ඇති වරද බලා එහි ආලය දුරු කොට තෘතියධ්‍යානයෙහි ආලය උපදවා එය ලබන්නට නැවැත ත් **'පඨවි පඨවි'** යි යොග කරන්නේ ය. එවිට ඔහුට පීති-සුඛ එකග්ගතා යන තුන් අඟින් යුත් තෘතියධ්‍යානය එක් වරක් උපදනේ ය. භවාඞ්ගයසින් අනතුරුව පහළ වේ.

ඉක්බිති මේ තෘතීයධ්‍යානය වසී කළයුතු ය. පංචවිධ වසිතාවන්ගෙන් එසේ වසී කොට 'මා ලත් මේ තෘතීයධ්‍යානය පීති නම් බලගතු අවයවයකින් හැනී සිටියේ ය, ඒ නො මැනැවි, ඒ හා එක් ව ඉදිරියට නො යා හැකි ය, එහෙයින් ඒ හැර දමා සුඛ-එකග්ගතා යන දෙයඟින් සැදුනු චතුර්ධ්‍යානය ලැබිය යුතුය' යි තෘතීයධ්‍යානයෙහි ආලය හැර චතුර්ධ්‍යානයෙහි ආලය උපදවා **'පඨවි පඨවි'** යි නැවැත ත් යොග කරන්නේ ය. එකල සුඛ-එකග්ගතා යන දෙයඟින් යුත් චතුර්ධ්‍යානය එක් වරක් උපදනේ ය. අනතුරුව භවාඞ්ගයසින් පහළ වේ.

ඉක්බිති මේ චතුර්ධ්‍යානය පංචවිධවසිතාවන්ගෙන් වසී කළ යුතු ය. 'මේ සුඛය වහා පෙරළෙන සුලුය' යි එහි දෙස් දැක්ක යුතු ය. නැවැත, පංචමධ්‍යානය සාත්තලෙසින් සලකා **'පඨවි පඨවි'** යි යොග වැඩිය යුතු ය. එවිට උපෙක්ඛා-එකග්ගතා යන දෙයඟින් යුත් පංචමධ්‍යානය වරක් උපදනේ ය. යට කී ලෙස මෙය ද වසිතාවන්ගෙන් වසී කළයුතු ය. දැන් මේ යොගී තෙමේ රූපාවචර ධ්‍යානයන්ගේ මුදුනට පැමිණියේය යි දත යුත්තේ ය.

ඉක්බිති යොගී තෙමේ, 'රූපය, කලහ විග්‍රහ විවාදාදියට හා නානාවිධරෝගයනට සථාන වන්නේ ය, සසරදුකට හෙතුව මේ රූපය ය, මේ කිසිවෙක් අරූපයෙහි නැතැ' යි රූපයෙහි දෙස් දැක **'ඛි රූපං, ඛි රූපං'** යි රූපයට ගරහා රූපධ්‍යානයෙහි ආලය හැර අරූපධ්‍යානයෙහි ආලය උපද වන්නේ ය. නැවැත රූපාවචරධ්‍යාන ඉපදවීමට කරුණු වූ ආකාසකසිණය හැර සිටි නවකසිණ අතුරෙහි යම්කිසි කසිණයෙහා චතුත්‍ථධ්‍යානය උපද වන්නේ ය. මෙසේ උපදවා ගත් චතුත්‍ථධ්‍යානයට අරමුණු වූ කසිණරූපයෙහි කලකිරුණු සිතැත්තේ එයින් දුරු වන්නට සිතා පුරුදු කළ වසිතා ඇති ව, ප්‍රගුණ වූ චතුත්‍ථධ්‍යානයෙන් නැගී එහි දෙස් සලකා ආලය දුරු කොට 'ආකාසානඤ්චායතනය සානන්ත' යි සිතට නගා පඨවිකසිණාදියෙන් සිත උගුළුවා ඒ කිසුණු ඉගුළු ආකාසය සක්වළ තෙළවර කොට හෝ තමන් කැමැති තැනෙක හෝ පතුරුවා, කිසුණු ඉගුළු අහස ම අරමුණු කොට **'ආකාසෝ, ආකාසෝ'** යි හෝ **'අනන්තෝ ආකාසෝ, අනන්තෝ ආකාසෝ'** යි හෝ සෝග කරන්නේ ය. එවිට යොගියා පිළිබඳ නීවරණ ධර්‍ම යටපත් ව යයි. යොගයට අරමුණු වූ ආකාසය අරමුණු කොට මනොචරාවජ්ජන චිත්තය උපදනේ ය. එයට අනතුරු ව තිහෙතුක උපෙක්ඛාසහගත මහාකුසලචිත්තයන් දෙදෙන අතරින් එක්තරා කුසල චිත්තයක් පරිකම්මාදි නමින් තුන් වරක් හෝ සතර වරක් උපචාරසමාධි ජවන කෘත්‍යය සිදු කළ කල්හි සතරවනු ව හෝ පස්වනු ව උපෙක්ඛා-එකග්ගතා යන ධ්‍යානනාමය ප්‍රධාන කොට ඇති චෛතසික සම්පිසකින් යුත් ආකාසානඤ්චායතනකුසල චිත්තය එක් වරක් උපදනේ ය. නැවැත භවාඞ්ග වේ.

ඉක්බිති යොගියා තමන් ලැබූ ඒ ආකාසානඤ්චායතනඛ්‍යානය යට කී ලෙසින් පංචවසිතාවන්ගෙන් පුරුදු කළ යුතු ය. අවුලා ගත් රන්මිලපොදියක් නැවැත නැවැත මුදා බලන්නාකු සේ ආකාසානඤ්චායතනකුසලචිත්තයෙහි යෙදී ඇති උපෙක්ඛා-එකග්ගතාවෝ නොයෙක් වර ප්‍රත්‍යවෙක්ෂා කොට බැලිය යුතුය. එවිට ඔහුට 'මේ ආකාසානඤ්චායතනකුසලචිත්තය රූපාවචරධ්‍යානසඞ්ඛ්‍යාත සතුරකුට ලංව සිටියේ ය, කසිණලොක නැමැති රූපය පැහිර වූ ආකාසය අරමුණු කොට, ලැබූ හෙයින් මේ ධ්‍යානය ප්‍රණීත නො වන්නේ ය, විඤ්ඤාණඤ්චායතනඛ්‍යානය ම ප්‍රණීත වන්නේ ය' යි විඤ්ඤාණඤ්චායතනඛ්‍යානයෙහි ආලය උපදවා විඤ්ඤාණඤ්චායතනය ශාන්ත වශයෙන් සිතට ගෙණ, ඒ අහස පැහිර සිටි විඤ්ඤාණය, **'විඤ්ඤාණං, විඤ්ඤාණං'** යි පුනපුනා මෙනෙහි කළ යුතු ය. එසේ කරන්නා වූ ඒ යොගියා පිළිබඳ නීවරණධර්‍ම යට පත් ව යෑමෙන් ආකාසානඤ්චායතන-

ඛ්‍යානය අරමුණු කොට මනොවාරවජ්ජනචිත්තය උපදනේ ය. ඉන් පසු තිහෙතුක උපෙක්ඛාසහගතකාමාවචරකුසලචිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා කුසලචිත්තයක්, පරිකම්ම, උපචාර අනුලොම, ගොත්‍රභූ යන නම් ගෙණ සතර වරක් හෝ, උපචාර අනුලොම, ගොත්‍රභූ යන නම් ගෙණ තුන් වරක් හෝ ඉපද ගිය පසු පස්වනු ව හෝ සතර වනු ව උපෙක්ඛා-එකග්ගතා යන ඛ්‍යානාඞ්ග දෙක ප්‍රධාන කොට ඇති චෛතසිකධර්ම සමනිසකින් යුත් විඤ්ඤාණඤ්චායතනඅජ්ඣාකුශලචිත්තය උපදනේ ය. දැන් ආකාසානඤ්චායතනය නැත්තේ ය. ඒ අභාවයට ගියේ ය.

ඉක්බිති යොගියා 'මේ ලත් විඤ්ඤාණඤ්චායතනඛ්‍යානය, පංචවසිතාවන්ගෙන් වසී කොට 'මෙය ආකාසානඤ්චායතනයට ළං ව සිටියේ ය, එය මෙයට ප්‍රතිපක්ෂ ය, ආකිඤ්චඤ්ඤායතනය සේ ශාන්ත නො වන්නේ ය' යි විඤ්ඤාණඤ්චායතනයෙහි දෙස් දැක එහි ආලය හැර ආකිඤ්චඤ්ඤායතනයෙහි ආලය උපදවා එය ශාන්ත යි සිතට නගා විඤ්ඤාණඤ්චායතනයට අරමුණු වූ ආකාසානඤ්චායතනයාගේ අභාවය අරමුණු කොට **'නත්ථි කිංචි, නත්ථි කිංචි'** යි හෝ, **'සුඤ්ඤං, සුඤ්ඤං'** යි හෝ, **'ඛි චිත්තං, ඛි චිත්තං'** යි සිත වඩන කල්හි එය ම අරමුණු කොට, මනොවාරවජ්ජනචිත්තය උපදනේ ය. නැවැත එම අරමුණ ම ඵල්ල තිහෙතුකඋපෙක්ඛාසහගතකාමාවචරකුසලචිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා එකෙක් සතර වරක් හෝ තුන් වරක් උපචාර සමාධිජවනකෘත්‍යයන්ගේ වශයෙන් ඉපිද නිරුද්ධ වෙයි. අනතුරු ව උපෙක්ඛා-එකග්ගතා යන ඛ්‍යානාඞ්ග ප්‍රධාන කොට ඇති චෛතසික සමනිසකින් යුත් ආකිඤ්චඤ්ඤායතනඅජ්ඣාකුශලචිත්තය පහිටින්නේ ය. මෙහිලා මේ යොගියා දනින්නේ විඤ්ඤාණඤ්චායතනයාගේ අභාවම ය.

ඉක්බිති යොගී තෙමේ මෙය පංච වසිතාවන්ගෙන් වඩ වඩාත් පුරුදු කරන්නේ 'මා ලැබූ මේ සමාපත්තියට විඤ්ඤාණඤ්චායතන නම් සත්‍යුරෙක් ඇත්තේ ය, එහෙයින් මෙය හැර දැමිය යුතු වන්නේ ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සේ ශාන්ත ද නො වන්නේ ය, ආකිඤ්චඤ්ඤායතනයෙහි දෙස් දැක, එහි ආලය හැර, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආලය උපදවා ශාන්ත හෙයින් සිතට නගා ආකිඤ්චඤ්ඤායතනඛ්‍යානචිත්තය අරමුණු කොට **'සන්තමෙතං, පණීතමෙතං'** යි සිත වඩන්නේ ය. භාවනා කරන්නේය. මෙසේ එහි සිත නැවැත නැවැත වඩන්නා හට නීවරණධර්ම යට ව ගොස් එයම විෂය කොට මනොවාරවජ්ජනචිත්තයෙක් පහළ වන්නේ ය. අනතුරු ව තිහෙතුකඋපෙක්ඛා

සහගතකාමාවචරකුසලචිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා සිතෙක් සතර වරක් හෝ තුන් වරක් යට කී ලෙසින් උපචාර සමාධිජවනකෘත්‍යය සිදු කරමින් ඉපද නිරුද්ධ වන්නේ ය. ඉන්පසු උපෙක්ඛා-එකග්ගතා යන ධ්‍යානාඞ්ග දෙක ප්‍රධාන කොට ඇති වෛතසික සමනිසකින් යුත් නෙවසඤ්ඤානාසඤ්ඤායතන අර්පණාචිත්තය සතර වතු ව හෝ පස්වතු ව එක්වරක් ඉපද නිරුද්ධ වේ. එය ද මේ යොගියා යට කී ලෙසින් වසීභූත කරන්නේ ය.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනචිත්තයෙහි ඇති චිත්ත වෛතසිකධර්ම විදර්ශනා වඩන යොගාවචරයන්ගේ නිලකුණු භාවනාවට අරමුණු නො වේ. එසේ අරමුණු නො වනුයේ ඒවා ඉතා සියුම් බැවිනි. ගුරුවරයා අතැවැසියා සමග දිග් මගෙක යන කල්හි අතැවැසියා ඉදිරියෙහි දියත්තක් දැක 'සඞ්ඝමින් වහන්ස! වහන්ස ගලවනු මැනැව, දිය ඇත්තේ ය'යි කී කල්හි ගුරුවරයා උන්නැහේ! එසේ නම් නානකඩ ගත්න, වතුර ටිකක් නාමි' යි කී විට, 'නාන්නට තරම් වතුර නැතැ' යි අතැවැසියා කී ය. මෙහිලා වතුර ටිකක් තුබූ බැවින් වතුර ඇතැ යි කීයේ ය. නාන්නට තරම් වතුර එහි නො වූ බැවින් වතුර නැතැ, යි කීයේ ය. එපරිද්දෙන් විදර්ශනාවට ගොදුරු විය යුතු පටු සංඥාවක් නැති බැවින් 'නෙව සඤ්ඤා, යි ද, සංඥා ව නැත්තේ ද, නො වන බැවින් 'නාසඤ්ඤා'යි ද කියති.

ගේ දොර ආදිය නැති මහකතරමගෙක එක්තරා මණ්ඩපයෙක් ඇත්තේ ය. එහි යට අසූචියෙන් අපවිත්‍ර ය. පා තැබීමට තැනක් එහි නැත. එක්තරා පුරුෂයෙක් හිරු රැසින් වෙහෙසට පත් වූයේ විඩා සන්සිඳ වන්නට තැනක් සොයන්නේ මණ්ඩපය දැක එහි ගියේ ය. එහෙත් එහි පා තබන්නට තැනක් නැති බව දැක විඩා හරින්නට පිළිවෙළක් ද නො වූ බැවින් මණ්ඩපයෙහි කොණෙක එල්ලී පය පොළොව නො හපා ම සිටියේ ය. ඒ අතර අනෙකෙක් ද එහි අයේ හිරුරැසින් ද තැවුනේ පළමු පුරුෂයා සේ මණ්ඩපය ලඟට ගොස් එහි යට අසූචි පිරී නිබෙනු දැක එහි පළමු එල්ලී සිටියහුගේ එක් පයෙක එල්ලී ගත්තේ ය. තවත් එකෙක් එහි අයේ ය. ඔහු ද හිරුරැසින් තැවී විඩා පත් ව සිටියේ ය. වට පිට බැලී ය. පා තබන්නට තැනෙක් එහි නො වී ය. එහෙයින් ඔහු මණ්ඩපයෙහි අනික් කොණෙහි එල්බ ගත්තේ ය. එසේ ම මගෑ විඩා පත් සිවුවැන්නෙක් ද එහි පැමිණ වට පිට බැලුයේ සිට ගන්නට තැනක් නො දැක තුන් වැන්නාගේ පය එල්බ ගත්තේ ය.

මෙහි කතරමග නම්, සසර ය. අසූචි යෙන් පිරි පෙදෙස නම් කාමලොකය ය. මණ්ඩපය නම්, සතර අරූපභූමීහු ය. මණ්ඩප-යෙහි පළමු එල්බ ගත්තේ නම් ආකාසානඤ්චාතනඩ්‍යානය ලැබූ යොගී තෙමේ ය. පළමු එල්බ ගත්තහුගේ පය එල්බ ගත් දෙවැන්නා නම්, ආකාසානඤ්චායතනය අරමුණු කොට විඤ්ඤාණඤ්චායතන ඩ්‍යානය ලැබූ යොගී තෙමේ ය. මණ්ඩපයෙහි අනික් කොණ එල්බ ගත් තෙවැන්නා නම්, ආකිඤ්චඤ්ඤායතනඩ්‍යානය ලැබූ යොගී තෙමේ ය. ඒ තෙවැන්නහුගේ පය එල්බ ගත්තේ නම්, නෙව සඤ්ඤානාසඤ්ඤායතනඩ්‍යානය ලැබූ යොගී තෙමේ ය. සසරකතර මග වැනි කොට, කාමලොකය අසූචියෙන් පිරි පෙදෙස වැනි කොට, යන ඈ ලෙසින් මේ හැමෙකක් මෙහිලා දත යුතු ය.

රූපාවචරප්‍රථමඩ්‍යානයට, දසකසිණ - දසඅසුභ - කායගතාසති - ආනාපානසති - මෙත්තා - කරුණා - මුදිතා යන පස් විස්ස, ස්ථාන වේ. මේ පස්විසි කමටහන් අතුරෙහි තමාගේ චරිතයට සුදුසු කමටහනක් වැඩීමෙන් ප්‍රථමඩ්‍යානය ඉපදවිය හැකි ය.

රූපාවචරමිතියඩ්‍යානයට, දස කසිණ-ආනපානසති-මෙත්තා-කරුණා-මුදිතා යන තුදුස ස්ථාන වේ. එ ද චරිතානුකූලව ය.

රූපාවචර තෘතියඩ්‍යානයට, හා රූපාවචරචතුර්ථඩ්‍යානයට, ද ස්ථාන වනුයේ මේ තුදුසම ය. චරිතානුකූලව ම ඒ වන්නේ ය.

රූපාවචරපංචමඩ්‍යානයට, දස කසිණ-ආනාපානසති-උපෙක්ඛා යන මේ දොළොස ස්ථාන වේ. වන්නේ ද චරිතානුකූලව ය.

මෙහි දැක් වූ කමටහන් ඒ ඒ යොගියාගේ චරිතයට නො ද ගැළපේ නම්, ඒ වැඩීමෙන් වැඩෙක් නො වේ. තම චරිතයට ගැළපෙන කමටහනක් වැඩීමෙන්ම ය ධ්‍යාන ඉපදවිය හැක්කේ.

ධ්‍යාන ඉපදවිය හැක්කෝ ත්‍රිහෙතුක පුද්ගලයෝ ය. සුගති අහෙතුක-දුහෙතුක-තිහෙතුක යි පුද්ගලයෝ තිදෙනෙකි. අලොභ-අදොස-අමොහ යන මොවුහු කුසල හෙතුහු ය. මිනිසකු පිළිසිඳ ගන්නා කල්හි ඔහුගේ ප්‍රතිසන්ධිචිත්තයෙහි මුලින් කී හෙතු තුනින් එකෙකුත් නො යෙදුනේ නම්, හෙතෙමේ සුගති අහෙතුක නම්. ඔහු උපන්නේ කුසලඅහෙතුකඋපෙක්ඛාසහගත සන්තීරණචිත්ත-යෙන් ය. එහෙයින් ඔහු ජාත්‍යන්ධ ත් ජාතිබධිර ත් ජාතිමූක ත් ජාත්‍යුන්මත්තක ත් පණ්ඩක ත් වේ. ඉන්ද්‍රියවිකලත්වයකට නො පත් වූයේ ද විචාරණශක්තියෙන් තොර වූයේ ය.

යමක්හුගේ ප්‍රතිසන්ධිචිත්තයෙහි අලොභාදිහෙතු තුනින් අලොභ-අදොස යන හෙතු දෙක පමණක් යෙදුනේ නම්, ඔහු ය

දුහෙතුක. ඔහු ද විචාරණශක්තියෙන් පිරිහී සිටියේ ය. මේ දෙදෙන ම ධ්‍යාන ලැබීමට සුදුසු නො වෙති. කොතෙක් උත්සාහ කළ ද, මොවුනට ධ්‍යාන නො ඉපදවිය හැකි ය.

යමක්හුගේ ප්‍රතිසන්ධිචිත්තයෙහි මෙකී හෙතු තුනම යෙදුනේ නම්, ඔහු ය තිහෙතුක. මේ තෙමේම ය මිනිස් ගණයෙහි මිනිස් සමාජයෙහි විශාරදව පැලඹෙන්නේ. ලොකයාගේ සම්භාවනයට පාත්‍ර වනුයේ. මොහුට ය ධනය ඉපදවිය හැක්කේ. සුගති අහෙතුකාදී වූ පුද්ගලයෙක් සීලය පිරිසිදු කොට බුදුරජුන් ම ඇසුරු කොට චරිතානුකූල වූ කමටහනක් ගෙණ ජීවිතය මුළුල්ලෙහි භාවනා කළේ නමුත් ඔහුට ධ්‍යාන නො ඉපදවිය හැක්කේ ය. එබඳු එකෙක් 'ධ්‍යාන උපදවමි' යි වාචකාල උපාසකාදීන් මෙන් නො සුදුසු තැන උත්සාහ කොට ද එබඳු ගුණයකට නො පැමිණියේ උමතු බවට, වෙහෙසට, සිත් පෙරළියට, වැටී මේ නෛයර්‍යාණික ශාසනය හිස් එකකැ යි ගෙණ, මැරී ගොස් සිවු අපායයෙහි වැටෙන්නේ ය. මොවුහු මේ අත්බවේ දී ධ්‍යාන නො ලැබෙන බව දැන දැන් 'මතු භවයෙක ධ්‍යාන ලබමු' යි යන අදහසින් භාවනා කරන්නෝ නම්, ඔවුන්ගේ ඒ භාවනාව හිස් නො වන්නී ය. සංසාරයෙහි භාවනා කොට පුරුදුද ඇත්තවුනට ගොයම්කමත් ආදියෙහි ද නිමිත්ත ලැබ ධ්‍යානය උපදනේ ය. එසේ භාවනා කොට සසර පුරුදුද ඇත්තෝ තිහෙතුක ව ඉපද ගත් අත්බවේ දී වහාම ධ්‍යාන ලබන්නෝ ය. ත්‍රිහෙතුකපුද්ගලයෝ ද පංචානන්තරිකමීය කලෝ නම්, ඔවුනට ද දෘඝලෝභයෙන් බැඳී සිටි ත්‍රිහෙතුකයන්ට ද පාරාජිකාපත්තියට පැමිණ, 'අපි නියම මහණෝ වෙමු' යි හඟවා ගෙණ සසුනෙහි වසන ත්‍රිහෙතුකයාට ද ධ්‍යාන නො ලැබේ.

ආකාසානඤ්චායතනඣානයට, යම්කිසි කසිණයක් වඩා උපදවා ගත් ප්‍රතිභාග නිමිත්ත කසිණාලොකය කැමැති තාක් අහසෙහි පතුරුවා ඒ කසිණාලොකය උගුළුවා ලබන කසිණුග්ඝාටිමාකාස පඤ්ඤත්තිය සථාන වේ.

විඤ්ඤාණඤ්චායතනඣානයට, ඒ ආකාසානඤ්චායතනකුසල චිත්තය සථාන වන්නේ ය. අරමුණු වන්නේ ය.

ආකිඤ්චඤ්ඤායතනඣානයට, ආකාසානඤ්චායතනයාගේ නාසත්තිභය සථාන වන්නේ ය. අරමුණු වන්නේ ය.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනඣානයට, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය සථාන වන්නේ ය. අරමුණු වන්නේ ය. මෙහි ඉතා සැකෙවින් කියූ ධ්‍යානයන්ගෙන් විසතර විසින් ධ්‍යායී-වූවෝය කියා නම්. මෙන්න ධ්‍යායීහු:-

පඨමෙන'පි ඛානෙන ඛායී
දුතියෙන'පි ඛානෙන ඛායී.
තතියෙන'පි ඛානෙන ඛායී.
චතුත්ථෙන'පි ඛානෙන ඛායී.
සවිතක්කසවිචාරෙන'පි ඛානෙන ඛායී.
අවිතක්කවිචාරමත්තෙන'පි ඛානෙන ඛායී.
අවිතක්කඅවිචාරෙන'පි ඛානෙන ඛායී.
සප්පීතිකෙන'පි ඛානෙන ඛායී.
නිප්පීතිකෙන'පි ඛානෙන ඛායී
පීතිසහගතෙන'පි ඛානෙන ඛායී.
සාතසහගතෙන'පි ඛානෙන ඛායී.
සුඛසහගතෙන'පි ඛානෙන ඛායී.
උපෙක්ඛාසහගතෙන'පි ඛානෙන ඛායී
සුඤ්ඤතෙන'පි ඛානෙන ඛායී.
අනිමිත්තෙන'පි ඛානෙන ඛායී.
අප්පණ්හිතෙන'පි ඛානෙන ඛායී.
ලෞකියෙන'පි ඛානෙන ඛායී.
ලොකුත්තරෙන'පි ඛානෙන ඛායී.

ඛානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකො ති ඛායී.
අත්ථ'කචෙවා ඛායී, සම්පත්තිං යෙව සමානං
විපත්තී'ති පචෙවති.
අත්ථ'කචෙවා ඛායී, විපත්තිං යෙව සමානං
සම්පත්තී'ති පචෙවති.
අත්ථ'කචෙවා ඛායී, සම්පත්තිං යෙව සමානං
සම්පත්තී'ති පචෙවති.
අත්ථ'කචෙවා ඛායී, විපත්තිං යෙව සමානං
විපත්තී'ති පචෙවති.
අත්ථ'කචෙවා ඛායී, දන්ධං සමාපජ්ජති ඛිප්පං වුඨාති.
අත්ථ'කචෙවා ඛායී, ඛිප්පං සමාපජ්ජති දන්ධං වුඨාති.
අත්ථ'කචෙවා ඛායී, දන්ධං සමාපජ්ජති දන්ධං වුඨාති.
අත්ථ'කචෙවා ඛායී, ඛිප්පං සමාපජ්ජති ඛිප්පං වුඨාති.
අත්ථ'කචෙවා ඛායී, සමාධිස්මිං සමාධිකුසලො හොති,
න සමාධිස්මිං සමාපත්ති කුසලො.

අත්ථ'කච්චො ඛ්‍යායී, සමාධිස්මිං සමාපත්තිකුසලො
හොති, න සමාධිස්මිං සමාධිකුසලො.
අත්ථ'කච්චො ඛ්‍යායී සමාධිස්මිං සමාධිකුසලො ච
හොති සමාධිස්මිං සමාපත්තිකුසලො ච.
අත්ථ'කච්චො ඛ්‍යායී, නෙව සමාධිස්මිං සමාධිකුසලො
හොති, න සමාධිස්මිං සමාපත්තිකුසලො.

සතාතිකා = නිතර පැවැති කායිකචෛතසිකවීර්‍යය ඇති.

'ධීරා' යන්නට විශෙෂණ යි. ගිහිගෙයින් නික්මුණු තැන් පටන් අභීන්මාර්ගය තෙක් නිතර පැවැති කයේ හා සිතේ නැගී වීර්‍යය ඇති ධීරයෝ මෙයින් ගැණෙති. **'සාතතිකාති අභිනික්ඛමණතො පඨාය යාව අරහත්තමග්ගා සත්තං පවත්ත කායික චෙතසිකවිරියා''** යනු අටුවා ය.

නිච්චං දළ්හපරක්කමා = නිති පැවැති දෘඪ පරාක්‍රමයෙන් යුත්.

'ධීරා' යනු බලා සිටියේ ය. දෘඪ පරාක්‍රමය නම්, සිරුරෙහි ලේ මස් වියලී ගිය ත්, ලැබිය යුතු දෑ නො ලබා, පැමිණිය යුතු තැනට නො පැමිණ, පසුබට නො වෙමි යි මෙසේ පැවැති වීර්‍යය. මේ ඒ කී සැටි:- **'යං තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිස පරක්කමෙන පත්තබ්බං න තං අපාපුණ්ත්වා විරියස්ස සන්ථානං භවිස්සති'** යි.

ඵුසන්ති = ස්පර්ශ කෙරෙත්. පහසත්.

මෙහි ඵුසනා දෙකෙකි. ඤාණඵුසනා-විපාකඵුසනා යි. ඤාණ ඵුසනා නම්, සොතාපත්ති ආදි වූ සිවු වැදෑරුම් මාර්ගයෝ ය. මේ ඒ කීම:- **'චත්තාරො මග්ගා ඤාණඵුසනා නාම'** යනු. විපාක ඵුසනා නම්, සිවු වැදෑරුම් වූ සොතාපත්ති ආදී වූ ඵලයෝ ය. මේ එය:- **'චත්තාරි ඵලානි විපාකඵුසනා නාම'** යන මෙයින් මෙහි අදහස් කරණ ලද්දේ විපාකඵුසනා නම් වූ ඵලධර්මයෝ ය. ඒ බව **'තෙසු ඉධ විපාකඵුසනා අධිප්පෙතා'** යන මෙයින් පැහැදිලි කළහ.

ධීරා — ප්‍රාඥයෝ. නුවණැත්තෝ.

ආර්‍යඵලයෙන් නිවන් පසක් කරන්නෝ ය ධීරයෝ. මේ **ධීරා'** යන්න පොතපතෙහි නොයෙක් ලෙසින් වැණූහ, අරුත් ගෙණ හැර පා. **'ධිතිමා'ති = ධීරා'** ධෘතිමත් පුරුෂයෝ ධීරයෝ. **'ධිතිසම්පන්නා'ති = ධීරා'** පාණ්ඩිත්‍යයෙන් යුක්තයෝ ධීරයෝ. **'ධික්කිතපාපා'ති = ධීරා'** නින්දා කළ පව් ඇත්තෝ ධීරයෝ. මේ ඒ වැණුම්වලින් කිහිපයෙකි. **'ධී'** නම් ප්‍රඥා ය. ඒ ඇත්තෝ

ධිරයෝ ය. **'යි වුච්චති පඤ්ඤා, තාය සමන්නාගතා ධිරා'** යනු ඒ බව කීහ. මොවුහු, ඛන්ධධිර-ධාතුධිර-ආයතනධිර-පටිච්ච සමුප්පාදධිර-සතිපට්ඨානධිර-සම්මප්පධානධිර – ඉද්ධිපාදධිර – ඉන්ද්‍රිය ධිර – බොජ්ඣඞ්ගධිර – මග්ගධිර – ඵලධිර – නිබ්බාණධිර යි නත් වැදූරුම් වෙති. පඤ්චසන්ධිය, නාමරූපවශයෙන් ලක්ඛණරස පච්චුපට්ඨාන වශයෙන් යන ඈ ලෙසින් බෙදූ වෙන් කොට සිතට නගා බලන්නෝ ය, පඤ්චසන්ධිවිෂයයෙහි නුවණ යොදූ බලන්නෝ ය ඛන්ධධිරයෝ. මේ ලෙසින් සෙස්ස ද සලකා ගත හැකි ය. මෙහි විපාකප්‍රවෘත්තිය නම් වූ ආයතිඵලයෙන් නිවන ප්‍රත්‍යක්ෂකර කරන්නෝ ය ධීරයෝ යි කියන ලද්දේ.

නිබ්බාණං = නිවන.

තෘෂ්ණා – උපාදනාදී වූ සියලු කෙලෙස් මූලසුන් කිරීමට මහ පල සිත්වලට අරමුණු වන ශාන්තස්වභාවය නිබ්බාණ නම්. මෙය තෘෂ්ණාවෙන් නික්ම සිටි බැවින්, තෘෂ්ණාව හා නොගැටුනු බැවින් නිබ්බාණ යි කියනු ලැබේ.[1] (ඉදිරියෙහි විස්තර එන්නේ ය).

යොගක්ඛෙමං = යොගයන්ගෙන් නිදහස් වූ

යොග නම්, කාම – භව – දිට්ඨි – අවිජ්ජා යන සතර ය. **'චත්තාරෝ යොගා කාමයොගෝ භවයොගෝ දිට්ඨියොගෝ අවිජ්ජායොගෝ'** යි. කාමවස්තූන් කෙරෙහි ඇල්ම, එහි යෙදීම, එහි ගිජුවීම කාමයොග නම්. රූපාරූපභවයෙහි ඇල්ම, යෙදීම, ගිජුවීම භවයොග නම්. දෙසැට මිසදිටු දිට්ඨියොග නම්. සිවු සස් මුවාකරණ මොහය අවිජ්ජායොග නම්. මෙකී කාමාදිහු, සත්වයන් සසරෙහි කම්ඵලයන් හා යොදන්නු යි එක් කෙරෙත්නු යි 'යොග' නම් වෙති. (විස්තරය ඉදිරියෙහි එන්නේ ය).

අනුත්තරං = නිරුත්තර වූ.

සියලු ලෞකික-ලෝකොත්තරධර්මයන්ට වඩා නිර්වාණය ශ්‍රේෂ්ඨ බැවින් අනුත්තර නම් වේ. **'සබ්බේසං ලෝකියලෝකුත්තර-ධම්මානං සෙට්ඨත්තා අනුත්තරං'** යනු අටුවාය. **'යොගක්ඛෙමං, අනුත්තරං,** යන දෙපදය **'නිබ්බාණං'** යන්නට විශෙෂණව සිටියේ ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

උදෙන සොෂක සාමාවතී ආදීන්ගේ කථා වස්තුව නිමියේ ය.

---

1. 1. - 14 'ධම්මසඞ්ගණී' යන්නට කළ පරිකථාව බලනු.

කුමහසොසක සිටුතුමා.

2 — 2

රජගහ නුවර රාජගෘහ නමින් ප්‍රසිද්ධ වූ සිටුවරයෙක් වාසය කෙළේය. ඔහුගේ ගෙයි අභිවාතක නම් රෝගයෙක් හට ගැණිණ. ඒ රෝගය යම් ගෙයක හට ගැණීනි නම්, එහි පළමු කොට මැරෙන්නෝ මැසි මදුරු ආදී තිරිසන් සත්වයෝ ය. සියල්ලන්ට පසුව මැරෙන්නෝ ගෙය අසිතිකාරයෝ ය. මේ ඒ රෝගයේ සැටි ය. එහෙයින් මෙහි ද, කුඩා කුඩාවුන් මැරීගිය පසු සිටාණන්ට හා සිටුඇඹෑනියට මේ රොගය වැලඳිණ. මෙසේ රෝගාතුර වූ ඔවුහු ලඟ සිටි පුතු දුක කදුලු හෙල හෙලා, 'පුත, මේ රෝගයෙන් බේරී ගන්නට ඇති එක් ම උපාය ගේබිත්තිය බිඳ එයින් බැහැර යෑම ය, ඒ නිසා නුඹ අප ගැණ නොසලකා ගේබිත්තිය බිඳ බැහැරට ගොස් පණ රැක ගන්න, සතියක් දෙකක් බැහැර ගෙවා අවුත් අන්න අතැන තැන්පත් කොට ඇති මිලමුදල් සියල්ල ගෙණ යහතින් කල් දවස යවන්න, අපි මෙයින් ඒකාන්තයෙන් මැරෙන්නමෝ ය, එ තැනැ සතළිස් කෝටියක තරම් මිලමුදල් ඇත, අප ගැණ බලා නොසිටින්නැ'යි කීහ. සිටුපුත් තෙමේ මවුපියන්ගේ මේ බැගෑපත් කතාව අසා හඬ හඬා ගේබිත්තිය බිඳ ගෙන් නික්ම කදු හෙල් බොහෝ ඇති එක් පෙදෙසකට ගොස් එහි නවාතැන් ගත්තේ ය. ඔහු එහි දෙලොස් අවුරුද්දක් ගෙවා නැවැත රජගහ නුවරට අවුත් ගේ තුබූ තැනට ගොස් බලා මිලමුදල්වලට හානියක් නොවූ බව දැන 'මම මෙහෙන් පිටවී ගියෙම් මේ රුවුල එන්නටත් කලින් ය, එහෙයින් මෙහි ඉන්න කිසිවකු ගැණ මට දැනුම් නැත, එසේම මූලාද මා නොහඳුනති, මම මේ මිලමුදල්, දැන් මෙ තැනින් නගා ගෙණ ජීවිකාව කරන්නට පටන් ගත්තෙම් නම්, හිඟන්නකු නිධානයක් ගොඩනගා ගත්නා ලදු සි මා අල්ලා වෙහෙස කරන්නේ ය, ඊට මිට වඩා හොඳ ය, මේ හැටියට ම ජීවත්වීමැ' යි සිතා ඇඳ සිටි වතින් ම කුලී වැඩ සොයමින් පාරට බැස්සේ ය. එ නුවර කුලීවැඩ කරණ කිහිප දෙනෙක් ඌ දැකා අඬ ගසා 'ඕය! තමුසේට අපට කුලීවැඩක් දිය හැකි ය, කරන්නට පිළිවන් නම්, කැම බියදමට සැහෙන කුලියක්ය එයට ලැබෙන්නේ වැඩි මුදලක් දෙන්ට නොහැකි ය, සතුටු නම් කියවු' යි කිහ. එයට ඔහු 'මට දෙන වැඩය කුමක් දැ'යි ඇසී ය. 'හුඟක් උදැසනින් නින්දෙන් නැගිට මේ ගෙවල නැවතී ඉන්න කම්කරුවන් වෙතට ගොස් උන් හැම කෙනකුත් නින්දෙන් නැගිට්ටවා බරකරත්ත බඳින්නන්ට, බරකරත්ත බඳින්නට, ඇතුන්ට හා

අසුන්ට තණ ගෙණෙන්නන්ට, තණ ගෙණ එන්නට, කොළ කපා ගෙණ එන්නන්ට කොළ කපා ගෙණ එන්නට, කැඳ බත් උයන ගැණුන්ට, කැඳ බත් උයන්නට, දිය අදින්නන්ට, දිය අදින්නට දර ගෙණෙන්නන්ට, දර ගෙනෙන්නට, පණිවිඩ ගෙණ යන්නන්ට, පණිවිඩ ගෙණ යන්නට නියම කිරීමැ'යි ඔවුහු කීහ. ඔහු එය පිළිගත්තේ ය. එවිට කුලීකරුවෝ ඔහුට එහි විසීමට කුඩාගෙයක් දුන්හ. එතැන් පටන් ඔහු එය කෙළේ ය.

හැම උදෑසනක මහරු නින්දෙන් නැගිට, පාරදිගේ යමින් 'නැගිටිවු, ගණිවු, යොදවු, උයවු, යවු' යි මොහු නගන හඬ ඇසූ බිම්සර රජ තෙමේ, 'මෙ හඬ මහාධනවතකුගේ ය'යි එහි සිටිය වුනට කීයේ ය. බිම්සර රජ තෙමේ උනුන්ගේ හඬින් උනුන්ගේ තතු කීමෙහි ශාස්ත්‍රය දැන සිටියේ ය. එහි සිටි එක් මෙහෙකරු ගැහැණියක් 'රජ තුමන්ගේ මේ කීම ඇත්ත දැ යි සොයා බලමි'යි සිතා මෙහෙකරුවකු එහි පිටත් කළා ය. ඔහු එහි ගොස් අවුත් 'මේ හඬ නගන්නා, කුලීකරුවන්ගේ ත් කුලීවැඩ කරණ හිඟන්-නෙක් ය' යි කීවේ ය. රජ තෙමේ කිසිත් නො බැණ නිහඬ ව සිටියේ ය. පසුදා උදෑසන ත් මෙ හඬ අසා, 'මෙ හඬ නම්, ධන-වතකුගේ ම ය' යි කී ය. ඊට පසුදා උදෑසන ත් එසේ ම කී ය. මෙසේ දෙතුන් දිනක් කී පසු මේ මෙහෙකරු ගැහැණිය 'රජතුමා මේ තෙමේ හිඟන්නෙකැ, යි කිම නො පිළිගණියි, මෙ හඬ ධනවතකුගේ ම ය යි කියයි, මෙය නිකමට කියන්නක් නො විය යුතු ය, ඒ නිසා මේ ගැණ තව ටිකක් දුරට සොයා බැලිය යුතු ය' යි සිතා රජු වෙත ගොස් 'දෙවයන් වහන්ස! මට වියදම් පිණිස රුපියල් දහසක් පමණ දෙවා වදාරණ සේක් නම්, මම මාගේ දුව ත් සමග ගොස් කාරණය හොඳහැටි සොයා බලා මේ කියන මිනිහා ලඟ මිලමුදල් තිබේ නම්, ඒ සියල්ල මෙහි ගෙණ එන්නෙමි'යි දන්වා සිටියා ය. එවිට රජ තෙමේ ඇයට ඇය ඉල්ලූ මුදල දෙවී ය. ඈ එය අතට ගෙණ දුවට රෙදි මාල්ලක් අන්දවා ඇය ත් ගෙණ රජවාසලින් නික්ම මහ පාරට බැස ගොස් කුලීකරුවන් වසන කඩමණ්ඩියට පැමිණ, එහි කුඩා ගේකට ඇතුල් ව, එහි හුන් මැහැල්ලකට 'අපි මග යන්නමෝ ය, එන්නමෝ ද දුර සිට ය, දිනක් දෙදිනක් පමණ මෙහි නැවතී ගන්නට අපට ත් ටිකක් ඉඩ ලබා දෙන්නැ'යි කිවූ ය. එවිට ගෙයි වැස්සෝ, 'මේ අපගේ ගේ ඉතා කුඩා ය, පෙණෙන්නේ නො වේ ද, කි දෙනෙක් මෙහි ඉදිත් ද, තවත් කෙනෙක්හට මෙහි ඉඩ තිබේ ද, මෙහි ඉඩ දෙන්නට පිළිවෙළක් නැත, අන්න අර පෙණෙන ගෙයි ඉන්නේ එකෙක් ය, ඒ නිසා තව දෙතුන් දෙනකුට ඉන්නට වුවද, එහි ඉඩ පහසු තිබේ, එහි යන්නැ'යි

කීහ. ඇ දූත් ගෙණ කුම්භඝොෂකයා වසන්නා වූ ගෙට ගොස් ඔහුගෙන් නවාතැන් ඉල්ලූ ය. ඔහු 'මෙහි ඉඩ පහසු නැතැ'යි ඉල්ලීමට ඉඩ නො දුන්නේ ය. එවිට ඇ 'ඇයි, ඔහොම කියනු, අපි මගියෝ වම්හ, අදට පමණක් අපට ඉඩ දෙන්න, හෙට ඉතා උදැසනින් ම අපි පිටත් ව යන්නෙමු'යි නැවැත නැවැතත් ඉල්ලා සිටියා ය. කුම්භඝොෂක එවර කියෙත් නො බැණ නිහඬ විය. ඇලා ද ඔහුගේ විරුද්ධත්වය ගැණ නො සලකා එහි ම රැඳුනාහ. පසුදා කුම්භඝොෂකයා වනයට යන වේලේ වැඩිමහලු ගැහැණිය 'පුතේ! නුඹ වනයේ සිට ආ පසු නුඹ කැමැති නම් කෑමට මොකුත් උයා පිහා තබන්නට අපට පිළිවන, හැබැයි, අපලඟ එයට වුවමනා හාල් දුරුමිරිස් ආදී වූ කිසිවක් නැත, ඒ නිසා සහල් දුරු මිරිස් ලුණු ලූනු ආදිය සැඟෙන පමණට අපට දීලා යන්නැ'යි කිවූ ය. කුම්භඝොෂක තෙමේ 'එයින් කමක් නැතැ'යි ගමනට සූදානම් වී ය. මැහැල්ලිය නැවැත නැවැත ත් ඇවිටිලි කළා ය. එවිට ඔහු සහල් දුරු මිරිස් ආදිය වුවමනා පමණට ඇට දී වනයට ගියේ ය. එකල ඕ තොමෝ කුම්භඝොෂකයා දුන් ඒ සහල් හා තුනපහේ පැත්තක තබා කඩපිළට ගොස්, තම අත තුබූ මුදල් දී, අලුත් හැලිවළං හා හොඳහාල් තුණපහේ ගෙණ අවුත් රජුට කෑම උයන හැටියට බත් හා එළවළු තුන හතරක් ද හොද්දක් හා මාළුවක් ද උයා පිළියෙල කොට තැබූ ය. බත් කන වේලේ කුම්භඝොෂක වනයෙන් හැරී ආයේ මූණ කට සෝදා පිළියෙල කොට තුබූ කෑම කෑයේ ය. එයින් ඔහුගේ මූලදී තුබූ තදගතිය බුරුල්ව ගියේ ය. ඒ බව දත් මැහැල්ලිය 'පුතේ! අප ඉතා දුර බැහැර සිට ආ බැවින්, ඇඟපතේ ඇති අමාරුව තව ම මග නො ඇරුණේ ය, පුතා කරුණා කොට අපට තව දෙතුන් දවසක් නැවතී යන්නට ඉඩ දෙන්නැ'යි කිවූ ය. ඔහු එයට ඉඩ දුන්නේ ය. ඇලා ද එහි නැවතී ගෙණ දෙතුන් දිනක් ම පළමු සේ ඔහුට කෑම පිළියෙල කොට දුන්හ. කුම්භඝොෂක ද මුලින් දුක් වූ සියලු තදගති අත් හැර ඔවුන් කෙරෙහි ඉතා මොළොක් බවක් දැක්වී ය. නැවැත මැහැල්ලිය තවත් කිහිප දිනක් එහි නවතින්නට කුම්භඝොෂකයාගෙන් අවසර ලබා ගත්තා ය. දැන් කුම්භඝොෂකයාගේ මොවුන් හා වෙනසෙක් නැත්තේය. එහෙයින් ඔවුහු එහි වසන්නෝ සියගෙයි වසන්නවුන් සේ ය. ඒ තරමට ඔවුන් අතර හොඳ හිත බැඳුම තදබද විය. කුම්භඝොෂකයා වනයට ගිය එක් දවසක මැහැලිගැහැණි තොමෝ මුවහත් ඇති පිහියක් ගෙණ ඔහු නිදන ඇදෙහි තැනැ තැනැ ලනුපට කිහිපයක්

කපා දැම්මා ය. ඔහු සවස වනයෙන් අවුත් බත් කා නිදන්නට ඇඳෙහි වැතිර ගත් කල්හි ඉතිරි ලනුපට ද කැඩී බිමට පාත් විය. එවිට වහා නැගිට බලා 'මේ ඇඳෙහි ලනු කඩා දැම්මේ කවුදැ' යි ඇසී ය. 'පුතේ! අහල පහල ගෙවල කුඩාලමෝ නිතර අවුත් එපා ය කියද්දීත් ඇඳෙහි වැතිර ගණිති, ඇඳ උඩ එහා මෙහා පෙරළෙති, කොයි හැටි කියූ වත් මේ ලමෝ ඒ නො සලකති'යි කීවිට කුම්භඝොෂක තෙමේ 'උඹලා නිසා ය මේ කරදරය මට සිදු වූයේ, මෙයට කලින් කො තැනක යත ත් මම යන්නේ දෙර වසා දමා ය, දැන් නිදන්නේ කෙසේ දැ' යි කීයේ ය. 'පුතේ! අපි කුමක් කරමු ද, කොල්ලන් වළකනු බැරි ය, දැන් ඔබ ලනුපට දෙක තුන එකට අල්ලා ගැට ගසා පැදුර එලා ගෙණ නිදන්නැ' යි මැහැල්ලිය කිවූ ය. ඔහු එසේ කෙළේ ය. පසුදා ත් කුම්භඝොෂකයා වනයට ගිය කල්හි මැහැල්ලිය ඇඳෙහි ලනුපට කපා හැරියා ය. එදා ත් ඔහු නිදන්ට වන් කල්හි ලනු කැඩී බිමට පාත් වීය. මැහැල්ලිය වහා නැගිට ලනුපට ගැට ගසා දුන්නා ය. කුම්භඝොෂක තෙමේ එදා ද මැසිවිලි කී ය. ඊට පසුදා ත් ඕ තොමෝ එසේ කළා ය. එදා කුම්භඝොෂක තෙමේ තදින් කිපී ගියේ ය. මැහැල්ලිය එදා ත් ඔහු අස්වසා ගත්තාය. පසුදා ඔහු වනයට ගියේ ය. ඒ අතර ඇඳෙහි ලනුපට එකක් දෙකක් ඉතිරි කොට සියලු ලනුපට කපා හැරියා ය. එදා ඔහු එහි හුන් කල්හි සියලු ලනුපට කැඩී ගියේ ය. ඔහුගේ හිස ත් දෙ දණ ත් එකට හැපුනේ ය. කුම්භඝොෂක වහා නැගිට 'අයියෝ! මේ මොන වධයෙක් ද, මේවා හැමදා ඉවසිය හැකි ද, නිදන්නට තුබූ ඇඳ කබලත් විනාශ කළහු ය, දැන් කොහි යම් ද, කුමක් කරම් දැ'යි කෑකෝ ගසන්නට වන. ඉක්බිති ඒ සත්‍රිය 'පුතා! දැන් කුමක් කරමු ද, අසල ගෙවල වැසි කොල්ලන්ගේ මුරණ්ඩුකම් අපට වළකා ලන්නට නො හැකි ය, අප ගැණ අමුත්තක් නො සිතන්න, දැන් මේ අවේලාවේ කො තැනකත් යෑම හොඳ නැතැ' යි කියා දුවට කතා කොට, 'දූ! අය්යාට නිදන්නට තැනක් පිළියෙල කරන්නැ' යි කිවූ ය. ඕ තොමෝ, තමන් නිදා හුන් පැදුරේ පැත්තකට වී 'අය්යා! මෙහි එන්න, මේ පැදුරේ නිදන්නැ'යි අඬ ගැසූ ය. මහලු ගැහැණිය ද 'යන්නැ'යි ඔහුට බල කළා ය. කුම්භඝොෂක ද ඇය හා එක් ව නින්දට ගොස් ඒ ඇසිල්ලේ ම ඇය හා කාමසන්ථවය ද කෙළේ ය එකෙණෙහි ඕ තොමෝ අඬන්නට වූ ය. 'හඬන්නී කුමක් නිසා දැ'යි මෑනියන් ඇසූ විට 'දැන් මොහු මට මෙබන්දක් කෙළේය'යි කිවූ ය. 'එසේ වේවා, දැන් කුමක් කරමු ද, උඹට ත් හිමියෙක් වුවමනා ය,

මොහුට ත් අඹුවක් වුවමනා ය, දැන් ඒ දෙක ම හරිය'යි ඕ තොමෝ මේ දෙදෙනා අඹුසැමියන් කළා ය. එතැන් සිට ඔවුහු එක් ව වාසය කළෝ ය.

ටික දිනකින් පසු ඒ මහලු සත්‍රී තොමෝ 'කුලිකරුවන් වසන කඩමණ්ඩියේ පාර දෙපස හැම ගෙයක් සරසා සැණකෙළි පැවැත් විය යුතුය, යමකු එසේ නො කළොත්, ඔහු දඩ ගෙවිය යුතු වන්නේ ය'යි දැන්වීමක් කරණු මැනැවැ'යි රජුට දන්වා යැවූ ය. රජ තෙමේ එසේ කෙළේ ය. ඉන් පසු ඒ මහගැණිය 'පුතේ! කුලී කරුවන් වසන මේ කඩමණ්ඩියේ සියලු ගෙවල සැණකෙළි පවත් වන්නැ,යි රජතුමන් අණ කොට තිබේ, එහෙයින් ඒ අණ අප විසින් ද පිළිපැදිය යුතු ය, කුමක් කරමු දැ'යි කිවු ය. 'අම්මේ! මම කුලී වැඩ කොට යන්තමක් ලැබ ජීවත් වන්නෙක්මි, රජ අණ ත් පිළිපැදිය යුතු ය, මේ ගැණ අප කුමක් කරමු දැ'යි කුම්භඝොෂකයා කී විට 'පුතේ! නුඹ කියන කාරණය ඇත්ත ය, එසේ නමුත් රජ අණ නො කොට මඟ හරින්නට නො හැකි ය, එ හෙයින් මෙය කෙසේ නමුත් කළ යුතු ය, ගෙවල මිනිස්සු නය ගණිති, කොහොම නමුත්, නයෙන් නිදහස් විය හැකි ය, ඒ නිසා කෝ තැනකින් නමුත් මුදල් ටිකක් නයට ඉල්ලා ගෙණ එන්නැ'යි ඕ තොමෝ කියා සිටියා ය. එවිට ඔහු අමාරුකම් දක්වා ගොස් පියසතු ධනය සඟවා තුබූ තැනින් කාටත් නො දැනෙන ලෙසට රුපියලක් ගෙණ ආයේ ය. මහගැණිය එය රජුට යවා තමන් ලඟ තුබූ මුදලින් සැණකෙළිය කළා ය. එයට පසු ද ඕ තොමෝ රජු ලවා සැණකෙළි පවත් වන්නට අණ කර වූ ය. කුම්භඝොෂක තෙමේ ඒ හැම වරම ධනය තුබූ තැනින් රුපියල් දෙක තුනක් ගෙණවුත් නැන්දම්මාට දුන්නේ ය. ඕ ද ඒ මුදල් රජු වෙත යවා තමන් අත තුබූ මුදලින් උත්සව කළා ය. නැවැත කිහිප දිනකට පසු 'රාජසෙවකයන් එවා, මොහු රජගෙට ගෙන්වා ගන්නා සේක්වා'යි දන්වා යැවූ ය. රජ තෙමේ රාජසෙවකයන් යැවී ය. ඔවුහු ගොස් කුම්භඝොෂකයා සොයා 'තමුසේ කැඳවා ගෙණ එන්නට රජ තෙමේ අපට නියම කෙළේ ය, එහෙයින් දැන් එහි යා යුතු ය'යි කීහ. ඔහු බිය පත් ව 'තමුසේලා මොනවා කියහු ද, රජ තෙමේ මා ගැණ නො දනියි, මට යනු නො හැකි ය'යි කී ය. රාජසේවකයන් ඔහු අතින් පයින් අල්ලා අදිනු දැක මහළු සත්‍රිය 'ඕය! තමුසේලා මා බැනනුවන්ගේ අතින් පයින් අදින්නෝ කුමක් හෙයින් ද, තෙපි කවරහු'යි අසා ඔවුනට බැණ වැදී 'පුතා! බිය නො වන්න, එන්න යන්නට, බිය නො වන්න, මම රජුට දන්වා මොවුන්ට දඬුවම් කරවන්නෙමි'යි

සනසා දුව ත් බැනා ත් ගෙණ රජවාසලට ගියා ය. රාජ සෙවකයෝ ද උන් පිරිවරා ගියෝ ය. කුම්භඝොෂකයා රජු වැද

සිටි කල්හි 'කුම්භඝොෂක නම් නුඹ දැ'යි ඇසී ය. 'එසේය ස්වාමීනි! මම යි කුම්භඝොෂක නම්'යි කී විට 'කුමක් නිසා විශාලධනයක්, ලොකු මුදලක් සඟවා ගෙණ කන්නෙහි දැ'යි රජතුමා ඇසී ය. 'දෙවයන් වහන්ස! මම කුලී වැඩ කරන්නෙක්, මට ධනයක් කොයින් ද, කුලී වැඩ කොට ලැබෙන දෙයින් දිවි ගෙවමි, එ ද යන්තමකිනැ'යි ඔහු කීවිට, රජතුමා 'අප රවටන්නට නො හැකි ය, මෙසේ නො කරව'යි කී ය. 'දෙවයන් වහන්සේ නො රවටමි' මට ධනයෙක් නැතැ' යි නැවැත ත් කීයේ ය. එවිට රජතුමා ඔහුගේ මුදල් පෙන්වා 'මේ මුදල් කාගේ දැ'යි ඇසී ය. කුම්භඝොෂක තෙමේ වෙව්ලන්නට විය. මුළු සිරුරෙන් දහඩිය ගලන්නට විය. කට වියලී ගියේ ය. 'මේ මුදල් රජුගේ අතට ආයේ කොයිලෙසින් දැ'යි සිතා වට පිට බැලී ය. එකල හොඳට හැඳ පැලඳ සැරසී ගෙයි දෙරලඟ සිටි ඒ ගැණු දෙදෙනා දැක වඩාත් බිය පත් ව 'මැලා මා අල්ලන්නට රජු විසින් යොදනලදැ' යි සිතී ය. රජ තෙමේ, නැවැත ද 'මෙසේ කරන්නෙහි කුමක් නිසා දැ'යි ඇසී ය. 'දෙවයන් වහන්ස! මට කිසිත් පිහිටෙක් නැතැ' යි ඔහු එයට කීයේ ය. 'ඇයි, එසේ කියහි, මම; මා වැනි පිහිටෙක්, මාගේ පිහිට තට පමණ නො වේ දැ'යි රජු කීවිට 'දෙවයන් වහන්සේ මට පිහිට වෙත් නම්, ඒ පමණ ය'යි කීයේ ය. එවිට 'ඔව්, මම තට පිහිට වෙමි, බිය නො වව, මම තා රකින්නම්, කොතරම් මුදල් තා ලඟ තිබේ දැ'යි රජතුමා ඇසී ය. 'සතළිස් කෝටියකැ' යි ඔහු කීයේ ය 'දැන් වුවමනා මොනවා දැ' යි ඇසූ විට 'දෙවයන් වහන්ස! ඒ මුදල් මෙහි ගෙණ එන්නට ගැල්'යි කී ය. රජ තෙමේ සිය ගණනක් ගැල් පිළියෙල කොට දුන්නේ ය. ඔහු ගැල් ගෙණ ගොස් පොළොවේ වළලා තුබූ සියලු ධනය වළෙන් ගොඩ නගා ගැල්වල පටවා රජ වාසලට ගෙණ ආයේ ය. රජ තෙමේ සියලු ධනය මිදුලෙහි ගොඩ ගස්වා නුවරැ වැසි සියල්ලන් රැස් කරවී ය. නුවරැ වැස්සෝ එහි රැස් වූහ. අනතුරු ව රජ තෙමේ ඔවුන්ගෙන් 'මේ නුවරැ වැසි කිසිවක්හට මෙතෙක් ධනය තිබේ දැ' යි ඇසී ය. ඔවුහු 'නැතැ' යි කීහ. 'එසේ නම් මොහුට අප විසින් කුමක් කළ යුතු දැ' යි ඇසූ විට 'දෙවයන් වහන්ස! මොහු සතකාර කළ යුත්තෙකැ' යි නුවරැ වැස්සෝ කීහ. එකල රජ තෙමේ ඔහු සිටු තනතුරෙහි තබා සතකාර කොට දුව ද විවාහ කොට දී ඔවුනු ත් ගෙණ බුදුරජුන් වෙත ගොස් වැඳ 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මේ පුරුෂයා දෙස බලනු මැනැවි, මොහු මහත් වූ ධෛර්‍යය ඇති හැබෑ මිනිහෙකි, මෙබඳු ධෛර්‍යය ඇති තව මිනිහෙක් මේ රටේ නැත යනු මාගේ කල්පනාය, සතළිස් කෝටියක් ධනය මොහුට ඇත්තේ ය, එහෙත් අහඬකාරය මාන්නය යනු කුමක් දැ යි මොහු නො දනියි, ඒ තරමට මොහු

නිරහඞ්කාර ය, නිහතමාන ය, මෙතෙක් මහත් ධනයකට හිමි ව සිට ද මෙතෙක් ජීවත් වූයේ, දිළින්දකු සේ ය, කිලිටි කඩ මාලු හැඳ කුලිකරුවන් හා එක් ව කුලී වැඩ කරමින් දිවි ගෙවී ය, ඒ අතර මොහුගේ කට හඬින් මොහු ධනවතෙකැ යි දැන උපාය යොදා ගෙන්වා ධන ඇත්තකුබව පිළිගන්වා ඒ ධනය ගැල් යවා ගෙන්වා මහාජනයාගේ කැමැත්ත ද ඇතිව සිටුතනතුරෙහි තබා දුව ද පාවා දුන්නේ ය' යි දන්වා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ 'මහරජ! මෙසේ ජීවත් වන්නහුගේ ජීවිතය දැහැමි ය, සොරකම් කිරීම් ආදිය මෙලොව පරලොව දෙකෙහි ම දුකට හෙතු ය, එයින් කවදත් සැපයෙක් නම් නො ලැබේ, දුප්පත්කම අනිකෙක, දැහැමි ජීවිතය අනිකෙක, දුප්පතා දැහැමි ව දිවි පවත්වා නම්, ඔහුගේ ඒ ජීවිතය නො දැහැමි පොහොසතාගේ ජීවිතයට වඩා හැම අතින් ම උසස් ය, පැසසිය යුතු ය, බුඩාදිආයර්‍යයෝ ඒ දැහැමි වූ ජීවිතයට ආශීර්‍වාද කෙරෙති, සම්‍යක් ව්‍යර්‍යයෙන් සමාහිමත් ව කයින් වචනයෙන් සිතින් පිරිසිදු ව නුවණැති ව විමසා කටයුතු කරණ දැහැමි ව දිවි යවන්නහුගේ යස ඉසුරු දිනපතා වැඩී යේ ය'යි වදාරා මේ ධර්‍මදේශනාව කළ සේක.

උඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො,
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස යසොභිවඩ්ඪති ති.

උට්ඨානවීර්‍යය ඇති සිහි ඇති පිරිසිදු වූ කායකර්‍මාදිය ඇති නිතර විමසා කටයුතු කරණ සුලු හික්මුනු දැහැමි දිවිපෙවෙත් ඇති නො පමාවූවහුගේ යසස වෙසෙසින් වැඩේ.

උඨානවතො = උට්ඨානවීර්‍යය ඇති. නැගී සිටි වීර්‍යය ඇති.

අප්පමත්තස්ස' යනු බලා සිටියේ ය. මෙලොව පරලොව දෙක්හි දියුණුව පිණිස වැඩිම පිණිස කළයුතු වූ කටයුතුවල කුසීත වීමට ඉඩ නො තබා එහි කය සිත දෙක නගා සිටුවන බලගතු-වීර්‍යය උට්ඨානවීර්‍යය නම් වේ. මෙ ඒ වදාළ සැටි:- **'කතමා ච ව්‍යග්ඝපජ්ජ! උඨානසම්පදා, ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො යෙන කම්මන්තෙන ජීවිකං කප්පෙති, යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන, තත්ථ දක්ඛො හොති අනලසො, තන්ත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ! උඨානසම්පදා'** යි. යමෙක් ලෝ වැස්සන් විසින් නින්දා නො කළ ගොවිකම් වෙණදැම් ගෙරි රැකීම් ආදී වූ යම් කිසිවෙකින් ජීවිකාව කෙරේ ද, ඒ ජීවිකාකරණයට කරුණු වූ ක්‍රියාවන්හි අනලස් ව යෙදීම නො පසුබටව ක්‍රියාකිරීම උට්ඨාන-වීර්‍යය යි කියූ සේය මේ.

සතිමතො - සිහි ඇති.

අප්පමත්තස්ස, යනු බලා සිටියේ ය. **'සතිමන්තු,** යනු ප්‍රකෘතිය යි. එහි තේරුම සිහි ඇත්තේ ය, යනු යි. ප්‍රථමා-විභක්තියට නැගී එන්නේ **'සතිමා'** කියා ය. මෙහි සිටියේ 'අප්පමත්තස්ස' යනු බලා ෂෂ්ඨීවිභක්තියෙනි.

කුසලචිත්තවීථියෙහි තමන් හා එක් ව යෙදෙන අවශෙෂ නාමධර්මයන්ට අරමුණු සිහි කර ගන්නට උපකාර වන සිතිවිල්ල **'සති'** යි කියනු ලබා. මේ එහි අරුත් අකුරු වෙන් කොට බෙදා බලා කියූ සැටි:- **'සරන්ති තාය සයං වා සරති සරණමත්ත-මෙව වා එසාති = සති'** යි. යම් බඳු ශක්තිමාත්‍රයකින් අරමුණු සිහි කරත් ද, තොමෝ හෝ සිහි කෙරේ ද, සිහි කිරීමේ ශක්ති මාත්‍රය හෝ සති නම්.

මෝ තොමෝ මුළුමනින් කුසල්සිතිවිල්ලෙකි. මෙහි **අපිලාපන උපගණ්හන** යි ලක්ෂණ දෙකක් ඇත්තේ ය. අපිලාපන නම්, සිතට වැටුනු අරමුණ අමතක වන්නට නො දී සිහි කරවන ගති ය. මේ සතර සතිපඨාන - මේ සතර සම්‍යක්ප්‍රධාන - මේ පඤ්චෙන්ද්‍රිය - මේ පංච බල - මේ සප්තබොඩ්‍යඞ්ග - මේ අෂ්ටාඞ්ගික මාර්ග - මේ ශමථ භාවනා - මේ විදර්ශනාභාවනා යන ඈ ලෙසින් සිතට ගත් ධර්ම අමතක වන්නට නො දී සිතෙහි ලා රැක ගන්නේ, මේ අපිලාප-නයේ ශක්තියෙනි. සක්විතිරජුට කුදු මහත් සියලු දෙය මතක් කර දෙන භාණ්ඩාගාරිකඅමාත්‍යයා සේ ය මේ ලක්ෂණ ය. භාණ්ඩා-ගාරිකඅමාත්‍ය තෙමේ රජු කරා ගොස් 'ඔබවහන්සේගේ ඇත් සෙනග මෙ පමණ ය, අස්සෙනග මෙ පමණ ය, රියසෙනග මේ පමණ ය, පාබලසෙනග මෙ පමණ ය, රත් මෙ පමණ ය, රිදී මෙ පමණ ය, කහවණු මෙ පමණ ය, දෙවයන් වහන්සේ මේ සියල්ල සිහි කෙරෙත්වා' යි සියලු දෙය සිහි කරවයි. එමෙන් අපිලාපන සිහිය ද කුශලධර්ම හා අකුශලධර්ම සිහි කරවයි. එහෙයින් දෙලොව හිත කැමැත්තේ, හළ යුතු දහම් හැර දමා සෙවිය යුතු දහම් සෙවනය කොට දියුණුවට යන්නේ ය.

උපගණ්හන නම්, ලං කොට ගැණීම ය. මේ උපගණ්හන ලක්ෂණයෙන් යුත් සිහිය, සක්විතිරජුගේ පරිනායකරතනය වැනි ය. පරිනායකරතනය, සක්විතිරජුට 'මොවුහු රජුට විරුඬය හ, මොවුහු අවිරුඬය හ, මොවුහු උපකාරය හ, මොවුහු අනුපකාරය හ' යි සලකා හිතවතුන් ලං කොට දෙන්නේ යම් සේ ද, එසේ මේ සිහිය කායකර්මාදිඅහිතකරධර්ම පන්නා හැර කායසුචරිතාදිහිතකර ධර්ම ලං කොට දෙන්නේ ය.

'සති ච ඛවාහං භික්ඛවෙ! සබ්බත්ථිකං වදාමි' 'මහණෙනි! සිහිය, සියලු අර්ථසිඬිය සිදු කරන්නී ය යි මම කියමි' යි වදාළෝ

මිනිස්ජීවිතය ප්‍රධාන විසින් එලොව මෙලොව දෙක්හි ම නගාලනු ලබන්නහු සිහිය වන බැවිනි. සිහිය අරමුණෙහි දැඩි ව පිහිටි බැවින් එලිපත්තක් සේ ද, ඇස්-කන් නාස් ආදී වූ දොරටු රක්නා බැවින් දොරටුපල්ලකු සේ ද දන්නැ' යි අටුවාව කීවා ය. **'ආරම්මණෙ දළ්හපතිඨිතත්තා පන එසිකා විය චක්ඛුමාරාදිරක්ඛණතො දොවාරිකො විය ච දඨබ්බා'** යනු අටුවා ය.

සිහියෙහි කෘත්‍යය, නො මුළාබව ය. ඵලය, ගුණදහම් රැකීම හා අරමුණුඵලවීම ය. ලංව සිටියේ, ස්ථිරසංඥාව හා සතිපඨාන ධර්මත් ය. ආහාරය, යොනිසොමනසිකාරය යි.

සිහිය, **අභිජානන-කටුමිකා - ඔලාරිකවිඤ්ඤාණ - හිත - විඤ්ඤාණ - අහිතවිඤ්ඤාණ - සභාගනිමිත්ත - විසභාගනිමිත්ත - කථාභිඤ්ඤාණ - ලක්ඛණ - සරණ - මුද්දා - සඞ්ඛ්‍යා - ධාරණ - භාවනා - පොත්ථකනිබන්ධන - උපනික්ඛෙපණ - අනුභූත** යන මේ සොළොසයුරෙන් උපදනා බව බණපොත කිය යි. එහෙයින් එහි විස්තර අනික් 'බණපොතෙන් දන්නේ ය.

සිහිය පිහිට විය යුතු තැන්, **කායානුපස්සනා - වෙදනානුපස්සනා - චිත්තානුපස්සනා - ධම්මානුපස්සනා** යි සතරෙක් වේ. මේ ස්ථාන සතරෙහි, යමෙක් සිහිය පිහිටුවා එහි සිත වැඩූයේ නම්, ඔහුට ඉන් ලැබෙන ඵලය, බුදුරජානන් වහන්සේ සතිපඨාන සූත්‍රයෙහි දී මැනැවින් වදාළ සේක. එය, එයින් දන්නේ ය.

යමෙකු පිළිබඳ සිහිය, **බුඩ - ධම්ම - සඞ්ඝ - සීල - චාග - දෙවතා - මරණ - කාය - ආනාපාන - උපසම** යන මෙ තැන්හි පුන පුනා වැඩේ ද, ඕ සිහිය, 'අනු' යන්නකින් වඩා 'අනුස්සති' යි කියනු ලැබේ. පැවැත්විය යුතු තැන ම පවතින, සැදැහැති කුල පුතුනට ම සුදුසු සිහිය යන තේරුම ද 'අනුස්සති' යන්නෙහි ඇත්තේ ය.

මෝ සිහිය, තැනට ගැළපෙන සේ, **සතිසම්බොජ්ඣඞ්ග - සම්මාසති - සතිබල - සතින්ද්‍රය** යන නම්වලිනුදු හඳුන්වති, බුදු රජානන් වහන්සේ. උන්වහන්සේ ම ක්‍රමානුකූල ව වැඩූ සිහිය සිදු කොට නො දෙන යහපතක් නැතැ යි වදාළ සේක.

සුචිකම්මස්ස = පිරිසිදු කර්ම ඇති.

අප්පමත්තස්ස' යනු බලා සිටියේ ය. මෙහි කායකර්ම හා වාක් කර්ම, කර්ම නම්. මනසකර්ම මෙහි නො ගැණේ. සතුන් මැරීමෙන් හා, සොරකමින් හා, සදොස් මෙවුන්දම් සෙවුමෙන් හා වැළක්ම පිරිසිදු වූ කායකර්ම නම්. බොරුකීමෙන් හා කේලාම් කීමෙන් හා රළුබස් කීමෙන් හා නිසරුබස් කීමෙන් හා වැළක්ම පිරිසිදු වූ

වාක්කම් නම්. මෙකී පිරිසිදු කායවාක්කම් ඇත්තේ ද සුවිචිකම්ම' යන්නෙන් ගැණේ. අන් අරුත් සමස් විසිනි එසේ ගැණෙනුයේ. එය විස්තර විසින් වදාළ සැටි මෙසේ දතයුතු ය:-

'ඉධ භික්ඛවෙ! එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති, අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති, කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගනිරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුණ පරික්ඛිත්තා'පි, තථාරූපාසු නාචාරිත්තං ආපජ්ජිතා හොති' යි කායකම්.

'ඉධ භික්ඛවෙ! එකච්චො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, සච්චවාදී සච්චසන්ධො ඨෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස, සභාගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුඨො, එහංභො පුරිස! යං ජානාසි තං වදෙහි'ති සො අජානං වා ආහ න ජානාමි'ති ජානං වා ආහ ජානාමි'ති අපස්සං වා ආහ න පස්සාමි'ති පස්සං වා ආහ පස්සාමි'ති ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජානමුසාභාසිතා හොති, පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති, ඉධ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පාදෙතා සමගගාරාමො සමගගරතො සමගගනන්දි සමගගකරණං වාචං භාසිතා හොති, ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, යා සා වාචා නෙළා කණ්ණසුඛා පෙමනියා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථා රූපිං වාචං භාසිතා හොති, සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං' යි වාක්කම්. මෙහි විස්තර ධම්ධරයන් විචාරා දතයුතු ය. පොත දිග්ගැසෙන බැවින් විස්තර මෙහි නො ආයේ ය.

නිසම්මකාරිනො = විමසා කරණසුලු

අප්පමත්තස්ස' යනු බලා සිටියේ ය. **'එවං'ව භවිස්සති එවං කරිස්සාමි'ති වා ඉමස්මිං කම්මෙ එවං කතෙ ඉදං නාම භවිස්සති'ති වා එවං නිදානං සල්ලකෙන්තා රොගතිකිච්ඡනං විය සඞ්ඛකම්මානි නිස්සාමෙන්තා උපධාරෙන්තා කරොන්තස්ස'** යනු අටුවාය. 'මෙසේ වන්නේ ය, මෙසේ කරන්නෙමි, මේ ක්‍රියාව කළ කල්හි මෙනම් දෙයක් වන්නේ ය' යි නිදානය සලකා හෙතුව සොයා ව්‍යාධියට කරණ පිළියම් සේ සියලු කර්මයන් තුවණින් විමසා බලා කරන්නේ **'නිස්සම්මකාරී'** නම්. සසුන් දියුණුව කැමැත්තහු විසින් හැම වේලේ හැම තැනදී තමන් කරණ කියන හැම එකක් තුවණින් විමසා බලා ම කළ යුතු ය. නැත, ඉන් ලැබෙන ඵලය ඝිත පිණිස සතුට පිණිස නො වන්නේ ය. **අඞ්කුර ඉද්ධක** දෙවපුත්‍රයන්ගේ කතාපුවත් බලන්නේ ය.

සඤ්ඤතස්ස ච = හික්මුනු.

අප්පමත්තස්ස' යනු බලා සිටියේ ය. **'කායාදීහි සංයතස්ස නිවජ්ජදස්ස'** යනු අටුවා ය. කාය – වාක් – මනස් – යන දෙරටු තුන මැනැවින් රැක සිටියේ, **'සඤ්ඤත'** නම්. මේ එක දෙරටුව කිනු ත් පවි නො කරන්නේ ය මොහු. කාය-වාක් වාරයන්ගේ සංසමය, හික්මීම සීලයෙන් වන කල්හි මනොවාරයාගේ හික්මීම සමාධියෙන් වන්නේ ය.

ධම්මජීවිනො = දැහමින් ජීවත් වන.

අප්පමත්තස්ස' යනු බලා සිටියේ ය. දැහැමි වූ ජීවිතය මෙහි ලා අගාරිකා-අනගාරිකා විසින් වෙන් කට හැකි ය. ගිහියා, අගාරික ය. අනගාරික ය, පැවිද්ද. මෙසේ ගිහිපැවිදි විසින් ජීවිතය දෙ පරිදි කොට බෙදා බැලිය යුතු ය. එහි, යම් කිසි ගිහියෙක්, තම දිවිගෙවී මෙහි ලා තුලාකූට කංසකූට මානකූට උකෙකාටන වංචන නිකති සාවියොග ඡෙදන වධ බන්ධන විපරාමොස ආලොපසහසාකාර යන මේ සැහැසිකම්හි නො යෙදී, **'පඤ්ඤවා හිකඛවෙ! වණිජ්ජා උපාසකෙන අකරණීයා'** යනු විසින් උපාසකයා විසින් නො කටයුතු කොට වදාළ, සැත්වෙණදම්-සත්වෙණදම්-මස්වෙණදම්-රහමෙරවෙණදම්-විසවෙණදම් යන සැහැසි වෙණදම්හි නො යෙදී සතුන් මැරීම් ආදී පවි කම්වලින් වැළකී සීසැම් ගෙරිරැකීම් දැහැමි වෙණදම් ආදියෙහි යෙදී දිවිගෙවන්නේ ද, ඔහු ය **'ධම්මජීවී'** නම්.

තරාදියෙන් කරණ, තලියෙන් කරණ, සේරුවෙන් කරණ රැවටීම පිළිවෙළින් තුලාකූට කංසකූට මානකූට නම්. අල්ලස් ගැණුම උකෙකාටන නම්. ඒ ඒ උපායයන්ගෙන් අන්හු රැවටීම වංචන නම්. යොගවශයෙන් හෝ මායාවශයෙන් හෝ නො රන් රන් කිරීම් විසින් ප්‍රතිරූපකවසතුන් දක්වා රැවටීම නිකති නම්.

සාචියොග නම් කුටිලයොගය යි. සමහර කෙනෙක් අනිකක් දක්වා අනිකකට පෙරළීම සාචියොගය යි කියති. අත්පාසිදීම් ආදිය ඡේදන නම්. මැරීම වධ නම්. රැහැන් ආදියෙන් බැඳීම බන්ධන නම්. හිම වැටෙන කාලයෙහි හිමෙන් සැඟවී, නැත, වන ලැහැබ් ආදියෙහි සැඟවී සිට මගැ යන මිනිසුන්ගෙන් යම් යම් දේ පැහැර ගැන්ම විපරාමොස නම්. ගම් පැහැරීම ආලොප නම්. ගෙට වැදී මිනිසුන්ගේ පපුව මත සැත් තබා බිය ගන්වා තමන් කැමැති බඩු පැහැරගැන්ම සහසාකාර නම්. සතුන් මැරීමෙන් හොරකම් කිරීමෙන් අබ්‍රහ්මචර්‍යයෙන් බොරුකීමෙන් කේලාම්කීමෙන් රළු බස්කීමෙන් තෘණබීජ සිඳීමෙන් විකල්බොජුනෙන් නැටුම් ගැයුම් වැයුම් ඇ විසුළු දැක්මෙන් මල්ගඳ විලවුන් ඇ දැරීමෙන් උසසුන් මහසුනෙන් රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් අමු ධාන්‍ය පිළිගැන්මෙන් අමු මස් පිළිගැන්මෙන් සත්‍රි කුමාරිකා පිළිගැන්මෙන් දැසි දැසයන් පිළිගැන්මෙන් එළු බැටළුවන් පිළිගැන්මෙන් ඌරන් කුකුළන් පිළිගැන්මෙන් ඇත් අස් ගව වෙළඹුන් පිළිගැන්මෙන් කෙත් වත් පිළිගැන්මෙන් මිලයට බඩු ගණුදෙනුවෙන් තුලා කූට කංසකූට මානකූටයෙන් උක්කොටන වංචන නිකති සාචියොගයෙන් ඡේදන වධ බන්ධන විපරාමොස ආලොපසහසාකාරයෙන් වැළකීම වූ චුල්ලසීලයෙන් ද, බීජගාමභූතගාමසමාරම්භයන් රැස් කොට තබා ප්‍රයොජනයට ගැණීමෙන් නැටුම් ගැයුම් වැයුම් ඇ විසුළු දැක්මෙන් සිහිමුළාවට කරුණු වූ දූ කෙළියෙන් උසසුන් මහසුනෙන් ඇඟ ඉලීම් මැඩීම් නැවීම් තැළීම් ඇ මෙයින් තිරිසන් කතා ඇසීමෙන් උනුන් බැණ දෙඩා ගැණීමෙන් රජ ඇමති ආදීන්ගේ පණිවුඩ ගෙණ යෑමෙන් කුහන ලපනාදියෙන් වැළකීම වූ මජ්ඣිම සීලයෙන් ද, අඞ්ගවිද්‍යාදියෙන් මණිලක්ෂණාදිය කීමෙන් චන්ද්‍රග්‍රහාදිය කීමෙන් රජුන්ගේ යුඩගමනාදිය කීමෙන් මහා වැසි වැසීම් ආදිය කීමෙන් ආවාහ කැරැවීම් ආදිය කීමෙන් දෙවියන්ට භාරහාර වීම් ආදිය කීමෙන් වැළකීම වූ මහාසීලයෙන් ද, හුණදඬු දීම් ආදි අනෙසනයෙන් දුරු වීමෙන් ද, දැහැමින් සෙමෙන් පිඬු සිඟා වළඳ දිවි ගෙවන පැවිද්දා ය **ධම්මජීවි** නම්.

අප්පමත්තස්ස = නො පමාවූවහුගේ.

මේය මේ ගාථාවෙහි විශෙෂ්‍ය පද ය. ප්‍රධානපද ය. එහි වූ අනික් හැම ෂෂ්ඨ්‍යන්තමයක් ම මෙයට විශෙෂණ ව මෙය එල්බ සිටියේ ය. මෙහිලා සියදිවි දැහැමින් ගෙවන්නට සීසෑම් ගෙරි රැකීම් ආදියෙහි හා රාජසෙවාවෙහි නො පසුබට ව සිහි නුවණින් යෙදී දැහැමින් දිවි යවන්නේ **අප්පමත්ත'** නමැයි කිය යුතු ය.

යසො = යසස.

ආධිපත්‍යය, භොගසම්පත්තිය, කීර්තිසම්පත්තිය, පරිවාර සම්පත්තිය, ඤාතිසම්පත්තිය, සම්මානය යන මේ ආදීහු ය, යසස්. ලෞකික විසින් ජීවිතයක ඇති අඩු ලුහුඬු පුරා ලන්නේ යසස් නම්.

අභිවඩ්ඪති = වෙසෙසින් වැඩේ.

මෙහි **'වඩ්ඪති'** යන ක්‍රියාපදය හා එක් ව සිටි **'අභි'** යනු උපසර්ගයෙකි. ගති තුනක් ඇත්තෝ ය උපසර්ගයෝ. ප්‍රසිද්ධාර්ථ වැළකීම, ප්‍රසිද්ධාර්ථයන්ට ම අනුගත ව සිටීම, ප්‍රසිද්ධාර්ථය වෙසෙසීමය ගතිතුන. මෙහි සිටියේ 'වඩ්ඪති' යන ක්‍රියාපදයෙහි ප්‍රසිද්ධාර්ථය වූ 'වැඩේ' යනු වෙසෙසා ය. වෙසෙසින් වැඩේ ය කීයේ එහෙයිනි.

අභි' යන මේ උපසර්ගය වනාහි අභිමුඛභාව – විශිෂ්ට – ඌර්ධ්ව ක්‍රියා – සාරූප්‍ය – ආධික්‍ය – කුල – අසත්‍ය – ලක්ෂණාදි අරුත්හි වැටේ. **අභික්කමති – අභිධම්මො – අභිරූහති – අභිරූපො – අභිවස්සති – අභිජාතො – රුක්ඛමභිවිජ්ජොතතෙ විජ්ජු** – යනු පිළිවෙළින් ඒ යෙදී සිටි තැන් ය. තවද ඉත්ථම්භූත – වීච්ඡා – වන්දනා යන අරුත්හි ද හෙන්නේ ය. **'සාධු දෙවදත්තො මාතරමභි – රුක්ඛමභි විජ්ජොතතෙ වන්දෙ – අභිවාදෙති'** යනු ඒ තෙ තැන ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි කුම්භඝොෂක සිටු තෙමේ සෝවන් පලයෙහි පිහිටියේ ය. අන් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියෝ ය. මෙසේ මේ දෙශනා තොමෝ මහා ජනයාට වැඩ සහිත වූ ය.

කුම්භඝොෂකවස්තුව නිමියේ ය.

---

1. 1—2 'අප්පමාදෙ' යන්නට කළ පරිකථාව බලනු.

චූලපන්ථකමහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ

2 — 3

රජගහානුවර ධනසිටුකුලය යි ප්‍රසිඩ වූ එක් කුලයෙක් වූයේ ය. එහි යොවුන් මදයෙන් මත් වූ කාන්තාවක් වූ ය. පුරුෂයන් කෙරෙහි තදින් ලොල් වූ ඕ තොමෝ මවුපියන් විසින් සත්මහල් ගෙයි මතුමාලෙහි ලා රකිනු ලබන්නී ය. එහෙත් ඕ තොමෝ එහි සිටි දුස්සකු හා රහසේ කාමසෙවනය කොට 'අප දෙන්නා අතින් සිදු වූ මේ වැරැද්ද මවුපියන් විසින් දන්නා ලද්දේ නම්, මා කැලිවලට කපා දමනු ඇතැ' යි බිය වූ වා, මගවියදම් හා ගෙයි තුබූ තවත් වටිනා ඇඳුම් කැඩුම් ආභරණ ද පොදි ගසා ගෙණ 'කො තැනෙක හෝ ගොස් දිවි යවන්නෙමි' යි දුස්සහු හා පැන ගියා ය. එක් ඈත ගමකට ගොස් එහි වසන ඇයගේ කුසෙහි දරුගැබෙක් හටගත්තේ ය. දරුගැබ මෝරා ගිය කල්හි ඕතොමෝ තම පුරුෂයාට අඩ ගා 'දැන් දරුගැබ හොඳට ම මෝරා ගොස් තිබේ, අද හෙට ම වාගේ දරුවා බිහිවිය හැකි ය, කාත් කවුරුත් නැති මෙ තැන එය සිදු වී නම්, අප දෙන්නාට ම වන්නේ මහත් ගැහටෙක, ඒ නිසා කොයි එකක් වුවත් කමක් නැත, ගෙදර යමු' යි කිවු ය. 'මම එහි ගියෙම් නම්, මා මරා දමනු වරදින්නේ නැතැ' යි සිතූ ඒ පුරුෂ තෙමේ, 'අද යමු, හෙට යමු' යි දවස් කිහිපයක් එහි ම ඉක්මවා හැරියේ ය. එකල්හි ඕ තොමෝ 'මූ යන හැඩෙක් නො පෙණේ, වන්නෙක් වේවා, මවුපියෝ, ගුරුවරු, දරුවන්, සිසුන් කෙරෙහි යම් යම් වේලෙහි කිපුනෝ ද, එකාන්තයෙන් හැම දා හිතවත්හු ය, දරුවන් ගේ සිසුන්ගේ හිතවැඩ කැමැත්තෝ ය, මොහු යේ නම් යේවා, නො යේ නම් නො යේවා, මා යා යුතු ය' යි සිතා පුරුෂයා, ගෙන් බැහැර ගිය කල්හි ගෙයි තුබූ බඩුමුට්ටු තැන්පත් කොට තමන් ගෙදර යනබව අසල් වැස්සන්ට දන්වා මගට බැස ගියා ය. මේ අතර ගෙදර ආ ඒ පුරුෂ තෙමේ ඇය නො දැක අසල් වැස්සන් විචාරා වහා දුව ගොස් අතරමගදී ඇය හා එකතු විය. ඒ ඇසිල්ලෙහි ඕ තොමෝ දරුවකු වැදූ ය. කුලගෙට යෑම එයින් අත් හිටවා දෙදෙන ම එක්සිත් ව පෙරළා මුලින් වුසූ තැනට ම ආහ. උපන් දරුවාට අතර මගදී උපන් බැවින් **පන්ථක** යි නම් කළහ. මාස කිහිපයක් ගිය තැන ඇය කුස තවත් දරු ගැබෙක් හට ගත්තේ ය. ඒ අවස්ථාවේ දී ද ගැබෙන් සැහැල්ලු වන්නට ගෙදර බලා මග බැස යන්නෝ පළමු සේ අතර මගදී ම දරු උපන් බැවින් කුල ගෙට යෑම අත හැර ආපසු හැරී හුන් තැනට ම ආහ. ඒ දරු උපත ත් අතර මගදී ම සිදු වූ බැවින් පළමු උපන් දරු **මහාපන්ථක** නම් කොට දෙවන දරුට **චූලපන්ථක** යි නම් තැබූහ.

දිනක් මහාපන්ථක තෙමේ එහි කුඩා ගම්දරුවන් කියන 'ලොකු අප්පා, බාප්පා, මුත්තා, මුත්තනී, නැන්දා, මාමා, ලොකුඅම්මා, බාලම්මා' යනාදී වූ නැකම් අසා, ගෙට අවුත් 'අම්මේ! අපට නැයෝ නැත්දැ' යි ඇසී ය. එවිට ඕ තොමෝ 'පුත! නුඹලාට මෙහි නැයෝ නැත, නුඹලාගේ මුත්තා රජගහනුවර මහාධන සිටු තෙමේ ය, අනික් නැයෝත් එහි බොහෝය' යි කිවූ ය. 'එහෙනම් අම්මේ! අපි එහි යමු' යි කී කල්හි ඕ තොමෝ කිසිත් නො බැණ සිටියා ය. නැවැත නැවැත ත් මහාපන්ථක තෙමේ එහි යන්නට මැනියන්ට බල කෙළේ ය. ඒ අතර දිනෙක ඕ තොමෝ සවාමියාට අඬ ගා 'මේ ලමයි නැයන් බලන්නට යන්නට ඕනෑ ය යි මට නිතර කරදර කරති, කොහොම ද දවසක් මේ ලමයි දෙදෙනා ත් ගෙණ එහි ගොස් එන්නට යමු ද, මේ දරුවන්ට නැයන් හඳුන්වා දිය යුතු නො වේ ද, හැම දෑ මෙසේ වල් වැදී ඉන්නට පිළිවන් ද, යමු ද හෙට' යි කිවූ ය. 'සොදුර! මට නම් එහි නො යා හැකි ය, මම ඔයා නම් එහාට ඇර ලන්නෙමි' යි කීවිට 'මොක ද ඔවුහු අප මරා කන්ද, ඔවුන් අපට තරවටු කරාවි, ඉතින් මොක ද තරවටු කලාට, අප කළ වැරද්දට' යි කියා ලමයින් දෙදෙනා ත් වඩා ගෙණ සවාමියා ත් සමග මගට බැස්සා ය. රජගහනුවර දෙරට පැමිණි ඔවුහු එහි වූ එක් අම්බලමෙක නවාතැන් ගෙණ පසු දා තමන් ලමයිනු ත් ගෙණ ආබව දෙමවුපියන්ට දන්වා යැවූහ. මවුපියෝ ඒ අසා 'සසර උපදින්නවුන්ට දු පුත් නො වූවෝ නැත, මූලා මහාඅපරාධකාරයෝ ය, අපේ ඇස්වලට මුන් පෙණීම නො ඉවසනු හැකි ය, ඒ නිසා මෙහි ඊමෙන් වැඩෙක් නැත, මේ මුදල් ටික ගෙණ පහසු තැනක ගොස් දිවිරැක ගණිවු, ලමයින් දෙදෙනා මෙහි එවවු'යි මුදල් ටිකක් දී පණිවුඩකරුවකු ඔවුන් වෙත යැවූහ. ඔවුහු මවුපියන් එවූ මුදල් ගෙණ ලමයින් පණිවුඩ කරු අතට දී පෙරලා හුන් තැනට ගියහ.

දැන් ලමයි මුත්තනුවන් ලහ වැඩෙති. චූලපන්ථක ඉතා ලදරු ය. මහාපන්ථක මුත්තනුවන් හා බණ අසන්නට විහාරයට යයි. නිතර නිතර පන්සල් යන මහාපන්ථකගේ සිත පැවිද්දට නතු විය. දිනක් ඔහු 'මුත්තනුවෝ මට අවසර දෙත් නම්, මම පැවිදි වෙමි' යි මුත්තනුවන්ට කී ය. 'පුත! කුමක් කියහි, මාගේ පැවිද්දට වඩා නුඹගේ පැවිද්ද දෙවියන් සහිතලොකයට හිත වේ, හැක්කෙහි නම් කොතරම් හොඳ ද, මම එයට මුළුමනින් ම සතුටු වෙමි' යි ඔහු මහාපන්ථකයන් බුදුරජුන් වෙතට පැමිණ විය. බුදුරජානන් වහන්සේ උන් බලා සිට, තට පුතෙක්, මේ ලමයා කොයින් ලැබුනේ දැ'යි ඇසූහ. 'එහෙයි! සවාමීනි! මේ මාගේ මුනුපුරා, දුවගේ පුතා, මොහු මා වෙතට අවුත් ටික දවසක් වෙනවා, දැන් පැවිදිවන්නට

කැමැති යි, මේ දරු පැවිදි කර වදාරන්නැ' යි සිටු තෙමේ කී ය. එවිට බුදුරජානන් වහන්සේ පැවිදි කරන්නට එක් පිණ්ඩවාරික-භික්ෂුනමක්හට නියමකළහ. උන්වහන්සේ **තවපංචක කර්මස්ථානය** කියවා ඒ දරු පැවිදි කළහ. මෙසේ පැවිදි වූ මහාපන්ථක තෙමේ කල් නො යවා ම බුදුදහම් උගත්තේ විසිවයසට පැමිණ උපසම්පදාව ලැබී ය. එ තැන් සිට වඩාලා ත් යොනිසොමනසිකාරයෙහි යෙදෙ-මින් ගැටෙමින් රහත්බව ද ලැබී ය. මෙ තැන් සිට ධ්‍යානසුඛයෙන් හා ඵලසුඛයෙන් කල් යවන මහාපන්ථක භික්ෂු තෙමේ, 'මේ මා ලත් සැපය චූලපන්ථකයාට ත් දිය හැකි දැ'යි සිතා දිනක් මුත්තනුවන් වෙත ගොස් 'සීයේ! සීයා අවසර දෙන්නේ නම් මම චූලපන්ථක පැවිදි කරමි' යි කියා සිටියේ ය. ගත් කටට ම 'පැවිදි කරන්නැ' යි සිටු තෙමේ කී ය. ඔහු බුදුසසුනෙහි ඉතා පහන් ව සිටියේ ය. එහෙත් 'මේ දරු නුඹගේ කිනම් දුවගේ දැරු' යි විචාළවිට දාසයකු හා පැනගිය දූගේ දරුය යි කීමෙහි ලජ්ජා ඇත්තේ විය. එහෙයින් ඔවුනට ඉතාසතුටින් පැවිදි වන්නට අවසර දුන්නේ ය. මහා පන්ථක තෙමේ සීයාගේ අවසරය පරිදි චූලපන්ථක පැවිදි කරවා සීලයෙහි පිහිටෙවේ ය. චූලපන්ථක පැවිදි වූයේ ද දක්ඛ විය. එහෙයින් ඔහුට:-

"පදුමා යථා කොකනදං, සුගන්ධං
පාතො සියා ඵුල්ලමවීතගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ"

යන මේ ගාථාව සිවුමසක් ගෙවා ත් උගන්නට නො හැකි විය.

මෙ තෙමේ වනාහි පෙර කසුප් සම්බුදු රජානන් වහන්සේගේ කාලයෙහි පැවිදි ව නුවණැත්තෙක් ව සිටියේ උගන්නා දක්ඛ භික්ෂුවක්හට කවටකම් කෙළේ ය. ඒ මහණ තෙමේ එයින් හටගත් ලජ්ජා ඇත්තේ නො ද උගත්තේ ය. නො ද හදාළේ ය. ඒ අකුශල කර්මයෙන් චූලපන්ථක තෙමේ පැවිදි වූ යේ ද දක්ඛ විය. පළමු උගත් පදය අන් පදයක් උගන්නට කලින් ම නැසී යයි. යට කියූ ගාථාව උගන්නට මොහුට සිවුමසකිනුත් නො හැකි විය. මහාපන්ථකස්ථවිර තෙමේ 'පන්ථක! නුඹට මේ සසුනෙන් වැඩෙක් නැත, නුඹ මේ සසුනට නො සුදුසු ය, සිවුමසක් ගෙවා ත් නුඹට මේ එක් ගාථාවක් උගන්නට නො හැකි විය, මෙසේ කල පැවිදිකිස කෙසේ මුදුන් පැමිණේ ද, මෙහි නිකම් ඉදීම හොඳ නැත, එහෙයින් වෙහෙරින් බැහැර යන්නැ'යි කීයේ ය. එහෙත් චූලපන්ථක තෙමේ බැහැර නො ගියේ ය. බුදු සසුන්හි සෙනහ ඇත්තේ ගිහිබව නො කැමැත්තේ ය. මෙකල, එහි භත්තුද්දෙසක වූයේ, මහාපන්ථක තෙමේ ය.

දිනක්, ජීවක කොමාරභච්ච තෙමේ මල්ගද ච්ලවුන් ද ගෙණ, අඹවන උයන් ගොස්, බුදුරජුන් ගඳින් මලින් පුදා, බුලත්, පිළිගත්වා, බණ ත් අසා, අවසන් කොට, බුදුරජුන් වැඳ, අවසර ගෙණ, මහා පන්ථක තෙරුන් වෙත ගියේ ය. එහි ගොස් උන්වහන්සේ වැඳ 'සවාමීනි! මෙහි බුදුරජුන් වෙත හාමුදුරුවන් වහන්සේලා කී නමක් වැඩ වෙසෙත් දැ' යි ඇසී ය. 'පන්සියයෙනි' යි උන්වහන්සේ කීහ. 'එසේ නම් සවාමීනි! හෙට ඒ හැම දෙනා වහන්සේ අප නිවසට දානය පිණිස වඩිනු මැනැවැ'යි ඔහු ආරාධනා කොළේ ය. එවිට මහාපන්ථක සථවිර තෙමේ 'වෙදමහතාණෙනි! මාගේ මලනු වූ චූලපන්ථක, මහාඅනුභාවයෙක්ය ඔහුට අපගේ මේ සසුනෙන් වැඩෙක් නො වේ, ඒ නිසා ඔහු අත හැර අනික් දෙනා වහන්සේ උදෙසා මම මේ ආරාධනාව පිළිගණිමි, ඒ හැටියට සූදානම් වන්නැ' යි ඔහුට කී ය. ඒ අසල සිටි චූලපන්ථක තෙරුන්ට මේ කතාව ඇසුනේ ය. එයින් 'මෙතෙක් දෙනා උදෙසා මේ ආරාධනාව පිළිගත් මාගේ සහෝදර තෙමේ, මා හැර දානය පිළිගත්තේ ය, එකතින් මාගේ සහොදරයා මා කෙරෙහි බිඳුනේ වන, ඉතින් මට දැන් මේ සසුනෙන්, මේ පැවිද්දෙන් වැඩෙක් නැත, ගිහි ව දන්පින්කම් කරමින් ජීවත් වෙමි' යි සිතා පසුදා උදෑසන සිවුරු හරින්නට නික්ම ගියේ ය.

එදින උදෑසන තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව බලා වදාළ සේක. එවිට උන්වහන්සේට චූලපන්ථක සිවුරු හැර දමන්නට නික්ම යන බව පෙණී ගියෙන් උන්වහන්සේ ගඳකිළියෙන් නික්ම දෙරකොටුව අසල, චූලපන්ථක යන මග සක්මන් කරමින් වැඩ සිටියහ. චූලපන්ථක, උන්වහන්සේ දැක වෙත එළැඹ වැඳ වැටී සිටි විට, 'චූලපන්ථක! කමුසේ මේ වේලෙහි කොහි යනු දැ'යි ඇසූහ. 'තිලෝගුරු භිම්යෙනි, සිවුරු හරින්නට, මාගේ සහෝදරයා මා සසුනෙන් බැහැර කරයි, මට සසුනෙන් වැඩක් නැතැ යි කියයි, මාගේ ජීවිතය නිසරු කොට දක්වයි, එ හෙයින් මම සිවුරු හරින්නට යමි' යි කීයේ ය. බුදුරජාණන් වහන්සේ, 'චූලපන්ථක! කාගේ පැවිද්ද මාගේ ය, එය මහාපන්ථකට අයත් නැත, සහොදරයා එසේ කීයේ නම්, මා වෙත නො ආවහු කුමක් හෙයින් ද, මෙහි එව, තමුසේට ගිහිකමෙන් වැඩෙක් නැත, මා ළඟ වසන්නැ'යි ශ්‍රී හස්තයෙන් ඔලුව අතගා කැඳවා ගෙණ ගොස්, ගඳ කිළි දෙරකඩ හිඳුවා, 'චූලපන්ථක! පෙර දිගට මුණ දී මේ රෙදිකඩ **'රජොහරණං, රජොහරණං'** යි පිරිමදිමින් හිඳුව' යි සෘඬියෙන් මැවූ රෙදි කඩක් දුන්හ. ඉන් පසු බුදුරජාණන් වහන්සේ කල් දැන්වූ කල්හි, භික්ෂු සඞඝයා ත් ගෙණ ජීවකයාගේ ගෙට වැඩ,

පණවා තුබූ බුඩාසනයෙහි වැඩහුන් සේක. චූලපන්ථක තෙමේ ද ඉරට මූණ ලා හිඳ, බුදුරජුන් දුන් ඒ රෙදිකඩ, 'රජොහරණං, රජොහරණං' යි පිරිමැද්දේ ය. ටික වේලාවක් එසේ කරත්, රෙදිකඩ කිලිටි විය. එවිට චූලපන්ථකයාගේ සිතට 'තම අත්බව නිසා ඉතා පිරිසුදු ව තුබූ රෙදිකඩ ඉතා ඉක්මනින් කිලිටි බවට පැමිණියේය'යි වැටහිණ. එය සිතට නගා ගත් ඔහු, 'ඒකාන්තයෙන් සංඝකාරයෝ අනිත්‍යයහ' යි බය වය පිහිටුවා විදසුන් වැඩී ය. බුදුරජානන් වහන්සේ, චූලපන්ථකගේ සිත විදර්ශනාවට නැංගබව දැන, 'චූලපන්ථක! තමුසේ මේ රෙදිකඩ ම මෙසේ කිලිටි විය යි නො සිතහු, තා ඇතුළත බොහෝ රාගාදි රජස් ඇත්තේ ය, ඒ රජස් වහා දුරු කරහු' යි ආලෝකයක් යවා, ඉදිරියෙහි වැඩ සිටියා සේ, පෙණ්පෙණි—

'රා මේ රජස් වේ – දුහුවිලි රජස් නො ම වේ,
රජස් යි මෙහි කියූ මේ – රාහට අදිවදන් වේ.
පහකළරජස් ඇති – මුනි උතුමන්ගෙ සසුනේ,
ඒ මහණහු තුමූ මේ – රජසැර වෙසෙත් වෙසෙසින්.
දෙස් මේ රජස් වේ – දුහුවිලි රජස් නො ම වේ,
රජසැ යි මෙහි කියූ මේ – දෙස්හට අදිවදන් වේ.
පහකළ රජස් ඇති – මුනි උතුමන්ගෙ සසුනේ,
ඒ මහණහු තුමූ මේ – රජසැර වෙසෙත් වෙසෙසින්.
මොහො මේ රජස් වේ – දුහුවිලි රජස් නො ම වේ,
රජසැ යි මෙහි කියූ මේ – මොහහට අදිවදන් වේ.
පහකළ රජස් ඇති – මුනි උතුමන්ගෙ සසුනේ,
ඒ මහණහු තුමූ මේ – රජසැර වෙසෙත් වෙසෙසින්'.

යි වදාළ සේක. මේ දෙසනාවගේ අවසානයෙහි චූලපන්ථක සථවිර තෙමේ, පිළිසිඹියාවන් ලබා රහත් බවට පැමිණියේ ය. ඒ හා ම තෙවළාදර වූයේ ය.

පෙර එක් අත්බවෙක, රජබවට පත් මේ චූලපන්ථක සථවිර තෙමේ, නුවර පැදකුණු කරණුයේ නළලින් ගැලූ ඩහදිය ඇද තුබූ සළුවකින් පිස දැම්මේ ය. සළුව කිලිටි විය. 'මේ සිරුර නිසා පිරිසිදු ව තුබූ සළුව කිලිටි වී ය'යි සිතත්, ඔහුට අනිත්‍ය සාඤ්ඤව උපන. ඒ හෙයින් මේ අත්බවේ දී රහත්බව ලබන්නට රජොහරණය ම ඔහුට කරුණු විය. ජීවක තෙමේ, බුදුරජුන්ට දන් වළඳනු පිණිස පැන් ඵල වී ය. උන්වහන්සේ 'ජීවකය! විහාරයෙහි තවත් උන්නාන්සේලා ඇත්තාහු නො වෙත් දැ' යි ශ්‍රී හස්තයෙන් පාත්‍රය වැසූහ. ඒ දුටු මහාපන්ථක සථවිර තෙමේ, 'සවාමිනි! එහි උන්නාන්සේ ලා නැතැ' යි කී ය. එවිට බුදුරජානන්

වහන්සේ 'ජීවක! විහාරයෙහි තවත් උන්නාන්සේලා ඇතැ'යි වදාළහ. ජීවක තෙමේ 'එකෙණෙහි විහාරයෙහි භික්ෂූන් ඇති නැති බව දන එව' යි පුරුෂයකු යැවී ය. චූලපන්ථක සථවිර තෙමේ 'මාගේ සහෝදරයා විහාරයෙහි උන්නාසේලා නැතැ යි කියයි, එ හෙයින්, විහාරයෙහි උන්නාන්සේලා ඇති බව මොහුට දන්වමි' යි මුළු අඹ උයන භික්ෂූන්ගෙන් පිරුණක් කොට දුක් වී ය. එහි ඇතැම්හු සිවුරු කපති. ඇතැම්හු මසති. ඇතැම්හු පඬු පොවති. ඇතැම්හු පාත්‍ර සෝදති. ඇතැම්හු හමදිති. ඇතැම්හු කුණු කසළ බැහැර කෙරෙති. ඇතැම්හු හදුරති. ඇතැම්හු දහම් දෙසති. ඇතැම්හු පිඬු සිඟා යන්නට පිළියෙල වෙති. මෙසේ එකිනෙකට නො සම වූ කටයුතුවල යෙදුනු භික්ෂූන් දහසක් මවා පෑවේ ය. විහාරයට ගිය පුරුෂයා විහාරයෙහි බොහෝ භික්ෂූන් ඇති බව දැක, ආපසු හැරී ගොස්, මුළු අඹ උයන භික්ෂූන්ගෙන් පිරී ඇති බව දැන්වී ය. චූලපන්ථක සථවිර තෙමේ එහි හැඩහුරු කමින් තමා වැනි භික්ෂූන් දහසක් මවා, කල් දන්වන තුරු ඒ අඹ උයනෙහි වැඩ හුන්නේ ය. ඒ අතර බුදු රජානන් වහන්සේ විහාරයට වැඩ 'ශාසනා තෙමේ චූල පන්ථකයා කැඳව යි කියව'යි ඒ පුරුෂයාට වදාළ සේක. ඔහු ගොස් එසේ කී ය. එවිට 'මම චූලපන්ථක, මම චූලපන්ථක' යි කියමින් දහස් දෙනෙක් ඉදිරියට ආහ. ඒ පුරුෂයා ගොස් 'සියල්ලන් ම චූලපන්ථක යි කියති'යි දැන් වී ය. 'එසේ නම් දැන් ගොස්, 'යමෙක් මා චූලපන්ථක යි කියා ද, ඔහු අතින් අල්ලා ගන්න, එවිට සෙස්සන් අතුරුදන් වෙති'යි වදාළ සේක. ඔහු එහි ගොස් 'චූලපන්ථක මම' යි කියා ඉදිරියට ආවුන්ගෙන් පළමු කියනලද්දහුගේ අත අල්ලා ගත්තේ ය. එකෙණෙහි එහි වූ සෙස්සෝ අතුරුදන් වූහ. චූලපන්ථක සථවිර තෙමේ අත් ගත් පුරුෂයා සමග එහි වැඩියේ ය. බුදුරජානන් වහන්සේ දන් වළඳ අවසන්හි 'චූලපන්ථකගේ පාත්‍රය ගන්න, ඒ තැන, තට බණ කියනු ඇතැ' යි ජීවකයාහට දැන් වූහ. ඔහු එසේ කෙළේය. සථවිර තෙමේ සිංහනාද කරණ තරුණ සිංහයකු සේ තුන්පිටකය අලලා අනුමොදනා බණ වදාළේ ය. බුදුරජානන් වහන්සේ හුනස්-නෙන් නැගිට භික්ෂුසඞ්ඝයා ත් ගෙණ විහාරයට වැඩ භික්ෂූන් වත් කොට අවසන් කල කල්හි ගඳකිළිය ඉදිරියෙහි සිට භික්ෂුසඞ්ඝයාට අවවාද දී කමටහන් වදාරා භික්ෂූන් පිටත් කොට ගඳකිළියට ඇතුල් ව දකුණුලලයෙන් සිංහසෙය්‍යාවට පැමිණි සේක.

ඒ අතර සවස් වරුවෙහි භික්ෂූන් වහන්සේලා එක් තැන් ව හිඳ 'මහාපන්ථක තෙමේ චූලපන්ථකයාගේ අදහස් නො දත්

බැවින් සිටු මසක් ගෙවා ත් එක් ගාථාවකු ත් උගන්වාලන්ට අපොහොසත් විය, මොක වත් නො දත් මෝඩයෙකැ යි චූල පන්ථකයා පන්සලෙන් ද පිටමං කෙළේ ය. බුදුරජානන් වහන්සේ තමන් ධර්මරාජන් බැවින්, එක වරුවකින් ම ඔහුට පිළිසිඹියාවන් සමග රහත් බව දුන්හ, තෙවළා දහම් ද නො ඉතිරි කොට ඔහු දත්තේ ය, බුදුරදුන්ගේ බලය කොතරම් මහත් ද, කොතරම් පුදුම දැ' යි කතා කරන්නට වූහ. භික්ෂූන් මෙසේ කතා කරණ අතර, ඒ කතාව දත් බුදුරජානන් වහන්සේ 'මා එහි යා යුතුය'යි සිංහසෙය්‍යාවෙන් නැගිට, අඳනය ඇඳ පටිය බැඳ සුගත්මහ සිවුර පොරොවා, සුවඳගඳකිළියෙන් නික්ම, උතුම් මතැතක්හුගේ නොහොත් සිංහරාජයකුගේ විලාසයෙන් අනන්ත වූ බුඩානුභාව යෙන් එතැනට වැඩ, මණ්ඩලමාලමධ්‍යයෙහි මැනැවින් සරසා පිළියෙල කොට තුබූ බුද්ධාසනයෙහි නීලපීතාදී වූ සවණක් රැස් විහිදුවමින් මුහුදු කුස කළඹවමින් යුගඳුරුපවුමුදුනෙහි බබලන ලහිරු සේ වැඩ හුන් සේක. එකෙණෙහි එහි රැස් ව හුන් භික්ෂූන් වහන්සේලා කිසිත් නො බැණ නො කිවිස නො කාරා නිහඬ වූහ. බුදුරජානන් වහන්සේ පිරිස දෙස බලා, 'මේ පිරිස ඉතා හොබනේ ය, එකක්හුගේ ත් නැත අත් හෙල්ලීමෙක්, පා හෙල්ලීමෙක්, කැරීමෙක්, කිවිසීමෙක්, සියල්ලෝ බුදුන් කෙරෙහි ගෞරව ඇත්තෝ ය, බුදුතෙදින් තැති ගත්තෝ ය, මා, ආයුඃ කල්පයක් නමුත් නො බැණ සිටියොත් මොවුහු කතා නො කරන්නෝ ය, කතා උපදවා ලන වත, මා විසින් ම දත යුතු ය, එ හෙයින් මම පළමු කොට කතා කරමි' යි ඉමිහිරි වූ බඹහඬින් 'මහණෙනි! තමුසේලා දැන් මෙහි මා එන්නට පෙරාතු ව කළ කතාව කුමක් ද, අඩාල කළා කි නම් කතාවක් දැ' යි අසා වදාළ සේක. දෙහොත් මුදුනේ තබා, 'තිලෝගුරු හිමියෙනි! අපි චූලපන්ථක ස්ථවිරයන් ගැණ කතා කරමින් හුන්නෙමු' යි කී කල්හි 'මහණෙනි! චූලපන්ථක අඥ වූයේ දැන් මේ අත්බවේ දී පමණක් ම නො වේ, පෙර ත් මොහු අඥයෙක් විය, මොහුට මම උපකාරක වූ යෙම් ද, දැන් පමණක් ම නො වෙමි, පෙර ත් මම මොහුට උපකාර කෙළෙමි, පෙර මම මොහුට ලෞකික ධනයක් ලබා දුනිමි, අද ලොකොත්තරධනයට හිමියකු කෙළෙමි'යි වදාළ සේක. 'තිලෝගුරු හිමියෙනි! අද ඔහුට කළ මේ උපකාරය අපට දැන් හොඳට පැහැදිලි ය, එදා කළ ඒ උපකාරය අපි නො දනිමු, එ හෙයින් එය ද වදාරනු මැනැවැ' යි භික්ෂූන් වහන්සේලා ආරාධනා කළහ.

'මහණෙනි! යට ගිය දවස මොහු එක් අවදියක, බරණැස් නුවර උපන්නේ ය, තරුණවියේදී සිප් උගන්නට තක්සලා වැසි

දිසාපාමොක් ඇදුරන්ගේ ශිල්පශාලාවට බැඳී උගන්නට පටන් ගත්තේ ය, එහි මොහු වැනි ම පන් සියයක් තරුණයෝ එවක එහි උගත්හ, ඒ පන්සිය දෙනා අතුරෙන්, මොහු ඒ ගුරුන්ට ඉතා හකනිමන් ව උපකාර ව සිටියේ ය, ගුරුන් පිළිබඳ දැහැවි එලවීම්, පැන්එලවීම්, කැඳබත් පිළිගැන්වීම්, දැහැත් පිළියෙල කිරීම් ගේදෙරඅතුගෑම්, ඇදඇතිරිලි පිළියෙලකිරීම්, අසුන් පැණවීම්, පඬික්කම්සේදීම්, උණුපැන් ඇල්පැන් පිළියෙලකිරීම්, නෑවීම්, අත්පාමැඩීම් ආදී වූ කුදු මහත් හැම වතාවතක් කෙළේ ද මොහු ය, එහෙත් ප්‍රකෘතියෙන් අඥ විය, කිසිවක් උගන්නට නො හැක්කේ වී ය, ගුරුවරයෝ ද 'මොහු අපට ඉතා හිතවත් ය උපකාර කරන්නේ ය, වත් දක් වන්නේ ය, කීකරු ය' යි මොහුගේ ගුණ සලකා උගන්වන්නට උත්සාහ කළෝ ද, එහි අපොහොසත් වූහ, එහි කලක් වාසය කළ මොහුට එක් ගාථා පදයකුත් උගන්නට බැරි විය, එයින් කළකිරී ගම් බලා යන්නට සිතා දිසාපාමොක් ඇදුරන් වෙත ගොස් ගමනට අවසර ඉල්ලා සිටියේ ය, එවිට ඇදුරු තෙමේ 'මූ මට ඉතා හිතවත් ය, උපකාරක ය, මොහු උගතකු කරන්නට ය මාගේ බලාපොරොත්තුව, උත්සාහය, එහෙත් ඒ කරුණු නො හැක්ක, කෙසේ නමුත්, මා විසින් මොහුට ප්‍රත්‍යුපකාරයෙක් කළ යුතු ම ය, වැඩ වන්නට මන්ත්‍රයක් සාදා දෙමි'යි සිතා කාලයට ගෙණ ගොස්, 'ගැටෙහි, ගැටෙහි, කුමක් හෙයින් ගැටෙහි, මම ද තා දනිමි, දනිමි' යි මන්ත්‍රය සාදා කටපාඩම් කර වී ය, සියක් වරට ත් වඩා කිය වී ය, නැවැත 'කට පාඩම් දැ' යි අසා, 'එසේය' යි කී විට 'අඥයා විසින් මහන්සියෙන් පුහුණු කළ ශිල්පය නො නැසේ ය' යි සිතා, මගවියදම් දී 'යව, මේ මන්ත්‍රය නිසා ජීවත් වෙව, මේ තට ඇති, මන්ත්‍රය අමතක වන්නට නිතර පාඩම් කරව' යි පිටත් කොට හැරියේ ය, මැනියෝ මොහු ගෙදර ආවිට 'මාපුතු සිප් උගෙණ ආයේ වනැ' යි කැම්බීම් පිළියෙල කොට දී සත්කාර කළහ,

මේ කාලයෙහි දිනෙක බරණැස්රජ තෙමේ 'මා අතින් කෙරෙණ වරද ඇත්තේ දැ'යි සිතන්නේ, තම අත එබඳු කිසිත් වරදක් නො දුන, 'තම වරද තමාට නො පෙණේ, එය පෙණෙනුයේ අනුනට ය, ඒ හෙයින් නුවරැ ඇවිද ආ යුතු ය' යි සිතා, අප්‍රසිඛ වෙශයෙන් ඉතා රහසේ නුවරට වැද, 'සවස බත් කා අවසන් කොට, මිනිස්සු නොයෙක් දේ කතා කෙරෙති, ඒ අතර සමහර විට ආණඩුව ද විවේචනය කෙරෙති, යම් ලෙසකින් මා කරණ රාජ්‍ය පාලනය නො දුහැමි නම්, එය ද ඔවුන්ගේ කතාවට අසුවිය හැකි ය, එහිදී මා ඇතුළු රාජ්‍යතිලඛරයන්ට

තළා පෙළා කතා කරණු ඇත, බණිනු දෙඩනු ඇත, මාගේ ආණ්ඩුව දැහැමි නම්, මිනිසුන් සිත් ගෙණ තිබේ නම්, රජයට ඔවුහු දිගාසිරි පතන්නෝ ය' යි සලකා ඒ දන්නට, ඒ ඒ ගෙවල පිළිකණු ගානේ හැසුරුණේ ය, මෙ දා රාත්‍රියෙහි උමංහොරු ගෙවල් දෙකකට, එක උමගකින් ඇතුල් වන්නට සිතා ගෙවල් දෙකක් අතර උමගක් හාරති, රජ තෙමේ ඔවුන් දැක ගෙට මුවා වී සිටියේ ය, හොරු උමගින් ගෙට ඇතුල් ව බඩුමුට්ටු සොයා බලන්නට වූහ, දිසාපාමොක් ඇදුරු වෙතින් මන්ත්‍රය උගත් තරුණයා ද සිටියේ මේ ගෙය තුළ ය, ඔහු එ වේලෙහි නැගිට, ගැටෙහි, ගැටෙහි, කුමක් හෙයින් ගැටෙහි, මම තා දනිමි, දනිමි' යි 'තමන් විසින් උගත් මේ මන්ත්‍රය අමතක වේ ය යන සිතින් පාඩම් කියන්නට වන, හොරු මේ අසා බිය පත් වූහ, 'මුන් අපි දක්නා ලද්දමෝ ය, වැරදුනේය වැඩේ, වහා යමු' යි තමන් ඇඳ තුබු රෙදි පවා අමතක ව එහි දමා, හමු හමු වූ තැනින් පලා ගියහ, රජ තෙමේ ද පැන යන සොරුන් දැක, මන්ත්‍ර පිරිවහණ හඬ ද අසා පෙරළා මාලිගාවට පැමිණියේ ය,

පසු දා උදෑසන නින්දෙන් නැගිට, කැඳ අවුළුපත් වළඳ අවසන් කොට, රජ තෙමේ, රාජසේවයකු ගෙන්වා, 'අසවල් කඩ මණ්ඩියේ හොරුන් විසින් උමං කණන ලද ගෙයක් ඇත, එහි තක්සලානුවරින් සිප් උගෙණ ආ තරුණයෙක් වාසය කරන්නේ ය, ඔහු මෙහි කැඳවා ගෙණ එව' යි නියොග කෙළේ ය, සේවක තෙමේ එහි ගොස් ඔහු රජවාසලට කැඳවා ගෙණ ආයේ ය,

රජ = පුත! තක්සලානුවරු දිසාපාමොක් වෙතින් සිප් උගෙණ ආ තරුණයා නුඹ ද?

තරුණයා = එසේ ය, දෙවයන් වහන්ස!

රජ = එය අපටත්?

තරුණයා = හොඳ යි, දෙවයන් වහන්ස! දිය හැකියි,

රජ = දෙන්නෙහි?

තරුණයා = මා වාඩි ගන්නා අසුනට සමාන අසුනක වාඩි ගත් විට,

රජ තෙමේ සම අසුනක වාඩි වී මන්ත්‍රය උගෙණ, ඔහුට 'ගුරු පඬුරු' යි කහවණු දහසක් දුන්නේ ය,

රජුගේ සෙනාපති තෙමේ, දිනෙක ඇම්බැට්ටයා අතින් 'තෝ රජුගේ රුවුල කපන්නෙහි කවදා දැ' යි ඇසී ය, හෙට හෝ අනිද්දා ඒ පිණිස යන්නෙමි' යි ඔහු කී ය, 'රහසෙක්, මේ කහවණු දහස ගණු, කාහට ත් නො කියනු, මට වැඩෙක් තිබේ, එය

ලොකු ම වැඩෙක්, තා හැර එය අන් කාහට ත් කරණු නො හැකි ය, ලොකු ම රහසෙක්, කලොත් අප දෙන්නාට ම හරි' යි සෙනාපතියා කීවිට 'ඒ කිමැ' යි ඔහු ඇසි ය, සෙනාපති තෙමේ රජු- කාට ත් නො කියනු, තව ත් දෙන්නම්, රජු- කලොත් හරි, රජකම, සෙනාපතිකම නො වරදින්නේ ය, තට රජකම, නැත, තට සෙනාපතිකම, මට රජකම' යි වචන හිලිමින් වචන හැර දම දමා ගොත ගසමින් 'රජුගේ රුවුල කපන්නට ගියා ම, රුවුල කැපීමට සේ, රජුට ලං ව දැලිපිහිය හොඳට මුවහත් කොට, රජුගේ බෙල්ල කපා දමව' යි කීයේ ය, ඔහු එය 'යහපතැ'යි පිළිගත්තේ ය, රුවුල කපන්නට ගොස්, පළමු කොට, රුවුල සුවඳදියෙන් තෙමා දැලිපිහිය මුවහත් කොට නළල අල්වා, 'දැලිපිහිය මොට ය, මුවඅත මදි ය, එකපාරට ම බෙල්ල කපා දමන්නටැ' යි නැවැත පැත්තක හිඳ, පිහිය මුවහත් කෙළේ ය, මේ අතර රජ තෙමේ තමන් උගත් **'සඤ්ඤසි, සඤ්ඤසි, කිං කාරණං සඤ්ඤසි, අහම්පි තං ජානාමි, ජානාමී'** යන මන්ත්‍රය, පාඩම් කියන්නට පටන් ගතු, ඒ කණ වැටුනු ඇම්බැට්ටයාගේ ඇඟපතින් ඛහදිය ගලන්නට වන, ඔහු 'මේ රහස රජ දැන සිටි ය' යි බිය පත් ව කරය බිම දමා පාමුල ඇද වැටුනේ ය,

රජහු ශූරයෝ ය, දක්ෂයෝ ය, අනුන් අදහස් ඉඟියෙන් ගමනින් කතායෙන් හැසිරීමෙන් ඇසින් කටින් මුණින් දත- හෙන්නෝ ය, එහෙයින් රජු 'ඇම්බැට්ටය! රජ තෙමේ මා නො දනී ය යි තෝ නො සිතව' යි කී විට, 'දෙවයන් වහන්ස මට කමන්න, මට දිවි දෙන්න, මා අත වරදෙක් නැතැ' යි ඔහු කී ය, එවිට රජ තෙමේ 'බිය නොව, ඇත්ත කියව, කාරණය කියව' යි කීයේ ය, ඔහු 'දෙවයන් වහන්ස! මෙහිලා මා පෙළඹුයේ සෙනාපතියා ය, ඔහු මට කහවණු දහසක් දී රුවුල කපන්නට සේ, රජුට ලං වී, රජුගේ ගෙල සිඳ දමව, එවිට තට සෙනාපතිපදවිය දෙමි, මම රජවෙමි යි කී ය' යි කීයේ ය, එකල රජ තෙමේ 'මාගේ ගුරුවරයා නිසා දිවි බේරුණේ ය, මාගේ ජීවිතයේ අසිතිකරු මාගේ ඒ ගුරුවරයා ය' යි සිතා, සෙනාපති කැඳවා, 'මගෙන් තට නො ලැබුනේ කුමක් ද, මම තට හැම දෙයක් දුන්නේ නො වෙමි ද, කුමක් නිසා මා කෙරෙහි වැරදි සිතිවිල්ලක් ඉපද වූයෙහි ද, දැන් තා දක්නට මා සිත්හි කැමැත්තෙක් නැත, රටින් පිට වෙව' යි ඔහු රටින් පිටවහල් කොට, ගුරුවරයා කැඳවා, 'ඔබතුමන් නිසා මම අද දිවි ලැබිමි, එ හෙයින් මාගේ ජීවිතය ඔබ අයත් ය, මෙ තැන් සිට මේ මාගේ රටෙහි සෙනාපතිධුරය ඔබවහන්සේට පවරමි, එහි නියම ලෙසින් පවතිනු මැනැවැ' යි ඔහුට සෙනාපති

ධුරය දුන්නේ ය, 'මහණෙනි! ඒ තෙමේ ය මේ චූලපන්ථක, දිසාපාමොක් මම ය' යි බුදුරජානන් වහන්සේ චූලපන්ථක තෙරුන් පිළිබඳ ඒ යටගියාව මෙසේ වදාළ සේක. නැවැත ද 'මහණෙනි! චූලපන්ථක, එදා ත් අඥ විය මෙසේ, එදා මොහුට උපකාර කෙළේ ද මම ය, ලෞකිකධනයෙහි පිහිට වූයේ ද මම ය, අද තමුසේලාට පෙණෙන සේ මේ තැන, ලොකොත්තර ධනයෙහි පිහිටා ගත්තේ ද මා නිසා ය, මාගේ වහළෙන් ය'යි වදාරා නැවැත, චුල්ලසෙට්ඨිජාතකය ද ගෙණහැර දක්වා-

"නුවණැති මිනිස්තෙමෙ-ටික මුදලකින් නමුදු,
මද ගිනි පිඹ මොලවමින්-මහගිනිගොඩක් කරණෙව්,
සුදුසු තැන කාබල-නැණ බල යොදා නිරතුරු,
නොවළහ තමන් ඉසුරෙහි-පිහිටුවාලයි නැත සැක"

යි පැහැදිලි කොට, 'එදා මේ චූලපන්ථක චුල්ලන්තෙවාසික නමින් පෙණී සිටියේ ය, මම ය චුල්ලසෙට්ඨි වූයෙමි' යි චුල්ල සෙට්ඨි ජාතකය ගැළපූ සේක.

නැවැත දිනෙක, භික්ෂූන් එක් තැන් ව, 'චූලපන්ථක එදා සිවු මසක් ගෙවා සිවු පැදිගයක් උගන්නට අපොහොසත් වූ යේ ද, මෙදා ඕනෑකම ත් උනන්දුව ත් එහිලා හැඟීම ත් නො අඩුව තුබූ බැවින් එක වරුවකදී ම රහත්බැව්හි පිහිටියේ තෙවළාදර වී ය, මෙසේ ලොවුතුරා ධනයට ද හිමි වී ය' යි කතා කරන්නට වූ කල්හි, බුදුරජානන් වහන්සේ එහි වැඩම කොට 'මහණෙනි! මාගේ සසුන්හි පටන් ගත් වීර්‍යය ඇති මහණ තෙමේ කල් නො යවා ම ලොකොත්තරධනය අත්පත් කර ගන්නේ ය' යි දක්වා, මේ ධර්මදෙශනාව ද කළ සේක.

උට්ඨානෙන'ප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච,
දීපං කයිරාථ මෙධාවී යං ඔසො නාභිකිරතී'ති.

නැගී සිටීමෙන්, අප්‍රමාදයෙන්, සීලයෙන්, ඉඳුරන් දැමීමෙන් (යන සතර කරුණෙන්) නුවණැති මිනිස් තෙමේ, කාමොඝාදී වූ සිවු වැදැරුම් කෙලෙස් මහවතුර, යම් පිහිටක් නො නසාද; ඒ පිහිට සිදුකර ගන්නේ ය.

උට්ඨානෙන = උත්ථාන වීර්‍යයෙන්[1]

අප්පමාදෙන = අප්‍රමාදයෙන්[2]

සඤ්ඤමෙන = සංයමයෙන්, සීලයෙන්[3]

---

1. ii ii 'උට්ඨානවතො' යන්න බලනු.
2. ii i 'අප්පමාදෙ' ,, ,,
3. ii ii 'සඤ්ඤතස්ස' ,, ,,

දමෙන = ඉඳුරන් දැමීමෙන්. ඉන්ද්‍රියසංවර සීලයෙන්[4]

දීපං = පිහිට. රහත්පලය.

කාමොඝාදීචතුර්විධඔඝයන්ගෙන් යටපත් කරණු බැරි හෙයින් රහත්පලය **'දීප'** යි කියනු ලැබේ **'චතූහි ඔඝෙහි අනජ්ඣොත්ථරණීයතො දීපො'** යනු එහිලා දතයුතු ය. සැඩ පහරකින් ගසා ගෙණ යන මිනිසාට පියවි දිවයින යම් සේ පිහිට වේ ද, එසේ ඉතා ගැඹුරු එ ගොඩ මෙ ගොඩ නො දත හැකි මේ සසර සයුරෙහි වැටී කාමොඝාදී වූ කෙලෙස් මහසැඩ පහරින් ගසා යන්නහුට පිහිට වේ නු යි රහත්පලය දීපයක් වැනි හෙයින් 'දීප' නම් වී. **'යථා පකතිදීපො නදීසොතෙන වුයහමානානං පතිට්ඨො හොති, එවම්දං නිබ්බාණං සංසාරමහොඝෙන වුයහ මානානං පතිට්ඨො හොති දීපො වියාති දීපො'** යනු දතයුතු ය තව ද නිකෙලශින්ට ප්‍රදීපයක් වැනි බව කරණ හෙයින් ප්‍රදීපයක් වැනි නුයි ද දීප නම් රහත් පල ය. **'නිකකිලෙසානං වා පදීප සදිසභාවකරණතො දීපො වියාති දීපො'** යන මෙයින් ඒ කීහ.

මෙධාවී = නුවණැත්තේ.

'මෙධා' නම් නුවණ යි. ඒ ඇත්තේ **'මෙධාවී'** නම්. විදර්ශනා ප්‍රඥා ය, 'මෙධා' නම්. සංස්කාරධර්මයන් කෙරෙහි ඇති අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රය දන්නා නුවණ ය විදර්ශනාප්‍රඥා. මෙය 'ධර්මෝජස් ප්‍රඥා' යි ද කියනු ලැබේ. මෝ ප්‍රඥා තොමෝ කඳුමුදුනට කඩා වැටුනු හෙණ පහර කඳුමුදුන බිඳලන්නා සේ සත්වසන්තානගත වූ සියලු කෙලෙස් හිංසා කරන්නී ය. අවබොධ යට අපහසු වූ සියුම් වූ ධර්මාර්ථයන් වහා ඇද දෙන්නී ය. **'අසනි විය සිලුච්චයෙ කිලෙසෙ මෙධති හිංසති, සුඛුම්මපි අත්ථං ධම්මංච බිප්පමෙව මෙති ආදදාතීති = මෙධා'** යනු එයරුත් විදැහීම ය. විදර්ශනාප්‍රඥාසඞ්ඛ්‍යාත වූ මෙධා ඇතියේ 'මෙධාවී' නම් වේ.

යං = යම් පිහිටක්.

මෙයින් ගන්නේ රහත්පලය යි. ඒ දෙවියන් සහිත ලොකයට එක ම පිහිට.

ය ශබ්දය, යන-යන්නහු-ආයු-කීර්තිශබ්ද-ප්‍රශංසා-ප්‍රත්‍යය-ආගම-කාර්‍ය්‍ය-සර්වනාම-ව්‍යඤ්ජන-ඡන්දස්ගණ යන මෙ තැන්හි වැටේ. **'යනති යායනති ගච්ඡනති එතෙහි රාජරාජමහාමච්චා දයොති = යා'** යනු යානයෙහි, **'යනති යායනති ගච්ඡනති = යා'** යනු යන්නහු කෙරෙහි, **'දීඝො යො ආයු යෙසං තෙ ති = යා'** යනු ආයුෂයෙහි, **'පත්ථමයො'** යනු කීර්තිශබ්දයෙහි, **'යො**

4. i 6 'ඉන්ද්‍රියෙසු සුසංවුතං' යන්න බලනු

සජ්ජනධිමනෙතහි විසෙසඤ්ඤුහි සාධුකං' යනු ප්‍රශංසායෙහි, **'දිවා දිතො යො'** යනු ප්‍රත්‍යයයෙහි, **'නයිමස්ස'** යනු ආගමයෙහි, **'තපස්ස'** යනු කාර්‍ය්‍යයෙහි, **'යො සො'** යනු සර්‍වනාමයෙහි, **'ය ර ල ව ස හ ළ අං'** යනු ව්‍යඤ්ජනයෙහි, **මනා'යො ගො යදි පණවො බ්‍යාතො'** යනු ඡන්දස්ගණයෙහි යන මෙ තැන්හි වැටේ. මෙහි වැටුනේ සර්‍වනාමයෙහි ය.

ඔසො = සැඩ පහර. දිය පාර.

ඔඝ, ශබ්දය, **'සඩාය තරති ඔඝං'** යනාදියෙහි කාමොඝාදියෙහි **'ජනො සො'** යනාදියෙහි සමූහයෙහි, **'ජලොසො'** යනාදියෙහි ජලවෙගයෙහි වැටේ. මෙහි ජලවෙගයෙහි වැටුනේය. එහෙත් මෙහි ගැණෙනුයේ ගඟෙක මූදෙක එන ජලවෙගයෙක් නො වේ. ගැණෙන්නේ සසරසයුරෙහි දිගට ගලා එන කාම-භව-දිඨි-අවිජ්ජා යන මේ සතර යි. මේ සතර, ඔඝ යි කියනු ලබන්නේ ඔඝ වැනි බැවිනි. අවහනන-රාශි, යි අර්ථ දෙකක් ඔඝ යන්නෙහි ඇත්තේ ය. අවහනන නම්, යට බැස් වීම ය. රාශි නම් සමූහ ය. ගඞ්ගා-සමුද්‍රාදියෙහි නැගෙන ඔඝයන්හි ඇති මේ දෙ අරුත ම සංසාර සමුද්‍රයෙහි නැගෙන ඔඝයන්හි ද ඇත්තේ ය. එහෙයින් ඒ ඔඝයන් හා මේ ඔඝයන් හා අරුත් විසින් සමාන ය. ජලාසයෝ, තමන් යටතට පත්, තමන්ට හසු වූ හැම සතුන් උඩු යටි කරමින් ගෙණ ගොස් මහ මුහුදට පමුණු වා එහි වූ මස් කැසුබ් ආදීනට බත් කෙරෙති. එමෙන් මේ කාමොඝයෝ තමන් වසයට පැමිණි හැම සතුන් ම නිරයාදි හෙද වූ දුගතියට පමුණුවති. මතු භවයකට හෝ නිවනට හෝ යන්නට නො දී යට තුන් භවයෙහි, චතුර්විධ යොනියෙහි, පඤ්චවිධ ගතියෙහි, සප්ත විධ විඥානස්ථිතියෙහි, නවවිධ සත්වාවාසයෙහි උපදවාලති. මේ ය මොවුන් කරණ අවහනන ය. කාමොඝයෝ මහත් කෙලෙස් රැසක් වෙති. පස්වැදැරුම් කාම ගුණයන්හි, පැවැති ඡන්දරාගය, අවීචියෙහි පටන් භවාග්‍රය තෙක් පැතිරී සිටියේ ය. මේ ය මොවුන්ගේ රාශි ය. **'ඔත්තරිත්වා සත්තෙ හරණතො ඔහනන තො වා හෙඨා කත්වා හනනතො ඔසීදාපනතො ඔසො වුච්චති ජලප්පවාහො' එතෙ ච සත්තෙ ඔත්තරිත්වා හරනතා වට්ටස්මිං සත්තෙ ඔසීදාපෙත්වා විය හොන්තීති ඔඝසදිසතාය ඔඝා'** යනු ආගම ය. සත්වයන් යට කොට යටභාගයට ගෙණ යන අරුතින්, යට කොට පහරණ අරුතින්, යට බස්වන අරුතින් දිය සැඩ පහර ඔඝ යි කියන්නා සේ මොවුහු ද, සත්වයන් යටපත් කොට යන්නෝ, වෘත්තදුඃඛයෙහි සත්වයන් යට බස්වන්නවුන් මෙන් වෙත් ද, එහෙයින් දියසැඩපහරට බඳු හෙයින් ඔඝ නම් වෙති යනු එහි ඉතා කෙටි සිංහලය යි.

එහි **කාමොඝ** නම්, පංචවිධකාමගුණයන්හි පැවැති ඡන්ද රාගය යි. **'පංචසු කාමගුණෙසු ඡන්දරාගෝ කාමොඝෝ නාම'**

භවොඝ නම්, රූපාරූපභවයන්හි පැවැති ඡන්දරාගය හා ධ්‍යානාඟා ය. **'රූපාරූපභවෙසු ඡන්දරාගෝ ච ඣාන නිඣානඤි ච භවොඝෝ නාම'**

දිට්ඨොඝ නම්, දෙසැට මිසදිටු ය. **'වාසඨි දිට්ඨියෝ දිට්ඨොඝෝ නාම'**

අවිජ්ජොඝ නම්, සිවුසස් දහම් නො දැන්ම ය. **'චතූසු සච්චෙසු අඤ්ඤාණං අවිජ්ජොඝෝ නාම'**

එහි කාමොඝය, අටවැදෑරුම් වූ ලොභසහගතචිත්තෝත්පාද යන්හි, භවොඝය, චතුර්විධදෘෂ්ටිගතවිප්‍රයුක්තලොභසහගතචිත් තෝත්පාදයන්හි, දිට්ඨොඝය, චතුර්විධදෘෂ්ටිගතසම්ප්‍රයුක්තචිත්තෝ ත්පාදයන්හි උපදනේ ය. අවිජ්ජොඝය, සියලු අකුශලචිත්තෝත්පාද යන්හි උපදනේ ය.

න අභිකිරති = නො නසයි.

'නහි සක්කා අරහත්තං ඔඝෙන විකිරිතුං' යනු මෙයට අටුවා ය. රහත්පලය ඔඝයන් විසින් වනසාලන්නට විසුරුවා හරින්නට නො හැකි ම ය, යනු එහි තේරුම ය.

මේ ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහා ජනයාට වැඩ සහිත වූ ය.

චූලපන්ථකවත්ථුව නිමියේ ය.

සැවැත්නුවර නැකත් කෙළියක්.

2 — 4

අප බුදුරජානන් වහන්සේ වැඩ වසන දවස, සැවැත් නුවර නැකත් කෙළියක් වූ ය. එය කළෝ එනුවරු වැසි නුගත් අය ය. ඔවුහු ඒ නැකත් කෙළියෙහි සියලු ඇඟපත ගොම තවරා ගෙණ, නො සැබිබස් බෙණෙමින්, දෙ මං තුන් මං සතර මං හන්දි ගානේ, කඩක් පිළක් ගෙයක් දොරක් නො හැර යමින්, කෙළි දෙළෙන් කල් යවති. එසේ වියරුවැටුනවුන් සේ නො සැබි බස් බෙණෙමින් තැනැ තැනැ ඇවිදින ඔවුනට ලජ්ජාමාත්‍රයකුදු ඇති බවෙක් නො පැණේ. ඒ තරමට ඔවුහු විළිබියරහිත ව හැසිරෙති. ගෙවල මිනිස්සු, උන් කියන ඒ නො සැබිබස් ඉවසනු නො හැක්කෝ, හැකි පමණින් මිලමුදල් දී වහා පිටත් කර හරිති.

මෙ දවස සැවැත්නුවර පස් කෙළක් පමණ ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ වාසය කළහ. ඔවුහු 'බුදුරජානන් වහන්සේ මේ නැකත්කෙළි පවතින කාලය තුළ භික්ෂුසඞ්ඝයා වහන්සේ ත් සමග විහාරයෙහි වැඩ වාසය කරණ සේක්වා' යි දන්වා යවා තුමූ කැඳබත් ආදිය පිළියෙල කොට විහාරයට යවා, කො තැනක ත් නො ගොස් ගෙවල ම විසූහ. නැකත්කෙළිය අවසන් වූ අටවනදිනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකයෝ, එක් ව බුදුපාමොක් මහසඟන නුවර තුළට වැඩමවා ගෙණ, මහදන් දී එකත් පසෙකට වී 'ස්වාමීනි! අපි මේ සත් දවස ගත කළෝ බලවත් සිත් තැවුල්ලෙනි, ඔවුන් කියූ අසභ්‍යවචන මොනරුසියකුට ත් නො ඉවසිය හැකි ය, ඒ තරමට ඒ වචන දරුණු ය, නුවරක තබා ඈත පිටිසර ගමකව ත් එබඳු වචන ඇත ද යනු සැක සහිත ය, අසන්නන්ගේ කන් පැළී යන තරම් ය ඒවා, එහෙත් ඒවා කියන්නන්ට ත් අසන්නන්ට ත් ලජ්ජාවක් නම් නො වූ ය, එහෙයිනි අපි මේ සත් දවස තුළ විහාරයෙහි ම වැඩ වෙසෙත්වා යි දන්වා එව්වමෝ, අපි ත් ගෙන් පිටත කොතැනක ත් නො ගියෙමු' යි කීහ. බුදුරජානන් වහන්සේ ඔවුන්ගේ ඒ කතාව අසා, 'නුවණ නැත්තන්ගේ වැඩ ඔවැනි ය, කිසිවක් නුගත් අයට, කරන්නට කියන්නට බැරි නපුරෙක් නො සැබිබසෙක් නැත්තේ ය, පව්කම් කරණු, නුවණ නැති නිසා ය, නුවණ නැති මිනිහා ඇස් තුබුන ද අන්ධයෙක් ය, ඔහුට, කළ නො කළ යුතු දේ, හොඳ නො හොඳ, යුතු අයුතු කිසිවෙක් නො වැටහෙන්නේ ය, විළි බියෙක් ඔවුනට නො උපදනේ ය, විළිබිය උපදින්නට නම්, ආත්මදමනයට හිත වූ බුඩවචනය උගත යුතු ය, නැත, කොතරම් ශිල්පශාස්ත්‍රඥානයක් ලැබුව ද අශික්ෂිත ය; විළි බිය රහිත ය, දරදඬු ය, තිරිසනුන් වැනි ය, යම් තරම් අපරාධයෙක්

වේ නම්, ඒ හැම වන්නේ බණදහම් නො උගත් එයට අනුව නො හැඩ ගැසුනු මිනිසුන් අතින් ය, බුදු දහම් දැනීම ත්, ශිල්ප ශාස්ත්‍ර දැනීම ත් එකෙක් නො වේ, එය දෙකෙක, මිනිහකු හොඳ වන්නට හික්මෙන්නට, රටට ගැළපෙන්නට බුදුදහම් ම උගත යුතු ය, එසේ නැති මිනිසා සමාජයට ශාපයෙකි, නුවණැත්තෝ වනාහි හරුති ධනයක් රකින්නකු සේ අප්‍රමාදය මොනවට රැක, හැම ගුණදහමක් වඩා අමාමහනිවන් සැප ලබන්නෝය' යි මේ ධර්මදෙශනාව කළ සේක.

පමාදමනුඤ්ජනති බාලා දුම්මෙධිනො ජනා'
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨි ව රක්ඛති.
මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛනති.

මෙලොව පරලොව දෙක්හි වැඩ නො දත් නුවණ නැති මිනිස්සු, ප්‍රමාදයෙහි යෙදෙත්. ධර්මෞජස් ප්‍රඥාවෙන් යුත් මිනිසා, ධන රකින සිටුවරයකු සේ අප්‍රමාදය රකියි.

ප්‍රමාදයෙහි නො යෙදෙවු. තෘෂ්ණාවෙන් බැඳී කාමයෙහි නො ඇලෙවු. නො පමාබවෙහි පිහිටි, ශමථවිදර්ශනාභාවනා කරණ මිනිස් තෙමේ, මහත් වූ නිවන් සුවයට පැමිණේ.

පමදං = ප්‍රමාදය. සිහියෙන් තොර බව[1].

අනුයුඤ්ජනති = යෙදෙත්.

පමාද' යන්න, **යුඤ්ජනති'** යන ක්‍රියාපදය හා එක් ව සිටි **අනු'** යන්නෙහි බලයෙන් 'පමාදං' යි චිතීයාවිභක්තියෙන් සිටියේ ය. තවත් ක්‍රියාපදයෙහි අර්ථය, 'එක්වන් යෙදෙති, නිරතුරු යෙදෙති' යි ද වඩාලා කිය හැකි ය.

බාලා = අඥ වූ. මෙලොව පරලොව නො දන්නා වූ.

ජනා' යන්න බලා සිටියේ ය. විස්තර ඉදිරියෙහි එන්නේ ය. **දුම්මෙධිනො** = නුවණ නැති. ධාරණප්‍රඥාව හා විදර්ශනාප්‍රඥාව නැති[2]

ජනා' යනු බලා සිටියේ ය. සියුම් වූ ධර්මාර්ථයන් වහ වහා ඇද ගන්නා වූ සියලු කෙලෙසුන් තළන පෙළන හිංසා කරණ ප්‍රඥාව යම් කෙනෙකුන්ට නැත්තේ ද ඒ සියල්ලෝ **'දුම්මෙධි'** නම් වෙති.

ජනා = ජනයෝ.

---

1. 2. 1. 'පමාදෙ' යන්න බලනු.
2. 2. 3. 'මෙධාවී' ,, ,,

කුසල් අකුසල් උපද වත්නෝ ය ජනයෝ. **'බාලා – දුම්මෙ-ධිනො'** යන දෙ පදයට විශෙෂ්‍යව සිටියේ ය. එහෙයින් මෙහි වූ **ජනා'** යන්නෙන්, අකුසල් උපදවන්නෝම ය ගත යුතු. **'කුසලා කුසලං ජනෙතී'ති = ජනො'** යනු අරුත් විදැහීම ය.

අප්පමාදං ච = අප්‍රමාදය (ද) නො පමාබව (ද)[3].

ච' යනු, භාෂායෙහි නාම – නිපාත විසින් යෙදේ. එයින් මෙහි යෙදුනේ නිපාත විසිනි. එ ද සමුච්චය – ව්‍යතිරෙක – විකල්ප – අවධාරණ – වාක්‍යාරම්භ – ආකර්ෂ – පදපූරණයෙහි වැටේ. මෙන්න කොෂකාරයන් එය කී සැටි:–

'සමුච්චයෙ බ්‍යතිරෙකෙ විකප්පත්ථාවධාරණෙ,
වාක්‍යාරම්භානුකඞ්ඝනෙ පදපූරෙ ච දිස්සති' යි.

'මිත්තාමච්චා ච භත්තා ච පුත්තදාරා ච බන්ධවො' යනාදියෙහි සමුච්චයෙහි, **'යො ච බුධං ච ධම්මං ච'** යනාදියෙහි ව්‍යතිරෙකයෙහි, **'ආරොහිම්හි ච'** යනාදියෙහි විකල්පයෙහි, **'සණෙවා ච'** යනාදියෙහි අවධාරණයෙහි, **'පඨමසඞ්ගීති නාමචෙසා'** යනාදියෙහි වාක්‍යාරම්භයෙහි, **'පුබ්බො ච'** යනාදියෙහි අනුකර්ෂයෙහි, **'යථා ච වණ්ණෙ බුධස්ස පාදපඞ්කෙරුහම්පි ච'** යනාදියෙහි පදපූරණයෙහි වැටේ. තව ද මේ චකාරය සමාහාරාදිඅර්ථයන්හි ද හෙන්නේ ය.

මෙධාවී = නුවණැත්තේ.

ධනං = ධනය.

රන් – රිදී – මුතු – මැණික් – වෙරළු – විදුරු – පබලු යන ධන සත කුලවංශාගතවශයෙන් මෙහි අදහස් කරණ ලද්දේ ය. එහි ම ලා වජිර – මහානීල – ඉන්ද්‍රනීල – මරකත – වෙළුරිය – පදුම රාග – ඵුස්ස රාග – කක්කෙතන – පුලොක = විමල – ලොහිතංක – එළික – පවාළ – ජෝතිරඞ්ග – ගොමුත්තක – ගොමෙද – සොගන්ධික – මුත්තා – සංඛ – අඤ්ජනමූල – රාජවට්ට – අමතංසක – පියක – බ්‍රහ්මය යි මැණික් සූ විස්සෙක් ගණු ලැබේ.

සෙඨී ඉව = සිටුවරයකු සේ.

අද මෙන් එදා ත් ධන රකින්නන් අතර, ප්‍රධාන වූවෝ, ධන යෙන් ආඪ්‍ය වූවෝ, මහාධන මහාභොග ඇත්තෝ සිටුවරයෝ වූහ. මිනිසුනට, ධනවතුන් සේ, ධන රකින්නන් සේ, පෙණි ගියෝ ද සිටුවරයෝ ය. එහෙයින් බුදුරජානන් වහන්සේ ඒ මහාජනමත යෙහි පිහිටා සිට 'නුවණැත්තේ අප්‍රමාදය රකින්නේ, සිටුවරයා ධනය රකින්නා සේ ය' යි වදාළ සේක.

---

3. 2. 1. 'අප්පමාදෙ' යන්න බලනු

සෙට්ඨී ච' යන්න කලක සිට ම **'සෙට්ඨං ච'** යි අප පොතපතෙහි ආයේ ය. බුරුමයෙහි කළ සවන ධම්මසඞ්ගායනාව සඳහා ග්‍රන්ථ ශෝධනයෙහි යෙදුනු ලඞ්කාඋත්තරිතරවිහාරයකසඞ්ඝසභාව ද භාෂානන්තර ඝටිතධම්මපද හා සසඳ බලා **'සෙට්ඨී ච'** යනු ම ශුද්ධ පාඨය සේ පිළිගත්තා ය. **'ධනං'** යන්නට **'සෙට්ඨං'** යි විශෙෂණ යෙක් අමුතුවෙන් යෙදිය යුතු නො වේ. මනුෂ්‍යසමාජයෙහි ඇත්තන් ධන, යන්නෙහි ලා ගැණෙන හැමෙකක් ශ්‍රෙෂ්ඨ යි ගන්නා බැවිනි.

රක්ඛති = රකියි.

සාමාජිකයෝ 'ධනය නිසා අපි කාමසම්පත්තියට පැමිණෙන්-නෙමු, අඹු දරුවන් රකින්නෙමු, පරලෝ මග සලසා ගන්නෙමු' යි ධනයෙහි අනුසස් දක්නෝ, ධනයෙහි අනුසස් දක්නා සිටුවරුන් සේ, ධනය මොනවට රකින්නෝ ය. එමෙන් නුවණැත්තේ 'ප්‍රථමද්විතීයධ්‍යානාදිය ලබන්නෙමි, මග පල ලබන්නෙමි, ත්‍රිවිද්‍ය-ෂඩභිඥවන් ලබන්නෙමි' යි අප්‍රමාදයෙහි අනුසස් දක්නේ, අප්‍රමාදය මොනවට රකියි.

මා පමාදං අනුයුඤ්ජථ = ප්‍රමාදයෙහි නො යෙදෙවු,

මා' යනු නාම-නිපාත විසින් භාෂායෙහි ආයේ ය. **'පුණ්ණමා-පුණ්ණමී'** යනාදි තන්හි චන්ද්‍රමාස වාචක වේ. **'මාලිනී-මඤ්ඤතු'** යනාදි තන්හි ශ්‍රීවාචක ය. **'මාතලී-මාඝෝ'** යනාදි තන්හි මාතෘ-වාචක ය. **'මාලා'** යනාදි තන්හි භාඞ්ගවාචක ය. **'අපුමෙ-මාඛවෝ'** යනාදි තන්හි මහෙශ්වරභාග්‍යවාචක ය. **'මා ගමී-මා වචි-මා ගච්ඡාහි-මා මං ආයස්මතෙනා කං වි අවචුත්ථ'** යනාදි තන්හි යෙදුනේ ප්‍රතිෂෙධාර්ථවාචක ය. ඒ ය නිපාත.

මා කාමරතිසන්ථවං = තෘෂ්ණාවශයෙන් කාමයෙහි ඇල්ම නො කරවු.

වස්තුකාම – ක්ලෙශකාම විසින් කාමය දෙ වැදෑරම් ය. එහි ලොව ඇත්තා වූ හැම රජනීයවස්තුහු, වස්තුකාමයෝ ය. මනවඩන රූප මනවඩන ශබ්ද මනවඩන ගන්ධ මනවඩන රස මනවඩන ස්ප්‍රෂ්ටව්‍ය අත්ථරණ පාපුරණ දාසි දාස අජ එළුක කුක්කුට සූකර හත්ති ගව අස්ස වළවා ඛෙත්ත වත්තු හිරණ්ඤ සුවණ්ණ ගාම නිගම රාජධානි රඨ ජනපද කොස කොට්ඨාගාර යනාදී වූ මිනිසුන්ගේ සිත් ඇලෙන බැඳෙන වැඹෙන තැන් ය රජනීය වස්තු, මේ ඒ වදුලෝ:-

'මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනා-පිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා අත්ථරණපාපුරණා දාසිදාසා

අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්ස වළවා ඛෙත්තං වත්ථු හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියෝ රට්ඨං ච ජනපදෙ ච කොසෝ ච කොට්ඨාගාරං ච යං කිඤ්චි රජනීයං වත්ථුකාමා' ති.

එහි කාමයෝ, අතීතකාම, අනාගතකාම, පච්චුප්පන්නකාම, අජ්ඣත්තකාම, බහිද්ධාකාම, අජ්ඣත්තබහිද්ධාකාම, හීනකාම, මජ්ඣිමකාම, පණීතකාම, ආපායිකකාම, දිබ්බකාම, පච්චුපන්නිතකාම, නිම්මිතකාම, පරනිම්මිතකාම, අනිම්මිතකාම, පරිගණ්හිතකාම, අපරිගණ්හිතකාම, මමායිතකාම, අමමායිතකාම යි නොයෙක් ලෙසින් බෙදී ගියහ.

එහි අතීතකාම නම්, පිළිසිඳ ගත් තැන් පටන් අතීත භවයන්හි, කප් කෙළ සිය දහසකින් මත්තෙහි උපන් කාමයෝ ය.

අනාගතකාම නම්, චුතිය පටන් අනාගතභවයන්හි කප් කෙළ දහසක් ගිය තැන උපදනා කාමයෝ ය.

පච්චුප්පන්නකාම නම්, චුතිපටිසි දෙක අතර පවත්නා කාමයෝ ය.

අජ්ඣත්තකාම නම්, තමන් අධිකාර කොට පැවති, සිය සතන්හි පැවැති පාටිපුග්ගලික කාමයෝ ය.

බහිද්ධාකාම නම්, ඉන්ද්‍රියබද්ධ වූ හෝ ඉන්ද්‍රියබද්ධ නොවූ හෝ එයින් පිටත්හි වූ කාමයෝ ය.

අජ්ඣත්තබහිද්ධාකාම නම්, අජ්ඣත්තකාම - බහිද්ධාකාම යන දෙපසෙහි වූ කාමයෝ ය.

හීනකාම නම්, නෙරයිකසත්වයන්ගේ කාමයෝ ය. නෙරයික සත්වයන්ගේ කාමයෝ කෙළවරට පැමිණි හීනකාමයෝ ය.

මජ්ඣිමකාම නම්, නාගසුපණ්ණියන්ගේ කාම හැර සෙසු තිරිසන්ගතයන්ගේ කාමයෝ ය.

පණීතකාම නම්, නාගසුපණ්ණියන්ගේ කාමයෝ ය. මේ ලෙසින් ඒ ඒ සත්වයන්ගේ වශයෙන් කාමයන්ගේ හීන මධ්‍යම ප්‍රණීතභාවය දත යුතු ය. අකනිට්ඨකදෙවියන්ගේ කාමයෝය කෙළ පැමිණි ප්‍රණීත කාමයෝ.

ආපායිකකාම නම්, සිවු අපායයෙහි උපන් කාමයෝය.

මානුසිකකාම නම්, මිනිසුන් අතර වූ කාමයෝය.

දිබ්බකාම නම්, දෙවියන් අතර වූ කාමයෝය.

පච්චුපඨිතකාම නම්, නෙරයිකසත්වයන් හැර, සෙසු තුන් අපාය-යෙහි වූ සත්වයන් හා මනුෂ්‍යයන් පිළිබඳ වූ ත් චාතුම්මහාරාජික දෙවියන් පටන් තුසිත දෙවියන් පිළිබඳ වූත් කාමයෝ ය.

නිම්මිතකාම නම්, නිම්මාණරතීදෙවියන්ගේ කාමයෝ ය.

පරනිම්මිතකාම නම්, පරනිර්මිතවශවර්තීදෙවියන්ගේ කාම-යෝ ය.

පරිගගහිතකාම නම්, මෙය මාගේ ය යි ගත් කාමයෝ ය.

අපරිගගහිතකාම නම්, එසේ නො ගත් උතුරුකුරු දිවයින් වැස්සන්ගේ කාමයෝ ය.

මමායිතකාම නම්, තෘෂ්ණාවශයෙන් මෙය මාගේ ය යි ගත් කාමයෝ ය.

අමමායිතකාම නම්, එසේ තෘෂ්ණාවශයෙන් නො ගත් කාම-යෝ ය.

මේ සියල්ල ඉතා සැකෙවින් පිඩු කොට ගෙණ කිය යුත්තේ කාමලොකයන්හි වූ සියලු ධර්ම, රූපාවචරබ්‍රහ්මලොකයන් වූ සියලු ධර්ම, අරූපාවචරලොකයන්හි වූ සියලු ධර්ම, ප්‍රතිෂ්ඨාර්ථයෙන් කාරණාර්ථයෙන් තෘෂ්ණාවට වස්තු වූ බැවින්, තෘෂ්ණාප්‍රවෘත්ති වශයෙන් තෘෂ්ණාවට අරමුණු වූ බැවින්, බලාපොරොත්තු විය යුතුය යන අරුත් විසින්, ඇලිය යුතුය, යන අරුත් විසින් කුලමදාදිමද ඉපද විය යුතුය, යන අරුත් විසින් කාම නම් වන බව ය. ත්‍රෛභූමික වෘත්තය, වස්තුකාමැ යි කොටින් දතයුතු වේ. මේ වදාළ සැටි:-

'අතීතා කාමා අනාගතා කාමා පච්චුප්පන්නා කාමා අජ්ඣත්තා කාමා බහිධා කාමා අජ්ඣත්තබහිධා කාමා හීනා කාමා මජ්ඣිමා කාමා පණ්තා කාමා ආපායිකා කාමා මානුසිකා කාමා දිබ්බා කාමා පච්චුපඨිතා කාමා නිම්මිතා කාමා පරනිම්මිතා කාමා අනිමිත්තා කාමා පරිගගහිතා කාමා අපරිගගහිතා කාමා මමායිතා කාමා අමමායිතා කාමා සබ්බෙපි කාමාවචරා ධම්මා සබ්බෙපි රූපාවචරා ධම්මා සබ්බෙපි අරූපාවචරා ධම්මා තණ්හාවත්ථුකා තණ්හාරම්මණා කමනීයට්ඨෙන රජනීයට්ඨෙන මදනීයට්ඨෙන කාමා, ඉමෙ වුච්චන්ති වත්ථුකාමා' යි.

මෙහි දැක් වූ කාමවස්තුන් විෂයයෙහි යම් ඇලීමෙක්, කැමැත්තෙක්, තද ඇලීමෙක්, බැඳීමෙක්, පිපාසාවක්, ප්‍රීතියක්, දැවීමෙක්, මූර්ඡාවක්, බැසගැණීමෙක්, කිඳා බැසීමෙක්, යෙදීමෙක්, දැඩිව ගැණීමෙක්, ඇවිරීමෙක් වේ ද, එය ක්ලේශකාමැ යි දතයුතු ය. මේ මෙහි කෙටි දෙසුම:-

'කතමෙ කිලෙසකාමා, ඡන්දො කාමො රාගො කාමො ඡන්දරාගො කාමො සඞ්කප්පො කාමො රාගො කාමො සඞ්කප්පරාගො කාමො, යො කාමෙසු කාමච්ඡන්දො කාම-රාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමූපාදානං කාමච්ඡන්දනීවරණං' යි

කෙලෙසකාමය විසින් පැතිය යුත්තේ ය, කැමැතිවනු ලබන්නේ ය යන අරුත් විසින් වස්තුකාමය 'කාම' නම්. **'වත්ථුකාමො කිලෙසකාමෙන පත්ථිතබ්බා ති කාමීයතීති=කාමො'** යනු අටුවා ය. කෙලෙසකාම ය, වස්තුකාමයන් පැතීමට ඇල්ලීමට කරුණු වන බැවින් 'කාම' නම්. මෙන්න එහි අටුවාව:- **'කිලෙස කාමො වත්ථුකාමානං පච්චාසිංසනස්ස කාරණභාවෙන කාමීයතෙ අනෙනාති = කාමො'** යනු.

එහි වස්තුකාමය රූපාදිසඤ්ඤයන්හි ඇතුළත් වේ. කෙලෙස-කාමය ඇතුළත් වනුයේ, සංඝකාරසඤ්ඤයෙහි ය. වස්තුකාමය සවැදෑරුම් විඤ්ඤනයන් විසින් දතයුතු ය. කෙලෙසකාමය මනෝ-විඤ්ඤනයෙන් දතයුතුය.

මෙහි මෙසේ ඉතා කොටින් කියූ වස්තුකාම-කෙලෙසකාමයන් කෙරෙහි තෘෂ්ණා විසින් ඇල්ම **'කාමරතිසත්ත්ව'** නම්. තෘෂ්ණා සත්ත්ව-මිත්‍රසත්ත්ව යි සත්ත්වය දෙවැදෑරුම් ය. මෙහිලා තෘෂ්ණා සත්ත්වය ගැණේ. තද ඇල්ම තද එක්වීම සත්ත්ව නම්. **'සත්තවොති සංසග්ගහා'** යන මෙයින් ඒ කියයි. නො කියැකි කලක සිට කාම වස්තූන්හි තෘෂ්ණාවශයෙන් දිගට පැවැත ආ පුරුද්ද ද සත්ත්ව යන්නෙන් කියැකි ය. **'සත්තවනං = සත්තභවා'** යනු අරුත් දැක්වීම ය.

අප්පමත්තෙනා හි=අප්‍රමත්තතෙමේ වනාහි. නො පමාවූයේ වනාහි.[1]

හි' යනු නිපාත යි. නාමයක් සේ ද පෙළඅටුවාවන්හි ආයේ ය. කාරණ – විශෙෂාවධාරණ – පදපූරණාදියෙහි ය, නිපාත වනුයේ. **'වුත්තං හෙතං භගවතා'** යනාදිතන්හි කාරණයෙහි, **'ජිනවචනයුත්තතං හි'** යනාදිතන්හි අවධාරණයෙහි, **'කතීහි-පිත්‍යායං, තස්මාකි'** යනාදිතන්හි පදපූරණයෙහි ආයේ ය. මෙහිද පදපූරණයෙහි වේ. කොෂග්‍රන්‍ථ මෙහි විස්තර කියන්නේ ය.

ඣායතෙනා = ධ්‍යාන කරන්නේ[2]

---

1. 2. i. 'අප්පමත්ත' යන්න බලනු
2. 2. i. 'ඣායිතබ්බා ,, ,,

පප්පොති විපුලං සුඛං = මහත් සැපයට පැමිණේ.

පප්පොති' යනු ක්‍රියාපද යි. **සුඛං'** යනු එහි කර්ම යි. **විපුලං'** යනු විශෙෂණ යි. එයින් කීයේ මෙහි කියන සුඛය සාමාන්‍ය එකක් නො ව, ලොවැති හැම සුඛයක් ම යට කොට සිටි සුඛයයි. සුඛය දෙපරිදි ය. වෙදයිත – ශාන්ති යි. එහි රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය යන කාමවස්තූන් පිළිබඳ රස විඳගැණුම **'වෙදයිත සුඛ'** නම්. මේ සුඛය, ක්ෂණයක් පාසා පෙරළෙන්නක් බැවින්, දුඃඛසත්‍යයෙහි ඇතුළත් වේ. ඒ ඒ සත්වයන්ගේ වශයෙන්, ඒ ඒ සත්වයන් විඳින සැටියෙන් නන් වැදැරුම් වේ. මේ වනාහි හැම සත්වයන් විසින් විඳිනු ලබන්නේ නම් අපායයෙහි වැසි සත්වයන් විසින් ද විඳිය යුතුය. සියලු ආපායිකසත්වයෝ, එක් ලෙසින් දුක් නො විඳිති. ඔවුහු ද දුක් විඳින්නෝ අකුශලකර්මයන්ගේ වශයෙනි. බලගතු අකුශලකර්ම කොට ආපායයෙහි උපන්නෝ, බලගතු දුක් විඳිති. එසේ නො උපන්නෝ, එසේ නො වෙති. කරුණු මෙසේ බැවින්, හැම සත්වයකු විඳින දුක් ද, සැප ද කර්මානුකූලව වෙනස් වේ. වෙදයිතසුඛය නන් වැදැරුම් වන්නේ මේ නිසාය.

පංචස්කන්ධයාගේ නිරෝධයෙන් ලැබිය යුතු වූ සංසිඳීම **'ශාන්ති සුඛ'** නම්. රූප – වෙදනාදිස්කන්ධයන්ගේ පැවැත්ම යම්තාක් කල් වේ ද, ඒතාක් සත්වයනට දුකින් නිදහසෙක් නැත. එහෙයින් මුළුමනින් සංසිඳෙන්නට පංචස්කන්ධය බහා තැබිය යුතු ය. මේ සංසිඳීම නිවනැ යි ද හඳුන්වනු ලැබේ. **විපුලං සුඛං'** යන මෙයින් වදාළෝ ශාන්තිසුඛ නම් වූ නිවන ය. මේ සුඛය, හැම සුඛයනට වඩා උත්තරීතර ය. හැම සුඛයක් ඔබා සිටියේ ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. ධර්මදෙශනා තොමෝ මහාජනයාට වැඩ සහිත වූ ය.

බාලනක්ෂත්‍රවස්තුව නිමියේ ය.

---

1. 1. 14. 'ධම්මස්ස' යන්න බලනු.

මහාකාශ්‍යප මහාස්ථවිරයන් වහන්සේ සත්වයන්ගේ චුතිය හා උත්පත්තිය බැලීම

2 — 5

මහාකාශ්‍යප මහාස්ථවිරයන් වහන්සේ, පිපළිගුහායෙහි වැඩ වසන දවසෙක රජගහනුවර පිඬු සිඟා ගොස්, පිණ්ඩපාතයෙන් හැරී අවුත්, දිය-ගොඩ-කඳු-හෙල් ආ තන්හි මැරී උපදින්නාවූ ප්‍රමත්ත අප්‍රමත්ත සත්වයන් ගැණ දිවැස ඔමා ආලෝකය පතුරුවා බලන්නට වූහ. දෙවරම්මහවෙරැ වැඩහුන් බුදුරජාණන් වහන්සේ, 'මා පුත් කසුප් දැන් මේ වේලෙහි කොයිලෙසකින් වාසය කෙරේදැ' යි දිවැසින් බලා වදාළ සේක. එවිට උන්වහන්සේට මහසුප් තෙරුන් සත්වයන්ගේ චුති-උත්පත්ති දෙක බලමින් ඉන්නා බව පෙණී යියේය. සත්වයන්ගේ චුති-උත්පත්ති දෙක බුඩඟුනයෙනුදු නොපිරිසිදින ලද්දේ ය, මවුකුසැ පිළිසිඳ ගෙණ මවුපියන් නොදන්වා මැරී යන සත්වයන්ගේ ගණනෙක් නැත, කසුප්! තමුසේට එය විෂය නොවන්නේ ය, තමුසේට ඒ අතේ දැනීම මද ය, මැරී යන්නන් හා ඉපැදෙන්නන් දැකීම බුදුවරුන්ට ම විෂය වූවක් ය' යි බුදුරජාණන් වහන්සේ ආලෝකය පතුරුවා ඉදිරිපිට සිටියකු සේ මේ ධම්දෙශනාව කළ සේක.

පමාදං අප්පමාදෙන යදා නුදති පණ්ඩිතො,
පඤ්ඤාපාසාදමාරුයහ අසොකො සොකිනිම්පජං,
පබ්බතට්ඨො, ව භූමට්ඨෙ ධීරො බාලෙ අවෙක්ඛති'නි.

නුවණැති පුරිස් තෙමේ යම් දවසෙක අප්‍රමාදයෙන් ප්‍රමාදය දුරු කෙරේ ද, එදවස ඔහු ප්‍රඥා නැමැති ප්‍රාසාදයට නැඟී, සොකරහිතව සොක කරණ සුලු සත්වයන් දකියි. නුවණැති පුරිස් තෙමේ බිම සිටින්නන් දක්නා කඳු මුදුනක සිටියකු සේ අඥජනයන් දකියි.

පමාදං – ප්‍රමාදය.[1]

අප්පමාදෙන – අප්‍රමාදයෙන්.[2]

යදා – යම් කලෙක.

නුදති – දුරු කෙරේ (ද).

පණ්ඩිතො – පණ්ඩිත තෙමේ. නුවණැත්තේ.[3]

---

1. 3. 1 'පමාදෙ' යන්න බලනු.
2. 2. 1. 'අප්පමාදේ' ,, ,,
3. 3. 1. 'පණ්ඩිතා' ,, ,,

'යතෝ ඛෝ ආනන්ද! භික්ඛු ධාතුකුසලෝ ච හොති ආයතනකුසලෝ ච පටිච්චසමුප්පාදකුසලෝ ච ඨානාඨානකුසලෝ ච එත්තාවතා ඛෝ ආනන්ද! පණ්ඩිතෝ භික්ඛූ'ති අලං වචනාය' යනු වදාළෝ ද, භික්ෂුවගේ පණ්ඩිතකම කිමැ යි පැහැදිලි කරණු සඳහා ය. ධාතුකුසල, ආයතනකුසල, පටිච්ච සමුප්පාදකුසල, ඨානාඨානකුසල යන සිවු වැදෑරුම් පාණ්ඩිත්‍ය යෙන් යුක්ත වූයේ පණ්ඩිත නම් වේ යනු, එහි කෙවි තේරුම ය. සිවු වැදෑරුම් ධර්ම පිළිබඳ දක්ෂභාවයෙහි පිහිටියේ පණ්ඩිත නමින් හඳුන්වනු ලැබේ යනු ද කියේ, මෙහි කී ධර්මසතරෙහි දක්ෂ භාවය ම පාණ්ඩිත්‍යය යි ගැණීමෙනි. **'චතූසු සොසල්ලෙසු ඨිතසෙසතං නාමං'** යනු එහි පාළිය ය.

පඤ්ඤාපාසාදං – ප්‍රඥා නැමැති ප්‍රාසාදයට.

පඤ්ඤාපාසාදං' යනු සමාසපදයෙකි. අත්‍යුදාහරණාර්ථයෙන් ප්‍රඥාව ම ප්‍රඥාප්‍රාසාද නමි. මෙහි උපමානය වූ ප්‍රාසාදයාගේ අත්‍යුදාහරණාර්ථය, උපමෙය වූ ප්‍රඥාව කෙරෙහි ආරොපිත කොට ඒ උභයවස්තූන් අතරෙහි භෙදයක් නො මැති සේ ගන්නා ලද්දේ ය. එහෙයින් මෙය රූපකැ'යි ආලඞ්කාරිකයෝ කියති. මේ එය කියූ සැටි:-

"තද්රූපකමභෙදෙය උපමානොපමෙයයොඃ" යි.

පඤ්ඤා, සංඛාරස්කන්ධයෙහි ගැණෙන සංඛාරයෙකි. සිතුවිල්ලෙකි. මෝ මුළුමනින් සහපත් ය. කිසිවිටෙකත් අයහ පතට නපුරට වැටෙන සිතුවිල්ලෙක් නො වේ. **'පකාරෙන ජානාති'ති පඤ්ඤා, පඤ්ඤාපනෙන = පඤ්ඤා, පජානාති එතායා'ති පඤ්ඤා, පජානනං-පඤ්ඤා'** යනු විවරණ කරුවන්ගේ විවරණයෝ ය. ප්‍රකෂීයෙන් දනී නුයි පඤ්ඤා; යථාසභාවය දන්වන බැවින් පඤ්ඤා; මෙයින් යථාසභාවය ප්‍රකෂීයෙන් දනී නු යි පඤ්ඤා; ප්‍රකෂීයෙන් දැනීම පඤ්ඤා, යි මූලින් කියූ විවරණ වාක්‍යයන්ට කෙටියෙන් සිංහලයෙන් අරුත්කීම ය. මේ හැම විවරණයෙක භාවය එකෙක් ම ය.

පඤ්ඤා යන්නෙන් කියන ප්‍රකෂීජානනය නම්, අන් කිසි තැනෙක දැනීමෙක් නොව, රූප- වෙදනා- සංඥා- සංඛාර- විඥාන යන සඛන්ධ පස බෙදිය හැකි හැම අතකට බෙදා, කැඩිය හැකි හැම අතකට කඩා, බැලිය යුතු හැම අතකින් බලා, ඒ හැම බෙදුමක් ම, කැඩුමක් ම, බැලුමක් ම, ලකඛණ රස- පච්චු පඨාන- පදඨානාදීන්ගේ වශයෙන්, බලා, එහි නියම තතු නියම අරුත් දැනීම ය.

දැනීම දෙන, දැනීම කරණ, තවත් ශක්තිමාත්‍රදෙකක් පොත පතෙහි දක්වා ඇත්තේ ය. ඒ නම්, සංඥා-විඥාන දෙක ය. එ දෙක ම දෙන්නේ ඉතා සුලු දැනීමක් ය. නො පැතුරුණු දැනීමක් ය. නො ගැඹුරු දැනීමක් ය. මෙ දෙකට, සකඬයන්ගේ ඇති තතු දන්නට මොන ලෙසකිනු ත් නො හැකි ය. එහි සංඥාව, ඒ ඒ වස්තූන්, යම්තමකින් හඳුනා ගන්නී ය. විඥානය ඒ ඒ වස්තූන් විෂයයෙහි එයට වඩා, යම්තමක් වැඩි වූ දැනුමක් ලබා දීමෙහි පොහොසත් වන්නේ ය. ප්‍රඥාව, එසේ නො වේ එය හැම එකෙකම ඇති තතු, නියම තතු දන්නී.

ලක්ෂණ විසින්, ඒ ඒ ධර්මයන්හි, වස්තූන්හි, පදාර්ථයන්හි නියම තතු දැනීම ය මෙහි ලක්ෂණ. කෘත්‍යය විසින්, ඒ ඒ ධර්ම වස්තු පදාර්ථ වසා සිටි මොහඳුර නැසීම ය, මෙහි කෘත්‍යය. කිසි තැනෙක නො මුලාවීම ය, මෙහි ප්‍රත්‍යුපස්ථාන ය. එකඟ කමය, මෙයට ලංව සිටියේ. චිත්ත-චෛතසිකධර්ම ආලොකවත් කිරීම හා ඒ ඒ වස්තූන්හි නො පැකිළ පවත්නා දැනීම ද මෙහි තවත් ලක්ෂණයෙකි. අරමුණු එලිය කිරීම ත් මෙහි කෘත්‍යයක් කොට ගත හැක්ක.

ප්‍රඥාවගේ ප්‍රභෙද බොහෝ ය. ඒ කියන්නට මොනලෙසකින් වත් අපට පිළිවන් කමෙක් නැත්තේ ය. පොතපතිත් දැන ගත් පමණ ද, සාමාන්‍යයන්ගේ දැනීම සඳහා කියන්නට ද මෙහි ඉඩ නැත. එහෙයින් එන්නේ මෙහි ඉතා ටිකෙක් ම ය.

ලෞකික – ලොකොත්තර විසින්, ප්‍රඥාව දෙ පරිදි ය. එහි, මහද්ගතලොකොත්තරඅර්පණාසමාපත්තිවීථින්හි පරිත්ත හෝ පෘථග්ජනගොත්‍ර මැඩ, නැත, මහද්ගතආර්‍යගොත්‍ර වඩමින් නැගෙන ගොත්‍රභූචිත්තය අවසාන කොට, කාමාවචරාදිලෞකික චිත්තයන් හා එක් ව යෙදුනු ප්‍රඥාව ලෞකිකැ යි ගැණේ. **'තීසු භූමිසු කුසලව්‍යාකතා පඤ්ඤා ලොකියා පඤ්ඤා'** යි බුදු රජානන් වහන්සේ එහිලා වදාළ සේක.

අටවැදැරුම් මගපල සිත් හා යෙදුනු ප්‍රඥාව ලොකොත්තර ප්‍රඥා නම්. මෙන්න බුඩ වචනය:- **'චතුසු මග්ගෙසු චතුසු ඵලෙසු පඤ්ඤා ලොකුත්තරා පඤ්ඤා'** යනු.

මෙහි ගාථාවෙහි එන 'පඤ්ඤාපාසාදං, යන්නෙන් බුදුරජානන් වහන්සේ දක්වා වදාළෝ, නානාභෙදගතප්‍රඥාවන් අතුරෙහි දිබ්බ චක්ඛුඤ්ඤාණය ය. මේ උන්වහන්සේ එය විස්තර කළ සැටි:-

'ඉධ තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුඛෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ හීනෙ

පණ්ඩිතෙ සුවණ්ණ දුබ්බණ්ණ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති, ඉමෙ, වත භොන්තෙ සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡා දිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තෙ සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්ම සමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති ඉති දිබ්බෙන චක්ඛුනා විසුබ්බෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති'ති යා තස්ස පඤ්ඤා පජානනා -පෙ- අමොහො සම්මාදිට්ඨි, ඉදං තථාගතස්ස සත්තානං චුතූපපාතං යථාභූතං ඤාණං' යි.

'ලොවැසි මිනිස්සු (ප්‍රධානවශයින්) කායාදීන්‍රිවිධදුශ්චරිතයෙන් යුක්ත වෙති, බුඩප්‍රත්‍යෙකබුඩාදී ආර්‍යයනට ඇණුම් බැණුම් ගැරහුම් ආදිය කරන්නෝ ය, මිසදිටු ගන්නෝ ය, මිසදිටුකම් සමාදන් ව ගන්නෝය, එහෙයින්, ඔවුහු මරණින් මතු දුගතියෙහි උපදිති, ඇතැම් කොනෙක් කායාදිත්‍රිවිධ සුචරිතයෙන් යුක්ත වෙති, ආර්‍යයනට උපවාද නො කරන්නෝ ය, සම්දිටු ගන්නෝය, සම්දිටුකම් සමාදන් ව ගන්නෝ ය, එහෙයින් මරණින් මතු සුගතියෙහි උපදිති' යි මෙසේ මැරෙණ-උපදින-හීන-ප්‍රණීත-සුවණ්ණ-දුර්‍වණ්ණ-සුගති දුර්‍ගතියට යන, කර්‍මානුරූප ව ඒ ඒ ගතිවල ඉපිද සුවදුක් විඳින සත්ත්වයන්, තථාගත තෙමේ දිබ්බචක්ඛු ඤාණයෙන් දැන වදාරණ සේකැ' යි. ඒ කියූ ලෙසින් සත්ත්වයන් පිළිබඳ චුතිඋත්පත්ති දන්නා ඥාණ චුතූපපාතඤාණ නම් වේ, යනු එහි කොටි සිංහල ය.

පාසාද' නම් දෙවියන් හා රජුන් උදෙසා ගඩොලින් ගොඩ නැගූ භවනයෝ ය. **'දෙවානං නරපතීනං ච ඉඤ්ඡාමය භවනං'** යනු ඒ කියයි. මන ඥාවන් පහදවන බැවින් මෙ කී භවනයෝ පාසාද යි කියනු ලැබෙති. **'පසීදන්ති නයනමනානි අත්‍රෙති-පාසාදෙ'** යනු අභිවිවෘතියි. සිවුරැස් ගෙය ද පාසාද යි කියන ලද්දේ ය **'චතුරස්සො පනිස්සයවිසෙසො පාසාදෙ'** යනු ඒ කියූ සැටි යි. තවත් නෙනෙක් දික් වූ සිවුරැස් ගෙය පාසාදු යි කියති. මේ ඒ කියුම:- **'ආයතචතුරස්සපාසාදෙති'**

මෙහි ලා දිබ්බචක්ඛුඤ්ඤාණය හා ප්‍රාසාදය අභෙදයෙහි ලා ගත්හ. **'පඤ්ඤා එව පාසාදො = පඤ්ඤාපාසාදො'** යනු කීයේ එහෙයිනි.

ආරුයහ = නැග. ලබා. උපදවා.

ප්‍රඥාප්‍රාසාදයට නැගීම නම්, මෙහි දිබ්බචක්ඛුඤ්ඤාණය ලැබීම ය. ඒ ලබන්නට කැමැති ආදිකර්මිකයා විසින් භූතකසිණ සතර, වර්ණකසිණ සතර යන අටවැදැරුම් කසිණ අතුරෙහි යම් කිසි කසිණයක් අරමුණු කොට නැගී සිටි අභිඥාපාදකචතුර්ථ ධ්‍යානය හැම අතකින් අභිනීහාරක්ෂම කොට, හෙවත් සිත මෙහෙයීමට සුදුසු කොට තෙජොකසිණ, ඔදාතකසිණ, ආලොක කසිණ යන තුන් කිසුණු අතුරෙහි එක්තරා කසිණයක් දිබ්බ චක්ඛුඤ්ඤාණයට ලා කොට හෙවත් ඒ කසිණයෙහි උපචාරධ්‍යානය වැඩියක් පුහුණු කොට අරමුණ වැඩිය යුතු ය. එහි අර්ථණා නො ඉපදවිය යුතු ය. මේ කියූ තුන් කසිණයන් අතුරෙහි මෙයට වඩා යොග්‍ය වනුයේ ආලොකකසිණය ය. ඒ නිසා ඒ ආලොක කසිණය හෝ අනික් කසිණ දෙදෙනා අතුරෙන් එකක් හෝ අරමුණු කොට **විශුද්ධිමාර්ගයෙහි** කසිණනිද්දෙසයෙහි කියූ පරිද්දෙන් උපචාරධ්‍යානය ඉපදවීම් වශයෙන් උපදවා ගත යුතු ය. එය වඩනා සැටි ද එහි ම කියන ලද්දේ ය. කසිණපටිභාග නිමිත්තය යි කියන ඒ ආලොකය, වැඩූ ප්‍රදෙශය තුළ පිහිටි, වැඩූ තැන්හි ම ඇතුළත් වූ රූප බැලිය යුතු ය. බැලිය හැකි ය. ඉන් පිටත්හි වූ රූප නො දැක්ක හෙන්නේ ය. ඒ රූප බලත් ම ඔහුගේ පරිකර්මවාරය ඉක්ම යෙයි. එහි වූ ආලොකය අතුරුදහන් වේ. ආලොකය අතුරුදහන් වීමෙන් රූප ද නො පෙණී ය යි. මෙහි පරිකර්මැ යි කීයේ කසිණය අරමුණු කොට පවත්නා උපචාරධ්‍යානය ය. ඒ උපාචාරධ්‍යානය පිටත්හි වූ රූප දකින්නාට නූපදනේ ය. මෙසේ පරිකර්මවාරය ඉකුත් ව ගොස් ආලොකය අතුරුදන් වීමෙන් රූප නො පෙණී ගිය පසු, ඒ යොගියා විසින් නැවැත පාදකධ්‍යානයට සමවැද, එයින් නැගිට, කසිණාලොකය පැතිර විය යුතු ය. මෙසේ කිරීමෙන් අනුක්‍රමයෙන් කසිණා ලොකය ශක්තිමත් වේ. කසිණාලොකය ශක්තිමත් වූ කල්හි ඒ පැතිර සිටි ප්‍රදෙශයෙහි පිහිටි හැම රූපයෙක් ම පෙණී යන්නේ ය. යොගී තෙමේ, 'කසිණාලොකය යම් තරම් ප්‍රදෙශයෙක පැතිරේවා' යි සිතා ද, වෙන් කර ගණී ද, ඒ ප්‍රදෙශයෙහි ආලොකය පැතිර සිටින්නේ ය. දවසක් මුළුල්ලෙහි නමුත් බලන්නාහට රූප පෙණී යන්නේ ය.

මිනිසෙක් හුළඟත්තක් ගෙණ රෑ ගමනක් යයි. මගට බැස යනවිට, හුළඟත්ත නිවෙයි. එකල කිසිවෙක් ඔහුට නොපෙණී යයි. මගැ පිහිටි සම විසම තැන් ආදී කිසිවකුත් නොපෙණෙයි. එකල ඔහු නිවීගිය හුළඟත්ත, බිම උලා නැවැතත් දල්වා ගණියි. එයින් හුළඟත්ත මහත් සේ ඇවිලී යයි. මුලින් තුබූ ආලොකයට ත් වඩා මහත් ආලොකයක් එයින් ලැබෙයි. නැවැත නැවැතත් නිවුනු කල ඔහු එසේ කොට හුළඟත්ත දල්වයි. මේ අතර හිරු උදා වෙයි. හිරු උදාවූ කල්හි හුළඟත්තෙත් වැඩෙක් නැතැ යි එය හැර දමා ගමත් කරයි.

මේ උපමායෙහි, පරිකම්අවස්ථායෙහි පහළවන කසිණාලොකය, හුළඟත්තෙන් ලැබුනු ආලොකය සේ සැලකිය යුතු ය. රූප බලන්නාහට, පරිකම්යාගේ වාරය ඉක්ම යෑමෙන් ආලොකය අතුරුදහන් වූ කල්හි රූපයන්ගේ නොදැක්ම, හුළඟත්ත නිවී ගිය කල්හි මගැ තුබූ සම විසම තැන් නොදැක්ම සේ සැලකිය යුතු ය. නැවැත නැවැත පාදකධ්‍යානයට සමවැදීම, හුළඟත්ත, බිම ඉලීම සේ සැලකිය යුතු ය. පුන පුනා පරිකම් කරන්නා වූ යොගාවචරයාට ඉතාබලවත් සේ ආලොකයාගේ පැතිරීම, ආලොකයාගේ නැගීම, හුළඟත්තේ මුලින් පැවැති ආලොකයට වඩා මහත් ආලොකයක් නැඟී පැතිරී යෑම සේ සැලකිය යුතු ය. තහවුරු බවට ගිය ආලොකය, වෙත් කොට ගත් ප්‍රදෙශයෙහි පැතිර සිටීම හිරු උදාවීම සේ සැලකිය යුතු ය. නොපැතිර ගත් ආලොකය හැර පැතිර ගත් ශක්තිමත් ආලොකයෙන් දවස පුරා රූප දැකීම, හුළඟ අත්ත හැර දමා හිරුඑළියෙන් රූප දැකීම සේ සැලකිය යුතු ය. දිබ්බචක්ඛුඤාණයට පිරියම් කරණ අවස්ථාවෙහි පිරියම් කරන්නහුගේ මසැසට නොහමුවන කුඤ්ඡිගතරූප, හෘදයවත්ථුගතරූප, පොළොව යට පැවැති රූප, ඛිත්ති පවු පවුරු ආදියෙන් මුවහ වූ රූප, පිට සක්වළෙහි සිටි රූප, යන සියලු රූපවිඤ්ඤ, මසැසින් දක්නා කල්හි මෙන්, නුවණැසට හමු වෙයි. මෙසේ මෙකී රූප මසැසින් දක්නා ලබන්නා සේ නුවණැසින් දක්නා ලැබේ ද එකල දිබ්බ චක්ඛුඤාණය උපනැ යි දත යුතුය.

දිබ්බචක්ඛුඤාණය ම රූපදැකීමෙහි සමර්ථ වේ. එය පහළවන්නට පෙරාතු ව පැවැති සිත්, රූපදැකීමෙහි සමර්ථ නොවේ. දිබ්බචක්ඛුඤාණය පෘථග්ජනයාට හිතකර නොවේ. පෘථග්ජන තෙමේ 'යම් පමණ තැනක් ආලොකවත් වේවා' යි ඉටා ද එ පමණ තැනැ පෘථිවි සමුද්‍ර පර්වතාදිය බිඳ ගෙණ විනිවිද ගෙණ ආලොකවත් වේ. මෙසේ ඒ ඉම් කොට ඉටූ ප්‍රදෙශයෙහි සිටි භයානක

යක්ෂ රාක්ෂසාදීරූප දක්නා වූ පාථග්ජනයාහට භය උපදින්නේ ය. එ හෙයින් ඔහු චිත්තවික්ෂේපයට පැමිණෙන්නේ ය. ධ්‍යාන-භාවනාවෙන් පිරිහී උමතු බවට යන්නේ ය. එහෙයින්, ඔහු විසින් කළ යුත්තේ, දිබ්බචක්ඛුඤ්ඤාණය ලදැයි සෑහීමට නො ගොස් විදර්ශනාභාවනාවෙහි උත්සාහවත් ව චතුස්සත්‍යාවබෝධයෙහි අප්‍රමත්තයකු වී ම ය.

මේ සඳහා යොග වඩන කල්හි, රූපය අරමුණු කොට මනොචාරාවර්ජනචිත්තය ඉපිද නිරුඬ ව යයි. එවිට ඒ රූපය ම අරමුණු කොට ජවන්සිත් සතරෙක් හෝ පසෙක් උපදියි. මේ චිත්ත වීථියෙහි ද පූර්වභාගයෙහි වූ ආවර්ජනාදිචිත්තයෝ සවිතර්ක සවිචාර වූවාහු කාමාවචර වෙති. චිත්තවීථියෙහි අවසානයෙහි වූ රූප දකින සිත, චතුර්ථධ්‍යානයෙන් යුක්ත වූයේ, රූපාවචර වේ. රූප දකින මේ සිත සමග හටගත් නුවණ **'චුතූපපාතඤ්ඤාණ'** නම්. 'දිබ්බචක්ඛුඤ්ඤාණ' යනු තවත් එයට නමෙකි.

ඉතා කොටින් මෙහි කියූ දිබ්බචක්ඛුඤ්ඤාණය ලැබිය හැක්කේ ඒ සඳහා සම්පූර්ණ කළ යුතු වූ ප්‍රතිපදා සම්පූර්ණ කොට සිටි කල්හි ය.

අසොකො = සොක රහිත වූයේ සොක නැත්තේ.

සොක' නම් ඥාතිව්‍යසනාදියෙන් පහස්නා ලද්දහුගේ, මැඩුනහුගේ, පෙළුනහුගේ සිතෙහි වන්නා වූ තැවිල්ලය. **'සොකො නාම ඤාතිබ්‍යසනාදිහි ඵුට්ඨස්ස චිත්තසන්තාපො'**යි ඒ කීහ. මෙය විස්තර විසින් වදාරන බුදුරජානන් වහන්සේ **'ඤාති බ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස, රොග බ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස, දිට්ඨිබ්‍ය-සනෙන වා ඵුට්ඨස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛ ධම්මෙන ඵුට්ඨස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්තාගතස්ස සොකො සොචනා සොචිතත්තං අන්තො සොකො අන්තො පරිසොකො අන්තොදාහො අන්තො පරිදාහො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං'** යි වදාළ සේක. ඥාති ව්‍යසනයෙන් හෝ භොගව්‍යසනයෙන් හෝ රොගව්‍යසනයෙන් හෝ ශීලව්‍යසනයෙන් හෝ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ මිත්‍රාමාත්‍යාදි ව්‍යසනයෙන් හෝ සොකය ඉපැත්මට හෙතු වූ අන් එක්තරා එකකින් හෝ පහස්නා ලද්දහුගේ මඩනා ලද්දහුගේ සිත්තැවිල්ල ශොකය යනු, මෙහි ඉතා කෙටි තේරුමය.

හිතයට නො වැටෙන, හිතසුව නසන සිදුවීම් ව්‍යසන නැමැ යි කීහු **'හිතසුඛං ඛිපති විධංසෙතීති** = **බ්‍යසනං,** යනු බ්‍යසන

යන්නෙහි අරුත් පැහැදිලි කිරීම ය. වොරහය රොගභයාදියෙන් වන ඤතීන්ගේ විනාශය, පිරිහීම, ඤතිබ්‍යසන නම්. සෙස්සද මේ ලෙසින් සලකන්නේ ය.

මෙහි කී ඤතිබ්‍යසනාදී වූ යමකින් උපදින තැවීම, සිත හැම අතකින් දවාලන්නේ ය. එ හෙයින් මේ සූත්‍රදෙශනාවෙහි බුදුරජාණන් වහන්සේ, ශොකය කිමැ යි වදාරණු පිණිස **'චෙතසො පරිජ්ඣායනා'** යනු වදාළ සේක. **'චිත්තස්ස ඣානාඣාරෙ සොකො හි උප්පජ්ජමානො අග්ගි විය චිත්තං ඣාපෙති පරිදහති චිත්තං මෙ ඣාමං න මෙ කිංචි පටිභාති'ති වදාපෙති'** යනු එය අටුවා කළ සැටිය. සිත දවන ආකාර වූ ශොකය තෙමේ උපදනේ ගින්නක් සේ සිත දවයි. හාත්පසින් දවයි. 'මාගේ සිත දනලද ය, මට කිසිවක් නොවැටහේ ය යි ශොකයෙන් යුත් මිනිසාට කියව' යි යනු එහි සිංහලය.

මේ වනාහි අරුත් විසින් දෙම්නස ම ය. **'සො පන යං කිංචා පි අප්පේතා දොමනස්සමෙව හොති'** යනු ආචාර්‍යවචනයි. **'අනොනා නිජ්ඣානලක්ඛණො සොකො'** ඇතුළත වියලීම ලකුණු කොට සිටියේ ය සොක ය. **'චෙතසො පරිනිජ්ඣායනරසො'** කෘත්‍යය සිතේ දැවීම ය. **'අනුසොචනපච්චුපට්ඨානො'** ඒ ඒ ගුණදෙස් අනුව ගොස් පසුතැවීම වැටහීම කොට සිටියේ ය.

ශොකය, කායික-චෙතසිකවශයෙන් දෙ පරිදි ය. සිතතුළ හටගත් ශොකවෙගයෙන් සමහර විට හෘදයෙහි මහගඩු හට-ගැණී මෝරා ගොස් බිඳී යන්නේ ය. එම අවස්ථාවෙහි කටින් කළු පැහැති ලේ නික්මෙන්නේ ය. මේ වනාහි **කායිකශොක**-යෙන් වන යන්තම් දුකෙකි. 'මාගේ මෙතෙක් නැයෝ විනාශයට ගියහ, මෙතෙක් භොගයෝ විනාශයට ගියහ' යි සිතන්නහුට බලවත් වූ දෙම්නසෙක් උපදින්නේ ය. ඒ දෙම්නසය චෙතසික ශොක ය. මෙසේ මේ දෙකට වසහුව සිටි බැවින් ශොකය දුකැයි ද වදාළ සේක.

'සත්තානං හදයං සොකො සල්ලං විය විහඤ්ජති,
අග්ගිතත්තො ව නාරාචො භුසං ච ඩහතෙ පුන.

සම්භවති ච ඛ්‍යාධි ජරාමරණභෙදනං,
දුක්ඛමපි විවිධං යසමා තසමා දුක්ඛාති වුච්චති'

ශොකය තෙමේ, හුලක් මෙන් සත්වයන්ගේ ලය පෙළයි. ගින්-නෙන් තැවූ නරදක් සේ නැවැත නැවැත තදින් දවයි.

ශොකය තෙමේ, යම්හෙයකින් සත්‍වයන් ව්‍යාධි ජරා මරණ හෙද ඇති මහත් දුකට පමුණුවා ද, එයින් අන්‍ය වූත් දුක් එළවාද එයින් ශොකය දුකැ යි බුදුරජානන් වහන්සේ වදාළ සේක.

මෙසේ සිත කය දවන පෙළන ශොකයෙන් තොරවූයේ **'අසොක'** නම් වේ.

සොකිනිං පජං = ශොක කරණ සුලු සත්‍වසමූහය.

මෙහි **'පජං'** යන්නෙන් මුළුසත්‍වලොකය ගැණේ. එහෙත් විශෙෂ විසින් මෙහිලා ගැණෙන්නේ භවයෙහි උපතට හෙතු වූ කර්මූලොච්ඡින්න නො කළ අවිද්‍යාදිකෙලෙස් ඇති අඥසත්‍වයෝය. ඔවුහු ය කුදු මහත් තැනැ ශොක කරණුවෝ.

පබ්බතට්ඨා ඉව = පර්වතමස්තකයෙක සිටියකු සේ. කඳුමුදුනෙක සිටියකු සේ.

හන්දිවලින් පුරුක්වලින් නැගී බැඳී රැස්වී සිටියේ **'පබ්බත'** නම්. එබඳු පුරුක් ඇත්තේ හෝ 'පබ්බත' නම්.

'භුම්මට්ඨෙ' = බිම සිටියවුන්.

ධීරො = ප්‍රාඥතෙමේ. නුවණැත්තේ

මෙහි **ධීර'** නම්, ඉද්ධිවිධ-දිබ්බසොත-දිබ්බචක්ඛු-පරචිත්ත විජානන-පුබ්බෙනිවාසානුස්සති-ආසවක්ඛයකරඤ්ඤාණ යන ඥාන-ෂට්කයෙන් යුක්ත වූයේ ය. ෂඩ්ඥානය ඇත්තේ ය. ෂඩභිඥ යනු ත් මේ ෂඩ්ඥානය ය.[1]

බාලෙ = අඥයන්. නුවණැත්තන්[2].

අවෙක්ඛති = දකියි. බලයි.

දැකීම දෙ පරිදි ය. ඇසින් දැකීම, නුවණින් දැකීම යි. එයින් මෙහි **'අවෙක්ඛති'** යන්නෙන් කියැවෙනුයේ නුවණින් දැකීම ය මෙන්න අටුවාව.-

'යථා නාම පොක්ඛරණිං විප්පසන්නං නවොදකං පුරා ණොදකං සඞ්ඛොහෙත්වා තස්සොකාසං අදත්වා තං අත්තනො මත්ථකමත්ථකෙන පලායන්තං නුදති නීහරති, එවමෙව පණ්ඩිතො අප්පමාදලක්ඛණං බ්‍රූහෙන්තො; පමාදස්සොකාසං අදත්වා යථා අප්පමාදවෙගෙන තං නුදති නීහරති අථ සො

1. 2. 1. 'ධීරා, යන්න බලනු.
2. 2. 4 'බාලා' ,, ,,

පනුණ්ණපමාදෙ අච්චුග්ගතඤෙන පරිසුඛං දිබ්බචක්ඛු සඞ්ඛාතං පඤ්ඤාය පාසාදං තස්ස අනුච්ඡවිකං පටිපදං පූරෙන්තො තාය පටිපදාය නිස්සෙනියා පාසාදං විය ආරුයහ පහිණසොකසල්ලතාය අසොකො, අප්පහිණසොක සල්ලතාය සොකිනිං පජං සත්තකායං චවමානං ච උප්පජ්ජමානං ච දිබ්බචක්ඛුනා පස්සති යථා කිං, පබ්බතමුඛනිට්ඨිතො භූමියං ඨිතො උපරි පාසාදෙ වා පන ඨිතො පාසාදපරිවෙණෙ අකිච්ඡෙන අවෙක්ඛති තථා සො පි ධීරො පණ්ඩිතො මහාබිණාසවො අසමුච්ඡින්න වටට බිජෙ බාලෙ චවන්තෙ ච උප්පජ්ජන්තෙ ච අවෙක්ඛතී'ති'

පොකුණට අලුතෙන් වැදෙන දිය පොකුණෙහි බොහෝ කලක් පල්ව තුබූ පැරණි දිය කළඹා ඒ පැරණි දියට ඉඩ නො දී එය මතු කොට පා කොට හරින්නේ ය. එ පරිද්දෙන් නුවණැති සමෘතිමත් මනුෂ්‍යයා අප්‍රමාදහෙතුවෙන් ප්‍රමාදයට ඉඩ නො දී අප්‍රමාද වෙගයෙන් ප්‍රමාදය පන්නා හරින්නේ ය. නැවැත, පන්නා හැරිය ප්‍රමාදය ඇති ඔහු පිරිසිදු වූ දිවැසැ යි කියන ප්‍රඥා ප්‍රාසාදයට, එයට සුදුසු ප්‍රතිපදා පුරන්නේ ඒ ප්‍රතිපදාවෙන් හිණි මගකින් පහයකට නගින්නා සේ නැගී පැහූ සොකහුල් ඇති බැවින් නිශ්ශොකී ව නො පැහූ කෙලෙස්හුල් ඇති මැරෙණ උපදින සත්වයන් දිවැසින් දකියි. උස කඳුමුදුනෙක සිටියකු බිමැ සිටිය වුන්, නැත, පහයමතුයෙහි සිටියකු බිම සිටියවුන් නිදුකින් පහසු වෙන් දකින්නේ ය. දකින්නේ මෙසේ අප්‍රමත්ත වූ ධෘතිසම්පන්න වූ පණ්ඩිත වූ මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ නො සිඳහැරිය සසරැ උපදවන ශක්තිය ඇත්තා වූ බාලජනයන් ප්‍රමත්තයන් දිවැසින් දකිත්.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා දියට පැමිණියාහු ය.

මහාකාශ්‍යපස්ථවිරවස්තුව නිමියේ ය.

යහළු භික්ෂු දෙනමක්

2 — 6

භික්ෂුන් වහන්සේලා දෙනමක් 'අපි සසරින් එතෙර වෙමු' යි බුදුරජුන් වෙත ගොස් කමටහන් උගෙණ තවත් භික්ෂුන් ද ගෙණ වනයට ගියහ. ඒ දෙනමගෙන් එක් නමක් අලස ය. ඔහු, වනයට ගිය දා සිට එක දවසකු ත් නො හැර, දර පරඬලා රැස් කොට ගිනිකබලක් දල්වා ගෙණ ලපටි හෙරණුන් හා එක් ව ස්වර්ගමොක්ෂබාධක වූ කතා කියමින් ගිනි තපිමින් රැ ප්‍රථමයාමය ඉක්ම වයි. අනික් භික්ෂුන් වහන්සේ, අප්‍රමත්ත ව මහණදහම් කරන්නෝ සිය යාළුවාහට 'ඇවැත්නි! ප්‍රමත්තයා හට සිවු අපායයෝ නිදන ගෙය වැනි ය, ඔහුට බුදුවරුන් සතුටු කරන්නට නො හැකි ය, ඔබතුමන් ප්‍රමත්ත ව කල් දවස ගත කරණබව පෙණේ, ඒ හොඳ මදි ය, එ හෙයින් මෙසේ නො කරණු මැනැවැ' යි අවවාද කරති. එහෙත්, ඔහු එයට කන් නො දී එලෙස ම කල් ගෙවයි. ප්‍රථමයාමයෙහි ගිනි තපියි. අනික් භික්ෂුන් වහන්සේ භාවනා කොට, තමන් වසන කාමරයට වන් කල්හි එහි ගොස්, 'අලසය, නිදන්නෙහි ද, කැලයට ආයෙහි නිදන්නට, බුදුරජුන් රවටන්නෙහි කුමට යැ, කමටහන් ගත්තෙහි කුමට යැ, බුදුරජුන් රවටනු තට නො හැකි ය, තා ම රැවටෙනු ඇතැ' යි ඇණුම් බැණුම් කියා, තමන් මුළුරැය ම මහණදම් කරන්නකු සේ හඟවා ගෙට වැද නිදයි. අප්‍රමත්ත භික්ෂු තෙමේ, මැදියම නිදා, පැසුළුයම නැගිට මහණදම් කරණුයේ, කල් නො යවා ම පිළිසිඹියාවන් ද ලබා රහත්බවට පැමිණියේ ය. අනික් මහණ තෙමේ දෙතිස් කතා කරමින් ගිනි තපිමින් ප්‍රමාදයෙන් කල් ගෙවී ය.

ඔවුහු, නිමකළ වස් ඇත්තෝ බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පස් ව හුන්නෝ ය. එකල බුදුරජානන් වහන්සේ උන් හා පිළිසඳර කතා කොට 'කිම, මහණ! හොඳින් මහණදම් කළහු ද? තමුසේලාගේ පැවිදිකිස මුදුන් පැමිණියේ ද? අදහස් ඉටු වී දැ?' යි අසා වදාළ සේක. 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මාගේ මේ යහළුවා අප්‍රමාදය කිමැ යි කිසිසේ ත් නො දන්නේ ය, එහෙයින් ඔහුට අප්‍රමාදයෙක් නැත, ගිය දා පටන් මොහු කළේ නිදා ගැණීම ය' යි කුසීතභික්ෂුව කීවිට, 'තමුසේ කල් යැවුවහු කෙසේ දැ' යි බුදුරජානන් වහන්සේ විචාළ සේක. 'ස්වාමීනි! මම දර පරඬලා රැස් කොට ගිනි කබලක් දල්වා මුල්යම ගිනි තපිමින් නො නිදා මැ කල් යැවූයෙමි' යි කී ය. එවිට බුදුරජානන්

වහන්සේ; 'තමුසේ ප්‍රමත්ත ව කල් යවා, අප්‍රමත්ත වීමි, යි කියන්නහු ය, අප්‍රමත්තයා, ප්‍රමත්තයා කරන්නහු ය, තමුසේ මාගේ පුත් වූ මේ තැන ලඟ, දිරුම්කඩට ගිය අස් මාල්ලකු වැනි වහු ය, මා පුත් තාගේ සමීපයෙහි බලජවැනි අසකු වැනි ය' යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

අප්පමත්තෙනා පමත්තෙසු සුත්තෙසු බහුජාගරෝ,
අබලස්සං ව සීඝස්සෝ හිත්වා යාති සුමේධසෝ'නි.

පමාවූවන් අතර නො පමා වූ කෙලෙස්නින්දෙන් නිදන්න වුන් අතර කෙලෙස්නින්දෙන් නො නිදන්නා වූ බොහෝ නිදි වැරීම් ඇති උතුම් නුවණැති මහරහතුන් වහන්සේ, කොරපා ඇති දුබල අසකු පසු කොට යන ඉක්මන් ගමන් ඇති අසකු සේ ප්‍රමත්තසත්වයන් හැර යත්නෝ ය.

අප්පමත්තෙනා = නො පමාගති ඇති මහරහතුන් වහන්සේ.

පමත්තෙසු = පමාගති ඇත්තන් අතුරෙහි.

සුත්තෙසු = කෙලෙස්නින්දෙන් නිදන්නවුන් අතුරෙහි.

නිදීම දෙයුරු ය. ප්‍රකෘතිනිද්‍රා-කෙලෙශනිද්‍රාවශයෙන්. සිරුරෙහි කටයුතුවලට නො සුදුසු බව ය, ප්‍රකෘතිනිද්‍රා.

'නිද්දූ'නි යා කායස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔනාහෝ පරියොනාහෝ අනෝනාසමොරොධෝ මිඛං සුප්පං පවලාසිකං සුප්පනා සුපිනත්තං' යනු එහිලා දෙශනා ය. කායයාගේ දරථය ද, දරථවශයෙන් වූ භවාඞ්ගසොතස ද පියවිනිදීම වශයෙන් ගැණේ. එය රහතුන් වහන්සේට ඇත්තේ ය. රහතුන් වහන්සේ ජින මිඳ දෙක රහත් මගින් මුළුමනින් පැහැ සේක.

පියවිනිදීම නම් වූ කයෙහි ගිලන්බව උපාදින්නසඞ්ඛයන්හි සේ අනුපාදින්නසඞ්ඛයන්හි ද වේ. කමල් උපුල් ආදීහු එක් විටෙක පිපෙති. එක් විටෙක හැකිළෙති. සවස්වේලෙහි සමහර ගස්වල කොළ හැකිළේ. උදැසන දිග හැරේ මෝ ප්‍රකෘතිනිද්‍රාය.

සිහිමුළාවෙන් සම්‍යක්ප්‍රඥාවෙන් තොර ව නින්දට බසින්නහුට ආදීනව පසෙක් වන්නේ ය. දුකසේ නිදීම-දුකසේ පිබිදීම පවිටු සිහින දැකීම - දෙවියන්ගේ ආරක්ෂාවෙන් බැහැරවීම-සුකුරු මිදීම යන මේ පසය ඒ. එළැඹැ සිටි සිහියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් යුක්ත ව නිදන්නහුට මේ කිසිත් ආදීනවයෙක් නො වන්නේය. මේ වදාළ සැටි:-

'පඤ්චිමෙ භික්ඛවෙ! ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො දුක්ඛං සුපති, දුක්ඛං පටිබුජ්ඣති, පාපකං සුපිනං පස්සති, දෙවතා න රක්ඛන්ති, අසුචි මුච්චති, ඉමෙ බො භික්ඛවෙ! පඤ්ච ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො, පඤ්චිමෙ භික්ඛවෙ! ආනිසංසා උපට්ඨිතසතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්කමතො, සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, දෙවතා රක්ඛන්ති, අසුචි න මුච්චති, ඉමෙ බො භික්ඛවෙ! පංච ආනිසංසා උපට්ඨිතසතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්කමතො'සි

යම්කිසි පෘථගජනයෙක් කාමයන්හි පහවූ ආශා ඇත්තේ නම්, ඔහුට ද අසුචි නො මිදෙන්නේ ය. රහතුන් වහන්සේට නම්, අසුචි මිදීමෙක් මොන ලෙසකිනුත් නො වේ ම ය. මේ ඒ පාළිය:-

'යෙපි තෙ ආනන්ද පුථුජ්ජනා කාමෙසු වීතරාගා තෙසම්පි අසුචි න මුච්චති අට්ඨානමෙතං ආනන්ද! අනවකාසො යං අරහතො අසුචි මුච්චෙය්‍ය' යනු.

පංචනීවරණධර්මයන්ගේ වශයට යෑම මෙහි කෙලශනිද්‍රා නම්. **'පංචනිවරණා සුත්තා නාම'** යනු ආගමය. මෝ මෙහිලා අදහස් කරණ ලද ය. කාමච්ඡන්දාදිකෙලශධර්මයන්ගේ වශයට ගිය පුද්ගල තෙමේ යම්කිසි තැනෙක හුන්නේ ද, සිටියේ ද අරුණ නැගුයේ ද පමාබැවින් කෙලශධර්මයන්ගේ වශයට ගිය බැවින්, **සුත්ත**, නම් වේ.

බහුජාගරො = බොහෝ නිදිවැරීම් ඇති.

සුමෙධසො' යන්නට විශෙෂණ යි. ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-ස්මෘති-සමාධි-ප්‍රඥා යන මොවුහු පස්දෙන ඉන්ද්‍රියයෝ ය. 'ජාගර' නම් වනුවෝ ත් මොවුහු ම ය. **'පඤ්චින්ද්‍රියානි ජාගරානි'** යනු එය ව්‍යක්ත කරයි. මේ ධර්මයෝ රහතුන් වහන්සේ පිළිබඳ වූවෝ ඉතා මහත්බවට පැමිණියෝ ය. එ හෙයින් උන්වහන්සේ යම්කිසි තැනෙක හෙව නිදන සේක් ද, ඒ හැම තැන නො පමාබවෙහි පිහිටා කයගිලන් බැවින් නිදන සේක. නිදන නො නිදන හැම වේලෙහි ම ශ්‍රද්ධාදිධර්මයන්හි පිහිටා සිටින බැවින් **'බහුජාගර'** නම් රහතුන් වහන්සේ ය.

අබලස්සං = දුබල අසකු.

කොර වූ පා ඇති සිදී ගිය ගමන් වේගය ඇති අශ්ව තෙමේ **'දුබලස්ස'** නම්.

සීඝස්සො = ඉක්මන් ගමන් ඇති අසකු සේ.

මෙයින් කියැවෙනුයේ සිත්‍රුදෙශයෙහි උපන් ආජානෙය නමින් කියවෙන අශ්ව තෙමේ ය.

හිත්වා යාති = හැර යයි.

දුබල අසු පසු කොට යන වෙගවත් අසකු සේ උතුම් නුවණැති මහරතුන් වහන්සේ බුදුදහම් ඉගෙණීමෙන් හා මගපල පසක් කිරීමෙන් ප්‍රමත්තප්‍රදාලයන් පසු කොට යති. මදනුවණැත්තකු එක් සූත්‍රයක් ඉගෙණීමට වැයම් කරණ කල්හි උතුම් නුවණැත්තේ එක් වගීයක් උගණියි. මෙසේ ය. නුවණැත්තේ නුවණ නැත්තහු ඉගෙණීමෙන් පසුබා යන්නේ.

මදනුවණැත්තහු රෑ තැන් දිවාතැන් ආදිය කරන්නට වැයම් කරණ කල්හි කමටහන් උගෙණ සජ්ඣායනා කරණ කල්හි උතුම් නුවණැත්තේ පූර්භාගයෙහි ම අන්හු කළ රෑතැන් දිවා තැන්වලට වැද කමටහන් මෙනෙහි කරණුයේ සියලු කෙලෙසුන් නසා නවලොවුතුරාදහම් අත්පත් කරයි. මෙසේ ය නුවණැත්තේ මගපල පසක් කිරීමෙන් නුවණනැත්තහු පසුබා යන්නේ, සසර හැරදමා සසරින් මිදී යන්නේ' මෙන්න පාළිය:-

'මන්දපඤ්ඤඤ්හි එකං සුත්තං ගණ්හතෝ වායමන්තෙයෙව සුමෙධසෝ එකං වගගං ගණ්හාති, එවං තාව ආගමෙන හිත්වා යාති. මන්දපඤ්ඤා පන රත්තිට්ඨානදිවාට්ඨානාදිනි කාතුං වායමන්තෙයෙව කම්මට්ඨානං උග්ගහෙත්වා සඤ්ඣායන්තෙයෙව සුමෙධසෝ පුබ්බභාගෙපි පරෙන කතං රත්තිට්ඨානදිවාට්ඨානං පවිසිත්වා කම්මට්ඨානං සම්මසන්තෝ සබ්බකිලෙසෙ ඛෙපෙත්වා නවලොකුත්තරධම්මෙ හත්ථගතෙ කරොති' එවං අධිගමෙනපි හිත්වා යාති. වට්ටපදං ජහිත්වා ජඬ්ඪත්වා වට්ටතො නිස්සරන්තෝ යාතියෙව'

සුමෙධසෝ = උතුම් නුවණැති මහරතුන් වහන්සේ.

වර්තමාන භවයෙහි දී ම මාගීඵලාවබොධයට ශක්තිමත් ප්‍රාඥ තෙමේ ම මෙයින් කිය වේ.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවත් පලා දියට පැමිණියෝ ය.

ප්‍රමත්ත අප්‍රමත්ත වෙසභායක භික්ෂූන්ගේ
කථාවස්තුව නිමියේ ය.

සක්දෙව්රජතුමා.

2 — 7

විශාලාමහානගරවරය, අප බුදුරජුන් දවස හැම සැපතකින් පිරී ගත්තේ ලිච්ඡවිරජදරුවනට වාසස්ථාන වූයේ ය. එ දවස එහි විසූ එක් ලිච්ඡවි රජෙක් මහාලි නමින් ප්‍රසිඩ විය. එහි දිනෙක බුදුරජුන් දෙසූ **'සක්ක පඤ්හ'** සූත්‍රදෙශනාව අසා 'බුදුරජානන් වහන්සේ සක්දෙව්රජු විඳින සැපත මහත් කොට වදාරණ සේක, මෙය දැක වදාරන්නක් ද, නැත, නො දැක වදාරන්නක් දැ'යි සිතා 'සක්දෙව්රජු හඳුනන්නහු ද, නැත, නො හඳුනන්නහු දැ'යි අසමි'යි බුදුරජුන් වෙත ගොස් වැඳ පසෙකට වී හිඳ මෙසේ ඇසී ය.

මහාලි = 'ස්වාමීනි! භාග්‍යවතුන්වහන්ස! ඔබවහන්සේ විසින් සක්දෙව්රජ තෙමේ දක්නාලද ද?

බුදුරජ = ඔව්, දක්නා ලද්දේ ය.

මහාලි = ස්වාමීනි! ඒ නො විය හැකි ය, ඔබහන්සේ විසින් දක්නා ලද්දේ සක්දෙව්රජ නො වේ, සක්දෙව්රජ වැන්නෙක් ය, සක්දෙව්රජ දකිනු පහසු නැත,

බුදුරජු = මහාලි! අසන්න, මා කියන කතාව, මම සක්දෙව්රජු ත් හඳුනමි, සක්දෙව්රජ වනසැටිත් දනිමි, යම්කිසි ධර්ම කෙනකුන් සමාදන් ව ගැණීමෙන් ශක්‍ර වූයේ ද, ඒ ධර්ම ත් මම දනිමි, මහාලි! පෙර මොහු මිනිසෙක් වූයේ නමින් මඝ නම් විය, එහෙයින් ඔහුට අද ඇතැම් කෙනෙක් **'මඝවා'** යි කියත්, එ දවස ම ඔහු නගරයක් ගමක් පාසා දානශාලා කරවා දන් දුන්නේ ය, එහෙයින් ඔහු අද **පුරිඤ්ද**'යි හඳුන්වනු ලැබේ, දන් දුන්නේ ද යන්තමකට නො වේ, ඉතා හොඳට සකස් කොට ම දුන්නේ යි, **'සක්ක'** යි කියන්නේ එහෙයිනි, ඔහු එදා මිනිස්කාලයේ ආවාසයක් කරවා පිදී ය, ඒ නිසා ඔහුට **'වාසව'** යන නම ලැබුනේ ය, මහාලි! සක්දෙව්රජ මොහොතක් තුළදී කරුණු දහසක් වටහා ගැණීමෙහි පොහොසත් ය, එහෙයින් ඔහු **'සහස්සක්ක'** නම් වී ය, ඔහුට සුජාතා නම් අසුර කන්‍යාවක් භාර්‍යා වූවා ය, එහෙයින් **'සුජම්පති'** නම් වේ. **'දෙවිඤ්ද'** යි කියන්නේ තව්තිසාවැසි දෙවියන්ගේ අධිපතියා බැවිනි, මහාලි! ඔහු පෙර සක්දෙව්බව ලැබමට හෙතු වූ **පණති බෙනතුරු ම මවුපියන් රැක බලා ගැණීම, කුලදෙටුවන් පිදීම, මොළොක්බස් බිණීම, කේලාම් නො කීම, පහ වූ මසුරුමල ඇති ව දීමෙහි ඇලීසිටීම, හැමවිට ඇත්තකීම,**

කිසින් කරුණෙක නො කිපීම යන මේ සප්තව්‍රතපදය මැනැවින් සම්පූර්ණ කෙළේ ය, මොන කරුණක් නිසා වත් ඔහු මේ සතින් බැහැර නො වී ය, මොනවට එය රැක්කේය, මේ ධර්ම සත මැනැවින් නො කඩ කොට රැකි බැවින් ඔහු ශක්‍රභාවය ලැබී ය,

මහාලි= සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! මම ඔහු පිළිබඳ ඉකුත් තොරතුරු අසනු රිසියෙමි, ඔහු ඒ කල හැටි කරුණාකර මට වදාරනු මැනැවි,

බුදුරජ= හොඳයි' කියමි, අසව, සි වදාළ සේක.

'යටගිය දවස මගධරට මචලනම් ගම්වරයෙක් තුබුනේ ය, එහි මඝ නම් තරුණ පුරුෂයෙක් වාසය කෙළේ ය, ඔහු ගමෙහි වැඩ කරණ තැනකට ගියේ නම්, පළමු කොට කරඤ්ඡුගේ තමන්ට නැවතී සිටින්නට, අතින් පයින් කුණුරොඩු තණපරඬලා බැහැර කොට බිම්පෙදෙසක් සමතලා කොට ගැණීම ය, මේ ඔහුගේ සිරිත ය, දිනෙක ඔහු වැඩ කරණ තැනට ගොස් බිම්පෙදෙසක් සකස් කොට එහි සිට ගත්තේ ය, අනෙකෙක් එහි පැමිණ එ තැනින් ඒ තරුණයා පන්නා හැර තෙමේ එතැනැ සිට ගත්තේ ය, ඒ වේලෙහි ම ඔහු අනිකාට නො කිපී නො බැණ කිසින් නො කියා තමන්ට අත් තැනක් පිළියෙල කොට ගත්තේ ය, එ තැන ත් අනෙකෙක් පැහැර ගතු, එ වේලෙහි ද නො කිපී නො බැණ අන් තැනක් සකස් කොට ගත්තේ ය, අනෙකකු එතැන ත් පැහැර ගත් කල, අන් තැනක් පිළියෙල කොට එතැන සිට ගත්තේ ය, මෙසේ කිහිපවිටක් ම ඔහු පිළියෙල කොට ගත් තැන්, අන්හු විසින් පැහැර ගන්නා ලද ද, ඒ කිසිවකු කෙරෙහි නො ද කිපුනේ ය, නො ද ගැටුනේ ය, හෙතෙමේ එ තැන්හි සිටියවුන් බලා සතුටුව 'අනේ! සාධු! සියල්ලෝ යහතින් සිටිනි, සුවසේ සිටිනි, මට පින්, මේ වැඩේ සැප දෙන එකක්, මෙයින් මට සැප ලැබේ, තව තවත් මිනිසුන්ට සතුටින් සිට ගන්නට බිම් පෙදෙස් පිරිසිදු කර දිය යුතු ය' යි සිතා පසු ද, කැහි පොරෝ උදලු කුන්තානි කූඩා ආදිය ගෙණ ගොස් ඒ ඒ තැන කමත් පමණ තැන් පිළියෙල කෙළේ ය, එහි පැමිණි හැම කෙනෙක් ඒ ඒ තැනැ සිට ගන්හ, සීතවේලෙහි ඔවුනට ගිනි දල්වා දුන්නේ ය, මෙයින් මේ තරුණයා මෙහි වඩාත් උනන්දු විය, 'සිත්කලු තැන, පිරිසිදු තැන, කාටත් ප්‍රිය ය, කාගේත් සිත් ගන්නේ ය, ඒ නිසා මම මෙතැන් සිට මංපෙත් පිළියෙල කොට දෙමි' යි සිතා ඉතා අලුයම නිතිදෙන් නැගිට කැඳ වතුර ටිකක් බී උදැසනින් ම කැහි උදලු

ආදිය ත් ගෙණ, ගෙත් නික්ම මංපෙත් සමකරමින් හැසිරෙන්නට වන, එකල අනෙකෙක් මූ දැක 'යහළුවේ! මේ කුමක් කෙරෙහි දැ'යි ඔහුගෙන් ඇසී ය, 'දෙව්ලොව යැමට මගක් පිළියෙල කරම්'යි ඔහුට පිළිතුරු දිනා, 'මමත් ඔබට උපකාර කරම්'යි ඔහු කීවිට, 'හොඳයි' ඒක අප දෙදෙනාට ම හොඳයි, දෙව්ලොව කාගේත් සිත් ගත්නා තැනක්' යි දෙදෙන ම එකතු ව, මං පෙදෙස් පිළියෙල කරන්නට පටන් ගත්හ, ඒ දෙදෙනා දුටු තවත් බොහෝ දෙනෙක් ඔවුන් හා එක්වූහ, මෙසේ එක්වූවෝ තෙතිස් දෙනෙක් වූ හ, මේ තෙතිස් දෙන මංපෙත් පිළියෙල කරමින් යොදුන දෙ යොදුන පමණ තැන් යන්නෝ ය, මෙසේ මංපෙත් පිළියෙල කරමින් යන ඔවුන් දුටු ගම්මුලාදැනියා 'මොකක් ද මූන් කරණ මේ වැඩේ, මූන්ට පිස්සු, නිකරුණේ කල් ගෙවති, කළ යුත්තේ ප්‍රයොජන ඇති වැඩෙකි, අපහසුවක් නැති ව මූන්ට කැලයෙන් උගුරු ගෝන මුව සා, ආදී වූ සතුන් මරා මස් ගෙණ ආ හැකි ය, අතර මග දී බොන්නට රා අරක්කු ත් ලබාගත හැකි ය, එ විට මටත් එයින් ප්‍රයොජන ගත හැකි ය, මටත් ප්‍රයොජන වන එබඳු දේ මූන් ලවා කරවිය යුතු ය'යි සිතා ඔවුන් කැඳවා 'තෙපි කුමක් කරමින් හැසිරෙහු දැ'යි ඇසී ය, රජයෙහි මෙහෙකරණ බොහෝ ගම්මුලාදැනීහු ගම් රට වනසති, ගම්වැසි මිනිසුන් දුසිරිතෙහි පොළොඹවති, අල්ලස් ගැණීම් ආදී පාපක්‍රියාවන්ගෙන් ගම් රට දූෂණය කරති, උනුන් අතර නඩුහබ ඇති කරති, අනුන්ගේ දුකෙහි කිසිත් කමපනයක් නො දක්වති, පවෙහි තැති ගැන්මෙක් මොවුනට නැත,

එ විට ඔවුහු 'රාළහාමි! අපි කරන්නමෝ දෙව්ලොව යැමට මගකැ' යි කීහ. 'ගිහිගෙයි වසන්නන් විසින් කළ යුත්තේ මේ වැඩ නො වේ, ගිහිගෙය ගැණ සිතා ක්‍රියා කළ යුතු ය, හොඳට කෑ යුතු ය, පිය යුතු ය, ඇන්ද යුතු ය, නැටුම් ගැයුම් කළ යුතු ය, දඩයම් කළ යුතු ය, සූදු කෙළිය යුතු ය, මේවා ගිහියා අයත් වැඩ ය, ගිහියා විසින් කළ යුත්තේ මේ ය' යි ගම්මුලාදැනියා කීයේ ය, ඔවුහු ගම්මුලාදැනියාගේ කීම් නො ද පිළිගත්හ, එබව දත් ඔහු මූන් කෙරෙහි කිපී, මූන් මරවන්නට සිතා රජු කරා ගොස් 'දේවයන් වහන්ස! කාණ්ඩ ගැසි ගම් පහරණ හොරු සමූහයෙක් රට තුළ දක්නට ලැබේ, රජයට විරුඬ ව හැසිරෙන්නන් සේ ය පෙණෙන්නෝ, අද හෙට ම ඔවුන් නො නැසුවොත් මහත් විපත් සිදු විය හැකි ය, රට දෙකට බෙදී යා හැකි ය, දුන වදුරන සේක්වා' යි කියා සිටියේ ය, රජ තෙමේ 'ඔපිසර! ආරක්ෂකභටයන් ගෙණ ගොස් උන් අල්ලා ගෙණෙව' යි නියම කෙළේ ය, ඔහු එසේ කෙළේ ය, රජයට විරුඬ ව නැගී සිටින සොරුන් ය සි හඟවා තුබූ බැවින් රජ

තෙමේ අධිකරණයට නො පමුණුවා ම උන් ඇතු ලවා පාගවා මරන්නට අණ කෙළේ ය, එ විට මඝ තෙමේ 'පින්වත්නි! නො බියවවු, දැන් අපට පිහිට වන්නේ මෙත් වැඩීම ය, ඒ නිසා රජු කෙරෙහි, මූලාදූනියා කෙරෙහි, ඇතු කෙරෙහි නො ද කිපෙවු, උන් හැම දෙන කෙරෙහි හා තමන් කෙරෙහි සමයිත් ඇත්තෝ වවු, එය ය අපට පිහිටැ' යි අවවාද කෙළේ ය, ඇත් උන් පාගා මරන්නට ආයේ ද, උන් වෙත ලංවන්නට අපොහොසත් විය, ඉදිරියට තබන පා පස්සට ම ඇදී යන්නේ ය, ඇත් ගොවිවෝ ඇතු මෙහෙයවීමෙහි අසමර්ථ වූහ, රජුට එ බව දැන් වූහ, රජ තෙමේ 'උන් හැමදෙනා කළාලයකින් වසා ඇතු ඉදිරියෙහි සිටුවා අනික් දෙනා එ තැනින් ඇත් ව සිට ඇතු මෙහෙයවු' යි නියම කොට හැරියේ ය, ඔවුහු එසේ කළහ, එහෙත් ඇත් තෙමේ තමන් සිටි තැනින් අඩියක් පමණකුත් ඉදිරියට පා තැබීමෙහි අපොහොසත් ව, සිටි තැන ම නො සැලී සිට ගත්තේ ය, රජ තෙමේ එ ද දැන 'මෙහි යම්කිසිවක් විය යුතු ය' යි සිතා 'ඔවුන් කැඳවා 'තෙපි කුමක් හෙයින් රට වනසහු ද, කුමක් නිසා කාණ්ඩ ගැසී රට පෙළහු ද, මා තොපට නො දුන්නේ කුමක් ද, මේ රට, මා සේ තොප විසිනු ත් රැකිය යුතු නො වේ දැ' යි ඇසී ය, 'දේවයන් වහන්ස! මේ කුමක් වදුරහු, දුප්පත් අපට පින්වත් දේවයන් වහන්සේගෙන් නො ලැබුනෙක් නැත, හැම දෙයක් ලැබේ, ඇයි! මෙසේ වදුරහු' යි උන් ඇසූවිට රජ තෙමේ 'තෙපි ගම්රට පෙළහු ය, කාණ්ඩ ගැසී සොරකම් කරහු ය, රජයට විරුඬ ව හැසිරෙහු ය, යි ඔපිසර තැන දන්වා තිබේ ය' යි කී ය, 'පින්වත් දේවයෙනි, අපි සොරහු නො වම්හ, සඟසැපලැබීමේ. මං සොය සොයා ඇවිදින්නමෝ ය, අපි ඒ පිණිස කටයුතු කරන්නමෝ ය, අපි මහාජනයා උදෙසා මංපෙත් පිළියෙල කරමින් පැන් පොකුණු කණිමින් හැසිරෙන්නමෝ ය, මේ දුටු ඔපිසර මහතා ඒ නො ඉවසා අප ලවා වැරදි වැඩ කරවන්නට සිතා ඒ පිණිස අප ඉදිරියෙහි නොයෙක් කරුණු කියා පෑය, ඔපිසර මහතා කියූ ඒ කිසිවක් අපි නො කෙළෙමු, එයින් කොපයට පත් ඔහු අප මරවන්නට සිතා ඔබවහන්සේ ඉදිරියෙහි මෙසේ බොරු කියා ඇතැ' යි ඔවුහු දැන්වූහ, රජ තෙමේ සංවෙගයට පැමිණ 'මේ ඔපිසර තැන තිරිසනෙකි, හොඳ නො හොඳ නො දන්නෙකි, උඹලාගේ ගති ගුණ කිසිවක් ඔහුට නො දැනුනේ ය, මම ත් උඹ කීවා අදහා ගත්තෙමි, ඔපිසර කෙරෙහි තුබූ ඇදහීම නිසා මම ත් වැඩිදුර කල්පනා නො කෙළෙමි, ඒ නිසා මා කෙරෙහි අමුත්තක් නො සිතවු' යි කියා අඹුදරුවන් සහිත වූ මූලාදූනියා

ඔවුන්ට දැසමෙහෙවර පිණිස දී 'වැඩ ගන්නැ' යි කියා ඇතු ද දුන්නේ ය, ඔවුන් විසූ ගම්වර ද ඔවුන්ට නින්දගම් කොට දුන්නේ ය,

මෙසේ රජුගෙන් ප්‍රසාද ලැබූ ඒ තෙතිස් දෙන 'අප කළ සහපත් වැඩවල ඵලය මෙහිදී ම අපි ලැබීමු' යි තුටු පහටු ව එකෙකා ඇතු පිට නැගී යන්නෝ 'අප වඩාත් පින්කම් කළයුතු ය' යි සිවු මං හන්දියක මහාජනයාගේ ප්‍රයොජනය පිණිස ඉඩ කඩ ඇති ඉතාසිත්කලු අම්බලමක් දක්ෂ වඩුවකු ලවා කරවූහ, එහෙත් එහි පින් ගැණුන්ට නො ද දුන්හ,

මඝයාට **නන්දා, චිත්තා, සුධම්මා, සුජාතා** යි අඹුවන් සිවු දෙනෙකි, උන් අතුරෙහි සුධම්මා තොමෝ වඩුවා හා කතා කොට 'මා මේ ගොඩ නගන හලෙහි ප්‍රධාන කරව' යි අල්ලස් දුන්නී ය, වඩුවා 'යහපතැ' යි අල්ලස ගෙණ කැලයට ගොස් කිණිහිරිගහක් කපා ගෙණ අවුත් වුවමනා පමණට එයින් කැබැල්ලක් කපා වෙන් කොට සැස වියලා යතු ගා විද කැණි මඩලක් සාදා එහි 'සුධම්මා' යන අකුරු ද කපා රෙදිකඩක් ඔතා තැබී ය, ගොඩනැගිල්ලෙහි වැඩ නිමවා කැණිමඩල සවි කරණ දිනයෙහි 'හා! අපට මතක නැති වූවක් තිබේ ය' යි වඩුවා කී කල්හි 'ඒ කුමක් දැ' යි ඔවුහු ඇසූහ, 'මුළුපරාල වද්දන වහළමුදුනෙහි සවිකරණ ලී කැබැල්ලැ' යි කී විට 'අපි ඒ පිණිස ලීයක් කපා ගෙණෙන්නෙමු' යි කීහ. 'දැන් අලුතෙන් කපා ගෙණ එන ලී කැබැල්ලකින් ඒ කරණු බැරි ය, කපා වියලා ගත් පරණ ලී කැබැල්ලකින් ම ඒ කළ යුතු ය' යි වඩුවා කීයේ ය, 'එසේ නම් දැන් කුමක් කළ යුතු දැ' යි ඔවුන් ඇසූ විට 'වැඩ අවසන් කොට තැබූ කැණිමඩලක් තිබෙන තැනකින් සොයා ගෙණ එවු' යි කීයේ ය, ඔවුහු සොයා බැලූහ, සුධර්මාවගේ ගෙයි වැඩ අවසන් කළ කැණිමඩලක් තිබෙන බව අසා එහි ගොස් මුදලට එය ඉල්ලූහ, සුධර්මා තොමෝ මුදලට එය නො දෙන බව ත් පිණට නම් දෙනබව ත් කිවූ ය, 'මුදලට මුත් පිණට නම් එය වුවමනා නැතැ' යි ඔවුන් කී කල්හි, වඩුවා 'තමුසේලා කුමක් කියහු ද, දැන් අලුත් කැණිමඩලක් මොන ලෙසකිනු ත් පිළියෙල කරගන්නට නො හැකි ය, මෙය මුදලට හෝ පිණට ගත්තහු නම්, ගොඩනැගිල්ලේ වැඩ අද ම අවසන් කළ හැකි ය, මුදලට නො දෙන්නී නම් පිණට වත් එය ගන්න! ගැණු නැත්තේ කොහි ද, බඹලොව පමණක්ය ගැණු නැත්තේ, එය කාරියක් නො වේ, මේ කැණිමඩල පිණට ගන්න! එවිට අපේ කාරිය මුදුන් පැමිණේ ය' යි කීයේ ය, ඔවුහු එය පි ණට ගත්හ

වඩුවා කැණිමඩල සවි කොට ගොඩ නැගිල්ලේ වැඩ මුළුමනින් අවසන් කලේ ය, ඔවුහු අම්බලම කොටස් තුනකට බෙදූහ, එක් කොටසක් පොහොසතුන් පිණිස ය, එක් කොටසක් දුප්පතුන් සඳහා ය, එක් කොටසක් ලෙඩුන්ට ය, ඒ හැම කොටසෙහි ඉදුම් හිටුම් ද පිළියෙල කළහ, එසේ කොට නැවැත ඔවුහු තෙතිස් දෙන එහි පැමිණියනට හිඳ ගණු පිණිස ඒ ඒ තැන ලෑලි තෙතිසක් ද පිළියෙල කොට තැබූහ, 'ආගනතුක ව එහි පැමිණි යමෙක් යමක්හු විසින් පිළියෙල කොට තැබූ ලෑලිකඩෙක හුන්නේ නම්, ඔහු ඒ ලෑලිකඩ තැබූ තැනැත්තහුගේ ගෙට ගෙණ එන්නැ' යි ඇතුට නියම කළහ, ඇතු විසින් ඒ ඒ ගෙට පමුණුවන ලබන ඒ ඒ ආගනතුකයන් පිළිබඳ පා මිරිකීම්, පිට මිරිකීම්, කැම් පීම් පිළියෙල කොට දීම් සෙනසුන් පණවා දීම් ආ සියල්ල ඒ ඒ ලෑලි කඩ තැබුවන් විසින් ම කළ යුතු ය, එ තැන් සිට ඇත් තෙමේ යමෙක් එහි පැමිණ යමක්හුගේ ලෑලි කඩෙක හුන්නේ නම්, ඔහු ඒ ලෑලිකඩ තැබූ තැනැත්තහුගේ ගෙට පමුණුවා ලයි, ලෑලිකඩ තැබූ තැනැත්තේ එ දවස ඒ ආගනතුකයාගේ සියලු කටයුතු මැනැවින් කරයි, මඝ තෙමේ අම්බලමට නො දුරු තැනෙක කොබෝලිලගසක් සිටුවා ගසේ මුල ගල්ලෑලක් පිහිටුවා ලී ය, අම්බලමට ඇතුල්වූවෝ කැණිමඩල බලා අකුරු දැක මේ අම්බලම සුධම්මා නමැ යි කියති, ඒ තෙතිස් දෙනාගේ නම් නො කිය වේ,

නන්දෘ තොමෝ, 'මොවුහු අම්බලම කරවන්නෝ අපට පින් නො දුන්නෝ ය, සුධම්මා තොමෝ තමන්ගේ දාසී කමින් පිණෙහි කොටසක් ලබා ගත්තා ය, දැන් මා විසිනු ත් කිසිවක් කළ යුතු ය, කුමක් කරම් දැ'යි සිතා 'අම්බලමට පැමිණියවුන්ට බීමට පැන් හා නැමට වතුර තිබිය යුතු ය, එ හෙයින් මා විසින් පොකුණක් කැණවිය යුතු ය' යි පොකුණක් කැණ වූවා ය, විත්‍රා තොමෝ 'සුධම්මා කැණිමඩලක් දුන්නී ය, නන්දෘ පොකුණක් කරවූ ය, මා විසිනු ත් යම් කිසිවක් කළ යුතු ය' යි සිතා මල්උයනක් කරවූ ය, මේ මල්උයන මල් ගන්නා පල ගන්නා අසුවල් ගස නැත්තේ ය යි නො කියැකි තරමට මල්රුක් පලරුක්වලින් පිරී සිටියේ ය, සුජාතා ව 'මම මඝයාගේ මාමාගේ දූ ය, පාදපරිචාරිකා ය, එ හෙයින් මොහු කරණ කම් මාගේ ය, මා කරණ කම් මොහුගේ ය' යි සිතමින් කිසිවක් නො කොට ඇඟපත සරසමින් දවස් ගෙවූ ය, මඝ තෙමේ ද තමන් කළ නොයෙක් පින්කම් අතර මවුපියන් රැකුම, කුලදෙටුවන් පිදුම, ඇත්තකීම යනාදි සප්පාවුතපදය ද අඩු නැති ව පුරා මැරී ගොස් තව්තිසා දෙව්ලොව සක්දෙව්රජ ව උපන, වඩුවා විස්කම් දෙව්පුත් විය

එ දවස තව්තිසාදෙව්ලොව අසුරයෝ විසූහ, ඔවුහු අලුත උපන් මොවුන් දැක 'අලුත් දෙව්පුත්හු උපන්හ' යි ඔවුනට සුදුසු සේ පැන් පිළියෙල කළහ, සක්දෙව් තෙමේ ඒ දැක, 'මේ පැන් මා පිරිසෙහි කිසිවකු විසින් නො පිය යුතු ය' යි නියම කෙළේ ය, අසුරයෝ ම ඒ පැන් බීහ, එයින් ඔවුහු මත් වූහ, සක්දෙව් තෙමේ 'මේ සාධාරණරාජ්‍යයෙන් මට වැඩක් නැතැ' යි සියපිරිසට දන්වා මත් ව වැටී සිටි අසුරයන් පාවලින් ගන්වා මහාමූදෙහි දැම්ම වී ය, ඔවුහු යටිකුරු හිස් ඇති ව මුහුදෙහි වැටුනාහ, එ කෙණෙහි ඔවුන්ගේ පින්බලෙන් මහමෙර පල්ලෙහි අසුර විමන පහළ වූයේ ය, සිත්පළොල් රුක ද එහි ම හටගැණුනේ ය, දෙවියන් හා අසුරයන් අතර යුද්ධයේ දී අසුරයන් පැරද ගිය කල්හි ය දස දහසක් යොදුන් පමණ වූ තව්තිසාදෙව්ලොව පහළ වූයේ, ඒ දෙව් නුවර පෙර අපර දෙ දිග දෙරටු අතර පරතරය යොදුන් දස දහසක් පමණ වේ, දකුණු උතුරු දෙ දිග අතර පරතරය ද එ පමණ ම ය, නගරය දෙරටු දහසකින් සැදුම් ලද්දේ ය, උයන් පොකුණු ආදියෙන් සිත් ගන්නේ ය, නුවරමැද යොදුන් සත් සියයක් උස් වූ වෛජයන්ත නමින් ප්‍රාසාදයෙක් නැගී සිටියේ ය, ලෙලදෙන ධජපතාකාදියෙන් පිරී සිටි ඒ ප්‍රාසාදය නැගී සිටියේ, පෙර අත්බවේ දී අම්බලම කළ පිණේ එක්තරා විපාකයක් වශයෙනි,

ඒ පහයෙහි රන්යටලීවල මැණික්දද, මැණික්යටලීවල රන් දද, පබලුයටලීවල මුතුදද, මුතුයටලීවල පබලුදද, සත්රුවන් යටලීවල සත්රුවන් දද නිතර ලෙල දුන්හ, හැම දදයෙක් ම යොදුන් තුන්සියයක් පමණ දිග ය, යොදුන් සත් සියයක් උස් වූ මෙම පහය සත්රුවණින් ම කැරුණෙක් ව සිටියේ ය,

කොබෝලීලගස සිටුවීමේ විපාක විසින් අවට යොදුන් සියයක් පැතිර ගත් පරසතුරුක පහළ විය,

ගල්ලෑල්ල සවි කළ පිණේ විපාක විසින් පරසතුරුක්මුල පඬුඇඹුල්ගල්අසුන නැගි සිටියේ ය, එය සැට යොදුනක් දිග ය, පණස් යොදුනක් පළල ය, පසළොස් යොදුනක් ඝනය, බඳුවද මල්පැහැය බඳු පැහැය ඇත්තේ ය, හුන් කල සිරුරෙන් අඩක් එහි ගැලී සිටි යි, හිඳ නැගී සිටි කල සමතල ඇත්තේ වේ.

මඝ මාණවක දවසෙහි, වැඩ ගත් ඇත් තෙමේ ඵෙරාවන නම් දිව්‍යපුත්‍ර ව උපන්නේ ය, දෙව්ලොව තිරිසන්නු නැත, එ හෙයින් ඒ දිව්‍යපුත්‍ර තෙමේ උයන් කෙළියට යන කල්හි ඒ අත්බව හැර දමා එක් සිය පණස් යොදුන් වූ ඇත්වෙසක් ගන්නේ ය, ඔහු මේ

තෙතිස් දෙනාට තෙතිස් කුඹක් මවාපාසි, ඒ මත්තෙහි දෙලොස් යොදුන් පමණ වූ රතනමණ්ඩපයෙක් වෙයි, එහි අතරින් අතර යොදුන් පමණ උස් වූ සප්තරතනමය ධ්වජයෝ වෙති. කෙළවර කිකිණිදැල් එල්බේ, මණ්ඩපය මැද, සක්දෙව් රජ පිණිස යොදුනක් පමණ වූ මිණිපළඟෙක් මැවුනේ ය, තෙතිස් කුඹු අතරෙහි එක් එක් කුඹෙහි දත් සත සත වේ, ඒ එක් එක් දත පණස් පණස් යොදුන් පමණ දික් වේ, එක් එක් දතෙහි පොකුණු සත සත වේ, එක් එක් පොකුණෙහි නෙළුම්පඳුරු සත සත වේ, එක් එක් නෙළුම්පඳුරෙහි මල් සත සත වේ, එක් එක් මලෙහි පෙති සත සත වේ, එක් එක් පෙත්තෙහි දෙවකන්‍යාවෝ සත් සත් දෙන නටති, මෙසේ හාත්පස පණස් යොදුන් පමණ වූ තැනැ ඇත් දත්හි ම නාට්‍ය මණ්ඩපයෙක් වේ, මෙසේ මහත් සැපත් විඳිමින් සක්දෙව් තෙමේ දවසරින්නේ ය,

සුධර්මා තොමෝ කලුරිය කොට එහි ම උපන, සුධර්මා නම්, දිව්‍යසභාවක් ඇයට පහළ වූ ය, ඕ නව සියයක් යොදුන් පමණ ය, ඒ දිව්‍යසභාවට වඩා සිත්කලු වූ අන් තැනෙක් එහි නැත්තේ ය, මසකට, අට වරක් එහි දහම් ඇසීම වේ,

නන්දා තොමෝ කලුරිය කොට එහි ම උපන, නන්දා නම් පොකුණ පහළ වූවා ඇයගේ පිණට ය, යොදුන් පන් සියයක් දිග පළල ය ඒ පොකුණ, චිත්‍රා උපන්නී ද එහි ම ය, පන් සියයක් යොදුන් පමණ වූ සිතුලියවනය පහළ වූයේ ඇය කළ පිණට ය, සුජාතා කලුරිය කොට එක් කඳුරැලියෙක කණ කෙකිණක් ව උපන, ඇයට දෙව්ලොව ඉපදීමට පිණෙක් නො වී ය,

මේ අතර දිනෙක ශක්‍ර තෙමේ ස්වකීයභාර්‍යාවන් ගැණ විමසන්නේ සුධර්මා – නන්දා – චිත්‍රාවන් තමන් හා එක් ව උපන් බවත් සුජාතාවන් එක්තරා කඳුරැලියෙක කණකෙකිණි ව උපන් බවත් දුටුයේ ය, 'අය්යෝ! මේ මෝඩිය කිසි පිණක් නො කොට දැන් තිරිසනුන් මැද ඉපද සිටී, දැන්වත් මැය ලවා පිණක් කරවා මා වෙත පමුණුවා ගත යුතු ය' යි සිතා දිව්‍යාත්මය හැර දමා රහස් වෙසක් ගෙණ ඇය හමුවට ගොස් 'මෙහි කුමක් කරහි දැ' යි ඇසී ය, එවිට 'තෝ කවු දැ' යි ඕ ඇසූ ය, 'මම ගිය අත්බවේ තීගේ ස්වාමි වූ මඝ නම් වෙමි' යි කී විට 'ඔබ වහන්සේ උපන්නහු කොහි දැ, යි ඇසූ ය, 'මම තව්තිසාදෙව්ලොව, තීගේ ඒ බුහුනනියෝ ත් එහි මා ලඟ, දකිනු කැමැත්තෙහි ද උන්' යි ශක්‍ර තෙමේ ඇසුයේ ය, 'දකිනු කැමැති යි, එහි කෙසේ යම් දැ' යි ඇය කී විට, ඔහු ඇය අතට ගෙණ දෙව් ලොවට ගෙණ ගොස් නන්දාපොකුණුඉවුරෙ තබා අතික් තිදෙනාට 'තොපගේ බුහුනැනි වූ සුජාතාවන් බලවු'යි

කීයේ ය, 'ඈ කොහි දැ' යි ඇලා ඇසූ විට 'ආ, නන්දපොකුණු ඉවුරෙහි' යි කී ය, එහි ගොස් ඇය බලා 'අනේ! දෙවියනේ! අපේ බුහුනැනියට සිදුවී ඇති විපත, ඇඟපත සරස සරසා ඉදීමේ විපාක, එදා යසට තුබූ කටක හැටි අද, බලවු, එය කටක් නො වේ, හොටයෙකි, කකුල්, කෙණ්ඩා, බලවු, ඒවායේ හැටි' යි කියා කවටකම් කොට ගියහ, එයට පසු පැමිණි සක්දෙව් තෙමේ 'බහුනැනියෝ දක්නා ලද්දහු දැ?' යි අසා 'දක්නා ලදහ, ඔවුහු මට කවටකම් කොට ගියහ, මා ගෙණ ගොස් මා හුන් තැනැ ලව' යි කී විට ඇය ගෙණ ගොස් හුන් තැනැ තබා බුහුනැනියන් හා එක් ව ඉපදීමට සෑහෙන යමක් කළ යුතු ය' යි කීයේ ය, 'මා විසින් ඒ සඳහා කුමක් කළ යුතු දැ' යි ඇය ඇසූ විට 'මා දෙන අවවාදය රකුව' යි ඔහු කී ය, සක් දෙව් තෙමේ ඇය පන්සිල් ගන්වා 'අප්‍රමත්ත ව පන්සිල් රකුව' යි කියා ගියේ ය, ඕ එතැන් සිට තමා මළමසුන් ම සොයා කයි, මසුන් තමන් මරා නො කයි ශක්‍ර තෙමේ කිහිප දවසකින් පසු ඇය විමසනු පිණිස එහි ගොස් වැලිපිට මළමසකු සේ හොත්තේ ය, ඕ ඒ දැක මළමසෙකැ යි සිතා හොටෙන් අල්ලා ගිලින්නට වන, එකල මත්ස්‍ය තෙමේ නඟුට සැලුයේ ය, කෙකිණි තොමෝ 'පණ ඇති මසෙකැ' යි සිතා හැර ගියා ය, ශක්‍ර තෙමේ ටික වේලාවක් හැර පියා නැවැත ත් ඇය ඉදිරියෙහි උඩ බලා හොත්තේ ය, එවර ද, කෙකිණි තොමෝ මළ එකෙකැ' යි ගෙණ මදක් ගිලින කල්හි නඟුටකෙළවර සැලී ය, එවර ත් ඕ ඌ හැර ගියා ය, මෙසේ සක්දෙව් තෙමේ ඈ තෙවරක් විමසා බලා යහපත් ව සිල්රකිනබව දැන 'මම ශක්‍ර වෙමි, තී විමසන්නට පැමිණියෙමි, හොඳින් සිල් රකුව, හොඳින් සිල් රැක්කොත් කල් නො යවා මා ලඟ උපදිනු හැකි ය, අප්‍රමත්ත වෙව' යි කියා ගියේ ය, කෙකිණි තොමෝ එතැන් සිට තමන් මළ මසුන් නො ලැබීමෙන් නිරාහාර වූවා කලුරිය කොට තමන් රැකි සීලයා ගේ විපාකවශයෙන් බරණැස්නුවර කුඹල් කරුවකුට දූව උපන, මෙසේ උපත ලැබූ ඇය වයසින් පසළොස් හවුරුද්දට පැමිණි කළ ශක්‍ර තෙමේ 'ඈ කො තැනැ උපන්නී දැ' යි බැලී ය, බරණැස් නුවරැ කුඹළකුට දූ ව උපන්බව දැන 'මා දැන් එහි යා යුතු ය' යි කැකිරිගෙඩි සේ පෙණෙන සත් රුවන් රැසක් බරකරත්තයක පටවා කරත්තය පැද ගෙණ බරණැසට ගොස් 'කැකිරි, කැකිරී' යි කියමින් කඩමණ්ඩියෙහි ඔබිනොබ හැසුරුණේ ය, මුං උඳු ආදිය දී කැකිරි ගන්නට ආවුන්ට මුං උඳු ආදිය ගෙණ කැකිරි නො දී, 'සිල් ඇත්තන්ට කැකිරි දෙමි' යි ඔහු කීයේ ය, 'මුදලාලි සිල් කෙබඳු ද, නිල් ද, කලු ද, සුදු ද, වට ද, පැතැලි ද දිග ද, කොට ද, රස මොක දැ' යි කැකිරි ගන්නට ආ අය ඇසූහ,

'තෙපි සිල් නම් කිමැ' යි නො දන්නහු, එසේ විට සිල් කෙසේ රකිහු ද, මේ කැකිරි දෙන්නේ සිල් රකින්නන්ටැ' යි කී විට 'මුදලාලි! මෝ මෙනුවර කුඹල් කරුවකුගේ දුවක්, මෝ නම්, සිල් රකිමි යි කිය යි, ඒ නිසා කැකිරි මැට දෙන්නැ' යි එහි පැමිණ සිටියෝ කීහ, එවිට ඕ ද 'මුදලාලි! මම යි මෙනුවර සිල් රකින්නී ය, මම නො හල පන්සිල් ඇත්තී වෙමි, නො කඩ කොට පන්සිල් රකිමි මම, එහෙයින් මට දෙව' යි කිවු ය, මේ කැකිරි කරත්තය ගෙණෙන ලද්දේ නී පිණිස ය' යි කියා ශක්‍ර තෙමේ බරකරත්තය ඇයගේ ගෙදරට දක්කා ගෙණ ගොස් අනෙකක්හට නො ගත හැකි කොට කැකිරි ලෙසින් ගෙණ ආ සත්රුවන් සමූහය ඇයට දී තමන් ශක්‍රයා බව දන්වා 'නිට දිවි ගැලවීමට මේ ධනය පමණ ය, එ හෙයින් නො කඩ කොට පන්සිල් රකුව' යි නියම කොට දෙව්ලොව බලා හියේ ය,

කුඹල්කරුගේ දූ තොමෝ දිවිහිම් කොට මැනැවින් පන්සිල් රැක මිනිස්බවින් චුත වූවා, අසුරභවනයෙහි නායකඅසුරයාගේ දූව උපන්නු ය, අත්බැව් දෙකේහි ම මැනැවින් සිල් රැකි බැවින් යහපත් රූ ඇත්ති රන්වන් වූවා අසාධාරණ රූපශ්‍රියෙන් යුකත වූ ය, මේ කාලයෙහි ආ බිරිය කොට ගැන්මට නොයෙක් අසුරයෝ ඇයගේ පියා වෙත පැමිණියෝ ය, ඇයගේ පිය වූ වෙපචිත්තිඅසුරෙන්ද්‍ර තෙමේ 'තෙපි මාගේ දුවට නො ද සෑහෙන්නහු' යි ඔවුන් යවා 'මාගේ දූ ම තමන්ට කැපෙන හිමියකු සොයා ගණු ඇතැ' යි දිනෙක අසුරයන් රැස් කරවා 'නිට කැපෙන හිමියකු මේ අසුරයන් අතුරින් නී ම සොයා ගණුව' යි දුවට මල්වඩමක් දුන්නේ ය, සක්දෙව් තෙමේ ඇය උපන් තැන බලන්නේ මේ තොරතුරු දුන 'දුන් මා එහි ගොස් ඈ ගෙණ ආ යුතු ය' යි අසුරවෙසක් ගෙණ එහි ගොස් පිරිස් කෙළවර සිටියේ ය, අසුරකන්‍යා තොමෝ ඔබිනොබ බලන්නී පෙර එක් ව විසිමෙන් හටගත් පෙම් බැඳුමෙන් 'මෙතෙමේ මාගේ හිමියා' යි සක්දෙවිකාර මල්වඩම දැම්මා ය, එ කෙණෙහි අසුරයෝ 'අන්න හරි, අපගේ රජ මෙතෙක් කල් දූට කැපෙන හිමියකු සෙවූ සැටි, දුන් නම් දෙන්නා හොඳට ගැළපෙති, මූ මැගේ මුත්තා සේ ය, ඌට ත් වඩා මූ නාකි ය, අනේ, අපූරු යි ගැළපුම, මුත්තාගේ හා මිනිබිරියගේ දිග ය' යි කවටකම් කරමින් හියහ, සක්දෙවි අසුරකත අතින් අල්ලා ගෙණ 'මම සක්දෙවිමි' යි හඬ නගා කියමින් අහස්කුසට නැංගේ ය, අසුරයෝ ද 'මේ මහල්ලා විසින් අපි රවටන ලද්දෙමු' යි ඔහු ලුහු බැඳ හියහ. මාතලිරියැදුරු තෙමේ වෛජයන්තරථය ගෙණ අතර මග සිටියේ ය, සක්දෙවි තෙමේ ඇය රියට නංවා ගෙණ දෙව්නුවර

බලා ගියේ ය, ඔවුන් ගුරුළන් වසන ඉඹුල් වනයට ලංවූ කල්හි බියපත් වූ ගුරුළුපැටවු හඬන්නට වන්හ, ශක්‍ර තෙමේ 'හඬන්නෝ කවුරහු දැ' යි අසා 'ගුරුළු පැටවු' යි කී කල්හි නැවැත 'කුමක් හෙයින් හඬත් දැ' යි ඇසී ය, 'රිය හඬ අසා මරණබියෙන් බියපත් ව හඬති' යි කී විට 'තනි මා නිසා මෙතෙක් දෙන රථවෙගයෙන් සුණුව ගියහ, උන් නො නසව, රිය නවතා ලව' යි දැන්වී ය, මාතලී තෙමේ රිය නවතාලී ය, අසුරයෝ ඒ දැක 'මහලු සක්දෙව්, අසුරපුරයෙහි පටන් පලා ගොස් දැන් රිය නවතා ලී ය, මොහු විසින් පිහිටක් ලද්දේ වනැ' යි නැවතී ආ මගින් ම අසුරපුරයට වන්හ, හිස් ඔසොවා නො ද බැලූහ,

සක්දෙව් තෙමේ මෙසේ සුජාතා අසුරකන්‍යාව දෙව්පුරයට ගෙණ ගොස් අඩු තුන් කෙළක් දෙවඟනන්ට ප්‍රධාන කොට තැබී ය, ඉක්බිති ඕ තොමෝ 'දේවයන් වහන්ස! මෙහි මට මවුපියෝ නැත, සහෝදරසහෝදරියෝ නැත, මම තනි වෙමි, නැදැ කිසිකෙනෙක් නැත, එ හෙයින් ඔබතුමන් යන යන තැනට මා කැටිව ම යනු මැනැවැ' යි ඉල්ලා සිටියා ය, සක්දෙව් තෙමේ 'යහපතැ' යි එය පිළිගත්තේ ය,

අසුරභවනයෙහි සිත්පළොල්ගසෙහි මල් හටගත් කල්හි 'අපගේ පරසතුගසෙහි මල් හටගන්නා කාලය' යි අසුරයෝ සක්දෙවිඳුන් හා යුද්ධයට යති, සක්දෙව් තෙමේ මුහුද යට නාගයන් ලවා, ඉන් උඩ ගුරුළන් ලවා, ඉන් උඩ කුම්භාණ්ඩයන් ලවා ආරක්ෂා කරවී ය, දෙව්පුර දොරටුවෙහි වජ්‍රායුධ ගත් අත් ඇති ශක්‍රප්‍රතිමා තැබ්බවී ය, අසුරයෝ නාගාදීන් සිඳ බිඳ හැර නැගී ආවෝ ද ශක්‍රප්‍රතිමා දැක 'ශක්‍ර තෙමේ නික්මුනේ වනැ' යි පැන දුවති' යි වදාරා 'මහාලි! මඝ තෙමේ මෙසේ අප්‍රමාදප්‍රතිපත්තියෙහි පිළිපැද මේ සා මහත් ඉසුරට පැමිණ දෙ දෙව්ලොව රජය කරවූයේ ය, අප්‍රමාදය වනාහි බුද්ධාදිමහොත්තමයන් විසින් පසස්නා ලද්දේ ය, අප්‍රමාදය නිසා ම සියලු ලෞකික ලොකොත්තරගුණයන්ට පැමිණි ය' යි මේ ධර්මදෙශනාව ද කළ සේක.

අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො,
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදාති,

මඝමාණවක තෙමේ අප්‍රමාදහෙතුවෙන් දෙවියන්ගේ ශ්‍රෙෂ්ඨ භාවයට ගියේ ය. (එහෙයින්) නො පමාබව පසසත්. පමාබව සියලු කල්හි ගරහන ලද්දේ ය.

අප්පමාදෙන අප්‍රමාදහෙතුවෙන්.[1]

---

1. 2. 1. "අප්පමාදො" යනු බලනු.

මඝමාණවකයා විසින් අත් දෙතිස් දෙනකුත් හා එක් ව මවල් නම් ගම්හි, බිම්පෙදෙස් පිරිසිදු කිරීමෙහි පටන් පුරණලද අප්‍රමාද ප්‍රතිපත්තිය මෙයින් කිය වේ.

මඝවා = ශක්‍ර තෙමේ.

මඝ යන නම මොහුට ඇත්තේ, මඝවනතු, නම්. ප්‍රථමා විභක්ති එකවචනයෙහි **'මඝවා'** යි ආයේ ය. පිදිය යුතු අරුතෙනුදු **'මඝවා'** යි කියත්.

දෙවානං = දෙවියන්ගේ

දෙවියෝ තෙ පරිදි ය. **සම්මුතිදෙව – උපපත්තිදෙව – විසුද්ධි දෙව** යි. එහි සම්මුතිදෙවියෝ නම් රජහු ය. චාතුම්මහාරාජකාදීහු උත්පත්තිදෙවියෝ ය. බුබාදිමහොත්තමයෝ විසුද්ධිදෙවියෝ ය. **'සම්මුතිදෙවා නාම රාජානො, දෙවියො, කුමාරා, උපපත්ති දෙවා නාම භුම්මදෙවෙ උපාදාය තදුත්තරිදෙවා, විසුද්ධිදෙවා නාම බුද්ධපච්චෙකබුද්ධඛීණාසවා'නි,** යනු පොතෙහි ආයේ ය.

මෙහිලා ගැණෙන්නෝ උත්පත්තිදෙවියෝ ය. මේ මොවුන් ගැණ කී සැටි:- **'දිබ්බන්ති කීළන්ති පංචහි කාමගුණෙහි, පටිපක්ඛෙ වා විජෙතුං ඉච්ඡන්ති, වොහරන්ති ච ලොකස්ස යුත්තායුත්තං, ජොතන්ති පරමාය සරීරජුතියා, ථොමියන්ති තබ්භාවත්ථිකෙහි, කාමියන්ති දට්ඨුං සොතුං ච සොභාවිසෙස යොගෙන ගච්ඡන්ති ච යථිච්ඡිතට්ඨානං අප්පවිහතගමනෙන, සක්කොන්ති ච අනුභාවසම්පත්තියා තං තං කිච්චං නිප්ඵා දෙතුන'නි'** යි. පස්කම්ගුණෙන් කෙළින්නෝ, ප්‍රතිපක්ෂයන් දිනන්නෝ, ලොකය පිළිබඳ යුතු අයුතුකම් පවසන්නෝ, උතුම් සිරුරුකැලුමින් ස්තුති කරණු ලබන්නෝ, ඒ අයුරු ප්‍රයොජන කොට ගත්තවුන් විසින් දකින්නට අසන්නට කැමැති වනු ලබන්නෝ, නො පැකිළි ගමනින් තමන් කැමැති තැනට යන්නෝ, සිය තෙදින් ඒ ඒ කටයුතු කිරීමෙහි පොහොසත් වන්නෝ දෙවියෝ ය යනු, මෙයින් කිහ.

දෙවානං' යන මෙයින් ප්‍රධාන විසින් ගැණෙන්නෝ **චාතුම්මහාරාජික-තාවතිංස** යන දෙදෙවිලොව වැසි දෙවියෝ ය.

සෙට්ඨතං ගතො = ශ්‍රෙෂ්ඨභාවයට ගියේ ය.

මෙකී දෙවියන්ගේ ශ්‍රෙෂ්ඨභාවයට ගියේ ශක්‍ර තෙමේ ය. මේ හැම දෙවියන්ට වඩා පස්කම්සැපයින්, බලපැරකුමෙන්, පින් තෙදින් නැඟී සිටියේ ශක්‍ර තෙමේ ය. මේ කිසිවකින් දෙදෙවිලොව වැසි අන් එක ද දෙවියෙක් ශක්‍රයා අබිබවා සිටීමෙහි අපොහොසත් ය. **'දෙවානමිඳු'** යනු යෙදුනේ ද ඒ නිසා ය.

අප්පමාදං පසංසන්ති = නොපමා බව පසසත්.

නො පමාබව කවුරු පසසත් ද? යත්:- බුඩාදිමහොත්තමයෝ පසසති නො පමාබව. නො පමාබව හෙතුකොට සියලු ලොවී ලොවුතුරු සැප ලැබෙන බැවින් එසේ පසසති. **'බුඩාදයො පණ්ඩිතා අප්පමාදං එව ථොමෙන්ති වණ්ණයන්ති කිං කාරණා සබ්බෙසං ලොකියලොකුත්තරානං විසෙසානං පවිලාභකරණත්තා'** යනු අටුවාය.

පමාදො ගරහිතො සදා = ප්‍රමාදය තෙමේ සියලු කල්හි ගරහන ලද ය.[1]

බුඩාදිආර්‍ය්‍යයන් විසින් පමාබව හැම කල්හි ගරහන ලද්දේ ය. කුමක්හෙයින් ද? යත්:- පමාබව සියලු විපත්වලට මුල් වන බැවිනි. මෙන්න අටුවා පාළිය:-

'පමාදො පන තෙහි අරියෙහි නිච්චං ගරහිතො නින්දිතො කිං කාරණා සබ්බවිපත්තීනං මූල භාවතො, මනුස්සදෙහගගං වා හි අපායුප්පත්ති වා සබ්බෙ පමාදමූලිකායෙවා ති,

ධර්මදෙශනාවගේ අවසානයෙහි මහාලි ලිච්ඡවි තෙමේ සෝවන් පලයෙහි පිහිටියේ ය. පැමිණ සිටි පිරිසෙන් බොහෝ දෙනෙක් සෝවන් පලාදියට පැමිණියෝ ය.

මහාලීප්‍රශන වසතුව නිමියේ ය.

---

1 2. 1. 'පමාදො' යනු බලනු.

කන්දක් උඩදි රහත් වූ උතුමෙක්

2 — 8

නමින් ප්‍රසිඩියට නොපැමිණි එක් සථවිරයන් වහන්සේ නමක් බුදුරජානන් වහන්සේ වෙතින් කමටහන් උගෙණ වනයට ගොස් රහත්බවට පැමිණෙන්නට උත්සාහ කළ සේක. එහෙත් උන්වහන්සේ රහත්බවට පැමිණෙන්නට අපොහොසත් වූහ. එ හෙයින් 'නැවැතත් කමටහන් කියවා ගන්නෙමි' යි වනයෙන් නික්ම බුදුරජුන් වෙත එන්නෝ අතරමග දී හැමනින් බුරබුරා නැගී මහත් ලැව්ගින්නක් දුක, වහවහා ගොස් ගස්කොළන් නැති කන්දක් උඩ නැගි වනය දවා පැතිර යන ඒ ලැව්ගින්න බලා 'මේ ගිනිකඳ ලොකු කුඩා දර පරඬලා දවමින් යම්සේ පැතිර යේ ද, එමෙන් ආයෂ්මාගීඤ්ඤන නැමැති ගින්නෙන් කුදු මහත් සසරබැදුම් දවා යා යුතු වන්නේ ය' යි අරමුණු ගත්හ. එ වේලෙහි තිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේ ගඳකිළි යෙහි වැඩහුන් සේක. උන්වහන්සේ එහි දී ඒ සථවිරයන් වහන්සේ ගේ සිතේ පැවැත්ම දුන, 'මහණ! ඒ එසේ ය' කමුසේගේ සිතුවිල්ල ඉතා යහපත් ය, සත්වයන්ගේ සිතතුළ හටගන්නා ලොකු කුඩා සංයොජන මේ වෙනෙහි වූ ලොකු කුඩා දරකැබලි වැනි ය, එහෙයින් සත්වයන්ගේ ඇතුලත උපදින ඒ ලොකු කුඩා සංයොජන, ආයෂ්මාගීඤ්ඤන නැමැති ගින්නෙන් දවා නැවැත ඔවුනට ඉපදීමට ඉඩ නොතැබිය යුතුය' යි ආලොකයක් පතුරුවා ඒ භික්ෂූන් වහන්සේගේ ඉදිරිපිට සිටියහු සේ පෙණෙන සේක් මේ ධම්දෙශනාව කළ සේක.

අපමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා,
සංයොජනං අණුං ථූලං ඩහං අග්ගි'ව ගච්ඡති'ති.

නොපමාබවෙහි ඇලුනු පමාබවෙහි බිය දක්නා සුලු මහණ තෙමේ ලොකු කුඩා දරකෝටු දවමින් පැතිර යන ගින්නක් සේ ලොකු කුඩා සංයොජන දවමින් නිවනට යන්නේ ය.

අපමාදරතො = නොපමාබවෙහි ඇලුනු.

මෙහි එන **'භික්ඛු'** යන්නට විශෙෂණ ව සිටියේ ය. අප්‍රමාද ප්‍රතිපත්තියෙන් කල් දවස ගත කරන්නේ ය **'අපමාදරත'** නම්.

භික්ඛු = මහණ තෙමේ.

පමාදෙ භයදස්සි වා = පමාබවෙහි බියදක්නා සුලු.

මෙ ද, භික්ඛු, යන්නට විශෙෂණ වේ නිරයෙහි ඉපැන්ම මුල් කොට ඇති පමාබවෙහි බිය දක්නේ, නොහොත්, නිරයෙහි ඉපැදුම් ආදියට මුල් වූ බැවින් පමාබව බිය විසින් දක්නා සුලු වූයේ ය, **'පමාදෙ භයදසසී'** නම්.

සංයොජනං = සංයොජනයන් සසරයෙදුම්. සසරබැඳුම්.

සත්වයන් සසරදුක හා යොදන බඳින, සත්වයන් සසරෙහි ගල්වන දහම් ය සංයොජන. **සක්කායදිට්ඨි-විචිකිච්ඡා - සීලබ්බත පරාමාස - කාමරාග - ව්‍යාපාද - රූපරාග - අරූපරාග - මාන-උද්ධච්ච - අවිජ්ජා** යන මේ දසය සංයොජනැ යි ගැණේ. මොවුන් ගේ ශක්තිය බලාය, සංයොජනැ යි කීවෝ. **'යස්ස සංවිජ්ජති තං පුග්ගලං වට්ටස්මිං සංයොජෙති බන්ධතීති = සංයොජනං'** සංයොජනයෝ යමකුට වෙත් නම්, ඒ පුද්ගලයා සසර යොදන්-නෝ ය, බඳින්නෝ ය, ඒ සංයොජනයෝ. **'වට්ටස්මිං සත්තෙ සංයොජෙති බන්ධතීති = සංයොජනං'** සත්වයන් සසරදුකෙහි දැඩි කොට යොදන්නේ බඳින්නේ සංයොජන නම. **'සංයොජනන්ති = බන්ධනං'** යනු කියේ එහෙයිනි. තව ද **'සංයොජනන්ති වට්ට දුක්ඛෙන සද්ධිං සන්ධානං'** යන මෙයින් ද කියේ ඒය.

'තානි සංයොජනානි සක්කායදිට්ඨිවාදිකි සක්කායදිට්ඨිවාදයො කම්මං වා ඵලෙන සමසා සංයොජනානීති වුච්චන්ති' යි තවත් මදක් සංයොජන යන්නෙහි අරුත හෙළි කළහ. ඔවුහු සක්කායදිට්ඨි භවාදිය, සක්කායදිට්ඨිභවාදිය හා යොදත්. **කම්ම** හෝ ඵලය සමග යොදත්. එහෙයින් සංයොජනැ යි කියනු ලැබෙත්, යනු එහි අරුත් ය.

සත්වයන්ගේ සසර ඉපැන්මට හෙතු වූවෝ, සත්වයන් සසර යොදන්නෝ සංයොජනයෝ ය, යනු මේ සියලු වාක්‍යයන්ගේ කෙටි තේරුම් ය. සියලු තන්හි අදහස එකෙක් ම ය. සත්වයන්ගේ සක්කා ධාරණය ත් අපායාදිගතිවල ඉපැන්ම ත් එකවොකාරාදි භවයන්හි විසීම ත් යම් ධර්මශක්තියකින් සිදු වෙත් නම් ඒ සිද්ධියට හෙතු වූ වෝ සංයොජනයෝ ය.

අණුං = කුඩා වූ

මෙයින් **රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා** යන පස ගැණේ. **උද්ධම්භාගිය** යි කියනු ලබන්නේ ද මේ පංචකය ය. රූපාරූපභවයෙහි උපතට හෙතු වන්නේ මේ පසය. එහෙයිනි උද්ධම්භාගිය යි කියන්නේ. **'උද්ධං වුච්චති රූපාරූපභවා'** රූප ලොක-අරූපලොක දෙක 'උද්ධං'යි කියනු ලැබේ. එහෙයින් රූප

රූපලොකයන්හි වූවෝ, එහි උපතට හෙතු වූවෝ 'උඩම්භාගීය' නම් වෙති. මේ සංයොජන පස, ඉතිරි සංයොජන පස සේ බල ගතු නො වන බව 'අණුං' යන මෙයින් වදාළ සේක. 'ථූලං' යන මෙයින් ගැණෙන සංයොජන සිඳහැරීම ම ඉතා දුකසේ කට යුතු ය. ඔවුන් සිඳහැරීමෙන් පසු මොවුන් සිඳහැරීම නිදුකින් කළ හැකි ය. මොවුන්ගේ සිඳහැරීම එකාන්තසිඩ ය. කාමලොක යෙහි උපත නැති කළ උතුමන් පිළිබඳය මේ සංයොජන පස. ආර්‍යපුද්ගලපක්ෂයෙහි ලා ගැණෙති මේ උත්තමයෝ.

ථූලං = ලොකු වූ. මහත් වූ.

මෙයින් **සක්කාය දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස-කාම-රාග-ව්‍යාපාද** යන පස ගැණේ **ඔරම්භාගීය'** යි කියනු ලබන්නේ ද, මේ පංචකය ය. කාමලොකයෙහි උපතට හෙතු වන්නේ මේ පස ය. එහෙයිනි ඔරම්භාගීය' යි කියන්නේ. **'ඔරං වුච්චති කාම ධාතු'** කාමලොකය 'ඔර' යි කියනු ලැබේ. එ හෙයින් කාම ලොකයෙහි වූවෝ, එහි උපතට හෙතු වූවෝ **'ඔරම්භාගීය'** නම් වෙති. මේ සංයොජන පස ඉතිරි සංයොජන පසට වඩා ඉතා බලගතු බව බව 'ථූලං' යන මෙයින් වදාළ සේක. සත්වයා සසර බැඳ තැබීමේ බලවත් ශක්තියක් මොවුනට ඇත්තේ ය. උඩම්භා ගීයසංයොජන සසර සැරිසරන සත්වයාගේ ගෙලෙහි ලූ රැහැණක් සේ ද, ඔරම්භාගීයසංයොජන පයෙහි ලූ රැහැණක් සේ ද දත යුතු ය. පයෙහි ලූ රැහණක් සේ ගැණෙන සංයොජන සිඳ හැරීම ඉතා දුකින් කළ යුතු ය.

අජ්ඣත්තසංයොජන – බහිඩාසංයොජන' යි සංයොජන තවත් දෙ පරිද්දෙකින් පොතෙහි ආයේ ය. එහි කාමභවය 'අජ්ඣත්ත' නම්. රූපාරූපභවය 'බහිඩා' නම්. කාමභවයෙහි ඉපදීම හා මැරීම බොහෝ සෙයින් වන බැවින් එහි ආලය ප්‍රාර්ථනාව අභිලාෂය ඉතා බොහෝ ය. ඉතා බලගතු ය. මෙසේ යම් තැනක ඉපදීම හා මැරීම බහුල ව සිදු වේ නම්, එ තැන ආලයාදිය ද බොහෝ ය. එහෙයින් කාමලොකය 'අජ්ඣත්ත' නම් වේ.

රූපාරූපභවයෙහි ඉපදීම හා මැරීම බොහෝ නො වන බැවින් එහි ආලය ප්‍රාර්ථනාව අභිලාෂය ස්වල්ප වේ. බොහෝ නො වේ. මෙසේ යම් තැනක ඉපදීම හා මැරීම බහුල ව සිදු නො වේ නම්, එ තැන ආලයාදිය ද බොහෝ නො වේ. රූපා. රූපභවය 'බහිඩා' නම් වූයේ එහෙයිනි.

අජ්ඣත්ත නම් වූ කාමභවයෙහි ඡන්දරාගය තෙමේ **'අජ්ඣත්ත සංයොජන'** නම්. රූපාරූපභවයෙහි ඡන්දරාගය තෙමේ **'බහිද්ධා සංයොජන'** නම්. අජ්ඣත්තසංයොජන යන්නෙන් ඔරම්භාගීය සංයොජනයෝ ත්, බහිද්ධාසංයොජන යන්නෙන් උඩම්භාගීය සංයොජනයෝ ත් ගැණෙති. දශකෙලශ, දශසංයොජනැ යි ගැණේ. දශකෙලශ කියන ලද්දේ ය.

ඛහං අගහි ඉව ගච්ඡති = ගින්නක් සේ දවමින් යයි.

ගින්න කුදු මහත් දර කෝටු දුව දඬු දවමින් යන්නා සේ නො පමාබවෙහි ඇලුනු මහණ තෙමේ අප්‍රමාදයෙන් තමන් ලැබූ අර්හත්වාගීඥන නැමැති ගින්නෙන් ඔරම්භාගීය-උඩම්භාගීය සංයොජනයන් දවමින් නැවැත ඉපැත්මට නො සුදුසු කරමින් නිවන් පුරයට යයි. **'යථා අයං අග්ගි තං මහන්තං ච බුද්ධඤ්ඤව උපාදානං ඛහන්තො ගච්ඡති, එවමෙව සො අප්පමාදරතො භික්ඛු අප්පමාදුඩ්ඩහනෙන ඤාණග්ගිනා එතං සංයොජනං ඛහන්තො අභබ්බුප්පත්තිකං කරොන්තො ගච්ඡති'** යනු අටුවා ය. **'ඛහං'** යනු ඛහන්ත ශබ්දයේ ප්‍රථමා එකවචන යි.

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ මහණ තෙමේ හුන් ලෙසින් ම සියලු සංයොජන දවා සිවු පිළිසැඹියාවන් ලබා රහත් බවට පැමිණ අහසින් අවුත් බුදුරජුන්ගේ රන්වන් සිරුරට ස්තුති කොට වඳිමින් ගියේ ය.

නමින් අප්‍රකට භික්ෂුවගේ කථාවස්තුව නිමියේ ය.

නිගමතිස්ස සථවිරයන් වහන්සේ.

2 – 9

එක්තරා අවසථාවෙක සම්මා සම්බුදු රජානන් වහන්සේ සැවැත්නුවර දෙවිරම්මහවෙහෙර චතුර්විධබ්‍රහමවිහරණයෙන් යුකත ව වැඩ වාසය කරණ සේක. ඒ කාලයෙහි සැවැත්නුවරට නො දුරෙහි වූ නියම්ගමෙක ඉපිද වැඩුනු කුලපුත්‍රයෙක් බුදු සසුනෙහි පැවිදි ව ලැබූ උපසමපද ඇති ව නිගමතිස්ස යන නමින් ප්‍රසිද්ධ විය. 'නිගමතිස්ස සථවිරයන් වහන්සේ අපපිචඡතා ගුණයෙන් යුකත ය, ලද දෙයින් සතුටු වන්නාහ, මහත් විවෙක යෙහි ඇලුනාහ, පටන්ගත් වීර්‍යය ඇත්තාහ' යි ද ගම්රට පැතිර ගියහ. උත්වහන්සේ මෙසේ පතළා වූ ගුණඇති සේක් නැයන් වසන ගමෙහි ම නිතර පිඬු සිඟා යන්නාහ. අනාථපිණ්ඩිකාදී වූ සිටුවරුන්ගේ දන් පිළිගන්නට, පසේනදිකොසොල් රජුගේ අසදෘශදානයට, සැවැත්නුවරට නො ද වැඩි සේක. අනික් දෙනා වහන්සේ 'මේ නිගමතිස්ස සථවිරයෝ හැම දා නැකුලයන් හා එක් ව වෙසෙති, අනාථපිණ්ඩිකාදීන් දන් දෙන තැනකට වත් කොසොල්රජුගේ අසදෘශදානයට වත් නො ද එති' යි උනුන් හා කතා කොට එය බුදුරජානන් වහන්සේට ද දන්වා සිටියාහ.

එවිට බුදුරජානන් වහන්සේ නිගමතිස්ස තෙරුන් ගෙන්වා 'මහණ! තමුසේ මෙසේ කරහු සැබෑ දැ' යි අසා වදාළ සේක. 'තිලෝගුරු හිමියනේ! මම එසේ නො කරමි, නැයන් හා එක් ව විසිමෙක් මාගේ නැත, මම මේ මිනිසුන්ගෙන් බත්පිකක් සිඟා ගෙණ වළඳා ජීවත් වෙමි, ඒ බත රළු වුව ත් මිහිරි වුව ත් මට කම් නැත, ඒ ගැණ මාගේ තැකීමෙක් නැත, දැහැමිලෙසින් මට සැහෙන පමණට බත්පිකක් ලැබුනු විට, ඉන් එහාට බත් සෙවීමෙක් නැත, මම වැඩිපුර සොයන්නට, මිහිරි දේ සොයන්නට කොහැනක ත් නො යමි, ලද දෙයින් සතුටු වෙමි, මා පිය බුදුරජානන් වහන්ස! මෙසේ මුත් නැයන් හා එක්වීමෙක් මාගේ නැතැ' යි කී විට බුදුරජානන් වහන්සේ ප්‍රකෘතියෙන් ම ඔහුගේ අදහස දන්නා සේක් සාධුකාර දී 'මහණ! මා වැනි ගුරුවරයකු ලත් තමුසේගේ මේ අපපිචඡතාගුණය එතරම් පුදුම නො වේ, මේ ගුණය, මා අයත්, මාගේ පරපුර බැවිනැ' යි වදාළ සේක. ඉක්බිති භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ නිගමතිස්ස සථවිරයන් වහන්සේගේ පූර්වචරිතය මෙසේ වදාළ සේක.

'යටගිය දවස හිමාලයවනයෙහි ගංඉවුරක ඉඹුල්වනයෙක් පිහිටා තුබුනේ ය, එහි දහස් ගණන් ගිරාපක්ෂීහු වාසය කළහ, උන් අතරෙහි විසූ එක් ගිරාරජෙක් තමන් විසූ ගසෙහි ගෙඩි අවසන් වූ කල්හි එහි ගිරඬ කොළ පතුරු ආදී වූ යමක් ඉතිරි ව තුබුනේ නම්, ඒවා කා ගඟින් පැන් බී අපපිච්ඡතා සන්තුඝිතා ගුණයන්ගෙන් යුක්ත ව අන් තැනක නො ගොස් එහි ම වසයි, මෙසේ කල් යවන මේ ගිරාරජුගේ අපපිච්ඡතා සන්තුඝිතා ගුණයන්ගෙන් ශක්‍රභවනය සැලී ගියේ ය, එකල සක්දෙව් රජ ඒ ගිරවා දැක විමසා බලන්නට ඌ හුන් ඒ ඉඹුල්ගස වියලවා හැරියේ ය, ඉඹුල්ගසෙහි කඳ පමණක් ඉතිරි කෙළේ ය, එහි ද හැම තැනැ ලොකු කුඩා සිදුරු විය, හුළං හමනා විට එයින් ශබ්දය නිකුත් වේ, සිදුරුවලින් කුඩු කඩා හැළේ, ගිරාරජ තෙමේ ඒ කුඩු අනුභව කොට පැන් බී අන් තැනක නො ගොස් අවු සුළං ගැණ නො සලකා ඉඹුල්කඳඋඩ හිඳියි, එවිට සක්දෙව් රජ තෙමේ 'මූ ඉතා උසස් අපපිච්ඡභාවය ඇත්තෙකැ' යි දැන මිත්‍ර ධර්මයෙහි ගුණ කියවා වරයක් දී ඉඹුල්ගෙඩි, අමාගෙඩි කොට එම්' යි සිතා හස්රජෙක් ව සුජාතාවන් ඉදිරියෙහි කොට ඉඹුල්වනයට ගියේ ය, එහි නො දුරු තැනක ගසක අත්තක හිඳ ඌ හා කතා වට පටන් ගෙණ 'නිල්වන් කොළවලින් ගැවසුනු ගෙඩිවලින් කිසිත් අඩුවක් නැති නොයෙක් ගස් ඇත්තේ ය, එසේ ගෙඩිවලින් බර වූ ගස් තිබියදී කුමක් නිසා වියලී ගිය කොළපුවෙක මේ ගිරවාගේ සිත ඇලුනේ දැ' යි ඇසී ය, (ජාතකය ජාතක පාළියෙහි එයි. අන්ථොත්පත්තිය පමණකි වෙනස්) යි.

තිලෝගුරු සම්මා සම්බුදු රජානන් වහන්සේ මේ ධර්මදෙශනා ව මෙසේ ගෙණ හැර දක්වා 'මහණෙනි! ඒ කාලයෙහි ශක්‍රයා වූයේ මේ ආනන්ද තෙමේ ය, ගිරාරජ වූයේ මම ය, අපපිච්ඡතා තොමෝ මාගේ පරපුරය, මා වැනි ගුරුවරයකු ලත් මේ නිගමතිස්ස තැනගේ අපපිච්ඡතාව පුදුම එකෙක් නො වේ, මහණහු මේ නිගමතිස්ස තැන වැනි අපපිච්ඡතාවය ඇත්තකු විය යුතු ය, මෙ බඳු භික්ෂු තෙමේ මාර්ගයන්ගෙන් පිරිහීමට සුදුසු නො වේ, මෙ තෙමේ මාර්ග ඵලයන්ගෙන් නො පිරිහේ, මෙ බඳු මහණ තෙමේ එකාන්තයෙන් නිවන සමීපයෙහි ම ය' යි මේ ධර්මදෙශනා ව කළ සේක:-

අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා,
අභබ්බො පරිහානාය නිබ්බාණස්සෙ ව සන්තිකෙ නි.

නො පමාබවෙහි ඇලුනු පමාබවෙහි බිය දක්නා සුලු මහණ තෙමේ පිරිහීමට නො සුදුසු ය. (ඔහු) නිර්වාණයාගේ සමීපයෙහි ම වේ.

අප්පමාදරතො = නො පමාබවෙහි ඇලුනු.

භික්ඛු = මහණ තෙමේ

පමාදෙ භයදස්සි වා = පමාබවෙහි බිය දක්නා සුලු.

අභබ්බො පරිහානාය = පිරිහීමට නො සුදුසු ය.

නො පමාබවෙහි ඇලුනු පමාබවෙහි බිය දක්නා සුලු මහණ තෙමේ ශමථ-විදර්ශනා මාර්ග-ඵලයන්ගෙන් පිරිහීමට සුදුසු නොවේ. අප්‍රමාදගුණයෙන් යුත් මහණ තෙමේ ශමථ-විදර්ශනාධර්මයෙන් හෝ මාර්ඵලාධිගමයෙන් හෝ පිරිහීමට යොග්‍ය නො වේ.

පංචනීවරණාදිකෙලශධර්ම සංසිදවනු පිණිස පඨවිකසිණාදී වූ අටතිස් අරමුණෙන් එකෙක සිත නවතා සිත බැඳ, එහි සිත දියුණු කිරීම වැඩීම 'ශමථ' නම්. (විසතර ඉදිරියෙහි ය)

ලොකය පුරා පවත්නා සකලසංස්කාරයන් පිළිබඳ අනිත්‍ය දුඃඛ-අනාත්ම යන ලකුණු තුනෙන් එකක් හෝ තුන ම හෝ සිතට කා වද්දා ගෙණ ඒ ගත් ලකුණෙහි සිත පුරුදු කිරීම සිත වැඩීම 'විදර්ශනා' නම්. (විසතර ඉදිරියෙහි එන්නේ ය.)

මෙ තෙමේ ලැබූ ගුණයෙන් නො පිරිහෙයි. නො පත් ගුණයන්ට පැමිණෙයි.

නිබ්බානස්සෙව සන්තිකෙ = නිර්වාණයාගේ සමීපයෙහි ම වේ.[1]

ලැබූ ගුණයෙන් මුදුන් පෙත්තට නැගී නො ලැබූ ගුණ හැම එකක් ලබා කෙලශපරිනිර්වාණයාගේ හා අනුපාදුපරිනිර්වාණයාගේ සමීපයෙහි වන්නේය, යනු අදහස්. සියලු කෙලෙස් මුලින් සිඳ ලන්නට අර්හත්මාර්ගඥානයට අරමුණු වන ශාන්තධර්මය කෙලශ පරිනිර්වාණ නම්. සොපාදිශෙෂනිර්වාණ යි කියනු ලබන්නේ ත් මේ ය. මෙය රහතුන් වහන්සේගේ මරණින් මතු අනුපාදුපරිනිර්වාණ නම් වේ. අනුපාදිශෙෂනිර්වාණ යි කියනු ලබන්නේ ත් මේ ය. (විසතර ඉදිරියෙහි එන්නේ ය)

නො පමාබවෙහි ඇලුනු පමාබවෙහි බිය දක්නා වූ මහණ තෙමේ පැමිණි ගුණයන්ගෙන් නො පිරිහී නො පැමිණි ගුණයන්ට පැමිණීමෙන් කෙලශපරිනිර්වාණයාගේ හා අනුපාදුපරිනිර්වාණයාගේ සමීපයෙහි ම වන්නේය යි වදාළ සේක.

එව' යනු නිපාත යි. අවධාරණාර්ථ ඇත්තේ ය.

'පුබ්බව මෙ භික්ඛවෙ! සම්බොධා අභිසම්බුද්ධස්ස බොධි සත්තස්සෙව සතො එතදහොසි' යනාදි තන්හි සේ ය.

---

1. 1. 14 'ධම්මස්ස' යනු බලනු

එව ශබ්දය, විශෙෂ්‍යයාකෙරෙන් පරව යෙදුනේ විශෙෂ්‍ය-සඞ්ගත ය. ඒ ම අන්‍යයොග ව්‍යවච්ඡෙදක නම් වේ. **'සුගත එව සම්බුද්ධෝ'** යන මෙහි වූ එවශබ්දය සම්බුද්ධභාවය සුගතයන් වහන්සේ කෙරෙහි මුත් අන්‍ය වූ කණ්හක්‍ෂ-අක්‍ෂපාදාදීන් කෙරෙහි නො වන්නේ ය යි ඔවුන් කෙරෙහි සම්බුද්ධභාවය වළකනලද ය. **එව** ශබ්දය විශෙෂණයා කෙරෙන් පරව යෙදුනේ විශෙෂණ සඞ්ගතය ඒ ම අයොගව්‍යවච්ඡෙදක නම් වේ. **'නන්දෝ විතරාග එව'** යන මෙහි වූ එව ශබ්දය නන්ද ස්ථවිරයන් වහන්සේගේ විත-රාගත්වය වළකන ලද්දේ නමුත් රාහුලභද්‍රාදීන්ගේ විතරාගත්වය නො වළකන ලද ය. **එව** ශබ්දය ක්‍රියාපදයකින් පරව යෙදුනේ ක්‍රියාසඞ්ගත ය. ඒ ම අත්‍යන්තායොගව්‍යවච්ඡෙදක නම් වේ. **'නීලං සරොජං අසනි එව'** යන මෙහි වූ එව ශබ්දය නිල්පියුමක්හුගේ නාස්තිභවයොගය අනිශ්‍රයින් වළකන ලද ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි නිගමතිස්‍ස ස්ථවිරයන් වහන්සේ සිවුපිළිසැඹියාවන් සමග රහත් බවට පැමිණි සේක. අන් බොහෝ භික්‍ෂූහු ද සෝවන්පලාදියට පැමිණියෝ ය. දෙශනා-තොමෝ මහාජනයාට වැඩ සහිත වූය.

නිගමතිස්සස්ථවිරවත්ථු නිමියේ ය.

සකලජනධර්මාජීවසඞ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල නායකස්ථවිරයන්** කළ 'සද්ධම්මසාගර' නම් වූ ධර්මපදවර්ණනාවෙහි අප්‍රමාදවග්ගාත්මකතිතීයතරඛණ්ඩය මෙ තෙකින් නිමියේ ය.

චින්තවගීය

තෘතීයතරඞ්ගීයකථාසූචි

පිට	වස්තුව	
413	1.	මෙසිය සථවිරයන් වහන්සේ
461	2.	අප්‍රසිඩ භික්ෂුවකට සැලකූ ප්‍රසිඩ උපාසිකාවක්
469	3.	සසුනෙහි නො ඇළුනු මහණෙක්
472	4.	භාගිනෙය්‍ය සංඝරක්ඛිත සථවිරයන් වහන්සේ
477	5.	චිත්තහත්ථ සථවිරයන් වහන්සේ
489	6.	පන්සියයක් විදර්‍ශීක භික්ෂූහු
500	7.	පූතිගත්තතිස්ස සථවිරයන් වහන්සේ
506	8.	නන්ද එඬේරු
511	9.	සොරෙය්‍ය සිටුතුමා

මෙඝියස්ථවිරයන් වහන්සේ

3 – 1

ස්වාමිදරු වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ එක් කලෙක වාලිකානුවර අසල වාලිකාපව්වෙහි කරවනලද මහාවිහාරයෙහි වැඩ වාසය කරණ සේක. එකල බුදුරජානන් වහන්සේට උපස්ථාන කළෝ, මෙඝියස්ථවිරයන් වහන්සේ ය. දිනක් බුදුරජුන් වෙත එළැඹැ සිටි උන්වහන්සේ බුදුරජුන් වැඳ 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මම පිඬු පිණිස ජන්තුග්‍රාමයට යනු කැමැත්තෙමි, ඊට අවසරැ' යි අවසර ඉල්ලා සිටියාහ. බුදුරජානන් වහන්සේ ඔහුට ඒ පිණිස අවසර දුන්හ. ඉක්බිති මෙඝියස්ථවිරයන් වහන්සේ පෙරවරුයෙහි සකසා හැඳ පෙරවැ පාසිවුරු ගෙණ ජන්තුග්‍රාමයට පිඬු පිණිස වැඩියහ. එහි පිඬු සිඟා පිණ්ඩපාතයෙන් හැරී අවුත් පස්වරුයෙහි කිමිකාලාගංඉවුරට වැඩියෝ ය. කෙණ්ඩා විඩා දුරු කරන්නට එහි ඔබිනොබ හැසිරෙන්නෝ, සිත්කලු අඹඋයනක් දැක 'මේ උයන සිත් ගන්නේ ය, ජනසමාජයෙන් ඈත් ව මහණදම් පුරන්නහුට ඉතා කදිම තැන ය, බුදුරජානන් වහන්සේ මට අවසර දෙන සේක් නම්, මම මහණදම් පුරන්නට මෙහි එන්නෙමි' යි සිතා බුදුරජුන් වෙත ගොස් වැඳ 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! අවසර, මම පෙරවරුයෙහි හැඳ පෙරවැ පාසිවුරු ගෙණ ජන්තුග්‍රාමයට පිඬු සිඟා ගියෙමි, සිඟා අවසන් කොට විඩා සංසිඳු වන්නට සිතා පස්වරු යෙහි කිමිකාලාගංඉවුරට පැමිණියෙමි, එහි ටිකක් එහා මෙහා යන්නේ අඹඋයනක් දුටුයෙමි, ඒක නම් මහණදම් පුරන්නට ඉතා කදිම තැන ය, සිත්කලු ය, බුදුරජානන් වහන්සේ අනුදන්නා සේක් නම්, මහණදම් කරන්නට මෙහි එමි,යි මට සිත් විය, එහෙයින් බුදුරජානන් වහන්සේ අනුදන්නා සේක් නම්, මම එහි යන්නෙමි' යි දන්වා සිටියහ. එවිට බුදුරජානන් වහන්සේ බලා වදාරන සේක්, මෙඝියතෙරුන්ගේ නුවණ මෝරා නො ගියබව දැන ගමන වළකන්නට 'මෙඝිය! පොඩ්ඩක් බලා පොරොත්තු වන්න, තමුසේ ගියාම මම තනි වෙමි, අනික් නමක් එනතුරු ටිකක් නව-තින්නැ' යි වදාළ සේක. (මෙ තෙමේ ගොස් කටයුතු නො සිදු වූ කල්හි නිරාශඞ්ක ව ප්‍රෙමවශයෙන් නැවැත එන්නේ ය යි දැන මොහුගේ සිතෙහි මොළොක්බව උපදවන්නට මෙසේ වදාළ සේක) මෙඝියස්ථවිරයන් වහන්සේ දෙවනු ද 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! ඉදිරියෙහි කළ යුතු කිසිවක් බුදුපියානන් වහන්සේට නැත, වැඩුමග නැවැත නො වඩන සේක, ප්‍රහීණ කළ කෙලෙසුන් ගේ නැවැත ප්‍රහාණයකුත් නැත, ස්වාමීනි! මට එසේ නො වේ, ඉදිරියෙහි කළයුතු වැඩ මට ඇත්තේ ය, මා ආර්‍යමාර්ගය අවබොධ

නො කළ බැවින් ආයුෂ්මාගීයාගේ වැඩීම කැමැති විය යුතු ය, එහෙයින් බුදුරජානන් වහන්සේ අවසර දෙන සේක් නම්, මම මහණදම් කරන්නට ඒ අඹ උයනට යන්නෙමි' යි කීහ. බුදුරජානන් වහන්සේ එ වරද 'මෙසිය! පොඩ්ඩක් ඉන්න, මම තනි වෙමි, අනික් නමක් එනතුරු' යි වදාළ විට, මෙසියසථවිරයන් වහන්සේ තෙවන වරත් පළමු ලෙසින් කරුණු කියා යන්නට අවසර ඉල්ලූහ. බුදුරජානන් වහන්සේ ඒ තෙවනවර 'මෙසිය! මහණදම් කරමි යි කියන්නහුට අපි අන් කුමක් කියමු ද, තමුසේ ම එයට කල් දත යුතු ය' යි වදාළ විට හුනස්නෙන් නැගිට බුදුරදුන් වැඳ පැදකුණු කොට අඹුයනට ගොස් එහි එක්තරා ගස්මූලෙක දිවාවිහරණය පිණිස වැඩහුන්හ. මෙසියතෙරුන් දිවාවිහරණයට හුන් එ තැන, තමන් පිළිවෙළින් ජානි පන්සියයක් ම රජ ව උයන් කෙළි කෙළිමින් නත් වැදෑරුම් නළඟනන් පිරිවරා හුන් තැන විය. එ හෙයින් එ තැන හුන් තෙරුන්ට තම මහණදම් අතුරු දහන් ව ගියා සේ ද, රජවෙස් ගෙණ නළඟනන් පිරිවරා සේසතයට මාහැඟි රජඅසුනෙහි හුන්නහු සේ ද වැටහින. එ කෙණෙහි ඔහු සිතැ කාමවිතකීයෙක් උපන. ඒ හා ම උන්වහන්සේ, බඩුසහිත ව අල්ලා ගත් සොරුන් දෙ දෙනකුන් ඉදිරියට පමුණුවා සිටියවුන් සේ දුටහ. එ කෙණෙහි උන් අතුරෙන් එකාක්ෂට වධය නියමකිරීම් වශයෙන් ව්‍යාපාදවිතකීය උපන. එකක්ෂට හිරදඬුවම් නියමකිරීම් වශයෙන් විහිංසාවිතකීය උපන. එකල මෙසියසථවිරයන් වහන්සේ වැල්ගොඩකින් වෙළුනු ගසක් සේ ද, මීමැස්සන් විසින් වට කර ගත් මී කඩන්නකු සේ ද, අකුශලවිතකීයන් විසින් වට කොට ගන්නා ලදහ. 'මම ගිහි ගෙයින් නික්ම මේ සසුනෙහි පැවිදි වූයේ ශ්‍රද්ධාවෙන් ම ය, එසේ වුව ත් ලාමකාඅකුශලවිතකීයෝ මා වට කොට ගත්හ, දැන් මෙහි මහණදම් කරන්නට නො හැකි ය, දීඝී-දර්ශි වූ බුදුරජානන් වහන්සේ එකාන්තයෙන් මේ දැන වදාරා මාගේ ගමන වැළකූ සේක, එහෙයින් උන්වහන්සේට මෙය දැන්විය යුතු ය දන්වමි' යි හුන් තැනින් නැගිට බුදුරජුන් වෙත එළැඹැ 'සුවාමීනි! භාග්‍යවතුන් වහන්ස! මා අඹුයනෙහි දිවාවිහරණය පිණිස හුන් හැටියේ ම ලාමකාඅකුශලවිතකීයෝ මා වට කොට ගත්හ, එවිට මට 'මම පැවිදි වූයෙම් ශ්‍රද්ධාවෙන් ම ය, එහෙත් ලාමකාඅකුශලවිතකී-යෝ මා වට කොට ගත්හ යි මට සිත් වී ය' යි දන්වා සිටියහ.

ඉක්බිති බුදුරජානන් වහන්සේ තමන් වෙත පැමිණි මෙසිය තෙරුන් අමතා, 'ඔය තැන විසින් කරණ ලද්ද ඉතා බැරෑරුම් ය, එය සුලු වැඩෙක් නො වේ, බලගතු ය, මෙසිය තව ටිකක් නවතින්න, මම තනි වෙමි, අනික් නමක් එනතුරු පොඩ්ඩක්

ඉවසන්නැ'යි කියද්දි ත් මා තනි කොට හැරදමා ගියහු ය, එසේ ගිය මහණ, සිතට යටත්වීම යුතු නැත, සිත ඉතාසැහැල්ලු ය, එය තම වසයට ගතයුතු ය' යි දක්වන්නට මේ ධම්දෙශනාව කළ සේක:-

එඤනං චපලං චිත්තං දූරක්ඛං දුන්නිවාරයං,
උජුං කරොති මෙධාවී උසුකාරොව තෙජනං.

වාරිජොව'ථලෙ ඛිත්තොඔකමොකතඋබ්භතො,
පරිඵන්දතිදං චිත්තං මාරධෙය්‍යං පහාතවෙ'ති.

සැලෙන්නා වූ චපල වූ නොරැකිය හැක්කා වූ නොවැළකිය හැක්කා වූ සිත, තුවණැත්තේ ශිවඩුවකු හිදණඩක් සෘජු කරන්නා සේ සෘජු කරයි.

(මසුන්) වසන තැන් වූ ජලයෙන් ගොඩ දැමූ මසකු සේ මේ සිත, ත්‍රෛභූමකවෘත්තය පහ කරන්නට වෑයම් කරණ කල්හි ඉතා තදින් සැලෙයි. නොහොන් මාරධෙය්‍ය යි කියන ලද කෙලෙශවෘත්තය නොහැර සිටි මේ සිත, උදකාලයෙන් නගා ගොඩ දැමූ මසකු සේ සැලෙන්නේ ය. එ හෙයින් මාරධෙය්‍යය පහකට යුතු ය.

එඤනං = සැලෙන්නා වූ.

'රූපාදිසු ආරම්මණෙසු විපඵන්දමානං' මිනිසුන්ගේ සිත නිරතුරුව ම නන් අරමුණු කරා දුවයි. සිත අරමුණුවල ඉටු අනිටුබවක් නොසලකා යි. නොවැඩුනු නොදුමුනු සිත එක අරමුණෙක නොපිහිටයි. රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන අරමුණු ගැණීමෙහි සැදී පැදී සිටියි. ගත් අරමුණෙහි සෑහීමකට නොයෑමෙන් එ තෙණෙහි ම අන් අරමුණක් වහා ගණියි. මේ සිතේ සැටි යි.

චපලං = චපල වූ. අසථිර වූ.

'එකිරියාපථෙන අසණ්ඨහනෙනා ගාමදාරකොවිය එකසමිං ආරම්මණෙ අසණ්ඨහනතො චපලං' එක් ඉරියව්වෙක නොපිහිටුනා ගම්දරුවකු සේ, එක අරමුණෙක නොපිහිටා සිටින බැවින් සිත චපල ය. අසථිර ය. තමන් ගත් අරමුණෙහි ගත් අයුරින් ක්ෂණයක් පමණකු ත් පිහිටා සිටීමට සිතට බැරි ය.

චිත්තං = සිත. විඤ්ඤාණය.

පංචස්කන්ධය අතුරෙන් එක් ස්කන්ධයෙක් **'චිත්තං'** යන මෙයින් ගැණේ. වෙදනා - සංඥා - සංස්කාර යන චෛතසික

ධම්මයන්ගේ පැවැත්ම සිත මූල් කොට වන්නේ ය. රූපසඤ්ඤය ද ක්‍රියාවෙහි සමඵ වන්නේ සිත ඇති කල්හි ම ය. එහෙයින් සිත ප්‍රධාන වේ. මනින්ද්‍රිය-මනායතන-විඤ්ඤාණ-හදය-චෙත යනාදී වූ නම්වලිනුදු මෙය පොතපතෙහි එන්නේ ය.

'ආරම්මණං චිනෙනති ති = චිත්තං' අරමුණු සිතන්නේ සිත නම්. රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය-ධම්ම යන මේ ය අරමුණු. මේ අරමුණු දැන ගන්නේ ය සිත. සියලු සිත් පිළිබඳ ව පොදුවේ සාමාන්‍යයෙන් මෙසේ කිය හැකි ය.

'චිනෙනන්ති වා එතෙන කරණභූතෙන සම්පයුත්තා ධම්මාති = චිත්තං' මේ **කරණ** කොට, මේ නිසා සඵශාදිවෙතසික ධම්යෝ ද අරමුණු සිතති. සඵශාදිසම්ප්‍රයුක්තධම්යන්ගේ අරමුණු සිතීමට, දැනීමට උපකාරකභාවයෙන් සිටියේ සිත නම්. සිත ඒ ඒ කටයුතු දැනීමට උපකාරභාවයෙන් පවත්නේ ය.

පරමාර්ථධම්යෝ ක්‍රියාමාත්‍රයෝ ය. උන් කෙරෙහි ද්‍රව්‍යයක් නො ලැබිය හැකි ය. එහෙයින් මෙහිලා කර්තෘකරණාදී විසින් නිරූක්ති දැක්වීම අප්‍රධාන ය. සිතීමෙහි, දැනීමෙහි සිත ප්‍රධාන බව දක්වන්නට කර්තෘත්වය සිතට නැගී ය. චිත්තසම්ප්‍රයුක්ත ධම්යන්ගේ ද සිතීමෙහි දී ඊට අනුකූල ව පැවැත්ම දක්වන්නට සිතට කරණත්වය නැගී ය.

'චින්තනමත්තං = චිත්තං' අරමුණුසිතීම සිත නම්. පරමාර්ථ ධම් ක්‍රියාමාත්‍ර බැවින් පරමාර්ථධම් කෙරෙහි මේ ම ප්‍රධාන වේ.

'විචින්තනකරණං = චිත්තං' විසිතුරු **කරණ** බැවින් සිත නම්. ලොකයෙහි ඇතිතාක් සියලු විසිතුරු දේවල ඉපැත්ම සිත කරණකොට ම වන්නේ ය. **සිතියම්** කරණු කැමැති සිත්කරුහට සිතියමක් කරණු කැමැතිවිට පළමු කොට ඒ පිළිබඳ සිත උපදනේ ය. ඒ පිණිස ඉරිගැසීම් ආදී වූ ක්‍රියා සිතින් ම පහළ වේ. ඉන් පසු තමන් කැමැති සේ එහි සායම්ගැම් ආදිය කරයි. මෙසේ සිතා ඉරි ගසා සායම් යොදා අවසන් කළ විට විසිතුරු සිතියමෙක් පහළ වේ. මේ විසිතුරුසිතියමෙහි පහළවීමට උපකාර වූයේ සිත ය.

'දිට්ඨං වො භික්ඛවෙ! චරණං නාම චිත්තනන්ති' මහණෙනි! තමුසේලා විසින් චරණ නම් සිතියම දක්නා ලද ද?

'එවං භගෙන!' සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! එසේ ය! දක්නා ලද්දේ ය.

'නමපි බොා භිකඛවෙ! චරණං චිත්තං චිත්තෙනෙව චිත්තිතං' මහණෙනි! ඒ චරණ නම් සිතියම ද සිතින් ම විසිතුරු කරණ ලද්දේ ය.

'තෙන පි බොා භිකඛවෙ! චරණෙන චිත්තෙන චිත්තෙසෙඤඤව චිත්තතරං' මහණෙනි! සිත ම ඒ චරණ නම් සිතියමට වඩා ඉතාවැඩියක් විසිතුරු ය, යනු සිතේ ඇති විසිතුරුබව දක්වන්නට බුදුරජානන් වහන්සේ වදාළ සේක. මේ ඒ පිණිස ම උන්වහන්සේ වදාළ දෙශනාවක්:-

'නාහං භිකඛවෙ! අඤඤං එකනිකායම්පි සමනුපස්සාමි යං එවං චිත්තං, යථයිදං භිකඛවෙ! තිරච්ඡානගතා පාණා තෙ පි බොා භිකඛවෙ! තිරච්ඡානගතා පාණා චිත්තෙනෙව චිත්තිඛතා, තෙහිපි බොා භිකඛවෙ! තිරච්ඡානගතෙහි පාණෙහි චිත්තසෙඤඤව චිත්තතරං' යනු.

'මහණෙනි! මේ තිරිසන්ගතප්‍රාණීහු යම්සේ විසිතුරු වූවෝ ද එසේ විසිතුරු වූ යම් එකෙක් වේ ද, එබදු වූ අන් එක් ම සමූහයකුදු මම බුදුනුවණින් නොා දකිමි, මහණෙනි! ඒ තිරිසන් ගියෝ ද සිතින් ම විසිතුරු කරණ ලදහ, මහණෙනි! ඒ තිරිසනුන්ට ත් වඩා සිත ම විසිතුරු ය' යනු එහි කෙටි තේරුම ය.

චරණ නම් සිතියම් යි වදාළෝ නොයෙක් ලෙසින් විසිතුරු වූ දිව්‍යවිමානාදිය සිතියම් කොට 'පින් කරන්නෝ මේ ලෙසින් විසිතුරු වූ සමපත්තියෙන් පිරී ඉතිරී ගියා වූ දෙව්විමන් ආදියෙහි උපදින්නාහ' යි දන්වමින් ගම් නියම්ගම් රජදනවුහි ගෙණ යන සිතියම ය. මේ චරණ සිතියම සිතින් ම කරණ ලද බැවින් එයට වඩා සිත ම ඉතාවිසිතුරු ය. සිතේ විසිතුරුබව නිසා සංඥාව ද විසිතුරු ය. ඒ නිසා තෘෂ්ණාව ද විසිතුරු ය. තෘෂ්ණාව විසිතුරු නිසා කුශලාකුශලකාමී විසිතුරු ය. කර්මයාගේ විසිතුරු බව හෙතු කොට දිව්‍ය මනුෂ්‍යාදිලොක ද විසිතුරු ය.

'අත්තනොා චිත්තතාඨ වා = චිත්තං' තමන්ගේ ම විසිතුරු බැවින් සිත නම්.

සිත, ලොභය හා යෙදුනු විට ලොභමූලික යි ද, වෙෂය හා යෙදුනු විට දොසමූලික යි ද, මොහය හා යෙදුනු විට මොහමූලික යි දැ යි තෙමේ විසිතුරු ය. කාමලොකය පිළිබඳ කල්හි කාමාවචර යි ද, රූපලොකය පිළිබඳ කල්හි රූපාවචර යි ද, අරූපලොකය පිළිබඳ කල්හි අරූපාවචර යි ද විසිතුරු ය,

මෙසේ ම වස්තු ආලම්බන ක්‍රියාදිවශයෙන් ද විසිතුරු ය. **'භූමි වත්ථු ආරම්මණකිරියාදිචිත්තතාය පනෙතං චිත්තං'** යනු එහි අටුවා ය.

'චිතං කම්මකිලෙසෙහි = චිත්තං' කර්මක්ලෙශයන් විසින් කැටි කළ බැවින් සිත නම්.

කුසල් අකුසල්කම් විසින්, අවිද්‍යා තෘෂ්ණා උපාදාන යන කෙලෙසුන් විසින් කැටි වූයේ ය සිත. කර්මක්ලෙශයන් විසින් රැස් කරණ ලද්දේ ය. කෙලෙස් සහාය කොට ඇති කර්මයෙන් ඵලභාවයෙන් නිපැදුනේ ය යන අරුත් ය. **තං හි කිලෙසසහාය කෙන කම්මුනා ඵලභාවෙන නිබ්බත්තිතං'** යි මණිසාරමංජුසා වෙහි කියන ලද ය.

'චිතං තායති වා = චිත්තං' කර්මක්ලෙශයන් විසින් ඵලභාවයෙන් නිපදවන ලද්ද පාලනය කෙරේණු යි සිත නම්. **'කම්මකිලෙසෙහි චිතං සඤ්චිතං අත්තභාවං තායති රක්ඛති ති = චිත්තං'** යනුත් ඒ සඳහා කීහ. කර්මක්ලෙශයන් විසින් රැස් කරණ ලද ආත්මභාව පරම්පරාව රක්ෂා කෙරේණු යි සිත නම් වේ යනු අරුත් ය.

'විනොති අත්තසන්තානං = චිත්තං' ආත්මභාවය යි ගැණෙන ජවනචිත්තපරම්පරාව රැස් කෙරේණු යි සිත නම්.

භවයාගේ නො සිඳ පැවැත්මට කරුණු වන සිත භවාඞ්ග නමින් කියැ වේ. එය ඉතාපිරිසිදු ය. නිර්මල ය. **'පභස්සරමිදං භික්ඛවෙ! චිත්තං'** යනු සාධකසූත්‍ර යි. ඒ මේ භවාඞ්ගචිත්තය චක්ඛුප්පසාදාදියෙහි රූපාදී වූ අරමුණු වැදීමෙන් සැලී යන්නේ ය. එයට භවාඞ්ගචලනැ යි කියනු ලැබේ. ඇස් හමුවට ආ රූ සටහන චක්ඛුප්පසාදරූපය ගටයි. ඒ ගැටීම නිසා චක්ඛුප්පසාදය ඇසුරු කොට පවත්නා මහාභූතරූපයන්ගේ සැලීමෙන් පිළිවෙළින් ඒ හා එක් ව පවත්නා අනෙක් රූපයන්ගේ ද සැලීම වේ. මේ භවාඞ්ග චලනය වන සැටියි. භවාඞ්ගචිත්තය මෙසේ සැලී ගිය කල්හි 'මේ කිමැ' යි විමසන්නකු සේ අරමුණු ගැණ සොයන බලන සිත ආවජ්ජනා නමින් ඉදිරියට එයි. එයට පසු ඒ හා ම අරමුණු දකින සිත දස්සන නාමයෙන්, අනතුරු ව අරමුණු පිළිගන්නා සිත සම්පටිච්ඡන නාමයෙන්, අනතුරු ව අරමුණු තීරණය කරණ සිත, සන්තීරණ නාමයෙන්, අනතුරු ව අරමුණු ස්ථිර කරණ සිත, වොත්ථපන නාමයෙන් ක්‍රමයෙන් ඉපැදී නැසී යත්. මින් පසු උපායමනස්කාරාදීවශයෙන් ලබන ලද ප්‍රත්‍යය ඇති ජවනචිත්තය අරමුණු රස විඳීම් වශයෙන් සත් වරක් අරමුණෙහි

දුවයි. ඉන් පසු තදුරම්මණ නමින් සිත් දෙකක් උපදී. මේ සියල්ලට පසු නැවැත සිත මුලින් කී ප්‍රකෘතිඅවස්ථාවට වැටේ භවාඬග වේ. මේ තමාගේ පරමපරාව රැස් කරණ සැටි යි.

'චිත්තාරම්මණං=චිත්තං' විසිතුරු වූ නත් වැදැරුම් වූ අරමුණු ඇත්තේ නුයි සිත නම්. **'චිත්තං අනෙකපකාරං විසදිසං වා ආරම්මණං යස්සා නි චිත්තාරම්මණං, සබ්බචිත්තං'** විසිතුරු වූ නත් වැදැරුම් වූ හෝ සම වූ හෝ රූපාදි වූ අරමුණු ඇත්තේ සිත නම් වේ යනු එහි තේරුම ය. මෙයින් සියලු සිත් ගැණේ.

'ආරම්මණවිජානනලක්ඛණං චිත්තං' සිත ලක්ෂණ වියින් අරමුණු දැනගැණීම ලකුණු කොට සිටියේ ය.

'පුබ්බඞගමරසං' වෙදනාදිවෙතසිකධර්මයන්ට පෙරටු ව යන බව කෘත්‍යය කොට සිටියේ ය.

'සඤ්ඤාණපච්චුපට්ඨානං' චකුඃ, සොත, ඝාණ, ජිවහා, කාය, මන යන දෙරටු සර්යන් දතයුතු වූ සියලු අරමුණු සිතින් ම දන්නේ ය. පසු පසු උපදින සිත පළමු පළමු උපන් සිත හා අතර නොතබා ගැළපීම, අනන්තරප්‍රත්‍යයවශයෙන් ගැළපීම වැටහෙන අයුර මෙහි පච්චුපඨානය වේ.

'නාමරූපපදට්ඨානං' සිත නාම රූප දෙක ආසන්නකාරණය කොට සිටියේ ය. පංචවොකාරභවයෙහිදී නාම රූප දෙක ම සිතට ආසන්නකාරණය වේ. චතුවොකාරභවයෙ දී නාමය පමණක් ම ආසන්නකාරණය වෙය යි දත යුතුය.

මෙහි මුලින් දැක් වූ ආරම්මණවිජානනලක්ඛණය සාමාන්‍ය ලක්ෂණ, සවභාවලක්ෂණ වියින් දෙ පරිදි ය. එහි පරමාර්ථධර්ම විෂයයෙහි සාධාරණභාවයෙන් පවත්නා උත්පාද, සිති, භඞග යන අවස්ථාවන්ගෙන් හා අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ලක්ෂණත්‍රයයෙන් යුකත ව පැවැත්ම සාමාන්‍යලක්ෂණ නම් වේ. පරමාර්ථ ධර්මවිෂය යෙහි පවත්නා ක්‍රියාමාත්‍රය සවභාවලක්ෂණ නම් වේ.

කෘත්‍ය යි කියූ රසය, කෘත්‍යරස, සම්පත්තිරස යි දෙ පරිදි ය. එහි ඒ ඒ ධර්මයන් විසින් කරණ කෘත්‍යය කෘත්‍යරස නම් වේ. ඒ ඒ ධර්මයන් පිළිබඳ සම්පූර්ණභාවය සම්පත්තිරස නම් වේ.

පච්චුපඨානය, ඵලපච්චුපඨාන, උපඨානපච්චුපඨාන යි දෙ පරිදි ය. 'මේ ධර්මය විසින් මෙ නම් ඵලයක් උපදවනු ලබා' යි දැනුම ඵලපච්චුපඨාන නම් වේ. 'මේ ධර්මය මෙ වැනි පිළිබිඹුවකැ' යි දැනුම උපට්ඨානපච්චුපට්ඨාන නම් වේ.

මෙසේ සිවි මේ සිත කාමාවචරභූමි, රූපාවචරභූමි, අරූපාවචරභූමි, ලෝකොත්තරභූමි සි භූමිභෙදයෙන් සිවු වැදෑරුම් ය. මෙයින් කාමාවචරභූමියෙහි ලොභය මුල් කර ගත් (ලොභමූලික) සිත් අටෙක් ලැබේ. මෙන්න ඒ අට:-

1. **සොමනස්සසහගතදිට්ඨිගතසම්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
2. **සොමනස්සසහගතදිට්ඨිගතසම්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**
3. **සොමනස්සසහගතදිට්ඨිගතවිප්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
4. **සොමනස්සසහගතදිට්ඨිගතවිප්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**
5. **උපෙක්ඛාසහගතදිට්ඨිගතසම්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
6. **උපෙක්ඛාසහගතදිට්ඨිගතසම්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**
7. **උපෙක්ඛාසහගතදිට්ඨිගතවිප්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
8. **උපෙක්ඛාසහගතදිට්ඨිගතවිප්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**

මෙහි 1 - 2 - 3 - 4 යන අඞ්කවලින් දැක්වෙන සිත් සතර සුඛ වෙදනාවෙන් යුක්තබව 'සොමනස්ස' යන්නෙන් ද, ඒ මානසික සුඛ වෙදනාව හා එකුපපාද, එකනිරොධ, එකාරම්මණ, එකවත්‌ථුක යන සිවු අයුරකින් යෙදීම 'සහගත' ශබ්දයෙන් ද කියයි. දිට්ඨිගත ශබ්දයෙන් කීයේ මේ සිත් මිසදිටු හා පෙර පසු නොවී එකුපපාද දින් හා යෙදීම ය. අසඞ්ඛාරිකයන්නෙන් පූර්‍වප්‍රයොග රහිතබව කියන ලද්දේ ය. ඒ ඒ පූර්‍වප්‍රයොගය තෙමේ තියුණු බවැ යි කියන සැරසීම් වෙසෙසින් සිත සරසන්නේ ය. එහෙයිනි 'සංඛාර, නම්. **'සඞ්ඛරොති චිත්තං තික්ඛභාවසංඛාතෙන මණ්ඩනවිසෙසෙන සජ්ජතීති = සඞ්ඛාරෝ'** යනු එහි අරුත් පැවසීම ය. තව ද ඒ ඒ කටයුතුවලදී පසු බස්නාහට අනුබල දීම වශයෙන් තමා කෙරෙහි පැවති පූර්‍වප්‍රයොගය සංඛාර නම්. ඒ මේ සැරසීම, අනුබලදීම යම් සිතෙක නොවූයේ ද, ඒ සිත අසඞ්ඛාරික නම් වේ. යම් සිතෙක ඒ වූයේ නම් ඒ සසඞ්ඛාරික වේ.

1 - 2 අඞ්කවලින් කියන සිත් දෙක, මිසදිටුවෙන් යුක්ත ය. 3 - 4 අඞ්කවලින් කියන දෙ සිත, මිසදිටුව හා නොයෙදුනේ ය. ඒ බව විප්පයුත්තශබ්දයෙන් කියන ලද්දේ ය. 1 - 3 අඞ්කවලින් කියන දෙ සිත්, පූර්‍වප්‍රයොගසඞ්ඛ්‍යාත වූ සැරසීමෙන් නොයෙදුනේ ය. 2 - 4 අඞ්කවලින් කියන දෙ සිත, පූර්‍වප්‍රයොගය හා හැනී සිටියේ ය.

5 - 6 - 7 - 8 යන අඞ්කවලින් දැක්වෙන සිත් සතර, උපෙක්ඛා වෙන් යුක්තබව ඒ හා යෙදී සිටි උපෙක්ඛා යන්නෙන් කියයි. උපෙක්ඛා නම් මධ්‍යස්ථානුභවනලක්ඛණ වූ වෙදනාව ය. සුඛ දුක්ඛ වෙදනාවන්ට නො බැස ඒ වෙදනා දෙක මැද සිටි වෙදනාව ය.

ඒ සිත් සතරෙහි ද 5 - 6 අඞ්කයන්ගෙන් දැක්වෙන දෙ සිත මිසදිටුවෙන් යුක්ත ය. අනික් දෙ සිත, මිසදිටුව හා නො හැනී සිටියේ ය. 5 - 7 අඞ්කයන්ගෙන් දැක්වෙන දෙ සිත, පූර්‍ව්‍රප්‍රයොග සහිත ය. අනික් දෙ සිත, පූර්‍ව්‍රප්‍රයොගරහිත ය.

දැන් මෙසේ දත යුතුයි:- මෙහි පළමු සිත, සොම්නස් සහගිය මිසදිටුවෙන් යුත් තමන් කෙරෙහි හෝ මෙරමා කෙරෙහි පැවැති පූර්‍ව්‍රප්‍රයොගයෙන් උත්සාහයෙන් තොර ව උපදනේ ය.

දෙවන සිත, සොම්නස් සහගියේ මිසදිටුවෙන් යුක්ත වූයේ පූර්‍ව්‍රප්‍රයොගයෙන් වෙන් වූයේ ය.

තෙවන සිත, සොම්නස් සහගියේ මිසදිටුව හා නො හැනී සිටියේ ය. පූර්‍ව්‍රප්‍රයොගරහිත වේ.

සිවුවන සිත, සොම්නස් සහගියේ මිසදිටුව හා නො හැනී සිටියේ පූර්‍ව්‍රප්‍රයොගසහිත වේ.

පස්වන සිත, මැදහත් වෙදනාවෙන් හා මිසදිටුවෙන් යුක්ත වූයේ පූර්‍ව්‍රප්‍රයොගරහිත ව සිටියේ ය.

සවන සිත, මැදහත් වෙදනාවෙන් හා මිසදිටුවෙන් යුක්ත ව පූර්‍ව්‍රප්‍රයොගසහිත ව සිටියේ ය.

සත්වන සිත, මැදහත් වෙදනාවෙන් යුක්ත ය. මිසදිටුවෙන් වියුක්ත ය. පූර්‍ව්‍රප්‍රයොගරහිත ය.

අටවන සිත, මැදහත් වෙදනාවෙන් යුක්ත ව මිසදිටුවෙන් වෙන් ව අනුබල ලබා සිටියේ ය.

සොමනස්සසහගතපටිසන්ධිවිත්තයකින් පිළිසිඳ ගැණීම, ඉටු අරමුණ, නො ගැඹුරු නුවණ යන මේ ය සොම්නස් වෙදනාවට කරුණු. උපෙක්ඛාසහගතපටිසන්ධිවිත්තයකින් පිළිසිඳ ගැණීම, මැදහත් විසින් ඉටුඅරමුණක් ලැබීම, ගැඹුරු නුවණ යන මේ ය මැදහත් වේදනාවට කරුණු. ශාස්වතොච්ඡෙදදෘෂ්ටියෙහි අඞ්ග සය හා මිසදිටු ගත්තවුන් සෙවනය කිරීම, මිසදිටුවට කරුණු ය. මෙ දෙකින් වෙන්වීම, මිසදිටුවෙන් වෙන්වීමට කරුණු ය. සුදුසු

කාල ය, සුදුසු නවාතැන ය, සුදුසු ආහාර ය, සුදුසු වස්ත්‍රාදි ය, සුදුසු මිත්‍ර ය, යන මොවුන් ලැබීම්, අසංඛාරිකභාවයට කරුණු ය. මෙයින් යමක් අඩුව ගිය කල්හි ලැබෙනුයේ සසංඛාරිකභාවය යි.

කාමසෙවනයෙහි වරදෙක් නැතැ යි මිසදිටු පෙරටු කොට තුටුපහටු වූයේ, අනෙකකු විසින් උත්සාහවත් නො කළ, ස්වභාව යෙන් තීක්ෂණ වූ සිතින් ම පස්කම් සෙවනය කෙරේ ද, දිඝමංගලා දිය හෝ සාර වශයෙන් පිළිගණී ද, එකල පළමු අකුසල් සිත උපදනේ ය.

අනෙකකු විසින් උත්සාහවත් කරණ ලද සිතින් පංචකාම සෙවනාදිය කෙරේ ද, එ කල්හි දෙවන අකුසල්සිත උපදනේ ය.

මිසදිටු ව පෙරදැරි නො කොට හුදෙක් තුටුපහටු වූයේ, ස්වභාව තීක්ෂණ වූ අනුත්සාහිතචිත්තයෙන් මෙවුන්දම් සෙවනය කෙරේ ද, අනුන් පිළිබඳ සැපතෙහි බලවත් ලොභය කෙරේ ද, අනුන් අයත් බඩු පැහැර ගණී ද, එකල තෙවන අකුසල්සිත උපදනේ ය.

මඳක් උත්සාහවත් වූ සිතින් මෙවුන්දම් සෙවනය කෙරේ ද අනුන් අයත් සැපතෙහි දැඩි ලොභය කෙරේ ද, අනුන් අයත් බඩු පැහැර ගණී ද, එකල සිවුවන අකුසල්සිත උපදනේ ය.

කාමමිත්‍ථ්‍යාචාරාදී වූ පව් කමක් කරන්නේ මැදහත් බවෙන් යුක්ත ව කෙරේ ද, මිසදිටු ගත්තේ ද, ලා හෙළා කෙරේ ද, එකල පස්වන අකුසල්සිත උපදනේ ය.

මැදහත්බවෙන් යුතු ව මිසදිටු ගෙණ තමා විසින් හෝ මෙරමා විසින් මෙහෙය වන ලදු ව කාමමිත්‍ථ්‍යාචාරාදී වූ පව්කම් කරන්නේ ද, එකල සවන අකුසල්සිත උපදනේ ය.

මැදහත්බවෙන් යුතු ව මිසදිටු නො ගෙණ උත්සාහිත ව කාම මිත්‍ථ්‍යාචාරාදී වූ පව්කම් කරන්නේ ද, එකල සත්වන අකුසල් සිත උපදනේ ය.

මැදහත්බවෙන් යුතු ව මිසදිටුවෙන් වෙන් ව අනුන්ගේ මෙහෙයීමෙන් හෝ තෙමේ පසු බැස අනුත්සාහිත ව පව්කම් කරන්නේ ද, එකල අටවන අකුසල්සිත උපදනේ ය.

සතුන්මැරීම, රළුබස්බිණීම, ව්‍යාපාදය යන ත්‍රිවිධඅකුශල කර්මපථයන් හැර ඉතිරි වූ සප්තවිධඅකුශලකර්මපථයන් අතුරෙන් එක් එක් අකුශලකර්මපථයෙහි අට අට බැගින් සිත් ස පණසෙක්

වේ. ඒ ස පණස ස වැදූරුම් රූපාදිආරම්මණයන්ගේ වශයෙන් ගිණූ කාල්හි තුන්සිය සතිසෙක් වේ. නැවැත ඡන්ද, විරිය, චිත්ත යන ත්‍රිවිධඅධිපතීන්ගේ වශයෙන් ගිණූ කාල්හි එක් දහස් අටෙක් වේ. කායකම්, වාක්කම්, මනඃකම් යන කම්ත්‍රිකයාගේ වශයෙන් ගිණූ කාල්හි තුන්දාස් සූවිස්සෙක් වේ. මේ ක්‍රමයෙන් කාලදෙශාදීන්ගේ වශයෙන් ද ගිණූ කාල්හි මෙහි ප්‍රමාණයක් නො කියැකි ය.

කාමාවචරභූමියෙහි වෙෂය මුල් කරගත් (දෙසමූලික) සිත් දෙකෙකි. මෙන්න ඒ දෙක:-

1. **දෙමනස්සසහගතපටිඝසම්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**

2. **දෙමනස්සසහගතපටිඝසම්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**

මෙහි පෙණෙන දෙමනස්ස යන්නෙන් මානසිකදුක්ඛ වෙදනා ව කියා වේ. පටිඝ යන්නෙන් වෙෂය කියා වේ. අරමූණෙහි හැපෙන ගැටේන බැවින් වෙෂය පටිඝ නම. **'පටිහඤ්ඤතී ති = පටිඝෝ'** යනු නිරුක්ති යි. සෙස්ස පෙර කියූ සේ ය.

මෙහි පළමු සිත, මානසිකදුක්ඛවෙදනාවෙන් හා ප්‍රතිඝයෙන් යුක්ත වූයේ, පූර්ව්‍රයොගරහිත වේ.

දෙවන සිත, මානසිකදුක්ඛවෙදනාවෙන් හා ප්‍රතිඝයෙන් යුක්ත වූයේ, පූර්ව්‍රයොගසහිත වේ.

තමන් නො කැමැති අරමූණු ලැබීම, නව ආඝාතවස්තූන් අතුරෙන් යම්කිසි වස්තුවක් හා ගැටීම, දෙම්නසට හා පටිඝයට කරුණු ය.

ප්‍රාණඝාතාදී වූ පාපයක් කරණ විට දෙම්නසින් හා පටිඝයෙන් යුක්ත ව තමන්ගේ හෝ අනුන්ගේ මෙහෙයීමකු ත් නැති ව කෙරේ ද, එකල දෙසමූලිකප්‍රථමචිත්තය උපදී. ප්‍රාණඝාතාදී වූ පාපයක් දෙම්නසින් හා පටිඝයෙන් යුක්ත ව අනුන්ගේ මෙහෙයීමෙන් හෝ තමන්ගේ පසු බැසීමෙන් හෝ කරණ කල්හි වෙෂය මුල් කර ගත් දෙවන සිත උපදී.

මෙහි අකුශලකම්පථ, අධිපති, කාල, දෙස, ආරම්මණ, ආදි භෙදයන්ගෙන් භෙදයට ගියේ, පමණ නො කොට හැකියැ භෙද වීසින් මේ දෙ සිත.

කාමාවචරභූමියෙහි මොහය මුල්කර ගත් (මොහමූලික) සිත් දෙනෙකි. මෙන්න ඒ දෙක:-

1. උපෙක්ඛාසහගතවිචිකිච්ඡාසම්පයුත්තචිත්තය.

2. උපෙක්ඛාසහගතඋද්ධච්චසම්පයුත්තචිත්තය.

ඒ ඒ ධර්මයන් පිළිබඳ යථාතත්ත්වය සෙවීමෙහි දී ඒ සොයන්නාහුගේ වෙහෙසීමට කරුණු වූ සැකය 'විචිකිච්ඡා නම්. යම් සවභාවයෙක් තෙමේ මත්තෙහි කම්පිත වේ ද, ඒ සවභාවය 'උද්ධත' නම් වේ. මෙයින් අරමුණුවල නො සංසුන් වූ සිත හෝ එයින් යුත් පුද්ගලයා ගැණේ. නො සංසුන් වූ සිතේ සැටි මෙයින් දක්වන ලද්දේ ය. සෙස්ස පෙර කියූ සේ ය.

මෙහි පළමු සිත, උපෙක්ෂාවෙන් හා විචිකිත්සාවෙන් යුක්ත වූයේ, දෙවන සිත, උපෙක්ෂාවෙන් හා ඖද්ධත්‍යයෙන් යුක්ත ය. මේ දෙ සිතෙහි සංසකාර භෙදයෙක් නැත්තේ ය.

'මූලභත්තාවෙව සංසප්ප විකෙඛපාවෙකහෙතුකං,
සොපෙකඛං සබ්බදා නො ච භින්නා සඞ්ඛාරභෙදතො,
න හි තස්ස සහාවෙන තිකඛතුස්සාහනීයතා,
අත්ථි සංසප්පමාණස්ස විකඛිපනතස්ස සබ්බදා'

යන මෙයින් එහි හෙතු කියන ලද්දේ ය.

අරමුණෙහි මුළාවන බැවින්, අරමුණෙහි සැකය හා අරමුණෙහි වික්ෂිපතභාවය ඇති බැවින්, එක් හෙතුවක් ඇති සිත, සියලු අරමුණෙහි උපෙක්ෂාවෙදනාවෙන් යුක්ත වේ. ඒ එකහෙතුක සිත් අසඞ්ඛාර සසඞ්ඛාර භෙදයෙන් වෙනස් නො වේ. බුඬාදී වූ අරමුණෙහි හැපෙන බැවින් හා අරමුණෙහි විසුරුණු බැවින් ද ඒ එකහෙතුක වූ සිතට යම් හෙයකින් සවභාවයෙන් තියුණු බවක්, උත්සාහකටයුතු බවක්, කිසිත් අරමුණෙක නැත්තේ ද එහෙයින් ඒ සිත් සංසකාර භෙදයෙන් වෙනස් නො වේ.

මෙහි පළමු සිත, උපෙක්ෂාවෙන් හා විචිකිච්ඡාවෙන් යුකත වූයේ, දෙවන සිත, උපෙක්ෂාවෙන් හා උඛ්ඛවයෙන් යුකත වූයේ ය.

අකුශලකර්මපථ, ආරම්මණ, අධිපති, කර්ම, කාල, දෙශාදීන්ගේ වශයෙන් මේ දෙ සිතෙහි ද ප්‍රමාණයක් නො දැක්විය හැකි ය.

මෙසේ කාමාවචරභූමියෙහි ලොභය මූල් කොට ඇති සිත් අටෙක, වෙෂය මූල් කොට ඇති සිත් දෙකෙක, මොහය මූල් කොට ඇති සිත් දෙකෙකැ' යි අකුසල් සිත් දෙළසෙකි. එය මෙසේ කීහ:-

'අඤ්ඤා ලොභමූලානි දෙසමූලානි ච විඤ්ඤා,
මොහමූලානි ච වෙති වාදසාකුසලා සියුං' යි.

1. **උපෙක්ඛාසහගතචක්ඛුවිඤ්ඤාණය.**
2. **උපෙක්ඛාසහගතසොතවිඤ්ඤාණය.**
3. **උපෙක්ඛාසහගතඝාණවිඤ්ඤාණය.**
4. **උපෙක්ඛාසහගතජිවහාවිඤ්ඤාණය.**
5. **දුක්ඛසහගතකායවිඤ්ඤාණය.**
6. **උපෙක්ඛාසහගතසම්පටිච්ඡනය.**
7. **උපෙක්ඛාසහගතසන්තීරණය.**

යන මේ සිත් සත අකුසලවිපාක සිත් ය.

චක්ඛු නම්, ඇසැ යි කියනු ලබන මස් ගඩුව ඇසුරු කොට පවත්නා රූපදැකීමේ ශක්තිය යි. **'චක්ඛති විඤ්ඤාණාධිට්ඨිතං භුඤ්ජා සම්විසමං ආවික්ඛණනං විය හොති ති = චක්ඛු'** යම් පසාදරූපයෙක් තෙමේ චක්ෂුර්විඥානයට ආධාරස්ථාන වී සම්විසම භාවය කියන්නකු සේ සිටියේ ද, ඒ පසාදරූපය චක්ඛු නම්. තවත් තේරුමක් මෙසේ ය:- **'අථ වා චක්ඛති රූපං අස්සා දෙන්තං විය හොති ති = චක්ඛු'** යම් පසාදරූපයෙක් තෙමේ වණ්ණායතනය (රූපය) රස බලන්නකු සේ සිටියේ ද ඒ චක්ඛු නම්. මෙහි චක්ඛති යන ක්‍රියාරූපය **'මඤ්ඤං චක්ඛති, ව්‍යඤ්ජනං චක්ඛති'** යනාදි තන්හි සේ රස විඳ ගැණීම අර්ථ කොට ඇත්තේ ය. ඒ බව **'චක්ඛු ඛො පන මාගණ්ඩිය රූපාරාමං රූපරතං රූපසම්මුදිතං'** යනාදී දෙශනාවන්ගෙන් භාග්‍යවතුන් වහන්සේ ද දක්වා වදාළ සේක. චක්ඛුපසාදය රූපාලම්බනය ම ඇලෙන තැන් කොට සිටියේ ය. රූපාලම්බනයෙහි ඇලුනේ ය. රූපාලම්බනයෙහි හටගන්නේ ය යනු, එහි කෙටි තේරුම ය.

මේ මෙසේ නම් සොතපසාදාදීන්ට ද ශබ්දාලම්බනාදීන්ගේ රසවිඳගැණීම ඇති බැවින් ඒ සොතපසාදාදිය ද චක්ඛු ශබ්ද යෙන් වාච්‍ය විය යුතු ය. රූපී බැවින් එසේ නො වේ. චක්ඛු යනු නගන ලද්දේ දකිනුකැමැතිබව කාමතෘෂ්ණාව කරුණු කොට

ඇති කර්මයෙන් හටගත් මහාභූතරූපයන්ගේ පසාදය ලකුණු කොට සිටි චක්ඛුප්පසාදයෙහි ම ය. මයූරයන් ම පොළොවෙහි ශබද කරන්නන් නො වෙතත් මයුරශබදය මයූරපක්ෂියා කෙරෙහි නගන ලද්දේ ය. තබන ලද්දේ ය. එ මෙන් චක්ඛුශබදය චක්ඛුප්ප-සාදයෙහි ම නගන ලද ය. චක්ඛුප්පසාදරූපය හා සමග හටගන්නා බැවින් බැමඅටින් පිරිසිඳිනාලද මස්ගඩුව ද චක්ඛු යි කියනු ලැබේ. **'චක්ඛති රූපං විභාවෙතී ති = චක්ඛු'** රූපය දැන ගන්නේ චක්ඛු නම්. මේ පසාදරූපය යි.

නීලපීතාදී වූ ඒ ඒ අරමුණු අනිත්‍යාදී වූ නොයෙක් අයුරින් දන්නේ විඤ්ඤාණ නම්. **'ආරම්මණං විජානාතී ති = විඤ්ඤාණං'** යනු නිරුක්ති යි. සිත, අරමුණුවිශෙෂයන් දැන ගණී ද එහෙයින් විඤ්ඤාණ යි කියනු ලැබේ. **'විජානාතීති ඛො ආවුසො! තස්මා විඤ්ඤාණන්ති වුච්චති'** යනු සාධක ය. විඤ්ඤාණය ගම්වැසි පුරුෂයකුගේ කහවණුවක් දැක එහි සැටි තේරුම් ගැණීම මෙන් ඒ ඒ අරමුණු ලැබුනු කල්හි එහි වූ නීලපීතාදී වූ පැහසටහන් දැන ගණීයි. ලක්ෂණප්‍රතිවෙධයට පමුණුවයි. **'විඤ්ඤාණං පන ගාමිකපුරිසස්ස කහාපණදස්සනම්ව නීලං පීතන්ති ආරම්ම ණඤ්ච ජානාති ලක්ඛණපටිවෙධඤ්ච පාපෙති'** යනු ආචාර්‍ය වචන යි.

මේ චක්ඛුශබදයෙන් චක්ඛුප්පසාදය ත් විඤ්ඤාණශබදයෙන් සිත ත් කියනු ලැබේ. එහෙයින් උපෙක්ෂාවෙදනාව හා එකොත් පාදාදිභාවයට ගිය චක්ඛුප්පසාදය ඇසුරු කොට පවත්නා සිතැ යි මෙහි අරුත් ගත යුතුය. **'චක්ඛුස්මිං නිස්සිතං විඤ්ඤාණං චක්ඛු විඤ්ඤාණං'** යනු එය පැහැදිලි කරයි. නුගරුක අරක් ගත් දෙවතාවා නිග්‍රොධ දෙවතා' යි කියනු ලබන්නා සේ චක්ඛුප්ප සාදය ඇසුරු කොට පවත්නා සිත චක්ඛු විඤ්ඤාණ යි කියනු ලැබේ. චක්ඛුවිඤ්ඤාණය තෙමේ චක්ඛුප්පසාදය ඇසුරු කොට රූපාලම්බනය දැන ගැණීම ලකුණු කොට ඇත්තේ ය. රූපාලම්බන මාත්‍රයක් ම අරමුණුකිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. රූපා ලම්බනයෙහි ම අභිමුඛවීම වැටහීම කොට ඇත්තේ ය. රූපය අරමුණු කොට ඇති ක්‍රියාමනොධාතුආවර්ජනචිත්තයෙහි පහවීම ආසන්නකාරණය කොට ඇත්තේ ය.

සොතයන්නෙන් සොතප්පසාදරූපය ගැණේ. **'සද්දං සුණාති විඤ්ඤාණාධිඨිතං හුත්වාති = සොතං'** යම් පසාද රූපයෙක් තෙමේ විඤ්ඤාණයට ආධාර ව ශබදශ්‍රවණය කෙරේ ද, ඒ ය සොත. විඤ්ඤාණය පෙර කියූ සේ ය. සොතශබදයෙන් සොතප්පසාද රූපය ත් විඤ්ඤාණ ශබදයෙන් සිත ත් කියනු ලැබේ. එහෙයින්

උපෙක්ඛාවෙදනා ව හා එකොතපාදදිභාවයට ගිය සොතපසාදය ඇසුරු කොට පවත්නා සිතැ'යි අරුත් ගත යුතු ය. **'සොතඤ්ං නිස්සිතා විඤ්ඤත්තිං = සොතවිඤ්ඤත්තිං'** යනු එය පැහැදිලි කරයි. සොතවිඤ්ඤත්තිය තෙමේ සොතපප සාදය ඇසුරු කොට ශබ්දලම්බනය දැන ගැණීම ලකුණු කොට ඇත්තේ ය. ශබ්දලම්බන මාත්‍රයක් ම අරමුණුකිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. ශබ්දලම්බනයෙහි ම අභිමුඛවීම වැටහීම කොට ඇත්තේ ය. ශබ්දලම්බනය අරමුණු කොට ඇති ක්‍රියා මනොධාතුපංචාරාවර්ජන චිත්තයෙහි පහවීම ආසන්නකාරණය කොට ඇත්තේ ය.

ඝාණයත්නෙන් ඝාණපපසාදරූපය ගැණේ. **'ඝායති ගන්ධා පාදනං කරොතීති ඝාණං'** යම් පසාදරූපයෙක් තෙමේ විඤ්ඤත්තියට ආධාර ව ගන්ධාරම්මණය ලං කොට ගණී ද, ඒ ය ඝාණවිඤ්ඤත්ත ය. පෙර කියූ සේ ය. ඝාණශබ්දයෙන් ඝාණපපසාදරූපය ත් විඤ්ඤත්තශබ්දයෙන් සිත ත් කියනු ලැබේ. එහෙයින් උපෙක්ඛාවෙදනාව හා එකොතපාදදිභාවයට ගිය ඝාණපපසාදය ඇසුරු කොට පවත්නා සිතැ' යි අරුත් ගත යුතු ය. **'ඝාණඤ්ං නිස්සිතං විඤ්ඤත්තිං = ඝාණවිඤ්ඤත්තිං'** යනු එය පැහැදිලි කරයි. ඝාණවිඤ්ඤත්තිය තෙමේ ඝාණපපසාදය ඇසුරු කොට ගන්ධාලම්බනය දැන ගැණීම ලකුණු කොට ඇත්තේ ය. ගන්ධාලම්බනමාත්‍රයක් ම අරමුණුකිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. ගන්ධාලම්බනයෙහි ම අභිමුඛවීම වැටහීම කොට ඇත්තේ ය. ගන්ධාලම්බනය අරමුණු කොට ඇති ක්‍රියාමනොධාතුආවර්ජනචිත්තයෙහි පහවීම ආසන්නකාරණය කොට ඇත්තේ ය.

ජිවහායත්නෙන් ජිවහාපසාදරූපය ගැණේ. **'ජීවිත නිමිත්තං රසෙ ජීවිතං, තං අවහයති තස්මිං නිනනතායා නි = ජිවහා'** ජීවිතයාගේ පැවැත්මට නිමිත්ත වන බැවින් රසාරම්මණය ජීවිත නම්. යම් පසාදරූපයෙක් තෙමේ ඒ රසාරම්මණයෙහි නැමී පවත්නා බැවින් රසාරම්මණය වෙතට කැඳවා ද, ඒ පසාදරූපය ජිවහා නම්. විඤ්ඤත්තිය පෙර කියූ සේ ය. ජිවහාශබ්දයෙන් ජිවහාපසාදරූපය ත් විඤ්ඤත්තශබ්දයෙන් සිත ත් කියනු ලැබේ. එහෙයින් උපෙක්ඛාවෙදනා ව හා එකොතපාදදි භාවයට ගිය ජිවහාපපසාදය ඇසුරු කොට පවත්නා සිතැයි අරුත් ගත යුතු ය. **'ජිවහාය නිස්සිතං විඤ්ඤත්තිං=ජිවහාවිඤ්ඤත්තිං'** යනු එය පැහැදිලි කරයි. ජිවහාවිඤ්ඤත්තිය තෙමේ ජිවහාපසාදය ඇසුරු කොට රසාලම්බනය දැන ගැණීම ලකුණු කොට ඇත්තේ ය.

රසාලම්බනමාත්‍රයක් ම අරමුණුකිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. රසාලම්බනයෙහි ම අභිමුඛවීම වැටහීම කොට සිටියේ ය. රසාලම්බනය අරමුණු කොට ඇති ක්‍රියාමනොධාතුආවජ්ජන චිත්තයෙහි පහවීම ආසන්නකාරණය කොට ඇත්තේ ය.

දුකඛ යන්නෙන් දුකඛවෙදනා ව කියනු ලැබේ. යම් වෙදනාවක් කායිකසුඛය නිඳිත කොට නිඳිත ව **කරන්නී** ද විනාශ කරන්නී ද ඒ සුඛවෙදනා ව කණින නසන වෙදනා ව දුකඛ යන්නෙන් කියන ලද්දී ය. **'දුකඛමනති වා = දුකඛං'** යම් වෙදනාවක් ඉවසීමට නොහැකි ද, ඒ දුකඛ නම්. කාය ශබ්දයෙන් කායපසාදය කියනු ලැබේ. චාදස අකුසලචිත්තයන්ගේ පැවැත්මට සථාන වන බැවිනි. **'ආයනති පවත්තනති එතථාති – ආයො, කුචඡිතානං ආයොති = කායො'** යනු අරුත් පැහැදිලි කිරීම ය. **'කුචඡිතානං කෙසාදීනං ආයොති = කායො'** යන අථී-සමථීනයෙන් සසම්භාරකාය ගැණේ. මෙහි කාය ශබ්දයෙන් කායපපසාදරූපය ත් විඤඤණශබ්දයෙන් සිත ත් කියනු ලැබේ. එහෙයින් දුකඛවෙදනා ව හා එකොත්පාදාදිභාවයට ගිය කායපප-සාදය ඇසුරු කොට පවත්නා සිතැ'යි අරුත් ගත යුතු ය. **'කායසමිං නිසසිතං විඤඤණං = කායවිඤඤණං'** යනු එය පැහැදිලි කරයි. කායවිඤඤණය තෙමේ කායපපසාදය ඇසුරු කොට ඵොඨඛබබාරම්මණය දැන ගැණීම ලකුණු කොට ඇත්තේ ය. ඵොඨඛබබාරම්මණමාත්‍රයක් ම අරමුණුකිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. ඵොඨඛබබාරම්මණයෙහි අභිමුඛවීම වැටහීම කොට ඇත්තේ ය. ඵොඨඛබබාරම්මණය අරමුණු කොට ඇති ක්‍රියා-මනොධාතුආවජ්ජනචිත්තයෙහි පහවීම ආසන්නකාරණය කොට ඇත්තේ ය.

සම්පටිච්ඡන යන්නෙන් රූපාදී වූ අරමුණු පිළිගන්නා සැටි-යෙන් පවත්නා සිත කියැ වේ. **'පංචවිඤඤණගහිතං රූපාදි ආරම්මණං සම්පටිච්ඡති තදුකාරපපවත්තනියාති = සම්පටිච්ඡනං'** යනු එයරුත් ගත් වන්නේ ය. චකඛුවිඤඤණ, සොතවිඤඤණ, ඝාණවිඤඤණ, ජිවහාවිඤඤණ, කායවිඤඤණ යන පංචවිඤඤණ යෙන් ගත් රූපාදී වූ අරමුණු ඒ අයුරෙන් පිළිගන්නේ සම්පටිච්ඡන නම් වේ. එහෙයින් උපෙඤඛාවෙදනාවෙන් යුත් රූපාදීන් පිළි-ගන්නා සිතැ'යි අරුත් ගතයුතු ය.

සන්තීරණ යන්නෙන් පිළිගත් ඒ අරමුණු විමසන ලෙසින් පවත්නා සිත කියැ වේ. මෙන්න අථීසම්ථීනය:- **'සම්මා තීරෙති යථා සම්පටිච්ඡිතං රූපාදිආරම්මණං විමංසතීති = සන්තීරණං'** යනු. සම්පටිච්ඡනචිත්තයෙන් පිළිගත් රූපාදී වූ

අරමුණු මොනවට විමසන සිත සන්තීරණ නම්. එහෙයින් උපෙක්ඛාවෙදනායෙන් යුත් අරමුණු විමසන්නා වූ සිතැ' යි අරුත් ගතයුතු ය.

මේ සිත් සත, අකුශලවිපාකඅහෙතුක ය. කුශලයන්ට ප්‍රතිපක්ෂ බැවින් අකුශල නම් වේ. එකිනෙකට විරුද්ධ වූ කුශලයන්ගේ විපාක බැවින් විපාක නම් වේ. විපාක නම් පැසීම ය. එකල කුශලාකුශලයන්ගේ පැසීම විපාක නමැ යි ගතයුතු ය.

කුශලාකුශලචිත්තයන්ගේ ස්ථිර පැවැත්මට අකුශලපාක්ෂික ලොභ, දෙස, මොහ යි හෙතු තුනක් හා කුශලපාක්ෂික අලොභ අදෙස, අමොහ යි හෙතු තුනක් හා හෙතු සයෙක් වේ. මේ හෙතූන් අතුරෙන් එක් හෙතුවක් වත් යම් සිතෙක නො යෙදුනේ නම්, ඒ සිත අහෙතුක නම් වේ. මේ අකුශල, විපාක, අහෙතුක යන වචනතුනෙහි ඉතා ම කෙටි තේරුම් ය.

චක්ඛුවිඤ්ඤාණයාගේ ඉපදීමෙහි හෙතු සතර මෙසේ දන්නේ ය. චක්ඛුපසාදය නො පිරිහීම, රූපාරම්මණයක් හමුවීම, ආලෝකයෙන් උපනිශ්ශ්‍රයප්‍රත්‍යය ලැබීම, මනසිකාරසහිතබව යන මේ ය ඒ. මේ කියූ සැටි:-

'අසමෙහදෙන චක්ඛුස්ස රූපාපාථගමෙන ච,
ආලොකතිස්සයෙනාපි සමනන්තරහෙතුනා,
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහි පි,
ජායතෙ චක්ඛුවිඤ්ඤාණං සම්පයුත්තෙනහි තං සහ' යි.

සොතවිඤ්ඤාණයාගේ ඉපදීමෙහි හෙතු සතර මෙසේ දන්නේය. සොතපසාදය නො පිරිහීම, ශබ්දාරම්මණයක් හමුවීම, කන්සිදුරෙහි විවරයෙන් උපනිශ්ශ්‍රයප්‍රත්‍යය ලැබීම, මනසිකාරසහිතබව යන මේය ඒ. මේ කියූ සැටි:-

'අසමෙහදෙන සොතස්ස සද්දපාථගමෙන ච,
ආකාසනිස්සයෙනාපි සමනන්තරහෙතුනා,
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහි පි,
ජායතෙ සොතවිඤ්ඤාණං සම්පයුත්තෙනහි තං සහ' යි.

ඝාණවිඤ්ඤාණයාගේ ඉපදීමෙහි හෙතු සතර මෙසේ දන්නේ ය. ඝාණපසාදය නො පිරිහීම, ගන්ධාරම්මණයක් හමුවීම, නැහැ සිදුරෙන් ඇද ගන්නා වායොධාතුහුගේ උපනිශ්ශ්‍රයප්‍රත්‍යය ලැබීම මනසිකාරසහිතබව යන මේය ඒ. මේ කියූ සැටි.-

'අසමෙහෙදෙන ඝාණස්ස ගන්ධාපාථගමෙන ච,
වායොසන්නිස්සයෙනාපි සමනන්තරහෙතුනා,
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහි පි,
ජායතෙ ඝාණවිඤ්ඤාණං සමපයුත්තෙනහි තං සහ' යි.

ජිව්හාවිඤ්ඤාණයාගේ ඉපදීමෙහි හෙතු සතර මෙසේ දන්නේ ය. ජිව්හාපසාදය නෝ පිරිහීම, රසාරම්මණයක් හමුවීම, මුඛගත වූ ආපොධාතුවගේ උපනිශ්ශ්‍රයප්‍රත්‍යය ලැබීම, මනසිකාරසහිතබව යන මේය ඒ. මේ කියූ සැටි:-

'අසමෙහෙදෙන ජීව්හාය රසාපාථගමෙන ච,
ආපොසන්නිස්සයෙනාපි සමනන්තරහෙතුනා,
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහි පි,
හොති ජිව්හායවිඤ්ඤාණං සමපයුත්තෙනහි තං සහ'යි.

කායවිඤ්ඤාණයාගේ ඉපදීමෙහි හෙතු සතර මෙසේ දන්නේ ය. කායපසාදය නො පිරිහීම, පඨවී, තෙජෝ, වායෝ යන මෙ තුනෙහි පහස ලැබීම, සසම්භාරකයෙහි පඨවීධාතූහුගේ උපනිශ්ශ්‍රයප්‍රත්‍යය ලැබීම, මනසිකාරසහිතබව යන මේ ය ඒ. මේ කියූ සැටි:-

'අසමෙහෙදෙන කායස්ස ඵොට්ඨබ්බාපාථසඞ්ගමා,
පඨවීනිස්සයෙනාපි සමනන්තරහෙතුනා,
පච්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහි පි,
ජායතෙ කායවිඤ්ඤාණං සමපයුත්තෙනහි තං සහ' යි.

1. **උපෙක්ඛාසහගතචක්ඛුවිඤ්ඤාණය.**
2. **උපෙක්ඛාසහගතසොතවිඤ්ඤාණය.**
3. **උපෙක්ඛාසහගතඝාණවිඤ්ඤාණය.**
4. **උපෙක්ඛාසහගතජිව්හාවිඤ්ඤාණය.**
5. **සුඛසහගතකායවිඤ්ඤාණය.**
6. **උපෙක්ඛාසහගතසම්පටිච්ඡනය.**
7. **සොමනස්සසහගතසන්තීරණය.**
8. **උපෙක්ඛාසහගතසන්තීරණය.**

යන මේ සිත් අට, කුශලවිපාකඅහෙතුක සිත් ය.

මෙහි උපෙක්ඛාසහගතචක්ඛුවිඤ්ඤාණාදීන්ගේ අරුත් පෙර කියූ සේ දන්නේ ය. සුඛ යන්නෙන් සුඛවෙදනාව කියැ වේ. යම් වෙදනාවක් සිත කය සුවපත් කරවා ද, නොහොත් සිත කය දෙක්හි ගිලන්බව මොනවට නසන්නී ද, නොහොත් යම් වෙදනාවක් සුවසේ ඉවසිය යුතු ද, ඒය සුඛවෙදනා. **'සුඛයති කායචිත්තං, සුටඨු වා ඛනති කායචිත්තාබාධං, සුඛෙන ඛමි තබ්බනති වා = සුඛං'** යනු අර්ථකථා ය. ඒ මේ සුඛවෙදනාවෙන් යුත් සිත සුඛසහගත නම් වේ.

චක්ඛුවිඤ්ඤාණාදී වූ කුසලාකුසලවිපාකයෝ වස්තු ආලම්බන යන්ගේ හැපීම දුර්වල බැවින් අනිටුඅරමුණෙහි ද ඉටුඅරමුණෙහි ද මැදහත්බවෙන් යුක්ත වූවෝ ම වෙති. (උපෙක්ෂාසහගත වෙති.) එහි මානසිකසුඛවෙදනාවක් හෝ මානසිකදුක්ඛවෙදනාවක් හෝ නො ලැබේ. චක්ඛුවිඤ්ඤාණාදී වූ චතුර්විධචිත්තයන්ට නිඃශ්‍රය වස්තු වූ චක්ඛුප්පසාදාදීහු උපාදායරූපයෝ ය. එසේ ම අරමුණු වූ රූපාරම්මණාදීහු ද උපාදායරූපයෝ ය. උපාදායරූපයක් හා උපාදායරූපයක්හුගේ ගැටීම ඉතා සුලු ය. දුර්වල ය. එය පුලුන් පිඩක් හා පුලුන්පිඩක්හුගේ ගැටීම හැපීම සේ ය. මෙසේ හෙයින් දුර්වල වූ වස්තු ආලම්බනයන්ගේ හැපීමේ දී චක්ඛුවිඤ්ඤාණාදි චිත්තයෝ උපෙක්ෂාසහගත ම වෙති. පොත මෙය මෙසේ කියයි:-

'චක්ඛුවිඤ්ඤාණාදීනි පන චත්තාරි උභයවිපාකානිපි වත්ථාරම්මණඝට්ටනාය දුබ්බලභාවතො අනිඨෙ ඉඨෙ පි ච ආරම්මණෙ උපෙක්ඛාසහගතානෙව, තෙසං හි චතුන්නම්පි වත්ථුභූතානි චක්ඛාදීනි උපාදාරූපානෙව, තථා ආරම්මණභූතානි පි රූපාදීනි උපාදාරූපකෙන ච උපාදාරූපකස්ස සංඝට්ටනං අතිදුබ්බලං පිචුපිණ්ඩකෙන පිචුපිණ්ඩකස්ස ඵුසනං විය, තස්මා තානි සබ්බථා පි උපෙක්ඛාසහගතානෙව' යි.

පඨවි, තෙජෝ, වායු යන මේ භූතරූප තුන ඵොඨබ්බා රම්මණය යි. එය කායවිඥානයට අරමුණු වේ එ හෙයින් එය කායප්පසාදයෙහි හැපෙන විට කායප්පසාදය ඉක්මවා ගොස් කායප්පසාදයාගේ නිඃශ්‍රයස්ථාන වූ මහාභූතරූපයන්හි ද හැපෙයි. භූතරූපයන් හා භූතරූපයන්ගේ හැපීම අතිශය බලවති. කිණිහිරියක් උඩ පුලුන්පොදක් තබා කුළුගෙඩියකින් ගැසූ කල්හි කුළුගෙඩිය පුලුන් පොද ඉක්මවා ගොස් කිණිහිරියෙහි වදින්නා සේ ය. මෙසේ හෙයින් වස්තු ආලම්බනයන්ගේ හැපීම බලවත් බැවින් කායවිඥානය අනිටුඅරමුණෙහි දුක්ඛසහගත ය. ඉටුඅර මුණෙහි සුඛසහගත ය. මෙන්න එය කියූ සැටි:

'කායවිඤ්ඤාණස්ස පන ඵොඨබ්බසඞ්ඛාතභූතත්තයමෙව ආරම්මණන්ති තං කායප්පසාදෙ සඞ්ඝට්ටිතම්පි තං අතික්කමිත්වා තන්නිස්සයෙසු මහාභූතෙසු පටිහඤ්ඤති, භූතරූපෙහි ච භූතරූපානං සඞ්ඝට්ටනං බලවතරං, අධිකරණ්මත්ථකෙ පිචුපිණ්ඩකං ඨපෙත්වා කූටෙන පහටකාලෙ කූටස්ස පිචුපිණ්ඩකං අතික්කමිත්වා අධිකරණ්ගහණං විය, තස්මා වත්ථාරම්මණ ඝට්ටනාය බලවභාවතො කායවිඤ්ඤාණං අනිඨෙ දුක්ඛසහගතං, ඉඨෙ සුඛසහගතන්ති' යි.

සම්පටිච්ඡනචිත්තයෝ තමන් හා සමාන නො වූ නිඃශ්‍රය ස්ථාන ඇති චක්ෂුර්විඥානාදීන්ට අනතුරුව උපදිත්. එ හෙයින් සමාන වූ නිඃශ්‍රයස්ථාන ඇති සිතකින් නො ලත් අනන්තර ප්‍රත්‍යය ඇති බැවින් සමාන වූ උපත්ථම්භකපුරුෂයකු කෙරෙන් වෙන් වූ පුරුෂයකු සේ අතිශය බලවත් නො වූ වෝ ය. ඉටු අරමුණුවල රසය විඳින්නට අසමර්ථ වෙති. මෙන්න එය කියූ සැටි:-

'සම්පටිච්ඡනයුගලං පන අත්තනා අසමානනිස්සයානං චක්ඛුවිඤ්ඤාණාදීනං අනන්තරං උප්පජ්ජතීති සමානනිස්සයතො අලඛානන්තරපච්චයතාය සහාගුපත්ථම්භරහිතො විය පුරිසො නාතිබලවං සබ්බථා පි විසයරසං අනුභවිතුං න සක්කොතීති සබ්බථා පි උපෙක්ඛාසහගතමෙව'

කුසලවිපාකසන්තීරණචිත්තයෝ මේ ක්‍රමයට විපරීත විසින් ඉටුඅරමුණෙහි ද ඉටුමැදහත්අරමුණෙහි ද සුඛවෙදනා උපෙක්ෂා වෙදනාසහගත වෙති. අනිටුඅරමුණක් තීරණය කරණ කල්හි සුඛවෙදනාසහගත ය. ඉටුමැදහත්අරමුණක් තීරණය කරණ කල්හි උපෙක්ෂාවෙදනාසහගත ය. මෙන්න ඒ කියූ සැටි:-

'වුත්තවිපරියතො කුසලවිපාකසන්තීරණං ඉට්ඨ ඉට්ඨ මජ්ඣත්තාරම්මණෙසු සුඛොපෙක්ඛාසහගතං' යි.

1. **උපෙක්ඛාසහගතපඤ්චද්වාරාවජ්ජනය.**
2. **උපෙක්ඛාසහගතමනොද්වාරාවජ්ජනය.**
3. **සොමනස්සසහගතහසිතුප්පාදය.**

යන මේ සිත් තුන අහෙතුකක්‍රියා සිත් ය.

මෙහි පංචද්වාරාවජ්ජන යන්නෙන් එනමින් කියවෙන සිත ගැණේ. යම් සිතක් චක්ෂුරාදී වූ දොරටු පසෙහි ගැටුනා වූ අරමුණු මෙනෙහි කෙරේ ද, ඒ සිත පංචද්වාරාවජ්ජන නම් වේ. භූත,

භවඞ්ගචිත්තපරම්පරාව භවඞ්ගචිත්තයාගේ වශයෙන් හටගැන්මට නො දී වීථිචිත්තයන්ගේ හටගැණීම පිණිස පිරිනමන්නේ ද, එය පංචද්වාරාවජ්ජන නම්. මෙන්න පොතේ ඒ කියූ සැටි:-

'චක්ඛාදිපංචද්වාරෙසටචිතං ආරම්මණං ආවජ්ජෙති තත්ථ ආභොගං කරොති චිත්තසන්තානං වා භවඞ්ගවසෙන පවත්තිතුං අදත්වා වීථිචිත්තභාවාය පරිණාමෙතීති පංචද්වාරාවජ්ජනං' යි.

පංචද්වාරයන් අතුරෙහි යම් ද්වාරයෙක්හි, අරමුණක් වැටුනු කල්හි, භවඞ්ගසන්තතිය සෙල වී, පංචද්වාරයෙන් කිනම් ද්වාරයෙක මේ අරමුණ වැටුනේ ද, යි සොයා බලන්නකු සේ උපදින සිත පංචද්වාරාවජ්ජනචිත්ත යි දත යුතු ය. ක්‍රියාහෙතුකමනොධාතු චිත්තය යි. මේ සිත භවඞ්ගැ යි කියූ මනොවිඤ්ඤාණධාතුවෙන් උපදනේ නමුත් විශෙෂ හැඟීමක් නොමැති බැවින් එසේ කියනු ලැබේ. මෙය පෙර කළ කුසල් අකුසල් දෙක්හි විපාකයෙක් ද නො වේ. අනාගතයෙහි විපාක නො ලැබෙන බැවින් කුශලා කුශලකර්මයෙක් ද නො වේ. හුදෙක් ක්‍රියාමාත්‍රයෙකි. මෙ ද මානසිකසුඛවෙදනාවෙන් හා මානසිකදුක්ඛවෙදනාවෙන් ද යුක්ත වීමට ශක්ති මඳ බැවින් උපෙක්ෂාසහගත ම වේ. චක්ෂුර්විඥානාදි යෙහි පෙරමුණේ හැසිරෙමින් රූපාදිය දැන ගැණීම ලකුණු කොට ඇත්තේ ය. චිත්තපරම්පරාව පෙර පැවැති ආකාරයෙන් පෙරළා අනික් ආකාරයකට නැවීම කෘත්‍යය කොට ඇත්තේ ය. එසේ බව නුවණට වැටහීම කොට ඇත්තේ ය. භවඞ්ගසන්තතිය සිඳ දැමීම ආසන්නකාරණය කොට ඇත්තේ ය.

මනොද්වාරාවජ්ජන නම්, ක්‍රියාහෙතුකමනොවිඤ්ඤාණධාතු චිත්තය යි. ආවජ්ජන යුග්මයට අනන්තරප්‍රත්‍යය වූ භවඞ්ගචිත්තය වීථිචිත්තයන්ගේ හටගැන්මට දොරටු වන බැවින් මනොද්වාර නම් වේ. මෙන්න එය කියූ සැටි:-

'ආවජ්ජනස්ස අනන්තරපච්චයභූතං භවඞ්ගචිත්තං මනොද්වාරං' යි.

යම් සිතක්, ඒ මනොද්වාරයෙහි දිඨ සුත මුතාදීන්ගේ වශයෙන් හමුබවට පැමිණි අරමුණ මෙනෙහි කෙරේ ද, නොහොත් කියූ ලෙසට චිත්තපරම්පරාව පිරිනමන්නේ ද, ඒ සිත මනොද්වාරාවජ්ජන නම් වේ. **'තස්මිං දිඨසුතමුතාදිවසෙන ආපාථමාගතමාරම්මණං ආවජ්ජෙති චුත්තනයෙන වා චිත්තසන්තානං පරිනාමෙතීති = මනොද්වාරාවජ්ජනං'** යනු ඒ කියූ සැටියි.

මේ සිත ම, පංචද්වාරිකචිත්තවීථින්හිදී සන්තීරණචිත්තයෙන් විමසන ලද අරමුණ නියම කෙරේ. එ හෙයින් මෙය වොත්ථපන චිත්ත යි ද කියනු ලැබේ. **'ඉදමෙව ච පංචදවාරෙ යථා සන්තීරිතං ආලම්බනං වවත්ථපෙති වොත්ථපනන්ති වුච්චති'** යනු එහි ආචාර්‍යකථා ය. මෙ ද කර්‍මයෙක් නො වේ විපාකයෙක් ද නො වේ. හුදෙක් ක්‍රියාමාත්‍රයෙක. පංචද්වාරාවර්ජනය සේ උපෙක්ෂා සහගත ය. අරමුණු දැන ගැණීම ලකුණු කොට ඇත්තේ ය. සන්තීරණචිත්තයෙන් විමසූ අරමුණ නියම කරන්නා සේ හට ගැණීම හා මනොද්වාරයෙහි අරමුණ මෙනෙහි කිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. අහෙතුකවිපාකමනොවිඤ්ඤාණධාතු තිදෙන හා ආවර්ජනකාලයෙහි යම් කිසි භවඞ්ගුපච්ඡේදයක් ද යන මොවුන් අතුරෙහි එක්තරා සිතක පහවීම ආසන්නකාරණය කොට ඇත්තේ ය.

ක්‍රියාහෙතුකමනොවිඤ්ඤාණධාතුචිත්තය, හසිතුප්පාද නම් වේ. මේ වනාහි මානසිකසුඛවෙදනාවෙන් යුක්ත ය. සිනා උපදවන සිත, හසිතුප්පාද නම්. **'යං හසිතං උප්පාදෙති තං චිත්තං හසිතුප්පාදං'** යනු ආප්තවචනයි. සිනාව උපදවන්නේ දෙම නස්සසහගතක්‍රියාහෙතුකමනොවිඤ්ඤාණධාතුචිත්තය යි.

මේ වනාහි රහතුන් වහන්සේට බලගතු විපාක ඇති දුගතියෙහි ඉපැත්මෙන් තොර වූ තම තමන් පිළිබඳ වූ ආත්ම භාවසම්පත්තිය අරමුණු වීමෙන් තුටුපහටු ආකාරය උපදවමින් උපදනේ ය. කර්‍මයෙක් නො වේ. විපාකයෙක් ද නො වේ. ක්‍රියා මාත්‍රයෙක. මෙය ෂඩාලම්බනයන් දැනීම ලකුණු කොට ඇත්තේ ය. රහතුන් වහන්සේට සියුම් වූ අරමුණෙහි නොහොත් අට්ඨි සංඛලිකප්‍රෙත රූපාදී වූ හෝ අතික් අප්‍රණීත වූ අරමුණෙහි මඳ සිනා පහළකිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. එසේබව වැටහීම කොට ඇත්තේ ය. සිනාව වනාහි සිත, හසිත, විහසිත, උපහසිත, අවහසිත, අතිහසිත යි ස වැදැරුම් ය.*

සිනා පහළ කරණ සිත් තෙළසකි. සොම්නසින් යුත් ලොභය මුල් කොට ඇති අකුසල්සිත් සතර, සොම්නසින් යුත් මහාකුසල්සිත් සතර, සොම්නසින් යුත් මහාක්‍රියා සිත් සතර, හසිතොත්පාද යන මේය ඒ. මොවුනතුරෙහි සොම්නසින් යුත් අකුසල්සිත් සතර, සොම්නසින් යුත් කුසල්සිත් සතර යන

---

* සිත මිහ විකාසි නයනං කිඤ්චාලඛ්‍ය විජන්තුනං හසිතං,
මධුරස්සරං විහසිතං සංසසිරොකම්පමුපහසිතං,
අපහසිතං සජලක්ඛී විකඛිත්තඞ්ගං හවත්‍යතිහසිතං,
වෙ වෙ කථිතා තෙසං ජෙඨෙ මජ්ඣෙ ධමෙ පිච කමසො.

මේ අටෙන්, ලෞකිකජනයෝ සිනා පහළ කෙරෙත්. දිට්ඨිවිප්පයුත්තසොමනස්සසහගත අකුසල්සිත් දෙකෙන් හා සොමනස්ස කාමාවචර කුසල්සිත් සතරින් ද, ශෛක්ෂයෝ සිනා පහළ කෙරත්, සොමනස්සසහගතකාමාවචරක්‍රියා සිත් සතරින් හා මේ අහෙතුකහසිතෝත්පාදක්‍රියා සිතින් ද, අශෛක්ෂයෝ සිනා පහළ කෙරෙත්. ඒ කියූ සැටි මේ:-

'සොමනස්සයුතානඤ්ච කුසලාකුසලානි ච,
කිරියතෝ පන පඤ්චව හාසචිත්තානි තෙරස.
පුථුජ්ජනා හසනෙනඤ්ච චිත්තෙනඤ්ච පන අඤ්ඤි,
ඡහි සෙඛා අසෙඛා ච හසන්ති පන පඤ්චහි' යි.

'සම්පයුත්තාහෙතුවිරහතෝ අහෙතුකානි ච තානි විපච්ච නවිපාකුප්පාදනකිච්චරහිතත්තා තං තං ක්‍රියාමත්තභූතානි චිත්තානි චා නි අහෙතුකක්‍රියාචිත්තානි' යන මෙයින් මොවුන් ගේ අහෙතුකත්වය හා ක්‍රියාමාත්‍රභාවය පැහැදිලි වේ. සම්ප්‍රයුක්ත හෙතූන්ගේ අභාවයෙන් අහෙතුක වෙති. මූහු කිරීමෙන් හා විපාක ඉපදවීමෙන් ද තොර බැවින් ක්‍රියාමාත්‍ර වෙති.

මෙසේ අකුසලවිපාක සිත් සතෙක, කුසලවිපාක සිත් අටෙක ක්‍රියාසිත් තුනෙකැ' යි අහෙතුක සිත් අටලොසෙකි.

'සත්තාකුසලපාකානි පුඤ්ඤපාකානි අඤ්ඣා,
ක්‍රියාචිත්තානි තීනීති අඨාරස අහෙතුකා'

යනු එහි සංග්‍රහය ය.

තව ද මෙහි මෙසේ දැක් වූ අකුසල්සිත් දෙලොස අහෙතුක සිත් අටලොස යන සමතිස් සිත්, ශ්‍රද්ධාදී වූ කිසි ම ශොභන ධර්මයක් හා නොයෙදෙන බැවින් අශොභනචිත්ත නම් වේ.

1. සොමනස්සසහගතඤ්ඤාණසම්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.
2. සොමනස්සසහගතඤ්ඤාණසම්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.
3. සොමනස්සසහගතඤ්ඤාණවිප්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.
4. සොමනස්සසහගතඤ්ඤාණවිප්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.
5. උපෙක්ඛාසහගතඤ්ඤාණසම්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.
6. උපෙක්ඛාසහගතඤ්ඤාණසම්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.
7. උපෙක්ඛාසහගතඤ්ඤාණවිප්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.
8. උපෙක්ඛාසහගතඤ්ඤාණවිප්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.

මේ කාමාවචරභූමියට අයත් කුසල්සිත් අටය.

මෙහි සොමනස්ස, සහගත යන මුත් සම්බන්ධයෙන් කියයුත්ත කියූ සේ දන්නේ ය. යථාසභාවය දැනීම ඤාණ නම්. දානාදිකුශල කර්මයන්ගෙන් ඉෂ්ටවිපාකයක් ලැබෙන්නේ ය, යනාදිය දැනීමෙහි නුවණය ඒ. **'ජානාති යථාසභාවං පවිචිජතීති = ඤාණං'** යනු ඒ පැහැදිලිකිරීම ය. ලොකයෙහි ඇත්තා වූ ඒ ඒ වස්තූන් මේ මේ යි හැඳිනීම ඤාණය නොවේ. ඒ ඒ වස්තූන් සකඛඨාතු – ආයතනාදීන්ගේ වශයෙන් විභාග කොට දැනීම ඤාණ නම්. ඒ ඤාණය එකොතපාදිප්‍රකාරයෙන් යෙදීම ය ඤාණසම්පයුත්ත. එසේ නොයෙදීම ය විප්පයුත්ත. අසඛ්ඛාරික-සසඛ්ඛාරික යන මෙ දෙකින් කියැවෙන විඤ්ඤාණය යට සැකෙවින් කියැවුනේ ය. ඒ දතයුතු ය.

සොමනස්සසහගතං, ඤාණසම්පයුත්තං, අසඛ්ඛාරිකං යන මේ පදත්‍රයෙන් කියන ලද්දේ ප්‍රථමකාමාවචරකුශලචිත්තය සන්තොෂයෙන්, නියමතතු දැනීමෙන්, සභාවතීක්ෂණබවයෙන් යෙදී හැනී සිටුනාබව ය. එවිට සොම්නස්සහගියනුවණින් යෙදුනු සභාවතීක්ෂණ වූ සිත, ප්‍රථමකාමාවචරකුශලචිත්තය යි.

සොම්නස්සහගියනුවණින් යෙදුනු සභාවතීක්ෂණ නොවූ පූර්ප්‍රයොගසහිත වූ සිත, දෙවන කාමාවචරකුශලචිත්තය යි. **සොමනස්සසහගතං, ඤාණසම්පයුත්තං, සසඛ්ඛාරිකං** යන විශෙෂණ තුනෙන් එ බව කියන්නේ ය.

සොම්නස්සහගියනුවණ හා නොයෙදුනු පූර්ප්‍රයොග රහිත වූ සිත, තෙවන කාමාවචරකුශලචිත්තය යි.

සොම්නස්සහගියනුවණ හා නොයෙදුනු පූර්ප්‍රයොග සහිත වූ සිත, සිවුවන කාමාවචරකුශලචිත්තය යි.

මැදහත්බවෙන් යුත් නුවණ හා යෙදුනු සභාවතීක්ෂණ වූ සිත, පස්වන කාමාවචරකුශලචිත්තය යි.

මැදහත්බවෙන් යුත් නුවණ හා යෙදුනු පූර්ප්‍රයොගසහිත වූ සිත, සවන කාමාවචරකුශලචිත්තය යි.

මැදහත්බවෙන් යුත් නුවණ හා නොයෙදුනු පූර්ප්‍රයොග රහිත වූ සිත, සත්වන කාමාවචරකුශලචිත්තය යි.

මැදහත්බවෙන් යුත් නුවණ හා නොයෙදුනු පූර්ප්‍රයොග සහිත වූ සිත, අටවන කාමාවචරකුශලචිත්තය යි.

වැඩුනු ශ්‍රද්ධාව, දර්ශනසම්පත්තිය, ප්‍රත්‍යයසම්පත්තිය, ප්‍රතිග්‍රාහක සම්පත්තිය, ප්‍රදේශසම්පත්තිය යන මේ කරුණු මේ සිත් සොම්නසට පමුණුවන්නේ ය. **'එත්ථ ච බලවසද්ධාය දස්සනසම්පත්තියා පච්චයපටිග්ගාහකාදිසම්පත්තියාති එවමාදිනි කාරණානි සොමනස්සසහගතතා'** යනු එහිලා කීහ.

ප්‍රඥාප්‍රතිලාභයට හේතු වූ කර්මය, බඹලොව ඉපදීම, ඉඳුරන් මුහුකිරීම, කෙලෙසුන්ගෙන් දුරුවීම යන මේ කරුණු ය ඥාන-සම්ප්‍රයුක්තවීමට මෙයට අනුබල දෙන්නේ. මේ ඒ කියූ සැටි:- **'පඤ්ඤාසංවත්තනිකකම්මතෝ අබ්‍යාපජ්ජලෝකූපපත්තිතෝ ඉන්ද්‍රියපරිපාකතෝ කිලෙසාදූරභාවතෝ ච ඤාණසම්පයුත්තා'** යනු.

ආවාසසප්පාය, උතුසප්පාය, භොජනසප්පාය, යන මෙයින් ලත්, කයෙහි හා සිතෙහි සුදුසුබව, පෙර දන්දීම් කළ පුරුදුබව, යන මෙයින් අසංඛාරිකභාවය වන්නේ ය. **'ආවාසසප්පායාදිවසෙන කායචිත්තානං කල්ලභාවතෝ පුබ්බ දානාදිසු කත පරියත්තාදිනි ච අසඞ්ඛාරිකතා'** යනු දන්නේ. මේ කියූ හේතූන්ට විපරීත වූ හේතූන් කරණ කොට උපෙක්ෂාසහගතභාවය ද ඥාන-විප්‍රයුක්තභාවය ද සසංඛාරිකභාවය ද දතයුතු ය.

යමෙක් වනාහි දානවස්තුප්‍රතිග්‍රාහකාදීන්ගේ සම්පූර්ණත්වය හෝ සතුටට හේතු වූ අනෙකක් හෝ ලැබීමෙන් තුටුපහටු වූයේ, දීමෙහි ඵල ඇත්තේ ය, යන මේ ආදික්‍රමයෙන් හටගත් සම්‍යක්දෘෂ්ටිය පෙරටු කොට මූකත්‍යාගාදීන්ගේ වශයෙන් නො පසු බස්නේ අනෙකකු විසින් නො මෙහෙයන ලද්දේ දානාදි වූ පින්කමක් කෙරේ ද, එකල ඔහුගේ සිත, සොම්නසින් යුක්ත වූයේ ඤාණය හා එක් ව ගියේ අසංඛාරික වූයේ වේ. මේ ප්‍රථමකුසලචිත්තයාගේ උත්පත්තිය යි.

යමෙක් වනාහි කියූ ලෙසින් තුටුපහටු වූයේ, සම්‍යක්දෘෂ්ටිය පෙරටු කොට අමූකත්‍යාගාදීන්ගේ වශයෙන් පසු බස්නේ, අනුන් විසින් මෙහෙයන ලද්දේ දන් පින්කම් කෙරේ ද, එකල ඔහුගේ ඒ සොමනස්සසහගතමහාකුශලචිත්තය සසංඛාරික වේ මේ තෘතීයකුශලචිත්තයාගේ උත්පත්තිය යි.

යම් කලෙක නෑ මිතුරන්ගේ යහපත් පිළිවෙත් දැකීමෙන් හටගත් පුරුදුද ඇති බාලදරුවෝ නිස්සූන් දැක හටගත් සොම්නස් ඇත්තාහු, යුහුසුලු ව අතට ගත් කිසිවක් දෙන්නාහු ත් වදින්නාහු ත් වෙත් ද, එකල ඒ බාලදරුවන්ට තෘතීයකුශල චිත්තය උපදී.

යම් කලෙක 'තෙරුන් වහන්සේ වදිවූ, පූජාකරවූ' යි මෙසේ නැයන් විසින් මෙහෙයනලද්දාහු ඒ කියූ ලෙසින් පිළිපදිත් ද එකල ඔවුනට චතුර්භූකුශලචිත්තය උපදී.

යම් කලෙක දානවස්තුප්‍රතිග්‍රාහකාදීන්ගේ අසම්පූර්ණත්වයක් හෝ සොම්නස ඉපදීමට හේතු වූ අනික් කරුණක අවිද්‍යමානත්වයක් ලැබ, සෙසු සිවු වැදෑරුම් වූ විකල්පයන්හි ද, සොම්නස් රහිත වූවා හු වෙත් ද, එකල්හි අනික් කුසල්යින් සතර ඔවුනට උපෙක්ෂා සහගත ව උපදී. මේ මොවුන්ගේ උත්පත්තික්‍රමය යි.

'කාමෙන ප්‍රඤ්ඤවන්තුම්හි ගොචරාධිපතීහි ච,
කාමමහිනාදිතෝ චෙව ගණෙය්‍ය නයකොවිදෝ'

යි කියූ බැවින්, මේ අට වැදෑරුම් සිත්, දශපුණ්‍යක්‍රියාවස්තූන්ගේ වශයෙන් වෙන වෙන ම දසය දසය කොට ගිණූ කල්හි, අසූවක් වේ. ඒ අසූව එක් අරමුණෙක අසූව බැගින් ෂඩාලම්බනයන්ගේ වශයෙන් ගිණූ කල්හි, සිත් සාරසිය අසූවක් වේ. මෙයින් දෙසිය සතළිසක් සිත් ඤානසම්ප්‍රයුක්ත ය. දෙසිය සතළිසක් ඤානවිප්‍රයුක්ත ය. ඒ දෙසිය සතළිසක් පමණ වූ ඤානවිප්‍රයුක්ත සිත් වීමංසාධිපතිධර්මය හා නොයෙදෙන බැවින් ඡන්ද-චිත්ත-වීරිය යන තුන් අධිපතියන්ගේ වශයෙන් එකෙක දෙසිය සතළිස බැගින් ගිණූ විට සිත් සත්සිය විස්සෙක් වේ. ඒ පරිද්දෙන් ඤානසම්ප්‍රයුක්ත සිත් ද, සතර අධිපතිධර්මයන්ගේ වශයෙන් එකෙක දෙසිය සතළිස බැගින් ගත් විට සිත් නවසිය සැටෙක් වේ. මෙසේ මෙහි සතර අධිපති ධර්මයන්ගේ වශයෙන් සිත් එක් දහස් සය සිය අසූවක් වේ. ඒ සිත් කායවාඞ්මනඃකර්මීන්ද්‍රියයාගේ වශයෙන් එකෙක එක් දහස් සය සිය අසූව බැගින් ගුණ කරණ ලද්දේ සිත් පත් දහස් සතළිසෙක් වේ. ඒ මේ පත් දහස් සතළිසක් විසින් ප්‍රභෙදයට ගිය මහාකුසල්සිත් හීන-මධ්‍යම-ප්‍රණීතභෙදයෙන් එකෙක පත් දහස් සතළිස බැගින් ගුණ කරණ ලද්දේ සිත් පසළොස් දහස් එක්සිය විස්සෙක් වේ. කාලදෙශාදිභෙදයෙන් කාමාවචර කුසල්සිත්වල ප්‍රභෙදය නො ගිණිය හැකි ය. මෙහිලා කුශල ශබ්දය තරමකින් නමුදු කියයුතු සේ පෙණේ. එ හෙයින් ඉතා සැකෙවින් ඒ කියන්නෙමි. ඒ මෙසේ දතයුතු ය:-

'කුච්ඡිතෙ පාපධම්මෙ සලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්ති අපගච්ඡන්තීති වා = කුසලානි' යම් සිත් කෙනෙක්, පිළිකුල් කටයුතු වූ අකුශලධර්මයන් ඉතිරි නො කොට ප්‍රහීණ කෙරෙත් ද ඒ සිත් කුසල නම්. මෙහි එන ම **'සලයන්ති'** යන ක්‍රියාපදය **කම්පෙන්ති, විද්ධංසෙන්ති අපගච්ඡන්ති** යි ක්‍රියාපද තුනකින්

වණ්ණනා කරණ ලද්දේ ය. එහි කමෙපනති යන්නෙන් කියූයේ, කදඬගප්‍රහාණය යි. විධංසෙනති යන්නෙන් කියූයේ විඤ්ඤාණප්‍රහාණය යි. අපගමෙනති යන්නෙන් කියූයේ, සමූලෙඡද ප්‍රහාණය යි.

'අථ වා කුචඡිතාකාරෙන සන්තානෙ සයනතො පවත්තනතො කුසසඬඛාතෙ පාපධමෙම ලුනනති ඡිනදතීති කුසලානි' යම් සිත් කෙනෙක්, සන්‍තානයෙහි පිළිකුල් ලෙසින් හටගන්නා බැවින් කුස යි කියූ පාපධර්මයන් සිඳ හරින් ද එහෙයින් ඒ සිත් කුසල නම්.

'අථ වා කුචඡිතෙ පාපධමෙම සානතො තනුකරණතො ඔසානකරණතො වා කුසලානි' යම් සිත් කෙනෙක්, පිළිකුල් කටයුතු වූ පාපධර්මයන් තුනී කරත් ද, කෙළවර කරත් ද ඒ සිත් කුසල නම්.

'කුසසඬඛාතෙන ඤාණෙන සඛාදිධමමජාතෙන වා ලාතබඛානි සහජාතඋපනිසසයභාවෙන යථාරහං පවත්තෙන තබඛානි නි = කුසලානි' කුස යි කියූ නුවණින් හෝ ශ්‍රද්ධාදිධර්ම සමූහයෙන් හෝ සහජාතප්‍රත්‍යයශක්තියෙන් උපනිඃශ්‍රයප්‍රත්‍යය ශක්තියෙන් සුදුසු පරිදි ඉපද විය යුතු සිත් කුසල නම්. එහි ප්‍රඥාවෙන් ඤාණසම්ප්‍රයුක්තකුශලය, සහජාතප්‍රත්‍යයශක්තිවශයෙන් උපදවනු ලැබේ. ඤාණවිප්‍රයුක්තකුශලය, උපනිඃශ්‍රයප්‍රත්‍යයශක්ති වශයෙන් උපදවනු ලැබේ. ශ්‍රද්ධාදිධර්මසමූහය විසින් කුසල් සිත් සහජාතශක්තිවශයෙන් හා උපනිඃශ්‍රයශක්තිවශයෙන් උපදවනු ලබා. කුශලය නිවරද බව ලකුණු කොට, පිරිසිදු බව කෘත්‍යය කොට, සැප විපාක ඇතිබව වැටහීම කොට, යොනිසොමනසිකාරය ආසන්නකාරණය කොට සිටියේ ය.

කාමාවචර කුසල් සිත් ම 'මහාකුසල්සිත්'යි ගණිත්. එයට හෙතුව ඒ කුසල්සිත්වලින් ලැබෙන විපාකයාගේ මහත්බව ය. ගුණයොගයෙන් මහත් වූ රූපාවචර, අරූපාවචර, ලොකොත්තර කුසල් සිත් එසේ නො වේ. ප්‍රථමධ්‍යානකුශලචිත්තය ප්‍රථමධ්‍යාන භූමියෙහි ම විපාක දේ. එසින් ඔටත් තන්හි විපාක නො දේ. ද්විතීයධ්‍යානාදිකුශලචිත්තයෝ ත් ඒ තම තමන්ට අයත් භූමි වලදී ම විපාක දෙත්. අරූපාවචරකුශලචිත්තයෝ ද ඒ ඒ අරූපාවචරභූමිවල ම විපාක දෙත්. ඉත් ඔටත නො යත්. ලොකොත්තරකුශලචිත්තයෝ තම තමන් පිළිබඳ විපාකය වූ එක ඒක විපාකයක් ම උපදවත්. එ හෙයින් මහාකුශලව්‍යවහාරය ඔවුනට නැත. කාමාවචරකුශලය, විපාක දීම් වශයෙන්

විෂයමහත්ත්වයෙන් මහත්ත්වයට ගියේ ය. එහෙයින් මහාකුශලය යි ව්‍යවහාර කෙරෙත්. කාමාවචරකුශලය ප්‍රතිසන්ධි වශයෙන් කාමාවචරප්‍රතිසන්ධි නවයක් ද කාමසුගතිභූමි සතක් ද දෙන්නේය. ප්‍රවෘත්තිවිපාකය වනාහි අවීචිමහානරකය පටන් භවාග්‍රය සීමා කොට එක් තිස් භූමියෙහි ම සුදුසු පරිදි දෙන්නේ ය.

1. **සොමනස්සසහගතඤ්ඤණසම්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
2. **සොමනස්සසහගතඤ්ඤණසම්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**
3. **සොමනස්සසහගතඤ්ඤණවිප්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
4. **සොමනස්සසහගතඤ්ඤණවිප්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**
5. **උපෙක්ඛාසහගතඤ්ඤණසම්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
6. **උපෙක්ඛාසහගතඤ්ඤණසම්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**
7. **උපෙක්ඛාසහගතඤ්ඤණවිප්පයුත්තඅසඞ්ඛාරිකචිත්තය.**
8. **උපෙක්ඛාසහගතඤ්ඤණවිප්පයුත්තසසඞ්ඛාරිකචිත්තය.**

මේ කාමාවචරභූමියට අයත් සහෙතුකකාමාවචරවිපාක සිත් අට ය.

මෙහි සොමනස්ස, ඤ්ඤණ, උපෙක්ඛා, අසඞ්ඛාරික, සසඞ්ඛාරික යන මොවුන් ගැණ කිය යුතු අරුත් කියන ලද්දේ ය. මෙහිලා ද ඒ එසේ දන්නේ ය.

මේ කාමාවචරවිපාක සිත්, කාමාවචර කුසල් සිත් සේ පුණ්‍යක්‍රියාවස්තූන්ගේ වශයෙන්, කර්මද්වාරයන්ගේ වශයෙන්, කායකර්මාදීන් හා යෙදීම් වශයෙන්, අධිපතිධර්මයන්ගේ වශයෙන් නො පවත්නේ ය. දන්දීම් ආදී විසින් නො හටගන්නා බැවින් කායවාග්විඥප්ති උපදවන බැවින්, විපාක දෙන ස්වභාව නැති බැවින්, ඡන්දාදීන් අධිපති කොට නො හටගන්නා බැවින් එසේ නො පවත්නේ ය. එ හෙයින් පුණ්‍යක්‍රියාවස්තූන්ගේ වශයෙන් ගණන් අඩු කොට ආරම්මණාදීන්ගේ වශයෙන් සුදුසු පරිදි ගිණිය යුතු ය. ආරම්මණයන්ගේ වශයෙන් ගිණු කල්හි එක්සිය සිවු සාළීසෙක් වේ. ඒ කියූ සැටි මේ:-

'යථාපනෙතානි පුඤ්ඤක්‍රියාවසෙන කම්මදවාරවසෙන කම්මවසෙන අධිපතිවසෙන ච පවත්තන්ති නෙවං පාපකානි දානාදිවසෙන අප්පවත්තනතො විඤ්ඤත්තිසමුඨානාභාවතො අවිපාකසභාවතො ඡන්දාදිනි පුරක්ඛත්වා අප්පත්තිතො ච තස්මා තං වසෙන පරිහාපෙත්වා යථාරහං ගණනහෙදෙ යොජෙ-තබ්බා' යනු.

මේ විපාක සිත් අතුරෙහි පළමුවන දෙවන තෙවන සිවුවන සිත් සොම්නසින් යුක්ත වේ. එහි හෙතුව ඉටුඅරමුණු ලැබීම ය. පස්වන සවන සත්වන අටවන සිත් උපෙක්ෂාවෙන් යුක්ත වේ. එහි හෙතුව ඉටු මැදහත් අරමුණු ලැබීම ය. **'ඉමානි පි ඉඨ ඉඨමජ්ඣත්තාරම්මණවසෙන යථාක්කමං සොමනස්සුපෙක්ඛා-සහිතානි'** යනු දන්නේ ය.

පළමුවන දෙවන පස්වන සවන සිත් ඥානසම්ප්‍රයුක්ත වේ. ප්‍රතිසන්ධිභවාඞ්ගච්‍යුතිවශයෙන් හටගැණෙන කල්හි, ප්‍රතිසන්ධිය දුන් කර්මයාගේ බලවත්භාවයෙන් ඒ ඥානසම්ප්‍රයුක්ත වේ.

ත්‍රිහෙතුකඋත්කෘෂ්ටකුශලකර්මය තෙමේ ප්‍රතිසන්ධිය දෙන්නේ නම්, ප්‍රතිසන්ධිය දෙන්නා වූ කුශලකර්මය බලවත් බැවින් එය ඥාන සම්ප්‍රයුක්තප්‍රතිසන්ධිය වේ. භවාඞ්ගචිත්තය හා ච්‍යුතිචිත්තය ඒ භව යෙහි ප්‍රතිසන්ධිචිත්තය හා සම බැවින් ඔවුන්ගේ ඥානසම්ප්‍රයුක්තවීම ද මේ කර්මයාගේ බලවත් භාවයෙන් ම වන්නේ ය. ඔවුන් තදාලම්බන වශයෙන් පවත්නා කල්හි ජවනයන්ට සුදුසු පරිදි උපදින හෙයින් ද ඔවුහු ඥානසම්ප්‍රයුක්ත වෙති. ඥානසම්ප්‍රයුක්තජවනයන්ට ඉක්බිති ව උපදින තදාලම්බන ද ඥානසම්ප්‍රයුක්ත ද වේ.

තෙවන සිවුවන සත්වන අටවන සිත් ඥානවිප්‍රයුක්ත වේ. ප්‍රතිසන්ධිභවාඞ්ගච්‍යුතිවශයෙන් හටගැණෙන කල්හි ප්‍රතිසන්ධිය දුන් කර්මයාගේ දුර්වලභාවයෙන් ඔවුහු ඥානවිප්‍රයුක්ත වෙති. ත්‍රිහෙතුක ඔමකකර්මය හෝ ච්හෙතුකඋත්කෘෂ්ටකර්මය හෝ ප්‍රතිසන්ධිය දෙන්නේ නම්, ඒ කර්මය දුර්වල බැවින් ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිසන්ධිභවාඞ්ග ච්‍යුතිහු ඥානවිප්‍රයුක්තය හ. තදාලම්බනයන්ගේ වශයෙන් පවත්නා කල්හි, ජවනයන්ට සුදුසු පරිදි ඥානවිප්‍රයුක්ත වෙති. ජවනයන්ට ඉක්බිති ව උපදින තදාලම්බන ද ඥානවිප්‍රයුක්ත ය. මේ ඒ කියූ සැටි:-

'පටිසන්ධාදිවසප්පවත්තියං කම්මස්ස බලවාබලවභාවතො, තදාලම්බනප්පවත්තියං යෙභුය්‍යෙන ජවනානුරූපතො ච කදාචි තත්ථාපි කම්මානුරූපතො ච ඤානසම්පයුත්තානි ඤාණවිප්ප-යුත්තානි ච හොන්ති' යනු. මේ මොවුන්ගේ ඥානසම්ප්‍රයුක්තභාවය හා ඥානවිප්‍රයුක්තභාවය යි.

පළමුවන තෙවන පස්වන සත්වන සිත් අසඞ්ඛාරික ය. පූර්ව ප්‍රයොගයෙන් වෙන් ව එළැඹැ සිටියා වූ කර්ම, කර්මනිමිත්ත, ගති-නිමිත්තහෙතුවෙන් හා සත්ප්‍රායඝෘතුභොජනාදීන්ගේ ප්‍රතිලාභ යෙන් අසඞ්ඛාරිකභාවය වේ.

දෙවන සිවුවන සවන අටවන සිත් සසඛ්ඛාරික වේ. පුඹි ප්‍රයොගය කරණ කොට හටගත් කම්ාදිහෙතුවෙන් හා අසත්ප්‍රාය ඍතුහොජනාදිහෙතුවෙන් ද සසඛ්ඛාරික වේ. ඒ කියූ සැටි:- **'යථා පයොගං විනා සස්සයොගඤ්ච යථා උපඛිතෙහි කම්මා-දිපච්චයෙහි උතුභොජනාදිසප්පායවසෙන ච අසඛ්ඛාරික-සසඛ්ඛාරිකානි'** යනු. මේ මොවුන්ගේ අසඛ්ඛාරික සසඛ්ඛාරික භාවය යි. මේ සිත්, මහා' යන්නකින් වෙසෙසා මහාවිපාකැ'යි කියත්. කාමාවචරවිපාකය මහාකුසලයන්ගේ විපාකය බැවින් හෙතුහුගේ නාමය ඵලයෙහි ආරොපණය කොට කාරණොපචාර වශයෙන් එසේ කියත්.

1. **සොමනස්සසහගතඤාණසම්පයුත්තඅසඛ්ඛාරිකචිත්තය.**
2. **සොමනස්සසහගතඤාණසම්පයුත්තසසඛ්ඛාරිකචිත්තය.**
3. **සොමනස්සසහගතඤාණවිප්පයුත්තඅසඛ්ඛාරිකචිත්තය.**
4. **සොමනස්සසහගතඤාණවිප්පයුත්තසසඛ්ඛාරිකචිත්තය.**
5. **උපෙක්ඛාසහගතඤාණසම්පයුත්තඅසඛ්ඛාරිකචිත්තය.**
6. **උපෙක්ඛාසහගතඤාණසම්පයුත්තසසඛ්ඛාරිකචිත්තය.**
7. **උපෙක්ඛාසහගතඤාණවිප්පයුත්තඅසඛ්ඛාරිකචිත්තය.**
8. **උපෙක්ඛාසහගතඤාණවිප්පයුත්තසසඛ්ඛාරිකචිත්තය.**

මේ කාමාවචරභූමියට අයත් සහෙතුකකාමාවචරක්‍රියා සිත් අටය.

සොමනස්සභාවාදිය පෙර කියූ සේ ය. මේ මහාක්‍රියාචිත්තයෝ සසර සිඳ බිඳ දැමූ බුදු පසේබුදු මහරහතුන් වහන්සේට පමණක් උපදිති. මේ මොවුන්ගේ වෙනස්කම ය. මේ සිත් පෘථග්ජන යන්ගේ හා ශෛක්ෂපුද්ගලයන්ගේ සන්තානයෙහි උපදී නම්, එකාන්නායෙන් විපාක දේ ම ය. පෘථග්ජනයාට හෝ ශෛක්ෂයා හට සොමනස්සසහගතඤාණසම්පයුත්තඅසඛ්ඛාරික කාමාවචර කුසල චිත්තය උපදින තැනැ රහතුන් වහන්සේට ඉපැදෙනුයේ පළමුවන කාමාවචරක්‍රියාචිත්තය ය. අනික් සිත් සතෙහි ක්‍රමය ද මෙසේ ය.

මත්තෙහි විපාක නො ලබන බැවින් කුසල් නො වේ. පෙර කළ කම්යක්හුගේ විපාක නො වන බැවින් විපාක ද නො වේ:

ඉටුඅරමුණු, සොම්නසින් යුත් පිළිසිඳගැණීම, නො ගැඹුරු සුභාවය යන මේ කරුණු මේ සිත්වල සොම්නස්බවට හෙතු ය. නුවණලැබීමට හෙතු වූ කම්, ඉදුරත් මුහුකිරීම යන මේ, නුවණ හා යෙදීමෙහි කරුණු ය. ආවාසසප්පායාදීන්ගේ වශයෙන් සිත

කය දෙක්හි සුදුසු බව අසඞ්ඛාරිකභාවයට හේතු වේ. මෙයට විපරීත වූ හෙතුන් කරණ කොට උපෙක්ඛාසහගතභාවය ද ඥාන විප්‍රයුක්තභාවය ද සසංඛාරිකභාවය ද වේ.

මෙහි මෙසේ ඉතා සැකෙවින් කියූ මේ කුශලවිපාකක්‍රියා චිත්තයෝ වෙදනාඤ්ඤණසඞ්ඛාරභෙදයෙන් සුවිස්සෙකැ යි දන්නා ලදහ. වෙදනාභෙදයෙන් දෙ වැදෑරුම් ය. ඤ්ඤණභෙදයෙන් සිවු වැදෑරුම් ය. සඞ්ඛාරභෙදයෙන් අට වැදෑරුම් ය. පිඬු කොට සූ විස්සෙක.

අකුශලවිපාක සතෙක, සහෙතුකාහෙතුකකුශලවිපාක සොළොසෙකැ යි විපාක සිත් තෙ විස්සෙකි. අකුසල් දෙලොසෙක කුසල් අටෙකැ, යි කුසල් අකුසල් විස්සෙකි. අහෙතුකක්‍රියා තුනෙක, සහෙතුකක්‍රියා අටෙකැයි ක්‍රියා සිත් එකොළසෙකි. මෙසේ සවිප්‍රකාරයෙන් කාමාවචර සිත් සූ පණසෙකි. මේ එහි සංක්ෂිප්තසංග්‍රහය:-

'කාමේ තෙවිසපාකානි පුඤ්ඤඤ්ඤානි වීසති,
එකාදස ක්‍රියා චෙ ති චතුපඤ්ඤාස සබ්බථා'

1. **විතක්කවිචාරපීතිසුඛඑකග්ගතාසහිත පඨමජ්ඣානකුසලචිත්තය.**
2. **විචාරපීතිසුඛඑකග්ගතාසහිතදුතියජ්ඣානකුසලචිත්තය.**
3. **පීතිසුඛඑකග්ගතාසහිතතතියජ්ඣානකුසලචිත්තය.**
4. **සුඛඑකග්ගතාසහිතචතුත්ථජ්ඣානකුසලචිත්තය.**
5. **උපෙක්ඛාඑකග්ගතාසහිතපංචමජ්ඣානකුසලචිත්තය.**

මේ වනාහි රූපාවචර කුසල් සිත් පස ය.

යම් ධර්මසමූහයෙක් තෙමේ තමා හා එක් ව යෙදුනු ධර්මයන් අරමුණට නංවා ද, ඒ චිත්තකී නම්. **'තඤ්ච ආරම්මණං චිත්තෙනෙව සම්පයුත්තධම්මෙ අභිනිරොපෙති'නි = චිත්තෙකෝ'** යනු අරුත් පැහැදිලි කිරීම ය. චිත්තකීය තෙමේ එක් ව උපන් ධර්මයන් අරමුණට අභිමුඛ කොට නැංවීම ලකුණු කොට සිටියේ ය. **'සෙසා සහජාතානං ආරම්මණාභිනිරොපනලක්ඛණෝ'** යනු කියේ එහෙයිනි. පිටිසර ගම් වැසි කිසි පුරුෂයෙක්, රජු හා මිත්‍ර වූ යමකු නිසා හෝ රජු හා මිත්‍ර වූ තම නෑයකු නිසා හෝ රජගෙට යම් සේ පිවිසේ ද, එ පරිදි දෙන් චිත්තකීය නිසා සිත අරමුණට නගින්නේ ය. **'යථා හි කොචි ගාමවාසී පුරිසෝ රාජවල්ලභං සම්බන්ධිනං මිත්තං වා නිස්සාය රාජඝරං අනුපවිසති, එවං චිත්තක්කං නිස්සාය චිත්තං**

ආරම්මණං ආරොහති' යනු එහි පාළිය යි. එසේ නම් විතර්ක රහිත වූ සිත අරමුණට කෙසේ නගී ද? යනු එහිලා ප්‍රශ්නයෙකි. විතර්කරහිත සිත, විතර්කශක්තියෙන් ම අරමුණට නගී, යනු එහි පිළිතුර ය. ඒ පුරුෂයා රජගෙයි හැසිර පුරුදු බැවින් රාජවල්ලභ පුරුෂයා නැති ව ද, සෑක නැති ව රජගෙට පිවිසෙන්නා සේ විතර්කසහිත වූ චිත්ත සන්තානයෙහි තීරතුරු හටගත් පුරුද්දෙන් විතර්කයෙන් තොරව ද, විතර්කරහිත වූ සිත අරමුණට නගියි. **'යථා හි සෝ පුරිසෝ පරිචයෙන තෙන විතක්කෙන විනා පි අවිතක්කං චිත්තං ආරම්මණං අභිනිරොහති'** යනු ඒ දැන්වීම ය. තව ද අවිතර්ක චිත්තයන් අතුරෙහි මේ පංචවිඤ්ඤාණය විතර්කයෙන් තොර වූයේ ද, වස්තු-ආලම්බනයන්ගේ ගැටීමේ ශක්තියෙන් අරමුණට නගියි.

යම් ශක්තියක් සිත අරමුණෙහි හසුරුවා ද, ඒ ය විචාර ය. **'ආරම්මණෙ තෙන චිත්තං විචාරෙති'නි = විචාරො'** යනු අරුත් කීම ය. **'සෝ ආරම්මණානුමජ්ජනලක්ඛණෝ'** ඒ විචාරය අරමුණු පිරිමැදීම ලකුණු කොට සිටියේ ය.

යම් ශක්තියක් කයසිත පිණවා ද, වඩා ද ඒ ය පීති ය. **'සා සම්පියායනලක්ඛණා'** ඒ පීතිය අරමුණු ප්‍රිය කරවීම ලකුණු කොට සිටියා ය.

යම් වේදනාවක් තමන් හා එක් ව යෙදුනු ධර්මයන් සුවපත් කෙරේ ද, ඒ ය සුඛ ය. **'තං ඉට්ඨානුභවනලක්ඛණං'** ඒ සුඛය කැමැති අරමුණු රසවිඳීම ලකුණු කොට සිටියේ ය.

නන් අරමුණුවල නො බැහැරීම් වශයෙන් මේ සිතට එක් අරමුණෙක් ඇත්තේ ද, ඒ සිත එකග්ග නම් වේ. ඒ එක් අරමුණක් ඇත්තා වූ සිතේ භාවය එකග්ගතා නම්. මෙයින් සමාධිය කියවේ. **'නානාලම්බනවික්ඛෙපභාවෙන එකං ආරම්මණං අග්ගං ඉමස්සා'නි, එකග්ගං, චිත්තං, තස්ස භාවෝ, එකග්ගතා'** යනු දන්නේ ය. **'සෝ අවික්ඛෙපලක්ඛණෝ'** ඒ සමාධිය අවික්ෂේපය ලකුණු කොට සිටියේ ය. සමාධියගේ බලයෙන් සම්ප්‍රයුක්තධර්ම සහිත වූ සිත අරමුණුවල නො විසිරී පවතී.

මෙසේ ඉතා සැකෙවින් කියූ චිතර්කාදිවූ පස් දෙනාගේ සමූහය ධ්‍යාන නම් වේ. මේ පස් දෙනාගේ සමූහය ම, මේ පස එක් ව කසිණාදිවූ අරමුණු අභිමුඛ කොට සිතන්නේ ය. ප්‍රතිපක්ෂවූ නීවරණාදිවූ ධර්මයන් දවා හලූ කරන්නේ ය. **'ඣානන්ති විතක්කෝ විචාරෝ පීති සුඛං එකග්ගතා'** යන මෙයින් එය පැහැදිලි ය.

ධ්‍යානව්‍යවහාරය ලැබූ විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා යන පස් අඟින් යුත් කුසල්සිත පළමු කොට පැමිණිය යුතු බැවින් ප්‍රථමධ්‍යානකුශලචිත්ත නම් වේ.

විචාර, පීති, සුඛ, එකග්ගතා යන සිවු අඟින් යුත් කුසල්සිත විතියධ්‍යානකුශලචිත්ත නම් වේ.

සුඛ, එකග්ගතා යන දෙයඟින් යුත් කුසල්සිත චතුත්‍ථධ්‍යාන කුශලචිත්ත නම් වේ.

උපෙක්ඛා, එකග්ගතා යන දෙයඟින් යුත් කුසල්සිත පංචම ධ්‍යානකුශලචිත්ත නම් වේ.

'කස්මා පන අඤ්ඤේසු පි එස්සාදිසු සම්පයුත්තධම්මේසු විජ්ජමානේසු ඉමේයෙව පඤ්ච ඣානඞ්ගවසෙන වුත්තා' යනු ප්‍රශ්නයෙකි. කුමක් හෙයින් අන්‍ය වූ ස්පර්ශාදිසම්ප්‍රයුක්තධර්මයන් තිබිය දී, මේ පස ම ධ්‍යානාඞ්ගවශයෙන් කියන ලද ද, යනු එහි සිංහල යි. **'උපනිජ්ඣානකිච්චවනත්තාය කාමච්ඡන්දාදීනං උජුපච්චනීකභාවතෝ ච'** යනු එයට දුන් පිළිතුර ය. චිත්තයාදී ධර්ම පස, කසිණාදී වූ අරමුණු කරා එළැඹ බලන කිස ඇති බැවින් ද කාමච්ඡන්දාදීනීවරණයන්ට ඉදුරා ප්‍රතිපක්ෂ බැවින් ද මෙසේ කියන ලද්දේ ය. චිත්තය, අරමුණෙහි සිත අභිමුඛ කොට නංවයි. විචාරය දැඩි සේ අරමුණෙහි ලුහු බැඳීම කරයි. මෙසේ මේ නැන්වීම, ගැළපීම, ප්‍රියකරවීම, වැඩීම යන කෘත්‍යය ඇති චිත්තයී විචාර ප්‍රීති සුඛයන් විසින් අනුග්‍රහ කරණ ලද එකග්ගතා තොමෝ, ඒ ධ්‍යාන චිත්තය අරමුණෙහි මොනවට පිහිටුවන කෘත්‍යයෙන් තමාට අනුව පවත් වන්නී, එකක් බවට පැමිණ අරමුණෙහි මොනවට පිහිටුවයි. ශ්‍රද්ධාදිපඤ්චේන්ද්‍රියයන්ගේ සමානත්වයෙන් සම කොට විරුද්ධ වූ නීවරණධර්මයන් දුරු වූ බැවින් ලීන, උද්ධත භාවයන්ගේ අභාව යෙන් මොනවට පිහිටුවයි. මේ චිත්තාදීන්ට කසිණාදී වූ අරමුණු බැලීම ආවෙණික ව පවතී.

කාමච්ඡන්දයාගේ වශයෙන් නත් අරමුණුවලින් පෙළඹුනු සිතෙහි අරමුණෙහි මනා කොට පිහිටීම එකග්ගතායෙන් සිදු වේ. එහෙයින් එකග්ගතා තොමෝ කාමච්ඡන්දනීවරණයට ප්‍රතිවිරුද්ධ ය. ප්‍රීතිය අරමුණෙහි සතුටු වන බැවින් ව්‍යාපාදනීවරණයට ප්‍රති විරුද්ධ ය. චිත්තයී තෙමේ හෙතු යුක්ති අනුගත ව කල්පනා කිරීම් වශයෙන් පවත්නා බැවින් ථීනමිද්ධනීවරණයට ප්‍රතිවිරුද්ධ ය. සුඛය සංසිඳුනු සිහිල්බව ඇති බැවින් උද්ධච්චකුක්කුච්චයට ප්‍රතිවිරුද්ධ ය. විචාරය ප්‍රඥව හා සමාන බැවින් විචිකිච්ඡානීවරණයට ප්‍රතිවිරුද්ධ ය.

මෙසේ කසිණාදී වූ, අරමුණු බලන කිස ඇති බැවින් නීවරණයන්ට ප්‍රතිවිරුඩ බැවින් මේ ධර්ම පස ධ්‍යානාඞ්ග වශයෙන් ගත්නා ලද්දේ ය. මේ සියල්ල පිඬු කොට සංග්‍රහ කළේ මෙසේ ය:-

'උපනිජ්ඣානකිච්චත්තා කාමාදිපටිපක්ඛතො,
සන්තෙසු පි ච අඤ්ඤෙසු පඤ්චෙව ඣානසඤ්ඤිතා' යි.

1. **විතක්කවිචාරපීතිසුඛඑකග්ගතාසහිතපඨමජ්ඣාන විපාකචිත්තය.**

2. **විචාරපීතිසුඛඑකග්ගතාසහිතදුතියජ්ඣානවිපාක චිත්තය.**

3. **පීතිසුඛඑකග්ගතාසහිතතතියජ්ඣානවිපාකචිත්තය.**

4. **සුඛඑකග්ගතාසහිතචතුත්ථජ්ඣානවිපාකචිත්තය.**

5. **උපෙක්ඛාඑකග්ගතාසහිතපංචමජ්ඣානවිපාකචිත්තය.**

මේ රූපාවචරවිපාකසිත් පස ය.

විතක්කාදීහු යට කියූ සැටි වෙති. කාමාවචරකුශලය වනාහි තමන් හා අසමානවිපාක උපද වන්නේ ය. මහද්ගතකුශලය වනාහි හැම කල්හි ම තමන් සමාන විපාක උපද වන්නේ ය. එ හෙයින් විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතාසහිතවිපාකචිත්තය යන ඇලෙසින් කුශලය හා ම සමාන වන්නේ ය.

විපාක සිත් වනාහි මුලින් කියූ කුසල්සිත් උපදවා ගත්ත වුන්ට ප්‍රතිසන්ධි, භවාඞ්ග, ච්‍යුති වශයෙන් උපදී. මේ අත්බවෙහි පඨවිකසිණාදී වූ භාවනාවකින් ප්‍රථමඩ්‍යානකුශලචිත්තය උපදවා ගත් තැනැත්තේ, ඒ උපදවා ගත් ධ්‍යානකුශලචිත්තය හීන ව (යන්තමකට) වඩන්නේ ධ්‍යානයෙන් නො ගිලි හී කලුරිය කෙළේ බ්‍රහ්මපාරිසජ්ජ' නම් ප්‍රථමඩ්‍යානභූමියෙහි උපදින්නේ ය.

ප්‍රථමඩ්‍යානකුශලචිත්තය ම එයට වැඩියෙන් මඩ්‍ය ම තරමින් වඩන්නේ, ධ්‍යානයෙන් නො ගිලි හී කලුරිය කෙළේ බ්‍රහ්මපුරොහිත' නම් බ්‍රහ්මභූමියෙහි උපදින්නේ ය.

ප්‍රථමඩ්‍යානකුශලචිත්තය ම ඉතාඋසස් ලෙසින් ප්‍රණීත ව වඩන්නේ ධ්‍යානයෙන් නො ගිලි හී කලුරිය කෙළේ මහාබ්‍රහ්ම' නම් බ්‍රහ්මභූමියෙහි උපදින්නේ ය. මේ භූමි තුන ම ප්‍රථමඩ්‍යාන භූමි ය. උත්පත්තිවශයෙන් මෙහි පළමු කොට පහළ වන සිත ප්‍රතිසන්ධිචිත්ත' යි කියනු ලැබේ. උපන්දා පටන් එහි වසන තාක්,

චක්ෂුරාදීන් විසින් අරමුණු නො ගෙණ පිරිසිදු ව සිටින තුරු ඇති වන සිත්, භවාඬගචිත්ත' නම් වේ. එයින් ව්‍යුතවීම් වශයෙන් පහළ වන සිත, චුතිචිත්ත' නම් වේ.

ත්‍රිතීය, තෘතීයඛ්‍යානයන් පරිත්තවශයෙන් වැඩූයේ පරිත්තාභ' නම් බ්‍රහමභූමියෙහි උපදින්නේ ය. මඛ්‍යමවශයෙන් වැඩූයේ අපපමාණාභ' නම් බ්‍රහමභූමියෙහි උපදින්නේ ය. ප්‍රණීතවශයෙන් වැඩූයේ ආභස්සර' නම් බ්‍රහමභූමියෙහි උපදින්නේ ය. මේ තුන් බිම ත්‍රිතීයඛ්‍යානභූමි ය.

චතුර්ථඛ්‍යානය පරිත්තවශයෙන් වැඩූයේ පරිත්තසුභ' නම් බ්‍රහමභූමියෙහි ද, මඛ්‍යමවශයෙන් වැඩූයේ අපපමාණසුභ' නම් බ්‍රහම භූමියෙහි ද, ප්‍රණීත වශයෙන් වැඩූයේ සුභකිණ්ණ නම් බ්‍රහම භූමියෙහි ද උපදින්නේ ය මේ තුන් බිම තෘතීයඛ්‍යානභූමි ය.

පංචමඛ්‍යානය වැඩූයේ වෙහප්ඵල' නම් බඹතලයෙහි උප දින්නේ ය. එය ම සංඥාවිරාගවශයෙන් වැඩූයේ අසඤ්ඤසත්ත යෙහි උපදින්නේ ය. අනාගාමීහු ශුඛාවාසයෙහි උපදින්. මේ චතුර්ථඛ්‍යානභූමි ය. **'පඨමජ්ඣානවිපාකං පඨමජ්ඣානභූමියං පටිසන්ධිභවඞගභුතිවසෙන පවත්තති, තථා දුතියජ්ඣානවිපාකං තතියජ්ඣානවිපාකං ච දුතියජ්ඣානභූමියං, චතුත්ථජ්ඣාන විපාකං චතුත්ථජ්ඣානභූමියං'** මේ විපාක සිත් සියලු තැන් හි ම මුල කියූ ලෙසින් ප්‍රතිසන්ධි, භවාඬග, ව්‍යුතිවශයෙන් පහළ වෙත් නුයි මෙයින් කීහ. ප්‍රථමඛ්‍යානාදිකුශලචිත්තයන්ට විපාකවශ යෙන් උපදනා බැවින් මේ විපාක සිත් නම් වේ.

1. **විතක්කවිචාරපීතිසුඛඑකග්ගතාසහිතපඨමජ්ඣාන ක්‍රියාචිත්තය.**
2. **විචාරපීතිසුඛඑකග්ගතාසහිතදුතියජ්ඣාන ක්‍රියාචිත්තය.**
3. **පීතිසුඛඑකග්ගතාසහිතතතියජ්ඣානක්‍රියාචිත්තය.**
4. **සුඛඑකග්ගතාසහිතචතුත්ථජ්ඣානක්‍රියාචිත්තය.**
5. **උපෙක්ඛාඑකග්ගතාසහිතපඤ්චමජ්ඣානක්‍රියාචිත්තය.**

මේ රූපාවචරක්‍රියාසිත් පස ය.

විතක්කාදීහු යට කියූ සැටි වෙති. පෘථග්ජනයකු විසින් හෝ ශෛක්ෂයකු විසින් පඨවිකසිණා දී වූ යම්කිසි භාවනාවක් වඩා විතක්කාදිඛ්‍යානාඞගයන්ගෙන් ප්‍රථමඛ්‍යානය උපදවන ලද්දේ නම් ඒ ප්‍රථමඛ්‍යානකුශලචිත්ත සි කියනු ලැබේ. රහතුන් වහන්සේ

විතර්කාදිධ්‍යානාඞ්ගයන්ගෙන් යුත් ප්‍රථමඩ්‍යානය ම ලැබූ සේක් ද ඒ ලැබූ ප්‍රථමඩ්‍යානය, ප්‍රථමඩ්‍යානක්‍රියාචිත්තය යි. චිතීයඩ්‍යානය ලැබූ සේක් ද එය, චිතීයඩ්‍යානක්‍රියාචිත්තය යි. සෙස්ස ද මෙසේ යි.

'පංචධා ඣානභෙදෙන රූපාවචරමානසං,
පුඤ්ඤපාකක්‍රියාභෙදා තං පංචදසධා භවෙ'

මෙසේ කියූ රූපාවචරය තෙමේ ධ්‍යානභෙදයෙන් පස් වැදැරුම් ය. නැවැත ඒ චිත්තය වෙන වෙන ම කුශල, විපාක, ක්‍රියාභෙදයෙන් පසළොස් වැදැරුම් ය.

1. **ආකාසානඤ්චායතනකුසලචිත්තය.**
2. **විඤ්ඤාණඤ්චායතනකුසලචිත්තය.**
3. **ආකිඤ්චඤ්ඤායතනකුසලචිත්තය.**
4. **නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලචිත්තය.**

මේ අරූපාවචර භූමියෙහි වූ කුසල්සිත් සතර ය.

මෙහි උත්පාදාදිඅන්ත නැති කසිණුගඝාටිමාකාසය' ආකාසානන්ත' යන මෙයින් කියන ලද්දේ ය. මේ ඒ බව:- **'තත්ථ උප්පාදාදිඅන්තරහිතතාය නාස්ස අන්තොති අනන්තං, ආකාසඤ්ච තං අනන්තඤ්චාති ආකාසානන්තං, කසිණුගඝාටිමාකාසො'** යනු.

අනන්තාකාස යි කිය යුතු තැන්හි විශෙෂණයාගේ පරනිපාතයෙන් ආකාසානන්ත'යි කියන ලද්දේ ය. ඒ ම සුවසේ කීම සඳහා ආකාසානඤ්ච' යි කීහ. මේ ධ්‍යානයට අනන්ත වූ ආකාශ ප්‍රඥප්තිය ආධාරස්ථාන වන බැවින් ආකාසානඤ්චායතන යි කියන ලදී. ඒ හා යෙදුනු කුශලචිත්තය, ආකාසානඤ්චායතනකුසල චිත්ත නම්.

'විඤ්ඤාණමෙව අනන්තං විඤ්ඤාණන්තං' යි කියූ බැවින් අනන්ත වූ විඤ්ඤාණය ම විඤ්ඤාණන්ත' නම්. මෙයින් ප්‍රථමාරූප්‍ය විඥානය කිය වේ. ප්‍රථමාරූප්‍යවිඥානය වනාහි උත්පාදාදිපරිච්ඡේද ඇත්තේ නමුත්, අනන්ත වශයෙන් අරමුණු කළ අහසෙහි උපදින බැවින්, තමන් අරමුණු කොට හටගත් භාවනාවන්ගේ උත්පාදාදී වූ අන්තය නො ගෙණ අනන්ත වශයෙන් පැතිර හට ගන්නා බැවින් අනන්ත' යි කියනු ලැබේ. විඤ්ඤාණන්ත යි කිය යුතු තැන්හි විඤ්ඤාණඤ්ච' යි කියන ලදී. මේ චිතීයාරූප්‍යධ්‍යානයට ප්‍රථමාරූප්‍ය විඥානය ආධාර වන බැවින්, විඤ්ඤාණඤ්චායතන, නම් වේ. ඒ හා යෙදුනු කුශලචිත්තය, විඤ්ඤාණඤ්චායතනකුසල චිත්ත නම් වේ.

ප්‍රථමාරූප්‍යවිඤ්ඤනයාගේ කිසිත් නැතිබව, ආකිඤ්චඤ්ඤ' නම්. මේ බව **'නාස්ස පඨමාරූපස්ස කිඤ්චනං අපපමත්තකං අනතමසෝ භවඬගමත්තම්පි අවසිඨං නත්ථී ති අකිඤ්චනං, තස්ස භාවෝ ආකිඤ්චඤ්ඤං'** යනු. මේ ධ්‍යානයට ප්‍රථමාරූප්‍ය විඤ්ඤනයාගේ අභාවමාත්‍රය ආඛාර වන බැවින් ආකිඤ්චඤ්ඤායතන' නම් වේ.

චතුත්‍ථාරූප්‍යධ්‍යානය, නෙවසඤ්ඤානාසඤ්ඤ යන මෙයින් ගැණේ. මහත් ලෙසින් සංඥ ව නැති බැවින් සියුම් ලෙසින් සංඥ ව ඇති බැවින් නෙවසඤ්ඤානාසඤ්ඤ' නම්. ඒ බව **'ඔළාරිකස්ස සඤ්ඤාය අභාවතෝ සුඛුමාය ච සඤ්ඤාය අත්ථිතාය නෙවස්ස සසම්පයුත්තධම්මස්ස සඤ්ඤා අත්ථිතාපි අසඤ්ඤං අච්ඡිජ්මානසඤ්ඤානති නෙවසඤ්ඤානාසඤ්ඤං'** යනු. මෙය මනායතනාදීන්ට ඇතුළත් බැවින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන' නම්. ඒ හා යෙදුන කුශලවිත්තය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන' නම් වේ.

1. **ආකාසානඤ්චායතනවිපාකචිත්තය.**
2. **විඤ්ඤාණඤ්චායතනවිපාකචිත්තය.**
3. **ආකිඤ්චඤ්ඤායතනවිපාකචිත්තය.**
4. **නෙවසඤ්ඤානාසඤ්ඤායතනවිපාකචිත්තය.**

මේ අරූපාවචරවිපාක සිත් සතර ය.

මේ විපාක සිත් එහි කුසල් සිත් වැනි වේ. වෙනස විපාකවීම පමණෙකි. මේ සිත් ඒ ඒ භූමීන්හි ප්‍රතිසන්ධි භවාඬග ව්‍යුතිවශයෙන් පවතී. ඒ බව **'පඨමාරූපාදිවිපාකානි පඨමාරූපාදිභූමිසු යථාක්කමං පටිසන්ධිභවඬගචුතිවසෙන පවත්තනතී'**

ආකාසානඤ්චායතනධ්‍යානය උපදවා ගත් තැනැත්තේ, එයින් නො පිරිහී කලුරිය කළේ ආකාසානඤ්චායතන' නම් අරූප බ්‍රහ්මලොකයෙහි උපදින්නේ ය. එහි ඉපදීම් වශයෙන් පහළවන ප්‍රතිසන්ධි විත්තය ද, එතැන් සිට චුත වන තෙක් ඇතිවන භවාඬග විත්තය ද, චුතවීම් වශයෙන් ඇතිවන චුතිවිත්තය ද, ප්‍රථමවිපාක විත්තය වන්නේ ය.

විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවා ගත් තැනැත්තේ, එයින් නො පිරිහී කලුරිය කළේ විඤ්ඤාණඤ්චායතනඅරූපබ්‍රහ්ම ලොකයෙහි උපදින්නේ ය. එහි දී මේ ද්විතීයවිපාකවිත්තය, ප්‍රතිසන්ධිභවාඬගව්‍යුතිවශයෙන් විපාක දෙයි.

ආකිඤ්චඤ්ඤායතනධ්‍යානය උපදවා ගත් තැනැත්තේ, එයින් නො පිරිහී කලුරිය කළේ ආකිඤ්චඤ්ඤායතනඅරූපබ්‍රහ්ම ලොකයෙහි උපදින්නේ ය. එහි දී මේ තෘතීයවිපාකචිත්තය, ප්‍රතිසන්ධිභවාඞ්ගච්‍යුතිවශයෙන් උපදින්නේ ය.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය උපදවා ගත් තැනැත්තේ එයින් නො පිරිහී කලුරිය කළේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරූපබ්‍රහ්මලොකයෙහි උපදින්නේ ය. එහි දී මේ චතුර්ථවිපාක චිත්තය, ප්‍රතිසන්ධිභවාඞ්ගච්‍යුතිවශයෙන් විපාක දෙයි.

1. **ආකාසානඤ්චායතනක්‍රියාචිත්තය.**
2. **විඤ්ඤාණඤ්චායතනක්‍රියාචිත්තය.**
3. **ආකිඤ්චඤ්ඤායතනක්‍රියාචිත්තය.**
4. **නෙවසඤ්ඤානාසඤ්ඤායතනක්‍රියාචිත්තය.**

මේ අරූපාවචරක්‍රියා සිත් සතර ය.

මෙහි කිය යුතු අරුත් යට කියැවුනේ ය. එය ඒ කියූ ලෙසින් දන්නේ ය. පෘථග්ජනයන්ට හා ශෛක්ෂපුද්ගලයන්ට ය ඒ සිත් උපදනේ. ක්‍රියා සිත් රහතුන් වහන්සේට පමණක් උපදී. අන්‍යයන්ට උපදිනු නැත. රහතුන් වහන්සේ විසින් උපදවනු ලබන ආකාසානඤ්චායතනධ්‍යානය, උන්වහන්සේට ආකාසානඤ්චායතනක්‍රියාචිත්තය වේ. සෙසු ධ්‍යාන තුන ද උන් වහන්සේට ක්‍රියා ම වේ.

'ආලම්බනපපභෙදෙන චතුධාරූපමානසං,
පුඤ්ඤපාකක්‍රියාභෙදා පුන වාදසධා ඨිතං'

අරූපාවචරචිත්තය තෙමේ ආලම්බනභෙදයෙන් සිවු වැදෑරුම් ය. නැවැත කුශලවිපාකක්‍රියාභෙදයෙන් දෙළොස් අයුරු ය.

අරූපාවචරයෝ රූපාවචරයන් සේ අඛණ්ඩ ඉක්මවා නො උප දින්නෝ ය. උපදින්නෝ අරමුණු ඉක්ම වීමෙනි. ප්‍රථමාරූප්‍යය, පඤ්චමධ්‍යානයට අරමුණු වූ කසිණනිමිත්ත උගුළුවා කිසුණු ඉගුළු අහස අරමුණු කොට උපදියි. විතීයාරූප්‍යය, ඒ අහස ඉක්මවා එහි පැවැති විඤ්ඤාණය අරමුණු කොට උපදියි. තෘතීයා රූප්‍යය, ඒ විඤ්ඤාණය ඉක්මවා විඤ්ඤාණයාගේ අභාවය අරමුණු කොට උපදියි. චතුර්ථාරූප්‍යය, ඒ අභාවමාත්‍රය ඉක්මවා තෘතීයාරූප්‍යය, අරමුණු කොට උපදියි.

1. **සොතාපත්තිමග්ගචිත්තය.**
2. **සකදාගාමිමග්ගචිත්තය.**
3. **අනාගාමිමග්ගචිත්තය.**
4. **අරහත්තමග්ගචිත්තය.**

මේ ලොකොත්තර කුසල් සිත් සතර ය.

ආයුෂ්මාන් අඤ්ඤාකොණ්ඩඤ්ඤ සොතාපන්න නම්. නිවීණ නැමැති මහා සමුද්‍රයට පමුණුවන බැවින් ආයුෂ්මාණන් මේ නම ලබයි. සොතාපත්ති නම්, ආයුෂ්මාණන්ට හාපුරා කියා පැමිණීම ය. **'සොතෝ ති වුච්චති අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, තස්ස ආපත්ති ආදිතෝ පජ්ජනං පාපුණනං පඨමඵලත්තාභිමුඛෝ සොතාපත්ති'** යනු ඒ වග කියයි. ඒ ආයුෂ්මාණන්ට පැමිණීමෙන් ලැබෙන මාර්ගචිත්තය, සොතාපත්තිමග්ගචිත්ත' නම් වේ. ඒ වග මේ:- **'සොතාපත්තියා ලද්ධං මග්ගචිත්තං සොතාපත්තිමග්ගචිත්තං'** යනු. සොතාපත්ති යන්නෙන්, මේ පමණක් නොව ආයුෂ්මාණන්ට මුලින් ම පැමිණි තැනැත්තේ ද ගැණේ. එවිට ඔහු පිළිබඳ මාර්ග සොතාපත්තිමග්ග' නම්. ඒ සෝතාපත්ති මාර්ගය හා එක් ව යෙදුනු චිත්තය, සෝතාපත්තිමාර්ග' යි. මේ ඒ කියූ සැටි:- **'අරියමග්ගසොතස්ස ආදිතෝ පජ්ජනං එතිස්සා ති සොතාපත්ති, පුග්ගලෝ, තස්ස මග්ගෝ, සොතාපත්තිමග්ගෝ, තෙන සම්පයුත්තං චිත්තං සොතාපත්තිමග්ගචිත්තං'** යනු.

පිළිසිඳගැණීම් විසින්, මිනිස්ලොවට එක් වරක් එන්නේ සකදාගාමී' නම්. ඔහුගේ මාර්ග හා එක් ව යෙදුනු සිත, සකදාගාමී මග්ගචිත්තය යි. මේ ඒ කියූ සැටි:- **'සකිං එකවාරං පටිසන්ධිවසෙන ඉමං මනුස්සලෝකං ආගච්ඡතී'ති = සකදාගාමී, තස්ස මග්ගෝ, සකදාගාමිමග්ගෝ, සකදාගාමිමග්ගෙන සම්පයුත්තං චිත්තං සකදාගාමිමග්ගචිත්තං'** යනු.

'ඉධ එකච්චෝ ඉධ පරිනිබ්බායි, තත්ථ එකච්චෝ තත්ථ පරිනිබ්බායි, ඉධ එකච්චෝ තත්ථ පරිනිබ්බායි, තත්ථ එකච්චෝ ඉධ පරිනිබ්බායි, ඉධ එකච්චෝ තත්ථ නිබ්බත්තිත්වා ඉධ පරිනිබ්බායි' යන මේ පාළියෙන් කියන පුද්ගලයන් පස් දෙනා අතුරෙන් මෙහි කියැවෙනුයේ පස්වැන්නා ය. මෙ තෙමේ වනාහි මෙසින් දෙවි ලොව උපතට ගොස්, නැවැත එක් වරක් මේ මිනිස්ලොව උපතට එන්නේ ය. මාර්ගය, එකචිත්තක්ඛණික බැවින් මාර්ගක්ෂණයෙහි මිනිස්ලොව පිළිසිඳගැණුමක් නොවන බැවින් ඵලස්ථපුද්ගල තෙමේ ම සකදාගාමී' නම් වේ. පුද්ගලභෙදය දුනගණු පිණිස මෙසේ දැක්විණ.

පිළිසිඳගැණීමට නැවැත මේ කාමලොකයට නො එන්නේ අනාගාමී' නම්. ඔහුගේ මාගීය හා එක් ව යෙදුනු සිත, අනාගාමී මග්ගචිත්ත නම් වේ. **'පටිසන්ධිවසෙන ඉමං කාමධාතුං න ආගච්ඡතී'ති = ආනාගාමී, තස්ස මග්ගො, ආනාගාමීමග්ගො තෙන සම්පයුත්තං චිත්තං ආනාගාමීමග්ගචිත්තං'** යනු ඒ බව කීයේ ය.

අහීද්ඵලය, අරහත්ත' නම්. ඒ අහීද්ඵලයට පැමිණීමට කරුණු වූ මාගීය අරහත්තමග්ග' නම් වේ. ඒ අහීත්මාගීය හා එක් ව යෙදුනු සිත, අරහත්තමග්ගචිත්තය යි. **'අරහතො භාවො අරහත්තං, චතුත්ථඵලස්සෙතං අධිවචනං, තස්ස ආගමනමග්ගභූතො මග්ගො, අරහත්තමග්ගො, තෙන සම්පයුත්තං චිත්තං අරහත්ත මග්ගචිත්තං'** යනු එ බව කීයේ ය.

1. සොතාපත්තිඵලචිත්තය.

2. සකදාගාමීඵලචිත්තය.

3. අනාගාමීඵලචිත්තය.

4. අරහත්තඵලචිත්තය.

මේ ලොකොත්තරවිපාකසිත් සතර ය.

සොතාපත්ති යනු ඈ පෙර කී සේ දන්නේ ය. ඵල නම් විපාකය යි. මේ ඵල සිත් ඒ ඒ මාගී සිත්වලට අනතුරුව ම ලැබෙන්නේ ය. සෝවන්මගසිත ලැබූ තැනැත්තහුට ඊට අනතුරු ව උපදින්නේ සොතාපත්තිඵලචිත්තය යි. සෙස්ස ද මෙසේ ය.

'චතුමග්ගප්පභෙදෙන චතුධා කුසලං තථා,
පාකං තස්ස ඵලත්තාති අඪධානුත්තරං මතං'

ස්‍රොතාපත්තිමාගීාදිචතුර්විධමාගීයන්ගේ ප්‍රභෙදයෙන් ලොකොත්තරකුශලචිත්තය සිවු වැදැරුම් ය. විපාකය වනාහි ඒ ලොකොත්තර සිත්හි ම විපාක බැවින් එසේ ම සිවු වැදැරුම් ය. ලොකොත්තර චිත්තය අටවැදැරුම් ය මෙසේ.

මෙහි ක්‍රියා සිත් නැත. මාගීචිත්තය එකචිත්තක්ෂණික බැවිනි. ලොකොත්තර සිත් එක් වරක් විනා දෙවරක් නො උපදියි. ඉදින් මගසිත් නැවැත නැවැත උපදනේ නම්, ඒ මගසිත් නැවැත ඉපදීමෙන්, ක්‍රියාස්වභාවය කියනු හැකි ය. නැවැත ඉපැත්මෙක් නැත. එහෙයින් ලොකොත්තරක්‍රියාචිත්තයන්ගේ සම්භවයෙක් නො වේ.

මෙසේ ඉතාසැකෙවින් කියූ මේ චිත්තසංග්‍රහයෙහි ජාති වශයෙන් අකුසල්සිත් දෙළසෙකි. කුසල්සිත් එක් විස්සෙකි. විපාකසිත් සතිසෙකි. ක්‍රියාසිත් විස්සෙකි. මූළුල්ල අසූනවයෙකි. මේ සිත් ම භූමිවශයෙන් කාමභවයෙහි සූපණසෙකි. රූප භවයෙහි පසළොසෙකි. අරූපභවයෙහි දෙළසෙකි. ලොකොත්තර භූමියෙහි අටකැ' යි මෙසේ ත් භෙදයට යයි.

'චාදසා කුසලානෙවං කුසලානෙකවීසති,
ඡත්තිංසෙව විපාකානි ක්‍රියාචිත්තානි වීසති,
චතුපඤ්ඤාසධා කාමෙ රූපෙ පණ්ණරසීරයෙ,
චිත්තානි චාදසාරූපෙ අඨධානුත්තරෙ තථා'

ලොකොත්තරචිත්තය, සමාපත්තිලාභීන්ට ධ්‍යානසම්ප්‍රයුක්ත ව ලැබෙන බැවින් එක එක ලොකොත්තරචිත්තය, ධ්‍යානපංචකය වශයෙන් ගිණූ කල්හි ලොකොත්තර යිත් සම සතළිසෙකි. හේ මෙසේ ය:-

1. **විතක්කවිචාරපීතිසුඛඑකග්ගතාසහිත-**
පඨමජ්ඣානසොතාපත්තිමග්ගචිත්තය.

2. **විචාරපීතිසුඛඑකග්ගතාසහිතදුතියජ්ඣාන-**
සොතාපත්තිමග්ගචිත්තය.

3. **පීතිසුඛඑකග්ගතාසහිතතතියජ්ඣාන-**
සොතාපත්තිමග්ගචිත්තය.

4. **සුඛඑකග්ගතාසහිතචතුත්ථජ්ඣාන-**
සොතාපත්තිමග්ගචිත්තය.

5. **උපෙක්ඛාඑකග්ගතාසහිතපංචමජ්ඣාන-**
සොතාපත්තිමග්ගචිත්තය.

සොතාපත්තිමග්ගචිත්තය, ධ්‍යානාඞ්ගයොගයෙන් මෙසේ පසකට බෙදන්නා සේ, සකදාගාමිමග්ගචිත්තය ද, අනාගාමිමග්ග චිත්තය ද, අරහත්තමග්ගචිත්තය ද ධ්‍යානාඞ්ගයොගයෙන් පසකට පසකට බෙදෙත්. එවිට මාගීසිත් විස්සෙකි. ඵලසිත් ද මෙසේ ඒ ඒ ඵල නාමයෙන් පසක් පසක් බැගින් විස්සෙක් වේ. ලොකොත්තර සිත් මෙසේ සතළිසෙක් වේ. මෙය කිහ මෙසේ:-

'ඣානඞ්ගයොගහෙදෙන තත්‍රෙකෙකනතු පංචධා,
වුච්චතානුත්තරං චිත්තං චත්තාලීසවිධන්ති ච'

එකෙකී ලොකොත්තරචිත්තය, ධ්‍යානාඞ්ග හා සම්ප්‍රයොගභෙද යෙන් පස් වැදෑරුම් කොට ලොකොත්තරසිත් සතළිස් වැදෑරුම් වේ යනු එහි තේරුම යි.

ලොකොත්තරචිත්තය, ධ්‍යානවශයෙන් ගණු ලබන්නේ **පාදකජ්ඣානය, සම්මසිතජ්ඣානය, පුග්ගලජ්ඣාසයජ්ඣානය** යන මොවුන්ගේ වශයෙනි.

ප්‍රථමධ්‍යානය පාදක කොට එයින් නැගිට, සංඛාරධර්මයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කරන්නහුට, සෝතාපත්තිමග්ග චිත්තය උපන්නේ නම්, එය **පඨමජ්ඣානසෝතාපත්තිමග්ග චිත්ත'** නම් වේ. ඔහු පිළිබඳ ඵලචිත්තය ද **පඨමජ්ඣාන සෝතාපත්තිඵලචිත්ත'** නම් වේ. සෙස්සෙහි ද ක්‍රමය මෙසේ ය. මේ පාදකජ්ඣානයාගේ වශයෙන් ගැණෙන හැටියි.

ප්‍රථමධ්‍යානය පාදක කොට නො ගෙණ, එහි ඇති විතර්කාදි අඞ්ගයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කරන්නහුට, ලැබෙන සෝතාපත්තිමග්ගචිත්තය, **'පඨමජ්ඣානසෝතාපත්තිමග්ග චිත්ත'** නම් වේ. ඵලචිත්තය ද, මේ නමින් ම උපදනේ ය. සෙස්ස ද මේ නයින් දත්තේ ය. මේ සම්මසිතජ්ඣානයාගේ වශයෙන් ගැණෙන සැටියි.

ප්‍රථමධ්‍යානයට සම වැද එයින් නැගිට, අනික් ධ්‍යානයෙක වූ අඞ්ගයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කරන්නහුට, තම අදහස් පරිදි මාර්ගචිත්තය පහළ වේ. සෙස්ස යට කී ලෙස ය. මේ පුග්ගලජ්ඣාසයජ්ඣානයාගේ වශයෙන් පහළවන සැටියි.

ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයුක්ත වූ කුශල - විපාක - ක්‍රියා වශයෙන් රූපාවචරයිත් තුනය, ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයුක්ත වූ මාර්ගඵල වශයෙන් ලොකොත්තර යිත් අටෙකැ යි ප්‍රථමධ්‍යාන චිත්තයෝ එකොළොසෙකි. මෙයින් තුනක් ලෞකික ය. අටක් ලොකොත්තර ය. මෙසේ ම ද්විතීයධ්‍යානචිත්තයෝ ද එකොළොසෙකි. තෘතීයධ්‍යානචිත්තයෝ ද එකොළොසෙකි. චතුර්ථධ්‍යානචිත්තයෝ ද එකොළොසෙකි. අරූපාවචර යිත් දෙළොස, පඤ්චමධ්‍යානයට ඇතුළත් වන බැවින් පඤ්චමධ්‍යානචිත්තයෝ තෙවිස්සෙකි. එහි ලෞකික යිත් පසළොසෙකි. ලොකොත්තර යිත් අටෙකැ යි දතයුතු යි.

කාමාවචර අකුසල්යිත් අටෙක, රූපාවචර කුසල්යිත් පසෙක, අරූපාවචර කුසල්යිත් සතරෙක, ලොකොත්තර කුසල් යිත් විස්සෙකැ යි කුසල්යිත් සත් තිසෙකි. කාමාවචරඅහෙතුක යිත් පසළොසෙක, සහෙතුක යිත් අටෙක, රූපාවචරවිපාක යිත් සතරෙක, ලොකොත්තරවිපාක යිත් විස්සෙකැ,යි විපාක යිත් දෙ පණසෙකි. අහෙතුකක්‍රියා යිත්, තුනෙක, සහෙතුකක්‍රියා යිත් අටෙක, රූපාවචරක්‍රියා යිත් පසෙක, අරූපාවචරක්‍රියා යිත්

සතරෙකැ,යි ක්‍රියා සිත් විස්සෙකි. මේ සියලු සිත් අකුසල් සිත් සමග ගිණු කල්හි මුළුල්ල එක්සිය එක් විස්සෙකැ,යි සැකෙවින් දතයුතු ය. කීහ මෙය මෙසේ:-

'සත්තතිංසවිධං පුඤ්ඤං විපඤ්ඤාසවිධං තථා,
පාකම්චාහු චිත්තානි එකවීසසතං බුධා' යි.

කාමාවචරාදී වූ කුසල්සිත් සත් තිසෙකි. විපාකසිත් දෙ පණසෙකි අකුසල්සිත් දෙළසෙකි. ක්‍රියාසිත් විස්සෙකි. හැම, එක් සිය එක් විස්සෙකි.

'එඤ්ඤනං චපලං චිත්තං' යනාදී වූ ගාථාවෙහි ආ **'චිත්තං'** යන්න ගෙණ මෙහි දක්වන ලද්දී සිත පිළිබඳ සාමාන්‍ය කථාවකි. එහෙත් මෙහි එන **'චිත්තං'** යන විභක්ත්‍යන්තපදයෙන් ගැණෙන්නේ ශමථ-විදර්ශනාවශයෙන් නො වැඩූ ශමථ-විදර්ශනා බලයෙන් තම යටතට නො ගත් කෙලෙස් සහිත සිත ය.

දූරක්ඛං = නො රැකියැකි වූ. රකින්නට අපහසු.

ශමථ - විදර්ශනාවන්ගේ බලයෙන් යටත් නො කළ සිත, හිත වූ අරමුණෙක පිහිටුවීම පහසු නො වේ. මේ සිත ඒ ඒ තැනින් වැට කටු බිඳ කුඹුරට වැද ගොයම් කන කුළුගොනකු වැනි ය. **'කිඤ්ඤම්බාධෙ කිඤ්ඛාදකගොණො විය එකස්මිං සප්පායා රම්මණෙයෙව දුඤ්පනතො දූරක්ඛං'** යනු අටුවා ය.

දුන්නිවාරයං = නො වැළකියැක්කා වූ. වළකාලීම අපහසු වූ.

කෙලෙස්සහිත වූ සිත විෂභාගාලම්බන කරා නිතර දුවන්නේ ය. එසේ නිතර නරක අතට දුවන සිත කායාදිදුශ්චරිතයන්ගෙන් නො වළකාලිය හැකි ය. දිවාරු දෙක්හි ම කායාදිදුශ්චරිත ම කරන්නේ ය. සොයන්නේ ය. **'විසභාගාරම්මණං ගච්ඡන්තං පටිසෙධෙතුං දුක්ඛං'** යනු අටුවා ය.

උජුං කරොති = ඍජු කෙරෙයි. ඇද නැත්තක් කෙරෙයි.

සිතෙහි ඇද නැතිකිරීම නම්, කෙලෙස් පුරුද්ද හා සියලු කෙලෙස් මුලින් උපුටා හැර, සිත කෙලෙසුන්ගෙන් මුළුමනින් සංසිඳුවා ගැණීම ය. සිතේ ඇද නැතිකම වන්නේ ශමථ-විදර්ශනා භාවනාබලයෙන් වූ තදඞ්ගවිෂ්කම්භණප්‍රහාණයන්ගේ වශයෙන් සිතෙහි ඇත්තා වූ කෙලෙසුන් යටපත් කොට මාර්ගඵලභාවනාවෙන් සමුච්ඡේදප්‍රහාණයාගේ වශයෙන් සියලු කෙලෙසුන් මුලින් උපුටා හැර, කෙලෙස් පුරුද්ද ත් ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණයාගේ වශයෙන් විනාශ කිරීමෙන් සංසිඳවාලීමෙනි.

මෙධාවී = නුවණැත්තේ[1]

උසුකාරෝ ඉව = හී වඩුවකු සේ. ඊ සාදන්නකු සේ

තෙජනං = හීය.

හීවඩු තෙමේ වනයෙන් දණ්ඩක් කපා ගෙණ වුත්, සැස පිට පොත්ත හැර, තෙල් කාඩි ගා, අඟුරුකබලෙන් රත් කොට හී අලුවෙහි ලා මැඩ, ඇද නැති කොට, අස්ලොම් විදීමට නිසි වූවක් කොට, රජ, රජඇමැති ආදීන්ට ශිල්ප දක්වා මහත් සත්කාර සම්මාන ලබන්නේ යම්සේ ද, එසේ නුවණැත්තේ, සැලෙන එක ඉරියව්වෙක නො පිහිටන නො රැකියැකි නො වැළකියැකි සිත ධුතඞ්ගධාරී ව වනයෙහි විසීම් වශයෙන් හී දණ්ඩක පිට පොත්ත වැනි දරදඬුකෙලෙස් තදඞ්ගාදිවශයෙන් දුරු කොට, ශ්‍රඩා නැමැති තෙලයෙන් තෙමා, කායිකචෛතසිකවීර්‍ය්‍ය නැමැති අඟුරුකබ-ලෙන් තවා, ශමථවිදර්ශනා නැමැති අලුවෙහි ලා, ඇද නැති කොට කාමරූපඅරූපභූමීන් පිළිබඳ සංස්කාරයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කොට, එයින් ලැබූ විදර්ශනාඥානයෙන්, දර දඬු වූ තද බද වූ අවිද්‍යාසක්ඛ්‍යය පළා, ත්‍රිවිද්‍යාෂඩභිඥානවලොකොත්තරධර්ම යන මේ ගුණවිශෙෂයන් අත් පත් කොට, අග්‍රදක්ෂිණාර්හභාවය ලබන්නේ ය, යනු මෙයින් වදාළ සේක.

වාරිජෝ ඉව = මසකු සේ.

වාරිජ නම් මත්ස්‍ය තෙමේ ය දියෙහි උපන්බැවින්.

ඵලෙ = ගොඩ බිම.

ඵල (ස්ථල) නම්, දිය නැති පෙදෙස ය. **'ඵලො ති නිරුදකප්ප දෙසො'** යනු දත්නේ ය.

ඵල ශබදය, මෙහි දියෙන් යට නො වන ගොඩබිම කියන ලද්දේ නමුත්, එය පැවිද්දෙහි හා නිවනෙහි ද වැටේ. පැවිද්ද හා නිවන කියනු ලැබේ. එසේ වැටෙනු කියනු පැවිද්ද හා නිවන එපරිදි වන බැවිනි. යම්සේ ලොකයෙහි දියසැඩපහරින් යටපත් නො වන යටපත් නො කළහැකි තැන ඵල යි කියනු ලැබේ ද, එපරිද්දෙන් රාගද්වෙෂ මොහාදීන්ගේ වශයෙන් නන්වැදැරුම් වූ කෙලෙස්දියපහරින් යටපත් නො කළ හැකි බැවින් පැවිද්ද හා නිවන ඵල යි කියනු ලැබේ. 'තිණ්ණො පාරගතො ඵලෙ තිට්ඨති බ්‍රාහ්මණො, යනු එහෙයින් කියන ලදි.

බිත්තො = දමන ලද්දා වූ. ගොඩ දමන ලද්දා වූ.

---

1. 2 3. 'මෙධාවී' යනු බලනු.

වාරිජෝ' යන්න වෙසෙසන්නේ ය. අතින් හෝ පයින් හෝ දැල් ආදී වූ අනෙකෙකින් හෝ ගොඩැ දමන ලද මසකු සේ' යි අරුත් ගත යුතු ය. **'හත්ථෙන වා පාදෙන වා ජාලාදීනං වා අඤ්ඤතරෙන ඵලෙ ඡඩ්ඩිතො'** යනු අටුවා ය.

ඔකං ඔකතො = වාසස්ථාන වූ ජලයෙන්. දියගෙයින්.

මෙහි ඔක' ශබ්ද දෙකෙකි. එකෙක් ගෘහවාචක ය. එකෙක් ජලවාචක ය. **'ඔකපුණ්ණෙකි වීවරෙති'** යන තැන්හි ඔක ශබ්දය ජලයෙහි වැටේ. **'ඔකං පහාය අනිකෙතසාරි'** යන තැන්හි ගෘහයෙහි වැටේ.

උබ්භතො = නගන ලද. ගොඩැ දැමූ.

පරිඵන්දති = තදින් සැලෙයි. තදින් ගැහෙයි.

ඉදං චිත්තං = මේ සිත.

පංචකාමයෙහි ඇලුනු ගැලුනු බැඳුනු පෘථග්ජනයන්ගේ නො වැඩූ සිත, නො හික්ම වූ සිත මෙයින් කිය වේ.

මාරධෙය්‍යං = ත්‍රෛභූමකවෘත්තය. මරු අයත් දහම්.

කම්මවෘත්ත – කෙලශවෘත්ත – විපාකවෘත්ත යන මේ තුනය මාරධ්‍යෙය නම්. මරු අයත් දහම් නම්. එහි **'සඞ්ඛාරභවා කම්මවට්ටං'** සංසකාර හා කම්භවය, කම්වෘත්ත නම්. **'අවිජ්ජා තණ්හූපාදානා කිලෙසවට්ටං'** අවිද්‍යා තෘෂ්ණා උපාදාන යන මොහු කෙලශවෘත්ත නම්. **'විඤ්ඤාණනාමරූපසළායතනඵස්සවෙදනා විපාකවට්ටං'** විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වෙදනා යන මොවුහු, විපාකවෘත්ත නම්.

පුණ්‍යාභිසංසකාර – අපුණ්‍යාභිසංසකාර – ආනෙඤ්ජාභිසංසකාර කායසංසකාර – වචීසංසකාර – චිත්තසංසකාර යි ස වැදැරුම් ය සංසකාර. එහි, කාමාවර කුසල්සිත් අට, අරූපාවචර කුසල්සිත් පස, පුණ්‍යාභිසංසකාර නම්. අකුසල්සිත් දොළස, අපුණ්‍යාභි සංසකාර නම්. අරූපාවචර කුසල්සිත් සතර, ආනෙඤ්ජාභිසංසකාර නම්.

කාමාවචර කුසල්සිත් අට, අකුසල්සිත් දොළස, යන මේ විස්ස, කායසංසකාර නම්. මේ ම වචීසංසකාර නම් ද වේ. කුසල් අකුසල් විස්ස, රූපාවචර සිත් පස. අරූපාවචර සිත් සතර යන මේ එකුන් තිස, චිත්තසංසකාර නම්. මෙහි මේ සියලු සංසකාරයෝ ලෞකික-කුශලාකුශලවෙතනාමාත්‍ර' යි දත යුතු යි.

'තත්ථ කතමො කම්මභවො, පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභි සඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො පරිත්තභූමකො වා මහාභූමකො වා, අයං වුච්චති කම්මභවො, සබ්බම්පි භවගාමි-කම්මං කම්මභවො' මේ දෙශනාව කර්මභවය, මේ ය යි කිය යි. කුශලාකුශලචෙතනාවන් හා ඒ චෙතනාවන් හා යෙදෙන චෛත-සිකධර්ම, කර්මභවය යි. පරිත්තභූමක - මහාභූමක යන මෙයින් කුශලාකුශල චෙතනාවන් හා ඒ හා යෙදුනු චෛතසික ද, කාමභව - රූපභව - අරූපභවයන්ට ඇතුළති යි ද, ඔවුන්ගේ මන්දබහු විපාකත්වය ද දක්වන ලද්දේ ය. **'සබ්බම්පි භවගාමිකම්මං කම්මභවො'** යන මෙයින් කුශලාකුශලචෙතනාවන් සමග උපදනා වූ ආලොභාදී වූ ද, ලොභාදී වූ ද චෛතසිකධර්ම, සකස් කිරීමේ ස්වභාවය ඇති බැවින් කර්මභව නම් වේ.

මෙහි සංසකාර, විභාග කොට දැක්වීමෙහි දී දැක් වූ පුණ්‍යාභි සංසකාරාදීන් ම, කර්මභවය විභාග කොට දැක්වීමෙහිදී ත් දැක් වූ බැවින් නො වෙනස්බවෙක් පෙණේ. එකදෙශයකින් නො වෙනස් බවක් ඇති නමුත් වෙනස්බවෙක් ඇත්තේ ය.

අතීතභවයෙහි රැස් කළ පුණ්‍යාභිසංසකාරාදීහු, සංඛාර' යන්-නෙන් ද, වර්තමානභවයෙහි රැස් කළ පුණ්‍යාභිසංසකාරාදීහු කම්ම-භව' යන්නෙන් ද කියන ලදහ. තවද සංඛාර' යන්නෙන් කුශලා කුශලචෙතනා ද, කම්මභව' යන්නෙන් කුශලාකුශලචෙතනා හා ඒ හා යෙදෙන චෛතසික ද ගැණෙත්. මෙයින් එහි වෙනස දැක් වේ. මෙසේ මෙහි සැකෙවින් කියූ සංසකාර හා භවගාමිකර්ම කර්මභව නමැ, යි දන්නේ ය.

අවිද්‍යා තෘෂ්ණා උපාදාන ක්ලෙශවෘත්ත නමැ, යි යට කියන ලදී එහි දුක් නො දැනීම, දුක් හටගැණීම නො දැනීම, දුක් නැතිකිරීම නො දැනීම, දුක් නැතිකිරීමේ පිළිවෙත නො දැනීම, පූර්වාන්තය නො දැනීම, අපරාන්තය නො දැනීම, පූර්වාන්තාපරාන්තය නො දැනීම, පටිච්චසමුප්පාදය නො දැනීම යනු අවිද්‍යා නමැ, යි කියන ලදී.

තෘෂ්ණා නම්, චක්ෂුරාදිෂඩ්ද්වාරයෙහි උපදින එක්සිය අටක් ප්‍රභෙද වූ ලොභය යි. එය රූපතණ්හා-සද්දතණ්හා-ගන්ධතණ්හා - රසතණ්හා - ඵොට්ඨබ්බතණ්හා - ධම්මතණ්හා යි පළමු කොට කොටස් සයකට බෙදේ. මේ ෂඩ්විධ තෘෂ්ණාවෙහි එකෙකි තෘෂ්ණාව කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා යි තෙපරිදි වන බැවින් අටළොස් වැදැරුම් වේ. ආඛ්‍යාත්මිකසන්තානයෙහි වූ රූපාදීන්හි පැවතීම් වශයෙන් අටළොසෙක, බාහිරසන්තානයෙහි වූ රූපාදීන්හි පැවැතීම් වශයෙන් අටළොසෙකැ යි ගත් කල්හි

තෘෂ්ණාව සතිසකට බෙදී යයි. ඒ සතිස අතීතභවයෙහි සතිසෙක වර්තමානභවයෙහි සතිසෙක, අනාගතභවයෙහි සතිසෙකැ, යි එක් සිය අටක් වේ.

උපාදාන, කාමූපාදාන-දිට්ඨුපාදාන-සීලබ්බතූපාදාන-අත්තවාදූපාදානැ යි සතරෙකි. උපාදාන නම්, දැඩි කොට ගැණීම ය. මෙසේ මෙහි ඉතා සැකෙවින් කියූ අවිද්‍යා-තෘෂ්ණා-උපාදාන යන මේ තුන කෙලෂවෘත්ත නම්.

විඤ්ඤාණ නම්, සිත යි. ඒ අවිශෙෂයෙනි. කුසලවිපාකචක්ඛු විඤ්ඤාණ – ෂෝතවිඤ්ඤාණ– ඝාණවිඤ්ඤාණ – ජිව්හාවිඤ්ඤාණ-කාය විඤ්ඤාණ පස හා, අකුසලවිපාකචක්ඛුවිඤ්ඤාණාදී වූ පස ද, අහෙතුක සිත් පස ද, ස හෙතුක සිත් අට ද, රූපාවචර සිත් පස ද, අරූපාවචර සිත් සතර ද, යි මෙහි විඤ්ඤාණයෝ දෙ තිසෙකි. චක්ඛුපපසාදය රූපය හා ගැටුනු කල්හි ඒ ඇසුරු කොට උපදින සිත චක්ඛුවිඤ්ඤාණ නම්. සෙස්ස ද මේ නයින් දත යුතු ය.

සිත ද, සිත සමග එකට ඉපිද නැසෙන සුලු අද්‍රව්‍ය අරූප ධර්ම වූ චෛතසික ද, රූපාදී වූ අරමුණුවල නැමී පවත්නා බැවින් නාම නම් වේ. වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණැ යි නාමය සිවු වැදෑරුම් ය. එහෙත් මෙහි නාමයෙහි ලා වෙදනා-සංඥා-සංඝකාර යන සඝාතත්‍රය පමණක් ගැණේ.

යම් ද්‍රව්‍යධර්මසමූහයෙක් ඉපිද බිඳෙන පෙරළෙන ගතියෙන් යුක්ත ද, ඒ ධර්මසමූහය රූප නම් වේ. පඨවි – ආපෝ – තෙජෝ – වායෝ, චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා-කාය, වණ්ණ – ගන්ධ – රස – ඕජඞ්ඛ – ඉත්ථීභාව – පුම්භාව – ජීවිත – කායවිඤ්ඤත්ති – වචී විඤ්ඤත්ති – ආකාසධාතු – ලහුතා – මුදුතා – කම්මඤ්ඤතා – උපචය සන්තති-ජරතා-අනිච්චතා-ඔජා-වත්‍ථු යි අටවිසි වැදෑරුම් වේ.

චිත්ත-චෛතසික ධර්මයන්ගේ උපදින තැන, රැස්වන තැන, යන අර්ථයෙන් හා සසර දික් කරන්නෝ ය යන අර්ථයෙන් චක්ඛු ආදීහු, ආයතන නම් වෙති. චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා-කාය-මනැ යි ආයතන සයෙකි.

රූපාදී වූ අරමුණුවල හැපෙන වැදෙන සුභාවයෙන් පැවැත්ම ඵස්ස නම් වේ. එය චක්ඛුසම්ඵස්ස-සෝතසම්ඵස්ස-ඝාණසම්ඵස්ස – ජිව්හාසම්ඵස්ස – කායසම්ඵස්ස – මනොසම්ඵස්ස යි සැකෙවින් ස වැදෑරුම් ය. විසතර විසින් විපාකඵලයෝ දෙ තිසෙක් වෙති.

අරමුණුරස විඳගැණීම වෙදනා නම් වේ. චක්ඛුසම්ඵස්සජා වෙදනා-සොතසම්ඵස්සජාවෙදනා – ඝාණසම්ඵස්සජාවෙදනා-ජිව්හා සම්ඵස්සජාවෙදනා – කායසම්ඵස්සජාවෙදනා – මනොසම්ඵස්සජා වෙදනා, යි වෙදනාව ස වැදැරුම් ය. ඒ සැකෙවිනි. විසතර විසින් විපාකවෙදනා දෙ තිසෙක් වේ.

මෙසේ මෙහි ඉතාසැකෙවින් කියූ විඤ්ඤාණ – නාමරූප – සළායතන-ඵස්ස-වෙදනා යන මේ වනාහි විපාකවෘත්ත නමැ, යි දත යුතු ය. මතු පහළ වන උත්පත්තිභවය හා ජාති ජරා මරණ ද මෙහි ම ඇතුලත් ය.

සසරෙහි ඉපැන්මට හෙතුවන කුශලාකුශලකර්ම්, කර්ම්වෘත්ත නමැ යි ද, සිතෙහි වූ ලොභ දෙස මොහාදි වූ කෙලෙස, කෙලෙශවෘත්ත නමැ යි ද, කර්ම්බලයෙන් පහළ වන නාමරූපඛම්, විපාකවෘත්ත නමැ යි ද, කොවින් දතයුතු ය.

පහාතවෙ = පහකරන්නට. පහකටයුතු.

මෙහි පහකිරීමැ යි කීයේ පස්කම්විසයෙහි ඇලුනු ගැලුනු සිත විදර්‍ශනාකර්‍මස්ථානයෙහි ඔහා කායික-චෛතසික වීර්‍යයෙන් ඉන් නගා සිටුවීම ය.

එක් අරමුණෙක පිහිටවනු නොහැකි මේ සිත, කර්‍මවෘත්තාදි වෘත්තත්‍රය පහකරන්නට විදර්‍ශනාකර්‍මස්ථානයෙහි ලා කායික චෛතසික වීර්‍යයෙන් තවන කල්හි තදින් සැලේ ද, නුවණැති පුරුෂ තෙමේ වීර්‍යය නොහැර යට කියූ ලෙසින් සිත නොඇද-වුවක් කරත්තේ ය. නොහොත් මාරධෙය්‍ය යි කියූ කෙලෙශවෘත්තය නොහැර සිටි බාලපෘථග්ජනයන්ගේ නොවැඩූ මේ සිත දියෙන් ගොඩැ දැමූ මසකු සේ නොයෙක් අරමුණු කරා දිවීම් වශයෙන් සැලෙන්නේ ය. එහෙයින් මාරධෙය්‍ය යි කියූ යම් කෙලෙශවෘත්තය කින් සිත සැලෙන්නේ ද, ඒ මේ කෙලෙශවෘත්තසඞ්ඛ්‍යාත මාර ධෙය්‍යය මාගීඵලාවබොධයෙන් පහකටයුතු ය යනු නාවයි.

ගාථාදෙශනාව ගේ අවසානයෙහි මෙසියසථවිරයන් වහන්සේ සෝවන් පලයෙහි පිහිටියාහු ය. අන් බොහෝ දෙන ද සෝවන් පලාදිය ලැබුවෝ වූහ.

මෙසියසථවිරවත්‍ථුව නිමි.

අප්‍රසිඬහික්ෂුවකට සැලකූ ප්‍රසිඬඋපාසිකාවක්

3 - 2

කොසොල් රජුට අයත් රටෙක කන්දක්පාමුල කන්දක් ඇසුරු කොට පිහිටි **ඇලගමු** නම් ගම්වරයෙක් වූයේ ය. එහි විසූ මිනිසුන්ගේ ගණන ද ඉතා බොහෝ ය.

එ දවස එක් දිනෙක සැටක් පමණ භික්ෂූන් වහන්සේලා බුදු රජුන් වෙතින් රහත්බව දක්වා කමටහන් උගෙණ **මාතික** නම් ගමට පිඬු සිඟා වැඩියෝ ය. එ ගමැ අධිපති තෙමේ ද මාතික නමින් ම ප්‍රසිඬ ව විසි ය. ඔහුගේ මවු තොමෝ ඒ භික්ෂූන් දැක වැඩමවා ගෙණවුත් සිය ගෙයි වඩා හිඳුවා නොයෙක් අග්‍ර රසයෙන් යුත් කැඳබත් වළඳවාලා 'ස්වාමිනි! හාමුදුරුවන් වහන්සේලා කොතැනැ වඩින්නා හු ද' යි ඇසූ ය. 'උපාසිකා! අපි විසුම් පහසු තැනක් බලා යන්නෙමු' යි කීවිට උපාසිකා තොමෝ 'මේ හාමුදුරුවන් වහන්සේලා වස් වසන්නට පහසු සුදුසු තැනක් සොයා යන්නෝ ය' යි සිතා පාමුල වැටී වැඳ 'ස්වාමීන් වහන්සේලා යම් ලෙසකින් මේ තෙමස මෙහි වස් එළැඹැ වැඩ වසන්නේ නම්, මම තිසරණසහිතපඤ්චසීලයෙහි පිහිටා පෙහෙවස් රකින්නෙමි' යි කිවු ය. භික්ෂූන් වහන්සේලා ද 'අපි මේ උපාසිකාවගෙන් සිවුපසය ලබා වැඩි වෙහෙසට නොපැමිණ සසරදුකින් නිදහස් වන්නමෝ' යි උපාසිකාවගේ ආරාධනාව පිළිගත්හ. ආරාධනාව පිළිගත්බව දත් උපාසිකා තොමෝ ඒ භික්ෂූන්ට විසීමට වෙහෙරක් පිළියෙල කොට දුන්නී ය. උන්වහන්සේලා එහි විසූහ. දිනෙක ඔවුහු එක් තැන් ව 'ඇවැත්නි! නො පමා විය යුතු ය, පමාවීම අපට නො සුදුසු ය, පමාවීමට මේ කල් නොවේ, සිඟගෙවල් සේ අපට අට මහා නරකයෝ හරිණලදදෙර ඇත්තෝ ය, අපි ජීවමාන බුදුරජුන් වෙතින් කමටහන් උගෙණ ආවෝ වෙමු, බුදුවරයන් ගේ පසු පස ඉතාලංව සිටියමෝ ද, කපටි කමින් නම් උන්වහන්සේලා සතුටු කරන්නට නොහැක්කෝ ය, හොඳ පැවැත්මෙන් හා නොකපට අදහසින්ම ය උන්වහන්සේලා සතුටු කළ යුත්තේ, එහෙයින් අප කවුරුන් නො පමා විය යුතුය, අද අද ම ප්‍රමාදය හැර දමා අප්‍රමාදයට බැසිය යුතු ය, සවස මහතෙරුන්ට උවැටන් කරණ වේලෙහි ද, උදැසන පිඬු සිඟා යන වේලෙහි ද එක් තැන් විය යුතු ය, අන් හැම වේලකම හැම මොහොතකට වෙන් ව හිඳ බවුන් වැඩිය යුතු ය' යි නියම කොට ගෙණ නැවැත ත්

'යම් මහණක්හට අපහසුවක් වී නම්, ඒ වේලෙහි ඔහු ගෙඩිය ගසා දැන් වූ කල්හි ඔහුට බෙහෙත් කරන්නට කවුරුත් රැස් විය යුතු ය' යි ද කතා කර ගත්හ.

මෙසේ උන්වහන්සේලා කතිකා කොට වසන්නෝ එක් දිනෙක උපාසිකා තොමෝ ගිතෙල් උක්සකුරු ආදිය ගෙන්වා ගෙණ දැසිකම්කරුවන් පිරිවරා සවස් වේලෙහි විහාරයට ගියා ය. ගොස් වෙහෙර මැද භික්ෂූන් නො දැක 'ස්වාමීන් වහන්සේලා කො තැනැ වැඩියාහු දැ' යි එහි සිටි මිනිසකු අතින් විචාළා ය. 'තම තමන්ගේ රැතැන් දිවාතැන්හි වසත්' යි කී කල්හි 'උන් වහන්සේලා මේ වේලේ දකින්නට කුමක් කළ යුතු දැ' යි නැවැත ඇසූ ය. 'උපාසිකාව, ගෙඩිය ගැසූ කල උන්වහන්සේලා මෙහි රැස් වෙත්' යි කීවිට මිනිසකු ලවා ගෙඩිය ගැස්සුවා ය. ගෙඩි හඬ ඇසූ භික්ෂූන් වහන්සේලා 'කිසිවක්හට අපහසුවෙකැ' යි සිතා වහ වහා ස්වකීයස්ථානයන්ගෙන් නික්ම අවුත් වෙහෙර මැද රැස් වූහ. එක් මගින් ආ දෙදෙනෙක් ඒ පිරිසෙහි නො වූහ. උපාසිකා තොමෝ එක් එක් තැනින් එක් එක් භික්ෂුනම එනබව දැක 'මාගේ ස්වාමීන් වහන්සේලා අතර කොලාහලයක් වියයුතු ය' යි සිතා භික්ෂූන් වැඳ 'ස්වාමීනි! ස්වාමීන් වහන්සේලා අතර කොලාහලයෙක් දැ' යි ඇසූ ය. 'මැනියෙනි! අපි කොලාහල කරන්නෝ නො වෙමු' යි කීහ. 'කොලාහලයෙක් නො වේ නම්, කුමක් හෙයින් සියල්ලන් එකතු ව මාගේ ගෙට වැඩම කරන්නා සේ නො වැඩ එක් එක් තැනැ හිඳ තනි තනි ව ආවහු දැ' යි විචාළා ය. එවිට භික්ෂූන් වහන්සේලා 'උපාසිකාවෙනි! අපි සියලු දෙන තනි තනි ව හිඳ මහණදම් කරන්නෙමු' යි කීහ. එවිට ඕ තොමෝ 'පුතුනි! මහණදම නම් කිමැ' යි ඇසූ ය. 'සිල් නො බිඳ සිල්වත් ව චත්තිංසාකාරය සජ්ඣායනාකිරීම, කමටහන්වැඩීම, ආත්මභාවයෙහි විනාශය දැකීම, සිතැ එහි පිහිටුවීම යනාදිය ය මහණකමැ' යි භික්ෂූන් කී කල්හි 'පුතුනි! මෙය ඔබවහන්සේලා විසින් ම කළ යුත්තෙක් ද, අප විසින් නො කළ යුතු ද, නො කොට හැකි ද, අපට නො වටී දැ' යි ඇසූ ය. 'සිල්රැකීම, භාවනා කිරීම, ආත්මභාවයෙහි අනිත්‍ය දුඃඛ අනාත්මයන් බැලීම, එහි සිත පිහිටුවා ධ්‍යාන වැඩීම කවරකුහට ත් තහනමක් නැත්තේ ය, කා විසිනු ත් කළ යුතු ය, කා විසිනු ත් කට හැකි ය' යි භික්ෂූන් වහන්සේ ලා කීහ. එවිට උපාසිකා තොමෝ 'ස්වාමීනි! එසේ නම් මට ත් චත්තිංසාකාරය උගන් වනු මැනැව, අත්බවේ විනාශය බලන සැටි උගන්වනු මැනැවැ' යි ඉල්ලා සිටියා ය. භික්ෂූන් වහන්සේලා ඇයට එය ඉගැන්නූහ.

උපාසිකා තොමෝ එතැන් සිට වතනිංසාකාරය නිතර සඤ්ඤා යනා කරයි. නිතර සිත එහි යොදයි. ආතම්භාවයෙහි බය වය පිහිටුවා බලයි. මෙසේ මහත් ඕනෑ කමකින් කම්මැලි කම් දුරලා වතනිංසාකාරය මෙනෙහි කරණ ඕ තොමෝ ඒ භික්ෂූන්ට පෙරාතුව ම තුන් මග තුන් පලයට පැමිණියා ය. ඒ හා ම ඕ තොමෝ සිවු පිළිසෑඹියාවන් හා ලෞකිකානිඤවන් ද ලැබූ ය. අනතුරු ව ඕ තොමෝ මගපලසුවයෙන් නැගිට දිවැසින් බලා 'කවර කලෙක මාගේ පුතුන් විසින් මේ ධර්මය අවබොධ කරණ ලද දැ' යි විමසන්නී, ඒ හැම දෙනා රාගවෙෂමොහසහිතයන් බව, ඔවුනට ධ්‍යාන විදර්‍ශීනාමාත්‍රයකු ත් නැතිබව දැන එවර 'කිමැ මාගේ පුතුනට රහත් බවට වාසනාව තිබේ දැ' යි බැලූ ය. එවිට ඔවුනට රහත්බවට වාසනාව ඇතිබව දැන, නැවැත ඒ ඒ සත්ප්‍රායයන් ගැණ බලන්නී, ආහාරසත්ප්‍රාය නැතිබව දුටුවා ය. දැන එ තැන් සිට ඕ තොමෝ භික්ෂූන් වහන්සේලාට නන් වැදෑරුම් වූ කැඳබත් හා තවත් කැයුතු වූ කයසිත පිණවන නානාග්‍රරසයෙන් යුත් බොජුන් කැවිලි, පෙවිලි, කිරි, පැණි ආදී වූ හැම රසවත් ඔද වඩන ආහාරපාන සපයා භික්ෂූන් වහන්සේලා ගෙට වැඩමවා පැන් පිළිගන්වා 'සවාමිනි! මෙහි ඔබවහන්සේලාට කැමැති සේ යමක් යමක් රුචි නම්, එය ගෙණ වළඳනු මැනැවැ' යි ඒ පිළියෙල කොට තුබූ බොජුන් පිළි ගැන්නූ ය. ඕ තොමෝ එ තැන් සිට භික්ෂූන් වහන්සේලාට රුචි වූ ඔජසකරආහාරපාන සපයා දුන්නී ය. භික්ෂූන් වහන් සේලා ද සිත් වූ පරිදි තම තමන්ට රුචි දෙය වළඳති. ඒ හා ම වතනිංසාකාරය ද වඩන්නා හ. ඉතා හොඳ ආහාරපාන ලැබීමෙන් එකඟ වූ සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේ ලා වැඩි දවස් නො යවා ම රහත් වූහ. 'වාසනාවකි, උපාසිකා තොමෝ අපට පිහිට වූ ය, යම් ලෙසකින් මේ ලෙසට අපට කැම් බීම් නො ලැබුනේ නම්, අපට මගපලලැබීමෙක් මෙතරම් ඉක්මනට නො වන්නේ ය, දැන් ඉනින් අපි වස් අවසන් කොට බුදුරජුන් දක්නට යන් නෙමු' යි සිතා වස් අවසන් කළහ. වස් පවරා උපාසිකාව අමතා 'උපාසිකාවෙනි! අපි බුදුරජුන් දක්නට යන්නට කැමැත්ත තෙමු' යි කීහ. එවිට ඕ තොමෝ 'හොඳයි, සවාමිනි! වඩින්න, නැවැත ත් මා ගැණ සිහිපත් කරන්නැ' යි ප්‍රියවචන කියා ඒ භික්ෂූන් පිටත් කර යැවූ ය.

භික්ෂූන් වහන්සේලා සැවැත්නුවර ජෙතවනාරාමයට ගියහ. ගොස් බුදුරජුන් වැඳ එකත් පසෙක හුන්හ. එ කල්හි බුදුරජානන් වහන්සේ 'මහණෙනි! සැපදුක් කෙසේ ද, ආහාරපාන හොඳින්

ලැබුනේ දැ'යි ඇසූහ. 'ස්වාමිනි! සැපදුක් ගැණ කියයුතු යමෙක් නැත, කෑම් බීම් හොඳට ලැබුනේ ය, මාතිකා මවු වූ උපාසිකා තොමෝ අපේ සිත් දැන අපට කෑම් බීම් පිළියෙල කර දුන්නී ය, අපට මෙ නම් අහරක් ලැබේ නම් හොඳ යි සිතුනු සැටියේ, ඒ ආහාරපාන අප සිතූ ලෙසින් ම පිළියෙළ කර දුන්නී ය' යි ඒ උපාසිකාවගේ ගුණ කීහ. එ වේලෙහි එහි සිටි එක්තරා මහණෙක් ඈ පිළිබඳ මේ ගුණකථාව අසා එහි යනු කැමැති ව බුදුරජුන් වෙතින් කමටහන් ගෙණ ජේතවනයෙන් නික්ම ගොස් ඒ ගමට පැමිණ, පැමිණි දිනයේ ම 'මේ උපසිකා තොමෝ සිතූ සිතූ දෙය දන්නී ය, මම ද මගැ ඊමෙන් විඩාවට පත් ව සිටිමි, වෙහෙර හමදින්නට නො හැක්කෙමි, වෙහෙර හමදින්නට මිනිසකු එවන්නී නම් හොඳ ය'යි සිතී ය. උපාසිකා තොමෝ ගෙයි හුන්නී ඔහුගේ සිතිවිල්ල දැන 'යව, විහාරය, අතු පතු ගා පිළිදැගුම් කොට එව'යි මිනිසකු පිටත් කළා ය. නැවැත ඒ මහණ තෙමේ හකුරු පැන් බොනු කැමැති ව 'හකුරුපැනක් සාදා එවන්නී නම් යහපතැ'යි සිතී ය. ඕ තොමෝ එය ද වහා පිළියෙල කොට යැවූ ය. නැවැත 'හෙට උදයට මට අවුලුපතුත් සමග සිනිදු කැඳක් එවා' යි සිති ය. ඕ, එය ද සිතූ පරිදි පිළියෙල කොට යැවූ ය. මහණ, එය වළඳ 'මට දැන් කෑයුතු දෙයක් එවන්නී නම් යහපතැ'යි සිතී ය. උපාසිකා එය ද පිළියෙල කොට යැවූ ය. 'මේ උපාසිකා තෙමෝ මා සිතූ සිතූ දෙය පිළියෙල කොට එව්වා ය, 'මට මැය දකින්නට ලැබේ නම් වාසනාවෙකි, එ හෙයින් ඉතාරසවත් පිණි බොජුනකුත් ගෙන්වා ගෙණ එන්නී නම් යහපතැ'යි සිතී ය. උපාසිකාව 'මාගේ පුත් මා දකිනු කැමැත්තේ ය, එහි මා එනු බලාපොරොත්තු වන්නේය' යි ඔහු සිතූ ලෙසට රසවත් කෑමක් පිළියෙල කොට ගෙන්වා ගෙණ විහාරයට ගොස් ඒ මහණහුට දුන්නී ය. හෙ තෙමේ එය වළඳ 'උපාසිකාවෙනි, මාතිකමාතා යි කියනු ලබන්නී ඔබ තුමිය දැ' යි ඇසූයේ ය. 'එහෙයි, ස්වාමිනි! මාතිකමාතා මමැ'යි ඕ කිවූ ය. 'තී පරසිත් දන්නී වෙහි දැ' යි ඇසූ විට 'කුමක් හෙයින් මා අතින් එය විචාරන්නෙහි දැ' යි ඕ තොමෝ ඇසූ ය. 'මා සිතූ සිතූ සියල්ල තී එසේ කළා වෙහි ය, එ හෙයින් විචාරමි'යි කීයේ ය. එවිට උපාසිකාව 'පරසිත් දන්නා භික්ෂූන් වහන්සේලා බොහෝ වෙති' යි කිවූ ය. මහණ තෙමේ 'උපාසිකාවෙනි! මම අනිකක්හු ගැණ නො විචාරමි, තී ගැණ විචාරමි' යි කීයේ ය. එසේ කී කල්හි ත් උපාසිකා තොමෝ 'පරසිත් දනිමි' යි නො දන්වා 'පුත්‍රය! පරසිත් නො දන්නෝ මෙසේ කරත් දැ' යි ඇසූ ය. ඉක්බිති ඒ භික්ෂු තෙමේ 'මේ කමීය අතිසාහසිකය, පෘථග්ජනයෝ

යහපත් දෙය ත් අයහපත් දෙය ත් සිතති, එ හෙයින් යම් ලෙසකින් මම අයුතු දෙයක් ගැණ සිතන්නෙම් නම්, මෝ තෙමෝ බඩු සහිත සොරු කෙස්වැටියෙන් අල්ලා ගන්නියක සේ මා වෙහෙසට පත් කරන්නී ය, එ හෙයින් මා මෙ තැනින් පලා යා යුතු ය' යි සිතා 'උපාසිකාවෙනි, මම යන්නෙමි' යි දන්වා සිටියේ ය. එවිට 'කොා තැනැ වසින්නෙ හි දැ'යි උපාසිකාව ඇසූ ය. 'මම බුදු රජුන් වෙත යන්නෙමි' යි හෙ තෙමේ කීයේ ය. 'මෙහි ම වැඩ හිඳිනු මැනැවැ' යි කී කල්හි ඔහු 'මෙහි හිඳිනු නොා හැකි ය, යන්නට ම ඕනැ ය' යි එ තැනින් නික්ම බුදු රජුන් වෙත ගියේ ය. බුදුරජානන් වහන්සේ 'මහණ! මොක ද මෙහි ආයෙහි, තට එහි වසන්නට ඉඩ නොා ලැබුනේ දැ' යි අසා වදාළ කල්හි 'ස්වාමීනි! මට එහි වසනු නොා හැකි ය' යි හෙ තෙමේ කී ය. 'ඇයි, වසනු නොා හැකි' යි ඇසූ කල්හි ඒ උපාසිකා තොමෝ සිතූ සිතූ සියල්ල දන්නී ය, පෘථග්ජනයෝ හොඳත් නොා හොඳ ත් දෙක ම සිතති, යම් ලෙසකින් මට නරකක් නපුරක් සිතුනේ නම්, එවිට ඕ, බඩු සහිත සොරු කෙස්වැටියෙන් අල්ලා ගන්නියක සේ මා වෙහෙසට පමුණුවනු ඇතැ යි සිතා එතැනින් නික්ම ආයෙමි' යි ඒ භික්ෂූ තෙමේ කීයේ ය. බුදුරජානන් වහන්සේ 'මහණ! තට එහි ම විසීම හිතකරය'යි වදාළ කල්හි 'ස්වාමීනි! මට එහි වසන්නට නම් නොා හැකි ය, මම එහි නොා යමි'යි කීයේ ය. බුදුරජානන් වහන්සේ 'එසේ නම්, තට එකක් පමණක් රැකිය හැකි දැ'යි ඇසූහ. එවිට 'ස්වාමීනි! ඒ කිමැ'යි ඔහු ඇසී ය. 'තෝ තාගේ සිත පමණක් රකුව, සිත එක් අරමුණෙක නොා තැබිය හැකි බැවින් දුකසේ රැකිය යුතු ය, තෝ තමන්ගේ සිතට නිග්‍රහ කරව, අන් කිසිවක් ගැණ නොා සිතුව, මේ සිත ඉතාදුකින් වෙහෙසී ගෙණ නිග්‍රහ කළ යුත්තෙකැ' යි වදාරා බුදුරජානන් වහන්සේ මේ ධම්දෙශනාව කළ සේක:-

දුනනිගගහසස ලහුනො යථාකාමනිපාතිනො*
චිතතසස දමථො සාධු චිතතං දනතං සුඛාවහනති.

දුකසේ නිග්‍රහ කටයුතු වූ වහා ඉපිද නැසෙන සුලු වූ යම් අරමුණෙක කැමැති සේ වැටෙන සුලු වූ සිතෙහි දැමීම යහපත් ය. සිත දැමුනේ සුව ඵලවන්නේ ය.

දුනනිගගහසස = දුකින් නිගහනැකි වූ. නිග්‍රහ කරන්නට නොා පිළිවන් වූ.

---

* 'යථා කාමනිපාතිනො' බොහෝ පොත්හි

සිතට නිග්‍රහ කිරීම නම් පහසු නොවේ. එය නුවණින් යෙදී කළ යුතු ය. යම් කිසිවිටෙක සිත උඩඟු වී නම්, එවිට ධම්මවිචය විරිය – පීති – සම්බොජ්ඣඟ නොවැඩිය යුතු ය. මෙකී ධර්ම වැඩීමෙන් සිතේ උඩඟුබව සංසිඳුවනු නොහැක්කේ ය. උඩඟුබව සංසිඳ වන්නට නම් වැඩිය යුත්තේ පස්සද්ධි – සමාධි උපෙක්ඛා යන සම්බොජ්ඣඟ තුනය. සිත ඇකිලී ගිය කල්හි ධම්මවිචය–විරිය–පීති සම්බොජ්ඣඟ වැඩිය යුතු ය. පස්සද්ධි–සමාධි–උපෙක්ඛා සම්බොජ්ඣඟ නොවැඩිය යුතු ය. මේ කියූ ලෙසින් සිතට නිග්‍රහ කළ යුත්තේ. එය පහසු වැඩෙක් නොවේ. 'දුන්නිග්ගහස්ස' යන්නෙන් වදාළේ එය අපහසුබව ය.

ලහුනෝ = වහා ඉපිද වහා නැසෙන සුලු.

සිත, ඉපැදීම-සිටීම-නැසීම යන අවස්ථා තුනකින් යුක්ත ය. මෙසේ වූ සිත මොහොතක් තුළ දී **කෙතෙක්වර** ඉපිද නැසෙන්–**නේ ද**' යි කීමට පිළිවන් **සමතෙක්** නැත. **'නාහං භික්ඛවේ! අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යං එවං ලහුපරිවත්තං, යථයිදං චිත්තං'** යනු දෙශනා ය. මේ චිත්තපරිවර්තනයෙහි ලා උපමා දැක්වීම් ත් අපහසුබව ය, බුදුරජාණන් වහන්සේ වදාළේ. මෙන්න ඒ බුද්ධවචනය:- **'යාවඤ්ඤිදං භික්ඛවේ! උපමාපි න සුකරා යාව ලහුපරිවත්තං චිත්තං'** යනු.

සවාමීනි! නාගසේනයන් වහන්ස! එක් අසුරුසණකට ගත වන කාලය තුළ පවත්නා චිත්තසංස්කාරයෝ යම් ලෙසකින් රූප වත් වෙත් නම්, කොපමණ මහත් රාශියක් වෙත් ද' යි මිලිඳුරජු විසින් නාගසේන ස්ථවිරයන් වහන්සේ අතින් චිත්තපරිවර්තන යෙහි ලා ඇසූ ප්‍රශ්නයෙකි. 'විසාල් එක්සිය පණස්සත් අමුණු දෙතිඹකුත් එක් අසුරු සණක් තුළ ඉපිද නැසෙන සිත් ගණනට නොපැමිණේය යි උන්වහන්සේ පිළිතුරු දුන්හ.

යථාකාමනිපාතිනෝ = යම්ම කැමැති අරමුණෙක හෙන සුලු වූ. වැටෙන සුලු වූ.

'එතං හි ලභිතබ්බට්ඨානං වා අලභිතබ්බට්ඨානං වා යුත්ත-ට්ඨානං වා අයුත්තට්ඨානං වා න ජානාති, නෙව ජානිං ඔලෝ-කෙති, න ඔලොකනං, න වංසං, යත්ථ යත්ථ ඉච්ඡකි තත්ථ තත්ථෙව නිපතති ති යථාකාමනිපාති ති වුච්චති' යනු අටුවා ය. මේ සිත ලැබිය හැකි වූ ද නොලැබිය හැකි වූ ද යුතු වූ ද අයුතු වූ ද කිසිවක් නොදනියි. ජානිගොත්‍ර කිසිවක් නොලබයි. **කොයි** යම් අරමුණක් නමුත් තමාට ප්‍රිය වේ නම්, එහි වැටෙන්නේ ය, යනු ඒ පාලිප්‍රදෙශයෙහි කෙටි තේරුම ය.

ඒ එසේම ය. සිත කිසිවක් සොයා බලන්නෙක් නො වේ. ඒ ඉතා පැහැදිලි ය. අන්‍යයන් විසින් නින්දා කරණ ලද්දක් වුවත් තමහට ප්‍රිය නම්, සිත එහි එල්බෙන්නේ ය. තා විසින් පිළිගණු ලබන අරමුණ අන්‍යයන් විසින් නින්දා කරණ ලද්දෙක, නො ද පිළිගත්තෙක, තාගේ ජාතිගොත්‍රයන් හා නො ගැළපෙන්නෙකැ යි කා විසිනුත් නො වැළකියැකි ය. තමහට රුචි නම්, කවුරුන් කුමක් කියුව ද පිළිගන්නේ ය. මෙයට මහාජනයාගෙන් ලැබිය හැකි සාධක අපමණ ය.

චිත්තස්ස දමථො සාධු = සිතේ දැමීම යහපත් ය.

නත් අරමුණු කරා යන්නට නො දී හිතකර වූ එක් අරමුණෙක පිහිටුවා චතුර්විධ ආර්‍යමාර්ගයෙන් සිතෙහි ඇතිතාක් කෙලෙස් මුලුසුන් කොට නැසීම, සිත කෙලෙසුන්ගෙන් මුළුමනින් ඈත්කර ගැණීම චිත්තදමන ය යි දත යුතුය.

සාධු' යනු යහපත් ය, යන අරුත් ඇත්තේ ය. සාධුශබ්දය **'සාධුකං සුණොම මනසි කරොම'** යනාදි තන්හි දළහීකර්‍ම-යෙහි වැටේ. **'සාධු භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙති'** යනාදි තන්හි ආයාචනයෙහි වැටේ. **'සාධු භන්තෙති ඛො තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා'** යනාදි තන්හි පිළිගැණීමෙහි ආයේ ය. **'අසාධුං සාධුනා දමෙ'** යනාදි තන්හි සජ්ජනයා කෙරෙහි ආයේ ය. **'සාධු සාධු සාරි-පුත්තො'** යනාදි තන්හි සම්පහංසනයෙහි ආයේ ය. **'සාධු ධම්ම රුචි රාජා සාධු පඤ්ඤාණවා නරො සාධු මිත්තානමඤ්ඤුඛොහා පාපානං අකරණං සුඛං'** යනාදි තන්හි සුන්දරයෙහි ආයේ ය මෙහි ද සුන්දරාර්ථයෙහි වැටේ. එහෙයිනි කීයේ 'සියලු කෙලෙස් නැසීම යහපත්'යි.

චිත්තං දන්තං සුඛාවහං = දැමූ සිත සුව එළ වන්නේ ය.

චිත්තදමනය යහපත් යි කීයේ මේ නිසා ය. චතුර්විධආර්‍ය මාර්ගයෙන් සියලු කෙලෙස් නසා සිත දමනය කරණ ලද්දේ නම් ඒ මේ දමනය කළ සිත, එකාන්තයෙන් මග පල සුව හා නිවන් සුව එළ වන්නේ ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි පැමිණි පිරිසෙන් බොහෝ දෙන සෝවන්පලාදියට පැමිණියාහු ය. ධර්මදෙශනාව මහජනයා-හට වැඩ සහිත වූ ය.

භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ඒ භික්ෂුනමට මෙසේ අවවාද කොට 'මහණ! යව, අන් කිසිත් ගැණ නො සිතා එහි ම

වසන්නැ'යි පිටත් කොට යැවූසේක. ඔහු ද බුදුරජුන් වෙනින් ලත් අවසර ඇති ව එහි ගොස් පිටත්හි වූ කිසි ත් ගැණ නො සිතා එහි විසි ය. උපාසිකා තොමෝ දිවැසින් බලා 'මාගේ පුත් අවවාද දෙන ඇදුරකු ලබා නැවැත ආයේ ය'යි දැන ඔහුට හිතකර වූ ආහාර පාන පිළියෙල කොට දුන්නී ය. මහණ තෙමේ හිතකර වූ ආහාරපාන වළඳ, මහණදම් කරන්නේ කිප දිනකින් ම රහත් ව මගපලසුවයෙන් දවස් යවන්නේ 'මහාඋපාසිකාව මට පිහිට වූ ය, මම මේ මැනියත් නිසා සසරදුකින් මිදුනෙමි'යි සිතා, නැවැත 'මෝ මට මේ අත්බවේදී පිහිට වූවා සැබෑ ය, සසර අනික් අත් බව්හිදී ත් පිහිට වූවා ද නො වූවා දැ' යි සලකන්නේ එකුන් සියයක් අත්බව් සිහිපත් කෙළේ ය. මේ උපාසිකාව එකුන් සියයක් අත්බවිහි තමාට බිරිය වූවා පරපුරුෂයන් කෙරෙහි තදින් ලොල් ව තමන් ජීවිතයෙන් තොර කළබව පෙණී ගියේ ය. සථවිර තෙමේ, මෙතෙක් අගුණරාසිය දැක 'මේ උපාසිකා තොමෝ අති සාහසිකකාමීයක් කළා ය' යි සිතුයේ ය. උපාසිකාව ගෙයි හුන්නී ම 'කිමැ මුළුමනින් මා පුතුගේ පැවිදිකිස මුදුන් පැමිණියේ දැ' යි විමසා බලන්නී ඔහු රහත්බවට පැමිණිබව දැන නැවැත ත් විමසා බලන්නී, 'මාගේ පුත් තෙමේ, මේ උපාසිකාව මට දැන් පිහිට වූවා ය, මෝ පෙර ත් මට පිහිට වූවා ද නො වූවා දැ'යි විමසමින් එකුන් සියයක් අත්බව් සිහිපත් කෙළේ ය, එහි ද මා එකුන් සියයක් අත් බව්හි දී මොහුගේ බිරිය බවට පත් ව පරපුරුෂයන් හා එකතු ව මොහුගේ ජීවිතය නැසුබව දැක, උපාසිකාව විසින් අතිසාහසික කාමීයක් කරණ ලදැ යි සිතුයේ ය, වේවා, සසර සැරි සරන මා විසින් මාගේ පුත්‍රයාට උපකාරයක් කළ විරූ දැ' යි විමසුවා ය. එහිදී ඕ තොමෝ නැවැත ත් සියක්වන අත්බව සිහිපත් කළා ය. ඒ සියක් වන අත්බවේදී මොහුට බිරිය වූ තමන් විසින් එක් ජීවිත විනාශයකා දී තමජීවිතය මොහුට පිදූ බව දුටුවා ය. එවිට 'මා විසින් මා පුතුට මහත් උපකාරයක් කරණ ලදැ' යි හෙයි හුන්නී ම, 'තවත් එහාට පොඩ්ඩක් විමසා බලනු මැනැවැ' කිවු ය. සථවිර තෙමේ, දිව කණින් එය අසා සියක්වන අත්බව සිහිපත් කොට ඒ අත්බවේදී ඇය තමන්ට දිවි පිදූ බව දැන 'අරුමයෙකි, මේ උපාසිකාව විසින් මට මහත් උපකාරයක් කළ විරූ ය' යි තුටු සිත් ඇත්තේ ඇයට එහිදී ම සිවුමගපල පිළිබඳ කරුණු කියා දී අනුපාදිශෙෂනිර්‍වාණධාතුවෙන් පිරිනිවියේ ය.

අන්‍යතරභික්ෂුවස්තුව නිමි.

සසුනෙහි නො ඇලුනු මහණෙක්

3 — 3

එක් කලෙක බුදුරජානන් වහන්සේ, සැවැත්නුවර ජෙතවන මහාවිහාරයෙහි වැඩ වසන සේක. එ කල්හි එ නුවර වැසි එක් සිටුපුත්‍රයෙක් තමන්ගේ හිතවත් තෙර නමක් කරා ගොස් 'සවාමීනි! මම දුකින් මිදෙනු කැමැත්තෙමි, එ හෙයින් මට දුකින් මිදෙන්නට සැටියක් කියනු මැනැවැ'යි දන්වා සිටියේ ය. 'හා හොඳ යි, දුකින් මිදෙනු කැමැත්තෙහි නම්, ලහබන් දෙව, පක්ෂයකට වරක් බැගින් දෙන බත් දෙව, වැසි කාලයෙහි දෙන බත් දෙව, සිවුරු පිරිකර දෙව, තමන්ගේ ධනය කොටස් තුනකට බෙදා එයින් එක් කොටසක් කර්‍මාන්ත දියුණුව පිණිස යොදා එක් කොටසකින් අඹු දරුවන් රකුව, එක් කොටසක් බුදුසසුනෙහි දියුණුවට යොදව' යි ඒ තෙරුන් මෙසේ කී කල්හි, හෙ තෙමේ 'ඉතා යහපතැ' යි කියූ ලෙසින් සියල්ල කොට නැවැත දවසෙක තෙරුන් වෙත ගියේ ය. ගොස් 'සවාමීනි! දැන් ඉතින් මා විසින් කුමක් කළයුතු දැ' යි ඇසී ය. 'උපාසකය! සරණසීලයෙහි පිහිටා පන්සිල් සමාදන් ව ඒ මැනැවින් රැකිය යුතු' යි සථවිර තෙමේ කී ය. උපාසකයා එසේ ත් කොට නැවැතත් තෙරුන් වෙත ගොස් 'සවාමීනි! ඒ කී සැටි කෙළෙමි, දැන් කුමක් කළ යුතු දැ'යි ඇසී ය. ඒ වර දස සිල් රකින්නට කීයේ ය. ඔහු දසසිල් රැක නැවැත තෙරුන් වෙත ගොස් දසසිල් රැකිය බව කියා නැවැත කුමක් කළ යුතු ද, ඉදිරියෙහි කළ යුතු තවත් යමක් වේ දැ' යි ඇසූයේ ය. එවිට සථවිර තෙමේ, ඔහුට පැවිදිවන්නට කී ය. ඒ වචනයෙන් ඔහු පැවිදි විය. එහි දී එක් ආභිධර්මිකනිඝ්‍රුවක් ඔහුට ආචාර්‍යය් වූයේ ය. විනයධරනිඝ්‍රුවක් උපාධ්‍යාය වූයේ ය. ලැබූ උපසමපදා ඇති ඒ නවක භික්ෂුවට ආභිධර්මිකාචාර්‍යය් තෙමේ තමන් වෙත පැමිණි විට අභිධර්මයෙහි ග්‍රන්ථාරූඪ පිළිබඳ ප්‍රශ්නයන් උගන්වයි. විනයාචාර්‍යය් තෙමේ 'බුදුසසුනෙහි පැවිදි බව ලැබූවහු විසින් මේ දේ කළ යුතු ය, මේ දේ නො කළ යුතු ය, මේ දේ කැප ය, මේ දේ නො කැප ය' යි ඔහුට විනයධර්‍මය උගන්වයි. මෙසේ ඉගෙණ ගත්තා වූ ඒ භික්ෂු තෙමේ, 'මේ වැඩේ ඉතා බැරුරුම් ය, මා සිතා සිටියා සේ නො වේ, මම දුකින් මිදෙනු කැමැති ව පැවිදි වීමි, එහෙත් විනය දහම් ලෙසින් මෙහි අත දිගු කිරීමට තැනක් පමණකු දු නැත, මෙසේ නම් ගෙදර ඉඳ ම දුකින් මිදෙන්නට හැකි ය, එහෙයින් සිවුරු හැර ගිහි වන්නෙමි'යි සිතා එ තැන් පටන් සසුනෙහි කළකිරී වත්තිංසාකාරය සඤ්ඤායනා නො කෙරෙයි. ඉගෙණීම නො කෙරෙයි. ශරීරය වැරුණේ ය.

නගර ඉල්පී සිටියේ ය. අලඝකම්න් වැඩුනේ ය. සිරුර කසන්නට පටන් ගත්තේ ය. සිටි තැන ම සිටියේ ය. හුන් තැනම හුන්නේ ය. ඒ දුටු හෙරණපැවිද්දෝ 'ඇවත! මොක ද සිටි තැන ම සිටින් නෙහි, හුන් තැන ම හිඳින්නෙහි, සිරුර සුදු මැලි වෙලා, වැරැණේ පැහැය නො පැහැය වූයේ, නිතර කසන්නෙහි, කුමක් හෙයින් ද, තා විසින් කුමක් කරණ ලද දැ' යි ඇසූහ. 'ඇවැත්නි! සසුනෙහි ඇලුම් නැත, සසුනෙහි කලකිරුණේ වෙමි' යි ඔහු කී විට සාමණේරයෝ 'කුමක් නිසා එසේ වූයෙහි දැ' යි අසා දැන ගෙණ ඒ බව ඔහුගේ ආචාර්යෝපාධ්‍යායයන්ට දන්වා සිටියාහු ය. ඔවුහු එවේලෙහි තම ශිෂ්‍යයා බුදුරජුන් ඉදිරියට ගෙණ යියහ. උන් වහන්සේ ඒ භික්ෂූන් අතින් 'මහණෙනි! තමුසේලා මේ වේලෙහි කුමක් නිසා මෙහි ආවහු දැ' යි අසා වදාළ විට 'සවාමීනි! මේ නම සසුනෙහි කලකිරී සිටි' යි දන්වා සිටියාහු ය. එවිට බුදුරජානන් වහන්සේ 'සැබෑ ද මහණ!' යි ඇසූහ. ඔහු 'එසේ ය' යි පිළිතුරු දින. 'කුමක් නිසා කලකිරුණෙහි දැ' යි නැවැත ඇසූ විට 'සවාමීනි! මම දුකින් මිදෙනු කැමැති ව පැවිදි වීමි, මට ආචාර්‍යයන් වහන්සේ අභිධර්මය උගන්වත්, උපාධ්‍යායයන් වහන්සේ විනයධර්මය උගන්වත්. ඒ ඉගෙණ ගන්නා වූ මට මෙහි බුදුසසුනෙහි අත දිගුකිරීමට පමණකු ත් ඉඩ නැත්තේ නො වේ දැ යි සිත් විය; ගිහි ව ද දුකින් මිදෙන්නට හැකි බැවින් සිවුරු හැර යෑමට ඉටා ගත්තෙමි' යි කීයේ ය. එ කල බුදුරජානන් වහන්සේ 'මහණ! තාගේ සිත රැකිය හැකි දැ' යි ඇසූහ. 'එහෙයි, සවාමීනි!' යි ඔහු පිළිතුරු දින. ඉක්බිති බුදුරජානන් වහන්සේ 'එසේ නම්, ඔය නම තමන්ගේ සිත පමණක් රැක ගන්නැ' යි අවවාද කොට මේ ගාථාධර්මය දෙසනා කළ සේක:-

**සුදුද්දසං සුනිපුණං යථාකාමනිපාතිනං*
චිත්තං රක්ඛේථ මෙධාවී චිත්තං ගුත්තං සුඛාවහන්ති.**

දුක්මට ඉතාඅපහසු වූ නො හැකි වූ ඉතා ම සියුම් වූ කැමැති යම් ම අරමුණෙක හෙනසුලු වූ සිත, නුවණැත්තේ රකින්නේ ය. සිත රක්නා ලද්දේ සුව එළවන්නේ ය.

සුදුද්දසං = දක්නට ඉතාඅපහසු වූ නො පිළිවන් වූ.

සිත අරූපීධර්මයෙකි. එහෙයින් එය ඇසින් නො දුක්ක හැකි ය.

සුනිපුණං = ඉතා සියුම් වූ.

යථාකාමනිපාතිනං = යම් ම කැමැති අරමුණෙක හෙන සුලු වූ[1] වැටෙන සුළු වූ.

---

* 'යත්ථ කාම නිපාතිනං' බොහෝ පොත්හි.

1. 2. 3. 'යථාකාමනිපාතිනං' යනු බලනු.

චිත්තං රක්ඛෙථ මෙධාවී = නුවණැත්තේ සිත රකින්නේ ය.[1]

සකඤ්ඤ – ධාතු – ආයතනයන්ගේ නො සිඳ පැවැත්මැ යි ගණු ලබන සසර ගැණ කිසිත් නො දත් අඥපුද්ගල තෙමේ තමන්ගේ සිත රැකුමෙහි අපොහොසත් ය. ඔහු චිත්තවශී ව සිතට යටත් ව විපතට වැටෙන්නේ ය. ප්‍රාඥපුද්ගල තෙමේ, චිත්තවශී ව විපතට වැටෙන අඥයා මෙන් නො ව සිත නොයෙක් අරමුණුවල විසිර යන්නට ඉඩ නො දී නිදොස් වූ එක් අරමුණෙක පිහිටුවා මැනැවින් රකින්නේ ය.

චිත්තං ගුත්තං සුඛාවහං = සිත රක්නා ලද්දේ සුව එළවන්නේ ය.

ඒ ඒ තැනැ විසිර යන්නා වූ සිත එසේ යන්නට ඉඩ නො දී හිත වූ එක් අරමුණෙක පිහිටුවා සිහිය යොදා රක්නා ලද්දේ මගපල සුව හා නිවන්සුව එළ වන්නේ ය.

දෙශනාවගේ අවසානයෙහි ඒ මහණ තෙමේ සෝවන් වූයේ ය. එහි සිටි අන් බොහෝ දෙන ද සෝවන්පලාදිය ලැබුවෝ වූහ. දෙශනාව මහාජනයාට වැඩ සහිතවූ ය.

අන්‍යතරඋත්කණ්ඨිතභික්ෂුවසතුව නිමි.

---

1. 2. 3. 'මෙධාවි' යනු බලනු

භාගිනෙය්‍යසඞ්ඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේ

3 – 4

සැවැත්නුවර වැසි සැදැහැවත් එක් කුලපුත්‍රයෙක් බුදුරජානන් වහන්සේ වෙත පැමිණ බණ අසා පැවිදි ව ලැබූ උපසම්පදා ඇත්තේ සඞ්ඝරක්ඛිත ස්ථවිරැ යි ප්‍රසිද්ධ වූයේ, කිහිප දිනකට පසු රහත් බවට ද පැමිණියේ ය. සඞ්ඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේගේ මලනු තෙමේ තම පුතුට සඞ්ඝරක්ඛිත යි නම් කළේ ය. හෙ තෙමේ භාගිනෙය්‍යසඞ්ඝ රක්ඛිත යි ප්‍රසිද්ධ වූයේ ය. සුදුසු වයසෙහි දී ඔහු තෙරුන් වෙතට පැමිණ පැවිදි උපසපන් බව් ලබා ගෙණ එක්තරා ගමෙක වූ වෙහෙරක වස් වසනු පිණිස ගියේ ය. එහි දී ඔහුට වස් කෙළවර සත් රියන් පමණ වූ ත් අට රියන් පමණ වූ ත් වැසිසළු දෙකක් ලැබුනේ ය. 'අට රියන් පමණ වූ රෙදිකඩ උපාඩ්‍යායයන් වහන්සේට දෙන්නෙමි, සත් රියන් රෙදි කඩ මාගේ ප්‍රයොජනයට ගන්නෙමි'යි සිතා වස් පවරා උපාඩ්‍යායයන් දකින්නට එන්නේ, අතර මග දී පිඬු සිඟා ගෙණ තෙරුන් විහාරයට පැමිණෙන්නට කලින් ම වෙහෙරට ගියේ ය. එහි දී තෙරුන් දැවල වැඩ හිඳින තැන හැමද පිරිසිදු කොට පාදෝනා දිය එළවා තබා අසුනකු ත් පණවා තෙරුන් එන මග බලා සිටියේ ය. ලඟ එන්නා වූ තෙරුන් දැක ඉදිරියට ගොස් පාසිවුරු පිළිගෙණ 'ස්වාමීනි! වැඩ හිඳිනු මැනැවැ'යි තෙරුන් වඩා හිඳුවා තල්වැට ගෙණ පවන් සලා පා සෝදා රෙදිකඩ ගෙණවුත් තෙරුන්ගේ පාමුල්හි තබා මෙය පිළිගෙණ වදාරා පරිභොග කරණු මැනැවැ'යි පවන් සල සලා සිටියේය.

සඞ්ඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේ ඔහුට 'සඞ්ඝරක්ඛිත ය! මට ඇඳීමට පෙරවීමට තුන් සිවුරු තිබේ, මෙය තමුසේ ම ප්‍රයොජන ගණුව'යි කීහ. 'ස්වාමීනි! මෙය ලැබූ දා ම හාමුදුරුවන් වහන්සේට ම දෙන්නෙමි' යි මා නියම කර ගන්නා ලද්දේ ය, එහෙයින් මෙය පරිභොග කරණු මැනැවැ' යි නැවැත ද ඉල්ලා සිටියේ ය. 'සඞ්ඝරක්ඛිත! තමුසේගේ අදහස් එසේ විය හැකි ය, මට තුන් සිවුර ම තිබේ, මෙය තෝ ම ප්‍රයොජන ගණුව' යි මහතෙරුන් වහන්සේ එවර ද කීහ. 'ස්වාමීනි, එසේ නො කළ මැනැව, හාමුදුරුවන් වහන්සේ මෙය ප්‍රයොජනයට ගන්නා විට මට මහත් ඵලයෙක් වන්නේ ය, එහෙයින් පිළිගත මැනැවැ' යි භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත ස්ථවිර තෙමේ නැවැත නැවැත ත් ඉල්ලා සිටියේ ය. එහෙත් මහතෙරුන් වහන්සේ ඒ පිළිගැණීමට සතුටු නො වූහ. තෙරුන්ට පවන් සලමින් සිටි භාගිනෙය්‍ය

සඞ්ඝරක්ඛිත සථවිර තෙමේ 'මම ගිහිනැකමින් තෙරුන්ගේ බැනනු වෙමි, දුන් අතැවැසි වෙමි, එහෙත් මුත්වහන්සේ මා හා එකතු වන්නට නො කැමැති සේක, මා අයත් දෙය ප්‍රයොජන ගැණීමට නො කැමැති සේක, මා අයත් දෙය ප්‍රයොජන ගන්නට නො කැමැති ය, එසේ මුත්වහන්සේ මා අයත් දෙය ප්‍රයොජනයට ගන්නට නො කැමැති සේක් නම්, මට මේ මහණකමින් ඇති ප්‍රයොජනය කුමක් ද, සිවුරු හරින්නෙමි' යි සිතා නැවැත 'ගිහිගෙය ඉතා දුකින් නගා තැබිය යුත්තකි, එහි කම්කටොලු ඉතා බොහෝ ය, එහෙයින් ගිහි ව කෙසේ ජීවත් වන්නෙම් දැ' යි සිතී ය. ඒ හා ම ඔහු 'අට රියන් පමණ වූ මේ රෙදිකඩ විකොට එළුදෙනක ගන්නෙමි, ඒ එළුදෙන වැදූ විට එළුපැටවුන් හදා වඩා විකොට මුදල් රැස් කරන්නෙමි, මුදල් රැස් කොට අඹුවක ගෙණෙන්නෙමි, ඇ පුතකු වැදූ කල ඔහුට මාගේ මාමාගේ නම තබා කුඩාකරත්තයක් සාදා පුතා හා අඹුව එහි නංවා ගෙණ මාමා බැහැ දකින්නට එන්නෙමි, එන ගමනේ අතර මග දී 'පුතා ගෙණ එව, මම වඩා ගන්නෙමි'යි අඹුවට කියන්නෙමි, එවිට ඇ 'පුතුගෙන් ඇති ප්‍රයොජනය කුමක් ද, කරත්තය දක්කව' යි මට කියා පුතු වඩා ගෙණ යන්නී ය, වඩා ගෙණ යනු නො හැකි වූ කල්හි කරත්තපාරෙහි පුතු හෙළන්නී ය, එවිට කරත්තරෝදය පුතුගේ ඇඟ උඹිත් යන්නේ ය, තී මට පුතු වඩා ගෙණ යන්නට නො දී කරත්තපාරෙහි හෙළා මා නැසුවා ය, යි කෙවිටෙන් ඇගේ හිසට ගසන්නෙමි' යි සිතන්නේ පවන් සලමින් ම තෙරුන්ගේ හිසට තල්වැටෙන් ගැසුවේ ය, තෙරුන් වහන්සේ 'සඞ්ඝරක්ඛිත තෙමේ මා හිසට ගැසූයේ කුමක් නිසා දැ' යි විමසන්නෝ ඔහු සිතූ සියල්ල දුන 'සඞ්ඝරක්ඛිත! බිරියට ගසනු නො හැකි හෙයින් ද මා හිසට ගැසුයෙහි මේ මහලු තෙරුන්ගේ අතැ ඇති වරද කිමැ' යි ඇසූහ. ඉක්බිති හෙතෙමේ 'මට වූයේ මහවරදෙකි, මහවිපතකි, උපාඛ්‍යායන් වහන්සේ මා සිතූ සියල්ල දත් සේක, මට මහණ කමින් වැඩෙක් නැතැ'යි තල්වැට දමා පැන ගියේ ය.

පැන දුවන ඔහු අල්ලා ගත් භික්ෂූන් වහන්සේලා ඔහු බුදුරජුන් වෙතට ඇද ගෙණ ගියහ. බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූන් දැක 'මහණෙනි! තමුසේලා කුමක් නිසා මෙහි ආවහු ද, තොප විසින් භික්ෂුනමක් මෙහි පමුණු වන ලද්දේ කුමක් නිසා දැ' යි ඇසූහ. 'සවාමීනි! මේ මහණ කළකිරී පැන යන්නේ අප විසින් අල්ලා ගන්නා ලදු ව ඔබ වහන්සේ වෙතට ගෙණ ආවෙමු' යි

ඒ භික්ෂූන් කී කල්හි 'මහණෙනි! එසේද' යි නැවැත අසා වදාළ සේක. 'සවාමීනි! එසේ ය' යි ඒ භික්ෂූහු දන්වූහ. එවිට බුදුරජානන් වහන්සේ 'තා විසින් මෙබඳු සාහසිකකමීයක් වැරදි වැඩෙක් කරණ ලද්දේ කුමක් නිසා ද, තෝ එක් බුදු කෙනකුන්ගේ සසුනෙහි පැවිදි වූයේ නො වෙහි ද, එසේ පැවිදිව ද සෙදගැමි මගට පැමිණියෙකැ යි හෝ අනගැම්මගට පැමිණියෙකැ යි හෝ රහත්මගට පැමිණියෙකැ යි හෝ කියවා ගැන්මෙහි අසමර්ථ වූ යෙහි ය, කුමක් නිසා මෙබඳු බැරැරුම් වැරදි වැඩක් කෙළෙහිදැ' යි විවාළ සේක. භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත සඵවිර තෙමේ 'සවාමීනි! මම කළකිරුනේ වෙමි' යි කී ය. 'කුමක් හෙයින් කළකිරුණෙහිදැ' යි ඇසූ කල්හි වැසිසළු ලත් ද පටන් තෙරුන්ට තල්වැටින් ගැසීම දක්වා සිදු වූ සියලු තොරතුරු කියා 'මම මේ නිසා පැන ගියෙමි' යි දන්වා සිටියේ ය. බුදුරජානන් වහන්සේ 'සඞ්ඝරක්ඛිත! තෝ කිසි ත්, නො සිතව, සිත වනාහි ඉතා ඈත්හි වූ ද අරමුණු පිළිගන්නා සැහැවි ඇත්තෙකි, එහෙයින් රාගවෙෂමොහ බන්ධනයෙන් මිදෙන්නට මහන්සි දරව' යි වදාරා මේ ධම්දෙසනාව කළ සේක:-

දූරඞගමං එකචරං අසරීරං ගුහාසයං,
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්තිමාරබන්ධනා.

දුර යන්නා වූ ද මේ සිත, යම් කෙනෙක් සංවරයෙහි පිහිටුවත් ද, ඔවුහු තුමූ මාරබන්ධනයෙන් මිදෙන්නාහු ය.

දූරඞගමං = දුර යන්නා වූ.

සිත නම්, කෙස්අඟක් පමණ වූ තැන් ද පෙරදිග් ආදියෙහි ගමන් නො කෙරෙයි. එහෙත් මෙයින් වදාළේ, පාත අජටාකාශය පටන් උඩ අජටාකාශය දක්වා මේ අතර ඉතා දුර වූත් අරමුණු පිළිගන්නේ ය, යනු යි. එහෙයින් ම සිත 'දූරඞගම' නම් වේ. සිත ඉතාදුර වූ ඇස් කන් නාස් ආදියෙහි හැපෙන්නා වූ නත් වැදෑරුම් අරමුණු පිළිගන්නා බවට මේ කතාපුවත ම නිදසුන් ය.

'චිත්තස්ස හි මක්කටසුත්තමත්තකම්පි පුරත්ථිමාදිදිසාභාගෙන ගමනං නාම නත්ථි, දූරෙ සන්තම්පි පන ආරම්මණං සම්පටිච්ඡතී ති දූරඞගමං නාම ජාතං' යනු අටුවා ය.

එකචරං = එකචර වූ. එකලා ව ම පවත්නා වූ. තනි ව හැසිරෙන්නා වූ.

මේ සිත කර්ණිකාවක් බැන්ද සේ එකවිට දෙතුන් සිතක් නො ඉපිද එක් සිතක් ඉපිද නිරුද්ධ වූ කල්හි ම අනික් සිතක් උපදින බැවින් 'එකචර' නම් වී ය.

'සත්තසන්තානානි පන එකතෝ කණ්ණිකබද්ධානි එකක්ඛණෙ උප්පජ්ජිතුං සමත්ථානි නාම නත්ථි, උප්පත්තික්ඛණෙ එකමෙව චිත්තං උප්පජ්ජති, තස්මිං නිරුද්ධෙ පුන එකෙකමෙව උප්පජ්ජති, තස්මා එකචරං නාම ජාතං' යනු අටුවා ය.

අසරීරං = සිරුරක් නැත්තා වූ.

'චිත්තස්ස සරීරසණ්ඨානං වා නීලාදිපකාරෙ වණ්ණභෙදෙ වා නත්ථි ති අසරීරං'

සිතෙහි සිරුරු සටහනෙක් නැත. නීලපීතාදී වූ පැහැයකුත් නැත. පැහැසටහන් රූපිධර්මයන් කෙරෙහි ම පිහිටන්නේ ය. සිත අරූපිධර්මී බැවින් ඒ කිසිත් නො පිහිටයි. එහෙයින් සිත 'අසරීර' නම් වේ.

ගුහාසයං = ගුහාවක නිදන්නා වූ. ගුහායෙහි පවත්නා වූ.

හෘදයවස්තුව මෙහි ගුහා නම් වේ. එය සිරුර තුළ දෙතන මැද පිහිටියේ ය. පැහැය විසින් රත්පියුම්පෙත්තේ පිටපැත්තෙහි පැහැයට බදු පැහැ ඇත්තේ ය. සටහන් විසින් පිට පෙති හැර යටිකුරු කොට තැබූ නෙළුම් මොට්ටුවකට බදු සටහන් ඇත්තේ ය පිටත හොඳට මට්ටම් ය. ඇතුළත වැටකොළඟෙඩියක ඇතුළතට සමාන ය. නුවණැත්තන්ගේ ඒ මේ හදවත විකශිත ය. මඳ නුවණැත්තන්ගේ මුකුලිත ය. හැකුළුනේ ය. එහි තුළ දෙඹ ඇටයක් පිහිටු වන තැන් පමණ වූ වළක් ඇත්තේ ය. එහි අඩපතක් පමණ ලේ ඇත්තේ ය. රාගචරිතයන්ගේ හදවත තුළ පවත්නා ඒ ලේ රත් පැහැය ගත්තේ ය. දෝෂචරිතයන්ගේ කළු පැහැය ගත්තේ ය. මොහචරිතයන්ගේ මස් සේදූ දිය වැනි වේ. විතර්කචරිතයන්ගේ කොල්ලු තම්බා ගත් දිය වැනි වේ. ශ්‍රද්ධාචරිතයන්ගේ කිණිහිරිමල්පැහැය වැනි වේ. ප්‍රඥාචරිතයන්ගේ ඉතා පහත් වේ. මෙසේ ඒ ඒ පුද්ගලයන්ගේ චරිත වශයෙන් නන් පැහැයෙන් යුත් ලේ ඇසුරු කොට සිතේ පැවැත්ම වන්නේ ය. එහෙයින් සිත 'ගුහාසය' නම් වී ය.

දූරඬගමං, එකචරං, අසරීරං, ගුහසයං යන මේ පද සතර මෙහි සිටියේ චිත්තං' යනු වෙසෙසා ය.

යෙ = යම් කෙනෙක්.

මෙයින් සත්‍රී පුරුෂ ගෘහස්ථ ප්‍රව්‍රජිතාදී වූ සියල්ලෝ ම ගැණෙති.

සඤ්ඤමං එස්සන්ති = සංවරයෙහි පිහිටුවත් ද.

නොඋපන් කෙලෙසුන් නොඋපදවා ප්‍රමාදහෙතුවෙන් උපන් කෙලෙසුන් දුරු කරමින් සිත සංවරයට පමුණුවත් ද, යනු ය මෙයින් කියූයේ. මෙහි දැක්වෙන ය ශබ්දය ත ශබ්දය අපෙක්ෂා කරණ බැවින් ඒ දක්වන්නට සිංහලයෙහි දී පමුණුවත් ද යි ද කාරය යොදන ලද්දේ ය. නොඋපන් කෙලෙස් නොඋපදවා යම්කිසි ප්‍රමාදයකින් උපන් කෙලෙස් වෙත් නම්, ඔවුන් දුරු කරමින් නන්වැදූරුම් අරමුණු කරා සිතට යන්නට ඉඩ නොදී එයින් සිත රැකුම 'සඤ්ඤම' නම්.

මොක්ඛනති මාරබන්ධනා = මාරබන්ධනයෙන් මිදෙන්නාහ.

සිත සංවරයෙහි පිහිට වූ සත්‍රිපුරුෂාදී වූ සියල්ලෝම මාර-බන්ධනයෙන් මිදෙත් යි වදාළ සේක. කාමාවචර - කෙලසාවචර විපාකාවචර යන තෙභූමකාවචර 'මාරබන්ධන' නම්. මාරඩෙය්‍යං' යන්නට කළ පරිකථාව බලනු.

'යෙ කෙචි පුරිසා වා ඉත්ථියො වා ගහට්ඨා වා පබ්බජිතා වා අනුප්පජ්ජනකස්ස කිලෙසස්ස උප්පජ්ජිතුං අදෙනතා සති සමෙමාහෙන උප්පන්නං කිලෙසං පජහනතා චිත්තං සඤ්ඤමෙස්සන්ති, සංයතං අච්කන්තිතං කරිස්සන්ති, සබ්බ තෙ කිලෙසබන්ධනාභාවෙන මාරබන්ධනසඞ්ඛාතා තෙභූමකවට්ටා මුච්චිස්සන්ති, යන අටුවා ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි භාගිනෙය්‍යසඞ්ඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේ සෝවන් වූහ. පැමිණ සිටි අන් බොහෝ දෙන ද සෝවන් ඵලාදියට පැමිණියෝ ය. ධර්මදෙශනාව මහා ජනයාට වැඩ සහිත වූ ය.

භාගිනෙය්‍යසඞ්ඝරක්ඛිතස්ථවිරවත්ථුව නිමි.

චිත්තහත්ථස්ථවිරයන් වහන්සේ

3 — 5

සැවැත්නුවරු වැසි එක් කුලපුත්‍රයෙක් ගාලෙන් පලා ගිය ගොනකු සොයමින් වනයට ගියේ ය. එහි පෙරවරුයෙහි තැන තැන සොයා ඇවිද ඉරමුදුන් වේලෙහි ගොනා දැක අල්ලා බැඳ ගෙණ ඌ ගවයන් සිටි තැනට යැවී ය. තෙමේ බඩගිනි ඉවසාගත නො හැකි ව 'බත් ටිකක් කමි'යි අසල තුබූ වෙහෙරකට ගියේ ය. ගොස් භික්ෂූන් වැඳ එකත් පසෙක හුන්නේ ය. එ වේලෙහි එහි ඉඳුල් ලන බඳුනෙහි වළඳ ඉතිරි වූ බත් තුබුනේ ය.

භික්ෂූන් වහන්සේලා බඩසයින් පෙළුනු ඔහු දැක 'මේ තැටියෙහි තිබෙන බත් ගෙණ කව'යි තැටිය තුබූ තැන පෙන් වූහ. බුදුරජානන් වහන්සේගේ කාලයෙහි භික්ෂූන් වහන්සේට නොයෙක් අන්දමේ මාලුපිණ්ඩියෙන් යුත් බත් ලැබුනේ ය. ඔහු ඒ තැටියෙන් බත් ගෙණ කාලා පැන් බීලා අත් සෝදා ගෙණ භික්ෂූන් වෙත ගොස් වැඳ 'ස්වාමීනි! අද දානයට පැවරූ තැනකට වැඩියෝ දැ' යි ඇසී ය. 'නැත, අපට සැම දා ම මේ ලෙසට කෑම් බීම් ලැබේ' යි භික්ෂූන් වහන්සේලා කීහ. 'අපි රෑ දාවල මහත් ආයාසයෙන් මහත් වීර්‍යයෙන් රැකී රක්ෂා කරන්නමෝ නමුත්, කිසි දිනක හිත බඩ පුරා මේ අන්දමේ රසවත් මාලුපිණ්ඩිවලින් යුත් බතක් කන්නට මොන ලෙසකිනුත් අපට නො ලැබේ, මේ හාමුදුරුවරු දිනපතා හැම වේලේ ම මෙසේ රසට ගුණට වළඳන්නෝ ය, මම ත් මහණ වෙමි' යි සිතා භික්ෂූන් වෙත ගොස් මහණකම ඉල්ලා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා ඔහු පැවිදි කළහ. පැවිදි වූ ඔහු උපසපන්බව් ඇත්තේ, වත් පිළිවෙත් කරමින් බුදුරජුන්ට උපන් ලාභසත්කාර වළඳන්නේ, කිහිපදිනකින් ම තර බාරු සිරුරු ඇත්තේ විය. එහෙත් පිඩු සිඟා යෑම කරදරයෙකැ යි සිතූ ඔහු 'මහණකමින් වැඩෙක් නැතැ' යි ටික දිනක් හොඳට කා බී සිවුරු හැර ගියේ ය. නැවැත ගෙයි කටයුතුවලට බැසීමෙන් ඔහුගේ සිරුර වෑරී ගියේ ය. එවිට 'මේ ගිහිකමෙන් වැඩෙක් නැතැ'යි ඔහු නැවැත ද ගෙය හැර දමා පැවිදි වූයේ ය. සිරුර තරබාරු වූ සැටියේ නැවැත ත් සිවුරු හැරියේ ය. මොහු පැවිදි ව සිටින්නේ භික්ෂූන් වහන්සේලාට නොයෙක් අතින් උපකාර කරන්නේ ය. නැවැත ත් කිහිප දිනකින් වෙහෙරට ගොස් මහණකම ඉල්ලී ය. භික්ෂූහු ඒ වර ත් උපකාර පිණිස ඔහු පැවිදි කළහ. මෙසේ මෙතෙමේ ස වරක් පැවිදි ව සිවුරු හැර ගියේ ය. එහෙයින් 'මොහු චිත්ත වශික ව හැසිරේය' යි ඔහුට චිත්තහත්ථ'යි නම් කළහ. වරක් ගිහි ව වරක්

පැවිදි ව දවස් යවන මොහුගේ බිරිඳ ගර්භිනී වූ ය. දිනක් මොහු සත්වනවර වනයෙහි වැඩට යෙදූ නඟුල් ව්‍යදඬු ආදී වූ සාන උපකරණ අරගෙණ ගෙට අවුත්, ඒ උපකරණ තැන්පත් කොට තබා 'සිවුර ගන්නෙමි'යි කාමරයට ඇතුල් විය. ඒ වේලෙහි බිරිය වැතිර නිදි ගත්තා ය. ඇය ඉණ ඇදි රෙදිකඩ ද ඇයගේ සිරුරෙන් පහව තුබුනේ ය. කටදෙකොණින් කුණුකෙළ වැගුරුණේ ය. නැහයෙන් 'සුරු, සුරු' යන හඬ නික්මුනේ ය. බිරිය දුටු හැටියේ ඇය ඉදිමී ගිය මළ සිරුරක් සේ ඔහුට වැටහිනි. 'අනේ, මේ තමා අනිත්‍ය ය, මේ තමා දුක, මට මෑ නිසා පැවිදි ව සිටිනු බැරි වී ය' යි සිතන්නට වූ ඔහු සිවුරු කොණ ගෙණ බඩ බඳිමින් ම ගෙයින් නික්ම ගියේ ය. අසල ගෙයි හුන් ඔහුගේ නැන්දනී තොමෝ සිවුරු කොණ බඩ බඳිමින් යන ඔහු දැක 'මූ කුඹුරෙන් ආ හැටියේ ම ගෙයි මදකු ත් නො නැවතී සිවුරෙත් බඩ බඳිමින් වෙහෙර දිහාවට යන්නේ ය, කුමක් හෙයින් එසේ යන්නේ දෝ යි බලන්නට ගෙට ඇතුල් වූවා, නිර්‍ඝාත්‍ර ව නිදන දුව දැක මැය වැද හෙව නිදන සැටි දැක කළකිරී ගියේය' යි දැන 'කාලකණ්ණියි! නැගිට පිය, තිගේ මිනිහා නි නිදන සැටි දැක කළකිරී ගියේ ය, අද සිට තිට ඔහු නැත්තේ ය, වෙන මිනිහෙකු සොයා ගන්නට තිට සිදු වන්නේය' යි හඬ නගා කිවු ය. 'අම්මා! නිකම් ඉන්න පැත්තකට වන්න, ඔයා ටික දිනකින් ආපසු එන්නේ ය, ඔයාට මා හැර යන්නට නො හැකි ය, කෑකෝ නො ගසන්නැ' යි ඕ තොමෝ කිවු ය. බිරිය දුක කළකිරී, ගෙන් නික්ම ගිය තැනැත්තේ ද 'අනිත්‍යය, දුකය' යි කියමින් සිතමින් යන්නේ සෝවන්පලයට පැමිණියේ භික්ෂූන් වෙත ගොස් වැඳ මහණකම ඉල්ලා සිටියේ ය. 'තා පැවිදි කරන්නට අපට නො හැකි ය, තට මහණකමෙන් වැඩෙක් නැත, තාගේ හිස කරගලක් වැනි ය' යි භික්ෂූන් කී කල්හි 'සඟාමිනි! මා තව එක් වරක් පැවිදි කරණු මැනැවැ' යි තදින් කියා සිටියේ ය. භික්ෂූහු ඔහු එවර ද උපකාර සලකා පැවිදි කළහ. ඔහු සත්වන වර ලැබූ මේ පැවිද්දෙන් ටික දවසකට පසු සිවුපිළි සැඹියාවන් ලබා රහත් වූයේ ය. භික්ෂූන් වහන්සේලා ද 'චිත්ත හත්ථය! තා පැන යන කාලය දන්නෙහි තෝ ම ය, මේ වර සිවුරු හැරීම කල් යන හැඩැ'යි කීහ. 'සඟාමිනි! ඒ එදා, අද සසර ඇලුම් සසර බැඳුම් නැති කෙලෙමි, එහෙයින් දැන් ඉතින් ගිහිගෙට නො යමි' යි චිත්තහත්ථසථවිරයන් වහන්සේ කීහ. එවිට භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් 'සඟාමිනි! මේ තෙරුන්නාන්සේ තමන් රහත් වූ බවක් හඟවත්, බොරු කියත්' යි කී කල්හි බුදු

රජානත් වහන්සේ 'මහණනි! ඒ එසේ ය, මේ මා පුත් සැලෙන සිත් ඇති අවදියේ දහම් නො දන්නා අවදියේ අතැන මෙතැන යෑම් ඊම් කෙළේ ය, දැන් ඔහුට පිණුත් නැත, පවුත් නැත, ඒ දෙක ම පහව ගියේ ය' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක:-

අනවඞ්තචිත්තස්ස සඩම්මං අවිජානතො,
පරිපලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති.

අනවස්සුතචිත්තස්ස අනන්වාහතචෙතසො,
පුඤ්ඤපාපපහීණස්ස නත්ථි ජාගරතො භයන්ති.

චපල වූ සිත් ඇති සදහම් නො දන්නා වූ ඉපිලෙන සැදැහ ඇත්තහුට නුවණ නො පිරේ.

රාගයෙන් තෙත් නො වූ සිත් ඇති, චෙෂයෙන් නො පහරණ ලද සිත් ඇති, පින් පව් නැසූ කෙලෙස් නින්දෙන් නො නිදන්නහුට බියෙක් නැත්තේ ය.

අනවඞ්තචිත්තස්ස = නො පිහිටි සිත් ඇති. චපල වූ සිත් ඇති.

යම් කිසිවෙක් අසුපිට තැබූ කොමඩුගෙඩියක් සේ ද, දහවියා ගොඩක සීටුවා ලූ කණුවක් සේ ද, කෙස් නැති හිසෙක තැබූ කොළොම් මලක් සේ ද, කිසි තැනෙක ස්ථිර ව නො පිහිටා ද, කලෙක බුඩශ්‍රාවකයෙක් වේ ද, කලෙක අචෙලකයෙක් වේ ද, කලෙක ආජීවකයෙක් වේ ද, කලෙක නිගණ්ඨයෙක් වේ ද, කලෙක තාපසයෙක් වේ ද, හෙතෙමේ ය, **අනවඞ්තචිත්ත.** අස්ථිර වූ සිතැත්තේ ය හේ.

'චිත්තං නාමෙතං කස්ස චි නිබ්බං වා ථාවරං වා නත්ථි, සො පන පුග්ගලො අස්සපිඨෙ ඨපිඨුකුම්භණ්ඩකං විය ච ථූසරාසිම්හි කොට්ඨිතබාණුකො විය ච බලලාටසීසෙ කදම්බපුප්ඵං විය ච කත්ථ චි න සණ්ඨහති, කදා චි බුඩසාවකො හොති, කදා චි අචෙලකො, කදා චි ආජීවකො, කදා චි නිගණ්ඨො, කදා චි තාපසො, එවරූපො පුග්ගලො අනවඞ්තචිත්තො නාම' යනු අටුවා ය.

සඩම්මං = සත්තිස් බොධිපාක්ෂිකධර්මය.

'අරියානං ගොචරෙ රතා' යන්නට කළ පරිකථාව බලනු.

අවිජානතො = නො දන්නා වූ.

පරිපලවපසාදස්ස = ඉපිලෙන සැදැහ ඇත්තහුට.

ශ්‍රද්ධාව (ඇදහීම) සිවුමග පිළිබඳ නො වූවා ද, සැලෙන්නීය. එසේ ම ස්වල්ප වූවා ද, යන්තමකට වූවා ද සැලෙන්නී ය.

පඤ්ඤා න පරිපූරති = ප්‍රඥාව නො පිරේ.

ප්‍රඥාවෙහි භෙද මහත් ය. ප්‍රඥාවෙහි විවිධඅවස්ථා ඇත්තේ ය. රූප – වෙදනා – සඤ්ඤා – සඞ්ඛාර – විඤ්ඤාණ යන සකන්ධ පස අතුරෙහි සංස්කාරසකන්ධය, සංස්කාර පනසකින් යුක්ත ය. ඒ පනසෙහි මේ ප්‍රඥාව ද එකෙකි. ඒකාන්තශොභනචෛතසිකයෙකි. මෙය, යට කියන ලද්දේ ය.

ඒ මේ ශොභනචෛතසික ය,

'පඤ්ඤාපනට්ඨෙන = පඤ්ඤා' ඒ ඒ ධර්මයන් පිළිබඳ යථාස්ව භාවය, ඇති සැටිය, නියම තේරුම දන්වන අරුතින් 'පඤ්ඤා' නම් වේ.

'පජානාති එතායාති = පඤ්ඤා' ඇති තතු, ඇති සැටියෙන් අවබොධ කිරීමට ඉවහල් වන බැවින් පඤ්ඤා' නම් වේ.

'පජානනං = පඤ්ඤා' ප්‍රකර්ෂජානනය, ඒ ඒ ධර්මයන්ගේ ඇති තතු ඉතිරි නො කොට එහි පතුලට ම බැස දැනුම පඤ්ඤා' නම් වේ. ඒ ඒ ධර්මයන් පිළිබඳ ඇති තතු, අවබොධ කරන්නී ප්‍රඥා තොමෝ ය. ඒ ලකුණෙන් මෝ එකවිධ වූ වාද, භෙද විසින් නොයෙක් භෙද ඇත්තී ය.

පජානනා – විචයො – පවිචයො – ධම්මවිචයො – සල්ලක්ඛණා – උපලක්ඛණා – පච්චුපලක්ඛණා – පණ්ඩිච්චං – කොසල්ලං – නෙපුඤ්ඤං – වෙභව්‍යා – උපපරික්ඛා – මෙධා – පරිනායිකා – විපස්සනා – සම්පජ්ඤ්ඤං – පතොදො – පඤ්ඤිත්‍රියං – පඤ්ඤා-බලං – පඤ්ඤාසත්ථං – පඤ්ඤාපාසාදො – පඤ්ඤාආලොකො – පඤ්ඤාපජ්ජොතො – පඤ්ඤාරතනං – අමොහො – සම්මාදිට්ඨි යනාදි නම්වලින් මේ ප්‍රඥාව ත්‍රිපිටකධර්මයෙහි එන්නී ය. මෙයට මෙසේ පර්‍යායනාම බොහෝ ඇත ත් ඤාණ' යනු ම අතිප්‍රසිද්ධ ය. භෙද විසින් මෝ පළමු කොට ම බෙදෙන්නී ලෞකික ලොකොත්තර විසිනි.

එහි ගොත්‍රභූචිත්තය කෙළවර කොට ඇති කාමාවචර–රූපාවචර අරූපාවචර යන ලෞකිකචිත්තයන් හා එක් ව යෙදුනු ප්‍රඥාව ලෞකික ප්‍රඥා නම්. මේ කියූ සැටි: **'තීසු භූමිසු කුසලව්‍යාකතෙ පඤ්ඤා, ලොකියා පඤ්ඤා'** යනු.

අට වැදැරුම් මග පල සිත් හා යෙදුනු ප්‍රඥාව ලොකොත්තර ප්‍රඥා නම්. මේ කියූ සැටි: **'චතුසු මග්ගෙසු චතුසු ඵලෙසු පඤ්ඤා, ලොකුත්තරා පඤ්ඤා'** යනු.

සුතමයඤාණ-සිලමයඤාණ-භාවනාමයඤාණ - ධම්මට්ඨිතිඤාණ සම්මසනඤාණ-උදයබ්බයානුපස්සනාඤාණ-භඞ්ගානුපස්සනාඤාණ භයතුපට්ඨානඤාණ - ආදීනවානුපස්සනාඤාණ - නිබ්බිදානුපස්සනා ඤාණ-මුඤ්චිතුකම්‍යතාඤාණ - පටිසඞ්ඛානුපස්සනාඤාණ - සංඛාරු පෙක්ඛාඤාණ-සච්චානුලොමිකඤාණ-ගොත්‍රභුඤාණ - සොතාපත්තී මග්ගඤාණ - සොතාපත්තිඵලඤාණ - සකදාගාමිමග්ගඤාණ - සකදා ගාමිඵලඤාණ - අනාගාමිමග්ගඤාණ - අනාගාමිඵලඤාණ-අරහත්ත මග්ගඤාණ - අරහත්තඵලඤාණ - විමුත්තිඤාණ - පච්චවෙක්ඛණ ඤාණ- නිරොධසමාපත්තිඤාණ- ඉද්ධිවිධඤාණ- දිබ්බසොතඤාණ - චෙතොපරියඤාණ - පුබ්බේනිවාසානුස්සතිඤාණ-දිබ්බචක්ඛුඤාණ - ආසවක්ඛයකරඤාණ - දුක්ඛසච්චඤාණ - දුක්ඛසමුදයසච්චඤාණ - දුක්ඛනිරොධසච්චඤාණ-දුක්ඛනිරොධගාමිනීපටිපදාසච්චඤාණ-අත්ථ පටිසම්භිදාඤාණ - ධම්මපටිසම්භිදාඤාණ-නිරුත්තිපටිසම්භිදාඤාණ - පටිභානපටිසම්භිදාඤාණ-ඉන්ද්‍රියපරොපරියත්තඤාණ - ආසයානුසය ඤාණ - යමකපාටිහිරඤාණ - මහාකරුණාසමාපත්තිඤාණ - අනා වරණඤාණ - සබ්බඤ්ඤුතඤාණ - ඨානාඨානඤාණ-විපාකඤාණ - සබ්බත්ථගාමිනීපටිපදාඤාණ-අනෙකධාතුනානාධාතුඤාණ-නානාධි මුත්තිකඤාණ-සංකිලෙසඤාණ-වොදානඤාණ-වුට්ඨානඤාණ-චුතූප පාතඤාණ-මහාපඤ්ඤා-පුථුපඤ්ඤා - විපුලපඤ්ඤා - ගම්භීරපඤ්ඤා - අසාමන්තපඤ්ඤා - භූරිපඤ්ඤා - බාහුල්ලපඤ්ඤා - සීඝපඤ්ඤා- ලහු පඤ්ඤා-හාසුපඤ්ඤා-ජවනපඤ්ඤා-තික්ඛපඤ්ඤා - නිබ්බේධිකපඤ්ඤා යන මේ කියූ ප්‍රඥාවෝ ලෞකික-ලොකොත්තරභෙදයෙහි ඇතුළත් වෙති.

දහම් අසන්නා වූ කාලයෙහි දහම් අසන්නහුගේ සිත්හි පහළ වන නුවණ **සුතමය** නම්. කොටින්.

කය-වචන යන දෙරටු සංවරණයෙහි භික්මවාලීමෙහි පැවැති නුවණ **සීලමය** නම්. කොටින්.

චිත්තචෛතසිකයන් එක් අරමුණෙක ලා පිහිටුවීමැ යි කියන සමාධියෙහි පැවැති නුවණ **භාවනාමය** නම්. කොටින්.

ඒ ඒ ධර්මයන් වෙන් වෙන් කොට සලකා ගැණීමෙහි පැවැති නුවණ **ධම්මට්ඨිති** නම්. කොටින්.

පඤ්චඋපාදානස්කන්ධය කලාප කලාප වශයෙන් සලකා ගැණීමෙහි නුවණ **සම්මසන** නම්. කොටින්.

සංස්කාරධර්මයන්ගේ ඉපැත්ම හා නැසුම දැනීම **උදයබ්බයානු පස්සනා** නම්. කොටින්.

සංඝකාරධර්මයන්ගේ බිඳීම දැනීම **භඞ්ගානුපස්සනා** නම්. කොටින්.

සංඝකාරධර්මයන් භය වශයෙන් දැකීම **භයතුපට්ඨාන** නම්. කොටින්.

සංඝකාරධර්මයන්ගේ දෙස් දැනීම **ආදීනවානුපස්සනා** නම්. කොටින්.

සංඝකාරධර්මයන් කලකිරීම් වශයෙන් දැකීම **නිබ්බිදානුපස්සනා** නම්. කොටින්.

සංඝකාරධර්මයන් කෙරෙහි මිදෙනු කැමැති බව **මුඤ්චිතුකම්‍යතා** නම්. කොටින්.

සංඝකාරධර්මයන් අනිත්‍ය-දුඃඛ-අනාත්ම වශයෙන් සැලකීම **පටිසඞ්ඛානුපස්සනා** නම්. කොටින්.

සංඝකාරධර්මයන් කෙරෙහි මැදහත් බව **සඞ්ඛාරුපෙක්ඛා** නම්. කොටින්.

උදයව්‍යයාදී වූ අෂ්ටවිධඥානඥනයන්ට හා බොධිපාක්ෂික ධර්මයන්ට අනුව පවත්නා දැකීම **සච්චානුලොමික** නම්. කොටින්.

පෘථග්ජනගොත්‍රය මැඩ ආර්‍යගොත්‍රයට බැස නිවන් අරමුණු කොට සොතාපත්තිමග්ගඤ්ඤණයට සයාකාරයකින් ප්‍රත්‍යයභාවය සිදු කරමින් උපදනා දැනීම **ගොත්‍රභූ** නම්. කොටින්.

සොතාපත්තිමග්ගචිත්තයෙහි යෙදී සිටි නුවණ **සොතාපත්ති මග්ගඤ්ඤණ** නම්. කොටින්.

සොතාපත්තිමග්ගඤ්ඤණයට අනතුරුව ඔවුන්ගේ ම විපාකය වූ නිවණ අරමුණු කොට උපදින නුවණ **සොතාපත්තිඵලඤ්ඤණ** නම් කොටින්.

සෙසු මග්ගඵලඤ්ඤණයෝ ද මෙසේ යුතු ය.

ඒ ඒ ආර්‍යමාර්ගයෙන් නැසූ කෙලෙස් පසුව දැකීම හෝ කෙලෙසයන්ගෙන් මිදුනු බව **විමුත්තිඤ්ඤණ** නම්. කොටින්.

මාර්ගඵල විසින් නැසූ කෙලෙස් හා ඉදිරියෙහි නසන්නට ඉතිරි වූ කෙලෙස් පස් විකුම **පච්චවෙක්ඛණඤ්ඤණ** නම් කොටින්.

අනාගාමිආර්‍යයන්ගේ හා රහතුන් වහන්සේගේ නිරෝධසමාපත්තිය පිළිබඳ නුවණ **නිරොධසමාපත්තිඤ්ඤණ** නම්. කොටින්.

සෘඬි කොට්ඨාශයන් දැනීම **ඉද්ධිවිධඤ්ඤණ** නම්. කොටින්.

දිව කන් උපදවා ගැණුමෙහි පැවැති නුවණ **දිබ්බසොතඤාණ** නම්. කොටින්.

තමාගේ හා මෙරමාගේ සිත පිරිසිඳ දැනීම **චෙතොපරියඤාණ** නම් කොටින්.

පෙර විසූ කඳපිළිවෙල දැනුම සිහිපත් කිරීම **පුබ්බෙනිවාසානුස්සතිඤාණ** නම්. කොටින්.

දිව ඇස උපදවා ගැණීමෙහි පැවැති නුවණ **දිබ්බචක්ඛුඤාණ** නම්. කොටින්.

පංචස්කන්ධය දුක් රැසකැ යි දැනීම **දුක්ඛසච්චඤාණ** නම්. කොටින්.

දුක් හටගැණීමේ හෙතු ව වූ තෘෂ්ණා ව දැනීම **දුක්ඛසමුදය සච්චඤාණ** නම්. කොටින්

පංචස්කන්ධදුඃඛයාගේ නො පැවැත්ම දැනීම **දුක්ඛනිරෝධ සච්චඤාණ** නම්. කොටින්.

පංචස්කන්ධදුඃඛයාගේ නැසීමෙහි මග දැනීම **දුක්ඛනිරෝධ-ගාමිනීපටිපදාසච්චඤාණ** නම්. කොටින්.

ඵලයෙහි දැනුම **අත්ථපටිසම්භිදා** නම්. කොටින්.

හෙතුවෙහි දැනුම **ධම්මපටිසම්භිදා** නම්. කොටින්.

නිරුක්තියෙහි දැනුම **නිරුත්තිපටිසම්භිදා** නම්. කොටින්.

අර්ථ-ධර්ම-නිරුක්තියෙහි දැනුම **පටිභාණපටිසම්භිදා** නම්. කොටින්.

ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන්ගේ අඩු වැඩි කම. උස් පහත් බව දැනුම **ඉන්ද්‍රියපරොපරියත්ත** නම්. කොටින්.

සත්වයන් පිළිබඳ ආසය; අනුසය දැනුම **ආසයානුසය** නම්. කොටින්.

යමාමහපෙළහරෙහි පැවැති නුවණ **යමකපාටිහීර** නම්. කොටින්.

මහාකරුණාවට පැමිණීමෙහි පැවැති නුවණ **මහාකරුණා සමාපත්ති** නම්. කොටින්.

සංඝඨාර – විකාර – ලක්ෂණ – නිර්වාණ – ප්‍රඥප්ති යන පංචවිධ ඥෙයමණ්ඩලයෙහි පැවැති ත්‍රුවණ **සබ්බඤ්ඤුතඤ්ඤාණ** නම්. කොටින්.

සර්ව්වඥතාඥානයෙහි අනාවරණය වූ දැනුම **අනාවරණ** නම්. කොටින්.

තැන් නො තැන් පිරිසිඳ දැනුම **ඨානාඨාන** නම්. කොටින්.

කර්ම්සමාදානයන්ගේ යථාභූතවිපාකදර්ශනය **විපාකඤ්ඤාණ** නම්. කොටින්.

මේ පිළිවෙත නිරයට පමුණු වන්නීය, මේ පිළිවෙත සුගතියට පමුණු වන්නීය, ඈ ලෙසින් දැනුම **සබ්බත්ථගාමිනිපටිපද** නම්. කොටින්.

සඤ්ඣානානානත්වය, ආයතනානානත්වය, ධාතුනානානත්වය, අනෙකධාතුනානාධාතුලෝකනානානත්වය යන මෙකී නානාත්වවිෂයෙහි දැනුම **අනෙකධාතුනානාධාතු** නම්. කොටින්.

සත්වයන්ගේ නිනොතකාෂ්ටභාවය දැනීම **නානාධිමුත්තතික** නම්. කොටින්.

හානභාගීයධර්ම්යන්ගේ දැනීම **සංකිලෙස** නම්. කොටින්.

ස්ථිතිභාගීයධර්ම්යන්ගේ දැනීම **වොදාන** නම්. කොටින්.

ඒ ඒ සමාධියෙන් නැගී සිටීමෙහි ත්‍රුවණ **වුට්ඨාන** නම්. කොටින්.

සත්වයන්ගේ චුති උත්පත්ති දැනුම **චුතූපපාත** නම්. කොටින්.

මහත් වූ සීල සමාධි පඤ්ඤා විමුක්ති ඤාණ දර්ශන ඨානාඨාන මහාවිහාරසමාපත්ති අර්යසත්ය සතිපට්ඨාන සම්මප්පධාන ඉර්ධිපාද ඉන්ද්‍රිය බොජ්ඣඞ්ග අර්යමාර්ග සාමඤ්ඤඵල නිබ්බාණ යන ධර්ම්යන්හි පැවැති ත්‍රුවණ **මහාපඤ්ඤා** නම්. කොටින්.

බොහෝ වූ නානාප්‍රකාර වූ සඤ්ඣ ධාතු ආයතන ප්‍රතීත්‍යසමුත්පන්නශූන්‍යතානුපලභ්‍යමානධර්ම්යන්විෂයෙහි ද සීල සමාධි ප්‍රඥාදිධර්ම්යන්විෂයෙහි ද පැවැති දැනීම **පුථුපඤ්ඤා** නම්. කොටින්.

මහත් වූ ධර්ම්යන් විෂයෙහි පැවැති දැනීම **විපුලපඤ්ඤා** නම්. කොටින්.

ගැඹුරු වූ සඤ්ඣාදීන් කෙරෙහි පැවැති දැනීම **ගම්භීරපඤ්ඤා** නම්. කොටින්.

අනිකක්හු විසින් යටපත් නොකරණු හැකි වූ පුදුමල අසාමන්ත' නම්. ඔහු පිළිබඳ නුවණ **අසාමන්තපඤ්ඤා** නම්. කොටින්. මෙහි අර්ථධම්මනිරුක්ති ප්‍රතිභාණාදි ධම්යන් දත් හෙයින් අනිකක්හු විසින් මැඩලන්නට නොහැකිය සි දත යුතුය.

රාගාදි කෙලෙසුන් ද භවගාමීකම් ද විනාශ කිරීමෙහි පැවැති ඥානය **භූරිපඤ්ඤා** නම්. කොටින්.

යමෙක් ප්‍රඥව අධිපති කොට සිටියේ ද, ඔහු පිළිබඳ නුවණ **බාහුල්ලපඤ්ඤා** නම්. කොටින්.

වහ වහා සිල් පිරීමෙහි පැවැති නුවණ **සීලපඤ්ඤා** නම්. කොටින්.

ලඝු ලඝු ව සිල් පිරීමෙහි පැවැති නුවණ **ලහුපඤ්ඤා** නම්. කොටින්.

යමෙක් හාස බහුල වූයේ, වෙද බහුල වූයේ, තුසි බහුල වූයේ, පාමොජ්ජ බහුල වූයේ, සිල් පුරා ද, ඉන්ද්‍රියසංවරය පුරා ද ඔහු පිළිබඳ නුවණ **හාසුපඤ්ඤා** නම්. කොටින්.

රූප-වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන සකඬ පසෙහි අනිත්‍ය-දුඃඛ-අනාත්ම වශයෙන් පැතිර යන්නා වූ නුවණ **ජවන පඤ්ඤා** නම්. කොටින්.

වහා කෙලෙස් සිද ලන නුවණ **තික්ඛපඤ්ඤා** නම්. කොටින්.

සකඬයන් කෙරෙහි කලකිරීම බහුල වූවහු පිළිබඳ නුවණ **නිබ්බේධිකපඤ්ඤා** නම්. කොටින්.

මෙහි දැක්වූ ඤාණ අතුරෙහි ඉන්ද්‍රියපරෝපරියත්තඤාණය, ආසයානුසයඤාණය, යමකපාටිහීරඤාණය, මහාකරුණාසමාපත්ති ඤාණය, සබ්බඤ්ඤුතඤාණය, අනාවරණඤාණය යන ඤාණෂට්කය සම්බුදුවරයන්ට මුත් අන්‍යශ්‍රාවකයන්ට නොලැබේ.

මෙහි කීවා කාමාවචරප්‍රඥය. කාමාවචරප්‍රඥව ත් නොපිරේ නම්, නොලැබේ නම්, අනික් රූපාවචරප්‍රඥාදීන්ගේ පිරීමෙක් ලැබීමෙක් කොයින් වේ ද[1].

අනවස්සුතචිත්තස්ස = රාගයෙන් තෙත් නොවූ සිත් ඇති.

---

1. 2 - 5 'පඤ්ඤුපාසාද' යන්නට කළ පරිකථාව බලනු.

කාමරාග - රූපරාග - අරූපරාග විසින් රාගය තෙ පරිදි ය. ඒ තෙ වැදැරුම් වූ රාගයන් සමූලඝාතනය කොට සිටියේ **අනවස්සුත චිත්ත'** නම්.

අනන්වාහතචෙතසො = ද්වේෂයෙන් නො පහළ සිත් ඇති.

ද්වේෂය මුළුමනින් නසා සිටියේ **අනන්වාහතචෙත'** නම්.
පුඤ්ඤපාපපහීණස්ස = පැහූ කුසල් අකුසල් ඇති. නැසූ පින් පව් ඇති.

පින් පව් දෙක, මුළුමනින් නසාලූවෝ රහතුන් වහන්සේ ය. එහෙයින් අහීනමාර්ගඥනයෙන් පින් පව් නසා සිටි රහතුන් වහන්සේ මෙයින් ගැණෙති.

නත්ථි ජාගරතො භයං = නො නිදන්නහුට බියෙක් නැත.

ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-ස්මෘති-සමාධි-ප්‍රඥා යන ඉන්ද්‍රියයන්ගෙන් යුක්ත සේක, රහතුන් වහන්සේ. උන්වහන්සේ කයේ ගිලන් බැවින් නිදන සේක. කෙලෙස් නින්දෙන් නම් නො නිදන සේක. රහතුන් වහන්සේ ඒ ඒ මාර්ගයෙන් නැසූ කෙලෙස් ඇති සේක. එහෙයින් ඒ ඒ මාර්ගයෙන් නැසූ කෙලෙසුන්ගේ නැවැත ඉපැත්මෙක්, පැවැත් මෙක් නැත්තේ ය. මෙසේ ජාගරණධර්මැ යි කියූ ඉන්ද්‍රියයන්ගෙන් වැඩි සිටි බැවින්, ඒ ඒ මාර්ගයෙන් කෙලෙස් නැසූ බැවින්, රහතුන් වහන්සේට කෙලෙසුන්ගෙන් වන බියෙක් නැත. කෙලෙස්, රහතුන් වහන්සේ ලුහු බැඳ නො යයි. ඒ ඒ මගින් නැසූ කෙලෙසුන් නැවැත නැවැත වෙත නො එන බැවිනි.

'ඛීණාසවස්ස ජාගරන්තස්සෙව භයාභාවො කථිතො විය සො පන සඩාදීහි පංචහි ජාගරධම්මෙහි සමන්නාගතත්තා ජාගරෙ නාම, තස්මා තස්ස ජාගරන්තස්ස පි අජාගරන්තස්ස පි කිලෙස භයං නත්ථි, කිලෙසානං අපච්ඡාවත්තනතො, න හි තං කිලෙසා අනුබන්ධන්ති තෙන තෙන මග්ගෙන පහීණානං පුනප්පුන අනුප ගමනතො, තෙනෙවාහ, සොතාපත්තිමග්ගෙන යෙ කිලෙසා පහීණා තෙ කිලෙසෙ න පුනෙති, න පච්චාගච්ඡති, සකදාගාමි -අනාගාමි-අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීණා තෙ කිලෙ-සෙ න පුනෙති, න පච්චාගච්ඡති ති' යනු වදාළෝ මේබව දක්වනු සඳහා ය. මෙය අටුවාවේ ආයේ ය.

ධර්මදෙශනාව මහාජනයාහට වැඩසහිත වූ ය. සඵල වූ ය. භික්ෂූහු 'ඇවැත්නි! කෙලශයෝ නම් සාහසිකයහ, මහාගුණැති රහත්බවට හෙතුසම්පත් ඇතුව සිටි කුලපුත්‍ර තෙමේ කෙලෙසුන්

විසින් කළඹ වන ලද්දේ, සත්වරක් ගිහි ව සත්වරක් පැවිදි වූයේ ය' යි කතාවක් ඉපද වූහ. බුදුරජානන් වහන්සේ ඒ අවසථාවට ගැළපෙන ගමනින් ධර්මසභාවට වැඩ බුද්ධාසනයෙහි වැඩ හිඳ භික්ෂූන් කළ කතාව කිමැ, යි අසා වදාළ සේක. භික්ෂූහු තමන් කළ ඒ කතාව මුළුමනින් සැලකොට සිටියහ. 'මහණෙනි! ඔව් කෙලහයෝ සාහසිකයහ, යම් ලෙසකින් මේ කෙලෙස් රූපවත් කොට යම්තැනෙක දමනු හැකි නම්, එයට මේ මුළු සක්වළ ම ඉඩ මද ය, බඹලොව කුඩා ය, ඔවුනට ඉඩ ඇති තැනෙක් නැත්තේ ය, මේ කෙලෙස් මා වැනි නුවණැති ශ්‍රෙෂ්ඨපුරුෂයකු ත් කැලඹූ නම් සෙස්සන් කෙරෙහි කි නම් කතා ද, මම වනාහි තණඇට නැළි බාගයකු ත් උදලු කෙටියකු ත් නිසා සවරක් පැවිදි ව සිවුරු හැර ගියෙමි' යි බුදුරජානන් වහන්සේ වදාළ විට භික්ෂූහු 'ස්වාමිනි! ඒ කවද දැ' යි ඇසූහ.

'යටගිය දවසැ බරණැස්නුවර බඹදත්රජ රජය කරණ කල්හි කුඳුල නම් පණ්ඩිතයෙක් එහි විය. ඔහු බාහිරකප්‍රව්‍රජ්‍යාවට බැස අට මසක් හිමාලය්වනයෙහි විසී ය. ඒ කාලයෙහි ඔහු, වැහි වැස පොළොව තෙමී ගිය කල්හි, 'මාගේ ගෙයි වරුඇට මනාවක් හා උදලු කෙටියක් ඇත්තේ ය, ඒ ඇට ටික නොවැපුරුවෝ ත් නැසියන්නේ ය' යි ඒ බාහිරකප්‍රව්‍රජ්‍යාව හැර දමා ගෙට අවුත් උදලු කෙටිය ගෙණ බිම කොටා වරුඇට වපුරා වැට කවු බැඳ රැක පැසුනු කල්හි කපා පාගා ගෙණ මනාවක් පමණ ඇට සුරැකි ව තබා අන් සියල්ල කා අවසන් කොට 'මට ගිහිකමින් වැඩෙක් නැත, තවත් අට මසක් පැවිදි ව තපස් කරමි' යි ගෙන් නික්ම ගොස් පැවිදි වූයේ ය, මේ ලෙසින් වරුඇට මනාව ත් උදළු කෙටිය ත් නිසා සත් වරක් පැවිදි වූ ඔහු අවසානයෙහි උදලු කෙටිය ගෙණ ගංඉවුරකට ගොස් 'මෙය වැටෙන තැන දුටහොත් ගන්නට සිත් වන්නේ ය, ඒ නිසා නොපැණෙන තැනක දමමි' යි වරුඇට මනාව රෙදිකඩක ලා බැඳ ඒ ඇටපොදිය උදලුකලයෙහි එල්ලා උදලුමිටෙන් අල්ලා ගෙණ ඇස් පියා හිස වටා තෙවරක් කරකවා ගඟෙහි බහා ඇස් හැර බලනුයේ වැටුනු තැන නොදැක 'මා දිනන ලදැ' යි තෙවරක් හඬ නගා කීයේ ය.

ඒ වේලෙහි බරණැස්රජ තෙමේ, පසල්දනව්ව සංසිඳුවා අවුත් ගංඉවුරෙහි කඳවුරු බැඳ නාන්නට ගඟට බැස්සේ ය, ඔහුට මේ හඬ ඇසුනේ ය, 'මා දිනන ලදැ' යි යන හඬ රජුන්ගේ සිත් ගත්තේ නොවේ, එ බැවින් බරණැස්රජ තෙමේ, ඔහු ලඟට ගොස් 'මම සතුරන් පරදවා මා දිනන ලදැ' යි කියා දැන් ආයේ වෙමි, ඔබ, මා දිනන ලද්දේය, මා දිනන ලද්දේය යි මොර දෙන්නෙහිය,

කුමක් හෙයින් එසේ කරන්නෙහි ද, යි ඇසී ය, එවිට කුඤ්ඤල පණ්ඩිත තෙමේ 'තමුන්නාන්සේ පිටත හොරුන් දිනුවහු ය, මා විසින් ඇතුළත්හි වූ ලොභ නැමැති හොරා දිනන ලද්දේ ය' ඔබ වහන්සේ විසින් දිනන ලද්ද නැවැත නො දිනන ලද්දේ ම වේ, මා විසින් දිනූ සොරා නැවැත මා නො පරද වන්නේය, යි කීයේ ය. එවිට ජය තට ය, යහපතැ' යි.

'දිනූ දේ නැවැත ත් – දිනන ලද නම් සතුරන්,
ඒ දිනුම නම් යහපත් – දිනුමෙක් නො වේ ලෙව්හි,
දිනූ දේ නැවැත ත් – නො දිනන ලද ද සතුරන්,
ඒ දිනුම නම් යහත් – දිනුමෙක් ය මේ ලෙව්හි'

යි මෙය කීයේ ය,

කුඤ්ඤලපණ්ඩිත තෙමේ, ඒ වේලෙහි ම ගඟ දෙස බල බලා ආපොකසිණය වඩා ලැබූ ධ්‍යානාභිඥ ඇත්තේ, අහස පලක් බැඳ හුන්නේ ය, බරණැස්රජ ඒ මහාපුරුෂයාගේ බණ අසා පැහැද වැද පැවිදි කරන්නට ආරාධනා කොට සිය පිරිස හා පැවිදි වූයේ ය, අනික් සාමන්තරජෙක් ද ඔහු පැවිදි වූ බව අසා රාජ්‍යය ගන්නට ආයේ ධනධාන්‍යාදියෙන් පිරී තුබූ නුවර සිස් ව ගියබව දුක මෙ වැනි මහානගරයක් හැර පැවිදි වූ රජ තෙමේ පහත් තැනක පැවිදි නො වන්නේ ය, මම ත් පැවිදි වෙමි' යි සිතා මහාපුරුෂයා කරා ගොස් සිය පිරිස හා පැවිදි විය. මේ ලෙසින් එහි රජහු සත් දෙනෙක් පැවිදි වූහ, ඔවුන් විසූ පන්සල දිග පළලින් සත් යොදුනකි, ඒ රජුන් පරිභොග කල සියල්ල ම හැර දමන ලද්දේය, මහාපුරුෂ තෙමේ ද මෙතෙක් දෙනා හා බඹසර වැස ධ්‍යාන උපදවා බඹලොව උපන්නේ ය' යි වදාළ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව කළ සේක. 'ඒ කාලයෙහි කුඤ්ඤල පණ්ඩිත වූයේ මම ය, කෙලෙස් නම් ඉතා දරුණුය' යි ද දෙසූ සේක.

චිත්‍රභෂනස්ථවිරවස්තුව නිමි.

පන්සියයක් විදර්ශකභික්ෂූහු

3 — 6

සැවැත්නුවර වැසි පන් සියයක් භික්ෂූන් වහන්සේලා බුදු රජානන් වහන්සේ වෙතින් රහත්බව දක්වා කමටහන් උගෙණ 'මහණ දම් පුරන්නෙමු'යි යොදුන් සියයක් පමණ වූ දිග් මහ මග ගෙවා එක් ජනාකීර්ණ වූ ගමකට පැමිණියහ. එ ගම්වැස්සෝ උන්වහන්සේලා දැක අසුන් පණවා වඩා හිඳුවා රසවත් කෑදබත් ආදිය මැනැවින් වළඳවා 'කොා තැනක වසින්නහු දැ' යි ඒ භික්ෂූන් ගෙන් විමසූහු ය. 'වස් විසුමට පහසු ඇති තැනක් සොයා බලා යන්නෙමු' යි ඔවුන් කී කල්හි, ඒ මිනිස්සු 'ස්වාමීනි! ස්වාමීන් වහන්සේලා මේ තෙ මස මෙහි වසනු මැනැව, අපි ඔබ වහන්සේලා වෙත සරණයෙහි පිහිටා සිල් සමාදන් වන්නෙමු'යි කීහ. භික්ෂූහු ඔවුන් ගේ ඒ ආරාධනාව ඉවසූහ. මිනිස්සු එ බව දැන එක් නොදුරු වන ලැහැබෙක රැතැන් දිවාතැන් වැසිකිළි කැසිකිළි පැන්පොකුණු ආදිය පිළියෙල කොට භික්ෂූන් වහන්සේලා එහි පිටත් කළහ. වන ලැහැබෙහි අරක් ගත් දෙවියෝ 'සිල්වත් භික්ෂූන් වහන්සේලා මේ වනලැහැබෙහි මෙසේ වසද්දී අඹුදරුවනුත් ගෙණ, ගස් නැගී විසීම අපට නොා සුදුසු ය' යි බිමට බැස, මේ හිමිවරු අද රැ පමණක් මෙහි වැස හෙට මෙතැනින් යනු ඇතැ' යි සිතූහ. භික්ෂූහු පසු දා ගමට වැද පිඬු සිඟා ගෙණ, වනලැහැබ තුළට ම පැමිණියහ. එවිට දෙවියෝ 'මේ සඬ්ඝයා වහන්සේ කවුරුන් විසින් නමුත් හෙටට ත් ආරාධනා කරණ ලද්දේ වන්නාහ, ඒ නිසා නැවැත මෙහි ආහ, අද ත් ඉඳ හෙට නික්ම යනු ඇතැ' යි සිතූහ. මේ ලෙසින් සිත සිතා ඔවුහු අඩමසක් ගස් නොා නැග ම හුන්හ. නැවැත 'මේ හිමිවරු මේ තෙමස ම මෙහි වසන්නන් සේ ය පෙණෙන්නෝ, එසේ නම්, අපට ගස් නැගී හිඳිනු නොා සුදුසු ය, තෙ මසක් ම මේ ලෙසට අඹුදරුවනුත් ගෙණ බිම ඉඳීම ත් නොා කළැකිය, එහෙයින් කිසිවක් කොට මේ භික්ෂූන් පිටමං කරන්නට ඕනෑ ය'යි සිතා රැ තැන් දිවාතැන් ආදී වූ ඒ ඒ තැන්හි ද, සක්මන්කෙළවර ද, භිස් සුන්සිරුර දක්වමින් යක්ෂ රාක්ෂෂාදීන්ගේ භයජනකශබ්ද ද අස්වන්නට වූහ. එයින් භික්ෂූන් වහන්සේලා අතර කැසි කිබිසිලි ආදී වූ රෝග හටගත්තේ ය. ඒ භික්ෂූන් වහන්සේලා 'ඇවැත්නි! ඔබවහන්සේ ලෙඩින් පෙළෙන්නහු සේ පෙණෙත්, හටගෙණ ඇති ලෙඩේ කුමක් දැ' යි එකිනෙකාගෙන් ඇසූහ. මට කැස්ස, මට කිබිසිලි යෑම' යි මේ ලෙසින් තම තමන්ට වැළඳී තුබූ

අසනීප කියා 'සක්මන් කෙළවර දී සිරුරු නැති ඔළුවක් දිටිමි, මම ඔළුව නැති සිරුරක් දිටිමි, මම වැසිකිළිය අසල දී අමනුෂ්‍යශබ්දයක් ඇසීමි'යි එකිනෙකා කී කල්හි කවුරු ත් 'අපට මේ ස්ථානය හිතකර නො වේ, අපහසුකම් බොහෝ ය, එහෙයින් බුදුරජුන් වෙත යමු' යි කවුරුත් සම සිත් ව බුදුරජුන් වෙත ගොස් වැඳ සිටියහ. උන්වහන්සේ 'මහණෙනි! තමුසේලා මෙ පමණ ඉක්මනින් පෙරළා මෙහි ආවහු කිමැ' යි ඇසූහ. 'ස්වාමීනි! එහි කරදර බොහෝ ය, අප ඉදිරියෙහි නන් වැදුරුම් බිහිසුණු අරමුණු පහළ වේ, සිරුරු නැති හිස්, ඔලු නැති සිරුරු දක්නට ලැබෙත්, අපි බොහෝ දෙනෙක් මේ නිසා ලෙඩ රෝග ඇත්තෝ වීමු, එහෙයින් එ තැන හැර දමා මෙහි ආම්හ' යි සැලකළහ. බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූන්ට 'එහි ම යවු' යි කී කල්හි ද භික්ෂුහු එහි යෑමට නො හැකි බව කීහ. 'මහණෙනි! යවු, නො බිය වවු, තමුසේලා මුලින් යද්දී හිස් අතින් ගියහු ය, මේ වර ආයුධයක් ගෙණ යවු' යි 'මෙත්තසූත්‍රය' උගන්වා නැවැත 'මහණෙනි! විහාරයෙන් පිටත වනලැහැබ පටන් සජ්ඣායනය කරමින් වනයතුළට අතුළු වවු' යි නියම කළ සේක. ඔවුහු 'එසේය' යි බුදුරජුන් වැඳ එ තැනින් නික්ම මෙත්සුත පිරිවහමින් ගොස් වනයතුළට පිවිසියහ. වනලැහැබෙහි අරක් ගෙණ හුන් දෙවියෝ මෙත්සිත් ලබා පෙර ගමන් කොට පා සිවුරු ඉල්ලූහ. අතපය මිරිකීමට, අවසර ඉල්ලූහ. ඒ ඒ තැන රැකවල් ගත්හ. උණු දෙයක් දියෙහි ලූ කලක් සේ ඒ සියලු උවදුරු සංසිඳුනේ ය. අමනුෂ්‍ය ශබ්දයෙක් කො තැන ත් නො වූයේ ය. එහෙයින් භික්ෂූන්ගේ සිත් එකඟ විය. ඔවුහු රැතැන් දිවාතැන්හි හිඳ විදර්ශනාවෙහි සිත් බහා ආත්මභාවයෙහි ඛයවය පිහිටුවා 'මේ ආත්මභාවය බිඳෙන සුලු ය, අස්ථිර ය, කුලල් බඳුනක් සේ'යි විදසුන් වැඩූහ. බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි වැඩ හුන් සේක් ඔවුන් විදර්ශනාව පටන් ගත්බව දැන ඔවුන් අමතා 'මහණෙනි! ඔව්, ආත්මභාවය බිඳෙන සුලු ය, අස්ථිර ය, කුලල් බඳුනක් බඳු ය'යි වදාරා ආලොකයක් පතුරුවා යොදුන් සියයකින් ඈත වැඩ සිටි සේක් ද, ඉදිරියෙහි හුන්නකු සේ සවණක් රැස් විහිදුවා පෙණෙන රූපයෙන් යුක්ත ව මේ ධර්මදෙශනාව කළ සේක:-

> කුම්භූපමං කායමිමං විදිත්වා
> නගරූපමං චිත්තමිදං ඨපෙත්වා,
> යොධෙථ මාරං පඤ්ඤායුධෙන
> ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියාති.

මේ සිරුර මැටිබදුනක් බදුය යි දැන මේ සිත, මැනැවින් රැකි නුවරක් සේ තබා, නුවණ නැමැති ආයුධයෙන් කෙලෙස් මරුට පහර දෙන්නේ ය. එසේ මරුට පහර දී දිනා ගන්නා ලද්ද රැක ගන්නේ ය. සමාපත්තිඇලය නොමැත්තෙක් වන්නේ ය.

කුම්භූපමං = මැටි බදුනක් වැනි කොට.

'කෙන ජලෙන උමඞ්ගියති පූරියති ති = කුම්භෝ' ජලයෙන් පුරවනු ලබන්නේ කුම්භ නම්. සිරුර බිඳෙන සුලු බැවින් කුම්භයට උපමා කරණ ලද්දේ ය.

කුම්භ කායං = මේ සිරුර.

නාමකාය-රූපකාය යි කය දෙ පරිදි ය. මෙහිලා ගැණෙන්නේ රූපකාය ය. **'කෙසාදිසමුහසඞ්ඛාතං කායං'** යනු අටුවා ය. නිත්දිත වූ කෙසාදීන්ගේ සමූහය හෝ ඔවුන්ගේ ම උත්පත්ති-සථාන බැවින් හෝ රූපකාය තෙමේ කාය නම්. **'අඞ්ගපච්චඞ්ගානං කෙසාදීනං ච සමූහඤෙන එවං කුච්ඡිතානං ජෙගුච්ඡානං ආයො, උප්පත්තිදෙසොතිපි කායො'** යනු එයරුත් කීම ය. මෙහි වචනාර්ථ දැක්වීම මෙසේ ය:- **'ආයනන්ති එත්ථාති = ආයො ඤෙ ආයනන්ති කුච්ඡිතා කෙසාදයො ඉති, කුච්ඡිතානං ආයොති පි - කායො'** යනු. අර්ථ වසින් සතර මහාභූතයන්ගේ වශයෙන් පවත්නා භූතොපාදයධර්මපුඤ්ජය, කාය යි දත යුතු ය. ඒ මේ කාය තෙමේ පඨවිකාය - ආපොකාය - තෙජොකාය - වායොකාය - කෙසකාය-ලොමකාය-ඡවිකාය යනාදීන්ගේ වශයෙන් බහුවිධ ය.

කෙසාදිසමූහය යි කියනු ලබන මේ ශරීරය අතිශය දුර්ගන්ධ ය. අසථිර ය. එහෙයින් කල් නො පවත්නේ ය. එහෙයින් ම ය මේ සිරුර මැටි බදුනක් වැනි ය යි වදාළෝ. **'අයං භික්ඛවෙ! චතුමහාභූතමයො රූපකායො භිඳුරො භෙදනසීලො භෙදනසභාවො බණෙ බණෙ විධංසනසභාවො ති'** යන මේ දෙශනාප්‍රදෙශයෙන් ද එබව ම වදාළෝය. 'මහණෙනි! සතර මහාභූතයන් විසින් කළ මේ රූපකාය තෙමේ නැසෙන සුලු ය' යනු එහි කෙටි තේරුමය.

'පුබ්බලොහිතසම්පන්නං බහුස්ස කුණපස්ස ව,
නරවීරකතං වඤ්ඤ සම්මඤ්ඤමිව චිත්තිතං'

සැරවයෙන් හා ලෙයින් පිරුණු බොහෝ කුණපයෙන් ද පිරුණු ශරීරය නරවීරයකු විසින් කරණ ලද සිත්කලු සුමුගුවක් සේ සිතියම් කරණ ලද ය.

'අලලවම්මපටිච්ඡන්නො නවචාරො මහාවණො,
සමන්තතො පග්ඝරති අසුචි පූතිගන්ධියො'

තෙත් වූ සමකින් වැසුනු නව දොරක් ඇති මහාවණයක් බඳු මේ සිරුර හැම පැත්තකින් වැගිරේ. හැම අතින් අපිරිසිදු ය. කුණු ගඳ ඇත්තේ ය.

'දුග්ගන්ධො අසුචි කායො කුණපො උක්කරූපමො,
නින්දිතො චක්ඛුභූතෙහි කායො බාලාභිනන්දිතො'

දුර්ගන්ධ වූ අසුචිසමූහයක් වූ කුණපයක් වූ කසළගොඩක් බඳු වූ මේ සිරුර නුවණැත්තන් විසින් නින්දා කරණ ලද්දේ ය. අඥයන් විසින් සතුටු වන ලද්දේ ය.

'දිපාදකොයං අසුචි දුග්ගන්ධො බහුපද්දවො,
නානාකුණපපරිපූරො විස්සවන්තො තතො තතො'

දෙපා ඇති මේ සිරුර අපවිත්‍ර ය. දුගඳ ය. බොහෝ උවදුරු ඇත්තේ ය. නොයෙක් කුණපයෙන් පිරුණේ ය. ඒ ඒ තැනින් කුණු වහනය කරන්නේ ය.

'ස වෙ ඉමස්ස කායස්ස අන්තො බාහිරතො සියා,
දණ්ඩං නූන ගහෙත්වාන කාකෙ සොණෙ ච වාරයෙ'

යම් ලෙසකින් මේ සිරුරෙහි ඇතුළත පිටත් හි වූයේ නම්, එකල මුගුරක් ගෙණ බලුකවුඩුහිවලුන් වළකන්නේ ය.

'අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං,
එකචාරෙන පවිසිත්වා නවචාරෙහි සන්දති'

එක් දොරකින් මෙහි ඇතුල් වූ ප්‍රණීත වූ ආහාරපානාදීහු නව දොරකින් වැගිරෙත්.

'අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං,
භුඤ්ජති සපරිවාරො නික්ඛාමෙන්තො නිලීයති'

ප්‍රණීත වූ ආහාරපානවර්ග පිරිවර සහිත ව හිඳ අනුභව කරයි. එය නික්ම වන්නේ සැඟ වෙයි.

'අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං,
එකරත්තිපරිවාසා සබ්බං භවති පූතිකං'

මෙහි පිවිසි ආහාරපානවර්ග එක් රැයක් පරණවීමෙන් කුණු වේ.

'ඉතො පක්කිත්තමෙතසම්ං එත්තො යාති ච පූතිකං,
ජනා තුච්ඡං විහඤ්ඤනති දෙහසම්ං උභතො මුඛෙ'

මේ සිරුරෙහි මැහිත් ලන ලද්ද, ඇනින් කුණු බවට යයි. ජනයෝ දෙ පසින් මුව ඇති සිරුරෙහි නිකරුණේ වෙහෙසෙත්.

'යථා අගාරිමහි පක්කිත්තං හොති සබ්බම්පි ඡාරිකං,
යථා දෙහෙපි පක්කිත්තං හොති සබ්බං කරීසකං'

ගින්නෙහි ලූ සියල්ල ම හළු වන්නා සේ සිරුරෙහි බහා ලූ සියල්ල එසේ අසුචි වන්නේ ය.

'න චාපක්කිපිතුං සක්කා පක්කිත්තං රක්කිතුම්පි ච,
දුප්පමුඤ්චව මිදං දුක්ඛං නරානං සතතාගතං'

සිරුරෙහි අහර නො බහාලන්නට ද නො හැකි ය. බහා ලන ලද්ද රකින්නට ද නො හැකි ය. මිනිසුන්ට මෙය නිරතුරු පැමිණි මූඪ ලිය නො හැකි දුකෙක.

'බහුධම්මසමොධානො බහුපච්චයසන්නිස්සිතො,
බහුසාධාරණො කායො බහුපද්දවපිළිතො'

සිරුර රූපධර්ම රැස් වූ තැනෙකි. බොහෝ හෙතූන් ඇසුරු කොට ඇත්තේ ය. බොහෝ දෙනාට සාධාරණ ය. බොහෝ උවදුරුවලින් පෙළුනේ ය.

'සවෙපි අන්තොගතභාගරාසි
චරෙය්‍ය කාමං බහි නික්ඛමිත්වා,
දණ්ඩං ගහෙත්වා පන කාකසොණෙ
නිවාරයෙ අඤ්ඤමකුබ්බමානො'

ඉදින් ඇතුළත්හි වූ කොටස් රැස එකාන්තයෙන් පිටතට නික්ම හැසිරෙන්නේ නම්, දණ්ඩක් ගෙණ අනිකක් නො කරමින් කවුඩන් හා බල්ලන් වළකන්නේ ය.

'න විජ්ජතෙ දුක්ඛමනත්තනිච්චං
සරීරතො පූති මසාරමඤ්ඤං,
එතාදිසෙ චාපි කරොනති ඡන්දං
තතො කිමඤ්ඤං පන මොඝනිච්චං'

සිරුරට වඩා දුකක්, අනාත්ම අනිත්‍යවස්තුවක් කුණුවූවක් අසාර වූවක් නැත. මෙබදු සිරුරෙහි පවා අනුවණයෝ ආලය කෙරෙත්. එයට වඩා අන්‍ය වූ සිස් වැඩෙක් කිම ඇත්තේ ද,

'විරූපමඤ්ඤං අසුචිං න දෙහතො
භයස්ස මූලං විපරීතචෙතසා,
උපෙන්ති දුක්ඛං කටුකං තහිං රතා
නරොරවක්කෙ විය ගිඬමානසො'

සිරුරට වඩා විරූපයෙක් අපවිත්‍රයෙක් බියට මුලෙක් නැත්තේ ය. පෙරළුනු සිතින් ඒ සිරුරෙහි ඇලුනු සත්වයෝ උරවක්‍රයෙහි ගිජු සිත් ඇති මිනිසකු සේ කර්කශ වූ දුකට පැමිණෙත්.

'සුසාදිසඤ්ඤිනො දෙහෙ සලභාවහුතාසනෙ,
මොහෙන පටිපජ්ජන්තා සොචන්ති සුචිරං කලි'

ගින්නෙහි ඇලුනු පලඟැටියන් සේ සිරුරෙහි ශුභසුඛාදිසංඥ ඇති ව මොහයෙන් පිළිපදින සත්වයෝ බොහෝ කලක් ශොක කෙරෙත්.

'ඉමං හි සුභතො කායං ගහෙත්වා තත්ථ මුච්ඡිතා,
බාලා කරොන්තා පාපානි දුක්ඛා න පරිමුච්චරෙ'

මේ සිරුර ශුභ වශයෙන් ගෙණ එහි මුසපත් වූ අඥජනයෝ පව් කරන්නාහු දුකින් නො මිදෙන්නාහ.

'අජඤ්ඤං ජඤ්ඤසඞ්ඛාතං අසුභං සුභසම්මතං,
නානාකුණපපරිපූරං ජඤ්ඤරූපං අපස්සතො'

අපවිත්‍ර වූ ශරීරය නුවණ නැත්තන් විසින් පවිත්‍රය යි කියන ලද්දේ ය. අශුභ වූ ශරීරය ශුභය යි දන්නා ලද්දේ ය. නොයෙක් කුණපයෙන් පිරුණු සිරුර නුවණින් නො බලන්නහුට පවිත්‍ර වූ ස්වරූප ඇත්තෙක් වේ.

'ධිරත්ථු මං ආතුරං පූතිකායං
ජෙගුච්ඡියං අසුභං ව්‍යාධිධම්මං,
එත්ථප්පමත්තා අධිමුච්ඡිතා පජා
හාපෙන්ති මග්ගං සුගතූපපත්තියා'

මේ සිරුරෙහි තදින් මුසපත් වූ සත්වයෝ දෙව්ලොව ඉපදීමට හෙතු වූ මග පිරිහෙලත්. එබඳු වූ ආතුර වූ පිළිකුල් කටයුතු වූ ශුභ නො වූ ව්‍යාධිස්වභාව වූ මේ කුණු සිරුරට නිඳා වේවා.

'නහාරුචම්මෙහි සමාවිනත්ධිතෙ
මනොනිලාපායුතුසම්පවත්තිතෙ,
ජරාරුජාමච්චුමලාදිපූරිතෙ
කිමෙත්ථ ගය්හං සුචිතො ච සාරතො'

නහරින් සමින් හෑන් පසින් වෙළුනු චිත්ත වාත ජ්ල ආයු උතු යන මොවුන් විසින් පවත් වන ලද ජරාව්‍යාධි මරණයෙන් හා මල මූ ආදියෙන් පිරුණු මේ සිරුරෙහි පිරිසිදු වශයෙන් සාර වශයෙන් ගත හැක්කේ කිමෙක් ද.

'දුම්මිත්තෙනා දුබ්භරෙ කායෙ දුක්ඛා දුප්පරිහාරියෙ,
දුත්තිකිච්ඡෙ දුරුදෙනෙ දුප්පූරෙ දූසකෙ සදා'

මේ සිරුර හැම කල්හි පාපමිත්‍රයකු වැනි ය. දුකින් පොෂණය කළ යුතු ය. දුක ය. දුකින් පරිහරණය කළ යුතුය. පිළියම් නො කොට හැකි ය. සාරයි ගත නො හැකි ය. එසේ ම පිරිය නො හැකි ය. පිරිසිදු බව දූෂණය කරන්නේ ය.

'නිච්චෙතනෙ නිරුස්සාහෙ නිස්සාරෙ නීවගොචරෙ,
නික්කිලෙසපරිච්චත්තෙනා කායෙ නිගුණසෙවිතෙ'

මේ සිරුර චෙතනා රහිත ය. විය්‍යීය රහිත ය. සාරයක් නැත්තේ ය. නීවයන්ට ගොදුරු ය. නිකෙලෙසින් විසින් හැර දමන ලද්දේ ය. ගුණහීන වූ අඥජනයන් විසින් සෙවනය කරණ ලද්දේ ය.

'නායං මිත්තෙනා න ඤාතී ච න ච කස්ස ච සන්තකෙ,
නිජ්ජීවාසුවිමත්තෙනාව කෙවලං කම්මසම්භවෙ'

මේ සිරුර මිතුරෙක් නො වේ. නෑයෙක් ද නො වේ. කිසිවකුටත් අයත් නො වේ. හුදෙක් කර්‍මයෙන් හටහත්තේ ය. දිවි රහිත ය. අපවිත්‍රමාත්‍රයෙක.

'අලෙනොසරණෙ කායෙ සබ්බානත්ථමහාපථෙ,
ජරාදිපාවකාදිත්තෙනා සබ්බදුක්ඛූපනිස්සයෙ'

මේ සිරුර සැඟවෙන තැනක් නො වන බැවින් අලෙන ය. එහෙයින් අසරණ ය. සියලු අනර්‍ථයන්ට මහමගෙකි. ජරාමරණාදි කින්නෙන් ඇවිළ ගන්නා ලද්දේ ය. සියලු දුකට හෙතු ය.

'තතොව නික්ඛිත්තමලා තහිඤ්ච
භවෙය්‍ය ලිත්තං සකලෙපි දෙහෙ
ඛණෙව තසම්ං කිමිගුථගන්ධා
දට්ඨුම්පි දුක්ඛං පන කො ඵුසෙය්‍ය'

සිරුරෙන් නික්මුනු අසුචිය එහි ම ආලෙපකරණ ලද්දේ නම් එකෙණෙහි ම පණුවන් හා අසුචිගඳ ඇතියේ දැකීම ද දුක් වන්නේය. කවරෙක් එය ඇලීම් වසයෙන් පහසාද,

'එතාහනික්ඛිත්තමලම්පිදෙහා
පහොති ඡාදෙතුමසෙසතො තං
කිමෙව වත්තුං පන මච්චුකාලා
තථාපි දෙහෙ සුචිසඤ්ඤි බාලො'

සිරුරෙන් එක් දවසක් නික්මුනු අසුචිය පවා ඒ සිරුර මුළුමනින් වසන්නට සෑහෙන්නේ ය. මරණකාලය තෙක් නික්මුනු අසුචිය පමණ විසින් කියන්නට නො හැකි ය. මෝඩ මිනිසා මේ අසුචි පිණ්ඩය පිරිසිදු ය, සාරය යි ගන්නේ ය.

මෙසේ නුවණැත්තන් විසින් පිළිකුල් කළ මේ සිරුර බිඳෙන සුලුබව, කල් නො පවත්නාබව යනාදී වූ ස්වභාවධර්මයන්ගෙන් යුක්ත බැවින් බුදුරජනන් වහන්සේ ශරීරය මැටිබඳුනක් බඳු ය යි වදාළ සේක.

විදිත්වා = දැන.

මේ පූර්වක්‍රියාපදයෙන් කියනු ලබන දැනුම සාමාන්‍ය දැනුමෙක් නො වේ. විදසුන් නුවණින් දැනුම මෙයින් කිය වේ. ශරීරයෙහි නියමතත්ත්වය දත යුත්තේ විදසුන් නුවණින් ය. අන් නුවණින් ඒ නො දත හැකි ය. ශරීරය මැටිබඳුනක් බඳු ය යි දැනීමෙහි සමර්ථ වන්නී විදර්ශනාප්‍රඥාව ය.

නගරූපමං = (මනාකොට රැකි) නුවරක් සේ.

මනා කොට රැකි නුවර සොරුන් විසින් නො පැහැර ගත හැකි ය. 'පැහැර ගණිමු'යි පැමිණි සොරු සිස් වූ අදහස් ඇති ව ආමග බලා පෙරළා යති. එමෙන් විදර්ශනාප්‍රඥාසහිතචිත්තය කෙලෙස් සතුරන්ට තමන්හේ වශයට නො ගත හැකි ය. එහෙයින් විදර්ශනාප්‍රඥාසහිත චිත්තය සුස්ථිර නගරයක් වැනි ය. මනා කොට රැකි නුවරක් සේ ය. විදර්ශනාප්‍රඥාව උපදවා රාගාදි කෙලෙශධර්මයන්ට යටත් නො වන ලෙසින් සිත පිහිටුවා ගැණීම, නුවර සුස්ථිර ව සුරක්ෂිත ව තැබීම ය යි දත යුතු යි.

ඉදං චිත්තං ඨපෙත්වා = මේ සිත තබා[1]

යොඛෙථ මාරං පඤ්ඤායුධෙන = ප්‍රඥා නැමැති ආවුධයෙන් මරුට පහර දෙන්නේ ය.

කෙලෙශමාර – සකන්ධමාර – අභිසංස්කාරමාර – මෘත්‍යුමාර – දෙවපුත්‍රමාර යි මාරයෝ පස්දෙනෙක් බෞද්ධ පොතපතෙහි එති. එහි රාගාදිකෙලෙශසමූහය, කෙලෙශමාර නම්. රූපූපාදානක්ඛන්ධ– වෙදනූපාදානක්ඛන්ධ – සඤ්ඤූපාදානක්ඛන්ධ – සඞ්ඛාරූපාදානක්ඛන්ධ–

1. 3 1 'චිත්ත' යන්නට කළ පරිකථාව බලනු

විඤ්ඤාණුපාදානක්ඛන්ධ යන මේ පස සක්ඛ්‍යමාර නම්. පුඤ්ඤාභිසඞ්ඛාර – අපුඤ්ඤාභිසඞ්ඛාර – ආනෙඤ්ජාභිසඞ්ඛාර යන මේ තුන අභිසංසකාරමාර නම්. සක්ඛ්‍යයන්ගේ බිඳීමෙන් වන මරණය මෘත්‍යුමාර නම්. පරනිර්මිතවශවර්තිදිව්‍යලොකයෙහි එක් පෙදෙසක වසමින් සිය පිරිසෙහි ඉසුරුබව පවත්වන මහානුභාවසම්පන්න දිව්‍යපුත්‍ර තෙමේ දෙවපුත්‍රමාර නම්. මේ පස් වැදෑරුම් මරුන් අතුරෙහි ලා මෙහි ගැණෙන්නේ රාගාදී වූ කෙලෙස්මරු ය.

විදර්ශනාප්‍රඥාව හා මාර්ගප්‍රඥාව ප්‍රඥායුධ නම්. සංසකාරධර්මයන් අනිත්‍ය – දුඃඛ – අනාත්ම විසින් දක්නා නුවණ විදර්ශනාප්‍රඥා නම්. සොතාපත්තිආදිආර්‍ය්‍යමාර්ග පිළිබඳ වූ නුවණ, මාර්ගප්‍රඥා නම්. විදර්ශනාප්‍රඥා යි කියූ සංසකාරයන් අනිත්‍යාදිවශයෙන් දක්නා නුවණින් රාගාදිකෙලශයෝ තදඞ්ගාදිවශයෙන් සංසිඳී යන්නෝ ය. එසේ විදර්ශනාප්‍රඥාවෙන් තදඞ්ගාදිවශයෙන් සංසිඳී ගිය ඒ ඒ මාර්ගයෙන් වසා සිටින අවුරා සිටින කෙලශයෝ ආර්‍ය්‍යමාර්ගප්‍රඥාවෙන් මූලොච්ඡින්න වන්නෝ ය. මෙසේ විදර්ශනාප්‍රඥාවෙන් හා මාර්ගප්‍රඥාවෙන් කෙලෙස් කැපී සිඳී යන බැවින් එ දෙක ප්‍රඥායුධැ යි දක්වන ලද්දේ ය.

ඡිතං ච රක්ඛෙ = දිනන ලද තරුණ විදර්ශනාව රකින්නේ ය.

මේ තරුණවිදර්ශනාව අස්ථිර වූ විදර්ශනාප්‍රඥාසහිතචිත්තයෙන් තදඞ්ගාදිවශයෙන් කෙලෙස් නසාලීමෙන් උපදවා ගත යුතු ය. අභාවිත අබහුලීකෘත විදර්ශනාප්‍රඥාව තරුණවිදර්ශනා ය.

කෙලෙස්සතුරන් නසා උපදවා ගන්නා ලද තරුණවිදර්ශනාව හිත වූ අවාස, හිත වූ කාල, හිත වූ බොජුන්, හිත වූ පුද්ගලයන් හිත වූ දහම් ඇසීම් යනාදිය සෙවනය කරමින් වළඳමින් අතරතුර සමාපත්තීන්ට සමවදිමින් එයින් නැගිට පිරිසිදු සිතින් සංසකාරයන් මෙනෙහි කරමින් රැකියයුතු ය.

අතිවේශනො සියා = ආලය නො මැත්තෙක් වන්නේ ය.

ලැබූ තරුණවිදර්ශනාව ඇත්තේ, නැවැත නැවැත සමවතට සමවැද ඉන් නැගිට පිරිසිදු සිතින් සංසකාරයන් මෙනෙහි කරන්නේ, උපදවා ගත් තරුණවිදර්ශනාව රැක ගැණුමෙහි සමර්ථ වන්නේ ය. මත්තෙහි මාර්ගඥානලාභයෙන් සියලු කෙලෙස් මරුන් දිනන්නේ ය. නො එසේ වූයේ, සමාපත්තියෙහි ම ආලය කරමින් සිටි ද, පිරිසිදු සිතින් නැවැත නැවැත සංසකාරයන් මෙනෙශු කෙරේ ද, එකල සිත කෙලෙස්සතුරන් විසින් යටපත් කරණ ලදු ව, ලැබූ තරුණවිදර්ශනාව නැසීයෑමෙන් මගපල ලැබීමට අපොහොසත් වන්නේ ය.

එහෙයින් රැකියයුතු වූ තරුණවිදර්ශනාව, හිත වූ ආවාස භොජනාදිය සෙවනය කිරීමෙන් ද, අතරතුර සමාපත්තියට සම වැද ඉන් නැගිට පිරිසිදු සිතින් සංස්කාරයන් මෙනෙහි කිරීමෙන් ද රකිනු විනා සමාපත්තියට ඇතුල් ව එහි නො විසියයුතු ය. එහි ආලය නො කටයුතුය යි දක්වන්නට **'අනිවෙසනො සියා'** යනු වදාළෝ ය.

මේ අටුවාව කියූ සැටි:

'යථා නාම යොධො සඞ්ගාමසීසෙ බලකොඨකං කත්වා අමිත්තෙහි සඩිං යුජ්ඣන්තො ජාතො වා පිපාසිතො වා හුත්වා සන්නාහෙ වා සිථිලෙ ආයුධෙ වා පතිතෙ බලකොඨකං පවිසිත්වා විස්සමිත්වා භුඤ්ජිත්වා පිවිත්වා සන්නයහිත්වා ආයුධං ගහෙත්වා පුන නික්ඛමිත්වා යුජ්ඣන්තො පරසෙනං මද්දති, අජිතං ජිනාති, ජිතං රක්ඛති, සො හි සවෙ බලකොඨකෙ සිතො එවං විස්සමන්තො තං අස්සාදෙන්තො අච්ඡෙය්‍ය, රජ්ජං පරහත්ථගතං කරෙය්‍ය, එවමෙව භික්ඛු පටිලඩං තරුණ විපස්සනං පුනපපුන සමාපත්තිං සමාපජ්ජිත්වා වුට්ඨාය සුඩ චිත්තෙන සඞ්ඛාරෙ සම්මසන්තො රක්ඛිතුං සක්කොති, උත්තරිං මග්ගපටිලාභෙන කිලෙසමාරං ජිනාති, සවෙ පන සො සමාපත්තිමෙව අස්සාදෙති, සුඩචිත්තෙන පුනපපුන සඞ්ඛාරෙ න සම්මසති, මග්ගඵලපටිවෙධං කාතුං න සක්කොති, තස්මා රක්ඛිතබ්බයුත්තකං රක්ඛන්තො අනිවෙසනො සියා, සමා පත්තිනිවෙසනං කත්වා තත්ථ න නිවසෙය්‍ය, ආලයං න කරෙය්‍ය' යනු.

යුඩභූමියෙහි බලකොටුවක් බැඳ සතුරන් හා යුද කරණ යුඩභට තෙමේ, බඩසසින් පෙළුනේ, බලකොටුවට ඇතුල් ව විඩා සංසිඳුවා කා බී අවුත් නැවැත යුඩ කරන්නේ, සතුරු සෙනාව පලවා හරියි. නො දිනූ දෙය දිනයි. ජය අත් පත් කෙරෙයි. ජයෙහි ස්ථිර වෙයි. එමෙන් යමෙක් තමන් ලත් තරුණවිදර්ශනාව සත්ප්‍රාය වූ ආවාසාදිය සෙවනයෙන් හා පිරිසිදු සිතින් සංස්කාර යන් මෙනෙහි කිරීමෙන් රැක ගන්නේ ද, ඔහු කෙලෙස්සතුරන් පලවා හැර, මාර්ගඵලප්‍රතිලාභයෙන් ජය අත්පත් කෙරෙයි. ජයෙහි ස්ථිර ව පිහිටයි.

යම් ලෙසකින් යුඩභට තෙමේ, බලකොටුවට ඇතුල් ව දිනන ලද්දෙහි ආලය කරමින් විඩා සංසිඳුවා කා බී එහි සිටින්නේ ද එකල ඔහු දිනූ දෙය ද සතුරන් අතට පත් වන්නේ ය. එ මෙන් සමාපත්තියෙහි ම ආලය කරමින් ඉන් සතුටු වෙමින් සංස්කාරයන්

මෙනෙහි කිරීමෙන් උපදවා ගත් තරුණවිදර්ශනාව නිසි සේ නොවඩා සිටින්නේ, ලැබූ තරුණවිදර්ශනාවෙන් ද පිරිහෙන්නේ ය. කෙලෙස්මරුන්ගේ වශයට යන්නේ ය. එ හෙයින් සමාපත්තියෙහි ආලය නොකටයුතු ය යි දක්වන ලද්දේ ය.

'මහණෙනි! කරුණු මෙසේ බැවින් තෙපි ද එකාන්තයෙන් මෙසේ කරවු' යි බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූන්ට මෙසේ දහම් දෙසූහ. ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ පන් සියයක් දෙනා වහන්සේ හුන් තැන හුන්නෝ ම, සිවුපිළිසැඹියාවන් ලබා රහත් ව බුදුරජානන් වහන්සේගේ රන්වන්සිරුරෙහි ගුණ කියමින් තුති පූජා පවත්වමින් වඳිමින් එහි පැමිණියහ.

ආරබ්ධවිදර්ශකභික්ෂුවස්තුව නිමි.

පූතිගත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ

3 — 7

සැවැත්නුවර වැසි එක් කුලපුත්‍රයෙක් බුදුරජුන්ගෙන් බණ අසා පැවිදි ව ලැබූ උපසම්පදා ඇත්තේ 'තිස්ස' යි ප්‍රසිද්ධ වූයේ ය. මදකලක් ගිය පසු උන්වහන්සේගේ සිරුරෙහි රොගයෙක් හට ගත්තේ ය. පළමු කොට සිරුරෙහි අබඇට තරම් බිබිලි නැංගේ ය. ඒ බිබිලි පිළිවෙළින් මුංඇට තරම් ව කඩල තරම් ව ඩෙබර තරම් ව නෙල්ලි තරම් ව බෙලිගැට තරම් ව මහත් ව ගොස් අන්තිමේ දී පැළී ගියේ ය. සිරුර ආස්සදයක් සේ පිළිදැගුම් නො කොට හැකි බවට පත් විය. හඳනා පොරෝණා සිවුරු ද ලේ සැරවෙන් තෙමී ගියේ ය. ගෝලබාලයෝ ද පිළිදැගුම් කරන්නට බැරි ව උන් වහන්සේ අත් හළහ. එයින් උන්වහන්සේ අනාථභාවයට පැමිණ ඇද වැටී නිදි ගත්හ. මෙසේ සිරුර කුණුවී ගිය බැවින් පූතිගත්ත ස්ථවිරැයි පසු ව ප්‍රසිඩ වී ගියේ ය.

බුදුවරයෝ වනාහි, දවසට දෙවරක් ලොකය බලා වදාරති. ඒ වනාහි බුදුවරුන් විසින් අත් නො හළ ධර්මතාවයක් වේ. ලොකය බලා වදාරන විට, සක්වළැ මුවවිට පටන් ගන්ධකුටි අභි මුඛයට නුවණ පතුරුවා බලන සේක. සවස ලොව බලන විට ගඳකිළිය පටන්, සක්වළැ මුවවිට දක්වා නුවණ පතුරුවා බලන සේක. මේ ධර්මතාවය ලෙසින් ලෝ බලා වදාරන අපගේ ස්වාමි දරු වූ බුදුරජානන් වහන්සේගේ නුවණට තිස්ස ස්ථවිරයන් වහන්සේ පෙණී ගියහ. එවිට බුදුරජානන් වහන්සේ තිස්ස තෙරුන් තුළ රහත්වීමට තුබූ බලවෙගය දැක 'මේ නම ගෝලබාලයන් විසින් අත් හැර දමන ලද්දේ ය, දැන් මා මිසක් අන් පිහිටෙක් මොහුට නැතැ'යි ගඳකිළියෙන් නික්ම විහාරචාරිකාවෙහි වඩින සේක් ගිනිහල්ගෙට වැඩ සැළියක් ගෙණ සෝදා එහි වතුර වත් කොට ලිප උඩ තබා වතුර උණු කරමින් එතැන ම වැඩ සිටි සේක. වතුර රත් වූ බව දැන තිස්ස තෙරුන් හුන් තැනට වැඩ ඒ තෙරුන් නිදා හුන් ඇඳෙහි කෙළවරක් උස්සා ගත් සේක. ඒ දුටු භික්ෂූහු 'ස්වාමීනි! අනේ, පැත්තකට වනු මැනැවි, අපි ඔසොවා ගන්නෙමු'යි ඇඳ දෙ කෙළවරින් ඔසොවා ගෙණ ගිනිහල්ගෙට ගෙණ ගියහ. ඉක්බිති බුදුරජානන් වහන්සේ ඔරුවක් ගෙන්වා උණුදිය එහි වත් කොට භික්ෂූන් ලවා තිස්ස තෙරුන් පෙරවූ සිවුරු ගෙන්වා උණු දියෙහි ලා පොඩි කරවා සෝදවා මඳඅව්වෙහි ලා වියළ වූ සේක. නැවැත ඒ තෙරුන් ලඟ ම වැඩ සිට උණුදිය ඇඟ වත් කරමින් ඇඟ උලා නෑ වූ සේක. ඒ අවසානයෙහි අව්වෙහි ලූ සිවුරුද වේලී

තුබුනෙන් ඒ ගෙන්වා හන්දවා ඇද තුබූ සිවුරු ගෙණ සෝදවා එය ද අවිවෙහි දුම්ම වූ සේක. ඇඟෙහි වතුර වියලී යන විට ඒ ද වියලින. ඉක්බිති තිස්ස සඵවිර තෙමේ එකක් හැඳ එකක් පොරවා ගෙණ සැහැල්ලු සිරුරු ඇති ව එකඟ වූ සිතින් ඇඳෙහි සයන කෙළේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ තිස්ස තෙරුන්ගේ හිස්දෙර වැඩ සිට 'මහණ! තාගේ මේ සිරුර පහ වූ සිත් ඇත්තේ උපකාර නැති ව දඬුකඩක් සේ පොළොවෙහි හෝනේ ය'යි වදාරා මේ ධම්මදෙශනාව කළ සේක:-

අචිරං වතයං කායෝ පඨවිං අධිසෙස්සති,
ඡුඩෝ අපෙතවිඤ්ඤාණෝ නිරත්ථං ව කලිඞ්ගරනති,

මේ කය, එකාන්තයෙන් නොබෝ කලකින් පහ වූ සිත් ඇත්තේ (එහෙයින්ම) බැහැර ලන ලද්දේ, වැඩක් නැති දිරා ගිය දරකඩක් සේ පොළෝ මතුපිට හෝනේ ය.

අචිරං = නොබෝ කලකින්. කල් නො යවා.

එදා කෙසේ වුව ද, අද නම් මිනිසුන්හුගේ පරමායුෂය පමණ කළ හැක්කේ පමණ කළ යුත්තේ සැට වසක් කොට ය. අතර තුර මෙයට වඩා හවුරුදු ගෙවා මැරෙන්නෝ ද, මෙහි නො වන්නෝ නො වෙති. අද පරමායුෂය සැට වසකින් පමණ කළ යුත්තේ ය යි කිය යුත්තේ බොහෝ සේ පැවැත්ම අනුව ය. යමෙක් සැට වසක් හෝ එයට වැඩි තරම් වසක් හෝ ජීවත් වන්නේ නමුදු, ඒ ජීවිත කාලය එතරම් දීර්ඝ වූවෙක් නො වේ. අචිරං' යන්නෙන් එය දැක්වූ සේක.

අයං කායෝ වත = මේ කය ඒකාන්තයෙන්. නියමයෙන් ම. නොවෙනස්ව ම.[1]

පඨවිං අධිසෙස්සති = පොළොවෙහි හෝනේ ය. පොළොව මතුයෙහි නිදන්නේ ය.

මෙහිලා 'කෝ ඉමං පඨවිං විජෙස්සති' යන්නට කළ පරිකථාව බැලිය යුතු ය. මෙහි **පඨවි'** යන්නෙන් පස්පොළොව ගැණේ. **'අධි පූර්ව සි × සයෙ'** යන ධාතුහුගේ යොගයෙහි ආධාරාර්ථයෙහි **පඨවිං'** යි විතීයාවිභක්තිය වූවා ය.

ඡුඩෝ = බැහර ලන ලද්දේ.

අපෙතවිඤ්ඤාණෝ = පහවූ සිත් ඇත්තේ.

සිත නැති සිරුරෙන් වැඩෙක් නැත්තේ ය. එහෙයින් බැහර ලෑ යුතු ම ය.

---

1. 3. 6. 'කායකම්මං' යන්නට කළ පරිකථාව බලනු.

නිරත්ථං ඉව කළිඞ්ගරං = වැඩක් නැති දිරා ගිය දඬු කඩක් සේ.

දූවදඬුවලින් වැඩ ගන්නා වූ මිනිස්සු වනයට ගොස් ඇද නැති දූවදඬු ඇදනැති සැටියෙනු ත් ඇදඇති දඬු ඇදඇති සැටියෙනු ත් කපා, ගැට මොට සැස වැඩට ගෙණ, ගැට මොට සිදුරු ඇති දූවදඬු වනයෙහි, දමා යෙති. ඊට පසු අන් කෙනෙක් එහි ගියාහු ද, ඒ දූවදඬු බලා තමන්ට වැඩට ගත හැකි වූවක් ම ගෙණ යෙති. අන් සියල්ල පොළොවෙහි ම දිරා යෙයි. වනයෙන් ගෙණ ආ දූවදඬුවලින් ඇඳ, පුටු, මේස, අල්මාරි ආදී වූ යම් කිසි ගෘහොපකරණ සාදු ගණිති. එහෙත් මේ සිරුරෙහි එක් කොටසකු ත් ඇඳ පුටු සාදු ගැණීම් ආදී කිසිම වැඩක් පිණිස නො පවත්නේ ය. එහෙයින් මේ සිරුර පහ වූ සිතැත්තේ, පලක් නැති දිරා ගිය දර කඩක් සේ යි වදාළ සේක. එය මෙසේ කීහ අටුවායෙහි:-

'දබ්බසම්භාරත්ථිකා හි මනුස්සා අරඤ්ඤං පවිසිත්වා උජුං උජුකසන්තානෙන, වඞ්කං වඞ්කසන්තානෙන, ඡින්දිත්වා දබ්බසම්භාරං ගණ්හන්ති, අවසෙසං පන සුසිරඤ්ච පූතිකඤ්ච ගණ්හිජාතං ච ඡින්දිත්වා තත්ථෙව ජඩ්ඩෙන්ති, අඤ්ඤං දබ්බත්ථිකා ආගන්ත්වා තං ගහෙතා නාම නත්ථි, ඔලොකෙන්තා අත්තනෝ උපකාරං එව ගණ්හන්ති, ඉතරං පඨවිගතං එව හොති, තං පන තෙන තෙන උපායෙන මඤ්චපටිපාදකං වා පාදකඨලිකං වා ඵලකපීඨං වා කාතුං සක්කා පි හවෙය්‍ය, යෝ පන ඉමස්මිං පන්නත්තභාවෙ වත්තිංසාය කොට්ඨාසෙසු එක කොට්ඨාසොපි මඤ්චපටිපාදකවසෙන අඤ්ඤස්ස වා උපකාර මුඛෙන ගය්හූපගො නාම නත්ථි, කෙවලං නිරත්ථං ච කළිඞ්ගරං, අයං අපගතවිඤ්ඤාණෝ කතිපාහස්සෙව පඨවියං සෙස්සති'

'ආයු උසුමා ච විඤ්ඤාණං යදා කායං ජහන්ති මං,
අපවිඩ්ඪා තදා සෙති යථාකඨං අවෙතනං'

රූපජීවිතෙන්ද්‍රිය කම්ජතෙජොධාතුව විඤ්ඤාණය යන මේ තුන මේ සිරුර හැර දමා පහව යේ ද, එ කල්හි බැහැර ලූ මේ සිරුර සිත් පිත් නැති දරකඩක් සේ ශයනය කරයි.

'භොගබන්ධුපරිච්චත්තෝ පතිතෝ කම්මබන්ධනා,
එකකෝ කපණෝ සෙති ඡඩ්ඩිතබ්බෝ ලහුං තදා'

මේ සිරුර උපභොග පරිභොග ඥාති මිත්‍රාදීන් විසින් හරණ ලද්දේ කම් නැමැති බන්ධනයෙන් වැටුනේ, දින වූයේ, වහා ම බැහැර ලිය යුත්තේ එකලා ව ශයනය කෙරේ.

'ජෙගුච්ඡවිවටචාරො සජීවාකාරනිස්සටො
අවිස්සාසපුරෙක්ඛාරො අවමඞ්ගලසජ්ජිතො'
'ගුථපිණ්ඩො ව සඞ්කාරකූටාදීසු නිරත්ථකො,
කායො අපෙතවිඤ්ඤාණො අනපෙක්ඛෙහි ඡඩ්ඩිතො'

පිළිකුල් වූ ඇරුණු නව දොරක් ඇති දිවි තොර වූ අවිශ්වාස ජනයන් විසින් පිරිවරා ගත් අවමඟුලෙන් සැදුනු, පහ වූ සිත් ඇති, එහෙයින් ප්‍රයොජන නැති මේ ශරීරය තෙමේ කසළගොඩ ආදියෙහි වූ අසුවි පිඩක් සේ බලාපොරොත්තු නැත්තන් විසින් බැහැර ලන ලද්දේය.

'විහතීහච්චයෙනෙව උද්ධුමාතකතං ගතො,
විරූපො හොති සම්භිමො විජාතාය පි මාතුයා'

දෙතුන් දිනක් ඉක්ම ගිය පසු ඉදිමුනුබවට ගිය මේ සිරුර වැදූ මවට ද බිය දෙන විරූප එකෙක් වන්නේ ය.

'සබ්බෙ නීලත්තමායන්ති වණ්ණා සාමාදයො තතො,
පක්කභාවං ගතො පච්ඡා දෙහනිස්සිතලොහිතෙ,

ඉන් පසු සියලු සම්වන් ඈ පැහැය නිල් බවට යයි. නැවැත සිරුර ඇසුරු කළ ලෙය සැරව බවට ගොස්,

'සහෙවාසුවිසොතෙහි පග්ඝරන්ති කිමී තතො,
ඡාදෙන්ති සකලං දෙහං භින්නභත්තපුටං විය'

මේ සිරුරෙන් පිටතට වැගිරෙන අසුවිධාරාවන් සමග පණුවෝ වැගිරෙත්. නැවැත බත්මුළක් සේ සියලු සිරුර වසා ගණිත්.

'තථා සුවි පග්ඝරන්ති භින්දිත්වාන ඉතො විතො,
ඡින්නබන්ධනයන්තොව ඡෙජ්ජතෙ සන්ධිබන්ධනං,

එසේ ම ඔබිනොබින් බිඳී කුණු වැගිරේ. සිඳී ගිය බැඳුම් ඇති යන්ත්‍රයක් සේ ඇටහන්දියෙහි නහර බැඳුම් සිඳී යයි.

'විතිණ්ණො භවතී කායො තත්ථ තත්ථ විභාගසො,
ඛාදිතෙ සොණකාදීහි දෙහභාවම්පි නොදති'

සිරුර ඒ ඒ තැන විසුරුනේ වේ. බලු ආදීන් විසින් කෑ කල්හි සිරුරු සටහන ද පහව යයි.

'අනිලාතපවුඨීහි තතො ජිණ්ණත්තමාගතෙ,
සබ්බෙ අන්තරධායන්ති නාමමත්තම්පි නො භවෙ'

අවු සුළඟින් හා වැස්සෙන් දිරුම් කඩට පැමිණි කල්හි සියලු අවයව අතුරු දහන් වේ. නම පමණකුත් ඉතිරි නො වේ.

'යානිමානි අපත්ථානි අලාපුනෙව සාරදෙ,
කාපොතකානි අඨීනි තානි දිසවාන කා රතී'

ශරත්කාලයෙහි ඒ ඒ තැන, දැමූ ලබුමෙන් කොබෝවත් පැහැ ඇති යම් ඹිනී ඇට වේ ද, ඒ ඹිනී ඇට දුක, කි නම් කාමරතියක් වේ ද.

'යෙ පූතිකායමහි කරොනති ඡන්දං
ජාතිං ජරං ව්‍යාධිමථො චුතිඤ්ච,
පුනප්පුනං තෙ සම්පෙනති බාලා
බාලා යථා ඛෙත්තුම්පෙනති වච්ඡා'

යම් කෙනෙක් මේ සිරුරෙහි ආලය කෙරෙත් ද, ඒ අඳුයෝ මවු කරු කුඩාවස්සන් යන්නා සේ නැවැත නැවැත ඉපදීමට දිරීමට ලෙඩට මරණයට පැමිණෙත්.

'තතො සරීරෙ බහුපඤ්චාලයෙ
පහාය එතමහි රතිං අසෙසතො,
විවිත්තයනෙතා පරමං ඉමං විධිං
තරෙය්‍ය ඛිප්පං භවසාගරං බුධො'

බොහෝ උවදුරුවලට තැන් වූ මේ සිරුරෙහි ආලය මුළුමනින් හැර දමා, නුවණැත්තේ මේ ලෙස සලකා වහා සසරසයුර එතර කරන්නේ ය.

'අචිරං වතයං කායො' යනාදීන් වදාළ ධර්මදෙශනාව අවසාන යෙහි නිස්ස ස්ථවිරයන් වහන්සේ පිළිසැඹියාවත් ලබා රහත් වූහ. අන් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියහ. නිස්ස ස්ථවිරයන් වහන්සේ රහත්බවට පැමිණ ම පිරිනිවි සේක. බුදු රජානන් වහන්සේ නිස්ස තෙරුන්ගේ ආදහනය කරවා ධාතූන් ගෙන්වා සැයක් කරවූ සේක.

එක් දිනෙක, භික්ෂූන් වහන්සේලා 'නිස්ස ස්ථවිර තෙමේ කොතැනැ උපන්නේ දැ' යි බුදුරජුන් වෙතින් ඇසූහ. උන්වහන්සේ 'නිස්ස තෙමේ පිරිනිවියේ ය' යි වදාළවිට, නැවැත ත් භික්ෂූහු 'රහත්වීමට වාසනාගුණය තුබූ මෙබඳු කෙනකුගේ සිරුරෙහි ඇට බිඳී ගියේ කුමක් නිසා ද, රහත්වීමට වාසනා ගුණය ලැබූයේ කෙසේ ද' යි ඇසූහ. 'මේ සියල්ල ඔහු විසින් පෙර කළ කර්මය පරිදි සිදුවී ය' යි වදාළ විට 'ඔහු පෙර කළ ඒ කර්මය කුමක් ද' යි නැවැත ඇසූහ.

'මේ තිස්ස තෙමේ කාශ්‍යප බුදුරජුන්ගේ කාලයෙහි පක්ෂි වැද්දෙක් ව සිටියේය, දුල් හා දුනු ගෙණ වනයට ගොස් බොහෝ පක්ෂීන් අල්ලා ගෙණ වුත් පොහොසතුන්ට තැගි කොට දී ඉතිරි වන පක්ෂීන් විකුණයි, විකුණා ඉතිරිවූවන් මරා තබයි, මරා තැබුවෝ කුණු වී යත්, පියාසර කරන්නට නොහැකිවන සේ කුරුල්ලන්ගේ කෙණ්ඩා ඇට ත් පියාපත් ඇට ත් කඩා පොඩි කොට ගොඩ ගසා තබයි, එසේ ඇට කඩා තැබූවන් පසු ද විකුණයි, ඉතා වැඩිගණනක් අල්ලා ගත් දිනවල දී තමා ත් උයවා කයි, තිස්සට රසමසවුලෙන් කෑම පිළියෙල කළ එක් දවසෙක රහතුන් වහන්සේ නමක් ඔහුගේ ගෙට පිඬු සිඟා වැඩියහ, තිස්ස, ඒ තෙරුන් දැක සිත පහදා 'මා විසින් බොහෝ පක්ෂීහු මරා කන ලද්දාහ, අද පින්වතුන් වහන්සේ නමක් මාගේ ගෙට වැඩි සේක. අද මෙහි රසවත් කෑම තිබේ, මුන්වහන්සේට පිණ්ඩපාතය දෙමි' යි පාත්‍රය පුරවා පිණ්ඩපාතය දී පසඟ පිහිටුවා වැඳ 'සවාමීනි! මම ත් ඔබවහන්සේ ලත් ධර්මයෙහි මුදුන් පැමිණෙන්නෙමි' යි කී ය. රහතුන් වහන්සේ ද 'එසේ වේවා' යි අනුමොදනා කළහ, තිස්ස විසින් දුරදිග නොබලා පව්පින් නොසලකා මෙලොව පරලොව නොදැන, එදා කළ මේ කර්මයාගේ විපාක විසින් තිස්සට මේ සිදු විය, කුරුල්ලන්ගේ ඇට බිඳීම නිසා තිස්සගේ සිරුර කුණු විය, ඇට පැළුනේ ය, රහතුන්ට පිණ්ඩපාතය දීම නිසා රහත් විය' යි බුදුරජානන් වහන්සේ එ පුවත මෙසේ වදාළ සේක.

පූතිගත්තතිස්සත්ථේරවත්ථු නිමි.

නන්ද එඬේරා

3 – 8

අනේපිඬුමහසිටාණන්හට ගවයන් රක්නා ධනවත් නන්ද නම් එඬේරෙක් සිටියේ ය. ඔහු **ඛෙනියජටිලයා** පැවිදි වෙසයෙන් හැසුරුනා සේ එඬේරකමින් රාජබලිපරිහරණය කරමින් සකීය ධනය රැක බලා ගණියි. කලින් කල අනේපිඬු සිටාණන්හට පස් ගොරස ගෙණ යන්නේ එහිදී බුදුරජුන්ගෙන් බණ අසා පැහැද උන්වහන්සේට තමන්ගේ ගෙට වඩින්නට ආරාධනා කොළේ ය. එහෙත්, උන්වහන්සේ එහි නො වැඩ ඔහුගේ නුවණ මෝරන තුරු කල් බලමින් හුන් සේක. ඒ අතර ක්‍රමයෙන් නුවණ මේරුනේ ය. බුදු රජානන් වහන්සේ භික්ෂුසඞ්ඝයා ත් ගෙණ චාරිකාවෙහි වඩිනා සේක් ඔහුගේ ගෙට නො දුරෙහි වූ එක්තරා ගසක්මූල වැඩ හුන් සේක. නන්ද තෙමේ බුදුරජුන් තමන් ගේ ගෙට නො දුරෙහි ගසක් මූල වැඩහිඳින බව දැන බුදුරජුන් වෙත ගොස් වැඳ පිළිසඳර කතා කොට බුදුරජුන් පවරා සත් දවසක් ම භික්ෂුසඞ්ඝයාට පංචගොරසය දුන්නේ ය. අවසානයෙහි සත්වන දා බුදුරජානන් වහන්සේ ධර්මදේශනා කළ සේක. ඒ අවසන්හි ඔහු සෝවන් වී බුදුරජුන්ගේ පාත්‍රය ගෙණ උන්වහන්සේගේ පසු පසැ ගියේ ය. එසේ බොහෝ දුර ගිය ඔහුට 'නවතින්නැ' යි වදාළ විට නැවතුනේ ය. ඒ වේලෙහි ම ඔහු එක්තරා වැද්දකු විසින් විද්දා වූ ඊ පහරකට අසුවී මැරී වැටුනේ ය. භික්ෂූන් වහන්සේලා ඒ දැක බුදුරජුන්ට ලංව 'ස්වාමීනි! නන්ද තෙමේ වැද්දකුගේ ඊ පහරකට අසුවී මළේ ය, ඔබ වහන්සේගේ පසුපසැ නො ගියේ නම්, ඔහුට මේ අනතුර සිදු නො වන්නේ ය' යි කියා සිටියහ. 'මහණෙනි! මා ආවත් නාවත් මා පස්සේ ගිය ත් නො ගිය ත් ඔහුට ඒ මරණය වන්නේ ම ය, මෙයින් නිදහස් වීමට උපායයෙක් ඔහුට නැත, ඔහු සතර දිගට, සතර අනුදිගට ගියේ ද මැරුම් කන්නේ ය, මෙය හොරුන් කරන්නෙක් සතුරන් කරන්නෙක් නො වේ, මෙය කරන්නේ ඒ ඒ සත්වයන් විසින් වරදවා පිහිටුවන ලද දුෂිත වූ සිත ය' යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

දිසෝ දිසං යන්තං කයිරා වෙරී වා පන වෙරිනං,
මිච්ඡාපණිහිතං චිත්තං පාපියෝ නං තතෝ කරෙ තිං.

සොරෙක් එ බදුවූ ම සොරකු දැක ඔහුට යම් විපතක් කරන්නේ ද බඩවෙර ඇත්තෙක් එබදු වූ ම බඩවෙර ඇත්තකු දැක ඔහුට යම් අවැඩක් කරන්නේ ද, වරදවා තැබූ සිත, ඔහු එයට වඩා ඉතා පවිටකු කරන්නේ ය.

දිසෝ දිසං යනතං කසිරා = සොරෙක් සොරකුට යම් ඒ අවැඩක් කරන්නේ ද.

එක්තරා එකක්හු ගේ අඹුදරු දුසි දස් කෙත් වත් ගෙරි මිටුන් ඇ සියලු සැපත පැහැර ගත් මිත්‍රද්‍රෝහී වූ සොරෙක් නැවැත එසේ ම තමාගේ ද සැපත පැහැර ගත් සොරකු දුක ඔහුගෙන් පළි ගැණීමට ඔහුගේ ද අඹුදරු දුසි දස් ඇ සැපත් පැහැර ගැණුම් වසයෙන් අවැඩ කරන්නේ ය. මෙය නුගත් මිනිසුන්ගේ සිරිති. පළිගැණීම නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. එය මිනිසුනට අවැඩ පිණිස වන්නේ ය.

'අන්‍යයන් ප්‍රිය නො කරන්නා ය, යන තේරුම පිට හෝ අන්‍යයන් විසින් ප්‍රිය නො කරණු ලබන්නා ය' යන තේරුම පිට හෝ සොරා **දිස** යි කියනු ලැබේ. **'පරෙ දෙසසති න පටියායති පරෙහි වා දෙසසියති පියො න කරියති ති =දිසෝ'** යනු අරුත් පැවසීම ය.

වෙරී වා පන වේරිනං = වෛර ඇත්තේ වෛර ඇත්තකුට අවැඩ කරන්නේ ය.

සිතෙහි හටගන්නා නො සතුට සැඩබව වෛර නම්. ඒ ඇත්තේ වෛරී නම් වේ.[1] සොරෙක් හෝ බඩවෛර ඇත්තෙක් හෝ තමාට අවැඩ කළහුගෙන් පළිගැණීමට, යම් නපුරක් අවැඩක් කෙරේ නම්, එක ම අත්බවක ඔහුගේ අඹුදරු දුසි දස් කෙත් වත් ගෙරි හරක් ඇ සැපත පැහැර ගණියි. ධනය හෝ පැහැර ගණියි. ජීවිතය හෝ නසයි.

මිච්ඡාපණිහිතං චිත්තං = වරදවා තැබූ සිත.

දශ අකුශල කර්මපථයෙහි යෙදූ සිත වරදවා තැබූ සිත නම් වේ. ශීලාදිගුණධර්මයන්හි පිහිටා සුදුසු කර්මස්ථානයක නො යෙදූ දරදඬු සිත හෝ **මිච්ඡාපණිහිතචිත්ත'** නම්.

පාපියො නං තතො කරෙ = එයට වඩා ඔහු ඉතා පව්ටකු කරන්නේ ය.

මේ අත්බවේදී ම එසේ වූ සිත් ඇත්තහු පරිභව වධබන්ධනාදී වූ නන්වැදෑරුම් දුකට පමුණු වන්නේ ය. පරලොව නොයෙක් සියදහස් ජාතීන්හි සතර අපායයෙහි හෙළා හිස ඔසොවා ගන්නට නො දෙන්නේ ය.

---

1. 1 - 4 'න හි වෙරෙන' යන්නට කළ පරිකථාව බලනු.

එහෙයින් බුදුරජානන් වහන්සේ වදාළෝ ය මෙසේ.

'චිත්තං භික්ඛවෙ! අභාවිතං අකම්මනියං හොති' මහණෙනි! නො වැඩූ සිත කටයුතුවලට සුදුසු නො වේ.

'චිත්තං භික්ඛවෙ! අභාවිතං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි! නො වැඩූ සිත මහත් අනර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! අභාවිතං අපාතුභූතං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි! නො වැඩූ විදසුන් ඈ අරමුණු කොට පහළ නො වූ සිත මහත් අනර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! අභාවිතං අබහුලීකතං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි! නො වැඩූ බහුල වශයෙන් නො වැඩූ සිත මහත් අනර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! අභාවිතං අබහුලීකතං දුක්ඛාවහං හොති' මහණෙනි! නො වැඩූ බහුල වශයෙන් නො වැඩූ සිත දුක් එළවන්නේ ය.

'චිත්තං භික්ඛවෙ! අදන්තං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි! නො දැමුනු සිත මහත් අනර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ, අගුත්තං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි! අගොපිත වූ සිත මහත් අනර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! අරක්ඛිතං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි! කො රැකි සිත මහත් අනර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! අසංවුතං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි, නො හික්ම වූ සිත මහත් අනර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං මහතො අනත්ථාය සංවත්තති' මහණෙනි! නො දැමූ අගොපිත වූ නො රැකි නො හික්මුනු සිත මහත් අනර්ථ පිණිස පවතී.

නැවැත උන්වහන්සේ මේ කාරණය ම උපමා ගෙණ හැර දැක්වීමෙන් මෙසේ ව්‍යක්ත කළ සේක. මේ එය.

'සෙය්‍යථාපි භික්ඛවෙ! සාලිසූකං වා යවසූකං වා මිච්ඡාපණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙච්ඡති, ලොහිතං වා උප්පාදෙස්සතීති නෙතං ඨානං විජ්ජති, තං කිස්ස හෙතු, මිච්ඡාපණිහිතත්තා භික්ඛවෙ! සූකස්ස, එවමෙව ඛො භික්ඛවෙ! සො වත භික්ඛු මිච්ඡාපණි-

හිතෙන චිත්තෙන අවිජ්ජං හෙච්ඡති, විජ්ජං උප්පාදෙස්සති, නිබ්බාණං සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති, තං කිස්ස හෙතු, මිච්ඡාපණ්හිතත්තා භික්ඛවෙ! චිත්තස්ස' යි.

මහණෙනි! වැරදි ලෙසට තැබූ හැල් වී නණ්ඩුවක් හෝ යව නණ්ඩුවක් හෝ අතින් හෝ පයින් මැඩුනේ අත හෝ පය එයින් බිඳෙන්නේ ය, ලේ ගලන්නේ ය, යනු නො විය හැකි ය. මෙය මෙසේ නො විය හැක්කේ ය එසේ නො විය හැක්කේ හැල්වී නණ්ඩුව හෝ යව නණ්ඩුව උඩු අක් කොට නො තබා, යට පැත්තට හරවා තැබූ බැවිනි. මහණෙනි! එමෙන් වැරදි ලෙසට පිහිට වූ සිතින් අවිද්‍යාව බිඳින්නට අභීන්මාගීඥාන විද්‍යාව උපද වන්නට, නිවන් අවබොධ කරන්නට නො හැකිය. නො හැක්කේ සිත වැරදි මග යෙදූ බැවිනි, යනු එහි කෙටි තේරුම ය.

බොහෝ සෙයින් සත්‍වයන්ගේ අපායොත්පත්තියට කරුණු වනුයේ වැරදිමගැ යෙදූ සිත ය. වැරදිමගැ යෙදූ සිතැත්තකුට අපායොත්පත්තියෙන් නරකයෙහි ඉපැත්මෙන් නිදහස්වනු නො හැකි ය. මේ ඒ දෙශනාව.

'ඉදාහං භික්ඛවෙ! එකච්චං පුග්ගලං පදුඨචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, ඉමම්හි චෙ අයං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ, තං කිස්ස හෙතු, චිත්තං හිස්ස භික්ඛවෙ! පදුඨං, චෙතො පදොසහෙතුච්ච පන භික්ඛවෙ! එවම්ධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජන්ති' යනු.

මහණෙනි! නො පැහැදුනු කැලඹුනු මඩ වූ දියවිලක්සමීපයෙහි සිටි ඇස් ඇත්තා වූ මිනිසෙක් ඒ විලෙහි එහා මෙහා පීනන හැසිරෙන සිටින සිප්පිබෙල්ලන් සක්බෙල්ලන් කැටගල් කැබිලිති මස්කැල යන මේ කිසිවක් විලෙහි දිය නො පැහැදුනු බැවින්, කැළඹුනු බැවින්, මඩ වූ බැවින්, නො දක්නේ යම් සේ ද, එසේ නො පහන් සිතින්, කැලඹුනු සිතින්, වැරදි ලෙස තැබූ සිතින්, ආත්මාර්ථය පරාර්ථය යන උභයාර්ථය නො දක්නේ ය. දශකුශල කර්මපථයෙන් මත්තෙහි වූ ධ්‍යානවිදර්ශනාමාර්ගඵල යන උසස් ගුණයක් මොන ලෙසකින් නමුත් ලබන්නේ ය යි කියන්නට කරුණු නැත. එබඳු නොපහන් කැළඹුන වැරදිලෙස තැබූ සිතින් ධ්‍යාන විදර්ශනා මාර්ගඵලාවබොධයක් නො වන්නේම ය.

'සෙය්‍යථාපි භික්ඛවෙ! උදකරහදො ආවිලො ලුලිතො කලලී භූතො, තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො න පස්සෙය්‍ය

සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිඨන්තම්පි, තං කිස්ස හෙතු, ආවිලත්තා භික්ඛවෙ! උදකස්ස, එවමෙව ඛො භික්ඛවෙ! සො වත භික්ඛු ආවිලෙන චිත්තෙන අත්තත්ථං වා ඤස්සති පරත්ථං වා ඤස්සති උභයත්ථං වා ඤස්සති උත්තරිං වා මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතී ති නෙතං ඨානං විජ්ජති, තං කිස්ස හෙතු, ආවිලත්තා භික්ඛවෙ! චිත්තස්සාති' යනු දෙශනා ය.

සොරෙක් හෝ සතුරෙක් විපතක් කෙරේ නම්, එය ඒ අවස්ථාවේදී ම කරන්නේය. දශඅකුශලකර්මපථයෙහි යෙදූ සිත නොයෙක් සිය දහස් ගණන් ජාතිවල දී සොර සතුරන් කරණ විපත්වලට වඩා බිහිසුණු විපත් කරන්නේ ය. සොරසතුරන්ගෙන් වන විපතට වඩා වැරදි මග යෙදූ සිතින් වන විපත ඉතා බලගතු ය. බිහිසුණු ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියහ. ධර්මදෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය. උපාසකයා විසින් අන්‍යභවයක දී කළ කර්මය භික්ෂූන් නො විචාළ බැවින් බුදුරජානන් වහන්සේ එය නො වදාළ සේක.

නන්දගොපාලවස්තුව නිමි.

සොරෙය්‍ය සිටුතුමා

3 – 9

ස්වාමිදරු වූ බුදුරජානන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් මහවෙහෙර වැඩවසන එක් දවසෙක **සොරෙය්‍ය** සිටුපුත් තෙමේ යහළුවකුත් සමග සැප පහසු ඇති රියෙක නැගී මහපිරිවරින් වතුර නෑමට නුවරින් නික්ම ගියේ ය. එ වේලෙහි **මහාකාත්‍යායන** මහාස්ථවිරයන් වහන්සේ පිඬු සිඟා යන්නට නුවරින් පිටත සිට සිවුරු පෙරවූහ. සිටුපුත් උන්වහන්සේගේ රන්වන් සිරුර දැක 'මේ ස්ථවිර තෙමේ මාගේ අඹුව වන්නේ නම්, නැත, මා බිරියගේ සිරුරුපැහැය මුන්වහන්සේගේ සිරුරුපැහැය සේ වන්නේ නම් යෙහෙකැ' යි සිතී ය. එ කෙණෙහි ම ඔහුගේ පිරිමි ඇඟ අතුරු දහන් ව ගොස් ගෑණුඇඟක් පහළ විය. එයින් හටගත් ලජ්ජා ඇති ඔහු රියෙන් බැස පලා ගියේ ය. පිරිවර ජන තෙමේ මේ කිසිත් නො දැන 'මේ කිමැ' යි අසන්නට විය. රියෙන් බැස ගිය ඕ තොමෝ තක්සලානුවරට යන මගට බැස්සා ය. යහළුවා ද ඇය ගිය අතක් නො දන්නේ ය. සියල්ලෝ වතුර නා ගෙවලට ගියහ. ගෙවල වැස්සෝ 'සිටුපුත් කොහි දැ' යි ඇසූහ. 'වතුර නා ගෙට ආයේය යි සිතුම්හ' යි ඔවුහු කීහ. එකල ඔහුගේ මවුපියෝ ඒ ඒ තැන සොයා බලා නො දක්නෝ මළේය යි සිතා මළබත් දානය දුන්හ. ගෑණුබවට පැමිණ පැන ගිය ඕ තොමෝ තක්සලා යන කරත්තයක් පස්සේ ගියා ය. කරත්තයෙහි හුන් මිනිස්සු ඇය දැක 'අපගේ කරත්තය පස්සේ එන මේ තරුණිය කවු දැ යි නො දනුම්හ' යි කීහ. ඕ තොමෝ මෙසේ පයින් ටික දුරක් ගොස් ඇඟිල්ලක තුබූ මුද්දක් ගලවා දී කරත්තයක යන්නට ඉඩ ලබා ගත්තා ය. ඒ කරත්තයෙහි යන සෙස්සෝ 'තක්සලාවෙහි අපගේ සිටුපුත්‍රයාහට භාර්‍යාවක් නැත, මේ වග ඔහුට කිය යුතු ය, එවිට අපට ත් පඬුරු මොකවත් ලබා ගත හැකි ය' යි සිතා එහි ගොස් 'ස්වාමීනි! නුඹවහන්සේට කැපෙන ගැළපෙන සත්‍රීරතනයක් අප විසින් ගෙණෙන ලද්දේ ය, ඇය පිළිගණු මැනැවැ' යි දන්වා සිටියහ. සිටුපුත් තෙමේ, එය අසා සතුටු ව ඇය කැඳවා බලා 'මෝ මට ම ගැළපෙන වයස් ඇත්තී ය, රූපලක්ෂණයෙන් යුක්ත ය, දුටු පමණින් සිත් සතුටු කරන්නී ය' යි සිතා බලවත් සෙනහයෙන් සිය බිරිය කර ගත්තේ ය.

මේ සසර, පුරුෂයෝ සත්‍රිහු ත්, සත්‍රිහු පුරුෂයෝ ත් නො වූ විරූවෝ නැත්තාහ. පුරුෂයෝ පරඹුවන් සෙවනය

කොට මිය ගොස් ලක්ෂගණන් අවුරුදු නරකයෙහි දුක් විඳ කලෙක මනුෂ්‍ය ව උපදින්නෝ නම්, අත්බව සියයක ම ගැණු ව උපදින්නෝ ය.

ආනන්ද සථවිරයන් වහන්සේ ද කල්ප ලක්ෂයක් පිරූ පැරැම් ඇති ආර්‍යශ්‍රාවකයෙක් ව සසර සැරිසරා එන්නෝ එක් අත් බවෙක කඹුරු කුලයක උපන්නෝ පරඹුවන් සෙවනය කොට නිරයෙහි ඉපිද දුක් විඳ ඉන් චුත ව මිනිස්ලොව උපන්නෝ කර්‍මාවශෙෂවශයෙන් තුදුස් අත්බවෙක අනුන්ට අඹු ව ගැහැණි ව උපන්හ. සියක් අත් බවෙක අණ්ඩවෙජ්දයට පැමිණියහ.

'ගැහැණු වනාහි දුනාදිපුණ්‍යකර්‍ම කොට ගැහැණු බවෙහි ආලය හැර, අප කළ මේ පිණ පිරිමිබවලැබීම පිණිස පවතීවා, සී සිනින් ඉටා ගෙණ කලුරිය කලෝ නම්, පිරිමි ව උපදින්නෝ ය,

භිමියා දෙවි කොට සලකා භිමියා කෙරෙහි මනා කොට පිළිපැදීමෙන් ද පිරිමිබව ලබන්නෝ ය. **මේ** සිටුපුත් තෙමේ මහා-කාත්‍යායන තෙරුන් කෙරෙහි නො මගින් සිතා, මේ අත්බවේදී ම ගැහැණු බව ලැබූයේ ය. තක්සලානුවර සිටුපුත් සමග එකතු ව වැස ඇයගේ කුසෙහි දරු ගැබක් පිහිටියේ ය. ඈ දස මසකට පසු පුතකු ලබා, ඔහු පයින් ඇවිදින කල්හි නවත් පුතකු ලැබුවා ය. ඇයගේ කුසෙහි උපන් දරු දෙදෙන ය, සොරෙය්‍ය සිටු කල, ඔහුට දුව උපන් දරු දෙදෙන ය යි දරුවෝ සිවු දෙනෙක් වූහ. ඇයගේ පෙර යහළු වූ ඒ සිටුපුත් තෙමේ බරකරත්ත පන් සියයක් ගෙණ සොරෙය්‍යනුවරින් සැප පහසු ඇති කරත්තයක නැගී තක්සලා නුවරට ගියේ ය. ඒ වේලෙහි ගෙයි උඩුමහලේ ජනේලයක් හැර පාර බලමින් සිටි ඈ, ඔහු දුක හැඳින වැඩකාරියක යවා ගෙන්වා උඩු මහලේ ම හිඳුවා සැලකිලි කළා ය. එවිට සිටුපුත් 'සොඳුර! ඔබ, මිට පෙර කිසි දිනෙක ත් අප විසින් නො දක්නා ලද්දෙහි නමුත් අපට බොහෝ සත්කාර කරන්නෙහි ය, ඔබ අප හඳුනන්නෙහි දැ' යි ඇසී ය 'එසේ ය, මම ඔබ හඳුනන්නෙමි, ඔබ සොරෙය්‍ය නුවර වැසියෙක් නොවෙහි දැ'යි ඇසූ විට 'සොඳුර! ඔව්, මම සොරෙය්‍ය වැසියෙක්මි' යි පිළිතුරු දින. ඉක්බිති ඕ තොමෝ, මවුපියන්ගේ ද බිරින්දගේ ද දරුවන්ගේ ද සැපදුක් විමසා ය. ඔහු ඒ හැම-දෙනාගේ සුවදුක් කියා 'ඔබ ඔවුන් හඳුනන්නෙහි දැ' යි ඇසී ය. ඈ 'එසේ ය, හඳුනමි, ඔවුන්ට එක් පුත්‍රයෙක් ඇත, ඔහු කොහි දැ'යි ඇසූ ය. 'සොඳුර! එහි විසතර බොහෝ ය, අපි දවසක් ඔහු සමග කරත්තයකට නැගී නාන්නට ගියෙමු, එහි දී ඔහු නො

පෙණී ගිය බැවින් අපි වට පිට සොයා බැලීමු, එහෙත් දක්නට නො ලැබුනේ ය, එවිට අපි ඒ වග ඔහුගේ මවුපියන්ට දැන්වීමු, ඔවුහු ද සොයා බලා මලේ වනැ සි මතකබත් දනක් දුන්හ'සි කී ය. එ වේලෙහි, ඇ, 'ඒ මම වෙමි' සි කී විට ඔහු වට පිට බලා 'කුමක් කියහි ද, මාගේ ඒ යහළුවා දෙවිකුමරකු වැනි පුරුෂයෙකි' සි කී ය. නැවැත ත් ඇ 'ඒ මම වෙමි' සි කිවු ය. ඇය කිහිපවිටක් මෙසේ කී කල්හි 'එසේ නම් මේ සිදු වූයේ කුමක් දැ'සි ඇසී ය. 'අප එදා නාන්නට ගිය දා ඒ අසල සිට සිවුර පෙරවූ මහාකත්‍යායන සථවිරයන් වහන්සේ දක්නා ලද්දේ ද, මම උන්වහන්සේ දිහාව බලා 'මේ සථවිර තෙමේ මාගේ බිරිඳ වන්නේ නම්, නැත, මාගේ බිරිඳගේ සිරුරුපැහැය මුන්වහන්සේගේ සිරුරුපැහැය සේ වන්නේ නම් යෙහෙකැ' යි සිතීමි, ඒ මොහොතේ ම මාගේ පිරිමි ඇඟ නැති වී ගියේ ය, මේ ගැණුඇඟ ලැබුනේ ය, මම මහත් ලජ්ජාවෙන් කිසිවකුට ත් නො දන්වා පලා ගොස් මෙහි ආවෙමි'සි ඕ තොමෝ කිවු ය. 'අයියෝ! ඇයි එසේ කෙළෙහි, ඇයි මට නො කීයෙහි, තෙරුන් වහන්සේ කමා කරවා ගත්තෙහි දැ' යි ඔහු ඇසී ය. 'කමා නො කරණ ලද්දේ ය, උන්වහන්සේ වැඩ ඉන්නා තැන මහත්මයා දන්නේ දැ'සි ඇ ඇසූ ය. මේ නුවර ම ඇසුරු කොට ගෙණ උන්වහන්සේ වැඩ වෙසෙති'සි සිටු පුත්‍රයා කී විට 'ඒ හාමුදුරුවන් වහන්සේ පිඬු සිඟා වඩින වේලෙහි මෙහි වඩින සේක් නම්, මම උන්වහන්සේට දන් පිළිගන්වන්නෙමි'යි කිවු ය. සිටුපුත් තෙමේ 'එසේ නම් දන් පිළියෙල කරව, මම උන්වහන්සේ කමා කරවන්නෙමි'සි තෙරුන් වසන තැනට ගොස් වැඳ පසෙකට වී 'සවාමිනි! හෙට මාගේ දානය පිළිගන්නා සේක්වා' යි ආරාධනා කෙළේ ය. සථවිරයන් වහන්සේ 'ඔබ ආගනතුකයෙක් නො වෙහි දැ' යි ඇසූ විට මාගේ ආගනතුකභාවය නො විචාරණ සේක්වා, හෙට මාගේ දානය පිළිගන්නා සේක්වා' සි නැවැතත් ඔහු කී ය. සථවිරයන් වහන්සේ ආරාධනය ඉවසූහ. ගෙයි ද මහාසතකාර පිළියෙල කරණ ලද්දේ ය. තෙරුන් වහන්සේ පසු දා ගෙදරට ම වැඩි සේක. සිටුත්, තෙරුන් වඩා හිඳුවා ප්‍රණීත ආහාරපාන වළඳවා ඒ ගැණිය තෙරුන් පාමුල හිඳුවා 'සවාමිනි! මාගේ යෙහෙළියට කමන්නැ' සි කී ය. සථවිරයන් වහන්සේ ඒ මක්නිසා දැ' යි ඇසූ විට 'මෑ ඉස්සර මාගේ යහළුවෙක, දිනක් ඔබවහන්සේ දුක මේ තෙරුන් වහන්සේ මාගේ බිරිය වන සේක් නම්, නැත, මාගේ බිරියගේ සිරුරුපැහැය මුන් වහන්සේගේ සිරුරුපැහැය සේ වන්නේ නම් හොඳය' යි සිතූ ය, ඒ සිතුවිල්ල සමග ම පිරිමි බව නැති ව ගොස් ගැහැණුබව පහළ වී ය, එහෙයින් මෙයට කමා වන්නැ' සි කීයේ ය. සථවිරයන් වහන්සේ 'එසේ නම් නැගී

සිටුව, තිට කමන්නෙමි'යි වදාළ සැටියේ ම ගැහැණුබව අතුරු දහන් ව පිරිමිබව පහළ විය. ඒ ඇසිල්ලෙහි ම තක්සලා සිටුපුත් තෙමේ කතා කොට 'මිත්‍රය! මේ දරුවෝ ඔබ කුස විසූ බැවින් ද, මා නිසා උපන් බැවින් ද අප දෙදෙනා ම අයත් වෙති, එහෙයින් කො තැනක වත් නො ගොස් මෙහි ම වසමු, නො කළකිරෙව'යි කී ය. 'යහළුව! මම මේ එක ම අත්බවේ පළමු ව පිරිමි ව නැවැත ගැහැණි ව නැවැත ත් පිරිමි ව මෙසේ විකාරයට පැමිණියෙමි, මා නිසා පළමු ව උපන් දරුවෝ දෙදෙනෙකි, මේ දැන් මෙහි දී මාගේ කුසින් උපන් දරුවෝ දෙදෙනා ය, බලන්න, එක අත්බවේ මෙසේ විකාරයට පැමිණියෙමි, ඉතින් තවත් ගිහි ව ඉන්නට නො සිත ව, මම මුන්වහන්සේ වෙත පැවිදි වන්නෙමි, මේ දරුවෝ ඔබට භාරයහ, මොවුන්ගේ දියුණුව පිණිස සියලු දෙය නො පමාව කරන්නැ'යි දරුවන් අල්වා සිඹ ඇඟ පත අත ගා ආදරය කොට පියාට භාර දී ගෙන් නික්ම ගොස් තෙරුන් වෙත පැවිදි විය. ස්ථවිරයන් වහන්සේ පැවිදි උපසපන් කොට ඔහු කැටිව ම චාරිකාවෙහි වඩින සේක් සැවැත් නුවරට ගියහ. මේ නවක භික්ෂුවට සොරෙය්‍ය ස්ථවිරැ යි නම් විය.

දනවුවැස්සෝ මේ පුදුම සිදුවීම අසා කැළඹී පුදුමයට පැමිණ ඒ භික්ෂුව කරා ගොස් 'ස්වාමීනි! පුදුම සිදුවීමක් අපට දැන ගන්නට ලැබුනේ ය, ඒ කෙසේ දැ' යි ඇසූහ. 'උපාසකයෙනි! සැබෑ ය' යි කී කල්හි ඔවුහු නැවැත ත් 'මෙහෙම දේ ත් සිදු වන්නේ ද, ඔබවහන්සේගේ කුසැ දරුවෝ දෙදෙනෙක් උපන්හ, ඔබ වහන්සේ නිසා ත් දරුවෝ දෙදෙනෙක් උපන්හ, මුන් අතුරෙහි කවරකුට ඔබවහන්සේ වැඩියෙන් සෙනහ කරන්නහු දැ'යි ඇසූහ. 'මම මා කුස විසූ දරු දෙදෙනා කෙරෙහි වැඩියෙන් සෙනහ කරමි' යි උන්වහන්සේ කීහ. මේ පුවත අසා නිතර නිතර බොහෝ දෙන තෙරුන් වෙත පැමිණෙති. පැමිණෙන සියලු දෙන ම 'කවුරුන් කෙරෙහි වැඩියක් සෙනහ කරන්නහු ද, කවුරුන් කෙරෙහි වැඩියක් සෙනහ කරන්නහු දැ' යි අසත්. ස්ථවිරයන් වහන්සේ 'මා කුසැ විසූ දරු දෙදෙන කෙරෙහි වැඩියක් සෙනහ කරමි' යි කියා, නැවැත දවසෙක 'කිසිවක්හු කෙරෙහි සෙනහ නැත්තේ වෙමි' යි කීහ. එවිට මිනිස්සු 'භික්ෂුව බොරු කියයි, පළමු දැ කුසැ විසූවන් කෙරෙහි වැඩියක් සෙනහ කරමි' යි කියා අද කිසිවක්හු කෙරෙහි සෙනහ නැත්තේ වෙමි යි කියා, මේ මහණ බොරු කියයි, රහත්වූ බව කියා යි කියන්නට වූහ.

බුදුරජානන් වහන්සේ මොවුන්ගේ මේ කතාව ඇසූහ. අසා 'මා පුත් බොරු නො කියා, මා පුත් රහත් බවක් නො කියා ඔහු මනා කොට පිහිට වූ සිතින් මාර්ගදර්ශනය ලත් දැ පටන් කිසිවක්හට

සෙනහ නො කරයි, දූපුතුන්ට යම් යම් සැපත් ලබාදීමෙහි මවු පියෝ පොහොසත් නො වෙති, මේ සත්වයන්ගේ ඇතුළත පැවැති මනා කොට පිහිටි වූ සිත, මවුපියන්ට ලබාදෙනු නො හැකි සියලු සැපත් ලබා දෙන්නේයැ'යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක:-

න තං මාතා පිතා කයිරා අඤ්ඤේ වා පි ච ඤාතකා,
සම්මාපණිහිතං චිත්තං සෙය්‍යසෝ නං තතෝ කරේ කි.

යම් කාරණයෙක් සත්වයාහට සහමොක් සුව ගෙණ දෙන්නේ ද ඒ කාරණය මවු නො කරන්නී ය. පියා ත් නො කරන්නේ ය. සෙසු නෑයෝ ත් නො කරන්නෝ ය. දශකුශලකම්පථයෙහි මනා කොට පිහිට වූ සිත ම, ඒ හෙතුවෙන් සත්වයා අතිශය උත්තමයකු කරන්නේ ය.

න තං මාතා පිතා කයිරා = මවු නො කරන්නී ය. පියා ත් නො කරන්නී ය.

යම් තැනැත්තියක් තොමෝ දූ පුතුන් විසින්, සිතින් නිතර ප්‍රිය කරුණු ලබන්නී ද, දූ පුතුන්ට කෑම් පිම් ආදියෙන් සංග්‍රහ කරන්නී ද ඕ ය **මාතා** **'පුත්තං මානෙති පූජෙතීති = මාතා'** යනු අරුත් විවරණ ය.

මෝ තොමෝ නිතර දූ පුතුන් පතන්නී ය. ඒ පිණිස ඉටු දෙවියන් පුදන්නී ය. කවර සෘතුවෙක, කවර මසෙක, කවර නැකතෙක, කවර දවසෙක උපන් දරුවෝ දීඝායුෂ ඇත්තෝ ද, යනාදිය සොයමින් බලමින් කල් ගෙවන්නී ය. දරුවකු කුසැ පිළිසිඳ ගත් කල්හි ඒ දරුගැබ රැක්මට බොහෝ වෙහෙසෙන්නී ය. ඒ පිණිස බොහෝ දුක් ගන්නී ය. දස මසකට අඩු නො වන තරම් කලක් නොයෙක් දුක්ගැහැට විඳිමින් දරුවා ප්‍රසූත කරන්නී ය. එ තැන් සිට හෘදයලොහිතය පොවමින් අත් පා වඩමින් ලෙහි හොවා පොෂණය කරන්නී ය. කන බොන සැටි අඳින පලඳින සැටි යුතු අයුතු කම් වරද නිවරද කියා දී ඔක්ම වන්නී ය. දූ පුතුන්ගේ දියුණුව පිණිස රන් රිදී මුතු මැණික් වස්ත්‍රාභරණාදිය සපයා තබන්නී ය. දූ පුතුන්ගේ විපතෙහි තදින් දුක් වන්නී මවු තොමෝ ය. දූ පුතුන්ගේ සැපතෙහි තදින් සතුටු වන්නී ත් මවු තොමෝ ය. දූ පුතුන්ගේ අභිවෘඩිය ඉත ගිනින් පතන්නී ත් මවු තොමෝ ය මෝ තොමෝ දූ පුතුන් කෙරෙහි මෙත්තා - කරුණා -මුදිතා-උපෙක්ඛා යන චතුර්විධ බ්‍රහ්ම විහරණය පතුරුවමින් වසන්නී ය. මෝ තොමෝ, **අම්මා - අම්බා - ජනනී - ජනෙත්තී - ජනිකා - සුහදා - පොසෙත්තී - තොසෙත්තී,** යනාදී නම් වලිනුදු පොතපතෙහි හඳුන් වනු ලබන්නී ය.

'අමීයතෙ පූජීයතෙති = අම්මා' දූ පුතුන් විසින් පුදනු ලබන්නී **අම්මා** නම්.

'පුත්තෙන අමීයතෙ ගමීයතෙති = අම්බා' දූ පුතුන් විසින් පූජා සත්කාර ගෙණ එළැඹෙනු ලබන්නී **අම්බා** නම්.

'ජනයතීති = ජනනී' දූ පුතුන් බිහි කරන්නී උපදවන්නී **ජනනී** නම්. **'ජනෙතතී'** යනු ද එම අරුති. **'ජනිකා'** යනු ත් එම අරුති.

'තෙන දෙහළිනී හොති සුහදා තෙන වුච්චති' කුසැ පිහිටි දරු ගැබ හෙතු කොට දෙළ දුක හටගත් කල්හි කුස උපන් දරු කෙරෙහි සෙනහ උපදින්නේය. එහෙයින් **සුහදා** නම්.

'පොසෙතීති පොසෙනතී' තන කිරෙන් දූ පුතුන් පොෂණය කරන්නීය යන අරුත්.

දූ පුතුන් රකින්නේ **පිතා** ය. **'පුත්තං පාති රක්ඛතීති=පිතා'** යනු අරුත් විවරණය. **තාතා-ජනක,** යන නම් ද පියා කෙරෙහි නැගේ.

'තායතී ති = තාතො' රකින්නේ **තාත** නම්.

'ජනෙතී ති = ජනකො' උපද වන්නේ **ජනක** නම්.

මව මෙන් පියා ද දූ පුතුන්ගේ දියුණුව පිණිස වෙහෙසෙන්නේ ය. දුර කතර ගොස් දූ පුතුන් පිණිස ධනය රැස් කරන්නේ පිය තෙමේ ය. මව මෙන් පියා ද හොඳ නරක කියා දී දූ පුතුන් හික්ම වන්නේ ය. පියා ද, දූ පුතුන් කෙරෙහි චතුර්විධ බ්‍රහ්ම විහරණයෙන් යෙදී වසන්නේ ය. මවු පිය දෙදෙන ම දූ පුතුන්ගේ අභිවෘධිය සම ව පතන්නෝ ය. **'බහූපකාරා භික්ඛවෙ! මාතාපිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරො'** යනු බුඩ වචනයි.

අඤ්ඤෙ වාපි ච ඤාතකා = සෙසු නෑයෝ ත් නො කරන්නාහු ය.

මවුපසින් හා පියපසින් පැවත එන්නෝ නෑයෝ ය. මවු පසෙහි හා පියපසෙහි සත්වන මුත්තනු දෙදෙන පටන් ඔබ්බෙහි පැවත එන්නෝ ය. **'මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතා මහායුගා සම්බන්ධා'** යනු ඒ කියූ සැටි ය. මෙහි කියූ 'පිතා මහායුගා' යන්නෙන් ඒ දෙපසෙහි ම වූ සත් වන මුත්තනුවන් දෙදෙනාගෙන් ඔබ්බෙහි වූ පූර්වපුරුෂයෝ ද නෑයන් ලෙස ගත යුත්තාහ' යි මින් කියැ වේ. **මුත්තා-මී මුත්තා-මාමා-නැන්දා-මහම්මා-කුඩම්මා** යනාදී වූ සමානපක්ෂ ඇත්තෝ ද නෑයෝ ය.

අඹුසැමි දෙදෙනාගේ පක්ෂවයෙහි වූවෝ 'ඤාති' යන්නෙනු ත් මවුපිය දෙපක්ෂයෙහි වූවෝ 'සාලොහිතා' යන්නෙනු ත් ගන්නට ද කියත්. **'ඤාති නි සඤ්ඤසසුරපක්ඛිකා, සාලොහිතා නි එක ලොහිතබඳා පිති පිතාමහාදයො'** යනු පොතෙහි ආයේ ය. මේ කීයල්ලෝ දත යුතුය යන අරුතින් ඤාති නම් වෙති. මොවුහු අපගේ ය යි දන්නා ලබන්නෝ ය ඤාති. මේ ගාථාවෙහි දුක්වෙන, ඤාතකා, යන පදයෙන් මෙ කී දෙපක්ෂයෙහි ම වූ නැයෝ ප්‍රධාන අප්‍රධාන විසින් ගණු ලබත්.

මවුපියාදී කෙනෙක් දූ පුතුනට දුයාද දෙන්නෝ, එක ම ජාතියක, කිසි ත් කම්මැතියක් නො කොට යන්තමකින් යැපෙන්නට ම දෙති. විශාඛාමහාඋපාසිකාවගේ මවු පියෝ පවා මහත් උපභොග පරිභොගවසතු ඇත්තෝ නමුත් ඇයට එක් ම අත් බවෙක යෙහෙන් යැපෙන පමණක් ම දුන්හ. සිවු දිවයිනෙහි සක්විති රජසිරි පමණ කුදු දීමෙහි පොහොසත් මවු පිය කෙනෙක් නැත. ඒ එසේ බැවින් සවගීසම්පත් ධ්‍යානසමපත් දීමෙහි පොහොසත් මවුපියෝ කොහැනෙක වෙත් ද, ලොකොත්තර සමපත් දීමෙහි නො පොහොසත්බව කිය යුතු ම නැත. චක්‍රවර්ති සමපත් සවගීසමපත් ධ්‍යානසමපත් ලොකොත්තරසමපත් දීමෙහි මවු පියාදීන් නො පොහොසත් බව, **'න තං මාතා පිතා කයිරා අඤ්ඤේ වා පි ච ඤාතකා'** යන මෙයින් වදළ සේක.

සම්මාපණිහිතං චිත්තං = මනා කොට පිහිට වූ සිත.

දශකුශලකම්පථයෙහි පිහිටි සිතය, **සම්මාපණිහිතචිත්ත** වනුයේ දශකුශලකම්පථයෙහි යෙදූ සිත මනා කොට පිහිටියේ නම් වේ.

සෙය්‍යසො නං තතො කරෙ = ඒ හෙතුවෙන් ඒ පුදගලයා උතුමකු කරන්නේ ය.

දශකුශලධම්පථයෙහි පිහිට වූ සිත, ඒ සිතින් යුක්ත වූ වහු ඒ හෙතුවෙන් මවුපියාදීන් විසින් නො දෙනු හැකි සක්විතිසැප සගසැප දුහැන්සැප ලොවුතුරුසැප ලබා දීමෙන් ශ්‍රෙෂ්ඨයෙකු කරන්නේ ය. යහපතෙහි යෙදූ සිතින් ම ශ්‍රෙෂ්ඨයකු වනු විනා අන් කිසිවකින් ශ්‍රෙෂ්ඨයකු වනු බැරිය. ලොකොත්තරසමපත් ලැබීමෙන් දිව්‍යබ්‍රහමාදීන් විසින් පිදියයුතු වන්නේ ත් දශකුශල ධම්යෙහි යෙදූ සිතැත්තේ ය.

එහෙයින් බුදු රජාණන් වහන්සේ වදළෝය, මෙසේ:-

'චිත්තං භික්ඛවෙ! භාවිතං මහතො අත්ථාය සංවත්තති'
මහණෙනි, වැඩූ සිත මහත් අර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! භාවිතං බහුලීකතං මහතො අත්ථාය සංවත්තති' = මහණෙනි! වැඩූ බහුල වශයෙන් වැඩූ සිත මහත් අර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! භාවිතං බහුලීකතං සුඛාවහං හොති' මහණෙනි! වැඩූ බහුල වශයෙන් වැඩූ සිත සැප ඵලවත්තේය.

'චිත්තං භික්ඛවෙ දන්තං මහතො අත්ථාය සංවත්තති' මහණෙනි! දැමුනු සිත මහත් අර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! ගුත්තං මහතො අත්ථාය සංවත්තති' මහණෙනි! ගොපිත වූ සිත මහත් අර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! රක්ඛිතං මහතො අත්ථාය සංවත්තති' මහණෙනි! රක්නා ලද සිත මහත් අර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ සංවුතං මහතො අත්ථාය සංවත්තති' මහණෙනි! හික්මුනු සිත මහත් අර්ථ පිණිස පවතී.

'චිත්තං භික්ඛවෙ! දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං මහතො අත්ථාය සංවත්තති' මහණෙනි! දැමුනු ගොපිත වූ රක්නා ලද හික්මුනු සිත මහත් අර්ථ පිණිස පවතී.

නැවැත උත්වහන්සේ මේ කාරණය උපමා ගෙණ හැර දක්වා මෙසේ ව්‍යාකෘත කළ සේක. මේ එය:- **'සෙය්‍යථාපි භික්ඛවෙ! සාලි සූකං වා යවසූකං වා සම්මාපණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙච්ඡති, ලොහිතං වා උප්පාදෙස්සති නි ඨානමෙතං විජ්ජති, තං කිස්ස හෙතු, සම්මා පණිහිතත්තා භික්ඛවෙ! සූකස්ස, එවමෙව ඛො භික්ඛවෙ! සො වත භික්ඛු සම්මාපණිහිතෙන චිත්තෙන අවිජ්ජං භෙච්ඡති, විජ්ජං උප්පාදෙස්සති, නිබ්බානං සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති, තං කිස්සහෙතු, සම්මාපණිහිතත්තා භික්ඛවෙ! චිත්තස්ස'** යි.

'මහණෙනි! නිවැරදි ලෙසට තැබූ හැල් වී නණ්ඩුවක් හෝ යව නණ්ඩුවක් හෝ අතින් හෝ පයින් මඬින ලද්දේ අත හෝ පය එයින් බිඳෙන්නේ ය, ලේ ගලන්නේය, යනු විය හැකිය. එසේ විය හැක්කේ හැල් වී නණ්ඩුව හෝ යව නණ්ඩුව හෝ උඩුකුරු කොට තැබූ බැවිනි, මහණෙනි! එ මෙන් නිවැරදි ලෙසට පිහිට වූ සිතින් අවිද්‍යාව බිඳින්නට විද්‍යාව උපද වන්නට නිවන් පසක් කරන්නට හැකි ය, හැක්කේ සිත නිවරද මග යෙදූ බැවිනි. යනු එහි කෙටි තේරුම ය.

බොහෝ සෙයින් සත්‍වයන්ගේ දෙවිලෝ ආදියෙහි ඉපැන්මට හෙතු වනුයේ නිවරද මග යෙදූ සිතය. නිවරද මග යෙදූ සිතැත්තාහුට දෙවිලෝ ආදියෙහි ඉපැන්ම ඉතා පහසු ය.

'මහණෙනි, මෙලොව පහන් සිත් ඇති යම් පුද්ගලයෙක් සිත ප්‍රසන්න ව පවත්නා කල්හි, වැඩීමෙන් මොළොක් ව ගිය කල්හි වැඩී ගිය කල්හි දැමුනු කල්හි, කෙලෙස් යටපත් ව ගිය කල්හි කලුරිය කරන්නේ නම්, ඒ පුද්ගල තෙමේ සුගතියෙහි උපදින්නේ ය, යනු මම පිරිසිඳ දනිමි මහණෙනි! මේ ලොකයෙහි ඇතැම් සත්වයෝ මෙසේ චිත්තප්‍රසාද හෙතුවෙන් මරණින් මතු සුගතිලොකයට පැමිණෙන්නාහ' යි වදාළ සේක.

මේ ඒ දෙශනාව:- **'ඉදඤ හි භික්ඛවෙ! එකච්චං පුග්ගලං පසන්නචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, ඉමඤ්හි වෙ අයං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථාහතං නික්ඛිත්තෙනා එවං සග්ගෙ, තං කිස්ස හෙතු, චිත්තං හිස්ස භික්ඛවෙ! පසන්නං, වෙතොපසාදහෙතුච්ච පන භික්ඛවෙ! එව මිධෙකච්චෙව සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපජ්ජන්ති'** යනු.

මහණෙනි! පැහැදුනු නො කැලඹුනු නො මඩ වූ දිය විලක් සමීපයෙහි සිටි ඇස් ඇති මිනිසෙක් එහි ඵුහා මේහී ඝනන හැසිරෙන සිටින සිප්පිබෙල්ලන් සක්බෙල්ලන් කැටගල් කැබැලිති මාලුරුල යන මේ කිසිවක්, විලෙහි දිය පහන් බැවින්, නො කැලඹුනු බැවින්, නො මඩ වූ බැවින්, දක්නේ යම්සේ ද, එසේ පහන් සිතින්, පිරිසිදු සිතින්, මනා කොට නැබූ සිතින්, ආත්මාර්ථය පරාර්ථය යන උභයාර්ථය දක්නේ ය. දශකුශලකර්මපථයෙන් මත්තෙහි වූ ධ්‍යාන විදර්ශනා මාර්ග ඵල ලබන්නේ ය, යනු කියන්නට කරුණු ඇත්තේය. එබදු සිතින් මාර්ගඵලාවබෝධය කරණු ඒකාන්ත ය. මේ ඒ දේශනාව:-

'සෙය්‍යථාපි භික්ඛවෙ! උදකරහදෙ, අච්ඡෙ විප්පසන්නෙ අනාවිලෙ, තඤ්ච චක්ඛුමා පුරිසෙ තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි, තිට්ඨන්තම්පි, තං කිස්ස හෙතු, අනාවිලත්තා භික්ඛවෙ! උදකස්ස, එවමෙව ඛො භික්ඛවෙ! සො වත භික්ඛු අනාවිලෙන චෙතසා අනන්තඤ්ච ඤස්සති පරඤ්ච ඤස්සති උභයඤ්ච ඤස්සති උන්නතිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති, තං කිස්ස හෙතු, අනාවිලත්තා භික්ඛවෙ! චිත්තස්සාති' යනු.

තවද,

දශ කුශල කර්ම පථයෙහි වැඩූ සිත කාමච්ඡන්ද නීවරණාදී ක්ලෙශධර්මයන් ගෙන් වෙන් වූයේ ගල් පව්වක් මෙන් සිටියේ අෂ්ටලොක ධර්මයෙන් නො සැලේ ද, රාගයාගේ ඉපැත්මට හෙතු වූ ත්‍රෛභූමක ධර්මයන්හි නො ඇලේ ද, කොපයාගේ ඉපැත්මට හෙතු වූ ආඝාතවස්තූන්හි නො ගැටේ ද, මෙබඳු සිත් ඇත්තහු කරා දුකෙක් නො ද පැමිණේ ය යනු ද මෙහිලා දත්නේ ය.

මේ දෙශනා:-

'යස්ස සෙලූපමං චිත්තං ඨිතං නානූපකම්පති,
විරත්තං රජනීයෙසු කොපනෙයෙපි න කුප්පති,
යස්සෙවං භාවිතං චිත්තං කුතො තං දුක්ඛමෙස්සති' යනු.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලා දියට පැමිණියහ. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

සොරෙය්‍යස්ථවිරවස්තුව නිමි.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්ම කුසල නායක ස්ථවිරයන්** කළ **සඛමීසාගර** නම් වූ **ධර්මපද වර්ණනාවෙහි** චිත්තවර්ගාත්මක තෘතීය තරඞ්ගය නිමියේ ය.

පුළුපවගීය

තුරියතරඞ්ගියකථාසූචි

පිට	වස්තුව	
521	1	පන්සියයක් භික්ෂූන් වහන්සේලා
618	2	මිරිඟු කමටහන් වැඩූ භික්ෂූන් වහන්සේ
621	3	විඩූඩභකුමාරයෝ
640	4	භිමියා පැතූ සත්‍රිය
546	5	මච්ඡරියකොසිය සිටානෝ
657	6	පාඨිකාජීවකයා
660	7	ඡත්තපාණී උපාසකතුමා
666	8	විශාඛා මහා උපාසිකාවෝ
698	9	උඩු සුළඟෙහි යන සුවඳ
702	10	පිණ්ඩපාතදායක
719	11	ගොධික සථවිරයන් වහන්සේගේ පිරිනිවන් පෑම
723	12	යහළුවෝ දෙදෙනෙක්.

පන්සියයක් භික්ෂූන් වහන්සේලා

4-1

දවසෙක අපගේ ස්වාමිදරු වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ හා එක් ව ගම්නියම්ගම්දනවුහි සැරිසරා පෙරළා පැමිණි පන්සියයක් භික්ෂූන් වහන්සේලා සවස්වේලෙහි උවැටන්හලට රැස් ව හිඳ 'අප ගියා වූ අසුවල්ගමෙහි අසුවල්තැන බිම්පෙදෙස සමතලා ව පිහිටා තුබුනේ ය, අසුවල්බිම්පෙදෙස විසම ව පිහිටා තුබුනේ ය, අසුවල් තැන මඩ බහුල ව තුබුනේ ය, අසුවල් තැන මුළුමනින් බොරලු සහිත ය, අසුවල් තැන තුබුනේ කළු මැටි ය, තඹපාට මැටි අසුවල් තැන තුබුනේය'යි තමන් ආගිය හැමතැන බිම්පෙදෙස් ගැණ කතා කරමින් හුන්හ. එවේලෙහි එහි වැඩමකළ බුදුරජානන් වහන්සේ 'මහණෙනි! දැන් මා මෙහි එන්නට කලින් තමුසේලා කුමක් කතා කරමින් හුන්නෝ දැ'යි විචාරා 'අප ආගිය ගම්නියම් ගම් රජදනවුහි ඒ ඒ තැන්හි පිහිටි ගම්පෙදෙස්වල උස්මිටිකම් ගැණ කතා කරමින් හුන්නෙමු'යි දන්වා සිටි කල්හි 'තමුසේලා ඒ කළ කතාව බැහැරි පොළොව පිළිබඳ එකක් ය, ඉන් වැඩෙක් නැත, කළයුතු තමන් පිළිබඳ ඇතුල් පොළොව ගැණ කතා ය, ඒ නිසා මෙ තැන් සිට තමුසේලා අජ්ඣත්තිකපඨවියෙහි පරිකම්ම කළ යුතු ය'යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක:-

කො ඉමං පඨවිං විචෙස්සති යමලොකං ච ඉමං සදෙවකං,
කො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව පචෙස්සති.

සෙඛො පඨවිං විචෙස්සති යමලොකං ච ඉමං සදෙවකං,
සෙඛො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව පචෙස්සතීති.

ආත්මභාවය යි කියූ මේ පොළොව ත් සිවු අපායයත් දෙව්ලෝ සහිත මිනිස්ලොව ත් තමනුවණින් කවරෙක් දැන ගණී ද, මනා කොට දෙසූ සත්තිස්බෝපැකිදම්, මල් කඩා රැස් කරණ දක්ෂ මල් දම් කරන්නකු සේ කවරෙක් ප්‍රතිවෙධ කරන්නේ ද?

ශෛක්ෂ තෙමේ ආත්මභාවය යි කියූ මේ පොළොවත් සිවු අපායයත් දෙව්ලෝ සහිත මිනිස්ලොවත් තමනුවණින් දැන ගන්නේ ය. ශෛක්ෂ තෙමේ මොනවට දෙසූ සත්තිස්බෝපැකිදම් ද ප්‍රත්‍යක්ෂ කරන්නේ ය. ප්‍රථමගාථාව ප්‍රශ්නය කොට ද දවිතීයගාථාව එහි පිළිතුරු කොට ද ගත යුතු ය.

කො ඉමං පඨවිං විචෙස්සති = කවරෙක් ආත්මභාවය යි කියූ මේ පොළොව නුවණින් දැන ගන්නේ ද. ප්‍රතිවෙධ කරන්නේ ද.

කො' යන මෙහි මූලය **කිං,** යනුයි. එයට **ක,** ආදෙශ වීමෙන් **ක,** යි සිද්ධව ප්‍රථමාවිභක්ති එකවචනයෙහි **කො,** යි සිට ගත්තේ ය. කවරෙක් ද? යනු අරුත් ය. **ඉමං,** යනු ඉදිරියෙහි සිටි **පඨවිං,** යන්නට විශෙෂණ යි. පඨවිං' යනු **විචෙස්සති'** යන්නට කර්මය වශයෙන් සිටගතු. මේ පොළොව, යනු එහි තේරුම යි. නාම-රූප ධාතු-ආයතන යනාදීන් කැටිවීමෙන් හටගත් හැම එකක් ම පෘථිවිය වතුදු, මෙහි ආ පඨවිශබදය නැගී සිටියේ, 'අජ්ඣත්තිකපඨවි'යි කියූ ආත්මභාවය උඩ ය. පංචස්කන්ධ නමුදු මේ ම ය **ලක්ෂණ** පෘථිවි'යි කීයේ ද මේ ය.

ඒ මේ ආත්මභාවය ඇති සැටියෙන් දැන ගැණීම නම්, **චතුධාතුවවත්ථාන, අඨාරසධාතු, මාදසායතන, පංචක්ඛන්ධ** යන මොවුන් අතුරෙන් එක් ලෙසක් සිතට නගා ගෙණ ඒ ලෙසින් අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රය නො හැර හොඳට දැනුම යි. විචෙස්සති, යන ක්‍රියාපදයෙන් කීයේ ඒ ය. එහෙයින් ම විචෙස්සති, යන්නට **'අත්තනො ඤාණෙන විජානිස්සති පටිවිජ්ඣිස්සති සච්ඡිකරිස්සති'**යි අර්ථකථාචාර්‍යයෝ අර්ථකථා කළහ.

අජ්ඣත්තිකපඨවිධාතුව හෙවත් ආත්මභාවය නාම-රූපය යි කෙටි කොට කොටස් දෙකකට බෙදිය හැකි ය. බෙදෙන්නේ ය. මේ කී දෙකොටස පංචස්කන්ධවශයෙන්, අෂ්ටාදශධාතුවශයෙන් ෂඩ්විධආයතනවශයෙන් බෙදේ. පංචස්කන්ධය, යි ගැණෙන රූප-වෙදනා-සංඥා-සංස්කාර-විඥාන, යන කොටස් පසින් වෙදනා-සංඥා-සංස්කාර-විඥාන, යන කොටස් සතර එක් කොට නාම යි ද, රූපකොටස පමණක් ම රූප යි ද කියනු ලැබේ. අෂ්ටාදශධාතු හා ෂඩායතනයෝ මෙහි ම ඇතුළත් වෙති. එහෙයින් අජ්ඣත්තික පඨවිධාතු ය යි කියූ ආත්මභාවය පංචස්කන්ධය වශයෙන් බෙදා ඒ පිළිබඳ කෙටිකතාවක් බුදුබණෙහි ආලෙසින් මෙහි දක්වනු ලැබේ.

ආත්මභාව, යනු රූප-වෙදනා-සංඥා-සංස්කාර-විඥාන යන පංචස්කන්ධයෙහි එකින් එක නො වෙන් ව පැවැත්මෙහි ලා ලොකයා විසින් ඇතිකර ගත් නමෙකි. එහි නැසීම ලකුණු කොට ඇති සියල්ල රූප යි ගැණේ. **'රූප්පන ලක්ඛණං රූපං'**යි කීයේ එහෙයි-නි. **කුප්පන, සටඨන, පීළන, භිජ්ජන,** යන අර්ථ ද **රූප්පන,** යන් නෙහි ම ඇතුළත් ය. එහෙයින් විකාරය **ලක්ෂණ** කොට, ගැටීම **ලක්ෂණ** කොට, පෙළීම **ලක්ෂණ** කොට, බිඳීම **ලක්ෂණ** කොට සිටියේ රූප ය යි කියයුතු ය. **'කිං ච භික්ඛවෙ! රූපං වදථ? රූප්පතීති**

විකාරය ලක්ෂණකොට – කුප්පන

ඉබා භික්ඛවෙ! රූපනති වුච්චති' මහණෙනි! කුමක් හෙයින් රූප සයි කියවූ ද? නැසෙන බැවින් රූප යයි කියනු ලැබේ, යනු එහි අදහස ය.

රූපලක්ෂණ වූ ඒ මේ විනාශය ශීතයෙන්, උෂ්ණයෙන් ක්ෂුධා වෙන්, පිපාසාවෙන්, ඩැහලේ බොන මැසි මදුරුවන්ගෙන්, අවුසුල හින්, නයිපොලොං ආදී සතුන් දෂ්ට කිරීමෙන් සිදු වේ. **'සීතෙනපි රූපති, උණ්හෙනපි රූපති, ජිඝච්ඡායපි රූපති, පිපාසායපි රූපති, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙනපි රූපති, රූපතීති බො භික්ඛවෙ! තස්මා රූපනති වුච්චති'** යනු එහි දෙශනා ය.

විනාශ විකාරාදිය ලකුණු කොට ඇති ශීතයෙන් වන රූප ධර්ම විනාශය ලොකාන්තරිකනරකයෙහි ප්‍රකට ව පෙණේ. සක්වළ තුනක් අතර එක් ලොකාන්තරිකනරකයෙක් මේ. උසින් එය අටදහසක් යෙදුන. ලොකාන්තරිකනරකයනට පොළෝ නැත. මත්තෙහි චන්ද්‍රසූර්‍යාදී වූ කිසි ත් ආලොකයෙක් ද නැත්තේ ය. හැම කල්හි ම අඳුරු ය. එහි උපන් සත්වයන්ගේ ආත්මභාවය තුන් ගවු පමණ මහත් ය. ඔවුහු වවුලන් මෙන් තියවලින් ලැගී යට හෙලූ ඇස් ඇති ව එල්බ වාසය කරති. එල්බ සිටි තැනින් ගිලිහී ගියෝ නම් අනෙකෙකුට හසු වෙති. එකල ඔවුහු අපවිසින් කෑ යුත්තෙක් ලදැ, යි ඩැහ ගෙණ කන්නට උත්සාහ කරන්නෝ පෙරැළී ගොස් භූමිය හමන කල්හි ඉදුනු මීපල, නටුවෙන් වෙන් ව බිම වැටන්නා සේ අඟපසඟ කැඩී බිඳී වැටෙති. වැටුනු ඇසිල්ලෙහි ඉතාතද ශීත ජලයෙන් සිදුනු බිදුනු සම්මස්ඇටනහර ඇති ව කකාළතෙලෙහි වත්කළ පිටිපිඬක් මෙන් පට පට යන හඬ නගමින් එහි ම දිය වී යෙති. පිනි වැටීමෙන් ශීත වූ මහිංසක ලප්ලනතරාෂ්ට්‍රාදියෙහි ද ශීතයෙන් වන විනාශය දක්නා ලැබේ.

උෂ්ණයෙන් වන විනාශය අවීචිමහානරකයෙහි ඉතා ප්‍රකට වේ. එහි ගිනියම් වූ යබිම්හි හොවා පංචවිධවධබන්ධනාදී වූ කම්කටොලු කරණ කාලයෙහි නිරිසතුන් විඳිනා දුක ඉතාමහත් ය.

බඩගින්නෙන් වන විනාශය ප්‍රෙතලොකයෙහි තදින් පවත්නේ ය. එහි බුඩානන්තර දෙක තුනක් ගිය තැනේ දී වත් කැදක් ඛතක් කැවිල්ලක් කටට ගන්නෝ නැත. ඔවුන්ගේ බඩතුර එහි නගින ගින්න නිසා සිදුරු සහිත රුකක් වැනි ය. කැදිත්තක් පමණකුත් නො ලැබ මළා වූ සත්වයන්ගේ පමණ නැත.

කාලකඤ්ජකඅසුරයෝ පවසා නිසා බොහෝ සෙයින් දුක් විඳිති. එහි දෙතුන් බුඩාන්තරයක් මුළුල්ලෙහි දිව තෙමෙන ලය තෙමෙන පමණකුදු දියබිඳක් ලබන්නෝ නැත. පැන් ටිකක් බොන්නෙමු' යි

ගඟක් බලා ගියෝ නම් එගඟ වැලිතලාවක් මෙන් ඔවුනට පෙණේ. මුහුද කරා ගියවුනට මුහුද ගල්තලාවක් මෙන් පෙණේ. ඔවුහු පව සින් වියෙලෙමින් දුක් විඳිති.

කාලකඤ්ඡකඅසුරයෙක් පවස ඉවසා ගත නොහැකිව යොදුනක් තරම් ගැඹුර හා පළල ඇති ගංගා නම් ගඟට බැස්සේ ය. ඔහු ගිය ගිය හැම තැනැ දිය සිඳී දුම් නැගුනේ ය. රත් වූ ගල්තලාවෙක යන කලක් සේ විය. දිය බස්නා හඬ අසා ඇතමැත බලමින් ඇවිදිද්දී පහත් විය. උදැසන සිඟා යන තිස් නමක් පමණ භික්ෂූන් වහන්සේ ඔහු දැක 'තෝ කවරෙක් වෙහි දැ' යි ඇසූහ. 'සඟමිනි! මම ප්‍රෙත යෙක් වෙමි' යි හේ කී ය. 'තෝ කුමක් කෙරෙහි දැ' යි ඇසූ විට 'මම බොන්නට පැන්ටිකක් සොයමි' යි කීයේ ය. එවිට භික්ෂූහු 'මේ ගඟ දියෙන් පිරී ඉතිරී ගලා යද්දී කුමක් හෙයින් තෝ මෙසේ කියහි දැ' යි අසා ඌ ගංඉවුරෙහි හොවා පාත්‍රවලින් දිය ඇද කට අරවා දිය වත් කොට සැනීමට පත් වූ යෙහි දැ, යි විචාළාහු ය. 'සඟමිනි! ඔබ වහන් සේලා තිස් නම මාගේ කටෙහි වත්කළ දියෙන් අඩපතක් පමණ වත් උගුරෙන් යටට ගියේ නම් කොතරම් සැනීමෙක් දැ' යි ඒ අසුරයා කී ය.

ඩැහැලේබොන මැසි ආදීන්ගෙන් වන නැසුම ප්‍රකට ව පෙණෙනුයේ ඔවුන් බහුල ව වසන පෙදෙස්වල ය. වාතරොගය රෝගීන් ගේ අත්පා ආදිය බිඳ කණුන් කොරුන් පිළුන් කරන්නේ ය. එය අපඉදිරියෙහි ම දක්නට ලැබේ. අවිවෙන් වන විනාශය වාලුකා කාන්තාරයන්හි යන්නවුන්ගෙන් දක්නට ලැබේ. වෙළඳසමූහයක් සමඟ මරුකතරට වත් එක් සත්‍රියක් වැළහුනි, දැවල හිරු උදුවන කල්හි අවිවෙන් පීඩිතව වැල්ලෙහි පා තබන්නට නොහැකිව හිසැතුබූ පැස බිම තබා එහි නැගී සිට ගත. එද තදින් රත් වූ බැවින් ඒ මත්තෙහි සළුවක් බහා නැගී සිටියා, නැවැත ඇකයෙහි හුන් ලදරුවා යටිවුව කොට හොවා හඬව හඬවා ඔහු පිට නැගුනී ද, අධික වූ අවිවෙන් ලදරුවාත් සමඟ එතැන ම මිය ගියා ය.

නයිපොලොං ආදී වූ දිග් දෑ සතුන්ගෙන් වන විපත් කවුරුත් දනිති. එය බොහෝ කොට දක්නට ලැබෙනුයේ ඔවුන් වසන පෙදෙස්වල දී ය.

මෙසේ ශීතොෂ්ණාදී වූ හෙතූන්ගෙන් නැසී යන රූපධර්ම ඇත්තේ අටවිස්සෙකි **පඨවී-ආපෝ-තේජෝ-වායෝ-චක්ඛු-සොත ඝාණ-ජිව්හා-කාය-රූප-සද්ද-ගන්ධ-රස-ඉත්ථිභාව - පුරිසභාව හදය- ජීවිත- කබලීකාරාහාර- ආකාසධාතු- කායවිඤ්ඤත්ති- වචීවිඤ්ඤත්ති-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා- උපචය- සන්තති- ජරතා-අනිච්චතා,** යන මොවුහු ය අටවිසි රූපයෝ.

එහි පඨවි-ආපෝ-තෙජෝ-වායෝ යන සතර, මහාභූතරූප ය යි හඳුන්වති. චක්ඛු-සොත-ඝාණ-ජිවහා-කාය යන පස හඳුන්-වන්නෝ පසාදරූප නාමයෙනි. රූප-සද්ද-ගන්ධ-රස යන සතර, විසය රූපය යි කියනු ලැබේ. භාවරූප නාමයෙන් ඉත්‍රීභාව-පුරිසභාව දෙක ගන්නා ලැබේ. තනි හදය රූපය, හදයවත්‍ථුරූපය යි ගැණේ. පරිවෙජ්දරූපය යි කියනු ලබන්නේ ආකාසධාතුරූපය යි. කාය-වචීවිඤ්ඤත්ති දෙක, විඤ්ඤත්තිරූප යි. ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා යන තුනත් විඤ්ඤත්තිරූප දෙකත් එක් කොට විකාර රූප ඉ ගණිත්. ලක්ඛණරූපයෑ යි ගැණෙන්නේ උපචය-සන්තති-ජරතා-අනිච්චතා, යන සතර යි. එයින් උපචය-සන්තති දෙක, වෙන ම ගැණීමෙන් ජාතිරූපනාමයෙන් හඳුන්වනු ලැබේ. ඒ මෙසේ කීහ:-

'භූතපසාදවිසයා-භාවෝ හදයමිච්චපි,
ජීවිතාහාරරූපෙහි-අට්ඨරසවිධං භවෙ.

පරිවෙජ්දෙ ච විඤ්ඤත්ති විකාරෝ ලක්ඛණංති ච,
අනිපඵන්නා දසවෙති අට්ඨවීසවිධං භවෙ'

තව ද භූතරූපය පටන් ආහාරරූපය තෙක් ඇති අටලොසට සභාව රූප, සලක්ඛණරූප, නිප්ඵන්නරූප, රූපරූප, සම්මසනරූප යන නම් ද යෙදේ. අටවිස්සෙන් ඉතිරි වූ අනික් දසය, අනිප්ඵන්නරූප නාමයෙන් ගැණේ. මහාභූතරූපෑ යි කියූ පඨවි ආදී වූ සතර හැර අනික් සූවිස්ස, මහාභූතරූප ඇසුරු කොට දැඩි ව ගෙණ පවත්නා බැවින් උපාදාරූප යි කියනු ලැබේ. උපාදාරූප, මහාභූතරූපයන් නො හැර ඔවුන් ඇසුරු කොට ම පවත්නේ ය. පඨවි ආදී වූ සතර, මහාභූතරූප යි කියන ලද්දේ මහත් ව පහළවන බැවිනි. චක්‍රවාට පර්‍වතාදීන්ගේ වශයෙන් දෙවමනුෂ්‍ය මත්ස්‍යකච්ඡපාදීන්ගේ වශ යෙන් මහත් ව පහළ වෙති මොවුහු. **"මහන්තානි භූතා භවන්ති පාතුභවන්තීති-මහාභූතානි, මහාභූතසාමඤ්ඤතා මහාභූතානි, මහාපරිහාරතෝ භූතානි මහාභූතානි, මහාවිකාරතෝ මහා භූතානි, මහතා වායාමෙන පරිගණ්හිතබ්බතතා මහාභූතානි, විජ්ජමානතතා මහාභූතානි"** යනු ආයේ මහාභූත ශබ්දයෙහි අර්‍ථ පැහැදිලි කරණු සඳහා ය. මහත්ව පහළවනු බැවින් මායාකාර මහාභූතයන් වැනි හෙයින්, දිනපතා කෑම් පිණ් දීමෙන් පරිහරණය කළයුතු බැවින්, කල්පාන්තයෙහි හා ධාතුක්ෂොභයෙහි විකාරයට පැමිණෙන බැවින් මහාභූත නම් වෙත් යත්, එ තන්හි තේරුම් ය.

මහාභූතරූපයන් අතර පළමුවැන්න පඨවිධාතුරූප ය යි. හැම වසතුවක ම පවත්නා කැකුළුබව පඨවිධාතුරූපය යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. පෘථිවි තොමෝ ලක්ෂණවශයෙන් කැකුළුබව

ලක්ෂණ කොට සිටියේ ය. **'කක්ඛළලක්ඛණා පඨවී'** යනු එහිලා කියන ලදී. කෘත්‍යය නම්, ආපෝ-තෙජෝ-වායෝ යන අනික් මහා භූතරූපයන් පිහිටන බව ය. **'පථයතීති=පඨවී, සහජාතරූපානං පතිට්ඨානභාවෙන පකාසයති උපට්ඨාතීති'** යන මෙයින් එය හොඳට පැහැදිලි කරයි. **'පතිට්ඨානරසා'** යි කියේ ද ඒ නිසා ම ය. තාර්කිකයෝ පෘථිවිය ගන්ධවත්භාවය ලකුණු කොට ඇතැ යි කියත්. **'ගන්ධවති පෘථිවී'** යනු තාර්කිකවචන යි.

අජ්ඣත්තික-බාහිරවශයෙන් ද උපාදිණ්ණක-අනුපාදිණ්ණකවශ යෙන් ද මෙය දෙකට බෙදේ. එයින් මෙහි විස්තර කැරෙන්නේ අජ්ඣත්තික-උපාදිණ්ණක වශයෙන් ආගමයෙහි කියැවෙන පඨවී ධාතුරූප ය යි. එය ආගමයෙහි මෙසේ දක්වනුයේ ය:-

'යං අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදිණ්ණං, සෙය්‍යථීදං? කෙසා ලොමා නඛා දන්තා තචෝ මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජං වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං යං වා පනඤ්ඤම්පි කිංචි අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදිණ්ණං, අයං වුච්චති අජ්ඣත්තිකා පඨවීධාතු ච' යි.

සියසතන්හි කැකුළු ව පවතින තදගතියෙන් යුත් මම ය මාගේ ය යි ගන්නාලද යමෙක් වේ ද, ඒය පඨවී නම්. මෙසේ වෙසෙසා කියන ලද්දේ නම් කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩු, හදවත්, අක්මා, දලබු, බඩදිවි, පපුමස්, අතුණු, අතුණුබහන්, නො දිරූඅහර, අසුචි යන මොවුහු ය. මෙයින් අන්‍ය වූ ත් තදගතියෙන් යුත් ආධ්‍යාත්මික වූ යමෙක් වේ ද, ඒ ද අජ්ඣත්තික පඨවියෙහි ඇතුලත් ය. මෙහි විසතරය ඉතාදිග එකෙකි. මෙහි ඒ කියනු බැරි ය. පොත දිග්ගැසෙනු ඉවසනු නො හැකි ය. අනික් පොතපතින් ඒ දත යුතු ය.

මෙ කියූ කෙශාදින් තමා කෙරෙහි වූ බැවින් 'අජ්ඣත්ත' යි ද, තමා නිසා පවත්නා බැවින් 'පච්චත්ත'යි ද, තද බැවින් 'කක්ඛල'යි ද, පරුෂ බැවින් 'ඛරිගත' යි ද, මම ය, මාගේ ය යි දැඩි කොට ගන්නා බැවින් 'උපාදිණ්ණ' යි ද කීහු. **'අත්තනි පවත්තත්තා, අජ්ඣත්තං අත්තානං පටිච්ච පවත්තත්තා පච්චත්තං, කක්ඛළභාවේ ඵඩං, ඛරිගතභාවේ ඵරුසං, උපාදිණ්ණභාවේ දළහං, ආදිණ්ණං අහං මමන්ති,** යනු එහි අටුවා යි. සෙස්ස කී සේ දත යුතු ය.

දෙවැන්න ආපොධාතුරූපය යි. හැම වස්තුවෙක පවත්නා ආබන්ධන එකට බඳවන ගතිය ආපොධාතුරූප ය යි වදුල සේක. සසම්භාරආපොධාතු ය, ආරම්මණආපොධාතු ය, සම්මනිආපොධාතු

ය, ලක්ඛණආපොධාතු ය, යි මෙය සතර තැනෙක පවතී. එහි ගඞ්ගා සමුද්‍රාදියෙහි පවත්නා ජලය, සසම්භාරආප නමින් ගැණේ. ආපො කසිණනිමිත්ත, ආරම්මණආප නම් වේ. ඒ කසිණ නිමිත්ත වඩා ධ්‍යාන ලබා බඹලොව උපන්නේ ආපොදෙව' යි හඳුන්වනු ලැබේ. ඒ ය සම්මතිආප. ශරීරය පිළිබඳ වූ එකට බඳවන ගති ඇත්ත, ලක්ඛණආප නම්. මෙය ලක්ෂණවශයෙන් එකට බඳවනබව ලකුණු කොට සිටියේ ය. **'ආබන්ධනලක්ඛණා ආපොධාතු'** යි කීයේ එහෙයිනි. කෘත්‍යය නම්, සහජාතධර්මයන් එකට බැඳ තැබීම යි. අබ්ධාතුවෙන් තොර වූ රූප ධර්මයන්ගේ එකට බැඳී පැවැත්මෙක් නැත. අබ්ධාතුව නිසා ම අනික් රූප ධර්ම එකට බැඳුනේ ය. **'ආපෙති සහජාතරූපානි ඛ්‍යාපෙත්වා තිඨතී'ති = ආපො, තානි වා අවිප්පකිණ්ණානි කත්වා භුසො පාති රක්ඛතීති = ආපො'** යනු විවරණ යි. **'ආපොධාතු ආබන්ධනරසා'** යි කීයේ ද මේ නිසා ම ය. අබ්ධාතුව සිහිල් පහස් ඇත්තකැ යි කෙනෙක් කියති. ඒ නො ගත යුතු ය. සිහිල් පහස් ගුණය තෙජොධාතුවෙහි ම ඇතුළත් වන බැවිනි.

ආපොධාතුව, අජ්ඣත්තික – බාහිරවශයෙන් ද, උපාදින්න අනුපාදින්නවශයෙන් ද දෙ වැදැරුම් ය. යටැ කියූ සේ මෙහි එන්නේ අජ්ඣත්තික – උපදින්නක වශයෙන් දැක්වෙන ආපො ධාතු රූප ය යි. එය ආයේ ආගමෙහි මෙසේ ය:–

'යං අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං සිනෙහො සිනෙහගතං බන්ධනත්තං රූපස්ස අජ්ඣත්තං උපදින්නං, සෙය්‍යථිදං? පිත්තං සෙම්හං පුබ්බො ලොතිතං සෙදො මෙදො අස්සු වසා ඛෙලො සිඞ්ඝානිකා ලසිකා මුත්තං, යං වා පනඤ්ඤම්පි අත්ථි අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං සිනෙහො සිනෙහගතං බන්ධනත්තං රූපස්ස අජ්ඣත්තං උපාදින්නං අයං වුච්චති ආපොධාතු' යි.

සියසතන්හි වූ ආබන්ධනගති ඇති මමය, මාගේ ය, යි දැඩි කොට ගන්නාලද යමෙක් වේ ද, එය අපො නම් වේ. පිත්, සෙම්, සැරව, ලේ, ඩහදිය, මේදතෙල්, කඳුලු, වුරුණුතෙල්, කෙල, සොටු, සඳමිදුළු මුත්‍ර යන මොවුහු ය අබ්ධාතු. මෙයින් අන්‍ය වූ තදගතියෙන් යුත් ආඞ්‍යාත්මික වූ යමෙක් වේ ද, ඒ හැම අජ්ඣත්තිකආපොධාතුවෙහි ඇතුළත් ය. සෙස්ස යට කී සේය.

තෙජොධාතුරූපය මහාභූතයන් අතුරෙහි තෙවැන්න යි. හැම වස්තුවක ම පවත්නා උණුසුම්ගතිය දිරිම දැවීම පැසවීම තෙජොධාතු නමැ යි වදාළාහු ය. එ ද සසම්භාර, ආරම්මණ, සම්මති, ලක්ඛණ වශයෙන් සතර තැනෙක පවතී. කැම්බීම් පිසගැණුමට හා පහන්

දල්වා ගැණීමට උපකාර වූ ගින්න සසම්භාර තෙජෝධාතුවැ යි ගැණේ. තෙජෝකසිණය, ආරම්මණතෙජෝ ධාතුව යි. ඒ වඩා බඹ ලොව උපන්නේ සම්මතිතෙජෝධාතුව යි. ශරීරයෙහි වූ උෂ්ණ සභාවාදිය ලක්ඛණතෙජෝධාතුව යි. ලක්ෂණ වශයෙන් උණුසුම් බව ලකුණු කොට සිටියේය. **'උණ්හත්ත ලක්ඛණං තෙජෝධාතු'** යි කියේ එහෙයිනි. කෘත්‍යය නම්, පැසවන මෝරවනබව යි. **'තෙජෝ එව හි සීතං'** ශීතය තෙජස්හි ම පිහිටි ගුණවිශෙෂයෙකැ යි කියත්. **'මන්දෙ පි උණ්හත්තෙන සීත බුද්ධි හොති'** උණුසුම්බව මඳ වූ කල්හි ශීතය යන හැඟීම පහළ වේ. මෙයින් අන්‍යයන්ගේ මතය තෙජස උෂ්ණ ස්පර්ශය ඇත්තේ ය යනු යි. ශීතභාවය උෂ්ණභාවය සේ පැසවන මෝරවන ගතියෙන් යුක්ත ය. ඒ නිසා ම වරෙක ශීත, වරෙක උෂ්ණ, වශයෙන් ද, වරෙක උෂ්ණ, වරෙක ශීත වශයෙන් ද සිහියට නැගී. අජ්ඣත්තික-බාහිරවශයෙන් හා උපාදින්න-අනුපාදින්න වශයෙන් තෙජෝධාතුව ද දෙවැදෑරුම් ය. මෙහි කියයුත්තේ අජ්ඣත්තික-උපාදින්න යන නම්වලින් ගැණෙන තෙජෝධාතුව යි. එය ආගමයෙහි මෙසේ ආයේ ය:-

'යං අජ්ඣත්තං පච්චත්තං තෙජෝ තෙජෝගතං උණ්හං උණ්හගතං උසුමං උසුමගතං අජ්ඣත්තං උපාදින්නං සෙය්‍යථීදං? යෙන ච සන්තප්පති යෙන ච ජීරියති යෙන ච පරිඩය්හති යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති, යං වා පන ඤඤම්පි අත්ථි අජ්ඣත්තං පච්චත්තං තෙජෝ තෙජෝගතං උණ්හං උණ්හගතං උසුමං උසුමගතං අජ්ඣත්තං උපාදින්නං, අයං වුච්චති අජ්ඣත්තිකා තෙජෝධාතු' යි.

තමාකෙරෙහි වූ තෙජෝගතියෙන් යුත් කර්මයෙන් හටගත් යමෙක් වේ ද, එය තේජස් නම් වේ. යමකින් තැවේ ද, යමක් කරණකොට දිරා ද, යමකින් දැවේ ද, යමකින් කෑ බී ආහාර පානාදිය මැනැවින් පැසීමට යේ ද ඒ තැවීම දිරීම දැවීම පැසීම යන මෙයට කරුණු වූ ධාතුශක්තිය තෙජෝධාතු නමැ යි ගතයුතු ය. මෙයින් අන්‍ය වූ ත් අජ්ඣත්තිකපරිපාචනලක්ෂණවත් යමෙක් වේ ද, ඒ හැම අජ්ඣත්තිකතෙජෝධාතුවෙහි ම ඇතුළත් ය. සෙස්ස යට කී සේ ය.

වායොධාතුරූපය මහාභූතයන් අතර සිවුවැන්න යි. හැම වසනුවෙක පවත්නා සැලෙනගතිය වායොධාතු නැමැ යි වදාළාහු ය. එ ද සසම්භාර, ආරම්මණ, සම්මති, ලක්ඛණ යි සතර තැනෙක පවතී. හැම අවකාශයෙක ම පැතිර පවත්නා වාතය, සසම්භාර වායොධාතුය යි කියනු ලැබේ. වායොකසිණය, ආරම්මණවායොධාතුව යි. එය වඩා බඹලොව උපන්නේ සම්මතිවායොධාතුව යි. කථා, වමන, ඔක්කාර, භික්කා ආදී වූ ක්‍රියාවිශෙෂයන්ට කාරණ වූයේ ලක්ෂණ

වායොධාතුව යි. ලක්ෂණවශයෙන් විත්ථම්භන ය යි කියූ පුරවන ගතිය ලකුණු කොට සිටියේ ය. **'විත්ථම්භනලක්ඛණං වායොධාතු'** යි කියේ එහෙයිනි. කෘත්‍යය නම්, සැලෙනබව යි. සහජාත රූපධර්මයන් නො වැටෙන සේ උසුලා සිටින්නේ මේ ය. **'වායති සහජාතධම්මෙ අපතමානෙ කත්වා වහතීති = වායො'** යි ඒ දැක්-විනි. තාර්කිකයෝ මෙය රූපරහිතස්පර්ශවත් යි කීහු. **'රූපරහිතස්පර්ශවාන් වායුඃ'** යනු තාර්කිකවචන යි.

අජ්ඣත්තික-බාහිර වශයෙන් හා උපාදින්න-අනුපාදින්න වශයෙන් දෙවැදැරුම් වන මෙහි ද, අජ්ඣත්තික-උපාදින්නක නමින් ගැණෙන වායොධාතුරූපය මෙහි කිය වේ. එය ආගමයෙහි මෙසේ ආයේ ය:-

'යං අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං ථම්භිතත්තං රූපස්ස අජ්ඣත්තං පච්චත්තං උපාදින්නං, සෙය්‍යථීදං? උඩ්ඩගමා වාතා අධොගමා වාතා කුච්ඡිසයා වාතා කොට්ඨාසයා වාතා අඞ්ගමඞ්ගානුසාරිනො වාතා සත්ථකවාතා ඛුරකවාතා උප්පලවාතා අස්සාසො පස්සාසො, ඉති යං වා පනඤ්ඤම්පි අත්ථි අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං ථම්භිතත්තං රූපස්ස අජ්ඣත්තං උපාදින්නං, අයං වුච්චති අජ්ඣත්තිකා වායොධාතු' යි.

තමන් කෙරෙහි පැවැති විත්ථම්භනගතියෙන් යුත් කර්මයෙන් හටගත් යමෙක් වේ ද, එය වායො නම් වේ. උඩ්ඩගමවාතය, අධොගමවාතය, කුච්ඡිසයවාතය, කොට්ඨාසයවාතය, අඞ්ගමඞ්ගානුසාරීවාතය, සත්ථකවාතය, ඛුරකවාතය, උප්පලකවාතය, අස්සාසපස්සාසවාතය යන මොවුහු ය ඒ. මෙයින් අන්‍ය වූ ත් ආද්‍ධ්‍යාත්මික විත්ථම්භනලක්ෂණයෙන් යුත් යමෙක් වේ ද, එයත් මෙහි ම ඇතුළත් ය. සෙස්ස යට කී සේ ය.

මෙසේ මේ ශරීරයෙහි පඨවීධාතු කොටස් විස්සෙකි. ආපොධාතු කොටස් දොළොසෙකි. තෙජොධාතු කොටස් සතරෙකි. වායොධාතු කොටස් සයෙකි. මුළුල්ල එකතු ව දෙසාළිසෙකි. ඔවුන් මෙසේ එක් තැන් කළෝ:-

"කෙසාදිමත්ථලුඞ්ගන්තා – පඨවංසා හි වීසති,
පිත්තාදිමුත්තදන්තා තෙ – ජලංසා චාදසීරිතා.

යෙන සන්තප්පනං යෙන – ජීරණං දහනං තථා,
යෙනාසිතාදිපාකො ච – චාතුරංසා නිලාධිකා.

උද්ධාධොගමකුච්ඡට්ඨා – කොට්ඨාසයඞ්ගසාරි ච,
අස්සාසොති ච විඤ්ඤෙය්‍යා – ඡලංසාවාතනිස්සිතා."

එකොළොස් අයුරකින් බෙදුනු රූපධර්ම අතරෙහි දෙවැන්න ප්‍රසාද රූපපඤ්චකය යි. චක්ෂුඃප්‍රසාදරූපය එහි ද පළමුවැන්න යි. එය සසම්භාර-ප්‍රසාදවශයෙන් දෙවැදෑරුම් ය. ඇටවලින් සෑදී හිස්මොළයෙන් ආ නහරින් එල්බ ගත් මස්පිඬ, සසම්භාරචක්ෂුස යි. පඨවි, ආපො, තෙජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඔජා, සම්භව, සණ්ඨාන, ජීවිත, භාව, කායපසාද, චක්ඛුපසාද යන තුදුස් සම්භාරයකින් යුක්ත බැවින් එය එනමින් හඳුන්වනු ලැබේ. එහි පඨවි, ආපෝ, තෙජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඔජා, සම්භව, සණ්ඨාන යන මේ දසය කම්මසමුට්ඨාන දසයෙක, චිත්තසමුට්ඨාන දසයෙක, උතුසමුට්ඨාන දසයෙක, ආහාරසමුට්ඨාන දසයෙ කැ යි සතර අයුරකින් බෙදී සතළිසෙක් වේ. මේ සතළිසට කර්මයෙන් හටගත් ජීවිත, භාව, කායපසාද, චක්ඛුපසාද යන සතර ත් එකතුවීමෙන් සුසාළිසෙක් වේ. මේ විසතරවිසිනි. ලොකයා විසින් ඇස, කියා පිළිගත් මේ මස් පිඬෙහි ඇත්තාහු සුසාළිසක් සම්භාරයෝ ම ය. චක්ෂුඃ ප්‍රසාදය යි කියනු ලබන්නේ, මේ සුසාළිස් සම්භාරයන් ඇසුරු කොට සිටි ප්‍රසාද රූපය යි. රූපදැක්මෙහි ශක්තිමාත්‍රය යි. කිරිමවුන් සතර දෙනෙක විසින් වෙන වෙන ම දරා, නහවා, සරසා, පවත්සලා, උවටැන් කරණ රජකුමරකු මෙන් සන්ධාරණ, බන්ධන, පරිපාචන සමුදීරණ යන මෙයින් පඨවි, ආපො, තෙජෝ, වායෝ යන මහා භූතරූපයන් විසින් උපස්ථාන කරණු ලබන මේ ප්‍රසාදරූපය උතුවිත්තයන් විසින් උපත්තම්භනය කරණු ලැබේ. ආයුසයෙන් පාලනය වේ. වණ්ණ, ගන්ධ, රසාදියෙන් පිරිවැරුනේ චක්ෂුර්විඤ්ඤාදි චිත්තයන්ට වාසනුද්වාරභාවය සිදු කරමින් පවතී. රූප හැපීමට සුදුසු භූතරූපයන්ගේ ප්‍රසාදය ලකුණු කොට ඇත්තේ ය. **'රූපාභිඝාතාරහභූතප්පසාද ලක්ඛණං චක්ඛු'** යි අටුවායෙහි ආයේ ය. තවත් ලෙසකින් කිය කොත් 'රූපතෘෂ්ණාව නිදුන කොට ඇති කර්මයෙන් හටගත් ප්‍රසාදය ලකුණු කොට ඇතැ' යි **'දට්ඨුකාමතා නිදානකම්මසමුට්ඨාන භූතප්පසාදලක්ඛණං වා චක්ඛු'** යන විවරණය අනුව කිය හැකි ය. කෘත්‍යය රූප විඳගැණීම යි. චක්ෂුර්විඤ්ඤනයට ආධාරභාවය පවවූ පධ්‍යානය යි. පදට්ඨානය වනුයේ රූප දැකීමේ තෘෂ්ණාව මූල් කොට ගත් කර්මජභූතය යි. **'රූපෙසු ආවිඤ්ජනරසං, චක්ඛුවිඤ්ඤාණස්ස ආධාරභාවපච්චුපට්ඨානං, දට්ඨුකාමතානිදානකම්මජභූත පදට්ඨානං'** යනු බණපොතෙහි එයි. චක්ෂුඃප්‍රසාදරූපයෙහිලා කියයුතු මෙයින් අන්‍ය වූ ධර්මවිස්තරය යටැ කියනලදී.

සසම්භාර-ප්‍රසාද වශයෙන් දෙකට බෙදෙන ශ්‍රොත්‍රප්‍රසාදරූපය දෙවැන්න යි. ලොකයා විසින් කණ ය යි පිළිගන්නා ලද්දේ සසම්භාරශ්‍රොත්‍රය යි. එහි කොරතුරු යටැ කියූ සේ ය. පසාදරූපය එහි තුළ පිහිටියේ ය. ශ්‍රොත්‍රවිඤ්ඤාදිචිත්තයන්ට වාසනුද්වාරභාවය

සිදු කරන්නේ එය යි. ශබ්ද හැපීමට සුදුසු භූතප්‍රසාදය ලකුණු කොට සිටියේ ය. ශබ්දතෘෂ්ණාව නිදාන කොට ඇති කර්මසමුත්ථාන භූතප්‍රසාදය ලකුණු කොට ඇත්තේ හෝ යි. කෘත්‍යය ශබ්ද විඳ ගැණුම යි. පච්චුපට්ඨානය ශ්‍රොත්‍රවිඤ්ඤණයට ආධාරභාවය යි. ශබ්ද තෘෂ්ණාව නිදාන කොට ඇති කර්මජභූතපදඝට්ඨානය කොට ඇත්තේ ය. **'සද්දාභිඝාතාරහභූතපසාදලක්ඛණං, සොතුකාමතානිදානකම්මසමුට්ඨානභූතපසාදලක්ඛණං වා සොතං, සද්දෙසු ආවිඤ්ඡනරසං, සොතවිඤ්ඤාණස්ස ආධාරභාවපච්චුපට්ඨානං, සොතුකාමතානිදානකම්මජභූතපදට්ඨානං,** යනු පාළියි.

තෙවැන්න ඝ්‍රාණප්‍රසාදරූප ය යි. එ ද සසම්භාර-ප්‍රසාද වශයෙන් දෙ පරිදි ය. සසම්භාර ඝ්‍රාණය ලොකයා විසින් නැහැය යි හඳුන්වනු ලැබේ. එය ඝ්‍රාණප්‍රසාදය නො වේ. ඝ්‍රාණප්‍රසාදය, සසම්භාරඝ්‍රාණයෙහි එළකුරයක සටහන් ඇති තැන ඇසුරු කොට සිටියේ ය. සිටියේ ඝ්‍රාණවිඤ්ඤාදී චිත්තයන්ට වාසනුද්ධාරභාවය සිදු කරමිනි. ගන්ධසපර්‍යට යොග්‍ය වූ භූතප්‍රසාදය ලකුණු කොට ඇත්තේ ය. නොහොත් ගන්ධඝ්‍රාණතෘෂ්ණාව නිදාන කොට ඇති කර්මසමුත්ථාන භූතප්‍රසාදය, ලක්ෂණ කොට සිටියේ ය. කෘත්‍යය, ගඳසුවඳ විඳගැණුම ය. පච්චුපට්ඨානය, ඝ්‍රාණවිඤ්ඤණයට ආධාරභාවය යි. ආඝ්‍රාණකාමතානිදානකර්මජභූතපදට්ඨානය යි. **'ගන්ධාභිඝාතාරහභූතපසාදලක්ඛණං ඝාණං, ඝායිතුකාමතානිදානකම්මසමුට්ඨාන භූතපසාදලක්ඛණංවා, ගන්ධේසු ආවිඤ්ඡනරසං, ඝාණවිඤ්ඤාණස්ස ආධාරභාවපච්චුපට්ඨානං, ඝායිතුකාමතානිදානකම්මජභූතපදට්ඨානං'** යනු පාළියි.

ජීවහාප්‍රසාදය සිවුවැන්න යි. එ ද පෙර සේ දෙ පරිදි ය. ලොකයා විසින් දිවය යි ගන්නා ලද්දේ සසම්භාරජීවහා යි. එහි මැද උපුල්පෙතිඅගක් වැනි සටහනෙක් වෙයි. ජීවහාප්‍රසාදය එය ඇසුරු කොට ජීවහාවිඤ්ඤාදිචිත්තයන්ට වාසනුද්ධාර ව සිටියේ ය. රසවිදුමෙහි තෘෂ්ණාව නිදාන කොට ඇති කර්මසමුත්ථානභූතප්‍රසාදය ලක්ෂණ කොට ඇත්තේ හෝ යි. කෘත්‍යය රසවිඳගැණුම යි. පච්චුපට්ඨානය ජීවහාවිඤ්ඤණයට ආධාරභාවය යි. ආස්වාදකාමතානිදාන කර්මජභූතපදට්ඨාන ය යි. **'රසාභිඝාතාරහභූතපසාදලක්ඛණා ජීවහා, සායිතුකාමතානිදානකම්මසමුට්ඨානභූතපසාදලක්ඛණා වා, රසෙසු ආවිඤ්ඡනරසා, ජීවහාවිඤ්ඤාණස්ස ආධාරභාව පච්චුපට්ඨානා, සායිතුකාමතානිදානකම්මජභූතපදට්ඨානා'** යනු පාළියි.

කායප්‍රසාදය පස්වැන්න යි. එ ද පෙරසේ දෙ පරිදි ය. ඇසට ගොදුරු වන සජීවශරීරය, සසම්භාරකාය නම් වේ. පාවකතෙජසක්

කෙස්, ලොම්, නියත්, වියලිසමත් හැර අන් සියලු සිරුරෙහි පුලුන් පොදක ඉසි තෙලක් සේ පැතිර පවත්නේ කායප්‍රසාදය යි එ ද කායවිඥානාදිචිත්තයන්ට වාසතුවාර ව පවතී. සපශීයට යොග්‍ය වූ භූතප්‍රසාදය ලකුණු කොට සිටියේ ය. පහස විඳිනු කැමතිබව නිදාන කොට ඇති කර්මයෙන් හටගත් භූතප්‍රසාදය ලකුණු කොට ඇත්තේ හෝ යි. කෘත්‍යය, පහස විඳගැණුම යි. පච්චුපඨානය, කායවිඥාන යට ආධාර භාවය යි. සපශීකාමතානිදානකර්මජභූතපදට්ඨානය යි. **'ඵොට්ඨබ්බාභිඝාතාරහභූතප්පසාදලක්ඛණො කායො, ඵුසිතුකාමතානිදානකම්මසමුට්ඨානභූතප්පසාදලක්ඛණො වා, ඵොට්ඨබ්බෙසු ආවිඤ්ජනරසො, කායවිඤ්ඤාණස්ස ආධාරභාවපච්චුපට්ඨානො, ඵුසිතුකාමතානිදානකම්මජභූතපදට්ඨානො'** යනු පාළියි.

මෙකී ප්‍රසාදරූප පසෙහි චක්ඛු, ආදීන්ගේ අර්ථය තෙමේ එකිනෙකට වෙනස් ය. අසාධාරණ වන්නේ ය. එය අර්ථකථාවාර්‍යයන් විසින් මෙසේ දක්වන ලදී **'චක්ඛතීති = චක්ඛු, රූපං අස්සාදෙති විභාවෙති චාති අත්ථො, සුණාතීති=සොතං, ඝායතීති =ඝාණං, ජීවිතං ආභවයතීති = ජිව්හා කුච්ඡිතානං සාසවධම්මානං ආයොති = කායො, ආයොති උප්පත්තිදෙසො'** යි.

යම් ප්‍රසාදරූපයෙක් තෙමේ රූපාරම්මණය රස විඳගැණුමක් මෙන් කෙරේ ද, ඒ චක්ෂුස් නම් වේ. යම් ප්‍රසාදරූපයෙක් ශබ්ද ශ්‍රවණය කෙරේ ද, ඒ ශ්‍රොත්‍ර නම් වේ. ඝ්‍රාණවිඥානය නිඃශ්‍රයස්ථාන කොට ගන්ධය ආඝ්‍රාණය කරණුයේ ඝ්‍රාණ නම් වේ. යම් ප්‍රසාද රූප යෙක් තෙමේ ජිව්හාවිඥානය නිඃශ්‍රයස්ථාන කොට ජීවිතයට කරුණු වූ රසය කැඳවා ද, ඒ ජිව්හා නම් වේ. 'ජීවිතව්හා' යි විය යුතු වුවත් මෙහි නිරුක්තිනයින් 'ජිව්හා' යි සිඩ ය. නින්දිත වූ සාස්‍රවධර්මයන්-ගේ ප්‍රවෘත්තියට කාරණ වූයේ කාය නම් වේ. ආය නම් උත්පත්ති දෙශය යි. හෙවත් පැවැත්මෙහි හෙතුව යි.

මිලඟට දැක්වෙන්නෝ විෂයරූපයෝ ය. එහි මුල් වූයේ රූප රූප ය යි. ඇසින් දැක්ක යුතු සතර මහාභූතයන් නිසා පවත්නා වර්ණය රූපරූප නම්. යට කී සතර මහාභූතයන්ගේ ම නීලපීතාදී වූ ද දිග කෙටි වූ ද කුඩා මහත් වූ ද වට පිරිමඬුලු වූ ද සතරැස් සරැස් ආදී වූ ද වළ ගොඩ වූ ද ඡායා ආතප ආලෝක අන්ධකාරාදී වූ ද ඇසට ගොදුරු වූ සතර මහාභූතයන් නිසා පවත්නා වර්ණායතනය හෙවත් පැහැය රූපරූපය, යි නියමයෙන් දත යුතු ය. බුදුරජානන් වහන්සේ මෙසේ වදාළ සේක:- **'කතමං තං රූපං රූපායතනං යං රූපං චතුන්නං මහාභූතානං උපාදායවණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං නීලං පීතං ලොහිතං ඔදාතං කාලකං මඤ්ජෙට්ඨකං**

හරිවණ්ණං අම්බඩකුරවණ්ණං දිසං රසසං අණුං ථූලං වට්ටං පරිමණ්ඩලං චතුරස්සා ඡළංසං -පෙ- ඉදං තං රූපං රූපායතනං' යි.

තාර්කිකයෝ මෙය ඇසින් ගතයුතු ගුණයකැ යි කීහ. **'චක්ඛුර් මාත්‍රග්‍රාහ්‍යා ගුණෝ රසඃ'** යනු තාර්කිකවචන යි. රූපය ඇසෙහි හැපීම ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය චක්ෂුර්විඥානයට විෂය භාවය යි. එයට ම ගොදුරුවනබව පච්චුපට්ඨානය යි. මහාභූතපද ස්ථාන කොට ඇත්තේ ය. **'චක්ඛුපටිහනනලක්ඛණං රූපං, චක්ඛු විඤ්ඤාණස්ස විසයභාවරසං, තස්සෙව ගොචරපච්චුපට්ඨානං මහාභූතපදට්ඨානං'** යනු පාළියි.

එහි දෙවැන්න ශබ්දය යි. සතර මහාභූතයන් නිසා පවත්නා කණින් ඇසිය යුතු වූ සකල ශබ්දවිශෙෂයෙක් ම මෙහි ඇතුළත් ය. අනිදර්ශන සප්‍රතිඝ වූ හෙරිශබ්දාදිය, වාතෝදකශබ්දාදිය, මනුෂ්‍ය මනුෂ්‍යශබ්දාදිය යන හැම හඬකෙනෙක් ම මෙහිලා ගැණෙති. **'කතමං තං රූපං සද්දායතනං? යෝ සද්දෝ චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනෝ සප්පටිඝෝ හෙරිඝද්දෝ - පෙ - ඉදං තං රූපං සද්දායතනං'** යනු දෙශනා ය.

කණින් ගත යුතු ගුණය ශබ්දය යි තාර්කිකයෝ කීහ. **'ශ්‍රොත්‍ර ග්‍රාහ්‍යා ගුණඃ ශබ්දඃ'** යනු තාර්කිකවචන යි. එය ආකාසයෙහි පමණක් පවත්නා බවත් ධවන්‍යාත්මක - වර්ණාත්මක වශයෙන් දෙවැ දුරුම් බවත් කියන ලද්දේ ය. මෙය සොතපටිහනනය ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය ශ්‍රොත්‍රවිඥානයට විෂයභාවය යි. එයට ම ගොදුරු වනබව පච්චුපට්ඨානය යි. සතරමහාභූතපදට්ඨානය යි. **'සොතපටිහනනලක්ඛණෝ සද්දෝ, සොතවිඤ්ඤාණස්ස විසයභාවරසෝ තස්සෙව ගොචරපච්චුපට්ඨානෝ, චතුමහාභූතපදට්ඨානෝ'** යනු පාළියි.

තෙවැන්න ගන්ධය යි. මහාභූතරූපයන් නිසා පවත්නා නැහැ යෙන් ඇද ගතයුතු වූ හැම ගඳසුවඳ ම මින් ගැණේ. මහාභූතයන් නිසා පවත්නා අනිදර්ශනාදී වූ මූලසාරතවගන්ධාදී වූ, සුගන්ධ දුගන්ධයෝ මෙහි ම ඇතුළත් වෙති. ඒ දක්වනු පිණිස බුදුරජානන් වදාළ පාළිය මෙසේ ය:- **'කතමං තං රූපං ගන්ධායතනං? යෝ ගන්ධෝ චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනෝ සප්පටිඝෝ මූල ගන්ධෝ සාරගන්ධෝ -පෙ- ඉදං තං රූපං ගන්ධායතනං'** යි.

තාර්කිකයෝ නැහැයෙන් ගතයුතු ගුණය ගන්ධය යි කියති. **'ඝ්‍රාණග්‍රාහ්‍යා ගුණෝ ගන්ධඃ'** යනු තාර්කිකවචන යි. එය

පෘථිවියෙහි පමණක් පවත්නාබවත් සුගන්ධදුර්ගන්ධවශයෙන් දෙ පරිදිබවත් කියති. ඝාණපටිහනනය ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය ඝ්‍රාණවිඥානයාගේ විෂයභාවය යි. එයට ම ගොදුරුවන බව පච්චුපට්ඨානය යි. සතර මහාභූතපදට්ඨානය යි. **'ඝාණපටිහනන ලක්ඛණො ගන්ධො, ඝාණවිඤ්ඤාණස්ස විසයභාවරසො තස්සෙව ගොචරපච්චුපඨානො, චතුමහාභූතපදඨානො'** යනු පාළියි.

සතරවැන්න රසය යි. දිවින් විඳගතයුතු වූ අනිදර්ශන සප්‍රතිඝ වූ මූලඛන්ධාදීරස හා මධුරාම්ලාදිරස, රසරූපයෙහි ඇතුළත් ය. මහාභූතයන් නිසා ම පවත්නේ ය. එය මෙසේ වදාළසේක.– **'කතමං තං රූපං රසායතනං? යො රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො මූලරසො ඛන්ධරසො තච රසො-පෙ-ඉදං තං රූපං රසායතනං'** යි.

තාර්කිකයෝ දිවින් ගතයුතු වූ ගුණය රසය යි කියති. **'රසනාග්‍රාහ්‍යො ගුණො රසඃ'** යනු තාර්කිකවචන යි. පෘථිවි ජල දෙක්හි පවත්නේ ය යි ද, පෘථිවියෙහි ෂඩ්රසයත්, ජලයෙහි මධුර රසයත් ඇතැයි ද ඔවුහු පිළිගණිති.

දිවෙහි වැද ගැණුම ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය ජිව්හා විඥානයට විෂයභාවය යි. එයට ම ගොදුරුවනබව පච්චුපට්ඨානයයි. සතරමහාභූතපදට්ඨානය යි. **'ජිව්හාපටිහනනලක්ඛණො රසො, ජිව්හා විඤ්ඤාණස්සවිසයභාවරසො, තස්සෙව ගොචර පච්චුපඨානො, චතුමහාභූතපදඨානො'** යනු පාළි යි

පස්වැන්න ඵොට්ඨබ්බය යි. ඵොට්ඨබ්බය යි විශෙෂයෙන් ගතයුතු රූපයෙක් නැත්තේ ය. පඨවි, තෙජෝ, වායො, යන මහාභූත තුන, ඵොට්ඨබ්බය යි ගණිනු ලැබේ. ආපොධාතුව එහි නො යෙදේ. මෙය කායවිඤ්ඤාණයෙන් දතයුතු ය. පඨවි, තෙජෝ, වායො, යන තුන, ශරීරයෙන් පහස්හි කරණු ලැබේ. ආපොධාතුව (ජලය) පහස්නා කල්හි පඨවි, තෙජෝ, වායො යන තුන, ස්පර්ශ වන්නේ ය. කර්කශ, මෘදුක, සණ්හ, පරුෂාදී වූ ස්පර්ශවිශෙෂ මෙහි ඇතුළත්ය. එහිලා බුදුරජානන් වහන්සේගේ දෙශනාව මෙසේ ය:– **'කතමං තං රූපං ඵොට්ඨබ්බායතනං? පඨවිධාතු, තෙජෝධාතු, වායොධාතු, කක්ඛලං, මුදුකං, සණ්හං, ඵරුසං –පෙ– ඉදං තං රූපං ඵොට්ඨබ්බායතනං'** යි.

තාර්කිකයෝ මෙය සමින් ගතයුතු වූ ගුණයෙකැ යි කියති. **ත්වගිඳ්‍රියමාත්‍රග්‍රාහ්‍යො ගුණඃ ස්පර්ශඃ'** යනු තාර්කිකවචන යි.

මොවුන් පිළිබඳ ලක්ෂණ-රසාදිය මහාභූතවිභාගයෙහි කියූ ලෙසින් දතයුතු ය.

භාවරූප දෙකෙකි. එ දෙක ස්ත්‍රීභාවය හා පුරුෂභාවය යි. හඳුන් වනු ලැබේ. එහි 'මෝ ස්ත්‍රීය' යි හැඳින ගැණීමට උපකාර වූ ශක්තිය ස්ත්‍රීභාවරූපය යි. ඒ භාවරූපය කායෙන්ද්‍රියය මෙන් අවිශදකාර යෙන් පිහිටි සකඞ්ගපංචකය පැතිර ගෙණ පවති. එය මෙසේ වදාළ සේක:- **'කතමං තං රූපං ඉත්ථින්ද්‍රියං? යං ඉත්ථිලිඞ්ගං ඉත්ථිනිමිත්තං ඉත්ථිකුත්තං ඉත්ථාකප්පෝ ඉත්ථත්තං ඉත්ථිභාවෝ ඉදං තං රූපං ඉත්ථින්ද්‍රියං'** යි. ස්ත්‍රීය පිළිබඳ යම් ලක්ෂණයෙක් නිමිත්තයෙක් කුත්තයෙක් ආකල්පයෙක් ස්ත්‍රීත්වයෙක් ස්ත්‍රීභාවයෙක් වේ ද, එය ස්ත්‍රීන්ද්‍රිය හෙවත් ස්ත්‍රීභාව නම් වේ යනු එහි කෙටි තේරුම යි. **'ඉත්ථිලිඞ්ගං ඉත්ථිනිමිත්තං ඉත්ථිකුත්තං ඉත්ථාකප්පෝ ඉත්ථත්තං ඉත්ථිභාවෝ'** යන මෙ කියූ පද තෝරණ ටීකාචාර්‍යවරයෝ මෙසේ කීහ:- **'තත්ථ ඉත්ථීනං අඞ්ගජාතං ඉත්ථිලිඞ්ගං, සරාධිප්පායා ඉත්ථිනිමිත්තං, ඉත්ථිසඤ්ඤාණස්ස පවත්තනාවතෝ අවිසදඛාන ගමනනිසජ්ජාදි ඉත්ථිකුත්තං, ඉත්ථිසණ්ඨානං, ඉත්ථාකප්පෝ, ඉත්ථියාභාවෝ ඉත්ථත්තං'** යි. ලිඞ්ග නම් සණ්ඨාන විශෙෂයෝ ය. එහි ගැණුබව හෝ පිරිමිබව හඟවන ප්‍රධාන සටහන වනුයේ ගැණුන්ගේ හා පිරිමින්ගේ අඞ්ගජාතය යි. **'ඉත්ථීනං අඞ්ගජාතං ඉත්ථිලිඞ්ගං, පුරිසානං අඞ්ගජාතං පුරිසලිඞ්ගං'** යන ටීකාවචනය එය පැහැදිලි කරයි. ස්ත්‍රීය, යි හැඳින ගැණීමට හෙතු වන බැවින් කටහඬ අදහස් ස්ත්‍රීනිමිත්ත නමැ යි කියති. අවිශද වූ හෙවත් අව්‍යක්ත වූ යෑම්-ඒම් ඉදුම්-සිටුම් ආදිය ඉත්ථිකුත්ත නම් වේ. ස්ත්‍රීකටයුතුය, යන තේරුම යි. පයොධර-කෙශාදිය ස්ත්‍රීආකල්ප නම්. ස්ත්‍රියගේ සවභාවය තෙමේ ස්ත්‍රීත්ව නම් වේ.

'මේ පුරුෂයා' යි හැඳින ගැණීමට උපකාර වූ ශක්තිය පුරුෂ භාවරූපය යි. එ ද කායෙන්ද්‍රියය මෙන් විශදකාරයෙන් පිහිටි සකඞ්ගපංචකයෙහි පැතිර සිටියි. එය මෙසේ වදාළෝය:- **'කතමං තං රූපං පුරිසින්ද්‍රියං? යං පුරිසස්ස පුරිසලිඞ්ගං පුරිසනිමිත්තං පුරිසකුත්තං පුරිසාකප්පෝ පුරිසත්තං පුරිසභාවෝ ඉදං තං රූපං පුරිසින්ද්‍රියං'** යි. මෙහි හැම තැන ස්ත්‍රීභාවයෙහි කී සෙයින් දන්නේ ය.

"ලිඞ්ගං හත්ථාදිසණ්ඨානං - නිමිත්තං මිහිතාදිකං,
කුත්තං සුපපාදිනා කීළා - ආකප්පෝ ගමනාදිකං"

අන්පා ආදීන්ගේ සටහන ලිඞ්ගය යි ද මදඝිනාදිය නිමිත්තය යි ද, කුඩා කුළු නගුල් ආදියෙන් ක්‍රීඩාකිරීම කුත්තය යි ද, යෑම් - ඒම් ආදිය ආකප්පය යි ද මෙයින් කීහ.

සත්‍රියගේ අත්පා ආදි අවයව හා යෑම් ඊම් ආදිය අවිශද ය. අව්‍යක්ත ය. පුරුෂයා පිළිබඳ ඒ සියල්ල විශද ය. අත්පා ආදිය මහත් ය. ගැහැණුන්ට දැලිරුවුල් නැත. පිරිමින්ට ඒ ඇත්තේ ය. ගැණු කුඩාකාලයෙහි කුළුමොහොල්වලින් සෙල්ලම් කරති. පිරිමි කුඩාකාලයෙහි රියනගුලෙන් සෙල්ලම් කරති.

සත්‍රීන්ද්‍රියය, සත්‍රිභාවය ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය **සත්‍රිය** යි පැවසීම ය. පච්චුපට්ඨානය සත්‍රීලිඞ්ග, නිමිත්ත, කුත්ත, ආකප්ප යන මොවුන්ගේ කාරණභාවය යි. මේ එය කියූ හැටි:- **'ඉත්ථීභාවලක්ඛණං ඉත්ථින්ද්‍රියං, ඉත්ථිති පකාසනරසං, ඉත්ථිලිඞ්ග නිමිත්ත කුත්තාකප්පානං කාරණභාවපච්චුපට්ඨානං'** යි. පුරුෂෙන්ද්‍රියය, පුරුෂභාවය ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය පුරුෂ ය යි පැවසීම ය. පච්චුපට්ඨානය, පුරිසලිඞ්ග නිමිත්ත කුත්ත ආකප්ප යන මොවුන් පිළිබඳ කාරණභාවය යි. **'පුරිසභාවලක්ඛණං පුරිසින්ද්‍රියං, පුරිසොති පකාසනරසං, පුරිසලිඞ්ගනිමිත්තකුත්තාකප්පානං කාරණභාව පච්චුපට්ඨානං'** යනු එහිලා දතයුතු ය.

රූපසංග්‍රහගාථායෙහි ආ පස්වැන්න හෘදයවාස්තුරූපය යි මනොධාතු මනොවිඤ්ඤාණධාතුන්ට නිශ්‍රය වූ සථානය හෘදයවාස්තු රූපය යි කියනු ලැබේ. සත්ත්වයන්ගේ අභිනන්දීයන්ට කරණ වන බැවින් හදය නම් වූයේ, චිත්තචෛතසිකධර්මයන්ගේ වාසයට සථාන බැවින් වස්තු නම් විය. හදය ම මනොධාත්වාදීන්ට නිශ්‍රයභාවයෙන් වස්තු වූයේ හදයවස්තු නම් වේ. හෘදයකොෂ්ඨාභ්‍යන්තරයෙහි අඩ පතක් පමණ ලේ ඇසුරු කොට ඒ පවත්නේ ය. හෘදයවාස්තුරූප යෙක් තථාගතයන් වහන්සේ විසින් ධම්මසඞ්ගණී රූපකාණ්ඩයෙහි නො ම වදරණ ලද්දේ ය. එහෙත් ආගමවශයෙන් හා යුක්තිවශ යෙන් හෘදයවාස්තුරූපයක් ඇතිබව දක්නා ලැබේ. **'තඤ්ච ඛෝ රූපං නිස්සාය මනොධාතු මනොවිඤ්ඤාණධාතු ච පවත්තති, තං රූපං මනොධාතුයා මනොවිඤ්ඤාණධාතුයා තඤ්ච සම්පයුත්තකානං ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයෝ'** යන මේ පට්ඨානාගතපාඨය එය පැහැදිලි කරයි. මනොධාතු මනොවිඤ්ඤාණධාතු දෙදෙන හෘදයවාස්තු රූපයකගේ නිශ්‍රයෙහි ම පවතිනු විනා එයින් අන්‍ය වූ පඤ්චප්‍රසාද රූපාදිය නිශ්‍රය කොට නො ද පවතිත්. මෙයින් ද පෙණෙනුයේ හෘදයවාස්තුරූපය ඇතිබව ම ය. බුදුරජානන් වහන්සේ ධම්මසඞ්ගණියෙහි හෘදයවාස්තුරූපය නො වදාළේ, වස්තු-ආරම්මණදුකයන්ගේ දෙශනා භෙදය වන බැවිනි. **'අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස වත්ථු, අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස න වත්ථු, අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණං, අත්ථි රූපං චක්ඛුවිඤ්ඤාණස්ස න ආරම්මණං'** යනාදි ක්‍රමයෙන් වස්තු

දුක, ආරම්මණදුක යන මේ දුකයෝ දෙදෙන චක්ඛුර්විඤ්ඤාණාදියෙහි ලැබෙන්නාක් මෙන් මනොවිඤ්ඤාණයෙහි නො ලැබෙති. මනොවිඤ්ඤාණයෙහි වනාහි **'අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස වත්ථු, අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස න වත්ථු'** යි වාසනාදීපකය පමණක් ලැබේ. මනොවිඤ්ඤාණයට ගොදුරු නො වන කිසිත් ධර්මයක් නැති හෙයින් **'අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස ආරම්මණං, අත්ථි රූපං මනොවිඤ්ඤාණස්ස න ආරම්මණං'** යන දෙශනාව අනුව ආරම්මණ දුකය නො ලැබෙනබව කිය යුතු ය. එහෙයින් දුකවශයෙන් ආදෙශනාක්‍රමය විරුද්ධ වන බැවින් ධම්මසඞ්ගණියෙහි හෘදයවාස්තු රූපය නො වදුරණ ලද්දේය යි දත යුතු ය.

හෘදයවාස්තුරූපය මනොධාතු මනොවිඤ්ඤාණධාතු දෙදෙනාගේ නිශ්‍රයභාවය ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය ඒ ධාතූන්ගේ ම දැරීම ය. උසුලාසිටීම පවත්වූපඨානය යි. **'මනොධාතු මනොවිඤ්ඤාණධාතූනං නිස්සයලක්ඛණං හදයවත්ථු, තාසඤ්ඤේව ධාතූනං ආධාරණරසං, උබ්බහනපච්චුපට්ඨානං'** යනු පාළියි.

හෘදයවාස්තුරූපය සතර මහාභූතයන් විසින් සඞ්ඛාරණාදි කෘත්‍යයන්ගෙන් කරණලද උපකාර ඇති ව ඍතුචිත්තාහාරයන් විසින් රැකුල් දෙනලදු ව ආයුෂයෙන් පාලනය කරණු ලබන්නේ මනොධාත්වාදීන්ට වත්ථුභාවය සිදුකරමින් පවතී.

අන්‍යයෝ මෙය, යටිකුරු කළ මුව ඇති සිත් කලු වූ පද්ම කොෂයක ආකාර ඇත්තෙකැ යි ද, සියල්ලට මහත් ස්ථානයකැ යි ද කීහු. මේ එය:

"පදමකොෂප්‍රතීකාශං රුචිරං චාප්‍යධොමුඛම්,
හෘදයං තද්විජානීයාද් විඥස්‍යායතනං මහත්" යනු.

පූර්වොක්තසංග්‍රහගාථාවෙහි සඳහන්න වනුයේ ජීවිතෙන්ද්‍රිය රූපය යි. **'ජීවනති තෙනාති = ජීවිතං'** සහජාතධර්මයෝ යම්ක් කරණ කොට ගෙණ ජීවත් වෙත් නම්, ඒ ආයුෂය ජීවිතය යි කියනු ලැබේ යනු ඒ විවරණයෙහි අරුත් ය. සහජාතරූපයන්ගේ ජීවත් වීමට ආධාර වූ එය සහජාත වූ කර්මජරූපයන් පාලනය කිරීමෙහි අධිපතිභාවය කරණ හෙයින් ඉන්ද්‍රිය නම් ද වේ. **'ජීවිතමෙව ඉන්ද්‍රියං ජීවිතින්ද්‍රියං'** යන්නෙන් එය ව්‍යක්ත කළහ.

ජීවිතෙන්ද්‍රියරූපය දෙ පරිදි ය. **'අත්ථි රූපජීවිතින්ද්‍රියං අත්ථි අරූපජීවිතින්ද්‍රියං'** යනු දෙශනා යි. මෙහි ගැණෙනුයේ රූපජීවිතෙන්ද්‍රිය යි. **'කතමං තං රූපං රූපජීවිතින්ද්‍රියං? යෙසං තෙසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං, ඉදං වුච්චති රූපජීවිතින්ද්‍රියං'** යන

මෙයින් රූපී ධම්මයන්ගේ ආයුෂය සිටීම යැපීම පැවැත්ම ජීවිතෙන්ද්‍රියරූප නම් වේ ය යි කියන ලදි. මෙය කර්මයෙන් හටගත් රූප ධම්මයෙකි. කර්මයෙන් හටගත් රූපධම්, කර්මය නැති ව ගිය ද, ජීවිතෙන්ද්‍රිය විසින් පාලනය කරණලදු ව අවුරුදු සිය දහස් ගණනක් ද පරම්පරාවශයෙන් පවති. බිජුවටින් හටගත් ගස් වැල් ආදිය බිජුවට නැති ව ගිය ද, ජලයෙන් පාලනය කරණ ලදු ව බොහෝ කල් පවතින්නාක් මෙන් ඒ පවත්නේ ය.

මෙය සහජාතරූපපාලනය ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය ඔවුන්ගේ පැවැත්ම යි. පච්චුපට්ඨානය ඔවුන් තැබීම යි. සැපියයුතු භූත පදට්ඨානය වේ. **'සහජාතරූපානුපාලනලක්ඛණං ජීවිතින්ද්‍රියං, තේසං පවත්තනරසං, තේසඤ්ඤේව ඨපන පච්චුපට්ඨානං, යාපයිතබ්බභූතපදට්ඨානං'** යනු පාළියි.

මේ වනාහි පාචනතෙජෝධාතුව හා සමග කෙස්, ලොම්, නිය අග, වියලිසම්, හැර අන් සියලු උපාදින්නකශරීරය පැහිර ගෙණ පවත්නේ ය. **'ඉදං පන සහ පාචනග්ගිනා අනවසෙස උපාදින්න කායං යාපෙන්තා පවත්තති'** යනු පාළියි.

සත්වැන්න ආහාරරූපය යි. කබලීකාරාහාරය, ඵස්සාහාරය, මනෝසඤ්චේතනාහාරය, විඤ්ඤාණාහාරය යි ආහාරය සිවුවැදෑරුම් ය. එහෙත් මෙහි ගැණෙනුයේ කබලීකාරාහාරය යි. ලෝ වැස්සන් විසින් යමක් පිඬු පිඬු කොට ගණු ලබන්නේ නම්, හෙවත් ගිලිනු ලබන්නේ නම් එය කබලීකාරාහාරය යි කියනු ලැබේ. කබල නම් බත් පිඬු ආදිය යි. ඔජට්ඨමකරූප ගන්නේ හෝ ආහාර නම්. **'කබලං කත්වා අජ්ඣොහරියතීති=කබලීකාරෝ, කබලීකාරෝ ච සෝ ආහාරෝ චේති=කබලීකාරාහාරෝ'** කබලීකාර වූයේ ත් ඒ ම ය. ආහාර වූයේ ත් ඒ ම යන අරුත්නි කබලීකාරාහාර නම් වේ. **'ඉදං ච සවත්ථුකං කත්වා ආහාරං දස්සෙතුං වුත්තන'**යි කී හෙයින් කබලීකාරාහාර යන මේ වචනය කියන ලද්දේ වස්තුසහිත කොට ආහාරය දක්වනු පිණිස ය. මෙහිලා කවර වස්තුවෙක් කබලීකාරාහාර යන වචනයෙහි ඇතුලත් වේ දැ යි අසන්නහුට, **'සෙඤ්ඤ කායොපත්ථම්භනහෙතුභූතා පන අඩ්ඨමඩ්ඨානුසාරිණී රස සඞ්ඛාතා අජ්ඣොහරිතබ්බාහාරසිනෙහභූතා ඔජා ඉධ ආහාර රූපං නාම'** යනු දිය යුතු පිළිතුර ය. අට වැදෑරුම් ඉන්ද්‍රියරූපයන් සමග හටගත් රූපයන්ගේ පැවැත්මට කරුණු වූ කුදු මහත් අවයවයන් අනු ව යන සුලු වූ රසධාතුහුගේ සාරය යි කියන ලද ගිලිය යුතු ආහාරයාගේ සෙනහය වූ ඕජාව කබලීකාරාහාරය යනු එහි අදහස ය. සමහර ආචාර්‍යයී කෙනෙක් සෙනහ සඞ්ඛ්‍යාත වූ ඔජාව ආහාරරූපය යි කියති. බුදුරජාණන් වහන්සේ ආහාරරූපය වදාළෝ

මෙසේය.– **'කතමං තං රූපං කබළිකාරෝ ආහාරෝ? ඔදනෝ, කුම්මාසෝ, සත්තු, මච්ඡා, මංසං, ඛීරං, දධි, සප්පි, නවනීතං, තෙලං, මධු, ඵාණිතං' -පෙ- යාය ඔජාය සත්තා යාපෙන්ති ඉදං තං රූපං කබළිකාරාහාරෝ'** යි. මෙහි ඔජාවන්ට වසතු වූවෝ ඔදන කුම්මාස සත්තු මච්ඡ මංසාදීහු ය. ඔදනාදීන්හි වූ රසය ඔජා නම්. වාසනුසඬ්ඛ්‍යාත වූ ඔදනාදිය ත් රසසඬ්ඛ්‍යාත වූ ඔජාවත් අතර, රූපය යි ගැණුම දෙශනානුකූල වේ. අර්ථකථාචාර්‍යවරයෝ ඔදනාදිය කම්ජතෙජස දුරු කරන්නේ ය යි ද, ඔජාව රූපධර්‍ම පාලනය කරන්නේ ය යි ද කීහු. වාසනුසඬ්ඛ්‍යාත වූ ඔදනාදිය ත් රසසඬ්ඛ්‍යාත වූ ඔජාව ත් යන දෙක එක් ව ම සඬ්ගරීරය පාලනය කරන්නේ ය කුසතුලට ගත් ඔදනාදිය පැසී ගියවිට එහි කම්ජ තෙජස නැගී උදර පටලය ඩැහැ ගන්නේ ය. එසේ නගින්නා වූ කම්ජතෙජස බඩගින්නැ, යි කියනු ලැබේ. නැවැත ආහාරපානාදි වූ යමක් කුසතුල වැටුනු කල්හි බඩගින්නැ යි කියූ කම්ජතෙජස තමන් ඩැහැගෙණ සිටි උදරපටලය හැර දමා කුසතුල් සිටි ආහාරය ඩැහැ ගන්නේ ය. කම්ජතෙජස උදරපටලය හැර ආහාරය ඩැහැ ගත්විට බඩගින්න ගියේය යි කියති.

ආහාරගතඔජාව ද, ඒ ඒ ආහාරයන්ගේ ඖදාරික සූක්‍ෂම භෙද යෙන් වෙනස් වන්නේ ය. ඖදාරික වූ බත් අල බතල කුරක්කන් ආදියෙහි ඇත්තේ ඉතාස්වල්ප වූ ඔජාවයි. එ ද බලගතු නො වේ. කිරි දි ගිතෙල් ආදියෙහි වූ ඔජාව ඉතා බලගතු ය. එබඳු ආහාරයක් ගත් කෙනෙක්හට එයින් කිහිප දිනක් ම බඩගින්නෙන් නො පෙළී සිටිය හැකි ය. අල බතල ආදිය ගත් කෙනෙක්හට එසේ කිහිප දිනක් බඩගින්නෙන් නො පෙළී සිටිය නො හැකි ය. කෑ ඇසිල්ලෙහි ම නැවැත බඩගින්න උපදී. ආහාරයන්ගේ ඖදාරිකසූක්‍ෂම භාවය ඒ ඒ සත්වයන්ගේ වසයෙනුදු සිදු වේ. දෙවියන්ගේ ආහාරය මනුෂ්‍යයන්ගේ ආහාරයනට වඩා ශ්‍රේෂ්ඨ ය. දෙවියන් අතර ද උසස් උසස් දෙවියන්ගේ ආහාරය පහත් පහත් දෙවියන්ගේ ආහාරයනට වඩා ශ්‍රේෂ්ඨ ය. මිනිසුන් අතරත් එසේ ය. සක්විතිරජුගේ ආහාරය සාමාන්‍ය රජුන්ගේ ආහාරයනට වඩා ශ්‍රේෂ්ඨ ය. උසස් උසස් මිනිසුන්ගේ ආහාරය පහත් පහත් මිනිසුන්ගේ ආහාරයනට වඩා ශ්‍රේෂ්ඨ ය. තිරිසනුන් අතර ද මෙය දක්නා ලැබේ. කිඹුල්ලු ගල් නිලින්නෝ ය. ඔවුන්ගේ කුසතුලදි ඒ ගල් දිය වී යති. මොනරු නයි ගෝනුසු ආදීන් කන්නෝ ය. මොනරුන්ගේ ආහාරය සඳහා, වලසුන්ගේ ආහාරය ශ්‍රේෂ්ඨ ය. වලස්සු තුන් අවුරුදු පමණ පරණ වූ හැර දමනලද සතුන්ගේ අං ඇට අනුභව කරන්නෝ ය. ඒ අං හා ඇට ඔවුන්ගේ කෙලවලින් තෙමුන කල්හි අල බීමෙන් මොළොක් වේ. වලසුන්ගේ ආහාරය සඳහා, ඇතුන්ගේ

ආහාරය සියුම් ය. ඔවුහු ගස්අතු කති. ඔවුන්ගේ ආහාරයනට වඩා ගව ගොණ මුව ආදීන්ගේ ආහාරය සියුම් ය. මේ ක්‍රමයෙන් ආහාරයන්ගේ ඖදාරිකසූක්ෂ්මභාවය දතයුතු ය. මේ අටුවායෙහි කී සැටි සි.

කබලීකාරාහාරය ඔජාව ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය රූපඵලවීම ය. රුකුල්දීම පච්චුපට්ඨානය කොට සිටියේ ය. පිඬු පිඬු කොට ගතයුතු ආහාරවාසනු පදට්ඨාන කොට ඇත්තේ ය. **'ඔජාලක්ඛණෝ කබලීකාරාහාරෝ, රූපාහරණරසෝ, උපත්ථම්භනපච්චුපට්ඨානෝ, කබළං කත්වා ආහරිතබ්බවත්ථු පදට්ඨානෝ'**

යටැ ඉතාසැකෙවින් කියූ භූත, පසාද, විසය, භාව, හදය, ජීවිත, ආහාර යන අටලොස් රූපයෝ සභාවරූප, සලක්ඛණ රූප, නිප්ඵන්නරූප, රූපරූප, සම්මසනරූප යන නම්වලිනු දු හඳුන්වනු ලැබෙති. කැකුළුබැව් ආදී වූ තම තමත් අයත් සභාවයන්ගෙන් යුක්තහෙයින් සභාවරූප ය සි ද, උත්පාද, සණ්ඨිති, භඞ්ගක්ෂණයන්ගෙන් හෝ අනිත්‍යාදිලක්ෂණයන්ගෙන් යුක්ත හෙයින් සලක්ඛණ රූප ය සි ද, පිරිසිදීම් ආදිය හැර තමන් අයත් කැකුළුබැව් ආදියෙන් යුක්ත ව කම්මාදිප්‍රත්‍යයන්ගෙන් නිපන් හෙයින් නිප්ඵන්න රූප ය සි ද, රූපනය සි කියූ නැසෙනගතියෙන් යුක්තහෙයින් රූපරූප ය සි ද, පිරිසිදීම් ආදී වූ සභාවමාත්‍රයක් ඉක්මවා කැකුළුබැව් ආදී වූ සභගතියෙන් ම ලැබිය යුතුබැවින් තිලකුණට නගා මෙනෙහි කරන්නට සුදුසුහෙයින් සම්මසන රූප ය සි ද කියති. එහි රූපරූපයෙහිලා කියයුතු විශෙෂයෙක් වේ. නැසෙන ගතියට රූප ය සි කියති. ඒ නැසෙන ගතියෙන් යුක්ත වූයේ ද රූප නම්. **'අරිසසෝ නීලුප්පලං'** යනු මෙහි. 'අරිස, යනු රොගයෙකි. අරිස නම් රොග ඇත්තේ 'අරිසසෝ' යන්නෙන් කිය වේ. අරිස, යන්නෙන් ප්‍රධානවශයෙන් කියැවෙන්නේ අශීස් නම් රොගවිශෙෂයයි. මේ රෝගය, රෝගී පුද්ගලයාගෙන් වෙන් ව නො හටගන්නා බැවින් රෝගී පුද්ගලයා ම සථානොපචාරවශයෙන් එසින් ගැණේ. එමෙන් චක්ඛුප්පසාදදීරූප, රූපනසභාවශකතියෙන් නො තොර හෙයින් උපචාර වශයෙන් රූප නම් වේ. නීලශබ්දය ප්‍රධානවශයෙන් නීලගුණය කියයි. ඒ මේ නීලගුණය ගුණීහු කෙරෙන් වෙන් ව නො හටගන්නා බැවින් ගුණොපචාරවශයෙන් ගුණවත් උත්පල ද්‍රව්‍යය කිය වේ. එමෙන් රූපශබ්දය පරමාණුසභාව වූ විකාරය ම ප්‍රධානවශයෙන් කියයි. ඒ විකාරය විකාරීහු කෙරෙන් වෙන් ව නො හටගන්නා බැවින් ශක්තිමත් වූ චක්ඛුප්පසාදදීරූප සථානොපචාරවශයෙන් ගැණෙයි. ඒ මේ රූප ශබ්දය තෙමේ රූඪිවශයෙන්

එබඳු රූපසභාවයක් නැති නිෂ්පන්නරූපයෙහි ද පවත්නා හෙයින් අන් රූපශබ්දයකින් වෙසෙසා රූපරූප ය, යි කියනලදී. දුකඛ දුකඛය යි කීවාක් මෙනි. කීහ මෙය මෙසේ:-

'කකඛළතතාදිනා අතතනෝ අත්තනෝ සභාවෙන උපලබභනතෝ සභාවරූපං නාම, උපපාදදිහි වා ලකඛණෙහි සඞ්ගහනහි සලකඛණං, පරිචෙජ්දදිභාවං විනා අත්තනෝ සභාවෙ නෙව කම්මාදිහි පචචයෙහි නිප්ඵන්නත්තා නිප්ඵන්නරූපං නාම, රූපනසභා වා රූපං, තෙන යුත්තම්පිරූපං, යථා අභිසඞ්ඛාරිකුපපලනහි, සඛායං රූපසඛඳ රූළ්හියං අතංසභාවෙපි පවත්තනතීති අපරෙන රූපසඛදෙන විසෙසෙතවා රූපරූපනහි වුත්තං, යථා දුකඛදුකඛනහි, පරිචෙජ්දදිභාවං අතික්කමිත්වා සභාවෙ නෙව උපලබභනතෝ ලකඛණත්තයාරොපණෙන සම්මසිතුං අරහත්තා සම්මසනරූපං' යි.

පරිචෙජ්දරූපය අටවැත්ත යි. පරිචෙජ්දරූප යනු ආකාස රූපයට අන් නමෙකි. දඹුම්මුගුරු අත්පා ආදි වූ යමකින් නො පැහැරිය හැකි තැන ආකාස නම්. ඒ ම නිසඝව නිජ්ජීවාජීවයෙන් ධාතු නම් වේ. **'න කසතීති=ආකාසෝ'** යනු නිරුක්ති යි. **ආකාසෝ'** යි කියයුතු තන්හි අකාරය දීඝ කොට **ආකාසෝ'** යි කියනලදී.

චක්ඛුදීශකාදි වූ එහි එකි කලාපයන්ට ඇතුළත් රූප අනික් කලාපයන් හා අසම්මිශ්‍රභාවයට පැමිණවීම්වශයෙන් පිරිසිදීම කරන්නේ හෝ, රූපකලාපයන් විසින් පිරිසිදුනු ලබන්නේ හෝ, චක්ඛුදීශකාදි වූ එකි එකි කලාපගතරූපයන්ගේ පිරිසිදීම් මාත්‍රය පරිචෙජ්ද රූප නමැ'යි කතීෘ-කම්-භාවසාධනවශයෙන් ක්‍රමතුනකින් කියනලදිදේ ය. **'පරිචඡිඳතීති=පරිචෙජ්දෙ, පරිචඡිජ්දියතීති=පරිචෙජ්දෙ, පරිචඡිජ්දියතෙති=පරිචෙජ්දෙ,** යනු ඒ ක්‍රමතුන ඕ.

අජටාකාස-පරිච්ඡින්නාකාස, යනාදි වූ භෙදයන් අතුරෙහි මෙහි ලා ගතයුතු ආකාසය නම්, එක් එක් රූපකලාපයන්ට ඇතුළත් රූපයන් හා අනික් අනික් රූපකලාපයන්ට ඇතුළත් වූ රූපයන් සපරිච්ඡේදකරණබව ඇති කල්හිදු ඒ ඒ කලාපයන් හා වෙන්වීම ය යි කියනලද රූපපරිසිදීම ඕ.

ආඛ්‍යාත්මික-බාහිර වශයෙන් මෙය දෙ පරිදිය යි ආගමෙහි දැක් වේ. උපාදිණ්ණාසඞ්ඛතානය හා අනුපාදිණ්ණාසඞ්ඛතානය පිළිබඳ ආකාසය, එකිනෙක නො ගැටීම, විවරය, සතර මහාභූතයන්ගෙන් සපරිච්ඡේදනො වන බව ආකාසධාතුරූප'යි ගතයුතු ය. එහි පාළිය මෙසේ ය:- **'කතමා ආකාසධාතු? ආකාසධාතු සියා අජ්ඣත්තිකා අසති බාහිරා, තඤ්ච කතමා අජ්ඣත්තිකා ආකාස**

ධාතු? යං අජ්ඣත්තං පච්චත්තං ආකාසෝ ආකාසගතං අසං අසගතං විවරෝ විවරගතං අසම්ඵුඨං මංසලෝහිතෙහි අජ්ඣත්තං උපාදිණ්ණං, සෙය්‍යථිදං? කණ්ණච්ඡිද්දං නාසච්ඡිද්දං මුඛවාරං යෙන ච අසිතපීතඛායිතසායිතං අජ්ඣොහරති, යත්ථ ච අසිත පීතඛායිතසායිතං සණ්ඨිඨති, යෙන ච අසිතපීතඛායිතසායිතං අධොභාගං නික්ඛමති යං වා පනඤ්ඤම්පි අත්ථි-පෙ-අජ්ඣත්තං උපාදිණ්ණං, අයං වුච්චති අජ්ඣත්තිකා ආකාසධාතු,

තත්ථ කතමා බාහිරා ආකාසධාතු? යං බාහිරං ආකාසෝ ආකාසගතං අසං අසගතං විවරෝ විවරගතං අසම්ඵුඨං චතූහි මහාභූතෙහි බහිද්ධා අනුපාදිණ්ණං, අයං වුච්චති බාහිරා ආකාස ධාතු' ති.

මෙය රූපපිරිසිදීම ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය රූප පරියන්තය පැවසීම ය. රූපමය්‍හීදුව පච්චුපඨානය කොට සිටී යේ ය. පිරිසිදින ලද රූප, පදඨාන කොට සිටී. 'රූපපරිච්ඡේද ලක්ඛණං ආකාසධාතුරූපං රූපපරියන්තපකාසනරසං, රූප මරියාදූ පච්චුපඨානං, පරිච්ඡින්නරූපපදඨානං' යනු පාළියි.

නවවැන්න විඤ්ඤත්තිරූපය යි. යම් ධර්මශක්තියකින් යමෙක් තම අදහස අනුනට හඟවා ද, තෙමේත් අන්‍යයාගේ අදහස දැන ගණී ද ඒ ධර්මශක්තිය විඤ්ඤත්ති රූප නම් වේ. ඒ දෙ වැදෑරුම් ය. කායවිඤ්ඤත්ති-වචීවිඤ්ඤත්ති වසයෙනි. සැලෙන කැපෙන සිරුරෙහි පැවති ඕ තොමෝ කායවිඤ්ඤත්ති නම. ශබ්දසඞ්ඛ්‍යාත වචන යෙහි වූවා වචීවිඤ්ඤත්ති නම. 'චලමානකායෙන අධිප්පායං විඤ්ඤාපෙති, සයං ච තෙන විඤ්ඤායතීති කායවිඤ්ඤත්ති, සවිඤ්ඤාණකසද්දසඞ්ඛාතවචාය අධිප්පායං විඤ්ඤාපෙති සයං ච තාය විඤ්ඤායතීති=වචීවිඤ්ඤත්ති, යනු ටීකා යි. මෙහි සවිඤ්ඤාණකශබ්දය යොදන ලද්දේ සෘතුවෙන් හටගත් ශබ්දයාගේ වැළක්ම පිණිස ය. විසතර විසින් කිය යුත්තේ යෑම් ඊම් ආදී වූ ක්‍රියා උපදවන චිත්තජවායොධාතු විකාරය කායවිඤ්ඤත්තිය බව යි. අත්පාසෙලවීම් ආදියෙන් ද සත්වයෝ තම අදහස් අනුනට හඟවති. ඒ අත්පාසෙලවීම් කායවිඤ්ඤත්තිය නො වේ. එහි වූ චිත්තජ වායොධාතුවිකාරය ම විඤ්ඤත්තිය යි ගැණේ. කතා කරණ කාලයෙහි ඇතිවන ශබ්ද මාත්‍රය වචීවිඤ්ඤත්තිය නො වේ. එහි වූ අදහස් ය වචීවිඤ්ඤත්තිය වනුයේ. ආගමෙහි මෙසේ ආයේ ය:-

'කතමං තං රූපං කායවිඤ්ඤත්ති? කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අව්‍යාකතචිත්තස්ස වා අභික්කමනස්ස වා පටික්කමනස්ස වා ආලොකෙනස්ස වා විලොකෙනස්ස වා සම්මිඤ්ජනස්ස වා පසාරෙනස්ස වා කායස්ස එජනා සන්ථම්භනා සන්ථම්භිතත්තං විඤ්ඤත්ති විඤ්ඤාපනා විඤ්ඤාපි

තත්තං ඉදං තං රූපං කායවිඤ්ඤත්තී' කතමං තං රූපං වචීවිඤ්ඤත්තී? යා කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා වාචා ගිරා -පෙ- ඉදං තං රූපං වචීවිඤ්ඤත්තී' යි.

කායවිඤ්ඤත්තියෙහි කෘත්‍යය අදහස් පැවසීම යි. කයසැලීමෙහි හෙතුභාවය පච්චුපට්ඨාන යි. චිත්තජවායොධාතු පදට්ඨාන යි. **'අධිප්පායප්පකාසනරසා කායවිඤ්ඤත්තී, කායවිප්ඵන්දනහෙතුභාවපච්චුපට්ඨානා, චිත්තසමුට්ඨානවායොධාතු පදට්ඨානා'** යනු පාළියි.

වචීවිඤ්ඤත්තියෙහි කෘත්‍යය කථා කරන්නහුගේ අදහස් අනුන්ට පැවසීම ය. වාඞ්මයශබ්දයට හෙතුභාවය පච්චුපඨානය යි. සිතින් හටගන්නාවූ පෘථිවිධාතුව පදට්ඨානය වේ. **'අධිප්පායප්පකාසනරසා වචීවිඤ්ඤත්තී, වචීඝොසස්ස හෙතුභාවපච්චුපට්ඨානා, චිත්ත සමුට්ඨාන පඨවිධාතුපදට්ඨානා'** යනු පාළියි.

දසවැන්න විකාර රූපය යි. මේ වනාහි නිෂ්පන්නරූප පිළිබඳ ආකාරවිශෙෂයෙකි. ලහුතා, මුදුතා, කාම්මඤ්ඤතා යි ඒ තෙ පරිදි ය. එහි ලහුතා නම්, නිෂ්පන්න රූපයන් බරබවට පමුණුවන ධාතුන්ගේ නැගීමට පටහැනි ව නැගුනු නිෂ්පන්නරූපවිකාරය යි. ඔවුන් තදබවට පමුණු වන ධාතුන්ගේ කැළඹීමට විරුඬ ව නැගුනු නිෂ්පන්න රූපවිකාරය මුදුතා නම්. ශරීරය, ශාරීරිකක්‍රියාවන්ට නො සුදුසු කරණ ධාතුන්ගේ නැගීමට විරුද්ධ ව උපන් විකාරය කම්මඤ්ඤතා නම්. කීහ මෙය මෙසේ:-

'ඵද්ධත්තකරධාතුක්ඛොභපටිපක්ඛපච්චයසමුට්ඨානො හි රූපවිකාරො ලහුතා, ඵද්ධත්තකරධාතුක්ඛොභපටිපක්ඛපච්චය සමුට්ඨානො මුදුතා, සරීරක්‍රියානං අනනුකූලභාවකරධාතු ක්ඛොභපටිපක්ඛපච්චයසමුට්ඨානො කම්මඤ්ඤතා' යි.

රූපයන්ගේ සැහැල්ලුබව ලහුතා, යි ද, රූපයන්ගේ මොළොක් බව මුදුතා, යි ද, රූපධර්මයන්ගේ කටයුතුවලට නැමෙන බව හෙවත් සුදුසු බව කම්මඤ්ඤතා, යි දැයි කොටින් දතයුතු ය. ලහුතාව, ලෙඩ නැති සිරුරෙහි සැහැල්ලුබව වැනි ය. මුදුතාව, පදම් කළ සමෙහි ඇති මොළොක්බව වැනි ය. කම්මඤ්ඤතාව, මොනවට පිඹගත් රණෙහි ඇති අනුකූලබව වැනි ය. මේ ගති තුන කිසිවිටෙකවත් වෙන් ව නො පවතිත්. එහෙත් ඒ ඒ විකාරය අධික කොට ඇති නිෂ්පන්නරූපයන්ගෙන් වෙනස්බව දක්නට ලැබේ. එසේ වන්නේ සත්ප්‍රාය, අසත්ප්‍රාය සෘතු චිත්ත ආහාර යන මොවුන්ගේ සෙවන යෙනි. ආගමෙහි එය මෙසේ ආයේ ය:-

'කතමං තං රූපං රූපස්ස ලහුතා? යා රූපස්ස ලහුතා ලහු පරිණාමතා අදන්ධතා අවිත්ථනතා, ඉදං තං රූපං රූපස්ස ලහුතා

කතමං තං රූපං රූපස්ස මුදුතා? යා රූපස්ස මුදුතා මද්දවතා අකක්ඛලතා අකඨිනතා, ඉදං තං රූපං රූපස්ස මුදුතා, කතමං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා? යා රූපස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො, ඉදං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා' යි. මෙහි චිත්තජ සෘතුජ ආහාරජ රූප ගැණෙති.

ලහුතාව නො බරබව ලකුණු කොට ඇත්තී ය. කෘත්‍යය රූප යන්ගේ බරබව දුරුකිරීම යි. පච්චුපට්ඨානය වහා පෙරළීම යි. ලහු රූප පදට්ඨාන යි. **'අදන්ධතා ලක්ඛණා රූපස්ස ලහුතා, රූපානං ගරුභාවවිනොදනරසා, ලහුපරිවත්තිතා පච්චුපට්ඨානං, ලහු රූප පදට්ඨානා'** යනු පාළියි.

මුදුතාව නො තදබව ලකුණු කොට ඇත්තී ය. කෘත්‍යය රූප යන්ගේ තදබවනැසීම යි. පච්චුපට්ඨානය සකල ක්‍රියාවන්හි අවිරුඬ භාවය යි. මෘදුරූප පදට්ඨාන යි. **'අඵද්ධතා ලක්ඛණා රූපස්ස මුදුතා, රූපානං ඵද්ධභාවවිනොදනරසා, සබ්බකිරියාසු අවිරොධිතා පච්චුපට්ඨානා'** යනු පාළියි.

කම්මඤ්ඤතාව ශාරීරිකක්‍රියාවන්ට අනුකූල ව කර්මයට යොග්‍ය භාවය ලකුණු කොට ඇත්තී ය. කෘත්‍යය කර්මයට නො සුදුසු බව නැසීම යි. පච්චුපට්ඨානය එහි ලා අබල නො වනබව යි. කර්මයට යොග්‍යරූප පදට්ඨාන යි. **'සරීරක්‍රියානුකූලකම්මඤ්ඤභාවලක්ඛණා රූපස්ස කම්මඤ්ඤතා, අකම්මඤ්ඤතා විනොදනරසා, අදුබ්බලභාවපච්චුපට්ඨානා, කම්මඤ්ඤරූපපදට්ඨානා'** යනු පාළියි.

එකොළොස් වැන්න ලක්ෂණරූපය යි. එය උපචය, සන්තති, ජරතා, අනිච්චතා යි සිවුවැදැරුම් ය. නිෂ්පන්නරූපධර්ම, උත්පාදාදි ඒ ඒ අවස්ථාභෙදයෙන් හැඳින්වීමට කරුණු වන බැවින් ලක්ෂණ රූප, නමැ යි කියන ලදි. **'උපචයනං උපචයො'** පළමු හටගැණීම යන අර්ථ යි. උපචය, යන්නෙහි මූලයෙදී සිටි උප, ශබ්දය උපඤ්ඤත්තං, යනාදි තන්හි සේ ප්‍රථමාර්ථ, උපරිඅර්ථවාචක ය. චයශබ්දය උත්පාදාර්ථ, වෘඬිඅර්ථ වාචක ය. **'නදීතීරෙ කතකූපස්මිං හි උදකුග්ගමනකාලො විය ආචයො නිබ්බත්ති, පරිපුණ්ණකාලො විය උපචයො වඩ්ඩි'** යන අර්ථකථාපාඨයෙහි දැක්වෙන ආචය, උපචය දෙක උපචයෙහි ම ඇතුළත් ය. ගංඉවුරෙක සෑරූ ලිඳෙක පළමු නැගී එන ජලය ආචය යි ද, පිරෙණ ජලය උපචය යි දැ, යි කීහ. ආගමෙහි මෙය මෙසේ ආයේ ය:–

'කතමං තං රූපං රූපස්ස උපචයො? යො ආයතනානං ආචයො, සො රූපස්ස උපචයො, ඉදං තං රූපං රූපස්ස උපචයො' යි.

'සන්තානො සන්තති' පරම්පරාවශයෙන් හටගැණුම හෙවත් තදින් බැඳී පැවැත්ම යනු එහි අර්ථ යි. සිත්පිත් ඇත්තාවූ ත් සිත් පිත් නැත්තා වූත් හැම වස්තුවකගේ අවසානය වනතුරු පවතින රූපප්‍රබන්ධය 'සන්තති, යි කියනු ලැබේ. එය ආගමෙහි ආයේ මෙසේ ය:-

'කතමං තං රූපං රූපස්ස සන්තති? යො රූපස්ස උපචයො, සා රූපස්ස සන්තති, ඉදං තං රූපං රූපස්ස සන්තති' යි

එක් භවයෙක්හි පෙර නො හටගත් රූපයන්ගේ පළමු හට ගැණුම උපචය, නම. එක් වරක් ඉපිද ඊට අනතුරු ව දිවි ඇති තාක් ඒ රූපයන්ගේ පරම්පරාව නො සිඳ හටගැණුම සන්තති නම. එහෙයින් ගැබැ හෝනා සත්වයන්ගේ පිළිසඳ හා සමග කාය දශක, භාවදශක, වාස්තුදශක යන කර්මජරූපකලාපයන්ගේ පළමු හට ගැණුම උපචය' නම. ඒ රූපකලාප තුන දිවි ඇති තාක් නැවැත නැවැත හටගැණුම සන්තති' නම. ප්‍රතිසන්ධිචිත්තයාගේ ස්ථිතිකාල යෙහි උතුජරූපයන්ගේ පළමු හටගැන්ම උපචය' නම. ජීවිතාන්තය දක්වා ඒ රූප නැවැත නැවැත හටගැණීම සන්තති' නම. පිළි සිඳ ගත් සිතට අනතුරු ව හටගන්නා වූ ප්‍රථම භවාඞ්ගයාගේ ම උත්පාදක්ෂණයෙහි චිත්තජරූපයන්ගේ පළමු හටගැණීම උපචය' නම. දෙවන භවාඞ්ගාදීන්ගේ උත්පාදක්ෂණයක් පාසා ජීවිතාන්තය දක්වා එම රූපයන්ගේ හටගැණීම සන්තති' නම. බාහිර ඔජාව ඒ ලදරුසිරුරෙහි පැතිර ගත් කාලය පටන් හටගන්නා වූ ආහාරජ රූපයන්ගේ පළමු හටගැණීම උපචය' නම. ජීවිතාන්තය දක්වා නැවැත නැවැත ඒ රූපයන්ගේ හටගැණීම සන්තති' නම. ප්‍රති සන්ධියෙහි පටන් හෙවත් ප්‍රතිසන්ධියෙන් සත්සත්තැවැනි රැය ඉක්ම ගිය තැන සිට චක්ඛු, සොත, ඝාණ, ජිව්හා යන සතර කලාපයන්ගේ පළමුවර හට ගැණීම උපචය' නම. ජීවිතාන්තය දක්වා නැවැත නැවැත ඒ රූපයන්ගේ හටගැණීම සන්තති' නම. මේ උපචය -සන්තති දෙක ගැබැ හෝනා සත්වයන්ගේ ප්‍රතිසන්ධිය සඳහා කියන ලද්දේ ය. සංසෙදජ-ඔපපාතික සත්වයන් කෙරෙහි වනාහි ප්‍රතිසන්ධි යෙහි දී වන රූපයන්ගේ උත්පාදක්ෂණය උපචය' නමැ යි ද, ඉන් පසු මරණය දක්වා නිෂ්පන්න රූපයන්ගේ පරම්පරාවශයෙන් හට ගැණීම සන්තති' නැමැ යි ද කීහු.

අර්ථකථා අනු ව ප්‍රතිසන්ධියගේ උත්පාදය පටන් සත්වන, අට වන, නවවන, දසවන සති ද, ටිකානය අනු ව එකොළොස්වන දොළොස්වන, තෙළෙස්වන, තුදුස්වන සති දැ යි යන සති පිළිවෙ ළින් චක්ඛු, සොත, ඝාණ, ජිව්හා යන මේ කලාපයන්ගේ පහළවීම වේ ය යි කිය යුතු ය. උපචය-සන්තතිරූප දෙක ජාතිරූපනාම

යෙන් ද කියැවේ. ප්‍රතිසන්ධිය පටන් ක්ෂණයක් පාසා රූපයන්ගේ ඉපැත්ම වන බැවින් ජාති ය යි ද, චතුසමුට්ඨානිකරූප ඉළිබඳ හට ගැණීම ඇති බැවින් රූපය යි ද සම්මත වූ ජාතිරූපය ම පළමුකොට හටගැණීම ය, මතු මතු හටගැණීම ය, යි කියනලද ප්‍රවෘත්තිආකාර භෙදය කරණ කොට විනෙයසත්ත්වයන්ගේ වශයෙන් උපචය-සන්තති, යි දෙකක් කොට බෙදූ වදුළ සේක.

'යථාසකං බණමත්තඨිතිං රූපානං නිරොධාභිමුඛභාව වසෙන ජීරණං ජරා' යනු ජරතාරූපය විසතර කිරීමෙහි වූ ටීකා චාර්‍යයන් කළ විවරණයෙකි මේ. සුදුසු පරිදි ක්ෂණමාත්‍රයක් පවත්නා සුලු රූපධර්මයන් නිරුඛවීමට අභිමුඛවීම් වශයෙන් දිරා යෑම ජරා නම් වේ යනු එහි සිංහල යි. ජරාවම තා' යන්නෙන් වැනි කොට 'ජරතා' යි කියනු ලැබේ. ආගමෙහි ඒ මෙසේ ආයේය:-

'කතමං තං රූපං රූපස්ස ජරතා? යා රූපස්ස ජරා ජීරණතා බණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනෝ සංහානි ඉන්ද්‍රියානං පරිපාකෝ, ඉදං තං රූපං රූපස්ස ජරතා' යි.

මෙහි එන ජරා, ජීරණතා' යනාදීහු ජරාවෙහි සභාව ආකාරය දිය දක්වනු පිණිස යෙදුනෝ ය. විසතර ඉදිරියෙහි එන්නේ ය.

'නිච්ච ධුවභාවෙන න ඉච්චං අනුගන්තබ්බන්ති=අනිච්චං, යනු ටීකා යි. හැම කල්හි සථිරව පැවතීම් වශයෙන් නොගතයුතු වූයේ අනිත්‍ය නම් වේ, යනු එහි සිංහල යි. එහි ඇති තා' යන්න සභාවය යන අරුත සඳහා යෙදුනේ ය. **'අනිච්චස්ස භාවෝ=අනිච්චතා'** යි කියේ එහෙයිනි. ආගමෙහි මෙසේ ආයේ ය:-

'කතමං තං රූපං රූපස්ස අනිච්චතා? යෝ රූපස්ස භයෝ වයෝ භෙදෝ පරිභෙදෝ අනිච්චතා අඤ්ඤථාභාවෝ, ඉදං තං රූපං රූපස්ස අනිච්චතා' යි.

මෙහි එන භයෝ, වයෝ, යනාදීහු අනිත්‍යතාවය මේ ය යි පැහැදිලි කරණු පිණිස යෙදුනෝ ය. විසතර මත්තෙහි එන්නේ ය.

රූපධර්මයන්හුගේ ආයුෂය චිත්තක්ෂණ සතළොසෙකි. විඤ්ඤත්තිරූප දෙක හැර යි. මේ දෙකෙහි ආයුෂය එක් චිත්තක්ෂණයෙකි. සතළොස් චිත්තක්ෂණයක් ඇති රූපධර්මයන්හුගේ ප්‍රථමචිත්තක්ෂණය උපචය, යි ද, දෙවැන්න පටන් පසළොස් වැන්න තෙක් සන්තති, යි ද, සොළොස් වැන්න ජරතා, යි ද, සතළොස් වැන්න අනිච්චතා, යි ද ගැණේ.

උපචයරූපය, ආවය ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය පූර්‍වභාගයෙන් රූපයන් මතුකරවීම ය. පච්චුපට්ඨානය රූපධර්ම

ඵලවීම ය නොහොත් රූපයන්ගේ පරිපූර්ණතාය යි. පදට්ඨානය උපචිතරූපය යි. **'ආචයලක්ඛණො රූපස්ස උපචයො, පුඤ්ඤතො රූපානං උම්මුජ්ජාපනරසො, නියාතනපච්චුපට්ඨානො, පරිපුණ්ණභාවපච්චුපට්ඨානො වා, උපචිතරූපපදට්ඨානො'** යනු පාළි යි.

සන්තතිරූපය, රූපපරම්පරාවගේ නො සිඳ පැවැත්ම ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය පූර්වාපර්වීමරූපපරම්පරාව නො සිඳ පැවැත්ම යි. පදට්ඨානය පරම්පරාව නො සිඳ හටගන්නා රූපය යි. **'පවත්තිලක්ඛණා රූපස්ස සන්තති, අනුප්පබන්ධරසා, අනුපච්ඡේදපදට්ඨානා, අනුප්පබන්ධිරූපපදට්ඨානා'** යනු පාළි යි.

ජරතාරූපය නිෂ්පන්නරූපපරිපාකය ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය රූපයන් හඞ්ගාවස්ථාවට ඵලවීම ය. පච්චුපට්ඨානය අලුත්බව පහවීම යි. පදට්ඨානය පැසෙන හෙවත් දිරෙණ රූපය යි. **'රූපපරිපාකලක්ඛණා රූපස්ස ජරතා, උපනයනරසා, සභාවානපගමෙසි නවභාවාපගමපච්චුපට්ඨානා, පරිපච්චමානරූපපදට්ඨානා'** යනු පාළි යි.

අනිච්චතාරූපය බිඳීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය සංසීදනය යි. පච්චුපට්ඨානය ඛයවය යි. පදට්ඨානය බිඳෙන රූපය යි. **'පරිභෙදලක්ඛණා රූපස්ස අනිච්චතා, සංසීදනරසා, ඛය වය පච්චුපට්ඨානා, පරිභිජ්ජමානරූපපදට්ඨානා'** යනු පාළි යි.

මහාභූතරූප සතරය, ප්‍රසාදරූප පසය, විෂයරූප සතරය, භාවරූප දෙකය, හදයරූපය, ජීවිතරූපය, ආහාරරූපය යන මොවුහු සවරූප වශයෙන් අටලොස් වැදෑරුම් වෙති. පිරිසිදීම් ආදියෙන් තොර ව සවගනියෙන් කර්මාදිප්‍රත්‍යයයන්ගෙන් නිපන් බැවින් නිෂ්පන්න රූපය යි කියති.

පරිච්ඡේදරූපය, විඤ්ඤත්තිරූප දෙක ය, විකාරරූප තුන ය, ලක්ෂණරූප සතර ය, යන දසය රූපපිරිසිදීම් ආදිය හැර අන්හෙතු වකින් නො නිපන් බැවින් අනිෂ්පන්නය යි කියති.

සූවිසි වැදෑරුම් වූ උපාදාය රූපයන්, යට කියූ සිවුවැදෑරුම් වූ භූත රූපයන්, එකතු ව රූපය අටවිසි වැදෑරුම් වේ. අඩුවැඩි නො වූ ඒ මේ අටවිසි රූපය තෙමේ **න හෙතු, අහෙතුක, හෙතුවිප්පයුත්ත, සප්පච්චය, ලෝකිය, සාසව** යනාදි වශයෙන් එක් වැදෑරුම් ය මෙහි ලා එකවිධනෙද තවත් ඇත්තේ ය. පොත දිග්ගැසෙන බියෙන් ඒ මෙහි නො ලියැ වේ.

අටවිසි රූපය ම හෙතු නො වූයේ න හෙතු නම. හෙතු ඇත්තක් ද නො වන බැවින් අහෙතුක නම. හෙතුන්ගෙන් වෙන් ව

සිවිබැවින් හෙතුවිපයුත්ත ය. ධම්නානාත්වයක් නො වතුදු වීනෙ යජනයන් පිණිස ශබ්දඥානනානාත්වයෙන් මෙසේ ආයේ ය. ලොභ, දොස, මොහ, අලොභ, අදොස, අමොහ යන මොවුහු හෙතූහු ය. මින් එක ද හෙතුවෙක් කිසිත් රූපයෙක නැත. සම්ප්‍රයුක්ත වශයෙන් ද නො යෙදේ. ප්‍රත්‍යයයන් සමග පවතිත් නුයි සපපච්චය නම්. කම්ම, චිත්ත, උතු, ආහාර යන මොවුහු ප්‍රත්‍යයයෝ ය. තමා හා යෙදුනු හෙතු නැත ද, රූපයෝ යම්කිසි ප්‍රත්‍යයයකින් ම හට ගන්නෝ ය. ලොකයෙහි යෙදුනෝ නුයි ලොකිය නම්. උපාදින්න සකකි, ලොකය සි ගැණේ. එහි ඇතුලත් හෙයින් ලොකිය, සි කීහු. ආශ්‍රවයන් විසින් අරමුණු කටයුතු නුයි සාසව නම්. කාම, භව, අවිජ්ජා, දිට්ඨි යන මොවුහු ආශ්‍රවයෝ ය. භූමි වශයෙන් භවාශ්‍රය දක්වා ද, ධම් වශයෙන් ගොත්‍රභූචිත්තය දක්වා ද වහනය වන බැවින් ආශ්‍රව නම් වෙත්.

නැවැත මේ රූපය, **අජ්ඣත්තිකා, බාහිර, ඔළාරිකා, සුඛුම, දූරෙ, සන්තිකෙ, නිප්ඵන්න, අනිප්ඵන්න, පසාද, නප්පසාද ඉන්ද්‍රිය, අනින්ද්‍රිය, උපාදින්න, අනුපාදින්න,** යනාදීන්ගේ වශයෙ නුදු දෙ වැදැරුම් වේ.

'ආහිතෙ අහං මානෙ එත්තාති = අත්තා' මම ය, මාගේ ය යන මානය මෙහි පිහිටුවන ලදු සි **ආත්ම** නම් වේ. ඒ **මේ ආත්මය** අධිපති කොට උදෙසා පවත්නේ අජ්ඣත්ත නම්. **'අත්තානං අධිකිච්ච උද්දිස්ස පවත්තං අජ්ඣත්තං'** යනු නිර්වචන සි. ඉන්ද්‍රිය බඩධම්ම සමූහය මෙයින් කියැ වේ. **'අජ්ඣත්තෙසු භවං අජ්ඣත්තිකං,** ඒ ඉන්ද්‍රියබද්ධධම්මසමූහයෙහි හටගැණෙන චකඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, යන ආත්මයට අධිපති රූපපංචකය, මින් කියැ වේ. විශෙෂ විසින් යමක තෘෂ්ණාව අධිකව පවතී නම්, ඒ අජ්ඣත්තික නම්. ශාරීරිකරූප අතුරෙහි චක්ෂුරාදියෙහි ම තෘෂ්ණාව බලවත් ව පවතී. අජ්ඣත්තික යන්නෙන් මනායතනය ත් කියවෙතත් එය රූපයක් නො වන හෙයින් මෙහිලා නො ගැණේ. විඤාර පිටතින් දතයුතුය. මෙයින් අන්‍ය වූයේ බාහිර නම් වේ. අජ්ඣත්තිකයන් කෙරෙහි මෙන් බාහිරයන් කෙරෙහි තෘෂ්ණාව බලවත් නො වේ. බාහිරය සි ගැණීමට එය ද හෙතුවෙකි. අජ්ඣත්තිකව්‍යවහාරය රූපීව්‍යවහාර යෙකැයි ද කියන ලද්දේ ය. චකඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, රූප, සද්ද, ගන්ධ, රස, පඨවි, තෙජෝ, වායෝ, යන දෙළොස විෂය -විෂයිය කියන ආරම්මණ-ආරම්මණිකයන්ගේ ඝටනය හෙවත් උනුන් එකට හැපීම ඖදාරික බැවින් හා සභාවයෙන් ම සථූල බැවින් ඔළාරිකය, සි කියති. ඔළාරික යන්නෙහි තේරුම් මහත්ය යනු සි. ආපෝ, ඉත්ථිභාව, පුමභාව, හදයවත්ථු, ජීවිත, ආහාර, ආකාස,

කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා, උපචය, සන්තති, ජරතා, අනිච්චතා යන සොළොස සුඛම රූප නම් වේ. යට දැක් වූ ඔළාරිකරූපයන්ගේ මෙන් මොවුන්ගේ ස්ථූලභාවයෙක් හෝ ඝටනයෙක් නැත. සුඛුමරූපැ යි කියේ එහෙයිනි. ඒ මේ සුඛුමරූපය ම දුකසේ ප්‍රතිවෙධ කළ යුතු බැවිනු ත් නුවණින් ඇත්හි වන බැවිනු ත් දුරෙරූප නම් වේ. ඔළාරික රූපය සුවසේ ප්‍රතිවෙධ කළයුතු වූ සවභාව ඇති බැවිනු ත් දුර සිටිය ද වහා ගත හැකි බැවිනුත් නුවණට සමීපයෙහි වූ බැවිනුත් සන්තිකෙරූප නම් වේ. ධාතුහු සතර ය, චක්ඛුරාදී වූ තෙළෙස් රූපයෝ ය, කබළීකාරාහාර රූපය යන අටළොස් රූප, පිරිසිදීම, විකාර, ලක්ඛණ, යන තුන් අයුර ඉක්මවා රූපයාගේ වෙන්කිරීම, රූපයාගේ විකාරය, රූපයාගේ උපචය යනාදිවශයෙන් නො ගෙණ සවකීය කැකුළුබැව් ආදී වූ සවභාවයෙන් ම නුවණින් පිරිසිද ගතයුතු බැවින් කම්මාදි චතුර්විධප්‍රත්‍යයයන් විසින් උපදවන ලද්දේ නිෂ්පන්නරූප නම් වේ. සවගතිය නුවණින් නො පිරිසිදිය යුතු බැවින් කම්මාදිප්‍රත්‍යයයන් විසින් අසිද්ධ වූයේ අනිෂ්පන්නරූප නම් වේ. චකඛු, සොත, ඝාණ, ජිවහා, කාය, යන පස්වැදෑරුම් වූ රූපය රූප, ශබද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන ගොචරරූපයන් ගොදුරු කොට ගැණීමෙහි ප්‍රත්‍යය භාවයෙන් කැටපතක් මෙන් අතිශයින් ප්‍රසන්න වූයේ ප්‍රසාදරූප නම් වේ. මෙයින් අන්‍ය වූ තෙවිසි රූපය තෙමේ ප්‍රසන්නභාවයෙන් තොර බැවින් නප්‍රසාදරූප නම් වේ ප්‍රසාදරූප පසත්, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, යන තුනත් ඊශ්වරභාවසඞ්ඛ්‍යාතඅධිපති භාවයෙන් යුක්ත හෙයින් ඉන්ද්‍රියරූප නම් වේ. ඉතිරි වූ විසිවැදෑරුම් රූපය අධිපතිභාවයෙන් තොර හෙයින් අනින්ද්‍රියරූප නම් වේ. චක්ඛුරාදිපඤ්ච ප්‍රසාදරූපය, පඤ්චවිඤ්ඤනයෙහි ද, භාවරූපඋභය ලිඞ්ග-නිමිත්ත-කුත්ත-ආකප්පයන්හි ද අධිපතිභාවය කරත්. කම්මයෙන් හටගත් රූප උපාදින්න නම් වේ. හදය, චකඛු, සොත, ඝාණ, ජිවහා, කාය, ඉත්ථි, පුරිස, ජීවිත, පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඔජා, ආකාස යන මොවුහු යි ඒ. නාමඤ්ඤා දෘෂ්ටීන් විසින් ලං කොට ගත්කාලද හෙයින් උපාදින්න යෝය යි කියනු ලැබෙති. සජීවසන්තානයෙහි මෙකී රූප අටළොස සියලු කල්හි පවත්නේ ය. මෙයින් අන්‍ය වූවෝ හෙවත් චිත්තජ, උතුජ, ආහාරජරූපයෝ කම්මයාගේ ඵලභාවයෙන් නො ගත්හෙයින් අනුපාදින්න නම් වෙති.

නැවැත රූපය තෙමේ, **සනිදස්සනසප්පටිඝ-අනිදස්සනසප්පටිඝ = අනිදස්සනඅප්පටිඝ, කම්මජ-අකම්මජ-නෙවකම්ම**

ජනාකම්මජ, චිත්තජ- අචිත්තජ- නෙවචිත්තජනාචිත්තජ, ආහාරජ- අනාහාරජ - නෙවආහාරජනඅනාහාරජ- උතුජ- අනුතුජ- නෙව උතුජ න අනුතුජ, යනාදි වූ තික වශයෙන් භෙදයට යන්නේ ය.

එහි දෙලොස් වැදැරුම් වූ ඖදාරිකරූපයෙහි රූපරූපය දැක්ක යුතු බැවින් ගැටීම් සහිත වූයේ **සනිදස්සනසප්පටිඝ** නම් වේ. අනික් එකොලොස නො දැක්ක යුතු බැවින් ගැටීම් සහිත බැවින් **අනිදස්සනසප්පටිඝ** නම් වේ. සොලොස් වැදැරුම් වූ සුඛුමරූපය නො දැක්ක යුතු බැවින් හා ගැටුම් නැතිබැවිනුත් **අනිදස්සනඅප්පටිඝ** නම් වේ. මෙහිලා ඇසට ගොදුරු වන බව දැක්ක යුතු බව ය යි ද, ආරම්මණ-ආරම්මණිකයන්ගේ එකට හැපීම ගැටුම යයි ද දත යුතු ය. කර්මයෙන් හටගත් ඉන්ද්‍රියරූප අට හා හදයවත්ථු රූපයත් ආකාසධාතුරූපය හා අවිනිබ්භොගසුද්ධට්ඨකරූපය ත් යන අට ලොස් රූපය කම්මජ නම් වේ. චිත්ත-උතු-ආහාර යන හෙතු තුනෙන් හට ගැණෙන රූපය තෙමේ අකම්මජ නම් වේ. කිසිත් හෙතුවකින් නො හටගැණෙන උපචය-සන්තති-ජරතා-අනිච්චතා යන ලක්ෂණරූපය නෙවකම්මජනාකම්මජ නම් වේ. කායවිඤ්ඤත්ති-වචීවිඤ්ඤත්ති-සද්ද-ආකාස-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා රූප හා සිතින් හට ගැණෙන අවිනිබ්භොගසුද්ධට්ඨකරූප යන පසලොස චිත්තජ නම් වේ. අනික් හෙතුන් නිසා හට ගන්නා රූපය තෙමේ අචිත්තජ නම් වේ. කිසිත් හෙතුවකින් නො හට ගන්නේ නෙව චිත්තජනාචිත්තජ නම් වේ. ආකාස-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා යන සතර හා ආහාරයෙන් හටගන්නා සුද්ධට්ඨකරූපය යන දෙලස ආහාරජ නම් වේ. අනික් තුන් හෙතුවෙන් හටගන්නේ අනාහාරජ නම් වේ. හෙතුවකින් නො හටගන්නේ නෙවආහාරජ නඅනාහාරජ නම් වේ. සද්ද-ආකාස දෙක හා ඍතුයෙන් හටගන්නා සුද්ධට්ඨකරූපය යන දසය උතුජ නම් වේ. එයින් අන්‍ය වූ හෙතුයෙන් හටගන්නා රූපය අනුතුජ නම් වේ. කිසිත් ප්‍රත්‍යයයකින් නො හටගන්නා රූපය නෙවඋතුජ න අනුතුජ නම් වේ.

නැවැත රූපය තෙමේ, **දිඨ-සුත-මුත-විඤ්ඤාත-රූපරූප-පරිච්ඡේද-විකාර-ලක්ඛණ, වත්ථුනමාර-මාරනවත්ථු-වත්ථුමාර-නෙව වත්ථු නමාර,** යන මේ වශයෙන් සිවුවැදැරුම් වේ.

එහි ඇසට ගොචර වන්නේ දිඨ නම්. ශබ්දය කණට අරමුණු වන බැවින් සුත නම් ගන්ධ රස-ස්පර්ශ යන තුන නාසය-දිව-ශරීරය යන තුනට අරමුණු වන බැවින් මුත නම්. නාසය, දිව, ශරීරය යන තිදෙන තමන් කරා පැමිණියා වූ ම අරමුණු ගන්නෝ ය. එහෙයින් වෙත පැමිණි අරමුණ මුත නමැයි කීහු. නාසය, දිව,

ශරීරය යනා තිදෙන තමත් වෙත පැමිණි අරමුණ ම ගන්නා බැවින් සමපත්තගහාහී ය යි ද, ඇස කණ දෙදෙන අරමුණ කරා ගොස් අරමුණු ගන්නා හෙයින් අසමපත්තගහාහී ය යි ද කියනු ලබති. ඉහිරි වූ එක්විසි රූපය සිතට ම අරමුණු වන හෙයින් විඤ්ඤත්ත නම්. මෙහි කියවුනු නිපඵන්නරූපය රූපරූප නම්. ඒ මේ නිපඵන්නරූපය විකාරයට පැමිණෙන බැවින් **'රූපනං=රූපං තං එතස්ස අත්ථි'** යන අර්ථසම්බන්ධය ලෙසින් මුඛ්‍ය රූප නම්. නීලගුණයෙන් යුකත බැවින් නීලවත්ථු, යනු මෙන් විකාරයෙන් යුකත බැවින්, ගුණොප චාරවශයෙන් රූප නම්. රූපශබ්දය අනිපඵන්නරූපයෙහි ද රුඬි හෙයින්, අනික් රූප ශබ්දයකින් වෙසෙසා නිලතෙලං, යනු මෙන් රූපරූප යි කියන ලදු යි කීහු. ආකාසරූපය නිපඵන්නරූපයාගේ පරිවෙජ්දකර ලක්ඛණයක් බැවින්, නිපඵන්නරූපයාගේ සවභාවය ඇත්තේ රූප නම්. එසේ කියන ලද්දේ ආකාසධාතුරූපය විකාර යක් නො වන බැවිනි. ආකාසධාතුරූපය පරිවෙජ්දරූප නම්. **කායවිඤ්ඤත්තිරූපය** ආදි කොට, **කම්මඤ්ඤතාරූපය** අවසන් කොට ඇති රූප පස විකාර නම්. ජාතිරූපය-ජරතාරූපය-අනිච්චතාරූපය යන මෙතුන ලකඛණ නම්. හදයරූපය වත්ථුනද්වාර නම. විඤ්ඤත්තිරූප දෙක ද්වාරනවත්ථු නම. **ප්‍රසාද** රූපය තෙමේ වත්ථු ද්වාර නම. සෙසු එක්විසි වැදෑරුම් වූ රූපය නෙවවත්ථුනද්වාර නම. සවැදෑරුම් වූ වත්ථුරූපයන් අතර හදයවත්ථුරූපය, මනොධාතු-මනොවිඤ්ඤාණධාතූන්ට නිඃශ්‍රය වන හෙයින් වත්ථුරූප නම. අනික් චකඛු ආදී වූ පස්දෙන අන්‍ය නිඃශ්‍රය වූ සම්පටිච්ඡනාදීන්ට ද්වාරවන්නාක් මෙන්, අන්‍ය නිඃශ්‍රය වූ ධර්මයන්ට ද්වාර නො වන්නෝ ය. විඤ්ඤත්ති දෙක කම්මාර හෙයින් ද්වාරූප නම්. එදෙක නිඃශ්‍රය කොට ගෙණ හටගන්නා චිත්ත චෙතසිකයක් නැති බැවින් වත්ථුරූප නො වේ. ප්‍රසාදරූපය තමත් ඇසුරු කොට ගෙණ හට ගන්නා චක්ඛුර්විඤ්ඤාණාදීන්ට ද වත්ථු වන්නේ ය. අන්‍ය නිඃශ්‍රිත සම්ප්‍රත්‍යෙෂණාදීන්ට ද ද්වාර වන්නේ ය. අනික් එක්විසි වැදෑරුම් වූ රූපය මෙසේ නො වන්නේ නෙවවත්ථුනද්වාර නම් වේ. **'වසන්ති එත්ථ චිත්තචෙතසිකා ධම්මා පවත්තන්තීති=වත්ථූ'** චිත්ත චෛතසික ධර්මයෝ මෙහි වසත් නුයි පවතිත් නුයි වත්ථු නම් වේ.

නැවැත රූපය තෙමේ, **එකජ-ඔජ-තිජ-චතුජ-නානතොවිඤ්ඤත** වශයෙන් පස්වැදෑරුම් ය. ඔවුන් අතර කර්මයෙන් පමණක් හට ගන්නා රූප හා සිතින් පමණක් හටගන්නා රූප එකජ නම්. හදය වත්ථුව සමග ඉන්ද්‍රිය රූප අට කර්මයෙන් ම හට ගණිසි. ශබ්දය සිතින් හා ඍතුවෙන් හටගන්නා බැවින් ඔජ නම්. ලහුතාදී වූ තුන ඍතු-චිත්ත-ආහාර යන මෙයින් හටගන්නේ තිජ නම්. ලකඛණ රූපය තොර කොට ඇති අනික් රූප චතුජ නම්. ලකඛණරූපය

වනාහි න කුතොවිජාත නම් වේ. උත්පාදයාගේ උත්පාදයෙක් නැත උපන්නා වූ රූපයාගේ මුහුකිරීම් බිඳීම් මාත්‍රයක් වූ ජරාමරණය වේ ද එහෙයින් ලක්ඛණරූප තුන කිසි ප්‍රත්‍යයකින් නො හටගන්නා බව දතයුතු ය.

මෙකී රූපයන්ගේ හටගැණීම කර්ම-චිත්ත-ඍතු-ආහාර යන මේ හෙතුන්ගෙන් සිදු වේ. කර්මයෙන් හටගන්නා රූප **කම්ම සමුට්ඨාන,** යි ද, සිතින් හටගන්නා රූප **චිත්තසමුට්ඨාන,** යි ද, ඍතුවෙන් හටගන්නා රූප **උතුසමුට්ඨාන,** යි ද, ආහාරයෙන් හටගන්නා රූප **ආහාරසමුඨාන,** දැයි ද කියති.

කාමාවචර කුසල් සිත් අට, අකුසල් සිත් දොළොස, රූපාවචර කුසල් සිත් පස යන පස් විසි වැදැරුම් වූ කුසල්-අකුසල් සිත් සමග යෙදුනු වෙතනා යි කියන කර්මය, අතීතභවයෙහි රැස් කරණ ලද්දේ, ආද්ධ්‍යාත්මික සන්තානයෙහි ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි පටන්, කර්මසමුත්ථානරූප උපද වන්නේ ය. අරූපා වචර කුශලකර්ම සතර රූප නො උපදවයි. ඔවුන් රූපවිරාගය පිණිස වඩනා බැවිනි. සමහර ආචාර්‍ය කෙනෙක් ස්ථිති-භඞ්ග ක්ෂණ දෙක්හි රූපයන්ගේ උත්පාදයෙක් නැතැ යි කියති.

අරූපාවචරවිපාක සතර, ද්විපඤ්චවිඤ්ඤාණ යන මේ තුදුස හැර, කුසලාකුසලවිපාකක්‍රියාභෙදයෙන් පන්සැත්තෑ චිත්තය තෙමේ, ප්‍රතිසන්ධිචිත්තයට අනතුරු වූ ප්‍රථමභවාඞ්ගචිත්තයෙහි පටන් චිත්තසමුත්ථානරූපය උපදවයි. මේ ඉපදවීම උත්පාදක්ෂණ යෙහි මුත් ස්ථිති-භඞ්ගක්ෂණ දෙක්හි නො වන්නේ ය. ඒ ක්ෂණ දෙකට රූපඉපදවීමෙහි ශක්තියක් නැති බැවිනි. අරූපවිපාක සිත් වලට රූපඉපදවීමේ ශක්තියක් නැත. ඒ සිත් අරූපභූමියට අයත් බැවිනි. ද්විපඤ්චවිඤ්ඤාණය ද ධ්‍යානාඞ්ග නො යෙදෙන බැවින් රූප නො උපදවයි. ධ්‍යානාඞ්ග රූපඉපදවීමෙහි විශෙෂහෙතු යි. උපෙක්ෂාසහගතසන්තීරණ දෙසිත, කාමාවචරමහාවිපාක සිත් අට, රූපාවචර විපාක සිත් පස, කාම-රූපප්‍රතිසන්ධි සිත් හා, රහතුන් පිළිබඳ චුති සිතත් යන මේ සිත් රූප නො උපදවයි. එහෙත් ඔවුහු භවාඞ්ග-චුතිවශයෙන් පවත්නා කල්හි රූප උපදවති. එබැවින් මෙහි නො දක්වන ලද ය. වස්තුදුර්මලත්වය නිසා ප්‍රතිසන්ධි චිත්තයන්ට රූප උපදවනු බැරි ය. හැම කෙනකුන් පිළිබඳ චුති සිත් රූප නො උපදවති යි ඇතැම් කෙනෙක් කියත්.

මෙහි ඍතු නම්, තෙජොධාතුව යි. ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි කර්මජරූපයන්ගේ පහළවීමෙහි දී ඒ කර්මජරූප කලාපයන්ට ම ඇතුළත් වූ ශීතොෂ්ණතාවය යි. එය ක්ෂණත්‍රය යෙන් ස්ථිතික්ෂණයෙහි ම ආද්‍යාත්මික-බාහිර වූ රූප උපදවයි.

ශබ්දය සෘතුවෙන් හටගණියි. එහි ද අවිඥානක වූ මෙඝශබ්දදිය ම, සෘතුවෙන් හටගණියි. සවිඥානක වූ වස්තූන් පිළිබඳ ශබ්දය චිත්ත යෙන් හටගන්නේ ය.

ආහාර නම් ඔජාවයි. ඒ ඔජාව සිරුරෙහි පැතිර ගෙණ ස්ථිති අවස්ථාවට පැමිණියා රූප උපදවයි. මේ ඔජාව ආඞ්‍යාත්මික-බාහිර වශයෙන් දෙ වැදැරුම් ය. ඒ දෙ වැදැරුම් වූ ඔජාව ම, එකතුව රූප උපදවයි. ආහාරයක් කට ගෑ ඇසිල්ලෙහි, රූප අටක් උපදවනබව ද, එක් එක් බත් උලකින් රූප අට අට බැගින් උපදවන බව ද ආචාර්‍යවරයෝ කියති.

චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය, ඉත්ථිභාව-පුරිසභාව, ජීවිතිත්‍රිය, හදයවත්ථු, පඨවී-ආපො-තෙජො-වායො, වණ්ණ-ගන්ධ-රස-ඔජා-ආකාස යන අටළොස කර්මයෙන් හටගත් රූප යි.

කායවිඤ්ඤත්ති-වචීවිඤ්ඤත්ති-සද්ද-ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා-පඨවී-ආපො-තෙජො-වායො-වණ්ණ-ගන්ධ-රස-ඔජා-ආකාස යන පසළොස චිත්තයෙන් හටගත් රූප යි.

සද්ද- ලහුතා- මුදුතා- කම්මඤ්ඤතා, පඨවී- ආපො- තෙජො- වායො- වණ්ණ- ගන්ධ-රස- ඔජා- ආකාස යන තෙළෙස සෘතුවෙන් හටගත් රූප යි.

ලහුතා - මුදුතා - කම්මඤ්ඤතා - පඨවී-ආපො-තෙජො-වායො-වණ්ණ-ගන්ධ-රස-ඔජා-ආකාස යන දොළොස ආහාරයෙන් හට ගත් රූප යි.

ලක්ඛණ රූපයෝ (උපචය-සන්තති-ජරතා-අනිච්චතා) කර්මාදි කිසිවකිනුත් නූපදිත්. සඞ්ග්‍රහය මෙසේය:-

"අට්ඨාරස පණ්ණරස තෙරස ද්වාදසානි ච,
කම්මචිත්තොතුකාහාර ජාති හොන්ති යථාක්කමං.
ජායමානාදිරූපානං සභාවත්තා හි කෙවලං,
ලක්ඛණානි න ජායන්ති කෙහිචීති පකාසිතං"

සමහර රූප කෙනකුන් හෙතු දෙකකින්, සමහර කෙනකුන් තුන කින්, සමහර කෙනකුන් සතරකින් උපදනා බව මෙයින් උගත යුතු ය.

තව ද රූපයෝ කලාප වශයෙන් ද දතයුතු වෙත්. එක් ව ඉප දීම් ඇති එක් ව නිරුඩවීම් ඇති එක් නිඃශ්‍රයක් ඇති එක් පැවැත් මක් ඇති රූප කොටස් කලාපය යි කියත්. එබඳු කලාප මෙහි එක් විස්සෙක් ලැබේ. එයින් නවයෙක් **කර්මසමුත්ථානකලාප** යි ද, සයෙක් **චිත්තසමුත්ථානකලාප** යි ද, සතරෙක් **සෘතුසමුත්ථාන කලාප** යි ද, දෙකෙක් **ආහාරසමුත්ථානකලාප** යි දැ යි දතයුතු ය.

යට කියන ලද කම්මජරූප අටලොස කලාප (මිටි) වශයෙන් නවයකට බෙදේ. **චක්ඛුදසකකලාප-සොතදසකකලාප-ඝාණදසකකලාප-ජිවහාදසකකලාප-කායදසකකලාප - ඉත්ථිභාවදසකකලාප - පුම්භාවදසකකලාප - වත්ථුදසකකලාප - ජීවිතනවකකලාප** කියා.

'දසපරිමාණං අස්සාති=දසකං, චක්ඛුනා උපලක්ඛිතං තස්ස ධානං වා දසකං=චක්ඛුදසකං' ඇයින් ලකුණු කරණ ලද්දා වූ හෝ ඇස ප්‍රධාන කොට ඇත්තා වූ දශ පරිමාණ වූ රූපසමූහය **චක්ඛුදසක** නම් වේ. චක්ඛුදසකයට අයත් වන්නේ චක්ඛුප්පසාද-ජීවිතින්ද්‍රය-පඨවි-ආපෝ- තෙජෝ- වායෝ- වණ්ණ- ගන්ධ- රස- ඔජා යන දසය යි. මේ දසය නො වෙත් ව එකට උපදී. එකට නිරුඬ වේ. එක් නිශ්‍රයෙක් ඇත්තේ වෙයි. එකට පවතී.

සොත- ඝාණ-ජීවහා-කාය-ඉත්ථිභාව - පුම්භාව - හදයවත්ථු යන සත, ජීවිත - පඨවි- ආපෝ- තෙජෝ-වායෝ- වණ්ණ- ගන්ධ-රස- ඔජා යන මොවුන්ගේ ආදියෙහි යොදා, **සොතදසක, ඝාණදසකාදි** වශයෙන් ව්‍යවහාර කරණු ලැබේ. ජීවිතින්ද්‍රිය හා අවිනිබෙභාගරූප අට **ජීවිතනවක'** යි කියත්.

චිත්තසමුට්ඨානරූපය කලාපවශයෙන් සයෙකි. **සුඛඅක-කායවිඤ්ඤත්තිනවක - වචීවිඤ්ඤත්තිදසක - ලහුතාදෙකාදසක - කායවිඤ්ඤත්තිලහුතාදිවාදසක - වචීවිඤ්ඤත්තිසද්දලහුතාදිතෙරසක** කියා.

අවිනිබෙභාගරූපය **සුඛඅකකලාප'** නම් වේ. අවිනිබෙභාග රූපය, කායවිඤ්ඤත්තිය හා **කායවිඤ්ඤත්තිනවකකලාප'** නම් වේ. **වචීවිඤ්ඤත්තිදසකකලාපය'** වනුයේ අවිනිබෙභාග රූප අටත් වචීවිඤ්ඤත්තියත් සද්දයත් එකතු වූ තැන ය. අවිනිබෙභාග රූපය ලහුතා-මුදුතා-කම්මඤ්ඤතා යන තුන හා එකතු ව **ලහුතාදෙකාදසකකලාපය'** සෑදේ. එය ම කායවිඤ්ඤත්ති, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන සතර හා කැටි වූයේ **කායවිඤ්ඤත්තිලහුතාදිවාදසකකලාපය'** නමින් කියැ වේ. නැවැත වචීවිඤ්ඤත්ති, සද්ද, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන පස හා කැටි වූයේ **වචීවිඤ්ඤත්තිසද්දලහුතාදිතෙරසකකලාපය'** වේ.

මේ මෙසේ කියන ලද ද ඇතැම් ආචාර්‍යයෝ තෙනෙක් චිත්තජ රූපකලාප අටෙකැයි කීහු. සද්දනවක, සද්දලහුතාදිද්වාදසක යි කලාප දෙකක් එකතුකර ගැණීමෙනි.

ඍතුසමුට්ඨානරූපකලාප සතරෙකි. **සුඛඅක-සද්දනවක-ලහුතාදෙකාදසක-සද්දලහුතාදිවාදසක** කියා.

අවිනිබ්භොගරූපය **සුද්ධට්ඨකකලාප'** යි කියනලදි. මෙහි ද එසේ ය. එය ම ශබ්දය හා කැටි වූයේ **සද්දනවකකලාප'** නම් වේ. ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා තුන සමග කැටි වූයේ **ලහුතාදෙකාදසකකලාප'** නම් වේ. සද්ද, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන සතර සමග කැටි වූයේ **සද්දලහුතාදිබාදසකකලාප'** නම් වේ.

ආහාරසමුට්ඨානරූපකලාපදෙකෙකි. **සුද්ධට්ඨක-ලහුතාදෙකාදසක** කියා.

අවිනිබ්භොගරූපය **සුද්ධට්ඨකකලාපය'** යි පෙරසේ මෙහිදී ද සැලකිය යුතුයි. ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා තුන සමග ඒ යෙදූ නේ **ලහුතාදෙකාදසකකලාප'** නම් වේ.

මෙයින් සුද්ධට්ඨක-සද්දනවක යන ඍතුජකලාප දෙක බාහිර වස්තූන්හි ද ලැබේ. මේ හැර අනික් සියලු කලාපයෝ අධ්‍යාත්මයෙහි ලැබෙත්. සංග්‍රහය මෙසේ ය:-

"කම්මචිත්තෝතුකාහාරසමුට්ඨානා යථාක්කමං,
නවච්ඡචතුරෝ චෙති කලාපා එකවීසති" යි.

ආකාසධාතුරූපය, කලාපයන්ගේ පිරිසිදීම් මාත්‍රයක් ම කරණ බැවින් ද උපචය, සන්තති, ජරතා, අනිච්චතාරූප, රූප පිළිබඳ උත් පාදාදි ලක්ෂණමාත්‍රයක් බැවින් ද කලාපාඞ්ග නො වේ.

රූපසඞ්ගහයෙහි ගැණෙන රූප පිළිබඳ ව මෙහි කියන ලද්දී ඉතා කෙටි කථාවෙකි. විස්තාරය පිණිස විසුද්ධිමග්ග-සමෝහවිනෝදනී විභඞ්ගට්ඨකථාදිය බලනු.

වෙදනා නම්, වෙදයිතලක්ෂණයෙන් යුක්ත වූ ගති යයි. අරමුණු රස අනුභව කිරීම් ආකාරයෙන් පැවැත්ම වෙදයිත නම්. **'විඳනති එතාය සන්තා සාතං වා අසාතං වා ලභතීති=වෙදනා'** සත්ව යෝ යහපත් වූ හෝ අයහපත් වූ හෝ මිහිරි නො මිහිරි අරමුණු රස යම් සුභාවධර්මයක් කරණ කොට විඳිත් ද, ලබත් ද ඒ ධර්මසුභාවය වෙදනා නමැ යි කීහ.

අරමුණුරස විඳින සුභාවලක්ෂණයෙන් එක්වැදෑරුම් වූවා ද කුසල -අකුසල-අව්‍යාකත යන ජාතිවශයෙන් වෙදනාව තෙවැදෑරුම් ය. කුසල් වශයෙන් හෝ අකුසල් වශයෙන් නො කියනලද විපාකක්‍රියා චිත්තචෛතසිකයෝ අව්‍යාකතවශයෙන් හැඳින් වෙති.

කාමාවචර සොමනස්ස උපෙක්ඛා ඤාණ සඞ්ඛාර භෙදයෙන් අට වැදෑරුම් ය, යන ආදික්‍රමයෙන් කුසලවිඤ්ඤාණය හා යෙදුනී **කුසලවෙදනා** ය. අකුසලවිඤ්ඤාණය හා යෙදුනී **අකුසලවෙදනා** ය. විපාක ක්‍රියා යි කියන අව්‍යාකතචිත්තය හා යෙදුනී **අව්‍යාකත වෙදනා** යි දතයුතු ය.

වෙදනා තොමෝ සවභාව වශයෙන් **සුඛවෙදනා-දුක්ඛවෙදනා-සොමනස්සවෙදනා-දෙමනස්සවෙදනා-උපෙක්ඛාවෙදනා** යි පස්වැදෑරුම් ය.

එහි කුසලවිපාකකායවිඤ්ඤාණය හා යෙදුනි **සුඛවෙදනා** ය අකුසලවිපාකකායවිඤ්ඤාණය හා යෙදුනී **දුක්ඛවෙදනා** ය. කාමාවචරවිඤ්ඤාණයන් කෙරෙන් සිවුවැදෑරුම් වූ සොම්නස් සහගියා වූ කුසල චිත්තයන් සමග ද, සිවුවැදෑරුම් වූ සොම්නස් සහගිය සහෙතුක විපාකචිත්තයන් සමග ද, අහෙතුකවිපාක වූ සොම්නස් සහගිය සන්තීරණ චිත්තය සමග ද, සිවුවැදෑරුම් වූ සොම්නස් සහගිය සහෙතුක ක්‍රියා චිත්තයන් සමගද, එක් ම සොම්නස් සහගිය අහෙතුක ක්‍රියා චිත්තය සමග ද, සිවු වැදෑරුම් සොම්නස් සහගිය අකුශල චිත්තයන් සමග ද, රූපාවචර විඤ්ඤාණයන් කෙරෙහි පංචමධ්‍යානික කුසලවිපාකක්‍රියාචිත්තයන් හැර අනික් ඉතිරි වූ සිවුවැදෑරුම් වූ කුසල විඤ්ඤාණයන් සමග ද, චතුර්විධ විපාකයන් සමග ද චතුර්විධ ක්‍රියාවිඤ්ඤාණයන් සමග ද, (ධ්‍යානවශයෙන්) සතළිසකට බෙදී යන ලොකොත්තර සිත් අතර පංචමධ්‍යානික සිත් අට හැර අනික් දෙතිසක් ලොකුත්තරවිපාක විඤ්ඤාණ සමග ද යි යන දෙසැටක් විඤ්ඤාණයන් හා යෙදුනු වෙදනා තොමෝ **සොමනස්සවෙදනා** ය. දෙමනස් සහගිය අකුසල් සිත් දෙක හා යෙදුනී **දෙමනස්සවෙදනා** ය. අනික් පස්පණස් චිත්තයන් හා යෙදුනු වෙදනා තොමෝ **උපෙක්ඛාවෙදනා** ය.*

සුඛවෙදනා තොමෝ ඉෂ්ට වූ ස්ප්‍රෂ්ටව්‍යයන් අනුභවකිරීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය තමන් හා යෙදුනු ධර්මයන්ගේ වැඩීම ය. පච්චුපට්ඨානය කායිකසුඛවෙදනාව විඳගැණීම ය. පදට්ඨානය කායෙන්ද්‍රිය යි. **'ඉට්ඨඵොට්ඨබ්බානුභවනලක්ඛණා සුඛවෙදනා, සම්පයුත්තානං උපබ්‍රූහණරසා, කායිකඅස්සාදපච්චුපට්ඨානා, කායින්ද්‍රියපදට්ඨානා'** යනු පාළි යි.

දුක්ඛවෙදනා තොමෝ අනිෂ්ට වූ ස්ප්‍රෂ්ටව්‍යයන් අනුභවකිරීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය තමන් හා එක් ව උපදනා ධර්මයන් මලානිකභාවයට පැමිණවීම ය. පච්චුපට්ඨානය කායිකාබාධය යි. කායෙන්ද්‍රිය පදට්ඨානය යි. **'අනිට්ඨඵොට්ඨබ්බානුභවනලක්ඛණා දුක්ඛවෙදනා, සම්පයුත්තානං මිලාපනරසා, කායිකාබාධපච්චුපට්ඨානා, කායින්ද්‍රියපදට්ඨානා'** යනු පාළි යි.

සොමනස්සවෙදනා තොමෝ ඉෂ්ටාලම්බනානුභවය ලකුණු කොට සිටියා ය. කෘත්‍යය සවභාවවශයෙන් හෝ වරදවා කල්පනා

---

* චක්ඛුසම්ඵස්සජා වෙදනා සොතසම්ඵස්සජා වෙදනා යනාදි විභඞ්ගය අනික් පොත පතින් දතයුතුය.

කිරීමෙන් කැමැති ලෙසකින් අරමුණුරස අනුභවකිරීම ය. පච්චුපට්ඨානය චෛතසිකආස්වාදය යි. සංසිඳීම පදට්ඨානය යි. **'ඉට්ඨාරම්මණානුභවනලක්ඛණා සොමනස්සවෙදනා, යථාතථා වා ඉට්ඨාකාරසම්භොගරසා, චෙතසිකඅස්සාදපච්චුපට්ඨානා, පස්සද්ධිපදට්ඨානා'** යනු පාළි යි.

දෞමනස්සවෙදනා තොමෝ අනිෂ්ටාලම්බනානුභවය ලකුණු කොට සිටියා ය. කෘත්‍යය ස්වභාවවශයෙන් හෝ අයථාකල්පනයෙන් අනිෂ්ට ලෙසින් අරමුණුරස අනුභවකිරීම යි. පච්චුපට්ඨානය චෛතසික ග්ලානත්වය යි. පදට්ඨානය හදයවත්ථුව යි. **'අනිට්ඨාරම්මණානුභවනලක්ඛණා දෞමනස්සවෙදනා, යථාතථා වා අනිට්ඨාකාරසම්භොගරසා, කාසිකාබාධපච්චුපට්ඨානා, එකන්තෙනෙව හදයවත්ථුපදට්ඨානා'** යනු පාළි යි.

උපෙක්ඛාවෙදනා තොමෝ මැදහත් ආකාරයෙන් අරමුණුරස අනුභවකිරීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය සම්ප්‍රයුක්තධර්මයන් මැදහත් අයුරෙන් පැවැත්වීම ය. සංසුන්බව පච්චුපට්ඨානය යි. පදට්ඨානය ප්‍රීතිරහිතචිත්තය යි. **'මජ්ඣත්තවෙදයිතලක්ඛණා උපෙක්ඛා, සම්පයුත්තානං නාතිඋපබ්‍රූහණමිලාපනරසා, සන්තභාවපච්චුපඨානා, නිප්පීතිකචිත්තපදඨානා'** යනු පාළි යි.

වෙදයිතලක්ෂණවශයෙන් එක් වැදැරුම් වූ වෙදනා තොමෝ කුසල, අකුසල, අව්‍යාකතවශයෙන් හා සුඛ-දුක්ඛ-සොමනස්ස-දෞමනස්ස-උපෙක්ඛා වශයෙන් භෙදයට ගියා, චිත්තවිභාග වශයෙනි. එහෙයින් වෙදනාවගේ විස්තරාවබොධය පිණිස චිත්තවිභාගය දතයුතු ය. චිත්තවගීයෙහි ඒ දැක්විනි. එහෙයින් ඒ මෙහි නොආයේය. ඒ බලා දතයුතු යි.

සංඥා නම්, නීල-පීතාදීවශයෙන් වෙනස් වෙනස් වූ අරමුණු සලකුණු කොට හැඳිනීම ය. **'සඤ්ජානාති සඤ්ජානාතීති ඛොභික්ඛවෙ! තස්මා සඤ්ඤාති වුච්චති, කිං ච සඤ්ජානාති නීලම්පි පීතම්පි ලොහිතකම්පි ඔදාතම්පි සඤ්ජානාති'** යනු දෙශනා ය. මේ නිසාම සිත අරමුණු හඳුනා ගණියි. සිත අරමුණු සිතතත්, සිතට අරමුණු හඳුනාගත නො හැකි ය. සිත අරමුණු හඳුනා ගන්නේ සංඥාවගේ ශක්තියෙන් ම ය. සංඥාව පෙර ගන්නාලද සලකුණක් අනු ව යෑමෙන් ම පසු ව ලැබෙන අරමුණ හඳුනා ගණියි. මෙසේ අරමුණු හැඳින ගැණීම් ලක්ෂණයෙන් ඕ එක් වැදැරුම් වූවා ද, කුශල-අකුශල-අව්‍යාකෘත යන ජාති වශයෙන් තෙපරිදි ය.

එහි කුශලවිඥානසම්ප්‍රයුක්ත වූවා **කුශලසඥා** යි. අකුශල විඥාන සම්ප්‍රයුක්ත වූවා **අකුශලසංඥා** යි. අව්‍යාකෘතවිඥානයන් හා සම්ප්‍ර

යුක්ත වූවා **අව්‍යාකතසංඥ** යි. සංඥවෙන් තොර වූ විඥනයෙක් නැත. එහෙයින් විඥනයාගේ හෙද යම් පමණ වේ ද, සංඥවගේ හෙද ත් එ පමණ ය.

සංඥ තොමෝ විඥනය හා සම වූ හෙද ඇත්තී නමුත් **ලක්ඛණ**-**රස**-**පච්චුපට්ඨාන**-**පදට්ඨාන** වශයෙන් හැඳිනීම ලකුණු කොට ඇත් තී ය. කෘත්‍යය, ඒ මෙසේ ය යි නැවැත හැඳිනීමට උපකාර වූ නිමිති කිරීම ය. දුවදඬු ආදියෙහි වඩුවන්ගේ දුලිනුල් හෙළීම මෙනි. පච්චුපට්ඨානය, ඇතුන් දක්නා දුස් නැත්තවුන් මෙන් වැටහී ගිය පරිදි අරමුණු ගැණීම් වශයෙන් බැස සිටීම ය. උත්පත්තියෙන් ම දැස් නැති බැවින් ඇතකු නො දුටු අන්ධයන් සමූහයකට ඇතකු දුක් වූ කල ඇත්පා අතගා බැලූ අන්ධයා ඇතා වංගෙඩියක් බඳුය යි කියාද කණ පමණක් ඇල්ලූ අන්ධයා කුල්ලක් බඳුය යි කියාද, වලිගය පමණක් ඇල්ලූයේ රැහණක් බඳුය යි කියා ද, එ මෙන් මේ සංඥව තමන් ගත් පරිදී ම ඒ ඒ අරමුණුවලට බැස ගත්තී ය. තෘණපුරුෂ යන් (පඹයන්) සජීවපුරුෂයනැ යි මුවපැවවුනට උපන් සංඥව මෙන් එලඹ සිටි අරමුණ ම පදට්ඨාන යි. **'සඤ්ජානනලක්ඛණා සඤ්ඤා, තදෙවෙතන්ති පුනසඤ්ජානනපච්චයනිමිත්තකරණ රසා, යථාගහිතනිමිත්තවසෙන අභිනිවෙසකරණපච්චුපට්ඨා නා'** යනු පාළියි.

සංඛාරනම්, කුශලාකුශලකර්මයන් රැස්කිරීම ලකුණු කොට සිටි ධර්මසමූහය යි. **'සඞ්ඛතං අභිසඞ්ඛරොන්තීති ඛො භික්ඛවෙ! තස්මා සඞ්ඛාරාති වුච්චන්ති, කිං ච සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති? රූපං රූපත්තාය, වෙදනං වෙදනත්තාය, සඤ්ඤං සඤ්ඤත්තා ය, සඞ්ඛාරෙ සඞ්ඛාරත්තාය, විඤ්ඤාණං විඤ්ඤාණත්තාය, සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති'** යනු දෙශනා යි.

රැස්කිරීම ලකුණු කොට ඇති මේ ධර්මසමූහයෙහි චෙතනාව ම අභිසංස්කරණාර්‍ථයෙන් ප්‍රධාන වේ. එහි වූ සපශ්‍රීදී වූ අනික් ධර්මයෝ අප්‍රධානයහ. එහෙත් සපශ්‍රීදිධර්මයන් චෙතනාව ප්‍රධාන කොට පවත්නා බැවින් ඔවුහු ද සංස්කාර යි කියනු ලැබෙති.

සංස්කාරයෝ රැස්කිරීම ලකුණු කොට ඇත්තාහ. කෘත්‍යය එක්රැස් කොට ගැණුම ය. ඵල සකස්කිරීමේ උත්සාහය හෙවත් ව්‍යාපාරසහිතබව පච්චුපට්ඨාන යි. සෙසු සකඤ්ඤන පදට්ඨාන යි. **අභිසඞ්ඛරණලක්ඛණා සඞ්ඛාරා, ආයූහනරසා, විප්ඵාරපච්චු පට්ඨානා, සෙසඛන්ධත්තයපදට්ඨානා'** යනු පාළියි.

මෙසේ ලක්ෂණ වශයෙන් එක්වැදුරුම් වූවාහු ද, සියලු සංස්කා රයෝ **කුශල**-**අකුශල**-**අව්‍යාකත** යි ජාතිවශයෙන් තුන්වැදුරුම් වෙති. එක්විසි කුසල්සිත් සමග යෙදුනු සංස්කාරයෝ, කුසල් නම්

වෙති. අකුසල්සිත් දෙලොස සමඟ යෙදුනෝ, අකුසල් නම් වෙති. විපාකසිත් සතිස ත්, ක්‍රියාසිත් විස්ස ත් සමඟ යෙදුනෝ, අව්‍යාකෘත නම් වෙත්.

සංඛාර අතුරෙහි පළමු කොට ප්‍රථමකාමාවචරකුශලවිඥානය හා සම්ප්‍රයුක්ත වූ සංඛාරයෝ, සඛකීය නාමයෙන් ම ඒ සිතෙහි යෙදුනෝ සත්විසි දෙනෙකි. සඛකීයනාමයෙන් නො ආ **'යෙවාපනකා'** යන්නෙහි වූ අනියමාඣීවාචී වූ යශබ්දයෙන් ගැණෙන්නෝ සිවුදෙනෙකි. එසේ ම අනියතයෝ පස්දෙනෙකැ යි ප්‍රභෙද වශයෙන් සතිස් දෙනෙක් වෙති. මේ **නියත යෙවාපනක අනියත** යන කොටස් තුනෙන් එස්ස-චෙතනා-චිතක්ක-විචාර-පීති-විරිය ජීවිත- සමාධි- සබ්බ-සති-හිරි-ඔත්තප්ප- අලෝභ-අදෝස-අමෝහ-කායපස්සඬ්- චිත්තපස්සඬ්- කායලහුතා- චිත්තලහුතා- කායමුදුතා- චිත්තමුදුතා-කායකම්මඤ්ඤතා- චිත්තකම්මඤ්ඤතා-කායපාගුඤ්ඤතා-චිත්තපාගුඤ්ඤතා-කායුජුකතා-චිත්තුජුකතා, යන සවිසි දෙන සඛකීයනාමයෙන් ම ප්‍රශෝභනචිත්තයෙහි යෙදුනු නියත සංස්කාරයෝ ය. සිත උපදනා කල්හි මේ සවිසිදෙන ද ඒකාන්තයෙන් හටගන්නා බැවින් නියතය යි කියත්.

ඡන්ද-අධිමොක්ඛ-මනසිකාර-තත්‍රමජ්ඣත්තතා යන සිවුදෙන අනියම්න් යෙදුනු සංඛාරයෝ ය. එහෙයින් ඔවුහු දෙවන කොටස වූ යෙවාපනකයෝ ය.

කරුණා-මුදුතා- කායදුච්චරිතවිරති- වචීදුච්චරිතවිරති-මිච්ඡාජීවවිරති, යන පස් දෙන නියතයොගීන් මෙන් නිතර නො යෙදෙති. ඇතැම් කලෙකමය යෙදෙන්නෝ. එක් ම චිත්තයෙහි එකවිට ත් නො උපදිති. අට මහකුසල්සිත්හි උපදනාවිට එක් එක් චිත්තවීථි යක එකොක් එකොක් ම උපදියි. එසේ වන්නේ ආරම්මණයන්ගේ වෙනස්බව නිසා ය. මහද්ගතචිත්තයෙහි ශීලවිශුද්ධියට ඇතුළත් වූ දුශ්චරිතදුරුජීවයන් නො ලැබිය යුතු බැවින් විරති තුන කොයි ලෙසකිනුදු නො ලැබේ. අප්පමඤ්ඤාවෝ ද අරමුණු වෙනස්බව නිසා එකක් එකක් වශයෙන් ම එක් එක් ධ්‍යානචිත්තයෙහි ලැබෙති. සබ්බචිත්තසාධාරණ- පකිණ්ණක- අකුසල- සොභන විරති- අප්පමඤ්ඤා-පඤ්ඤා යන චෛතසිකයන් පිළිබඳ තොරතුරු යටැ කියන ලද්දේ ය. සියලු චෛතසිකයන් පිළිබඳ කෙටිකතාවක් ද යට දැක් වින. මේ මතු කියන්නී එයට දික් වූ කතාවකි.

'ඵුසතීති=ඵස්සෝ, ඵුසනති සම්පයුත්තධම්මා එතේනාති වා = ඵස්සෝ, ඵුසනමත්තං වා = ඵස්සෝ' යම් ඒ සවභාව ධර්මයෙක් තෙමේ අරමුණු පහදු ද, ඒ පැහැසීම ඵස්ස නම් වේ. අරමුණට වැද

ගන්නේ ය එසස. අරමුණෙහි පවත්නා ධම්යෝ වැද ගැණීම් ලක්ෂණ වූ යම් ශක්තියකින් අරමුණු සපයී කෙරෙත් ද, ඒ එසස නම් වේ. සිත හා එක් ව යෙදුනා වූ වෙදනාදීවෙතසිකයෝ අරමුණෙහි පවත්නාහු, ඒ අරමුණ සපයීකරන්නන් වැනි වෙති. අරමුණට වැද ගැණීම් මාත්‍රය හෝ එසස නම් වේ. චක්ෂුරාදිවාරයකින් යම්කිසි රූපාදී වූ අරමුණක් වැදුනුවිට ඒ අරමුණෙහි උපදනා සිත හා එක් ව ඉපැදෙමින්, ඒ සිත ත් ඒ හා යෙදුනු අනික් වෙතසික ත් අරමුණෙහි හපත්නාක් මෙන් පවත්නා ධම්ශක්තිය එසස නැමැ යි කිහ. එය තවත් විසතර කරන්නට **'ඵුසනං චෙත්ථ ආරම්මණස්ස ඉට්ඨානිට්ඨරසං ආහවව උපහවව ගහණං දට්ඨබ්බං'** යනු කිහ. ඵුසන නම්, අරමුණ පිළිබඳ යහපත් අයහපත් රසය හැපී ගැණීමය යි මෙයින් අදහස් කෙරෙති.

මෙසේ මේ එසසශබ්දය කර්තෘ-කරණ-භාව සාධන වියින් විස්තර කරණලද්දේ ද, භාවසාධන වාක්‍යය ම නිෂ්පර්‍යාය වන්නේය. හෙවත් ප්‍රධාන වේ. කර්තෘ-කරණ සාධන වාක්‍යයෝ පර්‍යාය කථා වෝ ය. ඔවුහු අප්‍රධාන වෙති. පරමාර්ථ ධම්විෂයයෙහි භාවසාධන ය ම ප්‍රධාන බැව්නි.

සපයීය, අරමුණු වැළඳ ගැණීමක් නො කරයි. එහෙත් චක්ඛුපසාදය හා රූපය සේ ද, සොතපසාදය හා ශබ්දය සේ ද, සිත ත් අරමුණ ත් දෙදෙනාගේ ගැටීම කරයි. යම්සේ එක් අල්ලක් අනික් අල්ලෙහි ගැටීමට විශෙෂ කාරණ වූ වායොධාතු අධික වූ රූපධම්යෝ වෙත් ද, එ මෙන් සිත අරමුණෙහි ගැටීම ඊට විශෙෂ වූ එක් වෙතසිකධම්යෙකැ යි දත යුතු ය.

මෙකී සපයීයාගේ හටගැන්ම වන්නේ චක්ඛුස ත්, රූපය ත්, චක්ඛුර්විඤ්ඤාණය ත් යන තිදෙනාගේ එක් තැන්වීමෙනි. එය වදලෝ මෙසේ ය:- **'චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සෝ'** යි. මේ ධම් තුන එක් තැන් වීමෙහිදී පෙර පසු නො වී සපයීයාගේ පහළවීම වන්නේ ය. එය අරූපධම්යෙකි. එහෙයින් කිසිවක්හට අරූපධම්යන්ගේ හැපීම් සවභාවයෙක් නැත්තේ නො වේ ද, යි ඇසිය හැකි ය. ඒ එසේ ය. සපයීය අරූප වූයේ නමුත්, රූපාදී වූ අරමුණුවල වැදුගැණීම් හැපීම් ආකාරයෙන් පවත්නේ ය. එක් ව යෙදුනු සම්ප්‍රයුක්තධම්යන් ද අරමුණුවල හැපීම් ආකාරයෙන් පවත්ව යි. අරමුණෙහි වැද ගන්නාක් මෙන් උපදනා මේ සපයීය, ඇඹුල් අනුභව කරණ එකකු දුටුකල ඒ දුටු තැනැත්තහුගේ මුඛයෙහි ඇඹුල් නො වැද ම ඇඹුලෙහි හැපී කියාසේ කෙල උනායාමෙක් වේ ද, එමෙන් අරමුණෙහි වැද ගන්නා ආකාරයෙන් පැවැත්මය යි දතයුතු ය.

චකඛු- සොත- ඝාණ- ජිවහා- කායවිඤ්ඤාණ සිත්හි යෙදුනේ චකඛුසම්පයුත්ත- සොතසම්පයුත්ත-ඝාණසම්පයුත්ත- ජිවහාසම්පයුත්ත-කාය සම්පයුත්ත යි ද, සෙසු තන්හි යෙදුනේ මනොසම්පයුත්ත යි ද කියනු ලැබේ. සියලු සිත්හි සාධාරණ ව යෙදෙන බැවින් සඵීවිත්න සාධාරණයෙකි.

එස්සය, අරමුණට වැදගැන්ම ලකුණු කොට සිටියේය. කෘත්‍යය මනොද්වාරයෙහි ආරම්මණ-චිත්ත දෙ දෙනාගේ හැපීම යි. පවවුපඨානය,-වස්තු-ආලම්බන-විඤ්ඤන යන නි දෙනාගේ සන්නිපාතය යි. ආපාථගත වූ අරමුණ පදට්ඨානය යි. **'ඵුසන ලක්ඛණොඵස්සො සංඝට්ටනරසො, සන්නිපාතපච්චුපට්ඨානො, ආපාථගතවිසයපදට්ඨානො'** යනු පාළියි.

'චෙතයතීති=චෙතනා' තමා හා යෙදෙන, සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි යොදවා නු යි චෙතනා නම. රූපාදී වූ අරමුණුවල සිතත් ඒ හා උපන් ඵස්සවෙදනාදී වූ චෛතසිකධර්මත් යොදූ චිත්ත -චෛතසිකයන්ට අයත් කටයුතු කරණ කරවන ශක්තිමාත්‍රය චෙතනා යි කිහ. ආයූහනකෘත්‍යය වශයෙන් චෙතනාව හටගන්නා කල්හි සියලු සම්ප්‍රයුක්තධර්මයෝ ද තම තමන් අයත් කටයුතුවල යෙදෙත්. මෙසේ චෙතනාව සවකෘත්‍යය හා පරකෘත්‍යය සිදු කරණ හෙයින් සවපරකෘත්‍යයන් සිදුකරණ ප්‍රධාන ශිෂ්‍යයා සේ ද, මහ වඩුවා සේ ද දතයුතු ය. ප්‍රධාන ශිෂ්‍ය තෙමේ අනික් බාල ශිෂ්‍යයන් අධ්‍යයනාදී වූ කෘත්‍යයන්හි යොදවමින්, තමා ද අධ්‍යයනාදී වූ කෘත්‍යයන්හි යෙදෙයි. මහවඩුවා තමන් වැඩ කරමින්, සෙසු වඩුවන් ද ඒ ඒ කර්මාන්තයෙහි යොදුලයි. එ පරිද්දෙන්, මේ චෙතනා තොමෝ තමන් අයත් කෘත්‍යයෙන් අරමුණෙහි යෙදෙමින්, අනික් සෙසු චිත්ත-චෛතසිකධර්මයන් ද උන් උන් අයත් කෘත්‍යයන්හි යොදුලන්නී ය. චෙතනාව තමන් අයත් කටයුතු පටන් ගත් කල්හි සෙසු චිත්ත - චෛතසිකයෝ ද තම තමන් අයත් කටයුතු පටන් ගණිත්. **'සකිච්චපරකිච්චසාධකා ජෙට්ඨසිස්සමහාවඩ්ඪකී ආදයො විය'** යනු කියේ එහෙයිනි. චෙතනාව ම, සිතට අනුකූලව පවතිමින් අරමුණුබර උසුලන්නී කටයුතු පිණිස ඉදිරිපත් වේ.

කාමාවචර-රූපාවචර-අරූපාවචර, යන ත්‍රෛභූමිකකුශලාකුශලචිත්තයන් හා යෙදෙන චෙතනාචෛතසිකය, **පුඤ්ඤාභිසංඛාර -අපුඤ්ඤාභිසංඛාර-ආනෙඤ්ජාභිසංඛාර** යි හඳුන්වනු ලැබේ. මෙය කර්මය යි ගැණෙනුයේ රැස්කරණ ශක්තිය එහි ඇති බැවිනි. බිම සිටුවන ලද බීජයට, කරණු ලබන දියඉසීම්, බෙහෙත් දැමීම්, පෝර යෙදීම් ආදිය ඒ බීජුවවින් හටගත් ගසෙහි හෝ වැලෙහි විශෙෂඵල හටගැන්මට උපකාර වන්නා සේ චිත්ත-චෛතසිකයන්

එකතුව උපදවා ගත් කෙණෙ, අවිද්‍යා-තෘෂ්ණාවන්ගේ මහිමයෙන් උපච්ඡේදක-උපඝාතක-අහොසිකම්නාවයට නො පැමිණියේ නම්, මේ භවයෙහි හෝ නැත, අනික් භවයෙක දී විපාකදායක කරන්නේ ය. සවිඤ්ඤාණසංඛාරණයෙකි.

චෙතනාව, චිත්ත-චෛතසිකධර්මයන් තම තමන්ට අයත් අරමුණෙහි සම්බන්ධකිරීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය සම්ප්‍රයුක්ත ධර්මයන් තම තමන්ගේ කටයුත්තෙහි මෙහෙයීම හෙවත් යෙදවීම ය. මේ කෘත්‍යය, කුශලාකුශලක්‍රියාජවනසම්ප්‍රයුක්ත චෙතනාව පිළිබඳ වේ. පච්චුපඨානය නියොග කිරීම යි. සහ ජාතධර්මපදසඨාන යි. **'චෙතනාභාවලක්ඛණා චෙතනා, ආයූහනරසා, සංවිදහනපච්චුපට්ඨානා, සහජාතධම්මපදට්ඨානා'** යනු පාළි යි

'ආරම්මණං චිනකෙතනි සම්පයුත්තධම්මෙ අභිනිරොපෙති නි=චිනකෙතා' චිත්ත-චෛතසික ධර්ම, යම් සවභාවශක්තියකින් අරමුණට නැඟේ ද, ඒ සවභාවශක්තිය චිතක්ක නම් වේ. එය අරමුණට නැඟෙන කල්හි සම්ප්‍රයුක්තධර්මයෝ ද අරමුණට නැඟෙත්. එසේ වන්නේ චිතකීයාගේ සහායභාවය ලැබීමෙනි. එහෙයින් චිතක්ක, චිත්ත-චෛතසික ධර්මයන් තෙමේ ම අරමුණට නංවන්නේ ය. පිටිසරගම්වැසියෙක් රජගෙය දක්නට පැමිණියේ, රාජවල්ලභයකුගේ සහායයෙන් ම එහි පිවිස බලන්නේ ය. එමෙන් චිතකීයාගේ සහායභාවය ලබා ම, චිත්ත-චෛතසිකධර්මයෝ අරමුණට නගිති. මෙහි චිත්ත-චෛතසිකධර්ම පිටිසරගම්වැසියා මෙනි. චිතකීය රාජවල්ලභයා මෙනි. අරමුණ රජගෙය මෙනි.

චිතකීබලයෙන් චිත්ත-චෛතසිකධර්මයෝ අරමුණට නගින්නම්, චිතකීරහිත වූ සිත අරමුණට නගින්නේ කෙසේ දැ යි මෙහිලා ප්‍රශ්නයෙක් වෙයි. සවභාවයෙන් ම අචිතකී වූ විපඤ්චවිඤ්ඤාණය හැර සෙසු අචිතකී සිත් සපණස, සවිතකීවිත්තසන්තානයෙහි චිතකීය සමග පැවැති පුරුද්දේ (භාවනා) බලයෙන් ම අරමුණට නගී ය යනු පිළිතුරුයි. යට කියූ පිටිසරගම්වැස්සාට රජගෙට පිවිසීම පුරුදු වූවාට පසු ඔහු රාජවල්ලභයාගෙන් තොරව ද රජගෙට පිවිසෙයි. එ පරිද්දෙන් සවිතකීවිත්තසන්තානයෙහි නිරතුරු හටගත් පුරුද්දෙන්, චිතකීයෙන් තොර ව ද, අචිතකීධ්‍යාන චිත්තය අරමුණට නගියි. මෙය ඝණවාචට ගැසූ කල්හි නගිනා පළමු පහර සේ අහසට නගිනා පක්ෂියකුගේ පියා පැහැරීමක් සේ පියුමක් බලා බස්නා බමරකුගේ පහත බැස්මක් සේ ලෝබදුන මදිනා කල්හි ඒ බදුන එක් අතකින් අල්වා ගැණීමක් සේ දතයුතු ය.

චිතකීය, දවිපඤ්චවිඤ්ඤාණය හැර අනික් කාමාවචර සිවුඤාණික් සිත්හි හා ප්‍රථමධ්‍යානසිත් එකොළොසෙහි යෙදෙන්නේ ය.

සොභන සිත්හි මෙන් අහෙතුකසිත්හි ද, අහෙතුකසිත්හි මෙන් සොභන සිත්හි ද මිශ්‍රව ලැබෙන හෙයින් ප්‍රකීර්ණිකය, යි කියනු ලැබේ.

විතර්කය, අරමුණට සිත නැංවීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, අරමුණ තැළීම් පෙළීම් ස්වභාවය යි. පච්චුපට්ඨානය, සිත අරමුණ කරා ගෙණ යෑම යි. ආපාථගත වූ අරමුණ පදට්ඨානය යි. **'ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපණලක්ඛණො විතක්කො ආහනනපරියොහනනරසො, ආරම්මණෙ චිත්තස්ස ආනයන පච්චුපඨානො, ආපාථගතවිසයපදඨානො'** යනු පාළි යි.

'ආරම්මණං විචාරෙතීති=විචාරො' විතර්කය විසින් අරමුණට නැගූ සිත අරමුණෙහි තතු දැන ගත්නාතුරු එහි චිත්ත-චෛතසික ධර්මයන් හසුරුවන ස්වභාවය තෙමේ විචාර නම් වේ. විතර්ක-විචාර දෙක එකවිට ම සිතෙහි යෙදෙන්නේ ය. එහෙත් විතර්කය ඔළාරිකය. ඝණ්ටාවට ගැසූවිට නගිනා පහර සේ ය. විචාරය සියුම් ය. එය ඝණ්ටාවට ගැසූ පහරින් පසුව නගිනා ඡෙංකාරය සේ ය. පියාපත් පැහැර, අහසට නැගුනු පක්ෂියාගේ පියාපත් නිශ්චලව තබා ගෙණ, අහස පියාඹීම සේ ය. පියුමකරා පැමිණි බමරා ඒ සිසාරා කැරකීම සේ ය.

විචාරය, විතර්කය යෙදුනු පස් පණස් සිත්හි හා ද්විතීයද්ධ්‍යාන සිත් එකොළොසෙහි ද යෙදෙන්නේ ය. මෙ ද ප්‍රකීර්ණියෙකි.

විචාරය, සසම්ප්‍රයුක්තචිත්තය ලැබූ අරමුණ පිරිමැදීම ලකුණු කොට සිටියේ ය. අරමුණෙහි සහජාතධර්මයන් අනුකූලව යෙදීම කෘත්‍යය කොට සිටියේ ය. අරමුණෙහි චිත්තයාගේ නො සිඳී පැවැත් ම පච්චුපඨානය යි. ආපාථගත වූ අරමුණ පදඨානය යි. **'ස්වායං ආරම්මණානුමජ්ජනලක්ඛණො, ආරම්මණෙ සහජාත ධම්මානුයොජනරසො, චිත්තස්ස අනුප්පබන්ධපච්චුපඨානො ආපාථගත විසයපදඨානො'** යනු පාළියි.

'පීණයති කායචිත්තං තප්පෙති වඩ්ඪෙතීති ච=පීති' යම් ධර්ම ස්වභාවයෙක් තෙමේ, කය ත් සිත ත් දෙක පිණවා ද, තර්පණය කෙරේ ද, වඩා ද ඒ ධර්මස්වභාවය පීති නම් වේ. **ඛුද්දිකා-ඛණිකා-ඔක්කන්තිකා-උබ්බෙගා-ඵරණා** යි ඕ පස්වැදැරුම් ය. මෙසේ කීහ. ඒ:-

"ඛුද්දිකා ඛණිකා පීති-පීති ඔක්කන්තිකා පි ච,
උබ්බෙගා ඵරණා පීති-පීති පංචවිධා භවෙ" යි.

විස්තර යට කියූ සේය.

සොම්නස් සහගිය ලොභසිත් සතරෙහි, සොම්නස් සහගිය සන්තීරණහසිතුපපාද දෙ සිතෙහි, සොම්නස් සහගිය සහෙතුක කාමාවචර සිත් දෙලොසෙහි හා ප්‍රථම-තෘතීය-තෘතීයධ්‍යාන තෙතිස් සිත්හි ද යෙදේ. මෙ ද ප්‍රකීර්ණයෙකි.

ප්‍රීතිය, තමා හා සම්ප්‍රයුක්තධර්මයන් පිණවීම ලකුණු කොට සිටියෝ ය. කෘත්‍යය, කය ත් සිත ත් පිණවීම ය. චිත්තජරූපයන් ගෙන් කය පැතිරවීම හෝ මෙහි කෘත්‍යය වේ. ඔදවැඩිබව පච්චුපට්ඨානය යි. ප්‍රමොදය පදට්ඨානය යි. **'සා සම්පියායනලක්ඛණා, කායචිත්තපීණනරසා, එරණරසා වා, ඔදග්ගපච්චුපට්ඨානා, පාමොජ්ජපදට්ඨානා'** යනු පාළියි.

'විරස්ස භාවෝ=විරියං, විරානං කම්මං වා=විරියං, විධිනා ඵරිතබ්බං පවත්තෙතබ්බන්ති වා=විරියං' විරපුරුෂයා යි ව්‍යවහාරයට යම් භාවයෙක් කරුණු වී නම්, ඒ වීර්‍ය්‍ය යි ද, එබඳු භාවයකින් යුත් පුරුෂයාගේ කර්මය හෝ වීර්‍ය්‍ය යි ද, විධි වූ පරිදි පැවැත් විය යුත්ත හෝ වීර්‍ය්‍ය යි ද මෙයින් කියැ වේ.

දිරා ගිය ගෙයක් පිටතින් දුන් කණුවකින් හෝ කණුවලින් ලත් රැකුලින් බිමැ ඇද නො වැටී සිටින්නා සේ යෝගීපුද්ගල තෙමේ යම්කිසි ධර්මෝත්තමයකින් ලත් රැකුලින් ධ්‍යානක්ෂමාදියෙන් නො ගිලිනී සිටී ද, ඒ ධර්මෝත්තමය වීර්‍ය්‍ය, යි කියති. වීර්‍ය්‍යය, තෙමේ තමන් සමග උපදනා චිත්ත-චෛතසිකධර්මයන්ට අරමුණු ගැන්මෙහි පසු බස්නට නො දී අනුබල දෙන්නේ ය. ඒ පිණිස උනන්දු කරන්නේ ය. වීර්‍ය්‍යයෙන් ලැබූ උපස්තම්භනය ඇති කුශලධර්මයෝ නො පිරිහී සිටින්නෝ ය.

දෙලොස් අකුසල්සිත්හි, මනොද්වාරාවර්ජන-හසිතුපපාද දෙසිත්හි, සහෙතුකකාමාවචර සූවිසි සිත්හි, පසළොස් රූපාවචර සිත්හි, දෙලොස් අරූපාවචර සිත්හි හා, අටවැදෑරුම් ලෝකොත්තර සිත්හි දැයි තෙසැත්තෑ සිත්හි මේ යෙදේ. මෙ ද ප්‍රකීර්ණයෙකි.

වීර්‍ය්‍යය, ඒ ඒ කටයුතු මොනවට නිපදවීමෙහි උත්සාහකිරීම හෝ අතිශයින් උත්සාහ වැඩීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, තමන් හා එක් ව උපදින ධර්මයන්ට රැකුල් දීම ය. සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ නො පසුබටබව පච්චුපට්ඨානය යි. සංවේගඥානය පදට්ඨානය යි. **'උස්සහනලක්ඛණං වීරියං, සහජාතානං උපත්ථම්භනරසං, අසංසීදනපච්චුපට්ඨානං, සංවෙගපදට්ඨානං'** යනු පාළියි.

'ජීවන්ති සම්පයුත්තධම්මා එතෙනාති=ජීවිතං' යම් ස්වභාවශක්තියක් කරණ කොට තමා හා එක් ව යෙදුනු ධර්මයෝ ජීවත් වෙත් ද, සම්ප්‍රයුක්තධර්මයන්ගේ ඒ ජීවනයට කරුණු වන ස්වභාව

ශක්තිය ජීවිත නම් වේ. නාමජීවිත-රූපජීවිත යි මේ දෙ පරිදි ය. මෙහි ලා ගැණෙනුයේ නාමජීවිතය යි. රූපජීවිතය රූපසක්ඛ විභාගයෙහි දැක්විනි. නාම-රූපජීවිත දෙක්හි විශෙෂය නම්, නාම ජීවිතය අරූපධර්මයන්ගේ ජීවත්වීමට කරුණුවීම ත්, රූපජීවිතය කර්මජරූපයන්ගේ ජීවත්වීමට කරුණුවීමත් ය. අරූපධර්මයන්ගේ ජීවිතය නාමජීවිත, ය කර්මජරූපයන්ගේ ජීවිතය රූපජීවිත' යි දතයුතු ය.

සංසාරයෙහි පැවැත්මට ප්‍රධාන වනුයේ ජීවිතය යි. එහෙයින් ජීවිතය පවත්නා සක්ඛිසන්තතීන්හි අධිපතිබව ඇත්තේ ජීවිතය ට ම ය. නෙළුම් මහනෙල් පාලනය කරණ ජලය මෙනැ' යි කියන ලද්දේ එහෙයිනි.

ස්ථාවර ව පවත්නා ජීවිතයක් නැති වුව ද, පරම්පරාවශයෙන් ගලායන මහාගංවතුරක් සේ ක්ෂණයක් පාසා ඇති ව නැතිවෙමින් පෙළ සැදී පවත්නා මේ ජීවිතය, චිත්ත-චෛතසිකධර්මයන් පාලනය කරමින් සක්ඛිපරිනිර්මාණය දක්වා පවතී. ජීවිතයාගේ ශක්තියෙන් ම සිත හා චෛතසිකධර්මයෝ ජීවත් වෙති. සිතෙහි ජීවිතය නැත් තේ නම්, ඔවුන්ගේ එසේ ජීවත්වීමෙක් නැත. සර්වචිත්තසාධාරණ යෙකි.

ජීවිතය සමග උපන් චෛතසිකධර්ම පාලනය කිරීම ලකුණු කොට සිටියේ ය. කාත්‍යය, සමග උපන් නාමධර්මයන්ගේ පැවැත් වීම යි. සහජාතධර්මයන් තැබීම පච්චුපට්ඨානය යි. පැවැත්වියයුතු ධර්ම පදස්ථානය යි. **'සහජාතධම්මානුපාලනලක්ඛණං ජීවිතං, සහජාතධම්මපවත්තනරසං, සහජාතධම්මපච්චුපට්ඨානං, යාපයිතබ්බධම්මපදට්ඨානං'** යනු පාළියි.

'චිත්තං සමං ආධියති සම්මා වා ආධියති සමාධානමත්ත මෙව වා සමාධි' යම් ස්වභාවශක්තියක් අරමුණෙහි සිත සමව තබයි ද, ඒ මොනවට තබනු ලබා හෝ, අරමුණෙහි සිත පෙර පසු නො වී මනාකොට තැබීම නුයි හෝ සමාධි නම් වේ.

සුළඟ නැති තැන දැල් වූ පහන්සිළෙක් නො සැලී පවත්නේ යම්සේ ද, එමෙන් චිත්තයාගේ නො සැලීසිටීම සමාධිය, යි දත යුතු ය. අරමුණ එකක් වුව ද, එහි නොයෙක් ගතිවිශෙෂ ඇති විය හැකි ය. අරමුණ පිළිබඳ ඒ ගතිවිශෙෂයන්හි විසිරූ නො ගොස් එක් ම ස්වභාවයෙක්හි ක්ෂණයක් වුවත් සිතෙහි ඇතිවන නො සැලී පැවැත්ම සමාධි නම්. තමා හා සම්ප්‍රයුක්තධර්මයන්ට නානාරම්මණ යන්හි විසිරූ යෑමට මෙයින් ඉඩෙක් නො ලැබේ. කොකුම් සුණු

ආදි වූ යමක් පිඬු කිරීමට ජලය යම්සේ උපකාර වේ ද එමෙන් චිත්තචෛතසිකධර්මයන් සමාධිය කරණ කොට අරමුණෙහි නො විසිරී පවත්නාබව සැලකිය යුතු ය.

සිත හා චෛතසිකයෝ එක් අරමුණක් ම ගෙණ සිටින්නෝ මේ සමාධියේ බලයෙනි. සමාධිය ශක්තිමත් නො වේ නම් සිතටත් චෛතසිකයන්ට ත් එක් අරමුණක් ගෙණ සිටිය නො හැකි ය. සෑම චිත්තසාධාරණයෙකි.

සමාධිය, චිත්ත-චෛතසිකධර්මයන් නානාරම්මණයන්හි නො විසිරීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, සහජාතධර්මයන් රැස් කිරීම හෝ පිඬුකිරීම ය. පච්චුපට්ඨානය, සම්ප්‍රයුක්තධර්මයන් සන් සිඳවීම ය. පදට්ඨානය, සුඛවේදනා ය. **'අවිසාරලක්ඛණෝ සමාධි, අවික්ඛේපලක්ඛණෝ වා, සහජාතානං සම්පිණ්ඩනරසෝ, උප සමපච්චුපට්ඨානෝ, සුඛපදට්ඨානෝ'** යනු පාළි ඕ.

'සද්දහනති එතාය, සයං වා සද්දහති, සද්දහනමත්තං වා සද්ධා' යම් ධර්මස්වභාවයක් කරණ කොට තමා හා සම්ප්‍රයුක්ත වූ ධර්මයෝ නොහොත් ශ්‍රද්ධාවත් පුද්ගලයෝ බුදුගුණ අදහත් නුයි හෝ නොමෝ ම අදහා නුයි හෝ, ඇදහීම් මාත්‍රය නුයි හෝ සද්ධා නම් වේ. බුද්ධ-ධම්ම-සඞ්ඝ යන රත්නත්‍රය ත් කුශලාකුශලයන්ගේ ඉෂ්ටානිෂ්ට විපාකය ත් යන පස්වැදෑරුම් වූ ධර්මයෙහි විශ්වාසය තැබීම ශ්‍රද්ධා යි. පූරණකාශ්‍යපාදි අන්‍යශාස්තෘන් කෙරෙහි ඇදහීම ශ්‍රද්ධා නම් නො වේ. ඒ වනාහි මිත්‍යාධිමොක්ෂය යි. යම් කිසිවකුගේ යම් කිසි කාරණයක් සලකා ඇදහීම, ශ්‍රද්ධා යි නො ගත යුතු ය. බුද්ධාදිරත්නත්‍රය අරමුණු කොට සම්ප්‍රයුක්තධර්මයන් පහදවන ගති විශෙෂය ශ්‍රද්ධා යි කිහු. මේ හෙතු කොට සසම්ප්‍රයුක්තචිත්තයෙහි පවත්නා මොහාදික්ලිෂ්ටධර්ම පහව ගොස්, සිත පැහැදීම් සභාවයට පත් වේ. සක්විති රජක්හුගේ මාණික්‍යරත්නය කැලැනි දියෙහි බැහැ තෙණෙහි ජලයෙහි පැහැදීම සේ ය. අත නැති කල කිසිවක් ගත නො හැකි ද, ධනය නැති කල භෝගයෝ සමෘද්ධ නො වෙත් ද, බිජුවට නැතිකල සස්‍යාදීහු නො වෙත් ද, එමෙත් ශ්‍රද්ධාව නැති කල පුණ්‍යක්‍රියාවස්තූන්ගේ සමෘද්ධිමෙක් නැත. එහෙයින් ශ්‍රද්ධාව අත ත්, ධනය ත්, බිජුවට ත් වැනිය යි කියනලදී.

ශ්‍රද්ධාව, කාමාවචරකුශලවිපාකක්‍රියා සූවිසි සිත්හි, පසළොස් රූපාවචර සිත්හි, දෙළොස් අරූපාවචර සිත්හි හා අටවැදෑරුම් ලොකොත්තර සිත්හි ද යි එකුන්සැටක් සොභනසිත්හි පවතී.

ශ්‍රද්ධාතොමෝ, බුද්ධ-ධම්ම-සඞ්ඝ යන රත්නත්‍රය හා කර්මඵල යන් ඇදහීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය, චිත්තචෛතසික

ධර්මයන් පැහැදවීම යි. චිත්ත-චෛතසිකධර්මයන්ගේ නො කිලිටිබව පච්චුපට්ඨාන යි. රත්නත්‍රය හා කර්ම-කර්මඵල යන ඇදහිය යුතු වස්තු පදස්ථාන යි. **'සද්දහනලක්ඛණා සද්ධා, ඔක්ප්පනලක්ඛණා වා, සම්පසාදනරසා, අකාලුසියපච්චුපට්ඨානා, සද්ධෙය්‍ය වත්ථුපදට්ඨානා'** යනු පාළි යි.

'සරතීති = සති, සරන්ති සම්පයුත්තධම්මා එතායාති වා = සති, සරණමත්තමෙව වා = සති, සිහි කෙරේ නු යි හෝ, මේ ධර්ම ශක්තිය කරණ කොට තමා හා යෙදුනු චෛතසිකධර්මයෝ පෙර කළ යම් ක්‍රියාදියක් සිහි කෙරෙත් නු යි හෝ, සිහිකිරීම්මාත්‍රය නු යි හෝ සති නම් වේ. සිත හා සම්ප්‍රයුක්තධර්මයන් සිහි කරවන ස්වභාව ශක්තිය සති යි කීහ. ශොභනචෛතසිකයෙකි. ශ්‍රද්ධාව මෙන් මෝ එකුන් සැටක් සොභනසිත්හි යෙදේ.

සතිය, තමා හා යෙදුනු චෛතසිකධර්මයන්ට, දියමතුපිට ඉල්පී සිටින ලබුකබල් සේ ඉල්පෙන්නට නො දී ඔවුන් ගල් පුවරුවක් සේ අරමුණෙහි ස්ථිරව පිහිටුවීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය, නො මුළාබව යි. චිත්තාරක්ෂාව පච්චුපට්ඨාන යි. ස්ථිරසංඥාව පදස්ථාන යි. මෙය අරමුණෙහි සිත දැඩිව පිහිටු වන හෙයින් එලිපත නො සැලෙනු පිණිස සිටුවනලද එලිපත් කණුවක් මෙනැ යි ද, චක්ෂුර් ද්වාරාදිය රක්නා හෙයින් දොරටුපාලයකු වැනි, ය යි ද දත යුතු ය. **'අපිලාපනලක්ඛණා සති, අසම්මොහරසා, ආරක්ඛපච්චුපට්ඨානා, ඨිරසඤ්ඤාපදට්ඨානා, කායාදිසතිපට්ඨානපදට්ඨානා වා'** යනු පාළි යි.

'කායදුච්චරිතාදීහි හිරීයතීති = හිරි' කායදුච්චරිතාදියෙන් පිළිකුල් කෙරේ නු යි හිරි නම් වේ. කායදුච්චරිතාදිය කරණ කොට සිතෙහි ඇතිවන ලජ්ජාස්වභාවයට හිරි යනු නමෙකි. ඒ මේ හිරි තොමෝ ප්‍රාණඝාතාදිඅකුශලධර්මයන් අසූචියක් සේ සලකා පිළිකුල් කෙරෙයි. තමා ම ගරු කොට උපදින ආත්මගෞරවයෙක් වේ නම්, ඒ වන්නේ ද මේ හිරිබලයෙනි. මිත්‍ථ්‍යාචාරයෙන් වෙන් ව සිටි කුල කාන්තාවක සේ ය. ශොභනචෛතසිකයෙකි.

හිරි තොමෝ, පාපයෙන් වන පිළිකුල්බව ලකුණු කොට සිටියාය. කෘත්‍යය, ලජ්ජාවීම් ආකාරයෙන් පව් නො කිරීම ය. පච්චුපට්ඨානය පාපයෙහි සිත හැකිළී සිටීම ය. පදට්ඨානය, ආත්ම ගෞරවය යි. **'පාපතො ජිගුච්ඡනලක්ඛණා හිරි, ලජ්ජාකාරෙන පාපානං අකරණරසා, පාපතො සඞ්කොචනපච්චුපට්ඨානා, අත්තගාරවපදට්ඨානා'** යනු පාළියි.

'පාපතො ඔත්තපපතීති = ඔත්තප්පං' කායදුච්චරිතාදියෙන් ත්‍රස්ත වන්නා වූ සභාවය ඔත්තප්ප නම් වේ. මේ සභාවධර්මය උපදනේ කායදුශ්චරිතාදිය ආත්මඝාතකවහනියක් සේ සලකන් නත්වය. කායදුශ්චරිතාදිය නිසා සිතෙහි හටගන්නා භයගතිය ඔත්තප්පය යි සැකෙවින් දත යුතු ය. මේ, අන්හු ගරු තැනැ තබා දුශ්චරිතයෙන් වෙන් වන වෙසඟනක සේ ය. ශොභනවෛතසික යෙකි.

ඔත්තප්පය, පාපයෙන් තැති ගන්නාබව ලකුණු කොට සිටි යේය. කෘත්‍යය, තැති ගැණීම් ආකාරයෙන් පව් නො කිරීම ය. පච්චුපට්ඨානය, පාපයෙන් හැකිළී සිටීම ය. පදට්ඨානය, පරහට ගෞරවකිරීම ය. **'පාපතො උත්තාසලක්ඛණං ඔත්තප්පං, උත්තාසාකාරෙන පාපානං අකරණරසං, පාපතො සඞ්කොචනපච්චුපට්ඨානං, පරහාරවපදට්ඨානං'** යනු පාළියි.

'න ලුබ්භනති තෙන, සයං වා න ලුබ්භති, අලුබ්භනමත්තමෙව වා තනති-අලොභො' අලොභ නම් ධර්මශක්තිය හෙතුකොට සෙසු චෛතසිකධර්මයෝ රූපාදී වූ අරමුණුවල නො ඇලෙත් නු යි හෝ, තෙමේ රූපාදී වූ අරමුණුවල නො ඇලේ නු යි හෝ, රූපාදී වූ අරමුණුවල නො ඇලීම්මාත්‍රයෙක් නු යි හෝ අලොභ නම් වේ. **'ලොභ පටිපක්ඛා අලොභො'** ලොභයාගේ ප්‍රතිපක්ෂධර්මය අලොභය වන හෙයින් අලොභය හා සම්ප්‍රයුක්තධර්මයෝ ද, අලොභය හා යෙදුනු පුද්ගලයා ද අලොභහෙතුවෙන් රූපාදී වූ අරමුණෙහි නො ඇලෙත් ද තෙමේ ත් කිසිවිටෙක ත් රූපාදී වූ අරමුණෙහි නො ඇලේ ද, ඒ මේ චෛතසිකශක්තිය රූපාදී වූ අරමුණෙහි නො ඇලෙනාකාරයෙන් පවත්නා හෙයින් අලොභ නමැ යි දත යුතු ය. මෙය බලවත් කුශලයෙකි. කුශලමූලයෙක් ද වේ. ශොභන චෛතසිකයෙකි.

අලොභචෛතසිකය, රූපාදී වූ අරමුණෙහි ලා සිතෙහි අගෙධ සභාවය ලකුණු කොට සිටියේ ය. නෙළුම්පතෙහි දියබිඳු නො ඇලීම සේ ය. කෘත්‍යය, යම්කිසි වස්තුවක් මම ය මාගේ ය යි දැඩි ඡන්දයෙන් ලං කොට නො ගැණීම යි. රාගාදී වූ හැම කෙලසයන් කෙරෙන් සමුදෙජේදප්‍රහාණවශයෙන් මිදී සිටි රහත් කෙනකු මෙනි. රූපාදී වූ අරමුණෙහි නො ඇලෙනු කැමැතිබව පච්චුපට්ඨාන යි. අසුචිවලෙක හුනු පුරුෂයකුගේ ඒ අශුචියෙහි නො ඇලෙනු කැමැති බව මෙනි. ප්‍රහීණ කළ ලොභය පදට්ඨාන යි. **'අලොභො ආරම්මණෙ චිත්තස්ස අගෙධලක්ඛණො, අලග්ගභාවලක්ඛණො වා අපරිග්ගහරසො, අනාලීනභාවපච්චුපට්ඨානො, පහීනලොභ පදට්ඨානො'** යනු පාළියි.

'න දූසෙති, සයං වා න දූසෙති, අදූසනමත්තමෙව වා තනෝති = අදෝසෝ' යම් ධම්ශකතියකින් චෛතසිකධම්යෝ අර මුණුවල දූෂිත නොවෙත් ද, තෙමේ හෝ අරමුණුවල දූෂිත නොවේ ද, අරමුණුවල දූෂිත නොවීම්මාත්‍රයෙක් නු යි හෝ අදෝස නම් වේ. සිත යෙදෙන අරමුණෙහි දූෂ්‍ය නොවන ගතිය අදෝස නමැ යි කී සේ යි. මේ වනාහි තමහට අහිත වූ අරමුණුවල පැවැති වෙෂය නැති කිරීමෙන් දුටු දුටු සත්වයන් විෂය කොට සෞම්‍ය වූ චිත්ත සන්තානයන් උපදවමින් පවත්නේ ය. අදොෂය තෙමේ දුශ්ශීලකමට විරුද්ධ ය. ශීලයට හෙතු ය. ඇති ගුණය ගුණ වශයෙන් ම පිළිගණියි. බලවත් කුශලයෙකි. කුශල මූලයෙක් ද වේ. ශොභන චෛතසිකයෙකි.

අදොෂය, සැඩපරුෂ නොවීම ලකුණු කොට සිටියේ ය. විරුද්ධ නොවනබව හෝ ලක්ෂණ යි. අනුකූල මිත්‍රයකු සේ ය. කෘත්‍යය, වෛර සන්සිඳවීම යි. චිත්තචෛතසිකදුහය දුරු කිරීම හෝ කෘත්‍යය යි. ගොසිසචන්දනාලෙපයක් සේ ය. සෞම්‍යභාවය පච්චුපට්ඨාන යි. පහකළ දොෂය පදට්ඨානය යි. **'චිත්තස්ස අචණ්ඩිකකාලකඛණෝ අදෝසෝ, අවිරොධලකඛණෝ වා, ආඝාතවිනයරසෝ, පරිළාහවිනයරසෝ වා, සොම්මභාව පච්චුපට්ඨාණෝ, පහීණදෝසපදට්ඨානෝ'** යනු පාළියි.

'න මුයහති, සයං වා න මුයහති, අමුයහනමත්තමෙව වා තනෝති = අමොහෝ' යම් ධම්ශකතියක් කරණ කොට චෛතසික ධම්යෝ අරමුණුවල නොමුළා වෙත් ද, තෙමේ හෝ නොමුළා වේ ද, නොමුළාවීම් මාත්‍රයෙක් නු යි හෝ අමොහ නම් වේ. සිත යෙදෙන අරමුණුවල ඇති තතු දැන නොමුළාවන සභාවය, අමොහ නැමැ යි කීහ. මේ කරණ කොට හැම අරමුණෙක ම යථා සභාවය වැටහෙයි. බලවත් කුශලයෙකි. කුශල මූලයෙක් ද වේ. ශොභනචෛතසිකයෙකි. අමොහ නාමයෙන් ගැණෙන්නී ප්‍රඥා තොමෝ ය.

අමොහය, අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන සියලු ධම්යන්ට සාධාරණ වූ ලක්ෂණ ත්, කර්කශභාව, ඵුසනභාව යන විශෙෂ ලක්ෂණ ත් පිළිවිද දැනීම ලකුණු කොට සිටියේය. ඒ ඒ ධම්යන්ගේ තත්ත්වඥන යෙහි නොපැකිලපැවැත්ම හෝ ලක්ෂණ යි. දක්ෂ වූ ධනුශ්ශිල්පියකු විසින් හරණලද ශරවෙධයක් මෙනි. කෘත්‍යය, රූපාදී වූ සියලු අරමුණු ආලොක කිරීම යි. ප්‍රදීපයක් මෙනි. නොමුළාබව පච්චුපට්ඨාන යි. වනයෙහි හැසිරෙන යහපත් මාර්ගදෙශකයකු මෙනි. පහකළ මොහය පදට්ඨාන යි. **'අමොහෝ යථා සභාවපටිවෙධ**

ලක්ඛණො, අක්ඛලිත පටිවෙධලක්ඛණො වා, විසයොභාසන රසො, අසම්මොහපච්චුපට්ඨානො, පහිණමොහ පදට්ඨානො' යනු පාළියි.

'පස්සම්භනං=පස්සද්ධි' සන්සිඳීම පස්සද්ධි නම්. **'කායස්ස පස්සද්ධි=කායපස්සද්ධි'** එස්සවෙදනාදීවෛතසිකධර්මයන්ගේ දරථ සන්සිඳවීම කායපස්සද්ධි නම්. සක්විති රජක්හුගේ පංච කල්‍යාණ යෙන් යුත් බිසවගේ සිරුර වැළඳ ගැණීමෙන් රජුගේ විඩා සන් සිඳුමමෙන් මේ ධර්මශක්තිය කරණ කොට නාමසක්ඛ තුනෙහි කෙලෙස්විඩා සන්සිඳී යන්නේ ය. කාය යි කීයේ වෙදනාදිසක්ඛත්‍ර ය යි. යමක්හු පිළිබඳ කායපස්සද්ධිය දුර්ලභ වේ ද, ඔහු චිත්තසුඛයක් නො ලබයි. රත් වූ ගලෙක ලූ දිවි ඇති මසකු මෙන් කායපස්සද්ධි යෙන් තොර වූයේ, අරමුණෙහි නො සන්සුන් වන්නේ ය. මේ ඇතිවිට ම සිහිල්දියෙහි ලූ මසකු මෙන් ශාන්ත වන්නේ ය. මෙය උද්ධච්චාදිකෙලශයන්ට ප්‍රතිවිරුද්ධ ය.

කායපස්සද්ධිය, කායදාහය සන්සිඳවීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, කය පිළිබඳ විඩාව නැසීම ය. විඩාව හා සැලෙනබව දුරුකිරීමෙන් වන සිහිල්බව පච්චුපට්ඨාන යි. කය, පදට්ඨාන යි. **'කායදරථවූපසමලක්ඛණා කායපස්සද්ධි, කායදරථනිම්මද්දන රසා, කායස්ස අපරිඵන්දනසීතිභාවපච්චුපට්ඨානා, කාය පදට්ඨානා'** යනු පාළියි.

'චිත්තස්ස පස්සද්ධි = චිත්තපස්සද්ධි' සිතෙහි සන්සිඳීම චිත්ත පස්සද්ධි නම් වේ. විඥානසක්ඛය චිත්ත යන්නෙන් ගැණේ. ශොභනචිත්තයෝ ම මෙහි ලා ගත යුත්තාහ. චිත්තපස්සද්ධිය දුර්ලභ වූ කල්හි පින්කම් කිරීමෙහි දී සිත සැපවත් නො වේ. මෙ ද විඥාන සක්ඛය නො සන්සුන් කරණ ඖද්ධත්‍යාදිකෙලශයන් දුරුකෙරේ.

චිත්තපස්සඩිය, චිත්තදාහය සන්සිඳවීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, සිත්විඩාව නැසීම ය. විඩාව හා සැලෙනබව දුරු කිරීමෙන් වන සිහිල්බව පච්චුපට්ඨාන යි. චිත්තය, පදට්ඨාන යි. **'චිත්තදරථ වූපසමලක්ඛණා චිත්තපස්සද්ධි, චිත්තදරථ නිම්මද්දනරසා, චිත්ත ස්ස අපරිඵන්දනසිතිභාවපච්චුපට්ඨානා, චිත්තපදට්ඨානා'**

'ලහුභාවො=ලහුතා, කායස්ස ලහුතා, කාය ලහුතා, චිත්ත ස්ස ලහුතා, චිත්තලහුතා, කය–සිත දෙක්හි සැහැල්ලුබව මෙ දෙ කින් ගැණේ. මේ ධර්මශක්තිදෙක, කය – සිත දෙක්හි බරබව ඇති කරණ ජිනමිද්ධාදිකෙලශධර්මයන්ට ප්‍රතිපක්ෂ වේ.

මෙ දෙක, කය–සිත දෙක්හි බරබව සන්සිඳවීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, එ දෙකෙහි ගරුභාවය දුරු කිරීම යි. නො බර

බව පච්චුපට්ඨාන යි. කායචිත්තපදට්ඨාන යි. **'කායචිත්ත ගරුභාව වූපසමලක්ඛණා කායලහුතාචිත්තලහුතායො, කායචිත්තගරු භාවනිම්මද්දනරසා, කායචිත්තානං අදන්ධතාපච්චුපට්ඨානා, කායචිත්තපදට්ඨානා'**

'මුදුභාවො=මුදුතා, කායස්ස මුදුතා, කායමුදුතා, චිත්තස්ස මුදුතා චිත්තමුදුතා' කය-සිත දෙක්හි මොළොක්බව කායමුදුතා-චිත්තමුදුතා නම් වේ. වෙදනාදිසක්ඛිත්‍රයයාගේ මොළොක් බව කායමුදුතා නම්. විඥානසක්ඛියාගේ මොළොක් බව චිත්තමුදුතා නම්. මොවුහු කය-සිත දෙකේ තදබව ඇති කරණ ක්ලෙශධර්ම යන්ට ප්‍රතිපක්ෂ වෙති. ශොභනචෛතසිකයෝ ය.

මෙ දෙක, කය-සිත දෙක්හි තදබව සන්සිඳවීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, කය-සිත දෙක්හි තදබව දුරු කිරීම යි. කිසිත් අරමුණෙක නො ගැටීම පච්චුපට්ඨාන යි. කායචිත්තපදට්ඨාන යි. **'තා කායචිත්තඊද්ධභාවවූපසමලක්ඛණා, කායචිත්තඊද්ධභාව නිම්මද්දනරසා, අප්පටිඝාතපච්චුපට්ඨානා, කායචිත්තපදඨානා'**

'කායස්ස=කම්මඤ්ඤතා, කායකම්මඤ්ඤතා, චිත්තස්ස=කම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා, වෙදනාදිසක්ඛිත්‍රයයාගේ හා විඥානසක්ඛියාගේ ඒ ඒ කටයුත්තෙහි සුදුසුබව කායකම්මඤ්ඤතා-චිත්තකම්මඤ්ඤතා නම් වේ. කාය-චිත්තකර්මණ්‍යයන්ගෙන් තොර වූවහුට පින්කම් කිරීමෙහි ලා ඉදිරි පත් විය නො හැකි ය. කය-සිත දෙක එයට වුවමනා පරිදි පිළියෙල කර ගත නො හැක්කේ ය. උඩු සුළඟට දැමූ දැහැවියාමිටක් මෙනි. කායචිත්තකර්මණ්‍යයෝ, කාය චිත්තයන්ගේ සත්ක්‍රියාවිෂයයෙහි අනුකූල නො වනබව ඇති කරණ නීවරණාදික්ලෙශධර්මයන්ට ප්‍රතිවිරුද්ධ ව නැගී සිටිති. කෙලෙස් දුරු කොට පැහැදිය යුතු තැනැ පැහැදීම ඇති කරන්නාහ. ගින් නෙහි ලා පිරිසිදු කරගත් ස්වර්ණය, කටකනූපුරාදිආභරණ සෑදීමෙහි සුදුසු වන්නාක් මෙනි. මේ ධර්මශක්තිය කරණ කොට නාමසක්ඛි, අරමුණුගැණීමට සුදුසු වේ. ශොභනචෛතසිකයෝ ය.

මෙ දෙක, කාය චිත්තදෙදෙනාගේ අකර්මණ්‍යභාවය සන්සිඳ වීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, කාය-චිත්තදෙදෙනාගේ අකර්මණ්‍යභාවය දුරු කිරීම යි. කාය-චිත්තදෙදෙනාගේ කර්මණ්‍ය භාවයෙන් ම සම්පූර්ණ වූ සුදුසු ආකාරයෙන් අරමුණුගැණීම පච්චු පට්ඨාන යි. කායචිත්තපදට්ඨාන යි. **'තා කායචිත්තාකම්මඤ්ඤ භාවවූපසමලක්ඛණා, කායචිත්තාකම්මඤ්ඤභාව නිම්මද්දන රසා, කායචිත්තානං ආරම්මණකරණසම්පත්තිපච්චුපට්ඨානා, කායචිත්තපදට්ඨානා'**

'කායස්ස=පාගුඤ්ඤතා, කායපාගුඤ්ඤතා, චිත්තස්ස=පාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා, වෙදනාදිසකඛන්ධත්‍රයයාගේ හා විඤ්ඤාණ සකඛන්ධයාගේ අරමුණු ගැණීමෙහී පුහුණුබව මේ දෙකින් කියැ වේ. ගැඹුරුදියෙහි ලූ වඳුරකු සේ මේ ධර්මශාන්ති දෙකෙහි දුර්විලබව හෙතු කොට පුණ්‍යකර්මවිෂයයෙහි සිත කය දෙක දැඩි ව කම්පිත වෙයි. බලවත් වූ මෙ දෙක පින්කම් කිරීමෙහි අකම්පිත වේ. ගැඹුරු දියෙහි ලූ කිඹුලකු සේ ය. කාය-චිත්ත දෙක්හි ගිලන්බව ඇති කරණ අශ්‍රද්ධාදීන්ට ප්‍රතිපක්ෂ ව නැඟී එයි. ශොභනචෛතසික යි.

කායපාගුඤ්ඤතා-චිත්තපාගුඤ්ඤතා දෙක, කාය-චිත්ත දෙක්හි නො ගිලන්බව ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, කාය-චිත්ත දෙක්හි ගිලන්බව දුරු කිරීම යි. නිරාදීනභාවය පච්චුපට්ඨානය වේ. කාය-චිත්ත දෙක පදට්ඨාන යි. **'තා කායචිත්තානං අගෙලඤ්ඤභාවලක්ඛණා, කායචිත්තගෙලඤ්ඤනිම්මද්දනරසා, නිරාදීනව පච්චුපට්ඨානා, කායචිත්තපදට්ඨානා'**

'කායස්ස=උජුකභාවෝ, කායුජ්ජුකතා, චිත්තස්ස=උජුකභාවෝ, චිත්තුජ්ජුකතා' කාය-චිත්ත දෙක්හි ඇද නැතිබව කායුජ්ජුකතා-චිත්තුජ්ජුකතා නම්. මේ දෙකින් තොර වූයේ පින්කම් කිරීමෙහි විෂම වූ සවභාව ඇත්තේ වේ. ඔහු කිසි කලෙක පහත් වූවෙක් වෙයි. කිසිකලෙක උඩඟු වූවෙක් වෙයි. බේබද්දකු සේ ය. මෙ දෙක, කය සිත දෙක්හි කුටිලබව කරණ මායාසාඨෙය්‍යාදීන්ට විරුද්ධ ව නැඟී එයි. ශොභනචෛතසික යි.

කායුජ්ජුකතා-චිත්තුජ්ජුකතා දෙක, චිත්ත-චෛතසිකයන්හි නො ඇදබව ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, කය සිත දෙක්හි ඇදබව දුරු කිරීම යි. නො ඇදබව පච්චුපට්ඨාන යි. කාය-චිත්ත පදට්ඨාන යි. **'තා කායචිත්තඅජ්ජවලක්ඛණා, කායචිත්තකුටිලභාවනිම්මද්දනරසා, අජිම්හතාපච්චුපට්ඨානා, කායචිත්තපදට්ඨානා'**

'ඡන්දනං=ඡන්දෝ' අරමුණු ගැණීමෙහි කැමැතිබව ඡන්ද නම්. ඒ වනාහි අරමුණුගැණීමෙහි කැමැතිබවට කියන නමෙකි. කත්තුකම්‍යතාඡන්දය-තෘෂ්ණාඡන්දය යි. ඒ දෙ පරිදි ය. මෙහි ලා ගැණෙනුයේ කත්තුකම්‍යතාඡන්දය යි. ඒ නම්, කරණු කැමැති බව යි. අරමුණක් ලැබුනු විට එහි ඇලීම් වශයෙන් ගැලී පවත්නේ තෘෂ්ණාඡන්දය යි. කුශලපක්ෂයෙහි වූයේ කත්තුකම්‍යතාඡන්දය යි. අකුශලපක්ෂයෙහි වූයේ තෘෂ්ණාඡන්දය යි. කත්තුකම්‍යතාඡන්දය මහනෙල් මලෙහි ඇති ජලය මෙනැ යි ද, තෘෂ්ණාඡන්දය කොහොල්ලැවල ඇලෙන මැස්සා මෙනැ යි ද කීහ.

මේ වනාහි, තෘෂ්ණාඡන්දය සේ ඇලුම් ගැලුම් බැඳුම් පිණිස අරමුණු කැමැති වන්නේ නො වේ. ඒ ඒ අර්ථයන් සිදු කරණු පිණිස ම අරමුණුගැණීමෙහි කැමැත්තේ වේ. රාජසෙවක වූ ධනුර්ධරයෝ ධනය ත් යසස ත් ප්‍රයොජන කොට ඇත්තාහු, රජුගේ ප්‍රතිපාක්ෂිකයනට විදීම් වශයෙන් හැරිය යුතු වූ ඊතල කැමැති වෙත් ද, එමෙන් මේ ඡන්දය ත් තෙමේ ද අනුන්ට දිය යුතු වූ දානවස්තුව ත් තමන් නො ලැබූ දානවස්තුව ත් ලබන්නට කැමැති වන්නේ ය. මේ, කත්තුකම්‍යතාඡන්දය, තෘෂ්ණාවට වඩා බලවත්තර හෙයින් ඡන්දාධිපති වෙයි. ඡන්දිඩ්පාද ත් වෙයි.

මොමූහ සිත් දෙක හැර, අකුසල්සිත් තුදුසෙහි, සහෙතුක කාමාවචර සූවිසි සිත්හි හා රූපාවචර-අරූපාවචර-ලොකොත්තර පන්තිස් මහග්ගත සිත්හි ද යන එකුන් සැත්තෑවක් සිත්හි යෙදේ.

ඡන්දය, අරමුණු කරණු කැමැති බව ලකුණු කොට සිටියේ ය. කාත්‍යය, අරමුණු සෙවීම යි. අරමුණු කැමැතිබව පච්චුපට්ඨාන යි. කැමැති වන ලද අරමුණ ම පදට්ඨාන යි. **'කත්තුකාමතාලක්ඛණො ඡන්දො, ආරම්මණපරියෙසනරසො, ආරම්මණෙන අත්ථිකතා පච්චුපට්ඨානො, තදෙවස්ස පදට්ඨානො'**

'අධිමුච්චනං = අධිමොක්ඛො' අරමුණ සනිටුහන් කිරීම අධිමොක්ඛ නම්. නුවරදොර එලිපත සවිකරණු පිණිස පිහිටුවනලද එලිපත් කණුවක් සේ අරමුණෙක සසම්ප්‍රයුක්තවිත්තය තහවුරු ව පිහිටුවීම ස්වභාවය කොට ඇති චෛතසිකයෙකි, මේ. අරමුණෙහි සැකය දුරුවීමෙන් මේ, මේ මැ යි නිශ්චයට බැස ගන්නේ මේ ධර්මයාගේ බලයෙනි. අරමුණෙහි සිත සැලීම මෙයින් දුරු වේ.

විචිකිච්ඡාසම්ප්‍රයුක්ත සිත හැර, එකොළොස් අකුසල් සිත්හි දවිපඤ්චවිඤ්ඤාණය හැර, අහෙතුක සිත් අටෙහි, සහෙතුක කාමාවචර සූවිසි සිත්හි, පසළොස් රූපාවචර සිත්හි හා දොළොස් අරූපාවචර සිත්හි ද යන අටසත්තෑ සිත්හි යෙදේ.

අධිමොක්ෂය, අරමුණ සනිටුහන් කිරීම ලකුණු කොට සිටියේ ය. කාත්‍යය, නො සැලීම යි. ආරම්මණනිශ්චය පච්චුපට්ඨාන යි. නිශ්චය කළයුතු අරමුණ පදට්ඨාන යි. **'සන්තිට්ඨානලක්ඛණො අධිමොක්ඛො, අසංසප්පනරසො, නිච්ඡයපච්චුපට්ඨානො, සන්තිට්ඨෙය්‍යධම්මපදට්ඨානො'**

'කරණං=කාරො, මනමහි කාරො=මනසිකාරො' අරමුණ සිතෙහි කිරීම මනසිකාර නම්. සිත අරමුණට හැරවීම යි. **'පුරිම මනතො විසදිසං මනං කරොතීතිපි = මනසිකාරො'** පූර්

භවාඞ්ගයෙන් චිත්තවීථිජවනචිත්තයන් කෙරේ නුයි ද මනසිකාර නම් වේ. මේ මනසිකාරය, වීථිපටිපාදක-ජවනපටිපාදක-ආරම්මණ පටිපාදක, යි තෙ වැදූරුම් ය. එහි වීථිපටිපාදකමනසිකාරය යි කීයේ, පංචද්වාරාවජ්ජනචිත්තය යි. පංචද්වාරිකචිත්තපරම්පරාව අර මුණෙහි යොදන්නා ඔහු බැවිනි. මනොද්වාරාවජ්ජනචිත්තය, ජවන පටිපාදකමනසිකාරය යි කීහ. මනොද්වාරිකචිත්තපරම්පරාව අර මුණෙහි යොදන්නා ඔහු බැවිනි. මේ දෙක කුශලාකුශලවීථිසම්පා දකකාලයෙහි ද, කුශලාකුශලජවනසම්පාදකකාලයෙහි ද යොනි සො මනසිකාර-අයොනිසොමනසිකාර නමින් කියැ වේ. සම්ප්‍ර යුක්තධර්මයන් අරමුණෙහි යොදවන්නේ, ආරම්මණපටිපාදකමනසි කාරය යි. මේ ම මෙහිලා ගැණේ. හැම සිතක් පාසා චිත්තචෙත සිකයන් ඉදිරිපත් වූ අරමුණෙහි යොමු කරවන්නේ මේ මනසිකාර ය යි. සර්වචිත්තසාධාරණයෙකි.

මනසිකාරය, සිතට අරමුණු එළවාලීම ලකුණු කොට සිටි යේ ය. කෘත්‍යය, චිත්ත-චෛතසිකයන් අරමුණෙහි යෙදවීම යි. අරමුණට අභිමුඛවීම පච්චුපට්ඨාන යි. පදට්ඨානය, අරමුණ යි. **'චෙතසො ආරම්මණෙ සමනන්තාහාරලක්ඛණො මනසිකාරො, ආරම්මණෙ සංයොජනරසො, ආරම්මණාභිමුඛභාවපච්චුපට්ඨා නො, ආරම්මණපදට්ඨානො'**

'මජ්ඣෙ සිතො අන්තා සභාවො යස්සාති = මජ්ඣන්තො' සිතේ පසු බැස්මැ යි කියන පිනයට ත්, නො සන්සුන්බවැ යි කියන උද්ධච්චයට ත් මැද සිටි පුද්ගල තෙමේ මජ්ඣත්ත නම්. ඔහුගේ සභාවය හෙවත් මජ්ඣත්ත යි කීමට කරුණු වූ ගතිවිශෙෂය මජ්ඣත්තතා නම්. **'මජ්ඣත්තස්ස=භාවො මජ්ඣත්තතා'** යනු වාක්‍ය යි. **'තෙසු ධම්මෙසු මජ්ඣත්තතා = තත්‍රමජ්ඣත්තතා'** ඒ ඒ චිත්ත-චෛතසිකසම්ප්‍රයුක්තධර්මයන් කෙරෙහි මැදහත් ව බලන් නහුගේ සභාවය තත්‍රමජ්ඣත්තතා නම් වේ. ආජානීයඅශ්වයන් දෙදෙනකු යෙදූ රථයෙහි රියැදුරු ඒ අසුන් සමව යන කල මැදහත් වන්නේ යම්සේ ද, එ මෙන් මේ සභාවධර්මය තෙමේ අරමුණු පිළි බඳ වූ චිත්ත-චෛතසිකයන් ගැණ මැදහත් වන්නේ ය. උපෙක්ඛා යනු මෙයට ම නමෙකි. ශොභනචෛතසිකයෙකි.

තත්‍රමජ්ඣත්තතා තොමෝ, චිත්ත-චෛතසිකධර්මයන් තමතමන් අයත් ක්‍රියාවන්හි සමව පැවැත්වීම ලකුණු කොට සිටියා ය. ප්‍රජා පාලක තෙමේ නිශ්ශබ්ද ව සිටියේ ද, අණසාධනයෙහි තතපර වූ රාජපුරුෂයන් තම තමන් අයත් රාජ්‍ය පිළිබඳ කටයුතුවල යුහුව යෙදී සිටින්නාවුන් මෙන්, තත්‍රමජ්ඣත්තතාව ද උදාසීනභාවයෙන් පවත්නී නමුදු, සම්ප්‍රයුක්තධර්මයන් තම තමන් අයත් කටයුතුවල

පවත්ව යි. කෘත්‍යය, පක්ෂපාතබව සිඳ හැරීම යි. මැදහත්බව, පච්චුපට්ඨාන යි. පදට්ඨානය, යොනිසොමනසිකාරය යි. **'චිත්ත චෙතසිකානං සමවාහිතලක්ඛණා තත්‍රමජ්ඣත්තතා, පක්ඛ පාතුච්ඡෙදනරසා, මජ්ඣත්තතාභාවපච්චුපට්ඨානා, යොනිසො මනසිකාරපදට්ඨානා'**

'පරදුක්ඛෙ සති සාධූනං හදයකම්පනං කරොතීති = කරුණා, කිණාති වා පරදුක්ඛං හිංසති වා විනාසෙතීති = කරුණා, කිරියති වා දුක්ඛිතෙසු එරණවසෙන පසාරියතීති = කරුණා' අනුන් විඳින දුක් දුටු කල සත්පුරුෂයන්ගේ ලයෙහි වන කම්පනය හෙවත් සැලීම කරුණා නම්. දුක් විඳින්නකු දුටු කල සිතේ හටගන්නා අනුකම්පාගතිය කරුණා යි කී සේ ය. නැත මෙරමා දුක පහකෙරේ නු යි ද කරුණා නම්. තවත් ලෙසකින් කියතොත් දුඃඛිතයන් කෙරෙහි දුක් දුරුකිරීම් ආකාරයෙන් පැතිරීම් වශයෙන් පවත්නා චිත්ත ගතිය කරුණා නැමැ යි කිය යුතු ය. ශොභනචෛතසිකයෙකි.

කරුණා ව මෙරමා දුක් පහකිරීම් ආකාරයෙන් පැවැත්ම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය, අනුන්ගේ දුක නො ඉවසීම යි. පච්චුපට්ඨානය, අවිහිංසාව යි. පදට්ඨානය, දුකින් මැඩුනවුන්ගේ අනාථ භාවය දැකීම යි. **'පරදුක්ඛාපනයනාකාරප්පවත්තිලක්ඛණා කරුණා, පරදුක්ඛාසහනරසා, අවිහිංසා පච්චුපට්ඨානා, දුක්ඛාභි භූතානං අනාථභාවදස්සනපදට්ඨානා'**

'මොදන්ති තාය තං සමඞ්ගිනො, සයං වා මොදති, මොදන මත්තමෙවවාති = මුදිතා' සත්වයන්ගේ හා සම්ප්‍රයුක්තධර්මයන්ගේ සන්තොෂයට කරුණු වන ධර්මශක්තිය මුදිතා නම්. ඒ කරණ කොට සත්වයෝ හෝ සම්ප්‍රයුක්තධර්මයෝ සතුටු වෙත් නු යි කීවෝ එහෙයිනි. සත්වයන්ගේ හෝ සම්ප්‍රයුක්තධර්මයන්ගේ මොදනය මින් කිය වේ. තොමෝ සතුටු වේ නු යි සතුටුවීම් මාත්‍රය ම නු යි හෝ මුදිතා නැමැයි ද කීහ

මුදිතාවගේ ලක්ෂණය, සත්වයන් කෙරෙහි සතුටුවීම යි. කෘත්‍යය, ඊර්ෂ්‍යා නො කිරීම යි. පච්චුපට්ඨානය, ගෙහසිතප්‍රීතිය විනාශ කිරීම යි. පදට්ඨානය, සත්වයන්ගේ සම්පත් දැකීම යි. **'පමොදලක්ඛණා මුදිතා, අනිස්සායනරසා, අරතිවිඝාතපච්චුපට්ඨානා සත්තානං සම්පත්තිදස්සනපදට්ඨානා'**

කරුණා – මුදිතා දෙක ප්‍රමාණයක් කළ නො හැකි සත්වයන් අරමුණු කොට පවත්නා බැවින් **අප්පමඤ්ඤා** යි කියනු ලැබේ. තව ද පඨම – දුතිය – තතිය – චතුත්ථජ්ඣානකාමාවචරක්‍රියා සිත්

දෙලොස ය, කාමාවචර කුසල් සිත් අට ය, සහෙතුක කාමාවචර ක්‍රියා සිත් අට ය, යන අටවිසි සිත්හි මේ යෙදේ. එහෙත් කරුණාව ඇතිවිට මුදිතාව ත්, මුදිතාව ඇතිවිට කරුණාව ත් එකවිට නො යෙදේ. අනියතයොහි බැවිනි.

කරුණා – මුදිතා දෙක්හි විස්තරය සුදුසු තැන මතු එන්නේ ය. එහෙත් මෙහිලා කියයුතු විශෙෂයෙක් තිබේ. එ නම් මෙ දෙක බ්‍රහ්මවිහාර යන නාමයෙන් ගැණෙන බව ත්, එවිට රූපාවචර අර්ජිණාබවට පැමිණි මහද්‍රහතධර්මය යි සලකන බව ත්, මෙහි කාමාවචර ධර්ම දෙකක් වශයෙන් ආ බව ත්, බ්‍රහ්මවිහාරකරුණා – මුදිතාවන්, රූපාවචරබවත් ය.

'කායදුච්චරිතතො විරති = කායදුච්චරිතවිරති' ප්‍රාණඝාතය අදත්තාදානය – කාමමිත්‍ථ්‍යාචාරය යන කායික දුරාචාරයන් ගෙන් වැළක්ම හෝ, වැළක්මට කාරණය හෝ, වැළකීම්මාත්‍රය හෝ කාය දුච්චරිතවිරති නම්. ප්‍රාණඝාතාදිකායිකදුරාචාරයන් යට කියන ලදී.

කායදුච්චරිතවිරතියගේ ලක්ෂණය, කායදුශ්චරිතවස්තූන්ගේ නො ඉක්මවීම යි. කෘත්‍යය, කායදුශ්චරිතවස්තූන් කෙරෙන් සිතේ හැකිළීම යි. පච්චුපට්ඨානය, කායදුශ්චරිත නො කිරීම යි. පදට්ඨා නය, සද්ධා – හිරි – ඔත්තප්ප – අප්පිච්ඡතා යනාදි ගුණ සමූහය යි. **'කායදුච්චරිතවත්ථූනං අවිතික්කමලක්ඛණා කායදුච්චරිත විරති, කායදුච්චරිතවත්ථූතො සංකොචනරසා, තස්ස අකිරිය පච්චුපට්ඨානා, සද්ධාහිරිඔත්තප්ප අප්පිච්ඡතාදිගුණපදට්ඨානා'**

'වචීදුච්චරිතතො විරති=වචීදුච්චරිතවිරති' මුසාවාද-පිසුණ වචන-ඵරුසවචන-සම්ඵප්පලාප යන වාචසිකනිත්දිතාචාරයන් ගෙන් වැළකීම වචීදුච්චරිතවිරති නම්. විස්තරය යටකියන ලද්දේය.

මෙහි ලක්ෂණය, වචීදුශ්චරිතවස්තූන්ගේ නො ඉක්මවීම යි. කෘත්‍යය, වචීදුශ්චරිතවස්තූන්ගෙන් සිතේ හැකිළීම යි. පච්චුපඨා-නය, වචීදුශ්චරිත නො කිරීම යි. පදට්ඨානය, සඬා ගුණ යි. **'වචී දුච්චරිතවත්ථූනං අවිතික්කමලක්ඛණා වචීදුච්චරිතවිරති, වචී දුච්චරිතවත්ථූතො සංකොචනරසා, තස්ස අකිරියපච්චුපඨානා, සඬා හිරි ඔත්තප්ප අප්පිච්ඡතාදිගුණපදට්ඨානා'**

'මිච්ඡාජීවතො විරති = මිච්ඡාජීවවිරති' මිත්‍ථ්‍යාආජීවය යි කියූ සතුන් මැරීම් ආදිය, සත්වවෙළඳම් ආදිය, කුහනා ලපනා ආදිය යන මෙයින් කෙරෙණ ජීවත්වීමෙන් වැළක්ම මිච්ඡාජීව විරති නම්.

ත්‍රිවිධකායදුශ්චරිත-චතුර්විධවාග්දුශ්චරිතවස්තූන් නො ඉක්ම වීම, මෙහි ලක්ෂණය වේ. එයින් සිත හැකිළීම, කෘත්‍යය වේ. ඒ දුශ්චරිතයන්ගේ නො කිරීම, පච්චුපඨානය වේ. සඩාදිගුණ, පදඨානය වේ. **'තිවිධකායදුච්චරිතචතුබ්බිධවචීදුච්චරිතවත්ථූනං අවිතික්කමලක්ඛණා මිච්ඡාජීවවිරති, තතො එව සංකොචනරසා, තෙසං දුච්චරිතානං අකිරියපච්චුපට්ඨානා, සද්ධාහිරිඔත්තප්ප අප්පිච්ඡතාදිගුණ පදට්ඨානා'**

එස්සය පටන්, මිච්ඡාජීවවිරතිය තෙක් කියූ මේ සතිස් වැදැරුම් වූ සංස්කාරයෝ ප්‍රථමකාමාවචරකුශලවිඥානයෙහි යෙදෙත් යි යට කියන ලදී. ප්‍රථමකාමාවචරකුශලවිඥානයෙහි යම් සේ මොවුහු යෙදෙත් ද, දෙවන කාමාවචරකුශලවිඥානයෙහි ද එසේ යෙදෙති. සසඞ්ඛාරභාවමාත්‍රය, මේ දෙවන කුශලවිඥානයෙහි ලා ලැබෙන වෙනස යි. අමොහය හැර, අනික් පන්තිස් සංස්කාරයෝ තුන්වන කාමාවචරකුශලවිඥානය සමග යෙදෙති. සතර වැන්නෙහි ද මෙකී පන්තිස ම යෙදේ. මෙහි වෙනස සසඞ්ඛාරික භාවය යි. ප්‍රීතිය හැර, අනික් පන්තිස, පස්වැන්නෙහි යෙදේ. කරුණා-මුදිතා දෙදෙනා අපීණාභාවයට පැමිණීමට පූර්වභාගයෙහි ම උපෙක්ෂාසහගත චිත්තයෙහි යෙදෙති යි කීහ. යම් සංස්කාර කෙනෙක් පස් වැන්නෙහි යෙදෙත් ද, ඔවුහු ම සවැන්නෙහි ද යෙදෙත්. සසඞ්ඛාරභාවමාත්‍රය වෙනසි. සත් වැන්නෙහි යෙදෙන්නෝ, අමොහය හැර, සවැනි සිතෙහි යෙදුනෝ ම ය. අටවැන්නෙහි ඔවුහු ම යෙදෙත්. වෙනස සසඞ්ඛාරිකභාවමාත්‍රය යි.

පළමුවන කාමාවචරමහාකුසලචිත්තයෙහි කියනලද සතිස් සංස්කාරයන් අතුරෙහි විරති තුන හැර, අනික් තෙ තිස් සංස්කාරයෝ පළමුවන රූපාවචරකුශලවිඥානයෙහි යෙදෙත්. දෙවන සිතෙහි විතර්කය හැර, අන්‍යයෝ යෙදෙති. තෙවන සිතෙහි විචාරය ත් හැර, අනික් තිස යෙදේ. පස් වැන්නෙහි කරුණා-මුදිතා දෙක ත් හැර, අටවිසි සංස්කාර කෙනෙක් යෙදෙති.

පස්වන රූපාවචරකුශලවිඥානය හා යෙදුනු අටවිසි සංස්කාරයෝ ම අරූපාවචරකුශලවිඥාන සතරෙහි ද යෙදෙති.

පළමුවන රූපාවචරකුශලවිඥානයෙහි කියනලද සංස්කාරයෝ ලොකොත්තරකුශලවිඥානයන් අතුරෙහි පළමු කොට ප්‍රථමඛ්‍යානික මාර්ගවිඥානයෙහි යෙදෙත්. විතීයඛ්‍යානිකාදිභෙද ඇති මාර්ග විඥානාදියෙහි ද්විතීයාදිරූපාවචරවිඥානයන්හි කියනලද ක්‍රමයෙන් ස ස්කාරයන්ගේ යෙදීම දතයුතු ය. එහි එන විශෙෂය කරුණා-මුදිතාවන්ගේ අභාවය ත් නියතවිරතීන්ගේ අභාවය ත් ලොකොත්තර භාවය ත් යන මේ ය.

මෙතෙකින් මෙහි සැකෙවින් කියූ කුශලසංඝකාරයන්ගේ ලක්ෂණාදිසවභාවය ත් ඒ ඒ කුශලවිඥනයන් හා යෙදීම ත් හොඳින් උගත යුතු ය.

අකුශලවිඥනයන් අතුරෙහි වනාහි ලොභමූලිකප්‍රථම අකුශල විඥනයෙහි සංඝකාර සතලොසෙක් යෙදේ. එසස-චෙතනා-චිත්තක -විචාර-පිති-විරිය- ජීවිත- සමාධි- අහිරික-අනොත්තප්ප- ලොභ - මොහ-මිච්ඡාදිට්ඨි යි සවරූපයෙන් ආ නියතසංඝකාර තෙළස ද, ඡන්ද-අධිමොක්ඛ-උද්ධච්ච-මනසිකාර යි යෙවාපනක, වශයෙන් ආ සතර දැ යි යන මොවුහුය එහි යෙදුනාහු.

'න හිරියති කායදුච්චරිතාදීහි, න ලජ්ජති, න ජිගුච්ඡතීති= අහිරිකං' යම් සවභාවගතියක් තොමෝ කායදුශ්චරිතාදියෙන් ලජ්ජිත නො වේ ද, කායදුශ්චරිතාදිය පිළිකුල් නො කෙරේ ද, ඒ ගතිය අහිරික නම්. එසේ වූ පුද්ගලයා හෝ ධර්මසමූහය මෙයින් ගැණේ. **'අහිරිකස්ස=භාවෝ, අහිරිකං'** ඒ පුද්ගලයාගේ හෝ ධර්ම සමූහයාගේ සවභාවය අහිරික නැමැ යි කියනලදී. කොටින් කිය යුත්තේ, පව්කම් කිරීමෙහි ලජ්ජා නැති බව අහිරිකය කියා ය. අශුචියෙහි පිළිකුල්බැව් නැති ගම්භූරකුට මෙන් මෙයට පව්කම් කිරීමෙහි ලා පිළිකුල්බවෙක් නො උපදියි.

අහිරිකය, කායදුශ්චරිතාදියෙන් පිළිකුල් නො වීම හෝ ලජ්ජිත නො වීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, ලජ්ජිත නො වන සැටියෙන් අකුසල් කිරීම යි. පව් කිරීමෙන් නො හැකිළීම, පච්චුපඨාන යි. පදඨානය, ආත්මගෞරවය නැති බව යි. **'කායදුච්චරිතාදීහි අජිගුච්ඡනලක්ඛණං අහිරිකං, අලජ්ජාලක්ඛණං වා, අලජ්ජා කාරෙන පාපානං කරණරසං, පාපතෝ අසංකොචන පච්චුපඨානං, අත්තගාරවපදඨානං'**

'න ඔත්තප්පතීති=අනොත්තප්පං' පාපයෙන් තැතිගත්තේ නො වේ නු යි අනොත්තප්ප නම්. පාපයට භය නො වන ගතිය අනොත්තප්ප නැමැයි කීහ. සැකෙවින් කියයුත්තේ පව්කිරීමෙහිලා ඇතිවන නිර්භීයභාවය, අනොත්තප්පය කියා ය. ගින්නට බිය නො වන පලඟැටියකු සේ ය.

අනොත්තප්පය, කායදුශ්චරිතාදියෙන් බිය නො වීම ලකුණු කොට සිටියේ ය. නොහොත් පාපධර්මයන් හෙතුකොට නො තැති ගන්නා බව ලකුණු කොට ඇත්තෙකි. කෘත්‍යය, බිය නැති ලෙසින් පව්කිරීම යි. පවෙන් තැති නො ගැන්ම, පච්චුපට්ඨාන යි. අනුන් කෙරෙහි අගෞරවය, පදට්ඨාන යි. **'කායදුච්චරිතාදීහි අසාරජ්ජ**

ලක්ඛණං අනොත්තප්පං, අනුත්තාසලක්ඛණං වා, නිබ්භයාකාරෙන පාපානං කරණරසං, පාපතො අනුත්තාසපච්චුපට්ඨානං, පරඅගාරවපදට්ඨානං'

අහිරික-අනොත්තප්පයෝ, හිරි-ඔත්තප්පයන්ට ප්‍රතිපක්ෂ වෙති.

'ලුබ්භත්ති තෙන, සයං වා ලුබ්භති, ලුබ්භනමත්තමෙවවාති = ලොභො' ඒ කරණ කොට තමා හා යෙදී සිටි ධර්මයෝ අරමුණෙහි ගිජු වශයෙන් ඇලෙද්ද, තෙමේ හෝ ඇලෙන්නේ වේ ද, අරමුණෙහි ඇලීම් මාත්‍රයෙක් හෝ වේ ද, ඒ ලොහ නම්. විස්තර යට කියනලදී.

ලොභය තෙමේ මම ය, මාගේ ය යි අරමුණු අල්වා ගැණීම ලකුණු කොට සිටියේ ය. වඳුරු ලහටුව සේ ය. කෘත්‍යය, රත් කළ කබලෙක්හි දමනලද මස්වැදැල්ල, එහි ඇලී යන්නා සේ අරමුණුවල දැඩිව ඇලීම යි. පච්චුපට්ඨානය, අරමුණු අත් නො හැර පැවැත්මයි. තෙල්සහිත සායම සේ ය. සංයොජනයන්ට අරමුණු වන්නා වූ කාම සම්පත්තියෙහි ආස්වාදයක් ඇතැ යි දැකීම, පදට්ඨාන යි. **'ආරම්මණ ගහනලක්ඛණො ලොභො, අභිස්සඞ්ගරසො, අපරිච්චාගපච්චුපට්ඨානො, සංයොජනීයෙසු ධම්මෙසු අස්සාදදස්සනපදට්ඨානො'**

'මුයහත්ති තෙන, සයං වා මුයහති, මුයහනමත්ත මෙවවාති = මොහො' ඒ කරණ කොට අරමුණෙහි මුළා වෙත් නු යි හෝ, තෙමේ මුළා වේ නු යි හෝ, මුළාවීම් මාත්‍රයෙක් නු යි හෝ මොහ නම්.

මෙය, ධර්මවශයෙන් සොතාපත්තිමාර්ගචිත්තයට පූර්වභාගයෙහි ගොත්‍රභූචිත්තය දක්වා ද, පුද්ගලවශයෙන් අනාගාමීපුද්ගලයා දක්වා ද, භූමිවශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා ද පැතිර පවතී. සියලු දුකට මූලකාරණ වන්නේ ද, දුඃඛසත්‍යාදි සකලධර්ම යන් වසා ලන්නේ ද මොහය යි.

මොහය, ධර්මස්වභාවයන් තත් වූ පරිදි දක්නා ප්‍රඥාචක්ෂුස්හි අන්ධභාවය කිරීම, ලකුණු කොට සිටියේ ය. නොහොත් ප්‍රඥාවට ප්‍රතිපක්ෂභාවය, ලකුණු කොට ඇත්තේ ය. කෘත්‍යය, පිළිවිද දැනීමෙහි අපොහොසත්බව යි. නැත, ආරම්මණස්වභාවය වසා දැමීම යි. දුෂ්ප්‍රතිපත්තියට අභිමුඛවීම හෝ ප්‍රඥාචක්ෂුසෙහි අන්ධභාවයකිරීම, පච්චුපට්ඨාන යි. අයොනිසොමනසිකාරය, පදට්ඨාන යි. **'චිත්තස්ස අන්ධභාවලක්ඛණො මොහො, අඤ්ඤාණලක්ඛණො වා, අසම්පටිවෙධරසො, අසම්මාපටිපත්ති පච්චුපට්ඨානො, අන්ධකාරපච්චුපට්ඨානො වා, අයොනිසො මනසිකාරපදට්ඨානො'**

'මිච්ඡා පස්සති තාය, සයං වා මිච්ඡා පස්සති, මිච්ඡා දස්සනමත්තමෙවවාති = මිච්ඡාදිට්ඨි' තමන් හා, යෙදී සිටියා වූ ධර්මයෝ ඒ

කරණ කොට නියම තත්ත්වය වූ අනිත්‍යාදිධර්මතත්ත්වයන් නිත්‍යාදි ස්වභාවයෙන් දකී ද, තෙමේ වරදවා දකිත් ද, නිත්‍යාදිආකාරයෙන් වරදවා දැකීම් මාත්‍රයෙක් වේ ද, ඒ මිත්‍ථ්‍යාදෘෂ්ටි නම්. විස්තර යට කියන ලදී.

මෝ තොමෝ, නුනුවනින් අරමුණු දැඩි කොට ගැණීම, ලකුණු කොට සිටියා ය. කෘත්‍යය, ධර්මස්වභාවය ඇති තතු ඉක්මවා විපරීත වූ අවිද්‍යමාන වූ නිත්‍යාදිස්වභාවය දැඩි කොට අල්වා ගැණීම යි. විපරීත වශයෙන් 'මේ ම සත්‍ය ය, අනික අසත්‍ය ය' යි මෙනෙහි කිරීම, පච්චුපඨාන යි. බුඩාදිආර්‍ය්‍යයන් නො දක්නා කැමැතිබව, පදඨාන යි. **'අයොනිසො අභිනිවෙසලක්ඛණා මිච්ඡාදිඨි, පරාමාසරසා, මිච්ඡාභිනිවෙසපච්චුපට්ඨානා, අරියානං අදස්සනකාමතාදි පදට්ඨානා.'**

'උද්ධරතීති=උද්ධටං' යම් ස්වභාවධර්මයෙක් තෙමේ, අරමුණු වලින් නිතර උඩ නගී ද, ඒ ස්වභාවධර්මය උද්ධටැ යි කියන ලද්දේය. ඒ නම් චිත්තය යි. එසේ උඩුකුරු ව යන්නා වූ සිතෙහි සැලීම හෝ, සම්ප්‍රයුක්තධර්මයන්ගේ නො සන්සුන් ආකාරයෙන් පැවැත්ම හෝ උද්ධච්ච නම්. **'උද්ධටස්ස භාවො=උද්ධච්චං'** විස්තර යට කියන ලදී.

මේ වනාහි, සිතේ නො සන්සිඳුම, ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, එක් අරමුණක නො පිහිටීම යි. පච්චුපට්ඨානය, සැලීම යි. පදට්ඨානය, අයොනිසොමනසිකාරය යි. **'අවුපසමලක්ඛණං උද්ධච්චං, අනවට්ඨානරසං, භත්තත්තපච්චුපට්ඨානං, අයොනිසොමනසිකාරපදට්ඨානං'**

සෙස්සෝ කී ලෙසින් දතයුත්තාහ. ඒ ඒ අකුසලචිත්තයෙහි යෙදුනු සංස්කාරයන්ගේ අකුසලභාවය ත්, අකුසල් බැවින් ම වන ලාමකභාවය ත් කුසල සංස්කාරයන්ට වඩා දක්නා වෙනස යි.

යට කියූ ලෙසින් මේ සතළොස් සංස්කාරයෝ ප්‍රථම අකුශල විඥානයෙහි යෙදී ගණිත්. දෙවන අකුශලවිඥානයෙහි ද යෙදෙන් නෝ ය මොවුහු. අනුන් හෝ තමන් පිළිබඳ වූ පූර්වප්‍රයොගය යි කියන සංස්කාරිකභාවය ත්, ජිනමිඩ දෙක්හි අනියතභාවය ත් මෙහි දෙවන අකුශලවිඥානයෙහි ලා දක්නා ලැබෙන වෙනස යි.

'ජිනනතා=ජිනං' එහි හැසුනු බව, ජින නම්. **'මිද්ධනතා=මිද්ධං'** කලකිරෙණබව, මිද්ධ නම්. සිත අරමුණු නො ඉවසනබව හා හැකි ළෙනබව ජින යි ද, වෙදනාදිනාමස්කන්ධයන්ගේ අරමුණු ගැණීමෙහි අසමත්බව මිද්ධ යි ද කියන ලද්දේ ය.

ජිනය, උත්සාහයට ප්‍රතිපක්ෂභාවය ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, චෛතසිකවීර්‍ය්‍යය විනාශ කිරීම යි. පච්චුපට්ඨානය, සම්ප්‍ර

යුක්තධර්මයන් පසුබට කිරීම යි. පදට්ඨානය, විවෙකසෙනසුන් ආදි යෙහි නො ඇලීම, ඇඟමැලිකැඩීම ආදී වූ අලසබැව්හි අනුවණින් මෙනෙහි කිරීම යි. **'අනුස්සාහලක්ඛණං ථිනං, විරියවිනොදන රසං, සංසීදනපච්චුපට්ඨානං, අරතිවිජම්භිකාදීසු අයොනිසො මනසිකාරපදට්ඨානං'**

මිද්ධය, කටයුතුවල නො සමත්බව ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, සම්ප්‍රයුක්තධර්මයන් මුවහ කිරීම යි. පච්චුපට්ඨානය, හැකු එනු බව යි. නිදාවැටීම හෝ පච්චුපට්ඨාන යි. පදට්ඨානය, විවෙක සෙනසුන් ආදියෙහි නො ඇලීම, ඇඟමැලිකැඩීමාදී වූ අලසබැව්හි අනුවණින් මෙනෙහි කිරීම යි. **'අකම්මඤ්ඤතාලක්ඛණං මිද්ධං, ඔනහනරසං, ලීනතාපච්චුපට්ඨානං, පචලායිකානිද්දාපච්චුපට්ඨා නං වා, අරතිවිජම්භිකාදීසු අයොනිසොමනසිකාරපදට්ඨානං'** සෙස්ස පෙර කී සේ ය.

ප්‍රථම අකුශලවිඥානයෙහි කියූ සතළොස් සංස්කාරයන් අතු රෙහි මිත්‍ථ්‍යාදෘෂ්ටිය හැර, අනික් සොළොස් සංස්කාරයෝ තුන්වන අකුශලවිඥානයෙහි යෙදෙති. සෙස්සෙහි ද යෙදීම මෙසේ ය. එහෙත් තුන්වන අකුශලවිඥානයෙහි මානය අනියතවශයෙන් යෙදෙන්නේ ය. එහෙයින් එහි අනියතවශයෙන් යෙදෙන්නා වූ මානය සමග සතළොස් ධර්මකෙනෙක් වෙති යි දතයුතු ය. සෙස්ස යට කියනලදී.

මානය, උඩඟුබව ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, අනුග්‍රහ කිරීම යි. පච්චුපට්ඨානය, කොඩියක් මෙන් තමා උසස් තන්හි තබා පෙන්වීම යි. පදට්ඨානය, මිත්‍ථ්‍යාදෘෂ්ටියෙන් තොර වූ ලොභය යි. **'උන්නතිලක්ඛණො මානො, සම්පග්ගහරසො, කෙතුකම්‍යතා පච්චුපට්ඨානො, දිට්ඨිවිප්පයුත්තලොභපදට්ඨානො'**

දෙවන අකුශලවිඥානයෙහි කියූ සංස්කාරයන් අතුරෙහි මිත්‍ථ්‍යා දෘෂ්ටිය හැර, අනික් සොළොස් සංස්කාරයෝ සතරවන අකුශල විඥානයෙහි යෙදීමට යන්නෝ ය. මෙහි ද මානය අනියත වේ. පළමුවන අකුශලවිඥානයෙහි කියන ලද්දවුන් අතුරෙහි ප්‍රීතිය හැර, අනික් සොළොස, පස්වන අකුශලවිඥානයෙහි යෙදී ගන්නෝ ය. එ පරිද්දෙන් ම ස වැනි වූ අකුශලවිඥානයෙහි සොළොස් සංස්කාර කෙනෙක් සම්ප්‍රයොගයට යන්නාහ. එහි විශෙෂය වන්නේ, සවැනි වූ විඥානයාගේ සංස්කාරිකභාවය හා ථිනමිද්ධයාගේ අනියතභාව මාත්‍රය යි. පස්වැනි වූ විඥානයෙහි කියන ලද්දවුන් අතුරෙහි මිත්‍ථ්‍යා දෘෂ්ටිය හැර, අනික් සොළොස් සංස්කාරයෝ සත්වැන්නෙහි යෙදෙති. මෙහි මානය අනියත වේ. සවැනි වූ අකුශලවිඥානයෙහි

කියනලද්දවුන් අතුරෙහි මිත්‍ථ්‍යාදෘෂ්ටිය හැර, අනික් සංස්කාරයෝ අටවැන්න හා යෙදෙති. මෙහි ද මානය අනියත වේ. නියත වූ ස්ව රූපවශයෙන් ආ ඵස්ස – වෙදනා – විතක්ක – විචාර – විරිය – ජීවිත – සමාධි – අහිරික – අනොත්තප්ප – දෙස – මොහ, යන එකොළොස ද, යෙවාපනක' වශයෙන් ආ ඡන්ද – අධිමොක්ඛ – උද්ධච්ච – මනසිකාර, යන, සතර ද, අනියත වශයෙන් ආ ඉස්සා – මච්ඡරිය – කුක්කුච්ච, යන තුන දැ යි අටළොස් සංස්කාරයෝ දෙසමූලිකඅකුශලවිඥානයන් දෙදෙනා අතුරෙහි ප්‍රථමවිඥානයෙහි සම්ප්‍රයොගයට යෙති.

'දුස්සත්ති තෙන, සයං වා දුස්සති, දුස්සනමත්තමෙවවාති = දෙසො' යම් ධර්මශක්තියකින් තමා ත් තමන් හා යෙදුනු ධර්ම යෝත් අරමුණුවල දූෂිත වෙත් ද, ඒ දූෂණයට හෙතු වූ ධර්මශක්තිය දෙස නම්. දූෂිතවීම් මාත්‍රය හෝ දෙස නම්. යටැ කියන ලද ය.

දෙසය තෙමේ, කිපීම ලකුණු කොට සිටියේ ය. හෙවත් මහත් සැඩබව ලකුණු කොට ඇත්තේ ය. දඬු මුගුරු ආදියෙන් පහර කෑ සර්පයකු මෙනි. කෘත්‍යය, අනිෂ්ටරූපයන් ඉපදවීම් වශයෙන් ශරීර යාගේ කම්පනය යි. සර්පවිෂ පැතිරීම මෙනි. හෘදයවස්තුව දැවීම හෝ කෘත්‍යය යි. ලැව්ගින්නක් මෙනි. පච්චුපට්ඨානය, තමන් හා අනුන් දූෂණය කිරීම යි. ලැබූ ඉඩපහසුකම ඇති සතුරකු මෙනි. පදට්ඨානය, ආඝාතවස්තු යි. විස හා මුසු වූ පූතිමූත්‍රය මෙනි. **'චණ්ඩික්කලක්ඛණො දෙසො පහටාසිවිසො විය, විසප්පනරසො විසනිපාතො විය, අත්තනොනිස්සයදහනරසො වා දවග්ගි විය, දූසනපච්චුපට්ඨානො, ලඛොකාසො විය සපත්තො, ආඝාතවත්ථුපදට්ඨානො විසංසට්ඨපූතිමුත්තං විය'**

'ඉස්සායනා = ඉස්සා' පරසම්පත්තිය නුරුස්නා බව ඉස්සා නම්. ඕ පහළ වන්නී අනුන් අයත් සම්පත් දැකීමෙන් හා අනුන් ගුණ ඇසීමෙන් ය. ඊෂ්‍යාව සත්වයා සංසාර නැමැති රථයෙහි යොදවන්නා වූ සංයොජනසඞ්ඛ්‍යාත වූ රැහැණක් බඳුය යි ද, යමකුගේ සිත්හි ඊෂ්‍යා නැමැති ගිනිදැල දැල් වේ නම්, හෙතෙමේ බුද්ධාදි ආර්‍යයන් විසින් විඳිනු ලබන සතුටක් නො ලබා යි ද කීහු.

ඊෂ්‍යාව, අනුන් අයත් සම්පත් නො ඉවසීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය, අනුන් අයත් සම්පත්තියෙහි නො ඇල්ම යි. පච්චුපට්ඨානය, පරසම්පත්තිය දකිනු නො හැකිව මුහුණ හකුළුවා ගැණීම හෝ ඉවත බැලීම යි. පදට්ඨානය, පරසම්පත්තිය යි. **'පරසම්පත්තීනං උසුයනලක්ඛණා ඉස්සා, තත්ථෙව අනභිරතිරසා, තතො විමුඛභාවපච්චුපට්ඨානා, පරසම්පත්තිපදට්ඨානා'**

'මච්ඡරති අත්තසම්පත්තිං නිගූහතීති = මච්ඡෙරො' යමෙක් ස්වසම්පත්තිය සඟවා ද, හෙතෙමේ මච්ඡෙර නම්. එබන්දකුගේ ස්වභාවය හෙවත් මසුරා යි කීමට යම් ධර්මශක්තියක් උපකාර වේ ද, ඒ ධර්මශක්තිය මච්ඡරිය යි කියනු ලැබේ. **'මච්ඡෙරස්ස = භාවො මච්ඡරියං, මා ඉදං අච්ඡරියං අඤ්ඤෙසං හොතු මමෙව හොතු'** මේ ඓශ්වර්‍යය අන්‍යයන්ට නො වේවා, මට ම වේවා යි පැවැති ස්වභාවය හෝ චිත්තාද්ධ්‍යාශය මච්ඡරිය යි දත යුතු ය. මෙය ආවාස-කුල-ලාභ-වණ්ණ-ධම්ම' යි පස් වැදැරුම් ය.

මච්ඡරිය, ලැබූ ද එසේ ම ලැබිය යුතු වූ ද තම සම්පත්තිය ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, තමා අයත් ඒ සම්පත්තිය මෙරමා හා සාධාරණබව නො ඉවසීම යි. පච්චුපට්ඨානය, මෙරමා හා සාධාරණ බව නො ඉවසීම නුරුස්නා ආකාරයෙන් සිත හැකි ළීම යි. පදට්ඨානය, තමාගේ ආවාසාදී වූ සම්පත් සමූහය යි. **'ලද්ධානං වා ලභිතබ්බානං වා අත්තනො සම්පත්තීනං නිගූහන ලක්ඛණං මච්ඡරියං, තාසංයෙව පරෙහි සාධාරණභාවඅක්ඛම නරසං, සංකොචනපච්චුපට්ඨානං, අත්තසම්පත්තිපදට්ඨානං'**

'කුච්ඡිතං කතං = කුකතං' රැස්කළ දුශ්චරිතය හා රැස් නො කළ සුචරිතය ත් දෙකම පිළිකුල් කටයුතු බැවින් කුකත නම්. ඒ කුකතය අරමුණු කොට අපායගාමී වූ අකුසල් මා විසින් රැස් කරණ ලදැ යි සිතීමෙහි දී හටගැණෙන විපිළිසර වූ චිත්තොත්පාදය ත්, ස්වර්ගමොක්ෂ දෙකට කරුණු වූ කුසල් මා විසින් නො කරණ ලදැ යි සිතීමෙහි දී නැගෙන විපිළිසර වූ චිත්තොත්පාදය ත් යන චිත්තොත් පාද දෙක කුකත යි ගැණේ. කුකත නම් වූ චිත්තොත්පාද දෙක්හි වූ ස්වභාවය කුක්කුච්ච නම්.

කුක්කුච්චය, කළ නො කළ විවිධ දුශ්චරිතසුචරිතයන් අනුව ශොක කිරීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, කළ නො කළ දුශ්චරිත සුචරිතයන් නැවැත නැවැත සිහිකරමින් ශොක කිරීම යි. පච්චුපට්ඨානය, නැවැත නැවැත ශොක කිරීමෙන් විපිළිසරවීම යි. පදට්ඨානය, කළ නො කළ දුශ්චරිත සුචරිතය යි. **'පච්ඡානුතාපන ලක්ඛණං කුක්කුච්චං, කතාකතානුසොචනරසං, විප්පටිසාර පච්චුපට්ඨානං, කතාකතපදට්ඨානං'**

අන්‍යයෝ යට කීසේ දත යුත්තාහ. මේ අටලොස් සංස්කාරයෝ දෙසමූලික වූ ප්‍රථමඅකුශලවිඥානයෙහි යෙදෙති. එමෙන් දෙවන දෙසමූලිකඅකුශලවිඥානය හා ද සම්ප්‍රයොගයට යෙති. මේ දෙවන සිතෙහි වන්නා වූ විශෙෂය නම්, සසංස්කාරිකභාවය හා ඉස්සා මච්ඡරිය-කුක්කුච්ච, යන නියතයන් කෙරෙහි ජිනමිද්ධයන්ගේ සම්භවයත් ය.

මොහමූලිකඅකුශලවිඥන දෙ දෙනා අතුරෙහි විචිකිච්ඡා සම්ප්‍රයුක්තඅකුශලවිඥනය සමග පළමු කොට එස්ස-වෙතනා-චිතක්ක-විචාර-විරිය-ජීවිත-චිත්තට්ඨිති-අධිරික - අනොත්තප්ප-මොහ-විචිකිච්ඡා, යන සවරූපයෙන් ආවා වූ එකොළස ද, යෙවාපනක' වශයෙන් ආ උද්ධච්ච-මනසිකාර දෙක ද යන තෙළෙස සම්ප්‍රයොගයට යන්නේ ය. **'තඤ්ච චිත්තට්ඨිතිනිපවත්තනිට්ඨිති මනෙනා දුබ්බලෝ සමාධි'** යන මෙයින් එහි චිත්තට්ඨිති යි කියන ලද්දේ ප්‍රවෘත්තිසථිති මාත්‍ර වූ දුර්බල සමාධිය, යි කියනලදී. චිත්තපරම්පරාවගේ නොසැලී සිටීමෙහි ලා උපකාරවීමට, මෙයට ශක්තියක් නැත. මේ වනාහි චිත්තයාගේ පැවැත්මට ප්‍රත්‍යය මාත්‍රයෙක් ම වේ. එහෙයිනි **පවත්තනිට්ඨිති'** යි කීයේ. දුර්බලසමාධිය යි කියේ ත් එහෙයිනි. මෙය මාඝාඕඝාදිභාවයට නොයයි. අධිමොක්ෂය නැති බැවිනි.

විචිකිච්ඡාව සැකෙවින් යටැ කියන ලද ය. ඕ සැකකිරීම ලකුණු කොට සිටියා ය. 'මේ වේ ද, මේ නොවේ ද, යනාදීන් සැකකිරීම් වශයෙන් හටගැන්ම හෝ ලක්ෂණ යි. කෘත්‍යය, අරමුණෙහි චිත්තයාගේ වංචලභාවය යි. සැලෙනගතිය යි. පච්චුපට්ඨානය, අරමුණෙහි එක් කෙළවරක් නොගෙණ නොයෙක් ලෙසින් ගැණීම යි. පදට්ඨානය, අනුවණින් මෙනෙහි කිරීමයි. **'සංසයලක්ඛණා විචිකිච්ඡා, කම්පනරසා, අනිච්ඡයනපච්චුපට්ඨානා, අනෙකංසගාහපච්චුපට්ඨානා වා, අයොනිසොමනසිකාර පදට්ඨානා'**

'පටිපත්තිඅන්තරායකරා ඵස්සා' යි කියූ බැවින් විචිකිච්ඡාව ප්‍රතිපත්තීන්ට අන්තරායකරධර්මයෙකැ යි දතයුතු ය.

විචිකිච්ඡාසම්ප්‍රයුක්තචිත්තයෙහි කියූ ධර්මයන් අතුරෙහි විචිකිච්ඡාව හැර, අනික් දෙළොස් සංස්කාරයෝ උද්ධච්චසම්ප්‍රයුක්ත චිත්තය හා සම්ප්‍රයොගයට යෙති. මෙහි විශෙෂය නම්, විචිකිච්ඡාව නැති බැවින් අධිමොක්ෂයාගේ ලැබීම යි. ඒ හා ම තෙළෙස් සංස්කාර කෙනෙක් ම යෙදෙති. මෙහි අධිමොක්ෂයාගේ ලැබීම කරණ කොට සමාධිය බලවත් වේ. උද්ධච්චසම්ප්‍රයුක්තචිත්තයෙහි උපදින උද්ධච්චය, සවරූප වශයෙන් ම මෙහි ආගේ ය. අධිමොක්ෂ මනස්කාරයෝ ආවෝ යෙවාපනක වශයෙනි. අකුශලසංස්කාර යන්ගේ හැටි සැකෙවින් මෙසේ ය.

අව්‍යාකෘතසංස්කාරයන් අතුරෙහි පළමු කොට විපාක අව්‍යාකෘතයෝ අහෙතුක-සහෙතුක වශයෙන් දෙ වැදෑරුම් වෙති. එහි අහෙතුකවිපාකවිඥනයන් හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයෝ අහෙතුක යහ. ඔවුන් අතුරෙහි ද කුශලාකුශලවක්ෂුර්විඥනයන් හා සම්ප්‍රයුක්තවූවෝ එස්ස-වෙතනා-ජීවිත-චිත්තට්ඨිති යි සවරූපවශයෙන් ආවා වූ සතරදෙන හා යෙවාපනක වශයෙන් ආ මනසිකාර, යි පස්

දෙනෙක් වෙති. සොතවිඤ්ඤාණ-ඝාණවිඤ්ඤාණ-ජිව්හාවිඤ්ඤාණ-කායවිඤ්ඤාණ යන මොවුන් හා සම්ප්‍රයොගයට ගියෝ මෙකී පස් දෙන ම ය. එස්ස- චෙතනා- ජීවිත- චිත්තට්ඨිති- මනසිකාර යන පස ත් විතක්ක-විචාර-අධිමොක්ඛ යන තුන ත් දෙවැදැරුම් වූ කුශලවිපාක - අකුශලවිපාකමනොධාතුසඞ්ඛ්‍යාත සම්ප්‍රත්‍යෙෂණ චිත්තයන් හා සම්ප්‍රයුක්ත වෙත්. ඒ අට ම අහෙතුක මනොවිඤ්ඤාණ ධාතුසඞ්ඛ්‍යාතසන්තීරණ තුන හා ද යෙදේ. විශෙෂය නම්, ඒ ත්‍රිවිධ මනොවිඤ්ඤාණධාතුන් අතුරෙහි සොමනස්සසහගත සන්තීරණ අහෙතුකමනොවිඤ්ඤාණධාතුචිත්තයෙහි ප්‍රීතිය අධිකවීම යි. එයින් අන්‍ය වූ සහෙතුකවිපාකවිඤ්ඤාණය හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයෝ සහෙතුකසංස්කාරයෝ ම වෙති. ඔවුන් අතුරෙහි අට වැදැරු වූ කාමාවචරවිපාකවිඤ්ඤාණයන් හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයෝ, අට වැදැරුම් වූ කාමාවචරකුසල-විඤ්ඤාණයන් හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයන් හා සමාන වෙති. විශෙෂය නම්, අනියතයන් අතර වූ කරුණා-මුදිතා දෙක සත්වයන් ම අරමුණු කොට ඇති බැවින් විපාකචිත්ත යෙහි ඔවුන් නො ලැබීම ය. කාමාවචර විපාකයෝ, එකාන්තයෙන් කාමාවචරාරම්මණික වෙති. කරුණා-මුදිතාවන් පමණක් නො ව විරතීහු ද කාමාවචර චිත්තයෙහි නො ලැබෙති.

රූපාවචර-අරූපාවචර-ලොකුත්තරවිපාකවිඤ්ඤාණයන් හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයෝ, ඒ රූපාවචරාදිවිපාකවිඤ්ඤාණයන්ගේ කුසලවිඤ්ඤාණයන් හා යෙදී සිටින සංස්කාර හා සමාන වෙති ක්‍රියා අව්‍යාකෘතසංස්කාරයෝ ද, අහෙතුක-සහෙතුක භෙදයෙන් දෙවැදැරුම් ය. ඔවුන් අතුරෙහි අහෙතුකක්‍රියා විඤ්ඤාණයන් හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයෝ අහෙතුක වෙති. ඒ අහෙතුකක්‍රියාවිඤ්ඤාණයන් හා හා යෙදුනු සංස්කාරයෝ, කුසලවිපාක මනොධාතු-අහෙතුකමනොවිඤ්ඤාණධාතු දෙක හා යෙදෙන සංස්කාර හා සමාන වෙති. ක්‍රියා සංස්කාරයන් අතර අහෙතුක ක්‍රියාමනොධාතුව හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයෝ කුසලවිපාක මනොධාතුව හා යෙදුනු සංස්කාර හා සමාන වෙති. හසිතුප්පාද මනොවිඤ්ඤාණධාතුව හා සම්ප්‍රයුක්ත වූ සංස්කාරයෝ, සොමනස්සසහගතසන්තීරණවිඤ්ඤාණය හා යෙදෙන සංස්කාරයන් හා සමානයහ. වොත්ථපනචිත්තයෙහි යෙදෙන සංස්කාර, උපෙක්ඛා සහගතසන්තීරණචිත්තයෙහි යෙදුනවුන් හා සමාන ය. මනො විඤ්ඤාණධාතුයුගලයෙහි වීර්‍යය අධික වේ. වීර්‍යස්වභාවය ප්‍රකට හෙයින් බලප්‍රාප්ත වූ සමාධිය වන්නේ ය. මේ මෙහි වෙනස යි.

සහෙතුක ක්‍රියාවිඤ්ඤාණයන්හි වූ සංස්කාර, සහෙතුක නම් වේ. කාමාවචරක්‍රියාවිඤ්ඤාණ අට හා යෙදුනු සංස්කාර, විරති තුන හැර,

කාමාවචරකුසලවිඤ්ඤාණ අටෙහි වූ සංඝකාර හා සමාන ය. මෙහි විරතීන් හැරය යි කීයේ සමුච්ඡේදවිරති තුන හෙතු කොට රහතුන් වහන්සේට විරමණය සිද්ධවන හෙයින් ක්‍රියා සිත්හි විරතීන් නොලැබෙන බැවිනි. නවවැදෑරුම් රූපාවචර-අරූපාවචරක්‍රියා සිත්හි යෙදෙන සංඝකාරධර්ම, ආරම්මණප්‍රවෘත්ති ආකාරයෙන් ඔවුන්ගේ කුසලවිඤ්ඤාණයන්හි යෙදුනු සංඝකාර සමාන වේ. අව්‍යාකෘතසංඝකාරයි සැකෙවින් මේ කීයේ.

'විජානාතීති බො භික්ඛවෙ! තස්මා විඤ්ඤාණන්ති වුච්චති කිංච විජානාති-පෙ-අලොකිතම්පි විජානාති, විජානාතීති බො භික්ඛවෙ! තස්මා විඤ්ඤාණන්ති වුච්චති' යනු දෙශනා යි. අර මුණු වෙසෙසින් හඳුනා ද, දැන ගණී ද ඒ අරමුණු හඳුනා ගන්නා ශක්තිය විඤ්ඤාණ යි කියනු ලැබේ. අරමුණු ගැණීමෙහි පොහොසත් වූ ධර්මශක්තිය, වෙසෙසින් ඉතාහොඳින් අරමුණු දැනීම කෙරේ ය යන අර්ථයෙන් විඤ්ඤාණ නම් වේ. **විඤ්ඤාණං-චිත්තං-මනො** යන පදත්‍රය අර්ථවශයෙන් එකාර්ථ ඇත්තේ ය. එහෙත් ව්‍යඤ්ජනනානාත්වය මෙන් අර්ථනානාත්වයෙක් එහි නැත්තේ ද නො වේ.

අරමුණු දැන ගන්නා ලක්ෂණයෙන් එක් වැදෑරුම් වූ විඤ්ඤාණය ජාතිවශයෙන්, කුසල-අකුසල-අව්‍යාකත වශයෙන් තෙවැදෑරුම් ය. එහි කුශලාර්ථයෙන් සමාන වූ ධර්මකොට්ඨාසය, කුසලජාති නම් වේ. සෙසු ජාති දෙක ත් මෙසේ ය.

කුශලශබ්දය, ආරොග්‍ය - අනවද්‍ය - ඡේක - සුඛවිපාක යන අර්ථසතරෙහි වැටේ. **'කච්චිනු භොතො කුසලං කච්චිනු භොතො අනාමයං'** යනාදි තන්හි ආරොග්‍යාර්ථයෙහි ආයේය. **'කතමො පන භන්තෙ! කායසමාචාරො කුසලො සෙය්‍යථා බො මහාරජ! කායසමාචාරො අනවජ්ජෝති ච, පුනචපරං භන්තෙ! එතදනුත්තරියං සථා භගවා ධම්මං දෙසෙති කුසලෙසු ධම්මෙසු'** යනාදි තන්හි අනවද්‍යාර්ථයෙහි වැටේ. **'කුසලො ත්වං රථස්ස අඞ්ග පච්චඞ්ගානං, කුසලා නව්වගීතස්ස, සික්ඛිතා චාතුරිත්‍ථියො'** යනාදි තන්හි ආයේ දක්ෂාර්ථයෙහි ය. සුඛවිපාකාර්ථයෙහි ආයේ **'කුසලානං භික්ඛවෙ! සමාදානහෙතු කුසලස්ස ඣානස්ස ඣානත්තා උපචිතත්තා'** යනාදි තන්හි ය. මෙහිලා ආරොග්‍ය-අනවද්‍ය - සුඛවිපාක යන අර්ථ තුනෙහි කැමතිවනු ලැබේ.

'කුච්ඡිතෙ පාපකෙ ධම්මෙ සලයනතී චලයනතී කම්පෙනතී විධංසෙනතීති = කුසලා, කුච්ඡිතෙන වා ආකාරෙන සයනතීති = කුසා, තෙ අකුසලසඞ්ඛාතෙ කුසෙ ලුනනති ඡින්දනතීති = කුසලා, කුච්ඡිතානං වා ඝානතො තනු කරණතො ඔසාන

කරණතෝ කුසං කුසං නාම, තෙන කුසෙන ලාතබ්බානි = කුසලා, යථා වා කුසා උභයහාගහතං කිලෙස පක්ඛං ලුනන්ති තස්මා කුසා විය ලුනන්ති ති = කුසලා'

ශ්‍රඬාවෙන් අශ්‍රඬාව ත් අමොහයෙන් මොහය ත් යනාදි පිළිවෙළින් තදඬගප්‍රහාණයෙන් අකුශලචෛතසිකධර්මයන් පහ කරණ හෙයින්, නින්දිතලෙසින් සිත්සතන්හි හෝනා අරුතින් රාගාදිපාපධර්ම, කුස යි කියනු ලැබේ. ඒ කුස නම් වූ පාපධර්මයන් ශ්‍රඬාප්‍රඥාදි ගුණධර්මයන් විසින් සිදලන හෙයින්, රාගාදි පාපධර්මයන් තුනී කරණ හෙයින් කුසණය කුස යි කියනු ලැබේ. ඒ කුසසඬ්ඛ්‍යාත කුසණයෙන් ඔවුන් සිඳ අවසන් කරණ හෙයින්, අතට ගත් කුසතණපතින් අතේ දෙ පැත්ත කැපි යන්නාක් මෙන් ශ්‍රඬාදි කුශලධර්මයන් විසින් උපන්නා වූ ද, උපදින්නා වූ ද සියලු කෙලෙසුන් සිඳලන හෙයින් මෙකී චිත්තජනිය කුසල නම් වේ.

තවද මේ චිත්තශකනිය කායවාක්ආදිදුශ්චරිතයන් නසයි. ද්වේෂාදිපාපධර්මයන් සිඳලයි. ප්‍රාණඝාතාදිපාපයන් වනසයි.

කු, යි නාමරූපපරමපරාවට නමෙකි. රාගාදිකෙලෙසුන්ගේ පැවැත්මට ආධාරවන හෙයිනි. එහෙයින් රාගාදී වූ කෙලෙසුන් **කුස** යි කියති. ඒ ආධාර කොට පවත්නා බැවිනි. ආධාරධෙය වශයෙන් පවත්නා නාමරූපධර්ම හා රාගාදිකෙලශධර්ම සිඳලන මේ චිත්තකොට්ඨාසය කුසල යි කියනු ලැබේ.

ආරොග්‍ය-අනවද්‍ය-සුඛවිපාකාදියනට ප්‍රතිපක්ෂ වූ පටහැනි ව සිටියා වූ ධර්ම සමූහය අකුසල නම් වේ.

කුසලභාවයෙන් හෝ අකුසලභාවයෙන් නො වදුළ සමූහය අව්‍යාකත නම් වේ. ඒ මේ අව්‍යාකතයෝ අවිපාකස්වභාවය ලක්ෂණ කොට සිටියෝ ය. විපාක උපදවන්නෝ, කුශලාකුශලයෝමය. අව්‍යාකතයෝ විපාක නො උපදවති.

මොවුන් අතුරෙහි කුශලය තෙමේ, කාමාවචර - රූපාවචර - අරූපාවචර - ලොකුත්තර යි භූමිභෙදයෙන් සිවු වැදෑරුම් ය. යම් කිසි තැනෙක් යම්කිසි ධර්මයක්හුගේ හට ගැණීමට සථාන වේ නම්, ඒ සථානය ඒ ධර්මයට භූමි වේ. එය සථානවශයෙන් හා අවසථාවශ යෙන් ලැබේ. ලොකොත්තරධර්ම හටගන්නා භූමියක් නැත. ලොකොත්තරධර්ම යම් අවසථාවෙක හට ගණී නම්, ඒ අවසථාව ලොකොත්තරධර්මයන්ගේ භූමිය යි. කාම - රූප අරූපයන්ට සථානවශ යෙන් හා අවසථාවශයෙන් භූමිසම්භවය වේ.

අස්සක් මුල්ලක් නොහැර කාමවසතුන්ගෙන් පිරී සිටි වසතු කාම – ක්ලෙශකාමයන්ගෙන් නොතෙරවූ සථාන, කාම භූමි නම් වේ. ගණනින් ඒ එකොළොසෙකි. එහි ගැලෙන හැසිරෙන සිත් කොටස කාමාවචර නම් වේ. රූපතෘෂ්ණාවගේ පැවැත්මට සථාන වූයේ රූපභූමි නම් වේ. ගණනින් ඒ සොළොසෙකි. එහි හැසිරෙන ගැලෙන සිත්කොටස රූපාවචර නම් වේ. අරූපරාගයට සථාන වූයේ අරූපභූමි නම් වේ. ගණනින් සතරෙකි. එහි හැසිරෙන සිත් කොටස අරූපාවචර නම් වේ. උපාදානසකඛයෙන් නැගී සිටි සතරමගඵලසිත් ලොකොත්තර නම් වේ.

එහි ඔවුන් අතුරෙහි කාමාවචරකුසලය තෙමේ, **සොමනසස-උපෙකඛා-ඤාණ-සඞඛාර** භෙදයෙන් අට වැදෑරුම් ය.

රූපාවචරකුසලය තෙමේ, **විතකක- විචාර - පීති - සුඛ - එකගගතා** යන ධ්‍යානාඞගභෙදයෙන් පස් වැදෑරුම් ය. එහි පළමු සිතෙහි පසෙක, දෙවැන්නෙහි සතරෙක, තෙවැන්නෙහි තුනෙක, සිවුවැන්නෙහි දෙකෙක, පස්වැන්නෙහි දෙකෙකැයි මෙසේ ධ්‍යානාඞගයන්ගේ ලැබීම වේ.

අරූපාවචරකුසලය තෙමේ, කිසුණුඉගුළුඅහසය, ඒ අහසෙහි පැවැති විඤඤාණ ය, ඒ විඤඤාණයාගේ අභාව ය, තුන්වන ආරුප්පවිඤඤාණ ය යන ආරම්මණයන්ගේ සමතික්‍රමණයෙන් සිවු වැදෑරුම් ය.

ෂට්විශුද්ධීන්ගේ පරම්පරාවශයෙන් පැමිණිය යුතු වූ ලොකොත්තරකුශලය තෙමේ චතුර්විධමාර්ගීයන්ගේ වශයෙන් සිවුවැදෑරුම් ය. විසතර විතතවගීයෙහි කියන ලද ය. මෙසේ කුසලවිඤඤාණය එක් විසිවැදෑරුම් වේ.

අකුසලය තෙමේ, භූම්වශයෙන් කාමාවචරය. **ලොභ-දෙස මොහ** මූලයන්ගේ වශයෙන් තෙවැදෑරුම් ය. ලොභය මුල් කොට උපන්නා වූ සිත **සොමනසස-උපෙකඛා-දිට්ඨිගත-සංඛාර** භෙදයෙන් අටවැදෑරුම් ය. දෙසය මුල් කොට උපදනා සිත **දොමනසස-පටිඝ-අසඞඛාර-සසඞඛාර** භෙදයෙන් දෙ වැදෑරුම් ය. මොහය මුල් කොට උපදනා සිත **උපෙකඛා-විචිකිච්ඡා-උඛචච** භෙදයෙන් තෙවැදෑරුම් ය. දොමනසස්‍යාදිපද සමග **සහගත-සම්පයුත්ත** ශබ්දයන් සුදුසු සේ යොදා අරුත් ගත යුතු ය. මෙසේ අකුසල විඤඤාණය දෙළොස්වැදෑරුම් ය. විසතර විතතවගීයෙහි ආයේ ය.

අව්‍යාකෘතය තෙමේ, විපාක-ක්‍රියා යි ජාතිභෙදයෙන් දෙවැදෑරුම් ය. විපාකය තෙමේ කාමාවචර-රූපාවචර-අරූපාවචර-ලොකොත්තර, යි භූමි භෙදයෙන් සිවු වැදෑරුම් ය. නැවැත කාමාවචරය, කුසල

විපාක-අකුසලවිපාක වශයෙන් දෙපරිදි ය. එහි ද කුසලවිපාකය, අහෙතුක-සහෙතුක වශයෙන් දෙවැදැරැම් ය. එහි අලොභාදිවිපාක හෙතූන්ගෙන් තොර වූ කුසලවිපාකවිඤ්ඤාණය තෙමේ, අහෙතුක ය. එය චක්ඛු-සොත-ඝාණ-ජිවහා-කාය විඤ්ඤාණ පස, සම්ප්‍රතෙච්ඡණ කෘත්‍යය ඇති මනොධාතු, සන්තීරණාදි කෘත්‍යය ඇති උපෙක්ඛා සහගත මනොවිඤ්ඤාණධාතු, සොමනස්සසහගත මනොවිඤ්ඤාණ ධාතු යන තුන හා එකතු ව අටෙක් වේ.

චක්ඛුවිඤ්ඤාණය, චක්ඛුපසාදය ඇසුරු කොට රූප හැඳින ගැණීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, රූපාලම්බනමාත්‍රයක් අරමුණු කොට ගැණීම යි. පච්චුපට්ඨානය, රූපයට අභිමුඛවීම යි. පදට්ඨානය, රූපය අරමුණු කොට ඇති ක්‍රියාමනොධාතුචිත්තයාගේ පහවීම යි. **'චක්ඛුසන්නිස්සිතරූපවිජානනලක්ඛණං චක්ඛුවිඤ්ඤාණං, රූපමත්තාරම්මණරසං, රූපාභිමුඛභාවපච්චුපට්ඨානං, රූපාරම්මණාය ක්‍රියාමනොධාතුයා අපගමපදට්ඨානං'**

සොතවිඤ්ඤාණ - ඝාණවිඤ්ඤාණ - ජිවහාවිඤ්ඤාණ - කායවිඤ්ඤාණ යන මොවුහු, ඒ ඒ ප්‍රසාද රූපයන් ඇසුරු කොට ශබ්දාලම්බනාදිය දැන ගැණීම ලකුණු කොට ඇත්තාහ. තමතමන්ට ගොදුරු වන ශබ්දාලම්බනාදිය පමණක් ගැණීම කෘත්‍යය කොට සිටියෝ ය. ශබ්දාලම්බනාදියට අභිමුඛවීම පච්චුපට්ඨාන යි. ශබ්දාදිය අරමුණු කොට ඇති ක්‍රියාමනොධාතු චිත්තයන්ගේ පහවීම පදට්ඨාන යි. **'සද්දාදිවිජානනලක්ඛණානි සොත ඝාණ ජිවහා කායවිඤ්ඤාණානි, සද්දාදිමත්තාරම්මණරසානි, සද්දාදිඅභිමුඛභාවපච්චුපට්ඨානානි, සද්දාදිආරම්මණාදීනං ක්‍රියාමනො ධාතූනං අපගම පදට්ඨානානි'**

ක්‍රියාමනොධාතුචිත්තය, චක්ඛුර්විඤ්ඤාණාදියට අනන්තරුව රූපාදි අරමුණු හැඳිනීම ලකුණු කොට ඇත්තේය. කෘත්‍යය, රූපාදි අරමුණු පිළිගැණීම යි. පච්චුපට්ඨානය, රූපාදි අරමුණු පිළිගත්නා සභාවයෙන් නුවණට අභිමුඛව වැටහීම යි. පදට්ඨානය, චක්ඛුර්විඤ්ඤාණාදීන්ගේ පහවීම යි. **'රූපාදිවිජානනලක්ඛණා මනොධාතු රූපාදිසම්පටිච්ඡනරසා, තදාභාවපච්චුපට්ඨානා, චක්ඛුවිඤ්ඤාණාදි අපගමපදට්ඨානා'**

අහෙතුකවිපාක වූ ඝඩාලම්බනයන් හැඳිනීම ලකුණුකොට ඇති දෙවැදැරැම් වූ සන්තීරණාදි කෘත්‍යය ඇති මනොවිඤ්ඤාණ ධාතු තොමෝ, අරමුණු තීරණය කිරීමාදිය කෘත්‍යය කොට ඇත්තී, තථාභාවය පච්චුපට්ඨානය කොට සිටියා. හෘදයවස්තුව පදට්ඨානය කොට ඇත්තීය. සොමනස්ස-උපෙක්ඛා යොගයෙන් හා දවිට්ඨාන පංචට්ඨාන භෙදයෙන් ද මෙහි භෙදය වේ. මේ දෙදෙනා අතරෙහි

එක් සිතෙක් එකානන්ත ඉෂ්ටාලම්බනයෙහි පවත්නා බැවින් සෝමනස්ස වෙදනායෙන් යුක්ත ව සන්තීරණ-තදාරම්මණ වශයෙන් පංච ද්වාරයෙහි හා ජවනාවසානයෙහි ද පවත්නා බැවින් සථාන දෙකක් ඇත්තේ වේ. අනික් සිත ඉෂ්ටමධ්‍යසථාලම්බනයෙහි පවත්නා බැවින් උපෙක්ඛාවෙදනාවෙන් යුක්ත ව සන්තීරණ-තදාරම්මණ-පටිසන්ධි-භවඞ්ග-චුති වශයෙන් සථාන පසක් ඇත්තේ වේ.

අට වැදෑරුම් වූ මේ අහෙතුක විපාකවිඤ්ඤාණය තෙමේ, නියතාරම්මණ-අනියතාරම්මණ වශයෙන් දෙ පරිදි වේ. උපෙක්ඛා-සුඛ-සෝමනස්ස වෙදනාවන්ගේ වශයෙන් තෙ පරිදි වේ. චක්ඛූරාදි විඤ්ඤණපඤ්චකය, නියතාරම්මණික ය. චක්ඛුර්විඤ්ඤණය රූපය ත්, ශ්‍රොත්‍රවිඤ්ඤණය ශබ්දය ත්, ඝ්‍රාණවිඤ්ඤණය ගන්ධය ත්, ජිව්හා විඤ්ඤණය රසය ත්, කායවිඤ්ඤණය ඵොට්ඨබ්බය ත් අරමුණු කරගන්නා බැවිනි. අනික් සිත් තුන අනියතාරම්මණික ය. මනොධාතුවිත්තය පස්වැදෑරුම් වන රූපාදී වූ අරමුණුවල පවත්තේ ය. මනොවිඤ්ඤාණධාතු දෙදෙන රූපාදි ෂඩාලම්බනයෙහි පවත්නාහ. මෙහි කායවිඤ්ඤණය සුඛවෙදනාව හා යෙදුනේ ය. සථාන දෙකක් ඇති මනොවිඤ්ඤාණ ධාතු තොමෝ සොමනස්සවෙදනාව හා යෙදුනී ය. අනික් සියල්ල උපෙක්ඛාවෙදනාවෙන් යුක්ත ය. කුසලවිපාකඅහෙතුක අට සැකෙවින් මෙසේ ය. විස්තර අනික් පොතපතින් දතයුතු ය.

අලොභාදිවිපාකහෙතූන් හා යෙදුනේ සහෙතුක ය. එය කාමාවචරකුසලවිත්තය මෙන් සොමනස්ස – උපෙක්ඛාවෙදනා යොග යෙන් හා ඤාණසම්පයුත්ත – ඤාණවිප්පයුත්ත – අසඞ්ඛාරික – සසඞ්ඛාරිකයොගයෙන් අට වැදෑරුම් වේ. මෙහි ඤාණසම්ප්‍රයුක්ත විපාක සතර, අලොභ – අදෝස – අමොහ යන හෙතු තුනකින් ද යුක්ත වන බැවින් සහෙතුක යි ද කියත්. මේ වනාහි කාමාවචර භාවයෙහි හීනප්‍රණීතාදී වශයෙන්, ඉපදීම් වශයෙන් මහා කුසලයන්ට සමාන වූයේ ද, ඵලවශයෙන්, අරමුණුවශයෙන්, පවත්නා අයුරෙන් මහා කුසලයන්ට සමාන නො වේ. මහාකුසලය, දන්දීම් ආදි වශයෙන් ස වැදෑරුම් අරමුණුවල පවත්නාක් මෙන් මේ විපාක අටදෙන කාය විඤ්ඤත්තිය නො උපදවන බැවින් එසේ නො පවතිත්. එහෙත් ඔවුහු පටිසන්ධි – භවඞ්ග – චුති – තදාරම්මණවශයෙන් කාමාවචර ධර්මයන්ට ඇතුළත් වූ සවැදෑරුම් අරමුණුවල පවතිත්. මොවුන්ගේ අසඞ්ඛාරික – සසඞ්ඛාරිකභාවය ආගමනාදිවශයෙන් දත යුතු ය. සම්ප්‍රයුක්තධර්මයන්ගේ විශෙෂයක් නැති කල්හි කැටපත් ආදියෙහි පෙණෙන මුඛනිමිත්ත මෙන් විපාකය උත්සාහරහිත ය. කුසලය, මුඛය මෙන් උත්සාහසහිත ය.

අකුසලවිපාකය තෙමේ, අහෙතුකම ය. කුසලවිපාකහෙතු යි කියූ අලොභාදීඛමීයන් අකුසලවිපාකයන්ට ප්‍රතිපක්ෂ බැවින් සහෙතුක වූ අකුසලවිපාක කෙනෙක් නො ලැබෙති. චක්ඛු-සොත ඝාණ – ජිව්හා – කාය යි කියූ විඥාන පස ය, අරමුණු පිළිගන්නා කෘත්‍යය ඇති බැවින් සම්පටිච්ඡන යි කියූ මනොධාතු ය, අරමුණු තීරණය කරණ බැවින් සන්තීරණ යි කියූ මනොවිඤ්ඤාණධාතුය, යි ඒ සත් වැදැරුම් වේ. එය ලක්ෂණාදි වශයෙන් කුසලවිපාකාහෙතු යෙහි කී පරිදි යි.

හුදෙක් කුසලවිපාකයෝ ඉෂ්ටඉෂ්ටමඞ්‍යස්ථාලම්බන ඇත්තෝ ය. අකුසලවිපාකයෝ අනිෂ්ටඅනිෂ්ටමද්‍ධ්‍යස්ථාලම්බන ඇත්තෝ ය. ඔවුහු උපෙක්ඛා – සුඛ – සොමනස්සභෙදයෙන් තෙපරිදි වෙති. මොවුහු දුක්ඛ – උපෙක්ඛාවශයෙන් දෙපරිදි ය. කායවිඥානය දුඃඛ සහගත ය. සෙස්සෝ උපෙක්ඛාසහගතයහ. ඔවුනතුරෙහි උපෙක්ඛාවෙදනා තොමෝ හීන ය. දුක්ඛවෙදනා මෙන් ඉතාතියුණු නො වේ. මෙසේ කාමාවචරවිපාකවිඤ්ඤාණය සත් වැදැරුම් වූ අකුසලවිපාකයන්ගේ ද යට කියූ සොළොස් වැදැරුම් වූ කුසල විපාකයන්ගේ ද වශයෙන් තෙවිසි වැදැරුම් වේ.

රූපාවචරවිපාකවිඤ්ඤාණය, කුසලය මෙන් පස්වැදැරුම් ය. කාමාවචරකුසලය වනාහි සමාපත්තිවශයෙන් ජවනවීථියෙහි පවතී. විපාකවිඤ්ඤාණය, උපපත්තිභූමියෙහි පටිසන්ධි – භවඞ්ග – චුති වශ යෙන් පවතී.

අරූපාවචරවිපාකවිඤ්ඤාණය, කුසලය මෙන් සිවුවැදැරුම් ය. ප්‍රවෘත්තිභෙදය, රූපාවචරයෙහි කී පරිදි යි. කුසලය, සමාපත්තිවීථි යෙහි ජවන්වශයෙන් ද, විපාකය, පටිසන්ධි-භවඞ්ග-චුතිවශයෙන් ද පවතී.

ලොකොත්තරවිපාකය වනාහි, සිවුවැදැරුම් වූ මාර්ගසම්ප්‍රයුක්ත චිත්තයන්ගේ ඵලය බැවින් ඒ විසින් සිවුවැදැරුම් වේ. ඵලය මාර්ග වීථි විසින් ද, සමාපත්තිවීථි විසින් දැ යි දෙපරිද්දකින් පවතී.

මෙසේ සියලු විපාකවිඤ්ඤාණ, තෙවිසිවැදැරුම් වූ කාමාවචර විපාකවිඤ්ඤාණයන්ගේ වශයෙන් ද, පස්වැදැරම් වූ රූපාවචර විපාකවිඤ්ඤාණයන්ගේ වශයෙන් ද, සිවුවැදැරුම් වූ අරූපාවචර විපාකවිඤ්ඤාණයන්ගේ වශයෙන් ද, සිවුවැදැරුම් වූ ලොකොත්තර විපාකවිඤ්ඤාණයන්ගේ වශයෙන්දැ යි සතිස්වැදැරුම් වේ.

ක්‍රියාවිඤ්ඤාණ, කාමාවචර – රූපාවචර – අරූපාවචරභූමිභෙද යෙන් තෙපරිදි ය. නැවැත එහි කාමාවචරය, සහෙතුක-අහෙතුක

භෙදයෙන් දෙපරිදි වේ. අලෝභාදික්‍රියාහෙතුවිරහිතවූයේ අහෙතුක ය. එය, මනොධාතු-මනොවිඤ්ඤාණධාතු භෙදයෙන් දෙවැදෑරුම් වේ. මනොධාතුව, චක්ඛුර්විඤ්ඤාණාදීන්ගේ පෙරමුණෙහි හැසිරෙමින්, රූපාදී වූ අරමුණු හැඳින ගැණීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය, චිත්තපරම්පරාව අරමුණුවලට නැඟීම ය. පච්චුපට්ඨානය, රූපාදී වූ අරමුණුවල අභිමුඛවීම ය. පදට්ඨානය, භවඞ්ග සන්තතිය සිඳීම ය. **'චක්ඛුවිඤ්ඤාණාදි පුරෙචරරූපාදිවිජානනලක්ඛණා මනොධාතු, ආවජ්ජනරසා, රූපාදිඅභිමුඛභාවපච්චුපට්ඨානා, භවඞ්ගච්ඡෙදපදට්ඨානා'** ඔතොමෝ, සියලු අරමුණෙහි උපෙක්ඛා සහගතම ය.

ක්‍රියාමනොවිඤ්ඤාණධාතු තොමෝ, සාධාරණ-අසාධාරණ විසින් දෙපරිදි ය. සෙඛ-අසෙඛ-පුථුජ්ජන සියල්ලන්ට උපදනී සාධාරණ ය. හසිතොත්පාදක්‍රියාචිත්තය, රහතුන් වහන්සේට ලැබෙන්නක් බැවින් ඒ අසාධාරණ ය. සාධාරණ වූ උපෙක්ඛාසහගත අහෙතුක ක්‍රියාවිඤ්ඤාණය, සවැදෑරුම් අරමුණු හැඳිනීම ලකුණු කොට සිටියා ය. කෘත්‍යය වශයෙන්, පංචද්වාර මනොද්වාරයන්හි ව්‍යවස්ථාපිත ආවජ්ජනකෘත්‍යය ඇත්තේ ය. තථාභාවය පච්චුපට්ඨාන යි. අහෙතුක විපාකමනොවිඤ්ඤාණධාතුන්ගේ ද, යම්කිසි භවාඞ්ගයක්හුගේ ද යන අන්‍යතරයක්හුගේ පහවීම පදට්ඨාන යි. **'සාධාරණුපෙක්ඛා සහගතාහෙතුකකිරියාසළාරම්මණවිජානනලක්ඛණා, කිච්චවසෙන පඤ්චද්වාරමනොද්වාරෙසු වොට්ඨපනාවජ්ජනරසා, තථාභාවපච්චුපට්ඨානා, අහෙතුකවිපාකමනොවිඤ්ඤාණධාතු භවඞ්ගානං අඤ්ඤතරාපගමපදට්ඨානා'**

හසිතොත්පාද නම් වූ අසාධාරණසොමනස්සසහගතාහෙතුක ක්‍රියාචිත්ත ය, සවැදෑරුම් වූ අරමුණු හැඳිනීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය වන්නේ, අධිසංඛලිකප්‍රේතරූපාදි වස්තූන් කෙරෙහි රහතුන් වහන්සේගේ සිනා පහළකිරීම යි. තථාභාවය පච්චුපට්ඨාන යි. හදයවත්ථු පදට්ඨාන යි. **'අසාධාරණසොමනස්සසහගතාහෙතුකක්‍රියාසළාරම්මණවිජානනලක්ඛණා, කිච්චවසෙන අරහතං අනුළාරෙසු වත්ථූසු හසිතුප්පාදනරසා, තථාභාවපච්චුපට්ඨානා, එකන්තතො හදයවත්ථුපදට්ඨානා'** කාමාවචරඅහෙතුකක්‍රියාචිත්තය මෙසේ තුන් වැදෑරුම් ය.

සහෙතුකකාමාවචරක්‍රියාචිත්තය ද, අටවැදෑරුම් වූ කුසලචිත්තය මෙන් සොමනස්සාදිභෙදයෙන් අටවැදෑරුම් ය. වෙනස වන්නේ, හුදෙක් කුසලචිත්තය සෙඛයන්ට හා පුථුජ්ජනයන්ට ත්, ක්‍රියාචිත්තය, රහතුන් වහන්සේට ත් ඉපදීම ය. මේසේ සහෙතුක වශයෙන් භෙද වූ කාමාවචරක්‍රියා එකොළොසෙක් වේ. රූපාවචර-

අරූපාවචරක්‍රියා, ඒ කුසල්සිත් සේ පස්වැදෑරුම් ද, සිවුවැදෑරුම් ද වේ. මේ කුසල-ක්‍රියා දෙ කොටසෙහි වෙනස වන්නේ, සෙඛ පුථුජ්ජනයන්ට ඉපදීමෙන් විපාක දීමෙහි පොහොසත්බව හා රහතුන් වහන්සේට එසේ නොවනබවත් ය. මෙසේ තුන් බිම්හි සියලු ක්‍රියාවිඤ්ඤණය විසි වැදෑරුම් වේ.

පටිසන්ධි-භවඬග-ආවජ්ජන-දස්සන-සවන-ඝායණ-සායන-ඵුසන-සම්පටිච්ඡන-සන්තීරණ-වොත්ථපන-ජවන-තදාරම්මණ, චුතිවශයෙන් තුදුස් අයුරකින් පවත්නා වූ විඤ්ඤාණයෝ, එක්විසි කුසලවිඤ්ඤාණය-දෙලොස් අකුසලවිඤ්ඤාණය-සතිස් විපාකවිඤ්ඤාණය-විසිවැදෑරුම් වූ ක්‍රියාවිඤ්ඤාණය යි එකුන්අනූවෙක් වෙති. මෙකී විඤ්ඤාණයන් ප්‍රතිසන්ධි ආදී වූ ඒ ඒ කෘත්‍යයන්හි පවත්නා සැටි විසුද්ධිමග්ගාදියෙන් දත යුතු ය. පොත දිග්ගැසෙන බැවින් ඒ මෙහි නොආයේ ය.

අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්න-අධ්‍යාත්ම-බාහ්‍ය-ඕදාරික-සූක්ෂම-හීන-ප්‍රණීත-දූර-සන්තික යන අවකාශ එකොළොසෙහි ලා බෙදී ගියා වූ රූපරාශිය පිඬු කොට රූපඛන්ධය යි ද, එහි ම වූ වෙදනාරාශිය වෙදනාඛන්ධය යි ද, සංඥාරාශිය සංඥාඛන්ධය යි ද, වෙතනාරාශිය සංඛාරඛන්ධය යි ද කියනු ලැබේ.

සකලචතුසමුට්ඨානිකරූපය, රූපඛන්ධය යි ද, අටවැදෑරුම් වූ කාමාවචර කුසල්සිත් මූල් කොට ඇති එකුන්අනූවක් සමග එක් ව උපන්නා වූ වෙදනාව, වෙදනාඛන්ධය යි ද, සංඥාව, සංඥාඛන්ධය යි ද, එසසාදීහු, සංඛාරඛන්ධය යි ද, එකුන්අනූවක් සිත්, විඤ්ඤාණඛන්ධය යි ද, තවත් ක්‍රමයකින් මෙය දැක්විය හැකි ය.

ඛන්ධශබ්දය වනාහි, නොයෙක් අර්ථයන්හි වැටෙන්නෙකි. **'සෙය්‍යථාපි භික්ඛවෙ! මහාසමුද්දෙ -පෙ- මහාඋදකක්ඛන්ධොවෙව සංඛං ගච්ඡති'** යනාදියෙහි ආයේ රාශ්‍යර්ථයෙහි ය. **'ගවක්ඛන්ධොං බලක්ඛන්ධොං පුඤ්ඤක්ඛන්ධොං'** යනාදියෙහි ගුණයෙහි වැටේ. **'අද්දසා ඛොං භගවා මහන්තං දරුක්ඛන්ධං ගඞ්ගාය නදියා'** යනාදි තන්හි ආයේ ප්‍රඥප්තියෙහි ය. **'යං චිත්තං මනොං -පෙ- විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධොං'** යනාදි තන්හි රූඪිවශයෙන් ආයේ ය. මෙහි ලා රාශ්‍යර්ථය යෙදේ. එහෙයින් පඤ්චඛන්ධය, සමූහභාවය ලකුණු කොට සිටියේ ය. කොට්ඨාසාර්ථය ද මෙහි නොයෙදෙන්නේ නොවේ. රූපකොට්ඨාසය යි කිය හැකි බැවිනි.

ඉතාසැකෙවින් කියූ මේ සඛන්ධකථාවෙහි ප්‍රකීර්ණකථාව සැකෙවින් මෙසේ ය:- **සමුහභාම- පුබ්බාපර- අඛානපරිච්ඡද-**

එකුප්පාදනානානිරොධ- නානුප්පාදඑකනිරොධ- එකුප්පාද එකනිරොධ- නානුප්පාදනානානිරොධ- අතීතානාගතපච්චු- ප්පන්න- අජ්ඣත්තනිස්සබාහිර- ඔළාරිකසුඛුම - ගීනප්පණීත- දූර සන්තික- පච්චය-සමුට්ඨාන-පරිනිප්පන්න-සඞ්ඛත යි සොළොස් අයුරකින් එය බෙදී ගියා ය.

එහි **සමුගගම** යි කියේ, පඤ්චසකන්ධයාගේ හටගැන්ම ය. **ගබ්භසෙය්‍යකසමුගගමය-ඔපපාතිකසමුගගමය** යි ඒ දෙපරිදි ය. ගැබැ හෝනා සත්වයන් පිළිසිඳ ගන්නා කාලයෙහි සකන්ධපාවකය පෙර පසු නොවී එකට හටගණියි. ඒ අවස්ථාවෙහි පහළ වන කලලරූපය, කුඩාමැස්සකු විසින් පිවයුතු බිඳක් පමණ වේ ය යි මෙහි එක් ආචාර්‍යවාදයෙකි. තෙලෙහි ලා නගා ගත් ඉදිකටු අගක රැඳිසිටි තෙල්බිඳක් තරම් ය යි අනික් ආචාර්‍යවාදයෙකි. තෙලෙහි ලා නගා ගත් කෙස් අගක රැඳි තෙල්බිඳක් පමණය යි තවත් එකෙකි. මෙ දිවයිනැ වැසි මිනිසකුගේ කෙස්ගසක් අටට පැළූ කල්හි, ඉන් එක් කොටසෙක් උතුරුකුරුදිවයිනැ වැසි මිනිසකුගේ කෙසක් පමණ ය යි ද, ඒ කෙසක් තෙලෙහි ලා නගා ගත් කල්හි, එ අගැ රැඳි පහන් තෙල්බිඳ පමණ ය යි තවත් එකෙකි. මෙහිලා ආ මේ හැම ආචාර්‍යවාදයක් ම බැහැර කොට, කලලරූපය, හිමාලය වන පෙදෙසැ උපන් ඉතාසියුම් ලොම් ඇති එළුවකුගේ ලොමක්, පහන් තෙලෙහි ලා නගා ගත්විට, එහි අගැ රැඳි තලතෙල්බිඳ තරම් ය යි කියන ලද්දේය. මෙය ඉතා පහන් ය. නො කැළඹුනේ ය. පහන් තලතෙල්බිඳක් බඳු පැහැ ඇත්තේ ය. ඒ මෙසේ වදාළ සේක:-

"නිලතෙලස්ස යථාබින්දු-සප්පිමණ්ඩෝ අනාවිලෝ,
එවං වණ්ණපටිභාගං-කලලං සම්පවුච්චති"යි.

මෙසේ සවලප වූ මේ රූපසමූහයෙහි **වසතුදශක-කායදශක -භාවදශක** යි දශක තුනෙක් ඇත්තේ ය.

එහි වසතුදශකය, පඨවි-ආපෝ-තෙජෝ-වායෝ-වණ්ණ-ගන්ධ -රස-ඔජා-ජීවිතින්ද්‍රිය-හදයවත්ථු යන කොටස් දසයෙන් යුක්ත ය. කායදශකය, වසතුදශකයෙහි මූලින් කී නව කොටස ත් කායප්පසාදය ත් යන දස කොටසින් යුක්ත ය. භාවදශකය, ඉත්‍රීභාව-පුම්භාව යි දෙපරිදි ය. ඉත්‍රියට ඉත්‍රීන්ද්‍රියය ගේ වශයෙනු ත් පුරුෂයා හට පුරුෂෙන්ද්‍රියයගේ වශයෙනු ත් මේ ලැබේ. ඉත්‍රීභාවය හෝ පුරුෂභාවය පඨවී ආදී වූ නව කොටස හා යෙදී සිටියේ, භාවදශක යි කියනු ලැබේ.

මෙසේ ගැබැ හෝනා සත්වයනට පිළිසිඳ ගන්නා අවදියෙහි උඩත් පිරිසයින් කර්මජරූප තිසෙක් ලැබේ. මේ තිස ම කර්මයෙන් හටගන්නේ, රූපසකන්ධ යි ද කියනු ලැබේ.

ප්‍රතිසන්ධිචිත්තය හා එක් ව උපදනා වෙදනා-සංඥා-සංස්කාර තුන වෙදනාසකන්ධ, සංඥාසකන්ධ, සංස්කාරසකන්ධ යි ගැණේ. ප්‍රතිසන්ධිචිත්තය, විඥානසකන්ධ නම් වේ. ගැබැ හෝනා සත්වයනට පිළිසිඳ ගන්නා කෙණෙහි ම පංචසකන්ධයෝ පරිපූර්ණ ව ලැබෙත්. නපුංසකප්‍රතිසන්ධියෙහි භාවදශකය නො ලැබේ. එහි වන්නේ දශක දෙකක්හුගේ වශයෙන් කර්මජරූප විස්සෙකි.

ඔපපාතිකසත්වයනට පිළිසිඳ ගන්නා කාලයෙහි යට කියූ දශක තුන චක්ඛුදසක-සොතදසක-ඝාණදසක-ජිව්හාදසක යන දශක සතර ත් එකතු ව දසක සතෙක් ලැබේ. එහි චක්ඛුදසකය නම්, චක්ඛු-ජීවිත-පඨවි-ආපො-තෙජො-වායො-වණ්ණ-ගන්ධ-රස-ඔජා යන මේ දසය යි. චක්ඛු යන්න වෙනුවට ඒ අස් කොට අනික් නවය හා, සොත-ඝාණ-ජිව්හා යනු යෙදීමෙන් සොතදසක, ඝාණ දසක, ජිව්හාදසක, යි කියනු ලැබේ. මෙහි ද නපුංසකයාහට භාව දසකය නැත. මෙසේ සම්පූර්ණ වූ ආයතන ඇති ඔපපාතිකසත්ව යන්ට ලැබෙන සම සත්තැවක් කර්මජරූප ත් නපුංසකසත්වයාගේ වශයෙන් ලැබෙන සම සැටක් කර්මජරූපත් රූපසකන්ධය යි කියති. වෙදනා සකන්ධාදීහු ද යටකී සේ වෙති. ප්‍රතිසන්ධික්ෂණයෙහි ම ඔප පාතිකයනට ත් සකන්ධයෝ පරිපූර්ණ ව ලැබෙත්. මේ සකන්ධයන් පිළිබඳ සමුග්ගමය යි.

පුබ්බාපර යන්නෙන් කියැවෙනුයේ නාම-රූප දෙකින් කුමක් පළමු ව හට ගණී ද, පසුව හටගන්නේ කුමක් ද යන වග යි.

මවුකුසැ හෝනා සත්වයන්ගේ පෙර පසු නො වී උපන් සකන්ධ අතුරෙහි, පළමු කොට රූපය තෙමේ, රූපය පළමු කොට උපදවයි. නාමය තෙමේ, රූපය නො උපදවයි. **'රූපං රූපමෙව සමුට්ඨාපෙති න අරූපං'** යනු ආචාර්‍යවචන යි. පිළිසිඳ ගන්නා වූ සිතට රූප ඉපදවීමෙහි ශක්තියක් නැත්තේ ය. එබැවින් සකල සත්වයන් ගේ ප්‍රතිසන්ධිචිත්තය, රහතුන් වහන්සේගේ චුතිචිත්තය, දිවිපඤ්ච-විඤ්ඤාණය හා, අරූපවිපාක සිත් සතරත් යන සොළොස් වදැරුම් වූ විපාකචිත්තයෝ රූපය නො උපදවති. ඔවුන් අතුරෙහි ප්‍රතිසන්ධි චිත්තය, නිඃශ්‍රය වූ වස්තුරූපයාගේ දුබල බැවින් නො පිහිටි බැවින්, හෙතුවිකල බැවින්, ආගන්තුක බැවින් යන මේ කරුණෙන් රූපය නො ද උපදවයි.

ප්‍රතිසන්ධිචිත්තය හා සමග පැවැති හෘදයවස්තුරූපය තෙමේ, පිළිසිඳ ගත්තා ඇසිල්ලෙහි ඉතා දුර්බල වේ. හෘදයවස්තුරූපයාගේ ඒ දුර්බලත්වය හෙතු කොට ප්‍රතිසන්ධිචිත්තයට රූප උපදවනු නොහැකි ය. මහාප්‍රපාතයක වැටෙන පුරුෂයකුට අනිකකුහට උපකාරයක් කළ නොහැක්කේ යම්සේ ද, එ මෙන් ප්‍රතිසන්ධිචිත්තය, කර්ම ශක්තියෙන්, බහාලනලද බැවින් නොපිහිටිය බැවින් එයට රූප ඉපදවීමෙහි ශක්තියක් නැත. ප්‍රතිසන්ධිචිත්තය, හෘදයවස්තුරූපය සමග පෙරපසු නොවී උපන්නේ නමුත් හෘදයවස්තුරූපය පෙරාතුව ඉපිද එයට ප්‍රත්‍යය වන්නට අසමර්ථ වේ. ඉදින් සමර්ථ නම්, ප්‍රතිසන්ධිචිත්තය රූප උපද වන්නේ ය.

විපඤ්චවිඤ්ඤාණය ත් පඤ්චවොකාරභවයෙහි රහතුන් වහන්සේගේ චුතිචිත්තය ත් පුරෙජාතප්‍රත්‍යය ලද්දේ, කවර හෙයකින් රූප නොඋපදවා ද? යනු මෙහි ලා නැගෙන ප්‍රශ්නයෙකි. යම්කිසි පඤ්චවොකාරභවයෙක හෘදයවස්තුරූපය තෙමේ, පෙරාතුව ඉපිද ප්‍රත්‍යය වන්නට සමර්ථ වූයේ ද, එසේ චක්ෂුරාදීන්ගේ ප්‍රවේණිය ගැළපී යේ ද, හෙවත් එකක් ඇතිවිට ම අනිකක්හුගේ නිරොධය වේ ද, අතර දක්වා සිදියාමෙක් නොවේ ද, ඒ පඤ්චවොකාර භවයෙහි ද සිත ධ්‍යානාඞ්ගයන්ගෙන් නොපිරිහුනේ ම රූපය උපදවයි. නොඑසේ වූයේ නොඋපදව සි යනු එයට පිළිතුරු සි.

ප්‍රතිසන්ධිචිත්තය, උත්පාදක්ෂණයෙහි පුරෙජාතප්‍රත්‍යය නොලත් හෙයින් රූප නොඋපදවත ත්, උත්පාදක්ෂණයෙහි වූ හෘදයවස්තු රූපයෙහි ලත් පුරෙජාතප්‍රත්‍යය ශක්තිය ඇත්තේ ස්ථිති-භඞ්ගක්ෂණ දෙක්හි රූපය උපදවා ද? යනු ප්‍රශ්නයෙකි. ස්ථිති-භඞ්ගක්ෂණ දෙක්හි සිත රූප උපදවා නම්, ප්‍රතිසන්ධිචිත්තය ත් රූප උපදවාය, සි කිය යුතු ය. කිය යුත්තේ, ඒ ක්ෂණදෙක්හි ද සිත රූප නොඋපදවන බව සි.

නසිහතුකැකුලෙක් පොළොවෙන් මතු වන්නේ, පස් සුණු ටිකක් ගෙණ ම මතු වන්නේ ය. එ මෙන් සිත ද, පූර්වයෙහි හටගත් හෘදයවස්තුරූපය ඇසුරු කොට උත්පාදක්ෂණයෙහි පඨවි-ආපෝ-තෙජෝ-වායෝ-වණ්ණ-ගන්ධ-රස-ඔජා, යන අවිනිබ්භොග රූපය ගෙණ ම උපදනේ ය. ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි හෘදය වස්තුරූපය තෙමේ, පුරෙජාත ව ප්‍රත්‍යය වන්නට අසමර්ථ වේ. මෙසේ ප්‍රත්‍යයන්ගේ විකලත්වයෙන් ද ප්‍රතිසන්ධිචිත්තය රූප නොද උපදවයි.

නොගියව්රු පෙදෙසකට ගිය ආගන්තුකපුරුෂයෙක් එහි වූ අනිකකුහට 'තොපට බත් පැන් ගද මල් ආදිය දෙමි' සි කියන්නට අපොහොසත් වේ. තමන්ට එපෙදෙස විෂය නොවන බැවිනුත්,

තමන් එහි අපොහොසත් බැවිනු ත් තමන් ආගන්තුක බැවිනුත් ය, එසේ කියන්නට අසමර්ථ වනුයේ. එමෙන් ප්‍රතිසන්ධිචිත්තය ද, ආගන්තුක වූයේ රූප නොං උපදවයි. තවද සමහිස් කර්මජරූප, චිත්තජරූපයන්ගේ සථානය ගෙණ සිටි බැවින්, ප්‍රතිසන්ධිචිත්තය රූප නොං උපදවයි. රහතුන් වහන්සේගේ චුතිචිත්තය වෘත්තදුඃඛ මූලය සත්හුන් කළ බැවින් රූප නොං උපදවයි. රහතුන් වහන්සේ ගේ සියලු භවයන්හි වෘත්තදුඃඛමූලය සන්සිදුනේ වේ. උන්වහන් සේට පුනර්භවසන්තතියක් නැත. සොතාපන්නයාගේ වෘත්තදුඃඛ මූලය අන්බැව් සතක් තිබිය දී සන්සිඳෙයි. එහෙයින් ඔහුගේ චුති චිත්තය තෙමේ අන්බැව් සතෙක්හි රූප උපදවයි. සකෘදාගාමී පුද්ගලයාගේ චුතිචිත්තය, අන්බැව් දෙකෙක රූප උපදවයි. අනාගාමී හුගේ චුතිචිත්තය, රූප උපදවනුයේ එක් අන්බවෙක්හි ය.

දවිපඤ්චවිඤ්ඤාණයෙහි ධ්‍යානාඞ්ග – මාග්ගාඞ්ගසමප්‍රයුක්තහෙතු නැත. චිත්තාඞ්ග දුර්බල බැවින් දවිපඤ්චවිඤ්ඤාණය රූප නොං උපද වයි. අරූපභවයෙහි ඉපැද විය යුතු වූ රූපයක් නැති බැවින් අරූපා වචරවිපාකයෝ රූප උදවත්. කාමාවචර වූ කුසල්සිත් අටය, ද්වෙස මූලික දෙ සිත හැර අනික් අකුසල්සිත් දසය, ක්‍රියා සිත් නවය, අරූපාවචර වූ කුසල්සිත් සතර හා ක්‍රියා සිත් සතරය, මාර්ග සිත් තුන හා පලසිත් සතරය යන දෙ සාළිස් චිත්තයෝ අරූපභූමියෙහි රූප නොං උපදවත්. මෙසේ ප්‍රතිසන්ධිචිත්තය රූප නොං උපදවා.

පළමු කොට රූප උපද වනුයේ ඍතුව යි. ඍතු නම් පිළිසිඳ ගන්නා ඇසිල්ලෙහි හටගත් සමහිස් කර්මසමුත්ථානරූපයන්ගේ අභ්‍යනන්තරයෙහි වූ තෙජොධාතුව යි. ඒ තෙජොධාතුව ප්‍රතිසන්ධිය පිළිබඳ සන්තතික්ෂණයට පැමිණ අට වැදෑරුම් වූ අවිනිබ්භොගරූපය උපදවයි. ඍතු ව හිමිහිට කෙරෙණ නිරොධය ඇත්තෙකි. සිත යුහුව කෙරෙණ නිරොධය ඇත්තෙකි. ඍතු ව තිබියදීම සොළොස් සිත් කෙනෙක් ඉපිද නිරුද්ධ වෙත්. ඒ සොළොස් සිත් අතර පිළිසඳ ගන්නා සිතට අනතුරු වූ ප්‍රථමභවාඞ්ගචිත්තය, උත්පාදක්ෂණ යෙහි ම අවිනිබ්භොගරූප අට උපදවයි. ශබ්දය උපදනා කාලයෙහි ඍතු-චිත්තයෝ ශබ්දනවක නම් වූ රූපකලාපය උපදවත්. චිත්ත යාගේ සන්තතික්ෂණයට පැමිණි කබළීකාරාහාරය ද අවිනිබ්භොග රූපය උපදවයි. මවුගැබ හෝනා සත්වයාට කබළීකාරාහාරය ලැබෙන්නේ මවගෙනි. ඒ කීහ මෙසේ:–

"යඤ්චස්ස භුඤ්ජති මාතා-අන්නං පානං ච භොජනං,
තෙන සො තත්ථ යාපෙති-මාතුකුච්ඡිගතො නරො"ති.

ඔජා තොමෝ, සන්තීක්ෂණයට පැමිණියා, අවිනිබෙහාගරූප උපදවා. මව විසින් කන බොන ආහාර පානයන්ගේ ඔජාව මවුකුසැ උපන් සත්වයාගේ සිරුරෙහි පිහිටන්නී, සත්දිනක් හෝ තුදුස් දිනක් ගත වූ පසු ය. යම් දවසෙක ඒ ඔජාව මවුකුසැ උපන් සත්වයාගේ සිරුරෙහි පිහිටා ද, එකල්හි ඕ තොමෝ අවිනිබෙහාගරූප උපදවයි. ප්‍රකෘතියෙන් කෑම බීම ඇති තැනෙක උපන් කෑයුතු දෙය කන පිය යුතු දෙය බොන ඔපපාතිකයනට ද සන්තීක්ෂණයට පැමිණි ඔජා තොමෝ රූප උපදවයි.

කෑම බීම නැති, වන පෙදෙසෙකැ ඉපිද මහත් සාදුකින් පෙළෙන ඔපපාතිකසත්වයකු මුඛයෙහි කෙල පෙරළ පෙරළා ගිලින කල්හි සන්තීක්ෂණයට පැමිණි ඔජා තොමෝ රූප උපදවා. මෙසේ පස්වැදෑරුම් වූ රූපකොටස් අතුරෙහි තෙජෝධාතුව ත් කබලිංකාරාහාරය ත් යන දෙක රූප උපදවයි. රූප-චිත්ත-කර්ම-චෙතනා, සිකියන රූපජනකප්‍රත්‍යයයන් අතුරෙහි රූපය තෙමේ, උත්පාද-භඞ්ගක්ෂණ දෙක්හි දුබල වේ. බලවත් වනුයේ සන්තීක්ෂණයෙහි ය. එහෙයින් ඒ සන්තීක්ෂණයෙහි රූප ඉපදවීම කරයි. සිත, සන්තී-භඞ්ගක්ෂණ දෙක්හි දුර්බල වේ. උත්පාදක්ෂණයෙහි බලවත් වේ. සිත රූප උපද වනුයේ ඒ ක්ෂණයෙහි ය. කර්මචෙතනාව, නිරුද්ධවූවා ම ප්‍රත්‍යය වේ. අතීතභවයෙහි කප්කෙළලක්ෂයකින් මත්තෙහි ද රැස් කළා වූ කර්මය, මේ වර්තමානභවයෙහි ප්‍රත්‍යය වේ. වර්තමානභවයෙහි රැස් කළා වූ කර්මය, අනාගතභවයෙහි කප්කෙළලක්ෂයක්හුගේ අවසන්හි ද ප්‍රත්‍යය වන්නේ ය. මේ සකඞ්ගයන් පිළිබඳ පුබ්බාපර නියමය යි.

අද්ධානපරිච්ඡේදය යි කියේ කාලනියමය යි. රූපය තෙමේ, සෙමින් සෙමින් කෙරෙණ බිඳීම් ඇත්තේ ය. නාමය තෙමේ, වහා බිඳෙන්නේ ය. රූපධර්මයක් පවත්නා කාලයතුළ සිත් සොළසක් ඉපිද නිරුද්ධ වේ. සතලොස්වන සිත සමග ඒ රූපධර්මය බිඳී යයි. 'පල නෙලා ගණිමි' යි සිතා, යම් කිසිවකු විසින් ගසකට පොලු පහරක් ගැසූ කල්හි ගෙඩි ත් කොළ ත් එකවිට නැටිවලින් ගැලවී බිම වැටේ. එහිදී බර බැවින් පළමු කොට ගෙඩි බිමැ වැටේ. සැහැල්ලු බැවින් කොළ පසුව බිමැ වැටේ. පොලු පහරින් එකවිට ගෙඩි ත් කොළ ත් නැටිවලින් ගැලවී ගියාක් මෙන් පිළිසඳ ගන්නා කාලයෙහි රූපාරූපධර්මයන්ගේ එකවිට පහළවීම දත යුතු ය. බර බැවින් පළමු කොට ගෙඩි බිම වැටෙන්නා සේ රූපය පවත්නා කල්හි ම සොළොස්වැදෑරුම් වූ චිත්තයන්ගේ ඉපිද නිරුද්ධවීම සැලකිය යුතු ය. රූපය සතලොස්වන සිත සමග නිරුද්ධ වී යෑම,

සැහැල්ලු බැවින් කොළ පසුව බිම හෙන්නා සේ ය. එහෙත් රූපය තෙමේ, නාමය හැර, නාමය තෙමේ රූපය හැර, පවතින්නට අසමර්ථ වේ.

නාමරූපධර්මයන්ගේ පැවැත්ම සම පමණ වේ. කොට පා ඇති පුරුෂයකු හා දිග් පා ඇති පුරුෂයකු එකතුව යන කල්හි දිග් පා ඇති පුරුෂයා යම්තරම් කලකින් එක් පියවරක් නගා තබා ද, කොට පා ඇති පුරුෂයා ත් එතරම් කලකින් ම පියවර ලඟ පියවර නගා තබා සොළොස් පියවරකින් ගමන් කෙරෙයි. දිග් පා ඇති පුරුෂ තෙමේ, කොට පා ඇති පුරුෂයාගේ සොළොස් පියවර, තමාගේ පිය ඇද නගා එක් ම පියවරක් කෙරෙයි. මෙසේ ඇතිවිට එකෙක් අනිකා ඉක්මවා යන්නට අසමර්ථ වේ. දෙදෙනාගේ ම ගමන සම ප්‍රමාණ වේ. මෙ ද එ පරිදි ය. නාමය කොට පා ඇති පුරුෂයා සේ ද, රූපය දිග් පා ඇති පුරුෂයා සේ ද දත යුතු ය. දිග් පා ඇති පුරුෂයා එක් පියවරක් නගා තබන කාලයෙහි කොට පා ඇති පුරුෂයා සොළොස් පියවරක් නගා තැබීම මෙන් රූපය පවත්නා කල්හි ම නාමධර්මයන් කෙරෙහි ඇතුළත් සොළොස් වැදැරුම් වූ චිත්තයන්ගේ ඉපිද බිඳී යෑම ද, කොට පා ඇති පුරුෂ යාගේ සොළොස් පියවරෙහි, දිග් පා ඇත්තහු තම පිය ඇද නගා එක් පියවරක් කිරීම මෙන් රූපය සතළොස්වන සිත සමග බිඳී යෑම ද, උන් දෙන්නා උතුන් නො හැර පියා සම සේ ගමන් කිරීම මෙන් නාමය රූපය ත්, රූපය නාමය ත් නො හැර පියා සම පමණින් පැවැත්ම ද දත යුත්තේ ය. මේ අද්ධානපරිච්ඡේදය යි.

එකුප්පාදනානානිරොධ යි කියේ, එක් ව ඉපදීම හා වෙන් ව මිදීයෑම ය. පළමු කොට උපදිනුයේ ප්‍රතිසන්ධි චිත්තය යි. අනතුරුව දෙවැන්න පටන් සොළොස්වැන්න තෙක් උපදින්නෝ භවාඞ්ග-චිත්තයෝ ය. ඒ එක් එක් සිතකට උත්පාද-ස්ථිති-භඞ්ග වශයෙන් ක්ෂණ තුන තුන ඇත්තේ ය. ඒ සොළොස් සිතෙහි තුන් තුන් ක්ෂණයන්හි සමතිස් සමතිස් කර්මජරූපයෝ හට ගණිති. සමතිස් කර්මජරූපයන් අතුරෙහි ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළ වූ කර්මජරූපය සතළොස් වැනි වූ භවාඞ්ගචිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි ම බිඳී යයි. ප්‍රතිසන්ධිචිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි පහළ වූ කර්මජරූපය, සතළොස්වන චිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි ම බිඳෙයි. ප්‍රතිසන්ධිචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි පහළ වූ කර්මජරූපය සතළොස්වන චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ම නිරුද්ධ වෙයි. මෙ පරිද්දෙන් දෙවන භවාඞ්ගචිත්තය පටන් තම තමන් අයත් සත-ළොස්වන සිත හා යොදා මේ ක්‍රමය දතයුතු ය. මේ තික සොළො සෙහි තික අටසාළිසෙක් වේ. මේ කියන ලද්දී අටසාළිස් කර්මජ

රූපයන්ගේ ප්‍රවෙණිය යි. මෝ රූ දුවල් දෙක්හි ගලා බස්නා මහාගංවතුරක් සේ හැම දෙනකු පිළිබඳ ව නො සිඳ පවතී. මේ එකුපපාදනානානිරෝධය යි.

නානුප්පාදඒකනිරෝධ යි කීයේ, වෙන් ව ඉපැත් ම හා එක් ව මිදී යෑම යි. නානුප්පාදඒකනිරෝධයෙහි ආයුසංඛාරයාගේ අවසානයෙහි ඡොඩශචිත්තයන්ගේ වාරය පැමිණි කල්හි යට සොළොස ය, මත්තෙහි සොළොස ය යි ඡොඩශක දෙකක් එකතු කළ යුතු ය. යට සොළොසෙහි ප්‍රථමචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළ වූ සමතිස් කර්මජරූපය තෙමේ, මත්තෙහි වූ සොළොසෙහි ප්‍රථම චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ම නිරුද්ධ වේ. සිතිති ක්ෂණයෙහි හටගත් සමතිස් කර්මජරූපය තෙමේ, ඒ මතු සොළසෙහි වූ ප්‍රථමචිත්තයාගේ සිතිතික්ෂණයෙහි නිරුද්ධ ව යයි. භඞ්ගක්ෂණයෙහි හටගත් සමතිස් කර්මජරූපය තෙමේ, ඒ මතු සොළොසෙහි වූ ප්‍රථමචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි නිරුද්ධ වේ. යට සිටි සොළසෙහි වනාහි, එසේ ම දෙවන චිත්තයාගේ –පෙ– සොළොස්වන චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි පහළ වූ සමතිස් කර්මජරූපය තෙමේ, චුති චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ම නිරුද්ධියට පැමිණේ. යට සිටි සොළසෙහි සොළොස්වන චිත්තයාගේ සිතිතික්ෂණයෙහි හටගත් සමතිස් කර්මජරූපය තෙමේ, චුතිචිත්තයාගේ සිතිතික්ෂණයෙහි ම බිඳී යයි. භඞ්ගක්ෂණයෙහි පහළ වූ කර්මජරූපය තෙමේ, චුතිචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ම නිරුද්ධ වෙයි. එතැන් පටන් කර්මජරූපයන්ගේ පරම්පරාවක් නො පවත්නී ය. කර්මජරූපපරම්පරාවක් ඉන් ඔබ්බෙහි පවතී නම්, සත්ත්වයෝ ජීවිතක්ෂයට පත් නො වෙති. නො දිරන්නෝ නො මැරෙන්නෝ වෙති. **'සත්තරසමස්ස භවඞ්ගචිත්තස්ස උප්පාදක්ඛණෙයෙව නිරුජ්ඣති'** යනාදි නයින් 'එක් සිතක්හුගේ උත්පාදක්ෂණයෙහි උපන්නා වූ රූපය තෙමේ, අන් සිතක උත්පාදක්ෂණයෙහි නිරුද්ධ වේ' යි අටුවායෙහි ආයේ ය. එහෙත් මේ අටුවාව **'යස්ස කායසඞ්ඛාරෝ නිරුජ්ඣති තස්ස චිත්තසඞ්ඛාරෝ නිරුජ්ඣතී ති ආමන්තා'** යන යමකප්‍රකරණ පාලිය හා විරුද්ධ වන්නී ය. කායසංඛාරය නම්, සිත හේතු කොට හටගන්නා ආශ්වාසප්‍රශ්වාස වාතය යි. සිත හේතු කොට හටගන්නා රූපය, චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ඉපිද යම්තාක් කල් අනික් සිත් සොළොසෙක් උපදී ද, ඒතාක් පවතී.

ඒ සොළොස් සිත් අතුරෙන් සියලු සිත්වලට පසුව උපන් සිත ඒ සමග නිරුද්ධ වේ. මෙසේ යම් සිතක් සමග උපදී ද, ඒ සිතෙහි පටන් සතළොස්වන සිත සමග නිරුද්ධියට පැමිණේ. කිසියම් සිතෙක උත්පාදක්ෂණයෙහි හෝ, සිතිතික්ෂණයෙහි හෝ නිරුද්ධ

නො වේ. එසේ ම කිසියම් සිතෙක ස්ථිතික්ෂණයෙහි හෝ භඞ්ග ක්ෂණයෙහි හෝ නො උපදියි. චිත්තසමුත්ථානරූපයන්ගේ මේ ස්වභාවධර්මය යි. මෙ පරිද්දෙන් නියම වශයෙන් චිත්තසංස්කාරය සමග කායසංස්කාරය එකවිට නිරුද්ධ වේ ය යි වදාළ සේක. චිත්ත සමුත්ථානරූපයාගේ හා අනික් කර්මාදිසමුත්ථානරූපයාගේ ද ක්ෂණ නියමය සමාන වේ. දෙකෙහි ම ක්ෂණ නියමය එක හැටි ය. ක්ෂණ නියමය සමාන බැවින් ප්‍රතිසන්ධිචිත්තය සමග උපන් කර්මජරූපය එතැන් පටන් සතළොස්වන සිත සමග නිරුඬ වේ. පිළිසිඳ ගන්නා සිතෙහි ස්ථිතික්ෂණයෙහි උපන් කර්මජරූපය තෙමේ, අටළොස්වන සිතේ උත්පාදක්ෂණයෙහි නිරුද්ධ වේ. ප්‍රතිසන්ධිචිත්තයාගේ භඞ්ග ක්ෂණයෙහි උපන් කර්මජරූපය තෙමේ, අටළොස්වන සිතෙහි ස්ථිති ක්ෂණයෙහි නිරුද්ධියට යන්නේ ය. පශ්චිම වූ කර්මජරූපයාගේ බිඳියෑමෙන් මත්තෙහි ඍතුජරූපපරම්පරාව ඉතිරි වේ. නානුප්පාද එකනිරොධය මෙසේ ය.

එකුප්පාදෙකනිරොධ යි කියේ, එක් ව ඉපැත්ම හා එක් ව බිඳීයෑම ය. රූපය වනාහි රූපය හා සමාන ඉපදුම් ඇත්තේ ය. එසේ ම සමාන වූ බිඳුම් ඇත්තේ ය. නාමය, නාමය සමාන ඉපැදුම් බිඳුම් ඇත්තේ ය. මේ හැටියෙන් එකුප්පාදෙකනිරොධය දතයුතු ය.

නානුප්පාදනානානිරොධ යි කියේ, වෙන් ව උපදින වෙන් ව බිඳෙනබව ය පාතලින් උඩ කෙස්අගින් යට හම කෙළවර කොට ඇති මේ සිරුරෙහි ඒ ඒ තැනැ චතුර්විධසන්තතිරූපය තෙමේ, ඝන වූ සමූහයක් සේ පවත්නේ ය. මෙසේ පවත්නා සන්තතිරූප යාගේ එකොත්පාදාදිභාවය ගණන් ගත යුතු නො වේ. ගමන් ගත් වේයන් රැසක් හෝ කුහුඹුවන් රැසක් දකින්නකුට ඒ වේරැස හෝ කුහුඹුරැස එකාබද්ධ වූ සේ පෙණේ. එහෙත් එකාබද්ධ වූයේ නො වේ. එ පරිද්දෙන් චතුසන්තතිරූපයන්ගේ ද අනික් රූපයක්හුගේ උත්පාදක්ෂණයෙහි අනික් රූපයකගේ ඉපදීම ද, පැවැත්ම ද, බිඳී යෑම ද වේ. අනික් රූපයකගේ ස්ථිතික්ෂණයෙහි අනික් රූපයකගේ ඉපදීම ද, පැවැත්ම ද, බිඳී යෑම ද වේ. අනික් රූපයකගේ භඞ්ග ක්ෂණයෙහි අනික් රූපයකගේ ඉපදීම ද, පැවැත්ම ද, බිඳී යෑම ද වේ. මේ නානුප්පාදනානානිරොධය යි.

අතීතානාගතපච්චුප්පන්න යන මෙයින් කියනුයේ, ගිය කාලය, එන කාලය, පවත්නා කාලය, යන කාලතුනය. ඒ වශයෙනුදු පංචස්කන්ධය දත යුත්තේ ය.

පිළිසඳ ගත් තැන් පටන් ඉකුත් වූ භවයන්හි උපන් රූපය, අනතුරු ඉකුත් වූ භවයෙහි උපන්නේ හෝ කප්කෙළසිය දහස කින් මත්තෙහි උපන්නේ හෝ අතීත වේ. චුතිය පටන් නො

පැමිණි භවයන්හි මතු උපදින රූපය, අනාගතයට ආසන්න භව යෙහි උපදින්නේ හෝ කප්කෙළසියදහසකින් මත්තෙහි උපදින් නේ හෝ අනාගත වේ. චුති-පටිසන්ධි දෙකට අතර පවත්නා රූපය, පච්චුපන්න වේ. මෙහිලා තවත් ක්‍රමයෙක් වේ. උත්පාද-ස්ථිති-භඞ්ග වශයෙන් රූපයෙහි ක්ෂණ තුනෙක් වේ. මේ ක්ෂණ තුනට පැමිණ නිරුඬ වූ රූපය, ඉතා ආසන්න කාලයෙහි නිරුඬ වූයේ හෝ අතීත කාලයෙහි කප්කෙළ සිය දහසකින් මත්තෙහි නිරුද්ධ වූයේ හෝ අතීත නම්. මේ ක්ෂණයන්ට නො පැමිණියා වූ රූපය, එක් චිත්ත ක්ෂණමාත්‍රයෙක්හි නො පැමිණියේ හෝ, අනාගත නම්. මේ ත්‍රිවිධ ක්ෂණයන්ට පැමිණියා වූ රූපය තෙමේ, පච්චුප්පන්න නම්. තවත් ක්‍රමයෙක් එහි ම. අද්ධාන-සන්තති-සමය-ඛණ වශයෙන් අතීත වේ. එමෙන් අනාගතය හා පච්චුපන්නය ද ලැබේ.

එක් සත්වයකු පිළිබඳ එක් ආත්මභාවයෙහා ප්‍රතිසන්ධියෙන් පූර්ව යෙහි උපන් රූපය අතීත නම්. චුතියෙන් මත්තෙහි උපන් රූපය අනාගත නම්. පටිසන්ධි-චුති දෙදෙනාතර උපන් රූපය, පච්චුප්ප න්න නම්. සමානසභාව ඇති එක් ඍතුවකින් හටගන්නා වූ රූපය ද එක් ආහාරහෙතුවකින් හට ගන්නා වූ රූපය ද පූර්ව්‍යපරකාල යන්හි ප්‍රවෘත්තිවශයෙන් පවත් වන්නේ නමුත් පච්චුප්පන්න නම් වේ. ඒ පච්චුප්පන්නකාලයෙන් පෙර විසභාග ඍතු ආහාරයෙන් හටගන්නා රූපය අතීත නම්. පසුව හටගන්නා රූපය අනාගත නම්. එක් චිත්තවීථියක එක් ජවනවාරයෙක්හි හා සමාපත්තිවාර යෙක්හි උපදනා චිත්තජරූපය, පච්චුප්පන්න නම්. ඒ පච්චුප්පන්නය කෙරෙන් පෙර උපන් චිත්තජරූපය අතීත නම්. පසුව උපදනේ අනාගත නම් කර්මයෙන් උපදනා රූපයෙහි මෙන් සන්තතිවශ යෙන් කිය යුතු වූ අතීතාදිභෙදයෙක් නැත්තේ ය. ඍතු-ආහාර-චිත්තසමුත්ථාන වූ රූපයන්ට ම අනුබල දිම්වශයෙන් කර්මසමුත්ථාන රූපයාගේ අතීතාදිභෙදය දත යුතු ය. මොහොත, පෙරවරු, පස් වරු, රෑ දුවල් යනාදී වූ කාලයන් අතුරෙහි පෙළ සැදීම්වශයෙන් පවත්නා ඒ ඒ කාලය පච්චුප්පන්න නම්. එයින් පෙර පැවැති කාලය අතීත නම්. පසුව පවත්නා කාලය අනාගත නම්. උත්පා දක්ෂණ තුනට ඇතුළත් රූපය පච්චුප්පන්න නම්. එයින් පෙර උපන් රූපය අතීත නම්. පසුව උපන් රූපය අනාගත නම්. මේ එහි තවත් ක්‍රමයෙක් වේ. ඉක්මවා සිටි හෙතුකෘත්‍යය හා ප්‍රත්‍යය කෘත්‍යය ඇති රූපය, අතීත නම්. නිමකරණලද හෙතුකෘත්‍යය හා නිම නොකළ ප්‍රත්‍යය කෘත්‍යය ඇති රූපය, පච්චුප්පන්න නම්. හෙතුකෘත්‍යයට හා ප්‍රත්‍යය කෘත්‍යයට නො පැමිණි රූපය අනාගත

නම්. ස්වකීය කෘත්‍යය හා පවත්නා ක්ෂණයෙහි උපදනා රූපය පච්චුප්පන්න වේ. ඒ ස්වකීය කෘත්‍යක්ෂණයෙන් පෙර උපන් රූපය, අතීත වේ. පසුව උපදනේ අනාගත වේ.

අජ්ඣත්තික-බාහිර යන්නෙන් ගැණෙන්නෝ ස්වපරසන්තානයන්හි වූ සකන්ධයෝ යි. චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය, යන පස්වැදැරුම් රූපය, ආත්මභාවය අධිපති කොට පවත්නා බැවින් අජ්ඣත්තික නම් වේ. එයින් අන්‍ය වූ තෙවිසි රූපය, එයින් පිටත්හි වූ බැවින් බාහිර නම් වේ.

ඔළාරික-සුඛම යනු, මහත්බව හා සියුම් බව ය. පඤ්චප්‍රසාද රූපය හා සප්තවිෂයරූපය, ස්වභාවයෙන් ස්ථූල බැවින් හා වස්තු ආරම්මණයන්ගේ ඝට්ටනය මහත් බැවින් ඔළාරික නම්. ආපොධාතු-භාව-හෘදයවාස්තු- ජීවිතෙන්ද්‍රය- ආහාර-ආකාශ-විඥප්ති- විකාර-ලක්ෂණ යන රූප සමූහය, සුඛම නම්.

හීනප්පණීත යන මෙය, රූපයෙහි උස් පහත් බව කියාලයි. ලාමක වූ සිත් නො ගත් රූපකොටස් හීන නම් උසස් වූ සිත්ගත් රූපකොටස් පණීත නම්.

මෙහි තවත් ක්‍රමයෙක් වේ. සම්පත්තියෙන් තොර බැවින් අනිෂ්ට වූ රුචි නො වන අරමුණ, කර්මහෙතුවෙන් හටගන්නා රූප අතුරෙහි අකුශලකර්මසමුත්ථානරූප ය යි කියනු ලැබේ. ඒ වනාහි සැපයට කරුණු නො වන හෙයින් අනිෂ්ට වේ. දුකට හේතු බැවින් මන නො වඩන්නේ වේ. අකුශලකර්මසමුත්ථානරූපයාගේ වශයෙන් අනිෂ්ට වූ රුචි නො වූ පංචකාමකොට්ඨාසයෝ ද මෙහි ලා ගණු ලැබෙති. කුශලකර්මසමුත්ථානරූපය අනිෂ්ට වූයේ නො වේ. එය ඉෂ්ට වූයේ ම වෙයි. ඒ වශයෙනුදු පඤ්චකාම ගුණයෝ බෙදන ලදහ. කර්මසමුත්ථාන රූපයන්හි ඉටු අනිටුබව යම්සේ වේ ද, ඍතුසමුත්ථාන රූපාදියෙහි ද ඉටු අනිටුබව එසේ ය.

සත්ත්වප්‍රඥප්තිවශයෙන් ද, පරමාර්ථවශයෙන් ද, ද්වාරවශයෙන් ද, රූපධර්මයන්ගේ ඉටු අනිටුබව කිය යුතු ය. එහෙත් පොත දිග් ගැස්සෙන බැවින් ඒ මෙහි නො දැක්වින.

දූර-සන්තික යන මෙයින්, දූරස්ථරූපය හා සමීපස්ථරූපය කියත්. දූරස්ථරූපය නම් සුඛුමරූපය යි. අරුත් පිරිසිඳගැණීම ත් ලක්ෂණාවබොධය ත් නො පහසු බැවිනි. යම් රූපයක අර්ථාවබොධය හා ලක්ෂණාවබොධය පහසු වේ ද, ඒ මේ ඔළාරිකරූපය, සමීපස්ථ රූප නම්. තව ද දසවැදැරුම් වූ ඖදාරිකරූපය, ලක්ෂණ හෙයින් සන්තිකෙරූප යි ද පඤ්චලොස් වැදැරුම් වූ සූක්ෂ්මරූපය, අවකාශහෙයින් සන්තිකෙරූප යි ද කියනු ලැබේ. ප්‍රකෘතිගතිය

නොයික්මවා කතා කරන්නත් පිළිබඳ දෙළොස් රියනකින් මෙපිට පැවැති රූපය, සන්තිකෙරූප යි ගැණේ. එයින් ඔබ්බෙහි වූ රූපය, දූරෙරූප නම් වේ. ලක්ෂණවශයෙන් හා අවකාශවශයෙන් සූක්ෂම රූපය දූරයෙහි වන්නේ ය. අවකාශවශයෙන් සමීපයෙහි වන්නේ සන්තිකෙරූප නම් වේ. ලක්ෂණවශයෙන් සන්තිකෙරූප නොවේ. ඖදාරිකරූපය, සමීපයෙහි වූයේ, ලක්ෂණයෙහිත් හා අවකාශයෙහිත් ය. එහෙයිනි, සන්තිකෙරූප යි කියනු. දූරස්ථානයෙහි වන්නේ, අවකාශවශයෙන්ම ය. එහෙයින් දූරෙරූප යි කියති. ලක්ෂණවශයෙන් දූරෙරූප නොවේ.

මෙහි ලා වදාළ මේ ක්‍රමය ද සිත තබා ගත යුතු ය. තමාගේ රූපය, සන්තික ය. තමාගේ කුසතුළ හොත්තාවූ ද මෙරමාගේ රූපය, දූර ය. තමාගේ කුසතුළ හොත්තහුගේ රූපය, සන්තික ය. පිටත සිටියහුගේ රූපය, දූර ය. එක් ඇදෙහි හොත්තහුගේ රූපය, සන්තික ය. පිටත පිලෙහි සිටියහුගේ රූපය, දූර ය. පිරිවෙණතුළ සිටියහුගේ රූපය, සන්තික ය. පිරිවෙණෙන් පිටත සිටියහුගේ රූපය, දූර ය. සඞ්ඝාරාමයතුළ සිටියහුගේ රූපය, සන්තික ය. සඞ්ඝාරාමයෙන් පිටත සිටියහුගේ රූපය, දූර ය, යනාදි ලෙසිනි. ඒ වදාළ ක්‍රමය:

පචචයසමුට්ඨාන රූපධම්මසමූහය, ප්‍රත්‍යය-සමුත්ථාන දෙකින් වෙන් කරණු සඳහා මෙ කියන ලද්දේ ය. එහි චක්ඛුස්ප්‍රසාදාදී වූ අෂ්ටවිධරූපය, හෘදයවාස්තුව සමග වූයේ කම්ජ වේ. කෙස් රෝවුල් ඇත්දත් අස්ලොම් ආදීහු කම්ප්‍රත්‍යයයෝ වෙති. චක්‍රරතන දිව්‍ය විමානාදීහු කම්ප්‍රත්‍යයඍතුසමුත්ථානයෝ ය. ආහාරයෙන් හටගන්නා ශුද්ධාෂ්ටකරූපය, ආහාරසමුත්ථාන වේ. ආහාරසමුත්ථානරූප හා කම්ජරූප යන දෙවැදෑරුම් වූ රූපසන්තතීන්ට ආහාරය ප්‍රත්‍යය වේ. ආහාරසමුත්ථානරූපය උපදවමින් කම්ජරූපය පාලනය කරමින් එ දෙකට ප්‍රත්‍යය ව සිටියේ ය. මෙහි මෙසේ ආහාරයෙන් පාලනය කෙරෙණ මේ කම්ජරූපය, ආහාරප්‍රත්‍යය නම් වේ. විසම වූ ආහාර සෙවනය කොට අවිවෙහි යන්නහුට හටගන්නා තල කැලල් කාලකුෂ්ඨාදීහු, ආහාරප්‍රත්‍යයඍතුසමුත්ථාන වෙති. ඍතුවෙන් උපන් ශුද්ධාෂ්ටකය, ඍතුසමුත්ථාන වේ. ඍතුව එහි අනික් ශුද්ධාෂ්ටකයක් ද උපදවයි. එය ඍතුප්‍රත්‍යය නම්. ඍතුව, එහි ද අනික් අටක් උපදවයි. එය ඍතුප්‍රත්‍යය ඍතු සමුත්ථාන වේ. වලාකුට ඍතුසමුත්ථාන යි. විෂ්ඨාරාවෝ ඍතුප්‍රත්‍යයහ. වැස්ස ඇතිකල බිජ හටගණියි. පෘථිවිගන්ධය නික්මේ. කඳු නිල්වන් වූවාක් මෙන් පෙණේ. මුහුද වැඩේ. මේ ඍතුප්‍රත්‍යය ඍතුසමුත්ථාන යි. සිතින් හටගත් ශුද්ධාෂ්ටකය, චිත්තසමුත්ථාන නම්. පසුව හටගත් චිත්ත

චෛතසිකධර්මයෝ පළමු හටගත් මේ කයට පච්ඡාජාතප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යයයෝ වෙති යි කී බැවින් මෙය චිත්තප්‍රත්‍යය වේ. අහසෙහි දක්වන ඇත්රු – අස්රු – රියරු – සේනාරැස්වීම් චිත්ත ප්‍රත්‍යයසෘතුසමුත්ථාන යි. මේ සැකෙවින් කීයේ රූපධර්මයන්ගේ පච්චයසමුට්ඨානය යි.

පරිනිස්ථනත යන මෙයින් රූපවෙදනාදිසකන්ධපඤ්චකය, ප්‍රත්‍යයයන් විසින් පිරිසිඳිනා ලදුව නිපද වූ බව කිය වේ. **'පංචාපි පන ඛන්ධා පරිනිස්ථනතාව හොතති'** යනු කීයේ එහෙයිනි. පඤ්චසකන්ධයෝ වනාහි, ප්‍රත්‍යයයන් විසින් නිපදවන ලද්දේ ම ය. එසේ ම සඞ්ඛත ද වෙති. ප්‍රත්‍යයයන් විසින් සකස් කොට කරණලද බැවින් පඤ්චසකන්ධය සඞ්ඛත වේ.

මෙසේ ප්‍රකීර්ණිකවශයෙන් ද පඤ්චසකන්ධය දැන නැවැත, සකන්ධයන් කෙරෙහි ඤාණභෙදය පිණිස ක්‍රම විසින්, විශෙෂ විසින්, අනූනාධික විසින්, උපමා විසින්, දෙයාකාරයකින් දැක්ක යුතු විසින්, අර්ථසිද්ධි විසින්දැ යි මෙසේ ත් සකන්ධවිභාගය දතයුතු බැවින් එහිලා ද කෙටි කතාවක් මෙහි දක්වනු ලැබේ.

උත්පත්තික්‍රම-ප්‍රහාණක්‍රමාදීන්ගේ වශයෙන් මෙහි ක්‍රමය නත් වැදැරුම් ය. ඔවුන් අතුරෙන් මෙහි ලා ගැණෙන්නේ දෙශනා ක්‍රම ය යි. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සාමාන්‍යයෙන් පඤ්ච සකන්ධය ආත්මභාවය දැඩි ව ගන්නා විනෙයජනසමූහයා සකන්ධයන් ගේ ඝනබහලභාවය වෙන් කොට දැක්වීමෙන් ආත්ම දෘෂ්ටිග්‍රහණ යෙන් මුදනු කැමැති සේක්, සුවසේ දැන ගැණීම පිණිස චක්ෂුරාදීන්ට ගොදුරු වූ ඖදාරිකරූපරාශිය පළමු කොට වදාළ සේක. අනතුරු ව ඉෂ්ටානිෂ්ටරූපය විඳ ගන්නා වූ වෙදනා රාශිය, අනතුරු ව වෙදනා වට ගොදුරු වූ ඉෂ්ටානිෂ්ටාලම්බනයාගේ ආකාරය ගත් වන්නා වූ සංඥාරාශිය, අනතුරු ව සංඥාවශයෙන් සකස් කරන්නා වූ සංඝකාර රාශිය, අනතුරු ව වෙදනාදීන්ට නිඃශ්‍රය වූ ත් අධිපති වූ ත් විඥාන රාශිය දෙශනා කෙරෙති' යි දත යුතු ය.

විශෙෂ විසින් යනු, සකන්ධයන්ගේ හා උපාදානසකන්ධයන්ගේ විශෙෂය ගෙණ කිහ. සකන්ධයන්ගේ හා උපාදානසකන්ධයන්ගේ විශෙෂය මෙසේ ය:- සකන්ධයෝ, පළමු කොට ආශ්‍රව සහිත ය, උපා දානයන්ට හිතය, යි වෙනස් නො කිරීමෙන් ද, උපාදානසකන්ධයෝ ආශ්‍රවයන්ට හා උපාදානයන්ට අරමුණු වීම් වශයෙන් වෙනස් කිරී මෙන් ද දෙශනා කරණ ලදහ. සකන්ධ යන්නෙන් නිවන තොර කොට ඇති සියලු ලෞකිකලොකොත්තරධර්ම ත්, උපාදාන සකන්ධ යන්නෙන් ලෞකිකචිත්තචෛතසිකධර්ම හා රූපධර්ම ත් ගන්නා

ලැබෙයි. 'පඤ්චි මෙ භික්ඛවෙ! බන්ධෙ දෙසිස්සාමි, පඤ්චුපාදානක්ඛන්ධෙ, තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. කතමෙ ච භික්ඛවෙ! පංචක්ඛන්ධා? යංකිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං-පෙ-සන්තිකෙ වා අයං වුච්චති භික්ඛවෙ! රූපක්ඛන්ධො. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා-පෙ-යෙ කෙචි සඞ්ඛාරා-පෙ-යං කිඤ්චි විඤ්ඤාණං -පෙ- සන්තිකෙ වා අයං වුච්චති භික්ඛවෙ! විඤ්ඤාණක්ඛන්ධො ඉමෙ වුච්චන්ති භික්ඛවෙ! පංචක්ඛන්ධාති, භාසිතමෙ ච භික්ඛවෙ! පඤ්චුපාදානක්ඛන්ධා, යං කිඤ්චි භික්ඛවෙ! රූපං -පෙ- සන්තිකෙ වා සාසවං උපාදානියං, අයං වුච්චති රූපූපාදානක්ඛන්ධො. යා කාචි වෙදනා- පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ-යං කිඤ්චි විඤ්ඤාණං-පෙ-සන්තිකෙ වා සාසවං උපාදානියං, අයං වුච්චති විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ! පඤ්චුපාදානක්ඛන්ධාති' යන මේ දෙශනාපාලියෙන් මොවුන් පිළිබඳ අවිශෙෂකථනය හා විශෙෂකථනය මොනවට පැහැදිලි වේ.

ආශ්‍රවධර්මයන්ට අරමුණු වූ ත් අරමුණු නො වූ ත් සකල්ලයෝ පංචස්කන්ධයෙහි ද, ආශ්‍රව සහිත වූ සකල්ලයෝ උපාදානස්කන්ධයෙහි ද ඇතුළත් වෙති. චතුර්විධඋපාදානයන්ට අරමුණු වූ සකල්ලයෝ ම උපාදානස්කන්ධ යි ගැණෙත්.

සියලු සංස්කාරයන් සභාගවශයෙන් එක් කොට සඞ්ග්‍රහ කිරීමෙන් ද, මම ය, මාගේ ය, යි ගැණුමට වස්තූන් මෙ පමණක් ම බැවින් ද, සෙසු ශීලස්කන්ධාදිය ත් මෙහි ම ඇතුළත් වන බැවින් ද සකල්ල පසක් ම වදාළ සේක.

නොයෙක් ප්‍රභෙද ඇති සංස්කාරධර්මයන් සමාන කොට්ඨාශ වශයෙන් සංග්‍රහ කරණ කල්හි, රූපය, විනාශවිර්මිලක්ෂණයෙන් සමාන වූ කොටස් එක් තැන් කොට ගැණීමෙන් එක් සකල්ලයෙක් වේ. වෙදනාව අරමුණුරස විඳ ගැණීම ය යි කියන වෙදයිතස්වභාව යෙන් සමාන වූ කොටස් එක් තැන් කොට ගැණීමෙන් එක් සකල්ල යෙක් වේ. සංඥා-සංස්කාර-විඥානයන් පිළිබඳ ක්‍රමය ද මෙසේ ය. එහෙයින් සකල්ල පසෙක් ම වදාරණලද්දේ ය. මේ රූපාදි සකල්ල පස, මම ය, මාගේ ය, යි ආත්මදෘෂ්ටියෙන් ගැණීමට කරුණු වූ රූපාදිස්කන්ධපංචකය පමණ කොට ඇත්තේ ය. 'මහණෙනි! රූපය ඇති කල්හි රූපය නිසා රූපයට ඇතුල්ව හෙවත් රූපය ලෙහි පිහිටු වීමෙන් මේ රූපය මාගේය, මේ රූපය මම වෙමි, මේ රූපය මාගේ ආත්මය වේ, යි මිථ්‍යාදෘෂ්ටියක් උපදියි. වෙදනාදීන් ඇති කල්හි ද එසේ මිථ්‍යාදෘෂ්ටියක් උපදී' යි වදාළ බැවින් පංචස්කන්ධය ආත්මආත්මීයාභිනිවෙශයට කාරණය බව පැහැදිලි ය. ඒ මේ ආත්ම

ආතමීයාභිනිවෙශයෙහි කාරණය, පංචසකන්ධය ප්‍රමාණ කොට ඇති බැවින් සකන්ධ පසක් ම වදාළ සේක. ශීලසකන්ධාදී වූ සකන්ධපංචක ය ත් සංසකාරසකන්ධයෙහි ඇතුළත් බැවින් මේ සකන්ධ පසෙහි ම සංග්‍රහයට පැමිණේ. එ ද සකන්ධ පසක් දෙශනා කිරීමට කරුණු විය.

'අනෙකප්පභෙදෙසු හි සඞ්ඛතධම්මෙසු සභාගවසෙන සඞ්ගයහමානෙසු රූපං රූපසභාගෙකසඞ්ගහවසෙන එකො ඛන්ධො හොති. වෙදනාසභාගෙකසඞ්ගහවසෙන එකො ඛන්ධො හොති. එසනයො සඤ්ඤාදීසු. තස්මා සබ්බසඞ්ඛතසභාගෙක සඞ්ගහතො පඤ්චෙව වුත්තා. එතපරමඤ්චෙතං අත්තත්තනිය ගාහවත්ථු යදිදං රූපාදයො පඤ්ච. වුත්තංහෙතං:- රූපෙ බො භික්ඛවෙ සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති, එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති, එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති, තස්මා අත්තත්තනියගාහවත්ථුස්ස එතපරමතොපි පඤ්චෙව වුත්තා. යෙපි චඤ්ඤෙ සීලාදයො පඤ්ච ධම්මක්ඛන්ධා වුත්තා, තෙපි සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නත්තා එත්ථෙව අවරොධං ගච්ඡන්ති, යනු මෙහි ලා අටුවායෙහි ආයේය.

රූපොපාදානසකන්ධය ගිලනකු සමාන වූ විඥානොපාදානසකන්ධයට වාස්තුද්වාරආරම්මණ විසින් වාසස්ථාන වන බැවින් ගිලන් හලක් සමාන වේ. දැඩි කොට පෙළෙන බැවින් වෙදනොපාදාන සකන්ධය, ගිලන්බව හා සමාන ය. කාමසංඥාදීන්ගේ වශයෙන් රාගාදිය හා එක් වූ වෙදනාවගේ හටගැණීම වන හෙයින් සංඥොපාදාන සකන්ධය ගිලන්බව හටගැණීමට කරුණු වූ තුන් දොස් හා සමාන ය. වෙදනා නැමැති ගිලන්බවට ප්‍රධාන හෙතුව වන බැවින් සංසකාරොපාදානසකන්ධය නො සැප වූ ආහාර විහරණාදිය සෙවනය කිරීමක් බඳු ය. වෙදනා නැමැති ගිලන් බැවින් නො මිදුන බැවින් විඥානොපාදානසකන්ධය ගිලනකුට බඳු උපමා ඇත්තේ ය.

මෙය මෙසේ කීහ අටුවාවෙහි:- **'ගිලානසාලූපමො රූපූපාදානක්ඛන්ධො, ගිලානූපමස්ස විඤ්ඤාණූපාදානක්ඛන්ධස්ස වත්ථුද්වාරාරම්මණවසෙන නිවාසට්ඨානතො. ගෙලඤ්ඤූපමො වෙදනූපාදානක්ඛන්ධො, ආබාධකත්තා. ගෙලඤ්ඤසමුට්ඨානූපමො සඤ්ඤූපාදානක්ඛන්ධො, කාමසඤ්ඤාදිවසෙන රාගාදි සම්පයුත්තවෙදනාසබ්භාවා. අසප්පායසෙවනූපමො සඞ්ඛාරූ**

පාදානක්ඛන්ධො, වෙදනාගෙලඤ්ඤස්ස නිදානත්තා. ගිලානුපමො විඤ්ඤාණූපාදානක්ඛන්ධො, වෙදනාගෙලඤ්ඤෙන අපරිමුත්තත්තා' යි.

තව ද සිරගෙය, කම්කටොලුය, කම්කටොලු කරන්නාය, අපරාධ කළහුය යන මොවුන් හා ද, බඳුනය, බතය, ව්‍යඤ්ජනය, බත් කරන්නාය. අනුභව කරන්නාය යන මොවුන් හා ද සමා-නොපමා ඇත්තෝ ය, පිළිවෙළින් පංචොපාදානස්කන්ධයෝ.

මේ අටුවා:- **'චාරක-තාරණ-අපරාධ-කාරණකාරක-අපරාධිකූපමා එතෙ භාජන-භොජන-ව්‍යඤ්ජන-පරිවෙසක භුඤ්ජකූපමා චාති'** යි.

සැකෙවින් පංචොපාදානස්කන්ධය ඔසවා ගත් කඩු ඇති පස මිතුරකු සේ, මහත් බරක් සේ, මනුෂ්‍යමාංසානුභවයෙහි ගිජු වූ යක්ෂයකු සේ දැන අනිත්‍ය-දුඃඛ-අනාත්මවශයෙන්, ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ වශයෙන් හා වධකයකු වශයෙන් ද දත යුතු ය. විස්තර විසින් වනාහි, රූපස්කන්ධය පෙණපිඩක් සේ, වෙදනාව දියබුබුලක් සේ, සංඥාව මිරිඟුදියක් සේ, සංස්කාරස්කන්ධය කෙසෙල්කඳක් සේ, විඥානස්කන්ධය ඉන්ද්‍රජාලයක් සේ ද දැක්ක යුතු ය.

මේ අටුවා:- **'සඞ්ඛෙපතො පඤ්චුපාදානක්ඛන්ධො ආසීවිසූපමෙ වුත්තනයෙන උක්කිත්තාසිකපච්චත්ථිකො, භාරසුත්තවසෙන භාරතො, තජ්ජනීයපරියායවසෙන බාදකතො, යමකසුත්තවසෙන අනිච්චදුක්ඛානත්තසඞ්ඛතවධකතො දට්ඨබ්බං, විත්ථාරතො පනෙත්ථ ඵෙණපිණ්ඩො විය රූපං, පරිමද්දනාසහනතො. උදකබුබ්බුලං විය වෙදනා, මුහුත්තරමණීයතො. මරීචිකා විය සඤ්ඤා, විප්පලම්බනතො. කදලික්ඛන්ධො විය සඞ්ඛාරා, අසාරකතො. මායා විය විඤ්ඤාණං වඤ්චකතො'** යි.

පෙණපිඩ හර නැත්තේ ය. පාත්‍රතලුතැටිආදී කිසිවක් ඉන් නො කොට හැකි ය. ගත්තැන ම බිඳෙ යි. එ මෙන් රූපය ද නිත්‍ය ය, මම ය, මාගේ ය, යි නො ගත හැකි ය. ඒ අනිත්‍ය ය. දුක් ය අනාත්ම ය. අශුභයෙකි. පෙණපිඩෙහි සිදුරු බොහෝ ය. නො යෙක් සන්ධිස්ථානයෝ ය දියනයි ආදී වූ සතුන්ට වාසස්ථාන වේ. එ මෙන් රූපයෙහි ද කුදුමහත් සිදුරු බොහෝ ය. නොයෙක් සන්ධිස්ථානයෙන් ගැළපින. අසූකුලයෙක පණුවෝ වාසය කෙරෙති. මෙය ඔවුන්ට වැදුම්ගෙය ත් මල මූ හෙලනතැන ත් ගිලන්හල ත් සොහොන්බිම ත් වේ. මුල දී පෙණපිඩ ඩෙබරගෙඩිය පමණැති ව හටගෙණ ක්‍රමයෙන් පර්වතශිඛරයක් පමණට වැඩී යයි. එ මෙන්

රූපය ද මුලින් කලලරූපයක් ව හටගැණී පිළිවෙළින් බඹයක් පමණ ව ද, පඳිතකූටයක් පමණ ව ද මහත් ව යයි. මහාසත්වයන් ගේ වශයෙන් යොදුන් සියගණන් මහත් වන්නේ ද වෙයි. පෙණ පිඬ නැගුනු තැනම ත් බිඳෙයි. මදතැන් ගොසිනු ත් බිඳෙයි. කොතැන නොබිඳුන ද මුහුදට පැමිණ නම් බිඳෙයි. රූපය ද කලලාවස්ථාවෙහි නැත, අර්බුදාවස්ථාවෙහි බිඳෙයි. සියක් අවුරුද්ද අතර නොබිඳුන ද සියක් අවුරුද්දට පැමිණ නම් බිඳේ ම ය.

දියබුබුල අසාර සේ වෙදනාව ත් අසාර ය. එයින් පුවරුවක් අස්නක් නොකොට හැකි ය. ගත් ගත් තැන ම බිඳෙයි. වෙදනා වත් එබඳු ය. පල නැත්තී ය. නොගතයුතු වන්නී ය. නිත්‍යය. ශාස්වත ය' යි ගන්නට නොහැකි ය. දියබුබුල හටගන්නේ ත් බිඳෙන්නේ ත් වෙයි. කල් නොදපවතී. වෙදනාව ත් එබඳු ම ය. උපදිනී ත් වෙයි. බිඳෙන්නී ත් වෙයි. කල් නොදපවතී. එක් අසුරක් ගසන කාලයතුළ කෙළලක්ෂගණන් වෙදනාවෝ ඉපිද නිරුඬ වෙති. දියබුබුල, ජලතලාව ත් දියඹිදු ත් දියමිදුලු ත් කැටි කොට ගන්නා සුළඟ ත් යන කරුණු සතර දියෙහි කැටි ව පොළක් ව හටගන්නේ යම්සේ ද, එ මෙන් වෙදනාව ත් වසතු රූපය ත් අරමුණ ත් කෙලෙස්මල ත් සපාසීයාගේ සම්ණය ත් යන කරුණු සතර නිසා උපදියි.

සංඥව නිසරු ය. මිරිහුදිය වැනි ය. මිරිහුදිය බොන්නට නාන්නට බඳුන් පුරවන්නට නොගත හැකි ය. සැලෙන්නේ ය. හට ගත් රැළපකුල් මෙන් වැට හෙන්නේ ය. එ මෙන් නීලසංඥදි ප්‍රභෙද ඇති සංඥව ද නීලාදි වූ අරමුණුරස විදගණු පිණිස සැලෙන්නේ ය. මිරිහුදිය, දියපිරිවැවක සේ දියපිරිගඟක සේ මහාජනයා පොළොඹවයි. එ මෙන් සංඥව ත් නිල්පැහැ ඇති මේ අරමුණු ශුභ ය, සුඛ ය, නිත්‍යය, යි මහාජනයා පොළොඹව යි.

සංඛාරයෝ ද නිසරු ය. නිත්‍ය ය, සාර ය, යි ගන්නට නොසුදුස්සෝ ය. එහෙයින් කෙසෙල්කදක් බදු ය. කෙසෙල් කඳින් කිසිවක් ගෙණ කිසි වැඩක් සඳහා යොදනු බැරි ය. එ මෙන් සංඛාරයෝ ත් නිත්‍යාදිවශයෙන් ගන්නට නොහැක්කෝ ය. කෙසෙල් කඳ පතුරුරැසක් වූ සේ, සංඛාරස්කන්ධය ත් චෙතසිකරාශියක් වන්නේ ය. කෙසෙල්කඳ ලක්ෂණවත් ය. පිටපතුරු එක් පැහැය කිනු ත්, ඇතුල්පතුරු අනික් අනික් පැහැයෙනුත් යුකත ය. සංඛාරස්කන්ධය ත් එමෙන් නානා ලක්ෂණයෙන් යුකත ය. පහසෙහි ලක්ෂණ එකෙක, චෙතනාවගේ ලක්ෂණ අනිකෙක, යනාදී විසින් නොයෙක් නොයෙක් සවභාවයෙන් යුකත ය.

විඥානය නිසරු ය. ඒ අරුතෙන් ඉන්ද්‍රජාලමායාවක් බඳු ය. නිත්‍යාදිවශයෙන් ඇදහීම සුදුසු නො වේ. ඉන්ද්‍රජාලය ලාමක ව වහා වැට හෙන්නා සේ, විඥානය ද එයට ද වඩා ලාමක ව වහා වැට හෙන්නේ ය. ඊම, යෑම, සිටීම, හිඳීම එක සිතකින් ම කරන්නා සේ පෙණෙත ත්, ඊම එක සිතකින් ද, යෑම අනික් සිතකින් දැ යි ඒ ඒ අවස්ථාවන්හි අනික් අනික් සිතෙක් ම විය. ඉන්ද්‍රජාලය යමක් ගෙණ මේ රන් ය, මේ රිදී ය යනාදිවශයෙන් ගන්වමින් මහාජනයා මුළා කරන්නා සේ විඥානය ත් එක සිතින් ම එන්නකු සේ යන්නකු සේ හුන්නකු සේ පෙන්වමින් මහාජනයා මුළා කරන්නේය.

විශෙෂවශයෙන් වනාහි ඖදාරික වූ ස්වසන්තානගතරූපය තෙමේ ශුභාලම්බනයක් වුව ද අශුභ ය, යි කියා ම ගත යුතු ය වෙදනාව දුක්ඛදුක්ඛ ය, සඞ්ඛාරදුක්ඛ ය, විපරණාමදුක්ඛ ය යන ත්‍රිවිධදුක්ඛයෙන් නො මිදුනු බැවින් දුකැ යි දත යුතු ය. සංඥා සංස්කාරස්කන්ධවය තමාවශයෙහි පවත් වන්නට නො හැකි බැවින් අනාත්ම යි ද, විඥානස්කන්ධය ඉපදීම, නැසීම යන දෙකින් යුක්ත බැවින් අනිත්‍ය,යි ද දත යුතු ය. මෙසේ නුවණැසින් බලන්නාහට ම අර්ථසිද්ධිය වේ. එ ද සංක්ෂෙප විස්තරදෙකින් ම වන්නේ ය.

උපාදානස්කන්ධ පස ඔසවා ගත්කඩු ඇති වධකයකු සේ සැකෙවින් බලන්නා වූ යොගාවචර තෙමේ ස්කන්ධයන් හෙතු කොට වෙහෙසට නො පැමිණේ.

'සඞ්ඛෙපතො තාව:- පඤ්චුපාදානක්ඛන්ධෙ උක්ඛිත්තාසික පච්චත්ථිකාදිභාවෙන පස්සන්තො ඛන්ධෙහි න විහඤ්ඤති, යන අටුවාය.

විස්තරවශයෙන් වනාහි රූපාදීන් පෙණපිඩුආදිය හා සමානත්වයෙන් දක්නේ නිස්සාර වූ ස්කන්ධයන්හි සාර ය යි වරදවා ගත්තෙක් නො වන්නේ ය. ආද්ධ්‍යාත්මිකරූපය, අශුභවශයෙන් දක්නේ කබලිඞ්කාරාහාරය පිරිසිඳ දනියි. අශුභයෙහි ශුභ ය යන විපර්‍යාසය දුරු කරයි. කාමොඝය එතෙර කෙරෙයි, කාමයොගය හා නො යෙදෙ යි. කාමාශ්‍රවරහිත වේ. අභිජ්ඣාකායගන්ථය බිඳියි. කාමොපාදානය දැඩි කොට නො ගණියි.

'විත්ථාරතො පන රූපාදීනි ඵෙණපිණ්ඩාදිසදිසභාවෙන පස්සන්තො න අහාරෙසු සාරදස්සී හොති, විසෙසතො ච අජ්ඣත්තිකරූපං අසුභතො පස්සන්තො කබලීකාරාහාරං පරිජානාති, අසුභෙ සුභන්ති විපල්ලාසං පජහති, කාමොඝං උත්තරති, කාමයොගෙන විසංයුජ්ජති, කාමාසවෙන අනාසවො හොති, අභිජ්ඣාකායගන්ථං භිඤ්ඤති, කාමූපාදානං න උපාදියති, යනු අටුවා.

වෙදනාව දුක්වශයෙන් දක්නේ සපශ්‍රාහාරය පිරිසිඳ දනියි. දුකෙහි සැපය යන විපර්‍යාසය බැහැරලයි. භවොඝය තරණය කෙරෙයි. භවයොගය හා නො යෙදෙයි. භවාශ්‍රවරහිත වේ. ව්‍යාපාදකායගන්ථය බිඳියි. සීලබ්බතුපාදානය දැඩි කොට නො ගණියි.

'වෙදනං දුක්ඛතො පස්සන්තො ඵස්සාහාරං පරිජානාති, දුක්ඛෙ සුඛන්ති විපල්ලාසං පජහති, භවොඝං උත්තරති, භවයොගෙන විසංයුජ්ජති, භවාසවෙන අනාසවො හොති, ව්‍යාපාදකායගන්ථං භින්දති, සීලබ්බතුපාදානං න උපාදියති, යනු අටුවා.

සංඥාසක්ඛ්‍යය හා සංසකාරසක්ඛ්‍යය අනාත්ම වශයෙන් දක්නේ මනොසඤ්චෙතනාහාරය දැන අනාත්මයෙහි ආත්මය යන විපර්‍යාසය දුරු කරයි. දෘෂ්ටිඔඝය තරණය කරයි. දෘෂ්ටියොගය හා නො යෙදෙයි. දෘෂ්ටිආශ්‍රවරහිත වේ. ඉදංසච්චාභිනිවෙසකායගන්ථය බිඳියි. අත්තවාදූපාදානය දැඩි කොට නො ගණියි.

'සඤ්ඤෙ සඞ්ඛාරෙ ච අනත්තතො පස්සන්තො මනොසඤ්චෙතනාහාරං පරිජානාති, අනත්තනි විපල්ලාසං පජහති, දිට්ඨොඝං උත්තරති, දිට්ඨියොගෙන විසංයුජ්ජති, දිට්ඨාසවෙන අනාසවො හොති, ඉදං සච්චාභිනිවෙසකායගන්ථං භින්දති, අත්තවාදූපාදානං න උපාදියති, යනු අටුවා.

විඥානය අනිත්‍යවශයෙන් දක්නේ විඥානාහාරය පිරිසිඳ දැන අනිත්‍යයෙහි නිත්‍යය යන විපර්‍යාසය දුරු කරයි. අවිද්‍යාඔඝය තරණය කරයි. අවිද්‍යාශ්‍රවරහිත වේ. අවිද්‍යායොගය හා නො යෙදෙයි. සීලබ්බතපරාමාසකායගන්ථය බිඳියි. දිට්ඨුපාදානය දැඩි කොට නො ගණියි.

'විඤ්ඤාණං අනිච්චතො පස්සන්තො විඤ්ඤාණාහාරං පරිජානාති, අනිච්චෙ නිච්චන්ති විපල්ලාසං පජහති, අවිජ්ජොඝං උත්තරති, අවිජ්ජායොගෙන විසංයුජ්ජති, අවිජ්ජාසවෙන අනාසවො හොති, සීලබ්බතපරාමාසකායගන්ථං භින්දති, දිට්ඨුපාදානං න උපාදියති, යනු අටුවා.

මෙසේ මෙහි සැකෙවින් කියන ලද පඤ්චසක්ඛ්‍යය වධකාදි උපමාවනට සුදුසු සේ නගා බලා දැන සක්ඛ්‍යධීරයන් ව සක්ඛ්‍යභාරය බහා තැබීමෙහි උත්සාහවත් විය යුතු ය.

'එවං මහානිසංසං වධකාදිවසෙන දස්සනං යස්මා,
තස්මා ඛන්ධෙ ධීරො වධකාදිවසෙන පස්සෙය්‍ය'

යනු මෙහිලා දත යුතු ය.

ධම්මපදගාථාවෙහි 'පඨවිං' යි වදුලෝ මෙහි ඉතා සැකෙවින් කියූ පංචස්කන්ධය යි. ආත්මභාවය යි කියේ ද මේ ම ය. පඨවි ත් මේ ය.

විචෙස්සති = වෙසෙසින් දනියි. ප්‍රතිවෙධ කරයි. ප්‍රත්‍යක්ෂ කරයි.

මෙහි අර්ථය මෙසේ පද කිහිපයකින් විවෘත වුව ද, අදහස් විසින් එකෙක් ම ය. ආත්මභාවය යි කියූ පොළොව නාම-රූප-ස්කන්ධ-ධාතු-ආයතනාදිවශයෙන් හා අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශ යෙන් බෙදූ බලන ඥානීන් ද, සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් ලක්ෂණට නගා බලන විදසුන්ඥානීන් ද වෙසෙසින් දනීම මෙයින් කියන ලද්දේ ය. පංචස්කන්ධය මේ දෙ ඥානීන් ම පිරිසිඳ දත යුතු ය.

යමලෝකං ච = යමලොකය ද.

සතර අපාය යමලොක යන්නෙන් ගැණේ. විස්තර කී සේ ය.

ඉමං සදෙවකං = දෙවිලොව සහිත වූ මේ මිනිස්ලොව.

සදෙව්ලොව හා මිනිස්ලොව ත් කාමසුගී බැවින් සත් තැන ම එක් කොට මෙසේ වදාළ සේක.

ධම්මපදං සුදෙසිතං = මොනවට දෙසූ ධර්මකොටසය.

තේරුම්ගැණීමේ දී **සුදෙසිතං** යන්න මූල යොදා ගත යුතු ය. එය **ධම්මපදං** යන්නට විශෙෂණ බැවිනි.

බෝපැකිදම් මෙයින් කියා වේ. සිවුසස්දම් අවබොධ කරන්නා හෝ මාර්ගචිත්තෝත්පාදය බොධි නම් වේ. සිවුසස්දම් අවබොධ කරන්නාහට ඒ පිණිස උපකාර වූ ද එසේ ම මාර්ගචිත්තෝත්පාදයට අනුග්‍රහභාවයෙන් සිටියා වූ ද සමාධ්‍යාදි ධර්ම තුදුස, බෝපැකිදම් නම් වේ. පූර්භාගප්‍රතිපත්තික්ෂණයෙහි හා ලොකොත්තර ප්‍රතිපත්ති ක්ෂණයෙහි සමාධි ආදී වූ ඒ ඒ ධර්මයන් සතිපට්ඨාන-සම්මප්පධානාදි ක්‍රමයෙන් වඩා යොගාවචර තෙමේ චතුසත්‍යය අවබොධ කරයි. ඔහුට ඒ පිණිස මේ තුදුස් වැදෑරුම් වූ ධර්මයෝ උපකාර වෙති. එසේ ම ලොකොත්තරමාර්ගචිත්තයෙහි නිවන් අරමුණ ඵල්බ ගෙණ එකවිට යෙදෙන බැවින් මාර්ගචිත්තෝත්පාදයාගේ බොධන ක්‍රියාවට අනුග්‍රහභාවයෙන් සිටිති. විස්තර කී සේ ය.

කුසලෝ පුප්ඵං ඉව පචෙස්සති = මල් කඩා රැස් කරණ දක්ෂ මාලාකාරයකු සේ ප්‍රත්‍යක්ෂ කරන්නේ ද?.

මේ වනාහි ප්‍රථමගාථාවෙහි අවසාන කොටස ය. ගාථාපාදය මෙසේ වුව ද, අරුත්ගැණීමේ දී 'පුප්ඵං විචිනනෙනා කුසලෝ ඉව

කො සුදෙසිතං ධම්මපදං පචෙස්සති' යි. පදාන්වය ගත යුතු ය. විචිනන්තො' යනු අතින් හෙලා ගත් පදයෙකි. එසේ කරණ ලද්දේ මෙහිලා ඒ අවශ්‍ය බැවිනි. ක' යන්න ත්, සුදෙසිතං ධම්මපදං, යන්න ත් තෘතීයපාදයෙන් ඇදගත් පද දෙකෙකි. මෙ කී පද මෙසේ යෙදූවිට 'මල් කඩා රැස් කරණ දක්ෂමාලාකාරයකු සේ කව රෙක් මොනවට දෙසූ ධර්මකොට්ඨාසය ප්‍රත්‍යක්ෂ කරන්නේ ද' යන තේරුම ලැබෙන්නේ ය. **පචෙස්සති'** යන්න **'විචිනිස්සති-විජානිස්සති - උපපරික්ඛිස්සති - පටිවිජ්ඣිස්සති - සච්ඡිකරිස්සති'** යි පැහැදිලි කළහ.

සෙඛො පඨවිං විචෙස්සති = ශෛක්ෂ තෙමේ පොළොව දන්නේ ය.

මේ වනාහි දෙවන ගාථාවේ ප්‍රථමපාදය යි. සෝවන්මග සිටියහු පටන් රහත්මගට පැමිණියහු තෙක් වූ ආර්‍යයෝ සත් දෙන සෙඛ නම් වෙත්. කිනම් අරුතකින් මෙතෙමේ සෙඛ නම් වේ ද? යත්:- ශෛක්ෂ්‍ය වූ සම්‍යක්දෘෂ්ටි ආදියෙන් යුක්ත බැවිනි. **'කිත්තාවතා නු ඛො භන්තෙ! සෙඛො හොතීති? ඉධ භික්ඛවෙ! භික්ඛු සෙඛාය සම්මාදිට්ඨියා සමන්නාගතො හොති -පෙ- සෙඛෙන සම්මා සමාධිනා සමන්නාගතො හොති, එත්තාවතා ඛො භික්ඛු සෙඛො හොති'** යි ඒ අරුත පැහැදිලි කළ සේක, බුදුරජානන් වහන්සේ. ප්‍රධාන වශයෙනි මෙසේ වදාළෝ.

මාර්ග-ඵලචිත්තයන්හි යෙදෙන සම්මාවාචා-සම්මාකම්මන්ත-සම්මාආජීව යන විරතිචෛතසික තුන අධිශීල යි ද, එසේ ම මාර්ග ඵල සිත්වල යෙදෙන සම්මාවායාම-සම්මාසති-සම්මාසමාධි යන තුන සමාධිපාක්ෂික හෙයින් අධිචිත්ත යි ද, මාර්ගඵල සිත්වල යෙදෙන සම්මාදිට්ඨි-සම්මාසඞ්කප්ප යන දෙක අධිපඤ්ඤා යි ද, ශෛක්ෂ්‍ය වූ සම්මාදිට්ඨි ආදී වූ මාර්ගාඞ්ග අට, තුනක් කොට එ තුනෙහි හික්මෙන්නා සෙඛ, යි වදාළ සේක. **'සික්ඛති සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති වුච්චති, කිඤ්ච සික්ඛති? අධිසීලම්පි සික්ඛති අධිචිත්තම්පි සික්ඛති අධිපඤ්ඤම්පි සික්ඛති, සික්ඛති සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙඛොති, වුච්චති'** යි ඒ අර්ථය ම අත්ලෙසකින් මේ වදාළ සැටි යි. 'හික්මේ නු යි සෙඛ' නම් වේ, කිමෙක හික්මෙන්නේ ද? අධිශීල-අධිචිත්ත-අධිප්‍රඥාවන්හි හික් මෙන්නේ ය, එහෙයින් එසේ හික්මෙන්නා සෙඛ, යි කියනු ලැබේ' යනු එහි සිංහල ය.

අප්‍රධානවශයෙන් පංචශීලය හා දශශීලය ශීල නම් වේ. මේ වනාහි සියලු කල්හි ම ලෞවැ පවතී. බුද්ධොත්පාදකාලයන්හි

බුදුවරු ත් ශ්‍රාවකයෝ ත් මහාජනයා එහි පිහිටුවති. අබුද්ධොත්පාද යන්හි පසේ බුදුවරු නාම්වාදී වූ දැහැමි මහණ බමුණෝ, සක්විතිරජහු මහාබොධිසත්වයෝ සමාදන් කරවති. තුවණැති මහණ බමුණෝ තුමූ ද සමාදන් වෙති. සිල් පුරා දිව්‍යලොක-මනුෂ්‍යලොකයන්හි ඉපිද සමපත් විඳින්නෝ ය ඔවුහු.

පංචසීලයට අට සීලය, අට සීලයට දසසීලය, දසසීලයට පාතිමොක්ඛසංවරසීලය, පාතිමොක්ඛසංවරසීලයට මාගීඵලසම්ප්‍රයුක්ත ශීලය අධිශීල වේ.

ප්‍රදීපයන් අතර හිරු, පර්වත අතර, මහමෙර, අධික ත් උත්තම ත් වන්නා සේ සකලලෞකිකශීලයන් අතර පාතිමොක්ඛසංවර සීලය ම අධික ත් වේ. උත්තම ත් වේ. එය බුද්ධොත්පාදකාලයෙහි ම ලැබිය යුතු ය. බුදුවරයෝ ම ඒ පණවති. ඒ පිණිස දිව්‍යබ්‍රහ්මාදී වූ කිසි කෙනෙක් පොහොසත් නො වෙති. පාතිමොක්ඛසංවරසීලයට, වඩා අධික වන්නේ ත් උත්තම වන්නේ ත් මාගීඵලසම්ප්‍රයුක්ත ශීලය යි.

කාමාවචරචිත්තයට රූපාවචරචිත්තය, රූපාවචරචිත්තයට අරූපාවචරචිත්තය, අරූපාවචරචිත්තයට ලොකොත්තරචිත්තය අධිචිත්ත වේ.

තවත් ක්‍රමයකින් අෂ්ටවිධකාමාවචරකුසලචිත්තය හා ලෞකික අෂ්ටසමාපත්තිචිත්තය ද චිත්ත යි කියනු ලැබේ. අබුද්ධොත්පාද යෙහි ද ඒ පවති. සමාදානය පෙර කී සේ ය. විදර්ශනාපාදකඅෂ්ට සමාපත්තිචිත්තය, සකලලෞකික සිත් අතර අධික ත් උත්තම ත් වේ. බුද්ධොත්පාදයෙහි ම ඒ ලැබේ. මෙයට වඩා මාගීඵලචිත්තය ම අධික ද උත්තම ද වේ.

කාමාවචරප්‍රඥාවට රූපාවචරප්‍රඥාව, රූපාවචරප්‍රඥාවට අරූපාවචරප්‍රඥාව, අරූපාවචරප්‍රඥාවට ලොකොත්තරප්‍රඥාව අධිප්‍රඥා වේ.

තවද 'දෙනලද්ද විපාක ඇත්තේ ය' යනාදී විසින් පැවැසි කම්මස්සකතාඤාණය ප්‍රඥා නම්. ඒ වනාහි බුද්ධොත්පාද-අබුද්ධොත්පාද දෙක්හි ම ලැබේ. සෙස්ස අධිශීලයෙහි කී සේ ය.

අඞ්කුර තෙමේ අවුරුදු බොහෝ ගණනක් මහදත් දුන්නේ ය. වෙස්සන්තරාදිපණ්ඩිතයෝ ද මහදත් දුන්හ. ඒ කුශලකර්ම ශක්තියෙන් ඔවුහු දෙව්ලෝ මිනිස්ලෝ දෙක්හි ඉපිද චින්තේය නොයෙක් සැප සමපත්. මේ මෙයට නිදසුනෙකි.

නිලකුණු පිරිසිදින්නා වූ විදර්ශනාඥානය අධිප්‍රඥා නම්. එය අධිශීල-අධිචිත්තයන් සේ සකලලෞකිකප්‍රඥාවන්ට අධික ද උත්තම ද වේ. එසිනුදු මාගීඵලසම්ප්‍රයුක්තප්‍රඥාව ම අධිප්‍රඥා වන්නී ය.

'සික්ඛනං=සික්ඛා, සා එතස්ස සීලන්ති සෙඛො' අධිශීල අධිචිත්ත අධිප්‍රඥ යන ශික්ෂාවන්හි භික්මීම ශික්ෂා නම්. ඒ ශික්ෂාව හෙවත් භික්මීම මොහුගේ සුභාවය නු යි සෙඛ නම් වේ. ඒකාන්ත යෙන් භික්මුණු ගති ඇත්තේ සෙඛ යි කී සේ ය මේ.

ශීල සමාධි ප්‍රඥාවෝ සියලුසත්හි උපදවා ගැණුම්වසයෙන් භික්මිය යුතු බැවින් ශික්ෂා නම් වෙති. මේ කී ශික්ෂාත්‍රයයෙහි භික්මෙන්නේ, ආවර්ජනය කරන්නේ, මෙ නම් ශික්ෂා යි දන්නේ, දැන නැවැත නැවැත එසේ දක්නේ, දක්නාලද පරිදි ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ, එහි ම සිත නො සැලෙන සේ පිහිටු වන්නේ, ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, සමාධි, ප්‍රඥාවන්ගෙන් ඒ ඒ ශික්ෂාවන් අයත් කෘත්‍යය කරන්නේ දකයුත්ත මොනවට දන්නේ, දුරකළයුත්ත දුරු කරන්නේ, වැඩිය යුත්ත වඩන්නේ, ප්‍රත්‍යක්ෂ කටයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ භික්මෙන්නේ ය. ඒ මෙසේ කීහ:-

'ඉමායො තිස්සො සික්ඛායො ඤාණෙනෙතා-ආවජ්ජනෙනා-පස්සනෙනා-පච්චවෙක්ඛණෙනා-චිත්තං අධිට්ඨහනෙනා සික්ඛති, සද්ධාය අධිමුච්චනෙනා සික්ඛති, විරියං පග්ගණ්හනෙනා සතිං උපට්ඨපෙනෙනා-චිත්තං සමාදහනෙනා පඤ්ඤාය පජානනෙනා සික්ඛති, අභිඤ්ඤෙය්‍යං අභිජානනෙනා සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානනෙනා - පහාතබ්බං පජහනෙනා - භාවෙතබ්බං භාවෙනෙනා - සච්ඡිකාතබ්බං සච්ඡිකරොණෙනා සික්ඛති, ආවරති සමාවරති සමාදය සික්ඛති, තං කාරණා වුච්චති සෙඛො සච්ඡිකරොණෙනා සික්ඛති' යි.

ශෛක්ෂ තෙමේ භික්මෙනුයේ අධිශීල අධිචිත්ත අධිප්‍රඥ ශික්ෂාවන්හි ය. ඒ බවට මේ සාධක:-

'සෙඛො විනයාය පවිචිනයාය පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිපස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය අධිචිත්තම්පි සික්ඛෙය්‍ය අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය, යනු.

යම් කල්‍යාණපෘථග්ජනයෙක් තෙමේ අනුලොමප්‍රතිපදාව සම්පූණී කරණුයේ, ශීලයෙන් සම්පූණ වූයේ, චක්ෂුරාදීන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ බොජුනෙහි පමණ දන්නේ, නිදි දුරුකිරීමෙහි යෙදුනේ, පූර්‍වාපර රාත්‍රීන්හි බොධිපාක්ෂිකධර්මභාවනාවෙහි යෙදුනේ අද හෝ, හෙට හෝ, එක්තරා ශ්‍රාමණ්‍යඵලයකට පැමිණෙන්නෙමි, යි වාසය කෙරේ ද, හෙතෙමේ ද සෙඛ, යි කියනු ලැබේ.

'යොපි කල්‍යාණපුථුජ්ජනො අනුලොමපටිපදාය පරිපූරකාරී සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ ජාගරියානුයොගමනුයුත්තො සුබ්බිරත්තාපරරත්තං බොධි

පකතියාගතං ධම්මානං භාවනානුභයාගමනානුයුත්තෙනා විහරති අජ්ජ වා සෙට වා අඤ්ඤතරං සාමඤ්ඤඵලං අධිගමිස්සාමීති සොපි වුච්චති සෙඛොති, යනු එහි ලා සාධක ය.

එහෙත් ප්‍රධානවශයෙන් සෙඛ යන්නෙන් ගැණෙන්නෝ සප්තවිධ ආර්‍යයන් වහන්සේ ය. **'අරියාය ජාතියා තීසු සික්ඛාසු ජාතෝ තස්ථ වා භවොති සෙඛා'** යන මෙයින් ඒ පැහැදිලි ය.

මේ සප්තවිධආර්‍යයන් වහන්සේට පතිලීනවර, යි ද නමෙක් වේ. ඒ ඒ අරමුණුවලින් සිත හකුළවා ගෙණ නොහොත් චක්ඛු, සොත, ඝාණ, ජිවහා, කාය, මන යන දවාරයන්හි සිත හකුළවා ගෙණ වාසය කෙරෙත් ද, එහෙයින් පතිලීනවර යි කියනු ලැබෙති, සප්තවිධආර්‍යයෝ.

'පතිලීනචරා වුච්චන්ති සත්ත සෙඛා, තෙ තතෝ තතෝ චිත්තං පතිලීනනතා පතිකුටෙවනතා පතිවටෙවනතා සන්නිරුමෙහනතා සන්නිගහණහනතා සන්නිවාරෙනතා රක්ඛනතා ගොපෙනතා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. චක්ඛුදවාරෙ චිත්තං පතිලීනෙනතා පතිකුටෙවනතා පතිවටෙවනතා සන්නිරුමෙහනතා සන්නිගහණහනතා සන්නිවාරෙනතා රක්ඛනතා ගොපෙනතා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. සොතදවාරෙ චිත්තං-ඝානදවාරෙ චිත්තං-ජිවහාදවාරෙ චිත්තං-කායදවාරෙ චිත්තං-මනොදවාරෙ චිත්තං පතිලීනෙනතා පතිකුටෙවනතා පතිවටෙවනතා සන්නිරුමෙහනතා සන්නිගහණහනතා සන්නිවාරෙනතා රක්ඛනතා ගොපෙනතා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති යථා කුක්කුටපත්තං වා නහාරුදද්දුලං වා අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති පතිවටති න සම්පසාරියති, එවමෙවං තෙ තතෝ තතෝ චිත්තං පතිලීනෙනතා -පෙ- යාපෙන්ති' යනු මෙහිලා නිදෙසයෙහි ආයේ ය.

'ශෛක්ෂ තෙමේ කුමක් වලදම් ද, කොතැනක හෝ වලදම් ද මේ රෑ එකාන්තයෙන් දුකසේ හොවීමි, අද රෑ කොතැනක හොවිම් ද, යන වැලපිය යුතු වූ මේ සතර චිතක්‍රියන් පලිබොධ රහිත ව හැසිරෙන සුලු වූයේ දුරු කරන්නේ ය, යනු සෙඛ යන්ගේ ගතිය යි.

මේ, ඒ නිර්දෙශය:-

'කිංසු අසිස්සං කුහිං වා අසිස්සං
දුක්ඛං වත සෙට්ඨ කුවජ්ජ සෙස්සං
එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යෙ
විනයෙථ සෙඛෝ අනිකෙතචාරී' යනු.

යමලොකඤ්ච=සතර අපාය ද

ඉමං සදෙවකං=දෙවිලෝ සහිත වූ මේ මිනිස්ලොව ද,

සෙඛෝ ධම්මපදං සුදෙසිතං කුසලෝ පුප්ඵං ඉව පවෙච්ඡති= ශෛක්ෂ තෙමේ මනාකොට දෙසූ ධර්මකොට්ඨාසය, දක්ෂ මාලාකාර යකු සේ ප්‍රතිවෙධ කරන්නේ ය.

සත්වැදෑරුම් වූ සෙඛපුද්ගල තෙමේ, මේ ආත්මභාවපරම්පරාවය ත් යමලොව ත් දෙවිලෝ සහිත වූ මිනිස්ලොව ත්, දක්ෂ වූ මාලාකාර තෙමේ මල්උයනක් තුළට වැද, ලාමොට්ටු ත් පණුවන් කෑ මලු ත් පරවී ගිය මලු ත් ගැට ගැසුණු මලු ත් හැරදමා මැනැවින් වැඩී පිපී ගිය මල් කඩා රැස් කරන්නේ යම්සේ ද, එසේ මොනවට වදුල බෝපැකිදම්කොටස නුවණින් පිළිවිද දැන ගත්තේ ය' යි බුදු රජානන් වහන්සේ විසඳූ සේක ඒ ප්‍රශ්නය මෙසේ.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි පන්සියයක් භික්ෂූන්වහන්සේලා සිවුපිළිසැඹියාවන් ලබා රහත්බවට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

පාපිච්ඡථාවෙහි යෙදුනු පන්සියයක්දෙනා
වහන්සේගේ වසනුව නිමියේ ය.

මිරිඟුකමටහන් වැඩූ භික්ෂූන්වහන්සේ

4-2

සම්මා සම්බුදු රජානන් වහන්සේ වෙතින් කමටහන් ගෙණ මහණදම් පුරන්නෙමි' යි වන වැද උත්සාහ කොට ද රහත්බවට පැමිණෙන්නට නො හැකි වූ එක්තරා භික්ෂූන් වහන්සේ නමක් නැවැත ද කමටහන් කියවා ගන්නෙමි, යි බුදුරජුන් වෙත එනුවෝ අතරමග දී මිරිඟුවක් දුක 'ග්‍රීෂ්මකාලයෙහි හටගත් මේ මිරිඟුව ඇත සිටියවුනට රුවත් එකක් සේ පෙණෙතුදු, ලඟ සිටියවුනට එසේ නො පෙණේ, මේ අත්තභාවය ත් ඉපදීමෙන් හා විනාශවීමෙන් මෙබඳු සවභාව ඇත්තකැ' යි මිරිඟුකමටහන් වඩ වඩා ම ආවෝ ය. ඒ අතර ගමන් විඩා දුරු කරණු පිණිස අචිරවතී ගංගාවට බැස නා ඉත් නැගී ගංඉවුරෙහි හිඳ දියපහරින් නැගි මහත් පෙණපිඬු බිඳි බිඳී යනු දුක 'මේ ආත්මභාවය ත් ඉපිද බිඳී යන බැවින් මේ පෙණ පිඬු වැනි ය' යි අරමුණු ගත්හ. ඒ වේලෙහි බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන් සේක්, මේ තෙරුන් දුක 'මහණ! ඒ එසේ ය, ආත්මභාවය පෙණපිඬක් සේ ද, මිරිඟුදියක් සේ ද ඉපැදෙන බිඳෙන සවභාව ඇත්තකැ' යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.–

ඵෙණූපමං කායමිමං විදිත්වා මරීචිධම්මං අභිසම්බුධානො,
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි අදස්සනං මච්චුරාජස්ස ගච්ඡති.

'මේ කය පෙණපිඬක් බදු ය' යි විදර්ශනාඥානයෙන් දුන 'මිරිඟුවක් වැනි ය' යි ද සලකනු මහණ තෙමේ, කෙලෙස් මරහුගේ පපුප්ඵක යි නම් කරණ ලද ත්‍රෛභූමිකවෘත්තයන්, නොහොත් පංචකාම ගුණයන් සිඳ හැර මරරජුට විෂය නො වූ නිවනට යන්නේ ය.

ඵෙණූපමං කායං ඉමං විදිත්වා = මේ සිරුර පෙණපිඬක් බදු උපමා ඇත්තකැ යි දුන.

'ඉමං කායං ඵෙණූපමං විදිත්වා' යි යොදා ගත්කල්හි ඉතා පහසු වෙන් මේ අර්ථය වැටහේ. කය පෙණපිඬක් බදු ය, යි වදාළෝ කයෙහි හා පෙණපිඬෙහි ඇති සමානකම් සලකා ගැණීමෙනි. පෙණපිඬ අබල ය. දුබල ය. කල් නො ද පවතී. තාවකාලික වේ. දියනයි ආදී සතුන්ට වාසස්ථාන ද වේ. කය ද එසේ අබල ය. දුබල ය. කල් නො ද පවතී. තාවකාලික වේ. නන්වැදෑරුම් පණුකුල යන්ට වාසස්ථාන ද වේ. පෙණපිඬෙහි හා කයෙහි ඇති ඒ මේ නිස්සාර භාවය දන හැක්කේ විදර්ශනාඥානයෙනි. ඒ බව විදිත්වා'

යන ක්‍රියා පදයෙන් වදාළ සේක. බාහිරධර්මශාස්ත්‍රඥානයෙන් වැඩී ගිය නුවණින් ඒ කළ නො හැකිබව, ඒ අතින් දියුණු වූ සාමාන්‍ය මහාජනයාගෙන් පැහැදිලි වේ. කෙශාදිසමූහසඞ්ඛ්‍යාත වූ ශරීරය හත්ථිකාය, රථකාය යනාදිය මෙන් කාය නම් වේ.[1]

මරිවිධම්මං = මිරිඟුදිය වැනි ස්වභාව ඇත්තෙක.

මිරිඟුදිය දුරු සිට බලන්නවුන්ට රූවත් වූවක් සේ ද, ගතයුතු දෙයක් සේ ද වැටහේ. එහෙත් සමීපයෙහි සිටියවුන්ට සිස්දෙයක් නො ගතයුතු දෙයක් ලෙස වැටහේ. එ මෙන් මේ සිරුර ද නුවණින් නො බලන්නවුන්ට ගතයුතු දෙයක් සේ පෙණේ. එහෙත් නුවණ යොදා බලන්නවුන්ට පෙණෙනුයේ නො ගතයුතු හළයුතු දෙයක් සේ ය. තිරිසන් ගිය සතුන්, මිරිඟුව ජලයැ යි වරදවා ගෙණ වැනසෙන්නා සේ මුඬියෝ ද මේ සිරුර නිත්‍ය සුභ සුඛ යි වරදවා ගෙණ විනාශයට යන්නෝ ය. ශරීරය මිරිඟුවක් වැන්නැ' යි වදාළෝ එහෙයිනි.

'මියාසෙත බුද්දජනතවො අනෙනා ති = මරිවි' යනු අර්ථ සමර්ථනය යි.

අභිසම්බුධානො = සලකනුයේ.

'බුජ්ඣනෙතා ජානනෙතා' යි අටුවා කළ බැවින් සිරුර පෙණ පිඩක් බඳු කොට, මිරිඟුවක් වැනි කොට දැන ගන්නා, මෙයින් කියැ වේ. මේ දැන ගැණීම විදර්ශනාඥානයෙන් වන බව **අභි, සං,** යන උපසර්ගපද දෙකකින් ව්‍යක්ත කළහ.

ජෙත්වන = සිඳ.

ගච්ඡෙ' යන අවසානය බලා මේ සිටියේ ය. මේ දෙක ම සිදු කරණුයේ අභිසම්බුධානො' යන්නෙන් කියැවෙන යොගාවචර ශ්‍රමණ තෙමේ ය. ඔහු පළමු ව සිඳීම ද නැවැත ගමන ද කෙරෙයි. නො සිඳ, යනු බැරි ය. එහෙයින් ක්‍රියා දෙක ම ඔහු පිළිබඳ ය. සිඳ යන අර්ථය දෙන **ජෙත්වාන'** යනු පූර්ව්‍රක්‍රියා ය. ගච්ඡෙ' යනු අවසානක්‍රියා ය. කුමකින් සිඳැ ද? යත්: ආර්‍යමාර්ගඥානයෙන් ය.[2]

පූර්ව්‍රක්‍රියාවන්ගේ සිද්ධිය වනුයේ කර්තෘසාධනයෙහි ය. පූර්ව්‍රක්‍රියාවකින් වාක්‍යයක් අවසන් නො කළ හැකි ය. වාක්‍යයෙහි ලා එය අප්‍රධාන බැවිනි. මෙහි වාක්‍යය අවසන් වනුයේ **'ගච්ඡෙ'** යන ආඛ්‍යාත ක්‍රියාවෙනි. ඕ ක්‍රියා තොමෝ මෙහි ප්‍රධාන ව සිටුනී ය. අන් තන්හි ද මෙසේ ය.

---

1. 3. 6. "කුම්භූපමං කායම්මංවිදිත්වා" පරිකථා බලනු.

2 1. 7. "යොචවත්තකසාවස්ස, චිත්තං, යොඛෙථ මාරං පඤ්ඤායුධෙන" පරි කථා බලනු.

මාරස්ස = මාරයාගේ.

කිලෙසමාර- ඛන්ධමාර- අභිසංඛාරමාර- මච්චුමාර- දෙවපුත්තමාර, යි මරහු පස් දෙනෙකි. මොවුනතුරෙහි දිව්‍යපුත්‍රමාර තෙමේ, වසවර්තී දිව්‍යලොකයෙහි එක් පෙදෙසක තම පිරිසට ඉසුරුබැව් පවත්වමින් දැමරිකරාජපුරුෂයකු සේ වාසය කෙරෙයි. සත්වයන් අනන්‍ථයෙහි යොදමින් මරා, නු යි හේ මාර නම් විය. මෙතෙමේ, චතුර්විධවිපර්‍යාසයන්ගෙන් මැඩුනවුන්ගේ සිතට ආවිෂ්ට ව භීෂණ රූපාරම්මණයන් හා ශබ්දාරම්මණයන් දක්වයි. අස්වයි. එයින් ඔවුහු සිහි විකලබවට පැමිණෙති. මේ පස් දෙනා අතර කිලෙසමාර- අභිසඞ්ඛාරමාර-දෙවපුත්තමාර, යන මොවුහු ආර්‍යමාර්ගය ලබත් ම ලබන්නහු කෙරෙහි ක්‍රියාවිරහිත වෙති ඒ ඒ භව පිළිබඳ අවසාන චිත්තක්ෂණය පැමිණෙත් ම ඛන්ධමාර- මච්චුමාරයෝ ද ඒ භවය සම්බන්ධයෙන් අවසානයට යෙති. පුනර්භවයෙහි දී නැවැත ඔවුන්ගේ පැමිණීම වන්නේ ය. එසේ පැමිණෙනු කෙලශමාරාදීන් නොනැසූ බැවිනි.

'සම්පති ආයතිං ච අනත්ථාවහත්තා මාරණට්ඨෙන විබාධනට්ඨෙන ඛන්ධාව මාරො ති ඛන්ධමාරො, යථාහ, වධකං රූපං වධකං රූපං ති යථාභූතං නප්පජානාතීති ආදි, ජාතිජරාදිමහාව්‍යසනනිබ්බත්තනෙන අභිසඞ්ඛාරො ව මාරො ති අභිසඞ්ඛාරමාරො, සත්තානං ජීවිතස්ස ජීවිතපරික්ඛාරානං වා ජානිකරණෙන මහාබාධරූපත්තා මච්චු එව මාරොති මච්චුමාරො, සංකිලෙස නිමිත්තං හුත්වා ගුණමාරණට්ඨෙන දෙවපුත්තො ව දෙවපුත්තමාරො' යනු එහි ලා දතයුතු ය.

මෙහි එන **මාරස්ස,** යන්නෙන් ගැණෙනුයේ ඒ මරුන් අතරෙහි වූ කෙලශමාර තෙමේ ය.

පපුප්ඵකානි=ත්‍රෛභූමකවෘත්තයන් නොහොත් පංචකාම ගුණයන්

කර්ම-කෙලශ-විපාක වෘත්තත්‍රයට හා, රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන පංචකාමයට මේ නමෙකි.[1] **පපුප්ඵකානි,** යනු **ජෙත්වාන,** යන පූර්වක්‍රියාපදයෙහි කර්ම යි.

අදස්සනං = නිවනට.

මරණයට විෂය නො වන හෙයින් නිවන අදස්සන, නම් වේ.[2] **අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ,** යන සම්පූර්ණ පාදයෙන් වදාළෝ 'මරරජුට විෂය නො වූ නිවනට යන්නේ ය' යනුයි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ස්ථවිර තෙමේ පිළිසැඹියාවන් සමග රහත්බවට පැමිණ බුදුරජුන්ගේ රන්වන් සිරුරට ස්තුති කරමින් වැඳ වැඳ ඉදිරියට ආයේ ය.

මර්ජිකර්ම්ස්ථානිකස්ථවිරවස්තුව නිමියේ ය.

---

1. 3. 1. 'මාරධෙය්‍යං' පරිකථාව බලනු.
2. 1. 14. 'ධම්මස්ස හොති අනුධම්මචාරී' පරිකථාව බලනු.

විඩූඩභ කුමාරයෝ.

4-3

මහකොසොල්රජුගේ පුත් පසේනදිකුමාර, මහාලිලිච්ඡවි කුමාර, මල්ලරජුගේ පුත් බන්ධුලකුමාර යන තිදෙන දිසා පාමොක් ගුරුන් වෙත ශිල්ප ඉගෙණුම සඳහා තක්සලාවට ගියහ. යන්නෝ අතරමගැ අම්බලමෙක හිඳ උනුන් ආ කරුණු හා නම් ගොත් අසා දැන යහළු ව එක් ව ගුරුන් වෙත ගොස් වැඩි දවස් නො යාදී ම ශිල්ප උගත්හ. ඉක්බිති ඔවුහු, ගුරුන් වෙත ගොස් වැද ගම් රට බලා යන්නට අවසර ගෙණ එ තැනින් නික්ම තම තමන්ගේ ගම් රට බලා ආවෝ ය.

පසේනදි කුමාරයෝ පියානන් ඉදිරියෙහි දැක් වූ ශිල්ප ඇත් නෝ පියානන් විසින් රාජ්‍යයෙහි අභිෂෙක කරණ ලදහ. මහාලි කුමාරයෝ මහත් වෙහෙස ගෙණ ලිච්ඡවිනට ශිල්ප උගන්වනුවෝ අඩි වූහ. එකල ලිච්ඡවීහු 'අනේ! අපගේ ගුරුදෙවියන්ගේ දැස් නො පෙණී ගියේ ය, වූයේ මහත් හානියෙකැ' යි කම්පිත ව 'ගුරුන් නො හැර පිළිදුගුම් කරන්නෙමු' යි ලක්ෂයක් අයබදු උපදනා එක් වාසලක් ඔහුට දුන්හ. එයින් ලැබෙන ආයෙන් දිවි යවන ඔහු, පන් සියයක් පමණ ලිච්ඡවිකුමරුන්ට ශිල්ප උගන්වමින් කල් යැවූයේ ය. මල්ලරජදරුවෝ එකි එකී මිටියට උණ ගස් සැට සැට එකතු කොට උණ මිටි සැටක් බැඳ, ඒ හැම එකෙක මැද යකඩ කුර කුර ද බහා ඔසවා තබා, 'මේ උණ මිටි සැට කැලි කැලි කොට කපා සිඳ හරුව' යි බන්ධුලයන්ට දැන්වූහ. බන්ධුලකුමාර තෙමේ, අසූ රියනක් පමණ අහසට නැග උණමිටි කපා හරිණුයේ, අවසන් උණමිටියට කඩුපහර දුන් විට එහි තුබූ යකඩකුරෙහි කඩුව ගැටීමෙන් හට ගත් 'කිනී' යන හඬ අසා, හැම උණමිටියෙක යකඩකුරු බහා ඇති බව දැන, කඩුව බිමැ දමා හඬමින් 'මාගේ නැයන් අතර එකෙක්වත් මට මේ කාරණය නො කියේ ය, මා මේ දන්නා ලද නම් හඬ නොනහවා ම උණමිටි කපා හරින්නෙමි, දැන් සියලු නැයන් මරා රජය ගන්නෙමි'යි මවුපියන්ට දන්වා සිටියේ ය. 'පුත්‍රය! මේ වනාහි පර පුරෙන් පරපුරට එන රාජ්‍යයෙකි, තා කියන ලෙසට ඒ නො ගත හැකි ය'යි කියා ඔවුහු එය වළකාලූහ. 'එසේ නම්, මම මාගේ යහළුවා වෙතට යමි' යි ගෙන් පිටත් ව සැවැත්නුවරට ගියේ ය. පසේනදි කොසොල් රජ ඔහු එනු අසා, මහත් සත්කාර ඇති ව ඉදිරියට ගොස් පිළිගෙණ නුවරට ඇතුල් කරවා සෙනෙවි තනතුරෙහි තැබුයේ ය. බන්ධුල ඉන් පසු මවුපියන් ද එහි ගෙන්වා ගත්තේ ය.

දිනක් උඩුමහලෙහි සිටි රජ තෙමේ, අනාථපිණ්ඩික, චූලඅනාථපිණ්ඩික, විසාඛා, සුපවාසා යන මහාඛෙඩ්ඩොපාසක උපාසිකාවන්ගේ ගෙට දුනය පිණිස වඩින්නා වූ දහස්ගණන් භික්ෂූන් වහන්සේලා දැක 'මුන් වහන්සේලා කොතැනකට වඩනාහුදැ' යි ඇසුයේ ය 'දෙවයන් වහන්ස! අනාථපිණ්ඩික සිටාණන්ගේ ගෙට දින පතා ම නිතිබත් ගිලන්බත් ආදිය පිණිස දෙ දහසක් සඞ්ඝයා වහන්සේ වැඩම කරන්නාහ, චූලඅනාථපිණ්ඩිකයන්ගේ ගෙට පන්සියයක් දෙනා වහන්සේ වඩින්නෝ ය, විසාඛාවන්ගේ ගෙට පන්සියයක් දෙනා වහන්සේ ද, සුපවාසාවන්ගේ ගෙට පන්සියයක් දෙනා වහන්සේ ද වැඩම කරති' යි එහි සිටියෝ කීහ. එවිට රජ තෙමේ 'තමන් විසින් ද සඞ්ඝයා වහන්සේට උපස්ථාන කළයුතු ය' යි සිතා විහාරයට ගොස්, පන්සියයක් භික්ෂූන් හා බුදුරජුන්ට ආරාධනා කොට, සත් දිනක් දන් දී සත්වන දිනයෙහි 'භික්ෂූන් පන්සියයක් දෙනා වහන්සේ සමග දිනපතා මාගේ දන් පිළිගණු මැනැවැ' යි බුදුරජුන් වැඳ ඇඟැද සිටියේ ය. එකල බුදුරජාණන් වහන්සේ 'මහරජ! බුදුවරු වනාහි, එක් තැනෙක නිතර දන් නො පිළිගණිති, බොහෝ දෙනෙක් බුදුවරුන්ගේ පැමිණීම බලාපොරොත්තු වෙති' යි වදාළ සේක. 'එසේ නම් ස්වාමීනි! දිනපතා එක් නමක්වත් එවනු මැනැවැ' යි ආරාධනා කළවිට එය බුදුරජාණන් වහන්සේ ආනන්දස්ථවිරයන් වහන්සේට භාර කළහ. දුනය පිණිස භික්ෂූන් රජගෙට වැඩම කළ කල්හි පාත්‍ර ගෙණ මුන්වහන්සේ වලඳවන්නැ' යි අනුනට නියම නො කොට රජ තෙමේ ම සත් දිනක් උන්වහන්සේ වැලඳ වීය. එහෙත් අටවන දිනයෙහි රජහට ඒ අමතක ව ගියේ ය. රජගෙයි අණ නො ලද්දන්ට අසුන් පණවා, භික්ෂූන් වඩා හිඳුවා දන් වලඳවන්නට ඉඩ නැත. දුනය පිණිස එහි වැඩියා වූ භික්ෂූන් වහන්සේලා අතුරෙහි බොහෝ දෙනෙක් එහි බලා සිට කල් ඉක්ම ගිය බැවින් ඉන් බැහැර වැඩියහ. පසුදා ද රජහට දුනය පිණිස භික්ෂූන් පැමිණීබව අමතක විය. එදා ද එහි පැමිණි භික්ෂූන් වහන්සේලාගෙන් බොහෝ දෙනෙක් බැහැර වැඩියහ. ඊට පසුදා ත් මෙය රජුගේ සිහියට නො ආයේ ය. එ දින ද භික්ෂූන් වහන්සේලා ආනන්දස්ථවිරයන් වහන්සේ පමණක් එහි නවතා බැහැර වැඩියෝ ය. **පිණැත්තෝ වනාහි කරුණු සිහිකිරීමෙහි පොහොසත් වෙති. ශ්‍රද්ධාවන් කුලයන්ගේ ප්‍රසාදය රක්නෝ ය.**

ශාරීපුත්‍ර-මෞද්ගල්‍යායන යන අග්‍රශ්‍රාවකයෝ **ඛෙමා-උප්පලවණ්ණා** යන අග්‍රශ්‍රාවිකාවෝ **චිත්තගහපති-හත්ථකආලවක** යන අග්‍රශ්‍රාවක උපාසකයෝ, **වෙළුකණ්ඨකී-නන්දමාතා-බුජ්ජුත්තරා** යන අග්‍රශ්‍රාවිකා උපාසිකාවෝ යන මේ අට දෙනා ප්‍රධාන කොට

ඇති තනතුරු ලත් සියලු ශ්‍රාවකයෝ එක් දෙසකින් දසපැරුම්දම් පිරූ හෙයින් මහපිණැත්තෝ ය. එසේම අභිනීහාර සම්පන්නයෝ ය. ආනන්දස්ථවිරයන් වහන්සේ ද කල්පලක්ෂයක් පිරූ පැරුම් ඇත්තෝ මහපිණැත්තෝ ය. එ හෙයින් උන්වහන්සේලා කරුණු සිතීමෙහි පොහොසත් බැවින් රාජකුලයාගේ ප්‍රසාදය රකිමින් වැඩ සිටියහ. රාජපුරුෂයෝ එකලා වූ උන්වහන්සේ ම වලඳවාලූහ. රජ තෙමේ, භික්ෂූන් බැහැර වැඩිකල එහි පැමිණ පිළියෙල කොට තුබූ ආහාර පානාදිය දැක 'සඞ්ඝයා වහන්සේ නො වැඩියෝ දැ'යි ඇසී ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ පමණක් වැඩි සේකැ' යි කී කල්හි 'මොවුහු මෙ පමණ ගොඩක් ආහාරපානාදිය විනාශ කළහ'යි භික්ෂූන්ට කිපී බුදුරජුන් වෙත ගොස් 'ස්වාමීනි! මා විසින් පන්සියයක් දෙනා වහන්සේට දන් පිළියෙල කරණ ලද්දේ ය, එහෙත් එහි වැඩියෝ ආනන්ද ස්ථවිරයන් වහන්සේ පමණක් ය, පිළියෙල කළ දානය එසේ ම තිබේ, පන්සියයක් දෙනා වහන්සේම මා ගැණ නො සිතූහ, එයට හෙතු කිමැ' යි ඇසී ය.

එවිට බුදුරජානන් වහන්සේ භික්ෂූන් අත වරදක් නො වදාරා 'මහරජ! ඔබකෙරෙහි මාගේ ශ්‍රාවකයන්ගේ විශ්වාසයෙක් නැත, එහෙයින් නො ගියෝ වනැ' යි වදාළ සේක. එහි දී උන්වහන්සේ 'මහණෙනි! මේ යට කියන පරිදි සැදූ නැති නුවණ නැති මිනිසුන් වසන ගෙදරට නො යායුතු ය, හදිසියෙන් ගිය ද, එහි නො හිඳිය යුතු ය, යි භික්ෂූන්ට නියම කළහ. ඒ අඞ්ගනවය මෙසේ ය:-

දැක තුටුසිතින් හුන් තැනින් නැගී නො සිටීම
තුටු සිතින් පසඟ පිහිටුවා නො වැඳීම
තුටු සිතින් අසුන් පිළියෙල කොට නො දීම
ඇති දෙය දෙන්නට මැලිව නැත කියා සැඟවීම
බොහෝ තුබුන ද, පැමිණීම වෙනුවට යන්තමක් දීම
මිහිරිදේ තුබුන ද, ඒ සඟවා කටුක දේ දීම
සකස් නො කොට දීම
අනුමෙවෙනි බණ අසන්නට නො ඉඳීම
බණ අසනවිට එහි සිත නො අලවා ඉඳීම.

මතු කියන පරිදි සැදූහැති නුවණැති මිනිසුන් වසන ගෙය, යා යුතු තැන් කොට හිඳිය යුතු තැන් කොට දක්වා වදාළ සේක. ඒ ඒ අඞ්ගනවය මේ:-

භික්ෂූන් එනු දැක තුටු සිතින් නැගී සිටීම
වඩා හිඳුවා තුටුසිතින් පසඟ පිහිටුවා වැඳීම
තුටු සිතින් උසසුන් පණවා වඩා හිඳුවීම
ඇති දෙය නොං සඟවා දීම
බොහෝ ඇතිවිට බොහෝ කොට දීම
මිහිරි දෙයම සපයා දීම
දෙන දෙය සකස් කොට ම දීම
අනුමෙවෙනි බණ අසන්නට ලැදිව ලංව හිඳීම
බණ අසන විට කන් දී එහි සිත යොදවා ඉඳීම.

නැවැත 'මහරජ! මාගේ ශ්‍රාවකයෝ, තා හා විශ්වාසයටකට නොං පැමිණි බැවින් එසේ හියෝ නොං වන්නාහ, පෙර දවස නුවණැත්තේ විශ්වාසයක් පුරුද්දක් නැත්තකු විසින් කොතරම් උසස් ව සකස් ව උවටැන් කරණු ලබන්නේ ද, මරණාසන්න වෙදනාවකට පැමිණ සිටියේ ද, එ ද නොං බලා, විසවස් නැත්තහු හැර දමා විස්වස් ඇත්තහු කරා ම හියේ වනැ' යි වදාළ විට, රජ තෙමේ 'සවාමීනි! ඒ කවර දවසෙක දැ' යි ඇසී ය. බුදුරජානන් වහන්සේ ඒ ඉකුත් පුවත මෙසේ වදාළ සේක:-

'යට හිය දවස බඹදත් නම් රජකු රජය කරණ කල්හි කෙසව තෙමේ, රජකම් හැර දමා තවුස්පැවිද්දෙන් පැවිදි වූයේ ය, ඔහු හා පන්සියයක් පමණ රාජසේවකයෝ ද පැවිදි වූහ, මගුල්කපුවා ද පැවිදි විය, ඔහු කපපක නමින් ම මහතවුසාගේ අතැවැසි ද විය. කෙසව තෙමේ, අටමසක් හිමවතෙහි තපස් කොට, වැසි කාලයෙහි ලුනු ඇඹුල් මුසු අහර සෙවුමට සෙසු තවුසන් හා බරණැසට අවුත් එහි පිඬු සිඟා හියේ ය, බඹදත් රජ දුමුතු ඉදුරන් ඇති ඔවුන් දැක, පැහැද, වස් සාරමස තමන් වෙත වසන්නට ආරාධනා කොට පොරොන්දු ගන්වා, උයනෙහි වාසය කරවා උදය සවස උපස්ථාන යට එහි යැදී, අතැවැසි තවුසෝ කිහිප දවසක් එහි වැස, ඇත්අස් ආදීන්ගේ කැමොරගැසීම් ආදී වූ අරගලින් දුඹිව පෙළෙනෝ, කලකිරී 'ආචාර්‍යයීනි වහන්ස! මෙ තැනැ වසන්නට සිත් නැත්තෝ වම්හ, අරගල බොහෝ ය, කිසි පහසුවෙක් මෙහි නැත, අපි කලකිරුණෝ වෙමු, යම්හ' යි කීහ, 'යන්නෝ කොහි දැ' යි ඇසුවිට 'හිමවතැ' යි කීහ, රජ තෙමේ, අප ආ දවසේ ම වස් සාරමස මෙහි වසන්නට ආරාධනා කොට අපෙන් පොරොන්දුවක් ගත්තේ නොං වේ ද, මසක් විතරවත් මෙහි නොං වැස, බැහැර යැම නොං සුදුසු ය,

කොතරම් අරගල තිබුණ ත් මසක් වත් මෙහි හිඳ යා යුතු ය, එසේ නො වේ නම්, රජ තෙමේ කලකිරින්නේ ය' යි කීය, 'අපට නො කියා අප නො විචාරා රජු හා පොරොන්දුවට බැඳුනෝ ඔබවහන්සේ ය, එහෙයින් රජුගේ සතුට පිණිස ඔබවහන්සේ නවතිනු මැනැවි, අපට රජුගේ සතුටින් වැඩෙක් නැත, අප යා යුතුම ය, අපි වැඩි ඇත නො යන්නමෝ ය, මෙයින් තරමක් ඇතට ගොස් ඔබවහන්සේගේ තොරතුරු නිතර අසන්නට හැකි නො දුරු තැනෙක වසන්නෙමු' යි කියා වැඳ නික්ම ගියෝ ය, ඈදුරු තවුස් තෙමේ කපපක තවුසා හා එහි නැවතුනේ ය, එහෙත් කපපකයා ද කල කිරී කල් නො යවා ම ගුරුන් විසින් වළක්වනු ලබන්නේ ද, අනික් තවුසන් වෙත නො ගොස් ගුරුන්ට නො දුරු තැනකට ගොස් හුන්නේ ය, රජ තෙමේ, උපස්ථානයට ගියේ, තවුසන් නො දැක 'ආයුෂ්මයන් වහන්සේලා කොතැනැ වැඩියෝ දැ' යි ඇසී ය, ඔවුහු කලකිරී හිමවතට ගියෝ ය' යි කී ය, නිතර නිතර අතැවැස්සන් ගුණ සිහි කරන්නා වූ තාපසයාහට කල් නො යාදී ම බඩෙහි ලෙඩක් හට ගැණුනේ ය, රජ තෙමේ, වෙදුන් ලවා එයට පිළියම් කරව යි, එහෙත් එය නො සන්සිඳින, දිනක් වෙත පැමිණි රජු ගෙන් 'මහරජ! මාගේ ලෙඩය සන්සිඳෙනු කැමැත්තහු දැ' යි තවුස් තෙමේ ඇසී ය, රජ තෙමේ 'සඛාමිනි! මම එයට පොහොසත් වන්නෙම් නම්, අදම සන්සිඳ වන්නෙමි' යි කී ය, 'මහරජ! ඉදින් මාගේ පහසුව කැමැත්තහු නම්, මා මාගේ අතැවැස්සන් වෙතට යවන්නැ' යි කීවිට 'යහපත, වහන්සැ, යි ඇඳක හොවාලා නාරද ඇමැතියා ප්‍රධාන කොට ඇති ඇමැතියන් සතර දෙනකු 'තෙපිත් ගොස් මුන් වහන්සේගේ ලෙඩෙහි තතු දැන මට ත් දන්වා එවවු' යි තවුසා කැටිව ම පිටත් කොට යැවූයේ ය, කපපක තවුස් තෙමේ ගුරුවරයා එන බව අසා ඉදිරියට ගියේ ය, තවුස් තෙමේ අනික් අතැවැස්සන් නො දැක 'අනික් අය කොහි දැ' යි ඇසී ය, 'අසුවල් තැනැ'යි ඔහු පිළිතුරු දුන්නේ ය, සෙසු තවුසෝ ද ගුරුන් ආබව අසා එහි රැස්වී උණුදිය සපයා දෙමින් පලවැල ගෙණවුත් දෙමින් ගුරුවරයාට උවැටන් කළෝ ය, ලෙඩ සන්සිඳින, සිරුර රන්වන් විය,

නාරද:-

"හවි කම් සැපෙන් පිරි-රජු හැර කේසව කෙසේ,
සිත් අලවා ද, අසපුවෙ-කපුකුල උපන්නහුගේ"

තවුස්:-

"ඇමැත්තෙනි! නාරද,-කපුගෙ සුබැසි සිත්කලු,
එහි වූ ගස් වැල්ද මා-පිණවති නිතර මනරම්"

ඇමැතිඃ-

"පිරිසිදු රසමසැති-බත් ගත් ඔබ දුන් මෙසේ,
ලුනු නැති බොඩ හමු හා-හුරුහැල් කෙසේ පිණවා"

තවුස්ඃ-

"විස්වස් තැනෙක ඇති-අමිහිරි අහර මිහිරියි,
මඳ අහර බොහෝ වන්නේ-විස්වස් තැනැම රස වේ"

ඉකුත් පුවත මෙසේ වදාළ බුදු රජානන් වහන්සේ 'එ කල රජ, මෙ කල මෞද්ගල්‍යායන තෙමේ ය, එ කල නාරද, මෙ කල ශාරීපුත්‍ර තෙමේ ය, එ කල කප්පා, මෙ කල ආනන්ද තෙමේ ය, එ කල කෙසව, මෙ කල මමැ' යි ජාතකය ගළපා, 'මහරජ! පෙරත් පණ්ඩිතයෝ මරණාසන්නාවෙදනාවකට පැමිණ සිටියෝ ද විස්වස් ඇත්තන් කරා ම ගියෝ ය, එහෙයින් මාගේ සව්වෝත් ඔබ හා විශ්වාසයක් පුරුද්දක් නැත්තෝ වනැ යි සිතම්' යි වදාළ සේක.

මේ කතා පුවත ඇසූ කොසොල්රජ තෙමේ 'භික්ෂූන් හා විස්වස් ඇත්තකු විය යුතු ය, ඒ කෙසේ කරන්නෙම් ද, බුදුරජුන්ගේ නැදුවන මාගේ ගෙට කැඳවා ගත්තොත් එය පහසුවෙන් කළ හැකි ය, එසේ කළ විට කුඩා මහලු හැම දෙනා වහන්සේ බුදුරජුන්ගේ නෑ රජු' යි මා කෙරෙහි විස්වස් ඇති කොට නිතර මෙහි පැමිණෙන්නාහ' යි සිතා 'මට දුවක සරණ එවන්නැ' යි කියා ශාක්‍යයන් වෙත දූතයන් යවන්නේ 'මෙහි එන්නී කවර ශාක්‍යයක්හුගේ දුවක් ද' යි දැන එවු' යි ද අණ කෙළේ ය. දූතයෝ ගොස් ශාක්‍යයන් ගෙන් දැරියක ඉල්ලූහ.

ඔවුහු රැස් ව 'රජ තෙමේ පක්ෂබල ඇත්තෙක, දැරියක නොදුන්නමෝ නම් අප නසන්නේ ය, රජ නම්, අප කුලයට නොගැළපේ, කුමක් කළ යුතු ද' යි එකතුව කතා කළහ. ඒ සමාගමයෙහි හුන් මහානාම ශාක්‍ය තෙමේ 'මාගේ දාසියකගේ කුසැ උපන් දැරියක් ඇත, ඇ රූපයෙන් අගපත් ය, දාසියක සේ නොපෙණේ, ඇ සරණ දෙම්හ' යි සිතා 'හොඳයි, නොපගේ රජුට දැරියක දෙන්නෙමු' යි කී ය. එකල දූතයෝ 'ඕ කාගේ දැරියක් වේ ද' යි ඇසූහ. 'බුදු රජානන් වහන්සේගේ කුඩා පිය වූ අමිතොදන ශාක්‍යයන්ගේ පුත්‍ර වූ මහානාමයන්ගේ ය' යි කීහ. දූතයෝ ගොස් ඒ වග රජුට දන්වූහ. රජ තෙමේ 'එසේ නම් වහා ගොස් කැඳවා ගෙණ එවු, ක්ෂත්‍රියයෝ බොහෝ මසා දන්නෝ ය, දාසිකෙල්ලක එවන්නට ත් බැරි නැත, පියානන් හා එක් පිහානෙහි බත් කන්නිය දුක ගෙණ එවු' යි නියම කොට යැවී ය. ඔවුහු ගොස් 'දේවයන් වහන්ස! රජ තෙමේ බලා පොරොත්තු වනුයේ, ඔබ හා එක් ව ඉද එක් පිහානෙහි

බත් කන්නියක ගෙණ ඊම ය' යි කීහ. 'හොඳයි! කියා ඇය ඇඳුම් ආයිත්තම් ලා සරසවා තමන් බත් කන වේලෙහි ලඟට කැඳවා ගෙණ ඇය හා එකට හිඳ කන හැටි හඟවා, අප ගේ දුව කැඳවා ගෙණ ගොස් රජුට පාවා දෙවු' යි දූතයන්ට කී ය. ඔවුහු ඇය කැඳවා ගෙණ සැවැත්නුවරට ගොස් එ පුවත රජුට දැන්වූහ. රජ තෙමේ සතුටු සිත් ඇති ව ඇය පන්සියයක් සත්‍රීන්ට ප්‍රධාන කොට අගබිසෝ තනතුරෙහි තැබී ය. ඕ තොමෝ ද වැඩි කල් නො යා දී ම රන්වන් පුතකු වැදූ ය. එ දරුට නම් තබන දිනයෙහි රජුගේ මුත්තනියට, වාසභඛත්තියාව පුතකු වැදූ බව දන්වමින් 'තැබිය යුතු නම කුමක් දැ'යි අසා යැවූයේ ය. පණිවිඩය ගෙණ ගිය ඇමැති තෙමේ මඳක් බිහිරි වූ කන් ඇත්තේ ය. හේ ගොස් රජුගේ මුත්ත නියට ඒ බව කී ය. ඕ තොමෝ ඒ අසා 'වාසභඛත්තියාව පුතකු නො වදා ම සියලු දෙනා මැඩ ගත්තා ය, දැන් ඈ රජුට ඉතාවල්ලභ ය, ඉතා ප්‍රිය ය යි කිවූ ය. බිහිරි ඇමැති තෙමේ 'වල්ලභ' යි කියූ වචනය වරදවා 'විඩූඩභ' යි අදහා ගෙණ රජු වෙත ගොස් 'දේව යන් වහන්ස! කුමරුට විඩූඩභ යන නම තබන්නට කීවා ය' යි දැන්වී ය. ඔහු 'මෙය අපගේ කුලයට අයත් කුලය පිළිබඳ පැරණි නමක් විය යුතු ය'යි කුමරුට **'විඩූඩභ'** යි නම් කෙළේ ය.

නැවැත රජ තෙමේ බුදුරජුන්ගේ නෑකම සලකා ගෙණ 'බුදු රජුන්ට ප්‍රියයක් කරමි' යි සිතා ලදරුවියෙහිදී ම ඔහුට සෙනාපති තනතුර දුන්නේ ය. එ දරු කුමරපෙරහරින් වැඩෙන්නේ සත් හැවිරිදිකල සෙසු කුමරුන්ට තම මුතුන් මිත්තන් විසින් එවුනු ඇත්රූ අස්රූ මිනිස්රූ ආදී වූ බෝනික්කන් දැක 'මැනියෙනි! අනික් කුමරුන්ට ඔවුන්ගේ මුතුන් මිත්තෝ නොයෙක් පඬුරු පාක්කුඩම් එවති, මට කිසිවෙක් කිසිවක් නො එවයි, මොක ද අම්මාට මවුපියෝ නැත් දැ' යි ඇසී ය. 'පුතේ! නුඹගේ මුතුන් මිත්තෝ ශාක්‍ය රජදරුවෝ ය, ඔවුහු වසන්නෝ ඉතාදුර ය, ඒ නිසා කිසිවක් නො එවති' යි කියා ඔහු රැවටුවා ය. මදක් කල් ගිය තැන සොළොසැවිරිදි කාලයෙහි අපගේ මුත්තනු කුලය දකිනු කැමැත්තෙමි' යි කී විට ද 'කුමට එහි යන්නෙහි දැ' යි ඕ තොමෝ වැළකූ ය. එහෙත් ඔහු නැවැත නැවැතත් එහි යන්නට ඕනෑබව කීයේ ය. 'එසේ නම් යව'යි මව අවසර දුන් විට පියරජුට ද දන්වා මහත් පිරිවර ත් ගෙණ, ගෙන් නික්මුණේ ය. වාසභඛත්තියා තොමෝ ද ඔහු එහි ලඟා වන්නට පෙරාතුව ම ලැබෙන්නට ලියුමක් ලියා ශාක්‍යයන් වෙත යැවූ ය.

.....

සැවැත් නුවරදීය.

බුහුමන් පෙරදැරිව ලියමි.

මම මෙහි සුවසේ වෙසෙමි. ඒ අතින් කියයුතු අමුත්තක් නැත. කිය යුත්තේ මාගේ පුත් විඩූඩභ කුමරු මුතුන් මිත්තන් දකිනු පිණිස ගෙදරින් පිටත් වූ බව ය. ඔහු අද හෙට ඔහි එනු ඇත. එහෙයින් අප අතර ඇති වෙනස් කම් කිසිවක් ඔහුට නො දැන් විය යුතුබව ඉතා ඕනෑ කමින් දන්වමි. වරදට කමාවනු මැනැවි.

මේ වගට

යටත්, කීකරු,

වාසභඛත්තියා.

වාසභඛත්තියාවගේ මේ ලියුමෙන් විඩූඩභයාගේ පැමිණීම නියමයෙන් දැනගත් ශාක්‍යයෝ 'විඩූඩභයා අපඅතින් වැඳුම් ලැබිය යුත්තෙක් නො වේ, ලාබාල වූ කුමරුන් ලවා වන්දවන්නටත් නො සුදුසු ය, එහෙයින් සැලකිලි පමණක් කරමු' යි සම්මත කොට ගෙණ, ලාබාල සියලු කුමරුන් කිඹුල්වත්පුරයෙන් බැහැරට යවා තුමූ කිඹුල්වත්පුරයෙහි සන්ථාගාරශාලාවෙහි රැස්ව හුන්හ. විඩූඩභ එහි පැමිණියේ ය. ශාක්‍යයෝ විඩූඩභහට 'පුතේ! මේ නුඹගේ මුත්තා, මෝ ගෑණු මුත්තා, මේ මාමා, මේ බාප්පා, මේ මහම්මා, මේ කුඩම්මා යනාදි ලෙසට උනුන් අඳුන්වා දුන්හ. ඔහු එහිදී වැඩිමහලු හැමට පිළිවෙළින් වැන්දේ ය. එහෙත් ඔහුට වඳින්නෝ නො වූහ. එ කල 'මට වඳින්නෝ නැද්ද' යි ඔහු ඇසී ය. මෙහි උන් ලාබාල හැම කෙනකු නුවරින් බැහැරට ගොස් ඇතිබව කියා ශාක්‍යයෝ ඔහුට උසස්ලෙසින් සැලකිලි කළහ. ඔහු එහි කීපදවසක් නැවතී සිට පෙරළා සිය රට බලා ආයේ ය. දෘසියක්, එහි විඩූඩභ උන් පුටුව ගෙන් බැහැරට ගෙණ 'මේ වාසභඛත්තියාවගේ පුතා හුන් පුටුව ය' යි බැණ බැණ කිරිදියෙන් සෝදන්නට වන. ඒ අතර විඩූඩභ යාගේ සෙවකයෙක් ආයුධයක් අමතක කොට ගියේ, ඒ ගෙණ යන්නට හැරී ආයේ, විඩූඩභයාහට බණින හඬ අසා තොරතුරු විචාරා වාසභඛත්තියාව මහානාම ශාක්‍යයාහට දැව එක්තරා දෘසිය කගේ කුසෑ උපන්බව දැන පෙරළා ගියේ, මේ තොරතුරු සියපිරිසට දැන්වී ය. එවිට 'වාසභඛත්තියාව දෘසියකගේ දුවක් ල' යි එහි මහත් කොලාහලයෙක් විය. විඩූඩභ තෙමේ 'වේවා, මූලා මා හුන් පුටුව කිරිදියෙන් සෝදනි, මට රජකම් ලැබුනු විට මූලාගේ බොටුලෙසින්

මාගේ පුටුව සෝද වන්නෙමි, යි සිතා ගත්තේ ය. ඇමැත්තෝ ඔහු සැවැත්නුවරට පැමිණි කල්හි එ පුවත රජුට දැන්වූහ. රජ තෙමේ 'දැසියකගේ දුවක මට දුන්හ' යි ශාක්‍යයන් කෙරෙහි කිපි වාසභ ඛත්තියාවට හා ඇයගේ පුතුට දුන් තනතුරු පැහැර ගෙණ දැසිදස් සන් විසින් ලැබිය යුතු තරමක් ම දෙවී ය.

කිහිපදවසකට පසු බුදුරජානන් වහන්සේ රජගෙට වැඩි සේක. රජ තෙමේ අවුත් වැඳ 'ස්වාමීනි! නුඹවහන්සේගේ නෑයන් විසින් දැසියකගේ දුවක මට දීමෙන් කරණ ලද්දේ බලවත් අයුත් තෙක, මම ඇයටත් පුතුටත් දී තුබූ තනතුරු අස් කොට දැසිදස් සන්ට සෑහෙන තරමක් ම දෙවූයෙමි' යි කීය. 'මහරජ! ශාක්‍යයන් විසින් කරණ ලද්දේ බලවත් ම අයුත්තෙකැ' යි මම ද පිළිගණිමි, දෙතොත් සමානජාති ඇති දැරියක් දියයුතු ය, මහරජ! මම එකක් කියමි, වාසභඛත්තියාව රජදුවක, රජුගේ ගෙයි අභිෂෙක ලද්දියක, විඩූඩභකුමරුත් රජකුට ම දැව උපන, එහෙයින් මවුපසින් ඇති තේරුම කුමක් ද, පියපස ම පමණ ය, පෙර විසූ නුවණැත්තෝ දිළිඳු වූ, දර විකොට දිවිපවත් ගෙණ ගියා වූ කෙල්ලකට අගබිසෝ තනතුර දුන්හ, ඈ කුසැ උපන් කුමාර තෙමේ දෙළොස් යොදුන් දිගපළල ඇති බරණැස්නුවරැ රජකමට පැමිණ කාළවාහන නමින් ප්‍රසිද්ධ වී ය, යි කටඨහාරි ජාතකය වදාළ සේක. රජ තෙමේ දහම් අසා 'පියපරපුර ම පමණ ය' යි සතුටුව මවටත් පුතුටත් ඒ ඒ තනතුරු නැවැතත් දෙවූයේ ය.

බන්ධුලසෙනාපතියාහට භාර්‍යා වූවා, කුසිනාරානුවරැ මල්ලිකා වගේ දූ ය. ඕ ද නමින් මල්ලිකා ය. කලක් යන තුරු ඇයට දූ පුත් කෙනෙක් නො වූහ. එහෙයින් බන්ධුල තෙමේ ඇය තමන්ගේ කුල ගෙට පිටත් කෙළේ ය. ගෙන් නික්මුනු ඕ තොමෝ 'බුදුරජුන් දැක වැඳ යා යුතු ය' යි දෙව්රමට ගොස් වැඳ පසෙක සිටියා ය. එකල 'තී කොහි යෙහි දැ' යි බුදුරජුන් ඇසූ කල්හි 'මා වදියක බැවින් මාගේ ස්වාමිපුත්‍රයා මට ගෙන් බැහැර යන්නට අණ කළා, එබැවින් මවුපියන් වෙත යන්නෙමි' යි කිවු ය. එසේ නම් යෑමෙන් වැඩෙක් නැත, පොඩ්ඩක් නවතුව' යි වදාළ වචනයෙන් සතුටු ව වැඳ පෙරළා ගෙට ගියා ය. බන්ධුල, ගෙදර නො ගොස් පෙරළා මෙහි ආවා කිමැ' යි ඇසූවිට බුදුරජුන් ගමන වැළකුබව කිවු ය. බන්ධුල තෙමේ 'දීර්ඝ දර්ශී වූ බුදුරජානන් වහන්සේ අපගේ ඉදිරිකාලය දැක වදාළ සේ කැ' යි සොම්නසට පැමිණ, 'හොඳයි, නවතුව' යි ඇය පිළිත්තේ ය. වැඩි දවස් නො යාදී ම මල්ලිකා තොමෝ දරුගැබ් ඇත්තී වූ ය. ඉන් හටගත් දෙළදුක් ඇති ඕ තොමෝ ඒබව සැමියාට දැන්වූ ය. බන්ධුල

තෙමේ 'කෙබඳු දෙළුදුකෙක් දැ' යි ඇය විචාලේ ය. විසල්පුරයෙහි ලිච්ඡවිරජුන් සත්දහස් සත් සිය සත්දෙනකුන් හා ඔවුන්ගේ එ පමණ බිසෝවරුන් බැස දිය කෙළනා, ඔවුන්ගේ අභිෂෙකයට දිය ගන්නා මගුල්පොකුණට බැස නාන්නට හා පැන් බොන්නටය මට උපන් දෙළුදුකැ' යි කිවු ය. එවිට බඹුල තෙමේ 'යහපතැ' යි කියා දහස් දෙනකුන් විසින් උස් පහත් කළයුතු වූ දුන්න කරත්-තයක තබාගෙණ සැවැත්නුවරින් නික්ම කරත්තය දක්කා යනුයේ මහාලිලිච්ඡවිහට දුන් වාසලින් විසල්පුරයට ඇතුල් වූයේ ය. මහාලි-ලිච්ඡවිහුගේ ගෙය පිහිටි යේ ද මේ වාසල අසල ය. කරත්තය වාසල්එලිපතැ හැපුනු හඬ අසා මහාලි තෙමේ ඒ හඬ බඹුලයාගේ කරත්තයෙහි හඬ ය' යි දැන අද නම් ලිච්ඡවීන්ට නපුරු දවසෙකැ'යි කීයේ ය. ලිච්ඡවීන්ගේ ඒ මගුල්පොකුණ ඇතුළත පිටත දෙක ම කරණලද රැකවල් ඇත්තේ ය. එහෙයින් ඉතාබලගතු ය. මත්-තෙහි ලෝහයෙන් කළ දුලක් ඇත්තේ ය. ඉතාකුඩා කුරුල්ලකුට වත් එහි ඇතුල්වනු බැරි ය. බඹුල තෙමේ ඒ කිසිවක් බැරැරුම් ය' යි නොසලකා එහි ගොස් රැකවල් ගෙණ සිටියවුන් බස්තමින් ගසා පහර දී බැහැර කොට ලෝදුල කඩා ඇතුළට බැස බිරින්ද නාවා තෙමේත් නා අවසන් කොට ගොඩැවිත් කරත්තයට නැඟී බිරින්දුත් කැවිව ආ මගින් ම නුවරින් නික්ම ගියේ ය. රැකවලැ සිටියෝ මේ වගතුග ලිච්ඡවීන්ට දැන්වූහ. ලිච්ඡවිහු කිපියහ. 'බඹුලයා අල්වා ගන්නෙමු'යි රිය පන්සියයෙක නැඟී නික්ම ගියහ. එ පුවත මහාලිලිච්ඡවිහට ද ඔවුහු දැන් වූහ. ඔහු, බඹුලයා අල්ලා ගන්නට නොයවු, ඔහු තොප සියල්ලන්ගේ ගෙල සිඳින්නේය' යි කී ය. ඔවුහු එය නොපිළිගත්හ. 'යන්නෙමු මැ'යි කීහ. එකල මහාලි තෙමේ 'යන්නට ම නම්, තොපගේ බලාපොරොත්තුව, බඹුලයාගේ කරත්තයෙහි බොස්ගෙඩිය පොළොවට ගිලී ගන්නා තැන් දක්නා තුරු යවු, එ දැකත් ඉදිරියට යෑමෙහි ම අදහස නම්, හෙණහඬ වැනි හඬක් ඇසෙනතුරු ගොස් නවතිවු, එයිනුත් නොනවතින්නහු නම්, තොපගේ රියහිස්වල සිදුරු දක්නාතුරු ගොස් නවතිවු, එයින් ඉදිරියට නම්, අඩියක්වත් යෑම නොසුදුසු ය'යි කී ය. ඔවුහු ඒ නොපිළිගෙණ බඹුලයා පසුපස එළවා ගියහ. කරත්තයෙහි පසුපස හුන් මල්ලිකා තොමෝ පස්සේ එළවා එන කරත්ත දැක, ඒ බව සිය සැමියාට දැන්නූ ය. 'එසේ නම් ඒ එන කරත්ත එක් කරත්තයක් ව පෙණෙන විට මට කියව' යි කී ය. ඕ තොමෝ ඒ සියලු කරත්ත එක් කරත්තයක් ව පෙණෙන විට 'සවාමිනි! දැන් සියලු කරත්ත එක් කරත්තයක් ව පෙණේ ය' යි කිවු ය. බඹුල තෙමේ තමන් අත තුබූ රැහැන් මල්ලිකා ව අතට දී කරත්තය ඉදිරියට දක්කන්නට කියා, තෙමේ කරත්තයෙහි සිට ම දුන්න උස්සා ගත්තේ ය.

එවිට නැගී සිටියා වූ කරත්තයෙහි රෝදය බොස්ගෙනිය දක්වා පොළොවෙහි එරුණේ ය. ලිච්ඡවීහු එ දැක ද නො නැවත්තාහ. බඹුලයා මදක් ඉදිරියට ගොස් එන්නවුන් දැක දුනුදිය පෙළී ය. එහි හඬ හෙණහඬ වැනි විය. එයිනුදු ඔවුහු නො නැවැත්තාහ. එළවා ගෙණ ම ගියහ. ඉක්බිති බඹුල තෙමේ විෂ පෙවූ ඊතලයක් විද්දේ ය. ඒ ඊතලය කරත්තවල මුදුන් සිදුරා කර ගෙණ සන්නාහ ලා සිටියා වූ පන්සියයක් රජුන් පසා කොට පොළොවෑ ගිලුනේ ය. එයිනුදු ඔවුහු එහිදී තමන් විත්කැබව නො දැන 'ඔහොම සිටුව, ඔහොම සිටුව' යි කියමින් එළවා දිවූහ. ඒ වේලෙහි බඹුල තෙමේ කරත්තය නවතා ගෙණ 'තෙපි මළහු ය, මළවුන් හා මාගේ සට නෙක් නැත, මළවුන් හා කවුරු සටන් කෙරෙත් ද' යි කී ය. ලිච්ඡවීහු එ බසට 'හා! හා! අප වැන්නෝ මළහු වෙත් ද' යි මහාහඬින් මුරගැහ. 'තෙපි මළහු ද නො මළහු ද' යි දැන ගැණීමට නම් ඉදිරියෙහි සිටියහුගේ සන්නාහය ගලවා දමවු' යි කී කල්හි එහි ඉදිරියෙහි සිටියේ සන්නාහ ගලවා පියන්නේ ම මැරී වැටුනේ ය. 'තෙපිත් මෙබඳු වන්නහු ය, ගෙවලට ගොස් නියම කළයුතු දේ ඇතොත් නියම කොට අඹුදරුවනට කියයුතු දේත් ඇතොත් කියා අනුශාසනා කොට සන්නාහ ලිහා දමවු' යි කී කල්හි ඔවුහු ද එසේ කළහ. සියල්ලෝ මැරී වැටුනෝ ය. බඹුල තෙමේ මල්ලිකාවන් සමග සැවැත්නුවරට පැමිණියේ ය. ඈ සොළොස්වරකට නිවුන් දරුවන් දෙනිසක් වැදූ ය. සියල්ලෝ ම ශූරයහ. දක්ෂයහ. ශක්තිසම්පන්නයෝ ය. සියලු ශිල්පයෙහි කෙළවරට ගියෝ ය. එකෙකාට දහස දහස බැගින් පිරිවර ය. මොවුන් දෙනිස් දෙන දෙනිස් දහස පිරිවරා පියා සමග ගෙට යන විට රජගේ මිදුල ඔවුන්ගෙන් ම පිරී ගන්නේ ය.

එක් දවසක් උසාවියේ දී නඩුවකින් පැරදුනු මිනිස්සු කිහිප දෙනෙක් එන්නා වූ බඹුලයන් දැක මහහඬින් කෑමොර ගසා විනිස කරුවන් අල්ලස් ගැණීමෙන් කළ අයුත්ත කියා සිටියහ. ඔහු ඒ අසා නැවැත නඩුව විනිශ්චය කොට හිමියා, හිමියා කොට තීන්දුව දුන්නේ ය. මහාජන තෙමේ මහහඬින් සාධුකාර දුනි. රජ තෙමේ ඒ අසා 'කිමෙකැ' යි දැන සතුටු ව සියලු විනිසකරුවන් නිලයෙන් පහ කොට බඹුලයන් අධිකරණනායකධුරයෙහි තැබී ය. එ තැන් සිට අග්‍රවිනිශ්චයකාරධුරයට පත් බඹුල, තෙමේ ම සියලු නඩු ඇසී ය. අල්ලස්ගැණීම් ආදියෙන් කූටවිනිශ්චය කළ පුරාණ විනිශ්චයකාරයෝ අල්ලස් නො ලැබීමෙන් පිරිහී ගියෝ 'බඹුලයා රජ කම බලාපොරොත්තුවෙත් අණ්ඩුවේ කටයුතු කරත්තේ ය' යි රජුට හඟවා රජු හා භෙද කළහ. රජ තෙමේ ද ඔවුන් කී බස් සැබවැ' යි පිළිගෙණ 'මොහු මෙහි දී මරවන ලද්දේ නම්, එය මට

නින්ද, පිණිස වන්නේ ය' යි සිතා රාජපුරුෂයන් යවා පසල් දනවු පහරවා, නැවැත බන්ධුලයන් ගෙන්වා 'බන්ධුල! ප්‍රත්‍යන්තය අපට විරුද්ධ ව නැගී සිටියි, කැරලි ගැසී කොලාහල කරයි, පුතුන් සමග එහි ගොස් සොරුන් මැඩ ප්‍රත්‍යන්තය සාදා එව' යි ඔහු පිටත් කොට යවා 'එහිදී ම දෙතිස් පුතුන් සමග බන්ධුලයාගේ හිස සිඳ ගෙණෙව' යි ඔහු සමග ම තවත් මහායෝධසමූහයක් පිටත් කර හැරියේ ය. බන්ධුලයා රජඅණින් එහි යත් ම, එහි සිටි රාජපුරුෂයෝ 'සෙනාපති ඒ ය' යි පැන ගියහ. බන්ධුල තෙමේ ප්‍රත්‍යන්තය සෙමෙහි තබා එනුයේ, නුවරට නොදුරෙහි අතරමගැ රැක හුන් මහායෝධයන් විසින් රජ අණ ලෙසින් හිස සිඳ මරා දමන ලද්දේ ය. පුතුන්ගේ හිස් ද සිඳලූහ.

මෙ දවස වනාහි පන්සියයක් දෙනා වහන්සේ සමග වූ අග්‍ර ශ්‍රාවක දෙදෙනා වහන්සේ මල්ලිකාවන්ගෙන් ආරාධනාවක් ලබා පෙරවරුයෙහි එහි වැඩම කොට හුන්හ. ඒ වේලෙහි 'පුතුන්ගේ හා සිය සැමියාගේ හිස් සිඳිනා ලදැ' යි කියා ලියුමක් මල්ලිකාවට ලැබිනි. ඒ බලා කිසිවක්හට කිසිවක් නො දන්වා ලියුම ඔඩොක්කුවෙහි තබා මෙහෙකාර සත්‍රීන් සමග සඞ්ඝයා වහන්සේට දන් වැලදෙව්වා ය. එ වේලෙහි එහි මෙහෙකාරසත්‍රීහු ගිතෙල්සැලක් ගෙණ එන්නෝ, සඞ්ඝයාගේ ඉදිරියෙහි දී බිම හෙලා බිඳ දැමූහ. සැරියුත් මහතෙරුන් වහන්සේ එය දැක 'බිඳීම සුභාව කොට ඇති සියලු දෙය බිඳෙන්නේ ය, එහෙයින් අමුත්තක් නො සිකිය යුතු' යි වදාළහ. එ කෙණෙහි මල්ලිකා තොමෝ තම ඔඩොක්කුවෙහි තුබූ ලියුම ගෙණ කියවූ ය.

.....

පසල්දනවිවේදී ය

අතිශයගෞරවයෙන් ලියමු.

බන්ධුලමල්ලසෙනාපති තෙමේ යොධමුළක් විසින් මෙහි දී මරා දමන ලද්දේ ය. ඔවුන් විසින් ම සෙනාපති පුත්‍රයෝ ද හිස් ගසා මරණ ලදහ.

මේවගට,

යටත්

ගම්වැස්සෝ.

'ස්වාමිනි! මේ ලියුම කියවා බලාත් මට කිසිවක් නො සිතුනේ ය, එසේ කල්හි මේ ගිතෙල්සැලක් බිඳුනවිට මම කුමක් සිතම් ද' යි ඕ කිවූ ය.

ඉක්බිති දම්සෙනෙවි සැරියුත් මහතෙරණුවෝ **'අනිමිත්තං අනඤ්ඤාතං'** යනාදීන් ශොක තුනී වන්නට බණ දෙසා හුනස් නෙන් නැගිට වැඩි සේක. අනතුරුව ඕ තොමෝ යෙහෙළින් දෙ තිස, ලඟට ගෙන්වා 'තොපගේ හිමියෝ නිරපරාධයෝ ය, පෙර කරණලද බලගතු කර්මයක විපාක විසින් මේ විපතට පැමිණියෝ ය, ඒ නිසා ශොක නො කරවු, රජු කෙරෙහි යම්තමකිනුත් සිත් කිලිටක් ඇති නො කරවු' යි අවවාද කොට සනසාලූ ය. රජුගේ වරපුරුෂයෝ ඒ කතාව අසා රජු කරා ගොස් තමන්ගේ නිර්දෝ ෂත්වය කියා සිටියාහ. රජ තෙමේ සංවෙගයට පැමිණ බන්ධුලයන් ගේ නිවෙසට ගොස් මල්ලිකාව හා ඇයගේ යෙහෙළියන් කමා කරවා ගෙණ මල්ලිකාවට වරයක් දුන්නේ ය. ඕ තොමෝ 'මා විසින් ඒ වරය ගන්නා ලද්දේ වේවා' යි රජු ගිය කල්හි මළවුන්ට පින්පෙත් දීලා නාගෙණ ඇඳ පැලඳ රජු කරා ගොස් යෙහෙළියන් ටත් මටත් අපගේ කුලගෙවලට යෑමට අවසර දෙනු මැනැවැ' යි කිවූ ය. රජු 'යහපතැ'යි කී කල්හි ඕ තොමෝ යෙහෙළියන් දෙතිස් දෙන උන්උන්ගේ ගෙවලට යවා තොමෝ කුසිනාරානුවර තම මවුපියන් වෙත ගියා ය. ඉන් පසු රජ තෙමේ බන්ධුලයන්ගේ බෑනනු වූ දීඝකාරායණයාහට සෙනෙවිතනතුර දුන්නේ ය. ඔහු ද 'මොහු විසින් මාගේ මාමා මරවන ලදැ' යි සිත සිතා රජුගේ සිදු රක් සොයමින් කල් යැවී ය. රජ තෙමේ ද නිරපරාධී වූ බන්ධුලයන් මැරවූ දා සිට විපිළිසර ඇත්තේ සිත සැනසුම් නැති ව වෙසෙ යි. රජසැප ද නො විඳියි. මෙ දවස බුදුරජානන් වහන්සේ වැඩ වාසය කළෝ ශාක්‍යයන්ට ම අයිති වූ උලුම්ප' නමින් ප්‍රසිද්ධ වූ නියම්ගම ඇසුරු කොට ගෙණ ය. රජ තෙමේ එහි ගොස් බුදුරජුන් වැඩ වසන ආරාමයට නො දුරෙහි කඳවුරු බඳවා ටික දෙනකුන් හා බුදුරජුන් වඳිනු පිණිස විහාරයට ගොස් තමා වෙත තුබූ කකුධ භාණ්ඩයන් දීඝකාරායණයා අතට දී තනිය ම ගඳකිළියට ඇතුල් විය. සෙසු සියලු විස්තර **ධම්මවෙනිය** සූත්‍රයෙහි කී ලෙසින් දත යුතු ය. රජු ගඳකිළියට වන් ඇසිල්ලෙහි දීඝකාරායණ තෙමේ ඒ කකුධභාණ්ඩයන් ගෙණ විඩූඩභයා රජ කොට රජුට එක් අසකු හා උවැටනට එක් මාගමකුත් නවතා සැවැත්නුවරට ගියේ ය. රජ තෙමේ බුදුරජුන් හා ප්‍රිය වූ කතා කොට නිමවා පෙරළා ආයේ, සෙනාව නො දැක එහි සිටිය මාගම අතින් තොරතුරු දැන බෑනනු වූ අජාසත්රජු කැඳවා ගෙණ අවුත් විඩූඩභයා අල්ලා ගන්නෙමි'යි රජගහානුවර බලා සිටියේ ය. සවස නුවරදොර වසා තුබූ බැවින් නුවරින් පිටත ශාලාවෙක නිදන්නට වන. ගමන් විඩාවෙන් කලාන්තව සිටි රජ තෙමේ රැකාලයෙහි එහිදී ම කලුරිය කෙළේ ය. පාන් වූ කල්හි 'දෙවයන් වහන්ස! කොසොල්රජ අනාථ විය,

අහෝ! කොසොල් රජ මළේ ය' යි විලාප කියන ඒ ගැහැණියගේ විලාපහඬ අසා නුවරැ වැස්සෝ ඒ බව අජාසත් රජුට දැන් වූහ. රජ තෙමේ එහි පැමිණ මහත් පෙරහරින් මාමාගේ ආදාහනය කරවී ය.

විඩූඩභ තෙමේ ද රජකම් ලැබ ශාක්‍යරජුන් කෙරෙහි බැඳ තුබූ වෛරය ඉස් මතු කොට 'පළිගන්නෙමි' යි මහත් සෙනාවක් සරසා ගෙණ කිඹුල්වත් යෑමට නික්මුනේ ය.

එ දවස අලුයම් වේලෙහි ලොව බලා වදුරන මාගේ සවාමිදරු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නෑයන්ට වන්නට යන මේ විනාශය දක්නට ලැබිනා. මා, මේ වේලෙහි නෑයන්ට සංග්‍රහ කරන්නට වටී ය' යි පෙරවරුයෙහි සිඟා වළඳා අවසන් කොට ගඳකිළි යෙහි සැතපී ඉඳ සවස්වේලෙහි අහසින් වැඩ කිඹුල්වත අසල තුනී සෙවන ඇති එක් ගසක්මූල වැඩ හුන් සේක. විඩූඩභයාගේ රාජ්‍ය සීමාව අසල ගනසෙවන ඇති ලොකු නුගගසෙක් ඇත්තේ ය. විඩූඩභයා බුදුරජුන් දැක ලඟට ගොස් වැඳ 'සවාමීනි! මොකද මේ, තද අව්වේ තුනී සෙවන ඇති ගසමූල වැඩහුන් සේක්, මේ හොඳට සෙවන ඇති නුගගසමූල වැඩ හිඳිනු මැනැවැ' යි කී ය. 'මහරජ! එසේ වේවා, නෑයන්ගේ සෙවන සිහිල් ය' යි වදාළ කල්හි 'නෑයන් රකින්නට වැඩී සේක් වනැ' යි සිතා බුදුරජුන් වැද පෙරළා සැවැත් නුවරට ම ගියේ ය. බුදුරජාණන් වහන්සේ ද අහසින් දෙවිරමට වැඩි සේක. නැවැතත් විඩූඩභ තෙමේ ශාක්‍යයන් කල වරද සිහි කොට දෙවන තෙවනවරත් නික්ම ආයේ ද, බුදුන් දැක පළමු සේ පෙරළා ගියේ ය. එහෙත් සතරවනවර ද නැගී ආයේ ය. එකල බුදුරජාණන් වහන්සේ ශාක්‍යයන් පෙර කළ කම් බලා වදුරන සේක්, ඔවුන් පෙර එක් අත්බවෙක කුඩමස්සන් මරන්නට ගඟක විෂ, වෙඩි බැහූ බවත් එය වළකන්නට බැරි පාපකර්මයක් බවත් දැන සතරවනවර එහි නො වැඩි සේක. විඩූඩභ තෙමේ සතරවන වර ශාක්‍යයන් මරන්නට නැගී ආයේ, මහත් බලසෙනගක් ගෙණ ය. බුදුරජුන්ගේ නැයෝ, තුමූ මියෙන් නමුත් අනුන් නො මරති. කිසිවකුත් ජීවිතයෙන් තොර නො කරති. එහෙත් ඔවුහු 'අපි ධනුශ්ශිල්පයෙහි හික්මුනෝ වෙමු, එහි හොඳට පුරුදුකම් ඇත්තමෝ ය අපි, එහි ලා දක්ෂගුරුන් ඇසුරුකළෝ අපි ය, එහෙත් අපට අනිකකු මරන්නට නො හැකි ය, අපි අපේ ධනුශ්ශිල්පයෙහි හුරු බුහුටිකම් පෙන්වා ඔවුන් පලවා හරින්නෙමු'යි සිතූහ. මෙසේ සිතා සියල්ලෝ සන්නාහ ඇඳලා අවුත් යුද්ධයට වත්හ. ශාක්‍යයන් විසින් විදිනා ඊතල විඩූඩභයාගේ මිනිසුන් අතරින් පලිහ අතරින් කන් සිදුරු අතරින් යෙයි. විඩූඩභ තෙමේ ඊතල විදිනු

දැක 'ඇයි! ශාක්‍යයෝ අපි පරපණ නොං නසන්නමෝ ය' යි කියත් නෝ නොං වෙත් ද, කතා එසේ වුව ද, ඔවුහු මාගේ මිනිසුන් නසන්නෝ ය' යි කී ය. එවිට එහි සිටි එකෙක් 'ඇයි! සාමිනි! ඔහොම කියන්නහු, බලා වදුරන්න, ඔබවහන්සේගේ මිනිසුන් මරන්නෝ දැ' යි ශාක්‍යයෝ, නුඹවහන්සේගේ පිරිසෙහි එකෙක් වත් නොං මලේ ය, මා කියන්න නොං අදහන්නහු නම්, පිරිස ගණන් කරවා බලනු මැනැවැ' යි කී ය ගණන් කරවන්නේ එකාකුගේ ද අඩුබවක් නොං දුටුයේ ය. එ තැනින් යන්නට හිය විඞ්ඛඛයා පෙරළා අවුත් 'යම් යම් කෙනෙක් අපි ශාක්‍යයම්හ' යි කියත් ද, ඔවුන් සියල්ලන් මරා දමවු, මාගේ මුත්තනු වූ මහානාම ශාක්‍යයන් වෙත සිටියවුන් පමණක් නොං මරවු, ඔවුනට ජීවිතය දෙවු' යි අණ කෙළේ ය. එ වේලෙහි ශාක්‍යයෝ ඇසුරු කළයුතු රැකවලක් නොං දැක කෙනෙක් බිම වැතිර තණබියි ඩැහැ ගෙණ ද, කෙනෙක් හුණදඬු අල්ලා ගෙණ ද සිටියාහ. 'තෙපි ශාක්‍යයෝ ද නොං වහු දැ' යි ඇසූ විට ද මළත් බොරු නොං කියන බැවින් තණ පදුරු ඩැහැ ගෙණ සිටියෝ 'මේ සාක නොං වේ, තණය' යි කියති. හුණදඬු අල්ලා ගෙණ සිටියෝ 'මේ සාක නොං වේ, හුණදඬු' යි කියති. එහි දී ශාක්‍යයන් අතර දිවි ලැබුවෝ මහානාමයන් වෙත සිටියෝ පමණක් ම වෙති. තණපදුරු අල්ලා ගෙණ සිටියෝ එ තැන් සිට **තාණශාක්‍යයෝ** ද හුණදඬු අල්ලා ගෙණ සිටියෝ **නළශාක්‍යයෝ** ද වූහ. විඞ්ඛඛ තෙමේ මේ ඛබරයේ දී කිරිදරුවන් ද නොං හැර හැම ශාක්‍යයා ම මරවමින් ලේගහක් කොට එයින් තම පුටුව සෝදවා මුලින් කළ අදහස ඉටුකර ගත්තේ ය. මෙසේ ශාක්‍ය වංශය විඞ්ඛඛයා විසින් යිද හරින ලද්දේ ය. ඔහු මහානාමයා රඳවා ගෙණ නැවතුනේ 'උදැසන වේලෙහි උදැසන බත් කන්නෙමි' යි සිතා ය. බත් එළ වූ කල්හි හිඳ ගෙණ එකතු ව කන්නෙමි' යි මුත්තනුවන් කැඳවී ය. ක්‍ෂත්‍රියයෝ දිවි ගිය ද, දැඩිපුත්‍රයන් හා කැටිව හිඳ නොං කති. එහෙයින් මහානාම තෙමේ විලක් දැක 'ඇඟ කිලිටිය, කන්නට පළමු ව නැ යුතු ය' යි දැන්වී ය. 'හොඳයි! මුත්තනුවෙනි! නාන්නැ' යි විඞ්ඛඛ කී ය. 'මොහු හා කැටි ව හිඳ නොං කනවිට මෙ තෙමේ මා මරන්නේ ය, මොහුගෙන් මැරුම් කෑමට වඩා තමා ම මැරෙණු යහපතැ' යි සිතා කොණ්ඩය ලිහා කෙස්අග ගැටයක් ගසා පය මාපටඇඟිල්ල එහි අවුළුවා ගෙණ දියෙහි බිලුනේ ය. ඒ වේලෙහි ඔහුගේ ගුණතෙදින් නාගභවනය තැවී රත්වී හියේ ය. එහි වූ නාරජ තෙමේ 'කිමේඤ' යි විම සන්නේ ඔහු වෙනට පැමිණ ඔහු පෙණගොබයෙහි හිඳුවා නාග භවනයට ගෙණ හියේය. මහානාම තෙමේ දෙලොස් අවුරුද්දක් එහි විසී ය. විඞ්ඛඛ තෙමේ 'මාගේ මුත්තනුවන් දුන් එනි, දුන්

එනී' යි හිඳ කල් යත්, ගෙය සොයා බලවා අත් තැන්හි ද සොයවා නො දැක 'පැන ගියේ වනැ' යි සිතා එ තැනින් නික්ම ගියේ ය. නැවැත ඔහු රාත්‍රිකාලයෙහි අචිරවතී ගඟබඩට ගොස් එහි කඳවුරු බැන්දේ ය. ඔහුගේ පිරිසෙහි සමහර කෙනෙක් ඇතුළඟඟ වැලි තලා පිට නිදි ගත්හ. තවත් කෙනෙක් ගොඩබිම නිදි ගත්හ. ගඟබඩ නිදි ගත්තවුන් අතර ද පෙර පවි නො කළ අය සිටියහ. ගොඩ නිදි ගත්තවුන් අතර ද පෙර පවිකළෝ සිටියහ. උන් නිදා සිටි තැනැ පොළොවෙන් කඩියෝ මතු වූහ. ඔවුහු 'මා නිදා සිටි තැනැ කඩියෝ ය, මා නිදිගත් තැනැ කඩියෝ ය' යි කියමින් නැඟී අවුත් පවි නො කළ අය ගොඩ නිදා ගත්හ. පවිකළෝ ගඟවැල් ලෙහි ම නිදි ගත්හ. මේ වේලෙහි වලාකුල් නැඟී බලගතු ගල් වැස්සෙක් වට. ගඟෙහි ගැලූ මහදියපාර, එයට අසු වූ විඩූඩභයා හා ඔහු පිරිස මුහුදට ඇද ගෙණ ගියේ ය. එහි දී සියල්ලෝ මස් කැසුප් මෝරු තල්මස් ආදී සතුන්ට බත් වූහ. මේ අරගලය මෙසේ අවසන් වූ කල්හි මහාජනයා අතර 'ශාක්‍යයන්ගේ මරණය අයුතු ය, අස්යෝ! ශාක්‍යයෝ මෙසේ ආයුධවලින් ඇණ කොටා මැරිය යුත්තෝ ද, මෙය ඉතා සැහැසි ය' යි කතාවක් උපන. එවිට බුදුරජාණන් වහන්සේ 'ඇයි, මහණෙනි! ශාක්‍යයන්ගේ මේ මරණය අද අයුතු වුව ත් පෙර කළ අකුශලකර්මයට අනු ව මේ අයුතු ය' යි නො කිය හැකි ය, ඒ කර්මයට අනු ව කිය යුත්තේ, මොවුන් විසින් යුත්තක් ම ලැබූබව ය, මොවුහු පෙර එක් අත්බවෙක ගඟක විෂ වෙඩි බැහූහ' යි වදාළ සේක. ඉන්පසු එක් දවසක ධර්මසභාවට රැස් වූ භික්ෂූන් අතර 'විඩූඩභයා මෙතෙක් ශාක්‍යයන් මරා ද තමන් ගේ අදහස මුදුන් පමුණුවා ගත නො හී පරිවාර ජනයා ත් සමඟ මුහුදු වැටී මස්කැසුප් ආදීනට බත් වී ය' යි කතාවක් උපන. ඒ වේලෙහි එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ 'මහණෙනි! මා ඊට කලින් තමුසේලා කිනම් කතාවක් කරමින් හුන්නහු ද' යි අසා වදාළ කල්හි 'මෙ නම් කතාවක් කරමින් හුන්නෙමු' යි දැන්වූහ. එකල උන්වහන්සේ 'මහණෙනි! මේ සත්වයන් තමන්ගේ මනදොළ මුදුන් පමුණුවා ගන්නට මත්තෙන් ම මාර තෙමේ නිදි ගත් ගමක් හෙවත් ගම්වැස්සන් යටපත් කොට යන මහත් දිය සැඩපහරක් මෙන් ජීවිතෙන්ද්‍රිය සිඳ දමා සතර අපාය නැමැති මහමුහුදෙහි ගල්වා ය' යි වදාරා මේ ධර්මදේශනාව ද කළ සේක:-

පුප්ඵානිහෙව පචිනන්තං ව්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහොඝොව මච්චු ආදාය ගච්ඡතීති.

මල් කඩා රැස්කරන්නකු මෙන් මේ ලොකයෙහි පස්කම් මල් සොයන්නා වූ පස්කම් ගුණයන්හි තදින් ඇලුනු සිත් ඇති සත්වයා,

නිදා සිටි ගමක් මහමුහුදට ගසා ගෙණ යන මහදියපහරක් සේ මෘත්‍යුමාර තෙමේ සිවුඅපාය නැමැති මුහුදට ඇද ගෙණ යයි.

පුප්ඵානි ඉහ ඉව පචිනන්තං = මල්නෙලා රැස් කරන්නකු සේ මෙහි.

මල්නෙලන කා ගැණත් මෙසේ කිය හැකි වූව ද ප්‍රධාන වශයෙන් මාලාකාරයෙක් ම **පචිනන්ත** ශබ්දයෙන් ගැණේ. මෙහි එන ඉව, යන්න පචිනන්තං, යන්න හා එකතු කළවිට 'නෙලා රැස් කරණ මල්කරුවකු මෙන්, යන අරුත් මතු වේ. මේ උපමාන පක්ෂය යි. ඒ බව ඉව, යන්න ප්‍රකට කරයි. එහෙයින් එය උපමා වාචක නිපාතයෙක් වේ. නෙලා රැස් කරණ, යන අරුත් ඇති පචිනන්ත, යන්නට කර්මය වනුයේ පුප්ඵානි, යන පදය යි. පුප්ඵානි යන්නෙන් මල් කිය වේ. පුප්ඵානි, යනු මල් යන අරුත්හි ප්‍රකට වූව ද එයින් මෙහි ගැණෙන්නේ පංචකාමය යි. පචිනන්ත, යන්නෙන් මල්නෙලා රැස් කරන්නා ත් පංචකාමයන් සොයන්නා ත් කිය වේ. ඒ දෙදෙනාගේ එක්ලෙසකින් සමානධර්මත්වය, ඉව, යන්නෙන් වදාළ සේක.

ව්‍යාසත්තමනසං = තදින් ඇලුනු සිත් ඇති.

අතට පත් වස්තුවෙහි ඇලීම්වශයෙන් ද, අතට නො පත් වස්තුවෙහි පැතීම්වශයෙන් ද ගැලෙන බැඳෙන ඇලෙන සිත් ඇත්තේ මෙයින් ගැණේ.

මාලාකාරයෙක් මල් උයනකට වැද ගසකින් මල් කඩාගන්නේ අනික් ගසෙහි මල් මෙයට වඩා පියකරුය, සුවඳ ඇත්තේ ය, අනික් ගසෙහි මල් මෙයටත් වඩා සිත්කලු ය, අගනේ ය, යි මල් උයනෙහි සැම තැන ඇවිදිමින් මල්වලින් සෑහීමකට නො පත් ව පමා වන්නේ යම්සේ ද, එසේ ඇතැම් මිනිහෙක් මල් උයනක් වැනි පස්කම් ගුණ මැදට බැස සිත්කලු වූ රූපාරම්මණයක් ලැබ රස විඳින්නේ ද, සෑහීමකට නො පත් ව අනික් රූපාරම්මණයක් පතයි. එසේ ම ශබ්ද-ගන්ධ-රස ස්ප්‍රෂ්ටව්‍ය යන මොවුන් ද, පතයි. නිතර නිතර අමුතු අමුතු රූපශබ්දාදිය සෙවීමට වෙහෙසෙයි. ගොන් මීමුන් දැසි දස් ගම් නියම්ගම් දනවු ආදිය ලබා ද සෑහීමකට නො පත් ව තව තව සොයයි. පතයි. 'අසුවල් එක හොඳ ය, එයට වඩා අනික හොඳ ය' යි සිතමින් පතමින් වෙහෙසෙයි. පැවිද්දා ද පිරිවෙන් විහාර පා සිවුරු ආදිය කොතරම් ලබා ද අළුත් අළුත් වූ මහත් මහත් වූ තව තව පිරිවෙන් විහාර පා සිවුරු ආදිය සොයමින් පතමින් දවස් යවයි. මෙබඳු ගිහි පැවිද්දෝ නිතර සිත කෙලෙස්වලින් මැඩ ගත් හෙයින් මරණින් පසු සතර අපායයෙහි උපදිති. මෙබන්දෝ ය පස්කම්හි තදින් ඇලුනු සිත් ඇත්තෝ.

නරං = සත්වයා.

තමා ඇසුරු කරන්නන් උසස් තැනට පමුණු වන තැනැත්තේ නර, නම් වේ. ප්‍රථමප්‍රකෘතිය වූ සත්වයා අනික් ප්‍රකෘතියකට වඩා උසස් බැවින් පුරුෂ, යි කියනු ලබන්නා සේ තමා ඇසුරු කරණ ලොකු කුඩා හැම කෙනෙකුත් උසස් අඩියට පමුණු වන තැනැත්තේ නර, යි කියනු ලැබේ. **'ආමොදිතා නරමරූ'** යන මෙහි වූ නර සදින් මනුෂ්‍යයා කියනු ලැබේ. **'නරා ච අථ නාරියෝ'** යන මෙහි එන්නෙන් කියැවෙනුයේ පුරුෂ තෙමේ ය. **'සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ'** යන මෙහි වූ නර ශබ්දය හෙන්නේ දෙව් මිනිසුන් කෙරෙහි ය. තැනට සුදුසු සේ නරශබ්දයට පුරුෂ-සත්ව-මනුෂ්‍ය යන අර්ථ කිය හැකි ය. **'නීයති සකෙන කම්මෙන නීයන්තීති=නරෝ'** යනු ද නිරුක්ති යි.

සුත්තං ගාමං = නිදිගත් ගම.

ගමෙක නිදීමෙක් නැත. **'ගාමස්ස ගෙහභිත්තති ආදීනං සුපනවසෙන සුපනං නාම නත්ථි'** යනු ඒ කී සැටි යි. 'නිදි ගත් ගමෑ, ය යි වදලෝ ගම් වැසියන්ගේ නිද්‍රාප්‍රමාදත්වය කරුණු කර ගැණීමෙනි. ඒ මෙසේ කීහ:- **'සත්තානං නිද්දූපගතානං උපාදාය සුත්තෙනා නාම'** යි. මෙහි ගාම යන්නෙන් ගම්වැසියන් ගැණෙන බව අටුවාවෙන් හෙලි වෙයි. ගාම, යන්නට ගම්වැසි යන අරුත් කිය හැක්කේ අහෙදෙපචාරශක්තියෙනි. අහෙදෙපචාර, නම් තැනට සුදුසු ලෙස හැසිරීම ය. ගැණීම ය. කිය යුතු සවභාවය යමෙක නැත්තේ නම්, ඒ සවභාවය, ඒ නැත්තහු කෙරෙහි නගාලීම ය. ඉඳුරු-ඝිනි-යම යන තුන දෙවතා නාමයෝ ය. ඒ දෙවතා නාමයන් ඔවුන් අයත් කොට ඇති දිශාවන්ට ද කියති. ඉඳුරු යනු පෙර දිග යි. ඝිනි යනු පෙර අනුදිග යි. යම යනු දකුණු අනුදිගයි. එහි විවරණය මෙසේ ය:- **'අහෙදෙන උපචරණං= අහෙදෙපචාරො'** යි. එය සමීප- එකදෙස- සහචරිත- ඨාන- යෙහුය්‍ය- තඩ්ඩම- හෙද- ගුණ- ඵල- තාදත්ථ- තාසදිස- සම්බන්ධ- උපමෙය්‍ය යි තෙළෙස් වැදෑරුම් ය. සමහර තැනෙක මෙය දස වැදෑරුම් කොට සමහර තැනක දෙවිසි වැදෑරුම් කොට ද දක්වා නිබේ. මෙහි ඨාන නාමයෙන් ඨානීන් ගන්නා බැවින් ගාමං, යන්න ඨානොපචාරය යි. ගාම, නාමයෙන් ගැමියන් කීහ.

මහොසො ඉව = මහදියවතුරක් මෙන්.

ඔඝ ශබ්දය, **'කාමොසො'** යනාදී තන්හි කාම-භව-දිට්ඨි-අවිජ්ජා යන මෙහි ද **'ජනොසො'** යනාදී තන්හි සමූහයෙහි ද **'ජලොසො'** යනාදී තන්හි වෙගයෙහි ද ආයේ ය. මෙහිලා ජල

වෙගය කියැවේ. **'අවයවං ව්‍යාපීය ගච්ඡතීති=ඔඝො'** යනු වාක්‍ය ය යි. හැම තැනෙක ම හෙවත් එයට අසුවන හැමදෙයක් ම පැතිර ගෙණ යේ නුයි ඔඝ නම් වේ. **ඉව,** යන්න ගාමං යන්නට එකතු කොට අරුත් ගතයුතු ය.

මච්චු ආදාය ගච්ඡති=මෘත්‍යුමාර තෙමේ ගෙණ යයි.

යම්සේ මහාජලවෙගය තෙමේ ගැණු-පිරිමි-ගෙරි හරක්-මීමුන් -කුකුල්-ගස් කොළන්-ගේදොර යන කිසිවක් ඉතිරි නො කොට සියලු ගම පැහැර ගෙණ මුහුදට පමුණුවා මස් කැසුප් ආදීනට බත් කරයි ද, එමෙන් මෘත්‍යුමාර තෙමේ[1] ලද නො ලද පස්කම් සැප තෙහි ගැලෙමින් ඒ ම පතමින් ප්‍රමත්ත ව කල් යවන ගිහි පැවිද්දන් ගේ ජීවිත සිඳ දමා ඔවුන් සතර අපායයෙහි ගිල් වන්නේ ය' යි මෙයින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

විඩූඩභවසතුව නිමියේ ය.

1. 3-6 'යොඩෙථ මාරං පඤ්ඤායුඩෙන'' පරිකථා බලනු.

හිමියා පැතූ සත්‍රිය.

4-4

තවතිසා දෙව්ලොව **මාලහාරී** නම් දෙව පුත්‍රයෙක් විය. ඔහු දවසෙක දෙවඟනන් පිරිවරා මල් උයනකට ගියේ ය. ඉන් බොහෝ ගණනක් දෙවඟනෝ ගස් නැගී මල් නෙලා බිම හෙලති. එ පමණක් ම දෙවඟනෝ ඒ මල් ගෙණ දෙවපුත්‍රයාට පලඳවති. උන් අතර සිටි එක් දෙව්දුවක් එ වේලෙහි ගස උඩදී ම කලුරිය කළා ය.

දෙව්ලොවින් ගිලහුනු ඕ තොමෝ සැවැත්නුවර කුලගෙයක උපන්නා ය. ඒ ඇසිල්ලෙහි ජාතීන් සිහිකළ හැකි නුවණක් ද ඇට ලැබින. එයින් ඕ තොමෝ පෙර අත්බවෙහි තමන් තවතිසා දෙව්ලොව මාලහාරී දෙවපුත්‍රයාගේ බිරින්ද ව වුසුබව දැන නැවැත ත් ඔහු වෙත ම උපදින්නට පතා ගෙණ නන් වැදෑරුම් පින්දම් කළා ය. සොළොසැවිරිදි කල සරණ ගියා එහි ද ලහබත් පැකිබත් වස්වැසි බත් දෙමින් 'මා හිමියා වෙත ඉපදීමට මෙය අත්තිකාරමෙක් වේවා' යි කියන්නී ය. භික්ෂූන් වහන්සේලා ඇ කියන බස් අසා 'මේ තොමෝ නිතර හිමියා ම පතා ය' යි ඇයට **පතිපූජිකා,** යි නම් කළහ. බොජුන්හල හැම ද පිළියෙල කරන්නී ඕ තොමෝ ය. පැන් පෙරා තබන්නී ත් අසුන් පණවන්නී ත් ඕ ය. මෙ දවස ලහබත් ඇ දෙනු කැමැති අන්‍ය මනුෂ්‍යයෝ ද 'දුවනිය! මේවා ද පිළියෙල කොට සඞ්ඝයාට පිළිගන්වනු මැනැවැ' යි නොයෙක් දුනොපකරණ ගෙණවුත් ඇයට භාර දෙති. මේ සඳහා නිතර විහාරයට යන එන ඇය එක පියවරෙක්හි කුසල්දම් සපණසක් ලබයි. මෙසේ පින්කම්හි යෙදී සිටි ඇගේ කුසෙහි නිසිකල්හි දරුගැබෙක් හටගත්තේ ය. දස මසක් ගිය තැනැ ඕ පුතකු වැදූ ය. ඒ දරු පා නගා ඇවිදින කාලයෙහි අනික් පුතෙකැ යි මෙසේ පිළිවෙළින් පුතුන් සතර දෙනකු ලැබූ ය. දවසක් දන් දී පුද වෙසෙස් පවත්වා බණ අසා පන්සිල් රැක සවස් ව ගිය කල්හි හදිසියේ හටගත් ලෙඩකින් කලුරිය කොට පෙර අත්බවෙහි තම හිමි ව විසූ මාලහාරී දෙව්පුත් වෙත ම උපන්නා ය. එහි අනික් දෙවඟනෝ දෙවිපුත්හට ඒ තාක් ම මල් පලඳ වමින් හුන්නෝ ය. දෙවපුත්‍ර තෙමේ 'සොඳුර! උදය පටන් නී නො දැක්කෙමි, ගියෙහි කොහි දැ' යි ඇසී ය. ඕ තොමෝ මම මෙ තැනින් චුත ව ගොස් සැවැත්නුවර කුලගෙයක උපන්මි' යි කිවු ය. 'සරණ ගියා දැ' යි ඇසූ විට 'ඔව් සරණ ගියෙමි' යි කිවු ය. 'කොපමණ කල් එහි විසුවෙහි දැ' යි ඇසූවිට 'දස මසක් මවු කුසැ, සොළොස් වියේ දී සරණ ගියා, ඒ සරණයෙන් පුතුන් සතරදෙනකු

ලැබුවා' යි කිවු ය. 'තව මොක ද කෙලෙහි' යි ඇසුවිට 'ඔබ ම පතා ඔබ ගැණ ම සිතා දන් පින් කොට එ පිණෙන් නැවැත ඔබ වෙත ම උපන්මි' යි කිවා ය. දෙවපුත්‍ර තෙමේ 'මිනිසෙකුගේ පරමායුෂය කොතරම් ද' යි ඇසුයේ ය. 'අයියෝ! බොහොම ටික යි, වැඩිම ගණන අවුරුදු සියයක් පමණැ යි කිය යුතු ය' යි කී විට 'ආ! ඇත්ත ද, ඔපමණ ටික දැ' යි ඇසී ය. ඔව්! ගිමියෙනි! බොහෝ ම ටිකැ' යි කිවූ. 'මොක ද, ඔතරම් අඩු දිවිපැවැතුම් ඇති මිනිස්සු නින්දෙන් කෙළිසෙල්ලමෙන් කල් දවස යවත් ද, නැත, දන් පින් කෙරෙත් දැ' යි ඇසී ය. 'මොකට අසන්නහු ද, අසඞ්ඛ්‍යයක් ආයු ගෙණ උපන්නවුන් සේ, ජරාමරණ නැත්තවුන් සේ මිනිස්සු වරදෙහි බැඳි අපරාධ කෙරෙමින් සතුන්මැරීම් හොරකම්කිරීම් කාමයෙහි වරදවා හැසිරීම් බොරුකීම් රාඅරක්කුබීම් ආදී හැම දුශ්චරිතයක් ම කරමින් අනුන් තළා පෙළා අන්සතු ඉඩ කඩම් පැහැර ගණිමින් බොරුනඩු බොරුසාක්කි කියමින් මානයෙන් අහඞ්කාරයෙන් දරදඬු ව මහණ බමුණන්ට නින්දා පරිභව කරමින් වැඩිහිටියන්ට නිගා කරමින් මවු පියනට හිංසා කරමින් පරලොවක් නැති සේ කම්විපාකයක් නැති සේ සලකා මසුරුමලෙන් බැඳි ජීවත් වෙති, අද මිනිස්ලොව මිනිසුන් නො කරණ පව්කමෙක් නො පණත් කමෙක් නැත, වසතු තෘෂ්ණාවෙන් බැඳි උනුන් ඇණ කොටා ගණිති, බේබදුකම් කරති, සල්ලාලකම් කරති, ගෙයක් පාසා සූදුපිට්ටනිය, අඹුසැමි දෙපොල ම සූදුපිටියේ ය, පරපුරුෂ සෙවන පරස්ත්‍රී සෙවන ආදී වූ ජඩකම්වල නිමාවක් නැත, මිනිසුන් තුළ විලිබිය ඇත්තේ ම නැත, කුඩා කොළු කෙළි පටන් මහලු මැහැලියන් තෙක් හැම ගැණු පිරිමි කෙනෙක් ම ලජ්ජාභය දෙකින් තොර ය, ඒ නිසා තිරිසනුන් සේ දිවි යවති' යි කිවු ය. එ කල දෙවිපුත් තෙමේ 'සොඳුර! අවුරුදු සියයක් පරමායුෂය කොට සිටි මිනිස්සු මෙසේ නිදත් නම්, පමා වෙත් නම්, නො පණත් කම් කරත් නම්, කො තරම් අයුතු ද එය, අය්යෝ! ඔවුහු කවදා දුකින් මිදෙත් ද, මිනිස් ලොව අවුරුදු සිය යෙක් තව්තිසා වැසි අපට එක් දවසෙක් වෙයි, එ දවසින් නිස් දව සෙක් මසෙක් වෙයි, එ මසින් දෙළොස් මසෙක් අවුරුද්දෙක් වෙයි, එ අවුරුද්දෙන් අවුරුදු දහසෙක් අපගේ ආයුකාලය' යි, එය මිනිස් ගණනින් තුන්කෝටි සැට ලක්ෂයෙකැ' යි කී ය.

දෙවියන්ගේ ආයුෂය මෙසේ බැවින් ඒ දේවපුත්‍රයාහට එක් දවසෙකුදු ඉක්ම නො ගියේ ය. ඒ කාලය මොහොතක් පමණ විය. මදආයු ඇති මිනිසුන් දන්පින්කම් ආ කිරීමෙහි පමාවීම තමනට කරගත්නා ලොකු නපුරෙකි.

පසුදා ගමට වැඩි භික්ෂූන් වහන්සේලා ආසනශාලාව නො හැම ද අසුන් නො පණවා පැන් නො එළවා සිබෙනු දැක 'පනිපූජිකා

තොමෝ කොහි ද, යි ඇසූහ. 'ස්වාමිනි! ඇ කොතැන්හි දකින්නහු ද, ඔබ වහන්සේලා ඊයේ වලඳ වැඩියපසු සවස හදිසියෙන් නැගුනු ලෙඩකින් මළා ය' යි එහි සිටියෝ කීහ. සාමාන්‍ය භික්ෂූන් වහන්සේලා ඇ කළු උවැටැන් සලකා කදුලු වැගිර වූහ. රහතුන් වහන්සේට ධම්මසංවෙගය උපන. උන්වහන්සේලා විහාරයට ගොස් බුදු රජුන් කරා පැමිණ 'ස්වාමීනි! පතිපූජිකාව ඉතාඕනෑකමින් නිතර නොයෙක් පින්දම් කොට තමන්ගේ හිමියා ම පතමින් සිටියා, හදිසියෙන් මළා ය, ඇ කොහි උපන්නී ද' යි ඇසූහ. 'පැතූලෙසට ම හිමියා වෙත උපන්නී ය'යි වදාළවිට 'ස්වාමීනි! ඇ එහි නැතැ'යි කීහ. 'ඔය ඉන්නා හිමියා පතා, ඇ පින් කළා නො වේ, පෙර ජාතියෙහි ඇට හිමි වූයේ තව්තිසා දෙව්ලොවැ වැසි මාලහාරී දෙවපුත්‍රයා ය, ඔහුට මල් පලඳවන තැනේ දී මෝ තොමෝ එ තැනින් චුත ව මෙහි ඉපිද නැවැත එහි ම උපන්නී ය' යි වදාළ සේක. 'එහෙම ද ස්වාමීනි! යි භික්ෂූන් ඇසූවිට 'ඔව්, මහණෙනි!' යි වදාළ සේක. සත්වයන්ගේ ජීවිතය කොතරම් ටික ද, උදයවේලේ ඕ තොමෝ අප වැලඳෙව්වා ය, සවස් වේලේ මළා ය' යි භික්ෂූන් කතා කරන්නට වූ කල්හි ඒ අසා බුදුරජාණන් වහන්සේ 'ඔව් සත්වයන්ගේ ජීවිතය දිග් එකෙක් නො වේ, එය ඉතා කෙටි ය, ඒ නිසා ම මාර තෙමේ වසඟකාම-ක්ලේශකාමයන්ගෙන් සෑහීමට නො පත් මේ සත්වයන් තම යටතට ගෙණ හඬව හඬවා විලාප කියව කියවා ගෙණ යා' යි වදාරා මේ ධම්මදේශනාව ද කළ සේක:-

පුප්ඵානිහෙව පචිනන්තං බ්‍යාසත්තමනසං නරං,
අතිත්තංයෙව කාමෙසු අන්තකෝ කුරුතෙ වසං.

මල් කඩා රැස් කරන්නකු මෙන් පංචකාමගුණපුෂ්පයන් සොයන නොයෙක් පරිද්දෙන් පංචකාමගුණයෙහි ඇලුනු සිත් ඇති සත්වයා වසඟකාම-ක්ලේශකාමයන්හි නො සෑහුනහු ම මාර තෙමේ වසඟ කර ගන්නේ ය.

පුප්ඵානිහෙව පචිනන්තං=මල් කඩා රැස්කරන්නකු මෙන්.
බ්‍යාසත්තමනසං නරං=තදින් ඇලුනු සිත් ඇති සත්වයා.

පංචකාමය දක්වනු ව **'පුප්ඵානි'** යනු යෙදින. පංචකාමයෙහි තදින් ඇලුනුහු සඳහා ය **'බ්‍යාසත්තමනසං නරං'** යෙදුනේ.
අතිත්තං එව කාමෙසු=කාමයන්හි නො සෑහුනහු ම.

අතිත්තං' යන්නෙහි මූලය **තිප්පි'** හෝ **තිස'** යන්න ය. එයින් පිණායෑම හෝ සෑහීම කියැ වේ. යම් දෙයක් කරණ කොට යමක්හුගේ පිණායෑමෙක් හෝ සෑහීමෙක් නො වේ නම්, ඒ **අතිත්ත'** නම් වේ.

කාම ශබ්දය, **'කාමා හි චිත්‍රා මධුරා මනොරමා විරූප රූපෙන මථෙනති චිත්තං'** යනාදී තන්හි ආයේ මනවඩන රූප ශබ්දාදී වූ අරමුණු විෂය කොට ය. **'ඡන්දො කාමො, රාගො කාමො'** යනාදි තන්හි ආයේ ඡන්දරාගයෙහි ය. **'කිලෙසකාමො, කාමූපාදානං'** යනාදි තන්හි ලොභයෙහි ආයේ ය. **'අත්තකාම පාරිචරියාය වණ්ණං භාසෙය්‍ය'** යනාදී තන්හි මෙවුන්දම්හි දක්නා ලැබේ. **'සන්තෙත්ථ තයො කුලපුත්තා අත්තකාමරූපා විහරන්ති'** යනාදියෙහි ආයේ හිත කැමැත්තෙහි ය. **'අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙන කාමං ගමො'** යනාදියෙහි දක්නේ සෛවරීභාවයෙහි හුනුයේ ය. මෙහි මන වඩන රූප ශබ්දාදී වස්තු කාමයෙහි හා තද්විෂයකක්ලෙශකාමයෙහි ද වැටුනේ ය.[1]

මන වඩන රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය කාමයෝ ත් දැසි-දස්-කෙළි-කොළු- ඉඩකඩම්- ගේදොර- හරකබාන- රන්-රිදී-මුතු-මැණික් ඈ කාමයෝ ත් සත්ත්වලොකයට හිත පිණිස නො වෙති. එහෙත් අඥයෝ 'හිතකරයහ' යි ගණිති. එසේ ගන්නෝ කමනීය වස්තූන්ගේ රස විඳීමෙන් ලැබෙන ක්ෂණික වූ සැප සොම්නස් දෙක ස්ථිර එකක් සේ සලකා ගැණීමෙනි. 'කාමයෝ අහිතකරයහ, බොහෝ ආදීනව ඇත්තෝ ය, මඳ වූ ආස්වාද ඇත්තෝ ය, මෙ ලොව පරලොව දෙක්හි ම දුක් උපද වන්නෝ ය, දැඩි ආයාස ඇත්තෝ ය' යි බුදුරජානන් වහන්සේ කාමයන්ගේ ඇති තතු පැහැදිලි කළ සේක. තව ද යමෙක් හස්තමුද්‍රා ය, නිරතුරු ගිණි ම ය, පිඩුකොට ගිණීම ය, ගොවිතැන් කිරීම ය, වෙළඳාම් කිරීම ය, ගෙරි රැකීම ය, රජුන්ට උවැටැන් කිරීම ය, රාජපුරුෂභාව ය, දාස මෙහෙවර ය යනාදි නොයෙක් උස් පහත් කටයුතුවලින්, සීත-අවුසුළං නො බලා ඉන් මැඩෙමින්, මැසි-මදුරු-කුරු කුහුඹු-නයි-පොළොන් ආදීන්ගෙන් පීඩා විඳිමින්, බඩගිති උසුලමින් ධන ධාන්‍යාදිය රැස් කෙරේ ද, ඔහුට මේ සියලු දුක් කාමයන් නිසා ම කාමයන් හෙතුකොට ම විඳීමට සිදු වන්නේ ය.

'ඉධ මහානාම! කුලපුත්තො යෙන සිප්පට්ඨානෙන ජීවිකං කප්පෙති යදි මුද්දාය යදි ගණනාය යදි සඞ්ඛාතෙන යදි කසියා යදි වණ්ජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො ඩ සමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො ඛුප්පිපාසාය මියමානො, අයං මහානාම! කාමානං ආදීනවො සන්දිට්ඨිකො දුක්ඛන්ධො කාමහෙතු කාමනිදානං කාමාධිකරණං කාමානමෙව හෙතු' යනු එහි දෙශනා ය.

---

1. 2-4 "කාමරතිසන්ථවං" පරිකථා බලනු.

මෙසේ දුක් කරදර විඳ ද දවසෙහි දිවි රැකුමට පමණවත් යමක් සපයා නොගත හැකි වී නම් වැලපෙයි. ලෙහි අත් ගසා හඬයි. උමතු වෙයි. මෙ ද කාම හෙතුවෙන් ම වූ විපත් රැසෙකි. දිවි නොතකා කළ උස් පහත් හැම ක්‍රියාවකින් ම යම්කිසි ධනයක් උපයා ගත්තේ නම්, එය සොරුන්ගෙන්, රජුන්ගෙන්, ගින්නෙන්, ජලයෙන්, සතුන්ගෙන් රැකගත යුතු ය. යම් ලෙසකින් එය සොර, සතුරු ආදීනට හසු වී නම්, එ තැනදී හඬමින් වැලපෙමින් උමතු බවට ද යෙයි. මෙ ලොව ලැබෙන මේ දුක් රැසට හෙතු ද කාමයෝම ය.

තව ද මේ ලෝකයෙහි රජවරු, රජවරු හා ක්ෂත්‍රියයෝ, ක්ෂත්‍රියයන් හා බ්‍රාහ්මණයෝ, බ්‍රාහ්මණයන් හා ගෘහපතියෝ, ගෘහපතියන් හා මවු, පුතු හා පුතු, මව හා පියා, පුතු හා පුතු, පියා හා, සහෝදරයා, සහෝදරිය හා සහෝදරිය, සහෝදරයා හා යහළුවා, යහළුවා හා වාද කොට කලහ කොට අත්පාවලින් කැටකැබලිනි වලින් ලිපොලුවලින් කඩුකිරිවිවිවලින් තවත් නොයෙක් කුදු මහත් ආයුධවලින් විෂධූමවලින්, ඇණ කොටා ගෙණ එ තැන ම මිය යෙති. ඉදුම් හිටුම් නැති ව යෙති. මේ ආදී සියලු බිහිසුණු අපරාධවලට කරුණු වන්නෝ කාමයෝ ම ය. කාමහෙතුවෙන් ම මේ අපරාධයෝ සිදු වෙති. තව ද රජහු පස මිතුරන් ජීවගාහයෙන් ගෙණ තලා, පෙලා, අත්පාකන්නාසා ඉද දම්මවා, එයිනුදු සැහීමට නොපත් ව, හිස්කබල උපුටවා, ගිනියම් කළ යගුලි ඊ මත තබවා, හිස්මොළ උතුරවා හරවති. ඔලුවෙහි හම ගලවා බොරලුකැට උලවා, එය සකක් මෙන් සුදු කරවති. තෙල්රෙදි ඇතුල් කරවා කටෙහි ගිනි දල්වති. සිරුර මුළුල්ල තෙල්රෙදි වෙළවා ගිනි තබ්බවති. අත තෙල්රෙදි වෙළවා ගිනි තබ්බවති. බෙල්ලේ පටන් ඉහටිය දක්වා සම ගලවා පහතට හෙලවා, රැණකින් බැඳ ඇවිද්දවති. නැවැත වරක් බෙල්ලේ පටන් සම ගලවා ඉහටියෙහි රදවා, ඉහටියෙහි පටන් බොලට දක්වා සම ගලවා රැණින් බැඳ ඇවිද්දවති. දෙදනා, දෙවැලමිට යකඩ හුලින් පොලොවෙහි සවිකරවා, අවට ගිනියම් කරවති. සේ මුවහත් බිලියෙන් ඇඟ මස් කඩවති. කහ වණු පමණට ඇඟ මස් කඩා දමවති. සිරුරෙහි කාරම්දිය ඉස්වති. කණෙහි යවුල් ගසා, පොලොවට සවි කොට, සෙක්කුවක් සේ කරකවවති. ඇට තලා, පිදුරුබිස්සක් සේ කරවති. රත් වූ කකාළ තෙල් ඇඟ ඉස්වති. දරුණු බල්ලන් ලවා කවති. දිවස් හුල හිඳුවා දම්මවති. හිස ගසා දම්මවති. මේ ආදී බිහිසුණු දුක් ද කාමයන් නිසා මෙ ලොවදී ම ලැබෙන්නේ ය. මේ දුක්වලට හෙතු වන්නෝ කාමයෝ ම ය. මේ හෙතුවෙන් කයින් වචනයෙන් සිතින් හැම පව්කමක් කොට මරණින් මතු සතර අපායයෙහි ඉපිද කප්කෙළ

ගණනක් සත්‍යයෝ දුක් විඳිති. **තක්කජාතක-නළිනිජ්ජාතක-මුදුලක්ඛණජාතක-සඞ්කප්පජාතක-ආසංකජාතක-තෙලපත්තජාතක-සමිද්ධිජාතකාදිය** බැලිය යුතු ය.

මෙසේ කාමයන් නොයෙක් නපුරෙන් හැසී ගැවසී සිටි බැවින් **'අට්ඨිකඞ්ඛලූපමා භික්ඛවෙ! කාමා, මංසපෙසූපමා භික්ඛවෙ! කාමා, තිණුකකූපමා භික්ඛවෙ! කාමා, අඞ්ගාරකාසූපමා භික්ඛවෙ! කාමා, සුපිනකූපමා භික්ඛවෙ! කාමා, යාචිතකූපමා භික්ඛවෙ! කාමා, රුක්ඛඵලූපමා භික්ඛවෙ! කාමා, අසිසූනූපමා භික්ඛවෙ! කාමා, සත්තිසූලූපමා භික්ඛවෙ! කාමා, සප්පසිරූපමා භික්ඛවෙ! කාමා'** යි වදාළ සේක.

මඳ වූ රස විඳීම් ඇති බැවින් කාමයෝ ඇට සැකිල්ලකට බඳු උපමා ඇත්තෝ ය. බොහෝ දෙනකුට සාධාරණ බැවින් මස්වැදැල්ලක් සේ ය. දවන බැවින් තණහුලක් සේ ය. මහත් ව තවන බැවින් අඟුරුවළක් සේ ය. මඳ කලක් ම පවත්නා බැවින් සිහිනයක් සේ ය. තාවකාලික බැවින් ණයට ඉල්ලා ගත්තක් සේ ය. අඟ පසඟ බිඳින බැවින් රුක්පලයක් සේ ය. කපන කොටන බැවින් කඩුව හා මස්ලොඹුවක් සේ ය. විනිවිද යන බැවින් සැත්හුලක් සේ ය. බිය සැක සහිත බැවින් නයිහිසක් සේ ය, යනු එහි ඉතා කෙටි තේරුම ය. විස්තර ඉදිරියෙහි එන්නේ ය.

මෙසේ නොයෙක් නපුරෙන් කිසිවිටෙක ත් නො වෙන් ව පවත්නා වස්තුකාම- ක්ලෙශකාමයන්හි, සෙවීමෙන්, ලැබීමෙන්, වැලඳීමෙන්, තැන්පත් කර තැබීමෙන් සෑහීමට නො පැමිණියහු **'අතිත්තාංයෙව කාමෙසු,** යන මෙයින් දැක්වූහ.

අත්තකො කුරුතෙ වසං=මාර තෙමේ වසඟ කරන්නේ ය.

කවරකු වසඟ කරන්නේ ද, යත්:- යට කී ලෙසින් කාමයන්හි ගැලී සිටියහු ය. කාමයෙහි බැස ගෙණ එයින් ම අඩ්ව යුතු-අයුතු දැනීමෙහි අපොහොසත් ව වසනා පුද්ගලයා හඬව හඬවා වලප්ව වලප්වා ගෙණ ගොස් තම වසයෙහි කරන්නේ ය. **'අත්තං විනාසං කරොතීති=අත්තකො'** යනු මෘත්‍යුමාරයා ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදි යට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

පතිපූජිකාවසතුව නිමියේ ය.

මච්ඡරියකොසියසිටානෝ

4-5

රජගහානුවර අසල සක්කර, නම් නියම් ගමෙක් විය. එගමැ විසූ මච්ඡරියකෝසියසිටු තෙමේ මහාධනවතෙක් වූයේ ය. අසූ කෙළක් ධනය ඔහුට තුබුනේ ය. එහෙත් තණඅගැ රැඳි තෙල් බිඳක් පමණ වත් දුයක් අනුනට නො දෙයි. තෙමේ ද නො කයි. නො බොයි. නො අඳියි. මේ මහත් ධනයෙන් ඔහුට, අඹුදරුවන්ට මහණබමුණන්ට, රටට, ගමට, අසල්වැසියනට කිසිත් වැඩෙක් නැත. එ හෙයින් මේ ධනරාශිය රකුසන් අරක් ගත් විලක් සේ ප්‍රයෝජන නැත්තේ ය.

දවසෙක සම්මා සම්බුදු රජුනත් වහන්සේ අලුයම් වේලෙහි මහකුළුණුසමවතින් නැගී මුළු ලොව බලා වදාරණ සේක්, එයින් පන්සාළිස් යොදුනකින් ඔබ්බෙහි සිටි බිරින් ද සහිත වූ මේ සිටුහට සෝවන් විමට තුබූ භාග්‍යමහිමය දැක වදාළ සේක.

එයට පළමු දින රජුට උපසථානය පිණිස ගොස් එන මොහු අතරමග දී බඩසයින් පෙළුනු පිටිසරමිනිසකු, තිරිඟුපිටියෙන් කළ තලප හා කබලුකැවුම් කනු දැක කැවුම් කෑමෙහි ආශා ඇති ව ගෙට ගියේ ය. 'කැවුම් කන්නට ඇති ආශාව කීයේ නම්, හැම දෙන ම කැවුම් කන්නට බලාපොරොත්තු වෙති, එකල ගෙයි ඇති තල සහල් තිතෙල් හකුරු හුඟදුරක් වියදම් වන්නේ ය, ඒ නිසා කැවුම් කන්නට ඇති ආශාව නො හඟවම්' යි සිතා ඒ ආශාව සටපත් කර ගත්තේ ය. මේ සිතිවිල්ලෙන් ඔහුගේ සිරුර සුදුමැලි විය. සිරුරෙහි නහර ඉල්පිනා. කැවුම් කෑමේ ආශාව නැග එයි. එය බලවත් ය. එ හෙයින් දවසක් කාමරයකට වැද ඇඳක වැතිර අතපය අකුළුවා ගෙණ නිදන්නට වන. කැවුම් කෑමට ගියොත් මුදල් වියදම් වේ ය යන බියෙන් ඒ අදහස හෙලි නො කර යි. මෙසේ නිදන වේලාවක බිරිඳ කාමරයට ගොස් පිට අතගා 'හිමියෙනි! මොක ද අසනීපයැ' යි ඇසූ ය. 'අමුතු අසනීපයෙක් නැතැ' යි ඔහු කී ය. 'එහෙනම් වෙනදා නැති නින්දක්, රජු වත් කිපුනේ දැ' යි ඇසූ විට 'නැතැ' යි කී ය. 'එහෙ නම් දූ පුතුන් අතින් වරදක්, 'නැ නැ, මොක ද ඔවුන් කළ වරදු' යි කී ය. වැඩකාරයන් අතින් වත් වරදක් වුනා දැ' යි ඇසූවිට ද 'නැතැ' යි කී ය. එහෙ නම් මොකවත් ගැණ බලාපොරොත්තුවක් තිබේ දැ' යි ඇසූ ය. කැවුම් කෑමේ ආශාව කීයේ නම්, මුදල් වියදම් විය හැකි ය, යන බිය නිසා කිසිවක් නො කියා නිහඬ විය. නැවැත ත් බිරිඳ 'ඇත්ත කියන්න! මොකද,

මොකවත් ගැණ ආශාවක් තිබේ ද' යි ඇසූ ය. 'මොන ආශාවක් ද, මොකවත් ගැණ ආශාවක් නැතැ' යි එවර ද කීයේ ය. බිරින් ද එයිනුත් නොනැවතී, නැවැත නැවැත ත් ඇත්ත කියන්න, ඇත්ත කියන්නැ' යි ඇවිටිලි කළා ය. එවිට 'සොඳුර! මොකක් ගැණ වත් කා ගැණ වත් බලාපොරොත්තුවක් ආශාවක් නැත, මේ ඇත්ත ය, වින දිනකට උඩදී කැවුම් කන්නට ආශාවක් උපනැ' යි කී ය. 'හා! ඕක ද කාරිය, ඔහොම අදහසක් තිබුනා නම් ඇයි, දෙයියනේ කලින් නොකීයේ, ඔබ වහන්සේ දිළිඳු නොවන්නහු ය, හොඳ යි, මම මේ මුළුගමට ම සැහෙන්නට කැවුම් උයන්නෙමි, යි අඹුව කිවු ය. 'මොක ද ඒ, එහෙම වුවමනා නෑ, උගලා අපට කුමට ද, වුවමනා නම් උන් කැවුම් උයා කනවා ඇති, ඒවා වැඩි වැඩැ' යි සිටු කී විට, 'එහෙ නම් එක කඩපෙළක ඉන්නා මිනිසුන්ට සැහෙන්නට උයන්නෙමි' යි කීවා ය. 'මම දන්නවා ඔයාගේ පොහොසත් කම, අන ලොකුබව, එයින් වැඩෙක් නැතැ' යි කීයේ ය. 'එයට ත් අසතුටු නම්, මේ ගෙදර ඉන්නා අයට පමණක් සැහෙන්නට උයන්න දැ' යි ඇසූ ය. 'ඔව්, ඔයා උසස් අදහස් ඇති ගැණියක බව මම දන්නවා' යි එයට පිළිතුරු දුන්නේ ය. 'එහෙ නම්, අපට ත් දූලා පුතාලාට ත් සැහෙන්න උයන්න දැ' යි ඇසූ විට 'දූලා පුතාලාට ත් වුවමනා දැ' යි ඇසුයේ ය. එහෙ නම්, ඔයාට ත් මට ත්' යි ඇසූවිට 'ඔහේටත්' යි සිටු තෙමේ කී ය. 'හා! හොඳ යි, ඔයාට පමණක් උයන්නෙමි' යි කී කල්හි 'කුස්සියේ උයන්නට ගියොත් දකින දකින හැම දෙන ම කැවුම් කන්නට බලාපොරොත්තු වෙති, හොඳ හාල් නොගෙණ සුන් සාල් ටිකකුත් ලිප ත් කබල ත් කිරි ගිතෙල් හා හකුරු ටිකකුත් අරගෙණ උඩ ම මාලට ගොස් උයන්න, එහෙ ම කළා ම මට කැවුම් කෑ හැකි ය' යි කීයේ ය. අඹුව ද 'එසේ කරන්නෙමි' යි ගතයුතු සියල්ල ගන්වා ගෙණ උඩුමාලට නැගවැඩකරුවන් බැහැර කොට සිටානන් ගෙන්වා ගත්තා ය. සිටු තෙමේ පාතමාලයේ පටන් සියලු දෙර යතුරු ලා ඉහලමාලයට ගොස් එහි ද දෙර වසා හුන්නේ ය. භය්‍යාව ලිප ගිනි මොලවා කබල ලිප තබා කැවුම් පිසන්නට පටන් ගත්තා ය.

එදා උදය බුදුරජානන් වහන්සේ මහාමෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේට කතා කොට 'මුගලන! රජගහා නුවර අසල සකඛරනම්, නියම්ගම මවෂරියකොසියසිටු තෙමේ කැවුම් කන්නෙමි, යි කියා අනුන් දකිනා බියෙන් උඩුමාලට නැගී බිරින්ද ලවා කැවුම් පිසවා යි, තමුසේ දැන් එහි යා යුතු ය, සිටු භික්මවා තමන් කෙරෙහි නතු කර ගෙණ අඹු සැමි දෙදෙනා ලවා ම කැවුම් කිරි ගිතෙල් මී හකුරු ත් ගන්වා ගෙණ මෙහි දෙවරමට ආ යුතු ය, මම භික්ෂූන් සමග මෙහි ඉන්නෙමි, උන් ගෙණෙනා කැවුම්වලින් ම බත් කිසත්

කරන්නෙමි' යි වදාළ සේක. එ කෙණෙහි සථවිරයන් වහන්සේ සවකීයඍද්ධිබලයෙන් එහි වැඩම කොට ඔහුගේ පහයෙහි සිමැදුරු කවුළුව ලඟ හැඳ පෙරවූ ගෙණ මිණියෙන් කළ රුවක් සේ අහස් කුසෑ වැඩ සිටියහ. තෙරුන් දුටු සිවුගේ ලය දෙදරා ගියේ ය. මම මෙබන්දන්ට ම බියෙන් මෙහි ආමි, මේ තැනැත්තා ත් මෙ තැනට ම අවුත් ජනෙල්දොර සිටියේ ය' යි කලඹුතු දෙයක් නො දැන ගින්නෙහි වූ ලුහුකැට සේ තරහයෙන් පිපිරි පිපිරී 'මහණ! අහ සෙහි සිටීමෙන් මොනවා ලැබේ ද, පා නො තැබිය හැකි අහසෙහි පා තබා ඇවිද්ද ත් කිසිවක් නො ලැබේ ය' යි සිවු තෙමේ කීයේ ය. සථවිරයන් වහන්සේ එ තැනැ ම එහා මෙහා ඇවිද්දහ. 'ඇවිද්දට කුමක් ලැබේ ද, අහසැ පලක් බැඳ හුන්න ත් කිසිවක් ලැබෙන්නේ නැතැ'යි කීවිට උන්වහන්සේ අහසැ පලක් බැඳ හුන්හ. අහසැ පලක් බැඳ හුන්නාට තබා, මේ ජනෙල් පඬිය ලඟ හුන්න ත් මොකවත් ලැබෙන්නේ නැතැ' යි ඔහු කී ය. එවිට උන්වහන්සේ ජනෙල්පඬිය උඩ සිට ගත්හ. ජනෙල්පඬිය උඩ හුන්නාට ලැබෙන දෙයක් නැත, ඒ තබා ඔබ දුමා ගිය ත් මෙ තැනින් නම් ඔබට කිසිවක් ලැබෙන් නේ නැතැ' යි කී කල්හි සථවිරයන් වහන්සේ දුමා ගියහ. මුළු මාලිගාව එක ම දුම්කදෙක් විය. සිටානන්ගේ ඇස් ඉදිකටු ඇණෙන්නා සේ විය. ගෙය ද වැටේ ය' යි බියපත් ව 'ඔබ ගින් නෙන් ඇවිළ ගත්ත ත් කිසිවක් ලැබෙන්නේ නැතැ' යි නො කියා 'මේ මහණා, කැවුම් කෑමෙහි තද ආශා ඇත්තෙක, එහි තදින් ම ඇලී සිටියි, කැවුම් නො කා ම නො යන හැඩ යි පෙණෙන්නේ, ඒ නිසා එක් කැවුමක් දෙන්නෙමි' යි සිතා 'සොදුර! කැවුමක් කුඩා කොට උයා මේ මහණාට දී ඔහු පිටත් කරව' යි කීයේ ය. ඈ ද සැන්දට පිටි ටිකක් ගෙණ තෙල් ඇතිලියෙහි වත් කළා ය. ඒ පිටි ටික මහ කැවුමක් ව මුළු තෙල්ඇතිලිය පුරා පිපී සිටියේ ය. මුලින් පිසූ හැම කැවුමකට ම වඩා ඒ කැවුම මහත් විය. එ තැන් සිට යම් යම් කැවුමක් උයා ද, ඒ හැම කැවුම ම මහත් මහත් විය. එවිට සිවු තෙමේ 'සොදුර! මොහුට ඔයින් කොයි කැවුමක් නමුත් දී මේ තැනින් වහා පිටත් කරව'යි කී ය. ඈ කැවුම්කුඩයට අත බහා එක කැවුමක් ගන්නා විට සියලු කැවුම් එකට ඇලී ආයේ ය. 'සවාමිනි! සියලු කැවුම් එකට යාබද ව සිටියේ ය, වෙන් කොට ගන්නට බැරි ය, එකක් ගන්නා විට සියල්ල ම ඇදී එයි, කුමක් කරම් ද' යි ඇසූ විට 'පොඩ්ඩක් ඉන්න! මම වෙන් කරන්නෙමි' යි කැවුම් වෙන් කිරීමට ඔහු මහන්සි ගත්තේ ය. එහෙත් වෙන් කරණු බැරි විය. අඹු සැමි දෙදෙන කැවුම් කොන්වලින් අල්ලා දෙ පැත්තට අදින්නට වූහ. එහෙත් කැවුම් වෙන් නො වී ය. කැවුම් වෙන් කරන්නට මහන්සි ගත් සිටානන්ගේ සිරුරින්

ඛහදිය ගලන්නට වන. පිපාසා උපන. එවිට 'සොදුර! කැවුම් වලින් මට කම් නැත, කැවුම්කුඩය ම ඔහුට දෙන්නැ' යි කී ය. ඕ තොමෝ කැවුම්කුඩය ම ගෙණ තෙරුන් වෙත ගියා ය. සථවිර යන් වහන්සේ දෙදෙනාට ම බණ කීහ. තෙරුවන් ගුණ කියා පෑහ. 'දෙන ලද්ද විපාක ඇත්තේ ය, දුනාදීන්ගේ විපාකය අහස්තලයෙහි බබලන සඳ මෙනැ' යි කීහ. බණ අසා සිටු පහන් විය. 'සවාමිනි! මේ පුටුවෙහි වැඩ හිඳ ගෙණ කැවුම් වලදනු මැනැවැ' යි ආරාධනා කෙළේ ය. 'මහසිට! සම්බුදුරජානන් වහන්සේ කැවුම් වලදනු පිණිස භික්ෂූන් සමග විහාරයෙහි වැඩ හිඳින සේක, ඒ නිසා ඔබගේ කැමැත්ත ලෙස සිටුබිරිඳ ලවා කැවුම් කිරි ගිතෙල් මී හකුරු ගෙන්වා ගෙණ බුදුරජුන් වෙත යමු' යි කී කල්හි 'සවාමිනි! බුදුරජානන් වහන්සේ මේ දවස්වල කොතැනක වැඩ හිඳිනා සේක් ද?' යි ඇසී ය. 'ජෙතවනයෙහි වැඩ හිඳිති' යි කීහ. 'සවාමිනි! එක්සිය අසූ ගව්වකින් ඔබ පිහිටි ජෙතවනයට අපි කෙසේ යමු ද, ඔතරම් දිගගමනක් ටිකකල කින් කෙසේ යැ හැකි ද?' යි ඇසී ය. 'හා! මහසිට! එය ඔබ සිතන තරම් දිගගමනෙක් නො වේ, කැමැත්තහු නම් මම මාගේ ඍඬිබලයෙන් ඔබ ජෙතවනයට ගෙණ යන්නෙමි, ඔබගේ මේ පහයෙහි හිණිහිස තමන් සිටින තැන ම වන්නේ ය, හිණි පාමුල දෙවිරම්දෙරකොටු ව වන්නේ ය, උඩුමාලෙන් පහත මාලට බස්නා පමණින් ඔබ ජෙතවනයට ගෙණ යන්නෙමි' යි කී කල්හි සිටු තෙමේ සතුටු විය. සථවිරයන් වහන්සේ 'හිණි හිස එහි ම කොට හිණිපාමුල දෙවිරම් දෙරකොටුවෙහි වේවා' යි ඉටුවහ. ඒ එසේ විය. සිටුබිරිඳ උඩමාලින් පහත මාලයට බස්නා කලට ත් ඉනා අඩු කලකින් ඒ දෙදෙනා දෙවිරමට පැමිණ වූහ. ඔවුහු බුදුරජුන් වෙත ගොස් කල් දැන්වූහ. බුදුරජානන් වහන්සේ භික්ෂූන් සමග බොජුන්හලට වැඩ පැණ වූ අසුන්හි වැඩ හුන්හ. සිටු තෙමේ එහිදී බුදුපාමොක් මහසඟනට පැන් පිළිගැන්වී ය. සිටු බිරිය බුදුරජුන්ගේ පාත්‍රයට කැවුම් ගිතෙල් ඇ බෙදූ ය. උන්වහන්සේ යැපෙන පමණක් ම පිළිගත්හ. පන්සියයක් දෙනා වහන්සේ ද තම තමන්ට යැපෙන සෑහෙන පමණක් ම පිළිගත්හ. සිටු තෙමේ ද කිරි ගිතෙල් මී හකුරු බෙදමින් හැසුරුණේ ය. බුදුරජානන් වහන්සේ. භික්ෂූන් සමග දන් වලඳ අවසන් කළහ. සිටු තෙමේ ත් එහිදී ම භාර්‍යාව හා එක් ව බඬ පුරා කැවුම් කෑයේ ය. කැවුම්වල අවසානයෙක් නො විය. වෙහෙරැ වැසි අනික් භික්ෂූන්ට නිහන් නන්ට හා පුලන්නන්ට ත් දීලා කැවුම් අවසන් නො වී ය. එකල සිටු තෙමේ 'සවාමීනි! කැවුම් අවසන් වන හැඩෙක් නො පැණේ ය' යි කී ය. 'එසේ නම් දෙවිරම්වෙහෙරදොරටුවෙහි බහාලව' යි

වදාළ සේක. එවිට ඔහු කැවුම් ගෙණ ගොස් දෙරකොටුව අසල ඉදිරියට නෙරා සිටි ගල්තල්ලක් යට බැහි ය. අදත් එතැන **'කපල්ලකපූවපබ්භාර'** යි ප්‍රසිඛ ව පවතී. සිටු තෙමේ කැවුම් ඛහා බිරින්ද සමග බුදුරජුන් වෙත ගියේ, එකත් පසෙක හුන්නේ ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ඔවුනට දානානිසංස වදාළ සේක. ඛණඅවසන්හි දෙදෙන ම සෝවන් පලයට පැමිණියෝ, බුදුන් වැඳ දෙරකොටුවෙහි වූ පඞිපෙළ මඟින් මාලිගාවට ගියහ. එදා පටන් සිටු තෙමේ තමන් සතු ඒ අසූ කෙළක් ධනය සසුන් දියුණුවට යෙදී ය. පසුදා සවස ධම්ශාලාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා 'ඇවැත්නි! මහාමෞදගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේගේ මහිමය බලනු මැනැව, ශ්‍රඛ්ධාව නො නසා හොඟයනු ත් විනාශ නො කොට මච්ඡරියසිටු මොහොතකින් භික්ම්වා පහදවා ගෙණ කන්නට පිළියෙල කරවා ගත් කැවුමුත් ඔහු ලවා ම ගෙන්වා ගෙණ දෙවිරමට පැමිණ ඔවුන් බුදුරජුන් ඉදිරියට පමුණුවා සෝවන් පලයෙහි ද පිහිටුවා ලූහ, මහතෙරුන් වහන්සේගේ ආනුභාවය ඉමහත් ය' යි තෙරුන්ගේ ගුණ කතා කරමින් හුන්හ. එවිට බුදු රජානන් වහන්සේ එ තැනට වැඩි සේක. 'මහණෙනි! මා මෙහි එන්නට කලින් තමුසේලා කළ කතා ව කුමක් ද' යි අසා වදාළ කල්හි 'මෙ නම් කතාවකැ' යි උන්වහන්සේලා දන්වූහ. 'මහණෙනි! කුල පහදවන්නන් විසින් කුලයාගේ ශ්‍රඛ්ධාව නො නැසෙන සේ සම්පතට හානියක් නො වන සේ කුලය නො වෙහෙසා නො තලා මලින් රොන් පැණි ගන්නා මීමැස්සකු සේ කුලය කරා එළැඹ බුදු ගුණ කිය යුතු ය, මාගේ පුත්‍ර වූ මෞදගල්‍යායන කළේ එසේ ය' යි තෙරුන්ට සතුති කොට එහි දී මේ ධම්දෙශනාව කළ සේක:-

යථාපි භමරෝ පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං,
පලෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙති.

මීමැස්සා මල ත් පැහැය ත් සුවඳ ත් නො නසා හැසිරෙමින් මල්පැණි පමණක් හැර ගෙණ යන්නේ යම්සේ ද, එසේ භික්ෂු තෙමේ දායකකුලයාගේ ශ්‍රඛ්ධාවට ත් හොඟයන්ට ත් හානියක් නො කොට ගමෙහි පිඬු සිඟා යන්නේ ය.

යථා අපි = යම්සේ.

අපි, යනු පදපූරණයෙහි ය. මල්පැණි ගෙණ යන මීමැස්සා ගේ ඒ පිණිස මලෙහි හැසිරීම ත්, පිඬු සිඟා යන භික්ෂුවගේ ඒ පිණිස ගමෙහි හැසිරීම ත් යන දෙක එක සමානය' යි මෙයින් කීහ.

භමරෝ = මීමැස්සා. බමරා.

'පුප්ඵමත්ථකෙ භමතීති=භමරෝ' මල්මතුයෙහි හැසිරෙන්නේ භ්‍රමර නම් වේ.

පුප්ඵං = මල.

මෙය කුසුමයෙහි හා ඔසප්ලෙයෙහි වැටේ. 'පුප්ඵ පූජ ඉදං ඵලං' යනාදී තන්හි කුසුමයෙහි වැටේ. 'පුප්ඵංසා උප්පජ්ජී' යනාදී තන්හි ඔසප් ලෙයෙහි හෙන්නේ ය. තව ද කාමගුණයෙහි හා අශුචියෙහි ද පුප්ඵ ශබදය හුනුයේ ය. 'පුප්ඵානිහෙවපවිනත්තං, පුප්ඵජඩ්ඩකො' යනාදිය එයට නිදසුන් ය.

වණ්ණගන්ධං = පැහැය හා ගඳ.

වණ්ණ ශබදය වනාහි සංස්ථාන-රූප-ජාති-ඡවි-හෙතු-ප්‍රමාණ-ප්‍රශංසා-අක්ෂර-කීර්ති-ගුණ යන ඇරුත්හි වැටේ. 'මහත්තං හත්ථි රාජවණ්ණං අභිනිම්මිනිත්වා' යන මෙහි සංස්ථානයෙහි ආයේ ය. 'පරමායවණ්ණපොක්ඛරතාය සමත්තාගතො' යනු ආයේ රූප යෙහි ය. 'චත්තාරෝ මෙ භො ගතම! වණ්ණා බ්‍රාහ්මණොව සෙට්ඨො' යන තන්හි හුනුයේ ජාතියෙහි ය. 'සුවණ්ණවණ්ණො භගවා' යනු ඡවියෙහි වැටේ. 'න හරාමි න භුඤ්ජාමි -පෙ- අථ කෙන නු වණ්ණෙන' මේ ආදියෙහි ආයේ හෙතුයෙහි ය. 'තයො පත්තස්ස වණ්ණා' යනු ප්‍රමාණයෙහි ආයේ ය. ප්‍රශංසාවාචක වූයේ 'වණ්ණාරහස්ස වණ්ණං භාසති' යනාදියෙහි ය. අක්ෂර යෙහි දක්නා ලැබෙනුයේ 'වණ්ණාගමො වණ්ණවිපරියායො' යනාදියෙහි ය. 'කදා සංයුළ්හා පන තෙ ගහපති! ඉමෙ සමණස්ස ගොතමස්ස වණ්ණා' යන මෙහි ආයේ ගුණවාචකව ය.

'වණ්ණො සණ්ඨානරූපෙසු ජාතිච්ඡවීසු කාරණෙ
පමාණෙ ච පසංසායං අක්ඛරෙ ච යසෙ ගුණෙ'

යනු කොෂාගත ය.

මෙසේ ඒ ඒ අරුත්හි පවත්නා වණ්ණශබදය මෙහිලා නිල පීතාදිගුණවාචක වේ මෙහි වණ්ණ ශබදය හා එක් ව තිබෙන ගන්ධශබදය, සුගන්ධවාචක ව පවති. ගන්ධශබදය මනාගඳට ත් නො මනාප ගඳට ත් දෙකට ම සාධාරණ වුව ද, තැනට ඔබින සේ ප්‍රයොගානුගත ව අර්ථ ගතයුතු ය. සමහර තැනක සු-දු යන අව්‍යය පදදෙකින් වෙන වෙන ම වැඩි මනාපගන්ධයෙහි හා අමනාප ගන්ධයෙහි යෙදේ. එ දෙකින් තොර ව එනුයේ සුගඳ දුගඳ දෙක්හි ම අවිශෙෂ ව පවත්නේ ය. සුගන්ධය සුගන්ධභාවයෙන් දුර්ගන්ධයන්, දුර්ගන්ධය දුර්ගන්ධභාවයෙන් සුගන්ධයන් නසා නුයි, ගන්ධ නම් වේය යි නෛරුක්තිකයෝ කියති. සැඟවී සිටි පුෂ්පඵලාදිය මෙහි ඇතැ යි ද ගන්ධ නම් වේ යනු ත් ගන්ධ ශබදයෙහි තවත් තේරුමකි.

පලෙති = යෙයි.

රසං = මල් පැණි.

රස ශබ්දය වනාහි, ද්‍රව-ආචාර-වීර්‍ය්‍ය-ෂට්රස-රසදිය-ශෘඞ්ගාරාදිය ධාතු භෙදය-කෘත්‍ය-සම්පත්තිවාචක වේ. මෙහිලා මූලරස-ඛන්ධරස-තචරස-පත්තරස-පුප්ඵරස-ඵලරස යන මොවුන් පිළිබඳ කසට-තිත්ත-මිහිර-ලුණු-ඇඹුල්-කුළු යන රස අතුරෙහි මිහිර ම ගැණේ. **'දෙවමනුස්සාදයො සත්තා යස්මා රමමානා නං ධම්ම ජාතං අසන්ති භක්ඛන්ති තස්මා තං රසො නාම'** යනු පාළියෙහි ආයේ ය. සත්වයෝ යමක් විඳ ගණිත් ද ඒ විඳගන්නා දෙය රස නම් වේ. **'රසන්ති තං සත්තා අස්සදෙන්තීති = රසො'** යනු නිරුක්ති.

කොෂග්‍රන්ථයෙහි මෙසේ කී ය:-

'ද්‍රවාචාරෙසු විරියෙ මධුරාදීසු පාරදෙ,
සිඞ්ගාරාදෙ, ධාතුභෙදෙ කිච්චෙ සම්පත්තියං රසො' යනු.

එවං = එසේ.

අර්ථවශයෙන් නොයෙක් අරුත් ඇත්තේ ය. **'එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං'** යන තන්හි මෙන් මෙහි ආයේ උපමායෙහි ය.

ගාමෙ = ගමෙහි.

යම් කිසි බිම්පෙදෙසෙක් ගඩොල් කටු අතු ආදී යමකින් වට කරණ ලද්දේ හෝ නො වට කරන ලද්දේ මිනිසුන්ට වසන තැන් වූයේ ද, එ තැන ගාම නාමයෙන් හඳුන්වනු ලැබේ. යටත් පිරිස යින් යම්කිසි පෙදෙසක මිනිසුන් වසන එක් කිළියක් පමණකුදු තිබේ නම්, එ පෙදෙස ගාම යන්නෙන් කියැ වේ. තව ද වෙළඳ සමූහයෙක් යම් තැනෙක කුඩාරම් පිහිටුවා සාරමසක් පමණ කල් නැවතී සිටියෝ නම්, එ තැන ද ගාම නම් වේ

'ගාමො නාම එක්කූටිකොපි ගාමො දිකූටිකොපි ගාමො තිකූටිකොපි ගාමො චතුකූටිකොපි ගාමො සමනුස්සොපි ගාමො අමනුස්සොපි ගාමො පරික්කිත්තොපි ගාමො අපරික්කිත්තොපි ගාමො ගොනිසාදිනිවිට්ඨොපි ගාමො යොපි සත්ථො අතිරෙකචාතුමාසනිවිට්ඨො සොපි වුච්චති ගාමො' යනු විනයයෙහි එය දැක් වූ සැටියි. තවත් විස්තර ඉදිරියෙහි එන්නේ ය.

මුනි – භික්ෂු තෙමේ.

භික්ෂු තෙමේ මුනි' යි හඳුන්වන ලද්දේ කරුණු ඇතිව ය. එ හෙයින් මුනි යනු ද අන්වර්ථනාමයෙකි. මොන' යි නම් ලද මාගී ඥානයෙන් යුත් තැනැත්තේ මුනි නම් වේ ය යි කීහ. **'මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා -පෙ- ධම්මවිචයො සම්මා දිට්ඨි' තෙන ඤාණෙන සමන්නාගතො මුනි'** යනු දෙශනා ය.

ත්‍රිවිධකායදුශ්චරිතයන්ගේ ප්‍රහාණීය, ත්‍රිවිධකායසුචරිතය, කය අරමුණු කොට අනිත්‍යාදිවශයෙන් පැවැති කායාරම්මණඤාණය කය, ඤාත - තීරණ - පහාන පරිඥාශක්තියෙන් දැනීම් වශයෙන් පැවැති කායපරිඤ්ඤාව, ආද්‍ධ්‍යාත්මිකකය, සම්මර්ශනය කොට උපදවන ලද පරිඤ්ඤාසහගත වූ මාගීය, කායිකඡන්දරාගප්‍රහාණීය, අස්සාසපස්සාස කායයන්ගේ ආවරණය, හෙවත් චතුත්ථජ්ඣාන සමාපත්තියට සමවැදීමැ යි කියූ කායපාරිශුද්ධියට ද,

චතුර්විධවාක්සුචරිතය, වචනය අරමුණු කොට පැවැති ඤාණය, වචනය, ඤාතපරිඤ්ඤාදීන්ගේ ශක්තියෙන් දැනීම් වශයෙන් පැවැති ඤාණය, පරිඤ්ඤාසහගත වූ මාගීය, වාචසිකඡන්දරාගප්‍රහාණීය, වචීසඞ්ඛාරනිරොධය හෙවත් දුතියජ්ඣානසමාපත්ති යි කියූ වාක්පාරිශුද්ධියට ද,

ත්‍රිවිධමනොදුශ්චරිතයන්ගේ ප්‍රහාණීය, ත්‍රිවිධමනස්සුචරිතය, චිත්තාරම්මණඤාණය, චිත්තපරිඤ්ඤාව, පරිඤ්ඤාසහගත වූ ඤාණය, චෛතසිකඡන්දරාගප්‍රහාණීය, චිත්තසඞ්ඛාරනිරොධය, හෙවත් සඤ්ඤාවෙදයිතනිරොධැ යි කියූ චිත්තපාරිශුද්ධියට ද පැමිණියේ මුනි නම් වේ.

'තිවිධානං කායදුච්චරිතානං පහානං කායමොනෙය්‍යං තිවිධං කායසුචරිතං කායමොනෙය්‍යං කායාරම්මණෙ ඤාණං කායමොනෙය්‍යං කායපරිඤ්ඤා කායමොනෙය්‍යං පරිඤ්ඤා සහගතො මග්ගො කායමොනෙය්‍යං කායෙ ඡන්දරාගස්ස පහානං කායමොනෙය්‍යං කායසඞ්ඛාර නිරොධො චතුත්ථජ්ඣාන සමාපත්ති කායමොනෙය්‍යං, ඉදං කායමොනෙය්‍යං. චතුබ්බිධානං වචීදුච්චරිතානං පහානං වචීමොනෙය්‍යං චතුබ්බිධං වචී සුචරිතං වචීමොනෙය්‍යං වාචාරම්මණෙ ඤාණං වචීමොනෙය්‍යං වාචාපරිඤ්ඤා වචීමොනෙය්‍යං පරිඤ්ඤාසහගතො මග්ගො වචීමොනෙය්‍යං වාචාය ඡන්දරාගස්ස පහානං වචීමොනෙය්‍යං. වචීසඞ්ඛාරනිරොධො දුතියජ්ඣානසමාපත්ති වචීමොනෙය්‍යං, ඉදං වචීමොනෙය්‍යං. තිවිධානං මනොදුච්චරිතානං පහානං මනොමොනෙය්‍යං. තිවිධං මනොසුචරිතං මනොමොනෙය්‍යං චිත්තාරම්මණෙ ඤාණං මනොමොනෙය්‍යං චිත්තපරිඤ්ඤා මනො

මොනෙය්‍යං පරිඤ්ඤාසහගතො මගෙගා මනොමොනෙය්‍යං චිත්තෙ ඡන්දරාගස්ස පහානං මනොමොනෙය්‍යං. චිත්තසඞ්ඛාර නිරොධො සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්ති මනොමොනෙය්‍යං ඉදං මනොමොනෙය්‍යං'. යනු එහි සූත්‍ර යි.

මෙසේ කායදවාරාදියෙන් සිදුවන අකුශලයන් මුළුමනින් හැර ලීමෙන් පිරිසිදු වූ මොනෙය්‍යසඞ්ඛ්‍යාතමාර්ගඥානයෙන් නැසිය යුතු කෙලෙස් නසා සිටි, එ හෙයින් ම ආස්‍රවරහිතවූවහු, සියලු කෙලෙස් හැර සිටියහු මුනි යි කියත්. තව ද අජ්ඣත්තබහිද්ධාරම්මණ වශයෙන් උත්පත්තිය ගෙණ දෙන සියලු පව් මගනැණින් නසා සිටි බැවින් මෙ තෙමේ **නින්හාතපාපකා,** යි ද හඳුන්වනු ලැබේ.

"කායමුනිං වාචාමුනිං – මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං – ආහු සබ්බප්පහායිනං,
කායමුනිං වාචාමුනිං – මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං – ආහු නින්හාතපාපකං"

යනු දෙශනා ය.

මුනිවරයෝ, අගාරියමුනි – අනගාරියමුනි – සෙඛමුනි – අසෙඛ මුනි-පච්චෙකමුනි-මුනිමුනි' යි සදෙනෙක් වෙති. එහි සීසෑම් ගෙරි රැකීම් ආදිය කරමින් ගිහිගෙයි වසන දක්නාලද නිර්ජාණය ඇති ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාතශාසනය ඇත්තෝ අගාරියමුනි නම් වෙත්. **'යෙ තෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා ඉමෙ අගාරිය මුනිනො'** සීසෑම් ගෙරිරැකීම් ආදියෙන් තොර ව පැවිදිබවට පැමිණියෝ අනගාරියමුනි නම් වෙත්. **'යෙ තෙ පබ්බජිතා දිට්ඨ පදා විඤ්ඤාතසාසනා ඉමෙ අනගාරිය මුනිනො'** සෝවන්මගට පැමිණියහු පටන් රහත්මගට පැමිණියහු තෙක් ඇති ශෛක්ෂ පුද්ගලයෝ සත් දෙන සෙඛමුනි නම් වෙත්. **'සත්තසෙඛා සෙඛ මුනිනො'** රහත්පලයට පැමිණීමෙන් ආස්‍රවධර්මයන් මුළුමනින් දුරු කොට සිටි ආර්‍යයන් වහන්සේ අසෙඛමුනි නම් වෙත්. **'අරහන්තො අසෙඛමුනිනො'** ඒ ඒ කාරණය ඇසුරු කොට එකලා ව අනාචාර්‍යක ව චතුස්සත්‍යධර්මය අවබොධ කොට සිටි ප්‍රත්‍යෙක බුදුරජානන් වහන්සේ පච්චෙකමුනි නම් වෙත්. **'පච්චෙක සම්බුද්ධා පච්චෙකමුනිනො'** තථාගත සම්බුදුරජානන් වහන්සේ මුනිමුනි නම් වෙත්. **'මුනිමුනිනො වුච්චන්ති තථාගතා අර හන්තො සම්මාසම්බුද්ධා'** යනු දෙශනා ය.

රික්තස්වභාවය ඇති අඤ්ජන තෙමේ නිශ්ශබ්දව හිඳීම් පමණ කින් මුනි නො වේ. තරාදියක් ගෙණ සිටියේ, එහි ලූ දෙය පමණට වඩා අධික වේ නම්, ඒ අධිකය බැහැර කෙරෙයි. අඩු

වූයේ නම්, අතින් බහා ඒ අඩු ව පිරිමසයි. එ මෙන් යමෙක් අධිකය බැහැර කරන්නා සේ පව් දුරු කෙරේ ද, අඩු ව සම්පූර්ණ කරන්නා සේ කුසල් සම්පූර්ණ කෙරේ ද, මෙසේ කරමින් සීල-සමාධි - ප්‍රඥා-විමුක්ති - විමුක්තිඥානදර්ශනසඞ්ඛ්‍යාත වූ උත්තමධර්මීය ගෙණ ලාමක අකුශල ධර්මයන් දුරු කෙරේ ද, හෙතෙමේ මුනි නම් වේ.

යමෙක් මේ සඤ්ඤාදිලෝකයන් තුලාවට නගා කිරන්නකු මෙන් 'මොවුහු ආධ්‍යාත්මිකසඤ්ඤියෝ ය, මොවුහු බාහිරසඤ්ඤියෝ ය' යි යනාදි ලෙසින් මෙ දෙක මනී ද, ඔහු මුනි යි කියනු ලැබේ.

යමෙක් කුශලාකුශලප්‍රභෙද ඇති සත් අසත් ධර්මය අජ්ඣත්තික -බාහිර යි පව්චයඥනයෙන් දැන රාගාදී වූ සත් වැදැරුම් වූ සඞ්ගයන් ද තෘෂ්ණාදෘෂ්ටිභෙදයෙන් දෙ වැදැරුම් වූ ජාලය ද ඉක් මවා සිටියේ නම්, හෙතෙමේ ඒ මොනසඞ්ඛ්‍යාතපව්චයඥනයෙන් යුක්ත බැවින් මුනි වූයේ දෙව්මිනිසුන් විසින් පුදනලද්දේ වෙයි. මේ කීහ:-

"න මොනෙන මුනී හොති - මූළ්හරූපෝ අවිද්දසු,
යෝ ච තුලංව පග්ගය්හ - වරමාදාය පණ්ඩිතෝ,
පාපානි පරිවජ්ජෙති - ස මුනී තෙන සෝ මුනි,
යෝ මුනාති උභෝ ලොකෙ - මුනි තෙන පවුච්චති.'

අසතං සතඤ්ච ඤත්වා
ධම්මං අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
දෙවමනුස්සෙහි පූජිතෝ යෝ
සසඞ්ගජාලමතිච්ච සෝ මුනි,'

චරෙ = හැසිරෙන්නේ ය.

මෙසේ සෙඛාසෙඛභෙද ඇති අගාරියමුනි තෙමේ ගෙපිළි වෙළින් උස්පහත්කම් නොසලකා මාලිගාවෙන් පැල්පතට, පැල්පතින් මාලිගාවට යමින් පිඬු සිඟා යන්නේ ය යි මින් වදාළ සේක.

මොහුගේ මේ ගමෙහි පිඬුසිඟීමෙන් එ ගම්වැස්සන්ගේ ශ්‍රද්ධාවට හොගයට හානියක් නොවේ. ගෙපිළිවෙළින් පිඬු සිඟා හැසිරලත් අහර, ඉන් නික්ම ගමින් පිටත පහසු තැනෙක හිඳ අකඹ භඤ්ජන, වණපටිච්ඡාදන, පූත්තමංසයන් හා සම කොට ප්‍රත්‍යවෙක්ෂා කරමින් වලඳ, මහණකමට සුදුසු වනලැහබකට ගොස් ආධ්‍යාත්මිකකර්මස්ථාන වඩන්නේ, මගපල අත්පත් කෙරෙයි. අසෙඛමුනි තෙමේ දිඨධම්මසුඛවිහාරයෙහි යෙදෙයි. මුනිහුගේ මේ හම්හැසිරීම බමරුගේ මී බැඳීම හා සමානැ යි වදාළෝ බමරු ද මල්

උයනට වැද මලට පැහැයට සුවඳට කිසිත් හානියක් නොකොට මල්පැණි පමණක් ගෙණ රැක්බිලයෙක රොන්මුසු මල්පැණි තබා පිළිවෙළින් මීවද බඳින බැවිනි. බමරුගේ මල්උයනෙහි හැසිරීමෙන් මලට පැහැයට සුවඳට කිසිත් හානියක් නොවූ ය.

සම්මා සම්බුදුරජානත් වහන්සේ මේ ධම්දෙශනාව කොට තව තවත් තෙරුන් වහන්සේගේ ගුණ කියනු පිණිස 'මහණෙනි! මොදගල්ලායන තැන විසින් මච්ඡරියසිටු දමනය කරණලද්දේ අද පමණක් ම නොවේ, පෙර ත් ඔහු දමනය කොට කම්ඵල සම්බන්ධය කියා දෙනලදැ' යි වදාරා:-

උහො ඛඤ්ඣා උහොකුණී – උහො විසම චකඛුලා,
උභින්නං පිළකා ජාතා – නාහං පස්සාමි ඉලලිසං,

යන මේ ඉලලීසජාතකය වදාළ සේක. ඒ බලනු.

මච්ඡරියකොසියශ්‍රෙෂ්ඨිවස්තුව නිමියේ ය.

පායිකාජීවකයා

4-6

සැවැත්නුවර ගෘහපතිභාර්‍යාවක් තොමෝ **පාඝික** නම්, ආජීවකයකු, පුත් තනතුරේ තබා වඩයි. දවසක අසල්වැසි මිනිස්සු විහාරයට ගොස් බුදුරජුන්ගෙන් බණ අසා අවුත් ඈ ඉදිරියෙහි 'බුදුරජුන්ගේ බණකිම ඉතාපුදුමැ' යි නොයෙක් අයුරින් බුදුගුණ කියන්නට වූහ. ඈ ඒ අසා පුදුමයට පැමිණ විහාරයට ගොස් බණ අසනු කැමතිබව ආජීවකයාට කිවු ය. හෙතෙමේ 'නොයව' යි ගමන වැළකුයේ ය. එහෙත් ඕ තොමෝ නැවැත නැවැත ත් යායුතු බව ම දැන්වූ ය. ආජීවකයා, ඒ හැමවර ම ඇගේ ගමනට බාධා කෙළේ ය. 'මොහු විහාරයට ගොස් බණ අසන්නට ඉඩ නොදෙන බැවින්, බුදුරජුන් වැඩමවා ගෙණ මෙහිදී ම බණ අසන්නෙමි' යි සිතා සවස් වේලෙහි සියපුතු ගෙන්වා 'පුත! විහාරයට ගොස් බුදුරජානන් වහන්සේට හෙට මෙහි වඩින්නට ආරාධනා කොට එන්නැ' යි ඔහු පිටත් කළා ය. විහාරයට යන ගමනේ දී ඔහු පළමු ව ආජීවකයා ලඟට ගොස් වැඳ පසෙක හුන්නේ ය. එවිට 'කොහි යෙහි ද' යි ආජීවකයා ඇසී ය. 'හෙට අප ගෙට වඩින්නට බුදුරජුන්ට ආරාධනා කරන්නැ' යි අම්මා කිව්වා, ඒ නිසා මම විහාරයට යන්නෙමි' යි කී ය. 'එහි යන්නට වුවමනා නැතැ' යි ආජීවකයා කී කල්හි 'සවාමීනි! මා එහි යා යුතුම ය, මම අම්මාට බය යි, යන්නට ම ඕනෑ ය' යි කීයේ ය. එවිට ආජීවකයා 'ඔය බුදුන්ට දෙන දෙය අප දෙදෙනාට කෑ හැකි ය, යන්නට එපා ය' යි නැවැත ද කී ය. 'මට කොයිහැටියකින් වත් ඒ ආරාධනාව නොකොට බැරි ය, ආරාධනා නොකොට ගියොත් අම්මාගෙන් බේරුමක් නැතැ' යි කී කල්හි 'හා! ආරාධනා නොකොට ම බැරි නම්, එහි ගොස් ආරාධනා කොට අපේ ගේ අසුවල් තැන ය, අසුවල් කඩපේළියේ ය, අසුවල් පාරෙන් යා යුතු ය, යනාදී කිසිවක් නොකියා, ලඟ සිටියකු සේ අන් මගකින් යන්නකු සේ පැනලා එව' යි කී ය. ඔහු ද මේ කතාව අසා බුදුරජුන් වෙත ගොස් කී පරිද්දෙන් සියල්ල කොට ආජීවකයා වෙත ගියේ ය. 'කොහොම ද, මා කියූ සැටි කෙළෙහි ද' යි ඇසූ කල්හි 'ඔව්, සවාමීනි! එසේ කෙළෙමි' යි පිළිතුරු දුන්නේ ය. 'එහෙ නම් ඔහුට දෙන දෙය අප දෙදෙනාට කෑ හැකි ය' යි පසුදා උදෑසනින් ම ඔහු එහි ගියේය. ගෘහපතිභාර්‍යා තොමෝ ආජීවකයා ගෙයි පිටිපසෑ කාමරයෙක නිදුවා මිනිසුන් ලවා ගෙයත් පිරිඹඩ කරවා ලදපස්මල් ඉස්සවා බුදුරජුන්ට

නිදින්නට එහි මාහැනි අසුනක් පැණ වූවාය. බුදුරජුන් වෙත ගොස් පුරුදුකම් නැති මිනිස්සු බුදුරජුන්ට අසුන් පැණවීම නො දනිති. මග කියන්නකුගෙන් බුදුරජුන්ට වැඩෙක් නැත. බෝමැඩැ වැඩ හිඳ බුද්ධඥනය ලත් වේලේ 'මේ නරකයට යන මග ය, මේ මග තිරිසන් අපායට ය, මේ ය ප්‍රේත ලොකයට යන මග, මිනිස්ලොවට යන්නේ මේ මහින් ය, මේ දෙව්ලොවට මගය, මේ මග නිවන් පුර යටැ' යි උන්වහන්සේට සියලු මග එලිපෙහෙලි වී ය. ගම් නියම්ගම් යන මං ගැණ කිය යුත්තෙක් ම නැත. එ හෙයින් බුදුරජානන් වහන්සේ උදැසන ම පාසිවුරු ගෙණ උපාසිකාවගේ ගෙට වැඩි සේක. ඕ බුදුරජුන් දුක යුහු ව ගෙන් පිටතට බැස පසඟ පිහිටුවා වැඳ ගේ තුළට වැඩම කරවා අසුන්හි වඩා හිඳුවා පැන් පිළිගත්වා ඉතාරසැනි කෑම්බිම්වලින් බුදුන් වැලඳෙව්වා ය. උපාසිකා තොමෝ වලඳ අවසන් කළ බුදුරජානන් වහන්සේ ලවා අනුමෙවෙනිබණ කරවනු කැමැත්තී පාත්‍රය ගත්තා ය. උන්වහන්සේ මිහිරිහඬින් බණ දෙසූ සේක. උපාසිකා තොමෝ සාධුකාර දී දී බණ ඇසූ ය. ඇතුල් කාමරයෙහි හුන් ආජීවක තෙමේ සාධුකාර දෙමින් බණ ඇසූ උපාසිකාවගේ කට හඬ අසා ඉවසාගත නො හී 'මෝ දුන් මාගේ දැසිකාවක් නො වේ' යි කියමින් 'කාලකණ්ණිතැනැත්තිය! නී නටුවා වෙහි, මොහුට මේ සතකාර කුමට කරණු ලැබේ දැ' යි බුදුරජුන්ට හා උපාසිකාවට බැණ වදිමින් පලා ගියේ ය. ඉන් ලජ්ජාවට පැමිණි උපාසිකා තොමෝ අන් අතකට නතු වූ තම සිත, දෙශනානුසාරයෙන් නුවණට යොමු කරන්නට අපොහොසත් වූ ය. එවිට බුදුරජානන් වහන්සේ 'උපාසිකා! බණට සිත යොමු කරන්නට අපොහොසත් දැ' යි අසා වදාළ සේක. 'සවාමිනි! මොහුගේ කතාවෙන් මා සිත අන් අතකට පෙරළිනැ' යි කිවු ය. 'විසභාග මනුෂ්‍යයන්ගේ කතාවනට කන් දීම නොසුදුසු ය, මෙබදු දේට කන් නො දී ඒ ගැණ නො සිතා නො විමසා තමන් කළ නො කළ දේ ගැණ සිතා මතා බැලීම ය කළයුතු' යි වදාළ බුදුරජානන් වහන්සේ මේ ධම්දෙශනාව ද කළ සේක:-

න පරෙසං විලොමානි න පරෙසං කතා කතං,
අත්තනොව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච.

අනුන්ගේ බැණුම් දෙඩුම් මෙනෙහි නො කළ යුතු ය. අනුන් කළ නො කළ දේ මෙනෙහි නො කළ යුතු ය. තමන් කළ දුශ්චරිත හා නො කළ සුචරිත ගැණ සිතා මතා බැලිය යුතු ය.

න පරෙසං විලොමානි = අනුන්ගේ ඇණුම් බැණුම් මෙනෙහි නො කරන්නේ ය.

'පරෙසං විලොමානි එරූසානි මම්වෙජ්දකාවවනානි න මනසිකාතබ්බානි' යනු අටුවා ය. අනුන් කියන පරුෂ වූ මර්ම වේජ්දකවචන මෙනෙහි නො කටයුතු ය, යනු එහි තේරුම යි. ලොකයා විසින් අනුන්ට ගටා බිණීමට ජාති-ගොත්‍ර-නාම කර්ම-ශිල්ප-ආබාධ-ලිඞ්ග-කෙලෂ-ආපත්ති-ආක්‍රොශ යන මේ දශය ඇද ගණු ලැබේ. එ තෙක් 'තාගේ ජාතිය හීන ය, ලාමක ය, තෝ හීන ජාති ඇත්තෙහි, ලාමක ජාති ඇත්තෙහි' යනාදී ලෙසින් අනිකක්හට ජාතියෙන් ගටා බණියි. සෙස්ස ද මේ නයින් සැලකිය යුතු ය. තව ද ඔටුවෙක-එළුවෙක- ගොණෙක- තිරිසනෙක- නිරිසතෙක- ශ්‍රමණයෙක් නො වෙහි ය, තට ධනධාන්‍ය නැත, තා දුගතිය කැමැති විය යුතු ය' යන මේ ආදී ලෙසිනුදු එකෙක් අනිකාට ගරහයි. බණියි. මේ කඨොරවචන අසත්නහුගේ මර්මවේජ්දය කරණ බැවින් 'විලොම වචනැ' යි කියති.

න පරෙසං ඝතාඝතං=අනුන්කළ නොකළදෙය නො බලන්නේ ය.

'අසුවල් උපාසක තෙමේ ශ්‍රද්ධාව නැත්තෙක, පැහැදීම් නැත්තෙක, ඔහුගේ ගෙයි ලාබත් සැදිබත් ආදී වූ කිසින් දැනයෙක් නැත, චීවර=පිණ්ඩපාත-සෙනාසන-ග්ලානප්‍රත්‍යය යන සිවුපසයෙන් කිසින් නො දෙන්නේ ය, අසුවල් උපාසිකා තොමෝ ශ්‍රද්ධාව නැත්තියක, පැහැදීම් නැත්තියක, දන් නො දෙන්නී ය. අසුවල් භික්ෂුව ශ්‍රද්ධාව නැත්තෙක, පැහැදීම් නැත්තෙක, උපාඛ්‍යාය ආචාර්ය ආගනතුකවත් නො කරන්නේ ය, හොජනශාලා ජන්නාඝරවත් නො කරන්නේ ය, ධුතාඞග නො රකින්නේ ය, භාවනානුයොගයෙහි උත්සාහ නො කරන්නේ ය' යනාදි ලෙසින් අනුන් කළ නොකළ දේ ගැණ නො සිතිය යුතු ය, යනු කී සේ ය ඒ.

අත්තනෝ එව අවෙකෙඛය්‍ය ඝතානි අඝතානි ච = තමන් කළ දේ ත් නො කළ දේත් බලන්නේ ය.

සැදැලෙන් පැවිදි වූ කුලපුතුන් විසින් 'මාගේ රැදුවල ගෙවෙනුයේ වත්පිළිවෙන් පිරීමෙන් ද, බුදුවදන් හැදෑරීමෙන් ද, තිලකුණු මෙනෙහි කිරීමෙන් ද, යොනිසොමනසිකාරයෙහි යෙදීමෙන් ද, නැත, දඩුමොරොන්කමින් ද, නිදීමෙන් ද, වාවාල කමින් ද, සඞඝණිකාවෙහි යෙදීමෙන් ද, වත්පිළිවෙත් නො පිරීමෙන් ද, බුදුවදන් නො හැදෑරීමෙන් ද, යොනිසොමනසිකාරයෙහි නො යෙදීමෙන්දැ''යි නිතර සිහිකළ යුතු ය. මෙසේ කරන්නේ නම්, ඔහට අප්‍රමාද පදය පිරෙන්නේ ය. එහෙත් කළ නො කළ දේ ගැණ පසුතැවිලි නොවිය යුතු ය. එය ප්‍රමාදයට කරුණු වන බැවිනි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි උපාසිකා තොමෝ සෝවන් ඵලයෙහි පිහිටියා ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

පාසිඛාජීවවසතුව නිම්යේ ය.

ඡත්තපාණි උපාසකතුමා

4-7

අප බුදුරජුන් දවස සැවැත්නුවර ත්‍රිපිටකධර වූ අනාගාමී උපාසකයෙක් විසී ය. ඔහු අතැ නිතර කුඩයක් විය. එහෙයින් ඔහු 'ඡත්තපාණි, නමින් ප්‍රසිද්ධ වූයේ ය. ඔහු උදැසනින් ම පෙහෙව ගෙණ බුදුරජුන්ට උවැටැන් කරණු පිණිස යයි. අනාගාමී ආර්‍යශ්‍රාවකයන්ට සමාදානවශයෙන් පෙහෙව ගැණීමෙක් නැත. මාගීඥඵලලාභය සමග ම ඔවුනට බ්‍රහ්මචරියවාසය හා එකාභත්තික භාවය සිදු වේ. බුදුරජානන් වහන්සේ **'සප්පිකාරෝ බෝ මහාරාජ! කුමහකාරෝ එකභතතිකෝ බ්‍රහ්මචාරී සීලවා කල්‍යාණධම්මෝ'** යි වදාළ සේක් එහෙයිනි. අනාගාමීහු ප්‍රකෘතියෙන් ම එකභත්තික වෙති. ඡත්තපාණි තෙමේ ද එ පරිද්දෙන් උපොසථික ව බුදුරජුන් වෙත ගොස් වැඳ බණ අසමින් හුන්නේ ය. එ දවස, පසේනදිකොසොල්රජ තෙමේ ද බුද්ධොපස්ථානයට එහි ගියේ ය. උපාසක තෙමේ එන්නා වූ රජු දැක 'හුන් තැනින් නැගී සිටිය යුතු දැ' යි සිතා මම ඉන්නෙම් අග්‍රරාජන් වූ බුදු රදුන් වෙත ය, එ හෙයින් පෙදෙසිරජකු දැක මෙ තැන නැගී සිටීම යුතු නො වේ, නො නැගිට්ටොත් රජු මට කිපෙන්නේ ය, කිපුන ත් නැගී සිටීම නම් යුතු නැත, රජු දැක නැගී සිටියොත් රජ තෙමේ ගරුකරණලද්දේ වෙයි, එය බුදුරජානන් වහන්සේට ගරු නො කිරීමක් සේ පෙණේ, එහෙයින් නො නැගිටින්නෙමි' යි සිතා හුන් තැන ම හුන්නේ ය. **නුවණැත්තෝ තමනට වඩා ගරු කළයුත්තන් ඉදිරියෙහි දී නො නැගිටින්නකු දැක නො කිපෙති.** රජ තෙමේ නො නැගිටි උපාසකයා දැක කිපුනේ බුදුරජුන් වැඳලා පසෙකට වී හුන්නේ ය. බුදුරජානන් වහන්සේ රජු කිපිබව දැක 'මහරජ! මේ උපාසක තෙමේ පණ්ඩිතයෙකි, දක්නාලද වතුඃසත්‍යධර්මය ඇත්තෙකි, සාමාන්‍යයෙක් නො වේ, ත්‍රිපිටකධර ය, වැඩ නො වැඩ දනීමෙහි පොහොසතෙකැ' යි උපාසකයාගේ ගුණ කීහ. ඒ අසා සිටි රජුගේ සිත මොළොක් විය.

පසුදින උඩුමහලෙහි සිටි රජ තෙමේ කුඩය අතට ගෙණ වහන් පසැ ලා රජගේ මිදුලෙන් යන උපාසකයා දැක අඬගා යැවී ය. ඔහු කුඩය හා වහන් පසෙක තබා රජු වෙත ගොස් වැඳ සිටියේ ය. 'උපාසකය! අතැ තුබූ කුඩය, පයැ ලා තිබූ වහන් කුමක් හෙයින් පසෙක තබා ආවහු දැ' යි රජ තෙමේ ඇසී ය. 'දෙවයන් වහන්සේ මා කැඳ වූ නිසා ඒවා පැත්තක දමා ආමි' යි

කීවිට 'උපාසකය! ඔබ මා රජුබව දැන ගත්තහු අද දැ' යි විචාළේ ය. 'නැත, දෙවයන් වහන්ස! හැම කල්හි ම දෙවයන් වහන්සේ රජබව දනිමි' යි කී ය. 'එසේ නම් ඔබ ඊයේ බුදුරජුන් ඉදිරියේ දී කුමක් නිසා මා දැක හුන් තැනින් නො නැගිට්ටහු දැ' යි ඇසූවිට 'මහරජ! එතැන දී මම නො නැගිට්ටෙම් අමුත්ත කට, නො සැලකිල්ලකට නො වෙමි, අග්‍රරාජන් වූ බුදුරජුන් ඉදිරියේ පෙදෙසිරජකු දැක නැගී සිටීම ඒ බුදුරජානන් වහන්සේට කරණ අගෞරවයක් සේ මට එ තැන දී පෙණී ගියේ ය, දේවයන් වහන්සේ දැක මම නැගී සිටියෙම් නම්, එය බුදුරජුන්ට කළ අපරාධයෙක් අගෞරවයෙක් වන්නේ ය, එහෙයින් නො නැගිට් ටෙමි' යි කීයේ ය. 'හා! එය තුබුනා වේ, ඔබ එලොවැ මෙලොවැ දෙක්හි වැඩ අවැඩ දන්නහු ය, ත්‍රිපිටකධර වහු ය, මාගේ අන්තඃ පුරයෙහි වසන්නන්ට බණ උගත්වන්නට ඔබට ඉඩ පහසුකම් තිබේ දැ' යි ඇසී ය. 'දෙවයෙනි! ඉඩ පහසු නැතැ' යි ඔහු කී ය. 'මොක ද ඒ' යි රජු ඇසී ය. 'රජගේ මහාකරදර ඇති තැනෙකි, බිය ඇති තැනෙකි, කටයුතු ද ඉතාබරපතල ය, එ හෙයින් ඒ වැඩේ බාර ගැණීමට මට නො පිළිවනැ' යි කී විට 'එසේ නො කියව, ඊයේ මා දැක නො නැගිටීම ගැණ කුකුසක් නො කර ව, ඒ ගැණ මාගේ අමනාපයෙක් නැතැ' යි කී ය. 'දේවයන් වහන්ස! ඒ නිසා නො වේ, මෙබඳු තැනෙක ගිහින්ගේ හැසිරීම සුදුසු නැත, එයින් වැරදි සිදු විය හැකි ය, භික්ෂු නමක් ගෙන්වා බණ කියවා ගැණුම සියල්ලට ම වඩා හොඳ ය' යි උපාසකයා කී විට 'හා හොඳයි, ඔබ යන්නැ' යි කී ය. එවිට ඔහු රජගෙයින් නික්ම ගියේ ය. ඉන් පසු රජ තෙමේ බුදුරජුන් වෙත ගොස් වැඳ පසෙක හිඳ 'ස්වාමීනි! මල්ලිකා වත් වාසභඛත්තියා වත් බණ ඉගෙණ ගන් නට වුවමනා ය' යි කියති, එහෙයින් පන්සියයක් දෙනා වහන්සේ සමග එහි වැඩම කොට ඇලාට බණ උගන්වනු මැනැවැ' යි දන්වා සිටියේ ය. 'මහරජ! මට දිනපතා එක තැනකට නො යා හැකි ය, එබන්දක් බුදුවරුන් අතැ නැතැ' යි වදාළ විට අන් භික්ෂු නමක් එවනු මැනැවැ' යි ඉල්ලී ය. බුදුරජානන් වහන්සේ එය ආනන්ද ස්ථවිරයන් වහන්සේට බාර කළහ. උන් වහන්සේ එ තැන් පටන් එහි ගොස් ඇලාට බණ උගන්වති. මල්ලිකාව එ බණ සකසා ඉගෙණ සිත්හි දරා කඩපාඩම් කොට පාඩම් දෙන්නී ය. වාසභඛත්තියාව සකසා ඉගෙණීම නො කරයි. සිත්හි ද නො දරයි. කටපාඩම් ද නො දෙයි. දවසක් බුදුරජානන් වහන්සේ 'කොහොම ද ආනන්ද! උපාසිකාවෝ හොඳට ඉගෙණීම කරත් දැ' යි ඇසූහ. 'එසේ ය, ස්වාමීනි!' යි පිළිතුරු දුන්හ. හොඳට

ඉගෙණ ගත්නී මල්ලිකා ද, නැත, වාසභඛත්තියා දැ' යි නැවැත විචාළ සේක. 'සවාමිනි! මල්ලිකා හැම ද හොඳට ඉගෙණ ගණියි, හොඳට පාඩම් කොට පාඩම් ද දෙයි, බුදුරජාණන් වහන්සේගේ නෑ දුවනිය මේ කිසිවක් හොඳින් නො කරයි' යි කීවිට 'ආනන්ද මා දෙසූ මාගේ ධර්මය හොඳින් ඉගෙණ පුහුණු නො කරන්නාහට ත් ඒ දහම් මැනැවින් නො දෙසන්නාහට ත් පැහැයෙන් පමණක් සිත් ගන්නා සුවඳ නැති මලක් සේ ප්‍රයෝජන රහිත ය, එයින් වැඩෙක් නැත්තේ ය, එයට ලැදි ව කන් දී හොඳින් ඉගෙණ පුහුණු කොට කියන අසන හැම දෙනහට ම මහත්පල දෙන්නේ ය, එහි අනුසස් ඉමහත් ය' යි වදාළ බුදුරජාණන් වහන්සේ මේ ධර්ම දෙශනාව කළ සේක:-

යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං අගන්ධකං,
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො.

යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං සගන්ධකං,
එවං සුභාසිතා වාචා සඵලා හොති පකුබ්බතොති.

සිත්කලු පැහැයෙන් හා සටහනින් යුත් සුවඳ නැති මල යම්සේ වේ ද, එසේ සුභාෂිතවචනය ඉගෙණ එ ලෙස පිළිවෙත් නො පුරන්නහුට නිෂ්ඵල වේ.

සිත්කලු පැහැයෙන් හා සටහනින් යුත් සුවඳ ඇති මල යම් සේ ද, එසේ සුභාෂිතවචනය ඉගෙණ පිළිවෙත් පුරන්නහුට ඵල සහිත වේ.

මල්, පැහැයෙන් හා සටහනින් කොතරම් සිත්කලු වුව ද, සුවඳ නැත්තේ නම්, ඒ මල් පලඳින්නහුගේ සිරුර සුවඳවත් නො කෙරේ. එ මෙන් සුභාෂිතවචනය පරතෙරට උගන්නා ලද්දේ ද, ඒ අනුව නො පිළිපදින්නහුට එය ප්‍රයෝජන රහිත වේ.

පැහැයෙන් හා සටහනින් සිත් ගත් සුවඳැති මල් පලඳින්නහුගේ සිරුර සුවඳවත් කරන්නා සේ බුදුවදන් ඉගෙණ එ ලෙස පිළිපදින්නහුට එය ප්‍රයෝජන සහිත වේ.

යථාපි = යම් සේ.

රුචිරං = සිත්කලු වූ.

යමෙක් මැනැවින් බබලා නම් සිත් ගන්නේ නම් ඒ 'රුචිර' යි කියනු ලැබේ. සිත් ගත්තේ ද, ඒ ඒ වස්තූන්ගේ ශොභනත්වය යි සිතට සුදුසුබව සිත්කලු යි කියති.

පුප්ඵං = මල.

සියලු ම මල් මෙහිලා නො ගැණේ. එය මෙයට විශෙෂණව සිටි **'වණ්ණවන්තං, අගන්ධකං'** යන දෙ පදින් පැහැදිලි ය. එරබදු-ගිරිනිල්ල-බදුවද-කැල යනාදි පැහැයෙන් හා සටහනින් පමණක් සිත් ගන්නා සුවද නැති මල් පමණක් ම මේ **පුප්ඵ** ශබ්ද යෙන් කිය වේ. දෙවන ගාථාවෙහි එන **පුප්ඵ**ශබ්දයෙන් පැහැයෙන් සටහනින් සුවදින් සිත් ගන්නා මල් ගැණේ. සපු - දුනුකේ - එරහැඳි ආදිය ය ඒ.

වණ්ණවන්තං - පැහැ ඇති.

අගන්ධකං - සුවද නැති.

එවං - එසේ.

සුභාසිතා වාචා - සුභාෂිතවචනය.

එ ලොවැ මෙ ලොවැ වැඩ සලසන අමතදායක වූ නිවන් රස කැවුනු වචනය සුභාෂිත නම්. බුදුදහමය ඒ.

සමාස-ව්‍යාස-සාකල්‍ය ආදියෙන් හා එකත්ව-නානාත්ව යනාදි වශයෙන් ද, දශවිධව්‍යඤ්ජනයන්ගේ වශයෙන් ද නො අඩු ව මනා කොට දෙසූ බැවින් ඒ සුභාසිතවාචා නම් වේ.

අඵලා හොන්ති අකුබ්බතො = නොකරන්නහුට වැඩෙක් නොවේ.

ශ්‍රවණ-ධාරණ-ප්‍රතිපත්ති වශයෙන් ධර්මය ඉගෙණ ඒ අනුව නො පිළිපදින්නහුට, වත්පිළිවෙත් නො පුරන්නහුට වැඩෙක් ප්‍රයොජනයෙක් නො වේ ය, යි වදාළේය.

සසුනට බැසගත් ඇතැම් කෙනෙක් ධර්මය උගත්තෝ ද එහි අර්ථය හෙවත් ප්‍රයෝජනය නුවණින් නො සලකති. එහෙයින් ඔවුනට ධර්මය තතු සේ නො වැටහේ. ඔවුහු අනුන්ගේ වාදයට-ධර්මයට-ලබ්ධියට පහර ගැසීම පිණිස අනුනට දෙස්නැගීම අනුසස් කොට ම ඉගෙණීම කෙරෙති. තවද තම වාදයට-ධර්මයට-ලබ්ධියට අනුන් නැගූ නගන දෙෂයන්ගෙන් නිදහස්වීමේ බලාපොරොත්තු වෙන් ද උගණිති. යම් මගක් හෝ පලයක් උදෙසා දහම් උගණිත් ද, ඒ මග හෝ පලය නො ලබති. මෙසේ වනු දහම් මැනැවින් නො උගත් බැවිනි. නපුරු කොට උගත් ධර්මය වරදවා උගත් ධර්මය අවැඩ පිණිස දුක් පිණිස වන්නේ ය.

සර්පයන් සොයා යන මිනිසකු, සර්පයකු දැක සිරුරෙන් හෝ නගුටින් අල්ලා ගත් කල්හි සර්පයා ආපසු හැරී ඔහුගේ අතට හෝ බාහුවට, නැග, අනික් ශරීරාවයකට දෂ්ටකරණු එකාන්තය. ඒ

හේතුවෙන් ඒ මිනිසා එ තැනදී ම මරණයට හෝ ඒ සමාන දුකට පැමිණේ. සඕයා අල්ලා ගත් සැටි වරද බැවින් එසේ වන්නේ ය. ධම්ය වරදවා ගත් තැනැත්තේ ද ඒ හෙතුවෙන් අවැඩට දුකට වැටෙන්නේ ය. ඒ එකාන්තසිද්ධියකි. අඤ්ඤවිපරීත කොට වරදවා ගත්, උපාරම්භාදිහෙතුවෙන් හා 'චීවරාදී වූ සිවුපසය ලබම්, සිවුපිරිස් මැද ප්‍රසිද්ධ වෙම්' යි ලාභසක්කාරහෙතුවෙන් පුරුදු පුහුණු කළ ධම්ය තමහට අහිත පිණිස දුක් පිණිස පවත්නා බැවින් ඒ බණ දහම් ඉගෙණුම අලගද්දූපරියත්තියට වැටේ. මෙසේ බුදුවදන් පුහුණු කිරීමට වඩා පුහුණු නො කොට නිත්දට බැසීම වඩා හොඳ ය. එහෙයින් ය බුදුරජාණන් වහන්සේ වදාළ සේක්, ධම්ය මැනැවින් නො පිළිපදින්නහුට එයින් වැඩක් නොවන බව. දෙවන ගාථා වෙහි අදහස් ද එ සේ ය. විශෙෂය මෙසේ දතයුතු ය.

සඵලා හොති පකුබ්බතො = කරන්නහුට වැඩ සහිත වේ.

ශ්‍රවණ-ධාරණ-ප්‍රතිපත්තිවශයෙන් ධම්ය මනාකොට කරන්න හුට, පිළිපදින්නහුට, වත්පිළිවෙත් පුරන්නහුට වැඩෙක් වේ ය යනු කෙටි අදහස ය.

ශාසනගත වූ ඇතැම් කෙනෙක් ධම්ය ඉගෙණ, ඉගෙණ ගත් ධම්යෙහි අඤ්ය කිමැ යි නුවණින් විමසති. විමසනකල්හි උගත් ධම්ය හොඳින් වැටහේ. අනුන්ගේ වාදයට දෙස්නැගීම අනුසස් කොට අන්‍යයන් තමවාදයට නැගූ දෙෂයෙන් නිදහස් වීමට ඉගෙණීම නො කරති. යම් මාගීයක් හෝ ඵලයක් උදෙසා ධම්ය උගණිත් ද, ඒ ලබති. මෙසේ වනු ධම්ය මැනැවින් උගත් බැවිනි. මනා වැ ගත් ධම්ය ඔවුනට වැඩ පිණිස සැප පිණිස වේ. සඕයකු අල්ලා ගන්නේ, එළුකුරසටහන් ඇති දඹුකැබල්ලෙකින් ගෙල තද කොට අල්ලා ගන්නේ නම්, ඔහුට සඕයාගෙන් අනතුරෙක් නො වේ. සඕ තෙමේ දෂ්ටකිරීමෙහි අපොහොසත් වෙයි. ගෙලින් අල්ලා ගත් තැනැත්තහුගේ අත වෙළා ගණියි. අල්ලා ගත් සැටි නිවරද බැවිනි, එසේ වනු. එ පරිද්දෙන් ධම්ය උගත්තේ ද හිතයට, සැපයට වැටෙයි. **'තඤ්ඤතිත්ථ භික්ඛවෙ! යඤ්ඤ මෙ භාසිතඤ්ඤ අත්ථං ආජානෙය්‍යාථ අහං වා තත්ථ පටිපුච්ඡිතබ්බා යෙ වා පනඤ්ඤ විඤ්ඤූ භික්ඛූ'** යනු වදලෝ මෙබැවිනි. 'මහණෙනි! තමුසේලා මාගේ යම් දම්දෙසුමෙක අර්ථ විසතරය නො දන්නහු නම්, එහි දී මාගෙන් ඇසිය යුතු ය, නැත, උගත් භික්ෂූහු වෙත් නම් ඒ තැන්ගෙන් හෝ ඇසිය යුතු ය' යනු තේරුම ය. මෙයින් වදලෝ ද ධම්ය විපරීත නො කොට මැනැවින් ඉගෙණ ඒ අනුව පිළිපැදිය යුතුබව ය. අඤ්ඤවිපරීත

නො කොට උපාරම්භාදිහෙතුවෙන් හා සිවුපසය ලැබීමේ හෙතු වෙන් තොර ව සීලය පැමිණි තැන්හි සිල් පුරා, සමාධිය පැමිණි තැන්හි සමවත් ගැඹ ගන්වා, විදර්ශනාව පැමිණි තැන්හි විදසුන් වඩා, මාර්ගඵල පැමිණි තැන්හි මාර්ගය වඩමි, ඵලය ප්‍රත්‍යක්ෂ කරමි, යි ධර්මය උගණිත් ද, ඒ බණදහම් ඉගෙණුම නිර්වරණ පරියත්තියට වැවේ. ධර්මය පිළිපදින්නහුට එයින් වැඩෙක් වේ ය යි වදලෝ එ හෙයිනි.[1]

සුවඳ නැති මල් පැලඳීමෙන් සිරුර සුවඳවත් නො වේ. එ මෙන් බුදුවදන් සකසා ඇසීම් දැරීම් පිළිවිසීම් ආදියෙන් ඉගෙණ ද ඒ අනු ව නො හැසිරෙන්නහුගේ ශරීරය, ශ්‍රැතත්‍යාගප්‍රතිපත්ති ගන්ධයෙන් සුගන්ධවත් නො වේ.

සුවඳ ඇති මල් පැලඳීමෙන් සිරුර සුවඳවත් වේ. එ මෙන් බුදුවදන් සකසා ඇසීම් දැරීම් පිළිවිසීම් ආදියෙන් ඉගෙණ ඒ අනු ව හැසිරෙන්නහුගේ ශරීරය ශ්‍රැතත්‍යාගප්‍රතිපත්තිගන්ධයෙන් සුගන්ධවත් වේ.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

ජාතකපාණී උපාසකවස්තුව නිමියේ ය.

---

1 1-14 සහිතං යන්නට කළ පරිකථාව බලනු

විශාඛාමහාඋපාසිකාවෝ

4-8

අඟුරට භද්දියනුවර මෙණ්ඩක නම් සිටුවරයෙක් විය. ඔහුගේ පුත්‍ර තෙමේ ධනඤ්ජය නම් වූයේ ය. සුමනා තොමෝ ඔහුට භාර්‍යාව වූ ය. විශාඛාවෝ සුමනාවගේ දුවනියෝ ය. විශාඛාව වයසින් සත් හැවිරිද්දට පැමිණ සිටි දවස බුදුරජුනන් වහන්සේ භික්ෂුසඞ්ඝයා ත් පිරිවර කොට භද්දියනුවරට වැඩම කළ සේක. එහි වැඩි සේක් සෙලබ්‍රාහ්මණාදී වූ විනෙයබන්ධුන්ගේ හෙතුසම්පත් දැකීමෙනි. එ දවස ඒ නගරයෙහි මහපිණැතියෝ පස්දෙනෙක් විසූහ. ඔවුන් අතුරෙහි ප්‍රධාන ව සිටියේ ද, සිටුතනතුරු දැරුයේ ද මෙණ්ඩක ගෘහපති තෙමේ ය. **මෙණ්ඩකගෘහපති,** ඔහුගේ භාර්‍යාව වූ **චන්දපදුමා,** වැඩිමහල් පුත් **ධනඤ්ජය,** ධනඤ්ජයගේ භාර්‍යාව වූ **සුමනා** මෙණ්ඩකසෙවක වූ **පුණ්ණ** යන මොවුහු පස් දෙන ය, ඒ මහාපිණැතියෝ.

බිම්සරරජුගේ රාජ්‍යයෙහි අපමණ සම්පත් ඇති ව විසූවන් අතුරෙහි මෙණ්ඩක තෙමේ ද එකෙකි. **ඡෝතිය-ජටිල-පුණ්ණක භාර්‍යාවලි** යන මේ සිවුදෙන ද එහි අපමණ සම්පත් ඇති ව විසූවෝ ය. දිනක් මෙණ්ඩක සිටු තෙමේ බුදුරජුන් තමන්ගේ නුවරට වැඩි බව අසා ධනඤ්ජයගේ දූ වූ විශාඛාව ගෙන්වා 'දුව අද දූට ත් මගුල්, අපට ත් මගුල්, එහෙයින් ඔබගේ පිරිවර ලදුරියන් පන්සියය සමග රිය නැගී දුස්සත් පන්සියය ත් කැටුව බුදුරජුන් ඉදිරියට යන්නැ' යි කියේ ය. ඕ තොමෝ 'යහපතැ' යි කියා එසේ කළා ය. කරුණු නො කරුණු දන්මෙහි සමත් වූ විශාඛාවෝ යා හැකි පමණ කරන්තවලින් ගොස් ඉන් බැස පයින් බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක සිටියෝ ය. එවිට බුදුරජුනන් වහන්සේ ඇයගේ චරිතය බලා එයට සරිලන ධර්‍ම දෙශනාවක් කළ සේක. ඒ ඇසූ ඕ තොමෝ දුරියන් සමග සෝවන් පලයෙහි පිහිටියා ය. මෙණ්ඩක සිටු ද එහි හිඳේ බණ අසා සෝවන්පලයට පැමිණ පසුදා දනයට ආරාධනා කෙළේ ය. බුදුරජුනන් වහන්සේ ඒ ආරාධනාව ඉවසා සඞ්ඝයා ත් සමග ඒ පිණිස එහි වැඩි සේක. සිටු තෙමේ උන්වහන්සේලා ප්‍රණීත වූ ආහාරපානයෙන් වලඳවා එ තැන් සිට පිළිවෙළින් අට මසක් මහදන් දුන්නේ ය.

පසේනදිකොසොල්රජුගේ නැගනී තොමෝ ය, බිම්සර රජුගේ අගමෙහෙසි වූවා. බිම්සරරජුගේ නැගනී තොමෝ ය

කොසොල්රජුට අගමෙහෙසි වූවා. එ හෙයින් ඒ දෙදෙන භගිනිපති වෙති. දවසක් කොසොල්රජ තෙමේ 'බිම්සරරජුගේ රාජ්‍යයෙහි අපමණ සම්පත් ඇත්තෝ පස් දෙනෙක් වෙසෙති, මාගේ රාජ්‍ය යෙහි එබඳු එකෙක් වත් නැත, එ හෙයින් බිම්සර රජුගෙන් ඉන් එකකු ඉල්ලා ගණිමි' යි සිතා එහි ගියේ ය. බිම්සරරජ තෙමේ ඔහු පිළිගෙණ කළ පිළිසඳර ඇත්තේ, 'මෙහි යාපත් වූවහු කුමක් නිසා දැ' යි ඇසී ය. එවිට කොසොල්රජ තෙමේ 'ඔබතුමන්ගේ රාජ්‍යයෙහි මහපිණැත්තෝ පස් දෙනෙක් වෙසෙති, මම ත් ඉන් එකකු ඉල්ලා ගන්නට මෙහි ආමි, එ හෙයින් මට ත් එකකු දුන මැනැවැ' යි කී ය. බිම්සරරජ තෙමේ 'ඒ මහාකුලයෝ අප විසින් සොලවාලිය නො හැක්කෝ ය, ඔබගේ ඔය ඉල්ලීම ඉටු කරන්නට නො පිළිවනැ' කීයේ ය. 'එකෙකුදු නො ලැබේ නම්, ආපසු නො යමි' යි කොසොල්රජු දන්වා සිටි කල්හි බිම්සරරජ තෙමේ ඇමැති යන් හා කතා කොට 'ජෝතිය ආදී වූ මහාකුලයන් සෙලවීම මහ පොළොව සෙලවීමක් වැනි ය, මෙණ්ඩකසිටුහට ධනඤ්ජය නම් පුත්‍රයෙක් ඇත, ඔහු හා කතා කොට පිළිතුරක් කියමු' යි ධනඤ්ජය ගෙන්වා 'සිට! කොසොල්රජ ධනසිටුවරයකු එ නුවරට ගෙණ යන්නට මෙහි ඇවිත් හිඳියි, ධනසිටුවරයකු නො ගෙණ නො යමි යි ද කියයි, එ හෙයින් එහි යන්නට ඔබ කැමැත්තහු දැ' යි ඇසී ය. එවිට ඔහු 'දේවයන් වහන්සේ මට එහි යෑමට අණකරණ සේක් නම් යන්නට හැකි' යි කී ය. 'හා! එසේ නම් ගමන් සරහා ගන්නැ' යි කී කල්හි ගමනට වුවමනා සියල්ල ඔහු පිළියෙල කර ගත්තේ ය. රජ තෙමේ මහත් සතකාර ද කොට 'මොහු ගෙණ යන්නැ' යි කොසොල්රජුට පාවා දුන්නේ ය. රජ තෙමේ ද සිටානන් කැටු ව යන්නේ රැ බෝ වූ බැවින් අතර මගැ නවාතැන් ගත්තේ ය. ධනඤ්ජය තෙමේ එහි දී 'මේ කාගේ රටක් දැ' යි රජු ගෙන් ඇසී ය. 'මෙය මාගේ රටැ ය' යි රජ තෙමේ කී ය. 'මෙ තැන් සිට සැවැත්නුවර තව කො තරම් දුර දැ' යි සිටු තෙමේ නැවැත ඇසී ය. 'සැවැත්නුවර පිහිටියේ මෙයින් සත් යොදුනකින් ඈත් හි ය' යි කී විට 'දේවයන් වහන්ස! ඇතුල්නුවර කරදර සහිත ය, මාගේ පිරිසත් ලොකු ය, දේවයන් වහන්සේ කැමති වන සේක් නම්, අපි මෙහි ම වසන්නෙමු' යි කීයේ ය. රජ ද 'යහපතැ' යි කියා එ තැන නුවරක් කරවා ඔහු එහි නවතා නුවරට වන්නේ ය. නුවර ඉදි කළ තැනැ සවස නවාතැන් ගත් බැවින් ඒ ඉදි කළ නුවර **සාකෙත** නමින් හඳුන්වන ලද්දේ ය. මේ කාලයෙහි සැවැත් නුවරැ වැසි මිගාරසිටුගේ පුත්‍ර වූ පූර්ණවර්ධන කුමාරයෝ තරුණ වයසට පැමිණ විසූහ. එ හෙයින් මවුපියෝ 'සුදුසු තැනෙකින් තමහට කැමැති දැරියක සොයා බලන්නැ' යි ඔහුට දැන්වූහ. එවිට

'මෙබඳු ජටාවන්ගෙන් මට වැඩෙක් නැත, සරණ යෑම මහා අවුලෙකැ' යි ඔහු කියා සිටියේ ය. **අද තරුණ තරුණියෝ සුදුසු වයසට නො පැමිණියෝ ම මවුපියන්ගේ කැමැත්තට ද පිටුපා සරණ සොයා යෙති. අදහස ඉටු නො වූ තැනේ දී බලු කැණහිලුන් සේ විළිබියෙන් තොර ව හැසිරෙති. විස කා නැසෙති. බෙල්ල වැල ලා ගණිති. ගඟට මූදට පැන වැනසෙති. ගිහිගෙයි දෙස් නො දැන්ම පවෙහි ගිජුකම ලෝසිරින් හා කුලසිරින් නො දැන්ම ඇතුළත ගුණවගාවක් නොවීම යන මේ, මෙයට කරුණු ය.** පූණ්ණවඩ්ඪනයන් 'ගිහිගෙයි වාසය අවුල් ජාලයෙකැ' යි කී විට මවුපියෝ 'පුත! එසේ නො කළ යුතු ය, ඔබ දැන් එයට සුදුසු වයසෙහි සිටිනහු ය, පුතුන් නැති පරපුර කල් නො පවතී' යි කියා ඇවිටිලි කරණු ලැබූ ඔහු 'මවුපියන්ගේ ඉල්ලීමට පිටුපෑම තරම් නො වේ ය' යි සිතා එසේ නම් පස්-කළණින් යුත් දැරියක සොයා ගන්නට ලැබුනොත් ඔබ වහන්සේ ලාගේ ඉල්ලීම ඉටුකරණු හැකි ය' යි දැන්වී ය. කෙසකල්‍යාණය-මංසකල්‍යාණය-අට්ඨිකල්‍යාණය-ඡවිකල්‍යාණය-වයකල්‍යාණය යන මේ ය, පංචකල්‍යාණ ය.

මොනරපිල්කලඹක් සේ පෙණෙන මුදු හැරි කල්හි ඇඳ තුබූ රෙද්දෙහි පහත කෙළවර හැපි වැටෙන, උඩ බලා ගත් කොන් ඇති කෙස්වැටිය **කෙසකල්‍යාණ** නම්. බිඹුපලපැහැඇති සම වූ මොනවට හැපි සිටි දෙතොළ **මංසකල්‍යාණ** නම්. කොදකැකුළු සේ සුදු වූ එක් දතක් අනික් දතට නො උස් ව නො මිටි ව සම ව සිටි, අතරතුර සිදුරු නැති, ඔසවා තැබූ විදුරුපෙලක් සේ සම ව ම ගා යෙදූ සක්පතක් සේ බබලන දත්පෙල **අට්ඨිකල්‍යාණ** නම්. කලුපැහැති සත්‍රියකගේ නම් අත් පැහැයක් හා මුසු නො වූ සිනිදු නිලුපුල්මල්දමක් සේ සිටි සිවිපැහැය ද, සුදුපැහැ ඇත්තියකගේ නම් තලකැලැල් ඇ දෙසින් තොර වූ සිනිදු වූ කිහිරිමල් දමක් සේ සිටි සිවිපැහැය ද **ඡවිකල්‍යාණ** නම්. දසවරක් වැලුව ද, එක් වරක් වැලූ තැනැත්තියක මෙන් නො නැසුනු යොවුන්බව **වය කල්‍යාණ** නම්.

පස් කළණතොරතුරු දත් මවුපියෝ බමුණන් එක් සිය අට දෙනකු ගෙට පමුණුවා කිරිබත් අනුභව කරවා පස් කළණෙන් යුත් ගැණු සිටිත් දැ' යි ඇසූ හ. බමුණෝ 'ඇතැ' යි කීහ. 'එසේ නම් තෙපි අට දෙනෙක් යහු, පස් කලණින් යුත් දැරියක සොයහු, සොයා ආ කල්හි තමුසේලාට කළයුතු හැම උදවු උපකාර සැලකිලි නො අඩුව කරන්නෙමු, මගවියදමට මේ මුදල් ගණිවු, යම් ලෙසකින් මෙබඳු දැරියක දක්නට ලැබුනොත් මෙය ඇයට පලදවාලවු'යි

කියා ලක්ෂයක් වටිනා රතින් කළ මාලයක් ද මගවියදම් පිණිස බොහෝ මුදල් ද දී ඔවුන් අතුරෙන් අට දෙනකු පිටත් කොට යැවූහ. බමුණෝ පිටත් ව ගියහ. ඔවුහු මහාජනයා බොහෝ සේ රැස් වන ප්‍රසිද්ධ වූ ගම් නියම්ගම් නුවර සොයා බැලූහ. එහෙත් පස් කලණින් යුත් එබඳු දැරියක කො තැනකදීත් දැක ගත නො හැකි වූහ. ඔවුහු හැරී එන ගමනේ නැකැත් කෙළි දවසෙක සාකෙත නුවරට ගියහ. ගොස් අද අප ආ කාරිය ඉටුකර ගත හැකි ය' යි ද සිතූහ. එදා එහි නැකත්කෙළිඋලෙළෙක් විය. මෙය අවුරුදු පතා එහි පැවැත්වෙන උත්සවයෙක් වෙයි. අන් කිසි දිනෙක ගෙවලින් බැහැරට නො යන කුලකාන්තාවෝ ඒ නැකත්කෙළි දිනයෙහි පිරිවරකතුන් හා එක් ව උඩුකය නො වැසූ සිරුරු ඇති ව කාටත් පෙණී පෙණී ගෙවලින් නික්ම උයන් පොකුණු ගංතොට ආදී තැන්හි පාගමනින් ම කෙළිදෙළෙන් හැසිරෙති. ක්ෂත්‍රියමහා සාරාදී වූ කුලවල උපන් රූමත්තරුණයෝ ද, තමන් සමාන කුල ඇති කාන්තාවන් සොයා ගෙණ උන් ගෙල මල්වඩම් ලන්නෙමු' යි මල්වඩම් ගෙණ දෙ මංහන්දි තුන් මංහන්දි ආදී වූ ඒ ඒ තැනැරැක සිට තම තමන් කැමැති කාන්තාවන්ගේ කරට මල්වඩම් ලන්නෝ ය. බමුණෝ ද එහි ගංඉවුරෙක ශාලාවකට වී එහි යන එන්නන් බල බලා හුන්හ එ වේලෙහි සොළොස් හැවිරිදි තරම් වූ විශාඛාවෝ ද හැම අබරණින් සැරසී පන් සියයක් ලලනාවන් ද කැටි ව දිය නාන්නෙමි' යි ගං ඉවුරට පැමිණියෝ ය. එ කෙණෙහි මහත් වූ වැස්සෙක් වට. එවිට ඔවුහු හැම දෙන වෙගයෙන් දුව අවුත් ශාලාවට වන්හ. බමුණෝ උන් පන්සියය දෙස ඇස් යොමා බැලුවෝ ද එ පිරිසෙහි පස් කළණින් යුත් එක් කතක ද නො දුටුවෝ ය. විශාඛාවෝ ද පියවිගමනින් අවුත් ශාලාවට ඇතුල් වූහ. හැඳ තුබූ සාරිය හා පැලඳ තුබූ අබරණ ද මුළුමනින් තෙමී ගියේ ය. ඇත් ගමනින් ඇඟ නො සොල්වා සත්‍රීලීලාව නොයික්මවා. එන විශාඛාවන් දැක 'මහපිණැති දැරියකැ' යි කියමින් හුන් බමුණෝ ඇගේ කලණගුණ සතරක් දැක දන්තකල්‍යාණය දකිනු කැමැති ව ඈ කතා කරවන්නට සිතා 'අපේ මේ දූ බොහො ම අලස ය, මෑගේ හිමියා කාඩිහොදිටිකක් වත් ලබා නම් ඒ මහාපුදුමයෙක, එකතින් ඔහු හිඟමනෙක ඇත, මෙබඳු අලසගෑණුන් ඉන්නා ගෙය කෙසේ වැඩේ දැ' යි උනුන් ඇස් මර මරා කතා කරන්නට වූහ. එවිට උන්ගේ කතාව කණැ වැටුණු විශාඛාවෝ 'තෙපි කුමක් කියහු දැ' යි බමුණන් විචාළෝ ය. ඇයගේ ඒ හඬ ඉතා මිහිරි ය. එය කයිතාලම් හඬක් සේ නැගී පැතිර ගියේ ශාලාව පිරී සිට ගත. 'තී ගැණ කතා කරමු' යි බමුණෝ කීහ. 'මා ගැණ කුමක් කතා කළහු දැ' යි විශාඛාවෝ ඇසූහ. එවිට ඔවුහු 'නුඹගේ මෙතෙක්

පරිවාරසත්ත්‍වහු තම තමන් ඇඳ පැලඳ තුබූ වස්ත්‍රාභරණ කිසිවකුත් නොතෙමා වහා දුව අවුත් ශාලාවට ඇතුල් වූහ. නුඹට මේ ටික වත් හස්යෙන් දුව එන්නට බැරි විය, ඒ තරමට නුඹ අලස ය, වස්ත්‍රාභරණ තෙමී ගියේ ඒ නිසා ය, අපි ඒ ගැණ කතා කළෙමු' සි කීහ. 'පියවරුනි! එසේ නොකියනු මැනැවැ, ඒ කීම නොමැනැවි, මම මැලා හැම දෙනෙකුට වඩා බලගතු වෙමි, කරුණක් සලකා හස්යෙන් දුව නොආමි' සි ඇ කීවිට 'කරුණ කුමක් දැ' සි ඔවුහු ඇසූහ. 'පියවරුනි! මේ ලොකයෙහි සතර දෙනෙක් දුවන කල්හි නොහොබින්නෝ ය, ඒ හැර තවත් කරුණක් ද තිබේ, **'ඔබුණු පලන් රජ තෙමේ රාජාභරණයෙන් සැරසී අමුඩ හසාගෙණ රජවාසල මිදුලෙහි දුවා නම් නොහොබී,** එසේ දුවයි නම් මේ මහරජ ගැහැවියකු සේ ලජ්ජා නැති ව දුවා ය' සි නින්දා ලබන්නේ ය, හිමින් හිමින් යන්නේ ම හොබනේ ය, **'රජුගේ මඟුලැත් තෙමේ හස්ත්‍යාභරණයෙන් සැරසී මහැ බැස දුවන්නේ නම් නොහොබී,** ඇත්ගමනින් පය තබ තබා යන්නේ ම හොබනේ ය, **'පැවිද්දෙක් පැවිද්ද නොසිතා දුවසි නම් නොහොබනේ ය,** 'කිමෙක් ද මේ මහණ නොදැමුණු ගිහියකු සේ දුවා දැ' සි ලොකයා ගෙන් ගැරහුම් ලබයි, වියදඹුපමණින් ඔබ නොබලා අත පය හිස නොසොල්වමින් සන්සුන්ගමනින් යන්නේ ම හොබනේ ය, **'සත්‍රියක් දුවසි නම් නොහොබසි,** 'මොක ද මේ සත්‍රිය පිරිමියකු සේ දුවන්නී, මෝ සත්‍රියක් නොවේ, පිරිමියෙකැ' සි ගැරහිය යුතු ම වේ, පියවරුනි! මේ සතර දෙන දුවන පණින විට නොහොබින්' සි විශාඛාවෝ කීහ. එ කල්හි 'අනික් කරුණ කිමැ' සි බමුණෝ ඇසූහ. එවිට 'පියවරුනි! දූපුතුන් කවා පොවා හදා වඩන්නා වූ මවුපියෝ සිරුර අත් පය කන් නාසා ආදී වූ සියලු අඟපසඟ අතපත ගාලා මැනැවින් පිහිටුවා ඇති දැඩි කෙරෙති, ගැහැණු වූ අපි විකිණියයුතු බඩු වැන්නමිහ, විකිණියයුතු බඩුව සිදී බිඳී ගියේ නම්, එහි වටිනාකම අඩු වේ, අප දූවරු ඇති දැඩි කරන්නෝ අන් ගේකට පාවාදෙනු පිණිස ය, අප දුවන පණින වේලෙහි රෙදිකොණක හෝ පොලොවෙහි පය පැකිළ වැටී අතක් පයක් කැඩී බිඳී ගියේ නම්, අපි දිවි තිබෙන තුරු ම මවුපියන් විසින් රැකියයුත්තෝ වමිහ, අන් කෙනෙක් අප පාවා නොගණිති, එවිට අප හදා වැඩූ මවුපියන්ට අපෙන් පිහිටෙක් නැත, සහෝදරසහෝදරියන්ට ද පිහිට නැත. අපෙන් ඔවුනට වන්නේ හැම දා කරදරයෙක් ම ය, වැස්සට බිය ව නොදිවීමෙන් වන්නේ හැඳිවන් තෙමී ම පමණක් ම ය, පසුව ඒවා වියලා ගත හැකි ය, මේ කරුණු සලකා මම පියවිගමනින් හිමින් හිමින් ආයෙමි' සි කීහ.

ඈ මෙසේ කියනවේලෙහි ඇගේ දන්තසම්පත්තිය දැක තුටු පහටු වූ බමුණෝ 'අප මෙයට පෙර කවදත් මෙබඳු දන්තසම්පත්තියක් දැක නැතැ' යි සාධුකාර දී 'දුව අප ගෙණා මේ රන්මාලය සුදුසු ඔබටැ' යි කියා ඉදිරියට ගොස් ඇයගේ කර ලැවෝ ය. එවිට විශාඛාවෝ 'නුඹලා කිනම් නුවරක සිට කිනම් කුලයකින් මෙහි ආවහු දැ' යි ඇසූහ. 'අපි ආවමෝ සැවැත්නුවර මිගාරසිටු කුලයෙනැ' යි කියූහ. 'හිමියා කවරෙක් දැ' යි ඈ ඇසූවිට 'පුණ්‍ණවඩ්ඪන කුමාරයෝ ය' යි කීහ. එකල විශාඛාවෝ 'මේ කියන කුලය අපට සුදුසු කුලයෙකැ' යි දැන රන්මාලාව ඉවසා 'අපට එන්නට සුදුසු කරත්තයක් එවන්නැ' යි පියානන්ට කියා යැවූහ. ගංඉවුරට දිය නැම පිණිස ආවෝ පයින් ම ය. එහෙත් රන්මාලාව කරැ ලූ දැ පටන් එසේ නොයති.

රන්මාලා කරැ ලූ දැ සිට උසස් මහත් කුලවල කාන්තාවෝ හමන් බිමන් කරන්නෝ පියෙන් ම ය. අන් සෙසු කුලවල කාන්තාවන් කුඩයක් හෝ තල්අත්තක් හිස දරා යා යුතු ය. එබන්දකුදු නැති කාන්තාවන් හැඳි රෙද්දෙකි හෝ සාරියෙකි දුවලු කෙලවර හෙණ දසරුවෙකි ලා යා යුතු ය. මේ එදා පැවැති ව්‍යවස්ථා ය.

ධනඤ්ජයසිටු තෙමේ, දුවට එන්නට රිය පන්සියයක් එහි යැවී ය. විශාඛාවෝ රිය නැගී සපිරිවරින් ගෙට ගියහ. බමුණෝ ඔවුන් පසු පස්සෙහි ගියෝ ය. සිටු තෙමේ බමුණන් දැක 'තෙපි කොහි සිට ආවහු දැ' යි ඇසී ය. 'මහසිටු! අපි ආවමෝ සැවැත්නුවර සිට ය' යි කීහ. 'සිටු තෙමේ කවරෙක් දැ' යි ඇසී ය. 'මිගාරසිටුය' යි කීහ. 'සිටු පුත්‍රයාගේ නම කුමක් දැ' යි ඇසූවිට 'පුණ්‍ණවඩ්ඪන' යි කීහ. 'පොහොසත් කම කොපමණ දැ' යි ඇසූවිට 'සතළිස් කෙළෙකැ' යි කීහ. 'හා! මොකක් ද, ඒ, තොප සිටුහුගේ පොහොසත්කම මාගේ පොහොසත්කමට තුටුවිවක් තරම්වත් නොවේ, අලගු තබන්නටත් ඒ මදය, එයට කාරියක් නැත, මාගේ දුට ආරක්ෂාව පමණක් ලැබේ නම් ඒ ඇත, අනෙකකින් මට වැඩෙක් නැතැ' යි ඉවසා බමුණන් දවසක් දෙකක් නවතා ගෙණ ආදර සැලකිලි කොට පිටත් කර හැරියේ ය.

මහත් සතුටින් පුල පුලා සැවැත්නුවරට ගිය බමුණෝ 'අප බලාපොරොත්තු වූ පරිදි වැදගත් කුලකාන්තාවක් ලැබිනැ' යි මිගාර සිටානන්ට දන්වා සිටියහ. 'කාගේ දුවක් දැ' යි ඔහු ඇසී ය. 'ධනඤ්ජය සිටානන්ගේ ය' යි කී කල්හි ඉන් සතුටට පැමිණි මිගාරසිටු තෙමේ, 'මහාකුලයකින් කාන්තාවක් ලැබිනා, දැන් කල් යවන්නට බැරි ය, කල් නොයවා ම ඇ මෙහි පමුණුවා ගත

යුතු ය' යි කියා කොසොල් රජු වෙත ගොස් ඒ බව රජුට දන්වා සිටියේ ය. රජ තෙමේ, ඉතා සතුටු ව 'මේ මහාකුලය මාවිසින් බිම්සරරජුගෙන් ලබාගෙණ සාකෙතනුවර පදිංචි කර වූ කුලය යි, ඒ නිසා මාද සතකාර කළයුතු ය' යි සිතා 'සිට! දූරිය කැඳවාගෙණ එන මගුල්පෙරහැරට යන්නට මම ත් එන්නෙමි, තවත් ඒ සඳහා වූවමනා යමක් වෙතොත් නො වළහා කියන්නැ' යි කියේ ය. 'යහපත! දෙවයන් වහන්ස! කියා ගෙට ගොස්,

.....
සැවැත් නුවරදීය

සතුතිපූර්වකව ලියම්.
මහසිටාන!

ඔබගේ දුව කැඳවා ගෙණ එන්නට ලබන.....මස.....වනදා අපි ඔහි එන්නෙමු. අප එන විට කොසොල්රජතුමා ත් යාපත් වන්නේ ය. නරොත්තමයන්ගේ සෙනඟ ටික නො වේ. ඒ ඉතා විසාල ය. අප හැම දෙනකුට කළයුතු සංග්‍රහය ද විසාල විය හැකි ය. එහි දී රජුට කරණ සංග්‍රහය විශෙෂවත් ද විය යුතු ය. මෙතෙක් විසාල පිරිසකට අපහසු නැති ව සංග්‍රහ කළ හැකි දැ' යි මේ දුටු කඩිනමින් දන්වා එවනු මැනැවි.

සැපවත් වේවා.

මිට,
දයාබර,
මිගාර.

මේ ලියුම ලියා ධනඤ්ජයසිටානන්ට යැවී ය. ඔහු ලියුම බලා සිනාසී මෙසේ ලියා යැවුයේ ය.

.....
සාකොත නුවරදීය

සතුතියි!
මහසිටාන!

මෙහි එවූ ලියුම කියවා බැලීමි. එය මාගේ පුදුමයට කරුණු විය. ලියුමෙන් පෙණෙන්නේ අප තරම් නො දන්නා ලෙසක් ය. එක් රජකු තබා දස රජ කොනකු කැටුව ආව ද අපට එයින් අමුතු බරෙක් නො වේ.

සැපවත් වේවා.

මෙයට, හිතකාමී,
ධනඤ්ජය.

මිගාරසිටු තෙමේ, ලියුම කියවා, කල් බලා ඒ සා විසාල නගරයෙහි ගේ රැකුමට එකා එකකු නවතා සෙසු සියලුදෙනා ත්

රැගෙණ සුබ මොහොතින් නික්ම ගොස් සාකෙතනුවරට අඩ යොදුනක් තිබිය දී තමන් ආ බව දන්වා යැවුයේ ය. ඛනඤ්ජය තෙමේ, ඔවුන් වෙත යැවියයුතු වූ තැගි බෝග සවා විශාඛාවන් ගෙන්වා 'දුව! ඔබගේ මාමණ්ඩි වූ මිගාරසිටාණෝ කොසොල් මහ රජතුමන්ද කැටුව මහාපිරිවරින් සැවැත්නුවරින් පිටත් ව අවුත් මෙයට අඩ යොදුනකින් එපිට නො දුරු තැනෙක නැවතී සිටිති, ඔවුන් මෙහි ආ විට මාමාට නැවතී සිටීමට තැනක් පිළියෙල කොට දියයුතු ය, රජතුමාගේ නැවැත්මට තැනක් පිළියෙල විය යුතු ය, යුව රජුන්ට ත් සුදුසු පරිදි ඒ ඒ තැන් පිළියෙල කළයුතු ය' යි කීයේ ය. විදුරගක් සේ තියුණු නුවණැති කලපලක්ෂයක් මූළුල්ලෙහි පිරූ පාරමිතා ඇති අසීනසීඥනයෙන් ඥනවත් වූ විශාඛාවෝ 'පියානන් වහන්ස! මාමාට මේ ගෙය පිළියෙල කරවම්, රජ තුමාට මේ ගෙය හොඳ යි, යුවරජුන්ට මේ මේ ගෙය සූදානම් කරවම්' යි කියා ගෙවල් පිළියෙල කරන්නට නියම කොට දැසි දස් කම්කරුවත් ගෙන්වා 'රජුට වුවමනා දේ සැපයීම නුඹලාට භාර යි, යුවරජුන්ට හා ඔවුන් ගෙණ එන ඇත් අස් ආදීන්ට නිසි සේ සැලකීම උඹලාට භාර යි, ඔවුන් හැමදෙනාට ඉතා හොඳට කෑම් බීම් පිළියෙල කොට දිය යුතු ය, ඇත්ගොවු අස් ගොවු ආදීහු ද මඬගල උත්සවයට එක් වෙති, ඔවුන්ට ද නිසි සේ සැලකිය යුතු ය' යි විධාන කළෝ ය. 'විශාඛාවන්ගේ විවාහ මඬගලයට ත් ගොස් ඇතුන් අසුන් රකිමින් ම සිට ආවා මුත් අන් කිසිවකට එක් වන්නට ඉඩ නො ලැබුනේ ය' යි කියන්නට ඉඩ නො තබනු පිණිස එසේ විධාන කරණ ලද්දේ ය. ඛනඤ්ජය තෙමේ, ඒ දවස ම කඹුරන් පන්සියයක් ගෙන්වා මහාලතා පසාධන නම් ආභරණය තනවූ" යි ඔවුනට රන්නිකදුහක් හා රිදී, මුතු, මැණික්, පබළු, විදුරු ආදිය දෙවූයේ ය. කොසොල් රජ තෙමේ, නවාතැන ටික දිනක් සිට ඛනඤ්ජය සිටාණන්ට මේ ලියුම යැවී ය.

.....

අලුත් කදවුරේදීය.

කරුණාවෙනී.
මහසිට!

අපි කිහිප දිනක සිට මෙහි නැවතී සිටිමු. වැඩි දවසක් මෙහි නතර ව හිඳීම අපහසු ය. ඔහාට ආවත් ඔබට වැඩි දවසක් අප බලා ගැණීම ද පහසු නො වේ ය යි සිතමි. ඒ නිසා ලදුරිය කැදවා ගෙණ ආ හැකි දවසක් නියම කර දන්වා එවනු.

ඒ වගත් මෙසේ දන්වන්නෝ,

කොසලමහානරෙන්ද්‍රයෝ ය.

ඛනඤ්ජය තෙමේ, ලියුම කියවා බලා එයට පිළිතුරු මෙසේ ලියා යැවී ය.

.....
සාකෙත නුවරදීය

ඉතා යටත් ව දෙපා වැඳ ලියා සැල කරමි.
පින්වත් නරදෙවයන් වහන්ස!

මෙහි එවා වදාළ ලියුම ලැබිනි. මේ වැසිකාලය පටන්ගත් තැනම යි. රැදුවල අතර නොතබා මේ සිවු මස මුළුල්ලෙහි ම එකසේ වැසි වසී. දෙරට පිළට බැස එහා මෙහා යන්නට ඉඩ නොලැබේ. වැස්ස නිසා උතුරුවගේ කටයුතු ඉක්මනට ත් හොඳට ත් කරගැණීම ද අපහසු ය. දෙවයන් වහන්සේගේ බල සෙනඟට කළයුතු සියලු සැලකිලි මට කළ හැකි ය. මම සියලු කටයුතු බලා ගණිමි. මා දැන් වූ විටක මෙහි වඩින සේක්වා. මෙහි ඇති වරදට කමාවනු මැනැවි.

මේ වගට,
යටත්, මෙහෙකරු,
ඛනඤ්ජය.

සියලු සාකෙතනගරය මඟුලශ්‍රියෙන් බබලන්නට වන. සිටු තෙමේ, රජු ප්‍රධාන කොට සිටි ඒ මහාපිරිසට ඇදුම් කැඩුම් කෑම්බීම් සුවඳ මල් පියර ආදී වූ වුවමනා හැම දෙයක් දිනපතා පිළියෙල කොට යවයි. ඔවුහු 'සිටු අපට මෙසේ සතකාර කරති' යි සිතූහ. තුන්මසක් මෙසේ ඉක්ම ගිය ද පලදනාවේ කටයුතු තව ම නොනිමියේ ය.

දවසක් එ ඒ කටයුතුවල යෙදී සිටි ප්‍රධානයෝ සිටානන් කරා ගොස් 'සිටුතුමනි! සැවැත්නුවරින් ආවා වූ මඟුලපිරිසට කළ යුතු සියල්ල මැනැවින් කෙරෙත්නේ ය, ඒ කටයුතුවල කිසින් අඩුවෙක් නැත, බත්පිසීමට දර නම් නොසැහේ ය' යි දැන්වූහ. සිටු තෙමේ ඒ අසා 'එසේ නම් මේ නුවර දිරාගිය ඇත්හල් අස්හල් හා දිරාගිය සියලු ගෙවල් කඩා එහි තිබෙන දර ලී ගෙණ අවුත් බත් පිසවු' යි නියම කෙළේ ය. ඒ දර අඩමසකට පමණ විය. නැවැත ත් 'දර නැතැ' යි බත් පිසන්නෝ කීහ. 'දැන් මේ වේලෙහි දර සපයනු පහසු නොවේ, ඒ නිසා තෙපි ගොස් කොටු ගෙවල් ඇර එහි තිබෙන දළරෙදි ගෙණ පාන්කඩ විලක්කු පන්දම් ඔතා තෙල් සැලිවල බහා තෙල් පොවා ඒවායින් බත් පිසවු' යි කීයේ ය. ඔවුහු එසේ ද කළහ. එද අඩමසකට සෑහින.

සිවු මස මෙලෙසින් ඉක්ම ගියේ ය. පලඳනාවේ වැඩ ද නිමා විය. කපුනූලින් කළ මැසුමෙක් එහි නැත. සියලු මැහුම් කරණ ලද්දේ රිදී නූලෙනි. පලඳනාව හිසැ පැලඳි විට, මුළුසිරුර වැසී දෙපා පිටු තෙක් වැටෙයි. ඒ ඒ තැනැ මුදු සවිකොට ගැට රනින් කරණ ලද්දේ ය. පුඬු රිදියෙන් කරණලද ය. ඒ මුදු, හිස මුදුනෙහි, එකෙක, කන් දෙක මත දෙකෙක, බෙල්ලෙහි එකෙක, දෙඋරෙහි දෙකෙක, වැලමිටි දෙකෙහි දෙකෙක, උකුල් දෙපසෙහි දෙකෙකැ' යි ඒ ඒ තැන සවිකරණ ලද්දේ ය. පලඳනා මුදුනෙහි මොනරරූපයක් කරණලද ය. එහි දකුණුපසැ ගන රනින් කළ පන්සියයක් පියාපත් ය. වම්පසැ පන්සියයක් ය. තුඩ පබලුවෙන් කරණලද්දේ ය. දෙ නෙත් කරණ ලද්දේ ඉඳුනිල් මිණියෙන් ය. බෙල්ල හා පිල් නිමවන ලද්දේත් ඉඳුනිල් මිණි යෙන් ය. පිල්දඬු හා කෙණ්ඩා රුවනින් නිමවන ලද්දේ ය. විශාඛාවන්ගේ ඉස්මුදුනෙහි වූ මේ මොනරරූපය, කඳුමුදුනෙක පිල් විදහා නටන මොනරකුට වඩා කිසිත් වෙනසෙක් නැත. පත්නළ දහසෙහි නාදය දිව්‍යසඞ්ගීතනාදයක් සේ ද පසඟතුරු නදක් සේ ද පවත්නේ ය. එය දුරු සිට බලන්නන්ට පෙණෙනුයේ පණැති මොනරකු සේ ය. ලඟට පැමිණියෝ ම ඌ පණ ඇති මොනරකු නො වනබව දනිති. අගනාකමින් මේ පලඳනාව නවකෙළක් අගනේ ය. ඒ සඳහා කම්කරුවන්ට දුන් කුලිය ම නව ලක්ෂයෙකි. නවකෝටි එක් ලක්ෂයක් වටිනාකම් ඇති මේ පලඳනාව ලැබීමට විශාඛාවන් කළ කුශලකර්මය නම්, කසුප් බුදුරජුන් දවසැ දහසක් භික්ෂූන්ට සිවුරු පිණිස රෙදිපිළි දීම ත් සිවුරු මසා ගැණීමට නූල් ඉදිකටු දීම ත් සිවුරු පොවා ගැණීමට පඬු දීමත් ය. විශාඛාවෝ ඒ පෙර කළ සිවුරු දීමෙහි විපාකයෙන් මේ මේලපලඳනාව ලැබූහ. චීවරදානය හෙතු කොට සත්‍රීන්ට මහා ලතාපසාධනය ලැබීමෙන් කුශලකර්මය මුදුන් පැමිණේ. පිරිමින්ට මුදුන් පැමිණෙනුයේ සෘඩියෙන් පා සිවුරු ලැබීමෙන් ය.

සිටු තෙමේ ඥෝනියන්දැගේ මගුල්ඇඳුමේ කටයුතු නිමාවට ගිය පසු අතරමගැ නවාතැන් ගෙණ හුන් කොසොල්රජුට හා මිගාර සිටුහට සියනිවසට පැමිණෙන ලෙස දන්වා යැවී ය. ඔවුහු සහපිරිවරින් එහි පැමිණියහ. සිටුගෙදරු වැස්සෝ ඔවුන් පිළිගෙණ විශාඛාවන්ගේ විධානය පරිදි ඔවුනට සත්කාර කළහ. සියල්ලෝ මඞ්ගලභොජනයෙන් සන්තර්පිත වූහ. ඉක්බිති සිටු තෙමේ කුල සිරිත් නොයික්මවා සුබමොහොතින් සිය දුවනිය පාවා දී නැවැත දයාදවශයෙන් කහවණු පිර වූ පන්සියයෙක, රන්බඳුන් පැට වූ පන්සියයෙක, රිදීබඳුන් පැට වූ පන්සියයෙක, පටසළු කසීසළුවලින් පිර වූ පන්සියයෙක, ගිතෙල්බඳුනෙන් පිර වූ පන්සියයෙක, හැල්

සහලින් පිර වූ පන්සියෙක, නගුල් හි වැල් කැති උදළු දැකැති ආදී කෘෂිකර්මෝපකරණ පැට වූ පන්සියයෙකැ' යි මෙසේ සියල්ලෙන් ගැල් පන්සියය බැහින් දුන්නේ ය. 'මේ මේ දෙය වුවමනා ය' යි ඒ ඒ දෙය ලබා ගැණීමට මාගේ දුව අනිකැක්හුගේ ගෙට යෑම මට තරම් නො වේ ය' යි සිතා සිටු තෙමේ හැම දෙයක් දුන්නේ ය. තව ද ඒ එක් එක් රියෙහි හොඳට හැඳ පැලඳ ගත් වරඟනන් තුන් තුන් දෙනා බැගින් නංවා පන්සියයක් රිය ද දුන්නේ ය. විශාඛාවන් නාවන්නට ඇයගේ ඉස පීරන්නට ඇයට කවන්නට ඇදුම් ලා සරසන්නට සුවඳ ගල්වන්නට එක් දහස් පන්සියයක් මෙහෙකරු ගැණුන් යැවී ය. 'කිරි කන්නට කිරි දෙන්නු දිය යුතු ය' යි සිතා මෙහෙකරු පිරිමින් කැඳවා 'තෙපි ගොස් කුඩා ගාලක දෙර ඇර එ තැනින් තුන්ගවුවක් තැන් ඉදිරියට ගොස් බෙර තුනක් ගෙණ එහි නැවතී සිටුවු, පළලින් රියන් එක්සිය සතළිසක් තබා දෙපැත්තෙන් සිට ගණිවු, ඉන් ඔබ්බට යෑමට දෙනුන්ට ඉඩ නො දෙවු, ඔය කියූ පෙදෙස දෙනුන්ගෙන් පිරිහිය කල්හි ගාල් දෙර වසා, අතැ තිබෙන බෙර ගසා දන්වාලවූ' යි ඔවුන්ට නියම කෙළේ ය. මෙහෙකරුවෝ, දෙනුන් ගාලින් නික්ම ගව්වක් දුර ගිය තැන, නැවැත අඩයොදුනක් ගිය තැන, තුන් ගව්වක් ගිය තැන බෙර ගැසූහ. දෙ පැත්තේ සිටි මුරකරුවෝ නියම කළ තැනින් ඔබ්බට යෑමට දෙනුන්ට ඉඩ නො දුන්හ. දිගින් තුන්ගවු පමණ වූ ත් පළලින් රියන් එක්සිය සතළිසක් පමණ වූ ත් පෙදෙසෙහි දෙනුන් එකෙකා ඇඟ හැපෙමින් සිටි කල්හි සිටානෝ 'මා දුවට කිරි කන්නට මේ දෙන්නු පමණ වෙති, ගාල් දෙර වසා ලවු' යි ගාල්දෙර වස්වා ලූහ. ගාල්දෙර වැසූ ඇසිල්ලෙහි විශාඛාවන්ගේ පින්බලයෙන් හසිබල ඇති ගොන්නු හා දෙන්නු හා ගාල්දෙර පැන නික්මුනෝ ය. මිනිසුන් වළකත් වළකත් ම සැට දහසක් ගොන්නු ද සැටදහසක් දෙන්නු ද ගාලින් නික්ම අවුත් තුන් ගවු පමණ තැන් පසු කොට වල්පත් උඩ තබා ගෙණ කෙළවර සිට ගත්හ. එහි ශකතිසමපන්න වූ වස්සෝ ඒ දෙනුන්ගේ වෘෂභයෝ වූහ. මේ ගවයෝ මෙසේ ගාල් කඩා පැන ගෙණ දුව ආවෝ පෙර වළකත් වළකත් ම දුන් දනෙක විපාකවෙගයෙනි.

විශාඛාවෝ පෙර කසුප්බුදුරජුන් දවස **කිකී** නම්, රජුගේ දුවනියන් සත්දෙනා අතුරෙහි බාලදුවනියෝ ව උපන්හ. නම **සඞ්ඝදාසී** ය. විසිදහසක් භික්ෂූන්ට කිරි වලඳ වන මේ සඞ්ඝදාසී නොමෝ ලදරු මහණුන් කරා ගොස් අතින් වසා දුන් ඇතැ' යි කියා වළකද්දි ත් 'නෑ නෑ මේ ටික වලඳනු මැනැවි, මේ කිරි ඉතා රසවත් ය. අලුත් කිරිය, ඉතා පිරිසිදු ය, කියමින් පැරැන්ත

කරමින් හොඳට වැලඳෙව්වා ය. මේ ඒ පැරැන්න කරමින් එදා කිරිපැණි වැලඳවීමේ විපාකය යි. වළකනු ලබන්නාවූ ද ගවයෝ ගාල් පැන ආහ. නිතර කිරි වැගිර වූහ.

ධනඤ්ජයසිටාණන් මෙසේ මහත් වසතු රාශියක් දුවට දායාද වශයෙන් දී අවසන් කාල පසු සිටුඇඹේනියෝ සිටාණන් කරා ගොස් 'ඔබ වහන්සේ දුවට සියල්ල පිළියෙල කොට දුන්නහුය, එහෙත් මෙහෙකරු දැසි දස්සන්ට එහි යා යුතු සැටියක් නියම නොකළහුය, ඒ ඇයි දැ' යි ඇසූහ. 'විශාඛාවන් කෙරෙහි සෙනහ ඇත්තන් හා සෙනහ නැත්තන් දැනගණු පිණිස එක එකාට වෙන් වෙන් ව නියම නොකෙළෙමි, සෙනහ ඇත්තන් දුවනිය හා යනු ඇත, සෙනහ නැත්තන් නවතිනු ඇත, නොයන්නන් බෙල්ලෙන් අල්ලා නොයවමි, විශාඛාවන් සමග යනු කැමැත්තෝ යෙත්වා, නොයනු කැමැත්තෝ නොයෙත්වා' යි හෙට නුවර බෙර ලවමි' යි සිටු තෙමේ කී ය.

එදා රෑ ඔහු විශාඛාවන් තමන්ගේ කාමරයතුළට ගෙන්වා ලඟ වාඩි කරවා ගෙණ 'දුව! නුඹ හෙට සිට සවාමිකුලයෙහි වසන්නියකබව සිතා තබා ගත යුතු ය, සවාමිකුලයෙහි වසන ගැහැණියක විසින් දැන ගෙණ රැකිය යුතු වත් පිළිවෙත් බොහෝ ය' යි අවවාද කරන්නට වන. ඒ වේලෙහි මිහාරසිටු තෙමේ ඒ ලඟ කාමරයෙහි හුන්නේ, ධනඤ්ජයසිටු තමන්ගේ දූට දුන් අවවාද යන්ට කන් දුන්නේ ය. ධනඤ්ජය සිටු තෙමේ 'දුව! ඇතුළත වූ ගිනි කිසිදෑකත් පිටතට නොදිය යුතු ය, එසේම පිටත ගිනි ඇතුළට නොගතයුතු ය, දෙන්නහුට ම දියයුතු ය, නොදෙන්නහුට නොදියයුතු ය, දෙන්නහුට ත් නොදෙන්නහුට ත් දියයුතු ය, සුවසේ හිඳිය යුතු ය, සුවසේ කෑ යුතු ය, සුවසේ නිදිය යුතු ය, ගිනි පිදිය යුතු ය, ඇතුළත දෙවියෝ වැඳිය යුතු ය' යි අවවාද කෙළේ ය. මෙසේ අවවාද කොට පසු දා උදැසන හැමදෙනා රැස් කරවා හැම දෙනා ඉදිරියේ දී කෙළෙඹියන් අටදෙනකු ගෙන්වා 'යම් ලෙසකින් මා දුව ගිය තැනක දී ඇයට දෙසෙක් උපන්නේ නම්, තමුසේලා විසින් එය ශුද්ධ කළයුතු ය' යි පොරොන්දු කරවා නවකෙළක් අගනා මහාලතාපසාධනය ඇඟැ ලා දුව සරසා නැවැතත් සඞ්ඝන් පියෝර සුවඳදිය ආදියට සිවුපණස්කෙළක් ධනය දී රියට නංවා සාකොතනුවර අවට පිහිටි අනුරාධපුරය තරම් විශාල වූ තමන්ට අයත් බත්ගම් තුදුසෙහි 'මාගේ දුවනිය හා කැටුව යනු කැමැත්තෝ යෙත්වා' යි අණ බෙර ලැවූයේ ය. එ කෙණෙහි සියලු බත්ගම් වැස්සෝ අණබෙර හඬ අසා 'අපගේ සවාමිදුව

යන කල්හි අපි මෙහි කුමට වසමෝ ද' යි කිසිවකු ඉතිරි නොකොට දුවගෙණවුත් විශාඛාවත් පිරිවරා සිට ගත්හ. සිටු තෙමේ රජුට ත් මිගාර සිටුට ත් අනික් සෙස්සන්ට ත් සතකාර කොට ටික දුරක් පසු ගමන් ගොස් ඔවුන් හා දුව පිටත් කොට පෙරළා සිය නිවසට පැමිණියේ ය.

මිගාරසිටු තෙමේ සියල්ලන්ට පසු ව යානාවකට නැගී යන්නේ ආපසු බලා අතරක් නො මැති ව එන මහසෙනඟ දැක 'මොවුහු කවරහ' යි ඇසී ය. 'මොවුහු නුඹවහන්සේගේ යෙහෙළිනියගේ දූසිදස්කම්කරුවෝ ය' යි කී කල්හි 'හෝ! මෙතෙක් දෙන කුමට යැ' මොවුන්ට කන්නට බොන්නට දියහැක්කේ කාට ද, නවාතැන් දෙනු කෙසේ ද, ඇඳුම් කැඩුම් ආසිත්තම් දෙන්නේ කවරෙක් ද, මුන් තලා පෙලා පන්නා හරිවු' යි අණ කෙළේ ය. විශාඛාවෝ එ කියූ බස් අසා 'සඛාමිනි! එසේ නො වදුල මැනැවි, ඔවුන්ගේ ඊම නො වළක්වනු මැනැවි, එන්නට ඉඩ දුන මැනැවි, උන්ගෙන් ඔබවහන්සේට කරදරයෙක් නො වේ, උන් උන්ගේ බත් වැටුප් උන් උන්ම බලා සොයා ගන්නවා ඇත, ඒ නිසා එසේ නො කළ මැනැවැ' යි කීවාහු ය. 'දුව අපට මුන්ගෙන් වැඩෙක් නැත, මුන් රකින්නෝ කවුරු ද, මුන්ට කෑම් බීම් ඇඳුම් කැඩුම් බුලත් දුම්කොළ ඉදුම් හිටුම් සපයා දෙන්නෝ කවුරු ද' යි කියා වේවැල්කෝටුවලින් තලව තලවා බොහෝ දෙනකු පන්නා හැර ඉතිරි වූ ටික දෙන කටයුතුවලට පමණැ' යි ටික දෙනකුන් ගෙණ සැවැත්නුවර බලා ගියේ ය. සැවැත්නුවර දොරකඩට පැමිණි විශාඛාවෝ 'වැසුනු යානෙක හිඳ නුවරට වදිම් ද, නැත, රියකට නැගී නුවරට ඇතුල් වෙම් ද' යි සිතන්නාහු 'පිළිසන් යානාවකින් යන කල්හි මා හැඳ තිබෙන මේ මේලපලඳනාවෙහි වටිනාකම කිසිවක්හට ත් නො පෙණේ, මෙහි මා දකින්නට කැමැත්තෝ ද බොහෝ ඇත, ඒ නිසා රියකට නැග යෙම්' යි රියකට නැග නුවරට ඇතුල් වූහ. නුවර වැස්සෝ විශාඛාවන්ගේ දෙහොබහා සම්පත්තිය දැක 'මෑ විශාඛාව ලු, පුදුම යි, මෙබඳු සම්පත් සුදුසු මැට ම ය' යි කියන්නට වූහ. විශාඛාවෝ හැම දෙනකුන්ගේ ඇස් තමන් කරා ඇද ගණිමින් මහාපෙරහරින් ගොස් ගෙට වන්හ. මගුලට ගොස් පෙරළා පැමිණි නුවරවැස්සෝ 'ධනඤ්ජය සිටු අප එහි ගිය ගමනේ දී අපට මහත් සතකාර කළැ' යි තමන්ගේ වත් පොහොසත් කම් තරමින් විශාඛාවන් වෙත නොයෙක් පුද පඹුරු යැවූහ. විශාඛාවෝ ඒ පුද පඹුරු 'මෙය අම්මාට, මෙය තාත්තාට, මෙය අය්යාට, මෙය අක්කාට, මෙය මල්ලිට, මෙය නංගීට දෙව' යි උන් උන්ගේ වයසට සුදුසු සේ පියවදත් නැකම් කියමින් ඒ ඒ කුලයන් වෙත යවා

සියලු නුවරවැස්සන් නැයන් වැනි කොට සිත් දිනා ගත්හ. පසුද, පාන්විමට ඉතා ලංව තිබිය දී ආජඤ්ඤ වෙලඹක් තොමෝ පැටවකු ප්‍රසූත කළා ය. විශාඛාවෝ දැසින් සමග පහන් දල්වා ගෙණ එහි ගොස් ඇය උණුදියෙන් නාවා තෙල් ගාලා ආහ.

මිගාරසිටු තෙමේ සියපුතුගේ ආවාහමඬහල දිනයෙහි නගර ශ්‍රමණයන් කෙරෙහි වූ ප්‍රසාදයෙන් 'මාගේ ඉටුදෙවි වූ ආර්‍යියන් වහන්සේ ත් පමුණුවා ආදර සංග්‍රහ කළ යුතු ය' යි සිය ගණන් අලුත් බදුන්වල දිය නොමුසු කිරිබත් පිසවා නගර ශ්‍රමණයන් පන්සියයක් ගෙන්වා වඩා හිඳුවා 'යෙහෙළිය ද මෙහි අවුත් රහතුන් වැඳ පින් සිදුකර ගණිවා' යි විශාඛාවන්ට දන්වා යැවී ය. සොතාපන්නආර්‍යශ්‍රාවිකාවක් වූ විශාඛාවෝ රහත් යන වචනය ඇසූ ඇසිල්ලෙහි මහත් සතුටට පැමිණ එහි ගියෝ, නිවීසත්ව හුන් ඔවුන් දැක ලජ්ජාවට පැමිණ 'රහත්හු මේ අන්දමේ විලිබිය නැත්තෝ ද, කුමක් නිසා මේ විලිබිය නැත්තන් දක්වන්නට මා කැඳවී ද, චී, චී, මේ රහත්හු දැ' යි සිටානන්ට ගරහා පෙරළා තමන් වසන තැනට ආවෝ ය. නගනයෝ එය දැක 'හා! ගැහැවිය! මොක ද මේ කළ නපුරු වැඩේ, අන් යෙහෙළියක සොයා ගත නොහැකි වූවහු ද, ශ්‍රමණගෞතමයාගේ ශ්‍රාවිකාවක වූ මේ කාලකණ්ණි ගැහණිය කුමක් පිණිස ගෙණ ආවහු ද! ඉක්මනට මෑ මේ ගෙයින් පන්නා හරින්න, මොහොතක් වත් මෙහි නවතා ගැණීම සුදුසු නැත, වහා පන්නා හරින්නැ' යි තරයේ කීහ. සිටු තෙමේ 'මෑ මහාකුලදුවක, මොවුන් කීවාට ගෙයින් පන්නා හැරීම නොසුදුසු ය' යි සිතා 'ඕන්වතුන් වහන්ස! ලදරුවෝ තමන් කරණ කියන දෙය දැන ත් නොදැන ත් කරති, කියති, එයට ඔබ වහන්සේලා අමනාප නොවනු මැනැවි, මට කමන්නැ'යි නගනයන් සනසා, යවා, තෙමේ උසසුනෙක හිඳ මගුල්කිරිබත් රන්පිඟානෙක ලා කන්නට පටන් ගත්තේ ය. ඒ වේලෙහි එක් ශ්‍රමණයෙක් පිඬු සිඟා යන්නේ ඒ ගෙට ද පැමිණියේ ය. මාමණ්ඩිට පවත් සලමින් එහි සිටි විශාඛාවෝ පිඬු සිඟා අවුත් දෙරකඩ සිටි තෙරුන් දැක ද ඒ බව නොදන්වා තෙරුන් එහි වැඩ සිටිනබව ඔහුට පෙණෙන ලෙසින් මදක් ඇත් ව සිටියහ. සිටු තෙමේ තෙරුන් දෙරකඩ සිටිනබව දැක ත් නොදැක්කා සේ කර බා හිඳ කිසිත් නොබැණ කිරිබත් කෑයේ ය. එවිට විශාඛාවෝ 'මාගේ මාමණ්ඩි තෙරුන් දැක ත් නොදැක්කා සේ හිඳ කිරිබත් කතී' හි ඉවසිලි නැති ව තෙරුන් දිසාවට හැරී 'සාමීන් වහන්ස! අන් තැනක බලා වඩින්න, මාමණ්ඩි පුරාණය කතී' යි කීවාහු ය. ඒ ඇසූ සිටු තෙමේ දණෙඬන් පහර ලත් නයකු සේ කිපියේ ය. අතැතුබූ කිරිබත්පිඟාන පැත්තක දමා 'පෙණේ ද මෑ, නිගණ්ඨයන්

කියද්දී ත් මෑ ගෙයින් පිට නොං කෙළෙමි, මේ මඞ්ගලඅවස්ථාවේ මං අසුචි, කන්නකු කළ මෑ මෙහි නවතා ගැණීම කොහෙත් ම සුදුසු නැත, වහා ම මෑ මෙතැනින් පන්නා හරිවු' යි ගුගුලේ ය. ගෙයි සිටි සියල්ලෝ විශාඛාවන්ගේ දැසි දස් කම්කරුවෝ ය. ඒ හෙයින් ඇයගේ අතක් පයක් අල්ලන්නකු තබා කට බිම හෙළීමෙහි පොහොසත් එකෙක් වත් එහි නො වී ය. විශාඛාවෝ 'පියාණන් වහන්ස! මම මේ පමණකින් මේ තැනින් පිට ව නො යන්නෙමි, ඒ ගැණ නොං සිතුව මැනැව, ඔබවහන්සේ විසින් තොටුපලෙකින් දිය අදින වැඩකාරියක මෙන් මම ගෙණෙන ලද්දී නොං වෙමි, මාගේ මවුපියෝ තව ම ජීවත් වෙති, මා පිටමං කරණු ලෙහෙසි නැත, මාගේ තාත්තා මා මෙහි පාවා දෙද්දී, මාගේ අතැ යම් වරදෙක් වී නම්, එය සොයා බලා සන්සිඳවීමට කෙළඹියන් අටදෙනකුට මා භාර කොට ඇත, ඔවුන්ට මා භාර කෙළේ නිකමට නොං වේ, එ හෙයින් ඒ කෙළඹියන් ගෙන්වා මාගේ අතැ වරදෙක් තිබේ දැ'යි සොයා බලවන්නැ' යි දැන්වූහ. එවිට සිටු තෙමේ මෑ කියනු යුතු කමෙකැ' යි සිතා කෙළඹියන් ගෙන්වා 'මේ කෙල්ල, මගුල්දවසේ රන්පිහානෙක ලා මා මගුල්කිරිබත් කද්දී 'මෙතෙමේ අසුචි කා' යි කීවා ය, බලන්න! මේ කතාව කොතරම් කැත සැහැසි කතා වක් ද කියා, මෙය විමසා වහාම මෑ මෙ තැනින් පන්නා හරිවු'යි කීයේ ය. 'දුව! මේ කියමන සැබෑදැ' යි ඔවුහු ඇසූහ. විශාඛාවෝ 'මම එසේ නොං කීවෙමි, දැනු ත් නොං කියමි, මම හොඳ කෙල්ලක්' යි කීහ. 'එසේ නම් ඔබ කීයේ කෙසේ දැ' යි ඇසූවිට 'පිණ්ඩපාතයේ යන හාමුදුරු නමක් පිඬු පිණිස මේ ගෙට වැඩ දෙරකඩ සිටියා, තාත්තා ඒ බල බලා කිරිබත් කැවා, මේ ඇවිත් සිටින්නේ කවු ද යන වගක් වත් නැත, ඒ නිසා තාත්තා මේ අත්බවේ දී පින් නොං කොට පෙර කළ පින්කම්වල ඵල අනුභව කරති' යි සිතා හාමුදුරුවන්ට අන් තැනකට වඩින්නට කියා මම තාත්තා පුරුණය කති' යි කීවෙමි, මෙහි ඇති වරදෙක් මට නම් නොං පෙණේ ය' යි විශාඛාවෝ කීහ. 'නෑ, නෑ, එහි කිසි වරදෙක් නෑ, දුව කියා නිබෙන්නේ මුළුමනින් ඇත්ත යි, ඇයට කිපෙන්නේ ඇයි දැ' යි කෙළඹියෝ ඇසූහ. එවිට සිටු තෙමේ 'හා! හොඳයි, එය වරදෙක් නොං වේ ය' යි මම ද පිළිගණිමි, දවසක්, මෑ පුතුට ත් මටත් නොං දන්වා මහරැ මෑගේ දැසි දස්සනුත් එක්කර ගෙණ ගෙයි පිටිපස්සට ගොස් එනු දකින්නට ලැබුනා, එහි වරද නිවරද අසන්නැ' යි කී ය. 'කොහොම ද දුව! එසේ ශියා දැ' යි ඔවුහු ඇසූහ. 'ශියා ඇත්ත යි, ඒ ශියා අනිකක් නිසා නොං වෙමි, මේ ගෙයි ඉන්න වෙළඹ එදා රෑ වැදුවා, ඒ දුක, නොං දුක්කා සේ හිඳීම, නොං සුදුසු නිසා පහන් දල්වා ගෙණ දැසි දස්සනු ත්

කැවිව එහි ගොස් වෙලඹට කළයුතු ඇප උපසථාන කොට ආවා' යි කීවිට 'සිටුතුමනි! මේවා ද වැරදි, මේ ලමයා තමුන්නාන්සේගේ ගෙයි ඉන්නා දුස්සක විසින් වත් නො කරණ වැඩ, ඔබට හිත පිණිස කරණ බව මෙයින් පෙණේ, මෙය වරදක් සේ පිළිගත් එක, ලොකු ම වරදකැ'යි කෙළෙඹියෝ කීහ. එකල සිටු තෙමේ 'මම දැන් එය ද නිවරද ය' යි පිළිගණිමි, මෑගේ පිය වූ ඔනඤ්ජය මෙහි එනදා මෑට අවවාද දෙමින් පුදුම අවවාද දසයක් දුන්නා ඒවායේ අදහස් කිසිවක් යකකුට වත් තේරෙණ ඒවා නො වේ, ඔබතුමාලාට වත් තේරෙන්නේ නම්, ඒ අදහස් මට ත් කියා දෙන්න, ඇතුළත ගිනි පිටත නො දිය යුතු ය, යනු ඔනඤ්ජය, දුවට දුන් මුල් අවවාද ය යි, මේත් අවවාදයෙක් ද, මේ ගෙයි දෙ පැත්තේ අහල පහල ඉන්නා මිනිසුන් ගිනිවිකක් ඉල්ලූ විට එය නො දී ඉන්නට පිළිවත් ද, කාට ද එසේ කළ හැකි' යි කී ය. 'කොහොම ද මේ අවවාදය ගැණ ලමයා කියන්නී' යි බමුණන් ඇසූවිට 'පිය වරුනි! මාගේ තාත්තා ඇතුළත ගිනි පිටත නො දියයුතු ය' යි කීයේ, ඔය මාමණ්ඩි අදහස් කරණ ගින්නක් ගැණ නො වේ, ගෙයි වසන නැන්දා-මාමා-සවාමිපුත්‍රයා යන මොවුන්ගේ වරද දැක ඒ වරද ගෙන් ගෙට ගොස් උන් උන් සමග කතා නො කළ යුතු ය යනු, එහි අදහස ය, ඔවුන්ගේ වරද ගෙන් ගෙට කියා ඇවිද්දා ම එයින් අඩදබර හට ගන්නේ ය, මෙබඳු කතා බලගතු ගිනි වැනි ය, පියවි ගින්නට වඩා මේ ගිනි බිහිසුණු ය, පියවි ගින්න පවත්නේ මිනිසුන්ට හිත පිණිස ය, මේ ගිනි විනාශය පිණිස පවතී, ඒ නිසා මාගේ තාත්තා ඇතුළත ගිනි පිටත නො දියයුතු ය, යි මට කීයේ සැබෑ ය' යි විශාඛාවෝ කියා සිටියාහ. 'මෑගේ පියා කිව්වා පිටතින් ගිනි ඇතුළට ගන්නට එපාය කියා, ඔකත් කළ හැකි වැඩෙක් ද, අපේ ගෙයි දල්වා තිබෙන ගින්න නිවීගියොත් පිටතින් ගිනි ටිකක් ගත්තාට ඇති වරද මොක ද එය වරදකැ යි මට නම් පිළිගත නො හැකි ය' යි සිටානන් කී කල්හි කෙළෙඹියෝ 'ලමයා! තාත්තා එහෙ ම එකක් කීවා ද' යි ඇසූහ. 'ඔව්, කිව්වා, හැබෑ යි, ඔය කියන එකක් නො වෙ යි තාත්තා කිව්වේ, කිව්වේ අහල පහල ගෙවල් ඉන්නා ගෑණු පිරිමි, නැන්දා මාමා-සවාමිපුත්‍රයා යන මොවුන්ගේ දෙස් උඹ ඉදිරියෙහි කියන්නට පිළිවන, එහෙ ම දෙස්කීමක් උඹේ කණට ඇසුනාට ගෙට ඇවිත් අසුවල් ගැණිය, අසුවල් පුරුෂයා, නැන්දා මාමාලා ගැණ දෙස් කියනවා' ය යි නො කිය යුතු බවය කීයේ, නැති අවුල් ඇතිවී ඇති අවුල් වැඩිවී ගේ දොර විනාශ විය හැකි බැවින් මෙය ගින්නක් වැනි නො වේ ද, ඒ නිසාය තාත්තා කිව්වේ, පිටත ගිනි ඇතුළට නො ගතයුතුය කියා, දෙන්නහුට ම

දෙන්නැ සි කීයේ, යම් දෙයක් යම්කිසි ලෙසකින් යමකු ණයට ගත්තොත් ඒ ගත් ණය ගෙණැවිත් දෙන්නක්හට ම ණය දිය යුතුබව ය, ණය ගත් තැනැත්තේ ඒ ගත් ණය නැවැත නොදේ නම්, ඔහුට ණය නොදිය යුතුබව ය, නොදෙන්නහුට නොදිය යුතු ය' සි කීයේ, දෙන්නහුට ත් නොදෙන්නහුට ත් දෙන්නට කීයේ, දිළිඳු නැ මිතුරන් පැමිණ යමක් ඉල්ලූ විට දුන්න ත් නොදුන්නක් දිය යුතුබැවිනි, සැප සේ හිඳිය යුතු ය' සි කීයේ, නැදිමයිල් ආදී වැඩිහිටි තැන් දැක නැගී නොසිටින පරිදි සුදුසු තැනෙක හිඳිනු සඳහා ය, නැදිමයිල් ආදී වූ තමන්ගේ අතින් සැලකිලි ලැබියයුතු තැන්, කා බී අවසන් වූ පසු දැසිදස්සන් ගැණත් සොයා බලා කෑ යුතුබැවින් සැප සේ අනුභව කළයුතු ය' සි කිව්වා, නැන්දෑ මාමා හිමියා යන මොවුනට කලින් නොනිදා, ඔවුනට කළයුතු වත් පිළිවෙත් කොට ගේ දොර බඩුමුට්ටු තැන්පත් කොට තබා. දෙරගුලු ලා නිදියයුතු බැවින් සැප සේ නිදිය යුතු ය' සි කිව්වා. ගිනි පිදිය යුතුය' සි කීයේ, නැන්දෑ මාමා හිමියා යන මේ තිදෙන ගිනිකදු සේ සප්රජුන් සේ සලකා ඔවුනට යටත් ව බිය සුලු ව විසිය යුතුබැවිනි, එසේ ම ඒ තිදෙන දෙවියනැ සි සිතා ගරු සැලකිලි පැවැත්විය යුතු නිසා, ඇතුළත දෙවියෝ වැඳියයුතු ය' සි කිව්වා, මේ මාගේ තාත්තා මට දුන් අවවාදවල තේරුම්' සි විශාඛාවෝ කීහ.

එ වේලෙහි මිගාරසිටු තෙමේ කවින් නොබැණ බිම බලා හුන් වන ම හුන්නේ ය. කෙළෙඹියෝ 'කොහොම ද සිට, තවත් වරද තිබේ ද, මේ ලමයා අතේ තිබෙන වරද නොසඟවා දුන් කිය යුතු ය' සි කී හ. 'වෙන කියයුතු වරදෙක් නැතැ' යි ඔහු කිව්ට 'එසේ නම් කිසිත් වරදක් නැති මේ ලමයා ගෙයින් පන්නා දමන්නට කතා කෙළෙහි දැ' සි ඇසූහ. සිටු තෙමේ නිහඬ විය. 'ගෙයින් පිට වන්නැ සි කී ඇසිල්ලෙහි ම පිටවී යෑම, නොසුදුසු නිසා මම පිටවී නොගියෙමි, මා මෙහෙට පෑවා දෙන දවසෙහි මාගේ අතින් සිදුවන වරද නිවරද සොයා බලන්නට මා ඔබ වහන්සේලාට භාර කළා, දුන් මා අතැ වරදක් නැතිබව ඔබවහන්සේලාට වැටහී ඇත, දුන් ඉතින් මා මේ තැනින් පිට ව යායුතු ය, මෙ තැන ඉදීම මට කරදරයකැ' සි කියා විශාඛාවෝ යානවාහන පිළියෙල කරන්නට මෙහෙකරුවන්ට කීහ. 'ලමයා! මා නොදුන කළ කී දේට මට කමා වන්නැ' සි සිටානන් කී කල්හි 'පියානන් වහන්ස! ඔබවහන්සේගේ කමා කළයුතු වරදෙක් වේ නම්, ඒ හැම එකක් ම කමා කරමි, මම බුදුසසුනෙහි සැදුහැති කුලයකට අයත් කෙල්ලක්මි, බුදුසසුන කෙරෙහි මාගේ පැහැදීම සැලෙන වැනෙන සුලු එකෙක් නොවේ, ඒ නිසා බුඛශ්‍රාවකයන් නොදුක

උන්වහන්සේගෙන් වෙන් ව බණ නො අසා මට මෙහි වසනු බැරි ය, මා යා යුතු ම ය'යි විශාඛාවෝ කීහ. 'ලමයාට වුවමනා බුඩශ්‍රාවකයන් ගෙන්වා ඔවුනට සංග්‍රහ කිරීම නම්, බණ ඇසීම නම් එසේ කළාට මගෙන් වන වරද මොක ද, ලමයාට ඕනෑ ලෙසකින් ඒවා කරන්නැ' යි කී කල්හි 'තාත්තා සඞ්ඝයා වහන්සේ මෙහි වැඩමවා ගැණි මට ත් උන්වහන්සේලාට සංග්‍රහ කිරීමට ත් බණ ඇසීමටත් මට අවසර දේ නම්, මෙහි නවතිමි' යි කියා පසුදා ම සිටුගෙට වැඩම වන්නට බුදුරජානන් වහන්සේට ආරාධනා කළහ. උන්වහන්සේ එහි වැඩියහ. නගන ශ්‍රමණයෝ බුදුරජුන් මිගාරසිටුගෙට වැඩිබව දැන එහි ගොස් සිටුගෙය වට කර සිට ගත්හ. විශාඛා තොමෝ දන් පිළිගන්වා කෑම් බීම් පිළියෙල කොට 'තාත්තා ත් මෙහි අවුත් බුදුරජානන් වහන්සේට දන් පිළිගන්වා සත්කාර කෙරේවා' යි දන්වා යැවූ ය. නග්නයෝ ඒ දැන 'සිටාන! එහි යෑමෙන් ඔබට වැඩෙක් නැතැ'යි සිටානන්ගේ ගමන වළකාලූහ. එවිට සිටු තෙමේ 'දුව ම බුදුරජුන් වලඳවන්නැ' යි කියා දන්වා යැවී ය. වලඳවා අව සන්හි නැවැත ත් 'තාත්තා මෙහි අවුත් බණ අසන්නැ' යි දන්වා යැවූ ය. 'පළමු දැන්වීමෙහි නො ගියත් මේ වර නම් යා යුතු ය' යි බණ අසනු රිසියෙන් පිටත් වූ සිටානන්හට නග්නශ්‍රමණයෝ 'යා යුතුම නම්, ගොස්, තිරයක් බන්දවා එයට මුවා වී හිඳ බණ අසවු' යි කියා තුමූ ම පළමු ව ගොස් එහි තිරයක් බැඳ තැබූහ. සිටු තෙමේ! තිරයට මුවාවී සිටියේ ය. බුදුරජානන් වහන්සේ ඔහු දැක 'සිටාන තෙපි තිර බැඳ තිරයෙන් පිටත හුන්නහු ද, බිත්තියෙන්, ගලෙකින්, සක්වළින් පිටත හුන්නහු ද එය මට කාරියෙක් නො වේ, මම බුදුමි, ඔබට අස්වන්නට බැරිකමෙක් මට නැත, තමුසේ මාගේ තරම නො දන්නහු' යි ගවු සාරසියයක් උස ඇති ගවු එක්දහස් දෙ සියයක් වට ඇති දඹගස සොලවා දඹ වගුරවන එකකු සේ අමාවැසි වස්වන එකකු සේ බණ වදාරන්නට පටන් ගත් සේක. බුදුරජානන් වහන්සේ බණ වදාරන කල්හි ඉදිරි යෙහි සිටියෝ, පසුපස සිටියෝ, සක්වළ සියයක්, සක්වළ දහසක් ඉක්මවා සිටියෝ, අකනිටා බඹතල සිටියෝ, බුදුරජානන් වහන්සේ මා දෙස ම බලති, මට ම බණ වදාරති' යි කියත්. උන්වහන්සේ එකකු බලන්නකු සේ එකකු හා කතා කරන්නකු සේ බලන්න වුන්ට පෙණෙති. බුදුවරයෝ වනාහි සඳට බඳු උපමා ඇත්තෝ ය. අහස්මැද සිටියාවූ සඳ 'මා හිස මතුයෙහි සිටියේ ය, මා මත්තෙහි සිටියේය' යි සියලු දෙනාහට යම් සේ වැටහේ ද, එසේ බුදුවරයෝ කො තැනක සිටිය ත් ඉදිරියෙහි සිටින්නවුන් සේ පෙණෙති, උන්වහන්සේ පිළිබඳ ඒ මේ මහත් ආනුභාවය වනාහි සැරසූ හිස් සිඳ, අඳුන් ගෑ ඇස් උපුටා, පපුමස් ගළවා, අනුන්ට

මෙහෙවර පිණිස ජාලිය වැනි පුතුන්, කණ්හජිනා වැනි දූන්, මද්දියවැනි බිරිඳුන් කිසි ත් කනස්සල්ලක් නැති ව දීමේ විපාකයෙන් උපන්නේ ය.

සිටු තෙමේ බුදුරජානන් වහන්සේගේ විචිත්‍ර වූ ධර්මදේශනාව ඒ මේ අත පෙරළ පෙරළා විමසමින්, තිරයෙන් පිටත හුන්නේ ම දහසක් නයින් යුත් සෝවන්පලයෙහි පිහිටා නො පෙරළෙනු සැදැහ ඇති ව තිසරණයෙහි සෑක නැත්තේ කඩතුරා කොණ ඔසවා ගොස් විශාඛාවන්ගේ තනතුඩ කටින් ගෙණ 'ඔබ අද පටන් මාගේ මැනියෝ ය' යි කියමින් විශාඛාවන් වැළඳ ගත්තේ ය. මිගාරමාතාවෝ යි විශාඛාවෝ ත් එදා පටන් රට පුරා සෑම තැනැ පැතිර ගියහ. ඉන් පසු උපත් පුතාට, මිගාර' යි නම් කළහ. සිටු තෙමේ කටින් ගත් විශාඛාවන්ගේ තනතුඩ හැර ගොස් බුදුරජුන් වෙත වැටී පෙරළී දෙඅල්ලෙන් පා පිරිමදිමින් මුවින් පා සිඹිමින් 'සවාමීනි! මම මිගාර වෙමි, සවාමීනි! මම මිගාර වෙමි, සවාමීනි! මම මිගාර වෙමි, යි තෙවිටක් නම අස්වා 'මම මෙතෙක් කල් කොතැන දුන් දානය මහත් පල දැ යි නො දැන සිටියෙමි, මේ ලමයා නිසා දැන් එය දැන ගතිමි, සියලු අවාඛියෙන් නිදහස් වීමි, මේ ලමයා මෙනි ආවා මට වැඩ පිණිස ය' යි මහත් සතුටින් කිය කියා සිටියේ ය.

විශාඛාවෝ පසුදා ත් දානයට බුදුරජුන්ට ආරාධනා කළහ. එදා නැන්දා සෝවන්පලයට පැමිණියා ය. එතැන් පටන් මිගාර සිටු ගෙය බුදුසසුනට හළ දොර ඇත්තේ විය. සිටු තෙමේ 'මෑ මට බොහෝ උපකාර වූ ය, ඒ හෙයින් මෑ කෙරෙහි මා තුළ ඇති ප්‍රසාදය දැක්විය යුතු ය, මේ, මේලපලදනාව බර වැනි ය, නිතර ඇඟ ලන්නට බැරි ය, ඒ නිසා නිතර ඇඟැ ලෑමට සුදුසු ආභරණයක් කර දිය යුතු ය' යි සිතා ලක්ෂයක් වියදම් කොට 'ඝනමට්ටා' නම් ආභරණයක් කරවා, බුදුපාමොක්මහසඟන පවරා දන් දී සුවඳ දියකළ සොළොසකින් විශාඛාවන් නාවා බුදුරජුන් ඉදිරිපිට දී එය පලඳවා බුදුරජුන්ගේ පා වැන්දේ ය. උන්වහන්සේ අනුමෙවෙනිඛණ වදුරා විහාරයට වැඩි සේක. විශාඛාවෝ ත් දන් ෑ පින්කම් කරමින් බුදුරජුන් වෙනින් අටවරයක් ලබා අහස් තලා වන්‍දලෙඛාව සේ සෑම තන්හි පැතිර ගියාහු ය. ඇට වනාහි පුත්තු දස දෙනෙක් හා දූවරු දස දෙනෙක් වූහ. ඔවුන් හැම එකක් හට දස දස දෙනා බැගින් දූ පුත්තු වූහ. ඔවුන් එක එනා හට ද එසේ ම දස දස දෙනා බැගින් දූ පුත්තු වූහ. විශාඛාවන්ගේ දූ පුත්, මුණුබුරු, මීමුණුබුරු පරපුර අටදහස් සාරසිය විසිදෙනකු ගෙන් පමණ වූයේ ය. අවුරුදු එක්සිය විස්සක් වයස් වූ විශාඛා-

වන්ගේ හිසෙහි පැසුනු හිසකෙස් ගසෙක් නො වී ය. සොළො-සැවිරිදි වයස් ඇත්තියක සේ ම පෙණුනේ ය. දරු මුණුබුරන් පිරිවරා විහාරයට යන විට 'මේ පිරිසෙහි විශාඛාවෝ කවුරු දැ' යි අසන්නෝ නැත. මග බැස යන විට දකින්නෝ 'අපගේ ආය්‍යාව යන විට ම හොබී ය' යි සිතත්. නැවතී සිටින විට දකින්නෝ 'සිටින විට ම හොබී ය' යි සිතත්. හිඳින කල්හි දකින්නෝ හිඳින කල්හි ම හොබී ය' යි ද, නිදන කල්හි දකින්නෝ 'නිදන කල්හි ම හොබී ය' යි ද සිතති. එහෙත් සතර ඉරියවු අතර 'අසුවල් ඉරියව්වේ දී පමණක් හොබී ය' යි වෙන් කොට දක්වන්නට බැරි ය. සතර ඉරියව්වේදී ම විශාඛාවෝ එකසේ හොබිත්. ඇයට ඇතුන් පස්දෙනෙකුගේ බල ඇත්තේ ය. දවසක් රජ තෙමේ 'විශාඛාවන් ඇතුන් පස් දෙනෙකුගේ බල දරතී' යි අසා ඒ විමසනු කැමති ව විහාරයට ගොස් එන විශාඛාවන් ඉදිරියට ඇතකු යැවී ය. ඇතා ද සොඬ ඔසවා ගෙණ විශාඛාවන් ඉදිරියට දිවී ය. එ වේලෙහි පරිවාර සත්‍රීන් අතුරෙහි වූ බොහෝ සත්‍රීහු පැන දිව්වෝ ය. සමහරු එහි ම සිට ගත් හ. 'මොක ද මේ ඇතෙක්' යි විශාඛාවන් ඇසූ විට 'ආය්‍යාවෙනි! ඔබ විමසනු පිණිස රජ තෙමේ ඔබ ඉදිරියට මේ ඇතා එවී ය' යි ඔවුහු කීහ. මූ දැක පැන යෑම මට තරම් නො වේ, මම මූ තදින් අල්ලා ගත්තෙම් නම්, මෙ තැන ම මැරී වැටෙනු එකාන්ත ය, එ හෙයින් එසේ කළ යුතු නො වේ ය' යි සිතා විශාඛාවෝ ඇතුගේ සොඬ ඇඟිලිදෙකකින් අල්ලා පිටතට නැමූහ. ඇතා මොර දෙමින් දුව ගොස් රජගෙදරමිදුලෙහි ඇද වැටුනේ ය. මහාජන තෙමේ සාධුකාර දුන්නේ ය, විශාඛාවෝත් සපිරිවරින් ගෙට ගියහ. ඇයගේ දරුමුණුබුරුපරපුරෙහි හැම දෙන ම නීරොගී වූහ. අභිමඞ්ගලසම්මත ය. අකාලයෙහි මිය ගියා වූ එකෙක් වත් නො වී ය. සැවැත්නුවර වැස්සෝ මඟුල් දිනයන්හි විශාඛාවන් පමුණුවා මඟුල්බත ඉඳුල් කරවති. එක් උත්සව දිනෙක නුවර වැස්සෝ නොයෙක් තරා තිරමේ ඇඳුම් ආයිත්තමෙන් සැරසී බණ අසන්නට ජේතවනවිහාරයට ගියහ. විශාඛාවෝ ත් තමාට පැවරූ ගෙයකින් කෑම කා මේලපලඳනාවත් ඇඟැ ලා ඔවුන් සමග විහාරයට ගොස් පසෙකට වී පලඳනාව ගලවා පොදි බැඳ 'මෙබඳු බරපතලඇඳුමක් ඇඟැ ලා විහාරයට යෑම සුදුසු නො වේ ය' යි දාසියගේ අතට දුන්හ. ඒ දාසිය ද ඇතුන් පස්දෙන-කුන්ගේ තරම් හය්බල ඇත්තියකි. ඈ උපන්නී විශාඛාවන්ගේ පිණෙන්ම ය. ඒ දාසිය ම එය ඔසවනු මිසක් අනිකක්හට ඔසවනු බැරි ය. 'දුව! මා බුදුරජුන් වෙත ගොස් බණ අසා එනතුරු මෙය තබා ගන්නැ' යි කියා මිගාරසිටු කරවා දුන් ඝනමට්ටපලඳනාව පැලඳ බුදුරජුන් වෙත ගොස් බණ අසා අවසන් කොට හුන් තැනින්

නැගී ආහ. දැසිය ද පලඳනාව ගැණ සිහි නොකොට විශාඛාවන් සමග ම නැගී ආවාය. බණ අසා නැගී ගිය පිරිසෙහි යමක්හට යමක් අමතක වී නම් එය සොයා බලා ගෙන්වා තැබීම, අනඳ මහා තෙරුන්ගේ සිරිත බැවින්, එදා ද උන්වහන්සේ බණපිරිස නැගිට ගිය පසු අමතක කොට ගිය බඩු තිබේ දැ'යි සොයා බලන්නෝ, මේ පලඳනාව දුටහ. එවිට බුදුරජුන් කරා ගොස් විශාඛාවන් තම පලඳනා පොදිය අමතක ව තබා ගොස් ඇතිබව උන්වහන්සේට දැන් වූහ. අනඳ! එසේ නම්, එය ගෙන්නවා තබන්නැ'යි උන්වහන්සේ වදාළ සේක. අනඳ තෙරණුවෝ එය උස්සා තරප්පුව පසෙක එල්වා තැබූහ. ඒ වේලෙහි විශාඛාවෝ ත් සුපපියඋපාසිකාවන් සමග ආගනතුක, ගමික, ගිලානාදි භික්ෂූන්ට වුවමනා කුමක් දැ' යි සොයමින් විහාරය තුළ ම ඔබ්මොබ හැසුරුනෝ ය. ඔවුන් විහාරය තුළ එහා මෙහා ඇවිදිනු දැක වෙනදා මෙන් භික්ෂුශ්‍රාමණේරයෝ පාතැටි තලි ආදිය ගෙණ ඉදිරියට අවුත් 'හිතෙල් දෙන්න, මීපැණි දෙන්නැ' යි ඉල්ලූහ. සුපපියාඋපාසිකාවෝ ලෙඩින් නදින් වැහැරී ගිය භික්ෂූ නමක් දැක ලඟට ගොස් ඔබවහන්සේට වුවමනා කුමක් දැ' යි ඇසූහ. 'මස්හොද්දක් වුවමනා ය' යි ඒ රෝගී භික්ෂු නම කී ය. 'හොඳයි, සවාමීනි! මම කෙසේ හෝ එය පිළියෙල් කොට එවන්නෙමි' යි කියා ගිය උපාසිකාවෝ කැපමසක් නොලැබ කලවේ මස් කපා හොද්ද පිළියෙල කොට යැවූහ. බුදුරජානන් වහන්සේ කෙරෙහි වූ බලවත් ප්‍රසාදය හෙතු කොට ඒ වණයෙහි මස් පිරී ගියේ ය. උපාසිකාවෝ සුවපත් වූහ. ආගනතුක, ගමික, ගිලානාදි භික්ෂූන් බලා අවසන් කොට අනික් දෙරකින් පිට වූ විශාඛාවෝ විහාරය අසල සිට 'පලඳනාව ගෙණ එන්න, ඇඟ ලා ගන්නට ය' යි දැසියට කීහ. ඔ තොමෝ එය ගෙණ එන්නට අමතක වූ බව කිවූ ය. 'එසේ නම් එහි ගොසින් එය ගෙණ එව, යම් ලෙසකින් අනඳ මහාතෙරුන් එය කොතැනෙක වත් තබන ලද්දේ නම්, ගෙණ එන්නට එපා, එසේ කොතැනෙක වත් තබන ලද්දේ නම්, මාවිසින් එය උන්වහන්සේට පුදන ලද්දේ වනැ' යි විශාඛාවෝ දැසිය පිටත් කළහ. අනඳ මහා තෙරුන්, බණ අසා යන්නන් අමතක කොට තබා යන බඩුබාහිරාදිය සොයා බලා තැන්පත් කරණබව දන්නා හෙයින් එසේ කීහ. තෙරුන් වහන්සේ ඇදුම්පොදිය සොයා ආ දැසිය දැක 'මොක ද හැරී ආයෙහි' යි ඇසූහ. 'අප ආර්‍යාවගේ ඇදුම් පොදිය අමතකව ගියා, එය ගෙණ යන්නට ආයෙමි' යි ඈ කී විට 'අන්න අනනැ තරප්පුවේ පැත්තක එය තබා ඇති, ගෙණ යන්නැ' යි උන්වහන්සේ කීහ. 'සවාමීනි! එය ගෙණ යන්නට බැරි ය, ඔබවහන්සේගේ ශ්‍රීහස්තයෙන් ස්පර්ශ කරණ ලද්දේ නම්, එය ගෙණ එන්නට එපා ය'යි මට නියම කර තිබේ'යි දැසි තොමෝ එය

නො ගෙණ සිස්අතින් ම ගියා ය. 'කොහොම ද දුවනියනි!'යි ඇසූ විට තොරතුරු සියල්ල දැන් වූ ය. විශාඛාවෝ 'දුව! මාගේ පින්වතුන් වහන්සේ විසින් සපෂී කළ ඇඳුමක් නැවැත මා ඇඟැ ලා ගැණීම හොඳ නැත, එසේ වූ විට මාගේ අදහස, එය උන්වහන්සේට පූජා කළ එකක් සේ ය, එහෙත් මෙයින් උන්වහන්සේට කිසිත් වැඩෙක් නැත, ඒ නිසා මෙය විකොට වුවමනා කැපබඩු ගෙන්වා දියයුතු බැවින් එය ගෙණ එන්නට නැවැත ත් දැසිය යැවූහ. ඈ එහි ගොස් එය ගෙණ ආය. විශාඛාවෝ කඹුරන් ගෙන් වූහ. ඔවුහු 'කෙළින් ම මෙය නව කෝටියක් වටියි, කම්කරුමිල ම ලක්ෂයෙකැ' යි කීහ එවිට විශාඛාවන් ඇඳුම කරත්තයක පටවා 'මෙය ගෙණ ගොස් විකොට මුදල් ගෙණ එවු'යි කී කල්හි ඔවුහු එය ගෙණ නුවර සැමතැන ඇවිද්දේ ය. එහෙත් එය ගන්නට එකෙක් නො වී ය. එය යමකු ගත්ත ද පැලඳීමට සුදුසු පින්ඇති බලගතු ගැණු ලොව නැත. මේ මහපොළොව මතුපිට තුන්දෙනෙක් මය, මෙය ඇඟැ ලැමට සුදුසු සත්‍රීහු සිටියෝ. විශාඛා, මල්ලිකා, බාරාණසී සෙට්ඨිධිතා යන මේ තිදෙන ය ඔවුහු. එ හෙයින් විශාඛාවෝ ම එය මිල දී ගෙණ ඒ මුදල වූ නව කෝටි එක් ලක්ෂයක් රන්මසු මහාගැලෙක ලාගෙණ විහාරයට ගොස් බුදුරජුන් වැඳ 'සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! මා හිමි වූ අනඳ භාමුදුරුවන් දැසිය අමතක කොට ගිය මාගේ ඇඳුම රැකවරණයෙහි තබන ලද්දේ, සියතින් අල්ලනලද ය, දැන් එය මා ඇඟැ ලැම නො සුදුසු ය, එය විකොට ඉන් ලැබෙන මුදලින් සඬ්ඝයා වහන්සේට වුවමනා කැපබඩු ගෙණ දෙන්නට ඕනෑ ය යි සිතා කඹුරන් අතැ එය කඩපලට යැවීමි, ඔවුහු මුළුනුවරැ ඇවිද ගන්නට කෙනෙක් නැතැ' යි ආපසු ආහ, මම ම එය මිල දී ගනිමි, ඒ මුදල් සියල්ල දැන් මෙහි ගෙණැවිත් තිබේ, එයින් සඬ්ඝයාට වුවමනා යමක් ගෙණ ආ හැකි ය, එ හෙයින් කළ යුත්තක් වදුරනු මැනැවැ' යි දන්වා සිටියෝ ය. බුදුරජානන් වහන්සේ 'විශාඛාවෙනි! එසේ නම්, මෙ නුවරැ නැගෙනහිරදෙර සඬ්ඝයාට විසීමට සුදුසු විහාරයක් කරවනු වටී ය' යි වදාළ කල්හි 'එසේය, සවාමීනි!' යි එය මුදුනෙන් පිළිගෙණ නව කෝටියක් දී ඉඩමක් ගෙණ තවත් නව කෝටියක විය දමින් විහාරය කරවන්නට පටන් ගත්හ.

මෙ කල දවසෙක බුදුරජානන් වහන්සේ අලුයම්වේලෙහි ලොව බලා වදුරන සේක් දෙව්ලොවින් චුත ව එම භද්‍රියනුවර සිටු කුලයෙහි උපන් භද්‍රියසිටුපුත්හුගේ හෙතුසම්පත් දැක එදා අනාථ පිණ්ඩිකසිටානන්ගේ ගෙයි දන් වලඳා උතුරුදිසාව බලා වැඩි සේක. උන්වහන්සේ යම් දිනක විශාඛාවන්ගේ ගෙයි දන් වැලඳූ සේක් නම්, එදා දකුණුදෙරින් නික්ම ගොස් දෙව්රම්මහ

වෙහෙර වැඩවාසය කරණ සේක. යම් දවසක අනාථපිණ්ඩිකසිටානන්ගේ ගෙයි දන් වැලඳූ සේක් නම්, එ දින නැගෙනහිරිදෙරින් නික්ම පූර්වාරාමයෙහි වැඩ වසන සේක. යම් දිනෙක උතුරු දෙසට හැරී වඩින සේක් නම්, ඒ දක්නා වූ මනුෂ්‍යයෝ 'උන්වහන්සේ චාරිකාවෙහි වඩින සේකැ' යි දනිති. එදා ද 'උතුරු දෙසට මූණ ලා වැඩි සේකැ' යි ඇසූ විශාඛාවෝ වේගයෙන් ගොස් වැඳ 'මම මෙතෙක් වියදම් කොට බුදුරජානන් වහන්සේ උදෙසා විහාරයක් කරවමි, එ බැවින් චාරිකාවේ නො වැඩ නවතිනු මැනැවැ' යි කීහ. 'විශාඛා! මේ ගමන නතර කළ හැකි ගමනෙක් නො වේ, යායුතු ම ගමනෙකැ' යි වදාළ විට 'යම් කිසි හෙතුසම්පත් ඇත්තකු දැක වඩින සේකැ' යි සිතූ විශාඛාවෝ එසේ නම්, මා විසින් මෙහි කළ නො කළ දෙය සොයා බැලීමට භික්ෂූ නමක් නවතා වඩිනු මැනැවැ' යි කීහ. බුදුරජානන් වහන්සේ 'නිට කැමැති නමකගේ පාත්‍රය ගණුව' යි වදාළ විට විශාඛාවෝ කවදා ත් අනඳ මහාතෙරුන්ට ප්‍රිය කරන ත්, විහාර කර්මාන්තයෙහි වහා නිමාව බලා ශාඝ්‍රිමතුන් අතර අග්‍රෙසර වූ මුගලන් මහාතෙරුන් වහන්සේගේ පාත්‍රය ගත්හ. උන්වහන්සේ බුදුරජුන්ගේ මූණ බැලූහ. බුදුරජානන් වහන්සේ 'මුගලන! තමුසේ පිරිවර ත් සමග නතර වහු' යි වදාළාහු ය. උන්වහන්සේ නතර වූහ. මුගලන් මහාතෙරුන්ගේ අනුභාවයෙන් පහයට ගස් ගල්වැලි ගෙණෙන්නට පණස් සැටයොදුන් දුර සිය කම්කරුවෝ දිග මහතැති ගස් ගල් රැගෙණ එදා ම පෙරළා විහාරයට එති. බරකරන්නවල ගස් ගල් වැලි හුණු පැටවීමේ දී එය ඉතා පහසුවෙන් සිදු වේ. කොතරම් බර නැංවූව ද කරත්තවල අලවංගු නො කැඩේ. නො නැමේ. මෙසේ ඉතාපහසුවෙන් විශාඛාවෝ වැඩි දවස් නො යවා ම දෙමහල් පහයක් කරවූහ. එහි යටමාලේ කාමර පන්සියයකි. උඩමාලේ පන්සියයකි. මෙසේ ඒ මහාපහය කාමර දහසකින් සැදුම් ලද්දේ ය. බුදුරජානන් වහන්සේ තමන් වහන්සේගේ චාරිකාගමන නව මසකින් කොට නිමවා පෙරළා සැවැත්නුවරට වැඩිය සේක. ප්‍රාසාදකර්මාන්තය නවමසක් ගෙවෙත් ම නිමා විය. ප්‍රාසාදකූටය සන කොට තැළූ රනින් ම දියකළ සැටක් ගන්නා පමණට කර වූහ. 'චාරිකාවෙහි ගොස් පෙරළා එන බුදුරජානන් වහන්සේ දෙවිරමට වැඩම කරණ සේකැ' යි අසා විශාඛාවෝ ඉදිරියට ගොස් උන්වහන්සේ තමන්ගේ විහාරයට වැඩමවා ගෙණ අවුත් 'ස්වාමිනි! මේ සාරමස සඞ්ඝයා වහන්සේ සමග මෙහි ම වැඩ හිඳිනු මැනැව, විහාරපූජාමහොත්සවය කරගතයුතු බැවින් මේ සාරමස කො තැනක වත් නො වැඩ මෙහි ම වැඩ හිඳියයුතු ය' යි කියා බුදුරජුන් වෙතින් පොරොන්දු ගෙණ විහාරපූජාමහොත්සවය

පටන් ගත්හ. එ තැන් පටන් හැමදා විශාඛාවෝ සියවෙහෙර බුදු පාමොක් මහසඟනට මහදන් දෙති. නොයෙක් පුදපෙරහැර කරති ඒ අතර විශාඛාවන්ගේ එක් යහළු ගැහැණියක් ලක්ෂයක් වටිනා රෙදිකඩක් ගෙණ අවුත් 'ආර්‍යවෙනි! මේ රෙදිකඩ ඇතිරිල්ලක් කොට බිම එලන්නට තැනක් කියනු මැනැවැ'යි කිවුය. 'එලන්නට තැනක් නැතැ' යි මා කීවොත් ඉඩ දෙන්නට නො කැමැත්තෙන් මෙසේ කියතී' යි සිතෙන බැවින් විශාඛාවෝ 'උඩමාලෙහි හා පහතමාලෙහි කාමර දහස ම සොයා බලා එලන්නට තැනක් තිබේ නම් එලන්නැ' යි කීහ. ඕ තොමෝ තමන් ගෙණ ආවා වූ ලක්ෂයක් අගනා ඒ පලස ත් ගෙණ ඇවිද සොයා බලා තමාගේ පලසට වඩා වටිනාකම අඩු එක ම පලසක් වත් නො දැක 'මට මෙහි පිණක් නො ලැබෙන සේ ය' යි දෙම්නසට පැමිණ පැත්තකට වී අඬමින් සිටියා ය. අනඳ මහාතෙරුන් වහන්සේ ඇය දැක 'කුමක් හෙයින් හඬන්නෙහි දැ' යි අසා කාරණය දැන 'උපාසකම්මා නො අඬා ඉන්න, ඕක එලන්නට ඉතා හොඳ තැනක් මම කියමි' යි කියා පඩි පෙළට ත් පා සෝදන තැනට ත් අතර පාපිස්නක් කොට එලවා 'භික්ෂූන් වහන්සේලා පා සෝදා පළමු කොට ම එහි පා පිසදමා පහයතුළට පිවිසෙති, එවිට තිට අත්වන්නේ මහත් පිණෙකැ' යි කීහ. එ තැන, කිසිවක් නො එලා අත හැරදමා තුබූ තැනෙකි. විශාඛාවෝ වෙහෙරතුළ ම බුදුපාමොක් මහසඟනට දන් දෙමින් පුදපෙරහැර පවත්වමින් සාරමස ගෙවා අවසන් දිනයෙහි සියලු දෙනා වහන්සේට සිවුරු පිණිස වටිනා සළු පිළිගැන් වූහ. ඉතා කුඩා භික්ෂුනම විසින් පවා ලැබූ සළුව දහසක් අගනේ විය. සියලු දෙනා වහන්සේට, පා පුරා බෙහෙත් පිළිගැන්නූහ. මෙසේ දානයට නව කෝටියක් වියදම් කළහ. 'ඉඩම ගැණීමට නව කෝටියක, වෙහෙර කරවීමට නව කෝටියක, විහාරපූජාමහොත්සවයට නව කෝටියකැ' යි විසි හත් කෝටියක් ධනය විශාඛාවෝ බුදුසසුනට පූජා කළහ. මිසදිටුවකුගේ ගේක වෙසෙමින් මෙබඳු මහත් පූජාවක කළ අන් සත්‍රියක් මේ මහපොළොවෙහි නැත.

විශාඛාමහාඋපාසිකාවෝ විහාරපූජාව අවසානදිනයෙහි දරු මුණුබුරන් කැටුව ගොස් 'මා පෙර පැතූ සියල්ල මුදුන් පැමිණි යේ ය' යි තුටුපහටුව පහය වටේ යමින් මිහිරි හඬ නගා මෙසේ කියන්නට වූහ:-

"සුණු මැටි අලෙව් දුන් – පහයක් මෙ මම මනකල්,
වෙහෙර දන් කොට කවදා – දෙම් ද යන සිත් පිරුණේ,

අනේ! මම කවදා – ඇඳ පුටු බිසි ත් කොට්ට ත්,
දෙම් ද සෙනසුන් බඩු කොට – යන මගෙ දහස පිරුණේ,

කසීසළු කොමුපිලි – කපුපිලි සිවුරු දන් කොට,
කවදා දෙම් ද යන මේ – මගේ අදහස පිරුණේ,

ගිතෙල් වෙඩෙරු මී – තෙල් පැණි හකුරු කවදා,
බෙහෙත් දන් කොට දෙම් දෝ' – යන මගෙ දහස පිරුණේ"යි.

මේ උදන්හඬ අසා භික්ෂූන් වහන්සේලා බුදුරජුන් කරා ගොස් 'ස්වාමීනි! අපි මෙතෙක් කල් විශාඛාවන් ගී කියන බවක් නො ඇසූ විරූම්හ, නො දුටු විරූම්හ, අද දරුමුණුබුරන් කැටු ව ගී කියමින් පහස වටේ හැසිරෙති, කිමෙක් ද ස්වාමීනි! ඇගේ පිත කිපි ද, නැත, උමතු වූවෝ දැ' යි ඇසූහ. 'මාගේ දුවනියෝ නො ද ගයති, ඇයගේ අදහස දැන් සම්පූර්ණ ය, ඒ නිසා තමාගේ පැතුම් සියල්ල සම්පූර්ණ ය යි තුටුපහටු ව උදන් අනමින් හැසිරෙති' යි වදාළ සේක. එකල භික්ෂූන් වහන්සේලා 'ඇ කවදා එබඳු පැතුමක් කළා දැ' යි ඇසූහ. 'මහණෙනි! පදුමුත්තර බුදුරජානන් වහන්සේ ලෝ පහළවූවෝ මෙයින් කල්පලක්ෂයකට උඩදී ය, උන්වහන්සේගේ ආයුෂය කල්ප ලක්ෂයෙකි, ලක්ෂයක් රහතුන් වහන්සේලා පිරිවර වූහ, නුවර හංසවතී නම් ය, පියා සුනන්ද රජ ය, මවු සුජාතා ය, උන්වහන්සේට අග්‍රොපස්ථායිකා වූ උපාසිකාවක් අට වරයක් ඉල්වා මවු තනතුරෙහි සිට නිතර උපස්ථාන කර යි, උදය සවස ඒ පිණිස විහාරයට යයි, ඇය සමග හැමදා යෙහෙළියක් ද යයි, ඕ තොමෝ, උපාසිකාව බුදුරජුන් සමග විස්වස් ඇති ව කතා කරණ සැටිත් ප්‍රියමනාපභාවය ත් දැක, බුදුවරුන්ට මෙසේ ප්‍රියමනාප වන්නට කුමක් කළ යුතු දැ' යි සිතා බුදුරජුන් කරා එළැඹ 'මේ උපාසිකාව නුඹවහන්සේට කවුරු නම් වේ දැ' යි ඇසූ ය, මෝ තොමෝ මාගේ අග්‍රුපස්ථායිකා ය' යි උන්වහන්සේ වදාළවිට 'ස්වාමීනි! අග්‍ර උපස්ථායිකාවක වන්නට ඒ පිණිස කුමක් කළ යුතු දැ' යි නැවැත ත් ඇසූ ය, 'ඒ පිණිස කල්පලක්ෂයක් දානශීලාදී වූ පෙරුම් පිරිය යුතු ය' යි උන්වහන්සේ වදාළ සේක, එවිට ද 'දැනුත් එසේ කළ හැකි දැ' යි විවාළා ය, 'පිළිවනැ' යි වදාළ විට ඕ තොමෝ 'එසේ නම් ස්වාමීනි! ලක්ෂයක් භික්ෂූන් වහන්සේලා ත් සමග සත් දවසක් ම මාගේ ගෙයි මාගේ දානය පිළිගණු මැනැවැ' යි ආරාධනා කළා ය, උන්වහන්සේ එය ඉවසූහ, සත් දවසක් දන් දී අවසානදිනයෙහි සිවුරු පිළී පුදා වැඳ බුදුරජුන් පාමුල වැටී 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මම මේ දානයාගේ විපාකයට දිව්‍යසම්පත් ආදී වූ කිසිත් සම්පත්තියක බලාපොරොත්තු නො වෙමි, ඔබ වැනි බුදු රජකෙනකුන් හමුවෙහි වර අටක් ලබා මවුතනතුරෙහි සිට සිවු පසයෙන් උවැටැන් කරන්නියන් අතුරෙහි ප්‍රධාන වන්නට බලාපොරොත්තු වෙමි' යි කියා එසේ වන්නට පැතූ ය, ඉක්බිති

බුදුරජානන් වහන්සේ 'මැගේ මේ පැතීම මුදුන් පැමිණේ ද' යි බලා, දැක 'මෙයින් කල්පලක්ෂයකින් ඔබ්බෙහි ගෞතම නමින් ලෝ පහළ වන බුදුරජුන් ඉදිරියෙහි ඔබ, විශාඛා නම් උපාසිකාවක් වී ඒ බුදුරජුන් ඉදිරියෙහිදී ම අට වරයක් ලබා මවුතන තුරෙහි ද සිට, සිවුපසයෙන් සඟුන්ට උවැටැන් කරණ උපාසිකාවන් අතුරෙහි ප්‍රධාන වන්නහු ය' යි වදාළ සේක, ඇයට මේ සම්පත්තිය අද හෙට ම වහා ලැබිය යුත්තක මෙන් වැටහින, ඕ තොමෝ ආයු ඇති තාක් පින් කොට එයින් චුත ව දෙව්ලොව උපන, මෙසේ එ තැන් සිට දෙව්මිනිසුන් අතර ම සැරිසරන්නී කසුප් බුදුරජුන් දවස කිකී නම් කාසීරජුගේ දූන් සත් දෙනා අතර හැමට බාල ව උපන්නා ය, නම සඛසද්‌සී ය, නිසි වයසැ සරණ ගියා ද අන් සහොදරියන් හා එක් ව බොහෝ කලක් දන් ඇ පින්කම් කොට කසුප්බුදුරජුන් පාමුල දී ද අනාගතයෙහි බුදුකෙනකුන්ගේ මවුතනතුරෙහි සිට සිවුපසය දෙන්නියන් අතර ප්‍රධාන වන්නට ප්‍රාර්‍ථනා කළා ය, එ තැන් සිට ද දෙව්මිනිසුන් අතර ම සම්පත් ඇතිව ම ඉපිද ඉපිද ආවා ය, මේ අත්බවේ දී ඛනඤ්ජය සිටානන්ගේ දූ වූ ය, දැන් මාගේ සසුන්හි බොහෝ පින් කරයි, මෙසේ පිරූ දන් ඇ පෙරුම් ඇති පිණැත්තී වූ මාගේ දුවනියෝ නො ද ගයති, පැතූ ඒ පැතුම් මුදුන්පැමිණීබව දැක උදන් අනති' යි වදාළ සේක. නැවැත ද 'මහණෙනි! දක්ෂ වූ මාලාකාරයෙක් නන්වන් මල්, මහත් රැසක් එකතු කොට නන් වැදුරුම් මල්වඩම් යම් සේ ගොනා ද, එසේ නානාවිධකුශලක්‍රියාකරණයට විශාඛාවන්ගේ සිත නැමේ ය' යි වදාරා මේ ධර්‍මදෙශනාව ද කළ සේක:-

යථාපි පුප්ඵරාසිම්හා කයිරා මාලාගුණෙ බහූ,
එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුන්ති.

දක්ෂ වූ මාලාකාරයෙක් මල් රැසක් එකතු කොට එයින් බොහෝ මල් දම් ගොතන්නේ යම්සේ ද, එසේ උපන් මිනිසා විසින් බොහෝ කුසල් කටයුතු ය.

පුප්ඵරාසිම්හා = මල් රැසකින්.

මෙහි මල්, යි විශෙෂයක් නො කිවා ද ගැණෙන්නේ පැහැයෙන් සුවඳින් සටහනින් සිත් ගන්නා සපු-දුනුකේ-දැසමන්-එරහැදි-කොඳ-හෙල්මැලි-නුවරලා-බෝලිද්ද-සීනිද්ද ආදි මල් ය.

කයිරා = කරන්නේ ය. ගොතන්නේ ය. සාදන්නේ ය.

මාලාගුණෙ බහූ = බොහෝ මල්දම්.

මෙහි **මාලා**ශබ්දය හා එක් ව සිටි **ගුණ**ශබ්දය බඹුනයෙහි වැවේ. බඹුනය නම්, ගෙතුම යි. පටල-රුඹු-ආනිසංස-අප්‍රධාන-ශීලාදිය-ශුකුලාදිවණ්ණ-දුනුදිය ආදී වූ අර්‍ථයන්හි ද ගුණශබ්දය හෙන්නේ ය.

ගන්‍ථිම - ගොපඵිම - වෙඨිම - වෙඨිම - පූරිම - වාසිම යි මල් ගෙතුම් සයෙක් විනයයෙහි දැක් වේ. දණ්ඩෙන් දණ්ඩ හෝ නැව්ටෙන් නැව්ට එක් කොට ගොතන ලද්දේ **ගන්‍ථිම** නම් වේ. එක් පැත්තෙහි හෝ දෙ පැත්තෙහි මල්නටු සිටින සේ ගෙතූ මල්දම් **ගොපඵිම** නම් වේ. එය නූලින් ගොතා කරණු ලැබේ. මූනමල්-මිපුප්-බෝලිද්ද ආදියෙහි නටු, ඉරටු ආදියෙන් විද අවුණා කරණ ලද්දේ **වෙඨිම** නම් වේ. මල්දම් ම එකට වෙළා හෝ කෙඳිවලින් බැඳ කලේ **වෙඨිම** නම් වේ. දිගට ගොතා කළ මල්දම් **පූරිම** යි කියති. මල්දම් කිහිපයක් එකි නෙක හරස් කොට හුයින් බැඳ කලේ **වාසිම** නම් වේ.

"ගන්‍ථිමං ගොපඵිමං නාම වෙඨිමං වෙඨිමම්පි ච,
පූරිමං වාසිමං චෙති ඡබ්බිධා පුප්ඵසඞ්ගහා.

තත්‍ථ දණ්ඩෙන දණ්ඩං වා වණ්ටෙනපි ච වණ්ටකං,
ගන්‍ථිත්වා කරණං සබ්බං ගන්‍ථිමන්ති පවුච්චති.

ගොපඵිමං නාම ගොපෙත්වා සුත්තාදීහි කරියති,
එකතෝ වණ්ටිකාමාලා උභතෝ වණ්ටිකා ච තං.

වෙඨිමං නාම විජ්ඣිත්වා බුන්දෙසු වකුලාදිකං,
ආවුතං සුවිආදීහි මාලාවිකති වුච්චති.

වෙඨිමං නාම වෙඨෙත්වා කතං මාලාගුණෙහි වා,
වාකාදීහි ච බද්ධං වා වෙඨිමන්ති පවුච්චති.

පූරිමං පන දට්ඨබ්බං පුප්ඵමාලාහි පූරණෙ,
බොධිපුප්ඵපටාදීනං පරිකෙඛපෙසු ලබ්භති.

වාසිමං නාම දට්ඨබ්බං පුප්ඵරූපපටාදිසු,
පුප්ඵමාලා ගුණෙහෙව වාසිත්වා කරණෙ පන."

යි **විනය**පාළියෙහි මේ මෙසේ ආයේ ය.

මඤ්ජරික - විධූතික - වටංසක - ආවෙළ - උරච්ඡදයනාදි නම්වලින් හඳුන්වන මල්දම් ද මිනිසුන් අතැ ඇත්තේ ය. මල්, පොකුරු පොකුරු බැඳ කරණ ලද්දේ **මඤ්ජරික** නම් වේ. කටු ඉරටු ආදියෙන් අවුණා කරණ ලද්දේ **විධූතික** නම් වේ.

වටංසකා නම්, මල් වොටුණු ය. මල් කෙම් වැනි කොට කරණ ලද්දේ **ආවෙල** නම් වේ **උරච්ඡද** නම්, මුතුහර වැනි කොට කළ මල්දම් ය.

එවං ජාතෙන මවෙවන = එසේ උපන් මිනිසා විසින්.

නො සුදුසුකාලයෙහි නො සුදුසු තත්ත්වයකින් උපන්නේ උපන් මිනිසා නො වේ. උපන් මිනිසා නම්, අෂ්ටවිධදුෂ්ටක්ෂණයට අසු නො වී මිනිසත් බව ලැබුයේ ම ය.

නරක-තිරශ්චීක්-ප්‍රෙත යන අපාය තුන, ආකාසානඤ්චායතන-විඤ්ඤාණඤ්චායතන- ආකිඤ්චඤ්ඤායතන- නෙවසඤ්ඤානාසඤ්ඤායතන හා අසංඥතල ය, ප්‍රත්‍යන්තදෙශ ය, ඇස්-කන්-නාස්-දිව-සිරුර යන පඤ්චේන්ද්‍රියයන්ගේ විකලත්ව ය, දරුණු වූ මිසදිටු ව, අබුද්ධොත්පාදකාලය යන මේ ය අෂ්ටවිධදුෂ්ටක්ෂණ. මෙසේ කිහ, ඒ:-

'තයෝ අපායා ආරුප්පා - සඤ්ඤං පච්චනුම්මපිච,
පඤ්චින්ද්‍රියානං වෙකල්ලං - මිච්ඡාදිට්ඨි ච දුරුණා.

අපාතුභාවෝ බුද්ධස්ස - සද්ධම්මාමතදෘසිනො,
අට්ඨක්ඛණා අසමයා - ඉති එතෙ පකාසිතා' සි.

නිරයෙහි ඉපිද ඉතාදරුණු කම්කටොලු විඳින්නහුට පින් නො කළහැකි ය. සදහම් ය යන හැඟීමක් නැති නිතර මරණ බියෙන් බියපත් ව වෙසෙන තිරිසන් අපායයෙහි උපන්නහුට පින් නො කළහැකි ය. ප්‍රෙතලොකයෙහි ඉපිද අග්නි-ශොක-සන්තාපයන්ගෙන් වියලි වියලී සා පිපාසා දෙකින් පෙළෙන්නහුට පින් නො කළහැකි ය. අසන්නට කන් නැති හෙයින් දහම් ඇසීමෙන් නොරවුවහුට පින් නො කළහැකි ය. තථාගතශ්‍රාවක යන් නැති අඩම්බහුල වූ පිටිසරපෙදෙස්හි උපන්නහුට පින් කිරීමෙක් නැත. ජාත්‍යන්ධ-ජාතිබධිරතාදිඅඞ්ගවිකලත්වය ඇති නුවණ නැති විපාකාවරණඅහෙතුකප්‍රතිසන්ධියෙන් උපන්නහුට පින් කරණු බැරි ය. දරුණු මිසදිටු ගත් සසර කණුවක් සේ සිටියහුට පින්කරණු බැරි ය. නිවන්මග පාදා දෙන බුදුවරයකුගේ පහළ වීමක් නැති මොහදුරෙන් ගැවසී ගත් කාලයෙහි උපන්නහුට පින් කිරීමෙක් නැත. මේ ඒ කියූ සැටි සි:-

'කාරෙනෙතා කම්මකරණං - නිරයෙ අතිදුරුණං,
භයානකං භුසා ඝොරං - කථං පුඤ්ඤං කරිස්සති?.

සද්ධම්මසඤ්ඤුරහිතෙ - සදා උබ්බිග්ගජීවිතෙ,
තිරච්ඡානභවෙ සතෙතා - කථං පුඤ්ඤං කරිස්සති?.

ගන්ථාන පෙත්තිවිසයං – සන්තාපපරිසොසිතො,
බුජ්ඣිපාසා පරිසසන්තො – කථං පුඤ්ඤං කරිස්සති?.

ආරුප්පාසඤ්ඤලොකෙපි – සවණ්ණායවජ්ජිතෙ,
සද්ධම්මසවණාභිතො – කථං පුඤ්ඤං කරිස්සති?.

අච්චන්තාධම්මබහුලෙ – මුනින්දසුතවජ්ජිතෙ,
පච්චන්තවිසයෙ ජාතො – කථං පුඤ්ඤං කරිස්සති?.

ජලො මූගාදිකො වාපි – විපාකාවරණෙ සිතො,
ගහණෙපායරහිතො – කථං පුඤ්ඤං කරිස්සති?.

පකතිනෙතා පාපිකං දිට්ඨිං – සබ්බථා අනිවත්තියං,
සංසාරබාණුභූතෙහි – කථං පුඤ්ඤං කරිස්සති?.

බුද්ධාදිච්චෙ අනුදිතෙ – සිද්ධිමගාවභාසකෙ,
මොහන්ධකාරෙ වත්තන්තො – කථං පුඤ්ඤං කරිස්සති?' යි.

දුක්ඛ-සමුදය-නිරොධ-මාගී යන සිවු සස්දම් දැනුම ඵලවන විදර්‍ශනා භාවනාදිකුශලයන්ට අවකාශ නො වන බැවින් මොවුහු අක්‍ෂණ' යි දන්නා ලදහ. කීහ එය මෙසේ.-

'යං භාවනාමයං පුඤ්ඤං – සච්චාභිසමයාවහං,
තස්ස නොකාසභාවෙන – එතෙ අක්ඛණසම්මතා' යි.

මෙකී දුෂ්ටක්‍ෂණයන්ට අසු නො වී උපන්නහුට බොහෝ කුසල් කරණු හැකි ය. යමෙක් එසේ පින්කම්හි යෙදී වසන්නේ නම් උපන් මිනිසා ත් හෙතෙමේ ය.

'මරිතබ්බභාවතාය මච්චොති ලද්ධනාමෙන සත්තෙන' යනු **මච්චෙන,** යන්නෙහි අටුවා යි. මැරියයුතු බැවින් සියලු සත්වයෝ මච්ච' නම් වෙති. ධාතුප්‍රත්‍යයවිභාගයෙන් මෙය සියලු සත්වයන් කෙරෙහි වැටෙතුදු හැම සත්වයන් කෙරෙහි පින්කිරීම නො යෙදෙන බැවින් මෙහි බුද්ධොත්පාදයෙහි ඉන්‍ද්‍රියන් ගේ විකලත්වයක් නැති ව නුවණැති ව උපන් මිනිසුන් කෙරෙහි ම යෙදෙන බව සැලකිය යුතු ය.

බුද්ධොත්පාදකාලයෙහ ඉන්‍ද්‍රියන්ගේ විකලත්වයත් නො මැති ව මිනිසත්බව ලැබීම පහසු නො වේ. මිනිසත්බව ලැබීමට හෙතු වූ පින් කිරීම ඉතා අපහසු ය. එහෙයිනි ඒ ලැබීම අපහසු. නිවත් පිණිස පවත්නේ මේ උසස් වූ මිනිසත්බව ම ය. උදුරතර වූ විපාක දෙන ලෞකික කුශලකර්‍ම හා විදර්‍ශනා භාවනා සහිත වූ

ලොකොත්තර කුශලකර්මී ද යන හැම කුශලකර්මයනට භූමි වනුයේ මේ මිනිසත්බව ය. එ හෙයින් ම මිනිසත්බවෙහි මහත්ත්වය දැන ගත යුතු ය.

ඉතා දුලීහ වූ වහා ගෙවී යන දුෂ්ටක්ෂණයන්ගෙන් තොර වූ මේ ක්ෂණසම්පත්තිය ලැබූ කවර නම් නුවණැතියෙක් මකුළුදැල මැද සිටි මදුරුවාගේ ජීවිතය මෙන් ඉතාමඳ වූ මේ ජීවිතයෙහි ද මද රස විඳුම් ඇති ආත්මසාර රහිත වූ දුකට මුල් වූ වහා බිඳී යන මම ය, මාගේ ය' සි නො ගතයුතු වූ සථාවර ජඞ්ගමවස්තූන්හි කෙසේ වත් ඇලේ ද, නො ඇලේ ම ය. නො ඇලිය යුතු ම ය. එ හෙයින් නුවණැති හැමකෙනකුන් විසින් විෂමිශ්‍ර භොජනයක් මෙන් පව්කම් දුරු කොට පින්කම් කිරීමෙහි ම උත්සාහවත් විය යුතු ය.

මෙහිලා පොරණදුරෝ මෙසේ කීහ:-

'අවෙකල්ලමනුස්සත්තං බුද්ධාදිච්චාභිමණ්ඩිතං,
සුදුල්ලභතරං තංහි ඛණෙ නිබ්බනසිද්ධියා.

උදුරඵලදං කම්මං නිබ්බානාවහමෙව ච,
ඉධ සික්ඛති සබ්බන්ති ඤෙය්‍යා එත්ථ මහඤ්ඤතා.

දුල්ලභං අතිපාතං ච ලද්ධා ඨානම්මං බුධෝ,
ජීවිතෙ ජාලමජ්ඣට්ඨ මකසසෙසව අපපකෙ.

අපපස්සාදෙසු භොගෙසු නිස්සාරෙසු පභඞ්ගුසු,
සබ්බදා අසමූලෙසු අසජ්ජනෙතා කථඤ්චන.

ජනෙ ජීවිතුකාමොව විදිතං විසභොජනං,
පාපං සම්පරිවජෙජ්‍යා පුඤ්ඤකම්මරතොසියා' යනු

කත්තබ්බං කුසලං බහුං = බොහෝ කුසල් කළයුතු ය.

ලොභ-දෙෂාදිඅකුශලධර්මයන් තදඞ්ග-විෂ්කම්භන-සමුච්ඡේද යන්ගේ වශයෙන් ඒ ඒ පින්කම් කරණ වේලෙහි දැනවසතු ආදිය අරමුණු කොට කුසල්සිත්වල උපදනා චෙතනාචෛතසිකය කුසල් නම් වේ. තදඞ්ගවශයෙන් ලොභාදීන්ගේ නැසීම වන්නේ කාමාවචරකුසල්සිත්වල යෙදෙන්නා වූ චෙතනාචෛතසිකයෙනි. ලොභාදියට පටහැනි ව උපදින අලොභාදීහු, කුසලාඞ්ගයෝ ය. ඒ එක් එක් කුසලාඞ්ගයකින් ලොභාදිඅකුසලාඞ්ගයන් දුරු කිරීමෙන් කෙලෙසුන්ගෙන් සිතේ මිදීම තදඞ්ග නම්. එය ප්‍රදීපාලොකයෙන් අන්ධකාරය නැසීම වැනි ය. විෂ්කම්භනවශයෙන් ලොභාදීන්ගේ නැසීම වන්නේ රූපාවචර-අරූපාවචරකුසල්සිත්වල යෙදෙන

වෙතනාවෙතසිකයෙනි. ප්‍රථමධ්‍යානාදිය උපදවා ගැන්මෙන් කෙලෙසුන් යට ව ගොස් සිතෙහි ඇති වන සන්සිඳීම් විෂකම්භන නම්. එය දියමතුපිට බැඳුනු දියසෙවෙල් දිය ගන්නාතුරු කල යෙන් ගසා පහ කොට හැරීම මෙනි. සමුච්ඡේදවශයෙන් ලොභාදීන්ගේ නැසීම වන්නේ ලොකොත්තරකුසල්සිත්හි යෙදෙන වෙතනා වෙතසිකයෙනි. චතුර්විධමාගීඤ්ඤනයෙන් ඒ ඒ මග වසා සිටි කෙලෙසුන්ගෙන් සිත මුදා ගැණීම සමුච්ඡේද නම්. එය ගසකට හෙණ වැදීම මෙනි. හෙණ වැදුනු ගසෙහි නැවැත හට ගැණීමක් නැත්තා සේ මාගීඤ්ඤනයෙන් නැසුනු කෙලෙස් නැවැත නො හටගණියි.

'නිණ්ණං භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධා කුලපුත්තෙනා ඛහුං පුඤ්ඤං පසවති. කතමෙසං නිණ්ණං: සද්ධාය භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධා කුලපුත්තෙනා ඛහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධා කුලපුත්තෙනා ඛහුං පුඤ්ඤං පසවති. දක්ඛිණෙය්‍යානං භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධා කුලපුත්තෙනා ඛහුං පුඤ්ඤං පසවති. ඉමෙසං ඛෝ භික්ඛවෙ නිණ්ණං සම්මුඛීභාවා සද්ධා කුලපුත්තෙනා ඛහුං පුඤ්ඤං පසවති'

ශ්‍රද්ධාව හමු වීමෙන් දිය යුතු දනවසතු ලැබීමෙන් දීමට සුදුස්සන් හමු වීමෙන් සැදුහැති කුලපුත්‍ර තෙමේ බොහෝ පින් රැස් කෙරේ යයි මෙයින් දක්වා වදාළ බැවින්,

යමෙක් දනවසතු ප්‍රතිග්‍රාහකාදිසම්පත් ලැබීමෙන් තුටු පහටු ව මතු ඉෂ්ටඵල ලැබේ ය, යන අදහසින් උත්සාහවත් ව දනමය කුසලයක් කෙරේ නම්, දනවසතු ආදිය අරමුණු කොට ඒ වේලෙහි ඔහුට උපදනේ කුසල්සිතෙකි. එහි නොයෙක් වෙතසිකයෝ යෙදෙති. ඉන් ප්‍රධාන වන්නේ වෙතනාවෙතසිකය යි. ඒ කියූ කුසල් සිත ත් එහි යෙදුනු වෙතනාව ත් ඒ හා එක් ව යෙදුනු සපයීාදිධර්ම ත් යන හැම, කුසල් නම් වේ. දන සිල භාවනා යන පුණ්‍යක්‍රියාවසතුන් අරමුණු කොට උපදින සිත් හා ඒ සිත්වල යෙදෙන වෙතනාව ප්‍රධාන කොට අන්‍ය වෙතසික ත් කුසල් ය. කාමාවචරකුසල්සිත්වලට ත් එහි යෙදෙන වෙතසික වලට ත් වඩා රූපාවචර-අරූපාවචර-ලොකොත්තර සිත් හා එහි යෙදෙන වෙතනාදිධර්ම ත් ක්‍රමයෙන් ප්‍රණීත වේ. මෙසේ උපදින සිත්වලින් ලොභ-දෙස-මොහාදී වූ පව් සිනිවිලි නැසී යයි.

කුශලකර්ම රැස්කිරීමේ දී ඒ කරන්නහුගේ කත්තුකම්‍යතා කුසලච්ඡන්ද-විරිය-චිත්ත-වීමංසා යන මොවුහු ලාමක වූවාහු නම්

අඩු ව පැවැත්තෝ නම් ඒ කුසලය හීන වේ. හීන-උත්තම යන අවස්ථා දෙක අතර පැවැති ඡන්දීන්ගේ වශයෙන් මජ්ඣිම වේ. ඡන්දීන්ගේ උපස්බව හෙතු කොට පණ්ඩිත වේ. කුසලච්ඡන්දය අනිමුඛ කොට කළ කුසලය, ඡන්දාධිපතෙය්‍ය' නම්. විරියාධිපතෙය්‍ය, චිත්තාධිපතෙය්‍ය, වීමංසාධිපතෙය්‍ය කුසල් ද එසේ දත යුතුය.

පුප්ඵරාසිශබ්දය යෙදුනේ මල් බොහෝ බව දැක්වීමට ය. මල් ටික වී නම්, මාලාකාරයා දක්ෂයකු වුව ත් මල්දම් බොහෝ කොට ගොතනු බැරි ය. මල්, ටික වී නම් එකල්හි අදක්ෂ වූ මාලාකාරයාහට මල්දම් ගොතන්නට ම බැරිය. දක්ෂ වූ මාලාකාරයාහට මල් බොහෝ ඇති කල්හි බොහෝ මල්දම් ගොතන්නට හැකි ය. එ පරිද්දෙන් යමක්හට ශ්‍රද්ධාව මද ව තිබිය දී ඛනඛාන්‍යාදිවසතු සම්පත්තිය කොතරම් මහත් ව තුබුන ද, ඔහුට පින්කරණු බැරි ය. ශ්‍රද්ධාව මදකල්හි වසතුසම්පත්ත්‍යාදිය ත් මද ව ගියේ නම්, කුසල් කරණු කොහෙත් ම බැරිය. ශ්‍රද්ධාව මහත් ව ඇත ද වසතුසම්පත්ත්‍යාදිය මද වූ කල්හි ද කුසල් නො කළ හැකි ය. යමක්හුගේ ශ්‍රද්ධාව හා භොගයෝ මහත් වෙත් නම්, ඔහුට ය කුසල් කරණු හැකි. විශාඛාවෝ මහත් ශ්‍රද්ධාව ඇත්තෝ ය. භොග ඇත්තෝ ය. භාග්‍යසම්පන්නාය හ. ආර්‍යී ශ්‍රාවිකාවෝ ය. එ හෙයින් විශාඛාවෝ බොහෝ කුසල් කළෝ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූය.

විශාඛාවස්තුව නිමියේ ය.

උඩුසුළඟෙහි යන සුවඳ

4-9

දවසක් විවෙකයෙන් හුන් අනඳ මහතෙරණුවෝ 'බුදුරජානන් වහන්සේ සඳුන් ආදී වූ හරසුවඳ, හිරිවේරිය ආදී වූ මුල්සුවඳ, දැ සමන් ආදී වූ මල්සුවඳ, උතුම් සුවඳ කොට වදාරණ සේක, එහෙත් ඒ සඳුන් ආදී හැම සුවඳ, යටිසුළඟෙහි මුත් උඩුසුළඟෙහි නොයයි, මෙය මා තීරණය කරණු තබා මෙහි ලා බුදුරජානන් වහන්සේගේ තීරණය දැන ගැණීම වඩා හොඳ ය'යි බුදුරජුන් වෙත හියහ. ගොස් වැඳ 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! හරසුවඳ, මුල්සුවඳ, මල්සුවඳ යන මේ තුන් සුවඳ යටිසුළඟෙහි මිසක් උඩුසුළඟෙහි නොයයි, එ හෙයින් යටිසුළඟෙහි යන සුවඳක්, උඩුසුළඟෙහි යන සුවඳක් යටිසුළඟෙහි හා උඩුසුළඟෙහි යන සුවඳක් තිබේදැ'යි ඇසුහ. 'ඔව්, ආනන්ද! තිබේ ය' යි වදාළවිට, ආනන්ද ස්ථවිරයන් වහන්සේ 'ස්වාමීනි! මට එය පහදා දෙනු මැනැවැ'යි ඉල්ලා සිටියහ. එවිට බුදුරජානන් වහන්සේ 'ආනන්ද! ගමෙක හෝ නියම්ගමෙක වසන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් බුදුන් දහම් සඟුන් සරණ ගියේ, සතුන් මැරීම්-හොරකම්කිරීම් – කාමයෙහි වරදවා හැසිරීම් – බොරුකීම් රා අරක්කුබීම් යන පස් පවින් වැළකී සිල්වත් වූයේ යහපත් ගතිගුණ ඇත්තේ, මසුරුමල හැර මුදා ලූ ත්‍යාග ඇති ව දිමෙහි පිරිසිදු වූ අත් ඇති ව ඉල්ලීමෙහි සුදුසු ව තමන්ගේ කොටස පවා බෙදා දී වැළඳීමෙහි ඇලී ගිහිගෙයි වෙසේ ද, එබඳු ගැණුන්ගේ හා පිරිමින්ගේ ඒ උසස් ගුණය, දසදෙසැ වසන හැම මහණ බමුණු කෙනෙක් ම සතුටින් කියති, දෙවියෝ ත් කියති, අසුවල් ස්ත්‍රිය, අසුවල් පුරුෂයා තුන් සරණයෙහි පිහිටා පස්පවින් වැළකී සිල්වත් ව වෙසේ ය, යි ඒ හැම කෙනෙක් ම කියති, ආනන්ද! මෙබන්දගේ ගුණසුවඳ යටිසුළඟ උඩුසුළඟ දෙක්හි ම නිතර පැතිර යේ ය' යි වදාරා මේ ධර්මදේශනාව ද කළ සේක:-

න පුප්ඵගන්ධෝ පටිවාතමෙති න චන්දනං තගරමල්ලිකා වා,
සතං ච ගන්ධෝ පටිවාතමෙති සබ්බා දිසා සප්පුරිසෝ පවාති.

චන්දනං තගරං වා පි උප්පලං අථ වස්සිකි,
එතේසං ගන්ධජාතානං සීලගන්ධෝ අනුත්තරෝති.

මල්සුවඳ උඩුසුළඟෙහි නොයයි. සඳුන් – තුවරලා-බෝලිද්දමල් සුවඳ ත් උඩුසුළඟෙහි නොයයි. සත්පුරුෂයන්ගේ සිල්සුවඳ ම උඩුසුළඟෙහි යයි. සත්පුරුෂ තෙමේ සියලු දිසාවන්හි පැතිරෙයි.

සඳුන් – තුවරලා – උපුල් – දැසමන් යන සුගන්ධද්‍රව්‍යයන්ගේ සුවඳට වඩා සිල්සුවඳ ඉතාඋතුම් වේ.

පුප්ඵගන්ධො = මල්සුවඳ.

හැම සුවඳකට වඩා ලොකයාගේ සිත් පිණ වන්නේ මල් සුවඳ යි. එහෙත් ලොව ඇති තාක් මල්, සුවඳවත් නො වේ. පරසතු – මදාරා–සඳුන්–තුවරලා – බෝලිද්ද – සීනිද්ද–සපු– දුනුකේ– දැසමන්– එරහැඳි–ලොත්–තමාල–කොඳ–යොහොඹු–පුවඟු–සෙපාලිකා ආදී වූ මල් ම සුවඳින් ලොකයාගේ සිත් ඇද ගණියි. සුගන්ධද්‍රව්‍යයන් අතුරෙහි මේ ම ප්‍රධාන වේ. එහෙත් මේ කියූ මල්සුවඳ ත් යනුයේ යටිසුළඟෙහි ය. උඩුසුළඟෙහි නම් ඒ ද නො යයි. තව්තිසාදෙව්ලොව පරසතුරුකෙහි හටගන්නා මල්වල සුවඳ, යොදුන්සියයක් පැතිර ගියේ ද, යන්නේ යටිසුළඟෙහි ය. අනික් මල්සුවඳ ගැණ කුමන කතා ද.

න චන්දනං තගරමලලිකා වා = සඳුන් – තුවරලා – බෝලිද්ද මල් සුවඳ වත් (උඩුසුළඟෙහි නො යයි)

චන්දනං' යි කීයේ රත්සඳුන් ය. සාරගන්ධයන් අතුරෙහි ඒ ම ප්‍රධාන වේ.

සතං ච = සත්පුරුෂයන්ගේ ද.

සන්ත' යනු ප්‍රකෘතිය යි. පූජ්‍ය– විද්‍යමාන– ප්‍රශංසා– සත්‍ය– සත්පුරුෂ– කලාන්ත– ශාන්ත යන අර්ථයන්හි වැටේ. **'සන්තො සපපුරිසා ලොකෙ'** යන මෙහි පූජ්‍යාර්ථයෙහි ආයේ ය. **'පංචිමෙ භික්ඛවෙ! මහාචොරා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං'** යන මෙහි ආයේ, විද්‍යමානාර්ථයෙහි ය. පැසසීමෙහි හුනුයේ **'සන්තො පසත්ථො විනයෙ විසාරදෙ'** යන තැන ය. **'සන්තො හවෙ සබ්භි පවෙදයන්ති'** යනු සත්පුරුෂයන් කෙරෙහි ආ තැන ය. **'දීඝං සන්තස්ස යොජනං'** යනු කලාන්තයෙහි ය. **'සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී'** යන තැන හුනුයේ සන්සිඳීම කිය යි. මෙහි යෙදුනේ සත්පුරුෂයන් කෙරෙහි නැගී සිටියා වූ සන්ත ශබ්දය යි. සම්බන්ධාර්ථය කියන්නටය **සතං'** යි ආයේ. බුදුවරයෝ ය, ප්‍රධාන වශයෙන් සත්පුරුෂයෝ. එ තැන් සිට පසේබුදුවරයෝ, මගපල පසක් කළ අරී සව්වෝ, කලණපුහුදුන් දනෝ, සත්පුරුෂයෝ ය. සතුන්මැරීම් ආදී වූ පව්කම්වලින් වැළකී සිටියෝ ත් සත්පුරුෂයෝ ය. තුමූ පව්කම්වලින් වැළකී අනුනුත් පව්කම්වලින් වළකන්නෝ සත්පුරුෂතරයෝ ය. මෙසේ තුමූ සිල්වත්ව සද්ධා-හිරි-ඔත්තප්ප-සුත-විරිය-සති පඤ්ඤා යන උතුම් ගුණයන්ගෙන් යුක්තවූවෝ අන්‍යයා ත් මෙකී ගුණ ඇත්තවුන්

කෙරෙත් නම්, ඔවුහු ද, සම්මාදිට්ඨි ආදි ආර්‍යමාර්ගයෙහි යන්නෝ අන්‍යයා ත් එහි යවත් නම්, ඔවුහු ද සත්පුරුෂතරයෝ වෙති. **'ඉධ භික්ඛවෙ! සපපුරිසො යො හොති පරස්ස අවණ්ණං තං පුඤ්ඤොපි න පාතුකරොති -පෙ- යො හොති අත්තනොං වණ්ණං තං පුඤ්ඤොපි න පාතුකරොතීති'** මේ අනුව අනුන් පිළිබඳ දෙයක් විවාරණ ලද්දේ ත් නො කියන්නේ, අනුන් පිළිබඳ ගුණය නො විවාරා ම කියනුයේ, තමා පිළිබඳ ගුණය විවාරණ ලදුව ත් නො කියන්නේ සත්පුරුෂ ය යි කියයුතු ය.

කරුණු මැනැවින් සොයා බලා දැන කරුණාවෙන් අගුණ කියන්නේ, කරුණු මැනැවින් තීරණය කොට පසසන්නේ, නො පැහැදියයුතු තැන්හි නො පහදින්නේ, පැහැදියයුතු තැන්හි පහදින්නේ සත්පුරුෂ යි ද කියන ලද්දේ ය. ඉතාසැකෙවින් කිය යුත්තේ නිරවද්‍ය වූ කාය - වාක් - මනසකර්ම ඇත්තහු, සත් පුරුෂයා බවය.

බුදු- පසේබුදු- මහරහතුන් කෙරෙහි නැගෙන සත්පුරුෂ ව්‍යවහාරය හැම අතකින් සාර්ථක වේ. උන්වහන්සේලා ගුණයෙහි පරමකොටියට ගියෝ ය. එහෙයින් ඒ ව්‍යවහාරය කිසිවිටෙක වෙනස් නො වේ. වෙනස් කරවන්නට ද නො හැකි ය. එහි යුක්තිය මේ ය:-

'රාගස්ස සමිතත්තා සන්තො, දොසස්ස සමිතත්තා සන්තො, මොහස්ස සමිතත්තා සන්තො, කොධස්ස-උපනාහස්ස-මක්ඛස්ස පලාසස්ස- ඉස්සාය- මච්ඡරියස්ස- මායාය- සාඨෙය්‍යස්ස-ථම්භස්ස සාරම්භස්ස-මානස්ස-අතිමානස්ස-මදස්ස-පමාදස්ස - සබ්බකිලෙසානං- සබ්බදුච්චරිතානං- සබ්බදරථානං- සබ්බපරිළාහානං- සබ්බසන්තාපානං- සබ්බාකුසලාභිසඞ්ඛාරානං- සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති සන්තො' යි ආගම කියයි.

රාග-ද්වේෂ-මෝහයන් සන්සිඳ වූ හෙයින්, ක්‍රෝධ-බද්ධවෛර-ගුණ මැකීම-තා හා මා අතර කවර වෙසෙසක් දැ යි සැලකීම-අනුන් අයත් සැලකිලි ගරුබුහුමන් නො ඉවසීම - ඊර්ෂ්‍යා කම - රැවටීම - කපටිකම-තදගතිය-කරණ ලද්දට වැඩියකිරීම-තමන් උසස් කොට සැලකීම - මත්වීම-සිහි මුළාබව-ඕයලූ කෙලෙසුන්-සියලු දුසිරිත්-සියලු දරථයන්-සියලු දුඃඛයන්-සියලු සන්තාපයන්-සියලු අකුශල සංස්කාරයන්-සන්සිඳ වූ හෙයින්, දැමූ හෙයින්, නිවූ හෙයින්, පහ කළ හෙයින්, නැවැත නූපදින්නන් කළ හෙයින් සන්ත නම් වෙති යනු පද අනුව ගිය ඉතා කෙටි තේරුම යි.

ගන්ධො = සුවඳ.

මේ පුෂ්පගන්ධ මූලගන්ධාදිගන්ධයෙක් නො වේ. බුඩාදී වූ උතුමන්ගේ ශීලාදිගුණධර්මයන් නිසා පැන නගින්නා වූ කීර්තිගන්ධය යි මේ. ඒ නම් ශීලගන්ධය යි. උන්වහන්සේලාගේ ස්වභාවගන්ධය යි. ස්වභාවය නම් ශීලය යි.

සබ්බා දිසා සපපුරිසො පවාති=සත්පුරුෂ තෙමේ සියලු දිසා වන්හි පැතිරේ.

මෙම ලක්දිව රුහුණුදනව්වෙහි **කලුවැල්මණ්ඩප** නම්, ගමෙක් විය. එහි **මහානාග** නම්, තෙරකෙනෙක් වාසය කළහ. උන්වහන්සේගේ සිල්සුවඳ දඹදිව පුරා ද පැතිර ගියේ ය. පැළලුප් නුවර වැසි බමුණෝ දෙදෙනෙක් උන්වහන්සේ දකිනු කැමැත්තෙන් මෙහි එන්නට ඉන් පිටත් ව ආහ. අතර මග දී ඉන් එකෙක් මළේ ය. අනිකා, නැව් නැගී අවුත් මහතොටට ගොඩ බැස, අනුරාධපුරයට ගොස් කලුවැල්මඩලය පිහිටියේ කොහි දැ යි අසා ගොස් තෙරුන් වසන තැන දැන එහි පැමිණ එ ගමට යාව පිහිටි **සුලුනුවර** නම් ගමෙහි ගේක නවාතැන් ගෙණ එහි දී ම අහර පිළියෙල කොට ගෙණ උදැසන ම තෙරුන් වසන තැනට ගියේ, තෙරුන් දැක වැඳ වැටී 'ස්වාමීනි! ඔබවහන්සේගේ ගුණසුවඳ මුහුදින් එතෙර මුළු දඹදිව සැම තැනැ පැතිර පවතී, මම නුඹ වහන්සේ දකින්නට එහි සිට මෙහි ආමි' යි කියා පිළියෙල කොට ගෙණ ගිය අහර පිළිගන්වා පාසිවුරු සොයා ගෙණ අවුත් එහි ම පැවිදි ව උන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා කිහිප දිනකින් රහත් බවට පැමිණියේ ය.

මෙයින් සත්පුරුෂයාගේ ගුණසුවඳ පැතිරෙණුයේ මිනිසුන් අතර පමණකැ යි නො ගතයුතු ය. දිව්‍ය බ්‍රහ්ම යක්ෂ රාක්ෂස තිරශ්චීනාදී වූ හැම සතුන් අතර ම පැතිර යෙයි. මෙසේ සත්පුරුෂයා සත්ත්වලොකයෙහි හැම තැනැ පැතිරෙණ බැවින් **'සබ්බා දිසා සපපුරිසො පවාති'** යනු වදාළ සේක.

එතෙසං ගන්ධජාතානං = චන්දනාදී වූ මේ ගන්ධද්‍රව්‍යයන් අතුරෙහි.

සීලගන්ධො අනුත්තරො = සීලගන්ධය ඉතාඋතුම් වේ.

සිල්සුවඳ අනික් හැම සුවඳ ම මැඩගෙණ යට කොට ගෙණ පවතී.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

ආනන්ද ස්ථවිරයන්වහන්සේගේ ප්‍රශ්න විචාරීම් වසතුව නිමියේ ය.

පිණ්ඩපාතදායක

4-10

මහාකස්සප මහරහතුන් වහන්සේ සත් දවසක් නිරෝධසමාපත්තියට සමවැද හිඳ සත් දවස ගෙවා ඉන් නැගිට රජගහ නුවර පිඬු සිඟා යමි' යි එහි වැඩිය සේක. එ දවස සක්දෙවිරජුගේ පරිචාරිකා වූ පරවියන්ගේ පා වැනි පා ඇති පන්සියයක් දෙවඟනෝ තෙරුන් දැක 'පිණ්ඩපාතය පිළිගන්වමු' යි කලබල වී බත් වසුන් පන්සියයක් පිළියෙල කර ගෙණ අවුත් අතරමගැ රැක සිට 'සවාමීන් වහන්ස! අපගේ මේ දානය පිළිගණු මැනැවැ, මෙය පිළිගෙණ අපට සංග්‍රහ කරන්නැ' යි අයැද සිටියහ. 'තෙපි යවු, මා යන්නේ දුප්පතුන්ට සංග්‍රහ කරන්ට ය' යි තෙරුන් වදාළ කල්හි 'සවාමීනි! අප නො නසන්න, අපේ මේ දානය පිළිගන්නැ' යි නැවැත ත් ඉල්ලා සිටියහ. ඒ වර ද උන්වහන්සේ උන් වළකාලූහ. එහෙත් ඇලා බැහැර නො ගියහ. තෙරණුවෝ එබව දැක 'තෙපි තමන්ගේ පමණ නො දන්නහු ද, මින් ඉවත්ව යවු' යි ඇඟිලිතුඩු එකතු කොට අසුරක් ගැසූහ. අසුර ගැසූ හඬ අසා බිය පත් වූ ඇලා එහි සිටින්නට අපොහොසත් ව සැලී සැලී දෙව්ලොවට ම පලා ගියහ. සක්දෙවිරජ ඇලා දැක 'තෙපි මෙතෙක් වේලා කොහැනැ ගියහු දැ' යි ඇසී ය. 'අපි සමවතින් නැගී සිටි මහසුප් තෙරුන්ට පිණ්ඩපාතය දෙන්නට ගියෙමු' යි කී කල්හි 'දුන්නු දැ' යි ඇසී ය. උන්වහන්සේ අපෙන් පිණ්ඩපාතය පිළිගන්නට කැමැති නො වූහ' යි එයට පිළිතුරු දුන් විට 'එසේ නම් උන්වහන්සේ කුමක් කීසේක් දැ' යි ඇසී ය. දුප්පතුන්ට සංග්‍රහ කරන්නට ඕනෑ ය' යි කියති' යි කීහ. 'තෙපි කොයි සැටියෙකින් ගියහු දැ' යි සක්දෙවිරජ ඇසී ය. 'දෙවයන් වහන්ස! අපි ගියමෝ මේ සැටියෙන් ම ය, අමුතු ව වෙස්වලා නො ගත්තම්හ' යි කීහ. උන්වහන්සේට පිණ්ඩපාතය දෙන්නට තොපට පිළිවන් කමෙක් නැත, පොඩ්ඩක් ඉන්න, මම දෙන්නම් පිණ්ඩපාත ය' යි සක්දෙවිරජ දත්වැටුණු හිස කෙස් පැසුනු තුනටිය බිඳුනු ඇඟ රැලිවැටුනු කබ කෙල වැහෙන ඉතා මහලූ රෙදිවියන්නකුගේ වෙස් ගෙණ සුජාතා වත් එබඳු මැහැල්ලියක කොට රෙදිවියන්නන් වසන ගෙවල් පෙළක් මවා නුල් දිග් ගස්සමින් එහි සිටියේ ය. මහසුප් තෙරණුවෝ 'දුප්පතුන්ට සංග්‍රහ කරමි'යි නුවර බලා වඩින සේක් නුවරින් පිටතදී ම රෙදිවියන්නන් වසන ඒ කඩපෙළ දැක නුල් දිග් ගසමින් එහි හුන් මහලූ මැහැලියන් දෙදෙන දුටු සේක. ඒ වේලෙහි ශක්‍ර තෙමේ නුල් දිග හරිමින්

හුන්නේ ය. සුජාතා තොමෝ නූල් දණ්ඩ වඩමින් සිටියා ය. තෙරුන්නාන්සේ මොවුන් දැක 'අයියෝ! මෙ තරම් මහලුව ද දිවි රැකුම සඳහා මොවුහු වැඩ කරති, මොවුන්ට වඩා දුප්පතුන් මෙ නුවරැ ඇති විය නො හැකි ය, මොවුන් දෙන කැඳ ටිකක් වේවා, දෙන කොයි දෙයක් නමුත් පිළිගෙණ මුන්ට සංග්‍රහ කරන්නට ඕනෑ ය' යි සිතා ඔවුන්ගේ ගෙ දිහාවට වැඩි සේක. සක්දෙව්රජ, වඩින උන්වහන්සේ දැක 'සොඳුර! මාගේ හාමුදුරුවන් වහන්සේ මෙහි වඩිති, තී උන්වහන්සේ නො දැක්කා සේ බිම බලා හිඳුව, මම කිසි ත් නො හඟවා බත් ටිකක් පිළිගන්වාලමි' යි කී ය. තෙරුන් වහන්සේ එහි වැඩම කොට ගේදොර වැඩ සිටි සේක. ඔවුහු තෙරුන් නො දැක්කවුන් සේ තමන්ගේ වැඩ කරමින් ටිකක් කල් යැවූ හ. ගේඉදිරියෙහි භික්ෂු නමක් සිටින්නා සේ පෙණේ, සොඳුර! ටිකක් සොයා බලව' යි ශක්‍රයා කීවිට 'මට බැහැ, ඔයා ම සොයා බලන්නැ' යි සුජාතාව කිවු ය. ඔහු ඈනුම් හරිමින් මැලිකම් දක්ව දක්වා ගෙන් දොරට බැස තෙරුන් දැක වෙවුල වෙවුලා පසඟ පිහිටුවා වැඳ, දෙ දණට අත් ගසා තතනමින් හති දදා නැගිට කෙලින්වී 'මේ හාමුදුරුවෝ කවුරු දැ' යි කියමින් ටිකක් පස්සට වී 'අනේ! හාමුදුරුවනේ! දැන් අපේ ඇස් බොහො ම ඇඳිරියි, නැගිට ගන්නට අමාරු' යි කියමින් නලළෙහි අත තබා උඩ බලා 'අනේ මට බොහොම දුක යි, මේ මහසුප් හාමුදුරුවෝ නො වෙද් ද, අපේ මේ පැල්දොරට වැඩියෝ බොහො ම කලකින් ය, පිළිගන්වන්නට මොකවත් තිබේ දැ' යි නො දනිමි, කොහොම ද, කොස් දෙල් පලා තම්බපුවා මොකවත් ටිකක් තිබේ දැ' යි සුජාතාවගෙන් ඇසී ය. ඕ තොමෝ ද, තුනටියෙහි අත තබා ගෙණ ලෑටි ලෑටි ව කෙඳිරි ගාමින් 'බත් පොඩ්ඩක් තිබේ ය' යි කිවු ය. එවිට ශක්‍ර තෙමේ 'ස්වාමීනි! රසගුණ හොඳ නරක නො සලකා අපට කරුණා කරන් නැ' යි කීයේ ය. ස්ථවිරයන් වහන්සේ 'දෙන පලා ටිකක් වුවත් ගෙණ මොවුන්ට සංග්‍රහ කරමි' යි පාත්‍රය දුන්හ. එවිට ශක්‍ර තෙමේ ගේතුළට ගොස් 'සටිඹදන' නම් බතක් සැළියෙන් නගා පාත්‍රය පුරවා ගෙණ අවුත් තෙරුන් අතැ තැබී ය. ඒ බත නොයෙක් මාලු පිණියෙන් පිරී පැවැත්තේ ය. එහි සුවද රජගහානුවර මැඩ සිටියේ ය. 'මේ පිණ්ඩපාතය දුන් මිනිහා ඉතාදුප්පතෙකි, පිණ්ඩපාතය නම් දුප්පත් නො වේ, පිණ්ඩපාතයෙන් දුප්පතෙකැ' යි සිතනු බැරි ය, මෙය ශක්‍රයාගේ භොජනයක් වැනි ය, මොහු කවරෙක් දැ'යි සිතා බැලූ ස්ථවිරයන් වහන්සේට ඔහු ශක්‍රයා බව පෙණී ගියේ ය. එවිට උන්වහන්සේ 'තා කළේ ලොකු වරදෙකි, ලොකු අපරාධ යෙකි, දුප්පතුන්ගේ සැපත උදුරා ගැන්ම කොතරම් අයුතු ද, එය දෙවිකමට තබා මිනිස්කමට වත් නො හොබී, අනුන්ගේ දේ පැහැර

ගැන්ම තිරිසන් කමෙකි, දුප්පතාගේ ගුණ නො සලකන්නා තිරිසනාට ත් වඩා පහත් ය, තට නම් යසඉසුරෙන් අඩුවෙක් නැත, එසේ තිබියදී ත් දුප්පතාට ලැබෙන්නට තුබූ යහපත උදුරා ගැණීම මහත් සැහැසි කමෙක් ය, එ හෙයින් ඔබ මහා සාහසිකයෙක්, දුප්පතකු විසින් අද මේ දන දෙන ලද්දේ නම්, ඔහුට සෙනෙවි තනතුරක් හෝ සිටුතනතුරක් ලැබෙනු එකානන්ත ය, තා කළේ දරුණු අපරාධයෙකැ' යි වදාළ සේක. 'ඇයි, සවාමීනි! මෙසේ වදාරන්නෝ මට වඩා දුප්පතෙක් මෙහි සිටී දැ' යි ඔහු කීවිට 'කුමක් නිසා දුප්පත් වූ තෙපි දෙව්ලොව දෙව්සැප විඳිහු දැ' යි විමාළ සේක. 'සවාමීනි! කාරණය නම් එහෙ ම තම යි, බුදු රජුන් ලෝ පහළ වීමට කලින් කළ පිණකින් මම මේ සම්පත්තිය ලැබීමි, බුදුරජුන් ලෝ පහළවූවාට පසු පින් කළ තිදෙනෙක් වූලරථ-මහාරථ අනෙවණ්ණ නමින් දෙව්ලොව ඉපිද සිටිත්, ඒ තිදෙන ම මට වඩා හැම අතකින් ම තෙජවත් ය, ඔවුන් තිදෙනා මා ඉදිරියෙහි නැකැත්කෙළියට, ඇතුල්වීවියට වත් කල්හි මම පැන ගොස් ගෙට වදිමි, ඔවුන්ගේ සරීරයෙන් නික්මෙන තෙජස, මාගේ සරීරය ඔබා ගෙණ යට කොට සිටී යි, මාගේ සිරුරෙන් නික්මෙන තෙජස ඔවුන්ගේ සිරුරු යටපත් කිරීමෙහි අපොහොසත් ය, ඒ නිසා සවාමිනි! මා තරම් දුප්පතෙක් කොතැනැ වේ දැ'යි බලා වදාරන්නැ' යි ශක්‍රයා කී ය. 'දැන් කරන්නට දෙයක් නැත, ඉන්පසු මේ ලෙසට මා රවටා කැඳබන් දෙන්නට සුදුනම් නොවිය යුතු ය' යි වදාළවිට 'එසේ වේවා, පින්වතුන් වහන්සේට දනක් දුන්නොත් එයින් විපාකයෙක් නැද්දැ' යි ඇසී ය. 'ඇතැ' යි උන් වහන්සේ වදාළ සේක. 'එසේ නම් සවාමිනි! එය මාගේ වැඩෙකැ' යි කියා ශක්‍ර තෙමේ තෙරුන් වැඳ සුජාතාවත් ගෙණ තෙරුන් පැදකුණු කොට අහසට නැග

'ගුණෙනි මහමුහුදෙවි – මහසුප් තෙරුන් කෙරෙහි,
බැතියෙන් මෙ මා දුන් දන – මහදනෙකි නොකළැකි තුම්' යි

උදන් අනමින් දෙව්ලොව ගියේ ය. **'එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ -පෙ- ආකාසෙ අනනලිකෙඛ නිකඛිතතුං උදුනං උදුනෙසි'** යනු, එ හෙයින් කියන ලදී.

විහාරයෙහි වැඩ සිටියා වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ එ හඬ අසා 'මහණෙනි! බලවු, සක්දෙව්රජ උදන් අනමින් අධිකතර සන්තොෂයෙන් අහසින් යන සැටි' යි වදාළවිට 'සවාමිනි! මෙසේ ප්‍රීති වාක්‍යය කියමින් අහසින් යෑමට ඔහු කෙළේ කුමක් දැ' යි භික්ෂූන් වහන්සේලා ඇසූහ. 'මාගේ පුත් මහසුප් තැන රවටා

ඒ තැනට පිණ්ඩපාතයක් දී ඉන් ලැබෙන විපාකය මහත්බව දැන ප්‍රීතිවාක්‍යය කියා' යි උන්වහන්සේ වදාළ සේක. 'සඟමීනි! දෙව්ලොව සිටි ශක්‍ර තෙමේ මහසුප් තෙරුන්ට දෙන පිණ්ඩපාත යෙහි විපාක මහත්බව කෙසේ දැන ගත්තේ දැ' යි භික්ෂූන් ඇසූ විට 'මහණෙනි! මා පුතා වැනි වූ පිණ්ඩපාතයෙන් ජීවත්වන්න හුට දෙවියෝ මනුෂ්‍යයෝ යක්ෂරාක්ෂයෝ ප්‍රිය කෙරෙති' යි වදාළ බුදුරජාණන් වහන්සේ ඒ වේලෙහි තමන් වහන්සේ ත් 'තමන් පොෂණය කරණ අතුත් පොෂණය නො කරණ සත්හුත් ඉදුරන් හා කෙලෙස් ඇති සිහි ඇති පිණ්ඩපාතික භික්ෂූනමට නම් දෙවියන් කැමැති වෙති' යන අර්ථවත්,

'පිණ්ඩපාතිකස්ස භික්ඛුනො-අත්තහරස්ස අනඤ්ඤපොසිනො,
දෙවා පිහයන්ති තාදිනො-උපසන්තස්ස සදා සතීමතො' යි

මේ ප්‍රීතිවාක්‍යය වදාළ සේක. නැවැත ද 'මහණෙනි! මා පුතුගේ සිල්සුවදින් මෙහෙයුනු සක්දෙව්රජ තෙමේ ඒ තැන වෙත පැමිණ පිණ්ඩපාතය දී ගියේ ය' යි වදාරා මේ ධර්මදෙශනාව ද කළ සේක:-

අප්පමත්තෙතා අයං ගන්ධො යායං තගරවන්දනී,
යො ච සීලවතං ගන්ධො වාති දෙවෙසු උත්තමොති.

යම් මේ තුවරලා සඳුන් පිළිබඳ සුවදෙක් වේ ද, මේ සුවද සඵලප මාත්‍ර වේ සිල්වතුන්ගේ යම් සිල්සුවදෙක් වේ නම්, එය උතුම් වූයේ දෙව්ලොවෙහි ද හමයි.

අප්පමත්තෙතා = සඵලපමාත්‍ර වේ. ඉතා ම ටිකයි.

පරිත්තපරිමාණෙතා' යනු එහි අටුවා ය. තේරුම, සඵලපමාත්‍ර වේ යනු යි. ඉතා ටිකැ යි කී සේ ය. සඳුන්වල හා තුවරලාවල සුවද ඉතාවැඩි ය යනු අදහයි.

සීලවතං ගන්ධො = සිල්වතුන්ගේ සිල්සුවද.

යමක්හට සිල් ඇත්තේ ද හෙතෙමේ සිල්වත් නමි. ඔහු කෙරෙහි වූ ඒ සීලයම **සීලගන්ධ'** නම් වේ.

සතුන්මැරීම් ආදි වූ පවිකම්වලින් වලකින්නහු හෝ වත්පිළිවෙත් පුරන්නහු පිළිබඳ වෙතනා-චෙතසික-සංවර-අව්‍යතික්‍රම යන මේ, සිල් නම් වේ. **කිං සීලං?** යන ප්‍රශ්නයෙහි ලා දුන් **චෙතනාසීලං, චෙතසිකං සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං,** යන පිළිතුර එය අපට කියාලන්නේය.

එහි වෙතනාසීලය යි කියේ, සතුන්මැරීම් ආ පවිකම්වලින් වලකින්නහුගේ හෝ වත්පිළිවෙත් පුරන්නහුගේ සිත්හි යෙදෙන වෙතනාව ම ය. පවිකම්වලින් වලකින්නහුගේ, වත්පිළිවෙත්

පුරන්නහුගේ ඒ පිළිබඳ සිත, ඒ සිතෙහි යෙදෙන චෙතනාව ප්‍රධාන කොට ඇති ඒ චෙතනාව හා එක් ව උපදින අනික් චෛතසික, මෙහිලා චෙතනාසීලැ යි දතයුතු ය. තව ද ප්‍රාණඝාතාදිය හැර සිටියහුගේ ඒ ප්‍රාණඝාත-අදත්තාදාන කාමමිථ්‍යාචාර මුසාවාද-පිසුණ වචන-ඵරුසවචන-සම්ඵප්පලාප යන සත්වැදෑරූ වූ කම්මපථචෙතනා ද චෙතනාසීලැ යි ගැණේ.

ප්‍රාණඝාතාදියෙන් වලකින්නහුට ඒ වේලෙහි සිතෙහි ඇතිවන සම්මාවාචා – සම්මාකම්මන්ත – සම්මාආජීව යන විරතිචෛතසික තුන, චෛතසිකසීල නම් වේ.

පාතිමොක්ඛ-සති-ඤාණ-ඛන්ති-විරිය යන සංවර පස හා පාපජිරුකකුලපුත්‍රයන්ගේ සමපත්තවිරතිය සංවරසීල නම් වේ.

සමාදන් වූ ශික්ෂාපද, කසින් හා වචනයෙන් නො කඩ කොට රැකීම, අවීතික්කමසීල නම් වේ.

සමාධාන-උපධාරණවශයෙන් සීල' යන්නෙහි අර්ථ දෙකක් ඇත්තේ ය. සුසීල්‍යවශයෙන් (යහපත් බවනිසා) කායකර්මාදීන්ගේ විසිර නො යෑම සමාධාන නම් වේ. ප්‍රතිඥාවශයෙන් කුශල ධර්මයන් දුරීම කුශලකර්මයන්ට ආධාරභාවය උපධාරණ නම් වේ. චෙතනාදිවශයෙන් නන් වැදෑරුම් වූ සීලයෙහි ලක්ෂණය ද සමාධාන උපධාරණවශයෙන් දෙ වැදෑරුම් වූ මේ සීලනය මැ යි.

සීලයෙන් දුශ්ශීලභාවය නැසී යයි. දුශ්ශීලභාවය නැසී යෑම සීලයාගේ රසය යි. හෙවත් සීලයාගේ කෘත්‍යරසය යි. ශීලය ධ්‍යානාදිගුණලාභයට ද කරුණු වේ. සීලයෙහි ඇති ධ්‍යානාදි ගුණදයකත්වය සම්පත්තිරස ය යි කියයුතු ය. සම්පත්තිරසය වන්නේ වැරදි නැති ගුණදහම් ය. කය-වචන-සිත යන තුන් දෙරෙහි පිරිසිදුකම සීලයාගේ ප්‍රත්‍යුපස්ථානය වේ. ලජ්ජා-භය දෙක සීලයට ආසන්නකාරණය වේ. ලජ්ජා භය දෙක ඇති විටම ය සීලය උපදනේ. එ දෙක නැතිවිට ඉපැත්මෙක් ද පැවැත්මෙක් ද නැත.

අවිප්‍රතිසාරාදිගුණලාභය සීලයාගේ ආනිසංස ය යි. භොග ලැබීම-ගුණපැතිරීම-රජුන්කරු එලැඹීම-නො මුළාව කලුරියකිරීම -මරණින් මතු දෙවිලොව ඉපදීම යනාදිය ද සීලයාගේ ආනිසංස යි.

'පංචිමේ ගහපතයෝ! ආනිසංසා සීලවතෝ සීලසම්පදාය. කතමෙ පංච? ඉධ ගහපතයෝ සීලවා සීලසම්පන්නෝ අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති අයං පඨමෝ

ආනිසංසෝ සීලවතෝ සීලසම්පදාය. -පෙ- පුනචපරං ගහපතයෝ සීලවා සීලසම්පන්නෝ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපජ්ජති අයං පඤ්චමෝ ආනිසංසෝ සීලවතෝ සීලසම්පදාය. ඉමේ බෝ ගහපතයෝ! පංච ආනිසංසා සීලවතෝ සීලසම්පදාය' යනු එහිලා දත්තේ ය.

තව ද සබ්‍රහ්මචාරීන්ට ප්‍රියමනාපවීම ආදිකොට ඇති ආස්‍රවයන් නැති කිරීමෙන් ලැබෙන රහත්බව කෙළවර කොට ඇති නොයෙක් අනුසස් සීලයෙන් ලැබේ.

ශාසනාවචරකුලපුත්‍රයන්ට පිහිට වනුයේ සීලය යි. එහි අනුසස් මෙතෙකැ යි නොකිය හැකි ය. යමුනා-ගඞ්ගා ආදී ගඞ්ගා ජලයකින් සත්වයන්ගේ කෙලෙස්මල සෝදලන්නට නොහැකි ය. කෙලෙස්මල සෝදා හැරීමෙන් සත්වයන් පිරිසිදු කරණුයේ සීල නැමැති ජලය යි. සත්වයන්ගේ කෙලෙස්තැවුම් සන්සිදුවනුයේ සීලය යි. මෙඝ-වාත-හරිචන්දනාදීහු එහිලා අපොහොසත් ය. දෙවිලෝ නැගීමට හිණ වනුයේ ත් නිවන්පුර වැදීමට දෙරටු වනුයේ ත් සීලය යි. සිල්අබරණින් සැරසුනෝ ම ලොව බබලති. මුකතාමාණික්‍යාදිආභරණයෙන් සැරසුනවුන්ගේ එබඳු බැබලීමෙක් නැත. ආත්මානුවාදදිභය විනාශ කොට කීර්තියසස් ළඟවනුයේ ද, සියලු ගුණයන්ට මුල් වූයේ ද, සියලු දෙස් නසනුයේ ද සීලය යි.

ශීලනලක්ෂණයෙන් එක් වැදෑරුම් වන සීලය, චාරිත්ත-වාරිත්ත වශයෙන්, ආභිසමාචාරික-ආදිබ්‍රහ්මචරියක වශයෙන්, චිරති අචිරති වශයෙන්, නිස්සිත - අනිස්සිත වශයෙන්, කාලපරියන්ත ආපාණකොටික වශයෙන්, සපරියන්ත - අපරියන්ත වශයෙන්, ලෞකිය-ලෝකුත්තර වශයෙන් දෙ වැදෑරුම් වේ.

හීන-මජ්ඣිම - පණීත වශයෙන්, අත්තාධිපතෙය්‍ය - ලෝකාධිපතෙය්‍ය - ධම්මාධිපතෙය්‍ය වශයෙන්, පරාමට්ඨ - අපරාමට්ඨ - පටිප්පස්සද්ධි වශයෙන්, විසුද්ධ අවිසුද්ධ-වෙමතික වශයෙන්, සෙඛ-අසෙඛ-නෙව සෙඛනාසෙඛ වශයෙන් තෙ වැදෑරුම් වේ.

හානභාගිය - ඨිතිභාගිය - විසෙසභාගිය - නිබ්බෙධභාගිය වශයෙන්, භික්ඛු-භික්ඛුනී-අනුපසම්පන්න-ගහට්ඨ වශයෙන්, පකති-ආචාර-ධම්මතා-පුබ්බහෙතුකවශයෙන්, පාතිමොක්ඛ-ඉන්ද්‍රිය-ආජීව පාරිසුද්ධි-පච්චයසන්නිස්සිත වශයෙන් සිවු වැදෑරුම් වේ.

පරියන්තපාරිසුද්ධි-අපරියන්තපාරිසුද්ධි-පරිපුණ්ණපාරිසුද්ධි - අපරාමට්ඨපාරිසුද්ධි - පටිප්පස්සද්ධිපාරිසුද්ධි වශයෙන්, පහාණ-වෙරමණී-චෙතනා-සංවර-අවීතික්කම වශයෙන් පස් වැදෑරුම් වේ.

මේ මතු කියනු ලබන්නී මෙහි කෙටිකතා යි. සීලයෙහි එක්වැදෑරුම් සැටි කියන ලද්දේ ය. 'මේ දේ කළයුතු ය, යි බුදු රජුන් විසින් පණවා වදාළ සිකපදයන්හි එසේ පිළිපැදීම චාරිත්ත සීලය යි. **'චරනති තස්මිං සීලෙ පරිපූරකාරිතාය පවත්තනතීති= චාරිත්තං'** යන මෙයින් එය පැහැදිලි වේ. 'මේ දේ නො කළ යුතුය, යි ප්‍රතික්ෂෙප කරණලද්දහුගේ නො කිරීම චාරිත්තසීලය යි. **'චාරිතං තායනති රක්ඛනති තෙනාති වා = චාරිත්තං'** යනු එහි අර්ථසමර්ථනය යි. චාරිත්තසීලය ශ්‍රද්ධාවෙන් හා වීර්‍යයෙන් ද චාරිත්තසීලය ශ්‍රද්ධාවෙන් ද සිදුකළ යුතු ය.

උතුම්හැසිරීම අභිසමාචාරය, යි කියනු ලැබේ. අභිසමාචාර ය ම ආභිසමාචාරික නම් වේ. එ නම්, ස්‍රොතාපත්ත්‍යාදිමාර්ගඵල සඞ්ඛ්‍යාතඅභිසමාචාරය අරභයා පණවනලද සීලය යි. ආජීවඪමක සීලයෙන් අන්‍ය වූ සීලයන්ට ආභිසමාචාරික යනු නමෙකි. මාර්ග බ්‍රහ්මචර්‍යයට පෙරටුවෙහි වූයේ ආදිබ්‍රහ්මචරියක නම්. ආජීවඪමක සීලයට මේ නමෙකි. මේ සීලය මාර්ගයට පූර්වභාගයෙහි ම පිරිය යුතු ය. **'පුබ්බෙ ච ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොති'** යනු සූත්‍ර යි. ප්‍රාණඝාතාදිත්‍රිවිධකාය දුශ්චරිත යෙන් හා මුසාවාදාදිචතුර්විධවාග්දුශ්චරිතයෙන් ද මිත්‍ථ්‍යාආජීවයෙන් ද වැළකීම සඳහා සමාදන් වන සීලය, ආජීවඪමකසීල නම් වේ.

තව ද යම් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපද කෙනෙක් වෙත් ද, ඒ හැම ආභිසමාචාරිකසීලයෙහි ඇතුළත් ය. පචිති-දුක්කට-දුබ්භාසිත ශික්ෂාපදව්‍යතික්‍රමණය නො කිරීම, ආභිසමාචාරික සීල ය, යි දත යුතු ය. තවත් චුල්ලවග්ග-මහාවග්ග දෙක්හි ඇතුළත් වූ කඳුවත් පිරීම, ආභිසමාචාරිකසීලය යි. පාරාජිකා-සඞ්ඝාදිසෙසශික්ෂාපද නො කඩ කොට රැකීම, ආදිබ්‍රහ්මචරියක සීලය යි. තවත් ලෙසකින් භික්ඛු-භික්ඛුනීඋභයවිභඞ්ගයෙහි ඇතුළත් වූ සිකපදරැකීම, ආදි බ්‍රහ්මචරියක සීලය යි ගැණේ. 'යම් මහණෙක් ආභිසමාචාරික සීලය නො පුරන්නේ නම්, ඔහු ආදිබ්‍රහ්මචරියකසීලය පුරන් නේ ය, යනු ඒකාන්තයෙන් නො විය හැක්කේ ය. කවදත් ඒ නො වන්නෙකි. මේ එහි දෙශනා ය:- **'සො වත භික්ඛවෙ භික්ඛු ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා ආදිබ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති'** යනු.

ප්‍රාණඝාතාදියෙන් වළකින්නහුට ඒ වේලෙහි පහළවන වීර්‍යවිත්තයෙහි යෙදුන සම්මාවාචා-සම්මාකම්මන්ත-සම්මාආජීව යන විරති තුන, විරතිසීල යි ද, එහි ම උපදින සෙසු චෙතනාදිය අවිරතිසීල යි ද ගැණේ.

තණ්හානිස්සය-දිට්ඨිනිස්සය යි නිස්සය දෙකෙකි. එහි 'මම් දෙවියෙක් හෝ වන්නෙමි, අන්‍යතර දෙවියෙක් හෝ වන්නෙමි යි භවසම්පත්තිය කැමැතිවෙමින් පුරණ සීලය, තණ්හානිස්සිතසීල යි ද 'සීලයෙන් ම ශුද්ධිය වන්නී ය' යි දැක්මෙන් පුරණ සීලය, දිට්ඨි නිස්සිතසීල යි ද දතයුතු ය. මේ නිස්සය දෙකට නො බැඳුනු ඒ හා ගැටීමක් නැති ලෞකික-ලොකොත්තරසීල, අනිස්සිතසීල නම් වේ.

කාලසීමාවක් ඇතිව රකිනු ලබන්නේ කාලපරියන්තසීල යි ද, දිවිහිම් කොට රකිනු ලබන්නේ ආපාණකොටිකසීල යි ද කියනු ලැබේ.

ලාභ- යස- ඤාති අඞ්ග- ජීවිත යන මොවුන් අතුරෙහි යම් කිසිවක් අපෙක්ෂා කොට රකින සීලය, සපරියන්ත නම් වේ. එහි ඇතැම් කෙනෙක් 'ලාභයක් ලබමි' යි ලාභහෙතුවෙන් සිල් සමාදන් වෙති. ලාභය ලත් කල සිල් බිඳලති. තම බලාපොරොත්තුව ඉටු වූ කල්හි සිල් නො රකිති. සිල් රකින්නේ බලාපොරොත්තුව ඉටුවන තෙක් ය. සෙස්ස ද මේ නයින් සැලකිය යුතු ය. මෙබඳු සිල් පිරිසිදු නො වේ. බුද්ධාදිවිඥයන් විසින් නො ද පැසසුනේ ය. සමාධියට හිත නො වේ. නිවන් පිණිස නො පවතී. ලාභාදීන් අතුරෙහි කිසිවක් නො තකා රකින සීලය, අපරියන්ත නම්. ඇතැම් කෙනෙක් තමන් සමාදන්ව රකින සීලය, ලාභාදිය හෙතු කොට බිඳ හැරීමෙහි චින්තාමාත්‍රයකුදු නො කරති. මෙසේ රකින සීලය, සමාධියට හිත වේ. නිවන් පිණිස පවතී.

ආස්‍රවසහිත වූ සීලය, ලොකියසීල නම් වේ. පුහුදුන් විසින් රකින සීලය ලෞකික යි කීසේ ය. ආස්‍රවරහිත වූයේ ලොකුත්තර සීල නම්. සොතාපන්නාදිආර්‍යයන් විසින් රකින සීලය ලොකුත්තර යි කී සේ ය. ලෞකිකශීලය, භවසම්පත් සිදු කරණුයේ භවයෙන් මිදීමට ද කරුණු වේ. ලොකොත්තරශීලය භවනිස්සරණය සිදු කරණුයේ ප්‍රත්‍යවෙක්ෂාඥානයට ද භූමි වේ.

හීන වූ ඡන්ද-චිත්ත-වීර්‍ය්‍ය-ප්‍රඥා යන මෙයින් යුක්ත ව රකිනු ලබනුයේ හීනශීල නම් වේ. මඩ්‍යම වූ ඡන්ද-චිත්ත-වීර්‍ය්‍ය-ප්‍රඥා යන මෙයින් යුක්ත ව රකිනු ලබනුයේ මඩ්‍යමශීල නම් වේ. ප්‍රණීත වූ ඡන්ද-චිත්ත-වීර්‍ය්‍ය-ප්‍රඥා යන මෙයින් යුක්ත ව රකිනු ලබනුයේ ප්‍රණීතශීල නම් වේ.

තව ද කීර්ත්තිය ලබනු කැමැති ව සමාදන්වන ලද්දේ හීන ශීලය යි. පින්පල කැමැති ව සමාදන්වන ලද්දේ මඩ්‍යමශීලය යි. 'මෙය සමාදන් වියයුත්තෙක් ම ය' යි ආර්‍ය්‍යභාවය කැමැති ව

සමාදන්වන ලද්දේ ප්‍රණීතශීලය යි. 'සිල්වත් වූයේ මම ම වෙමි, අන්‍යයෝ දුශ්ශීලයෝ ය, පාපධර්මී ඇත්තෝ ය' යි තමන් උසස් කොට ත් අනුන් පහත් කොට ත් දැක්වීමෙන් රකින සීලය, හීන ය. එබඳු පහත් පව් අදහස්වලින් නො කිලිටි වූ පෘථග්ජනයන්ගේ සීලය, මධ්‍යම ය. ලොකොත්තරශීලය ප්‍රණීත ය. තෘෂ්ණාවශයෙන් භවභොග සම්පත් බලාපොරොත්තුවෙන් හෝ රකින සීලය හීන ය. තමන් පමණක් සසරින් මිදෙනු පිණිස රකින සීලය මධ්‍යම ය. සියලු සතුන් සසරදුකින් මුදනු සඳහා බොධිසත්ත්වයන් විසින් රකින සීලය, ප්‍රණීත ය.

තමාට සුදුසු දේ හැර තමා ම ගුරු කොට ගෙණ හෙවත් මා වැන්නකු විසින් පව්කම්කිරීම නො සුදුසු යැ යි ආත්මගෞරවය උපදවා රකිනු ලබන්න, අත්තාධිපතෙය්‍යසීලය යි. ලොකාපවාදය දුරලනු කැමැත්තෙන් ලොකය ගරු කොට ගත්තහු විසින් රකිනු ලබන්න, ලොකාධිපතෙය්‍යසීලය යි. ධර්මය මහත් අනුභාව ඇත්තෙක, සත්‍යය නිවනට පමුණුවන්නෙක, යනාදීන් ධර්මයෙහි මහත්බවට පුදනු කැමැත්තෙන් ධර්මය ගරු කොට ගත්තහු විසින් රකිනු ලබන්න, ධම්මාධිපතෙය්‍යසීලය යි.

'මම මේ ශීලයෙන් ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ දෙවියෙක් වන්නෙමි' යි තෘෂ්ණාවශයෙන් ද, 'සීලයෙන් ශුද්ධිය වන්නී ය යි දෘෂ්ටිවශයෙන් ද, අල්ලා ගන්නා ලද්ද, පරාමර්ශසීලය යි. කල්‍යාණපෘථග්ජනයා විසින් සොතාපත්තිආදිමාර්ගීයන් ලැබීමට සමාදන් වන සීලය ද සප්පාශෛක්ෂයන්ගේ මාර්ගචිත්තයන්හි යෙදෙන විරතිචෙතනා දිය ද තෘෂ්ණා දෘෂ්ටීන් විසින් නො ගන්නා ලද්දේ අපරාමර්ශසීලය යි. ශෛක්ෂයන්ගේ හා අශෛක්ෂයන්ගේ ඵලසිත් හා යෙදෙන විරති චෛතසික කෙලෙස් විඳා සන්සිඳු වන්නේ පටිප්පස්සද්ධිසීලය' යි.

කිසිත් ඇවැතකට නො පැමිණ රකින සීලය ද, ඇවැත්වලට පැමිණියේ ද පැමිණි ඒ ඇවැත් දෙසා ගැණීම් ආදී වශයෙන් පිළියම් කළ සීලය ද, විසුද්ධසීලය යි. වත්ථු-ආපත්ති-අජ්ඣාචාර යන මෙහි විමති ඇත්තහුගේ සීලය, වෙමතික නම්. මස් ලැබ මේ වැලඳිය යුතු ද, නො වැලඳිය යුතු දැ යි යන සැකය, වත්ථු විමතිය යි. තමා පැමිණි ඇවැත කිමැ යි උපදනා සැකය, ආපත්ති විමතිය යි. ඇවැතට පැමිණියෙම් ද, නො පැමිණියෙම් දැ යි වන සැකය, අජ්ඣාචාරවිමතිය යි. වෙමතිකයෙහි විනයධරයන් විචාරා විමතිය දුරු කරගත යුතු ය. එවිට ඔහුට සැප පිණිස වන්නේය එය.

සෙඛසීල නම්, චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයන් හා ත්‍රිවිධශ්‍රාමණ්‍ය ඵල යන් හා යෙදුනු විරතිචෙතනාදිය යි. අසෙඛසීල නම්, රහතුන් වහන්සේගේ ඵලචිත්තයන් හා යෙදුනු විරතිචෙතනාදිය යි. නෙව සෙඛනාසෙඛසීල නම්, පෘථග්ජනයන්ගේ සීලය යි.

යම් අඥානයෙක් දුශ්ශීලයන් සෙවනය කරණුයේ සිල්වතුන් සෙවනය නො කෙරේ ද, වරදෙහි දොස් නො දක්නේ වැරදි අදහස් බහුල කොට ඇත්තේ ද, ඉන්ද්‍රියසංවරයෙක් නැත්තේ නො හික්මුනේ ද, ඔහුගේ සීලය, හානභාගීය නම් වේ. පිරිහීම් කොටසෙහි සිටි සීලය යි කී සේ ය. යමෙක් තමන් සමාදන් වූ සීලසම්පත්තියෙන් තුටු පහටු වූයේ කර්මස්ථානානුයොගයෙහි චින්තා මාත්‍රයකු ත් නො උපදවා ද, එසේ තමන් සමාදන් වූ ශීලමාත්‍ර යෙන් සතුටු ව මත්තෙහි විශෙෂාධිගමයක් පිණිස වීර්‍ය්‍යය නො කරන්නහුගේ සීලය, ඨිතිභාගීය නම් වේ. පිරිහීම් වැඩීම් දෙකට නො වැටී සිටි සීලය යි කී සේ ය. යමෙක් සීලසම්පත්ත ව සමාධිය පිණිස වීර්‍ය්‍ය කෙරේ ද, ඔහුගේ සීලය, විසෙසභාගීය නම් වේ. යමෙක් ශීලමාත්‍රයෙන් සතුටට නො පැමිණ විදර්ශනාවෙහි යෙදුනේ වේ ද, ඔහුගේ සීලය, නිබ්බෙධභාගීය නම් වේ.

භික්ෂූන් උදෙසා පණවන ලද ශික්ෂාපද හා භික්ෂුකීන් උදෙසා පැණ වූ ශික්ෂාපද අතුරෙහි භික්ෂූන්ට ද සාධාරණ සේ පැණ වූ ශික්ෂාපද, භික්ඛුසීල නම් වේ. භික්ෂුකීන් උදෙසා පණවන ලද ශික්ෂාපද හා භික්ෂූන් උදෙසා පැණ වූ ශික්ෂාපද අතුරෙහි භික්ෂුකීන්ට ද සාධාරණ සේ පැණ වූ ශික්ෂාපද, භික්ඛුනීසීල නම් වේ. සාමණේර – සාමණේරීන්ගේ දසසීලය, අනුපසම්පන්නසීල නම් වේ. උපාසක-උපාසිකාවන්ට නීත්‍යශීලවශයෙන් පැණ වූ සික පද පස හා උත්සාහ ඇතිවිට රැකිය යුතුය යි පැණ වූ දසසික පද හා, උපොසථඞ්ග වසයෙන් වදාළ සිකපද අට හා ගහඪසීල නම් වේ.

පකතිසීල නම් වනුයේ, උතුරුකුරු දිවයින් වැස්සන්ගේ ස්වභාවයෙන් රැකෙන පංචසීලය යි. ආචාරසීල නම් වනුයේ, කුල-දෙශ-තීර්ත්‍යක යන මොවුන් කෙරෙහි වූ යහපත් සිරිත් ය. කුලපරම්පරා වශයෙන් මිනිසුන් අතැ පවත්නා සිරිත් ඒ සැටි යෙන් රැකගැණීම ආචාරසීල නමැ යි කී සේ ය. 'ආනන්ද! යම් දවසෙක බොධිසත්වයෝ මවුකුසැ පිළිසිඳ ගණිත් ද, ඒ තැන් පටන් බෝසත් මවට පුරුෂයන් කෙරෙහි කාමචින්තා පහළ නො වේ ය' යි වදාළ බැවින් බෝසත්මවගේ මේ ස්වභාවය ධම්මතාසීල නම් වේ. මහාකාශ්‍යපාදි ශුද්ධසත්වයන්ගේ හා බොධිසත්වයන්ගේ ඒ ඒ ජාතියෙහි පැවැති සීලය පුබ්බහෙතුක නම් වේ.

'ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරෝ විහරති' යනාදීන් වදාළ හෙයින් පාතිමොක්ඛයෙහි පණවා වදාළ සිකපද නොකඩ කොට රැකීම පාතිමොක්ඛසංවරසීල නම් වේ. **'යො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති'** යනාදීන් වදාළ බැවින් ඇස-කණ-නාසය දිව-සිරුර-සිත යන ඉඳුරන් සංවර කර ගැනීම, ඉන්ද්‍රියසංවර සීල නම් වේ. ආජීවය හෙතු කොට පැණ වූ සවැදෑරුම් සිකපද ඉක්මවීම් වසයෙන් හා කුහනා-ලපනා-නෙමිත්තිකතා-නිප්පෙසිකතා-ලාභෙනලාභං නිජ්ජිගිංසනතා යන කුහකධම්යන්ගේ වශයෙන් පවත්නා වැරදි ජීවිකාවෙන් වැළකීම, ආජීවපාරිසුද්ධිසීල නම් වේ. සිවු පසය ප්‍රත්‍යවෙක්ෂා කොට් වැලදීම, පච්චයසන්නිසිත සීල නම් වේ.

'අනුපසම්පන්නානං පරියන්තසික්ඛාපදානං ඉදං පරියන්ත පාරිසුද්ධිසීලං' යි වදාළ බැවින්, ගණනින් පිරිසිඳිනලද සිකපද ඇති අනුපසම්පන්නයන්ගේ සීලය, පරියන්තපාරිසුද්ධිසීල නම් වේ. අනුපසම්පන්නසීලය, ගණනින් පිරිසිඳිනලදය. **'උපසම්පන්නානං අපරියන්තසික්ඛාපදානං ඉදං අපරියන්තපාරිසුද්ධි සීලං'** යි වදාළ බැවින්, ගණනින් නොපිරිසුන් සිකපද ඇති උපසම්පන්නයන්ගේ සීලය, අපරියන්තපාරිසුද්ධිසීල නම් වේ. සංවරවිනය යි කියූ සිකපද නව කෙළ දහස් එක්සිය අසූකොටි පණස්ලක්ෂ සතිසක් විනයපිටකයෙහි විස්තාරවශයෙන් වදාළ බැවින්, මේ සීලය, පර්‍යන්ත නොවේ දැ යි කෙනෙකුට ඇසිය හැකි ය. ගණනින් එසේ පර්‍යන්තසහිත වූව ත්, නිරවශෙෂකොට සමාදන්වීම හා ලාභ-යස-ඤාති-අඞ්ග-ජීවිතවශයෙන් සීමාරහිත බව හෙණ, අපරියන්තපාරිසුද්ධිසීලය යි කියනු ලැබේ.

පෙර මෙම සිරිලක **'අම්බාදකතිස්ස'** නම් තෙරණුකෙනෙක් වූහ. උන්වහන්සේ එක් දුර්භික්ෂකාලයෙක දිග්මගෙක වඩින සේක්, එක්තරා ගමකට පිඬු සිඟා ගියහ. එහි දී කිසිත් නොලැබ විඩාවට පැමිණ අඹගසක් යට සිහිල්සෙවනේ වැතිර ගත්හ. ගස යට අඹ වැටී තුබුන ද, අඹ පිළිගත්වා ගන්නට එකකු නොසිටි බැවින්, අඹත් නොවලඳම බඩගින්නෙන් නිදා සුන්හ. එ වේලෙහි එහි පැමිණි උපාසකයෙක් උන්වහන්සේ දැක, විඩාවට පත් ව ඉන්නාබව දැන, අඹ මිරිකා පෙවූයේ ය. අඹපැනින් විඩා නොහැරුණුබව දුටු උපාසක තෙමේ උන්වහන්සේ දැනින් වඩා කර පිණවා ගෙණ සිය ගමට ගෙණ ගියේ ය. අතරමග දී මදක් සිහි ලැබූ තෙරණුවෝ

'මෙතෙමේ තගෙ පියා – නො වේ සිය මවු නො ද වේ,
නෑයෙක් ද අත්කිසි මේ – නො වේ තට හිතවත් වූ,

පිවිතුරු සිල්බෙලෙන් – නුඹ රැකි නිතොර දිවියැර,
උවසූ නො නෑ හැම වැඩ – කරයි බැතියෙන් ඔබහට' යි

සිතමින් කියමින් උපාසකයාගේ කරඋඩදී ම විවසුන් වඩා රහත් වූහ.

කල්‍යාණපෘථග්ජනයන්ගේ සීලය, උපසම්පදාවෙහි පටන් මොනවට පිරිසිදු කළ දැරගමිණක් සේ, මොනවට පිරියම් කළ රනක් සේ, ඉතා පිරිසිදු වූයේ, අකුසලයක් කරණු තබා සිතනු පමණ මලයකිනුදු තොර වූයේ, රහත්බවට කරුණු වේ. ඒ සීලය, පරිපුණ්ණපාරිසුද්ධි නම් වේ.

සැටවයස් ඉක්මවා සිටි 'මහාසඞ්ඝරක්ඛිත' ස්ථවිරයන් වහන්සේ මරණමඤ්චකයෙහි හොත් සේක්, භික්ෂූන් විසින් 'ඔබ වහන්සේ ලැබූ ලොවුතුරුදහම් ඇති සේක් දැ' යි විචාරණ ලද්දේ 'මට ලොවුතුරුදහම් නැතැ' යි කීහ එහි සිටි උපස්ථායකභික්ෂු නමක් 'ස්වාමීනි! ඔබවහන්සේ පිරිනිවි සේකැ යි අසා වටපිට දෙළොස් යොදුනෙක තරම් තැනැ ඉන්නා මිනිසුන් රැස්වනු ඒකාන්ත ය, ඔබවහන්සේ පෘථග්ජන ව කලුරිය කළ සේකැ යි දැනුනොත්, ඔවුනට විපිළිසර හටගණු නො අනුමාන ය' යි කී ය 'ඇවැත! මෙතේ බුදුරජුන් දකිනු කැමැත්තෙන් ම මම විවසුන් නො වැඩීමි, එසේ නම්, මා වඩා හිඳුවා මට පොඩ්ඩක් ඉඩ දෙව' යි කීහ. උපස්ථායක තෙමේ එසේ කොට ගෙන් පිටතට ගියේ ය. ඇසිල්ලකින් රහත්බවට පැමිණි උන්වහන්සේ අසුරක් ගැසීමෙන් දැනුම් දුන්හ. රැස් වූ සඞ්ඝයා වහන්සේ 'ස්වාමීන් වහන්ස! මේ මරණමොහොතෙහි රහත්වීමෙන් ඔබවහන්සේ විසින් කරණලද්ද, ඉතා ලොකු වැඩෙකැ' යි කීහ. 'මා කළ මේ වැඩේ ලොකු අමාරුවැඩෙක් නො වේ, මා කළ අමාරු වැඩක් තමුන්නාන්සේලාට කියමි. මා පැවිදි වූ දා සිට අමතක කොටවත් නො දැන වත්, කළ වරදෙක් නැත, කවදා වත් මා කළ වරදක් ගැණ මට දැනුම් නැත, අමාරුවැඩේ නම් ඒ ය' යි උන්වහන්සේ වදාළ සේක.

සප්තශෛක්ෂයන්ගේ සීලය, දෘෂ්ටිවශයෙන් අල්ලා නො ගත් බැවින් අපරාමට්ඨපාරිසුද්ධිසීල යි කියනු ලැබේ. තව ද පෘථග්ජන යන්ගේ හෝ, භවවශයෙන් අල්ලා නො ගත් සීලය, අපරාමට්ඨ පාරිසුද්ධි සීල යි ගැණේ. 'කුටුම්බියතිස්සපුත්ත' ස්ථවිරයන් වහන්සේගේ සීලය මෙනි. උන්වහන්සේ සීලය නිසා, රහත්

වන්නට සිතා තමා මරන්නට පැමිණි සතුරන්ට 'මම දෙපා බිඳ ගෙණ තොපට පොරොන්දුවක් දෙමි, රාගසහිත වූ මරණයට මම පිළිකුල් කරමි, මම එයට ලජ්ජිත වෙමි' යි සංඝකාරධර්මයන්හි සිත යවා පාන්වත් ම රහත් වූහ.

එක්තරා මහතෙර කෙනෙක්, දැඩි සේ ගිලන් ව අහරගැණි මෙහි ද අපොහොසත් ව, තමන්ගේ මල මූ දෙකෙහි ගැලි ගැලී ඔබමොබ පෙරළෙමින් කල් යැවූහ. ඒ දුටු තරුණභික්ෂු නමක් 'අයියෝ! ජීවිත සංඝකාරයෝ දුක් වන්නාහ'යි කියනු අසා ඔහුට කතා කොට 'ඇවත! මම දැන් මැරෙමි, සග සැප ලබමි, එහි සැක යෙක් නැත, සීලය බිඳ දමා ලබන සම්පත්තිය නම්, මහණකම හැර ලබන ගිහිකම වැනි ය, මට වුවමනා සීලය සමග මැරෙන්නට ය'යි කියූ උන්වහන්සේ එසේ ම හොත් සේක්, ඒ රෝගය ම සම්මර්ශන කරන්නෝ රහත් වූහ.

'තථාගතසාවකානං බීණාසවානං පච්චෙකබුඩානං තථාගතානං අරහන්තානං සම්මාසම්බුඩානං ඉදං පටිප්පස්සඩි පාරිසුඩි සීලං' යි වදාළ බැවින් රහතුන්ගේ පසේ බුදුරජුන්ගේ සම්මා සම්බුදුරජුන්ගේ සීලය, පටිප්පස්සඩිපාරිසුඩිසීල නම් වේ. ඒ සීලය මුළුමනින් කෙලෙස්දැවීම් සන්සිඳුවාලයි.

හිරි-ඔත්තප්පාදී වූ යම් කුශලචිත්තොත්පාදයකින් ප්‍රාණඝාතයා ගේ ප්‍රහාණය වේ ද, ඒ ප්‍රාණඝාතප්‍රහාණය පහාණසීල නම් වේ. අදින්නාදානප්‍රහාණදියෙහි ද ක්‍රමය මෙසේ ය. **'එත්ථ ච පහාණත්ති කො චි ධම්මො නත්ථි අඤ්ඤත්‍ර චුත්තප්පකාරානං පාණාතිපාතාදීනං අනුප්පාදමත්තතො'** යන මෙයින් පෙණෙනුයේ ප්‍රාණඝාතාදීන්ගේ අනුත්පාදමාත්‍රය මුත්, ප්‍රහාණැ යි ගතයුතු අනික් ධර්ම යක් නැතිබව ය. ප්‍රාණඝාතාදීන්ගේ ප්‍රහාණය, ඒ ඒ කුශලධර්ම යන්ට පිහිට වන හෙයින්, කුසල්දහම් දරා ගැණීමෙක් වේ ද, පර පණනැසුම් ඇ නො කිරීම, චිත්තකම්පනය නො කරණ හෙයින් සිතේ නො සැලීමට කරුණු වේ ද, එ හෙයින් යට කියූ උපධාරණ සමාධාන යන ශීලනාර්ථයෙන් පහාණසීල යි කියනු ලැබේ.

පරපණනැසුම් ඇ වරදින් වැළක සිටීම, වෙරමණිසීල නම් වේ. වෙරමණි-සංවරයන් හා යෙදුනු චෙතනාව, චෙතනාසීල නම් වේ. මෙය ප්‍රාණඝාතාදියට ප්‍රතිපක්ෂ භාවයෙන් වන්නේ ය. ප්‍රාණඝාතාදියෙන් සංවරවීම, සංවරසීල නම්. ප්‍රාණඝාතාදියෙන් වැළක්ම පිණිස පැණ වූ සිකපද නො බිඳ පවත්වාලීම අවීතික්කම සීල නම්. ඒ ඒ සික පද නොයික්මවා රැකීමැ යි කී සේ ය.

අදින්නාදාන-කාමමිච්ඡාචාර-මුසාවාද-පිසුණවාච-ඵරුසවාච-සම්ඵප්පලාප-අභිජ්ඣා-ව්‍යාපාද-මිච්ඡාදිට්ඨි යන මොවුන් පිළිබඳ පහාණ-විරමණ-චෙතනා-සංවර-අවීතික්කම යන මේ පස මේ නයින් දතයුතු ය. විස්තර කැමැත්තන් අනික් පොත පත බැලිය යුතුය. මේ හැම සීලයෙක් පිළිවෙළින් නිවන් පිණිස පවත්නේ ය. **'විනසො සංවරත්ථාය, සංවරො අවිප්පවිසාරාය'** යනාදි දෙශනා වෙන් ඒ පැහැදිලි ය.

ඛණ්ඩ-ඡිද්‍ර-සබල-කල්මාෂ යන මේ ලෙසින් සීලය කිලිටි වේ. සීලයෙහි මෙ කී ඛණ්ඩභාවාදිය වනුයේ ලාභ-යස-ඤාති-අඞ්ග-ජීවිත යන මෙයින් යමක් බලාපොරොත්තුවෙන්, සීලසමාදානයෙන් හා සත් වැදැරුම් මෙවුන්දම්හි යෙදීමෙනි.

සත්වැදැරුම් වූ ආපත්තිසකන්ධයන් අතුරෙහි යම් ආපත්තිසකන්ධ යෙක මුල හෝ අග, ශික්ෂාපදයෙක් කැඩී බිඳී ගියේ නම්, ඒ සීලය, ඛණ්ඩසීල නම් වේ. කෙළවර කැඩී ගියා වූ වස්ත්‍රයක් සේ ය. යම් ආපත්තිසකන්ධයෙක මැද ශික්ෂාපදයෙක් සිඳී බිඳී ගියේ නම්, ඒ සීලය, ඡිද්‍රශීල නම් වේ. මැද සිදුරු වූ වස්ත්‍රයක් සේ ය. යම් ආපත්ති සකන්ධයෙක පිළිවෙළින් සිකපද දෙක තුනෙක් කැඩී බිඳී ගියෝ නම් ඒ සීලය, සබලශීල නම් වේ. පිටෙහි හෝ බඩතුරෙහි නැගි කලු රතු ඇ එකිනෙකට නො සම වූ පැහැ ඇති දෙනක සේ ය. යම් ආපත්තිසකන්ධයෙක අතරින් පතර සිකපද බිඳී ගියේ නම්, ඒ සීලය, කල්මාෂශීල නම් වේ. අතරින් අතර විසභාගවණී ඇති තිත්දෙනක සේ ය. මෙසේ සීලය, ලාභාදිහෙතුවෙන් ඛණ්ඩාදිභාව යට පැමිණේ.

ඇතැම් මහණ බමුණෝ ගෑණුන් හා මෙවුන්දම් නො සෙවුනෝ ද, උන් කරණ ඇඟඉලීම්-නැහැවීම්-කැවීම්-පෙවීම්-අත් පා මැඩීම් සිනාසීම් ඇ ඉවසති. ඉන් තුටු වෙති. මේ ඉවසීම් තුටුවීම් බ්‍රහ්ම චර්‍යයට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වේ.

ගෑණුන් හා මෙවුන්දම් නො සෙවුනෝ, ඇඟඉලීම් ඇ නො ඉවසුවෝ, කෙලෙස් වසයෙන් සිනාසීම්-සෙල්ලම්කිරීම්-ආදරය කිරීම් කරන්නෝ ද, ඒ හැම, ඔවුන්ගේ බ්‍රහ්මචර්‍යයට ඛණ්ඩද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වේ.

උන් හා මෙවුන්දම්සෙවුම්-ඇඟඉලුම්-සිනාසීම් නො කරන්නෝ ගෑණුන්, ඇසින් ඇස පැහැර බලත් නම්, එය ඔවුන්ගේ බ්‍රහ්මචර්‍ය යට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද කල්මාෂ ද වේ.

716 ධම්පදවණ්ණනාව [යමක

මෙවුන්දම්සෙවුම් - ඇඟඉලුම් - සිනාසීම් - ඇසින් ඇස පැහැර බැලුම් නොකරන්නෝ, ගැණුන් සිනාසෙන කතා කරණ ගයන හඬන හඬ අසා තුටු පහටු වෙද්ද, එය බ්‍රහ්මචර්‍යයට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වේ.

මෙවුන්දම්සෙවුම් - ඇඟඉලුම් - සිනාසීම් - බැලීම් - හඬඇසීම් නොඉවසන්නෝ, උන් හා පෙර කළ ඉලීම්-බැලීම්-කීම්-කෙරීම්-සිනාසීම් - සෙල්ලම් ආදිය සිහි කරත් ද, එය බ්‍රහ්මචර්‍යයට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වේ.

මෙවුන්දම්සෙවුම් ඇ නොකළෝ ද, පංචකාමයෙන් පිරී ඉනිරී ගියා වූ ගැහැවියන් දැක හෝ, ඔවුන් ගැණ කරුණු අසා, ඒ කැමැති වන්නෝ ද, එය බ්‍රහ්මචර්‍යයට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වේ.

මෙවුන්දම්සෙවුම් ඇ නොඉවසන්නෝ, පස්කම්සුව නොකැමැත්තෝ, ශීලයෙන්, ව්‍රතයෙන්, තපසින් බ්‍රහ්මචර්‍යයෙහි හැසිරෙද්ද, එය බ්‍රහ්මචර්‍යයට ඛණ්ඩ ද, ඡිද්‍ර ද, සබල ද, කල්මාෂ ද වේ. මෙසේ මේ සිලය සත්වැදෑරුම් මෙවුන්දම්සෙවුමෙන් ඛණ්ඩාදි භාවයට පැමිණේ. මේ හෙතුවෙන් මේ මහණ බමුණෝ ජාති ජරා මරණාදී වූ දුකින් නොමිදෙති. සීලය මේ කී පරිද්දෙන් ඛණ්ඩාදිභාවයට නොපැමිණියේ ම පිරිසිදු වේ.

සිකපද නොබිඳුම, බිඳුනවුනට පිළියම්කිරීම, සත් වැදෑරුම් මෙවුන්දම්සෙවුමෙන් වෙන්වීම, ක්‍රෝධ, උපනාහ, මක්ඛ, පලාස ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාදාදී වූ පාපධර්‍මයන් නොඉපදවීම යන මෙයින් සීලයෙහි අඛණ්ඩ, අවඡිද්‍ර, අසබල, අකල්මාෂභාවය වන්නේ ය.

මේ කියූ කරුණෙන් නොබිඳුනු, බිඳුන ද පිළියම් කළ සීලය ම තෘෂ්ණාදෘෂ්ටියෙන් මුදන බැවින් භුජිස්සා'යි ද, නුවණැත්තන් විසින් පැසසූ බැවින් විඤ්ඤුප්පසත්ථා'යි ද, තෘෂ්ණා දෘෂ්ටින් විසින් නොගත් බැවින් අපරාමට්ඨා' යි ද, උපචාර-අප්පණා සමාධිය උපදවන බැවින් සමාධිසංවත්තනිකා' යි ද කියනු ලැබේ.

සීලයෙහි සිරිදුබව වනුයේ, සීලවිපත්තියෙහි දෙස් දුක්මෙන් හා සීලසම්පත්තියෙහි අනුසස් දුක්මෙන් ය.

දුශ්ශීලයා ප්‍රමාදහෙතුවෙන් භොගහානියට පැමිණෙයි. ඔහුගේ අපකීර්තිය දසත පැනිරෙයි. පිරිස් කරා පැමිණීමෙහි අපොහොසත් වෙයි. ඉදිරියට ඊමෙහි මැලිකම් දක්වයි. මුළුගැන්වීමෙහි කැමැත්ත නහවයි. බලවත් මුළාවෙන් නාලුරිය කෙරෙයි. මරණින් මතු අපායයෙහි උපදියි

තව ද දුශ්ශීලයා තම දුසිල්බව හෙතු කොට දෙව්මිනිසුන්ට අප්‍රිය වේ. අප්‍රිය බැවින් අවවාද නොකොට යුත්තේ වේ. සිල් නැත්තන්ට අවමන් කිරීමෙහි ලා දුක් ඇත්තේ වේ. සිල් ඇත්තන්ට පැසසීමෙහි ලා විපිළිසර ඇත්තේ වේ. හණරෙද්දක් සේ ගුණෙන් හා සිරුරෙන්, නපුරු පැහැ ඇත්තේ වේ. දිටඨානුගතියට පැමිණෙන්නවුන්ට අපාදුක් එළවන බැවින්, නපුරුපහස් ඇත්තේ වේ. දීමෙන් පලක් නොවන බැවින්, නොවටින්නේ වේ. අවුරුදු ගණන් ඉක්මුණු අසූවිවළක් සේ පිරිසිදු කරණු නොහැක්කේ වේ. සොහොන් පෙණෙල්ලක් සේ වැඩකට නැත්තේ වේ. 'මම ත් ගවයෙක්මි' යි ගොනුන් මැද හැසිරෙණ කොටලුවකු සේ 'මම ත් මහණෙක්මි' යි මහණුන් මැද හැසිරෙතැ'ය්, මහණෙක් නොවේ. මළමිනියක් සේ සංවාසයට නොසුදුසු වේ. උගත්තේ ද, සබ්‍රහ්මචාරීන් විසින් නොපිදිය යුතු වේ. රූපදැකීමෙහි දැස් නැත්තකු සේ විශෙෂාධිගමයෙහි නොසුදුසු වේ. රජයෙහි රොසීකොල්ලකු සේ සඬර්මයෙහි ආශා නැත්තේ වේ. මේ ආදී ලෙසින් සීලවිපත්තියෙහි වූ දොෂය ත්, මෙයට ප්‍රතිවිරුඬ ලෙසින් සීලසම්පත්තියෙහි ආනිසංසය ත් දතයුතු ය. තව ද සීලසම්පත්තියෙහි ලා මෙය ද දැක්කයුතු ය.

'අත්තානුවාදුදිහයං – සුඛසීලස්ස භික්ඛුනො,
අභ්භකාරං විය රවි – හදයං නාවගාහති'

නිරුකරු අදුර නොයන්නා සේ පිරිසිදුසිල් ඇති මහණුන්ගේ ලඟට ආත්මානුවාදුදිහය ඇතුල් නොවේ.

'සීලසම්පත්තියා භික්ඛු – සොභමානො තපොවනෙ,
පභාසම්පත්තියා චන්දො – ගගනෙ විය සොභති'

අහසෙහි සඳරැස්වලින් බබලන චන්ද්‍රයා සේ සීලසම්පත්තියෙන් බබලන මහණ තෙමේ තපොවනයෙහි බබලයි.

'කායගන්ධො පි පාමොජ්ජං – සීලවන්තස්ස භික්ඛුනො,
කරොති අපි දෙවානං – සීලගන්ධෙ කථාවකා'

සිල්වත්මහණුන්ගේ ශරීරගන්ධය ද, දෙවියන්ට පවා ප්‍රීතිය ගෙණ දෙයි. සීලගන්ධයෙහි ලා කියනු ම කිම.

'සබ්බෙසං ගන්ධජාතානං – සම්පත්තිං අභිභුය්‍ය හි,
අවිසාතී දසදිසා – සීලගන්ධො පවායති'

සීලගන්ධය තෙමේ, සියලු සුවඳජාතීන්ගේ සුගන්ධසම්පත්තිය යටපත් කොට දසදික්හි නොපැකිළ හමයි

'අප්පකම්පි කතාකාරා – සීලවන්තෙ මහප්ඵලා,
හොන්තීති සීලවා හොති – පූජාසක්කාරභාජනං'

සිල්වතුන් කෙරෙහි කළ ටික වූ ද සංග්‍රහයෝ මහත්ඵල ඇත්තෝ වෙති. සිල්වත් තෙමේ පූජාසත්කාරයට භාජන වේ.

'සීලවන්තා න බාධෙන්ති – ආසවා දිට්ඨධම්මිකා,
සම්පරායිකදුක්ඛානං – මූලං ඛණති සීලවා'

මෙම අත්බැව්හි වන වධබන්ධනාදී වූ උවදුරු, සිල්වතා නො පෙළත්. සිල්වත් තෙමේ පරලෙව්හි වන දුක්වල මූල සාරා දම යි.

'යා මනුස්සෙසු සම්පත්ති – යා ච දෙවෙසු සම්පදා,
න සා සම්පන්නසීලස්ස – ඉච්ඡිතො හොති දුල්ලභා'

මිනිසුන් කෙරෙහි යම් සම්පත්තියක් වේ ද, දෙවියන් කෙරෙහි ත් යම් සම්පත්තියක් වේ ද, ඒ හැම සම්පත්තියක් ම ඒ කැමැතිවන සිල්වත්හට දුල්ලභ නො වේ.

'අච්චන්තසන්තා පන යා – අයං නිබ්බාණසම්පදා,
සම්පන්නසීලස්ස මනො – තමෙව අනුධාවති'

අත්‍යන්තයෙන් ශාන්ත වූ යම් නිර්වාණසම්පත්තියක් වේ ද, සිල්වත්හු ගේ සිත, ඒ නිර්වාණසම්පත්තිය කරා දුවයි.

මේ කීයේ ආගමයෙහි එන සිල් පිළිබඳ ඉතාකෙටි විස්තර යකි. අතිවිස්තර කථා කැමැත්තන් විසින් අන් පොත පත බැලිය යුතුය. **'සීලවතං ගන්ධො'** යන මෙයින් ප්‍රධාන වශයෙන් ගැණෙනුයේ බුද්ධාදීආර්‍යයන් වහන්සේගේ මාර්ගඵලසම්ප්‍රයුක්ත වූ සීලය යි. එහෙත්, ඉන් අන් සිල් ද නො ගැණෙනුයේ නො වේ. මේ හා විස්තර ඉදිරියෙහි එන්නේ ය.

වාති දෙවෙසු උත්තමො = උතුම් වූ සිල්සුවඳ දෙවියන් අතර හමයි.

උත්තමො' යනු **ගන්ධො'** යන්නෙහි විශෙෂණය යි. උතුම් වූ සිල්සුවඳ දෙවිමිනිසුන් අතර පැතිර යන බවට මේ පිණ්ඩපාත දානය ම නිදසුන් කොට දැක්විය හැකි ය. චක්‍රවාල ස්ථවිරයන් වහන්සේගේ සිල්තෙදින් ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පඬු ඇඹුල් සලස්න උණුවී ගියේ ය. සරණ ස්ථවිරයන් වහන්සේගේ මැනියන් සමාදන් වූ සීලය දෙවියන් අතර පැතිර ගියේ ඇයගේ දිවි රැකුමට කරුණු විය.

ධර්මදෙශනාවගේ අවසනායෙහි බොහෝ දෙනෙක් සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට ද වැඩ සහිත වූ ය.

මහසුප්තෙරුන්ට පිණ්ඩපාතය දුන් කතාපුවත නිමියේ ය.

ගොධික සථවිරයන් වහන්සේගේ පිරිනිවන් පෑම

4-11

ඉසිගිලිකන්දපාමුල පිහිටි එක්තරා කලුගල්තලාවෙක අප්‍රමාද විහරණයෙන් යුක්ත ව වැඩ හුන් ගොධික තෙරණුවෝ, මහත් වූ වීර්‍යයෙන් දුරු කළ ආත්මභාවය ඇති ව භාවනා කළහ. එයින් උන් වහන්සේට ලැබුනේ කෙලෙස් යටපත් වීමෙන් සාමයික වෙතෝ විමුක්තියක් පමණෙකි. මුළුමනින් කෙලෙස් සිඳියෑමෙක් නොවීය. ලැබුනී කාලිකචිත්තවිමුක්තියකි. තමන් මැඩ ගෙණ සිටි, එක්තරා රොගයක් හෙතු කොට, උන්වහන්සේ මෙසේ පිරිහී ගියහ. එහෙත් එයින් පසුබට නොවූවෝ, නැවැත නැවැත ත් කිහිපවරක් ධ්‍යාන උපදවා ගත්තෝ ද, ඒ හැමවරෙක ම ධ්‍යානයෙන් ගිලිහුනෝ ය. සත්වනවර ද, ධ්‍යාන උපදවා ගෙණ 'මම සවරක් ම ධ්‍යානයෙන් පිරිහුනෙමි, පිරිහුනු ධ්‍යාන ඇත්තහුගේ ගතිය, හෙවත් මත්තෙහි ලබන ආත්මභාවය මේ ය යි නියම කරණු බැරි ය, ඒ අනියත ය, දැන් මම ලබා ඉන්නා මේ ධ්‍යානයෙනුත් පිරිහී ගියෙමි නම්, ඒ මහත් හානියකි, නපුරු සිතිවිලි උපදවමින් ජීවත්වීමට වඩා, මියයෑම හොඳ ය, මේ ධ්‍යානයෙන් පිරිහෙන්නට මත්තෙන් මිය යමි' යි සිතා දැළිපිහිය අතට ගෙණ 'බෙල්ල කපා ගණිමි' යි ඇදෙහි වැතිර ගත්හ. එවිට මාර තෙමේ උන්වහන්සේගේ අදහස දැන 'මේ මහණ බෙල්ල කපා ගන්නට දැළිපිහියක් ගෙණ ඇද වැතිර ගත්තෝ ය, බෙල්ල කපා ගැණීමට සිතන්නෝ, ජීවිතයෙහි බලාපොරොත්තු නැත්තෝ ය, බොහෝ දෙනෙක් මැරෙන්නට කලින් විඳසුන් වඩා රහත් වෙති, මෙය වළකන්නට මා යමක් කියුව ද, ඒ නොපිළිගණිත්, බුදුන් ලවා ම මෙය වළක්වන්නෙමි' යි අත් වෙසක් ගෙණ බුදුරජුන් වෙත ගොස්,

'කිසිත් තැන කිසිලෙස්-නොසැලෙන පැණැති මුනිසඳ!
පිණිපා කෙරෙමි ඔබ පා-දිමුත් සක්ලකුණෙන් තුම්,

යට කළ මරණැතී-නොසැලෙන දිමුත මුනිසඳ!
කැමැති යි ඔබේ සවිවෙක්-සියදිවි නසා ගැණුමට,

මහබා මුනිදුසඳ!-මහදන මැද පතළගුණ,
වළකනු මැනැවි දැන් එය - නොතබා ඔහුට එහි ඉඩ,

මුනිසදුනි! සිරිමත්-තුන් ලෝ එකලු කළ ඔබේ,
සසුන් පිළිවෙත ඇලුනු - රහත් පලසට නොම පත්,

ඉදිරියෙහි තව තව – භික්ඛුමැනි සවිවෙක් සෙකි,
කවර ලෙසකින් නම් මෙහි – සියදිවි නසා ගන්නෙ ද?'
යනු කීයේ ය.

ගොධික තෙරණුවෝ, දැලිපිහිය අතට ගත්හ. බුදුරජානන් වහන්සේ 'මෙතෙමේ මාරයා'යි දැන 'මාරය! නුවණැත්තෝ මෙසේ ද කෙරෙති, ජීවිතය බලාපොරොත්තු නො වෙති, ගොධික තෙමේ මුල්සහිත වූ තෘෂ්ණාව උපුටා දමා පිරිනිවි යේ, සි වදුරා භික්ෂූන් කැටුව ගොධික තෙරුන් හොත් තැනට වැඩියෝ, එ වේලෙහි 'මේ භික්ෂුනමගේ ප්‍රතිසන්ධිවිඥනය කො තැන පිහිටි යේ ද' යි අඳුරට වැටුනකුසේ සොයා යන මාරයා දැක, ඔහුගේ දුම් අඳුරුබව භික්ෂූන්ට දක්වා 'මහණෙනි! පාපී වූ මේ මාරයා ගොධිකකුලපුත්‍රයාගේ ප්‍රතිසන්ධිය කො තැන පිහිටියා ද යි විපරම් කරයි, ගොධික තැන පිරිනිවියේ නො පිහිටියා වූ විඥනයෙනැ' යි වදාළ සේක. නැවැත මාර තෙමේ කොළු වෙසක් ගෙණ බෙලුවපණ්ඩුවීණාව ත් රැගෙණ බුදුරජුන් වෙත ගොස්,

'සොයන්නෙම් උඩ යට-සරස් සිවුදිග අනුදිග,
ගෝදික තෙරුන් ගිය තැන-කො තැන් දැ යි මම් නො දනිමි' යි

කීයේ ය. බුදුරජානන් වහන්සේ 'ප්‍රාඥ වූ ඛෑතිමත් වූ ධ්‍යාන වඩන්නා වූ ධ්‍යානයෙහි නිතර ඇලී සිටියා වූ ජීවිතාලය හැර දමා රැ දුවල පිළිවෙතෙහි යෙදී සිටි ගොධික තෙමේ මරසෙන් දිනා නැවැත ඉපැත්මට නො එන සේ මුල් සහිත වූ තෘෂ්ණාව උදුරා පිරිනිවියේ ය' යි වදාළ කල්හි සොකයෙන් මැඩුනු මාරයාගේ කිසිල් ලෙන් වීණාව ගිලිනී ගියා ය. එයින් නො සතුටු වූ මාර තෙමේ ද අතුරුදහන් වී ය.

නැවැත, බුදුරජානන් වහන්සේ 'පාපය! තට ගොධික තැනගේ උත්පත්තිය සොයනු බැරි ය, තා තබා තා වැනි මාරයන් දහසකට ත් ඒ කරණු බැරි වැඩෙකැ' යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක:-

තෙසං සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං,
සම්මදඤ්ඤා විමුත්තානං මාරෝ මග්ගං න වින්දති.

සීලයෙන් පිරිපුන් නො පමා විහරණ ඇති මොනවට සිවුඵස් දුන මිදුනු රහතුන් වහන්සේ වැඩිය මග මාර තෙමේ නො දනියි.

සම්පන්නසීලානං=පිරිපුන් සිල් ඇති.

පිරිපුන්සිල් ඇත්තෝ නම්, මගපල පසක් කළ ආර්‍යයන් වහන්සේලා ය. උත්වහන්සේලා ලොකික වූ ත් ලොකොත්තර වූ ත් සීලයෙන් පිරී සිටියෝ ය. සීලයෙහි අඩු බවෙක් උන්වහන්සේලා කෙරෙහි නම් නො වන්නේ ය.

අප්පමාදවිහාරිනං=අප්‍රමාදවිහරණ ඇති.

ආයුෂ්මයන් වහන්සේලා නිතර සතර ඉරියව්වෙහි ම සමාහිතත්ව වාසය කරති. එ හෙයින් උන්වහන්සේලා **'අප්පමාදවිහාරී'** යි කියනු ලැබෙත්.

සම්මදඤ්ඤා විමුත්තානං=මොනවට දැන මිදුනා වූ.

සම්මා' යනු නිපාත යි. තතුලෙසින් යනු, එහි පැහැදිලි තේරුම යි. **අඤ්ඤා'** යනු පූර්ව්‍රක්‍රියාපද යි. අඤ්ඤය යි තුබූ තන්හි, ය ලොප්වී ගොස් ය. 'සිවුසස්දහම් තතුලෙසින් දැන' යනු මුළුල්ලෙහි තේරුම යි. සකඞ්ගයන්ගේ රාශ්‍යාර්ථය-ආයතනයන්ගේ ආයතනාර්ථය-ධාතූන්ගේ ශූන්‍යාර්ථය-දුඃඛසත්‍යයාගේ පීඩනාර්ථය-සමුදයසත්‍යයාගේ ප්‍රභවාර්ථය-නිරෝධසත්‍යයාගේ ශාන්තාර්ථය-මාර්ගසත්‍යයාගේ දර්ශනාර්ථය, 'සියලු සංස්කාරධර්මයෝ අනිත්‍යයහ' යන මේ ආදි භෙදය හෝ අවබෝධ කොට, තීරණය කොට, දැනුම වතුස්සත්‍යය තතු ලෙසින් දැනීම නම් වේ. ඒ කීහ මෙසේ:- **'සම්මා අඤ්ඤාය ඉදං වුත්තං හොති, ඛන්ධානං ඛන්ධට්ඨං ආයතනානං ආයතනට්ඨං ධාතූනං සුඤ්ඤට්ඨං දුක්ඛස්ස පීළනට්ඨං සමුදයස්ස පභවට්ඨං නිරෝධස්ස සමනට්ඨං මග්ගස්ස දස්සනට්ඨං සබ්බ සඞ්ඛාරා අනිච්චාති එවමාදිභෙදං වා සම්මා යථාභූතං ඤත්වා තීරයිත්වා තුලයිත්වා විභාවෙත්වා'** යි.

ප්‍රධානවසින් විමුක්ති දෙකෙකි. චිත්තවිමුක්තිය - නිර්‍වාණය කියා. මෙ දෙක නැවැත්ත තදඞ්ග, වික්ඛම්භන, සමුච්ඡේද, නිස්සරණ, පටිපස්සද්ධි යි පසකට බෙදේ. එහි තදඞ්ගවික්ඛම්භනයෝ චිත්තවිමුක්තියෙහි ලා ද, සමුච්ඡේද, නිස්සරණ, පටිපස්සද්ධීහු නිර්‍වාණයෙහි ලා ද ගැණෙති. විමුක්ති දෙකොකැ යි කීයේ එහෙයිනි.

අෂ්ටවිධසමාපත්තීහු නීවරණාදිවිරුද්ධධර්මයන්ගෙන් මිදී සිටි බැවින්, චිත්තවිමුක්ති නම් වෙති. නිර්‍වාණය, සමුච්ඡේද, නිස්සරණ පටිපස්සද්ධිවිමුක්තීන්ගේ ශක්තියෙන් සියලු සඞ්ක්‍රතධර්මයන්ගෙන් මිදිසිටි බැවින් විමුක්ති නම් වේ.

දැනවසතුපරිත්‍යාගාදී වූ ඒ ඒ අර්ථයන්ගෙන් හා, නාම රූප ධර්මයන් පිරිසිඳ දැනීම් ආදී වූ විදර්‍ශනාඥයන්ගෙන් සිතේ නො පිරිහීම, අනර්‍ථයන්ගෙන් මිදුනු බැවින්, විමුක්ති නම් වේ. එහි, වසතු පරිත්‍යාගය කරණ කොට මාත්සර්‍යලොභාදියෙන් ද, ශීලය කරණ කොට ප්‍රාණඝාතාදියෙන් ද, නාමරූපපරිසිඳීම කරණ කොට සත්කායදෘෂ්ටියෙන් ද, ප්‍රත්‍යයපරිග්‍රහණය කරණ කොට අහෙතුක විෂමහෙතුදෘෂ්ටීන්ගෙන් ද, ඒ ඒ ප්‍රත්‍යයන් පිළිබඳ සැක දුරුවීම කරණ කොට කෙසේ කෙසේ දැ යි පැවැති සැකයෙන් ද, කලාප

සම්මර්ශනය කරණ කොට මම ය, මාගේ ය යි ගැණීමෙන් ද, මග නො මග දැනීම කරණ කොට නො මග මගය යන හැඟීමෙන් ද, ඉපැත්ම දැකීම කරණ කොට, උච්ඡේදදෘෂ්ටියෙන් ද, විනාශය දැකීම කරණ කොට, ශාශ්වතදෘෂ්ටියෙන් ද, භයවශයෙන් දැකීම කරණ කොට, භයෙක් නැත යන හැඟීමෙන් ද, ආදීනව දැකීම කරණ කොට, රසවිඳගැණුමෙක් ය යන කල්පනාවෙන් ද, නිර්වේදය දැකීම කරණ කොට, ඇලියයුත්තක් ය යන හැඟීමෙන් ද, මිදෙනුකැමැති බව දැකීම කරණ කොට, නො මිදෙනු කැමැත්තෙන් ද යනාදී වූ ඒ ඒ අඞ්ගයන්ගෙන් සිතේ මිදීම තදඞ්ගවිමුක්ති නම්. උපචාර අර්ජිණ සමාධීන්ගෙන් සිතේ නො පිරිහීම් වශයෙන් යම් පැවැත්මෙක් වේ ද, කාමච්ඡන්දාදිනීවරණ ධර්මයන්ගේ ත් විතර්කාදිප්‍රත්‍යනීක ධර්මයන් ගේත් නො ඉපැත්ම ය යි කියනලද යම් මිදීමකු ත් වේ ද, එය වික්ඛම්භන විමුක්ති නම්. චතුර්විධආර්‍ය්‍යමාර්ගය වැඩූ බැවින්, ඒ ඒ මාර්ගයට පැමිණි ආර්‍ය්‍යපුද්ගලයන්ගේ සන්තානයෙහි සමුදයට ඇතුළත් ව සිටි ක්ලෙශයන්ගේ අත්‍යන්තඅප්‍රවෘත්තිභාවයෙන් සමුච්ඡේද ප්‍රහාණයාගේ වශයෙන් මිදීම සමුච්ඡේදවිමුක්ති නම්. ඵලක්ෂණයෙහි සියලු ක්ලෙශයන්ගේ සන්සිඳීම පටිප්පස්සද්ධිවිමුක්ති නම්. සියලු සඞ්ඛතධර්මයන්ගෙන් බැහැර වූ හෙයින් සංස්කාරයන්ගෙන් මිදුනු නිර්වාණය නිස්සරණවිමුක්ති නම්. යට කියූ විස්තර ද බලනු. ඉදිරියෙහි ද විස්තර එන්නේ ය.

රහතුන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් සිත මුදා සිටි බැවින් චිත්තවිමුක්තියෙන් මිදුනාහ. නිර්වාණයෙහි ඇලුනු බැවින් නිර්වාණයෙහි විමුක්තයහ. 'සම්මදඤ්ඤා විමුත්තානං' යන මෙයින් වදාරණ ලද්දේ මේ වග යි. **'සම්මදඤ්ඤා විමුත්තානන්ති හෙතුනානයෙන කාරණෙන ජාතිත්වා තදඞ්ගවිමුත්තියා වික්ඛම්භන විමුත්තියා සමුච්ඡේදවිමුත්තියා පටිප්පස්සද්ධිවිමුත්තියා නිස්සරණ විමුත්තියාති පංචහි විමුත්තිහි විමුත්තානං'** යි අවුවාවෙහි විවිධවිමුක්තිය පංචවිධ භෙදයෙහි ලා විවරණය කරණ ලද්දේ ය.
මාරො මග්ගං නවින්දති = මාර තෙමේ මග නො දනියි.

මහරහතුන් ගියා වූ මග මාරයා, මුළු ශක්තිය යොදා සෙවූයේ ද, බැලූයේ ද කිසිලෙසකින් ඒ නො ලද හැකි ය. මෙසේ වනුයේ රහතුන් වහන්සේ පූර්වොක්තවිමුක්තීන්ගෙන් සියලු කෙලෙස් සියලු සංස්කාරධර්මයන් මූලොච්ඡින්න කොට ප්‍රතිසන්ධිය හෙවත් සසර ඉපැත්ම නසාලූ බැවිනි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා දියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

ශොධිකස්ථවිරපරිනිර්වාණවස්තුව නිමියේ ය.

යහළුවෝ දෙදෙනෙක්.

4-12

අප බුදුරජුන් දවස සැවැත්නුවර **සිරිගුත්ත-ගරහදින්න** යි යහළුවෝ දෙදෙනෙක් වූහ. සිරිගුත්ත, බෞද්ධොපාසකයෙකි. ගරහදින්න නිගණ්ඨොපාසකයෙකි. දවසෙක නිගණ්ඨයෝ ගරහදින්නට 'ඔබගේ යහළු වූ සිරිගුත්තට 'තමුසේ ශ්‍රමණ ගෞතමයා වෙත කුමක් නිසා යන්නහු ද, ඔහු වෙත යෑමෙන් ඔබට ලැබෙන පලය කුමක් ද' යි අසා අප වෙත එන්නට, අපට දන් දෙන්නට සැලැස් සුවොත් නරක ද' යි කිහ. ගරහදින්න ද, ඔවුන් කී වචන පිළිගෙණ නිතර නිතර සිරිගුත්ත සිටින හිඳින තැන්වලට ගොස් 'මිත්‍රය! ඔබට ශ්‍රමණ ගෞතමයාගෙන් ඇති කාරිය කුමක් ද, ඔහු වෙත යෑමෙන් ලැබෙන පලය කුමක් ද, නරක ද අපේ හාමුදුරුවන් කරා ගොස් යමක් කමක් සොයා බැලීම, සැපදුක් විචාරා සතුටුවීම, උන්වහන්සේලාට ත් දන්දීම, උන්වහන්සේලාට සකසා දන්දීමෙන් මහත් වැඩක් සිදුවන බව මට කිය හැකි ය' යි කීයේ ය. සිරිගුත්ත තෙමේ බොහෝ දවස් මේ කතාව අසා නිහඬ වූයේ ද, එක් දවසක් 'මිත්‍රය! ඔබ හැමදෑ මා හිඳින සිටින තැනට අවුත් ශ්‍රමණගෞතමයා ලඟට යෑමෙන් ඇති කාරිය කුමක් දැ, යි අසා නිගණ්ඨයන්ට දන් දෙන්නැ යි කියන්නහු ය, මට කියන්න! ඔවුන් දන්නා දේ' යි කී ය. 'අයියෝ! මිත්‍රය! ඇයි, එහෙ ම කියන්නහු, අපේ හාමුදුරුවරු නො දන්නා ධර්මයෙක් නැත, අතීතානාගතවර්තමාන යන කාලත්‍රය පිළිබඳ හැමදේ ම උන්වහන්සේලා දනිති, සියලු කාය වාක් මනස් කර්මයන්, ඉන් ලැබෙන ඵලවිපාක, මෙයින් මෙසේ සිදු වන්නේ ය, මෙය මෙසේ සිදු වන්නේ ය, යි සියලු ම හොඳ නො හොඳ දනිති' යි කීයේ ය. 'හා! එහෙම ද, එසේ නම් ඇයි! මට මේ තෙක් දවස් ඔයවග නො කීවහු, මේ තෙක් දවස් එය නො කිමෙන් කලේ ලොකු වරදෙක්, අද ම මා උන්වහන්සේලාගේ ඤාණානුභාවය දත යුතු ය, එ හෙයින් මාගේ වචනයෙන් අද ම උන්වහන්සේලාට ආරාධනා කරන්නැ' යි සිරිගුත්ත කී ය.

ගරහදින්න එදා ම නිගණ්ඨයන් වෙත ගොස් වැඳ 'සවාමීනි! මා මිත්‍ර වූ සිරිගුත්තයා, හෙට ඔහුගේ ගෙදර දනට වඩින්නට ඔබවහන්සේලාට ආරාධනා කරන්නැ යි මට කියේ ය, එ හෙයින් සිරිගුත්තගේ මේ ආරාධනාව පිළිගණු මැනැවැ' යි ඉල්ලී ය. එකල නිගණ්ඨයෝ 'අපේ බලාපොරොත්තුව මුළුමනින් පිරී ගියේ ය, සිරිගුත්ත අපකෙරෙහි පැහැදුනු තැන් පටන් අපට කුමකින්

අඩුවෙක් වේ දැ' යි කිහ සිරිගුත්ත වසන ගෙය ඉතාවිශාල වූ ගෙයකි. එ හෙයින් ඔහු ගෙවල් දෙකක් අතර දෙපසින් පළල් වූ වළක් සාරවා අසුචි මඩ පුරවා වළෙහි පිටත දෙ කෙළවර කණු සිටුවා කණුවල රැහැන් බඳවා උන්කෙණෙහි ම හිස පහළට වැටෙන්නට බලා අසුන්වල ඉදිරි පා, වළෙහි ඉදිරිපස සිටින සේ තබවා, පසු පස පා රැහැන්වල සවිකරවා, පිළියෙල කරවී ය. වළ නොපෙණෙන සේ අසුන්වල ඇතිරිලි ද ඇතිර වී ය. ලොකු සැළි ගෙන්වා සෝදවා කෙසෙල්කොළින් හා මාලුරෙදිකැබලිවලින් සැළිකට බඳවා, සිස්ව ම ගෙයි පිටිපස තබවා, පිටත සෑම තැන කැඳ බත්හුළු ගිතෙල් හකුරු කැවුම් කැලි විසුරුවා හැරියේ ය. ගරහදින්නා, එදා උදැසන ම සිරිගුත්තගේ ගෙට ගොස් 'දැනය පිළියෙල කරණලද දැ' යි ඇසී ය. 'ඔව්! පිළියෙල කෙළෙමි' යි සිරිගුත්ත කී කල්හි 'පිළියෙල කෙළේ කොතැන දැ' යි ඔහු ඇසී ය. 'මේ මේ සැළිවල කැඳ, මේ සැළිවල බත්, මේ සැළිවල ගිතෙල්, හකුරු, කැවුම්, අතිරස, අග්ගලා, කොකිස්, ආස්මී, දෙදෙල්, කිරි, පැණි ආදි හැම දෙයක් ම සූදානම් ය, අසුන් පණවා ත් අවසාන ය' යි සිරිගුත්ත කී ය. ගරහදින්නා ඔහුට සතුති කොට ගියේ ය.

පන්සියයක් නිගණ්ඨයෝ දැනය පිණිස එහි ගියහ. සිරිගුත්ත ගෙයින් එලියට බැස, පසඟ පිහිටුවා වැඳ උන් ඉදිරියෙහි දෙයත් ඔසවා 'ඔබවහන්සේලා අතීතාදිභෙද වූ සියල්ල දන්නහු' ය යි ඔබවහන්සේලාගේ දැයක වූ ගරහදින්නා මට දන්වා තිබේ, එ හෙයින් සියල්ල නොදන්නහු නම්, මේ ගෙට ඇතුල් විය යුතු නොවේ, ඇතුල් වුව ද කැඳ බත් නොලැබේ, දැයකයා කී ලෙස සියල්ල දන්නහු නම්, ගෙට ඇතුල් වනු මැනැවැ' යි කී ය 'ඇතුල් වූහු නම්, අසුචිවළෙහි ලා තළවන්නෙමි' යි සිතූ සිරිගුත්ත උන් පිටිපස සිට, අසුන් මත්තෙහි එලාලූ ඇතිරිලි අසුචි නැවරෙන්නට ඉඩ නොතබා පැන්තකට ගන්නා සේ සෙවකයන්ට සංඥා කෙළේ ය. එසේ කොට 'සඞ්ඝමිනි! මෙහි වඩිනු මැනැවැ' යි නිගණ්ඨයන්ට කී ය. ඔවුහු එහි පිවිස ඇතිරිලි එලාලූ අසුන්හි හිඳිනට සූදානම් වූහ. එහි රැස් ව හුන් මිනිසුන් ඒ දැක 'සඞ්ඝමිනි! පොඩ්ඩක් බලාපොරොත්තු වන්නැ' යි කීවිට 'කුමක් නිසා එසේ කියන්නහු දැ' යි ඇසූහ. 'සඞ්ඝමිනි! මෙහි අප නිවසට පැමිණෙන සඞ්ඝමින් වහන්සේලා හිඳින වත දැන ගෙණ පැමිණ හිඳිය යුතු ය'යි කීවිට, 'පින්වන්නි! මෙහිලා අප දනයුතු කුමක්'දැ යි විවාළාහු ය 'හැම දෙනා ම තම තමන් වාඩි ගන්නා අසුන් වෙත ගොස් එක විට ම අසන්වල හිඳිය යුතු ය, එකකු එක්වරකුත් අනිකකු අනික් වරකු ත් හිඳගැණීම මෙහි සිරිත නොවේ, හැමදෙනා එක්විට හිඳගත යුතු ය' යි මිනිස්සු කිහ.

නිගණ්ඨයෝ, 'හොඳයි! වේවා, මොවුන් කියන සැටියට කළ යුතු ය' යි සිතා සියල්ලෝ ම, තම තමන් වාඩි ගන්නා අසුන් වෙත ගොස් පිළිවෙළට සිට ගත්හ. එකල මිනිස්සු 'සවාමිනි! දැන් හැම දෙනා වහන්සේ එක්වට ම අසුන්හි වැඩ හිඳිනු මැනැවැ' යි කීහ. ඔවුන් වාඩිවනු සමග ම අසුන් මතුපිට තුබූ ඇතිරිලි පිටතට ඇද ගත්හ. නිවටුන් එහි වාඩිවනු සමග ම රැහන්හි රඳවා තුබූ පුටුකකුල් එයින් වෙන් වී පහතට වැටුනේ ය. නිගණ්ඨයෝ යටිකුරු ව අසුවිවළෙහි වැටුනාහ. එවිට සිරිගුත්ත දෙර වසා, ගොඩ නැගුන නැගුනවුන් අතින් 'අතීතානාගත වර්තමානකර්මය දන්නහු දැ' යි අසමින් පොලුමුගුරුවලින් තළවා, 'දැන් මොවුනට පමණ ය' යි දෙර හැර වී ය. ඔවුහු අතන මෙතැනින් පැන ගියහ. යන මගැ කල් තබා ම බෙලසුල් ගා තුබූ බැවින් පා තබත් ම බිම ඇද වැටුනාහ. ඔවුනට ද පොලු මුගුරුවලින් තළවාපී ය. 'උපාසක! තා විසින් අපි නසන ලද්දමෝ ය, තා විසින් අපි නසන ලද්දමෝ ය' යි හඬමින් කෑ ගසමින් ඔවුහු ගරහදින්නයාගේ ගෙය බලා ගියෝ ය.

මේ දුටු ගරහදින්න තෙමේ අත් දිග් කොට 'සිරිගුත්තයා මා නැසූයේ ය, ඌ මා කෑයේ ය, වදින්නවුන්ට වැඳීම් පමණකින් සදෙව්ලෝසම්පත් සාද, දෙන මාගේ පින්කෙත් වූ පින්වතුන් වහන්සේලා තළා පෙළා විපතට පත් කරවී ය' යි තරහයෙන් පිපිරි පිපිරී උසාවියට ගොස් නඩු පවරා සිරිගුත්තයාට කහවණු දහසක් දඩ ගැස්සී ය. සිරිගුත්ත, උසාවියට ගොස් නඩුකාරයාට වැඳ 'හාමුදුරුවනේ! පැමිණිල්ලෙන් පමණක් කරුණු අසා, මට දඩ ගැසීම අයුතු ය, ඒ ධර්මයෙක් නොවේ, එය නීතියක් නොවිය හැකි ය. විත්තියෙනුත් කරුණු විමසා, වරද සොයා වරද කරු තෝරා බේරා ගෙණ මේ දඩය ගසන ලද්දේ නම් වරද නැතැ' යි දන්වා සිටි කල්හි, විනිසකරු එ පිළිගෙණ, නැවැත පැමිණිලිකරු හා විත්තිකරු ගෙන්වා නඩුව ඇසීමට පටන් ගත්තේ ය. සිරිගුත්ත නැගී සිට 'හාමුදුරුවනේ! මේ පැමිණිලිකරු කලක සිට මාගේ ඉතාහොඳ යහළුවෙකි' ඕ කී විට විනිසකරු 'හැබෑ ද ගරහදින්නා' යි ඇසී ය. 'එසේ ය, හාමුදුරුවනේ' යි ඔහු පිළිතුරු දින. නැවැත ද, සිරිගුත්ත නැගිට 'මේ ගරහදින්න නිතර මාවෙත පැමිණ ශ්‍රමණගෞතමයාගෙන් ඇති කාරිය කුමක් ද, ඔහු වෙත යෑමෙන් කුමක් ලැබේ ද, ශ්‍රමණ ගෞතමයා කුමක් දනී ද, අපේ හාමුදුරුවරු සියල්ල දන්නෝ ය, අතීතානාගත වර්තමානකාල පිළිබඳ හැම දෙයක් ම දනිති, දෙන දෙයක් ඔවුනට දෙන්නා'යි කියමින් කරදර කෙළේ ය.

ඒ නිසා මම දිනක් ඔවුන් ගෙන්වා දෙහොත් මුදුන් දී වැඳ, මේ පින්වත්හු සියල්ල දනිත් නම්, මා සිතන දේ දැන ගෙට පිවිසෙත්වා, නො දන්නෝ නම්, නො පිවිසෙන්වා, යි සිතමින් සිටියෙමි, මාගේ ඒ සිතුවිල්ල නො දැන ඔවුහු ගෙට පිවිසියෝ ය, එ හෙයින් මොවුහු මහාජනයා බොරුවෙන් වංචා වෙන් රවටන, බොරුසිල්, බොරුඋගත්කම් පෙන්වන, ඒ මඟින් පොහොසතා පටන් දුප්පතා තෙක් හැම දෙනෙකුගෙන් සිවුරු, රෙදිපිළි, කෑම් බීම්, ඉඩකඩම් ලබා ගෙණ, පන්සල් කරවා ගෙණ, මිලමුදල් උපයන රට පෙළන සොරහු ය යි මට සිත් විය, මේ කරුණු උඩ මම මොවුනට මෙසේ කෙළෙමි, මෙයින් මා කළේ වරදෙක් නම්, මට දඬුවම් කරණු මැනැවැ' යි කියා සිටියේ ය. ඉක්බිති 'ගරහදින්නා! උඹට මේ ගැණ යමක් කියන්නට තිබේ නම්, දැන් ඒ කියහැකි' යි විනිසකරු කීවිට, ගරහදින්නා, නැගිට 'ස්වාමීනි! සිරිගුත්තමහතාගේ කතාවේ බොරු නැත, මුළුමනින් ඒ කතාව ඇත්තැ' යි කී ය. එවිට විනිසකරු 'තෝ කිසිවක් නො දන්නා මොවුන් උගතුන් සිල්වතුන් සේ පිළිගෙණ, මොවුහු, සියල්ල දන්නෝ ය යි කියා හැසිරෙමින් බුදුරජුන්ගේ දායක යකු වූ මේ චිත්තිකරුට ත් කියා, ඔහු කරදරයෙහි හෙළා ලූයෙහි ය, මේ නඩුව පැන නැංගේ ඒ නිසා ය, මෙයින් මට පෙණෙනු, මේ දඩය ගැසිය යුත්තේ තට බව ය, එ හෙයින් මම සිරිගුත්ත නිදහස් කරමි, තා විසින් කහවණුසියයක් දඩය වශයෙන් ගෙවිය යුතු ය' යි නඩුව තීරණය කෙළේ ය.

ගරහදින්නා එ තැන් පටන් සිරිගුත්ත හා කතා නො කොට හැරියේ ය. එහෙත් ටික දිනකට පසු, සිරිගුත්තගෙන් පළිගැණීමට සිතා සිරිගුත්ත වෙතට ගොස් කතාවට වැටුනේ ය. 'මිත්‍රය! නෑදෑ මිතුරන් අතර කලකොලාහල, වාදවිවාද ඇතිවීම සුවභාව යිඩියකි, ඒ නො සලකා නුඹ මා හා කතා නො කරන්නෙහි කුමක් නිසා දැ' යි ගරහදින්නා ඇසූවිට, 'නුඹ මා හා කතා නො කරණ නිසා මම ත් කතා නො කරමි' යි සිරිගුත්ත කී ය. 'ගිය දේ ගියා වේ, එය අප අතර ඇති මිත්‍රධර්මය අත්හැරීමට කාරණයෙක් නො වේ ය' යි දෙදෙනා ම එ තැන් සිට නැවැත ත්, සමගි ව එක් ව සිටින්නට එක් ව හිඳින්නට එක් ව ඇවිදින්නට පටන් ගත්හ.

මේ අතර දවසෙක සිරිගුත්ත තෙමේ ගරහදින්නාට බුදුරජුන් වෙත ගොස්, උන්වහන්සේ ඇසුරු කරන්නට ත් දන් දෙන්නට ත් කී ය. ගරහදින්නා බලාපොරොත්තු වූයේ, මේ ම වුව ද, එය නො දන්වා 'නුඹගේ ශාස්තෘවරයා කුමක් දනී දැ' යි ඇසී ය. 'මාගේ ශාස්තෘවරයා හැම දෙයක් ම දනියි, නො දන්නා දෙයක් නැත,

හැම දෙයක් ම උන්වහන්සේගේ නුවණට ගොදුරු ය, හැම කෙන කුගේ ම සිත සොළොස් අයුරකින් උන්වහන්සේ දන්නා සේකැ'යි සිරිගුත්ත කී කල්හි, 'ඇයි ඔබ මෙතෙක් දවස් ඔයවග මට නො කීවහු, එසේ නම් ඔබ ම ගොස් පන්සියයක් දෙනා වහන්සේ ත් සමග අප ගෙදර දනට වඩින්නට බුදුරජුන්ට ආරාධනා කරන්නැ' යි ගරහදින්න කී ය. සිරිගුත්ත බුදුරජුන් වෙත ගියේ ය. ගොස් පන්සියයක් දෙනා වහන්සේ සමග ගරහදින්නගේ දනට වඩින්නට බුදුරජුන්ට ආරාධනා කෙළේ ය. ආරාධනා කොට ද, 'ස්වාමීනි! කිහිප දිනකට උඩදී මම නිගණ්ඨයන්ට ගැහැටක් කෙළෙමි, එයට පළිගැණීම සඳහා මෙය කරන්නේ ද, නැත, පිරිසිදුසිතින් කරන්නේ' දැ යි මට එතරම් වැටහීමෙක් නැත, බලා වදාරා සුදුසුය යි වැටහේ නම්, පිළිගෙණ වදාරණු මැනැවැ' යි කී ය. බුදුරජානන් වහන්සේ බලා වදාරණ සේක්, 'ගරහදින්න ගෙවල් දෙකක් අතර වළක් හාරවා එහි බරකරත්ත අසූවක පමණ කිහිරිදර ලා ගිනි තබා අඟුරු කොට, එහි, මා හෙලා නිග්‍රහ කරන්නට සූදානම් වේ ය' යි දැක ද, නැවැත එහි යෑමෙන් වැඩෙක් වේ දැ' යි බලන සේක් 'මා අඟුරුවළට දෙපා තැබූ කෙණෙහි, එය වසා තබන කළාලය නො පෙණී යන්නේ ය, අඟුරුවළ බිඳගෙණ පියුම් නැගී එන්නේ ය, එවිට මම පියුම්කෙමි පාගමින් ගොස්, පැණ වූ අසුනෙහි හිඳින්නෙමි, මාගේ ශ්‍රාවකයෝ ද, එසේ ගොස්, අසුන්හි හිඳ ගන්නෝ ය, මහාජන තෙමේ රැස් වන්නේ ය. මම ඔවුනට බණ කියන්නෙමි, බණ අවසන්හි අසූසාරදහසක් දෙනාට ධර්මාව බොධය වන්නේ ය, සිරිගුත්ත-ගරහදින්නයෝත් සෝවන් පලයට පැමිණෙති, තමන් සතු සියලු ධනය සසුන් දියුණුවට යොදත්'යි දැක 'මේ කුලපුත්‍රයා නිසා මා යායුතුය' යි ආරාධනාව පිළිගත් සේක.

බුදුරජුන් ආරාධනාව පිළිගත්බව සිරිගුත්ත තෙමේ, ගරහ දින්නට දන්වා 'මැනැවින් සතකාර කරව' යි ද කීයේ ය. 'සතකාර කරණ සැටි දන්නෙම් මම නො වෙම් දැ' යි සිත සිතා ගරහදින්න ගෙවල අතර මහවළක් හාරවා, බරකරත්ත අසූවක කිහිරිදර එහි බහා, ගිනි දල්වා අඟුරු කොට ඒ මත්තෙහි ලෑලි අතුරා කළාලින් වසා, ගොමපිරිබඩ කොට, පසෙක දිරාගියකොටන් කැබලි දමා අසුන් කරා යෑමට මග ද පිළියෙල කරවී ය. සිරිගුත්ත තැබූ ලෙසට ම සැළි ද තබ්බවා ආසන ද පැණවී ය. සිරිගුත්ත එදා උදෑසන එහි ගොස්, 'දානය පිළියෙල කරණ ලද දැ' යි ඇසී ය. 'ඔව් ඒවා සේරම හරි, එන්න බලන්නට දන් පිළියෙල කළේ මෙ තැනැ' යි සිරිගුත්ත පෙන්නුම් කළ ලෙසට, පෙන්නුම් කෙළේ ය. සිරිගුත්ත සියල්ල බලා, පසෙකට වී සිටියේ ය.

මිනිස්සු රැස්වූහ. මිථ්‍යාලබ්ධිකයකු බුදුරජුන්ට ආරාධනා කළවිට, එ තැනට මිනිසුන්ගේ පැමිණීම නො වැළැක්කිය හැක්කේ ය. මිථ්‍යාලබ්ධිකයෝ ත් රැස් වෙති. සම්‍යග්ලබ්ධිකයෝ ත් රැස් වෙති. මිථ්‍යාලබ්ධිකයෝ බුදුරජුන්ට කරණ ගැහැට දකිනු රිසියෙන් එති. සම්‍යග්ලබ්ධිකයෝ එන්නෝ දහම් අසා බුඩලීලාව බලා, පින් රැස් කර ගන්නා රිසියෙන් ය.

පසු ද, බුදුරජානන් වහන්සේ පන්සියයක් දෙනා ත් සමග ගරහදින්නාගේ ගෙට වැඩි සේක. ඔහු ගෙයින් පිටතට අවුත් පසඟ පිහිටුවා වැඳ, බුදුරජුන් ඉදිරියෙහි දෙහොත් මුදුන් දී සිට 'සඵාමිනි! ඔබවහන්සේ සියල්ල දන්නහු සි ද, දෙව් මිනිස් ආදී වූ සතුන්ගේ සිත් සොළොස් අයුරකින් පිරිසිඳ දන්නට සමතෙකැ සි ද සිරිගුත්ත මහතා කියේ ය සි ද, ඔහු කී ලෙසට සියල්ල නො දන්නහු නම්, ගේතුළට නො පැමිණෙනු යහපති' සි ද සිතී ය. මෙසේ සිතා ද බුදුන්ගේ පාත්‍රය ගෙණ 'පින්වතුන් වහන්ස! මෙහි වඩින්නැ' සි කියා නැවැත, 'අප ගෙට ඇතුල් වන්නන් විසින් වත දුන, ඇතුල් විය යුතු ය' සි ද කී ය. 'වත කිමැ' සි ඇසූවිට එකකු පළමුව ගොස් හුන් කල්හි, එයට පසු අනිකකු ගොස් හිඳිය යුතු ය, ඊට ත් පසු ව, තව එකකු ගොස් හිඳිය යුතු ය යි මෙසේ ගොස් හිඳුම වතැ' සි කී ය. බුදුරජානන් වහන්සේ 'යහපතැ' සි පිළිගෙණ තමන්වහන්සේ එකලාව ම එහි වැඩි සේක. ගරහදින්නා අහුරුවලට මදක් ඈත් ව සිට 'සඵාමිනි! වඩිනු මැනැවැ' සි කී කල්හි උන්වහන්සේ සිය සිරිපා අහුරුවලට දිගුකළ සේක. එ කෙණෙහි වළමතුයෙහි අතුරා තුබූ කලාල් අරුඳන් විය. වල බිඳගෙණ රියසක් පමණ පියුම් එයින් නැගී ආයේ ය. උන්වහන්සේ පියුම්පිට වැඩම කොට, පණවා තුබූ අසුනෙහි වැඩහුන් සේක. භික්ෂූහු ද එසේ ගොස් වැඩ හුන්හ.

ඒ දුටු ගරහදින්නාගේ සිරුරෙන් ඩහදිය ගලන්නට වන වහා දුව ගොස් සිරිගුත්තගේ ඇගේ එල්ලී 'මට පිහිට වන්නැ! මට පිහිට වන්නැ' සි කියන්නට විය. 'ඇයි කිමැ' සි සිරිගුත්ත ඇසී ය. 'අයියෝ! සංඝයා වහන්සේට දෙන්නට දෙයක් කැඳක් බතක් මා පිළියෙල කළේ නැතැ' සි කීවිට සිරිගුත්ත 'මේ කැඳ හැළි, මේ බත්හැළි, මේ ගිතෙල්හැළි, මේ හකුරු, මේ කැවුම් මුට්ටි, සි කියමින් නොයෙක් හැළිවලත් පෙන්නුම් කරණ ලද්දේ නො වේ දැ' යි ඇසූ විට 'ඒ හැළිවලත්වල කිසිවක් නැතැ' සි ඔහු කී ය. ඉක්බිති සිරිගුත්ත 'දැන් කුමක් කරමු ද, නුඹ ගොස් ඒ සැළිවලත් හැර බලව' සි කියා පිටත් කර හැරියේ ය. හැර බලත්, 'යම් සැළියක කැඳය' සි කියන ලද නම්, ඒ සැළිය

කැඳින් ද, 'යම් සැළියක බත්' යි කියන ලද නම්, ඒ සැළිය බතින් දැ යි මෙසේ එහි වූ හැම සැළියක් ම ඒ ඒ දෙයින් පිරී තිබුනු බව දැක පුදුමයට පැමිණි ගරහදින්න සතුරින් ඉල්පී ගියේ ය. ඔහු සිත පහන් විය. බුදුපාමොක්මහසඟන සකස් කොට වලඳවා අවසන් කොට අනුමෙවෙනිබණ අසනු කැමැති වැ බුදුරජුන්ගේ පාත්‍රය ගත්තේ ය. උන්වහන්සේ බණ වදාරණ සේක් 'මේ සත්වයෝ නුවණ නැති බැවින්, නුවණින් අඬ බැවින්, මාගේ ශ්‍රාවකයන්ගේ ත් මාගේ ශාසනයේ ත් ගුණ නො දනිත්, පැණැසින් තොරවූවෝ අන්ධයෝ ය, පියවි ඇස් නැත්තෝ අන්ධයෝ නො වෙති, පැණැසින් යුකතවූවෝ ඇස් ඇත්තෝ වෙති, පියවි ඇසින් තොරවූවෝ ද පැණැස් ඇත්තෝ නම්, ඇස් ඇත්තෝ, ය යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක:-

යථා සඬ්කාරධානස්මිං උජ්ඣිතස්මිං මහාපථෙ,
පදුමං තත්ථ ජායෙථ සුභගඬ්ගං මනොරමං,
එවං සඬ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ,
අතිරොචති පඤ්ඤාය සම්මාසම්බුද්ධසාවකො ති.

යම් සේ මහමගැ දැමූ කසළගොඩෙක මනා සුවඳැති සිත් කලු වූ පියුමෙක් උපදනේ වේ ද, එ පරිද්දෙන් (කසළගොඩෙක හටගත් පියුමක් මෙන්) කසළගොඩක් බඳු අන්ධ වූ පෘථග්ජන යන් අතුරෙහි උපන් සම්මා සම්බුදුරජුන්ගේ ශ්‍රාවක තෙමේ ප්‍රඥයෙන් පෘථග්ජන ලොකය යටපත් කොට බබලයි.

සඬ්කාරධානස්මිං = කසළගොඩෙක. කසළරාසියෙක.

නන්වැදෑරුම් වූ තණපත්කුණුරොඩු ආදියෙන් මිශ්‍රකරණු ලැබුයේ **සඬ්කාර'** නම්. **'නානාවිධෙහි තිණාදීහි සඬ්කීරියතෙ මිස්සීකරියතෙ'ති = සඬ්කාරො'** යනු එහි අර්ථ පැවසීම ය. සඬ්කාරතැවියට ගියා වූ එකට මුසුවී ගියා වූ තණපත් ආදිය දමන තැන, දැමූ තැන **සඬ්කාරධාන'** නම් වේ. **'සඬ්කාරස්ස = ධානං සඬ්කාරධානං'** යනු එහි වාක්‍යය යි.

මහාපථෙ = මහමගැ. මහපාරේ.

පථය හෙවත් මාගීය, ප්‍රකෘතිපථය-ආර්‍යපථය යි දෙ පරිදි ය. කුදු මහත් කටයුතු ඇති ජනයා විසින් පයින් යා යුත්තේ ප්‍රකෘති පථය ඩි. නිවන් බලාපොරොත්තු වන නුවණැත්තන් විසින් පිළිපැදිය යුත්තේ ආර්‍යපථය යි. **'අසා දුවිධො මහා ජනෙන පදසා පවිපජ්ජිතබ්බා පකතිමග්ගො ච. පණ්ඩිතෙහි නිබ්බානපවිත්තෙහි පවිපජ්ජිතබ්බා අරියමග්ගො චාති'** යන මෙයින් ඒ පැහැදිලි ය.

'පකතිමගෙගා උපන්නකිච්චාකිච්චෙහි ජනෙහි පථියති ගච්ඡියතීති=පථො, පවිපදා පන අමතමහාපුරං ගන්තුකාමෙහි කුලපුත්තෙහි සද්ධාපාථෙය්‍යං ගහෙත්වා පථියති පවිපජ්ජීය තීති = පථො' යි ඒ දෙ මග විවරණය කළ සැටි ය. මෙහි ගැණෙන්නේ ප්‍රකෘතිපථය යි.

පදුමං තත්ථ ජායෙත සුචිගන්ධං මනොරමං = එහි පිරිසුදු සුව දැති සිත්කලු වූ පියුමෙක් උපදනේ ද.

'තත්ථ සුචිගන්ධං මනොරමං පදුමං ජායෙථ' යනු පද සම්බන්ධ යි. පදුම' නාමයෙන්, එක් සඞ්ඛ්‍යාවිශෙෂයෙක් ද කිය වේ. **'පදුමනිරයෙ නිබ්බත්තො'** යනාදියෙහි ඒ ආයේ ය. මේ ඒ නො වේ. දෙවපූජාදියෙහි උපයොග වන්නේ හෝ මඩෙහි හට ගන්නේ පදුම' නම්. ඒ ම මෙහි අභිමත ය. **'පජ්ජති දෙව පූජාදිං යාතීති, පම්හි පඩකම්හි දවති රූහතීති=පදුමං'** යනු වාක්‍යය යි. මෙහි හෙලපියුම්, රත්පියුම් යි දෙවගීයෙකි. ඒ දෙවගීය ම මෙහි එන පදුම' යන්නෙන් ගත වරද නැත.

එවං සඞ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ = කසළගොඩක් බඳු අන්ධ වූ පෘථග්ජනයා අතරෙහි.

අන්ධ වූ පෘථග්ජන තෙමේ කසළගොඩක් මෙනැ යි මෙයින් වදාළ සේක. **'සඞ්කාරභූතෙ (සු) අන්ධභූතෙ'** යන දෙපදය **'පුථුජ්ජනෙ'** යන්නට එක්වන්නේ ය.

අන්ධභාවය, දෙ පරිද්දකින් වේ. මසැස් හා පණැස් නැසීමෙනි මසැස් පිරිහුනේ ත් පණැස් පිරිහුනේ ත් අන්ධයා ය. මසැසැ' යි කීයේ, ඉදිරියෙහි සිටයහුගේ රූපය ගැණීමෙහි සමත් වූ උපකරණ සහිත වූ ඇස්ගඩුවෙහි සුදුඉංගිරියාවෙන් වට වූ කලුඉංගිරියාව මැද පිහිටි ප්‍රසාදරූපය යි. එය නටුයේ ද අන්ධ යි. පණැසැ යි කීයේ, කාමාදීනව හා නෙක්ඛම්මානිසංසාදිය දැනීමේ පොහොසත් වූ නුවණ යි. එය නටුයේ ද අන්ධයි. මසැස නැසී ගිය ද, පැණැස තිබේ නම්, ඔහු අන්ධයා යි සැලකීමෙක් ආගමෙහි නැත. චක්ඛුපාල ස්ථවිරයන් වහන්සේ අන්ධයෙකැ යි නො පිළිගැණෙති. මසැස පිරිහීමෙන් වන දුකට වඩා බලගතු දුක්, පණැස නැති වීමෙන්, විඳින්නට සිදු වේ. පැණැස පිළිබඳ අන්ධභාවය ම භයානක ය. එය එලොව මෙලොව දුක් පිණිස වන්නේ ය. සංසාරයෙහි දීර්ඝත්වය පිණිස වන්නේ ය. මසැස නැති වීමෙන් වන්නේ ඉතාටික දුකෙකි. එය මෙලොව කට යුතු කිරීමෙහි අපොහොසත් බැවින් වන්නෙකි.

පුථුජ්ජනශබ්දය ලෞකිකමහාජනයා කෙරෙහි ම නැගුනෙකි. එයට යුතුකම් රාශියකි. ඒ යුතුකම් මෙසේ ය:- **'පුථු කිලෙසෙ**

ජනෙතීති, පුථු අවිගතසක්කායදිට්ඨිකාති, පුථු සත්ථාරානං මුඛුල්ලොකතොති, පුථු සබ්බගතීහි අවුට්ඨිතොති, පුථුනානාභි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොතීති, පුථු නානා ඔඝෙහි වුයහතීති, පුථු පඤ්චසු කාමගුණෙසු රත්තො ගිද්ධො ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො ලග්ගො ලගිතො පළිබුද්ධොති, පුථු පංචහි නිවරණෙහි ආවටො නිවුතො ඔවුතො පිහිතො පටිච්ඡන්නො පටිකුජ්ජිතොති, පුථූනං වා ගණනපථමතිතානං අරියධම්ම පරම්මුඛානං නීචධම්මසමාචාරානං අන්තොගධත්තාති, පුථුවා අයං විසුංයෙව සඞ්ඛං ගතො විසංසට්ඨො සිලසුතාදිගුණ යුත්තෙහි අරියෙහි ජනොපි=පුථුජ්ජනො' යි.

බොහෝ කෙලෙසුන් උපදවනුයේ, බොහෝ වූ නො නැසූ සත්කායදෘෂ්ටි ඇත්තේ, බොහෝ ශාස්තෘවරයන්ගේ මූණ බලනුයේ බොහෝ සියලු ගතිවලින් නැගී නො සිටියේ, පුණ්‍යාභිසංස්කාරාදී විවිධසංස්කාරයන් රැස් කරණුයේ, නානාවිධ ඔඝයන්ගෙන් පමුණු වනු ලබනුයේ, නොයෙක් සන්තාපයන්ගෙන් තැවෙනුයේ, නොයෙක් පරිදාහයන් විසින් දවනු ලබනුයේ, බොහෝ වූ පංචකාම ගුණයන්හි ඇලුනේ, ගිජු වූයේ, ගෙතුනේ, මුසපත් වූයේ, බැස ගත්තේ, වැළඳ ගැණුනේ, වැසුනේ, යටිකුරු වූයේ, පෘථග්ජන' නම්. එසේ ම ගණන් මග ඉක්ම ගිය ආර්‍යධර්මයන්ට පිටි පෑ නීච ධර්මයෙහි හැසිරෙන්නවුන්ට ඇතුළත් වූයේ, ශීලශ්‍රැතාදිගුණ ඇති ආර්‍යයන් කෙරෙන් වෙන් වූයේ, පෘථග්ජන නැමැ යි ද කීයේ ය. මේ පාලි වාක්‍යප්‍රදෙශයෙහි කෙටි තේරුම යි. පදරුත් පමණින් පැවසීම යි. මේ සියලු කරුණු ඉතා කොටින් කැටි කොට,

'පුථූනං ජනනාදීහි – කාරණෙහි පුථුජ්ජනො,
පුථුජ්ජනන්තොගධත්තා – පුථුවායං ජනො ඉති'

යි කීහ. බොහෝ වූ කෙලෙස් ඉපදවීමාදී වූ කාරණයෙන් ද, බොහෝ වූ අනාර්‍යජනයන් කෙරෙහි ඇතුළත් බැවින් ද මේ ජන තෙමේ ආර්‍යයන් කෙරෙන් වෙන් වූයේ නුයි පෘථග්ජන නම් වේ.

පෘථග්ජන තෙමේ අන්ධපෘථග්ජන, කල්‍යාණපෘථග්ජන යි දෙ වැදැරුම් කොට බුදුරජුන් විසින් වදාරණ ලද්දේය.

'දුවෙ පුථුජ්ජනා වුත්තා – බුඩෙනාදිච්චබන්ධුනා,
අන්ධො පුථුජ්ජනො එකො – කල්‍යාණෙකො පුථුජ්ජනො' යි.

මේ කුසල් ය, මේ අකුසල් ය, මේ සදොස් ය, මේ නිදොස් ය යනා දිය දැන ගත්තා නුවණින් තොර වූයේ අන්ධපෘථග්ජන' නම්. පංචස්කන්ධාදීන් පිළිබඳ මොහුගේ දැනීම කියනු කුමට යැ. **'තත්ථ යස්ස ඛන්ධධාතුආයතනාදිසු උග්ගහපරිපුච්ඡා සවණ ධාරණ**

පච්චවෙක්ඛණානි නාම්පි අසං අඤ්ඤපුථුජ්ජනෝ' යි කෙටි විවරණ ය යි. චතුරාර්යසත්‍යධර්මයන්ට අනුකූල වූ සත්‍යානුලෝමික ඥාන යෙන් හා වැඩ අවැඩ දන්නා නුවණින් ද යුක්ත වූයේ **කල්‍යාණ පෘථග්ජන'** නම්. **'යස්ස තානි අත්ථි සෝ කල්‍යාණ පුථුජ්ජනෝ'** යි එහි විවරණ යි.

අතිරොචති=යටපත් කොට බබලයි. වැඩියෙන් බබලයි.

පඤ්ඤාය = ප්‍රඥාවෙන්.

සම්මාසම්බුද්ධසාවකෝ = සම්මා සම්බුදුන්ගේ ශ්‍රාවක තෙමේ ය.

සම්මා සම්බුද්ධ' යනු බුදුරජුන් කෙරෙහි ම යෙදෙන නාමයක් ඛැවින්, බුදුරජුන්ගේ ම ශ්‍රාවක තෙමේ **'සම්මාසම්බුද්ධසාවකෝ'** යන්නෙන් ගැණේ. ශ්‍රැතබුද්ධ, ප්‍රත්‍යේකබුද්ධයන්ගේ ශ්‍රාවකයෝ මෙහි ලා නො ගැණෙති. බුද්ධ' යන්න ශ්‍රැතබුද්ධාදීන් සඳහා ත් සම්බුද්ධ' යන්න, ප්‍රත්‍යේකබුද්ධාදීන් සඳහා ත් යෙදෙන ත් සම්මා සම්බුද්ධ' යන්න, අපගේ සර්වාමීදරු වූ බුදුරජානන් වහන්සේ කෙරෙහි ම ආයේ ය.

ශ්‍රාවකයෝ නම්, බුදුරජානන් වහන්සේගේ අවවාදානුශාසනා සකස් කොට අසන්නෝ ය. **'භගවතෝ ඔවාදානුසාසනානි සක්කච්චං සුණන්තීති=සාවකා'** යන්නෙන් එබව පැහැදිලි ය. ඒ අනු ව ගත් කල්හි, යටත්පිරිසෙයින් සරණගතඋපාසකඋපාසිකා වෝ ද ශ්‍රාවකයෝ වෙති. **'හෙට්ඨිමකොටියා සරණගතඋපාසකෝ සෝතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නෝ හොති'** යි ඒ කිහ.

ශ්‍රාවකභාවයාගේ සිදුවිය මෙසේ බැවින්, භික්ෂු-භික්ෂූකින්ගේ ශ්‍රාවකභාවයෙහි ලා කියනු කිම. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුපිරිසෙහි ශ්‍රාවකභාවය මෙසේ සරණගතමාත්‍රයකින් සිදු වුදු නියතශ්‍රාවකභාවය වන්නේ, ඒ ඒ මාගීඵලයටනට පැමිණි මෙනැ යි කියන ලද්දේ ය. එය ධර්මදේශනාවෙහි මූල, ධර්මදේශනා වෙහි මැද, ධර්මදේශනාවෙහි කෙළවර යන තුන් තැන්හි උනුන් පිළිබඳ ශ්‍රද්ධාප්‍රඥාදීන්ගේ මහත්බව අනු ව නුවණ මුහුකුරා යෑම අනුව සිදු වේ.

ශ්‍රාවකයෝ වනාහි, බුදුරජුන්ගේ හෝ සබ්‍රහ්මචාරීන්ගේ චතුස්සත්‍ය හා කර්මස්ථානකථාවන් අසා, ඒ කෙණෙහි ම හෝ එයට පසුව ශ්‍රාවකභාවයට සුදුසු පිළිවෙතෙහි පිළිපදින්නෝ, ඉදසුන් කුළුගන්වා පිළිවෙත් වැඩීමෙන්, නැතහොත් වැඩෙන්නා වූ පිළිවෙතින් චතුස්සත්‍යධර්මයන් ප්‍රතිවෙධ කොට, තමන්ගේ පැතුමට

අනුව ශ්‍රාවකභාවයට පැමිණෙන්නෝ ය. එකල ශ්‍රාවකයෝ ශ්‍රාවක බුද්ධ' යි හඳුන්වනු ලැබෙති. චතුස්සත්‍යාවබෝධයෙන් ම නියම ශ්‍රාවකභාවය ලත් ආර්‍යයන් වහන්සේ අධිකාර, ඡන්ද දෙඅතින් යුත් පැතීම් ඇති ව ඒ පිණිය වීර්‍යය කළහ. මේ දෙ අඟ ඒ මේ ශ්‍රාවකභාවය ලැබීම පිණිස වුවමනා ම ය.

අග්‍රශ්‍රාවකභාවය ලැබූ අර්‍යයන් වහන්සේලා එකාසඞ්ඛ්‍යකල්ප ලක්ෂයක් ම ශ්‍රාවකපාරමිතා පිරූහ. බුදුරජානන් වහන්සේගේ මවුපියෝ ද, අසූමහාශ්‍රාවකයෝ ද, බුද්ධශ්‍රාවකභාවය පිණිස කප් ලක්ෂයක් පාරමිතා පිරූහ. මේ ශ්‍රාවකයෝ මෙහි දැක් වූ කාල ප්‍රමාණයෙන් අඩු ව පිරූ පාරමිතාවන්ගෙන් නො ලැබෙන්නේ ය. මේ කාලය, පැරැම් පිරීමෙහිලා ම යැවිය යුතු ය. මෙයට අඩු කාලයකින් ඒ පිණිස වූ නුවණ නො මේර වියහැකි ය. අඩුකාල යකින් නො වන්නේ එහෙයිනි.

මහබෝසතුන් පිළිබඳ දානපාරමිතාදීන් විසින් වඩනා ලද ප්‍රඥාපාරමිතාව යම්සේ පිළිවෙළින් ගැබ් ගන්නී, මෝරා යන්නී බුද්ධඥානය සම්පූර්ණ කරන්නී ද' එ මෙන් දානාදීන් විසින් වඩනා ලද ප්‍රඥාපාරමිතාව පිළිවෙළින් සුදුසු සේ ගැබ් ගන්නී, මෝරා යන්නී, ශ්‍රාවකබෝධිඥානය සම්පූර්ණ කරන්නී ය. මුන්වහන්සේලා දන් දීමෙහි පුරුද්ද නිසා නැගුනු අලෝභාධ්‍යාසය හෙතු කොට භවයෙහි කිසින් තැනෙක නො ලැගුනු සිත් ඇත්තෝ වෙති. බලාපොරොත්තු රහිත වෙති. ශීලපරිවයෙන්, මොනවට සංයත වූ කය වචන ඇති බැවින්, පිරිසිදු කායවාක්කර්ම ඇත්තෝ වෙති. පිරිසිදු ආජීවය ඇත්තාහු වෙති. ඉන්ද්‍රියයන්හි මොනවට වැසූ දොර ඇත්තාහු වෙති. භොජනයෙහි පමණ දන්නෝ ය. ජාගරියානුයොගයෙන් සිත සමාධි කරන්නෝ ය. මුන්වහන්සේ පිළිබඳ ජාගරියානුයොගය ගතපච්චාගතිකවශයෙන් සිදු වේ. මොවුනට අධිකාරසම්පත්තිය හෙතු කොට, නිදුකින් ම අෂ්ටසමාපත්ති, පංචාභිඥා, ෂඩභිඥාවන්ට සථාන වූ පූර්‍වභාගවිදර්‍ශනා යන මොවුහු අත්පත් වෙති. වීර්‍යපාරමිතාදීහු එහි ම ඇතුළත් ය.

ශ්‍රාවකභාවය පිණිස දානාදි වූ පින් රැස්කිරීමේ දී ඒ පිළිබඳ යම් උත්සාහයෙක් නැගී සිටීමෙක් වේ ද, ඒ වීර්‍ය' නම්. ආක්‍රොශ පරිභවාදිය ඉවසීම ක්ෂාන්ති' නම්. දානශීලාදිසමාදාන, අවිසංවාදනය සත්‍ය' නම්. අවලසමාදානාධිෂ්ඨානය අධිෂ්ඨාන' නම්. දානශීලාදියට ප්‍රතිඥා වූ සත්වයන් කෙරෙහි වූ හිතෛෂිභාවය මෛත්‍රී' නම්. සත්වයන් විසින් කරණලද විප්‍රකාරයන්හි මැදහත් බව උපෙක්ෂා' නම්. දාන සීල භාවනාවන්, සීල සමාධි ප්‍රඥාවන් සිදු වූ කල්හි, වීර්‍යාදිහු සිදු වූවාහු ම වෙති.

ධම්මචක්කප්පවත්තන සූත්‍රය දෙසූ දවසෙහි, කොණ්ඩඤ්ඤ සථවිරයන් වහන්සේ හා අටලොස්කෙළක් දිව්‍යබ්‍රහ්මයෝ නිවන් ලැබීමෙන් ශ්‍රාවකභාවයට පැමිණියෝ ය. **අනත්තලක්ඛණ සූත්‍රය** දෙසූ දවසෙහි, පඤ්චවර්ගිකභික්ෂූන් වහන්සේලා ශ්‍රාවකයෝ වූහ. යසකුලපුත්‍රයා ප්‍රධාන කොට සිටි පස්පණස්දෙන හා භද්දවග්ගිය කුමාරයෝ තිස් දෙන ද මගපල ලබා ශ්‍රාවකයෝ වූහ. **අනත්තලක්ඛණ පරියාය** සූත්‍රදෙශනාවසානයෙහි, උරුවෙල කසුප් ආදී දහස් ජටිල යෝ ද, වැල්මිවනයෙහි දී, බිම්සරරජු ප්‍රධාන කොට ඇති එකොළොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපතීහු ද, එහිදී ම තෙරුවන් සරණ කිය එක් නහුතයක් බ්‍රාහ්මණගෘහපතීහු ද, **ඨිරොකුඩ්ඩ** සූත්‍රය අසා අසූසාරදහසක් දෙන ද, **සුමනමාලාකාරසමාගමෙහි** අසූසාරදහසක් දෙන ද, ඛනපාලක සමාගමෙහි, දසදහසක් දෙන ද, ඛදිරඞ්ගාර ජාතකසමාගමෙහි, අසූසාර දහසක් දෙන ද, ජම්බුකාජීව සමාගමෙහි, අසූසාර දහසක් දෙන ද, ආනන්දසෙට්ඨිසමාගමෙහි, අසූසාර දහසක් දෙන ද, පාසාණකවෛත්‍යස්ථානයෙහි **පාරායණ** සූත්‍රය වදාළ දින, තුදුස්කෙළක් ද, යමාමහපෙළහර දවසෙහි, විසි කෙළක් ද, අභිධම්දේශනායෙහි, අසූකෙළක් ද, දෙවාරොහණයෙහි තිස්කෙළක් ද, **සක්කපඤ්හ** සූත්‍රදෙශනායෙහි, අසූදහසක් ද, ශ්‍රාවකභාවයට පැමිණියෝය. **මහාසමය, මඞ්ගල, චූළරාහුලෝවාද, සම්මිත්තපට්පදා** සූත්‍ර දෙශනාවන්හි, ශ්‍රාවකභාවයට පැමිණියවුන්ගේ ගණනක් කිසිලෙසකින් නො දැක් විය හැකි ය. අටුවාවන්හි ඒ ඒ තන්හි මෙතෙක් මෙතෙක් දෙන මගපල ලැබූහ යි දැක්වූයේ මගපල ලැබූවන්ගේ ගණනක් දැක්විය හැකි නිසා නොවේ. ඒ වනාහි 'ලොකානුකම්පාය' යන ධම්පදය විසතුර කරණු කැමැත්තෙන්, ශ්‍රාවකභාවය ලැබූවන්ගෙන් ඉතා ටිකදෙනකු ගෙණ හැර දැක්වීමෙකි. ශාසනිකප්‍රතිපදාව අශූන්‍ය බැවින් බුද්ධශ්‍රාවකභාවයට පැමිණියවුන්ගේ ගණනක් පිරිසිඳ නො දැක්විය හැකි ය.

මොවුන් අතරෙහි **කොණ්ඩඤ්ඤ, සාරිපුත්ත, මහාමොග්ගල්ලාන, මහාකස්සප, අනුරුද්ධ, භද්දිය, ලකුණ්ඨකභද්දිය, පිණ්ඩෝලභාරද්වාජ, පුණ්ණ, මන්තාණිපුත්ත, බුලිසපත්තක, මහාපන්ථක, සුභූති, රේවත, කඞ්ඛාරේවත, සෝණ, කුටිකණ්ණසෝණ, සිවලී, වඞ්කලී, රාහුල, රට්ඨපාල, කුණ්ඩධාන, වඞ්ගීස, උපසේන, දබ්බ, පිලින්දවච්ඡ, බාහිය, කුමාරකස්සප, මහාකොට්ඨිත, ආනන්ද, උරුවෙලකස්සප, කාළුදායි, ඛණ්ඩුල, සෝභිත, උපාලි, නන්දක, නන්ද, මහාකප්පින, සාගත, රාධ, මේඝරාජ,** යන මුන්වහන්සේලා බුදුරජුන් වෙතින් තනතුරු ද ලබා ශ්‍රාවකවූවෝ ය.

මහාපජාපතිගොතමී, ඛෙමා, උප්පලවණ්ණා, පටාචාරා, ධම්මදිත්තා, නන්දා, සොණා, සකුලා, කුණ්ඩලකෙසා, භද්දා කාපිලානී, භද්දකච්චානා, කිසාගොතමී, සිගාලමාතා යන මේ භික්ෂුකීහු ද තනතුරු ලබා ශ්‍රාවිකාවෝ වූහ.

තපස්සුභල්ලික, අනාථපිණ්ඩික, චිත්තගහපති, හත්ථක ආලවක, මහානාම, උග්ගගහපති, උග්ගතගහපති, සූරම්බට්ඨ, ජීවක, කොමාරභච්ච, නකුලපිතුගහපති යන මොවුහු තනතුරු ලබා ශ්‍රාවකභාවයට පැමිණි උපාසකයෝ ය.

සුජාතා, විසාඛා, ඛුජ්ජුත්තරා, සාමාවතී, උත්තරා, සුප්ප වාසා, සුප්පියා, කාතියානි, නකුලමාතා, කාලි, යන මොවුහු තනතුරු ලබා ශ්‍රාවකභාවයට පැමිණි උපාසිකාවෝ ය.

අසූ මහාශ්‍රාවකගණයට ඇතුළත් හැම දෙනා වහන්සේ ම තනතුරු ලැබූ බවෙක් නො පෙණේ. අසූ මහාශ්‍රාවකගණය මෙසේ ය:–

කොණ්ඩඤ්ඤ, සාරිපුත්ත, මහාමොග්ගල්ලාන, මහා කස්සප, අනුරුද්ධ, භද්දිය, ලකුණ්ටකභද්දිය. පිණ්ඩොලභාර චාජ, මන්තානීපුත්තපුණ්ණ, මහාකච්චාන, චුල්ලපන්ථක, මහා පන්ථක, සුභූති, ඛදිරවනියරෙවත, කඞ්ඛාරෙවත, කොලිවිස සොණ, කුටිකණ්ණසොණ, සීවලී, වක්කලී, රාහුල, රඨපාල, කුණ්ඩධාන, වඞ්ගීස, උපසෙන, දබ්බ, පිලින්දිවච්ඡ, බාහියදාරු චීරිය, කුමාරකස්සප, මහාකොඨිත, ආනන්ද, උරුවෙලකස්සප, කාලුදායි, බකකුල, සොභිත, නන්දක, නන්ද, මහාකප්පින, සාගත, රාධ, මොඝරාජ, භද්දිය, වප්ප, මහානාම, අස්සජී, කිම්බිල, භගු, චුන්ද, නාලක, සෙලුදායි, භද්දාලි, තොදෙය්‍ය, කප්ප, ජතුකණ්ණ, පොසාල, පුණ්ණක, ධොතක, නන්ද, අජිත, තිස්සමෙත්තෙය්‍ය, මෙත්තිය, උපසීව, හෙමක, භද්දාවුධ, උදය, පිඞ්ගිය, මෙඝිය, ජතන, උපවාණ, භද්දජී, යස, ලක්ඛණ, ගවම්පති, පුණ්ණජී, නදීකස්සප, අංගුලිමාල, ගයාකස්සප, අචෙලකස්සප, සභිය, සකුලදායි යන මොවුහු ය.

මහමගැ දූමූ ඉතා පිළිකුල් වූ කසළගොඩෙහි ද මනා සුවඳැති සිත්කලු වූ පියුම් උපදනේ, රජමහඇමැති ආදීන්ගේ හිසෙහි පැල දීමට යම්සේ සුදුසු වේ ද, එ මෙන් කසළගොඩක් බඳු නුවණනැති පුහුදුන් අතර උපන් බුඩශ්‍රාවක තෙමේ, තම නුවණින් කාමයෙහි ආදීනව ත්, නෙක්ඛම්මයෙහි ආනිසංස ත්, දැක ඒ පුහුදුන් කෙරෙන් නික්ම පැවිදි ව ඒ පැවිදිපමණින් ද, ඉන් මත්තෙහි ශීල, සමාධි'

ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥානදර්ශනයන් සම්පූර්ණ කොට, සාමාන්‍ය ලොකයා ඉක්මවා, යට කොට බබලන්නේ ය, යනු මේ ගාථා දෙකෙහි ඉතාම කෙටි අදහස ය.

ධර්මදෙශනාවසානයෙහි අසූ සාරදහසක් ප්‍රාණීන්ට ධර්මාව බොධය වූයේ ය. ගරහදින්න-සිරිගුත්තයෝ සෝවන් පලයට පැමිණියෝ ය. ඔවුහු තම තමන් අයත් සියලු ධනය බුදුසසුන් වැඩ පිණිස යෙදූහ. ස්වාමිදරු වූ බුදුරජානන් වහන්සේ හුනස්නෙන් නැගී වෙහෙරට වැඩි සේක. 'මහ පුදුමය බුදුගුණ, අනේ! අරහැටි බිහිසුණු කිහිරඟුරු ගොඩක් බිඳ ගෙණ පියුම් පිපියා නො වේ දැ' යි සවස් කල්හි ධර්මශාලාවෙහි රැස් වූ භික්ෂූන් වහන්සේලා කතා කරන්නට වූහ. එකල ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ එහි වැඩම කොට 'මහණෙනි! මා බොධිසත්වකාලයෙහි පියුම් පිපී මා පිළිගත් සැටි තමුසේලා නො දන්නහු දැ' යි අසා, 'ස්වාමීනි! අපි නො දනුම්හ, කවදා ද ස්වාමීනි! එසේ වූයේ' යි ඇසූ විට බුදුරජානන් වහන්සේ ඛදිරඞ්ගාර ජාතකය වදාළ සේක.

ගරහදින්නවස්තුව නිමියේ ය.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී පණ්ඩිත **අම්බලම්ගොඩ ධම්මකුසල** නායකස්ථවිරයන් කළ **"සධර්මසාගර"** නම් වූ ධර්මපදවර්ණනාවෙහි පුෂ්පවර්ගාත්මකචතුර්ථතරඞ්ගය නිමියේ ය.

බාලවර්ගය

පංචමතරඩගියකථාසූචි

වස්තුව	පිට
1. කොසොල්රජුට ඇසුනු මරහඬ	737
2. නොගික්මුනු ශිෂ්‍යභික්ෂුව	772
3. සිවුවරයකු රොඩියකුවීම	783
4. හැට කපන සොරු දෙදෙනෙක්	788
5. උදෑසී සඵවිරයන් වහන්සේ	791
6. හැහණියක සොයා ගියවුන් රහත්වීම	796
7. කුෂ්ඨරොගියකු සෝවන්වීම	798
8. මුදල් පොදියක්	818
9. පිණ එකෙණෙහි විපාක දෙන සැටි	822
10. නන්ද නම් තරුණයා	828
11. කම්විපාකයක සැටි	831
12. සහසතු දේ කැමෙති බිහිසුණුකම	841
13 සඞ්කූට ප්‍රේතයා	845
14. සුධම්මසඵරයන් වහන්සේ	850
15. පුණ්‍ය මහිමය	863

කොසොල් රජුට ඇසුනු මරහඬ.

5 — 1

පසේනදි කොසොල් රජ තෙමේ එක්තරා උත්සව දිනෙක, ඇත් අබරණින් සැරසූ පුණ්ඩරීක නම් සුදු ඇතකු පිට නැගී මහත් රාජතේජසින් නුවර හැසිරෙන්නට වන. 'පැත්තකට වෙයන්, පැත්තකට වෙයන්' යි කියමින් රාජපුරුෂයන් ලති පහර දෙමින් මිනිසුන් හසුරුවද්දී, ඒ මිනිස්සු 'රජු දුන් දනෙහි විපාකය බලවු, රජු සසර දී රක්නා ලද සීලයාගේ අනුභාවය පුදුම ය, කරණ ලද යහපත් කටයුතුවල පලය පෙණේ දැ'යි කියා කියා ලති පහර කමින් ම හැරි හැරී බලන්නට වූහ. මේ ගාලගෝට්ටිය අතර එක්තරා දුප්පත් මිනිසකුගේ අඹුවක් ගෙයි ජනෙල් කවුළුවක් හැර රජු දෙස බලා එතැනින් ඉවත් ව ගියා ය. රජුට ඇයගේ ඒ ඉවතට යෑම, පුන්සඳ, වලාකුල් අතරට ගියා සේ හැඟින. රජ තෙමේ ඇය කෙරෙහි ඇදී ගිය සිතැති ව ඇතුපිටින් බිම හෙන්නා සේ වී, වහ වහා නුවර ඇවිද අන්තඃපුරයට වැද, විස්වස් ඇතිව ලං ව ඇසුරු කරණ ඇමැතියකු ගෙන්වා 'අසුවල් තැන දී මා ඉතා ඕනෑකමින් බැලූ ගෙය දුටුවහු දැ' යි ඇසී ය. 'එසේ ය සවාමීනි!' යි ඔහු පිළිතුරු දින. 'එහි හුන් ගැහණිය ත් දුටු දැ' යි ඇසූවිට 'එසේ ය සවාමීනි!'යි එයටත් පිළිතුරු දින. එසේ නම්, නො පමාව එහි ගොස් ඇය දිග ගියා දැ යි දැන එවු' යි කීයේ ය. ඔහු එහි ගියේ, ඇය දිග ගියබව දැන රජුට ඒ බව දැන්වී ය. අනතුරුව රජ තෙමේ 'ඇයගේ සවාමි පුරුෂයා ගෙණ එන්නැ' යි නියම කෙළේ ය. ඇමැති තෙමේ නැවැත එහි ගොස් ඔහුට ඒ බව කී ය දුගියා ද 'එකත් එකට ම මා කැඳවනු මාගේ බිරිඳ නිසා ම විය යුතු ය, වන්නෙක් වේවා, කොයි එකක් වුවත් රජ අණ නො ඉක්ම විය යුත්තකැ' යි මාලිගාවට ගොස් රජු බැහ දැක වැද එකත් පසෙක සිටියේ ය. රජ තෙමේ, 'මාලිගාවෙහි නැවැතී හිඳ මෙහි කටයුතු සොයා බලව' යි ඔහුට කී ය. 'දේවයන් වහන්ස! මට ඒ අපහසු ය, මම ඉතා දුප්පතෙක්මි, මේ ඉන්නා ලෙසින් ඉඳ රක්ෂාවක් කොට ආණ්ඩුවට අයබදු ගෙවන්නෙමි, එ හෙයින් මේ ඉන්නා ලෙසින් ඉන්නට මට අවසර දී වදාළ මැනැවැ' යි කී කල්හි 'තාගේ අයබද්දෙන් මට වැඩෙක් නැත, අද සිට ම මෙහි නැවැතී කටයුතු සොයා බලව' යි අණ කොට 'කොයි අන්දමේ නමුත් වරදක් ගෙණ මූ මරාදමා අඹුව ගත්තෙමි' යි සිතා, රජ තෙමේ කඩුවක් හා පලිහක් ඔහුට දෙවී ය. මරණබියෙන් බියපත් වූ ඔහු මැනැවින් රජුට සෙවය කෙළේ ය. කාමගිජ්ඣන බුර

බුරා නගිත් නගිත් ම ඔහුගේ වරදක් නොදුටු රජ තෙමේ, 'වරදක් නගා මරා දමන්නෙමි,යි සිතා ඔහු ලඟට ගෙන්වා 'මෙයින් සියක් යොදුනක් පමණ ගිය තැන ගඟක් ඇත, එහි කුමුදු හා අරුණුවන් මැටි තිබේ, එහෙයින් එහි ගොස් මා නාන වේලාවට කුමුදුමල් හා අරුණුවන් මැටි ටිකකුත් ගෙණ එව, නොගෙණාවොත් දඬුවම් කරන්නෙමි' යි දැන්වී ය. ඒ දුගියා වනාහි, ගෙයි දෑ වඩා ගත් දුසැදීන් අතුරෙහි ද ඉතා ලාමක ය. මිල දී ගත් දුසැදීන්ට ද 'මට හිසරුදු ය, මගේ පිට රිදේ ය, ඇඟට පහසු නැත' යනාදීන් කියා මෙහෙ නොකොට මග හැරිය හැකි ය, එබඳු ඉඩෙක් ද මොහුට නැත. අණ කළ දේ එලෙසින් ම කළයුතු ය. ඒ නිසා ඔහු 'මා විසින් නොවරදවා ම මේ පිණිස යා යුතු ය, කුමුදු හා අරුණුවන් මැටි තිබෙන්නේ නාගභවනයෙහි ය, එහෙයින් මම මේවා කොතැනකින් ලබන්නෙම් දෝ' යි සිත සිතා මරණබියෙන් බියපත් ව ගෙට ගොස් 'සොඳුර! කෑම පිළියෙල කොට තිබේ දෝ'යි ඇසී ය. 'තව ම බත් ලිපේ ය' යි ඇ කිවූ ය. 'බත් බානතුරු නවතින්නට බැරි ය' යි හැන්දෙන් කැඳවතුර පෙරා බත් ටිකක් ගෙණ තුබුනු මාලුපිණිත් සමග වතුර සහිත වූ බත්ටික කොළපතෙක ලා බැඳ ගෙණ මඟට බැස යොදුනක් පමණ ගොස් කොළපත ලිහා ඉදුල් නොකොට බත් ටිකක් ඉත් අස් කොට කන්නට පටන් ගත්තේ ය. ඒ අතර, පාරේ යන්නකු දුක 'මෙහි එන්න, බත්ටිකක් කාලා යන්නැ' යි පැත්තක තබා තුබූ බත් ටික මඟියාට දුන්නේ ය. ඔහු එය අනුභව කෙළේ ය. දුගියා බත් කා මිටක් පමණ ඉතිරි කොට එය දියට දමා කට සෝදා 'ගඟබඩ අරක්ගත් නා ගුරුළු දෙවියනේ! අනේ! මා කියන්න අසත්වා, කොසොල්රජු මා මරවනු කැමැති ව කුමුදුමල් හා අරුණුවන් මැටි ගෙණ එන්නැ යි මට අණ කළා, මම කන්නට ගෙණා බතින් ටිකක් මඟියකුට දුන්නා, එය දහසක් අනුසස් ඇත්තකි, කුඩමැස්සන්ට ත් ටිකක් දුන්නා, එහි අනුසස් සියයෙකි, ඒ සියලු පින් ඔබවහන්සේලාට අනුමෝදන් කරවන්නම් මට කුමුදුමල් හා අරුණුවන් මැටි ටිකක් ගෙණැවිත් දෙන්නැ' යි මහහඬින් තෙවරක් කෑගැසී ය. එහි දරක් ගත් නයෙක් ඒ හඬ අසා මහල්ලකු ගේ වෙශයෙන් ඔහු වෙත පැමිණ 'තමුසේ කියන්නහු කුමක් දෝ' යි ඇසී ය. ඔහු නැවැත නැවැත ත් ඒ කීයේය. එවිට මහල්ලා ඔහු දුන් පින් අනුමෝදන් ව කුමුදුමල් හා අරුණුවන් මැටි ත් ගෙණැවිත් දුන්නේ ය.

රජ තෙමේ 'මිනිස්සු නුවණ ඇත්තෝ ය, උපාය දන්නෝ ය, මේ මිනිහා මොන උපායයකින් නමුත් ඒවා ගෙණාවොත් මාගේ අදහස වරදින්නේ ය, එහෙයින් නියම කළ වේලාවට මාවෙත

එන්නට බැරිලෙසක් කරන්නෙමි' යි සිතා කල්තියා ම නුවර දෙරගුලු ලවා යතුර තමන් වෙත ගෙන්වා ගත්තේ ය. දුගියා රජු නාන වේලාවට නුවර දෙරලඟට පැමිණ දෙර වසා තිබෙනු දැක දෙරටුපල්ලාඟට 'දෙර හරින්නැ' යි කීයේ ය. 'දෙර හරින්නට යතුර නැත, රජතුමා කල්තියා ම දෙර වස්වා යතුර ගෙන්වා ගත්තේය' යි කීවිට 'අයියෝ! මා ඉවර යි, දැන් කුමක් කරන්නෙම් දැ' යි සිතමින් නුවර දෙර උඩලිපත මතුයෙහි මැටිපිඩ තබා ඒ මත්තෙහි මල් ටිකත් තබා 'පින්වත්නි! රජ අණ ලෙසට මම කුමුදුමල් හා මැටිත් ගෙණාවා, ඒවා රජුට දෙන්නට පිළිවෙළක් නැත, අද කල්තියා ම දෙරගුලු ලා තිබේ, මේ මොන පුදුමයෙක් ද, රජතුමන් නිරපරාධයේ මා මරවන්නට බලාපොරොත්තු වන සේ පෙණේ, මෙය කාට කියා සහනයක් ලබම් දැ' යි හඬ නගා කියා 'දැන් කොතැනෙක යම් ද, භික්ෂූන් වහන්සේලා නම් මොළොක් සිතැත්තෝ ය, විහාරයට වත් ගොස් නිදන්නට ඕනෑ ය, මට දැන් අන් පිහිටෙක් නැතැ' යි විහාරයට ගොස් පසෙකට වී නිදා ගත්තේය.

වැඩිදෙනෙක් මිනිස්සු ඉඩකඩම් වතුපිටි මිලමුදල් උපයා-ගෙණ පොහොසත් වූ කල්හි, විවිධ විද්‍යාවන් හා භාෂාශාස්ත්‍ර උගෙණ උගතුන් වූ කල්හි කරුණාවෙන් ආදරයෙන් අත පොත් තබා පොතපත කියවා මහත් ආශිර්වාදයක් කළ මහණ බමුණු මවුපිය ආදි උතුම් ගුරුදෙගුරුන් අමතක කෙරෙති. ඔවුන් හෙලා දකිති. ඔවුනට වඩා තමන් උසස්ය යි දැපෙති. දුකින් පෙළෙන කල, වත්පොහොසත් කම් පිහිනුනු කල, එරාෂ්ටක පැමිණිකල මහණබමුණන්ගේ පිහිට සොයති. ඔවුන් කරා එළෙඹෙති. අදෝම ය.

රැ නිදි නො ලැබ ගැහණිය ගැණ නිතර සිහි කරණ රජුගේ ගත සිත දෙක්හි කාමගින්න දැඩි ව නැගී සිටියේ ය. එයින් දැවී දැවී රජ තෙමේ 'හෙට එළි වූ සැටියේ ම ඒ මිනිහා මරවා ඔහුගේ අඹුව ගන්නෙමි' යි සිතමින් තතන තතනා ඇඳෙහි වැතිර සිටියේ ය. එදා රැ සැට යොදුනක් දිග පළලැති ලෝකුඹු නරකයෙහි ඉපිද උතුර උතුරා පැසෙන බත්සැළියෙහි හාල් ඇට සේ වරක උඩුකුරුව වරක යටිකුරුව වරක සරස් ව පැසි පැසී අවුරුදු තිස් දහසකින් යටට බැස, නැවැත අනික් අවුරුදු තිස්දහසකින් මතු පිටට එමින් මෙසේ උඩ සිට යටට ත්, යට සිට උඩට ත් යෙමින් පැසෙන සතර දෙනෙක් මතුපිටට ආ එක්වරෙක ඔලු උස්සා උනුන් බලා එකෙකා, එකෙක ගාථා කියනු කැමැති ව එකෙක අකුර කියා යටිකුරු ව පෙරැළී පතුලට බසින්නට වූහ. නිදි නො ලැබූ රජ තෙමේ මහරැ තරමේ දී ඒ හඬ අසා තැති ගත්තේ 'කිම! මාගේ

දිවියට අනතුරෙක් ද, නැත, අගමෙහෙසියට නපුරෙක් ද, නො වේ නම් ආණ්ඩුවට විපතක් දැ'යි සිතමින් මුළුරැය ඇස් නො පියා ම ගත කෙළේ ය. පහන් වූ සැටියේ ම පුරොහිතයා ගෙන්වා 'ගුරුන්නාන්සේ! ඊයේ රෑ මැදියම් වේලෙහි මහත් බිහිසුණු හඬෙක් අසන්නට ලැබිණ, එහි විපාකය කුමක් විය හැකි ද? මට හෝ මෙහෙසියට, නැත, ආණ්ඩුවට නපුරක් ද, මෙයින් වන නපුර කාට දැ යි දැන ගන්නට ය ඔබ ගෙන් වූයේ, **දු, සා, නා, සො,** යන අකුරු හතරේ අඩ යි මට ඇසුනේ, ඒ නිසා මෙයින් වන හොඳ නො හොඳ කියන්නැ' යි රජු කී විට පුරොහිතයාගේ සිත සැලිණ. සිහි නැති විය. මහඅදුරට පිවිසියකුට සේ කිසිවක් සිතා ගණු බැරි විය. 'මෙය මට නො තේරේ ය යි කීවොත් මා නූගතකු සේ සලකා දෙන ලාභය නො දෙති' යි සිතූ පුරොහිත තෙමේ 'මහරජ! ශබ්ද සතර ම බිහිසුණු ය, වන්නේ හොඳෙක් නො වේ, ජීවිතයට අනතුරෙක් පෙණේ' යි කීහ. වඩාත් බිය වූ රජ 'එය වළකාලන්නට පුළුවන් කමෙක් තිබේ දැ' යි ඇසූ විට 'දෙවයන් වහන්ස! වළකාලිය හැකි ය, එහෙයින් බිය විය යුතු නො වේ, විපත්වල දී කණස්සලුවීම නො සුදුසු ය, ඒ පිළියමෙක් ද නො වේ, මෙය වළකාලන්නට වුවමනා ඇත්, අස්, ගොන්, එළු තිරෙළු, කුකුළු, ඌරු, කෙළි, කොළු යන සතුන්ගෙන් එක එකාගෙන් සියය සියය බැගින් ය, මොවුන් සියය සියය බැගින් ගෙණ මරා සබ්බසතයාගය කළයුතු ය' යි පුරොහිතයා කීයේ ය. ඌ මෙසේ කීයේ, මෘගජාතිකසත්වයන් පමණක් ම ගෙන්විම් නම්, මස් කෑ යුතු සත්තු ම ගෙන්වන ලදැ, යි තමන් කෙරෙහි නඟින අපවාදය දුරුකර ගැණීමේ අදහසින් ය. 'මාගේ ජීවිතයට වඩා අනිකෙක් නැතැ'යි සිතූ රජ තෙමේ 'මේ කී හැම සතුන් ම බැඳ ගෙණ එවු' යි රාජපුරුෂයන්ට අණ කෙළේ ය. ඔවුහු ද කීවාට ත් වඩා ඒ ඒ සතුන් බැඳ ගෙණ ආහ. මිනිස්සු තම දු පුතුන් නැයන් උදෙසා හඬන්නට වැලපෙන්නට වූහ. එ හඬ පොළොව පැළියන්නා සේ මහත් විය.

මේ අතර දිනෙක, මල්ලිකාවෝ රජු වෙතට ගියෝ 'දේවයන් වහන්ස! මූණ මැලවුනු සේ කට වියලුනු සේ තොල් ඇකුළුනු සේ සිරුර ගිලන්වූ සේ පෙණෙන්නේ ඇයි දැ' සි ඇසූහ. රජ තෙමේ 'නිට එයින් කිම' මා කණමුල නයකු ගිය ත් නිට ඒ නො පෙණේ, එසේ වූ නිට මට කුමක් වුවත් කිම් දැ' යි කී ය. 'අවසර! දේවයන් වහන්ස! ඇයි එහෙම වදාරන්නෝ, මම එසේ නො වෙමි, කාරණය වදාරන්නැ යි' මල්ලිකාවන් කී කල්හි රජ තෙමේ 'ඊයේ රෑ මැදියම මා ඇදෙහි වැතිර සිටිනා වේලේ බිහිසුණු හඬෙක් ඇසුණා,

මම පසුදා ගුරන්නාසේ ගෙන්වා එය කිව්වා, ඔහු ඒ බලා මාගේ ජීවිතයට අනතුරක් වනබව කියා, ඒ වළකාලන්නට සබ්බසතයාගය කළ යුතු ය, යි කියයි, මාගේ ජීවිතය මට ලොකු නිසා ඒ පිණිස මේ සතුන් ගෙන්විමි' යි කී ය. 'ඇයි ඔතරම් මෝඩ! හුඟක් කන්නට පමණක් ද දන්නෝ, මගධ නැළියෙන් දහසය නැළියක් සාලේ බත් බුදින ගමනුත් හොඳ නොහොඳ නොවැටහීම ය පුදුම, දෙරටක රජය කරවන්නෝ කෙසේ ද, නුවණ නම් පොඩ්ඩක්වත් ඇති බවෙක් නොපෙණේ' යි කී කල්හි 'නී මෙහෙම කියන්නී ඇයි දැ' යි රජු ඇසී ය. 'අනිකකුගේ මරණයෙන් අනිකකුට ජීවිතය ලැබුනු බවක් ඔබ මෙයට කලින් අසා තිබේ ද, මෝඩ බමුණාගේ කිම්බස් ගෙණ මිනිසුන්ට දුක් දෙන්නෝ කුමක් නිසා ද, අසල වෙහෙර තුන් කල්හි වූ හැම දෙයක නොපැකිළ පවත්නා නුවණ ඇති තිලෝ ගුරු බුදුරජානන් වහන්සේ වැඩ වසන සේක, මෙබදු යමක් කරණ විට උන්වහන්සේගෙන් ඇසිය යුතු නොවේ දැ' යි මල්ලිකාවන් කී කල්හි, රජ තෙමේ ඇය ත් නංවා ගෙණ සැහැල්ලු රථයකින් ගොස් මරණ බියෙන් බියපත් ව කිසිවක් කියාගත නොහී බුදුරජුන් වැඳ පසෙකට වී හුන්නේ ය.

එකල බුදුරජානන් වහන්සේ 'මහරජ! මේ මැදි දවල් මහකවිට අව්වේ කොහි සිට එන්නහු දැ' යි අසා වදාළ සේක. රජ තෙමේ කිසිවක් නොබැණ හුන්නේ ය. මල්ලිකාවෝ 'සවාමිනි! අපේ මහරජතුමන් රැයේ රෑ නිදන විට මැදියම පමණේ දී මොකක් හෝ මහහඬෙක් අසන ලදැ' යි කියා පුරොහිතයා ගෙන්වා කියා තිබේ, ඔහු එය ජීවිතයට නපුරකැ' යි කියා එය වළකාලන්නට ඇත් අස් ආදී සතුන් සියය සියය මරවා ලේ ගෙණ සබ්බසත නම් යාගයක් කරන්නට සූදානම් වෙයි, රජ තුමන් යාගය සඳහා මරන්නට රැස් කළ සත්තු බොහෝ ය, ඒ අතර කෙළි කොල්ලෝ ද සිටිති, මෙය දුනගන්නට ලැබී මම එහි ගොස් මොහු මෙහි කැඳවා ගෙණ ආමි, යි කීහ. 'හැබෑ ද මහරජ!, යි බුදු රජුන් අසා වදාළ කල්හි 'එසේ ය සවාමිනි!' යි කියා තමන්ට ඇසුනු මරහඬ ඇසුනු ලෙසට ම කියා සිටියේ ය බුදුරජුන්ට කාරණය තතු ලෙසින් වැටහී ගියෙන් 'මහරජ! බියවන්නට කරුණක් නොවේ මෙය, ඔබට වත් මෙහෙසියට වත් ආණ්ඩුවට වත් කිසින් නපුරෙක් මෙයින් සිදු නොවේ, පව් කොට ලොහොකුඹු නරකයෙහි ඉපද ඉන්නා කිහිප දෙනෙක් තමන් විඳින දුක කියන්නට මෙසේ කීහ' යි වදාළ කල්හි රජ තෙමේ 'ඔවුන් කළ පව්කම් කුමක් දැ' යි ඇසී ය. බුදුරජානන් වහන්සේ ඒ කිපදෙනා පිළිබඳ ඉකුත් කතාව ගෙණහැර දැක්වූ සේක.

'යටගිය දවස එක් කලෙක මිනිසුන්ගේ ආයුකාලය අවිරුදු විසින් විසිදහසෙක් වී ය, එදවස කාශ්‍යප තථාගතයන් වහන්සේ පහළ වූ සේක්, උන්වහන්සේ විසිදහසක් රහතන් පිරිවරා රටින් රට හැසිරෙන සේක්, බරණැස් නුවරට වැඩියෝ ය, එවිට බරණැස වැස්සෝ දෙතුන් දෙනා හා බොහෝ දෙනා එක් ව උන්වහන්සේලාට දන් දුන්හ, සතළිස් කෙළක්, සතළිස් කෙළක් ධනය ඇති සිටු දරුවෝ සිවු දෙනෙක් ද එදවස වූහ, ඔවුහු යහළුවෝ ය, එක් දිනක් මේ සිවු දෙන එක් ව 'අප ගෙවල ඇති ධනයෙන් කුමක් කරමෝ දැ' යි සාකච්ඡා කළහ, මෙ දවස බුදු රජුන් එහි වැඩ සිටිය ද, ඔවුනට උන්වහන්සේ ඇසුරු කරන්නට දන් දෙන්නට සිතෙක් නො උපන, එකෙක් 'අපි හොඳට කා බී කෙළි සෙල්ලමින් කල් ගෙවමු' යි කී ය, එකෙක් 'අපි දිනපතා ම තුන් අවුරුදු පරණ සුවඳ ඇල්සාල් ගෙණවුත් උයවා ගෙණ රසට මසට කමු' යි කීය, එකෙක් රටකජ්ජු, කඩල, මසල වඩේ, ඉඳි ආප්ප, රොටි, පිට්ටු ආ කඩසෝරු සාදවා ගෙණ කමු' යි කීය, අනිකා 'ඔවාන් හොඳ යි, මට ත් හොඳ එකක් කිය හැකි ය, ඒකයි හොඳ ම එක, සල්ලිවලට නො කැමැති ගෑණු මේ රටේ කොතැනක වත් නැත, ඒ නිසා දවස් පතා සල්ලි ටික ටික දී ගැණු සතර පස් දෙනකු ගෙණැවිත් රා අරක්කු බොමින්, රසුත් මසුත් බොමින් කමින්, නැටුම් ගැයුම් බලමින් නැටුම් ගැයුම් කරමින්, කියමින්, උන් හා එක් ව කල් යවමු, යි කී ය, අනික් තිදෙන ද එයට එකඟ වූහ, ඔවුහු සිවු දෙන එ තැන් සිට උනුන්ට මුදල් දී ගැණු ගෙන්වා ගෙණ, පරඹුවන් ගණිමින්, රා අරක්කු බොමින්, එළුවන් ඌරන් කුකුළන් මරා කමින්, දූ කෙළිමින්, නැටුම් ගැයුම් කරමින්, අවුරුදු විසිදහසක් ම ගෙවා මැරී ගොස්, අවීචිමහානරකයෙහි ඉපද ගත්හ, ඔවුහු එහි එක් බුඩාන්තරයක් දුවෙමින්, කිදෙමින්, ලොහගුලි ගිලමින්, ලොහොදිය බොමින්, ඉතා බිහිසුණු ලෙසින් පැසී, නැවැත, එයින් ගැලවී ගොස්, සැට යොදුන් දිග පළල ඇති ලෝකුඹු නරකයෙහි දුන් ඉපිද සිටිනි, අවුරුදු තිස් දහසකට වරක්, එහි පතුලේ සිට මතු පිටට ත් මතුපිට සිට පතුලට ත් යමින් එමින් සිටිති, ගින්නෙන් බුර බුරා තැවෙන ලොහොදියෙන් දුවි දුවි තිස් දහසක් අවුරුදු ගෙවා මතුපිටට ආ එක් දිනෙක එක එකා, එක එක ගය කියන්නට සිතා, එක එක අකුර කියා, කියන්නට කල් නො ලබා යටිකුරු ව ලොහොකුඹු නරකයෙහි ම ගැලී ගියහ' යි වදරා 'ඔබ පළමුවෙන් ඇසූ ශබ්දය කියව' යි රජුට කී සේක, සොමිනි! මට පළමු ඇසුනේ

'දු' යන ශබ්දය, සි කී විට, නිරිසත් හට කල් නො ලැබ, කියා ගත නො හැකි වූ ගාථාව සම්පූර්ණ කොට ගෙණ හැර දැක්වූ සේක. ඒ ගාථාව මෙසේ ය:-

'දුජ්ජීවිතං අජීවිමහ යෙසන්නෙත න දදම්හසෙ,
විජ්ජමානෙසු හොගෙසු දීපං නාකම්හ අත්තනො'

මෙසේ ගාථාව සම්පූර්ණ කොට එහි අදහස ද පහදා දුන්හ. 'අපි දිය යුතු දේ තිබිය දී, දෙන්නට සුදුස්සන් සිටිය දී දන් නො දීමු, ඉතා පහත් සේ ජීවත් වීමු, එකකුට සතළිස් කෙළක්, සතළිස් කෙළක් බැගින් ධනය තිබියදී ත් පිහිටක් කර නො ගත්තෙමු' යනු එහි අදහස ය.

නැවැත බුදුරජානන් වහන්සේ දෙවන තුන්වන සිවුවන අකුරුන් අසා ඒ ගාථා තුන ද —

'සතිං වස්සසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං කදා අන්තො භවිස්සති.

නත්ථි අන්තො කුතො අන්තො න අන්තො පතිදිස්සති,
තදා හි පකතං පාපං මම තුය්හං ච මාරිස!

සො හි නූන ඉතෝ ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නෝ කාහාමි කුසලා බහූ'

යි මෙසේ සම්පූර්ණ කොට වදාළ සේක.

'හැම අතකින් ම අවුරුදු සැට දහසෙක් නො අඩුව පිරිණ, ලෝකුඹු නරකයෙහි පැසෙන්නා වූ අපට කෙළවරෙක් කවදා පෙණේ ද, නිදුකානෙනි! යම් හෙයකින් ඒ කාලයෙහි මා විසිනුත් තොප විසිනුත් පව්, බොහෝ සෙයින් කරණ ලද්දේ ද, එහෙයින් මෙහි කෙළවරෙක් නම් නැත, කොයින් දුක් කෙළවර වන්නේ ද, දුක් කෙළවරෙක් දක්නා නො ලැබේ, ඒ මම වනාහි මෙයින් චුත ව ගොස්, මිනිස් උපතක් ලැබ, වචන දන්නෙක්ව ශීලයෙන් යුක්ත ව නියමයෙන් ම කුසල් කරන්නෙමි' යනු ඒ ගාථාතුනෙහි තේරුම් ය.

මෙසේ මේ ගාථාවන් සම්පූර්ණ කොට වදාරා, ඒ නිරිසතුන් එකෙක ගාථාව කියනු කැමති වුව ද, කල් නො ලැබ කියා ගත නො හී එකෙක අකුර කියා, ලොහොකුඹු නරකයෙහි ම ගැලී යිය බව ද වදාළ සේක.

ඒ නිරිසත්තු සතර දෙන පසේනදි කොසොල් රජු, එ හඬ ඇසූ ද සිට තව ම යටට කිඳ බසිති. එයින් අවුරුදු දහසෙක් වත් තව ම නො ගෙවුනේ ය. රජහට මහත් සංවේගයෙක් උපන. 'අනුන්ගේ අඹුවන් ගෙණ ඇලා සමග හැසිරීම ඉතා බිහිසුණු ය, එක් බුඩාන්තරයක් ම අවීචිමහානරකයෙහි පැසී එයින් චුත ව ලොහොකුඹු නරකයෙහි ඉපද සැට දහසක් අවුරුදු එහි පැසී ද, මොවුන් මේ මහත් දුකෙන් නිදහස් වන කාලයෙක් නො පෙණේ, කෙනෙක් කලකින් නමුත් එයින් ගැලවී මෙහි උපදින්නෝ ද අණ්ඩවෙජද නපුංසකාදී වූ නොයෙක් දුක්වලට බදුන් වන්නෝ ය, අනුන්ගේ අඹුවන් සමග හැසිරීම සුලු පවෙක් නො වේ, මම ත් අන් අඹුවක කෙරෙහි ආලය කොට මුළු රැයක් ම නිදි නො ලැබිමි, අහෝ, ඉතින් නම් දිවි තිබෙන තුරු පර අඹුවන් කරා යෑමක් තබා උන් හැණ සිතීමක් වත් කරන්නේ නැතැ' යි සිතා, 'සවාමීනි! රාත්‍රියේ දිග දැන ගත්තෙම් අද ය' යි රජ තෙමේ කීයේ ය. අසල සිටි දුගියා ද මේ කතාව අසා 'මට ත් ඉඩක් ලැබිනැ' යි බුදුරජුන් වෙත ගොස් 'සවාමීනි! අපේ රජතුමන් රැ දිග දැන ගත්තා සේ මම ත් ඊයේ යොදුනෙහි දිග දැන ගතිමි' යි කී ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ දෙදෙනාගේ ම කියුම් ගළපා 'එකකුට රැ දිග ය, එකකුට යොදුන දිග ය, මෝඩයාට සසර දිගය' යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

දීඝා ජාගරතො රත්තී දීඝං සන්තස්ස යොජනං,
දීඝෝ බාලානං සංසාරෝ සද්ධම්මං අවිජානතන්ති

නො නිදන්නාහට රැ දිග ය. ගමන් විඩා ඇත්තහුට යොදුන දිග ය. සදහම් නො දත් අඥානයාහට සසර දිගය.

දීඝා ජාගරතො රත්තී = නො නිදන්නහුට රාත්‍රිය දිග ය.

නො නිදන්නහු බලා රාත්‍රියෙහි දිග් වීමෙක් නැත. නො නිදන්නහුට රාත්‍රිය දිග් වූවක සේ වැටහේ, යි කීසේ ය. නො නිදා ඉන්නකුට රාත්‍රිය දිග එකක සේ වැටහීම සභාවයෙකි. 'ජාගරන්ත' ශබ්දයෙන් ගැණෙන්නේ නො නිදන්නේ ය. බුඩාගමෙහි ජාගර නාමයෙන් ශ්‍රඩ්ධාදි ඉන්ද්‍රිය පසද කිය වේ. මේ ඒ නො වේ. නො නිදන සඳ තෙමේ ම මෙයින් ගැණේ. රාත්‍රිය යි ගත්තේ සඳයන් පිළිබඳ නානාවිධ හසිතලපිතාදි ශබ්ද සන්සිදුනු කාලය යි. එය යාමතුනකින් යුක්ත ය. එහෙයින් **'නියාමා'** යි රාත්‍රියට නමෙකි. යාමයක් දසපැයකින් යුක්ත හෙයින් මුළු රැයෙහි ඇත්තේ තිස් පැයෙකි. මෙසේ රාත්‍රිය තුන් යම් පමණ වූවා ද, නො නිදන්නහුට එය දෙතුන් ගුණ වූවා සේ වැටහේ. එසේ වැටහෙනු හිර

උදා වන තෙක් පෙරැළි පෙරැළි කුසීත ව නිදන්නහුට වත්, මියුරු බොජුන් වළඳ සිරියහනෙහි නිදන්නා වූ කාමභොගියාට වත් නො වේ. මුළු රැය භාවනාවෙහි යෙදුනෝ, ධර්ම කථික වූවෝ, බණ අසන්නෝ, ශීර්ෂරොගාදියෙන් පෙළෙන්නෝ, අත් පා සිදී මට පැමිණියෝ, වෙදනාවකින් පෙළෙන්නෝ, රාත්‍රියෙහි මග පිළිපන්නෝ යන මොවුහු රාත්‍රිය දිගැ යි සලකති.

දීඝං සන්තස්ස යොජනං = ගමන් විඩා ඇත්තහුට යොදුන දිග ය.

සන්ත' ශබදය යට සැකෙවින් කියවින. ඒ, මෙහි එන්නේ පයින් ගමන් ගොස් වෙහෙසට පත්වූවහු කෙරෙහි ය. මග දිගැ යි දැනෙන්නේ එබන්දකුට ය. ගවු සතරෙක් යොදුනෙකි. ගව්වෙක් අසූ ඉස්බෙකි. ඉස්බෙක් බඹ පන්තිසෙකි. ගව්වකට ඉස්බ දෙදාස් අටසියයෙකි. යොදුනකට බඹ එකොළොස් දහස් දෙසියෙකි. දවස මුළුල්ලෙහි ගමන් කොට විඩා පත්වූයේ ඉදිරියෙහි එන්නකු දැක 'ඉදිරියෙහි ගමට කෙතෙක් දුර දැ' යි අසා තවත් ටිකක් දුර ගොස් අනිකකුගෙන් ද, අනිකකු ගෙන්දැ,යි හමුවන හැම දෙනකුගෙන් ම අසයි. හැම දෙන ම යොදුනෙකැ,යි කියත්. එවිට 'මේ යොදුන දිග එකෙකැ' යි හෙතෙමේ එක යොදුන දෙතුන් යොදුන් වූවා සේ සිතයි.

දීඝො බාලානං සංසාරො සඛම්මං අවිජානතං = සදහම් නොදන්නා වූ බාලයන්ට සසර දිග ය.

බාල' යන්න ප්‍රථම වයසින් යුත් කිරි බොන දරුවා කෙරෙහි ද අඥයා කෙරෙහි ද එන්නේ ය. එහි **'බලති අණති අස්සසිත පස්සසිතමත්තෙන ජීවති න පඤ්ඤාජීවිතෙනාති = බාලො'** යනු ප්‍රථම වයසින් යුත් බාලයා කෙරෙහි රූඪ වූ ශබදයෙහි නිරුක්තියි. ප්‍රඥා ජීවිතයෙන් තොරව ආශ්වාස ප්‍රශ්වාස මාත්‍රයකින් ජීවත් වන්නේ බාලයා යනු එහි කෙටි තේරුම ය. **'දිට්ඨධම්මිකසම්පරායික සඞ්ඛාතෙ වෙ අත්ථෙ ලාති ගණ්හාතීති ච, අත්තත්ථ පරත්ථ සඞ්ඛාතෙ වෙ අත්ථෙ ලුනාති ඡිඳතීති බාලො'** යනු අඥයා කෙරෙහි නැති බාල ශබදයෙහි අර්ථසමර්ථනය ය. මෙලොව පරලොව වැඩ ත් තමන් හා අනුන් පිළිබඳ වැඩ ත් සිඳලන්නේ බාලයා යනු එහි තේරුම ය. මෙයින් පූරණකස්සප, මක්ඛලිගොසාල, නිගණ්ඨනාථපුත්‍ර, සඤ්ජයබෙල්ලඝිපුත්ත, පකුධකච්චායන, අජිත කෙසකම්බලී යන සදෙන ද, දෙවදත්ත, කොකාලිකාදි පාප පුද්ගලයෝ ද බාලයෝ වෙති, යි කියන ලදී. ප්‍රාණඝාතාදි දශ

අකුශල කර්මපථයෙන් යුකත ව තමනු ත් අනුනු ත් පාපයෙහි යොදමින් මේලොව පරලොව දෙක්හි වැඩ නසාලන්නා බාලයා, යි කොටින් දතයුතු ය. මොහු ම මෙහි කැමැති වන ලද්දේ ය.

බාලයා වනාහි සිතන්නේ, නපුරු සිතීමෙක් ම ය. කියන්නේ, නපුරු කියුමෙක් ම ය. කරන්නේ, නපුරු කෙරුමක් ම ය. අභිද්‍යා – ව්‍යාපාද – මිථ්‍යාදෘෂ්ටි යන තෙවැදෑරුම් මනොදුච්චරිතය බාලයා පිළිබඳ බැවින් බාලයාගේ නපුරු සිතුම් ය. මුසාවාද–පිසුණවාචා – ඵරුසවාචා – සම්ඵප්පලාප යන සිවු වැදෑරුම් වචී දුච්චරිතය බාලයාගේ නපුරු කියුම් ය. ප්‍රාණඝාත – අදත්තාදාන–කාමමිථ්‍යාචාර යන තෙ වැදෑරුම් කාය දුච්චරිතය බාලයාගේ නපුරු කෙරුම් ය. ලොකයා, මොහු මේ අකුශල කර්මපථයෙහි යෙදී බැඳි වසන බැවින් බාලයා, යි හැඳින ගණිසි. එහෙයින් මෙය බාල ලක්ෂණය, බාල නිමිත්තය, බාලාපදානය, යි බුදුහු වදාළ සේක. **'තීණිමානි භික්ඛවෙ! බාලස්ස බාලලක්ඛණානි බාල නිමිත්තානි බාලාපදානානි, කතමානි තීණි? ඉධ භික්ඛවෙ! බාලො දුච්චිනතිත චිනති ච හොති දුබ්භාසිතභාසි දුක්කත කම්මකාරී'** යි.

මෙතෙමේ වනාහි වරද, වරද වශයෙන් පිළිගැණීමට නො කැමැති වෙයි. දුක ද එයට නිසි පිළියම් නො කරයි. අන්‍යයා වරද එළි කළවිට ද නො පිළිගණියි.

රූපාදිස්කන්ධයන්ගේ පිළිවෙළ නො සිද පැවැත්ම, චක්ඛු ධාතු ආදි අටලොස් ධාතූන්ගේ පිළිවෙළ නො සිද පැවැත්ම, චක්ඛු ආදි දෙලොස් ආයතනයන්ගේ පිළිවෙළ නො සිද පැවැත්ම **'සංසාර'** නම් වේ.

'ඛන්ධානං පටිපාටී ච ධාතු ආයතනාන ච,
අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරොති පවුච්චති'

යනු ඒ සඳහා කියන ලද ය. නිවන් පසක් කරණතුරු පරම්පරාව නො සිද යන සැම තෙමේ සංසාරය යි වදරන ලද්දේය. නො සිදෙන පරම්පරාව නම්, සකල ධාතු ආයතනයන්ගේ නො කැඩී දිගින් දිගට පැවැත්ම ය. දැන් ලබා සිටින සකල ධාතු ආයතනයන් අතීතයෙහි මෙන් මෙතැන් සිට ත් නිවන් ලබන තුරු ම චුතිපටිසන්ධි වශයෙන් මතු මත්තෙහි දිගින් දිගට සුදුසු පරිදි දෙව, බ්‍රහ්ම, මනුෂ්‍ය, අසුර, යක්ෂ, රාක්ෂස, නාග, සුපණ්ණ, නෙරයික, සත්ත්ව, පුරුෂාදි නොයෙක් නම් ලබමින් පැවැත ගෙණ යෑම ය. සංසාර යි එකෙකු ත් නැති යි අනෙකකු ත් නැත. සත්ව-සංසාර යන දෙක ම සකල ධාතු

ආයතනයන්ගේ කැටිව පැවැත්මට කියන නම් දෙකෙකි. තේරුම් දෙකක් ගෙණ එසේ කියන ලද්දේ ය. පරමාර්ථ වශයෙන් සකණ්ඩ යි ද, සම්මුති වශයෙන් සත්ව යි ද, කියනු ලබන නාම-රූප ධර්මරාශිය චුති පටිසන්ධි වශයෙන් නො සිඳී නො බිඳී අතර නො තඹා පවත්නා හෙයින් සංසාර යි ද, ඒ ඒ අරමුණුවල ඇලෙන සභාවයෙන් සත්ව යි ද කියනු ලැබේ. පඤ්චසකඛන්ධයෙහිවිසතර යට කියන ලදී.

පඤ්චසඛන්ධය, ධාතුනාමයෙන් ද හඳුන් වති. එසේ හඳුන් වන්නෝ ශූන්‍ය හෙයිනි. ඒ ඒ සභාව දරණ හෙයිනි. ධාතු අට ලොසෙකි. චකඛුධාතු-රූපධාතු-චකඛුවිඤඤණධාතු, සොතධාතු-සද්දධාතු - සොතවිඤඤණධාතු, ඝාණධාතු - ගඤඡධාතු - ඝාණ විඤඤණධාතු, ජිවහාධාතු - රසධාතු - ජිවහාවිඤඤණ ධාතු, කාය ධාතු - ඵොට්ඨබබ ධාතු - කායවිඤඤණධාතු, මනොධාතු - ධම්ම ධාතු - මනොවිඤඤණ ධාතු, යි.

මේ අටලොස, අර්ථ - ලක්ඛණ - ක්‍රම - නාවතපරිමාණ - සඞ්ඛ්‍යා ප්‍රත්‍යය - ද්‍රව්‍ය යන මොවුන්ගේ වශයෙන් දතයුතු වේ. එහි චකඛු ආදීන්ගේ විශෙෂාර්ථය යට කියන ලද්දේ ය. අවිශෙෂයෙන් වනාහි යම් ධර්ම සමූහයෙක් සසර දුක උපදවා ද, නොහොත් පිළියෙල කෙරේ ද, සත්වයන් විසින් දරුණු ලැබේ ද, ඒ ධර්ම සමූහය, ධාතු' නම් වේ. දුඃඛ විධානය ද, ධාතු' යි කියති. එසේ ම සත්වයන් විසින් සසර දුක උපදවනු ලැබේ ද, සසර දුක තබනු ලැබේ ද එහෙයිනු ත් මේ ධර්ම සමූහය, ධාතු' යි හඳුන්වනු ලැබේ. මෙ කී අර්ථයන් කතීෘ, කර්ම, භාව, අධිකරණ වශයෙන් අටුවාවෙහි දැක්වූහ. ඒ මෙ සේය:-

'විදහති, ධියතෙ, විධානං, විධියතෙ එතාය, එසා වා ධියතෙ'ති = ධාතු' යි.

රන් රිදී ආදීනට බීජ වූ ශෛලාදි ධාතූන් රන් රිදී ආදිය උපදවන්නාක් මෙන්, මේ ධාතූහු සසර දුක උපදවන්නෝ ය. බර උසුලන්නන් උසුලන බර මෙන් චක්ෂුරාදීහු, සත්වයන් විසින් දරුණු ලැබෙත්. මේ ධාතු සමූහය දුඃඛවිධාන මාත්‍රයෙක් ම ය. අනෙකෙක් නො වේ. තමත් වශයෙහි නො පවත්නා හෙයින් ඒ පැහැදිලි ව පෙණේ. මොවුන් නිසා සසර දුක ගැළපෙනු ලැබේ. එසේ ගැළ පූ සසර දුක මොවුන් කෙරෙහි ම තබනු ලැබේ. මේ පූර්‍වොක්ත ඍධනයන්ගේ අර්ථ පැහැදිලි කළ සැටි ය.

තීර්ථකයන් විසින් කියන ආත්මය වනාහි, පරමාර්ථවශයෙන් ඇත්තෙක් නො වේ. එහෙත් මොවුහු, පරමාර්ථවශයෙන් නැත්-තාහු නො වෙති. මොවුහු, තමන්ගේ සභාවය දරත්නු යි ධාතු නම්

වෙති. ලොකයා විසින් මනොසිලා ආදිය ධාතු යි ගණු ලැබේ. චක්ෂුරාදීහු, මනොසිලා ආදී ධාතූන් වැනි නු යි ධාතු නම් වෙත්. **'ධාතුයො විය ධාතුයො'** යි කී බැවින් කෙසර සිංහයා කෙරෙහි ප්‍රසිඛ වූ සිංහ' ශබ්දය පුරුෂයන් කෙරෙහි ව්‍යවහාරය වන්නාක් මෙන් ශෛලාවයවාදීන් කෙරෙහි රූඪ වූ ධාතු ශබ්දය චක්ෂුරාදීන් කෙරෙහි උපචරිතය යි දතයුතු ය. ශරීරයාගේ අවයව වූ උතුන් අසමාන **ලක්ෂණයෙන්** පිරිසිදින ලද රස සොණිතාදීන් කෙරෙහි ධාතු යන නාමය යෙදේ ද, එසේ පඤ්චසකන්ධ යි ගැණෙන ආතම භාවයාගේ අවයව වූ චක්ෂුරාදීන් කෙරෙහි ධාතු නාමය යෙදේ. චක්ෂුරාදීහු අසමාන සභාව ලක්ෂණයෙන් පිරිසිදින ලද්දේ ය. තව ද ධාතුනාම ප්‍රඥප්තිය වනාහි ජීවරහිත වූවක්හට කියන නමෙකි. සම්මා සම්බුදුරජානන් වහන්සේ ධාතු දෙශනාව කළෝ සත්ව, පුද්ගල, ආතම යන සංඥව නසනු පිණිස ය. එහෙයින් චකඛු වූයේ ත් හේ ම ය, ධාතු වූයේ ත් ඒ ම නු යි චකඛුධාතු' නම් වේ. සෙස්ස ද මෙ සේ ය.

චක්ෂුරාදීන්ගේ ලක්ෂණ ද යට කියූ සේ ය. උතපත්තික්‍රමාදි නොයෙක් ක්‍රම අතුරෙහි මෙහි යෙදෙන්නේ දෙශනාක්‍රමය යි. හෙද' හෙතුඵලධර්මයන්ගේ පිළිවෙල නිශ්චය කොට දැක්වීම් වශයෙන් වදරන ලද්දේ ය. චකඛුධාතු – රූපධාතු දෙක හෙතුයි. ඵලය, චකඛුවිඤඤාණය යි. සෙස්සෙහි ද ක්‍රමය මෙසේ ය.

ඒ ඒ සූත්‍රාභිධර්මදෙශනාවන්හි ආභාධාතු, සුභාධාතු, ආකාසානඤචායතනධාතු, විඤඤාණඤචායතනධාතු යනාදි වශයෙන් අන්‍ය වූ නොයෙක් ධාතුහු දක්නා ලැබෙති. එහෙත් අටලොසක් ම දක්වා වදලෝ, ඒ සියල්ල මේ අටලොසෙහි ම ඇතුළත්වන බැවිනි. චන්ද්‍රාභා, සූය්‍යාභාදිආභාධාතු තොමෝ රූපධාතු ම ය. රූපධාතු වෙහි ම ඒ ඇතුළත් ය. සුභාධාතු තොමෝ රූපාදි වූ අරමුණු පිළිබඳ ය. ශුභාකාරග්‍රහණයට නිමිත්ත වන බැවිනි. ශුභනිමිත්ත ශුභාධාතු නමි. ශුභනිමිත්ත, රූපධාතු ආදීන් කෙරෙන් වෙන් වූවෙක් නො වේ. නොහොත් කුශලව්පාක චිත්තොත්පාදයන්ට අරමුණු වූ රූපාදීහු ම සුභාධාතු නමැ යි කීහු. සෙස්ස විශුද්ධි මාගීයෙන් උගන්නේ ය. මේ ආයේ තාවතපරිමාණචිනිශ්චය යි.

චකඛුධාතු තොමෝ ජාතිවශයෙන් චක්ෂුඃප්‍රසාදසඞ්ඛ්‍යාත එක් ම ධර්මයෙක් වේ. සොත, ඝාණ, ජිවහා, කාය, රූප, ගන්ධ, රස, ධාතුහු ද, එපරිද්දෙන් ශ්‍රොත්‍රප්‍රසාදාදීන්ගේ වශයෙන් එක් එක් ධර්මයට බෙදී යති. පොථබ්බධාතු තොමෝ වනාහි, පඨවි, තෙජෝ, වායෝ යන මොවුන්ගේ වශයෙන් ධර්ම තුනෙකැ යි ගැණේ. චකඛු–විඤඤාණධාතුව කුශලව්පාක–අකුශලව්පාකයන්ගේ වශයෙන් ධර්ම

දෙකක් කොට ගණිති. සොත, ඝාණ, ජිවහා, කායවිඤ්ඤාණධාතුහු එපරිද්දෙන් කුශලවිපාක- අකුශලවිපාක වශයෙන් ධම් දෙකෙක, දෙකෙකැ යි ගිණිය යුතු ය. මනොධාතුව, පංචවාරාවජ්ජන-කුශල විපාකසම්ප්‍රතේ‍යෂණ - අකුශලවිපාකසම්ප්‍රතේ‍යෂණයන්ගේ වශයෙන් ධම් තුනකට බෙදේ. ධම්මධාතු තොමෝ වෙදනා, සංඥ, සංඝකාර යන ත්‍රිවිධ වූ අරූපඝන්ධයන්ගේ ද, සොළොස් වැදෑරම් වූ සූක්ෂ්මරූපයන්ගේ ද, අසංඝෘතධාතුවගේ ද, වශයෙන් විසි අයුරකට යන්නී ය. මනොවිඤ්ඤාණධාතුව, අනික් කුශලචිත්ත - අකුශලචිත්ත - අව්‍යාකෘතචිත්තයන්ගේ වශයෙන් සසත්තෑ අයුරකට වැටේ. මේ සඞ්ඛ්‍යාවශයෙන් අටළොස්ධාතූන්ගේ විනිශ්චය යි.

චක්ඛුධාතු තොමෝ, චක්ඛුවිඤ්ඤාණධාතුවට විපයුත්ත-පුරෙජාත-අත්ථි-අවිගත - නිස්සය - ඉන්ද්‍රියප්‍රත්‍යයයන්ගේ වශයෙන් උපකාර වන්නී ය. රූපධාතු තොමෝ, චක්ඛුවිඤ්ඤාණධාතුවට පුරෙජාත - අත්ථි - අවිගත - ආරම්මණප්‍රත්‍යයයන්ගේ වශයෙන් උපකාර වන්නී ය.

මෙසේ ම සොතධාතු සද්දධාතු ආදීහු, සොතවිඤ්ඤාණාදීන්ට සස සය අයුරකින් හා සතර සතර අයුරකින් උපකාර වෙති. පංචවාරාවජ්ජනමනොධාතු තොමෝ, චක්ඛ්වාදිපංචවිඤ්ඤාණයන්ට අනන්තර - සමනන්තර - නත්ථි - විගත - අනන්තරූපනිස්සය යන පස්වැදෑරුම් ප්‍රත්‍යයයන්ගෙන් උපකාර වන්නී ය. පංච විඤ්ඤාණධාතුහු, අරමුණු පිළිගන්නා ආකාරයෙන් පවත්නා සම්ප්‍රතේ‍යෂණමනොධාතුවට, සම්ප්‍රතේ‍යෂණමනොධාතු තොමෝ සන්තීරණමනොධාතුවට, සන්තීරණමනොවිඤ්ඤාණධාතු තොමෝ, වොට්ඨපනමනොවිඤ්ඤාණධාතුවට, වොට්ඨපනමනොවිඤ්ඤාණ-ධාතු තොමෝ ජවනමනොවිඤ්ඤාණධාතුවට, යට කියූ ප්‍රත්‍යය-යන්ගේ වශයෙන් පස් පස් අයුරෙන් ප්‍රත්‍යය වෙති. ජවනමනෝ ධාතු තොමෝ තමහට අනතුරුව උපදින ජවනමනොවිඤ්ඤාණ ධාතුවට අනන්තර - සමනන්තර - නත්ථි - විගත - අනන්තරූප නිස්සයප්‍රත්‍යයයන් ගෙන් හා ආසෙවනප්‍රත්‍යයයෙන් ද යන සවැදෑරුම් ප්‍රත්‍යයයන්ගෙන් උපකාර වේ. මේ පංචවාරයෙන් උපදින චිත්තයන්ට ප්‍රත්‍යය ලැබෙන සැටියි.

මනොද්වාරයෙහි වනාහි භවඞ්ගමනොවිඤ්ඤාණධාතු තොමෝ, මනොවාරාවජ්ජනමනොවිඤ්ඤාණධාතුවට ද, ආවජ්ජනමනෝ විඤ්ඤාණධාතු තොමෝ, ජවනමනොවිඤ්ඤාණධාතුවට ද යට කී අනන්තරාදි පංචවිධප්‍රත්‍යයශක්තියෙන් උපකාර වේ. ආසෙවන ප්‍රත්‍යය ද මෙහි ලැබේ. මනොධාතු, මනොවිඤ්ඤාණ ධාතූන්

හා එක්ව උපදින වෙදනා, සඤ්ඤා, සඞ්ඛාර යි කියූ ධම්ධාතු තොමෝ, සත්වැදෑරුම් විඤ්ඤාණධාතූන්හට, සහජාත-අඤ්ඤමඤ්ඤ නිස්සය- සම්පයුත්ත- අත්ථි- අවිගතාදි බොහෝ ප්‍රත්‍යයයන්ගේ වශයෙන් උපකාරව සිටියි. චක්ඛුධාතු ආදීහු ද, ඇතැම් සූක්ෂම රූප හා නිප්ඵන්න ධාතු ආදි ධම්ධාතුව ද, ඇතැම් මනොවිඤ්ඤාණ ධාතුවකට ආලම්බන ප්‍රත්‍යයයාදියෙන් ප්‍රත්‍යය වෙති. චක්ඛු විඤ්ඤාණාදිධාතූන්හට හුදෙක් චක්ඛුස්ප්‍රසාද රූපාලම්බනාදීහු ම ප්‍රත්‍යය නො වෙති. සූර්‍යාලෝකාදී ආලෝකයෝ ද ප්‍රත්‍යය වෙති. **'චක්ඛු රූපාලොක මනසිකාරෙ පටිච්ච උප්පජ්ජති, චක්ඛු විඤ්ඤාණං -පෙ- මනොවිඤ්ඤාණං'** යනු සාධක ය. තේරුම යට චිත්තවගීයෙහි කියන ලද ය.

ප්‍රත්‍යයයෙන් සකස් කරණ ලද ධාතූහු අතීතඅනාගත සභාව යෙන් සිස් වූහ යි ද, නිත්‍ය, ශුභ, සුඛ, අත්තසභාවයෙන් සිස් වූහ යි ද, කම්මාදිප්‍රත්‍යයයන් අයත් කොට ඇත්තාහු යි ද දත යුතු ය. විශෙෂයෙන් වනාහි, චක්ඛුධාතුව බෙර ඇසක් සේ ද, රූපධාතුව කඩිප්පුවක් සේ ද, චක්ඛුවිඤ්ඤාණධාතුව බෙරයෙන් නික්මෙන හඬ සේ ද, නැවැත, චක්ඛුධාතුව කැටපතක් සේ ද, රූපධාතුව මුහුණ සේ ද, චක්ඛුවිඤ්ඤාණධාතුව මුවසටහන සේ ද, නැවැත උක්, තල සේ චක්ඛුධාතුව ද, උක්දඬු පෙළන යන්ත්‍රය හා තල පෙළන දණ්ඩ සේ රූපධාතුව ද, උක්පැණි, තලතෙල් සේ චක්ඛු විඤ්ඤාණධාතුව ද, නැවැත, චක්ඛුධාතුව යට සිටි ගිනිගාන දණ්ඩ සේ ද, රූපධාතුව මත්තෙහි සිටි ගිනිගාන දණ්ඩ සේ ද, චක්ඛු විඤ්ඤාණධාතුව ඒ ගැටීමෙන් හටගත්නා ගින්න සේ ද සැලකිය යුතු ය. සොතධාතුන් කෙරෙහි ද ක්‍රමය මෙසේ ය. මෙයින් දැක් වුනේ චක්ඛුධාතු ආදීන් ආත්මයෙන් තොරබව ත් කාරක, වෙදක යකු නො වනබව ත් ය. ජීවිතයෙන් තොර බෙර ඇස, කඩිප්පු ආදීන්ගේ ගැටීමක් ඇතිවිට ජීවයක් නැත්තා වූ ශබ්දාදීන්ගේ හටගැණීම සේ ජීවිතයෙන් තොර චක්ඛුරූපාදීන් ගේ එක් වීමක් ඇතිකල්හි නිර්ජීව වූ චක්ඛුවිඤ්ඤාණදීන්ගේ හටගැණුම වන බව මෙයින් පෙණේ.

මනොධාතුව වනාහි, ලැබෙන සේ, චක්ඛුවිඤ්ඤාණදීන්ගේ පෙර පසු ගමන් ගත්තකු වැනි ය. ධම්ධාතුවෙහි වෙදනාඛන්ධය ශල්‍යයක්, ශූලයක් සේ ද, සංඥාසංඛාරඛන්ධයෝ වෙදනා සඞ්ඛ්‍යාතශල්‍යයක්, ශූලයක් යෙදීමෙන් ආතුර වූ රෝගීන් සේ ද, පෘථග්ජනයන්ගේ සංඥාව, බලාපොරොත්තුවන දේ නො ලැබීමෙන් දුක උපදවන හෙයින්, සිස් වූ මිටමොළවීමක් සේ ද, ඇති සැටියෙන් නිමිති නො ගන්නා හෙයින් වනමුවකු සේ ද,

සංඝාරයෝ ප්‍රතිසන්ධියෙහි ඇද බහාලන හෙයින් අහුරුවලෙක බහාලන පුරුෂයකු සේ ද, ජාති දුඃඛයෙන් ලුහු බැඳ පවත්නා හෙයින් රාජපුරුෂයන් විසින් ලුහු බඳින ලද සොරුන් සේ ද, ගියලු අවැඩ එළවන්නා වූ සකඤ්ඣපමපරාවට හෙතු වන හෙයින් විෂවෘක්ෂයක විෂබීජ සේ ද, රූපසකඤ්ඣය නානාප්‍රකාර වූ උපද්‍රවයන්ට හෙතු වන හෙයින් ක්ෂුරචක්‍රයක් සේ ද, දුක්ඛ යුතු ය.

අසඞ්ඛතනිබ්බාණධාතුව, අමෘතයක් සේ ශාන්තහෙයින් නිර්භය වශයෙන් දුක්ඛ යුතු ය. ගියලු අවැඩ එළවන රාගාදී වූ ද ජාත්‍යාදී වූ ද සප්‍රතිභයධර්මයන්ට ඉදුරා ප්‍රතිපක්ෂ බැවිනි. මනෝවිඤ්ඤාණධාතුව, අරමුණුවල 'මේ අරමුණ මේ විඤ්ඤාණයාගේ වේය' යන නියමයක් නැති බැවින් වල් වදුරකු සේ ද, නො දැමිය හැකි බැවින් කුළු අසකු සේ ද, තමා විසින් කැමැති වන ලද අරමුණෙහි හැසිරෙන බැවින් අහසෙහි වූ දඹුකඩක් සේ ද, ලොභ ද්වේෂ මොහාදී වූ නානාවිධකෙලෙශයන් හා යෙදෙන බැවින් ද සැරසී නටන්නා වූ නළුවකු සේ ද දතයුතු ය.

ආයතනයෝ දෙළෙසෙකි. චක්ඛායතන-රූපායතන-සොතායතන - සද්දායතන - ඝාණායතන - ගන්ධායතන - ජිව්හායතන - රසායතන - කායායතන - ඵොට්ඨබ්බායතන - මනායතන - ධම්මායතන යි. මොවුන්ගේ විශෙෂ ලක්ෂණ යට කියන ලද ය. සාමාන්‍යයෙන් හෙවත් පොදු වසයෙන් අරුත් පළකරණු පිණිස ආචාර්‍යපාදයෝ **'ආයතනතො ආයානං තනනතො ආයතස්ස ච නයනතො ආයතනන්ති** වෙදිතබ්බං' යනු ගෙණ පැහ.

ඇස් කන් නාස් ආදී වූ සථානයෙක පිහිටා සිට, ඒ ඒ දෙරටු වලට හමුවන අරමුණු රස විඳ ගන්නා වූ චක්ඛුවිඤ්ඤාණඵස්සාදි චිත්තචෙතසිකධර්මයෝ ත් තම තමන් අයත් අනුභවනාදි කෘත්‍ය විශෙෂයන්හි ව්‍යායාම කෙරෙත් ද, චිත්තචෙතසිකයන්ගේ ඒ අනුභවනාදි ක්‍රියා සිද්ධියට ආධාර සථාන වූ ඇස්, කන්, නාස්, ආදීහු 'ආයතන' යි කියනු ලැබෙත්. චක්ඛුරාදිධර්මයෝ ඉතා දික් වූ සසර දුකට ඇතුළත් වූ චිත්තචෙතසිකධර්මයන් භවයෙන් භවයට දිගින් දිගට ගෙණ යත් ද, එහෙයිනුදු චක්ඛුරාදීහු ආයතන නම් වෙති. නො දත හැකි පූජීකෙළවර ඇති (අවිද්‍යමාන බැවිනි.) සසරෙහි පැවැති දුක යම්තාක් කල් නො නැවතී පවතී ද, ඒතාක් කල් මේ චක්ඛුරාදීහු සත්වයන් සසරදුකට පමුණුවත් ම ය. එහෙයිනුදු මොවුහු ආයතන නම් වෙති. තව ද මේ ආයතනශබ්දය **වාසසථාන, ආකර, සමොසරණසථාන, සංජාතිදෙශ, කාරණ** යන අර්ථයන්හි ද වැටේ. ඊශ්වරයාගේ වාසසථානය ඊශ්වරායතනය වන්නා සේ චිත්තචෙතසිකයන්ගේ වාසසථාන වූ ඇස් කන්

නාසාදීහු ආයතන නම් වෙති. රත් රිදි උපදින තැන් සුවණ්ණාකර, රජතාකර යි කියන්නා සේ යි. චිත්තචෛතසිකයන්ට නිශ්‍රය-සථාන වූ චක්ෂුරාදිය ආයතන යි හඳුන්වති. කුරුළු සිවුපාවුන් ගොදුරු ගෙණ ලගින තැන් ආයතන යි කියන්නා සේ යි. රූපාදී වූ අරමුණු ගෙණ චිත්තචෛතසිකයන් ලගින ඇස්, කන්, නාස් ආදිය ආයතනැ යි ගණිති. ගොනුන්ගේ උපපත්තිස්ථානය දක්ෂිණා-පථ' යි ද, අසුන්ගේ උපපත්තිභූමිය කාම්බොජ' යි ද, කියන්නා සේ ඇස් කන් නාස් ආදිය චිත්තචෛතසිකයන්ගේ හටගැන්මට භූමි හෙයින් ආයතනැ යි කියත්. චිත්තචෛතසිකයන්ගේ පැවැත්මට කරුණු වූ ඇස් කන් නාස් ආදිය කාරණාඊයෙන් ද ආයතන' නමැ යි ගණිති. **'ඉති නිවාසඨානඨෙන ආකාරඨෙන සමොසරණඨානඨෙන සංජාතිදෙසඨෙන කාරණටෙඨෙනාති ඉමෙහි කාරණෙහි එතෙ ධම්මා ආයතනං ආයතනානීති වුච්චන්ති'** යනු අටුවා ය. එහෙයින් චක්ෂුස වූ යේත් ඒ ම ය, ආයතන වූයේත් ඒ ම නු යි 'චක්ඛායතන' නමැ යි ගත යුතු යි. සෙස්ස ද මෙසේ ය. චක්ඛායතනාදීන්ගේ ලක්ඛණ යට කියන ලද ය. ධම්මැ යි කියනු ලබන්නේ ද ඇස් කන් නාසාදිය ම ය. එසේ කල්හි සියල්ල 'ධම්මායතන' යි නො වදරා දෙලොස් ආයතන කෙනෙක් වදරන ලද්දේ සවැදෑරුම් විඤ්ඤාණකායයාගේ උපපත්තිවාරාලම්බනයන් පිරිසිදීම හෙතුකොට ගෙණ ය. සවැදෑරුම් විඤ්ඤාණය, වාරු රම්මණභාවයෙන් පිරිසිදින හෙයින් මොවුන්ගේ මේ දෙලොස් වැදෑරුම් ප්‍රභෙදය විය. චක්ඛුවිඤ්ඤාණ ආදියට ඇතුළත් වූ චිත්ත සමූහයට උපපත්තිවාරය වන්නේ චක්ඛායතනය යි. අරමුණ වන්නේ රූපායතනය යි. සෙස්ස ද මෙසේ ගතයුතු යි. සවන වූ විඤ්ඤාණකායයට (මනායතනයට) භවාඞ්ගචිත්ත යි කියනු ලබන මනායතනයාගේ එක් කොටසෙක් ම උපපත්තිවාරය වේ. චක්ඛුවිඤ්ඤාණාදීන්ට අරමුණුවීම් වසයෙන් සාධාරණ නො වූ ධම්මායතනය අරමුණ වේ. මෙසේ හෙයින් දෙලොස් ආයතන කෙනකුන් ම වදාළ සේක.

ආධ්‍යාත්මිකආයතනයන් අතුරෙන් චක්ඛායතනය උදාහරණ සහිත බැවින් හා හැපීම් සහිත බැවිනුත්, ප්‍රකට නු යි පළමු කොටත් නිදසුන් රහිත හැටීම් සහිත ශබ්දාලම්බනාදිය අරමුණු කොට ඇති සොතායතනාදිය පසු කොටත් දෙසූහ. තව ද දස්සනානුත්තරිය, සවණානුත්තරිය ධර්මීයන්ට හෙතුභාවයෙන් උපකාර වන බැවින් ආධ්‍යාත්මිකයන් කෙරෙහි චක්ඛායතන, සොතායතනයෝ පළමු කොටත් ඊට අනතුරු කොට ඝාණායතනාදි තිදෙනාත් වදරන ලදහ. චක්ෂුරාදී වූ පස් දෙනාගේ ගොචරයන් අරමුණු කොට ඇති මනායතනය අන්‍යයෙහි ලා වදාළ සේක. බාහිරායතනයන්

අතුරෙහි රූපායතනාදීන්, චක්ඛායතනාදීන්ගේ ගොචර බැවින් ඒ ඒ ආඛ්‍යාත්මික ආයතනයන්ට අනතුරු කොට දුක් වූහ. තව ද චක්ඛුවිඤ්ඤාණාදීන්ගේ ගට ගැණීමට ඇති හෙතු නියම කිරීම් වශයෙන් ද ආයතනයන්ගේ මේ ක්‍රමය වදුළ සේක. චක්ඛුස ත් රූපාරම්මණය ත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි. -පෙ- සිත ත් ධම්මාලම්බනය ත් නිසා මනොවිඤ්ඤාණය උපදියි. මේ ඒ ක්‍රමයයි. **'චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං -පෙ- මනං ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං'** යනු දෙශනා ය.

මනායතනය හා ධම්මායතනයෙහි එක් කොටසක් 'නාම' යන්නෙන් සංග්‍රහ කළ බැවින් ද, එයින් ඉතිරි වූ ආයතනයන් 'රූප' යන්නෙන් සංග්‍රහ කළ බැවින් ද මේ ආයතන දෙලොස නාම රූප මාත්‍රයෙක් ම වේ. මේ සැකෙවිනි. විසතර විසින් වනාහි චක්ඛායතනය චක්ඛුස්සභාවයෙන් චක්ඛුස්ප්‍රසාද මාත්‍රයෙක් ම ය. මෙහි ප්‍රත්‍යය, ගති, නිකාය, පුද්ගල වශයෙන් තවත් නොයෙක් භෙද ඇත්තේ ය. අනික් පොතපත බලා ඒ දතයුතු ය.

සොතායතනාදී වූ අනික් සිවු දෙන ද එසේ නොයෙක් භෙද ඇත්තෝ ය. මනායතනය කුශල - අකුශල - විපාක - ක්‍රියා භෙදයෙන් එකුන් අනූවක් භෙද හා, එක්සිය එක්විසි භෙදයෙක් ඇත්තේ ය. චක්ඛුවත්‍ථු ආදි වත්‍ථු භෙද හා, දුක්ඛාපටිපදාදි ප්‍රතිපදා භෙද ද ඇත. රූපායතන - සද්දායතන - ගන්ධායතන - රසායතනයෝ විභාග ප්‍රත්‍යයාදීන්ගේ වශයෙන් කෙළවරක් නැති භෙද ඇත්තෝ ය. ඵොට්ඨබ්බායතනය, පඨවීධාතු - තෙජෝධාතු - වායොධාතු භෙදයෙන් තෙවැදෑරුම් වේ. තවත් මෙහි ප්‍රත්‍යයාදි භෙද ද ඇත. ධම්මායතනය, වෙදනා - සඤ්ඤා - සඞ්ඛාර - සුඛුම රූප - නිබ්බාන යන එකුන් සැත්තැවක් ධම්මයන්ගේ සභාව භෙද හා නානාත්වභෙද ඇත්තේ ය. සංඛෙප විසතර විසින් මොවුන්ගේ භෙදය වන්නේ ය.

ආයතනයෝ යම්කිසිතැනකින් නො ආවෝ ය. එසේ ම කිසි තැනෙකින් නො නික්මෙන්නෝ ය. උපපාදක්ඛණයෙන් පූර්‍වයෙහි යම් කිසි තැනෙකින් එන්නෝ ත් නො වෙති. භඞ්ගක්ඛණයෙන් මතුයෙහි යම්කිසි තැනකට යන්නෝ ත් නො වෙති. පූර්‍වාන්ත නම් වූ පූර්‍වජාතියෙන් මෙහි නො ආ බැවින් හා අපරාන්ත නම් වූ අනතුරු ජාතියට මෙයින් නො යන බැවිනුත් ය. පවත්නා කාලයෙහි ද ඉතා විකා කාලයක් ම පවත්නා බැවින් විපරිණාම සභාවය ඇත්තෝ ය. අදහසට අනුව නො යන්නෝ ය.

චක්ඛුරූපාදීන්ට 'අපගේ එක්වීමක් ඇති කල්හි විඤ්ඤාණය උපන්නේ නම් යෙහෙකැ' යි යන සිතිවිල්ලෙක් නො වන්නේ ය. චක්ඛායතනාදීහු විඤ්ඤාණය උපදවනු පිණිස වාරභාවයෙන් හෝ වත්ථුභාවයෙන් හෝ ආරම්මණභාවයෙන් හෝ උත්සාහ කරන්නාහු ද නො වෙති. උත්සාහයට හෝ නො ද පැමිණෙන්නාහු වෙති. චක්ඛුරූපාදීන්ගේ එක්වීමක් ඇති කල්හි, චක්ඛුවිඤ්ඤාණදීහු යම් හෙයකින් හට ගණිද් ද, ඒ හට ගැණීම ධර්මතාවය වේ

'එත්ථ පන සබ්බානෙව සඞ්ඛතානි ආයතනානි අනාගමනතො අනිග්ගමනතො ච දට්ඨබ්බානි. න හි තානි පුබ්බෙ උදයා කුතො චි ආගච්ඡන්ති. න පි උද්ධං වයා කුහිඤ්චි ගච්ඡන්ති. අථ ඛො පුබ්බෙ උදයා අප්පටිලද්ධසභාවානි උද්ධං වයා පරිහින්නසභාවානි පුබ්බන්තාපරන්තවෙමජ්ඣෙ පච්චයා යත්තවුත්තිතාය අවසානි පවත්තන්ති. තස්මා අනාගමනතො ච අනිග්ගමනතො ච දට්ඨබ්බානි. තථා නිරීහකතො අබ්‍යාපාරතො ච න හි චක්ඛුරූපාදීනං එවං හොති:- අහො වත අම්හාකං සාමග්ගියං විඤ්ඤාණං නාම උප්පජ්ජෙය්‍යාති න ච තානි විඤ්ඤාණුප්පාදනත්ථං ද්වාරභාවෙන වත්ථුභාවෙන ආරම්මණභාවෙන වා ඊහන්ති. න බ්‍යාරමාපජ්ජන්ති. අථ ඛො ධම්මසභාවෙසා. යං චක්ඛුරූපාදිසාමග්ගියං චක්ඛුවිඤ්ඤාණාදීනි සම්භවන්ති' යනු මෙහිලා බණ පොතෙහි ආයේය.

චක්ෂූරාදි ආඛ්‍යාත්මික ආයතනයෝ, මිනිසුන්ගෙන් සිස් වූ ගමක් සේ දතයුතු ය. නිත්‍ය- ශුභ- සුඛ- ආත්ම යන මෙයින් තොර බැවිනි. බාහිරායතනයෝ, ආඛ්‍යාත්මිකායතනයන් පැහැර ගන්නා බැවින් ගම්පහරන සොරුන් වැනි වෙත්. **'චක්ඛු භික්ඛවෙ! හඤ්ඤති මනාපාමනාපෙහි රූපෙහි'** යනු දෙශනා ය. තවද ආඛ්‍යාත්මිකායතනයෝ, නයි, කිඹුල්, උකුසු, බලු, හිවල්, වල්වඳුරු යන සතුන් වැනි වෙති. බාහිරායතනයෝ ඔවුන්ගේ ගොදුරු වැනි වෙති. චක්ඛු- සොත- ඝාණ- ජිව්හා- කාය- මන යන සදෙන ආඛ්‍යාත්මිකයෝ ය. රූප- සද්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බ- ධම්ම යන සදෙන බාහිරයෝ ය.

මෙහි සැකෙවින් කියූ සකන්ධ- ධාතු- ආයතනයෝ භව- ගති- යොනි- විඥානස්ථිති- සත්වාවාස- වොකාර භව වශයෙන් විවිධාවස්ථාවන්ට පැමිණ චුතිපටිසන්ධි වසයෙන් නිවත් පසක් කරණ තුරු පෙළ ගැසී ගමන් කරන්නෝ ය.

එහි කාම- රූප- අරූප යි භව තුනකි. නිරය- තිරච්ඡාන පෙත්තිවිසය- මනුස්ස- දෙව යි ගති පසෙකි. අණ්ඩජ- ජලාබුජ- සංසෙදජ- ඔපපාතික යි යොනි සතරෙකි. නානත්තකාය

නානත්තසඤ්ඤිදි- නානත්තකායඒකත්තසඤ්ඤිදි- ඒකත්තකාය නානත්තසඤ්ඤිදි- ඒකත්තකායඒකත්තසඤ්ඤිදි- ආකාසානඤ්චා යතන- විඤ්ඤාණඤ්චායතන- ආකිඤ්චඤ්ඤායතන යි විඤ්ඤනසපිති සතෙකි. සපාවිඤ්ඤනසපිති- අසඤ්ඤසත්ත- නෙවසඤ්ඤානාසඤ්ඤි යතන යි සත්තාවාස නවයෙකි. කාමභව- රූපභව- අරූපභව- සඤ්ඤීභව- අසඤ්ඤීභව- නෙවසඤ්ඤීනාසඤ්ඤීභව- පංචවොකාර භව- චතුවොකාරභව- එකවොකාරභව යි වොකාරභව නවයෙකි. භවත්‍රයයෙහි හා ගතිපංචකයෙහි කෙටි කතාවක් යට කියනලදී.

'යෙ බොා සාරිපුත්ත! සත්තා අණ්ඩකොසං අභිනිබ්භිජ්ජ අභිනිබ්භිජ්ජ ජායන්ති, අයං වුච්චති සාරිපුත්ත! අණ්ඩජා යොනි' යි, අණ්ඩකොෂය බිඳ උපදින සත්වයෝ අණ්ඩජයොනිහු යි වදාරන ලද ය. බිජුවටින් උපදින පක්ෂි සර්පාදිහු අණ්ඩජයෝ ය. **'යෙ බොා පන සාරිපුත්ත! සත්තා වත්ථිකොසං අභිනිබ්භිජ්ජ අභිනිබ්භිජ්ජ ජායන්ති, අයං වුච්චති සාරිපුත්ත! ජලාබුජා යොා'** යි, වස්තිකොෂය බිඳ උපදින සත්වයන් ජලාබුජ, යි කීහු. **'ජරා ජීරණං භෙදං යානි උපෙතීති වා, ජලං වුච්චති කලලං තං ආවුණාති පවිජාදෙතීති = ජලාබුජා'** යි කී බැවින් දිරීමට යන්නේ හෝ කලල රූපය වසන්නේ හෝ ජලාබුජ නම්. වස්තිකොෂය යි මෙහි කීයේ වැදුමස යි. මිනිස් ආදීහු ජලාබුජයෝ ය. **'යෙ බොා පන සාරිපුත්ත! සත්තා පූතිමච්ඡෙ වා ජායන්ති පූතිකුණපෙ වා පූතිකුම්මාසෙ වා චන්දනිකාසෙ වා ඔලිගල්ලෙ වා ජායන්ති, අයං වුච්චති සාරිපුත්ත! සංසෙදජා යොනි'** යි, කුණු මස් මීනිකුණු කුණු බොජුන් ගම්දොර ගවරවල්හි උපන් සත්වයන් සංසෙදජ යි කීහ. දියසීරාව, සෝදිය සංසෙද නම්. මෙහි අපිරිසිදු තැන් දුක්වුව ද, ගිතෙල් තලතෙල් මීපැණි පියුම් පල ආදි තත්හි ද සත්වයෝ උපදිති. ඔවුහු ද සංසෙදජයෝ ය. උකුණු මකුණු ආදීහු ය සංසෙදජයෝ. **'දෙවා නෙරයිකා එකච්චෙ ච මනුස්සා එකච්චෙ ච විනිපාතිකා, අයං වුච්චති සාරිපුත්ත! ඔපපාතිකා යොනි'** යි, දෙවියෝ, නිරයෙහි වූවෝ, ඇතැම් මනුෂ්‍යයෝ, ඇතැම් විනිපාතිකයෝ ඔපපාතිකැ යි වදාරන ලදහ. තරුණ මාණවකයන් මෙන් සම්පූර්ණ අඞ්ගප්‍රත්‍යඞ්ග ඇති ව උපදින අය, ඔපපාතික නම් වෙත්. බූමාටු දෙවියෝ චතුර්විධයෝනි ඇත්තාහ. මිනිසුන් අතුරෙහි කිසිකෙනෙක් ම ඔපපාතික වෙති. වැඩි දෙනෙක් ජලාබුජයෝ ය. කුනත පුත් දෙබෑතෙරුන් මෙන් අණ්ඩජයෝ ද වෙති. පියුම් ගැබ උපන් පොක්ඛරසාතිබ්‍රාහ්මණ, පද්මාවති ආදීන් මෙන් සංසෙදජයෝ ද වෙති. විනිපාතිකයන් අතුරෙහි නිජ්ඣාමතණ්හිකා ප්‍රෙතයෝ, තිරිසතුන් මෙන් ඔපපාතිකයෝ ම ය. සෙස්සෝ සිවුයොනි ඇත්තෝ ය.

මනුෂ්‍යයෝ, කාමාවචරදෙවියෝ, ඇතැම් චතුපපාතිකයෝ නානත්තකායනානත්තසඤ්ඤී නම් වෙති. අප්‍රමාණචක්‍රවාටයන්හි අප්‍රමාණමනුෂ්‍යයන් අතර පැහැ සටහන් ආදියෙන් එක සමාන වූවෝ නැත. පැහැ සටහන් ආදියෙන් එක සමාන වූ නිඛුල් සහෝදරයෝ වූවාහු නමුත්, ඔවුහු ද යෑම්, ඒම්, හිඳුම්, සිටුම්, කෑම්, කෙරුම් බැලුම් ආදියෙන් අසමාන වෙති. ඔවුන්ගේ ප්‍රතිසන්ධි විඤ්ඤණය ද, ත්‍රිහෙතුක ද, ද්විහෙතුක ද, අහෙතුක ද වේ. එහෙයින් මනුෂ්‍යයෝ නානත්තකායනානත්තසඤ්ඤී නම් වෙති. කාමාවචර දෙවියන් අතර ඇතැමුන්ගේ ශරීරය නිල්පැහැ ඇත්තේ ය. ඇතැමුන්ගේ ශරීර රත්වන් ය. ඇතැමුන්ගේ ලේ වන් ය. ප්‍රතිසන්ධි චිත්තයෙන් ද, ඔවුහු ද්විහෙතුක ත් ත්‍රිහෙතුක ත් වෙති. එහෙයින් ඒ දෙවියෝ ත් නානත්තකායනානත්තසඤ්ඤීහු ය. උත්තරමාතා-යකඛිනී, පියඞ්කරමාතා, ධම්මගුත්තා යනාදී ඇතැම් චතුපපාතිකයෝ සුදු කලු ආදි පැහැයෙන් හා තර නො තර උස් මිටි කම්වලින්ද වෙනස් වෙති. ප්‍රතිසන්ධිචිත්තය ත් ද්විහෙතුක ද, ත්‍රිහෙතුක ද, අහෙතුක ද වේ. මෙසේ මොවුහු ද කයින් හා ප්‍රතිසන්ධිවිඤ්ඤන-යෙන් නානා සභාව ඇති බැවින් නානත්තකායනානත්තසඤ්ඤී නම් වෙති.

බ්‍රහ්මපාරිසජ්ජ- බ්‍රහ්මපුරෝහිත- මහාබ්‍රහ්ම යන හීන, මධ්‍යම, ප්‍රණීතභෙදයෙන් භින්න වූ ප්‍රථමධ්‍යාන කුශලවිපාකයෙන් උපන් බ්‍රහ්මකායිකයෝ ද, සතර අපායයෙහි වූවෝ ද, නානත්තකාය එකත්ත සඤ්ඤී නම් වෙති. ඔවුන් අතරෙහි බ්‍රහ්මපුරෝහිතයන්ගේ ශරීරය බ්‍රහ්මපාරිසජ්ජයන්ගේ ශරීරයට වඩා, ප්‍රමාණයෙන් මහත් වේ. බ්‍රහ්ම පුරෝහිතයන්ගේ ශරීරයට වඩා මහාබ්‍රහ්මයන්ගේ ශරීරය මහත් වේ. එහෙයින් මොවුහු කයින් වෙනස් කම් ඇත්තෝ ය. ප්‍රතිසන්ධි විඤ්ඤණයෙන් සමානයෝ ය. නරකයෙහි ද ඇතමුන්ගේ අත්බව යොදුන්, අඩයොදුන් පමණ වේ. දෙවිදත්-හුගේ අත්බව යොදුන් සියයෙකි. තිරිසනුන් අතර ද කෙනෙක් කුඩා ය. කෙනෙක් මහත් ය. ප්‍රෙත ලොකයෙහි ද සැට අසුරියන් උසැති ප්‍රෙතයෝ වෙති. සමහරු සුවණ්ණියහ. සමහරු දුවණ්ණියහ. දීඝපිට්ඨික ප්‍රෙතයෝ, සැට යොදුන් පමණ වෙති. කාලකඤ්ඤක අසුරයෝ ද එසේ ය. සියල්ලන්ගේ ම ප්‍රතිසන්ධි විඤ්ඤණය අකුශල-විපාකාහෙතුක ය. එහෙයින් ආපායිකයෝ ත් නානත්තකාය එකත්තසඤ්ඤීහු යි කියනු ලැබෙති. විතීයඣ්‍යාන භූමිකබ්‍රහ්මයන්ගේ සිරුරු උසමහතින් සමාන ය. පරිත්තාභ - අප්පමාණාභ - ආභස්සර යන මොවුහු, විතීයඣ්‍යානභූමිකයෝ ය. ප්‍රතිසන්ධිවිඤ්ඤණය විතීයඣ්‍යානවිපාකයන්ගේ වසයෙන් වෙනස් වේ.

එකත්තනකායඑකත්තසඤ්ඤීහු නම්, පරිත්තසුභ – අපපමාණසුභ- සුභකිණ්ණ යන මොවුහු ය. තෘතියධ්‍යාන භූමිකයෝ ත් මොවුහු ය. කයින් හා ප්‍රතිසන්ධිවිඤ්ඤනයෙන් සමානයෝ ය. චතුර්ථධ්‍යාන විපාකය මොවුන්ගේ ප්‍රතිසන්ධිවිඤ්ඤනය යි. වෙහප්ඵලබ්‍රහ්මයෝ ද මේ සිවුවන විඤ්ඤනසථිතිය ම සෙවුනෝ ය. කයින් හා පඤ්චධ්‍යාන විපාකයාගේ වශයෙන් ප්‍රතිසන්ධිවිඤ්ඤනයෙන් සමාන බැවිනි. සුඛාවාසිකබ්‍රහ්මයෝ උත්පත්තිය පිණිස පෙරළා නො එන බැවින් විවටය ඇසුරු කළෝ ය.. බුඛශූන්‍යලෝකයෙහි ඔවුහු නො උපදිති. බුදුවරුන්ගේ උත්පත්තිය ඇති කාලයෙහි ම ය උපදින්නෝ. අසඤ්ඤසත්තය හැර, පරිත්තසුභය පටන් අකනිඨය අවසන් කොට සිටි නවභූමියෙහි සත්වයෝ එකත්තනකායඑකත්තසඤ්ඤීහු යි හඳුන්වනු ලැබෙත්. අබුඛොත්පාදයෙහි තීර්ථකයන් වෙත පැවිදි ව යොගකසිණපරිකම්ම කොට චතුර්ථධ්‍යානය උපදවා එයින් නැගිට 'ඛි චිත්තං, ඛි චිත්තං' යි චිත්තයාගේ අභාවය මැනැව, සිත නිසා සියලු වධබන්ධනාදි වූ දුක් උපදනේ ය, සිත නැති කල්හි මේ කිසි දුකෙක් නැතැ, යි රුචි උපදවා ධ්‍යානයෙන් නො පිරිහුනෝ ම කලුරිය කොට රූපප්‍රතිසන්ධිවශයෙන් අසංඥභවයෙහි උපදිත්. ඔවුහු යම් ඉරියව්වෙකින් මනුෂ්‍යලෝකයෙහි කල් යැවිවෝ නම්, ඒ ඉරියව්වෙන් ම එහි ඉපිද කල්ප පන්සියයක් හෝ, හුන්නෝ හෝ නිදන්නෝ හෝ වෙති. මෙසේ චිත්තවිරාගභාවනාවශයෙන් එහි ඔවුන් පිළිබඳ විඤ්ඤනයාගේ පහළවීමක් නො වන බැවින් විඤ්ඤනයාගේ අභාවයෙන් විඤ්ඤනසථිතියක් භජනය නො කෙරෙති.

මෙසේ විනිපාතිකයන් ඇතුළු ව කාමාවචරදෙවියෝ ත් මනුෂ්‍යයෝ ත් නානත්තකායනානත්තසඤ්ඤී නම් වෙති. ප්‍රථමධ්‍යාන භූමිකයෝ ත් ආපායිකයෝ ත් නානත්තකායඑකත්තසඤ්ඤී නම් වෙති. ද්විතීයධ්‍යානභූමිකයෝ එකත්තනකායනානත්තසඤ්ඤී නම් වෙති. තෘතියධ්‍යානභූමිකයෝ ත් අසඤ්ඤසත්තය හැර චතුර්ථධ්‍යානභූමිකයෝ ත් එකත්තනකායඑකත්තසඤ්ඤී නම් වෙති, යි දතයුතු ය. ඉතිරි, ආකාසානඤ්චායතන- විඤ්ඤණඤ්චායතන- ආකිඤ්චඤ්ඤායතන- විඤ්ඤනසථිති, සට කියන ලද ය.

සත්තවිඤ්ඤනසථිතිය අසංඥසත්වය නෙවසඤ්ඤානාසංඥායතනය යන නව සත්වාවාසය, කියූ පරිදි දතයුතු ය.

සකඤ්චපඤ්ඤ ඇති භවය, පංචවොකාරභව නම්. කාමභවයෙහි හා රූපභවයෙහි එකදෙශයකු ත් එහි ඇතුළත් ය. වොකාර යනු සකඤ්ඣනට නමෙකි. සතර නාමස්කන්ධයෙන් යුත් භවය, එනම් අරූපීබ්‍රහ්මලොක සතර, චතුවොකාරභව නම්. රූපසන්ධිය පමණක් ඇති භවය, එකවොකාරභව නම්. ඒ නම් අසංඥභවය යි.

ඉතා සැකෙවින් කියූ භව, ගති, යොනි ආදිය, නොහැර පවත්නෝ සකඬ, ධාතු, ආයතනයෝ ය. සකඬ ධාතු ආයතනයෝ භවයෙන් භවයට ඒ ඒ හෙතූන් නිසා, ඒ ඒ භවසෙහි විපාක වශයෙන් සංක්‍රමණය වන්නෝ ය. වර්තමානභවයෙහි හෙතූන් නිසා අනන්තරභවයට ඵලවශයෙන් මාරුවීමේ දී (භවයෙක සිට ඒ සිටි භවයෙහි හෙතූන් නිසා අනික් භවයෙක උත්පත්තිය ගැණීමේදී) ඒ සිටි වර්තමානභවයෙහි කෙළවර ලැබෙන සිත 'චුති' යි කියනු ලැබේ. එසේ කියනු ලබන්නේ ලං වූ මරණය ඇත්තහුට පහළ වන චිරිචිත්තයාගේ අවසානයෙහි හෝ ඉන් පසු හෝ උපදින භවාඞ්ගයාගේ අවසානයෙහි ලැබෙන සිත වර්තමානභවයෙන් ගලවා දැමීම කරණ බැවිනි. එක් චිත්තවීථියක් හෝ, එක් සිතක් හා භවාඞ්ගචිත්තයක් හෝ ඉපැත්මෙන් යමෙක් වර්තමානභවයෙන් ගිලිනී යේ නම්, ඔහු ඉතා ලං වූ මරණ ඇත්තෙකැ යි කැලකේ.

'භවතෝ භවස්ස පටිසන්ධානං පටිසන්ධි' යි කී බැවින් අතීත භවය හා වර්තමානභවය ත් වර්තමානභවය හා අනාගතභවය ත් අතරක් නැති සේ ගළපන්නා වූ සිත 'පටිසන්ධි' නම් වේ.

මරණය ලං වූ විට අකුශලපක්ෂයෙන් ආනන්තර්‍යීකර්‍මය, කුශලපක්ෂයෙන් අෂ්ටසමාපත්ත්‍යාදිගරුකර්‍මය, නිතර පුරුදු කරණ ලද බහුලකර්‍මය, ආසන්නකර්‍මය, කප් කෙළගණනකින් පෙර කළ අපරාපරීයවේදනීයකර්‍මය යන මොවුන් අතුරෙන් එකක් හෝ කර්‍මනිමිත්තයෙන් එළවන ලද දැනවසතු, විහාර, පරායතනවසතු, පරප්‍රාණ, ආයුධාදි කර්‍මනිමිත්තක් හෝ උද්‍යාන, විමාන, කල්පවෘක්ෂ, මාතෘකුක්ෂි, නරකාග්නි, පර්‍වත, ආරණ්‍යාදි ගති නිමිත්තක් හෝ සවස් කාලයෙහි කදුසෙවනැල්ල පෙරදිගට වැටී යන්නා සේ සිතට වැටහෙන්නේ ය. මේ වැටහීම වනුයේ කර්‍මානුභාවයෙන් ම ය. ඉදිරි අත්බවෙහි ප්‍රතිසන්ධිය දීමට නියත වූ ප්‍රතිසන්ධිජනක කර්‍මය විසින් මෙය සිතට එළවනු ලැබේ. යමකු කළ කර්‍ම අතුරෙන් යම් කර්‍මයෙක් දෙවන ජාතියෙහි ප්‍රතිසන්ධිය දෙන්නේ ද, එය මෙහි 'කර්‍ම' යි කියන ලදි. එය කුශලාකුශල වශයෙන් දෙපරිදි ය. 'උපෙක්ඛාසහගතඋද්ධච්ච සිත හැර, අනික් අකුසල් සිත් එකොළොස අකුශලකර්‍ම නම්. උපෙක්ඛාසහගත උඬච්ච සිත ප්‍රතිසන්ධිවිපාක නොදෙන්නේ ය. කුශලපක්ෂයෙහි කාමාවචර කුසල් සිත් අට කර්‍ම නම් වේ. සුදුසු පරිදි ඔවුහු ප්‍රතිසන්ධිය දෙන්නෝ ය. රූපාවචර අරූපාවචර සත්ත්වයන්ට කර්‍මය අරමුණු නොවේ. ධ්‍යාන කුසල් ම ඔවුන්ට කර්‍මය වේ.

පරපණ-දඩ්ඩමුගුරු-අවි ආදිය අකුශලකම්මනිමිති යි. විහාර-වෛත්‍ය – ප්‍රතිමාඝරාදිය කුශලකම්මනිමිති යි. කුශලාකුශලකම්ම කිරීමට උපකරණ හෙයින් මොවුහු කම්ම නිමිති යි කියනු ලැබෙති. කම්ම වනාහි මනොද්වාරයට ම වැට හෙන්නේ ය. කම්මනිමිත්ත වනාහි රූප-ශබ්ද-ගන්ධ-ස්ප්‍රෂ්ටව්‍ය-ධම්ම වශයෙන් ෂඩ්වාරයෙහි වැට හෙන්නේ ය.

ප්‍රතිසන්ධිය දෙන්නා වූ කුශලාකුශලකම්මයකින් යම්කිසි ලෝකයෙක උපදින්නෝ ද, ඒ ලෝකය පිළිබඳ ඝම්කිසි නිමිත්-තෙක් ගතිනිමිත්ත යි ගැණේ නිරයෙහි උපදිනවුන්ට නිරයගිනි නිරයපාලාදීහු ද, තිරිසන් අපායයෙහි උපදිනවුන්ට පඵිතවනාදිය ද අකුශලකම්මයෙන් එළවන ගතිනිමිත්තයෝ ය. කුශලකම්මයෙන් මවූකුස උපදිනවුන්ට මාතෘකුක්ෂි, වණිකම්බලාදිය ද, දෙව්ලොව-උපදිනවුන්ට දිව්‍යසෞ – දිව්‍යවෘක්ෂාදිය ද ගතිනිමිත්ත වශයෙන් එන අරමුණු ය. ගතිනිමිත්ත, මනොද්වාරයට පමණක් අරමුණු වේ ය, යි කෙනෙකුන් කියන අතර, අනික් කෙනෙක් ෂඩ්වාරයට ම අරමුණු වේ ය, යි කියත්. කෙසේ හෝ වේවා, කම්මීන් අතුරෙන් යමක් ලං ව සිටිකල, ඔහුගේ චිත්තසන්තානය එහි ඵල්බ ගෙණ ඉඳිරියෙහි ලැබෙන භවයට සුදුසු පරිදි කුශල වශයෙන් පිරිසිදු ව හෝ අකුශල වශයෙන් අපිරිසිදු ව හෝ නැමී පවත්නේ ය. ඉකුත් ජාතියෙහි සොමනස්සසහගතඤාණසම්පයුත්ත සිතින් දැන සීල භාවනාදී වූ පින්කමක් කරණ ලද්දේ නම්, ඉදිරි භවයෙහි විපාක දිය යුතු වූ ඒ කුශලකම්ම, මරණාසන්නකාල යෙහි වැටහීමෙන් ඒ පින්කම සිදු කළ අවස්ථාවෙහි මෙන් ම මහත් සතුටෙක් උපදනේ ය. එ ඔතු ද, ඒ කුශලකම්ම කරන්නා සේ ද, ඒ ඇසිල්ලෙහි ඔහුට වැට හෙන්නේ ය. අකුශලකම්මයෙක් වැටනී ගියේ නම් දෙම්නස්විම් ආදි වශයෙන් එයට සරිලන සේ සිත සකස් වන්නේ ය.

ලං වූ මරණය ඇත්තේ කාමභාවයෙන් චුත ව කාමභවයෙහි උපදින්නේ නම්, ඔහුට ඒ අවස්ථාවෙහි ජවනපරියොසාන වූ හෝ තදාරම්මණපරියොසාන වූ විපිවිත්තයෙක් පහළ වන්නේ ය. කාම භවයෙන් චුත ව අන්‍යභවයෙක උපදින්නට ලැබෙන විපිවිත්තය ජවන් අවසන් කොට ම ඇත්තේ ය. මේ කියන චිත්තවීථිය ආසන්න මරණ ඇත්තහුට ඒ වර්තමානභවය පිළිබඳ ව උපදින අන්තිම චිත්තවීථිය යි. තමන් දැන් ජීවත් වන ඒ වර්තමානභවයෙහි මින් පසු තවත් චිත්තවීථියක් නො ලැබෙන්නේ ය. මේ චිත්තවීථියෙහි කෙළවර සිටි චුතිචිත්තයෙන් පසු වර්තමානභවය පිළිබඳ විපි සිත් පහළවීමෙක් නැත්තේ ය. තව ද මෙකී චිත්තවීථියෙන් පසු

එකොළොස් කාමභූමිය, පසළොස් රූපභූමිය යන පංචවොකාර භවයෙහි හෙවත් පඤ්චස්කන්ධය මුළුමනින් ඇති භවයෙහි හෘදය වාස්තුරූපය හෝ චතුවොකාරභවයෙහි හෙවත් රූපස්කන්ධය නැති සතර අරූපභූමියෙහි හෝ චිත්තසන්තානය, චිත්තක්ෂණ දෙකෙක ආයු ඇති ව සිටියේ නම්, වීථිචිත්තයාගේ අවසානයෙහි භවාඞ්ගයෙක් උපදනේ ය. එහි ද කාමභවයෙන් චුත ව කාමභව යෙහි උපදින තැනැත්ත හුට ජවනාවසානයෙහි හෝ තදාරම්මණාව සානයෙහි හෝ භවාඞ්ගය වන්නේ ය. අන්‍යයාට භවාඞ්ගය වන්නේ ජවන් කෙළවරදී ම ය. මෙසේ වීථිචිත්තයාගේ හෝ ඉන් පසුව උපදින භවාඞ්ගයාගේ හෝ අවසානයෙහි වර්තමානභවයාගේ අන්තිමචුතිචිත්තය ඉපිද නිරුඬ වන්නේ ය. ඒ නිරුඬවීම සමග එයට අනතුරුව මේ භවයෙහි අවසාන වශයෙන් පහළ වූ චිත්තවීථියට, පෙර කී කර්ම-කර්මනිමිත්ත - ගතිනිමිත්ත අතුරෙන් යමෙක් අරමුණු වී ද, එය ම ලබන්නා වූ භවයෙහි ප්‍රතිසන්ධි සිතට ද අරමුණු වන්නේ ය එසේ අරමුණු වූ කර්මාදී වූ යමෙක එල්බ ගෙණ අවිද්‍යාවෙන් වට කර ගන්නා ලද තෘෂ්ණානුශය මුල් කොට ඇති ප්‍රතිසන්ධිජනකචෙතනාවෙන් හෝ මරණාසන්නජවනවිඥාන සහජාතචෙතනාවෙන් හෝ උපද වන ස්පර්ශාදිසම්ප්‍රයුක්තධර්ම යන්ගෙන් වට කර ගත් සහජාතධර්මයන්ට ආධාරස්ථාන බැවින් පූර්වාඞ්ගම වූ ප්‍රතිසන්ධිචිත්තය, අකුශලකර්මයකින් නම්, සතර අපාය යෙහි ද, කුශලකර්මයකින් නම්, කාමස්වර්ගයෙහි හා රූපාරූපලොක යන්හි ද භවාන්තරසන්ධානවශයෙන් ඉපැදෙමින් පවත්නේ ය. ඉන්පසු භවාඞ්ග වන්නේ ය. මෙ කී ප්‍රතිසන්ධිචිත්තය චුතිපටිසන්ධි චිත්තයන්ගේ අතරතුරක් නැති ව පරම්පරාවගේ වශයෙන් එකට සම්බන්ධ ව පවතී. ඝණ්ඨාශබදයෙන් පසු ව දුවන ශබදය' මුල් ශබදයෙන් කිසිවක් නො ගොස් හට ගන්නා සේ ද, පහනකින් තවත් පහනක් දල්වන කල්හි පළමු පහනින් කිසි ත් නො ගොස් දෙවන පහන දැල් වෙන්නා සේ ද, කැටපතෙහි මූණ බලන කල්හි මූණෙන් කිසි ත් නො ගොස් කැටපතෙහි මූණ පිළිබිඹු වන්නා සේ ද, සත්‍යයා පිළිබඳ ප්‍රතිසන්ධිචිත්තය, අතීත ජාතිය සම්බන්ධ වූ පඤ්චස්කන්ධයෙන් කිසි ත් දෙයක් නො ගෙණ අතීත ජාතියෙහි වූ හෙතුධර්මයන්ගේ උපකාරය නිසා, මේ භවයෙහි පහළ වේ. එක් භවයකින් අනික් භවයෙක උපදින විට ඒ සිටි භවයෙහි පඤ්චස්කන්ධයෙන් කිසි ත් ස්කන්ධයෙක් උපදින භවය ට ත්, යන්නේ ය යි ද, උපදින භවයට, සිටි භවයෙන් කිසි ත් උපකාරයෙක් නො වූයේ යිද නො ගතයුතු ය. මරණයට පැමිණෙන් නහුගේ පංචස්කන්ධය මෙහි ම නිරුඬ වන්නේ නමුදු, කර්මවෙගය කරණ කොට මරණාසන්න ජවනවීථියෙහි උපදින මරණාසන්න

ජවනයන් පස්දෙනා හා යෙදී සිටින චෙතනාවෙන් නානාක්ෂණිකකර්මශක්තිය ප්‍රධාන කොට ඉදිරි භවයෙහි පිළිසිඳ ගැණුම වන්නේ ය.

සාමාන්‍යයෙන් ජවන් සිත් සත් වරක් උපදින්නේ නමුත්, මරණය ආසන්නවූවහුට මේ මරණාසන්නවීථියේදී ජවන් සිත් උපදින්නේ පස්වරෙකි. කර්මය හෝ හෘදයවාස්තුව දුර්ලබැවින් එසේ වේ.

අතීතයෙහි කර්ම රැස් කරණ කල්හි චතුස්සත්‍යධර්මවිෂයයෙහි මූලාවැ යි කියන අවිද්‍යාව ය, ආයූහනැ යි කියන පූර්වචෙතනා සඞ්ඛ්‍යාතසංස්කාර ය, ඇලුම් කිරිමැ යි කියන තෘෂ්ණාව ය, දැඩි කොට අල්ලා ගැණිමැ යි කියන උපාදාන ය, සප්තමජවන චෙතනා යි කියන කර්මභව ය යන මේ පස, මේ අත්බවෙහි පිළිසිඳ ගැණුමට කරුණු විය. මේ අතීතහෙතු ය. අතීතභවය ත් වර්තමානභවය ත් දෙක ගැළපීම් වශයෙන් උපදින ප්‍රතිසන්ධි විඥානය, ඒ හෙතුවෙන් වන්නා වූ රූපාරූපධර්මයන්ගේ පහළ වීමැ යි කියන නාමරූපය, චක්ෂුරාදිෂඩායතනය, අරමුණු පහස්නා ආකාර වූ ස්පර්ශය, ඒ හා උපන් විපාකවෙදනාය, යන පස, මේ භවයෙහි අතීතහෙතුන්ගේ ඵලභාවයෙන් පහළ විය මේ ය, වර්තමාන ඵල ය. මේ ජාතියෙහි වූ තෘෂ්ණා, උපාදාන, භව, අවිද්‍යා, සංස්කාර යන පස, අනාගතයෙහි ප්‍රතිසන්ධියට කරුණු වන බැවින් වර්තමානහෙතු ය. වර්තමානභවයෙහි මේ හෙතුන් නිසා අනාගතභවයෙහි විඥාන, නාමරූප ෂඩායතන, ස්පර්ශ, වෙදනා යන පස, ඵලභාවයෙන් පහළ වන්නේ ය.

මෙසේ හෙතුඵලභාවයෙන් සකන්ධ ධාතු ආයතනයන්ගේ භවයක් පාසා දිගින් දිගට ගැළපී යෑම 'පටිසන්ධි' යි යට කියා ඇත. ඒ මේ පටිසන්ධිය වනාහි **අපායපටිසන්ධිය, කාමසුගතිපටිසන්ධිය, රූපාවචරපටිසන්ධිය, අරූපාවචරපටිසන්ධිය,** යි සිවු වැදැරුම් ය. විස්තර විසින් මෙය **අසඤ්ඤසත්තපටිසන්ධිය** ත් සමග විස්සෙක් වේ. මෙහි අපායපටිසන්ධිය දෙන්නේ **'අකුසලවිපාකඋපෙක්ඛාසහගතසන්තීරණචිත්තය'** යි. නරක, තිරිසන්, ප්‍රෙත, අසුර යන සිවු අපායයෙහි උපදින්නෝ මේ සිතින් ම උපදිති. භවාඞ්ගවශයෙන් පවතින්නේ ත් චුතිය වන්නේ ත් මේ සිත ම ය. කාමසුගතිපටිසන්ධිය නම්, **'කුසලවිපාක උපෙක්ඛාසහගත සන්තීරණචිත්තය'** හා **කාමාවචරමහාවිපාක'** සිත් අට ය. එකතු ව නවයෙකි. මෙහි කුසලවිපාක උපෙක්ඛාසහගත සන්තීරණචිත්තයෙන් මිනිස්ලොව ජාත්‍යන්ධ, ජාතිබධිර, ජාත්‍යාඝ්‍රාණ, ජාතිමූග, ජාතිඵළ, ජාත්‍යුන්මත්ත, පණ්ඩක, උභතොබ්‍යඤ්ජනක,

නපුංසක, වාමන ආදීන්ගේ හා ඇතැම් විනිපාතිකඅසුරයන්ගේ ද ප්‍රතිසන්ධිය වන්නේ ය. කාමාවචරමහාවිපාකසිත් අට, සත් වදුරුම් කාමස්වර්ගයෙහි දෙවියන්ගේ හා මිනිස්ලොව බුදු පසේ බුදු අගසවු මහසවු සක්විති ආදීන්ගේ ප්‍රතිසන්ධිය දෙන්නේ ය. මේ මහාවිපාක අටින් සතරෙක් විහෙතුක ය. සතරෙක් ත්‍රිහෙතුක ය. විහෙතුක ප්‍රතිසන්ධි ඇත්තෝ රූපයෙන් හා ධනයෙන් ආඪ්‍ය වෙති. එහෙත් නුවණ නැත්තෝ ය. ත්‍රිහෙතුකයෝ සියල්ලෙන් සම්පූර්ණයහ.

අකුශලවිපාකප්‍රතිසන්ධිය හා මෙ කී නව ය, කාමාවචරප්‍රතිසන්ධිය යි ගන්නේ.

බ්‍රහ්මපාරිසජ්ජ – බ්‍රහ්මපුරොහිත – මහාබ්‍රහ්ම යන තුන් තලය ප්‍රථමඩ්‍යානභූමීහු ය. මෙහි ප්‍රතිසන්ධි වනුයේ **ප්‍රථමඩ්‍යානවිපාක චිත්ත** යි. භවාඞ්ග චුති වශයෙන් ද පවතී.

පරිත්තාභ – අප්පමාණාභ – ආභස්සර යන තුන්තලය චිතීය ඩ්‍යාන භූමීහු ය. **චිතීයතෘතීයඩ්‍යානවිපාක** සිත් දෙක ය, මෙහි ප්‍රතිසන්ධිය වනුයේ. භවාඞ්ග චුතිවශයෙන් පවත්නේ ද මේ ය.

පරිත්තසුභ – අප්පමාණසුභ – සුභකිණ්ණ යන තුන් තලය තෘතීයඩ්‍යාන භූමීහු ය. **චතුර්ථඩ්‍යානවිපාකචිත්තය,** මෙහි ප්‍රතිසන්ධිය වේ. භවාඞ්ග චුතිය වනුයේ ද මේ ය.

වෙහප්ඵල-අසඤ්ඤසත්ත-සුඩාවාස යන මොවුහු චතුර්ථඩ්‍යාන භූමීහු ය. **පංචමඩ්‍යානවිපාකචිත්තය,** ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතී. අසංඥසත්වයන්ට ප්‍රතිසන්ධිය වනුයේ රූපැ යි යට කියන ලදී. එහෙයින් ඔවුනට ප්‍රවෘත්ති – චුතිකාලයන්හි රූපය ම පැවැත තිරුඩ වේ. මේ සමග රූපාවචරප්‍රතිසන්ධි සයෙකි.

ආකාසානඤ්චායතන – විඤ්ඤාණඤ්චායතන – ආකිඤ්චඤ්ඤායතන – නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරූපී බ්‍රහ්මලොක සතරෙහි එ නමින් කියවෙන විපාකසිත් සතර, ප්‍රතිසන්ධි භවාඞ්ග චුති හෙයින් පවතී. මෙසේ අරූපාවචර ප්‍රතිසන්ධි සතරෙකි.

'පටිසන්ධි භවඞ්ගං ච තථා චවනමානසං,
එකමෙව තථෙවෙක විසයං වෙක ජාතියං'

යනු ආගම බැවින්, ප්‍රතිසන්ධි-භවාඞ්ග-චුති සිත්, එක ජාතියෙහි කර්ම – කර්මනිමිත්ත – ගතිනිමිත්ත අතුරෙන් එකක් ම අරමුණු කොට ගත් එක් සිතෙකැ යි දතයුතු ය. භවයෙක පිළිසිඳ ගන්නා සිත ද, ඒ භවයෙහි වසන තාක් උපදින භවාඞ්ග සිත් ද, එයින් ගිලි හී යන්නා වූ චුති සිත ද යන තුන, එයට පෙර භවයෙහි කළ කර්මාදී වූ එක් ම නිමිත්තක් අරමුණු කොට පවති යි කීයේ ය.

ප්‍රතිසන්ධි පිළිබඳ අරමුණ කම්ම – කම්මනිමිත්ත – ගතිනිමිත්ත යි තෙ පරිදිවත් ම අතීතාරම්මණය-පච්චුපන්නාරම්මණය-නවතබ්බා රම්මණය යි එහි තවත් ක්‍රමයක් වේ.

විඤ්ඤාණඤ්චායතන-නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරූතලයන්හි ඉකුත්වූ අරමුණක් ම අරමුණු කොට ප්‍රතිසන්ධිචිත්තය පහළ වන බැවින් අතීතාරම්මණය ඇත්තේ ප්‍රතිසන්ධි චිත්තයන්ට පමණෙකි යට කී දස වැදෑරුම් කාමාවචර ප්‍රතිසන්ධීන්ගේ අරමුණ අතීත හෝ වර්තමාන වේ මේ හැර අනික් ප්‍රතිසන්ධීන්ගේ අරමුණ, අතීතාදි වශයෙන් නො කිය යුතු වූ පඤ්චකසිණාදිප්‍රඥප්තිනිමිත්තෙක් වේ. මෙසේ තුන් අයුරකින් අරමුණු ගන්නා ප්‍රතිසන්ධි චිත්තය, කාමලොකයෙහි අතීත වූ හෝ, බ්‍රහ්මලොකයෙහි කසිණාදිප්‍රඥප්තිනිමිත්තක් හෝ අරමුණු කොට පවත්නා චුති චිත්තයට අනන්තරාව ම පහළ වන්නේ ය. ප්‍රතිසන්ධිචිත්තය මෙසේ අරමුණු ගණිත ත්, වර්තමානාරම්මණයක් ගත් චුති චිත්තයෙක් නැත්තේ ය. සත්වයාහට භවයෙහි උත්පත්තිය දෙන ප්‍රතිසන්ධිචිත්තයන් පිළිසඳ දුන් තැන සිට, ඒ භවයෙහි වසන තාක් හට ගන්නා භවාඞ්ගචිත්තයනුත් භවයෙන් ගිලිහී යන චුතිචිත්තය ත් මෙහි උත්පත්තියට ඊට පෙර උත්පත්තිය ලබා සිටි භවයෙහි දී කළ කර්මාදි වූ එක් ම නිමිත්තක් අරමුණු කර ගැණුම එකාකාර සිඳියක් බැවින්, වර්තමාන අරමුණු ගන්නා වුනි සිත් නැත්තේ ය. එහෙයින් වර්තමානාරම්මණය හැර අනික් අරමුණු දෙකින් යමක් අරමුණු කොට පවත්නා චුති චිත්තයට අනන්තරාව ත්‍රිවිධ ආරම්මණයන් අතුරෙහි යම්කිසි අරමුණක් ගෙණ පවත්නා ප්‍රතිසන්ධි චිත්තය, සුගති දුර්ගති වශයෙන් නැමී ගන්නේ ය.

කාමාවචරසුගතිභූමියෙහි සිටිමින් පව් කොට මරණාදෙහි හොන්තහුට යම් යම් ලෙසකින් සකස් කළ පාපකර්මයෙක් හෝ පාපකර්ම නිමිත්තෙක් හෝ මනොද්වාරයෙහි වැටේ ද, මනොද්වාරයට ලං වේ ද, ඒ වැටුනු පාපකර්මය හෝ පාපකර්මනිමිත්ත අරමුණු කොට පංචද්වාරාවජ්ජනචිත්තය ආදි කොට ඇති, තදාලම්බන චිත්තය අවසන් කොට ඇති, ජවන් ඔත් පසෙකින් යුත් චිත්ත වීථියක් හෝ තදාලම්බනයන් හා මිශ්‍ර නො වූ ජවන වීථියක් හෝ ඉපද, එයට පසු ව භවාඞ්ගයන් විසින් ගත් අරමුණ ම අරමුණු කොට ඒ මරණාසන්න ජවන වීථිය සම්බන්ධ වූ අවිද්‍යා තෘෂ්ණාදි ක්ලේශයන්ගේ බලයෙන් එහි වූ ම චේතනාධර්මයන් විසින් අපාය ප්‍රතිසන්ධිය උපදවනු ලැබේ. මේ වනාහි අතීත වූ අරමුණු ගත් චුතිචිත්තයට අනන්තරාව අතීතාලම්බනප්‍රතිසන්ධිය සිදුවූයුතු ය.

අනෙකෙකුට මරණාසන්නකාලයෙහි කියූ ආකාර ඇති, පාප කර්මයාගේ වශයෙන් එළවන ලද ගිනිදැල්, යමපල්, වන, කඳු, අදුරු ආදී වූ නිරයගතිනිමිත්තක් මනොවාරයට හමු වේ ද, එසින් ඔහුගේ භවාඞ්ගචිත්තය දෙවරක් ඉපිද නිරුද්ධ වූ කල්හි ඒ අරමුණ, අරමුණු කොට එකලා වූ මනොවාරාවජ්ජනය ද, මරණය ලං වීමෙන්, චිත්තවෙගය මඳ වූ බැවින් ජවන් සිත්පසක් ද, තදුලම්බන දෙක දැ සි විපිසිත් තුනක් උපදනේය. ඒ, විපිසිත් ඉපදීමෙන් පසු භවාඞ්ගචිත්තයාගේ අරමුණ ම, අරමුණු කොට එකලා වූ චුතිචිත්තය උපදී. මෙලෙසින් චිත්තක්ෂණ එකොළොසක් ඉක්ම ගිය පසු, එයට අනතුරු ව ඉතිරි වූ චිත්තක්ෂණ පසකට ආයු ඇති මරණාසන්නජවන විසින් ගත් එම අරමුණ එල්බ ගෙණ අනික් භවයෙහි ප්‍රතිසන්ධිය හටගණියි. මේ වනාහි අතීතාරම්මණ ඇති, චුතියට අනතුරු ව ඒ ඇසිල්ලෙහි ම එළඹ සිටි ගති නිමිත්ත අරමුණු කොට ඇතිවන ප්‍රතිසන්ධිය යි.

මෙහි නිරයගිනි ආදිය ගතිනිමිත්ත වශයෙන් කර්මබලයෙන් එළඹ සිටි කල්හි, එහි ආදීනව, අවිද්‍යාවෙන් යටපත් ව ඉෂ්ටාලම්බනයක් මෙන් කර්මානුභාවයෙන් වැටහී යයි. එකල එහි ලොභ උපදවා මරණාසන්නජවන් සිත්හි වූ අවිද්‍යා-තෘෂ්ණා-චෙතනා ත්‍රිදෙනාගේ විපාක වශයෙන් ආදීනව වැසී යෑම ත් එයට නැමී සිටීම ත් වන්නේ ය. මරණාසන්නවීථියෙහි වූ ජවනයන් විසින් ගත් අරමුණ ම එල්බ ගෙණ අනික් භවයෙහි ප්‍රතිසන්ධිය ලැබේ.

පව් කළා වූ අනෙකෙකුට මරණාසන්නකාලයෙහි පස් වැදෑරම් දෙරටුවෙන් එක්තරා දෙරටුවෙක රාගාදිකෙලශයන්ගේ උතපත්තියට කරුණු වූ ලාමක වූ රූපාදී අරමුණක් හමු වූ කල්හි, භවාඞ්ගචලනාදියෙන් පසු උපන් පංචද්වාරාවජ්ජන-චක්ඛුවිඤ්ඤණ-සම්පටිච්ඡන-සන්තීරණ-වොට්ඨපන යන සිත් පිළිවෙළින් ඉපද අවසානයෙහි මරණයට ලංවීමෙන් මඳව ගිය වෙගය ඇති බැවින් ජවන් සිත් පසක් ද, තදුලම්බන සිත් දෙකක් ද, ඉපද ඒ විපි සිත් වලට අනතුරු ව භවාඞ්ගයාගේ අරමුණ ම, අරමුණු කොට චුති චිත්තය උපදියි. මෙසේ රූපාරම්මණයෙහි භවාඞ්ග දෙක ය-පංචද්වාරාවජ්ජනය - චක්ඛුවිඤ්ඤණය- සම්පටිච්ඡනය - සන්තීරණය - වොට්ඨපනය යන ජවන් පස ය, තදුරම්මණ දෙක ය, චුතිචිත්තය යන මේ චිත්තක්ෂණ පසළොස ඉක්ම ගිය පසු, එයට අනතුරු ව ඉතිරි වූ එක් චිත්තක්ෂණයක ආයු ඇති මරණාසන්නජවන විසින් ගත් ඒ රූපාරම්මණයෙහි එල්බ ගෙණ අනතුරු භවයෙහි ප්‍රතිසන්ධිචිත්තය උපදියි. මේ අතීතාරම්මණචුතියට අනතුරු ව වර්තමානාලම්බන වූ ප්‍රතිසන්ධිය ලැබෙන සැටියි.

භවාඞ්ග - භවාඞ්ගචලන - භවාඞ්ගුපච්ඡේද - වුති යන සිත් සතර අතීතජාතියේ කල කර්මය අරමුණු කර ගණියි. පංචද්වාරාවජ්ජනාදී වූ සියලු විඳිවිත්තයෝත් ප්‍රතිසන්ධිවිත්තයත් එකෙණෙහි හමු වූ රූපාදී වූ අරමුණු ඵල්බ ගෙණ හට ගණිත්. ඒ හමු වූ අරමුණ, එක් චිත්තක්ෂණයක ආයු ඇති හෙයින් එම අරමුණ අල්වා ගෙණ අනික් භවයෙහි ප්‍රතිසන්ධිය වේ. සොතවිඤ්ඤණ ඵිඳිහු ද මෙසේ ය

සුගතියෙහි දී පින් කළ කෙනෙකු මරණැදෙහි වැටුන විට, ඔහු යම් යම් ලෙසකින් රැස් කළ කුශලකර්මයෙක් හෝ කර්මනිමිත්ත යෙක් හෝ මනොද්වාරයට හමු වේ. කුශලකර්මයෙක් හෝ කර්මනිමිත් තෙක් හෝ හමු වන්නේ ද, රැස් කළ පින් ඇත්තහුට ම ය. මහද්ගත කර්ම ඇත්තහුට කර්මනිමිත්ත ම හමු වේ. ඒ කල ඒ, අරමුණු කොට උපදින තදාරම්මණය කෙළවර කොට ඇත්තා වූ හෝ, තදාරම්මණයත් හා මිශ්‍ර නොවූ හෝ ජවනවීථියෙන් පසු භවාඞ්ගය විසින් ගත් අරමුණ ම ඵල්බ ගෙණ වුතිවිත්තය උපදියි. ඒ වුති චිත්තය ඉපද නිරුද්ධ වූ කල්හි, හමු වූ කර්මය හෝ කර්මනිමිත්ත හෝ අරමුණු කොට එහි වූ අවිද්‍යාතෘෂ්ණාදිකෙලෙශයන්ගේ බලයෙන් නැමී සිටියා වූ සුගතියට ඇතුළත් වූ ප්‍රතිසන්ධිවිත්තය උපදී. මේ වනාහි අතීතාරම්මණවුතියට අනතුරු ව අතීතාලම්බන ඇත්තා වූ හෝ කසිණාදිනවත්තබ්බාරම්මණ ඇති ප්‍රතිසන්ධිය ගන්නා සැටියි.

කාමසුගතියෙහි සිට පින් කළ අනෙකෙකු මරණය ලං වූ විට කාමාවචරකුශලකර්මයාගේ ශක්තියෙන් මිනිස් ලොව උපදින කල්හි නම්, මවුකුස් ඇ රූපාරම්මණයක් හෝ, දෙව් ලොව උපදින කල්හි නම්, උයන් කප්රුක් ඇ සුගති නිමිත්තක් හෝ මනොද්වාරයට හමු වේ. එකල්හි දුගති නිමිත්තෙහි කි ලෙසට වුති චිත්තය ඉපද නිරුඬ වූ කල්හි අලුත් භවයෙහි ප්‍රතිසන්ධිවිත්තය පහළ වේ. මේ අතීතාරම්මණවුතියට අනතුරු වූ ප්‍රත්‍යුත්පන්නා ලම්බනප්‍රතිසන්ධිය ගන්නා සැටියි.

අනෙකෙකුට මරණාසන්නකාලයෙහි දී බුබපූජාදිය සඳහා නැයන් විසින් එළවන ලද මල් පහන් ධජපතාකාදි රූපාරම්මණයක් හෝ ධම්ශ්‍රවණ තූර්‍යපූජා ආදී වූ ශබ්දාරම්මණයක් හෝ සුවඳ දුම් ආදී වූ ගන්ධාරම්මණයක් හෝ ආහාරපානාදිරසාරම්මණයක් හෝ චීනපට්ට - සොමාරපට්ටාදිඵොට්ඨබ්බාරම්මණයක් හෝ චක්ෂුරාදී වූ යම්කිසි දෙරටුවකට හමු වේ. එ කල ඒ රූපාදී වූ අරමුණෙහි පංචද්වාරාවජ්ජනය ආදි කොට ත් තදාලම්බනය කෙළවර කොට ත් උපන් චිත්තවීථියෙහි පිළිවෙළ නොසිඳ්මවා පහළ වූ වොට්ඨපනචිත්තයාගේ අවසානයෙහි මරණයට ලං

වීමෙන් වෙගය මඳ වූ බැවින් ජවන් සිත් පසෙක් ද, තදාලම්බන දෙකෙක් ද උපදනේ ය. ඉන්පසු, භවාඞ්ගයාගේ ම අරමුණ ගෙණ චුතිචිත්තය පහළ වේ. චුතිචිත්තයාගේ අවසානයෙහි එක් චිත්තක්ෂණයක ආයු ඇති භවාඞ්ග-චුතිචිත්ත දෙකට ත් අරමුණු වූ එම අරමුණෙහි ම අලුත් භවය පිළිබඳ ප්‍රතිසන්ධිචිත්තය හට ගණී යි. මේ වනාහි අතීතාලම්බනචුතියට අනතුරු ව වර්තමානාලම්බන ඇති ප්‍රතිසන්ධිය පහළවන සැටි යි.

පඨවිකසිණාදීන්ගේ වශයෙන් ලැබූ මහද්ගතධ්‍යාන ඇත්තහුට මරණාසන්නකාලයෙහි කාමාවචරකුශලකර්ම - කර්මනිමිත්ත - ගතිනිමිත්ත අතුරෙන් එක්තරා නිමිත්තක් හෝ පඨවිකසිණාදි ප්‍රඥප්ති නිමිත්තක් හෝ ධ්‍යානචිත්තයක් හෝ මනොචාරයට හමු වන්නේ ය. නැතහොත්, චක්ඛුචාර - සොතචාර දෙකින් එකකට කුසල් ඉපදීමට කරුණු වූ උතුම් අරමුණෙක් හමු වේ. එකල ක්‍රමයෙන් පිළිවෙළ නොයික්මවා උපන් වොත්ථපනචිත්තයාගේ ඉපැත්මෙන් පසු අවසානයෙහි මරණයට ලං වීමෙන් වෙගය මඳ ව ගීය බැවින් ජවන් සිත් පසෙක් උපදී. බඹලොවින් චුතවන්න වුන්ට තදාලම්බනයෙක් නැත. එහෙයින් ජවනයන්ට අනතුරු ව භවාඞ්ගයාගේ අරමුණ ම අල්වා ගෙණ චුතිචිත්තය උපදී. චුතියගේ අවසානයෙහි මරණාසන්නජවනවීථිය විසින් ගන්නා ලද අරමුණ පිළිබඳ ආයුෂය ඉතිරි ව ඇති බැවින්, ඒ අරමුණ ම අල්වා ගෙණ අලුත් භවයෙහි ප්‍රතිසන්ධිචිත්තය හටගණී යි. මේ වනාහි නවත්තබ්බාරම්මණැ යි කියන ලද කසිණාදිපඤ්ඤත්තාරම්මණ ඇති සුගතිචුතියට අනතුරු වූ අතීත වර්තමාන ප්‍රඥප්ති ආලම්බනයන් අතුරෙන් එක්තරා අරමුණක් ඇති ප්‍රතිසන්ධි ය යි. අරූපාවචරචුතියෙන් අනතුරු වූ ප්‍රතිසන්ධිය ද මෙසේ දත යුතු ය.

බඹලොවින් චුත ව කාමලොකයෙහි උපදිනවුනට අරමුණු වන්නේ කාමාවචරකුශලකර්ම- කර්මනිමිත්ත- ගතිනිමිත්ත යන තුන යි. රූපීබ්‍රහ්මලොකයෙන් චුත ව රූපීබ්‍රහ්මයන් අතර ම උපදිනවුනට පඨවිකසිණාදීහු අරමුණු වෙති. රූපීබ්‍රහ්මලොකයෙන් චුත ව අරූපීන් අතර උපදිනවුනට ධ්‍යානචිත්තය අරමුණු වේ බ්‍රහ්මලොකයෙන් චුත වන්නෝ, සතර අපායයෙහි නො උපදිති. එසේ ම මනුෂ්‍යයන් අතර ද, අහෙතුකජාත්‍යන්ධාදී වූ මිනිසත් බව ඇති ව නො උපදින්නෝ ය. එහෙයින් බඹලොවින් චුත වන්නන් ට අකුශලකර්ම නිමිත්තාදීහු නො වැටහෙති. යම් භවයකින් චුත වී නම්, ඒ භවයට ත් යම් භවයක උපන්නේ නම්, ඒ භවයට ත් අයත් වූ සිත් මරණාසන්නයේදී එළඹසිටි කර්මාදිය අරමුණු කරන්නේ ය. භවාඞ්ගචුතිචිත්තයෝ පෙරකළ කර්මය අරමුණු කෙරෙති.

දුගතියෙහි සිට පව් කළ තැනැත්තකු මරඇදෙහි හොත්විට පෙරකී සේ අකුශලකාමීයෙක් හෝ කම්නිමිත්තෙක් හෝ ගති නිමිත්තෙක් හෝ මනොවාරයට හමු වේ. පස්දෙරින් යම්දෙරකට විෂය වන සේ ඒ ඒ දෙරටුවට අකුසල් ඉපදීමට කරුණු වූ රූපාදී වූ යම්කිසි අරමුණෙක් හමු වන්නේ ය. ඒ අරමුණු කර ගෙණ මනොවාරයෙහි හෝ චක්ඛුරාදිවාරයෙහි විතතවීථිය ඉපිද අනතුරු ව චුතිචිත්තය ද පහළ ව ඉන් ඉක්බිති ව ජවනවීථිය විසින් ගත් දුගතියට ඇතුළත් අරමුණු අතුරෙහි එක්තරා අරමුණක් එල්බ ගෙණ සතර අපාය පිළිබඳ ප්‍රතිසන්ධිචිත්තය පහළ වේ මේ වනාහි අතීතාලම්බන ඇති දුගතිචුතියට අනතුරු ව අතීත හෝ වර්තමාන අරමුණු ගත් ප්‍රතිසන්ධිය පවත්නා ආකාර ය යි.

එකුන් විසිවැදෑරුම් වූ විපාකවිඤ්ඤාණයාගේ පිළිසිඳ ගැණුම් වසයෙන් පවත්නා සැටි මෙලෙසින් දතයුතු ය.

'සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො' යනාදි වසයෙන් හෝ **'ඛි චිත්තං, ඛි චිත්තං'** යනාදි වසයෙන් හෝ නාමධර්මයන්ගේ ආදීනවය දැක වායොකසිණය අරමුණු කොට භාවනා වඩා පංචමධ්‍යානය උපදවා ගත් කර්මක්‍රියාවාදීනට මරණාසන්න කාලයෙහිදී ඒ ධ්‍යානයට අරමුණු වූ කසිණනිමිත්ත අරමුණු කොට මනොවාරාවජ්ජනාදිජවනවීථිය ඉපදීමෙන් පසු භවාඞ්ගයාගේ අරමුණ ම ගෙණ චුතිචිත්තය පහළ වේ. අනතුරු ව උපදවා ගත් රූපාවචරපංචමධ්‍යානචෙතනාබලයෙන් උපන් ජීවිත නවකනම් එක් ම රූපකලාපයෙක් අසංඥතලයෙහි පහළ වන්නේ ය. එ තැන් පටන් පන්සියයක් මහකප් මුළුල්ලෙහි ජීවිත නවක, ඍතුජනවක යන රූපකලාප දෙක ඉපැදෙමින් නැසෙමින් පවති. මේ අසංඥසත්වයෙහි පිළිසිඳ ගන්නා ක්‍රමය යි. එහි ජීවිතනවක කලාපයෙන් නො තොරව සිට එයින් චුත වන කල්හි එම ජීවිතනවකය ම ව්‍යුතිඛාත්‍යය කොට නිරුඬ ව යන්නේ ය. අනතුරු ව ප්‍රතිසන්ධි දීමට සුදුසු වූ කාමාවචරවිපාකසිත් අටෙන් එකෙක් පෙර උපදවන ලද ධ්‍යානචෙතනා බලයෙන් ම ඵල වූ කර්මනිමිත්තාදීන් අතුරෙන් යමක් අරමුණු කොට අතික් භවයෙක ප්‍රතිසන්ධිය දෙන්නේ ය.

මෙසේ ඉතා සැකෙවින් කියූ මේ ප්‍රතිසන්ධිය රූපය හා මිශ්‍ර අමිශ්‍ර භෙදයෙන් දෙවැදෑරුම් වේ. කාම-රූප-අරූපභව වශයෙන් තෙවැදෑරුම් වේ. අණ්ඩජ-ජලාබුජ-සංසෙදජ ඔපපාතික වශයෙන් සිවුවැදෑරුම් වේ. නිරය - ප්‍රෙත - තිරශ්චීන - දෙව - මනුෂ්‍යගති වශයෙන් පස් වැදෑරුම් වේ. විඤ්ඤාණට්ඨිති වශයෙන් සත්වැදෑරුම් ය සත්ත්වාවාස වශයෙන් නවවැදෑරුම් ය. මොවුහු යට කියන ලදහ.

චුති-පටිසන්ධීන්ගේ විස්තරය ඉතාදිග ය. එය මුළුමනින් මෙහි කියනු බැරි ය. විස්තර පොතපතින් දතයුතු ය.

චුති-පටිසන්ධි දෙදෙනා අතුරෙන් චුතිචිත්තය, භවයෙන් ගිලිහී යෑම සිදු කර යි. ප්‍රතිසන්ධිචිත්තය අතික් භවයක් යොනියක් ගතියක් විඥානස්ථියක් සත්වාවාසයක් හා ගැළපීම කර යි.

මෙහි දක්වන ලද කොයි ක්‍රමයකින් නමුත් පිළිසඳ ගන්න වුන්ගේ ප්‍රතිසන්ධිචිත්තය ඉපිද නිරුඩ වන්නා හා ම භවාඞ්ග චිත්තය උපදනේ ය. ඒ අනෙකෙක් නො වේ. මේ ප්‍රතිසන්ධි-චිත්තය මය. ප්‍රතිසන්ධිචිත්තයෙහි ත් භවාඞ්ගචිත්තයෙහි ත් අරමුණ ද එකෙක් මය. භවාඞ්ග යි කියන්නේ භවයාගේ නො සිඳ පැවැත්-මට කරුණුවන බැවිනි. භවාඞ්ගචිත්තය නිරුඩවීම සමග ම එබඳු අතික් භවාඞ්ගචිත්තයෙක් වන්නේ ය. චක්ෂුරාදි චාරයන් කරණ කොට වීථිසිත් නො උපදින කල්හි මේ භවාඞ්ගසන්තතිය ගඟදිය පහරක් සේ නො සිඳී පවතී. අවසානයෙහි එය ම චුතිචිත්තය ත් වන්නේ ය. චුතිචිත්තය ඉපිද නිරුඩ ව ගිය කල්හි නැවැත ප්‍රතිසන්ධිචිත්තාදිය වේ. මෙසේ චිත්තසන්තතිය නිවන් පසක් කරණ තුරුම රිය සකක් සේ භවයෙන් භවයට පෙරළෙමින් පවත්නේ ය. මෙම කීහ. ආචාර්‍යපාදයෝ=

'පටිසන්ධිභවඞ්ගවීථියො – චුතිචෙහ තථා භවන්තරෙ,
පුන පටිසන්ධිභවඞ්ගමිච්චං – පරිවත්තති චිත්තසන්තති'

සකන්ධ-ධාතු-ආයතන-භව-යොනි-ගති ආදිය නො හැර චුතිපටි සන්ධි වශයෙන් දිගින් දිගට යෑම 'සංසාර' යි කියන ලද්දේ ය.

සංසාරය දික් වන්නේ, සදහම් නො දන්නා බාලයාහට ය දහම් යි වදාළේ සත්තිස් බොධිපාක්ෂික ධර්මය යි. එහි විස්තර යට කියන ලදි. බාලයාහට සසර දික්ගැසීම ධර්මතාසිඩියකි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ දුගී පුරුෂ තෙමේ සෝවන් පලයට පැමිණියේ ය. අතික් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩසහිත වූ ය.

රජ තෙමේ, බුදුරජුන් වැඳ යන්නේ, ඒ ඒ තැන බැඳ හුන් සියලු සතුන් බැම්මෙන් මුදා හැරියේ ය. බැම්මෙන් මිදුනු ගැහණු පිරිමි දෙගොල්ලෝ ඉස් සෝදා නා පියා යන්නෝ 'මල්ලිකාවෝ බොහෝ කලක් ජීවත් වෙත්වා, උන් නිසා අපි දිවි ලදුම්හ' යි කිය කියා ගියහ එදා සවස දම්සබාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා ද 'මල්ලිකාවෝ ඉතා නුවණැති ය, තම නුවණින් මෙතෙක් දෙනාට දිවි දුන්හ' යි මල්ලිකාවන් පිළිබඳ ගුණකතා-වෙහි යෙදී හුන්හ. ඒ අතර බුදුරජානන් වහන්සේ එහි වැඩි

සේක් 'මහණෙනි! තමුසේලා දැන් මෙහි කිනම් කතාවක් කරමින් හුන්නහු දැ' යි අසා වදාරා 'මෙ නම් කතාවක් කරමිනැ' යි කී කල්හි 'මහණෙනි! මල්ලිකා තොමෝ තම නුවණින් අනුනට දිවි දුන්නා අද පමණක් නොවන්නී, පෙරත් එසේ කළා ය' යි වදාරා, ඒ ඉකුත් කතාව ගෙණ හැර පෑ සේක.

'යටගිය දවස බරණැස් රජුගේ පුත්‍රයෙක් නුග රුකක් කරා ගොස් එහි අරක් ගත් දෙවියාට 'දෙවයන් වහන්ස! මේ දඹදිව සියයක් පමණ රජදරුවෝ ත් එ පමණ ම අගබිසෝවරු ත් වෙසෙති, මම, මා පියා මළකළ රජය ලබන්නෙම් නම්, මොවුන් ගෙල සිඳ ඔබට බිලිපූජා කරන්නෙමි' යි ගවිස්සේ ය, පියා මළ පසු රජකම ලත් ඔහු 'දෙවියන්ට බිලිපූජා කෙරෙමි' යි මහත් සෙන් ගෙණ ගොස් පළමු කොට එක් රජකු වශයට ගත්තේ ය, පසුව අනික් රජුන් හා අගබිසෝවරුනු ත් යටතට ගෙණ 'උග්ගසෙන' රජුගේ දරුගැබ් දුරු 'දිස්සා' නම් බිසව පමණක් ගෙයි නවතා රුක් මූලට ගොස් මොවුන් විෂ පොවා මරන්නෙමි'යි ගස මූල පිරිසිදු කරවී ය, රුක්දෙව් තෙමේ, එ දැක 'මෙතෙමේ මේ රජුන් මරන්නට සැරසෙනුයේ මුන්ගේ ගල ලෙයින් මා පුදනු සඳහා ය, මූ මේ රජුන් මැරී නම්, මුළු දඹදිව රජුන්ගෙන් සිස් වේ, රාජවංශය මූළුමනින් වැනසෙන්නේ ය, මාගේ වාසභවනය ත් අපිරිසිදු වේ, ය යි එය වළකාලන්ට තැත් කරණුයේ, තමන් එහි අපොහොසත්බව දැන අන් දෙවියකු කරා ගොස් මෙ පවත් කියා සිටියේ ය, ඔහු ද එය වළකාලීමෙහි තමන් අපොහොසත්බව කී ය, ඉක්බිති පිළිවෙළින් සක්වළ වැසි හැම දෙවියකු පාසා ගොස් මෙ බව දැන්වී ය, හැම කෙනෙක් ම එය වළකාලන්නට බැරිබව ම කීහ, අනතුරු ව සිවුවරම්රජුනට දන්වා සිටියේ ය, ඔවුහු සක්දෙව්රජුට දන්වන්නැ' යි කීහ, රුක්දෙව් තෙමේ, ඔහු වෙතට ගොස් කරුණු දන්වා මෙයට පිහිටවනු මැනැවැ' යි ඉල්ලී ය, සක්දෙව් තෙමේ, තමන් එහි අපොහොසත්බව දැන 'මම එයට අපොහොසත් වෙමි, එහෙත් මම කට උපායක් කියමි, තෝ රජු බලාසිටියදී ම රතු රෙදිකඩක් හැඳ තමන් වසන ගසින් අස් ව යන ලෙසක් දක්වව, එවිට රජ තෙමේ, තා වළකාලන්නට කරුණු කියන්නේ ය, එහෙත් යනබව ම කියව, පුන පුනා නවතින්නට පැරැත්ත කරනොත් 'මහරජ! අගබිසෝවරුන් හා සියයක් පමණ රජුන් ගෙණවුත් මරා උන් ලෙයින් බිලිපූජා කරණ බවට ගිවිස්සෙහි ය, එහෙත් උග්ගසෙන රජුගේ බිසව හැරදමා ආයෙහි ය, තා වැනි බොරු

කියන්නකුගේ පූජාවෙන් කම් නැතැ, යි කියව, එවිට ඔහු ඇය ද ගෙන්වන්නේ ය, ඇය රජුට මෙහි වරද කියා හැම දෙනකුට ම ජීවිත දානය කරවන්නී ය' යි කී ය, දෙවියා එසේ කෙළේ ය, රජ තෙමේ, ඇය ගෙන්වී ය, එහි පැමිණි ඕතොමෝ රජුන් අතර සිටි සිය සැමියාට වැඳ සිටියා ය, රජ තෙමේ, එය දුක ඇයට කිපින, එවිට ඇ 'මා අයත් කුමක් තා පිළිබඳ වේ ද, මේ මාගේ හිමියා ය, මට සියලු යසඉසුරු දෙන්නේ ය, මම මොවුන් නො වැඳ කවරකු වඳිම් දැ' යි කිවු ය, එවිට රුක්දෙවියා ද සියල්ලන් බලා සිටියදී 'එසේ ය, එසේ ය' යි කියමින් මල් මිටකින් ඇය පිදූයේ ය, රජ තෙමේ 'ඉදින් මා නො වඳිහි නම්, මට යසඉසුරු දෙන මේ දෙවියන් කුමක් හෙයින් නො වඳිහි දැ' යි ඇසී ය, 'මහරජ! නුඹවහන්සේට රජය ලැබුනේ නුඹවහන්සේගේ පිණෙන් මිස දෙවියන්ගේ පිහිටෙන් නො වේ' යි කී කල්හි රුක්දෙවි තෙමේ 'සොඳුර! එසේ ය, සොඳුර! එසේ ය' යි කියා නැවැත ත් මලින් පිදී ය, බිසවු තොමෝ නැවැත ත් 'මහරජ! දෙවියන් මට මෙපමණ රජහු අල්ලා දෙන ලදහ, යි නුඹවහන්සේ කියන්නහු ය, දැන් ඔහු වසන ගස ගිනි ගෙණ දන ලද ය, ඔහු ඒ නිවීමෙහි අපොහොසත් ය, මහානුභාව ඇත්තෙක් නම්, ගිනි නිවාලෑමෙහි ඔහු අසමර්ථ වූයේ කුමක් හෙයින් දැ' යි ඇසූ ය, එවිට ත් රුක්දෙවියා 'එසේ ය, එසේ ය' යි මලින් පිදූයේ ය, බිසවු මෙසේ කියමින් හඬමින් ම සිනාසුනා ය, රජ තෙමේ 'මෑට පිස්සු ය, නො වේ නම් එකවිට හඬා ද, සිනාසේ දැ' යි ඇසී ය, 'දෙවයන් වහන්ස! ඇයි එසේ කියන්නහු? මා වැන්නන් පිස්සන් නො වෙති' යි ඇය කී විට 'එසේ නම් එකවිට හඬන්ට ත් සිනාසෙන්ට ත් කරුණු කිමැ' යි ඇසී ය, 'මහරජ! මම එක්තරා ජාතියෙක කුල දුවක් ව ඉපිද නිසි වයසේදී දීග ගියෙමි, දිනක් මාගේ හිමියා හමුවන්නට ඔහුගේ යහළුවෙක් තෑගි බෝග ත් ගෙණ අප ගෙට ආයේ ය, මම ඔහුට කෑම පිළියෙල කරන්නට සිතා මුදලුත් දී දාසයකු මස් කඩයට යැවීමි, ඔහු මස් නැති ව ආවිට ගෙයි පිළිකන්නෙහි හුන් එළුදෙනකගේ බෙල්ල කපා මස් කොට කෑම පිළියෙල කෙළෙමි, එදා ඒ බෙල්ල කැපූ මම බොහෝ කලක් නිරයෙහි පැසී අවුත් ඉතිරි ව තුබූ පව්කමින් එළුදෙනගේ ලොම් ගණනින් හිස් කැපුම්වලට අසුවීමි, ඔබවහන්සේ මෙතෙක් දෙනා මැරූවහු නම්, කවදා දුකින් නිදහස් වන්නහු දැ' යි නුඹවහන්සේට විඳින්නට සිදුවන මහත් දුක සිහිවී හැඬුවෙමි' යි කී විට, 'සිනාසුනෙහි මක්නිසා දැ' යි රජ තෙමේ ඇසී ය, 'මම මේ බිහිසුණු දුකින් නිදහස් වූයෙමි' යි සතුටු ව සිනාසීමි' යි කිවූ ය, රුක්දෙවි තෙමේ ඒ අසා 'එසේ ය එසේ ය' යි ඒව රත්

මලින් පිදූයේ ය, රජ තෙමේ 'අයියෝ පව්කම්හි බලගතු කම, මෑ එක එළියක මරා නරකයෙහි දුක් විඳ එයිනුදු කර්ම නො ගෙවී ගියෙන් ඒ ඒ අත්බව්හි එළියගේ ලොම් ගණනින් හිස සිදුම්වලට අසුවූ ය, මම මෙතෙක් දෙන මරා කවදා සැපතකට පැමිණෙම් දැ'යි සිතා වැඩි මහලු රජුන් වැඳ බාලවූවන්ට ආචාර කොට සියල්ලන් කමා කරවා පිටත් කර හැරියේය' යි බුදුරජානන් වදන්සේ අතීතය දක්වා 'මහණෙනි! මල්ලිකා තොමෝ තම නුවණින් මහාජනයාට දිවි දුන්නී, මේ ජාතියේ ම පමණක් නො වන්නී ය, පෙරත් එසේ දුන්නු ය; ඒ කාලයෙහි බරණැස් රජ වූයේ, දැන් මේ පසේනදි කොසොල් රජ තෙමේ ය, දින්නාව වූවා මේ මල්ලිකාව ය, රුක්දෙවි වූයේ මම මැ' යි ඉකුත් වත ගළපා නැවැත ධර්මදෙශනා කරණ සේක් 'මහණෙනි! කිසිවක් සඳහා ත් සතුන් මැරීම නො කළයුත්තකි, එහි විපාකය අනිටු ය, බිහිසුණු ය, දිග ය, සතුන් මැරූවෝ බොහෝ කලක් ශොක කෙරෙත් ය' යි වදාළ සේක.

කුමුදුප්පලානීත දුගගත සෙවක වස්තුව නිමියේ ය.

— —

නොහික්මුනු ශිෂ්‍යභික්ෂූ

5 — 2

එක් කලෙක මහරහත් මහසුප්තෙරණුවෝ රජගහනුවර ගොදුරු ගම කොට 'පිපඵලි' ගුහාවෙහි වැඩවාසය කළ සේක. එහි උන්වහන්සේට පැවිදි ගෝලයෝ දෙදෙනෙක් වූහ. එකෙක් ගුරුන් කෙරෙහි හකහිමත් ය. උන්වහන්සේට කළයුතු සියලු උපස්ථාන නොපිරිහෙළා කරන්නේ ඔහු ය. අනිකා එසේ නොවේ. ඔහු අනුන් කරණ වැඩ තමන් කළ සේ හඟව සි. හකතිමත් ශිෂ්‍යනම දැහැටි පැන් සපයා ලූ කල, ඔහු එබව දුන තෙරුන් වෙත වහා ගොස් 'හාමුදුරුවන් වහන්ස! දැහැටි දිය ගෙණැවිත් තැබුවා, මුව දෝනා කරණු මැනැවැ' යි කියයි. පා දෝනා දිය තැබූ කල ත්, නාන්නට දිය සපයා තැබූ කල ත්, දුව ගොස් පා සෝදන්නට නාන්නට දන්වා සිටියි. අනික් භික්ෂුනම 'මෙයා හැමදා මා කළ දෙය තමන් කළ දෙයක් සේ කියයි, හොඳයි! ඔහෙ තුබුනා වේ, කළයුත්ත මම දනිමි' යි වංචකයා දවාලට බඩ පුරා කා නින්දට ගිය විට නාන දිය උණු කොට, අනික් සැලියෙක වක්කර නාන කොටුවේ පිටිපස සඟවා තබා, වතුර උණුකළ සැලියෙහි හුමාලය නැගෙන තරමට වතුර ටිකක් ඉතිරි කොට පසෙකට වී හුන්නේ ය. නිදිගත් තැනැත්තේ, ඉර බසින වේලෙහි නින්දෙන් නැගිට දිය කොටුව වෙත යන්නේ දුරදී ම වතුරසැලියෙන් හුමාලය නගිනු දැක, වතුර උණු කොට තබන ලදැ සි සිතා තෙරුන් වෙත වහා දුව ගොස් 'හාමුදුරුවන් වහන්ස! උණුවතුර පිළියෙල කොට තැබීමි, නාන්නට වඩනේ යහපතැ' යි කියා තෙරුන් වහන්සේ සමග ම නාන කොටු වට ගියේ ය. තෙරුන් වහන්සේ දියකොටුවෙහි වතුර නොදැක 'වතුර කොහි දැ' යි විවාල සේක. වංචනික භික්ෂුනම ගිනිහල් ගෙට වහා ගොස්, වතුර උණු කරණ සැලියෙහි කිණිසි මිට ඔබා බලා, එහි වතුර නැති බව දුන 'දුෂ්ටයාගේ වැඩක හැටි පෙණේ ද, නිස් බදුන ලිප උඩ තබා මූ කොහි ගියේ ද, නාන කොටුවෙහි වතුර තබන ලදැ සි සිතා, මම හාමුදුරුවන්ට නාන්නට වඩනේ යහපතැ' යි කීමි' යි බැණ බැණ කළය, ගෙණ නොටට ගියේ ය. එත් සපයන ගෝලනම, සඟවා තුබූ දිය ගෙණැවිත් තැබී ය. මහ තෙරුන් වහන්සේ 'මේ නම, වතුර උණු කොට නාන කොටුවෙහි තබන ලදැ සි ද, නාන්නට වඩනේ යහපතැ යි ද මට කියා, දැන් බැණ බැණ කළයක් ගෙණ නොටට යයි, කාරණය කුමක් දැ' යි විමසන සේක් 'මෙතෙක් කල්, මෙතෙමේ

මේ නම කළ හැම වතක් ම, තමන් කළ හැටියට හැඟවී ය' යි දැන වදුරා, සවස සමීපයට ඇවිත් සිටියහුට 'ඕය! භික්ෂූහු විසින් නම් කළ යුත්තේ, තමන් කළ දෙය පමණක් තමන් කළ හැටියට හැඟවීම ය, නොකළ දෙය, කළ හැටියට හැඟවීම ලොකු වරදෙකි, දැන් තමුසේ නාන කොටුවෙහි උණු දිය තබන ලදැ යි ද, නාන්නට වඩනේ යහපතැ යි ද මට කියා, මා එහි ගියවිට, කළයකුත් රැගෙණ, බැණ බැණ තොටට යනු දුටුවෙමි, මහණ උන්නාන්සේලාට එසේ කිරීම දෙසීම වටින්නේ නැතැ' යි අවවාද කළ සේක. 'බලාපියවු! මේ නාකි තෙරුන්නාන්සේ වතුර ටිකක් ගැණ දෙඩන දෙඩුම්' යි කෝපයට පත් ගෝලයා පසුදා තෙරුන් සමග පිඬු සිහා නොගියේ ය. මහතෙරුන් වහන්සේ අනිකා සමග පිඬු සිහා ගමට වැඩි ගමනේ දී අකීකරු ගෝලයා, තෙරුන්ගේ දායක ගෙදරකට ගියේ, ගෙයි වැස්සන්, 'හාමුදුරුවන් වහන්සේ කොහි ද' යි ඇසූ කල්හි, 'පහසු මද කමින් නොවැඩි සේකැ' යි කීයේ ය. 'සවාමිනි! එසේ නම් උන් වහන්සේට වුවමනා කරන්නේ කුමක් ද' යි ඇසූහ. 'මෙබඳු ආහාරයෙකැයි' යි ඔහු කී විට, කී ලෙසට ම එය පිළියෙල කොට දුන්හ. ඔහු අතරමග දී එය කා දමා විහාරයට ගියේ ය. පිඬු පිණිස ගිය ගමනේ දී තෙරුන්ට අඟින පටරෙදි කඩෙක් ලැබින. උන්වහන්සේ එය තමන් වහන්සේ සමග පිඬු සිහා ගිය නමට දුන්හ. ඒ නම එයින් සිවුරක් කොට පඬු පොවා ගන්නේ ය. පසුදා දායක ගෙදරට වැඩිය උන්වහන්සේගෙන් ගෙයි අය 'සවාමිනි! නුඹවහන්සේට සැදුනු අසනීපය කුමක් ද? දැන් එය සනීප ද? පොඩි හාමුදුරුවන් කී ලෙසට දනේ ටික පිළියෙල කොට ඇත, එයින් අපහසුව මග හැරුනේ දැ' යි ඇසූහ. එකල සථවිරයන් වහන්සේ කිසිවක් බැණ නොනැගූ සේක් පෙරළා විහාරයට වැඩි සේක. සවස තෙරුන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටි ඒ භික්ෂූ නමට 'ඔය නම ඊයේ ගෙදරකට ගොස් මා අසනීපයෙන් ඉන්නා බව කියා අහර ටිකක් පිළියෙල කරවා ගෙණ අවුත් පාරේ දී ම අනුභව කෙළේ නේ ද? එය කොතරම් පහත් වැඩෙක් ද, කරණ ල්දේදේ මහණුන්ට සුදුසු වැඩෙක් ද, මහණුන්ට වචනයෙන් ඉල්ලා ගෙණ කෑම වටී ද, ඔය නම කළේ ලොකු වරදෙකැ' යි වදුළ සේක. එයින් කෝපයට පත් ඒ භික්ෂූනම තෙරුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ 'මේ මහලු තෙරුන් වහන්සේ ඊයේ වතුර ටිකක් නිසා මා බොරු කියන්නකු කොට අද තමන්ගේ දායක ගෙදරකින් බත් මිටක් ඉල්ලා ගෙණ කෑය' යි මට නිග්‍රහ කරන්නා හැර, තමන්ට ලැබුනු රෙදිකඩ ත් අදරුනි ගෝලයාට ම දුන්හ, තෙරුන් කළ

සැටි හොඳ ද, කළ යුත්ත මම දනිමි' යි පසුදා තෙරුන් වහන්සේ පිඬු සිඟා ගියවිට, තෙමේ විහාරයෙහි නැවැතී සිට පොල්ලක් ගෙණ සියලු සැලිවලත් බිඳ දමා පන්සල ත් ගිනි තබා පැන ගියේ ය. ඔහු වැනි දවස් නොගෙවුම කලුරිය කොට අවීචි මහානරකයෙහි උපන්නේ ය. මිනිස්සු මේ තොරතුරු අසා 'මහාකාශ්‍යප හාමුදුරුවන්ගේ ගෝලයෙක් කියන එක නොඅසා තරහයෙත් පන්සල ත් ගිනි තබා පැනලා ගොසින් ය' යි තැන තැන රැස්ව කතා කරන්නට වූහ.

ටික දවසකට පසු, එක්තරා භික්ෂූන් වහන්සේ නමක් බුදුරජුන් දකිනු කැමැත්තෙන්, රජගහානුවරින් නික්ම දෙවිරමට ගියහ. බුදුරජුන් වැඳ සතුටු සාමීචි කතා කොට හුන් පසු 'කොහි සිට ආවහු දැ' යි බුදුරජාණන් වහන්සේ ඇසූහ. 'සවාමීනි! රජගහානුවරිනැ' යි කීහ. 'එසේ නම් මාපුත් මහසුප් තැනගේ සැපදුක් කෙසේ දැ' යි අසා වදාළ සේක. 'වරදෙක් නැත, සුවසේ වාසය කරති, ඊයේ පෙරේදා ගෝලයෙක් කිපී වැඩ ඉන්නා පන්සල් ගෙය ගිනි තබා පැන ගොසින් ය' යි කීහ.

එකල්හි සම්බුදුරජාණන් වහන්සේ 'මහණ! ඔය හෝලයා අවවාදයට කිපෙන්නේ, හිතුවක්කාරකම් කරන්නේ, ගුරුන්ට දෙස් නගන්නේ, අද ඊයේ නොවේ, ඔහු බොහෝ කලක පටන් හැඩ ගැසී සිටින්නේ, අවවාදයට කිපෙන්නට, හිතුවක් කරන්නට, ගුරුන්ට බණිත්නට දෙඩන්නට ය, ගෙවල් විනාශ කෙළේත් අද ඊයේ නොවේ, එ ද ඔහුට බොහෝ කලක පටන් පුරුදු වැඩෙකි, ඒ නිසා ඒ පාපයාගේ ක්‍රියාව පුදුමයක් නොවන්නී ය' යි ඉකුත් වත දක්වන සේක්-

'එක් කලෙක 'සිඛයිල' නම් කුරුල්ලෙක් හිමාලය කැලේ ගසෙක කුඩුවක් සාදාගෙණ හුන්නේ ය, උෂ, වැසි දවසෙක සිතලේ වෙවුලමින් ගසෙක හුන් වදුරකු දැක 'ඕය! ඔබට මිනිසකුට මෙන් හිස අත්පා ඇත්තේ ය, අත්පා හිස් මිනිසුන්ගේ අත්පා හිස් සමාන ය, කුමක් නිසා ඉන්නට ගෙයක් තනා නොගන්නෙහි දැ' යි ඇසී ය, එවිට වදුරා 'මට අත්පා ඇතිබව ඇත්ත ය, ගෙයක් තැනීමට වුවමනා නුවණ ය, එබඳු නුවණක් මට නැනැ' යි කී ය, එවිට කුරුල්ලා 'ඔබට මෙබඳු සුලු දෙයක් වත් කර ගැණීමට නුවණක් නැති නම්, ගිහිගෙය නොසුදුසු ය, මෝඩයාට ගිහිගෙය මහඅපායයෙක් ය, මෝඩයා එහි බරපතල කම් නොදනී, ගිහිගෙය පව් උපදින එක ම තැන ය, එක් අරමුණෙක නොපිහිටි නිතර සැලෙන ඒ මේ අත පෙරලෙන සිත් ඇති මිත්‍ර ද්‍රෝහී වූ ඔබට සැපයෙක් කොයින් ද? වදුරෝ!

ඒ නිසා නුවණ ලබා ගන්නා හැටියක් කර ගන්න, අලසකම දුරලන්න, අවුසුළගින් රැකෙනුව පැල්පතක් කරගන්නැ' යි නිත්ද කෙළේ ය, එවිට වඳුරා 'මූ, මා එක අරමුණෙක නො පිහිටි වහා පෙරළෙන සිත් ඇති මිත්‍රද්‍රෝහී සපිර පැවැත්මක් නැත්තකු සේ කියයි, මූට හොඳ පාඩමක් උගන්වන්නම්' යි පැන ගෙණ ගොස් කුඩුව කඩා වීසි කෙළේ ය, කුරුල්ලා, වඳුරා කුඩුව කඩා වීසි කරත් ම එක් කොණකින් පිටවී ගියේ ය' යි වදාළ සේක. සම්බුදුරජානන් වහන්සේ මෙසේ ධම්දෙශනා කොට 'ඒ කාලයේ වඳුරා වූයේ පැල්පත ගිනි තැබූ මේ භික්ෂු නම ය, මහා කාශ්‍යප තෙමේ සිඹිලියා වී ය' යි ජාතකය ගළපා 'මහණ! මේ තෙමේ පෙර ත් අවවාදයට කිපී මෙසේ විපත් කෙළේ ය, මාගේ පුත්‍ර වූ කාශ්‍යපයාට මෙබදු බාලයන් හා එක්ව වාසය කරණවාට වඩා හුදකලා වාසය යහපත ය, සැපදායක ය, යි ද වදාරා මේ ධම්දෙශනාව කළ සේක:-

චරං වෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො,
එකචරියං දළ්හං කයිරා නත්ථි බාලෙ සහායතා'ති

ආශ්‍රයට නිසි කලණ මිතුරකු සොයන්නේ, තමාට වඩා ශ්‍රෙෂ්ඨ වූ හෝ තමා හා සමාන වූ මිතුරකු ඉදින් සොයාගත නුහුනේ නම් එකලාව හැසිරීම දැඩි කරන්නේ ය. අඥනයා කෙරෙහි යහළු බව නැත්තේ ය.

චරං = හැසිරෙන්නේ.

කල්‍යාණ මිත්‍රයකු, සිතින් සොයා බලන්නා මෙයින් කිය වේ.

න අධිගච්ඡෙය්‍ය වෙ – නො පැමිණියේ නම්. ඉදින් නො ලද්දේ නම් යි සේයි.

සෙය්‍යං = (ශීල සමාධි ප්‍රඥ ගුණයන්ගෙන්) ශ්‍රෙෂ්ඨයකු.

සදිසං = (ශීල සමාධි ප්‍රඥ ගුණයන්ගෙන්) සමානයකු.

අත්තනො = තමහට (වඩා).

මේ ගාථාඩියෙහි අදහස නම්, 'තමා හා එක්ව විසීමට කලණ මිතුරකු සොයන්නහු විසින් තමහට වඩා ශීල සමාධි ප්‍රඥ ගුණයන්ගෙන් අධිකතරයෙක් හෝ මේ කියූ ගුණයන්ගෙන් තමන් හා සමාන වූවෙක් නො ලද්දේ නම්' යනුයි. මෙලොවින් හා පරලොවින් වැඩි සිරිනු කැමැත්තහුට, නො පිරිහෙනු කැමැත්තහුට කලණ මිතුරකු සිටිය යුතු ය. ඔහු වනාහි තමහට වඩා ශීලාදී ගුණධර්මයන් ගෙන් හැම අතෙකින්ම වැඩී සිටින කෙනකු විය යුතු ය. තම මිතුරා තමහට වඩා ගුණනුවණින් වැඩී සිටියේ ම නම් තෙමේ ද ගුණනුවණින් වැඩෙන්නේ ය. තමහට වඩා

ශ්‍රෙෂ්ඨයකු, ඇසුරු කළ තැනැත්තේ ම ශීලයෙන් වැඩෙන්නේ ය. සමාධියෙන් වැඩෙන්නේ ය. ප්‍රඥාවෙන් වැඩෙන්නේ ය එහෙයින් එබන්දෙක් ම ඇසුරු කළ යුතු ය. ආශ්‍රයට සුදුසු ශ්‍රෙෂ්ඨයෙක් නැත්තේ නම්, ශීල සමාධි ප්‍රඥා ගුණයන්ගෙන් තමන් හා සමානයකු ඇසුරු කිරීමේ දී, වැඩීමෙක් නො වූයේ ද, පිරිහීමෙක් නො වන්නේ ය. ඒ හෙතුවෙන් හානියක් නො ද වන්නී ය

එකවරියං දළ්හං කයිරා = (ශ්‍රෙෂ්ඨයකු ත්, සමානයකු ත්, ඇසුරට සොයාගත නුහුනේ නම්,) එකලා වාසය දැඩි කරන්නේ ය. සියලු ඉරියව්වෙහි එකලාව වසන්නේ ය.

හීනයා හා එක් ව වසන්නේ, එක් ව සම්භොග පරිභොග කරන්නේ, ශීලයෙන් පිරිහෙයි. සමාධියෙන් පිරිහෙයි. ප්‍රඥාවෙන් පිරිහෙයි. කොටින් කියතොත් මෙ ලොව දියුණුවෙන් හා පරලොව දියුණුවෙන් පිරිහෙයි. එය ම සතර අපා දුකට මග වෙයි. එහෙයින් හීන සෙවනයෙන් තොර ව එකලා වාසය දැඩි කළ යුතු ය යි වදාළ සේක. මෙසේය ඒ:-

'නිහීයති පුරිසො නිහීනසෙවී
න ච හායෙථ කදාචි තුල්‍යසෙවී,
සෙඪමුපනමං උදෙති බිප්පං
තස්මා අත්තනො උත්තරිං භජෙථ' යි.

නත්ථි බාලෙ සහායතා = බාලයා කෙරෙහි යහළු බව නැත්තේ ය.

බාලයා කෙරෙහි යහළු බව නැති බැවින් අඥයා ඇසුරු නො කළ යුතු ය. මෙහි යහළුබවැ යි වදාළෝ චුල්ලසීල, මජ්ඣිමසීල, මහාසීල, දසකථාවත්ථු, තෙරසධුතගුණ, විපස්සනා, සතරමග, සතරපල, ත්‍රිවිද්‍යා, ෂඩභිඥා යන මොවුන් ය. මෙබඳු උසස් ගුණ බාලයා ඇසුරු කිරීමෙන් නො ලද හැකි ය. එහෙයින් එකලා වාසය යහපත් වේ.

එහි ප්‍රාණඝාතය, අදත්තාදානය, අබ්‍රහ්මචර්‍යය, මෘෂාවාදය, පෛශුන්‍යය, පරුෂවචනය, සම්ඵප්‍රලාපය, බීජගාමභූතගාම-සමාරම්භය, විකාලභොජනය; නෘත්‍යගීතවාදිතවිශූකදර්ශනය, උච්චාසයනමහාසයනය, ජාතරූපරජතප්‍රතිග්‍රහණය, ආමක ධාන්‍යප්‍රතිග්‍රහණය, ආමකමාංසප්‍රතිග්‍රහණය, ස්ත්‍රීකුමාරිකා ප්‍රතිග්‍රහණය, දාසිදාසප්‍රතිග්‍රහණය, අජඵඩක ප්‍රතිග්‍රහණය, කුක්කුට සූකර ප්‍රතිග්‍රහණය, හස්ත්‍යශ්වවඩවාප්‍රතිග්‍රහණය, ක්ෂේත්‍රවාස්තු ප්‍රතිග්‍රහණය, දූතෙය්‍යපහෙන ගමනානුයොගය, ක්‍රයවික්‍රය, තුලා කූටකංසකූටමානකූටය, උත්කොටනනිකතිවංචනය, වධබන්ධනා දිය යන මෙයින් වැළකීම, 'චුල්ලසීල' නම් වේ. සත්තසන්නිධි

කාරය, සත්තවිසතිවිසූකදස්සනය, එකූනවීසතිදූතපපමාදය, අඨාරස උච්චාසනය, වීසතිවිභූසනඨාය, චත්තිංසතිතිරච්ඡානකථාය, විග්ගාහිතකථාය, සවදූරුම් දූතෙය්‍යපහෙනගමනය, පස්වැදූරුම් කුහනා ලපනා යන මෙයින් වැලක්ම **'මජ්ඣිමසීල'** නම් වේ තෙළෙස් වැදූරුම් අඞ්ගවිජ්ජාය, පස්විසි වැදූරුම් මණ්ලක්ඛණ කථනය, සූවිසි වැදූරුම් චන්ද්‍රග්‍රහකථනය, දෙළොස් වැදූරුම් රාජ නියීාණකථාය, තෙළෙස් වැදූරුම් සුවාඡටිකාකථනය, එකුන්විසි වැදූරුම් ආවාහනය, සූවිසි වැදූරුම් සත්තිකම්ය, යන මෙයින් වැලැක් ම **'මහාසීල'** නම් වේ. මෙහි විසතර ආගමයෙහි ආයේ ය.[1]

අපපිච්ඡකථා, සන්තුසිකථා පවිවෙකකථා, අසංසග්ගකථා, විරියාරම්භකථා, සීලසම්පදාකථා, සමාධිසම්පදාකථා, පඤ්ඤාසම්පදා කථා, විමුත්තිසම්පදාකථා, විමුත්තිඤාණ දස්සන සම්පදාකථා, යන මොවුහු දස කථා වත්තූහුය.

එහි ප්‍රථමය, අපපිච්ඡකථාව යි. මෙහි **අප්ප**, ශබ්දය අභාව යෙහි වැටේ. නැත, යන තේරුම කිය යි. **ඉච්ඡා**, නම් ආශාව යි. සම්ප්‍රකාරයෙන් ප්‍රනිණ වූ ආශාව අපපිච්ඡා යන්නෙන් කිය වේ. ආශාව, අත්‍රිච්ඡතා – පාපිච්ඡතා – මහිච්ඡතා – අපපිච්ඡතා යි සිවු වැදූරුම් ය. එහි ලද දෙයින් සෑහීමට නො ගොස්, අනුන් අයත් දූයෙහි ද කෙරෙණ ආශාව අත්‍රිච්ඡතා, නම්. එයින් යුත් තැනැත්තහුට එක බදුනෙහි, එක පමණට පිටි වක්කර, එක පමණට පිසූ කැවුම් අතුරෙන්, තම බදුනට බෙදූ කැවුම නො පැසුනු සේ ද, කුඩා සේ ද වැටහෙයි. එම කැවුම ම අනික්හුගේ බදුනෙහි බහාලන ලද්දේ, මනා කොට පැසුනක් මෙන් ද මහත් වූවක් මෙන් ද වැටහෙයි.

තමා කෙරෙහි නැත්තා වූ ගුණ, ඇති සේ කියා පෑම ද, පිළිගැන්මෙහි පමණ නො දන්නා බව ද පාපිච්ඡතා, නම්. එයින් යුත් තැනැත්තේ, කොහොත්බැව්හි පිහිටා, තෙමේ ශ්‍රද්ධාශීලාදි ගුණයන්ගෙන් තොර වූයේ නමුත්, ශ්‍රද්ධාශීලාදිගුණ ඇත්තකු ලෙස ලොවට හඟවයි.

තමන් කෙරෙහි ඇත්තා වූ ගුණ, ලොකයා ඉදිරියෙහි කියා පෑම හා, පිළිගැන්මෙහි පමණ නො දන්නා බව මහිච්ඡතා, නම්. මෙයින් යුත් තැනැත්තේ කිසිවකින් ඵණවිය හැක්කේ නො වේ. වැදූ මවට වත් ඔහුගේ සිත සතප්පත්තට බැරි ය.

'එසා හි බාහිරඤ්ඤං සාවෙසුං විය, අසෙසා පන නිරවසෙසෙසුං. න හි තස්ස අන්තෙනා අණුමත්තාපි අපිච්ඡා ඉච්ඡා

1. 2. 2. 'ධම්මජීවිනෝ' යන්න බලනු.

නාම අත්ථි. අපි චෙත්ථ අත්‍රිච්ඡතා පාපිච්ඡතා මහිච්ඡතා අප්පිච්ඡතාති අයං භෙදො වෙදිතබ්බො. තත්ථ සක්කලාභෙ අතිත්තස්ස පරලාභපත්ථනා අත්‍රිච්ඡතා නාම. තාය සමන්නාගතස්ස එක භාජනෙ පක්ක පුවෙසු අත්තනො පත්තෙ පතිතො න සුපක්කො විය ච න මහන්තො විය ච ඛායති. අසන්තගුණ පභාවනතා පන පටිග්ගහණෙ ච අමත්තඤ්ඤුතා පාපිච්ඡතා නාම. සා 'ඉධෙකච්චො අස්සද්ධො සමානො සද්ධොති මං ජනො ජානාතූ'ති ආදිනා නයෙන අභිධම්මෙ ආගතායෙව. තාය සමන්නාගතො පුග්ගලො කොහඤ්ඤෙ පතිට්ඨාති. සන්තගුණපභාවනතා පන පටිග්ගහණෙ ච අමත්තඤ්ඤුතා මහිච්ඡතා නාම. සාපි 'ඉධෙකච්චො සද්ධො සමානො සද්ධොති මං ජනො ජානාතූ'ති ඉච්ඡති. සීලවා සමානො සීලවාති මං ජනො ජානාතූ'ති ඉමිනා නයෙන ආගතා යෙව. තාය සමන්නාගතො පුග්ගලො දුස්සන්තප්පියො හොති. විජාතමාතාපිස්ස චිත්තං ගහෙතුං න සක්කොති' යි ආයේයි.

'අග්ගික්ඛන්ධො සමුද්දො ච මහිච්ඡො චාපි පුග්ගලො,
සකටෙන පච්චයං දෙන්තු තයො පෙතෙ අතප්පියා'

ගිනි කඳ ත්, සමුද්‍රය ත් මහෙච්ඡපුද්ගලයා ත්, යන තිදෙන සිවුපසය ගැල් පුරවා ගෙණවුත් දෙන ලද්දේ ද සතප්පනු බැරි ය.

ඇති ගුණ සැඟවීම ද, පිළිගැණීමෙහි පමණ දැනීම ද අප්පිච්ඡතා, නමු. මෙයින් යුත් තැනැත්තේ තමා කෙරෙහි ඇත්තා වූ ගුණය වසනු කැමති වෙයි. එහෙයින් ශ්‍රද්ධා ඇත්තේ, සිල් ඇත්තේ, විවෙක ඇතියේ, බහුශ්‍රැත වූයේ; පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තේ, සමාධි සම්පන්න වූයේ, ප්‍රඥාවත් වූයේ, ක්ෂීණාශ්‍රව වූයේ 'මා සැදැහැතියෙක, සිල් ඇතියෙක, විවෙක ඇතියෙක, බහුශ්‍රැත යෙක, වීර්‍ය්‍යය ඇත්තෙක, සමාධි සම්පන්නයෙක, ප්‍රඥාවතෙකැ යි ජනතෙමේ දැන ගණීවා' යි නො කැමැති වේ. එබඳු හැඟවීමක් කිසිලෙසකින් බලාපොරොත්තු නො වෙයි. මජ්ඣන්තික මහ රහතන් වහන්සේ එබඳු උතුමෙකි

ධර්මාශොක රජුගේ විහාර පූජාමඞ්ගලයෙහි සඞ්ඝස්ථවිර වූ මුන් වහන්සේ, තමන්ගේ රහත් බව කිසිවකුට හඟවන්නට කැමැති නො වූ සේක. උන්වහන්සේගේ පා සිවුරුවල වටිනාකම සත පන්සැත්තැවක් පමණ විය. ඒවාගේ ම ඒවා ඉතා රළු ය. එයින් තමන්ගේ උසස්කම හඟවන්නට නො සිතූ සේක. පා සිවුරුවල රළුබව දුටු මිනිස්සු 'ස්වාමීනි! පොඩ්ඩක් පැත්තකට වුව මැනැවැ' යි කියත්. 'අද ද බොහෝ දෙනෙක් ගුණවෘධ වයොවෘධයන් බැහැර කොට, බැලූ බැල්මට ප්‍රියභාවය එළවන, පා සිවුරු

ආදියෙන් සැරසෙන්නන් ම ගෞරවයෙන් පිළි ගණිති' නුවණ මද ලොකයෙහි සැටි බලනු මැනැවි. **'මෙසේ දුර දිග නොබලා ක්‍රියා කරන්නන් නිසා අලජ්ජීහු ප්‍රබල වෙති. ලජ්ජීහු දුබල වෙති. එසින් ශාසනය විනාශයට යෙයි'** මජ්ඣන්තික සථවිරයන්වහන්සේ 'මා වැනි මහරහත් නමක්, රජුට, සංග්‍රහ නොකරතොත් අන් කවරෙක් කරන්නේ ද' යි සිටි තැන ම පොළොවෙහි ගැලි සඞ්ඝසථවිරයන්ට පිළිගැන්වීමට ඔසවන ලද බත් පිඬ පිළිගණිමින් ම, රජු ඉදිරියෙහි මතු වූ සේක. මෙසේ රහත්වූවෝ ද, රහත් බව හැඟවීමට නොකැමැති අලෙසෑ ඇති භික්ෂූන් වහන්සේ නොඋපන් ලාභය උපදවත්. උපන් ලාභය සථිර කරත්. දායකයන්ගේ සිත් සතුටු කරත්. හෙතෙමේ තම අලෙවජ්ඣභාවය නිසා මද දෙයක් ම ගන්නට කැමැති වන්නේ ද, දායකයෝ ඔහුගේ වතෙහි පැහැද වැඩි වැඩියක් ම දෙන්නෝ ය.

මේ දපපිවජ්ඣභාවය අන් අයුරකින් ද සිවු වැදෑරුම් වේ. පච්චයපපිවජ්ඣභාවය, ධුතඞ්ගපපිවජ්ඣභාවය, පරියත්තිඅප්පිවජ්ඣභාවය, අධිගමඅපපිවජ්ඣභාවය යි. එහි සිවුපසයෙහි දපපිවජ්ඣ වූයේ පච්චයපපිවජ්ඣ නම්. හෙතෙමේ, දුනවසතුව බොහෝ වේ ද, එහෙත් දායක තෙමේ ටිකක් ම දෙනු කැමැති වේ ද, එ කල්හි දායකයා අනුව ටිකක් ම පිළිගණී යි. දුනවසතුව සුළප වුව ද, දායක තෙමේ බොහෝ දෙනු කැමැති වේ ද, එ කල්හි දුනවසතුව ඇති සැටි බලා පිළිගණී යි. දුනවසතුව ත් බොහෝ වේ ද, දායක තෙමේ ත් බොහෝ දෙනු කැමැති වේ ද, එ කල තමාගේ පමණ සලකා පිළිගණී යි.

ධුතඞ්ගසමාදානය තමා තෙරෙහි ඇතිබැව් නොදක්වනු කැමැත්තේ, ධුතඞ්ගපපිවජ්ඣ නම්. සොඝානික මහා කුමාරසථවිරයන් වහන්සේ සැට අවුරුද්දක් ම සොහොනෙහි විසූහ. එතෙක් කල් ධුතඞ්ගසමාදානයෙන් යුක්ත ව විසූ බව් ත් ඒ බව කිසි කෙනෙක් නොදන්හ. උන්වහන්සේ ම එය කිහ මෙසේ:-

'සුසානෙ සඨිවසසානි අබෙබාකිණණා වසාමහං,
දුතියෝ මං න ජානෙය්‍ය අහෝ සොඝානිකුත්තමෝ' යි.

'මම සොහොනෙහි සැට අවුරුද්දක් ම එකලාව වෙසෙමි, මා හැර දෙවැන්නෙක් මා එහි වසන බව නොදන්නේ ය, සොඝානිකඞ්ගයාගේ උතුම්කම පුදුම යි'

මිහින්තලාමහාවිහාරයෙහි සහොදර භික්ෂූන් වහන්සේ දෙනමක් විසූහ. මලනු තෙමේ දායකයකු දුන් උක්දඬු කැබැලි

කිහිපයක් ගෙණ වැඩි මහලු තෙරුන් වෙත ගොස් 'ස්වාමීනි! උක්දඬු කැබැල්ලක් වළඳනු මැනැවැ' යි කියා සිටියේ ය. දන් වළඳ මුව සෝදා අවසන් වූ බැවින්, උන්වහන්සේ 'මට දැන් වුවමනා නැතැ' යි කී විට, 'හාමුදුරුවන් වහන්සේ එකාසනිකඞ්ගය රකින්නෝ දැ' යි ඇසී ය. එවිට වැඩි මහල් තෙරණුවෝ පණස් වසක් ම නො කඩ කොට රක්නා එකාසනිකධුතඞ්ගය, සඟවනු කැමැති ව උක්දඬු කැබැල්ලක් ගෙන්වා ගෙණ වළඳ මුව සෝදා ගෙණ නැවැත ධුතඞ්ගය ඉටා ගත්හ. එසේ කළෝ තමන් වහන්සේ ධුතඞ්ග රක්නා බව නො දැනෙනු සඳහා ය.

තමන්ගේ බහුශ්‍රැතභාවය නො දන්වනු කැමැත්තේ පරියත්තිඅප්පිච්ඡ නම්. 'සාකෙත තිස්ස' ස්ථවිරයන් වහන්සේ මෙනි.

ස්‍රොතාපත්ත්‍යාදීමාර්ගඵල ලාභියෙක් ව ඒ සොතාපන්නාදිභාවය නො දන්වනු කැමැත්තේ, අධිගමප්පිච්ඡ නම්. අනුරුඬාදී කුලපුත්‍රයන් තිදෙනා හා ඝටීකාරයා මෙනි. මෙබඳු මහානිසංසදායක වූ අප්පිච්ඡභාවය පිළිබඳ කරණ කථාව අප්පිච්ඡකථා, නමු.

සන්තුඩිකථා නම්, සිතේ පිණායෑම පිළිබඳ කතා ය. එය මෙහිලා දෙළොස් වැදැරුම් ය. චීවරයෙහි යථාලාභසන්තොෂය, යථාබලසන්තොෂය, යථාසාරුප්පසන්තොෂය, යි ත්‍රිවිධ වන්නා සේ ම, පිණ්ඩපාත, සෙනාසන, ග්ලානප්‍රත්‍යයයන්හි ද එසේ තුන් තුන් පරිදි වන්නේ ය. දෙළොස්වැදැරුම් වන්නේ එවිට ය. යම් මහණක්හට සිවුරක් ලැබුනු කල්හි, එය හොඳ හෝ වේවා, අනිකක් ගැණ නො පතා එයින් ම සතුටු වේ නම්, ලැබුනේ නමුදු නො ගණී නම්, එය යථාලාභසන්තොෂය යි. ලැබුනු සැටියෙන් සතුටු වීම යි.

යම් මහණෙක් ස්වභාවයෙන් දුර්ඵල වේ ද, රොගයෙන් හෝ ජරාවෙන් මැඩුනේ ද, හරබරැති සිවුරක් පෙරවි කල්හි පෙළේ ද, හෙතෙමේ එය සහාග වූ අන් මහණක්හට දී ඒ මහණහුගෙන් සැහැල්ලු සිවුරක් ඉල්ලා ගෙණ ඉන් යැපේ ද, සතුටු වේ ද, ඒ වනාහි යථාබලසන්තොෂය යි.

අනෙකෙක් ප්‍රණීත වූ ප්‍රත්‍යය ය ලබන සුලුවූයේ, මෙය, පැවිදි ව බොහෝ කල් ඉක්මුණු තෙරුන්ට, මෙය බහුශ්‍රැතයන්ට මෙය ගිලනුන්ට, මෙය සිවුරු පිරිකර නො ලැබෙන්නන්ට වේවා' යි තමන් ලත් වටින අගින පට සිවුරු ආදි සිවුරු තමන්ට නො සුදුසු හෙයින් ඔවුන්ට දී තම පමණට ගැළපෙන සේ

ඔවුන්ගෙන් ඉල්ලා ගත් සිවුරක් හෝ කසළ ගොඩ ආදියෙන් අවුලා ගත් රෙදිකැබැලි එක් කොට මසා ගත් සිවුරක් හෝ පෙරව ගැන්මෙන් සතුටු වේ ද, ඒ වනාහි යථාසාරුප්පසන්තොෂ යි.

පිණ්ඩපාත, සෙනාසන, ග්ලානප්‍රත්‍යයයන් කෙරෙහි ද යථා ලාභාදි සන්තොෂ තුන වන්නේ මේ ලෙසට ය. මෙසේ මේ සන්තොෂයන් ගැණ කරණ කතාව සන්තුෂ්ඨිකථා, නම්.

පවිවෙක කථා නම්, ප්‍රකෘතිවිවෙකය පිළිබඳ කතා ය. කාය විවෙකය, චිත්තවිවෙකය, උපධිවිවෙකය යි ආගමයෙහි විවෙකය තෙපරිදි ය. හැම අතෙකින් ම, විවෙකය ලැබෙන්නේ නිවන් පසක් කිරීමෙනි. එහෙයින් නිර්‍වාණය ම පවිවෙක, නම් වේ.

අසංසග්ග කථා නම්, ශ්‍රවණසංසර්ගාදියෙන් තොරබව පිළිබඳ කතා ය. එහි සවණසංසග්ග – දස්සනසංසග්ග – සම්භුල්ලාපසංසග්ග, – සම්භොග සංසග්ග, – කායසංසග්ග යි සංසර්ග පසෙකි. මේ පස් වැදෑරුම් සංසර්ගයෙන් තොරවීම අසංසග්ග, නම් වේ.

විරියාරම්භ කථා නම්, කෙලෙස් නැති කරණු පිණිස පටන් ගත් කායිකචෛතසිකවීර්‍යය පිළිබඳ කතා ය.

සීලසම්පද කථා නම්, චතුපාරිසුද්ධිසීලය ගැණ කරණ කතා ය.

සමාධිසම්පද කථා නම්, විදර්‍ශනාපාදකඅෂ්ටසමාපත්තිය ගැණ කරණ කතා ය.

පඤ්ඤාසම්පද කථා නම්, ලෞකිකලෝකොත්තරප්‍රඥාසම්පත්තිය ගැණ කරණ කතා ය.

විමුත්තිසම්පද කථා නම්, ආර්‍යඵලය විමුක්තිසම්පද, නම්. ඒ මේ ආර්‍යඵලය ගැණ කෙරෙණ කතාව විමුක්තිසම්පදාකථා, නම්.

විමුත්තිඤාණ දස්සන සම්පද කථා නම්, එකුන් විසි ප්‍රත්‍යවෙක්ෂාඥානයෝ, විමුක්තිඤාණදස්සනසම්පද, නම්. ඒ ගැණ කෙරෙණ කතා ය, විමුක්තිඤාණදස්සනසම්පදාකථා යි කිවා. සොතාපත්ති ඵලයට පැමිණි අර්‍ය පුද්ගලයා පිළිබඳ, මාර්‍ගප්‍රත්‍යවෙක්ෂා, ඵල ප්‍රත්‍යවෙක්ෂා, නිර්‍වාණප්‍රත්‍යවෙක්ෂා, ප්‍රහීණක්ලේශප්‍රත්‍යවෙක්ෂා, ශෙෂක්ලේශප්‍රත්‍යවෙක්ෂා යි ප්‍රත්‍යවෙක්ෂා ඥාන පසෙකි. සකෘදාගාමී ඵලයට හා අනාගාමී ඵලයට පැමිණි ආර්‍යපුද්ගලයන් දෙදෙනාට ත් මේ පස ම ලැබේ. මේ තිදෙනාගේ වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා ඥාන පසළොසෙකි. රහතුන් වහන්සේ පිළිබඳ ව ඉතිරි කෙලෙස් පස් විකුමෙක් නො ලැබේ. උන්වහන්සේට ලැබෙන්නේ ඒ හැර අනික් සතර යි. එවිට ප්‍රත්‍යවෙක්ෂාඥානයෝ එකුන් විස්සෙකි.

තෙරසධුතගුණ නම්, පංසුකූලිකඞ්ග, තෙචීවරිකඞ්ග, පිණ්ඩපාතිකඞ්ග, සපදානචාරිකඞ්ග, එකාසනිකඞ්ග, පත්තපිණ්ඩිකඞ්ග, ඛලුපච්ඡාභත්තිකඞ්ග, ආරඤ්ඤිකඞ්ග, රුක්ඛමූලිකඞ්ග, අබ්භොකාසිකඞ්ග, සොසානිකඞ්ග, යථාසන්තතිකඞ්ග, නෙසජ්ජිකඞ්ග යන මොවුහු ය. තමහට ප්‍රතිපක්ෂ ව නැගී සිටි කෙලෙසුන් කම්පනය විනාශය කරණ හෙයින් මොවුහු ධුතඞ්ගයෝ යි කියනු ලැබෙති.

විදර්ශනා නම්, සංස්කාරධර්මයන් ඇති ව නැති වන බැවින් අනිත්‍ය ය යි ද, නැවැත නැවැත පෙළන හෙයින් දුක් ය යි ද, තමන් වශයෙහි නො පවත්නා හෙයින් අනාත්මය යි ද දක්නා නුවණ යි.

සතරමග සතරපල මේය යි යට කියන ලද්දේ ය.

ත්‍රිවිද්‍ය නම්, පුබ්බෙනිවාසානුස්සතිඤ්ඤාණ, චුතූපපාතඤ්ඤාණ, ආසවක්ඛයඤ්ඤාණ යන තිදෙන ය. ඉදිරියෙහි විස්තර වන්නේ ය.

ෂඩභිඥ නම්, දිබ්බචක්ඛුඤ්ඤාණ, දිබ්බසොතඤ්ඤාණ, පුබ්බෙනිවාසානුස්සතිඤ්ඤාණ, පරචිත්තවිජානනඤ්ඤාණ, ඉඩ්ඪිප්පභෙදඤ්ඤාණ, ආසවක්ඛයඤ්ඤාණ යන මේ සදෙන ය. විස්තරය ඉදිරියෙහි ය.

මෙසේ මෙහි සැකෙවින් කියන ලද චුල්ලසීලාදීහු සහායතා ගුණයෝ යි ද, ඔවුහු බාලයා කෙරෙහි නො වෙත් යි ද, එහෙයින් බාලයා ඇසුරු නො කොට එකලා ව වාසය කළ යුතු ය යි ද මෙයින් වදාළ සේක. ධර්මදෙශනාවගේ අවසානයෙහි ආගන්තුක ව පැමිණි භික්ෂු තෙමේ සොතාපත්ති ඵලයට පැමිණියේ ය. අන්‍ය වූ බොහෝ දෙන ද සොවන් පලාදියට පැමිණියෝ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූවා ය.

මහාකාශ්‍යපස්ථවිර සද්ධිවිහාරික වස්තුව නිමියේය.

— —

සිටුවරයකු රොඩියකු වීම

5 — 3

සැවැත් නුවර ආනන්ද නමින් ප්‍රසිඩ, සතළිස් කෙළක් ධනය ඇති තද මසුරු බැවින් මැඩුනු සිටාන කෙනෙක් වූහ. ඔහු පසලොස් දවසකට වරක්, නැයන් ගෙන්වා ගෙණ 'මූලසිරි' නම් තම පුතු ඔවුන් ඉදිරියට පමුණුවා දවසකට තුන් විටක් 'මේ සතළිස් කෙළක් ධනය බොහෝ ය යි නො සිතන්න, තිබෙන දේ කාටවත් කිසිවක් සඳහා දෙන්නට එපා, තව තවත් වැඩි වැඩි-යෙන් සපයා ගණින්, දවස ගානේ එක් එක් කහවණුව වුවත් වියදම් කලොත් නොබෝ දවසෙකින් සියල්ල ම අවසන් විය හැකි යි, ඒ නිසා නුවණැති මිනිසා, ගැමෙන් අඳුන් අවසන් වන සැටි ත්, වෙයන් තුඔස් බඳින සැටි ත්, මී මැස්සන් මී වද බඳින සැටි ත්, දැක ධනය රැස් කරා' යි අවවාද කෙරෙයි.

මෙසේ කලක් ගෙවා ආනන්ද සිටු තෙමේ සිතට යටත් ව මසුරු මලින් මැඩි මැඩි සිට මැරී ගොස් එ නුවර අසල රොඩි ගමෙක රොඩි ගැහැණියක කුසෙහි පිළිසිඳ ගත්තේ ය. එ ගම රොඩි ගෙවල් දහසක් පමණ ඇත. තරමක ලොකු ගමෙක් විය. රජ තෙමේ සිටු මළබව අසා ඔවුන් පුත් මූලසිරියා ගෙන්වා ඔහුට සිටු තනතුර දුන්නේ ය. එ ගම හැම රොඩි මිනිහා ම එකතු ව කුලී වැඩ කොට ජීවත් වන්නේ ය. ආනන්ද සිටු, එ ගම රොඩි ගැහැණියක කුස පිළිසිඳ ගත් තැන් පටන් එ ගම වැස්සන්ට කුලී වැඩත් නැති ව ගියේ ය. එදා වේලට වැඩියෙන් බත් පිඩක් වත් සපයා ගැණීමෙහි ඔවුහු හැම කෙනෙක් ම අපොහොසත් වූහ. දිනෙක එක් තැන් ව 'අප කොතරම් මහන්සි දරා වැඩ කළ ද, අපට දැන් එදා වේලවත් සපයා ගත නොහැකි ය, මෙසේ වීමට හෙතුව කුමක් ද? එක ත් එකට ම අප අතර කාලකණ්ණියකු සිටිය යුතු ය, නො වේ නම් මෙසේ වන්නට බැරි ය' යි කියා ඔවුහු දෙ කොටසක් ව වෙන් වූහ. මෙසේ මවුපියන් තේරෙන තුරා ම, දෙ කොටසට දෙ කොටසට බෙදී කාලකණ්ණියා උපන් ගෙය තෝරා ගෙණ දරාගැබ් සහිත වූ ඒ ගැණිය ගමින් පන්නා හැරියෝ ය. ඈ ද ඔහු පිළිසිඳ ගත් දා සිට බඩ පුරා කන්නට බත් වේලක් නොලැබ, ඉතා දුකින් කල් යවන්නී පුතා ද වැදුවා ය. වැදූ පුතා ද අන්පා ඇස් කන් නාස් මුහුණු යනාදිය ඒ ඒ නියම තන්හි නොපිහිටි හෙයින් රූපයෙන් හා අන්පා ආදීන්ගේ විකාරයෙන් පාංශු

පිශාචකයකු සේ පෙණෙන්නට වන. ඔහු පෙර අත්බව්හි ධනවත් සිටුවරයෙක් ව සිටියේ ද, ඒ අත්බව්හි දැන මානාදී කිසිත් පිණක් නොකළ හෙයින් ලෝ වැස්සත් විසින් පහත් යි සම්මත වූ රොඬි කුලයෙහි රොඬි ගැණියක කුසෙහි පිළිසිඳ ගෙණ, පිළිසිඳ ගත් දා සිට, එ ගෙට ද ගිනි දෙමින් බිය එළවන රෑ ඇති පාංශු පිශාචයකු ලෙසින් විරූප ව උපන්නේ ය. පින් නොකරණ, අන්‍යයාහට ද මේ නොවන්නේ නොවේ. මෙසේ ඔහු පාංශු පිශාචයකු ලෙසින් උපන් නමුත් මවු තොමෝ, පුත්‍රස්නේහය බලවත් හෙයින් දැඩි දුක් විඳ ඇතිදැඩි කළා ය. ඈ කැමට යමක් සපයා ගණු සඳහා පුතා ත් රැගෙණ බැහැර ගිය දවසෙක් වී නම්, එ දවස කිසිත් නොලැබ හිස් අතින් ම ගුබ්බෑයමට එයි. පුතා නවතා ගිය හැම දවසෙහි ම, යමක් කමක් සපයා ගෙණ එයි. ඈ සිය පුතු සිඟමනේ ගොස් ජීවත් වීමට තරම් ලෙසින් ඇති දැඩි වූ පසු කොළපතක් අතට දීලා, 'පුත! මම නා නිසා බොහෝ දුක් වින්දෙමි, මට හැමදා ම මේ ලෙසට දුක් විඳින්නට බැරි ය, උඹට කන්නට අඳින්නට දෙන්නට මට හයියක් නැත, ඒ නිසා, දැන් ඉතින් මේ නුවර ඇතැම් පොහොසතුන් විසින්, මහාජනයා විසින් සිඟන්නන්ට පුළන්නන්ට කෑ බත් ආදිය දෙනු පිණිස පිහිටුවන ලද දන්සැල් තැන් තැන්වල තිබේ, එබඳු තැන් කරා ගොස් යමක් කමක් සිඟාගෙණ අවුත් කා බී ජීවත් වෙයන්' යි කියා පිටත් කළා ය.

රොඬි කොළුවා ද මවු කී ලෙසින් සිඟා යන්නේ, පසුගිය අත් බව්හි, ආනන්ද සිටුව උපන් කාලයෙහි විසූ පෙදෙසට පැමිණ ජාති සිහිකිරීමෙහි නුවණ ලැබ, එ කල විසූ ඒ ගෙදරට ම ගියේය. පළමුවන, දෙවන, තුන්වන, දොරකොටුවල සිටි කිසි කෙනෙක් ඔහු හැණ නොසැලකූහ. සතරවන දොරකොටුව ලඟදී මූලසිරි සිටානන්ගේ පුත්‍රයෝ පාංශුපිශාචකයකු වැනි ඔහු දුක, භයට පැමිණ හඬන්නට වූහ. එවිට සිටානන්ගේ මෙහෙකරුවෝ, ඔහු අල්ලා, තලා, පෙළා, කුණු ගොඩකට ඇද දැමූහ.

එ දවස සම්මා සම්බුදුරජානන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග පිඬු පිණිස වඩින සේක් අතර මග දී තෙරුන් දිහා බැලූ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ 'සවාමීනි! භාග්‍ය වතුන් වහන්ස! මේ අතර මග දී කුමක් නිසා මා දිහා බලා වදාළ සේක් දැ' යි ඇසූ විට, උන්වහන්සේ කුණුගොඩෙහි වැනිර සිටියහු පිළිබඳ සියලු තොරතුරු වදාළ සේක. ස්ථවිරයන් වහන්සේ මූලසිරි සිටු ගෙන්වූහ. මිනිස්සු ද එහි රැස්වූහ. ඉක්බිති බුදු රජානන් වහන්සේ, 'මහසිටු! මේ කවරෙකැ යි දන්නෙහි දැ' යි

අසා වදුරා 'නො දනිමි' යි කී විට 'මොහු තාගේ පිය වූ ආනන්ද සිටු තෙමේ ය' යි වදුළ සේක. එහෙත් මූලසිරි තෙමේ ඒ නො ඇදහී ය. බුදුරජාණන් වහන්සේ, 'ආනන්ද සිටු! තාගේ පුතාට පස් මහානිධානයන් කියව' යි කියවාලා පෙර අත්බවේ තම පියා බව, ඔහු සිතට ගැන්වූ සේක. මූලසිරි තෙමේ සරණ සිලයෙහි පිහිටියේ ය. එකල්හි බුදුරජාණන් වහන්සේ ඔහුට මේ ධම්දෙශනාව කළ සේක:-

පුත්තාමත්ථි ධනම්මත්ථි ඉති බාලෝ විහඤ්ඤති,
අත්තා හි අත්තනෝ නත්ථි කුතෝ පුත්තා කුතෝධනන්ති.

මට පුත්‍රයෝ ඇත. මට ධනය ඇතැ යි යෙමින් මෝඩ මිනිහා නැසෙයි. තෙමේ ම තමාට නැත. එසේ නම් පුත්‍රයෝ කොයින් ද?

පුත්තා මෙ අත්ථි = මට පුත්‍රයෝ ඇත්තාහ.

'අත්තනෝ කුලං පුණාති සොධෙති' = ති පුත්තෝ, අත්තභාවා පිතුහදයං පූරෙති'ති = පුත්තෝ' යනු වාක්‍ය යි. තමාගේ කුලය පිරිසිදු කරන්නේ පුත්‍රයා ය, යනු පළමු වැන්නෙහි තේරුම යි. දෙවැන්නෙහි සිංහල නම්, තම මවුපියන්ගේ සිත් පුරන්නේ පුත්‍රයා ය, යනු යි. **අත්තජ, ඛෙත්තජ, අන්නෙවාසික, දින්නක** යි පුත්‍රයෝ සිවු දෙනෙකි. එහි තමා නිසා උපන්නේ අත්තජ, නම්. යහන මතුයෙහි, පළසෙහි, ලයෙහි යන මේ ආදි තන්හි උපන්නේ ඛෙත්තජ, නම්. තමා වෙත ශිල්ප ශාස්ත්‍රාදිය උගන්නේ අන්නෙවාසික, නම්. පොෂණය පිණිස දුන්නේ දින්නක, නම්. මේ සතර දෙනා අතුරෙහි කවරෙක් නමුත් තමන්ගේ ගුණ නුවණ කරණකොට මවුපියන් ඉක්මවා සිටියේ, හෙවත්, මවුපියන්ගේ ගුණ නුවණට අඩික ගුණ නුවණ ඇත්තේ ද, ධන ධාන්‍යාදියෙන් වැඩි සිටියේ ද, සවංශයෙහි ධවජයක් මෙන් බබලන්නේ පරහට හිතවත් වූයේ අතීජාත, නම් වේ. තමා, ගුණ නුවණින්, ධන ධාන්‍යාදියෙන් මවුපියන්හට අනුරූපව සිටියේ, මවුපියන් හා සමතාවයෙහි සිටියේ අනුජාත, නම් වේ. මවුපියනට ද වඩා ගුණනුවණින් පහත් ව සිටියේ, ධන ධාන්‍යාදියෙන් නො වැඩුනේ අවජාත, නම් වේ. බුදුරජාණන් වහන්සේ මෙසේ වදුළ සේක. **'ඉධ භික්ඛවෙ! පුත්තස්ස මාතාපිතරෝ හොනති, න බුඛං සරණං ගතා -පෙ- න සංඝං සරණං ගතා, පාණාතිපාතා අප්පටිවිරතා -පෙ- සුරාමෙරය මජ්ජපමාදට්ඨානා අප්පටිවිරතා දුස්සීලා පාපධම්මා, පුත්තෙනා ව තෙසං හොති, බුඛං සරණං ගතෙනා -පෙ- සංඝං සරණං ගතෙනා, පාණාතිපාතා**

පටිවිරතො -පෙ- සුරාමෙරය මජ්ජපමාදඨානා පටිවිරතො, සීලවා කල්‍යාණධම්මො, එවං ඛො භික්ඛවෙ! පුත්තො අතිජාතො හොති, ඉධ භික්ඛවෙ! පුත්තස්ස මාතාපිතරො හොන්ති, බුඩං සරණං ගතා -පෙ- පුත්තො ච නෙසං බුඩං සරණං ගතො -පෙ- සීලවා කල්‍යාණධම්මො, එවං ඛො භික්ඛවෙ! පුත්තො අනුජාතො හොති, ඉධ භික්ඛවෙ! පුත්තස්ස මාතාපිතරො හොන්ති, බුඩං සරණං ගතා -පෙ- පුත්තො ච නෙසං න බුඩං සරණං ගතො - දුස්සීලො පාපධම්මො, එවං ඛො භික්ඛවෙ! පුත්තො අවජාතො හොතීති' යි.

නුවණැති දෙමවුපියෝ අතිජාත අනුජාත පුත්‍රයන් දෙදෙනා කැමැති වෙති. අවජාතපුත්‍රයකු කැමැති නො වෙති. හෙතෙමේ කුලය සිඳින්නේ ය. කුලය වනසන්නේ ය. අසල් වාසීනට දුක් දෙන්නේ ය. සමාජය නසන්නේ ය. මහණ බමුණන්ට විපත් කරන්නේ ය. දුසිරිත් බෝ කරන්නේ ය. එහෙයිනි. යම් පුත්‍රයෝ දෙදෙනෙක් උපාසක ව ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා යන ගුණයන්ගෙන් යුක්ත වූවෝ, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ වචන දැන හැසිරෙන්නෝ, පහවූ මසුරු මල ඇත්තෝ ඝන මෙඝ පටලයෙන් මිදුන පුන්සඳ මෙන් ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී වූ පිරිස් අතර ගුණ නුවණින් බබලන්නෝ අතිජාත අනුජාත නම් වන්නෝ ය යි, සැකෙවින් වදාළ සේක. මෙසේය ඒ:-

'අතිජාතං අනුජාතං පුත්තමිච්ඡන්ති පණ්ඩිතා,
අවජාතං න ඉච්ඡන්ති යො හොති කුලගන්ධනො,

එතෙ ඛො පුත්තා ලොකස්මිං යෙ භවන්ති උපාසකා,
සඩාසීලෙන සම්පන්නා වදඤ්ඤූ වීතමච්ඡරා,
චන්දෙවබ්භඝනා මුත්තා පරිසාසු විරොවති.' යි

මෙහි එන්නෝ, අතිජාතාදි භෙදයෙන් භෙදයට ගිය පුත්‍රයෝ නො වෙති. අත්තජාදී භෙදයෙන් භින්න වූ පුතුන් සිවුදෙනා අතුරෙහි අත්තජතෙමේ ය මෙහි එනුයේ.

ධනං මෙ අත්ථි = මට ධනය තිබේ.

'මේ මාගේ ය' යි කියයුතු වූ චලාචලවස්තුහු මෙහි ධනය යි ගැණෙති. මනුෂ්‍යයකුගේ දියුණුවට උපකාර වන මිල මුදල් ඉඩකඩම් වතුපිටි ගේදොර හරකබාණ ආදි හැම දෙයක් ම ධන ශබදයෙහි ඇතුළත් ය. **'මම ඉදන්ති ධනාසිතබ්බං සඤ්ඤාසිතබ්බන්ති = ධනං[1]'** යනු එහි වාක්‍ය යි.

බාලො විහඤ්ඤති = මෝඩ මිනිසා නස්නේ ය.

1. 2 4 'ධනං' යන්න බලනු.

බාලා' යන්නෙහි විසතර කියූ ය.[1] **විහඤ්ඤති'** යන්නට දුක් වන්නේය සිද කිය හැකි ය.

අත්තා හි අත්තනෝ නාථෝ = තෙමේ ම තමාට නැත්තේ ය.

අත්තා' යනු සම්මුතිකථා යි. පරමාර්ථ වශයෙන් එසේ කියනු නො යෙදේ.

කුතෝ පුත්තා කුතෝ ධනං = පුත්‍රයෝ කොයින් ද? ධනය කොයින් ද?

මේ ගාථාවෙහි එන **පුත්ත'** ශබ්දයෙහි දූවරු ද සංග්‍රහ වෙති යූ පුතුන් දෙපක්ෂය ම මෙහි ගැණේ. පුත්‍ර දුහිතෘන් කෙරෙහි වූ තෘෂ්ණාවෙන් යුක්ත වූ තැනැත්තේ, 'දරුවෝ නැසුනාහ, දූනුත් නැසෙති, මත්තෙහි ද නැසෙත්නා' යි. වෙහෙසෙයි. දුක්වෙයි. ධනය ගැණත් එසේ ය. දරුවන් කෙරෙහි තුන් ආකාරයකිනු ත්, ධනය කෙරෙහි තුන් ආකාරයෙකිනු ත් යන සයාකාරයෙකින් වෙහෙසෙ යි. දුක් වෙයි. 'දරුවන් හදා වඩා ගන්නෙමි' යි දිවා රෑ දෙක්හි ම නොයෙක් බිහිසුණු ගොඩ දිය ආදි තන්හි ව්‍යායාම් කරන්නේ වෙහෙසෙයි. දුක් වෙයි. එසේ ම ධනය උපයන්නේ සී සෑම් වෙළහෙලදම් කරමින් වෙහෙසෙ යි. මෙසේ යූ පුත් ආදීන් ගැණ වෙහෙසෙන්නහුට තමන් විඳින ඒ වෙහෙසින් දුකට පත් වූ තමා මුදා ගන්නට සුවපත් කරන්නට ඔවුනට නො හැකි බැවින්, තමන් ජීවත් ව සිටිද්දී ම තෙමේ ම තමාට නැත. මරණ ඇදෙහි හොත් කල්හි ත්, ගිනිදැලින් මෙන් එහි මාරණාන්තිකවෙදනාවෙන් දැවෙන කල්හි ත්, හන්දි බැමි සිදින කල්හි ත්, ඇටසැකිලි බිඳින කල්හි ත්, ඇස පියා පරලොව ද, ඇස ඇර මෙලොව ද බලන්නහු ගේ, දිනපතා දවසට දෙවරක් නහවා, තෙවරක් කවා, සුවඳ මල් ආදියෙන් සරසා දිවිහිම් කොට උපස්ථානය කළ, පොෂණය කළ ආත්මයව ත්, තමන් දුකින් රැක ගන්නට අපොහොසත් ය. එබැවින් තෙමේ ත් තමාට නැත. ඒ කාලයෙහි දරුවෝ හෝ ධනය තමාට කුම් නම් පිහිටක් කරන්නෝ ද? කුමකුත් නො කරන්නෝ ය.

ආනන්ද සිටු තෙමේ කිසිවකු ත් කිසිවක්හට නො දී දරුවන් උදෙසා ධනය රැස් කොට තබා මිය ගොස් රොඹියෙක් ව උපන්නේ මහත් දුකට පත් විය. පුත්‍රයෝ හෝ ධනය ඔහු දුකින් මුදන්නට සමත් නො වූහ. කිසිත් සැපයක් නො ද එළවූහ.

ධම්දෙශනාවගේ අවසානයෙහි අසූසාර දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වූයේ ය. දෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

ආනන්දසෙඨිවත්ථුව නිමියේ ය.

---

1. 2. 4. 'බාලා' යන්න බලනු.

ගැට කපන සොරු දෙදෙනෙක්

5 — 4

අප බුදුරජුන් දවස සැවැත්නුවර ගැට කපන සොරු දෙදෙනෙක් වූහ. ඔවුහු මිත්‍රයෝ ය. බණ අසනු සඳහා, ජේතවන විහාරයට යන මහාජනයා අතරට වැටී යන මේ යහළුවන් දෙදෙනාගෙන් එකෙක්, සොරකම පසෙක තබා, මහාජනයා හා එක් ව හිඳ බණ අසන්නට වන්නේ ය. අනිකා යමක් කමක් සොරා ගන්නට මාන බලමින් හුන්නේ ය. උන් දෙදෙනා අතුරෙහි බණ අසා සිටියේ සොවන්පලයට පැමිණියේ ය. සොරකමට මාන බලමින් සිටියේ බණ පිරිසෙහි හුන් කෙනකුගේ ඉණෙහි ගැටගසා තුබූ ගැටය කපා පස්මස්සක් වටර මුදලක් පැහැර ගන්නේ ය. එය ඔහුගේ ගෙයි බත්මිල විය. අනිකාගේ ගෙදර බත් මිලෙක් නො වී ය. මසු සොරා ගත්තේ, අඹුවත් සමග අනිකාගේ ගෙට ගොස් 'ඔහේගේ අතිපණ්ඩිත කම නිසා ගෙදොර දොරේ කෑමට හාල් තුණපහේ ආදී වූ කිසිත් නෑ නොවේ ද? මිල මුදලුත් නෑ නේ ද' යි ගෙදොර දොරේ අඩුපාඩු කියමින් ඔහු වෙහෙසට පත් කෙළේ ය. එවිට ඔහු 'බාලභාවය නිසා ම, මොහු මාගේ පණ්ඩිත කම නො දනී ය' යි සිතා එපුවත බුදුරජුන්ට සැලකරණු පිණිස, නෑදෑයනුත් සමග දෙවිරමට ගොස්, ඒ බව දන්වා සිටියේ ය. එවිට බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව කළ සේක:-

යො බාලෝ මඤ්ඤති බල්‍යං පණ්ඩිතෝ වාපි තේන සෝ,
බාලෝ ච පණ්ඩිතමානී ස වෙ බාලෝති වුච්චතීති.

අඥාන වූ යමෙක් තමාගේ බාලභාවය දනි ද, ඒ හෙතුවෙන් ඔහු පණ්ඩිතයෙක් හෝ නො එසේ නම් පණ්ඩිතයකු සමානයෙක් හෝ වන්නේ ය. යම් බාලයෙක් 'මම පණ්ඩිත වෙමි' යි සිතා ද ඔහු එකාන්තයෙන් බාල ය යි කියනු ලැබේ.

යෝ බාලෝ = අඥ වූ යමෙක්.

සෝ' යනු, ය, යන්නෙන් ආ ප්‍රථමාවිභක්ත්‍යර්ථ එකවචනාන්ත පදයෙකි. **ය,** ශබ්දය **යාන, යාත, ආයු, කීර්ති, සුති** යන අර්ථයන්හි වැටේ. තවද **ප්‍රත්‍යය, ආගම, ආදෙශ, සඛ්‍යානාම, බ්‍යඤ්ජන, ඡන්ද, ඛණ** වශයෙන්ද යකාරය ආයේ ය. ඒ කීහ මෙසේ:-

'යානෙ යාතරි ආයුම්හි කිත්ති සද්දෙ ච ථොමනෙ,
පච්චයෙ ආගමෙ යෝ'හු එදන්තසඤ්ඤාසු කාරියෙ;
සබ්බනාමෙ බ්‍යඤ්ජනෙ ච, ඡන්දගණෙ යථාරහං' යි.

'යන්ති එතෙහිනි' යන වාක්‍යයෙහි ලා හස්ත්‍යශ්ව රථාදි වාහනයෝ කියනු ලැබෙති. **'හත්ථිඅස්ස යානෙහි යා යන්ති නි'** යන වාක්‍යයෙහි යන්නෝ කියනු ලැබෙති. **'දීඝෝ යා ආයු යෙසං තෙ දීඝයා'** යන්නෙහි ආයුෂ්මයෝ. **'පත්ථටයො පත්ථටකිත්ති සද්දෙ,'** යන විවරණයෙහි ලා පත්ථටයෝ' යි ආයේ කීර්ත්තියෙහි ය. **'ගීයතෙ ථොමීයතෙ විඤ්ඤූහිති = යො'** යි ආයේ සූත්‍රයෙහි ය. මෙහි වූ **ය,** ශබ්දය සර්ව්වනාමයෙහි වේ. අර්ථ විසින් අනියමාර්ථය කිය යි.

මඤ්ඤති – දනී (ද).

බාල්‍යං = බාල බව.

'බාලස්ස භාවො බාල්‍යං' යනු විවරණය යි. බාල යන ව්‍යවහාරයට යම් පැවැත්මෙක් උපකාර වේ නම්, එය භාවය යි කියනු ලැබේ. භාව නම්, ශබ්දයාගේ පැවැත්මට නිමිත්ත යි. බාල යන ශබ්දයාගේ පැවැත්මට යමෙක් නිමිත්ත වී නම්, ඒ භාව යි. එනම්, ත්‍රිවිධ දුශ්චරිත කරණය යි. යමෙක් දුශ්චරිත කෙරේ නම්, එයින් ඔහු බාලයා යි හඳුන්වනු ලැබේ. බාලබවැ යි කියේ දුශ්චරිත කිරීම යි. අඥානකම මේ සියල්ලට මූල් වේ. එහෙයින් අඥානකම ම ප්‍රධාන වශයෙන් බාලබව, යි දතයුතු ය.

පණ්ඩිතො = පණ්ඩිත තෙමේ.[1]

සො = හෙතෙමේ.

සො, යනු ත, යන්නෙන් ආ ප්‍රථමාවිභක්ත්‍යර්‍ථ එකවචනාන්ත පදයෙකි. **ත,** ශබ්දය **'එතෙනෙති තා පරඞ්ගං'** යනාදියෙහි ආයේ වොරවාචක වේ. **'නො තු සිඟාලනාමකො'** යනාදියෙහි සිවලා කෙරෙහි වැටේ. **'තවෙඩිකොඩනුගහගහො'** යනාදියෙහි ව්‍යාලමෘගයා කෙරෙහි ආයේ ය. **ප්‍රත්‍යය, සර්ව්වනාම** වශයෙන් ද තකාරය එන්නේ ය. **'චොර සිඟාලවාලෙසු පවත්තයෙ සබ්බනාමිකෙ'** යි මේ කීහ. මෙහි වූයේ සර්ව්වනාම යි.

පණ්ඩිතමානී = පණ්ඩිත වෙමි යි සලකන්නේ.

තෙමේ පණ්ඩිත නො වූයේ ම පණ්ඩිත වෙමි යි සලකන්නේ **පණ්ඩිතමානී'** නම්.

සො වෙ බාලො ඉති වුච්චති = ඔහු ඒකාන්තයෙන් බාලය යි කියනු ලැබේ.

---

1. 2. 1. 'පණ්ඩිතා, යන්ත බලනු.

යම් අඥයෙක්, අඥවූයේ ම, 'මම අඥයෙක්මි' යි තමන්ගේ අඥකම සලකා ද, ඔහු ඒ තමන්ගේ අඥකම සැලකීමෙන් විඥයෙක් වන්නේ ය. නැතහොත් විඥයකු සමානයෙක් වන්නේ ය. ඒ බාලයාහට 'මම බාලයෙක් වෙමි' යි සලකා, අන් පණ්ඩිතයකු කරා එළැඹැ, ඔහු ඇසුරු කරමින්, ඔහුගේ අවවාද අනුව හැසිරීමෙන් පණ්ඩිතයකු විය හැකි ය. තව ද සමහරවිට ඔහුට ද වඩා උසස් පණ්ඩිතයකු ත් විය හැකි ය. යම් අඥයෙක් අඥවූයේ ම 'මාවැනි බහුශ්‍රැතයෙක්, ධර්මකථිකයෙක්, විනයධරයෙක්, ධුතවාදියෙක්, තවත් කොහි වේ දැ' යි සිතා ගෙණ, තමාට වඩා නුවණින් වැඩිහිටියකු කරා නො යන්නේ, සෙවනය නො කරන්නේ, පර්‍යාප්තිය නො උගන්නේ, පිළිවෙත් නො පුරන්නේ වේ ද, ඔහු ගණ්ඩභෙදක සොරා මෙන් මහා අඥානයෙක් ම වන්නේ ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි මහාජන තෙමේ අනික් තැනැත්තහුගේ නෑයනු ත් සමග සෝවන් පලාදියට පැමිණියේ ය.

ගණ්ඩිකභෙදකවසතුව නිමියේ ය.

උදායි සථවිරයන් වහන්සේ

5 — 5

දිනක් උදායි සථවිරයන් වහන්සේ, මහතෙරවරුන් බණ මඩුවෙත් නික්ම වැඩි කල්හි, එහි ගොස්, පණවා තුබූ ධර්මාසනයෙහි වාඩි ගත්හ. එහි පැමිණි ආගන්තුකභික්ෂූන් වහන්සේලා උදායි තෙරුන් දැක, නො අඳුනන බැවින් 'මේතෙමේ උගත් මහාසථවිර නමක් වනැ' යි සිතා සකාර්‍යප්‍රතිසංයුක්ත වූ ප්‍රශ්නයක් ඇසූහ. එයට පිළිතුරු දී ගත නො හැකි වූ හෙයින් 'බුදුරජුන් හා එක විහාරයෙහි ඉඳ ද, සකාර්‍ය ධාතු ආයතන මාත්‍රයක් වත් නො දන්නා වූ මේ මිනිහා කවරෙක් දැ'යි උදායි තෙරුන්ට නිදා කොට, ඒ බව බුදුරජානන් වහන්සේට ද දැන්වූහ. එ කල්හි බුදුරජානන් වහන්සේ ඒ ආගන්තුකභික්ෂූන්ට මේ ධර්මදෙශනාව කළ සේක:—

යාවජීවම්පි චේ බාලෝ පණ්ඩිතං පයිරුපාසති,
න සෝ ධම්මං විජානාති දබ්බී සූපරසං යථා.

අඳ තෙමේ පණ තිබෙන තුරු ත්, නුවණැත්තකු නිතර සෙවනය කරන්නේ නමුත්, ඔහු ධර්මය නො දනියි. හැන්ද ව්‍යඤ්ජන රසය නො දන්නාක් මෙනි.

යාවජීවං අපි = පණ තිබෙන තුරුත්.

'ජීවස්ස යතනතෝ පරිවෙජදෙ = **යාවජීවං'** යනු වාක්‍යයයි.

බාලෝ = අඳයා.[1]

පණ්ඩිතං = නුවණැත්තකු.[2]

පයිරුපාසති = නැවැත නැවැත එළෙඹ සි.

ගුණ නුවණ දුන, වත් පිළිවෙත් කොට, 'ස්වාමීනි! කුසල් කිම? අකුසල් කිම? අනවද්‍ය කිම? සාවද්‍ය කිම?' යි යනාදී ලෙසින් ප්‍රශ්න විචාරීම් ආදිය පිණිස වෙත පැමිණීම, පයිරුපාසන නමැ යි අටුවාවෙහි කීහ. වතාවත් කිරීම් ආදිය පයිරුපාසන නම්. තෙමේ යමකු කරා යන්නේ නම් ප්‍රශ්න විචාරීමෙන් හෝ, ඔහුගේ පිළිවෙත අනුව හැසිරීමෙන් ඔහු ඇසුරු කිරීමත් පයිරුපාසනය යි කීහ. **'පයිරුපාසතීති පුනප්පුනං උපසඞ්කමති, සමීපෙ නිසීදති, සඛාජාතෝ උපසඞ්කමති, උපසඞ්කමිත්වා පයිරුපාසති'** යනු එය විවරණය කළ සැටි යි.

---

1 2 4 'බාලා' යන්න බලනු.
2. 2 1 'පණ්ඩිතා' යන්න බලනු.

ධම්මං = පයිරුපති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ ධර්මය.

පයිරුපති යි කියන ලද්දේ ත්‍රිපිටකබුදු වචනය යි. **'සුභාසිතං වාචං'** යන්න ද බලනු. ප්‍රගුණ කළ යුතු බැවින් වාචොදහත කළයුතු බැවින් බුදුවචනය, පයිරුපත්ති යි කියනු ලැබේ.

'තතිපිටකං බුද්ධවචනං පරියාපුණිතබ්බතෙන පරියත්තීති වුච්චති' යනු ආපත්ති යි. බුදුරජානන් වහන්සේ 'මා විසින් තොපට මේ ලඝු ඇවත ය, මේ ගරු ඇවත ය, මේ ප්‍රතිකර්ම සහිත ඇවත ය, මේ ප්‍රතිකර්මරහිත ඇවත ය, මෙය ලොකවජ්ජය, මෙය ප්‍රඥප්තිවජ්ජය, මේ ඇවත, පුද්ගලයා වෙත නැඟී සිටී යි, මෙය ගණයා වෙත නැඟී සිටී යි, මෙය සඞ්ඝයා වෙත නැඟී සිටී ය' යි සප්තාපත්තිසකාඛ්‍යයන්ගේ අව්‍යතික්‍රමණීයතා වශයෙන්, පැමිණී වස්තුවෙහි ඛන්ධක- පරිවාර- උභතොවිභඞ්ග යන මොවුහු මහා විනය නැමැ, යි වදාළ සේක. එහි පාළිය මේ ය. **'මයා වොසිතෙන ඉදං ලඝුකං, ඉදං ගරුකං, ඉදං සප්පටිකම්මං, ඉදං අප්පටිකම්මං, ඉදං ලොකවජ්ජං, ඉදං පණ්ණත්තිවජ්ජං, අයං ආපත්ති පුග්ගලස්ස සන්තිකෙ වුට්ඨාති, අයං ගණස්ස සන්තිකෙ අයං සඞ්ඝස්ස සන්තිකෙ වුට්ඨාතීති සත්තන්නං ආපත්තික්ඛන්ධානං අවීතික්කමනීයභාවතෙන ඛන්ධකපරිවාරෙ උභතොවිභඞ්ගෙ මහාවිනයොති නාම'** යනු. මෙය විනය පිටකය බව ත්, තමන් වහන්සේගේ පිරිනිවීමෙන් පසු, මෙය තමන් වහන්සේ අතින් ශ්‍රාවකයන් කෙරෙහි ඉටුවිය යුතු වූ හැම දෙයක් ම, හැම අනුශාසනාවක් ම, කරණ බවත් උන්වහන්සේ වදාළ සේක. **'තං සකලම්පි විනයපිටකං මයි පරිනිබ්බුතෙ තුම්හාකං සත්ථුකිච්චං සාධෙස්සති'** යනු බුඬවචනයි.

එසේ ම සතර සතිපට්ඨාන- සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද-පඤ්චේන්ද්‍රිය - පඤ්චබල - සප්තබොධ්‍යඞ්ග - අෂ්ටාඞ්ගික මාර්ග යන ධර්මයන් විනෙයජනයන්ගේ අදහස්වලට ගැලපෙන සේ විභාග කොට, සූත්‍ර පිටකය දෙශනා කළ බවත්, එ ද උන්වහන්සේගේ පිරිනිවීමෙන් පසු ශාසනකෘත්‍යය සිදු කරණ බවත්, වදාළ සේක. පාළිය මේය:- **'මයා ඉමෙ චත්තාරෝ සතිපට්ඨානා, චත්තාරෝ සම්මප්පධානා, චත්තාරෝ ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්තබොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගොති තෙන තෙන වෙනෙය්‍යානං අජ්ඣාසයානුරූපෙන පකාරෙන ඉමෙ සත්තතිංසබොධිපක්ඛිය ධම්මෙ විභජිත්වා සුත්තන්තපිටකං දෙසිතං, තං සකලම්පි සුත්තන්තපිටකං මයි පරිනිබ්බුතෙ තුම්හාකං සත්ථුකිච්චං සාධෙස්සතීති'** යනු.

එසේ ම වාදශායතන – අෂ්ටාදශධාතු – චතුරාර්‍ය්‍ය සත්‍යය – ත්‍රිවිශතීන්ද්‍රිය – නවහෙතු – චතුර්විධ ආහාර – සප්තවිධසපර්‍ශ – සප්තවිධ වෙදනා – සප්තවිධසංඥ – සප්තවිධචෙතනා සප්තවිධ චිත්ත යන මෙහි, මෙතෙක් ධර්‍ම කාමාවචරයහ, මෙතෙක් රූපාවචරයහ, මෙතෙක් අරූපාවචරයහ, මෙතෙක් පර්‍යාපන්නයෝ ය, මෙතෙක් අපර්‍යාපන්නයෝ ය, මෙතෙක් ලෞකිකයහ, මෙතෙක් ලෝකොත්තරයහ, යි වෙන් කොට අභිධර්‍මපිටකය දෙසන ලදැ' යි ද, එද තමන් වහන්සේගෙන් පසු ශාසනකෘත්‍යය සිදු කරන්නේ ය' යි ද වදාළ සේක. පාළිය මේ ය:- **'මයා පංචක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරස ධාතුයො, චත්තාරි සච්චානි, බාවීසතින්ද්‍රියානි, නව හෙතු, චත්තාරෝ ආහාරා, සත්ත ඵස්සා, සත්ත වෙදනා, සත්ත සඤ්ඤා, සත්ත චෙතනා, සත්ත චිත්තානි, තත්‍රාපි එත්තකා ධම්මා කාමාවචරා, එත්තකා රූපාවචරා, එත්තකා අරූපාවචරා, එත්තකා පරියාපන්නා, එත්තකා අපරියාපන්නා, එත්තකා ලෝකියා, එත්තකා ලෝකුත්තරාති ඉමෙ ධම්මෙ විභජිත්වා අභිධම්මපිටකං දෙසිතං, තං සකලම්පි අභිධම්මපිටකං, මයි පරිනිබ්බුතෙ සත්ථුකිච්චං සාධෙස්සති'ති'** යනු.

ඒ මේ ත්‍රිපිටකබුද්ධවචනසඞ්ඛ්‍යාතපර්‍යාපන්නය ප්‍රගුණ කරන්නවුන්ගේ වශයෙන් තෙපරිදිය. අලගද්දපරියත්ති – නිත්ථරණපරියත්ති – භාණ්ඩාගාරිකපරියත්ති' යි. යමෙක්, ලාභ කීර්ත්ති ප්‍රශංසාදිය ලැබීමේ අදහසින්, බුද්ධ වචනය පුහුණු කෙරේ නම්, උගණී නම්, ඔහුගේ ඒ පර්‍යාපන්නය අලගද්ද පරියත්ති, නමු. මෙසේ බුදුවදන් පුහුණු නො කොට නිකම් නිදුගැණීම ඉතා උතුම් ය. නිදුගැණීමෙන් වන්නා වූ විපතට වඩා, අලගද්දපරියත්තියෙන් වන්නා වූ විපත බලවත් හෙයිනි.

යමෙක් වනාහි බුදුවදන් ඉගෙණ ශීලය පැමිණි තැන සිල් පුරා, සමාධිය පැමිණි තැන සමවත් ගැබ් ගන්වා, විදර්‍ශනාව පැමිණි තැන විදසුන් පිහිටුවා, මාර්‍ග ඵලයන් පැමිණි තැන මාර්‍ගය වඳින්නෙමි, ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නෙමි' යි උගණී ද, ඔහුගේ ඒ පර්‍යාපන්නය නිත්ථරණපරියත්ති, නමු.

රහතුන් වහන්සේගේ පර්‍යාපන්නය භාණ්ඩාගාරිකපරියත්ති, නමු. ඔහු විසින්, දුන නො ගත් සකඹියෙක්, නො නැසූ කෙලෙසෙක්, නො වැඩූ මාර්‍ගයෙක්, පසක් නො කළ ඵලයෙක් නැත. යම් හෙයකින් හෙතෙමේ, දුනගත් සකඹි ඇත්තේ, නැසූ කෙලෙස් ඇත්තේ, වැඩූ මාර්‍ග ඇත්තේ, ප්‍රත්‍යක්ෂ කළ ඵල ඇත්තේ ද,

එහෙයින් බුදුවදන් පුහුණු කරන්නේ, පාළිය දරන්නේ, ප්‍රවේණිය රක්නේ, වංශය රකින්නේ ම ය. මෙසේ ඔහුගේ ඕ පය්‍යාප්තිය භාණ්ඩාගාරිකපරියත්ති යි කියනු ලැබේ.

තව ද පෘථග්ජනයෙක්, දුර්භික්ෂභය ආදිය ඇති කල්හි, ග්‍රන්ථධාරීන් එක් තැන වසන්නට අපොහොසත් වූ කල්හි, තෙමේ පිඹු සිඟීමෙන්, ඉතා වෙහෙස වෙමින්, බුදුවදන් නො නසිවා, පාළිය දරන්නෙමි, වංශය තබන්නෙමි, ප්‍රවේණිය රකින්නෙමි' යි පුහුණු කෙරේ ද, ඔහුගේ ඒ පය්‍යාප්තිය භාණ්ඩාගාරික පය්‍යාප්තිය වන්නී ද' යි මෙහි නගින ප්‍රශ්නයෙකි. නො වන්නී ය, යනු පිළිතුර ය. කුමක් හෙයින් ද; යත්:- නියම ස්ථානයෙහි නො සිට පුහුණු කළ හෙයිනි. පෘථග්ජනයාගේ පය්‍යාප්තිය අලගද්දපරියත්ති හෝ නිත්ථරණපරියත්ති හෝ වන්නීය. සත්තසෙඛයන්ගේ පය්‍යාප්තිය නිත්ථරණ පරියත්ති නම් වා රහත්හුගේ ම පය්‍යාප්තිය ය, භාණ්ඩාගාරිකපය්‍යාප්ති ය. පෙර ද මෙහි විස්තර කතාවක් කියා ඇත.

ලොකොත්තර ධර්මය පිණිස පිළිපදින්නහු විසින් ලොකොත්තර ධර්මප්‍රතිලාභයට පෙරාතු ව ඒ පිණිස පිළිපැදිය යුතු වූ පූර්භාග ධර්මය 'පටිපත්තිය'යි කියනු ලැබේ. **'ලොකුත්තර ධම්මඤ්ච පුබ්බභාගඤ්ච තදත්ථං පටිපජ්ජතීති' ති = පටිපත්ති'** යනු අටුවාය. සිල් පිරීම- ඉඳුරන් රැකීම- බොජ්ඣංගෙහි පමණ දැනුම- නිදි දුරු කිරීම- සතිසම්පජඤ්ඤ- සම්මප්පධාන- සතිපට්ඨාන- ඉද්ධිපාද- ඉන්ද්‍රිය- බල- බොජ්ඣඞ්ග- අට්ඨඞ්ගිකමග්ග යන මේ ධර්මයෝ පූර්භාගධර්ම නම් වෙති. **'තත්ථ කතමා පටිපත්ති? සීලෙසු පරිපූරකාරිතා, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා, ජාගරියානුයොගෙතා, සතිසම්පජඤ්ඤං, චත්තාරෝ සතිපට්ඨානා, චත්තාරෝ සම්මප්පධානා, චත්තාරෝ ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්තබොජ්ඣඞ්ගා, අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ'** යනු පාළි යි. මෙම පාළියෙහි දැක්වෙන දහම් කොටස්, ෂට්විශුද්ධි ක්‍රමයෙන් බෙදා සම්පූර්ණ කළ යුතු බැවින්, සීලවිසුද්ධි, චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි, යන ෂට් විශුද්ධිය, පටිපත්ති නැමැ'යි කීහ. **'පටිපත්ති' ති සීල විසුද්ධි ආදීසුඤ්ච විසුද්ධීසු, පටිපජ්ජති එතාය අරියමග්ගෝ'ති පටිපත්ති'** යනු විකාශය යි. මේ පූර්භාගධර්මයෙහි ඇතුළත් ඇතැම් ධර්මයන්ගේ විස්තර, යට ඒ ඒ තැන දක්වන.

පිළිවෙත් පිරීමෙන් ලැබිය යුතු වූ සතර මග- සතර ඵල- ත්‍රිවිද්‍යා- චතුපටිසම්භිදා- ෂඩභිඥා යන මේ කියූ ගුණ විශෙෂයෝ පටිවෙධ නම් වෙති.

විජානාති = දනී යි.

ගාථාවෙහි එන **න,** කාරය ද, ඒ හා එකතු කොට, අර්ථ ගත යුතු ය. මෙහි න කාරය **විජානාති,** යන ක්‍රියා පදය හා ම සම්බන්ධයට යන්නේ ය. එවිට මෙහි 'මේ බුද්ධ වචන ය, බුද්ධ වචන මෙතෙක් ය, යනාදිවශයෙන් පර්‍යාප්තිධර්මය ත්, මේ වාර ය, මේ විහාර ය, මේ ආචාර ය, මේ ගොචර ය, මේ සාවද්‍ය ය, මේ නිරවද්‍ය ය, මේ සෙවිය යුතු ය, මේ නො සෙවිය යුතු ය, මේ පිළිබඳ දත යුතු ය, මේ පසක් කළ යුතු ය, යනාදී වශයෙන් ප්‍රතිපත්ති, ප්‍රතිවෙධධර්මයනුත් නො දනී යන අර්ථය ලැබෙන්නේ ය.

දබ්බී සූපරසං යථා = ව්‍යඤ්ජන රස නො දන්නා සැන්ද සේ ය.

සැදූ දා සිට, ගෙවී යන තුරු ම නොයෙක් කැම් බීම් ආදිය ඒ අත මේ අත පෙරළ පෙරළා හැඳි ගැවත්, හැන්ද නම්, කිසිලෙස-කිනුත් මේ ලුනු රස ය, මේ තික්ත රස ය, මේ ක්ෂාර ය, මේ කටුක ය, මේ ඇඹුල් රස නො වේ, මේ කසට ය, යනාදී ලෙසින් බත් මාලු ව්‍යඤ්ජන කැවිලි පෙවිලි ආදී වූ කිසි දෙයක රසයක් දුන නො ගණී යි. ඒ එයට නො පොහොසත් ය. එ පරිද්දෙන් අඳයා ද උපන් දා සිට මැරෙණ තුරු ත්, නුවණැත්තකු ඇසුරු කළ ත්, ඔහු නම්, කියන ලද පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ යන මෙයින් කිසිවක් දුන ගැණීමෙහි අපොහොසත් වෙයි. එ හෙයින් දහම් දුනුමෙහි අපොහොසත් බාලයා රස දුනුමෙහි අපොහොසත් සැන්ද මෙනැ, යි වදාළ සේක.

'ඔදනාදීනි අනෙන දූරෙනහීති, = දබ්බී' ඔදනාදිය උඩ යටි කරමින් පෙරළ පෙරළා පිළියෙල කරන්නට උපකරණ වනුයේ දබ්බී ය. දබ්බී නම්, සැන්ද යි. **'සුඛත්ථාය පානබ්බතො = සූපො, සවති රුචිං ජනෙතී' ති = සූපො'** සැප පිණිස පියයුතු හෙයිනුත්, කැමැත්ත, ආශාව උපදවන හෙයිනුත් කුම්මාස, මාංසව්‍යංජනාදිය සූප යි ගැණේ. පිඬු පිඬු කොට අනුභව කරණ ආහාර පිළිබඳ මධුර ලවණාදී හැම රසයෙක් ම, මෙහි රස ශබ්දයෙන් කියා වේ. අඳයා ත්, හැන්ද ත්, එක සමාන බව කියන්නේ ගාථාවෙහි එන **යථා,** ශබ්දයෙනි. එය සමානාර්ථ වාචක ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි ආගන්තුකභික්ෂූන් ගේ සිත් කාමාදී වූ ආශ්‍රවයන්ගෙන් මිදී ගියේ ය.

උදයී ස්ථවිර වස්තුව නිමියේ ය.

ගැහැණියක සොයා ගියවුන් රහත්වීම

5 — 6

එක්තරා දවසෙක දනවු සැරි සරන බුදුරජානන් වහන්සේ උරුවේලාවට වඩින ගමනේ මහමගින් මදක් ඇතින් පිහිටි කපුහේනකට ගොස් ගසක් මුල වැඩහුන් සේක. එකල පාඨෙය්‍යක වාසි වූ පුරුෂයෝ තිස් දෙනෙක් සිය බිරිඳුන් සමඟ කෑම් පිම් ද ගෙණ එහි ගොස් කෙළිදෙලෙන් ඔබිනොබ හැසිරෙන්නට වූහ. මොවුන් අතර එකක්හට බිරිඳක් නො වූ ය. එහෙයින් ඔහු තමන් පිණිස වෙසහනක් ගෙණ ගියේ ය. ඈ මොවුන් ගේ ප්‍රමාදයක් දැක කුඩාරම් තුළට වැදී එහි තිබූ සියලු දේ ගෙණ සැඟවී ගියා ය. එකල මොවුහු ඇය සොයමින් කපු හේනෙහි හැසිරෙන්නෝ, ගස මුල වැඩහුන් බුදුරජුන් දැක උන්වහන්සේ කරා ගොස් 'ස්වාමීනි! ගැණියක හේම මේ පැත්තෙහි යනු දුටුවහු දැ' යි ඇසූහ. එවිට 'ගැණු සොයමින් ගැණු පස්සේ යෑමෙන් ඇති පලය කිමැ'යි උන්වහන්සේ විචාළ සේක. ඔවුහු සියලු තොරතුරු කියා පෑහ. එතැන දී 'ගැණියක සෙවීම ත් තමන් සෙවීම ත් දෙකින් වඩා සුදුසු වඩා වටින්නේ කා සෙවීම දැ' යි ඇසූකල්හි 'තමන් සෙවීම ය' යි ඔවුහු කීහ. එවිට බුදුරජානන් වහන්සේ ඔවුන් එහි මවානි කරවා ගෙණ ආනුපුබ්බිකථා නම් ධර්මදේශනාව කළ සේක. අවසානයෙහි සියල්ලෝ ම, එහි නිෂ්ක්‍රමභාවයෙන් පැවිදි ව ඍද්ධියෙන් ලත් පා සිවුරු ඇති ව ධූතඞ්ග සමාදන් ව වසනුවෝ, නැවැත පසු දවසෙක බුදුරජුන් වෙත එළඹියෝ, 'අනමතග්ග' සූත්‍රය අසා; හුන් අසුන්වලදී ම රහත් බවට පැමිණියෝ ය. එකල අනික් භික්ෂූන් වහන්සේලා 'මහා පුදුමයෙකි, මොවුන් වහා ධර්මය දැන ගන්නා ලද්දේ ය, සමහර දෙනාට රහත් වන්නට අවුරුදු ගණන් ගත වේ ය' යි ධර්මශාලාවෙහි රැස් ව හිඳ කතා කරන්නට වූහ. එහි වැඩි බුදුරජානන් වහන්සේ මේ කතාව අසා 'මහණෙනි! මේ නමලා වහා දහම් අවබෝධ කලෝ අද පමණක් නොවෙති, පෙරත් අන් අත්බවෙක ධූතීයෝ ව ඉපද සිටියෝ රා බී සල්ලාල කම්කරමින් තුණ්ඩිල නම් ඌරකු කියූ බණක් අසා, ඇසූ හැටියේ ම සියලු වැරදි අත්හැර දමා පන්සිල් සමාදන් වූහ. ඒ එදා ගත් පන්සිල් අනුභසින් අද මේ හුන් අසුන්වලදී ම රහත් වූහ' යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක:-

මුහුත්තමපි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති,
ඛිප්පං ධම්මං විජානාති ජිවහා සූපරසං යථානි.

ඉදින් නුවණැත්තේ මොහොතක් නමුත් නුවණැත්තකු සෙවනය කෙරේ නම්, ඔහු වහා ධර්මය දැන ගණියි. වහා ම ව්‍යඤ්ජන රසය දැන ගන්නා දිව මෙනි.

මුහුත්තං = මොහොතක්.

දස අසුරුසණක් ක්ෂණයෙකි. දශ ක්ෂණයෙක් ලයයෙකි. දශ ලයයෙක් ක්ෂණලයයෙකි. දශක්ෂණලයයෙක් මොහොතෙකි.

ඛණො (දසච්ඡරා කාලො) (ඛණා දස) ලයො භවෙ (ලයා දස) ක්ඛණලයො, මුහුත්තො (තෙ සියා දස)' යි කොෂාගත ය.

විඤ්ඤූ = පණ්ඩිත තෙමේ.

විශෙෂයෙන් දන්නා ස්වභාවය ඇත්තේ **විඤ්ඤූ**, නම් වේ.

'විසෙසං ජානාති සීලෙනාති = විඤ්ඤූ' යනු එහි විදුහීම ය.

ඛිප්පං = වහා.

ධම්මං විජානාති = ධර්මය දනි යි.

ජිවහා සූපරසං යථා = ව්‍යඤ්ජන රස දැන ගන්නා දිව මෙනි.

විඥපුරුෂ තෙමේ මොහොතක් නමුත් නුවණැත්තකු සෙවනය කරමින් ඔහු වෙතින් උගත යුත්ත උගන්නේ, ඇසිය යුත්ත අසන්නේ වහා ම ධර්මය දැන ගණි යි. ඉන් පසු කමටහන් කියවා ගෙණ පිළිවෙතෙහි යෙදෙන්නේ, ව්‍යායාම කරන්නේ, නො නට ජිවහා ප්‍රසාදය ඇත්තෙක්, රස දැන ගන්නා පිණිස දිවග තබා ම ඒ ඒ ආහාර පානාදියෙහි ලුනු ඇඹුල් ඈ රස යම් සේ දැන ගණි ද, එසේ වහා ම ලොකොත්තර ධර්මය දැන ගණි යි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ භික්ෂූන් වහන්සේලා රහත් බවට පැමිණියෝ ය.

පාඨෙය්‍යකභික්ෂුවස්තුව නිමියේ ය.

කුෂ්ඨ රොගියකු සොවන්වීම

5 — 7

රජගහා නුවර සුප්‍රබුද්ධ නම් කුෂ්ඨ රොගියෙක් විසූයේ ය. ඔහු දිනක් බණ අසන්නට වෙළුවනාරාමයට ගියේ, තමා කුෂ්ඨ රොගියකු බැවින්, පිරිස් කෙළවර හිඳ බණ අසන් ම සෝවන් පලයට පැමිණියේ ය. තමා ලත් ඒ ගුණය බුදුරජුන්ට දන්වනු කැමැති ව කුෂ්ඨරොගය නිසා පිරිස් මැදට යා ගණු නොහැක්කේ, මහාජනයා බුදුරජුන් වැඳ ගිය පසු විහාරයට ඇතුල් විය. ඒ වේලෙහි සක්දෙව් රජ තෙමේ 'මේ සුප්‍රබුද්ධ කුෂ්ඨයා, තමා බුදු සසුනෙහි ලත් ගුණය ප්‍රකාශ කරණු කැමැත්තේ ය' යි දැන 'මොහු විමසිය යුතු ය' යි අහස සිට 'සුප්‍රබුද්ධය! තෝ මිනිස් දිළින්දෙහි, බැගෑපත් මිනිසෙක් වෙහි, ඒ නිසා මම තට ලොකු මුදලක් දෙන්–නෙම්, තෝ බුදුන් නොබුදු ය, දහම් නොදහම් ය, සඟුන් නොසඟුන් ය, මට බුදුන්ගෙන්, ධර්මයෙන්, සඞ්ඝයාගෙන් වැඩෙක් නැතැ යි කියව, යි කීයේ ය. එවිට සුප්‍රබුද්ධ තෙමේ තෝ කවරෙක් වෙහි?' යි ඇසි ය. 'මම ශක්‍ර වෙමි' යි පිළිතුරු දුන්නේ ය. 'අනිබාලය! නිලීජ්ජය! ඔබ මට මෙබන්දක් කීමට නොසුදුස්සහු ය, ඔබ මම දුප්පතෙක්මි, දිළින්දෙක්මි, දිනයෙක්මි' යි කියන්නහු ය, එහෙත් මම දුප්පතෙක් දිළින්දෙක් ද නොවෙමි, සුවපත්මි, මහත් ධනවතෙක්මි, සඩා, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤ, යන උසස් වූ ධන සතක් මට තිබේ, යම් ගැහැණියකට හෝ යම් පිරිමියකුට මේ කී ධනය තිබේ නම්, ඒ ගැණි, ඒ පිරිමියා දිළිඳු නොවේ, ඔහුගේ ජීවිතය නොසිස් එකෙක, ඔහු ධනවතෙක, මට මේ සත්වැදෑරුම් ආර්‍ය ධනය තිබේ, යමක්හට මේ ධන සත තිබේ නම්, ඔහු දිළින්දෙකැ' යි බුදුවරු පසේ බුදුවරු නොවදරති' යි ඔහු කී ය. සක්දෙව්රජ තෙමේ ඔහුගේ කතාව අසා බුදුරජුන් වෙත ගොස්, ඒ සියලු කතාව දන්වා සිටියේ ය. එවිට බුදුරජාණන් වහන්සේ 'සක්දෙවිඳුනේ! තා වැනි දහසකට වත් සුප්‍රබුද්ධයා ලවා බුදුන් නොබුදු ය, දහම් නොදහම් ය, සඟුන් නොසඟුන් ය' යි කියවන්නට බැරිය' යි වදාළ සේක. සුප්‍රබුද්ධ කුෂ්ඨී තෙමේ ද, බුදුරජුන් වෙත ගොස් බුදුරජුන් හා කළ තුටු පහටු කතා ඇත්තේ, තමන් ලත් ගුණය කියා හුන් නැතින් නැගිට ගියේ ය. මගට බැස ටික දුරක් යත්, තරුණ ගව දෙනක් විසින් අණින ලදුව මැරී වැටුනේ ය. මෝ ගවදෙන එක්තරා යකින්නක. පුක්කුසාතිය, බාහිය දාරුචීරිය, කඔදනීක චොර ඝාතකය, සුප්‍රබුද්ධ කුෂ්ඨිය, යන සතර දෙන, මෑ විසින් සියයක් සියයක් අත් බවිහි දී ජීවිතක්ෂයට පත්කරණ ලදහ.

පෙර එක් කලෙක සිටු පුත් ව උපන් මේ සතරදෙන වෙසියක ගෙණ උයනට ගොස් තැඟි බෝග මිල මුදල් දී සිත් ගෙණ මුළු දවසක් ම ඇය සමග එකතුව හිඳ, සවස, 'මෙතැන කවුරුත් නැත, අප දුන් මුදලු ත් ඇදුම් කැඩුමු ත් ගෙණ මෑ මරා දමා යමු යි කතා කළහ. ඈ ඒ කතාව අසා, 'මොවුන් වැනි වල්ලු තවත් කොහි ද, මොවුනට විලි ලජ්ජා නැත, මා සමග වල්කම් කොට, දැන් මා මරා දමන්නට කොදුරති, හොඳයි! වේවා, කළ යුත්ත මම දනිමි, මා මැරුවොත් මම යකින්නක් ව මොවුන් මරා කන්නෙමි' යි සිතමින් පතමින් හුන්නී ය. සිටු පුත්‍රයෝ එක් ව ඇය එකෙණෙහි ම මරා දැමූහ. පෙර කළ ඒ අකුශල කර්මයාගේ විපාකය වශයෙන් මොවුහු සතර දෙන අතර මගදී මෙසේ මැරුම් කෑහ.

භික්ෂූන් වහන්සේලා සුප්‍රබුද්ධ කුෂ්ඨියාගේ මේ මැරුම් කෑම අසා, 'සුප්‍රබුද්ධ කුෂ්ඨියා කොහි උපන්නේ ද? කුමක් හෙයින් ඔහු කුෂ්ඨ රෝගියෙක් වී ද' යි බුදුරජාණන් වහන්සේගෙන් ඇසූහ. උන්වහන්සේ 'ඔහු සොතාපත්ති ඵලයට පැමිණි බව ත්, මරණින් මතු තව්තිසා දෙව්ලොව උපන් බව ත්, පෙර තගරසිඛී පසේ බුදුරජුන් දැක, කාරා කෙළ ගසා උන්වහන්සේට නින්දා කළ පවින් බොහෝ කලක් නිරයෙහි ඉපිද දුක් විඳ ඉතිරි වූ කර්මයාගේ විපාක වශයෙන් මෙකල කුෂ්ඨ රෝගියකු වූ බව ත්, මෙසේ මේ ලෝකයෙහි සත්වයන් තමහට කටුක විපාක දෙන පව්කම් තමන් ම කරමින් හැසිරෙන බව ත් වදාරා අනුසන්ධි ගළපා මත්තෙහි දහම් දෙසන සේක් මේ ගාථාව වදාළ සේක:-

චරන්ති බාලා දුම්මේධා අමිත්තේනේව අත්තනා,
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලන්ති.

දෙලෝ වැඩ නො දත් අඥානයෝ යම් පව් කමෙක් කටුක විපාක ඇත්තේ වේ ද, ඒ පව්කම කරමින් සතුරකු වැනි වූ ආත්මයෙන් යුක්ත ව හැසිරෙත්.

පව් කම් කරණ මිනිසා පව් කම් කරණුයේ, තමහට තමා සතුරු බැවිනි. පව් කම් හැර, රළු පරුෂ දුකක් දෙන්නට සමත් අන් සතුරෙක් කිසිවකුටත් නැත. පව්කම ම කැකුළු දුක් දෙන එක් ම සතුරා ය. තමා, තමාට මිතුරු නම්, ප්‍රිය නම් ඔහු කිසිවිටෙකත් කුඩා පවකුදු නො කරන්නේ ය. මේ බලන්න ඒ වදාළ සැටි:-

'අත්තානං වෙ පියං ජඤ්ඤා න නං පාපෙන සංයුජේ,
න හි තං සුලභං හොති සුඛං දුක්කතකාරිනා'

ඉදින් තමා, තමාට] ප්‍රිය යි දන්නේ නම්, ඒ තමා, පාපය හා නො යොදන්නේ ය. දැන ශීලාදි වශයෙන් ලැබිය යුතු සැපය පව් කම් කරන්නන්ට සුලභ නො වේ. පව් කරන්නෝ ඒ ලැබීමෙහි අසමර්ථයෝ ය.

චරන්ති = හැසිරෙත්.

සිවු ඉරියව්වෙහි ම පව්කම් කරමින් හැසිරෙත්. පව්කම් කරමින් ම ඉදිත්. පව්කම් කරමින් ම සිටිත්. පව්කම් කරමින් ම ඇවිදිත්. පව්කම් කරමින් ම නිදත්.

බාලා දුම්මේධා = එලොව මෙලොව වැඩ නො දත් අඥානයෝ.

බාලා' යන්න **දුම්මේධා'** යන්නට එක් වෙයි. එසේම දුම්මේධා, යන්නෙහි අර්ථය තවත් දැඩි කර යි. කඳු මුදුනෙහි වැටුනු හෙණ පහර කඳු මුදුන සුණු විසුණු කොට සිඳ බිඳ හරින්නාක් මෙන් යම් ධර්ම ශක්තියක් සත්වයන්ගේ සිත් තුළ පවත්නා ලොභ වෙෂ මොහාදී වූ සියලු කෙලෙස් හිංසනය නාශනය කරා ද, ඒ ධර්ම ශක්තිය මෙධා, යි කියනු ලැබේ. නොහොත් සම්පත්තියෙන් හා ශීලා දී වූ ගුණයන්ගෙන් සත්පුරුෂධර්ම හා එක්වන්නී එකලාව නො සිටී ද, නොහොත් සියුම් අර්ථයන්, ධර්මයන් වහා ම ගණී ද දරා ද, ඒ මෙධා, නම්. **'අසනි විය සිලුච්චයෙ කිලෙසෙ මෙධති හිංසති ති, සිරියා සීලාදිහි ච සප්පුරිසධම්මෙහි සමාගච්ඡති න එකිකා හුත්වා නිඝතීති, සුඛුම්මපි අත්ථං ධම්මං ච ඛිප්පමෙව මෙති ආදදාතීති ච ධාරෙති චාති = මෙධා'** යනු විවෘත්ති යි. යට කියූයේ ද බැලිය යුතුය.[1]

අමිත්තෙන ඉව අත්තනා = තමහට සතුරකු වැනි වූ ආත්මයෙන් යුක්ත ව.

කරොන්තා = කරමින්. රැස් කරමින්.

පාපකං කම්මං = පව්කමක්. පව් වැඩක්.

'පාන්ති රක්ඛන්ති සුජනා අත්තානං අස්මාති = පාපං' සජ්ජනයෝ යමක් කෙරෙන් තමන් රකිත් ද, ඒ පාප නම් **'අත්තානං දුග්ගතිං පාපෙතී'ති = පාපං'** තමන් දුගතියට පමුණු වන්නේ පාපය යි. පාප, යන මෙහි ආදි පකාරය තෙමේ අපාය කිය යි. එහෙයින් ප, යි කීයේ අපාය යි. මේ කරණ කොට අපායයට යේ නුයි පාප, නම්. **'ප සද්දො එත්ථ අපාය වචනො, තස්මා පං අපායං පෙති ගච්ඡති එතෙනා ති = පාපං'** එහි අවසානයෙහි වූ ක යන්න ඒ අර්ථයට ම අනුකූලව සිටියේ ය.

---

1. 2. 4 'බාලා දුම්මේධිනො' යන්න බලනු.

කම්ම, නම්, චෙතනාව ත් ඒ හා යෙදුනු අනික් ඵස්සාදි චෛතසික ධර්ම ත් ය. **'කිං පනේතං කම්මං නාම?'** යන චෝදනාවෙහිලා **'චෙතනා චේව එත්තකෙව ච චෙතනාසම්පයුත්තකා ධම්මා'** යි කළ පරිහාරකථාවෙන් මේ පැහැදිලි ය. චෙතනාව කර්මය බවට **'චෙතනාහං භික්ඛවෙ! කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා, කායෙ වා හි ආනන්ද! සති, කායසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං වාචාය වා ආනන්ද! සති, වචීසඤ්චෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං, මනෙ වා ආනන්ද! සති, මනොසංචෙතනාහෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං'** යනු සාධක කොට ගත යුතු ය.

සත්ව තෙමේ, යමක් කරණ කොට ඉෂ්ටානිෂ්ටඵල මොනවට උපදවා ද, ජවනවීථියෙහි දී පින් පව් හොඳ නො හොඳ රැස් කරණ ඒ මේ චෙතනාව කම් නම් වේ. **'කරොති අභිනිබ්බත්තෙති ඉට්ඨානිට්ඨඵලානි එතෙනාති = කම්මං'** යන්නෙන් ඒ පැහැදිලි ය. තවත් ලෙසකින් කර්මය කිමැ යි දක්වන්නට, **'කරීයතීති = කම්මං'** යි කීහු. ඒ ඒ සත්වයන් විසින් කායාදිවාරත්‍රයයෙන් යමක් කරණු ලැබේ නම්, ඒ කරණු ලබන්න, කම් නමැ, යි ඉන් හැඟේ. උනුන් විසින් කය වචන සිත යන තිදෙර අතුරෙහි යම් දෙරකින් යම් කිසිවක් කරණු ලබන කල්හි, ඒ සඳහා උපදින සිත ත්, උපදින චෙතනාව ත් ඒ හා යෙදුනු අනික් චෛතසික ත් කම්, යි ගණිත්. චෙතනා චෛතසිකය, පිළියෙල වෙමින් යෙදෙමින් තමන් හා යෙදුනු එක්වුනු සෙසු චෛතසික ත් ඒ ඒ චෛතසිකයන් අයත් කෘත්‍යයන්හි පිළියෙල කරවයි. යොදවයි. කර්මශක්තිය පිළියෙල කිරීමෙහි ප්‍රධාන වශයෙන් ව්‍යායාම කරන්නී චෙතනාව යි. එහෙයින් ප්‍රධාන වියින් චෙතනාවම කම්, යි කියන ලදී. චෛතනාවට ලියූ විවරණය බලනු. චෙතනාව, ජවන වීථියෙහි යෙදෙන විට ශ්‍රද්ධාදී වූ ශොභන චෛතසික හා යෙදේ ද, එකල්හි එය කුශල කම්, යි කියනු ලැබේ මොහාදිවූ අශොභන චෛතසික හා යෙදේ ද, එකල්හි අකුශලකම්, යි කියනු ලැබේ.

චෙතනාසංඛ්‍යාතකර්මය කෘත්‍ය වශයෙන් සිවු වැදෑරුම් ය. **ජනන- උපත්ථම්භන- උපපීළන- උපඝාත** යන මේ ය ඒ කෘත්‍ය සතර. එහෙයින් කර්මය කෘත්‍ය වශයෙන් **ජනකකම්, උපත්ථම්භකකම්, උපපීළකකම්, උපඝාතකකම්** යි සතරක් කොට ගණිත්.

එහි, විපාකනාමඝනස්කන්ධය ත් ප්‍රතිසන්ධිය හා එකට පහළ වන කර්මජරූප නම් වූ කටත්තාරූපය ත් උපදවන කර්මය **ජනක කම්** යි කියනු ලැබේ. ඒ කුශලාකුශලකම් වශයෙන් දෙ වැදෑරුම් ය.

භවයෙහි සත්වයාගේ ප්‍රතිසන්ධිය දී, සිටින තැක් ප්‍රවෘත්තිවිපාක දෙන්නේ ත් මේ ය. කම්පථභාවයට පැමිණි කම්ය ම, ප්‍රතිසන්ධි විපාක දෙන්නේ ය. එක් වරක් ප්‍රතිසන්ධිය දුන් කම්ය නැවැත ප්‍රතිසන්ධියක් නො දේ. එහිලා එය අපොහොසත් ය. ප්‍රවෘත්ති විපාකයන් දීමෙහි දී කම්පථභාවයට පැමිණ ත්, නො පැමිණ ත් විපාක දෙන්නේ ය. එ මතු ද නොවේ. සිහිනෙන් කෙරෙණ කම් ද, ප්‍රවෘත්තිවිපාක දෙන්නේය. එක කම්ය, අත්බවි සිය දහස් ගණන්හි ද ප්‍රවෘත්තිවිපාක නම් දෙන්නේ ය.

ජනකකම්ය විපාක දීමෙහි දී දුර්බල ව ගිය කල, ඒ කම්යෙන් උපන් සියලු විපාකයන්ට කලක් පැවැත්මට බල කරුවක් මෙන් අනුබල දෙන්නේ **උපත්ථම්භකකම්**, යි. මෙය ජනකකම්යටත් අනුබල දෙන්නේ ය. කුශලාකුශලවශයෙන් මෙ ද දෙපරිදි ය. ඔසුපත් නිරයෙක ඉපදිය යුත්තේ සමහර විටෙක ඔසුපත් නිරයෙක නො ඉපිද මහානිරයෙක උපදින්නේය. එසේ වනුයේ ඒ මේ අකුශලජනකකම්ය, අකුශලඋපත්ථම්භකකම්යකින් අනුබල ලැබීමෙන් ය. සාමාන්‍ය කුලයෙක ඉපැදිය යුත්තේ සමහර විටෙක උසස් කුලයෙක උපදි යි. එසේ වනුයේ කුශලජනකකම්ය, කුශලඋපත්ථම්භක කම්යකින් අනුබල ලත් කල්හි ය. කලින් කල පොහොසත් වනුත් දුප්පත් වනු ත් කුසලාකුසලඋපත්ථම්භක කම්යෙන් ප්‍රවෘත්තිවිපාකයන්ට අනුබල ලැබෙන බැවිනි.

උපපීළකකම්ය, යි කියේ ජනකකම්යට පීඩා කරණ ජනක කම්ශක්තිය හීන කරණ කම්ය යි. ජනකකම්යෙන් උපන් විපාක ද පෙළ යි. අඩු කර යි. මහානිරයෙක ඉපැදිය යුත්තේ සමහර විට ඔසුපත් නිරයෙක උපදි යි. අකුශලජනකකම්ය, උපපීළක කම්යෙන් පීඩා ලැබීම ය, එහි හෙතුව. උසස් කුලයෙක ඉපැදිය යුත්තේ සමහර විට පහත් කුලයෙක උපදි යි. එහි හෙතුව කුශල ජනකකම්ය, උපපීළකකම්යෙන් පහර ලැබීම ය. යමෙක් අකුශල ජනකකම්යකින් තිරිසන්යොනියෙහි තිරිසන් ව උපන්නේ ද, කුසලඋපපීළකය තෙමේ ඒ සත්වයා සුවපත් කර යි. යමෙක් මහාසාරු දී වූ උසස් කුලයෙක උපන්නේ ද, අකුසලඋපපීළකය තෙමේ ඔහු දුකට පමුණුවන්නේය. මෙ ද මෙසේ කුශලාකුශල වශයෙන් දෙ පරිදි ය. සුනක්ඛත්තයාගේ අකුශලකම්ය, කුශල කම්යට උපපීළක විය. වොරසාතකයාගේ කුශලකම්ය, අකුශල කම්යට උපපීළක විය. ඒ කථාවස්තු බලනු.

උපඝාතකකම්ය, යි කියේ ජනකකම්ය හෝ එයින් උපන් විපාකයන් මුළුමනින් සිදලන කම්ය යි. මෙය, ජනකකම්ය විසින් දෙන ප්‍රතිසන්ධිය සිඳ හරි යි. ඉපැත්මෙන් පසු විඳින

සුඛදුඃඛ විපාක ත් වනසාලන්නේ ය. උපඝාතකකුශලකර්මය, දුර්වල වූ අකුශලජනකකර්මය නසාල යි. උපඝාතකඅකුශලකර්මය, දුර්වල වූ කුශලජනකකර්මය බිඳ හරින්නේයි. සුගතියෙක හෝ දුගතියෙක උපන්නේ, ඒ ගතියට අයත් ආයු කාලය මුළුමනින් ජීවත්ව නො සිට අතර කාලයෙහි මියයනුයේ ද, මේ උපඝාතකකර්මය, ජනකකර්මය ත් එයින් දුන් විපාක ත් නසන බැවිනි. අකාලමරණයට හෙතුව උපඝාතකකර්මය යි. අජාසත් රජුගේ ආනන්තර්‍යකර්මය, කුශලකර්මයට උපඝාතක විය. අඞ්ගුලිමාල සථවිරයන් වහන්සේගේ ශීලසමාධ්‍යාදිකුශලකර්මය, අකුශලකර්මයට උපඝාතක විය. උපවෙජ්දක නමින් ද මේ හැඳින් වේ. ඒ කථාවසතු බලනු.

කර්මය, විපාක දෙන සැටියෙනුදු සිවු වැදෑරුම් ය. **ගරුක කම්- ආසන්නකම්- ආචිණ්ණකම්- කටත්තාවාපනකම්** යි.

එහි කුශලාකුශලකර්ම අතුරෙහි යම් කර්මයෙක් බලගතු වේ නම්, ඒ **ගරුකකර්ම**, නම් වේ. එහි විපාකය, අනික් කර්මයකට යටපත් කළ නො හැකි ය. කුශලපක්‍ෂයෙහි ගරුකකර්මය වනුයේ රූපාරූපඅෂ්ටසමාපත්තිය ය. ධ්‍යාන කුසල් ය. ධ්‍යානයෙන් යුක්ත ව යමෙක් මිය ගියේ නම්, ඔහු දෙවන අත්බවෙහි බඹලොව උපදි යි. අකුශල පක්‍ෂයෙහි නියත මිථ්‍යාදෘෂ්ටිය හා පඤ්චානන්තර්‍යකර්මය ගරුකකර්ම වේ. නියත මිසදිටු ගත්තේ ත් ආනන්තර්‍යකර්ම කෙළේ ත් දෙවන අත්බවෙහි අපායයෙහි උපදි යි. මෙය කිසි ලෙසකින් වළකනු බැරි ය. මෙසේ මෙ ද කුශලාකුශලවශයෙන් දෙ පරිදි ය.

ආසන්නකම්, නම්, මරණාසන්නකාලයෙහි සිතට අරමුණු වන්නේ ය. එය පෙර කරණ ලද්දක් හෝ මරණාසන්නකාලයෙහි කරණ ලද්දක් හෝ විය හැකි ය. මෙ ද කුශලාකුශලවශයෙන් දෙ පරිදි වේ. තමන් කළ කුශලාකුශලකර්ම දෙකින්, යමෙක මරණාසන්නයෙහි දී චුතිචිත්තය එල්බ ගණී ද, ඒ ආසන්නකර්ම, යි කියන ලදී. දම්ළ දෙවාරික-මහාමාවකාලවසතු බලනු.

ආචිණ්ණකම්, නම්, කුශලාකුශලකර්ම අතුරෙහි යම් කර්මයෙක් බොහෝ කලක් සෙවුනා ලද ද, පුරුදු කරණ ලද ද, නිතර නිතර සිහි කරණ ලද ද, ඒ ය. සොම්නස් බහුල වූ කුශලකර්ම ත් සන්තාප බහුල වූ අකුශලකර්ම ත් මෙහිලා ගණින්. යබබහුලකර්ම, යි කියනු ලබන්නේ ද, මේ ය. චුන්දසූකරිකවසතුව බලනු.

කටත්තාවාපනකම්, නම්, මේ තුන් අයුරින් ම නො ගැණෙන, නො දුන විසුරුණු සිතින් කෙළේ ය. මේ වනාහි කළ බැවින් කර්ම යි කියනු ලැබේ. පෙර ජාතීන් හි කළ අපරාපරියවෙදනීය කර්මය මින් ගැණේ. මෙ ද කුශලාකුශලවශයෙන් දෙ පරිදි ය.

මේ කර්ම සතරින් පළමු පළමු කර්මයක් නැති කල, පසු පසු කර්මයෝ විපාක දෙති. පළමු කොට විපාක දෙනුයේ ගරුකකර්මය යි. ගරුකකර්මයක් නැති කල්හි, ආවිණ්ණකර්මය විපාක දෙන්නේ ය. එබන්දකු ත් නැති කලට, යදාසන්නකර්මය විපාක දීමට ඉදිරියට එයි. යදාසන්නකර්මයකු ත් නො වූයේ නම්, අපරාපරියවෙදනීය යි කියූ කෘත්ත්වාත්කර්මය විපාක දෙයි.

විපාක දෙන කාලවශයෙන් ද කර්මය, **දිඝධම්මවෙදනීය- උපපජ්ජවෙදනීය- අපරාපරියවෙදනීය- අහොසි**, යි සිවු වැදූරුම් වේ.

කුශලාකුශලකර්ම රැස් කරන්නා වූ කාලයෙහි හමුවන ඉටු අනිටු අරමුණු අරබයා හට ගන්නා වූ චිත්තවීථින් පිළිබඳ ජවන වීථිය, අරමුණෙහි සත් වරක් දුවන්නී ය. ඒ චිත්තවාර සතින් පළමු වන චිත්තවාරයෙහි යෙදුනු චෙතනාව, කර්මය රැස් කළ අත්බව්හි ම විපාක දෙයි. එ හෙයින් ඒ චෙතනාව **දිඝධම්ම-වෙදනීය කර්මැ**, යි කියනු ලැබේ. මුලින්, යමකගේ රුකුලක් නො ලබන මෙය, ආසෙවනප්‍රත්‍යයයාගේ නො ලැබීම හෙතුකොට දුර්ලභ වේ. එහෙයින් ප්‍රතිසන්ධිවිපාක නො දේ. දෙන්නේ ප්‍රවෘත්ති විපාකමාත්‍රයෙකි. වීපාක දීමට අවස්ථා නො ලැබිනි නම්, අහොසි වෙයි. නැවැත විපාක දීම සඳහා කිසිකලෙක ත් නො එයි. මෙ ද කුශලාකුශලවශයෙන් දෙ පරිදි ය. අකුශලපක්ෂයෙහි නන්ද මාණවක තෙමේ උපුල්වන් මෙහෙණ කෙරෙහි වරදවා පිළිපැදී ම ද, නන්දගොඝාතක තෙමේ පසළොස්වක් දිනයෙහි ගොනුගේ දිව කපා උයා බැද ගෙන එව යි ගෙන්වා ගෙණ දිවෙහි තැබූ සැටියේ දිව මුලින් ගැලවී බත් පිඟානෙහි ගැලවී වැටීම ද, කොකාලිකයාගේ **'පාපිච්ඡා භන්තෙ! සාරිපුත්තමොග්ගල්ලානා'** යි කළ ආර්‍යෝප වාදයෙන් සිරුර හටගත් බෙලි ගෙඩි පමණ පිළිකා ඇති ව එයින් මැරී ගොස් නිරයෙහි ඉපදීම ද දත යුතු ය. කුශලපක්ෂයෙහි කාකවලිය සිටානන් නිරෝධසමාපත්තියෙන් නැගී සිටි මහසුප් තෙරුන් වහන්සේට දුන් කැඳ දානයේ විපාකයෙන් මේ අත් බවේදී ම මහත් සම්පත් ඇති ව සිටු තනතුරු ලැබීම ද, සැරියුත් මහතෙරුන් වහන්සේට දන් දීමෙන් එම අත්බව්හි ම පූණ්ණ නම් දුගියාගේ සිටු තතුරු ලැබීම ද, දත යුතු ය. දෘෂ්ටධර්මවෙදනීය කුශලකර්මය එම අත්බවෙහිම ඇස් ඉදිරියේ පෙණී පෙණී මහත් සේ විපාක දීමට නම්, බුදු පසේබුදු මහරහත් කෙනෙකු ලැබූ ධාර්මිකදානවස්තුව එ දවස්හි ම නිරෝධසමාපත්තියෙන් නැගී සිටියහු කෙරෙහි ශ්‍රද්ධා වීර්‍ය්‍ය ප්‍රඥාවන්ගෙන් යෙදී පිරිනැමිය යුතු ය.

උපපජ්ජවෙදනීයකම්ම, නම්, දෙවන අත්බවෙහි ප්‍රතිසන්ධිය දෙන චේතනා ය. එ ද කුශලාකුශල වශයෙන් දෙ පරිදි ය. කුශලාකුශලජවනවීථියෙහි අන්තිම චිත්තවාරය වූ සත්වන චිත්තවාරයෙහි යෙදෙන චේතනාව, උපපජ්ජවෙදනීයකම්ම නාමයෙන් කිය වේ. මෙය එයට මුලින් සිටි චිත්තවාර සයෙන් ලත් රැකුලෙන් ආසෙවනප්‍රත්‍යය ලද්දේ ම, දෙවන අත්බවෙහි විපාක දෙන්නේ ය. විපාක දීමට අවසර නොලද්දේ නම්, අහොසි වේ. මෙය ප්‍රතිසන්ධිවිපාකය පමණක් නොව, ප්‍රවෘත්තිවිපාක ද දෙයි. විපාකදානයට ආසෙවනප්‍රත්‍යය ලැබිය යුතු ම ය. අරමුණක් ගෙණ පහළ වූ ජවන් සිත් සතින්, සත්වන ජවන් සිත, විපාක දානය කරන්නේ එයට මුලින් සිටි පළමුවන දෙවන තෙවන සිවුවන පස්වන සවන චිත්තක්ෂණයන්ගෙන් අනුබල ලැබීමෙනි. ගැලෙන යෙදූ ගොන් යුග සතින්, මුලින් යෙදූ ගොන් යුග සය, සත්වන ගොන් යුගයට ගැල නහාලීමෙහි රැකුල් දෙන ලද්දේ නම්, ඒ සත්වන යුගය, ගැල පහසුවෙන් අදින්නාක් මෙනි. එක සත්වයකු කෙරෙහි ඇති උපපජ්ජවෙදනීයකම්ම බොහෝ ය. එහෙත් විපාක දෙනුයේ ඉතා බලවත් වූ කම්ම යි. අනික් කම්මයෝ, අහොසිකම්ම නම් වෙති. නියම කල් ඉක්මීමෙන් බොල්වී ගිය, පැල නොවන ඇට ජාති මෙනි.

අපරාපරියවෙදනීයකම්ම, නම්, දෙවන අත්බවෙන් පසු තුන්වන අත්බව පටන් නිවන් ලබා අවසන්වන තුරු, මේ අතර කාලයෙහි ඉඩ ලැබුනු විට ප්‍රතිසන්ධිවිපාක හා ප්‍රවෘත්තිවිපාක දෙන්නා වූ, ජවන් සිත් සතින්, මැදසිටි ජවන් සිත් පසෙහි යෙදුනු චේතනා ය. එ ද විපාක දෙනුයේ දෘෂ්ටධම්මවෙදනීයකම්ම, යි කියූ ප්‍රථම ජවන, චේතනාවෙන් අනුබල ලැබීමෙනි. රාත්‍රිකාලයෙහි එකලා ව සොහොන් බිමකට නොයා හැකි පුරුෂයක්හට දෙවැන්නකුගේ සහාය ලත් කල්හි රාත්‍රිකාලයෙහි වුව ද සොහොන් බිමට යා හැකි ය. එ පරිද්දෙන් දෘෂ්ටධම්මවෙදනීයකම්මයේ වහල් බව ලැබීමෙන් අපරාපරියවෙදනීයකම්මය විපාකදානයෙහි පොහොසත් වේ.

එක් සත්වයකුට ඇත්තා වූ අපරාපරියවෙදනීයකම්මයන්ගේ කෙළවරක් දක්වන්නට බැරි ය. සිවු මහාසයුරෙහි ජලය, අබ පියල්ලෙකින් මැන බැලුව ද එක් සත්වයකුට ඇති අපරාපරියවෙදනීයකම්මයන්ගේ ගණන කොයිලෙසකිනුත් මැන නොබැලිය හැකි ය. මෙය විපාක දීමට ඉඩ ලැබුනු කල්හි ම විපාක දෙන්නේ ය. නිම්නාණය දක්වා ම ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති විපාක දීමෙහි මෙය පොහොසත් ය. එක් කම්මයක් එක් ප්‍රතිසන්ධියක් දුන්නේ ද, අත්බව් ලක්ෂ ගණනක් ප්‍රවෘත්තිවිපාක දීමෙහි පොහොසත් ය.

අහොසිකම්, නම්, විපාක නො දිය හැකි කම් යි. ජවනවීථි යෙහි ප්‍රථම ජවනය මේ අත්බවිහි විපාක නො දුන්නේ නම්, ඒ අහොසි කම් වේ. සත්වන ජවනය දෙවන අත්බවිහි විපාක නො දුනහොත් අහොසි කම් වේ. එ ද කුශලාකුශල වශයෙන් දෙ පරිදි ය. දෙව්දත්තෙර, සිල් රැක අෂ්ටසමාපත්ති ඉපදවීමෙන් කාමාවචර රූපාවචර කුසල් රැස් කළ ද, කළා වූ සඞ්ඝභෙදකම්ය හෙතුකොට නිරයෙහි උපන. ඔහු රැස් කළ ඒ කුශලකම්යන්ගේ දෘෂ්ටධම්වේදනීය, උපපද්‍යවේදනීයකම් ශක්තිය අහොසි වූ ය. අඞ්ගුලිමාල ස්ථවිරයෝ තමන් කළ ප්‍රාණඝාත අකුශලකම්යන්ගේ උපපද්‍යවේදනීය- දෘෂ්ටධම්වේදනීයකම්ශක්තිය මූළුමනින් අහොසි බවට පමුණුවා ලූහ. එහෙත් අකුශලදෘෂ්ටධම්වේදනීය කම්ශක්තියෙන් බලු කපුටන්ට දමා ගසන දඩු මුගුරු කැට කැබලිහි තම හිස වැදීමෙන් ලෙයින් වැකුණු සිරුරු ඇති ව දුක් විඳින්නට උන්වහන්සේට සිදු විය. අපරාපර්‍යවේදනීයකම්ය අහොසි බවට යනුයේ, සසර ඉපදීම සිඳ දමා නිවන් අවබෝධ කිරීමෙන් පසු ය. අනුපාදිශෙෂනිර්‍වාණ ධාතුවෙන් නිවනට පැමිණෙන තුරු සත්ව යන්ට මේ කම්යෙන් මිදීමෙක් නැත්තේය. මෙසේ ඒ ඒ කම් යන්ගේ විපාකයට නියම කාලය ඉක්ම යෑමෙන් බොල්ව ගිය කම්, අහොසිකම්, යි දතයුතු ය.

විපාක දෙන සථානයන්ගේ වශයෙන් **අකුශලකම්- කාමාවචරකුශලකම්- රූපාවචරකුශලකම්- අරූපාවචරකුශල කම්,** යි කම්ය සිවු වැදෑරුම් ය.

එහි, අකුශලකම්, වාරවශයෙන් **කායකම්-** වාක්කම්- මනඃ කම් යි තෙපරිදි ය. පාණඝාත- අදින්නාදාන- කාමේසුමිච්ඡාචාර යන තුන බොහෝ සෙයින් කායවාරයෙහි පවත්නා බැවින් කායකම් යි. මුසාවාද- පිසුණවාච- ඵරුසවාච- සම්ඵප්පලාප යන සතර බොහෝ සෙයින් වාග්වාරයෙහි පවත්නා බැවින් වාක්කම් යි. අභිජ්ඣා- ව්‍යාපාද- මිච්ඡාදිට්ඨි යන තුන සිතෙහි වන බැවින් මනඃකම් යි. මෙකී ප්‍රාණඝාතාදීන් ගේ විසතරයට යට කියන ලද්දේ ය.

ලොභ- දෙස- මොහ යි අකුශලකම්යන්ගේ ඉපැත්මට මූල් තුනෙකි. මොහය, සියලු අකුසලයන්ට මූල් වේ. ලොභ- දෙස මූල් වනුයේ සමහර අකුසලයන්ට ය. එහෙයින් මෙහිලා යට කියූ ධම් විසතරය බලනු. දශඅකුශලය, චිත්තෙනාත්පාදවශයෙන් දෙලොස් වැදෑරුම් ය. එ ද යට කියේ ය. දැන් සැකෙවින් කියා නිමවන ලද්දේ නිරයෙහි විපාක දෙන කම් යි.

කාමාවචරකුශල කම්ම ද, කායකම්- වාකකම්- මනඃ කම් යි තුන් වැදෑරුම් ය. කුශලකම්, කායාදිවාරත්‍රයයෙහි පවත්නා ක්‍රම දෙකෙකි. කවර කුශලයක් නමුත් කයින් කරණ ලද්දේ කාය කම් යි. වචනයෙන් කරණ ලද්දේ වාකකම් යි. එසේ ම, සිතින් කරණ ලද්දේ මනඃකම් යි. එනම්, කයින් දුන් දෑනය කායකම් ය. වචනයෙන් දුන් දෑනය වාකකම් ය. සිතින් දුන් දෑනය මනඃකම් ය. සෙස්ස ද මේ නයින් සලකා ගත හැකි ය. අනික් ක්‍රමය නම්, කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් වැළකීම, කායවාඞ්මනඃ කම් කුසල් වීම ය. මෙහි මූලින් දුක්වෙන කම් දෙකෙහි කය-වචන දෙදෙනාගේ මෙහෙයුමෙක් නැත ද, සංවර බැවින් කුශලකායවාකකම්ම යි කියනු ලැබේ.

දෑන-සීල-භාවනාවශයෙන් කුශලකම්ය තෙ පරිදි වන්නේ ය. චිත්තොත්පාදවශයෙන් අට වැදෑරුම් වන්නේ ය. දෑන- සීල-භාවනා- අපචායන- වෙය්‍යාවච්ච- පත්තිදෑන- පත්තානුමොදනා- ධම්මදෙසනා- ධම්මසවණ- දිට්ඨුජ්ජුකම්ම යි දස වැදෑරුම් වන්නේ ය. යට කියන ලද්ද බලනු.

මෙහි, පත්තිදෑන, පත්තානුමොදනා දෙක දෑනයෙහි ඇතුළත් ය. අපචායන, වෙය්‍යාවච්ච දෙක සීලයෙහි ද, දෙසනා, සවණ, දිට්ඨුජ්ජුකම්ම තුන භාවනාවෙහි ද ඇතුළත් ය. ඇතැම් කෙනෙක් දෙසනාව දෑනයෙහි ද, දිට්ඨුජ්ජුකම්මය ත්‍රිවිධකුශලයෙහි ද ඇතුළත් කෙරෙත්.

මෙසේ විවිධභෙදයෙන් භින්න වූ ඒ කාමාවචරකම්ය, කුසල් අකුසල් වශයෙන් දෙ වැදෑරුම් වේ. කුසලය, කාමාවචර කුසල් සිත් වසයෙන් අට වැදෑරුම් ය. අකුසලය, අකුසල් සිත් වසයෙන් දෙලොස් වැදෑරුම් ය. මුළුල්ල එකතු ව කාමාවචරකම්, චිත්ත භෙදයෙන් විස්සෙක් වේ.

රූපාවචරකුසලය, මනඃකම් යි. එය සිතින් ම සිදු වේ. භාවනාමය කුසලය යි. අභිණ්හවට පැමිණි කුසලය ම රූපාවචර වේ. ඉන් මෙ පිට වූයේ කාමාවචර යි ගැණේ. එය ප්‍රථමධ්‍යානාදි-වශයෙන් පස් වැදෑරුම් ය තරමක විස්තරයක් චිත්තවගීයෙහි කියූ ඇත. ඒ බලනු.

අරූපාවචරකුසලය, ආලම්බනවශයෙන් සිවු වැදෑරුම් වූයේ මනඃකම් යි. භාවනාමය වේ. විස්තර චිත්තවගීයෙහි ඇත.

මෙසේ මෙහි සැකෙවින් කියූ කර්මය, සූත්‍රපිටකයෙහි දිඨ ධම්මවෙදනීය- **උපපජ්ජවෙදනීය- අපරාපරියවෙදනීය- යගගරුක- යබ්බහුල- යදාසන්න- කටත්තා වා පන කම්මජනක- උපත්ථම්භක- උපපීලක- උපඝාතක** යි එකොළොස් අයුරකින් බෙදෙන්නේ ය. මේ එකොළොස් අයුර ම මෙහි ඉතා කොටින් කියවින. අහොසිකම්ම, යි කියූ කර්මය, සූත්‍රපිටකයෙහි වෙන් කොට නො දැක්වුනේ, දිඨධම්මවෙදනීය, උපපජ්ජවෙදනීයකම්ම යන්ගේ අවිපාකඅවස්ථාවෙහි ගැණෙන බැවිනි. දෘෂ්ටධර්මවෙදනීය කර්මයට හෝ උපපද්‍යවෙදනීයකර්මයට හෝ යම් කිසිලෙසකින් විපාකදානයට ඉඩ නො ලැබුනි නම්, ඒ කර්ම, අහොසි වේ.

අභිධර්මපිටකයෙහි පාපකර්මසමාදානයෝ, **ගතිසම්පත්ති-උපධිසම්පත්ති-කාලසම්පත්ති-පයොගසම්පත්ති-ගතිවිපත්ති-උපධිවිපත්ති-කාලවිපත්ති-පයොගවිපත්ති** යි අටක් ද, කල්‍යාණකර්ම සමාදානයෝ, **ගතිවිපත්ති-උපධිවිපත්ති-කාලවිපත්ති-පයොගවිපත්ති-ගතිසම්පත්ති-උපධිසම්පත්ති-කාලසම්පත්ති-පයොගසම්පත්ති** යි අටක් දැ යි සොළොස් අයුරකින් බෙදා දක්වන ලදහ.

එහි, අනිටු, නො කැමැතිවන ලද අරමුණු රස විඳීමට සුදුසු පව්කම් ඇති කල්හි ම යමෙක් සුගතියෙක උපදී ද, ඔහුගේ ඒ පාපකර්මය ගතිසම්පත්තියෙන් වැළකී ගියේ, විපාක නො දේ. මෙසේ ගතිසම්පත්තියෙන් වැළකී විපාක දීමෙහි අපොහොසත් කර්මය **ගතිසම්පත්තිපතිබාළහ,** නම් වේ.

යමෙක් වනාහි පව්කම් හෙතුකොට දැසියක හෝ කර්ම කාරිණියක හෝ කුස ඉපද දෙහවිලාසයෙන් හා රූපශ්‍රියෙන් උසස් ආත්මභාවසමෘඩියක් ගෙණ සිටී ද, එකල එහි අධිපතියෝ ඔහු දැක 'මොහු පහත් වැඩ කිරීමට සුදුසු නො වේය' යි තමන්ට දාව උපන් පුතකු සේ සැපයෙන් හදා වඩා යම්කිසි උසස් තනතුරෙක තබා සියලු යස ඉසුරු දී පරිහරණය කෙරෙති. මෙබන්දහුගේ දැසියක කුස ඉපැත්මට කරුණු වූ ඒ මේ පාපකර්මය උපධිසම්පත්තියෙන්, වැළකුනේ විපාක නො දෙනුයේ **උපධිසම්පත්ති පතිබාළහ,** නම් වේ.

යමෙක් තෙමේ කල්පයෙහි මුල් කාලය වැනි කාලයෙක යස ඉසුරෙන් පිරිපුන් කෑම් බීම් බොහෝ කොට ඇති යම් කුලයෙක උපදී ද, ඔහුගේ විද්‍යමානකර්මය, කාලසම්පත්තියෙන් බාධිත ව විපාක නො දෙනුයේ **කාලසම්පත්ති පතිබාළහ,** නම් වේ.

යමෙක් තෙමේ, ප්‍රයොගයෙන් ජීවත් වේ ද, යම්කිසි වෙත යායුතු කාලයෙහි යේ ද, පෙරලා ආයුතු කාලයෙහි පෙරලා ඒ ද, පලායන්නට සුදුසු කාලයෙහි පලා යේ ද, අල්ලස් දියයුතු කාලයෙහි අල්ලස් දේ ද, මෙබන්දහුගේ විද්‍යමානකම්ය, ප්‍රයොග සම්පත්තියෙන් වැළකී ගියේ, විපාක නො දෙන්නේ ද වේ. ඒ **පයොගසම්පත්තිපතිබාළහ,** නම් වේ.

දුගතියෙහි උපන්නහුගේ පාපකම්ය, ගතිවිපත්තිය පිණිස විපාක දෙනුයේ **ගතිවිපත්ති, නම්** වේ

යමෙක් තෙමේ දාසියක හෝ කම්කාරිණියක හෝ කුස උපන්නේ, දුම්ණි ව ගියේ, නපුරු සටහන් ඇත්තේ 'මෙතෙමේ යනොක් ද මිනිසෙක් දැ' යි විමති ඉපදීමට කරුණු වේ ද, හෙතෙමේ යම්කිසි ලෙසකින් පුරුෂයෙක් වූයේ ද, වැදගත් තනතුරෙක යෙදීමට නො සුදුසු ය යි ඇත් අස් ගොන් බැලීමෙහි හෝ දිය දර තණ ගෙණ ඒමෙහි යොදනු ලැබේ. ඉදින් ස්ත්‍රියක් වූ නම් හස්ති අශ්ව සුනඛාදීන් පිණිස බත්පිසුම් දියගෙණුම් ආදී පහත් කටයුතුවල යොදත්. කුණුකසළ මල මූ ඇ බැහැර කරවත්. මෙබන්දහුගේ පාපකම්ය, උපධිවිපත්තිය හෙයින් විපාක දෙනු යේ **උපධිවිපත්ති,** නම් වේ.

යමෙක් තෙමේ දුර්භික්ෂ කාලයෙක හෝ පිරිහුනු යසඉසුරු ඇති කාලයෙක හෝ නැත, අන්‍යතා කල්පයෙක උපදී ද, ඔහුගේ පාපකම්ය කාලවිපත්තිය බැවින් විපාක දෙනුයේ **කාලවිපත්ති,** නම් වේ.

යමෙක් තෙමේ ප්‍රයොගයෙහි දක්ෂ නො වේ ද, එළැඹිය යුතු කාලයෙහි එළැඹෙන්නට නො දනී ද, යා යුතු තැන නො දනී ද කළ යුතු සැටි නො දනී ද, එබන්දහුගේ පාපකම්, ප්‍රයොගවිපත්ති බැවින් විපාක දෙනුයේ **පයොගවිපත්ති,** නම් වේ.

යමෙක් තෙමේ ඉටු අරමුණු රස විඳීමට සුදුසු වූ කම්යක් ඇති කල්හි ම දුගතියෙක උපදී ද, ඔහුගේ ඒ කුශලකම්ය ගතිවිපත්තින් බාධිත ව විපාක නො දෙනු යේ **ගතිවිපත්ති පතිබාළහ,** නම් වේ.

යමෙක් තෙමේ කුශලකම්ානුභාවයෙන් රජ ඇමැති සිටු ආදීන්ගේ ගෙයක ඉපද කණෙක්, කොරෙක්, කුදෙක්, ගොලුවෙක්, බිහිරෙක් වේ ද, එහෙයින් කුශලකම්ානුභාවයෙන් ලත් යුව රජ මැති ඇමති කම් ඇ උසස් තනතුරු ඔහුට නො ද පැමිණේ. මෙබන්දහුගේ ඒ කුශලකම්ය, උපධිවිපත්තින් බාධිත ව විපාක නො දෙනුයේ **උපධිවිපත්තිපතිබාළහ,** නම් වේ.

යමෙක් තෙමේ දුර්භික්ෂ කාලයෙක හෝ පිරිහුනු යසඉසුරු ඇති කාලයෙක හෝ, නැත, අනතඃකල්පයෙක මිනිසුන් අතර උපදී ද, ඔහුගේ ඒ කුශලකර්මය, කාලවිපත්තියෙන් බාධිත ව විපාක නො දෙනුයේ **කාලවිපත්තිපතිබාළ**, නම් වේ.

යමෙක් තෙමේ යට කියූ ලෙසින් ප්‍රයොග කරන්නට නො දනී ද, ඔහුගේ ඒ කුශලකර්මය, ප්‍රයොගබාධිත ව විපාක නො දෙනුයේ **පයොගවිපත්තිපතිබාළ**, නම් වේ.

යමෙක් තෙමේ කුශලකර්මයකින් සුගතියෙහි උපදී ද, ඔහුට ඒ කුශලකර්මය, ගතිසම්පත්තිය පිණිස විපාක දෙනු යේ **ගති සම්පත්ති**, නම් වේ.

යමෙක් තෙමේ රාජරාජමහාමාත්‍යාදීන්ගේ කුලයෙහි ඉපද රූපලක්ෂණයෙන් ආත්මභාවසම්‍ධියට, පැමිණියේ දෙවි පුරයෙක නැඟූ රුවන් තොරණක් වැනි ඔහුගේ ආත්මභාවය දුන මොහුට යුවරජ කම් ඇමැති කම් ඈ හැම උසස් තනතුරෙක් ම සුදුසුය' යි ලදරු කල ම ඒ ඒ තනතුරු දෙති. මෙබන්දහුගේ ඒ කුශල කර්මය උපධිසම්පත්තිභාවයෙන් විපාක දෙනුයේ **උපධිසම්පත්ති**, නම් වේ.

යමෙක් තෙමේ ප්‍රථමකල්පිකයන් කෙරෙහි හෝ සුලභ වූ ආහාරපාන ඇති කාලයෙක හෝ උපදී ද, ඔහුට ඒ කුශල කර්මය, කාලසම්පත්තිභාවයෙන් විපාක දෙනුයේ **කාලසම්පත්ති**, නම් වේ.

යමෙක් තෙමේ යට කියූ සේ ප්‍රයොගය දනී ද, එළැඹීම් පලායෑම් අල්ලස් දීම් ඇ දනී ද, උනුන්ගේ සිත් ගැණුමෙහි දක්ෂ වේ ද, මිහිරි තෙපුලෙහි සමර්‍ථ වේ ද, ඔහුගේ ඒ කුශලකර්මය ප්‍රයොගසම්පත්තිභාවයෙන් විපාක දෙනුයේ **පයොගසම්පත්ති**, නම් වේ.

ප්‍රතිසංවිත්මාර්ගයෙහි, කියූ ලෙසින් කර්මය තෙමේ, **'අහොසිකම්ම අහොසිකම්මවිපාක-අහොසිකම්ම නාහොසිකම්මවිපාක-අහොසිකම්ම අත්‍ථිකම්මවිපාක - අහොසිකම්ම නත්‍ථිකම්ම විපාක - අහොසිකම්ම භවිස්සතිකම්මවිපාක - අහොසිකම්ම න භවිස්සතිකම්මවිපාක - අත්‍ථිකම්ම අත්‍ථිකම්මවිපාක - අත්‍ථිකම්ම නත්‍ථිකම්මවිපාක - අත්‍ථිකම්මභවිස්සතිකම්මවිපාක - අත්‍ථිකම්ම න භවිස්සතිකම්මවිපාක - භවිස්සතිකම්මභවිස්සතිකම්මවිපාක - භවිස්සතිකම්ම න භවිස්සතිකම්මවිපාක'** යි දෙළොස් අයුරකින් බෙදී ගියේ දතයුතු ය.

පෙර රැස් කළ යම් කර්මයෙක් කිසි හෙතු ප්‍රත්‍යයයකින් පෙර ම විපාකවාර ලැබ, ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තිවිපාක දී නිමාවට යේ ද ඒ **අහොසිකම්ම අහොසිකම්ම විපාක,** නම් වේ.

යම් කර්මයෙක් විපාකවාරය නො ලැබ, ප්‍රතිසන්ධි- ප්‍රවෘත්ති විපාකදීමෙහි අපොහොසත් වී ද, ඒ **අහොසිකම්ම නාහොසිකම්මවිපාක,** නම් වේ.

යමෙක් තෙමේ යටගිය දවස රැස් කරණ ලද්දේ, දැන් මෙකල විපාකවාර ලැබ, ප්‍රතිසන්ධි- ප්‍රවෘත්තිවිපාක දී සිටියේ ද, ඒ **අහොසිකම්ම අජ්ජකම්මවිපාක,** නම් වේ.

යමෙක් තෙමේ විපාකවාර නො ලැබීමෙන් ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති විපාකදීමට අසමර්ථ වේ ද, ඒ **අහොසිකම්ම නාජ්ජකම්මවිපාක,** නම් වේ.

යමෙක් තෙමේ අතීතයෙහි රැස්කරණ ලද්දේ, අනාගත කාලයෙහි විපාකවාර ලැබ, ප්‍රතිසන්ධි- ප්‍රවෘත්තිවිපාක දීමට හැකි වන්නේ ද, ඒ **අහොසිකම්ම භවිස්සතිකම්මවිපාක,** නම් වේ.

යමෙක් තෙමේ අනාගතයෙහි විපාකවාර නො ලැබ, ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිවිපාක දීමට නො හැකි වන්නේ ද, ඒ **අහොසිකම්ම න භවිස්සතිකම්මවිපාක,** නම් වේ.

යමෙක් දැන් මෙකල සකස් කරණ ලද්දේ, මෙකල ම විපාකවාර ලබා ද, ඒ **අජ්ජකම්ම අජ්ජකම්මවිපාක,** නම් වේ.

යමෙක් දැන් මෙකල විපාකවාර නො ලබා ද, ඒ **අජ්ජකම්ම නාජ්ජකම්මවිපාක,** නම් වේ.

යමෙක් දැන් සකස් කරණ ලද්දේ, අනාගතයෙහි විපාකවාර ලදින් ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තිවිපාක දීමෙහි හැකි වන්නේ ද, ඒ **අජ්ජකම්මභවිස්සතිකම්මවිපාක,** නම් වේ.

යමෙක් එසේ නො වනුයේ **අජ්ජකම්ම න භවිස්සතිකම්ම විපාක,** නම් වේ.

යමෙක් අනාගතයෙහි වැළකුනේ අනාගතයෙහි ම විපාකවාර ලබා ද; ඒ **භවිස්සතිකම්ම භවිස්සතිකම්ම විපාක,** නම් වේ.

යමෙක් එසේ විපාක නො ලබනුයේ, ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තිවිපාක දීමෙහි නො හැකි වන්නේ **භවිස්සති කම්ම න භවිස්සති කම්ම විපාක,** නම් වේ.

මෙසේ, ප්‍රතිසංවින්මාගීයෙහි ආ කර්ම දෙළස ත්, අභිධම්පිටකයෙහි ආ කර්ම සොළස ත් යන කර්ම අටවිස්ස, සූත්‍ර පිටකයෙහි එන කර්ම එකොළොසෙහි ම ගැලී යයි.

අභිධම්යෙහි එන සොඩශ කම්යෝ ත්, ප්‍රතිසංවිත්තමාගීයෙහි එන වාදශ **කම්යෝ** ත්, සූත්‍රයෙහි එන යගහරුක- යබබහුල- යදුසන්න- කටත්තාපනකම්ම- ජනක- උපත්ථම්භක- උපපීලක උපඝාතක, යන අෂ්ටවිධ කම්යෝ ත්, සූත්‍රධම්යෙහි ම කී දිට්ඨම්මවෙදනීය- උපපජ්ජවෙදනීය- අපරාපරියවෙදනීය කම්ත්‍රය යෙහි ම ඇතුළත් වෙති. මේ තිදෙනාගේ සංක්‍රමණයෙක් නම් නැත්තේ ය.

යමෙක් තෙමේ කුසලය, කුසලැ යි ද අකුසලය, අකුසලැ යි ද කුසලවිපාකය, කුසලවිපාකැ යි ද අකුසලවිපාකය, අකුසලවිපාකැ යි ද දැන, කායවාරයෙහි අෂ්ටකාමාවචරචෙතනාය, වාදස අකුශල චෙතනාය යන විසි වැදෑරුම් කායසංඝකාරයන් ද, වාග්වාරයෙහි එසේ විසි වැදෑරුම් වූ වචීසංඝකාරයන් ද, මනොවාරයෙහි අෂ්ටවිධ කුශලචෙතනාය, වාදශවිධඅකුශලචෙතනාය, පංචවිධරූපාවචර කුශලචෙතනාය, චතුර්විධඅරූපාවචරකුශලචෙතනාය යන එකුන් තිස් වැදෑරුම් චිත්තසංඝකාරයත් ද, රැස් කෙරේ නම්, එසේ දැන රැස් කරන්නා වූ, සංඝකාර නම්නුත් හඳුන් වන්නා වූ කම්යෝ **සම්ප්‍රජානකම්, නම්** වෙති. නො දැන රැස් කරන්නෝ **අසම්ප්‍ර-ජානකම්, නම්** වෙති.

මේ සියලු කම්, සංසාරගමනීය – නිස්සාණගමනීය යි දෙකට බෙදේ. එහි, අපායයෙහි උපදවන බැවින්, කෘෂ්ණකම්, යි වදළ පාපකම් ත්, සුගතියෙහි උපදවන බැවින්, ශුක්ලකම්, යි වදළ කුශලකම් ත්, අපායයෙහි හා සුගතියෙහි උපදවන බැවින්, කෘෂ්ණ ශුක්ලකම්, යි වදළ උභයකම් ත්, සංසාරගමනීයකම්යෝ ය. කම්ක්ෂයකරඥානැ යි කියූ චතුර්විධමාගීඥානය, නිස්සාණගමනීය කම් යි. ඒ වනාහි, ඉදින් අකුශලකම්පක්ෂයෙහි වේ නම් කෘෂ්ණ විපාක දෙන්නේ ය. හෙවත් අපායයෙහි විපාක දෙන්නේ ය. එසේ ම කුශලකම්පක්ෂයෙහි නම්, ශුක්ලවිපාක දෙන්නේ ය. හෙවත් සුගී සමපත් දෙන්නේ ය. මෙ කී උභයවිපාකය ම නො දෙන බැවින් හුදෙක් එය නිස්සාණගාමිනීයකම්යෙහිලා ගැණේ. **'තත්‍ර භික්ඛවෙ! යම්දං කම්මං කණ්හං කණ්හ විපාකං, තස්ස පහාණාය යා චෙතනා, යම්පිදං කම්මං සුක්කං සුක්කවිපාකං තස්ස පහාණාය යා චෙතනා, යම්පිදං කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං, තස්ස පහාණාය යා චෙතනා, ඉදං වුච්චති භික්ඛවෙ! කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මක්ඛයාය සංවත්තති'** යනු දෙශනා ය.

කම්යන්ගේ කම්ානන්තරය ත්, විපාකානන්තරය ත් බුදුවරුන්ගේ අසාධාරණඥානයක් වූ කම්විපාක දන්නා ඥානයට ම විෂය වේ.

ශ්‍රාවකාදින්ට ඒ විෂය නොවේ. විදර්ශීකයොගාවචරයා විසින් දත යුත්තේ ද එකදෙශයකිනි. එ හෙයින් පොත පතෙහි ආයේ මූඛමාත්‍රයෙක් ම ය.

කර්ම කරන්නෙක් පරමාර්ථවශයෙන් නොලැබේ. විපාක විඳින්නෙක් ද, පරමාර්ථවශයෙන් නැත. විඤ්ඤන නමැති බිජුවටය, කර්ම නැමැති කුඹුරෙහි පිහිටි පසු, තෘෂ්ණා නමැති දිය වැක් කිරීමෙන් වඩනා ලද්දේ, සත්ව නැමැති මොටියෙක්, ගිරඩෙක් එයින් නැගී එයි. ඒ මුත් දිව්‍ය බ්‍රහ්ම ඊශ්වරාදින්ගේ වශයෙන් ලොකය කරන්නෙක්, සත්වයා මවන්නෙක් නැත්තේ ය. විපාක විඳින්නෙක් නැත්තේ ය. හෙතු ප්‍රත්‍යයන්ගේ බලයෙන්, ශුද්ධ ධර්මයන්ගේ පැවැත්ම වේ. කර්ම හටගෙණ එයින් ඵලය උපදවන බැවින් තනි වූ කර්මයෙහි ඵලය ත්, ඵලයෙහි කර්මය ත් නොලැබේ. විපාකයෙහි කර්මයෙක් ද කර්මයෙහි විපාකයෙක් ද නැත. මේ දෙදෙන උනුන් ශූන්‍ය වෙති. එහෙයින් කර්මයෙන් – තොර ව ඵලයෙක් නොලැබේ. සූර්‍යයා කෙරෙහි වත් මාණික්‍යයෙහි වත්, ගොම වැරටියෙහි වත් ගින්නෙක් නැත. ඔවුන්ගෙන් බැහැරක ත් ගිනි නැත. එහෙත් හෙතුබලයෙන් ගිනි හටගණී යි. එ මෙන් කර්මය තුළ, විපාකයෙක් නැත. කර්මයෙන් පිටත ද විපාකයෙක් නැත. විපාකයෙහි කර්මයෙක් ද නැත. කර්මය, ඵලයෙන් ශූන්‍ය වේ. කර්මයෙහි ඵලයෙක් නැත්තේ ය. කර්මය ඇසුරු කොට, එයින් ඵලය උපදී. මේ කිහ ගුරුහු මෙසේ:-

'කම්මස්ස කාරකෝ නත්ථි විපාකස්ස ච වෙදකෝ,
සුඛධම්මා පවත්තන්ති එවෙතං සම්මදස්සනං,
කම්මං නත්ථි විපාකම්හි පාකෝ කම්මෙ න විජ්ජති,
අඤ්ඤමඤ්ඤං උභෝ සුඤ්ඤා න ච කම්මං ඵලං විනා,
යථා න සූරියෙ අග්ගි න මණ්ඩිකා න ගොමයෙ,
න තෙසං බහි සෝ අත්ථි සම්භාරෙහි ච ජායති,
තථා න අඤ්ඤා කම්මස්ස විපාකෝ උපලබ්භති,
බහිද්ධාපි න කම්මස්ස න කම්මං තත්ථ විජ්ජති,
ඵලෙන සුඤ්ඤකං කම්මං ඵලා කම්මෙ න විජ්ජති,
කම්මං ච බෝ උපාදාය තතෝ නිබ්බත්තතී ඵලා' යි.

අතීතකර්මය හෙතුකොට හටගත් සන්තතියෝ, එහිදී ම නිරුඬ වූහ. අතීතකර්මහෙතුවෙන් අතීතසන්තතියන්ගෙන් අන්‍ය වූ ම සන්තතියෝ, මේ භවයෙහි උපන්නාහ. අතීතභවයෙන් වර්තමාන භවයට ආ එක ම ධර්මයෙක් වත් නැත්තේ ය. මෙහි රැස් කරන්නා වූ කර්මයන්ගේ හෙතුවෙන් හටගත් සන්තතියෝ, මෙහි ම

නිරුඬ වෙති. පුනර්භවයෙහි පහළ වන්නෝ, මෙයින් අන්‍ය වූ සකර්‍මිකයෝ ය. වර්‍තමානභවයෙන් පුනර්භවයට එක ධර්‍මයෙකුත් නො යන්නේ ය. ගුරුවරයාගේ මුඛයෙන් හැදෑරීම අතවැස්සාගේ මුඛයට ඇතුල් නො වේ. එහෙත් අතවැස්සාගේ මුඛයෙහි හැදෑරීම නො පිහිටිනුයේ නො වේ. පිහිටන්නේ ය. දූතයා විසින් පානය කළ මනෝදුකය රොගියාගේ කුස තුළට නො යේ. එහෙත් ඒ හෙතුවෙන් ඔහුගේ රොගය නො සංසිඳෙන්නේ නො වේ. එක් පහන් වැටියෙක පහන් සිළ අන් පහන් වැටියකට මාරු නො වතුදු, එහි ඒ හෙතුවෙන් පහන් සිළක් නො හටගන්නේ නො වේ. ඒ පරිද්දෙන් අතීතභවයෙන් මේ භවයට ත් මේ භවයෙන් පුනර්භවයට ත් කිසි ධර්‍මයෙක් එන්නේත් යන්නේ ත් නො වේ.

ලොකයෙහි සත්වයන්ගේ උස් පහත්කම් වනුයේ, කර්‍මශක්තියෙන් ම ය. ඒ නිසා ම සත්වයන් අතර සමානබවෙක් ඇතිවිය නො හැකි වේ. එක් එක් සත්වයා විසින් රැස් කරණ සකස් කරණ කර්‍ම, සමාන නො වීම මෙයට කරුණු ය. කර්‍මනානාත්වය ම සත්වයන්ගේ නානාභාවයට, උසස් පහත් වශයෙන් බෙදී යෑමට හෙතු වන බව, **'කම්මස්සකා මාණව! සත්තා කම්මදායාද කම්මයෝනි කම්මබන්ධු කම්මපටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය'** යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

සතුන් මරණුයේ මරණින් මතු නිරයෙහි උපදියි. මිනිසත් බව ලැබුයේ, මද ආයු ඇත්තේ වේ. සතුන් නො මරණුයේ, මරණින් මතු දෙව් ලොව උපදියි. මිනිසත් බව ලැබුයේ, බොහෝ ආයු ඇත්තේ වේ. සත්නට හිංසා කරණුයේ, නිරයෙහි උපදියි. මිනිසත් බවට ආයේ, බොහෝ ලෙඩ ඇත්තේ වේ. හිංසා නො කරණුයේ, දෙව්ලොව උපදියි. මිනිසත්බවට ආයේ, ලෙඩ නැත්තේ වේ. කිපියේ නිරයෙහි උපදියි. මිනිසත්බවට ආයේ, දුර්‍වර්‍ණ වේ. නො කිපියේ, දෙව්ලොව උපදියි. මිනිසත්බවට ආයේ, වර්‍ණවත් වෙයි. ඊර්‍ෂ්‍යා කරණුයේ, නිරයෙහි උපදියි. මිනිසත්බවට ආයේ, පිරිවර නැත්තේ වේ. ඊර්‍ෂ්‍යා නො කරණුයේ, දෙව්ලොව උපදියි. මිනිසත්බවට ආයේ, පිරිවර ඇත්තේ වේ. මසුරුමලින් බැඳී, දීමෙහි විපාක නැතැයි නො දෙනුයේ, නිරයෙහි උපදියි. මිනිසත්බවට ආයේ, දුප්පත් වේ. කර්‍මඵල අදහා දෙනුයේ, දෙව්ලොව උපදියි. මිනිසත්බවට ආයේ, පොහොසත් වේ. මානයෙන් දැඩි වූයේ, පිදියයුත්තන් නො පුදනේ, වැඳියයුත්තන් නො වඳනේ, නිරයෙහි උපදියි. නැසූ මාන ඇතියේ පිදිය යුත්තන් පුදනේ, වැඳියයුත්තන් වඳනේ, දෙව්ලොව උපදියි. මිනිසත් බවට ආයේ, උසස් කුල ඇත්තේ වේ. කුසල් අකුසල් වරද

නිවරද නො විමසනුයේ, පව්කම් කොට නිරයෙහි උපදියි. මිනිස් ලොව උපන්නේ, නුවණ නැත්තේ වේ. කුසල් අකුසල් වරද නිවරද විමසනුයේ, වරදින් වෙන් ව පින්කම් කොට දෙව්ලොව උපදියි. මිනිසත්බව ලැබුයේ, නුවණැත්තේ වේ.

කම් රැස් කරණ කාලයෙහි යමෙකුගේ ලොභය බලවත් වූයේ ද, අලොභය මද වූයේ ද, අදෙසඅමොහයෝ බලවත් වූවෝ දෙස මොහයෝ මද වූවෝ වෙත් ද, මද වූ අලොභය බලවත් වූ ලොභය මැඩලීමෙහි අපොහොසත් වේ. බලවත් වූ අදෙස අමොහයෝ මද වූ දෙසමොහයන් මැඩලීමෙහි පොහොසත් වෙති. එ හෙයින් හෙතෙමේ ඒ කම්යෙන් ලත් ප්‍රතිසන්ධි ඇත්තේ ලොභ ඇත්තේ ත් සුඛසවභාව ඇත්තේ ත් වේ. ක්‍රොධ නැත්තේ ත් නුවණැත්තේ ත් වේ.

යමක්හට වනාහි ලොභදෙසයෝ, බලවත් වූවෝ වෙත් ද, අලොභ අදෙසයෝ, මද වූවෝ වෙත් ද, අමොහය බලවත් වූයේ මොහය මද වූයේ වේ ද, හෙතෙමේ පෙර සේ ලොභ ඇත්තේ දෙස ඇත්තේ ත් නුවණැත්තේ ත් වේ.

යමක්හට වනාහි ලොභඅදෙසමොහයෝ, බලවත් වූවෝ, අන්‍යයෝ මද වූවෝ වෙත් ද, හෙතෙමේ යට කී සේ ලොභ ඇත්තේ ත් නුවණ නැත්තේ ත් සුඛසවභාව ඇත්තේ ත් ක්‍රොධ නැත්තේ ත් වේ.

යමක්හට වනාහි ලොභදෙසමොහයෝ, බලවත් වූවෝ, අලොභාදීහු මද වූවෝ වෙත් ද, හෙතෙමේ ලොභී වූයේ ත් දුෂට වූයේ ත් මුස වූයේ ත් වේ.

යමක්හට වනාහි අලොභදෙසමොහයෝ, බලවත් වූවෝ, අන්‍යයෝ මද වූවෝ වෙත් ද, හෙතෙමේ උපන්නේ මද කෙලෙස් ඇත්තේ ත් නො සැලෙනුයේ ත් අදුෂට වූයේ ත් මද නුවණැත්තේ ත් වේ.

යමක්හට වනාහි අලොභඅදෙසමොහයෝ, බලවත් වූවෝ, සෙස්සෝ මද වූවෝ වෙත් ද, හෙතෙමේ උපන්නේ ලොභ නැත්තේ ත් සුඛ සවභාව ඇත්තේ ත් නුවණ නැත්තේ ත් වේ.

යමක්හට වනාහි අලොභදෙසඅමොහයෝ, බලවත් වූවෝ, සෙස්සෝ මද වූවෝ වෙත් ද, හෙතෙමේ උපන්නේ ලොභ නැත්තේ ත් නුවණ ඇත්තේ ත් දුෂට වූයේ ත් ක්‍රොධ ඇත්තේ ත් වේ.

යමක්හට වනාහි අලොභාදීහු තිදෙන බලවත් වූවෝ, ලොභාදීහු තිදෙන මද වූවෝ වෙත් ද, හෙතෙමේ ලොභ නැත්තේ අදුෂට වූයේ ත් නුවණැත්තේ ත් වේ.

මෙසේ ලොභාදීහු සඳෙන, කර්මයන්ගේ නානාත්වයට ත් කර්ම නානාත්වය සත්වයන්ගේ නානාත්වයට ත් කරණු වෙති. මෙහිලා **'තිහෙතුකං කම්මං ති තිහෙතුකම්පි දුහෙතුකම්පි අහෙතුකම්පි විපාකං දෙති'** යනාදීන් එන හෙතුකිර්තනය ද විසතර කැමැත්තන් විසින් අනික් බණ පොතින් දත යුතු ය.

මොවුහු එකාන්ත සිඩිහු ය. මේ වෙනස දෙවියෙක්, බ්‍රහ්මයෙක්, ඊශ්වරයෙක් නොද කරන්නේ ය. කරණු ලබනුයේ කර්මය විසිනි. තමාගෙන් අන්‍ය වූ කරන්නෙක් විඳින්නෙක් නැත. කරණුයේ ත් විඳිනුයේ ත් තෙමේ ම ය.

කියූ පරිදි කර්මය අහොසිහාවයට නොගියේ නම්, ඒ කොතැනෙක දී නමුත් විපාක දෙන්නේ ය. එය දෙවියන් යැදීමෙන් බලිතොවිලෙන් යාගහෝමයෙන් වළකනු බැරි ය. කළකම් ඇත්තේ කොතැන සිටියේ ද, කර්මය ඔහු කරා එන්නේ ය. වසුපැටි තෙමේ සිය මවු දෙන, දෙතුන් දහසක් අතර සිටියා ද, වහා හඳුනා ගෙණ මවු දෙන ම කරා යයි. එමෙන් කර්මය ත් තම් කළහු කරා ම විපාක වාරය බලා වහා එයි.

අප බුදුරජුන් දවස සැවැත්නුවර අසල ගමෙක් ඉත්නෙන් මුළුමනින් දැවී ගියේ ය. ගිනිදැල් සහිත වූ තණහුලෙක් ඉන් නැගී ගොස් අහස යන කපුටකුගේ බෙල්ලෙහි දැවටී කපුටා දවා බිම හෙලී ය. මේ කපුටා යටගිය අත්බවෙක මිනිසෙක් ව උපන්නේ තමන් වෙත සිටි කුළු ගොනකු හික්මවා ගත නොහී බෙල්ලෙහි පිදුරු ඔතා ගිනි තැබී ය. ගොනා මළේ ය. ඒ දුබි පාපකර්මයෙහි සුලු විපාකයක් වශයෙන් කපුටු ව උපන් අත්බවෙහි අහස පියාඹා යනුයේ ද' ඉන්නෙන් දැවී මළේ ය. තමන් පෙර කළ ඒ කර්මයට සරිලන විපාකයෙක් එදා ඔහුට ලැබුනේ ය. එයට පෙර අත්බවිහි නිරයෙහි ඉපිද නිරය දුක් විඳ්දේ ය. මේ වනාහි කර්මනියාමය යි. කළ කර්මයට අනුරූප වූ විපාක දීම කර්මනියාමය යි. දතයුතු ය. **'තස්ස තස්ස කම්මස්ස තං තං සදිසවිපාකදානමෙව කම්ම නියාමෝ නාම,** යි ඒ කීහ බීජනියාම- උතුනියාම- කම්මනියාම- ධම්මනියාම- චිත්තනියාම යි නියාමඛණ්ඩ පසෙකි.

මෙසේ කර්මයෙන් විපාකයෝ වෙති. විපාකය කර්මයෙන් හට ගණී යි. එහෙයින් නැවැත නැවැත භවයෙහි ඉපදීම වේ. ලෝකය පවත්නේ මෙසේ ය. එය මෙසේ ව්‍යක්ත ය.

'කම්මං විපාකා වත්තන්ති විපාකෝ කම්මසම්භවෝ,
තස්මා පුනබ්භවෝ හොති එවං ලොකෝ පවත්තති'

මෙසේ කරණ ලද කර්මයට අනුරූප ව විපාක ලැබෙන බව ත්, සත්වයන් අතර පවත්නා උස් පහත් කර්මවලට ප්‍රධාන හෙතුව තම තමන් කළ කර්මය බවත්, භවයෙහි නැවැත නැවැත ඉපැත්ම කර්මශක්තියෙන් වන බව ත් දැන, කර්ම රැස් කිරීමෙහි දී පරීක්ෂාකාරී ව කුශල කර්ම ම රැස් කළ යුතු ය.

කම්මං, යන්නට **පාපකං**, යන්නක් විශෙෂණ ව සිටි බැවින් මෙහි අකුශලකර්ම කොඨාශය ම ගැණේ. එහෙත් මෙහි කර්මය විස්තර කරණ ලද්දේ කුශලාකුශලකර්ම දෙපක්ෂයට ම සාධාරණ ලෙසිනි. එහෙයින් මෙහි දී අකුශලකර්ම පක්ෂය දතයුතු ය.
යං = යම් අකුශල කර්මයෙක්.

කටුකඵලං = කර්කශ වූ විපාක ඇත්තේ.

අකුශලකර්මය, කටුක දුක්විපාක ඇත්තෙකි. අකුශල කර්මය තරම් රුදුරු දුක් දෙන්නෙක් ලොකයෙහි කොතැන ත් නැත. 'පව් කරමින් ජීවත්වීමට වඩා මිය යෑම යහපති' යි වදලෝ එහෙයිනි. මහාදුක්ඛක්ඛන්ධ – දෙවදූතාදිසූත්‍රයෝ මේ බව මැනැවින් පැහැදිලි කරත්.

පව්කම් කරණ්‍යේ තමාට ම සතුරු ය. ඔහුට, පව් කරණ තමාට වඩා අන් සතුරෙක් නැත. සතුරකු විසින් කළ හැක්කේ මේ ලොවෙහි දී පමණක් කළ හැකි නපුරෙකි. තෙමේ තමාට සතුරු වූයේ නම්, ඔහු තමාට දෙලොවින් ම මහත් විපත් සිදුකර ගණී යි. අපායයෙහි දුක්වලට හිමි වන්නේ ය. සසරින් නිදහස්වීම ඇත් වන්නේ ය. තමා කළ වරදින් අජාසත් රජුට සසර දික් විය. මේ නිසා බුදුරජාණන් වහන්සේ අකුසල් කරණ මිනිසාට තෙමේ ම සතුරු යි වදළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය.

සුප්‍රබුද්ධකුෂ්ඨිවස්තුව නිමියේ ය.

මුදල් පොදියක්

5 – 8

දිනෙක එක්තරා ගොවියෙක් සැවැත්නුවර අසල කුඹුරක් සාමින් සිටියේ ය. ඒ දිනට පළමු දා රත්‍රි, සොරු සමූහයෙක් දිය සොරොව්වකින් නුවරට ඇතුල් ව, ධනවතකුගේ ගෙට උමඟක් කැන, ඒ උමඟින් ගෙට ඇතුල් ව, ගෙයි තුබූ බොහෝ රන් රිදී මුතු මැණික් ආදී වූ වටිනා වසතුරාශියක් පැහැර ගෙණ, දිය සොරොව්වෙන් ම නික්ම ගියෝ ය. උන් අතර සිටි එක් සොරෙක් අනික් සොරුන් රවටා දහසක් බැඳි පොට්ටනියක් ඔඩොක්කුවෙහි ලා ගත්තේ ය. සියල්ලෝ ම සානා කුඹුර ලඟට ගොස්, එහිදී ඒ ගත් අනික් බඩු බෙදා ගත්හ. දහසකින් බැඳි පොට්ටනිය ඉණ නබා ගත් සොර තෙමේ ඉණ තුබූ පොට්ටනිය බිම වැටුන ද, ඒ නොදැන එ තැනින් නික්ම ගම් බලා ගියේ ය. එ දවස සම්මා සම්බුදුරජානන් වහන්සේ අලුයම් වේලෙහි ලොව බලා වදරන සේක්, ඒ ගොවියා දැන 'ඔහුට කුමක් වන්නේ දැ' යි විමසන සේක් 'මේ ගොවියා උදැසන ම සී සාන්නට යන්නේ ය, බඩු අයිතිකාරයෝ ත් සොරුන් අඹිපාරේ ගොස් දහසක් බැඳි පොදිය දැක, සොරා මොහුය, සී අල්වා ගෙණ කඩි බාන්නෝ ය, මොහුට මා හැර මොහුගේ නිදහස ගැණ කරුණු කියන වෙනෙකෙක් නැත, සෝවන් පලයට පැමිණීමේ වාසනාවක් මොහුට තිබේ, එහෙයින් මා එහි යා යුතු ය' යි දැන වදාළ සේක. ගොවියා උදැසන ම සී සාන්නට කුඹුරට ගියේ ය. සර්වාඥ බුදුරජානන් වහන්සේ ආනන්ද සථවිරයන් වහන්සේ සමඟ එහි වැඩි සේක. ගොවියා බුදුරජුන් දැක, වෙත ගොස් වැඳ, නැවැත සී සාන්නට පටන් ගත්තේ ය. බුදුරජානන් වහන්සේ ද ඔහු සමඟ කිසිත් කතා නොකොට මුදල් පොදිය වැටී තුබුනු තැනට වැඩමවා ඒ දැක 'ආනන්ද! බලන්න! සජීයෙකැ'යි වදාළ සේක. ආනන්ද සථවිරයන් වහන්සේ ද 'එසේ ය සර්වාඥ! දකිමි, සොරවිස ඇති සජීයෙකැ' යි කිහ. ගොවියා ඒ කතාව අසා, මා වේලාවෙහි ත් අවේලාවෙහි ත් හැසිරෙන, මෙ තැන සජීයෙක් සිටී' යි සිතා 'හොඳයි! බුදුරජානන් වහන්සේ වැඩියා වේ, එතකොට වැඩේ කරන්නෙමි' යි කෙවිට ද ගෙණ එහි ගියේ මුදල් පොදිය දැක, 'බුදුරජුන් වදාළේ මේ ගැණය' යි සිතා ඒ ගෙණ නැවතී කසින්නට පටන් ගත්තේ ය. ගෙවැස්සෝ ද පාන් වූ කල්හි සොරුන් ගේ බිඳ ගෙයි තුබූ බඩු ගෙණ ගිය බව දැක සොරුන් පැනගිය අත

බලා ඔවුන්ගේ අඩිපාරේ යන්නෝ, ඒ කුඹුර ලඟට පැමිණිය හ. එහි සොරුන් බඩු බෙදූ තැන දැක, එහි වඩා ත් විමසන්නෝ, ගොවියාගේ පා සටහන් දැක, ඒ අනුව ගොස්, මුදල් පොදිය තුබූ තැනට පැමිණ, පස් දෙපැත්තට කොට බලා පොදිය නගාගෙණ 'තෝ අපේ ගෙය පැහැර ගෙණ අවුත් සී සාන්නකු මෙන් හැසිරෙහි' යි තර්ජනය කොට අතින් පයින් දඬු මුගුරුවලින් තළා පෙළා රජු ඉදිරියට ගෙණ ගියහ. රජ තෙමේ තොරතුරු අසා, ඔහු මැරීමට අණ කෙළේ ය. රාජපුරුෂයෝ පිට හයා බැඳ කසවලින් තළ තළා පෝරකයට පැමිණ වූහ. මෙසේ කසවලින් තළත් තළ ත්, ඔහු අන් කිසි ත් නො කියා 'ආනන්දය! බලන්න සර්පයෙක, එසේ ය, ස්වාමීනි! දකිමි, සොර විස ඇති සර්පයෙකැ' යි කිය කියා යන්නේ ය. රාජ පුරුෂයෝ ඒ අසා 'තෝ බුදුරජුන්ගේ ත් අනඳ තෙරුන්ගේ ත් කතා කියන්නෙහි ය, මේ කියන කතාව කිමැ' යි ඇසූහ. ගොවියා 'රජු දැක රජු ඉදිරියෙහි ම කියන්නෙමි' යි කී කල්හි නැවැත ත් රජු වෙතට ගෙණ ගොස් ගොවියා කියන කතාව රජුට කීවාහු ය. රජ තෙමේ 'කුමක් හෙයින් මෙසේ කියන්නෙහි දැ' යි ඇසී ය. ඔහු 'දෙවයන් වහන්ස! මම හොරෙක් නො වෙමි' යි සී සාන්නට ගිය තැන් පටන් සියලු තොරතුරු දන්වා සිටියේ ය. රජ තෙමේ ඔහුගේ කතාව අසා 'ඕය්'! මෙතෙමේ බුදුරජුන් තමන්ගේ සාක්කිකාරයා හැටියට ඉදිරිපත් කෙරෙයි, මොහුට වධ පැමිණවීම නො සුදුසුය, හොඳ යි, මම මෙ ගැණ සොයා බලන්නෙමි, යි කියා ඔහු ත් සමග සවස්වේලෙහි බුදුරජුන් වෙත ගොස් 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හාමුදුරුවනු ත් සමග මේ ගොවියා සී සාන තැනට වැඩි සේක් දැ' යි ඇසී ය. 'එසේ ය, මහරජ! මම ගියෙමි යි, බුදුරජුන් වදාළ කල්හි 'ස්වාමීනි! එහිදී කිසිවක් දක්නා ලද දැ, යි නැවැත ඇසී ය. 'මහරජ! දහසක මුදල් පොදියක් දක්නා ලදැ, යි වදාළ සේක. නැවැත රජු එය දැක කුමක් වදාළ සේක් දැ' යි ඇසූවිට 'මෙසේ කීවෙමි' යි වදාළ සැටි වදාළෝ ය. 'ස්වාමීනි! මේ ගොවියා තථාගතයන් වහන්සේ වැන්නකු ම සාක්කි කාරයා කොට නො දැක්වී නම්, දිවි නො ලබන්නේය, එහි දී තථාගතයන් වහන්සේ වදාළ වචනය ම කී නිසා මොහු දිවි ලැබී ය' යි රජු දැන් වූ කල්හි, ස්වාමිදරු වූ බුදුරජානන් වහන්සේ 'මහරජ! එසේ ය; මම ත් ඔය ටික සිතා ගියෙමි, නුවණැත්තහු විසින් යමක් කොට, නැවැත ඒ ගැණ පසුතැවිලි වේ නම්, එබඳු දේ කිරීම නො සුදුසු ය, එබඳු දේ නො කළ යුතු ය, යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්ම දෙශනාව කළ සේක:-

න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති,
යස්ස අස්සුමුඛෝ රොදං විපාකං පටිසේවතීති.

යම් කර්මයක් කොට පසු තැවේ ද, යම් කර්මයක්හුගේ විපාකය කඳුලින් වැකුණු මුහුණු ඇති ව අඬමින් විඳී ද, ඒ කර්මය කරණ ලද්දේ නම් නො මැනැවි.

න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති = යම් කර්මයක් කොට පසු තැවේ ද, ඒ කර්මය කරණ ලද්දේ නම් නො මැනැවි.

යස්ස = යම් කර්මයක්හුගේ.

මින් ගැණෙනුයේ අකුශලකර්ම යි. අකුශලකර්ම සිහිවන විට ය කඳුලු වැගිරෙනු යේ. ඒ දුක් කඳුලු ය. සතුටෙහි ද කඳුලු වැගිරේ. ඒ මේ නො වේ. පරපණ නැසීම් අන්සතු දෑ ගැණීම් මිස හැසිරීම් ආදි වශයෙන් සත්වයන් විසින් කරණ කර්ම, අපායයෙහි දරුණු දුක් දෙන බැවින්, ඒ කර්ම ම කඳුලු වැගිරීමට කරුණු වේ.

අස්සුමුඛෝ = කඳුලින් වැකුණු මුණු ඇත්තේ. කඳුලින් පිරුණු මුණු ඇත්තේ.

'අස්සූහි තින්නං මුඛං යස්ස = සෝ, අස්සුමුඛෝ' මුණ කඳුලින් තෙම් ගියේ **අස්සුමුඛ'** නම් වේ. තනි **අස්සු**, ශබ්දය නිපාතයක් ආඛ්‍යාතයක්, නාමයක් වශයෙන් ව්‍යවහාරයෙහි එයි. **'නාස්සුධ කොචි භගවතානං උපසංකමති'** යන මෙහි යෙදුනේ නිපාතයක් ලෙසින් ආයේ ය. **'නාස්සුධ තෙ ආගතා'** මෙහි වූයේ ආඛ්‍යාතයක් වශයෙනි. **'අස්සු පරිගහකෙන පන යොගිනා අකනිකුපෙ පූරෙත්වා ඨිතවසෙනෙව පරිගණ්හිතබ්බං'** මෙහි වූයේ නාමයක් ලෙසටය. අස්සුමුඛෝ' යන්නෙහි ද එසේ ය. යම් තැනක් කරණ කොට යම් තැනක් නිසා හිත සුඛය පවතී නම්, එ තැන මුඛ ශබ්දයෙන් කියැ වේ. **'හිත සුඛං මුඛති පවත්තතති නි = මුඛං'** යනු අභිවිවරණය යි. බාහිරීය ප්‍රධාන වශයෙන් ගෙණ එසේ කීයේ ද, හොඳ නො හොඳ දෙකට ම වැඩ ඇවැඩ දෙකටම හිත අහිත දෙකට ම මුඛය හෙතු වේ. සුභාසිත දුබ්භාසිත දෙක ම මුඛයෙන් නිකුත්වන බැවිනි. සුභාසිතය හොඳට ත් හිතයට ත්, දුබ්භාසිතය නො හොඳට ත් අහිතයට ත් එකසේ හෙතු ය. මෙය ප්‍රධාන, හෙතු, වදන යන ඈ අරුත් කිය යි. මෙය බලනු මැනැවි. දුභාෂිත **පක්ෂ** යෙහිලා :-

'පුරිසස්ස හි ජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ,
යාය ඡින්දති අත්තානං බාලෝ දුබ්භාසිතං භණෙ' යනු.

මෙලොව පරලොව නො දන් අඥ තෙමේ දුබැසි බෙණෙමින් යමකින් තමා නසා ගණී ද, උපන් එබදු මිනිසාගේ මුවෙහි ඒ තමා නසන කෙවේරිය හට ගණී යි, යනු එහි අරුත් ය.

එසේ ම යමෙක්, යම් නුවණැත්තෙක් නිතර සුබැසි බෙණෙන්නේ නම්, ඔහු එලොව මෙලොව දෙක්හි ම සැපයට පැමිණෙන්නේ ය. සැප විඳින්නේ ය. ලොකිය මහා ජනයාහට ප්‍රියයෙක් වන්නේ ය.

රුදං = හඬන්නේ. (හඬමින්)

මෙහි මූලය **රුදනා**, යනු ය. මෙය විභක්ති විසින් ප්‍රථමා ය. වචන විසින් එක වචන ය. හඬන්නෙක් කිය වේ.

විපාකං = ඵලය. විපාකය.

කම්බලයෙන් පහළවන නාමරූපධම්, විපාක නම් වේ. මන් තෙහි ඇතිවන භව – විඤ්ඤාණ – නාමරූප – සළායතන – ඵස්ස – ජාති – ජරා – මරණ යන මොවුහු සසර වසන සත්වයන් විසින් කරණු ලබන කර්මයන් ගේ විපාකයෝ ය. එසේ ම ඒ ඒ භව–යෙහි ඒ ඒ කම් ලෙසින් උපදින සත්වයන් විසින් කර්මානුරූප ව විඳිනු ලබන්නා වූ සැප දුක් ද විපාක වේ. උස් පහත් කම් ද විපාක යි. විස්තර යට කියන ලදී.

පටිසෙවති = අනුභව කරයි. විඳි යි.

අතිශයින් විඳියි, නැවැත නැවැත විඳියි, කිවද වරද නැත තමන් විසින් කළ යම් කර්මයක්, සිහිකළ හැම විටක ම තැවීමට ශොක වීමට කරුණු වේ ද, කඳුලින් තෙමුනු මුණු ඇති ව හඬමින් එහි විපාකය විඳිය යුතු වේ ද, එබදු කර්ම කරණ ලද්දේ යහපත් නො වේ. එහෙයින් එබදු කම් නො කළ යුතු ය යි වදාළ සේක.

ධම්දෙශනාවගේ අවසානයෙහි ගොවියා සෝවන් ඵලයට පැමිණියේ ය. එහි පැමිණ සිටි භික්ෂූන් වහන්සේලා ද සෝවන් ඵලාදියට පැමිණියෝ ය.

කණ්ඨකවත්ථුව නිමියේ ය.

පිණ එකෙණෙහි විපාක දෙන හැටි

5 — 9

අප බුදුරජුන් දවස සුමන නම් මල්වඩම් ගොතන්නෙක් විය. ඔහු දින පතා උදැසන ම බිම්සර මහ රජුට සමන්මල් අට නැළියක් ගෙණ ගොස් දී කහවණු අටක් ලබා ගණී සි. දිනෙක ඔහු මලු ත් ගෙණ නුවරට වත් කල්හි සර්‍වාමිදරු වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ මහණ ගණයා පිරිවරා ගෙණ ඡබ්බණ්ණසනබුඩරශ්මිය විහිදුවමින් මහත් වූ බුඩානුභාවයෙන් පිඬු පිණිස නුවරට පිවිසියහ. සමහර කලෙක, උන්වහන්සේ අහුල් මල් තෙරුන්ගේ ඉදිරියට තුන් යොදුන් මඟ ගෙවා ගිය ගමන් සේ සවණක් රැස් සිවුරෙන් වසා, පිඬු සිහා යන එක්තරා භික්‍ෂු නමක් සේ වඩින සේක. සමහර කලෙක, කිඹුල්වත් පුරයට වැඩම කළ සේ, සවණක් රැස් විහිදුවමින් වඩින සේක. මෙ දවස ද උන්වහන්සේ බුදුසිරුරින් බුදුරැස් විහිදුවමින් මහත් වූ බුඩානුභාවයෙන් හා මහත් වූ බුඩලීලාවෙන් රජගහනුවරට වැඩියාහ. සුමන මාලාකාර තෙමේ ද, අතරමග සිටියේ රුවන් ඇඟෑ රන් ඇඟෑ ලෙසින් සැදුනු දෙතිස් මහා පුරිස් ලකුණෙන් හා අසූවක් පමණ කුඩා ලකුණෙන් බබලන බුදුරජුන්ගේ සිරුර දැක, පහන් සිත් ඇත්තේ 'නවර නම් සතකාරයක් කරම් දැ'යි සිතා අනිකක් නො දක්නේ 'මේ මලින් බුදුරජුන් පුදන්නෙමි' යි ද කල්පනා කොට නැවැත 'මේවා රජුට ගෙණ යන මල් ය, මේවා, රජුට ගෙණ ගොස් නො දුන්නෙම් නම්, මා සිරගෙයි ලන්නේ ය, මරවන්නට හෝ රටින් පිටිවහල් කරවන්නට හෝ බැරි නැත, කුමක් කරම් දැ' යි සිතූයේ ය. 'හා කුමක් හෝ වේවා, කමක් නැ, මා මැරුව ත් සිරගෙයි ලැව ත්, රටින් පිටිවහල් කළත්, හොඳට ම දුන්න ත් රජතුමන් මට දෙන්නේ මෙ ලොව යම්තමකින් ජීවත්වීමට සැහෙන මුදල් ටිකක් ය, මේ මල් බුදුරජානන් වහන්සේට පිදුවොත් එය මට නොයෙක් කෙළ ගණන් කප්හි හිතයට ත් සැපයට ත් පමණ වන්නේ ය' යි සිතා සිය දිවිය පළමු කොට පුදා නැවැත 'මාගේ මේ පහන් සිත පසු බසින්නට අන් අතකට පෙරළෙන්නට කලින් මල් පුදන්නෙමි' යි සිතා, තුටු පහටු වූයේ පළමු කොට මල් මිටි දෙකක් ගෙණ බුදුරජුන් හිස මතට විසි කෙළේ ය. ඒ මල් මිටි දෙක බුදුරජුන් මත්තෙහි වියනක් සේ සිට ගත. ඉනික්බිති තවත් දෙමිටක් විසි කෙළේ ය. ඒ දකුණත් පස මල් තිරයක් සේ සැදී සිට ගත. තවත් දෙමිටක්

දුම් ය. ඒ දෙමිට බුදුරජුන්ගේ පිටිපස මල් තිරයක් සේ බැස සිටියේ ය. නැවැත අනික් දෙමිටක් ද දුම් ය. ඒ දෙමිට වම් පසින් බැස තිරයක් සේ සිට ගත්තේ ය. මෙසේ මල් අට නැළිය, අටමිටක් කොට පිදූයේ බුදුරජුන් වට කොට සතර තැනෙක පිහිටියේ ය. ඉදිරිපස වඩනට පමණින් දෙරකඩ පිළියෙල විය.

මාගේ සවාමිදරුවානෝ රිදීපටකින් වට කරණ ලද්දහු සේ ඉදිරිය බලා වැඩි සේක. සිත් පිත් නැති මල් වුව ද සිත් පිත් ඇති බුදුරජුන් නිසා සිත් පිත් ඇත්තා සේ නොබිඳී නොහැලී බුදුරජුන් සමග ම ගමන් ගණී යි. සිවින කල්හි සිවී යි. බුදුරජුන්ගේ ශ්‍රී ශරීරයෙන් සවන් රැස්, විදුලි ගසන්නාක් සේ විහිදෙයි. ඉදිරි පසින් පිටිපසින් දකුණු පසින් වම් පසින් හිස් මුදුනෙන් නිකුත් රැස්, හමු හමු වූ අතින් නොගොස් සියල්ල එකතු ව බුදුරජුන් නෙවරක් පැදකුණු කොට තරුණ ලොකු තල් කදක් පමණ වී ඉදිරි පසින් දුවයි. මුළුනුවර ඇලලී ගියේ ය. එ දවස රජගහ නුවර ඇතුලෙහි නව කෙළක් ද, පිටත නව කෙළක්ද යි අටලොස් කෙළක් මිනිස්සු වාසය කළහ. ඒ අටලොස් කෙළක් මිනිසුන් අතරෙහි එක් ම ගෑණියක් එක් ම පිරිමියෙක් කැ යුතු දෙයක් ගෙණ නොඅයේ නොවී ය. මහාජන තෙමේ, මහත් සේ නාද කරමින් දහස් ගණන් පිළි හිස සිසාරමින් බුදුරජුන් ඉදිරියෙහි දිගට ගමන් ගත් පෙරහැරක් සේ සැදී ගමන් කර යි. සවාමිදරු වූ බුදුරජානන් වහන්සේ මල් කරුවාගේ ගුණ ප්‍රකට කොට කියනු කැමැති සේක්, තුන් ගවු පමණ නුවර රජ මාවතෙහිම වඩින සේක. මල්කරු, මහත් ප්‍රීතියෙන් පිරිතිරී ගියේ ය. ඔහු බුදුරජුන් සමග ටික දුරක් ම ගොස් සිරියෙල් කල්කයෙක ගැලී ගියා සේ බුදු රැස්හි ගැලී බුදුරජුන් ගුණ කියමින් වඳිමින් පුදමින් හිස් පසැත් ගෙණ සිය ගෙට ගියේ ය. එකල ඔහුගේ බිරිඳ 'පැසෙහි ලා-ගෙණ ගිය මල් කොහි දැ' යි ඇසූ ය. 'මා ඒ මල් බුදුරජුන්ට පුදන ලදැ' යි ඔහු කී ය. 'රජුට කරන්නේ කුමක් දැ' යි ඇසුවිට, 'දැන් කරන්නට දෙයක් නැත, රජ මා මැරුව ත් හොඳයි, සිරගෙයි ලැව ත් මොක ද, රටින් පිටුවහල් කළ ත් කමක් නැත, මාගේ ජීවිතය මම බුදුරජුන්ට පූජා කෙළෙමි, ඊට පසු ගෙණ ගිය මලුත් අට මිටක් කොට පිදීමි, අන්න! දැන් එහි මහාපූජාවක්; මහා ජන තෙමේ එකතු ව දහස් ගණන් ඔල්වර හඬ දෙමින් බුදුරජුන් සමග ම ගමන් ගෙණ සිටී යි, මේ ඇසෙන හඬ එහි රැස් ව සිටින මහාජනයාගේ ය' යි මහත් ප්‍රීතියෙන් කියා සිටියේ ය.

ඒ ඇසූ ඔහුගේ නුවණ මද බිරිඳ, මේ මහත් පෙළහරෙහි සතුට නොදක්වා බැණ වැදී නින්දා කොට 'රජවරු බොහෝ

වණ්ඩය හ, කිපියා වූ රජවරු එක්වරට ම වග තුග නො විමසා අත් පා සිඳවීම් ආදියෙන් බොහෝ අවැඩ කෙරෙත්, ඔය කළ වැඩෙන් මට ත් වන්නේ නපුරෙකැ' යි පුතුනු ත් වඩා ගෙණ රජමාලිගාවට ගියා, රජු විසින් ඉදිරියට පමුණුවා 'කුමක් නිසා දරුවනු ත් වඩා ගෙණ මෙහි ආවා දැ යි අසන ලද්දී, 'දේවයන් වහන්ස! මේ ලමයින්ගේ පියා නුඹවහන්සේට පිළිගත්වන්නට ගෙණ ආ සමන් මල් මග දී බුදුරජුන්ට පුදා හිස් අතින් ගෙදර ගියේ, 'මල් කොහි දැ; යි මා ඇසූ විට 'බුදුරජුන්ට පූජා කරණ ලදැ' යි කී ය, මම ඔහුට වගපල කියා 'ඔහේ කළ මේ වැඩෙන් අප කාටවත් වන්නේ මහත් නපුරෙකැ' යි ඔහු හැර දමා දෙවයන් වහන්සේගේ පිහිට පතා මෙහි පැමිණියෙමි' යි කියා, නැවැත 'දෙවයන් වහන්ස! අපේ එක්කෙනා කළ වැඩේ හොඳ හෝ වේවා, නරක හෝ වේවා, මට කරන්නට දෙයක් නැත, මා ඔහු අත් හළ බව දැන වදාරන්නැ' යි කියා සිටියා ය. බුදුරජුන් දුටුදා ම සෝවන් පලයට පැමිණි ආයර්‍යශ්‍රාවක වූ රජ තෙමේ 'අනේ! මේ මෝඩ අම්මණ්ඩි මෙබඳු උසස් වැඩක දී ත් සතුටු නො වන්නී ය' යි නිපුනකු සේ වී 'මොක ද අම්මා කියන්නී? මට ගෙණා මල් ද පූජා කෙළේ' යි ඇසී ය. 'එසේ ය! දේවයන් වහන්සැ' යි ඇය කී විට 'හා! අම්මා කළා හොඳ යි! ඔය මිනිහා හැර දමා, ඒ ගැණ කළ යුත්ත මම දනිමි, අම්මා යන්නැ'යි ඇය පිටත් කොට, රජ තෙමේ වහා ගොස් බුදුරජුන් හා යන මහාජනයාට එකතු විය.

බුදුරජාණන් වහන්සේ ඔහුගේ සිතෙහි සතුට දුන රජ මාවතින් නුවර හැසිර රජගෙට වැඩි සේක. රජ තෙමේ පාත්‍රය පිළිගෙණ බුදුරජුන් ගෙයි වඩා හිඳුවන්නට සූදානම් විය. එහෙත් උන්වහන්සේ ගෙමිදුලෙහි හිඳින්නට කැමැත්ත දැක් වූහ. රජ එය දුන වහා මණ්ඩපයක් කරවී ය. උන්වහන්සේ භික්ෂූන් සමඟ එහි වැඩ හුන්හ. 'මම, ගේ තුළට වී හුන්නෙමි නම්, මහාජන තෙමේ මා නො දක්නේ ය, ඔවුනට මා දැක ගන්නට ඉඩෙක් නො ලැබේ, මල්කරුගේ ගුණයත් පළ නො වන්නේ ය, ගෙමිදුලෙහි හුන් විට මහාජනයාට මා දැක්ක හැකි ය, මල්කරුගේ ගුණය ත් හැමතැන පැතිර යයි, ගුණවතුන්ගේ ගුණය ඇති හැටියෙන් පතුරුවා හැරීමෙහි සමර්‍ථයෝ ත් බුදුවරුම ය, අන් අය ගුණවතුන්ගේ ගුණ කීමෙහි මසුරු වෙත්' යි ගේ තුළට නො වැද ගෙමිදුලෙහි වැඩ හුන්හ. එ කල්හි මල්පට සතර, සතර දිසාවෙහි සිට ගත. මහාජන තෙමේ බුදුරජුන් පිරිවරා හුන්නේ ය. රජ තෙමේ බුඩප්‍රමුඛ භික්ෂූන් ප්‍රණීත වූ ආහාර පානයෙන් වැළඳ වී ය. වළඳා අවසානයෙහි

අනුමෙවෙනි කොට පළමු පරිද්දෙන් මල්පට සතරින් වට කරණ ලද්දේ මහත් සේ නද දෙන මහාජනයා පිරිවරා ගෙණ විහාරයට වැඩි සේක. රජ තෙමේ බුදුරජුන් පසුපස ගොස් නැවතුනේ, මල්කරු කැඳවා 'මට ගෙණා මල් අටමිට කුමක් සිතා බුදුරජුන්ට පූජා කෙළෙහි දැ' යි ඇසී ය. එවිට ඔහු 'දෙවයන් වහන්ස! රජ, මා මැරුව ත් රටින් පිටිවහල් කළ ත් කම් නැත, කරණ එකක් කෙරේවා' යි දිවි පුදා මල් පිදීමි' ඉ කීයේ ය.

ඉක්බිති රජ තෙමේ 'තමුසේ මහාපුරුෂයෙකැ' යි ඇතුන් අටදෙනකුන් අසුන් අටදෙනකුන් දාසයන් අටදෙනකුන් දාසීන් අටදෙනෙකුන් හා තවත් අබරණ මහත් රාශක් දී, නැවැත ත් සහවණු අට දහසක් වියදම් කොට ආභරණ තනවා එයින් සැරසූ සත්රින් අටදෙනකුන් හා ගම්වර අටකු ත් යන වුවමනා සියල්ලෙන් අට අට දුන්නේ ය. ආනන්ද සථවිරයන් වහන්සේ 'අද උදේ සිට දහස් ගණන් මිනිස්සු මහනද කෙරෙති, පිළිහිස සිසැරුම් පවත්වති, මල්කරුට වන විපාකය කිමැ' යි සිතා බුදුරජුන් වෙත ගොස් ඒ ඇසූහ. බුදුරජාන් වහන්සේ 'ආනන්දයි! මෙයින් මල්කරු කෙළේ සුවලප වූ කම්යෙකැ, යි නොසිතව, මෙතෙමේ මේ පූජාව කළේ දිවි පිදීමෙන් ය, මා කෙරෙහි පැහැදීමෙන් කළ මේ පූජාව නිසා කල්පලක්ෂයක් ම දුගතියක උපදනේ නොවේ, දෙව්ලොව දෙව් සැප, මිනිස් ලොව මිනිස් සැප විඳ අවසානයෙහි මේ කම්යාගේ විපාකය වසයෙන් සුමනා නම් පසේ බුදුවරයෙක් වන්නේය' යි වදාළ සේක. බුදුරජුන් වෙහෙරට වැඩ ගඳකිළියට ඇතුල්වත් ම ඒ මල් දෙරසඩ ඇද වැටුනේ ය. එ දින සවස් වේලෙහි 'පුදුම යි! දිවමන් බුදුරජුන්ට දිවිපුදා කළ මල් පිදීමෙන් මල්කරු විසින් කළ කම්ය, එකෙණෙහි ඔහු එහි විපාක වශයෙන් උසස් දිවි පැවැත්මකට වුවමනා හැම දෙයක් ම ලැබී ය, පින්කමේ විපාකය ඔහු විසින් ඇස් ඉදිරියෙහි ම ලදැ' යි කතාවක් ඇතිවි ය. බුදුරජානන් වහන්සේ ගඳකිළියෙන් නික්ම ධම්ශාලාවට වැඩමවා බුද්ධාසනයෙහි වැඩ හිඳ 'මහණෙනි! තමුසේලා මෙහි රැස් වී දැන් කුමක් කතා කරමින් හුන්නහු දැ' යි අසා වදාළ සේක. භික්ෂූන් වහන්සේලා 'ස්වාමීනි! මල්කරුගේ පින්කම ගැණ කතා කරමින් හුන්නෙමු' යි කී විට 'මහණෙනි! එසේ ය! යම් කම්යක් කොට පසුව නොතැවේ නම්, සිහිකළ සිහිකළ හැම විටක ම සතුට උපදී නම්, කළ යුත්තේ එබන්දෙකැ' යි වදාරා අනුසඤ්ඤි ගළපා මේ ධම් දෙශනාව කළ සේක:-

තං ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති,
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවතීති.

යම් කර්මයක් කොට පසු නො තැවේ ද, යම් කර්මයක්හුගේ විපාකය පිණා ගියේ, සතුටු සිත් ඇත්තේ විඳී ද, ඒ කර්මය කරණ ලද්දේ යහපත් ය.

තං ච කම්මං කතං සාධු යං කත්වා න අනුතප්පති = යම් කර්මයක් කොට පසු නො තැවේ ද, ඒ කර්මය කරණ ලද්දේ යහපත් ය.

මෙහි **කම්මං,** යන්නෙන් අදහස් කළේ කුශලකර්මය යි. කුශලකර්මය නො තැවීමට කරුණු වේ. අකුශලකර්මය තැවීමට හෙතු වේ. විස්තර කී සේ දතයුතු ය.

යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවති = යම් කර්මයක්හුගේ විපාකය පිණා ගියේ සතුටු සිත් ඇත්තේ විඳී (ද).

යස්ස, යනු කුශලකර්මය සම්බන්ධයෙන් කියන ලද්දේ ය. ප්‍රීති වෙගයෙන් යුක්තවූයේ **පතීත,** නම් වේ. යමකුගේ සිත සතුටින් නැගී ඒ නම්, හෙතෙමේ පතීත, යි කියනු ලැබේ. එබඳු සිත වුවත් පතීතශබදයෙන් කිය හැකි ය. සොමනස්සවෙගයෙන් **සුමන,** නම් වේ. යමකු ගේ සිත සොම්නසින් ඔද වැඩී ගියේ නම්, හෙතෙමේ ය සුමන.

මන, ශබදය හා සමාසයෙන් බැඳී ගිය **සු,** ශබදය ධාතු - විභක්ති - නිපාත - උපසග්ග - ඇසීම - වැඩීම - විසීම - හිංසා කිරීම - බිහිකිරීම - යෑම - වැගිරීම - තෙත්වීම - රැස් කිරීම - ප්‍රකට වීම - යෙදීම - සොතවිඤ්ඤාණ - එයින් දැරීම, යන මේ අරුත් හි එයි. එ තැන්හි උදාහරණ කොෂග්‍රන්ථයන්ගෙන් දත හැකි ය. සුමන, යන තන්හි වූයේ උපසර්ගවශයෙන් ගැණෙන සු, යන්න ය. සොභන - සුඛ - අවිපරීත - අතිසය - සුන්දර - සම්ඩි යන අරුත් හි වැටේ. **සුගත - සුකර - ස්වර්ත - සුගගහිත සුලක්ඛණ - සුභික්ඛ** යනු එයට නිදසුන් ය. මෙහි එනුයේ සොභන, සුඛ, සුන්දර අරුත්වලින් එකෙක වේ. **'සුට්ඨු සුඛිතං වා මනො යස්ස සො, සුන්දරං මනො යස්ස සො=සුමනො'** යි වාක්‍ය ගතයුතු ය. අරමුණු දන්නේ මන නම් වේ. එක් නැළි යකින් හෝ තුලාවකින් හෝ ඒ ඒ දැ මනින්නාක් මෙන් කිරන් නාක් මෙන් අරමුණු මනින්නේ හෝ පිරිසිඳින්නේ මන, නැමැ යි කීහ. විවරණය යට කියූයේ ය.

දෙව්මිනිස් සැප හෝ නිවන් සැප හෝ සිදුකිරීමෙහි ලා සමර්ථ වූ සුඛදායකකර්මයෙක් යමකු විසින් කරණ ලද්දේ නම්, ඔහු

කර්මය කළ අත්බවේදී සිහිකළ හැම විටකම ප්‍රීති වෙගයෙන් යුක්ත වූයේ සතුටින් ඔදවැඩි වූයේ, 'මම මෙබඳු සුඛදායකකර්මයක් කෙළෙමි' යි යන කර්මනන්දනයෙන් ද එසේ ම 'මෙලොව වසයෙන් ලැබය යුතු කීර්ති ප්‍රශංසා ලබමි' යි විපාකනන්දනයෙන් ද සතුටු වෙයි. පරලොව ගියේ ත්, ගති සම්පත් ආදී හැම එකෙකින් සතුටු වේ.

'ඉදං හි තං ජේතවනං ඉසිසඞ්ඝනිසෙවිතං,
ආවුත්ථං ධම්මරාජෙන පීතිසංජනනං මම'

භික්ෂු සමූහයා විසින් නිතර සෙවුනාලද ධර්මරාජ වූ බුදුරජානන් වහන්සේ විසින් විසුම් ගන්නා ලද ඒ මේ ජේතවනය මට ප්‍රීතිය උපද වන්නේය යනු එහි අරුත් ය. එහි දී බුදුරජානන් වහන්සේ, මාර්ගචෙතනාව ද, මාර්ගප්‍රඥාව ද, සමාධිය ද, උතුම් ජීවිතය වූ ශීලය ද යන මෙයින් සත්‍වයෝ පිරිසිදු වෙත්. ගොත්‍රයෙන් හෝ ධනයෙන් හෝ පිරිසිදු නො වෙත්. එහෙයින් නුවණැති පුරුෂ තෙමේ තමාගේ අභිවෘද්ධිය දක්නේ නුවණින් දහම් රැස් කරන්නේ ය. මෙසේ ඒ ආර්‍යමාර්ගයෙහි පිරිසිදු වෙති, යි.

'කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිතමුත්තමං,
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙනවා,

තස්මාහි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො,
යොනිසො විචිනෙ ධම්මං එවං තත්ථ විසුජ්ඣති'

යන මෙය වදාළ සේක.

යන මේ ප්‍රීතිගීතය ගයමින් අනාථ පිණ්ඩිකයෝ අදත් දෙව්ලොව, කළ සතකර්මයන් සිහි කරමින් දකිමින් ප්‍රීති වෙගයෙන් සොමනස්ස වෙගයෙන් සතුටු සිත් ඇත්තේ, සුඛවිපාකලාභයෙන් ප්‍රීත වෙති. අනාථ පිණ්ඩිකයන්ගේ මේ ප්‍රීතිගීතය පූර්වෝක්ත දෙශනාව වඩාලාත් සාර්ථක කරන්නී ය.

සුමනාමාලාකාරවස්තුව නිමියේ ය.

නන්ද නම් තරුණයා

5 — 6

උත්පලවණ්ණි, ස්ථවිරා තොමෝ පශ්චිමභවිකකෘතපුණ්‍ය භික්ෂුකියක් වූ ය. ඕ තොමෝ පියුමතුරා බුදුරජුන් ඉදිරියෙහි දී උන්වහන්සේගෙන් ලත් වරප්‍රසාද ඇත්තී, ප්‍රත්‍ථිනා තබා කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පින් දහම් කරමින් දෙව් මිනිසුන් අතර ම සැරිසරා එන්නී, අප බුදුරජුන් දවස දෙව්ලොවින් චුත ව සැවැත් නුවර සිටු ගෙයක උපන්නී ය. නිලුපුල් පැහැය සේ පැහැය ඇති බැවින් උත්පලවණ්ණි යි ඇයට නම් කළහ. ඇය වැඩිවිය පැමිණි කල දඹදිව ඒ ඒ දිසා වැසි රජ කුමරුවෝ ත් සිටු කුමරුවෝ ත් 'උත්පලවණ්ණිව අපට දෙව' යි ලියුම් පණිවිඩ එවූහ. එ කල එහි මැය පතා ලියුම් නො එවූ වැදගත් එකෙක් නො ද වී ය. සිටු තෙමේ 'මට හැම කෙනකුන්ගේ ම සිත් සනසන්නට නො හැකි ය. එකක්හට දුන්නො ත් අනෙකෙක් විරුඬ ව නැග එන්නේ ය. එහෙයින් පැවිදි කරවන්නෙමි' යි සිතා ඇය ගෙන්වා 'දුව! මහණ වන්නට නරක දූ' යි ඇසී ය. ඒ වචනය, සියවරක් පිස පිරිසිදු කළ තෙලක් හිසෙහි වක්කළාක් මෙන් වී එක්වරින් ම 'පියානන් වහන්ස! කැමැත්තෙමි' යි කිවූ ය. එවිට සිටු තෙමේ හැම සැලකිල්ලක් ම කොට ඇය මෙහෙණවරට කැඳවා ගෙණ ගොස් පැවිදි කර වී ය. පැවිද්දෙන් කල් නො ගිය බැවින් පොහෝ ගෙයි වත් කිරීමේ වාරය ඇයට නියම ව තිබින. එහෙයින් ඕතොමෝ පොහෝගෙය හැම ද දමා පිරිසිදු කොට පහන් දල්වා දැල්ලෙහි නිමිති ගෙණ සිටියා නැවැත නැවැත එය ම බලන්නී, තෙජො කසිණජ්ඣානය උපදවා එය ම පාදක කොට විදසුන් වඩා රහත් වූ ය. ඒ හාම සිවු පිළිසැඹියා හා ෂඩභිඥවන් ද ලැබූ ය. ටික දවසකින් පසු දනවු සැරි සැරීමට ගොස් හැරී ආවා, අඹ උයනට වැද හුන්නී ය. මෙ දවස භික්ෂුකීන්ට වනයෙහි විසීම තහනම් නො කළ බැවින් ඕ තොමෝ එහි කිළියක් තනා ඇඳක් තබා තිරයකින් වට කොට හිඳිනට වන. මේ කාලයෙහි දිනෙක ඕ තොමෝ සැවැත් නුවරට පිඬු සිඟා ගියා ය. මේ අතර නන්ද නම් තරුණයා අඹ උයනට ගියේ කිළිය තුළට වැද පණවා තුබූ ඇඳ යටට රිංගා සැඟ වී හුන්නේ ය. ස්ථවිරාවන්ගේ මාමා කෙනකුගේ පුත් වූ නන්ද තෙමේ කුඩා කල පටන් ඇය කෙරෙහි ඇලුනු සිත් ඇති ව සිටියේ ය. ස්ථවිරා තොමෝ පිඬු සිඟා අවුත් කිළියට ඇතුල්වීමෙන් ඇස් අඳුරුව ගිය බැවින් දොර අඩවල් කොට තබා

විඩා හරින්නට ඇඳෙහි වැතිර ගත්තා ය. එවිට ඇඳ යට සිටි නන්ද තෙමේ ස්ථවිරාවන්ගේ ඇස්හි වැටී තුබූ අඳුර පහව යන්නට ත් කලින් ඇඳට නැංගේ 'බාලය! නො නැසෙව, බාලය නො නැසෙව' යි වළකනු ලබන්නේ ද කාමදාහය සංසිඳුවා ගත නො හී තමා බලාපොරොත්තු වූ පව්කම කොට ඇඳෙන් බැස බිම සිට ගත. එකෙණෙහි ම පොළොව පැළින. නන්දයා පොළොව ගැලී ගියේ අවීචිමහානරකයෙහි උපන්නේ ය. ඉක්බිති ස්ථවිරා තොමෝ මේ පුවත අනික් ස්ථවිරාවන්ට දැන් වූ ය. ඔවුහු භික්ෂූන්ට ත්, භික්ෂූහු බුදුරජුන්ට ත් දන්වා ලූහ. එ කල බුදු රජානන් වහන්සේ භික්ෂූන් අමතා 'මහණෙනි! භික්ෂු භික්ෂුකී උපාසක උපාසිකා යන මොවුන් අතර යම් අඥයෙක් වේ නම්, ඔහු පව් කම් කරන්නේ, මී හකුරු, සූකිරි ආදී යම්කිසි මිහිරි දෙයක් කන්නා වූ පුරුෂයකු සේ තුටු පහටු සිත් ඇතිව' යි අනුසන්ධි ගළපා මේ ධර්ම දෙශනාව කළ සේක:-

මධුවා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ බාලො දුක්ඛං නිගච්ඡති ති.

පව්කම යම්තාක් විපාක නො දේ ද, ඒ තාක් අඥ තෙමේ එය මී මෙන් සිත යි. යම් කලෙක වනාහි පව්කම විපාක දේ ද, එ කල අඥ තෙමේ දුකට පැමිණෙන්නේ ය.

මධු වා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති = යම්තාක් පාපය නො පැසේ ද, ඒතාක් අඥ තෙමේ (එය) මී මෙන් සලක යි.

පව්කම් කරණ අඥයාහට වනාහි තමන් කරණ ඒ පව්කම විපාක දෙනතුරු මිහිරක් සේ මන වඩන්නක් සේ හිතයක් සේ වැටහෙන්නේ ය.

මධු, යනු, මිදිරස මල්රස මී වද යනාදියෙහි ආයේ ය. මිහිරි හැම දෙයක් ම මෙයින් කිය වේ. **වා,** යනු සදෘශ භාවාර්ථයෙහි නිපාත යි. එහෙත් ඇතැම් කෙනෙක් මධුවා, යන්න මධු, ඉව, යි වෙන් කරත්. එසේ වෙන් කොට ව යනු වා, යි ගණිත්. ඒ නො මැනැවි. සලකා බැලිය යුතුයි. **මඤ්ඤති** යනු ක්‍රියා පදයි. හඟියි, සිතයි, කල්පනාකර යි, අදහස් කර යි, යනාදි ලෙසින් එය සිංහලයට නැගිය හැකි ය. **පාපං,** යනු යට කියන ලදී. **පච්චති,** පැසේ. විපාක දේ, යන තේරුම ය.

යදා ච පච්චති පාපං අථ බාලො දුක්ඛං නිගච්ඡති = යම් කලෙක පාපය පැසේ ද, එකල අඥ තෙමේ දුකට පැමිණේ.

යම් කලෙක වනාහි මෙලොවදී නන් වැදැරුම් කම් කටොලු කරවමින් ද, පරලොව නරකයෙහි උපදවා මහත් දුක් අනුභව

කරවමින් ද, කළ පාපය පැසෙන විට කළ පව්කම් ඇත්තේ බලවත් දුකට පැමිණෙන්නේ ය. කළ කම් විපාක දෙන සැටි යට කියන ලදී.

ධර්ම දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

ටික දවසකට පසු ධර්මසභාවට රැස්වූවෝ 'රහතුන් වහන් සේලා ද කම්සැප වළඳති, එසේ නම් කාමසෙවනය නො කරන්නෝ කවුරු ද? මොවුනු ත් සෙවනය නො කරණ දෙයක් මිනිසුන් අතර තිබේ ද? කොලොපරුක් නො වෙති මොවුහු, තුඹස් නො වෙති, ලේ මසින් යුත් සිරුරු ඇත්තෝ ය, එහෙයින් කම්සැප විඳිති' යි කතා කරන්නට වූහ. ඒ අවස්ථාවෙහි එහි වැඩම කළ බුදුරජානන් වහන්සේ 'මහණෙනි! තමුසේලා දැන් මෙහි කුමක් කතා කරමින් හුන්නහු දැ' යි විචාරා භික්ෂූන් 'මෙ නම් කතාවක් කරමින් හුන්නෙමු' යි කී කල්හි 'මහණෙනි! රහත්හු කම්සැප නො ඉවසති, කාම සෙවනය නො කෙරෙති, පියුම් පතෙහි වැටුනු දිය බිඳ යම් සේ එහි නො ඇලේ ද, නො පිහිටා ද, පෙරළී ගොස් වැටේ ද, හිදි අගක අබ ඇටය නො රැඳේ ද, නො පිහිටා ද, පෙරළී බිම වැටේ ද. එ පරිද්දෙන් ක්ෂිණශ්‍රවයාගේ සිත්හි දෙවැදැ-රුම් වූ ම කාමය නො රැඳේ, නො පිහිටා ය' යි වදාරා අනුසන්ධි ගළපා ධර්මදෙශනා කරණ සේක් මේ ගාථා ධර්මය වදාළ සේක:-

'වාරි පොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො,
යො න ලිම්පති කාමෙසු තමහං බ්‍රූමි බ්‍රාහ්මණන්ති'

මෙහි තේරුම මතු එන්නේ ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ පසෙනදි කොසොල් රජු කැඳවා 'මහරජ! මාගේ මේ සාසනයෙහි කුලපුත්‍රයන් මෙන් ම කුල දුහිතෘහු ද මහත් නෑ සමූහයා ත් භොග සමූහයා ත් හැරදමා අවුත් පැවිදිව වෙනෙහි වසත්, මෙසේ වෙනෙහි වසන ඇලා රාගයෙන් රත් වූ පාපී පුද්ගලයෝ අවමාන අතිමාන වසයෙන් වෙහෙස කෙරෙත්, බ්‍රහ්මචර්‍යාන්තරායට ද පමුණුව ත්, ඒ නිසා භික්ෂුකීසංඝයාට විසීමට නුවර තුළ ඔ අසපුවක් කරවීම සුදුසු ය' යි වදාළහ. රජ ද 'යහපතැ' යි පිළිගෙණ නුවර තුළ එක් පසෙක භික්ෂුකීසංඝයා උදෙසා වාසස්ථානයක් කරවූයේ ය. එ තැන් පටන් භික්ෂුකීහු නුවර තුළ ම වාසය කෙරෙත්.

උත්ලපවණ්ඨවිරාවසතුව නිමියේ ය.

කම් විපාකයක හැටි

6 — 11

පෙර කසුප් බුදුරජුන් දවස ගම්වැසි එක් ධනවත් පුරුෂයෙක් වෙහෙරක් කරවා‍ලා සඵවිර නමක් එහි නවතා ගෙණ සිවු පසයෙන් උවැටන් කෙළේය. ඒ සඵවිරයෝ ද දින පතා දුනයට ඔහුගේ ගෙට යන්නාහ. මේ කල දිනෙක රහතුන් වහන්සේ නමක් ද දුවල පිඬු පිණිස ඔහුගේ ගෙට වැඩියාහ. කෙළෙඹි තෙමේ උන්වහන්සේ දුක ඉරියව්වල පැහැද ගෙට වැඩම කරවා ප්‍රණීත වූ ආහාර පානයෙන් වළඳවා 'සවාමීනි! මෙ සළුව ගෙණ ගොස් සිවුරක් කොට පඬු පොවා පොරවනු මැනැවැ' යි වටින සළුවක් ද පූජා කෙළේ ය. නැවැත 'සවාමීනි! නුඹවහන්සේගේ හිස රුවුල් බෑමට මම පනික්කියකු කැඳවා ගෙණ එන්නෙමි, ඒ ගමනේ ම නුඹවහන්සේට නිදන්නට ඇඳක් ගෙණ එන්නෙමි'යි කී ය. එ වේලෙහි කුලුපග භික්ෂු තෙමේ රහතුන් වහන්සේට කළ පූජා සත්කාර දුක සිත සඳ ගන්නට නොහැකි ව 'මේ කෙළෙඹියා මොහු දුටු සැටියේ ම පැහැද මහත් සේ ගරු සත්කාර කරයි, නිතර ගෙයි වළඳන මට මෙතෙක් මෙබඳු සත්කාර නො කෙළේ ය' යි සිතමින් විහාරයට ගියේ ය. රහතුන් වහන්සේ ද ඔහු කැටුව ම ගොස් කෙළෙඹියා, දුන් සළුවෙන් සිවුරක් කොට පඬු පොවා ගත්හ. කෙළෙඹියා පනික්කියකු කැඳවා ගෙණ ගොස් හිස රුවුල් බාවා ඇදෙහි ද ඇතිරිලි අතුරා 'සවාමීනි! මෙහි නිදන්නැ' යි කියා පසුදා දෙනමට ම දුනයට ආරාධනා කොට ගියේ ය.

නෙවාසික භික්ෂු තෙමේ කෙළෙඹියා රහතුන් වහන්සේට කරණ සත්කාරය ඉවසනු නො හැකි ව සවස තෙරුන් සයනය කළ තැනට ගොස් 'ඇවැත්නි! ආගන්තුකය! තට සුදුසු කෙළෙඹියාගේ බත නො ව අසුචි ය, පනික්කියා ලවා හිස රුවුල් බැව්ම නො ව, තල් ඇටයක් ගෙණ හිස රුවුල් ගලවා දැම්ම ය, කෙළෙඹියා දුන් රෙදි හැඳීමට වඩා හෙලුවෙන් ඇවිදීම වටනේ ය, ඇදෙහි නිදීමට වඩා බිම නිදීම ය කළ යුත්තේ' යන ආ‍කාරයෙන් බැණ වැදුනේ ය. රහතුන් වහන්සේ 'මේ බාලයා මා නිසා විනාශයට පැමිණෙන්නේ ය' යි සිතා කෙළෙඹියාගේ ආරාධනාව නො පිළි ගෙණ උදැසනින් ම නැගිට පහසු තැනක බලා වැඩි සේක. නෙවාසික තෙමේ උදැසනින් ම විහාරයෙහි කළයුතු වත් කොට පිඬු පිණිස යන වේලෙහි 'ආගන්තුකයා තවම නිද යි, ගෙඩිය

ගසා ලූ හඬින් නැගිටින්නේ නම් නැගිට්ටා වේ' යි සිතා නියගින් ගෙඩියට තට්ටු කොට උදෑසනින් ම නැගිට කෙළෙඹි ගෙය බලා ගියේ ය. කෙළෙඹි තෙමේ කෑම් බීම් ඇ පිළියෙල කොට තෙරුන් වඩින මග බලා සිටියේ එන්නා වූ නෙවාසිකයා දැක 'ස්වාමීනි! අනික් හාමුදුරුවන් වහන්සේ කොහි දැ' යි ඇසී ය. 'කුමක් කියහි ද? මහත්මයාගේ හාමුදුරුවෝ මහත්මයා විහාරයෙහි සිට ආ වේලේ පටන් කාමරයට වී නිදති, තව ම නින්දේ ය, මම උදෑසන ම නැගිට විහාරමලු හැම ද පැන් කළ පුරවා, ඒ කටයුතු අවසන් කොට තැබීමි, ඒ කිසිත් ඔහු නො දනි යි, පසුව මම ගෙඩිය ද ගැසීමි, එයට ත් අවදි නො වී ය' යි කීයේ ය. එවිට කෙළෙඹි තෙමේ 'අර ඉරියව්වලින් යුත් හාමුදුරුවන් වහන්සේ මෙතෙක් වේලා නො නිදති, උන්වහන්සේට කරණ සතකාර දැක මේ ස්වාමීන් වහන්සේ එයට නො සතුටුව මෙසේ කියත්' යි සිතා තමන් නුවණැති බැවින් නෙවාසිකයා හොඳට වළඳවා නැවැත ඔහුගේ ම පාත්‍රය සෝදා පිසදමා පිරිසිදු කොට එය නානාවිධ ප්‍රණීත ආහාරයෙන් පුරවා 'මේ ගෙණ ගොස් ඒ හාමුදුරුවන්ට දුන මැනැවැ' යි ඔහුට ම දුන්නේය. එය අතට ගත් ඔහු 'යම්කිසි ලෙසකින් ඔහු මේ කෑම් බීම් අනුභව කළේ නම්, මෙ තැනින් පිට මං කරන්නට නො හැකි වනු එකාන්ත ය, මෙහි ම ලගින්නට සූදානම් වන්නේ ය, එ හෙයින් මෙය මඟ දමා යන්නෙමි' යි සිතා ගෙණ අවුත් මග දමා ගොස් එබී බලනුයේ තෙරුන් නො දුටුයේ ය. **විසි දහසක් අවුරුදු ඔහු පිරූ ශ්‍රමණධර්මය තෙමේ මේ කළ අපරාධය නිසා ඔහු රැකීමෙහි අපොහොසත් වී ය.** මැරී ගොස් ඔහු අවීචියෙහි උපන. බුඩාන්තරයක් ම එහි මහත් දුක් වින්දේ ය. එයින් චුත ව අප බුදුරජුන් දවස කෑම් බීම්වලින් කිසිත් අඩුවක් නැති කුලගෙයක උපන්නේ ය. පයින් ඇවිදින්නට පටන්ගත් තැන් සිට ඇඳෙහි නිදන්නට බත් කන්නට නො කැමැත්තේ තමන් පහරණ අසුචිය ම කන්නේ ය. මවුපියෝ 'බාල බැවින් නො දැන කරා' යි සිතා ඔහු පොෂණය කළෝ ය. වැඩිවිය පැමිණියේ රෙදි නො හැඳ හෙලුවෙන් හැසිරෙ යි. බිම නිද යි. අසුචි ම අනුභව කර යි. එ කල මවුපියෝ 'මෙතෙමේ අපට නො හොබනේ ය, හොබනේ ආජීවකයනටැ' යි ගෙණගොස් 'මේ ලදරුවා පැවිදිකර ගණිවු' යි ඔවුනට බාර කළහ. ඔවුහු පැවිදි කළහ. එදා ආජීවකයෝ ගෙල පමණ වළක් සාරා ඔහු එහි බහා දෙවුර මතුයෙහි ලෑලි අතුරා ඒ මතුයෙහි හිඳ තල් ඇට කැල්ලකින් අල්ල අල්ලා සියලු කෙස් ගලවා දැමූහ. මවුපියෝ 'හෙට දානයට එන්නැ' යි ආජීවකයන්ට කියා ගියහ,

පසුදා ආජීවකයෝ 'ගමට යන්නට එන්නැ' යි ඔහුට අඬ ගැසූහ. හෙතෙමේ 'තමුන්නාන්සේලා වඩින්න, මම මෙහි නවතිමි' යි එහි ගැමට අසතුටු විය. නැවැත නැවැතත් අඬගසා අසතුටු වූ බැවින් නවතා ගියහ. එවිට ඔහු, ඔවුන් ගිය බව දැන වැසිකිළියෙහි අතුරා තුබූ ලැලි ඉවත් කොට වළට බැස පණු වැදලි සහිත වූ පල් වූ අසුචි දැතින් ගෙණ කෑයේ ය. ආජීවකයෝ ඔහුට කැම යැවූහ. ඔහු එයට නොකැමැති විය. නැවැත නැවැත ඇවිටිලි කරණ ලද්දේ ත් 'මට මෙයින් වැඩෙක් නැත, මම කැම ගත් තෙමි' යි කී ය. මෙසේ දෙවන තෙවන සිවුවන දවස්හි ද අඬගසන ලද්දේ 'මට කොතැනක වත් යනු නොහැකි ය' යි කියා සිටියේ ය. 'මොහු එක දවසකුදු දැනයට යෑමට සතුටු වූයේ නොවේ, ඒ තබා ලඟට එවූ කැම කන්නට ද සතුටු නොවේ, මෙයට මොකක් නමුත් කරුණක් විය යුතු ය' යි සිතූ ඔවුහු දිනක් ඒ පරීක්ෂා කරන්නට තැන තැන එකතු දෙන්නකු නවතා ගියහ. ඒ නවකාජීවකයා ඔවුන් ගිය බව දැන, පෙර සේ වැසිකිළිවලට බැස අසුචි කන්නට පටන් ගත්තේ ය. එහි සැඟවී සිටියෝ ඒ දැක ආජීවකයන්ට කීහ. ඔවුහු 'මෙය මහාපුදුමයෙකි, යම්ලෙසකින් ශ්‍රමණගෞතමයාගේ ශ්‍රාවකයෝ මෙය දන්නෝ නම්, ආජීවකයෝ අසුචි කත් ය' යි මොර දෙන්නෝ ය, රටේ වැසුමෙක් නොලැබේ, ඔවුහු අපට නිදු කරන්නෝ ය, මොහු පන්නා හැරිය යුතු ය' යි නියම කර ගෙණ 'මෙ තැනින් යව; අප හා වසන්නට නොහැකි ය' යි බැහැර කළහ. මෙසේ ආජීවකයන් පන්නා දුමූ මොහු ගල් පොත්තක පිහිටි ගල් වළක් ඇසුරු කොට සිටියේ, ඒ අසල මිනිසුන් මල පහ කරණ තැනට ගොස් අසුචි අනුභව කරන්නේ ය. අත් පා සෝදනු පිණිස එහි පැමිණියා වූ මිනිස්සු එක් අතකින් ගල්පොත්තේ කෙළ වරක් අල්ලා ගෙණ එක් පයක් ඔසොවා ගෙණ එය අනික් පයෙහි දණහිස තබා සිටින්නහු ගෙන්, කුමක් නිසා දැ' යි ඇසූහ. 'මම උග්‍ර වූ තපස් ඇත්තෙක්මි, මා පා දෙක ම බිම තැබුවොත් එයින් පොළොව සැලෙයි, පොළොව දෙදරයි, ඒ නිසා මෙසේ සිටිමි, රෑ දුවල් දෙක ම ගත කරන්නේ මෙසේ ය, නොද නිදමි' යි කී ය. **නූගත් මෝඩ මිනිසා බොහෝසෙයින් කරුණු නොවිමසා වචනමාත්‍රය ම අදහයි. මෝඩකම නිසා කුහක භාවයෙහි පහදියි.** එහෙයින් ඒ ඇසූ මිනිස්සු දුරදිග නොබලා 'මෙබඳු තාපසයෝ ලොව නැත්තාහ, මෙබඳු සිල්වත්හු කොහි වෙත් ද, දැන් හාමුදුරුවරුන්ට සැප පහසු ඇති වෙහෙර විහාර ඇඳ පුටු කොච්ච මෙච්ච ගුදිරි ඇඳ ඇතිරිලි බුමුතුරුණු කැම් බීම් වුවමනා ය, මුන්වහන්සේට ඒ කිසිවක් වුවමනා නැති බව පෙණේ,

මෙයට කලින් මෙබදු සිල්වත් කෙනෙක් නොදක්නා ලදහ' යි අහු මගද දෙරට වැස්සෝ තදින් පැහැද මසින් මස කැම් බීම් ආදිය ඵලවති. 'මම හුලඟම අනුභව කරමි, මට අන් කිසිවක් වුවමනා නැත, අනෙකක් කෑවොත් මාගේ තපස නැසෙන්නේය' යි ඔහු මිනිසුන් ගෙණ එන අන් කිසිවක් බාර නොගණ්ති මිනිස්සු 'සවාමීනි! එසේ නොකරණ මැනැව, ඔබවහන්සේ වැනි සිල්වත් සොර තපස් ඇත්තකු අප ගෙණෙන දෙය පරිභොග කළ විට එය අපට බොහෝ කලක් හිතසුව පිණිස වන්නේය' යි කියමින් නැවැත නැවැත යාඥ කරති. ඔහුට අසුචි හැර අන් අහරෙක් රුචි නොවේ. මිනිසුන්ගේ ඇවිටිල්ල නිසා ඔහු උන් විසින් ගෙණෙන ලද ගිතෙල් උක්හකුරු ආදිය, හිතණ අගින් ගෙණ දිවඟ තබා 'තමුසේලා යන්න! හිත සැප පිණිස මේ පමණ ය' යි ඔවුන් පිටත්කර හරි යි. මෙසේ හෙලුවෙන්, අසුචි කමින්, කෙස් උදුරමින්, බිම නිදමින් පණස් වසක් ගෙවූයේ ය.

හැම අලුයම ලොව බැලීම බුදුවරුන් විසින් අත් නොහළ සිරිතෙකි. එ සිරිතෙන් දවසෙක අලුයම ලොව බලා වදුරන්නා වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ මේ ජම්බුකාජීවකයා දුටු සේක. එවිට ඔහුගේ තතු බැලූ බුදුරජාණන් වහන්සේට ඔහුට රහත් වන්නට හෙතු ඇතිබව, අසූසාර දහසක් ප්‍රාණීන්ට වන ධර්මාවබෝධය හා මහාජනයා සුවපත් වනබව පෙණී ගියේ ය. පසුදා උන්වහන්සේ රජගහා නුවර පිඬු සිඟා ගොස් හැරී ආවෝ, අනඳ තෙරුන් අමතා 'ආනන්දය! මම ජම්බුකාජීවකයා හමුවන්නට යන්නෙමි'යි වදාළ සේක. අනඳ තෙරනුවෝ 'සවාමීනි! බුදුරජාණන් වහන්සේ පමණක් වඩින සේක් දැ' යි ඇසූහ. 'ආනන්දය! මම පමණක් යන්නෙමි' යි වදාරා සෙවන වැඩෙන වේලෙහි ඔහු වෙතට වැඩි සේක. එකල දෙවියෝ 'සවාමිදරු වූ බුදුරජාණන් වහන්සේ ජම්බුකාජීවකයා වෙතට වඩින සේක, ඔහු මල මූ දැහැටි දඬුවලින්ද පියෙදුවූ ඉතා පිළිකුල් වූ ගල්පොත්තක් උඩ වාසය කරයි, එ තැන ඉතා අපිරිසිදු ය, එ හෙයින් වැසි වස්වා පිරිසිදු කරමු' යි වැසි වැස්වූහ. ගල්පොත්ත වැසි දියෙන් සේදී ගොස් පිරිසිදු විය. මල රහිත විය. නැවැත ඒ මතුපිට මල්වැසි වැස්සූහ. බුදුරජාණන් වහන්සේ එහි වැඩියෝ, 'ජම්බුක! යි අඬගා වදාළ සේක. ඔහු 'මට ජම්බුකවාදයෙන් කතා කරණ මේ දුෂ්ට දුර්ජනයා කවරෙක් දැ' යි සිතා 'මට කතා කරන්නේ කවරෙක් දැ' යි ඇසී ය. එවිට 'මම ශ්‍රමණගෞතමයා වෙමි' යි උන්වහන්සේ පිළිතුරු දුන්හ. එවිට 'මොක ද මහාශ්‍රමණ!' යි ඔහු ඇසී ය. 'අද එක් රැයක් මෙහි නවතින්නට මට ඉඩ දෙව' යි උන් වහන්සේ ඉල්ලූහ. 'මහාශ්‍රමණය! එය කරණු බැරි වැඩෙකි, මෙහි

නවතින්නට ඉඩ දෙනු බැරි ය' යි කී කල්හි 'ජම්බුකය! එසේ කියනු නො සුදුසු ය, අද රෑට පමණක් ඉඩ දෙව, පැවිද්දේ පැවිද්දන් ම පතති, පැවිද්දන් කරා ම යෙති, මිනිස්සු මිනිසුන් කරා යෙති, සිවුපාවෝ සිවුපාවුන් කරා යෙති, ඒ නිසා කෙසේ නමුත් අද රෑට පමණක් නවතින්නට ඉඩ දෙව' යි කීහ. එවිට ජම්බුක තෙමේ බුදුරජුගෙන් 'කිම? ඔබ පැවිද්දහු දැ' යි ඇසී ය. 'එසේ ය' යි බුදු රජානන් වහන්සේ පිළිතුරු දුන්හ. 'එසේ නම් ඔබගේ ලබුකබල දුම් හැන්ද යාගහුය කොහි දැ' යි ඇසී ය. මට ඒ සියල්ල ම තිබේ, වෙන වෙන ම ගෙණ මග තොට යෑම කරදරනිසා සිරුර තුල ලාගෙණ ඇවිදිමි' යි වදාළහ. ජම්බුකයා 'ඔබ මෙ දැ ගෙණ හැසිරෙන්නහු දැ' යි කිපුනේ ය. 'ජම්බුකය! නො කිපෙව! මට ඉන්ට තැනක් කියව' යි නැවැතත් වදාළ සේක. එවර ද ඔහු 'මෙහි නවතින්නට තැනක් නැතැ' යි කී ය. එකල ඔහු වසන තැනට නො දුරෙහි ගල්පොත්තක් පෙන්වා 'මෙහි ඉන්නේ කවරෙක් දැ' යි ඇසූහ. 'ශ්‍රමණය! එහි කවුරුත් නැතැ' යි කී ය. 'එසේ නම් ඒ තැන මට ඉඩ දෙන්නැ' යි වදාළ කල්හි 'එය ඔබ දැන ගණිවු' යි කී ය. බුදුරජානන් වහන්සේ ගල්තල්ලෙහි තමන් හිඳින සිවුර අතුරා වැඩ හුන් සේක. එදා ප්‍රථමයාමයෙහි සතරවරම් මහරජහු සිවුදිග එකාලොක කරමින් බුදුරජුන් වෙත පැමිණියෝ ය. ඔහු ඒ ආලොකය දැක 'මේ කිමැ' යි සිතන්නට වන. මධ්‍යමයාමයෙහි සක්දෙව්රජ පැමිණියේ ය. ඔහු 'මේ කවරෙක් දැ' යි ද සිතී ය. පශ්චිමයාමයෙහි මහාබ්‍රහ්ම තෙමේ මූළුවනය එකලු කරමින් බුදුරජුන් වෙත ගොස් ආයේ ය. බඹහු ද දැක පුදුමයට පැමිණි ජම්බුක තෙමේ බුදුරජුන් වෙත ගොස් පිළිසඳර කතා කොට එකත් පසෙක සිට 'මහාශ්‍රමණය! සිවුදිගුත් බබුලුවමින් ඔබ වෙත පැමිණියෝ කවුරු දැ' යි ඇසී ය. 'ප්‍රථමයාමයෙහි සතරවරම් රජුහු, මධ්‍යමයාමයෙහි සක්දෙවි රජහු, පශ්චිමයාමයෙහි මහබඹහු ආහ' යි වදාළ කල්හි 'ආවෝ කුමකට දැ?, යි ඇසී ය. 'මට උවටැනට ය' යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. 'ඔබ ඔවුනට ත් වඩා උසස් වහු දැ' යි ජම්බුකයා ඇසී ය. 'ඔව්! මම ඔවුනට වඩා ඉතා ම උසස්මි, මම ඔවුන්ගේ රජ වෙමි, මම ලොව ශ්‍රෙෂ්ඨයෙමි, සක්දෙවිරජ ආයේ මට උවටැනට ය, ඔහු මාගේ වැඩකරු ය, මට නිතර උවටැන් කරණ සාමණේර නමක් සමාන ය, මහාබ්‍රහමයා ආයේ මා පා වඳින්නට ය, මම අනිබ්‍රහම වෙමි, කිඹිසිල්ලක් ගිය ත් පා හැපුන ත් මිනිස්සු බ්‍රහමයාට නමසකාර වේවා, යි කියති, එහෙත් ඔහු මා පා වඳි' යි වදාළ සේක. 'ශ්‍රමණය! පුදුම යි! ඔබ මහත් අනුභාව ඇතියහු, මා මෙහි පණස් පස් අවුරුද්දක් වෙසෙත ත් මොවුන්ගෙන් එකෙක් වත් උවටැනට

තබා මා දකින්නට වත් ආවේ නැත, මා මෙතෙක් කල් ගෙවූයේ සිට ගෙණ හුළං බොමින් ය' යි ජම්බුකයා කී විට 'බුදුරජාණන් වහන්සේ 'තෝ මේ රටෙහි මෝඩ මිනිසුන් රවටන ලෙසට මා ත් රවටන්නට සිතුයෙහි ය, හා! වේවා! මේ අවුරුදු පණස් පහේ ම තෝ අසුචි කෑයෙහි නොවෙහි ද? තල්ඇට කඩකින් කෙස් ඉදුරුවෙහි නොවෙහි ද? එහෙත් තෝ රට රවටමින් 'මම හුළං අනුභව කරමි, එක පයින් සිටිමි, නොඉදිමි, නොනිදමි, යි කියන්නෙහි, ඒ හැටියෙන් මා ත් රවටන්නට සිතුයෙහි, තෝ පෙර කළ පව් වැරදි අදහස් නිසා මෙතෙක් අසුචි අනුභව කරන්නෙක්, බිම නිදන්නෙක්, ගෙලුවෙන් ඉන්නෙක්, තල්ඇට කඩකින් කෙස් උගුල්ලන්නෙක් වෙහි, දුනුත් වැරදි දුකුම් ඇත්තෙක් වෙහි' යි වදාළ සේක. එවිට ජම්බුක තෙමේ 'මා විසින් කළ කර්‍මය කිමැ' යි ඇසී ය. බුදුරජුන් ඔහු පෙර කළ කර්‍මය වදාළවිට ඔහුට බලවත් සංවේගයෙක් උපන. ලජ්ජාභය හට ගැණින. එයින් එහි ම උක්කුටුකයෙන් හිඳගත. බුදුරජාණන් වහන්සේ ඔහුට නානකඩක් දුන්හ. ඔහු එය ඇඟ වට දවටා ගෙණ පසකට විය. එවිට උන්වහන්සේ පළමු කොට ආනුපුබ්බී කථාව වදාරා දහම් දෙසූ සේක. ඒ අවසන්හි සිවු පිළිසැඹියාවන් සමඟ රහත් ව බුදුරජුන් ඳෑද හුන් තැනින් නැගිට පැවිදි උපසපන් බව් ඉල්ලී ය. එ කෙණෙහි පෙර කළ සියලු පව් කැපී ගියේ ය.

පෙර මොහු රහත් නමකට ආක්‍රෝශ වසනු සතරකින් තදින් බැණ වැදුනේ ය. ඒ පවින් මේ මහපොළොව තුන් ගව්වකු න් යොදුනක් වැඩෙනතුරු අවීචිමහානරකයෙහි පැසි තැළී ගියේ ය. එහි පැසි ඉතිරි වූ ඉතා සුලු පව්කම විසින් පණස් පස් අවුරුද්දක් මේ තත්ත්වයෙන් දවසැරියේ ය. මෙතෙකින් මොහුගේ ඒ මේ පව්කම ගෙවිනා. අවුරුදු විසිදහසක් කළ මහණකමේ විපාකය නොනැසුනේ ය. එ හෙයින් බුදුරජාණන් වහන්සේ දකුණත දිග් කොට 'මහණ! මෙහි එන්න! බඹසර හැසිරෙන්නැ' යි වදාළ ඇසිල්ලෙහි ගිහි ලකුණු පහව ගියෙන් අට පිරිකර දරා සැටවස් පිරි මහලු මහණකු සේ බුදුරජුන් ඉදිරියෙහි සිට ගත.

මෙ දවස වනාහි අහුමගද වැස්සන් මොහුට පුදපඬුරු ගෙණ, දවසෙක් විය. එහි ඒ ආවෝ බුදුරජුන් දැක 'කිම! අපගේ ආර්‍ය්‍ය වූ ජම්බුකයෝ මහත්වන සේක් ද, නැත, බුදුරජහු මහත්වන සේක් ද, බුදුරජහු මහත්වන සේක් නම්, ජම්බුකයන් කරා නොඑති, ජම්බුකයෝ ඔහු කරා යෙති, ජම්බුකයන් ම මහත්වන බැවින් බුදුරජහු ජම්බුකයන් කරා ආහ' යි සිතූහ. එවිට බුදුරජාණන් වහන්සේ 'ජම්බුකය! තාගේ මේ උපස්ථායකයන්නේ

සැකය සිඳලව' යි වදාළ සේක. ඔහු 'ස්වාමීනි! මම බුදුරජුන් වදාරනතුරු නො ඉවසිල්ලෙන් බලා සිටියෙමි' යි චතුර්ත්ථ්‍යානයට සමවැද ඉන් නැගිට මාපටැඟිල්ල හා මැදැගිල්ල විදහා ගත් පමණින් තාලයක් අහසට නැගී 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මම භාග්‍යවතුන් වහන්සේගේ සුවච ශිෂ්‍යයෙක්මි' යි කියා අහසින් බැස වැඳ නැවැතත් දෙ තලෙක, ති තලෙකැ යි මෙසේ සත්තලක් අහසට නැගී බිමට බැස තමන් බුඩශ්‍රාවකයකු බව පෙන්වී ය. මහාජන තෙමේ ඒ දැක 'බුදුවරු නම් මහත් අනුභාව ඇත්තාහ, අලාමක වූ ගුණ ඇත්තාහ' යි සිතන්නට කියන්නට වන. බුදු රජානන් වහන්සේ 'මෙතෙමේ මෙතෙක් කල් ඔය දායකයන් දුන් ලාභසතකාර හී තණගින් ගෙණ දිවග තබමින් තපස් කරමි' යි මෙහි හුන්නේ ය, මෙලෙසින් සියක් අවුරුද්දක් තපස් කළත් ඒ තපසට වඩා කාලය ගැණ හෝ බත ගැණ හෝ කුකුස් උපදවා නො වළඳන්නහුගේ සිතෙහි හටගත් ඒ මේ භත්තච්ඡේදනකුශල චෙතනාව ම ඉතා මහත් වේ, ඒ චෙතනාව පිළිබඳ සොළොස්වන කොටස පමණවත් සියක් අවුරුද්දක් කළ තපස නො අගනේ ය' යි අනුසන්ධි ගළපා මේ ධර්ම දෙශනාව කළ සේක.–.

මාසෙ මාසෙ කුසගෙගන බාලො භුඤ්ජෙථ භොජනං,
න සො සඞ්ඛතධම්මානං කලං අග්ඝති සොළසිනති.

නුවණනැත්තේ මසකට වරක් කුසතණ අගින් බොජුන් අනුභව කරන්නේ ද, හෙතෙමේ, දන්නාලද ධර්මය ඇති රහතුන් වහන්සේ ලාගේ සොළොස්වන කලාවට ත් නො පැමිණේ.

මාසෙ මාසෙ = මසෙක්හි මසෙක්හි.

මෙහි මසක් පාසා මසකට වරක් යන අදහස යි. **මාස,** යි කියනු ලබන්නේ රෑ දාවල් තිසකින් පිරිසිඳ ගත් පිරිසිඳින කාලය යි. මේ කාලප්‍රමාණය සත්වයන්ගේ ආයුසය මනින්නා සේ කෙළවර කරන්නේ මාස නම් විය, යි කියති. මේ කරණ කොට ප්‍රමාණ කරණු ලැබේ නු යි හෝ මාස නමැ, යි ද යෙත්. **'සත්තානං ආයුං මිනන්තො විය සීයති අන්තං කරොතීති = මාසො, මස්‍යතෙ පරිමීයතෙනෙනෙති = මාසො'** යි එහි අර්ත්ථසමර්ත්ථනය යි. පුබ්බණ්ණමාසයෙහි හා අපරණ්ණමාසයෙහි ද මාස, යනු වැටේ. **'මම ඉදනති මසීයති ආමසීයති ගණ්හීයතීති'** යනු පුබ්බණ්ණ මාසය සඳහා කීයේය. **'මසීයති භක්ඛීයතීති'** යනු අපරණ්ණ මාසය සඳහා කීයේය. මෙ දෙක ම මෙහි වූ මාස ශබ්දයෙන් නො ගැණේ. මෙහි ගැණෙනුසේ පෙර කියූ කාලපරිච්ඡේදය යි.

කුසගෙගන = කුසතණ අගින්.

කුණ්ඨතිණ, යි ද මෙයට නමෙක් වේ. **'කුණ්ඨතිණෙසු' ති කුසතිණෙසු බුද්ධකතිණෙසු වා'** යන මෙයින් ඒ පැහැදිලි ව පෙණේ. **'කු පාපං ශෘති නාශයති, යමා කෞ භූමෞ ශෙතෙ රාජතෙ ශොභතෙ ඉ කුශම්'** යනු සංස්කෘතකොෂ යි. පසු කියූ තේරුම කෙසේ වුව ද, මූලින් කියන ලද්ද ඇදහිය යුතු නොවේ. ගසකින් වැලකින් ගලකින් කොළයකින් පවි නැසීමෙක් සිදු නොවේ. මෙයට පඤ්ඤය වශයෙන් කුඨ, දර්භ, පවිත්‍ර, යාඥික, හ්‍රස්වගර්භ, වර්භි, කුකුප, සූච්‍යග්‍ර, භූෂණ, දීර්ඝපත්‍ර ක්ෂුරපත්‍ර යනාදිය කොෂග්‍රන්ථයන්හි දක්නට ලැබේ. වෛදිකයන් මෙයට උසස් තැනක් දෙන ලද්දේය. එ හෙයින් ම ඔවුහු ඇතැම් මඞ්ගලක්‍රියාවන්හි ලා දෙව්යන් පිදීමට ගණිති. ඒ ඒ ක්‍රියාවන්ට කුශතෘණ ගැණීමෙන් ඔවුහු බලාපොරොත්තු වනුවෝ ඒ ඒ ක්‍රියාවන්හි පිරිසිදුකම ය. **'පූජා කාලෙ සර්ෂෙදෙව කුශහස්තෙනා භවෙවචඡුවිඃ'** යනාදියෙන් එය පැහැදිලි ය. **'කුශෙන රහිතා පූජා විඵලා භවති මඝා'** කුශතෘණ රහිත පූජාව විඵල බව මෙයින් කියන ලද්දේ ය. කුසතණ අහින් ගෙණ අහර බුදීම පාපනාශය පිණිස වේ ය යි බාහිරකයෝ සැලකූහ. ඔවුහු එසේ ද කළහ. එසේ කිරීමෙන් පවිනැසීමක් නොවන බව බුදුරජාණන් වහන්සේ මේ දෙශනාවෙන් පැහැදිලි කළ සේක. ඒ එසේම ය. එහෙත් බාහිරකයන් අනුව ගිය ඇතැම් බෞඩයෝ ද ඇතැම් තැන්හි කුසතණ පූජාවසතු වශයෙන් ගත්හ. දුනුදු ගණිති. තෙරුවන් උදෙසා කම්පල අදහා කුමක් පිදුව ද, එයින් පින් සිදු වේ. ඒ පිණෙන් ඉෂ්ට ඵලයක් ලැබීම කෂීනියාමය වේ. ඉෂ්ටඵලලාභය පවිනැසීමෙකැ යි කිය හැකි ය. එය කොයි පූජාවක් උදෙසා වුව ද යෙදේ. කුසතණ පූජාවට පමණක් යෙදෙන්නෙක් නොවේ. **'කුසති ඡිනත්ති භවති වානෙන නදති කු විය සර්ෂං විය ඝණහනනානං ශස්ත්‍රප්‍රදෙශං සශති ඡිනත්තීති - කුශෙඃ'** යනු පාලි පොත්වල එන තේරුම ය.

මෙහි **කුශ** ශබ්දය හා එක්ව සිටි **අගග** ශබ්දයෙන් අග, තුඩ කෙළවර, කිය වේ. **'අග්ගි කොඨාස කොටිසු පුරතොගගං වරෙ නිසු'** යනු කොෂාගත ය.

බාල, යන්නෙන් මෙහි දක්වන ලද්දේ යමක් කමක් නොතේරෙන අඥතෙමේ ම නොවේ. නොදත් දහම් ඇති දහම් පිරිසිඳ නොදත් ශීලාදිගුණධර්ම කිසිත් නැති බාහිර තීර්ථායතනයන්හි පැවිදි වූ කුහකකම් කරන්නේ ද අදහස් කරණ ලද්දේ ය. මෙහි අදහස් කරණ ලද්දේ හේය. **'බාලො අපරිඤ්ඤාතධම්මො ශීලාදිගුණපරිබාහිරො නිත්ථායතනෙ පබ්බජිතො'** යනු අට්ඨවාය.

තිත්ථායතනයන්හි පැවිද්ද, මොහුගේ අඥභාවය දියුණුවීමට හෙතු ය. දහම් නො දැනීමට ත් ශීලාදිගුණයන්ගෙන් බැහැර වීමට ත් ඒ පැවිද්ද කරුණු ය. තිත්ථායතනා යි කියේ තිත්ථිකයන්ගේ වාස ස්ථානය ය. දෙසැට මිසදිටු ඉපදීමට හෙතු කරුණු ත් තිත්ථායතන යි කියනු ලැබේ. දෙසැට මිසදිටු තිත්ථී නම්. ඒ ඉපදවූවෝ තිත්ථිඞ්කරයෝ ය. තිත්ථිඞ්කරයන් විසින් ඉපද වූ දෙසැට මිසදිටු ප්‍රිය කරන්නෝ, ඔවුන් පරලොව මිදුමට අදාළය යි පිළිගන්නෝ තිත්ථිකයෝ ය. ඔවුන්ට සිවුපසය දෙන්නෝ තිත්ථිශ්‍රාවකයෝ ය.

න සො සඞ්ඛතධම්මානං කලං අගඝති සොළසිං = නො දත් සිවුසස් දහම් ඇති ඒ අඥ තෙමේ සිවුසස් පිරිසිඳ දත් රහතුන් වහන්සේගේ සොළොස්වන **කලා**වට ත් නො පැමිණේ.

සඞ්ඛතධම්මානං, මින් ගැණෙන්නෝ අටවැදෑරුම් ආර්‍යීයන් වහන්සේ ය. සෝවන් වූවහු පටන් රහත් වූවහු තෙක් මෙ අතර සිටි ආර්‍යීයන් වහන්සේ ම සිවුසස් දහම් පිරිසිඳ දත්තෝ ය. **'හෙට්ඨිමකොටියා සොතාපන්නා සඞ්ඛතධම්මා' උපරිම කොටියා ඛීණාසවෝ, ඉමේසං සඞ්ඛතධම්මානං'** යි අටුවා ය. චතුර්විධ මාර්ගඥානයෙන් සොළොස් කිස සපැයීමෙන් චතුස්සත්‍යාව බෝධය කොට කරණ ලද කටයුතු ඇත්තෝ **සඞ්ඛතධම්ම** යි කියනු ලැබෙත්.

කලං, මෙහි ප්‍රකෘතිය කලා, යනු වේ. ඒ වනාහි අංශ, ශිල්ප චන්ද්‍රයාගේ සොළසමභාග යන අරුත්හි වැටේ. ගීතවාදනාදී වූ සිවුසැට **කලා**වෝ ද මෙයින් කිය වෙති. තවත් නොයෙක් අර්‍ථ සංසකෘතකොෂයන්හි දක්නට ලැබේ. මෙහි ආවා කොඩාශ වාචකය ය. **සොළසිං,** යන්න **කලා,** යන්නට විශෙෂණ ව සිටි හෙයින් මෙහි සොළොස්වන කොටස කිය වේ. **'සොළසන්නං පූරණී** = **සොළසි** යනු වාක්‍ය යි. එනම්, කොටස් සොළස සොළස බැගින්, සොළොස් වරක් බෙදූ ගන්නා කොටස, සොළොස්වන **කලා,** යි ගැණේ. සොළොස්වන වර සොළොසකට බෙදීමේ දී ලැබෙන එක් කොටසක් මෙයින් කියත්. ඇතැම් කෙනෙක් එනම්, සොළොස් කොටසක් කොට බෙදූ ගන්නා එක් කොටස කලා යි ගණිත්- ඒ නො මැනැවි. ආවාර්‍යීමතය මෙසේ වෙනස් වුව ත් මෙයින් ගැනෙන්නේ ඉතා සුලු කොටසක් බව සැලකිය යුතු ය.

සිවුසස් දහම් නො දත් සීලාදිගුණයන්ගෙන් තොර වූ කොහොන් පිළිවෙත් පුරණ තිත්ථිකයකුට සියක් අවුරුද්දක් ලොකය රවටමින් කරණ මිත්‍යාතපසින් ලැබෙන්නා වූ ඵලය

සිවුසස් දහම් පිරිසිඳ දත් රහතුන් වහන්සේට කාලයෙහි හෝ ආහාරයෙහි කුකුස් කොට එක් දවසක් අහර නො වැළඳීමෙන් උපන් කුසල චෙතනාව සොළොසට බෙදා, නැවැත ත් ඉන් එක් කොටසක් සොළසට ය, සොළසට ය යි මෙසේ සොළොස් වරක් බෙදීමෙන් ලැබෙන කොටසට කිසිලෙසකින් සම නො වන්නේ ය. කොහොන් තපස් කරන්නාහට තපස් කිරීමෙන් ලැබෙන්නා වූ ඵලයට වඩා ආර්‍යයන් වහන්සේ ගේ පෙර කියූ කුසලචෙතනාව පිළිබඳ සොළොස්වන කලාව ම ඉතා මහත් යි වදාළ සේක.

මේ අටුවා:- **'යාව තස්ස තථා තපචරණං පූරෙනතස්ස වස්සසතං චෙතනා යාවස්ස සඞ්ඝතඛම්මානං කාලං වා භත්තං වා කුක්කුච්චායිත්වා අභුඤ්ජනතාය එකභත්තචේදනා කුසලචෙතනා, තස්සා චෙතනාය සා තාව දිඝරත්තං පවත්ත චෙතනා සොළසිං කලං නාගඝති. යං තස්සා සඞ්ඝතඛම්මානං චෙතනාය ඵලං, තං සොළසකොට්ඨාසෙ කත්වා තතො එකෙකං පුන සොළස සොළස කොට්ඨාසෙ කත්වා තතො එකස්ස කොට්ඨාසස්ස යං ඵලං, තදෙව තස්ස බාලස්ස තප චරණතො මහන්නතරං'** යනු.

ධර්‍මදෙශනාවගේ අවසානයෙහි අසූසාර දහසක් ප්‍රාණීන්ට ධර්‍මාවබෝධය වූයේ ය.

ජම්බුකාජීවකවත්ථුව නිමියේ ය.

සඟසතු දේ කැමෙහි බිහිසුණුකම

5—12

දවසක ආයුෂ්මත් ලක්ෂණ සථවිරයන් වහන්සේ ත්, ආයුෂ්මත් මහාමෞදගල්‍යායන සථවිරයන් වහන්සේ ත් 'රජගහා නුවර පිඬුසිඟා යන්නෙමු' යි ගිජ්ඣකූට පර්වතයෙන් බස්නාහ. මෞදගල්‍යායන සථවිරයන් වහන්සේට එහි දී එක් අභිප්‍රෙතයකු දැකීමෙන් සිනා පහළ විය. ලක්ෂණ සථවිරයන් වහන්සේ ඒ දැක 'කුමක් නිසා සිනාසෙන්නහු දැ?' යි ඇසූහ. 'මෙයට පිළිතුරු දීමට මේ කාලය නොවේ, ලොවුතුරා බුදුරජුන් ඉදිරියෙහිදී එය අසන්නැ'යි උන්වහන්සේ කීහ. දෙදෙනා වහන්සේ ම පිඬු සිඟා අවසන් කොට බුදුරජුන් වෙත ගොස් හුන් කල්හි ලක්ෂණ සථවිරයන් වහන්සේ 'සථවිර තුමනි! ඔබවහන්සේ ගිජුකුළු පව්වෙන් බසිද්දී සිනාසෙනු දැක සිනාසෙන්නහු කුමක් නිසා දැ?' යි මම ඇසීම්, එවිට බුදුරජුන් ඉදිරියෙහිදී අසන්නැ' යි කීවහු ය, දැන් එය කියනු මැනැවැ' යි කීහ. ''ඇවැත්නි! මම එහි දී අභිප්‍රෙතයකු දුටුවෙමි, ඒ දුටු සැටියේ මට සිනා ගියේ ය, ඔහුගේ ඔලුව මිනිසකුගේ ඔලුවක් වැනි ය, කඳහරිය, සපීයකු වැනි ය, මේ අභිප්‍රෙතයා යොදුන් විසිපහක් පමණ දිග ය, ඔලුවෙන් නගින ගිනිදැල්ල, නගුට තෙක් දවාගෙණ යයි, නගුටින් නගින ගිනිදැල්ල, ඔලුව තෙක් එසේ ය යි, මැදින් නගින ගිනිදැල්ල, දෙපස දවා ය යි, දැලයෙන් නගින ගිනිදැල්ල මැද එක් වෙයි, ප්‍රෙතයන් දෙදෙනකුගේ ම කඳ පස්විසි යොදුන් පමණ ය, අනික් ප්‍රෙතයන්ගේ තුන් ගවු පමණ ය, මේ අභිප්‍රෙතයාගේ හා කාකප්‍රෙතයාගේ කඳ පස්විසි යොදුනකැ' යි මුගලන් මහතෙරනුවෝ වදාළහ. උන්වහන්සේ ම ගිජුකුළු පවු මුදුනෙහි පැසෙන කාකප්‍රෙතයා දැක, ඔහු පෙර කළ කර්මය විචාරන්නාහු 'තාගේ දිව ම පස්යොදුන් දිග ය, ඔලුව නවයොදුන් පමණ මහත ය, කඳ පස්විසි යොදුන් පමණ උස මහත ඇත්තේ ය, කෙබඳු පව්කමක් කොට මෙතරම් බිහිසුණු දුකකට පැමිණියෙහි දැ' යි ඇසූහ. එවිට ඔහු 'මම කසුප් බුදුරජුන් දවස සඞ්ඝයාට සැදැහැවතුන් විසින් එළ වූ බතින් බත්කටක් ගෙණ කෑවෙමි' යි කියා නැවැත 'සවාමීනි! කසුප් බුදුරජුන් දවස බොහෝ ගණනක් භික්ෂූන් වහන්සේලා ගමකට පිඬු සිඟා ගියහ. එහිදී එ ගම්වැස්සෝ උන්වහන්සේලා දැක සතුටු ව අසුන්හලෙහි පා සෝදා වඩා හිඳුවා කෑද වළඳවා පිළිගන්වා පිණ්ඩපාතකාලය ලංවනතුරු ම බණ අසමින් හුන්හ. ඒ බණ

අවසන්හි ඔවුහු උන්වහන්සේලාගේ පාත්‍ර ගෙණ ගෙවලට ගොස් නන් අන්දමේ උසස් රස යුත් අහරින් පාත්‍ර පුරවා පිළිගන්වනු පිණිස ගෙණ ආහ, මම එ දවස කපුටෙක් වැ උපන්නේ අසුන් හලෙහි වහල්පලය උඩ සැඟැවී වට පිට බලා ඉඳ එකකු ගෙණ ආ පාත්‍රයකින් කට පුරා තෙවරක් බත්කට තුනක් පැහැර ගෙණ කෑවෙමි, ඒ අහර, පාත්‍රවලට බෙදූ පමණ මුත් සඞ්ඝයාට නො පිළිගැන් වූ බැවින් සඟසතු වූයේ නො වේ, නියම කොට වෙන වෙන ම දුන්නේ ද නැත, වළඳ ඉතිරි වූයේ ද නො වේ, මා කෑයේ පාත්‍රවලට බෙදූව ද, ගෙවලට ගෙණ ගොස් නැවැත මිනිසුන් විසින් වුව ත් කෑයුතු අහර ටිකෙකි, හුදෙක් සඞ්ඝයාට කියා ගෙණ ආවා පමණෙකි, සඞ්ඝයාට අය ත් ගමක් බිමක් ගහක් කොළයක් මා ගත්තේ නැත, යටත් පිරිසෙයින් සඟසතු තණපතක් පොල් ඉරටක් පමණකු ත් නො ගත්තෙමි, වළඳ ඉතිරි වන බතින් තුන් කටක් ගත් පමණෙකි මා කෙළේ, ඒ පවින් ස්වාමීනි! මම අන්තඃකල්පයක් මෙසේ ආයු ඇති ව අවීචියෙහි ඉපිද, එහි ආයු පමණින් පැසී තවත් ඒ පව ටිකක් ඉතිරි වූ බැවින් මේ ගිජුකුළුපව්වෙහි කාකප්‍රෙත ව ඉපිද දුක් විඳිමි' යි විස්තර කොට කී ය.

කාකප්‍රෙතවස්තුව යි.

මෙහි දී මුගලන් මහතෙරනුවෝ 'මම අභිප්‍රෙතයකු දැක සිනා සීමි' යි කී කල්හි, බුදුරජානන් වහන්සේ 'මහණෙනි! මුගලන් කී කතාව ඇත්ත යි, මම ත් බුදු වූ දාම ඌ දුටිමි, එහෙත් මම මාගේ කීම නො අදහන්නෝ නම්, ඔවුනට එය අහිත පිණිස වන්නේ ය යනු දන්නා බැවින් තමුසේලා කෙරෙහි අනුකම්පාවෙන් ඒ වග මෙතෙක් නො කීමි' යි වදාළ සේක. රැස් ව හුන් භික්ෂූන් වහන්සේලා 'ඌ පෙර කළ දේ අපි නො දනිමු, එය වදාරනු මැනැවැ' යි ඇය ද සිටියාහ. එ කල්හි බුදුරජානන් වහන්සේ 'මහණෙනි! යටගිය දවස බරණැස් නුවර වැස්සෝ එ නුවර ගොදුරු ගම් කොට තබා ගංඉවුරෙක පසේ බුදුකෙනෙකුන්හට පන්සලක් කරවා දුන්හ, එහි වසන උන්වහන්සේ එ නුවරට පිඬු සිඟා වඩින සේක. නුවර වැස්සෝ ත් උදේ සවස සුවඳ මල් ගත් අත් ඇති ව පසේ බුදුරජුන් පුදන්නට පන්සලට යන්නෝය, එ නුවර ම වැසි මිනිසෙක් ඒ අසල ම කුඹුරක් සෑයේ ය, පන්සල් යන්නෝ ඒ කුඹුර උඩින් ම පන්සල් යති, ගොවියා 'කුඹුර උඩින් නො යවු' යි කීවෝ ද, ඔවුහු එසේ ම ගියහ, ඒ වළකාලනු බැරි විය, එ කල ඔහු පසේ බුදුරජුන්ගේ පන්සල මෙහි නො වේ නම්, මේ කරදර මොකුත් නැත, කුඹුරට හානියක් ද

නො වේ, පන්සල කඩා බිඳ දැමිය යුතු ය, යි සිතා පසේ බුදුරජුන් සිඟා ගිය අතර එහි ගොස් පන්සල් ගෙය තුළ තුබූ බඩුමුට්ටු පොඩිකර එහි දමා පන්සල් ගෙට ගිනි තැබී ය, පසේ බුදුරජානන් වහන්සේ සිඟා ගෙණ ආ සේක්, පන්සල ගිනි ඇවිළ දනබව දැක, අන් තැනක වැඩි සේක, නුවර වැස්සෝ පන්සල් ගියෝ පන්සල, දැ ගියබව දැක 'හාමුදුරුවෝ කො තැනෙක ගියෝ දැ' යි කෑ ගසන්නට වූහ, ගොවියා ද මොවුන් සමග ම පන්සල් ගියේ 'පන්සල ගිනි තැබුවේ මමැ' යි කී ය. එයින් කෝපයට පත් මිනිස්සු 'ඕකා ගණිවූ, ඔය පාපයා නිසා බුදුරජුන් දකිනු නැති වී ය, යි අල්ලා ගෙණ අතින් පයින් පොලු මුගුරුවලින් පහර දී එ තැන ම මරා දැමූහ, ඒ ගොවියා මේ පව්කමින් අවීවියෙහි ඉපිද මහපොළොව පසින් යොදුනක් පමණ උස්වන තුරු ම පැසී ඉතිරි වූ පව්කමින් ගිජුකුළු පව්වෙහි අභිප්‍රෙත ව උපනැ' යි වදාළ සේක. එහිදී බුදුරජානන් වහන්සේ මෙසේ ඌ කළ පෙර කම් පවසා 'මහණෙනි! පව්කම් නම් කිරිවැනි ය, දෙවන කිරි ඒ දෙවගත් සැටියේ ම නො මිදෙයි, දී බඳුන් ඈ ඇඹුල්රසැති බඳුනෙක වක් කරණතුරු හෝ නො මිදෙ යි, එමෙන් පව්කම් ද යම් දවසෙක පැසේ නම්, විපාක දේ නම්, එ දවස මෙබඳු දුකින් සොක කෙරේ ය, යි අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

න හි පාපං කතං කම්මං සජ්ජුඛීරං ව මුච්චති,
ඩහන්තං බාලමන්වෙති භස්මච්ඡන්නො ව පාවකොති.

කරණ ලද පාපකර්ම ය, දෙවූ කෙණෙහි ම (නො මිදෙන) කිරි සේ කළ කෙණෙහි ම විපාකයට නො පෙරළෙ යි. අලුවලින් වැසුන ගින්නක් සේ ඒ පාපියා දවමින් ලුහුබැඳ යයි.

න හි පාපං කතං කම්මං සජ්ජුඛීරං ඉව මුච්චති = කළ පාප කර්මය ඒ කළ කෙණෙහි ම දෙවගත් කිරි, දෙවූ විගසම නො මිදෙන්නා සේ විපාක නො දෙයි.

ඩහන්තං = දවමින්.

බාලංඅන්වෙති = බාලයා ලුහුබැඳ පසුපස්සෙහි යන්නේ ය.

භස්මච්ඡන්නො ඉව පාවකො = අලුවලින් වැසුනු ගින්නක් සේ.

භස්ම, නම්, හළු යි. **පාවක,** නම්, ගින්න යි. කස්ලෝ රෙදි පිළි ආදියෙහි පිරිසිදුකම දීප්තිය අළු ලා මැදීමෙන් සේදීමෙන් ඇති කළ හැකි ය. අළු භස්ම, යි කීයේ එහෙයිනි. **'මලින කංස වත්ථාදීනං භූං දිත්තිං සෙති පවත්තතීති භස්මං, භසති අධො පතති වත්ථාදීනං මලං එතෙනාති භස්මං, භසති පගස්සරතීති**

වා හසමං, යනු විවෘතියි. ගින්නෙහි ලා පිළිස්සීමෙන් ද යම් යම් වස්තූන්ගේ පිරිසිදුකම වන්නේ ය. පිරිසිදු කරණ අර්ථයෙන් ගින්න පාවකැ, යි කියනු ලැබේ.

යම්කිසි බඳුනකට දෙවගත් උණ කිරට, මෝරු ආදී මුහුන් නො දමන ලද්දේ නම් හෝ, දී බඳුන් ආදී ඇඹුල්රසැති අන් බඳුනෙක නො බහන ලද්දේ නම් හෝ නො මිදෙයි. තමන්ගේ ඒ මුල් අවස්ථාව නො හැර නො මිදී සිටි යි. එ පරිද්දෙන් පාපකර්ම්ය කළ විගස ම පැසෙන්නේ, විපාක දෙන්නේ නො වේ. එසේ කළ කෙණෙහි ම විපාක දෙන්නේ නම් කිසිකෙනෙක් පව්කම් කරන්නට ඉදිරිපත් නො වෙති. පව්කම් කිරීමෙහි පොහොසත් නො වෙති. පෙර අත්බව්හි කළ කුසලයන්ගේ විපාකවසයෙන් හටගෙණ ඇති සකන්ධයෝ යම් තාක් පවතිත් ද, ඒ තාක් ඒ විපාක සකන්ධයෝ පාපකාරී පුද්ගලයා රැක ගණිත්. මෙ කල පව් කළ ද පෙර කළ පින්, විපාකවාර ලැබ පවත්නාතුරු පව්කළ තැනැත්තේ මඳ කලකට රැකෙ යි. ඒ පෙරකළ පින් බලෙන් ලත් සකන්ධයෝ යම් දවසෙක බිඳී ගියෝ ද, අවසන් ව ගියෝ ද, එ කල්හි හෙතෙමේ අපායයෙහි ඉපද පැසෙන්නේ ය. අපාය යෙහි පහළ වූ සකන්ධවිෂයයෙහි පාපකර්ම්ය විපාක දෙන්නේ ය. අළුවලින් වැසීගිය ගිනි අඟුරු පැගුව ද, අළුවලින් වැසී තිබෙන බැවින් පා නො දවයි. අළු ඉවත දමා පැගුවිට සම් සිවි ආදිය දවමින් හිස තෙක් ගින්න පැතිරී ය යි. එ පරිද්දෙන් යමකු විසින් පව් කමෙක් කරණ ලද්දේ නම් එය ඒ පව්කම කළ පාපයා දෙවන හෝ තුන්වන අත්බවේ දී නිරයයෙහි ඉපද යන්නහු දවමින් ලුහුබැඳ යන්නේ ය, යනු මෙහි අදහස ය. කළ කෙණෙහි ම විපාක නො දෙන්නේ ය, යි කී සේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

අභිප්‍රෙතවසතුව නිමියේ ය.

සඞ්කුට ප්‍රේතයා

5 — 13

මහමුගලන් තෙරනුවෝ ලඤ්ඡණ සථවිරයන් වහන්සේ සමග ගිජ්ඣකූළ පව්වෙන් පහතට බස්නෝ එක් තැනෙකදී සිනාසී පහළ කළහ. ඒ දුටු ලඤ්ඡණ සථවිරයන් වහන්සේ සිනාසීමේ හෙතුව විචාළවිට, 'බුදුරජුන් ඉදිරියෙහි දී විචාරව' යි කීහ. පිඬු සිඟීමෙන් පසු බුදුරජුන් කරා ගොස් වැඳ හුන් කල්හි ලඤ්ඡණ සථවිරයන් වහන්සේ 'අතර මගදී කුමක් නිසා සිනා පහළ කළහු දැ' යි මුගලන් තෙරුන් ගෙන් ඇසූහ. 'ඇවැත්නි! මම එහිදී තුන් ගවු පමණ සිරුරක් ඇති ප්‍රේතයකු දුටු වෙමි, ඝනීගත් යකුළු සැටදහසක් එක විට ඔහුගේ ඔලුව උඩ කඩා වැටෙයි, නැවැත නැවැත ත් මතු මතු ව එසේ ම හිස මතුපිට වැටෙයි, ඒ හැමවර හිස දෙපළු වේ, එහෙත් පාපකර්මවිපාකයෙන් නැවැත හටගැණේ, මෙවැනි ආත්මභාවයක් මෙයට කලින් මා දුක නැත, සිනා හියේ ඔහු දුකැ' යි මුගලන් තෙරනුවෝ කීහ.

'සඞ්කුටසහස්සානි පරිපුණ්ණානි සබ්බසෝ,
සිසෙ තුයහං නිපතන්ති වොහින්දනෙනව මත්ථකං'

යනාදිය මූ සඳහා ප්‍රේතවස්තුප්‍රකරණයෙහි කියන ලද්දේ ය.

එවිට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ 'මහණෙනි! මම ත් බෝ මැඩදී ම ඔය කියන ප්‍රේතයා දුටිමි, එහෙත් යම්කෙනෙක් මාගේ වචනය නො අදහන්නෝ නම්, එය ඔවුනට අනර්ථ පිණිස පැවැතිය හැකි බැවින් උන් කෙරෙහි කරුණාවෙන් මා දුටු බව මෙතෙක් නො කීමි, දැන් මුගලන් තැන ත් දුක ඇති බැවින් මා දුටු බව ත් කියමි' යි වදාළ සේක. එකල භික්ෂූන් වහන්සේලා ඌ පෙරකළ කර්මය කිමැ?' යි ඇසූහ.

බුදුරජාණන් වහන්සේ 'මහණෙනි! යටගිය දවස බරණැස් නුවර අතකුරු ගැසීමේ අතිසමර්ථ වූ පිළෙක් විය, ඔහු විසූයේ එ නුවර දොරකඩ අසල වූ නුගගසක් යට ය, කුඩා කොල්ලන් එහි පැමිණ පිළා වට කොට සිට 'කැට ගල් ගසා අපට ඇත් රූ අස් රූ දක්වන්නැ' යි කී කල්හි කොල්ලන් කියන රූ දක්වමින් කෑම් පිම් ආදී මොකව ත් ලබා ගෙණ ජීවිකාව කර යි, දිනක් රජ තෙමේ උයනට යනුයේ එහි පැමිණියේ ය, එවිට කොල්ලෝ පිළා නුග අරළු හස්සේ ලා සඟවා පැන හියහ, ඉරමුදුන් වේලෙහි නුගගස යට සිටි රජුගේ ඇඟෙහි නුගකොළවල සෑදී තුබූ

සිදුරුවලින් ඇත් රූ අස් රූ වැනි නොයෙක් රූ සටහන් වැටින, රජ තෙමේ උඩ බැලුවිට නුග කොළවල ඇත් රූ අස් රූ සේ සිදී තුබූ සිදුරු දැක 'මේ කාගේ වැඩෙක් දැ' යි අසා එහි සිටියවුන් 'පිලකුගේ වැඩෙකැ' යි කී කල්හි 'ඌ දැන් කොහි දැ' යි සොයා බලා කැඳවා 'මාගේ පෙරෙවි බමුණු ලොකු වාවාලයෙක් ය, නිතර දෙඩවන්නට ගජසමතෙක් ය, මා ටිකක් කී විට ඔහු හුඟක් කිය යි, එය මට මහත් කරදරයක් ව තිබේ, වැඩට ලොකු බාධාවෙකි, ඒ නිසා ඌ දෙඩනවිට එළබෙට් නැළියක් තරම් උගේ කටට වීසි කරන්නට නුඹට හැක්කේ දැ?' යි ඇසී ය, 'දෙවයන් වහන්ස! ඔක ත් මහවැඩෙක් ද, එළබෙට් නැළියක් ගෙන්වා දුන මැනැවි, ඔබවහන්සේ පෙරෙවියා ත් සමග කඩතුරාවක් ඇතුළත වැඩ ඉන්න; අනික් හරිය මම බලා ගන්නෙමි' යි පිලා කී ය, රජ තෙමේ එළබෙට් නැළියක් ගෙන්වා දී පිලා කී ලෙසට කඩතුරාව ඇතුළට වී කතා කරමින් හුන්නේ ය, පිලා, කතුරුකොණින් තිරයෙහි සිදුරක් කපා පෙරෙවියා කතාවට කට හරි ත් හරි ත් ම එක එක එළබෙට්ට පෙරෙවියාගේ කටට වීසි කෙළේ ය, ඔහු කටට වැටුනු හැම එළබෙට්ට කතා කර කර ම ගිල්ලේ ය. පිලා, එළබෙට් නැළිය අවසන් වූවිට තිරය සෙලවී ය, රජ ඒ හලකුණෙන් එළබෙට් අවසන් වූ බව දැන 'ගුරුන්නාන්සේ මට ඔහේ සමග කතා කරලා අවසානයක් කරන්නට බැරි ය, ඔහේ ලොකු ම වාවාලයකු බැවින් නැළියක් තරම් එළබෙට් ගිලල ත් නිශ්ශබ්ද නො වූයෙහි' යි කීයේ ය, එ තැන් පටන් පෙරෙවි තෙමේ මකුබවට පැමිණ කට හැර රජු සමග කතා කරන්නට අපොහොසත් විය, රජ, පිලා ගෙන්වා 'තා නිසා මට ලැබුනේ මහත් වාසියෙකැ' යි සතුටු ව ඔහුට සබ්බඤ්ඤ' නම් ධනය දී නුවර සතර පැත්තේ ගම්වර සතරකු ත් දුන්නේ ය, ඒ දැන රජුට අනුශාසනා කරණ ඇමැති තෙමේ:-

'යම් කෙබදු වූ වද - සිප් නම් මහත් වේ මය,
බල, පිළිගෙ පහරින් - ලැබූ සිවුදිග ගම්වර'

යි මේ ගය කීයේ ය.

ඒ කාලයෙහි අමාත්‍ය වූවෝ මේ භාග්‍යවතුන් වහන්සේ ය. එක් පුරුෂයෙක් පිලා විසින් ලත් සමපත් දැක 'මෙතෙමේ පිලෙක් වී ශිල්පය නිසා මහත් සමපතට පැමිණියේ ය, මාත් මෙය උගත යුතු ය' යි පිලා සමීපයට ගොස් වැද 'ආචාර්‍ය්‍ය ය! මට ඔය ශිල්පය උගන්වනු මැනැවැ' යි කියා සිටියේ ය, එවිට උගන්වනු බැරිය' යි පිලා කී ය, ඉන් පසුබට නො වූ ඔහු පිලා වෙත යමින් එමින් කලක් ඔහුගේ අත් පා මෙහෙ කිරීම් ආදී වතාවත් කරමින් සිට

සිත් ගෙණ නැවැත ත් 'ශිල්ප උගත් වන්නැ' යි ඉල්ලී ය, ඒ වර 'මූ මට බොහෝ උපකාර ව සිටී යි, එහෙයින් මේ ඉල්ලීම වළකනු බැරි ය' යි ශිල්ප උගන්වා 'දරුව! තට දැන් ශිල්ප පුහුණු විය, මේ තැන් සිට කුමක් කරන්නෙහි දැ?' යි පිළා ඇසූ කල්හි 'මේ නුවරින් බැහැර ගොස් ශිල්ප විමසන්නෙමි' යි ඔහු කී ය, 'ශිල්ප විමසන්නේ කෙසේ දැ?' යි ඇසූ විට ගවයකු හෝ මිනිසකු පහරා මරන්නෙමි' යි කී ය, එවිට 'දරුව! එය ලොකුවරදෙකි, ගවයකු මරන්නාහට දඬය සියයෙකි, මිනිසකු මරන්නාහට දඬය දහසෙකි, අඹු-දරුවන් සහිත වූ දුප්පත් තෝ එබන්දක් කලොත් නිදහසක් නොලබන්නෙහි ය, නොනැසෙව, යමකුට පහර දුන් කල්හි එයින් දඬමුඩ ගැසීමෙක් නොවේ නම්, එබදු කා ත් කවුරු ත් නැති එකකු සොයා පහර දෙව' යි පිළා කී ය, ඔහු 'ඒ යහපතැ' යි පිළිගෙණ ඔඩොක්කුවෙහි ගල්කැට ලා එබන්දකු සොයමින් යන්නේ ගව දෙනක දුක 'මැ අසිහිකාරයන් ඇත්තිය කැ' යි සලකා අතහැර යනුයේ මිනිසකු දුක 'මූ ද මවුපියන් ඇත්තෙකැ' යි පහර නොදී හියේ ය, එ වේලෙහි සුනෙත්ත නම් පසේ බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා යන්නහු දුක 'මේ නම් මවුපියන් නැත්තෙක, මොහුට ගැසුවාට දඬමුඩ ගැසීමෙක් නොවේ, මොහුට පහර දී ශිල්ප විමසන්නෙමි' යි පසේ බුදුන්ගේ දකුණු කන් බිලට ඉලක්ක කොට ගලක් ගැසී ය, 'අහෝ ලොකයෙහි සැටි, ඒ ගල දකුණු කන් බිලයෙන් ඇතුල්ව වම් කන් බිලයෙන් පිට විය, බලවත් වේදනාවක් හට ගත, බුදුරජ තෙමේ පිඬු සිඟා යෑමෙහි අපොහොසත් වී ය, රෝගාතුර වී ය, උන් වහන්සේ අහසින් පන්සලට වැඩ එහි දී පිරිනිවියාහ, ගම්වැස්සෝ පසේ බුදුරජුන් පිඬු සිඟා නොවැඩි ය බැවින් රෝගාතුර වන්නට ඇතැ යි සිතා එහි ගියෝ පිරිනිවි බව දුක හඬන්නට වැලපෙන්නට වූහ, ගල ගැසූ මිනිසා ද ඔවුන් සමග ගියේ පසේ බුදුරජුන් හැදින 'මේ හාමුදුරුවන් ඊයේ පිඬු සිඟා යද්දී නුවර දෙර ලඟදී මම මා ඉගෙණ ගත් ශිල්පය විමසනු පිණිස හාමුදුරුවන් ඉලක්ක කොට ගලක් දමා ගැසීමි' යි කී ය, එවිට මිනිස්සු ඒ මිනිසා අල්ලා ගෙණ අතින් පයින් පොලුවලින් තලා පියා මරා දැමූහ, ඔහු ඒ පවින් අවීචියෙහි උපන, මහපොළොව යොදුනක් පමණ වැඩෙනතුරු ම අවීචියෙහි දුක් විඳ ඉතිරි වූ කර්මයාගේ විපාක වසයෙන් ගිජු කුළු පවු මුදුනෙහි සසීකූටප්‍රෙත ව උපන්නේ ය' යි බුදුරජාණන් වහන්සේ උන පෙර කළ කර්මය මෙසේ දක්වා 'මහණෙනි! බාලයා ඉගෙණ ගන්නා ශිල්පය ත් ලබන්නා වූ ඓශ්වර්යය ත් දෙක ම ඔහුට විපත් පිණිස වන්නේ ය, යමක් කාමක් උගත් අඥානයාත් ධන ධාන්‍යාදියෙන් පොහොසත්

මෝඩයා ත් යන දෙදෙන ම තම තමන්ට විපතක් ම අවැඩක් ම විනාශයක් ම කර ගණිති' යි අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති,
හනති බාලස්ස සුක්කංසං මුඩමස්ස විපාතයන්ති.

බාලයා උගත් ශිල්පය නොහොත්, බාලයා බොහෝ දෙනා අතර ප්‍රසිද්ධවීම ඔහුට විනාශය පිණිස ම වන්නේ ය. බාලයාගේ ප්‍රඥා නමැති හිස පළමින් කුසල් කොටස නසන්නේ ය.

යාවදෙව අනත්ථාය = අවැඩ පිණිස පමණක්.

ඤත්තං = ශිල්ප ශාස්ත්‍ර ඥානය නොහොත්, ප්‍රසිද්ධිය.

යමෙක් යම් ශිල්පයක් දනී ද, යම්බඳු සම්පත්තියක් කිත්තියක් ලබා සිටී ද, එහෙයින් ම ඔහු මහාජනයා අතර ප්‍රසිද්ධියට ය යි. එබඳු ශිල්පශාස්ත්‍රඥානය ත් ප්‍රසිද්ධිය ත් මෙයින් කිය වේ.

බාලස්ස = බාලයා විසින් නොහොත් බාලයාගේ.

ජායති = හටගණී යි.

හනති = නසයි.

සුක්කංසං = කුශලකොඨාශය.

කුශලය පවිත්‍ර බැවින් **සුක්ක**, යි කියනු ලැබේ. ශුක්‍ර, ශුඩ පුණ්‍ය යන අරුත්හි මේ වැටේ. **'සුක්කස්ස පරිහිනා සත්තො ජරා දුබ්බලත්තං පාපුණාති'** යනාදියෙහි ශුක්‍රයෙහි වැටේ. **'සුක්කං වත්ථං පරිච්චජි'** යනාදියෙහි ආයේ ශුඩාර්ථයෙහි ය. **'සුක්කං සුක්කවිපාකං'** යනාදියෙහි ආයේ කුශලයෙහි ය. ඒ හා එක් ව සිටි **අංස** ශබදයෙන් කොටස කිය වේ. සකන්ධ, කොඨාශාර්ථයන් කිය යි. **'උභො අංසෙ පාරුපති'** යන මෙහි සකන්ධ වාචක යි. දසරුව යි. **'අතීතංසෙ අප්පටිහතං ඤාණං'** මෙහි වූයේ මෙහි මෙන් කොඨාශාර්ථය කියා.

මුඩං අස්ස විපාතයං = බාලයාගේ ප්‍රඥා නමැති හිස පළමින් සිඳලමින්.

උකුණු ලේඛි ආදීහු මෙහි සතුටු වෙත් නු යි හිස **මුඩ**, යි, කියනු ලැබේ. මෙහි ගැණෙනුයේ ඒ නො වේ. මිනිසාගේ නුවණ මිනිසාට හිසවැනි හෙයින් මෙහි මුඩ ශබදයෙන් ප්‍රඥාව ගැණේ. නුවණ නැති මිනිසා මළ එකකු වැනිය යි කීයේ එහෙයිනි. නුවණ නැත්තේ හිස තිබුනේ ද මළ මිනිසකුට වඩා වෙනස් නො වේ.

අඤ්ඤ, යනු යෙදුනේ බාලයා සඳහා ය. **විපාතඤ්ච,** යන්නෙහි වූ ච් උපසර්ගය, විවිධ- අතිශය- අභාව- භෘශ- ඓශ්වර්‍ය්‍ය- අතික්‍රම- විරහ- කලහ- ප්‍රාදුර්භාව- කථන- කුත්සිත- දූර- අනභිමුඛ- මොහ- අනවසර්ජිති- ප්‍රධාන- දක්ෂ- පරිශ්‍රම- සහාර්‍ථ යන මෙහි දක්නා ලැබේ. **විමති- විමුතති- විමලෝ- විරති- විරූළහකෝ- විතිවතතතා- විපපයෝගෝ- විවාදෙ- විජාතා- විභාතා- විරූපෝ- විදෙසා- විමුබෝ- විමුලෙහා- විබභතතතා- විමුතති- විපඤ්ඤි- විඤ්ඤමිතා- විඤ්ඤාඤෝ-** යන මොවුහු පිළිවෙළින් නිදර්‍ශනයෝ ය. ආදිකර්‍මි-විරුඬාර්‍ථයන්හි ද මේ වැවේ. **විපප කතං- විරොබෝ** යනු එයට නිදසුන් ය. මෙහි වූයේ විවිධ අනිශයාර්‍ථයන්හි ය. එහෙයින් නොයෙන් ලෙසින් සිද හෙලමින් අනිශයින් සිද හෙලමින් යි අරුත් කිය හැකි ය.

බාලයාගේ ශිල්පශාස්ත්‍රඥානය ත් ධනධාන්‍යාදිඓශ්වර්‍ය්‍ය ත් ඔහුට ම විපත් පිණිස වේ. එ පමණෙක් නො වේ. එය ඔහුගේ කුශලකොඬාශය ත් ප්‍රඥ නමැති හිස ත් සිද දමා අපායයෙහි ලන්නේ ය, යනු කෙටි අදහස ය. දෙවිදත්තෙර-ආනන්ද සිටු ආදීහු මෙය අර්‍ථවත් කෙරෙති.

ධර්‍මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය.

සකිකූටප්‍රෙතවස්තුව නිමියේ ය.

සුධම්ම සථවිරයන් වහන්සේ

5 - 14

මච්ඡිකාසණ්ඩනගරයෙහි චිත්‍ර නම් ගෘහපතියෙක් වාසය කෙළේ ය. පස්වග තෙරුන්ට ඇතුළත් මහානාම තෙරුන් පිඬු පිණිස හැසිරෙන්නහු දුටු ඔහු උන්වහන්සේගේ ඉරියව්වල පැහැද පාත්‍රය ගෙණ ගෙට වැඩමවා වළඳවා අවසන්හි බණ අසන්නේ සෝවන් පලයට පැමිණියේ ය. එයින් නො සැලෙන සැදැහැ ඇතියේ තමන්ගේ අම්බරුල්ල නම් වන උයන, සඞ්ඝාරාමයක් කරණු කැමැත්තේ තෙරුන් අත පැන් වක්කර හාර කෙළේය. 'එකෙණෙහි බුදුසසුන පිහිටියේ වනැ, සි දිය කෙළවර කොට මහපොළොව සැලින. මහාසිටු තෙමේ උයනෙහි මහාවෙහෙරක් කර වූයේ හැම දිගින් වැඩියා වූ භික්‍ෂූන්ට හළදෙර ඇත්තෙක් විය. සුධම්ම සථවිර තෙමේ මච්ඡිකාසණ්ඩයෙහි නෙවාසික විය. ඉන් පසු කලෙක දැගසව්වෝ චිත්‍ර ගෘහපතියාගේ ගුණ කතාව අසා ඔහුට සංග්‍රහ කරණු කැමති ව මච්ඡිකාසණ්ඩයට වැඩියාහු ය. ගැහැවි තෙමේ උන්වහන්සේලා වැඩිබව අසා අඩ යොදුනක් ඉදිරියට ගොස් උන්වහන්සේලා පිළිගෙණ තම වෙහෙරට වැඩම කරවා ආගනතුග වත් කොට 'සවාමීනි! බණ ටිකක් අසනු කැමැත්තෙමි' සි දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් ඇයැද සිටියේ ය. එවිට උන්වහන්සේ 'උපාසකය! ගමන් විඩාවෙන් අපි වෙහෙසට පත්ව සිටිමු, ඇහට අමාරු ය, ඒ වුනත් ඔබගේ ඉල්ලීම නිසා බණ ටිකක් කියන්නෙමි, හොඳට අසව' යි බණ කීහ. ඔහු බණ අසා සිටියදී ම අනාගාමි ඵලයට පැමිණ දැගසව්වන් වැඳ 'සවාමීනි! හෙට දහසක් දෙනා වහන්සේ සමග මාගේ දුනය පිළිගණු මැනැවැ' සි ආරාධනා කොට නැවැත නෙවාසික වූ සුධම්ම තෙරුන් වෙත ගොස් 'සවාමීනි! ඔබවහන්සේ ත් හෙට දැගසවු තෙරුන් සමග දුනය පිණිස අප ගෙට වැඩම කරණු මැනැවැ'යි ආරාධනා කෙළේ ය. සුධම්ම සථවිර තෙමේ 'මෙතෙමේ මට ආරාධනා කළේ හැමට පසු' සි කිපී එය පිළිකෙව් කොට සිටියේ නැවැත කිහිපවරක් ඇයැදුනේ ද, ආරාධනාව නො පිළිගත්තේ ය. උපාසක තෙමේ 'සවාමීනි! ඔබවහන්සේ ම පෙණෙන සේක් මැ' යි කියා ගොස් පසුදා තම නිවසෙහි දන් පිළියෙල කෙළේ ය. සුධම්ම සථවිර තෙමේ ද 'ගැහැවියා විසින් අග සව්වන්ට පිළියෙල කළ සත්‍යාරය කෙබඳු දැ යි හෙට ගොස් බලන්නෙමු' යි සිතා උදැසන ම පා සිවුරු ගෙණ ඔහුගේ ගෙට

ගියේ ය. ගැහැවිහු විසින් 'සවාමිනි! මෙහි වැඩ ඉන්නැ' යි කියනු ලැබූ ඒ සුඛමම සථවිර තෙමේ 'මම මෙහි ඉන්නට නො ඇයෙමි, පිඬු සිඟා යන්නට මට පිළිවනැ' යි කියා එහි පිළියෙල කොට තුබූ දුන වසතුව බලා ගැහැවියාට ජාතියෙන් ගටනු කැමැති ව 'ගැහැවිය! තාගේ දුනය නම් ඉතා ලොකු ය, ඉතා මහත් ය, එහෙත් මෙහි එකෙක් අඩුය' යි කී ය. 'කුමක්ද? සවාමිනි!' යි ඔහු ඇසූවිට 'තලගුලි' යි කී ය. ඉක්බිති ගැහැවි තෙමේ 'ඔබවහන්සේ කපුටකු වැනි ය' යි එහිදී ම අවමන් කෙළේ ය. එයින් කිපුනු සුඛමම සථවිර තෙමේ 'ගැහැවිය! තමුසේගේ ආවාසය රකින්නට මට බැරි ය, එය බාර ගන්නැ' යි කියා යන්නට පිටත් වූ කල 'වඩින්නට එපා! නවතින්නැ' යි තුන් විටක් ම කියන ලද්දේ ද, එහෙත් නො නැවතී බුදුරජුන් වෙත ගොස් ගැහැවියා හා තමා අතර හුවමාරු වූ වචන කියා සිටියේ ය. බුදුරජානන් වහන්සේ 'ශ්‍රද්ධාවත් රතනත්‍රයයෙහි ප්‍රසන්න වූ උපාසක තෙමේ තා විසින් නින්දා කරණ ලදැ' යි ඔහු පිට ම දෙස් තබා පටිසාරණීයකම්ම කරවා 'යව! සිත් ගැහැවියා කමා කරන්නැ' යි පිටත් කොට එහි යැවූ සේක. ඔහු, ගැහැවියා වෙත ගොස් 'ගැහැවිය! වරද මා අතේ ය, එ හෙයින් මට කමා කරන්නැ' යි කී ය. 'මම ඔබට කමා නො කරමි' යි ගැහැවියා කී කල්හි නැවැත ත් සුඛමම සථවිර තෙමේ බුදුරජුන් වෙත ගියේ ඒ වග කීයේ ය. බුදුරජානන් වහන්සේ 'මොහුට උපාසකයා කමා නො කරන්නේ ය' යි දත් සේක් ද 'මොහු මානයෙන් තද ව ගියේ ය, මොහුගේ මානය මෙ තැන දී බිඳ හැරිය යුතු ය' යි තිස් යොදුන් මග ගොස් ආවහු, නැවැත ත් කමා කරවන්නට උපායකු ත් නො වදරා ම පිටත් කොට යැවූහ. ඒ වර ත් එහි ගොස් නැවැත ආ, මත් නැසී තුබූ ඔහුට දෙවැන්නකු දී 'යව! මොහු සමග ගොස් උපාසකයා කමා කරවන්නැ'යි වදරා 'මාගේ විහාර ය, මා වසන තැන ය, මාගේ දායකයා ය, මාගේ දායිකාව ය' යි මහණුන්ට මාන්නයක් අහංකාරයක් උපදවන්නට නො වටනේ ය, මෙසේ සිතන්නහුගේ රිෂ්‍යාමානාදී කෙලෙසයෝ තදින් වැඩෙත්' යි අනුසනි ගළපා දහම් දෙසන සේක් මේ ගය වදාළ සේක:-

අසතං භාවනමිච්ඡය්‍ය පුරෙක්ඛාරං ච භික්ඛුසු,
ආවාසෙසු ච ඉස්සරියං පූජා පරකුලෙසු ච.

මමෙව කතමඤ්ඤනතු ගිහී පබ්බජිතා උභො,
මමෙව අතිවසා අස්සු කිච්චාකිච්චෙසු කිස්මි චි,
ඉති බාලස්ස සඞ්කප්පා ඉච්ඡා මානො ච වඩ්ඪතීති.

නුවණ නැති මහණ තෙමේ තමන් තුළ නැති ගුණයෙන් බුහුමන් කිරීම ද, මහණුන් අතර පෙරටු කරණු ලැබීම ද, ආවාසයන්හි ඉසුරු බව ද, නොයෙක් කුලයන්හි සිවුපස පූජා ද කැමති වන්නේ ය.

ගිහියෝ ත් පැවිද්දෝ ත් යන දෙ කොටස 'මා විසින් ම විහාරයෙහි හැම කටයුතු කරණ ලදැ' යි දනිත්වා යි ද, කිසියම් කුදු මහත් කටයුතුවලදී මට ම අනුව පවතිත්වා, යි ද මෙසේ බාලයාහට අදහස් වේ. එ හෙයින් ඔහුට නෑසණාව ද මානය ද වැඩේ.

අසතං භාවනං ඉච්ඡේය්‍ය = තමන් තුළ නැති ගුණයෙන් මහාජනයා විසින් කරණ බුහුමන කැමැති වන්නේ ය.

නුවණ නැති මහණ, 'තෙමේ ශ්‍රද්ධා නැත්තේ ශ්‍රද්ධා ඇත්තකු ලෙස, සිල් නැත්තේ සිල් ඇත්තකු ලෙස, උගත්කම් නැත්තේ උගත්කම් ඇත්තකු ලෙස, අවිවෙකී වූයේ විවෙකියකු ලෙස, කුසීත වූයේ අකුසීතයකු ලෙස, සිහි නැත්තේ සිහි ඇත්තකු ලෙස, සමාහිත නොවූයේ සමාහිතයකු ලෙස, අඳ වූයේ ප්‍රාඥයකු ලෙස, නොරහත් වූයේ රහතකු ලෙස, මහාජන තෙමේ පිළිගණීවා' යි සන්සුන් ඉරියවු පැවැත්වීමෙන් බුහුමන් ලැබීමට බලාපොරොත්තු වන්නේ ය.

තවද ගරුබුහුමන් ලැබීමේ ආශාවෙන් මඩනා ලදුයේ 'මෙසේ ඇතිකල මට ගරු බුහුමන් කෙරේ ය' යි සිතා 'මෙබඳු පිරිකරින් යැපෙන්නේ මෙබඳු වෙහෙරෙක වසනුයේ ධ්‍යානලාභියෙක, මාගීඵලලාභියෙක යනාදීන් තෙමේ ම තමන්ගේ ගුණ කියයි.

පුරෙකඛාරං ච භික්ඛූසු = මහණුන් අතර පෙරටු කරණු ලැබීම.

'වෙහෙර වසන සියලු දෙනා වහන්සේ, මා පිරිවරා ගෙණ මාගෙන් බණ දහම් උගණිමින් පැණ පිළිච්සමින් මා ම ප්‍රධාන ස්ථවිරයන් කොට හැසිරෙත්වා' යි නුවණ නැති මහණ තෙමේ නිතර බලාපොරොත්තු වේ. මොන ලෙසකිනුත් තමහට නොතරම් ගරු සැලකිලි බලාපොරොත්තුවීම, තෙමේ ගුණ නැත්තේ ද, ගුණ ඇත්තන් කෙරෙහි ලා සමතත්වයෙන් ගැණීම අඥන භික්ෂූන්ගේ සභාවයෙකැ යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. පෙරටු කිරීම **පුරෙකඛාර,** නම්.

ගුණ නුවණ නැති මෙබඳු පව්ටු මහණුන් නිසා සසුනට හා මහාජනයාට වන විපත සුලු නොවේ. දෙවොල් කපුවෝ එය කියති. ලොකයෙහි වැඩිතරම් දෙන සුදුසු නොසුදුසු කම්, උගත් නූගත් කම් ගුණ ඇති නැති බැව් සලකා ගැණීමෙහි කවද ත් අසමත් ය. බොරු ගුණවත් කම් පා, බොරු උගත් කම් දක්වා, එබඳු මහාජනයා රවටන මහාජනයා නොමග යවන ශ්‍රමණයෝ අපාමඟ

දක්වත්නෝ ය. ධම්විනය දෙක නසත්නෝ ය. තුමූ ද අපායයෙහි හෙති. අනුන් ද අපායයෙහි හෙලති. ගුණ නුවණැති ශ්‍රමණයෝ මොවුන් නිසා ශාසනකාර්‍යයෙහි දුර්‍බල වෙති. පසුබට වෙති. 'මිනිස්කෙමින්' යි වදාළ වචනය මොවුන් සඳහා ද යෙදේ.

ආවාසෙසු ච ඉස්සරියං = ආවාසයන්හි ඉසුරු බව.

යම් තැනෙක වෙසෙත් නම් එතැන **ආවාස,** යි කියනු ලැබේ. ආවාස, යන මෙහි ධාතුප්‍රත්‍යයයන්ගේ වසයෙන් සලකා වසන තැන ආවාසැ, යි කිව ද, අවුසුළං ඈ උවදුරු දුරු කරණ ගෙය ආවාස නමින් කිය වේ. නිස්සූන්ගේ වාසය පිණිස බුදුරජානන් වහන්සේ සථාන පසක් වෙන් කොට දක්වූහ. **විහාර-අඩ්ඪයොග-පාසාද - හම්මිය - ගුහා** යනු ඒ පස යි. අඩ්ඪයොගාදී වූ සතර හැර අන් සියලු ආවාසයෝ විහාර යි කියනු ලැබෙත්. එහි **'අඩ්ඪයොගාදිමුත්තකො අවසෙසො ආවාසො'** යනු අටුවා ය. **'විහාරෙ නාම පාකාරපරිච්ඡින්නො සකලො ආවාසො'** යනු එහි විහාරය තේරූ සැටියෙක් ය. විහාරය ත් ආවාසසඛ්‍යාවෙහි ලා ගැණෙන බව මෙයින් පෙණේ. එ මතුද නො වේ. අරම්, පිරිවෙන්, ගබඩා, කාමර, විසීමට සුදුසු රුතැන්, දිවාතැන් ආදීහු ද ආවාස ම වෙති. **'ආවාසො නාම සකලාරාමොපි පරිවෙණම්පි එකොවරකොපි රතනඝරාදීනිපි'** යනු අටුවා ය.

අඩ්ඪයොග යි කියේ ගුරුළු පියා පතක හැඩහුරුකමින් තැනූ එක් පියස්සකින් යුත් ගෙය යි. **'එකපස්සෙයෙව ඡදනතො අඩ්ඪෙන යොගො අඩ්ඪයොගො ගරුළස්ස පක්ඛෙන සදිස ඡදනගෙහං'** යනු එහි විස්තාරකථා ය. **'සුපණ්ණවංකගෙහං'** යනු අටුවා ය. මෙහි එක් පසෙක බිත්තිය උස් වේ. එක් පසෙක මිටි වේ. **'තස්ස කිර එකපස්සෙ භිත්ති උච්චතරා හොති ඉතරපස්සෙ නීචා'** යනු ටීකා ය.

දෙවියන් රජුන් උදෙසා ගලින් ගඩොලින් එක් මහල් දෙ මහල් ඈ විසින් කැමැති තාක් මහල් තබා තැනූ දිඝ ප්‍රාසාදයෝ, ප්‍රාසාද යන්නෙත් ගැණෙති. මෙය දකින්නන්ගේ නෙත් සිත් පහදන බැවින් පාසාද, යි කියති. මෙය සිවුරුස්කොට දකරත්. **'පසීදන්ති නයනමනානි අත්‍රෙති = පාසාදෙ, දෙවානං ච නරපතීනං ච ඉද්ධිභාමයනවනං චතුරස්සා පතිස්සයවිසෙසා පාසාදෙ නාම'** යනු ඒ හෙළිකළ සැටි යි. රජුන් හැර අන්‍යධනවතුන්ගේ හා වෙළෙඳුන්ගේ වාසයට තැනෙන සඳලුතල සහිත ගෙය හම්මිය, නම් වේ. **'රාජතො අඤ්ඤසං ධනීනං වොහාරකාදිනං ච**

භවනං' යනු මෙහිලා ඒ කී සැටි යි. 'උපරි ආකාසතලෙ පතිඨිත කූටාගාරෝ' යනු එහි අටුවා ය. මෙයට ම මුණ්ඩච්ඡද්ද, යි නමෙක් ද වේ.

ගඩොල් ආදියෙන් කළ සිවුරැස් ගෙයක සටහන් ඇති බඳින ලද එක් කැණි මඩලකින් යුක්තවූ ද වඩා උස් නො වූ ගෘහවිශෙෂය ගුහා ය. 'ඉට්ඨකාදීහි කතං චතුරස්සකූටාගාරසණ්ඨානං එක-කණ්ණිකා බඩං නාතිඋච්චං පතිස්සයවිසෙසං ගුහාති වදන්ති' යනු අටුවාවේ ආයේ ය. ඒ ගුහා තොමෝ ඉට්ඨකගුහා - සිලා ගුහා - දරුගුහා - පංසුගුහා යි සිවුවැදැරුම් ය. ගඩොලින් තනන ලද්දී ඉට්ඨක ගුහා ය. කලුගලින් කරණ ලද්දී සිලාගුහා ය. දැව දඬුවලින් කරණ ලද්දී දරුගුහා ය. පස් ගොඩ ගසා හෝ පොළොව සාරා කරණ ලද්දී පංසුගුහා ය. මෙයට භූමිගුහා, උම්මග්ග යන නම් ද වේ. අවුසුළං ඈ අවුරණ හෙයින් ගුහා යි කියනු ලැබේ.

අට්ට, අට්ටාල, මාල, ලෙන, කූටාගාර, පරිවෙණ, උද්දණ්ඩ යන මොවුහු ද ආවාසසඞ්ඛ්‍යාවට ම යෙති. එහි ප්‍රතිපාක්ෂික වූ රජුන් වැළකීමට සුදුසු කොට සිවුමහල් පස්මහල් තබා කළ ගෘහ විශෙෂය අට්ට, යි ගැණේ. 'පටිරාජූනම්පි පටිබාහනයො-ගෙහා චතුපඤ්චභූමකො පතිස්සයවිසෙසො' යනු සිහියට ගත යුතු ය. බහල බිත්ති ඇති ගෙය යි. 'අට්ටො නාම බහල භිත්තී ගෙහං' යනු ටීකා යි. මෙහි පියස්ස, පරාල නො යොදා කරණ ලද්දේ ය. මැසි ආකාරයෙන් තැනූ ගෙය අට්ටාල, නම්. වාහළ මතුයෙහි කරණ අටල්ල වැනි ය. මෙහි මාල නම්, වටකුරු කොට එක් මුදුනක් තබා වහළ කොන් කිහිපයක් සිටින සේ කළ ගෙය යි. ලෙන නම්, කැණි මඩල බැඳ කරණලද ය. කැණි මඬුලු දෙකක් තබා කරණ ලද්දේ කූටාගාරය, යි. වෙහෙර තුළ ම භික්ෂූන්ගේ වාසය පිණිස ඒ ඒ තැන කළ ගෘහවිශෙෂය පිරිවෙණ' නමින් හැඳිනේ. ඒ එදා ය. අද පිරිවෙණ නම්, ප්‍රධාන විසින් ගිහිපැවිද්දන්ට ධර්ම විනය සහිත විවිධ විද්‍යාවන් උගන්වන තැන ය. මෙහි උගන්නෝ වැඩියක් ම භික්ෂූහු වෙති. ධර්මවිනයාධ්‍යාපනයට මුල් තැන ලැබේ. ගබඩා රහිත එක් දොරක් ඇති දීර්ඝශාලාව උද්දණ්ඩ, නමු. භණ්ඩශාලා, යි කියති. මෙහි කියන ලද්දේ ස සිකාවාසයෝ ය.

ඉස්සරිය නම්, අධිපතිභාවය යි. එහි ඊශ්වර, යි කීමට යම් ප්‍රභූත්වයෙක් කරුණු වේ නම්, ඒ මේ ප්‍රභූත්වය ඉස්සරිය, යි නම් වේ. ඒ ඒ තැන හෝ ඒ ඒ සමූහයන්හි හෝ ස්වාමිත්වයය, අධිපති භාවය යි කියේ.

විහාරයෙක ආවාසයෙක ඇති සඟසතු ඇඳ පුටු කොච්චට මෙච්චට ඇතිරිලි කලාල පැදුරු බිසි හච්චි මුච්චි පනිච්චු පාන් පඬික්කම් පිහන් කෝප්ප, පොත්පත්, දෙල් පොල් කොස් ඇ පලතුරු හා මිල මුදල් තම හිතවතුනට හා අතවැසියනට දෙමින් තමනු ත් එයින් කැමති සේ ප්‍රයෝජන ගන්නා වූ එහි වූ අත් මහණුන්ගේ හා අගනතුකයන්ගේ ප්‍රයෝජනය පිණිස ඒ කිසි ත් නොයොදන තමන් කරණ වරද අනුන් පිට හෙලාලන, 'මා මිසක් අන් කවුරු මෙහි අධිපති වෙත් ද' යි දරදඬු වූ, මුඬ වූ, තරුණ වූ හෝ මහලු වූ යම්කිසි මහණෙක් තෙමේ සඟසතු දේපල තම ගුරු දෙගුරුන් ගෙන් ලත් දායාදයක් සේ ගෙණ ක්‍රියා කෙරේ නම්, ඒ මහණ එයින් ම අපායයට නියම වූවකු බව, නිරා හිනිපෙණෙලි බව බුදුරජානන් වහන්සේ වදාළ සේක.

අඥ වූ ශ්‍රමණ තෙමේ අධිපති භාවයට පැමිණියේ, එයින් උදම් වූයේ සඟසතු දෙයින් අතවැසියන් හා යැපෙමින් සැතපෙමින් ආවාසික වූ අන්‍ය භික්ෂූන් නොයෙක් ලෙසින් පෙළන්නේ ය. කා බී වැඩ ගෙණ ඉතිරි වූ අත් හැම දේ ම විකොට මුදල් රැස් කරන්නේ ය. එ ද දුශ්චරිත පිණිස ම යොදන්නේ ය. නැයන් සඳහා යොදන්නේ ය. මෙසේ වූ අඥඅධිපතියාගෙන් සඞ්ඝසන්තක වස්තූන්ට හා සඞ්ඝයා වහන්සේට සිදුවන විපත සුලු නො වේ. එ මතු ද, නො වේ. ඔහු ද විපතට වැටේ. එය ඉතා බිහිසුණු ය. ගුණ නුවණින් නො වැඩුනු හුදෙක් වයසින් මෝරාගිය මහණ, සඟසතු දේපල රැකුමට සුදුසු නො වේ ය' යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. ශ්‍රද්ධා ශීල ශ්‍රුත ත්‍යාග ප්‍රඥ ගුණයන් හා සම ව එක් ව වැඩිගිය වයසින් වූ මහලු කමට මුත්, වයසින් පමණක් වූ මහලු කමට බුදුරජානන් වහන්සේගේ සම්භාවනාවක් නැත්තේ ය. එහෙයින් ම වයසින් පමණක් වැඩී සිටි ඇතැම් මහණ බමුණෝ නොයෙක් තැනදී **'අරඤරූපො භවං ගොතමො'** යනාදීන් උන්වහන්සේට නින්දා කළහ. සඟසතු දේපල රැකීමෙහි සුදුස්සෝ ප්‍රතිබල භික්ෂූන් වහන්සේ ය. විරරාත්‍රඥ ගුණවෘද්ධ ධර්මවිනයෙහි බුද්ධිමත් භික්ෂූන් වහන්සේ ය, ප්‍රතිබලයෝ. ගුණනුවණින් නො වැඩී වයසින් පමණක් වැඩුනු මහණ ත්, වයසින් නො වැඩී ගුණ නුවණින් පමණක් වැඩුනු මහණ ත් යන දෙදෙනා අතුරෙහි පසු කී මහණ ම සසුන් බර ඉසිලීමෙහි හා සඟසතු දැ රැකීමෙහි සුදුසු වේ. සඞ්ඝසන්තක විහාරාරාමයන්හි අධිපතිභාවයට සුදුසු වනුයේ මෙනෙමේ ය. මොහු හැර අනෙකෙක් මෙබඳු තැන නො තැබිය යුත්තේ ය. නො සුදුස්සා කෙරෙහි තබන අධිපති

භාවය ඔහුවත් අත්හටත් විපත්තිකර ය. ඒ අධිපතියාහට අපා මග නිරවුල් වේ. අන්‍යතොවාසිකයෝ දිඨානුගතිකා ව අපායයෙහි හෙති. දූයකයෝ ද ශ්‍රාවකයෝ ද අපායගත වෙති.

පූජා පරකුලෙසු ච = නො නෑ කුලයන්හි පූජා ද.

පූජා, යනු මතු කිය වේ. **පරකුලය නම්,** මවුපසින් හෝ පියපසින් හෝ නෑ කමක් නො කියැකි කුලය යි. භික්ෂූන් වහන්සේට සඟකුලය වනුයේ සත්මුතු පරපුරේ නෑ සමූහයා ය. ආත්තා- මුත්තා- නත්තා- පනත්තා- කිත්තා- කිරිකිත්තා- මිමුත්තා යන මොවුහු ය, සත්මුත්තෝ. මේ සත්දෙනාගේ දරු මුණුපුරෝ භික්ෂුවගේ කුලය වෙති. මෙයින් බැහැර වූ අන්‍ය මහා ජන තෙමේ පරකුලය, යි ගැණේ. කිසි ත් ලෙසකින් නෑ කමක් නො කියැකි කුලයන්ගෙන් 'සිවුපසය මට ම ලැබේවා, අන්හට නො ලැබේවා, ඔවුහු සිවුපසය මට ම පුදත්වා, අන්හට නො පුදත්වා' යි අඥභික්ෂු තෙමේ බලාපොරොත්තු වේ.

මම එව කතං මඤ්ඤනතු ගිහි පබ්බජිතා උභො = ගිහියෝ ත් පැවිද්දෝ ත් යන දෙකොටස 'මා විසින් ම කරණ ලදු' යි දනිත්වා.

අඥභික්ෂු තෙමේ 'විහාරයෙහි වූ දෑගැබ් පිළිමගේ බෝගේ පොහෝගේ ලැගුම්ගේ බණගේ පොත්ගේ නානගේ බොජුන් හල වැසිකිළි කෙසිකෙළි පවුරු වාහල අෑ හැම එකෙක් ම තමන් විසින් ම කරණ ලද්දේය යි ගිනි පෑවිදි හැම කෙනෙක් ම දනිත්වා' යි නිතර පතයි. සිතයි. කියයි. එ පමණක් ද නො ව 'පලරුක් මල්රුක් අෑ රොපණය කරණ ලද්දේ ත්, රොපණය කරවන ලද්දේ ත්, තමන් විසිනැ, යි ද, විහාරයෙහි අලුත් වැඩියා කිරීම් කරණ කරවන ලද්දේ ත් තමන් විසිනැ, යි ද දනිත්වා' යි පතයි. සිතයි. කියයි.

ගහ; යි පස්කම් සැපයට නමෙකි. **'ගහනති පංචකාම ගුණානං එතං අධිවචනං'** යන මෙයින් ඒ පැහැදිලි වේ. පංච කාමසඞ්ඛ්‍යාතස්ත්‍රී තොමෝ, පුරුෂයා තම යටතට ගණී යි. එසේ ම පංචකාමසඞ්ඛ්‍යාතපුරුෂ තෙමේ, ස්ත්‍රිය තම යටතට ගණී යි. ඒ හෙයින් පංචකාමය ගහ' යි කියනු ලැබේ. ස්ත්‍රී පුරුෂ දෙදෙන පංචකාමගුණය නො අඩුව පිරී සිටි තැන් ය. ස්ත්‍රිය ඇලෙන බැඳෙන ප්‍රධානස්ථානය වනුයේ පුරුෂයා ය. පුරුෂයා ඇලෙන බැඳෙන ප්‍රධාන ස්ථානය ස්ත්‍රිය යි. ස්ත්‍රිය පුරුෂයා දැකීමෙන් පෙළඹෙන්නී ය. පුරුෂයා ස්ත්‍රිය දැකීමෙන් පෙළඹෙන්නේ ය. ස්ත්‍රිය කෙරෙහි පවත්නා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන පස, පුරුෂයාගේ පෙළඹීමට කරුණු වේ.

එසේ ම පුරුෂයා කෙරෙහි වූ ඒ පස සත්‍රියගේ පෙළඹීමට කරුණු වේ. **චිත්තපරියාදානසූත්‍රය** මේ වග, මේ අරුත් පැහැදිලි කර යි. මුළුමනින් පංචසක්ඛය කියන ගහ ශබ්දයෙක් ද ඇත්තේ ය. මේ ඒ නො වේ.

එ දවස මෙම ලක්දිව මහාදාඨික නම් රජෙක් විය. ඔහට දෙමළ කුමරියක් බිසෝ වූ ය. දිනක් ඈ දුටු චිත්තහත්ථ නම් වූ තෙර කෙනෙක් ඇය කෙරෙහි ඇලුනෝ **'සුභං දමිළ දෙවී' සුභං දමිළ දෙවී'** යි කියමින් හැසිරෙන්නට වූහ. පසු කාලයෙහි ඇය මළ බව අසා ඒ තෙරනුවෝ උමතු බවට පැමිණියෝ ය.

අනුරාධපුරයෙහි ලෝවාමහාපාය දොරටුවෙහි සිටි තරුණයකු දුටු එක් සත්‍රියක් රාගයෙන් දැවී ජීවිතක්ෂයට පත් වූ ය. මේ අතීත සිඬිහු ය. වර්තමානයෙන් ද මෙබඳු සිදුවීම් බොහෝ ලැබිය හැකි ය.

පංචකාමය හෝ පංචකාමය පුරා සිටි සත්‍රීසඞ්ඛ්‍යාතගෘහය මෝහට ඇත්තේනු යි පුරුෂ තෙමේ **ගිහි,** නම් වේ. **'ගහමෙ තස්ස අත්ථීති = ගිහි'** යනු විවෘත්ති යි. එසේ ම පංචකාමය පුරා සිටි පුරුෂසඞ්ඛ්‍යාතගෘහය මෑ හට ඇත්තේ නු යි සත්‍රිය, **ගිහිනී,** නම් වූ. **'ගහමෙතිස්සා අත්ථීති=ගිහිනී'** යනු එහි අත්ථි පැහැදිලි කිරීම ය. මෙහි එන ගිහි ශබ්දයෙන් සත්‍රීපුරුෂදෙපක්ෂය ම වෙනසක් නැති ව කිය යුතු යි.

පබ්බජිතා, ගිහිගෙට හිත වූ කෘෂි වණික් ගොරක්ෂාදීකර්මය අගාරික, යි කියනු ලැබේ. ඒ මේ අගාරිකකර්මය යම් තැනෙක නැත්තේ ද ඒ අනගාරික, නමු. ප්‍රව්‍රජ්‍යාව යි. **'නත්ථි එත්ථ අගාරි යනති අනගාරියා පබ්බජ්ජා'** යි ඒ කීහ. පැවිද්ද හැම කුශලය කට ම ඉඩ ඇති බැවින් **'අඛ්ගොකාසො පබ්බජ්ජා'** යි වදාළ සේක. මෙ කී අනගාරියසඞ්ඛ්‍යාත ප්‍රව්‍රජ්‍යාවට පැමිණියෝ ප්‍රව්‍රජිතයෝ ය. පබ්බජිත, යනු පාළි යි. පැවිද්ද නිසා එයට පිළිපන්නහු විසින් තම සිතෙහි හටගන්නා රාගාදී වූ පාපමල සෝදා හරින බැවින් අනගාරිකපටිපදාව, පබ්බජ්ජා නමින් හඳුන්වන ලද්දී ය.

ගිහිසංයොජන නමින් හඳුන් වන වස්තුකාමයන් සිඳ හැරියෝ ද පබ්බජිතයෝ ය. පැවිද්දට යන්නන් විසින් සකල-භොග රාසිය ත් ඤාතිපරිවට්ටය ත් මුළුමනින් අත්හළ යුතු ය. එහෙයින් පැවිද්ද **නෙක්ඛම්ම,** නමින් ද කිය වේ පළමු කොට පිරිය යුතු සීලය, දෙවනු ව වැඩිය යුතු සමාධිය, තෙවනු ව දියුණු කළයුතු ප්‍රඥාව එසේ යම් කෙනෙක් පුරත් ද, වඩත් ද, දියුණු කෙරෙත් ද ඔවුහු පබ්බජිතැ, යි තවත් ලෙසකින් මෙය විවරණය කළහ. **'පබ්බා පබ්බං ජිනන්තීති = පබ්බජිතා,**

පඨමං සීලපබ්බං දුතියං සමාධිපබ්බං තතියං පඤ්ඤාපබ්බං පවිපාවියා ජිනනතීති = පබ්බජිතා' යනු එහි අර්ථසම්ර්ථනය යි. මේ අර්ථය සලකන්නෝ **පබ්බජිත** ශබ්දය, **පබ්බං,** යනු පෙරටු කොට **ජි - ජයෙ** යන ධාතුවෙන් **ත** ප්‍රත්‍යය කොට සිඩ කරති **'සෙඨත්තං වජනතීති = පබ්බජිතා'** යනු ගත්තෝ **ප** පූර්ව, **වජ ගතියං** යන ධාතුවෙන් **ත** ප්‍රත්‍යය කොට සිඩ කෙරෙති. තව කෙනෙක් **'පඨම මෙව වජිතබ්බං'** යි ගෙණ **ප** පූර්ව **වජ** යන ධාතුවෙන් **ණ්‍ය** ප්‍රත්‍යය කොට **පවවජ්‍ය** ශබ්දය නිපදවා අනතුරුව ජ්‍ය යන්නට **ජ්ජ,** යනු හා **වව,** යන්නට **බ්බ,** යනු හා කොට එයට සත්‍රි අර්ථයෙහි **ආ** ප්‍රත්‍යය දී **පබ්බජ්ජා,** යනු සිදු කරති. නැවැත **පබ්බජ්ජා සංජ්ඤිතා එතෙසනති = පබ්බජිතා'** යි **ඉත** ප්‍රත්‍යය යොදා **පබ්බජිත** ශබ්දය නිපදවති. මේ හැම එකෙක ම අදහස එකෙක් ම ය.

මම එව අතිවසා අස්සු කිච්චාකිච්චෙසු කිස්මි චි = කිසියම් කුදු මහත් කටයුත්තෙහි මට ම අනුව පවතිත්වා

'ගිහි පැවිදි දෙ පසෙහි ඇත්තෝ ගැල් ගොන් වෑ පොරෝ ඇ විසින් ලැබිය යුතු යමෙක් වේ ද, යටත් පිරිසෙයින් කැඳ ටිකක් පමණකුදු රත්කර ගණිත් නම්, එබඳු කුදු මහත් හැම කටයුත්තෙහි, මා යටතෙහි පවතිත්ව යි ද, විහාරයෙහි වූ හැම එකෙක් ම මාගේ කටයුතුය, යි මා විසින් කරණ ලදූ, යි සිතත් වායි ද; හැම එකක් මා විචාරා ම කෙරෙත්වා' යි ද අඥභික්ෂු තෙමේ සිතන්නේ ය. පතන්නේ ය.

කිච්චාකිච්ච, නම්, කුසල් හා අකුසල් ය. කළයුත්ත කුසල් ය. නො කළයුත්ත අකුසල් ය. තව ද දෙලොව වැඩ සිදු කරණ දෙය කිච්ච යි ද, එයට පටහැනි දෙය අකිච්ච යි ද, ටික දෙය කිච්ච යි ද, මහත් දෙය අකිච්ච යි ද, අවශ්‍යයෙන් කළයුත්ත කිච්ච යි ද, එසේ නො වන්න අකිච්ච යි ද, පළමු කළයුත්ත කිච්ච යි ද, පසු කළයුත්ත අකිච්ච දූ, යි කිච්චාකිච්ච, යන්නට අටුවාවන්හි අරුත් කී සැටි ය. මෙහි ද කුදු මහත් දෙය කිච්චාකිච්ච, යි කීහ.

ඉති බාලස්ස සඩ්කප්පො = බාලයාහට මෙසේ අදහස් වේ.

නැති ගුණ අඟවා ගරුබුහුමන් ලැබීමට භික්ෂූන් පිරිවරා ගැන්මට සඟසතු ආවාසයෙහි අධිපති වීමට නො නෑ කුලයන් ගෙන් සිවුපසය ලැබීමට බාලයා නිතර අදහස් කරන්නේ ය. තව ද 'විහාරයෙහි වූ සියලු කටයුතු තමන් විසින් කරණ ලදූ යි ගිහි පැවිදි හැම කෙනෙක් ම දනිත්ව යි ද, හැම දෙනෙක් ම

තමන් යටතෙහි පවතින්ව ගි ද, සියලු කුදු මහත් කටයුතු තමා විචාරා ම කරත්ව ගි' ද බාලයාහට අදහස් වන්නේ ය. මෙබඳු අදහස් ඇත්තහුට විදර්‍ශනා මාගී ඵලයෝ නො වැඩෙත්.

ඉච්ඡා මානෝ ච වඩ්ඪති = තෘෂ්ණාව හා මානය වැඩේ.

හුදෙක් සඳ උදෑවෙහි මුහුදු දිය වැඩෙන්නා සේ මේ මහණහුට සදෙරෙහි උපදනා අටතුරාසියක් තෘෂ්ණාවත් **'සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි'** යනාදීන් උපදින මානයත් වැඩෙන බව වදාළ සේක.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය.

සුධම්ම සථවිර තෙමේ ද, මේ අවවාදය අසා බුදුරජුන් වැඳ හුන් තැනින් නැඟිට පැදකුණු කොට ඒ දුන් අනුදුන මහණහු සමග ගොස් උපාසකයාහට පෙණෙන තෙක් මානයේ සිට ඇවතට පිළියම් කොට උපාසකයා කමා කරවී ය. ඔහු ද 'සවාමීනි! කමා කරමි, ඉදින් මා අත ත් දෙසෙක් වේ නම්, එයට මට කමා කරන්නැ' යි තෙරුන් වහන්සේ කමා කර වී ය. ඉනික්බිති සුධම්ම සථවිර තෙමේ, බුදුරජුන් දුන් අවවාදයෙහි සිට කිහිප දිනකින් ම සිවු පිළිසැඹියාවත් සමග රහත් බවට පැමිණියේ ය. උපාසක තෙමේ, 'මම බුදුරජුන් නො දුක ම සෝවන් පලයට පැමිණියෙමි, අනාගාමීත් වූයෙමි, එහෙයින් බුදුරජුන් දැකීමට යම්, යි ගැල් පන්සියයක තල උදු මූ සහල් උක්හකුරු රෙදිපිළී ආදිය පුරවා ගෙණ 'බුදුරජුන් දකින්නට යනු කැමැත්තෝ මා හා එත්වා, ආහාර පානාදියෙන් මග තොට දී අපහසුවෙක් නො වන්නේ ය, ඒ සියල්ල මම සපයන්නෙමි' යි භික්‍ෂු භික්‍ෂුකී උපාසක උපාසිකාවන්ට දුන්වී ය. මෙසේ දන්වා මගට බට උපාසකයාහට පන්සියයක් භික්‍ෂූහු, පන්සියයක් භික්‍ෂුකීහු, පන්සියයක් උපාසකයෝ, පන්සියයක් උපාසිකාවෝ දැ යි දෙදහස් දෙනෙක් එක්වූහ. උපාසකයා මේ දෙදහසට හා තම පිරිස වූ දහසට ත් තිස් යොදුන් මග අතරෙහි බතින් බුලතින් කිසි ත් ගැහැටක් අපහසුවක් නො වන ලෙසට කටයුතු පිළියෙල කරවී ය. උපාසක තෙමේ, පිරිවර සහිත ව ගෙන් නික්මිනි. දෙවියෝ ඒ බව දුන ඔහුගේ ගුණයෙන් තෙද ගැණුනෝ තැන තැන කඳවුරු බැඳ තමන් අයත් කැඳ බත් කැවිලි පෙවිලි ආදියෙන් ඔවුනට උවටැන් කළහ. කිසිවක්හට කිසිවකින් අඩුවෙක් නො වී ය. මෙසේ දෙවියන්ගෙන් සංග්‍රහ ලබන උපාසකයා දවසකට යොදුනකට වඩා ඒ පිට නො යනුයේ මසකින් සැවැත් නුවරට

පැමිණියේ ය. තල සහල් මුං උඳු ආදිය පුරවා ගත් ගැල් පන්සියය එ ලෙසින් ම පිරී තුබුනේ ය. එහි කිසිත් අඩු බවෙක් නො වී ය. ගැල්වලින් මගතොට වියදම් පිණිස නො ගත්තේ ය. දෙව් මිනිසුන් මග තොට දී දුන් පඬුරු පාක්කුඩම් ඇ බොහෝ දෙය ද හැර දමා ගියේ ය.

සම්මා සම්බුදුරජානන් වහන්සේ අනඳ මහතෙරුන් අමතා 'ආනන්ද! අද පස්වරුයෙහි චිත්තගහපතියා පන්සියයක් උපාසකයනු ත් කැටුව මෙහි මා වැඳ සිටින්නේ ය' යි වදාළ සේක. අනඳ තෙරුන් 'සවාමීනි! ඔහු බුදුරජුන් වඳින කාලයෙහි කිසියම් පෙළහරෙක් වන්නේ දැ, යි ඇසූවිට, 'එසේ ය, ආනන්ද! ඔහු මා වඳින කල්හි දෙනිස් අඹුණක් ගන්නා පමණ පෙදෙස්හි දණක් පමණ ගැලි සිටින ලෙසට පස්වණක් දිවමලින් යුත් මහත් වැස්සෙක් වස්නේ ය' යි වදාළාහු ය. නුවර වැස්සෝ මේ කතාව අසා 'මහත් පින් ඇති චිත්තගහපතියා අද බුදුරජුන් වඳිනුව එන්නේ ය, ඔහු බුදුරජුන් වඳින විට පෙළහරෙක් ද වන්නේ ය, අපිත් යමු, ඒ මහා පින්වතුන් දකින්නට, පෙළහරත් දක්නට ලැබෙන්නේ කලාතුරකිනැ' යි තැගි බෝගත් ගෙණ මග දෙපස රැස් ව ඔහු එනු බලා සිටියෝ ය.

නිසූන් වහන්සේලා පළමු කොට වෙහෙර තුළට වන්හ. ගහපති තෙමේ උපාසිකා පිරිසට පසු එන්නට නියම කොට උපාසකයන් ගෙණ බුදුරජුන් වෙත ගියේ ය. බුදුරජුන් ඉදිරියෙහි අවුරා ගෙණ හිඳින කෙනෙක්, සිටින කෙනෙක් නැත. බුදුරජුන් ඉදිරියෙහි කෙතෙක් තැන් වුව ත්, ඉඩ තබා දෙපස නිශ්චල ව සිටිති. චිත්ත ගහපති තෙමේ ඉඩ තුබූ බඩ වීථියට පිළිපන්නේ ය. තුන් පලයකට පැමිණ සිටි මේ ආයුෂ්ශ්‍රාවකයා බැලූ බැලූ හැම තැන ඔහුගේ ගුණ තෙදින් සැලී ගියේ ය. මහාජන තෙමේ 'චිත්තගහපතියා මෙතෙමේ ය' යි හැඳින ඒ දිහාව ම බලා සිටියේ ය. ගහපතියා බුදුරජුන් වෙත ගොස් ෂඩ්වර්ණඝනබුබ්‍රශ්මන්හි ගැලී බුදුරජුන්ගේ දෙ පය වළඳුකරින් අල්වා ගෙණ වැන්දේ ය. එ කෙණෙහි ම මල්වැසි වට. දහස් ගණන් සාධු නාදයෝ නිකුත් වූහ. එ තැන් සිට ඔහු මසක් බුදුරජුන් ලඟ රැඳුනේ ය. ඒ කාලය තුළ වෙහෙරෙහි ම වඩා හිඳුවා බුදුපාමොක් මහසඟනට මැනැවින් මහාදන් දුන්නේ ය. තමන් කැටුව ආවුන් ද වෙහෙර තුළ ම නවතා ගෙණ කෑම් බීම් දෙමින් රැකා ගත්තේ ය. එහෙත් එක් දිනක් වත් තමන් ගෙණ ආ කිසිවක් ඒ පිණිස ගන්නට සිදු නො වී ය. දෙවියන් හා මිනිසුන් එළ වූ පුදපඬුරින් ම සියලු කටයුතු කෙළේ ය.

ගහපති තෙමේ, දිනක් බුදුරජුන් වෙත ගොස් 'ස්වාමීනි! බුදුරජානන් වහන්සේට දන් දීමට ගෙදරින් පිටත් ව ආ මට, අතරමගට මසෙක් ම ගත විය, දැන් මම මෙහි ද මසක් ගත කෙළෙමි, ගෙණ ආ කිසිවකින් තව ම දන් දෙන්නට ඉඩෙක් නො ලැබින, මෙතෙක් දන් දුන්නේ දෙව් මිනිසුන් දුන් පුද පඬුරින් ය, මා මෙහි අවුරුද්දක් නැවතී සිටියත් මා ගෙණා දෙයින් නම්, කිසි ලෙසකින් දන් දෙන්නට ඉඩෙක් නො ලැබෙන්නේ ය, එහෙයින් ගැල්වල තිබෙන මේ තල මුං උඳු සහල් රෙදිපිළි කො තැනෙක නමුත් බහා තැබිය යුතු ය, ඒවා තැන්පත් කරන්නට තැනක් වදාරනු මැනැවැ' යි දැන්වී ය. එකල බුදුරජානන් වහන්සේ අනඳ තෙරුන් අමතා 'ආනන්ද! උපාසක තැනට ඒ බඩුබාහිරාදිය තැබීමට ඉඩකඩ ඇති තැනක් පෙන්නුම් කරන්න, කො තැනෙක නමුත් සිස් කරවා දෙන්නැ' යි වදාළ සේක. අනඳ තෙරනුවෝ එසේ කළහ.

චිත්තගහපතියා මුල්කොට කැප බිම අනුදත් සේක.

උපාසක තෙමේ, ගැල් සියල්ල සිස් කර ගෙණ ගැලුත් ගෙණ පිරිවරත් කැටුව මගට බැස්සේ ය. එවිට දෙව් මිනිස්සු ඉදිරියට අවුත් 'පින්වත! ඔබ කළ පින්, සිස් ගැල් ගෙණ යෑමට තරම් කොට කරණ ලද්දේ නො වේ ය' යි කියමින් ඒ ගැල් සත්රුවනින් පුරා ලූහ. උපාසක තෙමේ තමන් ගෙණ ආ කෑම් බීම් උපකරණ යෙන් ම සිය පිරිසෙහි සියලු දෙනාහට සංග්‍රහ කෙළේ ය. අනඳ තෙරනුවෝ ඒ අතර බුදුරජුන් වෙත ගොස් වැඳ 'ස්වාමීනි! උපාසකයා බුදුරජුන් වෙත එන්නේ මසක් ගෙවා ආයේ ය, මෙහි ද මසක් ගත කෙළේ ය, මෙතෙක් ගෙණ ආ දෙයින් ම දන් සැපයී ය, දැන් ගැල් සිස් කරවා ගෙණ මගට බැස ය යි, සියරට යෑමට ත් මසක් ම ගතවනු ඇත, දෙව් මිනිසුන් එක් ව 'ඔබ කළ පිණ, සිස් ගැල් ගෙණ යෑමට තරම් පින්කමෙක් නො වේ ය' යි ඒ ගැල් සත්රුවනින් පුරවා දුන්හ, උපාසකයා තමන් ගෙණ ආ බත් බුලතින් ම සිය පිරිසට කෑම් බීම් සපයමින් ය යි, ස්වාමීනි! බුදුරජුන් වෙත එන මොහුට මෙ තරම් මහත් සත්කාරයෙක් කුමක් නිසා ලැබුනේ ද? වෙන තැනෙක යන විට ත් මේ ලෙසට ම ඔහුට සත්කාර ලැබේ දැ' යි ඇසූහ. 'ඔව් ආනන්ද! කො තැනෙක ගිය ත් ඔහුට මේ සත්කාරය ලැබෙනවා ම ය, මොහු සැදැහැ ඇත්තෙක, තෙරුවන් කෙරෙහි පැහැදුනෙක, පිරිපුන් සිල් ඇත්තෙක, මෙබන්දකු කො තැනෙක ගිය ත් යන යන හැම තැනදී ම ඔහුට ලාභ සත්කාරයෙක් ම ලැබෙන්නේ ය'යි වදාරා ප්‍රකීර්ණක වර්ගයෙහි එන මේ ගාථාව ද වදාළ සේක.

'සද්ධෝ සීලෙන සම්පන්නෝ යසොභොගසමප්පිතෝ,
යං යං පදෙසං භජති තත්ථ තත්ථෙව පූජිතෝ'

ලෞකිකලොකොත්තරශ්‍රද්ධා ඇති අගාරියසීලයෙන් යුක්ත වූ යසසින් හා ධනධාන්‍යාදියෙන් ද සම්පත්විධ ආඪ්‍ය ධනයෙන් ද යුත් තැනැත්තේ යම් යම් පෙදෙසක් සෙවුනේ ද, ඒ ඒ පෙදෙස්හි ම දෙවියන් හා මිනිසුන් විසින් පුදන ලද්දේ වේ. ඉක්බිති අනඳ තෙරනුවෝ 'විත්තගහපතියා පෙර කළ කර්‍මය කිමැ' යි ඇසූහ. 'ආනන්ද! ඔහු පියුමතුරා බුදුරජුන් පාමුල පතන ලද පැතුම් ඇති ව කල්‍ප ලක්‍ෂයක් දෙව් මිනිසුන් අතර සැරිසරා එනුයේ කසුප් බුදුරජුන් දවස එක් මිගවැදි කුලයෙක උපන්නේ ය, වැඩිවිය පැමිණි මොහු වැසි දවසෙක මුවන් මැරීමට දුනු ඊ ගෙණ වනයට ගොස් මුවන් එනු බලා ගල්තොල්ලක් යට, ඔලුවේ සිට වසා ගෙණ හුන්නේ ය, එහි දී කමටහන් වඩන මහණකු දැක පැහැද 'කෑම ටිකක් ගෙණැවිත් දෙමි' යි ගෙට දුව ගොස් ලිප් දෙකෙක තබා මසු ත් බතු ත් උයවා දෙරට බැස්ස විට පිඬු සිඟා යන තව කිහිප නමක් දැක ඔවුන්ගේ ද පාත්‍ර ගෙණ අසුන් පණවා වඩාහිඳුවා 'මුන්වහන්සේලා වළඳ වන්නැ' යි එහි සිටිය වුනට කියා තෙමේ මස් හා බත් කොළයෙක ලා මුළක් බැඳ ගෙණ යන්නේ අතරමග දී මලුත් කඩාගෙණ කොළ ගොටුවෙක ලා මහණහු හුන් තැනට ගොස් 'ස්වාමීනි! මට සංග්‍රහ කරණු මැනැවැ' යි පාත්‍රය ඉල්ලා ගෙණ බතින් මසින් කැවිලියෙන් පුරවා එය තෙරුන්ට පිළිගන්වා මලින් ද පුදා 'යම් සේ මේ බත්, මස්, මල්, මාගේ සිත සතුටු කෙළේ ද, එමෙන් උපනුපන් තැන දී දහස් ගණන් පඬුරෙන් මාගේ සිත සතුටු වේවා, පස්වණක් මල් වැසි වසිවා' යි පැතී ය, මෙසේ පතා දිවිහිමියෙන් පින් දහම් කරණුයේ මරණින් මතු දෙව්ලොව උපන්නේ ය, උපත් තැනදී දණක් පමණ මල්වැසි වැස්සේ ය, මෙ දවස මොහු උපන් දවසේ ත් බුදුරජුන් වෙත ආ දවසේ ත් මල්වැසි වැසිම පඬුරු එළවීම සත් රුවණින් ගැල් පිරීම යන මේ හාස්කම් ඒ පෙරකළ කුශලකර්‍මයාගේ විපාකවශයෙන් සිදුවිනැ' යි බුදුරජානන් වහන්සේ වදාළ සේක.

සුධම්මස්ථවිරවත්‍ථුව නිමියේ ය.

පුණ්‍ය මහිමය

රජගහ නුවර මහාසෙන නම් බමුණෙක් විය. ඔහු සැරියුත් මහතෙරුන්ගේ පියා වූ වඩහන්න බ්‍රාහ්මණයාගේ මිත්‍රයෙකි. සැරියුත් මහතෙරනුවෝ, දවසක් පිඬු සිඟා යනුවෝ, මහසෙන් බමුණා කෙරෙහි කරුණාව උපදවා 'උදව්වක් කරමි' යි ඔහුගේ ගෙට වැඩියාහ. වත් පොහොසත් කම් කිසිත් නැති දිළිඳු බමුණා 'මාගේ පුතා මෙහි සිඟා ආයේ, මා දුප්පතකු බව නොදැන විය හැකි ය, මම දුප්පතෙක්මි, පිළිගන්වන්නට දෙයක් මට නැතැ' යි සිත සිතා තොල් මතුරමින් තෙරුන්ට මුණ නොදී සැඟවී ගියේ ය. තෙරනුවෝ, එසේ ම අන් දවසකුත් එහි වැඩියහ. එදත් බමුණා එසේ සැඟවුනේ ය. 'මොකවත් ටිකක් ලැබුනොත් දෙමි' යි සිතා සිටිය ද කිසිත් නොලැබින.

දිනෙක හෝමයක් කරණු සඳහා බැහැරට ගිය මොහුට එහිදී දළ රෙදි කඩක් හා කිරිබත් තලියක් ලැබුනේ ය. 'එය ගෙණැවිත් සැරියුත් හාමුදුරුවන්ට දිය යුතු ය' යි ඔහු සිතී ය. උන්වහන්සේ ද, ධ්‍යානයට සමවැද නැගිට සිටි සේක්, බමුණා දැක 'බමුණා කිරිබතක් ලැබ මා එනතුරු බලාපොරොත්තුවෙන් සිටි සි, දැන් මා එහි යා යුතු ය' යි සිවුර ගැටවටු කොට පොරවා පාත්‍රය ගෙණ බමුණාගේ ගෙදෙරට වැඩ තමන් එහි සිටින බව හැඟවූහ. මහතෙරුන් දුටු ඔහුගේ සිත ප්‍රසන්න විය. එවිට තෙරුන් වැඳ පිළිසඳර කතා කොට ගෙයතුළට වැඩම කරවා, වඩාහිඳුවා කිරිබත් තලිය උන්වහන්සේගේ පාත්‍රයට බෙදී ය. බාගයක් පමණ බෙදූ කල්හි උන්වහන්සේ අතින් පාත්‍රය වැසූහ. බමුණා 'ස්වාමීනි! ඇයි, මේ කිරිබත එකකුට මුත් දෙදෙනකුට සෑහෙන්නේ නොවේ, මේ ටික ත් පිළිගෙණ වදාරා මට පරලොවින් සංග්‍රහ කරණු මැනැවි, මෙලොව සංග්‍රහයට වඩා මා බලාපොරොත්තු වන්නේ පරලොව සංග්‍රහය යි, මේ බත් සේරම ඔබවහන්සේට පුදනු කැමැත්තෙමි, පිළිගණු මැනැවැ' යි පිළිගැන්වී ය. තෙරනුවෝ, ඔහුගේ ප්‍රසාදය පිණිස එහි ම වැඩහිඳ වැළඳු සේක. අවසන්හි රෙදිකඩත් පිළිගත්වා වැඳ 'ස්වාමීනි! මම ත් ඔබවහන්සේ මෙන් නිවනට පැමිණෙන්නෙමි' යි කී ය. 'බමුණ! එසේ වේවා' යි අනුමෙවෙනි බණ වදාරා තෙරුන් හුනස්නෙන් නැගී දෙව්රමට වැඩියාහ. දුගී ව දුප්පත් ව සිට දෙන දෑනය සිත සතුටු කිරීමෙහි පොහොසත් බැවින් බමුණු තෙමේ පහන් සිත් ඇත්තේ හටගත් සොම්නස් ඇති ව තෙරුන් කෙරෙහි වඩාත්

සෙනහ කරන්නේ විය. ඔහු තෙරුන් කොරෙහි කළ සෙනහයෙන් ම කලුරිය කොට සැවැත් නුවර තෙරුන්ගේ උපස්ථායකකුලයෙක පිළිසිඳ ගත්තේ ය. එකෙණෙහි මවු තොමෝ 'මා කුස දරු ගබෙක් පිහිටියේ ය' යි සවාමියාහට දැන්වූ ය. ඔහු ඇට ගර්භරක්ෂාව දුන්නේ ය. ඉතා උණුසුම් ඉතා සිහිල් ඉතා ඇඹුල් දේ නොකා නොබී සුවසේ ගැබ පරිහරණය කරණ ඇයට සැරියුත් තෙරුන් ප්‍රධාන කොට ඇති පන්සියයක් දෙනා වහන්සේ ගෙයි වඩා හිඳුවා ඔවුනට දිය නොමුසු කිරිබත් පිළිගන්වන්නට ත් තමනුත් කසාවත් හැඳ පොරවා රන් තලියක් ගෙණ අසුන් කෙළවර හිඳ මෙතෙක් දෙනා වහන්සේගේ ඉදුල් කිරිබත් කන්නටත් දෙළඳුකෙක් උපන. කසාවත් හැඳීමේ දෙළඳුක වනාහි ඇය කුස උපන්නහු බුදුසස්නෙහි ලබන පැවිද්දට පෙර නිමිති ය. එවිට ඇයගේ නෑයෝ 'අප දුවගේ දෙළඳුක දුහැමි එකෙකැ'යි සැරියුත් මහතෙරුන්, සඞ්ඝසඨවිර කොට පන්සියයක් භික්ෂූන් ගෙන්වා ඒ හැම දෙනා වහන්සේට දිය නොමුසු කිරිබත් පිළිගැන්වූහ. ඕ ද, එදා කසාවත් හැඳ එකක් පොරොවා රන්තලියක් ගෙණ අසුන් කෙළවර හිඳ ඉදුල් කිරිබත් අනුභව කළා ය. දෙළඳුක සංසිඳින. ගැබ්බරිත් සැහැල්ලු වනතුරු අතරින් අතර කළ මංගලයන්හි ද ගැබ්බරින් සැහැල්ලු වූ පසු කළ මංගලයෙහි ද සැරියුත් මහතෙරුන් ප්‍රධාන කොට ඇති පන්සියයක් දෙනා වහන්සේට දිය නොමුසු කිරිබත් ම පිළිගැන්නූහ. මේ වනාහි බමුණු කල, කළ කිරිබත් දුනයාගේ විපාකය යි.

ජාතමඞ්ගලදිනයෙහි උදෑසන ම කුමරුන් හොඳට නාවා සරසා ලක්ෂයක් අගින පලසක් එළූ ඇදෙක හෙවූහ. කුමරු එහි හෙව, තෙරුන් බලා 'මෙතෙමේ මාගේ පෙර ඇදුරු ය, මුන්වහන්සේ නිසා ම මා මේ සම්පත් ලද්දී ය, එහෙයින් මොවුනට මොකවත් පූජා කළ යුතු ය' යි සිතමින් හුන්නේ සිකපද ගැන්වීමට ගෙණ එනු ලබන්නේ ඇදෙහි එළා තුබූ පලස කුඩා ඇඟිල්ලෙක රදවා ගත්තේ ය. එවිට මවුපියෝ 'ලමයාගේ ඇඟිල්ලෙහි පලස ඇලුනේ ය' යි සිතා එය ගලවන්නට උත්සාහ කළහ. ලමයා හැඬී ය. එවිට පලස ත් සමග ම ලමයා වඩා ගෙණ මහතෙරුන් ඉදිරියට ආහ. මහතෙරුන් වඳින කාලයෙහි පලස ඇඟිල්ලෙන් ගලවා තෙරුන් පාමුල හෙළී ය. එවිට මවුපියෝ 'සවාමීනි! මේ දරු සිහින්තා ඔබවහන්සේට මෙය පුදන ලද්දේ ය, එහෙයින් එය පිළිගෙණ මේ දැසයා සිකපද ගන්වන්නැ' යි කීහ. සැරියුත් මහතෙරනුවෝ 'ලමයාගේ නම කුමක් දැ' යි ඇසූහ. 'සවාමීනි! මෙතෙමේ ඔබවහන්සේට ගිහිකල තුබූ නමට සමාන නම් ඇත්තෙක් වන්නේ නම් යහපතැ' යි

කීහ. තෙරනුවෝ තමන් ගිහිකල උපතිස්ස නම් වූ බැවින් ළමයාට 'තිස්ස' යි නම් කළහ. ඔහුගේ මවු නොමෝ තම පුත්‍රයාගේ අදහස නො බිඳින්නට ඉටා ගත්තා ය. මෙසේ නම් කරණ මගුල් නිමවා නැවැත බත් කැවිලි මගුලෙහි කන් විදින මගුලෙහි පිළි හන්දවන මගුලෙහි සිළු තබන මගුලෙහි සැරියුත් මහතෙරුන් ප්‍රධාන පන්සියයක් දෙනා වහන්සේට දිය නො මුසු කිරිබත් පිදූහ. සත් අවුරුදු වයසට පත් ඒ කුමාර තෙමේ දිනක් මෑනියන් අමතා 'මෑනියෙනි! සැරියුත් හාමුදුරුවන් ගුරුවරයා කොට උන්වහන්සේ වෙත මා පැවිදි කරවන්නැ' යි කී ය. ඕ ද 'හොඳයි පුතා! මම කල් සිට ම ඔබගේ අදහස්වලට විරුඬ නො වෙමි'යි කියා තෙරුන් ගෙට වැඩමවා දන් දී 'සාමිනි! මේ දරුවා ඔබ වහන්සේ වෙත පැවිදි වන්නට ඕනෑ ය' යි කිය යි, සවස ළමයා ත් රැගෙණ විහාරයට එන්නෙමි' යි තෙරුන් යවා සවස් වේලෙහි මහත් සත්කාර සම්මාන ඇති ව ළමයාත් ගෙණ විහාරයට ගොස් ඔහු මහතෙරුන්ට පාවා දුන්නු ය.

උන්වහන්සේ 'තිස්ස! පැවිද්ද නම් පහසු එකෙක් නො වේ, ඒ පැවිද්ද ඉතා බැරෑරුම් ය, උණුසුම් දේ වුවමනා විට සිහිල් දේ ලැබෙන්නේ ය, සිහිල් දේ වුවමනා විට උණුසුම් දේ ලැබෙන්නේ ය, පැවිද්දෝ ඉතාම දුකසේ ජීවත් වෙති, වළඳන්නෝ එක් වේලක් ය, ලත් දෙයකින් සතුටු විය යුතු ය, ගුරුන්ට වැඩමහල්ලන්ට සුවව ච යටත් ව විසිය යුතු ය, ගුරුන් වැඩිමහල්ලන් ඉදිරියෙහි වහන්දූරීම ඔවුන් දුක දුක උසසුන්වල හිඳීම හිස වසා හිඳීම දෙවුර වසා අතපා දිගුකරමින් කතාකිරීම කාරා කෙල ගැසීම සිටිනවිට තනි පසින් සිටීම හේත්තුවී සිටීම අත්පාවල ඇට කැඩීම ආදිය නො සුදුසු බැවින් නො කළ යුතු ය, ගෙදර කොතරම් පොහොසත් වුවත් අහංකාර නො විය යුතු ය, පා පිස්නා බිස්සක් සේ මන් නැති ව විසිය යුතු ය, දුටුවන්ගේ නෙත් සිත් පිණෑයන සේ ඉරියවු පැවැත් විය යුතු ය, කාම-හොගීන් සේ මල් ගඳ විලවුන් දූරීම නො හොබනේ ය, ක්ෂුද්‍ර තිබියදී රැවුළ ත් රැවුළ තිබිය දී හිසත් බැම නො සුදුසු ය, මූදල් ඉපැයීම මූදල් අතපතගෑම මූදල් ගණුදෙනු කිරීම වෙළඳාම් කිරීම වෙදකම් කිරීම ඉඛකඛම් වගා කිරීම කඩපිල් යෑම නො කල්හි ගම්වැදීම ගිහියන් හා එක් ව විසීම ඔවුන්ගේ පණිවිඩ පණත් ගෙණ යෑම බලි නොවිල් කිරීම ගුණ නුවණ නැත්තන් ඇසුරු කිරීම යනාදී වූ මේවා බුදුරජුන් විසින් තහනම් කරණ ලද ය, එහෙයින් ගිහියන් අයත් දේ මුළුමනින් අත් හැරිය

යුතු ය, නො කටයුතු ත් බොහෝ ය, කටයුතු ත් බොහෝ ය, තෝ ඉතා සියුමැලි ය, සැපයෙන් හොඳට වැඩුනෙහි ය, පැවිදිකම් කරණු තට පහසු නො වේ ය' යි කීහ. 'හාමුදුරුවන් වහන්ස! කටයුතු දේ කරන්නට ත් නො කටයුතු දේ නො කරන්ට ත් මට හැකි ය, හාමුදුරුවන් වහන්සේගෙන් අවසර ලැබෙන ලෙසට සියල්ල කරන්නෙමි, එයට පොඩ්ඩක් වත් වෙනස් ව නො කරන්නෙමි 'මා පැවිදි කරන්නැ' යි කී විට උන්වහන්සේ තව පංචක කර්මස්ථානය කියවා ඔහු පැවිදි කළාහු ය. පැවිද්ද මහණකම ලැබීමේදී චත්තිංසාකාරය ම කිය යුතු ය, එහෙත් එහිලා අපොහොසත්වේ නම්, තවපංචකය වත් කිය යුතු ය. මේ කර්මස්ථානය වනාහි කිසි ම බුදුවරයකු විසින් කිසිසේත් අත් නො හරන ලද ය, කෙස් ඇ දෙතිස් කොටසින් එකි එකී කොටසක් ම අරමුණු කොට විදසුන් වඩා රහත්වූවන්ගේ ගණනෙක් නැත. **කිසි හසරක් නො දත් ඇතැම් මහණෝ කුලදරුවන් පැවිදි කරන්නෝ රහත්වීමෙහි උන් තුළ ඇති වාසනා ගුණය නසන්නෝ ය. ගුණනුවණින් පිරිහුනු මහණුන් පැවිදි කම් කිරීම සසුන් නැසුමට හෙතු වේ. එබන්දන් ගුරුන් කොට ගෙණ පැවිදි වන්නෝ ද දෙලොවින් ම පිරිහෙති.** තෙරනුවෝ ඔහු පැවිදි කොට දසසිල්හි පිහිටුවා ලූහ. සාමණෙරයන්ගේ මවුපියෝ තම පුතුට සත්කාර කරන්නෝ සත් දවසක් එහි ම නැවතී සිට ගෙණ බුදුපාමොක් මහසඟන දිය නො මුසු කිරිබතින් ම සැතැප්පූහ. එකල්හි භික්ෂූහු එහි 'නිතර බත්කිරි වළඳන්නට නො හැකි ය' යි අරගල කරන්නට වූහ. තිස්සයන්ගේ මවුපියෝ සත්වනදා සවස ගේ දොර බලා ගියහ.

හෙරණ තෙමේ පසුදා අනික් වහන්දූ ත් සමග පිඬු සිඟා ගියේ ය. එදාසැවැත් නුවර වැස්සෝ 'තිස්ස හෙරණ තෙමේ අද පිඬු සිඟා එන්නේ ල, සත්කාර කළයුතු ය' යි රෙදිපිළී දරණු ගසා හොඳට බත්බඳුන් පන්සියයක් සාදා ගැල් පන්සියයකුත් ගෙණ ගොස් පෙරමග බල බලා සිට එහි දී හෙරණුන්ට පිළිගැන්නූහ. හෙරණ තෙමේ දවස් දෙකට සළු දහසක් හා බත් බඳුන් දහසක් ලැබ භික්ෂු සඞ්ඝයාට පිළිගැන්වී ය. බමුණු ව උපන් දවස දළරෙදි කඩ දුන් දානයෙහි එක්තරා විපාකයක් වසයෙන් මේ ලද්දේ ය. භික්ෂූහු එතැන් සිට හෙරණුන්ට 'පිණ්ඩපාතදායකතිස්ස' යි නම් කළහ. ශීත කාලයෙහි දවසෙක වෙහෙර හැසිරෙන හෙරණ තෙමේ ඒ ඒ තැන ගිනිගොඩ ගසා ගෙණ ගිනි තපින්නා වූ භික්ෂූන් දැක 'ස්වාමීනි! කුමක්හෙයින් ගිනි තපින්නහු දැ' යි ඇසී ය. 'ශීත ඉවසනු නො හැකි නිසා ය'යි භික්ෂූහු කීහ. 'ස්වාමීනි! ශීතට කම්බිලි පොර වන්නට හැක්කෝ නො වහු ද, කම්බිලි පෙරවීමෙන් ශීත

වළකන්නට හැකි ය, කම්බිලි පෙරවීම එයට සෑහේය' යි හෙරණුන් කී කල්හි 'තමුසේ මහාපිණැත්තෙක, එහෙයින් තමුසේට කම්බිලි ලැබේ, අපට මොන කම්බිලි ද, ඒ කවුරු දෙන් ද, එබදු පින් නො කොට කම්බිලි ගැණ කුමට බලාපොරොත්තු වෙමු දැ' යි කීහ. 'එහෙම ද, එසේ නම් කම්බිලි වුවමනා තෙරුන්නාන්සේලා මා සමඟ එත්වා' යි වෙහෙර වැසි සියලු භික්ෂූන්ට දැන්වී ය. එවිට වෙහෙර වැසි සියලු දෙනා වහන්සේ 'කම්බිලි ගෙණ එන්නෙමු' යි කුඩා හෙරණුන් හා නික්ම ගියහ. හෙරණ තෙමේ ද 'දහසක් පමණ වූ මුත්වහන්සේලාට කො තැනෙකින් ගෙණ මම කම්බිලි දෙම් දැ' යි නො සිතා ම භික්ෂූන් කැටුව නුවර බලා ගියේ ය. **කම්පල අදහා පිරිසිදු සිතින් කරණ දන් පින්කම්හි අනුභාවය නො සිතිය හැකි ය.** පළමු කොට හෙරණ තෙමේ නුවරින් පිට ගෙපිළිවෙළින් පිඬු සිඟා ගියේ ය. එහිදී හෙරණහුට කම්බිලි පන්සියයක් ලැබින. නැවැත ඇතුළු නුවර පිඬු සිඟා ගිය ඔහුට එහිදී ද පන්සියයක් ලැබින. ඒ හැර මිනිස්සු නොයෙක් තැනින් කම්බිලි ගෙණ ආහ. එකල එක් මිනිසෙක් කඩපිලක් ලඟින් යන්නේ කම්බිලි වෙළඳකු දැක 'ඔයි! මුදලාලි! කුඩානමක් කම්බිලි එකතුකරමින් මෙ නුවර හැසිරෙන්නේ ය, ඔහු මෙහි ද ආ හැකි ය, ඒ නිසා ඔය තිබෙන කම්බිලි සඟවා තබන්නැ' යි කී ය. 'මොක ද ඒ, ඔහු ගන්නේ දුන්නොත් නේ ද, නො දුන් දේ ත් ගණිදු' යි ඔහු ඇසී ය. 'ගන්නේ දුන් දේ තමා' යි කී විට 'හා! හොඳ යි! ඔහේට සතුති යි, කැමැති නම් දෙන්නෙමි, නො කැමැති නම් නො දෙන්නෙමි, ඒ මාගේ වැඩෙකි, තමුසේ යන්නැ' යි කී ය. **මසුරු මෝඩ මිනිස්සු අනුන් දන්දෙනු දැක ඔවුන් කෙරෙහි මසුරුකම් කොට අසදෘශමහාදුනය දැක සිත පහදා ගත නුහුනු කාල නම් සෙනෙවියා මෙන් අපායයෙහි උපදින්නෝ ය.**

මුදලාලි ද 'මේ මිනිහා යන තැනෙක නො ගොස් කම්බිලි සඟවන්නට කිය යි, කම්බිලි සොයා එන්නා ගන්නේ දුන් දෙයක් පමණකි, මාසතු මට අයත් දෙය මට ඕනෑ හැටියට ය, දීම හෝ නොදී ම මා අතේ ය, එහෙත් ඉල්ලුවොත් නො දීම මදිකමෙකි, එහෙයින් මා සතුදෙය සැඟෙව්වාට වරද නැතැ' යි කම්බිලි අතරෙහි තුබූ වටිනා කම්බිලි දෙකක් ගෙණ දුවලුවලින් එකට ගැට ගසා කම්බිලි ගොඩේ ම සඟවා තැබී ය.

සාමණේර තෙමේ දහසක් දෙනා ත් සමඟ එහි ගියේ ය. මුදලාලිට උන් දුටුසැටියේ ම දරුපෙම් උපන. මුළු සිරුරෙහි ඒ පැහිර ගියේ ය. ඇට මිදුළු කා වැදී සිටියේ ය. 'මේ ලදරුවා දුටු කල කම්බිලි නො ව පපුමස් දෙන්නට ත් සිතේ, එ කරම්

මහත් පින් ගුණයෙක් මේ ලදරුවා කෙරෙහි පිහිටා තිබේ ය'යි කියමින් මුදලාලි කම්බිලි ගොඩේ ගැන්නූ කම්බිලි දෙක ඇදලා ගෙණ සාමණේරයන් පාමුල තබා වැඳ 'සවාමීනි! ඔබ දන් නිවන මටත් ලැබේවා' යි කියා සිටියේ ය. එහිදී 'එසේ වේවා' යි සාමණේර තෙමේ අනුමෙවෙනි කෙළේ ය. එදා ඔහුට මෙසේ ඇතුළු තුවරින් ද කම්බිලි පන් සියයක් ලැබිනා. මෙසේ එක් දවසක් තුළදී ලත් කම්බිලි දහස, දහසක් දෙනා වහන්සේට එක් එක් කම්බිලිය බැගින් පිදී ය. එ තැන් සිට ඒ සාමණේර තෙමේ 'කම්බලදායක තිස්ස' යි හඳුන්වන ලද්දේ ය. ඔහුට නම් තබන දිනයෙහි සැරියුත් මහතෙරුන්ට පිදූ කම්බිලිය, සත්හැවිරිදි කල දහසක් බවට පැමිණ මේ අත්බවේදී ම විපාක දුන්නේ ය. **විකක් දී ගුහක් ලබන්නට දියයුතු එක ම තැන මේ බුදුසසුනය. බුදු සසුන හැර අන් තැනකට දීමෙන් එබඳු මහත් වූ විපාකයක් නො ලැබිය හැකි ය. උතුම් බුදුසසුනට විකක් දුන්නේ ගුහක් ලබන්නේ ය. ගුහක් දුන්නේ වඩ වඩා ලබන්නේ ය.** එහෙයින් බුදුරජාණන් වහන්සේ එහිලා **'තථා රූපොයං භික්ඛවෙ! භික්ඛු සඞ්ඝෝ යථාරූපෙ භික්ඛූසඞ්ඝෙ අප්පං දිනනං බහුං හොති, බහුං දිනනං බහුතරං'** යි වදාළ සේක.

දෙවරම් වෙහෙර වසන හෙරණුන්ගේ නෑ ගෙවල කුඩාලමෝ පැමිණ හෙරණුන් හා නිතර නිතර කතාවෙහි යෙදෙති. එය ඔහුට මහත් ගැහැටෙක් විය. එ හෙයින් හෙරණ තෙමේ 'මාගේ නෑ ලමෝ මා හා කතාවට නිතර මෙහි එති, මා මෙහි ඉන්නා බැවින් ය ඔවුහු එන්නෝ, මොවුන් හා කරණ කතාවෙන් මට කිසිත් වැඩෙක් නො වන්නේ ය, මා මේ කරණ මහණකම කුමක් ද, මෙයින් ලබන ලොව් ලොවුතුරා සැපය කුමක් ද, මේ කතාව දෙලොව ම පිරිහීමට කරුණු වේ, එහෙයින් බුදුරජුන් වෙතින් කමටහන් ගෙණ වනයට යා යුතු ය' යි තීරණය කර ගත්තේ ය.

එදා කුඩා හෙරණුන්ගේ පවා අදහස මෙසේ විය. ඔවුහු වැඩක් නැති කතා කිරීමෙහි දෙස් දුටහ. අද නවක මධ්‍යම සථවිර බොහෝ දෙනා වහන්සේ උතුන් හා කෙරෙණ අනර්ථකථායෙන් ම කල් දවස් යවති. අනර්ථකථා ම බොහෝසේ රුචි කෙරෙති. මහාජනරැස්වීම් ම ඔවුහුබලාපොරොත්තු වෙති. නිතරගිහියන් හා ආශ්‍රය ම පතති. ඔවුන් හාම ගැටෙන්නට සිතති. එයට උපාය මාගී සොයති. නාගරිකවාසයෙහි බැඳුනු තද ආශා ඇත්තෝ ය. ආත්මවිමුකතිය කිමැ යි නො සිතන්නෝ ය. වර්තමානික භික්ෂූන්ගේ මේ පැවතුම් ඔවුනට හිත නො වේ. ශාසනයට හිත නො වේ. ලොකයට හිත නො වේ.

හෙරණ තෙමේ බුදුරජුන් වෙත ගොස් රහත් වන්නට කමටහන් කියවා ගත්තේ ය. උපාධ්‍යායයන් වැඳ අවසර ලබා පා සිවුරු ගෙණ දෙරට බැස 'මා ලඟ තැනෙක නැවතුනොත්, නැයන් නොයෙක් දෙයට මා කරා එති' යි සිතා එයින් යොදුන් සියයකින් එපිට ඇත තැනකට ගියේ ය. එහි එක් ගම්දෙරකින් යන්නේ මහල්ලකු දුක 'මහණුන්ට විසීමට සැහෙන කැලෑ බද වෙහෙරෙක් මෙහි කොතැනෙක වත් තිබේ දැ' යි ඇසී ය. ඔහු 'එසේ ය' යි කී ය. 'උපාසක! 'එහි යන්නට පාර මට කියන්නැ' යි කී ය. හෙරණුන් දුටු සැටියේ ඒ මහල්ලාට ද දරුපෙම් උපන. ඔහු එක්වර ම වෙහෙරට යන්නට පාර නොකියා 'මෙහි වඩින්න! පාර මම කියන්නම්, වඩින්නැ' යි කැඳවා ගෙණ ගියේ ය. යන අතර හෙරණ තෙමේ අතරමග, මලාමැල්ලෙන් හා කුදු මහත් පලයෙන් බර වූ ගස් කොළන්වලින් සිත්කලු සතර පස් තැනක් දුක 'මේ පලාතට කියන නම කුමක් දැ' යි ඇසී ය. මහල්ලා ද ඒ ඒ තැන ගම් නම් කියමින් යන්නේ එක් වනසෙන සුනකට පමුණුවා 'සවාමීනි! මෙ තැන හොඳ සි! කිසි ගැහැටෙක් මෙ තැන නැත, එ හෙයින් මෙහි නවතිනු මැනැවැ' යි කියා හෙරණුන්ගෙන් නම ඇසී ය. හෙරණ තෙමේ ඔහුට තම නම් කී ය. 'සවාමීනි! හෙට අපේ ගමට පිඬු සිඟා වඩින්නැ' යි ආරාධනා කොට තම ගමට ගිය ඔහු ගෙයක් පාසා ගොසින් 'වනවාසික තිස්ස හාමුදුරුවෝ හෙට මෙහි පිඬු සිඟා එන්නෝ ය, ඒ නිසා කැඳබත් කැවිලි පෙවිලි කිරිපැණි ඇ තම තමන්ට හැකි දෙයක් පිළියෙල කරන්නැ' යි ගම්වැස්සන්ට දැන්වී ය.

මේ හෙරණ තෙමේ පළමුව තිස්ස, යන නම ද, දෙවනු ව පිණ්ඩපාතදායකතිස්ස, යන නම ද, තෙවනුව කම්බලදායකතිස්ස, යන නම ද සතරවනුව වනවාසික තිස්ස, යන නම දැ යි සත් ඇවිරිදි කල ම නම් සතරක් ලැබී ය. හෙරණ තෙමේ පසුදා උදැසන එහි පිඬු සිඟා ගියේ ය. එහි රැස් වූ මිනිස්සු දන් පිළිගන්වා වැන්දහ. හෙරණ තෙමේ 'සුව ඇත්තෝ වෙත්වා, දුකින් මිදෙත්වා' යන වචන සතර මුත් අන් එක් වචනයකුදු නොකී ය. කිසිවක් කිසිවකු ගෙන් නොදැ යි ඇසී ය. එහි එක් මිනිසෙක් වත් දන් පිළිගන්වා පිටිපා යෑමට පොහොසත් නොවී ය. සියල්ලෝ ම හෙරණුන් දිසාවම බලා සිටියෝ ය. හෙරණ ද යැපෙන පමණක් ම පිළිගත්තේ ය. ගම්වැස්සෝ එකමුතු ව පා මූල ඇදවැටී වැඳ 'සවාමීනි! මේ තෙමස මෙහි වැඩවසන්නහු නම්, අපි තෙරුවන් සරණ පිහිටා පන්සිල් ගෙණ පෙහෙවස් ද ගෙණ වසන්නෙමු, එහෙයින් මෙහි වැඩ වසන බවට පොරොන්දුවක් දෙනු මැනැව, අප සසරින් මුදලනු මැනැවැ' යි කීහ. ඉක්බිති හෙරණ තෙමේ තමන්

අතින් ඔවුන්ට වන වැඩ සලකා නවතින බවට පොරොන්දු දී හැමදා ඒගමට පිඬු සිඟා ය යි. මිනිසුන් දන් පිළිගන්වා හෝ නො පිළිගන්වා වැන්ද කල්හි 'සුව ඇත්තෝ වෙත්වා, දුකින් මිදෙත්වා' යනු පමණක් ම කියා පෙරළා යයි. පළමු මස ත් දෙවන මස ත් ඉක්ම තෙවන මසට පැමිණි කල්හි සිවුවන මසට නො පැමිණ ම හෙරණ තෙමේ සිවුපිළිසැඹියා යුත් රහත් බව ලැබී ය.

හෙරණුන්ගේ උපාධ්‍යාය වූ සැරියුත් මහතෙරනුවෝ වස් පවරා බුදුරජුන් වෙත ගොස් හෙරණුන් බලන්නට යෑමට අවසර ඉල්ලූහ. බුදුරජානන් වහන්සේ අවසර දුන් සේක. එවිට උන්වහන්සේ සිය පිරිවර වූ පන් සියයක් මහණුන් ද කැටුව මුගලන් මහතෙරුන් හමුවන්නට ගොස් 'ස්ථවිරතුමනි! මම අපේ කුඩා නම, තිස්ස හෙරණුන් දකින්නට යමි' යි කී කල්හි **මුගලන්** මහතෙරනුවෝ ද 'මමත් යමි' යි පන් සියයක් පමණ වූ සිය පිරිස ත් ගෙණ **සැරියුත්** මහතෙරුන්ගේ පිරිසට එකතු වූහ. මේ දහසක් පමණ වූ පිරිස හා එක් ව **මහාකාශ්‍යප, අනුරුඛ, උපාලි, පුණ්ණ** යනාදී මහාශ්‍රාවකයන් වහන්සේලා ද පන්සියය පන්සියය පමණ වූ සිය පිරිස් ගෙණ නික්ම ගත්හ. මේ මහාශ්‍රාවක ගණය තෙමේ හතළිස් දහසෙක් විය. එහි වූ හැම දෙනා වහන්සේ එක්සිය විසි යොදුන් පමණ වූ මග ගෙවා හෙරණුන්ගේ ගොදුරු ගමට වැඩියාහ. හෙරණුන්ට උපස්ථාන කරණ මහලු උපාසක තෙමේ ගම්දොරදී මේ මහපිරිස දැක ඉදිරියට ගොස් වැඳ සිටියේ ය. එවිට සැරියුත් මහතෙරනුවෝ 'උපාසකය! මේ පළාතේ කැලෑ බද කිසියම් වෙහෙරෙක් තිබේ දැ' යි ඇසූහ. 'එසේ ය ස්වාමීනි!' යි ඔහු පිළිතුරු දින. එසේ නම් 'එහි භික්ෂූහු වසත් දැ' යි ඇසූවිට 'එසේ ය' යි කී ය. නැවැත උන්වහන්සේ 'එහි වසන්නෝ කවුරු දැ' යි ඇසූහ. 'වනවාසිකතිස්ස හාමුදුරුවෝ ය' යි කී ය. එහි යන්නට පාර කියන්නැ' යි කී කල්හි ඔහු 'තමුන්නාන් සේලා කවුරු දැ' යි ඇසී ය. 'අපි හෙරණුන් හමුවන්නට ආවෝ වෙමු' යි කීහ. එහිදී සැරියුත් මහතෙරුන් ඇ මහසව්වන් හැඳින ගත් උපාසක තෙමේ ප්‍රීතියෙන් පිණා ගියේ 'ස්වාමීනි! පොඩ්ඩක් වැඩ සිටිනු මැනැවැ' යි කියා වහා ගමට දුව ගොස් 'සැරියුත් මහතෙරනුවෝ අසූ මහාශ්‍රාවකයන් වහන්සේ සමග පරිවාර භික්ෂූන් ද කැටුව අපේ හාමුදුරුවන් හමුවීමට ඇවිත් සිටිති, එ හෙයින් කවුරුත් ඇඳ පුටු ඇතිරිලි කොට්ට මෙට්ට කළාල පැදුරු, තෙල් පහන් දැහත් ගිලන් පස පැන් වළන් ගෙණ ආයුතු' යි කියා නියම කොට ගියේ ය. ගම්වැස්සෝ ද ඔහු කී ලෙසට ඇඳ පුටු ආදී සියල්ල සපයා අතින් කරින් ගෙණ තෙරුන් පසුපස ගොසින් විහාරයට වන්හ.

හෙරණ තෙමේ තෙරුන් හැඳින උපාධ්‍යායයන් පටන් මහ තෙරුන් කිහිප නමකගේ පා සිවුරු ගෙණ තැන් පත් කොට වත් කෙළේ ය. අනික් තෙරුන්ට ත් හිඳින තැන් පිළියෙල කරත් රැ බෝ විය. එවිට සැරියුත් මහතෙරනුවෝ උපාසකයන් අමතා රැ බෝ වූ බව කියා 'ගෙවලට යන්නැ' යි කීහ. උපාසක තෙමේ 'සවාමීනි! අද ගෙවල යන දවසෙක් නො වෙයි, අද බණ අසන දිනය යි, කලකින් බණක් අසා ගන්නට බැරි විය, එහෙයින් අද බණ අසන්නට ඕනෑ ය, එයට අද ඉතා ම හොඳ දවස යි, අපට සැනසෙන්නට බණක් වදරනු මැනැවැ' යි කීයේ ය. එවිට මහතෙරනුවෝ 'ඔය්! තිස්ස! දැයකවරු බණ අසන්නට ඕනෑ, ය යි කියති, එහෙයින් පහන් දල්වා බණ ඇසීමට කල් දන්වා ඔවුනට බණ ටිකක් කියන්නැ' යි කීහ. එවිට දැයකවරු නැගී සිට 'සවාමීනි! පොඩිහාමුදුරුවෝ හැම දෙම හැම විටක ම සුව ඇත්තෝ වෙත්වා, දුකින් මිදෙත්වා, යනු පමණක් ම කියති, මේ පද සතර හැර අන් බණ පදයක් උන්වහන්සේ දන්නා බවෙක් නො පෙණේ, එහෙයින් අනික් නමකට බණ කියන්නට නියම කරණු මැනැවැ' යි කීහ. එවිට සැරියුත් මහතෙරනුවෝ තිස්ස හෙරණුන් අමතා 'තිස්ස! මොවුන් සුවපත් වන සැටි දුකින් මිදෙන සැටි දතයුතු බැවින් ඒ පදයන්හි විස්තර කියා දෙන්නැ' යි කීහ. 'ඒ යහපතැ යි පිළිගෙණ විසිතුරු විජිනිපතක් අතට ගත් හෙරණ තෙමේ ධර්මාසනයට නැග පස් මහසඟියෙන් කරුණු ගෙණ මහදිවයින එක් පැහැර වස්නා මහවැස්සක් සේ සකඬ, ධාතු, ආයතන, බොධිපාක්ෂිකධර්ම බෙදා දක්වමින් අර්ථ යෙන් දෙශනාව මුදුන් පමුණුවා බණ වදරා අවසානයෙහි මහ තෙරුන් අමතා 'සවාමීනි! රහත්වූවහුට ම ය සැප ලැබෙන්නේ, ඔහු මය සුවපත් වන්නේ, ඔහු ම සසර දුකින් මිදේ, අන් කෙනෙක් ජාති ඇ දුකින් නරක ඇ දුකින් නො මිදෙන් ය' යි කීයේ ය. මහතෙරුන් වහන්සේ 'තෑගේ දම් දෙසුම් ඉතා විසිතුරු ය, පද බෙදුම ඉතාකදිම ය, එහෙයින් මිහිරි හඬින් කියව' යි කී කල්හි මිහිරිහඬ නගා ත් කීයේ ය. එදා පාන් වත් ම දැයකවරු දෙකට බෙදී සිටියහ. කෙනෙක් 'මෙයට කලින් අප මෙබඳු කැකුළු බවෙක් නො දක්නා ලද්දේ ය, මෙතෙමේ මෙතරම් සාරවත් ධර්මකථා දැන ත් මෙතෙක් මවුපිය තනතුරෙහි සිට සැලකූ අපට එක් බණ පදයකු ත් නො කීයේ ය' යි කිපී ගත්හ. අන් කෙනෙක් 'අපට වූයේ මහත් ලාභයෙකැ, එනම්, මෙබඳු ගුණවතකුට ගුණයක් හෝ අගුණයක් නො දැන උවැටන් කරන්නට ලැබීම ය, දැන් එහි පල ලැබිමු, මෙතෙක් බණ අසන්නට නො ලැබුන ද, අද යහපත් බණක් ම ඇසිමු' යි සතුටු වූහ.

බුදුරජාණන් වහන්සේ එදා අලුයම ලොව බලා වදුරන සේක්, හෙරණුන්ගේ දැයකයන් දැක වඩාලාත් විමසනුවෝ, දැයකයන් අතර ඇතැම් කෙනකු කිපී සිටි බව ත් ඇතැම් කෙනකු පැහැද සිටි බව ත් නො පැහැදුනවුන් මරණින් පසු නිරයෙහි උපදින බව ත් පැහැදුනවුන් දෙව්ලොව උපදින බව ත් තමන් වහන්සේ එහි ගියවිට හැම කෙනකුන් ම හෙරණුන් කෙරෙහි මෙත් සිත් උපදවා දුකින් මිදෙන බව ත් දුටහ. ඒ අතර මිනිස්සු බික්සහුන් පවරා ගමට ගොස් මඩු කුඩාරම් තනවා කැඳ බත් ඇ පිළියෙල කොට අසුන් පණවා සහුන් වඩින මග බලා හුන්හ. භික්ෂූහු සිරුරු පිළිදුහුම් නිමවා සිඟා යන වේලෙහි සිඟා යන්නෝ හෙරණුන්ට කතා කොට 'අප සමග යන්නහු ද? නැත, පසුව එන්නහු දැ' යි ඇසුහ. 'හාමුදුරුවන් වහන්සේලා වඩින්න! මම එන්නෙමි' යි හෙරණ තෙමේ කියේ ය. භික්ෂූහු පා සිවුරු ගෙණ සිඟා ගියහ.

බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙරෙහි දී සිවුරු ගැටවටු කොට පොරවා පාත්‍රය ගෙණ ඇසිල්ලෙකින් එහි වැඩ භික්ෂූන් ඉදිරියෙහි සිටියා සේ තමන් වහන්සේ දැක්වූහ. එකෙණෙහි 'බුදුරජාණන් වහන්සේ වැඩි සේකැ' යි මුළු ගම කැලඹී ගියේ ය. ඔද වැඩී ගිය ගම්වැස්සෝ බුදුපාමොක් මහසඟන වඩා හිඳුවා කැඳ පිළිගන්වා අවුළුපත් ද පිළිගැන්වූහ. වළඳ අවසන් වත්නට කල් තබා ම හෙරණ තෙමේ ඇතුළු ගමට වැඩියේ ය. ඔවුහු හෙරණුන්ට ද කැඳ අවුළු පිළිගැන්වූහ. ඔහු තමාට සෑහෙන පමණ ගෙණ බුදුරජුන් වෙත ගොස් පාත්‍රය ලං කෙළේ ය. බුදුරජාණන් වහන්සේ 'නිසඟ! පාත්‍රය මෙහි ගෙණෙන්නැ' යි වදාරා අත දිගු කොට පාත්‍රය ගෙණ 'ශාරීපුත්‍ර! බලන්න! කුඩා නමගේ පාත්‍රය' යි තෙරුන් වෙතට පාත්‍රය එළවූ සේක. මහතෙරතුමෝ පය ගෙණ හෙරණුන්ට දී 'යන්න; තමුසේ, ඔය නමට සුදුසු අසුනෙක හිඳ දන් වළඳන්නැ'යි කිහ. දැයකවරු බුදුපාමොක් මහසඟුන් වළඳවා අවසන් කොට 'අනුමෙවෙනි බණ වදාරනු මැනැවැ' යි බුදුරජුන්ට ආරාධනා කළහ. උත්වහන්සේ බණ වදාරන සේක් 'උපාසකයෙනි! තමුසේලාට වූයේ මහත් ලාභයෙක, තමන්ගේ කුලුපග වූ හෙරණුන් නිසා සැරියුත්, මුගලන්, කසුප් ඇ. මාගේ මේ අසූ මහසව්වන් දුටුවහු ය, මම ත් මෙහි ආයෙම් මේ කුඩා නම නිසා ය, තමුසේලාට මා දකින්නට ලැබුනේ ත් මේ සුරතලා නිසා ය, එහෙයින් තමුසේලාට වූයේ මහත් ම ලාභයෙකැ' යි වදාළ සේක.

එකල්හි ඔවුහු 'අනේ! වාසනාවන්, අපි බුදුරජුන් හා සඟුන් සතුටු කිරීමෙහි සමත් පින්වතකු ලැබුවෙමු, වඳින්නට පුදන්නට සුදුස්සෙක් ම අපට ලැබුනේ ය' යි මහත් සතුටින් කතා කරන්නට

වූහ. හෙරණුන් කෙරෙහි නො පැහැදී සිටියෝ පැහැදුනාහ. පහන් ව සිටියෝ වඩාලා ත් පහන් වූහ. අනුමෙවෙනි බණ අවසන්හි බොහෝ දෙන සෝවන්පලාදියට පැමිණියෝ ය. බුදු රජානන් වහන්සේ හුනස්නෙන් නැගී වැඩියාහ. දයකවරු උන්වහන්සේ පසුපස ගොස් නැවතුනාහ. හෙරණුන් හා සම වෙග යෙන් වඩින බුදුරජානන් වහන්සේ ඔහුගෙන් ඒ ඒ පලාත්වල නම් විචාරමින් වැඩි සේක. ඔහු ද හමු හමු වූ ඒ ඒ තැන නම් ගම් කියමින් බුදුරජුන් හා ම ගියේ ය. හෙරණුන් වසන තැනට වැඩි බුදුරජානන් වහන්සේ එහි දී කදු මුදුනකට නැග 'නිස්ස! මෙහි සිට ඇත මැත බලනවිට කුමක් පෙණේ දැ' යි ඇසූහ. 'සවාමීනි! මුද පෙණේ ය' යි කීහ. 'මුද දුටුවිට කුමක් සිතේ දැ' යි ඇසූ කල්හි 'මා දුකට පැමිණි කාලයන්හි ඇඹු කදුළු සිවු සයුරේ දියට වැඩි බව සිතේ ය' යි කීයේය. බුදුරජානන් වහන්සේ 'නිස්ස! තමුසේගේ සිතීම හරි, එක් එක් සත්වයා දුකට පත් අවදියේ වැගුරූ කදුළු සිවු සයුරේ දියට වඩා ඉතා බොහෝ ය යි,

'චතූසු සමුද්දෙසු ජලං පරිත්තකං
තතෝ බහුං අස්සුජලං අනප්පකං,
දුක්ඛෙන ඵුට්ඨස්ස නරස්ස සොචතා
කිං කාරණා සම්ම! තුවං පමජ්ජසි'

යි මේ ගාථාව වදාළ සේක.

'සිවු සයුරෙහි දිය ටික ය, දුකින් පහස්නා ලද මිනිසාගේ ශොකයෙන් වැගුරුනා වූ කදුළු දිය, ඒ සිවු සයුරෙහි දියට වඩා ඉතා බොහෝ ය, යහළුව! කුමක් හෙයින් තෝ පමාවෙහි ද?, යනු එහි අදහස ය.

ඉක්බිති බුදුරජුන් 'නිස්ස! තමුසේ කොතැනෙක වසහු දැ' යි ඇසූ කල්හි 'අර ගල්තල්ලේ ය' යි ගල්තල්ල පෙන්වී ය. එහි වසන තමුසේ කුමක් සිතමින් වසන්නහු දැ' යි ඇසූවිට 'සවාමීනි! මා මෙ තැන මැරුණු වාර ත් මෙහි මළ සිරුරු බැහැ වාර ත් ගණන් නැතැ යි සිතමි' යි කී ය. 'නිස්ස! එහෙම තමයි, මෙලොව වැසි සතුන් පොළොවෙහි වැදහෙව නො මළ තැනෙක් නැතැ'යි වදාරා දුක නිපානයෙහි මේ උපසාළහජාතකය ත් වදාළ සේක:-

'උපසාළහකනාමානි සහස්සානි චතුද්දස,
අසම්ං පදෙසෙ දඩ්ඪානි නත්ථි ලොකෙ අනාමතං.
යමහි සච්චං ච ධම්මෝ ච අහිංසා සඤ්ඤමෝ දමෝ,
එතදරියා සෙවන්ති එතං ලොකෙ අනාමතං' යි.

තුදුස් දහසක් උපසාළහක නම් ඇත්තෝ මේ පෙදෙස දැවුනෝ ය. ලොව නො මළ විරු තැනෙක් නැත.

යමකු කෙරෙහි සත්‍යඥනය, ලොකොත්තරධර්මය, අභිංසාව, ශීලසංයමය, ඉන්ද්‍රියදමනය යන මේ ගුණ සමූහය පිහිටා තිබේ ද? බුඬාදී වූ ආර්‍යයෝ ඔහු සෙවනය කරති. මේ ගුණ සමූහය නොමැරේ. නිවනට කරුණු වේ.

මෙසේ පොළොවෙහි ශරීරනික්ෂේපය කොට මැරෙන්නා වූ සතුන් අතර නොමළ විරූ තැනෙක මැරෙන්නෙක් නම් නැත. අනඳ මහතෙරුන් වැන්නෝ නොමළ විරූ පෙදෙස්හි මියෙති. උන්වහන්සේ එක්සිය විසි ඇවිරිදි කල තම ආයුසය බලා ඒ ගෙවී ගොස් ඇතිබව දුන මෙයින් සත්වනද පිරිනිවන් පාන්නෙමි, යි දුන්වූහ. මෙ පුවත අසා රොහිණී දෙගංබඩ වැස්සන් අතුරෙන් මේ ගොඩ වැස්සෝ 'තෙරුන් වහන්සේට අපි උපකාර ඇත්තම්හ. එහෙයින් උන්වහන්සේ අප සමීපයෙහි පිරිනිවන් පාන්නාහ' යි කීහ. එ ගොඩ වැස්සෝ ත් 'අපි ත් තෙරුන්ට උපකාර ඇත්තම්හ, අප සමීපයෙහි පිරිනිවන් පානු ඇතැ' යි කීහ. එකල්හි අනඳ මහතෙරනුවෝ මෙ බස් අසා 'දෙ ගොඩ වැස්සෝ ම මාගේ දායකයෝ ය, දෙගොල්ලෝ ම මට එකසේ උපකාරයහ, උපකාර නැතැ, යි කිසිවකු බැහැර කරන්නට නොහැකි ය, එ හෙයින් මා මේ ගොඩ පිරිනිවිය ත් එ ගොඩ පිරිනිවිය ත් ධාතු බෙදීමේ දී වන්නේ කෝලාහලයෙකි, මේ කෝලාහලය මා විසින් ම සංසිඳවිය යුතු ය' යි සිතා 'මෙ ගොඩ වැස්සෝ මේ ගොඩ ත්, එ ගොඩ වැස්සෝ එ ගොඩ ත් රැස් වෙත්වා' යි කියා එයින් සත්වන දා ගඟ මැද සත්තලක් පමණ අහසට නැග පළක් බැඳ වැඩ හිඳ රැස්වූවන්ට බණ වදාරා 'මාගේ සිරුර දිග අතට හරි මැදින් දෙකට බෙදී එක් කොටසක්, මේ ගොඩ ත් එක් කොටසක්, එගොඩ ත් වැටේවා' යි ඉටා වැඩහුන් ලෙසින් ම තෙජෝධාතුසමාපත්තියට සමවැදුනු සේක. පිරිනිවෙනුහා ම සිරුරෙන් නැගි ගිනිදැලින් සිරුර දැවී, ඉටීම ලෙසින් සිරුර බෙදී දෙ ගොඩ වැටුනේ ය. මහාජන තෙමේ ලතෝනි දෙමින් හඬන්නට විය. එදා එ හඬ පොළොව පැළී යන තරම් විය. බුදුරජුන් පිරිනිවි දා නැගී ගිය ලතෝනියට වඩා බලගතු ලතෝනියෙක් විය. එය අසා සිටියවුන් ගේ ලය නොපැළී ගියේ මහාපුදුමයෙකිනි. හැම පහයෙක හැම ගෙයක හැම පැල්පතෙක ම සිටි මිනිස්සු සාරමසක් ම හඬ හඬා දුක් කඳුළු බිබී හුන්හ. එකල්හි එහි බඩ පුරා කෑම වේලක් ගත්තෙක්, කට තෙමෙන තරම් දිය කටක් ගත්තෙක් නොවිය. 'අනේ! අග්‍යෝ!, යන හඬ ම හැම දෙසින් ඇසුනේ ය. මිනිස්සු 'බුදුරජුන්ගේ උපස්ථායකයා මෙතෙක් ජීවත්ව සිටි බැවින් බුදුරජුන් පිරිනිවීමෙන් වූ දුක්තැවිලි යන්තමට සංසිඳී තුබුනේ ය, දැන් ඉතින් කෙසේ ඉවසමු ද,

අය්යෝ! මුන්වහන්සේ තව කලක් ජීවත් වූ සේක් නම්, අය්යෝ! බුදුරජුන්ගේ පිරිනිවීම වූයේ අද ය, ඉතින් අප සනසන්නෝ කවුරු දැ' යි විලාප කිය කියා තැන තැන හැසිරෙන්නට වූහ.

නැවැත බුදුරජාණන් වහන්සේ 'නිස්ස! මේ වන ලැහැබෙහි දිවි, කොටි, සිංහාදීන් මොරලන විට තමුසේ බියපත් වහු දැ' යි ඇසූහ. 'ස්වාමීනි! බියෙක් නැත, ඔවුන් හඬලන විට වනයෙහි බලවත් ඇලුමෙක් මා සිත් තුළ හටගණී' යි කියා ගාථා සැටකින් පමණ වන වැණුමක් කෙළේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ නිස්ස හෙරණුන් අමතා 'නිස්ස! ඉතින් අප යා යුතු ය, දිගට මෙහි නවතිනු බැරිය, කොහොම ද? තමුසේ' යි අසා වදාළ කල්හි 'ස්වාමීනි! මාගේ ගුරුදෙවයෝ මාත් රැගෙණ යෙත් නම් යන්නෙමි, නවතින්නට වදාරන සේක් නම් නවතින්නෙමි' යි හෙරණ තෙමේ කී ය. බුදුරජාණන් වහන්සේ නිස්ස සඬ්ඝයාත් ගෙණ වැඩි සේක. හෙරණුන්ගේ අදහස වූයේ නවතින්නට ය සැරියුත් මහතෙරනුවෝ ඒ දැන 'නිස්ස! තමුසේ මෙහි නවතින්නට කැමැත්තහු නම් නවතින්න! එයට වරදෙක් නැතැ' යි කීහ. හෙරණ තෙමේ බුදුන් සඟුන් වැඳ ඒ වන සෙනසුනෙහි ම නතර විය.

එ දවස ධම්සබාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා 'පුදුමයි! නිස්ස හෙරණුන් කරන්නේ සාමාන්‍යයකුට කළහැකි වැඩෙක් නොවේ, පිළිසිඳ ගත් දා සිට ඔහුගේ නැදෑයෝ සත් මගුලෙක දහසක් පමණ වූ භික්ෂූන්ට දිය නොමුසු කිරිබත් පිළිගැන්නූහ, පැවිදි වූ දා තමන්ගේ විහාරයෙහි බුදුපාමොක් මහසඟනට සත් දවසක් ම කිරි බත් පිදූහ, පැවිද්දෙන් අට වනදා පිඬු සිඟා යියේ දවස් දෙකට පිළී දහසක් හා බත් බඳුන් දහසක් ලැබුවේ ය, එක් දිනක් තුළ දී කම්බිලි දහසක් ලැබී ය, මෙහි වසන දවස ඔහුට මහත් ලාභ සත්කාර ලැබිනා, දැන් එ හැම පුද පඬුරක් ම හැරදමා වනයට වැදී සිඟා යෑමෙන් ලැබෙන මුසු අහරින් දිවි පවත්ව යි, නිස්ස හෙරණ තෙමේ අනෙකෙකුට කරන්නට බැරි අමාරු වැඩ කරන්නෙකැ' යි කතා කරමින් හුන්හ. ඒ අතර එහි වැඩම කළ සම්මාසම්බුදුරජාණන් වහන්සේ 'මහණෙනි! දැන් තමුසේලා මෙහි කුමක් කතා කරමින් හුන්නහු දැ' යි අසා 'නිස්ස හෙරණුන් ගැණ ය' යි කී කල්හි 'තමුසේලාගේ කතාව ඇත්ත යි, පුද පඬුරු කිත් පැසසුම් ගැණ පිළිපදින සැටි එක් ලෙසක් ය, නිවන් පිණිස පිළිපදින්නේ අන්ලෙසකින් ය, ඒ දෙක එකෙක් නොවේ, දෙක එකිනෙකට විරුඬ ය, පුද පඬුරු සොයන්නහුට, ඉඛකඬම් ගේ දොර මිල මුදල් සොයන්නහුට නිවන් පිළිවෙතෙහි යෙදෙන්නට බැරිය, නිවන් පිළිවෙතෙහි

යෙදෙන්නහුට ඉඩකඩම් ගේ දෙර මිල මුදල් සෙවීමෙහි යෙදෙන්නට බැරිය, මෙසේ කළොත් පුද පඬුරු සොයන්නට හැකි ය යි සිතා ආරඤ්ඤිකාදිධුතඞ්ගසමාදානයෙන් පුද පඬුරු උපයන්නහුට සතර අපායයෝ හළ දෙර ඇත්තෝ ය, ලාභසත්කාර උපදවන්නත් විසින් පව් කළ යුතු ය, කුහක කම් කළයුතු ය, නොඑසේ නම් ඔවුනට ලාභසත්කාර උපදවන්නට ඉඩෙක් නැත, ධුතඞ්ගපූරණාදියෙන් බලාපොරොත්තු රහිත ව උපදින ලාභ සත්කාර ධාර්මිකය, ධුතඞ්ගපූරණාදිය මොන ලෙසකිනුත් ලාභ සත්කාර සඳහා නො විය යුතු ය, බුඩශ්‍රාවකයෝ වන සෙනසුන් වැද නිර්වාණගාමිණී ප්‍රතිපදාවෙහි ව්‍යායාම කරන්නෝ රහත් බවට පැමිණෙති' යි අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

අඤ්ඤා හි ලාභූපනිසා අඤ්ඤා නිබ්බානගාමිනී,
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො,
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙක මනුබ්‍රූහයෙති.

ලාභ උපදවන පිළිවෙත අනෙකෙක් ම ය. නිවන් යන පිළිවෙත අනෙකෙක් ම ය. බුඩශ්‍රාවකභික්ෂු තෙමේ මේ කාරණය වෙසෙසින් දැන සත්කාරය නො පතන්නේ ය. විවෙකය වඩන්නේ ය.

අඤ්ඤා හි ලාභූපනිසා = ලාභ උපදවන පිළිවෙත අනෙකෙක් ම ය.

චීවර-පිණ්ඩපාත-සෙනාසන-ග්ලානප්‍රත්‍යයයාදී ලාභසත්කාර උපදවනු කැමැති මහණහු විසින් ඒ පිණිස පව් කළ යුතු ය. කය වචන සිත යන තිදෙරින් වඩකවිය යුතු ය. ලාභය තමා වෙත ඇදී එන්නේ කායවඩකාදීන් අතුරෙහි යමක් කළ විට ය. කිරිබත් කනු සිතා ගෙණ කිරිබත් තලියෙක කෙලින් අත ඔබා කෙලින් ම අත ඔසොවා ගන්නහුට කිරිබත් කන්නට නො ලැබේ. වන්නේ අත කිරිබතෙහි තැවරීම පමණෙකි. අත වක ගසා ඔසොවා ගන්නහුට කිරිබත් කනු හැකි ය. කිරිබත් පිඩ එසවී නැගී එන්නේ අත වක් කොට එස වූ කල්හි ය. එ මෙන් ලාභසත්කාර උපදිනුයේ කායවඩකාදිය කරණ විට ය. මෙසේ උපදවන ලාභය අධාර්මික ය. ලාභසත්කාරයෙහි ගැලුනු ගිජු වූ මහණ තෙමේ ඒ උපදවනු සඳහා කුහනා, ලපනා, නෙමිත්තිකතා, නිප්පෙසිකතා නිජිගිංසනතා යන මේ කුහකවස්තු පස යොදා ගණියි.

එහි **කුහනා** නම්, ලාභසත්කාරයෙහි ගිජු වූ මහණ ඒ පිණිස අන්‍යයා පුදුමයට පත් කිරීම ය. ඒ වනාහි සිවුපසය වැළක්වීමෙන්, සමීප කොට කීමෙන්, ඉරියවු පැවැත්වීමෙන් කළ හැකි ය. දායකයකු මහණ වෙත පැමිණ සිවුරු ඈ සිවුපසයෙන් පැවරූ කල්හි ඒ ලැබීමෙහි ආශා ඇත්තේ ද එය නො හඟවා

'මහණුනට මෙබදු වටින සිවුරු, රසැති කැම් බීම් කෑමට ද, මහණ වනාහි යම්තමින් ජීවත් වත්නෙක' යන ඇ ලෙසින් ආශා නැති බව දක්වා කතා කරයි. කිසිත් දෙයක ආශා නැත්තකු සේ දායකයාට හඟවයි. ඒ දායක තෙමේ මේ මහණ සිල්වතකු සේ පිළිගණියි. එසින් ම ඔහු මහාජනයා මැද සිල්වතකු ගුණවතකු සේ පෙණී සිටියි. එවිට දායකයෝ හාමුදුරුවන් සිවුපසයෙහි ආශා නැත්තකු වුව ද නොයෙක් දේ ගෙණ පිළිගත්වන්නට ම තැත් කෙරෙති. එකල එහිදී මේ කපට කොහොන් මහණ 'මට මින් වැඩෙක් නැත, දායකයනට පින් පුරවනු පිණිස පිළිගණිමි' යි කියා ගෙණෙන හැම හැම දේම පිළිගණියි. මේ සිවුපසය වැළක් වීමෙන් ලාභ උපදවන සැටි ය.

ලාභසත්කාරයෙන් මැඩුනු තැළුනු මහණ 'මෙහෙම ඇත්දෙත් මෙහෙම හුත්නොත් මට බුහුමන් කරති' යි සිතා දායකයන් ඉදිරියෙහි යමෙක් මෙබදු සිවුරු හඳී ද, පොරවා ද, මෙබදු වෙහෙරෙක වෙසේ ද, ඔහු ධ්‍යාන ලැබුවෙක, මගපල ලැබුවෙක, යන ඇ විසින් තමා ධ්‍යානාදියට ලංකොට කියා මහාජනයා පුදුමයට පත් කොට ලාභසත්කාර උපදවයි. මේ සම්ප කොට කීමෙන් ලාභ උපදවන සැටි ය.

යම් මහණෙක් තෙමේ 'තමා රහතකු ලෙස ධ්‍යාන ලැබුවකු ලෙස මහාජන තෙමේ දැන ගණිවා' යි ඉදුම්, හිටුම්, නිදීම්, ඇවිදුම්, සන්සුන් ලෙසින් පැවැත්වීමෙන් ලාභසත්කාර උපදවා ද, ඒ ඉරියවු පැවැත්වීමෙන් ලාභ ඉපදවීම යි.

ලපනා නම්, ලාභසත්කාරයෙහි ගිජු ව තැනට ගැළපෙනසේ තමන් උසස් කොට හෝ පහත් කොට දක්වා ලාභ ඉපදවීම යි.

නෙමිත්තිකතා නම්, ලාභසත්කාරයෙහි ගිජු ව පාපිච්ඡතා-වෙන් යුකත ව සිවුපසය දීමට සංඥ උපදවනු පිණිස අනුනට කයින් හෝ වචනයෙන් නිමිති කිරීම් ආදිය යි.

නිප්පේසිකතා නම්, ලාභසත්කාරයෙහි ගිජු ව පාපිච්ඡතා-යෙන් යුකත ව අනුනට කරණ ආක්‍රෝශය යි.

නිජ්ජීවනතා නම්, ටික දෙයකින් වඤ්චිත කොට වැඩි දෙයක් සොයා ගැණීම ය. මත්තෙහි එන ආජීව පාරිසුද්ධිසීල කතාවෙහි මෙහි විසතරය දැක්ක හැකි ය. මෙසේ ලාභසත්කාර ඉපදවීම නිවත් යන පිළිවෙතට ඉඳුරා ම පටහැනි ය. මේ ලාභය දුහැම් නොවේ. සිරුරෙහි වූ මනා හැඩහුරුකම, සිවුරු දැරීම, උගත්කම, පිරිවර, වනවාසය යන ඇ මෙබදු කරුණෙන් උපන් ලාභයය දුහැම්. ලාභ නම් සිවුපසය යි. උපනිසා නම් ප්‍රතිපදුව යි.

අඤ්ඤා නිබ්බානගාමිනී = නිවනට යන පිළිවෙත අනෙකෙක.

නිවනට පිළිවෙත නම්, මධ්‍යමප්‍රතිපදාවයි. ඒ මේ ප්‍රතිපදාව මජ්ඣිමාපටිපදා, දුක්ඛනිරොධගාමිනීපටිපදා, අඪඞ්ගිකමග්ග යනාදී වූ නම් වලින් බණපොත්හි එයි.

නිවන් පිළිවෙත පුරන්නහු විසින් කායවඞ්කාදිය මුළුමනින් දුරු කළයුතු ය. එහි අඤ්ඤ නො ව අඤ්ඤයකු සේ, ගොලු නො ව ගොලුවකු සේ, බිහිරි නො ව බිහිරකු සේ විය යුතු ය. මායාකාරයකු නො විය යුතු ය. මෙසේ නො වන්නහුට නිවන් පිළිවෙත පුරන්නට නො හැකි ය. **'නිබ්බාණගාමිනීපටිපදං පූරෙන්තෙන පාපභික්ඛුනා කායවඞ්කාදීනි පහාතබ්බානි අනඤ්ඤෙනෙව අඤ්ඤෙන විය අමුගෙනෙව මූගෙන විය අබධිරෙනෙව බධිරෙන විය භවිතුං වට්ටති, අසඨෙන අමායාවිනා භවිතුං වට්ටති'** යනු අටුවාව කී සැටියි.

එවං එතං අභිඤ්ඤාය = මෙසේ මේ කාරණය වෙසෙසින් දැන.

ලාභ උපදවන පිළිවෙත හා නිවන් යන පිළිවෙතත් **එතං**, යන්නෙන් කිය වේ. මේ පිළිවෙත් දෙක්හි දැනීම යන්තමකින් නො වියයුතු බැවින් 'අඤ්ඤාය, යන ක්‍රියාපදය අභි, යන්නෙන් වඩා වදාළ සේක. එහෙයින් මෙහිලා ලොකුම දැනීමක් තිබියයුතු ය.

භික්ඛු බුඩස්ස සාවකො = බුද්ධශ්‍රාවක වූ මහණ තෙමේ.

සක්කාරං න අභිනන්දෙය්‍ය = සත්කාරය නො පතන්නේ ය.

මෙහි කී සත්කාරය ධාර්මික නො වේ. එහෙයින් සත්කාර නො පැතිය යුතුය යි වදාළ සේක. ධාර්මික සත්කාරය ඉවසීමෙහි වරදෙක් නැත්තේ ය. ඒ මේ ලාභය ම ආදරයෙන් පුදනු ලබන්නේ සත්කාර නම් වේ. එහි **'ලාභො එව සක්කච්චං ආදරවසෙන දීයමානො සක්කාරො'** යනු ටීකා ය. ඒ අධාර්මිකසත්කාරය වනාහි කොයි ලෙසිනුත් දිවි ගිය ද නො පැතිය යුතු ය යනු මෙහි ක්‍රියාපදය හා එකතු වූ න, අභි, යන පද කියන්නේ ය. මහාප්‍රාඥයෝ නො දැහැමි ය යි තමන්ට වැටහුනු කිසිත් ලාභ සත්කාරයක් නො පතති. නො ඉවසති. නො ද පිළිගනිති. සැරියුත් මහතෙරුන් තමන් උදෙසා කළ බෙහෙත් කිරිබත පිළිකෙව් කිරීම මෙයට නිදසුන් කළ හැකි ය.

විවෙකං අනුබ්‍රූහයෙ = විවෙකය වඩන්නේ ය.

විවෙකය ත්‍රිවිධ ය. කායවිවෙක, චිත්තවිවෙක, උපධිවිවෙක යි විවිකතිය හෙවත් වෙන්වීම විවෙක නම්. **'විවිතති විවිච්ඡනනං වා විවෙකො'** එහි යමෙක් එකලා යාම, ඊම, ඉදීම, සිටීම, නිදීම,

පිඬුසිඟීම ඇ කෙරේ ද, සෙනසුන් විසින් වන, රුක්, කඳු, කඳු රැලි, ගිරිගුහා, සොහොන් ඇ සෙවනය කෙරේ ද, ඒ එකලා යැම් ඊම් ඇ පැවැත් වීම කායවිවෙක, නම් වේ. **'ඉධ භික්ඛු විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං, කායෙන විවිත්තො විහරති සො එකො ගච්ඡති එකො තිඨති එකො නිසීදති එකො සෙය්‍යං කප්පෙති එකො ගාමං පිණ්ඩාය පවිසති එකො පටික්කමති එකො රහො නිසීදති එකො චඞ්කමං අධිඨාති එකො චරති එකො විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති අයං කායවිවෙකො'** යන මේ සූත්‍ර පාඨයෙන් කායවිවෙකය පැහැදිලි වේ. කොටින් කිය යුත්තේ ඒ ඒ පිරිස්වල ඇලී විසීමෙන් හා පස්වැදැරුම් වස්තුකාමයෙන් ඇත් ව වෙන් ව විසීම ය. **'ගණසඞ්ගණිකං පහාය පඤ්චන්නං වත්ථුකාමානං විවිච්ඡන්නං කායවිවෙකො'** යනු ටීකා ය.

කායවිවෙකය වැඩිය යුත්තේ සමූහයා කෙරෙන් ඇත් ව පිරිස්හි නො ඇලීමෙනි. මහවෙහෙර වසමින් ගණයා පාලනය කරන්නහුට චිත්ත – උපධිවිවෙක තබා කායවිවෙකය වත් නො වැඩිය හැකි ය. **'ගණසඞ්ගණිකං පහාය එව කායවිවෙකො වඩ්ඪිතබ්බො'** යන මෙයින් ඒ පැහැදිලි ය. ගණසඞ්ගණිකාව හැර සිටි, නෙක්ඛම්මයෙහි ඇලී වසන්නහුට මේ සමෘඩ වන්නේ ය. **'කායවිවෙකො පන ගණසඞ්ගණිකං පහාය නෙක්ඛම්මාභිරතානං එව සමිජ්ඣිස්සති'** යනු ටීකා ය.

ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ්‍යාන, ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන, සොතාපත්ති, සකදාගාමි, අනාගාමි, අරහත්තමග්ග යන මේ, චිත්තවිවෙක නම් වේ. අෂ්ටසමාපත්තීහු ම චිත්තවිවෙකය සේ ඇතැම් තැන ගැණෙති. **'පඨමං ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං විවිත්තං හොති' දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්ක විචාරෙහි චිත්තං විවිත්තං හොති, තතියජ්ඣානං සමාපන්නස්ස පීතියා චිත්තං විවිත්තං හොති, චතුත්ථජ්ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං විවිත්තං හොති, ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං විවිත්තං හොති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං**

විවිත්තං හොති, සොතාපන්නස්ස සක්කායදිඨියා විචිකිච්ඡාය සීලබ්බතපරමාසදිඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති, සකදාගාමිස්ස ඔළාරිකා කාමරාගසඤ්ඤෝජනා පටිඝසඤ්ඤෝජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති, අනාගාමිස්ස අනුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති, අරහතො රූපරාගා අරූපරාගා මානා උඩච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා තදෙකඨෙහි ච කිලෙසෙහි බහිඩා ච සබ්බනිමිත්තෙහි චිත්තං විවිත්තං හොති, අයං චිත්තවිවෙකො' යනු දෙශනා ය.

ප්‍රථමධ්‍යානයට පැමිණියහුගේ සිත නීවරණයන්යෙන් මිදෙන්නේ ය. ප්‍රථමධ්‍යානයට පැමිණියහුගෙ සිත උපචාරයෙහි නීවරණයන් ගෙන් මිදුනේ ද, හොඳට මිදෙන්නේ අර්පණාවස්ථාවෙහි ය. චිතීයධ්‍යානයට පැමිණියහුගේ සිත විතර්ක විචාරයන් ගෙන්, තෘතීයධ්‍යානයට පැමිණියහුගේ සිත ප්‍රීතියෙන්, චතුර්ථධ්‍යානයට පැමිණියහුගේ සිත සුඛදුඃඛයෙන් මිදෙන්නේය. මිදුනේය.

රූප – ප්‍රතිඝ – නානාත්ව සංඥාවන් ගෙන් ආකාසානඤ්චායතනයට පැමිණියනුගේ සිත, ආකාසානඤ්චායතන සංඥාවෙන් විඤ්ඤාණඤ්චායතනයට පැමිණියහුගේ සිත, විඤ්ඤාණඤ්චායතන සංඥාවෙන් ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියහුගේ සිත, ආකිඤ්චඤ්ඤායතනසංඥාවෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණියහුගේ සිත මිදෙන්නේ ය. මිදුනේ ය.

සොතාපන්නයාගේ සිත සක්කායදිඨි – විචිකිච්ඡා – සීලබ්බත පරාමාසයන් ගෙන් හා දිඨිවිචිකිච්ඡානුසයන් ගෙන් හා ඒ හා යෙදී සිටි කෙලෙසුන් ගෙන් හා, සකදාගාමීහුගේ සිත ඔළාරික කාමරාග පටිඝසඤ්ඤෝජනයන් ගෙන් හා ඔළාරික කාමරාග පටිඝානුසයන් ගෙන් හා ඒ හා යෙදී සිටි කෙලෙසුන් ගෙන් හා, අනාගාමීහුගේ සිත සියුම් වූ කාමරාග පටිඝසඤ්ඤෝජනයන් ගෙන් හා සියුම් වූ කාමරාගපටිඝානුසයන් ගෙන් හා ඒ හා යෙදී සිටි කෙලෙසුන් ගෙන් හා, රහත්හුගේ සිත රූපරාග – අරූපරාග – මාන – උඩච්ච – අවිජ්ජාවන් ගෙන් හා මාන – භවරාග අවිජ්ජානුසයන් ගෙන් හා ඒ හා යෙදී සිටි කෙලෙසුන් ගෙන් හා පිටත්හි වූ සංස්කාර නිමිත්තයන් ගෙන් හා මිදෙන්නේ ය. මිදුනේ ය. මේ වනාහි අතිශය පරිශුද්ධ භාවයට පැමිණි සිත් ඇත්තන් පිළිබඳ වේ. 'චිත්ත විවෙකො ච පරිසුඛවිත්තානං පරමවොදානප්පත්තානං'

යනු බැලිය යුතුය. අෂ්ට සමාපත්තීන්ගේ වශයෙන් චිත්තපාරිසුඬිය වත්තී ය. උපචාර සහිත අෂ්ටසමාපත්තිය, චිත්තවිසුඬි යි කියනු ලබන්නී එහෙයිනි.

උපධිවිවෙක නම්, නිවන යි. ඛන්ධ- කිලෙස- අභිසඞ්ඛාර යන තිදෙන උපධි නම් වෙති. නිවන මොවුන්ගෙන් වෙන් ව සිටි බැවින් උපධිවිවෙක යි ගැණේ. **'කිලෙසාභිසඞ්ඛාරානං උපධිනං සුඤ්ඤතාවෙ උපධිවිවෙකො, උපධි වුච්චති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච, උපධිවිවෙකො වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බ සඞ්ඛාරසමථො, සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'** යන මේ කියුම්වලින් උපධිවිවෙකය කිමැ යි දැනගත හැකි ය. කෙලෙස-සකඩ-අභිසංඛාරයෝ උපධිහු ය. නිවන උපධිවිවෙකය යි කියනු ලැබේ. සකල සංඛාරයන්ගේ යම් සංසිදීමෙක් උපධින් ගේ බැහැරලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂයවීමෙක් නොඇල්මෙක් දුක් වැළකීමෙක් තෘෂ්ණාවෙන් වෙන්වීමෙක් වේ ද, ඒ ය උපධි විවෙක ය. ඒ මේ උපධිවිවෙකය උපධිරහිත පහකළ සංඛාර ඇත්තන් පිළිබඳ ම ය. **'උපධිවිවෙකො ච නිරූපධිනං පුග්ගලානං විසඞ්ඛාරගතානං'** යනු කීයේ ඒ බව දක්වන්නට ය.

විවෙකය පස් වැදෑරුම් කොට ද කියන ලද්දේ ය. තදඞ්ගවිකඛම්භන- සමුච්ඡේද- පටිපස්සඞ්ඛි- නිස්සරණය ඒ පස. ඒ ඒ විදර්‍ශනාඥානයෙන් ලැබෙන විවෙකය තදඞ්ගවිවෙක නම් වේ. **'තදඞ්ගවිවෙකො නි තෙන තෙන විපස්සනාඤාණෙන විවෙකො'** යනු ඒ කීම ය. නීවරණයන් දුරුකිරීම් වසයෙන් ඇතිවන විවෙකය විකඛම්භනවිවෙක නම් වේ. **'නීවරණානං දූරීකරණ වසෙන විවෙකො විකඛම්භන විවෙකො'** යනු ඒ කීම ය. මූළුමනින් කෙලෙස් සිඳලීමෙන් ලැබෙන විවෙකය සමුච්ඡේද විවෙක නම් වේ. **'සමුච්ඡේදවිවෙකො නි කිලෙසානං සමුච්ඡේදන විවෙකො'** යනු ඒ කීම ය. කෙලෙස් සංසිඳීමෙහි ලැබෙන විවෙකය පටිපස්සද්ධිවිවෙක නම් වේ. **'කිලෙසානං පටිපස්සඞ්ඛි විවෙකො,** යනු ඒ කීම ය. ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම සඞ්ඛ්‍යාත සියලු ධර්‍මයන්ගෙන් වෙන්වීමෙන් ලැබෙන සංඛාරවිවෙකය නිස්සරණ විවෙක නම් වේ **'නිස්සරණවිවෙකො, නි සබ්බසඞ්ඛත නිස්සරණ තුතො සඞ්ඛාරවිවෙකො,** යනු ඒ කීම ය.

නාගසෙන මහාස්ථවිරයන් වහන්සේ, මිලිඳු රජු අමතා

'ඉධ මහාරාජ! පවිඝල්ලානං පවිඝල්ලියමානං රක්ඛති = මහරජ තුමනි! බුදුරජුන්ගේ මේ ශාසනයෙහි දුක් වූ විවෙකය නෙමේ විවෙකිහු හැම අතකින් රකින්නේ ය.

ආයුං වඩ්ඪෙති = විවෙකිහු පිළිබඳ වූ ආයුසංස්කාරය මොනවට වඩන්නේ ය. දියුණු කරන්නේ ය.

බලං දෙති = විවෙකිහු පිළිබඳ කායබල ඥනබලයන් වඩා ඔහු හැම බලයකින් බලගතු කරන්නේ ය.

වජ්ජං පිදහති = වරද වසා වරද පහකොට විවෙකිහු නිවරදයකු කරන්නේ ය.

අයසං අපනෙති = විවෙක රහිත ව හුන්දවසෙහි, කළ වරද නිසා යම්කිසි අයසෙක් වී නම් එය මුළුමනින් වසා දමා යශස්වියකු කරන්නේ ය.

යසං උපනෙති = මිනිසකු විසින් ලංකර ගත යුතු වූ හැම යශසක්ම ලභාකර දෙන්නේ ය.

අරතිං විනොදෙති = සසුන කෙරෙහි වූ යම්කිසි නොඇල්මෙක් වී නම් එය මුළුමනින් දුරලන්නේ ය.

රතිං උපදහති = විවෙකිහුගේ සිතෙහි ශාසනාලය පිහිටුවා විවෙකිහු සසුනෙන් නොගිල්ලෙන සේ එහි තද බද කරන්නේ ය.

භයං අපනෙති = එලොව මෙලොව බිය නසා බිය නැත්තකු කරන්නේ ය.

වෙසාරජ්ජං කරොති = විවෙකිහුගේ සිත කිසිතැනෙක නොහැපෙන, කිසි කරුණෙකා නොබියවන, කිසිවකු විසින් යටපත් නොකටහැකි විශාරද භාවයට පත්වූවක් කරන්නේ ය.

නොසජ්ජං අපනෙති = සියලු හිත දැ යටපත් කරණ, සසුන් කිසෙහි පසුබස් වන ආතමාණීය නසාලන කම්මැලිකම වනසන්නේ ය.

විරියං අභිජනෙති = සසුන් කිස පලගන්වා ලන, ලෞකික ලොකොත්තරාභිඥාධ්‍යය සාදුලන වීර්‍යය, විවෙක සිත බලගතු කරන්නේ ය.

රාගං අපනෙති = සත්වයන් හැම අතකින් නොමගට පොළඹවන රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය යන මෙතැන්හි ඇලීම දුර ගසා ලන්නේ ය.

දෝසං අපනෙති = ඇස් – කන් – නාසාදී ඉඳුරනට හමුවන අනිටු අරමුණු නිසා සිතෙහි පහළවන වණ්ඩභාවය උදුරාලන්නේ ය.

මොහං අපනෙති = දුක්ඛ – සමුදය – නිරෝධ – මාර්ග යන සිවුසස් දහම්හි හා පූර්වාන්තාදීන්හි නොදන්ම බැහැර කරන්නේ ය.

මානං නිහනති = 'සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි' යනාදී වශයෙන් සිතෙහි පහළ වන උන්නතිය වනසන්නේ ය.

විතක්කං හඤ්ඤති = කාම – ව්‍යාපාද – විහිංසා ආදී ලාමක විතර්ක කඩා බිඳ ලන්නේ ය.

චිත්තං එකග්ගං කරොති = නන් අරමුණුවල ඉතා චිකිත්සුදු දුවන පතින සිත, එක දැහැමි අරමුණෙක බැඳ තබන්නේ ය.

මානසං සොභයති = සිත මුදු සිනිදු බවට පමුණුවන්නේ ය.

භාසං ජනෙති = විවෙකයෙන් ලත් එකඟ බව නිසා සතුට උපදවන්නේ ය.

ගරුකං කරොති = දැහැමි නොදැහැමි සමාජයෙහි ගරුබවට පමුණුවන්නේ ය.

ලාභංඋප්පාදයති = ලැබියයුතු හැම ලාභයක් ම ලබා දෙන්නේ ය.

නමස්සියං කරොති = ලෝකයා විසින් දෙහොත් මුදුන් දී වැඳිය යුත්තකු කරන්නේ ය.

පීතිං පාපෙති = ධාර්මික වූ ප්‍රීතියට පමුණුවන්නේ ය.

පාමොජ්ජං කරොති = බල ප්‍රාප්ත වූ ප්‍රීතිය උපදවන්නේ ය.

සංඛාරානං සභාවං දස්සෙති = සංස්කාර ධර්මයන් පිළිබඳ වූ අනිත්‍ය – දුඃඛ – අනාත්මාදීන්ගේ වශයෙන් ඇති තතු විදහා දක්වන්නේ ය.

භවපටිසන්ධිං උපච්ඡාපෙති = හෙතු ඵල පරම්පරාවශයෙන් භවයෙන් භවය ගැටීම, ගැළපීම මුළුමනින් උදුරාලන්නේ ය.

සබ්බසාමඤ්ඤං දෙති = සෝතාපත්ති -- සකදාගාමි – අනාගාමි – අරහත්ත මග්ගඵල සංඛ්‍යාත හැම ශ්‍රමණ ගුණයක් ම දෙන්නේ ය. ආයුෂ්මත් අෂ්ටාඞ්ගික මාර්ගයද මෙහි ම හෙන්නේය' යි සැකෙවින් පොදුවේ විවෙක ගුණ වදාළ සේක.

එහෙයින් 'වැඩූ විවෙකය තෙමේ සියලු ලොවී ලොවුතුරා සැප සිදු කරන්නේ ය' යි දැන දිවා රෑ දෙක්හි ඒ වැඩීමට උත්සාහවත් විය යුතු ය.

අනුබ්‍රෑහයෙ, යනු ක්‍රියා පද යි. **අනුපූර්ව්බ්‍රෑහ – වඩ්ඪනෙ** යන ධාතුවෙන් නිපත්නේ ය.

වනවාසිකතිස්සසාමණෙරවස්තුව නිමියේ ය.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල නායක ස්ථවිරයන් කළ සඩම්සාගර** නම් වූ **ධර්මපදවර්ණනාවෙහි** බාලවර්ගාත්මකපංචමතරඞ්ගය මෙතෙකින් නිමියේ ය.

පණ්ඩිතවග්ග

ඡඡඨතරඩගීයකථාසූචි

වස්තුව	පිට
1. රාධසථවිරයන් වහන්සේ	885
2. අස්සජී පුනබබසුකයෝ	892
3. ඡන්නසථවිරයන් වහන්සේ	895
4. මහාකපපින සථවිරයන් වහන්සේ	903
5. පණ්ඩිත සාමණේරයෝ	912
6. ලකුණ්ඨකභද්දිය සථවිරයන් වහන්සේ	926
7. කැවුම් නිසා හටගත් නොසතුට	930
8. මිදිරොඩු දිය බුන් කොටලුවෝ	934
9 පවුලම මහණවීම	940
10. නිදි කිරමින් බණ ඇසූ මිනිස්සු	943
11. ආගනතුක භික්ෂූන් වහන්සේලා	946

රාධස්ථවිරයන් වහන්සේ

6 — 1

අප බුදුරජුන් දවස රාධ නම් දිළිඳු බමුණෙක් විය. දිවි පැවතුම් ගෙණ යෑමෙහි අපොහොසත් වූ ඔහු 'දිවි පවත්වමි' යි සිතා ගෙණ විහාරයට ගොස් තණ කසළ හැර දමමින් පන්සල් පිරිවෙන් ගේමලු හැමදිමින් දූහැටි පැන් එළවමින් මෙසේ භික්ෂූන් පිළිබඳ කුදු මහත් හැම වත් සපයමින් එහි ම විසී ය. භික්ෂූන් වහන්සේලා ද කෑම් බීම් බත් බුලත් ඇදුම් කැඩුම් දෙමින් ඔහුට සංග්‍රහ කළහ. කල් යත් බමුණු තෙමේ මහණවීමෙහි රුචි උපදවා ඒ බව භික්ෂූන්ට දන්වා සිටියේ ය. එහෙත් භික්ෂූන් වහන්සේලා එයට සතුටු නො වූහ. මහණවීමෙහි ම තද ආසාවෙන් මිරිකුනු බමුණා වැඩි කල් නො යාදී ම දිරුම් කඩට ගියේ ය. දිනෙක බුදුරජාණන් වහන්සේ අලුයම ලොව බලා වදාරන සේක් ඔහු දැක, 'බමුණාට වන්නේ කිමැ' යි බලනුවෝ රහත් වන බව දැක සවස විහාරචාරිකාවෙහි හැසිරෙන්නාකු සේ ඔහු වෙත ගොස් තොරතුරු විචාළ සේක. එවිට ඔහු 'සවාමීනි! මම පන්සලේ ඇති වත් පිළිවෙත් කරමින් ලැබුනු දෙයක් කමින් මෙහි නැවතී ඉඳිමි'යි කී ය. එසේ නම් 'කොහොම ද උඹට, ඔය නමලා ගෙන් බත් බුලතින් උපකාර ලැබේ දැ' යි ඇසූ කල්හි 'එහෙයි, බත්පික වතුර ටික නො වරදවා ම ලැබෙනවා, බුලත් පුවක් හුණු දුම්කොළ ත් ලැබෙනවා, ඒවායින් කිසි අඩුවක් නෑ, එහෙත්, හාමුදුරුවරු මා මහණ කර ගන්නට කැමැති නැතැ' යි කීයේ ය.

එකල්හි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් රැස් කරවා කාරණය අසා 'මහණෙනි! මේ බමුණා ගෙන් උපකාර ලත් එක් නමක් වත් මේ පිරිසෙහි නැද්ද, ලැබුනු උපකාරයක් ගැණ කෘට වත් මතක තිබේ දැ' යි ඇසූහ එවිට සැරියුත් මහතෙරනුවෝ 'සවාමීනි! දිනෙක මා රජගහනුවර සිඟා යද්දි, මොහුට දෙන්නට ගෙණා බත් සැන්දක් මා සිටිනු දැක මට දෙවූබව මතක තිබේ ය' යි කීහ 'ඇයි, ශාරිපුත්‍ර! එසේ නම් තමුසේට උපකාරයක් කළ මේ දිළින්දා දුකින් මුදුලන්නට නරක දැ' යි ඇසූ කල්හි 'සවාමීනි මම එසේ කරන්නෙමි' යි සැරියුත් මහතෙරනුවෝ බමුණා පැවිදි කළහ. එතැන් සිට දන් වැළඳීමට දානශාලාවට යන ඒ බ්‍රාහ්මණ භික්ෂූනමට හැමදා කෙළවර තුබූ ආසනය ම ලැබේ. එහි පිළිවෙළින් කෑද බත් බෙදා යන කල්හි, බොහෝ දවස ඒ කෑදබත් කෙළවර ආසනයට පැමිණෙන්නට පෙරාතුව ම අවසන් වී යයි. එහෙයින්

ඒ අලුත් මහණ, හැමදා කැඳ බතින් වෙහෙසට පත් විය. සැරියුත් තෙරනුවෝ ඒ බව හොඳින් දැන ඔහු ත් කැටුව වාරිකාවෙහි ගියහ. එහි දී උන්වහන්සේ 'මේ දෙය කළ යුතු ය, මේ දෙය නො කළ යුතු ය, මෙසේ පිළිපැදිය යුතු ය, යන ඈ ලෙසින් අවවාද දෙමින් සිරිත් විරිත්හි ඔහු හික්ම වූහ. ඔහු ද එතැන් සිට යටත් පහත් පැවතුම් ඇති ව, අවවාද ලෙසින් පිළිපැද කිහිප දිනකින් ම රහත් බවට පැමිණියේ ය. එවිට සැරියුත් මහතෙරුන් ඒ නවක භික්ෂු නමත් ගෙණ බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක හුන් කල්හි, උන්වහන්සේ සැපදුක් විචාරා සතුටු ව 'ශාරීපුත්‍ර! කොහොම ද ගෝලයා සුවච ද, කීකරු දැ' යි ඇසූහ. 'එසේ ය, ස්වාමීනි! බොහො ම කීකරු යි, වැරද්ද කියනවාට අවවාදයට ඒ නම බොහො ම කැමතියි, වැරද්දක් කීවාට කිපෙන්නේ නැත, කිපුනුබවෙක් කිසිත් දවසෙක හැඟුනේ නැතැ' යි කී කල්හි 'ශාරීපුත්‍ර! හොඳයි, තමුසේ ඔය අන්දමේ ගෝලයන් ලැබුනොත් කී දෙනෙකුන් බාර ගන්නහු දැ' යි ඇසූහ. 'ස්වාමීනි! මේ අන්දමේ කීකරු, අවවාදයට නො කිපෙන කියන්න එසේ කරණ ගෝලයන් කොපමණ ලැබුන ත් ඒ හැමදෙනෙකුන් ම බාර ගණිමි' යි සැරියුත් තෙරුන් වහන්සේ කීහ.

දවසෙක ධර්මශාලාවෙහි රැස් වූ භික්ෂූන් වහන්සේලා 'ඒක ද ශාරීපුත්‍ර මහාස්ථවිරයෝ ලොකුවට කළගුණ සලකන්නෙක, ඉතා ටික වූ උපකාරය මහත් වූ උපකාරයක් සේ පිළිගණිති, ප්‍රකටව ම එය කියා පාති, හැන්දක් පමණ බත් ටිකක් දුන් අර නාකි දුප්පත් ජර බමුණා තමන්ගේ ගෝලයකු කොට පැවිදි කළහ, එය කවුරුන් කරණ වැඩෙක් ද, ඒ නවක භික්ෂුනමට දැන ශාලාවේ දී ලැබුනේ කෙළවර ආසනය යි, එහෙත් එයට ඔහු නො ද කිපුනේ ය, ශාරීපුත්‍ර මහාස්ථවිරයෝ ද අවවාදක්ෂමයහ, ගෝලයා ත් ඒවාගේ ම ය, අවවාදක්ෂමයාට අවවාදක්ෂමයෙක් ම ලැබුනේ ය' යි කතා කරන්නට වූහ. බුදුරජානන් වහන්සේ ඒ අසා 'මහණෙනි! සැරියුත් තෙමේ කළගුණ සලකනුයේ එය ප්‍රකට කොට කියනුයේ අද ඊයේ නො වේ, පෙර ත් කළගුණ සැලකී ය, කළගුණ ප්‍රකට වශයෙනුත් දැන සිටියේ ය' යි වදාරා එය ප්‍රකට කරණු පිණිස දුකනිපාතයෙහි එන මේ **අලීනචිත්ත ජාතකය** විස්තර වශයෙන් වදාළ සේක.

'අලීනචිත්තං නිස්සාය පහඨා මහතී චමූ,
කොසලං සෙනා සන්තුඨො ජීවගාහං අගාහසි.
එවං නිස්සයසම්පන්නො භික්ඛු ආරඩවීරියො,
භාවයං කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා,
පාපුණෙය්‍යානුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයං' යි.

අලීනචිත්ත රජකුමරු ඇසුරු කොට සතුටු වූ මහාසෙනා කොමෝ, සඛකීය සේනාරාජ්‍යයට නො සතුටු වූ කොසොල් රජු ජීවග්‍රාහයෙන් ගැන් වීය.

මෙසේ අලීනචිත්ත කුමරුන් ඇසුරු කළ සෙනාව මෙන් කලණ මිතුරන් ඇසුරු කළ, පටන් ගත් වීර්‍ය ඇති යොගාවචර මහණ තෙමේ, නිවනට පැමිණීම පිණිස බෝ පැකි දම් වඩමින් පිළිවෙළින් සම්සංයොජනක්ෂය යි කියූ නිවනට පැමිණෙන්නේ ය.

'තමන් සසර ඇත් ව උපත් අවදියෙහි වඩුවන් පය ඇණුකු උල්කඩ ඇද දමා සුවපත් කිරීමෙන් කළ මහත් උපකාරය සලකා වඩුවන්ට සුදු ඇත් පැටවකු ගෙණ දුන්, එකලා ව හැසුරුනු ඇත් තෙමේ මේ සැරියුත් තැනැ'යි වදුරා නැවැත 'මහණෙනි! හැමදෙනකු මේ රාධ මහණහු මෙන් සිකරු වියයුතු ය, සුවචයකු වියයුතු ය, දෙස් දක්වා ගුරුන් කියන දෙඩන කණීකටුක වචනයට නො කිපිය යුතු ය, අන්‍යයන්ගේ රළුබසට ද නො කිපිය යුතු ය, තමාට වඩා බාල කෙනෙක් වුව ද, අවවාද වසයෙන් යමක් කියත් නම්, අවවාදය බාල නො වන බැවින් සතුටින් එය පිළිගත යුතුය, අවවාද කරන්නා වනාහී ධනයෙන් පිරී සිටි නිධන් කියන්නකු සේ උසස් කොට සැලකිය යුතු ය' යි අනුසන්ධි ගළපා මේ ධම්දෙශනාව කළ සේක:-

නිධිනං ව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං,
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ,
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියොති.

වරද වරද සේ දක්නා සුලු, නිග්‍රහ කොට කියන, තුවණැති යමකු නිධානයක් දක්වා කියන්නකු වැනි කොට දක්නේ වේ ද, එබඳු පණ්ඩිතයකු සෙවනය කරන්නේ ය. එබන්දකු සෙවනය කරන්නහුට යහපත වේ. නපුරෙක් නො වේ.

නිධිනං ඉව පවත්තාරං = නිධන් කියන්නකු වැනි කොට.

යම් යම් අවස්ථාවන්හි ප්‍රයොජන ගැණීම පිණිස රැකවල තබන වසතුව **නිධානෑ'** යි කියනු ලැබේ. **'නිධියතීති = නිධි, ඨපීයති රක්ඛීයති ගොපීයතීති අත්ථො'** යනු විවෘතති සි. 'මිනිසුන් විසින් මත්තෙහි ඉදිරියෙහි වැඩ ගැණුමට තැන්පත් කරණ නිධාන සතරෙක් ඇතැ' යි ආගමෙහි ආයේ ය. **ථාවර, ජඞ්ගම, අඞ්ගසම, අනුගාමික** යන මේ ය ඒ. පොළොව කැණ පොළොවෙහි හෝ යම්කිසි උඩක හෝ තැන්පත් කළ රන් රිදී මුතු මැණික් හෝ කෙත්වත් ඉඩ කඩම් ආ ඉරියවුවලින් තොර වසතු ජාතයෙක් හෝ වේ නම්, ඒ ථාවරනිධාන නම් වේ. **'ථාවරෝ නාම භූමිගතං අවහාසඤ්ච නිරඤ්ඤං වා සුවණ්ණං වා අඩ්ඨතං වා වත්තුං වා යං**

වා පනඤ්ඤං ඉරියාපථවිරහිතං' යනු අටුවාය. දැසි දස් ඇත් අස් ගව මහිස වෙළඹ එළු තිරළු කුකුළු හූරු යනාදී වූ ඉරියවු පැවැත්වීමෙන් යුත් සත්ත්වගණය, ජඞ්ගමනිධාන, නම් වේ. **'ජඞ්ගමො නාම දාසිදාසහත්ථිගවාස්සවළවඅජෙළකකුක්කුට සූකරා, යං වා පනඤ්ඤම්පි එවරූපං ඉරියාපථපවිසංයුත්තං'** යනු අටුවා ය. මිනිසුන් විසින් තමන්ගේ ප්‍රයොජනය පිණිස උගත් ශිල්ප කර්මාන්ත විද්‍යායතනාදිය හා තමන්ට හිත වූ ඒ අන්දමේ තවත් දේත් අඞ්ගසමනිධාන, නම් වේ. **'අඞ්ගසමො නාම කම්මායතනං සිප්පායතනං විජ්ජාඨානං බාහුසච්චං, යං වා පනඤ්ඤම්පි එවරූපං සික්ඛිත්වා ගහිතං අඞ්ගපච්චඞ්ගං ඉව අත්තභාව පටිබඩං'** යනු අටුවා ය. මේ නිධානය අඟපසඟ මෙන් සිරුර පිළිබඳ හෙයින් අඞ්ගසම, යි කියනු ලැබේ. දාන සීල භාවනා ධම්මසවණ ධම්මදෙසනාදීන්ගේ වසයෙන් ඒ ඒ අවස්ථාවෙහි සිදු කරණ කුශල කර්මසමූහය, අනුගාමිකනිධාන, නම් වේ. ඒ කීහ. **'අනුගාමිකො නාම දානමයං පුඤ්ඤං සීලමයං භාවනාමයං ධම්මසවණමයං ධම්මදෙසනාමයං, යං වා පනඤ්ඤම්පි එවරූපං පුඤ්ඤං තත්ථ තත්ථ අනුගන්ත්වා විය ඉඤ්ඵලං අනුප්පාදෙති'** යි.

බුදුරජානත් වහන්සේ මිනිසුන් වස්තුව නිදන් කරණ සැටි සැකෙවින් මෙසේ වදාළ සේක:–

'නිධිං නිධෙති පුරිසො ගම්භීරෙ ඔදකන්තිකෙ,
අත්ථෙ කිච්චෙ සමුප්පන්නෙ අත්ථාය මෙ භවිස්සති.

රාජතො වා දුරුත්තස්ස චොරතො පීළිතස්ස වා,
ඉණස්ස වා පමොක්ඛාය දුබ්භික්ඛෙ ආපදාසු වා,
එතදත්ථාය ලොකස්මිං නිධි නාම නිධීයති' යි.

මට වැඩැති කටයුත්තක් පැමිණි කල්හි වැඩ පිණිස වන්නේ ය' යි පුරුෂ තෙමේ දිය කෙළවර කොට ඇති ගැඹුරු තැන නිදන් පිහිටුවයි.

එසේ ම රජුන් ගෙන් සොරුන් ගෙන් ණය හිමියන් ගෙන් මිදීමට හා දුර්භික්ෂයෙහි හා විපතෙහි වැඩ ගැණීමටැ යි ලොකයෙහි නිදන් පිහිටුවනු ලැබේ. මේ කී නිදන් සතරින් මෙහි ගැණුනේ ථාවරනිධානය යි. **'තත්ථ තත්ථ නිදහිත්වා ඨපිතානං හිරඤ්ඤසුවණ්ණපූරානං නිධිකුම්භිනං'** යන අටුවාව ඒ හෙළි කරයි.

පවත්තාරං, යන්න ප පූර්ව වද-වචනෙ යන්නෙන් නිපන්නේය. **'පවදතීති = පවත්තා'** යනු වාක්‍ය යි. **වච – වියත්තියං වාචායං** යන්නෙන් ද නිපදවිය හැකි ය.

යං පස්සෙ වජ්ජදස්සිනං = වරද දක්නා සුලු යමකු දක්නේ වේ ද.

යං, යන්නට ගාථාවෙහි එන **පවත්තාරං, වජ්ජදස්සිනං, නිග්ගය්හවාදිං, මෙධාවිං** යන පද සතර විශෙෂණ ව සිටියේ ය. එහෙයින් 'වරද දක්නා සුලු නිග්‍රහ කොට කියන සුලු නුවණැති යමකු නිදන් කියන්නකු වැනි කොට' ඉන අරුත් ගතයුතු ය.

වරද දක්නා සුල්ලෝ දෙදෙනෙකි. එහි 'මේ නො සරුප් බවෙන් මේ වරදෙන් සහ මැද දී මොහුට නිග්‍රහ කරන්නෙමි' යි නිතර උනුන් පිළිබඳ සිදුරු සොයන එකෙක, නො දත් දෙය දන්වන්නට දත් දෙය දැනි ව ගන්වන්නට සිල් ආ ගුණ දහමින් දියුණු කරන්නට වරදින් නහා සිටුවන්නට බලාපොරොත්තු වන එකෙක' යි. පසු කියේ මෙහි එන්නේ ය.

මෙ ලොව විපාක දෙන වරද ය, ඉදිරියෙහි එන අත්බවෙහි විපාක දෙන වරද ය, යි වරද දෙකෙකි. **'ඉධ භික්ඛවෙ! එකච්චෙ පස්සති චොරං ආගුචාරිං රාජිනො ගහෙත්වා විවිධා කම්ම කාරණා කාරෙත්වා'** යනාදීන් වදලෝ මෙ ලොව විපාක දෙන වරද ය. **'ඉධ භික්ඛවෙ! එකච්චෙ ඉති පටිසංචික්ඛති කායදුච්චරිතස්ස බො පාපකො විපාකො'** යනාදීන් වදලෝ එන අත්බවෙහි විපාක දෙන වරද ය. මෙහි ප්‍රධාන වන්නේ ත් ඒ ය.

බණපොත **'සඞ්ඛ කිලෙසා වජ්ජා, සඞ්ඛ දුච්චරිතා වජ්ජා, සඞ්ඛ අභිසඞ්ඛාරා වජ්ජා, සඞ්ඛං භවගාමිකම්මං වජ්ජං'** යි මෙසේ වරද කියා පෑ ය. සියලු කෙලෙස්, සියලු දුසිරිත්, සියලු පින් පව් සසර උපත දෙන සියලු කම් වරද ය. කෙලෙස් යන්නෙන් රාගාදිහු ගැණෙති. දුසිරිත් යන්නෙන් ප්‍රාණඝාතාදිහු ගැණෙති. පින් පව් යන්නෙන් පුණ්‍යාපුණ්‍යානෙඤ්ජාභිසංඛාරයෝ ගැණෙති. කම් යන්නෙන් විපාකජනක කම්මයෝ ගැණෙති. ඒ මෙසේ ආයේ ය. **'කිලෙසාති රාගාදයො, දුච්චරිතානි පාණාතිපාතාදයො, අභිසඞ්ඛාරාති පුඤ්ඤාභිසඞ්ඛාරාදයො, භවගාමිකම්මංති විපාකජනකානි කම්මානි'** යි.

පරමාණු මාත්‍ර වූ වරද යොදුන් එක් ලක්ෂ අටසැට දහසක් පමණ උස් වූ මහමෙර වැනි කොට දක්නේ **වජ්ජදස්සී,** නම් වේ **'පරමාණුමත්තං වජ්ජං අඨසට්ඨියොජනසතසහස්සුබ්බෙධසිනෙරුපබ්බතසදිසං කත්වා දස්සනසභාවො'** යනු ආගම යි.

පරමාණු මාත්‍ර වරදු යි කියේ භික්ෂූන් පිළිබඳ නම් නො දැන, වරදවා, පිරිමඩුලු නො කොට හැදීම් පෙරළීම් ආ විසින් සෙඛිය ශික්ෂාපදයත් ඉක්මවා සිටීම ය. ඒහි පැවිදි හැම කෙනෙකුගේ ම

පරමාණු මාත්‍ර වරද සේ ගැණෙනුයේ අකුසල් සිත් ඉපදවීම ය. යම් භික්ෂු කෙනෙක් වනාහි දුර්භාෂිතමාත්‍රය ත් පාරාජිකාවක් වැනි කොට දකිත් නම් ඔවුහු ම **'වජ්ජදස්සී,** නම් වෙති. ගිහින් අතර යම් කෙනෙක් අකුශලචිත්තමාත්‍රය ත් ආනන්තර්‍යකර්මයක් කොට සිතත් නම් ඔවුහු ම **'වජ්ජදස්සී,** නම් වෙති. තමා පිළිබඳ වරද දක්නේ ත් මෙරමා පිළිබඳ වරද දක්නේ ත් වජ්ජදස්සී ය. මෙහිලා ප්‍රධාන විසින් අන්‍යයා පිළිබඳ කුදු මහත් වරද දැක උන් එයින් නගා සිටුවීමෙහි උත්සාහිතයා ගැණේ. වරද දැක වරදින් නගන්නට අවවාද දෙන්නේ ගරු බුහුමන් පෙරටු කොට සෙවිය යුතු ය. දිළිඳු මිනිසෙක්, 'මේ ගණුව' යි තර්ජනය කොට තළා පෙළා රන් රිදී මුතු මැණික් පිරුනු නිදන් සැළක් දක්වන්නහු කෙරෙහි යම්සේ නො කිපේ ද, සතුටු සිත් ඇත්තේ ම වේ ද, එපරිද්දෙන් නො සුදුසු ක්‍රියාවක් නො මනා හැසිරීමක් දොසක් වරදක් දැක කියන්නහු කෙරෙහි නො කිපිය යුතු ය. ඔහු කෙරෙහි සතුටු සිත් ඇත්තකු ම වියයුතු ය. 'පින්වත! ඔබ මට කළේ මහත් වැඩෙක, නැවැත නැවැත මාගේ වරද කියාදෙනු මැනැව, මාගේ ගුරුන් සේ මාකෙරෙහි ක්‍රියා කරණු දැක්මෙහි මම ආශා ඇත්තේ වෙමි, මාගේ අනාගතය හැඩ ගස්වනු මැනැවැ' යි පැවරිය යුතු ය.

නිග්ගයහවාදිං = නිග්‍රහ කොට කියන සුලු.

ඇතැම් කෙනෙක් ස්වකීය සඞ්විහාරිකාදීන්ගේ වරද දුටුවෝ ද 'මෙතෙමේ මුව දෝනා පැන් දීම් ආදියෙන් මට සකස් ව උවැටැන් කර යි, පිණ්ඩපාතය ගෙණ දෙයි, මොහුගේ නෑයෝ වත්පොහොසත් කම් ඇත්තෝ ය, ඒ අයත් මට සලකති' යි දැඩි ව ගෙණ වරදෙහි නිග්‍රහ කිරීමට දඬුවම් කිරීමට අවවාද දීමට පසුබට වෙති. 'එසේ කළොත් පිරිහීමෙක් වන්නේ ය' යි සිතති. එබන්දෝ නිග්ගයහවාදී නො වෙති. ඔවුහු මේ සසුනෙහි කුණු කසළ විසුරු වන්නෝ ය. සසුනට කුණු කසළ ඇද දමන්නෝ ය.

යම් කෙනෙක් වනාහි නිග්‍රහයට, දඬුවමට, අවවාදයට සුදුසු වරද දුටු තැන තදනුරූප ව තර්ජනය කොට ආවාසයෙන් නෙරපා හැරීමෙන් දඬුවම් කිරීමෙන් වරදකරු වෙහෙරින් බැහැර කිරීමෙන් හික්ම වද්ද, ඔවුහු **නිග්ගයහවාදී,** වෙති. බුදුරජානන් වහන්සේ නිග්‍රහ කළයුත්තෙහි නිග්‍රහ කළ සේක. බැහැර කළයුත්තෙහි බැහැර කළ සේක. දඬුවම් කළයුත්තෙහි දඬුවම් කළ සේක. අවවාද කළ යුත්තෙහි අවවාද කළ සේක. විනයෙහිලා උන්වහන් සේ නො මනාව හැසිරෙන අතවැස්සන්ට අවවාද කරන්නට දඬුවම් කරන්නට නිග්‍රහ කරන්නට ඔවුන් බැහැර කරන්නට

'අනුජානාමි භික්ඛවෙ අසම්මාවත්තනානං පණාමෙතුං'යි අනුදත් සේක. යම් අතවැස්සෙක් ආචාර්‍යෝපාධ්‍යායයන් කෙරෙහි නොමනාව පිළිපදනේ නම්, ඔහුට තමන් වෙත පැමිණෙන්නට තමන් වෙත වසන්නට ඉඩ නොදිය යුතු ය. පා සිවුරු බැහරට ගන්නට නියම කළයුතු ය. තමන්ට කරණ උපස්ථාන වලකාලිය යුතු ය. එය කයින් හෝ වචනයෙන් හෝ එදෙකින් ම හෝ කළහැකි ය. ගුරුවරුන් කෙරෙහි ප්‍රෙමයත් ප්‍රසාදයත් ලජ්ජාවත් ගෞරවයත් චිත්තභාවනාවත් නැති අතවැස්සන් පන්නා හැරීමට ගුරුන්ට බලය ඇත්තේ ය. එහෙයින් එබදු අතවැස්සන් කෙරෙහි එසේ පිළිපැදිය යුතු ය. ගුරුන්ට ගහන බණින නින්ද කරණ දුෂ්ප්‍රතිපත්තියෙහි හැසිරෙන විනය දහමට පටහැනි ව යන අතවැස්සන් පන්නා හැරීම ගුරුන් විසින් කළයුතු ය. එසේ නොකොට වරද දුක දුක ඉන්නා ආචාර්‍යෝපාධ්‍යායයෝ දෙස් සහිතයෝ ය. සසුනෙහි කුණු කසළ දමන්නෝ ය. සසුන නසන්නෝ ය.

නිග්‍රහ කරන්නහු නින්ද පරිභව කරණ අදහසින් නොව අනුග්‍රහබුද්ධියෙන් ම ඒ කළයුතුය. එ ද වරද පමණට ය. නැත එලයෙක් නොවන්නේ ය. ඇතැම්විට එය නිග්‍රහ කරන්නහුගේ හා නිග්‍රහ ලබන්නහුගේ පිරිහීමට කරුණු විය හැකි ය.

නිග්‍රහය **කායික, වාචසික, මානසික** යි තෙපරිදි ය. තැළීම් පෙළීම් බැඳීම් ආ විසින් කරන්නා වූ නිග්‍රහය **කායික** නම්. තැති ගැන්වීම් අවවාද දීම් ආ විසින් කරණු ලබන්නේ **වාචසිකය** ය. මානසිකය වනුයේ අවවාද අනුශාසනා කිරීම් ආ නොකොට හැරීමෙනි.

මෙධාවිං = නුවණැති.

තාදිසං පණ්ඩිතං භජෙ=එබදු පණ්ඩිතයකු සෙවනය කරන්නේ ය.

සෙවනය කළයුත්තේ කෙබදු පණ්ඩිතයෙක් ද; යත්:- මුලින් කියූ ගුණැති පණ්ඩිතයෙක් ය සෙවනය කළයුතු.[1]

තාදිසං භජමානස්ස සෙය්‍යා හොති = එබන්දකු සෙවනය කරන්නාහට යහපත වේ.

න පාපියො = නපුරෙක් නොවේ.

ගුණවතකු සෙවනය කරන්නේ ගුණනුවණින් දියුණු වන්නේ ය. එයින් යොග්‍ය පුරුෂයෙක් වන්නේ ය. එයින් ධනවත් බවට යන්නේය. ගුණය ත් ධනය ත් යොදා වැඩ කිරීමෙන් සදෙවකලොකයාගේ සම්භාවනයට පාත්‍ර වන්නේ ය. පරලොවෙහි සුගතිය ම වන්නී ය. නපුරෙක් නම් නොවන්නේ ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය.

රාධස්ථවිරවස්තුව නිමියේ ය.

---

1. 2. 1. 'පණ්ඩිතා' යන්න බලනු

අස්සජි පුනබ්බසුකයෝ

6 - 2

අස්සජි පුනබ්බසුකයෝ, කීටාගිරි ජනපදයෙහි විසූ සවග මහණුන් අතුරෙන් දෙදෙනෙකි. අග්‍රශ්‍රාවක දෙදෙනා වහන්සේගේ ශිෂ්‍යයෝ ය. ඔවුහු ජාති සම්පන්නයහ. එහෙත් ලජ්ජා නැත්තෝ ය. නිතර පව්කම් කරන්නෝ ය. මොවුහු තමන්ගේ පන්සියයක් පමණ වූ පිරිවර භික්ෂූන් හා කීටාගිරියෙහි වෙසෙමින් මල්පැලසිටුවීම, පොහොරදැමීම, දියඉසීම, මල්නෙලීම, මල්වඩම් ගෙතීම, මල්වඩම් ගෙවල වැසි ගැහැණුන්ට දීම, උන් හා එක බඳුනෙහි කෑම, එක තලියෙහි බීම, එක ඇඳෙහි නිදීම, තුරුල් ව ඉඳීම, නො කල්හි කෑම, රා අරක්කුබීම, මල්ගඳ විලවුන් ඇ දැරීම, උන් හා එක් ව පලසෙහි නැටීම, ගිකීම, කොටපැනීම, කල්ලි ගැසීම, කුත්තුගැසීම, කොළනලාපිඹීම යනාදී වූ නන්වැදෑරුම් අනාචාරයෙහි යෙදී කුල දූෂණයෙන් ලත් ආහාරපානයෙන් ජීවිකාව කරමින් කීටාගිරි ආවාසය ප්‍රියශීලි ශික්ෂාගරුක භික්ෂූන්ට අනාවාස කළහ. නො සුදුසු තැනක් කළහ. අද ද එබදු පාප භික්ෂූහු බොහෝ ය. ඔවුන්ගේ ගණන තදින් දියුණු වී යයි. බලය ද ප්‍රබල වේ. ඔවුහු සඟසතු ඉඩ කඩම් හා විහාරාරාමාදිය මවුපිය පරපුරෙන් ලත් දායාදයන් සේ ප්‍රයෝජන ගණිති. සියල්ල හැර දමා ගෙයින් නික්ම ආවෝ ද, සඟසතු ඉඩ කඩම් හා විහාරාරාමාදිය තමන් සතුකර ගැණීමෙහි ලා විනිශ්චයශාලා කරා යන්නෝ ය. එයට පටහැනි වන්නවුනට තලන්නට පෙලන්නට සැරසෙති. ඇතැම්හු සඞ්ඝයාගෙන් ලත් නෙවාසිකබලය තමන් මියන්නට ලංවත් ම තම සිත් ගත් අතැවැස්සකුට හෝ තලන්නට මරන්නට එන අතැවැස්සකුට හෝ ලියා තබා මියෙති. ඔහු වනාහි අලජ්ජියෙක් කුලදූෂකයෙක් අව්‍යක්තයෙක් මූග්ධයෙක් කලහකාරයෙක් වූයේ ද, ඒ නො සලකති. මොවුන්ගේ මේ පාපක්‍රියා අද ශාසනවිනාශයෙහි ප්‍රධානස්ථානයක් ගණී යි. මෙහිලා රජය විසින් සම්මතනීතිය ධාර්මික නො වේ. ශාසනික නො වේ. ඒ නීතිය ශාසනවිනාශයෙහි ප්‍රධාන හෙතුවෙකි. එයින් ශාසනික නීතිය යටපත් වේ. සඞ්ඝබලය මුළුඑගැන් වේ. සඟසතු වෙහෙර අරම් ඇ කිසි තැනෙක අද සඞ්ඝබලය ඇතැ යි කියන්නට කරුණු නැත්තේ ය. ඒ හැම තැනෙක ම ඇත්තේ පුද්ගලබලාදී අසද්බලයෝ ය. එහෙයින් ලජ්ජී ප්‍රියශීලි භික්ෂූන් වහන්සේ පසු බා වැඩ

වෙසෙති. ශ්‍රද්ධාවත් ගෘහස්ථකුලයෝ ද ලජ්ජීන් අලජ්ජීන් නො දැන ලජ්ජීන් අලජ්ජීන් කෙරෙහි සමව පිටු පාති. හෙලා දකිති. සම ව වැටෙති. එද ශාසනවිනාශයට හෙතු වේ.

ස්වාමිදරු වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ සවග මහණුන්-ගේ මේ තොරතුරු අසා අස්සජි පුනබ්බසුකයන් වෙහෙරින් බැහැර කරන්නට පිරිවර සහිත වූ සැරියුත් මුගලන් දෙනම කැඳවා 'ශාරීපුත්‍ර ය! තමුසේලා කීටාගිරියට ගොස් අනාචාරයෙහි යෙදි බැඳී සසුන් නසන මහණුන් දෙනමට එසේ නො කරන්නට අවවාද දෙන්න; ඒ අවවාද යමෙක් නො පිළිගණී නම්, ඔහු වෙහෙරින් බැහැර කරන්න; යමෙක් පිළිගණී නම්, නැවැත නැවැතත් ඔහුට අවවාද කරන්න: අවවාදය අප්‍රිය කරන්නෝ මෝඩයෝ ම පමණෙකි, නුවණැත්තෝ අවවාදයට කැමැති ය, එසේ ම එය ඔවුන්ගේ මන වඩන්නේ ය, තමුසේලා එහි ගොස් මේ මා කී ලෙසින් කරන්නැ' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

ඔවදෙය්‍යනුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ,
සතං හි සො පියො හොති අසතං හොති අප්පියොති.

(යමෙක්) අවවාද කරන්නේ ද, අනුශාසනා කරන්නේ ද, අකුසලිනුත් වළකන්නේ ද, හෙතෙමේ වනාහි සත්පුරුෂයන්ට ප්‍රිය වේ. අසත් පුරුෂයන්ට අප්‍රිය වේ.

ඔවදෙය්‍ය = අවවාද කරන්නේ ය.

ඔවදෙය්‍ය, යන්නට මෙසේ අරුත් පවසනු, **කර-කරණෙ** යන ධාතුවේ අර්ථය හැම ධාතුවක ම ඇති බැවිනි. **'භූ කරා සබ්බධාත්වත්ථෙස්වෙව සන්ති'** යනු අනුශාසනා ය.

අනුසාසෙය්‍ය = අනුශාසනා කරන්නේ ය.

අන්තෙවාසික-සද්ධිවිහාරිකාදීන් අතුරෙහි යම් කිසිවක්හට, උපන් වරදෙහි ලා හොඳ නො හොඳ වැඩ අවැඩ කියාපෑම, අවවාද නම්. අනුත්පන්න වස්තුවෙහි හෙවත් වරදක් කෙරෙන්නට පළමුව හිතවත් ව 'ඉදිරියෙහි අපට නින්දා පරිභව ලැබෙන්නට බැරි නැතැ' යි ඉදිරි කාලය දක්වා, වැඩ අවැඩ කියාදීම, අනුශාසනා නම්. හමුවෙහි කීම හෝ අවවාද යි. නො හමුවෙහි දූතයකු හෝ හසුනක් හෝ යවා, වැඩ අවැඩ කියාදීම, අනුශාසනා නම්. එක් වරක් කීම, අවවාද නම්. නැවැත නැවැත කීම, අනුශාසනා නම්. **'උප්පන්නෙන වත්ථුස්මිං ඔවදන්තො ඔවදති නාම, අනුප්පන්නෙන අයසොපි නො සියාති ආදීනං වසෙන අනාගතං දස්සෙන්තො අනුසාසති නාම, සම්මුඛා වදන්තොපි ඔවදති නාම, පරම්මුඛා**

දූතං වා සාසනං වා පෙසෙන්තො අනුසාසති නාම, සකිං වදන්තො ඔවදති නාම, පුනපපුනං වදන්තො අනුසාසති නාම' යි අටුවා ය.

අසබ්භා ච නිවාරයෙ = අකුසලින් ද වළකන්නේ ය. කුසල් දහම්හි පිහිටුවන්නේ ය යි සේයි.

සමාජයට අහිත වූ සත්පුරුෂයන්ට අයත් නො වූ කයිකාදි අසත් ක්‍රියා **අසබ්භා,** යන්නෙන් ගැණේ. කායික වාචසික මානසික අකුශල ක්‍රියා ය.

සතං හි සො පියො හොති = හෙතෙමේ සත්පුරුෂයන්ට ප්‍රිය වේ.

වරද දැක වරදට අවවාද කරණ, අනුශාසනා කරණ, අකුසල් කරන්නහු අකුසලින් නගා කුසල් දම්හි පිහිටු වන කල්‍යාණ මිත්‍ර තෙමේ, බුඩාදී වූ සත් පුරුෂයන්ට ප්‍රිය වේ. කැමැති විය යුත්තේ **පිය,** නම්. **පියායිතබ්බො = පියො'** යනු එහිලා කීහ.

අසතං හොති අප්පියො = අසත් පුරුෂයන්ට අප්‍රිය වේ.

පෙර කියූ කළණ මිතුරු තෙමේ, බුඩාදිඋත්තමයන්ට ප්‍රිය වූයේ ද, කිසිත් දහමක් නො දත් සිවුපසය රැස් කිරීමෙහි බලා-පොරොත්තු ඇති බඩ වියත සඳහා පැවිදි වූ අසත් පුරුෂයන්ට ප්‍රිය නො වේ. ඒ එසේම ය. වරද දක්වා වරදට අවවදානුශාසනා කරණ තැනැත්තේ අඥ වූ අසත්පුරුෂලොකයට කිසිලෙසකිත් ප්‍රිය නො වේ. එබන්දකු දුටු අසත්පුරුෂයෝ 'තෝ අපගේ උපාධ්‍යාය නො වන්නෙහි ය, ආචාර්‍ය්‍ය ද නො වන්නෙහි ය, එසේ ඇතිකල තෝ අපට කුමක් නිසා අවවාදානුශාසනා කරන්නෙහි දැ' යි දෙඩති. බණිති. නින්දා කෙරෙති. අසත්පුරුෂලොකයෙහි සැටි මෙසේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

සැරියුත් මුගලන් මහතෙරහු, කීටාගිරියට වැඩ, ඔවුනට අවවාද කළහ. අනුශාසනා කළහ. ඇතැම් කෙනෙක් අවවාදානු-ශාසනා පිළිගෙණ එලෙසින් පිළිපැද්දහු ය. කෙනෙක් සිවුරු හැර ගියහ. ඇතැම් කෙනකුට පබ්බාජනීය කර්මය කළහ.

අස්සජිපුනබ්බසුකවස්තුව නිමියේ ය.

ඡන්නසථවිරයන් වහන්සේ

6 — 3

'මම මාගේ සහාම්පුත්‍රයා සමග මහබිනික්මන් කෙළෙමි, එදා දුන් ඉන්නා මේ එකෙක් වත් නොසිටියේ ය, එකෙක් වත් පසු පස්සෙහි නොයේ ය, එදා උන්වහන්සේ සමග සිටියේ හුන්නේ මම පමණක් ය, දැන් නම්, මම සැරියුත් වෙමි, මම මුගලන් වෙමි, අපි අග්‍රශ්‍රාවකයෝ ය යි ලොකුවට මහත්කම ම කියා ගන්නෝ බොහෝ ය, දැන් පසුපස යන්නෝ ත් සිටිති' යි කියමින් ඡන්න සථවිරයන් වහන්සේ අග්‍රශ්‍රාවක දෙදෙනා වහන්සේට නින්දා පරිභව කළහ. බුදුරජාණන් වහන්සේ ඒ අසා ඡන්න සථවිරයන් කැඳවා අවවාද කරණ සේක. අවවාද දෙන විට නිශ්ශබ්දව සිට නැවැතත් නින්දා කරති. මෙසේ තුන්වන වර දක්වා ත් ආක්‍රොශ කළහු කැඳවා 'ඡන්නා! අග්‍රශ්‍රාවකයෝ තමුසේගේ කල්‍යාණමිත්‍රයෝ ය, මෙබඳු කල්‍යාණමිත්‍රයන් සෙවනය කරව, භජනය කරව, තට එයින් මහත් ම වඩෙක් එන්නේ ය, මෙබඳු උතුම් කල්‍යාණමිත්‍රයෝ ලොකයෙහි ඉතා දුර්ලභයහ, ඒ නිසා අග්‍රශ්‍රාවක දෙනම නිතර සෙවනය කරව' යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක:-

න භජෙ පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ,
භජෙථ මිත්තෙ කල්‍යාණෙ භජෙථ පුරිසුත්තමෙති.

පාපමිත්‍රයන් නොසෙවුනේ ය. අධමපුරුෂයන් නොසෙවුනේ ය. කල්‍යාණමිත්‍රයන් සෙවුනේ ය. උත්තම පුරුෂයන් සෙවුනේ ය.

න භජෙ පාපකෙ මිත්තෙ = පාපමිත්‍රයන් නොසෙවුනේ ය.

පාපකෙ, යන්න **මිත්තෙ,** යන්නට විශෙෂණ ව සිටියේ ය. **'මිජ්ජති සිනෙහතීති = මිත්තෙ'** සෙනහ කරන්නේ මිත්‍ර නම් වේ. සෙනහය නම්, හිතවත් ලෙසින් පැවැත්ම යි. යමෙක් යමකු කෙරෙහි හිතවත් ව මෙලොව වැඩ අවැඩ දක්වමින් අවැඩින් වෙන් කොට වැඩෙහි යොදන්නේ වේ ද, ඔහු මිත්‍රයා යි මෙයින් කිය වේ. **'මිනොති අනෙනා පකතිපතීති = මිත්තෙ,** යන මෙයින් හැගෙනුයේ යමෙක් යමකු සිත්හිලා ම පිළිගෙණ හිත වැඩ දක්වන්නේ වේ ද, ඔහු මිත්‍රයා වන බවය. **'සඛ්ඛහුයෙහසු මියති පකතිපියතීති = මිත්තෙ'** සැහවිය යුතු, රහසේ තබාගත යුතු තමන් පිළිබඳ සියලු දේ නොසඟවා කියන්නහු මිත්‍රයා බව මින් කිය වේ. **'මිදති බන්ධති අත්තනි පරතති = මිත්තෙ'** යන මෙයින් තමන් කෙරෙහි අන්‍යයා බැඳ ගන්නේ නතු කර

ගන්නේ මිත්‍රයා යි කීහ මේ හැම කථාවෙක ම ආසය එකෙක් ම ය. එහෙයින් හිතාකාරප්‍රවෘත්ති, හිත පැවැතුම් ඇත්තේ මිත්‍රයා යි දත යුතු ය. මෙය අර්ථානුගත කීමෙකි. **'මිත්තො හවෙ සත්තපදෙන හොති'** යි කීයේ ලොකව්‍යවහාරය සලකා ය. යමෙක් යමකු සමග සත් පියවරක් පමණ ගියේ ද හෙතෙමේ මිත්‍රයා ය යනු එහි තේරුම යි. ගිය පමණකින් මිත්‍රයෙක් නො වේ. එහෙයින් මෙසේ නො ගත යුතු ය. **'සත්තපදවීතිහාරමත්තෙනපි සහ ගච්ඡත්තො සහ ගච්ඡත්තස්ස පියවාචානිච්ඡාරණෙන අඤ්ඤමඤ්ඤං අල්ලාපසල්ලාපකරණමත්තෙනපි මිත්තො නාම හොති'** යි මෙයින් කීයේ විශ්වාසයෙන් දැඩිව සිටි මිත්‍රයා ය. මේ ම සාර්ථක වේ. හිතවත් පැවැත්මක් නො මැති තැන එසේ නො වන හෙයිනි.

සිගාලොවාද සූත්‍රදෙශනාවෙහි **පානසඛමිත්‍ර, සම්මිය-සම්මියමිත්‍ර, වැඩෙහි යහළුබව හඟවන මිත්‍ර, උපකාරක මිත්‍ර, සමානසුඛදුක්ඛමිත්‍ර, අත්ථක්ඛායිමිත්‍ර, අනුකම්පකමිත්‍ර** යි මිතුරන් සත් දෙනකු දැක්වූහ.

එහි සුරාපානය කරණ තැන පමණක් මිතුරුබව කියනුයේ පානසඛමිත්‍ර, නම් වේ. එහි **'පානසඛාති පානඨානෙ සුරාගෙහෙ යෙව සහායො හොති'** යනු අටුවා ය. මෙබඳු මිත්‍රයෝ අද රට ගම පුරා සිටිති. විසකදුරු මෙන් මොවුහු දුරු කටයුතු ය. යහළුව! යහළුව! කියා ඉදිරියෙහි පමණක් මිතුරුබව හඟවනුයේ සම්මිය සම්මියමිත්‍ර, නම් වේ. **'සම්ම සම්මාති වදත්තො සම්මුඛෙ යෙව සහායො හොති පරම්මුඛෙ වෙරීසදිසො සො සම්මිය සම්මියො නාම'** යි අටුවාවෙහි ආයේ ය. මෙතෙමේ අනහි මුඛයෙහි සතුරකු මෙන් ක්‍රියා කර යි. එහෙයින් මෙතෙමේ ද දුරු කටයුතු ය. තමන්ට වැඩක් ඇතිවිටක, ඒ පිරිමසා ගණු පිණිස යහළුබව අඟවන්නේ ද, මිත්‍රයෙකි ඔහු අමුතුවෙන් හැඳින් වියයුතු නො වේ. ප්‍රකට බැවිනි. ඔහු ද හළ යුතු ය. මේ තිදෙන එක් තැන් කොට මෙසේ දැක්වූහ:-

'හොති පානසඛා නාම හොති සම්මියසම්මියො,
යො ච අත්ථෙසු ජාතෙසු සහායො හොති සො සඛා' යි.

සුරාපානයෙන් මත්වූවහු රකී ද ඔහු අයත් දේ රකී ද බියට පැමිණියහුට පිහිට වේ ද, කටයුත්තක් වූ තැන වුවමනා දෙය දෙගුණයක් කොට දේ ද ඔහුය, උපකාරකමිත්‍ර. **'පමත්තං රක්ඛති, සාපතෙය්‍යං රක්ඛති, භීතස්ස සරණං හොති, උප්පන්නෙසු කිච්චෙසු තද්දිගුණං භොගං අනුප්පදෙති, ඉමෙහි ඛො ගහපති පුත්ත! චතූහි ඨානෙහි උපකාරකො මිත්තො සුහදො වෙදිතබ්බො'** යනු දෙශනා ය.

යමෙක් තමන් පිළිබඳ සැඟවියයුතු රහස පවා මිත්‍රයාට කියා පා ද, මිත්‍රයාගේ රහස සඟවා ගණී ද, විපත් පැමිණිකල නො හැර සිටී ද, මිත්‍රයා පිණිස ජීවිතපරිත්‍යාගය කෙරේ ද, හේ තෙමේ ය සමාන සුඛදුඃඛමිත්‍ර. **'ගුයහමස්ස ආවික්ඛති, ගුයහමස්ස පරිගුයහති, ආපදාසු න විජහති, ජීවිතම්පිස්ස අත්ථාය පරිච්චත්තං හොති, ඉමෙහි ඛො ගහපතිපුත්ත! චතූහි ඨානෙහි සමාන සුඛදුක්ඛො මිත්තො සුහදො වෙදිතබ්බො'** යනු පාළියි.

යමෙක් මිත්‍රයා පව්කමින් වළකා ද, කුසල්හි යොදවා ද, නො ඇසූවිරූ ධර්මශාස්ත්‍රය අස්වා ද, දෙව්ලොවට මග කියා ද, හෙතෙමේ ය අත්ථක්ඛායීමිත්‍ර. **'පාපා නිවාරෙති, කල්‍යාණෙ නිවාසෙති අස්සුතං සාවෙති, සග්ගස්ස මග්ගං ආවික්ඛති, ඉමෙහි, ඛො ගහපතිපුත්ත! චතූහි ඨානෙහි අත්ථක්ඛායීමිත්තො සුහදො වෙදිතබ්බො'** යනු පාළියි.

යමෙක් මිත්‍රයාගේ පිරිහීම දැක නො සතුටු වේ ද, දියුණුව දැක සතුටු වේ ද, දොස් කීම් වළකා ද, ගුණ කියන්නහුට පසසා ද, ඔහුය අනුකම්පකමිත්‍ර. **'අභවෙනස්ස න නන්දති, භවෙනස්ස නන්දති, අවණ්ණං භණමානං නිවාරෙති, වණ්ණං භණමානං පසංසති' ඉමෙහි ඛො ගහපතිපුත්ත! චතූහි ඨානෙහි අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්බො'** යනු දෙශනා ය. මේ සිවුදෙන එක් ගයකින් මෙසේ දැක්වූහ:–

'උපකාරො ච යො මිත්තො යො ච මිත්තො සුඛෙ දුඛෙ,
අත්ථක්ඛායී ච යො මිත්තො යො ච මිත්තොනුකම්පකො' යි.

සන්දිඨ – සම්හත්ත වශයෙන් මොවුහු, දෙපරිදි දෙපරිදි වෙති. එවිට අට දෙනෙකි. ඒ ඒ තැන්හි රැස්ව දැකීම් පමණින් විශ්වාසයට පැමිණියෝ **සන්දිඨ**, යි ද, මොනවට ඇලී සිටියෝ **සම්හත්ත**, යි ද ගැණෙති. නො දැඩි මිතුරෝ සන්දිඨයහ. දැඩි මිතුරෝ සම්හත්තයහ. **'තත්ථ තත්ථ සඞ්ගම්ම දිඨත්තා සන්දිඨා නාතිදළ්හමිත්තා, සුටඨු හත්තා සිනෙහවත්තො සම්හත්තා දළ්හමිත්තා'** යනු අටුවා ය. මඳ කලක් දැක්ක යුතු නුයි හෝ, සන්දිඨ යන්නෙහි සකාරය නෑයන් කෙරෙහි වැටෙන බැවින් නෑයන් මෙන් ඔවුනොවුන් දැක්කේ හෝ සන්දිඨ නමැ යි ද, හැම කල්හි ම භජනය කරන්නේ හෝ බන්ධුන් මෙන් උනුන් විශ්වාස වශයෙන් භජනය කරන්නේ හෝ සම්හත්ත නමැ යි ද කීහ. **'කිංචි කාලං පස්සිතබ්බොති සන්දිඨො, අථවා සන්දිඨොති එත්ථ සකාරො බන්ධවෙ වත්තති, තස්මා සො විය බන්ධවො විය අඤ්ඤමඤ්ඤං විස්සාසවසෙන දිඨො**

දිඝපුබ්බොති සන්දිඝො, සබ්බකාලං භජතීති සමහත්තො, බන්ධවො විය අඤ්ඤමඤ්ඤං විස්සාසවසෙන භජතීති සමහත්තො' යනු ටීකා ය.

පෙර නො දක්නා ලද්දේ ද, නම් දැන ලියුම් ගණුදෙනු කිරීම් ආදියෙන් විශ්වාසයට පැමිණියේ ද, ලොකයා විසින් අදෘෂ්ටමිත්‍ර, යි කියනු ලැබේ.

මිත්‍රස්වරූපයෙන් හැසිරෙන අමිත්‍රයෝ සතර දෙනෙක් ද ලොකයා අතර ඇත. ඔවුහු නම්, **අඤ්ඤදත්ථුහර, වචීපරම - අනුප්පියභාණී, අපායසහායයෝ** ය.

එහි යමෙක් කිසියම් දෙයක් පැහැර ගෙණ යා ද, ටිකක් දී බොහෝ දෙයක් බලාපොරොත්තු වේ ද, බියක් පැමිණිවිට ඉන් මිදීම පිණිස දූසයකු සේ කටයුතු කෙරේ ද, තමන්ගේ ප්‍රයොජනය පිණිස ඇසුරු කෙරේ ද ඔහු ය, අඤ්ඤදත්ථුහර. **'අඤ්ඤදත්ථුහරො හොති අප්පෙන බහුමිච්ඡති, භයස්ස කිච්චං කරොති, සෙවති අත්තකාරණා'** යනු දෙශනා ය.

ඉකුත් දෙයින් සංග්‍රහ කිරීම, ඉදිරියෙහි වන දෙයින් සංග්‍රහ කිරීම, අවැඩ බසින් සංග්‍රහ කිරීම, කිසියම් කටයුත්තක් එළැඹැ සිටි කල්හි එය මග හරිනු පිණිස නැති බැරිකම් කියා පෑම යන මේ සතර වචීපරමමිත්‍රයාගේ ලක්ෂණයෝ ය. එහි **'අතීතෙන පටිසන්ථරති, අනාගතෙන පටිසන්ථරති, නිරත්ථකෙන සඞ්ගණ්හාති, පච්චුප්පන්නෙසු කිච්චෙසු ව්‍යසනං දස්සෙති, ඉමෙහි ඛො ගහපතිපුත්ත! චතූහි ඨානෙහි වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො'** යනු දෙශනා ය.

පව්කම් කිරීම යහපතැ යි අනුමත කිරීම, පින්කම් කිරීම යහපතැ යි අනුමත කිරීම, මිත්‍රයා ඉදිරිපිට ගුණ කීම, නො ඉදිරියෙහි දොස් කීම යන මේ සතර අනුප්පියභාණීමිත්‍රයාගේ අඩයාලම් ය. **'පාපකම්පිස්ස අනුජානාති, කල්‍යාණම්පිස්ස අනුජානාති, සම්මුඛාස්ස වණ්ණං භාසති, පරම්මුඛාස්ස අවණ්ණං භාසති, ඉමෙහි ඛො ගහපතිපුත්ත! චතූහි ඨානෙහි අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො'** යනු දෙශනාය.

රහමෙරපානයෙහි යහළුකම් කිරීම, නො කල්හි කඩ පිළ හැසිරීමෙහි යහළුවීම, නැටුම්හල් කරා යෑමෙහි යහළුවීම, දූ කෙළි යෙහි යහළුවීම අපායසහායමිත්‍රයාගේ ලක්ෂණ යි. **'සුරාමෙරය මජ්ජපමාදඨානානුයොගෙ සහායො හොති, විකාලවිසිඛා චරියානුයොගෙ සහායො හොති, සමජ්ජාභිචරණෙ සහායො හොති, ජූතප්පමාදඨානුයොගෙ සහායො හොති, ඉමෙහි ඛො**

ගහපතිපුත්ත! චතූහි ඨානෙහි අපායසහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො' යනු බුඩවචන යි. මොවුන් එක් තැන් කොට දැක් වූ දෙශනාව මෙසේ ය:-

'අඤ්ඤදත්ථුහරො මිත්තො යො ච මිත්තො චවීපරො,
අනුප්පියං ච යො ආහ අපායෙසු ච යො සඛා' යි.

අඤ්ඤදත්ථුහරාදි සිවුදෙනා ත් බිය සහිත මගතොට මෙන් හළ යුතුය යි වදාළ ගාථාව මෙසේ ය:-

'එතෙ අමිත්තෙ චත්තාරො ඉති විඤ්ඤාය පණ්ඩිතො,
ආරකා පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථා' යි.

න භජෙ පාපකෙ මිත්තෙ' යන මෙයිනුදු වදාළෝ කාය දුශ්චරිතාදි අකුශලකර්මයන්හි ඇලී වසන මෙ කී මිත්‍රයන් සිංහ ව්‍යාඝ්‍රාදි චණ්ඩ සත්වයන් සේ සලකා දුරුකළ යුතු බව ය. පවිටු මිතුරන් සෙවුම මිනිසා එ ලොවින් හා මෙ ලොවින් මහත් විපතට හෙලන්නකි. මිනිසා අපායයෙහි ලන අනික් හැම එකකට ම වඩා පවිටු මිතුරන් සෙවුම ඉතාබලගතු ය. ඉතානපුරු ය. හැම පව්කමෙක් ම මේ නිසා සිදු වන්නේ ය. අජාසත් රජ තෙමේ තම පියා මැරීමට පෙළඹුනේ, පවිටු මිතුරන් සෙවුමෙනි. එ හෙයින් ඔහුට ඒ අත්බවේ දී ම ලැබිය හැකි ව තුබූ සෝවන් මගපල නැති ව ගියේ ය.

ගිහි පැවිදි දෙපක්ෂයෙහි ම පවිටු මිතුරෝ ඇත්තාහ. එයින් වඩාලා ත් බිහිසුණු වන්නේ පැවිදි පවිටු මිතුරා ය. පව්කම් කරණ පැවිද්දාට, පව්කම් කරණ ගිහියාට වඩා පහසුවෙන් උනුත් අපාය යෙහි බැහිය හැකි ය. ඔහුට ඒ පිණිස නොයෙක් මං ඇත්තේ ය. බොහෝසෙයින් ගෙණ බලත්, ලොකය ජඩය ජඩ ස්වභාවය ඇත්-තේය. නිර්ඝ්‍රාව එක් පයක් ඔසොවා අනික් පයෙහි දණ හිස තබා කට හයා හුළං බිබී ඉදීම ත්, උග්‍ර තපසෙකැ යි ගත් මේ ලොකයෙහි පව්කම් කරණ පැවිද්දාට හැම අසත්ක්‍රියාවක් ම සත් ක්‍රියාවකැ යි ගැන්වීම ඉගැන්වීම ඉතා පහසු ය. අද ත් අයහපත යහපතැ යි ගෙණ හිතමග නසා ගන්නා ලොකය කුඩා නො වේ. පවුටු මිතුරන් ඇති, උන්ට නැමී සිටි, උන් පසුපස යන, උන්ගේ වචන කරණ ගිහි පැවිද්දෝ මෙලොව ත් විපතට පැමිණ මරණින් මතු අපායයට යෙති යි වදාළ සේක. එහෙයින් හිතමග කැමැත්තන් විසින් පවිටු මිතුරා දැන හැඳින ඔහු විසයක් සේ සලකා මුළු මනින් දුරු කටයුතු ය. **සඤ්ජීවකජාතක, ගොධජාතකාදිය** බැලිය යුතුය.

න භජෙ පුරිසාධමෙ = අධම පුරුෂයන් නො සෙවුනේ ය.

'අඩ්ඩා භාගෙ ජාතො = අඩ්ඩමො' අඩ්ඩා, යන්නෙහි ඔ කාරයට අකාරය ත් ඉම ප්‍රත්‍යයයාගේ ඉකාර ලෝපය ත් වීමෙන් අඩ්ඩමො, යනු නිපන්නේ ය. 'පහත්හි වූයේ' යන අරුති. පහත් ලාමක තුච්ඡ වූ හැම එකකු කෙරෙහි මේ යෙදිය හැකි ය. මෙහි වූ **අධම,** ශබ්දය **පුරුෂ** ශබ්දයට විශෙෂණ ව සිටියේ ය. **'සන්ති-චෙජ්දුදිතෙ වා එකච්චසති අනෙසනාපසුතෙදෙ වා අඤ්ඤෙ නියොජකා පුරිසාධමා නාම'** යනු, මෙය අටුවාව විවරණය කළ සැටි යි. අත් පා සිදුම් දඩු මුගුරින් තැළීම් බඩු පැහැරුම් ආදියෙන් සොක ඉපදවීම්, ආහාර වැලක්වීම් ආදියෙන් වෙහෙස ඉපදවීම, ගෙවල් බිඳුම, මං පැහැරුම මග යන්නන්ගේ ඉණ ඉහ පැහැරුම යනාදී වූ මේ බිහිසුණු ක්‍රියාවෝ මහ සොරුන් විසින් කරණු ලබත්නෝ වෙති. මේ සැහැසි කම්හි උනුන් යොදන්නෝ පුරිසාධමයෝ ය.

දුසිල් මහණුන් විසින් සිවු පසය සොයනු සඳහා ගිහියන්ගේ සිත් ගැණුමෙහි ලා කරණ සදෙස් වූ උපායයෝ අනෙසන නාමයෙන් කිය වෙති. ඒ උපායය එක් විස්සෙකි. සඩ්ඪ ගණ පුදාලයන් සතු හුණදඩු ඇ දඩ්ඩීම, තල්පත් බුලත් ඇ පත්දීම, සපු දුනුකේ සමත් සිනිද්ද ඇ මල්දීම, කොස් පොල් දෙල් අඹ දඹ ඇ පලදීම, දුහැරි දඩ්ඩීම, මුව දෑනා පැන්දීම, නහන පැන්දීම, ඇඟ ගානා සඩන් පියර කොකුම් ඇ සුණුදීම, ඒ ඒ කටයුතු සඳහා මැවිදීම, දුයකයන් ඉදිරියෙහි වාටුබස් කීම, සැබෑ මද කොට බොරු බොහෝ කොට කීම, කුඩා දරුවන් රෙදි පිළි අබරණින් සරසා හෝ නො සරසා හෝ උකුලෙහි තබා නැලවීම, ගිහියන් පිළිබඳ ලියුම් කියුම් පණිවිඩ ගෙණ යෑම වෙදකම්කිරීම, දූතකම්කිරීම, ගිහින් සතු කෙත්වත් ආදියට මෙහෙවර යෑම, තමා ලත් දෙය ගිහින්ට දී ඔවුන් දෙන දෙය ගැණීම, ලාභාශාවෙන් අල්ලස්දීම, ගෙබිම්බැලීම, නැකත් කීම, අඟපසඟ බලා ශුභාශුභ කීම යන මේ ය ඒ එක්විස්ස. මේ අනෙසන යන්හි උනුන් යොදන්නෝ පුරිසාධමයෝ ය. ශ්‍රමණාධමයෝ ය. මොවුන්ගේ ඇසුරෙන් ඒ ඇසුරු කරන්නන් දෙ ලොවෙහි ම පිරිහෙන බව බුදුරජානන් වහන්සේ වදාළ සේක.

භජෙථ මිත්තෙ කල්‍යාණෙ = කලණ මිතුරන් සෙවුනේ ය.

යොග්‍යපුරුෂයට හෝ හිතයට පමුණුවන්නේ කල්‍යාණ නම්. **'කල්‍යං වා හිතං අණති පාපියති නි = කල්‍යාණං'** යනු වාක්‍ය යි. ඇසුරු කරන්නහු යොග්‍යතියට හෝ හිතයට පමුණුවන මිත්‍රයෝ කල්‍යාණමිත්‍රයෝ ය. පව්වූ මිතුරන්ට වෙනස් ලෙසින් පවත්නෝ කල්‍යාණමිත්‍රයෝ යි අටුවාව සැකෙවින් කිය යි.

උපකාරක, සමානසුඛදුක්ඛ, අප්පිකඛාසි, අනුකම්පක යන සිවු දෙන ලොකයා අතර ජීවත්වන සාමාන්‍යකල්‍යාණමිත්‍රයෝ ය. විශෙෂයෝ නම්, බුඬප්‍රත්‍යෙකබුඬඅග්‍රශ්‍රාවකමහාශ්‍රාවකාදි ආර්‍යයෝ ය. උපකාරකාදී වූ සිවු දෙන වුව ද ශ්‍රඬා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා සමෘති සමාධි ප්‍රඥ යන ගුණයන්ගෙන් යුකත ව ම උපකාරක භාවාදියෙහි සිටින්නෝ නම් කල්‍යාණමිත්‍ර වෙති. **'තදිදං කල්‍යාණමිත්තලක්ඛණං, ඉධ කල්‍යාණමිත්තො සඬාසම්පන්නො හොති'** යනාදීන් වදළ බැවිනි. ශ්‍රඬාශීලාදිය කියූ සේ දතයුතු ය.

ශ්‍රඬාව කරණ කොට, බුදු නුවණ, කම්ය, කම්ඵලය උසස් කොට අදහති. ශීලය කරණ කොට, සබ්‍රහමචාරීන්ට ප්‍රිය මනාප වූ වෝ පාපයට ගරහන සුලු වෙති. ශ්‍රැතය නිසා, දුඃඛාදි ආර්‍ය සත්‍යය, ප්‍රතීත්‍යසමුත්පාදය යනාදී වූ ගැඹුරු ධම්කථාවනට බැස ගණිත්. ත්‍යාගය නිසා අපපිච්ඡතාදී වූ ගුණ ඇත්තෝ ඉතරෙත රසතෘෂ්ණාදියෙන් සතුටු වෙති. වීර්‍යය නිසා, සියලු සත්වයන් පිළිබඳ භිතව්ඛානයෙහි ඉදිරිපත් වෙති. සමෘතිය නිසා, එළඹ සිටි සිහි ඇත්තෝ වෙති. සමාධිය නිසා, නත් අරමුණුවල නො විසිර සන්හුන් සිතැත්තෝ වෙති. ප්‍රඥව නිසා, යථාභූත ම දන්නෝ වෙති.

මෙ කී ගුණයන්ගෙන් මුදුන් පැමිණියෝ සම්මාසම්බුදුරජාණන් වහන්සේ ම ය. එහෙයින් උන්වහන්සේ ම ප්‍රධානකල්‍යාණමිත්‍රයා වෙති. අනික් අනික් ආර්‍යයන් වහන්සේලා ද තම තමන් දුටු මාගීඵලයන්ගේ වශයෙන් වැඩි සිටින්නෝ ය. එහෙයින් උන්වහන්සේලා ද එසේ ම කල්‍යාණමිත්‍රයෝ ය. මුන්වහන්සේලාගේ කල්‍යාණමිත්‍රභාවය කිසිලෙසකින් අත් අතකට නම් නො පෙර ලෙන්නේ ය. එහෙයින් උන්වහන්සේලාගේ ඇසුරෙන් ගණන් නැති සත්ව කෙනෙක් හිතමග සලසා ගත්හ. නිවන් අවබොධ කිරීමෙන් දුක් කෙළවර කළහ.

මෙ කල කල්‍යාණමිත්‍රයන් නො ලද හැකි වුව ද ලොකය කල්‍යාණ මිත්‍රයන්ගෙන් සිස් නො වේ. මෙ කී ගුණධම්යන්ගේ මුදුන් පෙත්තට පැමිණීමේ අදහස් ඇති ව ආර්‍යයන් යිය මග යන වරදෙහි නො බැඳෙන ආශ්‍රිතයන් හිත වැඩෙහි යොදන එක්විසි අනෙසනයන්හි නො යෙදෙන දුහැම්ව දිවි පවත්වන පැවිද්දන් ද කායදුඡ්චරිතාදියෙන් මූළුමනින් තොර ව සියල්ලන් කෙරෙහි දයානුකම්පා ඇති ව දුහැම් ව දිවි ගෙවන වරදෙහි නො බැඳෙන ගිහියන් ද කාලානුරූපව කල්‍යාණමිත්තුරන් සේ හිණිය හැකි බැවින්, ඔවුන් සෙවුම දෙලොව වැඩ පිණිස වන්නේ ය.

සිවු පිරිසිදු සිල් ඒ ලෙසින් නො රකින ලජ්ජා භය දෙකින් තොර පාපය මී මෙන් සලකා අනෙසනයන්හි යෙදෙන අගොචර ස්ථානයන්හි වසන කුහකපටිපදාවෙහි යෙදී වසන පැවිද්දෝ පන්සිල් පමණකුදු නැති දයානුකම්පාවෙන් තොර පරහට වෙහෙස දෙන දුසිල් ගිහියෝ කල්‍යාණමිත්‍රයෝ නො වෙති.

භජෙථ පුරිසුත්තමෙ = උත්තම පුරුෂයන් සෙවුනේ ය.

ශීල සමාධි ප්‍රඥාවන් ගෙන් උසස් ලෙසින් නැගී සිටියේ උසස් තැනට ගියේ උත්තම නම් වේ. ඒ නම් ආර්‍යගණයා ය. **'උබඟුතො අත්‍යත්ථං උත්තමො, උගගතමත්තා වා උත්තමො'** යනු ඒ සඳහා කීහ. සියලු කායදුශ්චරිතාදියෙන් වෙන් ව දැහැමෙන් සෙමෙන් පිඬු සිගීමාදියෙන් දිවි යවන පැවිද්දෝ ත් උත්තම පුරුෂයෝ ය. ඔවුන්ගේ සෙවුම හිත පිණිස වේ.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය. ජන්න ස්ථවිර තෙමේ ද මේ බණ අසාත් පෙර සේ භික්ෂූන්ට ආක්‍රොශ පරිභව කෙරෙ යි. බුදුරජානන් වහන්සේ එ ද දැන 'මහණෙනි! මාගේ දිවි තිබෙනතුරු ජන්නයා හික්ම වන්නට මොන ලෙසකිනුත් බැරිය' යි වදාළ සේක. එහෙයින් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් පිරිනිවීමට ලං වූ කල්හි 'ස්වාමීනි! ජන්න ස්ථවිරයන් කෙරෙහි අප කෙසේ පිළිපැදිය යුතු දැ' යි ඇසූ කල්හි 'ආනන්ද ය! ජන්නයාහට බ්‍රහම දණ්ඩය පැණවිය යුතු ය' යි වදාළ සේක. බුදුරජුන් පිරිනිවි කල්හි අනදතෙරුන් දැනුම් දුන් බ්‍රහමදණ්ඩය ඇසූ ජන්න ස්ථවිර තෙමේ 'ස්වාමීනි! නො නසනු මැනැවැ' යි කියා මොනවට පිළිපන්නේ වැඩි දවස් නො යවා ම පිළිසැඹියාවන් සමග රහත් බවට පැමිණියේ ය.

ජන්නස්ථවිරවස්තුව නිමියේ ය.

මහාකප්පින සථවිරයන් වහන්සේ

6 — 4

යටගිය දවස ආයුෂ්මත් මහාකප්පින සථවිරයන් වහන්සේ, පියුමතුරා බුදුරජාණන් වහන්සේගේ සිරිපා මුල්හි කරණලද පැතුම් ඇති ව, පින් කරමින් සසර සැරිසරා එන්නෝ, බරණැසට මදක් ඇත්හි පිහිටි එක්තරා සාලිගමෙක දෙටු සාලියෙක් ව උපන්හ. එදවස දහසක් පමණ පසේ බුදුරජාණන් වහන්සේලා අට මසක් හිමාලයයෙහි වැස, වැසි සාරමස ගම්මානයට අවුත් වාසය කෙරෙති. මේ උන්වහන්සේලාගේ චාරිත්‍රධර්මයෙකි. ඒ මේ සිරිතට අනුව, උන්වහන්සේලා එක් වස් කාලයෙක බරණැසට පැමිණ වස් වසනු පිණිස කුටි සාදා ගැණීමට උපකාර ඉල්ලා අට නමක් රජු වෙත යැවූහ. එ දවස රජුගේ සී සෑම් මගුලෙක් විය. රජ තෙමේ, පසේ බුදුවරුන් මාලිගාවට ආ බව අසා, එලි බැස තොරතුරු අසා 'සවාමීනි! අද කිසිදෙයකට ඉඩ නැත, හෙට මෙහි සී සෑම් මගුලෙක, ඒ වැඩ අවසන් වූවායින් පසු ඕනෑ දෙයක් කර දෙන්නෙමි' යි කියා පෙරළා මාලිගාවට වන. උන්වහන්සේලා ද අන් ගමකට යනු පිණිස එතැනින් පිටත් වූහ.

ඒ වේලෙහි දෙටු සාලියාගේ බිරින් ද කිසියම් කටයුත්තක් සඳහා බරණැස් නුවරට යන ගමනේ, මග යන උන්වහන්සේලා දැක වැද 'සවාමීන් වහන්සේලා මේ අවේලාවෙහි කොතැනක වඩින්ද' යි ඇසූ ය. එවිට උන්වහන්සේලා ඇයට තම අදහස කියූහ ඕ තොමෝ ඒ අසා 'සවාමීනි! හෙට දානයට අප ගෙට වඩින්නැ' යි ආරාධනා කළා ය. උන්වහන්සේලා 'උපාසිකාවෙනි! අපි බොහෝ දෙනෙක් වමිහ' යි කී කල්හි 'ඔබවහන්සේලා කොපමණ ද' යි ඇසුවා ය. 'දහසක් පමණ ය' යි පසේ බුදුවරු කීහ. හොඳයි! සවාමීනි! එහි අමාරුවෙක් නැත, මේ ගමෙහි රෙදි විසන ගෙවල් දහසක් තිබේ, එක එක නමට එක එක ගෙයින් දන් පිළියෙල කළ හැකි ය, අපට එය මහ වැඩෙක් නොවේ, මම ම වස් විසීමට කුටි ත් පිළියෙල කරන්නම්, ඒ නිසා දුප්පත් මාගේ ආරාධනාව පිළිගන්නැ' යි ඉල්ලා සිටියා ය. උන්වහන්සේලා ආරාධනාව පිළිගත්හ. පෙහෙරඹු තොමෝ ගමට ගොස් තැන තැන යමින් 'මම දහසක් පමණ පසේ බුදුවරුන්ට හෙට දානයට මේ ගමට වඩින්නැ යි ආරාධනා කළා, ඒ නිසා උන්වහන්සේලාට වැඩ හිඳින තැන් සූදානම් කරන්ට ඕනෑ, කෑද බත් ආදිය පිළියෙල කරන්ට ඕනෑ' යි හඬ නගා

කියමින් ගම් වැද මඩුවක් තනවා අසුන් පණවා පසු දා වැඩි පසේ බුදුවරුන් එහි වඩා හිඳුවා ඉතා රසැති ආහාරපානාදියෙන් වළඳවා අවසන්හි එ ගම සිටි තරම් ගැණුන් එකතු කර ගෙණ ගොස් පසේ බුදුවරුන් වැඳ 'ස්වාමීනි! අද පටන් මෙහි තෙ මසක් ම වැඩ හිඳින බවට පොරොන්දුවක් දුන මැනැවැ' යි කියා උන්වහන්සේලා පොරොන්දු කරවා ගත්තා ය. එසේ කොට ගමට ගොස් පින්වත්නි! පසේ බුදුවරු වස් තෙමස මෙහි නැවැත්මට පොරොන්දු වුනා, ඒ නිසා අප කවුරු ත් කැලයට ගොස් කුටි සැදීමට වුවමනා ලී දඬු පත් වැල් ආදිය කපා ගෙණ ආ යුතු ය, බුදුවරුන්ට වැඩ හිඳිනට පමණ වන සේ කුටි සැදිය යුතු ය' යි කියමින් ගෙයක් නො හැරගියා ය. සියලු ගම් වැස්සෝ ද ඒ පිළිගෙණ එක එකා රෑ තැන් දිවා තැන්වලින් යුත් පන්සල් දහසක් ගොඩ නැගූහ. තම තමන් ගොඩ නැගූ පන්සලෙහි වස් එළැඹැ වැඩහුන් පසේ බුදුනට තම තමා ම උපස්ථාන කළහ. උපාසිකා තොමෝ වස් කෙළවර 'තම තමන් උපස්ථාන කළ පසේ බුදුන්ට තුන් සිවුරු පිළියෙල කරවු' යි ගම්වැස්සන්ට දැන්වූ ය. ඔවුහු එසේ කොට පසේ බුදුනට සිවුරු පිළිගැන්වූහ. උන්වහන්සේලා වස් නිමවා අනුමෙවෙනි බණ වදාරා එ ගමින් නික්ම වැඩියෝ ය. ගම්වැස්සෝ මෙසේ පින්කම් කොට ආයු ඇති කාක් සිට එයින් චුත ව තව්තිසා දෙව්ලොව ඉපද සමූහ ව උපන් බැවින් **'ඝණ දෙවපුත්තා'** නමින් ප්‍රසිඩ වූහ. එහි දෙව් සැප විඳින ඔවුහු, එයින් චුත ව කසුප් සම්බුදු රජුන්ගේ කාලයෙහි බරණැස්නුවර කෙළෙඹි ගෙවල උපන්හ. වැඩිමහල් පෙහෙර තෙමේ, දෙටු කෙළෙඹියගේ පුත් ව උපන. ඔහුගේ බිරිඳ ද අන් දෙටු කෙළෙඹියකුට දූව උපන්නු ය. **ඇලා සියල්ලෝ වැඩිඩිය පැමිණ දිග යන්නෝ පෙර සාලිජාතියෙහි උපන් අවදියෙහි යම් යම් කෙනෙකුන් හා දිග ගියෝ ද උන් උන් හාම දිග ගියෝ ය.**

දවසෙක ඔවුහු 'බුදුරජානන් වහන්සේ ධර්මදෙශනා කරණ සේකැ' යි අසා බණ අසන්නට අඹුවනු ත් සමග විහාරයට ගියහ. ඔවුන් වෙහෙරට ඇතුල්වත් ම වැසි වසින්නට වන. එකල යම් කෙනෙකුට එහි කුලුපග වූ හෝ නෑ මිතුරු වූ හෝ සාමණේරයෝ වූවාහු ද, ඔවුහු ඔවුන්ගේ කාමර තුළට දුව ගත්හ. කෙළඹියනට එහි එබන්දකු නො වූ බැවින්, දන්නා හඳුනන්නකු නො සිටි බැවින්, ඔවුහු ඇතුල් වන්නට තැන් නො ලැබ වෙහෙර මැද ම තෙමේ තෙමේ සිට ගත්හ. මෙසින් සිත් නැවිල්ලට පත් දෙටු කෙළෙඹි තෙමේ, කතා කොට 'බලන්න! අපට වූ විකා, දුටු ද අපට වූ කරදර ය, ලජ්ජිතවන්නට මේ විකා මදි ද, අපට මේ විකා වූයේ මෙහි හඳුනන්නකු නො සිටිය බැවින් ය, ඒ නිසා

අපි ත් මෙහි පිරිවෙණක් කරවමු' යි කීයේ ය. සියල්ලෝ එයට සතුටු වූහ. එවිගස ම මුදල් එකතු කළහ. එහි දී දෙටු කෙළෙඹියා දහසක් දුන්නේ ය. අන් සියල්ලෝ පන්සියය, පන්සියය බැගින් ද, කෙළෙඹි ගෑණු දෙසිය පණස දෙසිය පණස බැගින් ද දුන්හ. මෙසේ ඔවුහු, මුදල් එකතු කොට බුදුරජුන් පිණිස කුළු ගෙවල් දහසකින් යුත් මහපිරිවෙණක් ගොඩ නගන්නට පටන් ගත්හ. කර්මාන්තය ඉතා මහත් ව ගියෙන් මුල්වර එකතු කළ මුදල් නො පොහොනේ විය. එවිට නැවැත නැවැතත් හැම කෙනෙක් ම මුලින් දුන් මුදලින් අඩ අඩ දුන්හ. එයින් කර්මාන්තය නිමවාට පත් කොට එය පූජා කිරීමෙහි දී බුඩප්‍රමුඛමහාඞ්ඝයා වහන්සේට සත් දවසක් මහදන් පවත්වා විසි දහසක් භික්ෂූන් පිණිස තුන් සිවුරු පිළියෙල කළහ. එහි දෙටු කෙළෙඹියාගේ බිරිඳ තමන් කළ පින්කම් හැම එකක් ම හැම දෙනා හා සමාන ව ම කළා ය. නුවණැති බැවින් වැඩියෙන් පින් දහම් කරණු කැමැති ඕ තොමෝ බුදුරජුන් පුදනට අනොජාමල් සමූහයක් සේ රන්වන් වූ දහසක් වටිනා සළුවක් හා අනොජාමල් පැසකු ත් ගෙණ බුදුරජුන් අනුමෙවෙනි බණ වදාරන වේලෙහි මලින් පුදා සළුව පා මුල තබා 'ස්වාමීනි! උපනුපන් හැම තැනක ම මාගේ සිරුර, අනොජාමල්වඩමක් සේ රන්වන් වේවා, නමත් අනොජා නම් වේවා' යි ප්‍රාර්ථනා කළා ය. උන්වහන්සේ 'එසේ වනු ඇතැ' යි අනුමෙවෙනි කළහ. සියල්ලෝ ආයු ඇති තාක් සිට මරණින් මතු දෙව්ලොව ඉපිද දෙව්සැප විඳින්නෝ අප සම්මා සම්බුදු රජානන් වහන්සේ දවස දෙව්ලොවින් චුත වූහ. උන් අතුරෙහි දෙටු කෙළෙඹි තෙමේ **කුකකුටවති,** නගරයෙහි රජකුලයෙහි ඉපිද වැඩිවිය පැමිණ **මහාකප්පින,** නමින් රජ වූයේ ය. සෙස්සෝ එහි ඇමැති ගෙවල උපන්හ දෙටු කෙළෙඹි බිරිඳ තොමෝ මදුරට **සාගල,** නුවර රජගෙයි උපන. සිරුර අනොජාමල්වඩමක් සේ රන්වන් විය. එහෙයින් නමින් අනොජා නම් වූ ය. වැඩිවිය පැමිණියා කප්පින රජු හා දීග ගොස් අනොජාදෙවී යි ප්‍රසිඬ වූ ය. එහි සෙසු ගෑණු ද ඇමැති ගෙවල ම ඉපද වැඩිවිය පැමිණියෝ ඒ ඒ අමාත්‍යපුත්‍රයන් හා දීග ගියහ. සියල්ලෝ රජසැපත් වැනි සැපත් අනුභව කළහ. ලත් සැපත රජුගේ සැපතට අඩු නො වූ ය. රජ සව් අබරණින් සැරසී ඇතු පිට නැගී ගමන් කරණවිට ඔවුහු ද ඔටුන්න හැර අන් හැම අබරණින් සැරසී ඇතුන් පිට නැගී ගමන් ගන්නාහ. රජ අසකු පිට හෝ රියක නැගී ගමන් ගන්නා විට, ඔවුහු ද අසුන් පිට හෝ රියක නැගී යන්නාහ. සසර එක්ව පින් කළ බැවින් මෙසේ එක්ව ම සම සම්පත් අනුභව කළහ.

රජුට වනාහි **වාල, වාලවාහන, පුප්ඵ, පුප්ඵවාහන, සුපත්ත** යි අස්සු පස් දෙනෙක් වූහ. උන් ගෙන් රජ නැගෙනුයේ සුපත්ත නම් අසු පිට ය. සෙසු සිවුදෙන ලියුම් පණිවිඩ ගෙණ යන අසරුවන් සිවු දෙනකුන් භාරයේ සිටියහ. එහිදී රජ තෙමේ ඒ අසරුවන් හැම උදෑසනක ම හොඳට කවා පොවා 'යවු! දෙතුන් යොදුනක් නමුදු ඇවිද සොයා බලා තෙරුවන් ලෝ පහළ වී දූ යි දූන එවු' යි පිටත් කොට යව යි. ඔවුහු නුවර සිවු දෙරින් නික්ම දෙතුන් යොදුන් තැන් ඇවිද බලා තෙරුවන් ගැණ දූනගත නොහී පෙරළා එති. දිනක් රජ තෙමේ අසු නැගී දහසක් අමැත්තන් පිරිවරා උයන් යනුයේ විඩා පත් වෙළඳුන් සමූහයක් දුටුයේ ය. දූක, මොවුහු ගමනින් වෙහෙසට පත්වූවෝ ය, මොවුන් වෙතින් යම් කිසිවක් දූනගත හැකි ය' යි සිතා උන් ගෙන්වා 'කොහි සිට එන්නහු දූ' යි ඇසී ය. 'දෙවයන් වහන්ස! මින් විසි යොත්නක් ඈත්හි වූ සැවැත් නුවර සිට එන්නමෝ ය' යි උන් කී කල්හි ඒ පළාතේ දතයුතු කිසිත් ඇත් දූ' යි ඇසී ය. 'දෙවයන් වහන්ස! දත යුතු අන් තොරතුරක් නැත, බුදුරජානන් වහන්සේ නම් ලෝපහළ ව වැඩ සිටිති' යි ඔවුහු කීහ. ඒ වචනය ඇසූ රජුගේ සිරුර ප්‍රීති යෙන් පිරී ඉතිරී ගියේ ය. කිසිත් සලකා ගත නොහී මොහොතක් නිශ්ශබ්දව සිට 'තමුසේලා කීයේ කුමක් දූ' යි නැවැත ත් ඇසී ය. 'දෙවයන් වහන්ස! අප කීයේ බුදුරජුන් ලෝ පහළව වැඩ වසන බවැ' යි කී විට දෙවනු තෙවනු ත් එසේ ම මොහොතක් ගෙවා සිවුවන වර ත් 'කීයේ කිමැ' යි විචාළේ ය. එවර ත් බුදුරජුන් උපන් බව ම කීහ. රජ තෙමේ 'මම තොපට රන්මිල දහසක් දෙනවා, දූනගත යුතු තවත් කිසිත් තිබේ නම් දූන කියවු' යි කීහ. එවිට ඔවුහු ධර්මය ලෝ පහළව ඇතිබව කීහ. එහිදී ද රජ තෙමේ පළමු සේ නිහඬ විය. සිවුවන වර ත් 'ධර්මය' යි කී කල්හි 'මම තොපට තව දහසක් දෙමි, තවත් කිසිත් වේ නම් එ ද කියවු' යි රජ කියා සිටියේ ය. වෙළෙඳුන් සඞ්ඝයා ත් ලෝ පහළව ඇති බව කී කල්හි රජ තෙමේ කතා නැත්තේ විය. සිවුවන වර 'සඞ්ඝයා' යි කී විට ඔවුනට තවත් ලක්ෂයක් දී ඇමැතියන් මුහුණ බලා 'තොපි කුමක් කරන්නහු දූ' යි ඇසී ය. 'ඔබවහන්සේ කරන්නක් අපි ත් කරමු' යි ඇමැත්තන් කී කල්හි 'බුදුන් දහම් සඟුන් උපන් බව දූන ආයෙ ත් මාගේ මෙහි නැවැත්මෙක් නැත, බුදුරජුන් සොයා ගොස් මම පැවිදි වන්නෙමි' යි රජ තෙමේ කී ය. 'දෙවයන් වහන්ස! එසේ නම් අපි ත් ගෙය හැර පැවිදි වන්නෙමු, ගෙය පව් උපදින උල්පතෙකි, ගිහියෙක් සදාචාරසම්පන්න වනුයේ කලාතුරකින් ය, ගෙය හැම ජඩකමකට ම ඉඩ ඇති තැනෙක් ය, එහෙයින් ඔබ වහන්සේ සමග ම පැවිදි වන්නෙමු' යි ඔවුහු

කීහ. රජ තෙමේ එහිදී ම රන් තලල්පට ගලවා ලියුමක් ලියා වෙළඳුන් අතට දී 'මම තොපට දීමට පොරොන්දු වූ රත්මල අනොජාදෙවිය දෙනවා ඇත, රජකම බිසවට පැවැරූ බව ත් කැමැති ලෙසකින් එහි පිළිපැදිය යුතු බව ත් මා කියුව, යි ඇයට කියවූ, රජ කොහි දැ, යි ඇසුවොත් බුදුරජුන් වෙත මඟණ වන්නට ගිය බව ත් කියවූ' යි කීයේ ය. ඇමතියෝ ද තම අඹුවනට එසේ කියා ලියුම් යැවූහ. රජ තෙමේ මෙසේ වෙළඳුන් යවා ඇමැත්තන් දහසක් ගෙණ එ වේලෙහි ම බුදුරජුන් වෙත ගියේ ය. බුදුරජානන් වහන්සේ පෙර දැ අලුයම ලොව බලා වදුරනුවෝ පිරිවර සහිත වූ මහාකපපින රජු දුටහ. දැක 'මෙතෙමේ වෙළඳුන් අතින් තුනුරුවන් ගැණ අසා ඔවුන්ට රන් තුන් ලක්ෂයක් දී රජකම ත් හැරපියා ඇමැත්තන් හා කැටුව මා වෙත පැවිදිවීමේ රිසින් හෙට මෙහි එන්නේ ය, පිරිවර සහිත වූ ඔහු සිවු පිළිසැඹියා සමග රහත් බවට පැමිණෙන්නේ ය, ඔහු ඉදිරියට මා යා යුතු ය' යි පසුදැ ගම්මුලාදෑනියකු වෙත යන සක්විති රජකු සේ තමන් වහන්සේ ම පා සිවුරු ගෙණ එක්සිය විසි යොදුන් මග ගෙවා ඉදිරියට ගොස් **චන්දභාගා,** නම් ගංතෙර නුගගසක් මූල සවණක් රුස් විහිදුවමින් බබලමින් වැඩහුන් සේක. රජ තෙමේ මග බැස එනුයේ අතරමග ගඟක් වෙත පැමිණ 'මේ ගඟෙහි නම කිමැ' යි ඇසී ය. 'දෙවයන් වහන්ස! මෝ **අරවච්ඡා,** නමැ යි එහි සිටියෝ කීහ. එවිට රජ තෙමේ එහි පළල හා ගැඹුර කොපමණ දැ, යි ඇසී ය. 'ගව්වක් පමණ ගැඹුරය, දිග දෙ ගව්වෙවෙකැ' යි කීහ. 'මෙහි ඔරු පාරු පිලා නැත් දැ' යි ඇසී ය. 'නැත, දෙවයන් වහන්සැ, යි කී විට 'මෙහි ඔරු පාරු පිලා අහුල් සොය සොයා කල් යැවීවොත් ජාතිය අප ජරාවට පමුණුවයි, ජරාව මරණයට පමුණුවයි, එක් සිතින් ම රජසැප හැර දමා තුනුරුවන් උදෙසා නික්ම ආවේ නිකමට නො වෙමි, එහෙයින් තුනුරුවනේ අනුහසින් මේ මහත් දිය කඳ මට දියකදෙක් නො වේවා' යි බුදුගුණ සිහි කොට ඇමැත්තන් හා ඇතුනුත් සමග දියට පැන්නේ ය. අශ්වයෝ ගල් තලාවක මෙන් පැන ගියහ. උන්ගේ කුර අග පමණක් තෙමිණ. රජ තෙමේ ගඟින් එතර ව යනුයේ තවත් ගඟක් හමු වූයෙන් ඒ ගඟේ ද නම හා දිග පළල අසා දැන එහිදී ත් දහම් ගුණ සිහි කොට ගඟට පැන්නේ ය. මෙසේ ඒ ගඟින් එතෙර ව යන රජහට තවත් ගඟක් හමු වූ ය. එ ගඟේ ද නම අසා ගැඹුර ත් පළල ත් යොදුන යොදුන බව දැන පළමු සේ ම සිතා සඟගුණ සිහි කොට ගඟට පැන එතර ව යන්නේ බුදු රජුන්ගේ සිරුරින් නිකුත් සවණක් රුස් දුටුයේ ය. නුගගසේ අතු වෙළෙප් කොල දලු

රතින් කරණලද්දා සේ බැබලුනේ ය. ඒ දුටු රජ තෙමේ 'මේ ආලොකය වනාහි සඳ හිරුන්ගේ වත් බඹ නා ගුරුළු ආදීන් ගේ වත් නො විය හැකි ය, බුදුරජුන් තකා එන මම බුදු රජු විසින් දක්නා ලද්දේ වෙමි' යි සිතා එ කෙණෙහි ම අසු පිටින් බැස නැමුනු සිරුරු ඇති ව රැස් පාරේ ගොස් බුදුරජුන් වෙත එළැඹැ සිරියල් කල්කයෙක ගැලුනකු සේ බුදුරැස් තුළ වැද, වැඳ ඇමතියන් හා එක් ව පසෙකට වී හුන්නේ ය. එකල බුදු රජානන් වහන්සේ ඔවුනට අනුපිළිවෙළ කතාව වදාළ සේක. බණ කෙළවර පිරිවර සහිත වූ රජ තෙමේ සෝවන් පලයෙහි පිහිටා ගත්තේ ය. සියල්ලෝ හුන් තැනින් නැගී සිට පැවිදි කම් ඉල්ලා සිටියහ. බුදුරජානන් වහන්සේ 'මොවුනට සෘද්ධි යෙන් සිවුරු ලැබෙන්නේ දැ' යි බලා වදාරන සේක් ලැබෙනබව දැක දකුණත දිගු කොට 'මහණෙනි'! මෙහි එන්න! යහතින් දුක් කෙළවර කරණු පිණිස බඹසර හැසිරෙන්නැ' යි වදාළ සේක එසේ වදාරත් ම සියලු දෙන සිවුරු පිරිකර දැරූ සැට වස් පිරුනු මහතෙරුන් සේ අහසට පැන නැගී නැවැත බිමට බැස බුදුරජුන් වැඳ එකත් පසෙක වැඩ හුන්හ. මොවුහු පෙර දහසක් පසේබුදුරජුනට සිවුරු දහසක් හා පසේ බුදුරජුන් දවස විසි දහසක් භික්ෂූන්ට විසි දහසක් සිවුරු දුන්හ. එපිණ මෙ තැන මුදුන් පැමිණියේ ය.

වෙළෙන්දෝ රජවාසලට ගොස් රජු තමන් පිටත් කොට එවූ බව දැන්වූහ. එකල රාජවාසල තුළට කැඳ වූ ඔවුහු පසෙකට වී සිටියෝ 'තමුසේලා කුමක් නිසා මෙහි ආවහු දැ' යි බිසව විසින් අසන ලද්දාහු 'අපි රජු විසින් මෙහි එවන ලද්දෙමු, අපට රජ තෙමේ ඔබතුමියගෙන් රන් තුන් ලක්ෂයක් ඉල්ලා ගන්නට නියම කෙළේ ය' යි කීහ. බිසවු තොමෝ 'තොප ඉල්ලන්නේ ලොකු ගණනකි, රජුට තොප කළේ කුමක් ද, රජ තෙමේ කුමක් නිසා තොප කෙරෙහි මෙසේ ප්‍රසන්න වී ද, මෙ තරම් ලොකු මුදලක් ඉල්ලා ගන්නට කීයේ කුමක් නිසා දැ' යි ඇසූ ය. 'අප කළ ලොකු වැඩෙක් නැත, අපි එක්තරා ආරක්ෂවියක් රජුට කීමු' යි ඔවුන් කී විට 'ඒ ආරක්ෂවිය මට ත් කියවු' යි කිවු ය. ඔවුහු බුඩ ධම්ම සඞ්ඝ යන රත්නත්‍රය ලෝ පහළව ඇති බව බිසවට ද කීහ. ඕ තොමෝ ද ඒ අසා ප්‍රීතියෙන් පිණා ගියා, කිසිත් සලකා ගත නො හී මඳක් සිට 'මේ කියූ ආරක්ෂවියට රජු කළ සැටි හොඳ මදි ය, මෙය ඉතා වටිනා ආරංචියෙකි, මම තොපට මාගේ දුප්පත් පඬුරක් වශයෙන් තුන් තුන් ලක්ෂය බැගින් නව ලක්ෂයක් දෙමි' යි නව ලක්ෂයක් දුන්නී ය. වෙළඳුන් රජුගෙන් හා බිසවගෙන් ලත් සියලු ධනය දොළොස්

ලක්ෂයක් විය. නැවැත 'රජු ගියේ කොහිද, කීයේ කුමක් දැ' යි ඇසූ විට 'රජු පැවිදි වන්නට බුදුරජුන් වෙත ගිය බව, රජකම බිසවට පැවරූ බව, බිසව කැමති සේ සම්පත් වැළඳිය යුතු බව දන්වන්නට අපට නියම කෙළේ ය' යි කීහ. නැවැත 'එක් ව ගිය ඇමැත්තෝ කොහි දැ' යි ඇසූ විට ඔවුන් ද රජු සමඟ ගිය බව දැන්වූහ. ඉක්බිති බිසවු තොමෝ ඇමැත්තන්ගේ භාග්‍යවත් ගෙන්වා ඇමැත්තන් පැවිදි වන්නට ගිය බව දන්වා 'දැන් ඉතින් නුඹලාගේ අදහස කෙසේ දැ' යි ඇසූ ය. එහිදී 'රැජින කරන්නක් අපි ත් කරන්නෙමු' යි ඇලා කීහ. 'අපේ රජතුමා මගදී ම තුන් ලක්ෂයකින් තෙරුවන් පුදා සියලු සැපත අලුයම කෙලපිඬක් සේ හැර දමා, පැවිදි වන්නට ගියේ ය, මම ද තෙරුවන් ලෝ පහළ වූ බව අසා නව ලක්ෂයකින් තුනුරුවන් පිදීමි, මේ සම්පත්තිය දුක් දෙන්නී, රජුට පමණක් නොවන්නී ය, මෝ මට ත් මහත් දුක් දෙන්නී ඒකාන්තය, මෝඩයනට ධනය සැප දෙන්නක් සේ පෙණේ, මෝඩයා ධනයෙන් උදම් ව රට පෙළන්නට රට වනසන්නට රට තම යටතට ගන්නට කැත් කරයි, එය ම ඔහුගේ දෙලොව විනාශය පිණිස වේ, ධනවත් මෝඩයා දෙමවුපියන් හා ගුරුන් හා වැඩිහිටියන් හා මහණ බමුණන් හා නොතකයි, පව්පින් නොතකයි, නොකටයුත්ත කටයුතු සේ ද, කටයුත්ත නොකටයුතු සේ ද ගෙණ නිතර නොමග යයි, දනක් පිණක් කරණුයේ ද, තමන්ගේ මිල මුදලෙහි මහත්කම ම පෙන්වීමට ය, මේ නිසා ධනය තෙමේ මෝඩයා විනාශයට විපතට හෙලයි, එහෙත් මෝඩයා සිතනුයේ, ධනයෙන් තමහට මහත් වැඩෙක් සිදු වේය කියා ය, එහෙයින් විපතට හෙතු වූ ධනය මම ද හැර දමමි, මට මේ ධනයෙන් සම්පත්තියෙන් කිසිත් වැඩෙක් නැත, මම ද රජු ගත් මග ගෙණ බුදුරජුන් වෙත ගොස් පැවිදි වෙමි' යි බිසව කිවු ය. එකල්හි ඇලා ද 'අපි ද ඔබ සමඟ ම ගොස් පැවිදි වෙමු' යි කීහ. එවිට ඕ තොමෝ 'එවු' යි ඇලා ත් ගෙණ රිය නැගී නික්ම ගියා ය. අතර මගදී රජුට සේ ගඟ මුණ ගැසිනා සියලු තොරතුරු අසා දැන 'රජු ගිය මග බලවු' යි කිවු ය. ඔවුහු රජු ගිය මග සෙවූහ. එහෙත් සොයාගත නොහැකි වූහ. 'රජු ගිය මග නොපෙණේ ය' යි කී කල්හි, 'රජ නික්ම ගියේ තෙරුවන් උදෙසා ය, සත්‍යක්‍රියා බලයෙන් රජු ගඟ එතෙර කරන්නට ඇත, මම ද සියල්ල හැර දමා ආවා තෙරුවන් උදෙසා ම ය, එහෙයින් මට ත් තෙරුවන් බලෙන් මේ දිය කඳ දිය කදෙක් නොවේවා' යි තුනුරුවන් ගුණ සිහි කොට රිය දහස ඉදිරියට ගමන් කරවූ ය. දිය ගල් තලාවක් සේ විය. රියසක්හි නිම්වළලු ම නෙමිනා. අතික්

දෙ ගඟින් ද මෙලෙසින් එතෙර වූ බිසවු තොමෝ පිරිවර සමග ඉදිරියට ගියා ය. තිලෝගුරු බුදුරජානන් වහන්සේ ඇගේ ඊම අසා, තමන් වෙත හිඳින මහණුන් ඇට නො පෙණෙන ලෙසක් කොට වදාළ සේක. බිසවු තොමෝ ඉදිරියට යත්, යත්, බුදුරජුන්ගේ ශ්‍රීශරීරයෙන් නික්ම යන බුදු රැස් දැක රජු සිතූ සේ ම සිතා බුදුරජුන් වෙත එළැඹැ වැඳ පසෙක සිට 'ස්වාමීනි! මහාකප්පින රජතුමා සියලු සැපත් හැර දමා ඔබවහන්සේ බලා නික්ම ආයේ දැන් කොහි ද, ඔහු මට දක්වනු මැනැවැ' යි කිවු ය. 'හිඳ ගන්න! මෙහි දී ඔහු දැක්ක හැකි ය, කලබල නො වන්නැ' යි වදාළ විට, ඇලා සියල්ලෝ තුටු පහටු ව එ තැන ම හිඳ ගත්හ. බුදුරජානන් වහන්සේ අනුපිළිවෙළ කතාව වදාළ සේක. බිසවු තොමෝ බණකෙළවර, තම පිරිවර හා එක්ව ම සෝවන් පලයට පැමණියා ය. මහාකප්පින තෙරනුවෝ ඒ දෙශනාව අසා සිවුපිළිසැඹියාවන් සහිත ව රහත්බවට පැමිණියහ. ඉක්බිති බුදුරජානන් වහන්සේ ඇලාට ඒ භික්ෂූන් දැක්වූහ. ආ සැටියේ ම කසට වත් දරා හිස මුඩු කොට සිටි තම හිමියන් දුටුවෝ නම්, ඔවුන්ගේ සිත් එකඟ නො වන්නේ ය. ඔවුහු මාර්ගඵලාවබොධයෙහි අසමර්ථ වෙති. එහෙයින් ශ්‍රඩාව නො සැලෙන සේ පිහිටා ගත් පසු ඔවුනට, රහත්බවට පැමිණ එහි සිටි ඒ භික්ෂූන් දැක්වූහ. එහිදී ඇලා ඔවුන් දැක පසඟ පිහිටුවා වැඳ 'ස්වාමීනි! ඔබවහන්සේලා මහණ වූ කාරිය නම් දැන් සම්පූර්ණ ය' යි කියා බුදුරජුන් වැඳ පසෙක සිටියාහු මහණකම ඉල්ලූහ. උන් මෙසේ මහණකම ඉල්ලා සිටි කල්හි (බුදුරජානන් වහන්සේ උත්පලවර්ණාවගේ ඊම බලාපොරොත්තු වූහ යි ඇතැම් කෙනෙක් කියති.) 'සැවැත්නුවර මෙහෙණවරට ගොස් පැවිදි වවු' යි උන්වහන්සේ වදාළ සේක. ඇලා පිළිවෙළින් යන්නාහු අතරමග ඒ ඒ තැන මහාජනයා විසින් එළ වූ ආදර සංග්‍රහ ඇති ව පයින් ම එක්සිය විසි යොදුන් මග ගෙවා මෙහෙණවරට ගොස් පැවිදිව රහත් වූහ. බුදුරජානන් වහන්සේ ද දහසක් භික්ෂූන් වහන්සේ ගෙණ අහස් මගින් දෙව්රමට වැඩි සේක. මහාකප්පින තෙරනුවෝ එහි 'අහො සුඛං අහො සුඛං' යි උදන් අනමින් නිතර හැසිරෙති. සෙසු භික්ෂූන් වහන්සේලා ඒ අසා 'ස්වාමීනි! මහාකප්පින ස්ථවිර තෙමේ 'අහො සුඛං, අහො සුඛං' යි උදන් අනමින් හැසිරේ, එසේ උදන් අනනුයේ පෙර තමන් විඳි රජ සැපත සිහිවීමෙනැ' යි දැන්වූහ. බුදුරජානන් වහන්සේ මහාකප්පින තෙරුන් කැඳවා 'කප්පින! තමුසේ කම්සැප රජ සැප සිහියට ගෙණ උදන් අනන්නහු සැබෑදැ' යි ඇසූහ. 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! ඔය කියන සැපයක් නිමිති කොට මා උදන් අනනු භාග්‍යවතුන් වහන්සේ දන්නා සේකැ' යි මහාකප්පින තෙරනුවෝ කීහ. එවිට බුදුරජානන් වහන්සේ 'මහණෙනි! මා පුත් මහාකප්පිනයෝ කම්සැප රජසැප සිහියට ගෙණ උදන් නො අනති, මහාකප්පිනයාගේ සිත්හි ධර්මරතිය නිතර උපදනී ය, එහෙයින් ඔහු නිවන අරමුණු කොට ම උදන් අනාය, යි අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:–

ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා,
අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතොති.

දහම් රස බොනුයේ සුවසේ හොවියි. පණ්ඩිත තෙමේ වෙසෙසින් පහන් සිතින් ආර්‍යයන් දෙසූ (නොහොත්) දන්නා ලද ධර්මයෙහි ඇලෙයි.

ධම්මපීති සුඛං සෙති = දහම් රසය බොන්නේ සුවසේ හොවි යි.

නවලොව්තුරා දහම්, සිතින් සලකනුයේ, අරමුණු කිරීම් වසයෙන් ප්‍රතිවෙධ කරණුයේ, දුංඛසත්‍යය පිරිසිඳ දැනීම් වස-යෙන්, සමුදය සත්‍යය ප්‍රහාණය කිරීම් වසයෙන්, නිරෝධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීම් වසයෙන්, මාර්ගසත්‍යය වැඩීම් වසයෙන් ප්‍රතිවෙධ කරණුයේ ධම්මපීති නම් වේ. එහි **'ධම්මපීතීති ධම්මපායකො ධම්මං පිවන්නො ති අත්ථො'** යනු අටුවාහි ආයේ ය.

ධර්මරසය තැටිවල කොළගොටුවල කෝප්පවල කැඳ කිරි පැන් ආදිය වත් කොට ගෙණ බොන්නා සේ නො බිය හැකි ය. පෙළ දහම් ඉගෙණ අරුත් රසය නැණ තුඩින් බොනුයේ දහම් බොන්නේ ය. එසේ නවලොවුතුරා දහම සිතින් පහසනුයේ දහම් බොන්නේ ය. නිවන අරමුණු කිරීම් වසයෙන් නිවනට හමු කරණුයේ දහම් බොන්නේ ය. දුක් සස් ඈ පිරිසිඳ දැනීම් ඈ විසින් අවබොධ කරණුයේ දහම් බොන්නේ ය. මේ ඈ ලෙසින් දහම් බොනුයේ සිවු ඉරියව්වෙහි ම සුවසේ හොවියි. **'ධම්මො හවෙ රක්ඛති'** යනු වදාළේ ද මේ නිසා ය. ලෞකිකශරණශීල-මාත්‍රයෙනුදු සත්වයෝ සියලු උවදුරු විපත් නසා සුවපත් වූහ. පන්සිල් පමණකිනුදු සත්වයෝ සුවපත් වූහ. ශීලසමාදානාදියෙන් තොර ව සිටි සත්වයෝ නිවරද සිත් පමණකිනුදු සුවපත් වූහ. එයට ආගම දෙස් දෙන්නේ ය. ලොකය සාක්ෂ්‍ය කියන්නේය. අන් ගුණයක් ගැණ කුමන කතා ය.

විප්පසන්නෙන චෙතසා – වෙසෙසින් පහන් සිතින්.

සිත පහන් වනුයේ කෙලෙසුන් නැති විටය. සිත කරා පැමිණ සිත කිලිටි කරණ ධර්ම උපක්ලෙශ නම. සිත පිරිසිදු ය. එහෙත් අමුතුවෙන් එන අසඞ්ඛර්මහෙතුවෙන් සිත අපිරිසිදු වේ. එසේ අපිරිසිදු නො වූ වඩාලා ම පිරිසිදු වූ සිත මෙයින් කිය වේ.

අරියප්පවෙදිතෙ ධම්මෙ = ආර්‍යයන් දත් දහම්හි.

ආර්‍යයෝ නම් බුඩාදිමහොත්තමයෝ ය. උන්වහන්සේලා දත් උන්වහන්සේලා පැවසූ දහම් නම් බෝපැකි දහම් ය. **'බුඩාදීහි අරියෙහි පවෙදිතෙ සතිපඨානාදිභෙදෙ බොධිපක්ඛිය ධම්මෙ'** යනු අටුවාය.[1]

සදා රමති පණ්ඩිතො = නුවණැත්තේ හැම කල්හි ඇලේ.[2]

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

මහාකප්පිනස්ථවිර වස්තුව නිමියේ ය

---

1 2. 1 'අරියානාගොචරෙ' යන්න බලනු.
2 2. 1 'පණ්ඩිතා' ,, ,,

පණ්ඩිතසාමණේරයෝ

6 — 5

කස්සප සම්බුදුරජානන් වහන්සේ විසි දහසක් රහතුන් පිරිවරා බරණැසට වැඩි සේක. එහිදී නුවර වැස්සෝ උන්වහන්සේලා දැක හැකි පමණින් අටදෙනා; දසදෙනා බැගින් එකතු ව ආගන්තුක දැනය දුන්හ. දිනෙක අනුමෙවෙනි බණ වදාරන බුදුරජානන් වහන්සේ 'උපාසකවරුනි! මෙලොව ඇතැම් එකෙක් 'තමන් සතු දෙය ම දිය යුතුය, අනුන් හා එක්ව දීමෙන් වැඩෙක් නැතැ' යි තෙමේ ම දෙයි, මේ නිසා උපනුපන් තැනදී ඔහුට ලැබෙන්නී භොගසම්පත්තිය පමණකි, පිරිවර සැපතක් ඔහුට නො ලැබේ, අනෙකෙක් අනුන් ලවා දෙව යි, තෙමේ නො දෙයි, ඔහුට පිරිවර සැපත මුත් භොග සැපතක් නො ලද හැකි ය, තවෙකෙක් තෙමේ ද නො දෙයි, අනුන් ලවා ද නො දෙව යි, ඔහුට භොග සැපතත් පිරිවර සැපතත් දෙක ම නො ලැබේ, ඔහු උපනුපන් තැන සිඟන්නෙක් ව උපදියි, එකෙක් තෙමේ ද දෙයි, අනුන් ලවා ද දෙව යි, ඔහුට ගිය ගිය තැන භොගසම්පත්තිය හා පරිවාරසම්පත්තිය නො අඩුව ලැබිය හැකි ය' යි අනුමෙවෙනි කළ සේක. එහි එබණ අසා සිටි නුවණැති මිනිසෙක් 'මම මෙකී හැම සැපතක් ම ලබන්නෙමි' සි සිතා බුදුරජුන් වෙත ගොස් වැඳ 'සවාමිනි! හෙට දැනයට මාගේ ගෙට වඩිනු මැනැවැ' යි ආරාධනා කෙළේ ය. උන්වහන්සේ එය ඉවසා 'කෙතෙක් භික්ෂූන් වා යුතු දැ' යි විචාළ කල්හි 'හැමදෙනා වහන්සේ වැඩිය යුතු ය' යි දන්වා සිටියේ ය. එහි භික්ෂූන් වහන්සේලා විසි දහසක් පමණ වූහ. එකල උපාසක තෙමේ ගම් බලා ගොස් 'පින්වත්නි! මම හෙට දැනයට බුදුරජානන් වහන්සේට ආරාධනා කලා, තමුසේලා කවුරුත් හැකි පමණින් දන් පිළියෙල කර ගෙණ එන්නැ' යි කියමින් ගෙන් ගෙට ඇවිද්දේ ය. ගම්වැස්සෝ අපි දස නමකට අපි විසි නමකට, අපි තිස් නමකට දන් පිළියෙල කර ගෙණ එන්නෙමු' සි තම තමන්ට හැකි පමණින් දන් පිළියෙල කරන්නට බාර ගත්හ. ඒ ගම්වැස්සෝ ඉතා දිළිඳු ය. මහාජනයා විසින් මහදිළින්දු ය යි හඳුන්වන එක්තරා මිනිසෙක් එ දවස එ ගම විසී ය. උපාසක තෙමේ ඔහු හමු ව 'මිත්‍රය! මම බුදුපාමොක් මහසඟනට හෙට දැනය පිණිස අපේ ගමට වඩින්නට ආරාධනා කළා, ගම්වැස්සෝ හෙට දන් දෙන්නට සූදානම් ව සිටින්, තමුසේටත් එයට එක් වන්නට හැකි නම් ඔහාට එය දියුණුව පිණිස වන්නේ ය' යි කී ය. 'මොකද ඕය්! කියන්නේ, මම

දිළින්දෙක්, තමුසේ ඒ වග නොදන්නහු ද? මහණුන්ගෙන් වැඩ තිබෙන්නේ සල්ලි ඇති මිනිසුන්ට ය, හෙට කෑද ටිකක් බොන්නට හාල් ඇටයක් පමණ වත් ගෙයි නැත, එබදු මම ඔය කියන දනට කෙසේ එක් වෙම් දැ' යි දිළින්දෑ කී විට 'බලන්න! මේ ගම් වැසි බොහෝ දෙනෙක් ගේ දොර කදිමට ගොඩ නගා ගෙණ හොඳට කා බී හොඳට ඇඳ පැළඳ ගෙණ රන් රිදී මුතු මැණික් අබරණ ලා සුව පහස් දෙන ඇඳ පුටුවල නිදමින් හිඳිමින් සැප විඳිති, දවස මුළුල්ලෙහි කුලී වැඩ කළ ත් ඔබට කට බඳ පුරා කන්නට යමක් නොලැබේ, වෙනස බලන්න! මේ වෙනස පෙර ජාතිවලදී පින් නොකළ නිසා වූවකැ, යි ඔබට නොසිතේ දැ' යි ඇසි ය. මදක් නිහඬ ව සිට 'මට ත් ඒ වග නම් සිතෙනවා' යි ඔහු කී ය. 'එසේ නම් දැන් වත් යන තැනට පිණක් දහමක් කර ගන්න, ඔබ තරුණයෙක්, ඇඟ පත ත් හොඳට වැඩී තිබේ, දිනපතා ම කුලී වැඩත් කරණවා, එබන්දකින් ලැබෙන යමකින් වත් දන් පින් කර ගතයුතු නොවේ දැ' යි කී විට, ඔහුට සංවෙග උපන. 'එසේ නම් මට ත් එක නමක් ලියන්න, කුලී වැඩක් කරලා වත් මම ත් එක නමකට දන් දෙන්නෙම්' යි කියා ගෙට ගොස් මේ සියලු තොරතුරු බිරින්දට කී ය. එහිදී ඇ එය සතුටින් පිළිගෙණ 'අපි පෙර දන් පින් නොකළ නිසා දැන් දිළින්දෝ ව සිටිමු, එහෙයින් අපි හෙට කුලී වැඩට ගොස් මුදල් ටිකක් වැඩියෙන් සොයා ගෙණ ඒ බාර ගත් දෑනය හොඳට පිළියෙල කර ගෙණ යමු' යි කිවු ය. පසුදා දෙදෙන ම උදැසනින් හිස් බඳින් ගෙන් නික්ම කුලී වැඩ කරණ තැනට ගියහ. එහි සිටි සිටු තෙමේ ඔහු දැක 'අද වැඩ කරණවා දැ' යි ඇසි ය. 'එසේ ය' යි ඔහු පිළිතුරු දුන. 'එහෙ නම් මෙහෙ වරෙන්, හෙට තුන් දහස් නමකට දන් දීමට මා බාරගෙණ තිබෙනවා, දන් පිළියෙල කිරීමට දර ගොඩක් වුවමනා ය, මේ වෑ පොරෝ රැගෙණ ගොස් අර පෙණෙන ලී කොටත් පලා දර කරව' යි නියම කෙළේ ය. දිළින්දෑ හොඳට අමුඩ ගසා පැලිය යුත්ත පලමින් සැසිය යුත්ත සසිමින් කපමින් ඉතා මහත් ඕනෑකමින් දර පළ ඝි. සිටානෝ ඒ දැක 'වෙනදාට වඩා අද බොහෝ ඕනෑකමින් වැඩ කරණවා, මොක ද වෙනදා නැති ඕනෑ කමක්' යි ඔහුගෙන් ඇසූහ. 'සිටු-තුමනි! මම ත් එක නමකට දන් දීමට බාර ගත්තා' යි කී විට, සිටානෝ සතුටු සිත් ඇති ව 'මේ මිනිහා පුදුම මිනිහෙකි, මු කරණුගේ පහසු වැඩෙක් නොවේ, මම දිළින්දෙක්මි යි නිකම් නොසිට එක් නමක් වැළඳවීමට සූදානම් වේ ය' සිතූහ. සිටු බිරින්ද ද දිළින්දාගේ අඹුව දැක තොරතුරු විචාරා කියන යමක්

කරන්නට කැමැති යි කී විට, වංගෙඩි මෝල් තුබූ තැනට ඇය කැඳවා වංගෙඩි මෝල් කුලු ආදිය දෙවා 'මේ වී කොටා පොළා පිළියෙල කරව' යි නියම කළා ය. ඕ තොමෝ නිළියක මෙන් තුටු පහටු ව වණෙහි ලා වී කොට කොටා පොළ යි. සිටුබිරිය එහි පැමිණ උපාසකම්මා අද බොහෝ සතුටින් වී කොටන පොළන බව පෙණේ, මොක ද ඒ වෙනදා නැති සතුටෙක්, උනන්දුවෙකැ' යි ඇසූ ය. 'හාමිනේ! අපේ එක්කෙනා ත් හෙට එක් නමක් වළඳ වන්නට බාරගෙණ සිටි යි, එයට වුවමනා දුරු මිරිස් උම්බලකඩ හාල් මුං උඳු පරිප්පු ආදි කිසිවක් ගෙයි නැත, තිබෙන තැනකින් ගන්නට මුදලු ත් නැත, වැඩියෙන් මුදල් ටිකක් හාමිනේලාගෙන් ඉල්ලා ගන්නට සිතා අමාරුකම් නො බලා මෙසේ වැඩ කරණ වා ය' යි කී විට, සිටු බිරිය ඈ කෙරෙහි ප්‍රසන්න වූ ය.

සිටු තෙමේ, දර පළා අවසන් කළ දුගියාට කුලිය පිණිස ඇල් හාල් නැළි සතරක් දෙවා 'මේ නුඹට තුටුපුඬුරු' යි කියා තවත් නැළි සතරක් දෙවී ය. ඔහු ගෙට ගොස් බිරින්දට කතා කොට 'මට අද මා කළ කුලී වැඩට හොඳ ඇල් හාල් ටිකක් ලැබුනා, මේ හාල් බතට සෑහේ, හාල ත් බතට හොඳ ය, ඔයාට ලැබෙන කුලියෙන් දී ගිතෙල් කඩ සරක්කු ආදිය ගෙන්වා ගන්නැ' යි කීයේ ය. වී කොටා පොළා තැන්පත් කළ කල්හි ඇයට ද කුලිය පිණිස, දී ගිතෙල් කුළුබඩු හා පිරිසිදු ඇල් හාල් නැළියක් ලැබුනේ ය. එයින් සතුටට පැමිණි ඔවුහු පසුදා උදෑසන ම නැගී සිටියාහ. අඹුව හිමියාට කතා කොට 'එලවළු වෙළඳපොළට ගොස් පලා මිටියක් දෙකක් ගෙණෙන්නැ' යි කිවූ ය. ඔහු එහි ගියේ වෙළඳපොළෙහි කෑමට සුදුසු පලා නො දැක අසල වූ ගං ඉවුරට ගොස් 'දන් දීමට මට ත් ඉඩ ලැබුනේ ය' යි මහහඬ නගා කියමින් පලා නෙලන්නට වන. එ ගඟ දැල් දමමින් සිටි මිනිසෙක් 'මේ මහාදිළින්දාගේ හඬැ' යි දැන ඔහු වෙතට ලං ව 'වෙනදා නැති සතුටෙක් අද මොක දැ' යි ඇසී ය. 'දනක් දීමට මා බාරගෙණ තිබේ, එය සිහිවන විට මා සිත් තුළ නගිනුයේ පමණ නො කට හැකි මහත් සතුටෙකි, මේ පලා නෙලනුයේ ද ඒ පිණිස මැ' යි කී ය. 'තමුසේ හරි මිනිහෙක්, දනට පලා තම්බා දිය හැකි ද, නිතර රසමසයෙන් වළඳන භික්ෂුන් වහන්සේලා පලා වළඳත් දැ' යි කී විට, 'මට තිබෙන සැටියෙන් මිසක් අන් ලෙසකින් දන් දෙන්නට මට පිළිවන් කමක් නැත, හාමුදුරුවන් වහන්සේලා රසමස ගුණ බලාපොරොත්තු නො වෙති, උන්වහන්සේලා ලැබුනු සැටියෙන් වළඳන්නෝ ය' යි කීයේ ය. මස් මරන්නා ඒ කතාව අසා 'මෙහි එන්නැ' යි අඩ ගා ලඟට කැඳවා ගෙණ 'මේ මසුන් අකක් දෙ අකක් කහවණුවක් වටින ලෙසට වැල් කිහිපයකට

අවුණන්නැ' යි මසුන් දුගියාට ලං කෙළේ ය. ඔහු එසේ කී ලෙසට ඇවුණුයේ ය. ඇවුණු ඇවුණු මාලු වැල් නුවර වැස්සෝ අවුත් දුනයට ගෙණ ගියහ. දුගියා මාලු වැල් අවුණ අවුණා හිත්ද දී ම භික්ෂූන් පිඬු සිහා යන කාලය ලං විය. එවිට ඔහු වේලාව සලකා 'මිත්‍රය! මම යනවා, මට නැවතී ඉන්නට දැන් කාලයෙක් නැත, දැන් භික්ෂූන් පිඬු සිහා යන වේලාවය, යි, හුන් තැනින් නැගී සිටි කල්හි අනිකා 'ඔහේට ත් මාලු වැලක් ඉතිරිව තිබේ දැ' යි ඇසී ය. 'නැතැ, යි කී විට 'පොඩ්ඩක් ඉන්නැ' යි කියා ගෙට ගෙණ යනු පිණිස වළලා තුබූ රේ මසුන් සිවු දෙනකු දී මේ 'මාලුත් උයා හොඳට වළඳවන්නැ' යි කියේ ය.

මේ දවස බුදුරජානන් වහන්සේ ලොව බලා වදාළ සේක. එවිට මේ දුගියා උන්වහන්සේ ගේ නුවණැසට පෙණී ගියේ ය. නැවැත 'වන්නේ කිමැ' යි බලා වදාළ කල්හි දුගියා මහණකු වළඳවන්නට ඊයේ මුළු දවස භාග්‍යවත් සමග කුලී වැඩ කළබව හා අන් මිනිසුන් තමන් ලඟ ඇති සැටියෙන් භික්ෂූන් ගෙවලට කැඳවා ගෙණ ගිය විට, එහි නැවැතී සිටින තමන්වහන්සේ දුගියාට ලැබෙන බව දුටු සේක. බුදුවරු වඩාලා ත් අනුකම්පා කරන්නෝ දුප්පතුන්ට ය. බුදුරජානන් වහන්සේ උදැසන ම සිරුරු කිස කොට 'දුගියාට සංග්‍රහ කරම්' යි ගඳකිළියට පිවිස වැඩ හුන්හ. දුගියා මාලු ත් ගෙණ ගෙට ගියේ ය. එ කෙණෙහි සක්දෙව් රජුගේ ගල් අසුන රත්වන්නට විය. 'එහි කරුණු කිමැ' යි බලනුයේ දුගියා අඹුව ත් සමග කුලී වැඩ කොට භික්ෂු නමකට දන් දෙන්නට සූදානම් වන බව හා ඒ දැනයට බුදුරජුන් වැඩමවන බව ද, එහිදී දුගියා බුදු රජුන්ට එහි පිළියෙළ කළ කැඳ බත් හා පලාමැල්ලුම් පිළිගන්වන බව ද දුටුයේ ය. ඉක්බිති සක්දෙව් තෙමේ 'මම එහි අරක්කැමි ව කැඳ බත් ටික හොඳට පිළියෙල කරම්' යි සිතා රහස් වේසයකින් දුගී පැල අසලට ගොස් 'කුලී වැඩ තිබේ දැ' යි එහා මෙහා යන එන මිනිසුන්ගෙන් ඇසී ය. ඔහු දුටු දුගියා 'උඹට කළ හැකි කුමක් දැ' යි විචාළවිට 'තමුසේලාට වුවමනා හැම දෙයක් ම මට කළ හැකිය, වඩු වැඩ, පෙදරේරු වැඩ, යකඩ වැඩ හා කැඳ බත් මස් මාලු පලාමැල්ලුම් ඇඹුල් සුප් කැවිලි පෙවිලි ආ පිළියෙල කිරීම යන කොයි දෙය ත් මම දනිමි' යි පිළිතුරු දින, 'තමුසේ මේ වේලෙහි මෙහි ඒම අපට මහත් උපකාරයෙකි, ඒ උනත් වැඩ කරවා ගෙණ ඔහාට දෙන්නට දෙයක් අපලඟ නැතැ' යි දුගියා කී ය. 'තමුසේලාට මගෙන් කෙරෙන්නට ඕනෑ කුමක් දැ' යි ඇසූ කල්හි' එතරම් ලොකු වැඩෙක් නො වේ, අපට කර ගන්නට තිබෙනුයේ, භික්ෂු නමකට දන් ටිකක් දීමට අප නියම කරගෙණ තිබෙනවා, එයට හොඳට කැඳ බත් ටික උයා පිහා ගැණීමය

කරගත යුතු ව තිබෙන්නේ, වෙන වැඩෙක් නැතැ' යි කීයේ ය. 'එහෙම ද, එසේ නම් එයට මට කුලියක් වුවමනා නැත, මට ත් හොඳයි පින්, මම ඒ සියල්ල හොඳට පිළියෙල කරන්නම්' යි දුගියා ගේ ගෙට ගොඩ වී හාල් දුරු මිරිස් ආදිය ඉල්ලා ගෙණ 'උපාසක උන්නැහේ! යන්න, ඔහාට නියම කෙරෙණ හාමුදුරුවන් වැඩමවා ගෙණ එන්නැ' යි දුගියා පන්සලට පිටත් කොට යැවූයේ ය

ප්‍රධානදායක තෙමේ ලියා තුබූ ලෙසට ඒ ඒ අයගේ ගෙවලට දස නම, තිස් නම බැගින් භික්ෂූන් පිටත් කෙළේ ය. දුගියා ත් ඔහු වෙත ගොස් 'මට දෙන හාමුදුරුවන් පෙන්වන්නැ' යි ඉල්ලා සිටියේ ය. එ කල්හි දුගියාට ද එක් නමක් දෙන්නට වූ පොරොන්දුව මතක් වී 'ආහ්! තමුසේට වූ පොරොන්දුව මට අමතක වී ය' යි කී ය. දුගියා ඔහුගේ බසින් තියුණු සැතකින් පහර ලද්දකු සේ 'මහත්තයා මෙසේ කියන්නේ ඇයි, ලොකු වරදක් කෙළේ, මට ත් එක් කමක් දීමට පොරොන්දු වුනා, මම එය බාර ගත්තේ තමුසේගේ ඇවටිල්ල නිසා ය, මම අපේ ගෙදර එක්කෙනා ත් සමග කුලී වැඩ කොට දනට වුවමනා දේ මට හැකි පමණින් සපයා ගත්තා, අද පාන්දර ම පලා නෙලන්නට ගංඉවුරේ හැම තැන ඇවිද්දා, කොහොම හරි මට ත් එක් නමක් ලැබෙන්නට ම ඕනෑ ය' යි ඔලුවේ දෙ අත බැඳ හඬන්නට වන්නේ ය. එහි රැස් ව සිටි මිනිසුන් ඒ දැක 'කුමක් නිසා හඬන් නෙහිදැ' යි ඇසූ කල්හි ඔහු සියලු තොරතුරු ඔවුනට දැන්වී ය. 'කුලී වැඩ කොට වත් එක් නමකට දන් ටිකක් දෙන්නැ' යි කියන ලද දැ' යි ඒ මිනිස්සු දායකයාගෙන් ඇසූහ. 'ඔව්! මම කීමි' යි දායකයා කී විට 'තමුසේ කරලා තිබෙන්නේ ලොකු වරදෙක්' එක් නමක් වත් දෙනවාය යි කියා එසේ නො දීම බලගතු වරදෙකැ' යි කීහ. මිනිසුන්ගේ කතාබහෙන් කිසිවක් කියා ගත නුහුනු ඔහු දුගියා පැත්තකට ගෙණ 'ඕය් මම ඔහේගේ මේ වැඩෙන් මහත් කරදරයට පැමිණියා, ලැයිස්තුවේ ලියා තුබූ ලෙසට දන් දීමට බාර ගෙණ සිටි අය හාමුදුරුවරු වැඩමවා ගෙණ ගියහ, දැන් එක් නමක් වත් ඒ තැන්වලින් ලබා ගැණීම නො කොට හැකි ය, ගෙට, දානය පිණිස වැඩිය හාමුදුරු නමක් දන් නො වළඳවා පිටත් කොට යවන්නට කිසිවෙක් කැමති නො වේ, මම දැන් කුමක් කරම් ද, බුදුහාමුරුවෝ මුව සෝදා ගෙණ ගඳකිළියෙහි වැඩ හිඳිති, මේ රජ යුවරජ ඇමතියෝ උන්වහන්සේ ගඳකිළියෙන් දොරට වඩිනතුරු බලා සිටින්නෝ උන්වහන්සේගේ පාත්‍රය ගෙණ යෑමට ය, එහෙත් බුදුවරු වැඩියක් අනුකම්පා කරන්නෝ දිළින්දන්ට ය, එබැවින් ඔහේ බුදුරජුන් ලඟට ගොස් 'මම දිළිඳුය, මට සංග්‍රහ කරණු මැනැවැ' යි වැඳ වැටෙන්න, පි ණෙක්

තිබේ නම්, බුදුරජානන් වහන්සේ ඔබේගේ දැනයට වැඩම වනවා ඇත' යි කී ය. එවිට දුගියා විහාරයට ගියේ ය. එහි සිටි රජ යුවරජ ඇමතියෝ 'මේ කවු ද, මොක ද මේ භිඟන්නා, තව ම සවාමීන් වහන්සේලා දන් වළඳා අවසන් නැත, ඒ තබා දන් වළඳන්නට වත් සුදුනමෙක් නැත, යන්නේ කොහි ද' යි ඔහු ගෙන් ඇසූහ. 'සවාමිවරුනි! මම ආවේ බුදුරජුන් වඳින්නට ය, දන් වළඳන කාලය තව ම ලං නො වූ බව මට ද පෙණෙනවා, බුදුරජුන් වඳින්නට මට පොඩ්ඩක් ඉඩ දෙනු මැනැවැ' යි යටහත් ව කියා ඉඩකඩ ලබා ගත් දුගියා ගඳකිළිය ලඟට ගොස් එහි එලිපත මත්තෙහි හිස තබා පසඟ පිහිටුවා වැඳ 'සවාමීනි! මෙ තුවර මා තරම් දුප්පතෙක් තවත් ඇත්තේ නැත, මා කෙරෙහි අනුකම්පා කරන්න! මට පිහිට වන්න! අනේ! මට අනුග්‍රහ කරන්නැ' යි කියා සිටියේ ය. බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි දෙර ඇර පාත්‍රය ගෙණවුත් ඔහුගේ අත තැබූහ. ඒ වේලෙහි ඔහු තමා සක්විති රජ කමට පැමිණියකු කොට සිතී ය. රජ යුවරජ ඇමතියෝ උතුන්ගේ මුණු බැලූහ. බුදුරජුන් විසින් දුන් පාත්‍රය තම බලය පා පැහැර ගැන්මෙහි පොහොසතෙක් මෙ ලොව නැත. එහෙයින් ඔවුහු 'පින්වත! ඔය පාත්‍රය අපට දෙන්න! නුඹට සල්ලි දෙන්නෙමු! උඹට ඔයින් වැඩෙක් නැතැ' යි කියා පාත්‍රය ඉල්ලූහ. 'අනේ! මේ පාත්‍රය නම් සක්විති රජකම දුන්න ත් දෙන්නේ නැත, සල්ලි වලින් මට වැඩෙක් නො වේ, අද නම් බුදුරජුන් වළඳවන්නට ඕනෑ ය' යි කී විට ඔවුහු නිහඬ වූහ. ඉක්බිති රජ තෙමේ 'මේ මිනිහා මුදලින් පොළඹවනු හැක්කෙක් නො වේ, කොතරම් මුදල් දුන්න ද පාත්‍රය නම් ලැබෙන්නේ නැත, බුදුරජුන් දුන් පාත්‍රය ගන්නට පිළිවන් කමෙක් ද නැත, මූ බුදුරජුන්ට පිළිගන්වන දැනවසතුව කෙබඳු වේ ද, කො තරම් වටිනාකම ඇත්තෙක් වේ ද, මූ දන් පිළිගැන්නුවාට පසු බුදුරජුන් රජගෙට වැඩමවා ගෙණ මම දන් පිළිගන්වන්නෙමි' යි සිතා බුදුරජුන් පසුපසු ගියේය.

සක්දෙවිරජ තෙමේ දුගියාගේ ගෙයි කැඳ බත් මාලුපිණි පිළියෙල කොට බුදුරජුන්ට වැඳ හිඳිනට නිසි අස්නකු ත් පණවා බලා හුන්නේ ය. දුගියා බුදුරජුන් වැඩමවා ගෙණ ගොස් 'සවාමීනි! ගෙට වඩිනු මැනැවැ' යි ඉල්ලී ය. දුගිගෙය ඉතා මිටි පැල්පතෙක් විය.

බුදුවරු ගෙවලට පිවිසෙත්නෝ නො නැමී පිවිසෙති. මිටි ගෙයකට වදින කාලයෙහි මහපොළොව යටට ගිලා බසී යි. ගෙය හෝ උස්ව සිටී යි. මෙසේ වන්නේ උන්වහන්සේලා පෙර දුන් දැනයන්ගේ විපාක වශයෙනි. ගෙයින් බැහැරට වැනිය කල්හි ගෙය පෙර සේ සිටී යි.

බුදුරජානන් වහන්සේ සිටි සේක් ම ගෙතුළට වැද පැණවුනු අසුනෙහි වැඩ හුන්හ. රජ තෙමේ 'අප ඉල්ලා සිටිය ද තා බුදුරජුන්ගේ පාත්‍රය අපට නො දෙන ලද ය, තා බුදුරජුන්ට කරණ සත්කාරය කෙබඳු දැ යි අපිත් බලමු' යි කී ය. සක්දෙව් තෙමේ එහිදී කැඳ බත් මාලුපිණි පිළියෙල කොට තුබූ හට්ටි වළන් ඇර දැක්වී ය. එ කෙණෙහි ඒ කැඳ බත් මාලු පිණිවල ගන්වා තුබූ සුගන්ධය මුළු නුවර වසා පැතිර ගියේ ය. රජ, කැඳ බත් මාලු පිණි ඇ බලා 'ස්වාමීනි! දුගියාගේ දානය කෙසේ පිළියෙල කරණ ලද දැ' යි බලා ඉන් පසු බුදුරජානන් වහන්සේ මාගේ මාලිගාවට වැඩමවා එහි පිළියෙල කළ ආහාර පාන පිළිගන්වන්නට සිතාය මම මෙහි ආයෙම්, එහෙත් මෙබඳු ප්‍රණීත ආහාර පාන මෙයට කලින් මා දැක නැත, මා මෙහි තව සිටියො ත් මොහු වෙහෙසට පත්වන්නේ ය, එහෙයින් මට යන්නට අවසර දෙනු මැනැවැ' යි අවසර ගෙණ වැඳ එතැනින් නික් ම ගියේ ය. සක්දෙව් තෙමේ බුදුරජුන්ට කැඳ බත් පිළිගන්වා සත්කාර කෙළේ ය. වළඳ අවසන්හි අනුමෙවෙනි බණ වදාරා බුදුරජුන් හුනස්නෙන් නැගී වඩින කල්හි දුගියා ද පාත්‍රය ගෙණ බුදුරජුන් පසු පස ගියේ ය. සක්දෙව් තෙමේ ගෙයි සිටියේ උඩ බැලී ය. එ කෙණෙහි වට සත් රුවන් වැස්සෙන් දුගීගෙය මුළුමනින් පිරී ගියේ ය. ගෙයි තුබූ සියලු හට්ටි මුට්ටි එයින් පිරින. ගෙයි හැම තැන ඉඩ කඩ නැති විය. දුගී භාර්‍යාව කුඩා දරුවන් අත එල්ලා ගෙණ ගෙයින් බැහැර වූ ය. බුදුරජුන් පසු පස ගිය දුගියා ටික දුරක් ගොස් පෙරළා ආයේ බැහැර සිටි දරුවන් දැක 'කුමක් නිසා බැහැර සිටින්නෙහි දැ' යි අඹුවගෙන් ඇසී ය. 'හිමියෙනි! මුළු ගෙය ම හැමතැන ම සත් රුවනින් පිරීලා ය, ඇඟිල්ලක් ගහන්න ටතැනක් එහි නැතැ' යි ඕ තොමෝ කිවු ය. 'දානයෙහි විපාක අද ම හොඳට ලැබුනා ය' යි සිතමින් රජු කරා ගොස් වැඳ සිටි දුගියාගෙන් 'මෙහි ආයෙහි කුමක් නිසා දැ' යි රජ තෙමේ ඇසී ය. 'දෙවයන් වහන්ස! මාගේ ගෙය සත් රුවනින් පිරී ගොස් ය, ඉන්නට හිටින්නට තැනෙක් එහි නැත, ඒ ධනය අද ම මෙහි ගෙන්වා ගත මැනැවැ' යි කී ය. පුදුමයට පැමිණි රජ තෙමේ 'බුදුරජුන්ට පිළිගැන්නූ දානය අද ම මුදුන් පැමිණියේ ය' යි සිතා තට මාගෙන් වුවමනා කුමක් දැ' යි ඇසී ය. 'දෙවයන් වහන්ස! වුවමනා කරන්නේ ඒ ධනය මෙහි ගෙණ ඊමට ලොකු ගොන් බැඳි කරත්ත දහසකැ' යි කී විට රජ තෙමේ බර කරත්ත දහසක් යවා ධනය ගෙන්වා රජගෙය මිදුලෙහි ගොඩ ගැස්සී ය. සත්රුවන් ගොඩ මහත් තල් ගසක් පමණ උස් ව සිටියේ ය. නුවර වැස්සන් ගෙන්වා 'මෙ නුවර අන් කාටවත් මෙතරම් විශාල ධනයෙක් ඇත් දැ, යි විචාළ විට ඔවුහු

නැතැ' යි පිළිතුරු දුන්හ. 'එසේ නම් මේ ඔනඹිමියාට කළ යුත්තේ කුමක් දැ' යි ඇසූ කල්හි 'දෙවයන් වහන්ස! සිටු තනතුරක් දීම වටී ය' යි කීහ. රජ තෙමේ ඔහුට සිටුතනතුරක් දෙවා පෙර සිටුවරයකු විසූ ගෙයක් තුබුනු තැන් පෙන්වා 'මෙහි ඇති ගස් කොළන් වල් පැලෑටි උදුරා දමා ගෙයක් ගොඩ නගා ගෙණ වාසය කරන්නැ' යි නියම කෙළේ ය.

ඔහු එහි ගොස් එ තැන පිරිසිදු කොට ගෙපල ඇද අඩිතාලම් සාරවන විට එකට එක හැපී තුබූ නිදන් සැලි සතෙක් මතුවී සිටියේ ය. එ බව රජුට දුන් වූ කල්හි ඔබ පිණින් ලැබෙන වසතුව ඔබට ම අයත් ය, එබැවින් ඒ ධනය ත් ඔබ ම ගන්නැ යි රජ තෙමේ කී ය. ඔහු යුහු ව ගෙය ගොඩ නගා බුදුපාමොක් මහ සඟනට සත් දිනක් මහදන් දුන්නේ ය. ඉන් පසු පසු ත් දිවි ඇති තාක් ම නන් වැදෑරුම් පින්කම් කොට ආයු කෙළවර මැරී ගොස් දෙව්ලොව උපන. එක් බුඩානන්තරයක් ම දෙව්සැප විඳිනුයේ අප බුදුරජුන් දවස දෙව්ලොවින් චුත ව සැවැත් නුවර සැරියුත් මහ තෙරුන්ට හිතවත් වූ සිටු ගෙයක පිළිසිඳ ගත්තේ ය. මවුපියෝ දුවකුස දරාගැබක් පිහිටි බව දැන එයට සරිලන සියලු රූකවල යෙදූහ. ගැබ මුහුකුරායන් ම ඇයට දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් ප්‍රධාන කොට පන් සියයක් දෙනාවහන්සේට රේමසින් සුප් සාදා දන් දෙන්නට ත් කසට වත් හැඳ හිඳුන් වැඩ හිඳින අසුන් කෙළවර හිඳ උන්වහන්සේලාගේ ඉදුල් බත් කන්නට ත් දෙළඳුකෙක් උපන. ඕ තොමෝ ඒ දන්වා එසේ කළා ය. දෙළ දුක සංසිඳුනේ ය. මවුපියෝ එයින් පසු ද ඇ පිළිබඳ සත් මගුලෙක රේමස් සුප් සැරියුත් මහතෙරුන් මුල් කොට භික්ෂූන් පන් සියය පන් සියය වැළඳවූහ. මේ වනාහි සිහමනින් දිවි යවන කාලයෙහි මොහු දුන් රේමස් සුප් දැනයෙහි විපාකය යි. නම් ගන්නා දවසෙහි ඔවුහු 'ස්වාමිනි! ඔබ වහන්සේගේ මෙහෙකරුට සිකපද ගන්වන්නැ' යි දන්වා සිටියහ.

ඉක්බිති මහතෙරනුවෝ 'මේ ලදරුවාගේ නම කිමැ' යි ඇසූහ. 'ස්වාමිනි! මේ ලදරුවා පිළිසිඳ ගත් දා සිට මේ ගෙයි වැසි මෝඩයෝ ද කෙලතොල්ලෝ ද පණ්ඩිතයෝ වූහ, එහෙයින් අප පුතුට **පණ්ඩිත** යන නම සුදුසු ය' යි කී කල්හි උන්වහන්සේ ඒ පිළිගෙණ සිකපද ගැන්වූහ. මොහු උපන්දා ම මැනියන්ට 'මම මා පුතුගේ අදහස් කිසි කලෙකත් නොබිඳිමි' යි සිතෙක් උපන. සත් හැවිරිදි වූ ලදරු තෙමේ 'අම්මා! මා සැරියුත් මහ තෙරුන් වහන්සේගේ අතවැස්සකු කොට පැවිදි කරවන්නැ' යි කී ය. 'හොඳයි' පුතා! මම නුඹගේ අදහස ඉටු කරන්නෙමි' යි

කියා මවු තොමෝ මහතෙරුන් වහන්සේ ගෙට වැඩමවා ගෙණ වළඳවා 'ස්වාමීනි! ඔබවහන්සේගේ මෙහෙකරු වූ මේ කොලු පැංචා මහණවීමෙහි ආශා ඇත්තේ ය, මම සවස ලදරුවා ගෙණ එන්නෙමි' යි මහතෙරුන් පිටත් කොට නැයන් ගෙන්වා 'මා පුතු ගිහියකු කොට සලකා කරණ සත්කාර අද කරන්නැ' යි කිවු ය. නැයන් එසේ සත්කාර කළ පසු ඕ තොමෝ ලදරුවා වෙහෙරට කැඳවා ගෙණ ගොස් පැවිදි කරන්නට සැරියුත් මහතෙරුන්ට බාර කළා ය. උන්වහන්සේ පැවිද්දෙහි බරපතල කම ත් එය නියි ලෙස රැකීමෙහි අපහසුව ත් වදාළ කල්හි 'මම මහණකම හොඳින් රකිමි, හාමුදුරුවන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා ගැණීම මාගේ ජීවිතයට වන එක ම ආශීර්වාදය යි, මම හැමවිට ම අව වාදයට අනුව කරමි' යි ඒ සත් හැවිරිදි ලමයා කියා සිටියේ ය. 'එසේ නම් මෙහි එන්නැ' යි කියා තවපසඳුවකකමීසථානය කියවා උන්වහන්සේ ඔහු පැවිදි කළහ. මවුපියෝ බුදුපාමොක් මහ සඟනට සත් දවසක් රේමස් සුප් ඇතිව ම දන් දී සත්වනදා සවස ගෙවල බලා යියහ.

සැරියුත් මහතෙරහුයෝ අටවනදා ඒ කුඩා හෙරණුන් හා ඇතුළඟමට වැඩි සේක. අන් මහණ කෙනෙකුන් හා නො යියහ. කුඩා හෙරණුන්ගේ සිවුරු ගැටවටු කිරීම, පාත්‍රය දුරී ම, ඉරියවු පැවැත්වීම ආදී වූ මේ ක්‍රියාවෝ තව ම දුටුවන් නො පිණ වන්නෝ ය. තව ද විහාරයෙහි තෙරුන් පිළිබඳ කළයුතු වතෙක් ඇත්තේ ය. භික්ෂුසඞඝයා ගමට පිවිසි කල්හි සථවිරයන් වහන්සේ මුළු වෙහෙර ඇවිද නො හැමදි තැන් හැම ද, හිස් බඳුන්, පැන් ඇද පුරවා, තැන තැන තබා ඇති ඇඳ පුටු ආදිය තැන්පත් කොට සියල්ලන්ට පසුව ගමට වඩින සේක. තීර්ථකයෝ හිස් වෙහෙරට වැද ශ්‍රමණ ගෞතමයාගේ ශ්‍රාවකයන් හිඳින තැනක සැටි බලවු' යි කියන්නට ඉඩ නො ලැබෙන සේ සියලු විහාරය පිළියෙල කොට තබා ගමට වඩින සේක. මෙය උන්වහන්සේගේ පියවි සිරිත බැවින් එදා ද හෙරණුන් ලවා පා සිවුරු ගන්වා ගෙණ දවල් කොට ගමට වැඩි සේක. හෙරණ ද උපාඛ්‍යායයන් සමග යන්නේ අතර මග එක් ඇලක් දැක 'මේ කිමැ' යි ඇසි ය. 'ඇලකැ' යි පිළිතුරු දුන්හ. 'ඇලෙන් ඇති ප්‍රයොජනය කුමක් දැ' යි නැවැත ඇසුවිට 'තැන තැන රැස්ව සිටි දිය ගෙණවුත් දෙපස පිහිටි කුඹුරුවලට යවා ගොයම් කරති' යි වදාළ සේක. 'දියට සිත් පිත් ඇති දැ' යි ඇසූ කල්හි 'නැතැ' යි වදාළ සේක. 'එසේ නම් ස්වාමීනි! සිත් පිත් නැති දිය තමන් කැමැති තැනට ගෙණ යන්නෝ ද?, 'එසේය! ඇවැතැ' යි එයට පිළිතුරු දුන්හ. ඉක්බිති හෙරණ තෙමේ 'මේ හැටියෙන් සිත් පිත් නැති මේ දිය ත් තමන් කැමැති තැනට

පමුණුවා වුවමනා කටයුතු කරත් නම් සිත් පිත් ඇති සත්‍වයෝ සිත තම වශයෙහි පවත්වා කුමක් හෙයින් මහණදම් කිරීමෙහි අපොහොසත් වන්නෝ දෑ' යි සිතන්නට විය. තව ටිකක් ඉදිරියෙහි ගිය ඔහු හී වඩුවකු ඊ දණ්ඩක් ගින්නෙහි ලා තව තවා ඇස් කොණින් බල බලා ඇද හරිනු දැක 'මොවුහු කවුරු දෑ' යි ඇසී ය. 'ඊ වඩුවෝ ය' යි වදාළ කල්හි හෙරණ 'මොවුන් මේ කරන්නේ කුමක් දෑ' යි ඇසී ය. 'ඊ දණ්ඩ ගින්නෙහි ලා ඇද හරින් ය' යි වදාළ සේක. එවිට 'ඊ දණ්ඩවලට සිත් පිත් තිබේ දෑ' යි ඔහු ඇසී ය. 'නැතැ' යි වදාළ විට 'මෙලෙසින් සිත් පිත් නැති ඊ දණ්ඩ ත් ගින්නෙහි ලා තවා ඇද හරින් නම්, සිත් පිත් ඇති සත්‍වයෝ තම සිත තමාට නතු කොට ගෙණ මහණදම් කරන්නට කුමක් හෙයින් අසමර්ථ දෑ' යි සිතමින් තව ටිකක් ඉදිරියට යන් ම දැව් නිම්වළලු බොස් ගෙඩි සඳහා දැව සසින්නන් දැක 'මොවුන් මේ කරන්නේ කුමක් දෑ' යි විචාළේ ය. 'මොවුහු දැව දඬු සසින්නෝ ය, වනයෙන් දැව දඬු ගෙණවුත් තිරික්කල, කරත්ත, බරබාඟ, බරකරත්ත ආදියට රෝද, දුති, බොස්ගෙඩි, පවිටම් සාදති' යි වදාළ කල්හි 'ඒවාට පණ තිබේ දෑ' යි ඇසී ය. 'නැතැ' යි වදාළ විට 'මොවුහු මෙලෙසින් සිත් පිත් නැති දැව දඬු සැප කරත්ත රෝද ආදිය සාදන් නම් සිත් පිත් ඇති සත්‍වයන්ට තම සිත් නතු කොට ගෙණ මහණදම් කරන්නට බැරි කුමක් නිසා දෑ' යි සිතා 'හාමුදුරුවන් වහන්ස! පා සිවුරු ඇර ගන්නා සේක් නම් මට නවතිනු හැකි ය' යි කී ය.

'ඊයේ පෙරේදා මහණ වූ මේ ලදරු හෙරණ අනුබුඬ ව සිටින මට, මාගේ තරම් නොදුන මෙසේ කියා' යි නොසිතා ම 'ගෙණෙව' යි ගෙන්වා ගෙණ උන්වහන්සේ තම පා සිවුරු තම අතට ගත්හ. හෙරණ තෙමේ තෙරුන් වැඳ නැවතී 'හාමුදුරුවන් වහන්ස! මට කෑම ගෙණෙනවිට රේමසුත් සමඟ බත් ගෙණ එන්නට ඕනෑ ය' යි කී ය. එවිට තෙරනුවෝ 'උන්නැහේ! තමුසේ කියන රේමස් මම කොතැනකින් ලබම් දෑ' යි ඇසූහ. 'හාමුදුරුවන් වහන්ස! හාමුදුරුවන් වහන්සේගේ පිණට නොලැබුන ද, මාගේ පිණට ලැබෙන්නේ ය' යි කී කල්හි සථවිරයන් වහන්සේ 'මා පිටතට ගිය විට කුඩා නම ඉතා ලදරු බැවින් උවදුරු විය හැකි ය' යි සිතා තමත් වහන්සේ වසන කාමරයෙහි යතුරු දී 'ඔබ! තමුසේ මා එනතුරු මා වසන කාමරය තුළට වී පිටත නොගොස් ඉන්නැ' යි නියම කොට වැඩියාහ. හෙරණ තෙමේ ගුරුවරයා කී ලෙසට කාමරයතුළට වී සිය ඝිරුරෙහි නුවණ බහා නිලකුණු සිහි කරන්නට විය. එකල හෙරණුන්ගේ ගුණ තෙදින් තැති ගත් සක්දෙවිරජ තෙමේ 'කරුණු කිමැ' යි සොයා බලනුයේ, පණ්ඩිත සාමණේරයන් මහණදම් කරන්නට සූදානම් බව දැක සිවුවරම්

රජුන් ගෙන්වා 'පණ්ඩිත සාමණෙරයන් වසන විහාරය අවට සිටි ගස්කොළන්වල ඉන්නා කොවුල් ගිරවු මයින සැළලිහිණි කොබෙයි පරෙවි කහකුරුලු නීල කොබෙයි ආදී පක්ෂීන් පන්නා හැර අවට පෙදෙස් නිහඬ කොට අරක් ගණිවු' යි අණ කෙළේ ය. සඳ හිරු දෙව්පුතුන්හට 'විමානයන්ගේ ගමන් නවතාලවු' යි අණ කොට තෙමේ ගොස් එලිපත අගුල් කණුව ලඟ අරක් ගෙණ සිටියේ ය. විහාරයෙහි පරඬලාවක් වැටෙන හඬකුදු නො වී ය. හෙරණහුගේ සිත එකඟ විය. අත්බව ගැණ සිහි කරණුයේ පෙරවරුයෙහි ම තුන්පලයට පැමිණියේ ය.

සැරියුත් මහතෙරුන් වහන්සේ 'කුඩා නම විහාරයේ ය, ඒ නමට සෑහෙන අහරක් අසවල් ගෙයින් ලබා ගත හැකි ය' යි එක් දායක ගෙයකට වැඩි සේක. ඒ ගෙය උන්වහන්සේ කෙරෙහි අතිශය භක්තිමත් ය. ගෙයි වැස්සෝ එ දවස රේමස් පිළියෙල කොට තෙරුන් වඩිනු බලා හුන්හ. තෙරුන් වඩිනු දැක ඔවුහු ඉදිරියට ගොස් 'හාමුදුරුවන් වහන්සේ මෙහි ඊමෙන් කොට වදාළෝ ඉතා යහපතකැ' යි ගෙට වැඩමවා කැඳ හා කැවිලි පෙවිලි පිළිගන්වා රේමස් හා පිණ්ඩපාතය ද පිළිගැන්නූහ. එය පිළිගෙණ උන්වහන්සේ බැහැරට වඩින්නට සූදානම් වූහ. 'ස්වාමීනි! නො වැඩිය මැනැව, මෙහි ම හිඳ වළඳනු මැනැව, ගෙණ යන්නට පිණ්ඩපාතය අපි දෙන්නෙමු' යි කී විට උන්වහන්සේ එහි ම හිඳ වැළඳූහ. අවසානයෙහි පාත්‍රය සෝදා පිසදමා එහි රේමස් සහිත බත් පුරවා පිළිගැන්නූහ. එය පිළිගත් ස්ථවිරයන් වහන්සේ 'කුඩා නම බඩ ගින්නේ ය' යි වහ වහා වෙහෙරට වැඩි සේක. එදා කලින් වළඳා හුන් ස්වාමිදරු වූ බුදුරජානන් වහන්සේ වෙහෙරට වැඩ පණ්ඩිත සාමණෙරයන් ගුරුවරයාට පාත්‍රය දී මහණදම් කරන්නට වෙහෙර නැවතී ගත් බැවින් මහණදම් සඵල වන්නේ දැ' යි බැලූහ. එ කෙණෙහි සෝවන් ඇ තුන් පලයට පැමිණි බව දැක 'රහත්වන්නට ත් පින් ඇත්තේ දැ' යි බැලූහ ඇතැ' යි දැක 'කොයි වේලෙහි රහත් වේ දැ' යි බැලූහ. පෙරවරුයෙහි ම රහත් වන බව දුටහ. නැවැත උන්වහන්සේ සැරියුත් තෙරුන් ගෙණෙන බත සාමණෙරයන්ගේ රහත්බව වළකාලන්නක් බව දැක, මම දොරකොටුවෙහි සිට සැරියුත් තැනගෙන් ප්‍රශන සතරක් අසන්නෙමි, ඒ තැන එයට පිළිතුරු දෙත් ම කුඩා නම සිවුපිළි සැඹියාවන් ඇති ව රහත් වන්නේ ය' යි ද දැක දොරකොටුවෙහි නැවතී ගත් සේක. එකල සැරියුත් මහතෙරනුවෝ එහි ආහ. බුදු රජානන් වහන්සේ ප්‍රශන සතරක් අසා වදාළහ. උන්වහන්සේ ඒ හැම ප්‍රශනයන් ම විසඳූහ. මේ මතු කියන්නේ ඒ ප්‍රශන විසඳීම ය.

බුදුරජානන් වහන්සේ = තමුසේට ලැබුනේ මොනවා ද?
ස්ථවිරයන් වහන්සේ = අහරෙක් ලැබුනේ ය.
බුදුරජ = අහර කුමක් එළවා ද?
ස්ථවිර = අහර වෙදනාව එළවයි.
බුදුරජ = වෙදනාව කුමක් එළවා ද?
ස්ථවිර = වෙදනාව රූපය එළවා.
බුදුරජ = රූපය කුමක් එළවා ද?
ස්ථවිර = රූපය ස්පර්ශය එළවා.

මේ මතු පහළ වන්නේ මෙහි අදහස ය බඩගිනි ඇත්තහු විසින් අනුභව කළ ආහාරය බඩගින්න දුරු කොට සැප වේදනාවක් ගෙණ දෙයි. ආහාර වැළඳීමෙන් උපදනා සැපවෙදනාවෙන් සුඛිත වූවහු ගේ සිරුරෙහි පැහැසපුව වැඩෙයි. වෙදනාව රූපය එළ වන්නේ මෙසේ ය. සුඛිත වූයේ අහරින් උපන් රූපයන්ගේ වශ යෙන් සැප සොම්නස් ඇත්තේ 'දැන් මට රසවිඳුමෙක් උපනැ' යි නිදන්නේ හෝ හිඳින්නේ සුවපහස් ලබයි.

හෙරණ තෙමේ මේ පැණවිසඳුම් අසා රහත් වූයේ ය. ඒ සමග සිවුපිළිසැඹියා ද ලැබින. ඉක්බිති බුදුරජානන් වහන්සේ 'සාම ණෙරයාහට වළඳන්නට මොකවත් දෙන්නැ'යි සැරියුත් තෙරුන්ට වදාළ සේක තෙරනුවෝ දොරට තට්ටු කළහ. හෙරණ තෙමේ දොර හැර දොරට බැස තෙරුන් අතින් පාත්‍රය ගෙණ පසෙක තබා තල් අත්තක් ගෙණ පවන් සැලූයේ ය. 'තමුසේ ගොස් දන් වළ ඳන්නැ'යි කී විට 'මම දන් වැළඳීම්' යි ඔහු කී ය. නැවැතත් 'දන් වළඳන්නැ' යි තෙරුන් කියූ හෙරණ තෙමේ ප්‍රත්‍යවෙක්ෂාස්ථානය ප්‍රත්‍යවෙක්ෂා කරමින් දන් වැළඳුයේ ය. වළඳ අවසන්හි පා සෝදා තැන්පත් කෙළේ ය. එ කෙණෙහි චන්ද්‍රදිව්‍යපුත්‍ර තෙමේ රඳවා තුබූ සඳමඬල හැරියේය. සූර්‍යදිව්‍යපුත්‍ර තෙමේ හිරුමඬල හැරියේ ය. සිවු මහවරම් රජහු අරක් ගෙණ සිටි තැන් හැර ගියහ. අගුලු කණුවෙහි රැක සිටි සක්දෙව්රජ තෙමේ ඒ හැර ගියේ ය. ඉර මුදුනෙන් ගිලිහින. භික්ෂූහු 'සෙවණැල්ල වැසී තිබේ, ඉර මුදුනෙන් ඉවත් ව සිටියි, හෙරණුන් වළඳ අවසන් කළේ ද දැන් ය, මේ සුදුසු දැ' යි පරිභව මුඛයෙන් කතා කරන්නට වූහ. බුදුරජානන් වහන්සේ ඒ දැන වදාරා භික්ෂූන් හුන් තැනට වැඩ 'තමුසේලා කුමක් කියන්නහු දැ' යි අසා වදාළ සේක. පණ්ඩිත සාමණෙර යන්ගේ දන් වැළඳීම ගැණ කතා කරමින් හුන්නෙමු' යි ඔවුහු කීහ. 'ඔව්, මහණෙනි! එහෙම තමා, පින් ඇත්තහු මහණදම් කරණ විට සඳ හිරු දෙව් පුත්හු තම විමානයන් රඳවා තැබූහ, සිවු මහවරම් රජහු විහාරොපවනයෙහි අරක් ගෙණ සිටියෝ ය, අගුලු කණුවෙහි අරක් ගෙණ සිටියේ සක් දෙව්රජ තෙමේ ය, මට ත්

බුදුම්, යි කියා උත්සාහ හැර ඉන්නට ඉඩ නො ලැබින, මම ත් එහි ගොස් දෙර කොටුවෙහි මපුත්හට රැකවල් ගතිමි, ඇලවල ඇති දිය ගෙණ යන දියාලුවන් ද ඊ ඇද හරින හී වඩුවන් ද දැවදඬු සසින්නන් ද දැක මෙතෙක් අරමුණු ගෙණ පණ්ඩිතයෝ ආත්මදමනය කොට රහත්බවට පැමිණෙන්නාහු ම ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

උදකං නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතාති.

දියාලුවෝ දිය ගෙණ යත්. හීවඩුවෝ ඊදඬු නවත්. සස්නා වඩුවෝ දැව නවත්. පණ්ඩිතයෝ තමන් දමනය කෙරෙත්.

උදකං නයන්ති නෙත්තිකා = දියාලුවෝ (තමන් කැමැති තැනට) දිය ගෙණ යත්.

ජලය තෙමේ ඝනීභූතවස්තූන් වැගිරෙන බවට පත් කරණ බැවින් **උදක,** යි කියනු ලැබේ. පොළොවෙහි උස්තැන් කපා සාරා වළතැන් මිටිතැන් පුරවා ඇල බිඳ වේලි නගා හෝ දිය ඇද ගන්නා පීළි තබා හෝ තමන් කැමති තැනට දිය ගෙණ යන්නෝ ය දියාලුවෝ. **'පඨවියා ඵලට්ඨානං ඛණ්ඩා ආවාටට්ඨානං පූරෙත්වා මාතිකං වා කත්වා රුක්ඛදොණිං වා ඨපෙත්වා අත්තනො ඉච්ඡිතිච්ඡිතඨානං උදකං නෙත්තීති = නෙත්තිකා,** යනු අටුවාය.

උසුකාරා නමයන්ති තෙජනං = හීවඩුවෝ ඊදඬු නවත්.

අහසින් යනුයේ **උසු,** නම්. **'ඉසති ආකාසතො ගච්ඡතී ති= උසු' ඉස - ගමනෙ** යන ධාතුයි. **'උසති දාහං කරොති = උසු'** දාහ කරණුයේ ද උසු නම්. **උස - දාහෙ** යනු ධාතුයි. **'උසුං කරොතීති = උසුකාරො'** ඊ සාදනුයේ උසුකාර ය. **තෙජනං,** යනු ඊදණ්ඩ යි. **'තෙජනන්ති කඨං'** යනු අටුවා ය. වඩුවන් විසින් තවා ඇද මැඩ තියුණු කරණු ලබන හෙයින් කාෂ්ඨය තෙජන නමින් කිය වේ. හීවඩුවෝ දැව දඬු ගෙණ ගින්නෙහි ලා තවා ඇද මැඩ, විද්ද කල්හි දුර යන සේ සියුම් කෙරෙති. ඇද කුද හරිති. එහෙයින් තවා ඇද මැඩ තමන් කැමැති සේ නමන්නාහුය යි කිහ.

දාරුං නමයන්ති තච්ඡකා - සසින්නෝ දැවදඬු නවත්.

පළනු ලබන ලී කොටන් **දාරු,** යි කියත්. යමක් සඳහා වෙන් නො කළ සාමාන්‍ය දැවදඬු ය. **'තච්ඡති තනු කරොතීති = තච්ඡකො,** දැවදඬු සසින්නේ තුනී කරන්නේ **තච්ඡක,** නම් වේ. සසින වඩුවෝ නිම්වළලු ආදිය සඳහා දැව දඬු සසින්නෝ තමන් කැමති සේ දැව දඬු සැස ඇද හරිති. වක් හෝ කෙරෙති.

අත්තානං දමයන්ති පණ්ඩිතා - නුවණැත්තෝ සිත දමනය කෙරෙත්.

මෙහි **අත්තානං**, යන පදයෙන් ප්‍රධාන විසින් සිත ගැණේ. නුවණැත්තෝ තම සිත, තමන් කැමැති තැනට, දිය ගෙණ යන දියාලුවන් සේ විදසුන් නැමැති ඇල, අරමුණු නැමැති කෙතට නමා ගෙණ භාවනා නැමැති ගොයම් කොට, ඊදඬුවල ඇද හරින නිවඩුවන් සේ තම සිතෙහි වූ මායා සාඨෙය්‍යාදි වඬහාවයන් හැර, නිම්වළලු ආදියට දූව දඬු සසින වඩුවන් සේ තදඬහාදි වශයෙන් කෙලෙසුන්ගේ හැම අවස්ථාවක් සැස දමා සෝවන් ආ මගපල උපදවමින් සිත දමනය කෙරෙති.

ආතමදමනය කරන්නෝ පලමු කොට ශීලයෙහි පිහිටා ගණිති. ඒ ය විය යුතු සැටි. නැවැත ශ්‍රඬාවෙන් අශ්‍රඬාව, ත්‍යාගයෙන් මාත්සය්‍යය යන ඇලෙසින් සිතෙහි උපදින අයහපත් සිතිවිලි දුරු කොට අධිචිත්ත අධිප්‍රඥ ශික්ෂාවන්හි හික්මෙන්නෝ ය. මෙසේ හික්මෙන්නෝ මානුසිකසුඛයෙන් දිව්‍යසුඛයට ත් එයින් ධ්‍යාන සුඛයට ත් එයින් මාගීසුඛයට ත් එයින් ඵලසුඛයට ත් ඵලසුඛ යෙන් නිර්‍වාණසුඛයට ත් පැමිණ සසර දුක් තරණය කෙරෙති. සසර දුකින් එතර ව සිටියෝම ය ආතමදමනය කළෝ.

නො දැමූනු සිත රූප, ශබද, ගඬ, රස, ස්ප්‍රෂටව්‍ය යන විෂය වස්තූන් කරා දුවයි. වැට කටු නැති කුඹුරට ගොනකු වදින කල එයට යා නො දී වැලකීම කුඹුරෙහි වැට කටු නැති බැවින් ඉතා අපහසු ය. එමෙන් කොණක් නො දුක්විය හැකි ඉතා දිගු කලක් පස්කම් සැපයෙහි ඇලී එන එහි ම නතු ව පවත්නා එයට පුරුදු වූ මේ සිත, එයින් වලකාලීම පහසු නො වේ. පණ්ඩිතභාවය වුවමනා වනුයේ ඒ නිසා ය. අඥයකුට ඒ කල නො හැකි ය නුවණැත්තේ තදනුකූල වූ පිළිවෙත සොයා සිත එහි යොදයි. ඒ පිණිස කමටහන් නමින් පිළිවෙත් සතළිසක් ආගම ධර්මයෙහි දක්වා ඇත. ඒ සතළිස් කමටහනෙන් තමාගේ චරිතයට ගැලපෙන්නක් ගෙණ එහි සිත බැඳ තබා පිළිවෙල කළ යුතු ය. මෙසේ කරණ කල්හි සිත කෙමෙන් දැමෙන්නේ ය. සිත දැමීමේ තරමට සිත දමන්නාහට සැප ලැබේ. හොඳට ම දැමූනු කල නිවන් සැප සිදු වේ. එහෙයින් හැම කෙනකුගේ හැම ක්‍රියාවක් ම චිත්තදමනය පිණිස විය යුතුය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය.

පණ්ඩිතසාමණේරවත්ථුව නිමියේ ය.

ලකුණටකභද්දියසථවිරයන් වහන්සේ

6 — 6

මේ **සසුනෙහි** විසූ තෙරුන් අතුරෙහි ඉතා මිටිවූවෝ **ලකුණටක භද්දිය** සථවිරයන් වහන්සේ ය. පෙර සසර ඇවිදින කාලයෙහි, අන්‍යයකු මහත් කොට කරන්නට පිළියෙල කළ පින් කමක් කුඩා කොට කරවීම උන්වහන්සේගේ මිටිකමට කරුණු විය. ශීලසමාධ්‍යාදිගුණ නො දත් පුහුදුන් කුඩා උන්නාන්සේලා තෙරුන් දුටු කල්හි, අතින් බෙල්ලෙන් කණින් නැහැයෙන් අල්ලා 'කොහොම ද, පුංචි බාප්පේ! කොයිබ ද යන්නේ, ඔහි කියමින් කෙළිකවටකම් කෙරෙති. එහෙත් උන්වහන්සේ ඒ කිසිවකු කෙරෙහි නො කිපෙති. අමනාපයක් නො ද උපදවති. දිනෙක දම්සබාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා 'බලන්න, කිසිවක් නො දත් මේ කුඩා හෙරණුහු අතින් පයින් ඔලුවෙන් බෙල්ලෙන් කණින් නැහැයෙන් අල්ලා කොහොම ද, පුංචි බාප්පේ'ඔ කියමින් ලකුණටක භද්දිය තෙරුන්ට වෙහෙස කරත්, කෙළිකවටකම් කරත්, එහෙත් ඒ තෙරුන් වහන්සේ ඒ කිසිවකු කෙරෙහි නො කිපෙති, අමනාප නො වෙති' සි කතා කරමින් හුන්හ. මේ වේලාවෙහි බුදු රජානන් වහන්සේ එහි වැඩ 'තමුසේලා කියන්නහු කුමක් ද' යි ඇසූහ. භික්ෂූන් වහන්සේලා ඒ සියලු තොරතුරු දන්වූහ. එවිට උන් වහන්සේ 'ඔව්! මහණෙනි! මාගේ පුතා ලකුණටකභද්දිය, රහත් තැනකි, රහත්හු, කිසිවකු කෙරෙහි නො කිපෙති, දෙස් පහළ නො කරති, රහත්හු, ඝන වූ ගල් පව්වක් වැනි වෙති, කිසිවිට ත් නො සැලෙති' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

සෙලො යථා එකඝනො වාතෙන න සමීරති,
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා.

යම්සේ එකට කැටි වූ ගල, සුළඟින් නො සැලේ ද, එසේ නුවණැත්තෝ නිඳා ප්‍රශංසාවන්හි නො සැලෙති.

සෙලො යථා එකඝනො = යම්සේ එකට කැටි වූ ගල්කන්ද.

යම් ගලෙක් සිදුරක් පටලයක් නැති සේ එකට හැසි ගැසි කැටි වී තිබේ ද ඒගල **එකඝන,** යි කියනු ලැබේ. **එකඝනො,** යන්න **සෙලො,** යන්න වෙසෙසන්නේය. **යථා,** යනු නිපාත ය. සමානභාවයෙහි වැටේ.

වාතෙන න සමීරති = සුළඟින් නො සැලේ.

එකට ඝන ව කැටිව සිටි ශෛලපර්වතය, ඉමහත් වෙගයෙන් ගමන්නා වූ සුළඟකිනුදු නො සැලෙන්නේ ය. ඒ එසේ ම ය. සුළඟ එකවිට සිවු දිගින් නැගී ආයේ ද, කොතරම් සැඩ වූයේ ද එකට හැසුනු ගැසුනු ගල් කන්දෙක් නම් එයින් නො සැලෙන්නේ ම ය. **එවං නින්දාපසංසාසු** = එපරිදිදෙන් නිදි පැසසුම්හි.

එවං, යනු නිපාත ය. නින්දා නම් ගැරහීමය. අවමන් කිරීමය. ඛෙප, කුච්ඡා, ජිගුච්ඡා, ගරහා යනු නින්දාවට නම් ය. පසංසා නම්, නබුම් කිරීම ය. සතුතිකිරීම ය. තුති, ථුති, ථොමන යනු පැසසීම කියන තවත් නම් ය. මේ දෙක ලොකධම් අටෙහි ඇතුළත් වේ. ගාථාවෙහි දෙකක් කියූයේ ද ලොකධම් අට ම ගතයුතු ය යි අටුවාව කිය යි. **'ඉධ වෙ ලොකධම්මා නාම වුත්තා, අඤ්ඤා පන අඤ්ඤානම්පි වසෙන වෙදිතබ්බා'** යනු අටුවා ය. රහතුන් වහන්සේ මේ අට තැන්හි ම නො සැලෙන බැවින් එසේ කීහ. **ලාභ, අලාභ, අයස, යස, නින්දා, ප්‍රශංසා, සුඛ, දුඃඛ** යන මේ අටය ඒ. 'ලොක ධම්මා, යන්නෙහි තේරුම ලොකසවභාවය යනු යි. මේ ධර්මයන්ට යටත් නො වූ කෙනෙක් ලොව නැත. බුදුවරයෝ ද මෙයට යටත් ය. සත්ත්වලොකයෙහි අවස්සංභාවීධර්මයෝ ය මොවුහු. මේ අනුව ලොකය පෙරළේ. ලොකය යම්තාක් ද ඒ තාක් මේ ධර්මයන්ගේ පැවැත්ම වේ. ලොකය තිබෙනතුරු තිබේ.

ලාභ නම්, පැවිද්දන්ගේ සිවිපසය ලැබීම හා ගිහියන්ගේ ධනධාන්‍ය ලැබීම ය. ඔවුන්ගේ නො ලැබීම අලාභය යි. යස නම්, පිරිවර ය. ඒ නො ලැබීම අයස ය. නින්දා නම්, නුගුණ කීම ය. පසංසා නම්, ගුණකීම ය. සුඛ නම්, කාමාවචරයන් පිළිබඳ කය සිත දෙක්හි පිණවීම ය. දුඃඛ නම්, පුථුජ්ජන සොතාපන්න සකදාගාමීන් පිළිබඳ කය සිත දෙක්හි පෙළීම ය. අනාගාමීන් හා ක්ෂීණාශ්‍රවයන් පිළිබඳ වන්නේ කය පෙළීම ය. එහි **'ලාභොති පබ්බජිතස්ස චීවරාදිලාභො, ගහට්ඨස්ස ධනධඤ්ඤාදිලාභො, සොයෙව අලබ්භමානො ලාභො අලාභො, යසොති පරිවාරො, සොයෙ ව අලබ්භමානො යසො අයසො, නින්දාති අවණ්ණභණනං, පසංසාති වණ්ණභණනං, සුඛන්ති කාමාවචරානං කායිකචෙතසිකං, දුක්ඛන්ති පුථුජ්ජන සොතාපන්නසකදාගාමිනං කායිකචෙතසිකං, අනාගාමිඅරහන්තානං කායිකං'** යනු දතයුතුය. යම්කෙනෙක ලාභය වේ නම් එකැන අලාභය ද ඇත. **'ලාභෙ ආගතෙ අලාභො අනාගතොයෙව'** යන මෙයින් ඒ පැහැදිලිය. සෙස්සද මෙසේ ය.

කැම ඇදීම ලැබීම ලාභය යි. සිවුපසය හෝ ලැබිය යුතු බැවින් ලාභ නම් වේ. කැම ඇදීම ලැබීම ලාභය යි ගැණීමෙන් ඔවුන්විෂය කොට ඇති අනුරොධය ද ගැණේ. අනුරොධ යයි කීයේ

ලාභාදියෙහි ඇලීම බැඳීම ගිජුවීම උඩඟුවීම යන මේ ය. අලාභ යන්නෙන් විරොධය ගැණේ. විරොධය යි කියේ කෑම ඇඳීම නො ලැබීමෙන් වන අප්‍රීතිය යි.

න සමිඤ්ජනති පණ්ඩිතා = නුවණැත්තෝ නො සැලෙති.

අෂ්ටලොක ධර්මයෙහි නො සැලෙන පණ්ඩිතයෝ නම් රහතුන් වහන්සේලා ම ය. **'ඛිණාසවස්සෙව චිත්තං න කම්පතීති වුත්තං'** යනු ආගමය. මේ කියන ලද්දේ උත්කෘෂ්ට වශයෙනි. එයින් අන්‍ය වූ ආර්‍යශ්‍රාවකයාගේ ද සිත නො සැලේ ය යි කිය හැකිය.

ආගම-අධිගම නැති පෘථග්ජනයාහට ලාභ අලාභ යසස් නින්දා ප්‍රශංසා සුඛ දුඃඛ යන මොවුහු උපදනාහ. එහෙත්, ඔහු ඒ ලාභාදිය අනිත්‍ය ය, දුක් ඇත, පෙරළෙන සුලු ය, යි නො ගණී යි. නො සලකයි. තත්ත්වඥානයෙන් නො දනී යි. එහෙයින් ඔහුගේ සිත ඒ ලාභාදීහු යටපත් කොට ගණීත්. ඔහු ද ලාභාදි සතරෙහි ඇලෙ යි. බැඳෙ යි. ගැටෙයි. ඒ ම පත යි. අලාභාදි වූ සතරෙහි හැපෙ යි. ගැටෙ යි. එ හෙයින් ඒ සතර නො පත යි. මෙසේ ලාභාදිය පතන අලාභාදිය නො පතන ඔහු ජාති ජරා මරණාදියෙන් සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයන්ගෙන් නො මිදෙ යි. සසර ම ගැට ගැසෙ යි. එහි ම වැටෙයි. මේ ඒ දෙශනාය. **'අස්සුතවතො භික්ඛවෙ! පුථුජ්ජනස්ස උප්පජ්ජති ලාභො, සො න ඉති පටිසංචික්ඛති උප්පන්නො ඛො මෙ අයං ලාභො, සො ච ඛො අනිච්චො දුක්ඛො විපරිණාමධම්මොති යථාභූතං නප්පජානාති, උප්පජ්ජති අලාභො, උප්පජ්ජති යසො, උප්පති අයසො, උප්පජ්ජති නින්දා, උප්පජ්ජති පසංසා, උප්පජ්ජති සුඛං, උප්පජ්ජති දුක්ඛං, සො න ඉති පටිසංචික්ඛති උප්පන්නං ඛො මෙ ඉදං දුක්ඛං, තං ච ඛො අනිච්චං, දුක්ඛං විපරිණාමධම්මන්ති යථාභූතං නප්පජානාති, තස්ස ලාභොපි චිත්තං පරියාදාය තිඨති -පෙ-දුක්ඛම්පි චිත්තං පරියාදාය තිඨති, සො උප්පන්නං සුඛං අනුරුජ්ඣති, දුක්ඛෙ පටිවිරුජ්ඣති, සො එවං අනුරොධවිරොධසමාපන්නො න පරිමුච්චති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොම-නස්සෙහි උපායාසෙහි, න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි'**

මෙහි ශුක්ල පක්ෂය මෙසේ ය:- **'සුතවතො ඛො භික්ඛවෙ! අරියසාවකස්ස උප්පජ්ජති ලාභො-පෙ-උප්පජ්ජති දුක්ඛං, සො ඉති පටිසංචික්ඛති උප්පන්නං ඛො මෙ ඉදං දුක්ඛං තං ච ඛො අනිච්චං දුක්ඛං විපරිණාමධම්මන්ති, යථාභූතං පජානාති, තස්ස ලාභො පි චිත්තං න පරියාදාය තිඨති -පෙ- දුක්ඛම්පි**

චිත්තං න පරියාදාය තිඨති, -පෙ- දුක්ඛම්පි චිත්තං න පරියාදාය තිඨති, සො උප්පන්නතං ලාභං න අනුරුජ්ඣති අලාභෙන පටිවිරුජ්ඣති -පෙ- සුඛං නානුරුජ්ඣති දුක්ඛෙන පටිවිරුජ්ඣති, සො එවං අනුරොධපටිවිරොධවිප්පහීණො පරිමුච්චති ජාතියා -පෙ- උපායාසෙහි පරිමුච්චති දුක්ඛස්මාති වදාමි'

ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ ලාභාලාභාදියෙහි තාදී ව එක හැටි ව ලාභාදිය නො පතා නො හැපී සියලු දුකින් මිදේය යනු කෙටි අදහස ය. මෙ ද දතයුතු ය:-

'ලාභො අලාභො අයසො යසො ච
නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං,
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා
අසස්සතා විපරිණාමධම්මා' යනු.

මිනිසුන් කෙරෙහි වූ ලාභ අලාභ අයස යස නින්දා ප්‍රශංසා සුඛ දුඃඛ යන මේ ස්වභාවධර්මයෝ අනිත්‍යයහ. හැම කල්හි නො පවත්නෝ ය. පෙරළෙන ස්වභාවය ඇත්තාහ.

'එතෙ ච ඤත්වා සතිමා සුමෙධො අවෙක්ඛති විපරිණාමධම්මෙ
ඉට්ඨස්ස ධම්මා න මථෙන්ති චිත්තං අනිට්ඨතො
නො පටිඝාතමෙති'

සිහි ඇති නුවණැති මිනිස් තෙමේ, මේ අෂ්ටලොක ධර්මයන් දැන පෙරළෙන ගති ඇතැ යි බලයි. මොහුගේ සිත ඉෂ්ටධර්මයෝ නො ම කලඹති. අනිෂ්ටධර්මයන් කෙරෙන් සිත පීඩාවට පත් නො වේ. ගාථාවෙහි මේ අරුත් ය.

'තස්සානුරොධා අථවා විරොධා විධූපිතා අත්ථගතා න සන්ති
පදඤ්ච ඤත්වා විරජං අසොකං සම්මප්පජානාති භවස්ස පාරගූ'

ඒ ආර්‍යශ්‍රාවකයාගේ අනුරෝධ විරෝධභාවයෝ නැසුනාහ. විනාශයට ගියහ. භවයාගේ පරතෙර ගිය ආර්‍යශ්‍රාවක තෙමේ ශොක නැති රාගාදිරජස් නැති නිර්වාණ පදය දැන, භවයෙහි එතර ගිය බව මොනවට දනියි, යනු වදාළෝ ද බුරජානන් වහන්සේ ය. දැන් **'න සම්ඤ්ජනති පණ්ඩිතා'** යනු පැහැදිලිය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

ලකුණටක භද්දියස්ථවිරවස්තුව නිමියේ ය.

118-119

කැවුම් නිසා හටගත් නොසතුට

6 — 7

කාණමාතා තොමෝ සිය දුව නො සිස් අතින් සැමිකුලයට යවන්නට සිතා උයා පිළියෙල කළ කැවුම් සිවුවරක් සිය ගෙට වැඩි භික්ෂූන් සිවු නමකට පිළිගැන්නුවා ය. එයින් ඇගේ ගමන වැළකුනේ ය. බුදුරජාණන් වහන්සේ ඒ නිමිති කොට සිකපද පැණවූහ. කාණාව, කලට වේලාවට නො ආ බැවින් ඇය හා සහ වාසයට නියම ව සිටි පුරුෂ තෙමේ අත් අඹුවක් ගෙට පමුණුවා ගත්තේ ය. කාණාව ඒ අසා 'මේ උන්නාන්සේලා මාගේ ගෙයි වාසය කා දැමූහ' යි භික්ෂූන් දුටු දුටු තැන බණින්නට දෙඩන්නට වූ ය. භික්ෂූන්ට කාණාවගේ, ගේ අසල පාරෙන් යන්නට ද ඉඩ නැති විය. එකල බුදුරජාණන් වහන්සේ ඒ දැන එහි වැඩි සේක. කාණමාතා තොමෝ පණවා තුබූ අසුන්හි උන්වහන්සේ වඩා හිඳුවා කෑද හා කැවිලි පිළිගැන්නූ ය. වළඳා අවසන්හි උන්වහන්සේ 'කාණාව කොහි දැ' යි ඇසූහ. එවිට 'ස්වාමිනි! ඇ ඔබවහන්සේ දැක මකු ව හඬමින් ඉන්නී ය' යි කී කල්හි 'කුමක් නිසා හඬා දැ' යි විචාළ සේක. 'ස්වාමීනි! ඇ දකින දකින ස්වාමින් වහන්සේලාට බණී යි, නින්දා කර යි, එහෙයින් ඔබවහන්සේ දැක ද ඉදිරියට එනු බැරි ව හඬමින් සිටී' යි කිවූ ය. එවිට බුදුරජාණන් වහන්සේ කාණාව කැඳවා 'සැහවී සිට හඬනෙහි කුමක් නිසා දැ' යි ඇසූහ. එකල කාණාමාතා තොමෝ කාණාව කළ කී සියල්ල කියා සිටියා ය. උන්වහන්සේ 'මාගේ ශ්‍රාවකයෝ දුන් දෙය ගත්තෝ ද, නො දුන් දෙය ගත්තෝ දැ' යි අසා වදාළ කල්හි 'උන්වහන්සේලා ගත්තෝ දුන් දෙය' යි කාණමවු තොමෝ කිවූ ය. 'මාගේ ශ්‍රාවකයෝ පිඬු සිඟා යන ගමතේ නුඹලාගේ ගෙට ත් පැමිණ දුන් දෙය ම ගත්හ, එහෙයින් ඒ නමලා අත වරදක් ඇත්තේ දැ' යි අසා වදාළ කල්හි 'ස්වාමීන් වහන්සේලා අත වරදෙක් නැත, උන්වහන්සේලා ගත්තෝ දුන් දෙය ය, වරද කාණාව අතේ ය' යි ඇ කීවා ය. බුදුරජාණන් වහන්සේ 'කාණා වෙනි! වරද කා අතේ ද? මාගේ ශ්‍රාවකයෝ පිඬු සිඟා යන ගමතේ නුඹලාගේ ගෙට ත් ගෙ පිළිවෙළින් පැමිණියහ, නුඹගේ මවු ඒ නමලාට කැවුම් පිළිගැන්නූ ය, ඔවුහු ඒ පිළිගත්හ, කාරණය සිදු වූයේ ඔය සේ ය, එහෙයින් මෙහි මාගේ ශ්‍රාවකයන් අත වරදෙක්, තිබේ දැ' යි ඇසූහ. 'නැත, ස්වාමීනි! හාමුදුරුවරු අත වරදෙක්, වරද මා අතේ ය, මට කමාවනු මැනැවැ' යි කාණා තොමෝ බුදුරජුන් කමා කරවූ ය. එවිට උන්වහන්සේ අනුපිළිවෙළ

කතාව වදුල සේක. එහිදී ඇ ඒ අසා සෝවත් පලයට පැමිණියා ය. බුදුරජානත් වහන්සේ රජගේ මිදුලෙන් විහාරයට වැඩි සේක. රජු බුදුරජුන් දැක 'වඩින්නත් බුදුරජානන් වහන්සේ වගේ ය' යි, කී විට එහි සිටි සෙවකයෝ 'දෙවයන් වහන්ස! එසේ ය' යි කීහ. 'වහා යවු, මා වඳින බව බුදුරජුන්ට දන්වවු' යි බුදුරජුන් වෙත සෙවකයන් යැවී ය. ඔවුහු එහි වහා ගොස් එබව බුදුරජුන්ට දුන් වූහ. උන්වහන්සේ රජ ගෙදොර මිදුලෙහි නැවතී සිට ගත්හ. එවිට රජ තෙමේ බුදුරජුන් වෙත ගොස් වැඳ 'කොහි වැඩි සේක් දැ' යි ඇසි ය. 'කාණාමවුගේ ගෙටැ' යි වදුලාහ. එහි වැඩි සේක් කුමට දැ' යි ඇසූ විට 'මහරජ! කාණා තොමෝ මාගේ සව්වන්ට බණිමින් දෙඩමින් සිටියා, ඒ කිමැ යි සොයන්නට ගියෙමි' යි දුන් වූහ. 'කිමෙක් ද ස්වාමිනි! නො බණින සැටියෙක් කරණ ලද දැ' යි නැවැත ඇසි ය. 'ඔව්! මහරජ! මින් පසු ඇය කාට ත් නො බණින්නියක කලා, එ පමණෙක් ම නො වෙ යි, ලොකොත්තරධනයට හිමි තැනැත්තියක ද කෙලෙමි' යි වදුල කල්හි 'හොඳයි! ස්වාමිනි! බුදුරජානන් වහන්සේ ඇය ලොකොත්තර ධනයට හිමි තැනැත්තියක කල බැවින් මම ඇය ලෞකික ධනයට හිමි තැනැත්තියක කරමි' යි බුදුරජුන් වැඳ ගියේ පිළිසත් යානයක් යවා කාණාව කැඳවා අබරණින් සරසා වැඩිමහල් දූ තනතුරෙහි තබා 'මාගේ දුව පොෂණය කල හැක්කෙක් පාවා ගණිවා' යි දුන්වීම් පල කෙළේ ය. එක් අගමැති වරයෙක් 'දෙවයන් වහන්ස! ඔබ දුව රැක ගන්නට මට පිළිවන, එහෙයින් ඇය මට පාවා දෙන්නැ' යි පාවා ගෙණ ගෙට කැඳවා සියලු යසඉසුරු දී 'කැමති සේ පින් දහම් කරව' යි ඉඩ පහසු සලසා දුන්නේ ය. මෙසේ ඉඩ පහසු ලත් කාණා තොමෝ සිවු දිග සිවු දොරටුවෙහි පුරුෂයන් නවතා උපස්ථාන කලයුතු භික්ෂු භික්ෂුකින් සොයා බැලුවා ය. එහෙත් එකෙකුදු නො ලද්දේ ය. කාණාවගේ ගෙයි දෙන්නට උයා පිහා තුබූ කැම් බිම්වල පමණ නැත. මෙ දවස ධම්ශාලාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා 'ඇවැත්නි! පෙර දවස මහලු තෙර සතර දෙනෙක් මහලුකල පැවිදි වූ බැවින් කැවුම් කැම බුදීම දන්බව මුත් කාණාවගේ අදහස නො දුන ඇය විපිළිසර කරවූහ, විපිළිසර වූ ඕ තොමෝ බුදුරජුන් කරා පැමිණ නැවැත ත් සැදුහ ඇත්තී වූ ය, බුදුරජානන් වහන්සේ නැවැත ත් භික්ෂූන්ට කාණාවගේ ගෙට යන්ට මං සැලසූහ, එහෙත් දැන් ඇට භික්ෂුනමක් හෝ භික්ෂු කියක සොයා ගැණීම අපහසුව තිබේ, එහෙයින් බුදුරජානන් වහන්සේලා වැනි අරුම පුදුම ගුණ ඇත්තෝ කොහි වෙත් දැ' යි කියමින් උන්හ. එවේලෙහි එහි වැඩම කල බුදුරජානන් වහන්සේ

'මහණෙනි! කමුසේලා කියන්නහු කුමක් දැ' යි විමැරූ, 'මෙනම් කතාවකැ' යි කී කල්හි 'ඔය මහලු උත්නාන්සේලා කාණාවට විපිළිසර ඉපද වූවෝ දැන් පමණක් නොවෙති, ඉස්සර ත් එසේ කළහ' ඒ වාගේ ම මම කාණා ව කීකරු කළේ දැන් පමණක් ම නොවෙමි, පෙරත් කාණා ව මාවිසින් කීකරු කරණ ලද්දී ය' යි වදුළ විට භික්ෂූහු 'ස්වාමීනි! අපි එය අසනු කැමැත්තමහ' යි දන්වා සිටියෝ ය. එවිට බුදුරජානන් වහන්සේ

'යම් තැනෙක බළලෙක්-නොලබා ද කිසි ගොදුරක්,
එහි උපදිති බළල්ලු-දෙවැනි තෙවැනි සිවුවැනි,
පළිහුමුවා බිල මේ-බබ්බුකාබිල නම් වේ,
(නැත) මෙබිලට පැහැර-සිය දිවි හලෝ ඔහු හැම' යි

බබ්බුජාතකය සවිස්තර ව වදුළ සේක

යම් තැනෙක බළලෙක් මී මස් ආදි ගොදුරක් ලබා ද එ තැන දෙවන බළලෙක් ද උපදියි. තෙවන බළලෙක් ද උපදියි. සිවුවන බළලෙක් ද උපදියි. තිගේ මේ පළිහුයෙන් කළ බිලය බබ්බුකාබිල නම් වේ, යනු එහි කෙටි තේරුම ය. 'මේ මහලු මහණහු එ දවස බළල්ලු වූහ, කාණා ව මී දෙන වූ ය, මැණික් කරු තෙමේ මමැ' යි ජාතකය ගළපා 'මහණෙනි! කාණා ව ඉස්සර ත් නොසතුටු වූ ය, විසුරුනු සිතැත්තී වූ ය, මාගේ වචනයෙන් පහන් දිය ඇති විලක් මෙන් වෙසෙසින් පැහැදුනී ය' යි වදුරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

යථාපි රහදෙ ගම්භීරෙ විප්පසන්නෙනා අනාවිලෙ,
එවං ධම්මානි සුත්වාන විප්පසීදන්ති පණ්ඩිතාති.

යම්සේ වනාහි ගැඹුරු වූ මහමුහුදද වෙසෙසින් පහන් වූ යේ ද, නොකැලඹුනේ ද, එපරිද්දෙන් නුවණැත්තෝ බණ අසා වෙසසින් පහදින්නෝ ය.

යථා අපි රහදෙ ගම්භීරෙ = ගැඹුරු වූ මහමුහුද යම්සේ ද.

කුදු මහත් හැම ජලාශයෙක් ම **රහද**, නමින් හඳුන් වනු ලැබේ. එහෙත් මෙහි ගැණෙන්නේ මහාසමුද්‍රය යි. **ගම්භීර**, යන විශෙෂණයෙන් ඒබව කීහ. යම් තැනෙක හයින් යෙත් නම් එතැන ගම්භීර යි කියති. පොළොව බිඳ මහාවාටයක් සේ පවත්නා තැන ද ගම්භීර ශබ්දයෙන් කිය වේ. ගම්භීර ශබ්දය වඩා ත් සාර්ථක වන්නේ සමුද්‍රයට විශෙෂණව සිටි තැන්හි ය. සාමාන්‍ය ජලාශයක් කියවෙන නාමයකට ගම්භීර ශබ්දය විශෙෂණ ව සිටියේ නම්, ඒ නාමයෙන් සමුද්‍රය කිය වෙන්නේ ය. මෙ ද එසේ ය.

විප්පසන්නෙනා අනාවිලෙ = වෙසෙසින් පහන් වූ නොකැලඹුනු.

මේ දෙපදය ද සිරියේ **රහදෙ,** යන්නට විශෙෂණ වශයෙනි. සමුද්‍රය යොදුන් අසූසාර දහසක් ගැඹුරු ය. මුහුදු පත්ලේ සිට උඩට සතළිස් දහසක් යොදුන් තැන්හි සිටි ජලය තිමි, තිමිඬගල, තිමිරපිඬගලාදී වූ කුදු මහත් මසුන් කරණ කොට නිතර සැලෙ යි. මතුපිට සිට යටට සතළිස් දහසක් යොදුන් තැන්හි ජලය වාත යෙන් සැලෙ යි. උඩින් හා පත්ලෙන් අසූ දහසක් අසූ දහසක් යොදුන් පමණ තැන් හැර, මැද සාර දහසක් යොදුන් පමණ තැන සිටි ජලය වෙසසින් පහත් ය. නො කැලඹුනේ ය. **'සඛඛාකාරෙන පන චතුරාසීතියොජනසහස්සගම්භීරො නිලමහාසමුද්දෙ රහදෙ නාම, තස්ස හි හෙට්ඨා වත්තාළීසසහස්සයොජනමත්තඨානෙ උදකං මචෙඡහි වලති, උපරි තාවතකෙ එව ඨානෙ උදකං වාතෙන වලති. මජ්ඣෙ චතුයොජනසහස්සමත්තෙ ඨානෙ උදකං නිච්චලං තිඨති. අයං ගම්භීරො රහදෙ නාම'** යන මේ පාළිය එහි තතු පැහැදිලි කර යි.

උඩින් හා පත්ලෙන් මෙසේ සැලුන ද, සමුද්‍රයෙහි නො සැලෙන්නා වූ මැද කොටස ගෙණ ඒ වෙසෙසින් පහත් බව හා නො කැලඹුනු බව සියලු සමුද්‍රයෙහි ආරොපණය කරණ ලද්දේ ය. එ ද ශාස්ත්‍ර යුක්තියකි.

සිවුරඟසෙනඟ බටුවත් නො සැලෙන නො කැලඹෙන දිය කඳ ද රහද නමින් කිය වේ.

එවං ධම්මානි සුත්වාන විපසීදන්ති පණ්ඩිතා = එපරිද්දෙන් නුවණැත්තෝ බණ අසා වෙසෙසින් පහදිත්.

ගාථාවෙහි පෙරඹින් කියවුන මෙහි වූ **එවං,** යන්නෙන් පසු කොටස හා එකතුකර පෙන්වති. යම්සේ මුහුද නො කිලිටි බැවින් පහන් වේ ද, නො සැලෙන බැවින් නො කැලඹුනේ වේ ද, එපරිද්දෙන් මාගේ බණ දහම් අසා, සොතාපත්තිමාගීාදිය ලැබීමෙන් උපකෙලෙශ රහිත සිත් ඇතිබවට පැමිණෙන්නා වූ පණ්ඩිතයෝ වෙසෙසින් පහන් වන්නාහ, යි කියන ලද්දේ ය. රහත්බවට පැමිණියෝ ම එකාන්ත විප්‍රසන්නයෝ ය.

මේ ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය.

කාණාමාතාවත්‍ථුව නිමියේ ය.

මිදිරොඩුදිය බුන් කොටලුවෝ

6 — 8

බුදුබවට පැමිණි දා සිට, ඉදිරියෙහි අවුරුදු විස්සක් පමණ කාලය ප්‍රථමබෝධි ය යි හත්නා බැවින්, ඒ අවුරුදු විස්ස තුළ එක් අවසථාවෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පන්සියයක් භික්ෂූන් සමග වෙරඤ්ජාවට වැඩ වෙරඤ්ජ නම් බ්‍රාහ්මණයාගේ ආරාධනාවෙන් එහි ම වස් විසූහ. වෙරඤ්ජ තෙමේ මාරවෙශයෙන් සිහි මුලා බවට පැමිණියේ, එක් දවසකුදු බුදුරජුන්ගේ ගුණ සිහි නො කෙළේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුට අමතක වූහ. වෙරඤ්ජාව ද කැම් බීම්වලින් දුක් පත් විය. භික්ෂූන් වහන්සේලා වෙරඤ්ජාවෙහි හා ඉන් පිටත පිඬු සිඟා ගියෝ ද කැම්බීම් කිසිත් නො ලැබ එයින් වෙහෙසට පත් වූහ. පිඬු සිඟා ගිය උන්වහන්සේලාට අසුන් වෙළඳුමට එහි ඇවිත් සිටි වෙළෙන්දෝ, එක්නමට එක් දවසට යවහාල් නැළිය බැගින් දින පතා යවහාල් නැළි පන් සියය, පන් සියය දෙන්නට නියම කර ගත්හ. ඒ වළඳු ත් වෙහෙසට පත් භික්ෂූන් දැක මෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේ පොළෝ පත්ලෙහි වූ රස ඕජා ඔවුනට වළඳ වනු කැමැති වූහ තමන්ගේ අනුභාවයෙන් සියලු භික්ෂූන් පිඬු පිණිස උතුරුකුරුදිවසිනට ගෙණ යන්නට අදහස් කළහ. බුදුරජාණන් වහන්සේ ඒ සියල්ල වළක්වා ලූහ. භික්ෂූන් වහන්සේ රසතෘෂ්ණාව බැහැර කොට විසූ බැවින්, ඔවුනට ආහාර පානයෙන් එක් දවසකුදු චිත්තපීඩාවක් නො ද වූ ය. ඒ තෙමස එහි වැඩ වසා, වස් නිම කළ බුදුරජාණන් වහන්සේ බමුණා වෙතට වැඩි සේක්, එහිදී ඔහු කළ සත්කාර සම්මාන ඇති ව ඔහු ශරණාගමනයෙහි පිහිටුවා වෙරඤ්ජාවෙන් නික්ම පිළිවෙළින් චාරිකා කරණ සේක්, සැවැත් නුවරට වැඩ ජේතවනමහාවිහාරයෙහි වැඩ විසූහ. ඒ නුවර වැස්සෝ උන්වහන්සේට දන් පිළිගැන්නූහ.

ඒ දවස භිහන්නන් පන්සියයක් එහි වාසය කෙළේ ය. ඔවුහු හැම දෙන භික්ෂූන් වළඳු ඉතිරි වූ රසැති ආහාර පාන කා බී නිදි නිදා නැගිට ගං තොටට ගොස් කෑ කෝ ගසමින් ඒ ඒ තැන නටමින් සෙල්ලම් කරමින් ගුස්ති අල්ලමින් විහාරය තුළ හා ඉන් පිටත ත් නො පණත් කම් කරමින් කල් ගෙවති. භික්ෂූන් වහන්සේලා ධර්මශාලාවට රැස්ව 'බලන්න! ඇවැත්නි! මේ භිහන්නෝ කෑමට දෙයක් නැති අවදියේ වෙරඤ්ජාවෙහි දී මේ එක ම නො පණත් කමකුදු නො කොළෝ ය, දැන් රසමසින් යුත් කෑම් බීම්

කොට නොයෙක් අන්දමේ විකාර කරමින් හැසිරෙති, භික්ෂූන් වහන්සේ වනාහි කෑම් බීම් නැති වෙරඤ්ජාවෙහිදී ද උපශාන්තව හුන්හ, දැන් එයට ත් වඩා හොඳින් ශාන්තව හිඳිති' යි කතා කරමින් ඉන්ද දී එහි වැඩි බුදුරජාණන් වහන්සේ 'මහණෙනි! තමු සේලා කියන්නහු කුමක් දැ' යි අසා 'මෙ නම් කතාවකැ' යි දැන් වූ කල්හි 'ඔය හොඳට කා බී පෙරළි කරණ හිඟන්නෝ, පෙර එක් අත්බවෙක කොටලුවෝ ව උපන්හ, දිනක් මේ කොටලුවෝ මිරිකා, රස ගෙණ අසුන්ට පොවා වීසි කළ මිදිරොඩු ගෙණ නැවැත දිය වක් කොට මිරිකා නියඳ වැහැරියෙන් පෙරා ගත් වාලොදක නම් කිසිත් මිදි රසක් නැති ලාමක වූ මිදිරොඩු සේදූ වතුර බී, මත් වූ බඹරුන් සේ කෑ කෝ ගසමින් හැසිරෙන්නට වූහ' යි වදාරා

'නියඳ පෙරහණ ලා – පෙරූ මිදි රොඩු රසසුන්,
දිය බී කොටලුවන්හට – මද උපදීය නිදි ලත්,
මිදිපල මැඬ පෙරා – ගත් මේ පිණි මිදිරස,
බීමෙන් අසුන්හට – මද නොද, උපදි කිසිවිට,

දනිදුනි! දුදුයෙන් – නැත, මද රසින් පැහැසූ,
මදරසැති මිදිරොඩු – දිය බී කොටලු මත් වේ.
උතුම් දැ ඇති ඒ – බර ඉසුලුමෙහි යුහුසුලු,
දැ අසු අග් මිදිරස – බීලා ද මත් නොම වේ'

යි **වාලොදකජාතකය** වදාළ සේක. නැවැත 'සත්පුරුෂයෝ ලොභය දුරු කොට සැපවත් කාලයෙහි ද දුක්පත් කාලයෙහි ද විකාර නො කොට එක සේ වාසය කරති' යි අනුසන්ධි ගලපා මේ ධම්දෙශනාව කළ සේක:–

සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති
න කාමකාමා ලපයන්ති සන්තො,
සුඛේන ඵුට්ඨා අථවා දුඛේන
නොච්චාවචං පණ්ඩිතා දස්සයන්තීති.

සත්පුරුෂයෝ එකැතින් (ඡන්ද රාගය) දුරු කරති. සත්පුරුෂයෝ කාමයන් කැමැති ව කතා නො කෙරෙති. සුවයෙන් පහස්නා ලද්දාහු, නොහොත්, දුකින් පහස්නා ලද්දාහු ද නුවණැත්තෝ උස් පහත් ගති නො දක්වන්නෝ ය.

සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති = සත්පුරුෂයෝ සියලු තන්හි (ඡන්ද රාගය) දුරු කරති.

සඤ්ඤා, ධාතු, ආයතනා දී හෙද වූ සියලු ධම්යෝ **සබ්බත්ථ**, යන්නෙන් කිය වෙති. **'සබ්බත්ථාති පඤ්චකඛන්ධාදි භෙදෙසු සබ්බධම්මෙසු'** යනු අටුවා ය. 'සත් පුරුෂයෝ කුමක් හරින් ද' යි

මෙහි ප්‍රශ්නයක් නැගිය හැකි ය. එයට පිළිතුර 'සත් පුරුෂයෝ ඡන්දරාගය හරිත්' යනුයි. ඡන්දරාගය නම්, කාමවස්තූන් කෙරෙහි පැවැති බලගතු ඇල්ම යි. කාමවස්තූන් විෂය කොට පැවැති ඇල්ම දුර්වල වේ නම්, ඒ දුර්වල වූ ඇල්ම **ඡන්ද,** යි ද, බලගතු ඇල්ම **රාග,** යි ද කියත්. රූපශබ්දාදීන් විෂයෙහි පවත්නා සෙනහය ඡන්දරාගැ යි තවත් තැනෙක පෙණේ. **'ඡන්දරාගො නි රූපසඤ්ඤ දිසූ සිනෙහො'** යනු එහි විවරණය යි.[1] ඡන්දරාගය දුරුකිරීම අර්හන්මාර්ගඥානයෙන් කළ යුතු ය. බුඩාදිසත්පුරුෂයෝ අර්හන් මාර්ගඥානයෙන් ඡන්දරාගය දුරු කරති.

න කාමකාමා ලපයන්ති සන්තො = සත්පුරුෂයෝ කාමයන් කැමැති ව කතා නො කරති.

සන්තො, යනු කියන ලදි. කාමවිස්තරය ද කියවින. අදහස මෙසේ ය:- බුඩාදිසත්පුරුෂයෝ කාමවස්තූන් ලබනු කැමැති ව හෙවත් සිවුරු, කෑම්, බීම්, වෙහෙර, පන්සල්, ඇඳ පුටු කොට්ට මෙට්ට පාන් පඬික්කම් ඇඳ ඇතිරිලි රෙදිපිළි තුවා ලේන්සු සබන් හුණු ගිලන්පස ආදි කිසිවක් ලබා ගන්නා අදහසින් වචනයකුදු නො කියති. අනුන් ලවා ත් නො කියවති. එහෙත් මේ ඇ හැම දෙයක් ම ලබා ගැණීමේ ආශා ඇත්තෝ, දායකගෙවලට ගොස් 'සුව පහසු කෙසේ ද? ධර්මපාල පාඨශාලාවට යනවා ද? ඔහු කීවන පඬක්කතියේ ද? චන්ද්‍රා! විනීතා! කොහොම ද පාඨශාලාවේ වැඩ? මොක ද ඊයේ පෙරේදා පන්සලට නො ආවහු? මේ දවස්හි පන් සලේ ද නොයෙක් වැඩ, මිල මුදලුත් හිග යි, මට ත් විවෙකයෙක් නැහැ, නිතර ම වාගේ සභාරැස්වීම්වලට, බණවලට යන්නට සිදු වෙනවා යනාදි ලෙසින් මිනිසුන්ගේ සිත් තමා වෙත නැමී එන් නට කතා කරති. මහත්මයා ගෙයි නැති විටක ගියෝ නම්, 'මහත් මයා ගියේ කොහි ද? කවදා ද එන්නේ? පුංචිමහත්මයා මෙහි එන්න' යනාදි ලෙසින් කතා කරති. නෝනා මහත්මයා නැති විටක ගියෝ නම්, 'වාඩි වෙන්න, පුටුවක් ගෙණ, කෝ ලමයි? පියදාස බොහෝ දවසකින් දකින්නට ලැබුනේ නැහැ, ජිනදාස, පුංචිමහත්මයා දවසක් පන්සලට ගිය නමුත් කතා කරන්නට ඉඩ ලැබුනේ නැත, ධර්මරත්න පෙරකදෝරු මහත්මයා ඇවිත් සිටියා, කෝ නෝනා මහත්මයා දකින්නට නැත්තේ?' යනාදි ලෙසින් උනුන්ගේ සිත් ගැණුමට මාසී ව කතා කරති. එසේ ම ගුරුවරයා ගෝලයාගේ ඇති නැති ගුණ කියා දායකයන් කෙරෙහි ගෝලයා හිතවත් ය යනාදීන් දක්වා ලාභ උපදවති. ගෝලයා ද ගුරුවර යාගේ ඇති නැති ගුණ කියා සිවුපසය උපදවති.

---

1. 2. 4. 'කාමරති සන්ථවං' යන්න බලනු.

ලාභාශාවෙන් මැඩුනවුන්ගේ මේ කීම් බස් වලින් පැහැදුනු මුග්ධ වූ දායකදායිකාවෝ 'ඒ හාමුදුරුවෝ කො තරම් හොඳ ද, අපේ හැම සැප දුකක් ම සොයති, අපේ ලමයින්ට බොහෝ ආදරය කරති, පිරිත මතක් කළා ම ඇත, පිරිත් කියන්නට අසා එති, අපේ පන්සලේ හාමුදුරුවරු අප ගැණ කිසි ත් නො සොයති, අප ගෙට නො එති, පාර තොටේ දී හමුවූ විට ද කතා නො කරති, මේ හාමුදුරුවෝ එසේ නො වෙති, කො තැනක දී හමු වුන ත් කතා කරති, කතා නො කොට නො යති' යනාදිය කියමින් සිතමින් පැහැද 'ඔව්! ස්වාමීනි! අපට මේ දවස්වල වැඩි කරදරයක් නැත, පන්සලේ මේ දවස්වල ගොඩ නගා ගෙණ යන දාන ශාලාවට මුදල් ටිකක් අපි ත් එවන්නෙමු, මල් අසුනක් බැන්ද වීමට මගේ ද අදහසක් තිබේ, ඉඩ ලැබුනු විටක මම ඊට මුදල් එවන්නෙමි, හාමුදුරුවන් වහන්සේ එය බඳවන්න! එයට යන වියදම මම දෙන්නම්' යනාදිය කියා බත බුලතින් ද සංග්‍රහ කොට යවති. මේ හෙතුවෙන් මේ ගිහි පැවිද්දෝ මරණින් මතු අපාය යෙහි උපදිත්. දෙපසෙහි ම කීම් කෙරුම් බැලුම් සැලකුම් නො දැහැමි බැවිනි. සසුන් පිළිවෙතට පටහැනි බැවිනි. මහණකමට නො ගැළපෙන බැවිනි.

'බුඩාදයො සන්තො කාමහෙතු නෙ ව අත්තනා ලපයන්ති, න පරං ලපාපෙන්ති, යෙ හි භික්ඛාය පවිට්ඨා ඉච්ඡාචාරෙ ඨිතා, කිං උපාසක! සුඛං තෙ පුත්තදාරස්ස රාජවොරාදීනං වසෙන ම්පදවතුප්පදෙසු නත්ථි කොචි උපද්දවො ති ආදීනි වදන්තා තාව තෙ ලපන්ති නාම, තථා පන වත්වා ආම භන්තෙ! සබ්බෙ සං නො සුඛං නත්ථි කොචි උපද්දවො, ඉදානි නො ගෙහං පහුත අන්නපානං ඉඩෙ ව වසථා ති අත්තානං නිමන්තාපෙන්තා ලපාපෙන්ති නාම, සන්තො පන ඉදං උභයම්පි න කරොන්ති' යනු අටුවාය.

සුඛෙන පුට්ඨා අථවා දුඛෙන – සුවයෙන් පහස්නා ලද්දාහු නොහොත්, දුකින් පහස්නා ලද්දාහු ද.

මෙහි සුඛ, දුක්ඛ ගෙණ දෙසීම දෙශනාමාත්‍රයෙකි. අෂ්ට ලොක ධර්මයෙන් ම පහස්නා ලද්දාහුය යි ගතයුතු ය. අෂ්ටලොක ධර්මයෙන් නිරතුරු පහස්නා ලද්දෝ නමුත් බුඩාදිසත්පුරුෂයෝ සසුන් පිළිවෙතට විරුඬවූවක් නම් නො කරති. කරන්නට නො සිතති. අෂ්ටලොකධර්මය යට කියන ලදී. **අථ,** යනු ත් වා, යනු ත් නිපාත යි අථ යනු **'අථබො භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලොමපටිලොමං මනසාකාසි'** යන තන්හි අවිච්ඡින්නාර්ථයෙහි ආයේ ය. **'අථ නං ආහ'**

යන්නෙහි ආගේ අනන්තරාර්‍ථයෙහි ය. අධිකාරයෙහි වැටුනේ **'අථ දකඛසි භද්‍දඉත්ථිං නිග්‍රොධං මඛුරපඵලං'** යන තැන්හි ය. **'අථ තං කෙන වණ්ණෙන කෙන වා පන හෙතුනා'** යන තන්හි වූයේ ප්‍රශ්නාර්‍ථයෙහි ය. පදපූරණයෙහි ද වැටේ. **'අථ පුරිසො ආගච්ඡෙය්‍ය පුරත්ථිමාය දිසාය'** යනු එයට නිදසුන්ය. මෙහි වැටුනේ අනන්තරාර්‍ථය පිණිස ය.

'පංචලිපුත්තස්ස බො ආනන්ද! තයො අනන්තරායා භවිස්සන්ති අගිනිතො වා උදකතො වා මිථුභෙදතො වා' යනාදියෙහි වා ශබ්දය සමුච්චයයෙහි වැටුනේ ය. **'මඛු වා මක්ඛෙති බාලො'** යන තන්හි උපමායෙහි ය. **'කිං වා ඉධං භාසස වා පුඉත්තං'** යන්නෙහි වූයේ සංශයාර්‍ථ වාචක වේ. **'ඉමස්ස වචනං සච්චං වා යදි වා මුසා'** යන තන්හි පදපූරණයෙහි ය. **'අමාපතො සම්මං සමානං වා'** යනු ව්‍යවස්ථිතවිභාෂාර්‍ථයට නිදසුන් ය. නිශ්චයාර්‍ථයෙහි හා විකල්පාර්‍ථයෙහි ද වැටේ. **'අයං වා ඉමෙසං සමණ බ්‍රාහ්මණානං සඛ්ඛබාලො සඛ්ඛමූළෙහා'** යනු හා **'වගහනනං වා වගෙහ'** යනු පිළිවෙළින් එයට නිදසුනි.

න උච්චාවචං පණ්ඩිතා දස්සයන්ති = නුවණැත්තෝ උස් පහත් ගති නො දක්වන්නාහ.

අට ලෝ දහමින් පෙළුනෝ ද, සත්පුරුෂයෝ ද තුටු බවට මකුබවට පැමිණීම් වසයෙන් හෝ ගුණාගුණ කීම් වසයෙන් හෝ උස් පහත් ගති කිසිවිටෙක ත් නො දක්වන්නෝ ය. සත්පුරුෂ යන්ගේ ගති එසේ වුව ද, අධම වූ ගිහි පැවිද්දෝ අවස්ථානුරූපව ලාභාපෙක්ෂාවෙන් උස් පහත් ගති දක්වති. පැවිද්දෝ, ගිහි පැවිද්දන් ඉදිරියෙහි ද, ගිහියෝ, ගිහි පැවිද්දන් ඉදිරියෙහි ද යම් යම් දේ ලබා ගණු පිණිස යම් යම් වැඩ කරවා ගණු පිණිස එසේ කරති. ඇතැම් මහණ කෙනෙක් සථානාන්තරලාභයෙන් උසස් ව සිටින ගිහියන් දුක හිස නමති. දත් දක්වා සිනාසෙති. ඇඟඇලි කම් දක්වති. සැප දුක් විචාරති. දෙකට තුනට නැමී සිට ගණිති. නැවැත ඔහුගේ ගෙට යන්නාහ. එහිදී ද ගේ දෙරේ හැම දෙයක්, ගේ හිමියා මෙන් විචාරන්නාහ. දායකයා කුලයෙන් උසස් කොට කතා කරන්නාහ. ඇරයුම් නැති ව පිරිත් දහම් දෙසන්නාහ. ඔවුන්ගේ දූතමෙහෙවර දූසමෙහෙවර කරන්නාහ, යනාදී පහත් කම් දිනකම් කරමින් සසුන් නසත්නාහ.

ඇතැම් මහණ කෙනෙක් සථානාන්තරලාභයෙන් උසස් නො වූ ගිහියා ඉදිරිපිට තමන් කුලවතකු සේ හුවා දක්වන්නෝ ය. උගතකු සේ සිල්වතකු සේ රජ යුවරජ මැති ඇමැති ආදීන් ගෙන් පුද සැලකිලි ලබන්නකු සේ කියා පාන්නෝ ය. ලොකු

ගෝල පිරිසක් ලොකු දායක පිරිසක් ඇත්තකු කොට කියන්නෝ ය. මෙසේ තමන්ගේ බොරු උසස්බව කියමින් අඟවමින් සසුන් නසන්නෝ ය.

ඇතැම් මහණ කෙනෙක් ලාභාශාවෙන් තදබද ව සංඝ පරිණායකයන් ඉදිරියෙහි කීකරුබව, දැමුනුබව, සංසිඳුනුබව පෙන්වන්නෝ ය. නායකයන් කෙරෙහි ලැදිබව පෙන්වන්නෝ ය. දැක වැඳ වැටෙන්නෝ ය. දෙහොත් මුදුනැ තබන්නෝ ය. මෙසේ පැවිද්දන් ඉදිරියෙහි තමන් පහත් කොට පෙන්වමින් සසුන් නසන්නෝ ය.

ඇතැම් මහණ කෙනෙක් ලාභාශාවෙන් මිරිකී සාමාන්‍ය භික්ෂූන් ඉදිරියෙහි බොරුවෙන් තමන් උගතකු, පණ්ඩිතයකු, පූජ්‍යයකු, ප්‍රබලයකු, මහානායකයකු, අනුනායකකු, ස්ථානාධිපතියකු, පරිවෙණාධිපතියකු, විචිත්‍රකථිකයකු, ධර්මධරයකු, විනයධරයකු, විද්‍යාධරයකු, ග්‍රන්ථකාරයකු, අනුශාසකයකු, විනිශ්චයකාරයකු කොට කියන්නෝ ය. හඟවන්නෝ ය. මෙසේ කියමින් හඟවමින් සසුන් නසන්නෝය යි. මේ සියල්ල බුදුරජානන් වහන්සේ වදාළ සේක. ගිහියෝ ත්, ගිහින් ඉදිරියෙහි හා පැවිද්දන් ඉදිරියෙහි ද මෙසේ කියන්නෝ ය. **උච්චාවචං,** යනු වදාළෝ මෙසේ දක්වන උස් පහත්කම් දැක්වීමට ය. උසස් බව **උච්ච,** නම්. පහත්බව **අවච,** නම්. සෙස්ස කියනලද සේ ය.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

විසාසාදානයන්ගේ දෙස් දැක් වූ පන්සියයක් භික්ෂූන්ගේ කථාවස්තුව නිමියේ ය.

පවුලම මහණවීම

6 — 9

සැවැත් නුවර එක්තරා උපාසකයෙක් වෙසෙ යි. ඔහු ඉතා දුහැමි ය. කල් යත් ඔහුට බුදුසසුන්හි පැවිදි වීමට ආශාවක් උපන. දිනක් ඔහු සියඹුව හා කා බී අවසන් කොට පිළිසඳර කතාවෙහි යෙදුනේ 'සොඳුර! කලක සිට ම මට මහණ වන්නට පැවිදි වන්නට සිතෙක් ඉපද තිබේ ය' යි කී ය. එවිට අඹුව 'පොඩ්ඩක් ඉන්නා! ටිකක් ඉවසන්න! මේ කුස ඉන්නා ලමයා බිහිවනතුරු' යි කීවා ය. ඔහු එයට ඇහුම් කන් දී ලමයා බිහි ව පසින් ඇවිදින තුරු බලාපොරොත්තුව හිඳ, නැවැතත් දවසෙක මහණවීමේ ආශාව අඹුවට කී ය. එයට ද අඹුව කීවා, 'ලමයා ටිකක් ඇතිදැඩි වනතුරු නවතින්නට ය' යි. එවිට උපාසක තෙමේ 'අනේ! මෑ විචාරීමෙන් හෝ නො විචාරීමෙන් මට වැඩෙක් නො වේ, මෑ ගැණ බලා සිටියොත් මට වන්නේ මහත් නපුරෙකි, මෑ ගැණ බැලුවොත් මෑ කියන්නට කන් දුන්නොත් කත් නතු කළොත් මට සසර දුකින් නිදහසෙක් නො වේ, මාගේ දුක්, මා ම කෙළවර කරගත යුතු ය, අනිකකුට ඒ නො කළ හැකි ය' යි කියා ගෙන් නික්ම ගොස් පැවිදි විය. පැවිදි වූ දා සිට මහත් වැරෙන් කමටහන් වඩා පැවිදිබව මුදුන් පෙන්නට නගා ගෙණ අඹුව ත් පුත ත් දකින රිසියෙන් සැවැත් නුවරට ගියේ ය. එහිදී පුතා හමුව ඔහුට බණ කී ය. බණ අසා ඔහු ද සසරට කලකිරුනේ ය. පැවිදි විය. වැඩි දවස් නොයා දී ම රහත් බවට ද පැමිණියේ ය. අඹුව මේ දුන 'යම් කෙනකුන් නිසා මම මේ ගෙයි වසම් ද, ඒ දෙදෙන ම ගෙන් නික්ම ගොස් පැවිදිව වෙසෙ ත්, මට ත් දැන් මේ ගෙයින් වැඩෙක් නැත, පැවිදි වෙමි' යි සිතා ගේ හැර ගොස් පැවිදිව මහණදම් කොට කල් නො යවා ම රහත් වූ ය.

දිනෙක දම්සබාවෙහි 'ධම්මිකඋපාසක තෙමේ තමා ඉතා දුහැමි බැවින් ගේ දොර හැර ගොස් පැවිදිව රහත්බවට ද පැමිණ අඹු දරුවනට ඒ අකිනුත් පිහිට වී ය' යි භික්ෂූන් අතර කතාවක් උපන. ඒ අතර බුදුරජාණන් වහන්සේ එහි වැඩි සේක් භික්ෂූන්ගේ කතාව අසා 'මහණෙනි! නුවණැත්තහු විසින් තමන් නිසා හෝ අනුන් නිසා හෝ නො දුහැමි දියුණුවක් සම්පත්තියක් බලාපොරොත්තු නො විය යුතු ය, බලාපොරොත්තු වන්නහු විසින් ධාර්මික සමෘද්ධියක් ම බලාපොරොත්තු විය යුතු ය, ඔහු ධාර්මිකයකු, ධර්ම පිළිසරණ කොට වසන්නකු විය යුතු ය' යි අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:—

න අත්තහෙතු න පරස්ස හෙතු
න පුත්තමිච්ඡෙ න ධනං න රඨං,
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා.

තමා හෙතු කොට පව්කම් නොකරන්නේය. අනුන් හෙතු කොට ද පව්කම් නොකරන්නේය. පුතකුදු නොකැමැති වන්නේය. ධනය ද නොකැමැති වන්නේය. රටක් ද බලා-පොරොත්තු නොවන්නේය. නොදුහැමින් තමාගේ සමෘඛ්‍යක බලාපොරොත්තු නොවන්නේය. ඒ පුදගල තෙමේ සිල්වත් වන්නේය. නුවණැත්තේ වන්නේය. දුහැමි වන්නේය.

න අත්තහෙතු = තමා හෙතු කොට පව්කම් නොකරන්නේය.

මෙහි **අත්තහෙතු,** නම් සවකීය ජීවිතහෙතුව ඝි. මුග්ධ වූ ලොකය සවකීය ජීවිතය රැකගණු පිණිස පරපණ නැසුම් ආදී වූ නත් වැදැරුම් පව්කම් කරයි. කියනු තබා සිතනු බැරි පව්කම් ආත්මපොෂණය පිණිස කරන්නේය. ඇතැම් කෙනකු බඹ වියත රැකුමට කරණ කම්යෝ ඇසීම් පමණකිනුදු අන්‍යයා කැති ගත්වති. ලොමු ඩැහ ගත්වති.

න පරස්ස හෙතු = අනුන් හෙතු කොට පව්කම් නොකරන්නේය.

මවුපිය අඹුදරු නෑ මිතුරු ආදීන් නිසා පව්කම් කරන්නේය, ලොකය. **පරස්ස හෙතු,** ඝි වදලෝ එහෙයිනි. එසේ කරන්නා වූ පව්කම් ද සමහර විටෙක ඉතා බිහිසුණු ය. ඇතැම් කෙනෙක් අඹුව නිසා මවුපියන් මරති. දූ දරුවන් නිසා අඹුව මරති. ඈ ලෙසින් කරණ පව්කම් ද ලොකයා අතර ඇත්තේය. සතුන් මැරීම් හොරකම් කිරීම් ආදි හැම පව් කමක් ම කරණුගේ තමන් හෙතු කොට හෝ අනුන් හෙතු කොටය. තමන් හා අනුන් හා හෙතු කොට ත් කරෙන්නේය. **'න අත්තහෙතු න පරස්ස හෙතු'** ඝි වදලෝ නුවණැත්තහු උකුණු හිසක් තරමකුදු පවක් තමන් නිසාවත් අනුන් නිසාවත් නොකරණ බව දක්වීමට ය.

න පුත්තං ඉච්ඡෙ = පුතකු නොපතන්නේය.

න ධනං – ධනය නොකැමැති වන්නේය.

න රඨං ≒ රටක් නොකැමැති වන්නේය.

තමන් උදෙසා හෝ අනුන් උදෙසා නුවණැත්තේ පව්කමින් පුතකු ලබන්නට, ධනය ලබන්නට, රටක් ලබන්නට බලා-පොරොත්තු නොවේ. මේ තබා පව්කමින් ලැබෙන සක්විති සැපත ද නුවණැති මිනිසා හැර දමන්නේය.

'ධනං චජෙ යො පන අඞ්ගහෙතු
අඞ්ගං චජෙ ජීවිතං රක්ඛමානො,
අඞ්ගං ධනං ජීවිතං චාපි සබ්බං
චජෙ නරො ධම්මමනුස්සරන්තො'

ශරීරාවයව රකින්නට ධනය දෙන, ජීවිතය රකින්නට ශරීරාවයව දෙන නුවණැති මිනිසා දහම් සිහි කරමින් ධර්මය රැක ගන්නට යුතුකම් ඉටු කරන්නට ශරීරාවයව ධන ජීවිත යන මේ හැම දෙයක් ම හැර දමන්නේ ය. නිසියේ නුවණ දියුණු කළ මිනිසා කො තරම් උසස් ද, යනු මේ ගාථාවෙන් දත හැකි ය.

න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිඩිංඅත්තනො = නො දැහැමින් තමන්ගේ සමෘඩියක නො කැමැති වන්නේ ය.

නුවණැත්තේ අධර්මයෙන් කිසිත් දියුණුවක් තමහට වේවා යි නො පතන්නේ ය. අධර්මයෙන් ලැබුන ද ඒ වහා හැර ලන්නේ ය. දහම් නිසා දහම් සිහිකරමින් සිය දිවි හරින්නේ ය. කිසිකලෙක අධර්මයෙන් කිසිවක් නො ගන්නේ ය. නො පතන්නේ ය. අද ලොකය මෙසේ නො වේ. තණපතට පවා පරපණ නසන්නේ ය. ජඩකම් කරන්නේ ය. එකිනෙකා ඇණ කොටා ගන්නේ ය. දැහැමි මිනිසා ජීවිතය නිසා ද උකුණකු මකුණකු පවා ද දිවියෙන් තොර නො කරන්නේ ය.

සො සීලවා පඤ්ඤවා ධම්මිකො සියා = ඔහු සිල් ඇත්තේ, නුවණැත්තේ, දැහැමි වන්නේ ය.

යමෙක් තමන් නිසා හෝ අනුන් නිසා පව් නො කෙරේද, පුතකු හෝ ධනයක් හෝ රටක් හෝ පව්කමින් ලබා ගැණීමට අයත් කර ගැණීමට, හදා වඩා ගැණීමට කැමැති නො වේ ද, තමන්ගේ දියුණුවක් අධර්මයෙන් සිදුකර ගැණීමට බලාපොරොත්තු නො වේ ද, ඔහු සිල්වතෙක්, නුවණැත්තෙක්, දැහැමියෙක් වේ ය, යි මේ ගයින් වදාළ සේක.

දශකුශලධර්මය මුල් කොට නෛර්‍යාණිකධර්මයන්හි අවිරුඬ ප්‍රතිපදාවන්හි පිහිටියේ **ධාර්මික** යි කියනු ලැබේ. **'ධම්මෙ පසන්නො, ධම්මෙ ඨිතො, ධම්මෙ නියුත්තො, ධම්මො අස්ස අත්ථි'** යි යන මේ කොයි ලෙසකින් වෙන්කොට බැලුව ද වරද නැත.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

ධාර්මිකසර්වවිරවසතුව නිමියේ ය.

නිදිකිරමින් බණ ඇසූ මිනිස්සු

6 — 10

සැවැත් නුවර එක් වීථියක වැස්සෝ කට්ටි කට්ටි ව පෙරවරු යෙහි දන් දී එදා මුළු රැය බණ අසන්නට පටන් ගත්හ. එහෙත් ඔවුහු එහි හිඳ මුළු රැය බණ ඇසීමෙහි අපොහොසත් වූහ. කෙනෙක් කාමාශාවෙන් මැඩුනෝ පෙරළා ගෙවලට ගියහ. කෙනෙක් කෝප යෙන් අඩ දබර කළහ. තවත් කෙනෙක් සිත කය දෙක්හි මැලි කමින් නිදි කිර කිරා හුන්හ. පසු දා දම්සබාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා එගැණ කතා කරමින් ඉන්නා අතර බුදුරජානන් වහන්සේ එහි වැඩි සේක්, එ පුවත දැන වදාරා 'මහණෙනි! ඕක එතරම් අරුමයෙක් නො වේ, ඔය මිනිස්සු බොහෝ සේ භවයෙහි ඇලී ගැලී වසන්නෝ ය, නිවන් යන්නෝ ඉතා ටික දෙනකැ' යි අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.

යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරන්ති.

මිනිසුන් අතුරෙහි යම්කෙනෙක් පරතෙරට යන සුලු ද, එබඳු මිනිස්සු ස්වල්පයහ. මේ අන්‍යප්‍රජා තොමෝ මෙතෙරට ම නැවැත නැවැත දුවයි.

යම් කෙනෙක් මැනැවින් දෙසූ ධර්මවිෂයයෙහි ධර්මය අනුව පවත්නෝ ද, ඔවුහු තරණයට ඉතා දුෂ්කර වූ ත්‍රෛභූමිකවෘත්තය (ඉක්මවා) නිවනට පැමිණෙන්නාහ.

අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො = මිනිසුන් අතු රෙහි යම් කෙනෙක් පරතෙරට යන සුලු ද ඔවුහු ටික දෙනෙකි.

අප්පකා, ශබ්දය, සාවශෙෂ, නිරවශෙෂ යන දෙයරුතෙහි වැටේ. **අප්පිච්ඡා,** යනාදි තන්හි නිරවශෙෂයෙහි ය. කැමැත්තක් කැල ම නැත යන අරුති. මෙහි ආයේ සාවශෙෂයෙහි ය. මුළුමනින් නැති බවෙක් මෙයින් නො කිය වේ. **තෙ,** යන්න, **යෙ,** යන්න හා සම්බන්ධ වේ. කුසල් අකුසල් උපදවන්නේ **ජන,** නම්. **'කුසලා කුසලං ජනෙතීති = ජනො'** යනු විවෘති යි. **පාරගාමිහු,** යි කියනලද්දේ නිවනට යන්නෝ ය. **'පාරං වුච්චති අමතං නිබ්බානං'** නිවන පාර නැමැ යි මින් කියනලද ය. සසර දුක්

තැවුම් සංසිඳවන්නට පොහොසත් නු යි නිවන **පාර,** නම් වේ. **'පාරෙති සක්කොති සංසාරදුක්ඛ සන්තාපං සමෙතුන්ති=පාරං'** යනු ඒ කී ලෙස ය. **'පහතා සංසාර චක්කස්ස අරා එතස්මාති වා = පාරං'** සසර සකේ අර සිඳින ලදනු යි කියා හෝ නිවන පාර යි කියනු ලැබේ. නිර්ථාණය පඤ්ච උපාදානස්කන්ධසඞ්ඛ්‍යාත ලොකය හැර දමා ඉන් එතෙර ව ලැබිය යුතු බැවින්, පාර නම් වී ය යනු මෙහි ආශය වේ. ඒ මේ පාරසඞ්ඛ්‍යාතනිර්ථාණයට යන සුල්ලෝ පාරගාමී නම් වෙත්. ස්වකීය වූ ආත්මභාවසඞ්ඛ්‍යාත වූ රූපූපාදානක්ඛන්ධ-වෙදනූපාදානක්ඛන්ධ-සඤ්ඤූපාදානක්ඛන්ධ-සඞ්ඛාරූපාදානක්ඛන්ධ-විඤ්ඤාණූපාදානක්ඛන්ධ යන පංචවිධ උපාදානස්කන්ධ යන්හි පරිඤ්ඤා-අභිසමය-පාරිපූරි යන මොවුන්ගේ වශයෙන් ද, මෙ කියූ උපාදානස්කන්ධයන්ට හෙතු වූ තෘෂ්ණාවෙහි ද, ඔවුන්ගේ නො පැවැත්ම ලකුණු කොට ඇති නිරොධයෙහි ද, නිරොධගාමිනී ප්‍රතිපදාවෙහි ද පහාන- සච්ඡිකිරියා- භාවනා- අභිසමය- පාරිපූරි යන මොවුන්ගේ වශයෙන් ද නිවනට යන්නෝ ය පාරගාමීහු. **'සකඅත්තභාවසඞ්ඛාතෙසු පඤ්චසුඋපාදානක්ඛන්ධෙසු පරිඤ්ඤා භිසමයපාරිපූරිවසෙන ච තතොයෙව තෙසං හෙතුභූතෙ සමුදයෙ තදප්පවත්තිලක්ඛණෙ නිරොධෙ නිරොධගාමිනියා පටිපදාය ච පහාණසච්ඡිකිරියා භාවනාභිසමයපාරිපූරිවසෙන පාරඞ්ගච්ඡන්තා නාම'** යනු අර්ථකථා ය **'සීලසමාධිපඤ්ඤා විමුත්තිආදීනං එතෙසං සීලාදිධම්මානං අත්තනො සන්තානෙ අරහත්තසමධිගමෙන අනවසෙසතො නිබ්බත්තපාරිපූරියා පාරං පරියන්තං නිබ්බානං ගච්ඡන්තීති = පාරගාමිනො'** යනු ද බැලිය යුතු ය. පාරගාමී සත්වයෝ ඉතා ටික දෙනෙකි, යනු මුල් කොටසේ අදහසය.

අථ අයං ඉතරා පජා = නැවැත මේ අන්‍ය වූ ප්‍රජා තොමෝ.

පජා, යන්නෙන් මුළු සත්ලොව ම ගැණේ. **'පජාති සත්ත ලොකස්ස පරියාය වචනමෙතං'** යි ඒ කීහ. එහෙත් මෙහි අන්‍යාර්ථවාචක වූ **ඉතරා,** යන්න විශෙෂණව යෙදීමෙන් නිවනට යන්නන් හැර අන්‍ය වූ සත්වලොකය කිය වේ.

තීරං එව අනුධාවති = මෙතෙරට ම පුන පුනා දුව යි.

පියවි මුහුදට එ ගොඩ මෙ ගොඩ දෙකක් වන්නා සේ සසර සයුරට ද එ ගොඩ මෙ ගොඩ දෙකක් වේ. සසරසයුරේ එගොඩ නම් නිවන යි. උපාදානස්කන්ධයන්ගෙන් එතෙර වූ තැන යි. සංස්කාරයන්ගේ නැවැත නො ඉපැත්ම යි. මෙ ගොඩ උපාදාන ස්කන්ධලොකය යි. සසරසයුරේ තීරය යි කියන, සත්කායට ම

හෙවත් ආශ්‍රව සහිත වූ උපාදානයන්ට ගොචර වූ සඤ්ඤයන්ට ම නැවැත නැවැත උත්පත්ති වශයෙන් දුව් යි. භවයෙහි නැවැත නැවැත උපදි යි.

යෙ ච බො සම්මාඅක්ඛාතෙ ධම්මෙ = යම් කෙනෙක් වනාහි මැනැවින් දෙසූ ධර්මයෙහි.

'එකන්තනියාන්තිකං කත්වා භාසිතෙ, සම්මා අවිපරීතතො අක්ඛාතා' යනාදිය 'සම්මදක්ඛාතා, යන්නට කල අර්ථ කථාපාඨ කිහිපයෙකි. කොටින් කිය යුත්තේ නිවනට අනුරූප වූ පිළිවෙත ත් පිළිවෙතට අනුරූප වූ නිවන ත් කියූ බැවින් බුද්ධධර්මය සම්මදක්ඛාත වූ බව ය. ප්‍රතිපත්තිය මේ ය යි කියන මෙහි පර්‍යාපත්තියෙහි කිසිවිටෙක ත් අර්ථවිපර්‍යාසයෙක් නො වේ. අන්‍යයන් අන්තරායකර ය යි කියූ ධර්ම, අන්තරායකර නො වන බැවින් ඒ අන්‍යතීර්ථකාදීන්ගේ ධර්මයෙහි අර්ථවිපර්‍යාසය පෙණේ. ඔවුන් නෛර්‍යාණිකය යි කියූ ධර්ම, නෛර්‍යාණික නො වේ. එහෙයින් ඔවුන්ගේ ධර්මය දුරක්ඛාත ය. බුද්ධධර්මය සම්මදක්ඛාත ය. කියූ අර්ථයෙහි වෙනසක් කිසිවිටක ත් නො වන බැවිනි.

ධම්මානුවත්තිනො = ධර්මය අනුව පවත්නෝ වෙත් ද.

මනා කොට වදාළ ධර්මය අසා දැන එයට සුදුසු පිළිවෙත් පුරන්නෝ, එයට අනුව පවත්නෝ ධර්මානුවර්තීහු නම් වෙත්. මැනැවින් දෙසූ ධර්මයෙහි යම් ගුරුවරයෙක් යම් අතවැස්සකු සමාදන් කරවා ද, හික්මවා ද ඒ ගුරුවරයා ත් ගුරුවරයා විසින් සමාදන් කරවන ලද ඒ අතවැස්සා ත් දෙදෙන ම ධර්මානුවර්තීකයෝ ය.

තෙ ජනා පාරංඑස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං = ඒ ජනයෝ තුම්බ තරණයට අතිදුෂ්කර වූ ත්‍රෛභූමිකවෘත්තය (ඉක්මවා) නිවනට පැමිණෙන්නාහ.

මනාකොට දෙසූ ධර්මය අසා තදනුවර්තීක ව දිවි ගෙවන මිනිස්සු සාමාන්‍ය ජනයා විසින් තරණය කරණු නබා, සිතනු බැරි ත්‍රෛභූමිකවෘත්තය තරණය කරණබව ය මින් වදාළෝ. නිවන් ලබන් ය යනු එහි තේරුම ය. මච්චු නම්, ක්ලේශමාරතෙමේ ය. ක්ලේස මරුට කැන් වූයේ කම්, ක්ලේශ, විපාක යන තුනය. මේතුන ත්‍රෛභූමිකවෘත්ත නම්.[1]

මේ ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියෝ ය.

ධම්ශ්‍රවණවසතුව නිමියේ ය.

---

1. 3. 1. 'මාරඛෙය්‍ය' යන්න බලනු

ආගන්තුකභික්ෂූන් වහන්සේලා

6—11

කොසොල් රට වැසි පත් සියයක් භික්ෂූන් වහන්සේලා වස් වැස පවරා, බුදුරජුන් දක්නට දෙව්රමට ගොස් බුදුරජුන් වැඳ පසෙක හුන්නාහු ය. බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ චරිතය බලා මේ ධර්මදේශනාව කළ සේක:-

කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතෝ,
ඔකා අනෝකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.
තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනෝ,
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතෝ.
යෙසං සම්බොධිඅඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා,
ඛීණාසවා ජුතීමන්තෝ තෙ ලොකෙ පරිනිබ්බුතාති.

නුවණැති තැනැත්තෝ අකුසල් දහම් වෙසෙසින් දුරු කොට, ගෙත් (නික්ම) ගේ නැති පැවිද්දට නොහොත් නිවන් පිණිස කුසල් දහම් වඩන්නෝ ය. යම් උපධිවිවෙකයෙක්හි සිත් අල වන්නට දුෂ්කර ද (ඒ නිවන් පිණිස ය)

ඒ නිවනෙහි ඇල්ම කැමැති වන්නේ ය. කාමයන් හැර දමා පළිබෝධ නැත්තේ සිත, සිත පිළිබඳ කෙලෙසුන්ගෙන් පිරිසිදු කරන්නේ ය.

යම් මහ රහත් කෙනෙකුන්ගේ සිත බොධ්‍යඞ්ගධර්මයන් කෙරෙහි නොහොත් සත්තිස් බෝ පැකි දහම් කෙරෙහි මනාකොට, මනා සේ වඩන ලද ද (කිසිවක් සිතින්) දුඩිව නො ගෙණ, ගැණීමට පටහැනි වූ නිවනෙහි යම් රහත් කෙනෙක් ඇලුනාහු ද, ද්‍යුතිමත් වූ ක්ෂීණාශ්‍රව වූ ඒ ආර්‍යපුද්ගලයෝ ලොකයෙහි පිරිනිවියෝ ය.

කණ්හං ධම්මං විප්පහාය = අකුසල් දහම් වෙසෙසින් දුරු කොට.

'කණ්හං ධම්මන්ති කායදුච්චරිතාදිභෙදං අකුසලධම්මං' යි අටුවා හෙයින් අකුසල් දහම්, කාෂ්ණධර්ම – කණ්හධම්ම යි කියනු ලැබේ. කායදුශ්චරිතාදිය යි. විස්තර යට කියනලද ය.

සුක්කං භාවෙථ පණ්ඩිතෝ = නුවණැත්තේ කුසල් දහම් වඩන්නෝ ය.

'සුක්කන්ති කාය සුචරිතාදිභෙදං කුසලධම්මං' යනු අටුවා බැවින් ශුක්ලධර්ම නම්, කායසුචරිතාදිය යි ගැණේ.

ඔකා අනොකං ආගමම්ම = ගෙන් (නික්ම) ගේ නැති පැවිද්දට. නොහොත් නිවනට පැමිණ. නිවන් පිණිස.

'ඔකං වුච්චති ආලයෝ, අනොකං වුච්චති අනාලයෝ, ආලයතෝ නික්ඛමිත්වා අනාලයසඞ්ඛාතං නිබ්බානං පවිවේව ආරබ්භාති' යනු ඔක - අනොක දෙක පැහැදිලි කළ සැටි යි. ඔක, යි කීයේ වසන තැන ය. අනොක, යි කීයේ විසීමක් නැති තැන ය. ඒ වනාහි පැවිදිබව හෝ නිවන යි. ඔක යි කියූ ගිහිගෙන් මුළුමනින් නික්ම ගෙයක් නැති බැවින් නිරුලය යි කියන පැවිද්දට පැමිණ, නොහොත් නිවන් පිණිස, යනු ඒ පාළියෙහි කෙටි තේරුම ය.

නුවණැත්තේ අකුසල් දහම් හැර, ගිහිගෙන් නික්ම, පැවිද්දට පැමිණ, නොහොත් නිවන් පිණිස, පැවිද්ද පටන් නිවන් ලැබීම තෙක් කුසල් දහම් වඩන්නේ ය, යනු මේ කොටසෙහි ඉතා කෙටි අදහස ය.

විවෙකෙ යත්ථ දූරමං = යම් විවේකයෙක්හි ඇලීම දුෂ්කර ද (ඒ නිවන සඳහා ය.

විවෙක, යි කීයේ ත්‍රිවිධ විවේකයන් අතුරෙහි උපධිවිවේක ය යි. උපධිවිවේක නම් නිවන ය. ඒ යට කියන ලද ය.

තත්‍ර අභිරතිං ඉච්ඡය්‍ය= ඒ නිවනෙහි ඇල්ම කැමැති වන්නේ ය.

හිත්වා කාමෙ අකිඤ්චනෝ = කාමයත් හැර කිසිවක් නැත්තේ.

වසතුකාමකෙලෙසකාම දෙක **කාමෙ,** යන පිතියා විභක්තියෙන යෙන් ගැණේ[1] **අකිඤ්චනෝ,** යනු **පණ්ඩිතෝ,** යන්නෙහි එල්බ සිටි යි.

පළිබොධ නැති නුවණැත්තේ යි හෝ, නුවණැත්තේ පළිබොධ නැත්තේ යි අරුත් ගත හැකි ය. එහි **'නත්ථි කිංචනං එතස්සාති= අකිංචනෝ'** යනු අත්‍ථසමත්‍ථනය යි. එහි **'රාගෝ කිංචනං, දොසෝ කිංචනං, මොහෝ කිංචනං'** යි මේ ඇ ලෙසින් ආ බැවින් රාග වෙෂ මොහාදිය හා දූ පුත් දැසි දස් ගො මහිස වතුපිටි ධනධාන්‍යාදිය කිංචනැ යි, කිංචන නම්, සත්‍වයා බැඳ වෙලා තබන ඒ රාගවෙෂාදී වූ කෙලෙස් හා උපභොග පරිභොග වස්තු සමූහය යි. රාගය උපදනේ සත්‍වයා බැඳ තබ යි. ඇතැම් මහණ කෙනෙක් වෙහෙර අරම් අතැවැසි ආදීන් හැර, අන් තැනෙක නො යන්නෝ ද මේ කිංචනයන්ගෙන් ඒ ඒ තැන්හි බැඳී සිටින බැවිනි. ගිහියෝ ගේ දොර ඉඩකඩම් අඹු දරුවන් හරින්නට

1. 4. 4. 'කාමෙසු' යන්න බලනු.

නො කැමැත්තාහු නිරාහාරව වුව ද එහි ම ඇලී ගැලී ඉන්නට කැමැත්තාහු නිතර ගේ සිහි කරන්නාහු වූවෝ මේ කිංචන ධර්මයන්ගේ ශක්තිය නිසා ය. **'රාශො උප්පජ්ජමානො සත්තෙ බන්ධති පළිබන්ධති තස්මා කිංචනති වුච්චති,** යනු අටුවා ය. සෙස්ස ද මෙසේ ය. පළිබොධ – කරදර යනු කිංචන යන්නෙහි ඉතා පැහැදිලි තේරුම යි. නිවනෙහි ඇලුනේ **අකිංචන,** නම් වේ. එසේ නිවන බලාපොරොත්තුවෙමින් සියල්ල හැර දමා ලාභා-පෙක්ෂාවෙන් තොර ව හරිහැටි මහණදම් කරණුයේ ත් අකිංචන නම්. පැවිදි ව සිවුපසය රැස් කරණුයේ මිල මුදල් උපයනුයේ අකිංචන නො වේ.

පරියොදපෙය්‍ය අත්තානං චිත්තකෙලසෙහි පණ්ඩිතො = නුව-ණැත්තේ සිත, සිත පිළිබඳ කෙලෙසුන්ගෙන් පිරිසිදු කරන්නේ ය.

මෙහි සිත **අත්තානං,** යන්නෙන් කියන ලදු යි දන්නේ ය. පංචනීවරණයෝ **චිත්තකෙලසෙහි,** යන්නෙන් ගැණෙති. කාම-ච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිඬ, උඩච්චකුක්කුච්ච, විචිකිච්ඡා යන මොවුහු ය නීවරණයෝ. **'නීවරනති චිත්තං හිතපටිපත්තිං ච නිවාරෙනතීති= නීවරණා,** යම්කිසි ධර්මකෙනෙක් කුසල් සිත් වළකත් ද, ලෞකිකලොකොත්තරගුණයට නැමුනු හිත වූ පිළිවෙත වළකත් ද ඔවුන් නීවරණැ යි මින් කීහ. සිතෙහි උපදවා ගතයුතු ධ්‍යාන විමොක්ෂ මාර්ගඵලාදී වූ සියලු ගුණ දහම් වළකාලන්නෝ නීවරණ යෝ' යි කී සේ ය. නීවරණ, යම් සිතෙක උපදී නම්, ඒ සිතෙහි නො උපන් ලෞකිකලොකොත්තරප්‍රඥාවට ඉපදීමට ඉඩ නො දෙන්නේ ය. ඉපද සිටියා වූ අෂ්ටසමාපත්තිපඤ්චාභිඥාදිගුණයන් සිඳ බිඳ හෙල යි. එහෙයින් මේ ධර්මපස ප්‍රඥාව දුර්ලභ කර යි. ඒ කීහ මෙසේ:

'ඉමෙ පංචනීවරණා උප්පජ්ජමානා අනුප්පන්නාය ලොකිය ලොකුත්තරාය පඤ්ඤාය උප්පජ්ජිතුං න දෙනති, උප්පන්නාපි අට්ඨසමාපත්තියො පඤ්ච වා අභිඤ්ඤා උච්ඡින්දිත්වා පාතෙනති තස්මා පඤ්ඤාය දුබ්බලීකරණාති වුච්චනතීති'

වස්තුකාමයන්හි ඇලීම **කාමච්ඡන්ද** නම්. වස්තුකාමයන් කරුණු කොට සිතේ උපදින කෙලශකාමය යි. කාමවස්තු මේය යි යට කියන ලදී. ඒ මේ කාමවස්තුහු ගොදුරු වන්නෝ ඇස, කණ, නැහැය, දිව, කය, සිත යන මේ සදෙනාට ය. ඇසට රූපයක් අරමුණු ගොදුරු වූ විට සිතෙහි උපදින රූපකාමය රූපය කෙරෙහි වූ ආශාව කාමච්ඡන්දය යි. කන් ආදීනට ද ශබ්දාදී වූ අරමුණු ලැබුනු විට ඒ ඇසුරෙන් සිතෙහි උපදින ශබ්ද කාමාදිය ශබ්දාදිය කෙරෙහි වූ ආශාව කාමච්ඡන්දය යි.

යමෙක් යමකු වෙනින් ණය ගෙණ කා බී අවසන් කොට ණයෙන් බැඳී සිටියේ ද, ඔහු ණය හිමියන් විසින් 'ණය දෙව' යි ඉල්ලනු ලබන්නේ කුණු කතා කියමින් බණිනු ලබන්නේ බදිනු ලබන්නේ කිසිවක් කියා ගත නො හි සියලු ඇණුම් බැණුම් ඉවසා සිටී යි. එසේ ඇණුම් බැණුම් ඉවසා සිටීමට කරුණු වූයේ ඔහු ගත් ණය යි. එ පරිද්දෙන් යමෙක් යම් කිසිවකු කෙරෙහි කාමච්ඡන්ද-යෙන් ඇලේ ද, බැඳේ ද ඔහු, ඔහු විසින් බණිනු ලබන කල්හි, ගසනු ලබන කල්හි සියල්ල ඉවසා සිටී යි. කාමච්ඡන්දය එයට හෙතු යි. පුරුෂයා ස්ත්‍රියගේ ඇණුම් බැණුම් ඉවසන්නේ, ස්ත්‍රිය පුරුෂයාගේ ඇණුම් බැණුම් ඉවසන්නී කාමච්ඡන්දය නිසා ය. සත්වයා එ ලොව මෙ ලොව දෙක්හි මහත් විපතට නපුරට වැටෙනුයේ ද මේ නිසා ය. සසර දුක මහත් වනුයේ ද මේ නිසා ය. කාම-ච්ඡන්දය ණයක් වැනිය යි බුදුරජහු වදළෝ ය. **සිඟාල-චුල්ල පලෝභන-මුදුලක්ඛණ-තෙලපත්තජාතකාදිය** බැලිය යුතු ය.

ව්‍යාපාද නම්, නස්නා සිතිවිල්ල යි. 'අන්හු නැසෙත්වා' ඇ විසින් මෛත්‍රියට පටහැනි ව සිතේ පවත්නා යහපත් ගති නසන්නා වූ සිතිවිල්ල යි. එහි කොපයට වැඩිතරම් වූයේ ව්‍යාපාදය යි. **'අත්තනෝ ච පරස්ස ච හිතසුඛං ව්‍යාපාදෙතීති = ව්‍යාපාදෝ,** තමන්ගේ හා අනුන්ගේ හිත සුව නසන්නේ ද ව්‍යාපාදයයි, මෙයින් කීහ. කුණු වීමෙන් මුලින් පැවැති ගති ගුණ නැතුව ගිය කොමු පිඹු ඔත් ආදිය මෙන් වෙෂය කරණ කොට මුලින් පැවැති ගති ගුණ නැතුව යයි. එහි **'ඛ්‍යාපජ්ජති ඉමිනා චිත්තං පූතිකුම්මාසාදයෝ ව පුරිමපකතිං ජහතීති = ඛ්‍යාපාදෝ,** යනු අර්ථසමර්ථනය යි.

පිත කිපීමෙන් හටගත් ලෙඩ ඇත්තෝ මී හකුරු ආදි මිහිරක් අනුභව කළේ ද, ඔහුට ඒ මිහිර තිත්ත රසයක් සේ වැටහේ. මිහිර තිත්තැ යි කියා වමනය කර යි. එමෙන් ව්‍යාපාදයෙන් මැඩුනේ ගුරුවර මවුපියාදීන් විසින් කරණලද සවලපවූ ත් අවවාදය නො පිළිගණියි. 'තෙපි මට වඩ වඩා ත් උවදුරු කරන්නහු' යි වඩා ලා ත් කිපෙ යි. එහෙයින් මෙය පිත්තරොගියකු වැනි ය.

මිනීමැරුම් ආදි මහත් වූ ව්‍යසනයන්ට කරුණු වන්නේ ව්‍යාපාදය යි. මේ ද එ ලොව මේ ලොව දෙක්හි සත්වයාගේ මහත් විපතට හෙතු වේ. සසර දුක මහත් කෙරේ. **එකපණ්ණ-තිල මුට්ඨි-සෙට්ඨිඅණ්ඩජාතකාදිය** බැලිය යුතු ය.

ථිනමිද්ධ නම්, සිතේ හා වෙදනාදි සතර තුනේ කිලන් බවයි. සිතේ කිලන්බව, අරමුණු ගැණීමේ අපොහොසත් බව ථින, නම්.

වෙදනාදී වූ ස්කන්ධ තුනේ ගිලන්බව, මැලිබව මිඩ, නම්. චිත්ත චෛතසිකයෝ අරමුණු ගැණීමෙහි මැලි වන්නෝ ථිනමිඩය සිතෙහි උපන්විට ය.

වඳුරා නිදන්නේ බිම වැටේය යන බියෙනි. එහෙයින් උගේ නින්ද ඉතාටික ය. ඉතාකෙටි ය. නිදීම නො නිදීම වැනි ය. නිතර බියෙන් සිටින බැවිනි. එහෙයින් නාම ධර්ම පිළිබඳ වඳුරු නින්ද වැනි ගතිය ථිනමිද්ධ යි කියත්. යට කියූ විස්තරය ද බැලිය යුතු ය.

උත්සවදිනෙක සිර ගෙයි වැටී සිටි මිනිසෙක් උත්සවය පිළිබඳ කිසිත් නො දක්නේ ය. සිරගෙන් නිදහස් ව පිටත ආ පසු ඔහු උත්සවය ගැණ කථාකරන්නවුන් දැක අසා ත් උත්සවය නො දුටු බැවින් ඒ ගැණ කිසිවක් නො කියන්නා සේ ථිනමිඩයෙන් මැඩුනු තැනැත්තේ බණ දෙසුම් විසිතුරු ව ඇති කල්හි ද, එහි කිසිත් කරුණක් ගැණ නො දනි යි. ථිනමිඩයෙන් මැඩී සිටි බැවිනි. ථිනමිඩය සිරගෙයක් වැනි ය. මෙ ද සත්වයාගේ විපතට හෙතු ය සසර දුක මහත් කරයි. **වරණ-ගජකුම්භජාතකාදිය** බැලිය යුතු ය.

උඩච්චකුක්කුච්ච නම්, සිතේ නො සන්සුන්බව හා තමන් කළ නො කළ හොඳ නො හොඳ ගැණ උපදනා සිතිවිල්ල යි. සිතේ වන නො සන්සුන්බව උඩච්චය යි. අලුගොඩට ගලකින් ගැසූ කල්හි අලුගොඩ විසිර යන්නා සේ සිත නන් අරමුණෙහි විසිර පවත්නේ මේ නො සන්සුන් ගතිය පැවැත්ම නිසා ය. පසුතැවීම කුක්කුච්චය යි. තැවෙන්නේ ද 'අයියෝ! මම අකුසල් කෙළෙමි, කුසල් නො කෙළෙමි, කරණ ලද්දේ අකුසල්ම ය, නො කරණලද්දේ කුසල් ම ය' යි තැවෙන්නේ ය. මේ තැවීම, කටයුතු පමාවට කරුණු ය සිතෙහි විපිළිසරයට හෙතු ය. මෙයින් සිත දූෂිත වේ. යට කියූ විස්තරය ද බලනු.

සෙල්ලම් කරමින් සිටියා වූ දාස තෙමේ 'ඕ! මා අතින් වහා ඉටු විය යුතු කටයුත්තෙක් තිබේ, මෙසේ සෙල්ලම් කරමින් දවස ගෙවීම් නම් එය කරණු බැරි වෙයි, මම මාගේ හිමියා විසින් 'මෙය වහා කරව' යි අණවන ලද්දේ වෙමි, එය වහා නො කොළොත් දඬුවම් කරණබව ත් කී ය, ඒ නිසා මා යා යුතු ය' යි සෙල්ලම් නවතා එ තැනින් නික්ම යයි. ඒ මගුල් සෙල්ලමෙහි කිසිවක් විඳ දරා ගන්නට ඔහුට නො ලැබේ. අනුන් යටතෙහි සිටින බැවිනි. එ පරිද්දෙන් විනයයෙහි දැනුම් නැති විවෙකය පිණිස වනයට ගියහු විසින් ඉතා සුලු කරුණෙහි පවා සැක දුරු කරගන්නට නිතර නිතර උගතකු කරා යා යුතු ය. කැපමසෙහි පවා නො කැපමසකැ යි අදහසක් පහළවූ විට ද විවෙකය හැර

දමා සිල් පිරිසිදු කරන්නට විනයධරයකු වෙතට යා යුතු ම ය. එහෙයින් මොහුට විවෙක සැපය වළඳන්නට ඉඩෙක් නො ලැබේ. උඩිවවකුක්කුච්චියෙන් මැඩී සිටීම එහි හෙතුව යි. එහෙයින් මෙය දුසඤ්ඤ වැනි ය. මෙ ද ඒ ලොව මෙ ලොව දෙක්හි දියුණුව නසාල යි. සසරදුක මහත් කර යි.

විවිකිච්ඡා නම්, සැකය යි. බුද්ධාදී වූ අට තැනෙක පවත්නා ඛැවින් අට වැදූරුම් කොට ත් අතීත, වර්තමාන, අනාගත යන කාල තුනේ පවත්නා සඤ්ඤයන් කෙරෙහි සත්ව පුද්ගල ආත්ම භාවයන් නිසා ගෙණ 'මම වූයෙම් ද, මම නො වූයෙම් ද, මම වන්නෙම් ද, මම නො වන්නෙම්' ද යනාදි ලෙසින් සොළොස් වැදූරුම් කොට ද දක්වන ලද්දේ ය.

කාන්තාරමාගීයට බට පුරුෂයා, සොරුන් මිනිසුන්ගෙන් ඕන පැහැර ගත් තැන් හා හිය තැන් දුක තැන තැනින් නහින ලී දඹුහඬ හෝ කුරුලුහඬ හෝ අසා 'සොරු ආහ' යි සිත සිතා සේ ද, සිටී ද, නවතී ද, එහෙයින් හට්ගත් උපන් සැක ඇත්තේ වේ ද, හිය තැනට වඩා ආ තැන් ම ඔහුට ඉතා බොහෝ වේ ද, දුකෙන්, බියෙන් බියරහිත තැනට යන්නේ පැමිණෙන්නේ හෝ නො යන්නේ නො පැමිණෙන්නේ හෝ යම්සේ ද එසේ යමකුට බුද්ධාදී වූ අට තැන්හි විචිකිච්ඡාව උපන්නී ද, ඔහු 'බුදු වූයේ ද් නො බුදු වූයේද් හෝ' යි යනාදී ලෙසින් සැක උපදවන්නේ ගුණ සලකා ගන්නට අපොහොසත් වේ. එසේ අපොහොසත් වූයේ මාගීයට හෝ ඵලයට හෝ නො පැමිණේ. කතරමග සොරු ඇද්ද, නැද්ද' යි නැවැත නැවැත සිතෙහි ඉදිරියට යෑම තැතිගැණීම උපදවමින් නිර්භය භූමියට පැමිණීමට අන්තරාය කරන්නා සේ විචිකිච්ඡාව ද බුදුහු ද, නො බුදුහු ද යනාදි ලෙසින් නැවැත නැවැත සිතේ ඉදිරියට යෑම තැති ගැණීම උපදවන්නී ආර්යභූමියට පැමිණීමට අන්තරාය කෙරේ නු යි කාන්තාරමාගීයක් වැනි ය යි කීහ. මෙ ද ඔහුන් විපතට කරුණු ය. සසරදුක මහත් කර යි.

ඉතා සැකෙවින් කියූ නීවරණධර්මයන්ගෙන් සිය සිත පිරිසිදු කිරීම ධ්‍යාන විමොක්ෂ මාර්ගඵලාදිය පිණිස හෙතු වන බැවින් නුවණැත්තේ නීවරණධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නේ ය; යනු **පරියොදපෙය්‍ය,** යන ක්‍රියා පදයෙන් දක්වා වදාළ සේක. නුවණැත්තේ නො උපන් කාමච්ඡන්දයට ඉපදීමට ඉඩ නො දීමෙන් හා උපන්නා වූ කාමච්ඡන්දය දුරු කිරීමෙන් සිත පිරිසිදු කරන්නේ ය.

අනිත්‍යය, අනිත්‍යය සේ ත් දුක, දුක සේ ත් අනාත්මය, අනාත්මය සේ ත් මෙනෙහි කිරීම වූ යොනිසොමනසිකාරය අසුබ අරමුණුවල බහුල කොට පවත්වන්නහුට කාමච්ඡන්දය පහව යයි. **'අපි භික්ඛවෙ! අසුභනිමිත්තං තත්ථ යොනිසෝ මනසිකාර බහුලීකාරෝ, අයමාහාරෝ අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස පහානාය'** යනු එහෙයින් වදාළ සේක.

තව ද අසුබ අරමුණු ඉගෙණීම, අසුබබැවුම්හි යෙදීම, සසිඳුරන්හි වැසූ දෙර ඇතිබව, බොජ්ඣන්හි පමණ දැනීම, කලණ මිතුරන් සෙවීම, හිතවත් සැප කතාව යන මේ සය, කාමච්ඡන්දය දුර හසා යෑමට, කාමච්ඡන්දයාගේ විනාශයට කරුණු වේ. **'අපි ච ඛෝ ඉමෙසං කාමච්ඡන්දස්ස පහානාය සංවත්තන්තානි අසුභනිමිත්තස්ස උග්ගහෙ, අසුභභාවනානුයොගෝ, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා, කල්‍යාණ මිත්තතා, සප්පායකථා'** යනු එහි දෙසනා ය. මේ ධර්ම සය හෙතුකොට රහත් ඔහුන් පහව ගිය කාමච්ඡන්දයාගේ මත්තෙහි නො ඉපදී ම වේ ය යි දතයුතු ය.

නුවණැත්තේ නො උපන් ව්‍යාපාදයට ඉපදීමට ඉඩ නො දීමෙන් හා උපන් ව්‍යාපාදය දුරු කිරීමෙන් සිය සිත පිරිසිදු කරන්නේ ය.

මෛත්‍රීචිත්තසමාධියෙහි යොනිසො මනසිකාරය බහුල කොට පවත්වන්නහුට ව්‍යාපාදය පහව යයි. මේ ඒ වදාළ සැටි:- **'අපි භික්ඛවෙ! මෙත්තාචෙතොවිමුත්තිං තත්ථ යොනිසෝ මනසිකාර බහුලීකාරෝ, අයමාහාරෝ අනුප්පන්නස්ස වා ව්‍යාපාදස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස පහානාය'** යි. මෙහි **මෙත්තා,** යන්නෙන් අප්පණා උපචාර සමාධි දෙක ම ගැණේ. **චෙතොවිමුත්ති,** යනු පමණක් කියනලද්දේ නම් ගැණෙන්නේ අප්පණාසමාධිය පමණක් වේ.

තව ද මෙත් නිමිති ඉගෙණීම, මෙත්බවුම්හි යෙදී ම, කමීය තමන් පිළිබඳ කොට ඇතිබව සිහිකිරීම, නුවණින් විමසීම බහුල කොට ඇතිබව, කලණ මිතුරන් සෙවීම, හිතවත් සැපකතාව යන මේ ද ව්‍යාපාදයාගේ දුර හසා යෑමට කරුණුවන බව, **'අපි ච ඛෝ ඉමෙසං ව්‍යාපාදස්ස පහානාය සංවත්තන්තානි මෙත්තානිමිත්තස්ස උග්ගහෙ, මෙත්තාභාවනානුයොගෝ, කම්මස්සකතාපච්චවෙක්ඛණා, පටිසඞ්ඛානබහුලතා, කල්‍යාණමිත්තතා, සප්පායකථා'** යන මෙයින් පැහැදිලි කළහ.

නුවණැත්තේ නො උපන් පීනමිඛයට ඉපදීමට ඉඩ නො දීමෙන් හා උපන් පීනමිඛය දුරු කිරීමෙන් සිය සිත පිරිසිදු කරන්නේ ය.

ත්‍රිවීධවීර්‍යයෙහි යොනිසොමනසිකාරය බහුල කොට පවත්වන්නහුට පීනමිඛය පහව යයි. **'අපි හික්ඛවෙ! ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු, තස්ස යොනිසොමනසිකාර බහුලිකාරෙ, අයමාහාරෙ අනුප්පන්නස්ස වා පීනමිඛස්ස අනුප්පාදය උප්පන්නස්ස වා පීනමිඛස්ස පහානාය'** යන මෙයින් ඒ වදාළ සේක.

මෙහි ප්‍රථමාරම්භවීර්‍යය ආරම්භධාතු නමි. කුසිතභාවයෙන් නික්මුණු බැවින් ඊට වඩා ඉතා බලවත් වීර්‍යය නික්කමධාතු නමි. ඒ නික්කමධාතුවට ද වඩා අතිශයබලප්‍රාප්තවීර්‍යය පරක්කමධාතු නමි.

තව ද අධිකභොජනයෙහි නිමිති ගැණීම, ඉරියවු පෙරළීම, ආලොකසංඥාව මෙනෙහි කිරීම, අභ්‍යවකාශයෙහි වසිම, කලණමිතුරන් සෙවීම, හිතවත් සැපකතාව යන මෙ ද පීනමිඛය පහ කොට යැවීමට කරුණු වේ. ඒ වදාළ සැටිය මේ:- **'අපි ච ඛො ඉමං පීනමිඛස්ස පහානාය සංවත්තනානි අතිභොජනෙ නිමිත්තග්ගාහො, ඉරියාපථසම්පරිවත්තනතා, ආලොකසඤ්ඤා මනසිකාරෙ, අබ්භොකාසවාසො, කල්‍යාණමිත්තතා, සප්පායකථා'** යි.

නුවණැත්තේ නො උපන් උඛ්ඛවකුක්කුච්චයට ඉපදීමට ඉඩ නො තැබීමෙන් හා උපන් උඛ්ඛවකුක්කුච්චය දුරු කිරීමෙන් සිය සිත පිරිසිදු කරන්නේ ය.

උඛ්ඛවකුක්කුච්චයෙහි යොනිසොමනසිකාරය බහුල කොට පවත්වන්නහුට උඛ්ඛවකුක්කුච්චය දුර ගසා යයි. ඒ වදාළේ මෙසේ ය:- **'අපි හික්ඛවෙ! චෙතසො අවූපසමො, තස්ස යොනිසොමනසිකාරබහුලිකාරෙ, අයමාහාරෙ අනුප්පන්නස්ස වා උඛ්ඛවකුක්කුච්චස්ස අනුප්පාදය උප්පන්නස්ස වා උඛ්ඛවකුක්කුච්චස්ස පහානාය'** යි.

තව ද බොහෝ ඇසූ පිරූ තැන් ඇතිබව, පිළිවිස්නාබව, විනයයෙහි ප්‍රගුණබව, වැඩිහිටියන් සෙවුම, කලණමිතුරන් සෙවුම, හිතවත් සැපකතාව යන මෙ ද උඛ්ඛවකුක්කුච්චය පහ කොට යැවීමට කරුණු වේ. මේ ඒ වදාළ සැටි යි:- **'අපි ච ඛො ඉමං උඛ්ඛවකුක්කුච්චස්ස පහානාය සංවත්තනානි, බහුස්සුතතා, පරිපුච්ඡකතා, විනයෙ පකතඤ්ඤුතා, වුඩ්ඪසෙවිතා, කල්‍යාණමිත්තතා, සප්පායකථා'** යි.

නුවණැත්තේ නො උපන් විචිකිච්ඡාවට ඉපදීමට ඉඩ නො දීමෙන් හා උපන් විචිකිච්ඡාව දුරු කිරීමෙන් සිය සිත පිරිසිදු කරන්නේ ය.

විචිකිච්ඡාව දුර ගසා යන්නී, කුශලාකුශලධර්ම සාවද්‍ය නිරවද්‍යධර්ම, සෙවිතව්‍යඅසෙවිතව්‍යධර්ම, හීනප්‍රණීතධර්ම, කෘෂ්ණ ශුක්ලධර්ම නුවණින් මෙනෙහි කිරීමෙන් ය. **'අත්ථි භික්ඛවෙ! කුසලාකුසලා ධම්මා සාවජ්ජානවජ්ජා ධම්මා සෙවිතබ්බා සෙවිතබ්බා ධම්මා හීනප්පණීතා ධම්මා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය අනුප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය පහානාය'** යි ඒ වදාළ සේක.

තව ද බොහෝ ඇසුපිරූ තැන් ඇතිබව, පිළිවිස්නාබව, විනයයෙහි ප්‍රගුණබව, අරමුණු නිශ්චයයාගේ බොහෝ බව, කලණ මිතුරන් සෙවුම, හිතවත් සැපකතාව යන මෙ ද විචිකිච්ඡාවගේ ප්‍රහාණයට උපකාර වේ. මේ එහි දෙශනා ය:- **අපි ච ඡ ධම්මා විචිකිච්ඡාය පහානාය සංවත්තන්ති, බහුස්සුතතා, පරිපුච්ඡකතා, විනයෙ පකතඤ්ඤුතා, අධිමොක්ඛබහුලතා, කල්‍යාණමිත්තතා, සප්පායකථා'** යි.

නීවරණයන්ගේ ඉපැත්මේ හෙතුන් හා විනාශයේ හෙතුන් පිරිසිඳ දැනුම දුඃඛසත්‍යය යි. එහිලා **'කෙවලං හි ඉධ නීවරණ පරිගගාහිකා සති දුක්ඛසච්චං'** යනු කියාලයි.

ණය ගෙණ කටයුතුවල යොදා සමෘඩ වූ වැඩිගිය කර්මාන්ත ඇති පුරුෂ තෙමේ 'ණය මහත් කරදරයෙකැ' යි පොලිය සහිත ණය ගෙවා නිදහස් වේ එහෙයින් ඔහු වෙත නැවැත ණය ඉල්ලා නැවැත කිසිවෙක් නො එයි. පණිවිඩ පණත් ද නො එව යි. ණය හිමියන් දැක නැගී නො සිටියි. භයෙක් ද නො වේ. එපරිද්දෙන් මහණ තෙමේ කාමච්ඡන්දය පළිබොධයට මුලැ යි **සතිපඨාන**යෙහි කී ලෙසින් අසුබ නිමිති ඈ දහම් වඩා කාමච්ඡන්දය දුර ගසා හරි යි. පහව ගිය කාමච්ඡන්දය ඇති ඔහුට, ණයෙන් මිදුනු පුරුෂයාහට ණය හිමියන් දැකීමෙන් බියක් තැති ගැන්මක් නො වන්නා සේ අනුන් අයත් වස්තුවෙහි ඇල්මෙක් බැඳීමෙක් නො වේ. දිව්‍යරූප දක්නා ලද ද කෙලෙස් නො උපදි යි. එහෙයින් කාමච්ඡන්දයාගේ ප්‍රහාණය ණය නැති බව සේ ය.

පිත්තරොගී පුරුෂ තෙමේ බෙහෙත් කා බී ඉන් මිදී, මී සකුරු ආදීන්ගේ රසය ඇතිලෙසින් විඳ ගන්නේ යම්සේ ද, එසේ ව්‍යාපාදය අනර්ථ කර ය යි ගත් මහණ තෙමේ මෙත් නිමිති ඈ වඩා

ව්‍යාපාදය දුරුකර යි. දුරුකළ ව්‍යාපාදනීවරණය ඇත්තේ පිත්ත රොගයෙන් මිදුනු පුරුෂයා මී සකුරු ආදීන්ගේ රසය විඳින සේ ආචාරප්‍රඥප්ති ආදියෙහි හික්මවනු ලබන්නේ සතුටින් හික්මෙයි. ව්‍යාපාදනීවරණප්‍රහාණය ආරොග්‍ය මෙනැ යි වදලෝ එහෙයිනි.

පෙර මගුල්දිනෙක සිරගෙයි ලූ පුරුෂයා, පසු මගුලෙක 'ප්‍රමාද දොෂයෙන් බැඳුනු මට පෙර මගුලෙහි කිසිවක් විඳ ගන්නට නො ලැබිනැ, මෙ වක නො පවා වියයුතු ය' යි සතුරන්ට ඉඩ නො තබා මගුල් කෙළි විඳ, එයින් උදම් ව උදත් අනන්නේ යම්සේ ද එසේ මහණ තෙමේ 'ථිනමිඛය මහානත්‍ථකර ය' යි ආහාරයෙහි පමණ දැනීම් ආදි ධර්‍ම වඩා ථිනමිඛනීවරණය දුරු කර යි. මෙසේ පහකළ ථිනමිඛය ඇත්තේ, යම්සේ බැඳුමෙන් මිදුනු පුරුෂයා සතියක් පමණකු ත් මගුල් කෙළි කෙළිනේ, මූල මැද කෙළවර මගුල් කෙළි විඳි ද, එසේ දහම් නමැති මගුල් කෙළි, කෙළ කෙළ මූල මැද කෙළවර ඒ විඳ සිටු පිළිසැඹියාවත් සමග රහත්බවට පැමිණේ. එහෙයින් ථිනමිඛනීවරණප්‍රහාණය බැඳුමෙන් මිදීම සේ ය.

දැසයෙක් තෙමේ මිතුරකු මගින් හිමියන්ට ධනය දී දැසභාව යෙන් මිදී කැමැති සේ හැසිරෙන්නේ යම්සේ ද, එසේ මහණ තෙමේ 'උඛ්ඛච්චකුක්කුච්චය විපත්තිකර ය' යි බහුශ්‍රැතභාවාදි ධර්‍මයන් වඩා උඛ්ඛච්චකුක්කුච්චය දුරුකර යි. මෙසේ පහ වූ උඛ්ඛච්චකුක්කුච්චය ඇත්තේ, දැසකම්හි මිදුනු පුරුෂයා තමන් කැමැති සේ කරා ද, කිසිවෙක් බලාත්කාරයෙන් ඔහු නො වළකා ද, එ පරිද්දෙන් තමන් කැමැති සේ නෙකඛම්මපටිපදාවට පැමිණේ. උඛ්ඛච්චකුක්කුච්චය ඔහු එයින් නො ද වළක යි එහෙයින් උඛ්ඛච්චකුක්කුච්චනීවරණප්‍රහාණය දැසකමින් මිදීම සේ ය.

හස්තාරෝහ ගෙණ ආයුධ ඇති ව පිරිවර සහිත ව කතරට පිළිපන් බලවත් පුරුෂයකු දුටු සොරු, දුරදී ම දුක බියෙන් පලා යන්නාහ. ඔහු සුවසේ ඒ කතර තරණය කොට අභයභූමියට පැමිණ සතුටු වෙයි. එ පරිද්දෙන් මහණ තෙමේ 'මේ විචිකිච්ඡාව භයානකැ' යි බහුශ්‍රැතභාවාදී වූ ධර්‍ම වඩා ඒ දුරු කරයි. මෙසේ පහ වූ විචිකිච්ඡා ඇත්තේ දුසිරිත්කතර එතෙර කොට පරමක්ෂෙම භූමිය වූ නිර්‍වාණයට පැමිණේ. විචිකිච්ඡානීවරණප්‍රහාණය ක්ෂෙම භූමියක් සේ වූයේ එහෙයිනි. මේ මතු දක්වෙන්නී ඒ දෙශනා ය.

'සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො ඉණං ආදාය කම්මනෙන පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සම්පජ්ජෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි, තානි ච ඛ්‍යන්තී කරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං ධනාහරණාය, තස්ස එවමස්ස, අහං බො

පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං, තස්ස මෙ කම්මන්තා සමිජ්ඣිංසු, සො අහං යානි ච පොරාණානි ඉණ මූලානි තානි ච ඛ්‍යත්තී අකාසිං, අත්ථි ච මෙ උත්තරිං අවසිඨං දාරාභරණායාති, සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තමස්ස නච්ඡාදෙය්‍ය, න චස්ස කායෙ බල මත්තා, සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය, භත්තමස්ස ඡාදෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා, තස්ස එවමස්ස, අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො, භත්තං ච මෙ නච්ඡාදෙසි, න ච මෙ ආසි කායෙ බලමත්තා, සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති, අත්ථි ච මෙ කායෙ බලමත්තා, සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො බන්ධනාගරෙ බඩො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනා මුච්චෙය්‍ය සොත්ථිනා අඛ්‍යයෙන, න චස්ස කොචි භොගානං වයො, තස්ස එවමස්ස, අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බඩො අහොසිං, සොම්හි එතරහි තම්හා බන්ධනා මුත්තො සොත්ථිනා අඛ්‍යයෙන, නත්ථි ච මෙ කො චි භොගානං වයොති, සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙන කාමඞ්ගමො, සො අපරෙන සමයෙන තම්හා දාසව්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙන කාමඞ්ගමො, තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙන කාමඞ්ගමො, සොම්හි එතරහි තම්හා දාසව්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙන කාමඞ්ගමොති, සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො සධනො සභොගො කන්තාරඩානමග්ගං පටිපජ්ජෙය්‍ය, සො අපරෙන සමයෙන තම්හා කන්තාරා නිත්ථරෙය්‍ය සොත්ථිනා අඛ්‍යයෙන, න චස්ස කො චි භොගානං වයො, තස්ස එවමස්ස, අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරඩානමග්ගං පටිපජ්ජිං, සොම්හි එතරහි කන්තාරා නිත්තිණ්ණො සොත්ථිනා අඛ්‍යයෙන නත්ථි ච මෙ කො චි භොගානං වයොති, සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

එවමෙව ඛො භික්ඛවෙ! භික්ඛු යථාඉණං යථාරොගං යථාබන්ධානාගාරං යථාදාසව්‍යං යථාකන්තාරධානමග්ගං, ඉමෙ පංචනීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති, සෙය්‍යථාපි භික්ඛවේ! ආනණ්‍යං යථාආරොගං යථාබන්ධනා මොක්ඛං යථාභුජිස්සං යථාඛෙමන්තභූමිං, එවමෙව භික්ඛු ඉමෙ පංචනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති' යනු.

නුවණැත්තේ පංචනීවරණයන්ගේ ඉපැත් ම හා නැවැත්ම සවිස්තරව දැන ඉපැත්මේ හෙතුන් නසා නැවැත්මේ හෙතුන් වඩා සිත පිරිසිදු කරන්නේ ය. **'පරියොදපෙය්‍ය අත්තානං චිත්තකෙලසෙහි පණ්ඩිතො'** යනු වදාළෝ ඒ බව දක්වන්නට ය.

යෙසං = යම්බඳු රහතුන්ගේ.

සම්බොධි අඞ්ගෙසු = බොධ්‍යඞ්ගධර්ම කෙරෙහි (නොහොත්) බොධි පාක්ෂිකධර්ම කෙරෙහි.

නිවන් අරමුණ එල්බ ලොකොත්තර සිත්වල එකක්ෂිණිකව ද නන් අරමුණ එල්බ ලෞකික සිත්වල නානාක්ෂණිකව ද උපදින සති, පඤ්ඤා, විරිය, පීති, පස්සඩි, එකග්ගතා, උපෙක්ඛා යන සත බොජ්ඣඞ්ග නමැ, යි කියත්. බුදුරජානන් වහන්සේ ඒ බොජ්ඣඞ්ග සත මෙසේ වදාළ සේක:- **'සත්තිමෙ භික්ඛවෙ! බොජ්ඣඞ්ගා, කතමෙ සත්ත? සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සඩිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො, ඉමෙ ඛො භික්ඛවෙ සත්තබොජ්ඣඞ්ගා'** යි.

'බොධියා බොධිස්ස වා අඞ්ගා බොජ්ඣඞ්ගා' සිවුසස් දහම් දැනුමට කරුණුවන සති පඤ්ඤා ආදී වූ ධර්ම සමූහය පිළිබඳ අව යව, සිව්සස් දහම් අවබොධ කරණ ආර්‍යශ්‍රාවකයාගේ අවයව, බොජ්ඣඞ්ග නම් වේ.

'බුජ්ඣති එතායාති = බොධි' කියා ත් **'බුජ්ඣතීති = බොධි'** කියා ත් **බොධි,** යන්න ව්‍යාඛ්‍යාත හෙයින් ආර්‍ය ශ්‍රාවකයාහට සිවුසස්දහම් දැනුමට සති පඤ්ඤා ආදී වූ ධර්ම සත උපකාර වන බව හා බොධි නම් වූ ආර්‍යශ්‍රාවකයාගේ අවයව ත් මෙකී ධර්ම සප්තකය බව හා පැහැදිලි ය.

'යා එසා ධම්මසාමග්ගි යාය ලොකුත්තරමග්ගක්ඛණෙ උප්පජ්ජමානාය ලීනුද්ධච්චපතිඨානාසූහනකාමසුඛත්තකිලමථානුයොගඋච්ඡෙදසස්සතාභිනිවෙසාදීනං අනෙකෙසං උප්පද්දවා

නං පටිපක්ඛභූතාය සති ධම්මවිචය විරිය පීති පස්සඩ්ඩි සමාධි උපෙක්ඛාසඞ්ඛාතාය ධම්මසාමග්ගියා අරියසාවකො බුජ්ඣති ති කත්වා බොධීති වුච්චති'

ලෞකිකලොකොත්තරමාර්ගක්ෂණයෙහි හෙවත් විදසුන් වඩනා වේලෙහි සිවුසස් දහම් දැන ගන්නා වේලෙහි සිතෙහි පහළ වන, ලීන, ඖඩත්‍යපතිඨාන, ආයූහන, කාමසුඛල්ලිකානුයොග, අත්තකිලමථානුයොග, උච්ඡේද, සස්සත යන මොවුන් තුළට කා වැදීම් ආදී වූ නොයෙක් උවදුරුවලට ප්‍රතිවිරුඬ භාවයෙන් සිටි සති, ධම්මවිචය, විරිය, පීති, පස්සඩ්ඩි, සමාධි, උපෙක්ඛා යන ධර්ම සාමග්‍රිය කරණ කොට ආර්‍යශ්‍රාවක තෙමේ අවබොධ කෙරේනු යි **බොධි,** නම් වේ. ආර්‍යශ්‍රාවකයාගේ චතුස්සත්‍යාවබොධයට කරුණු වන්නේ මෙ කී ධර්ම සතැ යි මෙයින් කීහ.

ආර්‍යශ්‍රාවක තෙමේ ක්ලෙශයන්ගේ පරම්පරා වශයෙන් පැවැත්මැ යි කියූ කෙලෙස් නින්දෙන් මුළුමනින් නැගී සිටින්නේ මේ ධර්මවර්ගීය හෙතු කොට ය. සිවුසස් දහම් ලක්ෂණ, රස, ප්‍රත්‍යුප ස්ථාන, පදස්ථාන වශයෙන් ප්‍රතිවෙධ කරන්නේ ත් මේ හෙතු කොට ය. නිබ්බානසච්ඡිකරණය ද වන්නේ මේ නිසා ය. බලන්න ඒ කියූ සැටිය:- **'බුජ්ඣති කිලෙසසන්තානනිද්දය උඨහති චත්තාරි වා අරියසච්චානි පටිවිජ්ඣති නිබ්බානමෙව වා සච්ඡිකරොති තස්සා ධම්මසාමග්ගියා සඞ්ඛාතායා බොධියා අඞ්ගාති = බොජ්ඣඞ්ගා'** යි.

මේ ධර්මසමූහයෙහි අවයව වූ සති ආදී වූ ධර්මයෝ එකෙක් එකෙක් ම බොජ්ඣඞ්ග වෙති. මෙහි වූ **අඞ්ග,** ශබ්දය **ඣානඞ්ග-මග්ගඞ්ග** යනාදි තන්හි සේ අවයවයෙහි ආයේ ය. අර්ථසම්පර්ධනය, කරණ සාධනයෙනි. **'බුජ්ඣති එතාය, බුජ්ඣති කිලෙසසන්තාන නිද්දය, උඨහති එතාය, බුජ්ඣති චත්තාරි අරියසච්චානි එතාය, බුජ්ඣති සච්ඡිකරොති නිබ්බානං එතාය,** යි මෙසේ ගන්නේ ය.

මෙහි **බුජ්ඣති,** යන්නෙන් ප්‍රධාන විසින් කියවෙනුයේ නිවන් අරමුණු කොට සිටි මාර්ගඥානය මුල් කොට ඇති චිත්තොත්පාදය යි. **එතාය,** යන්න, විදසුන් ජවන් සිත් හා යෙදුනු සතිධම්මවිචය ආදී වූ බොජ්ඣඞ්ගයන්ගේ ප්‍රකෘත්‍යුපනිඃශ්‍රයප්‍රත්‍යයශක්තිය හා මගසිත් හා යෙදුනු බොජ්ඣඞ්ගයන්ගේ සහජාතප්‍රත්‍යයශක්තිය එලොපචාර විසින් කියයි. බොධි යන තන්හි වූ ප්‍රත්‍යය තෙමේ විදසුන් කුසල් ජවන්සිත් හා යෙදුනු ලෞකික වූ බොජ්ඣඞ්ග හා ලොකොත්තර බොජ්ඣඞ්ග දක්වාල යි. එ පමණෙක් නො වේ. **බුධ,** ධාතුව හා එක්ව ගිය ඒ මේ **ඉ,** ප්‍රත්‍යය විසින් ආර්‍යශ්‍රාවක තෙමේ ත්

(බොධි යි) කියනු ලැබේ. **'යො පනෙස චුත්තපකාරාය එතාය ධම්මසාමග්ගියා බුජ්ඣතීති කත්වා අරියසාවකො බොධී ති වුච්චති,** යනු බැලිය යුතු ය.

'බොජ්ඣඞ්ගාති කෙනට්ඨෙන බොජ්ඣඞ්ගා? බොධාය සංවත්තන්තීති = බොජ්ඣඞ්ගා, බුජ්ඣන්තීති = බොජ්ඣඞ්ගා, අනු බුජ්ඣන්තීති = බොජ්ඣඞ්ගා, පටිබුජ්ඣන්තීති = බොජ්ඣඞ්ගා, සම්බුජ්ඣන්තීති=බොජ්ඣඞ්ගා, යනු පටිසම්භිදා පාළියෙහි ආයේ ය.

මාගීචිත්තවීථියෙහි විදර්‍ශනාපාදකපුථුභාගපරිකර්‍ම උපචාර අනුලෝම ගොත්‍රභූ චිත්තයන්හි නානාරම්මණික වශයෙන් නානා ක්‍ෂණික ව ද, අපරභාගයෙහි නිබ්බානාරම්මණික වශයෙන් එක ක්‍ෂණික ව ද උපදින සති පඤ්ඤා ආදී වූ චෛතසික, නිර්‍වාණාව බෝධය පිණිස පවත්නා බැවින්, ස්‍රෝතාපත්තිමාගීක්‍ෂණයෙහි නිවන් අවබෝධ කරණ බැවින්, සකෘදාගාමිමාගීක්‍ෂණයෙහි, අනාගාමිමාගීක්‍ෂණයෙහි, අර්‍හත්මාගීක්‍ෂණයෙහි නිවන් අවබෝධ කරණ බැවින් **බොජ්ඣඞ්ග,** නම් වේ යනු කෙටි සිංහල ය යි. **'බුජ්ඣන්ති, අනුබුජ්ඣන්ති, පටිබුජ්ඣන්ති, සම්බුජ්ඣන්ති'** යන ක්‍රියාපද සතරකින් බොජ්ඣඞ්ග, යන්නෙහි අර්‍ථ වර්‍ණනා කළේ, ස්‍රෝතාපත්ත්‍යාදිමාගීක්‍ෂණ සතරෙහි දී ම බෝධ්‍යඞ්ගයන් නිවන් අවබෝධ කරණ බැවිනි. **'සොතාපත්තිමග්ගබොජ්ඣඞ්ගානං බුජ්ඣනට්ඨො, සකදාගාමිමග්ගබොජ්ඣඞ්ගානං අනුබුජ්ඣනට්ඨො, අනාගාමිමග්ග බොජ්ඣඞ්ගානං පටිබුජ්ඣනට්ඨො, අරහත්තමග්ග බොජ්ඣඞ්ගානං සම්බුජ්ඣනට්ඨො'** යනු ඒ පැහැදිලි කෙරේ.

බෝධ්‍යඞ්ගයන් පිළිබඳ **බොධන-අනුබොධන-පටිබොධන සම්බොධන** යන අර්‍ථ සතර, ක්‍රමයෙන් **සොතාපත්ති-සකදාගාමි අනාගාමි-අරහත්ත** යන මාගී සිත් සතර පිළිබඳ වේ. මාගී චිත්තයෙහි පහළ වන මේ බෝධ්‍යඞ්ගධර්‍ම පිළිවෙළින් බලගතු වේ. සොතාපත්තිමග්ගචිත්තයෙහි පහළ වන බෝධ්‍යඞ්ගයනට වඩා, සකදාගාමිමග්ගචිත්තයෙහි පහළ වන බෝධ්‍යඞ්ග බලවත් ය. සෙසු මාගීයන්හිදී පහළ වන්නෝ ද මෙසේ ක්‍රමයෙන් බලවත් වෙත්. අතිශයබලප්‍රාප්තයෝ අරහත්තමග්ගචිත්තයෙහි පහළ වන්නෝ ය. ඔවුහු ම සත්‍සන්තානගත සකලක්ලෙශයන් ඉතිරි නො කොට නසති. ඉතා පැහැදිලි ලෙස නිවන් අවබෝධ කරවන්නෝ ඔවුහු ය. **අනු, පටි, සං** යන උපසර්‍ගයෝ ය ක්‍රමයෙන් ඔවුන්ගේ බලවත්බව කීවෝ. තව ද **බොජ්ඣඞ්ග** ශබ්දය හා යෙදී සිටි **සං,** යන්න ප්‍රශස්‍ත සුන්දරාර්‍ථ ඇත්තේ ය. **'පසත්ථා සුන්දරො වා බොජ්ඣඞ්ගා = සම්බොජ්ඣඞ්ගා'** යි කීයේ එහෙයිනි.

සති නම්, පෙර කළ කියූ දේ අමතක වන්නට නොදී දරා ගැණීමේ ශක්තිය ය. එහි විස්තර යට කියන ලදී. එහෙත් මෝ සාමාන්‍ය නොවේ. භාවනා බලයෙන් භාවිත වූ එහින් ම පොෂිත වූ ප්‍රබල වූ සමෘතිය මෙහිලා ගණිත්. විදර්ශනා, මාර්ග, ඵල වශයෙන් ඒ තෙ පරිදි ය. මග පල ලැබීම පිණිස සංඝාර ධර්මයන් අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් සිතා බලන්නහුගේ විදර්ශනාකුශලචිත්තයන්හි විදසුන් වඩන කාලයෙහි පහළ වන සමෘතිය, විදර්ශනාසමෘතිය යි කියනු ලැබේ. මෝ ම ය පූර්භාග බොධ්‍යඞ්ග නම්.

එසේ වැඩූ විදර්ශනා ඇති යොගාවචරයාහට සොතාපත්ති ආදී වූ මගසිත් සතරෙහි ඒ ඒ මගින් හළ යුතු නැසිය යුතු කෙලෙස් මූළඹනින් නසා පහළ වන්නී මාර්ගසමෘතිය යි. මගසිත්වලට අනතුරු ව ඒ හා පහළ වන පල සිත්හි පහළ වන්නී ඵලසමෘතිය යි. විදර්ශනා මාර්ගඵල චිත්තයන්හි මෙසේ පහළ වන සමෘතිය ම මෙහිලා අභිමත ය. සිවුසස් දහම් අවබොධ කරන්නහුගේ හෝ ඒ පිණිස උපකාර වූ ධර්ම සමූහයාගේ හෝ අවයව බැවිනි. සිහියෙන් තොරව සිවුසස් දහමිහි අවබොධයෙක් නොලැබේ. එහෙයින් සමෙබාධිඅඞ්ගයෙකැ යි කීහ. **'සති එව සංබොජ්ඣඞ්ගෝ= සතිසම්බොජ්ඣඞ්ගෝ'** යන මෙයින් සම්බොධියට අවයව වූයේ සතිය ම නුයි සතිසම්බොජ්ඣඞ්ග නම් වා යි කියූ.

'ඉධ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතෝ චිරකතම්පි චිරභාසිතම්පි සරිතා හොති අනුස්සරිතා අයං වුච්චති සතිසම්බොජ්ඣඞ්ගෝ' යනු බොජ්ඣඞ්ග පාලියෙහි ආයේ ය. මේ සසුනෙහි වූ මහණ තෙමේ සිහි ඇත්තේ උතුම් සිහි නුවණින් යුක්ත වූයේ පෙර කළ පෙර කියූ දේ සිහිකරන්නේ වෙයි. මේ වනාහි සතිසම්බොජ්ඣඞ්ග යි, කියනු ලැබේ යනු එහි ඉතා කෙටි තේරුම ය. මෙහි වූ සිහිය බලවත් එකක් බව දක්වන්නට ප්‍රඥාවක වූ නෙපක්ක ශබ්දය සති ශබ්දය හා එක් කොට තවත් පරමෙන යනුත් විශෙෂණ කොට යෙදූහ. මෙයින් වදාළෝ විදර්ශනාඥානසම්ප්‍රයුක්තසමෘතිය යි. එය ම සතිසම්බොජ්ඣඞ්ග නමැ යි ද කීහු. **'අයං එවං උපපන්නා සෙසබොජ්ඣඞ්ගසමුඨාපිකා විපස්සනාසම්පයුත්තා සති, සති සම්බොජ්ඣඞ්ගොති කථියති'** යනු ද දන්නේ ය.

තව ද බුදුරජාණන් වහන්සේ **'නනු භන්තෙ සතිසම්බොජ්ඣඞ්ගෝ?'** යි කථෙතුකම්‍යතාපුච්ඡා කොට එයට පිළිතුරු විසින් **'අත්ථි අජ්ඣත්තං ධම්මෙසු සති, අත්ථි බහිද්ධා ධම්මෙසු සති යදපි අජ්ඣත්තං ධම්මෙසු සති, තදපි සතිසම්බොජ්ඣඞ්ගෝ**

අභිඤ්ඤෙය්‍ය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, යදපි බහිධා ධම්මෙසු සති, තදපි සතිසම්බොජ්ඣඞ්ගා අභිඤ්ඤෙය්‍ය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති' යි වදාළ සේක. සිය සතන්හි වූ සංඝකාර ධර්මයන් සම්මර්ශනය කරන්නහුට පහළ වන සිහියක් ඇත. පර සතන්හි වූ සංඝකාර ධර්මයන් හැම අතින් ගෙණ බලන්නහුට පහළ වන සිහියක් ඇත. මෙසේ දෙයාකාර වූ සිහිය සතිසම්බොජ්ඣඞ්ග වූයේ, සිවුසස් දහම් මනා නුවණින් දැන ගැණීමට මනා අවබෝධයට නිර්වාණය පිණිස පවතී, යන අරුත් මෙයින් වදාළේ ලෞකිකලෝකොත්තර වශයෙන් දෙ පරිදි වූ සතිසම්බොජ්ඣඞ්ගය යි.

සතිසම්බොජ්ඣඞ්ගය නිවැරදි, අරමුණු සිහිකිරීම ලක්ෂණ කොට ඇත්තේ ය. නො මුලා බව කෘත්‍යය කොට සිටියේ ය. අරමුණු ඉදිරිපත් කිරීම පලය කොට ගත්තේ ය. සතර සතිපට්ඨානය ආසන්න කාරණය කොට පැවැත්තේ ය. **'උපට්ඨානලක්ඛණා සතිසම්බොජ්ඣඞ්ගා, අසම්මොහරසා, ගොචරාභිමුඛභාව පච්චුපට්ඨානා සතිපට්ඨානපදට්ඨානා'** යනු පාළිය යි. සක්විති රජුගේ චක්‍රරත්නය සියලු රත්නයන්ගෙන් පෙරටු ව යන්නා සේ මෙ ද සියලු ධර්මයන්ගේ ඉදිරියෙහි යන්නේ ය. එහෙයින් චක්‍රරත්නය වැනිය මෙ ය.

දුඃඛ, සමුදය, නිරෝධ, මාර්ග යන සිවුසස් දහම් රැස් කරනු යි හෝ විමසනු යි **ධම්මවිචය**, නම් වේ. **'චතුසච්චධම්ම විචිනාතීති = ධම්මවිචයෝ'** යි ඒ කීහ. ඒ චතුස්සත්‍යධර්ම විචිනනය, බොධි නම් වූ ධර්මසමූහයාගේ අවයව බැවින් හෝ චතුස්සත්‍ය ධර්ම අවබෝධ කරණ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ අවයව බැවින් හෝ **ධම්ම විචයසම්බොජ්ඣඞ්ග**, නම් ලබා. තව ද ඒ ම සම්බෝධියට අවයව වූයේ නු යි ධම්මවිචයසම්බොජ්ඣඞ්ග යි කියනු ලැබේ. **'ධම්ම විචයෝ එව සම්බොජ්ඣඞ්ගා = ධම්මවිචය සම්බොජ්ඣඞ්ගා'** යනු ඒ අර්‍ථය කියා පෑම ය.

වඩාලා ද කිය යුත්තේ උපාදානස්කන්ධ පස, නාම රූප වශයෙන් වෙන් කොට හැම නාම රූප ධර්මයක් කෙරෙහි අනිත්‍ය දුඃඛ අනාත්ම යන තිලකුණු සොඳ බලන්නා වූ ප්‍රඥා චෛතසිකය, ධර්මවිචයසම්බොධ්‍යඞ්ග බව ය. මෙ ද විදර්‍ශනා-මාර්ග-ඵල වශයෙන් තෙවැදෑරුම් ය. සෙස්ස සතිසම්බොජ්ඣඞ්ගයෙහි කී සේ ය.

සතිසම්බොජ්ඣඞ්ගයෙහි වැඩී කිය, එහෙයින් ම ප්‍රධානීභූත වූ මහණ තෙමේ කියූ ලෙසින් උපන් සිහියෙන් යුක්ත ව වසන්නේ

ඒ ධර්මයන් අනිත්‍ය – දුඃඛ – අනාත්ම වශයෙන් විදර්ශනා ප්‍රඥා වෙන් මනා කොට සොයා බලා ද, මනා කොට එහි හැසිරේ ද, සොයා බැලීමට පැමිණේ ද එබඳු වූ විදර්ශනාප්‍රඥාව, ධම්මවිචය සම්බොජ්ඣඞ්ග යි. **'සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනාති පවිචරති පරිවීමංසං ආපජ්ජති, අයං වුච්චති ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො'** යි බොජ්ඣඞ්ග පාළියෙහි ඒ වදාළ සේක. විදර්ශනා සම්ප්‍රයුක්තප්‍රඥාව මෙයින් ගැණේ. **'ඉදං වුත්තප්පකාරං බොජ්ඣඞ්ගසමුඨාපිකං ඤාණං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො නාම'** යනු එහි මෙලෙසින් කීහ.

තවත් ක්‍රමයකින් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය මෙසේ විස්තර වන්නේ ය. **'තත්ථ කතමො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො? අත්ථි අජ්ඣත්තං ධම්මෙසු පවිචයො, අත්ථි බහිධා ධම්මෙසු පවිචයො යදපි අජ්ඣත්තං ධම්මෙසු පවිචයො, තදපි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යදපි බහිධා ධම්මෙසු පවිචයො, තදපි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති'** යි. ඇතුළත පිටත දෙක්හි වූ සංස්කාරධර්මයන් සොයා බලන්නහුට ඒ පිළිබඳව උපදින ප්‍රඥාව, ධම්මවිචයසම්බොජ්ඣඞ්ග නම් වන බව හා එය ම විශිෂ්ටඥානය පිණිස මනා අවබොධය පිණිස නිර්වාණය පිණිස පවත්නා බවත්ය, මෙයින් කියවෙනුයේ. ලෞකික ලොකොත්තර වශයෙන් එය දෙ පරිදි වන බව ද කිය වේ.

ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය ධර්මතත්ත්වය විමසීම ලකුණු කොට සිටියේ ය. දහම් තතු එලිදරව් කිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. නො මුළා බව එහි පලය වේ. ආසන්නකාරණය සමාධිය ය. **'පවිචයලක්ඛණො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, ඔභාසන රසො, අසම්මොහපච්චුපඨානො,** යනු පාළිය යි.

මේ වනාහි මහත් ධර්මසමූහයක් ගෙණ සිටි බැවින් සක් විති රජුගේ හස්තිරත්නය සේ ය යි කීහ.

'වීරස්ස භාවො = විරියං, වීරානං වා කම්මං = විරියං, විධිනා ඊරයිතබ්බං වා = විරියං' යන විවරණයෙන් වීරයාගේ ගතිය වීරයන්ගේ ක්‍රියාව ක්‍රමානුකූලව පැවැත්විය යුත්ත වීර්‍ය්‍ය, යි කියන ලදී. එය කායික, මානසික යි දෙපරිදි ය. එහි සක්මණ ඉටනුහට උපන් වීර්‍ය්‍යය, කායික නම. 'යම්තාක් කලකින් මාගේ සිත, උපාදාන රහිත ව ආශ්‍රවධර්මයන් කෙරෙන් මිදෙන්නේ ද, ඒ තාක් මම මේ පළඟ නො බිඳින්නෙමි' යි මෙපරිද්දෙන් කාය ප්‍රයොග රහිත ව උපන් වීර්‍ය්‍යය, මානසික නම. **'කායිකතති**

වඩ්කමං අධිඝහන්තස්ස උප්පන්නවිරියං, චෙතසිකන්ති න තා වාහං ඉමං පලලඞ්කං භින්දිස්සාමි යාව මෙ න අනුපාදාය ආස වෙහි චිත්තං විමුච්චිස්සතීති එවං කායප්පයොගං විනා උප්පන්නවිරියං, යන්න එහි පාළිය යි.

මෙහිලා ප්‍රධාන වනුයේ මානසික වීර්‍යය ය. ඒ මේ මානසික වීර්‍යය සිවුසස් දහම් අවබොධ කරන්නහුගේ ධර්මසමූහයෙහි එක් අවයවයක් බැවින් **බොධ්‍යඞ්ග,** නම් වේ. නො උපන් අකුසල් නො උපදින ලෙසට, උපන් අකුසල් දුරුවන ලෙසට, නො උපන් කුසල් උපදින ලෙසට, උපන් කුසල් වැඩෙන ලෙසට රුකුල් දෙන ඒ මේ වීර්‍යය ම සම්බොජ්ඣඞ්ග නු යි **විරියසම්බොජ්ඣඞ්ග,** නම් වේ. **'විරියමෙව සම්බොජ්ඣඞ්ගො = විරියසම්බොජ්ඣඞ්ගො'** යනු ඒ පැහැදිලි කිරීම ය.

පුර්‍යෝක්තධර්මයන් නුවණින් විචිනනය කරණ නුවණ හසුරු වන පිරික්සුමට පැමිණි මහණහුගේ වීර්‍යය සිවුසස් දහම් දැනුමට පටන් ගැණුනේ නො හැකුළුනේ වීර්‍යසම්බොධ්‍යඞ්ග යි. **'තස්ස තං ධම්මං පඤ්ඤාය විචිනතො පච්චරතො පරිවීමංසං ආපජ්ජතො ආරඩං හොති විරියං අසලලීනං අයං වුච්චති විරිය සම්බොජ්ඣඞ්ගො'** යන මේ බොජ්ඣඞ්ග පාළියෙන් එලි පෙහෙලි වේ. විදර්ශනාසම්ප්‍රයුක්තවීර්‍යය මෙයින් ගැණේ. **'තස්ස භික්ඛුනො තං හෙඨා වුත්තප්පකාරං ධම්මං පරිපුණ්ණං හොති පගගහිතං අසලලීනං ඉදං බොජ්ඣඞ්ගසමුඨාපකං විපස්සනාසම්පයුත්තං විරියං විරියසම්බොජ්ඣඞ්ගො නාම'** යනු අටුවා ය.

'තත්‍ථ කතමො විරියසම්බොජ්ඣඞ්ගො? අත්‍ථ කායිකං විරියං, අත්‍ථ චෙතසිකං, විරියං, යදපි කායිකං විරියං, තදපි විරියසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යදපි චෙතසිකං විරියං, තදපි විරියසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති' යන බොජ්ඣඞ්ග පාළියෙන් කායික මානසික වශයෙන් දෙප රිදි වූ වීර්‍යය, විරියසම්බොජ්ඣඞ්ග බව හා එම විශිෂ්ටඥානය පිණිස මනා අවබොධය පිණිස නිර්‍යාණය පිණිස පවත්නා බව ත් පැහැදිලි වේ.

වීර්‍යසම්බොධ්‍යඞ්ගය දැඩි කොට ගැණුම ලකුණු කොට සිටි යේ ය. රුකුල් දීම කෘත්‍යය කොට ඇත්තේ ය. නො පසු බැස්ම පලය වේ. ආසන්නකාරණය වීර්‍යාරම්භවස්තුව යි. **'පගගහ ලක්ඛණො විරියසම්බොජ්ඣඞ්ගො උපත්‍ථම්භනරසො,** යනු එහි පාළිය යි.

මේ වනාහි සම්ප්‍රයුක්තධර්ම වැටෙනු නො දී දැඩි ව ගන්නා වෙග ඇති බැවින් සක්විතිරජුගේ අශ්වරත්නය සේ ය යි කීහ.

'පීණයතීති = පීති' තමන් හා යෙදුනු ධර්මයන් පිණවානු යි **පීති,** නම. ඒ නම් අරමුණු ලැබීමේ දී තමන් හා යෙදුනු චිත්ත චෛතසිකධර්මයන් පිණවන කාමාමිස- ලොකාමිස- වට්ටාමිසයන් ගේ අභාවයෙන් නිරාමිස වූ ප්‍රීතිචෛතසිකය යි. එහි විතර වැණුම් යට කියන ලදී. සිවුසස් දහම් අවබොධයට උපකාර ව පවත්නා ධර්මසමූහයෙහි එක්තරා ප්‍රශස්ත අවයවයක් බැවින් චතුස්සත්‍යාවබොධය කරන්නහුගේ සුන්දර අවයවයක් බැවින් ප්‍රීතිචෛතසිකය **ප්‍රීතිසම්බොධ්‍යඞ්ග'** යි කියනු ලැබේ. ප්‍රීතිය ම ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යි දතයුතු. **'පීති එව සම්බොජ්ඣඞ්ගො = පීතිසම්බොජ්ඣඞ්ගො' ආරඩවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා, අයං වුච්චති පීතිසම්බොජ්ඣඞ්ගො'** යනු බොජ්ඣඞ්ග පාළි යෙහි ආයේ ය. මෙයින් විදර්ශනාසම්ප්‍රයුක්තප්‍රීතිය කිය වේ. **'කාමාමිසලොකාමිසවට්ටාමිසානං අභාවෙන නිරාමිසා පරිසුඩා අයං බොජ්ඣඞ්ගසමුඪාපිකා විපස්සනාසම්පයුත්තා පීති, පීතිසම්බොජ්ඣඞ්ගො නාම'** යන මෙයිනු දු පැහැදිලි වන්නේ ඒ ය. කාමලොකවට්ටාමිසයෝ නම් තෘෂ්ණාව ත් එයට අරමුණු වූ සක්‍යත්ය. තරමක විස්තර විසින් කිය යුත්තේ පඤ්ච කාමය පිළිබඳ වූ රාගය ත් එයට අරමුණු වන දේ ත් කාමා මිස යි ද, **'සස්සතො අත්තා ච ලොකො'** යනාදි ලොකග්‍රහණ වශයෙන් පැවැති ශාස්වතොච්ඡේදදෘෂ්ටි සහගත වූ රාගය ත් එයට අරමුණු වන දේ ත් ලොකාමිස යි ද, සසර ඇලුම් කිරීම් වශයෙන් උපදින, සත්වයා සසර උපදවන රාගය ත් එයට අරමුණු වන දේ ත් වට්ටාමිස යි ද කියා ය. **'කාමලොකවට්ටාමිසාති තණ්හා, තදාරම්මණක්ඛන්ධාති වදන්ති, පංචකාමගුණිකරාගො තදාරම්මණඤ්ච කාමාමිසං, සස්සතො අත්තා ච ලොකො චෙති ආදිනා ලොකග්ගහණවසෙන පවත්තො සස්සතුච්ඡේදසහගතො රාගො තදාරම්මණඤ්ච ලොකාමිසං, ලොකධම්මං වා වට්ටස්සාදවසෙන උප්පන්නො සංසාරජනකො රාගො තදාරම්මණඤ්ච වට්ටාමිසං''** යනු එහි ටීකා ය.

කාමය ම කාමාමිස නම. ක්ලෙශකාමය මෙයින් අදහස් කරණ ලදී. ක්ලෙශයන් විසින් කැමැතිවනු ලබන්නේ වස්තු කාමය යි. වස්තුකාමය ආම්ශීනය කරන්නේ ක්ලෙශකාමය යි. සෙසු දෙ තැන ද මෙසේ ගන්න. **'කාමෙතීති = කාමො, අස්සාද වසෙන ආමසතීති = ආමිසං, කාමො ච ආමිසන්ති කාමාමිසං, කිලෙසකාමො, වත්ථුකාමො පන ආමසීයතීති = ආමිසං, එවං සෙසචයම්පි'** යනු අටුවා ය.

අතික් ලෙසකින් මේ වදාරන බුදුරජානන් වහන්සේ **'තත්ථ කතමො පීතිසම්බොජ්ඣඩ්ගො? අත්ථි සවිතක්කසවිචාරා පීති අත්ථි අවිතක්කඅවිචාරා පීති, යදපි සවිතක්කසවිචාරා පීති තදපි පීතිසම්බොජ්ඣඩ්ගො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යදපි අවිතක්කඅවිචාරා පීති, තදපි පීතිසම්බොජ්ඣඩ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති'** යනු වදාළ සේක. විතර්ක විචාර සහිත වූ ද විතර්ක විචාර රහිත වූ ද ප්‍රීතිය පීතිසම්බොජ්ඣඞ්ග යි ද, ඒ ම විශිෂ්ටඥානය පිණිස මනා අවබොධය පිණිස නිර්වාණය පිණිස වන බව ද මෙයින් පැහැදිලි වේ. ලෞකික ලොකොත්තර වශයෙන් දෙ පරිදි බව ද මෙයින් පැවසේ.

පීතිසම්බොජ්ඣඞ්ගය පැතිරීම ලකුණු කොට සිටියේ ය. කය සිත දෙක්හි පිණවීම මෙහි කෘත්‍යය වේ. ඔවුන්ගේ ම ඔද වැඩි බව පලය කොට ඇත්තේ ය. ආසන්නකාරණය ප්‍රමොද්‍යය යි. **'ඵරණලක්ඛණො පීතිසම්බොජ්ඣඩ්ගො, කායචිත්තපීණනරසො, ඔදග්ගපච්චුපඨානො, පාමොජ්ජපදඨානො'** යනු පාළියි.

මේ වනාහි කෙලෙස් අඳුරු නසා ආලොකය පතුරුවන බැවින් සක්විතිරජුගේ මණිරත්නය සේ ය.

'පස්සම්භනං = පස්සඩ්' සංසිඳීම ය, **පස්සඩ්.** ඒ වනාහි වෙදනා – සංඥා – සංස්කාර – විඥාන යන නාම කාය පිළිබඳ වේ. කායපස්සඩ්, චිත්තපස්සඩ් යි දෙකක් වශයෙන් මේ එතුදු මෙහිලා එකක් වශයෙන් ගැණේ. චතුස්සත්‍යාවබොධයට උපකාර වූ ධර්ම සමූහයෙහිලා ගැණෙන එක්තරා ප්‍රශස්ත අවයවයක් බැවින් චතුස්සත්‍යාවබොධයාගේ සුන්දර අවයවයක් බැවින් **බොධ්‍යඞ්ග** නම් වී ය මෙ ය. **'පස්සඩ් එව සම්බොජ්ඣඩ්ගො=පස්සඩ් සම්බොජ්ඣඩ්ගො'** යි යූ බැවින් පස්සඩ්ය ම පස්සඩ්සම්බොජ්ඣඞ්ග යි දත යුතුය.

'පීතිමනස්ස කායො පි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති. අයං වුච්චති පස්සඩ්සම්බොජ්ඣඩ්ගො' යනු බොජ්ඣඞ්ග පාළියෙහි ආයේ ය. මෙයින් කියනුයේ ප්‍රීතියෙන් යුත් සිතැත්තහුගේ වෙදනාදි නාමකායයෙහි කෙලෙස් දැවුම් නිවී යෑමෙන් ලැබෙන සංසිඳීම, පස්සඩ්සම්බොජ්ඣඞ්ගය බව ය. සෙසු බොධ්‍යඞ්ගයන් උපදවන විදර්ශනාඥානසම්ප්‍රයුක්ත වූ පස්සඩ්ය යනු එහි අදහස ය. **'පීතිසම්පයුත්තස්ස ඛන්ධත්තයසඞ්ඛාතො නාමකායො කිලෙස දරථ පටිප්පස්සඩ්යා පස්සම්භති, විඤ්ඤාණක්ඛන්ධො පි තථෙව පස්සම්භති, අයං බොජ්ඣඞ්ගසමුඨාපිකා විපස්සනාසම්පයුත්තා පස්සඩ්, පස්සඩ්සම්බොජ්ඣඩ්ගො නාම'** යන අටුවාව එය පැහැදිලි කරයි.

'තත්ථ කතමො පස්සඩ්සම්බොජ්ඣඞ්ගො? අත්ථි කාය පස්සඩ්, අත්ථි චිත්තපස්සඩ්, යදපි කායපස්සඩ්, තදපි පස්සඩ්සම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති යදපි චිත්තපස්සඩ්, තදපි පස්සඩ්සම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති' යනු වදාළෝ පස්සඩ්සම්බොජ්ඣඞ්ගය අත් ලෙසකින් පහදා දෙන්නට ය. වෙදනාදි නාමකායයෙහි හා විඥානය යි කියූ චිත්තයෙහි සංසිඳීම පස්සඩ්සම්බොජ්ඣඞ්ගය බවත් එය විශිෂ්ටඥානය පිණිස සම්‍යක් අවබොධය පිණිස නිර්වාණය පිණිස පවත්නා බවත්ය මෙයින් වදාළෝ. මෙයින් ම මෙය ලෞකිකලොකොත්තර වශයෙන් දෙපරිදි බව ද පැහැදිලි ය.

පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය සංසිඳීම ලකුණු කොට සිටියේ ය. කායචිත්තදරථයන් මැඩීම කෘත්‍යය කොට ඇත්තේ ය. කාය චිත්තයන්ගේ නො සැලීම වූ සිහිල් බව පලය කොට ගත්තේ ය. සිටියේ කායචිත්ත දෙක ආසන්නකාරණය කොට ය. **'උපසම ලක්ඛණො පස්සඩ්සම්බොජ්ඣඞ්ගො, කායචිත්තදරථමද්දනරසො, කායචිත්තානං අපරිප්පන්දභූතසීතිභාවපච්චුපඨානො, කායචිත්තපදඨානො'** යනු පාළියි.

මේ වනාහි සක්විතිරජුගේ සත්‍රිරත්නය සේ ය. සක්විතිරජු සත්‍රිරත්නය වැළඳ ගැණීමෙන් කායචිත්තදාහයන් සංසිඳුවා ගන්නා සේ ආර්‍යශ්‍රාවකයා පස්සඩ්සම්බොජ්ඣඞ්ගය උපදවා ගැණීමෙන් කායචිත්ත දෙක්හි කෙලෙස් දැවුම් සංසිඳුවා ගන්නේ ය.

'එකාලම්බනෙ සුටඨු ආධානං = සමාධි' සමාධි නම් තමන් හා සම්ප්‍රයුක්තධර්මයන් අරමුණෙහි මැනැවින් පිහිටුවීම ය. චිත්ත චෛතසිකධර්මයන්ට ඒ ඒ අරමුණු කරා යන්නට නො දී එක් අරමුණෙක රඳවන චිත්තගතිය යි. වියලී සිටි සුණුවලට දිය එකතු කළ කල්හි එය එකට බැඳී සිටින සේ මේ චිත්තගතිය සිත එක් අරමුණෙක බැඳ තබයි. කුසල් සිත් පිළිබඳමය මේ චිත්තගතිය. **'කුසලචිත්තෙකග්ගතා සමාධි'** යනු ආප්ත වචනයි. මෙය සිවු මග නැණ ලැබුමට උපකාර වූ ධර්මසමූහයෙහි ප්‍රශස්ත අවයවයක් බැවින් මග නැණ ලැබුමට තැත් කරන්නහුගේ සුන්දර අවයවයක් බැවින් **බොධ්‍යඞ්ග** නම වී ය. **'සමාධි එව සම්බොජ්ඣඞ්ගො = සමාධිසම්බොජ්ඣඞ්ගො'** යි යූ බැවින් සමාධිය ම සමාධිසම්බොජ්ඣඞ්ග යි දතයුතු ය.

'පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති, අයං වුච්චති සමාධිසම්බොජ්ඣඞ්ගො' යනු බොජ්ඣඞ්ග පාළියෙහි ආයේ ය.

මෙයින් කියනුයේ සංසිඳුනු නාමකාය ඇති, එයින් ම සුවපත් වූවහුගේ සිතෙහි වූ එකඟ බව මැනැවින් පිහිටා ගැණීම, සමාධි සම්බොජ්ඣඞ්ගය බව ය. විදර්ශනාසම්ප්‍රයුක්තසමාධිය යනු එහි තේරුම ය. **'පස්සද්ධිකායතාය උප්පත්තසුඛෙන සුඛිතස්ස සම්මා ආධියති, නිච්චලං හුත්වා ආරම්මණෙ ඨපීයති, අප්පණාප්පත්තං විය හොති, අයං බොජ්ඣඞ්ගසමුඨාපිකා විපස්සනාසම්පයුත්තා චිත්තෙකග්ගතා සමාධිසම්බොජ්ඣඞ්ගො නාම'** යන අටුවාව එය පැහැදිලි කරයි.

අනික් නය මෙසේ ය:- **'තත්ථ කතමො සමාධිසම්බොජ්ඣඞ්ගො? අත්ථි සවිතක්කො සවිචාරො සමාධි, අත්ථි අවිතක්කො අවිචාරො සමාධි, යදපි සවිතක්කො සවිචාරො සමාධි තදපි සමාධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යදපි අවිතක්කො අවිචාරො සමාධි, තදපි සමාධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති'** යනු බොජ්ඣඞ්ග පාළි යි. විතර්කවිචාර සහිත වූ ත් විතර්කවිචාර රහිත වූ ත් සමාධිය, සමාධිසම්බොජ්ඣඞ්ගය බව හා එ දෙක ම විශිෂ්ටඥානය පිණිස සම්‍යක් අවබෝධය පිණිස නිර්වාණය පිණිස පවත්නා බව ත් ලෞකිකලොකොත්තර වශයෙන් දෙපරිදි බව ත් බුදුරජානන් වහන්සේ පැහැදිලි කළහ.

සමාධිසම්බොජ්ඣඞ්ගය, චිත්තචෛතසිකධර්මයන් නො විසිරීම ලකුණු කොට සිටියේ ය. චිත්තචෛතසිකධර්මයන් නන් අරමුණු කරා යෑම නැවැත්ම කෘත්‍යය කොට ඇත්තේ ය. චිත්තචෛතසිකයන්ගේ නො සැලීම මෙහි පලය වේ. පංචකාමයෙන් තොර වූ නිරාමිස සුඛය ආසන්නකාරණය යි. **'අවික්ඛෙපලක්ඛණො සමාධිසම්බොජ්ඣඞ්ගො, චිත්තචෙතසිකානං සම්පිණ්ඩනරසො, චිත්තඨිති පච්චුපඨානො, සුඛිනො චිත්තං සමාධියතීති වචනතො පන සුඛමස්සපදඨානං'** යනු පාළියි.

මේ වනාහි චිත්තවික්ෂෙපය නසා සිත එක අරමුණෙක තැන්පත් කරණ බැවින් සක්විතිරජුගේ ගෘහපතිරත්නය සේ ය. ඒ මේ ගෘහපතිරත්නය ධනධාන්‍යාදිය මොනවට පිළියෙල කොට තබා සක්විතිරජුගේ සිත එකඟ කරයි.

'උපපත්තිතො යුත්තිතො ඉක්ඛතීති = උපෙක්ඛා' උපෙක්ෂා නම් පක්ෂයක් නො ගෙණ සතුරු මිතුරු කා කෙරෙහිත් යුක්තියට අනුව බැලීම ය. සිතෙහි පහළ වන උසස් ගතියකි මේ. මානාවමාන දෙක්හි සම ව සිටින්නේ මේ චිත්තගතිය හෙතු

කොට ය. යමෙක් ඡන්දදීන්ගේ වශයෙන් යුක්තිය ඉක්මවා නො යා නම්, එ ද, මේ ශක්තියෙන් ම වේ. මේ වනාහි යට සැකෙවින් කියූ තත්‍රමඛ්‍යස්ථතාචෛතසිකය යි. මගනැණ ලැබුමට උපකාර වූ ධර්මසමූහයෙහි ප්‍රශස්ත අවයවයක් බැවින් මගනැණ ලැබුමට තැත් කරන්නහුගේ සුන්දර අවයවයක් බැවින් මේ චෛතසිකධර්මය තෙමේ **'බොධ්‍යඞ්ග, නම් වී. 'උපෙක්ඛා එව සම්බොජ්ඣඞ්ගො= උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො'** යි යූ බැවින් උපෙක්ෂාව ම උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග යි දතයුතු ය. දශවිධ උපෙක්ෂාවන් අතුරෙහි බොධ්‍යඞ්ගොපෙක්ෂාව මෙහිලා ගැණේ.

'සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, අයං වුච්චති උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො' යනු බොජ්ඣඞ්ග පාළියෙහි ආයේ ය. මහණ තෙමේ එසේ සංසිඳුනු අරමුණෙහි මොනවට පිහිටි සිත මැදහත් ව යුක්තියට අනුව බලනුයේ වෙයි. මේ වනාහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග යි කියනු ලැබේ, යනු එහි සිංහල යි. විදර්ශනාසම්ප්‍රයුක්තඋපෙක්ෂාව මෙයින් කිය වේ. **'අප්පණාප්පත්තෙන විය සමාධිනා සමාහිතං (චිත්තං) සුටඨු අජ්ඣුපෙක්ඛිතා හොති, තෙසං ධම්මානං අනොසක්කන අනතිවත්තනභාවසාධකො මජ්ඣත්තාකාරො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො නාම'** යනු අටුවා ය.

මෙය අනික් ලෙසින් වදාළෝ මෙසේ ය:- **'තත්‍ථ කතමො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො? අත්‍ථි අජ්ඣත්තං ධම්මෙසු උපෙක්ඛා අත්‍ථි බහිඩා ධම්මෙසු උපෙක්ඛා, යදපි අජ්ඣත්තං ධම්මෙසු උපෙක්ඛා, තදපි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යදපි බහිඩා ධම්මෙසු උපෙක්ඛා තදපි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති'** යි. ආඛ්‍යාත්මිකබාහිර සංස්කාරයන් කෙරෙහි වූ උපෙක්ෂාව, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය බව හා එය විශිෂ්ටඥානය පිණිස සම්‍යක් අවබොධය පිණිස නිර්වාණය පිණිස පවත්නා බවත් ලෞකිකලොකොත්තර වශයෙන් දෙපරිදි බවත් මෙයින් පැහැදිලි කළහ.

උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය සිටියේ මැදහත් ව දැක්ම ලකුණු කොට ගෙණ ය. කෘත්‍යය වූයේ අඩු වැඩි නො කොට සමව දැකීම ය. මැදහත් බව එහි පලය යි. කර්මය ස්වකීය කෘත්‍යාදී වශයෙන් දැක්ම ආසන්නකාරණය කොට සිටියේ ය. **'පටිසඞ්ඛාන ලක්ඛණො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, ඌනාධිකතිචාරණරසො, මජ්ඣත්තභාවපච්චුපට්ඨානො, කම්මස්සකතාදිදස්සනපදට්ඨානො'** යනු එහි පාළිය යි.

මේ වනාහි සිත හැකිළීමෙන් හා උඩහු බවෙන් වෙන් කොට මැදහත් කරණ බැවින් සිය පියරජු සියලු කටයුතුවලින් මුදා සියල්ලෙහි මැදහත් කරණ සක්විති රජුගේ පරිනායකරත්නය සේ ය.

මේ හැම බොධ්‍යඞ්ගයෝ යොනිසොමනසිකාරය ආහාරය කොට සිටියෝ ය. මොවුන්ගේ ආහාරය යොනිසොමනසිකාරය යි.

'සෙය්‍යථාපි භික්ඛවෙ! අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති, අනාහාරෙ නො තිට්ඨති, එවමෙව බොභික්ඛවෙ! ඉමෙ සත්තබොජ්ඣඞ්ගා ආහාරට්ඨිතිකා ආහාරං පටිච්ච තිට්ඨන්ති, අනාහාරා නො තිට්ඨන්ති' යන මෙයින් වදාළේ මේ සිරුර ආහාරය නිසා පවත්නා සේ සප්තබොධ්‍යඞ්ගයන් යොනිසොමනසිකාරය නිසා පවත්නා බව හා යොනිසොමනසිකාරයෙන් තොර ව නො සිටින බවත් ය. **'සුරියස්ස භික්ඛවෙ! උදයතො එතං පුබ්බඞ්ගමං, එතං පුබ්බනිමිත්තං, යදිදං අරුණුග්ගමනං, එවමෙව බොභික්ඛවෙ! භික්ඛුනො සත්තන්නං බොජ්ඣඞ්ගානං උප්පාදාය එතං පුබ්බඞ්ගමං, එතං පුබ්බනිමිත්තං, යදිදං යොනිසොමනසිකාරො යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ! භික්ඛුනො පාමිඣබ්බං සත්තබොජ්ඣඞ්ගෙ භාවෙස්සති සත්තබොජ්ඣඞ්ගෙ බහුලී කරිස්සති'** යන මෙයින් පැහැදිලි වනුයේ සූර්‍යයාගේ උදාවීමට අරුණු නැගීම පෙරනිමිති වන්නා සේ බොධ්‍යඞ්ගයන්ගේ පහළවීමෙහි යොනිසොමනසිකාරය පෙර නිමිති වන බව හා බොධ්‍යඞ්ගයන් වැඩිය හැක්කේ බහුලීකෘත කළ හැක්කේ යොනිසොමනසිකාරයෙන් යුක්ත භික්ෂුනමට බවත් ය.

බොධ්‍යඞ්ගයෝ, ලෞකික – ලොකොත්තර වශයෙන් දෙපරිදි වෙති. එහි යම් බොධ්‍යඞ්ග කෙනෙක් සසරින් නිදහස් වීමට හෙතු වන්නෝ ද, ඔවුහු ලෞකිකයහ. මේ ලෞකිකයෝ ම ය විවට්ටූපනිස්සය නම් වූ පූජාභාගබොධ්‍යඞ්ගයෝ වන්නෝ ත්. මාගීයට පූජාභාග වන බැවින් පූජාභාග නම්හු. සීලයෙන් පිරිසිදු ව නාමරූපධර්ම අනිත්‍යාදි වශයෙන් තිලකුණට නගා විදසුන් වඩන්නහුට එ වේලෙහි උපදින විදර්ශනාකුශලචිත්තයන්හි හට ගැණෙන සති ආදි වූ චෛතසිකධර්ම සත, මෙසේ බැවින් ලෞකිකය යි ගැණේ. විදර්ශනාචිත්තයන් හා සම්ප්‍රයෝගයට ගියෝ ය ඔවුහු.

ලොකොත්තරකුශලචිත්තයන් හා යෙදුනු බොඩ්‍යඞ්ගයෝ ලොකොත්තරයහ. මාර්ගබොඩ්‍යඞ්ග-ඵලබොඩ්‍යඞ්ග, යි ඔවුහු දෙ පරිදි ය. ස්‍රොතාපත්ති සකෘදාගාමී අනාගාමී අර්හත් යන මග සිත් සතරෙහි පහළ වන්නෝ මාර්ගබොඩ්‍යඞ්ගයෝ ය එහි ම පල සිත් සතරෙහි වූවෝ ඵලබොඩ්‍යඞ්ගයෝ ය.

මෙ කී හැම බොඩ්‍යඞ්ගයෝ විවෙකය, විරාගය, නිරොධය ඇසුරු කළෝ නිවනට නැමී සිටියෝ ය. **'ඉධ භික්ඛු සති සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධ නිස්සිතං වොස්සගගපරිණාමිං ධම්මවිචයසම්බොජ්ඣ-ඞ්ගං -පෙ- විරියසම්බොජ්ඣඞ්ගං -පෙ- පීතිසම්බොජ්ඣඞ්ගං -පෙ- පස්සඩ්සම්බොජ්ඣඞ්ගං -පෙ- සමාධිසම්බොජ්ඣඞ්ගං -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාග-නිස්සිතං නිරොධනිස්සිතං වොස්සගගපරිණාමිං'** යනු එහි දෙශනා ය.

එහි විවෙකය, කාය - චිත්ත - උපධි යි තුනකට ත් තදඞ්ග-වික්ඛම්භන - සමුච්ඡේද - පටිප්පස්සඩ්ධි - නිස්සරණ යි පසකට ත් බෙදී යයි. විස්තරය යට කියන ලදී. බොඩ්‍යඞ්ගයන් සිය සිත්හි ඉපදවීමෙහි යෙදුනු යොගීහු පිළිබඳ මෙ කියූ බොඩ්‍යඞ්ගයෝ විදර්ශනාක්ෂණයෙහි කෘත්‍යය වශයෙන් තදඞ්ගවිවෙකය ද අදහස් වසයෙන් නිස්සරණවිවෙකය ද ඇසුරු කෙරෙති. විදර්ශනාපාදක කසිණ-ආනාපාන-අසුභ-බ්‍රහ්මවිහාරධ්‍යානයන් ගේ ප්‍රවෘත්තික්ෂණ යෙහි කෘත්‍යය වශයෙන් වික්ඛම්භනවිවෙකය ඇසුරු කෙරෙති. මාර්ගක්ෂණයෙහි කෘත්‍යය වශයෙන් සමුච්ඡේදවිවෙකය ද, අරමුණු කිරීම් වසයෙන් නිස්සරණවිවෙකය ද ඇසුරු කරති. ඵලක්ෂණ යෙහි කෘත්‍යය වශයෙන් පටිප්පස්සඩ්ධි විවෙකය ද අදහස් වසයෙන් නිස්සරණවිවෙකය ද ඇසුරු කරති. බොඩ්‍යඞ්ගයන් ගේ පංචවිධ විවෙකාශ්‍රය මෙසේ දතයුතු ය.

'විරජ්ජනං = විරාගො' නො ඇලීම **විරාග,** නම් වේ. කෙලෙසුන් හා කිසිත් ඇලීමක් නැතිබව මින් කිය වේ.

'නිරුජ්ඣනං - නිරොධො' නැවැත නො උපදින පරිදි කෙලෙසුන් නිරුඩ කිරීම **නිරොධ,** නම් වේ. මේ දෙපදින් ම කියන ලද්දේ විවෙකාර්ථයම ය. විරාගාදීහු විවෙකාර්ථ ඇත්තාහ. **'විවෙකත්ථා එව හි විරාගාදයො'** යන්නෙන් ඒ පැහැදිලි ය.

'වොස්සජ්ජනං පහාණං = වොස්සගෙගා, කෙලශත්‍යාගය කෙලෙස් පැහිම **වොස්සගග,** නම් වේ. ඒ වනාහි පරිච්චාග-පක්ඛන්දන වශයෙන් දෙවැදෑරුම් ය. **'පරිච්චාගවොස්සගෙගාති**

කිලෙසප්පහාණං' කෙලෙස්පැහිම පරිච්චාගවොස්සග්ග යි ද, **'පක්ඛන්දනවොස්සග්ගෙනාති නිබ්බානපක්ඛන්දනං'** නිවනට පිවිසීම පක්ඛන්දනවොස්සග්ග යි ද කියන ලදී. මෙලෙසින් වොස්සග්ග ශබ්දයෙහි අර්ථ දෙකක් ඇත්තේ ය.

විදර්ශනාක්ෂණයෙහි දී බොඬ්ඣඬ්ගයෝ තදඬ්ගවික්ඛම්භන් වශයෙන් කෙලෙසප්පහාණයෙන් පරිච්චාගවොස්සග්ගයට නැමී සිටිති. අරමුණුකිරීම් වශයෙන් පක්ඛන්දනවොස්සග්ගයට (නිවනට) නැමී සිටිති.

මාර්ගක්ෂණයෙහි දී සමුච්ඡේද වශයෙන් කෙලෙසප්පහාණය කොට පරිච්චාගවොස්සග්ගයට ද අරමුණු කිරීම් වසයෙන් පක්ඛන්දන වොස්සග්ගයට ද නැමී ගණිති. පක්ඛන්දනවොස්සග්ගයට නැමී සිටියෝ ම ය ඵලබොඬ්ඣඬ්ගයෝ.

මෙසේ, විවෙක, විරාග, නිරොධයන් ඇසුරු කොට සිටි බොඬ්ඣඬ්ගයන් වඩන්නහු විසින් ඒ වැඩිය යුත්තේ පරිච්චාග පක්ඛන්දනවොස්සග්ග පිණිස ය. ඒය ඔහුගේ පරමාර්ථය. බොඬ්ඣඬ්ග වැඩීමෙහි නිරත වූ යොගාවචරයා මේ පිණිසම ය, ඒ වඩන්නේ. මුහුකුර වන්නේ.

දැන් මෙහිලා අඩු වැඩි නොකොට බොඬ්ඣඬ්ග සතක් ම දැක්වීමෙහි හේතු කිමැ යි දතයුතු ය. ඒ පිණිස මේ දෙශනා ය.

'කස්මා පන භගවතා සත්තෙව බොජ්ඣඬ්ගා වුත්තා අනූනාධිකාති? ලීනුද්ධච්චපටිපක්ඛතෝ සබ්බත්ථිකතෝ ච, එත්ථ හි තයොව බොජ්ඣඬ්ගා ලීනස්ස පටිපක්ඛා, යථාහ, යස්මිං ච බො භික්ඛවෙ! සමයෙ ලීනං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ ධම්මවිචයසම්බොජ්ඣඬ්ගස්ස භාවනාය, කාලො විරියසම්බොජ්ඣඬ්ගස්ස භාවනාය, කාලො පීතිසම්බොජ්ඣඬ්ගස්ස භාවනායාති, තයො උද්ධච්චස්ස, යථාහ, යස්මිං ච බො භික්ඛවෙ! සමයෙ උද්ධතං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඬ්ගස්ස භාවනාය, කාලො සමාධිසම්බොජ්ඣඬ්ගස්ස භාවනාය, කාලො උපෙක්ඛාසම්බොජ්ඣඬ්ගස්ස භාවනායාති'

බුදු රජුන් විසින් බොඬ්ඣඬ්ගධර්ම සතක් ම අඩු වැඩි නොකොට වදාරණ ලද්දේ හැකුළුනු බවට ත් උඩගුබවට ත් ප්‍රතිපක්ෂ භාවයෙන් හා සියලු අරුත් සිදු කරණ බැවිනුත් ය. මේ සප්ත බොඬ්ඣඬ්ගයන් අතුරෙහි තිදෙනෙක් ලීනමිද්ධයට පටහැනි වෙති. ධම්මවිචය = විරිය – පීති සම්බොඬ්ඣඬ්ගයෝය බවුහු තිදෙන. සිත හැකුළුනු විට, අලසබවට පැමිණි විට මේ බොඬ්ඣඬ්ග තුන වැඩිය

යුතු ය. එයින් සිත අලස බැවින් මිදී භාවනාකර්මයට සුදුසු වේ. අභිමතාර්ථලාභයට යොග්‍ය වේ. පස්සඩ්-සමාධි-උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගයෝ උඩඟුබවට විරුද්ධ වෙති. සිත උඩඟු වූ විට ඇවුසුනු විට මේ බොඩ්‍යඞ්ග තුන වැඩිය යුතු ය. එයින් සිත උඩඟුබවෙන් මිදේ. භාවනාවට සුදුසු වේ. එකලා වූ සතිසම්බොජ්ඣඞ්ගය සියලු බොඩ්‍යඞ්ගයන් විෂයෙහි බල පවත්වයි. ලුණු, හැම මස් මාලුවෙහි බල පවත්වන්නා සේ ය. ලුණෙන් තොරවූ මස් මාලු අනුභව නො කළ හැක්කා සේ සිහියෙන් තොර වූ බොඩ්‍යඞ්ගයෝ තමන් අයත් කටයුත්තෙහි අපොහොසත් වෙති. **'එකො පනෙත්ථ ලොණධුපනං විය සබ්බබ්‍යඤ්ජනෙසු ඉච්ඡිතබ්බො'** යනු මෙහිලා සිහියට ගත යුතු ය. රජු පිළිබඳ සියලු කටයුතු විමසා බලන මහඇමැතියකු සේ සිහිය සියලු හිතාහිතධර්මයන් විමසා බලයි. හිතධර්මයන් ලංකොට අහිතධර්මයන් පහ කොට හරියි. එහෙයින් සියලු බොඩ්‍යඞ්ගයන් කෙරෙහි සිහිය ක්‍රියා කරන්නී ය. **'සබ්බකම්මිකමහාමච්චො විය ච සබ්බෙසු රාජකිච්චෙසු, සබ්බ බොජ්ඣඞ්ගෙසු ඉච්ඡිතබ්බො'** යනු කීයේ එහෙයිනි. මෙයින් පෙණෙනුයේ සතිසම්බොජ්ඣඞ්ගය ජිනමිඩයට පටහැනි ව ගිය බොඩ්‍යඞ්ගතුනෙහි ද උඩච්චයට පටහැනි ව ගිය බොඩ්‍යඞ්ග තුනෙහි ද යන ත්‍රික දෙකෙහි යෙදිය යුතු බව ය. **'සතිඤ්චඛ්වාහං භික්ඛවෙ! සබ්බත්ථිකං වදාමි,** යනු බුද්ධ වචනයි.

සප්තබොඩ්‍යඞ්ගයන් අතුරෙහි තුනක් ජිනමිඩයට ප්‍රතිපක්ෂ වශයෙන් ද තුනක් උද්ධච්චයට ප්‍රතිපක්ෂ වශයෙන් ද, එකක් සර්වසාධාරණ වශයෙන් දැ යි මෙසේ බොඩ්‍යඞ්ග සතක් ම වදාළ සේකැ, යි දතයුතු ය.

දෙශනාක්‍රමයෙහි සිහිය මුල් කොට වදාළෝ සිහියෙන් තොරව ධම්මවිචයාදීන්ගේ පිළිලැබීම නො වන බැවිනි. ස්මෘතිමත් යොගාවචර තෙමේ ම බොඩ්‍යඞ්ගධර්මප්‍රතිලාභයෙහි පොහොසත් වේ. සියලු බොඩ්‍යඞ්ගයන්ගේ ඉදිරියෙහි යන්නී සිහිය ය. සතිසම්බොජ්ඣඞ්ගය මුල් කොට වදාළෝ එබැවිනි.

තත්ත්වවිමර්ශකයාහට ම ය වීර්‍යකරණයෙහි උද්‍යෝගය වන්නේ. දහම් තතු විමසීමෙන් පසු තදවබොධයෙහි සිත උනන්දු වේ. ස්මෘතිමත්යොගීහට ස්මෘතිබලයෙන් එයට අනතුරු ව තත්ත්ව ඥානය වන බැවින් දෙවන කොට ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයත් තෙවන කොට විරියසම්බොජ්ඣඞ්ගයත්, උද්‍යෝගී යොගාවචරයාහට ම නිරාමිෂප්‍රීතිය පිළිලැබෙන බැවින් සිවුවැනි කොට පීතිසම්බොජ්ඣඞ්ගයත්, ප්‍රීතිමත් වූවහු ගේ ම කායචිත්තදරථයන් සංසිඳෙන බැවින් පස්වැනි කොට පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයත්,

කායචිත්තදාහයන් සංසිඳුනහු ගේම සිත එකඟ වන බැවින් සවැනි කොට සමාධිසම්බොජ්ඣඞ්ගය ත්, එකඟ වූ සිතැත්තහු ම මැදහත් ව බලන බැවින් සත් වැනි කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග යත් වදාළ සේක.

'එවං භාවිතෙසු ඛො භික්ඛවෙ! සත්තසු බොජ්ඣඞ්ගෙසු එවං බහුලීකතෙසු සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛා, කතමෙ සත්තඵලා? සත්තානිසංසා? දිඝෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, අථ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, අථ පංචන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති, අථ උපහච්චපරිනිබ්බායී හොති, අථ අසංඛාරපරිනිබ්බායී හොති, අථ සසඞ්ඛාරපරිනිබ්බායී හොති අථ උඩංසොතො අකනිඝගාමී හොති, එවං භාවිතෙසු ඛො භික්ඛවෙ! බොජ්ඣඞ්ගෙසු එවං බහුලීකතෙසු ඉමෙ සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛා' යන මෙයින් විධිමත් ලෙසින් වැඩූ විධිමත් ලෙසින් බහුල කළ බොඞ්ඣඞ්ගයන් ගෙන් ලැබෙන ඵලය, ලැබෙන ආනිසංසය දක්වා වදාළ සේක. මරණයට බොහෝ කල් තබා අර්හත්ත්වය ලබනුයේ, මරණාසන්න කාලයෙහි හෝ අර්හත්ත්වය ලබනුයේ, අන්තරාපරිනිබ්බායී හෝ වනුයේ, උපහච්චපරිනිබ්බායී හෝ වනුයේ, අසඞ්ඛාරපරිනිබ්බායී හෝ වනුයේ, සසඞ්ඛාරපරිනිබ්බායී හෝ වනුයේ, උඩංසොත අකනිඝගාමී හෝ වනුයේ, ක්‍රම නො වරදවා වැඩූ බොඞ්ඣඞ්ග යන්ගේ ශක්තියෙන් බව මෙයින් පැහැදිලි වේ. මේ ආර්‍යයන් ගැණ යට කියන ලදී. වැඩූ බහුල කළ බොඞ්ඣඞ්ගබලයෙන් ලැබෙන අනුසස් සතකි, මෙහි කියවුනේ.

අසුරගැසීම් පමණ කලකුදු සති ආදී බොඞ්ඣඞ්ගයන් වඩන සිය සිත්හි උපද වන මහණහු, නො සිස් වූ ධ්‍යාන ඇත්තකු බුදුවදන් කරන්නකු, අවවාදයෙහි පිළිපදින්නකු, රට වැසි භක්ති මතුන් සැදැහයෙන් දෙන ණය නැති නො සිස් බත් පිඩ රහතකු සේ වළඳන්නකු වනබව හා බොඞ්ඣඞ්ගයන් බහුල වශයෙන් වඩන්නහුට ඉන් ලැබෙන අනුසස් පමණ නො කළැකි බව ත් **'අච්ඡරාසඞ්ඝාතමත්තම්පි වෙ භික්ඛවෙ! භික්ඛු සතිසම්බොජ්ඣ-ඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, අයං වුච්චති භික්ඛවෙ! භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසන කරො ඔවාදපතිකරො අමොඝං රඝපිණ්ඩං පරිභුඤ්ජති, කො පන වාදො? යෙ නං බහුලී කරොන්ති'** යන මෙයින් වදාළ සේක.

සසර දුක් නසා නිවන් ලබන්නහු ඒ පිණිස, සම්මාසම්බෝධි පවේණිබෝධි – සාවකබෝධි යනු තුනෙන් එකකට පැමිණිය යුතු ය. මේ කියූ බෝධීන්ට අඩංග වූවෝ සති ආදීහු ය. එහෙයින් වැඩූ-දියුණු කළ සති ආදී වූ බෝධ්‍යඞ්ගයන්ගේ අනුභාවයෙන් මය සම්මාසම්බෝධි ආදීනට නැඟිය හැක්කේ. එහෙයින් සසර දුක් නසන්නට නිවන් ලබන්නට ඒ ඒ පමණින් තමහට අභිමත බෝධියට පැමිණෙන්නට සැහෙන පමණින් බෝධ්‍යඞ්ග වැනිය යුතු ය.

සවාමිදරු වූ බුදුරජානන් වහන්සේ සම්මාසම්බෝධිය අවබෝධ කළෝ තමුන් වහන්සේ වැඩූ බෝධ්‍යඞ්ගයන්ගේ අනුභාවයෙනැ යි **'සතා බොජ්ඣඞ්ග භාවෙත්වා අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ'** යන මෙයින් වදාළ සේක.

දිනෙක බුදු රජානන් වහන්සේ භික්ෂූන් අමතා තෘෂ්ණාව නසනු පිණිස මාගීය වූ, ප්‍රතිපදාව වූ සප්ත බෝධ්‍යඞ්ගයන් වඩන්නැ, යි වදාළ කල්හි උදායි ස්ථවිරයන් වහන්සේ බුදු රජුන් වැඳ 'කෙසේ වඩන ලද බෝධ්‍යඞ්ගයෝ තෘෂ්ණාව නසන්නට උපකාර වෙත් දැ?' යි ඇසූහ. එවිට බුදු රජානන් වහන්සේ 'උදායි! විවේකාදිය ඇසුරු කළ බෝධ්‍යඞ්ග, තෘෂ්ණාව නසන්නට වහල් වේ ය, විවේකාදිය ඇසුරු කළ බෝධ්‍යඞ්ග වඩන්නහුගේ තෘෂ්ණාව ක්ෂය වන්නේ ය, තෘෂ්ණාව ක්ෂය වීමෙන් කර්මක්ෂය වන්නේ ය. කර්මක්ෂය වීමෙන් සියලු දුක් පහව යන්නේ ය' යි වදාළ සේක.

'මාරසෙනප්පමද්දනං වෝ භික්ඛවෙ! මහණං දෙසිස්සාමි තං සුණාථ, කතමෝ ච භික්ඛවෙ! මාරසෙනප්පමද්දනෝ මහණෝ, යදිදං සත්තබොජ්ඣඞ්ගා' යන මෙයින් වදාළේ මර සෙනඟ බිඳ පලවා හැරීමෙහි මාගීය, මැනැවින් වැඩූ සප්ත බෝධ්‍යඞ්ගයන් බවය. 'මහණෙනි! මම තමුසේලාට මර සෙනඟ එඬි ඔඬින මඟ කියන්නෙමි, එය අසවු! මහණෙනි! මර සෙනඟ එඬි මඬින මඟ නම්, සප්තබෝධ්‍යඞ්ගය' යනු එහි ඉතා කෙටි තේරුමය.

'යෙ කෙචි භික්ඛවෙ! අතීතමඛානං සමණා වා බ්‍රාහ්මණා වා නිස්සෝ විධා පජහිංසු, සබ්බ තෙ සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා, යෙපි කෙචි භික්ඛවෙ! අනාගතමඛානං සමණා වා බ්‍රාහ්මණා වා නිස්සෝ විධා පජහිස්සන්ති! සබ්බ තෙ සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා, යෙපි කෙචි භික්ඛවෙ! එතරහි සමණා වා බ්‍රාහ්මණා වා නිස්සෝ විධා පජහන්ති, සබ්බ තෙ සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා' යනා

මේ දෙශනාවෙන් පැහැදිලි කළෝ ඉකුත් දවස යම් මහණ බමුණු කෙනෙක් ත්‍රිවිධ මානය නැසුවෝ නම්, එන දවස යම් මහණ බමුණු කෙනෙක් ත්‍රිවිධ මානය නසන්නෝ නම්, මෙදවස යම් මහණ බමුණු කෙනෙක් ත්‍රිවිධ මානය නසත් නම්, ඒ සියල්ලෝ එසේ කළෝ ත් කරන්නෝ ත් මොකවට වැඩූ බහුල වශයෙන් දියුණු කළ බොඬ්‍යඬගබලයෙන් බව ය.

අතීතානාගතවර්තමානකාලික වූ බුඬ ප්‍රත්‍යකබුඬ අග්‍රශ්‍රාවකමහාශ්‍රාවකාදිආර්‍යීභාවය බොඬ්‍යඬග වැඩීමෙන් ම වන්නේ ය, යනු එහි ආශය වේ.

මහසුප් තෙරනුවන් දැනි සේ ශීලත් ව රජගහ නුවර පිපඵලි නම් ගල් ගුහාවෙක වසනබව දත් බුදුරජානන් වහන්සේ එහි වැඩ අසනීපයෙහි තොරතුරු අසා මහසුප් තෙරුන් කෙරෙහි මහත් දයාවෙන් බොධ්‍යඬගධර්මී වදුරා සෙත් වැඩූහ. ඒ ඇසූ මහතෙරනුවෝ එ කෙණෙහි එම රොගයෙන් නැගී සිට ගත්හ. මෙසේ මේ බොධ්‍යඬගධර්මීයන්ගෙන් සෙත් ලැබූ උත්තමයෝ එදා බොහෝ වූහ. අද ද නො ද ඇතැ යි නො කියැකි ය.

බොධ්‍යඬගධර්මීයෝ සසර දුකින් නිදහස ලබන තෙක් ම සත්වලොකයට හිතකර වෙති. අවසානැ සසර දුකින් සත්වයා මුළුමනින් ගලවා ලන්නෝ ද බොධ්‍යඬගයෝ ය. එහෙයින් බොඬ්‍යඬග වැඩීමෙහි කවර නම් නුවණැත්තෙක් පසුබට වන්නේ ද?

බොඬ්‍යඬග පහළ වීමෙහි හෙතූහු ඇත්තාහ. ඔවුහු අහෙතුක ව පහළ නො වෙති. එහෙයින් හෙතූහු ද ආගමයෙහි වෙන් වෙන් කොට දක්වන ලදූහ. ඒ මෙසේය කොටින්.

'වත්තාරෝ ධම්මා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, සතිසම්පජඤ්ඤං, මුළ්හසතිපුග්ගලපරිවජ්ජනතා උපට්ඨිතසතිපුග්ගලසෙවනතා තදධිමුත්තතා' යි සතිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැත්මට රුකුල් දෙන කරුණු සතරක් මෙයින් දක්වූහ. සිහිනුවණ ඇතිබව, සිහිමුළා පුගුලන් පලවා හැරීම, එළඹ සිටි සිහි ඇත්තන් සෙවුම, සිහිය උපදවා ගැන්මෙහි නැඹුරු වූ සිත් ඇති බව ඒ සතර ය.

එහි අභික්කන්තාදි සත් තැනෙහි සිහි නුවණින් යෙදී විසීමය, සතිසම්පජඤ්ඤ නම්.

බත් සඟවා තැබූ තැන එ කෙණෙහි අමනක ව යන කවුඩන් වැනි පුගුලන් දුරු කිරීම, ඔවුන්ගේ ආශ්‍රය අත් හැරීම, මුළුසතිපුග්ගලපරිවජ්ජනතාය.

තිස්සදත්ත, අභය ස්ථවිරාදීන් වැනි එළඹ සිටි සිහි ඇත්තන් සෙවුමය, උපඝිතසතිපුග්ගලසෙවනතා යි කීයේ.

ඉදීම – සිටීම – නිදීම – සක්මණ යන සිවු ඉරියව්වෙහි සිහිය පිහිටුවීමට නැමී ගත් එයට බරව සිටි සිත් ඇතිබවය; තදධිමුත්තතා නම්. මේ සතර ය, සතිසම්බොජ්ඣඞ්ගය ඉපැත්මෙහි හෙතු. මෙයින් උපන් සතිසම්බොජ්ඣඞ්ගය වැඩුම සම්පූර්ණ වනුයේ අභීත්මගීයෙනි.

'සත්තධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, පරිපුච්ඡකතා, වත්ථුවිසදකිරියතා, ඉන්ද්‍රියසමත්ත පටිපාදනා, දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා, පඤ්ඤාවන්තපුග්ගල සෙවනා, ගම්භීරඤ්ඤාචරියපච්චවෙක්ඛණා, තදධිමුත්තතා' යි. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයාගේ පහළවීමෙහි මෙසේ කරුණු සතක් දැක්වූහ. ඇසුම්බැලුම්බහුලබව, ඇතුළත පිටත පිරිසිදුබව, ශ්‍රඩාදී වූ ඉඳුරන්ගේ සමබවකිරීම, නුවණ නැති පුගුලන් පලවාහැරීම, නුවණැති පුගුලන්සෙවුම, ගැඹුරු නුවණෙහි වෙනස්කම්සැලකීම, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය නිපදවීමට නැමී සිටීම යනු ඒ සතය.

එහි, සක්ඛ ධාතු ආයතන ඉන්ද්‍රිය බල බොඩ්‍යඞ්ග මාර්ගාඞ්ග ශමථ විදර්ශනාවන්හි අරුත් ඇසුරු කළ විචාරීම් බහුලබවය පරිපුච්ඡකතා නම්.

කෙස් රැවුල් නිය කපා හැර, උඩවිරෙවනාදියෙන් සිරුර සැහැල්ලු කොට, ඩහ මල උළා හැර නා, සිරුර පිරිසිදුකිරීම සිවුරු පිරිකර මසා සෝදා පඬු පොවා ගේ දොර හැමද කුණු කසළ බැහැර කොට ඇඳ පුටු ඇතිරිලි කොට්ට මෙට්ට පාපිසි ඈ අවු ගන්වා පිරිසිදුකිරීමය වත්ථුවිසදකිරියතා නම්. ඇතුළත පිටත අපිරිසිදු කල්හි චිත්තචෛතසිකයන් කෙරෙහි වූ නුවණ අපිරිසිදු ය. අපිරිසිදු පහන්, පහන්වැටි, තෙල් නිසා හටගත් පහන් සිළුවෙහි ආලොකය අපිරිසිදු වන්නා සේ ය. පිරිසිදු පහන්, පහන් වැටි, තෙල් නිසා දැල් වෙන පහන් සිළ පිරිසිදු වන්නා සේ ඇතුළත පිටත වස්තූන් පිරිසිදු කල්හි උපන් චිත්තචෛතසිකයන් කෙරෙහි වූ නුවණ ද පිරිසිදු වේ.

ශ්‍රඩා – වීර්‍ය්‍ය – ස්මෘති – සමාධි – ප්‍රඥා යන ඉන්ද්‍රියයන් එකකට එකක් අඩු වැඩි වන්නට නො දී ඒ ඒ ඉන්ද්‍රියයන්ට තම තමන් අයත් කෘත්‍යය නිසි සේ කරන්නට ඉඩ ලැබෙන සේ සමබවෙහි තැබුම ය ඉන්ද්‍රියසමත්තපටිපාදනා යි කීයේ. ශ්‍රඩෙන්ද්‍රිය බලවත් වූ තැන, අනික් ඉන්ද්‍රියයෝ දුර්වල වෙත්. එකල්හි වීර්‍ය්‍යෙන්ද්‍රිය ය තමන් හා එක් ව උපන් අනික් ධර්මයන් උත්සාහවත් කිරීමෙහි

සමාධීන්ද්‍රිය ය අරමුණු කරා ඵලඹීමෙහි, සමාධීන්ද්‍රිය ය තමන් හා එක් ව උපන් ධර්මයන්ට විසිර යා නොදී රැක ගැන්මෙහි, ප්‍රඥෙන්ද්‍රිය ය අරමුණුතතු දැක්මෙහි අපොහොසත් ය. එහෙයින් දහම් තතු සලකා ශ්‍රද්ධෙන්ද්‍රිය ය වැඩි හිඟේ යම් ලෙසකින් ද, ඒ ලෙස හැර ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වැඩීම පිරිහෙළිය යුතු ය. මෙයට වක්කලී තෙරුන් වත නිදසුන් කළ හැකි ය.

වක්කලී තෙරනුවෝ මහාශ්‍රාවකයෙකි. මහාශ්‍රාවකයකු වන්නට උත්වහන්සේ පළමු කොට ප්‍රාර්ථනා තැබුවෝ පියුමතුරා බුදු රජුන් දවසේ ය. උන්වහන්සේ මෙ කපට කල්පලක්ෂයකින් ඔබ්බෙහි ලොව පහළ වූහ. වක්කලී ස්ථවිරයන් වහන්සේ එදා හංසවතී නුවර කුලගෙයක ඉපිද නුවණැති බවට පැමිණ සිටියහ. එ දවස පියුමතුරා බුදුරජාණන් වහන්සේ සියලු මර රුපුන් දිනා බුදුබව ලබා දම්සක් පවත්වා ලෝවැඩ වඩමින් එහි මහාවිහාරයක වැඩ වාසය කරති. එනුවර වැසි උපාසක උපාසිකාවෝ සුවඳ මල් ඇ ගෙණ බුදුරජුන් පුදා බණ අසන්නට විහාරයට යති. දිනෙක මෙතෙමේ ද සුවඳ මල් ගෙණ විහාරයට යන බවුන් දැක බවුන් හා ම විහාරයට ගොස් බණ පිරිසෙහි කෙළ වරට ම බණ අසන්නට වන. බණ අවසන්හි බුදුරජාණන් වහන්සේ බණ අසමින් එහි හුන් මහපිරිසෙහි එක් නමක් ශ්‍රද්ධාධිමුක්තකභික්ෂූන් අතුරෙහි අගතැන්හි තැබූහ. එ වේලෙහි මේ උපාසකයන්ගේ සිත අනාගතයෙහි බුදු කෙනකුන් අතින් මේ තනතුර ලැබීමට නතු වී හිඟේ ය. එහෙයින් ඔහු බුදුරජුන් පවරා සත් දිනක් මහදන් පවත්වා සත්වන දිනයෙහි වළඳවා අවසන්හි බුදුරජුන් ඉදිරියෙහි දෙහොත් මුදුන් දී සිට 'ස්වාමීනි! මම මේ කළ පිණෙන් බලාපොරොත්තු වන්නෙමි, අනාගතයෙහි ලොව පහළ වන බුදු කෙනකුන් අතින් ශ්‍රද්ධාධිමුක්තකභික්ෂූන්ගේ අගතැන් පත්වීමැ' යි කියා ඒ පිණිස ප්‍රාර්ථනා කෙළේ ය. බුදු රජාණන් වහන්සේ අනාගතය බලා වදාළෝ, එයට අනතුරක් නැති බව දැක 'උපාසකය! තමුසේගේ පැතීම සිදු වන්නේ ය, එය අද හෙට නොවේ, අදින් කල්පලක්ෂයක් ගිය තැන ගෞතම නමින් බුදුවරයෙක් ලොව පහළ වන්නේ ය, ඒ බුදුරජුන්ගේ සාසනයෙහි මහණගණයා අතර තමුසේ ම ශ්‍රද්ධාධිමුක්තකයන් අතර ශ්‍රේෂ්ඨ වන්නහු ය, අගතැන් ලබන්නහු ය' යි වදාළ සේක.

බුදුරජාණන් වහන්සේගේ මේ ප්‍රකාශයෙන් ඔද වැඩුනු ඔහු එ තැන් සිට නොයෙක් පින් දහම් කොට අප බුදුරජුන් දවස දක්වා, දෙව් මිනිසුන් අතර ම ඉපිද එන්නේ මෙ දවස

සැවැත් නුවර බමුණු ගෙදරක උපන්නේ ය. නම වක්කලී නම් ය. නිසිවියට පැමිණ ඔහු ත්‍රිවෙදය ඉගෙණ බ්‍රාහ්මණශිල්ප යන්හි පරතෙරට ගියේ දිනෙක භික්ෂූන් පිරිවරා වඩින බුදුරජුන් දැක උන්වහන්සේගේ ශ්‍රී දෙහදර්ශනයෙන් වශීකෘත විය. ඔහු, ඔහුගේ දෙ ඇස බුදු සිරුරින් මුදා ගන්නට අසමර්ථ වූයේ, බුදුරජුන් හා ම හැසිරෙන්නට වන. හිදින විට ත් නගින විට ත් සිටින විට ත් හෝනා විට ත් බුදුරජුන් දෙස ම බලා හිඳියි. නගයි. සිටියි. හොවියි. බණ දෙසන විට ත් උන්වහන්සේගේ මුව කැලුම් බලමින් ම සිට බණ අසයි.

දිනෙක මොහුට, 'බුදුරජුන් නිතර, දක්නට නම්, පැවිදි විය යුතු ය, ගිහිගෙයි වසන්නහුට නිතර බුදුරජුන් දැක්ම නො කළැකි ය, ගිහිගෙයි වැඩ බොහෝ ය, ඒ සඳහා කාලය ගෙවී ගිය කල පිණට දහමට කල් ඉතිරි නො වේ, නෑයන් සඳහා හිතවතුන් සඳහා දන සපයනු සඳහා ලෙඩට දුකට මගුලට අවමගුලට කල් ගෙවී යන්නේ ය, එහෙයින් පැවිදි වන්නෙමි' යි සිත් උපන. ඔහු බුදුරජුන් වෙත ගොස් පැවිදි විය. එතැන් සිට දන් වළඳන කාලය හැර අන් සියලු වේලෙහි බුදුරජුන් දක්නට යම් තැනෙක යම් ලෙසකින් සිට හැක්කේ නම්, එතැනට ගොස් ඒ ලෙසින් සිටියි. මේ කාලයෙහි ඔහුට යොනිසො මනසිකාරයෙක් නො ද විය. බුදුරජානන් වහන්සේ මේ ගැණ ඔහුට කිසිවක් නො වදාළහ. ඔහුගේ නුවණ මෝරන තුරු උන්වහන්සේ මෙය ඉවසා වදාළ සේක. මෙසේ කල් යත් වක්කලි තෙරුන්ගේ නුවණ ද මෝරා ගියේ ය. එකල බුදුරජානන් වහන්සේ 'වක්කලි! තමුසේ මා දෙස බලා සිටින්නහු, මේ කුණු සිරුර දැකීමෙන් තමුසේට ඇති ප්‍රයොජනය කුමක් ද වක්කලි! මා කියන්න අසන්න, යමෙක් ධර්මය දකී නම්, ඔහු ය මා දකින්නේ, යමෙක් මා දැකී ද, ඔහු ධර්මය ත් දකියි, වක්කලි! ධර්මය දක්නේ මා දකියි, මා දක්නේ ධර්මය දකී' යි වදාළ සේක. එහෙත් වක්කලී ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් දැක්ම හැරදමා අන් තැනෙක යන්නට අපොහොසත් වූහ. එකල බුදුරජානන් වහන්සේ 'මේ නම සංවෙගයක් නො ලැබ සිවුසස් දහම් නො ද අවබොධ කරන්නේ ය' යි දැන වස් වසන්නට රජගහා නුවරට වැඩි සේක. වක්කලී ස්ථවිරයන් වහන්සේ ද එහි ගියහ. බුදුරජානන් වහන්සේ වස්වසන දිනයෙහි 'වක්කලි! මෙතැනින් පහව යන්නැ' යි පලවා හැරිය සේක. එවිට වක්කලී තෙරනුවෝ බුදුරජුන් ඉදිරියෙහි සිටින්නට අපොහොසත් ව 'මට බුදුරජුන් දැක්ම නො ලැබේ නම්, මාගේ මේ ජීවිතයෙන් වැඩක් නැත, දැන් කුමක් කළ හැකි ද, බුදුරජානන් වහන්සේ මා පන්නා

හැරි සේක, මෙ තැන් සිට උන්වහන්සේ මට නො හමුවන සේක, එහෙයින් බුදුරජුන් දැක්ම නො ලැබේ නම්, මාගේ ජීවිතයෙන් වැඩෙක් නැතැ' යි පණ නසා ගන්නට ගිජුකුළු පව්වට නැංගාහ. බුදුරජානන් වහන්සේ එවේලෙහි එබව දැන 'මේ නමට මා වෙතින් අස්වැසුමෙක් නො ලැබුනේ නම්, මග පල ලැබීමට ඇති වාසනාව නැසී යන්නී ය' යි සිතා තමන් වහන්සේ පෙණී යන සේ ආලොකයක් පතුරුවා හැරි සේක. එයින් ඔහුට බුදුරජානන් වහන්සේ එතැන සිටියදී ම පෙණී ගියහ. ඔහුගේ සිත නැගී තුබූ ශොකය එයින් පහව ගියේ ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ වක්කලී තෙරුන්ගේ සිත්හි සතුට උපදවන්නට.

'පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුඩසාසනෙ,
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං;

යන ගාථාව වදාරා, නැවැත 'වක්කලි! තමුසේ බලාපොරොත්තු වන්නහු කුමක් ද' යනාදි ලෙසින් අවවාද කරණ ලදුව ත් ගිජුකුළු පව්වෙහි ම සිට විදසුන් වඩන්නට පටන් ගත්හ. එහෙත් උන්වහන්සේගේ ශ්‍රඩාව පමණ ඉක්මවා වැඩී සිටිය බැවින්, විදර්ශනාව සුදුසු තැනට නො පත් වූ ය. බුදුරජානන් වහන්සේ ඒ දැන නැවැත ත් කමටහන් කිය වූහ. එ වරද වක්කලී ස්ථවිරයන් වහන්සේ විදසුන් මුදුන් ගන්වන්නට අපොහොසත් වූහ. ඒ අතර ආහාරවිකලත්වයෙන් වාතරෝග-යෙක් හට ගැණින. බුදුරජානන් වහන්සේ වක්කලී තෙරුන් වාතරොගයෙන් පෙළෙන බව දැන එහි වැඩම කොට,

'වාතරොගාභිනීතො ත්වං විහරං කානනෙ වනෙ,
පවිඪගොචරෙ ඵෑඛෙ කථං භික්ඛු කරිස්සසි.'

යි වදාළ සේක. 'වාතරොගයෙන් පෙළෙන තමුසේ රළුබිම් පෙදෙස් ඇති මේ වනයෙහි ලෙඩට හිත වූ බෙහෙතු ත් නො ලැබ ආහාර ගැණුම් ද නො කොට මෙහි කුමක් කරන්නහු ද?' යනු එහි කෙටි තේරුම ය වක්කලී ස්ථවිරයන් වහන්සේ-

'පීතිසුඛෙන විපුලෙන එරමානො සමුස්සයං,
ඵෑඛම්හි අභිසම්භොන්තො විහරිස්සාමි කානනෙ.

භාවෙන්තො සතිපඨානෙ ඉන්ද්‍රියානි බලානි ච,
බොජ්ඣඞ්ගානි ච භාවෙන්තො විහරිස්සාමි කානනෙ.

ආරඩවිරියො පහිතත්තො නිච්චං දළ්හපරක්කමො,
සමග්ගෙ සහිතෙ දිස්වා විහරිස්සාමි කානනෙ.

අනුස්සරන්තො සම්බුඩං අග්ගං දන්තං සමාහිතං,
අතන්දිතො රත්තින්දිවං විහරිස්සාමි කානනෙ'

යනු කීහ.

'මම මහත් වූ ප්‍රීතිසුඛයෙන් හා එයින් හටගත් ප්‍රණීත වූ රූපයන්ගෙන් මුළු කය පතුරුවමින් රළු සිවුපසය ඉවසමින් වනයෙහි වසන්නෙමි,

සතරසතිපඨාන-ඉන්ද්‍රිය-බල-බොඩ්‍යඞ්ගධර්ම වඩමින් ඵලසුඛ යෙන් හා නිර්ජාණසුඛයෙන් යුක්තව වනයෙහි වසන්නෙමි,

පටන් ගත් වීර්‍යය ඇති ව නිවන් කරා යැවූ සිත් ඇති ව නිති පැවැති දැඩි පැරකුම් ඇති ව සමග වූ මහණබවෙන් එක් වූ සබ්රම්සරුන් දැක වනයෙහි වසන්නෙමි,

සියලු දහම් දත් සියලු සතුන්ට උතුම් වූ දැමුනු මැනැවින් පිහිටා සිටි බුදුරජුන් 'ඉතිපි සො භගවා' යනාදි ලෙසින් අනලස් ව රැ දවල් සිහි කරමින් වනයෙහි වසන්නෙමි, යනු එහි සිංහල ය.

මෙසේ කියා වක්කලී තෙරනුවෝ විදසුන් ඔදගන්වා රහත් බවට පැමිණියහ.

බුදුරජානන් වහන්සේ වක්කලීතෙරුන්ගේ ශ්‍රද්ධෙන්ද්‍රිය පමණ ඉක්මවා වැඩී ගිය බැවින්, අදහස් මුදුන් නො පැමිණෙනු දැක ඔහුට සංවෙග උපදවා ශ්‍රඩෙන්ද්‍රිය ය පිරිහෙළන කමටහන් දී රහත් බවට පමුණුවා ලූ සේක.

වීර්‍යෙන්ද්‍රිය ය වැඩී ගිය කල ශ්‍රඩෙන්ද්‍රිය අධිමොක්ෂකෘත්‍යය කිරීමෙහි ද, අනික් ඉන්ද්‍රියයෝ ඒ තම තමන් අයත් කෘත්‍යය කිරිමෙහි ද අපොහොසත් වෙති. එහෙයින් වීර්‍යෙන්ද්‍රියයාගේ ඒ වැඩී යෑම පිරිහෙළන්නට පස්සඩ්-සමාධි-උපෙක්ඛාබොජ්ඣඞ්ග වැඩිය යුතු ය. මෙයට, සොණ තෙරුන්ගේ වත නිදසුන් කළ හැකි ය.

සොණ ස්ථවිරයන් වහන්සේ පෙර බුදුරජුන් වෙත කළ අධිකාර ඇත්තෝ, ඒ ඒ භවයන්හි ඉපිද නන්වැදැරුම් පින් රැස් කළහ. මේ තෙමේ සසර එනුයේ, අනොමදස්සි බුදු රජුන්ගේ කාලයෙහි මහත් වස්තුව ඇති සිටුවරයෙක් ව ඉපිද වැඩිවිය පැමිණ උපාසකයන් හා එක් ව විහාරයට ගොස් බණ අසා පැහැද බුදුරජුන් සක්මන් කරණ තැන සුණු පිරියම් කරවා නන්පැහැති මල් එහි අතුරා නන්පැහැති රෙදි පිළියෙන් වියනක් බැඳ සකස් කෙළේ ය. සඞ්ඝයා වහන්සේ උදෙසා දීර්ඝ ශාලාවක් කරවා පිදී ය. ඔහු, ඒ පින්කමින් දෙව්මිනිසුන් අතර ම සැරිසරා එනුයේ, පියුමතුරා බුදුරජුන්ගේ කාලයෙහි හංසවතී නගරයෙහි සිටුගෙදරක උපන්නේ ය. එදා ඔහුගේ නම සිරි වඩ්ඪ ය. කෙමෙන් වැඩිවිය පත් මෙතෙමේ බණ අසන්නට

නිතර විහාරයට යයි. දිනෙක ඔහු බණ අසන්නට ගොස් පිරිස් කෙළවර හිඳ බණ අසනුයේ, එදවස බුදුරජානන් වහන්සේ එක් භික්ෂුනමක් ආරබ්ධවිය්‍යය ඇති භික්ෂූන් අතරෙහි ශ්‍රෙෂ්ඨ ස්ථානයෙහි තබනු දැක, ඔහු ද ඒ තනතුර ලැබීමේ අදහසින් බුදුරජුන් පවරා සත් දිනක් මුළුල්ලෙහි මහදන් පැවැත් වීය. සත්වන දිනයෙහි ඒ පිණිස ප්‍රාර්‍ථනා ද තැබී ය. බුදුරජානන් වහන්සේ මෙසේ ඔහු කළ ප්‍රාර්‍ථනාව සමෘඛ වන බව දැක 'උපාසකය! උපාසක තැන කළ පැතීම මෙයින් කල්පලක්‍ෂයක් ගිය තැන ලොව පහළ වන ගෞතම බුදුරජුන්ගේ සාසන යෙහි දී සමෘඛ වන්නේ ය' යි දන්වා සිටියහ. එ තැන් සිට ඔහු නොයෙක් පින්දහම් කරමින් සසර එනුයේ, කසුප් බුදුරජුන් පිරිනිවි කල්හි, අප බුදුරජුන් ලොව පහළ වන්නට පෙරාතු ව මනුලොව ඉපිද වැනිවිය පැමිණියේ, සිය යහළුවන් හා ගහදියෙහි කෙළින්නට ගියේ ය. එකල එහි ඉරියිය සිවුරු හැඳ පොරොවා ගත් පසේබුදුවරයෙක් 'බරණැස ඇසුරු කොට ගඟ අසබඩ පන්සලක් කොට වස් වසන්නෙමි' යි ඒ පිණිස දියපහරින් ගසා ආ ලී දඬු වැල් එකතු කරමින් සිටියි. මේ කුමාර තෙමේ යහළුවන් හා එක් ව ගොස් බුදුරජුන් වැඳ 'ස්වාමීනි! ඔබහන්සේ මෙහි කුමක් කරන්නහු දැ' යි ඇසී ය. 'කුමාරය! වස් වසන දවස ලං වූ කල පැවිද්දන්ට වස් වසන්නට තැනක් වුවමනා ය, එහෙයින් වස් වසනු පිණිස තැනැක් පිළියෙල කර ගන්නට සිතා මේ ලීදඬු වැල් එකතු කරමි' යි කීහ. කුමාර තෙමේ 'ස්වාමීනි! අද ඔය ලෙසින් ඉවසා සිටිනු මැනැවි, හෙට මම ඔබ වහන්සේට වසීමට තැනක් පිළියෙල කර දෙන්නෙමි' යි කී ය. උන්වහන්සේ එය ඉවසූහ. ඔහු, පසේ බුදුරජුන් ඒ ඉල්ලීම පිළිගත්බව දැන පසුදා සතකාරසමමාන පිළියෙල කොට පසේ බුදුරජුන්ගේ ඊම බලාපොරොත්තුවෙමින් සිටියේ ය. උන් වහන්සේ ද 'අද කොතැනකට පිඬු පිණිස යා යුතු දැ' යි සිතන සේක්, ඔහුගේ ගෙදරට ම වැඩි සේක. කුමාර තෙමේ පසේ බුදුරජුන් දැක සතුටු ව පාත්‍රය ගෙණ දන් පිළිගන්වා 'මේ තෙමස මාගේ ගෙදරට ම වඩින සේක්වා' යි ආරාධනා කොට පොරොත්දු ගෙණ පසේබුදුරජුන් වළඳා වැඩිය කල්හි සිය යහළුවන් සමග එක් දවසින් ම පසේබුදුරජුන්ට පන්සලක් හා සක්මන් දිවාතැන් රැතැන් ආ හැම එකක් කරවා දුන්නේ ය. පන්සල තුළට පිවිසෙන කල්හි පාදයන්හි දුවිලිමඬ ආදිය නොතැරවේවා' යි සිතා පසේබුදුරජුන් පන්සලට ඇතුල්වන කල්හි තමාගේ ලක්‍ෂයක් අගනා රතු කම්බිලිය බිම අතුරන්නේ ය. උන්වහන්සේ ඒ මත වඩින කල්හි කම්බිලියේ පැහැය හා

උන්වහන්සේගේ සිරුරෙහි පැහැයත් එක හැටිබව දැක ඉතා පහන් වූ කුමාර තෙමේ 'ස්වාමීනි! ඔබවහන්සේ පැගුවේලේ සිට මේ කම්බිලියේ පැහැය ඉතා හොබනේ ය, අතිශයකාන්තිමත් ය, එ පරිද්දෙන් මින් පසු මා උපනුපන් හැම අත්බවේදී මේ මාගේ අත්පාවල පැහැය, බඳුවදමල්පැහැය ඇත්තේ වේවා, පහස, සියක් වරක් පෙළූ කපුපුලුනෙහි පැහැය වැනි වේවා' යි පතා තෙමසක් පසේබුදුරජුන්ට උපස්ථාන කොට වස් අන්තයෙහි තුන් සිවුරු පිදී ය. බුදුරජානන් වහන්සේ පිරිපුන් තුන් සිවුරු ඇති සේක්, ගන්ධමාදනපර්වතය බලා වැඩි සේක.

ඒ කුලපුත්‍ර තෙමේ ද ජාතියක් ජාතියක් පාසා නොයෙක් පින් දහම් කොට දෙව්මිනිසුන් අතර ම ඉපිද එන්නේ, අප බුදුරජුන් දවස කාලවම්පා නුවර උසහ සිටුහුගේ ගෙයි පිළිසිඳ ගත්තේ ය. ඔහු පිළිසිඳ ගත් දා සිට ඒ සිටුගෙට ලැබුනු පඬුරු පාක්කුඩම් ඉතා බොහෝ විය. නම් තබන මගුලේ දී මවුපියෝ 'අපේ පුතා තම නම ගෙණැවිත් සිටී' යි සොණ යි ඔහුට නම් කළහ. එසේ නම් කළෝ, ඔහුගේ සිරුරුසිවිය රතුරන්දිය ගාන ලද්දක් සේ බබලන්නට වූ බැවිනි. කිරිමවුවරු සැට දෙනෙක් දෙව් කුමරකු වඩන්නා සේ ඔහු වැඩූහ. ඔහුගේ ජීවිතයෙහිලා සිදු වූ පුණ්‍යර්ධීහු ඉතා බොහෝ ය. හස්තපාදතලයෝ, බඳුවදමල් පැහැ ඇත්තෝ වූහ. එහි පහස, සියක් වර පෙළූ කපුපුලුනක පහස වැනි විය. යටිපතුල්හි හට ගෙණ තුබූ ලොමයෝ, මිණිකොඩොල් සුළි සටහන් ඇත්තෝ වූහ. සෘතුත්‍රයට සුදුසු වූ ප්‍රාසාද ත්‍රයෙක වසමින් දෙව්සිරි බඳු හැම සිරි විඳිමින් දෙව්කුමරකු සේ කල් ගෙවී ය ඔහු.

මේ කාලයෙහි අපගේ සම්බුදු රජානන් වහන්සේ රජගහා නුවර ඇසුරු කොට වැඩ වසන සේක. දිනෙක බිම්සර රජු විසින් කැඳ වූ මොහු අසූදහසක් ගැමියන් හා බුදුරජුන් වෙත ගොස් ලැබූ සැදැහැති ව බුදුරජුන් වැඳ පැවිද්ද ඉල්ලී ය. උන්වහන්සේ 'මවුපියන්ගෙන් අවසර ලද දැ' යි ඇසූ කල්හි 'නැත' යි කී විට මවුපියන් නො අනුදන්නවුන් පැවිදි නො කරති' යි වදාළ සේක. ඉක්බිති මවුපියන් වෙත ගියේ, කරුණු කියා ඔවුන්ගෙන් අවසර ගෙණ බුදුරජුන් කරා ගොස් එක්තරා ස්ථවිර නමක් වෙත පැවිදි විය. පැවිද්දෙන් ටික දිනකට පසු උපසම්පදාව ලැබූ මොහු වෙතට, පඬුරු පාක්කුඩම් නිතර ගෙණ එන්නෝ බොහෝ වූහ. ඔවුහු උන්වහන්සේගේ රූසපුව ගැණ, තැන තැන කියන්නට ද වූහ. එයින් තවත් නොයෙක් දෙන උන්වහන්සේ වෙත ගලා ආහ. 'මා ලඟට නිතර එන්නෝ

ඉතා බොහෝ ය, මේ නිසා මට මහණකම් කරන්නට ඉඩ නැත්තේ ය, කමටහනෙක, විදසුන් වැඩුමෙක යෙදෙන්නට නො හැකි ය, එහෙයින් බුදුරජුන් ලවා කමටහන් කියවා ගෙණ සීතවන සොහොනට ගොස් මහණදම් කරමි, ඒ සොහොන ඉතා පිළිකුල් තැනක් බැවින් වැඩි දෙනෙක් එහි නො එන්නාහ, එවිට මට මාගේ මහණදම් මුදුන් පමුණුවා ගන්නට හැකි වන්නේ ය' යි සිතා බුදුරජුන් වෙතින් කමටහන් ගෙණ සීතවනයට ගොස් මහණදම් කරන්නට පටන් ගත්තේ ය. ඒ අතර උන්වහන්සේට 'මාගේ සිරුර ඉතා සියුමැලි ය, සැප-යෙන් සැපයක් නො ලබනු හැකි ය, කය වෙහෙසාය මහණදම් කළ යුත්තේ' යි සිතෙක් උපන. එහෙයින් සිටීම, සක්මන් කිරීම යන ඉරියවු දෙක ඉටා රහත් වන්නට තදින් වැර වැඩූ උන්වහන්සේගේ යටිපතුල්හි පොළ හටගත්තේ ය. ඒවා පැළී ලේ ගලන්නට වන. සක්මන් බිම මුළුමනින් ලෙයින් වැසී ගියේ ය. එක් ම ලේ බිමක් විය එ තැන. වෙදනාව බලගතු වූ ය. පයින් ඇවිදින්නට නො හැකි වූ කල දෙදණින් දෙඅතින් ඇවිදින්නට පටන් ගත්හ. මෙසේ රහත් වන්නට කොතෙක් උත්සාහ කළ ද ඒ අදහස මෙතෙක් ඉටු නො වී ය. එහිලා ලකුණක් වත් දක්නට නො ලැබින. උන්වහන්සේට 'ඉදින් අනෙකෙක් පටන්ගත් වීර්‍යය ඇත්තේ වන්නේ නම්, මා වැන්නෙක් ම වන්නේය ඔහු, මම මෙසේ වෑයම් කරන්නෙම් ද මාර්ගයෙක් ඵලයෙක් දක්නට නැත, එකතින් මම උද්ඝටිතඥ-යෙක්, විපචිතඥයෙක් නො ද වෙමි, ඥෙය්‍යයෙක් ද නො වෙමි, කරුණු ඇතිසැටියෙන් පෙණෙනුයේ මා පදපරමයකු බව ය, මට මේ මහණකමින් වැඩෙක් නො වේ, ගිහි ව හොඳට කා බී පින්දහම් කරන්නෙමි' යි සිත් විය. එ වේලෙහි බුදුරජානන් වහන්සේ තෙරුන්ගේ අදහස දැන සවස් වේලෙහි භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරනලදු ව එහි වැඩම කොට ලෙයින් තෙත් ව ගිය සක්මන් බිම දැක, තෙරුන්ට අවවාද කොට වීර්‍යය සමාධිය, සම කොට වඩන්නට අධිකවීර්‍යය හැර දමන්නට කමටහන් දී ගිජුකුළුපව්වට වැඩි සේක. ඉක්බිති සොණ ස්ථවිරයන් වහන්සේ ඒ අවවාදයෙහි සිට අත්‍යාරබ්ධවීර්‍යය හැරදමා වීර්‍ය සමත්වයෙහි තබා කමටහන් වඩනුවෝ නොබෝ දිනකින් ම රහත් වූහ. මේ උන්වහන්සේ කළ ප්‍රකාශය ඉන් පසු:-

'යාහු රඬෙ සමුක්කඬො රඤ්ඤෙ අඞ්ගස්ස පඩගු,
සවජ්ජ ධම්මෙසු උක්කඬො සොණො දුක්ඛස්ස පාරගු.
පංච ඡින්දෙ පංච ජහෙ පංච චුත්තරි භාවයෙ,
පංචසඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණොති වුච්චති.

උන්නලස්ස පමත්තස්ස බාහිරාසස්ස භික්ඛුනො,
සීලං සමාධි පඤ්ඤා ච පාරිපූරිං න ගච්ඡති.

යං හිං කිච්චං තදපච්චිඩං අකිච්චං පන කයිරති,
උන්නලානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා.

යෙසඤ්ච සුසමාරඩා නිච්චං කායගතාසති,
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො.

සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා,
උජුමග්ගම්හි අක්ඛාතෙ ගච්ඡථ මා නිවත්තථ.

අත්තනා චොදයන්තානං නිබ්බාණමභිහාරයෙ,
අච්චාරඩම්හි විරියම්හි සත්ථා ලොකෙ අනුත්තරො.

වීණොපමං කරිත්වා මෙ ධම්මං දෙසෙසි චක්ඛුමා,
තස්සාහං වචනං සුත්වා විහාසිං සාසනෙ රතො.

සමතං පටිපාදෙසිං උත්තමත්ථස්ස පත්තියා,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුඩස්ස සාසනං.

නෙක්ඛම්මෙ අධිමුත්තස්ස පවිවෙකඤ්ච චෙතසො,
දිස්වා ආයතනුප්පාදං සම්මා චිත්තං විමුච්චති.

යස්ස සම්මා විමුත්තස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
කතස්ස පතිවයො නත්ථි කරණීයං න විජ්ජති.

සෙලො යථා එකඝනො වාතෙන න සමීරති,
එවං රූපා රසා සඳ්ද ගන්ධා ඵස්සා ච කෙවලා.

ඉඨා ධම්මා අනිඨා ච නප්පවෙධන්ති තාදිනො,
ඨිතං චිත්තං විසංයුත්තං වයං චස්සානුපස්සති' යනු.

'අඟුරට බිම්සර රජුගේ පිරිසෙහි වූ යමෙක් හැම සැපතින් ශ්‍රෙෂ්ඨ වූ කෙළඹියෙක් වී ද, ඒ සොණ අද ලොකොත්තරධර්මයෙහි ද, ශ්‍රෙෂ්ඨ වූයේ සසරදුකෙහි කෙළවරට ගියේ ය.

ඔරම්භාගීයසංයොජන පස සිඳින්නේ ය. උඩම්භාගීය සංයොජන පස හරින්නේ ය. ශ්‍රඩාදී වූ ඉන්ද්‍රිය පස මත්තෙහි වඩන්නේ ය. රාගාදිසඞ්ග පස ඉක්මවා ගිය මහණ, ඔඝ තිණණ, යි කියනු ලැබේ.

උස් වූ මන් ඇති, පමා බවට ගිය, කාමයන්හි ඇලී සිටි මහණහුගේ ශීල සමාධි ප්‍රඥාවෝ පිරිපුන්බවට නො යත්.

යමක් කළයුතු ද එය කරණ ලද්දේ ය. නො කළයුත්ත වනාහි කරයි. උද්ගත වූ මානය ඇති ප්‍රමත්ත වූවන්ගේ ආශ්‍රවයෝ වැඩෙත්.

නිතර, යමකු විසින් කායගතාසතිය වඩන ලද ද, පැහිදිවූ ද සිට කළයුතු කටයුතු නිතර කරණ සුලු වූ ඔවුහු, නොකළයුතු දෙය නොකරත්.

සිහි නුවණ ඇත්තත්ගේ ආශ්‍රවයෝ විනාශයට යත්. බුදුරජුන් විසින් වදාළ මැදුම් පිළිවෙතෙහි පිළිපදිවූ. නොනවතිවූ.

තෙමේ තමා ත් මෙහෙයන්නේ, තමන් නිවනට පමුණුවන්නේ ය. මා, වීර්‍යය පමණ ඉක්මවා තදින්, වැඩූ කල්හි, ලොකයෙහි නිරුත්තර ශාස්තෘ වූ චක්ෂුෂ්මත් බුදුරජානන් වහන්සේ විණොපමාව ගෙණ හැර දක්වා මට ධර්මදේශනා කළ සේක. මම උන්වහන්සේගේ බණ අසා සසුන්හි ඇලී විසූයෙමි.

රහත්බව ලැබීම පිණිස සමාධි වීර්‍ය දෙදෙනාගේ සමබව පිළියෙල කෙළෙමි. එයින් ත්‍රිවිද්‍යාවන් ලැබීමි. බුදුරජුන්ගේ අනුශාසනාව කරණ ලද්දී ය.

පැවිද්දෙහි හා චිත්තවිවෙකයෙහි යුක්තප්‍රයුක්ත වූ ධ්‍යාන සමාපත්තීන් උපදවා සමථයෙහි හා රහත්බවෙහි යෙදුනු නිවනට නැමී සිටි ආයුෂ්මාගීයෙහි රැඳුනු භික්ෂුනමගේ චක්ඛාදි ආයතනයන්ගේ කෙණෙහි කෙණෙහි හටගැන්ම හා නිරෝධය, මාගීඥානයෙන් දැකීම් හෙතුවෙන් මාගීඵලවිපාකයෙන් සිත, සියලු ආශ්‍රවයන්ගෙන් මිදුනේ ය.

සියලු කෙලෙසුන්ගෙන් මොනවට මිදුනු, එහෙයින් ම සංසිදුනු සිත් ඇති ඒ භික්ෂුනමට පෙර කළ කුශලාකුශලයන්ගේ රැස්ව සිටීමෙක් නැත්තේ ය. ඉදිරියෙහි කළයුත්තෙක් නැත්තේ ය.

එකඝන වූ ශෛලපර්වතය යම් සේ සුළඟින් නොසැලේ ද එසේ රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය ආලම්බනධර්ම හා ඉෂ්ටානිෂ්ට ධර්මයෝ තාදීභාවයට පැමිණි භික්ෂුනමගේ සථිර වූ අකම්පිත වූ ප්‍රහීණ වූ සංයෝග ඇති සිත නොද සොලවත්, යනු සිංහලයි.

මෙසේ මේ ඉන්ද්‍රියයන් එකක් අනිකකට වඩා වැඩි ශිය කල්හි එක ද ඉන්ද්‍රියයෙක් තම තමන් අයත් කෘත්‍යයෙහි සමර්ථ නොවේ. වෙසෙසින් ශ්‍රද්ධා-ප්‍රඥ දෙදෙනාගේ හා සමාධි වීර්‍ය දෙදෙනා ගේ වැඩීම එක් තරම් ම විය යුතු ය. ශ්‍රද්ධාව බලවත් වූවහුගේ ප්‍රඥව බලවත් නොවූ නම්, ඒ ශ්‍රද්ධාව ඇත්තේ කිසිත් නොවිමසා නොපැහැදිය යුතු තැන පහදින්නේ ය. එසේ ම ප්‍රඥවෙන් වැඩී ගිහේ, සැදුහැ නැත්තේ නම්, කොරාවිකාවන්නේ ය. බෙහෙතින් හටගත් රෝගයට පිළියම් නොකොට

හැක්කා සේ මොහු ද පිළියම් නො කොට හැක්කේ ය. 'දන් දෙමි, සිල් රකිමි, බවුන් වඩමි' යි සිතිවිල්ල ම, කුසල් යි ගෙණ කිසිත් පින් දහමක් නො කරයි. අනුන් ද නො මගට හෙළයි පින් දහම් ඇ වැඩක් නැතැ' යි කියයි. මෙසේ මෙහි පමණ ඉක්මවා ගිය මෙතෙමේ පින් දහම් නො කොට මිය ගියේ, නිරයෙහි උපදින්නේ ය. සමාධියෙන් බලවත් වූයේ, වීර්‍යයෙන් දුර්වල වූයේ නම් සමාධිය, අලසකමට ලං ව සිටින බැවින්, අලසකමෙහි ගැලී යන්නේ ය. සමාධියෙහි වැඩීමෙක් නො වේ. සමාධිය පිරිහී ගිය තැන, වීර්‍යයෙන් වැඩී සිටියේ, වීර්‍යය බොහෝසෙයින් උඩච්චයට සමානවූවක් බැවින්, උඩච්චයෙහි වැටී යයි. සමාධිය, වීර්‍යය හා ද, වීර්‍යය, සමාධිය හා ද යෙදුනේ, අලසබවෙහි හා උඩඟුබවෙහි නො වැටේ එහෙයින් ශ්‍රද්ධා-ප්‍රඥා දෙදෙනා සේ ම සමාධි-වීර්‍ය දෙදෙනා සම ව එක් උසට වැඩිය යුතු ය. මොවුන් සම ව වැඩුනු කල්හි ය, අර්පණාසමාධිය උපදනේ. නැත, නො උපදී. තව ද ශමථ කර්මිකයාහට බලවත් වූ ශ්‍රද්ධාව අර්පණාසමාධිය සිදු කරන්නී ය. ශමථකර්මිකයාහට බලවත් එකාග්‍රතාව අවශ්‍ය ය. එ කල්හි ඔහු අර්පණාවට පැමිණේ. විදර්ශනා කර්මිකයාහට ප්‍රඥාව බලවත් විය යුතු ය එ කල්හිය ඔහු ලක්ෂණ ප්‍රතිවෙධයට පැමිණෙන්නේ. උභය සමතා ව ඇති කල්හි කියනු කිම. ස්මෘතීන්ද්‍රියය සියලු ඉන්ද්‍රියයන් කෙරෙහි බලවත් වූයේ ම, අභිමතාර්ථසාධක වේ. ස්මෘතිය, සිත ඖඛත්‍යපක්ෂයෙහි වූ ශ්‍රද්ධා, වීර්‍ය, ප්‍රඥාවන්ගේ වසයෙන් උඩඟුබවෙහි වැටීමෙන් ද, අලසබවට පක්ෂ වූ සමාධිය හෙතු කොට අලසබවෙහි වැටීමෙන් ද රැක ගන්නී ය. එහෙයින් ස්මෘතිය හැම තන්හි කැමැති විය යුතු ය. **'සති ච පන සබ්බත්ථිකා වුත්තා භගවතා'** යි අටුවාවෙහි කීයේ එහෙයිනි. සිත, සිහිය පිළිසරණ කොට කුසල් දහම් රැකීම පලය කොට සිටියේ ය. සිහියෙන් තොර ව සිත පිළිබඳ ප්‍රග්‍රහ නිග්‍රහ දෙක නො වේ. එහෙයින් මෙසේ විය යුතු.

සක්ඛ්‍යධාතුආයතනාදිභෙදයෙහි බැසගත් නුවණ නැති මෝඩ මිනිසුන් ඇසුරට නො ගෙණ ඔවුන් මුළුමනින් දුරු කිරීම **දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනතා** නම් වේ. **පඤ්ඤාවන්තපුග්ගල සෙවනතා** නම්, සම පණස් අයුරකින් පංචසක්ඛ්‍යය පිළිබඳ ලක්ෂණ, ඉතා මැනැවින් දැන ගන්නා වූ උදයව්‍යයප්‍රඥාවෙන් යුක්තපුද්ගලයන් සෙවනය කිරීම ය.

අතිශයගම්භීර වූ සක්ඛ්‍යධාතුආයතනාදිභෙද ඇති දහම් විසයෙහි නො පැකිළ පැවැති ගැඹුරු නුවණෙහි ප්‍රභෙද සැලකීම **ගම්භීරඤ්ඤාණචරියපච්චවෙක්ඛණා,** යි කියන ලද ය.

තදධිමුත්තතා, යි කීයේ, ඉදිම් සිටීම් ඇ හැම ඉරියව්වෙහි ම ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය උපදවන්නෙමි, යි එහි නැමී සිටීම ය. එයට බරව සිටීම ය. මෙලෙස උපන් මෙ ද කුළුගැන්නෙනුයේ අභීන්මාගීයෙනි.

'එකාදස ධම්මා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, අපායභයපච්චවෙක්ඛණතා, ආනිසංසදස්සාවිතා, ගමන විථිපච්චවෙක්ඛණතා, පිණ්ඩපාතාපචායනතා, දායජ්ජමහත්තපච්චවෙක්ඛණතා, සත්ථුමහත්තපච්චවෙක්ඛණතා, ජාතිමහත්තපච්ච වෙක්ඛණතා බ්‍රහ්මචාරිමහත්තපච්චවෙක්ඛණතා, කුසීත පුග්ගලපරිවජ්ජනතා, ආරඩවිරියපුග්ගලසෙවනතා, තදධිමුත්තතා' යන මෙයින් දැක්වූවෝ විරියසම්බොජ්ඣඞ්ගයා ගේ ඉපැත්මට රුකුල් දෙන කරුණු එකොළොසෙක් ය. අවාබිය සැලකීම, වීර්‍යයෙහි අනුසස් සැලකීම, යා යුතු මඟ සැලකීම, පිඬුපිදුම සැලකීම, දායාදයෙහි මහත්කම සැලකීම, බුදුරජුන් පිළිබඳ මහත් කම සැලකීම, ජාතිමහත්ත්වය සැලකීම, සබ්‍රම් සරුන් පිළිබඳ මහත්කම සැලකීම, අලසපුගුලන් දුරු කිරීම, පටන් ගත් වැර ඇති පුගුලන් සෙවීම, වීර්‍ය උපදවන්නට නැමී සිටීම යන මේ ය ඒ එකොළොස.

එහි නිරයැ පස්වැදැරුම් වද බැඳුම් පටන් විඳින දුක්බිය, තිරිසන් අපායයෙහි දැල් කෙමින් කටු සැමිටි ආදියෙන් විඳින දුක් බිය, ප්‍රෙතලොකයෙහි බුඩාන්තර ගණන් සා පිපාසාවෙන් විඳින දුක් බිය, අසුරලොකයෙහි හැට අසූ රියන් පමණ වූ ඇට සම් පමණින් සැදුනු සිරුරු දරා අවු සුළං ආදියෙන් විඳින දුක් බිය සැලකීම ය **අපායභයපච්චවෙක්ඛණතා,** යි කීයේ ය.

'කම්මැලියකු විසින් නවලොවුතුරා දහම් ලබනු නො හැකිය, එහි වීර්‍යවත් විය යුතු ය, වීර්‍ය ඇත්තහු විසින් ම ය ඒ ලැබිය යුතු, යනාදීන් සැලකීම ය **ආනිසංසදස්සාවිතා** නම්.

'බුදු පසේබුදු මහරත්හු ගියෝ, සියලු අරුත් සිදු කරණ මගැය, එහෙයින් මා ද ඒ මග ම යා යුතුය, කම්මැලියාට ඒ මග නො යා හැකි ය, නියම මග යන්නට වීර්‍ය ඇත්තකු විය යුතු ය' යනාදීන් සැලකීම **ගමනවිථිපච්චවෙක්ඛණතා** නම්.

'යම් කෙනෙක් තට සිවුපසය දී උවැටන් කෙරෙත්ද, ඔවුහු තාගේ නෑයෝ නො වෙති, දැසි කම්කරුවෝ ත් නො වෙති, ඔවුහු 'අපි ජීවත් වන්න මෝ තා නිසා ය' යි තට සිවුපසය නො දෙති; ඔවුහු එසේ කරන්නෝ, තා පිළිබඳ ගුණනුවණ සලකා ය, තට කරණ සංග්‍රහයන් ගෙන් සසර දුක් ගෙවා යන්නට ලැබේ ය, යනු සලකා ය, තා කෙරෙහි වූ ගුණධර්ම සලකා ම තට සිවුපසය

දෙන්නෝ ය, තාගේ අනික් ලොකුකමක් සලකා නොදෙන්නෝ ය, බුදුරජුන් විසින් ද මාගේ මහණ තෙමේ සැදැහැවතුන්ගේ සිවුපසය වළඳා සිරුර තර කොට ගෙණ මොරොම්කම් පෑමින් සුවසේ වැඩ වෙසේවා' යි සිතා තට සිවුපසය නොඅනුදන්නා ලද්දේ ය, මාගේ මහණ, සිවුපසය වළඳා මහණදම් පුරා සසර දුක් ගෙවාලන්නේය' යි සිතා ම උන්වහන්සේ විසින් ඒ අනුදන්නා ලද්දේ ය, ඒ නුඹ දැන් කම්මැලිව සිවුපසය පිළිගැණීමට නොසුදුසු ය, වියර්‍යවත් වුවහුටමය ඒ පිළිගැණුම සුදුසු' යන මේ ආ ලෙසින් සැලකීමය **පිණ්ඩපාතාපචායනතා**, යි කීයේ.

මහාමිත්‍ර තෙරනුවෝ මෙම ලක්දිව **රුහුණු රට කසඟක** නම් ගල් ලෙන වාසය කළ ගුණවාඩ කෙනෙක් වූහ. එක් සදුහැති උපාසිකාවක්, උන්වහන්සේ සිය පුතකු සේ සලකා පොෂණය කළා ය. ඒ අතර දවසෙක දර පලා පිණිස කැලයට යන ඔ තොමෝ දුවට කතා කොට හාමුදුරුවන් පිඬු සිඟා මෙහි වැඩිය කල්හි සැළියේ ඇති පැරණි ඇල් හාල් ටික උයා කිරි ගිතෙල් සමග පිළිගන්වන්නට නියම කොට, තමන් කා ඉතිරිව තුබූ හීල් බත් ටිකක් කාලා කැලයට ගියා ය. පිඬු සිඟා යන තෙරුන් වහන්සේ ඒ ගෙට ලං වත් ම, මේ කතාව අසා කම්පිත වූ සිත් ඇති ව 'මේ උපාසිකාව මෙ ලොව වසයෙන් මගෙන් කිසිවක් බලාපොරොත්තු නෝ වේ, බලාපොරොත්තු වන්නී පරලොව ලබන ත්‍රිවිධසම්පත්තිය ය, මම හිස මුඩු කොට සිවුරු කරලා නන්දෙඩමින් මහණුන් අයත් නොවන වෙදහෙදකම් කිරීම නැකත් කීම වතු පිටි වගා කිරීම කඩ සාප්පු දැම්ම කාර් බස් ගෙණ කුලියට තැබීම මුදල් පොලි කිරීම ආදී අයුතු කටයුතුවල යෙදී මුදල් උපයමින් ගිහියන් හා උරෙන් උර ගැටී කමින් බොමින් කල් යවන්නෙම් නම්, ඒ ඉතා බලගතු වරදෙකි, ඇයගේ බලාපොරොත්තුව මා අතින් සිදු නොවේ, එසේ කලොත් මා අපායට යනු නොවැලකිය හැකි ය, අපායට යනු ඒකාන්ත ය, එසේ නොව සිවු පිරිසිදු සිල්හි පිහිටා බණ දහම් ඉගෙණ, ඒ බණ දහම් ලාභාපෙක්ෂාවෙන් තොර ව, පරහට කියවමින්, තෙමේ ද එයට අනුව හැසිරෙමින් කමටහන් ගෙණ වියර්‍යවත් ව භාවනාවෙහි යෙදෙන්නෙම් නම්, එය මේ උපාසිකාවට ත් මට ත් පමණක් නොව මුළුලොවට ම වැඩ පිණිස වන්නේ ය, එ හෙයින් මේ ධාර්මිකපිණ්ඩපාතය රාග ද්වෙෂ මොහයන්ගෙන් කිලිටිව පිළිගැණීම මට තරම් නොවේ' යි සිතා තදින් සිතට ගෙණ පෙරළා ලෙනට වැඩි සේක. පෙරළා ලෙනට ගිය තෙරුන් වහන්සේ පාත්‍රය ඇද යට තබා, සිවුර මුදා එය සිවුරු ලන වැලෙහි දිග හැර ලා 'රහත් නොවී එලි නොබසිමි' යි

ඉටා ගෙණ වීර්‍යවත් ව විදර්ශනාභාවනාවට පටන් ගත්හ. බොහෝ කලක් සිවු පිරිසුදු සිල් පුරා අප්‍රමාදයෙහි පිහිටා පළපුරුදු වූ මෙම තෙරනුවෝ ඒ පෙරවරුයෙහි ම රහත්බවට පැමිණ සිනා පහළ කරමින් ලෙනෙන් බැහැරට වැඩි සේක. එවිට ඒ අසල ගසෙක හුන් දෙවියෙක්:-

'නිදුකානෙනි! පිණැත් – මුළුලොව ගලා සිටි ඒ,
ආසව නසා සිටියෙන් – ලොවට ඔබ තුම දකිණ රහ වහු,
සෙට පුරිස! ඔබහට – වේවා වැඳුම් මාගේ,
වේවා වැඳුම් ඔබහට – උතුම් පුරිසය! දියබ පුත් වූ'

යි උදන් ඇනී ය. තව ද ඔහු, හිමිය! ඔබවහන්සේට දන් පිළි ගන්වා ඒ මැහැල්ලිය දුකින් මිදේය' යි ද කී ය. තෙරනුවෝ දෙර හැර බලා පිඬු සිඟා යෑමට කල් ඇති බව දැන පා සිවුරු ගෙණ පිඬු සිඟා ගියහ. උපාසිකාවගේ දූ ද බත් පිළියෙල කොට තබා මග බලා හුන්නු ය. තෙරනුවෝ එහි වැඩියාහ. එකල ඕ තොමෝ පාත්‍රය ගෙණ ගිතෙල් හකුරු බහා පිසූ කිරිබතින් පුරවා එය තෙරුන් අතට පිළිගැන්නු ය. උන්වහන්සේ 'සැප වේවා' යි අනුමෙවෙනි කොට ගියහ. ඕ ද තෙරුන් වඩින මග බලා සිටි යා ය. ඒ වේලෙහි උන්වහන්සේ ඉතා වැඩියක් බැබලුනාහ. කැලේ සිට ආ උපාසිකා තොමෝ සියලු තොරතුරු අසා 'මා පුතුගේ මහණකම මුදුන් පැමිණියේ අද වනැ' යි දැන 'දුව! තොපගේ සොහොයුරා බුදු සසුනෙහි නො පෙරළෙන ලෙසින් ස්ථිර ව සිට ගත්තේ ය' යි කිවු ය.

බුදුරජුන් පිළිබඳ දායාදය නම් සප්තාර්‍යධනය යි මවුපියෝ නො මග ගිය දූ පුතුන් තම දායාදයට අහිමි කෙරෙති. ඔවුහු මවු පියන් අයත් පරම්පරාගත ධනය නො ලබත්. එමෙන් බුදුරජුන් පිළිබඳ ඒ මේ සප්තාර්‍යධනසඞ්ඛ්‍යාතදායාදය කම්මැලියකු විසින් නො ලද හැකි ය, වීර්‍යයෙන් යුක්ත ව ශාසනිකප්‍රතිපත්තියෙහි යෙදුනේ ම ඒ ලබාය, යි මෙසේ බුදුරජුන් පිළිබඳ දායාදමහත්ත්වය සැලකීම **දායජ්ජමහත්තපච්චවෙක්ඛණතා** නම්. ඒ මේ දායාද මහත්ත්වය සලකන්නහුට ද වීර්‍යසම්බොඞ්‍යඞ්ගය උපදී.

'තාගේ බුදුරජානන් වහන්සේ මහාපුරුෂ සේක, ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානදර්ශනාදී වූ මහත් ගුණයන්ගෙන් අගතැන් පත් සේක, සුප්පතිඝිතපාදතාදි මහාපුරුෂලක්ෂණයෙන් විරාජමාන වන සේක, මවුකුස පිළිසිඳ ගැන්ම, ගිහිගෙයින් නික්මීම, බුදුවීම, දම්සක් දෙසීම, යමාමහපෙළහර දැක්වීම, දෙව්ලොවින් බැසීම, ආයු හැරපීම, පිරිනිවන් පෑම යන මේ හැම තන්හි දසදහස්

ලෝදා සැලුනා ය, ඒ මේ පමණ නො කළැකි ගුණ ඇති බුදුරජුන්ගේ සාසනයෙහි පැවිදි බවට පැමිණ කුසීතයකු වන්නට වටනේ දැ' යි මෙසේ බුදුරජුන් පිළිබඳ මහත්කම සැලකීම **සත්ථුමහත්ත පච්චවෙක්ඛණතා** නම්.

'තෝ ජාතියෙන් ලාමකයෙක් නො වෙහි, සාමාන්‍ය පුද්ගලයෙක් නො ද වෙහි, අතරතුර නො බිඳුනු මහාසම්මතරාජවංසයෙන් පැවත එන ඔක්කාකරාජවංසයෙහි උපන්නෙහි, සුඩොදන මහරජුගේ හා මහාමායාබිසවගේ මුණුබුරු වෙහි, රාහුලභද්‍රගේ බාල සොහොයුරු වෙහි. එසේ බුදුපියානන් වහන්සේගේ පුත් බවට පැමිණි තා මෙබඳු ලාමකයකු අලසයකු වනු නො සුදුසු ය, යි මහාසම්මතවංසයෙහි හා බුඩවංසයෙහි මහත්බව සැලකීම **ජාතිමහත්තපච්චවෙක්ඛණතා** නම්.

'සැරියුත් මුගලන් මහරහත්හු හා අසූමහසව්වෝ වීර්‍යයෙන් ම ලොකොත්තරධර්මය ප්‍රතිවෙධ කළෝ ය, හෝ මේ සබ්‍රහ්මචාරීන් වහන්සේලා ගිය මග යන්නෙහි ද, පිළිපැදි මග පිළිපදින්නෙහි ද, එසේ නො ද යන්නෙහි ද, නො ද පිළිපදින්නෙහි දැ' යි සබ්‍රහ්මචාරීන් පිළිබඳ වූ මහත් බව සැලකීම **සබ්‍රහ්මචාරීමහත්තපච්චවෙක්ඛණතා** නම්. වීර්‍යසම්බෝඩ්‍යඞ්ගය මෙයිනුදු උපදී.

බඩ පුරා කා වැදහොත් පිඹුරන් වැනි, දුරු කළ කායික චෛතසික වීර්‍ය ඇති පුද්ගලයන්ගේ සෙවනය හැරපීම **කුසීතපුග්ගලපරිවජ්ජනතා** ය.

කුසීතපුද්ගලයන් හැර, පටන් ගත් වීර්‍යය ඇති, ආත්මාලය හැර, අභිමතාර්ථසංසිඩිය තෙක් නො පසුබට ව ඉදිරිය බලා යන පුද්ගලයන් සෙවුම **ආරඩවිරියපුග්ගලසෙවනතා** ය.

වීර්‍ය උපදවනු පිණිස ඉදීම් සිටීම් ඇ හැම ඉරියව්වක ම නැමී සිටිනබව, එයට බරව පවතින චිත්තගතිය **තදධිමුත්තතා** ය. මෙ තුන ද, වීර්‍යසම්බොඩ්‍යඞ්ගයාගේ ඉපැත්මෙහි හෙතු වෙති. මෙසේ උපන් වීර්‍යසම්බොඩ්‍යඞ්ගයාගේ භාවනාපාරිපූරිය වන්නී අර්හත්මාර්ගයෙනි.

'එකාදස ධම්මා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, බුඩානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවානුස්සති, උපසමානුස්සති, ලූඛපුග්ගලපරිජ්ජනතා, සිනිඩපුග්ගලසෙවනතා, පසාදනීයසුත්තන්තපච්චවෙක්ඛණතා, තදධිමුත්තතා' යි ප්‍රීතිසම්බොඩ්‍යඞ්ගයාගේ ඉපැත්මට කරුණු වන්නෝ ය, මේ දැක්වුනෝ. ඔවුහු එකොළොසෙකි. බුඩ – ධම්ම – සඞ්ඝ – සීල – චාග – දෙවතා – උපසමා

නුස්සති හා රළු පරළු සිත් ඇත්තන් දුරුකිරීම, මොලොක් ගති ඇත්තන් සෙවනය කිරීම, සතුටට හෙතුවන සූත්‍රධර්ම ප්‍රත්‍යවෙක්ෂාව, ප්‍රීතිය ඉපදවීමට නැමී සිටිබව ය, ඒ එකොලොස.

එහි බුදුරජාණන් වහන්සේගේ කෙළවර නොදුක්විය හැකි ගුණ සමූහය අරබයා පුන පුනා සිහිකිරීම, ඒ ගුණ සිතට නගා බැලීම **බුද්ධානුස්සති** නම.

ලෞකික ලොකොත්තර වශයෙන් දෙපරිදි වූ ධර්මය කෙරෙහි පවත්නා ස්වාක්ඛාතතාදී වූ හැම ගුණයක් පුන පුනා සිහි **කිරීම**, සිතට නගා බැලීම **ධම්මානුස්සති** නම.

මාගීඥනයන්ගෙන් ඒ ඒ කෙලෙස් නසා සිටි ආර්‍යසඞ්ඝයා වහන්සේ පිළිබඳ සුප්‍රතිපන්නතාදී වූ ගුණයන් පුන පුනා සිහිකිරීම **සඞ්ඝානුස්සති** නම.

බුද්ධ – ධම්ම – සඞ්ඝ ගුණ පුන පුනා සිහි කරන්නාහට උපචාර සමාධිය හෙක් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය මුළු සිරුර පැතිර ගෙණ සිටියි.

තමන් බොහෝ **කලක්** නොකඩ කොට නොසිදුරු කොට නොකබර කොට තෘෂ්ණාවෙන් නොමැඩි පිරිසිදු **කොට** සමාධිය පිණිස රක්නා ලද සිලය, නැවැත නැවැත සිහි කිරීම **සීලානුස්සති** නම. ශ්‍රාවකයා විසින් නම්, තමන් රැකි ශ්‍රී සිල්පිළිබඳ පිරිසිදු බව නිතර නිතර සිහි කිරීම ය. පැවිද්දා විසින් නම්, තමන් රැකි ප්‍රාතිමෝක්ෂාදී වූ සිවු පිරිසිදු සිල් සිහිකිරීම ය.

දුර්භික්ෂයෙහි රසමසවුලෙන් යුත් ප්‍රණීත වූ ආහාර පාන සබ්‍රහ්මචාරීන්ට දී මම මෙසේ රසැති උසස් ආහාරපාන **සබ්‍රහ්මචාරීන්ට** දුනිමි' යි පැවිද්දාගේ නැවැත නැවැත සිහිකිරීම ත් ගිහියකු විසින් කැම්බිම් භිගකල සිල්වත්හට දෙනලද දානය නැවැත නැවැත සිහිකිරීම ත් **චාගානුස්සති** නම.

'යම් කෙනෙක් යම් ගුණධර්මශ්‍රැතියකින් දෙව්බවට ගියෝද, ඒ ගුණධර්මී මා කෙරෙහි ද පිහිටියේ ය' යි නැවැත නැවැත සිතා බැලීම **දෙවතානුස්සති** නම.

'සමාපත්තිබලයෙන් යටපත් කළ කෙලෙස්, අවුරුදු හැට හැත්තැවකිනිදු තම සිත්හි නොඋපදිති' යි නැවැත නැවැත සිහිකිරීම **උපසමානුස්සති** නම.

වෙහෙර බෝමලු ආදියෙහි පාවහන් ලා කුඩ මොට්ටැක්කිලි ගිස ලා දුම් බීම් කෙලගැසීම් කරමින් අගරුළෙස හැසිරෙන,

සඟුන් දැක හුනස්නෙන් නො නැගී සිටින, තුනුරුවන් කෙරෙහි නො පහන් බැවින් සෙනේ නැති රළුපරළු ගති ඇති පුද්ගලයන් බැහැර කිරීම **ලූඛපුග්ගලපරිවජ්ජනතා** ය.

බුඩාදී වූ තුනුරුවන්හි පැහැදීම බහුල කොට ඇති මොළොක් සිත් ඇති සිනිඳු පුද්ගලයන් සෙවනය කිරීම **සිනිඩපුග්ගල සෙවනතා** ය.

තුනුරුවන්හි ගුණ පැවසෙන, පැහැදීම ඉපදීමට කරුණු වූ සූත්‍රධර්මප්‍රත්‍යවෙක්ෂාකරණය **පසාදනීයසුත්තන්තපච්චවෙක්ඛණතා** ය.

ඉඳුම් හිටුම් ඇ හැම ඉරියව්වෙහි ම ප්‍රීතිසම්බොඩ්‍යඞ්ගය උපදවා ගැණීමට කරණ උත්සාහය, එයට නැමී සිටිනාබව **තදධිමුත්තතා** ය. මෙසේ වූ චාගානුස්සති ආදී මොවුහු ද ප්‍රීතිසම්බොඩ්‍යඞ්ගය උපදවා ගන්මට කරුණු වෙති.

මෙ කියූ හෙතුන් නිසා උපන් ප්‍රීතිසම්බොඩ්‍යඞ්ගයාගේ වැඩීම පිළිබඳ සම්පූර්ණත්වය වන්නේ අභීන්මාගීඥානයෙනි.

'සත්ත ධම්මා පස්සඩ්සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය සංවත්තන්ති, පණ්ණිතභොජනසෙවනතා, උතුසුඛසෙවනතා, ඉරියා පථසුඛසෙවනතා, මජ්ඣත්තපයොගතා, සාරඩපුග්ගල පරිවජ්ජනතා, පස්සඩකායපුග්ගලසෙවනතා, තදධිමුත්තතා' යි මෙයින් දැක්වූවෝ ප්‍රශ්‍රබ්ධිසම්බොඩ්‍යඞ්ගය ඉපැත්මට රුකුල් දෙන්නෝ ය. ඔවුහු සතෙකි. ප්‍රණීතභොජනසෙවනය, සෘතුසුඛ සෙවනය, ඊර්‍යාපථසුඛසෙවනය, මඩ්‍යස්ථප්‍රයොගය, සාරඩපුද්ගල පරිවර්ජනය, සමාහිතපුද්ගලසෙවනය, තදධිමුත්තතාය, යන මේ ය ඒ සත.

එහි ප්‍රණීත වූ හිතකර වූ ආහාරපාන සෙවනය ම සිරුරෙහි හා සිතෙහි ඇති බරබව නසාලයි. කටුකාහාරසෙවනයෙන් කයෙහි හා සිතෙහි බරබව නැගී යයි. සනීපයට හිත වූ පිණි සිනිඳු ආහාරපානසෙවනයෙන් වැඩී ගිය සැහැල්ලු සිරුරු ඇති යොගාවචරයාගේ භාවනාකර්මය ම මුදුන් පැමිණේ. එහෙයින් භාවනා වෙහි යෙදෙන්නහුට ප්‍රණීතආහාරපානසෙවනය ආවශ්‍යක ය. **පණ්ණිතභොජනසෙවනතා** යි කීයේ මේ ය.

ශීතොෂ්ණ සෘතු අතුරෙහි යම් සෘතුවක යොගාවචරයාගේ සිත එකඟ වේ නම්, ඔහුට ඒ සෘතුව සප්පාය වේ. සප්පාය වූ සෘතු සුඛසෙවනය, **උතුසුඛසෙවනතා,** යි කීයේ. ඒ ඒ කාලයන්හි

පහළ වන ශීතොෂ්ණාදී වූ කාලගුණය ය උතුසුඛ නම්. භාවනා වෙහි යෙදෙන්නහු විසින් තමාගේ කයට සිතට පහසු ගෙණ දෙන කාලයෙක හෝ දෙශයෙක එහි යෙදිය යුතු ය.

ඉදීම් සිටීම් ඇ ඉරියවු අතුරෙහි යම් ඉරියව්වක් යමක්හට පහසු කර වේ නම්, ඔහු විසින් ඒ ඉරියව්ව ඇසුරු කළ යුතු ය. විසම වූ උතු ඉරියවු හැර, සම උතු ඉරියවු සෙවනයෙන් ම සිත භාවනාවට සුදුසු වේ. එහෙයින් **ඉරියාපථසුඛසෙවනතා,** යි කීයේ සුව පහස් එළවන ඉරියවු සෙවුම ය.

තමන් හා අනුන් ද කර්ම්ය ස්වකීය කොට සිටින බව මෙනෙහි කිරීම, **මජ්ඣත්තපයොගතා** ය. කර්ම්ය ස්වකීය කොට ඇති බව නුවණින් මෙනෙහි කිරීමෙන් කය සිත දෙක්හි දුහය සංසිඳී යයි.

කැට කැබලිති දඬු මුගුරු ඇ ගෙණ අනුන් පෙළන්නේ වෙහෙසන්නේ සාරඩපුද්ගල තෙමේ ය. එබන්දන් නො සෙවුම, නො බැජුම, **සාරඩපුග්ගලපරිවජ්ජනතා** ය. ඔවුන් නො සෙවුම සංසිඳීමට කරුණු වේ.

දුමුනු භික්මුනු සංසිඳුනු රළු පරළු ගති නැති මිනිසුන් සෙවුම බැජුම, **පස්සඛකායපුග්ගලසෙවනතා** නම්.

හැම ඉරියව්වෙහි ම ප්‍රශ්‍රබ්ධිසම්බොඩ්‍යඞ්ගය ඉපදවීමට නැමී ගත් බවය; **තදධිමුත්තතා** නම්.

මෙකී හෙතුන් නිසා උපන් ප්‍රශ්‍රබ්ධිසම්බොඩ්‍යඞ්ගය පිළිබඳ භාවනාවගේ මුදුන් පැමිණීම, අභීන්මාගීඥනයෙන් සිදු වේ.

'එකාදස ධම්මා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තනති, වත්ථුවිසදකිරියතා, ඉන්ද්‍රියසමත්තපටිපාදනතා නිමිත්තකුසලතා, සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා, සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා, සමයෙ චිත්තස්ස සංපහංසනතා සමයෙ අජ්ඣුපෙක්ඛණතා, අසමාහිතපුග්ගලපරිවජ්ජනතා සමාහිතපුග්ගලසෙවනතා, ඣානවිමොක්ඛපච්චවෙක්ඛණතා තදධිමුත්තතා' යි. සමාධිසම්බොඩ්‍යඞ්ගයාගේ ඉපැත්මට රුකුල් දෙන්නෝ මොවුහු යි දැක්වූහ. එකොළොසෙකි ඔවුහු. එහි වත්ථුවිසදකිරියතා, ඉන්ද්‍රියසමත්තපටිපාදනතා දෙක කියූ ලෙසින් දත යුතු ය.

126-127

කසිණනිමිත්ත ඉගෙණීමෙහි දක්ෂභාවය ය, **නිමිත්තකුසලතා** නම්. එ ද තෙ පරිදිය. කසිණනිමිත්ත ඉපදවීමෙහි දක්ෂභාවය, ඉපද වූ නිමිත්ත වැඩීමෙහි දක්ෂභාවය, වැඩූ නිමිත්ත රක්ෂා කිරීමෙහි දක්ෂභාවය යි.

යම් අවස්ථාවෙක යොගාවචරයාගේ සිත, ඉතා පහත් වූ හීන ව ගිය වීර්‍යාදිය කරණ කොට හැකුළුනේ ද, එ කල්හි පස්සද්ධි-සමාධි-උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගයන් නො වඩා ධම්මවිචය-විරිය - පීති සම්බොධ්‍යඞ්ගයන් වැඩීමෙන් නගාලීම ය, **සමයෙ චිත්තස්ස පග්ගහණතා,** යි කියේ. අවස්ථානුකූලව සිත වඩා ගැණීම මෙයින් කිය වේ.

යම්කිසි අවස්ථාවෙක සිත, පටන් ගත් වීර්‍යාදිය කරණ කොට උඩඟු වූයේ ද, නො සන්සුන් වේ ද, එකල්හි පස්සද්ධි - සමාධි - උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගයන් ඉපදවීමෙන් සිතේ නො සන්සුන්බව පිරිහෙලීම ය, සිතට නිග්‍රහකිරීම ය, **සමයෙ චිත්තස්ස නිග්ගහණතා,** යි කියේ

යම් කිසි අවස්ථාවෙක සිත, සිතෙහි යෙදුනු නුවණ මඳ බැවින් හෝ සිත එකඟ කිරීමෙන් ලැබිය යුතු වූ උපසමසුඛය පහවීමෙන් හෝ අස්සාද රහිත වේ ද, එකල්හි ජාති ජරා ව්‍යාධි මරණ අපායදුක, ඉකුත් ව ගිය සසර දුක, ඉදිරියෙහි එන සසර දුක, ආහාරසෙවීම මුල් කොට සිවි දුක යන අට වැදෑරුම් සංවෙගවස්තු ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් සිත සංවෙගයට පමුණුවා නුනුරුවන් ගුණ සිහි කිරීමෙන් පහන් කිරීම, සිත සතුටු කිරීම **සමයෙ සම්පහංසනතා** නම්.

යම් කලෙක මනා පිළිවෙන් නිසා සිත නො හැකුළුනේ ද නො ද, නො සන්සුන් වූයේ ද, නො ද අස්සාද රහිත වූයේ ද, අරමුණෙහි සම ව පවත්නේ ද, සමව විඳියට පැමිණියේ ද, එ කල්හි සිතේ දැඩිව ගැන්ම, නිගාකිරීම, පහන්කිරීම යන පග්ගහ - නිග්ගහ - සම්පහංසනයන්හි උත්සාහයට නො පැමිණ මැදහත් බව ය, මැදහත්ව බැලීම ය, **සමයෙ අජ්ඣුපෙක්ඛණතා,** යි කියේ. රියෙහි යෙදූ අසුන් සම ව දුවන කල්හි අසුන් නො තළා නො පෙළා මැදහත් ව ඉන්නා රියැදුරු සේ ය මෙය.

උපචාරසමාධියට හෝ අප්පණාසමාධියට හෝ නො පැමිණීමෙන් නත් අරමුණු කරා විසිර ගිය සිත් ඇත්තන් දුරු කිරීම ය **අසමාහිතපුග්ගලපරිවජ්ජනතා** නම්.

උපචාරසමාධියට හෝ අප්පණාසමාධියට හෝ පැමිණීමෙන් එකඟ වූ සිත් ඇත්තන් සෙවුම ය, **සමාහිතපුග්ගලසෙවනතා,** යි කීයේ.

'රූපී රූපානි පස්සති, යනාදීන් දෙශනාවෙහි ආවෝය ඤාණවිමොක්ඛයෝ. අට දෙනෙකි ඔවුහු **කෙලෙසුන්ගෙන් විකඛම්භණ** වසින් මිදීම, නීවරණයන්ගෙන් මිදීම, **විමොක්ඛ** නම්. ප්‍රථමධ්‍යානාදිය, විරුඩධර්මයන්ගෙන් මොනවට මිදුන බැවින් **ඣානවිමොක්ඛ** නම්. ඔවුන් පිළිබඳ වැඩීම, ඔවුනට පැමිණීම, ඉටීම, නැඟිටීම, කොලෙසීම, පිරිසිදුකිරීම, මෙසේ මෙසේය යි නිතර ප්‍රත්‍යවෙක්ෂා කිරීම, **ඤාණවිමොක්ඛපඩිවෙක්ඛණතා** නම් වී. අතීත්මාගීය හා නිබ්බාණය විමොක්ෂනාමයෙන් කිය වේ. ඒ මෙහිලා අභිමත නො වේ.

ඉදිරි සිටීම් ඇ හැම ඉරියව්වෙහි සමාධිසමෙබාධ්‍යඞගය ඉපදවීමට නැමී සිටීබව, එයට බර ව සිටීබව, **තදධිමුත්තතා** නම් වේ.

මෙ කියූ හෙතුන් නිසා පහළ වූ සමාධිසමෙබාධ්‍යඞගය මුදුන් පත් වනුයේ අතීත්මාගීයෙනි

'පඤ්ච ධම්මා උපෙක්ඛාසම්බොජ්ඣඞගස්ස උප්පාදාය සංවත්තන්ති, සත්තමජ්ඣත්තතා, සඞඛාරමජ්ඣත්තතා, සත්ත සඞඛාරකෙලායනපුග්ගලපරිවජ්ජනතා, සත්තසඞඛාරමජ්ඣත්ත පුග්ගලසෙවනතා, තදධිමුත්තතා, යන කරුණු පස උපෙක්ෂා සමෙබාධ්‍යඞගයාගේ ඉපැත්මෙහි හෙතු යැ, යි කීහු.

එහි තම සිත් ගත් ගිහි පැවිද්දන් කෙරෙහි මැදහත්වීම, **සත්තමජ්ඣත්තතා** නම් වේ. කම්ප්‍රත්‍යවෙක්ෂා – නිස්සත්වප්‍රත්‍ය වෙක්ෂා යි දෙයයුරෙන් එය හට ගැණේ. එහි 'ඔබ තමන් කළ කර්මයෙන් මෙහි මිනිසකු වශයෙන් ඉපිද කම් වූ පරිදි සැප දුක් විඳ නැවැත නැවැත ත් කුශාලාකුශලකර්ම රැස් කොට මෙයින් ගිලිහී යන්නහු ය, මේ තෙමේ ත් ඒ සැටියෙන් ම මෙහි ඉපිද පෙර කළ කම් අනුව දිවි යවමින් නැවැත නැවැත ත් කර්ම රැස් කොට මෙයින් ගිලිහී යන්නේ ය, ඔබ ගේ හා ඔහු ගේ භවයෙන් භවයට යෑමෙන් ඵලභුකතිවිදුම මෙසේ කල්හි, ඔබ මෙහි දැන් කවරකු කෙරෙහි ආලය කරහු ද' යි මෙසේ සැලකීම, කම්ප්‍රත්‍යවෙක්ෂා ය, 'පරමාර්ථවශයෙන් සත්වයෙක් නැත, පුද්ගල-යෙක් නැත, ඇත්තේ එකට කැටි වූ සඞඛ්‍යාතුආයතනරාශියකි, එසේ කල්හි කවරක්හට ආලය කරහු ද' යනාදීන් සැලකීම නිස්සත්වප්‍රත්‍යවෙක්ෂා ය.

චීවරපිණ්ඩපාතාදිසංඝකාරයන් කෙරෙහි මැදහත් බව **සඞ්ඛාරමජ්ඣත්තතා** නම් වේ. අසඞ්ගිකභාවය සැලකීම, තාවකාලිකභාවය සැලකීමැ, යි එ ද දෙයයුරු වේ. 'මේ සිවුර දුන් පැහැයෙන් සිත් ගණියි, එහෙත් පිළිවෙළින් පැහැය වෙනස් බවට හා දිරුම් කඩට ගියේ, අවසානයෙහි පා පිස්නා කඩක් ව හැර මිටි කොණින් ගෙණ හැර දැමිය යුතු වන්නේ ය, යම් ලෙසකින් මේ සිවුර අයත් එකෙක් වේ නම්, මෙසේ විනාශ වන්නට නො දෙන්නේ ය' යනාදීන් සලකා මැදහත්වීම අසඞ්ගිකභාවය සැලකීමෙන් වන සඞ්ඛාරමජ්ඣත්තතාය ය. සිවුරෙහි කල් නො පැවැත්ම තාවකාලිකභාවය සැලකීමෙන් වන සඞ්ඛාර මජ්ඣත්තතා නාය ය. පය ඇඳ පුටු කොට්ට මෙට්ට ඇඳ ඇතිරිලි ගේ දොර පොත් පත් ආදි අනික් හැම සංඝකාරයන් කෙරෙහි ද මැදහත්වීම මෙසේ ය.

සත්වයන් කෙරෙහි හා සංඝකාරයන් කෙරෙහි ආලය කරන්නන් දුරුකිරීම, **සත්තසඞ්ඛාරකෙලායනාපුග්ගලපරිවජ්ජනතා** නම්. යම් පැවිද්දෙක් තම අත වැස්සන් කෙරෙහි හා සමානොපාධ්‍යායාදීන් කෙරෙහි, දූ දරුවන් කෙරෙහි ප්‍රේමය කරණ ගිහියකු සේ මමායනය කෙරේ ද, තෙමේ ම ඔවුන්ගේ කෙස් කැපීම්, සිවුරු මැසීම්, රැඳවීම්, පා පිසීම්, ආදි වූ කුදු මහත් කටයුතු ගෙහසින ප්‍රේමයෙන් බැඳී සිට කෙරේ ද, ඇඹිල්ලක් පමණකුදු අතැවැසියා හෝ අතැවැස්සන් නො දුක්කේ 'අසවල් හෙරණ කොයි ගියේ ද, බලන්න! කුඩා නම කොයි දූ' යි සිහි නැතුව බියෙන් වෙව්ලා ගිය මෘගයකු සේ ඔබිමොබ දුව බලා ද, 'අසවල් හෙරණ අපගේ කෙස් කැප්පවා ගැණීමට ටික වේලාවකට මෙහි එවන්නැ' යි අනිකකු කියන ලද්දේ ද 'හා! ඒ නමට ඒ කරණු බැරි ය, මම ද ඒ නම ලවා එබඳු වැඩ කරවා නො ගණිමි, ඒ නම වෙහෙසට පත් වන්නේ ය, එබැවින් ඔය ඉල්ලීම ඉටුකරණු නො හැකි ය' යනාදිය කියමින් සත්වයන් කෙරෙහි මමායනය කරන්නේ **සත්තකෙලායන** නම් වේ. දූ දරුවන් කෙරෙහි ගෙහසින ප්‍රේමයෙන් බැඳි මෙසේ මමායනය කරණ ගිහියා ද, සත්තකෙලායන නම් වේ. යම් පැවිද්දෙක් පා සිවුරු තලි හැරමිටි කොට්ට මෙට්ට ආදියෙහි ආලය කරන්නේ අනික්හට අනින් අල්ලන්නට බලන්නට

පමණකුත් නො දේ ද, ඉල්ලන ලද්දේ 'අපි ත් තව ම මෙතෙක් එය පරිභොගය නො කෙළෙමු, තොපට එය කෙසේ දෙමු දු' යි කියා ද, ඒ පැවිද්දු **සඞ්ඛාරකෙළායන** නම් වේ. ගිහියා ගැණ ද මෙසේ දතයුතු ය. සත්‍වසංස්කාරයන් කෙරෙහි මමත්වය **කරණ** ඇලෙන ගිහි **පැවිද්දන්** දුන හැඳින ගැණීමෙන් ඔවුන් දුරුකිරීම සත්‍වසංස්කාරපුද්ගලපරිවජ්ජනය යි.

සත්‍වසංස්කාරයන් කෙරෙහි මැදහත් පැවතුම් ඇති පුද්ගලයන් සෙවනය කිරීම, **සත්තසඞ්ඛාරමජ්ඣත්තපුග්ගලසෙවනතා** නම් වේ. 'මෙතෙමේ මාගේ අතැවැසි යි, මෙතෙමේ මාගේ නැයා ය, මෙතෙමේ මට උපකාර කරන්නේ ය' යනාදීන් කිසිවකු කෙරෙහි හා 'මාගේ සිවුර මාගේ පාත්‍රය' යනාදීන් කිසිවක් කෙරෙහි හා නො බැඳී මමායනය නො කොට, එසේ ම 'මෙතෙමේ මා පිළිබඳ එකෙක් නො වේ, මොහු මාගේ නො වේ, **එහෙයින්** කුමක් වුවත් මට කම් නැතැ' යි වෙෂ ද නො කොට ඡඋදියෙන් අගතියට නො ගොස් සවපරකීය හැම කෙනකු කෙරෙහි හා හැම දෙයක් කෙරෙහි හා මැදහත් වන්නේ, සත්‍වසංස්කාරමඛ්‍යසථපුද්ගලතෙමේ ය. ඔවුන්ගේ සෙවනය මෙයින් කිය වේ.

'උපෙක්ඛාසම්බොඣඞ්ගය උපදවම්' යි එයට බර ව, එයට නැමී සිටීම, **තදධිමුත්තතා** නම් වේ. උපෙක්ඛාසම්බොඣඞ්ගය ඉපදවීමෙහි උද්‍යොගවත් චිත්තගතිය ය මේ. එය හැම ඉරියව්වෙහි ම කැමැති විය යුතු ය.

මේ කියූ හේතූන් නිසා පහළ වූ උපෙක්ඛාසම්බොඣඞ්ගයාගේ සම්පූණීභාවය අඟීන්මාගීයෙන් වන්නේ ය.

මෙහි මෙසේ සැකෙවින් කියූ බොඣඞ්ගයෝ වනාහි විදර්‍ශනාපාදකමාගීචිත්තවීථියෙහි පූර්‍වභාගයෙහි වූ, එහෙයින් ම ලෞකික වූ පරිකර්‍ම-උපචාර-අනුලොම-ගොත්‍රභූ චිත්තයන්හි නන් අරමුණු ගෙණ නානාවස්ථාවන්හි ද මාගීචිත්තවීථියෙහි නිවන් අරමුණු කොට එක් අවස්ථාවක ද පහළ වෙති.

මහසින් සතර උපදින්නේ එක් එක් වරට බැගින්, ලොකොත්තර බොඣඞ්ගයෝ ද, චතුර්විධමාගීචිත්තවාර ඝණනින් සතර වරක් උපදිති. එක් සිතෙක එක් වර බැගින්, මාගීයින්

සතරෙහි සතර වරක් පහළ වූ බොඩ්‍යඞ්ගයෝ, එසේ පහළ වෙමින් උපදිමින් ඒ ඒ මගින් නැසිය යුතු වූ වැනසිය යුතු වූ සියලු කෙලෙස් නසාලති. සොතාපත්තිමග්ගබොජ්ඣඞ්ගයෝ ඒ මගින් නැසිය යුතු වූ කෙලශධර්මයන් පළමු කොට නසා හරිති. සකදාගාමී අනාගාමී අරහත්ත මග්ගබොජ්ඣඞ්ගයෝ ද මෙසේ පිළිවෙළින් දෙවනු තෙවනු සිවුවනු ව කෙලෙස් නසාලති. වනසාලති. විදර්ශනා බොඩ්‍යඞ්ගයෝ නොයෙක් වර නානාක්ෂණික ව පහළ වෙමින් උපදිමින් ලොකොත්තරමාර්ගය සකස් කරත්.

සම්බොධිඅඞ්ගෙසු, යන්නෙන් අර්ථාන්තරයක් වශයෙන් කියවෙන සත්තිස් බෝපැකිදම් පිළිබඳ කෙටිකතාවක් යට කියන ලදී.

සම්මා චිත්තං සුභාවිතං = මනාකොට හෙතුවශයෙන් හා නය වශයෙන් සිත වඩනා ලද්දේ ද.

බොඩ්‍යඞ්ගධර්මවිෂයයෙහි නොහොත් බොධිපාක්ෂිකධර්මවිෂය යෙහි විධිලෙසින් වැඩූ සිත මෙයින් කියන ලදී. ශීලවිශුද්ධියෙහි පිහිටා අනතුරු ව චරිතානුකූල වූ කර්මස්ථානයක් ගෙණ එයට පට හැනි වූ සියලු කුදු මහත් උවදුරු නසා සුදුසු සෙනසුනකට එළැඹැ ගත් කමටහන අනුව සිත වැඩිය යුතු ය. එසේ වැඩෙන්නේ, ප්‍රථම ඩ්‍යානාදීන්ගේ ලැබීමෙන් ඉපදීමෙන් පුෂ්ටිමත් ව ගියේ, තව තවත් වැඩෙන්නේ, උපකෙලශරහිත වූයේ **සුභාවිත** යි කියනු ලැබේ.

ආදානපටිනිස්සග්ගෙ = නිර්ඵාණයෙහි.

ගැණීම, ආදානැ, යි කියනු ලැබේ. **'ආදානං වුච්චති ගහණං'** යනු අටුවා ය. මෙහි කාමූපාදානාදිචතුර්විධඋපාදාන 'මමය, මගේය' යනාදීන් සලකා අල්ලා ගන්නා බැවින් ඇලෙන බැවින් **ආදාන** නම් වේ. නිර්ඵාණය එසේ ගැණීමට ප්‍රතිපක්ෂහෙයින් **ආදාන පටිනිස්සග්ග** නම් වි.

අනුපාදාය - නො ගෙණ

කාම-දිට්ඨි-සීලබ්බත-අත්තවාද යන සතර 'මම ය, මාගේ ය කියා නො ගෙණ. සිත්හිලා දැඩිව අල්ලා නො ගෙණ.

යෙ රතා - යම් කෙනෙක් ඇලුනෝ (ද)

මෙහි වූ **යෙ,** යන්න **තෙ,** යන්න එල්බ සිටියේ ය. රහතුන් වහන්සේ ඇලෙන එක් ම තැන නිවනයි. උන්වහන්සේගේ ඇලීම ගැලීම රැඳෙන්නේ නිවනෙහි ය. එහෙයින් නිවන කියවෙන ආදානපටිනිස්සග්ග, යන්න ආදානපටිනිස්සග්ගෙ, යි ආධාරාර්ථයෙන් දැක්විනි.

ඛීණාසවා - ක්ෂය කළ ආශ්‍රව ඇති.

ජුතිමන්තො - ප්‍රභාවත් වූ අනුභාවවත් වූ

රහතුන් වහන්සේ සක්කාදිභෙදභින්න ධර්මයන් අර්ථන්මාර්ග ඥානාලොකයෙන් මැනැවින් බබුලුවා සිටියෝ ය, යනු එහි තේරුම යි. සක්කාදිභෙදභින්නධර්ම උන්වහන්සේට මැනැවින් තේරී බේරී වැටහෙන්නේ ය, යනු කී සේ ය.

තෙ ලොකෙ පරිනිබ්බුතා = ඒ ආර්‍යයෝ ලොකයෙහි පිරිනිවියාහු වෙති.

මෙහි සක්ක ධාතු ආයතනාදිධර්මරාශිය **ලොක,** යි ගැණේ. සක්කාදිධර්මසමූහය නැසෙන වැනසෙන බැවින් ලොක, යි කිය වේ. එය ඉන්ද්‍රියබඩසන්තානය-අනින්ද්‍රියබඩසන්තානය යි දෙපරිදි ය. සත්ත්වශරීරය, ඉන්ද්‍රියබඩසන්තාන නම. සක්කලොකැ යි කීයේ ද මේ ය. වෘක්ෂලතා පෘථිවි පර්වත ගඞ්ගා සමුද්‍රාදිය, අනින්ද්‍රියබඩ සන්තාන නම. සසරින් එතෙර විය හැක්කේ ඉන්ද්‍රියබඩසන්තාන යෙහි පිහිටා ගැණීමෙන් ය. අනින්ද්‍රියබඩසන්තානය, ඉන්ද්‍රියබඩ සන්තානයාගේ පිහිටීමට ආධාර බැවින් ඔකාසලොකැ, යි කියති. මේ මෙහි අභිමත නො වේ. අභිමත සක්කලොකය යි.

ඒ මේ සක්කලොකයෙහි රහත්බවට පැමිණි තැන් පටන් ක්ලේශවෘත්තය ක්ෂය කළ බැවින් ගෙවූ බැවින් සොපාදිශේෂ නිර්වාණධාතුවෙන් ද, චරිමචිත්තනිරෝධයෙන් දවසක් හුස්ම පිට කිරීමෙන් පෙර ජාතිවල කළ කර්මයාගේ විපාක වශයෙන් මෙලොව ලත් සක්කයන් ද, ක්ෂය කළ හෙයින් අනුපාදිශේෂනිර්වාණධාතු වෙන් දැ, යි ද්විවිධ වූ ම නිර්වාණයෙන් පිරිනිවියාහු තෙල් නැති පහනක් මෙන් අපණ්ණත්තිකභාවයට හෙවත් සත්ත්වපුද්ගලාදි වශයෙන් නො පැණවියයුතු බවට පැමිණෙන්නාහ. එහෙයිනි **පරිනිබ්බුතා,** යි වදාළෝ. **'අරහත්තප්පත්තිතො පඨාය කිලෙස**

වට්ටස්ස බෙපිතත්තා සොපාදිසෙසෙන චරිමචිත්තනිරොධෙන ඛන්ධවට්ටස්ස බෙපිතත්තා අනුපාදිසෙසෙන චාති චීහිපි පරිනිබ්බානෙහි පරිනිබ්බුතා අනුපාදානො විය පදීපො අපණ්ණත්තිකභාවං ගතාති අත්ථො' යනු අටුවා ය.

දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

පන්සියයක් ආගතතුකභික්ෂුන්ගේ වස්තුව නිමියේ ය.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී පණ්ඩිත **අම්බලම්ගොඩ ධම්මකුසල** නායක ස්ථවිරයන් කළ **සඩමීසාගර** නම් වූ **ධර්මපදවර්ණනාවෙහි** පණ්ඩිතවර්ගාත්මක ෂෂ්ඨතරඞ්ගය නිමියේ ය.